# පටුන

## අකුසලචිත්ත සඞ්ග්‍රහය


ත්‍රිපිටක ධර්මය බෙදෙන ක්‍රම:— ........ 6

අභිධර්මය බුද්ධභාෂිතයක් නොවේ යැයි නොකියයුතුයි:— ........ 29

සප්තප්‍රකරණයෙහි බෙදීම:— ........ 35

කථාවත්ථුප්පකරණය බුද්ධභාෂිතයක් ද? ........ 55

අභිධර්මය ලැබුණු ආකාරය:— ........ 58

අභිධර්මයට නිදනයක් නැත්තේ ද? ........ 60

ප්‍රථම ආභිධම්මිකයා කවරහු ද? ........ 68

කවර අර්ථයකින් අභිධර්මය නම් වෙයි ද? ........ 69

අභිධර්මයෙහි ගම්භීර භාවය:— ........ 76

අභිධර්මය ඉගෙනීම කළයුතු ආකාර:— ........ 83

අභිධර්මය ඉගෙනීමෙහි වැදගත්කම:— ........ 85

නියම ධර්මකථිකයා යනු කවරෙක් ද? ........ 86

සතර පරමාර්ථ හා එහි ස්වරූපාර්ථයෝ:— ........ 87

චිත්තය භූමි වශයෙන් හා ජාති වශයෙන් බෙද දැක්වීම:— ........ 89

චිත්තය යනු:— ........ 121

සිතට වෙනත් නම්:— ........ 156

චිත්ත පදය සෑදෙන මූල ධාතු:— ........ 162

ලක්ෂණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨානයන්ගේ අර්ථ:— ........ 163

චිත්තයාගේ ලක්ෂණාදිය:— ........ 166

චිත්තයාගේ ආයුෂ:— ........ 169

චිත්තය වහා වෙනස් වන සුළු ධර්මයකි:— ........ 171

චිත්තය තනිව උපදී ද? ........ 175

චිත්තය හදයවත්ථුව ඇසුරුකොට උපදින ආකාරය:— ........ 175

සහගත ශබ්දයෙහි අර්ථ:— ........ 176

සිත සෝමනස්සාදී වශයෙන් බෙදීමට හේතු:— ...................................178

සිත සෝමනස්ස උපේක්‍ෂාසහගත වීමට හේතු:— ...............................179

චිත්තයාගේ අසඞ්ඛාර සසඞ්ඛාර භේදය:— .....................................192

වේදනා හා සඞ්ඛාරභේදයට මෝහ මූල සිත පත්නොවීමට හේතු:—......210

අකුසල පදය විස්තර කර ඇති අයුරු:— .........................................218

පාප පදය විස්තර කර ඇති අයුරු:— .............................................222

අකුසල චිත්තයාගේ ලක්‍ෂණාදිය:— ................................................222

ලෝභ සිත මුලින් දැක්වීමට හේතු:— ...............................................224

දෙළොස් අකුසල් සිත්:— ..................................................................226

අකුසල් සිත උපදින ආකාරය:— ......................................................227

ඉෂ්ටාරම්මණයෙහි කෙසේ කුසල් සිත් පහළ වේද? ........................... 253

අකුසල චිත්තයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම්:— ................................256

## අහේතුකචිත්ත සඞ්ග්‍රහය ................................... 257

අහේතුක යනු:— ............................................................................ 257

විපාක යනු:— .................................................................................266

ආරම්මණයාගේ ඉෂ්ට අනිෂ්ට භේද:— ...........................................276

අටළොස් අහේතුක චිත්තයෝ:— ....................................................294

අහේතුක චිත්තයන්ගේ ධාත්වර්ථ:—................................................297

චක්ඛුවිඤ්ඤාණාදි අහේතුක විපාක සිත් ඉපදීමට හේතු:— .................302

පඤ්ච විඤ්ඤාණයන්ගෙන් අන්‍ය සිත් ඉපදීමට හේතු:—......................314

කායවිඤ්ඤාණය ආපෝධාතුව හේතුකොටගෙන උපදී ද?....................315

අහේතුක විපාක චිත්තයන්ගේ ලක්‍ෂණාදිය:— .................................. 327

අහේතුක විපාක සිත් උපදින ආකාරය:—.........................................341

අහේතුක චිත්තයෝ වේදනා භේදයෙන් වෙනස්වීමට හේතු:—............. 352

ද්විපඤ්ච විඤ්ඤාණයෙහි සම්පත්ත-අසම්පත්ත භේදය:— ................364

පඤ්චවිඤ්ඤාණයෝ කුසල් ද? අකුසල් ද? .......................................384

සම්පටිච්ඡන සිතට වඩා සන්තීරණ සිත බලවත් වන්නේ ඇයි? ............387
අකුසල සන්තීරණ එකක්ම කියන ලද්දේ කුමක්හෙයින් ද? ....................388
වොත්ථපනය සන්තීරණය මෙන් වේදනා භේදයක් නැත්තේ ඇයි?.........393
අහේතුක ක්‍රියා යනුඃ— ......................................................................397
අහේතුක ක්‍රියා සිත් ඉපදීමට හේතුඃ— ..............................................400
අහේතුක ක්‍රියා චිත්තයන්ගේ ලක්‍ෂණාදියඃ—.................................... 401
අහේතුක ක්‍රියා සිත් උපදින ආකාරයඃ— ...........................................404
හසිතය සෝමනස් වී ආවර්ජන දෙදෙන උපේක්‍ෂා වීමටහේතුඃ— ..........417
භාග්‍යවතුන් වහන්සේට හසිතුප්පාද චිත්තය උපදී ද? ........................ 418
ආවර්ජන දෙදෙන විපාක නොදීමට හේතුඃ— ....................................424
අහේතුක චිත්තයන්ගේ අර්ථඃ— ........................................................424
අහේතුක චිත්තයන්ගේ ස්වරූපාර්ථයෝඃ—.........................................465

## කාමාවචර සෝභනචිත්ත සඞ්ග්‍රහය ..................... 467

කුසල පදය විස්තර කර ඇති අයුරුඃ— ..............................................467
පුඤ්ඤ පදය විස්තර කර ඇති අයුරුඃ— ............................................486
කුසලපදයෙහි ධාත්වර්ථඃ—..............................................................489
පුඤ්ඤපදයෙහි ධාත්වර්ථඃ—.............................................................490
කාමාවචර කුසලචිත්තයෝ අටදෙනඃ— ............................................. 491
කාමාවචර කුසලචිත්තයාගේ ලක්‍ෂණාදියඃ— ..................................... 491
කුසලචිත්තය ඤාණසම්පයුත්ත හා විප්පයුත්ත වීමට හේතුඃ— ............502
ඤාණය නැති කල සිත වනාහි කෙසේ කුසල් වන්නේ ද? ......................522
කාමාවචර කුසල් සිතෙහි හීන ප්‍රණීත භාවයඃ— ..................................524
කාමාවචර කුසල සිත උපදින ආකාරයඃ— ..........................................527
කුසල් අකුසල් අතරින් බලවත් කුමක් ද?...........................................542
සෝමනස්ස-උපේක්‍ෂා දෙදෙනාගේ බලව-දුබල භාවයඃ—....................550
කාමකුසල චිත්තයට “මහාකුසල සිත” යැයි කියනුයේ ඇයි?...............565

"සහේතුක" ශබ්දය විපාක-ක්‍රියාවන්ට කීමට හේතු:— ........................ 567
කාමාවචර කුසල් සිත් වැඩිවන ආකාරය:— ........................ 568
එක්විසි කුසල්සිත්හි අභිධෙයාර්ථ:— ........................ 575
කාමාවචර විපාක ක්‍රියා චිත්තයෝ:— ........................ 575
විපාක-ක්‍රියා චිත්තයන්ගේ ලක්‍ෂණාදිය:— ........................ 576
කාමාවචර විපාක-ක්‍රියා චිත්තය විස්තර කර ඇති අයුරු:— ........................ 579
කාමාවචර විපාක-ක්‍රියා චිත්තයන් වැඩිවන ආකාරය:— ........................ 596

## මහග්ගතචිත්ත සඞ්ග්‍රහය........................ 597

රූපාවචර කුසලචිත්තයෝ පස්දෙන:— ........................ 597
රූපාවචර කුසල චිත්තය විස්තර කර ඇති ආකාරය:— ........................ 598
රූපාවචර සිත පුද්ගලයන් පෙරටු කොට දේශනා කිරීමටහේතු:— ........................ 607
සතර ප්‍රතිපදාවෝ:— ........................ 608
ධ්‍යාන සිත උපදවන්නට අරමුණු සතරකි:— ........................ 621
ධ්‍යාන සිත බෙදී යන ආකාර:— ........................ 624
ධ්‍යාන සිත චතුෂ්ක-පඤ්චක ක්‍රමයෙන් දේශනා කිරීමට හේතු:— ........................ 629
විතර්කාදී ධර්ම පසට ධ්‍යාන යැයි කීමට හේතු:— ........................ 634
ධ්‍යානය දෙවැදෑරුම් වෙයි:— ........................ 649
රූපාවචර සිත සඞ්ඛාර භේදයකට පත් නොවන්නේ ඇයි? ........................ 650
විතර්ක විචාරයන් ප්‍රහීණ වන ආකාරය:— ........................ 662
අභිභායතන යනු:— ........................ 663
  සූත්‍රාන්ත ක්‍රමයට අභිභායතන ........................ 663
  අභිධර්ම ක්‍රමයට අභිභායතන ........................ 679
රූපාවචර විපාක ක්‍රියා චිත්තයෝ:— ........................ 711
රූපාවචර විපාක-ක්‍රියා සිත් විස්තර කර ඇති ආකාරය:— ........................ 712
අරූපාවචර කුසල චිත්තයෝ:— ........................ 722
අරූපාවචර කුසල චිත්තය විස්තර කර ඇති ආකාරය:— ........................ 723

අරූපාවචර විපාක ක්‍රියා චිත්තයෝ:—............................................749
අරූපාවචර විපාක-ක්‍රියා සිත් විස්තර කර ඇති ආකාරය:— ..............750

## ලෝකෝත්තර චිත්ත සඞ්ග්‍රහය ........................... 753

ලෝකෝත්තර කුසල් චිත්තයෝ සිව් දෙන:—..................................... 753
ලෝකෝත්තර කුසල චිත්තය විස්තර කර ඇති ආකාරය:— ............... 753
මාර්ග සිත් නය ක්‍රමවලට බෙදෙන ආකාරය:— .................................. 775
ලෝකෝත්තර විපාක චිත්තයෝ සිව් දෙන:—....................................780
ලෝකෝත්තර විපාක සිත විස්තර කර ඇති ආකාරය:—.....................780
ලෝකෝත්ත්‍ර ක්‍රියා සිත් නොලැබීමට හේතු:— .....................................784
ලෝකෝත්තර සිත්වල විස්තාර ක්‍රමය:—..........................................788

# විස්තර වර්ණනා සහිත අභිධර්මාර්ථ සඞ්ග්‍රහය

## චිත්තසඞ්ග්‍රහවිභාගය - ප්‍රථම පරිච්ඡේදය

### නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

## අකුසලචිත්ත සඞ්ග්‍රහය

### ත්‍රිපිටක ධර්මය බෙදෙන ක්‍රම:—

"සාමඤ්ඤඵලං පනාවුසෝ ආනන්ද, කත්ථ භාසිත"න්ති? 'රාජගහේ භන්තේ, ජීවකම්බවනේ"ති. "කේන සද්ධි"න්ති? "අජාතසත්තුනා වේදේහිපුත්තේන සද්ධි"න්ති. අථ ඛෝ ආයස්මා මහාකස්සපෝ ආයස්මන්තං ආනන්දං සාමඤ්ඤඵලස්ස නිදානම්පි පුච්ඡි, පුග්ගලම්පි පුච්ඡි. ඒතේනේව උපායේන පඤ්චනිකායෝ පුච්ඡි. **පඤ්චනිකායා** නාම දීඝනිකායෝ, මජ්ඣිමනිකායෝ, සංයුත්තනිකායෝ, අඞ්ගුත්තරනිකායෝ, ඛුද්දකනිකායෝති. තත්ථ ඛුද්දකනිකායෝ නාම චත්තාරෝ නිකායේ ඨපෙත්වා, අවසේසං බුද්ධවචනං. තත්ථ විනයෝ ආයස්මතා උපාලිත්ථේරේන විස්සජ්ජිතෝ, සේසඛුද්දකනිකායෝ චත්තාරෝ ච නිකායා ආනන්දත්ථේරේන. තදේතං සබ්බම්පි බුද්ධවචනං රසවසේන ඒකවිධං, ධම්මවිනයවසේන දුවිධං, පඨමමජ්ඣිමපච්ඡිමවසේන තිවිධං; තථා පිටකවසේන, නිකායවසේන පඤ්චවිධං, අඞ්ගවසේන නවවිධං, ධම්මක්ඛන්ධවසේන චතුරාසීතිසහස්සවිධන්ති වේදිතබ්බං.

කථං රසවසේන **ඒකවිධං**? යඤ්හි භගවතා අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුජ්ඣිත්වා යාව අනුපාදිසේසාය නිබ්බානධාතුයා පරිනිබ්බායති, එත්ථන්තරේ පඤ්චචත්තාලීසවස්සානි දේවමනුස්සනාගයක්ඛාදයෝ අනුසාසන්තේන පච්චවෙක්ඛන්තේන වා වුත්තං, සබ්බං තං ඒකරසං විමුත්තිරසමේව හෝති. ඒවං රසවසේන ඒකවිධං.

කථං **ධම්මවිනයවසේන දුවිධං**? සබ්බමේව චේතං ධම්මෝ චේව විනයෝ චාති සඞ්ඛ්‍යං ගච්ඡති. තත්ථ විනයපිටකං **විනයෝ,** අවසේසං බුද්ධවචනං **ධම්මෝ;** තේනේවාහ "යංනූන මයං, ආවුසෝ, ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායෙය්‍යාමා"ති. "අහං උපාලිං විනයං පුච්ඡෙය්‍යං, ආනන්දං ධම්මං පුච්ඡෙය්‍ය"න්ති ච ඒවං ධම්මවිනයවසේන දුවිධං.

කථං **පඨමමජ්ඣිමපච්ඡිමවසේන තිවිධං**? සබ්බමේව හිදං පඨමබුද්ධවචනං, මජ්ඣිමබුද්ධවචනං, පච්ඡිමබුද්ධවචනන්ති තිප්පභේදං හෝති. තත්ථ

"අනේකජාතිසංසාරං, සන්ධාවිස්සං අනිබ්බිසං;
ගහකාරං ගවේසන්තෝ, දුක්ඛා ජාති පුනප්පුනං.

"ගහකාරක දිට්ඨෝසි, පුන ගේහං න කාහසි;
සබ්බා තේ ඵාසුකා භග්ගා, ගහකූටං විසඞ්ඛතං;
විසඞ්ඛාරගතං චිත්තං, තණ්හානං ඛයමජ්ඣගා"ති. (ධ. ප. 153-154); ඉදං **පඨමබුද්ධවචනං.**

කේචි "යදා හවේ පාතුභවන්ති ධම්මා"ති **ඛන්ධකේ** උදානගාථං ආහු. ඒසා පන පාටිපදදිවසේ සබ්බඤ්ඤුභාවප්පත්තස්ස සෝමනස්සමයඤාණේන පච්චයාකාරං පච්චවෙක්ඛන්තස්ස උප්පන්නා උදානගාථාති වේදිතබ්බා.

යං පන පරිනිබ්බානකාලේ අභාසි "හන්ද දානි, භික්ඛවේ, ආමන්තයාමි වෝ, වයධම්මා සඞ්ඛාරා, අප්පමාදේන සම්පාදේථා"ති (දී. නි. 2.218) ඉදං **පච්ඡිමබුද්ධවචනං.**

උභින්නමන්තරේ යං වුත්තං ඒතං **මජ්ඣිමබුද්ධවචන**න්ති. ඒවං පඨමමජ්ඣිමපච්ඡිමවසේන තිවිධං.

කථං **පිටකවසේන තිවිධං?** සබ්බම්පි හේතං විනයපිටකං සුත්තන්තපිටකං අභිධම්මපිටකන්ති තිප්පභේදමේව හෝති. තත්ථ පඨමසඞ්ගීතියං සඞ්ගීතඤ්ච අසඞ්ගීතඤ්ච සබ්බම්පි සමෝධානෙත්වා උභයානි පාතිමොක්ඛානි, ද්වේ විභඞ්ගානි, ද්වාවීසති ඛන්ධකානි, සෝළසපරිවාරාති ඉදං **විනයපිටකං** නාම.

බ්‍රහ්මජාලාදි චතුත්තිංසසුත්තසඞ්ගහෝ දීඝනිකායෝ, මූලපරියායසුත්තාදි දියඩ්ඪසතද්වේසුත්තසඞ්ගහෝ මජ්ඣිමනිකායෝ, ඕඝතරණසුත්තාදි සත්තසුත්තසහස්ස සත්තසත ද්වාසට්ඨිසුත්තසඞ්ගහෝ සංයුත්තනිකායෝ, චිත්තපරියාදානසුත්තාදි නවසුත්තසහස්ස පඤ්චසත සත්තපඤ්ඤාසසුත්තසඞ්ගහෝ අඞ්ගුත්තරනිකායෝ, ඛුද්දකපාඨ-ධම්මපද-උදාන-ඉතිවුත්තක-සුත්තනිපාත-විමාන වත්ථු-පේතවත්ථු-ථේරගාථා-ථේරීගාථා-ජාතක-නිද්දේස-පටිසම්භිදා-අපදානබුද්ධවංස-චරියාපිටකවසේන පන්නරසප්පභේදෝ ඛුද්දකනිකායෝති ඉදං **සුත්තන්තපිටකං** නාම.

ධම්මසඞ්ගහෝ, විභඞ්ගෝ, ධාතුකථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමකං, පට්ඨානන්ති ඉදං **අභිධම්මපිටකං** නාම. තත්ථ;

විවිධවිසේසනයත්තා, විනයනතෝ චේව කායවාචානං;
විනයත්ථවිදූහි අයං, විනයෝ විනයෝති අක්ඛාතෝ.

විවිධා හි ඒත්ථ පඤ්චවිධ පාතිමොක්ඛුද්දේස පාරාජිකාදි සත්තආපත්තික්ඛන්ධමාතිකා විභඞ්ගාදිප්පභේදා නයා, විසේසභූතා ච දළ්හීකම්මසිථිලකරණප්පයෝජනා අනුපඤ්ඤත්තිනයා, කායිකවාචසිකඅජ්ඣාචාර නිසේධනතෝ චේස කායං වාචඤ්ච විනේති, තස්මා විවිධනයත්තා විසේසනයත්තා

කායවාචානඤ්ච විනයනතෝ “විනයෝ”ති අක්ඛාතෝ. තේනේතමේතස්ස වචනත්ථකෝසල්ලත්ථං වුත්තං;

“විවිධවිසේසනයත්තා, විනයනතෝ චේව කායවාචානං;
විනයත්ථවිදූහි අයං, විනයෝ විනයෝති අක්ඛාතෝ”ති.

ඉතරං පන;

අත්ථානං සූචනතෝ, සුවුත්තතෝ සවනතෝ ච සූදනතෝ;
සුත්තාණා සුත්තසභාගතෝ ච, සුත්තන්ති අක්ඛාතං.

තඤ්හි අත්තත්ථපරත්ථාදිභේදේ අත්ථේ සූචේති, සුවුත්තා චෙත්ථ අත්ථා වේනෙය්‍යජ්ඣාසයානුලෝමේන වුත්තත්තා. සවති චේතං අත්ථේ සස්සමිව ඵලං පසවතීති වුත්තං හෝති. සූදති චේතං ධේනුවිය ඛීරං, පග්ඝරතීති වුත්තං හෝති. සුට්ඨු ච නේ තායති රක්ඛතීති වුත්තං හෝති. සුත්තසභාගඤ්චේතං, යථා හි තච්ඡකානං සුත්තං පමාණං හෝති; ඒවමේතම්පි විඤ්ඤූනං. යථා ච සුත්තේන සඞ්ගහිතානි පුප්ඵානි න විකිරියන්ති න විද්ධංසියන්ති; ඒවමේතේන සඞ්ගහිතා අත්ථා. තේනේතමේතස්ස වචනත්ථකෝසල්ලත්ථං වුත්තං;

“අත්ථානං සූචනතෝ, සුවුත්තතෝ සවනතෝ ච සූදනතෝ;
සුත්තාණා සුත්තසභාගතෝ ච, සුත්තන්ති අක්ඛාත”න්ති.

ඉතරෝ පන;

යං එත්ථ වුඩ්ඪිමන්තෝ, සලක්ඛණා පූජිතා පරිච්ඡින්නා;
වුත්තාධිකා ච ධම්මා, අභිධම්මෝ තේන අක්ඛාතෝ.

අයඤ්හි අභිසද්දෝ වුඩ්ඪිලක්ඛණපූජිතපරිච්ඡින්නාධිකේසු දිස්සති. තථාහේස “බාළ්හා මේ ආවුසෝ දුක්ඛා වේදනා අභික්කමන්ති නෝ පටික්කමන්තී”ති ආදීසු (ම. නි. 3.389; සං. නි. 5.195) වුඩ්ඪියං ආගතෝ. “යා තා රත්තියෝ අභිඤ්ඤාතා අභිලක්ඛිතා”ති ආදීසු (ම. නි. 1.49) ලක්ඛණේ. “රාජාභිරාජා මනුජින්දෝ”ති ආදීසු (ම. නි. 2.399; සු. නි. 558) පූජිතේ. “පටිබලෝ විනේතුං අභිධම්මේ අභිවිනයේ”ති ආදීසු (මහාව. 85) පරිච්ඡින්නේ. අඤ්ඤමඤ්ඤසඞ්කරවිරහිතේ ධම්මේ ච විනයේ චාති වුත්තං හෝති. “අභික්කන්තේන වණ්ණේනා”ති ආදීසු (වි. ව. 75) අධිකේ.

එත්ථ ච “රූපූපපත්තියා මග්ගං භාවේති, මෙත්තාසහගතේන චේතසා ඒකං දිසං ඵරිත්වා විහරතී”ති ආදිනා (ධ. ස. 160 ආදයො) නයේන වුඩ්ඪිමන්තෝපි ධම්මා වුත්තා. “රූපාරම්මණං වා සද්දාරම්මණං වා”ති ආදිනා නයේන ආරම්මණාදීහි ලක්ඛණීයත්තා සලක්ඛණාපි. “සෙක්ඛා ධම්මා, අසෙක්ඛා ධම්මා, ලෝකුත්තරා ධම්මා”ති ආදිනා නයේන පූජිතාපි පූජාරහාති අධිප්පායෝ. “ඵස්සෝ හෝති වේදනා හෝතී”ති ආදිනා නයේන සභාවපරිච්ඡින්නත්තා පරිච්ඡින්නාපි. “මහග්ගතා ධම්මා, අප්පමාණා ධම්මා, අනුත්තරා ධම්මා”ති ආදිනා නයේන අධිකාපි ධම්මා වුත්තා. තේනේතමේතස්ස වචනත්ථකෝසල්ලත්ථං වුත්තං;

“යං එත්ථ වුඩ්ඪිමන්තෝ, සලක්ඛණා පූජිතා පරිච්ඡින්නා;
වුත්තාධිකා ච ධම්මා, අභිධම්මෝ තෙන අක්ඛාතෝ”ති.

යං පනෙත්ථ අවිසිට්ඨං, තං

පිටකං පිටකත්ථවිදූ, පරියත්තිබ්භාජනත්ථතෝ ආහු;
තේන සමෝධානෙත්වා, තයෝපි විනයාදයෝ ඤෙය්‍යා.

පරියත්තිපි හි “මා පිටකසම්පදානේනා”ති ආදීසු (අ. නි. 3.66) පිටකන්ති වුච්චති. “අථ පුරිසෝ ආගච්ඡෙය්‍ය කුදාලපිටකං ආදායා”ති ආදීසු (ම. නි. 1.228; අ. නි. 3.70) යං කිඤ්චි භාජනම්පි. තස්මා පිටකං පිටකත්ථවිදූ, පරියත්තිබ්භාජනත්ථතෝ ආහු.

ඉදානි **තේන සමෝධානෙත්වා තයෝපි විනයාදයෝ ඤෙය්‍යා**ති. තේන ඒවං දුවිධත්ථේන පිටකසද්දේන සහ සමාසං කත්වා විනයෝ ච සෝ පිටකඤ්ච පරියත්තිභාවතෝ තස්ස තස්ස අත්ථස්ස භාජනතෝ චාති විනයපිටකං, යථාවුත්තේනේව නයේන සුත්තන්තඤ්ච තං පිටකඤ්චාති සුත්තන්තපිටකං, අභිධම්මෝ ච සෝ පිටකඤ්චාති අභිධම්මපිටකන්ති ඒවමේතේ තයෝපි විනයාදයෝ ඤෙය්‍යා.

ඒවං ඤත්වා ච පුනපි තේස්වේව පිටකේසු නානප්පකාරකෝසල්ලත්ථං;

දේසනාසාසනකථා, භේදං තේසු යථාරහං;
සික්ඛාපහානගම්භීර, භාවඤ්ච පරිදීපයේ.

පරියත්තිභේදං සම්පත්තිං, විපත්තිං චාපි යං යහිං;
පාපුණාති යථා භික්ඛු, තම්පි සබ්බං විභාවයේ.

තත්‍රායං පරිදීපනා විභාවනා ච, ඒතානි හි තීණි පිටකානි යථාක්කමං ආණා වෝහාර පරමත්ථදේසනා යථාපරාධ-යථානුලෝම-යථාධම්මසාසනානි, සංවරාසංවර-දිට්ඨිවිනිවේඨ-නාමරූපපරිච්ඡේදකථාති ච වුච්චන්ති.

එත්ථ හි විනයපිටකං ආණාරහේන භගවතා ආණාබාහුල්ලතෝ දේසිතත්තා **ආණාදේසනා,** සුත්තන්තපිටකං වෝහාරකුසලේන භගවතා වෝහාරබාහුල්ලතෝ දේසිතත්තා **වෝහාරදේසනා,** අභිධම්මපිටකං පරමත්ථකුසලේන භගවතා පරමත්ථබාහුල්ලතෝ දේසිතත්තා **පරමත්ථදේසනා**ති වුච්චති.

තථා පඨමං යේ තේ පචුරාපරාධා සත්තා තේ යථාපරාධං එත්ථ සාසිතාති **යථාපරාධසාසනං,** දුතියං අනේකජ්ඣාසයානුසයචරියාධිමුත්තිකා සත්තා යථානුලෝමං එත්ථ සාසිතාති **යථානුලෝමසාසනං,** තතියං ධම්මපුඤ්ජමත්තේ “අහං මමා”ති සඤ්ඤිනෝ සත්තා යථාධම්මං එත්ථ සාසිතාති **යථාධම්මසාසන**න්ති වුච්චති.

තථා පඨමං අජ්ඣාචාරපටිපක්ඛභූතෝ සංවරාසංවරෝ එත්ථ කථිතෝති **සංවරාසංවරකථා,** දුතියං ද්වාසට්ඨිදිට්ඨිපටිපක්ඛභූතා දිට්ඨිවිනිවේඨනා එත්ථ කථිතාති **දිට්ඨිවිනිවේඨනකථා,** තතියං රාගාදිපටිපක්ඛභූතෝ නාමරූපපරිච්ඡේදෝ එත්ථ කථිතෝති **නාමරූපපරිච්ඡේදකථා**ති වුච්චති.

තීසුපි ච ඒතේසු තිස්සෝ සික්ඛා, තීණි පහානානි, චතුබ්බිධෝ ච ගම්භීරභාවෝ වේදිතබ්බෝ. තථා හි; විනයපිටකේ විසේසේන **අධිසීලසික්ඛා** වුත්තා, සුත්තන්තපිටකේ **අධිචිත්තසික්ඛා,** අභිධම්මපිටකේ **අධිපඤ්ඤාසික්ඛා.**

විනයපිටකේ ච **වීතික්කමප්පහානං** කිලේසානං, වීතික්කමපටිපක්ඛත්තා සීලස්ස. සුත්තන්තපිටකේ **පරියුට්ඨානප්පහානං,** පරියුට්ඨානපටිපක්ඛත්තා සමාධිස්ස. අභිධම්මපිටකේ **අනුසයප්පහානං** අනුසයපටිපක්ඛත්තා පඤ්ඤාය.

පඨමේ ච **තදඞ්ගප්පහානං** කිලේසානං, ඉතරේසු **වික්ඛම්භනසමුච්ඡේදප්පහානානි.** පඨමේ ච **දුච්චරිතසංකිලේසස්ස** පහානං, ඉතරේසු **තණ්හාදිට්ඨිසංකිලේසානං.**

ඒකමේකස්මිඤ්චෙත්ථ චතුබ්බිධෝපි ධම්මත්ථදේසනාපටිවේධගම්භීරභාවෝ වේදිතබ්බෝ. තත්ථ **ධම්මෝ**ති පාළි. **අත්ථෝ**ති තස්සායේවත්ථෝ. **දේසනා**ති තස්සා මනසාවවත්ථාපිතාය පාළියා දේසනා. **පටිවේධෝ**ති පාළියා පාළිඅත්ථස්ස ච යථාභූතාවබෝධෝ. තීසුපි චේතේසු ඒතේ ධම්මත්ථදේසනාපටිවේධා යස්මා සසාදීහි විය මහාසමුද්දෝ මන්දබුද්ධීහි දුක්ඛෝගාහා අලබ්භනෙය්‍යපතිට්ඨා ච, තස්මා ගම්භීරා. ඒවං ඒකමේකස්මිං එත්ථ චතුබ්බිධෝපි ගම්භීරභාවෝ වේදිතබ්බෝ.

අපරෝ නයෝ **ධම්මෝ**ති හේතු. වුත්තං හේතං "හේතුම්හි ඤාණං ධම්මපටිසම්භිදා"ති. **අත්ථෝ**ති හේතුඵලං. වුත්තං හේතං "හේතුඵලේ ඤාණං අත්ථපටිසම්භිදා"ති. **දේසනා**ති පඤ්ඤත්ති, යථාධම්මං ධම්මාභිලාපෝති අධිප්පායෝ. **පටිවේධෝ**ති අභිසමයෝ, සෝ ච ලෝකියලෝකුත්තරෝ විසයතෝ අසම්මෝහතෝ ච අත්ථානුරූපං ධම්මේසු, ධම්මානුරූපං අත්ථේසු, පඤ්ඤත්තිපථානුරූපං පඤ්ඤත්තීසු අවබෝධෝ.

ඉදානි යස්මා ඒතේසු පිටකේසු යං යං ධම්මජාතං වා අත්ථජාතං වා, යා චායං යථා යථා ඤාපේතබ්බෝ අත්ථෝ සෝතූනං ඤාණස්ස අභිමුඛෝ හෝති, තථා තථා තදත්ථජෝතිකා දේසනා, යෝ චෙත්ථ අවිපරීතාවබෝධසඞ්ඛාතෝ පටිවේධෝ සබ්බමේතං අනුපචිතකුසලසම්භාරේහි දුප්පඤ්ඤේහි සසාදීහි විය මහාසමුද්දෝ දුක්ඛෝගාහං අලබ්භනෙය්‍යපතිට්ඨඤ්ච, තස්මා ගම්භීරං. ඒවම්පි ඒකමේකස්මිං එත්ථ චතුබ්බිධෝපි ගම්භීරභාවෝ වේදිතබ්බෝ.

කථං නිකායවසේන පඤ්චවිධං? සබ්බමේව චේතං දීඝනිකායෝ, මජ්ඣිමනිකායෝ, සංයුත්තනිකායෝ, අඞ්ගුත්තරනිකායෝ, ඛුද්දකනිකායෝති පඤ්චප්පභේදං හෝති. තත්ථ කතමෝ **දීඝනිකායෝ**? තිවග්ගසඞ්ගහානි බ්‍රහ්මජාලාදීනි චතුත්තිංස සුත්තානි.

චතුත්තිංසේව සුත්තන්තා, තිවග්ගෝ යස්ස සඞ්ගහෝ;
ඒස දීඝනිකායෝති, පඨමෝ අනුලෝමිකෝ.

කස්මා පනේස දීඝනිකායෝති වුච්චති? දීඝප්පමාණානං සුත්තානං සමූහතෝ නිවාසතෝ ච, සමූහනිවාසා හි නිකායෝති වුච්චන්ති. "නාහං, භික්ඛවේ, අඤ්ඤං ඒකනිකායම්පි සමනුපස්සාමි ඒවං චිත්තං; යථයිදං, භික්ඛවේ, තිරච්ඡානගතා පාණා; පෝණිකනිකායෝ, චික්ඛල්ලිකනිකායෝ"ති (සං. නි. 3.100) ඒවමාදීනි චෙත්ථ සාධකානි සාසනතෝ ච ලෝකතෝ ච. ඒවං සේසානම්පි නිකායභාවේ වචනත්ථෝ වේදිතබ්බෝ.

කතමෝ **මජ්ඣිමනිකායෝ**? මජ්ඣිමප්පමාණානි පඤ්චදසවග්ගසඞ්ගහානි මූලපරියායසුත්තාදීනි දියඩ්ඪසතං ද්වේ ච සුත්තානි.

දියඩ්ඪසතං සුත්තන්තා, ද්වේ ච සුත්තානි යත්ථ සෝ;
නිකායෝ මජ්ඣිමෝ පඤ්ච-දසවග්ගපරිග්ගහෝ.

කතමෝ **සංයුත්තනිකායෝ**? දේවතාසංයුත්තාදිවසේන ඨිතානි ඕඝතරණාදීනි සත්ත සුත්තසහස්සානි සත්ත ච සුත්තසතානි ද්වාසට්ඨි ච සුත්තානි.

සත්ත සුත්තසහස්සානි, සත්ත සුත්තසතානි ච;
ද්වාසට්ඨි චේව සුත්තන්තා, ඒසෝ සංයුත්තසඞ්ගහෝ.

කතමෝ **අඞ්ගුත්තරනිකායෝ**? ඒකේකඅඞ්ගාතිරේකවසේන ඨිතානි චිත්තපරියාදනාදීනි නව සුත්තසහස්සානි පඤ්ච සුත්තසතානි සත්තපඤ්ඤාසඤ්ච සුත්තානි.

නව සුත්තසහස්සානි, පඤ්ච සුත්තසතානි ච;
සත්තපඤ්ඤාස සුත්තානි, සඞ්ඛ්‍යා අඞ්ගුත්තරේ අයං.

කතමෝ **ඛුද්දකනිකායෝ**? සකලං විනයපිටකං අභිධම්මපිටකං ඛුද්දකපාඨාදයෝ ච පුබ්බේ නිදස්සිතා පන්නරසභේද ඨපෙත්වා චත්තාරෝ නිකායේ අවසේසං බුද්ධවචනන්ති.

ඨපෙත්වා චතුරෝපේතේ, නිකායේ දීඝආදිකේ;
තදඤ්ඤං බුද්ධවචනං, නිකායෝ ඛුද්දකෝ මතෝති. ඒවං නිකායවසේන පඤ්චවිධං.

කථං අඞ්ගවසේන නවවිධං? සබ්බමේව හිදං සුත්තං, ගෙය්‍යං, වෙය්‍යාකරණං, ගාථා, උදානං, ඉතිවුත්තකං, ජාතකං, අබ්භුතධම්මං, වේදල්ලන්ති නවප්පභේදං හෝති. තත්ථ උභතෝවිභඞ්ගනිද්දේසඛන්ධකපරිවාරා සුත්තනිපාතේ මඞ්ගලසුත්ත-රතනසුත්ත-නාලකසුත්ත-තුවට්ටකසුත්තානි අඤ්ඤම්පි ච සුත්තනාමකං තථාගතවචනං **සුත්ත**න්ති වේදිතබ්බං. සබ්බම්පි සගාථකං සුත්තං **ගෙය්‍ය**න්ති වේදිතබ්බං. විසේසේන සංයුත්තකේ සකලෝපි සගාථාවග්ගෝ, සකලං අභිධම්මපිටකං, නිග්ගාථකං සුත්තං, යඤ්ච අඤ්ඤම්පි අට්ඨහි අඞ්ගේහි අසඞ්ගහිතං බුද්ධවචනං තං **වෙය්‍යාකරණ**න්ති වේදිතබ්බං. ධම්මපදං, ථේරගාථා, ථේරීගාථා, සුත්තනිපාතේ නෝසුත්තනාමිකා සුද්ධිකගාථා ච **ගාථා**ති වේදිතබ්බා. සෝමනස්සඤාණමයිකගාථාපටිසංයුත්තා ද්වාසීති සුත්තන්තා **උදාන**න්ති වේදිතබ්බං. "වුත්තඤ්හේතං භගවතා"ති ආදිනයප්පවත්තා දසුත්තරසතසුත්තන්තා **ඉතිවුත්තක**න්ති වේදිතබ්බං. අපණ්ණකජාතකාදීනි පඤ්ඤාසාධිකානි පඤ්ච ජාතකසතානි **ජාතක**න්ති වේදිතබ්බං. "චත්තාරෝමේ, භික්ඛවේ, අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දේ"ති (දී. නි. 2.209) ආදිනයප්පවත්තා සබ්බේපි අච්ඡරියඅබ්භුතධම්මපටිසංයුත්තා සුත්තන්තා **අබ්භුතධම්ම**න්ති වේදිතබ්බං. චූළවේදල්ල-මහාවේදල්ල-සම්මාදිට්ඨි-සක්කපඤ්හ-සඞ්ඛාරභාජනිය-මහාපුණ්ණමේ සුත්තාදයෝ සබ්බේපි වේදඤ්ච තුට්ඨිඤ්ච ලද්ධා ලද්ධා පුච්ඡිතසුත්තන්තා **වේදල්ල**න්ති වේදිතබ්බං. ඒවං අඞ්ගවසේන නවවිධං.

කථං ධම්මක්ඛන්ධවසේන චතුරාසීතිසහස්සවිධං? සබ්බමේව චේතං බුද්ධවචනං;

"ද්වාසීති බුද්ධතො ගණ්හිං, ද්වේ සහස්සානි භික්ඛුතෝ;
චතුරාසීති සහස්සානි, යේ මේ ධම්මා පවත්තිනෝ"ති. (ථෙරගා. 1027);

ඒවං පරිදීපිතධම්මක්ඛන්ධවසේන චතුරාසීතිසහස්සප්පභේදං හෝති. තත්ථ ඒකානුසන්ධිකං සුත්තං ඒකෝ ධම්මක්ඛන්ධෝ. යං අනේකානුසන්ධිකං තත්ථ අනුසන්ධිවසේන ධම්මක්ඛන්ධගණනා. ගාථාබන්ධේසු පඤ්හාපුච්ඡනං ඒකෝ ධම්මක්ඛන්ධෝ, විස්සජ්ජනං ඒකෝ. අභිධම්මේ ඒකමේකං තික-දුක-භාජනං, ඒකමේකඤ්ච චිත්තවාරභාජනං, ඒකෝ ධම්මක්ඛන්ධෝ. විනයේ අත්ථි වත්ථු, අත්ථි මාතිකා, අත්ථි පදභාජනීයං, අත්ථි අන්තරාපත්ති, අත්ථි ආපත්ති, අත්ථි අනාපත්ති, අත්ථි පරිච්ඡේදෝ; තත්ථ ඒකමේකෝ කොට්ඨාසෝ, ඒකමේකෝ ධම්මක්ඛන්ධෝති වේදිතබ්බෝ. ඒවං ධම්මක්ඛන්ධවසේන චතුරාසීතිසහස්සවිධං.

**[පාරාජිකා අටුවා 01 (පඨමසඞ්ගායනා බාහිරනිදානකථා යටතේ) විනය අටුවා 01/09-13 පිටු (හේ.වි.මු)]**

**ආවුසෝ** ඇවැත්නි **ආනන්ද** ආනන්දයෙනි! **සාමඤ්ඤඵලං පන** සාමඤ්ඤඵල සූත්‍රය වූ කලි **කත්ථ** කොහිදී **භාසිතං ඉති** වදාරණ ලද්දේ යැයි (**පුච්ඡි** විචාළ සේක) **භන්තේ** ස්වාමිනි **රාජගහේ** රජගහනුවර **ජීවකම්බවනේ ඉති** ජීවක අඹවනයෙහි දී යැයි (**විස්සජ්ජී** විසඳූ සේක) **කේන සද්ධිං ඉති** කවරෙකු සමග දැයි (**පුච්ඡි** විචාළ සේක) **වේදේහපුත්තේන අජාතසත්තුනා සද්ධිං ඉති** වේදේහ පුත්‍ර අජාසත් රජු සමඟ යැයි (**විස්සජ්ජී** විසඳූ සේක) **අථ ඛෝ** ඉක්බිතිව **ආයස්මා මහාකස්සපෝ** ආයුෂ්මත් මහාකාශ්‍යප තෙරුන් වහන්සේ **ආයස්මන්තං ආනන්දං** ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේගෙන් **සාමඤ්ඤඵලස්ස** සාමඤ්ඤඵල සූත්‍රයාගේ **නිදානං අපි** නිදානය ද **පුච්ඡි** විචාළ සේක **පුග්ගලං අපි** පුද්ගලයා ද **පුච්ඡි** විචාළ සේක **ඒතේන උපායේන ඒව** මෙම ක්‍රමයෙන්ම **පඤ්චනිකායෝ** නිකාය පස **පුච්ඡි** විචාළ සේක **දීඝනිකායෝ** දික්සඟිය **මජ්ඣිමනිකායෝ** මැදුම්සඟිය **සංයුත්තනිකායෝ** සංයුත්සඟිය **අඞ්ගුත්තරනිකායෝ** අඞ්ගුත්තරසඟිය **ඛුද්දකනිකායෝ ඉති** කුදුගොත්සඟිය යන මොවුහු **පඤ්චනිකායා නාම** නිකාය පස නම් වෙත් **තත්ථ** ඒ නිකාය අතරින් **ඛුද්දකනිකායෝ නාම** කුදුගොත් සඟිය නම් **චත්තාරෝ නිකායේ** (දික්සඟිය ආදී) නිකාය සතර **ඨපෙත්වා** හැර **අවසේසං** ඉතිරි (සෙසු) **බුද්ධවචනං** බුද්ධවචනයයි **තත්ථ** කුදුගොත් සඟියට අයත් වූ **විනයෝ** විනය පිටකය තෙමේ **ආයස්මතා උපාලිත්ථේරේන** ආයුෂ්මත් උපාලි තෙරුන් වහන්සේ විසින් **විස්සජ්ජිතෝ** විසඳන ලදි **සේසඛුද්දකනිකායෝ ච** බුද්ධදේශනාවෙහි ඉතිරි ඛුද්දකනිකායත් **චත්තාරෝ නිකායා ච** නිකාය සතරත් **ආනන්දත්ථේරේන** ආනන්ද තෙරුන් වහන්සේ විසින් (**විස්සජ්ජිතෝ** විසඳන ලදහ) **තදේතං සබ්බම්පි බුද්ධවචනං** (තං ඒතං සබ්බං අපි) ඒ මේ සියළුම බුදුවදන **රසවසේන** රස වශයෙන් **ඒකවිධං** එක් වැදෑරුම්ය **ධම්මවිනයවසේන** ධර්ම විනය වශයෙන් **දුවිධං** දෙවැදෑරුම්ය **පඨමමජ්ඣිමපච්ඡිමවසේන** ප්‍රථම බුද්ධ වචනය මධ්‍යම බුද්ධවචනය පශ්චිම බුද්ධවචනය වශයෙන් **තිවිධං** තෙවැදෑරුම්ය **තථා පිටකවසේන** එසේම පිටක වශයෙන් (තෙවැදෑරුම්ය) **නිකායවසේන** නිකාය වශයෙන් **පඤ්චවිධං** පස් වැදෑරුම්ය **අඞ්ගවසේන** අඞ්ග වශයෙන් **නවවිධං** නව වැදෑරුම්ය **ධම්මක්ඛන්ධවසේන** ධර්මස්කන්ධ වශයෙන් **චතුරාසීතිසහස්සවිධං ඉති** සූවාසූදහස් ප්‍රකාර යැයි **වේදිතබ්බං** දතයුතුය.

**රසවසේන** රස වශයෙන් **ඒකවිධං** එක් වැදෑරුම් වනුයේ **කථං?** කෙසේද යත්? **යං හි** යම්කලෙක වනාහි (**භගවා** භාග්‍යවතුන් වහන්සේ) **අනුත්තරං** උතුම් වූ **සම්මාසම්බෝධිං** සම්මාසම්බෝධිය **අභිසම්බුජ්ඣිත්වා** අවබෝධ කොට

**අනුපාදිසේසාය නිබ්බානධාතුයා** අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් **යාව පරිනිබ්බායති** පිරිනිවන්පෑම දක්වා **එත්තන්තරේ** මේ අතරතුර **පඤ්චචත්තාළීසවස්සානි** පන්සාලිස් වසක් **දේවමනුස්සනාගයක්ඛාදයෝ** දෙවි-මිනිස්-නා-යක් ආදීන්ට **අනුසාසෙන්තේන වා** අනුශාසනා කරන්නා වූ හෝ **පච්චවෙක්ඛන්තේන වා** උදන වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ හෝ **භගවතා** භාග්‍යවතුන් වහන්සේ විසින් **වුත්තං** වදළා වූ **තං සබ්බං** ඒ සියළු ධර්මය **ඒකරසං** එකම රසයවූ **විමුත්තිරසං ඒව** විමුක්ති රසයම **හෝති** (ගෙනදෙන්නේ) වෙයි **ඒවං** මෙසේ **රසවසේන** රස වශයෙන් **ඒකවිධං** එක් වැදෑරුම්ය.

**ධම්මවිනයවසේන** ධර්ම විනය වශයෙන් **දුවිධං** දෙවැදෑරුම් වූයේ **කථං?** කෙසේද යත්? **ඒතං සබ්බං ඒව** මේ සියළුම බුද්ධවචනය **ධම්මෝ ච** ධර්මය ද **විනයෝ ච** විනය ද **ඉති සඞ්ඛ්‍යං** යන මේ ගිණීමට **ගච්ඡති** යයි **තත්‍ථ** එහි **විනයපිටකං** විනය පිටකය තෙමේ **විනයෝ** විනය නම් වෙයි **අවසේසං** ඉතිරි **බුද්ධවචනං** බුද්ධවචනය **ධම්මෝ** ධර්මය නම් වෙයි "**අවුසෝ** ඇවැත්නි **මයං** අපි **ධම්මඤ්ච** ධර්මයත් **විනයඤ්ච** විනයත් **සඞ්ගායෙය්‍යාම** සඞ්ගායනා කරන්නෙමු නම් **යන්නූන** යෙහෙකි" **ඉති ච** යනුවෙන් ද "**අහං** මම **උපාලිං** උපාලි තෙරුන් වහන්සේගෙන් **විනයං** විනය **පුච්ඡෙය්‍යං** විචාරන්නෙමි **ආනන්දං** ආනන්ද තෙරුන් වහන්සේගෙන් **ධම්මං** ධර්මය **පුච්ඡෙය්‍යං** විචාරන්නෙමි" **ඉති ච** යනුවෙන් ද **තේන ඒව** ඒ නිසාම **ආහ** මහාකාශ්‍යප තෙරුන් වහන්සේ වදළ සේක **ඒවං** මෙසේ **ධම්මවිනයවසේන** ධර්ම විනය වශයෙන් **දුවිධං** දෙවැදෑරුම්ය.

**පඨමමජ්ඣිමපච්ඡිමවසේන** ප්‍රථම බුද්ධවචනය මධ්‍යම බුද්ධවචනය පච්ඡිම බුද්ධවචනය වශයෙන් **තිවිධං** තෙවැදෑරුම් වූයේ **කථං?** කෙසේද යත්? **ඉදං සබ්බං ඒව හි** මේ සියළුම ධර්මය **පඨමබුද්ධවචනං** ප්‍රථම බුද්ධවචනය **මජ්ඣිමබුද්ධවචනං** මධ්‍යම බුද්ධවචනය **පච්ඡිමබුද්ධවචනං** පච්ඡිම බුද්ධවචනය **ඉති** යැයි **තිප්පභේදං හෝති** තෙවැදෑරුම් වෙයි **තත්‍ථ** එහි:—

**ඒසා ජාති** මේ ජාති තොමෝ වනාහි **පුනප්පුනං** නැවත නැවත **උපගන්තුං** පැමිණෙන්නට **යස්මා** යම්හෙයකින් **දුක්ඛා** දුක් වන්නීද **තස්මා ච** එසේහෙයින් ද **තස්මිං** ඒ තෘෂ්ණා නැමති වඩුවා **අදිට්ඨේ** නොදක්නා ලද කල්හි **සා ජාති** ඒ ජාති තොමෝ **න නිවත්තති** නොනවත්නී ද **තස්මා ච** එහෙයින් ද **ඒවං උභයකාරණා** මෙසේ ද්විප්‍රකාර වූ හේතුවෙන් **ගහකාරකං** ආත්මභාව සඞ්ඛ්‍යාත ස්කන්ධ ගෘහය කරන්නා වූ තෘෂ්ණාව නැමති වඩුවා **ගවේසන්තෝ** සොයන්නා වූ **අහං** මම (මේ ගාථාවෙහි "ගහකාරකං" යන ද්විතියාන්තය කැමති වෙයි) **යේන ඤාණේන** යම් සර්වඥතාඥාණයක් කරණකොටගෙන **තං** ඒ තෘෂ්ණාව නැමති වඩුවා **දට්ඨුං සක්කා** දැක්ක හැකිවේද **තස්ස බෝධිඤාණස්ස අත්ථාය** ඒ සර්වඥතා ඥාණය පිණිස **දීපඞ්කරපාදමූලේ** දිවකුරු බුදුන් පාමුල්ලෙහි **කතාභිනීහාරෝ** කරනලද ප්‍රාර්ථනා ඇත්තේ **එත්තකං** සාරාසඞ්ඛ්‍යකල්පලක්‍ෂයක් ප්‍රමාණ වූ මෙපමණ කාලයක් මුළුල්ලෙහි **අනේකජාති සංසාරං** නොයෙක් ජාති ඇත්තා වූ සංසාරයෙහි (නොහොත්) සංසාරය මුළුල්ලෙහි **තං ඤාණං** ඒ සර්වඥතා ඥාණය **අනිබ්බිසං** නොලබන්නේ **සන්ධාවිස්සං** සැරිසැරූයෙමි **ගහකාරක** මාගේ ආත්මභාව සඞ්ඛ්‍යාත ස්කන්ධ ගෘහය ඉදිකළා වූ එම්බල තෘෂ්ණා නැමති වඩුව **ඉදනි** දැන් වනාහි **තං ඤාණං** ඒ සර්වඥතා ඥාණය **පටිවිජ්ඣන්තේන** ප්‍රතිවේදය කරන්නා වූ **මයා** මා විසින් **ත්වං** තා **දිට්ඨෝ අසි** දක්නා ලද්දේ විය **පුන** නැවත **ගේහං** මගේ ආත්මභාව සඞ්ඛ්‍යාත ස්කන්ධ ගෘහය **ත්වං** තෝ

**න කාහසි** නොකරන්නෙහිය **තේ** තාගේ **සබ්බං** සියළු **ඵාසුකා** ක්ලේශ සඞ්ඛ්‍යාත ගෘහෝපකරණ (හෙවත්) දැවීහු **භග්ගා** බිඳින ලද්දහුය **ගහකූටං** අවිද්‍යා සඞ්ඛාත කැණිමඩල **විසඞ්ඛතං** මා විසින් නසන ලද්දේය **මේ** මාගේ **චිත්තං** චිත්තය තෙමේ **විසඞ්ඛාරගතං** සංස්කාරයන්ගෙන් පහවූ නිර්වාණය අරමුණු කොට ගැණීම් වශයෙන් පැමිණියේය **(සෝ අහං ච)** ඒ මම ද **තණ්හානං** එක්සිය අටක් ප්‍රභේද තෘෂ්ණාවන්ගේ **ඛයං** විනාශයෙන් ලබන්නා වූ අරහත් මග අරහත් ඵලයට **අජ්ඣගා** පැමිණියෙමි.

**ඉති** යන **ඉදං** මේ **පඨමබුද්ධවචනං** පළමුවන බුදුවදනයි ධම්මපදභාණක මහාතෙරුන් වහන්සේලාගේ අදහසයි **කේචි** ඛන්ධකභාණක මහාතෙරුන් වහන්සේලා වනාහි **"යදා හවේ පාතුභවන්ති ධම්මා"** "යදා හවේ පාතුභවන්ති ධම්මා" **ඉති** යන **උදානගාථං** උදානගාථාව **ආහ** ප්‍රථම බුද්ධවචනයයි කියත් (නොහොත් මෙහි ඉති ශබ්දයෙන් "ආතාපිනෝ ඣායතෝ බ්‍රාහ්මණස්ස" යනාදි ඛන්ධකයෙහි ආ උදානගාථා තුන සඞ්ග්‍රහකරයි) **ඒසා පන** මේ ඛන්ධකයෙහි ආ උදානගාථා වනාහි **සබ්බඤ්ඤුතභාවප්පත්තස්ස** සර්වඥතාභාවයට පැමිණි **සෝමනස්සඤාණේන** සොම්නස්මය නුවණින් **පච්චායාකාරං** ප්‍රත්‍යාකාරය **පච්චවෙක්ඛන්තස්ස** ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ හට **පාටිපදදිවසේ** පෑළවිය දවසෙහි **උප්පන්නා** උපන්නා වූ **උදානගාථා ඉති** උදානගාථාව යයි **වේදිතබ්බා** දතයුතුය "**භික්ඛවේ** මහණෙනි! **හන්ද** එසේනම් **ඉදානි** දැන් **වෝ** තොප **ආමන්තයාමි** අමතමි **සඞ්ඛාරා** ත්‍රෛභූමික සංස්කාරයෝ **වයධම්මා** විනාශ වීම ලක්‍ෂණ කොට ඇත්තාහු ද (**තස්මා** එසේහෙයින් **තුම්හේ** තෙපි) **අප්පමාදේන** පමානොවීමෙන් **සම්පාදේථ** නිවන් යාමට හේතුභූත වූ සත්ප්‍රතිපත්තිය සම්පූර්ණ කරව් (නොහොත්) ත්‍රිවිධ ශික්‍ෂාව සම්පූර්ණ කරව්" **ඉති** යනුයෙන් **යං පන** යමක් වනාහි **පරිනිබ්බානකාලේ** පරිනිර්වාණ කාලයෙහි **අභාසි** වදළ සේක් ද **ඉදං** මෙය **පච්ඡිමබුද්ධවචනං** පච්ඡිම බුද්ධවචනය වෙයි **උභින්නං අන්තරේ** ප්‍රථම පච්ඡිම බුද්ධවචන දෙක අතුරෙහි **යං** යම් ධර්මයක් තෙමේ **වුත්තං** වදරණ ලදද **ඒතං** මෙය **මජ්ඣිමබුද්ධවචනං** මධ්‍යම බුද්ධවචනය වෙයි **ඒවං** මෙසේ **පඨමමජ්ඣිමපච්ඡිමවසේන** ප්‍රථම මධ්‍යම පච්ඡිම වශයෙන් **තිවිධං** තෙවැදෑරුම් වේ.

**පිටකවසේන** පිටක වශයෙන් **කථං?** කෙසේ **තිවිධං** තෙවැදෑරුම් ද යත්? **ඒතං සබ්බං අපි හි** මේ සියළුම බුද්ධවචනය **විනයපිටකං** විනයපිටකය **සුත්තපිටකං** සූත්‍ර පිටකය **අභිධම්මපිටකං** අභිධර්ම පිටකය **ඉති** යනුවෙන් **තිප්පභේදං ඒව** තෙවැදෑරුම් භේද ඇත්තේම **හෝති** වෙයි **තත්ථ** එහි **පඨමසඞ්ගීතියං** ප්‍රථම සඞ්ගායනාවේ දී **සඞ්ගීතඤ්ච** සඞ්ගායනා කරන ලද්දවූ ද **අසඞ්ගීතඤ්ච** සඞ්ගායනා නොකරන ලද්දවූ ද **සබ්බං අපි** සියල්ලම **සමෝධානෙත්වා** එක්කොට **උභයානි පාතිමොක්ඛානි** භික්‍ෂු භික්‍ෂුණී උභය ප්‍රාතිමෝක්‍ෂය **ද්වේ විභඞ්ගානි** භික්‍ෂු භික්‍ෂුණී උභය විභඞ්ගය **ද්වාවීසතිඛන්ධකානි** මහාවග්ග චූලවග්ග දෙකෙහි ආවාවූ දෙව්සි ඛන්ධකයෝය **සෝළසපරිවාරා ඉති** ෂෝඩශ පරිවාරය යන **ඉදං** මේ ධර්ම සමූහය **විනයපිටකං නාම** විනය පිටකය තෙමේ නම් (**හෝති** වෙයි) **බ්‍රහ්මජාලාදි** බ්‍රහ්මජාල සූත්‍රය ආදී කොට ඇති **චතුත්තිංසසුත්තසඞ්ගහෝ** සූතිස් සූත්‍රයන්ගේ සඞ්ග්‍රහය **දීඝනිකායෝ** දික්සඟිය නම් **මූලපරියායසුත්තාදි** මූලපරියාය සූත්‍රය ආදී කොට ඇති **දියඩ්ඪසත ද්වේසුත්තසඞ්ගහෝ** එකසිය දෙපණසක් සූත්‍රයන්ගේ සඞ්ග්‍රහය **මජ්ඣිමනිකායෝ** මැදුම්සඟිය නම් **ඕඝතරණසුත්තාදි** ඕඝතරණ සූත්‍රය ආදී කොට ඇති **සුත්ත** සූත්‍රයන් **සත්තසහස්සසත්තසතද්වාසට්ඨි** සත්දහස්සත්සියදෙසැටක් **සුත්තසඞ්ගහෝ** සූත්‍ර සඞ්ග්‍රහය **සංයුත්තනිකායෝ** සංයුත් සඟිය නම්

**චිත්තපරියාදනසුත්තාදි** චිත්තපරියාදන සූත්‍රය ආදී කොට ඇති **සුත්ත** සූත්‍රයන් **නවසහස්සපඤ්චසත සත්තපඤ්ඤාසසුත්තසඞ්ගහෝ** නවදහස්පන්සියසත්පණසක් **අඞ්ගුත්තරනිකායෝ** අඞ්ගුත්තර සඟිය නම් **ඛුද්දකපාඨ** ඛුද්දකපාඨය **ධම්මපද** ධම්මපදය **උදාන** උදානය **ඉතිවුත්තක** ඉතිවුත්තකය **සුත්තනිපාත** සුත්තනිපාතය **විමානවත්ථු** විමානවත්ථුව **පේතවත්ථු** ප්‍රේතවත්ථුය **ථේරගාථා** ථේරගාථාය **ථේරීගාථා** ථේරීගාථාය **ජාතක** ජාතකය **නිද්දේස** නිද්දේසය **පටිසම්භිදා** පටිසම්භිදාය **අපදාන** අපදානය **බුද්ධවංස** බුද්ධවංසය **චරියාපිටක** චරියාපිටකය **වසේන** යන මොහුන්ගේ වශයෙන් **පණ්ණරසභේදෝ** පසළොස් භේද ඇත්තේ **ඛුද්දකනිකායෝ** කුදුගොත් සඟිය නම් **ඉදං ඉති** මේ වනාහි **සුත්තපිටකං නාම** සුත්තන්ත පිටක නම් වේ **ධම්මසඞ්ගණී** ධම්මසඞ්ගණිය **විභඞ්ග** විභඞ්ගය **ධාතුකථා** ධාතුකථාවය **පුග්ගලපඤ්ඤත්ති** පුද්ගලප්‍රඥප්තියය **කථාවත්ථු** කථාවස්තුවය **යමක** යමකය **පට්ඨාන** පට්ඨානය **ඉති ඉදං** යන මෙය **අභිධම්මපිටකං නාම** අභිධර්ම පිටකය නම් වේ **තත්ථ** එම පිටකත්‍රයෙහි **වචනත්ථෝ** වචනාර්ථය **ඒවං** මේ වක්‍ෂ්‍යමාන ක්‍රමයෙන් **වේදිතබ්බෝ** දතයුත්තේයි:—

**විවිධ විසේසනයත්තා ච** බොහෝ ප්‍රභේද ඇත්තා වූ විශේෂ ක්‍රම ඇති හෙයින් ද **කායවාචානං** කය වචන දෙක **විනයනතෝ චේව** හික්මවන හෙයින් ද **විනයත්ථවිදූහි** විනය ශබ්දයාගේ අර්ථ දන්නාවූ පණ්ඩිතයන් විසින් **අයං විනයෝ** මේ විනය පිටක තෙමේ **විනයෝ ඉති** විනය යැයි **අක්ඛාතෝ** ප්‍රකාශ ලද්දේය.

**හි** ඒ එසේමැයි **එත්ථ (විනයේ)** මේ විනය පිටකයෙහි **පඤ්චවිධපාතිමොක්ඛුද්දේස-පාරාජිකාදිසත්තාපත්තික්ඛන්ධ-මාතිකා-විභඞ්ගාදිප්පභේද** නිදානුද්දේශය පාරාජිකාදී උද්දේශය ආදී වූ පඤ්ච ප්‍රකාර ප්‍රාතිමෝක්ෂෝද්දේශය කෙනෙක පාරාජිකාදී සප්තාපත්තිස්කන්ධ කෙනෙක මාතෘකාද්වය විභඞ්ගද්වය ආදී ප්‍රභේද ඇත්තා වූ **විවිධා** බොහෝ ප්‍රභේද ඇත්තාවූ **නයා (සන්ති)** ක්‍රමයෝ ඇත්තාහු වෙත් ද **තස්මා විවිධනයත්තා ච** එසේ බොහෝ ප්‍රභේද වූ ක්‍රම ඇති හෙයින් ද **ච** "විවිධනයත්තා" යන හේත්වර්ථයාගේ විස්තරය තබා "විසේසනයත්තා" යන හේත්වර්ථයාගේ විස්තරය දක්වමි **දළ්හිකම්මසිථිලකරණප්පයෝජනා** මූලපඤ්ඤත්තිය දැඩිකිරීමය මූලපඤ්ඤත්තිය ලිහිල් කිරීමය යන ප්‍රයෝජන ඇත්තා වූ **විසේසභූතා** විශේෂභූත වූ (හෙවත්) වෙනස් වූ **අනුප්පඤ්ඤත්තිනයා (සන්ති)** අනුප්‍රඥප්ති ක්‍රම කෙනෙක් ඇත්තාහු වෙත් ද **තස්මා විසේසනයත්තා ච** එසේ විශේෂ ක්‍රම ඇති හෙයින් ද **ච** "විසේසනයත්තා" යන හේතුපාඨයාගේ විස්තරය තබා "විනයනතෝ චේව කායවාචානං" යන හේතු අර්ථයාගේ විස්තරය දක්වමි **එසෝ විනයෝ** මේ විනය තෙමේ **කායිකවාචසිකඅජ්ඣාචාරනිසේධනතෝ** කය පිළිබඳ ඉක්මවීමය වචනය පිළිබඳ ඉක්මවීමය යන දෙයාකාර වැරදි වූ හැසිරීම් වළක්වන හෙයින් **කායඤ්ච** ශරීරය ද **වාචඤ්ච** වචනය ද **විනේති ච** හික්මවා ද **කායවාචානං** කය වචනයන් **තස්මා විනයනතෝ** එසේ හික්මවන හෙයින් ද **අයං විනයෝ** මේ විනය තෙමේ **විනයෝති අක්ඛාතෝ** විනයයයි ප්‍රකාශකරන ලද්දේයි **තේන** ඒ විවිධනයත්තා යන හේත්වර්ථ පාඨයෙන් **ඒතස්ස** මේ විනය ශබ්දයාගේ **වචනත්ථකෝසල්ලත්ථං** වචනාර්ථයෙහි දක්‍ෂබව පිණිස **"විවිධවිසේසනයත්තා -පෙ- අක්ඛාතෝ"ති** විවිධවිසේස -පෙ- අක්ඛාතෝ යන **ඒතං** මේ ගාථාවචනය **(මයා වුත්තං)** මා විසින් කියනලදි (ඇතැම් ආචාර්‍යවරයෝ තුමූ ලබ්ධගුණය ප්‍රකාශ කරණු කැමැතිව "තේනේතමේතස්ස" (තේන ඒතං ඒතස්ස) යනාදිය කීහ. ඇතැම් ආචාර්‍යවරයෝ ශ්‍රෝතෘජනයාට ස්මෘතිහුගේ ස්ථිරභාවය පිණිස "තේනේතමේතස්ස" යනාදිය කීහ.

ඇතැම් ආචාර්‍යයීවරයෝ පූර්ව වූ සංක්ෂේප ගාථාව හා "විවිධා හි" යනාදි විස්තරය විශේෂ වශයෙන් දැනගන්නා පිණිස "තේනේතමේතස්ස" යනාදිය කීහයි අර්ථශාලිනී ගණ්ඨිපදයෙහි දක්වන ලද්දේයි "විවිධවිසේසනයත්තා" යනාදී වශයෙන් විනය ශබ්දයාගේ අර්ථ දක්වා දැන් "සුත්ත" ශබ්දයාගේ අර්ථ දක්වනු පිණිස "ඉතරං පන" යනාදිය කීහ) ...

**පන** විනය ශබ්දයාගේ වචනාර්ථයෙන් අන්‍යවූ සුත්ත ශබ්දයාගේ අර්ථ දක්වම් **ඉතරං** සුත්ත ශබ්දය **අත්ථානං** ආත්මාර්ථ පරාර්ථයන් (නොහොත්) දෘෂ්ටධාර්මික සාම්පරායික අර්ථයන් (නොහොත්) ලොවීලොව්තුරා අර්ථයන් (හෙවත්) ශබ්දර්ථයන් **සූචනතෝ ච** ප්‍රකාශ කරණ හෙයින් ද **සුවුත්තතෝ ච** මොනවට දේශනා කළ හෙයින් ද **සවනතෝ ච** වහනය වන අර්ථයෙන් ද **අථ** තවද **සූදනතෝ ච** මොනවට වගුරුවන හෙයින් ද **සුත්තාණා ච** මොනවට ආරක්ෂා කරන අර්ථයෙන් ද **සුත්තසභාගතෝ ච** සූත්‍රයකට (හෙවත්) දැළිහුයකට සමානාර්ථයෙන් ද **සුත්තන්ති අක්ඛාතං** සූත්‍ර යයි ප්‍රකාශ කරන ලද්දේයි (මේ ගාථාව ආර්‍යයාවෘත්ත ගාථාවක් වෙයි. "සුත්තන්ති" යන පදය ඇතැම් පොත්හි "සුත්තං සුත්තන්ති අක්ඛාතං" යනු දක්නා ලැබෙත්. එතකුදුවුවත් "සුත්තං" යන එක් පදයක් අධිකබව හැගෙයි.) ...

**හි** විස්තර කෙරෙම් **තං (සුත්තං)** ඒ සූත්‍ර තෙමේ **අත්තත්ථපරත්ථාදිභේදේ** ස්වාර්ථ පරාර්ථාදී භේද ඇත්තා වූ **අත්ථේ** අර්ථයන් (හෙවත්) ශබ්දර්ථයන් **සූචේති** ප්‍රකාශ කෙරෙයි **ච** "සූචනතෝ" යන හේත්වර්ථයාගේ විස්තරය තබා "සුවුත්තතෝ" යන හේත්වර්ථයාගේ විස්තරය දක්වම් **වේනෙය්‍යජ්ඣාසයානුලෝමේන** විනයජනයන්ගේ අදහසට සුදුසු පරිද්දෙන් **වුත්තත්තා** වදළ හෙයින් **එත්ථ** මේ සූත්‍රයෙහි **අත්ථා** ප්‍රයෝජනයෝ (හෙවත්) ස්වාර්ථ පරාර්ථයෝ **සුවුත්තා** මොනවට වදරණ ලද්දහුය **ච** "සුවුත්තතෝ" යන හේත්වර්ථයාගේ විස්තරය තබා "සවනතෝ" යන හේත්වර්ථයාගේ විස්තරය දක්වම් **ඒතං (සුත්තං)** මේ සූත්‍රය තෙමේ **අත්ථේ** අර්ථයන් (හෙවත්) ප්‍රයෝජනයන් **සවති** වහනය කරයි (හෙවත්) උපදවයි **සස්සං** සස්‍ය තෙමේ **ඵලං සවති ඉව** ඵලය උපදවන්නාක් මෙන් **සවති** ඵලය උපදවන්නේ යයි **වුත්තං හෝති** කී නියායි **ච** "සවනතෝ" යන හේත්වර්ථයාගේ විස්තරය තබා "සූදනතෝ" යන හේත්වර්ථයාගේ විස්තරය දක්වම් **ඒතං සුත්තං** මේ සූත්‍ර තෙමේ **අත්ථේ** ස්වාර්ථ පරාර්ථාදී අර්ථයන් **සූදති** වගුරුවයි **ධේනු** වසුපැටවෙක් සහිත ගවදෙන තොමෝ **ඛීරං පග්ඝරති ඉව** කිරි වගුරන්නාක් මෙන් **පග්ඝරතීති** වගුරුවන්නේ යයි **වුත්තං හෝති** කී නියායි **ච** "සූදනතෝ" යන හේත්වර්ථයාගේ විස්තරය තබා "සුත්තාණා" යන හේත්වර්ථයාගේ විස්තරය දක්වම් **ඒතං සුත්තං** මේ සූත්‍රය තෙමේ **නේ අත්ථේ** ඒ අර්ථ සඞ්ඛ්‍යාත ප්‍රයෝජනයන් **සුට්ඨු තායති රක්ඛතීති** මොනවට රක්ෂා කරන්නේ යයි **වුත්තං හෝති** කියන ලද්දේ වෙයි **ච** "සුත්තාණා" යන හේත්වර්ථයාගේ විස්තරය තබා "සුත්තසභාගතෝ" යන හේත්වර්ථයාගේ විස්තරය දක්වම් **ඒතං (සුත්තං)** මේ සූත්‍ර තෙමේ **සුත්තසභාගං හෝති** සූත්‍රයකට (හෙවත්) දැළිහුයකට සමාන වෙයි **හි** ඒ අර්ථය පහළ කෙරෙම් **තච්ඡකානං** වඩුවන්ගේ **සුත්තං** දැළිහුය **පමාණං හෝති යථා** යම්සේ ප්‍රමාණ වේද **ඒවං** එපරිද්දෙන් **ඒතම්පි සුත්තං** මේ සූත්‍ර තෙමේ ද **විඤ්ඤූනං** නුවණැත්තවුන්ට **පමාණං හෝති** ප්‍රමාණ වෙයි **ච** නොහොත් **සුත්තේන** සූත්‍රයෙන් **සඞ්ගහිතානි** අවුණන ලද්ද වූ **පුප්ඵානි** පුෂ්පයෝ **න විකිරියන්ති යථා** යම්සේ නොවිසිරෙත් ද **න විද්ධංසීයන්ති යථා** යම්සේ විනාශ නොවෙත් ද **ඒවං** එපරිද්දෙන් **ඒතේන සුත්තේන** මේ සූත්‍රය කරණකොටගෙන **සඞ්ගහීතා** හකුලුවා ගන්නා ලද්දවූ **අත්ථෝ** අර්ථයෝ තුමූ **න විකිරියන්ති** නොවිසිරෙත්

ද **න විද්ධංසීයන්ති** විනාශ නොවෙත් ද **තේන** ඒ සූත්‍ර නාමයාගේ රූඪී නොවන්නා වූ අන්වර්ථ නාමයාගේ වශයෙන් **ඒතස්ස** මේ සූත්‍ර ශබ්දයාගේ **වචනත්ථකෝසල්ලත්ථං** වචනාර්ථ කෞශල්‍යය පිණිස **අත්ථානං** -පෙ- **අක්ඛාතං** අත්ථානං -පෙ- අක්ඛාතං යන **ඒතං** මේ ගාථාව **වුත්තං** කියනලදි.

(විනයාභිධර්මය ද ස්වක්ඛාත ධර්ම නොවන්නේ ද යත් කුමක් හෙයින් සූත්‍රයම "සුවුත්තා චෙත්ථ" යනු කියන ලද්දේද යත්? "වේනෙය්‍යජ්ඣාසයානුලෝමේන වුත්තත්තා" යනු ඊට පරිහාරයි. සස්‍ය තෙමේ රෝපණය කළාවූ ක්ෂණයෙහිම ඵලදයක නොවෙයි. අනුක්‍රමයෙන් පොහොර දැමීම් දිය බැඳීම් ආදී කටයුතු කිරීමෙන්ම ඵලදයක වෙයි. එපරිද්දෙන්ම සූත්‍රාන්තය ද යථාක්‍රමයෙන් පිළිපැදීම හේතුකොටගෙනම පසු කාලයෙහි ඵල විශේෂය දෙන බව හඟවනු පිණිස "සස්සම්ව ඵලං පසවතීති වුත්තං හෝති" යනු කීහ. වසුපැටවුන් ඇත්තාවූ කල්හි ක්‍රියාවෙහි දක්‍ෂ පුරුෂ තෙමේ දෙනගේ තනයෙන් කිරි දෙව ගන්නේයි. වසුපැටවුන් නැත්තාවූ කල්හි අඟ අල්වා දෙවීමෙන් කිරි නොලැබෙන්නේයි. එපරිද්දෙන් සූත්‍රාන්තය ද නිස්සණාජ්ඣාශයෙන් උගෙන ගන්නවූ පුරුෂ තෙමේ ලෞකික ලෝකෝත්තර අර්ථ සිද්ධිය ලබන්නේයි. එහෙයින් "ධේනුවියඛීරං පග්ඝරතීති වුත්තං හෝති" යනු කීහ. "අත්තත්ථපරත්ථාදිභේදේ අත්ථේ සූචේතීති ච, සුවුත්තා චෙත්ථ අත්ථාති ච, අත්ථේ සවති පසවතීති ච, අත්ථේ සූදතීති ච, සුට්ඨු අත්ථේ තායතීති ච, සුත්තං වියාති ච" යන වාක්‍යයන් ගන්නේ යනු කීහ)

(විනය සූත්‍ර ශබ්දයාගේ වචනාර්ථ දක්වා අභිධර්ම ශබ්දයාගේ වචනාර්ථ දක්වනු කැමතිව "ඉතරෝ පන" යනාදිය කීහ) **පන** විනය සූත්‍ර ශබ්දයාගේ වචනාර්ථයෙන් අන්‍යවූ අභිධම්ම ශබ්දයාගේ අර්ථ දක්වම් **ඉතරෝ** අභිධම්ම ශබ්දය **එත්ථ** මේ අභිධර්ම පිටකයෙහි **වුද්ධිමන්තෝ** අභිවෘර්ධිමත් වූ **ධම්මා ච** ධර්මයෝ ද **සලක්ඛණා** ලක්‍ෂණ සහිත වූ **ධම්මා ච** ධර්මයෝ ද **පූජිතා** පිදියයුතු වූ **ධම්මා ච** ධර්මයෝ ද **පරිච්ඡින්නා** පිරිසිඳිනා ලද්දවූ **ධම්මා ච** ධර්මයෝ ද **අධිකා** අධික වූ **ධම්මා ච** ධර්මයෝ ද **යං (යස්මා)** යම්හෙයකින් **වුත්තා** වදරණ ලද්දාහු වෙත් ද **තේන (තස්මා)** එහෙයින් **අභිධම්මෝ** අභිධර්ම නම් වෙයි **අක්ඛාතෝ** ප්‍රකාශ කරන ලද්දේයි "අභිවුද්ධිමන්තෝ ධම්මා එත්ථාති ච, අභිලක්ඛිතා ධම්මා එත්ථාති ච, අභිපූජිතා ධම්මා එත්ථාති ච, අභිපරිච්ඡින්නා ධම්මා එත්ථාති ච, අභිඅධිකා ධම්මා එත්ථාති ච" යි වාක්‍යය ගන්නේයි "සබ්බත්ථ වුත්තාති ක්‍රියා වේදිතබ්බා" යනු මූලටීකායි. (එකම අභි ශබ්දය වනාහි වුද්ධිමන්තාදී නොයෙක් අර්ථයන් හා කෙසේ සම්බන්ධ වන්නේද යත්? එකම අභි ශබ්දය වුයේද අනේකාර්ථ වූ හෙයින් නොයෙක් අර්ථයෙහි සාමාන්‍ය වශයෙන් යෙදෙන්නේ යයි දතයුතු. සාක්ෂි නැත්තාවූ විනිශ්චයක් නුවණැත්තන් විසින් පිළිනොගන්නාක් මෙන් උදහරණයන්ගෙන් වෙන්වූ අභිධම්ම ශබ්දය ආභිධාර්මිකයන් විසින් නොපිළිගන්නේයි. එහෙයින් වුද්ධිමන්ත ලක්‍ෂණාදී අර්ථයෙහි අභි ශබ්දය පවතනා බව දක්වනු පිණිස "යථාහේස" යනාදිය කීහ) **හි** විස්තර කෙරෙම් **අයං අභිසද්දෝ** මෙහි අභි ශබ්ද තෙමේ **වුද්ධිලක්ඛණපූජිතපරිච්ඡින්නාධිකේසු** අභිවෘර්ධි අර්ථය ලක්‍ෂණාර්ථය පූජිතාර්ථය පරිච්ඡින්නාර්ථය අධිකාර්ථය යන මෙතෙක් අර්ථයන්හි **දිස්සති** දක්නා ලැබේ **තථා (තං වචනං)** ඒ වචනය **හි** ප්‍රකට කෙරෙම් **ඒසෝ** මේ අභිධම්ම ශබ්ද තෙමේ **බාළ්හා මේ** -පෙ- **පටික්කමන්තීති** ආදීසු බාළ්හා මේ ආවුසෝ -පෙ- පටික්කමන්ති යනාදි පාළි ප්‍රදේශයෙහි **වුද්ධියං** වැඩීමය යනාර්ථයෙහි **ආගතෝ** ආයේයි **යා තා රත්තියෝ** රාත්‍රී කෙනෙක් තුමූ **අභිඤ්ඤාතා** අර්ධ චන්‍ද්‍රාදි සළකුණෙන් ප්‍රකටවූවාහු ද (නොහොත්) **යා තා රත්තියෝ** යම් රාත්‍රී කෙනෙක් **අභිඤ්ඤාතා** අර්ධ චන්‍ද්‍රාදි සළකුණෙන් හැඳිනිය යුත්තාහු ද **අභිලක්ඛිතා**

අර්ධ චන්ද්‍රාදි සළකුණෙන් ලකුණුකට යුත්තාහු ද **ඉති ආදීසු** යන මේ ආදී උදහරණයෙහි **ලක්ඛණෝ ආගතෝ** ලක්‍ෂණාර්ථයෙහි ආයේයි **මනුජින්දෝ** මනුජේන්ද්‍ර වූ **රාජාභිරාජා** රාජ සමූහයා විසින් පිදියයුතු වූ රජුය **ඉති ආදීසු** යන මේ ආදී උදහරණයෙහි **පූජිතේ ආගතෝ** පූජිතාර්ථයෙහි ආයේයි **අභිධම්මේ** පිරිසිඳිනා ලද පරමාර්ථ ධර්මයෙහි ද **අභිවිනයේ** පිරිසිඳිනා ලද විනය ධර්මයෙහි ද **විනේතුං** හික්මවන්නට **පටිබලෝ** ප්‍රතිබල වෙයි **ඉති ආදීසු** මේ ආදී උදහරණයෙහි **පරිච්ඡින්නේ** පිරිසිඳිනා ලද අර්ථයෙහි **ආගතෝ** ආයේයි **අඤ්ඤමඤ්ඤසඞ්කරවිරහිතේ** ඔහුනොහුන් හා මිශ්‍රවීමෙක් නැත්තා වූ **ධම්මේ ච** ධර්මයෙහි ද **විනයේ ච** විනයේ ද **ඉති වුත්තං හෝති** මෙසේ කියන ලද්දේ වෙයි **අභික්කන්තේන වණ්ණේන** අතිශයින් සිත්කලු වූ වර්ණයෙන් **ඉති ආදීසු** යන මේ ආදී උදහරණයෙහි **අධිකේ ආගතෝ** අධිකාර්ථයෙහි ආයේයි (ඇතැම් ප්‍රකරණයෙක්හි වුද්ධිමන්තාදි අර්ථයෝ අභි ශබ්දයෙන් වාචකවීම් වශයෙන් සාධකපාඨ කීහ. මේ අභිධර්ම පාළියෙහි වුද්ධිමන්ත අධික ධර්මයන් වදළා වූ පාඨයෝ කවරහු දැයි යන චෝද්‍යය සඳහා "එත්ථ ච රූපුප්පත්තියා" යනාදිය කීහ)

(ඒ අභි ශබ්යෙන් වුද්ධිලක්ඛණාදී වූ පඤ්ච ප්‍රකාර අර්ථයන් වාචක වියයුතු හෙයින් මේ අභිධර්මයෙහි වුද්ධිමන්තාදී ධර්මයන් ප්‍රකාශ වන්නාවූ පාළි ප්‍රදේශ නැති කල්හි ශබ්දය හා අර්ථය නොගැළපෙන්නේය. එහෙයින් මේ ශබ්දය රූඪී ශබ්දයක් දැයි චෝද්‍යය සඳහා "එත්ථ" යනාදිය කීහ) **ච** යනු වාක්‍යාරම්භයෙහි නිපාතයි **එත්ථ (අභිධම්මේ)** මේ අභිධර්ම පිටකයෙහි **රූපුප්පත්තියා** රූපභූමියෙහි උත්පත්තිය පිණිස **මග්ගං භාවේති** කාරණා වූ ධ්‍යාන වඩයි **මෙත්තාසහගතේන චේතසා** මෛත්‍රිය සමඟ හටගත්තා වූ සිත කරණකොටගෙන **ඒකං දිසං** එක් දිශාවක් **ඵරිත්වා විහරති** පතුරුවා වාසය කරයි **ඉති ආදිනා නයේන** යන මේ ආදී ක්‍රමයෙන් **වුද්ධිමන්තා ධම්මාපි** අභිවෘද්ධිමත් වූ ධර්මයෝ ද **වුත්තා** වදරණ ලද්දහුය **රූපාරම්මණං වා** රූපාලම්බනයක් හෝ **සද්දාරම්මණං වා** ශබ්දාලම්බනයක් හෝ **ආරබ්භ** අරභයා (නොහොත්) **රූපාරම්මණං වා** රූපාලම්බනයක්ම අරමුණු කොට ඇත්තා වූ **සද්දාරම්මණං වා** ශබ්දාලම්බනයක්ම අරමුණු කොට ඇත්තා වූ **ඉති ආදිනා නයේන** යන මේ ආදී ක්‍රමයෙන් **ආරම්මණාදීහි** ආලම්බනය සම්ප්‍රයුක්ත ධර්මය කර්මද්වාරය ප්‍රතිපදය යනාදීන් කරණකොටගෙන **ලක්ඛණීයත්තා** සළකුණු කටයුතු හෙයින් **සලක්ඛණා** ලක්‍ෂණ සහිත වූ **ධම්මාපි වුත්තා** ධර්මයෝ ද වදරණ ලද්දහුය **සෙක්ඛා ධම්මා අසෙක්ඛා ධම්මා ලෝකුත්තරා ධම්මා ආදිනා නයේන** සෙක්ඛා ධම්මා අසෙක්ඛා ධම්මා ලෝකුත්තරා ධම්මා යනාදි ක්‍රමයෙන් **පූජිතා ධම්මාපි** පිදියයුතු ධර්මයෝ ද වදරණ ලද්දහුය **පූජාරහාති** පූජාරහා ධර්මයෝ යනු **අධිප්පායෝ** අර්ථකථාචාරීන්ගේ අදහසයි ("පූජිතා" යන්නෙහි කර්මාර්ථයෙහි ත-ප්‍රත්‍යයාගේ අර්හත්ව (සුදුසු බව) සඞ්ඛ්‍යාත අර්ථය පහළ කරනබව හගවනු පිණිස "පූජාරහාති අධිප්පායෝ" යනු කීහ) **ඵස්සෝ** වැදගැනීම ලක්‍ෂණ කොට ඇති ස්පර්ශ තෙමේ **හෝති** වන්නේය **වේදනා** අරමුණු රසවිඳීම ලක්‍ෂණ කොට ඇති වේදනා තොමෝ **හෝති** වන්නේයි **ඉති ආදිනා නයේන** මේ ආදී ක්‍රමයෙන් **සභාවපරිච්ඡින්නත්තා** තම තමාගේ ඵුසන වේදනාදී වූ ස්වභාව කරණකොටගෙන වෙන්කරන ලද බැවින් **පරිච්ඡින්නා ධම්මාපි** පිරිසිඳිනා ලද ධර්මයෝ ද **වුත්තා** වදරණ ලද්දහුය **මහග්ගතා ධම්මා** -පෙ- **අනුත්තරා ධම්මාති ආදිනා නයේන** යනාදී ක්‍රමයෙන් **අධිකා ධම්මාපි** අධික වූ ධර්මයෝ ද **වුත්තා** වදරණ ලද්දහුය **තේන** ඒ අභිධම්ම ශබ්දය රූඪී නොවෙයි කියනලද්දවූ වචනාර්ථයන්ට අනුව අන්වර්ථ නාමයක් වන හෙයින් **ඒතස්ස** ඒ අභිධම්ම ශබ්දයාගේ **වචනත්ථකෝසල්ලත්ථං** වචනාර්ථයෙහි දක්‍ෂබව පිණිස **යං එත්ථ වුද්ධිමන්තෝ**

**සලක්ඛණා** -පෙ- **තේන අක්ඛාතෝති** යං එත්ථ -පෙ- අක්ඛාතෝ යන **ඒතං** මේ ගාථාව **වුත්තං** කියන ලද්දේයි.

**පන** සාධාරණ අර්ථය දක්වම් (**අඤ්ඤමඤ්ඤවිසිට්ඨේසු** ඔහුනොහුන් විසදෘශ වූ) **එත්ථ (ඒතේසු විනයාදීසු)** මේ විනය ආදී ශබ්දයන් කෙරෙහි **යං පිටකං** යම් පිටක ශබ්දයක් තෙමේ **අවිසිට්ඨං** නොවෙසසන ලද්දේ වේද **තං (පිටකං)** ඒ පිටක ශබ්දය **පිටකත්ථවිදූ** පිටක ශබ්දයාගේ අර්ථ දන්නා වූ පණ්ඩිතයෝ තුමූ **පරියත්තිභාජනත්ථතෝ** උගතමනා පාළිය යනාර්ථය භාජනය යනාර්ථය යන මොහුන්ගේ වශයෙන් **ආහු** කීවාහුය **තේන** ඒ ද්විප්‍රකාර අර්ථ ඇත්තා වූ පිටක ශබ්දය හා **සමෝධානෙත්වා** සමාස කොට **තයෝපි විනයාදයෝ** තුන් වැදෑරුම් වූද විනය සූත්‍ර අභිධර්මයෝ **ඤෙය්‍යා** දතයුත්තාහුය **හි** විස්තර කියම් **පිටකසම්පදානේන** පාළිහුගේ සම්පූර්ණ වීම් මාත්‍රයෙකින් **මා (ගණ්හිත්ථ)** නහමක් ගනුව **ඉති ආදීසු** මේ ආදී පාළි ප්‍රදේශයෙහි **පරියත්තිපි** උගතමනා පාළිය ද **පිටකන්ති වුච්චති** පිටක යැයි කියනු ලැබේ **අථ** ඉක්බිත්තෙන් **පුරිසෝ** පුරුෂයෙක් තෙමේ **කුද්දාලපිටකං** උදැල්ලක් හා කූඩයක් **ආදාය** රැගෙන **ආගච්ඡෙය්‍ය** එන්නේය **ඉති ආදීසු** යන මේ ආදී උදාහරණයෙහි **යංකිඤ්චි භාජනම්පි** යම්කිසි කූඩා සඞ්ඛ්‍යාත භාජනයක් ද **පිටකන්ති වුච්චති** පිටක යැයි කියනු ලැබේ **තස්මා** එසේ උගතමනා පාළිය කූඩා සඞ්ඛ්‍යාත භාජනය යන මොවුහු පිටක ශබ්දයෙන් කියනලද හෙයින් **පිටකං** පිටක ශබ්දය **පිටකත්ථවිදූ** පිටක ශබ්දයාගේ අර්ථ දන්නා විචක්ෂණයෝ **පරියත්තිභාජනත්ථතෝ** උගතමනා පාළිය කූඩා සඞ්ඛ්‍යාත භාජනය යන අර්ථ වශයෙන් **ආහු** කීවාහුය **ඉදානි** දැන් වනාහි **තේන සමෝධානෙත්වා තයෝපි විනයාදයෝ ඤෙය්‍යාති** එත්ථ ඤෙය්‍යා යන මේ අපරාර්ධයෙහි **අත්ථෝ** අර්ථය **වේදිතබ්බෝ** දතයුත්තේයි **ඒවං** මෙසේ **දුවිධත්ථේන** ද්විප්‍රකාර අර්ථ ඇත්තාවූ **තේන පිටකසද්දේන සහ** ඒ පිටක ශබ්දය සමඟ **සමාසං කත්වා** සංක්ෂේප කොට **සෝ ධම්මෝ** ඒ ධර්ම තෙමේ **විනයෝ ච හෝති** විනය නම් ද වෙයි **පරියත්තිභාවතෝ ච** උගතමනා බැවින් ද **තස්ස තස්ස අත්ථස්ස** ඒ ඒ අර්ථයාගේ **භාජනතෝ ච** ආධාර බැවින් ද **පිටකඤ්ච හෝති** පිටක නම් ද වෙයි **ඉති (තස්මා)** එසේ ද්විප්‍රකාර වූ අර්ථ ඇති හෙයින් **සෝ ධම්මෝ** ඒ ධර්ම තෙමේම **විනයපිටකං** විනයපිටක නම් වේ **යථා වුත්තේනේව ඒවං දුවිධත්ථේන** යනාදීන් කියනලද්ද වූ **නයේන** ක්‍රමයෙන් **තං බුද්ධවචනං** ඒ සර්වඥ බුද්ධවචනය **සුත්තඤ්ච හෝති** සූත්‍ර නම් ද වෙයි **පිටකඤ්ච හෝති** පිටක නම් ද වෙයි **ඉති (තස්මා)** එසේහෙයින් **තං බුද්ධවචනං** ඒ බුද්ධවචන තෙමේ **සුත්තන්තපිටකං** සුත්තන්ත පිටක නම් වේ **සෝ ධම්මෝ** ඒ ධර්ම තෙමේ **අභිධම්මෝ ච හෝති** අභිධර්ම නම් ද වෙයි **පිටකඤ්ච හෝති** පිටක නම් ද වෙයි **ඉති (තස්මා)** එසේහෙයින් **සෝ ධම්මෝ** ඒ ධර්ම තෙමේ **අභිධම්මපිටකං** අභිධර්ම පිටක නම් වේ **ඉති (ඒවං)** මෙසේ **තයෝපි ඒතේ විනයාදයෝ** තුන් වැදෑරුම් වූද මේ විනයාදීහු තුමූ **ඤෙය්‍යා** දතයුත්තාහුය **ච** තත් සම්බන්ධ වාක්‍යයක් දක්වම් **ඒවං (යථා වුත්තනයේන)** මෙසේ කියන ලද්ද වූ ප්‍රභේදයෙන් **තයෝපි** තුන් වැදෑරුම් වූද **ඒතේ විනයාදයෝ** මේ විනයාදීහු **ඤත්වා** දැන **පුනපි** නැවත ද **තේසු ඒව පිටකේසු** ඒ තුන් පිටකයෙහිම **නානාප්පකාරකොසල්ලත්ථං** අනේකප්‍රකාර අර්ථ කෞසල්‍යය පිණිස **තේසු තීසු විනයාදීසු** ඒ තුන් වැදෑරුම් විනයාදියෙහි **යථාරහං** සුදුසු පරිද්දෙන් **දේසනාසාසනකථාභේදඤ්ච** දේශනාභේදය සාසනභේදය කථාභේදය යන මේ භේදයන් ද **සික්ඛාප්පහාණගම්භීරභාවඤ්ච** ශික්ෂා ප්‍රහාණ ගම්භීරභාවය ද **පරිදීපයේ** ප්‍රකාශ කරන්නේයි **යහිං** යම් තුන් පිටකයෙක්හි **භික්ඛු** මහණ තෙම **යථා** යම් උපාරම්භාදී කාරණයක් හේතුකොට ගෙන උගනීම් ආදී ප්‍රභේදයෙන් **යං පරියත්තිභේදඤ්ච** යම් ත්‍රිවිධාකාර උගෙනීමකට **යං සම්පත්තිඤ්ච** යම් සීලාදී

සම්පත්තියකට ද **යං විපත්තිං චාපි** යම් සීල විපත්ති ආදී විපත්ති භේදයකට **පාපුණාති** පැමිණේ ද **තං සබ්බම්පි** ඒ සියළු පරියත්ති භේදදිය ද **විභාවයේ** ප්‍රකාශ කරන්නේයි **තත්‍ර (ගාථාසු)** ඒ ගාථාවන් කෙරෙහි **අයං** මේ කියනු ලබන්නා වූ **පරිදීපනා ච** පූර්ව ගාථාවගේ අර්ථ පහළ කිරීම ද **විභාවනා ච** පශ්චිම ගාථාවගේ අර්ථ පහළ කිරීම ද **(භෙස්සතීති)** වෙයි **හි** ඒ ප්‍රකාශ කෙරෙම් **ඒතානි තීණි පිටකානි** ඒ තුන් පිටකයෝ **යථාක්කමං** පිළිවෙළින් **අණාවොහාරපරමත්ථදේසනා** අණාදේශනා වෝහාරදේශනා පරමාර්ථදේශනාවෝ **හොන්ති** වෙත් **යථාපරාධ-යථානුලෝම-යථාධම්මසාසනානි හොන්ති** යථාපරාධශාසනය යථානුලෝමශාසනය යථාධම්මශාසනයයි වෙත් **සංවරාසංවර-දිට්ඨිවිනිවේඨන-නාමරූපපරිච්ඡේදකථා හොන්ති** සංවරාසංවරකථාය දිට්ඨිවිනිවේඨනකථාය නාමරූපපරිච්ඡේදකථායයි වෙත් **ඉති** මෙසේ **වුච්චන්ති** කියනු ලැබෙත් **හි** විස්තර කෙරෙම් **එත්ථ (එතේසු තීසු පිටකේසු)** මේ තුන් පිටකයන් අතුරෙන් **විනයපිටකං** විනයපිටකය **ආණාරහේන** ආඥා තැබීමට සුදුසු වූ (හෙවත්) ආඥා කිරීමට සුදුසු වූ **භගවතා** භාග්‍යවතුන් වහන්සේ විසින් **ආණාබාහුල්ලතෝ** ආඥා බහුල වශයෙන් **දේසිතත්තා** දේශනා කළ හෙයින් **ආණාදේසනා හෝති** ආණාදේශනා නම් වේ **ඉති වුච්චති** මෙසේ කියනු ලැබේ **සුත්තන්තපිටකං** සූත්‍රාන්තපිටකය **වෝහාරකුසලේන** ව්‍යවහාරයෙහි දක්‍ෂ වූ **භගවතා** භාග්‍යවතුන් වහන්සේ විසින් **වෝහාරබාහුල්ලතෝ** ව්‍යවහාර බහුල වශයෙන් **දේසිතත්තා** දේශනා කළ හෙයින් **වෝහාරදේසනා හෝති** වෝහාරදේශනා නම් වෙයි **ඉති වුච්චති** මෙසේ කියනු ලැබේ **අභිධම්මපිටකං** විජම්පිටකය **පරමත්ථකුසලේන භගවතා** පරමාර්ථයෙහි දක්‍ෂ වූ භාග්‍යවතුන් වහන්සේ විසින් **පරමත්ථබාහුල්ලතෝ** පරමාර්ථ බහුල වශයෙන් **දේසිතත්තා** දේශනා කළ හෙයින් **පරමත්ථදේසනා හෝති** පරමාර්ථ දේශනා නම් වෙයි **ඉති වුච්චති** මෙසේ කියනු ලැබේ **තථා** එයින් අන්‍යවූ **පඨමං** පළමුවන විනයපිටකය **පචුරාපරාධා** බොහෝ අපරාධ ඇත්තා වූ **යේ තේ සත්තා සන්ති** යම් සත්වකෙනෙක් ඇත්තාහු වෙත් ද **තේ සත්තා** ඒ සත්වයෝ **යථාපරාධං** අපරාධයට සුදුසු පරිද්දෙන් **එත්ථ** මේ විනයපිටකයෙහි **සාසිතා** හික්මවන ලද්දහු වෙත් ද **ඉති (තස්මා)** එසේ අපරාධයට සුදුසු පරිද්දෙන් හික්මවන ලද හෙයින් **යථාපරාධසාසනං හෝති** යථාපරාධශාසන නම් වෙයි **ඉති වුච්චති** මෙසේ කියනු ලැබේ **දුතියං** දෙවැනි සූත්‍ර පිටකය **අනේකාජ්ඣාසයානුසයචරිතාධිමුත්තිකා** නොයෙක් අදහස් නොයෙක් අනුශය නොයෙක් චරිත නොයෙක් මෙනෙහි කිරීම් ඇත්තාහු **සත්තා** සත්වයෝ තුමූ **යථානුලෝමං** යම් යම් බොහෝ අදහස් බොහෝ අනුශය බොහෝ චරිත බොහෝ මෙනෙහි කිරීමය යන මෙහුන්ට අනුලොම් වශයෙන් **එත්ථ** මේ පිටකයෙහි **සාසිතා** හික්මවන ලද්දහු වෙත් ද **යථානුලෝමසාසනං හෝති** යථානුලෝම ශාසන නම් වේ **ඉති වුච්චති** මෙසේ කියනු ලැබේ **තතියං** තුන්වෙනි වූ අභිධර්ම පිටකය **ධම්මපුඤ්ජමත්තේ** පරමාර්ථ ධර්ම සමූහ මාත්‍රයෙක්හි **අහං** මමය **මම සන්තකං** මා සතු වස්තුවය **ඉති සඤ්ඤිනෝ සත්තා** මෙබඳු අදහස් ඇති සත්වයෝ තුමූ **යථාධම්මං** යම් යම් පරමාර්ථ ධර්මයකට සුදුසු පරිද්දෙන් **එත්ථ** මේ අභිධර්ම පිටකයෙහි **සාසිතා** හික්මවන ලද්දහු වෙත් **ඉති (තස්මා)** එසේ පරමාර්ථයට සුදුසු පරිද්දෙන් හික්මවන ලද හෙයින් **යථාධම්මසානං හෝති** යථාධම්මසාසන නම් වෙයි **ඉති වුච්චති** මෙසේ කියනු ලැබේ **තථා** එයින් අන්‍ය වූ **පඨමං** පළමුවන විනය පිටකය **අජ්ඣාචාරපටිපක්ඛභූතෝ** ඉක්මවා හැසිරීමට ප්‍රතිපක්‍ෂ වූ **සංවරාසංවරෝ** කුදු මහත් සංවරය **එත්ථ** මේ විනය පිටකයෙහි **කථිතෝ** වදරණ ලද්දේයි **ඉති (තස්මා)** එසේ කුදු මහත් සංවරයන් වදළ හෙයින් **සංවරාසංවරකථා හෝති** සංවරාසංවරකථා නම් වෙයි **ඛුද්දකෝ චේව** කුඩා වූද **මහන්තෝ ච** මහත් වූද **සංවරාසංවරෝ** සංවරාසංවර තෙමේ **සංවරාසංවරෝති** සංවර අසංවර නම් ඇත්තේ **හෝති** වෙයි

(ඉති ශබ්දය නාම වාචකයි) **කිම්ච** කුමක් මෙන්ද යත්? **කම්මාකම්මං විය ච** කුදු මහත් කර්මයන් මෙන් ද **ඵලාඵලං විය ච** කුදු මහත් ඵලයන් මෙන් ද වෙයි **දුතියං** දෙවෙනි වූ සුත්තන්තපිටකය **ද්වාසට්ඨිදිට්ඨිපටිපක්ඛභූතා** දෙසැටක් ප්‍රභේද වූ මිත්‍යාදෘෂ්ටීන්ට ප්‍රතිපක්ෂ වූ **දිට්ඨිවිනිවේඨනා** මිත්‍යාවාද සඞ්ඛ්‍යාත වූ අවුල්හරන කථාව **එත්ථ** මේ සූත්‍ර පිටකයෙහි **කථිතා** දේශනා කරන ලද්දීය **ඉති (තස්මා)** එසේ මිත්‍යාවාද සඞ්ඛ්‍යාත අවුල්හරන කථාව දේශනා කළ හෙයින් **දිට්ඨිවිනිවේඨනකථා හෝති** දිට්ඨිවිනිවේඨනකථා නම් වෙයි **ඉති වුච්චති** මෙසේ කියනු ලැබේ **තතියං** තුන්වෙනි වූ අභිධර්ම පිටකය **රාගාදිපටිපක්ඛභූතෝ** රාග ද්වේශාදි කෙලෙසුන්ට ප්‍රතිපක්ෂ වූ **නාමරූපපරිච්ඡේදෝ** නාමරූපයන්ගේ පිරිසිදීම **එත්ථ** මේ අභිධර්ම පිටකයෙහි **කථිතෝ** දේශනා කරන ලද්දේ වේද **ඉති (තස්මා)** එසේ නාමරූපපරිච්ඡේදය දේශනා කළ හෙයින් **නාමරූපපරිච්ඡේදකථා නාම හෝති** නාමරූපපරිච්ඡේදකථා නම් වේ **ඉති වුච්චති** මෙසේ කියනු ලැබේ **ඉති** මේ වනාහි එක් අර්ථයක්හුගේ නිගමනයයි ✤

**ච** දේශනා ශාසනකථා පක්ෂයෙන් අන්‍යවූ සික්ඛාපහාණගම්භීරභාව පක්ෂය දක්වම් **තීසු** තුන් වැදෑරුම් වූද **ඒතේසු පිටකේසු** මේ තුන් පිටකයන්හි **තිස්සෝ සික්ඛා** ත්‍රිවිධ වූ ශික්ෂාවෝ **වේදිතබ්බා** දතයුත්තාහුය **තීණි පහාණානි** ත්‍රිවිධ ප්‍රහාණයෝ **වේදිතබ්බානි** දතයුත්තාහුය **චතුබ්බිධෝ ගම්භීරභාවෝ ච** සතරාකාර වූ ගැඹුරු බවද **වේදිතබ්බෝ** දතයුත්තේයි **තථා (තං වචනං)** ඒ වචනය **හි** විස්තර කෙරෙම් **විනයපිටකේ** විනයපිටකයෙහි **විසේසේන** අධිචිත්තශික්ෂා අධිප්‍රඥාශික්ෂාවන්ගේ විශේෂයෙන් **අධිසීලසික්ඛා වුත්තා** අධිශීලශික්ෂාව වදරණ ලද්දීය **සුත්තන්තපිටකේ** සූත්‍රාන්ත පිටකයෙහි **විසේසේන** අධිශීලශික්ෂා අධිප්‍රඥාශික්ෂාවන්ගේ විශේෂයෙන් **අධිචිත්තසික්ඛා වුත්තා** අධිචිත්තශික්ෂාව වදරණ ලද්දීය **අභිධම්මපිටකේ** අභිධර්ම පිටකයෙහි **විසේසේන** අධිශීල-අධිචිත්තශික්ෂාවන්ගේ විශේෂ වශයෙන් **අධිපඤ්ඤාසික්ඛා වුත්තා** අධිප්‍රඥාශික්ෂාව වදරණ ලද්දීය ✤

**ච** ශික්ෂා පක්ෂයෙන් අන්‍යවූ ප්‍රහාණ පක්ෂය දක්වම් **විනයපිටකේ** විනය පිටකයෙහි **කිලේසානං** කෙලෙසුන්ගේ **වීතික්කමප්පහාණං** ඉක්මවීම සඞ්ඛ්‍යාත වූ ප්‍රහාණය **වුත්තං** වදරණ ලද්දෙයි **කස්මා?** කුමක්හෙයින යත්? **සීලස්ස** ශීලයට **වීතික්කමපටිපක්ඛත්තා** ඉක්මවීම ප්‍රතිපක්ෂ හෙයිනි **සුත්තන්තපිටකේ** සූත්‍රාන්ත පිටකයෙහි **කිලේසානං** කෙලෙසුන්ගේ **පරියුට්ඨානප්පහාණං** හාත්පසින් කුශලධර්මයන් මැඩගෙන නැඟිටීම ප්‍රහාණය කිරීම **වුත්තං** වදරණ ලද්දෙයි **කස්මා?** කුමක්හෙයින යත්? **සමාධිස්ස** සමාධියට **පරියුට්ඨානපටිපක්ඛත්තා** කෙලෙසුන්ගේ නැඟිටීම ප්‍රතිපක්ෂ හෙයිනි **අභිධම්මපිටකේ** අභිධර්ම පිටකයෙහි **කිලේසානං** කෙලෙසුන්ගේ **අනුසයප්පහාණං** අනුශය ප්‍රහාණය **වුත්තං** වදරණ ලද්දෙයි **කස්මා?** කුමක්හෙයින යත්? **පඤ්ඤාය** ප්‍රඥාවට **අනුසයපටිපක්ඛත්තා** අනුශය ධර්මයන්ගේ ප්‍රතිපක්ෂ බව ඇති හෙයිනි ✤

(ක්ලේශ තෙමේ වීතික්‍රමක්ලේශය, පරියුට්ඨානක්ලේශය, අනුශයක්ලේශයයි ත්‍රිවිධාකාර වේ. ශික්ෂා පදයන් ඉක්මවන්නා වූ කාලය වීතික්‍රම කෙලෙස් ඇත්තා වූ කාලය නම් වේ. උප්පාද ස්ථිති භඞ්ග වශයෙන් ක්ෂණ ත්‍රයෙකින් යුක්තව ප්‍රත්‍යුප්පන්න ක්ලේශය ඇත්තා වූ කාල තෙමේ පරියුට්ඨාන ක්ලේශ ඇත්තා වූ කාලය නම් වේ. මාර්ගයෙන් ප්‍රහීණ නොකරන ලද්ද වූ ක්ලේශ තෙමේ අනුශය ක්ලේශ නම් වේ)

**ච** නොහොත් **පඨමේ** පළමුවන විනයපිටකයෙහි **කිලේසානං** ක්ලේශයන්ගේ **තදඞ්ගප්පහාණං** ඒ ඒ කුශලාඞ්ගයෙන් ප්‍රහාණය **වුත්තං** කියන ලද්දෙයි **ඉතරේසු**

මෙයින් අන්‍යවූ සූත්‍රාන්ත අභිධර්ම පිටකයන්හි **කිලේසානං** ක්ලේශයන්ගේ **වික්ඛම්භනසමුච්ඡේදප්පහාණානි** මුවහා කිරීම් වශයෙන් ප්‍රහාණය කිරීමය, මාර්ගයෙන් නිරවශේෂයෙන් ප්‍රහාණය කිරීමය යන මොවුහු **වුත්තානි** කියන ලද්දහුය **ච** නොහොත් **පඨමේ** පළමුවන විනය පිටකයෙහි **දුච්චරිතසඞ්කිලේසප්පහාණං** දුශ්චරිත සඞ්ඛ්‍යාත වූ ක්ලේශ ප්‍රහාණය **වුත්තං** කියන ලද්දෙයි **ච** (නොහොත්) ශික්‍ෂා ප්‍රහාණ පක්‍ෂයෙන් අන්‍යවූ ගම්භීරභාව පක්‍ෂය කියම් **එත්ථ (ඒතේසු තීසු පිටකේසු)** මේ තුන් පිටකයන් අතුරෙන් **ඒකමේකස්මිං** එකි එකී පිටකයෙක්හි **චතුබ්බිධෝපි** සතරාකාර වූද **ධම්මත්ථදේසනා පටිවේධගම්භීරභාවෝ** ධර්මයාගේ ගැඹුරු බවය අර්ථයාගේ ගැඹුරු බවය දේශනාවගේ ගැඹුරු බවය ප්‍රතිවේධයාගේ ගැඹුරු බවය යන සතරාකාර ගම්භීර භාවය **වේදිතබ්බෝ** දතයුත්තේයි.

**තත්ථ** ඔහුනතුරෙන් **ධම්මෝති එත්ථ** "ධම්මෝ" යන මේ පදයෙහි **තන්ති** භාග්‍යවතුන් වහන්සේ විසින් සිතින් මෙනෙහි කරනලද පාළි තොමෝ **ධම්මෝ** ධර්ම නම් වෙයි **ඉති (අත්ථෝ වේදිතබ්බෝ)** යන මේ අර්ථය දතයුත්තේයි **අත්ථෝති එත්ථ** "අත්ථෝ" යන මේ පදයෙහි **තස්සායේව තන්තියා** ඒ පාළියගේම **අත්ථෝ** අර්ථය තෙමේ **අත්ථෝ** අර්ථ නම් වෙයි **ඉති (අත්ථෝ)** මේ අර්ථය **දට්ඨබ්බෝ** දතයුත්තේයි **දේසනාති එත්ථ** "දේසනා" යන මේ පදයෙහි **මනසා වවත්ථාපිතාය** බුදුනුවණින් ව්‍යවස්ථා කරනලද්ද වූ **තස්සා තන්තියා** ඒ පාළිය දේසනා මුඛයෙන් වාග්භේද කොට කීම දේශනා නම් වේ (හෙවත්) මුඛයෙන් වදරණ ලද්ද වූ සවිඤ්ඤත්ති විකාර වචීභේද ශබ්දතෙමේ දේශනා නම් වෙයි **ඉති (අයං අත්ථෝ)** මේ අර්ථය **වේදිතබ්බෝ** දතයුත්තේයි **පටිවේධෝති එත්ථ** "පටිවේධෝ" යන මෙහි **තන්තියා ච** සිතින් මෙනෙහි කරනලද්ද වූ පාළිය ද **තන්ති අත්ථස්ස ච** ඒ පාළ්‍යර්ථය ද **යථාභූතාවබෝධෝ** අවිපරීත කොට අවබෝධ කිරීම් සඞ්ඛ්‍යාත වූ ඤාණතෙමේ **පටිවේධෝ** පටිවේධ නම් වේ **ඉති (අත්ථෝ වේදිතබ්බෝ)** මේ අර්ථය දතයුත්තේයි **ච** තත් සම්බන්ධ වාක්‍යයක් දක්වම් **තීසුපි ඒතේසු පිටකේසු** මේ තුන් පිටකයන්හිම **ඒතේ ධම්මත්ථදේසනාපටිවේධා** මේ ධර්මය අර්ථය දේශනාය ප්‍රතිවේධය යන මොවුහු **මහාසමුද්දෝ** මහාසමුද්‍ර තෙමේ **සසාදීහි** කුඩා සාවුන් ආදී සත්වයන් විසින් **දුක්ඛෝ ගාහෝ විය ච** දුකසේ බැසගතයුතුවාක් මෙන් ද **අලබ්භනෙය්‍ය පතිට්ඨා ච** නොලැබිය හැකි ප්‍රතිෂ්ඨා ඇත්තාක් මෙන් ද **ඒවං** එපරිද්දෙන් **මන්දබුද්ධීහි** නුවණ මද පුද්ගලයන් විසින් **දුක්ඛෝගාහා ච** දුකසේ බැසගතයුතු වූවාහු ද **අලබ්භනෙය්‍ය පතිට්ඨා ච** නොලැබිය හැකි ප්‍රතිෂ්ඨා ඇත්තාහු ද **යස්මා හොන්ති** යම්හෙයකින් වෙත් ද **තස්මා** එසේ හෙයින් **ගම්භීරා** ගැඹුරු වෙත් **ඒවං (ඉමිනා යථා වුත්තනයේන)** මෙසේ "ධම්මෝති තන්ති" යනාදි කියනලද ක්‍රමයෙන් **ඒතේසු තීසු පිටකේසු** මේ තුන් පිටකයන් අතුරෙන් **ඒකේකස්මිං** එකී එකී පිටකයෙක්හි **චතුබ්බිධෝපි** සතරාකාර වූද **ගම්භීරභාවෝ** ගැඹුරු බව **වේදිතබ්බෝ** දතයුත්තේයි.

(සවිඤ්ඤත්ති විකාර වචීභේද ශබ්දය දේශනායයි ගතයුත්තේයි. "ඉමස්ස අත්ථස්ස අයං සද්දෝ වාචකෝති වචනවචනීයං වවත්ථපෙත්වා තං තං වචනීයවිභාවනවසේන පවත්තිතෝ හි සද්දෝ දේසනාති" යනු ධ:සං: අනුටීකායි. "ධම්මෝති තන්ති" යන මේ පක්‍ෂයෙහි ධර්මයාගේ ද ශබ්ද ස්වභාව ඇති හෙයින් ධර්ම දේශනාවන්ගේ විශේෂය නොකිය යුතු නොවේදැයි මෙබඳු චෝදනාවක් ඇති කල්හි නොවිය යුතු නොවෙයි, විය යුත්තේම යැයි කියයුතුයි. "තේසං තේසං අත්ථානං බෝධකභාවේන ඤාතෝ උග්ගහිතාදී වසේන ච පුබ්බේ පවත්තෝ සද්දප්පබන්ධෝ

ධම්මෝ, පච්ඡා පරේසං අවබෝධනත්ථං පවත්තිතෝ තදත්ථපකාසනකෝ සද්දෝ දේසනාති නනු සියා විසේසෝ" යනු ධ:සං: අනුටීකායි)

**තේසං තේසං අත්ථානං** ඒ ඒ අර්ථයන් **බෝධකභාවේන** අවබෝධ කිරීමෙන් **ඤාතෝ ච** තමා විසින් දන්නා ලද්දවූ ද **උග්ගහිතාදිවසේන** උගනීම් ආදී වශයෙන් **පුබ්බේ** පූර්වයෙහි **පවත්තිතෝ ච** උපදවන ලද්දවූ ද (හෙවත්) පවත්වන ලද්දවූ ද **සද්දප්පබන්ධෝ** ශබ්ද පරම්පරා තෙමේ **ධම්මෝ** ධර්ම නම් වේ **පච්ඡා** පසු භාගයෙහි **පරේසං** මෙරමා හට **අවබෝධනත්ථං** අවබෝධ කරනු පිණිස **පවත්තිතෝ** පවත්වන ලද්දවූ (නොහොත්) ශ්‍රී මුඛයෙන් වදාරණ ලද්දවූ **තදත්ථප්පකාසනකෝ** ඒ ඒ අර්ථය ප්‍රකාශ කරන්නා වූ **සද්දෝ** ශබ්ද තෙමේ **දේසනා** දේශනා නම් වේ **ඉති (තස්මා)** එසේ හෙයින් **විසේසෝ න සියා** වෙනසක් නොවූයේ **න** නොවෙයි **සියා ඒව** වන්නේමැයි (ශබ්ද ප්‍රබන්ධය වන හෙයින් පඤ්ඤත්ති ශබ්ද තෙමේ ධර්ම නම් වෙයි. එක එක අක්ෂරයයි කියන ලද්දවූ පරමාර්ථ ශබ්ද තෙමේ දේශනා නම් වෙයි කී නියායි) ධම්මෝති තන්තීති ආදීකෝ ධම්මෝති තන්ති යනාදී වූ (**යෝ පුබ්බනයෝ** යම් පූර්ව ක්‍රමයෙක්) **මයා** මා විසින් **වුත්තෝ** කියනලද්දේ වේද **තතෝ පුබ්බනයතෝ** ඒ පූර්ව ක්‍රමයෙන් **අපරනයෝ** අනික් ක්‍රමයෙක් **(මයා)** මා විසින් **වුච්චතේ** කියනු ලැබේ.෴

**ධම්මෝති එත්ථ** ධම්මෝ යන මේ පාඨයෙහි **හේතු** කාරණා තෙමේ **ධම්මෝ** ධර්ම නම් වෙයි **ඉති අත්ථෝ** යන මේ අර්ථය **වේදිතබ්බෝ** දතයුත්තේයි **හි** ඒ එසේමැයි **හේතුම්හි ඤාණං ධම්මපටිසම්භිදාති** හේතුම්හි ඤාණං ධම්මපටිසම්භිදා යන **ඒතං වචනං** මේ වචනය (**ධම්මසේනාපතිනා** දම්සෙනවි සැරියුත් මහාතෙරුන් විසින් **පටිසම්භිදාමග්ගේ** පටිසම්භිදා මාර්ගයෙහි) **වුත්තං** වදාරණ ලද්දෙයි **හේතුම්හි පවත්තං** කාරණායෙහි පැවතියා වූ **ඤාණං** නුවණ **ධම්මපටිසම්භිදා** ධම්මපටිසම්භිදා නම් වේ **අත්ථෝති එත්ථ** අත්ථෝ යන මෙහි **හේතුඵලං** හේතුහුගේ ඵලය **අත්ථෝ** අර්ථ නම් වෙයි **ඉති අත්ථෝ** යන මේ අර්ථය **වේදිතබ්බෝ** දතයුත්තේයි **හි** ඒ එසේමැයි **හේතුඵලේ ඤාණං අත්ථපටිසම්භිදාති** හේතුඵලේ ඤාණං අර්ථපටිසම්භිදා යන **(ඒතං වචනං)** මේ වචනය (**ධම්මසේනාපතිනා** දම්සෙනවි සැරියුත් මහාතෙරුන් විසින් පටිසම්භිදාමග්ගේ පටිසම්භිදා මාර්ගයෙහි) **වුත්තං** කියන ලද්දෙයි **හේතුඵලේ** හේතුහුගේ ඵලයෙහි **පවත්තං ඤාණං** පැවති නුවණ **අත්ථපටිසම්භිදා** අත්ථපටිසම්භිදා නම් වෙයි **දේසනාති එත්ථ** දේසනා යන මෙහි **පඤ්ඤත්ති** ප්‍රභේද වශයෙන් අර්ථ හඟවන්නා වූ සවිඤ්ඤත්ති විකාර වචීභේද ශබ්දතෙමේ **දේසනා** දේශනා නම් වෙයි **ඉති අත්ථෝ** යන මේ අර්ථය **වේදිතබ්බෝ** දතයුත්තේයි **යථාධම්මං** යම් යම් අවිද්‍යාදී කාරණාය සංස්කාරාදී ඵලය යන ධර්මයෙහි **පවත්තෝ** හටගත්තා වූ **ධම්මාභිලාපෝ** අවිපරීත වූ ශ්‍රී මුඛයෙන් වදාරණ ලද්දවූ සවිඤ්ඤත්ති විකාර වචීභේද ශබ්දතෙමේ **පඤ්ඤත්ති** පඤ්ඤත්ති නම් වෙයි **ඉති අත්ථෝ** යන මේ අර්ථ තෙමේ **අධිප්පායෝ (අධිප්පේතෝ)** කැමති වන ලද්දෙයි **තබ්බිනිම්මුත්තා** ඒ ස්වභාව නිරුක්තියෙන් විනිර්මුක්ත වූ **පඤ්ඤත්ති** අක්ෂරාවලී සඞ්ඛ්‍යාත වූ නාම පඤ්ඤත්ති තොමෝ **පඤ්ඤත්තීති අත්ථෝ** පඤ්ඤත්තිය යන අර්ථය **න අධිප්පේතෝ** නොකැමැති වන ලද්දෙයි.෴

(දේසනාති පඤ්ඤත්ති යථාධම්මං ධම්මාභිලාපෝති ඉමිනා දේසීයති කථීයති අත්ථෝ ඒතායාති විග්ගහේන දේසනාය ධම්මනිරුත්තිභාවං දස්සෙත්වා දේසීයති සමුට්ඨාපීයති සද්දෝ ඒතේනාති වා දේසාපේති සමුට්ඨාපේති සද්දන්ති වා විග්ගහේන

තස්සා ධම්මනිරුත්තිසඞ්ඛාත සද්දසමුට්ඨාපකචිත්තුප්පාදභාවම්පි දස්සේතුං අනුලෝමපටිලෝම සඞ්ඛේපවිත්ථාරාදී වසේන වා කථිතන්ති වුත්තං)

**ච** විස්තර දක්වම් **ලෝකියලෝකුත්තරෝ සෝ අභිසමයෝ** ලෞකික ලෝකෝත්තර වූ ඒ ප්‍රතිවේධ තෙමේ **විසයතෝ ච** අරමුණු කිරීම් වශයෙන් ද **අසම්මෝහතෝ ච** නොමුළාවීම් වශයෙන් ද **අත්ථානුරූපං** ඵලයට සුදුසු වූ **ධම්මේසු** හේතුයෙහි ද **ධම්මානුරූපං** හේතුවට සුදුසු වූ **අත්ථේසු** ඵලයෙහි ද **පඤ්ඤත්තිපථානුරූපං** පඤ්ඤත්තියගේ හේතුවට සුදුසු වූ පරිද්දෙන් **පඤ්ඤත්තීසු** පඤ්ඤත්තියෙහි **අවබෝධෝ** අවබෝධ කිරීම (හෙවත්) දැනගන්නා ප්‍රඥව **පටිවේධෝ** ප්‍රතිවේධ නම් වේ.

**ඉදනි** දැන් වනාහි **යස්මා** යම්හෙයකින් **ඒතේසු තීසු පිටකේසු** මේ තුන් පිටකයන්හි **යං යං ධම්මජාතං වා** යම් යම් හේතුවක් හෝ (නොහොත්) හේතූන් සම්බන්ධ ප්‍රභේදයන්ගේ ප්‍රභේදයක් හෝ **යං යං අත්ථජාතං වා** යම් යම් ඵලයක් හෝ **යථා යථා** යම් යම් ප්‍රභේදයකින් **ඤාපේතබ්බෝ** හැඟවියයුතු වූ **අත්ථෝ** අර්ථය තෙමේ **සෝතූනං** ශ්‍රෝතෘන්ගේ **ඤාණස්ස** නුවණට **අභිමුඛෝ හෝති** අභිමුඛ වේද **තථා තථා** ඒ ඒ ආකාරයෙන් **තදත්ථජෝතිකා** ඒ ඒ අර්ථය ප්‍රකාශ කරන්නා වූ **යෝ චායං දේසනා** යම් කියනු ලබන්නා වූ සවිඤ්ඤත්ති විකාර වාග්භේද ශබ්දයක් වූ (නොහොත්) දේශනාවට කාරණ වූ දේශනාඥාණය ප්‍රධාන කොට ඇත්තා වූ චිත්තුප්පාදය හෝ **එත්ථ (ඒතේසු තං තං පිටකගතේසු ධම්මාදීසු)** ඒ ඒ පිටකයෙහි පවත්නා වූ ධර්ම අර්ථ දේශනාවන්හි **අවිපරීතාවබෝධසඞ්ඛාතෝ** අවිපරීත වූ අර්ථාවබෝධයයි කියන ලද්දවූ (නොහොත්) දැන ගැනීමට හේතුවූ ඥාණයයි කියන ලද්දවූ **යෝ පටිවේධෝ ච** යම් ප්‍රතිවේධයක් ද **වා** නොහොත් **එත්ථ (ඒතේසු තීසු පිටකේසු)** මේ තුන් පිටකයන්හි **වුත්තානං** වදාරණ ලද්දවූ **තේසං තේසං** ඒ ඒ ස්වභාව ඇත්තා වූ **ධම්මානං** රූප වේදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ නිබ්බාන යන ධර්මයන්ගේ **පටිවිජ්ඣිතබ්බෝ** ප්‍රතිවේධ කටයුතු **සලක්ඛණසඞ්ඛාතෝ** තම තමාගේ රුප්පන වේදියනාදී ලක්ෂණයයි කියන ලද්දවූ **වා** (නොහොත්) කක්ඛලත්ත ඵුසනාදියයි කියන ලද්දවූ **සෝ අවිපරීතසභාවෝ ච** යම් අවිපරීත ස්වභාවක් ද **අත්ථි** ඇත්තේ වේද **සබ්බං** සියළු **ධම්මාදිකං** ධර්මාදී වූ (නොහොත්) ධර්ම අර්ථ දේශනා ප්‍රතිවේධයයි කියන ලද්දවූ **ඒතං චතුක්කං** මේ චතුෂ්කය (හෙවත්) මේ චතුෂ්ක තෙමේ **මහාසමුද්දෝ** මහාසමුද්‍රය **සසාදීහි** කුඩා සාවුන් ආදී සත්වයන් විසින් **යස්මා** යම්හෙයකින් **දුක්ඛෝගාහෝ විය ච** දුකසේ බැසගතයුතු වූවාක් මෙන් (හෙවත්) බැසගත නොහැක්කාක් මෙන් ද **අලබ්බනෙය්‍ය පතිට්ඨෝ විය ච** නොලැබිය යුතු ප්‍රතිෂ්ඨා ඇත්තාක් මෙන් ද **අනුපචිතකුසලසම්භාරේහි** රැස් නොකරනලද පුණ්‍ය සම්භාර ඇත්තාවූ **දුප්පඤ්ඤේහි** මන්දබුද්ධීන් විසින් **දුක්ඛෝගාහඤ්ච** දුකසේ බැසගතයුතු ද **අලබ්බනෙය්‍ය පතිට්ඨඤ්ච හෝති** නොලැබිය හැකි ප්‍රතිෂ්ඨා ඇත්තේ වේද **තස්මා** එසේ හෙයින් **ඒවම්පි (යථා වුත්තනයේනපි)** මෙසේ "ධම්මෝති තන්ති" යනාදීන් කියනලද ක්‍රමයෙන් ද **එත්ථ (ඒතේසු තීසු පිටකේසු)** මේ තුන් පිටකයන් අතුරෙන් **ඒකමේකස්මිං** එකී එකී පිටකයෙක්හි **චතුබ්බිධෝපි ගම්භීරභාවෝ** සතරාකාර වූද ගැඹුරු බව **වේදිතබ්බෝ** දතයුත්තේයි **ච** විස්තර දක්වම් **එත්තාවතා** මෙපමණකින් (හෙවත්) මෙපමණ වූ "ඒතානි පිටකානි" යනාදීන් කියනලද වචන පඞ්කතියෙන් **දේසනාසාසනකථා** -පෙ- **පරිදීපයේ ඉති** දේසනා -පෙ- පරිදීපයේ යන **අයං ගාථා** මේ ගාථාව **වුත්තත්ථාව** වර්ණනා කරනලද අර්ථ ඇත්තීම **හෝති** වෙයි.

**නිකායතෝ** නිකාය වශයෙන් **පඤ්චනිකායා** පස් මහා නිකාය කෙනෙක් තුමූ **කථං හොන්ති?** කෙසේ වෙත්ද යත්? **ඉති අයං** මේ වනාහි **පුච්ඡා** ප්‍රශ්නයකි **හි** විස්තර කෙරෙම් **සබ්බං ඒව** සියළුම **ඒතං බුද්ධවචනං** මේ බුද්ධවචන තෙමේ **දීඝනිකායෝ** දීර්ඝ නිකාය **මජ්ඣිමනිකායෝ** මධ්‍යම නිකාය **සංයුත්තනිකායෝ** සංයුත් නිකාය **අඞ්ගුත්තරනිකායෝ** අඞ්ගුත්තර නිකාය **ඛුද්දකනිකායෝ** ඛුද්දක නිකාය **ඉති (ඉමිනා පභේදේන)** මේ ප්‍රභේදයෙන් **පඤ්චප්පභේදං හෝති** පස් ආකාර ප්‍රභේදයෙක් වෙයි **තත්‍ථ** ඒ පඤ්ච ප්‍රකාර නිකායන් අතුරෙන් **දීඝනිකායෝ** දීර්ඝ නිකාය තෙමේ **කතමෝ?** කවරේද? **තිවග්ගසඞ්ගහනි** වර්ග ත්‍රයකින් සඞ්ග්‍රහ කරන ලද්දවූ (නොහොත්) වර්ග ත්‍රයක් ඇත්තාවූ සඞ්ග්‍රහයන් කරණකොටගෙන හකුළුවා ගන්නා ලද්දවූ **බ්‍රහ්මජාලාදීනි චතුත්තිංසසුත්තානි** බ්‍රහ්මජාලාදී සූතිස් සූත්‍ර කෙනෙක් තුමූ **දීඝනිකායෝ** දීර්ඝ නිකාය නම් වේ **යස්ස** යම් නිකායක්හුගේ **සුත්තගණනතෝ** සූත්‍රයන්ගේ ගණන් වශයෙන් **චතුත්තිංසේව සුත්තන්තා** සූතිස් සූත්‍ර කෙනෙක්ම **සන්ති** ඇත්තාහු ද **වග්ගගණනවසේන** වර්ගයන්ගේ ගණන් වශයෙන් **තිවග්ගසඞ්ගහෝ අත්‍ථි** වර්ග තුනකින් යුක්තවූ සඞ්ග්‍රහයක් ඇත්තේ වේද **පඨමෝ** පළමුවැනි වූ **ඒසෝ නිකායෝ** මේ නිකාය තෙමේ **අනුලෝමිකෝ** අර්ථයට සුදුසු නමක් ඇත්තාවූ **දීඝනිකායෝ** දීර්ඝ නිකායයි **ඉති වේදිතබ්බෝ** මේ දතයුත්තේයි ("යෝ වග්ගා අස්ස සඞ්ගස්සාති තිවග්ගසඞ්ගහෝ" යන අර්ථ වර්ණනාව වනාහි තිවග්ග ශබ්දය හා සඞ්ගහ ශබ්දය ද අස්ස යන්නෙන් අතුරුකොට සමාස කිරීම වනාහි "නවං පන භික්ඛුනා චීවරලාභේන" යන්න මෙනි "අනුලෝමේතීති අනුලෝමං දීඝනිකායෝති නාමං අස්ස අත්‍ථීති අනුලෝමිකෝ" යනු නිර්වචනයි) **ඒසෝ නිකායෝ** මේ නිකාය **දීඝනිකායෝති** දීර්ඝ නිකායයි **කස්මා වුත්තෝ?** කුමක්හෙයින් කියනු ලැබේද යත්? **දීඝප්පමාණානං** දීර්ඝ ප්‍රමාණ ඇත්තා වූ **සුත්තානං** සූත්‍රයන්ගේ **සමූහතෝ ච** සමූහයක් වූ හෙයින් ද **නිවාසතෝ ච** නිවාස ස්ථානයක් වූ හෙයින් ද **දීඝනිකායෝති** දීර්ඝ නිකායයි **වුච්චතේ** කියනු ලැබේ **හි** ඒ එසේමැයි **සමූහනිවාසා** සමූහය නිවාසය යන දෙදෙන **නිකායෝති වුච්චන්ති** නිකායයි කියනු ලැබෙත් **ච** ඊට උදහරණ දක්වම් **භික්ඛවේ** මහණෙනි **තිරච්ඡානගතා** තිරිසන්ගියා වූ (නොහොත්) තිරිසනුන් කෙරෙහි ඇතුළත් වූ **ඉදං (ඉමේ පාණා)** මේ සත්වයෝ තුමූ **චිත්තා යථා** යම්සේ විසිතුරුවූවාහු ද **ඒවං** එපරිද්දෙන් **භික්ඛවේ** මහණෙනි **චිත්තං** විසිතුරු වූ **අඤ්ඤං** තිරිසනුන්ගෙන් අන්‍යවූ **ඒකනිකායම්පි** එක් සමූහයකුදු **අහං** මම **න සමනුපස්සාමි** නොදක්නෙමි **පෝතිකනිකායෝ** පෝතික නම් රජුන්ගේ වාසස්ථානය **චික්ඛල්ලිකනිකායෝ** චික්ඛල්ලික නම් රජුන්ගේ වාසස්ථානය **ඉති ඒවමාදීනි** මේ ආදී උදහරණයෝ තුමූ **එත්‍ථ** මේ නිකාය ශබ්දයාගේ සමූහ-නිවාසවාචක බැවිහි **සාසනතෝ ච** ශාසන වශයෙන් ද **ලෝකතෝ ච** ලෝක ව්‍යවහාර වශයෙන් ද **සාධකානි** සිද්ධ කටයුතු උදහරණ වචනයෝයි **දීඝනිකායස්ස** දීර්ඝ නිකායයාගේ **නිකායභාවේ** නිකාය නම් වන බැව්හි **වචනත්ථෝ** වචනාර්ථය **යථා වේදිතබ්බෝ** යම්සේ දතයුත්තේ ද **ඒවං (තථා)** එපරිද්දෙන් **සේසානම්පි** දීර්ඝ නිකායෙන් අවශිෂ්ඨ වූ නිකායයන්ගේ ද **නිකායභාවේ** නිකාය භාවයෙහි **වචනත්ථෝ වේදිතබ්බෝ** වචනාර්ථය දතයුත්තේයි **මජ්ඣිමනිකායෝ** මධ්‍යම නිකාය තෙමේ **කතමෝ?** කවර යත්? **මජ්ඣිමප්පමාණානි** මැදුම් පමණ ඇත්තා වූ **පඤ්චදසවග්ගසඞ්ගාහානි** පසළොසක් වර්ගයන්ගෙන් සඞ්ග්‍රහ කරන ලද්දවූ **මූලපරියායසුත්තාදීනි** මූලපරියාය සූත්‍රය ආදී කොට ඇත්තාවූ **දියඩ්ඪසතඤ්ච සුත්තානි** එක්සියපණසක් සූත්‍රයෝ ද **ද්වේ ච සුත්තානි** සූත්‍රයෝ දෙදෙනෙක් ද **මජ්ඣිමනිකායෝ** මධ්‍යම නිකාය නම් වේ **යත්‍ථ** යම් නිකායෙක්හි **දියඩ්ඪසතසුත්තන්තා** එක්සියපණස් සූත්‍ර කෙනෙක් ද **ද්වේ ච සුත්තානි සන්ති** සූත්‍රයෝ දෙදෙනෙක් ද ඇත්තාහු වෙද්ද **පඤ්චදසවග්ගපරිග්ගහෝ** පසළොස් වර්ගයෙකින්

සඞ්ග්‍රහ කරන ලද්දවූ **සෝ නිකායෝ** ඒ නිකාය තෙමේ **මජ්ඣිමෝ නිකායෝ** මධ්‍යම නිකාය නම් වේ **ඉති වේදිතබ්බෝ** මෙසේ දතයුත්තේයි **සංයුත්තනිකායෝ** සංයුත් නිකාය තෙමේ **කතමෝ?** කවරේද යත්? **දේවතාසංයුත්තාදිවසේන** දේවතා සංයුත්තකාදී වශයෙන් **ඨිතානි** සිටියාවූ **සත්තසුත්තසහස්සානි** සත්දහසක් සූත්‍රයෝ ද **සත්තසුත්තසතානි ච** සත්සියයක් සූත්‍රයෝ ද **ද්වාසට්ඨිසුත්තානි චේව** දෙසැට සූත්‍ර කෙනෙක් ද **සන්ති** ඇත්තාහු වෙත් ද **ඒසෝ නිකායෝ** මේ නිකාය තෙමේ **සංයුත්තසඞ්ගහෝ** සංයුත් නිකායයි සඞ්ග්‍රහ කරන ලද්දෙයි **අඞ්ගුත්තරනිකායෝ** අඞ්ගුත්තර නිකාය තෙමේ **කතමෝ?** කවරේ ද? **ඒකේකඅඞ්ගාතිරේකවසේන** ඒකේකී අඞ්ගයක්හුගේ අධික වශයෙන් **ඨිතානි** සිටියාවූ **චිත්තපරියාදනාදීනි** චිත්තපරියාදන සූත්‍රය ආදී කොට ඇත්තාවූ **නවසුත්තසහස්සානි** නව දහසක් සූත්‍රයෝ ද **පඤ්චසුත්තසතානි ච** පන්සියයක් සූත්‍රයෝ ද **සත්තපඤ්ඤාසසුත්තානි ච** සත්පණස් සූත්‍ර කෙනෙක් ද **අඞ්ගුත්තරනිකායෝ** අඞ්ගුත්තර නිකාය නම් වේ **නවසුත්තසහස්සානි** නව දහසක් සූත්‍රයෝ ද **පඤ්චසුත්තසතානි ච** පන්සියයක් සූත්‍රයෝ ද **සත්තපඤ්ඤාසසුත්තන්තා** සත්පණස් සූත්‍රාන්ත කෙනෙක් **සන්ති** ඇත්තාහු වෙද්ද **අයං සඞ්ඛ්‍යා** මේ සූත්‍ර සඞ්ඛ්‍යා තොමෝ **අඞ්ගුත්තරේ** අඞ්ගුත්තර නිකායෙහි **සඞ්ඛ්‍යා** සූත්‍රයන්ගේ සඞ්ඛ්‍යාවයි **ඛුද්දකනිකායෝ** ඛුද්දක ග්‍රන්ථ නිකාය තෙමේ **කතමෝ?** කවර යත්? **සකලං විනයපිටකං** සියළු විනයපිටකය ද **අභිධම්මපිටකං** සියළු අභිධර්ම පිටකය ද **ඛුද්දකපාඨ ධම්මපදාදයෝ** ඛුද්දකපාඨ ධර්මපදාදී වූ **පුබ්බේ දස්සිතා** පෙර දක්වන ලද්දවූ **පඤ්චදසප්පභේද** පසළොස් ප්‍රභේද ඇත්තා වූ ග්‍රන්ථයෝ ද **ඛුද්දකනිකායෝ** ඛුද්දක නිකාය නම් වේ **චත්තාරෝ නිකායේ ඨපෙත්වා** සතර මහා නිකාය තබා **අවසේසං බුද්ධවචනං** අවශිෂ්ඨ බුද්ධවචනය **ඛුද්දකනිකායෝ** ඛුද්දකනිකාය නම් වේ **ඉති වේදිතබ්බෝ** මෙසේ දතයුත්තේයි **දීඝආදිකේ** දීර්ඝ නිකාය ආදී කොට ඇති **චතුරෝපි** සතරාකාර වූද **ඒතේ නිකායේ ඨපෙත්වා** මේ නිකායයන් තබා **තදඤ්ඤං** එයින් අන්‍යවූ **බුද්ධවචනං** බුද්ධවචනය **ඛුද්දකනිකායෝ** ඛුද්දකනිකායයයි **මතෝ** දන්නා ලද්දෙයි. **ඒවං (ඉමිනා යථා වුත්තනයේන)** මේ යථෝක්ත ක්‍රමයෙන් **නිකායතෝ** නිකාය වශයෙන් **පඤ්චනිකායා හොන්ති** නිකාය පසෙක් වෙත් (නොහොත්) පස්මහාසඟි කෙනෙක් වෙත්.

**අඞ්ගවසේන** අඞ්ගයන්ගේ වශයෙන් **නවඞ්ගානි** නව ප්‍රකාර වූ අඞ්ගයෝ තුමූ **කථං හොන්ති?** කෙසේ වෙත් ද යත්? **ඉති අයං පුච්ඡා** මේ ප්‍රශ්නයකි **හි** විස්තර කරම් **සබ්බං ඒව ඉදං බුද්ධවචනං** සියළුම මේ බුද්ධවචන තෙමේ **සුත්තං** සූත්‍රාඞ්ගය **ගෙය්‍යං** ගෙය්‍යාඞ්ගය **වෙය්‍යාකරණං** වෙය්‍යාකරණාඞ්ගය **ගාථා** ගාථාඞ්ගය **උදානං** උදානාඞ්ගය **ඉතිවුත්තකං** ඉතිවුත්තකාඞ්ගය **ජාතකං** ජාතකාඞ්ගය **අබ්භූතධම්මං** අබ්භූතධර්මාඞ්ගය **වේදල්ලං** වේදල්ලාඞ්ගය **ඉති (ඉමිනා පභේදේන)** මේ ප්‍රභේදයෙන් **නවප්පභේදං හෝති** නව ප්‍රභේද ඇත්තේ වෙයි **තත්‍ථ** ඔහුන් අතුරෙන් **උභතෝවිභඞ්ග-නිද්දේස-ඛන්ධක-පරිවාරා** භික්‍ෂු-භික්‍ෂුණී යන උභතෝ විභඞ්ගය නිර්දේශය මහාවග්ග ඛන්ධකය චූලවග්ග ඛන්ධකය පරිවාරය යන මොහු ද **සුත්තනිපාතේ** සූත්‍ර නිපාතයෙහි **මඞ්ගලසුත්ත-රතනසුත්ත-නාලකසුත්ත-තුවටකසුත්තානි** මඞ්ගල සූත්‍රය රතනසූත්‍රය නාලකසූත්‍රය තුවටක සූත්‍රය යන මොහු ද **අඤ්ඤම්පි ච** අනිකුදු **සුත්තනාමකං** සූත්‍ර යැයි ලබනලද නම් ඇත්තාවූ **තථාගතවචනං** ශාස්තෘන් වහන්සේගේ වචනය ද **සුත්තං** සූත්‍ර නම් වෙයි **ඉති වේදිතබ්බං** මෙසේ දතයුත්තේයි **සබ්බම්පි** සියළුම **සගාථකං** ගාථා සහිත වූ **සුත්තං** සූත්‍ර තෙමේ **ගෙය්‍යං** ගෙය්‍ය නම් වේ **ඉති වේදිතබ්බං** මෙසේ දතයුත්තේයි **හි (විසේසේන)** විශේෂ වශයෙන් **සංයුත්තනිකායේ** සංයුත් නිකායෙහි **සකලෝපි** සියළුම

**සගාථවග්ගෝ** ගාථා සහිත වර්ග තෙමේ **ගෙය්‍යං** ගෙය්‍ය නම් වේ **සකලම්පි** සියළුම **අභිධම්මපිටකං** අභිධර්ම පිටක තෙමේ ද **නිග්ගාථකං** ගාථා නැත්තාවූ **සුත්තං** සූත්‍ර තෙමේ ද **අඤ්ඤම්පි** අන්‍යවූ ද **අට්ඨහි අඞ්ගේහි** අඞ්ග අටකින් **අසඞ්ගහිතං** සඞ්ග්‍රහ නොකරන ලද්දවූ **යඤ්ච බුද්ධවචනං අත්ථි** යම් බුද්ධවචනයක් ඇත්තේ වේද **තං (බුද්ධවචනං)** ඒ බුද්ධවචන තෙමේ **වෙය්‍යාකරණං** වෙය්‍යාකරණාඞ්ග නම් වේ **ඉති වේදිතබ්බං** මෙසේ දතයුත්තේයි **ධම්මපදං** ධර්මපදය ද **ථේරගාථා** ථේරගාථාව ද **ථේරීගාථා** ථේරීගාථාව ද **සුත්තනිපාතේ** සූත්‍ර නිපාතයෙහි **නෝසුත්තනාමිකා** සූත්‍ර යැයි ලබනලද නම් නැත්තාවූ **සුද්ධිකගාථා ච** සුද්ධික ගාථාවෝ ද (හෙවත්) අමිශ්‍ර වූ ගාථාවෝ ද **ගාථා** ගාථා නම් වේ (ථේරකථා ථේරීකථා යයි සමහර පොත්හි දක්නා ලැබෙතත් ඒ විරුද්ධ පාඨයි දතයුතු) **සෝමනස්සඤාණමයිකගාථා පටිසංයුත්තා** සොම්නස් වේදනා සම්ප්‍රයුක්ත වූ ඤාණයෙන් හටගත්තා වූ ගාථාවන්ගෙන් පිළිසයුත් වූ **ද්වේ අසීති සුත්තන්තා** දෙයාසූවක් සූත්‍රාන්තයෝ තුමූ **උදානං** උදාන නම් වේ **වුත්තඤ්චේතං භගවතාති ආදී නයප්පවත්තා** වුත්තඤ්චේතං භගවතා යනාදි නයින් පැවතියා වූ **දසුත්තරසතසුත්තන්තා** දෙළොස් සූත්‍රයක් අධික කොට ඇත්තාවූ එක් සියයක් සූත්‍රයෝ තුමූ **ඉතිවුත්තකං** ඉතිවුත්තක නම් වේ **ඉති වේදිතබ්බං** මෙසේ දතයුත්තේයි ("දසුත්තර" යන තන්හි ද්වි ශබ්දය ඌන වූ බැවින් ඌන සඞ්ඛ්‍යා නම් වේ) **අපණ්ණකජාතකාදීනි** අපණ්ණක ජාතකාදී වූ **පඤ්ඤාසාධිකානි** පණසක් අධික කොට ඇත්තා වූ **පඤ්චජාතකසතානි** පන්සියයක් ජාතකයෝ තුමූ **ජාතකං** ජාතකාඞ්ග නම් වෙයි **ඉති වේදිතබ්බං** මෙසේ දතයුත්තේයි **චත්තාරෝ මේ** -පෙ- **ආනන්දේති ආදීනයප්පවත්තා** චත්තාරෝ මේ -පෙ- ආනන්දේ යනාදි ක්‍රමයෙන් හටගත්තාවූ **සබ්බේ** සියළු **අච්ඡරියබ්භූතධම්මපටිසංයුත්තසුත්තන්තා** අසිරිමත් වූ පෙර නොවූවිරූ දම්පිළිසයුත් සූත්‍රාන්තයෝ තුමූ **අබ්භූතධම්මං** අද්භූතධර්ම නම් වෙයි **ඉති වේදිතබ්බං** මෙසේ දතයුත්තේයි **චූළවේදල්ල-මහාවේදල්ල-සම්මාදිට්ඨි-සක්කපඤ්හ-සඞ්ඛාරභාජනීය-මහාපුණ්ණමසුත්තාදයෝ** චූල්ලවේදල්ල සූත්‍රය මහාවේදල්ල සූත්‍රය සම්මාදිට්ඨි සූත්‍රය සක්කපඤ්හ සූත්‍රය සඞ්ඛාරභාජනීය සූත්‍රය මහාපුණ්ණම සූත්‍රය යනාදී වූ **සබ්බේපි** සියළුම **වේදඤ්ච** ප්‍රඥව ද **තුට්ඨිඤ්ච** ප්‍රීතිය ද **ලද්ධා ලද්ධා** ලැබ ලැබ **පුච්ඡිතසුත්තන්තා** ප්‍රශ්න කරනලද සූත්‍රාන්තයෝ තුමූ **වේදල්ලං** වේදල්ල නම් වෙයි **ඉති වේදිතබ්බං** මෙසේ දතයුත්තේයි **ඒවං (ඉමිනා යථා වුත්තනයේන)** මෙසේ "සබ්බමේවහිදං" යනාදීන් කියනලද ක්‍රමයෙන් **ඒතං බුද්ධවචනං** මේ බුද්ධවචන තෙමේ **අඞ්ගතෝ** අඞ්ග වශයෙන් **නවඞ්ගානි හොන්ති** නවඞ්ග කෙනෙක් වෙත්.

**ධම්මක්ඛන්ධතෝ** ධර්මස්කන්ධ වශයෙන් **චතුරාසීතිධම්මක්ඛන්ධසහස්සානි** අටනහුතසාරදහසක් ධර්මස්කන්ධයෝ තුමූ **කථං හොන්ති?** කෙසේ වෙත් ද යත්? **ඉති අයං පුච්ඡා** මේ වනාහි ප්‍රශ්නයයි **ච** විස්තර කෙරෙමි **සබ්බං ඒව ඒතං බුද්ධවචනං** සියළුම මේ බුද්ධවචන තෙමේ **ද්වාසීතිං** -පෙ- **පවත්තිනෝති** පවත්තිනෝ යනු **ඒවං ඉමාය ගාථාය** මේ ගාථාව කරණකොටගෙන **පරිදීපිතධම්මක්ඛන්ධවසේන** ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් විසින් දක්වනලද ධර්මස්කන්ධයන්ගේ වශයෙන් **චතුරාසීතිසහස්සප්පභේදං හෝති** අටනහුතසාරදහසෙක් ප්‍රභේද ඇත්තේ වෙයි ඒ ගාථාවෙහි අර්ථ මෙසේයි:—

**බ්‍රාහ්මණ** එම්බා ගෝපක මොග්ගල්ලාන නම් බමුණ **අහං** මම **බුද්ධතෝ** ශාස්තෘන් වහන්සේගෙන් **ද්වාසීතිසහස්සානි** අටනහුතදෙදහසක් ධර්මස්කන්ධයන් **ගණ්හිං** උගෙන ගත්තෙමි **භික්ඛුතෝ** ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිර ආදීන්ගෙන් **ද්වේ**

**සහස්සානි** දෙදසහක් ධර්මස්කන්ධයක් **ගණ්හිං** උගෙන ගත්තෙමි **යේ ධම්මා** යම් ධර්ම කෙනෙක් **මේ** මා විසින් පවත්තිනෝ පුරුදුකරන ලද්දහු ද (නොහොත්) **යේ ධම්මා** යම් ධර්ම කෙනෙක් තුමූ **මේ** මගේ **(ජිව්හග්ගේ)** දිවග **පවත්තිනෝ** පිහිටියාහු ද **තේ ධම්මා** ඒ ධර්මයෝ තුමූ **චතුරාසීතිසහස්සානි හොන්ති** අටනහුතසාරදහසෙක් වෙත් (හෙවත්) අසූසාරදහසෙක් වෙත්.

**තත්‍ථ** ඒ ධර්මස්කන්ධයන් අතුරෙන් **ඒකානුසන්ධිකං** එක් අනුසන්ධියක් ඇත්තාවූ **සුත්තං** සූත්‍ර තෙමේ **ඒකෝ ධම්මක්ඛන්ධෝ** එක් ධර්මස්කන්ධයෙක් නම් වෙයි **යං සුත්තං** යම් සූත්‍රයක් තෙමේ **අනේකානුසන්ධිකං** නොයෙක් අනුසන්ධි ඇත්තේ වේද **තත්‍ථ** ඒ සූත්‍රයෙහි **අනුසන්ධිවසේන** අනුසන්ධීන්ගේ වශයෙන් **ධම්මක්ඛන්ධගණනා** ධර්මස්කන්ධයන්ගේ සඞ්ඛ්‍යාව **වේදිතබ්බා** දතයුත්තීය **ගාථාබන්ධේසු** ගාථා බන්ධනයෙහි **පඤ්හපුච්ඡකං** දැනගනු කැමතිව ප්‍රශ්න විචාරණ වචන තෙමේ **ඒකෝ ධම්මක්ඛන්ධෝ** එක් ධර්මස්කන්ධයක් නම් වේ **විස්සජ්ජනං** විසර්ජනා වචන තෙමේ **ඒකෝ ධම්මක්ඛන්ධෝ** එක් ධර්මස්කන්ධයෙක් නම් වේ **අභිධම්මේ** අභිධර්මයෙහි **ඒකමේකං** එක එකක් වූ **තිකදුකභාජනං** තිකදුකයන් බෙදන්නා වූ වචනයක් වේද **ඒකමේක** එක එකක් වූ **චිත්තවාරභාජනඤ්ච** චිත්තවාර බෙදීමෙක් ද **ඒකෝ ධම්මක්ඛන්ධෝ** එක් එක් ධර්මස්කන්ධයක් නම් වේ (ඒකෝ ධම්මක්ඛන්ධෝති එත්‍ථ ඒකමේකං තිකදුකභාජනං ඒකමේකං චිත්තවාරභාජනන්ති ච වුත්තත්තා ඒකේකෝ ධම්මක්ඛන්ධෝති වේදිතබ්බෝ ඒකේකෝති අවුත්තේපිහි අයමත්ථෝ අත්ථතෝ විඤ්ඤායමානෝව හෝතීති ඒකෝ ධම්මක්ඛන්ධෝති හි වුත්තං) යනු මණිදීපටීකා බැවින් "ඒකෝ ධම්මක්ඛන්ධෝ" යන වචනය පුරාණ පාඨයයි දතයුතුයි **ඒකෝ ධම්මක්ඛන්ධෝ** එකී එකී ධර්මස්කන්ධ නම් වෙයි යන අර්ථය සඳහා "ඒකේකෝ" යි තිබිය යුතුය යන සඤ්ඤාවෙන් මෑත භාගයෙහි වචන සකස්කොට "ඒකේකෝ ධම්මක්ඛන්ධෝ" යන පාඨය ගත්තේයයි දතයුතුයි.

**විනයේ** විනය පිටකයෙහි **වත්‍ථු අත්‍ථි** වස්තුවෙක් ඇත්තේය **මාතිකා අත්‍ථි** මාතෘකාවෙක් ඇත්තීය **පදභාජනීයං අත්‍ථි** පදභාජනීයක් ඇත්තීය **ආපත්ති අත්‍ථි** ආපත්තියක් ඇත්තීය **අන්තරාපත්ති අත්‍ථි** අනන්තරාපත්තියෙක් ඇත්තීය **අනාපත්ති අත්‍ථි** අනාපත්තියක් ඇත්තීය **තිකච්ඡේදෝ** ත්‍රිකයන්ගේ පිරිසිදීම කියන්නා වූ වචනයක් ඇත්තේය **ඉති** මෙසේ **සත්තකොට්ඨාසා හොන්ති** සත් කොටසෙක් වෙත් (සත්තකොට්ඨාසා යනු ආධ්‍යාහාරයි) **තත්‍ථ** ඒ සත් වැදෑරුම් කොට්ඨාශයන් අතුරෙන් **ඒකේකෝ කොට්ඨාසෝ** ඒකේකී කොට්ඨාශ තෙමේ **ඒකේකෝ ධම්මක්ඛන්ධෝ** ඒකේකී ධර්මස්කන්ධයක් වෙයි **ඉති** මෙසේ **වේදිතබ්බෝ** දතයුත්තේයි **ඒවං (ඉමිනා යථා වුත්තනයේන)** මෙසේ "සබ්බමේව හි" යනාදී වශයෙන් කියනලද ක්‍රමයෙන් **ධම්මක්ඛන්ධතෝ** ධර්මස්කන්ධ වශයෙන් **චතුරාසීතිධම්මක්ඛන්ධසහස්සානි හොන්ති** සූවාසූදහසක් ධර්මස්කන්ධයෝ වෙත්. **[අර්ථශාලිනී අර්ථකථා සන්නය 60-84 පිටු]**

සියළු බුද්ධ වචනය රස වශයෙන් එක් වැදෑරුම්ය. ධර්ම විනය වශයෙන් දෙවැදෑරුම්ය. ප්‍රථම-මධ්‍යම-පශ්චිම වශයෙන් හා පිටක වශයෙන් තෙවැදෑරුම්ය. නිකාය වශයෙන් පස් වැදෑරුම්ය. ධර්ම ස්කන්ධ වශයෙන් සූවාසූ දහසක්ය. මේ මෙසේ බෙදුවෝ ප්‍රථම සඞ්ගීතිකාරක මහා ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේලාය.

**[සද්ධර්මසාගරය 01/221 පිට]**

සම්මා සම්බුදුරජාණන් වහන්සේ ඒ ඒ චරිතයන්ට අනුලොම් වන සේ නිර්වාණ මාර්ගය සම්පාදනය කරමින් අනුශාසනා වශයෙන් දේශනා කරණ ලද ධර්ම විනය සඞ්ඛ්‍යාත සාසනය බුද්ධකාලයෙහිම මතාන්තර සංකලනයෙන් තොරව චිරස්ථායී වන පරිදි කොටස් වශයෙන් බෙද සඞ්ග්‍රහ කොට මේ නෛය්‍යානික බුද්ධවචන යැයි තථාගත ශ්‍රාවකයන් විසින් සම්මත කරණ ලදි. **[මහවග්ග පාළි සඤ්ඤපනය xiv පිට (බු.ජ)]**

## අභිධර්මය බුද්ධභාෂිතයක් නොවේ යැයි නොකියයුතුයි:—

අයං අභිධම්මෝ පිටකතෝ අභිධම්මපිටකං, නිකායතෝ ඛුද්දකනිකායෝ, අඞ්ගතෝ වෙය්‍යාකරණං, ධම්මක්ඛන්ධතෝ කතිපයානි ධම්මක්ඛන්ධසහස්සානි හොන්ති.

තං ධාරයන්තේසු භික්ඛූසු පුබ්බේ ඒකෝ භික්ඛු සබ්බසාමයිකපරිසාය නිසීදිත්වා අභිධම්මතෝ සුත්තං ආහරිත්වා ධම්මං කථෙන්තෝ "රූපක්ඛන්ධෝ අබ්‍යාකතෝ, චත්තාරෝ ඛන්ධා සියා කුසලා සියා අකුසලා සියා අබ්‍යාකතා; දසායතනා අබ්‍යාකතා, ද්වේ ආයතනා සියා කුසලා සියා අකුසලා සියා අබ්‍යාකතා; සෝළස ධාතුයෝ අබ්‍යාකතා, ද්වේ ධාතුයෝ සියා කුසලා සියා අකුසලා සියා අබ්‍යාකතා; සමුදයසච්චං අකුසලං, මග්ගසච්චං කුසලං, නිරෝධසච්චං අබ්‍යාකතං, දුක්ඛසච්චං සියා කුසලං සියා අකුසලං සියා අබ්‍යාකතං; දසින්ද්‍රියා අබ්‍යාකතා, දෝමනස්සින්ද්‍රියං අකුසලං, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං කුසලං, චත්තාරි ඉන්ද්‍රියානි සියා කුසලා සියා අබ්‍යාකතා, ඡ ඉන්ද්‍රියානි සියා කුසලා සියා අකුසලා සියා අබ්‍යාකතා"ති ධම්මකථං කථේසි.

තස්මිං ඨානේ ඒකෝ භික්ඛු නිසින්නෝ 'ධම්මකථික ත්වං සිනේරුං පරික්ඛිපන්තෝ විය දීඝසුත්තං ආහරසි, කිං සුත්තං නාමේත'න්ති ආහ. 'අභිධම්මසුත්තං නාම, ආවුසෝ'ති. 'අභිධම්මසුත්තං කස්මා ආහරසි? කිං අඤ්ඤං බුද්ධභාසිතං සුත්තං ආහරිතුං න වට්ටතී'ති? 'අභිධම්මෝ කේන භාසිතෝ'ති? 'න ඒසෝ බුද්ධභාසිතෝ'ති. 'කිං පන තේ, ආවුසෝ, විනයපිටකං උග්ගහිත'න්ති? 'න උග්ගහිතං, ආවුසෝ'ති. 'අවිනයධාරිතාය මඤ්ඤේ ත්වං අජානන්තෝ ඒවං වදේසී'ති. 'විනයමත්තමේව, ආවුසෝ, උග්ගහිත'න්ති. 'තම්පි තේ දුග්ගහිතං, පරිසපරියන්තේ නිසීදිත්වා නිද්දායන්තේන උග්ගහිතං භවිස්සති; තුම්හාදිසේ හි පබ්බාජෙන්තෝ වා උපසම්පාදෙන්තෝ වා සාතිසාරෝ හෝති'. 'කිං කාරණා'? විනයමත්තස්සපි දුග්ගහිතත්තා; වුත්තඤ්හේතං; "තත්ථ අනාපත්ති, න විවණ්ණේතුකාමෝ ඉඞ්ඝ තාව, ආවුසෝ, සුත්තන්තං වා ගාථායෝ වා අභිධම්මං වා පරියාපුණස්සු, පච්ඡාපි විනයං පරියාපුණිස්සසී"ති (පාචි. 442) භණති. "සුත්තන්තේ ඔකාසං කාරාපෙත්වා අභිධම්මං වා විනයං වා පුච්ඡති, අභිධම්මේ ඔකාසං කාරාපෙත්වා සුත්තන්තං වා විනයං වා පුච්ඡති, විනයේ ඔකාසං කාරාපෙත්වා සුත්තන්තං වා අභිධම්මං වා පුච්ඡතී"ති (පාචි. 1221). 'ත්වං පන එත්තකම්පි න ජානාසී'ති එත්තකේනපි පරවාදී නිග්ගහිතෝ හෝති.

මහාගෝසිඞ්ගසුත්තං පන ඉතෝපි බලවතරං. තත්‍ර හි ධම්මසේනාපති **සාරිපුත්තත්ථේරෝ** අඤ්ඤමඤ්ඤං පුච්ඡිතපඤ්හඤ්ච විස්සජ්ජනඤ්ච ආරෝචේතුං සත්ථු සන්තිකං ගන්ත්වා මහාමොග්ගල්ලානත්ථේරස්ස විස්සජ්ජනං ආරෝචෙන්තෝ "ඉධාවුසෝ සාරිපුත්ත, ද්වේ භික්ඛූ අභිධම්මකථං කථෙන්ති, තේ අඤ්ඤමඤ්ඤං පඤ්හං පුච්ඡන්ති, අඤ්ඤමඤ්ඤස්ස පඤ්හං පුට්ඨා

විස්සජ්ජෙන්ති, නෝ ච සංසාදෙන්ති, ධම්මී ච නේසං කථාපවත්තිනී හෝති, ඒවරූපේන බෝ, ආවුසෝ, සාරිපුත්ත, භික්ඛුනා ගෝසිඞ්ගසාලවනං සෝභෙය්‍යා”ති (ම. නි. 1.343) ආහ. සත්ථා ආභිධම්මිකා නාම මම සාසනේ පරිබාහිරාති අවත්වා සුවණ්ණාලිඞ්ගසදිසං ගීවං උන්නාමෙත්වා පුණ්ණචන්දසස්සිරිකං මහාමුඛං පූරෙත්වා බ්‍රහ්මඝෝසං නිච්ඡාරෙන්තෝ “සාධු සාධු සාරිපුත්තා”ති මහාමොග්ගල්ලානත්ථේරස්ස සාධුකාරං දත්වා “යථා තං මොග්ගල්ලානෝ ච සම්මා බ්‍යාකරමානෝ බ්‍යාකරෙය්‍ය, මොග්ගල්ලානෝ හි සාරිපුත්ත ධම්මකථිකෝ”ති (ම. නි. 1.343) ආහ. ආභිධම්මිකභික්ඛූයේව කිර ධම්මකථිකා නාම, අවසේසා ධම්මකථං කථෙන්තාපි න ධම්මකථිකා. කස්මා? තේ හි ධම්මකථං කථෙන්තා කම්මන්තරං විපාකන්තරං රූපාරූපපරිච්ඡේදං ධම්මන්තරං ආලෝළෙත්වා කථෙන්ති. ආභිධම්මිකා පන ධම්මන්තරං න ආලෝළෙන්ති. තස්මා ආභිධම්මිකෝ භික්ඛු ධම්මං කථේතු වා මා වා, පුච්ඡිතකාලේ පන පඤ්හං කථෙස්සතීති. අයමේව ඒකන්තධම්මකථිකෝ නාම හෝති. ඉදං සන්ධාය සත්ථා සාධුකාරං දත්වා ‘සුකථිතං මොග්ගල්ලානේනා’ති ආහ.

අභිධම්මං පටිබාහෙන්තෝ ඉමස්මිං ජිනචක්කේ පහාරං දේති, සබ්බඤ්ඤුතඤ්ඤාණං පටිබාහති, සත්ථු වේසාරජ්ජඤ්ඤාණං පටිනිවත්තේති, සෝතුකාමං පරිසං විසංවාදේති, අරියමග්ගේ ආවරණං බන්ධති, අට්ඨාරසසු භේදකරවත්ථූසු ඒකස්මිං සන්දිස්සති උක්ඛේපනීයකම්මතජ්ජනීයකම්මාරහෝ හෝති. තං තං කම්මං කත්වා උය්‍යෝජේතබ්බෝ ‘ගච්ඡ විඝාසාදෝ හුත්වා ජීවිස්සසී’ති.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා නිදානවණ්ණනා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 23-24 පිටු (හේ.වි.මු)]**

**අයං අභිධම්මෝ පිටකතෝ අභිධම්මපිටක**න්ති ආදිනා පිටකාදිභාව දස්සනේනේව මජ්ඣිමබුද්ධවචනභාවෝ තථාගතස්ස ච ආදිතෝ ආභිධම්මිකභාවෝ දස්සිතෝති වේදිතබ්බෝ.

එත්ථ සියා “යදි තථාගතභාසිතභාවෝ අභිධම්මස්ස සිද්ධෝ සියා, මජ්ඣිමබුද්ධවචනභාවෝ ච සිද්ධෝ භවෙය්‍ය, සො ඒව ච න සිද්ධෝ”ති තස්ස විනයාදීහි බුද්ධභාසිතභාවං සාධේතුං වත්ථුං දස්සෙන්තෝ **“තං ධාරයන්තේසු භික්ඛූසු”**ති ආදිමාහ. **සබ්බසාමයිකපරිසායා**ති සබ්බනිකායිකපරිසාය පඤ්චපි නිකායේ පරියාපුණන්තියා. **න උග්ගහිත**න්ති සකලස්ස විනයපිටකස්ස අනුග්ගහිතත්තා ආහ. **විනයමත්තං උග්ගහිත**න්ති විභඞ්ගද්වයස්ස උග්ගහිතත්තා ආහ. විනයං අවිවණ්ණේතුකාමතාය “අභිධම්මං පරියාපුණස්සූ”ති භණන්තස්ස අනාපත්තිං, අභිධම්මේ අනෝකාසකතං භික්ඛුං පඤ්හං පුච්ඡන්තියා පාචිත්තියඤ්ච වදන්තේන භගවතා අභිධම්මස්ස බුද්ධභාසිතභාවෝ දීපිතෝ බුද්ධභාසිතේහි සුත්තාදීහි සහ වචනතෝ, බාහිරකභාසිතේසු ච ඊදිසස්ස වචනස්ස අභාවා.

**ඉතොපි බලවතරං** ආභිධම්මිකස්ස සාධුකාරදානේන විචිකිච්ඡාවිච්ඡේදස්ස කතත්තා. කම්මතෝ අඤ්ඤං කම්මං **කම්මන්තරං,** තං කාමාවචරාදිං රූපාවචරාදිභාවේන, කණ්හවිපාකාදිං සුක්කවිපාකාදිභාවේන කථෙන්තෝ ආලෝළේති.

**ජිනචක්කේ**ති ජිනසාසනේ. **විසංවාදේතී**ති විප්පලම්භේති. **භේදකරවත්ථූසු ඒකස්මි**න්ති “භාසිතං ලපිතං තථාගතේන අභාසිතං අලපිතං තථාගතේනාති දීපේතී”ති ඒකස්මිං සන්දිස්සති. **[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා නිදානවණ්ණනා යටතේ)]**

**අයං අභිධම්මෝ** මේ අභිධර්ම තෙමේ **පිටකතෝ** පිටක වශයෙන් **අභිධම්මපිටකං** අභිධම්ම පිටක නම් වේ **නිකායතෝ** නිකාය වශයෙන් **ඛුද්දකනිකායෝ** ඛුද්දක නිකාය නම් වේ **අඞ්ගතෝ** අඞ්ග වශයෙන් **වෙය්‍යාකරණං** වෙය්‍යාකරණාඞ්ග නම් වේ **ධම්මක්ඛන්ධතෝ** ධර්මස්කන්ධ වශයෙන් **කතිපයානි ධම්මක්ඛන්ධසහස්සානි හොන්ති** සතළිස් දෙදහසක් පමණ ධර්මස්කන්ධයෝ වෙත් (පිටකාදීන්ගේ ස්වභාව ප්‍රකාශ කිරීමට හේතු වූ "අයං අභිධම්මෝ පිටකතෝ අභිධම්මපිටකං" යනාදී වූ මේ පාළිය කරණකොටගෙන අභිධර්මයාගේ මධ්‍යම බුද්ධවචන බව ද ශාස්තෘන් වහන්සේ විසින් පළමු කොටම අභිධර්ම පිටකය අවබෝධ කළ බව ද නෙය්‍යාර්ථ වශයෙන් දක්වන ලද්දේ යැයි දතයුතු. මේ වෙන් කරන ලද්දවූ වචන පරම්පරාවෙන් බුද්ධවචන පිටක නිකාය අඞ්ග ධර්මස්කන්ධයන් කරණකොටගෙන සර්ව දර්ශී වූ ශාස්තෘන් වහන්සේ පළමු කොටම අභිධර්මය අවබෝධ කළ බව සිද්ධ කෙළේයි. "අයං අභිධම්මෝ පිටකතෝ අභිම්මපිටකං" යනාදී වචනයෙහි අභිධර්මය ශාස්තෘන් වහන්සේ විසින් වදාරණ ලද බව සිද්ධ වන්නේ වී නම් අභිධර්මයාගේ මධ්‍යම බුද්ධවචන භාවය ද සිද්ධ වන්නේයි. අභිධර්මය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද බව නිදානයෙහි නැති හෙයින් සිද්ධ නොවන්නේ යයි කියත් නම් අභිධර්මයාගේ බුද්ධභාෂිත බව සිද්ධ කරනු පිණිස වස්තුවක් උද්ධරණය කරනු කැමති අර්ථකථාචාර්‍ය්‍යී තෙමේ "තං ධාරෙන්තේසු" යනාදිය කීහ. (නොහොත්) බුද්ධභාෂිත බව සිද්ධ කරන්නාවූ විනයපිටකය කරණකොටගෙන ධර්මකථික වස්තුවක් ද ගෝසිඞ්ග සූත්‍රය කරණකොටගෙන මහාමොග්ගල්ලාන වස්තුවක් ද නිදානය කරණකොටගෙන මණ්ඩලාරාම වාසී තිස්සභූති වස්තුව ද ගාමවාසී සුමනදේව ස්ථවිර වස්තුව ද සුමේධ වස්තුව ද යන මේ වස්තූහු දක්වනු කැමති වූ අර්ථකථාචාර්‍ය්‍යී තෙමේ "තං ධාරෙන්තේසු" යනාදිය කීහ)

**තං (අභිධම්මං)** ඒ අභිධර්මය **ධාරෙන්තේසු** ධරන්නා වූ **භික්ඛූසු** භික්‍ෂූන් අතුරෙන් **පුබ්බේ** පූර්වයෙහි **ඒකෝ භික්ඛු** එක් භික්‍ෂුවක් තෙමේ **සබ්බසාමයිකපරිසාය** සියළු නිකාය ධරන්නා වූ පිරිස් මධ්‍යයෙහි **නිසීදිත්වා** වැඩහිඳ **අභිධම්මතෝ** අභිධර්ම පිටකයෙන් සුත්තං ආහරිත්වා පාළියක් එළවා **ධම්මං කථෙන්තෝ** දහම් දෙසනුයේ **රූපක්ඛන්ධෝ** රූපස්කන්ධ තෙමේ **අබ්‍යාකතෝ** අව්‍යාකෘත නම් වෙයි **චත්තාරෝ ඛන්ධා** සතර නාමස්කන්ධයෝ තුමූ **සියා** ඇතැම් ධර්ම කෙනෙක් **කුසලා** කුසල් නම් වෙත් **සියා** ඇතැම් ධර්ම කෙනෙක් **අකුසලා** අකුසල් නම් වෙත් **සියා** ඇතැම් ධර්ම කෙනෙක් **අබ්‍යාකතා** අව්‍යාකෘත නම් වෙත් **සෝළස ධාතුයෝ** සොළොස් ධාතූහු තුමූ **අබ්‍යාකතා** අව්‍යාකෘත නම් වෙත් **ද්වේ ධාතුයෝ** ද්විප්‍රකාර වූ මනෝවිඤ්ඤාණධාතු ධම්මධාතූහු තුමූ **සියා** ඇතැම් ධාතු තුමූ **කුසලා** කුසල් නම් වෙත් **සියා** ඇතැම් ධාතු තුමූ **අකුසලා** අකුසල් නම් වෙත් **සියා** ඇතැම් ධාතු තුමූ **අබ්‍යාකතා** අව්‍යාකෘත නම් වෙත් **සමුදයසච්චං** සමුදය සත්‍යය තෙමේ **අකුසලං** අකුසල් නම් වෙයි **මග්ගසච්චං** මාර්ග සත්‍යය තෙමේ **කුසලං** කුසල් නම් වෙයි **නිරෝධසච්චං** නිරෝධ සත්‍යය තෙමේ **අබ්‍යාකතං** අව්‍යාකෘත නම් වෙයි **දුක්ඛසච්චං** දුක්ඛ සත්‍යය තෙමේ **සියා කුසලං** ඇතැම් ධර්ම කෙනෙක් කුසල් නම් වෙයි **සියා අකුසලං** ඇතැම් ධර්ම කෙනෙක් අකුසල් නම් වෙත් **සියා අබ්‍යාකතං** ඇතැම් ධර්ම කෙනෙක් අව්‍යාකෘත නම් වෙත් **දසින්ද්‍රියා** ඉන්ද්‍රිය ධර්මයෝ දසදෙනෙක් තුමූ **අබ්‍යාකතා** අව්‍යාකෘත නම් වෙත් **දෝමනස්සින්ද්‍රියං** දෝමනස්සින්ද්‍රිය තෙමේ **අකුසලං** අකුසල් නම් වෙයි **අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං** අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය තෙමේ **කුසලං**

කුසල් නම් වෙයි **චත්තාරි ඉන්‍ද්‍රියානි** සද්ධින්‍ද්‍රිය සතින්‍ද්‍රිය සමාධින්‍ද්‍රිය පඤ්ඤින්‍ද්‍රිය යන ඉන්‍ද්‍රිය ධර්මයෝ සතර දෙන **සියා** ඇතැම් කෙනෙක් **කුසලා** කුසල් නම් වෙත් **සියා** ඇතැම් කෙනෙක් **අබ්‍යාකතා** අව්‍යාකෘත නම් වෙත් **ඡ ඉන්‍ද්‍රියානි** ඉන්‍ද්‍රියෝ සදෙනෙක් තුමූ **සියා කුසලා** ඇතැම් ධර්ම කෙනෙක් කුසල් නම් වෙත් **සියා අකුසලා** ඇතැම් ධර්ම කෙනෙක් අකුසල් නම් වෙත් **සියා අබ්‍යාකතා** ඇතැම් ධර්ම කෙනෙක් අව්‍යාකෘත නම් වෙත් **ඉති** මෙසේ **ධම්මකථං කථේසි** ධර්ම කථාව කීයේයි.

**යස්මිං ඨානේ** යම් තැනෙක්හි **ඒකෝ භික්ඛු** එක් භික්‍ෂුවක් තෙමේ **නිසීදිත්වා** හිඳ **අභිධම්මතෝ** අභිධර්ම පිටකයෙන් **සුත්තං** ආහරිත්වා පාළි ප්‍රදේශයක් එළවා **ධම්මං කථේසි** ධර්මය කීයේ ද **තස්මිං ඨානේ** ඒ ස්ථානයෙහි **ඒකෝ භික්ඛු** එක් භික්‍ෂුවක් තෙමේ **නිසින්නෝ** හුන්නේ **ධම්මකථිකං** ධර්මකථිකයාහට **ධම්මකථික!** එම්බා ධර්මකථිකය! **ත්වං** නුඹ වහන්සේ **සිනේරුං පරික්ඛිපන්තෝ විය** මහමෙර වටකරන්නක්හු මෙන් **දීඝසුත්තං** දීර්ඝ වූ සූත්‍රයක් (හෙවත්) පාළි ප්‍රදේශයක් **ආහරසි** එළවූයෙහිය **ඒතං සුත්තං** මේ සූත්‍ර තෙමේ **කිං සුත්තං නාමාති ආහ** කිනම් සූත්‍රයක් දැයි ඇසීය **ආවුසෝ!** ඇවැත්නි! **ඒතං සුත්තං** මේ සූත්‍ර තෙමේ **අභිධම්මසුත්තං නාමාති ආහ** අභිධර්ම සූත්‍ර නම් වෙයි කීය **කස්මා?** කුමක් හෙයින් **අභිධම්මසුත්තං ආහරසි** අභිධර්ම සූත්‍රයක් එළවූයෙහි ද? **අඤ්ඤං** අභිධර්ම පාළියෙන් අන්‍යවූ **බුද්ධභාසිතං සුත්තං** බුදුරජාණන් වහන්සේ විසින් වදාරන ලද සූත්‍ර පාළියක් **ආහරිතුං න වට්ටති කිං?** එළවන්නට නොවටනේ දැයි **ඉති ආහ** මෙසේ කීහ **අභිධම්මෝ** අභිධර්මය **කේන පුග්ගලේන** කවර පුද්ගලයෙකු විසින් **භාසිතෝ ඉති ආහ** වදාරන ලද්දේ දැයි කීයේය **ඒසෝ අභිධම්මෝ** මේ අභිධර්මය තෙමේ **න බුද්ධභාසිතෝ** බුද්ධභාෂිත නොවේ **ඉති ආහ** මෙසේ කීයේය **ආවුසෝ!** ඇවැත්නි! **තේ** තොප විසින් **විනයපිටකං** විනය පිටකය **උග්ගහිතං පන** උගෙන ගන්නා ලද්දේදැයි **ඉති ආහ** මෙසේ කීයේය **ආවුසෝ!** ඇවැත්නි! **තං විනයපිටකං** ඒ විනය පිටකය **න උග්ගහිතං** නූගන්නා ලද්දෙමි **ඉති ආහ** මෙසේ කීයේයි **ත්වං** තෙපි **අවිනයධාරිතාය** විනය නොධරන හෙයින් **අජානන්තෝ** නොදන්නේ **ඒවං වදේසි මඤ්ඤේ** මෙසේ කීයෙහි යයි හඟිමි **ඉති ආහ** මෙසේ කියේයි **ආවුසෝ!** ඇවැත්නි! **විනයමත්තං** ස්වල්ප වූ විනයක් **උග්ගහිතන්ති ආහ** උගෙන ගන්නා ලද්දෙමි (නොහොත්) ("විනයමත්තන්ති එත්ථ මත්ත සද්දෝ මත්තාසුඛපරිච්චාගාති ආදීසු විය ඊසකත්ථෝ හෝති") **තම්පි** ඒ ස්වල්ප වූ විනය ද **තේ** තා විසින් **දුග්ගහිතං** නපුරු සේ උගන්නා ලද්දේය **පරිසපරියන්තේ** පිරිස් කෙළවර **නිසීදිත්වා** හිඳ **නිද්දායන්තේන හුත්වා** නිදවැටෙන්නෙක්ව **උග්ගහිතං භවිස්සති** උගෙන ගන්නා ලද්දේ වන්නේය **තුම්හාදිසේහි** තා වැන්නවුන් විසින් **දුග්ගහිතවිනයමත්තේහි** නපුරු සේ උගන්නා ලද ස්වල්ප වූ විනය ඇත්තා වූ පුද්ගලයන් විසින් **සරණගමනදායකේහි හුත්වා** සරණගමනය දෙන්නා වූ ආචාර්‍යයෙක් වී **පබ්බාජේන්තෝ වා** පැවිදි කරන ලද්දවූ පුද්ගල තෙමේ හෝ **අනුසාවනාචාරියේහි හුත්වා** කර්ම වාක්‍යය කියන්නා වූ කර්මාචාර්‍යයන්ව **උපසම්පාදෙන්තෝ වා** උපසම්පද කරනලද පුද්ගල තෙමේ ද **සාතිසාරෝ හෝති** වරද සහිත වෙයි (පබ්බාජේන්තෝති එත්ථ හි කම්මත්ථේ වත්තමානස්ස මානප්පච්චයස්ස අත්තනෝපදනි පරස්සපදත්තන්ති යෝගේන අන්තාදේසෝ හෝති යප්පච්චයස්ස ච මහාවුත්තිනා ලෝපෝ හෝති තථා දුතිය පදේපි) **කිං කාරණා** කුමක් හෙයින් වනාහි **විනයමත්තස්සාපි** ස්වල්ප මාත්‍ර වූ විනයක් ද **දුග්ගහිතත්තා** නපුරු සේ උගෙන ගන්නාලද හෙයිනි **හි** ඒ සැබෑමය **අනාපත්ති** -පෙ- **පරියාපුණිස්සසී ච** පරියාපුණිස්සසීති යනුවෙන් ද **සුත්තන්ත** -පෙ- **පුච්ඡතීති ච** පුච්ඡති යනුවෙන් ද **ඒතං වචනං** ඒ වචනය **තත්‍ථ (තස්මිං වියනමත්තේ)** ඒ උගන්නලද

ස්වල්ප වූ විනයෙහි **භගවතා වුත්තං** භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේයි **යෝ භික්ඛු** යම් භික්ෂුවක් තෙමේ **විනයං** විනය **න විවණ්ණේතුකාමෝ හුත්වා** නොගහරනු කැමතිව **ඉච්ඡ** මෙහෙයම් **තාව** පළමු කොට **සුත්තන්තං වා** සූත්‍රාන්තය හෝ **ගාථායෝ වා** ගාථාවන් හෝ **අභිධම්මං වා** අභිධර්මය හෝ **පරියාපුණස්සු** පිරිවහාව **පච්ඡා** පසුව **විනයං** විනය **පරියාපුණිස්සසි** පිරිවහන්නෙහිය **ඉති භණති** මෙසේ කියන්නේ වී නම් **තස්ස භික්ඛුනෝ** ඒ භික්ෂුව හට **අනාපත්ති** ඇවැත් නොවේ **යා භික්ඛුනි** යම් භික්ෂුණියක් තොමෝ **සුත්තන්තේ** සූත්‍රාන්තයෙහි **ඕකාසං කාරාපෙත්වා** අවකාශ කරවා (හෙවත්) අවසර ගෙන **අභිධම්මං වා** අභිධර්මය හෝ **විනයං වා** විනය හෝ **පුච්ඡති** විචාරන්නේ වී නම් **අභිධම්මේ** අභිධර්මයෙහි **ඕකාසං කාරෙත්වා** අවසර ගෙන **සුත්තන්තං වා** සූත්‍රාන්තය හෝ **විනයං වා** විනය හෝ **පුච්ඡති** විචාරන්නේ වී නම් **විනයේ** විනයෙහි **ඕකාසං කාරාපෙත්වා** අවකාශ කරවා **සුත්තන්තං වා** සූත්‍රාන්තය හෝ **අභිධම්මං වා** අභිධර්මය හෝ **පුච්ඡති** විචාරන්නේ වී නම් **තස්සා භික්ඛුනියා** ඒ මෙහෙනින්ට **පාචිත්තියං** පචිති ඇවතට (නොහොත්) **ආපත්ති ආපජ්ජනං හෝති** ඇවතට පැමිණීම වෙයි **ත්වං පන** තෝ වනාහි **එත්තකම්පි න ජානාසි** මෙපමණකුදු නොදන්නෙහිය **ඉති ආහ** මෙසේ කීයේයි **එත්තකේනපි** මෙපමණකිනිදු **පරවාදී** විතණ්ඩවාදී තෙමේ **ධම්මකථිකේන** ධර්මකථික භික්ෂුව විසින් **නිග්ගහිතෝ හෝති** නිග්‍රහ කරන ලද්දේ වෙයි (මේ ධර්මකථික වස්තුවෙන් අභිධර්ම පිටකයාගේ බුද්ධභාෂිත බව දක්වා මහාගෝසිඞ්ග සූත්‍රයෙහි මොග්ගල්ලාන වස්තුවෙන් අභිධර්ම පිටකය බුදුරජාණන් වහන්සේ විසින් වදාළ බැව් දක්වනු කැමතිව "මහාගෝසිඞ්ගසුත්තං පන" යනාදිය කීහ) ("අථවා ගෝසිඞ්ගසුත්තේන අභිධම්මස්ස බුද්ධභාසිතභාවං සාධේතුං මහාමොග්ගල්ලානත්ථේරවත්ථුං දස්සෙන්තෝ මහාගෝසිඞ්ගසුත්තං පන ඉතෝපි බලවතරන්ති ආදිමාහ" යනු මූලටීකායි) **පන** අන්‍ය අර්ථයක් දක්වම් **මහාගෝසිඞ්ගසුත්තං** මැදිපනස මහාගෝසිඞ්ග සූත්‍ර තෙමේ **ඉතෝපි** මේ විනයට ද වඩා (හෙවත්) භික්ෂුණී විභඞ්ග ශික්ෂාපදයට වඩා **අභිධම්මස්ස** අභිධර්ම පිටකයාගේ **බුද්ධභාසිතභාවසාධනේ** බුද්ධභාෂිත බැව් සිද්ධ කිරීමේ **බලවතරං** අතිශයින් බලවත් වෙයි (හෙවත්) අතිශයින් උතුම් වෙයි **හි** ඒ සැබෑමය (නොහොත්) **හි (යස්මා)** යම්හෙයකින් **තත්‍ර (තස්මිං මහාගෝසිඞ්ගසුත්තේ)** ඒ මහාගෝසිඞ්ග සූත්‍රයෙහි **ධම්මසේනාපති සාරිපුත්තත්ථේරෝ** දම්සෙනවි සැරියුත් මහතෙරුන් වහන්සේ **අඤ්ඤමඤ්ඤං** ඔවුනොවුන් **පුච්ඡිතපඤ්හඤ්ච** විචාරනලද ප්‍රශ්නය ද **විස්සජ්ජනඤ්ච** විසදීම ද **ආරෝචේතුං** දක්වනු පිණිස **සත්ථු සන්තිකං ගන්ත්වා** ශාස්තෲන් වහන්සේ සමීපයට ගොස් **මහාමොග්ගල්ලානත්ථේරස්ස** මහාමුගලන් තෙරුන්ගේ **විස්සජ්ජනං** විසදීම **ආරෝචෙන්තෝ හුත්වා** දක්වනු කැමතිව **ඉධාවුසෝ** -පෙ- **සෝභෙය්‍යාති වචනං** සෝභෙය්‍ය යන වචනය **ආහ** සැලකෙළේයි **ආවුසෝ සාරිපුත්ත!** ඇවැත් ශාරිපුත්‍රය! **ඉධ** මේ ශාසනයෙහි **ද්වේ භික්ඛූ** භික්ෂූහු දෙදෙනෙක් තුමූ **අභිධම්මකථං** අභිධර්ම කථාව **කථෙන්ති** දේශනා කෙරෙත් **තේ** ඒ භික්ෂූහු දෙදෙන තුමූ **අඤ්ඤමඤ්ඤං** ඔවුනොවුන් **පඤ්හං පුච්ඡන්ති** ප්‍රශ්න විචාරත් **අඤ්ඤමඤ්ඤස්ස** ඔවුනොවුන්ගේ **පඤ්හං** ප්‍රශ්නය **පුට්ඨා හුත්වා** විචාරන ලද්දාහු වී **විස්සජ්ජෙන්ති** විසර්ජනා කෙරෙත් **නෝ ච සංසාදෙන්ති** ඔවුනොවුහු විරුද්ධ නොවෙත් **තේසං** ඒ භික්ෂූන් දෙදෙනාගේ **කථාපවත්තිනී ච** කථා පැවැත්ම ද **ධම්මී හෝති** දැහැමි වෙයි **ආවුසෝ සාරිපුත්ත!** ඇවැත් ශාරිපුත්‍රය! **ඛෝ** ඒකාන්තයෙන් **ඒවරූපේන භික්ඛුනා** මෙබඳු ස්වභාව ඇති භික්ෂුව කරණකොටගෙන **ගෝසිඞ්ගසාලවනං** ගෝසිඞ්ගසාල වනය **සෝභෙය්‍ය** හොබවන්නේය (ගෙරී අං බදු සල්ගස් ඇති හෙයින් ගෝසිඞ්ගසාලවන නම් වෙයි කියත්) **සත්ථා** ශාස්තෲන් වහන්සේ **ආභිධම්මිකා නාම** අභිධර්මය දන්නා භික්ෂූහු නම් **මම සාසනේ** මගේ නෛර්යාණික ශාසනයෙහි

**පරිබාහිරාති අවත්‍වා** පිටත්හියයි නොවදරා (හෙවත්) නොගරහා **සුවණ්ණාලිඞ්ගසදිසං** රන්මිහිගු බෙරයකට බඳු වූ **ගීවං උන්නාමෙත්‍වා** ග්‍රීවා ධාතුව ඔසවා **පුණ්ණචන්දසස්සිරිකං** පූර්ණ චන්ද්‍රයා මෙන් ශ්‍රීමත් වූ **මුඛං පූරෙත්‍වා** මුඛය පුරා (හෙවත්) උතුම් වූ මුඛය විවෘත්ත කොට **බ්‍රහ්මඝෝසං** බ්‍රහ්මස්වරය (හෙවත්) බ්‍රහ්මයන්ගේ ස්වරය බඳු වූ අඞ්ග අටකින් යුක්ත වූ ශබ්දය **නිච්ඡාරෙන්තෝ** පතුරුවන්නේ **සාරිපුත්ත!** ශාරිපුත්‍රය! **සාධු සාධු ඉති** යහපත යහපතැයි **මහාමොග්ගල්ලානත්ථේරස්ස** මහමුගලන් තෙරුන්ට **සාධුකාරං දත්‍වා** සාධුකාර දී **යථා** යම්පරිද්දෙකින් **තං පඤ්හං** ඒ ප්‍රශ්නය **මොග්ගල්ලානෝ ච** මුගලන් තෙරුන්ම **සම්මා බ්‍යාකරමානෝ** මොනවට විසඳනු ලබන්නේ නම් **බ්‍යාකරෙය්‍ය** විසඳන්නේය **හි** ඒ සැබෑමය **සාරිපුත්ත!** ශාරිපුත්‍රය! **මොග්ගල්ලානෝ** මුගලන් ස්ථවිර තෙමේ **ධම්මකථිකෝති** ඒකාන්ත ධර්මකථික පුද්ගලයා නම් වේ **ඉති ආහ** මෙසේ වදළේයි **තස්මා** එසේ හෙයින් **බලවතරං** අතිශයින් බලවත් උදහරණයක් වෙයි (නොහොත්) උතුම් වූ උදහරණයක් වෙයි (මෙහි තර-ප්‍රත්‍යය උත්තමාර්ථයෙහි වැටෙයි)

**ආභිධම්මිකභික්ඛුයේව** අභිධර්මය දන්නා වූ භික්‍ෂුහුම **ධම්මකථිකා නාම කිර** ඒකාන්ත ධර්මකථික පුද්ගලයෝ නම් වෙත් **අවසේසා** අවශිෂ්ඨ වූ **භික්ඛූ** භික්‍ෂුහු තුමූ **ධම්මං කථෙන්තාපි** ධර්මය දේශනා කරන්නාහු නමුදු **න ධම්මකථිකා** ඒකාන්ත ධර්ම කථිකයෝ නම් නොවෙත් **කස්මා?** කුමක් හෙයින යත්? **හි (යස්මා)** යම් හෙයකින් **තේ** ඒ අභිධර්මය නොදන්නා වූ භික්‍ෂුහු තුමූ **ධම්මං කථෙන්තාපි** ධර්මය දේශනා කරන්නාහු නමුදු **කම්මන්තරං** අනික් කර්මයක් (නොහොත්) කාමාවචර කර්මාදීන්ගෙන් අන්‍යවූ රූපාවචර කර්මාදිය **විපාකාන්තරං** කාමාවචර විපාකාදීන්ගෙන් අන්‍යවූ රූපාවචර විපාකාදිය **රූපාරූපපරිච්ඡේදං** රූප ධර්මයන්ගේ හා නාම ධර්මයන්ගේ පිරිසිඳීම (හෙවත්) වෙන් කිරීම **ධම්මන්තරං** කාමාවචර ධර්මාදියෙන් අන්‍යවූ රූපාවචර ධර්මාදිය **ආලෝළෙත්‍වා** මිශ්‍ර කොට **කථෙන්ති** කියන්නාහු වෙත් **තස්මා** එසේ හෙයින් **න ධම්මකථිකා** ඒකාන්ත ධර්මකථික පුද්ගලයෝ නම් නොවෙත් **පන** විශේෂාර්ථයක් කියම් **ආභිධම්මිකා භික්ඛූ** අභිධර්මය දන්නා වූ භික්‍ෂුහු තුමූ **ධම්මන්තරං** කාමාවචර ධර්මාදියෙන් අන්‍යවූ රූපාවචර ධර්මාදිය **න ආලෝළෙන්ති** මිශ්‍ර නොකෙරෙත් **තස්මා** එසේ හෙයින් **ආභිධම්මිකෝ භික්ඛු** අභිධර්මය දන්නා වූ මහණ තෙමේ **ධම්මං** ධර්මය **කථේතු වා** දේශනා කරන්නේ හෝ වේවා **පන** එසේ දේශනා නොකරන්නේ නමුදු **පුච්ඡිතකාලේ** විචාළ කල්හි **පඤ්හං** ප්‍රශ්නය **කථෙස්සති** විසඳ කියන්නේ වෙයි **ඉති (තස්මා)** මෙසේ විසඳ කියන හෙයින් **අයමේව** මේ අභිධර්මය දන්නා මහණ තෙමේම **ඒකාන්තධම්මකථිකෝ නාම හෝති** ඒකාන්ත ධර්මකථික පුද්ගල නම් වෙයි **ඉති (ඉදං කාරණං සන්ධාය** මේ කාරණය සඳහා) **සත්‍ථා** ශාස්තෲන්වහන්සේ **සාධුකාරං දත්‍වා** සාධුකාර දී **මොග්ගල්ලානේන** මුගලන් තෙරුන් විසින් **පඤ්හං** ප්‍රශ්නය **සුකථිතන්ති** මොනවට විසඳන ලද්දේයයි **ආහ** වදළේයි **අභිධම්මං** අභිධර්මය **පටිබාහන්තෝ** ප්‍රතිබාහනය කරන්නාවූ (හෙවත්) නිෂ්ප්‍රයෝජනයයි වළක්වන්නා වූ **භික්ඛු** මහණ තෙමේ **ඉමස්මිං ජිනචක්කේ** මේ ශාස්තෘ ශාසනයෙහි **පහාරං දේති** පහර දෙන්නේ නම් වෙයි **සබ්බඤ්ඤුතඤාණං** සර්වඥත් නුවණ **පටිබාහති** වළක්වන්නේ නම් වෙයි **සත්‍ථු** ශාස්තෘන් වහන්සේගේ **වේසාරජ්ජඤාණං** විසාරද වූ නුවණ (හෙවත්) නොපැකිලෙන්නා වූ සතර වෙසරද නුවණ **පටිනිවත්තේති** වළක්වන්නේ නම් වෙයි **සෝතුකාමං පරිසං** ධර්ම දේශනාව අසනු කැමති පිරිස **විසංවාදේති** රවටන්නේ නම් වෙයි **අරියමග්ගේ** ආර්‍ය්‍ය මාර්ගයෙහි **ආවරණං බන්ධති** කටුපැලලි බඳින්නේ නම් වෙයි **අට්ඨාරසසු භේදකරවත්‍ථූසු** අටළොස් භේදකර වස්තූන් අතුරෙන් **ඒකස්මිං** එක් වස්තුවෙක්හි (හෙවත්) "භාසිතං

ලපිතං තථාගතේන අභිසිතං අලපිතං තථාගතේනාති දීපේති” යනුවෙන් වදළ වස්තුවෙහි **සන්දිස්සති** දක්නා ලැබේ **උක්ඛේපණීයකම්ම-නියස්සකම්ම-තජ්ජනීකම්මාරහෝ හෝති** උක්‍ෂේපණීය කර්මය හා නියස්ස කර්මය තජ්ජනීය කර්මය ද කිරීමට සුදුස්සෙක් වෙයි **තං තං කම්මං කත්‍වා** ඒ ඒ විනය කර්මය කොට **උයෙය්‍යාජේතබ්බෝ** සඟරමින් නෙරපිය යුත්තේයි **ගච්ජ** මෙතනින් පලායව **විඝාසාදෝ හුත්‍වා** භික්‍ෂූහු වළඳ ඉතිරි බත් අනුභව කරන්නෙක්ව **ජීවිස්සසීති** ජීවත් වෙවයි **වත්‍වා** කියා **උයෙය්‍යාජේතබ්බෝ** සඟරමින් නෙරපිය යුත්තේයි.

**[අර්ථශාලිනී අර්ථකථා සන්නය 85-91 පිටු]**

## සප්තප්‍රකරණයෙහි බෙදීම:—

“ධම්මසඞ්ගණී විභඞ්ගඤ්ච - කථාවත්ථු ච පුග්ගලං
ධාතු යමක පට්ඨානං - අභිධම්මෝති වුච්චති

**[සාරත්ථදීපනී ටීකා 01 (ඡට්ඨසඞ්ගායනා පඨමසඞ්ගීතිකථා වණ්ණනා යටතේ)]**

**පකරණපරිච්ඡේදතෝ** පනේස ධම්මසඞ්ගණීවිභඞ්ගධාතුකථා පුග්ගලපඤ්ඤත්තිකථාවත්ථුයමකපට්ඨානානං සත්තන්නං පකරණානං වසේන ඨිතෝ. අයමෙත්ථ ආචරියානං සමානකථා. විතණ්ඩවාදී පනාහ “කථාවත්ථු කස්මා ගහිතං? නනු සම්මාසම්බුද්ධස්ස පරිනිබ්බානතෝ අට්ඨාරසවස්සාධිකානි ද්වේ වස්සසතානි අතික්කමිත්වා **මොග්ගලිපුත්තතිස්සත්ථේරේනේතං** ඨපිතං? තස්මා සාවකභාසිතත්තා ඡඩ්ඩේථ න”න්ති. “කිං පන ඡප්පකරණානි අභිධම්මෝ”ති? “ඒවං න වදාමී”ති. “අථ කිං වදේසී”ති. “සත්තප්පකරණානී”ති. “කතරං ගහෙත්වා සත්ත කරෝසී”ති? “මහාධම්මහදයං නාම අත්ථි, ඒතේන සහ සත්තා”ති. “මහාධම්මහදයේ අපුබ්බං නත්ථි, කතිපයාව පඤ්හාවාරා අවසේසා, කථාවත්ථුනාව සද්ධිං සත්තා”ති. “නෝ කථාවත්ථුනා, මහාධාතුකථා නාම අත්ථි, තාය සද්ධිං සත්තා”ති. “මහාධාතුකථායං අපුබ්බං නත්ථි, අප්පමත්තිකාව තන්ති අවසේසා. කථාවත්ථුනාව සද්ධිං සත්තා”ති.

සම්මා සම්බුද්ධෝ හි සත්තප්පකරණානි දේසෙන්තෝ කථාවත්ථුං පත්වා යා ඒසා පුග්ගලවාරේ තාව චතූසු පඤ්හේසු ද්වින්නං පඤ්චකානං වසේන අට්ඨමුඛා වාදයුත්ති තං ආදිං කත්වා සබ්බකථාමග්ගේසු අසම්පුණ්ණභාණවාරමත්තාය පාළියා මාතිකං ඨපේසි. සා පනේසා “පුග්ගලෝ උපලබ්භති සච්චිකට්ඨපරමත්ථේනාති. ආමන්තා. යෝ සච්චිකට්ඨෝ පරමත්ථෝ තතෝ සෝ පුග්ගලෝ උපලබ්භති සච්චිකට්ඨපරමත්ථේනාති. නහේවං වත්තබ්බේ. ආජානාහි නිග්ගහං...පෙ.... පුග්ගලෝ නුපලබ්භති සච්චිකට්ඨපරමත්ථේනාති. ආමන්තා. යෝ සච්චිකට්ඨෝ පරමත්ථෝ තතෝ සෝ පුග්ගලෝ නුපලබ්භති සච්චිකට්ඨපරමත්ථේනාති. නහේවං වත්තබ්බේ. ආජානාහි නිග්ගහං...පෙ..... සබ්බත්ථ පුග්ගලෝ උපලබ්භති සබ්බත්ථ පුග්ගලෝ නුපලබ්භති, සබ්බදා පුග්ගලෝ උපලබ්භති සබ්බදා පුග්ගලෝ නුපලබ්භති, සබ්බේසු පුග්ගලෝ උපලබ්භති සබ්බේසු පුග්ගලෝ නුපලබ්භති සච්චිකට්ඨපරමත්ථේනා”ති (කථා. 15-16) ඒවං පඨමං වාදං නිස්සාය පඨමං නිග්ගහං, දුතියං නිස්සාය දුතියං ...පෙ.... අට්ඨමං නිස්සාය අට්ඨමං නිග්ගහං දස්සෙන්තේන සත්ථාරා ඨපිතා. ඉමිනා නයේන සබ්බත්ථ මාතිකාඨපනං වේදිතබ්බං. තං පනේතං මාතිකං ඨපෙන්තෝ ඉමං දිස්වා ඨපේසි; මම පරිනිබ්බානතෝ අට්ඨාරසවස්සාධිකානං ද්වින්නං වස්සසතානං මත්ථකේ **මොග්ගලිපුත්තතිස්සත්ථේරෝ** නාම භික්ඛු භික්ඛුසහස්සමජ්ඣේ නිසින්නෝ සකවාදේ පඤ්ච සුත්තසතානි පරවාදේ පඤ්චාති

සුත්තසහස්සං සමෝධානෙත්වා දීඝනිකායප්පමාණං කථාවත්ථුප්පකරණං භාජෙස්සතීති.

**මොග්ගලිපුත්තතිස්සත්ථේරෝපි** ඉදං පකරණං දේසෙන්තෝ න අත්තනෝ ඤාණේන දේසේසි, සත්ථාරා පන දින්නනයේන ඨපිතමාතිකාය දේසේසි. ඉති සත්ථාරා දින්නනයේන ඨපිතමාතිකාය දේසිතත්තා සකලම්පේතං පකරණං බුද්ධභාසිතමේව නාම ජාතං. යථා කිං? යථා මධුපිණ්ඩිකසුත්තන්තාදීනි. මධුපිණ්ඩිකසුත්තන්තස්මිඤ්හි භගවා "යතෝනිදානං භික්ඛු පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති, එත්ථ චේ නත්ථි අභිනන්දිතබ්බං අභිවදිතබ්බං අජ්ඣෝසිතබ්බං, ඒසේවන්තෝ රාගානුසයාන"න්ති (ම. නි. 1.202) මාතිකං ඨපෙත්වා උට්ඨායාසනා විහාරං පාවිසි.

ධම්මපප්පටිග්ගාහකා භික්ඛූ **මහාකච්චානත්ථේරං** උපසඞ්කමිත්වා දසබලේන ඨපිතමාතිකාය අත්ථං පුච්ඡිංසු. ථේරෝ පුච්ඡිතමත්තකේනේව අකථෙත්වා දසබලස්ස අපචිතිදස්සනත්ථං "සෙය්‍යථාපි ආවුසෝ පුරිසෝ සාරත්ථිකෝ සාරගවේසී"ති (ම. නි. 1.203) සාරෝපමං ආහරිත්වා සාරරුක්ඛෝ විය භගවා සාඛාපලාසසදිසා සාවකා, "සෝ හාවුසෝ භගවා ජානං ජානාති, පස්සං පස්සති චක්ඛුභූතෝ ඤාණභූතෝ ධම්මභූතෝ බ්‍රහ්මභූතෝ වත්තා පවත්තා අත්ථස්ස නින්නේතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතෝ"ති සත්ථාරං ථෝමෙත්වා පුනප්පුනං ථේරේහි යාචිතෝ සත්ථාරා ඨපිතමාතිකාය අත්ථං විභජිත්වා "ආකඞ්ඛමානා ච පන තුම්හේ ආයස්මන්තෝ භගවන්තංයේව උපසඞ්කමිත්වා ඒතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ සචේ සබ්බඤ්ඤුතඤ්ඤාණේන සද්ධිං සංසන්දියමානං සමේති ගණ්හෙය්‍යාථ, නෝ චේ මා ගණ්හිත්ථා"ති ඉමිනා අධිප්පායේන "යථා වෝ භගවා බ්‍යාකරෝති තථා නං ධාරෙය්‍යාථා"ති වත්වා උය්‍යෝජේසි.

තේ සත්ථාරං උපසඞ්කමිත්වා පුච්ඡිංසු. සත්ථා දුක්කථිතං කච්චානේනාති අවත්වා සුවණ්ණාලිඞ්ගං උස්සාපෙන්තෝ විය ගීවං උන්නාමෙත්වා සුපුප්ඵිතසතපත්තසස්සිරිකං මහාමුඛං පූරෙන්තෝ බ්‍රහ්මස්සරං නිච්ඡාරෙත්වා සාධු සාධූති ථේරස්ස සාධුකාරං දත්වා "පණ්ඩිතෝ, භික්ඛවේ, මහාකච්චානෝ, මහාපඤ්ඤෝ භික්ඛවේ මහාකච්චානෝ, මං චේපි තුම්හේ, භික්ඛවේ, ඒතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ, අහම්පි තං ඒවමේවං බ්‍යාකරෙය්‍යං යථා තං මහාකච්චානේන බ්‍යාකත"න්ති (ම. නි. 1.205) ආහ.

ඒවං සත්ථාරා අනුමෝදිතකාලතෝ පට්ඨාය ච පන සකලං සුත්තං බුද්ධභාසිතං නාම ජාතං. **ආනන්දත්ථේරාදීහි** විත්ථාරිතසුත්තේසුපි ඒසේව නයෝ. ඒවමේව සම්මාසම්බුද්ධෝ සත්තප්පකරණානි දේසෙන්තෝ කථාවත්ථුං පත්වා වුත්තනයේන මාතිකං ඨපේසි. ඨපෙන්තෝ ච පන ඉමං අද්දස; මම පරිනිබ්බානතෝ අට්ඨාරසවස්සාධිකානං ද්වින්නං වස්සසතානං මත්ථකේ **මොග්ගලිපුත්තතිස්සත්ථේරෝ** නාම භික්ඛු භික්ඛුසහස්සමජ්ඣේ නිසින්නෝ සකවාදේ පඤ්ච සුත්තසතානි පරවාදේ පඤ්චාති සුත්තසහස්සං සමෝධානෙත්වා දීඝනිකායප්පමාණං කථාවත්ථුප්පකරණං භාජෙස්සතීති.

මොග්ගලිපුත්තතිස්සත්ථේරෝපි ඉමං පකරණං දේසෙන්තෝ න අත්තනෝ ඤාණේන දේසේසි, සත්ථාරා පන දින්නනයේන ඨපිතමාතිකාය දේසේසි. ඉති සත්ථාරා දින්නනයේන ඨපිතමාතිකාය දේසිතත්තා සකලම්පේතං පකරණං බුද්ධභාසිතමේව ජාතං. ඒවං කථාවත්ථුනාව සද්ධිං සත්ත පකරණානි අභිධම්මෝ නාම.

තත්ථ **ධම්මසඞ්ගණීපකරණේ** චතස්සෝ විභත්තියෝ චිත්තවිභත්ති රූපවිභත්ති නික්ඛෙපරාසි අත්ථුද්ධාරෝති. තත්ථ කාමාවචරකුසලතෝ අට්ඨ, අකුසලතෝ ද්වාදස, කුසලවිපාකතෝ සෝළස, අකුසලවිපාකතෝ සත්ත, කිරියතෝ ඒකාදස; රූපාවචරකුසලතෝ පඤ්ච, විපාකතෝ පඤ්ච, කිරියතෝ පඤ්ච; අරූපාවචරකුසලතෝ චත්තාරි, විපාකතෝ චත්තාරි, කිරියතෝ චත්තාරි; ලොකුත්තරකුසලතෝ චත්තාරි, විපාකතෝ චත්තාරීති ඒකූනනවුති චිත්තානි චිත්තවිභත්ති නාම. **චිත්තුප්පාදකණ්ඩ**න්තිපි ඒතස්සේව නාමං. තං වාචනාමග්ගතෝ අතිරෙකඡභාණවාරං, විත්ථාරියමානං පන අනන්තමපරිමාණං හොති.

තදනන්තරං ඒකවිධේන දුවිධේනාතිආදිනා නයේන මාතිකං ඨපෙත්වා විත්ථාරේන විභජිත්වා දස්සිතා රූපවිභත්ති නාම. **රූපකණ්ඩ**න්තිපි ඒතස්සේව නාමං. තං වාචනාමග්ගතෝ අතිරේකද්විභාණවාරං. විත්ථාරියමානං පන අනන්තමපරිමාණං හෝති.

තදනන්තරං මූලතෝ ඛන්ධතෝ ද්වාරතෝ භූමිතෝ අත්ථතෝ ධම්මතෝ නාමතෝ ලිඞ්ගතෝති ඒවං මූලාදීහි නික්ඛිපිත්වා දේසිතෝ නික්ඛේපරාසි නාම. සෝ

මූලතෝ ඛන්ධතෝ චාපි, ද්වාරතෝ චාපි භූමිතෝ;
අත්ථතෝ ධම්මතෝ චාපි, නාමතෝ චාපි ලිඞ්ගතෝ;
නික්ඛිපිත්වා දේසිතත්තා, නික්ඛේපෝති පවුච්චති.

**නික්ඛෙපකණ්ඩ**න්තිපි තස්සේව නාමං. තං වාචනාමග්ගතෝ තිමත්තභාණවාරං. විත්ථාරියමානං පන අනන්තමපරිමාණං හෝති.

තදනන්තරං පන තේපිටකස්ස බුද්ධවචනස්ස අත්ථුද්ධාරභූතං යාව සරණදුකා නික්ඛිත්තං **අට්ඨකථාකණ්ඩං** නාම. යතෝ මහාපකරණියා භික්ඛූ මහාපකරණේ ගණනවාරං අසල්ලක්ඛේන්තා ගණනවාරං සමානෙන්ති. තං වාචනාමග්ගතෝ ද්විමත්තභාණවාරං. විත්ථාරියමානං පන අනන්තමපරිමාණං හෝති.

ඉති සකලම්පි ධම්මසඞ්ගණීපකරණං වාචනාමග්ගතෝ අතිරේකතේරසමත්තභාණවාරං. විත්ථාරියමානං පන අනන්තමපරිමාණං හෝති. ඒවමේතං;

චිත්තවිභත්ති රූපඤ්ච, නික්ඛේපෝ අත්ථජෝතනා;
ගම්භීරං නිපුණං ඨානං, තම්පි බුද්ධේන දේසිතං.

තදනන්තරං **විභඞ්ගප්පකරණං** නාම. තං ඛන්ධවිභඞ්ගෝ ආයතනවිභඞ්ගෝ ධාතුවිභඞ්ගෝ සච්චවිභඞ්ගෝ ඉන්ද්‍රියවිභඞ්ගෝ පච්චයාකාරවිභඞ්ගෝ සතිපට්ඨානවිභඞ්ගෝ සම්මප්පධානවිභඞ්ගෝ ඉද්ධිපාදවිභඞ්ගෝ බොජ්ඣඞ්ගවිභඞ්ගෝ මග්ගඞ්ගවිභඞ්ගෝ ඣානවිභඞ්ගෝ අප්පමඤ්ඤාවිභඞ්ගෝ සික්ඛාපදවිභඞ්ගෝ පටිසම්භිදාවිභඞ්ගෝ ඤාණවිභඞ්ගෝ ඛුද්දකවත්ථුවිභඞ්ගෝ ධම්මහදයවිභඞ්ගෝති අට්ඨාරසවිධේන විභත්තං.

තත්ථ ඛන්ධවිභඞ්ගෝ සුත්තන්තභාජනීයඅභිධම්මභාජනීයපඤ්හපුච්ඡකානං වසේන තිධා විභත්තෝ. සෝ වාචනාමග්ගතෝ පඤ්චමත්තභාණවාරෝ,

විත්ථාරියමානෝ පන අනන්තෝ අපරිමාණෝ හෝති. තතෝ පරං ආයතනවිභඞ්ගාදයෝපි ඒතේහේව තීහි නයේහි විභත්තා. තේසු ආයතනවිභඞ්ගෝ වාචනාමග්ගතෝ අතිරේකභාණවාරෝ, ධාතුවිභඞ්ගෝ ද්විමත්තභාණවාරෝ. තථා සච්චවිභඞ්ගෝ. ඉන්ද්‍රියවිභඞ්ගේ සුත්තන්තභාජනීයං නත්ථි; වාචනාමග්ගතෝ පනේස අතිරේකභාණවාරමත්තෝ. පච්චයාකාරවිභඞ්ගෝ ඡමත්තභාණවාරෝ, පඤ්හපුච්ඡකං පනෙත්ථ නත්ථි. සතිපට්ඨානවිභඞ්ගෝ අතිරේකභාණවාරමත්තෝ; තථා සම්මප්පධානඉද්ධිපාදබොජ්ඣඞ්ගමග්ගඞ්ගවිභඞ්ගා. ඣානවිභඞ්ගෝ ද්විභාණවාරමත්තෝ, අප්පමඤ්ඤාවිභඞ්ගෝ අතිරේකභාණවාරමත්තෝ. සික්ඛාපදවිභඞ්ගේපි සුත්තන්තභාජනීයං නත්ථි; වාචනාමග්ගතෝ පනේස අතිරේකභාණවාරමත්තෝ; තථා පටිසම්භිදාවිභඞ්ගෝ. ඤාණවිභඞ්ගෝ දසවිධේන විභත්තෝ; වාචනාමග්ගතෝ පනේස තිමත්තභාණවාරෝ. ඛුද්දකවත්ථුවිභඞ්ගෝපි දසවිධේන විභත්තෝ; වාචනාමග්ගතෝ පනේස තිමත්තභාණවාරෝ. ධම්මහදයවිභඞ්ගෝ තිවිධේන විභත්තෝ; වාචනාමග්ගතෝ පනේස අතිරේකද්විභාණවාරමත්තෝ. සබ්බේපි විත්ථාරියමානා අනන්තා අපරිමාණා හොන්ති. ඒවමේතං විභඞ්ගප්පකරණං වාචනාමග්ගතෝ පඤ්චතිංසමත්තභාණවාරං; විත්ථාරතෝ පන අනන්තමපරිමාණං හෝති.

තදනන්තරං **ධාතුකථාපකරණං** නාම. තං සඞ්ගහෝ අසඞ්ගහෝ, සඞ්ගහිතේන අසඞ්ගහිතං, අසඞ්ගහිතේන සඞ්ගහිතං, සඞ්ගහිතේන සඞ්ගහිතං, අසඞ්ගහිතේන අසඞ්ගහිතං; සම්පයෝගෝ විප්පයෝගෝ, සම්පයුත්තේන විප්පයුත්තං, විප්පයුත්තේන සම්පයුත්තං, සම්පයුත්තේන සම්පයුත්තං, විප්පයුත්තේන විප්පයුත්තං; සඞ්ගහිතේන සම්පයුත්තං විප්පයුත්තං; සම්පයුත්තේන සඞ්ගහිතං අසඞ්ගහිතං, අසඞ්ගහිතේන සම්පයුත්තං විප්පයුත්තං, විප්පයුත්තේන සඞ්ගහිතං අසඞ්ගහිතන්ති චුද්දසවිධේන විභත්තං. තං වාචනාමග්ගතෝ අතිරේකඡභාණවාරමත්තං, විත්ථාරියමානං පන අනන්තමපරිමාණං හෝති.

තදනන්තරං **පුග්ගලපඤ්ඤත්ති** නාම. සා "ඛන්ධපඤ්ඤත්ති ආයතනපඤ්ඤත්ති ධාතුපඤ්ඤත්ති සච්චපඤ්ඤත්ති ඉන්ද්‍රියපඤ්ඤත්ති පුග්ගලපඤ්ඤත්ති"ති ඡබ්බිධේන විභත්තා. සා වාචනාමග්ගතෝ අතිරේකපඤ්චභාණවාරා; විත්ථාරියමානා පන අනන්තා අපරිමාණාව හෝති.

තදනන්තරං **කථාවත්ථුප්පකරණං** නාම. තං සකවාදේ පඤ්ච සුත්තසතානි පරවාදේ පඤ්චාති සුත්තසහස්සං සමෝධානෙත්වා විභත්තං. තං වාචනාමග්ගතෝ ඉදානි පොත්ථකේ ලිඛිතං අග්ගහෙත්වා සඞ්ගීතිආරෝපිතනයේන දීඝනිකායප්පමාණං, විත්ථාරියමානං පන අනන්තමපරිමාණං හෝති.

තදනන්තරං **යමකං** නාම. තං මූලයමකං ඛන්ධයමකං ආයතනයමකං ධාතුයමකං සච්චයමකං සඞ්ඛාරයමකං අනුසයයමකං චිත්තයමකං ධම්මයමකං ඉන්ද්‍රියයමකන්ති දසවිධේන විභත්තං. තං වාචනාමග්ගතෝ වීසභාණවාරසතං, විත්ථාරතෝ පන අනන්තමපරිමාණං හෝති.

තදනන්තරං **මහාපකරණං** නාම. **පට්ඨාන**න්තිපි තස්සේව නාමං. තං හේතුපච්චයෝ ආරම්මණපච්චයෝ අධිපතිපච්චයෝ අනන්තරපච්චයෝ සමනන්තරපච්චයෝ සහජාතපච්චයෝ අඤ්ඤමඤ්ඤපච්චයෝ නිස්සයපච්චයෝ උපනිස්සයපච්චයෝ පුරේජාතපච්චයෝ පච්ඡාජාතපච්චයෝ ආසේවනපච්චයෝ

කම්මපච්චයෝ විපාකපච්චයෝ ආහාරපච්චයෝ ඉන්ද්‍රියපච්චයෝ ඣානපච්චයෝ මග්ගපච්චයෝ සම්පයුත්තපච්චයෝ විප්පයුත්තපච්චයෝ අත්ථිපච්චයෝ නත්ථිපච්චයෝ විගතපච්චයෝ අවිගතපච්චයෝති. පච්චයවසේන තාව චතුවීසතිවිධේන විභත්තං.

ඉමස්මිං පන ඨානේ පට්ඨානං සමානේතබ්බං. කුසලත්තිකාදයෝ හි ද්වාවීසති තිකා නාම, හේතූධම්මා නහේතූධම්මා ...පෙ.... සරණාධම්මා අරණාධම්මාති ඉමේ සතං දුකා. අපරේපි විජ්ජාභාගිනෝ ධම්මා අවිජ්ජාභාගිනෝ ධම්මා...පෙ.... ඛයේ ඤාණං, අනුප්පාදේ ඤාණන්ති ද්වාචත්තාලීස සුත්තන්තිකදුකා නාම. තේසු ද්වාවීසති තිකා සතං දුකාති අයං ආහච්චභාසිතා ජිනවචනභූතා සබ්බඤ්ඤුබුද්ධේන දේසිතා සත්තන්නං පකරණානං මාතිකා නාම.

අථාපරේ ද්වාචත්තාලීස සුත්තන්තිකදුකා කුතෝපභවා කේන ඨපිතා කේන දේසිතාති? **ධම්මසේනාපතිසාරිපුත්තත්ථේරප්පභවා,** තේන ඨපිතා, තේන දේසිතාති. ඉමේ ඨපෙන්තෝ පන ථේරෝ න සාමුක්කංසිකේන අත්තනෝ ඤාණේන ඨපේසි. ඒකුත්තරියං පන ඒකනිපාතදුකනිපාතසඞ්ගීති දසුත්තරසුත්තන්තේහි සමෝධානෙත්වා ආභිධම්මිකත්ථේරානං සුත්තන්තං පත්වා අකිලමත්ථං ඨපිතා. තේ පනේතේ ඒකස්මිං නික්ඛේපකණ්ඩේයේව මත්ථකං පාපෙත්වා විභත්තා. සේසට්ඨානේසු යාව සරණදුකා අභිධම්මෝ විභත්තෝ.

සම්මාසම්බුද්ධේන හි අනුලෝමපට්ඨානේ ද්වාවීසතිතිකේ නිස්සාය **තිකපට්ඨානං** නාම නිද්දිට්ඨං. සතං දුකේ නිස්සාය **දුකපට්ඨානං** නාම නිද්දිට්ඨං. තතෝ පරං ද්වාවීසති තිකේ ගහෙත්වා දුකසතේ පක්ඛිපිත්වා **දුකතිකපට්ඨානං** නාම දස්සිතං. තතෝ පරං දුකසතං ගහෙත්වා ද්වාවීසතියා තිකේසු පක්ඛිපිත්වා **තිකදුකපට්ඨානං** නාම දස්සිතං. තිකේ පන තිකේසුයේව පක්ඛිපිත්වා **තිකතිකපට්ඨානං** නාම දස්සිතං. දුකේ ච දුකේසුයේව පක්ඛිපිත්වා **දුකදුකපට්ඨානං** නාම දස්සිතං. ඒවං;

තිකඤ්ච පට්ඨානවරං දුකුත්තමං,
දුකතිකඤ්චේව තිකදුකඤ්ච;
තිකතිකඤ්චේව දුකදුකඤ්ච,
ඡ **අනුලෝමම්හි** නයා සුගම්භීරාති. (පට්ඨා. 1.1.39);

පච්චනීයපට්ඨානේපි ද්වාවීසතිතිකේ නිස්සාය **තිකපට්ඨානං** නාම. දුකසතං නිස්සාය **දුකපට්ඨානං** නාම. ද්වාවීසතිතිකේ දුකසතේ පක්ඛිපිත්වා **දුකතිකපට්ඨානං** නාම. දුකසතං ද්වාවීසතියා තිකේසු පක්ඛිපිත්වා **තිකදුකපට්ඨානං** නාම. තිකේ තිකේසුයේව පක්ඛිපිත්වා **තිකතිකපට්ඨානං** නාම. දුකේ දුකේසුයේව පක්ඛිපිත්වා **දුකදුකපට්ඨානං** නාමාති පච්චනීයේපි ඡහි නයේහි පට්ඨානං නිද්දිට්ඨං. තේන වුත්තං;

තිකඤ්ච පට්ඨානවරං දුකුත්තමං,
දුකතිකඤ්චේව තිකදුකඤ්ච;
තිකතිකඤ්චේව දුකදුකඤ්ච,
ඡ **පච්චනීයම්හි** නයා සුගම්භීරාති. (පට්ඨා. 1.1.44);

තතෝ පරං අනුලෝමපච්චනීයේපි ඒතේනේව උපායේන ඡ නයා දස්සිතා. තේනාහ;

තිකඤ්ච පට්ඨානවරං දුකුත්තමං,
දුකතිකඤ්චේව තිකදුකඤ්ච;
තිකතිකඤ්චේව දුකදුකඤ්ච,
ඡ **අනුලෝමපච්චනීයම්හි** නයා සුගම්භීරාති. (පට්ඨා. 1.1.48);

තදනන්තරං පච්චනීයානුලෝමේපි ඒතේහේව ඡහි නයේහි නිද්දිට්ඨං. තේනාහ;

තිකඤ්ච පට්ඨානවරං දුකුත්තමං,
දුකතිකඤ්චේව තිකදුකඤ්ච;
තිකතිකඤ්චේව දුකදුකඤ්ච,
ඡ **පච්චනීයානුලෝමම්හි** නයා සුගම්භීරාති. (පට්ඨා. 1.1.52);

ඒවං අනුලෝමේ ඡ පට්ඨානානි, පටිලෝමේ ඡ, අනුලෝමපච්චනීයේ ඡ, පච්චනීයානුලෝමේ ඡ පට්ඨානානීති ඉදං චතුවීසතිසමන්තපට්ඨානසමෝධානං පට්ඨානං මහාපකරණං නාම.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා නිදනකථා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 03-09 පිටු (හේ.වි.මු); විභඞ්ගප්පකරණ අටුවා සන්නය 01/V – XII පිටු]**

**පන** වචනාර්ථයෙන් අන්‍ය වූ ප්‍රකරණපරිච්ඡේදය කියම් **පකරණපරිච්ඡේදතෝ** ප්‍රකරණයන්ගේ පිළිසිඳීමට කාරණා වූ සඞ්ඛ්‍යා වශයෙන් **ඒස (ඒසෝ අභිධම්මෝ)** මේ සංවර්ණනා කටයුතු අභිධර්ම තෙමේ **ධම්මසඞ්ගණීවිභඞ්ගධාතුකථා පුග්ගලපඤ්ඤත්තිකථාවත්ථුයමකපට්ඨානානං** දම්සඟුණුපවුරුණය විභඞ්ග-පවුරුණය ධාතුකථාපවුරුණය පුග්ගලපඤ්ඤත්තිපවුරුණය කථාවත්ථුපවුරුණය යමකපවුරුණය පට්ඨානපවුරුණය යන **සත්තන්නං පකරණානං වසේන** සත්පවුරුණ්ගේ වශයෙන් **ඨිතෝ හෝති** සිටියේ වෙයි **අයං කථා** මේ කථාතොමෝ **එත්ථ** මේ ප්‍රකරණපරිච්ඡේදයෙහි **ආචරියානං** අර්ථකථාචාරීන්ගේ **සමානකථා** සමාන වචනයයි **පන** එහි විශේෂ කියම් **විතණ්ඩවාදී** ප්‍රඥාවන්තයන්ගේ හෘදය කම්පාකරන්නා වූ මිත්‍යාවාද ඇති හෙයින් විතණ්ඩවාදී නම් වූ පුද්ගල තෙමේ **ආහ** මෙසේ කීවේය **කිං ආහ** කුමක් කීයේද යත්? **කථාවත්ථු** කථාවස්තු ප්‍රකරණය **කස්මා ගහිතං** කුමක්හෙයින් ගන්නාලද්දේ ද? **සම්මාසම්බුද්ධස්ස** සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ **පරිනිබ්බාණතෝ** පිරිනිවීමෙන් **අට්ඨාරසවස්සාධිකානි** අටළොස් වර්ෂයක් අධික කොට ඇත්තා වූ **ද්වේවස්සසතානි අතික්කමිත්වා** දෙසියක් අවුරුදු ඉක්මවා **මොග්ගලිපුත්තතිස්සථේරේන** මොග්ගලීපුත්තතිස්ස ස්ථවිරයන් විසින් **ඒතං** මේ කථාවත්ථුපකරණය **ඨපිතං නනු?** තබනලද්දේ නොවේ ද යත්? **කථාවත්ථුප්පකරණස්ස** කථාවස්තු ප්‍රකරණය **තස්මා සාවකභාසිතත්තා** එසේ ශ්‍රාවකයන් විසින් දේශනා කළ හෙයින් **නං** ඒ කථාවස්තුප්‍රකරණය **ඡඩ්ඩේථ ඉති** දුරුකරව් යයි **ආහ** කීයේයි (යනු විතණ්ඩවාදීන්ගේ වචනයයි) **කිං පන** කිමෙක් ද යත්? **අභිධම්මෝ** අභිධර්ම පිටක තෙමේ **ඡප්පකරණානි** ෂට් ප්‍රකරණයෙක් දැයි **ඉති වුත්තේ** විභජ්ජවාදීන් විසින් මෙසේ කී කල්හි **ඒවං** මෙසේ ෂට් ප්‍රකරණයෙක්ම යයි **න වදමීති** නොකියන්නෙමියි **ආහ** විතණ්ඩවාදී තෙමේ කීයේයි **අථ** එසේ ෂට් ප්‍රකරණයෙක්ම යයි නොකියන්නේ වී නම් **කිං** කවර ප්‍රකරණයක් **වදේසි** කියන්නෙහි දැයි **ඉති වුත්තේ** විභජ්ජවාදීන් විසින් මෙසේ කී කල්හි **සත්තප්පකරණානීති** සප්ත

පකරණයෙක්ම යයි **වදමි ඉති** කියන්නෙමියි **ආහ** විතණ්ඩවාදී තෙමේ කීයේයි **කතරං ගහෙත්වා** කවර ප්‍රකරණයක් ගෙන **සත්ත කරෝසීති** සප්ත ප්‍රකරණය කරන්නේ දැයි **වුත්තේ** විභජ්ජවාදීන් විසින් කී කල්හි **මහාඅට්ඨකථායං** මහ අටුවායෙහි **ආගතං** ආවාවූ **මහාධම්මහදයං නාම අත්ථි** මහාධම්මහදය නම් ප්‍රකරණයක් ඇත්තේය **ඒතේන සහ** ඒ මහාධම්මහදය නම් ප්‍රකරණය සමඟ **සත්ත ඉති වුත්තේ** සතක් වන්නේ යයි (විතණ්ඩවාදීන් විසින්) කී කල්හි **මහාධම්මහදයේ** මහාධම්මහදයෙහි **අපුබ්බං** නොවූවිරූ (නොහොත්) අභිනව වචනයක් තෙමේ **නත්ථි** නැත්තේයි **ධම්මහදයවිභඞ්ගේ** ධම්මහදය විභඞ්ගයෙහි **අනාගතා හුත්වා** නොයෙන ලදුව **මහාධම්මහදයේ** මහාධම්මහදය නම් ප්‍රකරණයෙහි **ආගතා** ආවාවූ **ධම්මහදයවිභඞ්ගවචනවසේන** ධම්මහදය විභඞ්ගයාගේ වචන වශයෙන් **අවසේසා** අවශිෂ්ට වූ **පඤ්හාවාරා** පුච්ඡා-විස්සජ්ජනා වාරයෝතුමූ **කතිපයාව (අප්පහෝනකාව) හොන්ති** කිහිපයක්ම (නොහොත්) ස්වල්ප මාත්‍රයක්ම නොපොහෝනාහු වෙත් ("ධම්මහදයවිභඞ්ගේව" යන පාඨ ශේෂයි) **කථාවත්ථු නාම සද්ධිං** කථාවස්තු ප්‍රකරණය හා සමඟම **සත්ත ඉති වුත්තේ** ප්‍රකරණ සතක් වන්නේ යැයි කී කල්හි **කථාවත්ථුනා** කථාවස්තු ප්‍රකරණය සමඟ **සත්ත** ප්‍රකරණයෝ සත් දෙනෙක්තුමූ **නො** නොවන්නාහුය **මහාධාතුකථා නාම** මහාධාතුකථා නම් ප්‍රකරණයක් තොමෝ **අත්ථි** ඇත්තේයි **තාය සද්ධිං** ඒ මහාධාතුකථා ප්‍රකරණය සමඟ **සත්ත ඉති** සප්ත ප්‍රකරණ කෙනෙක් වෙත් යැයි **ආහ** විතණ්ඩවාදී තෙමේ කීයේයි **මහාධාතුකථායං** මහාධාතුකථා ප්‍රකරණයෙහි **අපුබ්බං** පෙරනොවූ වචනයෙක් (නොහොත්) අභිනව වචනයෙක් **නත්ථි** නැත්තේය **ධම්මහදයවිභඞ්ගේ** ධම්මහදය විභඞ්ගයෙහි **අනාගන්ත්වා** නොයීමෙන් **මහාධම්මහදයේ** මහාධම්මහදය නම් ප්‍රකරණයෙහි **ආගතතන්තිතෝ** ආවාවූ පාළියෙන් යට ("අප්පමත්තිකාව" යන්නෙහි සම්බන්ධ කරනු) **රූපකණ්ඩධාතුවිභඞ්ගාදීසු** රූපකාණ්ඩ ධාතුවිභඞ්ගාදියෙහි ද **ධාතුකථාය** ධාතුකථා ප්‍රකරණයෙහි ද **අනාගන්ත්වා** නොආවාවූ **අවසේසා** අවශිෂ්ඨ වූ **මහාධාතුකථාය** මහාධාතුකථා ප්‍රකරණයෙහි **ආගතා** ආවාවූ **තන්ති** පාළිතොමෝ **අප්පමත්තිකාව හෝති** ස්වල්ප මාත්‍රයක් ඇත්තීම වෙයි **කථාවත්ථුනා සද්ධිං** කථාවස්තු ප්‍රකරණය සමඟ **සත්ත ඉති** සප්ත ප්‍රකරණයෙකැයි **වත්තබ්බෝ** කියයුත්තේයි.

(මෙසේ පාඨ ශේෂ සමඟ අර්ථ යෝජනා කිරීමෙන්ම අර්ථාවබෝධය මනාසේ සිද්ධ වේ. පාළියෙහි ආ නයින් අර්ථ යෝජනා කළේ නම් අනුසන්ධි ඝටනය නොවන හෙයින් ආධ්‍යාහාර කටයුතු වූ සියළු පාඨ ශේෂයන් යොද අර්ථ දැක්වීම ආචායර්‍ය පරම්පරාගත යුක්තියි. "සාවකභාසිතත්තා ඡඩ්ඩේථ නං" යන විතණ්ඩවාදී වචනයෙන් කථාවස්තු ප්‍රකරණයාගේ ශ්‍රාවක භාෂිත බව ප්‍රකාශකිරීම වළක්වනු සඳහා "සම්මාසම්බුද්ධෝ" යනාදි පාඨය කීහ)

**හි** "කථාවත්ථුනා සද්ධිං සත්ත" යනුවෙන් මා කී වචනය යෙදේමැයි **සම්මාසම්බුද්ධෝ** සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ **සත්තප්පකරණානි** සප්ත ප්‍රකරණයන් **දේසෙන්තෝ** දේශනා කරනුයේ (හෙවත්) දේශනා කරන කල්හි **කථාවත්ථුං පත්වා** දේශනා ක්‍රමයෙන් කථාවස්තු ප්‍රකරණයට බැස **පුග්ගලවාරේ** පුද්ගල වාරයෙහි **තාව** පළමු කොට **චතූසු පඤ්හේසු** සතර ප්‍රශ්නයෙහි **ද්වින්නං පඤ්චකානං වසේන** පඤ්චකයන් දෙදෙනාගේ වශයෙන් **අට්ඨාමුඛා** අටවැදෑරුම් කාරණයෙකින් හටගැනීම් සඞ්ඛ්‍යාත වූ (නොහොත්) කාරණා අටකින් යුක්ත වූ **යා ඒසා වාදයුත්ති** යම් වාදයක්හුගේ යෙදීමෙක් **අත්ථි** ඇත්තේ වේද **තං (වාදයුත්තිං)**

ඒ වාදයුත්තිය **ආදිං කත්වා** ආදියෙහි කොට **සබ්බකථාමග්ගේසු** සියළු කථා මාර්ගයෙහි **අසම්පුණ්ණ භාණවාරමත්තාය** අසම්පූර්ණ බණවරක් පමණ වූ **පාළියා** පෙළ කරණකොටගෙන **මාතිකං ඨපේසි** මාතෘකාව තබා වදළේයි.

("අට්ඨමුඛානි" යන තන්හි ආ-කාර ආදේශ කොට මුඛායයි සිටියි. "ධම්මාතිරේකධම්මවිසේසෝයේව අත්ථෝ" යන්නෙහි මෙන් විශේෂණ විශේෂයන්ගේ විභත්ති විසදෘශත්වය වෙයි. "ගුණාපමාණං" යන්නෙහි මෙන් ලිඞ්ගයද විසදෘශ වෙයි. ඉදින් "උත්තරෝ මුඛෝ උත්තරා මුඛා උත්තරං මුඛං" යන්නෙහි මෙන් මුඛ ශබ්දය ත්‍රිලිඞ්ගික වන්නේ නම් මෙතන්හි ස්ත්‍රීලිඞ්ග වශයෙන් ගෙන "අට්ඨමුඛායෝ අට්ඨමුඛා"යි පද සිද්ධ වේ නම් ලිඞ්ග විසදෘශ භාවය වෙයි. විභක්තිය ද විසදෘශ වෙයි. "අට්ඨපමාණානි ඒතිස්සාති අට්ඨපමාණා සා ඒව මුඛා අට්ඨමුඛා පුබ්බපදේ උත්තරපදලෝපෝ"යි මෙසේ කළ කල්හි පුල්ලිඞ්ගයෙහි වචන ද්වයම සමාන වෙයි. එහෙයින් "අට්ඨමුඛා" යන ශබ්දයට අෂ්ට ප්‍රමාණ කාරණා සඞ්ඛ්‍යාත වූ යනුවෙන් අර්ථ දියයුතුයි. "මුඛසද්දෝ එතථ මුඛෝපායේසු වදනේ චාදිස්මිං මුඛමීරිතන්ති වුත්තේසු චතුසු අත්ථේසු උපායත්ථේ පවත්තතීති දට්ඨබ්බෝ" යනු ප්‍රකරණ වචනයි. මේ ප්‍රකරණ වචනානුසාරයෙන් අට්ඨමුඛ නම් වූ යම් වාදයක් වේද ඒ වාදයට හේතුභූත වූ කාරණයයි අර්ථ දියයුතුයි. අනුලෝමපච්චනික පඤ්චකයෙහි ආදි නිග්‍රහය ප්‍රකාශ කොට භාග්‍යවතුන් වහන්සේ විසින් තව්තිසා භවනයෙහි පඬුඇඹුල් සලස්නේ වැඩහිඳ දෙවියන්ට දේශනාකර වදළා වූ මාතෘකාව පහළකරණු පිණිස "සා පනේසා" යනාදිය කීහ)

**පන** තවද **සා ඒසා (මාතිකා)** ඒ මාතෘකාව ("සත්ථාරා ඨපිතා" යන්නෙහි සම්බන්ධයි) **පුග්ගලෝ** ආත්මය (නොහොත්) සත්වයෙක් හෝ ජීවයෙක් **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍ය වූ අර්ථ ස්වභාවයෙන් හා නොපෙරලෙන්නා වූ උතුම් වූ අර්ථ ස්වභාවයෙන් ද **උපලබ්භති** නුවණින් කල්පණා කිරීමෙන් දතයුත්තේ දැයි **ඉති** මෙසේ **පුච්ඡති** සකවාදී තෙමේ විචාළේයි **ආමන්තා** එසේය! දතයුත්තේ යයි **ඉති** මෙසේ **පටිජානාති** (පරවාදී තෙමේ) පිළිගන්නේයි **යෝ සච්චකට්ඨෝ** යම් සත්‍ය වූ අර්ථ ස්වභාවෙක් ද **යෝ පරමත්ථෝ** යම් අවිපරීත වූ අර්ථ ස්වභාවෙක් ද **අත්ථි** ඇත්තේ වේද **තතෝ** ඒ සත්‍යාර්ථ පරමාර්ථයෙන් **අඤ්ඤෝ** අන්‍ය වූ **තදාධාරෝ** ඒ සත්‍යාර්ථ පරමාර්ථයම ආධාර කොට ඇත්තා වූ **සෝ පුග්ගලෝ** ඒ පුද්ගලයා **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ ස්වභාවය අවිපරීතාර්ථ ස්වභාවය යන දෙකින් **උපලබ්භති** නුවණින් දතයුත්තේ දැයි **ඉති පුච්ඡති** මෙසේ (සකවාදී තෙමේ) විචාරයි **ඒවං** මෙසේ **නහි වත්තබ්බේ (න වත්තබ්බෝ ඒව)** නොකිය යුත්තේමැයි **ඉති** මෙසේ **පටික්ඛිපති** (පරවාදී තෙමේ) ප්‍රතික්ෂේප කෙරෙයි **ත්වං** තෝ **නිග්ගහං** නිග්‍රහය **ආජානාහි** දනුව -පෙ- **ඉති** මෙසේ **නිග්ගහති** සකවාදී තෙමේ නිග්‍රහ කෙරෙයි (මේ වනාහි අනුලෝමපච්චනීක පඤ්චකයෙහි ආදි නිග්‍රහයයි නොහොත් පළමුවන නිග්‍රහයයි) **පුග්ගලෝ** ආත්මය **සච්චකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් **නූපලබ්භති** නුවණින් නොදතයුත්තේ දැයි **ඉති** මෙසේ **පුච්ඡති** පරවාදී තෙමේ විචාරයි **ආමන්තා** එසේය! නුවණින් නොදතයුත්තේ යයි **ඉති** මෙසේ **පටිජානාති** සකවාදි තෙමේ පිළිගනී **යෝ සච්චිකට්ඨෝ අත්ථි** යම් සත්‍යාර්ථයක් ඇත්තේ වේද **යෝ පරමත්ථෝ අත්ථි** යම් අවිපරීතාර්ථයෙක් ඇත්තේ වේද **තතෝ** ඒ සත්‍යාර්ථ පරමාර්ථයෙන් **අඤ්ඤෝ** අන්‍ය වූ **තදාධාරෝ** ඒ සත්‍යාර්ථ පරමාර්ථයම ආධාර කොට ඇත්තා වූ **සෝ පුග්ගලෝ** ඒ ආත්මය **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ පරමාර්ථයෙන් **නූපලබ්භති** නුවණින් නොදතයුත්තේ දැයි **ඉති** මෙසේ **පුච්ඡති** පරවාදි තෙමේ පෙරළා විචාරයි **ඒවං** මෙසේ **නහි වත්තබ්බේ (න වත්තබ්බෝ ඒව)**

නොකිවයුත්තේමැයි **ඉති** මෙසේ **පටික්ඛිපති** සකවාදී තෙමේ ප්‍රතික්ෂේප කෙරෙයි **ත්වං** තෝ **නිග්ගහං** නිග්‍රහය **ආජානාහි** දනුව -පෙ- **ඉති** මෙසේ **නිග්ගහති** පරවාදී තෙමේ නිග්‍රහ කෙරෙයි ("තේ සච්චිකට්ඨපරමත්ථෝ ආධාරෝ යස්ස සෝ තදධාරෝ"යි) විග්‍රහ කටයුතුයි. මේ වනාහි පච්චනීයානුලෝම පඤ්චකයෙහි පළමුවන නිග්‍රහයයි. ("වත්තබ්බේ" යන තන්හි "ක්වචේවා" යන මුගලන් සූත්‍රෙන් හෝ "තිලිඞ්ගතෝ ඨානේසියෝනමේ" යන ශබ්දනීති සූත්‍රයෙන් හෝ ප්‍රථමා සි-විභක්තියට ඒ-කාරාදේශ කොට මේ පදය සිද්ධ කරනු)

**සබ්බත්ථ** සියළු ශරීරයෙහි **පුග්ගලෝ** ආත්මය **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ අවිපරීතාර්ථ වශයෙන් **උපලබ්භති** නුවණින් දතයුත්තේ ද යත්? **සබ්බත්ථ** සියළු ශරීරයෙහි **පුග්ගලෝ** ආත්මය **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ අවිපරීතාර්ථ වශයෙන් **නුපලබ්භති** නුවණින් නොදතයුත්තේ ද යත්? **සබ්බදා** හැමකල්හිම **පුග්ගලෝ** ආත්මය **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ අවිපරීතාර්ථ වශයෙන් **උපලබ්භති** නුවණින් දතයුත්තේ ද යත්? **සබ්බදා** හැමකල්හි **පුග්ගලෝ** ආත්මය **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ අවිපරීතාර්ථ වශයෙන් **නුපලබ්භති** නුවණින් නොදතයුත්තේ ද යත්? **සබ්බේසු** සියළු ස්කන්ධායතන ධාතූන් කෙරෙහි **පුග්ගලෝ** ආත්මය **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ අවිපරීතාර්ථ වශයෙන් **උපලබ්භති** නුවණින් දතයුත්තේ ද යත්? **සබ්බේසු** සියළු ස්කන්ධායතන ධාතූන් කෙරෙහි **පුග්ගලෝ** ආත්මයක් **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ අවිපරීතාර්ථ වශයෙන් **නුපලබ්භති** නුවණින් නොදතයුත්තේ ද යත්? **ඉති** මෙසේ **පුච්ඡති** විචාරයි **ඒවං** මේ කියනලද නයින් **පඨමං වාදං නිස්සාය** පළමුවන වාදය නිශ්‍රය කොටගෙන **පඨමං නිග්ගහං** පළමුවන නිග්‍රහය ද **දුතියං වාදං නිස්සාය** දෙවෙනි වාදය නිශ්‍රය කොටගෙන **දුතියං නිග්ගහං** දෙවෙනි නිග්‍රහය ද **තතියං** -පෙ- **චතුත්ථං** -පෙ- **පඤ්චමං** -පෙ- **ඡට්ඨං** -පෙ- **සත්තමං** -පෙ- **අට්ඨමං වාදං නිස්සාය** අටවෙනි වාදය නිශ්‍රය කොටගෙන **අට්ඨමං නිග්ගහං** අටවෙනි නිග්‍රහය ද **දස්සෙන්තේන** දක්වනු කැමති වූ **සත්ථාරා** ශාස්තෘන් වහන්සේ විසින් **ඨපිතා** තබා වදාරණ ලද්දීය.

(පුද්ගලවාරයෙහි නය ප්‍රකාශකොට මාතෘකා ඨපනය මෙසේ අවබෝධ කොට පුද්ගලවාරයෙන් අන්‍ය වූ සියළු වාරයෙහි නය දැක්වීම පිණිස "ඉමිනා නයේන" යනාදිය කීහ) **ඉමිනා නයේන** මෙසේ පුද්ගලවාරයෙහි දක්වනලද ක්‍රමයෙන් **සබ්බත්ථ** සියළු වාරයෙහි **මාතිකාඨපනං** මාතෘකාව තැබීම **වේදිතබ්බං** දතයුත්තේයි (භාග්‍යවත් වූ සර්වඥයන් වහන්සේ විසින් මේ මාතෘකාව තබනලද්දේ යැයි අර්ථකථාචාර්‍ය්‍යයන් වහන්සේලා විසින් කියනලදි. ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් මාතෘකා මාත්‍රයක් තබනලද්දේ වී නම් ඒ මාතෘකාව පමණක් බුද්ධභාෂිත නම් වෙයි. විතණ්ඩවාදීන් කී පරිද්දෙන් නිද්දේශවාරය ශ්‍රාවකභාෂිත නම් නොවිය යුත්තේ දැයි යන චෝද්‍ය සඳහා "තං පනේතං" යනාදිය කීහ) **පන** තවද **තං ඒතං (මාතිකං)** ඒ මාතෘකාව **ඨපෙන්තෝ** තබා වදරන්නා වූ (**සම්බුද්ධෝ** සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ) **ආයතිං** අනාගත කාලයෙහි **භාජනසඞ්ඛාතං** බෙදීමට කාරණා වූ හෙයින් භාජනයයි කියනලද්ද වූ **(ඉමං) කාරණං** මේ කාරණය **දිස්වාව** දැක වදාරාම **ඨපේසි** තබා වදළේයි **මම පරිනිබ්බාණතෝ** මගේ පිරිනිවීමෙන් **අට්ඨාරසවස්සාධිකානං** අටළොස් වර්ෂයක් අධික කොට ඇත්තා වූ **ද්වින්නං වස්සසතානං මත්තකේ** අවුරුදු දෙසීයක්හුගේ මස්තකයෙහි **මොග්ගලීපුත්තතිස්සථේරෝ නාම භික්ඛු** මොග්ගලීපුත්තතිස්ස නම් ස්ථවිර භික්ෂුවක් තෙමේ **භික්ඛු සහස්සමජ්ඣේ** දහසක් භික්ෂූන්ගේ මධ්‍යයෙහි **නිසින්නෝ** වැඩහුන්නේ **සකවාදේ** සකවාද සඞ්ඛ්‍යාත වූ

විභජ්ජවාද පක්‍ෂයෙහි (නොහොත්) ථේරියවාද පක්‍ෂයෙහි **පඤ්චසුත්තසතානි** පන්සියයක් සූත්‍රයෝ ද **පරවාදේ** ශාසන ප්‍රතිපක්‍ෂ වූ විතණ්ඩවාද සඞ්ඛ්‍යාත වූ මිත්‍යාවාද පක්‍ෂයෙහි **පඤ්චසුත්තසතානි** පන්සියයක් සූත්‍රයෝ දැයි **ඉති** මෙසේ **සුත්තසහස්සං සමෝධානෙත්වා** සූත්‍ර දහසක් එක්රැස්කොටගෙන **දීඝනිකායප්පමාණං** දික්සඟිය පමණ වූ **කථාවත්ථුප්පකරණං** කථාවස්තු ප්‍රකරණය **භාජෙස්සති** බෙද වදරන්නේ යයි **ඉති (ඉදං කාරණං)** මෙසේ මේ කාරණය **දිස්වාව** දැකවදරාම **ඨපේසි** මාතෘකාව තබා වදළේයි **මොග්ගලිපුත්තතිස්සථේරෝ** මොග්ගලිපුත්තතිස්ස ස්ථවිර තෙමේ **ඉදං පකරණං** මේ කථාවස්තු ප්‍රකරණය **දේසෙන්තෝපි** දේශනා කරන්නේ ද **අත්තනෝ ඤාණේන** තමන් වහන්සේගේ නුවණින් **න දේසේසි** දේශනා නොකළේයි **පන** එසේ වී නම් කෙසේ දේශනා කළ සේක්ද යත්? **සත්ථාරා** ශාස්තෲන් වහන්සේ විසින් **දින්නනයේන** දෙනලද්ද වූ ක්‍රමයෙන් **ඨපිතමාතිකාය** තබනලද්ද වූ මාතෘකාව කරණකොටගෙන **දේසේසි** දේශනා කළේයි **ආයතිං** අනාගත කාලයෙහි **භාජනසඞ්ඛාතං** බෙදීම යයි කියනලද්ද වූ **යං කාරණං** යම් හේතුවක් **දිස්වා** දැක වදළ හෙයින් **සම්මාසම්බුද්ධේන** සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් **මාතිකා ඨපිතා** මාතෘකාව තබාවදරන ලද්දේය **ඉති (ඒවං ඉමිනා)** මෙබඳු ස්වභාව ඇත්තා වූ **සම්මාසම්බුද්ධේන** සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් **දිට්ඨේ** දැකවදරන ලද්දවූ **භාජනසඞ්ඛාතේන** බෙදීම යයි කියනලද්ද වූ **කාරණේන** හේතුව කරණකොටගෙන **සත්ථාරා** ශාස්තෲන් වහන්සේ විසින් **දින්නනයේන** දෙනලද්ද වූ ක්‍රමයෙන් **ඨපිතමාතිකාය** තබනලද්ද වූ මාතෘකාව කරණකොටගෙන **මොග්ගලිපුත්තතිස්සථේරේන** මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන් විසින් **කථාවත්ථුප්පකරණස්ස** කථාවස්තු ප්‍රකරණය (භාවසම්බන්ධ ෂෂ්ඨිවිභත්තියි) **දේසිතත්තා** දේශනාකළ හෙයින් (නොහොත් "අයඤ්ච අත්ථෝ ගම්භීරෝ දුබ්බිඤෙය්‍යෝ තස්මා විඤ්ඤූහි සම්මාධාරේතබ්බෝ" යනු පුරාතනාචාරීන්ගේ අනුශාසනා බැවින්) **සත්ථාරා දින්නනයේන** ශාස්තෲන් වහන්සේ විසින් දෙනලද ක්‍රමයෙන් **ඨපිතමාතිකාය** තබනලද මාතෘකාව කරණකොටගෙන **මොග්ගලිපුත්තතිස්සථේරේන** මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන් විසින් **කථාවත්ථුප්පකරණස්ස** කථාවස්තු ප්‍රකරණය **ඉති (තස්මා දේසිතත්තා)** මෙසේ දේශනාකළ හෙයින් ("ඉති සද්දස්ස ඉධ හේතුවත්ථේ පවත්තත්තා තස්මාති අත්ථෝ සත්ථාරා -පෙ- දේසිතත්තාති ඉදං පන තබ්බිවරණන්ති නොතක්කෝ" යනු මණිදීපටීකායි) **සකලම්පි ඒතං පකරණං** මාතෘකා මාත්‍රයක්ම නොව මේ සියළු කථාවස්තු ප්‍රකරණයම **බුද්ධභාසිතමේව නාම ජාතං** බුද්ධභාෂිත නම්ම වූයේය **යථා (යේන පකාරේන)** යම් ප්‍රකාරයකින් **ඒතං පකරණං** මේ කථාවස්තු ප්‍රකරණ තෙමේ **බුද්ධභාසිතං නාම ජාතං** බුද්ධභාෂිත නම් වීද **තං නිදස්සනං** ඒ බුද්ධභාෂිත බව දක්වන්නා වූ **සක්ඛීභූතං** ඊට සාක්‍ෂි වූ **සුත්තං කිං** සූත්‍රය කවරේද? ("යේන පකාරේනාති යේන කාරණේන සත්ථාරා දින්නනයේන ඨපිතමාතිකාය විභත්තභාවෝ ඉධ පකාරෝ නාම" යනු ටීකායි) නොහොත් **යථා කිං** කුමක්මෙන්ද යත්? **මධුපිණ්ඩිකසුත්තන්තාදීනි යථා** මධුපිණ්ඩික සූත්‍රාන්තාදීහු මෙනැයි සේයි ("ඒතේන ච යථා කින්ති ඉමස්ස කිං යථා කිම්වාති අත්ථං නිවත්තේති කිඤ්චාපි නිවත්තේති තථාපි අයමත්ථෝපි යුත්තෝ විය දිස්සති තථාහි යථා කිං මධුපිණ්ඩිකසුත්තන්තාදීනීති එත්තකමේව අවත්වා යථාති ඉදම්පි වුත්තන්ති අඤ්ඤථා ඉදං න වත්තබ්බං සියාති" යනු මණිදීපටීකායි) **හි** විස්තරාර්ථය **මයා** මා විසින් **වුච්චතේ** කියනු ලැබේ.

**මධුපිණ්ඩිකසුත්තන්තස්මිං** මධුපිණ්ඩික සූත්‍රාන්තයෙහි **භගවා** භාග්‍යවතුන් වහන්සේ **භික්ඛූ** මහණ **යතෝනිදානං (යං කාරණං)** යම් සය වැදෑරුම්

ආධ්‍යාත්මිකායතනය සය වැදෑරුම් බාහිරායතනය යනාදී හේතූන්ගෙන් **පුරිසං (පරිසං)** පිරිස **පපඤ්චසඤ්ඤාසඞ්ඛා** සංසාර වෘර්තයෙහි බොහෝ කලක් ප්‍රමාද කරන්නාවූ තෘෂ්ණා මාන දෘෂ්ටීන්ගෙන් යුක්ත වූ සඤ්ඤාරාශීහු **සමුදාචරන්ති** ඉක්මවද්ද **එත්ථ (ඒතේසු ආයතනාදීසු)** මේ ස්කන්ධායතන ධාතූන් අතුරෙන් **ඒකේකං** එකී එකී ස්කන්ධායතන ධාතුවක් තෙමේ (මේ ප්‍රකෘති කර්තෘයි) **තණ්හාමානදිට්ඨීහි** තෘෂ්ණා මාන දෘෂ්ටීන් කරණකොටගෙන **අභිනන්දිතබ්බං** අතිශයින් සතුටුවියයුතු ද **අභිවන්දිතබ්බං** මමය මාගේ යයි විශේෂයෙන් ඉක්මවා කිවයුතුද **අජ්ඣෝසිතබ්බං** ගිලියයුතු වේද (මේ තුන් පදය වනාහි විකෘති කර්තෘයි) **නත්ථි චේ** ඉඳින් නැත්තේ වේද **ඒවං සති** මෙසේ නැති කල්හි **ඒසේව** (ඒසෝ ඒව) මේ අභිනන්දනාදීන්ගේ අවිද්‍යමානත්වය කරන්නා වූ ආර්‍ය්‍ය මාර්ග ආර්‍ය්‍ය ඵලයම **රාගඅනුසයාදීනං** කාමරාග අනුශයාදී සප්තානුශය ධර්මයන්ගේ **අන්තෝ (අවසානං)** කෙළවරය **අප්පවත්තීති** නොපැවැත්මයයි **මාතිකං ඨපෙත්වා** මාතෘකාව තබා **ආසනාවුට්ඨාය** ධර්මාසනයෙන් නැගිට **විහාරං** පාවිසි ගඳකිලියට වැඩවදාළේයි **ධම්මපටිග්ගහකා භික්ඛූ** බණ ඇසූ භික්ෂූහු **මහාකච්චානත්ථේරං** මහාකත්‍යායන ස්ථවිරයන් කරා **උපසඞ්කමිත්වා** එළඹ **දසබලේන** දසබලධාරී සර්වඥයන් වහන්සේ විසින් **ඨපිතමාතිකාය** තබනලද මාතෘකාවගේ **අත්ථං පුච්ඡිංසු** අර්ථ විචාළාහුය **ථේරෝ** මහාකත්‍යායන ස්ථවිර තෙමේ **පුච්ඡිතමත්තකේනේව** විචාළ පමණකින්ම **අකථෙත්වා** නොවිසඳ **දසබලස්ස** දසබලධාරීන් වහන්සේට **අපචිතිදස්සනත්ථං** පූජා කිරීම ප්‍රකාශකිරීම පිණිස **ආවුසෝ** ඇවැත්නි! **සෙය්‍යථාපි** යම්සේ වනාහි **සාරත්ථිකෝ** හර කැමති වූ **සාරගවේසී** හර සොයන්නා වූ **පුරිසෝ** පුරුෂයෙක් තෙමේ **ඉති** මෙසේ **සාරෝපමං ආහරිත්වා** සාරෝපමාව එලවා **භගවා** භාග්‍යවතුන් වහන්සේ **සාරරුක්ඛෝ විය** හරඇති රුක්ෂයකට බඳු වෙයි **සාවකා** ශ්‍රාවකයෝ තුමූ **සාඛාපලාසසදිසා** අතුපතරට බඳු වෙත් **හි (සච්චං)** ඒ වචනය සැබැයි **ආවුසෝ** ඇවැත්නි **සෝ භගවා** ඒ භාග්‍යවතුන් වහන්සේ **ජානං (ජානාතබ්බං)** දතයුතු වූ සියළු ඥෙය්‍ය ධර්මය **ජානාති** සර්වඥත් නුවණ කරණකොටගෙන දැනවදරයි **පස්සං (පස්සිතබ්බං)** දැක්කයුතු වූ සියළු ඥෙය්‍ය ධර්මය **පස්සති** සමන්තචක්ෂුස කරණකොටගෙන දැක වදරයි **ජානං (ජානන්තෝ)** අවිපරීත වශයෙන් දැන වදරන්නේ **ජානාති** දැන වදරන්නේ මැයි **පස්සං (පස්සන්තෝ)** අවිපරීත වශයෙන් දැක වදරනුයේ **පස්සති** දැක වදරන්නේ මැයි **චක්ඛුභූතෝ** තමන් වහන්සේ සර්වප්‍රකාරයෙන් ඇසකට බඳු ස්වභාව ඇත්තේ වෙයි (නොහොත්) සත්ව ලෝකයට ප්‍රඥා නැමති ඇසකට බඳු වෙයි **ඤාණභූතෝ** තමන් වහන්සේ සර්වප්‍රකාරයෙන් ඤාණයකට බඳු වෙයි (නොහොත්) සත්ව ලෝකයාගේ ඤාණයට බඳු වෙයි **ධම්මභූතෝ** බෝධිපාක්ෂික ධර්මයෙන් හටගත්තේ වෙයි (නොහොත්) සත්ව ලෝකයට බෝධිපාක්ෂික ධර්මයක් වැනි වෙයි **බ්‍රහ්මභූතෝ** ආර්‍ය්‍ය මාර්ගය කරණකොටගෙන හටගත්තේ වෙයි (නොහොත්) සත්ව ලෝකයට ආර්‍ය්‍ය මාර්ගයක් බඳු වෙයි **වත්තා** චතුරාර්‍ය්‍ය සත්‍යය දේශනා කරන්නේ වෙයි **පවත්තා** චතුරාර්‍ය්‍ය සත්‍යාවබෝධය කොටගෙන නිරන්තරයෙන් ලෝකවාසීන්ට චතුරාර්‍ය්‍ය සත්‍යය දේශනා කරන්නේ වෙයි **අත්ථස්ස** චතුරාර්‍ය්‍ය සත්‍යය සඞ්ඛ්‍යාත අර්ථය (නොහොත්) චතුරාර්‍ය්‍ය සත්‍යය සඞ්ඛ්‍යාත ධනය **නින්නේතා** නිකුත්කොට දක්වන්නේ වෙයි (නොහොත්) **අත්ථස්ස** පරමාර්ථ වූ නිර්වාණයට **නින්නේතා** ගෙනහැර සිටුවන්නෙක් මෙන් වෙයි **අමතස්ස** අමෘත සඞ්ඛ්‍යාත වූ නිර්වාණය **දතා** දෙනසුලු වෙයි **ධම්මසාමී** බෝධිපාක්ෂික ධර්මයට ස්වාමී වෙයි **තථාගතෝ** පෙර බුදුවරයන් මෙන් ආයේ වෙයි **ඉති** මෙසේ **සත්ථාරං** ශාස්තෘන් වහන්සේට **ථෝමෙත්වා** මුව නොපොහොනා පරිද්දෙන් ස්තුති කොට **පුනප්පුනං** නැවත නැවත **ථේරේහි** ධර්ම ප්‍රතිගාහක තෙරුන් විසින් **යාචිතෝ** යාඥාකරන ලදුව **සත්ථාරා** ශාස්තෘන් වහන්සේ විසින් **ඨපිතමාතිකාය**

තබනලද්ද වූ මාතෘකාවගේ **අත්ථං විභජිත්වා** අර්ථ විභාග කොට **පන** එසේ විභාග කරන්නේ නමුදු **ආයස්මන්තෝ** ආයුෂ්මත්වරුනි! **තුම්හේ** නුඹවහන්සේලා **ආකඞ්ඛමානාව** ඉදින් කැමැත්තාහු නම් **භගවන්තංයේව උපසඞ්කමිත්වා** භාග්‍යවතුන් වහන්සේ කරාම එළඹ **ඒතමත්ථං** මේ අර්ථය **පටිපුච්ඡෙය්‍යාථ** වරක් විචාරත්වයි **සබ්බඤ්ඤුතඤ්ඤාණේන සද්ධිං** සර්වඥතා ඥානය හා **සංසන්දියමානං** ගළපනු ලබන්නේ **සචේ සමෙස්සති** ඉදින් සමවේ නම් **ඒතමත්ථං** මේ අර්ථය **ගණ්හෙය්‍යාථ** ගන්නා සේක්වා **නෝ චේ සමේති** ඉදින් සමනොවේ නම් **මා ගණ්හිත්ථ** නොගනුව **ඉති ඉමිනා අධිප්පායේන** මේ අභිප්‍රාය කරණකොටගෙන **යථා (යේන පකාරේන)** යම් ප්‍රකාරයකින් **භගවා** භාග්‍යවතුන් වහන්සේ **වෝ** නුඹවහන්සේලාට **බ්‍යාකරෝති** විසඳ වදරන්නේ වේද **තථා (තේන පකාරේන)** ඒ ප්‍රකාරයෙන් **නං (අත්ථං)** ඒ අර්ථය **ධාරෙය්‍යාථ** දරණ සේක්වා **ඉති වත්වා** මෙසේ කියා **උය්‍යෝජේසි** භික්‍ෂූන් පිටත් කළේය.

("චක්ඛුභූතෝති පඤ්ඤාචක්ඛුමයත්තා සත්තේසු ච තදුප්පාදනතෝ ලෝකස්ස චක්ඛුභූතෝ" යනු ටීකායි. මේ ටීකායෙහි "පඤ්ඤාචක්ඛුමයත්තා" යන හේතුව චක්ඛුශබ්දයෙහිම සම්බන්ධ කරනු. "චක්ඛුමයභූතෝ"යි කියයුතු තන්හි මය ශබ්දය ලොප් කොට චක්ඛුභූතෝ යි ශබ්දය නිෂ්පන්න විය. එහෙයින් චක්ඛුභූතෝ යි දේශනා පාළියෙහි ආයේයි. "සත්තේසු ච තදුප්පාදනතෝ" යන හේතුව "ලෝකස්ස චක්ඛුභූතේන" යන්නෙහි සම්බන්ධ කරනු. "චක්ඛු ඉව භූතෝ යෝ භගවා සෝයං චක්ඛුභූතෝ" යි බහුබ්බීහි සමාස කරනු) **යෝ භගවා** යම් භාග්‍යවත් කෙනෙක් තෙමේ **චක්ඛු ඉව භූතෝ** තමන්වහන්සේ සර්වප්‍රකාරයෙන්ම ප්‍රඥා නැමති ඇසකට බඳු උපමා ඇත්තේ වේද (නොහොත්) ප්‍රඥා නැමති ඇස කරණකොටගෙන සිද්ධවූයේ වේද **ඉති (තස්මා)** එසේ හෙයින් **සෝ භගවා** ඒ භාග්‍යවතුන් වහන්සේ **චක්ඛුභූතෝ** චක්ඛුභූත නම් වෙයි "පඤ්ඤා ඒව චක්ඛු පඤ්ඤාචක්ඛු යේන නිප්පන්නං පඤ්ඤාචක්ඛු මයං භගවතෝ ඛන්ධපඤ්චකං තේන වා නිප්පන්නෝ පඤ්ඤාචක්ඛුමයෝ භගවා තස්ස වා ඛන්ධසන්තානෝ" යන පාළිය බලා උන්වහන්සේ සර්වාකාරයෙන්ම ප්‍රඥා නැමති ඇසකට බඳු වෙයි. (නොහොත්) ප්‍රඥා නැමති ඇස කරණකොටගෙන තථාගතයන් වහන්සේගේ පඤ්චස්කන්ධය නිපන්නේ යයි අර්ථ යෝජනා කටයුතුයි (නොහොත්) **සෝ භගවා** යම් භාග්‍යවත් කෙනෙක් තෙමේ **චක්ඛු ඉව භූතෝ** සත්වලෝකයාගේ ඇසකට බඳු ස්වභාවය ඇත්තේ වේද ("සත්තේසු ච තදුප්පාදනතෝ ලෝකස්ස චක්ඛුභූතෝ" යන ටීකා පාඨය බලා මේ අර්ථ යෝජනාව කටයුතුයි. "චක්ඛුභූතෝති අයං සමාසෝ නිග්‍රෝධපරිමණ්ඩලෝති සමාසෝ විය බහුබ්බීහිසමාසෝව හෝති නසංඛපණ්ඩරන්ති සමාසෝ විය කම්මධාරයසමාසෝ ඒතස්ස හි චක්ඛු ඉව භූතෝ යෝ භගවාති වාක්‍යමේව හෝති නිග්‍රෝධපරිමණ්ඩලෝති සමාසපදස්ස විය නිග්‍රෝධෝ ඉව පරිමණ්ඩලෝ යෝ රාජකුමාරෝති වාක්‍යමේව නසංඛපණ්ඩරන්ති සමාසපදස්ස විය සඞ්ඛෝ ඉව පණ්ඩරන්ති වාක්‍යම්ව චක්ඛු ඉව භූතෝති වාක්‍යන්ති, කේචි පන චක්ඛූභූතෝති කම්මධාරේ සමාසෝති වදන්ති තං න යුජ්ජති නිග්‍රෝධපරිමණ්ඩලෝති සමාසස්ස විය චක්ඛූභූතෝති සමාසස්ස බහුබ්බීහි සමාසත්තා ඒවඤ්ච කත්වා සමාසකප්පේ බහුබ්බීහි සමාසාධිකාරේ චක්ඛූ ඉව භූතෝ යෝ භගවා සෝයං චක්ඛූභූතෝති වුච්චති" යන මණිදීපවාක්‍ය බලා කච්චායනයෙහි සමාසප්‍රකරණයෙහි "චක්ඛූනෝ භූතෝ චක්ඛූභූතෝ චක්ඛුභූතෝ ඉව භූතෝ යෝ භගවා යෝයං චක්ඛුභූතෝ නිග්‍රෝධස්ස පරිමණ්ඩලෝ නිග්‍රෝධපරිමණ්ඩලෝ නිග්‍රෝධපරිමණ්ඩලෝ ඉව පරිමණ්ඩලෝ යෝ රාජකුමාරෝ" යන පාඨය මෑතභාගයෙහි ආකූල වූ පාඨයෙකැයි දතයුතුයි. "පවත්තාති චිරං සච්චපටිවේධං පවත්තෙන්තෝ වදතීති පවත්තා" යනු ටීකායි. මේ ටීකායෙහි "චිරං" යන පාඨය කරණකොටගෙන "පවත්තා"

යන්නෙහි ප-ශබ්දය ප්‍රකර්ෂාර්ථ වාචක වන්නේ යැයි හැගේ. ප්‍රකර්ෂාර්ථය ද මෙහි "චිරං" යන අර්ථය අභිමතවනබව ප්‍රකාශ කෙළෙයි. "චිරන්ති ඉමිනා හි පකාරස්ස පකට්ඨං දස්සේති තේන වුත්තං අනුටීකායං පවත්තාති එත්ථ පකාරස්ස පකට්ඨතං දස්සේතුං චිරං සච්චපටිවේධං පකාසෙන්තෝ වදතීති පවත්තාති ආහ. අඤ්ඤත්ථ පන චිරත්ථෝව පකට්ඨෝති වුත්තෝ ඉධ පන චිරෝ දීඝෝ කාලෝ ඒව පකට්ඨෝති වුත්තෝ" යනු මණිදීපටීකායි)

**තේ භික්ඛූ** ඒ ධම්මප්‍රතිග්‍රහක භික්‍ෂූහු **සත්ථාරං උපසඞ්කමිත්‍වා** ශාස්තෘන් වහන්සේ කරා එළඹ **පුච්ඡිංසු** විචාළාහුය **සත්ථා** ශාස්තෘන් වහන්සේ **කච්චානේන** මහාකත්‍යායන ස්ථවිරයන් විසින් **දුක්කථිතන්ති** නපුරු සේ කියනලද්දේ යයි **අවත්‍වා** නොවදරා **සුවණ්ණාලිඞ්ගං** රන්මිහිගු බෙරයක් **උස්සාපෙන්තෝ විය** ඔසවන්නාක් මෙන් **ගීවං උන්නාමෙත්‍වා** ග්‍රීවාධාතුව ඔසවා **සුපුප්ඵිතසතපත්තසස්සිරීකං** මොනවට පිපීගියාවූ පියුමක් මෙන් සශ්‍රීක වූ **මහාමුඛං** පූරෙන්තෝ උතුම් වූ ශ්‍රී මුඛය පුරවමින් **බ්‍රහ්මස්සරං** බ්‍රහ්මයාගේ ශබ්දයට බඳුවූ අෂ්ටාඞ්ගස්වරය **නිච්ඡාරෙත්‍වා** විහිදුවා **සාධුසාධූති** යහපත යහපතැයි **ථේරස්ස** මහාකත්‍යායන තෙරුන්ට **සාධුකාරං දත්‍වා** සාධුකාර දී **භික්ඛවේ** මහණෙනි! **මහාකච්චානෝ** මහාකත්‍යායන තෙමේ **පණ්ඩිතෝ** වියත් වෙයි **භික්ඛවේ** මහණෙනි! **මහාකච්චානෝ** මහාකත්‍යයන තෙමේ **මහාපඤ්ඤෝ** මහාපැණැත්තේය **භික්ඛවේ** මහණෙනි! **තුම්හේ** තෙපි **මං** මා **ඒතමත්ථං** මේ අර්ථය **චේපි පටිපුච්ඡෙය්‍යාථ** ඉදින් පසුව විචාරහු නම් **මහාකච්චානේන** මහාකත්‍යායනයන් විසින් **තං සුත්තං** ඒ සූත්‍රය **වෝ** තොපට **බ්‍යාකතං යථා** යම්සේ විස්තර කොට දේශනා කෙළේ ද **ඒවමේව** එපරිද්දෙන්ම **අහම්පි** මමද **තං සුත්තං** ඒ සූත්‍රය **වෝ** තොපට **බ්‍යාකරෙය්‍යං** ප්‍රකාශ කරන්නෙමි **ඉති ආහ** මෙසේ වදළේයි **ඒවං** මෙසේ **සත්ථාරා** ශාස්තෘන් වහන්සේ විසින් **අනුමෝදිතකාලතෝ පට්ඨාය** සතුටුවූ කාලය පටන් **සකලසුත්තං** සියළු සූත්‍රය **බුද්ධභාසිතමේව නාම ජාතං** බුද්ධභාෂිත නම් වූයේය. (මෙහි "පන" ශබ්දය පදපූර්ණාර්ථයි) **මධුපිණ්ඩිකසුත්තේ** මධුපිණ්ඩික සූත්‍රයෙහි **යෝ නයෝ** යම් ක්‍රමයක් **මයා** මා විසින් **වුත්තෝ** කියනලද්දේ වේද **ආනන්දථේරාදීහි** ආනන්ද ස්ථවිරාදීන් විසින් **විත්ථාරිතසුත්තේසුපි** විස්තර කරනලද සූත්‍රයෙහිදු **ඒසේව** (ඒසෝ ඒව) මේ මධුපිණ්ඩික සූත්‍රයෙහි කියනලද්දවූම **නයෝ** ක්‍රමය තෙමේ **වේදිතබ්බෝ** දතයුත්තේයි **අඤ්ඤෝ නයෝ** අනික් ක්‍රමයක් **න වේදිතබ්බෝ** නොදතයුත්තේයි **ඒවමේව** එපරිද්දෙන්ම **සම්මාසම්බුද්ධෝ** සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ **සත්තප්පකරණානි** සප්ත ප්‍රකරණයන් **දේසෙන්තෝ** දේශනා කරණුයේ **කථාවත්ථුං පත්‍වා** කථාවස්තු ප්‍රකරණයට පැමිණ **වුත්තනයේනේව** යට කියනලද ක්‍රමයෙන්ම **මාතිකං ඨපේසි** මාතෘකාව තබා වදළේයි **පන** එතෙකුදුවුවත් **ඨපෙන්තෝ ච** තබනුයේ ද **ආයතිං** මත්තෙහි **භාජනසඞ්ඛාතං** බෙදීම් සඞ්ඛ්‍යාත වූ **ඉදං කාරණං** මේ කාරණය **අද්දස** දැක වදළේයි **මම පරිනිබ්බානතෝ** මගේ පිරිනිවීමෙන් **අට්ඨරසවස්සාධිකානං** අටළොස් වර්ෂයක් අධික කොට ඇත්තාවූ **ද්වින්නං වස්සසතානං** අවුරුදු දෙසීයයක්හුගේ **මත්ථකේ** මතුයෙහි **මොග්ගලීපුත්තතිස්සත්ථේරෝ නාම භික්ඛු** මොග්ගලීපුත්තතිස්ස ස්ථවිර නම් භික්‍ෂුතෙමේ **භික්ඛුසහස්සමජ්ඣෙ නිසින්නෝ** භික්‍ෂූන් දහසක් මැද වැඩහුන්නේ **සකවාදේ** විභජ්ජවාදයෙහි **පඤ්චසුත්තසතානි** සූත්‍ර පන්සියයෙක් ද **පරවාදේ** විතණ්ඩවාදයෙහි **පඤ්චසුත්තසතානීති** පන්සියයක් සූත්‍රයෝ දැයි **සුත්තසහස්සං සමෝධානෙත්‍වා** දහසක් සූත්‍රයන් එක්කොටගෙන **දීඝනිකායප්පමානං** දික්සඟිය පමණ වූ **කථාවත්ථුප්පකරණං** කථාවස්තු ප්‍රකරණය **භාජෙස්සතීති** බෙදන්නේ යයි **ආයතිං** මත්තෙහි **භාජනසඞ්ඛාතං** බෙදීම යයි

කියනලද්ද වූ **ඉදං කාරණං අද්දස** මේ කාරණය දැක වදාළේයි **මොග්ගලිපුත්තතිස්සත්ථේරෝ** මොග්ගලීපුත්තතිස්ස ස්ථවිර තෙමේ **ඉදං පකරණං** මේ ප්‍රකරණය **දේසෙන්තෝපි** දේශනා කරනුයේ ද **අත්තනෝ ඤාණේන** තමන් වහන්සේගේ නුවණ කරණකොටගෙන **න දේසේසි** දේශනා කළ සේක් නොවෙයි **පන** එතකුදුවුවත් **සත්ථාරා දින්නනයේන** ශාස්තෲන්වහන්සේ විසින් දෙනලද ක්‍රමයෙන් **ඨපිතමාතිකාය** තබනලද මාතෘකාව කරණකොටගෙන **දේසේසි** දේශනාකළ සේක් **ආයතිං** මත්තෙහි **භාජනසඞ්ඛාතං** බෙදීම යයි කියනලද **යං කාරණං දිස්වා** යම් කාරණයක් දැක වදාරා **සම්මාසම්බුද්ධේන** සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ විසින් **මාතිකා ඨපිතා** මාතෘකාව තබා වදාරණ ලද්දීද **ඉති (ඒවං ඉමිනා)** මෙසේ මේ **සම්මාසම්බුද්ධේන** සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ විසින් **දිට්ඨේන** දක්නාලද්ද වූ **භාජනසඞ්ඛාතේන කාරණේන** බෙදීම් සඞ්ඛ්‍යාත වූ කාරණයෙන් **සත්ථාරා** ශාස්තෲන්වහන්සේ විසින් **දින්නනයේන** දෙනලද්දවූ ක්‍රමයෙන් **ඨපිතමාතිකාය** තබා වදාරණ ලද්දවූ මාතෘකාව කරණකොටගෙන **මෝග්ගලීපුත්තතිස්සත්ථේරේන** මොග්ගලීපුත්තතිස්ස ස්ථවිරයන් විසින් **කථාවත්ථුප්පකරණස්ස** කථාවස්තු ප්‍රකරණය **දේසිතත්තා** දේශනා කළ හෙයින් **සකලම්පි ඒතං පකරණං** මේ සියළු ප්‍රකරණය **බුද්ධභාසිතමේව නාම ජාතං** බුද්ධභාෂිතම නම් විය **ඒවං** මෙසේ **කථාවත්ථුනාව සද්ධිං** කථාවස්තු ප්‍රකරණය සමඟම **සත්තප්පකරණානි** සප්ත ප්‍රකරණ කෙනෙක් තුමූ **අභිධම්මෝ නාම** අභිධර්ම නම් වී.

**තත්‍ථ** ඒ අභිධර්ම සප්ත ප්‍රකරණයන් අතුරෙන් **ධම්මසඞ්ගණීප්පකරණේ** දම්සඟුණු ප්‍රකරණයෙහි **චිත්තවිභත්ති** චිත්තය බෙදන්නා වූ පාළි ප්‍රදේශය ද **රූපවිභත්ති** රූපය බෙදන්නා වූ පාළි ප්‍රදේශය ද **නික්ඛේපරාසි** නික්ඛේපරාශි නම් පාළි ප්‍රදේශයෙක් ද **අත්ථුද්ධාරෝ** අර්ථය උද්ධරණය කරන්නා වූ අර්ථකථා කාණ්ඩය ද **ඉති** මෙසේ **චතස්සෝ විභත්තියෝ** සතරාකාර විභාගය වූ පාළි ප්‍රදේශ කෙනෙක් (**හොන්ති** වෙත්) **තත්‍ථ** ඒ සතරාකාර විභත්තීන් අතුරෙන් **කාමාවචරකුසලතෝ (කාමාවචරකුසලේසු)** කාමාවචර කුසල නාමස්කන්ධයන් සතරදෙනා අතුරෙන් **අට්ඨ** කාමාවචර කුසලයෝ අටදෙනෙක් ද **අකුසලතෝ** අකුසල නාමස්කන්ධයන් සතරදෙනා අතුරෙන් **ද්වාදස** දොළොස් අකුසල් සිත් කෙනෙක් ද **කුසලවිපාකතෝ** කුසලවිපාක නාමස්කන්ධයන් සතරදෙනා අතුරෙන් **සෝළස** අහේතුකවිපාක අටය, සහේතුකවිපාක අටය යන සොළොස් කුසලවිපාක නාමස්කන්ධ කෙනෙක් ද **අකුසලවිපාකතෝ** අකුසලවිපාක සතර නාමස්කන්ධයන් අතුරෙන් **සත්ත** සත් වැදෑරුම් අකුසලවිපාක සිත් කෙනෙක් ද **ක්‍රියතෝ** ක්‍රියා නාමස්කන්ධ සතරදෙනා අතුරෙන් **ඒකාදස** එකොළොස් ක්‍රියාසිත් කෙනෙක් ද **රූපාවචරකුසලතෝ** රූපාවචරකුසල නාමස්කන්ධයන් සතරදෙනා අතුරෙන් **පඤ්ච** පඤ්චප්‍රකාර රූපාවචර කුසල්සිත් කෙනෙක් ද **විපාකතෝ** රූපාවචරවිපාක නාමස්කන්ධයන් සතරදෙනා අතුරෙන් **පඤ්ච** පඤ්ච ප්‍රකාර වූ රූපාවචරවිපාක සිත් කෙනෙක් ද **ක්‍රියතෝ** රූපාවචරක්‍රියා නාමස්කන්ධයන් සතරදෙනා අතුරෙන් **පඤ්ච** පඤ්චප්‍රකාර වූ රූපාවචර ක්‍රියාසිත් කෙනෙක් ද **අරූපාවචරකුසලතෝ** අරූපාවචරකුසල නාමස්කන්ධයන් සතරදෙනා අතුරෙන් **චත්තාරි** සතරාකාර වූ අරූපාවචර කුසල්සිත් කෙනෙක් ද **විපාකතෝ** අරූපාවචර විපාක නාමස්කන්ධයන් සතරදෙනා අතුරෙන් **චත්තාරි** සතරාකාර වූ අරූපාවචර විපාකසිත් කෙනෙක් ද **ක්‍රියතෝ** අරූපාවචරක්‍රියා නාමස්කන්ධයන් සතරදෙනා අතුරෙන් **චත්තාරි** සතරාකාර වූ අරූපාවචර ක්‍රියාසිත් කෙනෙක් ද **ලෝකුත්තරකුසලතෝ** ලෝකෝත්තරකුසල නාමස්කන්ධ සතරදෙනා අතුරෙන් **චත්තාරි** සතරාකාර වූ ලෝකෝත්තර කුසල්සිත් කෙනෙක් ද **විපාකතෝ** ලෝකෝත්තර විපාක

නාමස්කන්ධයන් සතරදෙනා අතුරෙන් **චත්තාරි** සතරාකාර වූ ලෝකෝත්තර විපාකසිත් කෙනෙක් ද **ඉති** මෙසේ **ඒකූනනවුතිචිත්තානි** එකුන්අනූවක් චිත්තයන්ගෙන් බෙදන ලද්දවූ පාළි ප්‍රදේශයෝ තුමූ **චිත්තවිභත්ති නාම** චිත්තවිභත්ති නම් වේ **චිත්තුප්පාදකණ්ඩන්ති නාමම්පි** චිත්තෝත්පාදකාණ්ඩය යන නමද **තස්සේව** (තස්ස ඒව) ඒ විභත්තියගේම **නාමං** නාමයයි **තං** ඒ චිත්තුප්පාදකාණ්ඩ තෙමේ **වාචනාමග්ගතෝ** ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ විසින් හදරවනලද වචන පරම්පරා වශයෙන් **අතිරේක ඡ භාණවාරං හෝති** මඳක් අධික වූ බණවර සදෙනෙක් පමණ ඇත්තේ වේ **පන** විශේෂ වශයෙන් වනාහි **විත්ථාරියමානං** විස්තර කරණු ලබන්නේ නම් **අනන්තං** කෙළවරක් නැත්තේ **අපරිමාණං හෝති** ප්‍රමාණයක් නැත්තේ වෙයි.

**තදනන්තරං** ඒ චිත්තෝත්පාදකාණ්ඩයට අනතුරුව **ඒකවිධේන දුවිධේනාති ආදිනා නයේන** ඒකවිධෙන දුවිධෙන යනාදී ක්‍රමයෙන් **මාතිකං ඨපෙත්වා** මාතෘකාව තබා **විත්ථාරේන** විස්තර වශයෙන් **විභජිත්වා** බෙද **දස්සිතා** දක්වනලද්ද වූ විභත්තිතොමෝ **රූපවිභත්තිනාම** රූපවිභත්ති නම් වේ **රූපකණ්ඩන්ති නාමම්පි** රූපකාණ්ඩය යන නමද **තස්සේව නාමං** ඒ රූපවිභත්තියටම නමෙකි **තං** ඒ රූපකාණ්ඩ තෙමේ **වාචනාමග්ගතෝ** ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේගේ වාචනා මාර්ගයෙන් **අතිරේකද්විභාණවාරං** හෝති මඳක් අධික වූ බණවර දෙකක් පමණ ඇත්තේ වේ **විත්ථාරියමානං පන** විස්තර කරණු ලබන්නේ නම් වනාහි **අනන්තං** කෙළවරක් නැත්තේ **අපරිමාණං හෝති** ප්‍රමාණයක් නැත්තේ වෙයි.

**තදනන්තරං** ඒ රූපකාණ්ඩයට අනතුරුව **මූලතෝ** මූල වශයෙන් ද **ඛන්ධතෝ** ස්කන්ධ වශයෙන් ද **ද්වාරතෝ** ද්වාර වශයෙන් ද **භූමිතෝ** භූමි වශයෙන් ද **අත්ථතෝ** අර්ථ වශයෙන් ද (නොහොත් විපාක වශයෙන් ද) **ධම්මතෝ** පාළි වශයෙන් ද (නොහොත් හේතු වශයෙන් ද) **නාමතෝ** නාම වශයෙන් ද **ලිඞ්ගතෝ** ස්ත්‍රීලිඞ්ග පුරුෂලිඞ්ග නපුංසකලිඞ්ග වශයෙන් ද **ඉති (ඒවං)** මෙසේ **මූලාදීනි** මූලාදීන්ගේ වශයෙන් **නික්ඛිපිත්වා** නික්‍ෂේප කොට (නොහොත් තබා) **දේසිතෝ** දේශනාකර වදරණ ලද්ද වූ ධර්මසමූහ තෙමේ **නික්ඛේපරාසි නාම** නික්ඛේපරාසි නම් වේ **මූලතෝචාපි** මුල් වශයෙන් ද -පෙ- **ලිඞ්ගතෝචාපි** ලිඞ්ග වශයෙන් ද **නික්ඛිපිත්වා** තබා **දේසිතත්තා** දේශනාකළ හෙයින් **නික්ඛේපෝති** නික්ඛේපරාසි යයි **පවුච්චති** ප්‍රභේද වශයෙන් කියනු ලැබේ **නික්ඛේපකණ්ඩන්ති නාමම්පි** නික්‍ෂේපකාණ්ඩය යන නාමය ද **තස්සේව** (තස්ස ඒව) ඒ නික්‍ෂේපරාශියටම **නාමං** නමෙකි (රාසි යනු වනාහි අග්ගි ශබ්දය මෙන් ඉ-කාරන්ත පුල්ලිඟුයි) **තං** ඒ නික්‍ෂේපකාණ්ඩ තෙමේ **වාචනාමග්ගතෝ** ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේගේ වාචනා මාර්ග වශයෙන් **තිභාණවාරමත්තං හෝති** තුන්බණවරක් පමණ වෙයි **විත්ථාරියමානං පන** විස්තර කරණු ලබන්නේ නම් වනාහි **අනන්තං** කෙළවරක් නැත්තේ **අපරිමාණං හෝති** ප්‍රමාණරහිත වූයේ වෙයි.

**තදනන්තරං** ඒ නික්‍ෂේපකාණ්ඩයට අනතුරුව **තේපිටකස්ස බුද්ධවචනස්ස** ත්‍රිපිටක සඞ්ඛ්‍යාත වූ බුද්ධවචනයාගේ **අත්ථුද්ධාරභූතං** අර්ථය උද්ධරණය කරන්නා වූ **යාව සරණදුකා** සරණදුකය දක්වා **නික්ඛිත්තං** තබනලද්ද වූ කාණ්ඩ තෙමේ **අට්ඨකථාකණ්ඩං නාම** අට්ඨකථාකාණ්ඩ නම් වේ **යතෝ** යම් අර්ථකථාකාණ්ඩයකින් **මහාපකරණියා** පටන්මහාපවුරුණ ඉගෙණ ගන්නාවූ **භික්ඛූ** භික්‍ෂූහු තුමූ **මහාපකරණේ** පටන්මහපවුරුණෙහි **ගණනවාරං** ගණන් තැබීම **අසල්ලක්ඛේන්තා** නොසලකන්නාහු **ගණනවාරං (ගණනවාරං)** ගණන් තැබීම **සමානෙන්ති (සමානං**

**කරොන්ති)** සමාන කෙරෙත් ද නොහොත් **සමානෙන්ති (සම්මා ආනෙන්ති)** මොනවට එළවත් ද **තං** ඒ අර්ථකථාකාණ්ඩ තෙමේ **වාචනාමග්ගතෝ** ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේගේ වාචනාමාර්ග වශයෙන් **ද්විභාණවාරමත්තං හෝති** බණවර දෙකක් පමණ ඇත්තේ වෙයි **විත්ථාරියමානං** පන විස්තර කරණු ලබන්නේ නම් වනාහි **අනන්තං** කෙළවරක් නැත්තේ **අපරිමාණං හෝති** ප්‍රමාණරහිත වෙයි **ඉති** මෙසේ **සකලම්පි ධම්මසඞ්ගණීප්පකරණං** සියළු දම්සඟුණු පවුරුණු තෙමේ **වාචනාමග්ගතෝ** සැරියුත් මහතෙරුන්ගේ වාචනාමාර්ග වශයෙන් (නොහොත් තමන් වහන්සේගේ ශිෂ්‍යවූ පන්සියයක් භික්ෂූන්ට දෙසූ ක්‍රමයෙන්) **අතිරේකතේරසභාණවාරමත්තං හෝති** මඳක් අධික වූ තෙළෙස් බණවරක් පමණ ඇත්තේ වෙයි **විත්ථාරියමානං පන** විස්තර කරණු ලබන්නේ නම් වනාහි **අනන්තං** කෙළවරක් නැත්තේ **අපරිමාණං හෝති** ප්‍රමාණරහිත වූයේ වෙයි **ඒවං (ඉමිනා වුත්තනයේන)** මේ කියනලද ක්‍රමයෙන් **චිත්තවිභත්ති** චිත්තවිභත්ති කාණ්ඩය ද **රූපකණ්ඩ** රූපකාණ්ඩය ද **නික්ඛේපෝ** නික්ෂේප කාණ්ඩය ද **අත්ථජෝතනා** අර්ථයන් ප්‍රකාශ කරන්නා වූ අර්ථකථා කාණ්ඩය ද **ඒතං ඨානං** මේ ස්ථානය **ගම්භීරං** ගැඹුරු වෙයි **නිපුණං** සියුම් වෙයි **තම්පි (ඨානං)** ඒ ස්ථානය ද **බුද්ධේන** සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් **දේසිතා** දේශනා කර වදාරණ ලද්දේයි.

(පි-ශබ්දය වනාහි කියනු ලබන්නා වූඅර්ථය අපේක්ෂා කෙරෙයි. ධම්මසඞ්ගණී ප්‍රකරණ මාත්‍රයක් නොව විභඞ්ග ප්‍රකරණය ද භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේම යයි කී නියායි)

**තදනන්තරං** ඒ දම්සඟුණු පවුරුණට අනතුරුව (**දේසිතං** දේශනාකර වදරණ ලද්ද වූ ප්‍රකරණතෙමේ) **විභඞ්ගප්පකරණං නාම** විභඞ්ග ප්‍රකරණ නම් වේ **තං** ඒ විභඞ්ග ප්‍රකරණය **ඛන්ධවිභඞ්ගෝ** ස්කන්ධවිභඞ්ගය -පෙ- **ධම්මහදයවිභඞ්ගෝ ඉති** ධම්මහදයවිභඞ්ගය දැයි **අට්ඨාරසවිධේන** අටළොස් ප්‍රකාරයකින් **විභත්තං** බෙදන ලද්දේයි **තත්‍ථ** ඒ අටළොස් විභඞ්ගයන් අතුරෙන් **ඛන්ධවිභඞ්ගෝ** ස්කන්ධවිභඞ්ගය **සුත්තන්තභාජනියඅභිධම්මභාජනියපඤ්හපුච්ඡකනයානං වසේන** සූත්‍රාන්තභාජනීය අභිධර්මභාජනීය ප්‍රශ්නපුච්ඡකනය යන මොහුන්ගේ වශයෙන් **තිධා විභත්තෝ** ත්‍රිවිධාකාරයකින් බෙදන ලද්දේයි **සෝ** ඒ ඛන්ධවිභඞ්ග තෙමේ **වාචනාමග්ගතෝ** සැරියුත් මහතෙරුන්ගේ වාචනාමාර්ග වශයෙන් **පඤ්චභාණවාරමත්තෝ හෝති** පස්බණවරක් පමණ ඇත්තේ වෙයි **විත්ථාරියමානෝ පන** විස්තර කරණු ලබනුයේ වනාහි **අනන්තෝ** කෙළවරක් නැත්තේ **අපරිමාණෝ හෝති** ප්‍රමාණරහිත වූයේ වෙයි **තතෝපරං** ඒ ඛන්ධවිභඞ්ගයෙන් මත්තෙහි **ආයතනවිභඞ්ගාදයෝපි** ආයතනවිභඞ්ග ආදීහුද **ඒතේහේව තීහි නයේහි** මේ තුන් ක්‍රමයෙන්ම **විභත්තා** බෙදන ලද්දහුය **තේසු** ඒ ආයතනවිභඞ්ගාදි අතුරෙන් **ආයතනවිභඞ්ගෝ** ආයතනවිභඞ්ග තෙමේ **වාචනාමග්ගතෝ** සැරියුත් මහතෙරුන්ගේ වාචනාමාර්ග වශයෙන් **අතිරේකභාණවාරමත්තෝ හෝති** මඳක් අධිකවූ බණවරක් පමණ ඇත්තේ වෙයි **ධාතුවිභඞ්ගෝ** ධාතුවිභඞ්ග තෙමේ **ද්විභාණවාරමත්තෝ හෝති** බණවර දෙකක් පමණ ඇත්තේ වෙයි **සච්චවිභඞ්ගෝ** සච්චවිභඞ්ග තෙමේ **තථා ද්විභාණවාරමත්තෝ හෝති** එසේම බණවර දෙකක් පමණ ඇත්තේ වෙයි **ඉන්ද්‍රියවිභඞ්ගේ** ඉන්ද්‍රියවිභඞ්ගයෙහි **සුත්තන්තභාජනියං නත්‍ථි** සූත්‍රාන්තභාජනීයක් නැත්තේය **පන** ඒ ඉන්ද්‍රියවිභඞ්ගයෙහි විශේෂ කවරේ ද? **ඒසෝ ඉන්ද්‍රියවිභඞ්ගෝ** මේ ඉන්ද්‍රියවිභඞ්ග තෙමේ **වාචනාමග්ගතෝ** සැරියුත් තෙරුන්ගේ වාචනාමාර්ගයෙන් **අතිරේකභාණවාරමත්තෝ හෝති** මඳක් අධිකවූ බණවරක් පමණ ඇත්තේ වෙයි

**පච්චයාකාරවිභඞ්ගේ** පටිච්චසමුප්පාද විභඞ්ග තෙමේ **ඡමත්තභාණවාරෝ හෝති** බණවර සයක් පමණ ඇත්තේ වෙයි **පන** ඒ පටිච්චසමුප්පාද විභඞ්ගයෙහි විශේෂ කවරේ ද? **එත්ථ** මේ පටිච්චසමුප්පාද විභඞ්ගයෙහි **පඤ්හපුච්ඡකං නත්ථි** ප්‍රශ්නපුච්ඡක ක්‍රමය නැත්තේයි **සතිපට්ඨානවිභඞ්ගෝ** සතිපට්ඨානවිභඞ්ග තෙමේ **අතිරේකභාණවාරමත්තෝ හෝති** මඳක් අධිකවූ බණවරක් පමණ ඇත්තේ වෙයි **සම්මප්පධාන-ඉද්ධිපාද-බොජ්ඣඞ්ග-මග්ගවිභඞ්ගා** සම්මප්පධානවිභඞ්ගය ඉද්ධිපාදවිභඞ්ගය බොජ්ඣඞ්ගවිභඞ්ගය මග්ගවිභඞ්ගය යන මේ සතරදෙන **තථා (අතිරේකභාණවාරමත්තා හොන්ති)** එසේම මඳක් අධිකව බණවරක් පමණ ඇත්තාහු වෙත් **ඣානවිභඞ්ගෝ** ඣානවිභඞ්ග තෙමේ **ද්විභාණවාරමත්තෝ හෝති** බණවර දෙකක් පමණ ඇත්තේ වෙයි **අප්පමඤ්ඤවිභඞ්ගෝ** අප්පමඤ්ඤවිභඞ්ග තෙමේ **අතිරේකභාණවාරමත්තෝ හෝති** මඳක් අධිකවූ බණවරක් පමණ ඇත්තේ වෙයි **සික්ඛාපදවිභඞ්ගේපි** ශික්ෂාපදවිභඞ්ගයෙහි ද **සුත්තන්තභාජනියං නත්ථි** සූත්‍රාන්තභාජනිය නැත්තේයි **පන** ඒ ශික්ෂාපදවිභඞ්ගයෙහි විශේෂ කිම? **ඒසෝ (සික්ඛාපදවිභඞ්ගෝ)** මේ ශික්ෂාපදවිභඞ්ග තෙමේ **වාචනාමග්ගතෝ** සැරියුත් මහතෙරුන්ගේ වාචනාමාර්ග වශයෙන් **අතිරේකභාණවාරමත්තෝ හෝති** මඳක් අධික බණවරක් පමණ ඇත්තේ වෙයි **පටිසම්භිදවිභඞ්ගෝ** පටිසම්භිදවිභඞ්ග තෙමේ **තථා (අතිරේකභාණවාරමත්තෝ හෝති)** එපරිද්දෙන්ම මඳක් අධිකවූ බණවරක් පමණ ඇත්තේ වෙයි **ඤාණවිභඞ්ගෝ** ඤාණවිභඞ්ගය **දසවිධේන** දශ ප්‍රකාරයෙකින් **විභත්තෝ** බෙදන ලද්දේයි **ඒසෝ (ඤාණවිභඞ්ගෝ)** මේ ඤාණවිභඞ්ග තෙමේ **වාචනාමග්ගතෝ පන** සැරියුත් මහතෙරුන්ගේ වාචනාමාර්ග වශයෙන් වනාහි **තිභාණවාරමත්තෝ හෝති** තුන් බණවරක් පමණ ඇත්තේ වෙයි **ඛුද්දකවත්ථුවිභඞ්ගෝපි** ඛුද්දකවත්ථුවිභඞ්ගය ද **දසවිධේන විභත්තෝ** දශ ප්‍රකාරයෙකින් බෙදන ලද්දේයි **පන** ඒ ඛුද්දකවත්ථුවිභඞ්ගයෙහි විශේෂ කිම? **ඒසෝ (ඛුද්දකවත්ථුවිභඞ්ගෝ)** මේ ඛුද්දකවත්ථුවිභඞ්ග තෙමේ **වාචනාමග්ගතෝ** සැරියුත් මහතෙරුන්ගේ වාචනාමාර්ග වශයෙන් **තිභාණවාරමත්තෝ හෝති** තුන් බණවරක් පමණ ඇත්තේ වෙයි **ධම්මහදයවිභඞ්ගෝ** ධම්මහදයවිභඞ්ගය **තිවිධේනේව** තුන් ප්‍රකාරයකින්ම **විභත්තෝ** බෙදන ලද්දේයි **පන** ඒ ධම්මහදයවිභඞ්ගයෙහි විශේෂ කිම? **ඒසෝ (ධම්මහදයවිභඞ්ගෝ)** මේ ධම්මහදයවිභඞ්ග තෙමේ **වාචනාමග්ගතෝ** සැරියුත් මහතෙරුන්ගේ වාචනාමාර්ග වශයෙන් **අතිරේකද්විභාණවාරමත්තෝ හෝති** මඳක් අධිකවූ දෙබණවරක් පමණ ඇත්තේ වෙයි **සබ්බේපි** සියළුම විභඞ්ගයෝ ද **විත්ථාරියමානා** විස්තර කරණු ලබන්නාහු නම් **අනන්තා** කෙළවරක් නැත්තාහු **අපරිමාණා හොන්ති** ප්‍රමාණරහිත වූවාහු වෙත් **ඒවං (ඉමිනා වුත්තනයේන)** මේ කියනලද ක්‍රමයෙන් **ඒතං විභඞ්ගප්පකරණං** මේ විභඞ්ග ප්‍රකරණ තෙමේ **වාචනාමග්ගතෝ** සැරියුත් මහතෙරුන්ගේ වාචනාමාර්ග වශයෙන් **පඤ්චතිංසභාණවාරමත්තං හෝති** පන්තිස්බණවරක් පමණ ඇත්තේ වෙයි **විත්ථාරතෝ පන** විස්තර වශයෙන් වනාහි **අනන්තං** කෙළවරක් නැත්තේ **අපරිමාණං හෝති** ප්‍රමාණරහිත වූයේ වෙයි.෴

**තදනන්තරං** ඊට අනතුරුව (**දේසිතං** දේශනා කරණ ලද්දවූ ප්‍රකරණ තෙමේ) **ධාතුකථාපකරණං නාම** ධාතුකථා ප්‍රකරණ නම් වෙයි (හෙවත්) **ධාතුකථාපකරණං** ධාතුකථා ප්‍රකරණය **දේසිතං** දේශනා කරණ ලද්දේය **තං** ඒ ධාතුකථා ප්‍රකරණය **සඞ්ගහෝ** -පෙ- **අසඞ්ගහිතන්ති** අසඞ්ගහිතං යනුවෙන් **චුද්දසවිධේන** තුදුස් ප්‍රකාරයකින් **විභත්තං** බෙදන ලද්දේයි **තං** ඒ ධාතුකථා ප්‍රකරණ තෙමේ **වාචනාමග්ගතෝ** ශාරිපුත්‍රස්ථවිරයන්ගේ වාචනාමාර්ග වශයෙන්

**අතිරේකඡභාණවාරමත්තං හෝති** අධිකයක් සහිත බණවර සයක් පමණ වෙයි **විත්ථාරියමානං පන** විස්තර කරණු ලබන්නේ වනාහි **අනන්තං** කෙළවරක් නැත්තේ **අපරිමාණං හෝති** ප්‍රමාණරහිත වෙයි.

**තදනන්තරං** ඒ ධාතුකථා ප්‍රකරණයට අනතුරුව (**දේසිතං** දේශනා කර වදාරණ ලද්දවූ ප්‍රකරණ තෙමේ) **පුග්ගලපඤ්ඤත්ති නාම** පුග්ගලපඤ්ඤත්ති ප්‍රකරණ නම් වෙයි **සා** ඒ පුග්ගලපඤ්ඤත්ති තොමෝ **ඛන්ධපඤ්ඤත්ති** ඛන්ධපඤ්ඤත්තිය -පෙ- **පුග්ගලපඤ්ඤත්තීති** පුග්ගලපඤ්ඤත්ති යයි **ඡබ්බිධේන විභත්තා** සයාකාරයකින්ම බෙදන ලද්දීය **සා** පුග්ගලපඤ්ඤත්ති තොමෝ **වාචනාමග්ගතෝ** සැරියුත් තෙරුන්ගේ වාචනාමාර්ග වශයෙන් **අතිරේකපඤ්චභාණවාරමත්තා හෝති** අධිකයක් සහිත වූ බණවර පසක් පමණ වෙයි **විත්ථාරියමානා පන** විස්තර කරණු ලබන්නී නම් වනාහි **අනන්තා** කෙළවරක් නැත්තී **අපරිමාණාව හෝති** ප්‍රමාණරහිතම වන්නීය.

**තදනන්තරං** ඒ පුග්ගලපඤ්ඤත්ති ප්‍රකරණයට අනතුරු තන්හි (**දේසිතං** දේශනා කර වදාරණ ලද්දවූ ප්‍රකරණ තෙමේ) **කථාවත්ථුප්පකරණං නාම** කථාවස්තු ප්‍රකරණ නම් වෙයි **තං** ඒ ප්‍රකරණය **සකවාදේ** විභජ්ජවාදයෙහි **පඤ්චසුත්තසතානි** පන්සියයක් සූත්‍රයෝ ද **පරවාදේ** විතණ්ඩවාදයෙහි **පඤ්චසුත්තසතානීති** පන්සියයක් සූත්‍රයෝ දැයි **සුත්තසහස්සං සමෝධානෙත්වා** සූත්‍ර දහසක් රැස්කොට **විභත්තං** බෙදන ලද්දේයි **තං** ඒ ප්‍රකරණ තෙමේ **වාචනාමග්ගතෝ** මොග්ගලීපුත්තතිස්ස ස්ථවිරයන්ගේ වාචනාමාර්ග වශයෙන් **ඉදනි** වර්තමාන කාලයෙහි **පොත්ථකේ ලිඛිතං** පොත්හි ලියන ලද්දවූ පාළිය **අගහෙත්වා** නොගෙන **සඞ්ගීති ආරෝපිතනයේන** සිව්පිළිසිඹියාපත් මහරහත් දහසක් දෙනා විසින් සඞ්ගායනාවට නඟනලද ක්‍රමයෙන් **දීඝනිකායප්පමාණං හෝති** දික්සඟිය පමණ වෙයි **විත්ථාරියමානං පන** විස්තර කරණු ලබන්නේ නම් වනාහි **අනන්තං** කෙළවර නැත්තේ **අපරිමාණං හෝති** ප්‍රමාණරහිත වූයේ වෙයි.

**තදනන්තරං** ඊට අනතුරුව (හෙවත් අනතුරු තන්හි **දේසිතං** දේශනා කරණ ලද්දවූ ප්‍රකරණ තෙමේ) **යමකප්පකරණං නාම හෝති** යමක ප්‍රකරණ නම් වෙයි **තං** ඒ යමක ප්‍රකරණය **මූලයමකං** මූලයමකං -පෙ- **ඉන්ද්‍රියයමකන්ති** ඉන්ද්‍රියයමකය දැයි **දසවිධේන** දශ ප්‍රකාරයකින් **විභත්තං** බෙදන ලද්දේයි **තං** ඒ යමක ප්‍රකරණ තෙමේ **වාචනාමග්ගතෝ** සැරියුත් මහතෙරුන්ගේ වාචනාමාර්ග වශයෙන් **වීසභාණවාරසතං හෝති** එකසියවිසි බණවරක් පමණ වෙයි **විත්ථාරියමානං පන** විස්තර කරණු ලබන්නේ නම් වනාහි **අනන්තං අපරිමාණං හෝති** අනතාපරිමාණ වන්නේයි.

**තදනන්තරං** ඊට අනතුරු තන්හි හෙවත් ඒ යමක ප්‍රකරණයට අනතුරු තන්හි (**දේසිතං** දේශනා කර වදාරණ ලද්දවූ ප්‍රකරණ තෙමේ) **මහාපකරණං නාම** මහාප්‍රකරණ නම් වෙයි **පට්ඨානන්ති නාමම්පි** පට්ඨාන යන නාමය ද **තස්සේව** ඒ මහාප්‍රකරණයාගේ **නාමං** නමෙකි **තං** ඒ මහාප්‍රකරණය **හේතුපච්චයෝ** -පෙ- **අවිගතපච්චයෝති** අවිගත ප්‍රත්‍යයෙක් දැයි **පච්චයවසේන** ප්‍රත්‍යයන්ගේ වශයෙන් **තාව** පළමුකොට **චතුවීසතිවිධේන** සූවිසි ප්‍රකාරයකින් **විභත්තන්ති** බෙදන ලද්දේයයි (**වේදිතබ්බං** දතයුතුයි) "තාව" යනු වක්තව්‍යාන්තරාපේක්ෂක බැවින් "වේදිතබ්බං" යනු ආධ්‍යාහාර කොට අර්ථ කියයුතුයි.

(ප්‍රකරණ ප්‍රභේද ඇත්තා වූ යමක ප්‍රකරණයෙහි සන්නිට්ඨානසංසය අනුලෝම ප්‍රතිලෝමාදි වශයෙන් නොබෙද මූලයමකය ඛන්ධයමකය යනාදී වශයෙන් ප්‍රකරණ

වශයෙන් බෙදුවාක් මෙන් මේ පට්ඨාන ප්‍රකරණයෙහි ද "හේතුපච්චයෝ" යනාදි වශයෙන් නොබෙද තිකපට්ඨානය දුකපට්ඨානය යනාදි වශයෙන් නොබෙදිය යුත්තේ යැයි යන චෝද්‍ය සඳහා "ඉමස්මිං පන ඨානේ පට්ඨානං සමානේතබ්බං" යනාදිය කීහ)

**පන** තත් සම්බන්ධ වාක්‍යයක් දක්වමින් **ඉමස්මිං ඨානේ** මේ ස්ථානයෙහි **පට්ඨානං (චතුවීසතිපට්ඨානං)** මේ සූවිසි පට්ඨානප්‍රකරණය **සමානේතබ්බං** මොනවට එළවිය යුත්තේයි **හි** විස්තර කියම් **කුසලත්තිකාදයෝ** කුසලත්‍රිකය ආදී කොට ඇත්තාවූ **ද්වාවීසති** දෙවිසි ත්‍රිකපදයෝ තුමූ **තිකා නාම** ත්‍රිකයෝ නම් වෙත් **හේතුධම්මා** -පෙ- **සරණාධම්මාති** සරණධම්මා යන **ඉමේ දුකා** මේ දුකයෝ තුමූ **සතං දුකා** දුක සියය නම් වෙත් **අපරේහි** මෙයින් අන්‍යවූද **විජ්ජාභාගිනෝ ධම්මා** -පෙ- **අනුප්පාදේ ඤාණන්ති** අනුප්පාදේ ඤාණං යන **ද්වාචත්තාළීස** දෙසාළිස් දුකයෝ තුමූ **සුත්තන්තිකදුකා** නාම සෞත්‍රාන්තික දුකයෝ නම් වෙත් **තේසු** ඒ තිකදුකයන් අතුරෙන් **ද්වාවීසති තිකා** දෙවිසි ත්‍රිකයෝ ද **සතං දුකා** එක්සිය දුකයෝ ද **ඉති (අයං මාතිකා)** මේ මාතෘකා තොමෝ **ආහච්චභාසිතා** භාග්‍යවතුන් වහන්සේ විසින් ස්ථානකරණයන් ගටා දේශනා කරණ ලද්දවූ **ජිනවචනභූතා** සර්වඥවචන වූ **සබ්බඤ්ඤු බුද්ධේන** සර්වඥ වූ තථාගතයන් වහන්සේ විසින් **දේසිතා** දේශනා කරණ ලද්දවූ **සත්තන්නං පකරණානං** අභිධර්ම සප්ත ප්‍රකරණයන්ගේ **මාතිකා නාම** මාතෘකා නම් වන්නීය **අථ** එසේ දෙවිසි ත්‍රිකයන් හා එක්සිය දුකයන් ද තථාගතයන් වහන්සේ විසින් දේශනා කර වදරණ ලද කල්හි **අපරේ** මෙයින් අන්‍ය වූ **ද්වාචත්තාළීසසුත්තන්තිකදුකා** දෙසාළිස් සෞත්‍රාන්තික දුකයෝ තුමූ **කුතෝ පභවා?** කොතනින් හටගත්තාහු ද යත්? (හෙවත්) කවරෙක් මුල්කොට ඇත්තාහු ද යත්? **කේන ඨපිතා?** කවරෙකු විසින් තබනලද්දහු ද? **කේන දේසිතා?** කවරෙකු විසින් දේශනාකරණ ලද්දහු ද යත්? ඉති (**අයං** මේ වනාහි **පුච්ඡා** ප්‍රශ්නයයි) **ධම්මසේනාපතිසාරිපුත්තත්ථේරප්පභවා** දම්සෙනවි සැරියුත් මහතෙරුන් මුල්කොට ඇත්තාහුය **තේන** ඒ සැරියුත් මහාතෙරුන් විසින් තබනලද්දහුය **තේන** ඒ සැරියුත් මහාතෙරුන් විසින් **දේසිතා** දේශනාකරණ ලද්දහුය **ඉති** (**අයං** මේ වනාහි **පරිහාරෝ** ඒ ප්‍රශ්නයට පරිහාරයි) **ථේරෝ** සැරියුත් මහතෙරුන් වහන්සේ **ඉමේ** මේ දෙසාළිස් සෞත්‍රාන්තික දුකයන් **ඨපෙන්තෝ පන** තබනුයේ වනාහි **සාමුක්කංසිකේන** තුමූම උත්කර්ෂ වූ (හෙවත් අතිශයින් උත්කෘෂ්ට වූ) **අත්තනෝ ඤාණේන** තමන් වහන්සේගේ නුවණ කරණකොටගෙන **න ඨපේසි** නොතැබුයේයි **පන** එසේ නොවීනම් කෙසේවිද යත්? **ඒකුත්තරියං** අඞ්ගුත්තර නිකායෙහි **ඒකනිපාත දුකනිපාත** ඒකනිපාත දුකනිපාතයන්ගෙන් හා **සඞ්ගීතිදසුත්තරසුත්තන්තේහි** දික්සඟියෙහි සඞ්ගීති දසුත්තර සූත්‍රාන්තයන්ගෙන් **සමෝධානෙත්වා** රැස්කොටගෙන **ආභිධම්මිකථේරානං** විජම්පෙල දරන්නාවූ භික්ෂූන්ට **සුත්තන්තං පත්වා** සූත්‍රාන්තයට පැමිණ **අකිලමනත්ථං** ක්ලාන්ත නොවන පිණිස (හෙවත් නොවෙහෙසෙනු පිණිස) **ඨපිතා** තබනලද්දහුය **පන** තත් සම්බන්ධ වාක්‍යයක් දක්වම් **තේ ඒතේ** ඒ ත්‍රිකදුකයෝ **ඒකස්මිං නික්ඛේපකණ්ඩේයේව** එකම නික්ෂේපකාණ්ඩයෙහිම **මත්ථකං පාපෙත්වා** නිෂ්ටාවට පමුණුවා **විභත්තා** බෙදන ලද්දහුය **සේසට්ඨානේසු** නික්ෂේප කාණ්ඩයෙන් අවශිෂ්ට වූ අභිධර්ම දේශනාවෙහි **යාව සරණදුකා** සරණදුකය තෙක් **අභිධම්මෝ විභත්තෝ** අභිධර්මය බෙදන ලද්දේයි **හි** ඒ එසේමැයි **සම්මාසම්බුද්ධේන** සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් **අනුලෝමපට්ඨානේ** අනුලෝමපට්ඨානයෙහි **ද්වාවීසතිතිකේ නිස්සාය** දෙවිසි ත්‍රිකයන් නිසා **තිකපට්ඨානං නාම නිද්දිට්ඨං** තික නම් වූ පට්ඨානයක් ප්‍රකාශ කරනලදි **සතං දුකේ නිස්සාය** දුක සියය නිසා **දුකපට්ඨානං නාම නිද්දිට්ඨං** දුක නම් පට්ඨානයක් ප්‍රකාශ කරනලදි **තතෝපරං** ඒ දුකපට්ඨානයෙන්

මත්තෙහි **ද්වාවීසතිතිකේ ගහෙත්වා** දෙවිසි ත්‍රිකයන් ගෙන **දුකසතේ පක්ඛිපිත්වා** දුකසියයෙහි ප්‍රක්ෂේප කොට (බහා) **දුකතිකපට්ඨානං නාම දස්සිතං** දුකතික නම් පට්ඨානයෙක් දක්වන ලද්දේයි **තතෝ** ඒ දුකතික පට්ඨානයෙන් මත්තෙහි **දුකසතං ගහෙත්වා** දුක සියය ගෙන **ද්වාවීසතියා තිකේසු** දෙවිසි ත්‍රිකයෙහිම **පක්ඛිපිත්වා** බහා **තිකදුකපට්ඨානං නාම දස්සිතං** තිකදුක නම් පට්ඨානයෙක් දක්වන ලද්දේයි **පන** තවද **තිකේ** ත්‍රිකයන් **තිකේසු යේව** ත්‍රිකයන්හිම **පක්ඛිපිත්වා** බහා **තිකතිකපට්ඨානං නාම දස්සිතං** තිකතික නම් පට්ඨානයක් දක්නව ලද්දේයි **දුකේ ච** දුකයන් ද **දුකේසු යේව පක්ඛිපිත්වා** දුකයන්හිම බහා **දුකදුකපට්ඨානං නාම දස්සිතං** දුකදුක නම් පට්ඨානයක් දක්වන ලද්දේයි **ඉති ඒවං (ඉමිනා වුත්තනයේන** මේ කියනලද ක්‍රමයෙන්) **තිකං** -පෙ- **සුගම්භීරාති** සුගම්භීරා යනු (**ආචරියේන** ආචායර්‍යයන් විසින්) **වුත්තං** කියනලදි.෴

**උත්තමං** ප්‍රසිද්ධ වූ (හෙවත්) මෝහ විද්වංශනය කරන්නා වූ **වරං** ප්‍රාර්ථනීය වූ **තිකං පට්ඨානඤ්ච** තිකපට්ඨානයෙක් ද ("පට්ඨානං" යන්නෙහි නිග්ගහීත ලෝපයි) **දුකඤ්ච** දුකපට්ඨානයෙක් ද **දුකතිකඤ්චේව** දුකතිකපට්ඨානයෙක් ද **තිකදුකඤ්ච** තිකදුකපට්ඨානයෙක් ද **තිකතිකඤ්චේව** තිකතිකපට්ඨානයෙක් ද **දුකදුකඤ්ච ඉති** දුකදුකපට්ඨානයෙක් දැයි **අනුලෝමම්හි** අනුලෝම පට්ඨානයෙහි **සුගම්භීරා** අතිශයින් ගැඹුරු වූ **ඡ නයා** ෂඩ් නයක් (හෙවත්) ක්‍රමයෝ සය දෙනෙක් වෙතියි (**වේදිතබ්බා** දතයුත්තාහුය)

**පච්චනීයපට්ඨානේපි** පච්චනීය පට්ඨානයෙහි ද **ද්වාවීසතිතිකේ නිස්සාය** දෙවිසි තිකයන් නිශ්‍රය කොටගෙන **තිකපට්ඨානං නාම නිද්දිට්ඨං** තික නම් පට්ඨානයක් දක්වනලදි **දුකසතං නිස්සාය** දුක සියය නිසා **දුකපට්ඨානං නාම නිද්දිට්ඨං** දුක නම් පට්ඨානයක් දක්වනලදි **ද්වාවීසතිතිකේ** දෙවිසි ත්‍රිකයන් **දුකසතේ පක්ඛිපිත්වා** දුක සියයෙහි බහා **දුකතිකපට්ඨානං නාම නිද්දිට්ඨං** දුකතික නම් පට්ඨානයක් දක්වනලදි -පෙ- **දුකේ** දුකයන් **දුකේසු පක්ඛිපිත්වා** දුකයෙහි බහා **දුකදුකපට්ඨානං නාම නිද්දිට්ඨං** දුකදුක නම් පට්ඨානයක් දක්වන ලද්දෙයි **ඉති** මෙසේ **පච්චනීයේපි** පච්චනීය පට්ඨානයෙහි ද **ඡහි නයේහි** ක්‍රම සයෙකින් **පට්ඨානං නිද්දිට්ඨං** පට්ඨාන ප්‍රකරණය ප්‍රකාශකරණ ලද්දේයි **තේන** එහෙයින් **තිකඤ්ච පට්ඨාන** -පෙ- **සුගම්භීරාති** සුගම්භීරා යනු (**ආචරියේන** ආචායර්‍යයන් විසින්) **වුත්තං** කියනලද්දේයි **තතෝපරං** ඉන් මත්තෙහි **අනුලෝමපච්චනීයේපි** අනුලෝමපච්චනීය පට්ඨානයෙහි ද **ඒතේන උපායේන ඒව** මෙම ක්‍රමයෙන්ම **ඡ නයා** ක්‍රම සයක් දක්වන ලද්දාහුය **තේන** එහෙයින් **තිකඤ්ච** -පෙ- **සුගම්භීරාති** සුගම්භීරා යනු (**ආචරියෝ** අර්ථකථාචායර්‍ය තෙමේ) **ආහ** කීයේයි **තදනන්තරං** ඊට අනතුරු තන්හි **පච්චනීයානුලෝමේපි** පච්චනීයානුලෝම පට්ඨානයෙහි ද **ඒතේහේව ඡහි නයෙහි** මේ ක්‍රම සයෙන්ම **නිද්දිට්ඨං** ප්‍රකාශකරණ ලද්දේයි **තේන** එහෙයින් **තිකඤ්ච** -පෙ- **සුගම්භීරාති** සුගම්භීරා යනු (**ආචරියෝ** අර්ථකථාචායර්‍ය තෙමේ) **ආහ** කීයේයි **ඒවං (ඉමිනා වුත්තනයේන** මේ කියනලද ක්‍රමයෙන්) **අනුලොමේපි** අනුලෝම ක්‍රමයෙහි ද **ඡ පට්ඨානානි** පට්ඨානයෝ සදෙනෙක් ද **පටිලෝමේ** පටිලෝම ක්‍රමයෙහි **ඡ පට්ඨානානි** පට්ඨාන සයෙක් ද **අනුලෝමපච්චනීයේ** අනුලෝමපච්චනීය ක්‍රමයෙහි **ඡ පට්ඨානානි** පට්ඨාන සයෙක් ද **පච්චනීයානුලෝමේ** පච්චනීයානුලෝම ක්‍රමයෙහි ද **ඡ පට්ඨානානි** පට්ඨාන සයෙක් ද **ඉති** මෙසේ **චතුවීසතිසමන්තපට්ඨානසමෝධානං** සූවිසි සමන්ත පට්ඨාන ප්‍රකරණයාගේ රැස්කිරීමක් වූ **ඉදං පට්ඨානං** මේ පට්ඨාන තෙමේ **මහාපකරණං නාම** මහාප්‍රකරණ නමුදු වේ.෴

**[අර්ථශාලිනී අර්ථකථා සන්නය 25-43 පිටු]**

## කථාවත්ථුප්පකරණය බුද්ධභාෂිතයක් ද?

සම්මාසම්බුද්ධෝ හි සත්තප්පකරණානි දේසෙන්තෝ කථාවත්ථුං පත්වා යා ඒසා පුග්ගලවාරේ තාව චතූසු පඤ්හේසු ද්වින්නං පඤ්චකානං වසේන අට්ඨමුඛා වාදයුත්ති තං ආදිං කත්වා සබ්බකථාමග්ගේසු අසම්පුණ්ණභාණවාරමත්තාය පාළියා මාතිකං ඨපේසි. සා පනේසා "පුග්ගලෝ උපලබ්භති සච්චිකට්ඨපරමත්ථේනාති. ආමන්තා. යෝ සච්චිකට්ඨෝ පරමත්ථෝ තතෝ සෝ පුග්ගලෝ උපලබ්භති සච්චිකට්ඨපරමත්ථේනාති. නහේවං වත්තබ්බේ. ආජානාහි නිග්ගහං…පෙ…. පුග්ගලෝ නුපලබ්භති සච්චිකට්ඨපරමත්ථේනාති. ආමන්තා. යෝ සච්චිකට්ඨෝ පරමත්ථෝ තතෝ සෝ පුග්ගලෝ නුපලබ්භති සච්චිකට්ඨපරමත්ථේනාති. නහේවං වත්තබ්බේ. ආජානාහි නිග්ගහං…පෙ….. සබ්බත්ථ පුග්ගලෝ උපලබ්භති සබ්බත්ථ පුග්ගලෝ නුපලබ්භති, සබ්බදා පුග්ගලෝ උපලබ්භති සබ්බදා පුග්ගලෝ නුපලබ්භති, සබ්බේසු පුග්ගලෝ උපලබ්භති සබ්බේසු පුග්ගලෝ නුපලබ්භති සච්චිකට්ඨපරමත්ථේනා"ති (කථා. 15-16) ඒවං පඨමං වාදං නිස්සාය පඨමං නිග්ගහං, දුතියං නිස්සාය දුතියං …පෙ…. අට්ඨමං නිස්සාය අට්ඨමං නිග්ගහං දස්සෙන්තේන සත්ථාරා ඨපිතා. ඉමිනා නයේන සබ්බත්ථ මාතිකාඨපනං වේදිතබ්බං. තං පනේතං මාතිකං ඨපෙන්තෝ ඉමං දිස්වා ඨපේසි; මම පරිනිබ්බානතෝ අට්ඨාරසවස්සාධිකානං ද්වින්නං වස්සසතානං මත්ථකේ **මොග්ගලිපුත්තතිස්සත්ථේරෝ** නාම භික්ඛු භික්ඛුසහස්සමජ්ඣෙ නිසින්නෝ සකවාදේ පඤ්ච සුත්තසතානි පරවාදේ පඤ්චාති සුත්තසහස්සං සමෝධානෙත්වා දීඝනිකායප්පමාණං කථාවත්ථුප්පකරණං භාජෙස්සතීති.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා නිදාන කථා); ධම්මසඞ්ගණී අටුවා 03-04 පිටු (හේ.වි.මු); විභඞ්ගප්පකරණ අටුවා සන්නය 01/V පිට]**

**සම්මාසම්බුද්ධෝ** සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ **සත්තප්පකරණානි** සප්ත ප්‍රකරණයන් **දේසෙන්තෝ** දේශනා කරනුයේ (හෙවත්) දේශනා කරන කල්හි **කථාවත්ථුං පත්වා** දේශනා ක්‍රමයෙන් කථාවස්තු ප්‍රකරණයට බැස **පුග්ගලවාරේ** පුද්ගල වාරයෙහි **තාව** පළමු කොට **චතූසු පඤ්හේසු** සතර ප්‍රශ්නයෙහි **ද්වින්නං පඤ්චකානං වසේන** පඤ්චකයන් දෙදෙනාගේ වශයෙන් **අට්ඨමුඛා** අටවැදෑරුම් කාරණායෙකින් හටගැනීම් සඞ්ඛ්‍යාත වූ (නොහොත්) කාරණා අටකින් යුක්ත වූ **යා ඒසා වාදයුත්ති** යම් වාදයක්හුගේ යෙදීමෙක් **අත්ථි** ඇත්තේ වේද **තං (වාදයුත්තිං)** ඒ වාදයුත්තිය **ආදිං කත්වා** ආදියෙහි කොට **සබ්බකථාමග්ගේසු** සියළු කථා මාර්ගයෙහි **අසම්පුණ්ණ භාණවාරමත්තාය** අසම්පූර්ණ බණවරක් පමණ වූ **පාළියා** පෙළ කරණකොටගෙන **මාතිකං ඨපේසි** මාතෘකාව තබා වදළේයි.

("අට්ඨමුඛානි" යන තන්හි ආ-කාර ආදේශ කොට මුඛායයි සිටියි. "ධම්මාතිරේකධම්මවිසේසෝයේව අත්ථෝ" යන්නෙහි මෙන් විශේෂණ විශෙෂයන්ගේ විභත්ති විසදෘශත්වය වෙයි. "ගුණාපමාණං" යන්නෙහි මෙන් ලිඞ්ගයද විසදෘශ වෙයි. ඉදින් "උත්තරෝ මුඛෝ උත්තරා මුඛා උත්තරං මුඛං" යන්නෙහි මෙන් ම්ඛ ශබ්දය ත්‍රිලිඞ්ගික වන්නේ නම් මෙතන්හි ස්ත්‍රීලිඞ්ග වශයෙන් ගෙන "අට්ඨමුඛායෝ අට්ඨමුඛා"යි පද සිද්ධ වේ නම් ලිඞ්ග විසදෘශ භාවය වෙයි. විභක්තිය ද විසදෘශ වෙයි. "අට්ඨපමාණානි ඒතිස්සාති අට්ඨපමාණා සා ඒව මුඛා අට්ඨමුඛා පුබ්බපදේ උත්තරපදලෝපෝ"යි මෙසේ කළ කල්හි පුල්ලිඞ්ගයෙහි වචන ද්වයම සමාන වෙයි.

එහෙයින් "අට්ඨමුඛා" යන ශබ්දයට අෂ්ට ප්‍රමාණ කාරණා සඞ්ඛ්‍යාත වූ යනුවෙන් අර්ථ දියයුතුයි. "මුඛසද්දෝ එත්ථ මුඛෝපායේසු වදනේ චාදිස්මිං මුඛමීරිතන්ති වුත්තේසු චතුසු අත්ථේසු උපායත්ථේ පවත්තතීති දට්ඨබ්බෝ" යනු ප්‍රකරණ වචනයි. මේ ප්‍රකරණ වචනානුසාරයෙන් අට්ඨමුඛ නම් වූ යම් වාදයක් වේද ඒ වාදයට හේතුභූත වූ කාරණායයි අර්ථ දියයුතුයි. අනුලෝමපච්චනික පඤ්චකයෙහි ආදි නිග්‍රහය ප්‍රකාශ කොට භාග්‍යවතුන් වහන්සේ විසින් තව්තිසා භවනයෙහි පඬුඇඹුල් සලස්නේ වැඩහිඳ දෙවියන්ට දේශනාකර වදාළා වූ මාතෘකාව පහළකරණු පිණිස "සා පනේසා" යනාදිය කීහ)

**පන** තවද **සා ඒසා (මාතිකා)** ඒ මාතෘකාව ("සත්ථාරා ඨපිතා" යන්නෙහි සම්බන්ධයි) **පුග්ගලෝ** ආත්මය (නොහොත්) සත්වයෙක් හෝ ජීවයෙක් **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍ය වූ අර්ථ ස්වභාවයෙන් හා නොපෙරලෙන්නා වූ උතුම් වූ අර්ථ ස්වභාවයෙන් ද **උපලබ්භති** නුවණින් කල්පණා කිරීමෙන් දතයුත්තේ දැයි **ඉති** මෙසේ **පුච්ඡති** සකවාදී තෙමේ විචාළේයි **ආමන්තා** එසේය! දතයුත්තේ යයි **ඉති** මෙසේ **පටිජානාති** (පරවාදී තෙමේ) පිළිගන්නේයි **යෝ සච්චකට්ඨෝ** යම් සත්‍ය වූ අර්ථ ස්වභාවෙක් ද **යෝ පරමත්ථෝ** යම් අවිපරීත වූ අර්ථ ස්වභාවෙක් ද **අත්ථි** ඇත්තේ වේද **තතෝ** ඒ සත්‍යාර්ථ පරමාර්ථයෙන් **අඤ්ඤෝ** අන්‍ය වූ **තදාධාරෝ** ඒ සත්‍යාර්ථ පරමාර්ථයම ආධාර කොට ඇත්තා වූ **සෝ පුග්ගලෝ** ඒ පුද්ගලයා **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ ස්වභාවය අවිපරීතාර්ථ ස්වභාවය යන දෙකින් **උපලබ්භති** නුවණින් දතයුත්තේ දැයි **ඉති පුච්ඡති** මෙසේ (සකවාදී තෙමේ) විචාරයි **ඒවං** මෙසේ **නහි වත්තබ්බේ (න වත්තබ්බෝ ඒව)** නොකිය යුත්තේමැයි **ඉති** මෙසේ **පටික්ඛිපති** (පරවාදී තෙමේ) ප්‍රතික්ෂේප කෙරෙයි **ත්වං** තෝ **නිග්ගහං** නිග්‍රහය **ආජානාහි** දනුව -පෙ- **ඉති** මෙසේ **නිග්ගහති** සකවාදී තෙමේ නිග්‍රහ කෙරෙයි (මේ වනාහි අනුලෝමපච්චනීක පඤ්චකයෙහි ආදි නිග්‍රහයයි නොහොත් පළමුවන නිග්‍රහයයි) **පුග්ගලෝ** ආත්මය **සච්චකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් **නූපලබ්භති** නුවණින් නොදතයුත්තේ දැයි **ඉති** මෙසේ **පුච්ඡති** පරවාදී තෙමේ විචාරයි **ආමන්තා** එසේය! නුවණින් නොදතයුත්තේ යයි **ඉති** මෙසේ **පටිජානාති** සකවාදි තෙමේ පිළිගනී **යෝ සච්චිකට්ඨෝ අත්ථි** යම් සත්‍යාර්ථයක් ඇත්තේ වේද **යෝ පරමත්ථෝ අත්ථි** යම් අවිපරීතාර්ථයෙක් ඇත්තේ වේද **තතෝ** ඒ සත්‍යාර්ථ පරමාර්ථයෙන් **අඤ්ඤෝ** අන්‍ය වූ **තදාධාරෝ** ඒ සත්‍යාර්ථ පරමාර්ථයම ආධාර කොට ඇත්තා වූ **සෝ පුග්ගලෝ** ඒ ආත්මය **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ පරමාර්ථයෙන් **නූපලබ්භති** නුවණින් නොදතයුත්තේ දැයි **ඉති** මෙසේ **පුච්ඡති** පරවාදි තෙමේ පෙරළා විචාරයි **ඒවං** මෙසේ **නහි වත්තබ්බේ (න වත්තබ්බෝ ඒව)** නොකිවයුත්තේමැයි **ඉති** මෙසේ **පටික්ඛිපති** සකවාදි තෙමේ ප්‍රතික්ෂේප කෙරෙයි **ත්වං** තෝ **නිග්ගහං** නිග්‍රහය **ආජානාහි** දනුව -පෙ- **ඉති** මෙසේ **නිග්ගහති** පරවාදි තෙමේ නිග්‍රහ කෙරෙයි ("තේ සච්චිකට්ඨපරමත්ථෝ ආධාරෝ යස්ස සෝ තදාධාරෝ"යි) විග්‍රහ කටයුතුයි. මේ වනාහි පච්චනීයානුලෝම පඤ්චකයෙහි පළමුවන නිග්‍රහයයි. ("වත්තබ්බේ" යන තන්හි "ක්වචේවා" යන මුගලන් සූත්‍රයෙන් හෝ "තිලිඞ්ගතෝ ඨානේසියෝනමේ" යන ශබ්දනීති සූත්‍රයෙන් හෝ ප්‍රථමා සි-විභක්තියට ඒ-කාරාදේශ කොට මේ පදය සිද්ධ කරනු)

**සබ්බත්ථ** සියළු ශරීරයෙහි **පුග්ගලෝ** ආත්මය **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ අවිපරීතාර්ථ වශයෙන් **උපලබ්භති** නුවණින් දතයුත්තේ ද යත්? **සබ්බත්ථ** සියළු ශරීරයෙහි **පුග්ගලෝ** ආත්මය **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ අවිපරීතාර්ථ වශයෙන් **නූපලබ්භති** නුවණින් නොදතයුත්තේ ද යත්? **සබ්බදා** හැමකල්හිම **පුග්ගලෝ**

ආත්මය **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ අවිපරීතාර්ථ වශයෙන් **උපලබ්භති** නුවණින් දතයුත්තේ ද යත්? **සබ්බදා** හැමකල්හි **පුග්ගලෝ** ආත්මය **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ අවිපරීතාර්ථ වශයෙන් **නූපලබ්භති** නුවණින් නොදතයුත්තේ ද යත්? **සබ්බේසු** සියළු ස්කන්ධායතන ධාතූන් කෙරෙහි **පුග්ගලෝ** ආත්මය **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ අවිපරීතාර්ථ වශයෙන් **උපලබ්භති** නුවණින් දතයුත්තේ ද යත්? **සබ්බේසු** සියළු ස්කන්ධායතන ධාතූන් කෙරෙහි **පුග්ගලෝ** ආත්මයක් **සච්චිකට්ඨපරමත්ථේන** සත්‍යාර්ථ අවිපරීතාර්ථ වශයෙන් **නූපලබ්භති** නුවණින් නොදතයුත්තේ ද යත්? **ඉති** මෙසේ **පුච්ඡති** විචාරයි **ඒවං** මේ කියනලද නයින් **පඨමං වාදං නිස්සාය** පළමුවන වාදය නිශ්‍රය කොටගෙන **පඨමං නිග්ගහං** පළමුවන නිග්‍රහය ද **දුතියං වාදං නිස්සාය** දෙවෙනි වාදය නිශ්‍රය කොටගෙන **දුතියං නිග්ගහං** දෙවෙනි නිග්‍රහය ද **තතියං** -පෙ- **චතුත්ථං** -පෙ- **පඤ්චමං** -පෙ- **ඡට්ඨං** -පෙ- **සත්තමං** -පෙ- **අට්ඨමං වාදං නිස්සාය** අටවෙනි වාදය නිශ්‍රය කොටගෙන **අට්ඨමං නිග්ගහං** අටවෙනි නිග්‍රහය ද **දස්සෙන්තේන** දක්වනු කැමති වූ **සත්ථාරා** ශාස්තෘන් වහන්සේ විසින් **ඨපිතා** තබා වදරණ ලද්දීය.

(පුද්ගලවාරයෙහි නය ප්‍රකාශකොට මාතෘකා ඨපනය මෙසේ අවබෝධ කොට පුද්ගලවාරයෙන් අන්‍ය වූ සියළු වාරයෙහි නය දැක්වීම පිණිස "ඉමිනා නයේන" යනාදිය කීහ) **ඉමිනා නයේන** මෙසේ පුද්ගලවාරයෙහි දක්වනලද ක්‍රමයෙන් **සබ්බත්ථ** සියළු වාරයෙහි **මාතිකාඨපනං** මාතෘකාව තැබීම **වේදිතබ්බං** දතයුත්තේයි (භාග්‍යවත් වූ සර්වඥයන් වහන්සේ විසින් මේ මාතෘකාව තබනලද්දේ යැයි අර්ථකථාචාර්‍ය්‍යයන් වහන්සේලා විසින් කියනලදි. ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් මාතෘකා මාත්‍රයක් තබනලද්දේ වී නම් ඒ මාතෘකාව පමණක් බුද්ධභාෂිත නම් වෙයි. විතණ්ඩවාදීන් කී පරිද්දෙන් නිද්දේශවාරය ශ්‍රාවකභාෂිත නම් නොවිය යුත්තේ දැයි යන චෝද්‍ය සඳහා "තං පනේතං" යනාදිය කීහ) **පන** තවද **තං ඒතං (මාතිකං)** ඒ මාතෘකාව **ඨපෙන්තෝ** තබා වදරන්නා වූ (**සම්බුද්ධෝ** සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ) **ආයතිං** අනාගත කාලයෙහි **භාජනසඞ්ඛාතං** බෙදීමට කාරණා වූ හෙයින් භාජනයයි කියනලද්ද වූ **(ඉමං) කාරණං** මේ කාරණය **දිස්වාව** දැක වදරාම **ඨපේසි** තබා වදළේයි **මම පරිනිබ්බාණතෝ** මගේ පිරිනිවීමෙන් **අට්ඨාරසවස්සාධිකානං** අටළොස් වර්ෂයක් අධික කොට ඇත්තා වූ **ද්වින්නං වස්සසතානං මත්තකේ** අවුරුදු දෙසීයක්හුගේ මස්තකයෙහි **මොග්ගලිපුත්තතිස්සථේරෝ නාම භික්ඛු** මොග්ගලිපුත්තතිස්ස නම් ස්ථවිර භික්ෂුවක් තෙමේ **භික්ඛු සහස්සමජ්ඣෙ** දහසක් භික්ෂූන්ගේ මධ්‍යයෙහි **නිසින්නෝ** වැඩහුන්නේ **සකවාදේ** සකවාද සඞ්ඛ්‍යාත වූ විභජ්ජවාද පක්‍ෂයෙහි (නොහොත්) ථේරියවාද පක්‍ෂයෙහි **පඤ්චසුත්තසතානි** පන්සියයක් සූත්‍රයෝ ද **පරවාදේ** ශාසන ප්‍රතිපක්‍ෂ වූ විතණ්ඩවාද සඞ්ඛ්‍යාත වූ මිත්‍යාවාද පක්‍ෂයෙහි **පඤ්චසුත්තසතානි** පන්සියයක් සූත්‍රයෝ දැයි **ඉති** මෙසේ **සුත්තසහස්සං සමෝධානෙත්වා** සූත්‍ර දහසක් එක්රැස්කොටගෙන **දීඝනිකායප්පමාණං** දික්සඟිය පමණ වූ **කථාවත්ථුප්පකරණං** කථාවස්තු ප්‍රකරණය **භාජෙස්සති** බෙද වදරන්නේ යයි **ඉති (ඉදං කාරණං)** මෙසේ මේ කාරණය **දිස්වාව** දැකවදරාම **ඨපේසි** මාතෘකාව තබා වදළේයි. **[අර්ථශාලිනී අර්ථකථා සන්නය 26-29 පිටු]**

යමකපාටිහීරාවසානස්මිඤ්හි භගවා තිදසපුරේ පාරිච්ඡත්තකමූලේ පණ්ඩුකම්බලසිලායං වස්සං උපගන්ත්වා මාතරං කායසක්ඛිං කත්වා දේවපරිසාය අභිධම්මකථං කථෙන්තෝ ධම්මසඞ්ගණීවිභඞ්ගෝධාතුකථා පුග්ගලපඤ්ඤත්තිප්පකරණානි දේසයිත්වා කථාවත්ථුදේසනාය වාරේ සම්පත්තේ

"අනාගතේ මම සාවකෝ මහාපඤ්ඤො **මොග්ගලිපුත්තතිස්සත්ථේරෝ** නාම උප්පන්නං සාසනමලං සෝධෙත්වා තතියසඞ්ගීතිං කරොන්තෝ භික්ඛුසඞ්ඝස්ස මජ්ඣෙ නිසින්නෝ සකවාදේ පඤ්ච සුත්තසතානි පරවාදේ පඤ්චාති සුත්තසහස්සං සමෝධානෙත්වා ඉමං පකරණං භාජෙස්සතී"ති තස්සෝකාසං කරොන්තෝ යා චේසා පුග්ගලවාදේ තාව චතූසු පඤ්හේසු ද්වින්නං පඤ්චකානං වසේන අට්ඨමුඛා වාදයුත්ති, තං ආදිං කත්වා සබ්බකථාමග්ගේසු අසම්පුණ්ණභාණවාරමත්තාය තන්තියා මාතිකං ඨපේසි. අථාවසේසං අභිධම්මකථං විත්ථාරනයේනේව කථෙත්වා වුත්ථවස්සෝ සුවණ්ණරජතසෝපානමජ්ඣෙ මණිමයේන සෝපානේන දේවලෝකතෝ සඞ්කස්සනගරේ ඕරුය්හ සත්තහිතං සම්පාදෙන්තෝ යාවතායුකං ඨත්වා අනුපාදිසේසාය නිබ්බානධාතුයා පරිනිබ්බායි.
**[පඤ්චප්පකරණ අටුවා (ඡට්ඨසඞ්ගායනා නිදානකථා යටතේ); පඤ්චප්පකරණ අටුවා 80 පිට (හේ.වි.මු)]**

## අභිධර්මය ලැබුණු ආකාරයඃ—

අනෝතත්තදහතීරේ නිසින්නෝ තං පරිභුඤ්ජිත්වා දිවාවිහාරාය චන්දනවනං ගච්ඡති. ධම්මසේනාපති සාරිපුත්තත්ථේරෝපි තත්ථ ගන්ත්වා සම්මාසම්බුද්ධස්ස වත්තං කත්වා ඒකමන්තං නිසීදති. අථස්ස සත්ථා නයං දේති. සාරිපුත්ත! එත්තකෝ ධම්මෝ මයා දේසිතෝති ආචික්ඛති. ඒවං සම්මාසම්බුද්ධේ නයං දෙන්තේ පටිසම්භිදප්පත්තස්ස අග්ගසාවකස්ස වේලන්තේ ඨත්වා හත්ථං පසාරෙත්වා දස්සිතසමුද්දසදිසං නයදානං හෝති. ථේරස්සාපි නයසතේන නයසහස්සේන නයසතසහස්සේන භගවතා දේසිතධම්මෝ උපට්ඨාතියේව. සත්ථා දිවාවිහාරං නිසීදිත්වා ධම්මං දේසේතුං කාය වේලාය ගච්ඡතීති? සාවත්ථිවාසීනං කුලපුත්තානං සම්පත්තානං ධම්මදේසනවේලා නාම අත්ථි, තාය වේලාය ගච්ඡති. ධම්මං දේසෙත්වා ගච්ඡන්තං වා ආගච්ඡන්තං වා කේ ජානන්ති කේ න ජානන්තීති? මහේසක්ඛා දේවතා ජානන්ති, අප්පේසක්ඛා දේවතා න ජානන්ති. කස්මා න ජානන්තීති? සම්මාසම්බුද්ධස්ස වා නිම්මිතබුද්ධස්ස වා රස්මිආදීසු නානත්තාභාවා. උභින්නම්පි හි තේසං රස්මීසු වා සරේසු වා වචනේසු වා නානත්තං නත්ථි.

**සාරිපුත්තත්ථේරෝපි** සත්ථාරා දේසිතං දේසිතං ධම්මං ආහරිත්වා අත්තනෝ සද්ධිවිහාරිකානං පඤ්චන්නං භික්ඛුසතානං දේසේසි. තේසං අයං පුබ්බයෝගෝ. තේ කිර කස්සපදසබලස්ස කාලේ ඛුද්දකවග්ගුලියෝනියං නිබ්බත්තා පබ්භාරේ ඕලම්බන්තා ද්වින්නං ආභිධම්මිකභික්ඛූනං අභිධම්මං සජ්ඣායන්තානං සරේ නිමිත්තං ගහෙත්වා කණ්හපක්ඛසුක්කපක්ඛේ අජානිත්වාපි සරේ නිමිත්තග්ගාහමත්තකේනේව කාලං කත්වා දේවලෝකේ නිබ්බත්තිංසු. ඒකං බුද්ධන්තරං දේවලෝකේ වසිත්වා තස්මිං කාලේ මනුස්සලෝකේ නිබ්බත්තා යමකපාටිහාරියේ පසීදිත්වා ථේරස්ස සන්තිකේ පබ්බජිංසු. ථේරෝ සත්ථාරා දේසිතං දේසිතං ධම්මං ආහරිත්වා තේසං දේසේසි. සම්මාසම්බුද්ධස්ස අභිධම්මදේසනාපරියෝසානඤ්ච තේසං භික්ඛූනං සත්තප්පකරණඋග්ගහණඤ්ච ඒකප්පහාරේනේව අහෝසි.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා නිදාන කථා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 13-14 පිටු (හේ.වි.මු); විභඞ්ගප්පකරණ අටුවා සන්නය 01/ XIV පිට]**

**ඒකප්පහාරේනා**ති එත්ථ **පහාරෝ**ති දිවසස්ස තතියෝ භාගෝ වුච්චති.
**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා නිදානකථාවණ්ණනා යටතේ)]**

(**භගවා** භාග්‍යවතුන් වහන්සේ) **අනෝතත්තදහතීරේ** අනවතප්ත විල් ඉවුරෙහි **නිසින්නෝ** වැඩහුන්නේ **තං** ඒ උතුරුකුරු දිවයිනෙන් එළවනලද පිණ්ඩපාතය **පරිභුඤ්ජිත්වා** වළඳ දිවාවිහාරාය දවල් වාසය පිණිස **චන්දනවනං ගච්ඡති** සඳුන් වනයට වඩනේයි **ධම්මසේනාපතිසාරිපුත්තත්ථේරෝපි** දම්සෙනෙවි සැරියුත් මහතෙරණුවෝ ද **තත්‍ථ ගන්ත්වා** ඒ සඳුන් වනයට ගොස් **සම්මාසම්බුද්ධස්ස** සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට **වත්තං කත්වා** වත් කොට **ඒකමන්තං නිසීදි** එකත්පසෙක හුන්නේය **අථ** ඉක්බිති **අස්ස** ඒ සැරියුත් මහතෙරුන්ට **සත්ථා** ශාස්තෲන් වහන්සේ **නයං දේති** ක්‍රමය දෙයි **සාරිපුත්ත** මපුතනු ශාරිපුත්‍රය! **එත්තකෝ ධම්මෝ** මෙපමණ ධර්මයක් තෙමේ **මයා** මා විසින් **දේසිතෝ ඉති** දෙසන ලද්දේ යැයි **ආචික්ඛති** ප්‍රකාශ කෙරෙයි **ඒවං** මෙසේ **සම්මාසම්බුද්ධේ** සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ **නයං දෙන්තේ** නයදනය කළ කල්හි **පටිසම්භිදප්පත්තස්ස** පිළිසිඹියාවට පැමිණියා වූ **අග්ගසාවකස්ස** අග්‍ර ශ්‍රාවකයන් වහන්සේට **වේලන්තේ ඨත්වා** වෙරළ සිටගෙන **හත්‍ථං පසාරෙත්වා** අත දිගු කොට **දස්සිතසමුද්දසදිසං** දක්වනලද සමුද්‍රයකට බඳුවූ **නයදනං හෝති** නයදනය වෙයි **ථෙරස්සපි** තෙරුන්ට ද **නයසතේන** ක්‍රම සියයකින් ද **නයසහස්සේන** ක්‍රම දහසකින් ද **භගවතා** භාග්‍යවතුන් වහන්සේ විසින් **දේසිතධම්මෝ** දෙසනලද ධර්ම තෙමේ **උපට්ඨාති යේව** වැටහේමැයි (හෙවත්) එළඹ සිටිනේමැයි **සත්ථා** ශාස්තෲන් වහන්සේ **දිවාවිහාරං නිසීදිත්වා** දිවා විහරණයට වැඩහිඳ (හෙවත්) දිවා විහරණය කොට **ධම්මං දේසේතුං** දහම් දෙසනු පිණිස **කාය වේලාය** කවර වේලාවෙක්හි **ගච්ඡති** තව්තිසා දෙව්ලෝ වඩනේදැයි **ඉති** (**අයං** මේ වනාහි **පුච්ඡා** ප්‍රශ්නයයි) **සාවත්ථිවාසීනං** සැවැත්නුවරවාසී වූ **සම්පත්තානං** දෙව්රමට රැස්ව ආවාවූ **කුලපුත්තානං** කුලපුත්‍රයන්ට **ධම්මදේසනවේලා නාම අත්‍ථි** දම්දෙසන වේලාවෙක් නම් ඇත්තේයි **තාය වේලාය** ඒ වෙලායෙහි **ගච්ඡති** තව්තිසා භවනයට වඩනේයි **ධම්මං දේසෙත්වා** ධර්ම දේශනා කොට **ගච්ඡන්තං වා** දෙව් ලෝ වඩනා වූ හෝ **ආගච්ඡන්තං වා** මනුෂ්‍ය ලෝකයට නැවත වඩනා වූ හෝ භාග්‍යවතුන් වහන්සේ **කේ ජානන්ති** කවරෙක් තුමූ දනිත් ද **කේ න ජානන්ති** කවර දෙවිකෙනෙක් තුමූ නොදනිත් ද **ඉති (අයං පුච්ඡා)** මේ වනාහි ප්‍රශ්නයයි **මහේසක්ඛා දේවතා ජානන්ති** මහානුභාව සම්පන්න දෙවියෝ දනිති **අප්පේසක්ඛා දේවතා** ස්වල්ප ආනුභාව ඇති දෙවියෝ **න ජානන්ති** නොදනිති **කස්මා න ජානන්ති?** කුමක් හෙයින් නොදනිද්ද? **ඉති (අයං පුච්ඡා)** මේ වනාහි ප්‍රශ්නයයි **සම්මාසම්බුද්ධස්ස වා** ප්‍රකෘති සර්වඥයන් වහන්සේගේ හෝ **නිම්මිතබුද්ධස්ස වා** නිර්මිත බුදුන්ගේ හෝ **රස්මිආදීසු** රශ්මි ආදියෙහි **නානත්තාභාවා** වෙනසක් නැති බැවින් **න ජානන්ති** නොදනිත් **හි** ඒ වචනය සැබෑමය **තේසං උභින්නම්පි** ඒ ප්‍රකෘති බුදුන්ය නිර්මිත බුදුන්ය යන දෙදෙනා වහන්සේගේම **රස්මීසු වා** ෂඩ්වර්ණ රශ්මියෙහි හෝ **සරේසු වා** අෂ්ටාඞ්ග ස්වරයෙහි හෝ **වචනේසු වා** කථාවෙහි හෝ **නානත්තං නත්‍ථි** වෙනසක් නැත්තේයි (දැන් වනාහි අභිධර්ම පිටකයෙහි වාචනාමාර්ගය දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්ගෙන් පහළ වූ බව දක්වනු පිණිස "සාරිපුත්තත්ථේරෝ" යනාදිය කීහ) **සාරිපුත්තත්ථේරෝපි** සැරියුත් මහතෙරුන් වහන්සේ ද **දේසිතං දේසිතං ධම්මං** දෙසන දෙසනලද ධර්මය **ආහරිත්වා** ගෙනවුත් **අත්තනෝ** තමන් වහන්සේගේ **සද්ධිවිහාරිකානං** උපාධ්‍යාය ග්‍රහණයෙන් ශිෂ්‍යවූ **පඤ්චන්නං භික්ඛුසතානං** පන්සියයක් භික්ෂූන්ට **දේසේසි** දේශනා කළේයි **තේසං** ඒ පන්සියයක් භික්ෂූන්ගේ **අයං** මේ මතු කියනු ලබන්නේ **පුබ්බයෝගෝ** පූර්වයෙහි කරණලද කුසලකර්ම විශේෂයයි **කිර** අසනුලැබූයේ මෙසේයි **තේ** ඒ පන්සියයක් භික්ෂූහු **කස්සපදසබලස්ස කාලේ** කසුප් බුදුන් සමයෙහි **ඛුද්දකවග්ගුලියෝනියං නිබ්බත්තා** කිරිවවුල් යෝනියෙහි හටගත්තාහු **පබ්භාරේ** ප්‍රාග්භාර වූ (නොහොත්) ඉදිරියට නැමුනා වූ පර්වතයෙක්හි **ඕලම්බන්තා** එල්බුනාහු

**අභිධම්මං** අභිධර්ම දේශනාව **සජ්ඣායන්තානං** සද්ධ්‍යායනා කරන්නා වූ **ද්වින්නං ආභිධම්මිකභික්ඛූනං** අභිධර්මය දරන්නා වූ භික්‍ෂූන් දෙදෙනෙකුන්ගේ **සරේ** සද්ධ්‍යායනා ස්වරයෙහි **නිමිත්තං ගහෙත්වා** ධර්මය යන අරමුණ ගෙන **කණ්හපක්ඛං වා** කුසලපක්‍ෂය හෝ (නොහොත්) ශුක්ලපක්‍ෂය හෝ **අජානිත්වාපි** නොදැන ද **සරේ** සද්ධ්‍යායනා ස්වරයෙහි **නිමිත්තග්ගාහමත්තකේනේව** ධර්මය යන අරමුණ ගත් පමණින්ම **කාලං කත්වා** කිරිවවුල් යෝනියෙන් චුතව **දේවලෝකේ නිබ්බත්තිංසු** දෙව්ලොව උපන්නාහුය **ඒකං බුද්ධන්තරං** බුදුවරයන් දෙදෙනෙකුගේ එක් අතරතුර කාලය මුළුල්ලෙහි **දේවලෝකේ** තව්තිසා දෙව්ලොව **වසිත්වා** වාසය කොට **තස්මිං කාලේ** ඒ අප බුදුන් උපන් කාලයෙහි **මනුස්සලෝකේ** මිනිස් ලොව **නිබ්බත්තා** හටගත්තාහු **යමකපාටිහාරියේ පසීදිත්වා** යමාමහා පෙළහරෙහි පැහැද **ථේරස්ස සන්තිකේ** සැරියුත් මහතෙරුන් සමීපයෙහි **පබ්බජිංසු** පැවිදි වූවාහුය **ථේරෝ** සැරියුත් මහතෙරුන් වහන්සේ **සත්ථාරා** ශාස්තෘන් වහන්සේ විසින් **දේසිතං දේසිතං ධම්මං** දෙසන දෙසන ලද ධර්මය **ආහරිත්වා** ගෙනවුත් **තේසං** ඒ කිරිවවුල් යෝනියෙන් චුතව දෙව්ලොව ඉපිද දෙව්ලොවින් සැව අවුත් දැන් මේ පැවිදි වූ භික්‍ෂූන්ට **දේසේසි** දේශනා කළේයි **සම්මාසම්බුද්ධස්ස** සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ **අභිධම්මදේසනා පරියෝසානඤ්ච** අභිධර්ම දේශනාව කෙළවරවීමද **තේසං භික්ඛූනං** ඒ භික්‍ෂූන්ගේ **සත්තප්පකරණ උග්ගහණඤ්ච** අභිධර්ම සප්තප්‍රකරණය උගෙන අවසන්වීම ද (පරියෝසාන ශබ්දය ලොප් වූ තැනි) **ඒකප්පහාරේනේව අහෝසි** එකපැහැරින්ම වූයේයි.

**[අර්ථශාලිනී අර්ථකථා සන්නය 56-58 පිටු]**

## අභිධර්මයට නිදානයක් නැත්තේ ද?

අථාපි ඒවං වදෙය්‍ය; "සචේ අභිධම්මෝ බුද්ධභාසිතෝ, යථා අනේකේසු සුත්තසහස්සේසු 'ඒකං සමයං භගවා රාජගහේ විහරතී'ති ආදිනා නයේන නිදානං සජ්ජිතං, ඒවමස්සාපි නිදානං සජ්ජිතං භවෙය්‍යා"ති. සෝ 'ජාතකසුත්තනිපාතධම්මපදාදීනං ඒවරූපං නිදානං නත්ථි, න චේතානි න බුද්ධභාසිතානී'ති පටික්ඛිපිත්වා උත්තරිපි ඒවං වත්තබ්බෝ; 'පණ්ඩිත, අභිධම්මෝ නාමේස සබ්බඤ්ඤුබුද්ධානංයේව විසයෝ, න අඤ්ඤේසං විසයෝ. බුද්ධානඤ්හි ඔක්කන්ති පාකටා, අභිජාති පාකටා, අභිසම්බෝධි පාකටා, ධම්මචක්කප්පවත්තනං පාකටං. යමකපාටිහාරියං පාකටං, තිදිවක්කමෝ පාකටෝ, දේවලෝකේ දේසිතභාවෝ පාකටෝ, දේවෝරෝහනං පාකටං. යථා නාම චක්කවත්තිරඤ්ඤෝ හත්ථිරතනං වා අස්සරතනං වා ථේනෙත්වා යානකේ යෝජෙත්වා විචරණං නාම අට්ඨානං අකාරණං; චක්කරතනං වා පන ථේනෙත්වා පලාලසකටේ ඔලම්බිත්වා විචරණං නාම අට්ඨානං අකාරණං; යෝජනප්පමාණං ඔභාසනසමත්ථං මණිරතනං වා පන කප්පාසපච්ඡියං පක්ඛිපිත්වා වළඤ්ජනං නාම අට්ඨානං අකාරණං. කස්මා? රාජාරහභණ්ඩතාය; ඒවමේව අභිධම්මෝ නාම න අඤ්ඤේසං විසයෝ, සබ්බඤ්ඤුබුද්ධානංයේව විසයෝ. තේසං වසේන දේසේතබ්බදේසනා. බුද්ධානඤ්හි ඔක්කන්ති පාකටා...පෙ.... දේවෝරෝහනං පාකටං. අභිධම්මස්ස නිදානකිච්චං නාම නත්ථි පණ්ඩිතා'ති. න හි සක්කා ඒවං වුත්තේ පරවාදිනා සහධම්මිකං උදාහරණං උදාහරිතුං.

මණ්ඩලාරාමවාසී **තිස්සභූතිත්ථේරෝ** පන මහාබෝධිනිදානෝ ඒස අභිධම්මෝ නාමාති දස්සේතුං "යේන ස්වාහං, භික්ඛවේ, විහාරේන පඨමාභිසම්බුද්ධෝ විහරාමි තස්ස පදේසේන විහාසි"න්ති (සං. නි. 5.11) ඉමං පදේසවිහාරසුත්තන්තං ආහරිත්වා කථේසි. දසවිධෝ හි පදේසෝ නාම; ඛන්ධපදේසෝ, ආයතනපදේසෝ, ධාතුපදේසෝ,

සච්චපදේසෝ, ඉන්ද්‍රියපදේසෝ, පච්චයාකාරපදේසෝ, සතිපට්ඨානපදේසෝ, ඣානපදේසෝ, නාමපදේසෝ, ධම්මපදේසෝති. තේසු සත්ථා මහාබොධිමණ්ඩේ පඤ්චක්ඛන්ධේ නිප්පදේසේන පටිවිජ්ඣි, ඉමං තේමාසං වේදනාක්ඛන්ධවසේනේව විභාසි. ද්වාදසායතනානි අට්ඨාරස ධාතුයෝ නිප්පදේසේන පටිවිජ්ඣි. ඉමං තේමාසං ධම්මායතනේ වේදනාවසේන ධම්මධාතුයඤ්ච වේදනාවසේනේව විභාසි. චත්තාරි සච්චානි නිප්පදේසේන පටිවිජ්ඣි, ඉමං තේමාසං දුක්ඛසච්චේ වේදනාවසේනේව විභාසි. බාවීසතින්ද්‍රියානි නිප්පදේසේන පටිවිජ්ඣි, ඉමං තේමාසං වේදනාපඤ්චකඉන්ද්‍රියවසේන විභාසි. ද්වාදසපදිකං පච්චයාකාරවට්ටං නිප්පදේසේන පටිවිජ්ඣි, ඉමං තේමාසං ඵස්සපච්චයා වේදනාවසේනේව විභාසි. චත්තාරෝ සතිපට්ඨානේ නිප්පදේසේන පටිවිජ්ඣි, ඉමං තේමාසං වේදනාසතිපට්ඨානවසේනේව විභාසි. චත්තාරි ඣානානි නිප්පදේසේන පටිවිජ්ඣි, ඉමං තේමාසං ඣානඞ්ගේසු වේදනාවසේනේව විභාසි. නාමං නිප්පදේසේන පටිවිජ්ඣි, ඉමං තේමාසං තත්ථ වේදනාවසේනේව විභාසි. ධම්මේ නිප්පදේසේන පටිවිජ්ඣි, ඉමං තේමාසං වේදනාත්තිකවසේනේව විභාසීති. ඒවං ථේරෝ පදේසවිහාරසුත්තන්තවසේන අභිධම්මස්ස නිදානං කථේසි.

ගාමවාසී **සුමනදේවත්ථේරෝ** පන හෙට්ඨාලෝහපාසාදේ ධම්මං පරිවත්තෙන්තෝ "අයං පරවාදී බාහා පග්ගය්හ අරඤ්ඤේ කන්දන්තෝ විය, අසක්ඛිකං අට්ටං කරොන්තෝ විය ච, අභිධම්මේ නිදානස්ස අත්ථිභාවම්පි න ජානාතී"ති වත්වා නිදානං කථෙන්තෝ ඒවමාහ; ඒකං සමයං භගවා දේවේසු විහරති තාවතිංසේසු පාරිච්ඡත්තකමූලේ පණ්ඩුකම්බලසිලායං. තත්‍ර ඛෝ භගවා දේවානං තාවතිංසානං අභිධම්මකථං කථේසි; "කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මා"ති.

අඤ්ඤේසු පන සුත්තේසු ඒකමේව නිදානං. අභිධම්මේ **ද්වේ නිදානානි** අධිගමනිදානඤ්ච දේසනානිදානඤ්ච. තත්ථ **අධිගමනිදානං** දීපඞ්කරදසබලතෝ පට්ඨාය යාව මහාබෝධිපල්ලඞ්කා වේදිතබ්බං. **දේසනානිදානං** යාව ධම්මචක්කප්පවත්තනා. ඒවං උභයනිදානසම්පන්නස්ස පනස්ස අභිධම්මස්ස නිදානකෝසල්ලත්ථං ඉදං තාව **පඤ්හාකම්මං** වේදිතබ්බං. අයං අභිධම්මෝ නාම කේන පභාවිතෝ? කත්ථ පරිපාචිතෝ? කත්ථ අධිගතෝ? කදා අධිගතෝ? කේන අධිගතෝ? කත්ථ විචිතෝ? කදා විචිතෝ? කේන විචිතෝ? කත්ථ දේසිතෝ? කස්සත්ථාය දේසිතෝ? කිමත්ථං දේසිතෝ? කේහි පටිග්ගහිතෝ? කේ සික්ඛන්ති? කේ සික්ඛිතසික්ඛා? කේ ධාරෙන්ති? කස්ස වචනං? කේනාභතෝති?

තත්‍රිදං **විස්සජ්ජනං; කේන පභාවිතෝ**ති බෝධිඅභිනීහාරසද්ධාය පභාවිතෝ. **කත්ථ පරිපාචිතෝ**ති අඩ්ඪඡක්කේසු ජාතකසතේසු. **කත්ථ අධිගතෝ**ති බෝධිමූලේ. **කදා අධිගතෝ**ති විසාඛාපුණ්ණමාසියං. **කේනාධිගතෝ**ති සබ්බඤ්ඤුබුද්ධේන. **කත්ථ විචිතෝ**ති බෝධිමණ්ඩේ. **කදා විචිතෝ**ති රතනඝරසත්තාහේ. **කේන විචිතෝ**ති සබ්බඤ්ඤුබුද්ධේන. **කත්ථ දේසිතෝ**ති දේවේසු තාවතිංසේසු. **කස්සත්ථාය දේසිතෝ**ති දේවතානං. **කිමත්ථං දේසිතෝ**ති චතුරෝඝනිද්ධරණත්ථං. **කේහි පටිග්ගහිතෝ**ති දේවේහි. **කේ සික්ඛන්තී**ති සෙක්ඛා ච පුථුජ්ජනකල්‍යාණා ච. **කේ සික්ඛිතසික්ඛා**ති අරහන්තෝ ඛීණාසවා. **කේ ධාරෙන්තී**ති යේසං වත්තති තේ ධාරෙන්ති. **කස්ස වචන**න්ති භගවතෝ වචනං අරහතෝ සම්මාසම්බුද්ධස්ස. **කේනාභතෝ**ති ආචරියපරම්පරාය.

අයඤ්හි සාරිපුත්තත්ථේරෝ භද්දජි සොභිතෝ පියජාලී පියපාලෝ පියදස්සී කෝසියපුත්තෝ සිග්ගවෝ සන්දේහෝ මොග්ගලිපුත්තෝ සුදත්තෝ ධම්මියෝ දාසකෝ සෝණකෝ රේවතෝති ඒවමාදීහි යාව තතියසඞ්ගීතිකාලා ආභතෝ. තතො උද්ධං තේසංයේව සිස්සානුසිස්සේහීති ඒවං තාව ජම්බුදීපතලේ ආචරියපරම්පරාය ආභතෝ. ඉමං පන දීපං;

තතෝ මහින්දෝ ඉට්ටියෝ, උත්තියෝ සම්බලෝ තථා;
පණ්ඩිතෝ භද්දනාමෝ ච, ඒතේ නාගා මහාපඤ්ඤා.

ජම්බුදීපා ඉධාගතාති (පරි. 3, 8). ඉමේහි මහානාගේහි ආභතෝ. තතෝ උද්ධං තේසංයේව සිස්සානුසිස්සසඞ්ඛාතාය ආචරියපරම්පරාය යාවජ්ජතනකාලා ආභතෝ.

**[ධම්මසඞ්ගණී අටුවා (ජට්ඨසඞ්ගායනා නිදානකථා); ධම්මසඞ්ගණී අටුවා 25-26 පිටු (හේ.වි.මු); විභඞ්ගප්පකරණ අටුවා සන්නය 01/XXIII - XXIV පිටු]**

**උත්තරිපි ඒවං වත්තබ්බෝ**...**පෙ**.... **න අඤ්ඤෙද්සං විසයෝ**...**පෙ**.... **නිදානකිච්චං නාම නත්ථී**ති අපාකටානං කාලදේසදේසකපරිසානං පාකටභාවකරණත්ථං තදුපදේසසහිතේන නිදානේන භවිතබ්බං, අඤ්ඤෙද්සං අවිසයත්තා දේසකෝ පාකටෝ, ඔක්කන්තිකාලාදීනං පාකටත්තා කාලෝ ච, දේවලෝකේ දේසිතභාවස්ස පාකටත්තා දේසපරිසා ච පාකටාති කිං නිදානකිච්චං සියාති.

යත්ථ ඛන්ධාදයෝ නිප්පදේසේන විභත්තා, සෝ අභිධම්මෝ නාම, තස්මා තස්ස නිදානේන ඛන්ධාදීනං නිප්පදේසතෝපි පටිවිද්ධට්ඨානේන භවිතබ්බන්ති අධිප්පායේන ථේරෝ **"මහාබෝධිනිදානෝ අභිධම්මෝ"**ති දස්සේති. "සෝ ඒවං පජානාමි සම්මාදිට්ඨිපච්චයාපි වේදයිත"න්ති ආදිනා (සං. නි. 5.12) නයේන පච්චයාදීහි වේදනං උපපරික්ඛන්තෝ ඛන්ධාදිපදේසානං වේදනාක්ඛන්ධාදීනං වසේන විහාසි. **ධම්මේ**ති කුසලාදිඅරණන්තේ.

**ධම්මං පරිවත්තෙන්තෝ**ති සාට්ඨකථං පාළිං පරිවත්තෙන්තෝ ඒතං පරවාදී චෝදනං පත්වා **"අයං පරවාදී"**ති ආදිමාහ. අම්හාදිසේසු නිදානං ජානන්තේසු පටිසරණේසු විජ්ජමානේසු අප්පටිසරණෝ අරඤ්ඤෙ කන්දන්තෝ විය නිදානසබ්භාවේ සක්ඛිභූතේසුපි අම්හේසු විජ්ජමානේසු අසක්ඛිකං අඩ්ඩං කරොන්තෝ විය හෝති, නිදානස්ස අත්ථිභාවම්පි න ජානාති, නනු ඒතං නිදානන්ති කථෙන්තෝ ඒවමාහ. **ඒකමේවා**ති දේසනානිදානමේව අජ්ඣාසයානුරූපේන දේසිතත්තා. **ද්වේ නිදානානී**ති අධිගන්තබ්බදේසේතබ්බධම්මානුරූපේන දේසිතත්තා. අභිධම්මාධිගමස්ස මූලං අධිගමං නිදේතීති **අධිගමනිදානං. බෝධිඅභිනීහාරසද්ධායා**ති යාය සද්ධාය දීපඞ්කරදසබලස්ස සන්තිකේ බෝධියා චිත්තං අභිනීහරි පණිධානං අකාසි.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ජට්ඨසඞ්ගායනා නිදානකථා යටතේ)]**

**පරවාදිචෝදනං පත්වා**ති අට්ඨකථායං ආගතං පරවාදිචෝදනං පත්වා. **අධිග**...**පෙ**.... **රූපේනා**ති අධිගන්තබ්බෝ ච සෝ දේසේතබ්බෝ චාති අධිගන්තබ්බදේසේතබ්බෝ, සෝ ඒව ධම්මෝ, තදනුරූපේන. ඒත්ථ ච යථාධම්මසාසනත්තා යථාධිගතධම්මදේසනාභාවතෝ අභිධම්මස්ස අභිසම්බෝධි අධිගමනිදානං. දේසකාලාදියේව දේසනානිදානං. යං පන අට්ඨකථායං "දේසනානිදානං යාව ධම්මචක්කප්පවත්තනා"ති වුත්තං, තං අභිධම්මදේසනා විසේසේන

ධම්මචක්කප්පවත්තනන්ති කත්වා වුත්තං. ධම්මචක්කප්පවත්තනසුත්තේ වා දේසිතේහි අරියසච්චේහි සකලාභිධම්මපදත්ථසඞ්ගහතෝ, පරමත්ථතෝ අභිධම්මභූතානං වා සම්මාදිට්ඨිආදීනං තත්ථ දේසිතත්තා වුත්තං. තත්තකානංයේව දේසනාරුළ්හතාය අඩ්ඪඡක්කේසු ජාතකසතේසු පරිපාචනං වුත්තන්ති දට්ඨබ්බං. න හි එත්තකාසු ඒව ජාතීසු පුඤ්ඤාදිසම්භාරසම්භරණං, කිං පන කාරණං එත්තකා ඒව ජාතියෝ දේසිතාති? තදඤ්ඤේසං අට්ඨුප්පත්තියා අභාවතෝ.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා නිදානකථා යටතේ)]**

**අභිධම්මෝ** අභිධර්ම පිටකය **බුද්ධභාසිතෝ** බුද්ධභාෂිතයක් වූයේ (හෙවත්) බුදුන් විසින් වදාරණ ලද්දේ **සචේ හෝති** ඉදින් වේ නම් **ඒවං සති** මෙසේ ඇති කල්හි **අනේකේසු සුත්තසහස්සේසු** නොයෙක් දහස් ගණන් සූත්‍රයන්හි **ඒකං සමයං භගවා රාජගහේ විහරතීති** ඒකං සමයං භගවා රාජගහේ විහරති යන **ආදිනා නයේන** මේ ආදී ක්‍රමයෙන් **නිදානං** නිදානය **සජ්ජිතං යථා** යම්සේ රචනා කරන ලද්දේ ද **ඒවං (තථා)** එපරිද්දෙන් **අස්සාපි** මේ අභිධර්ම දේශනාවගේ ද **නිදානං** නිදානය **සජ්ජිතං භවෙය්‍ය** රචනා කටයුතු වන්නේය **ඉති (ඒවං)** මෙසේ **පරවාදී** පරවාදී පුද්ගල තෙමේ **අථාපි (යදිපි වදෙය්‍ය)** ඉදින් කියන්නේ වී නම් **සෝ** ඒ පරවාදී පුද්ගලයා හට **ජාතකසුත්තනිපාතධම්මපදාදීනං** ජාතකය සූත්‍ර නිපාතය ධර්මපදය යනාදීන්ගේ (හෙවත්) යනාදීන්ට **ඒවරූපං නිදානං** මෙබඳු නිදානයක් තෙමේ **නත්ථි** නැත්තේ නොවේ ද **ඒතානි** ඒ ජාතක සූත්‍ර නිපාත ධර්මපද ආදීහු ද **න බුද්ධභාසිතං** බුදුරජාණන් වහන්සේ විසින් දේශනා නොකරන ලද්දාහු **න** නොවෙද්දැයි කියයුත්තේයි **බුද්ධභාසිතානියේව** බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද්දාහු මැයි (න-කාරයන් දෙදෙනෙක් ඇත්තා වූ ප්‍රතිෂේධය වළක්වන්නා වූ පාඨය මණිදීපටීකාව හා ගැළපේ. "ද්වේ පටිසේධා පකත්‍යත්ථෝ ඒව සද්දෝ යෝජේතබ්බෝ") **ඉති** මෙසේ **පටික්ඛිපිත්වා** පරවාදීන්ගේ වචනය පිළිකෙව් කොට **උත්තරිම්පි අධිකං** ජාතක -පෙ- න චේතානි බුද්ධභාසිතානි යන මේ වචනයටත් අධික වූ **ඒවම්පි (ඉදම්පි වචනං)** මේ වචනය **වත්තබ්බෝ** කියයුත්තේයි **පණ්ඩිත** එම්බා නුවණැත්ත **ඒසෝ අභිධම්මෝ නාම** මේ අභිධර්මය වනාහි **සබ්බඤ්ඤූ බුද්ධානං ඒව** සර්වඥ බුදුවරයන්ගේම **විසයෝ** ගෝචර ස්ථානය වෙයි **අඤ්ඤේසං** සර්වඥ බුදුවරයන්ගෙන් අන්‍යවූ ලෞකික පණ්ඩිතයන්ගේ **න විසයෝ** ගෝචර ස්ථානය නොවෙයි **හි** එසේමැයි **බුද්ධානං** බුදුවරයන්ගේ **ඔක්කන්ති** මාතෘ වූ මහාමායා දේවීන්ගේ කුස පිළිසිඳීම **පාකටා** ප්‍රකටයි **අභිජාති** මව්කුසින් බිහිවීම **පාකටා** ප්‍රකටයි **අභිසම්බෝධි** චතුස්සත්‍යය අවබෝධය **පාකටා** ප්‍රකටයි **ධම්මචක්කප්පවත්තනං** දම්දක් පැවැත්වීම **පාකටං** ප්‍රකටයි **යමකපාටිහාරියං** යමාමහපෙළහර දැක්වීම **පාකටං** ප්‍රකටයි **තිවික්කමෝ** (තීහි පදවීතිහාරසඞ්ඛාතේහි පදවාරේහි භගවතෝ දේවලෝකස්ස ගමනං) තුන් පියවරකින් භාග්‍යවත්හුගේ දෙව්ලෝ වැඩමවීම **පාකටෝ** ප්‍රකටයි ("තිදිවික්කමෝති පාඨේ පන සති දිවි දේවලෝකස්ස ගමනන්ති අත්ථෝ වේදිතබ්බෝ දිවීති එත්ථ හි උපයෝගත්ථේ භුම්මේකවචනං තස්ස ච ඕසරේචාති එත්ථ යෝගේවග්ගහණේන ඉ-කාර ආදයෝ හෝති අයඤ්ච පාඨෝ සුන්දරෝ යේව" යනු මූලටීකායි) **දේවලෝකේ** දිව්‍ය ලෝකයෙහි **අභිධම්මස්ස** අභිධර්මයාගේ **දේසිතභාවෝ** දේශනා කළ බව **පාකටෝ** ප්‍රකට වෙයි **දේවෝරෝහණං** දෙව් ලොවින් සකස්පුර දෙරට වැඩීම **පාකටං** ප්‍රකටයි ("අභිධම්මස්ස සබ්බඤ්ඤුබුද්ධානං යේව විසයභාවං අඤ්ඤේසං අවිසයභාවං උපමාය පාකටං කාතුං යථා නාමාති ආදිමාහ" යනු ටීකා වචනයි) **යථා නාම** උපමා වනාහි **චක්කවත්තිරඤ්ඤෝ** සක්විති රජුගේ **හත්ථිරතනං** හස්තිරත්නය හෝ **අස්සරතනං වා** අශ්වරත්නය හෝ **ථේනෙත්වා** සොරකම් කොට **යානකේ** කුඩා

ගැලෙක්හි **යෝජෙත්වා** යොද **විවරණං නාම** හැසිරීමෙක් නම් **අට්ඨානං අකාරණං** නොකරුණෙකි (නොහොත්) **චක්කරතනං** චක්‍ර රතනය **ථේනෙත්වා** සොරකම් කොට **පළාලසකටේ** පිදුරු ගැලෙක්හි **ඕලම්බෙත්වා** එල්වාගෙන **විවරණං නාම** හැසිරීම නම් **අට්ඨානං අකාරණං** නොකරුණෙකි **චා පන** (නොහොත්) **යෝජනප්පමාණං** යොදුනක් පමණ තැන **ඕභාසනසමත්ථං** ආලෝක කිරීමෙහි පොහොසත් වූ **මණිරතනං** මාණික්‍ය රත්නය **කප්පාසපච්ඡියං** කපු පැසෙක්හි **පක්ඛිපිත්වා** බහා **වලඤ්ජනං නාම** පරිභෝග කිරීම නම් **අට්ඨානං අකාරණං** කාරණයෙක් නොවෙයි **කස්මා?** කුමක්හෙයින් ද යත්? **රාජාරහභණ්ඩතාය** රජුන්ට සුදුසු භාණ්ඩයක් බැවින් **ඒවමේව** එපරිද්දෙන්ම **අභිධම්මෝ නාම** අභිධර්ම තෙමේ **අඤ්ඤේසං** බුදුවරයන්ගෙන් අන්‍යවූවන්ගේ **න විසයෝ** ගෝචරස්ථානයක් නොවෙයි **සබ්බඤ්ඤු බුද්ධානංයේව** සර්වඥ බුදුවරයන්ගේම **විසයෝ** ගෝචර ස්ථානය වෙයි **තේසං වසේන** ඒ සර්වඥ බුදුවරයන්ගේ වශයෙන් **දේසේතබ්බදේසනා හෝති** දේශනා කළයුතු දේශනාවක් වෙයි **හි** ඒ සැබෑමය **බුද්ධානං** සර්වඥ බුදුවරයන්ගේම **ඕක්කන්ති** මව්කුස පහළවීම **පාකටා** ප්‍රකටයි -පෙ- **දේවෝරෝහණං** දෙව්ලොවින් සකස්පුර දෙරට බැසීම **පාකටං** ප්‍රකටයි ෴

**පණ්ඩිත** එම්බා නුවණැත්ත **අභිම්මස්ස** අභිධර්මයාගේ **නිදානකිච්චං නාම නත්ථි** නිදාන කෘත්‍යයෙක් නම් නැත්තේයි **ඉති** මෙසේ **ඒවම්පි ඉදං** මේ වචනය ද **අභිධම්මෝ න බුද්ධභාසිතෝති මිච්ඡාගහ ජඩ්ඩාපේතුං** අභිධර්ම තෙමේ ශාස්තෘන් විසින් දේශනා නොකළේය යන මිත්‍යාදෘෂ්ටිය හරවනු පිණිස **වත්තබ්බෝ** කිවයුතුයි ("වත්තබ්බෝති එත්ථපි වච ධාතු හගවා භික්ඛූ එතදවෝචාති ආදිසු විය ද්විකම්මිකාති වුත්තඤ්ච

"දුහ-යාච-රුධි-පුච්ඡ-භික්ඛ-සාසු-වචාදයෝ
නීවහ හරාදයෝ ච උභයේ තේ ද්විකම්කාති"

සම්පිණ්ඩනත්ථේන පන පි-සද්දේන න කේවලං සෝ ජාතකං -පෙ- ඉන තානි බුද්ධභාසිතානීති ඉදමේව වත්තබ්බෝ අථ බෝ ඉතෝ වචනතෝ උත්තරි අධිකං ඉති ඒවම්පි ඉදම්පි වචනං වත්තබ්බෝති අත්ථං සම්පිණ්ඩේති" යනු මූලටීකා වචනයි) **හි** එහි ප්‍රයෝජන දක්වම් **ඒවං වුත්තේ** මෙසේ කී කල්හි **පරවාදිනා** පරවාදී පුද්ගලයා විසින් **සහධම්මිකං** හේතු සහිත වූ **උදාහරණං** උදාහරණයක් **උදාහරිතුං** එළවන්නට **න සක්කා** නොහැකි වෙයි ("නිදානේන සාධේතුං මණ්ඩලාරාමවාසී තිස්සභූතිත්ථේරවත්ථුං දස්සෙන්තෝ මණ්ඩලාරාමවාසීති ආදිමාහ") **පන** අන්‍ය අර්ථයක් දක්වම් **මණ්ඩලාරාමවාසී තිස්සභූතිත්ථේරෝ** මණ්ඩලාරාම වාසී වූ තිස්සභූතිස්ථවිර තෙමේ **ඒසෝ අභිධම්මෝ නාම** මේ අභිධර්ම තෙමේ **මහාබෝධිනිදානෝ** මහාබෝධිය නිදාන කොට ඇත්තේයි **ඉති දස්සේතුං** මෙසේ දක්වනු පිණිස **යේන**-පෙ- **විහාසින්ති** යේන -පෙ- විහාසිං යන **ඉමං පදේසවිහාරසුත්තං** මේ ප්‍රදේශවිහාර සූත්‍රය **ආහරිත්වා කථේසි** එළවා කීයේයි **භික්ඛවේ** මහණෙනි **සෝ අහං** හේ මම **ඛන්ධවිහාරාදීසු** ස්කන්ධවිහාරාදී වූ **දසසු විහාරේසු** දශ විහාරයන් අතුරෙන් **යේන විහාරේන** යම් විහාරයන් කරණකොටගෙන **පඨමාභිසම්බුද්ධෝ** අභිසම්බෝධියට පැමිණි ප්‍රථම කල් ඇත්තේ **විහරාමි** වාසය කෙළෙම් ද **තස්ස විහාරස්ස** ඒ විහාරයාගේ **පදේසේන** ප්‍රදේශයකින් (හෙවත්) අවයවයකින් **විහාසිං** වාසය කෙළෙම් **හි** විස්තර කෙරෙම් **පදේසවිහාරෝ නාම** ප්‍රදේශවිහාරය වනාහි **ඛන්ධපදේසෝ** ස්කන්ධයන්ගේ ප්‍රදේශයෙක **ආයතනපදේසෝ** ආයතනයන්ගේ ප්‍රදේශයක -පෙ- **ධම්මපදේසෝ** කුසලපදදීකොට අරණපදය අවසන් කොට ඇත්තා වූ ධර්මය සම්බන්ධ

ප්‍රදේශයෙකැයි **ඉති** මෙසේ **දසවිධෝ හෝති** දශ ප්‍රකාර වෙයි **තේසු** ඒ දශ ප්‍රකාර ප්‍රදේශයන් අතුරෙන් **සත්‍ථා** ශාස්තෘන් වහන්සේ **මහාබෝධිමණ්ඩේ** මහාබෝමැඩ **පඤ්චක්ඛන්ධේ** පඤ්චස්කන්ධයන් **නිප්පදේසවසේන** නිරවශේෂ වශයෙන් **පටිවිජ්ඣි** ප්‍රතිවේධ කොට දැන වදාළේයි **ඉමං තේමාසං** මේ තුන්මස මුළුල්ලෙහි **වේදනාක්ඛන්ධවසේන ඒව** වේදනාස්කන්ධ වශයෙන්ම **විහාසි** වාසය කෙළේයි **ද්වාදසායතනානි** දොළොස් ආයතනයෝය **අට්ඨාරසධාතුයෝ** අටළොස් ධාතූහුය යන මොහු **නිප්පදේසේනේව** නිරවශේෂ වශයෙන්ම **පටිවිජ්ඣි** ප්‍රතිවේධ කොට වදාළේයි **ඉමං තේමාසං** මේ තුන්මස මුළුල්ලෙහි **ධම්මායතනේ** ධර්මායතනයෙහි **වේදනාවසේන** වේදනා වශයෙන් **විහාසි** වාසය කෙළේයි **ධම්මධාතුයඤ්ච** ධර්මධාතුයෙහි ද **වේදනාවසේනේව** වේදනා වශයෙන්ම **විහාසි** වාසය කෙළේයි **චත්තාරි සච්චානි** චතුරාර්‍ය්‍ය සත්‍යයන් **නිප්පදේසේන** නිරවශේෂයෙන් **පටිවිජ්ඣි** පිළිවිද දැන වදාළේයි **ඉමං තේමාසං** මේ තුන්මස මුළුල්ලෙහි **දුක්ඛසච්චේ** දුක්ඛසත්‍යයෙහි **වේදනාවසේන ඒව** වේදනා වශයෙන්ම **විහාසි** වාසය කෙළේයි **බාවීසතින්ද්‍රියානි** දෙවිසි ඉන්ද්‍රියයන් **නිප්පදේසේන** නිරවශේෂයෙන් **පටිවිජ්ඣි** ප්‍රතිවේධ කොට දැන වදාළේයි **ඉමං තේමාසං** මේ තුන්මස මුළුල්ලෙහි **වේදනාපඤ්චකඉන්ද්‍රියවසේන** වේදනා සඞ්ඛ්‍යාත වූ පඤ්චේන්ද්‍රියයන්ගේ වශයෙන් **විහාසි** වාසය කෙළේයි **ද්වාදසපදිකං** දොළොස් පදයක් ඇත්තා වූ **පච්චයාකාරවට්ටං** ප්‍රතීත්‍යසමුප්පාදය **නිප්පදේසේන** නිරවශේෂ වශයෙන් **පටිවිජ්ඣි** පිළිවිද දැන වදාළේයි **ඉමං තේමාසං** මේ තුන්මස මුළුල්ලෙහි **ඵස්සපච්චයා** ස්පර්ශ සඞ්ඛ්‍යාත ප්‍රත්‍යයෙන් **වේදනාවසේනේව** වේදනාවගේ වශයෙන්ම **විහාසි** වාසය කෙළේයි **චත්තාරෝ සතිපට්ඨානේ** සතර සිවටන්හු **නිප්පදේසේනේව** නිරවශේෂයෙන්ම **පටිවිජ්ඣි** පිළිවිද දැන වදාළේයි **ඉමං තේමාසං** මේ තුන්මස මුළුල්ලෙහි **වේදනාසතිපට්ඨානවසේන ඒව** වේදනා සිවටන්හුගේ වශයෙන්ම **විහාසි** වාසය කෙළේයි **චත්තාරි ඣානානි** චතුෂ්ක ධ්‍යානයන් **නිප්පදේසේන** නිරවශේෂ වශයෙන් **පටිවිජ්ඣි** පිළිවිද දැන වදාළේයි **ඉමං තේමාසං** මේ තුන්මස මුළුල්ලෙහි **ඣානඞ්ගේසු** ධ්‍යානාඞ්ගයන් කෙරෙහි **වේදනාවසේන ඒව** වේදනාවගේ වශයෙන්ම **විහාසි** වාසය කෙළේයි **නාමං** නාමය **නිප්පදේසේනේව** නිරවශේෂයෙන්ම **පටිවිජ්ඣි** පිළිවිද දැන වදාළේයි **ඉමං තේමාසං** මේ තුන්මස මුළුල්ලෙහි **තත්‍ථ** ඒ නාමයන් අතුරෙහි **වේදනාවසේනේව** වේදනා වශයෙන්ම **විහාසි** වාසය කෙළේයි **ධම්මේ** කුසලාදී ධර්මයන් **නිප්පදේසේන ඒව** නිරවශේෂයෙන්ම **පටිවිජ්ඣි** පිළිසිද දැන වදාළේයි **ඉමං තේමාසං** මේ තුන්මස මුළුල්ලෙහි **වේදනාතිකවසේන ඒව** වේදනා ත්‍රිකයාගේ වශයෙන්ම **විහාසි** වාසය කෙළේයි **ඉති (ඒවං)** මෙසේ **ථේරෝ** තිස්සභූති ස්ථවිර තෙමේ **පදේසවිහාරසුත්තන්තවසේන** ප්‍රදේශවිහාර සූත්‍රාන්තයාගේ වශයෙන් ("සත්‍ථා චතුසු ඉරියාපථේසු විහරිත්‍වා පවත්තිත්‍වා ඒතේන ඛන්ධාදීනං ඒකදේසේන වේදනා ධම්මේන පච්චයාදීහිතප්පච්චය වේදනාක්ඛන්ධවසේනාති විහාරෝ ඛන්ධාදීනං පදේසෝ විහාරෝ පදේසවිහාරෝති" යනු ටීකායි) **අභිධම්මස්ස** අභිධර්මයාගේ **නිදානං** නිදානය **කථේසි** කීයේයි.

("පුන අපරේන නිදානේන සාධේතුං ගාමවාසී සුමනදේවත්ථේරවත්‍ථුං දස්සෙන්තෝ ගාමවාසීති ආදිමාහ" යනු ටීකායි) **පන** පක්ෂාන්තරයක් දක්වම් **ගාමවාසී සුමනදේවත්ථේරෝ** ග්‍රාමවාසී සුමනදේවස්ථවිර තෙමේ **ලෝහපාසාදේ (ලෝහපාසාදස්ස)** ලෝහප්‍රාසාදයාගේ **හෙට්ඨා** යට ධර්ම මණ්ඩපයෙහි **ධම්මං** අර්ථකථාව සමඟ පාළිධර්මය **පරිවත්තෙන්තෝ** පිරිවහන්නේ ("ඒතං පරවාදී චෝදනං පත්‍වා" යනු ආධ්‍යාහාරයි) **අයං පරවාදී** මේ පරවාදි පුද්ගල තෙමේ

**අම්හාදීසේසු** අප වැනිවූ **නිදනං ජානන්තේසු** නිදනය දන්නා වූ **පටිසරණේසු** පිළිසරණ වූ පුද්ගලයන් **විජ්ජමානේසු** විද්‍යමාන වන කල්හි **අප්පටිසරණෝ** පිළිසරණයක් නැත්තාවූ පුද්ගල තෙමේ **බාහා පග්ගය්හ** දෙයත් බැදගෙන **අරඤ්ඤේ** වනයෙහි **කන්දන්තෝ විය ච** හඬන්නා වූ පුර්ෂයෙකු මෙන් ද **නිදනසබ්භාවේ** නිදනය ඇති බැව්හි **සක්ඛිභූතේසු** සාක්ෂි වූ **අම්හේසු විජ්ජමානේසු** අපි විද්‍යමාන වන්නේහිදු **අසක්ඛිකං** සාක්ෂි නැත්තාවූ **අට්ටං කරොන්තෝ විය ච** අධිකරණයක් කරන්නාවූ පුරුෂයෙකු මෙන් ද **අභිධම්මේ** අභිධර්මයෙහි **නිදනස්ස** නිදනයාගේ **අත්‍ථිභාවම්පි** විද්‍යමාව බවද **න ජානාතීති වත්‍වා** නොදන්නේ යැයි කියා **නිදනං කථෙන්තෝ** නිදනය කියනුයේ **ඒකං සමයං** එක් සමයෙක්හි **භගවා** භාග්‍යවතුන් වහන්සේ **දේවේසු තාවතිංසේසු** තව්තිසාවැසි දෙවියන් අතුරෙහි **පාරිච්ඡත්තකමූලේ** පරසතු මදරා රුක්මුල්හි **පණ්ඩුකම්බලසිලායං** පඬුඇඹුල් සලස්නෙහි **විහරති** වැඩවාසය කෙළේයි **තත්‍ර ඛෝ** එසමයෙහි වනාහි **භගවා** භාග්‍යවතුන් වහන්සේ **දේවානං තාවතිංසානං** තව්තිසාවැසි දෙවියන්ට **කුසලා ධම්මා** -පෙ- **අබ්‍යාකතා ධම්මාති** කුසලා ධම්මා -පෙ- අබ්‍යාකතා ධම්මා යනුවෙන් (නොහොත්) මේ කුසලත්‍රිකය ආදී කොට ඇත්තාවූ **අභිධම්මකථං** අභිධම්ම කථාව **කථේසි** දේශනා කෙළේයි **ඉති ඒවං (ඉදං වචනං)** මෙසේ මේ වචනය **ආහ** කීයේයි ("පුන අපරේන නිදනේන සාධේතුං සුමේධතාපසවත්‍ථුං දස්සෙන්තෝ අඤ්ඤේසු පන සුත්තේසූති ආදිමාහ" යනු මූලටීකායි) **පන** අර්ථ පක්‍ෂයක් දක්වම් **අඤ්ඤේසු** අභිධර්මයෙන් අන්‍යවූ **සුත්තේසු** පාළියෙහි **ඒකමේව නිදනං හෝති** එකම දේශනා නිදනයෙක් වෙයි **අභිධම්මේ** අභිධර්ම පිටකයෙහි **අධිගමනිදනං** අධිගමනිදනය ද **දේසනානිදනඤ්ච ඉති** දේශනානිදනය දැයි **ද්වේ නිදනානි හොන්ති** නිදනයෝ දෙදෙනෙක් වෙත් **තත්‍ථ** ඒ නිදනයන් අතුරෙන් **අධිගමනිදනං** අධිගමනිදනය **දීපඞ්කරදසබලතෝ පට්ඨාය** දිවකුරු බුදුන්ගේ පාමුල පටන් **මහාබෝධිපල්ලඞ්කා** මහාබෝධි පයඞ්කය **යාව (අන්තෝ කත්‍වා)** යම්තාක් ද ඒතාක් ඇතුළත් කොට **වේදිතබ්බෝ** දතයුත්තේයි **දේසනානිදනං** දේශනානිදනය **ධම්මචක්කප්පවත්තනා** දම්සක් පැවැත්වීම **යාව** යම්තාක් ද **තාව (අන්තෝ කත්‍වා)** ඒතාක් ඇතුළත් කොට **වේදිතබ්බං** දතයුත්තේයි **පන** තත් සම්බන්ධ වාක්‍යයක් දක්වම් **ඒවං** මෙසේ **උභය නිදනසම්පන්නස්ස** නිදන ද්වයකින් සම්පූර්ණ වූ **අස්ස අභිධම්මස්ස** මේ අභිධර්ම පිටකයාගේ **නිදනකෝසල්ලත්‍ථං** නිදන කෞශල්‍යය පිණිස **ඉදං පඤ්හකම්මං** මේ ප්‍රශ්න කර්මය **වේදිතබ්බං** දතයුත්තේයි.

**අයං අභිධම්මෝ නාම** මේ අභිධර්මය වනාහි **කේන** කවර ධර්මයකින් **පභාවිතෝ?** මුල්කොට ඉපදවූයේද යත්? **කත්‍ථ** කවර තැනෙක්හි **පරිපාචිතෝ?** මුහු කරන ලද්දේ ද? **කත්‍ථ** කවර තැනෙක්හි **අධිගතෝ?** පැමිණෙන ලද්දේ ද? (හෙවත්) අවබෝධ කෙළේද? **කද** කවර කලෙක්හි **අධිගතෝ?** අවබෝධ කරන ලද්දේ ද? **කේන** කවරෙකු විසින් **අධිගතෝ?** අවබෝධ කරන ලද්දේ ද? **කත්‍ථ** කවර තැනෙක්හි **විචිතෝ?** පරීක්‍ෂා කරන ලද්දේ ද? **කද** කවර කලෙක්හි **විචිතෝ?** පරීක්‍ෂා කරන ලද්දේ ද? **කේන** කවරෙක් විසින් **විචිතෝ?** පරීක්‍ෂා කරන ලද්දේ ද? **කත්‍ථ** කොතැන්හි **දේසිතෝ?** දේශනා කරන ලද්දේ ද? **කස්ස අත්ථාය** කවරෙක් සඳහා **දේසිතෝ?** දේශනා කරන ලද්දේ ද? **කිමත්ථං** කවර අර්ථයක් සඳහා **දේසිතෝ?** දේශනා කරන ලද්දේ ද? **කේහි** කවර කෙනෙකුන් විසින් **පටිග්ගහිතෝ?** ඇසීමෙන් පිළිගන්නා ලද්දේ ද? **කේ** කවර පුද්ගලයෙක් තුමූ **සික්ඛන්ති?** හික්මෙන්නාහු වෙද්ද? (නොහොත්) උගන්නාහු ද? **කේ** කවර පුද්ගලයෙක් තුමූ **ධාරෙන්ති?** ධරන්නාහු ද? **කස්ස** කවර පුද්ගලයෙකුගේ **වචනං?** වචනයක් වේද? **කේන** කවර පුද්ගලයෙකු විසින් **ආභතෝ?**

එළවන ලද්දේ ද? **ඉති ඉදං පඤ්හකම්මං** මේ ප්‍රශ්න කර්මය **වේදිතබ්බං** දතයුත්තේයි **තත්‍ර** ඒ ප්‍රශ්න කර්මයෙහි **ඉදං** මේ මතු ව්‍යක්ෂයමාන වන්නාවූ **විස්සජ්ජනං** විසදීම **වේදිතබ්බං** දතයුත්තේයි **කේන පභාවිතෝති පඤ්හකම්මේ** කේන පභාවිතෝ යන ප්‍රශ්න කර්මයෙහි **අභිනීහාරසද්ධාය** සර්වඥතා ඥාණයට සිත එළවීමෙන් උපන්නාවූ ශ්‍රද්ධාව විසින් **පභාවිතෝ** මුල් කොට උපදවන ලද්දේය ("බෝධියා චිත්තං අභිනීහරති ඒතායාති බෝධිඅභිනීහාරෝ බෝධි අභිනීහාරෝ ච සෝ සද්ධා චාති බෝධිඅභිනීහාරසද්ධා අභිනීහරණඤ්ච සරූපතෝ සබ්බඤ්ඤුතඤාණස්ස පණිධානකරණමේව" යනු මූලටීකායි) **කත්ථ පරිපාචිතෝති පඤ්හකම්මේ** කත්ථ පරිපාචිතෝ යන ප්‍රශ්න කර්මයෙහි **අඩ්ඪචක්කේසු ජාතකසතේසු** අර්ධයක් සමඟ වූ සසියක් ජාතකයෙහි (නොහොත්) පන්සියපණස් ජාතකයෙහි **පරිපාචිතෝ** මුහුකුරුවන ලද්දේ වෙයි **කත්ථ අධිගතෝති පඤ්හකම්මේ** කත්ථ අධිගතෝ යන මේ ප්‍රශ්න කර්මයෙහි **බෝධිමූලේ** අස්වර්ථ බෝධිද්‍රැමූලයෙහි **අධිගතෝ** අවබෝධ කරන ලද්දේ වෙයි **කදා අධිගතෝති පඤ්හකම්මේ** කදා අධිගතෝ යන ප්‍රශ්න කර්මයෙහි **විසාඛපුණ්ණමාසියං** වෙසක්මස පුණුපොහෝ දවස්හි **අධිගතෝ** අවබෝධ කරන ලද්දේ වෙයි **කේන අධිගතෝති පඤ්හකම්මේ** කේන අධිගතෝ යන මේ ප්‍රශ්න කර්මයෙහි **සබ්බඤ්ඤු බුද්ධේන** සර්වඥ වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ විසින් **අධිගතෝ** අවබෝධ කරන ලද්දේ වෙයි **කත්ථ විචිතෝති පඤ්හකම්මේ** කත්ථ විචිතෝ යන මේ ප්‍රශ්න කර්මයෙහි **බෝධිමණ්ඩේ** බෝ මැඩෙහි **විචිතෝ** පරීක්‍ෂා කරන ලද්දේ වෙයි **කදා විචිතෝති පඤ්හකම්මේ** කදා විචිතෝ යන මේ ප්‍රශ්න කර්මයෙහි **රතනඝරසත්තාහේ** රුවන්ගෙයි වැඩහුන් සතියෙහි **විචිතෝ** පරීක්‍ෂා කරන ලද්දේ වෙයි **කේන විචිතෝති පඤ්හකම්මේ** කේන විචිතෝ යන මේ ප්‍රශ්න කර්මයෙහි **සබ්බඤ්ඤු බුද්ධේන** සර්වඥ වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ විසින් **විචිතෝ** පරීක්‍ෂා කරන ලද්දේ වෙයි **කත්ථ දේසිතෝති පඤ්හකම්මේ** කත්ථ දේසිතෝ යන මේ ප්‍රශ්න කර්මයෙහි **දේවේසු තාවතිංසේසු** තව්තිසාවැසි දෙවියන් මධ්‍යයෙහි **දේසිතෝ** දේශනා කරන ලද්දේයි **කස්සත්ථාය දේසිතෝති පඤ්හකම්මේ** කස්සත්ථාය දේසිතෝ යන මේ ප්‍රශ්න කර්මයෙහි **දේවතානං අත්ථාය** දෙවියන්ගේ වැඩ පිණිස **දේසිතෝ** දේශනා කරන ලද්දේයි **කිමත්ථං දේසිතෝති පඤ්හකම්මේ** කිමත්ථං දේසිතෝ යන මේ ප්‍රශ්න කර්මයෙහි **චතුරෝඝනිත්ථරනත්ථං** කාමාදී චතුරාශ්‍රවයන් එතරකරනු පිණිස **දේසිතෝ** දේශනා කරන ලද්දේයි **කේහි පටිග්ගහිතෝති පඤ්හකම්මේ** කේහි පටිග්ගහිතෝ යන මේ ප්‍රශ්න කර්මයෙහි **දේවේහි** දෙවියන් විසින් **පටිග්ගහිතෝ** ශ්‍රවණ මුඛයෙන් පිළිගන්නා ලද්දේයි **කේ සික්ඛන්තීති පඤ්හකම්මේ** කේ සික්ඛන්ති යන මේ ප්‍රශ්න කර්මයෙහි **සෙක්ඛා ච** ශෛක්‍ෂයෝ ද **පුථුජ්ජනා ච** කල්‍යාණ පෘථග්ජනයෝ ද **සික්ඛන්ති** හික්මෙන්නාහු වෙත් (හෙවත්) උගන්නාහු වෙත් **කේ සික්ඛිතසික්ඛාති පඤ්හකම්මේ** කේ සික්ඛිතසික්ඛා යන මේ ප්‍රශ්න කර්මයෙහි **ඛීණාසවා** ගෙවනලද ආශ්‍රව ඇත්තාවූ **අරහන්තෝ** රහත්හු **සික්ඛිතසික්ඛා** හික්මෙනලද ශික්‍ෂා ඇත්තාහු වෙත් **කේ ධාරෙන්තීති පඤ්හකම්මේ** කේ ධාරෙන්ති යන මේ ප්‍රශ්න කර්මයෙහි **යේසං** යම් පුද්ගල කෙනෙකුන්ගේ **හදයේ** සිත්හි **වත්තන්ති** පවත්නාහු වෙත් ද **තේ** ඒ පුද්ගලයෝ තුමූ **ධාරෙන්ති** ධරන්නාහු වෙත් **කස්ස වචනන්ති පඤ්හකම්මේ** කස්ස වචනං යන මේ ප්‍රශ්න කර්මයෙහි **අරහතෝ** දිව්‍ය-බ්‍රහ්ම-මනුෂ්‍යයන්ගේ පූජා විශේෂය ඉවසීමට සුදුසුවූ **සම්මාසම්බුද්ධස්ස** අවිපරීත කොට ස්වයම්භූ ඥාණයෙන් චතුස්සත්‍යාවබෝධය කළා වූ **භගවතෝ** භාග්‍යවතුන් වහන්සේගේ **වචනං** වචනයයි **කේන ආභතෝති පඤ්හකම්මේ** කේන ආභතෝ යන මේ ප්‍රශ්න කර්මයෙහි **ආචරියපරම්පරාය** ඇජර (ආචරිය) පරම්පරාව විසින් **ආභතෝ** ගෙනෙන ලද්දේයි **හි** විස්තර කෙරෙම් **අයං අභිධම්මෝ** මේ අභිධර්මය තෙමේ **සාරිපුත්තත්ථේරෝ**

ශාරිපුත්‍ර ස්ථවිරය **භද්දජී** භද්‍රජී ස්ථවිරය **සෝභිතෝ** සෝභිත ස්ථවිරය **පියජාලී** පියජාලී ස්ථවිරය **පියපාලෝ** පියපාල ස්ථවිරය **පියදස්සී** පියදස්සි ස්ථවිරය **කෝසියපුත්තෝ** කෝසියපුත්ත ස්ථවිරය **සිග්ගවෝ** සිග්ගව ස්ථවිරය **සන්දේහෝ** සන්දේහ ස්ථවිරය **මොග්ගලීපුත්තෝ** මොග්ගලීපුත්තතිස්ස ස්ථවිරය **සුදත්තෝ** සුදත්ත ස්ථවිරය **ධම්මියෝ** ධම්මිය ස්ථවිරය **දසකෝ** දසක ස්ථවිරය **සෝනකෝ** සෝනක ස්ථවිරය **රේවතෝ** රේවත ස්ථවිරය **ඉති ඒවමාදීහි** මේ ආදී වූ මහාස්ථවිරයන් විසින් **තතියසඞ්ගීතිකාලා** තුන්වැනි සඞ්ගායනා කාලය **යාව** යම්තාක් ද **තාව (අන්තෝ කත්වා)** ඒ කාලය ඇතුළත් කොට **ආභතෝ** ගෙනෙන ලද්දේයි **තතෝ උද්ධං** ඒ තුන්වන සඞ්ගායනා කාලයෙන් මත්තෙහි **තේසං යේව** ඒ මහාස්ථවිරයන්ගේම **සිස්සානුසිස්සේහි** ශිෂ්‍යානුශිෂ්‍යයන් විසින් **ආභතෝති** ගෙනෙන ලද්දේ යැයි **විස්සජ්ජේතබ්බෝ** විසදිය යුත්තේයි **ඒවං (ඉමිනා යථා වුත්තනයේන)** මෙසේ "අයම්පි සාරිපුත්තත්ථේරෝ" යනාදී කියනලද නයින් **තාව** පළමුකොට **ජම්බුදීපතලේ** දඹදිව් තෙලෙහි **ආචරියපරම්පරාය** ඇජර පරම්පරාව විසින් **ආභතෝ** ගෙනෙන ලද්දේයි **පන** විශේෂාර්ථයක් දක්වම් **ඉමං දීපං** මේ සිංහල දීපයට **තතෝ ජම්බුදීපා** ඒ දඹදිවින් **මහින්දෝ** මහින්ද ස්ථවිරය **ඉට්ටියෝ** ඉට්ටිය ස්ථවිරය **උත්තියෝ** උත්තිය ස්ථවිරය **සම්බලෝ** සම්බල ස්ථවිරය **භද්දනාමෝ** භද්දනාම ස්ථවිරය යන **මහාපඤ්ඤා** මහා නුවණැත්තා වූ **ඒතේ මහානාගා** මේ මහරහත් පස්දෙනා වහන්සේලා **ඉධ** මේ සිංහල දීපයට **ආගතා** ආවාහුය **ඉති වුත්තේහි** මෙසේ කියන ලද්දහු **ඉමේහි මහානාගේහි** මේ මහරහතුන් විසින් **අභිධම්මෝ** අභිධර්මය **ආභතෝ** ගෙනෙන ලද්දේය **තතෝ උද්ධං** ඒ ගෙනෙන ලද කාලයෙන් මත්තෙහි **තේසං යේව මහානාගානං** ඒ මහරහතුන්ගේම **සිස්සානුසිස්සසඞ්ඛාතාය** ශිෂ්‍යානුශිෂ්‍ය යැයි කියනලද **ආචරියපරම්පරාය** ඇජර පරපුර විසින් **යාවජ්ජතනකාලා** මේ වර්තමාන කාලය දක්වා **අභිධම්මෝ** අභිධර්ම පිටකය තෙමේ **ආභතෝ** එළවන ලද්දේය.

**[අර්ථශාලිනී අර්ථකථා සන්නය 92-97 පිට]**

අපරානිපි දූරේනිදානං, අවිදූරේනිදානං, සන්තිකේනිදානන්ති තීණි නිදානානි. තත්ථ දීපඞ්කරපාදමූලතෝ පට්ඨාය යාව තුසිතපුරා **දූරේනිදානං** වේදිතබ්බං. තුසිතපුරතෝ පට්ඨාය යාව බෝධිමණ්ඩා **අවිදූරේනිදානං**. 'ඒකං සමයං භගවා දේවේසු විහරති තාවතිංසේසු පාරිච්ඡත්තකමූලේ පණ්ඩුකම්බලසිලායං, තත්ථ ඛෝ භගවා දේවානං තාවතිංසානං අභිධම්මකථං කථේසී'ති ඉදමස්ස **සන්තිකේනිදානං**.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා නිදානකථා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 61 පිට (හේ.වි.මු)]**

## ප්‍රථම ආභිධම්මිකයා කවරහු ද?

අභිධම්මේ වාචනාමග්ගෝ නාම **සාරිපුත්තත්ථේරප්පභවෝ**. මහාපකරණෝ ගණනචාරෝපි ථේරේනේව ඨපිතෝ. ථේරෝ හි ඉමිනා නීහාරේන ධම්මන්තරං අමක්ඛෙත්වාව සුඛං ගහේතුං ධාරේතුං පරියාපුණිතුං වාචේතුඤ්ච පහෝතීති ගණනචාරං ඨපේසි. ඒවං සන්තේ ථේරෝව පඨමතරං ආභිධම්මිකෝ හෝතීති? න හෝති. සම්මාසම්බුද්ධෝව පඨමතරං ආභිධම්මිකෝ. සෝ හි නං මහාබෝධිපල්ලඞ්කේ නිසීදිත්වා පටිවිජ්ඣි. බුද්ධෝ හුත්වා ච පන සත්තාහං ඒකපල්ලඞ්කේන නිසින්නෝ උදානං උදානේසි.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා නිදානකථා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 14-15 පිටු (හේ.වි.මු); විභඞ්ගප්පකරණ අටුවා සන්නය 01/XIV පිට]**

**ඒවං සන්තේති** පුබ්බේ වුත්තමග්ගහෙත්වා වාචනාමග්ගස්ස ථේරප්පභවත්තවචනමේව ගහෙත්වා තේන පුරිමවචනඤ්ච පටික්ඛිපන්තෝ චෝදේති. **[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා නිදානකථා යටතේ)]**

**අභිධම්මේ** අභිධර්ම පිටකයෙහි **වාචනාමග්ගෝ නාම** උගෙන ගතයුතු වූ පාළි ක්‍රමය වනාහි **සාරිපුත්තත්ථේරප්පභවෝ** සැරියුත් මහතෙරුන් වහන්සේගෙන් පහළ වූයේයි **මහාපකරණේ** පටන් මහාපවුරෙහි **ගණනවාරෝපි** ගණන් තැබීම ද **ථේරේනේව ඨපිතෝ** තෙරුන්වහන්සේ විසින්ම තබනලද්දේයි **හි** එහි ඵලය කියම් **ථේරෝ** මහතෙරුන් වහන්සේ **ඉමිනා නීහාරේන** මේ ක්‍රමයෙන් **ධම්මන්තරං** ධර්ම විශේෂයක් **අමක්ඛෙත්වාව** නොමකාම (නොහොත්) ආකූල නොකොටම **සුඛං** සුවසේ **ගහේතුං** ගැණීම පිණිස ද (හෙවත්) උගෙනීම පිණිස ද **ධාරේතුඤ්ච** දැරීම පිණිස ද **පරියාපුණිතුඤ්ච** පිරිවැහීම පිණිස ද **වාචේතුඤ්ච** කියවීම පිණිස ද **පහෝති** පොහොසත් වෙයි **ඉති** මෙසේ **ගණනවාරං** ගණන් තැබීම **ඨපේසි** තබා වදළේයි (අභිධර්මයෙහි වාචනා මාර්ගය සැරියුත් මහතෙරුන්ගෙන් පහළ වූ බව දක්වා සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පළමු කොට අභිධර්ම ප්‍රතිවේධය හගවනු පිණිස "ඒවං සන්තේ" යනාදිය කීහ) **වා** නොහොත් (පූර්වයෙහි කියන ලද්දවූ "යං දේවදේවෝ දේවානං දේසෙත්වා" යනාදි වචනය නොගෙන වාචනාමාර්ගය සැරියුත් මහතෙරුන්ගෙන් පහළ වූ බව පමණක් ගෙන ඒ වචනයෙන් පූර්වයෙහි කී වචනය පහළ කරමින් චෝදනා කරනු කැමතිව "ඒවං සන්තේ" යනාදිය කීහ) **ඒවං (අභිධම්මේ වාචනාමග්ගස්ස සාරිපුත්තත්ථේරා පභවත්තේ)** මෙසේ අභිධර්මයෙහි වාචනා මාර්ගය ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේම මුල් කොට හටගත් බව **සන්තේ** ඇති කල්හි **ථේරෝව** ශාරිපුත්‍ර ස්ථවිර තෙමේම **පඨමතරං** පළමු කොට **ආභිධම්මිකෝ හෝති** අභිධර්මය දැන ගත්තේ වෙයිදැයි **ඉති** (**අයං** මේ වනාහි **පුච්ඡා** ප්‍රශ්නයයි) **ථේරෝ** මහතෙරුන් වහන්සේ **පඨමතරං** පළමු කොටම **ආභිධම්මිකෝ න හෝති** අභිධර්මය අවබෝධ කළේ නොවෙයි **සම්මාසම්බුද්ධෝව** සම්‍යක් සම්බුද්ධයන් වහන්සේම **පඨමතරං** සියල්ලන්ට පළමු කොට **ආභිධම්මිකෝ හෝති** අභිධර්මය අවබෝධ කෙළේ වෙයි (දැන් වනාහි සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පළමු කොට ආභිධම්මික බව ප්‍රතිවේධයෙන් සිද්ධවූ හෙයින් "සෝ හි" යනාදිය කීහ) **හි** ඒ අර්ථය සමර්ථනය කෙරෙම් **සෝ (සම්මාසම්බුද්ධෝ)** ඒ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ **නං (අභිධම්මං)** ඒ අභිධර්මය **මහාබෝධිපල්ලඞ්කේ** මහාබෝධි පර්‍ය්‍යඞ්කයෙහි **නිසීදිත්වා** වැඩහිඳ **පටිවිජ්ඣි** ප්‍රතිවේධ කෙළේයි ("ඒවං පටිවේධේන සාධෙත්වා ඉදනි සම්මාසම්බුද්ධස්ස පඨමතරං ආභිධම්මිකභාවං පඨමාදිබුද්ධවචනේන සාධෙන්තෝ බුද්ධෝති ආදිමාහ" යනු මූලටීකා වචනයි) **පන** ඒ හැර (ච යනු පදලඞ්කාරයෙහි නිපාතයි පන යනු පක්ෂාන්තරයෙහි නිපාතයි) **බුද්ධෝ හුත්වා** චතුරාර්‍ය්‍ය සත්‍යය හා පඤ්චවිධ ඥෙය්‍යමණ්ඩලය ස්වයම්භූ ඥාණයෙන් අවබෝධ කිරීමෙන් බුදුව **සත්තාහං** සතියක් මුළුල්ලෙහි **ඒකපල්ලඞ්කේන** එක පලගින්ම (නොහොත්) සතියක් මුළුල්ලෙහි පර්‍ය්‍යඞ්කය නොබිඳීමෙන්ම **නිසින්නෝ** වැඩහුන්නේ **යදාහවේ** -පෙ- **අන්තලික්ඛන්ති** යදා හවේ -පෙ- අන්තලික්ඛං යන **උදානං** උදානය **උදානේසි** උදන් ඇනූයේයි. **[අර්ථශාලිනී අර්ථකථා සන්නය 58-59 පිටු]**

## කවර අර්ථයකින් අභිධර්මය නම් වෙයි ද?

තත්ථ කේනට්ඨේන **අභිධම්මෝ?** ධම්මාතිරේකධම්මවිසේසට්ඨේන. අතිරේකවිසේසත්ථදීපකෝ හෙත්ථ 'අභි' සද්දෝ. "බාළ්හා මේ දුක්ඛා වේදනා

අභික්කමන්ති නෝ පටික්කමන්ති" (ම. නි. 3.384; සං. නි. 5.195) "අභික්කන්තවණ්ණා"තිආදීසු (සං. නි. 1.1-2) විය. තස්මා යථා සමුස්සිතේසු බහූසු ඡත්තේසු චේව ධජේසු ච යං අතිරේකප්පමාණං විසේසවණ්ණසණ්ඨානඤ්ච ඡත්තං, තං 'අතිච්ඡත්ත'න්ති වුච්චති, යෝ අතිරේකප්පමාණෝ නානාවිරාගවණ්ණවිසේසසම්පන්නෝ ච ධජෝ සෝ 'අතිධජෝ'ති වුච්චති, යථා ච ඒකතෝ සන්නිපතිතේසු බහූසු රාජකුමාරේසු චේව දේවේසු ච යෝ ජාතිභෝගයසඉස්සරියාදිසම්පත්තීහි අතිරේකතරෝ චේව විසේසවන්තතරෝ ච රාජකුමාරෝ සෝ 'අතිරාජකුමාරෝ'ති වුච්චති, යෝ ආයුවණ්ණඉස්සරියයසසම්පත්තිආදීහි අතිරේකතරෝ චේව විසේසවන්තතරෝ ච දේවෝ සෝ 'අතිදේවෝ'ති වුච්චති, තථාරූපෝ බ්‍රහ්මාපි 'අතිබ්‍රහ්මා'ති වුච්චති, ඒවමේව අයම්පි ධම්මෝ ධම්මාතිරේකධම්මවිසේසට්ඨේන **'අභිධම්මෝ'**ති වුච්චති.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා නිදානකථා වණ්ණනා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 02 පිට (හේ.වි.මු); විභඞ්ගප්පකරණ අටුවා සන්නය 01/III පිට]**

**"තත්ථ කේනට්ඨේන අභිධම්මෝ"**ති. තත්ථ **තත්ථාති** "අභිධම්මස්ස අත්ථං පකාසයිස්සාමී"ති යදිදං වුත්තං, තස්මිං. "යස්ස අත්ථං පකාසයිස්සාමී"ති පටිඤ්ඤාතං, සෝ අභිධම්මෝ කේනට්ඨේන අභිධම්මෝති අත්ථෝ. **තත්ථාති** වා "අභිධම්මකථ"න්ති ඒතස්මිං වචනේ යෝ අභිධම්මෝ වුත්තෝ, සෝ කේනට්ඨේන අභිධම්මෝති අත්ථෝ. **ධම්මාතිරේකධම්මවිසේසට්ඨේනාති** එත්ථ ධම්මෝ අතිරේකෝ ධම්මාතිරේකෝ, සුත්තන්තාධිකා පාළීති අත්ථෝ. ධම්මෝ විසේසෝ ධම්මවිසේසෝ ධම්මාතිසයෝ, විචිත්තා පාළීති අත්ථෝ, ධම්මාතිරේකධම්මවිසේසා ඒව අත්ථෝ **ධම්මාතිරේකධම්මවිසේසට්ඨෝ**. ද්වින්නම්පි අත්ථානං අභිධම්මසද්දස්ස අත්ථභාවේන සාමඤ්ඤතෝ ඒකවචනනිද්දේසෝ කතෝ. **තස්මාති** යස්මා "අභික්කමන්ති, අභික්කන්තවණ්ණා"තිආදීසු විය අතිරේකවිසේසට්ඨදීපකෝ අභිසද්දෝ, තස්මා අයම්පි ධම්මෝ ධම්මාතිරේකධම්මවිසේසට්ඨේන "අභිධම්මෝ"ති වුච්චතීති සම්බන්ධෝ.

තත්ථ සියා "අභික්කමන්ති, අභික්කන්තවණ්ණා"ති එත්ථ ධාතුසද්දස්ස පුරතෝ පයුජ්ජමානෝ අභිසද්දෝ කිරියාය අතිරේකවිසේසභාවදීපකෝ හෝතීති යුත්තං උපසග්ගභාවතෝ, ධම්මසද්දෝ පන න ධාතුසද්දෝති ඒතස්මා පුරතෝ අභිසද්දෝ පයෝගමේව නාරහති. අථාපි පයුජ්ජෙය්‍ය, කිරියාවිසේසකා උපසග්ගා, න ච ධම්මෝ කිරියාති ධම්මස්ස අතිරේකවිසේසභාවදීපනං න යුත්තන්ති? නෝ න යුත්තං. අඤ්ඤස්සාපි හි උපසග්ගස්ස අධාතුසද්ද පුරතෝ පයුජ්ජමානස්ස අකිරියායපි අතිරේකවිසේසභාවදීපකස්ස දස්සනතෝති ඒතමත්ථං විභාවේතුං අතිඡත්තාදිඋදාහරණං දස්සෙන්තෝ ආහ **"යථා"**තිආදි. **ඒවමේවාති** යථා ඡත්තාතිරේකඡත්තවිසේසාදි අත්ථේන අතිඡත්තාදයෝ හොන්ති අතිසද්දස්ස උපසග්ගස්ස අධාතුසද්දස්සපි පුරතෝ පයුජ්ජමානස්ස අකිරියාය ච තබ්භාවදීපකත්තා, ඒවමයම්පි ධම්මෝ ධම්මාතිරේකධම්මවිසේසට්ඨේන **"අභිධම්මෝ"**ති වුච්චති අභි-සද්දස්ස උපසග්ගස්ස අධාතුසද්දස්සපි පුරතෝ පයුජ්ජමානස්ස අකිරියාය ච තබ්භාවදීපකත්තාති අධිප්පායෝ.
**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා නිදානවණ්ණනා යටතේ)]**

**අභිධම්මෝ** අභිධර්ම තෙමේ **කේනට්ඨේන** කවර අර්ථයකින් **අභිධම්මෝති** අභිධර්මය නම් වන්නේ ද යත් **ධම්මාතිරේකධම්මවිසේසට්ඨේන** සූත්‍රාන්ත පාළියට වඩා විශේෂ වූ විචිත්‍ර වූ පාළි සඞ්ඛ්‍යාත විශිෂ්ඨාර්ථයෙන් ද **අභිධම්මෝ හෝති**

අභිධර්මය නම් වෙයි **හි (යස්මා)** යම්හෙයකින් **බාළ්හා මේ අවුසෝ** -පෙ- **අභික්කන්තවණ්ණාති ආදීසු** බාළ්හා මේ ආවුසෝ -පෙ- අභික්කන්තවණ්ණා යනාදියෙහි **අභිසද්දෝ** අභි ශබ්ද තෙමේ **අතිරේකවිසේසට්ඨදීපකෝ විය** අධිකාර්ථ විශේෂාර්ථ ප්‍රකාශ කරන්නාක් මෙන් **ඒවං** එපරිද්දෙන් **එත්‍ථ** මේ අභිධම්මෝ යන පදයෙහි **අභිසද්දෝ** අභි ශබ්ද තෙමේ **අතිරේකවිසේසත්ථදීපකෝ** අධිකාර්ථ විශේෂාර්ථ ප්‍රකාශ කරන්නේ **හෝති** වෙයි (උදහරණ පාඨයාගේ අර්ථ මෙසේයි) **ආවුසෝ** ඇවැත්නි **මේ** මාගේ **බාළ්හා** අතිශයින් බොහෝ වූ **දුක්ඛා වේදනා** දුක් වේදනා තුමූ **අභික්කමන්ති** විශේෂයෙන් දියුණු වෙත් **නෝ පටික්කමන්ති** නොපසුබස්නාහු වෙත් **අභික්කන්තවණ්ණා** අතිශයින් සිත්කළු වර්ණ ඇත්තා වූ **දේවතා** දිව්‍යපුත්‍ර තෙමේ යනුයි **තස්මා** එසේ අභික්කමන්ති, අභික්කන්තවණ්ණා යනාදි පාළියෙහි මෙන් අභි ශබ්දයාගේ අධිකාර්ථ විශේෂාර්ථ වාචක බැවින් ("අයම්පි ධම්මෝ ධම්මාතිරේකධම්මවිසේසට්ඨේන අභිධම්මෝති වුච්චති" යන්නෙහි සම්බන්ධයි. "අභික්කමන්ති අභික්කන්තවණ්ණා" යන මේ ප්‍රයෝගයෙහි ධාතුවට පෙරටුව යෙදුනා වූ අභි ශබ්ද තෙමේ ක්‍රියාවගේ අතිරේක විශේෂාර්ථ භාවය ප්‍රකාශ කරන්නා වූ උපසර්ග වූ හෙයින් යෙදෙන්නේයි. ධම්ම ශබ්දය වනාහි ධාතුවක් නොවන හෙයින් ධම්ම ශබ්දයාගේ පූර්වයෙහි අභි ශබ්දයාගේ යෙදීම නුසුදුසු වන්නේ නොවේ ද? ඉදින් "අතිමාලා" යනාදී ප්‍රයෝගයෙහි මෙන් යෙදෙන්නේ යැයි කියත් නම් උපසර්ගයෝ තුමූ ක්‍රියාව වෙසසන්නාහු වෙති. ධම්ම ශබ්දයාගේ අර්ථය පාළිය වන හෙයින් ක්‍රියාව නොවේනුයි. පාළියගේ අතිරේක විශේෂාර්ථ බව ප්‍රකාශ කිරීම නොයෙදෙන්නේ යැයි මෙබඳු චෝදනාවක් වියයුතු හෙයින් නොයෙදෙන්නේ නොවෙයි, යෙදෙන්නේ මැයි. කුමක් හෙයින යත්; ධාතුහුගේ පූර්වයෙහි යෙදෙන ලද්දෙන් අන්‍යවූ ධාතූන්ගෙන්ම නොව නාමපදයාගේ පූර්වයෙහි ද යෙදියයුතු උපසර්ග පදයාගේ ද ක්‍රියාව නොව ද්‍රව්‍යයාගේ ද අතිරේක විශේෂාර්ථ බව ප්‍රකාශ කරනබව දන්නා හෙයින් මෙසේ අර්ථය ප්‍රකාශ කොට දක්වනු පිණිස "අතිඡත්තං" යනාදී උදහරණයන් දක්වනු පිණිස "යථා ච" යනාදිය කියන ලද්දේයි)

**සමුස්සිතේසු** මොනවට නගන ලද්දවූ **බහූසු ඡත්තේසු චේව** බොහෝ ඡත්‍රයන් අතුරෙනුදු **ධජේසු ච** ධ්වජයන් අතුරෙනුදු **යං ඡත්තං** යම් ඡත්‍රයක් තෙමේ **අතිරේකප්පමාණඤ්ච** අධික ප්‍රමාණ ඇත්තේ වේද **විසේසවණ්ණසණ්ඨානඤ්ච** විචිත්‍ර විශේෂ වූ වර්ණ සණ්ඨාන ඇත්තේ වේද **තං ඡත්තං** ඒ ඡත්‍රය **අතිඡත්තන්ති** අධික වූ ඡත්‍රයයි **වුච්චති යථා ච** කියනු ලබන්නාක් මෙන් ද **යෝ ධජෝ** යම් ධ්වජයක් තෙමේ **අතිරේකප්පමාණෝ ච** අධික ප්‍රමාණ ඇත්තේ වේද **නානාවිරාගවණ්ණවිසේසසම්පන්නෝ ච** නානාප්‍රකාර වූ රැදුම් විශේෂයෙන් සම්පූර්ණ වූයේ වේද **යෝ ධජෝ** ඒ ධ්වජය **අතිධජෝති** අතිධ්වජයයි **වුච්චති යථා ච** කියනු ලබන්නාක් මෙන් ද **ඒකතෝ** එකවට **සන්නිපතිතේසු** රැස්ව ආවාවූ **බහූසු රාජකුමාරේසු චේව** බොහෝ රාජකුමාරයන් අතුරෙනුදු **දේවේසු ච** දෙවියන් අතුරෙනුදු **යෝ රාජකුමාරෝ** යම් රජකුමරුවෙක් තෙමේ **ජාතිභෝගයසඉස්සරියාදිසම්පත්තිහි** කුල ගෝත්‍ර භෝග යස ඓශ්වර්‍ය්‍ය සම්පත් ආදීන් කරණකොටගෙන **අතිරේකතරෝ චේව** අතිශයින් අධික වූයේ වේද **විසේසවන්තතරෝ ච** අතිශයින් විශේෂවත් වූයේද **සෝ රාජකුමාරෝ** ඒ රජකුමරු **අතිරාජකුමාරෝති** අතිරාජකුමාරයයි **වුච්චති යථා ච** යම්සේ කියනු ලැබේ ද **යෝ දේවෝ** යම් දිව්‍යපුත්‍රයෙක් තෙමේ **ආයුවණ්ණඉස්සරියයසසම්පත්තිආදීහි** ආයුෂය වර්ණය ඓශ්වර්‍ය්‍ය කීර්තිය සම්පත්තිය යනාදීන් කරණකොටගෙන **අතිරේකතරෝ චේව** අතිශයින් අධිකවූයේ වේද **විසේසවන්තතරෝ ච** අතිශයින් විශේෂවත් වූයේ වේද **සෝ දේවෝ** ඒ

දිව්‍යපුත්‍රයා **අතිදේවෝති** අතිදේව යයි **වුච්චති යථා ච** කියනු ලබන්නාක් මෙන් ද **තථාරූපෝ** එබඳු ස්වභාව ඇත්තා වූ **බ්‍රහ්මාපි** බ්‍රහ්මයා ද **අතිබ්‍රහ්මාති** අධික වූ බ්‍රහ්මය (විශේෂවත් වූ බ්‍රහ්මයයි) **වුච්චති යථා ච** කියනු ලබන්නේ යම්සේ ද **ඒවමේව** එපරිද්දෙන්ම **අයම්පි ධම්මෝ** මේ අභිධර්ම පාළිය ද **ධම්මාතිරේකධම්මවිසේසට්ඨේන** සූත්‍රාන්ත පාළියට වඩා අධික වූ පාළිය යන අර්ථයෙන් ද සූත්‍රාන්ත පාළියට වඩා විශේෂ විචිත්‍ර වූ පාළිය යන අර්ථයෙන් ද **අභිධම්මෝ ඉති** අභිධර්මයයි **වුච්චති** කියනු ලැබෙයි. ෴

උපසර්ගය වනාහි ධාතූහුගේ පූර්වයෙහි යෙදෙන්නා වූ උපසර්ගය ධාතු නොවන්නා වූ නාමපදයාගේ පූර්වයෙහි යෙදෙන්නා වූ උපසර්ගයයි දෙයාකාර වෙයි. ඔහුන් අතුරෙන් ධාතූහුගේ පූර්වයෙහි යෙදෙන්නා වූ උපසර්ග තෙමේ ක්‍රියාව වෙනස් කරන්නේයි. ධාතු නොවන්නා වූ නාමපදයාගේ පූර්වයෙහි යෙදෙන්නා වූ උපසර්ග තෙමේ "අතිමාලා" යනාදී ප්‍රයෝගයෙහි මෙන් ක්‍රියාව නොවෙසෙසන්නේයි. අතිඡත්තාදී ඇතැම් උදහරණයෙහි ක්‍රියාව නොවන්නා වූ නාමපදයාගේ අර්ථය වූ ද්‍රව්‍ය වෙනස් කරන්නේයි. මේ "අභිධම්මෝ" යන පදයෙහි ධාතු නොවන්නා වූ නාමපදයක් වූ ධම්ම ශබ්දයාගේ පූර්වයෙහි යොදන ලද්දවූ අභි යන උපසර්ගය ද, ක්‍රියා නොවන්නා වූ ද්‍රව්‍ය වූ පාළියගේ අධිකාර්ථ බවය විශේෂාර්ථ බවය යන අර්ථ ද්වයෙහි යෙදියයුතු යැයි කී නියායි. "ඉමස්ස ධම්මාතිරේකධම්මවිසේසට්ඨේන අභිධම්මෝති චාහ" යනු මූලටීකා වචනයි. ෴ **[අර්ථශාලිනී අර්ථකථා සන්නය 21-23 පිටු]**

නිබ්බට්ටිත (නිබ්බත්තිත) පරමත්‍ථභාවේන අභි විසිට්ඨා ධම්මා එත්‍ථාති අභිධම්මෝ. ධම්මසඞ්ගණී ආදි සත්තප්පකරණං අභිධම්මපිටකං.

උපදවන ලද පරමාර්ථ භාවයෙන් ඉතා ශ්‍රේෂ්ඨ වූ ධර්මය මෙය වේනුයි අභිධර්මය නම්. ධම්මසඞ්ගණී ආදී සප්ත ප්‍රකරණය අභිධර්ම පිටකයයි.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 03 පිට]**

**අභිධම්මේති** නාමරූපපරිච්ඡේදේ.

**[සාරත්ථදීපනී ටීකා 03 (ඡට්ඨසඞ්ගායනා අංක 145-147 යටතේ)]**

**අභිධම්මේති** විසිට්ඨේ ධම්මේ, ඉමේසු සත්තතිංසබෝධිපක්ඛියධම්මේසූති අත්ථෝ.

**[ම.නි. උපරිපණ්ණාස අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 35 යටතේ); මජ්ඣිමනිකාය අටුවා 20 පිට (හේ.වි. මු); ධම්මසඞ්ගණීප්පකරණ සංශෝධනය xiv පිට (බු.ජ)]**

අපිච ධම්මාතිරේකධම්මවිසේසභාවතෝ චස්ස විසිට්ඨභාවෝ වේදිතබ්බෝ. අභිධම්මේ හි නිප්පදේසතෝ ඛන්ධායතනාදිධම්මානං විභත්තත්තා ඉතරද්වයතෝ අතිරේකතරා, විසිට්ඨා ච පාළි හෝති, තස්මා අතිරේකස්ස, විසිට්ඨස්ස ච පාළිධම්මස්ස වසේන ඉදමේව තීසු පිටකේසු උත්තමන්ති වත්තුං වට්ටති. යථාවුත්තවිසිට්ඨභාවයෝගතෝයේව චේතං "අභිධම්මපිටක"න්ති වුච්චති අභි-සද්දස්ස විසිට්ඨභාවජෝතනතෝ. අපිච වුඩ්ඪිමන්තාදිධම්මානං එත්ථ වුත්තත්තා චේතං අභිධම්මපිටකං. යථාහු පෝරාණා

"යං එත්ථ වුඩ්ඪිමන්තෝ, සලක්ඛණා පූජිතා පරිච්ඡින්නා;
වුත්තාධිකා ච ධම්මා, අභිධම්මෝ තේන අක්ඛාතෝ"ති.

*(දී. නි. අට්ඨ. 1.පඨමමහාසඞ්ගීතිකථා; පාරා. අට්ඨ. 1.පඨමමහාසඞ්ගීතිකථා; ධ. ස. අට්ඨ. නිදානකථා);*

තථා හෙත්ථ "රූපූපපත්තියා මග්ගං භාවේති, මෙත්තාසහගතේන චේතසා ඒකං දිසං ඵරිත්වා විහරතී"තිආදිනා (ධ. ස. 160 ආදයෝ) වුඩ්ඪිමන්තෝපි ධම්මා වුත්තා, "රූපාරම්මණං වා සද්දාරම්මණං වා"තිආදිනා (ධ. ස. 1) නයේන ආරම්මණාදීහි ලක්ඛිතබ්බත්තා සලක්ඛණාපි "සෙක්ඛා ධම්මා අසෙක්ඛා ධම්මා, ලෝකුත්තරා ධම්මා"තිආදිනා නයේන පූජිතා පූජාරහාපි "ඵස්සෝ හෝති, වේදනා හෝතී"තිආදිනා (ධ. ස. 1) නයේන සභාවපරිච්ඡින්නත්තා පරිච්ඡින්නාපි "මහග්ගතා ධම්මා අප්පමාණා ධම්මා (ධ. ස. තිකමාතිකා 12, දුකමාතිකා 99), අනුත්තරා ධම්මා"තිආදිනා නයේන අධිකා විසිට්ඨාපි ධම්මා වුත්තා, තස්මා අභි-සද්දස්ස වුඩ්ඪිආදිඅත්ථේසුපි පවත්තනතෝ "වුඩ්ඪිමන්තෝ ධම්මා එත්ථා"තිආදිනා නිබ්බචනේන ඉදං පිටකං "අභිධම්ම"න්ති වුච්චති.

**[අභිධම්මාවතාර අභිනවටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 04 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 24-26 පිටු]**

තවද ධර්මාතිරේක ධර්මවිශේෂ භාවයෙන් ද ඒ අභිධර්ම පිටකයාගේ විශිෂ්ඨ බව දතයුත්තේයි. යම්හෙයකින් අභිධර්මයෙහි නිශ්ප්‍රදේශ වශයෙන් ස්කන්ධායතනාදී ධර්මයන් බෙදනලද හෙයින් අනික් පිටක ද්වයට වඩා අතිශයින් අධික වූද විශිෂ්ඨ වූද පාළිය ඇත්තේ වේද එහෙයින් අධික වූද විශිෂ්ඨ වූද පාළි ධර්මයාගේ වශයෙන් මේ අභිධර්ම පිටකයම තුන් පිටකයන් අතුරෙන් උත්තම යැයි කියන්නට වටනේය. යට කියනලද විශිෂ්ඨ භාවයෙන් යුක්ත හෙයින්ම එය අභිධර්ම පිටකයයි කියනු ලැබේ. කුමක් හෙයින යත්? අභි යන උපසර්ග ශබ්දය තමා විශිෂ්ඨ භාව අර්ථය ප්‍රකාශ කරන හෙයිනි. තවද වෘද්ධිමන්තාදී ධර්මයන් මෙහි කියනලද හෙයින් ද එය අභිධර්ම පිටකයයි කියනු ලැබේ. එහෙයින් කීහු පුරාණාචාර්‍ය්‍යවරයෝ:—

> යං එත්ථ වුඩ්ඪිමන්තෝ සලක්ඛණා පූජිතා පරිච්ඡින්නා
> වුත්තාධිකා ච ධම්මා අභිධම්මෝ තේන අක්ඛාතෝ යි ෴

ඒ එසේමැයි; මෙහි "රූපූප්පත්තියා මග්ගං භාවේති, මෙත්තාසහගතේන චේතසා ඒකං දිසං ඵරිත්වා විහරති" යනාදී ක්‍රමයෙන් වෘද්ධිමත් වූ ධර්මයෝ ද වදරන ලද්දහ. "රූපාරම්මණං වා සද්දාරම්මණං වා" යනාදී ක්‍රමයෙන් අරමුණු ආදිය කරණකොටගෙන ලක්‍ෂිතව්‍ය හෙයින් සලක්ඛණ ධර්මයෝ ද වදරන ලද්දහ. "සෙක්ඛාධම්මා අසෙක්ඛාධම්මා ලෝකුත්තරා ධම්මා" යනාදී ක්‍රමයෙන් පූජාරහ ධර්මයෝ ද වදරන ලද්දහ. "ඵස්සෝ හෝති වේදනා හෝති" යනාදී ක්‍රමයෙන් ස්වභාවයෙන් පිලිසිඳිනා හෙයින් පරිච්ඡින්න ධර්මයෝ ද "මහග්ගතා ධම්මා අප්පමාණා ධම්මා අනුත්තරා ධම්මා" යනාදී ක්‍රමයෙන් අධික වූද විශිෂ්ඨ වූද ධර්මයෝ වදරන ලදහ. එහෙයින් අභි ශබ්දය වෘද්ධිමන්තාදී අර්ථයන්හිදු වැටෙන හෙයින් "වුඩ්ඪිමන්තෝ ධම්මා එත්ථාති" යනාදී නිර්වචන වශයෙන් මේ පිටකය අභිධර්මයයි කියනු ලැබේ ෴ **[අභිධර්මාවතාර මහෝදධි ටීකා සන්නය 14-15 පිටු]**

අභි අතිරේකෝ අභි විසිට්ඨෝ වා ධම්මෝ අභිධම්මෝති වුත්තේ නාමරූප පරිච්ඡේදකං අභිධම්ම පිටකන්ති ආහ.

**[පාචිත්තියාදියෝජනාපාළි (ඡට්ඨසඞ්ගායනා අංක 84 යටතේ)]**

තත්ථ තස්මිං අභිධම්මේ සබ්බථා කුසලාදී වසේන ඛන්ධාදි වසේනව වුත්තා අභිධම්මත්ථා, පරමත්ථතෝ සම්මුතිං ඨපෙත්වා නිබ්බත්තිත පරමත්ථ වසේන, චිත්තං විඤ්ඤාණක්ඛන්ධෝ, චේතසිකං වේදනාදි ඛන්ධත්තයං, රූපං භූතුපාදයා

භේදභින්නෝ රූපක්ඛන්ධෝ, නිබ්බානං මග්ගඵලානමාලම්බන භූතෝ අසඞ්ඛතධම්මෝති ඒවචතුධා චතුහාකරේහි ඨිතාති යෝජනා.

තත්ථ පරමෝ උත්තමෝ අවිපරීතෝ අත්ථෝ පරමස්ස වා උත්තමස්ස ඤාණස්ස අත්ථෝ ගෝචරෝති පරමත්ථෝ.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 02 යටතේ) විභාවනී ටීකාව 14 පිට]**

**තත්ථ (තස්මිං අභිධම්මේ)** ඒ අභිධර්ම සප්තප්‍රකරණයෙහි **තථාගතේන** තථාගතයන් වහන්සේ විසින් **සබ්බථා** සර්වාකාරයෙන් **කුසලාදිවසේන ච ඛන්ධාදිවසේන ච** කුශලාදීන්ගේ වශයෙන් හා ස්කන්ධාදීන්ගේ වශයෙන් **වුත්තා** වදාරන ලද්දාවූ **අභිධම්මත්ථා** අභිධර්මාර්ථයෝ **පරමත්ථතෝ සම්මුතිං ඨපෙත්වා නිබ්බත්තිත පරමත්ථවසේන** සම්මුති ප්‍රඥප්තිය හැර හෙවත් සම්මුති ප්‍රඥප්තියෙන් වෙන්කොට ගන්නා ලද්දාවූ අවිපරීත පරමාර්ථයාගේ වශයෙන් **චිත්තං (විඤ්ඤාණක්ඛන්ධෝ)** විඤ්ඤාණස්කන්ධය ද **චේතසිකං (වේදනාදිඛන්ධත්තයං)** වේදනාදී ස්කන්ධත්‍රයයාගේ සමූහය ද **රූපං (භූතෝපාදයභේදභින්නෝ රූපක්ඛන්ධෝ)** සතර මහාභූතරූපය සූවිසි උපාදයරූපය යන මොහුන්ගේ ප්‍රභේදයන්ගේ වශයෙන් වෙනස් වූ රූපස්කන්ධය ද **නිබ්බානං (මග්ගඵලානමාලම්බනභූතෝ අසඞ්ඛතධම්මෝ)** මාර්ග ඵලයන්ට අරමුණු වූ අසඞ්ඛත ධර්මය දැයි **ඒවං** මෙසේ **චතුධා (චතූහි ආකාරේහි)** සතරාකාරයෙකින් **ඨිතා** සිටියාහුය **ඉති යෝජනා** මෙසේ අර්ථ යෝජනාව **කාතබ්බා** කටයුතුයි.

(තත්ථ යන්නෙහි "ත්ථ" විභත්තිය නිද්ධාරණ අර්ථයෙහි ද, බහුවචනාර්ථයෙහි ද නොව ඒකවචනාර්ථයෙහිම වෙයි යන බව දක්වනු පිණිස "තස්මිං" යනු කියනලදි. තස්මිං යන පදයාගේ අභිධෙය්‍යාර්ථය "අභිධම්මේ" යන පාඨයෙන් දක්වනලදි. "සබ්බථා" යන පදයාගේ අභිධෙය්‍යාර්ථය දක්වන පිණිස "කුසලාදී ඛන්ධාදී" යන පාඨය කියනලදි. "ථා" ප්‍රත්‍යය තෙමේ නිපාත ප්‍රත්‍යය වූ හෙයින් "ථා" ප්‍රත්‍යයෙන් පරවූ සප්තවිභක්තියම ලොප් වියයුතු හෙයින් මෙහි වනාහි විශේෂණාර්ථයෙහි විභක්ති ලෝපය වන්නේ යැයි දක්වන පිණිස "වසේන" යනු කියනලදි. "පරමත්ථතෝ" යන මෙහි "තෝ" ප්‍රත්‍යය තෙම පඤ්චම්‍යාර්ථයෙහි නොවෙයි විශේෂණාර්ථයෙහිම වන්නේය යන බව දක්වන පිණිස "පරමත්ථවසේන" යනු කියනලදි. "චිත්ත" ශබ්දය තෙමේ චිත්ත නම් ගෘහපතියාය විචිත්‍ර කර්මාන්තය යනාදී අර්ථයෙහි ද වන හෙයින් මේ ස්ථානයෙහි ඒ අර්ථයෙහි නොව ඒකූනනවුති ප්‍රභේද වූ චිත්තය යැයි කියනලද විඤ්ඤාණස්කන්ධයෙහි පවත්නේ යැයි දක්වන පිණිස "චිත්තං" යන්න "විඤ්ඤාණක්ඛන්ධෝ" යනුවෙන් වර්ණනා කෙළේයි. "චේතසික" ශබ්දය "චේතසා කතං චේතසිකං" යන කත තද්ධිතයෙහි කළ කල්හි සිතින් කරනලද ක්‍රියාව හා චිත්තජ රූපය ද ලැබෙන හෙයින් ඒ සිතින් කරනලද ක්‍රියාව හා චිත්තජ රූපයන් ද වළක්වන පිණිස "චේතසිකං" යන්න "වේදනාදිඛන්ධත්තයං" යනුවෙන් අර්ථ වර්ණනා කරනලදි. "රූප" ශබ්දය තෙමේ රුප්පනලක්ෂණ විරහිත වූ ලෞකික චිත්ත චෛතසික යැයි කියනලද පියරූප සාතරූපයෝ ද වාචක වෙයි. ඒ පියරූප සාතරූපයන් වළක්වන පිණිස හා රුප්පනලක්ෂණය ඇත්තා වූ අටවිසි රූපයන් අතුරෙන් ඒකේකී රූපයන්ම නොව සියළුම රූපයෝම කැමති වන්නේය යන අර්ථය දක්වන පිණිස "භූතෝපාදයභේදභින්නෝ" යන විශේෂණය කරනලදි. "නිබ්බාන" ශබ්දය තෙමේ අරිහත් ඵලය ද වාචක වන බැවින් ඒ අර්ථය වලක්වා අසඞ්ඛත ධාතුවම මෙහි වාචක වන බව දක්වන පිණිස "නිබ්බානං" යන්න "අසඞ්ඛතධම්මෝ" යනුවෙන් අර්ථ වර්ණනා කරනලදි. ප්‍රඥප්තිය ද අසඞ්ඛත ධාතු නම් වන හෙයින් ප්‍රඥප්තිය වළක්වන පිණිස "මග්ගඵලානමාලම්බනභූතෝ" යන විශේෂණ පදය කියනලදි. "ඉති" ශබ්දය තෙමේ

විපල්ලාසය හේතුය ඉදමත්ථය යන අර්ථයන්හි ද පවත්නා හෙයින් "නිබ්බානමිති" යන පදයෙහි ඉති ශබ්දය වනාහි ඒ අර්ථයෙහි නොව ස්වරූප නිදර්ශණාර්ථයෙහි වන්නේය යන බව දක්වන පිණිස ඉති ශබ්දය "ඒවං" යන්නෙන් වර්ණනා කරනලදි. "චතුධා" යන්නෙහි ධා-ප්‍රත්‍යය විභාගාර්ථ ප්‍රකාරාර්ථ යන අර්ථ ද්වයෙහි පවත්නේ ද මේ ස්ථානයෙහි ධා-ප්‍රත්‍යයෙන් පරවූ විභක්ති ලොප් වූ තැනයැයි දක්වන පිණිස "චතුධා" යන්න "චතූහි ආකාරේහි" යනුවෙන් අර්ථ වර්ණනා කරනලදි. "ඨිතා" යන පදය වනාහි කාරක තෙම ක්‍රියාවෙන් වෙන්ව නොවිය යුතු හෙයින් "අභිධම්මා" යන කර්තෘ කාරකයාගේ සම්බන්ධයෙහි ක්‍රියා පිණිස තබනලදි.)

**තත්‍ථ** ඒ තත්‍ථ වුත්තා යනාදී ගාථාවෙහි **අවයවත්ථෝ** අවයව වූ අර්ථය **ඒවං** මෙසේ **වේදිතබ්බෝ** දතයුතුයි **පරමෝ (උත්තමෝ)** උතුම් වූ **අවිපරීතෝ** නොපෙරළෙන්නා වූ **අත්ථෝ** අර්ථය **පරමත්ථෝ** පරමත්ථ නම් වේ.෴

(පරම ශබ්දය තෙමේ ප්‍රමාණාර්ථ අතිරේකාර්ථයන්හි පවත්නා හෙයින් ඒ අර්ථය වළක්වන පිණිස ද උත්තමාර්ථයෙහි වැටෙන බව දක්වන පිණිස "පරම" ශබ්දය "උත්තමෝ" යනුවෙන් වර්ණනා කරනලදි. කුමක් හෙයින් සතරාකාර පරමාර්ථ ධර්මය තෙම උතුම් වන්නේ ද යන චෝද්‍යයට පරිහාර පිණිස "අවිපරීතෝ" යි අර්ථ වර්ණනා කරනලදි. "පරමෝ අත්ථෝ පරමත්ථෝ" යි විශේෂණ පූර්වපද කර්මධාරය සමාසය කටයුතුයි)

**වා** නොහොත් **යෝ සභාවෝ** යම් ස්වභාව ධර්මයක් තෙමේ **පරමස්ස (උත්තමස්ස)** උතුම් වූ **ඤාණස්ස** සර්වඥතා ඥාණයට **අත්ථෝ (ගෝචරෝ) හෝති** අරමුණු වේද **ඉති (තස්මා)** එසේ හෙයින් **සෝ සභාවෝ** ඒ ස්වභාව ධර්මය තෙමේ **පරමත්ථෝ** පරමාර්ථ නම් වේ.෴

(මේ පසුව කියනලද විග්‍රහයෙහි පරම ශබ්දය උත්තමාර්ථයෙහි වැටෙයි. උත්තම ශබ්දයාගේ අර්ථය ඥාණයයි දක්වන පිණිස "උත්තමස්ස ඤාණස්ස" යන්නෙන් අර්ථ වර්ණනා කරනලදි. අත්ථ ශබ්ද තෙමේ ආරම්මණ වාචක වන බව දක්වන පිණිස "අත්ථෝ" යන්න "ගෝචරෝ" යන්නෙන් වර්ණනා කරනලදි. "අරියතිඤායතීති අත්ථෝ" යි විග්‍රහ කොට "පරමස්ස අත්ථෝ පරමත්ථෝ" යි ෂෂ්ඨී තත්පුරුෂ සමාස කටයුතුයි)

**[විභාවනී ටීකා සන්නය 29-31 පිටු]**

දෙවි, මිනිස්, ඇත්, අස්, ගව, මැසි. මදුරු ආදී කුඩා මහත් සියළු සතුන් හා පස්, ගල්, දිය, සුළං, ගස්, වැල් ආදී සියළු වස්තූන් ද සෑදෙන මූල ධාතූන් විභාග කොට දක්වන්නා වූ ද ඒ මූල ධාතූන් ඇතිවන සැටි පරම්පරා වශයෙන් පවත්නා සැටි උගන්වන්නා වූ ද නිර්වාණ ධාතුව විභාග කොට දක්වන්නා වූ ද ධර්මය අභිධර්මයයි.

**[අභිධර්ම මාර්ගය 21 පිට]**

අතිරේක ධර්මයට හෙවත් විශේෂ ධර්මයට අභිධර්මය යැයි කියනු ලැබේ. සූත්‍ර විනය ධර්මයන්ට වඩා අතිරේකයක් අභිධර්මයෙහි ඇත. සූත්‍රාන්තයෙහි "ඒවං මේ සුතං" ආදී වශයෙන් හෝ "වුත්තමිදං භගවතා" යනාදී හෝ විනයෙහි "තෙන ඛෝ පන සමයේන" යනාදීන් නිදානයන් දක්වා ඇත. මෙහි කෙලින්ම කාරණයට බැස ඇත. නිදානයක් එක් කිරීම් මාත්‍රයකින්වත් මෙහි සම්මුතිය කිට්ටුකරගෙන නැත. එය මෙහි ඇති අතිරේක ලක්‍ෂණයකි, ගුණයෙකි, විශේෂයෙකි.

චතුරාර්‍ය සත්‍යයෙහි සියල්ල ඇතුළත් කරණ විට කෙබඳු සම්මුතීන්ට බැස සිටියත් අභිධර්මයෙහිම ඇතුළත්වනු දක්නා ලැබේ. නිවන් දැකීම හුදෙක් අභිධර්මය ප්‍රත්‍යක්‍ෂයෙන් දැකීමයි. සුත්ත, සුත්තානුලෝම, ආචරියවාද, අත්තනෝමත යන සතර ධර්ම විනිශ්චයෙහිදී සුත්ත යනුවෙන් දැක්වූයේ අභිධර්මයයි. චතුසච්චසුත්ත යනුවෙන් එය නෙත්තියෙහි සඳහන් වෙයි. බුදු දහමෙහි සියුම් සාරය අභිධර්මයයි. එහෙයින් මෙය අතිවිශිෂ්ඨ වූ විශේෂ ධර්මයයි. **[සිත සිරුර සහ නිවන හෙවත් ධම්මසඞ්ගණී 02 පිට]**

## අභිධර්මයෙහි ගම්භීර භාවය:—

ඉමස්ස අභිධම්මස්ස ගම්භීරභාවවිජානනත්ථං **චත්තාරෝ සාගරා** වේදිතබ්බා; සංසාරසාගරෝ, ජලසාගරෝ, නයසාගරෝ, ඤාණසාගරෝති. තත්ථ **සංසාරසාගරෝ** නාම

බන්ධානඤ්ච පටිපාටි, ධාතුආයතනාන ච;
අබ්බොච්ඡින්නං වත්තමානා, සංසාරෝති පවුච්චතීති.

ඒවං වුත්තං සංසාරවට්ටං. ස්වායං යස්මා ඉමේසං සත්තානං උප්පත්තියා පුරිමා කෝටි න පඤ්ඤායති එත්තකානඤ්හි වස්සසතානං වා වස්සසහස්සානං වා වස්සසතසහස්සානං වා, කප්පසතානං වා කප්පසහස්සානං වා කප්පසතසහස්සානං වා මත්ථකේ සත්තා උප්පන්නා, තතෝ පුබ්බේ නාහේසුන්ති වා, අසුකස්ස නාම රඤ්ඤො කාලේ උප්පන්නා, අසුකස්ස බුද්ධස්ස කාලේ උප්පන්නා තතෝ පුබ්බේ නාහේසුන්ති වා, අයං පරිච්ඡේදෝ නත්ථි; "පුරිමා, භික්ඛවේ, කෝටි න පඤ්ඤායති අවිජ්ජාය, ඉතෝ පුබ්බේ අවිජ්ජා නාහෝසි අථ පච්ඡා සමභවී"ති (අ. නි. 10.61) ඉමිනා පන නයේන සංසාරසාගරෝ අනමතග්ගෝව.

මහාසමුද්දෝ පන **ජලසාගරෝ** නාමාති වේදිතබ්බෝ. සෝ චතුරාසීතියෝජනසහස්සගම්භීරෝ. තත්ථ උදකස්ස ආළ්හකසතේහි වා ආළ්හකසහස්සේහි වා ආළ්හකසතසහස්සේහි වා පමාණං නාම නත්ථි. අථ ඛෝ අසඞ්ඛෙය්‍යයෝ අප්පමෙය්‍යෝ මහාඋදකක්ඛන්ධෝත්වේව සඞ්ඛ්‍යං ගච්ඡති. අයං ජලසාගරෝ නාම.

කතමෝ **නයසාගරෝ**? තේපිටකං බුද්ධවචනං. ද්වේපි හි තන්තියෝ පච්චවෙක්ඛන්තානං සද්ධාසම්පන්නානං පසාදබහුලානං ඤාණුත්තරානං කුලපුත්තානං අනන්තං පීතිසෝමනස්සං උප්පජ්ජති. කතමා ද්වේ? විනයඤ්ච අභිධම්මඤ්ච. විනයධරභික්ඛූනඤ්හි විනයතන්තිං පච්චවෙක්ඛන්තානං දෝසානුරූපං සික්ඛාපදපඤ්ඤපනං නාම; ඉමස්මිං දෝසේ ඉමස්මිං වීතික්කමේ ඉදං නාම හෝතීති සික්ඛාපදපඤ්ඤපනං අඤ්ඤෙසං අවිසයෝ බුද්ධානමේව විසයෝති. උත්තරිමනුස්සධම්මපෙය්‍යාලං පච්චවෙක්ඛන්තානං නීලපෙය්‍යාලං පච්චවෙක්ඛන්තානං සඤ්චරිත්තපෙය්‍යාලං පච්චවෙක්ඛන්තානං අනන්තං පීතිසෝමනස්සං උප්පජ්ජති. ආභිධම්මිකභික්ඛූනම්පි ඛන්ධන්තරං ආයතනන්තරං ධාත්වන්තරං ඉන්ද්‍රියන්තරං බලබොජ්ඣඞ්ගකම්මවිපාකන්තරං රූපාරූපපරිච්ඡේදං සණ්හසුඛුමධම්මං ගගනතලේ තාරකරූපානි ගණ්හන්තෝ විය රූපාරූපධම්මේ පබ්බං පබ්බං කොට්ඨාසං කොට්ඨාසං කත්වා විභජන්තෝ දස්සේසි වත නෝ සත්ථාති අභිධම්මතන්තිං පච්චවෙක්ඛන්තානං අනන්තං පීතිසෝමනස්සං උප්පජ්ජති.

ඒවං උප්පත්තියා පනස්ස ඉදං වත්ථුපි වේදිතබ්බං **මහාගතිගමියතිස්සදත්තත්ථේරෝ** කිර නාම මහාබෝධිං වන්දිස්සාමීති පරතීරං ගච්ඡන්තෝ නාවාය උපරිතලේ නිසින්නෝ මහාසමුද්දං ඕලෝකේසි. අථස්ස තස්මිං සමයේ නේව පරතීරං පඤ්ඤායිත්ථ, න ඕරිමතීරං, ඌමිවේගප්පභේදසමුග්ගතජලචුණ්ණපරිකිණ්ණෝ පන පසාරිතරජතපට්ටසුමනපුප්ඵසන්ථරසදිසෝ මහාසමුද්දෝව පඤ්ඤායිත්ථ. සෝ කිං නු ඛෝ මහාසමුද්දස්ස ඌමිවේගෝ බලවා උදාහු චතුවීසතිප්පභේදේ සමන්තපට්ඨානේ නයමුඛං බලවන්ති චින්තේසි. අථස්ස මහාසමුද්දේ පරිච්ඡේදෝ පඤ්ඤායති; අයඤ්හි හෙට්ඨා මහාපථවියා පරිච්ඡින්නෝ, උපරි ආකාසේන, ඒකතෝ චක්කවාළපබ්බතේන, ඒකතෝ වේලන්තේන පරිච්ඡින්නෝ; සමන්තපට්ඨානස්ස පන පරිච්ඡේදෝ න පඤ්ඤායතීති සණ්හසුඛුමධම්මං පච්චවෙක්ඛන්තස්ස බලවපීති උප්පන්නා. සෝ පීතිං වික්ඛම්භෙත්වා විපස්සනං වඩ්ඪෙත්වා යථානිසින්නෝව සබ්බකිලේසේ ඛෙපෙත්වා අග්ගඵලේ අරහත්තේ පතිට්ඨාය උදානං උදානේසි;

අත්ථේව ගම්භීරගතං සුදුබ්බුධං,
සයං අභිඤ්ඤාය සහේතුසම්භවං;

යථානුපුබ්බං නිඛිලේන දේසිතං,
මහේසිනා රූපගතංව පස්සතීති. අයං නයසාගරෝ නාම.

කතමෝ **ඤාණසාගරෝ**? සබ්බඤ්ඤුතඤ්ඤාණං ඤාණසාගරෝ නාම. අයං සංසාරසාගරෝ නාම, අයං ජලසාගරෝ නාම, අයං නයසාගරෝ නාමාති හි අඤ්ඤේන න සක්කා ජානිතුං, සබ්බඤ්ඤුතඤ්ඤාණේනේව සක්කා ජානිතුන්ති සබ්බඤ්ඤුතඤ්ඤාණං ඤාණසාගරෝ නාම. ඉමේසු චතූසු සාගරේසු ඉමස්මිං ඨානේ නයසාගරෝ අධිප්පේතෝ. ඉමඤ්හි සබ්බඤ්ඤුබුද්ධාව පටිවිජ්ඣන්ති.

තථාගතෝ තාවතිංසභවනේ පාරිච්ඡත්තකමූලේ පණ්ඩුකම්බලසිලායං දසසහස්සචක්කවාළදේවතානං මජ්ඣේ නිසින්නෝ මාතරං කායසක්ඛිං කත්වා කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මාති ධම්මං දේසෙන්තෝ සතභාගේන සහස්සභාගේන සතසහස්සභාගේන ධම්මන්තරා ධම්මන්තරං සඞ්කමිත්වා සඞ්කමිත්වාව දේසේසි. තයෝ මාසේ නිරන්තරං පවත්තිතදේසනා වේගේන පවත්තා ආකාසගඞ්ගා විය අධෝමුඛඨපිතඋදකඝටා නික්ඛන්තඋදකධාරා විය ච හුත්වා අනන්තා අපරිමාණා අහෝසි.

බුද්ධානඤ්හි භත්තානුමෝදනකාලේපි ථෝකං වඩ්ඪෙත්වා අනුමෝදෙන්තානං දේසනා දීඝමජ්ඣිමනිකායප්පමාණා හෝති. පච්ඡාභත්තං පන සම්පත්තපරිසාය ධම්මං දේසෙන්තානං දෙසනා සංයුත්තඅඞ්ගුත්තරිකද්වේමහානිකායප්පමාණාව හෝති. කස්මා? බුද්ධානඤ්හි භවඞ්ගපරිවාසෝ ලහුකෝ දන්තාවරණං සුඵුසිතං මුඛාදානං සිලිට්ඨං ජිව්හා මුදුකා සරෝ මධුරෝ වචනං ලහුපරිවත්තං. තස්මා තං මුහුත්තං දේසිතධම්මෝපි එත්තකෝ හෝති. තේමාසං දෙසිතධම්මෝ පන අනන්තෝ අපරිමාණෝයේව.

**ආනන්දත්ථේරෝ** හි බහුස්සුතෝ තිපිටකධරෝ පඤ්චදස ගාථාසහස්සානි සට්ඨි පදසහස්සානි ලතාපුප්ඵානි ආකඩ්ඪන්තෝ විය ඨිතපදෙනේව ඨත්වා ගණ්හාති වා වාචේති වා දේසේති වා. එත්තකෝ ථේරස්ස ඒකෝ උද්දේසමග්ගෝ නාම හෝති.

ථේරස්ස හි අනුපදං උද්දේසං දදමානෝ අඤ්ඤො දතුං න සක්කෝති, න සම්පාපුණාති. සම්මාසම්බුද්ධෝව සම්පාපුණෙය්‍ය. ඒවං අධිමත්තසතිමා අධිමත්තගතිමා අධිමත්තධිතිමා සාවකෝ සත්ථාරා තේමාසං ඉමිනා නීහාරේන දේසිතදේසනං වස්සසතං වස්සසහස්සං උග්ගණ්හන්තෝපි මත්ථකං පාපේතුං න සක්කෝති.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා නිදාන කථා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 09-14 පිටු (හේ.වි.මු); විභඞ්ගප්පකරණ අටුවා සන්නය 01/X-XIII පිටු]**

**ඉමස්ස අභිධම්මස්ස** මේ අභිධර්මයාගේ **ගම්භීරභාවවිජානනත්ථං** ගැඹුරු බව දැනගණු පිණිස **සංසාරසාගරෝ** සංසාරසාගරය **ජලසාගරෝ** ජලසාගරය **නයසාගරෝ** නයසාගරය **ඤාණසාගරෝ ඉති** ඤාණසාගරයයි **චත්තාරෝ සාගරා** සතර සාගර කෙනෙක් **වේදිතබ්බා** දතයුත්තාහුය **තත්‍ථ** ඒ සතර සාගරයන් අතුරෙන් **ඛන්ධානඤ්ච** ස්කන්ධයන්ගේ ද **ධාතුආයතනානඤ්ච** ධාතු ආයතනයන්ගේ ද (මෙහි නිග්ගහීත ලෝපයි) **අබ්බොච්ඡින්නා** නොසිඳී වත්තමානා පවත්නා වූ (හෙවත්) හටගන්නා වූ පටිපාටි පිළිවෙළ **සංසාරෝති** සංසාර නම් වේ **ඉති පවුච්චති** මෙසේ කියනු ලැබේ **ඉති ඒවං** මෙසේ **(භගවතා) වුත්තං** භාගවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දවූ **සංසාරවට්ටං** සංසාරය යැයි කියනලද්ද වූ වෘත්තය **සංසාරසාගරෝ නාම** සංසාරසාගර නම් වූයේ **යස්මා** යම්හෙයකින් ("න පඤ්ඤායති අනමතග්ගෝව" යන දෙපදයෙහි සම්බන්ධ කරණු) **ඉමේසං සත්තානං** මේ සත්ත්වයන්ගේ **උප්පත්තියා** උප්පාදයාගේ **පුරිමා කෝටි** පළමුවන කෙළවර **න පඤ්ඤායති** නොපෙණෙයි **හි** ඒ එසේමැයි (හෙවත්) **හි (යස්මා)** යම්හෙයකින් (අයං පරිච්ඡේදෝ නත්‍ථි යන්නෙහි සම්බන්ධ කරණු) **එත්තකානං වස්සසතානං වා** මෙපමණ වර්ෂ සතයන්ගේ හෝ **වස්සසහස්සානං වා** වර්ෂ සහස්‍රයන්ගේ හෝ **වස්සසතසහස්සානං වා** වර්ෂ සතසහස්‍රයන්ගේ හෝ **කප්පසතානං වා** කල්ප සතයන්ගේ හෝ **කප්පසහස්සානං වා** කල්ප සහස්‍රයන්ගේ හෝ **කප්පසතසහස්සානං වා** කල්ප සතසහස්‍රයන්ගේ හෝ **මත්ථකේ** මතුයෙහි **සත්තා** සත්ත්වයෝ තුමූ **උප්පන්නා** පළමුවෙන් උපන්නාහුය **තතෝ** ඒ කල්පසතසහස්‍රයන්ගෙන් **පුබ්බේ** පූර්වයෙහි **නාහේසුං ඉති වා** නොවූවාහුයයි කියා හෝ **අසුකස්ස නාම රඤ්ඤො කාලේ** අසවල් නම් රජුගේ කාලයෙහි **සත්තා උප්පන්නා** සත්ත්වයෝ පළමුවෙන් උපන්නාහුය **අසුකස්ස බුද්ධස්ස කාලේ** අසවල් බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි **සත්තා උප්පන්නා** සත්ත්වයෝ පළමුවෙන් උපන්නාහුය **තතෝ පුබ්බේ** එයින් පූර්වයෙහි **නාහේසුං ඉති වා** නොවූවාහුයයි කියා හෝ **අයං පරිච්ඡේදෝ** මේ පිරිසිඳීම **නත්‍ථි** නැත්තේයි **තස්මා** එහෙයින් **පුරිමා කෝටි** සංසාරය සම්බන්ධ පූර්ව කෙළවර **න පඤ්ඤායති** නොවැටහෙයි **පන** පුග්ගලාධිට්ඨානයෙන් අන්‍යවූ ධර්මාධිට්ඨානය දක්වමි **භික්ඛවේ** මහණෙනි! **ඉතෝ පුබ්බේ** මෙයින් පූර්වයෙහි **අවිජ්ජා නාහෝසි** අවිද්‍යාව නූපන්නීය **අථ පච්ඡා** නැවත පසුව **සම්භවීති** අවිද්‍යාව හටගත්තී යයි **අවිජ්ජාය** අවිද්‍යාවගේ **පුරිමා කෝටි** පූර්ව කෙළවර **න පඤ්ඤායති** නොවැටහෙයි **ඉමිනා නයේන** මේ පුග්ගලාධිට්ඨාන ධම්මාධිට්ඨාන දේශනා ක්‍රමයෙන් **ස්වායං සංසාරසාගරෝ** ඒ සංසාරසාගර තෙමේ (මෙහි "අයං" යනු අභිමත නොවෙයි. පූර්වයෙහි "ස්වායං" යනු ඇත්තේයි) **අනමතග්ගෝව** නොදතහැකි ආදිය ඇත්තේමැයි (නොහොත් නොදතයුතු ආදිය ඇත්තේමැයි)

"අකම්මකේහි ධාතූහි භාවේකිච්චා භවන්ති තේ
සකම්මකේහි කම්මත්ථේ අරහසක්කත්ථදිපකා"

(යන ගාථාවෙහි "කිච්චා" යන්නෙන් කිච්ච ප්‍රත්‍යය කීයේ ද යේභුය්‍යන්‍යාය වශයෙන් කියන ලද්දේය. කර්මාර්ථයෙහි පවත්නා වූ කිතකප්‍රත්‍යයෝද අරහාර්ථ සක්කාර්ථයන් ප්‍රකාශ කරණ හෙයින් "අනමතග්ගෝච" යන තන්හි නොදතයුතු වූ ආදිය ඇත්තේ යයි අර්ථ ගතයුතුයි)

**පන** සංසාර සාගරයෙන් අන්‍යවූ ජලසාගරය කියම් **මහාසමුද්දෝ** මහාසමුද්‍ර තෙමේ **ජලසාගරෝ නාම** ජලසාගර නම් වේ **ඉති** මෙසේ **වේදිතබ්බෝ** දතයුත්තේයි **සෝ** ඒ ජලසාගර තෙමේ **චතුරාසීතියෝජනසහස්සගම්භීරෝ හෝති** සූවාසූදහසක් යොදුන් ගැඹුරු ඇත්තේ වෙයි **තත්‍ථ** ඒ සමුද්‍රයෙහි **උදකස්ස** ජලය **ආළ්හකසතේහි වා** නැළි සියගණනකින් හෝ **ආළ්හකසහස්සේහි වා** නැළි දහස්ගණනකින් හෝ **ආළ්හකසතසහස්සේහි වා** නැළි ලක්‍ෂ ගණනකින් හෝ **පමාණං නාම නත්‍ථි** මෙතෙකැයි ප්‍රමාණයක් නම් නැත්තේයි **අථ ඛෝ** ඒකාන්තයෙන් (නොහොත්) සත්‍ය වශයෙන් **අසඞ්ඛෙය්‍යෝ** ගණන නොදතහැකි වෙයි **අප්පමෙය්‍යෝච** ප්‍රමාණ නොකටහැකි වෙයි හෙවත් නොමිණිය හැකිවෙයි **මහාඋදකක්ඛන්ධෝත්වේච** මහත් වූ ජලස්කන්ධයකැයි කියාම **සඞ්ඛ්‍යං ගච්ඡති** ගණන්පථයට යෙයි **අයං සාගරෝ** මේ සාගර තෙමේ **ජලසාගරෝ නාම** ජලසාගර නම් වෙයි.

**නයසාගරෝ** නයසාගර තෙමේ **කතමෝ?** කවරයත්? **තේපිටකං** ත්‍රිපිටකයෙහි වදරණ ලද්දවූ **බුද්ධවචනං** බුද්ධවචන තෙමේ **නයසාගරෝ නාම** නයසාගර නම් වේ **හි** ඒ එසේමැයි **ද්වේපි තන්තියෝ** ද්විප්‍රකාර වූ පාළිහු **පච්චවෙක්ඛන්තානං** පස්විකන්නාවූ හෙවත් මෙනෙහි කරන්නාවූ **සද්ධාසම්පන්නානං** ශ්‍රද්ධාවෙන් සම්පූර්ණ වූ **පසාදබහුලානං** ප්‍රශාදය බහුලකොට ඇත්තාවූ **ඤාණුත්තරියානං** උතුම් නුවණ ඇත්තාවූ **කුලපුත්තානං** ආචාර කුල පුත්‍රයන්ට **අනන්තං පීතිසෝමනස්සං** කෙළවරක් නැත්තාවූ ප්‍රීති සෞමනස්‍යය **උප්පජ්ජති** උපදනේයි **කතමා ද්වේ?** කවර පාළිහු දෙදෙනෙක් ද යත්? **විනයඤ්ච** විනයපාළිය ද **අභිධම්මඤ්ච** අභිධර්මපාළිය ද (**පච්චවෙක්ඛන්තාං** ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ **සද්ධාසම්පන්නානං** -පෙ- **කුලපුත්තානං** ආචාර කුල පුත්‍රයන්ට **අනන්තං පීතිසෝමනස්සං** කෙළවරක් නැත්තා වූ ප්‍රීති සෞමනස්‍යය **උප්පජ්ජති** උපදනේයි) **හි** ඒ එසේමැයි (**මයා** මා විසින් **වුච්චතේ** ඊට පරිහාර කියණු ලැබේ) **විනයතන්තිං පච්චවෙක්ඛන්තානං** විනයපාළිය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ **විනයධරභික්ඛූනං** විනයධර භික්‍ෂූන්ට **දෝසානුරූපං** දෝෂයට සුදුසු වූ **සික්ඛාපදපඤ්ඤපනං නාම** ශික්‍ෂාපද පැණවීම වනාහි **ඉමස්මිං දෝසේ** මේ දෝෂයෙහි **ඉමස්මිං වීතික්කමේ** මේ ව්‍යතික්‍රමයෙහි (නොහොත්) **ඉමස්මිං දෝසේ සති** මෙබඳු දෝෂයක් ඇතිකල්හි **ඉමස්මිං විතික්කමේ සති** මෙබඳු ඉක්මවීමක් ඇති කල්හි **ඉදං නාම හෝති** මෙනම් වරදක් වන්නේ යයි **සික්ඛාපදපඤ්ඤපනං** ශික්‍ෂාපද පැනවීම **අඤ්ඤේසං** තථාගතයන් වහන්සේ හැර සෙස්සන්ට **අවිසයෝ** ගෝචර නොවන්නේය **බුද්ධානමේව** බුදුරජාණන් වහන්සේලාටම **විසයෝ ඉති** ගෝචර වන්නේ යයි **පච්චවෙක්ඛන්තානං** ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ **විනයධරභික්ඛූනං** වියනධර භික්‍ෂූන්ට ද **උත්තරිමනුස්සධම්මපෙය්‍යාලං** උත්තරිමනුෂ්‍යධර්ම පෙය්‍යාලය **පච්චවෙක්ඛන්තානං** ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ **භික්ඛූනං** භික්‍ෂූන්ට ද **නීලපෙය්‍යාලං** නීලපෙය්‍යාලය **පච්චවෙක්ඛන්තානං** ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ **භික්ඛූනං** භික්‍ෂූන්ට ද **සංචරිත්තපෙය්‍යාලං පච්චවෙක්ඛන්තානං** සංචරිත්තපෙය්‍යාලය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ භික්‍ෂූන්ට ද **අනන්තං පීතිසෝමනස්සං** කෙළවරක් නැති ප්‍රීති සෞමනස්‍යය **උප්පජ්ජති** උපදනේයි **ඛන්ධන්තරං** ස්කන්ධ විශේෂය -පෙ- **සන්හසුඛුමධම්මං** මටසිලුටු ධර්මය (හෙවත්) ඉතා සියුම් ධර්මය **ගගණතලේ** ආකාශ තලයෙහි

**තාරකරූපානි** තාරකාරූප සමූහයන් **ගණ්හන්තෝ විය** ගන්නෙකු මෙන් **රූපාරූපධම්මේ** නාමරූප ධර්මයන් **පබ්බං පබ්බං** පුරුක් පුරුක් වශයෙන් (හෙවත්) පරිච්ඡේද පරිච්ඡේද වශයෙන් **කොට්ඨාසං කොට්ඨාසං කත්‍වා** කොටස් කොටස් කොට **විභජන්තෝ** විභාග කරමින් **නෝ** අපගේ **සත්ථා** ශාස්තෘන් වහන්සේ **දේසේසි වත** දේශනා කළේ නොවේදැයි **ඉති** මෙසේ **අභිධම්මතන්තිං** අභිධර්ම පාළිය **පච්චවෙක්ඛන්තානං** ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ **ආභිධම්මිකභික්ඛූනම්පි** අභිධර්මය හදරණ භික්ෂූන්ට ද **අනන්තං පීතිසෝමනස්සං** අප්‍රමාණ වූ ප්‍රීති සෞමනස්‍යය **උප්පජ්ජති** උපදී.

**පන** තත් සම්බන්ධ වූ වාක්‍යයක් දක්වම් **අස්ස** ඒ ප්‍රීති සෞමනස්‍යයාගේ **ඒවං** මෙසේ **උප්පත්තියා** ඉපදීමෙහි **ඉදං වත්ථුම්පි** මේ වක්‍ෂ්‍යමාන වන්නාවූ වස්තුව ද **වේදිතබ්බං** දතයුත්තේයි **මහාගතිගම්යතිස්සදත්තථේරෝ නාම** (මහාගතිම්බයතිස්සදත්තථේරෝ නාම) මහාගතිගම්යතිස්සදත්ත ස්ථවිරතෙමේ වනාහි **මහාබෝධිං වන්දිස්සාමීති** මහබෝ වඳිමියි **පරතීරං** ජම්බුද්වීපයට **නාවාය ගච්ඡන්තෝ** නැවෙන් යනුයේ **නාවාය උපරිතලේ** නැව මත්තෙහි **නිසින්නෝ** වැඩහුන්නේ **මහාසමුද්දං** මහා සමුද්‍රය **ඕලෝකේසි කිර** බැළුවේය **අථ** නැවත **අස්ස** ඒ මහතෙරුන්ට **තස්මිං සමයේ** ඒ සමයෙහි **පරතීරං** එතර **නේව පඤ්ඤායිත්ථ** නොපෙනී ගියේය **ඕරිමතීරං** මෙතර ද **නේව පඤ්ඤායිත්ථ** නොපෙනී ගියේය **පන** ඒකාන්තයෙන් වනාහි **ඌමිවේගප්පභේදසමුග්ගතජලචුණ්ණපරිකිණ්ණෝ** රළ වේගයෙන් බිඳී බිඳී උඩට නැගෙන්නා වූ දියබින්දු ජලචූර්ණයෙන් හාත්පසින් ගැවසීගත්තාවූ **පසාරිතරජතපට්ටසුමනපුප්ඵසන්ථරසදිසෝ** දිගහරණාලද රිදීපටක් සමන්මල් ඇතිරියක් බඳුවූ **මහාසමුද්දෝව** මහා සමුද්‍රයම **පඤ්ඤායිත්ථ** පෙණින **සෝ** ඒ මහාස්ථවිර තෙමේ **කින්නු බෝ** කිමෙක්ද **මහාසමුද්දස්ස** මහාසමුද්‍රයාගේ ද **ඌමිවේගෝ බලවා කින්නු බෝ** රළ වේගය බලවත්දෝහෝයි **උදාහු** නොඑසේවීනම් **චතුවීසතිභේද** සූවිසි ප්‍රකරණයෙකින් ප්‍රභේදවත් වූ **සමන්තපට්ඨානේ** සමන්ත පට්ඨානප්‍රකරණයෙහි **නයමුඛං බලවං කින්නු බෝ** නයමුඛය බලවත්දෝහෝ **ඉති චින්තේසි** මෙසේ සිතූයේය **අථ** ඉක්බිත්තෙන් **අස්ස** ඒ මහතෙරුන්ට **මහාසමුද්දස්ස** මහාසමුද්‍රයාගේ **පරිච්ඡේදෝ** පිරිසිඳීම (හෙවත්) වෙන් කිරීම **පඤ්ඤායිත්ථ** පෙණීන **හි** ඒ එසේමැයි **අයං** මේ මහාසමුද්‍රය **හෙට්ඨා** යට **මහාපඨවියා** මහාපෘථිවියෙන් **පරිච්ඡින්නෝ** පිරිසිඳිනා ලද්දේය **උපරි** මත්තෙහි **ආකාසේන පරිච්ඡින්නෝ** අහසින් පිරිසිඳිනා ලද්දේය **ඒකතෝ** එක් පාර්ශවයකින් **චක්කවාලපබ්බතේන පරිච්ඡින්නෝ** සක්වළ ගලින් වෙන්කරණ ලද්දේය **ඒකේන** එක් පාර්ශවයකින් **වේලන්තේන පරිච්ඡින්නෝ** වෙරළින් වෙන්කරණ ලද්දේය **පන** විශේෂයෙන් වනාහි **සමන්තපට්ඨානස්ස** සමන්ත පට්ඨානහුගේ **පරිච්ඡේදෝ** පිරිසිඳීමෙක් **න පඤ්ඤායති** නොපෙණෙයි **ඉති** මෙසේ **සන්හසුඛුමධම්මං** සියුම් වූ ප්‍රණීත ධර්මය **පච්චවෙක්ඛන්තස්ස** ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ මහාතෙරුන්ට **බලවපීති උප්පන්නා** බලවත් ප්‍රීතිය උපන්නේය **සෝ** ඒ මහා ස්ථවිර තෙමේ **පීතිං වික්ඛම්භෙත්‍වා** ප්‍රීතිය වළක්වා **විපස්සනං වඩ්ඪෙත්‍වා** විවසුන් වඩා **යථා නිසින්නෝව** වැඩහුන් පරිද්දෙන්ම වැඩහිඳ **සබ්බකිලේසේ ඛේපෙත්‍වා** සියළු කෙලෙසුන් ගෙවා **අග්ගඵලේ** උතුම් ඵලය යැයි කියනලද්ද වූ **අරහත්තේ පතිට්ඨාය** අර්හත්වයේ පිහිටා **අත්ථේව -පෙ- පස්සතීති** අත්ථේව -පෙ- පස්සතීති යන **උදානං උදනේසි** ප්‍රීති වාක්‍යය පැවැත්වූයේය.

**සහේතුසම්භවං** හේතු ප්‍රත්‍යයාදී සූවිසිප්‍රත්‍යය යැයි කියනලද හේතූන්ගෙන් හටගත්තා වූ එක්සැත්තෑවක් සහේතුක චිත්තය මෝහමූලික දෙසිතෙහි මෝහය

වර්ජිත කොට ඇත්තා වූ දෙපණස් චෛතසිකය සහේතුක චිත්තජ රූපය සහේතුක පටිසන්ධි කර්මජ රූපයයි කියනලද්ද වූ ප්‍රත්‍යයෝත්පන්න ධර්මය **සයං** තෙමේම **අභිඤ්ඤාය** විශේෂවත් වූ සර්වඥතා ඤාණයෙන් දැන (හෙවත්) අවබෝධ කොට **නිබ්ලේන (කිඤ්චිනයං අනවසේසකේනභූතචා)** කිසි ක්‍රමයක් අවශිෂ්ට නොකොට (හෙවත්) ඉතිරි නොකොට **යථානුපුබ්බං** අනුලෝමාදීවූ ද ත්‍රිකාදීවූ ද පටිච්චවාරාදීවූ ද පච්චයානුලෝමාදීවූ ද හේතුමූලකාදීවූ දැයි කියනලද නානාප්‍රකාර ක්‍රමයෙන් (හෙවත්) පිළිවෙළින් **මහේසිනා** මහීෂී වූ තථාගතයාණන් වහන්සේ විසින් **දේසිතං** දේශනාකර වදරණ ලද්ද වූ (නොහොත්) **නිබ්ලේන** සියළු කෙලෙසුන්ගෙන් පවිත්‍ර වූ (හෙවත්) චේතෝබිලයන්ගෙන් පහවූ **මහේසිනා** මහීෂීහු විසින් **දේසිතං** දේශනා කරණ ලද්ද වූ **සුදුබ්බුධං** මන්දප්‍රාඥයන් විසින් අතිශයින් දැනගැනීමට දුෂ්කර වූ **ගම්භීරගතං** අතිශයින් ගැඹුරු වූ (නොහොත්) ගැඹුරු හටගැනීම් ඇත්තාවූ (**චතුවීසතිප්පභේදං** සූවිසි ප්‍රකරණයකින් ප්‍රභේද වූ **සමන්තපට්ඨානං** සමන්ත පට්ඨාන ප්‍රකරණය **යෝ බුද්ධසාවකෝ** යම් බුද්ධශ්‍රාවකයෙක් තෙමේ) **රූපගතං (හත්‍ථගතරූපං)** අත්ලෙහි නඟාලූ නිර්දෝශ මාණික්‍යයක් (**චක්ඛුනා** ප්‍රකෘති චක්‍ෂුප්‍රශාදය කරණකොටගෙන) **පස්සති ඉව** යම්සේ දක්නේ වේද (**තථා** එපරිද්දෙන් **පටිවේධඤාණේන පස්සති** ප්‍රතිවේධ ඤාණයෙන් දක්නේ වේද **සෝ බුද්ධසාවකෝ** එබඳු බුද්ධශ්‍රාවකයෙක් තෙමේ **ඉමස්මිං සාසනේ** මේ ශාසනයෙහි) **අත්ථේව** ඇත්තේමැයි (නොහොත්) **සහේතුසම්භවං** හේතුප්‍රත්‍යය සමඟ හටගන්නා වූ ධර්මය **සයං අභිඤ්ඤාය** තෙමේම දැන **නිබ්ලේන** නිර්ගත කරනලද චේතෝබිල ඇත්තාවූ **මහේසිනා** මහීෂීවූ සර්වඥයන් වහන්සේ විසින් **යථානුපුබ්බං** පිළිවෙළින් **දේසිතං** දේශනා කරන ලද්ද වූ **සුදුබ්බුධං** අතිශයින් අවබෝධ නොකටහැකි වූ **ගම්භීරගතං** ගැඹුරුවූ හටගැනීම් ඇත්තා වූ (**චතුවීසතිප්පභේදං** සූවිසි ප්‍රකරණයකින් ප්‍රභේදවූ **යං සමන්තපට්ඨානං අත්‍ථි** යම් සමන්ත පට්ඨානයක් ඇත්තේ වේද **තං** ඒ සමන්ත පට්ඨානය **බුද්ධසාවකෝ** බුද්ධශ්‍රාවක තෙමේ) **රූපගතං** අත්ලෙහි තබනලද මාණික්‍ය රත්නයක් මෙන් (**චක්ඛුනා පස්සති ඉව** ඇසින් දක්නාක් මෙන්) **පස්සති ඒව** දක්නේමැයි (**නෝ න පස්සති** නොදක්නේ නොවෙයි) ("යෝ යෝ අනුපුබ්බෝ යථානුපුබ්බං"යි අව්‍යයීභාව සමාස කරණු. "දේසිතං" යන්න හා සම්බන්ධ වන කල්හි තෘතීයා විභක්තියට "අංවිභත්තිනමකාරන්ත බ්‍යයීභාවා" යන සූත්‍රයෙන් අං-ආදේශ වෙයි. එහෙයින් මූලටීකායෙහි "යථානුපුබ්බන්ති යථානුපුබ්බේන" යනුවෙන් අර්ථ වර්ණනා කෙළේයි. "යථානුපුබ්බේන" යනුවෙන් ද අං-අදේශ නොකොටත් ඇත්තේය. තෘතියා විභක්තියට අං-ආදේශය ඒකාන්ත නොවේ.

"න පඤ්චම්‍යාය මම්භාවෝ ක්වචීති අධිකාරතෝ
තතියා සත්තමීජ්ට්ඨී නන්තුභෝති විකප්පතෝ" යනු රූපසිද්ධියි) **අයං සාගරෝ** මේ සාගර තෙමේ **නයසාගරෝ නාම** නයසාගරය නම් වෙයි.

**ඤාණසාගරෝ** ඤාණසාගර තෙමේ **කතමෝ?** කවරයත්? **සබ්බඤ්ඤුතඤාණං** සර්වඥතා ඤාණතෙමේ **ඤාණසාගරෝ නාම** ඤාණසාගරය නම් වෙයි **හි** ඒ එසේමැයි **හි** (නොහොත් **යස්මා**) යම්හෙයකින් **අයං සාගරෝ** මේ සාගරතෙමේ **සංසාරසාගරෝ** නාම සංසාර සාගරනම් වෙයි **අයං සාගරෝ ජලසාගරෝ නාම** මේ සාගරතෙමේ ජලසාගරය නම් වෙයි **අයං සාගරෝ නයසාගරෝ** මේ සාගරතෙමේ නයසාගරය නම් වෙයි **ඉති** මෙසේ **අඤ්ඤේන ඤාණේන** සර්වඥතා ඤාණයෙන් අන්‍යවූ ඤාණයක් කරණකොටගෙන **ජානිතුං න සක්කා** දැනගන්නට නොහැකි වෙයි **සබ්බඤ්ඤුතඤාණේනේව** සර්වඥතා ඤාණයෙන්ම **ජානිතුං සක්කා** දැනගන්නට

පිළිවන් වෙයි **ඉති (තස්මා)** එසේහෙයින් **සබ්බඤ්ඤුතඤ්ඤාණං** සර්වඥතා ඥාණය **ඤාණසාගරෝ නාම** ඥාණසාගරය නම් වෙයි **ඉමේසු චතුසු සාගරේසු** මේ සතර සාගරයන් අතරින් **ඉමස්මිං ඨානේ** මෙ ස්ථානයෙහි **නයසාගරෝ අධිප්පේතෝ** නයසාගරය අදහස් කරන ලද්දේයි (ආයුෂ්මත් අර්ථකථාචාරීන් වහන්ස! "අඤ්ඤෙද්න න සක්කා ජානිතුං සබ්බඤ්ඤුතඤ්ඤාණේනේව සක්කා ජානිතුං" යන පාඨයෙහි සර්වඥතා ඥාණය හැර අනික් ඥාණයකින් නොදත හැක්කේ යැයි කී කල්හි අග්‍රශ්‍රාවක මහශ්‍රාවකාදී වූ උත්තමයන් විසිනිදු නොදත හැක්කේය යන අර්ථය ලැබෙන්නේ නොවේ ද? මහාශ්‍රාවකාදී උත්තමයන් විසිනිදු මේ ධර්මය අවබෝධ කරණ ලද්දේ නොවේ දැයි යන චෝද්‍ය සඳහා "ඉමං" යනාදිය කීහ) **හි** ඒ එසේමැයි **ඉමං** මේ නයසාගරය **සබ්බඤ්ඤු බුද්ධා ඒව** සර්වඥ බුදුවරයෝම **පටිවිජ්ඣන්ති** ප්‍රතිවේධ කරන්නාහු වෙති (ශ්‍රාවකයෝ වනාහි භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවෙන්ම දැනගන්නාහුය යනු කී නියායි)

**තථාගතෝ** තථාගතයන් වහන්සේ **තාවතිංසභවනේ** තව්තිසා භවනෙහි **පාරිච්ඡත්තකමූලේ** පරසතුමදරා රුක්මුල් සමීපයෙහි **පණ්ඩුකම්බලසිලායං** පඬු ඇඹුල් සලස්නෙහි **දසසහස්සචක්වාලදේවතානං** දසදහසක් සක්වලින් එකවිට රැස්ව ආවාවූ දෙවියන්ගේ **මජ්ඣෙ** මධ්‍යයෙහි **නිසින්නෝ** වැඩහුන්නේ **මාතරං** මාතෘ දිව්‍යපුත්‍රයා **කායසක්ඛිං කත්වා** තමන් වහන්සේගේ ඉදිරියෙහි කොට **කුසලා ධම්මා අකුසලා ධම්මා අබ්‍යාකතා ධම්මාති** කුසලා ධම්මා -පෙ- ධම්මා යනුවෙන් **ධම්මං දේසෙන්තෝ** දහම් දෙසනුයේ **සතභාගේන** සියක් කොටසකින් **සහස්සභාගේන** දහසක් කොටසකින් **සතසහස්සභාගේන** ලක්‍ෂයක් කොටසින් **ධම්මන්තරා** අන්‍ය ධර්මයකින් **ධම්මන්තරං** අන්‍ය ධර්මයකට **සඞ්කමිත්වා සඞ්කමිත්වාව** සඞ්ක්‍රමණය කොට කොටම **දේසේසි** දේශනා කෙළේයි **තයෝ මාසේ** තුන්මසක් මුළුල්ලෙහි **නිරන්තරං** අතුරක් නැතිව **පවත්තිතදේසනා** වදරණ ලද්දවූ දේශනා තොමෝ **වේගේන** සීඝ්‍ර වූ වේගයෙන් පවත්තා **ආකාසගඞ්ගා විය ච** බස්නා වූ අහස්ගඟක් මෙන් ද (නොහොත්) වේගයෙන් බස්නා වූ උදකධ්වජයක් මෙන් ද **අධෝමුඛං** යටිකුරු කොට **ඨපිතඋදකඝටා** තබනලද දියපිරූ කළයකින් **නික්ඛන්තා** නික්මෙන්නා වූ **උදකධාරා විය ච** ජලධාරාවක් මෙන් ද **හුත්වා** වී **අනන්තා** කෙළවරක් නැත්තී **අප්පමාණා අහෝසි** ප්‍රමාණ රහිත වී **හි** ඒ එසේමැයි **බුද්ධානං** බුදුවරයන්ගේ **භත්තානුමෝදනකාලේ** දනානිසංස වදරන්නා වූ කාලයෙහි **ථෝකං වඩ්ඪෙත්වා** මඳක් වඩා **අනුමෝදෙන්තානං** අනුමෝදනා කරන්නා වූ **බුද්ධානං** බුදුවරයන්ගේ **දේසනා** දේශනා තොමෝ **දීඝමජ්ඣිමප්පමාණා හෝති** දික්සඟි මැදුම්සඟි පමණ වෙයි **පන** පුරේභත්ත කෘත්‍යයෙන් අන්‍යවූ පශ්චාද්භත්ත කෘත්‍යය දක්වම් **පච්ඡාභත්තං** පසුබත් කාලයෙහි (හෙවත්) සවස් වේලෙහි **සම්පත්තපරිසාය** පැමිණි පිරිසට **ධම්මං දේසෙන්තානං** දහම් දෙසන්නා වූ **බුද්ධානං** බුදුවරයන්ගේ **දේසනා** දේශනා තොමෝ **සංයුත්තඅඞ්ගුත්තරික ද්වේ මහානිකායප්පමාණාව හෝති** සංයුත්නිකාය අඞ්ගුත්තරනිකාය යන උභය මහානිකාය පමණ ඇත්තී වෙයි **කස්මා?** කුමක්හෙයින යත්? **හි (යස්මා)** යම්හෙයකින් **බුද්ධානං** බුදුවරයන්ගේ **භවඞ්ගපරිවාසෝ** භවාඞ්ග චිත්තයන්ගේ ඉපදීම **ලහුකෝ** ඉතා සැහැල්ලු වෙයි (නොහොත්) ඉතා ස්වල්ප වෙයි **දන්තාවරණං** දෙතොළ **සුඵස්සිතං** මොනවට ස්පර්ශ කරණ ලද්දේ වෙයි **මුඛාදනං** මුඛය විවෘත කිරීම **සිලිට්ඨං** අතිශයින් සිළුටු වෙයි **ජිව්හා** ජිව්හාධාතු තොමෝ **මුදුකා** අතිශයින් මොළොක් වෙයි **සරෝ** ශබ්දය **මධුරෝ** මිහිරි වෙයි **වචනං** වචනය **ලහුපරිවත්තං හෝති** වහ වහා පෙරළෙන්නේ වෙයි **තස්මා** එසේ ලෞකික පුද්ගලයෙකු විසින් එක් පදයක් කියනු ලබන කාලය තුළ එකසියඅටවිසි පදයකින් යුත්

වචනමාලාවක් කථාකිරීමෙහි පොහොසත් හෙයින් **තං මුහුත්තං** ඒ මොහොතක් පමණ කාලය මුළුල්ලෙහි **දේසිතධම්මෝපි** දේශනා කරණලද ධර්මය ද **එත්තකෝ හෝති** මෙපමණ දීර්ඝ වන්නේයි **තේමාසං** තුන් මසක් මුළුල්ලෙහි **දේසිතධම්මෝ පන** දේශනා කරණලද ධර්මය වනාහි **අනන්තෝ** කෙළවරක් නැත්තේ **අපරිමාණෝ හෝති යේව** ප්‍රමාණ රහිත වූයේම වෙයි **හි** ඒ වචනය සැබෑවමය **ආනන්දත්ථේරෝ** ආනන්දස්ථවිරයන් වහන්සේ **බහුස්සුතෝ** බොහෝ ඇසූපිරූතැන් ඇත්තේය **තිපිටකධරෝ** තෙවළාධර වෙයි **පඤ්චදසගාථා සහස්සානි** ගාථා පසළොස් දහසක් **සට්ඨිපදසහස්සානි** සැටදහසක් පදයන් **ලතාපුප්ඵානි** වැලක පුෂ්පයන් **ආකඩ්ඪේන්තෝ විය** ඇදගන්නාක් මෙන් **ඨිතපදේනේව** සිටිපියෙන්ම (හෙවත්) සිටි ඉරියව්වෙන්ම **ඨත්වා** සිටගෙන **ගණ්හාති** උගෙනගණී (හෙවත්) උගෙනීමට පොහොසත් වෙයි **වාචේති** කියවිය හැකි වෙයි **දේසේති** දේශනා කෙරෙයි **ථේරස්ස** ආනන්ද ස්ථවිරයන්ගේ මේ සැටදහසක් පදයන්ගෙන් යුක්තවූ උද්දේශය **ඒකෝ උද්දේසමග්ගෝ නාම** උගෙන ගන්නාවූ එක් පාළි පන්තියක් නම් වෙයි (හෙවත්) එක් පාඩමක් නම් වෙයි **හි** ඒ එසේමැයි **ථේරස්ස** ආනන්ද ස්ථවිරයන්ට **අනුපදං** පදයක් පාසා **උද්දේසං දදමානෝ** උගෙන ගතයුතු වූ පාළියක් දෙන්නා වූ **අඤ්ඤෝ** ශාස්තෲන් වහන්සේ හැර අන්කිසිවෙක් **දතුං න සක්කෝති** උද්දේශ දීමට පොහොසත් නොවෙයි **න සම්පාපුණාති** ලං කළ නොහැකි වෙයි **සම්මාසම්බුද්ධෝව** සම්‍යක් සම්බුද්ධයන් වහන්සේම **සම්පාපුණෙය්‍ය** ලං කරන්නේ වෙයි **ඒවං** මෙසේ **අධිමත්තසතිමා** අතිශයින් අධික වූ ස්මෘති ඇත්තාවූ **අධිමත්තගතිමා** අතිශයින් අධික වූ ප්‍රඥගති ඇත්තාවූ **අධිමත්තධිතිමා** අතිශයින් අධික වූ වියර්‍ය සමාධි ඇත්තාවූ **සාවකෝ** මහාශ්‍රාවක තෙමේ **සත්ථාරා** ශාස්තෲන් වහන්සේ විසින් **තේමාසං** තෙමසක් මුළුල්ලෙහි **ඉමිනා නීහාරේන** මෙම ක්‍රමයෙන් **දේසිතදේසනං** දේශනා කරණ ලද්දවූ අභිධර්ම දේශනාව **වස්සසහස්සං** අවුරුදු දහසක් මුළුල්ලෙහි **උග්ගණ්හන්තෝපි** උගන්නේ ද **මත්ථකං පාපේතුං** මුදුන් පමුණුවන්නට **න සක්කෝති** නොහැකි වෙයි.

("ලතාපුප්ඵානි" යන්නෙහි ලතා ශබ්දය හා පුප්ඵ ශබ්බද ද්වන්දසමාසයි. අරිමද්දන නගර කාලයෙහි විසූ ත්‍රිපිටකධාරී සීලවංස මහාස්ථවිරයන් විසින් මේ වචනය ද්වන්දසමාස යැයි උන්වහන්සේ විසින් රචනාකරණ ලද්දවූ ස්වභාෂාකාව්‍යයෙහි දක්වනලදි. "අනුපදං" යන්නෙහි වීප්ෂාර්ථද්‍යෝතක අනු උපසර්ගය වේ. "කම්මප්පවචනීය යුත්තේ" යන සූත්‍රයෙන් තෘතීයාර්ථයෙහි දුතියාවිභක්තිය වූ හෙයින් "පදේන පදේන" යනුවෙන් අර්ථ යෝජනා කටයුතු වෙයි. මේ වනාහි මනසාදේසනා වචීභේදදේසනා විශේෂයෙන් අභිධර්ම දේශනාවගේ ගැඹුරුබව ප්‍රකාශ කිරීමයි.) **[අර්ථශාලිනී අර්ථකථා සන්නය 43-55 පිටු]**

## අභිධර්මය ඉගෙනීම කළයුතු ආකාරඃ—

අභිධර්මය ඉතා ගැඹුරු විද්‍යාවකි. එහි උගන්වන ධර්ම අතිශයින් සූක්‍ෂම ඒවාය. කුඩා දේ මහත් කොට දක්වන කණ්නාඩි ආදී නවීන විද්‍යාඥයන් පාවිච්චි කරන උපකරණවල ආධාරයෙන් ඒ ධර්මය නොදතහැකිය. ඒවා සුද්ධ ඥණයෙන්ම දතයුතු ධර්මයෝය. ඒවා මැනවින් තේරුම් ගතහැකිවීමට උත්පත්තියෙන් පිහිටි සුද්ධ බුද්ධිය තිබිය යුතුය. උත්පත්තියෙන් පිහිටි ඥණය නැතියවුන්ට ඒවා අවබෝධ කරගැනීම අපහසුය. ඒ නිසා පොත පත උගත් සෑම දෙනාටම ඒවා ගැන මනා වැටහීමක් ඇති නොවේ. ගුරුන්ගෙන් හා පොත පතින් අභිධර්මය උගත් මන්ද බුද්ධිකයන් සමත් වන්නේ ධර්ම පාඨ කීමට හා පරමාර්ථ ධර්මයන්ගේ නම් හා ගණන්

කීමට පමණකි. එයින් අභිධර්මය දනිමු යැයි ඔවුහු රැවටෙති. ක්‍රමානුකූලව ඉගනීමක් නොකොට අභිධර්මය දැනගන්නට සිතා අතනින් මෙතනින් පොත පත කියවන්නන්ට ද බොහෝ සෙයින් ඇති වන්නේ පරමාර්ථ ධර්ම පිළිබඳ වැරදි හැඟීම්ය. එසේ වැරදි හැඟීම් ඇති වීම නිසා පරමාර්ථ ධර්ම දනිමු යැයි රැවටී සිටින්නෝ ද බොහෝය.

පරමාර්ථ ධර්ම අතිසූක්ෂම බැවින් දුරවබෝධය. එබැවින් ඒ ධර්මයන් ගුරුන්ගෙන් අසන කල්හි ද පොත පතින් බලන කල්හි ද වැරදි හැඟීම් ඇතිවීමෙන් උත්පත්තියෙන් පිහිටි නුවණ ඇත්තෝ ද නොයෙක් විට රැවටෙති. වැරදි දැනුම නොදැනීමට වඩා නපුරුය. එබැවින් සෑම කරුණක්ම පිරිසිදු ලෙස දැනගැනීමට උත්සාහ කළයුතුය. තමා ඒ කාරණය දැන සිටින සැටි හරි ද වැරදි ද යන බව දැනගැනීමට නැවත නැවත පොත පත කියවිය යුතුය. එක පොතකින් තේරුම් ගත් කරුණු තවත් පොත්වල විස්තර කර තිබෙන සැටි ද බැලිය යුතුය. ඒවා එකිනෙකට සසඳ බැලිය යුතුය. දන්නා වූ අන්‍යයන්ගෙන් ද කරුණු විමසිය යුතුය. එසේ කොට සෑම පරමාර්ථ ධර්මයක් පිළිබඳ වූම දැනුම පිරිසිදු කරගත යුතුය.

චිත්තය චෛතසික දෙපණසය රූප අටවිස්සය නිවන යැයි අභිධර්මයේ මූලික ධර්ම දෙඅසූවකි. අභිධර්මය උගන්නා තැනැත්තා විසින් උගනීමේ අඩිතාලම වශයෙන් ඒ ධර්ම අසූදෙක මැනවින් උගතයුතුය. මූලික ධර්ම පිළිබඳ දැනුමෙහි වරදක් ඇතිවුවහොත් ඒවා දිගටම යන බැවින් සෑම තැනදීම එයින් අවුල් ඇතිවේ. ඒ ධර්ම ටික හොඳින් තේරුම් ගතහොත් අභිධර්ම පිටකය පහසුවෙන් උගත හැකි වේ. ඒ ධර්ම ටික හොඳින් තේරුම් නොගෙන අභිධර්ම පිටකය කිහිප වාරයක් අවසන් වන්නට උගතත් ධර්මය ගැන පිරිසිදු අවබෝධයක් ඒ තැනැත්තාට නොවන්නේය. එබැවින් මූලික ධර්ම සමූහය මනා කොට තේරුම් ගැනීමට අභිධර්මය උගනුවන් විසින් විශේෂයෙන් උත්සාහ කළ යුතුය. **[අභිධර්මයේ මූලික කරුණු 23-24 පිටු]**

අභිධර්ම පිටකය ගැන මනා අවබෝධයක් ඇතිකර ගැනීමට ඇති එකම ක්‍රමය ඒ අභිධර්ම පිටකය ඉගෙනීමය. අභිධර්ම පිටකය ප්‍රකරණ සතෙකි.

> "ධම්මසඞ්ගණී විභඞ්ගඤ්ච - කථාවත්ථු ච පුග්ගලං
> ධාතු යමක පට්ඨානං - අභිධම්මෝති වුච්චති"

*[සාරත්ථදීපනී ටීකා 01 (ඡට්ඨසඞ්ගායනා පඨම සඞ්ගීති කථා වණ්ණනා යටතේ)]*

අභිධර්මය උගෙනීම යැයි කියනුයේ පොත් බැලීම නොව ඒ ප්‍රකරණ පාළි වශයෙන් හා ස්වරූපාර්ථ වශයෙන් ද අවබෝධයෙන් තමාට යොද කිවහැකි වන පරිදි දැනුම ඇතිකර ගැනීමය.

අභිධර්මය ප්‍රකරණවලට බැස ගෙන ඒවා උගතහැකි වීමට පළමුවෙන් කොටින් අභිධර්මය උගතයුතුය. එසේ නොකොට සත්ත ප්‍රකරණයට අයත් පොත් වලින්ම අභිධර්මය ඉගෙනීම දුෂ්කරය. එබැවින් අභිධර්ම පිටකයට බැසගැනීමට බලාපොරොත්තු වන්නවුන්ට පටන් ගැනීමේ දී ඉගෙනීමට පෞරාණික ධර්මධරයන් වහන්සේලා විසින් අභිධර්ම ග්‍රන්ථ නිපදවා තිබේ. අභිධර්මාර්ථ සඞ්ග්‍රහය, අභිධම්මාවතාරය, නාමරූප පරිච්ඡේදය, පරමාර්ථ විනිශ්චය, නාමරූප සමාසය යන මේ පොත් ඒ සඳහා විරචිත ඒවාය. ඒ පොත් වලින් අභිධර්මය උගන්නවුන් අතර වඩා ප්‍රසිද්ධියට පැමිණ තිබෙන්නේ අභිධර්මාර්ථ සඞ්ග්‍රහයය. අන් සියල්ලටම වඩා උගෙනීමට හොඳ පොත සැටියට පිළිගෙන තිබෙන්නේ ද එයය.

**[අභිධර්මයේ මූලික කරුණු xvii-xviii පිටු]**

## අභිධර්මය ඉගෙනීමෙහි වැදගත්කම:—

දැනට ජීවත්ව ඉන්නා මේ මනුෂ්‍යාදී සත්වයන් අතීතයෙහි ද විසූ බවත්, මරණින් මතු නැවත නැවතත් උපදනා බවත්, නැවත ඉපදීම සිදුවන සැටිත් හරියට දත හැක්කේ අභිධර්මය උගෙනීමෙනි. පින්ය කියා දෙයක් ඇති බවත්, පව්ය කියා දෙයක් ඇති බවත්, ඒ පින් පව් වල ඇති බලයත්, පින් පව් වලින් සත්වයන් හට සැප දුක් දෙන සැටිත් හරියට තේරුම් ගත හැක්කේ අභිධර්මය උගෙනීමෙනි. අප සමීපයෙහිත් අපට බොහෝ දුරිනුත් අපේ ඇස්වලින් දැකිය නොහෙන නොයෙක් රූ සටහන් ඇති නොයෙක් ආකාර සැප දුක් ඇති දිව්‍ය බ්‍රහ්ම ආදී නොයෙක් ජාති වලට අයත් බොහෝ සත්වයන් ඇති බව දත හැක්කේ ද අභිධර්මය ඉගෙනීමෙනි. නිවන කුමක් ද? නිවන් මඟ කුමක් ද? කියා හරියට තේරුම් ගත හැකිවන්නේ ද අභිධර්මය උගෙනීමෙනි. බෞද්ධයෙකුවුවද මේ ධර්මය තරමක් දුරටවත් නොදත් තැනැත්තා අන්ධ පෘථග්ජනයෙකි. ඔහුට බණක් අසා හෝ බණ පොතක් කියවා හෝ හොඳින් තේරුම් ගත නොහැකිය. කියන බණක් හොඳින් තේරුම් ගත හැකිවීමටත්, බණ පොතක් කියවා හොඳින් තේරුම් ගත හැකිවීමටත් තරමක් දුරටවත් අභිධර්මය උගෙන තිබිය යුතුය. **[අභිධර්ම මාර්ගය 20-21 පිටු]**

සූත්‍ර පිටකයෙහි එන කරුණු වලින් එක්තරා කොටසක් නුවණ දියුණුකළ සාමාන්‍ය ජනයාට ද වැටහෙන සාමාන්‍ය කරුණුය. ඒවා අවබෝධ කිරීමට කල්ප ගණනක් පෙරුම්පුරා ලැබිය යුතු විශිෂ්ඨ ඥාණයක් නුවමනාය. එබැවින් ඒ කරුණු අන්‍යාගම්වල ද දක්නා ලැබෙයි. අන්‍ය පණ්ඩිතයන්ගේ පොත් වලද දක්නා ලැබෙයි. ශුද්ධ වූ අභිධර්මය බුදුසස්නෙන් පිට ඇතියක් නොවේ. සූත්‍ර පිටකයෙහි එන කරුණු වලින් බොහෝවක් අභිධර්ම පිටකයෙහි ඇති කරුණුමය. එහෙත් එහි ඒ ධර්ම අභිධර්ම පිටකයෙහි සේ විස්තර කර ද නැත. ක්‍රමානුකූලව විභාග කර ද නැත. පැහැදිළි කර ද නැත. එබැවින් බුදුසමය පිළිබඳ සම්පූර්ණ දැණුමක්, නිරවුල් දැණුමක් සූත්‍ර පිටකය පමණක් උගෙනීමෙන් නොලැබිය හැකිය. නිරවුල් ලෙස දහම් දෙසිය හැකි ධර්මකථිකයෙකු වීමට නම් අභිධර්මය උගත යුතුමය. ධර්ම දේශනයක වරද නිවරද සොයාගත හැකි වීමට ඇදකුද සොයාගත හැකිවීමට අඩුවැඩිකම් සොයාගත හැකිවීමට ඇත්තාවූ නූල ද ලඹය ද මට්ටම්ලෑල්ල ද කෝදුලීය ද අභිධර්ම පිටකයය. අභිධර්මය නොදැන කරන ධර්ම දේශනය දික්නූල පාවිච්චි නොකොට ලඹය පාවිච්චි නොකොට මට්ටම්ලෑල්ල පාවිච්චි නොකොට කෝදුලීය පාවිච්චි නොකොට තනන ගෘහයක් වැනිය. **[අභිධර්මයේ මූලික කරුණු ix පිට]**

චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කරගැනීමට දැනට ඇත්තා වූ ඉතාම හොඳ ක්‍රමය අභිධර්ම පිටකය උගෙනීමය. සූත්‍ර පිටකයෙහි සූත්‍රවල තිබෙන කරුණු කෙනෙකුට චතුරාර්‍ය්‍ය සත්‍යය පිළිබඳ සෑහෙන අවබෝධයක් ඇතිකර ගැනීමට ප්‍රමාණය නොවේ. අහස් යානය ගැන එය ගිගුම් දෙමින් අහස්හි ගමන් කරනු දක්නා ගැමියෝ ද දනිති. එය පදවන ඇදුරෝ ද දනිති. සූත්‍ර ධර්ම ඇසීමෙන් කියවීමෙන් චතුරාර්‍ය්‍ය සත්‍යය දැනගන්නා තැනැත්තන්ගේ එය පිළිබඳ දැනුම අහස් යානය ගැන ගැමියන්ට ඇති දැණුම වැනිය. අභිධර්ම පිටකය උගෙන චතුරාර්‍ය්‍ය සත්‍යය දැනගන්නහුගේ දැනුම අහස්යානය පදවන ඇදුරෙකුට එය ගැන ඇති දැනුම වැනිය. චතුරාර්‍ය්‍ය සත්‍යය පිළිබඳ වූ පරිපූර්ණ දැනුමකින් මිස මඳ දැනුමකින් මගඵල ලබා නිවන් නොදැකිය හැකිය. එබැවින් නිවන් දකිනු රිසියන් විසින් තරමක් දුරටවත් අභිධර්මය උගත යුතුය. එසේ කරන තැනැත්තාම බුදු සස්නෙහි ලැබිය යුතු උසස් ප්‍රයෝජන ලබන්නේය.

**[අභිධර්මයේ මූලික කරුණු xv පිට]**

සූත්‍ර විනය දෙක රැඳෙනුයේ අභිධර්මය මතය. විනය විනිශ්චයක් හෝ ධර්ම විනිශ්චයක් කරන්නට අභිධර්මයෙහි හසල බුද්ධිමතෙකු වියයුතුය. ආභිධම්මික ගෝදත්ත තෙරුන් වහන්සේගේ කථාවෙන් ද එය ඔප්පු වන්නේය. විනයෙහි ඇවැත් වලට පැමිණීබව හෝ නොපැමිණීබව විනිශ්චයෙහි "කිං චිත්තෝ ත්වං භික්ඛු" භික්‍ෂුව ඔබ කිනම් සිතකින් විසුවාදැයි ඇවැත් පැමිණි වේලෙහි ඔහුගේ සිත ගැන විමසිය යුතුය. ඒ ඒ අවස්ථාවෙහි පහළවන සිත් හා ඒවායේ අවශ්‍යයෙන් යෙදෙන චෛතසික අනුව විනිශ්චයක් දිය යුතුය. කම්මන්තරය විපාකන්තරය දැන කුසලාකුසල කර්ම හැඳින නිසැක බෞද්ධයෙකුව ගතකිරීමට සෑම බෞද්ධයෙකු විසින්ම අභිධර්මය දත යුතුය. සියළු සංස්කාරයන්ගේ යථාභූත තත්වය දැන නිවන් ලබා ගැනීමට ද අභිධර්මය උගතයුතුය. **[සිත සිරුර සහ නිවන හෙවත් ධම්මසඞ්ගණී 03 පිට]**

## නියම ධර්මකථිකයා යනු කවරෙක් ද?

ආභිධම්මිකභික්ඛුයේව කිර ධම්මකථිකා නාම, අවසේසා ධම්මකථං කථෙන්තාපි න ධම්මකථිකා. කස්මා? තේ හි ධම්මකථං කථෙන්තා කම්මන්තරං විපාකන්තරං රූපාරූපපරිච්ඡේදං ධම්මන්තරං ආලෝළෙත්වා කථෙන්ති. ආභිධම්මිකා පන ධම්මන්තරං න ආලෝළෙන්ති. තස්මා ආභිධම්මිකෝ භික්ඛු ධම්මං කථේතු වා මා වා, පුච්ඡිතකාලේ පන පඤ්හං කථෙස්සතීති. අයමේව ඒකන්තධම්මකථිකෝ නාම හෝති.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා නිදාන කථා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 24 පිට (හේ.වි.මු); විභඞ්ගප්පකරණ අටුවා සන්නය 01/XXII පිට; අභිධර්මයේ මූලික කරුණු 22-23 පිටු]**

කම්මතෝ අඤ්ඤං කම්මං **කම්මන්තරං,** තං කාමාවචරාදිං රූපාවචරාදිභාවේන, කණ්හවිපාකාදිං සුක්කවිපාකාදිභාවේන කථෙන්තෝ ආලෝළේති. **[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා නිදානකථා යටතේ)]**

**ආභිධම්මිකභික්ඛුයේව** අභිධර්මය දන්නා වූ භික්‍ෂුහුම **ධම්මකථිකා නාම කිර** ඒකාන්ත ධර්මකථික පුද්ගලයෝ නම් වෙත් **අවසේසා** අවශිෂ්ඨ වූ **භික්ඛූ** භික්‍ෂූහු තුමූ **ධම්මං කථෙන්තාපි** ධර්මය දේශනා කරන්නාහු නමුදු **න ධම්මකථිකා** ඒකාන්ත ධර්ම කථිකයෝ නම් නොවෙත් **කස්මා?** කුමක් හෙයින යත්? **හි (යස්මා)** යම් හෙයකින් **තේ** ඒ අභිධර්මය නොදන්නා වූ භික්‍ෂූහු තුමූ **ධම්මං කථෙන්තාපි** ධර්මය දේශනා කරන්නාහු නමුදු **කම්මන්තරං** අනික් කර්මයක් (නොහොත්) කාමාවචර කර්මාදීන්ගෙන් අන්‍යවූ රූපාවචර කර්මාදිය **විපාකාන්තරං** කාමාවචර විපාකාදීන්ගෙන් අන්‍යවූ රූපාවචර විපාකාදිය **රූපාරූපපරිච්ඡේදං** රූප ධර්මයන්ගේ හා නාම ධර්මයන්ගේ පිරිසිඳීම (හෙවත්) වෙන් කිරීම **ධම්මන්තරං** කාමාවචර ධර්මාදියෙන් අන්‍යවූ රූපාවචර ධර්මාදිය **ආලෝළෙත්වා** මිශ්‍ර කොට **කථෙන්ති** කියන්නාහු වෙත් **තස්මා** එසේ හෙයින් **න ධම්මකථිකා** ඒකාන්ත ධර්මකථික පුද්ගලයෝ නම් නොවෙත් **පන** විශේෂාර්ථයක් කියම් **ආභිධම්මිකා භික්ඛූ** අභිධර්මය දන්නා වූ භික්‍ෂූහු තුමූ **ධම්මන්තරං** කාමාවචර ධර්මාදියෙන් අන්‍යවූ රූපාවචර ධර්මාදිය **න ආලෝළෙන්ති** මිශ්‍ර නොකෙරෙත් **තස්මා** එසේ හෙයින් **ආභිධම්මිකෝ භික්ඛු** අභිධර්මය දන්නා වූ මහණ තෙමේ **ධම්මං** ධර්මය **කථේතු වා** දේශනා කරන්නේ හෝ වේවා **පන** එසේ දේශනා නොකරන්නේ නමුදු **පුච්ඡිතකාලේ** විචාළ කල්හි **පඤ්හං** ප්‍රශ්නය **කථෙස්සති** විසඳා කියන්නේ වෙයි **ඉති (තස්මා)** මෙසේ විසඳා කියන හෙයින්

**අයමේව** මේ අභිධර්මය දන්නා මහණ තෙමේම **ඒකාන්තධම්මකථිකෝ නාම හෝති** ඒකාන්ත ධර්මකථික පුද්ගල නම් වෙයි **[අර්ථශාලිනී අර්ථකථා සන්නය 90 පිට]**

# සතර පරමාර්ථ හා එහි ස්වරූපාර්ථයෝ:—

"තත්ථ වුත්තාභිධම්මත්ථා - චතුධා පරමත්ථතෝ
චිත්තං චේතසිකං රූපං - නිබ්බානමිති සබ්බථා" **[අභිධම්මාර්ථ සඞ්ග්‍රහය 10 පිට]**

**තත්ථ** ඒ (සප්ත ප්‍රකරණ සඞ්ඛ්‍යාත) අභිධර්ම පිටකයෙහි **සබ්බථා** (කුසලාදී වශයෙන් ද ස්කන්ධාදි වශයෙන්දැයි) සර්වප්‍රකාරයෙන් **වුත්තා** වදාළන ලද්ද වූ **අභිධම්මත්ථෝ** අභිධර්මාර්ථයෝ **පරමත්ථතෝ** (සංවෘතිය හැර) පරමාර්ථ හෙයින් **චිත්තං** චිත්තය හෙවත් විඤ්ඤාණස්කන්ධය **චේතසිකං** චෛතසික හෙවත් වේදනාදී ස්කන්ධත්‍රය **රූපං** (භූතෝපාදය භේද භින්න) රූපය හෙවත් රූපස්කන්ධය **නිබ්බානං ඉති** (මාර්ග ඵලයන්ට අරමුණු වූ) අසංස්කෘත ධර්මයයි මෙසේ **චතුධා** සතර ආකාරයකින් (සිටියාහුයි). **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ පුරාණ සන්නය 06 පිට]**

චිත්තං චේතසිකං රූපං - නිබ්බානන්ති නිරුත්තරෝ
චතුධා දේසයී ධම්මේ - චතුසච්චප්පකාසනෝ
**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 02 යටතේ)]**

**චිත්තං** චිත්තය හෙවත් විඤ්ඤාණස්කන්ධය **චේතසිකං** චෛතසික හෙවත් වේදනාදී ස්කන්ධත්‍රයය **රූපං** භූතරූප උපාදයරූප භේදයෙන් භින්නවූ රූපස්කන්ධයය **නිබ්බානං** මාර්ග-ඵල චිත්තයන්ට අරමුණු වූ අසංස්කෘත ධාතුය **ඉති** මෙසේ **නිරුත්තරෝ** ශීල-සමාධි-ප්‍රඥ-විමුක්ති ආදී වූ ගුණයන් කරණකොටගෙන අධික වූ කිසි සත්වයෙක්හු නැත්තාවූ නොහොත් **නිරුත්තරෝ** නිර්භය වචන කියන සත්‍වයන් අතුරෙන් අතිශයින් නිර්භය කථා ඇත්තාවූ **චතුසච්චප්පකාසනෝ** දුක්ඛාදී චතුස්සත්‍යයන් ප්‍රකාශ කරන්නාවූ (**බුද්ධෝ** සර්වඥයන් වහන්සේ) **චතුධා (චතූහි පකාරේහි)** සතර ප්‍රකාරයෙකින් **ධම්මේ** පරමාර්ථ ධර්මයන් නොහොත් **ධම්මේ** පරමාර්ථ ධර්මයන් ප්‍රකාශකරන අභිධර්ම පිටකයෙහි උක්ත ධර්මයන් **දේසයී** වදාළ සේක. **[පරමත්ථවිභාවනී ව්‍යාඛ්‍යාව 03 පිට]**

එකුන් අනූ චිත්තයෝය, දෙපණස් චෛතසිකයෝය, අටවිසි රූපයෝය, නිර්වාණය යැයි කියන ලද්ද වූ සතර පරමාර්ථ ධර්මයෝ වනාහි ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වෙති. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වෙති. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වෙති. ආර්ය සත්‍යය වශයෙන් සිව් වැදෑරුම් වෙති.

ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්:- රූප අටවිස්ස රූපස්කන්ධය නම් වේ. චෛතසික දෙපණස අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වේ. සඤ්ඤ චෛතසිකය සඤ්ඤස්කන්ධය නම් වේ. ඉතිරි සමපණස් චෛතසික සංස්කාරස්කන්ධය නම් වේ. සිත් එකුන් අනූව විඤ්ඤාණස්කන්ධය නම් වේ. නිර්වාණය උප්පාද, ඨිති, භඞ්ග නම් වූ අවස්ථාවක් නැති බැවින් ද අතීත අනාගත වර්තමාන ආදී කාල භේදයකට අයත් නැති බැවින් ද ස්කන්ධ සඞ්ග්‍රහයෙන් විනිර්මුක්ත නම් වේ. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්:- අටවිසි රූපය අතුරෙන් චක්‍ෂුප්‍රසාද රූපය චක්ඛායතන නම්. සෝතප්‍රසාද රූපය සෝතායතනය නම්. ඝානප්‍රසාද රූපය ඝානායතනය නම්. ජිව්හාප්‍රසාද රූපය ජිව්හායනතය නම්. කායප්‍රසාද රූපය කායායතනය නම්. වර්ණ රූපය රූපායතනය නම්. ශබ්ද රූපය සද්දයතනය නම්. ගන්ධ රූපය ගන්ධායතන නම්. රස රූපය රසායතන නම්. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සඞ්ඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම්. සිත් අසූනවය මනායතනය නම්. චෛතසික දෙපණස, ආපෝ ධාතු, ඉත්ථි ඉන්‍ද්‍රිය, පුරිසින්‍ද්‍රිය, හදය රූපය, ජීවිතින්‍ද්‍රිය රූපය, ආහාර රූපය, ආකාස රූපය, කාය විඤ්ඤත්ති රූපය, වචී විඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සූක්‍ෂම රූප සොළොස හා නිර්වාණය ද යන මේ ධර්ම සමූහය ධම්මායතනය නම්. මෙසේ ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම් වෙති.

ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වන්නාහු කෙසේද යත්:- අටවිසි රූප අතුරෙන් චක්‍ෂුප්‍රසාද රූපය චක්ඛුධාතු නම්. සෝතප්‍රසාද රූපය සෝතධාතු නම්. ඝානප්‍රසාද රූපය ඝානධාතු නම්. ජිව්හාප්‍රසාද රූපය ජිව්හාධාතු නම්. කායප්‍රසාද රූපය කාය ධාතු නම්. වර්ණ රූපය රූපධාතු නම්. ශබ්ද රූපය සද්දධාතු නම්. ගන්ධ රූපය ගන්ධධාතු නම්. රස රූපය රසධාතු නම්. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සඞ්ඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බධාතු නම්. චක්ඛුවිඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණ ධාතු නම්. සෝතවිඤ්ඤාණ දෙසිත සෝතවිඤ්ඤාණ ධාතු නම්. ඝානවිඤ්ඤාණ දෙසිත ඝානවිඤ්ඤාණ ධාතු නම්. ජිව්හාවිඤ්ඤාණ දෙසිත ජිව්හාවිඤ්ඤාණ ධාතු නම්. කායවිඤ්ඤාණ දෙසිත කායවිඤ්ඤාණ ධාතු නම්. පඤ්චද්වාරාවජ්ජන සිත හා සම්පටිච්ඡන දෙසිත මනෝ ධාතු නම්. ඉතිරි සසැත්තෑ චිත්තය මනෝවිඤ්ඤාණ ධාතු නම්. චෛතසික දෙපණස, ආපෝ ධාතු, ඉත්ථි ඉන්‍ද්‍රිය, පුරිසින්‍ද්‍රිය, හදය රූපය, ජීවිතින්‍ද්‍රිය රූපය, ආහාර රූපය, ආකාස රූපය, කාය විඤ්ඤත්ති රූපය, වචී විඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සූක්‍ෂම රූප සොළොස හා නිර්වාණය ද යන මේ ධර්ම සමූහය ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම් වෙති.

ආර්ය සත්‍යය වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේද යත්:- ලෞකික සිත් එක් අසූව ද, ලෝභ චෛතසිකය හැර ඉතිරි එක් පණස් චෛතසික ද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම්. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම්. නිර්වාණය නිරෝධ සත්‍යය නම්. ලෝකෝත්තර සතර මාර්ග චිත්තයෙහි යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව. සම්මා වායාම, සම්මා සති සම්මා සමාධි නම් වූ මාර්ගාංග අට දෙන මාර්ග සත්‍යය නම්. ඉතිරි මාර්ග චිත්තුප්පාද එකුන්තිස හා ඵල චිත්තුප්පාද සත්තිස සත්‍ය විනිර්මුක්ත වෙති. මෙසේ ආර්ය සත්‍යය වශයෙන් සිව් වැදෑරුම් වෙති. **[අභිධම්ම භාවනා 01/03-04-05 පිටු]**

(විඤ්ඤාණස්කන්ධය යැයි කියන ලද) චිත්තය, (වේදනාදීස්කන්ධ ත්‍රය සඞ්ඛ්‍යාත) චෛතසිකය, (භූතෝපාදය භේද හෙයින් අටවිසි වැදෑරුම්) රූපය, (මාර්ගඵලාලම්බන වූ) නිර්වාණය කියා සතර ප්‍රකාරයකි.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රශ්නෝත්තර 01 පිටු]**

## චිත්තය භූමි වශයෙන් හා ජාති වශයෙන් බෙදා දැක්වීම:—

තත්ථ චිත්තං තාව චතුබ්බිධං හෝති කාමාවචරං,
රූපාවචරං, අරූපාවචරං, ලෝකුත්තරඤ්චේති. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 01 පිට]**

**තත්ථ** ඒ (යථෝද්දිෂ්ට වූ චතුර්විධ අභිධර්මාර්ථයන්) අතුරෙහි; නොහොත් ඒ යථා ප්‍රතිඥාත අභිධර්මාර්ථ සඞ්ග්‍රහ නම් වූ ප්‍රකරණයෙහි **තාව** පළමු කොට **චිත්තං** චිත්තය තෙමේ **කාමාවචරං** කාමාවචරය **රූපාවචරං** රූපාවචරය **අරූපාවචරං** අරූපාවචරය **ලෝකුත්තරඤ්චේති** ලෝකෝත්තර යැයිද **චතුබ්බිදං** සතර ප්‍රකාර ඇත්තේයි. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 06 පිට]**

ද්වාදසාකුසලානේවං - කුසලානේකවීසති
ඡත්තිංසේව විපාකානි - ක්‍රියා චිත්තානි වීසති. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 20 පිට]**

**ඒවං** මෙසේ (උක්තක්‍රමයෙන්) **අකුසලානි** අකුසල චිත්තයෝ **ද්වාදස** දෙළොස් දෙනෙක් (වෙත්) **කුසලානි** කුසල චිත්තයෝ **ඒකවීසති** එක් විස්සෙක් (වෙති) **විපාකානි** විපාක චිත්තයෝ **ඡත්තිංසේව** සතිසෙක්ම (වෙති) **ක්‍රියාචිත්තානි** ක්‍රියා චිත්තයෝ **වීසති** විස්සෙක් (වෙති) **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 29 පිට]**

චතුපඤ්ඤාසධාකාමේ - රූපේ පණ්ණරසීරයේ
චිත්තානි ද්වාදසාරුප්පේ - අට්ඨධානුත්තරේ තථා.
**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 20 පිට]**

**කාමේ** ඒකාදසවිධ කාමභවයෙහි **චිත්තානි** චිත්තයන් **චතුපඤ්ඤාසධා** සූපණස් ප්‍රකාරයෙකින් **ඊරයේ** කියන්නේය. **රූපේ** රූපභවයෙහි **පණ්ණරස ඊරයේ** පසළොසක් කියන්නේය. **ආරුප්පේ** අරූපභවයෙහි **චිත්තානි** චිත්තයන් **ද්වාදස** දෙළොසක් **ඊරයේ** කියන්නේය. **අනුත්තරේ** නවවිධ ලෝකෝත්තර ධර්ම සමුදයෙහි **චිත්තානි** චිත්තයන් **අට්ඨධා** අෂ්ට ප්‍රකාරයෙකින් **තථා** එසේම **ඊරයේ** කියන්නේය.
**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 29 පිට]**

ඒ අභිධර්ම පිටක සඞ්ඛ්‍යාත සප්තප්‍රකරණයන් අතුරෙන් පළමු කොට වදළ ධම්මසඞ්ගණී ප්‍රකරණයෙහි චිත්තවිභත්තියැ, රූපවිභත්තියැ, නික්ෂේපරාශියැ, අර්ථෝද්ධාරණයැ කියා චතුර්විධ විභාග කෙනෙක් ඇත්තාහ. ඔහුනතුරෙහි කාමාවචරකුශල වශයෙන් සිත්හු අට දෙනෙක, අකුශල වශයෙන් දෙළොස් දෙනෙක, කුශලවිපාක වශයෙන් සොළොස් දෙනෙක, අකුශලවිපාක වශයෙන් සත් දෙනෙක, ක්‍රියා වශයෙන් එකොළොස් දෙනෙක, රූපාවචර කුශල වශයෙන් සිත්හු පස් දෙනෙක, විපාක වශයෙන් පස් දෙනෙක, ක්‍රියා වශයෙන් පස් දෙනෙක, අරූපාවචර කුශල වශයෙන් සිත්හු සිව් දෙනෙක, විපාක වශයෙන් සිව් දෙනෙක, ක්‍රියා වශයෙන් සිව් දෙනෙක, ලෝකෝත්තර කුශල වශයෙන් සිත්හු සිව් දෙනෙක, විපාක වශයෙන් සිව් දෙනෙක යැයි මෙසේ එකුන්අනූවක් චිත්තයන්ගේ විභාගයැ චිත්තවිභක්ති නම්. චිත්තුප්පාද කාණ්ඩය කියාත් මෝහටම නමකි. **[විභඞ්ගප්පකරණ අටුවා සන්නය 01/v පිට]**

කාමේ අවචරන්තීති **කාමාවචරා** රූපේ අවචරන්තීති **රූපාවචරා**. අරූපේ අවචරන්තීති **අරූපාවචරා**. අයමෙත්ථ සඞ්ඛෙපෝ.

**[ධම්මසඞ්ගණී අට්ඨකථා (ඡට්ඨසඞ්ගායනා දුකමාතිකාවණ්ණනා අංක 83-100 යටතේ); ධම්මසඞ්ගණී අට්ඨකථා 71 පිට (හේ.වි.මු)]**

**කාමාවචරාදීසු** අයමපරෝ අත්ථෝ; කාමතණ්හා කාමෝ, ඒවං රූපාරූපතණ්හා රූපං අරූපඤ්ච. ආරම්මණකරණවසේන තානි යත්ථ අවචරන්ති, තේ **කාමාවචරා**දයෝති. ඒවඤ්හි සති අඤ්ඤභූමීසු උප්පජ්ජමානානං අකාමාවචරාදිතා කාමාවචරාදිතා ච නාපජ්ජතීති සිද්ධං හෝති. **නික්ඛේපකණ්ඩේපි** "එත්ථාවචරා"ති වචනං අවීචිපරනිම්මිතපරිච්ඡින්නෝකාසාය කාමතණ්හාය ආරම්මණභාවං සන්ධාය වුත්තන්ති වේදිතබ්බං, තදෝකාසතා ච තණ්හාය තන්නින්නතාය වේදිතබ්බා. යදි පරියාපන්නසද්දස්ස අන්තෝගධාති අයමත්ථෝ, මග්ගාදිධම්මානඤ්ච ලෝකුත්තරන්තෝගධත්තා පරියාපන්නතා ආපජ්ජති. න හි "පරියාපන්නා"ති එත්ථ තේභූමකගහණං අත්ථීති? නාපජ්ජති සබ්බදා පවත්තමානස්ස පච්චක්ඛස්ස ලෝකස්ස වසේන පරියාපන්නනිච්ඡයතෝ. අථ වා පරිච්ඡේදකාරිකාය තණ්හාය පරිච්ඡින්දිත්වා ආපන්නා පටිපන්නා ගහිතාති **පරියාපන්නා**.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 83-100 යටතේ)]**

කාමතණ්හා **කාමෝ** උත්තරපදලෝපේන යථා රූපභවෝ රූපං. ඒවං සේසේසුපි. **ආරම්මණකරණවසේනා**ති ඒතේන කාමරූපාරූපතණ්හානං විසයභාවෝ යථාක්කමං කාමරූපාරූපාවචරතාය කාරණන්ති දස්සේති. අවස්සඤ්චේතමේවං සම්පටිච්ඡිතබ්බං, අඤ්ඤථා කාමාවචරාදිභාවෝ අපරිපුණ්ණවිසයෝ සියා. යදි හි ආලම්බිතබ්බධම්මවසේන භූමිපරිච්ඡේදෝ, ඒවං සති අනාරම්මණානං සඞ්ගහෝ න සියා. අථ විපාකදානසේසේන, ඒවම්පි අවිපාකානං සඞ්ගහෝ න සියා, තස්මා ආරම්මණකරණවසේන පරියාපන්නානං භූමිපරිච්ඡේදෝ කාතබ්බෝ. ඒවඤ්හි සති කාමාවචරාදිභාවෝ පරිපුණ්ණවිසයෝ සියා. තේනේවාහ **"ඒවඤ්හි සතී"**තිආදි. අපරියාපන්නානං පන ලෝකතෝ උත්තිණ්ණභාවේන අනුත්තරභූමිතා. **අකාමාවචරාදිතා නාපජ්ජතී**ති අබ්‍යාපිතදෝසං පරිහරති, **කාමාවචරාදිතා නාපජ්ජතී**ති අතිබ්‍යාපිතදෝසං. නනු ච ඉමස්මිං පක්ඛේ කාමතණ්හා කතමා, කාමාවචරධම්මාරම්මණා තණ්හා, කාමාවචරධම්මා කතමේ, කාමතණ්හාවිසයාති ඉතරීතරනිස්සයතා දෝසෝති? න, අවීචිආදිඒකාදසෝකාසනින්නතාය කිඤ්චි තණ්හං කාමතණ්හාභාවේන ගහෙත්වා තං සභාවාය විසයභාවේන කාමාවචරධම්මානං උපලක්ඛේතබ්බත්තා.

ඉදානි යථාවුත්තමත්ථං පාඨේන සමත්ථෙන්තෝ **"නික්ඛේපකණ්ඩේපී"**ති ආදිමාහ. තත්ථ හි කාමතණ්හාය ආලම්බිතබ්බත්තා කාමධාතුපරියාපන්නධම්මා ච කාමභවසඞ්ඛාතේ කාමේ ඕගාළ්හා හුත්වා චරන්ති, නාඤ්ඤත්ථාති **එත්ථාවචරා**ති වුත්තන්ති. විසේසත්ථිනා විසේසෝ අනුපයුජ්ජතීති ඉමමත්ථං දස්සෙන්තෝ ආහ **"ලෝකස්ස වසේන පරියාපන්නනිච්ඡයතෝ"**ති. තේන ලෝකියධම්මේසු පරියාපන්න-සද්දස්ස නිරූළ්හතං දස්සේති භගවතෝ තදුච්චාරණානන්තරං විනෙය්‍යානං තදත්ථපටිපත්තිතෝ. පරිච්ඡේදකාපෙක්ඛා පරිච්ඡින්නතාති **"පරිච්ඡේදකාරිකාය තණ්හායා"**ති වුත්තං. සා හි ධම්මානං කාමාවචරාදිභාවං පරිච්ඡින්දති. **පරි**-සද්දෝ චෙත්ථ "උපාදින්නා"ති ආදීසු උප-සද්දෝ විය සසාධනං කිරියං දීපේතීති අයමත්ථෝ වුත්තෝති දට්ඨබ්බං.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා දුකමාතිකා වණ්ණනා අංක 83-100 යටතේ)]**

**ලෝකියා ධම්මාති ලෝකෝ** වුච්චති ලුජ්ජනපලුජ්ජනට්ඨේන වට්ටං; තස්මිං පරියාපන්නභාවේන ලෝකේ නියුත්තාති **ලෝකියා**. තතෝ උත්තිණ්ණාති උත්තරා; ලෝකේ අපරියාපන්නභාවේන ලෝකතෝ උත්තරාති **ලෝකුත්තරා.**
**[ධම්මසඞ්ගණී අට්ඨකථා (ඡට්ඨසඞ්ගායනා දුකමාතිකා වණ්ණනා අංක 7-13 යටතේ); ධම්මසඞ්ගණී අට්ඨකථා 69 පිට (හේ.වි.මු)]**

න ලුජ්ජති න පලුජ්ජතීති යෝ ගහිතෝ තථා න හෝති, සෝ ලෝකෝති තං ගහණරහිතානං ලෝකුත්තරානං නත්ථි ලෝකතා. දුක්ඛසච්චං වා ලෝකෝ, තත්ථ තේනේව ලෝකසභාවේන විදිතාති **ලෝකියා**.
**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා දුකමාතිකා වණ්ණනා අංක 7-13 යටතේ)]**

**ලෝකියා ධම්මා ඉති** ලෝකියා ධම්මා යනු **ලුජ්ජනපලුජ්ජනට්ඨේන** නැසෙන විනාශ වන අර්ථයෙන් **වට්ටං** සංසාර වෘතය **ලෝකෝ වුච්චති** ලෝකය යැයි කියනු ලැබෙයි **තස්මිං** එහි **පරියාපන්නභාවේන** ඇතුළත් බැවින් **ලෝකේ** ලෝකයෙහි **නියුත්තතාති** නියුක්ත බැවින් **ලෝකියා** ලෝකිය නම් **තතෝ** එයින් **උත්තිණ්ණාති** එතරවූ බැවින් **උත්තරා** උත්තරා නම් **ලෝකේ** ලෝකයෙහි **අපරියාපන්නභාවේන** ඇතුළත් නොවූ බැවින් **ලෝකතෝ** ලෝකයට වඩා **උත්තරාති** ශ්‍රේෂ්ඨනුයි **ලෝකුත්තරා** ලෝකුත්තර නමි. **[ධම්මසඞ්ගණී අට්ඨකථා පරිවර්තනයි]**

**කාමාවචර**න්ති "කතමේ ධම්මා කාමාවචරා? හෙට්ඨතෝ අවීචිනිරයං උපරිතෝ පරනිම්මිතවසවත්තිං පරියන්තං කත්වා"තිආදිනා (ධ. ස. 1287) නයේන වුත්තේසු කාමාවචරධම්මේසු පරියාපන්නං. තත්‍රායං වචනත්ථෝ; උද්දානතෝ ද්වේ කාමා, වත්ථුකාමෝ ච කිලේසකාමෝ ච. තත්ථ කිලේසකාමෝ අත්ථතෝ ඡන්දරාගෝව වත්ථුකාමෝ තේභූමකවට්ටං. කිලේසකාමෝ චෙත්ථ කාමේතීති **කාමෝ;** ඉතරෝ පන කාමියතීති කාමෝ. යස්මිං පන පදේසේ දුවිධෝපේසෝ කාමෝ පවත්තිවසේන අවචරති, සෝ චතුන්නං අපායානං, මනුස්සානං, ඡන්නඤ්ච දේවලෝකානං වසේන ඒකාදසවිධෝ පදේසෝ. කාමෝ එත්ථ අවචරතීති **කාමාවචරෝ,** සසත්ථාවචරෝ විය. යථා හි යස්මිං පදේසේ සසත්ථා පුරිසා අවචරන්ති, සෝ විජ්ජමානේසුපි අඤ්ඤේසු ද්විපදචතුප්පදේසු අවචරන්තේසු, තේසං අභිලක්ඛිතත්තා 'සසත්ථාවචරෝ'ත්වේව වුච්චති, ඒවං විජ්ජමානේසුපි අඤ්ඤේසු රූපාවචරාදීසු තත්ථ අවචරන්තේසු, තේසං අභිලක්ඛිතත්තා අයං පදේසෝ 'කාමාවචරෝ'ත්වේව වුච්චති. ස්වායං යථා රූපභවෝ රූපං, ඒවං උත්තරපදලෝපං කත්වා 'කාමෝ'ත්වේව වුච්චති. ඒවමිදං චිත්තං ඉමස්මිං ඒකාදසපදේසසඞ්ඛාතේ කාමේ අවචරතීති කාමාවචරං.

කිඤ්චාපි හි ඒතං රූපාරූපභවේසුපි අවචරති, යථා පන සඞ්ගාමේ අවචරණතෝ සඞ්ගාමාවචරෝති ලද්ධනාමකෝ නාගෝ නගරේ චරන්තෝපි 'සඞ්ගාමාවචරෝ'ත්වේව වුච්චති, ථලජලචරා ච පාණා අථලේ අජලේ ච ඨිතාපි 'ථලචරා ජලචරා'ත්වේව වුච්චන්ති, ඒවමිදං අඤ්ඤත්ථ අවචරන්තම්පි කාමාවචරමේවාති වේදිතබ්බං. ආරම්මණකරණවසේන වා එත්ථ කාමෝ අවචරතීතිපි කාමාවචරං. කාමඤ්චේස රූපාරූපාවචරේසුපි අවචරති, යථා පන වදතීති 'වච්ඡෝ', මහියං සේතීති 'මහිංසෝ'ති වුත්තේ, න සත්තා යත්තකා වදන්ති, මහියං වා සෙන්ති සබ්බේසං තං නාමං හෝති, ඒවංසම්පදමිදං වේදිතබ්බං. අපිච කාමභවසඞ්ඛාතේ කාමේ පටිසන්ධිං අවචාරේතීතිපි **කාමාවචරං**.
**[ධම්මසඞ්ගණී අට්ඨකථා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය අංක 01 යටතේ); ධම්මසඞ්ගණී අට්ඨකථා 80 පිට (හේ.වි.මු)]**

**උද්දනතෝති** උද්දේසතෝ සඞ්ඛේපතෝ. කිලේසකාමෝ වත්ථුකාමභාවං භජන්තෝ කාමනීයවසේන භජති, න කාමනවසේනාති කාමනවසේන කිලේසකාමෝ ඒව හෝති, න වත්ථුකාමෝ. **දුවිධෝපේසෝති** වචනේන දුවිධස්සපි සහිතස්ස අවචරණප්පදේසං සඞ්ගණ්හාති. තේන වත්ථුකාමස්සේව පවත්තිදේසෝ රූපාරූපධාතුද්වයං අපනීතං හෝති. නනු ච දුවිධෝපි සහිතෝ රූපාරූපධාතූසු පවත්තති රූපාරූපාවචරධම්මානං වත්ථුකාමත්තා තදාරම්මණානං රූපාරූපරාගානඤ්ච කිලේසකාමභාවසිද්ධිතෝති? තං න, බහලකිලේසස්ස කාමරාගස්ස කිලේසකාමභාවේන ඉධ සඞ්ගහිතත්තා. ඒවඤ්ච කත්වා රූපාරූපධාතූසු පවත්තමානේසු කාමාවචරධම්මේසු නිකන්ති ඉධ න සඞ්ගහිතා සුඛුමත්තා. "උද්දනතෝ ද්වේ කාමා"ති සබ්බකාමේ උද්දිසිත්වාපි හි "දුවිධෝපේසෝ"ති එත්ථ තදේකදේසභූතා අඤ්ඤමඤ්ඤසහිතතාපරිච්ඡින්නා කාමරාගතබ්බත්ථුකධම්මාව සඞ්ගහිතාති, නිරවසේසෝ වා කිලේසකාමෝ කාමරාගෝ කාමතණ්හාරූපතණ්හාඅරූපතණ්හානිරෝධතණ්හාභේදෝ ඉධ පවත්තතීති අනවසේසප්පවත්තිතං සන්ධාය "දුවිධෝපේසෝ"ති වුත්තං, වත්ථුකාමෝපි ච අප්පකෝ ඉධාපි න වත්තති රූපාරූපාවචරවිපාකමත්තෝ, තථාපි පරිපුණ්ණවත්ථුකාමත්තා කාමාවචරධම්මාව ඉධ ගහිතා. ඒවඤ්ච කත්වා සසත්ථාවචරෝපමා යුත්තා හොති. "රූපූපපත්තියා මග්ගං භාවේතී"ති (ධ. ස. 163; විභ. 625) එත්ථ රූපභවෝ උත්තරපදලෝපං කත්වා "රූප"න්ති වුත්තෝ, ඒවමිධාපි උත්තරපදලෝපෝ දට්ඨබ්බෝ. අඤ්ඤදත්ථා හි චිත්තං කාමාවචරාවචරන්ති වුච්චෙයයාති. **ආරම්මණකරණවසේනා**තිආදිකේ "කාමෝ"ති සබ්බං තණ්හමාහ, තස්මා "**කාමඤ්චේසා**"තිආදි වුත්තං, "කාමේ අවචාරේතීති කාමාවචාර"න්ති වත්තබ්බේ **චා**-සද්දස්ස රස්සත්තං කතං.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය අංක 01 යටතේ)]**

**උද්දනතෝ**ති යදි සඞ්ඛේපතෝති අත්ථෝ. නනු ච අවසිට්ඨකිලේසාදයෝ විය කිලේසකාමෝපි අස්සාදේතබ්බතාය වත්ථුකාමේ සමවරුද්ධෝ ඛන්ධං විය ඛෙදයෙය්ති සඞ්ඛේපතෝ ඒකෝයේව කාමෝ සියාති අනුයෝගං සන්ධායාහ "**කිලේසකාමෝ**"ති ආදි. **සහිතස්සා**ති විසයවිසයිභාවේන අවට්ඨිතස්ස. "උද්දනතෝ ද්වේ කාමා"ති කිඤ්චාපි සබ්බේ කාමා උද්දිට්ඨා, "චතුන්නං අපායාන"න්ති ආදිනා පන විසයස්ස විසේසිතත්තා ඕරම්භාගියකිලේසභූතෝ කාමරාගෝ ඉධ කිලේසකාමෝති ගහිතෝති "**තේනා**"තිආදිමාහ. චෝදකෝ තස්ස අධිප්පායං අජානන්තෝ "**නනු චා**"තිආදිනා අනුයුඤ්ජති. ඉතරෝ පන "**බහලකිලේසස්සා**"තිආදිනා අත්තනෝ අධිප්පායං විවරති.

**කාමාවචරධම්මේසු** විමානකප්පරුක්ඛාදිප්පකාරේසු පරිත්තකුසලාදීසු වා. නනු ච "චතුන්නං අපායාන"න්ති විසයස්ස විසේසිතත්තා රූපාරූපධාතුග්ගහණස්ස අසම්භවෝයේවාති? න, "උද්දනතෝ ද්වේ කාමා"ති නිරවසේසතෝ කාමානං උද්දිට්ඨත්තා. උද්දිට්ඨේපි හි කාමසමුද්දයේ යථා තදේකදේසෝව ගය්හති, තං දස්සේතුං "**දුවිධෝ**"තිආදිමාහ. **කාමරාගෝ** පඤ්චකාමගුණිකෝ රාගෝ. **කාමතණ්හා** කාමාවචරධම්මවිසයා තණ්හා. **නිරෝධතණ්හා** උච්ඡේදදිට්ඨිසහගතෝ රාගෝ. **ඉධා**ති ඒකාදසවිධේ පදේසේ. යදි අනවසේසප්පවත්ති අධිප්පේතා, "දුවිධෝපේසෝ"ති න වත්තබ්බං වත්ථුකාමේකදේසස්ස ඉධ අප්පවත්තනතෝති අනුයෝගේන යේභුය්‍යභාවතෝ අනවසේසෝ විය අනවසේසෝති වා අත්ථෝ ගහේතබ්බෝති දස්සෙන්තෝ "**වත්ථුකාමෝපී**"තිආදිමාහ. අනවසේසසදිසතා චෙත්ථ සභාවභින්නස්ස කස්සචි අනවසේසතෝ. **ඒවඤ්ච කත්වා**ති කිලේසකාමවත්ථුකාමානං

අනවසේසපරිපුණ්ණභාවේන අභිලක්ඛිතත්තාති අත්ථෝ. **වාසද්දස්ස රස්සත්තං කත**න්ති කාමාවචරසද්දේ හේතුකත්තුඅත්ථෝ අන්තෝනීතෝති දස්සේති.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය අංක 01 යටතේ)]**

**කාමාවචරං ඉති** කාමාවචරං යන මෙහි **කතමේ ධම්මා කාමාවචරා?** කවර ධර්මයෝ කාමාවචර වෙත්ද? **හෙට්ඨතෝ** යටින් **අවීචිනිරයං** අවීචිමහානිරය ද **උපරිතෝ** ඉහළින් **පරනිම්මිතවසවත්තිං** පරනිර්මිතවසවර්තිය ද **පරියන්තං කත්‍වා** කෙළවර කොට **ඉති ආදිනා නයේන** මේ ආදී ක්‍රමයෙන් **වුත්තේසු කාමාවචරධම්මේසු** කියනලද කාමාවචර ධර්මයන්හි **පරියාපන්නං (හෝති)** අතුළත් වෙයි **තත්‍රායං වචනත්ථෝ** එහි මේ වචනාර්ථයයි **උද්දානතෝ** උද්දේශ වශයෙන් සඞ්ක්ෂේප වශයෙන් **වත්ථුකාමෝ ච** වස්තු කාමය ද **කිලේසකාමෝ** ක්ලේශ කාමය ද **ච (ඉති)** යැයි **ද්වේ කාමා** කාමයෝ දෙදෙනෙක් වෙති **තත්‍ථ** ඒ අතුරින් **කිලේසකාමෝ** ක්ලේශ කාමය තෙමේ **අත්ථතෝ** අර්ථ වශයෙන් **ඡන්දරාගෝව** ඡන්ද රාගයමයයි **වත්ථුකාමෝ** වස්තු කාමය **තේභූමකවට්ටං** ත්‍රෛයිභූමික වට්ටයයි **එත්‍ථ ච** ඒ අතරින් ද **කිලේසකාමෝ** ක්ලේශ කාමය තෙමේ **කාමේතීති** කැමති වෙයිනුයි **කාමෝ** කාම නම් **ඉතරෝ පන** වස්තු කාමය තෙම වනාහි **කාමීයතීති** කැමතිවනු ලැබෙයිනුයි **කාමෝ** කාම නම් **යස්මිං පන පදේසේ** යම් ප්‍රදේශයක වනාහි **දුවිධෝපි ඒසෝ කාමෝ** දෙවැදෑරුම් ඒ කාමය **පවත්තිවසේන** පැවතීම් වශයෙන් **අවචරති** හැසිරෙයි **සෝ** ඒ කාමය තෙම **චතුන්නං අපායානං** සතර අපාය **මනුස්සානං** මනුෂ්‍ය ලෝකය **ඡන්නඤ්ච දේවලෝකානං වසේන** දිව්‍යලෝක සයගේ වශයෙන් **ඒකාදසවිධෝ පදේසෝ** එකොළොස් වැදෑරුම් ප්‍රදේශයක (**අවචරති** හැසිරෙයි) **සසත්ථාවචරෝ විය** ශස්ත්‍ර සහිත පුරුෂ තෙමේ හැසිරෙන ප්‍රදේශය සසත්ථාවචර නම් වන්නාක් මෙන් **කාමෝ** කාමය තෙමේ **එත්‍ථ** මෙහි **අවචරතීති** හැසිරෙයිනුයි **කාමාවචරෝ** කාමාවචර නම් වේ **හි** උපමාවක් දක්වම් **යථා** යම්සේ **යස්මිං පදේසේ** යම් ප්‍රදේශයෙක්හි **සසත්ථා පුරිසා** ශස්ත්‍ර ඇති පුරුෂයෝ **අවචරන්ති** හැසිරෙත් ද **විජ්ජමානේසු** විද්‍යමාන වූ **අඤ්ඤේසු ද්විපදචතුප්පදේසු** අන්‍ය දෙපා සිවුපා සතුන් **අවචරන්තේසුපි** හැසිරෙන කල්හි ද **සෝ (පදේසෝ)** ඒ ප්‍රදේශය **තේසං** ඒ ශස්ත්‍ර ඇති පුරුෂයන්ගේ **අභිලක්ඛිතත්තා** ප්‍රකට හෙයින්ම (නොහොත් "අස්ස" යනු කරණාර්ථයෙහි සාමිවචනයි එහෙයින්) **තේසං** ඒ ශස්ත්‍ර ඇති පුරුෂයන් කරණකොටගෙන **අභිලක්ඛිතත්තා** හැඳින්වීම කරණ හෙයින් **සසත්ථාවචරෝත්වේව** සසත්ථාවචරම යැයි **වුච්චති** කියනු ලැබෙයි **ඒවං** මෙසේ **විජ්ජමානේසු අඤ්ඤේසු රූපාවචරාදීසු තත්‍ථ අවචරන්තේසු** අන්‍ය රූපාවචරාදී භූමීන්හි හැසිරීම විද්‍යමාන කල්හි **තේසං** ඒ දෙවැදෑරුම් වූ කාමයාගේ **අභිලක්ඛිතත්තා** ප්‍රකට හෙයින්ම නොහොත් **තේසං** ඒ දෙවැදෑරුම් කාමයන් කරණකොටගෙන **අභිලක්ඛිතත්තා** හැඳින්වීම කරන හෙයින් **අයං පදේසෝ** මේ ප්‍රදේශය තෙමේ **කාමාවචරෝත්වේව** කාමාවචරමයයි **වුච්චති** කියනු ලැබෙයි **යථා** යම්සේ **උත්තරපදලෝපං කත්‍වා** උත්තර පදයාගේ ලෝපය කොට **රූපභවෝ** රූපභවය තෙමේ (හෙවත් රූපභව ශබ්ද තෙමේ) **රූපං** රූපය යන නම ඇත්තේ වේද **ඒවං** ඒ පරිද්දෙන්ම **සෝ අයං** ඒ කාමාවචරය තෙමේ (හෙවත් ඒ කාමාවචර ශබ්ද තෙමේ උත්තර පද ලෝපය කොට) **කාමෝත්වේව වුච්චති** කාමාවචරම යැයි කියනු ලැබෙයි **ඒවං** මෙසේ **ඉදං චිත්තං** මේ චිත්තය **ඉමස්මිං ඒකාදසපදේසසඞ්ඛාතේ කාමේ** මේ එකොළොස් වැදෑරුම් සඞ්ඛ්‍යාත කාමභූමියෙහි **අවචරතීති** හැසිරෙයිනුයි **කාමාවචරං** කාමාවචර නම් වෙයි.

**ඒතං (චිත්තං)** මේ චිත්තය **රූපාරූපභවේසුපි** රූපාරූපභවයන්හි ද **අවචරති** හැසිරෙයි **හි (තථා)** එහි **කිඤ්චාපි?** කෙසේ වේද යත්? **යථා පන** යම්සේ වනාහි **සඞ්ගාමේ** යුධ බිමෙහි **අවචරණතෝ** හැසිරෙන හෙයින් **සඞ්ගාමාවචරෝ ඉති** සඞ්ගාමාවචර යන **ලද්ධනාමකෝ නාගෝ** ලබනලද නම් ඇති හස්තියා **නගරේ** නගරයෙහි **චරන්තෝපි** හැසිරෙනුයේ ද **සඞ්ගාමාවචරෝත්වේව වුච්චති** සඞ්ගාමාවචර යැයිම කියනු ලැබෙයි **ථලජලචරා ච පාණා** දිය ගොඩ හැසිරෙන ප්‍රාණීහු ද **අථලේ අජලේ ච ඨිතාපි** දිය ගොඩ නොසිටියාහු ද **ථලචරා ජලචරාත්වේව වුච්චන්ති** ථලචර ජලචර යැයි කියනු ලැබෙත් **ඒවං** මෙසේ **ඉදං** මේ චිත්තය **අඤ්ඤත්ථ** අන් තැනෙක **අවචරන්තම්පි** හැසිරෙන්නේ ද **කාමාවචරමේව ඉති** කාමාවචරම යැයි **වේදිතබ්බං** දතයුතුයි **ආරම්මණකරණවසේන වා** අරමුණු කිරීම් වශයෙන් හෝ **එත්ථ** මෙහි **කාමෝ** කාමය තෙමේ **අවචරතීතිපි** හැසිරෙයි ද **කාමාවචරං** කාමාවචර නම් **කාමඤ්ච** ඒකාන්තයෙන් **ඒස** ඒ කාම තෘෂ්ණාව **රූපාරූපාවචරේසුපි** රූපාරූපභූමීන්හි ද **අවචරති** හැසිරෙයි **යථා පන** යම්සේ වනාහි **වදතීති** කියයි ද යත්? **වච්ඡෝ** වසු පැටවා **මහියං** පොළොවෙහි **සේතීති** නිදයිනුයි **මහිංසෝති වුත්තේ** මහිස යැයි කිවූ කළ **යත්තකා සත්තා** යම්පමණ සත්වයෝ **මහියං** පොළොවෙහි **සෙන්ති** නිදත් යැයි **වදන්ති** කියත් ද **සබ්බේසං** ඒ සියළු සත්වයන්ට **තං නාමං** ඒ නම **න හෝති** නොවෙයි **ඒවං** මෙසේ **සම්පදමිදං** මේ උපමාව **වේදිතබ්බං** දතයුතුයි **අපි ච** තව ද **කාමභවසඞ්ඛාතේ කාමේ** කාමභව සඞ්ඛ්‍යාත කාමභූමියෙහි **පටිසන්ධිං** ප්‍රතිසන්ධිය **අවචාරේතීතිපි** උපදවයිනුයි **කාමාවචරං** කාමාවචර නම් වේ. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

**අකුසලං** පන භූමිතෝ ඒකවිධං කාමාවචරමේව, මූලතෝ තිවිධං ලෝභමූලං දෝසමූලං මෝහමූලඤ්ච.

**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 453 යටතේ); විසුද්ධිමග්ග අටුවා 339 පිට (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය විඤ්ඤාණස්කන්ධය 196 පිට (තායිවාන් මුද්‍රණය)]**

**කාමාවචරමේවා**ති එත්ථ නිකායන්තරියා රූපාරූපාවචරම්පි අකුසලං ඉච්ඡන්තීති තේසං මතිනිසේධනත්ථං කාමාවචරග්ගහණං. මහග්ගතභූමියං උප්පජ්ජන්තම්පි තත්ථ රූපධාතුයං පවත්තිවිපාකං දෙන්තම්පි ඒකන්තේන කාමාවචරමේවාති දස්සනත්ථං අවධාරණං. යදි ඒවං, කස්මා කාමාවචරමේවාති? තත්ථ කාරණං වුත්තමේව. කථං වුත්තං? "කාමතණ්හා කාමෝ උත්තරපදලෝපතෝ, අවචරති එත්ථාති අවචරං, කාමස්ස අවචරං කාමාවචර"න්ති. එත්ථ හි කාමතණ්හාවිසයතා "කාමාවචරභාවස්ස කාරණං" වුත්තා යථා රූපාරූපතණ්හාවිසයතා "රූපාරූපාවචරභාවස්ස". ඒකංසේන චේතං ඒවං ඉච්ඡිතබ්බං. අඤ්ඤථා බ්‍යාපිලක්ඛණං න සියා. යදි හි ආලම්බිතබ්බධම්මවසේන භූමිවවත්ථානං කරෙය්‍ය, ඒවං සති අනාරම්මණානං සඞ්ගහෝ න සියා. අථ විපාකදානවසේන, එවම්පි අවිපාකානං සඞ්ගහෝ න සියා. තස්මා ආලම්බණධම්මවසේන පරියාපන්නානං සා කාතබ්බා, අපරියාපන්නානං පන ලෝකතෝ උත්තිණ්ණතාය ලෝකුත්තරතා, උත්තරිතරාභාවතෝ අනුත්තරතා ච වේදිතබ්බා.

**පරියාපන්නා**ති ච පරිච්ඡේදකාරිකාය තණ්හාය පරිච්ඡිජ්ජ ආපන්නා, ගහිතාති අත්ථෝ. නනු චෙත්ථ කාමතණ්හා කතමා? කාමාවචරධම්මාරම්මණා තණ්හා, කාමාවචරධම්මා කතමේ? කාමතණ්හාවිසයාති ඉතරේතරසන්නිස්සයතාදෝසෝති? නයිදමේවං අවීචිආදිඒකආදසෝකාසනින්නතාය කඤ්චි තණ්හං කාමතණ්හාභාවේන

ගහෙත්වා තංසභාවාය තණ්හාය විසයභාවේන කාමාවචරධම්මානං උපලක්ඛිතබ්බත්තා. **නික්ඛේපකණ්ඩේපි** *(ධ. ස. 985 ආදයෝ)* "එත්ථාවචරා"ති වචනං අවීචිපරනිම්මිතපරිච්ඡින්නෝකාසාය කාමතණ්හාය විසයභාවං සන්ධාය වුත්තන්ති ගහේතබ්බං. තදෝකාසතා ච තණ්හාය තන්නින්නතාය වේදිතබ්බා.

**මූලතෝ තිවිධ**න්ති තීණි අකුසලමූලානි ලෝභාදීනි, තේසං වසේන තං සහිතම්පි තිවිධන්ති අත්ථෝ. තානි හි සුප්පතිට්ඨිතභාවකාරණත්තා මූලමිවාති මූලානි, ලෝභෝ මූලං ඒතස්සාති **ලෝභමූලං**. අසාධාරණේන නිද්දේසෝ යථා භේරිසද්දෝ, යවඞ්කුරෝති. තථා **දෝසමූලං**. මෝහෝ ඒව මූලං ඉමස්ස, නාඤ්ඤන්ති **මෝහමූලං**.
**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 453 යටතේ)]**

**අකුසලං පන** අකුශලය වනාහි **භූමිතෝ** භූමි වශයෙන් **ඒකවිධං** එක් වැදෑරුම් **කාමාවචරං ඒව** කාමාවචරම (**හෝති** වෙයි) **මූලතෝ** මූල වශයෙන් **ලෝභමූලං** ලෝභමූලය **දෝසමූලං** ද්වේෂ මූලය **මෝහමූලඤ්ච** මෝහ මූලයද යයි **තිවිධං** තෙවැදෑරුම් (**හෝති** වෙයි) ෴

"කාමාවචරමේව" යනුයෙහි නිකායානන්තරියයෝ රූපාරූපාවචර අකුශලයන් කැමැති වෙත්නුයි ඔහුන්ගේ මත නිෂේධය පිණිස කාමාවචර ග්‍රහණය කරණලදි. මහග්ගත භූමියෙහි උපදනේ ද ඒ රූපධාතුවෙහි ප්‍රවෘත්ති විපාක දෙනුයේ ද ඒකාන්තයෙන් කාමාවචරමයයි දක්වන පිණිස අවධාරණය කරණලදි. ඉදින් රූපධාතුවෙහිදු උපදී නම් ඉහි ප්‍රවෘත්ති විපාක දේනම් "කාමාවචරමේව" යනු කුමටය යත්? ඉහි කාරණ කියනලදමැයි. කොයි කියනලද යත්? "කාමතණ්හා කාමෝ, උත්තර පදලෝපතෝ. අවචරති එත්ථාති = අවචරං, කාමස්ස අවචරං = කාමාවචරං" යි ගෙන මෙහි කාමතෘෂ්ණා විෂයත්වය කාමාවචරභාවයට කාරණයයි කියනලදි. රූපාරූපතෘෂ්ණා විෂයත්වය රූපාරූපාවචරභාවයට මෙනි. අවශ්‍යයෙන් මේ මෙසේම පසැස්ස යුතුය. නොඑසේවුව ලක්‍ෂණය ව්‍යාපීනොවන්නේයි. ඉදින් ආලම්බනීය ධර්ම වශයෙන් භූමි ව්‍යවස්ථාව කටයුතු වී නම් එසේ කල්හි අනාලම්බනයන්ගේ සඞ්ග්‍රහය නොවන්නේයි. නැවත විපාකදන වශයෙන් වී නම් එසේද කල්හි අවිපාක ධර්මයන්ගේ සඞ්ග්‍රහය නොවන්නේයි. එහෙයින් ආලම්බක ධර්ම වශයෙන් පරියාපන්නයන්ගේ භූමි ව්‍යවස්ථාව කටයුතුය. අපරියාපන්නයන්ගේ වනාහි ලෝකයෙන් උත්තීර්ණ්ණ බැවින්ම ලෝකෝත්තර තාවද අතිශයින් උත්තරීතර භාවයෙන් අනුත්තරතාව ද දතයුතු ෴

"පරියාපන්නා" යනුයෙහිදු "පරිච්ඡේදකාරිකාය තණ්හාය පරිච්ඡිජ්ජ්ආපන්නාගහිතා" යන අර්ථයි. "කාමතණ්හා කතමා? කාමාවචරධම්මාරම්මණා තණ්හා. කාමාවචරධම්මා කතමේ? කාමතණ්හා විසයා"යි ඉතරේතර සන්නිශ්‍රයතා දෝෂය පැමිණෙයි යත්? නොපැමිණේ. අවීචි ආදී ඒකාදශාවකාශයෙහි නිම්නබැවින් කිසි තෘෂ්ණාවක් කාමතෘෂ්ණා භාවයෙන් ගෙන තත් ස්වභාව වූ තෘෂ්ණාවට විෂය භාවයෙන් කාමාවචරධර්මයන් උපලක්‍ෂණය කටයුතු බැවින් නික්ෂේපකාණ්ඩයෙහිදු "එත්ථාවචරා" යන වචනය අවීචි පරනිර්මිත ලෝකයන්ගෙන් පිරිසිඳුනා ලද අවකාශ ඇත්තා වූ කාමතෘෂ්ණාවගේ විෂය භාවය සඳහා කියනලදැයි ගතයුතුයි. තෘෂ්ණාවගේ තදවකාශතාව ද තන්නිම්න බැව් නැයි දතයුතු ෴

මූලතෝ තිවිධං ලෝභාදී මූල වශයෙන් පිරිසිඳුනා ලද අවකාශ ඇති කාමතෘෂ්ණාවට විෂයභාව සඳහා තත් සහිත චිත්තය ද ත්‍රිවිධ වේ යන අර්ථයි. ඒ

ලෝභාදීහු වනාහි සුප්‍රතිෂ්ඨිත භාවයට කාරණ බැවින් "මූලම්වාති = මූලානි" යනු වෙත්. "ලෝභෝමූලං ඒතස්සාති = ලෝභමූලං, භේරිසද්දෝ - යවඞ්කුරෝ" යනු මෙන්. අසාධාරණ මූලයෙන් දැන්වීමයි. "දෝසමූලං" යනුදු එසේමය. "මෝහෝ ඒව මූලං ඉමස්ස නාඤ්ඤන්ති = මෝහමූලං" **[විසුද්ධිමාර්ග සන්නය 1088-1089 පිටු]**

උද්දානතෝ දුවේ කාමා, ක්ලේසවත්ථුවසා පන;
කිලේසෝ ඡන්දරාගෝව, වත්ථු තේභූමවට්ටකං.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේසවණ්ණනා අංක 12 යටතේ)]**

**උද්දානතෝ** සඞ්ඛේපවසේන කිලේසවත්ථුවසේන දුවේ කාමා හොන්ති. ඡන්දරාගෝව කිලේසෝ, තේභූමකේ පවත්තං වට්ටසහිතං වත්ථු, වසති කිලේසෝ එත්ථාති **වත්ථු**.

**[අභිධම්මවතාර පුරාණටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 12 යටතේ)]**

යේන පනත්ථේන ඉදං "කාමාවචර"න්ති වුච්චති, තං දනි දස්සේතුං "**උද්දානතෝ**"තිආදි ආරද්ධං. තත්ථ **උද්දානතෝ**ති උද්දේසතෝ, සඞ්ඛේපතෝති අත්ථෝ. කිඤ්චාපි අවසිට්ඨකිලේසාදයෝ විය කිලේසකාමෝපි අස්සාදේතබ්බතාය වත්ථුකාමේ සඞ්ගහිතෝ ඤණං විය ඤෙදයෙය්ති සඞ්ඛේපතෝ ඒකෝයේව කාමෝ සියා, තථාපි කිලේසකාමෝ වත්ථුකාමභාවං ගච්ඡන්තෝ කාමනීයට්ඨේන ගච්ඡති, න කාමනවසේන. කාමනවසේන ච පන කිලේසකාමෝව හෝති, න පන වත්ථුකාමෝති ආහ "**ක්ලේසවත්ථුවසා**"තිආදි. කෝ පනෙත්ථ වත්ථුකාමෝ, කෝ කිලේසකාමෝති චෝදනං මනසි නිධාය "ඡන්දෝ කාමෝ, රාගෝ කාමෝ, ඡන්දරාගෝ කාමෝ, සඞ්කප්පෝ කාමෝ, රාගෝ කාමෝ, සඞ්කප්පරාගෝ කාමෝ"ති (මහානි. 1) ඒවං **නිද්දේසපාළියං** ආගතා නිද්දිට්ඨා කාමතණ්හාව ඉධ කිලේසකාමෝ. වත්ථුකාමෝති ච "මනාපිකා රූපා…පෙ…. මනාපිකා ඵොට්ඨබ්බා…පෙ…. සබ්බේපි කාමාවචරා ධම්මා…පෙ…. සබ්බේපි රූපාවචරා…පෙ…. සබ්බේපි අරූපාවචරා…පෙ…. කාමා"ති (මහානි. 1) තත්ථේව නිද්දිට්ඨා සවිඤ්ඤණාවිඤ්ඤණප්පභේද තේභූමකධම්මාති දස්සෙන්තෝ ආහ "**කිලේසෝ**…**පෙ**…. **වට්ටක**"න්ති. "**ඡන්දරාගෝවා**"ති අවධාරණේන කිලේසභාවේන නිරුළ්හේසු ලෝභදෝසමෝහාදීසු දසසු දෝසමෝහාදයෝ නව කිලේසේ පටික්ඛිපති. කාමරූපාරූපතණ්හාය වත්ථු පතිට්ඨානං, කාරණභූතන්ති වා **වත්ථු**.

**[අභිධම්මවතාර අභිනවටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 12 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 68-70 පිටු]**

කිලේසකාමෝ කාමේති, වත්ථු කාමීයතීති ච;
සිජ්ඣති දුවිධෝපේස, කාමෝ වෝකාරකද්වයේ.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේසවණ්ණනා අංක 13 යටතේ)]**

කිලේසකාමෝ වත්ථුං කාමේති ඉච්ඡති, වත්ථු කිලේසකාමේන කාමීයති ඉච්ඡීයතීති කත්තුකාරකකම්මකාරකද්වයේ සාධනද්වයේ **ඒස** ඒසෝ දුවිධෝපි කාමෝ සිජ්ඣති. **[අභිධම්මාවතාර පුරාණටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේසවණ්ණනා අංක 13 යටතේ)]**

කථං පන කිලේසකාමෝ නාම, කථඤ්ච වත්ථුකාමෝති ආහ "**කිලේසකාමෝ**"තිආදි. **කාමේතී**ති වත්ථුකාමං පත්ථේති. **කාමීයතී**ති කිලේසකාමේන පත්ථීයති. **ඉති**-සද්දෝ "තස්මා"ති ඉමස්ස අත්ථේ. **ච**-සද්දෝ ඒව-කාරත්ථේ, තේන

යස්මා කිලේසකාමෝ කාමේතීති කාමෝ, වත්ථුකාමෝ ච කාමීයතීති, තස්මා ඒව කිලේසකාමෝ, වත්ථුකාමෝ චාති **දුවිධෝපි ඒස** කාමෝ **කාරකද්වයේ** කත්තරි, කම්මනි ච සිජ්ඣති, කත්තුභාවං, කම්මභාවඤ්ච පච්චනුභෝතීති අත්ථෝ. අථ වා **දුවිධෝති** ද්වින්නං කාමානං වාචකතෝ දුවිධෝ. "කාමෝ"ති අයං සද්දෝ **කාරකද්වයේ සිජ්ඣති** යථාවුත්තකාරකයුගළේ නිප්ඵජ්ජති, කත්තරි, කම්මනි ච "කාමෝ"ති පදසම්භවෝ හෝතීති අත්ථෝ. **වෝ**-කාරෝ පන නිපාතමත්තං "ඒවං වෝ කාලාමා"තිආදීසු (අ. නි. 3.66) විය. අථ වා **වෝකාරකද්වයේති** ඛන්ධද්වයේති අත්ථෝ. කිලේසකාමෝ හි සඞ්ඛාරසභාවත්තා සඞ්ඛාරක්ඛන්ධේ, වත්ථුකාමෝ ච වක්ඛමානනයේන පඤ්චකාමගුණභූතෝ රූපසභාවත්තා රූපක්ඛන්ධේති ඒවං දුවිධෝපේස කාමෝ ඛන්ධද්වයේ **සිජ්ඣති** නිප්ඵජ්ජති, අන්තෝභාවං ගච්ඡතීති.
**[අභිධම්මවතාර අභිනවටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 13 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 70 පිට]**

යස්මිං පන පදේසේ සෝ, කාමෝයං දුවිධෝපි ච;
සම්පත්තීනං වසේනාව-චරතීති ච සෝ පන.

පදේසෝ චතුපායානං, ඡන්නං දේවානමේව ච;
මනුස්සානං වසේන්ව, ඒකාදසවිධෝ පන.
**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේසවණ්ණනා අංක 14-15 යටතේ)]**

සෝ අයං දුවිධෝපි කාමෝ යස්මිං පදේසේ සම්පත්තීනං වසේන අවචරති, **ඉති** තස්මා කාරණා සෝ පන පදේසෝ චතුපායානං ඡන්නං දේවානං මනුස්සානං වසේන ඒව ඒකාදසවිධෝ හෝති.
**[අභිධම්මවතාර පුරාණටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 14-15 යටතේ)]**

සම්පජ්ජනානි **සම්පත්තියෝ,** තාසං වසේන විසයවිසයීභාවේන අඞ්ගඞ්ගමඞ්ගඞ්ගං සමෝසරණවසේන, සම්පාපුණනවසේනාති අත්ථෝ. ඉමිනා පන ඉදං දීපේති; යත්ථ දුවිධෝපි කාමෝ විසයවිසයීභාවේන සහිතෝ පවත්තති, සෝයේව ඒකාදසවිධෝ පදේසෝ කාමාවචරසඞ්ඛාතෝ. යත්ථ පන රූපාරූපධාතුයං කේවලං වත්ථුකාමෝව පවත්තති, න සෝ පදේසෝ කාමාවචරෝ නාමාති. නනු ච දුවිධෝපි සහිතෝ රූපාරූපධාතූසු පවත්තති, රූපාරූපාවචරධම්මානං වත්ථුකාමත්තා, තදාරම්මණභූතානඤ්ච රූපාරූපතණ්හානං තං යෝගේන කිලේසකාමභාවසිද්ධිතෝති? නයිදමේවං ඕරම්භාගියභූතස්ස බහලකිලේසස්සේව කාමරාගස්ස ඉධ කිලේසකාමභාවේන අධිප්පේතත්තා. "උද්දානතෝ ද්වේ කාමා"ති සබ්බේ කාමේ උද්දිසිත්වාපි හි "පදේසෝ චතුපායාන"න්තිආදිනා විසයනියමනේන "දුවිධෝපි අය"න්ති එත්ථ කාමේකදේසභූතෝ නීවරණාවත්ථාය කථිතෝ කාමරාගෝ කිලේසකාමභාවේන, තබ්බත්ථුකායේව ධම්මා වත්ථුකාමභාවේන ගහිතා, න රූපාරූපතණ්හා, තබ්බත්ථුකධම්මා චාති ඤායති. ඒවඤ්ච කත්වා උපරි වක්ඛමානා සසත්ථාවචරූපමා උපපන්නා හෝති, යථාවුත්තානමේව කාමානං ඉධ අධිප්පේතත්තා රූපාරූපධාතූසු විමානකප්පරුක්ඛවත්ථාලඞ්කාරපරිත්තකුසලාදිභේදේසු කාමාවචර ධම්මේසු පවත්තෝ ඡන්දරාගෝ කිලේසකාමෝ නාම න හෝති, න ච තබ්බත්ථුභූතං විමානකප්පරුක්ඛාදිපරිත්තධම්මජාතං වත්ථුකාමෝ නාමාති සිද්ධං. තේනේවාහ "කාමෝ වා කාමසඤ්ඤා වා බ්‍රහ්මලෝකේ න විජ්ජතී"ති. කාමාවචරසත්තසන්තාන ගතතණ්හාය විසයභාවේ සති පන තං යෝගේන රූපාරූපධාතූසුපි පවත්තමානෝ පරිත්තධම්මෝ වත්ථුකාමෝයේවාති වේදිතබ්බං. අථ වා නිද්දේසේ ආගතනයේන

නිරවසේසෝ කිලේසකාමෝ කාමතණ්හාභවතණ්හාවිභවතණ්හානිරෝධතණ්හා පභේදෝ ඉධ පවත්තති. වත්ථුකාමේසුපි අප්පකං රූපාරූපවිපාකමත්තං ඨපෙත්වා සබ්බෝයේව ඉධ පවත්තතීති අනවසේසප්පවත්තිං සන්ධාය "**කාමෝයං දුවිධෝපි චා**"ති වුත්තං. කිඤ්චාපි ඒවං වුත්තං, තේසු පන බහලකිලේසකාමභූතෝ බහලකාමරාගෝ ච තබ්බත්ථුකා පඤ්ච කාමගුණා ච ඉධ ගහිතාති දස්සනත්ථං "**සම්පත්තීනං වසේනා**"ති වුත්තං. සම්පජ්ජනවසේන, සම්ජ්ඣනවසේනාති අත්ථෝ. **අවචරතීති** පවත්තති. **ඉති**-සද්දෝ හේතුම්හි, යස්මා දුවිධෝපි අයං කාමෝ අවචරති, තස්මා කාමෝ එත්ථ අවචරතීති කාමාවචරසඞ්ඛිතෝති අත්ථෝ.

සග්ගමොක්ඛහේතුභූතා පුඤ්ඤසම්මතා අයා යේභුයෙන්‍ය අපේතාති අපායා. නිරයාදිවසේන චත්තාරෝ අපායා **චතුපායා. ඡන්න**න්ති චාතුමහාරාජික තාවතිංස යාමාතුසිතානිම්මානරති පරනිම්මිතවසවත්තිසඞ්ඛාතානං ඡන්නං දේවලෝකානං. මේරුපාදවාසිනෝ පන අසුරා තාවතිංසේසුයේව සඞ්ගය්හන්තීති න තේහි සද්ධිං සත්තන්නන්ති වුත්තං. මනසෝ උස්සන්නතාය **මනුස්සා,** සතිසූරභාවබ්‍රහ්මචරිය යෝග්‍යතාදිගුණවසේන උපචිතමානසතාය උක්කට්ඨගුණචිත්තතායාති අත්ථෝ, තේ පන නිප්පරියායතෝ ජම්බුදීපවාසිනෝ වේදිතබ්බා. යථාහ;

"තීහි, භික්ඛවේ, ඨානේහි ජම්බුදීපකා මනුස්සා උත්තරකුරුකේ ච මනුස්සේ අධිග්ගණ්හන්ති දේවේ ච තාවතිංසේ. කතමේහි තීහි? සූරා සතිමන්තෝ ඉධ බ්‍රහ්මචරියවාසෝ"ති (අ. නි. 9.21).

තේහි පන සමානරූපාදිතාය සද්ධිං පරිත්තදීපවාසීහි ඉතරමහාදීපවාසිනෝපි "මනුස්සා"ඉච්චේව පඤ්ඤායිංසු. ලෝකියා පන මනුනෝ අපච්චභාවේනේව "මනුස්සා"ති වදන්ති. **ඒකාදසවිධෝ**ති චතුරාපායේසු තිරච්ඡානපෙත්තිවිසයානං විසුං පරිච්ඡින්නස්ස ඔකාසස්ස අභාවේපි යත්ථ තේ අරඤ්ඤසමුද්දපබ්බතපාදදිකේ නිබද්ධවාසං වසන්ති, තාදිසස්ස ඨානස්ස ගහිතත්තා ඒකාදසවිධෝ.
**[අභිධම්මවතාර අභිනවටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 14-15 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 70-74 පිටු]**

කාමෝවචරතීතෙත්ථ, කාමාවචරසඤ්ඤිතෝ;
අස්සාභිලක්ඛිතත්තා හි, සසත්ථාවචරෝ විය.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේසවණ්ණනා අංක 16 යටතේ)]**

**කාමෝවචරතීති එත්ථ** ඒතස්මිං ඒකාදසවිධේ පදේසේ කාමෝ අවචරති, **ඉති** තස්මා කාරණා සෝ පදේසෝ **අස්ස** කාමස්ස අනේන කාමේන අභිලක්ඛිතත්තා කාමාවචරසඤ්ඤිතෝ. අභිලක්ඛිතසද්දප්පයෝගේ තතියත්ථේ "අස්සා"ති ඡට්ඨී හෝතීති සද්දසත්ථවිදූ පඨන්ති. සසත්ථාවචරෝ පදේසෝ විය සත්තේ සසන්ති හිංසන්ති තේහීති සත්ථා, සහ සත්ථෙහීති සසත්ථා, සසත්ථා පුරිසා අවචරන්ති එත්ථාති **සසත්ථාවචරෝ**. යථා හි යස්මිං පදේසේ සසත්ථා පුරිසා අවචරන්ති, සෝ පදේසෝ විජ්ජමානේසුපි අඤ්ඤේසු ද්විපදචතුප්පදේසු අවචරන්තේසු තේසං උපලක්ඛිතත්තා "සසත්ථාවචරෝ"ත්වේව වුච්චති, ඒවං විජ්ජමානේසුපි අඤ්ඤේසු රූපාවචරාදීසු තත්ථ අවචරන්තේසු තේසං අභිලක්ඛිතත්තා අයං පදේසෝ "කාමාවචරෝ"ත්වේව වුච්චති.

**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේසවණ්ණනා අංක 16 යටතේ)]**

නනු චෙත්ථ අඤ්ඤෙසම්පි ධම්මානං පවත්තිසම්භවතො කාමස්සේව අවචරණවසේන කථං නාමලාභෝති ආහ "**අස්සාභිලක්ඛිතත්තා**"තිආදි. තත්ථ **අස්සාති** ඉමස්ස දුවිධස්ස කාමස්ස. **අභිලක්ඛිතත්තාති** ඒකාදසවිධෙ පදේසේ පාකටත්තා. අථ වා **අස්සාති** කරණත්ථේ සාමිවචනං, තස්මා අනේන දුවිධේන කාමේන ඒකාදසවිධස්ස පදේසස්ස **අභිලක්ඛිතත්තා,** පඤ්ඤපිතත්තාති අත්ථෝ. අථ වා උපයෝගත්ථේ සාමිවචනවසේන **අස්ස** ඒකාදසවිධස්ස පදේසස්ස තේන දුවිධේන අභිලක්ඛිතත්තාති අත්ථෝ. සහ සත්ථේහීති සසත්ථා, යත්ථ තේ අවචරන්ති, සෝ **සසත්ථාවචරෝ,** පදේසෝ. සෝ විය. යථා හි යස්මිං පදේසේ සසත්ථා පුරිසා අවචරන්ති, සෝ විජ්ජමානේසුපි අඤ්ඤේසු ද්විපදචතුප්පදදීසු අවචරන්තේසු තේසං තත්ථ පාකටත්තා, තේහි වා අභිලක්ඛිතත්තා "සසත්ථාවචරෝ"ත්වේව පඤ්ඤායති, ඒවං විජ්ජමානේසුපි අඤ්ඤේසු රූපාවචරාදීසු අවචරන්තේසු අභිලක්ඛණවසේන අයං පදේසෝ "කාමාවචරෝ"ත්වේව සඞ්ඛිතෝති. ඒස නයෝ රූපාරූපාවචරේසු.
**[අභිධම්මවතාර අභිනවටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 16 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 74 පිටු]**

ස්වායං රූපභවෝ රූපං, ඒවං කාමෝති සඤ්ඤිතෝ;
උත්තරස්ස පදස්සේව, ලෝපං කත්වා උදීරිතෝ.

තස්මිං කාමේ ඉදං චිත්තං, සදාවචරතීති ච;
කාමාවචරමිච්චේවං, කථිතං කාමඝාතිනා.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 17-18 යටතේ)]**

යථා රූපභවෝ උත්තරපදස්ස ලෝපං කත්වා රූපන්ති වුත්තෝ, ඒවං තථා **ස්වායං** සෝ අයං ඒසෝ කාමාවචරෝ උත්තරපදස්ස ලෝපං කත්වා **කාමෝ ඉති සඤ්ඤිතෝ** කාමෝ නාම උදීරිතෝ පණ්ඩිතේන කථිතෝ.

**තස්මිං කාමේ** ඉදං චිත්තං තස්මිං කාමාවචරේ සදා අවචරති, **ඉති** තස්මා කාරණා කාමාවචරං ඉති ඒවං **කාමඝාතිනා** කාමානං විනාසකේන බුද්ධේන කථිතං. කිඤ්චාපි ඒතං රූපාරූපභවේසුපි අවචරති, යථා පන සඞ්ගාමේ යේභුයෙන අවචරණතෝ "සඞ්ගාමාවචරෝ"ති ලද්ධනාමෝ නාගෝ නගරේ චරන්තෝපි "සඞ්ගාමාවචරෝ"ත්වේව වුච්චති, ථලචරජලචරා පාණිනෝ අථලේ අජලේ ඨිතාපි "ථලචරජලචරා"ත්වේව වුච්චන්ති, ඒවං ඉදං අඤ්ඤත්ථ අවචරන්තම්පි කාමාවචරමේවාති දට්ඨබ්බං. ආරම්මණකරණවසේන වා එත්ථ කාමෝ අවචරතීතිපි කාමාවචරං. කාමඤ්චේස රූපාරූපාවචරේසුපි අවචරති, යථා පන වදතීති වච්ඡෝ, මහියං සේතීති මහිංසෝති වුත්තේ න යත්තකා වදන්ති, මහියං වා සෙන්ති, සබ්බේසං තං නාමං හෝති, ඒවංසම්පදමිදං දට්ඨබ්බං.

**[අභිධම්මාවතාර පුරාණටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 17-18 යටතේ)]**

නනු ච චිත්තං කාමාවචරන්ති වුත්තං, යථාවුත්තනයේන පන පදේසස්ස ගහිතත්තා කථං තත්ථ අවචරන්තං කාමාවචරං නාමාති ආහ **"ස්වාය"**න්තිආදි. සෝ අයං කාමාවචරෝ "කාමෝ"ති සඤ්ඤිතෝති සම්බන්ධෝ. **රූපභවෝ රූප**න්ති යථා රූපභවෝ රූපං. අවුත්තෝපි හි යථාසද්දෝ ඒවං-සද්දසන්නිට්ඨානතෝ ලබ්භති. යථා "රූපූපපත්තියා මග්ගං භාවේති"ති එත්ථ "රූපභවූපපත්තියා"ති වත්තබ්බේ රූපභවෝ "රූප"න්ති සඤ්ඤිතෝති අයමෙත්ථ අත්ථෝ. කථං පනේස ඒවං සඤ්ඤිතෝති ආහ **"උත්තරස්සා"**තිආදි. අථ වා යථා උත්තරස්ස පදස්ස ලෝපං

කත්වා උදීරිතෝ ඒස රූපභවෝ "රූප"න්ති සඞ්ඛිතෝ, ඒවං ස්වායං කාමාවචරෝ කාමෝති සම්බන්ධෝ. **තස්මිං කාමේති** තස්මිං උත්තරපදලෝපවසේන කාමසඞ්ඛාතේ පදේසේ. **ඉද**න්ති ඉදං අට්ඨවිධං චිත්තං. අධිකාරවසේන පන තස්ස ගහණේපි සබ්බේසමේව පරිත්තචිත්තානමයමත්ථෝ ලබ්භති සබ්බේසම්පි කාමේ අවචරණතෝ. **සදා**ති සබ්බකාලං, බාහුල්ලේනාති අධිප්පායෝ. ඉමිනා පන ඉදං දීපේති යථා සඞ්ගාමේ යේභුයෙන අවචරන්තෝ "සඞ්ගාමාවචරෝ"ති ලද්ධනාමෝ හත්ථී අඞ්කත්ථ අවචරන්තෝපි බාහුල්ලප්පවත්තිවසේන "සඞ්ගාමාවචරෝ"ත්වේව පඤ්ඤායති, ඒවමිදං අඤ්ඤත්ථ අවචරන්තම්පි කාමලෝකේ බාහුල්ලවුත්තිතෝ "කාමාවචර"මිච්චේව වුත්තන්ති. තේන පන නනු චේතං රූපාරූපභවේසුපි අවචරණතෝ රූපාවචරාදිනාමම්පි ලභෙය්‍යාති ඉදං චෝදනං පරිහරති. හෝති චෙත්ථ

"කාමේවචරතීතේ්‍යතං, කාමාවචරසඞ්ඛිතං;
සේසේ අවචරන්තම්පි, සඞ්ගාමාවචරෝ යථා"ති.

**ඉති**-සද්දෝ හේතුම්හි. **ච**-සද්දෝ වත්තබ්බන්තරසමුච්චයේ. තේන යස්මා උත්තරපදලෝපේන කාමාවචරෝ "කාමෝ"ති සඞ්ඛිතෝ, යස්මා ච තස්මිං කාමේ ඉදං චිත්තං සදා අවචරති, තස්මා "කාමාවචර"මිච්චේව කථිතං, න පන කාමාවචරාවචරං, නාපි රූපාරූපාවචරන්ති වාති අධිප්පායෝ. **කාමඝාතිනා**ති දේසනාඤාණේන විනෙය්‍යසන්තානගතස්ස කිලෙසකාමස්ස හනනසීලේන සම්මාසම්බුද්ධේන.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 17-18 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 74-76 පිටු]**

පටිසන්ධිං භවේ කාමේ, අවචාරයතීති වා;
කාමාවචරමිච්චේවං, පරියාපන්නන්ති තත්‍ර වා.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේසවණ්ණනා අංක 19 යටතේ)]**

**පටිසන්ධිං භවේ කාමේ** කාමභවසඞ්ඛාතේ කාමේ පටිසන්ධිං අවචාරයති, **ඉති** තස්මා කාමාවචරං. ඉති ඒවං **වා** අයං අඤ්ඤෝ නයෝ. **තත්‍ර** තස්මිං කාමාවචරේ **පරියාපන්නං** අන්තෝගධං, **ඉති** තස්මා කාමාවචරං.

**[අභිධම්මවතාර පුරාණටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 19 යටතේ)]**

**පටිසන්ධිං** ...පෙ.... **අවචාරයතීති වා**ති අථ වා යස්මා යත්ථ කත්ථචි උප්පන්නම්පි කාමේ භවේයේව පටිසන්ධිං අවචාරයති, තස්මා ඉදං කාමේ අවචාරයතීති "කාමාවචර"න්ති කථිතං වා-සද්දස්ස රස්සත්තං කත්වාති අත්ථෝ. ඒවං උත්තරපදලෝපවසේන පදසම්භවං දස්සෙත්වා ඉදානි විනාපි උත්තරපදලෝපං කාමාවචර සද්දස්ස සම්භවං දස්සේතුං **"පරියාපන්නන්ති තත්‍ර වා"**ති වුත්තං. **තත්‍රා**ති තස්මිං කාමභවේ. **පරියාපන්න**න්ති අන්තෝගධං. අයං පනෙත්ථ අධිප්පායෝ

"කතමේ ධම්මා කාමාවචරා? හෙට්ඨතෝ අවීචිනිරයං පරියන්තං කත්වා උපරිතෝ පරනිම්මිතවසවත්තී දේවේ අන්තෝකරිත්වා යං ඒතස්මිං අන්තරේ එත්ථාවචරා එත්ථ පරියාපන්නා ඛන්ධධාතුආයතනා රූපං වේදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං. ඉමේ ධම්මා කාමාවචරා"ති (ධ. ස. 1287) වුත්තත්තා යථා මනුස්සිත්ථියා කුච්ඡිස්මිං නිබ්බත්තෝපි තිරච්ඡානගතිකෝ තිරච්ඡානයෝනියමේව පරියාපන්නත්තා "තිරච්ඡානෝ"ත්වේව වුච්චති, ඒවමිදං රූපාරූපභවේසු උප්පන්නම්පි

කාමභවපරියාපන්නත්තා "කාමාවචර"මිච්චේව කථීතන්ති. තප්පරියාපන්නතා චස්ස අවීචිපරනිම්මිතපරිච්ඡින්නෝකාසනින්නාය කාමතණ්හාය විසයභාවතෝති වේදිතබ්බා. තථා හි වුත්තං ආචරියධම්මපාලත්ථේරේන **නික්ඛේපකණ්ඩේපි** "'එත්ථාවචරා'ති වචනං අවීචිපරනිම්මිතපරිච්ඡින්නෝකාසාය කාමතණ්හාය විසයභාවං සන්ධාය වුත්ත"න්ති. පදසම්භවෝ පනෙත්ථ ඒවං වේදිතබ්බෝ; කාමතණ්හා කාමෝ, සෝ එත්ථ ආරම්මණකරණවසේන අවචරතීති කාමාවචරන්ති. නනු චෙත්ථ කතමා කාමතණ්හා, යා කාමාවචරධම්මාරම්මණා තණ්හා. කතමේ කාමාවචරධම්මා, යේ කාමතණ්හාවිසයාති ඒවං ඉතරීතරනිස්සයතාදෝසෝ ආපජ්ජතීති? නාපජ්ජති, අවීචිආදිඒකාදසෝකාසනින්නතාය යංකිඤ්චි තණ්හං කාමතණ්හාභාවේන ගහෙත්වා තංසභාවාය තණ්හාය විසයභාවේන කාමාවචරධම්මානං උපලක්ඛේතබ්බභාවතෝ. අථ වා කිලේසවත්ථුවසේන දුවිධෝපි කාමෝ යථාරහං සහජාතවසේන එත්ථ අවචරතීති කාමාවචරං, ආරම්මණකරණවසේන වා දුවිධේපි කාමේ ඒතං අවචරතීති කාමාවචරං. අථ වා මඤ්චනිස්සිතකේසු උක්කුට්ඨිං කරොන්තේසු නිස්සයනිස්සිතානං අභේදස්ස බුද්ධියා ගහිතත්තා නිස්සිතකේසු නිස්සයූපචාරවසේන "මඤ්චා උක්කුට්ඨිං කරොන්තී"ති වුච්චති, ඒවමේතම්පි කාමාවචරභවේ පවත්තනවසේන තන්නිස්සිතත්තා නිස්සයවෝහාරේන "කාමාවචර"න්ති වුච්චති. හෝති චෙත්ථ

"කාමෝවචරතීතෙ‍ත්ථ, කාමේවචරතීති වා;
ඨානූපචාරතෝ වාපි, තං කාමාවචරං භවේ"ති.

**[අභිධම්මවතාර අභිනවටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 19 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 76-78 පිටු]**

**උද්දානතෝ** උද්දේශ වශයෙන් හෙවත් සංක්ෂේපයෙන් **කාමා** කාමයෝ තුමූ **කිලේසවත්ථුවසා පන** ක්ලේශකාම වස්තුකාම වශයෙන් වනාහි **දුවේ** දෙදෙනෙක් වෙති **ඡන්දරාගෝ ඒව** ඡන්දරාගය තෙමේම **කිලේසෝ** ක්ලේශකාම නම් වේ **තේභූමවට්ටකං** ත්‍රෛභූමක වෘත්තය තෙමේ **වත්ථු** (කාම රූප අරූප තෘෂ්ණාවට කාරණා වන හෙයින්) වස්තුකාම නම් වෙයි **කිලේසකාමෝ** ක්ලේශකාමය තෙමේ **කාමේති** යම්හෙයකින් වස්තුකාමය පතාද **වත්ථු** වස්තුකාම තෙමේ **කාමීයති** ක්ලේශකාමය විසින් පතනු ලැබේ ද **ඉති ච** එහෙයින්ම **දුවිධෝපි ඒසෝ කාමෝ** ක්ලේශකාමය වස්තුකාමය දැයි යන මේ දෙවැදෑරුම් වූ කාමය තෙමේ **කාරකද්වයේ** කර්තෘ කර්ම යන කාරක දෙක්හි **සිජ්ඣති** සිද්ධ වෙයි (නොහොත්) **දුවිධෝ** කාමයන් දෙදෙනාගේ වාචක භාවයෙන් දෙවැදෑරුම් වූ **කාමෝ** කාම යන මේ ශබ්ද තෙමේ **කාරකද්වයේ සිජ්ඣති** යථෝක්ත කාරක යුගලයෙහි ශබ්ද නිෂ්පත්තිය වෙයි (කර්තෘ කර්ම දෙක්හි කාම යන මේ පදයාගේ නිෂ්පත්තිය වෙයි යන අර්ථයි) මෙහි "වෝ-කාර" තෙමේ "ඒවං වෝ කාලාමා" යනාදියෙහි මෙන් නිපාත මාත්‍රයෙකි. (නොහොත්) **දුවිධෝපි එසෝ කාමෝ** දෙවැදෑරුම් වූද මේ කාමය තෙමේ **වෝකාරද්වයේ** ස්කන්ධ ද්වයෙහි **සිජ්ඣති** සිද්ධ වෙයි (හෙවත්) ඇතුළත් බවට යෙයි. ඒ එසේමැයි ක්ලේශකාමය තෙමේ සංස්කාර ස්වභාව හෙයින් සංස්කාරස්කන්ධයෙහි ද වස්තුකාමය තෙමේ වක්ෂ්‍යමාන නියායෙන් පඤ්චකාම ගුණය වූයේ රූප ස්වභාවයක් හෙයින් රූපස්කන්ධයෙහි දැයි යන ස්කන්ධ ද්වයෙහි ඇතුළත් වෙයි.

**සෝ අයං දුවිධෝපිච කාමෝ** ඒ දෙවැදෑරුම් වූද කාමය තෙමේ **යස්මිං පන පදේසේ** යම් ප්‍රදේශයෙක්හි **සම්පත්තීනං වසේන** (ක්ලේශකාමය තද්වස්තුක වූ පඤ්චකාම ගුණය යන මොහුන්ගේ) සමෘර්ධ වීම් වශයෙන් (හෙවත් විෂයවිෂයී

භාවයෙන් ඔවුනොවුන් බැසගැනීම් වශයෙන් හෝ පැමිණීම් වශයෙන්) **අවචරති** පවතී ද **ඉති ච (තස්මා ඒව)** එහෙයින්ම **චතුපායානං** සිව් අපායන්ගේ ද **ඡන්නං දේවානං ඒව ච** ෂඩ්විධ දිව්‍යලෝකයන්ගේ ද **මනුස්සානං** මනුෂ්‍යයන්ගේ ද **වසේන** වශයෙන් **ඒකාදසවිධෝ** එකොළොස් වැදෑරුම් වූ **සෝ පන පදේසෝ** ඒ ප්‍රදේශ තෙමේම **එත්ථ** මෙහි **කාමෝ** කාමය තෙමේ **අවචරති** යම් හෙයකින් පවතී ද **ඉති (තස්මා)** එසේහෙයින් **අස්ස** මේ දෙවැදෑරුම් වූ කාමයාගේ **අභිලක්ඛිතත්තා හි** (එකොළොස් වැදෑරුම් ප්‍රදේශයෙහි) ප්‍රකට හෙයින්ම (නොහොත් "අස්ස" යනු කරණාර්ථයෙහි සාමිවචනයි එහෙයින්) **අස්ස** ඒ දෙවැදෑරුම් වූ කාමය කරණකොටගෙන **අභිලක්ඛිතත්තා** (එකොළොස් වැදෑරුම් ප්‍රදේශයාගේ) හැඳින්වීම කරණ හෙයින් (නොහොත් උපයෝගාර්ථයෙහි සාමිවචන වශයෙන්) **අස්ස** ඒ එකොළොස් වැදෑරුම් වූ ප්‍රදේශය **අභිලක්ඛිතත්තා** (ඒ දෙවැදෑරුම් කාමය කරණකොටගෙන) සළකුණු කිරීමෙන් හඳුන්වන හෙයින් **සසත්ථාවචරෝ විය** ශස්ත්‍ර සහිත පුරුෂයන් හැසිරෙන ප්‍රදේශය තෙම සසත්ථාවචර නම් වන්නාක් මෙන් **කාමාවචරසඞ්ඛාතෝ** කාමාවචර නම් වේ.෴

මෙහි "උද්දානතෝති උද්දේසතෝ සඞ්ඛේපතෝති අත්ථෝ" යනු ටීකා හෙයින් ඉඳින් සංක්ෂේප හෙයින් යන අර්ථය වන්නේ නම් අවශිෂ්ඨ ක්ලේශාදීහු මෙන් ක්ලේශ කාමය තෙමේ ද ආස්වාදනය කටයුතු හෙයින් ශෛද්‍ය ධර්මයෙහි ඡන්දනය මෙන් වස්තුකාමයෙහි සඞ්ගෘහීත වේනුයි සංක්ෂේප හෙයින් එකම කාමයක් වන්නේ නොවේ ද? එසේදවුවත් ක්ලේශකාමය තෙමේ වස්තුකාම භාවයට යනුයේ කාමනීය අර්ථයෙන් යෙයි. කැමැතිවීම් වශයෙන් නොයෙයි. කාමන (කැමැති) ක්‍රියා වශයෙන් ක්ලේශකාමයම වෙයි. වස්තුකාමය නොවෙයි යනු දක්වනු පිණිස "කිලේසවත්ථුවසා" යනාදිය කීයේයි. එහි වස්තුකාමය කවරේ ද? ක්ලේශකාමය කවරේ දැයි? යන චෝදනාව සිත්හි පිහිටුවා "ඡන්දෝ කාමෝ රාගෝ කාමෝ ඡන්දරාගෝ කාමෝ සඞ්කප්පෝ කාමෝ සඞ්කප්පරාගෝ කාමෝ"යි මෙසේ නිද්දේස පාළියෙහි ආවාවූ කාමතෘෂ්ණාවම මෙහි ක්ලේශකාම යයිද "මනාපිකා රූපා -පෙ- මනාපිකා ඵොට්ඨබ්බා -පෙ- සබ්බේපි කාමාවචරා ධම්මා කාමනීයට්ඨේන කාමා සබ්බේපි රූපාරූපාවචරා -පෙ- කාම"යි එම නිද්දේස පාළියෙහි දක්වන ලද්දවූ සවිඤ්ඤාණක අවිඤ්ඤාණක ප්‍රභේද වූ ත්‍රෛයිභූමික ධර්මයෝ වස්තුකාම යැයිද දක්වන්නා වූ ආචාර්‍යයන් වහන්සේ "කිලේසෝ ඡන්දරාගෝව වත්ථුතේභූමවට්ටකං"යි කීයේයි. "ඡන්දරාගෝව" යන මෙහි අවධාරණය හේතු කොටගෙන ක්ලේශ භාවයෙන් ප්‍රකට වූ ලෝභ ද්වේශ මෝහ ආදී දස ක්ලේශයන් අතුරෙහි දෝස මෝහාදී නව ක්ලේශයන් ප්‍රතික්ෂේප කෙරෙයි. "සම්පත්තීනං වසේන" යන මෙයින් කුමක් ප්‍රකාශ කෙරේද යත්?

යම්තැනෙක්හි දෙවැදෑරුම්වූ ද කාමය තෙමේ ආරම්මණ ආරම්මණික වශයෙන් ඔවුනොවුන් හා සම්බන්ධව පවතී ද ඒ එකොළොස් වැදෑරුම් ප්‍රදේශයේ තෙමේම කාමාවචර නම් වෙයි. යම් රූප අරූප ධාතුවෙක්හි වනාහි හුදෙක් වස්තුකාමය පමණක් පවතීද ඒ ප්‍රදේශය තෙමේ කාමාවචර නම් නොවේ යැයිද ප්‍රකාශ කෙරේ. රූපාරූපාවචර ධර්මයන් වස්තුකාම බැවින් ද ඒ ධර්මයන් අරමුණු කොට ඇත්තාවූ රූපාරූපතෘෂ්ණාවන්ගේ ක්ලේශකාම භාවය සිද්ධවන හෙයින්ද දෙවැදෑරුම් වූ කාමය ද ආරම්මණ ආරම්මණික භාවයෙන් ඔවුනොවුන් හා සම්බන්ධව රූප අරූප ධාතු දෙක්හි පවත්නේ නොවේද යත්? එය එසේ නොපවතී. කුමක් හෙයින යත්? ඕරම්භාගිය ඖදරික ක්ලේශයක් වූම පඤ්චකාම ගුණික රාගය මෙහි හෙවත් මේ "දුවිධෝපි" යන පදයෙහි ක්ලේශකාම භාවයෙන් අභිප්‍රාය කරණලද හෙයිනි. ඒ එසේමැයි "උද්දානතෝ දුවේ කාමා" යන මෙයින් සියළු කාමයන් උද්දේශ


පටුන

කොට ද "පදේසෝ චතුපායානං" යනාදියෙන් විසය නියම කිරීම කරණකොටගෙන "දුවිධෝපි අයං" යන මෙහි කාමේකදේසයක් වූ නීවරණාවස්ථාවෙහි කියනලද පඤ්චකාම ගුණික රාගය තෙමේ ක්ලේශකාම භාවයෙන් ද තද් වස්තුකාම වූම ධර්මයෝ වස්තුකාම භාවයෙන් ද ගන්නා ලද්දහුය. රූපාරූපතෘෂ්ණාව හා තද් වස්තුක ධර්මයෝ ද නොගන්නා ලද්දහු යැයි හගවනු ලැබේ. එහෙයින් හෙවත් ක්ලේශකාම වස්තුකාමයන්ගේ අනවශේෂ පරිපූර්ණ භාවයෙන් හඳුන්වන හෙයින් මතු කියනු ලබන්නා වූ සසත්ථාවචරෝපමාව යුක්ත වෙයි. යට කියනලද්දවූම කාමයන් මෙහි අභිප්‍රාය කරනලද හෙයින් රූපාරූපධාතුවෙහි විමාන කල්පවෘක්ෂ ආත්මාලඞ්කාර පරිත්ත කුසලාදී ප්‍රභේද වූ කාමාවචර ධර්මයන් කෙරෙහි පැවැත්තා වූ ඡන්දරාගය තෙමේ ක්ලේශකාම නම් නොවේ. ඡන්දරාගයට වස්තු වූ විමාන කල්පවෘක්ෂ ආදී කාමාවචර ධර්ම සමූහය වස්තුකාම නම් නොදවෙයි යනු සිද්ධයි. එහෙයින් කීවේමැයි:— "කාමෝ වා කාමසඤ්ඤා වා බ්‍රහ්මලෝකේ න විජ්ජති"යි.

කාමවචර සත්ව සන්තානගත තෘෂ්ණාවට ගෝචරවීමක් ඇති කල්හි රූපාරූප ධාතුවෙහිදු පවත්නා වූ කාමාවචර ධර්මය තෙමේ වස්තුකාමයම වේ යැයි දතයුතුයි. නොහොත් නිද්දේස පාළියෙහි ආ ක්‍රමයෙන් කාමතෘෂ්ණා රූපතෘෂ්ණා අරූපතෘෂ්ණා නිරෝධතෘෂ්ණා ප්‍රභේද වූ අනවශේෂ ක්ලේශකාමය තෙමේ මේ එකොළොස් වැදෑරුම් වූ ප්‍රදේශයෙහි පවතී ද වස්තුකාමයන් අතුරෙහිදු ස්වල්ප වූ රූපාරූප විපාක මාත්‍රයක් හැර සියළු වස්තුකාමයම මේ එකොළොස් වැදෑරුම් ප්‍රදේශයෙහි පවතී ද එහෙයින් අනවශේෂ ප්‍රවෘත්තිය සඳහා "කාමෝ'යං දුවිධෝ'පි ච"යි කියන ලද්දේය. ඉදින් එසේ කියනලද්දේ නමුදු ඔහුන් අතුරෙහි ඖදරික ක්ලේශකාමයක් වූ බහල කාමරාගය ද තද් වස්තුක පඤ්චකාම ගුණයෝ ද මෙහි ගන්නා ලද්දහු යයි දක්වනු පිණිස "සම්පත්තීනං වසේන" යනාදිය කියනලද්දේයි. එහි ඉති ශබ්දය හේත්වර්ථයෙහි වැටෙන බැවින් යම්හෙයකින් දෙවැදෑරුම් වූද මේ කාමය තෙමේ පවතී ද එහෙයින් "කාමෝ එත්ථ අවචරති" යන වාක්‍යයෙහි කාමාවචර නම් වේ යනු අර්ථයි.

"සග්ගමොක්ඛහේතුභූතා පුඤ්ඤසම්මතා අයා යේභුයෙය්න අපේතාති අපායා" යනු ද "නිරයාදි වසේන චත්තාරෝ අපායා චතුපායා" යනු ද වචනාර්ථයි. "ඡන්නං" යන මෙහි චාතුම්මහාරාජික තාවතිංස යාම තුසිත නිර්මානරති පරනිර්මිතවසවර්ති සඞ්ඛ්‍යාත ෂඩ් දිව්‍යලෝකයන්ගේ ද යන අර්ථයි. මහමෙර පත්ලෙහි වාසය කරන්නා වූ අසුරයෝ වනාහි තව්තිසා දිව්‍යලෝකයෙහිම සඞ්ග්‍රහවනු ලැබෙත්. එහෙයින් ඔහුන් හා සමඟ "සත්තන්නං"යි නොකියන ලද්දේය.

"මනසෝ උස්සන්නතාය මනුස්සා" යනු වචනාර්ථ හෙයින් ස්මෘති සූරභාව බ්‍රහ්මචර්ය යෝග්‍යතාදී ගුණ වශයෙන් උත්කෘෂ්ට ගුණයෙන් යුත් සිත් ඇති බැවින් මනුස්ස නම් වෙති යනු භාවයි. ඔවුහූ වනාහි නිෂ්පයෘීය හෙවත් ප්‍රධාන වශයෙන් ජම්බුද්වීප වාසීහුම වෙතියි දතයුත්තාහ. එහෙයින් වදාළ බුදුරජාණන් වහන්සේ:—

"තීහි භික්ඛවේ ඨානේහි ජම්බුද්වීපිකා මනුස්සා උත්තරකුරුකේ මනුස්සේ අධිගණ්හන්ති, දේවේ ච තාවතිංසේ. කතමේහි තීහි; සූරා සතිමන්තෝ ඉධ බ්‍රහ්මචරියවාසෝ"යි.

ඒ දඹදිව්වාසීන් හා සමාන රූපාදීන් ඇති හෙයින් අවශේෂ කොදෙව් වාසීන් හා සමඟ අනික් මහාද්වීපත්‍රය වාසීහු ද මනුෂ්‍යයෝම යැයි ප්‍රසිද්ධ වූහ. ලෞකික පණ්ඩිතයෝ වනාහි මනු නම් ආදී ක්‍ෂතියයාගේ පුත්‍ර වන හෙයින් මනුෂ්‍යයෝ යැයි

කියත්. "ඒකාදසවිධො" යන මෙහි තිරච්ඡාන පෙත්තිවිෂයයන්ට පිරිසිඳින ලද වෙනම අවකාශයක් නැත්තේහිදු ඔවුහු ආරණ්‍යය සමුද්‍ර පර්වතපාදදී යම්තැනෙක්හි නිබඳ වාසය කෙරෙත් ද එබඳු ස්ථානය ගන්නාලද හෙයින් එකොළොස් වැදෑරුම් වේ යැයි කියනලදි. එහි අනිකුදු ධර්මයන්ගේ හටගැන්ම විද්‍යමාන හෙයින් කාමයාගේම පැතීම් වශයෙන් කෙසේ නම් කාමාවචර වේ දැයි යන චෝද්‍යය සඳහා "අස්සාභිලක්ඛිතත්තා" යනාදිය කීයේයි. එහි "සහ සත්ථේහීති සසත්ථා" යනු ද "යත්ථ තේ අවචරන්ති සෝ සසත්ථාවචරෝ පදේසෝ" යනු ද වචනාර්ථයි. ඒ එසේමය. යම්සේ යම් ප්‍රදේශයෙක්හි ශස්ත්‍ර සහිත පුරුෂයෝ හැසිරෙත් ද ඒ ප්‍රදේශය තෙමේ විද්‍යමාන වූ අනික් ද්විපද චතුස්පද ආදී සත්වයන් හැසිරෙතුදු එහි ඒ ශස්ත්‍ර සහිත පුරුෂයන්ගේ හැසිරීම් ප්‍රකට හෙයින් හෝ ඔහුන් කරණකොටගෙන හඳුන්වන හෙයින් හෝ සසත්ථාවචරම යයි ප්‍රසිද්ධ වේද එපරිද්දෙන්ම විද්‍යමාන වූ අනික් රූපාවචරාදී ධර්මයන් පවත්නේහිදු අභිලක්‍ෂණ වශයෙන් මේ ප්‍රදේශය තෙමේ කාමාවචර නම් වෙයි. රූපාරූපාවචරයන්හි ද මෙම ක්‍රමයමැයි. චිත්තය තෙමේ කාමාවචරනමැයි කියනලද්දේ නොවේද? යට කියනලද ක්‍රමයෙන් වනාහි ප්‍රදේශය කාමාවචර යැයි ගන්නාලද හෙයින් කෙසේ එහි හටගන්නා වූ චිත්තය තෙමේ කාමාවචර නම් වේදැයි යන චෝද්‍යය සඳහා "ස්වායං" යනාදිය කීයේයි:—

("යථා" ශබ්දය නොකියන ලද්දේ නමුදු "උත්තරස්ස පදස්සේව" යන මෙහි ඒව ශබ්ද සන්නිට්ඨානයෙන් ලැබේ) **(යථා)** යම්සේ **උත්තරස්ස පදස්ස** උත්තර පදයාගේ **ලෝපං කත්වා** ලෝපය කොට **උදීරිතෝ** වදරණ ලද්දවූ **රූපභවෝ** රූපභවය තෙමේ (හෙවත් රූපභව ශබ්ද තෙමේ) **රූපං** රූපය යන නම ඇත්තේ වේද **ඒවං** ඒ පරිද්දෙන්ම **සෝ අයං** ඒ කාමාවචරය තෙමේ (හෙවත් ඒ කාමාවචර ශබ්ද තෙමේ උත්තර පද ලෝපය කොට) **කාමෝති සඞ්ඛිතෝ** කාම යන නම් ඇත්තේ වෙයි.

(යම්සේ "රූපුප්පත්තියා මග්ගං භාවේති" යන මෙහි "රූපභවුප්පත්තියා"යි කියයුතු වුවද රූපභව ශබ්දයාගේ උත්තර පදය වන භව ශබ්දය ලොප් කොට "රූප" යයි වදරණ ලද්දේ ද එපරිද්දෙන්ම මෙහි ද "කාමාවචර" ශබ්දයාගේ උත්තර පදය වන "අවචර" ශබ්දය ලොප් කොට "කාම"යි කියන ලද්දේය. එසේ නොගතහොත් චිත්තය තෙමේ "කාමාවචරාවචරං"යි කියයුතු වන්නේය යනු භාවයි.)

**තස්මිං කාමේ** ඒ උත්තරපද ලෝප වශයෙන් කාම නම් ලද ප්‍රදේශයෙහි **ඉදං චිත්තං** මේ අටවැදෑරුම් වූ චිත්තය තෙමේ **සදා** හැමකල්හි (බාහුල්‍ය වශයෙන් යනු අභිප්‍රායයි) **අවචරති** (යම්හෙයකින්) පවතී ද **ඉති ච** එසේහෙයින් **කාමාවචරං ඉති ඒව** කාමාවචරම යයි **කාමඝාතිනා** දේශනා ඥාණය කරණකොටගෙන වෛනෙය්‍ය ජන සන්තාන ගත ක්ලේශකාමය නසන සුළුවූ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ විසින් **කථිතං** වදරණ ලද්දේය.

මෙහි අට වැදෑරුම් චිත්තය යයි අධිකාර වශයෙන් ගැනීමෙහිදු සියළු කාමාවචර චිත්තයන්ට මේ අර්ථය ලැබෙයි. කුමක්හෙයින් ද යත්? සියළුම කාමාවචර චිත්තයන් මේ ප්‍රදේශ කාමයෙහි හටන්නා හෙයිනි. තවද මෙයින් කුමක් ප්‍රකාශ කෙරේ ද යත්? යම්සේ සඞ්ග්‍රාමයෙහි බොහෝසෙයින් හැසිරෙන්නා වූ සඞ්ග්‍රාමාවචර යයි ලබනලද නම් ඇති හස්තිරාජ තෙමේ අන් තැනෙක්හි හැසිරෙන්නේ නමුදු බාහුල්‍ය වෘත්ති වශයෙන් සඞ්ගාමාවචරම යැයි කියනු ලැබේ ද එපරිද්දෙන්ම මේ චිත්තය ද අන් තැනෙක්හි හටගන්නේ නමුදු කාමලෝකයෙහි බහුල වශයෙන් හටගන්නා හෙයින් කාමාවචරම යයි කියන ලද්දේය. එයින් ඒ චිත්තය රූපාරූපභවයන්හි ද හටගන්නා

බැවින් රූපාරූපාවචර නම් වන්නේ නොවේදැයි යන මේ චොද්‍යය වළක්වයි. එහෙයින් කියනලදමැයි:—

කාමේවචරතීතෙතං - කාමාවචරසඤ්ඤිතං;
සේසේ අවචරන්තම්පි - සඞ්ගාමාවචරෝ යථා෴යි

"සදවචරතීතිච" යන මෙහි "ඉති" ශබ්ද තෙමේ හේත්වර්ථයෙහි ද "ච" ශබ්ද තෙමේ කියයුත්තෙන් අනිකක් පිඬු කිරීමෙහි ද වැටෙයි. එහෙයින් කාමාවචරය තෙමේ "අවචර" යන උත්තර පද ලෝපයෙන් යම්හෙයකින් කාම යයි නම් ලද්දේ වේද යම්හෙයකින් ඒ කාමයෙහි මේ චිත්තය තෙම හැම කල්හි හටගැනීමත් වේද එහෙයින් කාමාවචරම යයි වදරණ ලද්දේය. "කාමාවචරාවචර" කියා හෝ "රූපාරූපාවචරාවචර" යයි කියා හෝ නොවේය යනු අභිප්‍රායයි෴

**වා** නොහොත් **කාමභවේ** කාමභවයෙහි **පටිසන්ධිං** ප්‍රතිසන්ධිය **අවචාරයති** යම්හෙයකින් උපදවාද **ඉති (තස්මා)** එහෙයින් **(ඉදං)** මේ චිත්තය **කාමාවචරං ඉති ඒව** කාමාවචරම වේයයි **කථිතං** වදරණ ලද්දේය (චා ශබ්දයාගේ ආ-කාරය හ්‍රස්වකොට යනු අර්ථයි) (මෙසේ උත්තරපද ලෝප වශයෙන් පද සිද්ධිය දක්වා දැන් උත්තරපද ලෝපය නැතිව ද කාමාවචර ශබ්දයාගේ නිෂ්පත්තිය දක්වනු පිණිස) "පරියාපන්නන්ති තත්‍ර වා"යි කියනලද්දේය෴ **වා** නොහොත් **ඉදං චිත්තං** මේ සිත් තෙමේ **තත්‍ර** ඒ කාමභවයෙහි **පරියාපන්නං** යම්හෙයකින් ඇතුළත් වේද **ඉති (තස්මා)** එසේහෙයින් **කාමාවචරං ඉති ඒව** කාමාවචරම වේ යයි **කථිතං** වදරණ ලද්දේය෴

මේ එහි අභිප්‍රායයි; "කතමේ ධම්මා කාමාවචරා හෙට්ඨිමන්තතෝ අවීචිනිරයං පරියන්තං කත්වා උපරිමන්තතෝ පරනිම්මිතවසවත්තිදේවේ අන්තෝ කරිත්වා යං එත්ථන්තරේ එත්ථාවචරා එත්ථ පරියාපන්නා ඛන්ධා ධාතු ආයතන රූපං වේදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං ඉමේ ධම්මා කාමාවචරා"යි වදළ හෙයින් යම්සේ මනුෂ්‍යස්ත්‍රියකගේ කුස උපන් තිරිසන්ගතික සත්ව තෙමේ තිරිසන්යෝනියෙහිම ඇතුළත් හෙයින් තිරච්ඡානම යයි කියනු ලැබේ ද; එපරිද්දෙන්ම මේ චිත්තය තෙමේ රූපාරූපභූමියෙහි හටගත්තේ නමුදු කාමභූමියෙහි ඇතුළත් හෙයින් කාමාවචරම යයි කියන ලද්දේය. ඒ චිත්තයාගේ කාමභවයෙහි ඇතුළත් බව ද අවීචිය පරනිර්මිතවසවර්ති දිව්‍යලෝකය යන දෙකින් පිරිසිඳිනා ලද අවකාශයෙහි නැමී පවත්නා වූ කාමතෘෂ්ණාවට විෂය වූ බැවි නැයි දතයුත්තේයි෴

එහෙයින් කියනලදි ආචාර්‍ය්‍ය ධර්මපාල ස්ථවිරපාදයන් විසින්:— "නික්ඛිපකණ්ඩේපි එත්ථාවචරාති වචනං අවීචිපරනිම්මිතවසවත්ති පරිච්ඡින්නෝකාසය කාමතණ්හාය විසයභාවං සන්ධාය වුත්තං"යි.

එහි වනාහි පද නිෂ්පත්තිය මෙසේ දතයුත්තේය. කෙසේ යත්? "කාමතණ්හා කාමෝ සෝ එත්ථ ආරම්මණකරණවසේන අවචරතීති කාමාවචරං" යනු වේ. මේ චිත්තයෙහි ඒ කාමතෘෂ්ණා සඞ්ඛ්‍යාත කාමය තෙමේ අරමුණු කිරීම් වශයෙන් හැසිරේ ද එහෙයින් ඒ චිත්තය තෙම කාමාවචර නම් වේ යනු භාවයි. එහි ද "කතමා කාමතණ්හා යා කාමාවචරධම්මාරම්මණා තණ්හා, කතමේ කාමාවචරා ධම්මා; යේ කාමතණ්හා විසයා"යි මෙසේ දක්වනලද හෙයින් ඉතරේතරනිශ්‍රය භාවදෝෂය පැමිණෙන්නේ නොවේද යත්? නොපැමිණෙයි. කුමක් හෙයින යත්? අවීචි ආදී එකොළොස් වැදෑරුම් අවකාශයෙහි නැමී පවත්නා බැවින් ඇතැම් තෘෂ්ණාවක්

කාමතෘෂ්ණා භාවයෙන් ගෙන ඒ ස්වභාව තෘෂ්ණාවට අරමුණුවීම හේතුකොටගෙන කාමාවචර ධර්මයන් හැඳිනවියයුතු හෙයිනි. නොහොත් "කිලේසවත්ථුවසේන දුවිධෝපි කාමෝ යථාරහං සහජාතවසේන එත්ථ අවචරතීති කාමාවචරං" යනු නිර්වචන හෙයින් ක්ලේශකාම වස්තුකාමවශයෙන් දෙවැදෑරුම් වූ කාමය තෙමේ සුදුසු පරිද්දෙන් සහජාත වශයෙන් මේ චිත්තයෙහි පවතී ද එහෙයින් ඒ චිත්තය තෙමේ කාමාවචර නම් වෙයි. නොහොත් "ආරම්මණකරණවසේන දුවිධේපි කාමේ ඒතං අවචරතීති කාමාවචරං"යි නිර්වචන හෙයින් අරමුණු කිරීම් වශයෙන් දෙවැදෑරුම් වූද කාමයෙහි මේ චිත්තය තෙමේ පවතීනුයි කාමාවචර නම් වෙයි. නොහොත් යම්සේ මඤ්චයෙහි සයනය කරණ ලද්දවුන් ඔල්වර හඬ පවත්වන කල්හි නිශ්‍රය-නිශ්‍රිතයන්ගේ අභේදය බුද්ධියෙන් ගන්නාලද හෙයින් නිශ්‍රිතයන් කෙරෙහි නිශ්‍රය ව්‍යවහාරය ආරෝපනය කිරීම් වශයෙන් "මඤ්චාඋක්කුඨිං කරෝති"යි කියනු ලැබේ ද එපරිද්දෙන්ම මේ චිත්තය ද කාමාවචර භූමියෙහි හටගැනීම් වශයෙන් ඒ කාමාවචරය ඇසුරුකරණලද හෙයින් නිශ්‍රයෝපචාර වශයෙන් කාමාවචර යයි කියනු ලැබේ. එහෙයින් කියනලදමැයි:—

කාමෝ'වචරතීත්‍යෙත්ථ - කාමේ'වචරතී'ති වා;
ඨානූ'පචාරතෝවා'පි - තං කාමාවචරං භවේ..... යී

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 44-50 පිටු]**

තත්ථ කාමේතීති කාමෝ, කාමතණ්හා, සා එත්ථ අවචරති ආරම්මණකරණවසේනාති **කාමාවචරං**. කාමීයතීති වා කාමෝ, ඒකාදසවිධෝ කාමභවෝ, තස්මිං යේභුය්‍යේන අවචරතීති **කාමාවචරං**. යේභුය්‍යේන චරණස්ස හි අධිප්පේතත්තා රූපාරූපභවේසු පවත්තස්සාපි ඉමස්ස කාමාවචරභාවෝ උපපන්නෝ හෝති. කාමභවෝයේව වා කාමෝ එත්ථ අවචරතීති කාමාවචරෝ, තත්ථ පවත්තම්පි චිත්තං නිස්සිතේ නිස්සයවෝහාරේන **කාමාවචරං** "මඤ්චා උක්කුට්ඨිං කරොන්ති"ත්‍යාදීසු වියාති අලමතිවිසාරණියා කථාය. හෝති චෙත්ථ;

"කාමෝවචරතීත්‍යෙත්ථ, කාමේවචරතීති වා;
ඨානූපචාරතෝ වාපි, තං කාමාවචරං භවේ"ති.

**රූපාරූපාවචරේ**සුපි ඒසේව නයෝ යථාරහං දට්ඨබ්බෝ. උපාදානක්ඛන්ධසඞ්ඛාතලෝකතෝ උත්තරති අනාසවභාවේනාති **ලෝකුත්තරං,** මග්ගචිත්තං. ඵලචිත්තං පන තතෝ උත්තිණ්ණන්ති **ලෝකුත්තරං**. උභයම්පි වා සහ නිබ්බානේන ලෝකතෝ උත්තරං අධිකං යථාවුත්තගුණවසේනේවාති **ලෝකුත්තරං**.
**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා භූමිභේදචිත්ත වණ්ණනා අංක 03 යටතේ)/ විභාවනී ටීකා සන්නය 20-22 පිටු]**

**තත්ථ** ඒ කාමාවචරාදී නිර්දේශයෙහි **වචනත්ථෝ** වචනාර්ථය **මයා** මා විසින් **වුච්චතේ** කියනුලැබේ **යා තණ්හා** යම් තෘෂ්ණාවක් තොමෝ **ආලම්බනං** අරමුණ **කාමේති** කැමත් වන්නේ ද **ඉති (තස්මා) සා තණ්හා** ඒ තෘෂ්ණා තොමෝ **කාමෝ** කාම නම් වේ **කාමතණ්හා** කාමතෘෂ්ණාව **ලබ්භති** ලැබේ. ("කාමේතීති කාමෝ" යන වචනාර්ථ තෙමේ සාමාන්‍ය වචනාර්ථ හෙයින් කත්තුකාමතාඡන්දපුද්ගලාදී වූ නොයෙක් අභිධෙය්‍යාර්ථයෙහි පවත්නා බැවින් මෙහි වනාහි කාමතෘෂ්ණාවම කැමැතිවිය යුතුය යන අර්ථය දක්වන පිණිස "කාමතණ්හා"යි අභිධෙය්‍යාර්ථය කියනලදි)

**එත්ථ** මේ සූපණස් ප්‍රභේද ඇත්තා වූ චිත්තයෙහි **සා** ඒ කාමතෘෂ්ණා තොමෝ **ආලම්බනකරණවසේන** අරමුණු කිරීම් වශයෙන් **අවචරති** හැසිරේද, නොහොත් හටගනීද **ඉති (තස්මා) තං චතුපඤ්ඤාසවිධං චිත්තං** ඒ සූපණස් ප්‍රභේද චිත්ත තෙමේ **කාමාවචරං** කාමාවචර නම් වේ. (අධිකරණසාධනයි— "ආලම්බනකරණවසේන" යන ක්‍රියා විශේෂණයෙන් "අලම්බිතබ්බවසේන පටිසන්ධිදානවසේන" යන මේ විශේෂණ දෙපදය වළක්වයි) **වා** නොහොත් **යෝ පදේසෝ** කාමභව සඞ්ඛ්‍යාත යම් එකොළොස් ප්‍රදේශයක් තෙම **කාමතණ්හාය** කාමතෘෂ්ණාව විසින් (මේ වනාහි කර්තෘ කාරකයි) **කාමීයති** කැමැතිවනු ලැබේද **ඉති (තස්මා) සෝ පදේසෝ** ඒ ප්‍රදේශ තෙම **කාමෝ** කාම නම් වේ **ඒකාදසවිධෝ** එකොළොස් ප්‍රකාර වූ **කාමභවෝ** කාමභවය **ලබ්භති** ලැබේ ("කාමීයතීති කාමෝ" යන වචනාර්ථයෙහි රූපාලම්බන ශබ්දලම්බනාදී වශයෙන් බොහෝ වූ අභිධෙයාර්ථයන් යෙදෙන බැවින් මෙහි එකොළොස් කාමභවයම ලැබෙන්නේ යයි දක්වන පිණිස "ඒකාදසවිධෝ කාමභවෝ" යනුවෙන් අභිධෙයාර්ථය දක්වන ලදි "අවචරතීති වා" යන්නෙහි වා ශබ්දය හා සමඟ ද සමහර පොතක දක්නා ලැබේ. ඒ වා ශබ්දය මණිසාරමඤ්ජූසායෙහි "දුතියවා-සද්දෝ පමාදලිඛිතෝ" යන පාඨයෙන් ප්‍රතික්ෂේප කරනලදි)

**යං චතුපඤ්ඤාසවිධං චිත්තං** යම් සූපණස් ප්‍රකාර වූ චිත්තයක් තෙමේ **තස්මා** ඒ එකොළොස් කාමභූමියෙහි **යේභුයෙය්‍යන** බොහෝසෙයින් **අවචරති** හැසිරේ ද නොහොත් හටගනීද **ඉති (තස්මා) තං චතුපඤ්ඤාසවිධං චිත්තං** ඒ සූපණස් ප්‍රකාර චිත්ත තෙමේ **කාමාවචරං** කාමාවචර නම් වේ (මේ කර්තෘ සාධනයි— "යේභුයෙය්‍යන" යන පාඨයෙන් ඇතැම් කාමාවචර චිත්තයන්ගේ රූපාරූපභූමියෙහි ද හටගන්නා බව දක්වයි)

(ආයුෂ්මති ටීකාචාරිනී "කාමේ අවචරතීති"යි නොකියා "යේභුයෙය්‍යන" යන විශේෂණය ද ආචාර්යයන් විසින් කියන ලද්දේය. ඒ වචනයෙන් කවර ප්‍රයෝජනද යන චෝද්‍යට පරිහාර පිණිස "යේභුයෙය්‍යන -පෙ- හෝති" යන පාඨය කියනලදි) **හි (සච්චං)** ඒ එසේමැයි **යේභුයෙය්‍යන** බොහොසෙයින් **චරණස්ස** හැසිරීම **අධිප්පේතත්තා** කැමැතිවන ලද හෙයින් **රූපාරූපභවේ** රූපාරූපභූමියෙහි **පවත්තස්සාපි** හටගත්තාවූ ද **ඉමස්ස (චිත්තස්ස)** මේ කාමාවචර චිත්තයාගේ **කාමාවචරභාවෝ** කාමාවචරභාව තෙමේ **උපපන්නෝ හෝති** සම්පූර්ණ වූයේ වේද **වා** නොහොත් **කාමභවෝ යේව** වස්තුකාම ක්ලේශකාමයෝම **කාමෝ** කාම නම් වේ (කාම ශබ්දයෙන් පරවූ භවශබ්දය ලොප්වූ තැනි) **එත්ථ** මේ එකොළොස් කාමභවයෙහි (**සෝ කාමෝ** ඒ ද්විප්‍රකාර වූ කාමතෙමේ) **අවචරති** හැසිරෙත් ද **ඉති (තස්මා) සෝ පදේසෝ** ඒ ප්‍රදේශ තෙම **කාමාවචරෝ** කාමාවචර නම් වේ.

(ආයුෂ්මත් ටීකාචාරිනී මෙතන්හි කාමාවචර සිව්පණසම කාමාවචර නම් නොවේද? "කාමෝ අවචරති එත්ථාති" යන වචනාර්ථ වශයෙන් එකොළොස් කාමභවය ගන්නාලද බැවින් කවරහෙයකින් එකොළොස් කාමභවයෙහි හැසිරෙන්නා වූ නොහොත් හටගන්නා වූ චිත්තය කාමාවචර නම් වන්නේද? යන චෝද්‍යට පරිහාර වශයෙන් "තත්ථ පවත්තම්පි -පෙ- කාමාවචරං" යන පාඨය කියනලදි)

**තත්ථ** ඒ එකොළොස් කාමභවයෙහි **පවත්තං** හටගත්තා වූ **චිත්තම්පි** සිත් තෙමේ ද **නිස්සිතේ නිස්සයවෝහාරේන** නිශ්‍රිතයෙහි නිශ්‍රය ආරෝපණය කොට

ව්‍යවහාර කිරීම් වශයෙන් **කාමාවචරං** කාමාවචර නම් වේ (ඊට උදහරණ කුමක්ද යන චෝද්‍යට පරිහාර පිණිස "මඤ්චා -පෙ- වියාති" යන පාඨය කියනලදි) කිංසු විය යනු පාඨශේෂයි. කවර පාඨයක් වැනිදැයි යතහොත්? **මඤ්චාළක්කුටිං කරොන්තීති ආදීසු විය** මඤ්චාළක්කුටිං කරොන්ති යනාදියෙහි මෙනි **ඉති (තස්මා) අතිවිසාරණීයං** ඉතා විස්ථාර වූ **කථාය** වචනයෙන් **අලං (නිරත්ථකං)** නිෂ්ප්‍රයෝජනයි **එත්ථ** මේ "කාමේතීති කාමෝ" යනාදී වචනයෙහි (අයං සඞ්ගහගාථා යනු පාඨශේෂයි) මේ මතු කියනුලබන සඞ්ග්‍රහ ගාථා තොමෝ **හෝති** වේ (ච-ශබ්දය වාක්‍යාරම්භයෙහි නිපාතයි) (කියනුලබන සඞ්ග්‍රහ ගාථාව කුමක්දැයි යන චෝද්‍යට පරිහාර පිණිස "කාමෝවචරතීත්‍යෙත්ථ -පෙ- භවේ" යන ගාථාව කියනලදි)

**එත්ථ** මේ සූපණස් ප්‍රභේද වූ චිත්තයෙහි **කාමෝ** කාම සඞ්ඛ්‍යාත තෘෂ්ණා තොමෝ **ආලම්බනකරණවසේන** අරමුණු කිරීම් වශයෙන් **අවචරති** හැසිරේ ද **ඉති (තස්මා) තං (චතුපඤ්ඤාසවිධං චිත්තං)** ඒ සූපණස් ප්‍රභේද වූ චිත්ත තෙම **කාමාවචරං භවේ** කාමාවචර නම් වේ **වා** නොහොත් **යං (චතුපඤ්ඤාසවිධං චිත්තං)** යම් සූපණස් ප්‍රභේද වූ චිත්ත තෙම **කාමේ** එකොළොස් කාමභවයෙහි **යේභුයෙය්න** බොහොසෙයින් **අවචරති** හැසිරේද **ඉති (තස්මා)තං (චතුපඤ්ඤාසවිධං චිත්තං)** ඒ සූපණස් ප්‍රභේද වූ චිත්ත තෙම **කාමාවචරං භවේ** කාමාවචර නම් වේ **වා** නොහොත් **ඨානූපචාරතෝපි** ඨානූපචාර වශයෙන් ද **තං** ඒ එකොළොස් කාමභවය **කාමාවචරං භවේ** කාමාවචර නම් වේ ("ඨානූපචාරතෝවා" යන පාඨය "සෝ එත්ථ අවචරතීති කාමාවචරෝ" යන තුන්වෙනි විකල්පය හා සම්බන්ධ කොට කියනලදි)

(කාමාවචර ශබ්දයාගේ වචනාර්ථය ආචාර්යයන් විසින් දක්වන ලද්දේයි. රූපාවචර අරූපාවචර ශබ්දයන්ගේ වචනාර්ථය කෙසේදැයි යන චෝද්‍ය සඳහා "රූපා -පෙ- ඒසේව නයෝ" යන පාඨය කියනලදි) **රූපාවචරාරූපාවචරේසුපි** රූපාවචර අරූපාවචර චිත්තයෙහිදු (නොහොත් රූපාවචර අරූපාවචර ශබ්දයෙහිදු) **ඒසේව නයෝ** කාමාවචර චිත්තයෙහි නොහොත් කාමාවචර ශබ්දයෙහි කියනලද ඒ නයම **යථාරහං** රූපාවචර අරූපාවචර චිත්තයන්ට සුදුසු පරිද්දෙන් **දට්ඨබ්බෝ** දතයුතුයි.

(දැන් වනාහි ලෝකුත්තර ශබ්දයාගේ අර්ථ දක්වනු කැමැතිව "උපාදානක්ඛන්ධ" යනාදී පාඨ කියනලදි) **යං චිත්තං** යම් චිත්තයක් තෙමේ **උපාදානක්ඛන්ධසඞ්ඛාත ලෝකතෝ** උපාදානයන්ට අරමුණු වූ ස්කන්ධපඤ්චක සඞ්ඛ්‍යාත ලෝකයෙන් **අනාසවභාවේන** ආශ්‍රවධර්මයන් අරමුණු නොකිරීම් වශයෙන් **උත්තරති** එතර වෙයි **ඉති (තස්මා) තං චිත්තං** ඒ චිත්ත තෙමේ **ලෝකුත්තරං** ලෝකුත්තර නම් වේ **මග්ගචිත්තං** මාර්ගචිත්තය **ලබ්භති** ලැබේ (ලෝක ශබ්ද තෙමේ සත්වලෝකය ඕකාසලෝකය සඞ්ඛාරලෝකය යන මේ ලෝකත්‍රයෙහි වැටෙතුදු මෙහි සංස්කාර ලෝකයෙහිම වැටෙනබව දක්වන පිණිස "උපාදානක්ඛන්ධසඞ්ඛාත" යන විශේෂණය කරනලදි)

("අනාසවභාවේන" යන විශේෂණයෙන් "උපාදානක්ඛන්ධානං අනාරම්මණභාවේන" යන විශේෂණය වැළැක්වූහු මෙසේ වචනාර්ථ ගත් කල්හි නිර්වාණය ද උපාදානධර්මයන්ට අරමුණු වූ ස්කන්ධයයි කියනලද ලෝකයෙන් ආශ්‍රවධර්මයන්ට අරමුණු නොවීම් වශයෙන් එතරවන හෙයින් නිර්වාණය වළක්වන පිණිස "මග්ගචිත්තං" යනු කීහු)

**ඵලචිත්තං පන** ඵලචිත්තය වනාහි **තතෝ** ඒ උපාදනධර්මයන්ට අරමුණු වූ ස්කන්ධ සඞ්ඛ්‍යාත ලෝකයෙන් **උත්තිණ්ණං** එතරවනලදි **ඉති (තස්මා) ලෝකුත්තරං** ලෝකුත්තර නම් වේ **වා** නොහොත් **උභයම්පි** මාර්ග-ඵලචිත්ත දෙදෙනාගේ සමූහය ද **නිබ්බානේන සහ** නිර්වාණය හා සමඟ **ලෝකතෝ** ලෝකයා කෙරෙන් **යථාවුත්තගුණවසේනේව** යම් යම් පරිද්දෙකින් කියනලද ගුණයන්ගේ වශයෙන්ම **උත්තරං (අධිකං)** ශ්‍රේෂ්ට වූයේය **ඉති (තස්මා) ලෝකුත්තරං** ලෝකුත්තර නම් වේ.

(මේ පශ්චිම විකල්පයෙහි උත්තරශබ්දය අධිකාර්ථයෙහි වැටෙයි. "යථාවුත්තගුණවසේනේව" යන පාඨයෙන් "අනාසවභාවේන" යන පාඨය ආකර්ශණය කරනලදි) **[විභාවනී ටීකා සන්නය 42-46 පිටු]**

**කාමාවචර**න්ති එත්ථ කාමීයතීති කාමෝ. කාමෙන්ති වා එත්ථ සත්තා අවික්ඛම්භිතකාමරාගත්තා කාමරතියා ඒව රමන්ති. න උපරිභූමීසු විය ඣානරතියාති කාමෝ. ඒකාදසවිධා කාමභූමි. නනු චෙත්ථ ඣානලාභිනෝපි සන්තීති. න න සන්ති. තේ පන කදචි දේවාති නත්ථෙත්ථ දෝසෝ. අවීචිනිරයාදයෝ කථං කාමීයන්ති. කථඤ්ච තත්ථ සත්තා කාමරතියා රමන්තීති. නිමිත්තස්සාදවසේන වා භවනිකන්තිවසේනවාති. මරණකාලේ හි උපට්ඨිතා නිරයග්ගිජාලා සුවණ්ණවණ්ණා විය ඛායන්ති. ඒකෝ කිර මිච්ඡාදිට්ඨිකෝ බ්‍රාහ්මණෝ මරණමඤ්චේ නිප්පන්නෝ හෝති. තස්ස ආචරියබ්‍රාහ්මණා සමීපේ ඨත්වා බ්‍රහ්මලෝකං හෝ ගච්ඡාති වදන්ති. තස්සපන අවීචිනිරයේ අග්ගිජාලා උපට්ඨහන්ති. තද සෝ හෝ ආචරියා සුවණ්ණවණ්ණා පඤ්ඤායන්තීති ආහ. ඒස හෝ බ්‍රහ්මලෝකෝ. තත්ථ ගච්ඡාති වදන්ති. සෝ කාලඞ්කත්වා අවීචිම්හි උප්පජ්ජි. ඒවං නිමිත්තස්සාදවසේන තේ කාමීයන්ති. තත්ථ උප්පන්නානම්පි භවනිකන්තිනාම හෝතීති. අපිච, තත්ථ උප්පන්නා අවික්ඛම්භිතකාමරාගාඒව හොන්ති, ඕකාසේ සති කාමරතියා රමිස්සන්ති යේවාති. තස්මිං කාමේ අවචරතීති කාමාවචරං. එත්ථච අවචරතීති පදස්ස උප්පජ්ජතීති අත්ථෝ න ගහේතබ්බෝ. සෝ හි අත්ථෝ පාළියාච න සමේති. නානාදෝසයුත්තෝච හෝතීති. යං ඒතස්මිං අන්තරේ එත්ථාවචරා එත්ථ පරියාපන්නාති හි පාළියං වුත්තං. යදි චෙත්ථ සෝ අත්ථෝ අධිප්පේතෝ සියා. ඒවං සති එත්ථාවචරා එත්ථුප්පන්නාති වුත්තං සියා. න පන වුත්තං. නච පරියාපන්නසද්දෝ උප්පන්නසද්දේන සහ සමානත්ථෝති සක්කා වත්තුං. න හි ලෝකුත්තරචිත්තානි තීසු භවේසු උප්පන්නානිපි තත්‍ර පරියාපන්නානියේව හොන්තීති. ඒවං තාව පාළියා න සමේතීති.

යදිච සෝ අත්ථෝ ගහිතෝ සියා. ඒවඤ්ච සති තස්මිං කාමේ යේ මහග්ගත ලෝකුත්තරධම්මා උප්පජ්ජන්ති. තේසංපි කාමාවචරතාපත්තිදෝසෝ රූපාවචරතාදි මුත්තිදෝසෝච ආපජ්ජති. යේච කාමාවචරධම්මා රූපාරූපභූමීසු උප්පජ්ජන්ති. තේසඤ්ච රූපාරූපාවචරතාපත්තිදෝසෝ කාමාවචරතාමුත්තිදෝසෝච ආපජ්ජතීති. නනු යේභුය්‍යවුත්තිවසේනපි කේසඤ්චි නාමලාභෝ හෝති. යථා වනචරකෝ සඞ්ගාමාවචරෝති. තස්මා ඉධපි තේසං ධම්මානං අත්තනෝ අත්තනෝ භූමීසු උප්පන්නබහුලත්තා කාමාවචරාදි නාමලාභේ සති න කෝචි දෝසෝති. න. එවඤ්හි සති ලොකුත්තර ධම්මානං කාමාවචරතාදි මුච්චනත්ථං යේභුයෙය්‍ය උප්පන්නභූමි විසුං වත්තබ්බා සියා. න ච සා නාමභූමි අත්ථි. යත්ථ තේ යේභුයෙය්‍ය උප්පජ්ජන්තීති. තේ හි උප්පජ්ජන්තා තීසු භවේසු ඒව උප්පජ්ජන්ති. තස්මා තේසං කාම රූපාරූපාවචරතාපත්තිදෝසෝ දුන්නිවාරෝ සියාති. ඒවං නානාදෝසයුත්තෝ හෝතීති. තස්මාස්ස තථා අත්ථං අග්ගහෙත්වා එත්ථාවචරා එත්ථ පරියාපන්නාති භගවතා සංවණ්ණිතේන පාළිනයේනේවස්ස අත්ථෝ ගහේතබ්බෝති. අයඤ්හෙත්ථ

අත්ථෝ. කාමේ අවචරති පරියාපන්නභාවේන තස්මිං අජ්ඣෝගාහෙත්වා චරති පවත්තතීති කාමාවචරන්ති. පරියාපන්නභාවෝචනාම අත්තනෝ ආධාරභූතේන තේන කාමේන සහ සමානජාතිගොත්තනාමතා සඞ්ඛාතේහි පරිතෝභාගේහි තස්මිං කාමේ ආපන්නභාවෝ අනුප්පවිට්ඨ භාවෝ. අන්තෝගධභාවෝති වුත්තං හෝති. සෝච තථා පරියාපන්නභාවෝ පරිග්ගාහිනියා කාමතණ්හාය කතෝති දට්ඨබ්බෝ. එත්තාවතා යේ ධම්මා රූපාරූපසත්තසන්තානභූතාපි මය්හං ඒතේති කාම තණ්හාය පරිග්ගහිතා කාමේ පරියාපන්නාව හොන්ති. තේ කාමාවචරානාමාති සිද්ධා හොන්ති. රූපාරූපා වචරේසුපි අයං නයෝ නේතබ්බෝ. තේසුපන රූපතණ්හා අරූපතණ්හාච පරිග්ගාහිනී තණ්හා දට්ඨබ්බා.

යේ පන ධම්මා තිණ්ණං තණ්හානං පරිග්ගහවිමුත්තා හොන්ති. තේ තීසු භවේසු උප්පන්නාපි තත්‍ර අපරියාපන්නාඒව හොන්තීති ලෝකුත්තරා නාම ජාතාති වේදිතබ්බා. එත්ථච පට්ඨානේ ආරුප්පේ කාමච්ඡන්දං නීවරණං පටිච්ච උද්ධච්චනීවරණන්තිආදිනා අරූපසත්තසන්තානේපි කාමච්ඡන්දසඞ්ඛාතාය කාමතණ්හාය උප්පත්ති වුත්තා. තස්මා රූපාරූපභූමීසු උප්පන්නානං කාමධම්මානං පරිග්ගාහිනීතණ්හා රූපාරූපසත්තසන්තාන ගතාපි දට්ඨබ්බා. පාළියං කාමච්ඡන්දනීවරණන්ති ඉදං නීවරණජාතිකත්තා වුත්තං. න හි ඣානභූමීසු ඒකන්තනීවරණකිච්චානි නීවරණානි සක්කා ලද්ධුන්ති. අත්‍ර කාමභේදෝ වත්තබ්බෝ. ද්වේකාමා කිලේසකාමෝච, වත්ථුකාමෝචාති. තත්ථ ඨපෙත්වා රූපාරූපරාගේ අඤ්ඤෝ සබ්බෝපි ලෝභෝ ඉමස්මිං චතුබ්භූමිපරිච්ඡේදේ කිලේසකාමෝ නාම. ඨපෙත්වාච රූපාරූපාවචරධම්මේ අඤ්ඤේ සබ්බේපි තීසු භූමීසු උප්පන්නා කාමාවචරධම්මා වත්ථුකාමෝ නාමාති. යං පන අට්ඨසාලිනියං සබ්බේපි තේභූමකා ධම්මා වත්ථුකාමෝති වුත්තං. තං මහානිද්දේසේ නිද්දිට්ඨේන සුත්තන්තිකපරියායේන වුත්තන්ති ගහේතබ්බං. න හි රූපාරූපාවචරධම්මා අභිධම්මේ කාමනාමේන වුත්තා අත්ථීති. [කාමාවචරපදං]

**රූපාවචරං අරූපාවචර**න්ති එත්ථ රූපාරූපසද්ද තාසු භූමීසු නිරුළ්හාති දට්ඨබ්බා. අපිච ද්වේ භූමියෝ රූපභූමි, අරූපභූමීති. තත්ථ රුප්පනලක්ඛණං රූපං යත්ථ නත්ථි, සා චතුබ්බිධා භුම්මි අරූපභූමිනාම. සේසා සත්තවීසතිවිධා භුම්මි රූපභූමිනාම. තත්ථච හෙට්ඨා ඒකාදසවිධා භුම්මි ඕළාරිකේන කාමේන විසේසෙත්වා කාම භූමීති වුත්තා. උපරි සෝළසවිධා භුම්මි රූපභූමිඉච්චේව වුත්තාති දට්ඨබ්බා. යත්ථ පන තණ්හා වා ඣානානි වා රූපාරූපසද්දේහි වුත්තානි. තත්ථ නිස්සයස්ස නාමං නිස්සිතේ ආරෝපනවසේන නිස්සයෝපචාරෝ වේදිතබ්බෝ. යත්ථ ච කාමාවචරාදිසද්දේහි භූමිඒව වුත්තා. තත්ථ නිස්සිතස්ස නාමං නිස්සයේ ආරෝපනවසේන නිස්සිතෝපචාරෝති. යමෙත්ථ වත්තබ්බං, තං කාමාවචරපදේ වුත්තනයමේවාති. අයමෙත්ථ තේභූමකපරිච්ඡේදේ පාළිඅනුගතා පරමත්ථදීපනා. යථාහ;

කතමේ ධම්මා කාමාවචරා. හෙට්ඨතෝ අවීචිනිරයං පරියන්තං කරිත්වා උපරිතෝ පරනිම්මිතවසවත්තීදේවේ අන්තෝ කරිත්වා යං ඒතස්මිං අන්තරේ එත්ථාවචරා එත්ථ පරියාපන්නා ඛන්ධධාතුආයතනා රූපා වේදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං. ඉමේ ධම්මා කාමාවචරා. කතමේ ධම්මා රූපාවචරා. හෙට්ඨතෝ බ්‍රහ්මලෝකං පරියන්තං කරිත්වා උපරිතෝ අකනිට්ඨේ දේවේ අන්තෝ කරිත්වා යං ඒතස්මිං අන්තරේ එත්ථාවචරා එත්ථ පරියාපන්නා සමාපන්නස්සවා උපපන්නස්සවා දිට්ඨධම්මසුඛවිහාරිස්සවා චිත්තචේතසිකා ධම්මා, ඉමේ ධම්මා රූපාවචරා. කතමේ

ධම්මා අරූපාවචරා. හෙට්ඨතෝ ආකාසානඤ්චායතනූපගේ දේවේ පරියන්තං කරිත්වා උපරිතෝ නේවසඤ්ඤානාසඤ්ඤායතනූපගේ දේවේ අන්තෝ කරිත්වා යං ඒතස්මිං අන්තරේ ....පෙ.... ඉමේ ධම්මා අරූපාවචරාති.

**ටීකාසු** පන යථාවුත්තං සුවිසදං පාළිනයං අග්ගහෙත්වා අඤ්ඤථා වචනත්ථාච විනිච්ඡයාච එත්ථ වුත්තා. සබ්බේ තේ සාරතෝ න පච්චේතබ්බාති. නනු අට්ඨසාලිනියමේව තේච අඤ්ඤේච අත්ථා වුත්තාති. සච්චං. භූතං පන සුවිසදං පාළිඅනුගතං අත්ථං ඤත්වා කිං වික්ඛේපේනාති.

**ලොකුත්තර**න්ති එත්ථ ලුජ්ජනපලුජ්ජනට්ඨේන ලෝකෝ වුච්චති යථා වුත්තෝ තේභූමකධම්මෝ. යථාහ ලුජ්ජති පලුජ්ජතීති ඛෝ භික්ඛවේ තස්මා ලෝකෝති වුච්චතීති. ඒවං සන්තේ ලෝකුත්තරධම්මානංපි නිබ්බානවජ්ජානං ලෝකතාපත්ති සියා. කස්මා, තේසංපි ලුජ්ජනපලුජ්ජනධම්මත්තාති. න සියා. යත්ථ හි නිච්චෝ ධුවෝ සස්සතෝති මහාජනස්ස මිච්ඡාගාහෝ නිවිසති. තත්ථේව තස්ස නිවාරණත්ථං අයං ලෝකසමඤ්ඤා නියමීයති. තස්මා සබ්බසෝ මිච්ඡාගාහවිමුත්තානං තේසං ලෝකතාපත්ති නත්ථීති වදන්ති. යේසං වා ලුජ්ජනංපලුජ්ජනඤ්ච මහාජනස්ස පාකටං. තේසඤ්ඤේව ලෝකතාසිද්ධීති නත්ථි ලෝකුත්තරානං ලෝකත්තප්පසඞ්ගෝති. ලෝකතෝ උත්තරතීති ලෝකුත්තරං. මග්ගචිත්තං. තතෝ උත්තිණ්ණන්ති ලෝකුත්තරං. ඵලචිත්තං. නිබ්බානං පන ඉධ න ලබ්භතීති. උත්තරණඤ්චෙත්ථ තණ්හාත්තයග්ගාහ විමුත්තියා තීසු ලෝකේසු අපරියාපන්නභාවෝයේව. සෝච අපරියාපන්නභාවෝ කේසං ධම්මානං අධිට්ඨාන භූතෝවිය ගය්හතීති විසුං ඒකා චතුත්ථී අවත්ථාභූමිනාමාති.

**[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 18-19-20 යටතේ)]**

කාමාවචරපදේ. "කාමීයතී"ති ඉච්ඡීයති. නිමිත්තස්සාදවත්ථු මජ්ඣිමට්ඨකථායං ආගතං. "තේකාමීයන්තී"ති තේ අවීචිනිරයාදයෝ ඉච්ඡීයන්ති. "තත්ථ උප්පන්නානම්පී"ති අවීචිනිරයාදීසු උප්පන්නානංපි සත්තානං. "භවනිකන්ති නාම හෝතී"ති භවසඞ්ඛාතං අත්තනෝ ඛන්ධං ඒතං මම, ඒසෝහමස්මි, ඒසෝ මේ අත්තාති ගණ්හන්ති තණ්හා භවනිකන්ති නාම. සා නේරයිකසත්තානංපි අත්ථියේව. "කාමේ අවචරතී"ති කාමේපරියාපන්නං හෝති. කාමේ අන්තෝගධං හෝති. රූපාරූපභූමීසු උප්පන්නංපි රූපාරූපසඞ්ඛ්‍යං න ගච්ඡති. කාමසඞ්ඛ්‍යමේව ගච්ඡති. කාමගණනමේව ගච්ඡතීති අත්ථෝ. "තීසුභවේසු උප්පන්නානිපී"ති කාමරූපාරූපසත්තසන්තානේසු උප්පන්නානිපි න තත්‍ර පරියාපන්නානේව හොන්ති. තත්‍ර අපරියාපන්නානේව හොන්තීති අධිප්පායෝ. "කාමාවචරතාපත්තිදෝසෝ"ති කාමාවචරධම්මාති වත්තබ්බතාපත්තිදෝසෝ. "රූපාවචරතාදිමුත්තිදෝසෝ"ති ඉමේ රූපාවචරධම්මා න හොන්ති, අරූපාවචරධම්මා න හොන්ති, ලොකුත්තරධම්මා න හොන්තීති ඒවං වත්තබ්බතාපත්තිදෝසෝති වුත්තං හෝති. ඒස නයෝ "රූපාරූපාවචරතාපත්තිදෝසෝ කාමාවචරතාමුත්තිදෝසෝ"ති පදේසු. අවචරසද්දස්ස උප්පන්නත්ථේ ගහිතේපි ඒතේ දෝසා නාපජ්ජන්ති. කස්මා, ලෝකේ යේභුය්‍ය නයතබ්බහුලනයානංපි සබ්භාවාති ඉමමත්ථං වදන්තෝ "නනුයේභුය්‍ය වුත්තිවසේනපී"ති ආදිමාහ. තත්ථ "කේසඤ්චී"ති කේසඤ්චි පුග්ගලානං වා ධම්මානං වා. යථාමිගලුද්දකෝ ගාමේ චරන්තෝපි වනේ චරණබහුලත්තා වනචරකෝති නාමං ලභති. රාජභත්ථී අඤ්ඤත්ථ චරන්තෝපි සඞ්ගාමේ චරණබහුලත්තා සඞ්ගාමාවචරෝති නාමං ලභති. අයං යේභුය්‍යනයෝ නාම. යස්මිං වනේ අම්බරුක්ඛාපි අත්ථි, අඤ්ඤරුක්ඛාපි අත්ථි. අම්බරුක්ඛබහුලත්තා පන තං වනං

අම්බවනන්ති නාමං ලභති. ඒවං සිම්බලිවනාදීසු. අයං තබ්බහුලනයෝ. ඉධ පන භූමියෝ තබ්බහුලනයේන කාමරූපාරූප නාමං ලභන්ති, ධම්මා යේභුය්‍යනයේන කාමාවචරාදි නාමං ලභන්තීති. ඒවං ගහිතේ සති, තේ දෝසා නාපජ්ජන්තීති ඉමමත්ථං දස්සේතුං "තස්මා ඉධාපි...පෙ.... දෝසෝති"ති ආහ. "නා"ති න කෝචිදෝසෝ නත්ථි. අත්ථි ඒවාති අධිප්පායෝ. "තස්මාස්සා"ති එත්ථ "අස්සා"ති අවචරසද්දස්ස. "තථා අත්ථං අග්ගහෙත්වා"ති උප්පජ්ජනත්ථං අග්ගහෙත්වා. "පරිග්ගාහිනියා කාමතණ්හාය කතෝ"ති තථා පරිග්ගාහිනියා කාමතණ්හාය ගෝචරවිසයත්තා තාය තණ්හාය කතෝ නාම හෝති. ඒතේන කාමේතීති කාමෝ, කාමතණ්හා. අවචරති එත්ථාති අවචරං. කාමස්ස අවචරන්ති කාමාවචරං. කාම තණ්හාය ගෝචරවිසයත්තා කාමාවචරන්ති අයමත්ථෝපි සිජ්ඣති.

රූපේ අවචරතීති රූපාවචරං. "රූපේ"ති සෝළසවිධාය රූපභූමියා. "අවචරතී"ති තත්ථ පරියාපන්නභාවේන පවත්තති. අරූපේ අවචරතීති අරූපාවචරං. "අරූපේ"ති චතුබ්බිධාය අරූපභූමියා. "අවචරතී"ති තත්ථ පරියාපන්නභාවේන පවත්තතීති ඉමමත්ථං වදති "රූපාරූපාවචරේසුපි අයං නයෝ නේතබ්බෝ"ති. රූපේ භවෝ රූපං. රූපතණ්හා. අරූපේ භවෝ අරූපං, අරූපතණ්හා. රූපස්ස අවචරං රූපාවචරං. අරූපස්ස අවචරං අරූපාවචරන්ති ඉමමත්ථං දීපේති "තේසු පනා"ති ආදිනා. "අත්‍රා"ති ඉමස්මිං ඨානේ. යදිපි ලෝභෝ, රාගෝ, කාමෝ, තණ්හාති සබ්බම්පේතං ලෝභස්ස වේවචනං හෝති. රූපරාගෝ අරූපරාගෝති පන විසුං විභත්තත්තා ඉධ කාමසද්දේන තං අඤ්ඤෝ ලෝභෝ ගය්හති. "සබ්බෝපි ලෝභෝ"ති ඒතේන සස්සතුච්ඡේදදිට්ඨිසහගතෝපි සඞ්ගහිතෝති දට්ඨබ්බං.

"රූපාරූපසද්ද තාසු භූමීසු නිරුළ්හා"ති අනිමිත්තා හුත්වා නිරුළ්හාති අධිප්පායෝ. ඉදනි සනිමිත්තං නයං වදති "අපිචා"තිආදිනා. "නිස්සයෝපචාරෝ"ති ඨානූපචාරෝ, යථා සබ්බෝ ගාමෝ ආගතෝති. "නිස්සිතෝපචාරෝ"ති ඨාන්‍යූපචාරෝ. යථා ධජා ආගච්ඡන්තීති. "යං ඒතස්මිං අන්තරේ"ති යේ ඒතස්මිං අන්තරේ ඛන්ධධාතු ආයතනා. යං රූපං, යා වෙදනා, යා සඤ්ඤා, යේ සඞ්ඛාරා, යං විඤ්ඤාණන්ති යෝජනා. "සුවිසද"න්ති යේභුය්‍යාදි නයේහි අනාකුලත්තා සුවිසුද්ධං. "කිං වික්ඛේපේනා"ති චිත්තවික්ඛේපේන කිං පයෝජනන්ති අත්ථෝ.

"ලුජ්ජනප්පලුජ්ජනට්ඨේනා"ති භිජ්ජනප්පභිජ්ජනට්ඨේන. "යත්ථා"ති යස්මිං තේභූමකේ ධම්මසමූහේ. "නිවිසතී"ති නිච්චං විසති, උපගච්ඡති. "තස්සා"ති මිච්ඡාග්ගාහස්ස. "තේස"න්ති ලෝකුත්තරධම්මානං. "යේස"න්ති ලෝකියධම්මානං. "ලුජ්ජන"න්ති ඛණිකභඞ්ගේන භිජ්ජනං. "පලුජ්ජන"න්ති සණ්ඨානභේදේන සන්තතිච්ඡේදේන නානප්පකාරතෝ භිජ්ජනං. නිබ්බානං පන ඉධ න ලබ්භති චිත්තසඞ්ගහාධිකාරත්තාති අධිප්පායෝ. සෝ ච අපරියාපන්නභාවෝ, විසුං ඒකා චතුත්ථී අවත්ථා භූමිනාමාති යෝජනා.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 18-19-20 යටතේ)]**

**කාමාවචරං ඉති එතථ** කාමාවචරං යන මෙහි **කාමීයතීති** කැමතිවෙනු ලබයිනුයි **කාමෝ** කාම නම් **වා** නොහොත් **කාමෙන්ති** කැමතිවෙත්නුයි (**කාමෝ** කාම නම්) **එත්ථ** මෙහි **සත්තා** සත්වයෝ **අවික්ඛම්භිතකාමරාගත්තා** විෂ්කම්භනය නොකළ කාමරාග ඇති බැවින් **කාමරතියා ඒව** කාමරතියෙහිම **රමන්ති** ඇලෙත් **උපරිභූමීසු විය** රූපාරූපභූමීන්හි මෙන් **ඣානරතියා** ධ්‍යානයෙහි ඇලීම **න කාමෝ** කාමය නොවෙයි **කාමභූමි** කාමභූමිය **ඒකාදසවිධා** එකොළොස් වැදෑරුම්ය **එත්ථ** මෙහි **ඣානලාභිනෝ**

ධ්‍යානලාභී පුද්ගලයෝ **සන්තීති නනු ච?** ඇත්තේ නොවේද? **න නසන්ති** නැත්තේ නොවෙයි ඇත්තේමය **කදාචි** කිසිකලෙක **තේ පන** ඔවුහු වනාහි **දේවාති** දෙවියෝ මෙන් යැයි **එත්‍ථ** මෙහි **දෝසෝ නත්‍ථි** දෝෂයක් නැත **අවීචිනිරයාදයෝ** අවීචිනිරයාදී සත්වයෝ **කථං** කෙසේ **කාමීයන්ති?** කැමතිවනු ලබත්ද? **තත්‍ථ** එහි **සත්තා** සත්වයෝ **කාමරතියා** කාමරතියෙන් **කථං** කෙසේ **රමන්තීති ච?** රමනය කරත් ද යත්? **නිමිතස්සාදවසේන වා** නිමිත්ත ආශ්වාද කිරීම් වශයෙන් හෝ **භවනිකන්තිවසේන වා** භවයට ඇලුම් කිරීම් වශයෙන් හෝ **ඉති (රමන්ති)** රමනය කරත් **හි** උපමාවක් දක්වමි **මරණකාලේ** මරණාසන්න කාලයෙහි **උපට්ඨිතා නිරයග්ගිජාලා** එළඹසිටි නිරය ගිනි දැල් **සුවණ්ණවණ්ණා විය ඛායන්ති** රන් වර්ණයෝ මෙන් වැටහෙත් **ඒකෝ කිර මිච්ඡාදිට්ඨිකෝ බ්‍රාහ්මණෝ** එක් මිසදිටු බමුණෙක් වනාහි **මරණමඤ්චේ** මරණමඤ්චකයෙහි **නිපන්නෝ හෝති** හොවින්නේ වෙයි **ආචරියබ්‍රාහ්මණා** ආචාර්‍ය්‍ය බ්‍රාහ්මණයෝ **තස්ස** ඔහුගේ **සමීපේ ඨත්‍වා** සමීපයෙහි සිට **භෝ** පින්වත **බ්‍රහ්මලෝකං** බ්‍රහ්මලෝකයට **ගච්ඡ ඉති** යහි යැයි **වදන්ති** පවසත් **තස්ස පන** ඔහුට වනාහි **අවීචිනිරයේ** අවීචිමහානිරයෙහි **අග්ගිජාලා** ගිනි දැල් **උපට්ඨහන්ති** එළඹසිටිත් **තද** එකල්හි **සෝ** ඒ බ්‍රාහ්මණ තෙම **භෝ ආචරියා** පින්වත් ආචාර්‍ය්‍යවරුනි **සුවණ්ණවණ්ණා** රන් වර්ණයෝ **පඤ්ඤායන්තීති** ප්‍රකට වෙත් යැයි **ආහ** කීවේය **භෝ** පින්වත **ඒස බ්‍රහ්මලෝකෝ** ඒ බ්‍රහ්මලෝකයයි **තත්‍ථ** එහි **ගච්ඡ ඉති** යව යැයි **වදන්ති** කියත් **සෝ** හෙතෙමේ **කාලං කත්‍වා** කළුරිය කොට **අවීචිම්හි** අවීචිමහනිරයෙහි **උප්පජ්ජි** ඉපදුනේය **ඒවං** මෙසේ **නිමිත්තස්සාදවසේන** නිමිත්ත ආශ්වාද කිරීම් වශයෙන් **තේ** ඔවුහු **කාමීයන්ති** කැමතිවෙත් **තත්‍ථ** එහි **උප්පන්නානම්පි** උපදිනවුන්හට ද **භවනිකන්ති නාම හොන්ති** භවයට ඇලීම නම් වෙත් **අපි ච** තව ද **තත්‍ථ** එහි **උප්පන්නා** උපන්නාවූ සත්වයෝ **අවික්ඛම්භිතකාමරාගා ඒව** විෂ්කම්භනය නොකළ කාමරාගය ඇති පුද්ගලයෝම **හොන්ති** වෙත් **ඕකාසේ සති** අවකාශයක් ඇති කල්හි **කාමරතියා යේව** කාමරතියෙන්ම **රමිස්සන්ති** ඇලෙන්නාහ **තස්මිං කාමේ** ඒ කාමයෙහි **අවචරතීති** හැසිරෙයිනුයි **කාමාවචරං** කාමාවචර නම් වෙයි **එත්‍ථ ච** මෙහි ද **අවචරතීති** අවචරති යන **පදස්ස** පදයාගේ **උප්පජ්ජතීති** උප්පජ්ජති යන **අත්‍ථෝ** අර්ථය **න ගහේතබ්බෝ** නොගතයුතුයි **සෝ හි අත්‍ථෝ** ඒ අර්ථය වනාහි **පාළියා ච** පෙළ හා සමඟ ද **න සමේති** සම නොවෙයි **නානාදෝසයුත්තෝ ච හෝති** නා නා දෝෂයෙන් යුක්ත ද වෙයි **ඒතස්මිං අන්තරේ** ඒ අතරෙහි **එත්ථ** මෙහි **අවචරා** හැසිරෙන්නෝ **එත්ථ** මෙහි **පරියාපන්නාති** ඇතුළත්වූවෝ යැයි **පාළියං හි** පෙළෙහි වනාහි **යං වුත්තං** යමක් කියනලදි ද **යදි** ඉදින් **එත්ථ ච** මෙහි ද **සෝ අත්‍ථෝ** ඒ අර්ථය **අධිප්පේතෝ සියා** අදහස් කරනලද්දේ වන්නේය **ඒවං සති** මෙසේ ඇති කල්හි **එත්ථ** මෙහි **අවචරා** හැසිරෙන්නෝ **එත්ථ** මෙහි **උප්පන්නාති** උපන්නෝ යැයි **වුත්තං සියා** කියනලද්දේ වන්නේය **න පන වුත්තං** එසේ නොකියනලදි **පරියාපන්නසද්දෝ** පර්‍ය්‍යාපන්න ශබ්දය තෙමේ **උප්පන්නසද්දේන සහා** උප්පන්න ශබ්දය සමඟ **සමානත්‍ථෝති** සමාන අර්ථ යැයි **වත්තුං** කියන්නට **නච සක්කා** නොහැක්කාහ **ලෝකුත්තරචිත්තානි හි** ලෝකෝත්තර චිත්තයෝ වනාහි **තීසු භවේසු** තුන් භවයෙහි **උප්පන්නානිපි** උපන්නාහු ද **තත්‍ර පරියාපන්නානියේව** එහි අතුළත්වූවෝම **න හොන්තීති** නොවෙත් **ඒවං** මෙසේ **තාව** පළමුව **පාළියා** පෙළ හා සමඟ **න සමේතීති** සම නොවෙයි.

**යදි** ඉදින් **සෝ අත්‍ථෝ** ඒ අර්ථය **ගහිතෝ සියා ච** ගන්නාලද්දේ වන්නේ ද **ඒවඤ්ච සති** මෙසේ ඇති කල්හි **තස්මිං කාමේ** ඒ කාමභූමියෙහි **යේ මහග්ගතලෝකුත්තරා ධම්මා** යම් මහග්ගත ලෝකෝත්තර ධර්මයෝ **උප්පජ්ජන්ති**

උපදිත් ද **තේසම්පි** ඒ ධර්මයනට ද **කාමාවචරතාපත්තිදෝසෝ** කාමාවචර ධර්මයෝ යැයි කිවයුතු බවට පැමිණීමේ දෝෂය ද **රූපාවචරතාදිමුත්තිදෝසෝ ච** රූපාවචර ධර්මයෝ අරූපාවචර ධර්මයෝ ලෝකෝත්තර ධර්මයෝ නොවෙත් යැයි කිවයුතු බවට පැමිණීමේ දෝෂයට **ආපජ්ජති** පැමිණෙයි **යේ ච කාමාවචරධම්මා** යම් කාමාවචර ධර්මයෝ **රූපාරූපභූමීසු** රූපාවචර අරූපාවචර භූමීන්හි **උප්පජ්ජන්ති** උපදිත් ද **තේසඤ්ච** ඒ ධර්මයන්ට ද **රූපාරූපාවචරතාපත්තිදෝසෝ** රූපාවචර ධර්මයෝය අරූපාවචර ධර්මයෝ යැයි කිවයුතු බවට පැමිණීමේ දෝෂය ද **කාමාවචරතාමුත්තිදෝසෝ ච** කාමාවචර ධර්මයෝ නොවෙත් යැයි කිවයුතු බවට පැමිණීමේ දෝෂයට **ආපජ්ජති** පැමිණෙයි **යේභුය්‍යවුත්තිවසේනපි** බොහෝසෙයින් පැවතීම් වශයෙන් ද **කේසඤ්චි** කිසියම් පුද්ගලයන්ට හෝ ධර්මයන්ට **නාමලාභෝ** නාමය ලැබීම **නනු හෝති?** වන්නේ නොවේද? **යථා** යම්සේ **මිගලුද්දකෝ** මුව වැද්දි තෙමේ **ගාමේ චරන්තෝපි** ගමෙහි හැසිරෙන්නේ ද **වනේ** වනයෙහි **චරණබහුලත්තා** හැසිරීම බහුල බැවින් **වනචරකෝති** වනචරක යන **නාමං ලභති** නාමය ලබයි ද **රාජහත්ථී** රජුගේ හස්ථිරාජයා **අඤ්ඤත්ත** අන් තැනෙක **චරන්තෝපි** හැසිරෙන්නේ ද **සඞ්ගාමේ** යුධ බිමෙහි **චරණබහුලත්තා** හැසිරීම බහුල බැවින් **සඞ්ගාමාවචරෝති** සඞ්ගාමාවචර යන **නාමං ලභති** නාමය ලබයි ද **තස්මා (තථා)** එසේම **ඉධපි** මෙහි ද **තේසං ධම්මානං** ඒ ධර්මයනට **අත්තනෝ අත්තනෝ භූමීසු** තම තමන්ගේ භූමීන්හි **උප්පන්නබහුලත්තා** ඉපදීම බහුල බැවින් **කාමාවචරාදී නාමලාභේ සති** කාමාවචර ආදී නාමලාභය ඇති කල්හි **න කෝචි දෝසෝ** කිසි දෝෂයක් නොවෙයි **කෝචිදෝසෝ න නත්ථි** කිසිදෝෂයක් නැත්තේ නොවෙයි (කිසි දෝෂයක් ඇත්තේමය) **ඒවඤ්හි සති** මෙසේ ඇති කල්හි **ලෝකුත්තරධම්මානං** ලෝකෝත්තර ධර්මයන්ගේ **කාමාවචරතාදිමුච්චනත්ථං** කාමාවචර ආදී භාවයෙන් මිදීම පිණිස **යේභුය්‍යේන** බොහෝ සෙයින් **උප්පන්නභූමි** උපදින භූමි **විසුං** වෙනම **වත්තබ්බා සියා ච** කිවයුතු වන්නේ ද **සා නාමභූමි** එනම් භූමියක් **න අත්ථි** නැත්තේය **යත්ථ** යම්තැනෙක **තේ** ඒ ධර්මයෝ **යේභුය්‍යේන** බොහෝ සෙයින් **උප්පජ්ජන්ති** උපදිත් **උප්පජ්ජන්තා තේ හි** උපදින්නා වූ ඒ ධර්මයෝ වනාහි **තීසු භවේසු ඒව** තුන් භවයෙහිම **උප්පජ්ජන්ති** උපදිත් **තස්මා** එහෙයින් **තේසං** ඒ ධර්මයන්හට **කාමරූපාරූපාවචරතාපත්තිදෝසෝ** කාමාවචර ධර්මයෝ රූපාවචර ධර්මයෝ අරූපාවචර ධර්මයෝ යැයි කිවයුතු බවට පැමිණීමේ දෝෂය **දුන්නිවාරෝ** නොවැළැක්වීම **සියා** වන්නේය **ඒවං** මෙසේ **නානාදෝසයුත්තෝ** නොයෙක් නොයෙක් දෝෂයන්ගෙන් යුක්ත **හෝති** වෙයි.

**තස්මා** එහෙයින් **අස්ස** අවචර ශබ්දයට **තථා අත්ථං අග්ගහෙත්වා** ඉපදීම යන අර්ථය නොගෙන **එත්ථ** මෙහි **අවචරා** හැසිරෙන්නාහු **එත්ථ** මෙහි **පරියාපන්නා ඉති** ඇතුළත්වූවාහු යැයි **භගවතා** භාග්‍යවතුන් වහන්සේ විසින් **සංවණ්ණිතේන පාළිනයේනේව** වර්ණණනා කරනලද පෙළ ක්‍රමයෙන්ම **අස්ස** අවචර ශබ්දයාගේ **අත්ථෝ** අර්ථය **ගහේතබ්බෝ** ගතයුතුයි **අයං හි** මේ වනාහි **එත්ථ අත්ථෝ** මෙහි අර්ථයයි **කාමේ** කාම භූමියෙහි **අවචරති** හැසිරෙයි **පරියාපන්නභාවේන** අන්තර්ගත භාවයෙන් **තස්මිං** එහි **අජ්ඣෝගාහෙත්වා** ඇතුළත් කොට **චරති** හැසිරෙයි **පවත්තතීති** පවතීනුයි **කාමාවචරං** කාමාවචර නම් වෙයි **පරියාපන්නභාවෝ ච නාම** අන්තර්ගත භාවය නම් **අත්තනෝ** තමාට **ආධාරභූතේන තේන කාමේන සහ** ආධාර වූ ඒ කාමධර්මයන් හා සමඟ **පරිභෝගභාගේහි** භාත්පසින් වටවූ **සමානජාතිගොත්තනාමතා** සමාන ජාති සමාන ගෝත්‍ර නාම ඇති බැව් **සඞ්ඛාතේහි** සඞ්ඛ්‍යාත වූ **තස්මිං කාමේ** ඒ කාමයෙහි **ආපන්නභාවෝ** පැමිණි බවයි **අනුපවිට්ඨභාවෝ** පිවිසි බවයි **අන්තෝගධභාවෝති** අතුළත් වූ බවයැයි ද **වුත්තං**

කියනලද්දේ **හෝති** වෙයි **තථා** එසේ **සෝ ච පරියාපන්නභාවෝ** ඒ අන්තර්ගත බව ද **පරිග්ගාහිනියා කාමතණ්හාය** හාත්පසින් ගන්නාලද කාමතෘෂ්ණාව විසින් **කතෝති** කරනලදැයි **දට්ඨබ්බෝ** දතයුතුයි **එත්තාවතා** මෙපමණකින් **රූපාරූපසත්තසන්තාභූතාපි** රූප අරූප සත්වසන්තානයෙහි හටගත්තාහු **යේ ධම්මා** යම් ධර්මයෝ වේද **මය්හං** මාගේ **ඒතේ** ඒ ධර්මයෝ **කාමතණ්හාය** කාමතෘෂ්ණාව විසින් **පරිග්ගහිතා** පිරිවරන ලදුයේ **කාමේ පරියාපන්නාව** කාමයෙහි ඇතුළත්වූවෝම **හොන්ති** වෙත් **තේ** ඒ ධර්මයෝ **කාමාවචරනාමාති** කාමාවචර නැමැයි **සිද්ධා හොන්ති** සිද්ධ වෙති **රූපාරූපාවචරේසුපි** රූපාරූපභූමීන්හි ද **අයං නයෝ** මේ ක්‍රමය **ඤේතබ්බෝ** පැමිණාවිය යුතුයි **තේසු පන** ඔහුන් අතුරෙන් වනාහි **රූපතණ්හා අරූපතණ්හා ච** රූපතෘෂ්ණාව ද අරූපතෘෂ්ණාව ද **පරිග්ගාහිනිතණ්හා ඉති** හාත්පසින් ගන්නාලද තෘෂ්ණාව යැයි **දට්ඨබ්බා** දතයුත්තාහ

**යේ පන ධම්මා** යම් ධර්මයෝ තුමූ වනාහි **තිණ්ණං තණ්හානං** කාමරූපාරූප තෘෂ්ණාවන්ගේ වශයෙන් **පරිග්ගහවිමුත්තා හොන්ති** අල්වා ගැනීමෙන් මිදෙන ලද්දෝ වෙත් ද **තේ** ඒ ධර්මයෝ තුමූ **තීසු භවේසු** කාමරූපාරූප භවයන්හි **උප්පන්නාපි** උපන්නාහු ද **තත්‍ර** එහි **අපරියාපන්නා ඒව** ඇතුළත් නොවන්නාහුම **හොන්තීති** වෙත්නුයි **ලෝකුත්තරානාමජාතාති** ලෝකෝත්තර නම් වේ යැයි **වේදිතබ්බා** දතයුත්තාහ **එතථ ච** මෙහි **පට්ඨානේ** ප්‍රශ්ඨානප්‍රකරණ පාළියෙහි **ආරුප්පේ** අරූපභූමියෙහි **කාමච්ඡන්දං නීවරණං පටිච්ච** කාමච්ඡන්ද නීවරණය හේතුවෙන් **උද්ධච්චනීවරණන්තිආදිනා** උද්ධච්ච නීවරණය යනාදියෙන් **අරූපසත්තසන්තානේපි** අරූපසත්ව සන්තානයෙහි ද **කාමච්ඡන්දසඞ්ඛාතාය කාමතණ්හාය** කාමච්ඡන්ද සඞ්ඛ්‍යාත කාමතෘෂ්ණාවගේ **උප්පත්ති වුත්තා** හටගැනීම කියනලද්දීය **තස්මා** එහෙයින් **රූපාරූපභූමීසු** රූපාරූපභූමීන්හි **උප්පන්නානං කාමධම්මානං** උපන්නා වූ කාමධර්මයන් විසින් **පරිග්ගාහිනී තණ්හා** හාත්පසින් ගන්නාලද තෘෂ්ණාව **රූපාරූපසත්තසන්තානගතාපි** රූපාරූපසත්ව සන්තානයන්ට ඇතුළත් යැයි ද **දට්ඨබ්බා** දතයුත්තීය **පාළියං** පෙළෙහි **කාමච්ඡන්දනීවරණං ඉති** කාමච්ඡන්ද නීවරණය යැයි **ඉදං** මෙය **නීවරණජාතිකත්තා** නීවරණ ජාතික බැවින් **වුත්තං** කියනලදි **ඣානභූමීසු හි** ධ්‍යානභූමියෙහි වනාහි **ඒකන්තනීවරණකිච්චානි** ඒකාන්ත නීවරණ කෘත්‍යයවත් වූ **නීවරණානි** නීවරණයෝ **ලද්ධුං** ලබන්නට **න සක්කා ඉති** නොහැක්කාහ **අත්‍ර** මෙහි **කාමභේදෝ** කාමයන්ගේ භේදය **වත්තබ්බෝ** කිවයුතුයි **කිලේසකාමෝ ච** ක්ලේශ කාමය ද **වත්ථුකාමෝ ච ඉති** වස්තු කාමය යැයි ද **ද්වේ කාමා** කාමයෝ දෙදෙනෙක් (**හොන්ති** වෙති) **තතථ** ඒ අතුරින් **රූපාරූපරාගෝ** රූපාරූපතෘෂ්ණාව **ඨපෙත්වා** හැර **අඤ්ඤෝ සබ්බෝපි ලෝභෝ** අන්‍යවූ සියළු ලෝභය **ඉමස්මිං චතුබ්භූමිපරිච්ඡේදේ** මේ සතරක් වූ භූමි ප්‍රදේශයෙහි **කිලේසකාමෝ** නාම ක්ලේශ කාමය නම් **රූපාරූපාවචරධම්මේ ච** රූපාරූපාවචර ධර්මයන් ද **ඨපෙත්වා** හැර **තීසු භූමීසු** ත්‍රෛයි භූමීන්හි **උප්පන්නා** උපන්නා වූ **අඤ්ඤේ සබ්බේපි කාමාවචරධම්මා** අන්‍ය සියළු කාමාවචර ධර්මයෝ තුමූ **වත්ථුකාමෝ නාම** වස්තුකාම නම් යැයි **ඉති (වේදිතබ්බෝ)** දතයුතුයි **අට්ඨසාලිනියං පන** ධම්මසඞ්ගණීයෙහි වනාහි **සබ්බේපි තේභූමකා ධම්මා** සියළු ත්‍රෛයි භූමික ධර්මයෝ **වත්ථුකාමෝ ඉති** වස්තුකාම යැයි **යං වුත්තං** යමක් කියනලදි ද **තං** එය **මහානිද්දේසේ** මහානිර්දේශයෙහි **නිද්දිට්ඨේන** දක්වනලද **සුත්තන්තිකපරියායේන** සූත්‍රාන්තික පයර්‍යායෙන් **වුත්තං ඉති** කියනලද යැයි **ගහේතබ්බං** ගතයුතුයි **අභිධම්මේ හි** අභිධර්මයෙහි වනාහි **කාමනාමේන** කාම යන නමින් **වුත්තා** කියනලද්දහු **රූපාරූපාවචරධම්මා** රූපාරූපාවචර ධර්මයෝ **න අතථි** ඇත්තේ නොවෙයි

**රූපාවචරං අරූපාවචරං ඉති එත්‍ථ** රූපාවචරං අරූපාවචරං යන මෙහි **රූපාරූපසද්දා** රූප අරූප ශබ්දයෝ **තාසු භූමීසු** ඒ භූමීන්හි **නිරූළ්හාති** නංවනලදැයි **දට්ඨබ්බා** දතයුතුයි **අපි ච** එසේවුවත් **රූපභූමි** රූපාවචර භූමිය **අරූපභූමීති** අරූපාවචර භූමිය යැයි **ද්වේ භූමි** භූමි දෙකෙකි **තත්‍ථ** ඒ භූමි දෙක අතුරින් **රුප්පනලක්ඛණං** රුප්පන ලක්‍ෂණයෙන් යුත් නොහොත් විකාරයට පැමිණෙන ලක්‍ෂණයෙන් යුත් **රූපං** රූපය **යත්‍ථ** යම්තැනෙක **නත්‍ථි** නැති ද **සා චතුබ්බිධා භූමි** ඒ සිව් වැදෑරුම් භූමිය **අරූපභූමි නාම** අරූපාවචර භූමිය නම් **සේසා** සෙසු **සත්තවීසතිවිධා භූමි** සත්විසි වැදෑරුම් භූමිය **රූපභූමි නාම** රූපාවචර භූමිය නම් **තත්‍ථ ච** ඒ සත්විසි රූපභූමි අතුරින් ද **හෙට්ඨා ඒකාදසවිධා භූමි** යට එකොළොස් වැදෑරුම් භූමිය **ඕළාරිකේන කාමේන** ඕළාරික කාමයෙන් **විසේසෙත්‍වා** විශේෂ කොට **කාමභූමීති** කාමභූමිය යැයි **වුත්තා** කියනලද්දිය **උපරි සෝළසවිධා භූමි** මතු සොළොස් වැදෑරුම් භූමිය **රූපභූමීති** රූපභූමි යැයි **ඒවං** මෙසේ **වුත්තාති** කියනලදි යැයි **දට්ඨබ්බා** දතයුත්තීය **යත්‍ථ පන** යම්තැනෙක වනාහි **තණ්හා වා** තෘෂ්ණාව හෝ **ඣානානි වා** ධ්‍යාන හෝ **රූපාරූපසද්දේහි** රූප අරූප ශබ්දයන්ගෙන් **වුත්තානි** කියනලද්දාහු ද **තත්‍ථ** එහි **නිස්සයස්ස නාමං** නිශ්‍රයාගේ නම **නිස්සිතේ** නිශ්‍රිතකයා කෙරෙහි **ආරෝපනවසේන** ආරූඪ කිරීම් වශයෙන් **නිස්සයෝපචාරෝ** ස්ථානූපචාරය **වේදිතබ්බෝ** දතයුතුයි **යත්‍ථ** යම්තැනෙක **කාමාවචරාදිසද්දේහි ච** කාමාවචර ආදී ශබ්දයන් කරණකොටගෙන ද **භූමි ඒව වුත්තා** භූමියම කියනලද්දී ද **තත්‍ථ** එහි **නිස්සතස්ස නාමං** නිශ්‍රිතකයාගේ නම **නිස්සයේ** නිශ්‍රයා කෙරෙහි **ආරෝපනවසේන** ආරූඪ කිරීම් වශයෙන් **නිස්සිතෝපචාරෝ** ඇසුරලබනලද හෙයින් නිශ්‍රිතෝපචාර වෙයි **එත්‍ථ** මෙහි **යං වත්තබ්බං** යමක් කිවයුතු ද **තං** එය **කාමාවචරපදේ** කාමාවචර පදයෙහි **වුත්තනයමේව** කියනලද ක්‍රමයෙන්ම **ඉති (වේදිතබ්බං)** දතයුතුයි **අයං** මේ **එත්‍ථ** මෙහි **තේභූමකපරිච්ඡේදේ** ත්‍රෛයි භූමික පරිච්ඡේදයෙහි **පාළිඅනුගතා** පෙළ අනුව යනලද **පරමත්ථදීපනා** පරමත්ථදීපනයයි.

**යථා** යම්සේ **කාමාවචරා ධම්මා** කාමාවචර ධර්මයෝ **කතමේ?** කවරහු ද? **හෙට්ඨතෝ** යටින් **අවීචිනිරයං** අවීචිමහානිරය **පරියන්තං කත්‍වා** කෙළවර කොට **උපරිතෝ** ඉහළින් **පරනිම්මිතවසවත්තීදේවේ** පරනිර්මිතවසවර්ති දිව්‍යලෝකය **අන්තෝ කත්‍වා** ඇතුළත් කොට **ඒතස්මිං අන්තරේ** ඒ අතරෙහි **එත්ථාවචරා** මෙහි හැසිරුණාහු **එත්ථ** මෙහි **පරියාපන්නා** ඇතුළත්වූවාහු **යං (යේ)** යම් **ඛන්ධධාතුආයතනා** ස්කන්ධ ධාතු ආයතනයෝය **රූපා** රූපයෝය **වේදනා** වේදනාවය **සඤ්ඤා** සංඥාවය **සඞ්ඛාරා** සංස්කාරයෝය **විඤ්ඤාණං** විඤ්ඤාණය යන **ඉමේ ධම්මා** මේ ධර්මයෝ **කාමාවචරා** කාමාවචර නම් වෙති **රූපාවචරා ධම්මා** රූපාවචර ධර්මයෝ **කතමේ?** කවරහු ද? **හෙට්ඨතෝ** යටින් **බ්‍රහ්මලෝකං පරියන්තං කත්‍වා** බ්‍රහ්මලෝකය කෙළවර කොට **උපරිතෝ** ඉහළින් **අකනිට්ඨේ දේවේ** අකනිඨා බඹලොව **අන්තෝ කත්‍වා** ඇතුළත් කොට **ඒතස්මිං අන්තරේ** ඒ අතරෙහි **එත්ථාවචරා** මෙහි හැසිරුණාහු ද **එත්‍ථ** මෙහි **පරියාපන්නා** ඇතුළත්වූවාහු ද **සමාපන්නස්ස වා** සමවැදුනහුගේ හෝ **උප්පන්නස්ස වා** උපන්නහුගේ හෝ **දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා** දෘෂ්ටධර්මසුඛවිහරණයෙන් යුක්තවූවකුගේ හෝ **යං (යේ)** යම් **චිත්තචේතසිකා ධම්මා** චිත්ත චෛතසික ධර්මයෝ වේද **ඉමේ ධම්මා** මේ ධර්මයෝ **රූපාවචරා** රූපාවචර නම් වෙති **අරපාවචරා ධම්මා** අරූපාවචර ධර්මයෝ **කතමේ?** කවරහු ද? **හෙට්ඨතෝ** යටින් **ආකාසානඤ්චායතනුපගේ දේවේ** ආකාසානඤ්චායතන බඹලොව **පරියන්තං කත්‍වා** කෙළවර කොට **උපරිතෝ** ඉහළින් **නේවසඤ්ඤානාසඤ්ඤායතනුපගේ දේවේ** නෙවසංඥානාසංඥායතන බඹලොව **අන්තෝ කත්‍වා** ඇතුළත් කොට **ඒතස්මිං**

**අන්තරේ** ඒ අතරෙහි **එතථාවචරා** මෙහි හැසිරුණාහු ද **එතථ** මෙහි **පරියාපන්නා** ඇතුළත්වූවාහු ද **සමාපන්නස්ස වා** සමවැදුනහුගේ හෝ **උප්පන්නස්ස වා** උපන්නහුගේ හෝ **දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා** දෘෂ්ටධර්මසුඛවිහරණයෙන් යුක්තවූවකුගේ හෝ **යං (යේ)** යම් **චිත්තචේතසිකා ධම්මා** චිත්ත චෛතසික ධර්මයෝ වේද **ඉමේ ධම්මා** මේ ධර්මයෝ **අරූපාවචරා** අරූපාවචර නම් වෙත් **ඉති** යයි **ආහ** වදළ සේක.

**ටීකාසු පන** ටීකාහි වනාහි **යථාවුත්තං** යම්සේ දේශනා කරනලද **සුවිසදං** ඉතා පැහැදිළි **පාළිනයං** පෙළ ක්‍රමය **අග්ගහෙත්වා** නොගෙන **අඤ්ඤථා** වෙනත් ආකාර **වචනත්ථා ච** වචනාර්ථය ද **විනිච්ඡයා ච** විනිශ්චය ද **එතථ** මෙහි **වුත්තා** කියනලදහ **තේ සබ්බේ** ඒ සියල්ල **සාරතෝ** සාර වශයෙන් **න පච්චේතබ්බා** නොගතයුතුයි **අට්ඨසාලිනීයමේව** අර්ථශාලිනී අර්ථකථායෙහිම **තේ අත්ථා ච** ඒ අර්ථයෝ ද **අඤ්ඤේ (අත්ථා ච)** අන්‍ය අර්ථයෝ ද **වුත්තාති නනු?** කියනලද්දේ නොවේද? **සච්චං** ඒ කීම සැබෑවකි **භූතං** සත්‍යය වූ **සුවිසදං** ඉතා පැහැදිළි වූ **පාළිඅනුගතං** පෙළ අනුව ගියා වූ **අත්ථං ඤත්වා පන** අර්ථය දැන වනාහි **කිං වික්ඛේපෙන?** වික්ෂේපයෙන් කිම?

**ලෝකුත්තරං ඉති එතථ** ලෝකුත්තරං යන මෙහි **ලුජ්ජනපලුජ්ජනට්ඨේන** කැඩෙන බිඳෙන අර්ථයෙන් **ලෝකෝ වුච්චති** ලෝකය යැයි කියනු ලැබෙයි **යථා** යම්සේ **වුත්තෝ තේභූමකධම්මෝ** කියනලද ත්‍රෛයිභූමික ධර්මයයි **යථා** යම්සේ **භික්ඛවේ** මහණෙනි! **ලුජ්ජති** විනාශ වෙයි **පලුජ්ජතීති** බිඳවැටෙයි නුයි **තස්මා** එහෙයින් **ලෝකෝති** ලෝකය යැයි **වුච්චතීති** කියනු ලැබෙයි යනුවෙන් **ආහ** දේශනා කළ සේක **ඒවං සන්තේ** මෙසේ ඇති කල්හි **නිබ්බානවජ්ජානං** නිර්වාණය වර්ජිත වූ **ලෝකුත්තරධම්මානං අපි** ලෝකෝත්තර ධර්මයන්ට ද **ලෝකතාපත්ති සියා** ලෝකයට අයත් බවට පැමිණීම වන්නේය **කස්මා?** කුමක් හෙයින් ද යත්? **තේසම්පි** ඒ ධර්මයන්ගේ ද **ලුජ්ජනපලුජ්ජනධම්මත්තාති** විනාශවන බිඳවැටෙන ධර්මතා බැවිනි (**ලෝකතාපත්ති** ලෝකයට අයත් බවට පැමිණීමක්) **න සියා** නොවන්නේය **යත්ථහි** යම්තැනෙක වනාහි **නිච්චෝ** නිත්‍යයි **ධුවෝ සස්සතෝති** සදා කාලිකයයි **මහාජනස්ස** මහා ජනයාගේ **මිච්ඡාගාහෝ** මිසදිටු ගැණීමක් **නිවිසති** පැමිණෙයි **තත්ථ ඒව** එහිම **තස්ස** ඒ මිසදිටු ගැණීමගේ **නිවාරණත්ථං** නිවාරණය පිණිස **අයං** මේ **ලෝකසාමඤ්ඤ** ලෝක සාමාන්‍යය **නියමීයති** නියමකරනු ලැබෙයි **තස්මා** එබැවින් **සබ්බසෝ** සියළු ආකාරයෙන් **මිච්ඡාගාහවිමුත්තානං තේසං** මිසදිටු ගැණීමෙන් මිදුනාවූ ඔහුන්ට **ලෝකාපත්ති** ලෝකයට අයත් බවට පැමිණීමක් **නත්ථීති** නැත යැයි **වදන්ති** කියති **යේසං** යම් ලෞකික ධර්මයන්ගේ **ලුජ්ජනං වා පලුජ්ජනඤ්ච** විනාශවීම හෝ බිඳීම ද **මහාජනස්ස** මහා ජනයාට **පාකටං** ප්‍රකටය **තේසං ඒව ලෝකුත්තරානං** ඒ ලෝකෝත්තර ධර්මයන්ගේ **ලෝකතාසිද්ධි** ලෝකයට අයත් සිදුවීම ද **ලෝකත්තපපසඞ්ගෝ** ලෝකත්‍රය හා එක්වීමක් ද **නත්ථි** නැත **ලෝකතෝ** ලෝකයෙන් **උත්තරතීති** එතරකරානුයි **ලෝකුත්තරං** ලෝකෝත්තර නම් **මග්ගචිත්තං** මාර්ග චිත්තයයි **තතෝ** එයින් **උත්තිණ්ණං ඉති** එතරවූයේනුයි **ලෝකුත්තරං** ලෝකෝත්තර නම් **ඵලචිත්තං** ඵලචිත්තයයි **නිබ්බානං පන** නිර්වාණය වනාහි **ඉධ** මෙහි **න ලබ්භතීති** නොලබයි **එත්ථ** මෙහි **උත්තරණං ච** එතරවීම නම් **තණ්හාත්තයග්ගාහවිමුත්තියා** තෘෂ්ණාත්‍රය නොගෙන මිදීමෙන් **තීසු ලෝකේසු** තුන් ලොකයෙහි **අපරියාපන්නභාවෝයේව** ඇතුළත් නොවන බවම වෙයි **සෝ ච අපරියාපන්නභාවෝ** ඒ ඇතුළත් නොවුනු බව ද **කේසං ධම්මානං** කිසියම් ධර්මයකගේ **අධිට්ඨානභූතෝ**

විය අධිෂ්ඨානයෙන් හටගත්තාවූවක් මෙන් **ගය්හතීති** ගනියිනුයි **විසුං** වෙන්ව **චතුත්ථී** සතරවැනි **ඒකා අවත්ථාභූමිනාමති** එක් අවස්ථා භූමියක් නම් වෙයි ෴

**[පරමත්ථදීපනී පරිවර්තනයි]**

කුසලාදිවිභාගේන - තත්ථ චිත්තං චතුබ්බිධං
තථා භූමිවිභාගේන - කාමභූමාදිතෝ කථං

**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 08 යටතේ)]**

**තත්ථ** ඒ "චිත්තමේකූනනවුතිවිධං" යන නිර්දේශයෙහි (**සමභිනිවිට්ඨං** මොනවට ප්‍රවේශ වූ) **චිත්තං** චිත්තය තෙමේ **කුසලාදිවිභාගේන** කුශලජාති ආදී වූ භේද වශයෙන් **චතුබ්බිධං** සතර ප්‍රකාරයෙක් ඇත්තේ (**හෝති** වේ) **කාමභූමිතෝ** කාමභූමි ආදී වශයෙන් **භූමිවිභාගේන** භූමි භේද වශයෙන් **තථා** එසේම **චතුබ්බිධං** සතර ප්‍රකාරයෙක් ඇත්තේ (**හෝති** වේ) නොහොත් **චිත්තං** චිත්තය තෙම **කුසලාදිවිභාගේන** කුශලාදී චතුර්විධ භේද වශයෙන් විභාග කරනලද හෙයින් **චතුබ්බිධං** සතර ප්‍රකාරයෙක් ඇත්තේ (**හෝති** වේ) **කාමභූමිතෝ** කාමභූමි ආදී වූ චතුර්විධ භේද වශයෙන් **භූමිවිභාගේන** භූමිය විභාගය කරනලද හෙයින් **තථා** එසේම **චතුබ්බිධං** සතර ප්‍රකාරයෙක් ඇත්තේ (**හෝති** වේ) **කථං?** කෙසේද? සෝමනස්සසහගතං යනාදී වශයෙනි ෴

"කාමේතීති කාමෝ" කාම තෘෂ්ණාව ලැබේ. "සා එත්ථ අවචරති ආලම්බණකරණවසේනාති කාමාවචරං" එම සිත ලැබේ. නොහොත් "කාමීයතීති කාමෝ" එකොළොස් කාමභූමිය ලැබේ. "කාමේ යේභුයෙය්න අවචරතීති කාමාවචරං" එම සිත ලැබේ. රූපාරූපභව ප්‍රවෘත්තිය කැමතිවන ලද හෙයින් කාමාවචර භාවය තෙම යුක්ත වේ. එහෙයින් "යේභුයෙය්න" යනු කීයේය. "කාමෝ එත්ථ අවචරතීති කාමාවචරෝ" කාමභූමිය ලැබේ. එම භූමියෙහි උපන් සිත "මඤ්චා උක්කුට්ඨිං කරොන්ති" යනාදියෙහි මෙන් නිශ්‍රය වූ භූමියගේ නාමය නිශ්‍රිත වූ සිත්හි ආරෝපණය කොට කාමාවචර සිත කීයේ යයි දතයුතු. නොහොත් "කාමාවචරේ අවචරතීති කාමාවචරාවචරං" යී කියයුතු නමුත් "රූපභවෝ රූපං" යන තන්හි මෙන් "අවචර" යන පශ්චිම පදය ලොප් කිරීමෙන් "කාමාවචරං" යී කීයේය. එහෙයින් විභාවනී ටීකායෙහි:—

"කාමේච චරතීත්‍යත්ථ - කාමේච චරතීති වා
ඨානූපචාරතෝ වාපි - තං කාමාවචරං භවේ" ති යනු දක්වන ලදි ෴

**[පරමත්ථවිභාවනී ව්‍යාඛ්‍යාව 07-08 පිටු]**

යම් හෙයකින් මේ කාමාවචරාදි චාතුර්භූමක ධර්මයෝ අනුක්‍රමයෙන් ප්‍රණීතයෝ ද එහෙයින් හීන උත්කෘෂ්ට උත්කෘෂ්ටතර උත්කෘෂ්ටතමානුක්‍රමයෙන් ඔවුන්ගේ නිද්දේශය කරණ ලදි. "කාමේතීති කාමෝ, කාම තණ්හා, සා එත්ථ අවචරති ආලම්බන කරණවසේන කාමාවචරං" නොහොත් "කාමීයතීති කාමෝ, ඒකාදසවිධෝ කාමභවෝ, තස්මිං යේභුයෙය්න අවචරතීති කාමාවචරං" මෙහි යේභුය්‍යවචරණය අභිමත බැවින් රූප භව අරූප භවයෙහි ප්‍රවෘත්ත වූ මොහුගේ කාමාවචර භාවය යුක්තමැයි. නොහොත් "කාමෝ එත්ථ අවචරතීති කාමාවචරෝ, කාමභවෝ. තත්ථ පවත්තම්පි චිත්තං නිස්සිතේ නිස්සයවෝහාරේන කාමාවචරං" මෙහි නිශ්‍රිතයා කෙරෙහි නිශ්‍රය ව්‍යවහාර හෙයින් "මඤ්චා උක්කුට්ඨිං කරොන්ති" යනාදියෙහි මෙන් කාම භවයෙහි ප්‍රවෘත්ත වූ චිත්තය කාමාවචර නම් වෙයි යනු භාවයයි. කියන ලද්දේමැයි.

"කාමෝවචරතීතෙත්ථ - කාමේවචරතීතිවා
ඨානූපචාරතෝවාපි තං - කාමාවචරම්භවේ" යී

නොහොත් "කාමේ පටිසන්ධිං අවචාරේතීති කාමාවචරං" යනු වේ. රූපාවචර අරූපාවචයෙහිදු මෙම ක්‍රමයෙන් සුදුසු සුදුසු පරිද්දෙන් වාක්‍ය ගතයුතුයි. "උපාදනක්ඛන්ධසඞ්ඛාතලෝකතෝ උත්තරති අනාසවභාවේනාතික්කමතීති ලෝකුත්තරං මග්ගචිත්තං" ඵල චිත්තය වනාහි "ලෝකතෝ උත්තිණ්ණතීති ලෝකුත්තරං" යනු වේ. නොහොත් නිර්වාණය හා සමඟ මාර්ග ඵල චිත්තය "ලෝකතෝ උත්තරං අධිකං යථාවුත්තගුණවසේනේති ලෝකුත්තරං" යි වාක්‍ය ගත යුතුයි.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 06-07 පිට; සිත සිරුර සහ නිවන හෙවත් ධම්මසඞ්ගණී 267 පිට]**

සිත සාමාන්‍යයෙන් එකකි. එහෙත් එය එකක් වශයෙන් ගෙන අභිධර්මය නුගැන්විය හැකිය. සිතේ සැටි උගැන්විය හැකි පිණිස මේ ධර්මයෙහි එක් ක්‍රමයකින් (89) අසූනවයකට ද තවත් ක්‍රමයකින් (121) එකසිය විසි එකකට ද බෙදී තිබේ. සිත බෙදෙන්නේ භූමි ජාති යනාදීන්ගෙනි.

අපාය සතරය, මිනිස් ලොවය, දිව්‍ය ලෝක සයය යන මේ භූමි එකොළොසට කාමභූමි යැයි කියනු ලැබේ. ඒ එකොළොස් වැදෑරුම් කාමභූමියෙහි බොහෝ සෙයින් ඉපදීම නිසා කාමභූමියට අයත්වන සිත කාමාවචර නම් වේ. පසළොස් වැදෑරුම් රූපභූමියෙහි බොහෝ සෙයින් ඉපදීම නිසා රූපභූමියට අයත් සිත රූපාවචර නම් වේ. අරූපභූමි සතරෙහි බොහෝ සෙයින් ඉපදීම නිසා අරූපභූමියට අයත්වන සිත් අරූපාවචර නම් වේ. ලෝකෝත්තර භූමියක් ගැන කියතත් ලෝකෝත්තර භූමි යැයි කියා තැනක් නැත. මේ චිත්ත විභාගයෙහි දී ලෝකෝත්තර ධර්මයන්ටම ලෝකෝත්තර භූමි යැයි කියනු ලැබේ. කියනලද භූමි තුනට අයත් නැති ලෝකෝත්තර භූමියට අයත් සිත ලොකෝත්තර නම් වේ. ඇතැම් කාමාවචර සිත් රූප-අරූප භූමීන්හි ද ඇති වේ. එසේම ඇතැම් රූපාවචර අරූපාවචර සිත් කාමාවචර භූමියෙහි ද ඇති වේ. මේ සිත්වලට කාමාවචර ආදී නම් දී තිබෙන්නේ බොහෝ සෙයින් ඒ ඒ භූමිවල ඇතිවීම සලකාගෙනය.

කාමාවචර සිත යන්නෙහි තේරුම බොහෝ සෙයින් කාමලෝකයෙහි උපදනා සිත යනුයි. රූපාවචර සිත යන්නෙහි තේරුම බොහෝ සෙයින් රූප ලෝකයෙහි උපදනා සිත යනුයි. අරූපාවචර සිත යන්නෙහි තේරුම බොහෝ සෙයින් අරූප ලෝකයෙහි උපදනා සිත යනුයි. ලෝකෝත්තර සිත යන්නෙහි තේරුම ලෝකය ඉක්මවන්නා වූ ද ලෝකේ ඉක්ම සිටියා වූ ද සිත යනුයි. **[අභිධර්ම මාර්ගය 27-28 පිටු]**

කාමාවචර යන පදයෙහි කාම ශබ්දය, "කාමේතීති කාමෝ" යනුවෙන් විග්‍රහ කරණු. කාම තෘෂ්ණාව ලැබේ. **කාම ධාතුවෙන් පරව ණ ප්‍රත්‍යයි. යා** යම් තෘෂ්ණාවක් තොමෝ **කාමේති** කැමති වේද **ඉති (තස්මා)** එසේ හෙයින් **සා** ඒ තෘෂ්ණා තොමෝ **කාමෝ** කාම නම් වේ. මෙසේ අර්ථ යෝජනා කරණු. "සා එත්ථ අවචරති, ආලම්බන වසේනාති කාමාවචරං" යනුවෙන් විග්‍රහ කරණු. සූපණස් කාමාවචර චිත්තය ලැබේ. **සා** ඒ තෘෂ්ණා තොමෝ **එත්ථ** මේ සූපණස් කාමාවචර චිත්තයෙහි **ආලම්බන කරණ වසේන** අරමුණු කිරීම් වශයෙන් **අවචරති** හැසිරෙන්නේ වේද **ඉති (තස්මා**) එසේ හෙයින් **තං** ඒ කාමාවචර සූපණස් සිත් තෙමේ කාමාවචර නම් වේ. මෙසේ අර්ථ යෝජනා කරණු."කාමීයතීති කාමෝ" යනුවෙන් ද කර්ම සාධනය වේ. **යෝ පදේසෝ**

යම් කාමභූමි සඞ්ඛ්‍යාත ප්‍රදේශයක් **තණ්හාය** තෘෂ්ණාව විසින් **කාමීයති** කැමතිවනු ලැබේ ද **ඉති (තස්මා)** එසේ හෙයින් **සෝ පදේසෝ** ඒ ප්‍රදේශය තෙමේ **කාමෝ** කාම නම් වේ. එකොළොස් කාමභූමිය ලැබේ. "තස්මිං යේභුයෙය්‍යන අවචරතීති කාමාවචරං" යනුවෙන් විග්‍රහ කරණු. **කාම ශබ්දය උප පද කොට ඇත්තාහු අව පූර්ව වූ චර ධාතුව කෙරෙන් අ ප්‍රත්‍යය වූ තැනී**. සූපණස් කාමාවචර චිත්තය ලැබේ. **තස්මිං** ඒ එකොළොස් කාම භූමියෙහි **යං** යම් කාමාවචර සූපණස් සිත් කෙනෙක් තෙමේ **යේභුයෙය්‍යන** බොහෝ සෙයින් **අවචරති** හැසිරෙන්නේ වේද **ඉති (තස්මා)** එසේ හෙයින් **තං** ඒ සූපණස් කාමාවචර සිත් තෙමේ **කාමාවචරං** කාමාවචර නම් වේ. සූපණස් කාමාවචර සිත් තෙමේ තෘෂ්ණාවගේ හැසිරෙන්නාවූ ස්ථානයක් වන හෙයින් එකොළොස් කාමභූමියෙහි බොහෝ සෙයින් හැසිරෙන්නා වූ අර්ථ වශයෙන් ද කාමාවචර චිත්ත නම් වේ.

ලෞකික උපමා වශයෙන් වනාහි යුධභූමියෙහි හැසිරෙන්නා වූ සතුරන් ජයගන්නා පිණිස ශක්තිමත් වූ මහන්ත හස්ති තෙමේ වනාහි සඞ්ගාමාවචර නම් වේ. ඒ හස්ති තෙමේ නගර ග්‍රාම නිගමාදියට පැමිණෙන්නේ නමුදු නගරාවචර ග්‍රාමාවචර නිගමාවචර යැයි නොකියාම ලෝකයේ ව්‍යවහාර කරන්නාක් මෙන් එම කාමාවචර සූපණස් චිත්තය රූපභූමි අරූපභූමියෙහි හටගත්තේ නමුදු රූපාවචර චිත්තය අරූපාවචර චිත්තය යැයි ව්‍යවහාර නොකෙරෙත්. කාමාවචර චිත්තය යැයි කියාම ව්‍යවහාර කරණු ලැබේ. රූපාවචර චිත්තය අරූපාවචර චිත්තය යන මෙහි ද ඒ ක්‍රමය දතයුතුය. ලෝකුත්තරං යන පදයෙහි ලෝකතෝ උත්තරං යැයි දෙකක් කොට ලෝක සඞ්ඛ්‍යාත වූ පදය ලුජ්ජති පලුජ්ජතීති ලෝකෝ යනුවෙන් විග්‍රහ කොට **ලුජ්ජති පලුජ්ජති** විනාශ වන්නේය **ඉති (තස්මා)** එසේහෙයින් **ලෝකෝ** ලෝක නම් වේ. ලුජ ධාතුවෙන් පරව ණ-ප්‍රත්‍යය වූ තැනි. උත්තරතීති උත්තරං උපාදනක්ඛන්ධ සඞ්ඛ්‍යාත ලෝකතෝ උත්තරති අනාසවභාවේනාති ලෝකුත්තරං යනුවෙන් දෙපදය සම්බන්ධ කොට විග්‍රහ කරණු. සතර මාර්ග චිත්තය ලැබේ.

**යං චිත්තං** යම් සතර මාර්ග චිත්තයෙක් තෙමේ **උපාදනක්ඛන්ධලෝකතෝ** උපාදනයන්ගේ අරමුණු වූ ස්කන්ධ සඞ්ඛ්‍යාත වූ ලෝකයෙන් **අනාසවභාවේන** ආශ්‍රව ධර්මයන්ගේ අරමුණු නොවීම් වශයෙන් **උත්තරති** එතර වන්නේ වේද **ඉති (තස්මා)** එසේහෙයින් **තං චිත්තං** ඒ මාර්ග සිත් සතර **ලෝකුත්තරං** ලෝකෝත්තර නම් වේ. තතෝ උත්තිණ්ණන්ති ලෝකුත්තරං යනුවෙන් විග්‍රහ කරණු සතර ඵල චිත්තය ලැබේ. **තතෝ** ඒ උපාදනයන්ගේ අරමුණු වූ ස්කන්ධ පඤ්ච සඞ්ඛ්‍යාත ලෝකයෙන් **උත්තිණ්ණං** එතරවන ලද්දේ වේද **ඉති (තස්මා)** එසේහෙයින් **ලෝකුත්තරං** ලෝකෝත්තර නම් වේ. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 11-12 පිටු]**

එකොළොස් කාමභූමියෙහි නොහොත් කාම ලෝකයෙහි බහුලව පවතින, කාම ලෝකයටම අයත්, කාමයන් පිළිබඳ වූ සිත් කාමාවචර සිත් නම්. රූපාවචර බ්‍රහ්මලෝකයෙහි බහුලව පවත්නා සිත් රූපාවචර සිත් නම්. කාමයන් අරමුණු කරන කාමාවචර සිත්වලට වඩා මේ සිත් උසස්ය. බලවත්ය. තැම්පත්ය. පිරිසිදුය. රූපාවචර ධ්‍යාන සිත් යැයි ද මෙයට නමකි. අරූපලෝක සතරෙහි පවත්නා හෙවත් අරූපලෝකවලට අයත් සිත් අරූපාවචර සිත් නම්. රූපාවචර බ්‍රහ්මලෝකවලට වෙනස් වූ ද රූප කයක් හෙවත් ශරීරයක් නැති නාම කය පමණක් පවත්නා හෙයින් අරූප ලෝකය යැයි කියනු ලැබේ. තණ්හා දිට්ඨි වශයෙන් තදින් අල්වා ගන්නාලද පඤ්ච උපාදනස්කන්ධ සඞ්ඛ්‍යාත ලෝකයෙන් ද කාමලෝක රූපලෝක අරූපලෝක යන තුන්ලෝකයෙන් ද එතර කරවන අර්ථයෙන් ලෝකෝත්තර නම් වේ.

**[අභිධර්මාර්ථ ප්‍රදීපිකා 01/30-70-83-84-90 පිටු]**

(කාමාවචර රූපාවචර අරූපාවචර ලෝකෝත්තර වශයෙන්) සතර ප්‍රකාරයකි. (සප්ත කාම ස්වර්ගයෙහි ද සතර අපායෙහි ද යන එකොළොස්) කාම භවයෙහි බෙහෙවින් හැසිරෙන හෙයින් කාමාවචර නම් වේ. (බ්‍රහ්මපාරිසජ්ජය පටන් අකනිටා බඹ ලොව දක්වා සොළොස්) රූ තලයෙහි හැසිරෙන හෙයින් රූපාවචර නම් වේ. (ආකාසානඤ්චායතනාදී සතර) අරූප තලයෙහි හැසිරෙන හෙයින් අරූපාවචර නම් වේ. (උපාදානස්කන්ධය යැයි කියන ලද) ලෝකයෙන් එතරවේනුයි ලෝකෝත්තර නම් වේ. සෝවාන් ආදී සතර මාර්ග චිත්තයයි. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රශ්නෝත්තර 01 පිට]**

කාමා අවචරන්ති එත්ථ, බාහුල්ලේන පවත්තන්තීති කාමාවචර භූමි. තස්සං විසේසතෝ පවත්තමානං චිත්තං කාමාවචරන්ති වුච්චති. රූපාවචරන්ති ඣාන භූමි චිත්තං. තං රූළ්හීවසේන රූපාවචරන්ති වුත්තං. අරූපාවචරන්ති ආකාසානඤ්චාදි ආයතනගතං චිත්තං. තේසු ආයතනේසු සබ්බසෝ රූපං අත්ථං ගච්ඡති, තස්මා තානි අරූපාවචරානි. තේහි සම්පයුත්තං චිත්තං අරූපාවචරන්ති. ලෝකුත්තරා නාම චත්තාරෝ අරියමග්ගා, චත්තාරිච මග්ගඵලානි. තේහි සම්පයුත්තං චිත්තං ලෝකුත්තරං චිත්තන්ති වේදිතබ්බං. **[නවනීත ටීකා 02 පිට]**

යටින් අවීචියත් උඩින් පරනිම්මිතවසවර්ති දෙව් ලොවත් අතර කාම භවයයි. සැකෙවින් කාමයෝ දෙදෙනෙකි. වත්ථු කාමය, කිලේස කාමය කියායි. කිලේස කාමය අර්ථ වශයෙන් ඡන්දරාගයයි. ලෝභයයි. තෘෂ්ණාවයි. කැමති වන්නා වූ ලෝභයයි. එහෙයින් "කාමේතීති කාමෝ" කැමතිවේනුයි කාම නම් වේ.

වත්ථු කාමය නම් රූපාදී සියල්ල ඇතුළත් තුන් භූමියයි. එහෙයින් "වත්ථුකාමෝ තේභූමකවට්ටං" යනුවෙන් ධම්මසඞ්ගණී අටුවාවෙහි කියන ලදි. ඡන්දරාගය ඇත්තහු විසින් කැමතිවන ලද දෙය භවයයි. එහෙයින් "කාමීයතීති කාමෝ" කැමතිවන ලද්දේ කාම නම් වේ. මෙයින් ත්‍රිවිධ භවයම ගන්නා ලදි.

මෙම දෙවැදෑරුම් කාමයෙහි පැමිණීම් පැවතීම් වශයෙන් හැසිරේනුයි කාමාවචර නම් වේ. සතර අපාය, මිනිස් ලොව, සදෙව් ලොව වත්ථුකාමයන්හි ඉපදීම් වශයෙන් හැසිරීම් පැවතීම් වශයෙන් කැමතිවීම කිලේස කාමයෙන් සිදුවේ. රූප-අරූප ලෝකයන්හි ද කාමසිත් පහළවතුදු ඉපදීම් වශයෙන් ඉහත සඳහන් එකොළොස් භූමියට පැමිණෙන සිත් කාමාවචරය. **[සිත සිරුර සහ නිවන හෙවත් ධම්මසඞ්ගණී 06-07 පිටු]**

## චිත්තය යනුඃ—

**චිත්ත**න්ති ආරම්මණං චින්තේතීති චිත්තං; විජානාතීති අත්ථෝ. යස්මා වා 'චිත්ත'න්ති සබ්බචිත්තසාධාරණෝ ඒස සද්දෝ, තස්මා යදෙත්ථ ලෝකියකුසලාකුසලකිරියචිත්තං, තං ජවනවීථිවසේන අත්තනෝ සන්තානං චිනෝතීති චිත්තං. විපාකං කම්මකිලේසේහි චිතන්ති චිත්තං. අපිච සබ්බම්පි යථානුරූපතෝ චිත්තතාය චිත්තං. චිත්තකරණතාය චිත්තන්ති ඒවම්පෙත්ථ අත්ථෝ වේදිතබ්බෝ. තත්ථ යස්මා අඤ්ඤදේව සරාගං චිත්තං, අඤ්ඤං සදෝසං, අඤ්ඤං සමෝහං, අඤ්ඤං කාමාවචරං, අඤ්ඤං රූපාවචරාදිභේදං, අඤ්ඤං රූපාරම්මණං, අඤ්ඤං සද්දදිආරම්මණං, රූපාරම්මණේසු චාපි අඤ්ඤං නීලාරම්මණං, අඤ්ඤං

පීතාදිආරම්මණං, සද්දාදිආරම්මණේසුපි ඒසේව නයෝ, සබ්බේසුපි චේතේසු අඤ්ඤං හීනං අඤ්ඤං මජ්ඣිමං අඤ්ඤං පණීතං, හීනාදීසුපි අඤ්ඤං ඡන්දාධිපතෙය්‍යං, අඤ්ඤං වීරියාධිපතෙය්‍යං අඤ්ඤං චිත්තාධිපතෙය්‍යං, අඤ්ඤං වීමංසාධිපතෙය්‍යං, තස්මා අස්ස ඉමේසං සම්පයුත්තභූමි ආරම්මණහීනමජ්ඣිම පණීතාධිපතීනං වසේන චිත්තතා වේදිතබ්බා. කාමඤ්චෙත්ථ ඒකමේව ඒවං චිත්තං න හෝති, චිත්තානං පන අන්තෝගධත්තා ඒතේසු යංකිඤ්චි ඒකම්පි චිත්තතාය චිත්තන්ති වත්තුං වට්ටති. ඒවං තාව චිත්තතාය චිත්තං.

කථං චිත්තකරණතායාති? ලෝකස්මිඤ්හි චිත්තකම්මතෝ උත්තරි අඤ්ඤං චිත්තං නාම නත්ථි. තස්මිම්පි චරණං නාම චිත්තං අතිචිත්තමේව හෝති. තං කරොන්තානං චිත්තකාරානං 'ඒවංවිධානි එත්ථ රූපානි කාතබ්බානී'ති චිත්තසඤ්ඤා උප්පජ්ජති. තාය චිත්තසඤ්ඤාය ලේඛාගහනරඤ්ජනඋජ්ජෝතනවත්තනාදි නිප්ඵාදිකා චිත්තකිරියා උප්පජ්ජන්ති, තතෝ චරණසඞ්ඛාතේ චිත්තේ අඤ්ඤතරං විචිත්තරූපං නිප්ඵජ්ජති. තතෝ 'ඉමස්ස රූපස්ස උපරි ඉදං හෝතු, හෙට්ඨා ඉදං, උභයපස්සේ ඉද'න්ති චින්තෙත්වා යථාචින්තිතේන කමේන සේසචිත්තරූපනිප්ඵාදනං හෝති, ඒවං යංකිඤ්චි ලෝකේ විචිත්තං සිප්පජාතං සබ්බං තං චිත්තේනේව කරියති, ඒවං ඉමාය කරණවිචිත්තතාය තස්ස තස්ස චිත්තස්ස නිප්ඵාදකං චිත්තම්පි තථේව චිත්තං හෝති. යථාචින්තිතස්ස වා අනවසේසස්ස අනිප්ඵජ්ජනතෝ තතෝපි චිත්තමේව චිත්තතරං. තේනාහ භගවා;

"දිට්ඨං වෝ, භික්ඛවේ, චරණං නාම චිත්තන්ති? 'ඒවං, භන්තේ'. තම්පි ඛෝ, භික්ඛවේ, චරණං නාම චිත්තං චිත්තේනේව චින්තිතං. තේනපි ඛෝ, භික්ඛවේ, චරණේන චිත්තේන චිත්තංයේව චිත්තතර"න්ති (සං. නි. 3.100).

තථා යදේතං දේවමනුස්සනිරයතිරච්ඡානභේදාසු ගතීසු කම්ම-ලිඞ්ග-සඤ්ඤා-වෝහාරාදිභේදං අජ්ඣත්තිකං චිත්තං තම්පි චිත්තකතමේව. කායකම්මාදිභේදඤ්හි දානසීලවිහිංසාසාඨෙය්‍යාදිනයප්පවත්තං කුසලාකුසලකම්මං චිත්තනිප්ඵාදිතං කම්මනානත්තං. කම්මනානත්තේනේව ච තාසු තාසු ගතීසු හත්ථ-පාද-කණ්ණ-උදර-ගීවා-මුඛාදිසණ්ඨානභින්නං ලිඞ්ගනානත්තං. ලිඞ්ගනානත්තතෝ යථාගහිතසණ්ඨානවසේන 'අයං ඉත්ථී අයං පුරිසෝ'ති උප්පජ්ජමානාය සඤ්ඤාය සඤ්ඤානානත්තං. සඤ්ඤානානත්තතෝ සඤ්ඤානුරූපේන 'ඉත්ථී'ති වා 'පුරිසෝ'ති වා වෝහරන්තානං වෝහාරනානත්තං. වෝහාරනානත්තවසේන පන යස්මා 'ඉත්ථී භවිස්සාමි පුරිසෝ භවිස්සාමි, ඛත්තියෝ භවිස්සාමි බ්‍රාහ්මණෝ භවිස්සාමී'ති ඒවං තස්ස තස්ස අත්තභාවස්ස ජනකං කම්මං කරියති, තස්මා වෝහාරනානත්තතෝ කම්මනානත්තං. තං පනේතං කම්මනානත්තං යථා පත්ථිතං භවං නිබ්බත්තෙන්තං යස්මා ගතිවසේන නිබ්බත්තේති තස්මා කම්මනානත්තතෝ ගතිනානත්තං. කම්මනානත්තේනේව ච තේසං තේසං සත්තානං තස්සා තස්සා ගතියා අපාදකද්විපාදකාදිතා, තස්සා තස්සා උපපත්තියා උච්චනීචාදිතා, තස්මිං තස්මිං අත්තභාවේ සුවණ්ණදුබ්බණ්ණාදිතා, ලෝකධම්මේසු ලාභාලාභාදිතා ච පඤ්ඤායති. තස්මා සබ්බමේතං දේවමනුස්සනිරයතිරච්ඡානභේදාසු ගතීසු කම්මලිඞ්ගසඤ්ඤාවෝහාරාදිභේදං අජ්ඣත්තිකං චිත්තං චිත්තේනේව කතන්ති වේදිතබ්බං. ස්වායමත්ථෝ ඉමස්ස සඞ්ගීතිඅනාරුළ්හස්ස සුත්තස්ස වසේන වේදිතබ්බෝ.

වුත්තඤ්හේතං;

“කම්මනානත්තපුථුත්තප්පභේදවවත්ථානවසේන ලිඞ්ගනානත්ත පුථුත්තප්පභේද වවත්ථානං භවති, ලිඞ්ගනානත්තපුථුත්තප්පභේදවවත්ථානවසේන සඤ්ඤානානත්ත පුථුත්තප්පභේදවවත්ථානං භවති, සඤ්ඤානානත්ත පුථුත්තප්පභේද වවත්ථානවසේන වෝහාරනානත්තපුථුත්තප්පභේදවවත්ථානං භවති, වෝහාරනානත්තපුථුත්තප්පභේදවවත්ථානවසේන කම්මනානත්ත පුථුත්තප්පභේද වවත්ථානං භවති. කම්මනානාකරණං පටිච්ච සත්තානං ගතියා නානාකරණං පඤ්ඤායති; අපද ද්විපද චතුප්පද බහුප්පද, රූපිනෝ අරූපිනෝ, සඤ්ඤිනෝ අසඤ්ඤිනෝ නේවසඤ්ඤීනාසඤ්ඤිනෝ. කම්මනානාකරණං පටිච්ච සත්තානං උපපත්තියා නානාකරණං පඤ්ඤායති; උච්චනීචතා හීනපණීතතා සුගතදුග්ගතතා. කම්මනානාකරණං පටිච්ච සත්තානං අත්තභාවේ නානාකරණං පඤ්ඤායති සුවණ්ණදුබ්බණ්ණතා සුජාතදුජ්ජාතතා සුසණ්ඨිතදුස්සණ්ඨිතතා. කම්මනානාකරණං පටිච්ච සත්තානං ලෝකධම්මේ නානාකරණං පඤ්ඤායති ලාභාලාභේ යසායසේ නින්දපසංසායං සුඛදුක්ඛේ”ති.

අපරම්පි වුත්තං;

කම්මතෝ ලිඞ්ගතෝ චේව, ලිඞ්ගසඤ්ඤ පවත්තරේ;
සඤ්ඤතෝ භේදං ගච්ඡන්ති, ඉත්ථායං පුරිසෝති වා.

“කම්මුනා වත්තතේ ලෝකෝ, කම්මුනා වත්තතේ පජා;
කම්මනිබන්ධනා සත්තා, රථස්සාණීව යායතෝ”. (ම. නි. 2.460; සු. නි. 659);

කම්මේන කිත්තිං ලභතේ පසංසං,
කම්මේන ජානිඤ්ච වධඤ්ච බන්ධං;

තං කම්මනානාකරණං විදිත්වා,
කස්මා වදේ නත්ථි කම්මන්ති ලෝකේ. (කථා. 785);

“කම්මස්සකා මාණව සත්තා කම්මදායාද කම්මයෝනී කම්මබන්ධූ කම්මපටිසරණා; කම්මං සත්තේ විභජති යදිදං හීනප්පණීතතායා”ති (ම. නි. 3.289).

ඒවං ඉමාය කරණචිත්තතායපි චිත්තස්ස චිත්තතා වේදිතබ්බා. සබ්බානිපි හි ඒතානි විචිත්‍රානි චිත්තේනේව කතානි. අලද්ධෝකාසස්ස පන චිත්තස්ස යං වා පන අවසේසපච්චයවිකලං තස්ස ඒකච්ච චිත්තකරණාභාවතෝ යදේතං චිත්තේන කතං අජ්ඣත්තිකං චිත්තං වුත්තං, තතෝපි චිත්තමේව චිත්තතරං. තේනාහ භගවා “නාහං, භික්ඛවේ, අඤ්ඤං ඒකනිකායම්පි සමනුපස්සාමි ඒවං චිත්තං යථයිදං, භික්ඛවේ, තිරච්ඡානගතා පාණා... තේහිපි ඛෝ, භික්ඛවේ, තිරච්ඡානගතේහි පාණේහි චිත්තංයේව චිත්තතර”න්ති (සං. නි. 3.100).

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය අංක 01 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 81 පිට (හේ.වි.මු)]**

විජානාතීති සඤ්ඤපඤ්ඤකිච්චවිසිට්ඨං විසයග්ගහණං ආහ. සබ්බචිත්තසාධාරණත්තා යත්ථ යත්ථ යථා යථා අත්ථෝ ලබ්භති, තත්ථ තත්ථ තථා තථා ගහේතබ්බෝති. යං ආසේවනපච්චයභාවේන **චිනෝති,** යඤ්ච කම්මුනා අභිසඞ්ඛතත්තා **චිතං,** තං තථා “**චිත්ත**”න්ති වුත්තං. යං පන තථා න හෝති, තං පරිත්තකිරියද්වයං අන්තිමජවනඤ්ච ලබ්භමානචින්තනවිචිත්තතාදිවසේන

"**චිත්ත**"න්ති වේදිතබ්බං. හසිතුප්පාදෝ පන අඤ්ඤදප්පවනගතිකෝව. **චිත්තානං පනාති** විචිත්‍රානන්ති අත්ථෝ. තදන්තෝගධත්තා හි සමුදයවෝහාරේන අවයවෝපි "**චිත්ත**"න්ති වුච්චති යථා පබ්බතනදීසමුද්දදිඒකදේසේසු දිට්ඨේසු පබ්බතාදයෝ දිට්ඨාති වුච්චන්තීති. **චරණං** නාම ගහෙත්වා චරිතබ්බචිත්තපටෝ. **රූපානීති** බිම්බානි.

**අජ්ඣත්තිකන්ති** ඉන්ද්‍රියබද්ධං වදති. **චිත්තකතමේවාති** චිත්තස්ස මූලකාරණතං සන්ධාය වුත්තං. කම්මස්ස හේතං චිත්තං කාරණන්ති. තං පන අත්ථං විභාවේතුං "**කායකම්මාදිභේද**"න්තිආදිමාහ. **ලිඞ්ගනානත්තන්ති** සණ්ඨානනානත්තං, භින්නසණ්ඨානඞ්ගපච්චඞ්ගවතෝ සරීරස්ස වා නානත්තං. වෝහාරවසේන ඉත්ථිපුරිසාදිභාවේන වෝහරිතබ්බේසු පත්ථනාවිසේසා උප්පජ්ජන්ති, තතෝ කම්මවිසේසා. ඒවමිදං **කම්මනානත්තං** වෝහාරනානත්තතෝ හෝති. **අපා...පෙ.... කාදිතාති** ඒවමාදීසු **ආදි**-සද්දේහි ගතියා උපපත්තියා අත්තභාවේ ලෝකධම්මේසු ච නානාකරණානි සුත්තාගතානි සඞ්ගණ්හාති.

**කම්මනානත්තාදිවසේනාති** එත්ථ කුසලාකුසලවසේන **කම්මනානත්තං** වේදිතබ්බං. විසදිසසභාවතා හි නානත්තන්ති. කුසලකම්මස්ස දානාදිවසේන කායසුචරිතාදිභාවේන ච **පුථුත්තං,** අකුසලකම්මස්ස ච මච්ඡරියාදීහි කායදුච්චරිතාදීහි ච **පුථුත්තං** වේදිතබ්බං. බහුප්පකාරතා හි පුථුත්තන්ති. අන්නදානාදිවසේන දානාදීනං පාණාතිපාතාවිරතිආදිවසේන කායසුචරිතාදීනං ආවාසමච්ඡරියාදිවසේන මච්ඡරියාදීනං පාණාතිපාතාදිවසේන කායදුච්චරිතාදීනඤ්ච **පභේදෝ** වේදිතබ්බෝ. ඒකේකස්ස හි පකාරස්ස භේදෝ පභේදෝති. නානත්තාදීනං **වවත්ථානං** තථා තථා වවත්ථිතතා නිච්ඡිතතා. ඒතේනුපායේන ලිඞ්ගනානත්තාදීනි වේදිතබ්බානි. කම්මනානත්තාදීහි නිබ්බත්තානි හි තානීති.

පච්චුප්පන්නස්ස ලිඞ්ගස්ස කම්මතෝ පවත්තිං තදනුක්කමේන පච්චුප්පන්නකම්මස්ස නිප්ඵත්තිඤ්ච දස්සෙත්වා තතෝ අනාගතලිඞ්ගනානත්තාදිනිප්ඵත්තිදස්සනේන සංසාරං ඝටෙන්තෝ "**කම්මනානාකරණං පටිච්චා**"තිආදිමාහ. තත්ථ පුරිමේන කම්මවචනේන අවිජ්ජාසඞ්ඛාරා, ලිඞ්ගාදිවචනේන විඤ්ඤාණාදීනි භවපරියෝසානානි, ගතිආදිවචනේන ජාතිජරාමරණානි ගහිතානීති දට්ඨබ්බානි. තත්ථ **ගතීති** නිරයාදයෝ පඤ්ච ගතියෝ වුච්චන්ති, තාසං නානාකරණං අපදාදිභාවෝ. තා හි තථා භින්නාති. **උපපත්තීති** ගෝමහිංසාදිඛත්තියාදිචාතුමහාරාජිකාදිඋපපත්තියෝ, තාසං නානාකරණං උච්චාදිතා. ඛත්තියෝ ඒව හි ඒකච්චෝ කුලභෝගඉස්සරියාදීහි **උච්චෝ** හෝති, ඒකච්චෝ **නීචෝ**. තේහි ඒව හීනතාය **හීනෝ,** පධානභාවං නීතතාය **පණීතෝ,** අඩ්ඪතාය **සුගතෝ,** දලිද්දතාය **දුග්ගතෝ**. කුලවසේන වා **උච්චනීචතා,** ඉස්සරියවසේන **හීනපණීතතා,** භෝගවසේන **සුගතදුග්ගතතා** යෝජේතබ්බා. **සුවණ්ණදුබ්බණ්ණතාති** ඕදාතසාමාදිවණ්ණසුද්ධිඅසුද්ධිවසේන වුත්තං. **සුජාතදුජ්ජාතතාති** නිග්‍රෝධපරිමණ්ඩලාදිආරෝහපරිණාහේහි ලක්ඛණේහි වා අත්තභාවපරිපුණ්ණාපරිපුණ්ණජාතතාවසේන. **සුසණ්ඨිතදුස්සණ්ඨිතතාති** අඞ්ගපච්චඞ්ගානං සණ්ඨානවසේන.

**අපරම්පි වුත්තං** අජ්ඣත්තිකචිත්තස්ස යථාවුත්තස්ස චිත්තකතභාවසාධකං සුත්තං **"කම්මතෝ"**තිආදි. කම්මඤ්හි චිත්තතෝ නිබ්බත්තන්ති තතෝ

නිප්ඵජ්ජමානං සබ්බම්පි චිත්තං චිත්තකතමේවාති සාධෙති. කම්මනිබ්බත්තතෝ ලිඞ්ගතෝ පවත්තමානලිඞ්ගසඤ්ඤා මූලකාරණතෝ කම්මතෝ ආසන්නකාරණතෝ ලිඞ්ගතෝ ච පවත්තා හෝතීති **"කම්මතෝ…පෙ…. පවත්තරේ"**ති ආහ. අථ වා ලිඞ්ගඤ්ච සඤ්ඤා ච **ලිඞ්ගසඤ්ඤා,** තා යථාසඞ්ඛ්‍යං කම්මතෝ ලිඞ්ගතෝ ච පවත්තරේති අත්ථෝ. **සඤ්ඤාතෝ භේදං ගච්ඡන්තීති** තේ ඉත්ථිපුරිසාදිලිඞ්ගසඤ්ඤාතෝ ඉත්ථිපුරිසාදිවෝහාරභේදං ධම්මා ගච්ඡන්ති, තථා තථා වෝහරිතබ්බාති අත්ථෝ. ඉමාය ගාථාය අතීතපච්චුප්පන්නද්ධපටිච්චසමුප්පාදවසේන චිත්තකතං චිත්තං දස්සිතං.

**ලෝකෝ** ඒව පජාතත්තා **පජාති** පුරිමපාදස්ස විවරණං පච්ඡිමපාදෝ දට්ඨබ්බෝ. යථා රථස්ස ආණි නිබන්ධනා, ඒවං සත්තලෝකරථස්ස කම්මං නිබන්ධනන්ති උපමා සංසන්දනං වේදිතබ්බං. ඉමාය ච ගාථාය අද්ධද්වයවසේන චිත්තස්ස කම්මවිඤ්ඤාණකතතා දස්සිතා. **කිත්ති**න්ති පරම්මුඛා කිත්තනං පත්ථටයසතං. **පසංස**න්ති සම්මුඛා පසංසනං ථුතිං. **කම්මනානාකරණ**න්ති කම්මතෝ නිබ්බත්තනානාකරණං කම්මජේහි අනුමියමානං කම්මස්සේව වා නානාකරණං.

**කම්මස්සකාති** කම්මසයා. කම්මස්ස දායං තේන දාතබ්බං ආදියන්තීති **කම්මදායාදා.** අණ්ඩජාදීනඤ්ච යෝනීනං කම්මතෝ නිබ්බත්තත්තා කම්මමේව යෝනි අත්තභාවපටිලාභනිමිත්තං ඒතේසන්ති **කම්මයෝනී.** බන්ධනට්ඨේන කම්මං බන්ධු ඒතේසන්ති **කම්මබන්ධූ.**

**චිත්තස්සාති** කම්මවිඤ්ඤාණස්ස. තස්ස පන අලද්ධෝකාසතා අඤ්ඤේන කම්මේන පටිබාහිතත්තා තදවිපච්චනෝකාසේ පුග්ගලස්ස නිබ්බත්තත්තා ච වේදිතබ්බා. විජ්ජමානම්පි අපරාපරියවේදනීයකම්මවිඤ්ඤාණං කාලගතිපයෝගාදිසහකාරීපච්චයවිකලතාය **අවසේසපච්චයවේකල්ලං** දට්ඨබ්බං. **ඒකච්ච චිත්ත**න්ති චිත්තේන කත්තබ්බචිත්‍රෙන ඒකච්චභූතං තේන කත්තබ්බචිත්‍රමාහ.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය අංක 01 යටතේ)**

සඤ්ඤාපඤ්ඤාකිච්චං සඤ්ඤාණකරණපටිවිජ්ඣනානි, තදුභයවිධුරා ආරම්මණූපලද්ධි "විජානාතී"ති ඉමිනා වුච්චතීති ආහ **"සඤ්ඤා…පෙ…. ගහණ"**න්ති. නනු ච ඵස්සාදිකිච්චතෝපි විසිට්ඨකිච්චං චිත්තන්ති? සච්චමේතං, සෝ පන විසේසෝ න තථා දුරවබෝධෝ, යථා සඤ්ඤාපඤ්ඤාවිඤ්ඤාණානන්ති සඤ්ඤාපඤ්ඤාකිච්චවිසිට්ඨලක්ඛණතාය විඤ්ඤාණලක්ඛණමාහ. අනන්තරධම්මානං පගුණබලවභාවස්ස කාරණභාවේන පවත්තමානෝ සන්තානං චිනෝති නාම. තථාපවත්ති ච ආසේවනපච්චයභාවෝති ආහ **"ආසේවනපච්චයභාවේන චිනෝතී"**ති.

**චිත්තකතමේවාති** අභිසඞ්ඛාරවිඤ්ඤාණකතමේව. **නානත්තාදීනං වවත්ථාන**න්ති එත්ථ වවත්ථානං පච්චේකං යෝජේතබ්බං. **වවත්ථානං** පරිච්ඡේදෝ අසඞ්කරභාවෝ. තේන ච ධම්මෝ නිච්ඡිතෝ නාම හෝතීති ආහ **"නිච්ඡිතතා"**ති. **ලිඞ්ගනානත්තාදීනීති** එත්ථ ඉත්ථිපුරිසසණ්ඨානවසේන ලිඞ්ගනානත්තං. දේවමනුස්සතිරච්ඡානාදිවසේන ඉත්ථිලිඞ්ගස්ස පුථුත්තං, තථා පුරිසලිඞ්ගස්ස. දේවාදිභේදේ ඉත්ථිලිඞ්ගේ පච්චේකං නානත්තකායතාසඞ්ඛාතස්ස අඤ්ඤමඤ්ඤවිසදිසසභාවස්ස දේසාදිභේදභින්නස්ස ච විසේසස්ස වසේන

පභේදෝ වේදිතබ්බෝ. තථා පුරිසලිඞ්ගේ. ලිඞ්ගනිබ්බත්තකස්ස වා කම්මස්ස යථාවුත්තනානත්තාදිවසේන ලිඞ්ගස්ස නානත්තාදීනි යෝජේතබ්බානි. ලිඞ්ගනානත්තාදීසු පවත්තත්තා සඤ්ඤාදීනං නානත්තාදීනි. තේනේවාහ "කම්මනානත්තාදීහි නිබ්බත්තානි හි තානී"ති. අපදදිනානාකරණදස්සනේන ලිඞ්ගනානත්තං දස්සිතං. තස්මිඤ්ච දස්සිතේ සඤ්ඤානානත්තාදයෝ දස්සිතා ඒවාති ආවත්තති භවචක්කන්ති දස්සෙන්තෝ ආහ **"අනාග…පෙ…. ඝටෙන්තෝ"**ති. ඉත්ථිලිඞ්ගපුරිසලිඞ්ගාදි විඤ්ඤාණාධිට්ඨිතස්ස රූපක්ඛන්ධස්ස සන්නිවේසවිසේසෝ. සඤ්ඤාසීසේන චත්තාරෝ ඛන්ධා වුත්තා. වෝහාරවචනේන ච පඤ්චන්නං ඛන්ධානං වෝහරිතබ්බභාවේන පවත්ති දීපිතා, යා සා තණ්හාදිට්ඨිඅභිනිවේසහේතූති ඉමමත්ථං දස්සෙන්තෝ **"ලිඞ්ගාදි…පෙ…. යෝසානානී"**ති ආහ.

"යේ කේචි, භික්ඛවේ, ධම්මා අකුසලා අකුසලභාගියා, සබ්බේතේ මනෝපුබ්බඞ්ගමා"ති (අ. නි. 1.56-57), "මනෝපුබ්බඞ්ගමා ධම්මා"ති (ධ. ප. 1, 2) ච ඒවමාදිවචනතෝ චිත්තහේතුකං කම්මන්ති ආහ **"කම්මඤ්හි චිත්තතෝ නිබ්බත්ත"**න්ති. **යථාසඞ්ඛ්‍ය**න්ති කම්මතෝ ලිඞ්ගං ලිඞ්ගතෝ සඤ්ඤාති අත්ථෝ. න පුරිමවිකප්පේ විය කම්මතෝ ලිඞ්ගසඤ්ඤා ලිඞ්ගතෝ ලිඞ්ගසඤ්ඤාති උභයතෝ උභයප්පවත්තිදස්සනවසේන. "භේදං ගච්ඡන්ති ඉත්ථායං පුරිසෝති වා"ති භේදස්ස විසේසිතත්තා ඉත්ථාදිභාවේන වෝහරිතබ්බභාවෝ ඉධ භේදෝති **"ඉත්ථිපුරිසාදිවෝහාරං ගච්ඡන්තී"**ති වුත්තං. **අද්ධද්වයවසේනා**ති අතීතපච්චුප්පන්නද්ධද්වයවසේන. ගුණාභිබ්‍යාපනං කිත්තීති ආහ **"පත්ථටයසත"**න්ති. කම්මනානාකරණේන විනා කම්මනිබ්බත්තනානාකාරණාභාවතෝ **"කම්මජේහි…පෙ…. නානාකරණ"**න්ති වුත්තං. **අවිපච්චනෝකාසෝ** අට්ඨානභූතා, ගතිකාලෝපි වා. කාමාවචරං අභිසඞ්ඛාරවිඤ්ඤාණං රූපධාතුයා චක්ඛුවිඤ්ඤාණාදිං ජනෙත්වා අනෝකාසතාය තදාරම්මණං අජනෙන්තං එත්ථ නිදස්සේතබ්බං. ඒකච්චචිත්තකරණස්ස අධිප්පේතත්තා චක්ඛාදිවේකල්ලේන චක්ඛුවිඤ්ඤාණාදීනං අජනකං කම්මවිඤ්ඤාණං අවසේසපච්චයවිකලේ අනෝගධං දට්ඨබ්බං. තදපි **කාලගතිපයෝගාදීති ආදි**-සද්දේන සඞ්ගහිතන්ති. එත්ථ ච "සහකාරීකාරණවිකලං විපාකස්ස අච්චන්තං ඔකාසමේව න ලභති, ඉතරං විපාකේකදේසස්ස ලද්ධෝකාසන්ති, ඉදමේතේසං නානත්ත"න්ති වදන්ති, තං විපාකස්ස ඔකාසලාභේ සති සහායකාරණවිකලතාව නත්ථීති අධිප්පායේන වුත්තං.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය අංක 01 යටතේ)]**

**චිත්තං ඉති** චිත්තය යනු **ආරම්මණං** අරමුණ **චින්තේති** සිතයිනුයි **ඉති (තස්මා)** එහෙයින් **චිත්තං** චිත්ත නම් **විජානාති** සඤ්ඤ පඤ්ඤවන්ගේ විශිෂ්ඨ කෘත්‍යයතාවයෙන් අරමුණ දැනගනී **ඉති (අයං)** මේ වනාහි **අත්ථෝ** අර්ථයි **යස්මා** යම්හෙයකින් **චිත්තං ඉති** චිත්තං යන **ඒස සද්දෝ** මේ ශබ්ද තෙමේ **සබ්බචිත්තසාධාරණෝ** සර්වචිත්තසාධාරණය **තස්මා** එහෙයින් **එත්ථ** මෙහි **යං** යම් **ලෝකියකුසලාකුසලකිරියචිත්තං** ලෞකික කුසල අකුසල ක්‍රියා චිත්තයක් වේද **තං** ඒ චිත්තය තෙමේ **ජවනවීථිවසේන** ජවනවීථි වශයෙන් **අත්තනෝ සන්තානං** තමාගේ සන්තානය **චිනෝති** ආසේවන ප්‍රත්‍යය භාවයෙන් රැස්කරයිනුයි **ඉති (තස්මා)** එහෙයින් **චිත්තං** චිත්ත නම් **වා** පක්‍ෂාන්තරයක් දක්වම් **කම්මකිලේසේහි** කර්ම ක්ලේශයන් විසින් **විපාකං** විපාකය තෙමේ **චිතන්ති** රැස්කරන ලද්දේනුයි **චිත්තං** චිත්ත නම් **අපිච** එසේම **යථානුරූපතෝ** යථානුරූප වශයෙන් **සබ්බම්පි** සියළු චිත්තය තෙමේ **චිත්තතාය** තෙමේම විසිතුරු බැවින් **චිත්තං** චිත්ත නම් **චිත්තකරණතාය** විසිතුරු

කරණ බැවින් **චිත්තං ඉති** චිත්තය යැයි **ඒවං අපි** මෙසේ ද **එත්ථ** මෙහි **අත්ථෝ** අර්ථය **වේදිතබ්බෝ** දතයුතුයි **තත්ථ** එහි **යස්මා** යම්හෙයකින් **සරාගං චිත්තං** රාග සහිත සිත **අඤ්ඤඤ්ච** අනිකෙකි **සදෝසං** දෝෂ සහිත සිත **අඤ්ඤං** අනිකෙකි **සමෝහං** මෝහ සහිත සිත **අඤ්ඤං** අනිකෙකි **කාමාවචරං** කාමාවචර සිත **අඤ්ඤං** අනිකෙකි **රූපාවචරාදීභේදං** රූපාවචරාදී භේද ඇති සිත **අඤ්ඤං** අනිකෙකි **රූපාරම්මණං** රූපාරම්මණය ගත් සිත **අඤ්ඤං** අනිකෙකි **සද්දදිආරම්මණං** ශබ්දදී අරමුණු ගත් සිත **අඤ්ඤං** අනිකෙකි **රූපාරම්මණේසු චාපි** රූපාරම්මණයන් අතුරින් ද **නීලාරම්මණං** නිල්පැහැ ගත් සිත **අඤ්ඤං** අනිකෙකි **පීතාදිආරම්මණං** කහපැහැ ආදී අරමුණු ගත් සිත **අඤ්ඤං** අනිකෙකි **සද්දදිආරම්මණේසුපි** ශබ්දදී අරමුණු කෙරෙහි ද **ඒසේව නයෝ** මේ ක්‍රමයයි **ඒතේසු ච සබ්බේසුපි** ඒ සියළු සිත් අතුරින් ද **හීනං** හීන සිත **අඤ්ඤං** අනිකෙකි **මජ්ඣිමං** මධ්‍යම සිත **අඤ්ඤං** අනිකෙකි **පණීතං** ප්‍රණීත සිත **අඤ්ඤං** අනිකෙකි **හීනාදීසුපි** හීනාදී සිත් අතුරින් ද **ඡන්දධිපතෙය්‍යං** ඡන්දය අධිපති කොට ඇති සිත **අඤ්ඤං** අනිකෙකි **විරියාධිපතෙය්‍යං** වීර්‍ය අධිපති කොට ඇති සිත **අඤ්ඤං** අනිකෙකි **චිත්තාධිපතෙය්‍යං** චිත්තය අධිපති කොට ඇති සිත **අඤ්ඤං** අනිකෙකි **වීමංසාධිපතෙය්‍යං** වීමංසාව අධිපති කොට ඇති සිත **අඤ්ඤං** අනිකෙකි **තස්මා** එහෙයින් **අස්ස** මේ චිත්තයාගේ **ඉමේසං** මේ **සම්පයුත්තභූමි** සම්ප්‍රයුක්ත භූමිය **ආරම්මණ** අරමුණ **හීනමජ්ඣිමපණීතාදීනං** හීන මධ්‍යම ප්‍රණීතාදීන්ගේ **වසේන** වශයෙන් **චිත්තතා** විසිතුරු බව **වේදිතබ්බා** දතයුත්තාහ **එත්ථ** මෙහි **කාමඤ්ච** ඒකාන්තයෙන් **ඒකමේව චිත්තං** එකම සිතක් **ඒවං** මෙසේ **න හෝති** නොවෙයි **චිත්තානං පන** විසිතුරුවූවන්ට වනාහි **අන්තෝගධත්තා** ඇතුළත් බැවින් **ඒතේසු** ඒ චිත්තයන් අතුරින් **යංකිඤ්චි ඒකම්පි** යම්කිසි එක් සිතක් හෝ **චිත්තතාය** විසිතුරු බැවින් **චිත්තං ඉති** චිත්තය යැයි **වත්තුං** කියන්නට **වට්ටති** වටී **ඒවං** මෙසේ **තාව** පළමුව **චිත්තතාය** විසිතුරු බැවින් **චිත්තං** චිත්ත නම් ෴

**චිත්තකරණතාය** විසිතුරු කරණ බැවින් **කථං** කෙසේ **ඉති (චිත්තං නාම හෝති)** චිත්තය නම් වෙයි ද? **ලෝකස්මිං හි** ලෝකයෙහි වනාහි **චිත්තකම්මතෝ උත්තරි** චිත්‍ර කර්මයට වඩා **අඤ්ඤං චිත්තං නාම නත්ථි** අන්‍යවූ විසිතුරු දෙයක් නම් නැත **තස්මිම්පි** එහි ද **චරණං නාම චිත්තං** චරණ නම් සිතියම **අතිචිත්තමේව හෝති** අතිශ්‍රයින්ම විසිතුරු වෙයි **තං** ඒ සිතියම **කරොන්තානං චිත්තකාරානං** කරන්නා වූ චිත්‍ර ශිල්පීන්ට **එත්ථ** මෙහි **ඒවවිධානි රූපානි** මෙබඳු රූපයන් **කාතබ්බානි ඉති** කළයුතු යැයි **චිත්තසඤ්ඤා** චිත්‍ර සංඥාවෝ **උප්පජ්ජති** උපදියි **තාය චිත්තසඤ්ඤාය** ඒ චිත්‍ර සංඥාවෙන් **ලේඛාගහණ** ඉරි ගැසීම් **රඤ්ජන** සායම් කිරීම් **උජ්ජෝතනවත්තනාදි** බැබලවීම පැවැත්වීම් ආදීය **නිප්ඵාදිකා** නිපදවන්නාවූ **චිත්තකිරියා** චිත්‍ර ක්‍රියාවෝ **උප්පජ්ජන්ති** උපදිති **තතෝ** එහෙයින් **චරණසඞ්ඛාතේ චිත්තේ** චරණ සඞ්ඛ්‍යාත චිත්‍රයෙහි **අඤ්ඤතරං** එක්තරා **විචිත්තරූපං** විසිතුරු රූපයක් **නිප්ඵජ්ජති** නිපදියි **තතෝ** එහෙයින් **ඉමස්ස රූපස්ස** මේ රූපයාගේ **උපරි** ඉහළින් **ඉදං හෝතු** මෙසේ වේවා **හෙට්ඨා** යට **ඉදං (හෝතු)** මෙසේ වේවා **උභයපස්සේ** දෙපසින් **ඉදං (හෝතු) ඉති** මෙසේ වේවා යැයි **චින්තෙත්වා** සිතා **යථා** යම්සේ **චින්තිතේන කමේන** සිතනලද ක්‍රමයෙන් **සේසචිත්තරූපනිප්ඵාදනං** සෙසු චිත්‍රරූප නිපදවීම **හෝති** වෙයි **ඒවං** මෙසේ **ලෝකේ** ලෝකයෙහි **යංකිඤ්චි විචිත්තං** යම්කිසි විසිතුරු **සිප්පජාතං** ශිල්පයක් හටගනී ද **තං සබ්බං** ඒ සියල්ල **චිත්තේනේව** සිතින්ම **කරීයති** කරණු ලබයි **ඒවං** මෙසේ **ඉමාය කරණවිචිතතාය** මේ කරණ විචිත්‍රතාවයෙන් **තස්ස තස්ස චිත්තස්ස** ඒ ඒ චිත්‍ර කර්මයාගේ **නිප්ඵාදකං චිත්තම්පි** නිපදවන්නා වූ සිත ද **තථේව** එසේම **චිත්තං හෝති** විසිතුරු වෙයි **යථාචින්තිතස්ස වා** යම්සේ සිතූ ලෙසට හෝ

**අනවසේසස්ස** ඉතිරියක් නැතිව **නිප්ඵජ්ජනතෝ** නිපදවන හෙයින් **තතෝපි** ඒ චිත්‍ර කර්මයට වඩා **චිත්තමේව** සිතම **චිත්තතරං** විසිතුරුය **තේන** එහෙයින් **භගවා** භාග්‍යවතුන් වහන්සේ

"දිට්ඨං වෝ, භික්ඛවේ, චරණං නාම චිත්තන්ති? 'ඒවං, භන්තේ'. තම්පි ඛෝ, භික්ඛවේ, චරණං නාම චිත්තං චිත්තේනේව චින්තිතං. තේනපි ඛෝ, භික්ඛවේ, චරණේන චිත්තේන චිත්තංයේව චිත්තතර" **ආහ** වදාළ සේක.

**තථා** එසේම **දේවමනුස්සනිරයතිරච්ඡානභේදසු ගතීසු** දිව්‍ය මනුෂ්‍ය නිරය තිරිසන් භේදදී ගතීන්හි **කම්ම-ලිඞ්ග-සඤ්ඤ** කර්ම ලිඞ්ග සංඥ යන **යං ඒතං වෝහාරාදිභේදං** යම් ඒ ව්‍යවහාරාදී භේදයක් වේද **අජ්ඣත්තිකං චිත්තං** ආධ්‍යාත්මික චිත්තය තෙමේ **තම්පි** ඒ භේදය ද **චිත්තකතමේව** සිතින්ම කරණලද්දේමය **හි** විස්තර කෙරෙම් **කායකම්මාදිභේදං** කාය කර්මාදී භේද ඇති **දනසීලවිහිංසාසාඨෙය්‍ය ආදිනයප්පවත්තං** දනය සීලය විහිංසාව කෛරාටික බව ආදී ක්‍රමයෙන් පැවැතියා වූ **කුසලාකුසලකම්මං** කුසල අකුසල කර්මය **චිත්තනිප්ඵාදිතං** සිතින් නිපදවනලද **කම්මනානත්තං** කර්ම නානත්වයයි **කම්මනානත්තේනේව** කර්ම නානත්වයෙන්ම **තාසු තාසු ගතීසු** ඒ ඒ භවයන්හි **හත්ථ-පාද-කණ්ණ-උදර-ගීවා-මුඛාදිසණ්ඨානභින්නං** අත් පා කණ් උදරය ගීවා මුඛ ආදී සටහන්වලින් භින්න වූ **ලිඞ්ගනානත්තං හෝති** ලිඞ්ග නානත්වය වෙයි **ලිඞ්ගනානත්තතෝ** ලිඞ්ගනානත්වයෙන් **යථා** යම්සේ **සණ්ඨානවසේන** සටහන් වශයෙන් **අයං ඉත්ථී** මේ ස්ත්‍රියෙකි **අයං පුරුසෝ ඉති** මේ පුරුෂයෙකි යැයි **උප්පජ්ජමානාය සඤ්ඤය** උපන්නා වූ සංඥවෙන් **සඤ්ඤනානත්තං (හෝති)** සංඥ නානත්වය වෙයි **සඤ්ඤනානත්තතෝ** සංඥ නානත්වයෙන් **සඤ්ඤනුරූපේන** සංඥවට අනුරූප වූ **ඉත්ථී ඉති වා** ස්ත්‍රිය යැයි හෝ **පුරිසෝ ඉති වා** පුරුෂයෙක් යැයි හෝ **වෝහරන්තානං** ව්‍යවහාර කරන්නවුන්ගේ **වෝහාරනානත්තං (හෝති)** ව්‍යවහාර නානත්වය වෙයි **වෝහාරනානත්තවසේන පන** ව්‍යවහාර නානත්වය වශයෙන් වනාහි **යස්මා** යම්හෙයකින් **ඉත්ථී භවිස්සාමි** ස්ත්‍රියක් වන්නෙමි **පුරිසෝ භවිස්සාමි** පුරුෂයෙක් වන්නෙමි **ඛත්තියෝ භවිස්සාමි** ක්‍ෂත්‍රියෙක් වන්නෙමි **බ්‍රාහ්මණෝ භවිස්සාමි** බ්‍රාහ්මණයෙක් වන්නෙමි **ඉති** යැයි **ඒවං** මෙසේ **තස්ස තස්ස අත්තභාවස්ස** ඒ ඒ ආත්මභාවයාගේ **ජනකං** ඉපදවීම **කම්මං** කර්මය **කරීයති** කරණු ලැබෙයි **තස්මා** එහෙයින් **වෝහාරනානත්තතෝ** ව්‍යවහාර නානත්වයෙන් **කම්මනානත්තං (හෝති)** කර්ම නානත්වය වෙයි **තං ඒතං කම්මනානත්තං පන** ඒ මේ කර්ම නානත්වය වනාහි **යථා** යම්සේ **පත්ථිතං භවං** ප්‍රාර්ථනා කරනලද භවය **නිබ්බත්තෙන්තං (පුග්ගලං)** උපදින්නා වූ පුද්ගලයා **යස්මා** යම්හෙයකින් **ගතිවසේන** ගති වශයෙන් **නිබ්බත්තේති** උපදවයි ද **තස්මා** එහෙයින් **කම්මනානත්තතෝ** කර්ම නානත්වයෙන් **ගතිනානත්තං (හෝති)** ගති නානත්වය වෙයි **කම්මනානත්තේනේව** කර්ම නානත්වයෙන්ම ද **තේසං තේසං සත්තානං** ඒ ඒ සත්වයන්ගේ **තස්සා තස්සා ගතියා** ඒ ඒ භවයෙහි **අපාදකද්විපාදකාදිතා** අපාද ද්විපාද ආදී බවද **තස්සා තස්සා උප්පත්තියා** ඒ ඒ උත්පත්තියෙහි **උච්චනීචාදිතා** උසස් පහත් බවද **තස්මිං තස්මිං අත්තභාවේ** ඒ ඒ ආත්මභාවයෙහි **සුවණ්ණදුබ්බණ්ණාදිතා** ස්වර්ණ දුර්වර්ණ බවද **ලෝකධම්මේසු** අටලෝ දහමෙහි **ලාභාලාභාදිතා ච** ලාභ අලාභ ආදී බවද **පඤ්ඤයති** ප්‍රකට වෙයි **තස්මා** එහෙයින් **දේවමනුස්සනිරයතිරච්ඡානභේදසු ගතීසු** දිව්‍ය මනුෂ්‍ය නිරය තිරිසන් භේද ඇති භවයන්හි **ඒතං සබ්බං** ඒ සියළු **කම්ම-ලිඞ්ග-සඤ්ඤවෝහාරාදිභේදං** කර්ම ලිඞ්ග සංඥ ව්‍යවහාරාදී භේදය ද **අජ්ඣත්තිකං චිත්තං** ආධ්‍යාත්මික චිත්තය

නම් වූ **චිත්තේනේව** සිතින්ම **කතං ඉති** කරනලදැයි **වේදිතබ්බං** දතයුතුයි **ස්වායං අත්ථෝ** ඒ මේ අර්ථය **ඉමස්ස සඞ්ගීතිඅනාරූළ්හස්ස සුත්තස්ස** මේ සඞ්ගීතියට නොනැංගාවූ සූත්‍රයාගේ වශයෙන් **වේදිතබ්බෝ** දතයුතුයි.

**කම්මනානත්තපුථුත්තප්පභේදවවත්ථානවසේන** කර්ම නානත්ව පෘථුත්ව ප්‍රභේද ව්‍යවස්ථාන වශයෙන් **ලිඞ්ගනානත්තපුථුත්තප්පභේදවවත්ථානං** ලිඞ්ග නානත්ව පෘථුත්ව ප්‍රභේද ව්‍යවස්ථානය **භවති** වෙයි ("කම්මනානත්තාදිවසේන" යනු මෙහි කුසලාකුසල වශයෙන් කර්ම නානත්වය දතයුතුයි. විසදෘසභාවය වනාහි නානත්වයයි. කුසල කර්මයාගේ දනාදී වශයෙන් කාය සුචරිතාදී භාවයෙන් ද පෘථුත්වය දතයුතුයි. තවද අකුසල කර්මයාගේ මච්ඡරිය ආදියෙන් ද කාය දුශ්චරිතාදියෙන් ද පෘථුත්වය දතයුතුයි. බොහෝ උපකාර ඇති බව වනාහි පෘථුත්වයයි. ආහාර-පාන දීම් වශයෙන් දනාදීන්ගේ ද ප්‍රාණඝාතයෙන් වැළකීම් වශයෙන් කාය සුචරිතයන්ගේ ද ආවාස මච්ඡරියාදී වශයෙන් මච්ඡරියාදීන්ගේ ද ප්‍රාණඝාතාදී වශයෙන් කාය දුශ්චරිතාදීන්ගේ ද ප්‍රභේදය දතයුතුයි. නොයෙක් නොයෙක් ආකාර ඇති බවගේ ද එසේ එසේ වෙන්කරනලද බැවින් ද නිශ්චය කරනලද බැවින් ද ව්‍යවස්ථානයයි දතයුතුයි. ඒ ක්‍රමයෙන් ලිඞ්ග නානත්වාදිය ද දතයුතුයි යනු මූලටීකායි) **ලිඞ්ගනානත්ත පුථුත්තප්පභේදවවත්ථානවසේන** ලිඞ්ග නානත්ව පෘථුත්ව ප්‍රභේද ව්‍යවස්ථාන වශයෙන් **සඤ්ඤානානත්තපුථුත්තප්පභේදවවත්ථානං** සංඥා නානත්ව පෘථුත්ව ප්‍රභේද ව්‍යවස්ථානය **භවති** වෙයි **සඤ්ඤානානත්තපුථුත්තප්පභේද වවත්ථානවසේන** සංඥා නානත්ව පෘථුත්ව ප්‍රභේද ව්‍යවස්ථාන වශයෙන් **වෝහාරනානත්තපුථුත්තප්පභේද වවත්ථානං** ව්‍යවහාර නානත්ව පෘථුත්ව ප්‍රභේද ව්‍යවස්ථානය **භවති** වෙයි **වෝහාරනානත්තපුථුත්තප්පභේදවවත්ථානවසේන** ව්‍යවහාර නානත්ව පෘථුත්ව ප්‍රභේද ව්‍යවස්ථාන වශයෙන් **කම්මනානත්ත පුථුත්තප්පභේදවවත්ථානං** කර්ම නානත්ව පෘථුත්ව ප්‍රභේද ව්‍යවස්ථානය **භවති** වෙයි **කම්මනානාකරණං පටිච්ච** කර්ම නානාකරණය නිසා **සත්තානං** සත්වයන්ගේ **අපද** පා නැති **ද්විපද** ද්විපාද **චතුප්පද** සිව්පා **බහුප්පද** බොහෝ පා ඇත්තාවූ ද **රූපිනෝ** රූපීවූ ද **අරූපිනෝ** අරූපීවූ ද **සඤ්ඤිනෝ** සංඥා ඇත්තාවූ ද **අසඤ්ඤිනෝ** සංඥා නැත්තාවූ ද **නේවසඤ්ඤිනාසඤ්ඤිනෝ** සංඥා ඇත්තේත් නැති නැත්තේත් නැති **ගතියා** ගතියෙහි **නානාකරණං** නානාකරණය **පඤ්ඤායති** ප්‍රකට වේ **කම්මනානාකරණං පටිච්ච** කර්ම නානාකරණය නිසා **සත්තානං** සත්වයන්ගේ **උච්චනීචතා** උස් පහත් බව **හීනපණීතතා** හීන ප්‍රණීත බව **සුගතදුග්ගතතා** සුගති දුගති බව යන **උප්පත්තියා** උත්පත්තියගේ **නානාකරණං** නානාකරණය **පඤ්ඤායති** ප්‍රකට වේ **කම්මනානාකරණං පටිච්ච** කර්ම නානාකරණය නිසා **සත්තානං** සත්වයන්ගේ **සුවණ්ණදුබ්බණ්ණතා** ස්වර්ණ දුර්වර්ණ බව **සුජාතදුජ්ජාතතා** සුජාත දුර්ජාත බව **සුසණ්ඨිතදුස්සණ්ඨිතතා** මනාසේ පිහිටීම නපුරු ලෙස පිහිටීම යන **අත්තභාවේ** ආත්මභාවයෙහි **නානාකරණං** නානාකරණය **පඤ්ඤායති** ප්‍රකට වේ **කම්මනානාකරණං පටිච්ච** කර්ම නානාකරණය නිසා **සත්තානං** සත්වයන්ගේ **ලාභාලාභේ** ලාභ අලාභ **යසායසේ** යස අයස **නින්දපසංසායං** නින්ද ප්‍රසංශා **සුඛදුක්ඛේ** සැප දුක් යන **ලෝකධම්මේ** අටලෝ දහමෙහි **නානාකරණං** නානාකරණය **පඤ්ඤායතීති** ප්‍රකට වේ යැයි **ඒතං හි** මෙය වනාහි **වුත්තං** දේශනා කරනලදි.

**කම්මතෝ ලිඞ්ගතෝ චේව** කර්ම වශයෙන් මෙන්ම ලිඞ්ග වශයෙන් ද **ලිඞ්ගසඤ්ඤා** ලිඞ්ග යන සංඥාව **පවත්තරේ** පවති **සඤ්ඤාතෝ** සංඥාවෙන් **අයං**

**ඉත්ථී** මේ ස්ත්‍රිය **අයං පුරිසෝ ඉති වා** මේ පුරුෂයා යන හෝ **භේදං ගච්ඡන්ති** බෙදීමට යති.

**කම්මුනා** කර්මයෙන් **ලෝකෝ** ලෝකය **වත්තතේ** පවති **කම්මුනා** කර්මයෙන් **පජා** ප්‍රජාව **වත්තතේ** පවති **යායතෝ** ගමන් ගන්නා වූ **රථස්ස** රථයට **අණී ඉව** ඇණය මෙන් **සත්තා** සත්වයෝ **කම්මනිබන්ධනා** කර්මයෙන් බැඳුනාහුය.

**කම්මේන** කර්මයෙන් **කිත්තිං** කීර්තිය ද **පසංසං** ප්‍රසංශාව ද **ලබ්භතේ** ලබයි **කම්මේන** කර්මයෙන් **ජානිඤ්ච** හානිය ද **වධඤ්ච** වධයද **බන්ධං ච** බන්ධනය ද (**හෝති** වෙයි) **තං කම්මනානාකරණං** ඒ කර්ම නානත්වය **විදිත්වා** දැන **කස්මා** කවරහෙයින් **ලෝකේ** ලෝකයෙහි **කම්මං** කර්මය **නත්ථීති** නැත යැයි **වදේ?** කියයි ද?

**මාණවා** මාණවකය **සත්තා** සත්වයෝ **කම්මස්සකතා** කර්මය ස්වකීය කොට ඇත්තාහ **කම්මදායාද** කර්මය දායාද කොට ඇත්තාහ **කම්මයෝනි** කර්මය උත්පත්ති ස්ථාන කොට ඇත්තාහ **කම්මබන්ධු** කර්මය ඥාතියා කොට ඇත්තාහ **කම්මපටිසරණා** කර්මය පිළිසරණ කොට ඇත්තාහ **යදි** ඉදින් **ඉදං කම්මං** මේ කර්මය **සත්තේ** සත්වයන් **හීනප්පණීතතාය** හීන ප්‍රණීත වශයෙන් **විභජතීති** බෙදයි යැයි **අපරම්පි** අන්‍ය ක්‍රමයක් ද **වුත්තං** දේශනා කරනලදි.

**ඒවං** මෙසේ **කරණචිත්තතායපි** කරණ විචිත්‍රතාවයෙන් ද **චිත්තස්ස** චිත්තයාගේ **චිත්තතා** විසිතුරු බව **වේදිතබ්බා** දතයුතුයි **සබ්බානි ඒතානි විචිත්‍රානි හි** ඒ සියළු විචිත්‍රතාවයෝ වනාහි **චිත්තේනේව** සිතින්ම **කතානි** කරනලදහ **අලද්ධෝකාසස්ස තස්ස චිත්තස්ස පන** නොලබනලද අවකාශ ඇති ඒ සිතට වනාහි **යං වා පන අවසේසපච්චයවිකලං** යම් හෝ වනාහි අවශේෂ ප්‍රත්‍යය විකලයක් වේද **ඒකච්ච චිත්තකරණාභාවතෝ** ඇතැම් විසිතුරු නොකිරීම් වශයෙන් **යං ඒතං** ඒ විසිතුරු නොකිරීම ද **චිත්තේන** සිතින්ම **කතං** කරනලදි **අජ්ඣත්තිකං චිත්තං** ආධ්‍යාත්මික සිත **වුත්තං** කියනලදි **තතෝපි** එබැවින් ද **චිත්තමේව** සිතම **චිත්තතරං** විසිතුරුය **තේන** එහෙයින් **භගවා** භාග්‍යවතුන් වහන්සේ "නාහං, භික්ඛවේ, අඤ්ඤං ඒකනිකායම්පි සමනුපස්සාමි ඒවං චිත්තං යථයිදං, භික්ඛවේ, තිරච්ඡානගතා පාණා... තේහිපි ඛෝ, භික්ඛවේ, තිරච්ඡානගතේහි පාණේහි චිත්තංයේව චිත්තතර" **ඉති ආහ** යනුවෙන් වදාළ සේක. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

ආරම්මණං චින්තේතීති චිත්තං, විජානාතීති අත්ථෝ. යං පනෙත්ථ ජවනං හෝති, තං ජවනවීථිවසේන අත්තනෝ සන්තානං චිනෝතීතිපි චිත්තං, යං විපාකං හෝති, තං කම්මකිලේසේහි චිතන්තිපි චිත්තං, සබ්බම්පි යථානුරූපං චිත්තතාය චිත්තං, චිත්තකරණතාය චිත්තං, යං වට්ටස්ස පච්චයෝ හෝති, තං සංසාරදුක්ඛං චිනෝතීතිපි චිත්තං.
**[පටිසම්භිදාමග්ග අට්ඨකථා (ඡට්ඨසඞ්ගායනා අභිඤ්ඤෙය්‍යනිද්දේස වණ්ණනා අංක 14 යටතේ); පටිසම්භිදාමග්ග අටුවා 01/70 පිට (හේ.වි.මු)]**

**ආරම්මණං** අරමුණ **චින්තේතීති** සිතානුයි **චිත්තං** සිත නම් **විජානාතීති** දැනගනී යන **අත්ථෝ** අර්ථයයි **එත්ථ පන** මෙහි වනාහි **යං (චිත්තං)** යම් චිත්තයක් **ජවනං හෝති** ජවන වෙයි ද **තං (චිත්තං)** ඒ චිත්තය **ජවනවීථිවසේන** ජවන වීථි වශයෙන් **අත්තනෝ සන්තානං** තමාගේ සන්තානය **චිනෝතිපි** රැස්කෙරේ ද **ඉති**

**(තස්මා)** එහෙයින් **චිත්තං** චිත්ත නම් **යං (චිත්තං)** යම් චිත්තයක් **විපාකං හෝති** විපාක වෙයි ද **තං (චිත්තං)** ඒ චිත්තය **කම්මකිලේසේහි** කර්ම ක්ලේශයන් විසින් **චිතම්පි** රැස්කරණලද්දේ වේද **ඉති (තස්මා)** එහෙයින් **චිත්තං** චිත්ත නම් **සබ්බම්පි** සියළු සිත් **යථානුරූපං** සුදුසු පරිදි **චිත්තතාය** විසිතුරු බැවින් **චිත්තං** චිත්ත නම් **චිත්තකරණතාය** විසිතුරු කෘත්‍යය ඇති බැවින් **චිත්තං** චිත්ත නම් **යං (චිත්තං)** යම් සිතක් **වට්ටස්ස** සංසාර වෘර්තයට **පච්චයෝ හෝති** ප්‍රත්‍යය වෙයි ද **තං (චිත්තං)** ඒ චිත්තය **සංසාරදුක්ඛං** සංසාර දුක්ඛය **චිනෝතිපි** රැස්කෙරේද **ඉති (තස්මා)** එහෙයින් **චිත්තං** චිත්ත නම්.... **[පටිසම්භිදමග්ග අටුවා පරිවර්තනයි]**

චිත්තං චේතසිකං රූපං - නිබ්බානන්ති නිරුත්තරෝ
චතුධා දේසයී ධම්මේ - චතුසච්චප්පකාසනෝ

තත්ථ **චිත්ත**න්ති විසයවිජානනං චිත්තං, තස්ස පන කෝ වචනත්ථෝ? වුච්චතේ සබ්බසඞ්ගාහකවසේන පන චින්තේතීති චිත්තං, අත්තසන්තානං වා චිනෝතීතිපි චිත්තං. **[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 08 යටතේ)]**

**තත්ථ** තේසු චතුබ්බිධේසු පරමත්ථේසු, ජාතිනිද්ධාරණං. **චිත්තන්ති** චිත්තං නාම. විජානාතීති විජානනං, විසයානං විජානනං **විසයවිජානනං**. චිත්තසරූපපරිදීපනමිදං වචනං. **තස්ස පන** චිත්තස්ස **කෝ වචනත්ථෝ** කෝ සද්දත්ථෝ. **වුච්චතේ** ආචරියේන. **සබ්බසඞ්ගාහකවසේන** සබ්බේසං චිත්තානං සඞ්ගාහකනයවසේන. ආරම්මණං චින්තේති ජානාතීති චිත්තං, තද සබ්බං චිත්තං අධිප්පේතං. ජවනවීථිවසේන අත්තසන්තානං චිනෝතීති චිත්තං, තද කුසලාකුසලමහාකිරියාචිත්තං අධිප්පේතං. අඤ්ඤෙසං ජවනානං අග්ගහණං කාමාවචරජවනානි ඒව යේභුය්‍යවසේන සත්තක්ඛත්තුං ජවන්තීති ඤාපනත්ථං. **[අභිධම්මාවතාර පුරාණටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 08 යටතේ)]**

**නිරුත්තතෝ** තම හට උත්තරීතරයෙක් නැති හෙයින් නිරුත්තර වූ (නොහොත් චතුර්වෛසාරද්‍ය විසාරද භාවය ඇති හෙයින් තමන් වහන්සේට සතුරු වූ උත්තර වචනයක් කියන්නට සමර්ථයෙක් නැති හෙයින්) නිරුත්තර වූ **චතුසච්චප්පකාසනෝ** චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකාශකරන්නා වූ සර්වඥයන් වහන්සේ **චිත්තං** චිත්තය (හෙවත් විඤ්ඤාණස්කන්ධය) **චේතසිකං** චෛතසිකය (වේදනාදී ස්කන්ධත්‍රය) **රූපං** (සතරමහා භූතරූපය, සූවිසි උපාදයරූපය යන මොහුන්ගේ වශයෙන් අටවිසි වැදෑරුම් වූ) රූපස්කන්ධය **නිබ්බානං ඉති** අමෘත අසඞ්ඛත වස්තුධර්මය යයි මෙසේ **චතුධා** සතරාකාරයකින් **ධම්මේ** ධර්මයන් **දේසයි** දේශනා කළ සේක.

**තත්‍ථ** ඒ චිත්තාදි සිව් වැදෑරුම් ධර්මයන් අතුරෙන් **චිත්තං ඉති** චිත්තය යනු **විසයවිජානනං** යම් විෂය සඞ්ඛ්‍යාත අරමුණ විශේෂයෙන් දැනගැනීමන් වේද (**තං** ඒ දැනීම) **චිත්තං** ඒ චිත්ත නම් වෙයි. **තස්ස පන** ඒ චිත්ත ශබ්දයා වනාහි **කෝ වචනත්ථෝ** වචනාර්ථ තෙමේ කවරේද යත්? **සබ්බසඞ්ගාහකවසේන** ඒ සියළු චිත්තයන්ම සඞ්ග්‍රහ කිරීම් වශයෙන් **වුච්චති** වචනාර්ථ කියනු ලැබේ. **වා** නොහොත් **අත්තසන්තානං** ස්වසන්තානං (හෙවත් ජවනචිත්ත පරම්පරාව) **චිනෝති** රැස්කෙරෙයි **ඉතිපි** එසේහෙයිනිදු **(චිත්තං)** චිත්ත නම් වෙයි.... **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 16-19 පිටු]**

ඒවං තාව රතනත්තයප්පණාමාදිකං දස්සෙත්වා ඉදානි යථාරද්ධප්පකරණස්ස අත්ථසරීරභූතමභිධම්මං සඞ්ඛෙපතෝ උද්දිසන්තෝ ආහ **"චිත්තං චේතසික"**න්තිආදි. තත්ථ චිත්තසද්දස්ස තාව වචනත්ථං සයමේව අනන්තරං විපඤ්චේති. **"චේතසික"**න්තිආදීසු පන අවිප්පයෝගීභාවේන චේතසි චිත්තේ නියුත්තං, තත්ථ වා භවං තදායත්තවුත්තිතායාති **චේතසිකං,** වේදනාදික්ඛන්ධත්තයස්සේතං අධිවචනං. රුප්පති, රූපියතීති වා **රූපං,** සීතුණ්හාදීහි විකාරමාපජ්ජති, ආපාදීයතීති අත්ථෝ, චතුන්නං මහාභූතානං, චතුවීසතිඋපාදාරූපානඤ්ච වසේන අට්ඨවීසතිවිධස්ස රූපක්ඛන්ධස්සේතං අධිවචනං. භවාභවං විනනතෝ සංසිබ්බනතෝ වානං වුච්චති තණ්හා, න විජ්ජති සා එත්ථ, තතෝ වා නික්ඛන්තං ඒතන්ති **නිබ්බානං,** අමතං අසඞ්ඛතං වත්ථු. **ඉති**-සද්දෝ නිදස්සනේ. නත්ථි ඒතස්ස උත්තරිතරෝති **නිරුත්තරෝ**. අථ වා චතුවේසාරජ්ජවිහාරත්තා නත්ථි ඒතස්ස උත්තරං පච්චනීකවචනන්ති **නිරුත්තරෝ**. ඤාණප්පහානඅන්තරායනියානිකේසු හි සදේවකේ ලෝකේ න කෝචි සත්තෝ සහධම්මිකං උත්තරං වචනං කථේතුං සමත්ථෝ අත්ථීති. තත්‍ර භගවා උත්‍රාසාභාවතෝ විසාරදෝව හෝති. වුත්තඤ්හේතං භගවතා;

" 'සම්මාසම්බුද්ධස්ස තේ පටිජානතෝ ඉමේ ධම්මා අනභිසම්බුද්ධාති තත්‍ර වත මං සමණෝ වා බ්‍රාහ්මණෝ වා දේවෝ වා මාරෝ වා බ්‍රහ්මා වා කෝචි වා ලෝකස්මිං සහධම්මේන පටිචෝදෙස්සතීති නිමිත්තමේතං, සාරිපුත්ත, න සමනුපස්සාමි, ඒතමහං, සාරිපුත්ත, නිමිත්තං අසමනුපස්සන්තෝ ඛේමප්පත්තෝ අභයප්පත්තෝ වේසාරජ්ජප්පත්තෝ විහරාමි.

"ඛීණාසවස්ස තේ පටිජානතෝ ඉමේ ආසවා අපරික්ඛීණාති තත්‍ර වත මං…පෙ…. විහරාමි.

"යේ ච ඛෝ පන තේ අන්තරායිකා ධම්මා වුත්තා, තේ පටිසේවතෝ නාලං අන්තරායායාති තත්‍ර වත මං…පෙ…. විහරාමි.

"යස්ස ඛෝ පන තේ අත්ථාය ධම්මෝ දේසිතෝ, සෝ න නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායාති තත්‍ර වත මං…පෙ…. විහරාමී"ති (ම. නි. 1.150).

චත්තාරි අරියසච්චානි පකාසේතීති **චතුසච්චප්පකාසනෝ**. දුක්ඛ-සමුදය-නිරෝධ-මග්ගවසේන හි චත්තාරි අරියසච්චානි. යථාහ, "චත්තාරිමානි, භික්ඛවේ, අරියසච්චානි. කතමානි චත්තාරි? දුක්ඛං අරියසච්චං, දුක්ඛසමුදයං අරියසච්චං, දුක්ඛනිරෝධං අරියසච්චං, දුක්ඛනිරෝධගාමිනී පටිපදා අරියසච්ච"න්ති (සං. නි. 5.1083). තත්ථ තේභූමකා ධම්මා අනේකූපද්දවාධිට්ඨානතාය ධුවසුභාදිවිරහේන, කුච්ඡිතතුච්ඡට්ඨේන **ච දුක්ඛං** නාම. කම්මාදිවිසේසපච්චයසමවායේ දුක්ඛුප්පත්ති කාරණභාවේන තණ්හා **සමුදයෝ** නාම "සමෙච්ච උදේති දුක්ඛං ඉමස්මා"ති කත්වා. දුක්ඛස්ස අනුප්පාදනිරෝධපච්චයත්තා **දුක්ඛනිරෝධෝ** නිබ්බානං. තං පන දුක්ඛනිරෝධං ආලම්බණකරණවසේන ගමනතෝ පාපුණනතෝ, තදධිගමාය පටිපදාභාවතෝ චාති **"දුක්ඛනිරෝධගාමිනී පටිපදා"**ති ලෝකුත්තරමග්ගෝ වුච්චති. සච්චට්ඨෝ පන තේසං තච්ඡාවිපරීතභූතභාවතෝ වේදිතබ්බෝ. වුත්තඤ්හි " 'ඉදං දුක්ඛන්ති, භික්ඛවේ, තථමේතං අවිතථමේතං අනඤ්ඤථමේත"න්ති (සං. නි. 5.1090) විත්ථාරෝ. එත්ථ පන චතුන්නං අරියඵලානං, අරියමග්ගසම්පයුත්තානඤ්ච සච්චවිනිස්සටභාවේපි ඉධ මග්ගනිබ්බානප්පකාසනතා වචනේනේව

තප්පකාසනත්ථම්පි වුත්තං හෝති, අනාසවභාවේන ඒකලක්ඛණත්තා තං තං හේතුකවිසයභාවතෝ චාති දට්ඨබ්බං.

එත්ථ ච "නිරුත්තරෝ චතුසච්චප්පකාසනෝ"ති ඉමේහි භගවතෝ චිත්තාදිචතුබ්බිධධම්මදේසනානුකූලගුණවිසේසං දස්සේති අතථාවිධස්ස තං දේසනාසාමත්ථියායෝගතෝ. අථ වා "නිරුත්තරෝ"ති වචනේන චතුබ්බිධධම්මස්ස අනඤ්ඤදත්ථත්තං දීපේති. "චතුසච්චප්පකාසනෝ"ති පන ඉමිනා යේ තේ ධම්මා භගවතා විනෙය්‍යපරිපාචනත්ථං දේසිතා, න තේ ඉධ අධිප්පේතා. යේ පන පරිපාචිතේහි තේහි අභිසමේතබ්බවසේන දුක්ඛාදයෝ චතුබ්බිධා වුත්තා, තේයේව උද්දිසිතබ්බත්ථේන අධිප්පේතාති දස්සේති.

ඒවං සඞ්ඛේපතෝ චත්තාරෝ ධම්මේ උද්දිසිත්වා ඉදනි උද්දේසෝ නාම නිද්දේසත්ථාය හෝතීති යථාඋද්දිට්ඨධම්මේ නිද්දිසිතුං **"තත්ථ චිත්ත"**න්තිආදි ආරද්ධං. තත්ථ **තත්ථා**ති තේසු චිත්තාදීසු ධම්මේසු. **විසයවිජානනං චිත්ත**න්ති යං විසයසඞ්ඛාතස්ස ආරම්මණස්ස විජානනං උපලද්ධි, තං චිත්තන්ති අත්ථෝ. ඉමිනා පන චිත්තස්ස ආරම්මණපටිබද්ධවුත්තිතං, අනිච්චතං, අකාරකතඤ්ච දීපේති. "විසයවිජානන"න්ති හි ආරම්මණේන චිත්තං උපලක්ඛෙන්තෝ තස්ස තදයත්තවුත්තිතං, තං දීපනේන ච තදභිමුඛකාලේයේව උප්පත්තිදීපනතෝ අනිච්චභාවඤ්ච දීපේති. භාවනිද්දේසේන පන විජානනමත්තදීපනතෝ අකාරකභාවං. යථාපච්චයඤ්හි පවත්තිමත්තමේවේතං, යදිදං සභාවධම්මෝ නාමාති. ඒවඤ්ච කත්වා සබ්බේසම්පි චිත්තචේතසිකධම්මානං භාවසාධනමේව නිප්පරියායතෝ ලබ්භති. යං පන "චින්තේතීති චිත්තං, තේන චින්තං විචරතීති විචාරෝ"ති ආදිනා කත්තුකරණවසේන නිබ්බචනං වුච්චති, තං පරියායකථනන්ති වේදිතබ්බං. සකසකකිච්චේසු හි ධම්මානං අත්තප්පධානතාසමාරෝපනේන කත්තුභාවෝ, තදනුකූලභාවේන තං සම්පයුත්තධම්මසමූහේ කත්තුභාවසමාරෝපනේන කරණත්තඤ්ච පරියායතෝව ලබ්භතීති. තථා නිදස්සනං පන ධම්මසභාවතෝ අඤ්ඤස්ස කත්තාදිනෝ අභාවපරිදීපනත්ථන්ති වේදිතබ්බං.

වචනත්ථවිජානනේන විදිතචිත්තසාමඤ්ඤස්ස උත්තරි චිත්තවිභාගෝ වුච්චමානෝ සෝභෙය්‍යාති වචනත්ථවිජානනමේව තාව ආදිම්හි යුත්තතරන්ති තං තාව කථේතුකම්‍යතාය පුච්ඡති **"තස්ස පන කෝ වචනත්ථෝ"**ති. පඤ්චවිධා හි පුච්ඡා; (දී. නි. අට්ඨ. 1.7; ම. නි. අට්ඨ. 1.449; සං. නි. අට්ඨ. 2.2.1; අ. නි. අට්ඨ. 1.1.170) අදිට්ඨජෝතනාපුච්ඡා දිට්ඨසංසන්දනාපුච්ඡා විමතිච්ඡේදනාපුච්ඡා අනුමතිපුච්ඡා කථේතුකම්‍යතාපුච්ඡාති. තත්ථ යං අඤ්ඤාතං අදිට්ඨං, තස්ස ඤාණාය දස්සනාය පඤ්හාකරණං **අදිට්ඨජෝතනාපුච්ඡා** නාම. යං පන ඤාතං දිට්ඨං, තස්ස අඤ්ඤේහි පණ්ඩිතේහි සංසන්දනත්ථාය පඤ්හාකරණං **දිට්ඨසංසන්දනාපුච්ඡා** නාම. පකතියා පන සංසයපක්ඛන්දනස්ස අත්තනෝ සංසයසමුග්ඝාටනත්ථං පඤ්හාකරණං **විමතිච්ඡේදනාපුච්ඡා** නාම. "තං කිං මඤ්ඤථ, භික්ඛවේ, රූපං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං, භන්තේ. යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වා"ති ආදිනා (සං. නි. 3.79; මහාව. 21) අනුමතිග්ගහණත්ථං පඤ්හාකරණං **අනුමතිපුච්ඡා** නාම. "චත්තාරෝමේ, භික්ඛවේ, සතිපට්ඨානා. කතමේ චත්තාරෝ"ති ආදිනා (දී. නි. 2.373; සං. නි. 5.402-404) පන තං තං ධම්මානං දේසනාධිප්පායේන පඤ්හාකරණං **කථේතුකම්‍යතාපුච්ඡා** නාම.

තාසු පුරිමා තිස්සෝ ආචරියානං න සම්භවන්ති. න හි තේ ගන්ථකරණත්ථාය ආරභිත්වා ඉදනි අදිට්ඨං ජෝතෙන්ති, දිට්ඨං සංසන්දෙන්ති, සංසයං වා පක්ඛන්දන්ති තබ්බිසෝධනපුබ්බකමේව ගන්ථකරණේ අභිනිවේසනතෝ. ඉතරා පන ද්වේ සම්භවන්ති. තාසු අයං කථේතුකම්‍යතාපුච්ඡා. අපිච චෝදනං සමුට්ඨාපෙන්තා ආචරියා අඤ්ඤදං චෝදකං පරිකප්පෙත්වා තස්ස වචනවසේන සමුට්ඨාපෙන්තීති තං වසේනෙත්ථ අදිට්ඨජෝතනාවිමතිච්ඡේදනාපුච්ඡාපි ලබ්භන්තේවාති දට්ඨබ්බං. **තස්සාති** තස්ස චිත්ත-සද්දස්ස. චිත්තේ හි අධිගතේ තස්ස වාචකෝ සද්දෝපි සහචරියතෝ අධිගතෝව හෝතීති තස්ස ඉධ ත-සද්දේන පරිග්ගහෝ. කේචි පන "තස්ස චිත්තස්සා"ති අත්ථං වදන්ති, තං "තස්ස කෝ වචනත්ථෝ"ති ඉමිනා න සමේති. න හි චිත්තස්ස "කෝ වචනත්ථෝ"ති පුච්ඡා සම්භවතීති.

ඉදනි යථාපුච්ඡිතමත්ථං විස්සජ්ජේතුං **"වුච්චතේ"**ති තාව පටිඤ්ඤදං කත්වා **"සබ්බසඞ්ගාහකවසේනා"**ති ආදිනා විස්සජ්ජනමාරද්ධං. තත්ථ **සබ්බසඞ්ගාහකවසේනාති** හෙට්ඨීමන්තතෝ චක්ඛුවිඤ්ඤණාදයෝ උපාදය සබ්බේසං ආරම්මණවිජානනසභාවත්තා තේසං සබ්බේසමේව සඞ්ගාහකවසේන, න පන වක්ඛමානනිබ්බචනේසු විය යථාලාභවසේනාති අත්ථෝ. **චින්තේතීති** විජානාති. චින්තෙන්ති තේන ගෝචරන්ති වා **චිත්තං**. සම්පයුත්තධම්මානං කත්තුතාසමාරෝපනේන හිස්ස කරණභාවෝ ලබ්භති. සබ්බසඞ්ගාහකවසේන තාව අත්ථං දස්සෙත්වා ඉදනි යථාලාභවසේනපි දස්සේතුං **"අත්තසන්තානං වා චිනෝතීතිපී"**ති ආදි වුත්තං. සබ්බචිත්තසාධාරණත්තා හි චිත්ත-සද්දස්ස යත්ථ යත්ථ යථා යථා අත්ථෝ ලබ්භති, තත්ථ තත්ථ තථා තථා ගහේතබ්බෝ. යස්ස පන චිත්තස්ස යථාවුත්තඅත්ථවිසේසෝ න ලබ්භති, තං රුළ්හීවසේන චිත්තන්ති වේදිතබ්බං. යථා කිලඤ්ජාදීහි කතම්පි තාලපණ්ණේහි කතසරික්ඛකතාය රුළ්හීසද්දේන "තාලවණ්ට"න්ත්වේව වුච්චතීති. **අත්තසන්තාන**න්ති සකසන්තානං, ජවනසන්තානන්ති අත්ථෝ. අත්ත-සද්දස්ස හි පරපච්චනීකවචනත්තා අත්තනෝ සන්තානෝති සදිසවසේන උප්පජ්ජමානෝ ජවනසන්තානෝ වුච්චති. තං **චිනෝති** රාසිං කරෝතීති අයමත්ථෝ සාසේවනකානං ජවනචිත්තානං වසේන දට්ඨබ්බෝ. තානි හි පුරෙජාතානි පච්ඡාජාතානං ආසේවනපච්චයා හුත්වා අත්තනෝ ජවනසන්තානස්ස පගුණබලවභාවකරණේන තං චිනන්ති නාම. **වා**-සද්දෝ අසබ්බසඞ්ගාහකත්ථ විකප්පනේ. **පි**-සද්දෝ කිරියාසම්පිණ්ඩනත්ථේ. අථ වා "සබ්බසඞ්ගාහකවසේනා"ති ඉමස්ස ඉධාපි සම්බන්ධෝ හෝතීති ඉදම්පි සබ්බසඞ්ගාහකවසේන වුත්තන්ති ගය්හමානේ අත්තසන්තානන්ති විඤ්ඤණවචනස්ස අත්ත-සද්දස්ස සකත්ථවුත්තිත්තායේව තං වසේන චිත්තසන්තානන්ති අත්ථෝ. අනන්තරාදිපච්චය වසේන හි චිත්තසන්තානස්ස අබ්බොච්ඡින්නප්පවත්තිකරණතෝ සබ්බමේව චිත්තජාතං චිත්තසන්තානං චිනෝති නාම. ඉමස්මිං පනත්ථේ **වා**-සද්දෝ කිරියාවිකප්පනත්ථෝ. **පි**-සද්දෝ "චිත්ත"න්ති ඉමස්ස ආකඩ්ඪනත්ථෝති දට්ඨබ්බං. පුරිමපක්ඛේ පන චිත්තන්ති අධිකාරතෝව ගහේතබ්බං.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 08 යටතේ)]**

ඒ සිව් වැදෑරුම් ධර්මයන් අතුරෙන් පළමුකොට චිත්ත ශබ්දයාගේ වචනාර්ථය තමන් වහන්සේම ප්‍රණාමයට අනතුරුව විස්තර කෙරේයි. "චේතසිකං" යනාදී පදයෙහි වනාහි "අවිප්පයෝගිභාවේන චේතසි (චිත්තේ) නියුත්තං— තත්‍ථ වා භවං— තදයත්තවුත්තිතායාති චේතසිකං" යනු නිර්වචන හෙයින් වෙන් නොවීම් වශයෙන් ඒ සිත අයත් කොට පවත්නා හෙයින් ඒ චිත්තයෙහි හටගත්තේනුයි හෝ චේතසික නම් වෙයි. නියුත්තතද්ධිත වශයෙන් හෝ භාවතද්ධිත වශයෙන් හෝ අර්ථ දතයුතුයි.

"චේතසිකය" යනු වේදනාදි ස්කන්ධත්‍රයට නමෙකි. "රුප්පති රූපයතීති වා රූපං" යනු නිර්වචන හෙයින් ශීතෝෂ්ණාදීන් කරණකොටගෙන විකාරයට පැමිණේයි; විකාරයට පමුණුවනු ලැබෙයි යන අර්ථයි. "රූප්ප; රූප්පනේ" යන ධාතුයි. සතරමහා භූතයන්ගේ ද සූවිසි උපාදරූපයන්ගේ ද වශයෙන් අටවිසි වැදෑරුම් රූපස්කන්ධයට මේ නමෙකි.

"භවා භවං විනනතෝ සංසිබ්බනතෝ වානං වුච්චති තණ්හා. න විජ්ජති සා එත්ථ තතෝ වා නික්ඛන්තං ඒතන්ති නිබ්බානං" යනු නිර්වචන හෙයින් කුදු-මහත් භවය හෙවත් මනුෂ්‍යගතිය හා දේවගතිය ද, දේවගතිය හා මනුෂ්‍යගතිය ද, නිරයගතිය හා සුගතිය ද, සුගතිය හා දුගතිය ද එක් කොට හිවන (වෙළන) අර්ථයෙන් තෘෂ්ණාව වාන යයි කියනුලැබේ. ඒ තෘෂ්ණා තොමෝ ඒ අසඞ්ඛත වස්තු ධර්මයෙහි විද්‍යමාන නොවේ ද නොහොත් ඒ වාන සඞ්ඛ්‍යාත තෘෂ්ණාව කෙරෙන් ඒ නිර්වාණය නික්මගියේ වේද එහෙයින් ඒ අසඞ්ඛත වස්තු ධර්මය නිර්වාණය යයි කියනුලැබේ.

"නත්ථි ඒතස්ස උත්තරෝති නිරුත්තරෝ" යනුද "චතුවේසාරජ්ජවිසාරදත්තා නත්ථි ඒතස්ස උත්තරං පච්චනීකවචනන්ති වා නිරුත්තරෝ" යනුද නිර්වචනයෝයි. ඒ එසේමැයි ශාස්තෘන්වහන්සේගේ ඥාණය පහාණය අන්තරායධර්මය නෛර්‍යාණික ධර්මය යන මොහුන් කෙරෙහි කරුණු සහිත උත්තර වචනයක් කියන්නට සමර්ථවූ කිසිවෙක් දෙවියන් සහිත ලෝකයෙහි නැත්තේය. එහි භාග්‍යවතුන් වහන්සේ තැතිගැනීමක් නැති හෙයින් විසාරදම වෙයි. මේ වදරණ ලද්දේමැයි භාග්‍යවතුන් වහන්සේ විසින්:—

"සම්මාසම්බුද්ධස්ස තේ පටිජානතෝ ඉමේ ධම්මා අනභිසම්බුද්ධාති තත්‍ර වත මං සමණෝ වා බ්‍රාහ්මණෝ වා දේවෝ වා මාරෝ වා බ්‍රහ්මා වා කෝචි ලෝකස්මිං සහධම්මේන පටිචෝදෙස්සතීති නිමිත්තමේතං සාරිපුත්ත න සමනුපස්සාමි එතමහං සාරිපුත්ත නිමිත්තං අසමනුපස්සන්තෝ ඛේමප්පත්තෝ අභයප්පත්තෝ වේසාරජ්ජප්පත්තෝ විහරාමි. ඛීණාසවස්ස තේ පටිජානතෝ ඉමේ ආසවා අපරික්ඛීණ්ණාති තත්‍ර වත මං -පෙ- විහරාමි. යේ ඛෝ පන තේ අන්තරායිකා ධම්මා වුත්තා. තේ පටිසේවතෝ නාලං අන්තරායායාති. තත්‍ර වත මං -පෙ- විහරාමි. යස්ස ඛෝ පන තේ අත්ථාය ධම්මෝ දේසිතෝ සෝ නනීයාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායාති තත්‍ර වත මං -පෙ- විහරාමි" යනුයි.

"චත්තාරි අරියසච්චානි පකාසේතීති චතුසච්චප්පකාසනෝ" යනු නිර්වචනයි. ඒ එසේමැයි. දුක්ඛ-සමුදය-නිරෝධ-මාර්ග වශයෙන් ආර්‍ය්‍ය සත්‍යයෝ සතරදෙනෙක් වෙති. එහෙයින් වදළහ බුදුරජාණන් වහන්සේ විසින්:—

"චත්තාරිමානි භික්ඛවේ අරියසච්චානි; කතමානි චත්තාරි, දුක්ඛං භික්ඛවේ අරියසච්චං දුක්ඛසමුදයෝ අරියසච්චං දුක්ඛනිරෝධෝ අරියසච්චං දුක්ඛනිරෝධගාමිනීපටිපද අරියසච්චං" යනුයි.

එහි ත්‍රෛභූමක ධර්මයෝ නොයෙක් උපද්‍රවයන්ට ආධාරස්ථාන වන හෙයින් ද ස්ථිරය සුභය යනාදියෙන් තොරවූ හෙයින් ද කුත්සිතාර්ථයෙන් හා තුච්ඡාර්ථයෙන් ද දුක්ඛ නම් වෙයි. කර්මාදි විශේෂ ප්‍රත්‍යයන්ගේ එක්වීම ඇති කල්හි දුඃඛොත්පත්තියට කාරණාවන බැවින් තෘෂ්ණා තොමෝ සමුදය නම් වෙයි. කුමක්හෙයින යත්? "සමෙච්ච

උදේති දුක්ඛං ඉමස්මා" යනු නිර්වචන හෙයිනි. දුක්ඛයාගේ අනුත්පාද නිරෝධයට ප්‍රත්‍යය වන බැවින් හෙවත් උපකාරවන වැවින් නිර්වාණය දුක්ඛනිරෝධ නම් වෙයි. ඒ දුක්ඛනිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අරමුණු කිරීම් වශයෙන් පැමිණෙන හෙයින් ද ඒ නිර්වාණයට පැමිණීම පිණිස ප්‍රතිපදවක් වන හෙයින් ද ලෝකෝත්තර මාර්ගය තෙම දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපද යයි කියනු ලැබේ. ඔහුන්ගේ සත්‍යාර්ථය වනාහි තච්ඡ අවිපරීත භූතභාව වශයෙන් දතයුත්තේය. එහෙයින්:—

"ඉදං දුක්ඛන්ති භික්ඛවේ තථමේතං අවිතථමේතං අනඤ්ඤථමේතං" යනාදි විස්තරය වදරණ ලද්දේමැයි. මෙහි වනාහි සතර ආර්‍ය්‍යඵලයන්ගේ හා සම්‍යක්දෘෂ්ටි ආදී මාර්ගාඞ්ග අටෙන් තොරවූ අවශේෂ මාර්ග සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ චතුස්සත්‍යයෙන් විනිර්මුක්ත බව ඇත්තේහිදු මෙහි මාර්ග නිර්වාණ ප්‍රකාශකභාව වචනයෙන්ම ඒ ආර්‍ය්‍යඵලයන්ගේ හා ආර්‍ය්‍යමාර්ග සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ ද ප්‍රකාශ කිරීම පිණිස කියනලද්දේ වෙයි. කුමක්හෙයින යත්? අනාශ්‍රව භාවයෙන් ඒක ලක්‍ෂණ බැවින් ද ඒ ඒ හේතූන්ට විෂයවන බැවින් දැයි දතයුත්තේයි. මෙහි ද "නිරුත්තරෝ චතුසච්චප්පකාසනෝ" යන මේ ගුණයන් කරණකොටගෙන භාග්‍යවතුන් වහන්සේගේ චිත්තාදී චතුර්විධ ධර්මදේශනානුගුණ විශේෂය දක්වයි. නොහොත් එබඳු ගුණයෙන් පරිපූර්ණ වූ භාග්‍යවතුන් වහන්සේගේ ඒ දේශනා සාමර්ථය යෝගය ඇති හෙයිනි. නොහොත් "නිරුත්තරෝ" යන වචනයෙන් සිව් වැදෑරුම් ධර්මයාගේ අනන්‍යථාත්වය හෙවත් අවිපරීතාර්ථය ප්‍රකාශ කෙරෙයි. "චතුසච්චප්පකාසනෝ" යන මෙයින් යම් ධර්ම කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් වේනෙය්‍ය ජනයන්ගේ නුවණ මූ කිරීම පිණිස දේශනා කරණ ලද්දවූ ද ඒ ධර්මයෝ මෙහි අභිප්‍රාය නොකරණ ලද්දහ. මූ කළ ප්‍රඥ ඇත්තවුන් විසින් අවබෝධ කටයුතු වශයෙන් යම් දුක්ඛාදී සිව් වැදෑරුම් ධර්ම කෙනෙක් වදරණ ලද්දහු ද ඒ ධර්මයෝම උදෙසිය යුතු අර්ථයෙන් අදහස් කරණ ලද්දහුය යන අර්ථය දක්වයි. මෙසේ සංක්‍ෂෙපයෙන් සතර පරමාර්ථ ධර්මයන් දැන් යම් හෙයකින් උද්දේශය වනාහි නිද්දේශය පිණිස වේද එහෙයින් යථෝද්දිෂ්ට ධර්මයන් විස්තර කරණු පිණිස "තත්‍ථ චිත්තං" යනාදිය ආරබ්ධයි.

මෙයින් චිත්තයාගේ අරමුණු පිළිබඳ පැවැත්ම ඇති බව හා අනිත්‍ය බවද අකාරකත්වය ද ප්‍රකාශ කෙරෙයි. ඒ එසේමැයි; "විසයවිජානනං" යන මෙයින් අරමුණෙන් චිත්තය උපලක්‍ෂණය (හැඳිනවීම) කරණුයේ චිත්තයාගේ ඒ අරමුණ අයත් කොට හටගැනීම වනබව ප්‍රකාශ කිරීමෙන් ද ඒ අරමුණ අභිමුඛ වූ කල්හිම උපදනාබව ප්‍රකාශ කරණ හෙයින් චිත්තයාගේ අනිත්‍ය බවද ප්‍රකාශ කෙරෙයි. යම් පරමාර්ථ ස්වභාව ධර්මයක් ඇත්තේ වේද ඒ ප්‍රත්‍යයට සුදුසු පරිද්දෙන් හටගැනීම පැවැතීම් මාත්‍රයක්ම වේද එහෙයින් මෙහි "විසයවිජානනං" යන භාවනිර්දේශය කරණ කොටගෙන විජානන මාත්‍රයක්ම ප්‍රකාශ කරණ හෙයින් චිත්තයාගේ අකාරකත්වය ද දක්වයි. මෙසේ ප්‍රත්‍යය වූ පරිද්දෙන් පැවැතීම් මාත්‍රයක්ම වෙයි යන කාරණයෙන් සියලුම චිත්ත චෛතසික ස්වභාව ධර්මයන්ගේ භාවකාරකයෙහි ශබ්ද නිෂ්පත්තිය වන බවම මුඛ්‍ය වශයෙන් ලැබෙයි.

"චින්තේතීති චිත්තං. තේන චින්තං විචාරේතීති විචාරෝ" යනාදී ක්‍රමයෙන් කර්තෘසාධන කරණසාධනයන්ගේ වශයෙන් යම් නිර්වචනයක් කියනුලැබේ ද එය පරියාය කථාවෙහි හෙවත් ක්‍රමාන්තර වචනකැයි දතයුතුයි. ඒ එසේමැයි; තම තමන්ගේ කෘත්‍යයෙහි පරමාර්ථ ධර්මයන්ගේ ස්ව ප්‍රධාන බව මොනවට ආරෝපණය කිරීමෙන් කර්තෘ ස්වභාවය ද ඒ කර්තෘ ස්වභාවයට අනුකූලත්වයෙන් තත් සම්ප්‍රයුක්ත ධර්ම සමූහයෙහි කර්තෘ ස්වභාවය මොනවට ආරෝපණය කිරීමෙන් කරණකාරක

භාවයද පරියාය වශයෙන්ම ලැබෙයි. එසේ කර්තෘසාධන කරණසාධන වශයෙන් දැක්වීම වනාහි පරමාර්ථ ධර්ම ස්වභාවයෙන් අන්‍ය වූ කර්තෘ ආදීන්ගේ අවිද්‍යමාන බව දැක්වීම පිණිසයයි දතයුතුයි.

වචනාර්ථ විජානනයෙන් දන්නාලද චිත්තසාමාන්‍ය ඇත්තාහට මත්තෙහි කියනුලබන චිත්තවිභාගය තෙමේ හොබවන්නේ වෙයි. එහෙයින් වචනාර්ථ විජානනයම ආරම්භයෙහි පළමුකොට දැක්වීම යුක්තතර වේනුයි එය පළමුකොට "තස්ස පන කෝ වචනත්ථෝ" යනුවෙන් කථේතුකම්‍යතා පුච්ඡාවෙන් විචාරයි. ඒ එසේමැයි; පුච්ඡා තොමෝ අදිට්ඨජෝතනා පුච්ඡාය දිට්ඨසංසන්දනා පුච්ඡාය විමතිච්ඡේදනා පුච්ඡාය අනුමති පුච්ඡාය කථේතුකම්‍යතා පුච්ඡායයි පස් වැදෑරුම් වේ. ඔහුන් අතුරෙන් යම් කාරණයක් නොදන්නා ලද්දේ ද නුවණින් නොදක්නා ලද්දේ ද ඒ කාරණයාගේ දැනගැනීම පිණිස නුවණින් දක්නා පිණිස ප්‍රශ්න කිරීම අදිට්ඨජෝතනා පුච්ඡා නම් වෙයි. යම් කාරණයක් දන්නා ලද්දේ වේද දක්නා ලද්දේ වේද ඒ කාරණය අනෙක් පණ්ඩිතයන් හා සමඟ සංසන්දනය කරණු පිණිස ප්‍රශ්න කිරීම දිට්ඨසංසන්දනා පුච්ඡා නම් වෙයි. ස්වභාවයෙන් සංසයට පැමිණි තමාගේ සංසය සමුද්ඝාතනය පිණිස ප්‍රශ්න කිරීම විමතිච්ඡේදනා පුච්ඡා නම් වෙයි. "තං කිං මඤ්ඤථ භික්ඛවේ රූපං නිච්චං වා අනිච්චං වාති, අනිච්චං භන්තේ, යදනිච්චං තං දුක්ඛං වා සුඛං වා" යනාදින් අනුමති ග්‍රහණය පිණිස ප්‍රශ්න කිරීම අනුමතිපුච්ඡා නම් වෙයි. "චත්තාරෝමෙ භික්ඛවේ සතිපට්ඨානා කතමේ චත්තාරෝ" යනාදින් ඒ ඒ ධර්මය දේශනා කරණ අභිප්‍රායෙන් ප්‍රශ්න කිරීම කථේතුකම්‍යතා පුච්ඡා නම් වෙයි. ඔහුන් අතුරෙන් පළමු තුන් පුච්ඡාවෝ ආචාර්‍ය්‍යයන්ට ඇති නොවෙත්. ඒ එසේමැයි; ඒ ආචාර්‍ය්‍යවරයෝ තුමූ ග්‍රන්ථ කරණය පිණිස ආරම්භ කොට දැන් නොදක්නා ලද්දක් ප්‍රකාශ නොකරත්. දන්නා ලද්දක් හෝ සංසන්දනය නොකෙරෙත්. සංසයකට හෝ නොපැමිණෙත්. ඒ පිරිසිදු කිරීම පෙරටුවම ග්‍රන්ථ කරණයෙහි අභිනිවේශය ඇති හෙයින් අනික් පුච්ඡාවෝ දෙදෙන ඇති වෙත්. ඔහුන් අතුරෙන් මේ පුච්ඡා තොමෝ කථේතුකම්‍යතා පුච්ඡා නම් වෙයි. තවද චෝදනා උපදවන්නාවූ ආචාර්‍ය්‍යවරයෝ තුමූ අනෙක් චෝදකයෙක් කල්පනා කොට ඔහුන්ගේ වචන වශයෙන් උපදවත්නුයි ඒ වශයෙන් මෙහි අදිට්ඨජෝතනා, විමතිච්ඡේදනා පුච්ඡාවෝ ද ලැබිය යුත්තාහුම වෙතියි දතයුත්තේයි.

**තස්ස පන** ඒ චිත්ත ශබ්දයා වනාහි **කෝ වචනත්ථෝ** වචනාර්ථ තෙමේ කවරේද යත්? (දැනි විචාරණලද අර්ථය විසඳනු පිණිස පළමුකොට "වුච්චති"යි ප්‍රතිඥා කොට "සබ්බසඞ්ගාහකවසේන" යනාදීන් විසජ්ජනාව ආරබ්ධයි) **සබ්බසඞ්ගාහකවසේන** (යටත්පිරිසෙයින් චක්ඛුවිඤ්ඤාණාදිහු පටන් සියළු චිත්තයන්ගේ ආරම්මණවිජානන ස්වභාවය ඇති හෙයින්) ඒ සියළු චිත්තයන්ම සඞ්ග්‍රහ කිරීම් වශයෙන් **වුච්චති** වචනාර්ථ කියනු ලැබේ. (වක්ෂ්‍යමාන නිර්වචනයන්හී මෙන් යථාලාභ වශයෙන් නොකියනු ලැබේ යන අර්ථයි)

**චිත්තේතීති** අරමුණ සිතානුයි **චිත්තං** චිත්ත නම් වේ. "චින්තෙන්ති තේන ගෝචරන්ති වා චිත්තං" යනු නිර්වචන හෙයින් ඒ විඤ්ඤාණය කරණකොටගෙන තමා හා එක්ව යෙදුනා වූ ස්පර්ශ ආදී ධර්මයෝ අරමුණ සිතත්නුයි හෝ චිත්ත නම් වෙයි. ඒ එසේමැයි; සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ කර්තෘභාව සමාරෝපනයෙන් ඒ චිත්තයාගේ කරණකාරකභාවය ලැබේ. සර්වසඞ්ග්‍රාහක වශයෙන් පළමුකොට අර්ථ දක්වා දැන් යථාලාභ වශයෙනුදු දක්වනු පිණිස "අත්තසන්තානං වා චිනෝතීතිපි" යනාදිය කියනලදි. ඒ එසේමැයි; චිත්ත ශබ්දය තමා සර්ව සාධාරණ හෙයින් යම් යම්

තැනෙක්හි යම් යම් පරිද්දෙකින් අර්ථය ලැබේද ඒ ඒ තන්හි ඒ ඒ පරිද්දෙන් ගතයුත්තේයි. යම් චිත්ත ශබ්දයක්හුගේ යම් තැනෙක්හි කියනලද අර්ථ විශේෂය නොලැබේ ද එය රූඪී වශයෙන් චිත්තය යයි දතයුතුයි. කුමක්මෙන්ද යත්? යම්සේ කිලඤ්ජාදියෙන් කරනලද්දේ නමුදු තල්පතින් කරනලද්දක් සමාන බැවින් රූඪී වශයෙන් තාලවණ්ටයයි කියනු ලබන්නාක් මෙනි.

මෙහි අත්ත ශබ්දය පර ප්‍රත්‍යනීක වචනයක් බැවින් "අත්තනෝ සන්තානෝ"යි සදෘශ වශයෙන් උපදිනු ලබන්නා වූ ජවන සන්තානය කියනු ලැබේ. එය රැස්කරන හෙයින් චිත්ත නම් වෙයි යන මේ අර්ථය තෙමේ ආසේවන ප්‍රත්‍යය සහිත වූ ජවන චිත්තයන්ගේ වශයෙන් දතයුත්තේයි. ඒ එසේමැයි; පෙරටුව උපදනා වූ චිත්තයෝ තුමූ පසුව උපදනා චිත්තයන්ට ආසේවන ප්‍රත්‍යය වී ස්වකීය ජවන සන්තානය ප්‍රගුණ ප්‍රබල භාවය කරණ හෙයින් එය රැස්කරන්නාහු නම් වෙත්. මෙහි වා ශබ්දය තෙමේ අසර්ව සඞ්ග්‍රාහාකාර්ත්‍ථවිකල්පයෙහි වැටේ. පි-ශබ්ද තෙමේ ක්‍රියා සම්පිණ්ඩනාර්ත්‍ථයෙහි වැටේ. නොහොත් "සබ්බසඞ්ගාහකවසේන" යන මේ පදය මෙහිදු සම්බන්ධ වෙයි. එහෙයින් මෙය ද සර්වසඞ්ග්‍රාහක වශයෙන් කියනලද්දේයයි ගනුලබන කල්හි "අත්තසන්තානං" යන මෙහි අත්ත ශබ්දය විඤ්ඤාණ වාචක වෙයි. ඒ වශයෙන් චිත්ත සන්තාන යන අර්ථ ඇත්තේ වෙයි. ඒ එසේමැයි; අනන්තරාදී ප්‍රත්‍යය වශයෙන් චිත්ත සන්තානයාගේ නොසිඳ පැවැත්මට කාරණා වන හෙයින් සියළුම චිත්ත සමුදය තෙමේ චිත්ත සන්තානය රැස්කෙරේ නම් වෙයි. මේ අර්ථයෙහි වා-ශබ්ද තෙමේ ක්‍රියා විකල්පාර්ත්‍ථ ඇත්තේ වේ. පි-ශබ්දය තෙමේ "චිත්තං" යන මේ පදයාගේ ආකර්ෂණය අර්ථ කොට ඇත්තේ යයි දතයුතුයි. පුරිම පක්‍ෂයෙහි "චිත්තං" යනු අධිකාර වශයෙන් හෙවත් මතු සම්බන්ධ කිරීම් වශයෙන් ගතයුතුයි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 17-22 පිට]**

විචිත්තකරණා චිත්තං - අත්තනෝ චිත්තතාය වා;
පඤ්ඤත්තියම්පි විඤ්ඤාණෝ - විචිත්තේ චිත්තකම්මකේ;
චිත්තසම්මුති දට්ඨබ්බා - විඤ්ඤාණෝ ඉධ විඤ්ඤුනා.

තං පන සාරම්මණතෝ ඒකවිධං, සවිපාකාවිපාකතෝ දුවිධං. තත්ථ සවිපාකං නාම කුසලාකුසලං, අවිපාකං අබ්‍යාකතං. කුසලාකුසලාබ්‍යාකතජාතිභේදතෝ තිවිධං.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 09 යටතේ)]**

විචිත්තං කරණං යස්ස තං විචිත්තකරණං, තස්ස භාවෝ **විචිත්තකරණා**. "ඉමස්ස රූපස්ස උද්ධං ඉදං හෝතු, හෙට්ඨා ඉදං හෝතු, උභයපස්සේ ඉද"න්ති චින්තෙත්වා යථාචින්තිතේන කමේන සේසචිත්තරූපනිප්ඵාදනං හෝති, ඒවං යං කිඤ්චි ලෝකේ විචිත්තං සිප්පජාතං, සබ්බං තං චිත්තේනේව කරීයති. ඒවං **විචිත්තකරණතාය** චිත්තං. තද කරණතාය චිත්තං කරෝතීති චිත්තං. ඉදං තද්ධිතපදං. **වා** අයං අඤ්ඤෝ නයෝ. තං අත්තනෝ චිත්තතාය අඤ්ඤදේව සරාගං චිත්තං, අඤ්ඤං සදෝසං, අඤ්ඤං සමෝහං. අඤ්ඤං කාමාවචරං, අඤ්ඤං රූපාවචරාදිභේදං. අඤ්ඤං රූපාරම්මණං, අඤ්ඤං සද්දාදි ආරම්මණං. රූපාරම්මණේසුපි අඤ්ඤං නීලාරම්මණං, අඤ්ඤං පීතාදි ආරම්මණං. සද්දාදි ආරම්මණේසුපි ඒසේව නයෝ. සබ්බේසුපි තේසු අඤ්ඤං හීනං, අඤ්ඤං මජ්ඣිමං, අඤ්ඤං පණීතං. හීනාදීසුපි අඤ්ඤං ඡන්දාධිපතෙය්‍යං, අඤ්ඤං චිත්තාධිපතෙය්‍යං, අඤ්ඤං වීරියාධිපතෙය්‍යං, අඤ්ඤං වීමංසාධිපතෙය්‍යං, තස්මා යස්ස ඉමේසං සම්පයුත්තභූමි ආරම්මණහීනමජ්ඣිමපණීතාධිපතීනං වසේන **අත්තනෝ චිත්තතාය**

චිත්තං. චිත්තෝ ඒතස්මිං අත්ථීති චිත්තං. තද සබ්බං චිත්තං. පඤ්ඤත්තියම්පි විඤ්ඤාණේ විචිත්තේ චිත්තස්ස කම්මං චිත්තකම්මං, චිත්තකම්මමේව චිත්තකම්මකං, **චිත්තකම්මකේ** විචිත්තේ **ඉධ** ඉමස්මිං අධිකාරේ **චිත්තසම්මුති** චිත්තසද්දෝ **විඤ්ඤාණේ** චිත්තේ විඤ්ඤූනා දට්ඨබ්බෝ.

**තං පන** සබ්බසඞ්ගාහකවසේන චින්තේන්තීතිආදිනා වුත්තප්පකාරං චිත්තං. **සාරම්මණතෝ** සාරම්මණභාවේන ඒකවිධං. සවිපාකාවිපාකතෝ සවිපාකාවිපාකවසේන දුවිධං. තත්ථ තස්මිං දුවිධේ චිත්තේ සවිපාකං නාම චිත්තං කුසලාකුසලං, අවිපාකං අබ්‍යාකතං, කුසලාකුසලභාවේන අකථිතන්ති අත්ථෝ. කුසලජාති අකුසලජාති අබ්‍යාකතජාතීති ජාතිභේදතෝ තිවිධං.

**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 09 යටතේ)]**

**විචිත්තකරණා** විසිතුරු කෘත්‍ය ඇති හෙයින් හෙවත් විසිතුරු වූ චිත්‍ර කර්මාදිය කරණ හෙයින් **චිත්තං** චිත්ත නම් වෙයි **වා** නොහොත් **අත්තනෝ** තමාගේ **චිත්තතාය** (ජාති භූමි සම්ප්‍රයෝගාදි වශයෙන්) විසිතුරු බැවින් **චිත්තං** චිත්ත නම් වෙයි **චිත්තසම්මුති** චිත්ත ව්‍යවහාරය **පඤ්ඤත්තියම්පි** නාමප්‍රඥප්තියෙහි ද **විඤ්ඤාණේ** සවිපාක අවිපාක ප්‍රභේද වූ චිත්තයෙහි ද **විචිත්තේ** විසිතුරු වූ හෙවත් නානාප්‍රකාරවූ **චිත්තකම්මේ** සිතුයමෙහිද **දට්ඨබ්බා** දතයුත්තීය. **ඉධ** මේ සිව් වැදෑරුම් පරමාර්ථ ධර්මයන් දක්වන තන්හි **විඤ්ඤාණේ** විඤ්ඤාණයෙහි වැටේ යයි **විඤ්ඤූනා** නුවණැත්තහු විසින් හෙවත් ආභිධම්මිකයා විසින් **දට්ඨබ්බා** දතයුත්තීය.

**තම්පන** ඒ චිත්තය තෙමේ වනාහි **සාරම්මණතෝ** අරමුණු සහිත බැවින් (හෙවත් අරමුණක් ඇති කල්හිම උපදනා බැවින්) **ඒකවිධං** එක් වැදෑරුම් වෙයි **සවිපාකාවිපාකතෝ** විපාක උපදනා ස්වභාවයාගේ විද්‍යමාන අවිද්‍යමාන භාවයෙන් **දුවිධං** දෙවැදෑරුම් වෙයි (ඔහුන් අතුරෙන් සවිපාක සිත කවරේද? අවිපාක සිත කවරේදැයි යන චෝද්‍යය සඳහා "තත්ථ සවිපාකං" යනාදිය කීයේයි) **තත්ථ** ඔහුන් අතුරෙන් **සවිපාකං නාම** සවිපාක චිත්තය නම් **කුසලාකුසලං** කුසල් සිත හා අකුසල් සිතයි **අවිපාකං** අවිපාක චිත්තය නම් **අබ්‍යකතං** විපාක ක්‍රියා වශයෙන් දෙවැදෑරුම් වූ අව්‍යාකෘත සිතයි **කුසලාකුසලඅබ්‍යකතජාතිභේදතෝ** කුසලය අකුසලය අව්‍යාකෘතය යන ජාති භේද හෙයින් **තිවිධං** කුසලජාතිය අකුසලජාතිය අව්‍යාකෘතජාතිය යැයි තුන් වැදෑරුම් වෙයි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 22-25 පිටු]**

විචිත්තං කරෝති, විචිත්තස්ස වා කරණන්ති විචිත්තකරණං, තතෝ **විචිත්තකරණා,** විචිත්තචිත්තකම්මාදීනං කරණතෝති අත්ථෝ. ලෝකස්මිඤ්හි යං කිඤ්චි චිත්තකම්මාදිභේදං විචිත්තං සිප්පජාතං, සබ්බං තං චිත්තේනේව චින්තෙත්වා කරීයතීති. තේනාහ භගවා "දිට්ඨං වෝ, භික්ඛවේ, චරණං නාම චිත්තන්ති? ඒවං, භන්තේ. තම්පි ඛෝ, භික්ඛවේ, චරණං නාම චිත්තං චිත්තේනේව චින්තිත"න්ති (සං. නි. 3.100). ස්වායමත්ථෝ සවිඤ්ඤත්තිකානං බාත්තිංසචිත්තානමුපලබ්භති. සාසවකුසලාකුසලං වා විචිත්තගතිආදිකරණතෝ වා විචිත්තකරණට්ඨේන චිත්තං. නනු ච විචිත්තගතිආදයෝ කම්මවසේන නිප්ඵජ්ජන්ති. යථාහ;

"කම්මනානාකරණං පටිච්ච සත්තානං ගතියා නානාකරණං පඤ්ඤායති අපද ද්විපද චතුප්පද බහුප්පද රූපිනෝ අරූපිනෝ සඤ්ඤිනෝ අසඤ්ඤිනෝ

නේවසඤ්ඤිනාසඤ්ඤිනෝ, කම්මනානාකරණං පටිච්ච සත්තානං උපපත්තියා නානාකරණං පඤ්ඤායති උච්චනීචතා හීනපණීතතා සුගතදුග්ගතතා, කම්මනානාකරණං පටිච්ච සත්තානං අත්තභාවේ නානාකරණං පඤ්ඤායති සුවණ්ණදුබ්බණ්ණතා සුජාතදුජ්ජාතතා සුසණ්ඨිතදුස්සණ්ඨිතතා, කම්මනානාකරණං පටිච්ච සත්තානං ලෝකධම්මේ නානාකරණං පඤ්ඤායති ලාභාලාභේ යසායසේ නින්දපසංසායං සුඛදුක්ඛේ"ති (ධ. ස. අට්ඨ. 1).

තස්මා කම්මභේදනිබ්බත්තත්තා ගතිආදීනං චිත්තතා. කම්මන්ති ච චේතසිකධම්මභූතා චේතනා, අභිජ්ඣාදයෝ ච වුච්චන්ති, න චිත්තන්ති. කථං චිත්තස්ස විචිත්තගතිආදිකරණන්ති? වුච්චතේ; කම්මස්ස චිත්තසන්නිස්සිතත්තා තන්නිප්ඵාදිතම්පි චිත්තේනේව කතං හෝති, යථා රාජයෝධේන පරාජිතෝ සත්තු රඤ්ඤා ජිතෝති වුච්චති. විචිත්තං කරණමස්සාති වා **විචිත්තකරණං**. තතෝ ඒකට්ඨානිකවජ්ජිතඤ්හි චිත්තං පච්චේකං පටිසන්ධාදිවිචිත්තකිරියවන්තතාය, සබ්බමේව වා චිත්තං ආවජ්ජනාදිඅඤ්ඤමඤ්ඤවිසදිසකිරියවන්තතාය විචිත්තකරණං යුත්තන්ති. සබ්බවිකප්පේසුපි "රූපභවෝ රූප"න්තිආදීසු විය උත්තරපදලෝපෝ චිත්තපරියායේන ච විචිත්ත-සද්දේන වා විග්ගහෝ වි-සද්දලෝපෝ වා දට්ඨබ්බෝ. අථ වා **"විචිත්තකරණා"**ති ඉදං චිත්තවිචිත්තභාවස්ස ඤාපකහේතුනිදස්සනං. තේන යස්මා ඉදං විචිත්තකරණං, තස්මා තස්ස විචිත්තස්ස නිප්ඵාදකං සයම්පි තථේව විචිත්තන්ති විඤ්ඤාතබ්බන්ති ඒවං කරණවිචිත්තතාය විචිත්තත්තා චිත්තන්ති අත්ථෝ. ඨපෙත්වා තං කරණවිචිත්තතාය විචිත්තභාවං අත්තනෝ ඒව ජාතිභූමිසම්පයෝගාදිවසේන විචිත්තතාය චිත්තන්ති දස්සෙන්තෝ ආහ **"අත්තනෝ චිත්තතාය වා"**ති. තත්ථ යස්මා අඤ්ඤදේව කුසලං, අඤ්ඤං අකුසලං, අඤ්ඤං අබ්‍යාකතං, අඤ්ඤං කාමාවචරං, අඤ්ඤං රූපාවචරාදිභේදං, අඤ්ඤං සරාගං, අඤ්ඤං වීතරාගං, අඤ්ඤං සදෝසං, අඤ්ඤං වීතදෝසං, අඤ්ඤං සමෝහං, අඤ්ඤං වීතමෝහං, අඤ්ඤං රූපාරම්මණං, අඤ්ඤං සද්දාදි ආරම්මණං, රූපාරම්මණේසු ච අඤ්ඤං නීලාරම්මණං, අඤ්ඤං පීතාදි ආරම්මණං. ඒවං සද්දාරම්මණාදීසුපි යථාසම්භවං. සබ්බේසු චේව තේසු අඤ්ඤං හීනං, අඤ්ඤං මජ්ඣිමං, අඤ්ඤං පණීතං, හීනාදීසු ච අඤ්ඤං ඡන්දාධිපතෙය්‍යං, අඤ්ඤං චිත්තාධිපතෙය්‍යං, අඤ්ඤං වීරියාධිපතෙය්‍යං, අඤ්ඤං වීමංසාධිපතෙය්‍යන්ති ඒවමාදිනා ජාතිභූමිසම්පයුත්තආරම්මණහීනමජ්ඣිමපණීතඅධිපතිආදීනං වසේන විචිත්තමනේකප්පකාරං, තස්මා ඉමාය අත්තවිචිත්තතාය වා චිත්තන්ති වුච්චතීති.

කාමඤ්චෙත්ථ ඒකමේව චිත්තං ඒවං විචිත්තං නාම න හෝති, විචිත්තානං පන අන්තෝගධත්තා ඒතේසු යං කිඤ්චි ඒකම්පි විචිත්තතාය චිත්තන්ති වත්තුං වට්ටති සමුදායවෝහාරේන අවයවස්සාපි වෝහරියමානත්තා යථා පබ්බතනදීසමුද්දාදීනමේකදේසා දිට්ඨා පබ්බතාදයෝ දිට්ඨාති, යථා ච ඒකේකචිත්තසම්පයුත්තාපි වේදනාදයෝ රාසට්ඨේන ඛන්ධවෝහාරේන "වේදනාක්ඛන්ධෝ සඤ්ඤාක්ඛන්ධෝ"තිආදිනා වුච්චන්ති. අපිචෙත්ථ විපාකවිඤ්ඤාණං කම්මකිලේසේහි චිතන්ති චිත්තං, තං කිලේසසහායේන කම්මුනා ඵලභාවේන නිබ්බත්තිතං තේහි චිතං නාම හෝති. හෝතු තාවිදං ලෝකියවිපාකං සන්ධාය, ලෝකුත්තරං පන පත්වා කථන්ති? වුච්චතේ; "කතමේ ධම්මා කුසලා, යස්මිං සමයේ ලෝකුත්තරං කුසලං චිත්තං උප්පන්නං හෝති…පෙ…. තස්මිං සමයේ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"තිආදිනා අරියමග්ගචේතනායපි අවිජ්ජූපනිස්සයභාවස්ස පකාසිතත්තා ලෝකුත්තරකුසලස්සාපි අනුසයා උපනිස්සයා හොන්තීති තන්නිබ්බත්තිතස්ස විපාකස්ස කම්මකිලේසසඤ්චිතතාපරියායෝ ලබ්භතීති. චිතං

තායතීති වා **චිත්තං**. කම්මාදිසඤ්චිතෝපි හි අත්තභාවෝ විඤ්ඤාණූපරමේ මතෝති වුච්චති. යථාහ;

"ආයු උස්මා ච විඤ්ඤාණං - යදා කායං ජහන්තිමං;
අප්පවිද්ධෝ තදා සේති - නිරත්ථංව කලිඞ්ගර"න්ති. (සං. නි. 3.95);

සෝ පනායං චිත්තසද්දෝ කිඤ්චාපි අනේකත්ථේසු දිස්සති. තථා හේස "චිත්තෝ ච ගහපතී"ති ආදීසු (අ. නි. 2.133; 4.176) පඤ්ඤත්තියං ආගතෝ. "සබ්බෝ ලෝකෝ පරචිත්තේන අචිත්තෝ"ති ආදීසු විඤ්ඤාණේ. "නාහං, භික්ඛවේ, අඤ්ඤං ඒකනිකායම්පි සමනුපස්සාමි, ඒවං චිත්ත"න්ති ආදීසු (සං. නි. 3.100) විචිත්තේ, නානප්පකාරේති අත්ථෝ. "චරණං නාම චිත්ත"න්ති ආදීසු චිත්තකම්මකේ. ඉධ පන චතුබ්බිධධම්මේ නිද්දේසතෝ පකරණවසේන යථාවුත්තවචනත්ථයුත්තෝ විඤ්ඤාණවචනෝව දට්ඨබ්බෝති ඉමමත්ථං දස්සෙන්තෝ ආහ **"පඤ්ඤත්තියම්පී"**ති ආදි. පඤ්ඤපීයති ඒතායාති **පඤ්ඤත්ති,** තස්සං නාමපඤ්ඤත්තියන්ති අත්ථෝ. චිත්තෝති හි ඒකස්ස ගහපතිනෝ නාමං. **පි**-සද්දෝ වක්ඛමානසම්පිණ්ඩනත්ථෝ. **විඤ්ඤාණේ**ති සවිපාකාවිපාකභේදේ චිත්තේ. තඤ්හි විජානනට්ඨේන "විඤ්ඤාණ"න්ති වුච්චති. යථාහ; "විජානාතීති ඛෝ, භික්ඛවේ, විඤ්ඤාණං, තස්මා විඤ්ඤාණන්ති වුච්චතී"ති. **චිත්තසම්මුතී**ති චිත්තවෝහාරෝ. **දට්ඨබ්බා**ති විඤ්ඤාතබ්බා. **ඉධා**ති ඉමස්මිං චතුබ්බිධධම්මනිද්දේසට්ඨානේ. **විඤ්ඤූනා**ති විජානතා, ආභිධම්මිකේනාති අත්ථෝ.

විභාගවන්තානං ධම්මානං සභාවවිභාවනං විභාගේන විනා න හෝතීති චිත්තස්ස විභාගං දස්සේතුං **"සාරම්මණතෝ"**ති ආදි ආරද්ධං. තත්ථ ආලම්බන්ති තං නිස්සාය පවත්තන්තීති ආරම්මණං, පච්චයෝ, ගෝචරෝ ච. තථා හි "ලභති මාරෝ ආරම්මණං, ලභති මාරෝ ඕතාර"න්ති ආදීසු (දී. නි. 3.80) පච්චයෝ "ආරම්මණ"න්ති වුච්චති. "නිමිත්තං අස්සාසපස්සාසා, අනාරම්මණමේකචිත්තස්සා"ති ආදීසු (පටි. ම. 1.159) ගෝචරෝ. ඉධ පන උභයම්පි වට්ටති සබ්බස්සේව චිත්තස්ස සප්පච්චයසගෝචරත්තා. සහ ආරම්මණේන වත්තතී තදවිනාභාවතෝති **සාරම්මණං.** භාවප්පධානනිද්දේසවසේන චෙත්ථ සාරම්මණභාවෝ සාරම්මණ-සද්දේන වුත්තෝ යථා "ඉදම්පි බුද්ධේ රතනං පණීතං (ඛු. පා. 6.3). චක්ඛු සුඤ්ඤං අත්තේන වා අත්තනියේන වා"ති ආදීසු (සං. නි. 4.85) රතනඅත්තත්තනියාදිභාවෝ රතනාදීහි සද්දේහීති, තතෝ සාරම්මණභාවතෝති අත්ථෝ. ඒවමඤ්ඤත්ථාපි යථානුරූපං දට්ඨබ්බං. **ඒකවිධ**න්ති ඒකප්පකාරං, ඒකකොට්ඨාසන්ති අත්ථෝ.

**සවිපාකාවිපාකතෝ**ති විපාකුප්පාදනසභාවස්ස විජ්ජමානාවිජ්ජමානභාවතෝ. විපාක-සද්දෝ හි ද්වීසු අත්ථේසු පවත්තති. කත්ථචි විපක්කභාවමාපන්නේසු අරූපධම්මේසු, කත්ථචි විපාකුප්පාදනසභාවේ. තථා හේස "විපාකා ධම්මා"ති ආදීසු (ධ. ස. තිකමාතිකා 3) විපක්කභාවමාපන්නේසු අරූපධම්මේසු පවත්තති. "විපාකධම්මධම්මා"ති ආදීසු (ධ. ස. තිකමාතිකා 3) විපාකුප්පාදනසභාවේ. ඉධ පන විපාකුප්පාදනසභාවෝ දට්ඨබ්බෝ. ඉතරථා හි අභිඤ්ඤාකුසලාදීනං සවිපාක-පදේ අසඞ්ගහිතභාවාපත්ති සියා. තථා හි යදි විපක්කභාවමාපන්නා ඒව ධම්මා ඉධ ගහිතා සියුං, තේ යස්ස සන්ති, තං සවිපාකමිතරමවිපාකන්ති අභිඤ්ඤාකුසලස්ස චේව කදාචි අවිපාකස්ස දිට්ඨධම්මවේදනීයාදිකම්මස්ස භාවනාය පහාතබ්බා කුසලස්ස ච විපාකුප්පත්තියා අභාවතෝ අවිපාක-පදසඞ්ගහෝ සියා, ඒවඤ්ච සති "අවිපාකං අබ්යාකත"න්ති වක්ඛමානත්තා නේසං අබ්යාකතභාවෝ ආපජ්ජති, න චේතමිට්ඨං කුසලාකුසලනිද්දේසේයේව තේසං නිද්දේසතෝ. විපාකුප්පාදනසභාවේ පන ගහිතේ

තං සභාවෝ නාම අනුපච්ඡින්නාවිජ්ජමානතණ්හානුසයස්මිං සන්තානේ සබ්‍යාපාරප්පවත්ති ඒවාති තස්සා තේසුපි අත්ථීතාය අසතිපි විපාකුප්පාදනේ සවිපාක-පදසඞ්ගහෝ සිද්ධෝති න කෝචි ඉට්ඨවිඝාතෝ ආපජ්ජති. යේන පන කාරණේන අභිඣ්ඣාදකුසලාදිකමවිපාකං, යෝ චෙත්ථ වත්තබ්බෝ විනිච්ඡයෝ, තං සබ්බං තස්ස තස්ස ආගතට්ඨානේයේව දස්සයිස්සාම.

කතමං පනෙත්ථ සවිපාකං, කතමමවිපාකන්ති චෝදනං සන්ධායාහ **"තත්ථ සවිපාක"**න්ති ආදි. **අබ්‍යාකත**න්ති විපාකකිරියාවසේන දුවිධමබ්‍යාකතං. තේසු විපාකචිත්තං තාව ආදාසතලේ මුඛනිමිත්තං විය නිරුස්සාහත්තා විපාකුප්පාදනේ අසමත්ථං. කිරියචිත්තේසු ච යදේතං ඛීණාසවසන්තානේයේව නියතමට්ඨාරසවිධං ඣක්ඛණං, තං උපච්ඡින්නභවමූලාය සන්තතියං පවත්තතීති සමුච්ඡින්නමූලාය ලතාය පුප්ඵං විය ඵලදායී න හෝති. ආවජ්ජනද්වයං පන අනුපච්ඡින්නභවමූලේපි සන්තානේ පවත්තමානං අනාසේවනභාවේන දුබ්බලත්තා මෝඝපුප්ඵමිව බීජභාවේ අසමත්ථං අඵලමේව. ඉති සබ්බමේතං අබ්‍යාකතං විපාකාරහතාභාවතෝ අවිපාකන්ති වුත්තං "අවිපාකං අබ්‍යාකත"න්ති. ජායන්ති එත්ථ අසදිසාපි සදිසාකාරාති ජාති, සමානාකාරෝ, කුසලාකුසලාබ්‍යාකතානං ජාති කුසලාකුසලාබ්‍යාකතජාති, තස්සා භේදතෝ **තිවිධං** කුසලං අකුසලං අබ්‍යාකතන්ති. වචනත්ථපුච්ඡාය පයෝජනං වුත්තමේව.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 09 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 32-42 පිටු; අභිධම්මත්ථ විකාසිනී 16 පිට]**

"විචිත්තං කරෝති විචිත්තස්ස වා කරණන්ති විචිත්තකරණං—තතෝ විචිත්තකරණා" යනු නිර්වචනයි. විසිතුරු වූ සිතියම් ආදිය කරණහෙයිනැයි යන අර්ථයි. ඒ එසේමැයි; ලෝකයෙහි යම්කිසි චිත්‍ර කර්ම ආදී ප්‍රභේද වූ විසිතුරු ශිල්ප සමූහයක් වේද ඒ සියල්ල සිතින්ම සිතා කරණු ලැබේ. එහෙයින් විසිතුරු දෑ කරණ අර්ථයෙන් චිත්ත නම් වෙයි. එහෙයින් වදාළහ භාග්‍යවතුන් වහන්සේ විසින්; "දිට්ඨං වෝ භික්ඛවේ චරණං නාම චිත්තං, ඒවම්භන්තේ! තම්පි ඛෝ භික්ඛවේ චරණං චිත්තං චිත්තේනේව චින්තිතං" යි.

ඒ අර්ථය තෙමේ විඥප්ති සහිත වූ දෙතිස් චිත්තයන්ට ලැබිය යුත්තේයි. නොහොත් ආශ්‍රව සහිත වූ කුසලාකුසල චිත්තය තෙමේ විසිතුරු ගති ආදිය කරණ හෙයින් විචිත්‍ර කරණාර්ථයෙන් චිත්ත නම් වෙයි. විසිතුරු ගති ආදීහු කර්ම වශයෙන් නිපදනාහු නොවේද්ද යත්? ඒ එසේමැයි; කර්මයාගේ අනේකාකාර බව නිසා සත්වයන්ගේ ගතියෙහි නානාස්වභාවය පැණෙයි. එනම් අපාදකවූ ද ද්විපාදකවූ ද චතුස්පාදකවූ ද බහුප්පාදකවූ ද රූපීවූ ද අරූපීවූ ද සඤ්ඤීවූ ද අසඤ්ඤීවූ ද නේවසඤ්ඤීනාසඤ්ඤීවූ ද සත්වයෝයි. එසේම කර්ම නානාත්වය නිසා සත්වයන්ගේ උපප්‍රාප්තියෙහි අනේක ප්‍රකාර බව හෙවත් උසස් පහත් බව හීන ප්‍රණීත බව පොහොසත් දුප්පත් බව පැණෙයි. කර්ම නානාත්වය නිසා සත්වයන්ගේ ආත්මභාවයෙහි නානාප්‍රකාර බව හෙවත් සුවර්ණ දුවර්ණ බව සුජාත දුර්ජාත බව යහපත් සටහන් අයහපත් සටහන් ඇතිබව පැණෙයි. තවද කර්ම නානත්වය නිසා සත්වයන්ගේ ලෝකධර්මයෙහි හෙවත් ලාභ අලාභයෙහි ද යශස් අයශස්හි ද නින්ද ප්‍රශංසාවෙහි ද සුව දුක් දෙකෙහි ද නානාප්‍රකාරබව පැණෙයි. එහෙයින් කර්ම භේදයෙන් නිපන් ගති ආදීන්ගේ විසිතුරු බව කරන්නාහු කර්මයයි ද චෛතසික ධර්ම වූ චේතනාවයයි ද අභිධ්‍යාදීහු යයිද කියනු ලැබෙත්. සිත යැයි නොකියනු ලැබෙත්.

කෙසේ චිත්තයාගේ විසිතුරු ගති ආදී කරණය වේද යත්? ඊට පරිහාර කියනු ලැබේ. කර්මය ද සිත ඇසුරු කොට ඇති බැවින් කර්මය විසින් නිපදවන ලද්දේ නමුදු සිතින්ම කරණ ලද්දේ වෙයි. යම්සේ රජහුගේ යෝධයා විසින් පරදවනලද සතුරු තෙමේ රජහු විසින් දිනනලද්දේයයි කියනු ලැබේද එමෙනි. "විචිත්තකරණමස්සාති වා විචිත්තකරණං තතෝ" යනුද නිර්වචන හෙයින් විසිතුරු කිරීම මෝහට ඇත්තේනුයි හෝ "විචිත්තකරණ" නම් වෙයි. ඒ එසේමැයි; ඒකස්ථානික වර්පිත චිත්තය තෙමේ වෙන් වෙන්ව ප්‍රතිසන්ධි ආදි විසිතුරු ක්‍රියා ඇති හෙයින් ද සියළුම චිත්තය හෝ ආවර්ජන ආදී ඔවුනොවුන් හා විසදෘශ වූ විසිතුරු ක්‍රියාවත් බැවින් ද විචිත්තකරණය යුත්ත වෙයි. සියළු විකල්පයන්හිම "රූපභවෝ රූපං" යනාදියෙහි මෙන් උත්තරපද ලෝපය වේ. චිත්ත පර්‍යාය විචිත්ත ශබ්දයෙන් ද විග්‍රහය වෙයි. වි-ශබ්ද ලෝපය හෝ වේයැයි දතයුතුයි. නොහොත් "විචිත්තකරණා" යන මේ පදය තෙමේ චිත්ත විචිත්‍ර භාවයාගේ ඥාපකහේතු නිදර්ශන පදයකි. ඒ කරණකොටගෙන යම්හෙයකින් මේ විචිත්‍ර කරණය වේද එහෙයින් ඒ ඒ විචිත්‍ර කර්මය නිපදවන්නා වූ සිත් තෙමේත් එසේම විචිත්‍ර නම් වේයයි දතයුතුයි. මෙසේ කරණ විචිත්‍රතා වශයෙන් විසිතුරු හෙයින් චිත්ත නම් වේ යනු අර්ථයි.෴

කරණ විචිත්‍රතා වශයෙන් වන්නා වූ ඒ විසිතුරු බව හැර තමාගේම ජාති-භූමි-සම්ප්‍රයෝගාදි වශයෙන් විසිතුරු බැවින් ද චිත්ත නම් වනබව දක්වනුයේ "අත්තනෝ චිත්තතාය වා" යනු කීයේයි. යම්හෙයකින් කුසල සිත අනිකක්ම වේද අකුසල් සිත අනිකක්ම වේද අව්‍යාකෘත සිත අනිකක්ම වේද කාමාවචර සිත අනිකක්ම වේද රූපාවචරාදී ප්‍රභේද වූ සිත අනිකක්ම වේද රාග සහිත සිත අනිකක්ම වේද වීතරාග සිත අනිකක්ම වේද ද්වේශ සහිත සිත අනිකක්ම වේද වීතදෝස සිත අනිකක්ම වේද සමෝහ සහිත සිත අනිකක් වේද වීතමෝහ සිත අනිකක් වේද රූපය එල්ඹගෙණ උපදනා සිත අනිකෙක, ශබ්දදිය අරමුණු කොට ඇත්තාවූ සිත අනිකෙක, රූපාලම්බනයන් අතුරෙනුදු නීල වර්ණය එල්ඹගෙන උපදනා සිත අනිකෙක, පීත වර්ණ ආදිය අරමුණු කොට උපදනා සිත් අනිකෙක, මෙසේ ශබ්දදි ආරම්මණයන්හි ද සම්භවවන පරිද්දෙන් අනික් අනික් ප්‍රකාර වේද ඒ සියළු සිත් අතුරෙන් ලාමක වූ සිත අනිකෙක, මධ්‍යම වූ සිත අනිකෙක, ප්‍රණීත වූ සිත අනිකෙක. ලාමකාදි සිත් අතුරෙනුදු ඡන්දය අධිපති කොට උපදනා සිත අනිකෙක, චිත්තය අධිපති කොට උපදනා සිත අනිකෙක, වීර්‍ය්‍ය අධිපති කොට උපදනා සිත අනිකෙක, වීමංසා සඞ්ඛ්‍යාත ප්‍රඥව අධිපති කොට උපදනා සිත අනිකෙකැයි යන මේ ආදී ක්‍රමයෙන් ජාති භූමි සම්ප්‍රයුක්ත ධර්ම ආලම්බන හීන මධ්‍යම ප්‍රණීත අධිපතිහුය යන මේ ආදීන්ගේ වශයෙන් විසිතුරු බව අනේක ප්‍රකාර වේද එහෙයින් මේ තමාගේ විසිතුරු බව ඇති බැවින් හෝ චිත්තය යැයි කියනු ලැබේ.෴

මේ "අත්තනෝ චිත්තතාය" යන පාඨයෙහි කියනලද ප්‍රකාරයෙන් ඉඳින් චිත්තය එකක්ම නොවේද? එසේ නොවතුදු අනේක ප්‍රකාරයෙන් විසිතුරු චිත්තයන්ට ඇතුළත් හෙයින් මේ චිත්තයන් අතුරෙන් යම්කිසි එක් සිතකුදු විචිත්‍ර බැවින් චිත්ත නම් වේයයි කියන්ට වටනේයි. කුමක් හෙයින යත්? සමුදය ව්‍යවහාරයෙන් අවයවයද ව්‍යවහාර කරණු ලබන හෙයිනි. කුමක් මෙන්ද යත්? යම්සේ පර්වත නදී සමුද්‍ර ආදීන්ගේ ඒකදේශයක් දක්නාලද්දහු පර්වතාදීහු දක්නාලද්දහු යයි කියත් ද, යම්සේ එක එක චිත්තයන් හා සම්ප්‍රයුක්ත වූද වේදනාදීහු රාශ්‍යර්ථ වූ ඛන්ධ ව්‍යවහාරයෙන් "වේදනාක්ඛන්ධෝ සඞ්ඛාරක්ඛන්ධෝ" යනාදීන් කියනු ලබත් ද එමෙනි. තවද "විපාකවිඤ්ඤාණං කම්මකිලේසේහි චිතන්ති චිත්තං"යනුද නිර්වචනයි. විපාක විඤ්ඤාණ තෙමේ කර්ම ක්ලේශයන් විසින් රැස්කරණ ලද්දේ වේද එහෙයින් ඒ විපාක

විඥාණ තෙමේ චිත්ත නම් වෙයි. ඒ එසේමැයි; කෙලෙස් සහාය කොට ඇති කර්මය විසින් තමාගේ ඵල භාවයෙන් උපදවන ලද්ද වූ ඒ විපාක විඥාණ තෙමේ කම්ම ක්ලෙශයන් විසින් රැස්කරණ ලද්දේ නම් වෙයි. එබඳු ආකාරය ලෞකික දෙතිස් විපාක විඥාණය සඳහා වේවා ලෝකෝත්තර විපාක විඥාණයට පැමිණ කෙසේ වේද යත්? "කතමේ ධම්මා කුසලා, යස්මිං සමයේ ලෝකුත්තරං මග්ගං භාවේති -පෙ- තස්මිං සමයේ අවිජ්ජා පච්චයා සඞ්ඛාරා" යනාදීන් ආර්‍ය මාර්ග චේතනාවට ද අවිද්‍යාවගේ උපනිශ්‍රය භාවය ප්‍රකාශ කළ හෙයින් ලෝකෝත්තර කුසලයට ද අනුශය ධර්මයෝ උපනිශ්‍රය වෙත්. එහෙයින් එයින් උපදිනලද විපාකයාගේ ද කර්මයෙන් රැස්කරණ ලද බව පර්‍යාය වශයෙන් ලැබේයයි දතයුතුයි. "චිත්තං තායතීති වා චිත්තං" යනුද නිර්වචන හෙයින් කර්ම ක්ලේශයන් විසින් රැස්කරණ ලද ආත්මභාවය රකීනුයි හෝ චිත්ත නම් වෙයි. ඒ එසේමැයි; කර්මාදියෙන් රැස්කරණ ලද්දවූ ද ආත්මභාවය තෙමේ විඥාණය තොරවූ කල්හි මළේ යැයි කියනු ලැබේ.

"ආයු උස්මා ච විඥාණං - යද කායං ජහන්තිමං;
අප්පවිද්ධෝ තද සේති - නිරත්ථංව කලිඞ්ගර"න්ති.

එහි "ආලම්බන්ති තන්නිස්සාය පවත්තන්තීති ආරම්මණං" යනු නිර්වචන හෙයින් ප්‍රත්‍යය ද ගෝචරය ද ආරම්මණ නම් වෙයි. ඒ එසේමැයි; "ලභති මාරෝ ආරම්මණං ලභති මාරෝ ඕතාරං" යනාදි තන්හි ප්‍රත්‍යය ආරම්මණ නම් වෙයි කියනු ලැබේ. "නිමිත්තං අස්සාසපස්සාසා ආරම්මණාමේකචිත්තස්ස" යනාදි තන්හි ගෝචරය ආරම්මණය යයි කියනු ලැබේ. මෙහි වනාහි ඒ දෙකම වටනේයි. කුමක් හෙයින යත්? සියළු චිත්තයටම ප්‍රත්‍යය ගෝචරය යන දෙක ඇති හෙයිනි. "සහ ආරම්මණේන වත්තති තදවිනා භාවතෝති සාරම්මණං" යන සමාස විග්‍රහ හෙයින් එයින් වෙන්ව නොපවත්නා බැවින් අරමුණ හා සමඟ පවතීනුයි සාරම්මණ නම් වෙයි. එහි ද භාව ප්‍රධාන නිර්දේශ වශයෙන් අරමුණු සහිත බව සාරම්මණ ශබ්දයෙන් කියන ලද්දේයි. කුමක් මෙන්ද යත්? "ඉදම්පි බුද්ධේ රතනං පණීතං, චක්ඛු සුඤ්ඤං අත්තේන වා අත්තනියේන වා" යනාදි තන්හි රතන, අත්ත, අත්තනියාදි භාවය රතනාදි ශබ්දයෙන් යම්සේ කියන ලද්දේ වෙයිද එමෙනි. මෙසේ සෙසු තන්හිද සුදුසු පරිද්දෙන් දතයුතුයි. "සවිපාකාවිපාකතෝ" යන මෙහි විපාක ශබ්දතෙමේ දෙයාකාර අර්ථයෙක්හි වැටේ.

හේ කෙසේද යත්? කිසිතැනෙක්හි විපාකබවට පැමිණියා වූ අරූපධර්මයන් කෙරෙහි ද කිසිතැනෙක්හි විපාකෝත්පාදන ස්වභාවයෙහි ද වැටේ. ඒ එසේමැයි; ඒ විපාක ශබ්දතෙමේ "විපාකා ධම්මා" යනාදි තන්හි විපාකබවට පැමිණි අරූපධර්මයන් කෙරෙහි වැටේ. "විපාකධම්මධම්මා" යනාදි තන්හි විපාකෝත්පාදන ස්වභාවයෙහි වැටේ. මෙහි වනාහි විපාකෝත්පාදන ස්වභාවයෙහි වැටේ යැයි දතයුතුයි. එසේ නොගතහොත් අභිඥකුසලාදීහු සවිපාකපදයෙහි අසඞ්ගෘහිත භාව ප්‍රාප්තිය වන්නේය. යම්හෙයකින් විපාක බවට පැමිණි ධර්මයෝම මෙහි ගන්නාලද්දාහු නම් ඒ විපාකධර්මයෝ යම් ධර්මයකට ඇති වෙද්ද ඒ සවිපාක වෙයි. එයින් අන්‍යය අවිපාක වෙයි. අභිඥකුසලයාගේ ද කිසිකලෙක අවිපාක වූ දිට්ඨධම්මවේදනීයාදි කර්මයාගේ ද භාවනාවෙන් පැහියයුතුවූ අකුසලයාගේ ද විපාකෝත්පත්තියක් නොමැති බැවින් අවිපාක පදයෙහි සඞ්ග්‍රහ වන්නේය. එසේ ඇති කල්හි "අවිපාකමබ්‍යාකතං"යි වක්‍ෂමාන බැවින් ඔහුන්ගේ අව්‍යාකෘත භාවප්‍රසඞ්ගය පැමිණෙයි. එයද අභිමත නොවන්නේය. කුමක් හෙයින යත්? කුසලාකුසලනිර්දේශයෙහිම ඔහුන්ගේ නිර්දේශය ඇති හෙයිනි. විපාකෝත්පාදන ස්වභාවය ගත් කල්හි ඔහුන්ගේ ස්වභාවය නම් මුල්නුසුන් අවිද්‍යමාන තෘෂ්ණා අනුශය ඇති සන්තානයෙහි සව්‍යාපාර ප්‍රවෘත්තියම

වේනුයි එයද ඔහුන් කෙරෙහි ඇති බැවින් විපාකුත්පාදන ස්වභාවය නැති කල්හිදු සවිපාක පද සඞ්ග්‍රහය සිද්ධවේනුයි කිසි අභිමතාර්ථ විඝාතයෙක් නොපැමිණෙයි.

"අබ්‍යාකතං" යන මෙහි අව්‍යාකෘත සිත් තෙමේ විපාක ක්‍රියා වශයෙන් දෙවැදෑරුම් වෙයි. ඔවුන් අතුරෙන් විපාක සිත් තෙමේ ආදසතලයෙහි ප්‍රතිබිඹිත වන්නාවූ මුඛ නිමිත්තක් මෙන් නිරුත්සාහ ශාන්ත බැවින් විපාකෝත්පාදනයෙහි අසමර්ථ වෙයි. ක්‍රියා චිත්තයන් අතුරෙහි ද ක්ෂීණාශ්‍රව සන්තානයටම නියත වූ අට මහාක්‍රියාය නව මහග්ගතක්‍රියාය හසිතෝත්පාදයදැයි යන අටළොස් වැදෑරුම් වූ ත්‍රෛයිභූමික වූ යම් විඤ්ඤාණයක් වේද එය සිඳිනාලද භවමූල ඇති සන්තානයෙහි හටගන්නේ වෙයි. එහෙයින් සිඳිනාලද මුල් ඇති වැලෙක හටගත් පුෂ්පයක් මෙන් විපාකදයි නොවෙයි. පඤ්චද්වාරාවර්ජන මනෝද්වාරාවර්ජන යුගලය වනාහි නොසිඳිනාලද භවමූල ඇති සන්තානයෙහි හටගන්නේ නමුදු සමාන ජාතික චිත්තයෙකින් ආසේවන ප්‍රත්‍යය නොලැබීම හේතුකොටගෙන දුර්වල බැවින් බීජ භාවයෙහි අපොහොසත් වූ වාත පුෂ්පයක් මෙන් විපාක රහිතම වෙයි. මෙසේ ඒ සියළු අව්‍යාකෘත චිත්තය තෙම විපාකාභී නොවන හෙයින් "අවිපාකමබ්‍යාකතං"යි කියන ලද්දේයි. "ජායන්ති එතථ අසදිසාපි සදිසාකාරාති ජාති සමානාකාරෝ" යනු නිර්වචනයි. "කුසලාකුසලමබ්‍යාකතානං ජාති කුසලාකුසලමබ්‍යාකතජාති" යනු සමාස විග්‍රහයි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 22-26 පිටු]**

චින්තේතීති චිත්තං, ආරම්මණං විජානාතීති අත්ථෝ. යථාහ "විසයවිජානනලක්ඛණං චිත්ත"න්ති (ධ. ස. අට්ඨ. 1 ධම්මුද්දේසවාරඵස්සපඤ්චමකරාසිවණ්ණනා) සතිපි හි නිස්සයසමනන්තරාදිපච්චයේ න විනා ආරම්මණේන චිත්තමුප්පජ්ජතීති තස්ස තං ලක්ඛණතා වුත්තා, ඒතේන නිරාරම්මණවාදිමතං පටික්ඛිත්තං හෝති. චින්තෙන්ති වා ඒතේන කරණභූතේන සම්පයුත්තධම්මාති චිත්තං. අථවා චින්තනමත්තං චිත්තං. යථාපච්චයං හි පවත්තිමත්තමේව යදිදං සභාවධම්මෝ නාම. ඒවඤ්ච කත්වා සබ්බේසම්පි පරමත්තධම්මානං භාවසාධනමේව නිප්පරියායතෝ ලබ්භති. කත්තුකරණවසේන පන නිබ්බචනං පරියායකථාති දට්ඨබ්බං. සකසකකිච්චේසු හි ධම්මානං අත්තප්පධානතාසමාරෝපනේන කත්තුභාවෝ ච, තදනුකූලභාවේන සහජාතධම්මසමූහේ කත්තුභාවසමාරෝපනේන පටිපාදේතබ්බධම්මස්ස කරණත්තඤ්ච පරියායතෝව ලබ්භති, තථානිදස්සනං පන ධම්මසභාවවිනිමුත්තස්ස කත්තාදිනෝ අභාවපරිදීපනත්ථන්ති වේදිතබ්බං. විචිත්තකරණාදිතෝ චිත්තසද්දත්තං පපඤ්චෙන්ති. අයං පනෙත්ථ සඞ්ගහෝ.

"විචිත්තකරණා චිත්තං - අත්තනෝ චිත්තතාය වා;
චිතං කම්මකිලේසේහි - චිතං තායති වා තථා;
චිනෝති අත්තසන්තානං - විචිත්තතාරම්මණන්ති වා" ති.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා පරමත්ථධම්ම වණ්ණනා යටතේ); විභාවනී ටීකා 14-16 පිටු]**

**යං විඤ්ඤාණං** යම් විඤ්ඤාණයක් තෙම **චින්තේති** සිතන්නේ වේද **ඉති (තස්මා) තං විඤ්ඤාණං** ඒ විඤ්ඤාණය තෙමේ **චිත්තං** චිත්ත නම් වේ. **ආරම්මණං** අරමුණ **විජානාති** විශේෂයෙන් දැනගනී **ඉති (අයං)** මේ වනාහි **අත්ථෝ** අර්ථයි. ("චින්තේති" යන ක්‍රියාවගේ "චිතක්කේති" යන අර්ථය වියයුතු හෙයින් ඒ අර්ථය වලක්වනු පිණිස "විජානාති" යනුවෙන් වර්ණනා කරනලදි. "චින්තේති" යන ක්‍රියාවගේ කර්මය පිණිස "ආරම්මණං" යනු කියනලදි. එසේ අරමුණු දැනගන්නා අර්ථයෙන් සිත් නම් වෙයි යන අර්ථය කවර පාඨයකින් සිද්ධ කටයුතු ද යන චෝද්‍යයට පරිහාර

පිණිස "යථාහ -පෙ- චිත්තන්ති" යන පාඨය කියනලදි. යථාහ යන්නෙහි අර්ථය යටකියන ලදමැයි.) විසයවිජානනලක්ඛණං චිත්තන්ති විසයවිජානනලක්ඛණං චිත්තං යි ආහ කීයේය. **චිත්තං** සිත් තෙම **විසයවිජානනලක්ඛණං** අරමුණු විශේෂයෙන් දැනගැනීම ලක්‍ෂණ කොට ඇත්තේ වේ.

(ආයුෂ්මත් ටීකාචාරිනී සිත් තෙමේ අරමුණෙන් පමණක් තොරව හටගන්නේ නොවෙයි. නිස්සය සමනන්තර ආදී ප්‍රත්‍යයන්ගෙනුදු තොරව හටනොගනී. එතකුදුවුවත් නිස්සය සමනන්තර ආදී ප්‍රත්‍යයන්ගෙනුදු විරහිතව චිත්තය හටගන්නේ යැයි නොකියා අරමුණු දැනගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය යන මාත්‍රය කුමක්හෙයින් යෙදෙන්නේ යන චෝද්‍යයට පරිහාර පිණිස "සතිපි -පෙ- වුත්තා" යන පාඨය කියනලදි)

**විසයවිජානනලක්ඛණං චිත්තන්ති යං වචනං** විසයවිජානනලක්ඛණං චිත්තං යන යම් වචනයක් **මයා** මා විසින් **වුත්තං** කියනලදද? **හි (තදේව සච්චං)** ඒ වචනයම සැබෑයි **නිස්සයසමනන්තරාදිපච්චයේ** නිස්සය සමනන්තර ආදී ප්‍රත්‍යයක් **සතිපි** ඇත්තේහිදු **ආරම්මණේන විනා** අරමුණෙන් තොරව **චිත්තං** සිත් තෙමේ **යස්මා න උප්පජ්ජති** යම්හෙයකින් නූපදීද? **ඉති (තස්මා) තස්ස චිත්තස්ස** ඒ චිත්තයාගේ **තං ලක්ඛණතා** ඒ ආරම්මණවිජානනලක්‍ෂණ ඇති බව වුත්තා කියනලදි. (කර්තෘහු අර්ථකථාචාරීවරයෝයි)

(ආයුෂ්මත් ටීකාචාරිනී "විසයවිජානනලක්ඛණං චිත්තං"යි නොකීයේද? චිත්තයාගේ අරමුණු දැනගන්නා ලක්‍ෂණය ප්‍රකටව තිබියදී කවර අර්ථයක් සඳහා චිත්තයාගේ ආරම්මණ විජානනලක්‍ෂණය අර්ථකථාචාර්‍ය්‍යවරයෝ කීවාහුදැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "ඒතේන -පෙ- හෝති" යන පාඨය කියනලදි) **ඒතේන** ඒ විසයවිජානනලක්ඛණං චිත්තං යන පාඨයෙන් **චිත්තස්ස** චිත්තයාගේ **නිරාලම්බනවාදී මතං** අරමුණෙන් වෙන්ව සිත පවත්නේය යන වාද ඇත්තාහු නිරාලම්බනවාදීන්ගේ මතය **පටික්ඛිත්තං හෝති** ප්‍රතික්‍ෂේප කරනලද්දේ වෙයි. **වා** නොහොත් **කරණභූතේන** කරණකාරකයෙහි වූ **ඒතේන (විඤ්ඤාණේන)** මේ විඤ්ඤාණය කරණකොටගෙන **සම්පයුක්තධම්මා** තමා හා එක්ව යෙදුනාවූ ස්පර්ශාදී ධර්මයෝ **ආරම්මණං** අරමුණ **චින්තෙන්ති** සිතත් **ඉති (තස්මා)** (ඒතේනාති පදේන ඒතේන යන මේ පෙදින් නිද්දිට්ඨං දක්වන ලද්දවූ තං විඤ්ඤාණං ඒ විඤ්ඤාණය තෙමේ චිත්තං චිත්ත නම් වේ) **අථවා** නොහොත් **චින්තනමත්තං** අරමුණු සිතීම් මාත්‍රයක් තෙමේ **චිත්තං** චිත්ත නම් වේ. (චින්තනමත්තං චිත්තං) යන පසුව කී විග්‍රහ පදය භාවසාධනයෙහි සිද්ධ කෙළේයි.

(ආයුෂ්මත් ටීකාචාරිනී කර්තෘසාධන කරණසාධනයන්ගෙන් ලැබිය යුතු අර්ථය ද්‍රව්‍ය වශයෙන් ප්‍රකටව තිබිය දී කුමක්හෙයින් භාවසාධන විග්‍රහය කළේදැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "යථාපච්චයං -පෙ- ධම්මෝ නාම" යන පාඨය කියනලදි) **යදිදං (යෝ අයං) සභාවධම්මෝ නාම** යම් මේ පරමාර්ථ ස්වභාව ධර්මයක් තෙමේ **අත්‍ථි** ඇත්තේ වේද **සෝ සභාවධම්මෝ** ඒ ස්වභාව ධර්ම තෙමේ **යථාපච්චයං** ප්‍රත්‍යයට සුදුසු පරිද්දෙන් **පවත්තිමත්තමේව** හටගැනීම් (පැවතීම්) මාත්‍රයක්ම **හි (යස්මා)** යම්හෙයකින් **හෝති** වේද **තස්මා** එසේවන හෙයින් **චින්තනමත්තං** සිතීම් මාත්‍රයක් තෙමේ **චිත්තං හෝති** චිත්ත නම් වෙයි. (මෙසේ සම්බන්ධකටයුතුයි. "මත්ත" ශබ්දයෙන් ව්‍යාපාර විශේෂය අපේක්‍ෂා කිරීම වලක්වයි. ප්‍රත්‍යයවූ පරිද්දෙන් පවත්නා

මාත්‍රයක්ම පරමාර්ථ ධර්මයන්ගේ ස්වභාවයයි කියනලද වචනයාගේ ලබ්ධව්‍යගුණය ප්‍රකාශ කරණු කැමතිව "ඒවඤ්ච -පෙ- ලබ්භති" යන පාඨය කියනලදි)

**ඒවඤ්ච කත්‍වා** මෙසේ සිත්හි කොට (නොහොත් මෙසේ ප්‍රත්‍යයවූ පරිද්දෙන් පැවතීම් මාත්‍රයක්ම සිත් නම් වෙයි යන කාරණයෙන්) **සබ්බේසම්පි** සියළුම **පරමත්ථධම්මානං** පරමාර්ථ ස්වභාව ධර්මයන්ගේ **භාවසාධනමේව** භාවකාරකයෙහි ශබ්ද නිෂ්පත්තිය වන බවම **නිප්පරියායතෝ** මුඛ්‍ය වශයෙන් **ලබ්භති** ලැබේ. (භාවසාධනයම මුඛ්‍ය වශයෙන් ලැබිය යුතුයැයි ටීකාචාර්‍ය්‍ය තෙමේ කියයි. කර්තෘසාධන කරණසාධනයන්ගේ වශයෙන් ලැබියයුතු නිර්වචනයෝ කෙසේ ලැබෙත් ද යන චෝද්‍යයට පරිහාර පිණිස "කත්තු -පෙ- දට්ඨබ්බං" යන පාඨය කියනලදි) කත්තුකරණවසේන කර්තෘසාධන කරණසාධනයන්ගේ වශයෙන් (පවත්තං යනු පාඨ ශේෂයි) **නිබ්බචනං පන** විග්‍රහය වනාහි **පරියායකථාති** ක්‍රමානන්තර වචනයකැයි **දට්ඨබ්බං** දතයුතුයි. (එසේ කර්තෘසාධන කරණසාධන වශයෙන් ලැබියයුතු වූ විග්‍රහ පදයන්ගේ ක්‍රමානන්තරභාවය ප්‍රකටකොට දක්වන පිණිස "සකසකකිච්චේසු -පෙ- ලබ්භති" යන පාඨය කියනලදි)

("හි" යනු තත්ප්‍රකටීකරනාර්ථයෙහි නිපාතයි) **සකසකකිච්චේසු** තම තමන්ගේ කෘත්‍යයෙහි **ධම්මානං** පරමාර්ථ ධර්මයන්ගේ **කත්තුභාවෝ** කර්තෘ ස්වභාව තෙමේ (කරණත්තං යන්නෙහි "තාව" යනු සම්බන්ධකටයුතුයි) **අත්තප්පධානතා සමාරෝපනේන** ස්වප්‍රධානත්වය මොනවට ආරෝපණය කිරීමෙන් **කත්තුභාවෝ ච** කර්තෘ ස්වභාවය ද **තදනුකූලභාවේන** ඒ කර්තෘ ස්වභාවයට සුදුසු වශයෙන් **සහජාතධම්මසමූහේ** එක්ව උපදනා වූ ධර්ම සමූහයෙහි **කත්තුසමාරෝපනේන** ක්‍රියා නිෂ්පාදක ශක්ති ස්වභාවය මොනවට ආරෝපනය කිරීමෙන් **පටිපාදේතබ්බධම්මස්ස** තමා විසින් නිෂ්පාදනය කටයුතු ධර්මයාගේ **කරණත්තඤ්ච** කරණකාරකභාවය ද **පරියායතෝව** ක්‍රමානන්තරයකින්ම **ලබ්භති** ලැබේ.

(ආයුෂ්මත් ටීකාචාරිනී මෙසේ කර්තෘසාධන කරණසාධනයෝ පරියාය කථා වශයෙන්ම ලැබියයුතු කල්හි මුඛ්‍ය වශයෙන් ලැබියයුතු වූ භාවසාධනයම නොදක්වා කවරාර්ථයක් සඳහා කර්තෘසාධනාදිය ආචාර්‍ය්‍යයන් විසින් දක්වන ලද්දේද යන චෝද්‍යයට පරිහාර වශයෙන් "තථා -පෙ- වේදිතබ්බං" යන පාඨය කියනලදි) **තථා නිදස්සනං පන** කර්තෘසාධන කරණසාධනයන් දැක්වීම වනාහි **ධම්මසභාවවිනිම්මුත්තස්ස** පරමාර්ථධර්ම ස්වභාවයෙන් මිදුනාවූ **කත්තාදිනෝ** කර්තෘ ආදීන්ගේ **අභාවපරිදීපනත්ථං හෝති** අවිද්‍යමානබව දැක්වීම පිණිස වෙයි **ඉති** මෙසේ **වේදිතබ්බං** දතයුතුයි. (දැන් වනාහි චිත්ත ශබ්දයාගේ කියනලද අර්ථයෙන් අන්‍යය වූ අර්ථයෙහිද පවත්නා බව දක්වනු කැමතිව "විචිත්තකරණාදිතෝපි -පෙ- පපඤ්චන්ති" යන පාඨය කියනලදි)

**විචිත්තකරණාදිතෝපි** විසිතුරු කර්මාන්ත කිරීම් ආදී ප්‍රභේදයෙන් ද **චිත්තසද්දස්ස** චිත්ත ශබ්දයාගේ **අත්ථං** අර්ථය **ආචරියා** අර්ථකථාචාර්‍ය්‍යවරයෝ **පපඤ්චන්ති** වර්ණනා කෙරෙත්. (පි ශබ්දය සම්පිණ්ඩනාර්ථයෙහි නිපාතයි. ඒ පි ශබ්දයෙන් ආරම්මණවිජානනලක්‍ෂණ වූ චිත්ත ශබ්දයාගේ අර්ථයන් සම්පිණ්ඩනය කෙරෙත්) **එත්‍ථ** මේ විචිත්තකරණාද්‍යර්ථයෙහි **අයං පන** මේ මතුකියනු ලබන්නේ වනාහි **සඞ්ගහෝ හෝති** සඞ්ග්‍රහය වෙයි. (ආයුෂ්මත් ටීකාචාරිනි මේ මතු කියනුලබන

සඞ්ග්‍රහයයි කීයේය. ඒ කුමක්දැයි යන චෝද්‍යයට පරිහාර වශයෙන් "විචිත්තකරණා -පෙ- විචිත්තාරම්මණන්ති ච" යන ගාථාව කියනලදි)

**විචිත්තකරණා** විසිතුරු කෘත්‍යය ඇති බැවින් **චිත්තං** චිත්ත නම් වේ (මේ ප්‍රථම විකල්පයෙන් විඥප්ති සමුත්ථාපක වූ දෙතිස් චිත්තය දක්වන ලදි නොහොත් ආශ්‍රව ධර්මයන්ට අරමුණ වූ කුසලාකුසල චිත්තයෝ දක්වන ලද්දහුය) **වා** නොහොත් **අත්තනෝ** තමාගේ **විචිත්තතාය** විසිතුරු බැවින් හෝ **චිත්තං** චිත්ත නම් වේ (මේ ද්විතීය විකල්පයෙහි වනාහි ඒකූනනවුති චිත්තුප්පාදයන් අතුරෙන් ඒකේකී චිත්තය ගන්නාලදි) **යං විඤ්ඤාණං** යම් විපාකවිඤ්ඤාණයක් **කම්මකිලේසේහි** කර්ම ක්ලේශයන් විසින් **චිතං** රැස්කරණලද්දේ වේද **ඉති (තස්මා) තං විඤ්ඤාණං** ඒ විඤ්ඤාණ තෙමේ **චිත්තං** චිත්ත නම් වේ (මෙයින් විපාකවිඤ්ඤාණය ලැබේ) **වා** නොහොත් **යං විපාකවිඤ්ඤාණං** යම් විපාකවිඤ්ඤාණයක් තෙමේ **චිතං** කර්ම ක්ලේශයන් විසින් රැස්කරණලද්ද වූ **අත්තභාවං** ආත්මභාවය **තායති** රක්‍ෂාකෙරේද **ඉති (තස්මා)** එසේ ආරක්‍ෂා කරන අර්ථයෙන් **තං විඤ්ඤාණං** ඒ විඤ්ඤාණ තෙමේ **චිත්තං** චිත්ත නම් වේ (චිත්තසද්දූපපදතා ධාතුහු කෙරෙන් ත-ප්‍රත්‍යය වූ තැනි විපාකවිඤ්ඤාණය ලැබේ) **තථා** එපරිද්දෙන් **යං විඤ්ඤාණං** යම් විඤ්ඤාණයක් තෙමේ **අත්තසන්තානං** ආත්මභාවයයි කියනලද ජවනචිත්තපරම්පරාව **චිනෝති** රැස්කෙරේද **ඉති (තස්මා) තං විඤ්ඤාණං** ඒ විඤ්ඤාණ තෙමේ **චිත්තං** චිත්ත නම් වේ (මෙයින් ආසේවනප්‍රත්‍යය ලබන්නාවූ ජවනචිත්ත පරම්පරාව ලැබේ) **යං විඤ්ඤාණං** යම් විඤ්ඤාණයක් තෙමේ **විචිත්තාරම්මණං** විසිතුරු අනේකප්‍රකාර අරමුණු ඇත්තේ **හෝති** වේද **ඉති (තස්මා ච) තං විඤ්ඤාණං** ඒ විඤ්ඤාණ තෙමේ **චිත්තං** චිත්ත නම් වේ (මෙයින් සියළු චිත්තයෝම ලැබෙත්. මේ අන්තිම විකල්පයෙහි වනාහි "චිත්තං අස්ස අත්‍ථීති චිත්තං"යි චිත්ත ශබ්දය අස්සත්‍ථිතද්ධිතයෙහි කටයුතුයි) **අස්ස විඤ්ඤාණස්ස** මේ විඤ්ඤාණයට **චිත්තං** විසිතුරු නානාප්‍රකාර අරමුණු **අත්‍ථි** ඇත්තේ වේද **ඉති (තස්මා) තං විඤ්ඤාණං** ඒ විඤ්ඤාණ තෙමේ **චිත්තං** චිත්ත නම් වේ.

**[විභාවනී ටීකා සන්නය 31-35 පිටු]**

**චිත්ත**න්ති එත්ථ චින්තේතීති චිත්තං. එත්ථච චින්තනක්‍රියා නාම නිච්චං ආරම්මණාපෙක්ඛා හෝති. න හි සා ආරම්මණේන විනා ලබ්භතීති. තස්මා ආරම්මණග්ගහණ ආරම්මණූපලද්ධියේව ඉධ චින්තනාති දට්ඨබ්බාති. ඒවඤ්හි සති භවඞ්ගසමය විසඤ්ඤිසමයේසු චිත්තං ආරම්මණේන විනාපි පවත්තතීති ඒවං වාදීනං වාදෝ පටික්ඛිත්තෝ හෝති. සන්තේසුපිච නිස්සය සමනන්තරාදීසු තස්ස පච්චයේසු තේහි නාමං අලභිත්වා ආරම්මණපච්චයවසේනේවස්ස නාමං සිද්ධන්ති දට්ඨබ්බං. චින්තෙන්ති සම්පයුත්තකා ධම්මා ඒතේනාති චිත්තං. තඤ්හි ආරම්මණග්ගහණකිච්චේ පුබ්බඞ්ගමභූතන්ති තං සම්පයුත්තධම්මාපි ආරම්මණං ගණ්හන්තා තස්ස වසේනේව ගණ්හන්තීති. චින්තනමත්තං වා චිත්තං. සබ්බේපි හි ධම්මා තං තං ක්‍රියාමත්තාව හොන්ති. න තේසු දබ්බං වා සණ්ඨානං වා විග්ගහෝ වා උපලබ්භති. පච්චයායත්ත වුත්තිනෝ ච හොන්ති. න තේ අත්තනෝ ථාමේන වා බලේන වා වසේන වා සත්තියා වා උප්පජ්ජිතුංපි සක්කොන්ති. පගේව චින්තේතුං වා ඵුසේතුං වාති. ඛණමත්තට්ඨායිනෝව හොන්ති, න කදචි කස්සචි වසේ වත්තිතුං සක්කොන්තීති. තස්මා තේසු ඉදං දබ්බං, අයං සත්ති, අයං ක්‍රියාති ඒවං විභාගෝ න ලබ්භතීති දට්ඨබ්බං. ඒවඤ්ච කත්වා සබ්බේසු පරමත්ථපදේසු ඒකං භාවසාධනමේව පධානතෝ ලබ්භති. තදඤ්ඤ සාධනානිපන පරියායතෝව ලබ්භන්තීති වේදිතබ්බං. එත්ථ ච දබ්බාදිවසේන අභේදස්ස චින්තනස්ස අත්ථවිසේසඤපනත්ථං විභාග

කප්පනාවසේන භේදකරණං පරියායකථාති දට්ඨබ්බං. යථා සිලා පුත්තකස්සසරීරන්ති, තථා කරණඤ්ච තං තං ක්‍රියාසඞ්ඛාත ධම්මවිමුත්තස්ස පරපරිකප්පිතස්ස කාරකභූතස්ස අත්තජීවසත්තපුග්ගලස්ස සබ්බසෝ අභාවදීපනත්ථං. සති හි අත්තාදිම්හි කිං අභේදස්ස භේදකප්පනායාති.

**විභාවනියං** පන සසවිසාණං විය අභූතස්ස භූත කප්පනා වුත්තා විය දිස්සති. අයමස්සාධිප්පායෝ-ධම්මේසු කත්තාවා කාරේතාවා කෝචි නත්ථි. ලෝකේ පන අත්තප්පධානෝ ක්‍රියා නිප්ඵාදකෝ කත්තානාම සිද්ධෝ. තස්මා චින්තනකිච්චේ අත්තප්පධානතා දීපනත්ථං තං කත්තුභාවං චිත්තේ ආරෝපෙත්වා චින්තේතීති චිත්තන්ති වුත්තං.

චිත්තස්සච බලේන තංසම්පයුත්තානංපි තස්මිං කිච්චේ තදනුකූලප්පවත්තිදීපනත්ථං පුනකරණභාවං චිත්තේ කත්තුභාවඤ්ච තේසු ආරෝපෙත්වා චින්තෙන්ති සම්පයුත්තකා ධම්මා ඒතේනාති චිත්තන්ති වුත්තන්ති. අපි චෙත්ථ චිත්තසද්දෝ විචිත්‍රත්ථවාචකෝ දට්ඨබ්බෝ. වුත්තඤ්හේතං සංයුත්තකෙ දිට්ඨං වෝ භික්ඛවේ චරණංනාම චිත්තන්ති. ඒවං භන්තේ. තම්පි බෝ භික්ඛවේ චරණං චිත්තං චිත්තේනේව චින්තිතන්ති. තේනාපි බෝ භික්ඛවේ චරණේන චිත්තේන චිත්තඤ්ඤෙව චිත්තතරන්ති, නාහං භික්ඛවේ අඤ්ඤං ඒකනිකායංපි සමනුපස්සාමි යං ඒවං චිත්තං. යථයිදං භික්ඛවේ තිරච්ඡානගතා පාණා. තේපි බෝ භික්ඛවේ තිරච්ඡානගතා පාණා චිත්තේනේව චිත්තිකතා. තේහිපි බෝ භික්ඛවේ තිරච්ඡාන ගතේහි පාණේහි චිත්තඤ්ඤෙව චිත්තතරන්ති.

තත්ථ චරණං නාම චිත්තන්ති යත්ථ විචිත්‍රානි දිබ්බවිමානාදීනි චිත්තකම්මානි කත්වා ඉදඤ්චිදඤ්ච පුඤ්ඤං කරොන්තා ඉධවිධව නිබ්බත්තාති දස්සෙන්තෝ විචරන්ති. තස්ස පටකොට්ඨකස්සේතං නාමං. චිත්තේනාති නිස්සක්කේ කරණවචනං. යථයිදන්ති යථා ඉමේ. චිත්තිකතාති විචිත්‍රාකතා. එත්ථච චිත්තවිචිත්තතාය සඤ්ඤාවිචිත්තා. සඤ්ඤාවිචිත්තතාය තණ්හාවිචිත්තා. තණ්හාවිචිත්තතාය කම්මානි විචිත්තානි. කම්මවිචිත්තතාය යෝනියෝ විචිත්තා. යෝනිවිචිත්තතාය තේසං තිරච්ඡා නගතානං විචිත්තතා වේදිතබ්බා. [වචනත්ථෝ]

**[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 13 යටතේ)]**

චිත්තවචනත්ථේ. නහි සා ආරම්මණේන විනා ලබ්භති. චින්තේතීති වුත්තේ කිං චින්තේති, ආරම්මණං චින්තේතීති ඒවං ආරම්මණභූතේන කම්මපදේන විනා අසම්භවතෝ. තස්මා ඉධ චින්තනාති දට්ඨබ්බා, තස්මා අස්ස නාමං සිද්ධන්ති දට්ඨබ්බන්ති සම්බන්ධෝ. සුතමයඤාණං, චින්තාමයඤාණ'න්ති එත්ථ ආරම්මණස්ස භූතසභාව චින්තාපි අත්ථි, සා පඤ්ඤා ඒවාති තං නිවත්තේතුං "ආරම්මණ…පෙ…. නුපලද්ධියේවා"ති වුත්තං. චිත්තං, මනෝ, මානසං, විඤ්ඤාණ'න්ති සබ්බං චිත්තස්ස නාමං. ආරම්මණපච්චයප්පටිබද්ධං හෝති. න අඤ්ඤපච්චයප්පටිබද්ධං. න ච අඤ්ඤපච්චයේන ලද්ධං නාමං. ඒවරූපස්ස ආරම්මණවිජානනසඞ්ඛාතස්ස අත්ථන්තරස්ස බෝධකං න හෝතීති දස්සේතුං "සන්තේසු වා"තිආදි වුත්තං. "ඒතේනා"ති ඉදං කත්තුනෝ කිරියාසාධනේ අතිස්සයූපකාරකං කරණසාධනං වදතීති දස්සේතුං "තඤ්හී"තිආදි වුත්තං. "චින්තනමත්ත"න්ති එත්ථ මත්තසද්දෝ විසේසනිවත්ති අත්ථෝති, තේන නිවත්තිතං අත්ථං දස්සේති "සබ්බේපිහී"ති ආදිනා. "විග්ගහෝ වා"ති සරීරං වා. පච්චයේන ආයත්තා පච්චයායත්තා. "ආයත්තා"ති සම්බන්ධා. වත්තනං වුත්ති. උප්පජ්ජනං වා

ඨිති වා. පච්චයායත්තා වුත්ති ඒතේසන්ති "පච්චයායත්ත වුත්තිනෝ". "ඨාමේනා"ති ආදි අඤ්ඤමඤ්ඤවේවචනානි. "ඒකං භාවසාධනමේව පධානතෝ ලබ්භතී"ති ඉදං ධම්මානං තං තං කිරියාමත්තභාවං සන්ධාය වුත්තං. කිරියාමත්තභූතාපි පන තේ ධම්මාසයං නානාපච්චයාවත්ථායං ඨිතා වා හොන්ති නානාපච්චයුප්පන්නාවත්ථායං ඨිතා වා. තස්මා පරමත්ථපදේසුපි යථාරහං තදඤ්ඤසාධනානං පටිලාභෝ අවාරිතෝ හෝති. ඉතරථා හෙතුපච්චයෝ, ආරම්මණපච්චයෝ, සහජාතපච්චයෝ, නිස්සයපච්චයෝති ආදීසු කථං භාවසාධනං යුත්තං සියාති. "පධානතෝ"ති මුඛ්‍යතෝ. "අභේදස්ස චින්තනස්ස භේදකරණා"න්ති ඉදං චින්තේතීති චිත්තන්ති කතං කත්තුසාධනං සන්ධාය වුත්තං. "සිලාපුත්තකස්සා"ති භේසජ්ජමූලානං පිසනසිලාපොතකස්ස. තස්ස සරීරං නාම විසුං අඞ්ගං නත්ථි. අභින්නංපි භින්නං කත්වා වුච්චති "සිලාපුත්තකසරීර"න්ති. ඉදං අභේදස්ස භේදකරණං නාම අභූතරූපං හෝති. පයෝජනේ සති වත්තබ්බං, අසති න වත්තබ්බන්ති ආහ "තථාකරණඤ්චා"ති ආදිං. තත්ථ "පරපරිකප්පිතස්සා"ති පරේහි අඤ්ඤතිත්ථාචරියේහි පරිච්චින්තිතස්ස. "සතිහි...පෙ.... කප්පනායා"ති සචේ අත්තා අත්ථි, අත්තා චින්තේති, තස්මා අත්තා චිත්තෝ නාමාති ආදි වත්තබ්බං. න වත්තබ්බං චින්තේතීති චිත්තන්ති, චිත්තස්ස කිරියාමත්තත්තා. න පන අත්තාදිකෝ කත්තා නාම අත්ථි. තස්මා කිරියාමත්තමේව කත්තාරං කත්වා "චින්තේතීති චිත්ත"න්ති වුත්තං. තේන විඤ්ඤායති ලෝකේ අත්තාදිකෝ කත්තා නාම නත්ථීති. ඉදං අභේදස්ස භේදපරිකප්පනාය පයෝජනන්ති වුත්තං හෝති. "අත්තප්පධානෝ"ති කිරියාසාධනේ බහූනං කාරකානං මජ්ඣෙ සයං පධානෝ සයං ජෙට්ඨකෝ හුත්වා. "තං කත්තුභාව"න්ති ලෝකේ සිද්ධං කත්තුභාවං. "පුන කරණභාව"න්ති පුන ලෝකේ සිද්ධං කරණභාවං. ඒවං චිත්තස්ස වචනත්ථං දස්සෙත්වා ඉදානි තස්ස අභිධානත්ථං දස්සෙන්තෝ "අපිචෙත්ථා"ති ආදිමාහ. යථයිදං යේ ඉමේ තිරච්ඡානගතා පාණා චිත්තා විචිත්තා. ඒවං චිත්තං විචිත්තං යං අඤ්ඤං අත්ථි, තං අඤ්ඤං ඒකනිකායම්පි න සමනුපස්සාමී'ති යෝජනා. "නිකාය"න්ති සත්තජාතිසමූහං. "නිස්සක්කේ කරණවචන"න්ති විභත්තාපාදනත්ථේ කරණවචනං. ඒතේන තතෝ චරණතෝ චිත්තතෝති අත්ථං වදති.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 13 යටතේ)]**

**චිත්තං ඉති** චිත්තං යන **එත්ථ** මෙහි (**ආරම්මණං** අරමුණ) **චින්තේතීති** සිතයිනුයි **චිත්තං** චිත්ත නම් **එත්ථ ච** මෙහි ද **චින්තනක්‍රියා නාම** චින්තන ක්‍රියාව නම් **නිච්චං** නිරතුරුව **ආරම්මණාපෙක්ඛා හෝති** අරමුණ අපේක්‍ෂා කරන්නේ වෙයි **සා** ඒ සිතීමේ ක්‍රියාව **ආරම්මණේන විනා** අරමුණක් නැතිව **න හි ලබ්භති** නොලබයි **තස්මා** එහෙයින් **ආරම්මණග්ගහණ** අරමුණ ගැණීම **ආරම්මණුපලද්ධියේව** අරමුණ ලැබීමම **ඉධ** මෙහි **චින්තනාති** සිතීම යැයි **දට්ඨබ්බා** දතයුත්තීය **ඒවඤ්හි සති** මෙසේ ඇති කල්හි **භවඞ්ගසමය** භවඞ්ග කාලය **විසඤ්ඤිසමයේසු** ක්ලාන්ත වූ කාලයන්හි **චිත්තං** චිත්තය **ආරම්මණේන විනාපි** අරමුණක් නැතිව ද **පවත්තතීති** පවතී යැයි **ඒවං (ඉමිනා යථා වුත්තනයේන)** යම්සේ මේ කියනලද ක්‍රමයෙන් **වාදීනං** වාද ඇත්තන්ගේ **වාදෝ** වාදය **පටික්ඛිත්තෝ හෝති** ප්‍රතික්‍ෂේප කරනලද්දේ වෙයි **නිස්සය-සමනන්තරාදීසු** නිශ්‍රය සමනන්තරාදී **පච්චයේසු සන්තේසුපි ච** ප්‍රත්‍යය ඇති කල්හි ද **තස්ස (චිත්තස්ස)** ඒ චිත්තයට **තේහි නාමං අලභිත්වා** නිශ්‍රය ආදී ප්‍රත්‍යය ධර්මයන් කරණකොටගෙන නාමය නොලැබ **ආරම්මණපච්චයවසේනේව** ආරම්මණ ප්‍රත්‍යය වශයෙන්ම **අස්ස (චිත්තස්ස)** ඒ චිත්තයට **නාමං සිද්ධන්ති** නාමය සිද්ධ යැයි **දට්ඨබ්බං** දතයුතුය **සම්පයුත්තකා ධම්මා** සම්ප්‍රයුක්තක ධර්මයෝ **ඒතේන** මෙය කරණකොටගෙන **චින්තෙන්ති** සිතත්නුයි **චිත්තං** චිත්තය නම් **තඤ්හි** ඒ චිත්තය වනාහි **ආරම්මණගහණකිච්චේ** ආරම්මණ ගැණීම් කිසෙහි **පුබ්බඞ්ගමභූතන්ති**

පූර්වාඞ්ගම වන ලද්දේනුයි **ආරම්මණං ගණ්හන්තා** අරමුණ ගන්නාවූ **තං සම්පයුත්තධම්මාපි** ඒ චිත්තය හා සම්ප්‍රයුක්තක ධර්මයෝ ද **තස්ස වසේනේව** චිත්තයාගේ වශයෙන්ම (**ආරම්මණං** අරමුණ) **ගණ්හන්ති** ගනිත් **චින්තනමත්තං වා** සිතීම් මාත්‍රයම හෝ **චිත්තං** චිත්තය නම් **සබ්බේපි හි ධම්මා** සියළු ධර්මයෝ ද වනාහි **තං තං ක්‍රියාමත්තාව** ඒ ඒ ක්‍රියා මාත්‍රයම **හොන්ති** වෙති **තේසු** ඒ ධර්මයන්හි **දබ්බං වා** ද්‍රව්‍යයක් හෝ **සණ්ඨානං වා** සටහනක් හෝ **විග්ගහෝ වා** ශරීරයක් හෝ **න උපලබ්භති** විද්‍යමාන නොවෙයි **පච්චයායත්තවුත්තිනෝ ච** ප්‍රත්‍යය හා සම්බන්ධ පැවතුම් ඇත්තෝ ද **හොන්ති** වෙති **තේ** ඔවුහු **අත්තනෝ** තමාගේ **බලේන වා** බලයෙන් හෝ **වසේන වා** වසඟයෙන් හෝ **සත්තියා වා ථාමේන වා** ශක්තියෙන් හෝ **උප්පජ්ජිතුම්පි** ඉපදීමට ද **න සක්කොන්ති** නොහැකිවෙත් **චින්තේතුං වා** සිතන්නට හෝ **ඵුසේතුං වා** ස්පර්ශ කරන්නට හෝ **ඉති** යැයි **පගේව** කියනු කිම **ඛණමත්තට්ඨායිනෝ ච හොන්ති** ක්‍ෂණ මාත්‍රයකගේ පැවතුම් ඇත්තෝ වෙති **කදචි** කිසිකලෙක **කස්සචි වසේ** කිසිවෙකුගේ වසඟයෙහි **වත්තිතුං** පවතින්නට **න සක්කොන්ති** නොහැකිවෙති **තස්මා** එහෙයින් **තේසු** ඔවුන් කෙරෙහි **ඉදං දබ්බං** මේ ද්‍රව්‍යය **අයං සත්ති** මේ ශක්තියය **අයං ක්‍රියාති** මේ ක්‍රියායයි **ඒවං** මෙසේ **විභාගෝ** විභාගය **න ලබ්භතීති** නොලබයි යැයි **දට්ඨබ්බං** දතයුතුයි **ඒවඤ්ච කත්වා** මෙසේද කොට **සබ්බේසු පරමත්ථපදේසු** සියළු පරමාර්ථ පදයන්හි **ඒකං භාවසාධනමේව** එක් ක්‍රියාමාත්‍ර භාවයක්ම **පධානතෝ** ප්‍රධාන වශයෙන් නොහොත් මුඛ්‍ය වශයෙන් **ලබ්භති** ලබයි **තදඤ්ඤසාධනානි පන** කර්තෘ සාධන කරණ සාධනයෝ වනාහි **පරියායතෝව** පර්‍යාය වශයෙන්ම **ලබ්භන්තීති** ලබත් යැයි **වේදිතබ්බං** දතයුතුයි **එත්ථ ච** මෙහි ද **දබ්බාදිවසේන** ද්‍රව්‍යාදී වශයෙන් **අභේදස්ස චින්තනස්ස** නොබෙදූ සිතීමගේ **අත්ථවිසේසඤාපනත්ථං** අර්ථ විශේෂය ප්‍රකටකිරීම පිණිස **විභාගකප්පනාවසේන** බෙදීම කල්පනා කිරීම් වශයෙන් **භේදකරණං** භේද කරණය **පරියායකථාති** පර්‍යාය කථාවක් යැයි **දට්ඨබ්බං** දතයුතුයි ")අභේදස්ස චින්තනස්ස භේදකරණං" යන මෙය "චින්තේතීති චිත්තං" යන කර්තෘසාධනය සඳහා කරනලදැයි කියනලදි යනු අනුදීපනී ටීකා (**සිලාපුත්තකස්ස සරීරං ඉති** බෙහෙත් මුල් අඹරන අත්ගලගේ ශරීරය **යථා** යම්සේ ද  නොබිඳෙන ලද්දේ .අත්ගලගේ ශරීරයක් යැයි වෙනම අඩිගක් නම් නැත) " ද බිඳුනු දෙයක් කොටසිලාපුත්තකසරීරං" යැයි කියනුලැබේ (**තථා කරණඤ්ච** එසේ නොබිඳෙනලද්දගේ භේද කිරීම නම් **තං තං ක්‍රියාසඞ්ඛාතධම්මවිමුත්තස්ස** ඒ ඒ ක්‍රියා සඞ්ඛ්‍යාත ධර්මයෙන් මිදුනාවූ **පරපරිකප්පිතස්ස** අන්‍ය තීර්ථකාචාර්‍යයන් විසින් සිතනලද්ද වූ **කාරකභූතස්ස** කාරකයෙක් වූ **අත්තජීවසත්තපුග්ගලස්ස** ආත්ම ජීව සත්ව පුද්ගලයෙකුගේ **සබ්බසෝ** සියළු ආකාරයෙන් **අභාවදීපනත්ථං** අභාවය දැක්වීම පිණිසයි **අත්තාදිම්හි සති හි** ආත්ම ආදිය ඇති කල්හි **අභේදස්ස** අභේදයාගේ **භේදකප්පනාය** භේදය කල්පනා කිරීමෙන් **කිං?** කිම ?**ඉති** පරිහාරය කියනු ලැබේ **සචේ** ඉදින් **අත්තා අත්ථි** ආත්මයක් ඇත්තේ නම් **අත්තා** ආත්මය **චින්තේති** සිතයි  (සිතීමේ ක්‍රියාව කරයි)**තස්මා** එහෙයින් **චිත්තෝ නාමාති** සිත නම් **අත්තා** ආත්මයක් **ආදි වත්තබ්බං** ආදිය ලෙස කිවයුතුයි **චින්තේතීති චිත්තං** සිතානුයි සිත **චිත්තස්ස** චිත්තයාගේ **කිරියාමත්තත්තා** ක්‍රියා මාත්‍රයක් බැවින් )**අත්තාති** ආත්මයක් යැයි (**න වත්තබ්බං** නොකියයුතුයි **අත්තාදිකෝ කත්තා නාම** ආත්මාදී කරන්නෙකු නම් **න පන අත්ථි** ඇත්තේ නොවෙයි **තස්මා** එහෙයින් **කිරියාමත්තමේව** ක්‍රියා මාත්‍රයම **කත්තාරං කත්වා** කරන්නෙකු කොට "චින්තේතීති චිත්තං" යැයි **වුත්තං** කියනලදි **තේන** එහෙයින් **ලෝකේ** ලෝකයෙහි **අත්තාදිකෝ කත්තා නාම** ආත්මාදී කරන්නේකු නම් **නත්ථීති** නැත යැයි **විඤ්ඤායති** හැගෙයි **ඉදං** මෙය **අභේදස්ස**

අභේදයාගේ **භේදපරිකප්පනාය** භේදපරිකල්පනාව සඳහා **පයෝජනන්ති** ප්‍රයෝජනය යැයි **වුත්තං හෝති** කියනලද්දේ වෙයි.෴

**විභාවනියං පන** විභාවනී ටීකාවෙහි වනාහි **සසවිසාණං විය** සාවෙකුගේ අඟ මෙන් **අභූතස්ස** සිද්ධනොවූ ධර්මයකගේ **භූතකප්පනා විය** සිද්ධවූවක් මෙන් කල්පනා කොට **වුත්තා** කියනලද්දේ යැයි **දිස්සති** පෙනෙයි **අයං** මේ **අස්ස** පාඨයාගේ **අධිප්පායෝ** අදහසයි **ධම්මේසු** ධර්මයන්හි **කත්තා වා කෝචි** කරන්නා වූ කිසිවෙකු හෝ **කාරේතා වා (කෝචි)** කරවන්නා වූ කිසිවෙකු හෝ **නත්‍ථි** නැත **ලෝකේ පන** ලෝකයෙහි වනාහි **අත්තප්පධානෝ** ආත්මය ප්‍රධාන වූ **ක්‍රියානිප්ඵාදකෝ** ක්‍රියාව නිපදවන්නා **කත්තා නාම** කර්තෘ නම් **සිද්ධෝ** සිද්ධය **තස්මා** එහෙයින් **චින්තනකිච්චේ** සිතීම් කෘත්‍යයෙහි **අත්තප්පධානතා** ආත්මය ප්‍රධාන බැව් **දීපනත්‍ථං** දැක්වීම පිණිස **තං කත්තුභාවං** ඒ කර්තෘ බව **චිත්තේ ආරෝපෙත්‍වා** සිතෙහි ආරෝපණය කොට **චින්තේතීති චිත්තං ඉති** චින්තේතීති චිත්තං යැයි **වුත්තං** කියනලදි.෴

**චිත්තස්ස ච බලේන** චිත්තයාගේ බලයෙන් ද **තං සම්පයුත්තානම්පි** ඒ චිත්තය හා සම්ප්‍රයුක්තක ධර්මයන්ගේ ද **තස්මිං කිච්චේ** ඒ කෘත්‍යයෙහි **තදනුකූලප්පවත්තිදීපනත්‍ථං** ඒයට අනුකූල වූ පැවැත්ම දැක්වීම පිණිස **පුනකරණභාවං** නැවත සිද්ධකරණ බව ද **චිත්තේ** සිතෙහි **කත්තුභාවඤ්ච** කර්තෘ බව ද **තේසු** ඒ සම්ප්‍රයුක්තක ධර්මයන්හි **ආරෝපෙත්‍වා** ආරෝපණය කොට **චින්තේති සම්පයුත්තකා ධම්මා ඒතේන ඉති** චින්තේති සම්පයුත්තකා ධම්මා ඒතේන යනුවෙන් **චිත්තං ඉති** චිත්තයයි **වුත්තං** කියනලදි **අපි චෙත්‍ථ** එසේවුවත් මෙහි **චිත්තසද්දෝ** චිත්ත ශබ්දය **විචිත්‍රත්‍ථවාචකෝ** විචිත්‍ර අර්ථ වාචකයයි **දට්ඨබ්බෝ** දතයුතුයි **සංයුත්තකේ** සංයුත්ත පෙළෙහි **භික්ඛවේ** මහණෙනි **වෝ** නුඹලා විසින් **චරණං නාම චිත්තං** චරණ නම් සිතියම **දිට්ඨං** දකිනලදිද? **ඒවං භන්තේ** එසේය භාග්‍යවතුන් වහන්ස **භික්ඛවේ** මහණෙනි **තම්පි ඛෝ චරණං චිත්තං** ඒ චරණ නම් සිතියම **චිත්තේනේව** සිතින්ම **චින්තිතං** සිතනලදි **භික්ඛවේ** මහණෙනි **තේනාපි ඛෝ චරණේන චිත්තේන** ඒ චරණ නම් සිතියමට වඩා **චිත්තඤ්ඤේව** සිතම **චිත්තතරං** විසිතුරුය **භික්ඛවේ** මහණෙනි **යථයිදං තිරච්ඡානගතා පාණා** මේ තිරිසන්ගත ප්‍රාණීහු යම්බඳු වෙත් ද **භික්ඛවේ** මහණෙනි **ඒවං චිත්තං** මෙසේ විසිතුරු වූ **යං අඤ්ඤං ඒකනිකායම්පි** යම් අන් එක ද සමූහයක් **අහං** මම **න සමනුපස්සාමි** නොදකිමි **භික්ඛවේ** මහණෙනි **තේපි ඛෝ තිරච්ඡානගතා පාණා** ඒ තිරිසන්ගත ප්‍රාණීහු ද **චිත්තේනේව** සිතින්ම **චිත්තිකතා** විසිතුරු වූහ **භික්ඛවේ** මහණෙනි **තේහිපි ඛෝ තිරච්ඡානගතේහි පාණේහි** ඒ තිරිසන්ගත ප්‍රාණීන්ට වඩා **චිත්තඤ්ඤේව** සිතම **චිත්තතරං** ඉතා විසිතුරුය **ඉති** යැයි **ඒතං** මෙය **වුත්තං** වදාරණලදි.෴

**තත්‍ථ** එහි **චරණං නාම චිත්තං ඉති** චරණං නාම චිත්තං යනු **යත්‍ථ** යම්තැනෙක **විචිත්‍රානි දිබ්බවිමානාදීනි** විචිත්‍ර වූ දිව්‍ය විමානාදිය **චිත්තකම්මානි කත්‍වා** සිතුවම් කර්මයන් කොට **ඉදඤ්ච ඉදඤ්ච පුඤ්ඤං කරොන්තා** මේ මේ පින කරන්නෝ **ඉධච්ඡිධ** මේ මේ තැන්හි **නිබ්බත්තා ඉති** උපදින්නාහු යැයි **දස්සෙන්තෝ** දක්වමින් **විචරන්ති** හැසිරෙති **තස්ස පටකොට්ඨකස්ස** මේ වස්ත්‍රයෙන් කළ කොටුවට **ඒතං නාමං** ඒ නමෙකි **චිත්තේන ඉති** චිත්තේන යනු **නිස්සක්කේ** පඤ්චමී අර්ථයෙහි **කරණවචනං** තෘතීයා විභක්ති වචනයෙකි **යථයිදං ඉති** යථයිදං යනු **යථා ඉමේ** යථා ඉමේ යන පද සන්ධියයි **චිත්තිකතා ඉති** චිත්තිකතා යනු **විචිත්‍රාකතා** විසිතුරු වූහ යන අර්ථයි **ඒත්‍ථ ච** මෙහි ද **චිත්තවිචිත්තතාය** චිත්තයාගේ විසිතුරු බව

හේතුකොටගෙන **සඞ්ඛාරවිචිත්තා** සංස්කාරව විසිතුරුය **සඞ්ඛාරවිචිත්තතාය** සංස්කාරවගේ විසිතුරු බව හේතුකොටගෙන **තණ්හාවිචිත්තා** තෘෂ්ණාව විසිතුරුය **තණ්හාවිචිත්තතාය** තෘෂ්ණාවගේ විසිතුරු බව හේතුකොටගෙන **කම්මානි විචිත්තානි** කර්මයෝ විසිතුරුය **කම්මවිචිත්තතාය** කර්මයාගේ විසිතුරු බව හේතුකොටගෙන **යෝනියෝ විචිත්තා** ජාතීහු විසිතුරුය **යෝනිවිචිත්තතාය** ජාතියගේ විසිතුරු බව හේතුකොටගෙන **තේසං තිරච්ඡානගතානං** ඒ තිරිසන්ගත සත්ත්වයන්ගේ **විචිත්තතා** විසිතුරු බව **වේදිතබ්බා** දතයුත්තාහ. **[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

"ආරම්මණං චින්තේති විජානාතීති චිත්තං" යනු නිර්වචනයි. මේ වචනාර්ථය සර්වචිත්තසාධාරණ වශයෙන් කියන ලද්දේය. දුෂ්ප්‍රාඥ වූ පුද්ගලයන්ට විශේෂ වශයෙන් සිතන කල්හි ද සියුම් වූ අර්ථ දැනීමක් නැති හෙයින් "චින්තේති" යන පදයාගේ අර්ථය "විජානාති" යී නොකියයුතු නොවේද? සැබව; "විජානාති" යන පදය චිත්තයාගේ පඤ්ඤ සඤ්ඤ කෘත්‍යයන් කෙරෙන් විශේෂ වූ අරමුණු ගැනීම් අර්ථය දැක්වීමට කී හෙයින් "චින්තේති" යන්න "විජානාති" යී කීයේයයි දතයුතුයි. "චිනෝතීති චිත්තං, විපාකකම්මකිලේසේහි චිතන්ති චිත්තං, චිත්තේති විචිත්තේති චිතිත්තං කරීයති ඒතේනාති චිත්තං" යනු නිර්වචනයි. මේ විග්‍රහයන්හි "චිචයේ" "චිති චින්තායං" යන ධාතූන්ගේ වශයෙන් කීයේයයි දතයුත්තේය. මේ විග්‍රහ වශයෙන් එකම මෝහසහගත චිත්තයාගේ එපරිද්දෙන් විසිතුරු බවක් නැති හෙයින් විසිතුරු කිරීම හේතුකොට ගෙන චිත්ත නම් වේ යන වචනය තෙම කවර හෙයකින් යෙදේ දැයි කියතහොත් ඒ එක එක චිත්තයක්හුගේ විසිතුරු ස්වභාව නැත්තේ නමුත් විසිතුරූ වූ චිත්තයන්ගේ අභ්‍යන්තරයෙහි ප්‍රවේශ වූ හෙයින් පර්වත ගඞ්ගා සමුද්‍ර ආදීන්ගේ ඒකදේශයක් දක්නාලද කල්හි පර්වතාදිය දක්නා ලද්දේයයි කියන්නාක් මෙන් සමුදය ව්‍යවහාරය අවයවයෙහි ආරෝපණය කොට සිත යයි කීම යෝග්‍යයයි දතයුතු.

**[පරමත්ථවිභාවනී ව්‍යාඛ්‍යාව 03-04 පිටු]**

**"ආරම්මණං චින්තේතීති චිත්තං;** අරමුණු සිතන්නේ සිත නමි. රූප ශබ්ද ගන්ධ රස ස්පෂ්ටව්‍ය ධර්ම යන මේ අරමුණු දැනගන්නේය සිත. සියළු සිත් පිළිබඳව පොදුවේ සාමාන්‍යයෙන් මෙසේ කිය හැකිය. **චින්තෙන්ති වා ඒතේනකරණභූතේන සම්පයුත්තාධම්මාති චිත්තං;** මෙය කරණකොට මේ නිසා ස්පර්ශාදී චෛතසික ධර්මයෝ ද අරමුණු සිතති. ස්පර්ශ ආදී සම්ප්‍රයුත්ත ධර්මයන්ගේ අරමුණු සිතීමට, දැනීමට උපකාරක භාවයෙන් සිටියේ සිත නමි. සිත ඒ ඒ කටයුතු දැනීමට උපකාර භාවයෙන් පවත්නේය. **චින්තනමත්තං චිත්තං;** අරමුණු සිතීම සිත නමි. පරමාර්ථ ධර්ම ක්‍රියා මාත්‍ර බැවින් පරමාර්ථ ධර්ම කෙරෙහි මෙයම ප්‍රධාන වේ. **විචිත්තකරණා චිත්තං;** විසිතුරු කරන බැවින් සිත නමි. ලෝකයෙහි ඇතිතාක් සියළු විසිතුරු දේවල ඉපැත්ම සිත කරණ කොටම වන්නේය. සිතියම් කරණු කැමති සිත්කරුහට සිතියමක් කරණු කැමති විට පළමු කොට ඒ පිළිබඳ සිත උපදනේය. ඒ පිණිස ඉරි ගැසීම් ආදී වූ ක්‍රියා සිතින්ම පහළ වේ. ඉන්පසු තමන් කැමති සේ එහි සායම් ගෑම ආදිය කරත්. මෙසේ සිතා ඉරි ගසා සායම් යොදා අවසන් කළ විට විසිතුරු සිතියමක් පහළ වේ. මේ විසිතුරු සිතියම පහළවීමට උපකාර වූයේ සිතය. **අත්තනෝ චිත්තතාය වා චිත්තං;** තමාගේම විසිතුරු බැවින් සිත නමි. සිත ලෝභය හා යෙදුනු විට ලෝභ මූලිකයි ද ද්වේශය හා යෙදුනු විට ද්වේශ මූලිකයි ද මෝහය හා යෙදුනු විට මෝහ මූලිකයි දැයි තෙමේ විසිතුරුය. කාම ලෝකය පිළිබඳ කල්හි කාමාවචර යැයි ද, රූප ලෝකය පිළිබඳ කල්හි රූපාවචර යැයි ද, අරූප ලෝකය පිළිබඳ කල්හි අරූපාවචර යැයි ද විසිතුරුය. **චිතං කම්මකිලේසේහි චිත්තං;** කර්ම, ක්ලේශයන් විසින් කැටිකළ බැවින් සිත නමි. කුසල් අකුසල් කම් විසින්, අවිද්‍යා තෘෂ්ණා උපාදාන යන කෙලෙසුන්

විසින් කැටි වුයේය සිත. **චිතං තායති වා චිත්තං;** කර්ම, ක්ලේශයන් විසින් ඵල භාවයෙන් උපදවන ලද්ද පාලනය කෙරේනුයි සිත නම්. **චිනෝති අත්තසන්තානං චිත්තං;** ආත්මභාවය යැයි ගැනෙන ජවන චිත්ත පරම්පරාව රැස්කරන්නේනුයි සිත නම්. **විචිත්තාරම්මණං චිත්තං;** විසිතුරු වූ නන්වැදෑරුම් වූ අරමුණු ඇත්තේනුයි සිත නම්. **ආරම්මණවිජානනලක්ඛණං චිත්තං,** සිත ලක්‍ෂණ විසින් අරමුණු දැනගැනීම ලකුණු කොට සිටියේය. **පුබ්බඞ්ගමරසං,** වේදනා ආදී චෛතසික ධර්මයන්ට පෙරටුව යන බව කෘත්‍යය කොට සිටියේය. **සන්ධානපච්චුපට්ඨානං,** චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන යන දෙරටු සයෙන් දතයුතු සියළු අරමුණු සිතින්ම දන්නේය. පසු පසු උපදින සිත පළමු පළමු උපන් සිත හා අතර නොතබා ගැළපීම අනන්තර ප්‍රත්‍යය වශයෙන් ගැළපීම වැටහෙන අයුරු මෙහි පච්චුපට්ඨානය වේ. **නාමරූපපදට්ඨානං,** සිත නාම-රූප දෙක ආසන්න කාරණය කොට සිටියේය. පඤ්චවෝකාර භවයෙහි දී නාම-රූප දෙකම සිතට ආසන්න කාරණය වේ. චතුවෝකාර භවයෙහි දී නාමය පමණක්ම ආසන්න කාරණය වේ යැයි දතයුතුය." **[සද්ධර්මසාගරය 2/415-419 පිටු]**

**"ආරම්මණං චින්තේතීති චිත්තං" යං ධම්මජාතං** යම් ධර්ම ස්වභාවයක් තෙමේ **ආරම්මණං** අරමුණ **චින්තේති** සිතයි ද **ඉති** එසේ අරමුණ සිතන හෙයින් **තං ධම්මජාතං** ඒ අරමුණ සිතන ස්වභාවය **චිත්තං** චිත්ත නම් වේ.

**[අභිධර්ම ප්‍රකාශය 06 පිට]**

චිත්තං යන පදයෙහි "චි" ධාතුව යැයි කල්පනා කොට, **ජවන වීථි වසේන අත්තනෝ සන්තානං චිනෝතීති චිත්තං**, යනුවෙන් විග්‍රහ කරණු. **යං** යම් විඤ්ඤාණයක් තෙමේ **ජවන වීථි වසේන** ජවන චිත්තයන්ගේ වශයෙන් **අත්තනෝ** තමාගේ **සන්තානං** පරම්පරාව **චිනෝති** රැස්කරන්නේ වේද **ඉති (තස්මා)** එසේ හෙයින් ඒ පරම්පරා තොමෝ **චිත්තං** චිත්ත නම් වේ. විකල්පයෙන් "චින්ත" ධාතුව යැයි කල්පනා කොට **ආරම්මණං චින්තේතීති චිත්තං** යනුවෙන් විග්‍රහ කරණු. **ආරම්මණං** අරමුණ **චින්තේතීති** සිතන්නේනුයි **ඉති (තස්මා)** එසේ හෙයින් **චිත්තං** චිත්ත නම් වේ. උග්‍රහන චින්තාය, විජානන චින්තාය, පජානන චින්තාය යැයි මොවුන්ගේ වශයෙන් ත්‍රිවිධාකාර ඇත්තේය. ඒ ත්‍රිවිධාකාරයන් අතරින්; විතර්කයෙන් කල්පනා කිරීම උග්‍රහන චින්තා නම් වේ. විඤ්ඤාණයෙන් කල්පනා කිරීම විජානන චින්තා නම් වේ. ප්‍රඥාවෙන් කල්පනා කිරීම පජානන චින්තා නම් වේ. මේ ස්ථානයෙහි විජානන චින්තාව ගැනෙත්. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 08 පිට]**

**"චිත්තං"** යන්නට සිත යැයි අර්ථය නොදී **"චිත්තං විඤ්ඤාණක්ඛන්ධෝ"** යනු කුමක් හෙයින් අර්ථ වර්ණනා කළේද යත්? **"චිත්ත"** ශබ්දය විචිත්‍රාර්ථය, චිත්‍ර කර්මාන්තය, චිත්‍රා නම් නක්‍ෂත්‍රය, චිත්‍ර නම් වෘෂභයාය, චිත්‍ර නම් ගෘහපතියාය, චිත්‍ර නම් උද්‍යානය යන මෙතෙක් අර්ථයන්හි පවත්නා හෙයින් ඒ අර්ථයෙන් වලක්වා ආලම්බන විජානන ස්වභාව ඇත්තා වූ චිත්තයෙහි පවත්තා බව හගවනු පිණිස **"විඤ්ඤාණක්ඛන්ධෝ"** යනු කීහ. **[විස්තර භාව සන්නය 08 පිට]**

මෙහි "පරමෝ උත්තමෝ අවිපරීතෝ අත්ථෝ පරමස්ස වා උත්තමස්ස ඤාණස්ස අත්ථෝ ගෝචරෝති පරමත්ථෝ, තතෝ පරමත්ථතෝ, රූපාදි ආරම්මණං චින්තේති විජානාතීති චිත්තං" මෙහි නිශ්‍රය සමනන්තරාදි ප්‍රත්‍යයන් ඇති කල්හිදු ආලම්බනයක් නැතිව චිත්තයා නූපදින හෙයින් චිත්තයාගේ ආලම්බන විජානන ලක්‍ෂණත්වයම කියන ලදි. මෙයින් "චිත්තය නිරාලම්බනිකය" යන වාදීන්ගේ මතය ප්‍රතික්ෂිප්තයි.

"චින්තෙන්ති වා ඒතේන සම්පයුත්තධම්මාති චිත්තං" නොහොත් "චින්තනමත්තං චිත්තං" සිතීම් මාත්‍රය චිත්ත නම් වේ. එසේමැයි ස්වභාව ධර්ම නම් වූ යම් මේ ස්වරූපයක් ඇද්ද හෙතෙමේ ස්වකීය ස්වකීය ප්‍රත්‍යය වූ පරිද්දෙන් ප්‍රවෘත්ති මාත්‍රයක්මය. එසේ හෙයින් සියළු පරමාර්ථ ධර්මයන්ගේ භාවසාධනයම නිෂ්පර්‍ය්‍යාය හෙයින්ම ලැබෙයි. කර්‍තෘ කරණ වශයෙන් නිර්වචනය වනාහි පර්‍ය්‍යායකථා යැයි දතයුතු. එසේ හෙයින් ධර්මයන්ගේ ස්වකීය ස්වකීය කෘත්‍යයෙහි ආත්ම ප්‍රධානත්වය සමාරෝපණයෙන් කර්‍තෘත්වය ද, තදනුකූලත්වයෙන් සහජාත ධර්ම සමූහයෙහි කර්‍තෘත්ව-සමාරෝපණයෙන් ප්‍රතිපාදනය කටයුතු ධර්මයාගේ කරණත්වය ද පරියායෙන් ලැබෙන්නේය. එසේ පර්‍ය්‍යාය වූ කර්‍තෘ කරණ වශයෙන් නිද්දේශය වනාහි ධර්ම ස්වභාවයෙන් විනිර්මුක්ත වූ කර්‍තෘ ආදිහුගේ අභාවය ප්‍රකාශ කරණු පිණිසයයි දතයුතු. විචිත්‍රකරණාද්‍යර්ථයෙනුදු චිත්ත නම් වේ. කියන ලදමැයි.

"විචිත්තකරණා චිත්තමත්තනෝ චිත්තතාය වා
චිතං කම්මකිලේසේහි චිතං තායති වාතථා
චිනෝති අත්තසන්තානං විචිත්තාරම්මණන්ති වා" යි

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 05 පිට; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ පුරාණ සන්නය 06-07 පිට]**

**චිත්තය** හෙවත් සිත යනු පරමාර්ථ වශයෙන් හා අපරමාර්ථ වශයෙන් ද ඇත්තා වූ අනේකප්‍රකාර අර්ථයන් පිළිබඳ වූ දැනීමය. **[අභිධර්මයේ මූලික කරුණු 37 පිට]**

පරමාර්ථ සතර අතරින් චිත්තය යනු දැනීමය. ඇස, කණ, නාසය, දිව, කය යන මේ ඉන්ද්‍රිය පස නිසාත්, සුද්ධ මනෝද්වාරය නිසාත් ඒ දැනීම ඇති වේ. ඉන්ද්‍රියන්හි අරමුණු ගැටෙන කල්හි ඒවා සම්බන්ධයෙන් වෙන වෙනම සිත් ඇති වේ. ඒ දැනීම් සියල්ලම ක්‍රියාවෝය. එබැවින් ඇතිවන සිත් සියල්ලම එකෙනෙහිම නැති වේ. දැනීම් මාත්‍රයම චිත්තය හෙවත් සිත බව මතක තබා ගතයුතුය. **[අභිධර්ම මාර්ගය 25 පිට]**

"චිත්තං විසයගාහං තං පාකාපාකදතෝ දුධා
කුසලාකුසලං පුබ්බං පරමබ්‍යාකතං මතං"

**චිත්තං** විඤ්ඤාණස්කන්ධ සඞ්ඛ්‍යාත චිත්තය **විසයගාහං** ආලම්බන ග්‍රහනය හෙවත් අරමුණු දැනගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය. **තං** ඒ චිත්තය **පාකාපාකදතෝ** විපාක දන අවිපාක දන භාවයෙන් හෙවත් සවිපාක අවිපාක භාවයෙන් **දුධා** ද්වි ප්‍රකාරයෙන් විභත්තය. **කුසලාකුසලං** එක්විසි කුසල් සිත් දොළොස් අකුසල් සිත් එකතුව ත්‍රයත්ත්‍රිංශද්විධ වූ කුශලාකුශල චිත්තය **පුබ්බං** පූර්වෝක්ත විපාක දන චිත්තය ඉද **අබ්‍යාකතං** සතිස් විපාක සිත් සමවිසි ක්‍රියා සිත් එකතුව පස්පණස් වැදෑරුම් වූ අව්‍යාකෘත චිත්තය **පරං** පශ්වාදුක්ත අවිපාක දන චිත්තය යයි **මතං** දන්නා ලදී.

"චින්තේතීති චිත්තං විසයං ආරම්මණං ගණ්හාතී" ති විසයගාහං මෙයින් ආරම්මණ විජානන ලක්‍ෂණය කියන ලද්දේ වේ. එහෙයින් කීහ; "විසයවිජානන ලක්ඛණං චිත්තං" යි. නිශ්‍රය සමනන්තරාදී ප්‍රත්‍යය ශක්තිය ඇති කල්හිදු අරමුණක් නැතිව චිත්තය නුපදනා හෙයින් චිත්තයාගේ තල්ලක්‍ෂණත්වය කියන ලදී. එහෙයින් චිත්තය නිරාලම්බනිකය යන වාදීන්ගේ මතය ප්‍රතික්‍ෂිප්තයි. "චින්තේති වා ඒතේන කරණභූතේන සම්පයුත්තධම්මාති චිත්තං, චින්තනමත්තං චිත්තං" මේ කරණකොට ගෙන සම්ප්‍රයුක්ත ධර්මයෝ සිතන්නේනුයි හෝ චිත්ත නම්. සිතීම් මාත්‍රය හෝ චිත්ත

නම් වේ. ඒ එසේමැයි ස්වභාව ධර්ම නම් වූ මේ ස්වරූපයෙක් ඇද්ද හෙතෙමේ ස්වකීය ස්වකීය ප්‍රත්‍යය වූ පරිද්දෙන් ප්‍රවෘත්ති මාත්‍රයෙක්මය, එසේහෙයින් සියළු පරමාර්ථ ධර්මයන්ගේ භාව සාධනයම නිශ්පයඝීාය හෙයින්ම ලැබෙයි. කර්තෘ කරණ වශයෙන් නිර්වචනය වනාහි පරියාය කථායයි දතයුතු. එසේ හෙයින් ධර්මයන්ගේ ස්වකීය ස්වකීය කෘත්‍යයෙහි ආත්ම ප්‍රධානත්ව සමාරෝපණයෙන් කර්තෘත්වය ද තදනුකූලත්වයෙන් සහජාත ධර්ම සමූහයෙහි කර්තෘත්ව සමාරෝපණයෙන් ප්‍රතිපාදනය කටයුතු ධර්මයාගේ කරණත්වය ද පරියාය භාවයෙන් ලැබෙන්නේය. එසේ පරියාය වූ කර්තෘ කරණ නිර්දේශය වනාහි ධර්ම ස්වභාවයෙන් විනිර්මුක්ත වූ කර්තෘ ආදීහුගේ අභාවය ප්‍රකාශ කරණු පිණිස යැයි දතයුතු. විචිත්‍රකරණා අර්ථයෙනිදු චිත්ත ශබ්දයාගේ අර්ථය විස්තර කෙරෙත්. මේ වනාහි එහි සඞ්ග්‍රහ මාත්‍රයෙකි;

"විචිත්තකරණා චිත්තමත්තනෝ චිත්තතාය වා
චිතං කම්මකිලේසේහි චිතං තායති වාතථා
චිනෝති අත්තසන්තානං විචිත්තාරම්මණන්ති වා"

**[සච්චසඞ්ඛේප ටීකා සන්නය 84-85 පිටු]**

## සිතට වෙනත් නම්:—

කතමං තස්මිං සමයේ චිත්තං හෝති? යං තස්මිං සමයේ චිත්තං මනෝ මානසං හදයං පණ්ඩරං මනෝ මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධෝ තජ්ජාමනෝවිඤ්ඤාණධාතු ඉදං තස්මිං සමයෝ චිත්තං හෝති.

**[ධම්මසඞ්ගණී පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 06 යටතේ); ධම්මසඞ්ගණී පාළි 28 පිට (බු. ජ)]**

කවරෙක් එසමයෙහි චිත්ත වෙයි ද යත්? එසමයෙහි යම් චිත්තයෙක් මනසෙක් මානසෙක් සිතෙක් (පණ්ඩර වූ) භවඞ්ග සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඤ්ඤාණයෙක් විඤ්ඤාණස්කන්ධයෙක් තදනුරූප වූ මනෝවිඤ්ඤාණ ධාතුයෙක් වේද මේ එසමයෙහි චිත්තය වෙයි. **[ධම්මසඞ්ගණී ප්‍රකරණය 29 පිට (බු.ජ)]**

චිත්තනිද්දේසේ චිත්තවිචිත්තතාය චිත්තං. ආරම්මණං මිනමානං ජානාතීති **මනෝ. මානස**න්ති මනෝ ඒව. "අන්තලික්ඛචරෝ පාසෝ ය්වායං චරති මානසෝ"ති (සං. නි. 1.151; මහාව. 33) හි එත්ථ පන සම්පයුත්තකධම්මෝ 'මානසෝ'ති වුත්තො.

"කථඤ්හි භගවා තුය්හං, සාවකෝ සාසනේ රතෝ;
අප්පත්තමානසෝ සෙක්ඛෝ, කාලං කයිරා ජනේසුතා"ති. (සං. නි. 1.159);

එත්ථ අරහත්තං 'මානස'න්ති වුත්තං. ඉධ පන 'මනෝව' මානසං. බ්‍යඤ්ජනවසේන හේතං පදං වඩ්ඪිතං.

**හදය**න්ති චිත්තං. "චිත්තං වා තේ ඛිපිස්සාමි, හදයං වා තේ ඵාලෙස්සාමී"ති (සං. නි. 1.237; සු. නි. ආළවකසුත්ත) එත්ථ උරෝ හදයන්ති වුත්තං. "හදයා හදයං මඤ්ඤෙ අඤ්ඤාය තච්ඡතී"ති (ම. නි. 1.63) එත්ථ චිත්තං. "වක්කං හදය"න්ති (දී. නි. 2.377; ම. නි. 1.110) එත්ථ හදයවත්ථු. ඉධ පන චිත්තමේව අබ්භන්තරට්ඨේන 'හදය'න්ති වුත්තං. තමේව පරිසුද්ධට්ඨේන **පණ්ඩරං.** භවඞ්ගං සන්ධායේතං වුත්තං. යථාහ "පභස්සරමිදං, භික්ඛවේ, චිත්තං, තඤ්ච ඛෝ ආගන්තුකේහි උපක්කිලේසේහි උපක්කිලිට්ඨ"න්ති (අ. නි. 1.49). තතෝ නික්ඛන්තත්තා පන අකුසලම්පි, ගඞ්ගාය

නික්ඛන්තා නදී ගඞ්ගා විය, ගෝධාවරිතෝ නික්ඛන්තා ගෝධාවරී විය ච, පණ්ඩරන්ත්වේව වුත්තං.

**මනෝ මනායතනන්**ති ඉධ පන මනොග්ගහණං මනස්සේව ආයතනභාවදීපනත්ථං. තේනේතං දීපෙති 'නයිදං දේවායතනං විය මනස්ස ආයතනත්තා මනායතනං, අථ ඛෝ මනෝ ඒව ආයතනං මනායතන'න්ති. තත්ථ නිවාසට්ඨානට්ඨේන ආකරට්ඨේන සමෝසරණට්ඨානට්ඨේන සඤ්ජාතිදේසට්ඨේන කාරණට්ඨේන ච ආයතනං වේදිතබ්බං. තථා හි ලෝකේ 'ඉස්සරායතනං වාසුදේවායතන'න්තිආදීසු නිවාසට්ඨානං ආයතනන්ති වුච්චති. 'සුවණ්ණායතනං රජතායතන'න්තිආදීසු ආකරෝ. සාසනේ පන "මනෝරමේ ආයතනේ සේවන්ති නං විහඞ්ගමා"තිආදීසු (අ. නි. 5.38) සමෝසරණට්ඨානං. "දක්ඛිණාපථෝ ගුන්නං ආයතන"න්තිආදීසු සඤ්ජාතිදේසෝ. "තත්‍ර තත්‍රේව සක්ඛිභබ්බතං පාපුණාති සති සතිආයතනේ"තිආදීසු (ම. නි. 3.158) කාරණං. ඉධ පන සඤ්ජාතිදේසට්ඨේන සමෝසරණට්ඨානට්ඨේන කාරණට්ඨේනාති තිධාපි වට්ටති.

ඵස්සාදයෝ හි ධම්මා එත්ථ සඤ්ජායන්තීති සඤ්ජාතිදේසට්ඨේනපි ඒතං ආයතනං. බහිද්ධා රූපසද්දගන්ධරසඵොට්ඨබ්බා ආරම්මණභාවේනෙත්ථ ඕසරන්තීති සමෝසරණට්ඨානට්ඨේනපි ආයතනං. ඵස්සාදීනං පන සහජාතාදිපච්චයට්ඨේන කාරණත්තා කාරණට්ඨේනපි ආයතනන්ති වේදිතබ්බං. මනින්ද්‍රියං වුත්තත්ථමේව.

විජානාතීති විඤ්ඤාණං විඤ්ඤාණමේව ඛන්ධෝ **විඤ්ඤාණක්ඛන්ධෝ**. තස්ස රාසිආදිවසේන අත්ථෝ වේදිතබ්බෝ. මහාඋදකක්ඛන්ධොත්වේව සඞ්ඛ්‍යං ගච්ඡතීති (අ. නි. 4.51). එත්ථ හි රාසට්ඨේන ඛන්ධෝ වුත්තෝ. "සීලක්ඛන්ධෝ සමාධික්ඛන්ධෝ"තිආදීසු (දී. නි. 3.355) ගුණට්ඨේන. "අද්දසා ඛෝ භගවා මහන්තං දාරුක්ඛන්ධ"න්ති (සං. නි. 4.241) එත්ථ පණ්ණත්තිමත්තට්ඨේන. ඉධ පන රුළ්හිතෝ ඛන්ධෝ වුත්තෝ. රාසට්ඨේන හි විඤ්ඤාණක්ඛන්ධස්ස ඒකදේසෝ ඒකං විඤ්ඤාණං. තස්මා යථා රුක්ඛස්ස ඒකදේසං ඡින්දන්තෝ රුක්ඛං ඡින්දතීති වුච්චති, ඒවමේව විඤ්ඤාණක්ඛන්ධස්ස ඒකදේසභූතං ඒකම්පි විඤ්ඤාණං රුළ්හිතෝ විඤ්ඤාණක්ඛන්ධෝති වුත්තං.

**තජ්ජාමනෝවිඤ්ඤාණධාතූ**ති තේසං ඵස්සාදීනං ධම්මානං අනුච්ඡවිකා මනෝවිඤ්ඤාණධාතු. ඉමස්මිඤ්හි පදේ ඒකමේව චිත්තං මිනනට්ඨේන මනෝ, විජානනට්ඨේන විඤ්ඤාණං, සභාවට්ඨේන නිස්සත්තට්ඨේන වා ධාතූති තීහි නාමේහි වුත්තං. ඉති ඉමස්මිං ඵස්සපඤ්චමකේ ඵස්සෝ තාව යස්මා ඵස්සෝ ඒව, න තජ්ජාමනෝවිඤ්ඤාණධාතුසම්ඵස්සජෝ, චිත්තඤ්ච යස්මා තජ්ජාමනෝවිඤ්ඤාණධාතු ඒව, තස්මා ඉමස්මිං පදද්වයේ 'තජ්ජාමනෝවිඤ්ඤාණධාතුසම්ඵස්සජා'ති පඤ්ඤත්ති න ආරෝපිතා. විතක්කපදාදීසු පන ලබ්භමානාපි ඉධ පච්ඡින්නත්තා න උද්ධටා.

ඉමේසඤ්ච පන ඵස්සපඤ්චමකානං ධම්මානං පාටියෙක්කං පාටියෙක්කං විනිබ්භෝගං කත්වා පඤ්ඤත්තිං උද්ධරමානේන භගවතා දුක්කරං කතං. නානාඋදකානඤ්හි නානාතේලානං වා ඒකභාජනේ පක්ඛිපිත්වා දිවසං නිම්මථිතානං වණ්ණ ගන්ධරසානං නානතාය දිස්වා වා ඝායිත්වා වා සායිත්වා වා නානාකරණං සක්කා භවෙය්‍ය ඤාතුං. ඒවං සන්තේපි තං දුක්කරන්ති වුත්තං. සම්මාසම්බුද්ධේන පන ඉමේසං අරූපීනං චිත්තචේතසිකානං ධම්මානං ඒකාරම්මණේ පවත්තමානානං

පාටියෙක්කං පාටියෙක්කං විනිබ්භෝගං කත්වා පඤ්ඤත්තිං උද්ධරමානේන අතිදුක්කරං කතං. තේනාහ **ආයස්මා නාගසේනත්ථේරෝ;**

"දුක්කරං, මහාරාජ, භගවතා කතන්ති. 'කිං, භන්තේ නාගසේන, භගවතා දුක්කරං කත'න්ති. 'දුක්කරං, මහාරාජ, භගවතා කතං, යං ඉමේසං අරූපීනං චිත්තචේතසිකානං ධම්මානං ඒකාරම්මණේ පවත්තමානානං වවත්ථානං අක්ඛාතං අයං ඵස්සෝ, අයං වේදනා, අයං සඤ්ඤා, අයං චේතනා, ඉදං චිත්ත'න්ති. 'ඕපම්මං, භන්තේ, කරෝහී'ති. 'යථා, මහාරාජ, කෝචිදේව පුරිසෝ නාවාය සමුද්දං අජ්ඣෝගාහෙත්වා හත්ථපුටේන උදකං ගහෙත්වා ජිව්හාය සායිත්වා ජානෙය්‍ය නු ඛෝ, මහාරාජ, සෝ පුරිසෝ ඉදං ගඞ්ගාය උදකං, ඉදං යමුනාය උදකං, ඉදං අචිරවතියා උදකං, ඉදං සරභුයා උදකං, ඉදං මහියා උදක'න්ති? 'දුක්කරං, භන්තේ, ජානිතු'න්ති. 'තතෝ දුක්කරතරං ඛෝ, මහාරාජ, භගවතා කතං යං ඉමේසං අරූපීනං චිත්තචේතසිකානං ධම්මානං...පෙ.... ඉදං චිත්ත"'න්ති (මි. ප. 2.7.16).

**[ධම්මසඞ්ගණී අට්ඨකථා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසල නිද්දේසවාරකථා අංක 05 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 141-142 පිටු (හේ.වි.මු); මහානිද්දේස අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 01 හා 69 යටතේ); මහානිද්දේස අටුවා 15-16-204-205 පිටු (හේ.වි.මු); පටිසම්භිදාමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 176 යටතේ); පටිසම්භිදාමග්ග අටුවා 359-360 පිටු (හේ.වි.මු)]**

**පාසෝ**ති රාගපාසෝ. සෝ හි නිරාවරණත්තා අන්තලික්ඛචරෝ. අකුසලම්පි **පණ්ඩර**න්ති වුත්තං, කෝ පන වාදෝ කුසලන්ති අධිප්පායෝ. තඤ්හි පණ්ඩරතෝ නික්ඛන්තං සයඤ්ච පණ්ඩරන්ති. අථ වා සබ්බම්පි චිත්තං සභාවතෝ පණ්ඩරමේව, ආගන්තුකෝපක්කිලේසවෝදානේහි පන සාවජ්ජානවජ්ජානං උපක්කිලිට්ඨ විසුද්ධතරතා හොන්තීති. දාරුප්පමාණේසු සිලාදීසු ඛන්ධපඤ්ඤත්තියා අභාවා කිඤ්චි නිමිත්තං අනපෙක්ඛිත්වා දාරුම්හි පවත්තා ඛන්ධපඤ්ඤත්තීති "**පණ්ණත්තිමත්තට්ඨේනා**"ති වුත්තං. තං-සද්දේන මනෝවිඤ්ඤාණධාතුයේව වුච්චෙය්‍ය නිද්දිසිතබ්බත්තාති න තස්සා තජ්ජතා. තේහි ආරම්මණේහි ජාතා **තජ්ජා**ති ච වුච්චමානේ සම්ඵස්සජතා න වත්තබ්බා. න හි සෝ ආරම්මණං, නාපි විසේසපච්චයෝ. "තිණ්ණං සඞ්ගති ඵස්සෝ"ති විඤ්ඤාණමේව ඵස්සස්ස විසේසපච්චයෝති වුත්තෝති තස්මා න විඤ්ඤාණං විසේසපච්චයභූතං සම්ඵස්සජතාය තජ්ජාමනෝවිඤ්ඤාණධාතුසම්ඵස්සජා පඤ්ඤත්තිං ලභති, න ච තදේව තස්ස කාරණභාවේන ඵලභාවේන ච වුච්චමානං සුවිඤ්ඤෙය්‍යං හෝතීති. කිං වා ඒතේන, යථා භගවතා වුත්තා තං සභාවායේව තේ ධම්මාති න ඒවං විධේසු කාරණං මග්ගිතබ්බං.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසල නිද්දේසවාරකථා වණ්ණනා අංක 05 යටතේ)]**

**න තස්සා තජ්ජතා**ති තස්සා මනෝවිඤ්ඤාණධාතුයා තස්සාරුප්පා "තස්ස ජාතා"ති වා උභයථාපි තජ්ජතා න යුජ්ජති. යදිපි ඵස්සෝ විඤ්ඤාණස්ස විසේසපච්චයෝ න හෝති, තථාපි සෝ තස්ස පච්චයෝ හෝතියේවාති තස්ස තජ්ජාමනෝවිඤ්ඤාණධාතුසම්ඵස්සජතා වත්තබ්බාති චෝදනං සන්ධායාහ "**න ච තදේවා**"තිආදි. **තේහි ආරම්මණේහි ජාතා තජ්ජා**ති ඉමිනාපි අත්ථේන තජ්ජා මනෝවිඤ්ඤාණධාතුසම්ඵස්සජාති වත්තුං න සක්කා. විඤ්ඤාණස්ස පන තජ්ජතා පඤ්ඤත්ති ලබ්භතේව. තථා හි "කිං වා ඒතේනා"තිආදිනා ඵස්සාදීනං තථා දේසේතබ්බතං ආහ.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසල නිද්දේසවාරකථා වණ්ණනා අංක 05 යටතේ)]**

**චිත්තවිචිත්තතාය** සිතිවිල්ල විසිතුරු බැවින් **චිත්තං** චිත්ත නම් **ආරම්මණං** අරමුණ **මිනමානං** මනිමින් **ජානාති** දැනගනී **ඉති (තස්මා)** එහෙයින් **මනෝ** මන නම් **මානසං ඉති** මානසං යනු **මනෝ ඒව (අත්ථෝ)** මනම යන අර්ථයි **හි** විශේෂයක් කියමි "අන්තලික්ඛචරෝ පාසෝ ය්වායං චරති මානසෝ" **ඉති** යන **එත්ථ පන** මෙහි වනාහි **සම්පයුත්තධම්මෝ** සම්ප්‍රයුක්ත ධර්මයෝ **මානසෝ ඉති** මානසෝ යනුවෙන් **වුත්තෝ** දේශනා කරනලදි.

**භගවා!** භාග්‍යවතුන් වහන්ස! **තුය්හං** ඔබවහන්සේගේ **සාසනේ** සසුනෙහි **රතෝ** ඇලුණු **අප්පත්තමානසෝ** නොපැමිණි අර්හත් ඵලය ඇති **ජනේසුතෝ** ජනයා අතර ප්‍රසිද්ධ වූ **සේඛෝ සාවකෝ** ශෛක්‍ෂ වූ ශ්‍රාවක තෙමේ **කථඤ්හි** කෙසේ නම් **කාලං කයිරා?** කාලක්‍රියා කෙරේද? **ඉති එත්ථ** යන මෙහි **අරහත්තං** රහත් බව **මානසං ඉති** මානසං යනුවෙන් **වුත්තං** දේශනා කරනලදි **ඉධ පන** මෙහි වනාහි **මනෝ ඒව** සිතම **මානසං (ඉති වුත්තං)** මානසං යනුවෙන් දේශනා කරනලදි **ඒතං පදං හි** මේ පදය වනාහි **බ්‍යඤ්ජනවසේන** බ්‍යඤ්ජන වශයෙන් **වඩ්ඪිතං** වැඩිණ.

**හදයං ඉති** හදයං යනු **චිත්තං** චිත්තයයි "චිත්තං වා තේ ඛිපිස්සාමි, හදයං වා තේ ඵාලෙස්සාමි" **ඉති එත්ථ** යන මෙහි **උරෝ** ලය **හදයං ඉති** හදය යනුවෙන් **වුත්තං** දේශනා කරනලදි "හදයා හදයං මඤ්ඤේ අඤ්ඤදය තච්ඡති" **ඉති එත්ථ** යන මෙහි **චිත්තං** චිත්තය කියනලදි "වක්කං හදයං" **ඉති එත්ථ** යන මෙහි **හදයවත්ථු** හෘදය වස්තුව කියනලදි **ඉධ පන** මෙහි වනාහි **අබ්භන්තරට්ඨේන** අභ්‍යන්තර අර්ථයෙන් **චිත්තමේව** සිතම **හදයං ඉති** හදය යනුවෙන් **වුත්තං** දේශනා කරනලදි **තමේව** ඒ සිතම **පරිසුද්ධට්ඨේන** පිරිසිදු අර්ථයෙන් **පණ්ඩරං** පණ්ඩර නම් **භවඞ්ගං සන්ධාය** භවඞ්ග සිත සඳහා **ඒතං වුත්තං** මෙය දේශනා කරනලදි "පභස්සරමිදං භික්ඛවේ චිත්තං, තඤ්ච ඛෝ ආගන්තුකේහි උපක්කිලේසේහි උපක්කිලිට්ඨං" **ඉති** යැයි **යථා (තේන)** එහෙයින් **ආහ** වදාරණ ලදි **තතෝ** එයින් **නික්ඛන්තත්තා පන** නික්මුණු බැවින් වනාහි **අකුසලම්පි** අකුසලය ද **පණ්ඩරං ඉති වුත්තං** පණ්ඩර යැයි දේශනා කරනලදි **ගඞ්ගාය** ගඞ්ගා නදියෙන් **නික්ඛන්තා නදී** නික්මුණු නදියක් **ගඞ්ගා විය ච** ගඞ්ගා වූවාක් මෙන් ද **ගෝධාවරිතෝ** ගෝධාවරියෙන් **නික්ඛන්තා (නදී)** නික්මුණ නදිය **ගෝධාවරී විය** ගෝධාවරී වූවාක් මෙන් (**පරිසුද්ධට්ඨේන** පිරිසිදු අර්ථයෙන්) **පණ්ඩරං ඉති ඒව** පණ්ඩර යැයිම **වුත්තං** දේශනා කරනලදි.

**මනෝ මනායතනං ඉති ඉධ** මනෝ මනායතනං යන මෙහි **මනෝග්ගහණං පන** මනෝග්‍රහණය වනාහි **මනස්සේව** මනසගේම **ආයතනභාවදීපනත්ථං** ආයතන භාවය දැක්වීම පිණිසය **තේන** එහෙයින් **ඒතං දීපේති** මෙය දක්වයි **ඉදං** මෙය **දේවායතනං විය** දේවායතනයක් (දේවාලයක්) මෙන් **මනස්ස** මනසට **ආයතනත්තා** ආයතනයක් වූ බැවින් **න මනායතනං** මනායතනයක් නොවෙයි **අථ ඛෝ** එසේවුවත් **මනෝ ඒව ආයතනං** මන ම ආයතන වූයේ **මනායතනං ඉති** මනායතන යනුයි **තත්ථ** එහි **නිවාසට්ඨානට්ඨේන** වාසයකරන තැන යන අර්ථයෙන් ද **ආකරට්ඨේන** ආකරය යන අර්ථයෙන් ද **සමෝසරණට්ඨානට්ඨේන** එක්රැස්වන ස්ථානය යන අර්ථයෙන් ද **සඤ්ජාතිදේසට්ඨේන** උපන් දේශය යන අර්ථයෙන් ද **කාරණට්ඨේන ච** කාරණය යන අර්ථයෙන් ද **ආයතනං** ආයතනය යන්න **වේදිතබ්බං** දතයුතුයි **හි** උපමාවක් දක්වමි **යථා** යම්සේ **ලෝකේ** ලෝකයෙහි **ඉස්සරායතනං** ඊශ්වරායතනය **වාසුදේවායතනං ඉති ආදීසු** විෂ්ණු ආයතන යනාදීන්හි **නිවාසට්ඨානං** වාසයකරන ස්ථාන **ආයතනං ඉති වුච්චති** ආයතන යැයි කියනු ලැබේ **සුවණ්ණායතනං** ස්වර්ණායතන

**රජතායතනං ඉති ආදීසු** රතනායතනය යනාදීන්හි **ආකරෝ** ආකරය (**ආයතනං ඉති වුච්චති** ආයතන යැයි කියනු ලැබේ) **සාසනේ පන** ශාසනයෙහි වනාහි **විහඞ්ගමා** පක්ෂීහු **මනෝරමේ ආයතනේ** සිත්අලවන ස්ථානයෙහි **සේවන්ති** සේවනය කරත් **ඉති ආදීසු** යනාදියෙහි **සමෝසරණට්ඨානං** එක්රැස්වන ස්ථානය (**ආයතනං ඉති වුච්චති** ආයතන යැයි කියනු ලැබේ) **දක්ඛිණාපථෝ** දකුණු දිග **ගුන්නං** ගවයින්ට **ආයතනං** ආයතන වූයේ **ඉති ආදීසු** යනාදියෙහි **සඤ්ජාතිදේසෝ** උපදින දේශය යන අර්ථයෙන් (**ආයතනං ඉති වුච්චති** ආයතන යැයි කියනු ලැබේ) **සති සති ආයතනේ** කාරණයක් ඇති කල්හි **තත්‍ර තත්‍රේව** ඒ ඒ විශේෂයෙහි **සක්ඛිභබ්බතං** ප්‍රත්‍යක්‍ෂ භාවයට **පාපුණාති** පැමිණෙයි **ඉති ආදීසු** යනාදියෙහි **කාරණං** කාරණය යන අර්ථයෙන් (**ආයතනං ඉති වුච්චති** ආයතන යැයි කියනු ලැබේ) **ඉධ පන** මෙහි වනාහි **සඤ්ජාතිදේසට්ඨේන** උපන් දේශය යන අර්ථයෙන් ද **සමෝසරණඨානට්ඨේන** එක්රැස්වන ස්ථාන යන අර්ථයෙන් ද **කාරණට්ඨේන ඉති** කාරණය යන අර්ථයෙන් ද **තිධාපි** ත්‍රිවිධ අර්ථයම **වට්ටති** වටී.

**එත්ථ** මෙහි **ඵස්සාදයෝ හි ධම්මා** ස්පර්ශාදී ධර්මයෝ වනාහි **සඤ්ජායන්තීති** උපදිත්නුයි **සඤ්ජාතිදේසට්ඨේනපි** උපදින දේශය යන අර්ථයෙන් ද **ඒතං** එය **ආයතනං** ආයතනය නම් **එත්ථ** මෙහි **බහිද්ධා** බාහිර **රූපසද්දගන්ධරසඵොට්ඨබ්බා** රූප ශබ්ද ගන්ධ රස ස්පර්ෂ (යන ධර්මයෝ) **ආරම්මණභාවේන** ආරම්මණ භාවයෙන් **ඕසරන්තීති** එක්රැස් වෙත්නුයි **සමෝසරණඨානට්ඨේනපි** එක්රැස්වන ස්ථානය යන අර්ථයෙන් ද **ආයතනං** ආයතන නම් **ඵස්සාදීනං පන** ඵස්සාදීන්ට වනාහි **සහජාතාදිපච්චයට්ඨේන** සහජාතාදී ප්‍රත්‍යයාර්ථය **කාරණත්තා** කාරණය වූ බැවින් **කාරණට්ඨේනපි** කාරණාර්ථයෙන් ද **ආයතනං ඉති** ආයතන යැයි **වේදිතබ්බං** දතයුතුයි **මනින්ද්‍රියං** මනින්ද්‍රිය **වුත්තත්ථමේව** කියනලද අර්ථමැයි.

**විජානාතීති** දැනගනීනුයි **විඤ්ඤාණං** විඤ්ඤාණය නම් **විඤ්ඤාණමේව ඛන්ධෝ** විඤ්ඤාණයම ස්කන්ධ වූයේ **විඤ්ඤාණක්ඛන්ධෝ** විඤ්ඤාණක්ඛන්ධ නම් **තස්ස** විඤ්ඤාණයාගේ **රාසිආදිවසේන** රාශි ආදී වශයෙන් **අත්ථෝ** අර්ථය **වේදිතබ්බෝ** දතයුතුයි **මහාඋදකක්ඛන්ධෝත්වේව** මහත් ජලකඳක්ම යන **සඞ්ඛ්‍යං** සඞ්ඛ්‍යාවට **ගච්ඡති ඉති** යයි නුයි **එත්ථ හි** මෙහි වනාහි **රාසට්ඨේන** රාශි අර්ථයෙන් **ඛන්ධෝ** ස්කන්ධ යැයි **වුත්තෝ** දේශනා කරනලදි **සීලක්ඛන්ධෝ** සීලස්කන්ධය **සමාධික්ඛන්ධෝ** සමාධිස්කන්ධය **ඉති ආදීසු** යනාදියෙහි **ගුණට්ඨේන** ගුණ අර්ථයෙන් (**ඛන්ධෝ** ස්කන්ධ යැයි **වුත්තෝ** දේශනා කරනලදි) **භගවා** භාග්‍යවතුන් වහන්සේ **මහන්තං දරුක්ඛන්ධං** මහත් දරකඳක් **අද්දසා ඛෝ** දැක **ඉති එත්ථ** යන මෙහි **පණ්ණත්තිමත්තට්ඨේන** ප්‍රඥප්ති මාත්‍රයෙන් (**ඛන්ධෝ** ස්කන්ධ යැයි **වුත්තෝ** දේශනා කරනලදි) **ඉධ පන** මෙහි වනාහි **රූළ්හිතෝ** රූළ්හි වශයෙන් **ඛන්ධෝ** ස්කන්ධ යැයි **වුත්තෝ** දේශනා කරනලදි **රාසට්ඨේන හි** රාශි අර්ථයෙන් වනාහි **විඤ්ඤාණක්ඛන්ධස්ස** විඤ්ඤාණස්කන්ධයාගේ **ඒකදේසෝ** ඒකදේශයක් **ඒකං විඤ්ඤාණං** එක් විඤ්ඤාණයකි **තස්මා** එහෙයින් **යථා** යම්සේ **රුක්ඛස්ස** වෘක්‍ෂයාගේ **ඒකදේසං** එක් ප්‍රදේශයක් **ඡින්දන්තෝ** සිඳිනුයේ **රුක්ඛං** වෘක්‍ෂය **ඡින්දතීති** සිඳියි යැයි **වුච්චති** කියනු ලැබෙයි **ඒවමේව** එසේම **විඤ්ඤාණක්ඛන්ධස්ස** විඤ්ඤාණස්කන්ධයාගේ **ඒකදේසභූතං** එක් දේශයක් වූ **ඒකම්පි විඤ්ඤාණං** එක් විඤ්ඤාණයක් ද **රූළ්හිතෝ** රූළ්හි වශයෙන් **විඤ්ඤාණක්ඛන්ධෝති** විඤ්ඤාණස්කන්ධය යයි **වුත්තං** දේශනා කරනලදි.

**තජ්ජාමනෝවිඤ්ඤාණධාතු ඉති** තජ්ජාමනෝවිඤ්ඤාණධාතු යනු **තේසං ඵස්සාදීනං ධම්මානං** ඒ ඵස්සාදි ධර්මයන්ට **අනුච්ඡවිකා** සුදුසු **මනෝවිඤ්ඤාණධාතු** මනෝවිඤ්ඤාණධාතුවයි **ඉමස්මිඤ්හි පදේ** මේ පදයෙහි වනාහි **ඒකමේව චිත්තං** එකම සිතක් **මිනනට්ඨේන** මනින අර්ථයෙන් **මනෝ** මන නම් **විජානනට්ඨේන** දැනගැනීම් අර්ථයෙන් **විඤ්ඤාණං** විඤ්ඤාණ නම් **සභාවට්ඨේන වා** ස්වභාව අර්ථයෙන් හෝ **නිස්සත්තට්ඨේන** නිස්සත්ව අර්ථයෙන් **ධාතූති** ධාතු යැයි ද **තීහි නාමෙහි** නම් තුනෙකින් **වුත්තං** දේශනා කරනලදි **ඉති** මෙසේ **ඉමස්මිං ඵස්සපඤ්චමකේ** මේ ස්පර්ශ පඤ්චකයෙහි **යස්මා තාව ඵස්සෝ** යම්හෙයකින් පළමුව ස්පර්ශය තෙමේ **ඵස්සෝ ඒව** ස්පර්ශයමය **න තජ්ජාමනෝවිඤ්ඤාණධාතු සම්ඵස්සජෝ** තජ්ජාමනෝ විඤ්ඤාණධාතුවෙන් හටගත් ඵස්සය නොවෙයි **චිත්තඤ්ච** සිත ද **යස්මා** යම්හෙයකින් **තජ්ජාමනෝවිඤ්ඤාණධාතු ඒව** තජ්ජාමනෝවිඤ්ඤාණ ධාතුවමය **තස්මා** එහෙයින් **ඉමස්මිං පදද්වයේ** මේ පද දෙකෙහි **තජ්ජාමනෝවිඤ්ඤාණධාතුසම්ඵස්සජා ඉති** තජ්ජාමනෝවිඤ්ඤාණධාතුසම්ඵස්සජ යැයි **පඤ්ඤත්ති න ආරෝපිතා** ප්‍රඥප්ති වශයෙන් නො නංවනලදි **විතක්කපදදීසු පන** විතර්ක පදදීන්හි වනාහි **ලබ්භමානාපි** ලැබෙනුයේ නමුදු **ඉධ** මෙහි **පච්ඡින්නත්තා** පිරිසිඳිනලද බැවින් **න උද්ධටා** උපුටා නොදක්වනලදි.

**ඉමේසඤ්ච පන ඵස්සපඤ්චමකානං ධම්මානං** මේ ඵස්සපඤ්චමක ධර්මයන්ගේ වනාහි **පාටියෙක්කං පාටියෙක්කං** වෙන වෙනම **විනිබ්භෝගං කත්වා** බෙද වෙන් කොට **පඤ්ඤත්තිං** ප්‍රඥප්තිය **උද්ධරමානේන භගවතා** උපුටා දක්වන භාග්‍යවතුන් වහන්සේ විසින් **දුක්කරං කතං** දුෂ්කර දෙයක් කරනලදි **හි** උපමාවක් දක්වම් **ඒකභාජනේ පක්ඛිපිත්වා** එක් භාජනයෙක්හි බහා **දිවසං** දවසක් පුරා **නිම්මත්ථිතානං** කලවම් කළ **නානාඋදකානං වා** නොයෙක් නොයෙක් ජලයගේ හෝ **නානාතේලානං වා** නොයෙක් නොයෙක් තෙල්වලගේ හෝ **වණ්ණගන්ධරසානං** වර්ණ ගන්ධ රසයන්ගේ **නානතාය** නානත්වය **දිස්වා වා** දැක හෝ **ඝායිත්වා වා** ආඝ්‍රාණය කොට හෝ **සායිත්වා වා** රස විඳ හෝ **නානාකරණං** නානත්වය **ඤාතුං** දැනගන්නට **සක්කා භවෙය්‍ය** හැකි වන්නේය **ඒවං සන්තේපි** මෙසේ ඇති කල්හිදු **තං** එය **දුක්කරං ඉති වුත්තං** දුෂ්කරයැයි කියනලදි **ඒකාරම්මණේ** එක් අරමුණෙක්හි **පවත්තමානං** පවතින්නා වූ **ඉමේසං අරූපීනං චිත්තචේතසිකානං ධම්මානං** මේ අරූපී චිත්ත චෛතසික ධර්මයන්ගේ **පාටියෙක්කං පාටියෙක්කං** වෙන් වෙන් වශයෙන් **විනිබ්භෝගං කත්වා** බෙද වෙන්කොට **පඤ්ඤත්තිං** ප්‍රඥප්තිය **උද්ධරනමානේන** උපුටා දක්වන **සම්මාසම්බුද්ධේන පන** සම්මාසම්බුදුරජාණන් වහන්සේ විසින් වනාහි **අතිදුක්කරං කතං** ඉතා දුෂ්කර කාර්යයක් කරනලදි **තේන** එහෙයින් **ආයස්මා නාගසේනත්ථේරෝ** ආයුෂ්මත් නාගසේන තෙරුන් වහන්සේ "දුක්කරං, මහාරාජ, භගවතා කතන්ති. 'කිං, භන්තේ නාගසේන, භගවතා දුක්කරං කත'න්ති. 'දුක්කරං, මහාරාජ, භගවතා කතං, යං ඉමේසං අරූපීනං චිත්තචේතසිකානං ධම්මානං ඒකාරම්මණේ පවත්තමානානං වවත්ථානං අක්ඛාතං අයං ඵස්සෝ, අයං වේදනා, අයං සඤ්ඤා, අයං චේතනා, ඉදං චිත්ත'න්ති. 'ඕපම්මං, භන්තේ, කරෝහී'ති. 'යථා, මහාරාජ, කෝචිදේව පුරිසෝ නාවාය සමුද්දං අජ්ඣෝගාහෙත්වා හත්ථපුටේන උදකං ගහෙත්වා ජිව්හාය සායිත්වා ජානෙය්‍ය නු ඛෝ, මහාරාජ, සෝ පුරිසෝ ඉදං ගඞ්ගාය උදකං, ඉදං යමුනාය උදකං, ඉදං අචිරවතියා උදකං, ඉදං සරභුයා උදකං, ඉදං මහියා උදක'න්ති? 'දුක්කරං, භන්තේ, ජානිතු'න්ති. 'තතෝ දුක්කරතරං ඛෝ, මහාරාජ, භගවතා කතං යං ඉමේසං අරූපීනං චිත්තචේතසිකානං ධම්මානං...පෙ.... ඉදං චිත්තං"' **ඉති** යැයි **ආහ** වදාරණ ලදි.

## චිත්ත පදය සෑදෙන මූල ධාතුඃ—

චින්ත = චින්තාය: චින්තේති, චින්තයති, චිත්තං, චින්තා, චින්තනා, චින්තනකෝ. කාරිතේ = චින්තාපේති, චින්තාපයතී'ති රූපානි.

තත්ථ 'චිත්ත'න්ති ආරම්මණං චින්තේතී'ති චිත්තං. විජානාතී'ති අත්ථෝ. සබ්බචිත්තසාධාරණවසේනේ'තං දට්ඨබ්බං.

එත්ථ සියා "කස්මා ආරම්මණං චින්තේතී'ති 'චිත්ත'න්ති වත්වා පි 'විජානාතී'ති අත්ථෝ'ති වුත්තං? නනු චින්තනවිජානන සභාවාන චින්තේතී'ති පදස්ස විජානාතී'ති අත්ථෝ සම්භවති. දුප්පඤ්ඤස්ස හි නානාප්පකාරේහි චින්තයතෝ'පි සුඛුමත්ථාධිගමෝ නහෝතී" ති. සච්චං, විජානාතී'ති ඉදං පදං චිත්තස්ස සඤ්ඤාපඤ්ඤ කිච්චේහි විසිට්ඨවිසයග්ගහණං දීපේතුං වුත්තං. සබ්බචිත්තසාධාරණත්තා චිත්තසද්දස්ස 'යං හි ධම්මජාතං චිත්ත'න්ති වුච්චති? තදේව විඤ්ඤාණං තස්මා විජානනත්ථං ගහෙත්වා සඤ්ඤාපඤ්ඤාකිච්ච විසිට්ඨවිසයගහණං දීපේතුං 'විජානාතී'ති වුත්තං. ඉදානි අඤ්ඤගණික ධාතු වසේන'පි නිබ්බචනං පකාසයාම.

සබ්බේසු චිත්තේසු යං ලෝකියකුසලාකුසලමහාක්‍රියාචිත්තං? තං ජවනවීථිවසේන අත්තනෝ සන්තානං චිනෝතී'ති චිත්තං. විපාකං කම්මකිලේසේහි චිතන්ති චිත්තං. ඉදං **චි=ධාතු** වසේන නිබ්බචනං. යං කිඤ්චි ලෝකේ විචිත්තං සිප්පජාතං සබ්බස්ස තස්ස චිත්තේනේව කරණතෝ චිත්තේති විචිත්තේති විචිත්තං කරීයති ඒතේනා'ති චිත්තං. චිත්තකරණතාය චිත්තන්ති වුත්තං හෝති. ඉදං **චිත්ත=ධාතු** වසේන නිබ්බචනං. චිත්තතාය චිත්තං. ඉදං පාටිපදික වසේන නිබ්බචනං. තෙනාහු අට්ඨකථාචරියා:- "සබ්බම්පි යථානුරූපතෝ චිත්තතාය චිත්තං. චිත්තකරණතාය චිත්තන්ති ඒවම්පෙත්ථ අත්ථෝ වේදිතබ්බෝ"ති. එත්ථහි චිත්තස්ස සරාගසදෝසාදිභේදභින්නත්තා සම්පයුත්තභූමිආරම්මණ හීණමජ්ඣිමපණීත අධිපතීනං වසේන චිත්තස්ස චිත්තතා වේදිතබ්බා.

කිඤ්චා'පි ඒකස්ස චිත්තස්ස ඒවං විචිත්‍රතා නත්ථි, තථාපි විචිත්‍රතානං අන්තෝගධත්තා සමුදයවෝහාරේන අවයවෝ'පි චිත්ත'න්ති වුච්චති, යථා පබ්බතා නදීසමුද්දදී ඒකදේසේසු දිට්ඨේසු පබ්බතාදයෝ දිට්ඨා'ති වුච්චන්ති. තේනාහු අට්ඨකථාචරියා;

"කාමං චෙත්ථ ඒකමේව ඒවං චිත්තං න හෝති චිත්තානං පන අන්තෝගධත්තා ඒතේසු යංකිඤ්චි ඒකම්පි චිත්තතාය චිත්තන්ති වත්තුං වට්ටතී"ති එත්ථච වුත්ප්පකාරානමත්ථානං විනිච්ඡයෝ භවති. කථං යස්මා යත්ථ යත්ථ යථා යථා අත්ථෝ ලබ්භති? තත්ථ තත්ථ තථා තථා ගහේතබ්බෝ. තස්මා'යං ආසේවන පච්චයභාවේන චිනෝති, යඤ්ච කම්මුනා අභිසඞ්ඛතත්තා චිතං තං තේන කාරණේන චිතත'න්ති වුත්තං, යං පන තථා න හෝති තං පරිත්ත කිරියද්වයං අන්තිමජවනඤ්ච ලබ්භමාන චින්තනවිචිත්තතත්තාදි වසේන චිත්තන්ති වේදිතබ්බං, හසිතුප්පාදෝ පන අඤ්ඤජවනගතිකෝයේවා'ති.

ඉමානි චිත්තස්ස නාමානි.

චිත්තං මනෝ මානසං ච - විඤ්ඤාණං හදයං පන,
නාමානේතානි වෝහාර - පථේ වත්තන්ති පායතෝ.

චිත්ත සද්දෝ:- පඤ්ඤත්තියං, විඤ්ඤාණේ, විචිත්තේ, චිත්තකම්මේ, අච්ඡරියේති ඒවමාදිසු අත්ථේසු දිස්සති.

"අයං හි චිත්තෝ ගහපති, චිත්තමානසෝ"ති ආදිසු පඤ්ඤත්තියං දිස්සති.

"චිත්තං මනෝ මානස"න්ති අදීසු විඤ්ඤාණේ.

"විචිත්තවත්ථාභරණානි'පී"ති ආදිසු විචිත්තේ.

"දිට්ඨං වෝ භික්ඛවෝ චරණං නාම චිත්ත"න්ති ආදිසු චිත්තකම්මේ.

"ඉඩ්ඪසමද්දි නිසාමේහි චිත්තරූපං'ව දිස්සතී"ති ආදිසු අච්ඡරියේති.
**[මහාසද්දනීතිය (ඡට්ඨසඞ්ගායනා ත-කාරාන්ත ධාතු යටතේ); මහාසද්දනීතිය 477-480 පිටු]**

චිත: (භූ) සඤ්ඤාණේ "සිතීමෙහි; හැඟීමෙහි"

චිත: (චු) සංචේතදීසු "සිතීම් ආදියෙහි"

චින්ත: (චු) චින්තනේ "සිතීමෙහි" **[කච්චායන ධාතු මඤ්ජූසා විවරණය 92-93 පිටු]**

චිත: සඤ්ඤාණේ (භූ) "සිතීමෙහි" චේතති.

චිත: සඤ්චේතදීසු (චු) "සිතීම් ආදියෙහි" චේතේති. චේතයත්. චේතනා.

"සඤ්චේතනා චේතසිතං චේතනා කම්මමේව ච
කම්මඤ්හි චේතනාතේව ජිනේනාහච්ච භාසිකං" යි *(මහා සද්දනීතිය)*

චිති: චින්තායං (චු) "සිතිවිල්ලෙහි" චේතේති. චේතයති. චේතනා.

චිත්ත: විචිත්තාකරණේ (චු) "විසිතුරු කිරීමෙහි" චිත්තේති. චිත්තයති. චිත්තං.

විචිත්තං. "කදචි දස්සනේපි" යි *(මහා සද්දනීතිය)*

චිනේ: මඤ්ඤනායං (භූ) "සිතීමෙහි" චිනායති.

චින්ත: චින්තායං (චු) "සිතීමෙහි" චින්තේති. චිත්තයති. චින්තා. චින්තනා. චින්තං. **[ව්‍යාකරණසද්දසින්ධු 282-283 පිටු]**

## ලක්ෂණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨානයන්ගේ අර්ථ:—

ලක්ඛණාදීසු හි තේසං තේසං ධම්මානං සභාවෝ වා සාමඤ්ඤං වා **ලක්ඛණං** නාම. කිච්චං වා සම්පත්ති වා **රසෝ** නාම. උපට්ඨානාකාරෝ වා ඵලං වා පච්චුපට්ඨානං නාම. ආසන්නකාරණං **පදට්ඨානං** නාම. ඉති යත්ථ යත්ථ ලක්ඛණාදීනි වක්ඛාම තත්ථ තත්ථ ඉමිනාව නයේන තේසං නානත්තං වේදිතබ්බං.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීයං අංක 01 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 81 පිට (හේ.වි.මු); අභිධම්මමාතිකා පාළියෙහි මෝහවිච්ඡේදනී (ඡට්ඨසඞ්ගායනා කුසලපදත්ථෝ යටතේ); මොක්පුර රන්දෙර 02/250-251 පිටු]**

**සභාවෝ** කක්ඛළාදිඵුසනාදිකෝ අසාධාරණෝ. **සාමඤ්ඤං** සාධාරණෝ අනිච්චාදිසභාවෝ. ඉධ ච කුසලලක්ඛණං සබ්බකුසලසාධාරණසභාවත්තා සාමඤ්ඤං දට්ඨබ්බං, අකුසලාදීහි අසාධාරණතාය **සභාවෝ** වා. **උපට්ඨානාකාරෝති** ගහේතබ්බභාවේන ඤාණස්ස උපට්ඨහනාකාරෝ. **ඵලං** පන අත්තනෝ කාරණං පටිච්ච තප්පටිබිම්බභාවේන, පටිමුඛං වා උපට්ඨාතීති **පච්චුපට්ඨානං**. **[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය යටතේ)]**

**ලක්ඛණාදීසු හි** ලක්‍ෂණාදිය අතුරින් වනාහි **තේසං තේසං ධම්මානං** ඒ ඒ ධර්මයන්ට අසාධාරණ වූ **සභාවෝ වා** කර්කශ බව ස්පර්ශ කිරීම් ආදීවූ ස්වභාව ලක්‍ෂණය හෝ **සාමඤ්ඤං වා** ඒ ඒ ධර්මයනට සාධාරණ වූ පොදු ලක්‍ෂණය **ලක්ඛණං නාම** ලක්‍ෂණය නම් වේ **කිච්චං වා** (ඒ ඒ ධර්මය විසින් සිදුකරන) කෘත්‍යය හෝ **සම්පත්ති වා** (ඒ ඒ ක්‍රියාව සිදුකිරීමේ) ශක්තිය හෝ **රසෝ නාම** රසය නම් වේ **උපට්ඨානාකාරෝ වා** ගතයුතු භාවයෙන් ඥාණයට වැටහෙන ආකාරය හෝ **ඵලං වා** තමාගේ කෘත්‍යය නිසා ප්‍රතිබිම්බ භාවයෙන් ඇතිවන ඵලය හෝ **පච්චුපට්ඨානං නාම** වැටහෙන ආකාරයයි **ආසන්නකාරණං** ඒ ඒ ධර්මය ඇතිවීමට ප්‍රධාන වූ ආසන්න කාරණය **පදට්ඨානං නාම** පදට්ඨානය නම් වේ **ඉති** මෙසේ **යත්‍ථ යත්‍ථ** යම් යම් තැනෙක **ලක්ඛණාදීනි** ලක්‍ෂණාදිය **වක්ඛාම** කියන්නෙමු ද **තත්‍ථ තත්‍ථ** ඒ ඒ තැන **ඉමිනාව නයේන** මේ ක්‍රමයෙන්ම **තේසං** ඒ ධර්මයන්ගේ **නානත්තං** නානත්වය **වේදිතබ්බං** දතයුතුයි. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තන]**

තත්ථ **ලක්ඛණං** නාම තස්ස තස්ස රූපවිසේසස්ස අනඤ්ඤසාධාරණෝ සභාවෝ. **රසෝ** තස්සේව අත්තනෝ ඵලං පති පච්චයභාවෝ. **පච්චුපට්ඨානං** තස්ස පරමත්ථතෝ විජ්ජමානත්තා යාථාවතෝ ඤාණස්ස ගෝචරභාවෝ. **පදට්ඨානං** ආසන්නකාරණං. **[දීඝනිකාය මහවග්ග ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 63 යටතේ)]**

**තත්‍ථ** එහි **ලක්ඛණං නාම** ලක්‍ෂණය නම් **තස්ස තස්ස රූපවිසේසස්ස** ඒ ඒ රූප විශේෂයාගේ **අනඤ්ඤසාධාරණෝ** අන්‍යයන්ට සාධාරණ නොවූ **සභාවෝ** ස්වභාවයයි **රසෝ නාම** රසය නම් **තස්සේව අත්තනෝ** ඒ තමාගේම **ඵලං** ඵලය ඇති කිරීමට **පති පච්චයභාවෝ** ප්‍රත්‍යය වන ස්වභාවයයි **පච්චුපට්ඨානං නාම** පච්චුපට්ඨානය නම් **තස්ස** ඒ ධර්මයාගේ **පරමත්ථතෝ** පරමාර්ථ වශයෙන් **විජ්ජමානත්තා** විද්‍යමාන බැවින් **යාථාවතෝ** තත්වාකාරයෙන් **ඤාණස්ස** නුවණට **ගෝචරභාවෝ** වැටහෙන ස්වභාවයයි **පදට්ඨානං නාම** පදට්ඨානය නම් **ආසන්නකාරණං** ආසන්න කාරණයයි. **[දීඝනිකාය මහවග්ග ටීකා පරිවර්තන]**

තං තං සභාවෝ ලක්ඛණං, කිච්චසම්පත්තියෝ රසෝ;
ගය්හාකාරෝ ඵලංවාපි, පච්චුපට්ඨාන සඤ්ඤිතං.

ආසන්නකාරණං යං තං, පදට්ඨානන්ති තං මතං;
ධම්මානං වවත්ථානාය, අලං ඒතෙ විබුද්ධිනෝ.

**[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 13 යටතේ)]**

තං තං සභාවෝ"ති විජානනඵුසනාදිකෝ සභාවෝ, අග්ගිස්ස උණ්හෝ විය. "කිච්චසම්පත්තියෝ රසෝ"ති තේන තේන ධම්මේන කරණකිච්චඤ්ච, තං කිච්චං කත්වා ලද්ධෝ සම්පත්තිගුණෝ ච. අග්ගිස්ස වත්ථුම්හි පරිපාචනකිච්චං විය, ඕභාසනගුණෝ විය ච. "ගය්හාකාරෝ"ති ඤාණේන ගහේතබ්බෝ තස්ස තස්ස ධම්මස්ස ධජභූතෝ ආකාරෝ. සම්පත්තිරසෝයේව වුච්චති. "ඵලං වාපී"ති කාරියප්ඵලං වාපි, අග්ගිස්ස ධූමෝ විය. "ආසන්නකාරණ"න්ති අත්තනෝ අනන්තරේ ඵලනිබ්බත්තකං කාරණං, අග්ගිස්ස අග්ගිකාරකපුරිසෝ විය. "අල"න්ති සමත්ථා. "විබුද්ධිනෝ"ති විසේසබුද්ධි සම්පන්නස්ස පණ්ඩිතස්ස.

[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 13 යටතේ)]

**තං තං සභාවෝ** ගින්නෙහි උෂ්ණය මෙන් ඒ ඒ ධර්මයන්ගේ දැනගැනීම් ස්පර්ශ කිරීම් ආදී ස්වභාවය **ලක්ඛණං** ස්වභාව ලක්‍ෂණයයි **කිච්චසම්පත්තියෝ** ගින්න වස්තුව දවන කෘත්‍යය මෙන් ඒ ඒ ධර්මය විසින් සිදුකරන කෘත්‍යය කෘත්‍යය රසය ද ගින්නෙහි බබලන ගුණය මෙන් ඒ ඒ කෘත්‍යය සිදුකොට ලබනලද ගුණ සම්පත්ති රසය ද **රසෝ** රසයයි **ගය්හාකාරෝ** ඒ ඒ ධර්මය නුවණින් ගතයුතු ආකාරය **සම්පත්තිරසෝයේව** සම්පත්ති රසයම යැයි **වුච්චති** කියනු ලැබේයි **ඵලං** ගින්නෙහි දුම මෙන් ඒ ඒ කායසීයෙහි ඵලය **පච්චුපට්ඨානං** වැටහෙන ආකාරයයි **යං තං ආසන්නකාරණං** ගින්න උපදවන පුරුෂයා මෙන් අතරක් නැතිව තමාගේ ඵලය උපදවන ප්‍රධාන වූද ප්‍රකට වූද ආසන්න කාරණයක් වේද **තං පදට්ඨානං** එය පදට්ඨානයයි **සඤ්ඤිතං** දන්නාලදි **වාපි (තස්මා)** එහෙයින් **විබුද්ධිනෝ** නුවණැත්තන්හට **ධම්මානං** ධර්මයන්ගේ **වවත්ථානාය** ව්‍යවස්ථාපනය පිණිස **ඒතේ** මෙකරුණු **අලං ඉති** ප්‍රමාණවත් යැයි **මතං** දන්නාලදි.

[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]

**"ලක්‍ෂණය"** යනු ඒ ඒ පරමාර්ථ ධර්මයන්ගේ ස්වභාවයය. පරමාර්ථ ධර්මයන්ගේ ශරීරයත් ඒ ලක්‍ෂණයමය. එක් එක් පරමාර්ථ ධර්මයකට එයින් සිදුකරන කෘත්‍යයක් ද ඇත්තේය. එසේම ඒ ඒ කෘත්‍යය සිදුකළ හැකි ශක්තියක් ද පරමාර්ථ ධර්මයන්ට ඇත්තේය. ඒ ශක්තියට **"සම්පත්තිය"**යි ද කියනු ලැබේ. **"රසය"**යි කියනුයේ ඒ කෘත්‍යය සම්පත්ති දෙකටය. පරමාර්ථ ධර්මයකින් සිදුකරන කෘත්‍යය නිසා ඇතිවන ඵලයක් ද ඇත්තේය. ඒ ඵලයට **"ප්‍රත්‍යුපස්ථානය"**යි කියනු ලැබේ. තවද පරමාර්ථ ධර්ම විමසන යෝගාවචරයාගේ සිතට යම් කිසි ආකාරයකින් ඒ පරමාර්ථ ධර්ම වැටහෙන්නේය. ඒ වැටහෙන ආකාරයට ද **"ප්‍රත්‍යුපස්ථානය"**යි කියනු ලැබේ. ඒ ඒ පරමාර්ථ ධර්මය ඇතිවීමේ ප්‍රධාන වූද ප්‍රකට වූද හේතුවට **"පදස්ථානය"**යි කියනු ලැබේ. එයට **"සමීපහේතුව ය"**යි ද කියනු ලැබේ.

මේ කරුණු සතරින් ලක්‍ෂණය ගින්නෙහි උෂ්ණ ස්වභාවය මෙන් දතයුතුය. රසය ගින්නෙහි දිලිසෙන ස්වභාවය මෙන් දතයුතුය. ප්‍රත්‍යුපස්ථානය ගින්නෙහි දුම ඇති කරන ස්වභාවය මෙන් දතයුතුය. පදස්ථානය ගින්න ඇති කරන දර මෙන් දතයුතුය. ගින්නේ ලක්‍ෂණය උෂ්ණ ස්වභාවයය. රසය දිලිසෙන ස්වභාව හෝ පැසවන ස්වභාවයය. ගින්නේ ප්‍රත්‍යුපස්ථානය දුම් දැමීමය. පදස්ථානය දරය.

ලක්‍ෂණාදී කරුණු සතරින් ප්‍රධාන කාරණය ලක්‍ෂණයය. එය දැන ගත්තාම ඒ ඒ පරමාර්ථ ධර්මය දැන ගත්තා වන්නේය. රසය, ප්‍රත්‍යුපස්ථාන, පදස්ථානයන් ද දැන ගත්තාම ඒ ඒ පරමාර්ථ ධර්ම ඉතා හොඳින් දැන ගත්තා වන්නේය. එබැවින් අටුවා

වල පරමාර්ථ ධර්ම හැදින්වීමේ දී සැම සංස්කාරයකම ලක්ෂණාදී කරුණු සතර දක්වා තිබේ. **[අභිධර්ම මාර්ගය 320-321 පිටු]**

**"ලක්ඛණ"** යනු ස්වභාවයයි; එනම් හැටියි. කෙරෙන වැඩය **"රස"** නමි. කෘත්‍යය නමින් ද ව්‍යවහාරයි. **"පච්චුපට්ඨානය"** නම් වැටහෙන කාරණයයි. ආසන්න; ලගම ඇති කාරණය **"පදට්ඨාන"** නමි. **[පේසැත්තෑසඳණ කථා 392 පිට]**

## චිත්තයාගේ ලක්ෂණාදියː—

'ආරම්මණං චින්තේතී'ති චිත්තන්ති නයේන චිත්තස්ස වචනත්ථෝ වුත්තෝ ඒව. ලක්ඛණාදිතෝ පන විජානනලක්ඛණං චිත්තං, පුබ්බඞ්ගමරසං, සන්දහනපච්චුපට්ඨානං, නාමරූපපදට්ඨානං. චතුභූමකචිත්තඤ්හි නෝවිජානනලක්ඛණං නාම නත්ථි. සබ්බං විජානනලක්ඛණමේව. ද්වාරං පන පත්වා ආරම්මණවිභාවනට්ඨානේ චිත්තං පුබ්බඞ්ගමං පුරේචාරිකං හෝති. චක්ඛුනා හි දිට්ඨං රූපාරම්මණං චිත්තේනේව විජානාති ...පෙ.... මනේන විඤ්ඤාතං ධම්මාරම්මණං චිත්තේනේව විජානාති. යථා හි නගරගුත්තිකෝ නාම නගරමජ්ඣේ සිඞ්ඝාටකේ නිසීදිත්වා 'අයං නේවාසිකෝ අයං ආගන්තුකෝ'ති ආගතාගතං ජනං උපධාරේති වවත්ථපේති ඒවංසම්පදමිදං දට්ඨබ්බං. වුත්තම්පි චේතං මහාථේරේන - "යථා, මහාරාජ, නගරගුත්තිකෝ නාම මජ්ඣේ නගරස්ස සිඞ්ඝාටකේ නිසින්නෝ පුරත්ථිමතෝ දිසතෝ පුරිසං ආගච්ඡන්තං පස්සෙය්‍ය... පච්ඡිමතෝ... දක්ඛිණතෝ... උත්තරතෝ දිසතෝ පුරිසං ආගච්ඡන්තං පස්සෙය්‍ය, ඒවමේව ඛෝ, මහාරාජ, යං චක්ඛුනා රූපං පස්සති තං විඤ්ඤාණේන විජානාති, යං සෝතේන සද්දං සුණාති, ඝානේන ගන්ධං ඝායති, ජිව්හාය රසං සායති, කායේන ඵොට්ඨබ්බං ඵුසති, මනසා ධම්මං විජානාති, තං විඤ්ඤාණේන විජානාතී"ති (මි. ප. 2.3.12). ඒවං ද්වාරං පත්වා ආරම්මණවිභාවනට්ඨානේ චිත්තමේව පුබ්බඞ්ගමං පුරේචාරිකං. තස්මා පුබ්බඞ්ගමරසන්ති වුච්චති.

තදේතං පච්ඡිමං පච්ඡිමං උප්පජ්ජමානං පුරිමං පුරිමං නිරන්තරං කත්වා සන්දහනමේව උපට්ඨාතීති සන්දහනපච්චුපට්ඨානං. පඤ්චවෝකාරභවේ පනස්ස නියමතෝ නාමරූපං, චතුවෝකාරභවේ නාමමේව පදට්ඨානං. තස්මා නාමරූපපදට්ඨානන්ති වුත්තං.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා ඵස්සපඤ්චමකරාසි වණ්ණනා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 119 පිට (හේ.වි.මු); මොක්පුර රන්දෙර 02/265 පිට; සිත සිරුර සහ නිවන හෙවත් ධම්මසඞ්ගණී 83 පිට]**

**විජානනං** ආරම්මණස්ස උපලද්ධි. **සන්දහනං** චිත්තන්තරස්ස අනුප්පබන්ධනං. **චක්ඛුනා හි දිට්ඨ**න්ති චක්ඛුනා දට්ඨබ්බං. යථා "දිට්ඨං සුතං මුතං විඤ්ඤාත"න්ති දට්ඨබ්බාදි වුච්චති, ඒවම්ධාපි වේදිතබ්බං. **චක්ඛුනා හී**තිආදීසු චක්ඛුනා...පෙ.... මනසා ද්වාරේනාති අත්ථෝ. නගරගුත්තිකස්ස විය චිත්තස්ස ආරම්මණවිභාවනමත්තං උපධාරණමත්තං උපලද්ධිමත්තං කිච්චං, ආරම්මණපටිවේධනපච්චාභිඤ්ඤාණාදි පන කිච්චං පඤ්ඤාසඤ්ඤාදීනන්ති වේදිතබ්බං.
**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා ඵස්සපඤ්චමකරාසි වණ්ණනා යටතේ); මොක්පුර රන්දෙර 02/265 පිට]**

**ආරම්මණං චින්තේතීති** අරමුණ සිතානුයි **චිත්තං ඉති නයේන** චිත්තය යන ක්‍රමයෙන් **චිත්තස්ස** චිත්තයාගේ **වචනත්ථෝ** වචනාර්ථය **වුත්තෝ ඒව** කියනලද්දේමය **ලක්ඛණාදිතෝ පන** ලක්‍ෂණාදි වශයෙන් වනාහි **විජානනලක්ඛණං චිත්තං** අරමුණ දැනගැනීම් ලක්‍ෂණය ඇත්තේ සිතයි **පුබ්බඞ්ගමරසං** අරමුණ දැනගැනීමේ පෙරමුණ ගන්නා බව කෘත්‍යය රසයයි **සන්දහනපච්චුපට්ඨානං** චිත්ත සන්තතිය නොසිඳී පවතින ලෙසට පසු සිත් හා ගළපන බව වැටහෙන ආකාරයයි **නාමරූපපදට්ඨානං** නාමරූප ආසන්න කාරණයයි **හි** ඒ එසේමැයි **චතුභූමකචිත්තං** චාතුර්භූමික සිත වනාහි **නෝ විජානනලක්ඛණං නාම නත්ථි** දැනගැනීම් ලක්‍ෂණයක් නම් නැත්තේ නොවෙයි **සබ්බං (චිත්තං)** සියළු චිත්තය **විජානනලක්ඛණමේව** දැනගැනීම් ලක්‍ෂය ඇත්තේමය **චිත්තං** චිත්තය තෙමේ **ද්වාරං පන පත්වා** ද්වාරයට පැමිණ වනාහි **ආරම්මණවිභාවනට්ඨේන** අරමුණ ප්‍රකට කිරීම් අර්ථයෙන් **පුබ්බඞ්ගමං හෝති** පූර්වාඞ්ගම වෙයි **පුරේචාරිකං (හෝති)** පෙරටුව හැසිරෙන්නේ වෙයි **හි (සච්චං)** සැබෑවකි **චක්ඛුනා** ඇසින් **දිට්ඨං රූපාරම්මණං** දකිනලද රූපාරම්මණය **චිත්තේනේව** සිතින්ම **විජානාති** දැනගනියි **මනේන** මනසින් **විඤ්ඤාතං ධම්මාරම්මණං** දැනගන්නාලද ධම්මාරම්මණය **චිත්තේනේව** සිතින්ම **විජානාති** දැනගනියි **හි** උපමාවක් දක්වම් **යථා** යම්සේ **නගරගුත්තිකෝ නාම** නගරය ආරක්‍ෂා කරන පුද්ගල තෙමේ නම් **නගරමජ්ඣෙ** නගරය මැද **සිඞ්ඝාටකේ නිසීදිත්වා** සිව්මංසලෙහි හිඳ **අයං** මෙතෙමේ **නේවාසිකෝ** නේවාසිකයෙකි **අයං** මෙතෙමේ **ආගන්තුකෝ** ආගන්තුකයෙකි **ඉති** යැයි **ආගතාගතජනං** පැමිණෙන පැමිණෙන ජනයා **උපධාරෙන්ති** විමසා බලයි **ඒවං** මෙසේ **ඉදං සම්පදං** මේ උපමාව **දට්ඨබ්බං** දතයුතුයි **මහාථේරේන අපි** නාගසේන තෙරුන් වහන්සේ විසින් ද **මහාරාජ!** මහරජ! **නගරගුත්තිකෝ නාම** නගරය ආරක්‍ෂා කරන පුද්ගල තෙමේ **නගරස්ස මජ්ඣෙ** නගරයාගේ මැද **සිඞ්ඝාටකේ** සිව්මංසලෙහි **නිසින්නෝ** හිඳිමින් **පුරත්ථිමතෝ දිසතෝ** නැගෙනහිර දෙසින් **ආගච්ඡන්තං පුරිසං** එන්නා වූ පුරුෂයෙකු **යථා** යම්සේ **පස්සෙය්‍ය** දකින්නේ ද **පච්ඡිමතෝ දිසතෝ** බටහිර දෙසින් **ආගච්ඡන්තං පුරිසං** එන්නා වූ පුරුෂයෙකු **යථා** යම්සේ **පස්සෙය්‍ය** දකින්නේ ද **දක්ඛිණතෝ දිසතෝ** දකුණු දෙසින් **ආගච්ඡන්තං පුරිසං** එන්නා වූ පුරුෂයෙකු **යථා** යම්සේ **පස්සෙය්‍ය** දකින්නේ ද **උත්තරතෝ දිසතෝ** උතුරු දෙසින් **ආගච්ඡන්තං පුරිසං** එන්නා වූ පුරුෂයෙකු **යථා** යම්සේ **පස්සෙය්‍ය** දකින්නේ ද **මහාරාජ!** මහරජ! **ඒවමේව ඛෝ** මෙසේම වනාහි **චක්ඛුනා** ඇසින් **යං රූපං පස්සති** යම් රූපයක් දකියි ද **තං (රූපං)** ඒ රූපය **විඤ්ඤාණේන** සිතින් **විජානාති** දැනගනියි **සෝතේන** කණෙන් **යං සද්දං** යම් ශබ්දයක් **සුණාති** අසයි ද **ඝාණේන** නාසයෙන් **(යං) ගන්ධං** යම් ගන්ධයක් **ඝායති** ආඝ්‍රාණය කරයි ද **ජිව්හාය** දිවෙන් **(යං) රසං** යම් රසයක් **සායති** රස විඳී ද **කායෙන්** කයෙන් **(යං) ඵොට්ඨබ්බං** යම් ස්පර්ෂයක් **ඵුසති** පහසයි ද **මනසා** මනසින් **(යං) ධම්මං** යම් ධම්මාරම්මණයක් **විජානාති** දැනගනී ද **තං (ආරම්මණං)** ඒ ආරම්මණ **විඤ්ඤාණේන** විඤ්ඤාණයෙන් **විජානාති ඉති** දැනගනී යැයි **ඒතඤ්ච වුත්තං** මෙය ද දේශනා කරනලදි **ඒවං** මෙසේ **ද්වාරං පත්වා** ද්වාරයට පැමිණ **ආරම්මණවිභාවනට්ඨේන** අරමුණ ප්‍රකට කිරීම් අර්ථයෙන් **චිත්තමේව** සිතම **පුබ්බඞ්ගමං (හෝති)** පූර්වාඞ්ගම වෙයි **පුරේචාරිකං (හෝති)** පෙරටුව හැසිරෙන්නේ වෙයි **තස්මා** එහෙයින් **පුබ්බඞ්ගමරසං ඉති** අරමුණ දැනගැනීමේ පෙරමුණ ගන්නා බව කෘත්‍යය රසයයි **වුච්චති** කියනු ලැබෙයි.

**පච්ඡිමං පච්ඡිමං** පසු පසුව **උප්පජ්ජමානං තදේතං (චිත්තං)** උපදින්නා වූ ඒ මේ චිත්තය **පුරිමං පුරිමං (චිත්තං)** පූර්ව පූර්ව චිත්තය හා **නිරන්තරං කත්වා** නිරතුරු

කොට **සන්දහනමේව** ගළපමින්ම **උපට්ඨාති ඉති** වැටහෙයිනුයි **සන්දහනපච්චුපට්ඨානං** සන්දහනපච්චුපට්ඨාන නම් **අස්ස පන** චිත්තයට වනාහි **පඤ්චවෝකාරභවේ** පඤ්චවෝකාර භවයෙහි **නියමතෝ** නියම වශයෙන් **නාමරූපං** නාමරූප ද **චතුවෝකාරභවේ** චතුවෝකාර භවයෙහි **නාමමේව** නාමයම **පදට්ඨානං** ආසන්න කාරණය වෙයි **තස්මා** එහෙයින් **නාමරූපපදට්ඨාං ඉති** නාමරූප පදස්ථාන යැයි **වුත්තං** දේශනා කරනලදි. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

**"විසයවිජානන"**න්ති ච ඒතේන චිත්තස්ස ආරම්මණූපලද්ධිලක්ඛණතා වුත්තාති ඉදනිස්ස රසාදීනි වුච්චන්ති. පුබ්බඞ්ගමරසඤ්හි චිත්තං සන්ධානපච්චුපට්ඨානං නාමරූපපදට්ඨානං. ද්වාරං පත්වා තදරම්මණඤ්හි විභාවනට්ඨේන චිත්තං පුබ්බඞ්ගමං පුරේචාරිකං. තථා හි චක්ඛුද්වාරේන දට්ඨබ්බං රූපාරම්මණං චිත්තේනේව ජානාති...පෙ.... මනෝද්වාරේන විඤ්ඤාතබ්බං ධම්මාරම්මණං චිත්තේනේව ජානාති. යථා හි නගරගුත්තිකෝ නගරමජ්ඣෙ සිඞ්ඝාටකේ නිසීදිත්වා "අයං නේවාසිකෝ, අයං ආගන්තුකෝ"ති ආගතාගතං ජනං උපධාරේති, ඒවං සම්පදමිදං දට්ඨබ්බං, තස්මා ද්වාරං පත්වා තදරම්මණං විභාවනට්ඨේන පුරේචාරිකන්ති **පුබ්බඞ්ගමරසං**. පච්ඡිමං පච්ඡිමං උප්පජ්ජමානං පුරිමං පුරිමං නිරන්තරං කත්වා සන්දහමානමිව උපට්ඨාති, ගහණභාවං ගච්ඡතීති **සන්ධානපච්චුපට්ඨානං.** පඤ්චවෝකාරේ පනස්ස නියමතෝ නාමරූපං, චතුවෝකාරභවේ නාමමේව පදට්ඨානන්ති **නාමරූපපදට්ඨානඤ්ච** හෝති. නානත්තං පන ලක්ඛණාදීනං උපරි වක්ඛමානනයේන වේදිතබ්බං. වක්ඛති හි **රූපපරිච්ඡේදේ**

"සාමඤ්ඤං වා සභාවෝ වා - ධම්මානං ලක්ඛණං මතං;
කිච්චං වා තස්ස සම්පත්ති - රසෝති පරිදීපිතෝ.

"ඵලං වා පච්චුපට්ඨානං - උපට්ඨානනයෝපි වා;
ආසන්නකාරණං යං තු - තං පදට්ඨානසඤ්ඤිත"න්ති. (අභිධ. 633-634) යත්ථ යත්ථ පන ලක්ඛණාදීනි වුච්චන්ති.

**[අභිධම්මාවාතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 08 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 34 පිට]**

"විසයවිජානනං" යන මේ පදය කරණකොටගෙන චිත්තයාගේ ආරම්මණෝපලද්ධි ලක්‍ෂණත්‍වය කියනලදි. දැන් ඒ චිත්තයාගේ රස-ප්‍රත්‍යුපස්ථාන-පදස්ථානයෝ කියනු ලැබෙත්. ඒ එසේමැයි; සිත් තෙමේ චෛතසික ධර්මයන්ට පෙරටුව යාම කෘත්‍යය කොට ඇත්තේය. අතුරු නැතිකොට අනෙක් සිතක් හා ගැළපීම වැටහීම කොට ඇත්තේය. නාමරූපය ආසන්න කාරණය කොට ඇත්තේය. චිත්තය තෙමේ ද්වාරයට පැමිණ අරමුණ ප්‍රකාශ කරණ අර්ථයෙන් පෙරටුව යන්නේ වෙයි. ඒ එසේමැයි; චක්ෂුර් ද්වාරයෙන් දැක්කයුතු වූ රූපාළම්බනය සිතින්ම දැනගනී -පෙ- මනෝද්වාරයෙන් දතයුතු වූ ධර්මාළම්බනය සිතින්ම දැනගනී. යම්සේ වනාහි නගරාරක්‍ෂාවෙහි නියුතවූ පුරුෂතෙමේ නුවර මධ්‍යයෙහි වූ සතරමං සන්ධියෙක හිඳ මේ නේවාසික පුරුෂය මේ ආගන්තුක පුරුෂය යයි ආ ආ ජනයා පරීක්‍ෂා කෙරේද ව්‍යවස්ථා කෙරේද මෙසේ මේ උපමා සම්පත්තිය දත්තේයි. එහෙයින් ද්වාරයට පැමිණ අරමුණු පරීක්‍ෂා කිරීමෙහි පුරේචාරික වේනුයි චිත්තය තෙමේ පූර්වඞ්ගම කෘත්‍යය ඇත්තේ යයි කියනු ලැබේ. පසු පසුව උපදිනු ලබන්නා වූ සිත් තෙමේ පළමු පළමු උපන් චිත්තය හා අතුරු නැති කොට ගැළපීමම වැටහේනුයි හටගැනීම් ස්වභාවයට යේනුයි සන්ධානපච්චුපට්ඨාන නම් වෙයි. ඒ සිතට පඤ්චවෝකාර භවයෙහි වනාහි නාමරූප දෙක ආසන්නකාරණා වෙයි. චතුවෝකාරභවයෙහි නාමය පමණක්ම

ආසන්නකාරණා වෙයි.එහෙයින් නාමරූපපදට්ඨාන යයි කියනලදි. ලක්‍ෂණාදීන්ගේ නානත්වය වනාහි මතු කියනුලබන ක්‍රමයෙන් දතයුත්තේයි. එහෙයින් රූප පරිච්ඡේදයෙහි;

සාමඤ්ඤං වා සභාවෝ වා - ධම්මානං ලක්ඛණං මතං;
කිච්චං වා තස්ස සම්පත්ති - රසෝති පරිදීපතෝ.

ඵලං වා පච්චුපට්ඨානං - උපට්ඨානනයෝපි වා;
ආසන්නකාරණං යන්තු - පදට්ඨානන්ති සඤ්ඤිතන්ති.
යනු වක්‍ෂ්‍යමාන වන්නේයි.

යම්තැනෙක්හි ලක්‍ෂණාදිය කියනු ලැබේද ඒ ඒ තන්හි මේ ක්‍රමයෙන් ඔහුන්ගේ නානත්වය දතයුත්තේයි. **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 19-20 පිටු]**

ආරම්මණවිජානනලක්ඛණං චිත්තං, පුබ්බඞ්ගමරසං, සන්ධානපච්චුපට්ඨානං, නාමරූපපදට්ඨානං. [චිත්තං] **[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 13 යටතේ)]**

“පුබ්බඞ්ගමරස”න්ති ආරම්මණග්ගහණෙ පධානරස කිච්චං. “සන්ධාන පච්චුපට්ඨාන”න්ති නිරන්තරප්පවත්තාකාරපච්චුපට්ඨානං. “නාම රූපපදට්ඨාන”න්ති ඵස්සාදිනාමක්ඛන්ධ වත්ථුරූපක්ඛන්ධ චිත්තස්ස පදට්ඨානං.
**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 13 යටතේ)]**

**ආරම්මණවිජානනලක්ඛණං චිත්තං** අරමුණ දැනගන්නා වූ ලක්‍ෂණය චිත්තය නම් **පුබ්බඞ්ගමරසං** අරමුණ ගැනීමෙහි ප්‍රධාන බව රසයයි **සන්ධානපච්චුපට්ඨානං** නිරන්තරයෙන් පවතින ආකාරය නොහොත් අතරක් නැතිව අනෙක් සිතක් හා ගැළපීම පච්චුපට්ඨානයයි **නාමරූපපදට්ඨානං** නාම-රූප ආසන්න කාරණයයි.
**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

## චිත්තයාගේ ආයුෂ:—

ඉදං රූපං නාම කම්මාදිවසේන චතූහි කාරණේහි නිබ්බත්තති. තත්ථ සබ්බේසං සත්තානං රූපං නිබ්බත්තමානං පඨමං කම්මතෝ නිබ්බත්තති. පටිසන්ධික්ඛණේයේව හි ගබ්භසෙය්‍යකානං තාව තිසන්තතිවසේන වත්ථු-කාය-භාවදසකසඞ්ඛාතානි තිංස රූපානි නිබ්බත්තන්ති, තානි ච ඛෝ පටිසන්ධිචිත්තස්ස උප්පාදක්ඛණේයේව. යථා ච උප්පාදක්ඛණේ, තථා ඨිතික්ඛණේපි භඞ්ගක්ඛණේපි.

තත්ථ රූපං දන්ධනිරෝධං ගරුපරිවත්ති, චිත්තං ඛිප්පනිරෝධං ලහුපරිවත්ති. තේනාහ “නාහං, භික්ඛවේ, අඤ්ඤං ඒකධම්මම්පි සමනුපස්සාමි, යං ඒවං ලහුපරිවත්තං යථයිදං, භික්ඛවේ, චිත්ත”න්ති (අ. නි. 1.48). රූපේ ධරන්තේයේව හි සෝළසවාරේ භවඞ්ගචිත්තං උප්පජ්ජිත්වා නිරුජ්ඣති. චිත්තස්ස උප්පාදක්ඛණෝපි ඨිතික්ඛණෝපි භඞ්ගක්ඛණෝපි ඒකසදිසා. රූපස්ස පන උප්පාදභඞ්ගක්ඛණායේව ලහුකා, තේහි සදිසා. ඨිතික්ඛණෝ පන මහා, යාව සෝළස චිත්තානි උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති, තාව වත්තති.
**[විසුද්ධිමග්ග 02 (ඡට්ඨසඞ්ගායනා අංක 700 යටතේ); විසුද්ධිමග්ග අටුවා 460-461 පිටු (හේ.වි.මු); අභිධම්මාර්ථ ප්‍රදීපිකා 01/22-23 පිටු]**

**සබ්බේස**න්ති කාමාවචරාදිඅණ්ඩජාදිභේදභින්නානං සබ්බේසං සත්තානං. **පඨමං කම්මතෝ නිබ්බත්තති** තං මූලකත්තා උතුජාදිරූපානං. පරතෝ පවත්තනකකායදසකාදිවසේන ලබ්භමානං පබන්ධත්තයං, සන්තතිසීසං වා සන්ධාය **"තිසන්තතිවසේනා"**ති වුත්තං.

දන්ධං මන්දං චිරේන නිරෝධෝ ඒතස්සාති **දන්ධනිරෝධං** සත්තරසචිත්තක්ඛණායුකත්තා. තේනාහ **"ගරුපරිවත්තී"**ති. **තේනා**ති තස්මා, යස්මා "තතෝ සීඝතරං බෝ, භික්ඛවේ, ආයුසඞ්ඛාරා ඛීයන්තී"ති (සං. නි. 2.228) වචනතෝ රූපධම්මාපි ඉත්තරකාලා ඒව, අරූපධම්මා පන තේහි සාතිසයං ඉත්තරකාලා, තස්මා ආහ භගවාති අත්ථෝ. යං පනෙත්ථ වත්තබ්බං, තං හෙට්ඨා විචාරිතමේව. **තේහි සදිසා**ති චිත්තස්ස උප්පාදභඞ්ගක්ඛණේහි සදිසා. සබ්බේසම්පි හි සඞ්ඛාරානං උප්පාදභඞ්ගක්ඛණේසු විසදිසතා නත්ථි, සමානකාලාව තේ. **ඨානප්පත්ත**න්ති ඨිතික්ඛණප්පත්තං. **[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 700 යටතේ)]**

**ඉදං රූපං නාම** මේ රූප නම් **කම්මාදිවසේන** කර්මාදී විසින් **චතූහි කාරණේහි නිබ්බත්තති** සතරාකාරයෙන් නිපදී **තත්ථ** එහි **සබ්බේසං සත්තානං** කාමාවචරාදී ජාතිභේද භින්න සියළු සත්නට **රූපං නිබ්බත්තමානං** රූපය නිපදනේ **පඨමං** පළමු කොට **කම්මතෝ නිබ්බත්තති** කර්මයෙන් නිපදී **පටිසන්ධික්ඛණේයේවහි** ප්‍රතිසන්ධික්‍ෂණයෙහිම **ගබ්භසෙය්‍යකානං** ගර්භශායීනට **තාව** පළමු කොට **තිසන්තතිවසේන** මතු කියන කායදසකාදි ත්‍රිවිධ සන්තතින්ගේ වශයෙන් **වත්ථු-කාය-භාවදසකසඞ්ඛාතානි** වත්ථුදසක කායදසක භාවදසක යයි කියනලද **තිංසරූපානි** තිස් රූපකෙනෙක් **නිබ්බත්තන්ති** නිපදිත්. **තානි ච බෝ** ඔහුද **පටිසන්ධිචිත්තස්ස උප්පාදක්ඛණේයේව** ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහිමැයි **යථා ච උප්පාදක්ඛණේ** යම්සේ උත්පාදක්‍ෂණයෙහි ද **ඨිතික්ඛණේ** ස්ථිතික්‍ෂණයෙහි ද **භඞ්ගක්ඛණේපි** භඞ්ගක්‍ෂණයෙහි ද **තථා** එසේමැයි තිස්දෙන වෙතියි සේයි.

**තත්ථ** එහි නාමරූප දෙක්හි **රූපං** රූපය තෙමේ **දන්ධනිරෝධං** ලස්වූ නිරෝධ ඇත්තේය **ගරුපරිවත්තති** ගුරුව පිරිවැටෙයි **චිත්තං** චිත්තය තෙමේ **ඛිප්පනිරෝධං** වහා නිරෝධ ඇත්තේය **ලහුපරිවත්තති** සැහැල්හුව පිරිවැටෙන්නේයි **තේන ආහ** එහෙයින් වදළ සේක **භික්ඛවේ** මහණෙනි! **අහං** මම **එවං ලහුපරිවත්තං** මෙසේ ලඝු පිරිවැටුම් ඇති **අඤ්ඤං ඒකධම්මම්පි** අනික් එක ධර්මයෙකුදු **න සමනුපස්සාමි** නොදක්මි **භික්ඛවේ** මහණෙනි! **යථා ඉදං චිත්තං** යම්සේ මේ සිත ලඝුවූ පෙරළි ඇත්තේදැයි **රූපේ** රූපයක් **ධරන්තේයේවහි** පවත්නා කල්හිම **සෝළසවාරේ** සොළොස් වරෙකැ **භවඞ්ගචිත්තං** භවඞ්ගසිත **උප්පජ්ජිත්වා නිරුජ්ඣති** ඉපිද නිරුද්ධ වෙයි. **චිත්තස්ස උප්පාදක්ඛණෝ** චිත්තයාගේ උත්පාදක්‍ෂණය ද **ඨිතික්ඛණෝ** ස්ථිතික්‍ෂණය ද **භඞ්ගක්ඛණෝපි** භඞ්ගක්‍ෂණය ද **ඒකසදිසා** ඒක සදෘශයහ, සමප්‍රමාණයහ **රූපස්ස පන** රූපයාගේ වනාහි **උප්පාදභඞ්ගක්ඛණායේව** උත්පාද භඞ්ගක්‍ෂණයෝම **ලහුකා** සැහැල්හුහ **තේහි සදිසා** චිත්තයාගේ උත්පාද භඞ්ගක්‍ෂණ හා සදෘශයෝයි **ඨිතික්ඛණෝ පන** ස්ථිතික්‍ෂණය වනාහි **මහා** මහති **යාව** යම්තාක් **සෝළසචිත්තානි උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති** සොළොස් චිත්ත කෙනෙක් ඉපිද නිරුද්ධ වෙත්ද **තාව** ඒතාක් **වත්තති** පවති.

**[විසුද්ධි මාර්ග සන්නය 1527-1528 පිටු; සිංහල විසුද්ධි මාර්ගය මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය 509 පිට (තායිවාන් මුද්‍රණය)]**

**ඒකචිත්තක්ඛණං නාමා**ති ඒකස්ස චිත්තස්ස ඛණෝ නාම. සෝ පන ඛණෝ අච්ඡරාසඞ්ඝාටක්ඛණස්ස අක්ඛිනිම්මිලනක්ඛණස්සච අනේකකෝටි සතසහස්සභාගෝ දට්ඨබ්බෝ. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 136 යටතේ); අභිධර්මයේ මූලික කරුණු 39 පිට]**

"අච්ඡරාසඞ්ඝාටක්ඛණස්සා"ති අඞ්ගුලීනං සඞ්ඝට්ටනක්ඛණස්ස.
**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 136 යටතේ)]**

**ඒකචිත්තක්ඛණං නාම ඉති** ඒකචිත්තක්ඛණං නාම යනු **ඒකස්ස චිත්තස්ස** එක් සිතකගේ **ඛණෝ නාම** ක්‍ෂණය නම් **සෝ පන ඛණෝ** ඒ ක්‍ෂණය වනාහි **අච්ඡරාසඞ්ඝාටක්ඛණස්ස** එක් අසුරුසැණක් පමණ කාලයකගේ ද **අක්ඛිනිම්මිලනක්ඛණස්ස ච** ඇසපිය හෙළන කාලයකගේ ද **අනේකකෝටි සතසහස්සභාගෝ** නොයෙක් කෝටි සතසහස්‍රයකින් කොටසක් යැයි **දට්ඨබ්බෝ** දතයුතුයි. **[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

"වාහසතං ඛෝ, මහාරාජ, වීහීනං අඩ්ඪචූළඤ්ච වාහා වීහිසත්තම්බණානි ද්වේ ච තුම්බා ඒකච්ඡරාක්ඛණේ පවත්තචිත්තස්ස එත්තකා වීහී ලක්ඛං ඨපීයමානාපරික්ඛයං පරියාදනං ගච්ඡෙය්‍යුං?
**[මිලින්දපඤ්හ පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 02 සබ්බඤ්ඤුභාව පඤ්හෝ යටතේ); මිලින්දපඤ්හෝ 99 පිට; අභිධර්මයේ මූලික කරුණු 40 පිට]**

"මහරජාණෙනි! සතර නැළියක් ගන්නා ලාස්සෙන් වී තිස්දෑමුනෙක් යාළෙක. එහි වී ඇට සකෝටි තිස්තුන්ලක්‍ෂ සැටදහසක් වන නියායෙන් වීහීන්ගේ එකසිය පණස්යාළ සතමුණු දෙළාසෙක. මෙතෙක් වියෙහි වී ඇට එක අසුරුසැණක් පමණ කාලයෙහි ප්‍රවෘත්තව පෙරළී උපදනා චිත්තයාගේ ගණනට ලක් තබන කල්හි ක්‍ෂයට ඌණත්වයට යන්නාහුය." **[සිංහල මිලින්ද ප්‍රශ්නය 121 පිට]**

## චිත්තය වහා වෙනස් වන සුළු ධර්මයකි:—

"නාහං, භික්ඛවේ, අඤ්ඤං ඒකධම්මම්පි සමනුපස්සාමි යං ඒවං ලහුපරිවත්තං යථයිදං චිත්තං. යාවඤ්චිදං, භික්ඛවේ, උපමාපි න සුකරා යාව ලහුපරිවත්තං චිත්ත"න්ති.
**[අඞ්ගුත්තර නිකාය ඒකකනිපාත පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 48 යටතේ); අඞ්ගුත්තර නිකාය 01/18 පිට (බු.ජ); කථාවත්ථු පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 335 යටතේ); කථාවත්ථු පාළි 01/524 පිට (බු.ජ)]**

**භික්ඛවේ** මහණෙනි! **යං** යමක් **ඒවං** මෙසේ **ලහුපරිවත්තං** වහා ඉපිද වහා නස්නාසුලු ද (එබඳු වූ) **අඤ්ඤං ඒකධම්මම්පි** (මේ මතු කියන ධර්මය හැර) අන් එකම ධර්මයකුත් **අහං** මම **න සමනුපස්සාමි** (ඤාණසමනුපස්සනාවෙන්) නොදක්නෙමි (ඒ කවර ධර්මයක් ද?) **යථයිදං** යම්බඳු වූ මේ **චිත්තං** චිත්තය වේ **භික්ඛවේ** මහණෙනි! **යාවඤ්චිදං** යම් මේ **චිත්තං** සිත **යාව** යම්තාක් **ලහුපරිවත්තං** වහා ඉපිද වහා නස්නාසුලු ද (එබඳු වූ) **උපමාපි** උපමාවකුදු **න සුකරා** සුකර නොවන්නේය (දක්වන්නට නො හැක්කේයයි වදාළසේක) **[අඞ්ගුත්තර නිකාය ව්‍යාඛ්‍යා 19 පිට]**

**ඒවං ලහුපරිවත්තන**න්ති ඒවං ලහුං උප්පජ්ජිත්වා ලහුං නිරුජ්ඣනකං. **යාවඤ්චා**ති අධිමත්තපමාණත්ථේ නිපාතෝ, අතිවිය න සුකරාති අත්ථෝ. **ඉදන්**ති නිපාතමත්තං. **චිත්තන්**ති ඒකච්චේ තාව ආචරියා "භවඞ්ගචිත්ත"න්ති වදන්ති, තං

පන පටික්ඛිපිත්වා "ඉධ චිත්තන්ති යංකිඤ්චි අන්තමසො චක්ඛුවිඤ්ඤාණම්පි අධිප්පේතමේවා"ති වුත්තං. ඉමස්මිං පනත්ථේ මිලින්දරාජා ධම්මකථිකං නාගසේනත්ථේරං පුච්ඡි, "භන්තේ නාගසේන, ඒකස්මිං අච්ඡරාක්ඛණේ පවත්තිතචිත්තසඞ්ඛාරා සචේ රූපිනෝ අස්සු, කීව මහාරාසි භවෙය්‍යා"ති? "වාහසතානං ඛෝ, මහාරාජ, වීහීනං අඩ්ඪචූළඤ්ච වාහා වීහිසත්තම්බණානි ද්වේ ච තුම්බා ඒකච්ඡරාක්ඛණේ පවත්තිතස්ස චිත්තස්ස සඞ්ඛම්පි න උපෙන්ති, කලම්පි න උපෙන්ති, කලභාගම්පි න උපෙන්තී"ති (මි. ප. 4.1.2). අථ කස්මා සම්මාසම්බුද්ධේන "උපමාපි න සුකරා"ති වුත්තං? යථේව හි උපමං පටික්ඛිපිත්වාපි කප්පදීඝභාවස්ස යෝජනිකපබ්බතේන යෝජනිකසාසපපුණ්ණනගරේන, නිරයදුක්ඛස්ස සත්තිසතාහතෝපමේන, සග්ගසුඛස්ස ච චක්කවත්තිසම්පත්තියා උපමා කතා, ඒවම්ධාපි කාතබ්බාති? තත්ථ "සක්කා පන, භන්තේ, උපමා කාතු"න්ති ඒවං පුච්ඡාවසේන උපමා කතා, ඉමස්මිං සුත්තේ පුච්ඡාය අභාවේන න කතා. ඉදඤ්හි සුත්තං ධම්මදේසනාපරියෝසානේ වුත්තං. ඉති ඉමස්මිං සුත්තේ චිත්තරාසි නාම කථිතෝති.

**[අඞ්ගුත්තර නිකාය ඒකකනිපාත අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 48 යටතේ); අඞ්ගුත්තර නිකාය අටුවා 01/34 පිට (හේ.වි.මු)]**

චිත්තස්ස පරිවත්තනං උප්පාදනිරෝධා ඒවාති ආහ **"ඒවං ලහුං උප්පජ්ජිත්වා ලහුං නිරුජ්ඣනක"**න්ති. **අධිමත්තපමාණත්ථේ**ති අතික්කන්තපමාණත්ථේ, පමාණාතීතතායන්ති අත්ථෝ. තේනාහ**"අතිවිය න සුකරා"**ති. **චක්ඛුවිඤ්ඤාණම්පි අධිප්පේතමේවා**ති සබ්බස්සපි චිත්තස්ස සමානඛණත්තා වුත්තං. චිත්තස්ස අතිවිය ලහුපරිවත්තිභාවං ථේරවාදේන දීපේතුං **"ඉමස්මිං පනත්ථේ"**තිආදි වුත්තං. **චිත්තසඞ්ඛාරා**ති සසම්පයුත්තං චිත්තං වදති. **වාහසතානං ඛෝ, මහාරාජ, වීහීන**න්ති පොත්ථකේසු ලිඛන්ති, "වාහසතං ඛෝ, මහාරාජ, වීහීන"න්ති පන පාඨේන භවිතබ්බං. **මිලින්දපඤ්හේපි** (මි. ප. 4.1.2) හි කත්ථචි අයමේව පාඨෝ දිස්සති. "වාහසතාන"න්ති වා පච්චත්තේ සාමිවචනං බ්‍යත්තයේන වුත්තන්ති දට්ඨබ්බං. **අඩ්ඪචූළ**න්ති ථෝකේන ඌනං උපඩ්ඪං. කස්ස පන උපඩ්ඪන්ති? අධිකාරතෝ වාහස්සාති විඤ්ඤායති. "අඩ්ඪචුද්දස"න්ති කේචි. "අඩ්ඪචතුත්ථ"න්ති අපරේ. සාධිකං දියඩ්ඪසතං වාහාති දළ්හං කත්වා වදන්ති, වීමංසිතබ්බං. චතුනාළිකෝ **තුම්බෝ. පුච්ඡාය අභාවේනා**ති "සක්කා පන, භන්තේ, උපමං කාතු"න්ති ඒවං පවත්තාය පුච්ඡාය අභාවේන **න කතා උපමා. ධම්මදේසනාපරියෝසානේ**ති සන්නිපතිතපරිසාය යථාරද්ධධම්මදේසනාය පරියෝසානේ. **[අඞ්ගුත්තර නිකාය ඒකකනිපාත ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 48 යටතේ)]**

**ඒවං ලහුපරිවත්තං ඉති** ඒවං ලහුපරිවත්තං යනු **ඒවං** මෙසේ **ලහුං උප්පජ්ජිත්වා** වහා ඉපිද **ලහුං නිරුජ්ඣනකං** වහා නිරුද්ධවන **යාවඤ්ච ඉති** යාවඤ්ච යනු **අධිමත්තපමාණත්ථේ** අධිමාත්‍ර ප්‍රමාණාර්ථයෙහි **නිපාතෝ** නිපාතයි **අතිවිය න සුකරාති අත්ථෝ** අතිශ්‍රයින් පහසු නොවේ යන අර්ථයයි **ඉදං ඉති** ඉදං යනු **නිපාතමත්තං** නිපාත මාත්‍රයෙකි **චිත්තං ඉති** චිත්තං යනු **ඒකච්චේ තාව ආචරියා** ඇතැම් ආචාර්‍ය්‍යවරු වනාහි **භවඞ්ගචිත්තං ඉති** භවඞ්ගචිත්තය යැයි **වදන්ති** කියත් **තං පන** එය වනාහි **පටික්ඛිපිත්වා** ප්‍රතික්ෂේප කොට **ඉධ** මෙහි **චිත්තං ඉති** චිත්තං යනු **අන්තමසෝ** යටත්පිරිසෙන් **යං කිඤ්චි චක්ඛුවිඤ්ඤාණම්පි** යම්කිසි චක්‍ෂුර්විඤ්ඤාණ සිතක් ද **අධිප්පේතමෙව ඉති** අදහස් කොටම **වුත්තං** දේශනා කරනලදි **ඉමස්මිං පන අත්ථේ** මේ අර්ථයෙහි වනාහි **මිලින්දරාජා** මිලිඳු රජු **ධම්මකථිකං නාගසේනථේරං** ධම්මකථික නාගසේන තෙරුන් වහන්සේගෙන් **භන්තේ නාගසේන!** ස්වාමීනි නාගසේනයන් වහන්ස! **ඒකස්මිං අච්ඡරාක්ඛණේ** එක්

අසුරැසැණෙක්හි **පවත්තිතචිත්තසඞ්ඛාරා** පවතිනලද චිත්ත සංස්කාරයෝ **සචේ** ඉදින් **රූපිනෝ අස්සු** රූපී ධර්මයෝ වන්නාහු නම් **කීව මහාරාසි භවෙය්‍ය ඉති** කොපමණ මහා ගොඩක් වන්නේ දැයි **පුච්ඡි** විමසීය **මහාරාජ!** මහරජ! **වාහසතානං ඛෝ වීහීනං අඩ්ඪචූළඤ්ච වාහා වීහිසත්තම්බණානි ද්වේ ච තුම්බා** එකසිය පණස්යාළ සතමුණු දෙළොසක වූ වීවලගේ වී ඇට **ඒකච්ඡරාක්ඛණේ** එක් අසුරැසැණෙක්හි **පවත්තිතස්ස චිත්තස්ස** පවතිනලද චිත්තයාගේ **සඞ්ඛම්පි** ගණනට **න උපෙන්ති** නොම එළඹෙත් **කලම්පි** කලදකුදු **න උපෙන්ති** නොම එළඹෙත් **කාලභාගම්පි** කලං භාගයකුදු **න උපෙන්ති** නොම එළඹෙත් **ඉති ආහ** යැයි වදළ සේක **අථ** ඉක්බිති **කස්මා** කුමක්හෙයින් **සම්මාසම්බුද්ධේන** සම්මාසම්බුදුරජාණන් වහන්සේ විසින් **උපමාපි** උපමාවකුදු **න සුකරා ඉති** දක්වන්නට නොහැක්කේ යැයි **වුත්තං?** වදළ සේක් ද? **යථේව හි** යම්සේ වනාහි **උපමං** උපමාවක් දැක්වීම **පටික්ඛිපිත්වාපි** ප්‍රතික්ෂේප කොට ද **කප්පදීඝභාවස්ස** කල්පයාගේ දීර්ඝභාවයට **යෝජනිකපබ්බතේන** යොදුනක් දිග පළල පර්වත උපමාවෙන් ද **යෝජනිකසාසපපුණ්ණනගරේන** යොදුනක් දිග පළල ඇති අබ පිරවූ නගර උපමාවෙන් ද **සත්තිසතාහතෝපමේය** යවුල් සියයකින් බේදයට පමුණුවනලද උපමාවෙන් **නිරයදුක්ඛස්ස** නිරය දුක්ඛයාගේ ද **චක්කවත්තිසම්පත්තියා** සක්විති රාජ්‍ය සම්පත්ති උපමාවෙන් **සග්ගසුඛස්ස ච** ස්වර්ග සැපයගේ ද **උපමා කතා** උපමාවෝ කරනලදි **ඒවං** මෙසේ **ඉධාපි** මෙහි ද **(උපමා** උපමාවක්) **කාතබ්බා ඉති (ננු?)** කළයුතු නොවේද? **තත්‍ථ** මිලින්ද ප්‍රශ්නයෙහි **භන්තේ** ස්වාමීනි **උපමා පන** උපමාවක් වනාහි **කාතුං** කරන්නට **සක්කා ඉති** හැකිදැයි **ඒවං** මෙසේ **පුච්ඡාවසේන** ප්‍රශ්න කිරීම් වශයෙන් **උපමා කතා** උපමාවක් කරනලදි **ඉමස්මිං සුත්තේ** මේ සූත්‍රයෙහි **පුච්ඡාය අභාවේන** ප්‍රශ්න නොකිරීමෙන් **න උපමා කතා** උපමාවක් නොකරනලදි **ඉදඤ්හි සුත්තං** මේ සූත්‍රය වනාහි **ධම්මදේශනාපරියෝසානේ** ධර්මදේශනාව අවසානයෙහි **වුත්තං** දේශනා කරනලදි **ඉති** මෙසේ **ඉමස්මිං සුත්තේ** මේ සූත්‍රයෙහි **චිත්තරාසි නාම** චිත්තරාශියක් නම් **කථිතෝ** දේශනා කරනලදි.

**[අඞ්ගුත්තර නිකාය අටුවා පරිවර්තනයි]**

යෝ පනේතස්ස කුසලචිත්තස්ස පවත්තිකාලෝ නාම හෝති, සෝ අතිපරිත්තෝ. සා චස්ස අතිපරිත්තතා "යථා ච, භික්ඛවේ, තස්ස පුරිසස්ස ජවෝ, යථා ච චන්දිමසූරියානං ජවෝ, යථා ච යා දේවතා චන්දිමසූරියානං පුරතෝ ධාවන්ති තාසං දේවතානං ජවෝ, තතෝ සීඝතරං ආයුසඞ්ඛාරා ඛීයන්තී"ති (සං. නි. 2.228) ඉමස්ස සුත්තස්ස අට්ඨකථාවසේන වේදිතබ්බා. තත්‍ර හි සෝ රූපජීවිතින්ද්‍රියස්ස තාව පරිත්තකෝ කාලෝ වුත්තෝ. යාව පටුප්පන්නං රූපං තිට්ඨති තාව සෝළස චිත්තානි උප්පජ්ජිත්වා භිජ්ජන්ති. ඉති තේසං කාලපරිත්තතාය උපමාපි නත්ථි. තේනේවාහ "යාවඤ්චිදං, භික්ඛවේ, උපමාපි න සුකරා යාව ලහුපරිවත්තං චිත්ත"න්ති (අ. නි. 1.48). ඒවමේතේසු කාලසඞ්ඛාතෝ සමයෝ කුසලචිත්තප්පවත්තිකාලස්ස අතිපරිත්තතං දීපේති. ඒවං දීපෙන්තේන චානේන අතිපරිත්තකාලතාය, විජ්ජුලතෝභාසේන මුත්තාවුණනං විය, දුප්පටිවිජ්ඣධම්මිදං චිත්තං, තස්මා ඒතස්ස පටිවේධේ මහාඋස්සාහෝ ච ආදරෝ ච කත්තබ්බෝති ඕවාදෝ දින්නෝ හෝති.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය අංක 01 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 78-79 පිටු (හේ.වි.මු)]**

**තස්ස පුරිසස්සාති** "සෙය්‍යථාපි භික්ඛවේ චත්තාරෝ දළ්හධම්මා ධනුග්ගහා සික්ඛිතා කතහත්ථා කතූපාසනා චතුද්දිසා ඨිතා අස්සු, අථ පුරිසෝ ආගච්ඡෙය්‍ය 'අහං ඉමේසං...පෙ.... කතූපාසනානං කණ්ඩේ ඛිත්තේ ඛිත්තේ අප්පතිට්ඨිතේ

පඨවියං ගහෙත්වා ආහරිස්සාමී’”ති (සං. නි. 2.228) ඒවං වුත්තජවනපුරිසස්ස. **තාව පරිත්තකෝ**ති ගමනස්සාදනං දේවපුත්තානං හෙට්ඨුපරියායේන පටිමුඛං ධාවන්තානං සිරසි පාදේ ච බද්ධඛුරධාරාසන්නිපාතතෝ ච පරිත්තතරෝ කාලෝ. කාලසඞ්ඛාතෝ සමයෝ චිත්තපරිච්ඡින්නෝ වුච්චමානෝ තේනේව පරිච්ඡේදකචිත්තේන “ඒවං පරිත්තෝ අහ”න්ති අත්තනෝ පරිත්තතං දීපේති. යථා චාහං, ඒවං සබ්බෝ කුසලචිත්තප්පවත්තිකාලෝති තස්ස පරිත්තතං දීපේති.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා කාමවචරකුසලපද භාජනීය වණ්ණනා අංක 01 යටතේ)]**

**දළ්හධම්මා ධනුග්ගහා**ති දළ්හධනුනෝ ඉස්සාසා. **දළ්හධනු** නාම ද්විසහස්සථාමං වුච්චති. **ද්විසහස්සථාම**න්ති ච යස්ස ආරෝපිතස්ස ජියාබද්ධෝ ලෝහසීසාදීනං භාරෝ දණ්ඩේ ගහෙත්වා යාව කණ්ඩප්පමාණා උක්ඛිත්තස්ස පඨවිතෝ මුච්චති. **සික්ඛිතා**ති දසද්වාදසවස්සානි ආචරියකුලේ උග්ගහිතසිප්පා. **කතහත්ථා**ති ධනුස්මිං චිණ්ණවසීභාවා. කෝචි සිප්පමේව උග්ගණ්හාති, කතහත්ථෝ න හෝති, ඉමේ පන න තථාති දස්සේති. **කතුපාසනා**ති රාජකුලාදීසු දස්සිතසිප්පා. **චතුද්දිසා ඨිතා අස්සූ**ති ඒකස්මිංයේව පදේසේ ථම්භං වා රුක්ඛං වා යං කිඤ්චි ඒකංයේව නිස්සාය චතුද්දිසාභිමුඛා ඨිතා සියුන්ති අත්ථෝ. **ඒවං වුත්තජවනපුරිසස්සා**ති න ඒවරූපෝ පුරිසෝ කෝචි භූතපුබ්බෝ අඤ්ඤත්‍ර බෝධිසත්තේන. සෝ හි ජවනහංසකාලේ ඒවරූපමකාසි. සුත්තේ පන අභූතපරිකප්පනවසේන උපමාමත්තං ආහටං.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා 01 කාමාවචරකුසලපද භාජනීය වණ්ණනා යටතේ)]**

**ඒතස්ස පන කුසලචිත්තස්ස** ඒ කුසල චිත්තයාගේ වනාහි **යෝ පවත්තිකාලෝ නාම හෝති** යම් ප්‍රවෘත්ති (පවතින) කාලයක් නම් වෙයි ද **සෝ (පවත්තිකාලෝ)** ඒ ප්‍රවෘත්ති කාලය **අතිපරිත්තෝ** ඉතා අල්පය නොහොත් ඉතා කෙටිය **අස්ස (චිත්තස්ස)** ඒ චිත්තයාගේ **සා (පවත්ති)** ඒ ප්‍රවෘත්තිය **අතිපරිත්තතා** ඉතා කෙටි බැවින් **ච** උදහරණයක් දක්වම් **භික්ඛවේ** මහණෙනි **තස්ස පුරිසස්ස** ඒ පුරුෂයාගේ **යථා ච ජවෝ (හෝති)** යම්බඳු ජවයක් වෙයි ද **චන්දිමසුරියානං** චන්ද්‍ර සූර්ය දෙදෙනාගේ **යථා ච ජවෝ (හෝති)** යම්බඳු ජවයක් වෙයි ද **යා දේවතා** යම් දේවතාවෝ **චන්දිමසුරියානං** චන්ද්‍ර සූර්ය දෙදෙනාගේ **පුරතෝ** ඉදිරියෙන් **ධාවන්ති** දුවත් ද **තාසං දේවතානං** ඒ දෙවියන්ගේ **යථා ච ජවෝ (හෝති)** යම්බඳු ජවයක් වෙයි ද **තතෝ සීඝතරං** ඊටත් වඩා වේගයෙන් **ආයුසඞ්ඛාරා** ආයු සංස්කාරයෝ **ඛීයන්ති** ගෙවෙත් **ඉති (ආහ)** යැයි වදාළ සේක **ඉමස්ස සුත්තස්ස** මේ සූත්‍රයගේ **අට්ඨකථාවසේන** අර්ථකථා වශයෙන් **වේදිතබ්බා** දතයුතුයි.

(“තස්සපුරිසස්ස” යනු මහණෙනි යම්සේ ආචාර්‍ය්‍ය කුලයෙහි දස ද්වාදස වසරක් ඉගෙන ගන්නාලද ශිල්ප ඇති දුන්න පිළිබඳ මනා පලපුරුද්දක් ඇති රාජකුලාදියට දක්වනලද ශිල්ප ඇති දක්‍ෂ දුනුවායන් සතර දෙනෙක් සතර දිශාවෙහි සිටින ලදහ. ඉක්බිති පුරුෂයෙක් පැමිණෙන්නේ “**මම** ආචාර්‍ය්‍ය කුලයෙහි දස ද්වාදස වසරක් ඉගෙන ගන්නාලද ශිල්ප ඇති දුන්න පිළිබඳ මනා පලපුරුද්දක් ඇති රාජකුලාදියට දක්වනලද ශිල්ප ඇති දක්‍ෂ දුනුවායන් සතර දෙනාගේ දුන්නෙන් විදිනලද ඊතල පොළවට පතිතවන්නට මත්තෙන් ගෙන එන්නෙමි” **මෙසේ කියනලද ජවනපුරුෂයකුගේ** වේගයයි)

**තත්‍ර හි** එහි වනාහි **තාව** පළමුව **රූපජීවිතින්ද්‍රියස්ස** රූපජීවිතෙන්ද්‍රියාගේ **සෝ පරිත්තකෝ කාලෝ වුත්තෝ** ඒ කෙටි කාලය දේශනා කරනලදි **යාව පටුප්පන්නං**

**රූපං** යම්තාක් වර්තමාන රූපය **තිට්ඨති** පවතියි ද **තාව** ඒතාක් **සෝළස චිත්තානි උප්පජ්ජිත්වා** සිත් සොළොසක් ඉපිද **භිජ්ජන්ති** බිඳෙත් **ඉති** මෙසේ **තේසං** ඔහුන්ගේ **කාලපරිත්තතාය** කාලය කෙටි බැවින් **උපමාපි** උපමාවකුදු **නත්ථි** නැත **තේනේව** එහෙයින්ම **භික්ඛවේ** මහණෙනි **යාවඤ්චිදං** යම් මේ **චිත්තං** සිත **යාව** යම්තාක් **ලහුපරිවත්තං** වහා ඉපිද වහා නැසෙන සුළු ද (එබඳු වූ) **උපමාපි** උපමාවකුදු **න සුකරා** දක්වන්නට පහසු නොවෙයි **ඉති ආහ** යැයි වදළ සේක **ඒවං** මෙසේ **ඒතේසු** මෙහුන් අතුරෙන් **කුසලචිත්තප්පවත්තිකාලස්ස** කුසල සිත පවතින කාලයාගේ **කාලසඞ්ඛාතෝ සමයෝ** කාල සඞ්ඛ්‍යාත වූ සමය **අතිපරිත්තතං** ඉතා ස්වල්ප බව **දීපේති** දක්වයි **ඒවං** මෙසේ **අනේන දීපෙන්තේන** මේ දැක්වීමෙන් **අතිපරිත්තකාලතාය** ඉතා කෙටි කාලයක් බැවින් **විජ්ජුලතෝභාසේන** විදුලි එළියෙන් **මුත්තාවුණනං විය** මුතු අමුණන්නාක් මෙන් **ඉදං චිත්තං** මේ සිත **දුප්පටිවිජ්ඣං** අවබෝධ කරගැනීම දුෂ්කර **ච (හෝති)** වෙයි **තස්මා** එහෙයින් **ඒතස්ස** ඒ චිත්තයාගේ **පටිවේධේ** ප්‍රතිවේද කිරීමෙහි **මහාඋස්සාහෝ ච** මහත් උත්සාහයක් ද **ආදරෝ ච** ආදරයක් ද **කත්තබ්බෝ ඉති** කළයුතු යැයි **ඕවාදෝ දින්නෝ හෝති** අවවාදයක් දෙනලද්දේ වෙයි.

**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

## චිත්තය තනිව උපදී ද?

**චිත්තං උප්පන්නං හෝතීති** චේතං දේසනාසීසමේව න පන චිත්තං ඒකකමේව උප්පජ්ජති තස්මා යථා රාජා ආගතෝති වුත්තේ න පරිසං පහාය ඒකකෝව ආගතෝ, රාජපරිසාය පන සද්ධිංයේව ආගතෝති පඤ්ඤායති, ඒවමිදම්පි පරෝපණ්ණාසකුසලධම්මේහි සද්ධිංයේව උප්පන්නන්ති වේදිතබ්බං.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරවණ්ණනා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 84 පිට (හේ.වි.මු)]**

"චිත්ත"න්ති හි චිත්තුප්පාදෝපි වුච්චති. තේන වුත්තං "චිත්තං උප්පන්නන්ති එත්ථ චිත්තමේව අග්ගහෙත්වා පරෝපණ්ණාසකුසලධම්මේහි සද්ධිංයේව චිත්තං ගහිත"න්ති. **[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 988 යටතේ)]**

**චිත්තං උප්පන්නං හෝතීති** චිත්තං උප්පන්නං හෝති යනු **චේතං** චිත්තය **දේසනාසීසමේව** දේශනා ශීර්ෂයෙන්ම **(වුත්තං හෝති)** දේශනා කරනලද්දේ වෙයි **පන** එසේ දේශනා කළේ නමුදු **චිත්තං** සිත **ඒකකමේව** තනිවම නොහොත් සිතපමණක්ම **න උප්පජ්ජති** නූපදී **තස්මා** එබැවින් **යථා** යම්සේ **රාජා** රජු **ආගතෝති** පැමිණියේයැයි **වුත්තේ** කියූ කල්හි **පරිසං** පිරිවර **පහාය** හැර **ඒකකෝව** එකලාවම **න ආගතෝ** එනලද්දේ නොවේ **රාජපරිසාය** රාජ්‍යසේනාව **සද්ධිංයේව** සමගම **ආගතෝති** පැමිණියේයයි **පඤ්ඤායති** ප්‍රකට වෙයි **ඒවං** මෙසේ **ඉදං (චිත්තං) අපි** මේ සිතද **පරෝපණ්ණාසකුසලධම්මේහි** පරෝපණ්ණාස කුසලධර්මයන් **සද්ධිංයේව** සමගම **උප්පන්නන්ති** උපන්නේයැයි **වේදිතබ්බං** දතයුතුයි.

]ධම්මසඞ්ගණී **අටුවා පරිවත්තනයි[**

## චිත්තය හදයවත්‍ථුව ඇසුරුකොට උපදින ආකාරයඃ—

පටිසන්ධිචිත්තස්ස උප්පාදක්ඛණේ උප්පන්නං ඨානප්පත්තං පුරේජාතං වත්ථුං නිස්සාය දුතියං භවඞ්ගං උප්පජ්ජති. තේන සද්ධිං උප්පන්නං ඨානප්පත්තං පුරේජාතං වත්ථුං නිස්සාය තතියං භවඞ්ගං උප්පජ්ජති. ඉමිනා නයේන යාවතායුකං

චිත්තප්පවත්ති වේදිතබ්බා. ආසන්නමරණස්ස පන ඒකමේව ඨානප්පත්තං පුරේජාතං වත්ථුං නිස්සාය සෝළස චිත්තානි උප්පජ්ජන්ති.
**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 700 යටතේ); විසුද්ධිමග්ග අටුවා 460-461 පිටු (හේ.වි.මු)]**

**තේනා**ති දුතියභවඞ්ගචිත්තේන. වත්ථුරූපං ඒකස්ස චිත්තස්ස නිස්සයෝ හුත්වා අඤ්ඤස්ස න හෝති ඨපෙත්වා මරණාසන්නං, තස්මා වුත්තං **"තේන සද්ධි"**න්තිආදි. **[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 700 යටතේ)]**

**පටිසන්ධිචිත්තස්ස** පිළිසඳ (පටිසන්ධි) සිත්හුගේ **උප්පාදක්ඛණේ උප්පන්නං** උත්පාදක්‍ෂණයෙහි උපන් **ඨානප්පත්තං** ස්ථිතිප්‍රාප්ත වූ **පුරේජාතං වත්ථුං නිස්සාය** පුරේජාත හදවත නිසා **දුතියභවඞ්ගං උප්පජ්ජති** දෙවන භවාඞ්ගය උපදී **තේන සද්ධිං උප්පන්නං** ඒ දෙවන භවාඞ්ගය හා සමඟ උපන් **ඨානප්පත්තං පුරේජාතං වත්ථුං නිස්සාය** ස්ථිතික්‍ෂණප්‍රාප්ත වූ පුරේජාත වස්තුව නිසා **තතියභවඞ්ගං උප්පජ්ජති** තුන්වන භවාඞ්ගය උපදී **ඉමිනා නයේන** මෙම නයින් **යාවතායුකං** යාවජීවයෙන් **චිත්තප්පවත්ති වේදිතබ්බා** චිත්තප්‍රවෘත්ති තොමෝ දතයුත්තීයි.

**ආසන්නමරණස්ස පන** ආසන්න මරණ ඇත්තාහට වනාහි **ඒකමේව ඨානප්පත්තං වත්ථුං නිස්සාය** එකම ස්ථානප්‍රාප්ත වස්තුව නිසා **සෝළසචිත්තානි උප්පජ්ජන්ති** සොළොස් චිත්තකෙනෙක් උපදනාහුයි.
**[විසුද්ධි මාර්ග සන්නය 1528-1529 පිටු; සිංහල විසුද්ධි මාර්ගය මග්ගාමග්ගඤාණදස්සනය 509 පිට (තායිවාන් මුද්‍රණය)]**

## සහගත ශබ්දයෙහි අර්ථः—

**සෝමනස්සසහගත**න්ති සාතමධුරවේදයිතසඞ්ඛාතේන සෝමනස්සේන සහ ඒකුප්පාදදිභාවං ගතං. අයං පන **'සහගත'**-සද්දෝ තබ්භාවේ වෝකිණ්ණේ නිස්සයේ ආරම්මණේ සංසට්ඨේති ඉමේසු අත්ථේසු දිස්සති. තත්ථ "යායං තණ්හා පෝනෝබ්භවිකා නන්දිරාගසහගතා"ති (විභ. 203) තබ්භාවේ වේදිතබ්බෝ; නන්දිරාගභූතාති අත්ථෝ. "යා, භික්ඛවේ, වීමංසා කෝසජ්ජසහගතා කෝසජ්ජසම්පයුත්තා"ති (සං. නි. 5.832) වෝකිණ්ණේ වේදිතබ්බෝ; අන්තරන්තරා උප්පජ්ජමානේන කෝසජ්ජේන වෝකිණ්ණාති අයමෙත්ථ අත්ථෝ. "අට්ඨිකසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවේතී"ති (සං. නි. 5.238) නිස්සයේ වේදිතබ්බෝ; අට්ඨිකසඤ්ඤං නිස්සාය අට්ඨිකසඤ්ඤං භාවෙත්වා පටිලද්ධන්ති අත්ථෝ. "ලාභී හෝති රූපසහගතානං වා සමාපත්තීනං අරූපසහගතානං වා"ති (පු. ප. 3-5) ආරම්මණේ වේදිතබ්බෝ; රූපාරූපාරම්මණානන්ති අත්ථෝ. "ඉදං සුඛං ඉමාය පීතියා සහගතං හෝති සහජාතං සංසට්ඨං සම්පයුත්ත"න්ති (විභ. 578) සංසට්ඨේ. ඉමස්මිම්පි පදේ අයමේවත්ථෝ අධිප්පේතෝ. සෝමනස්සසංසට්ඨඤ්හි ඉධ සෝමනස්සසහගතන්ති වුත්තං.

'සංසට්ඨ'-සද්දෝපි වේස සදිසේ අවස්සුතේ මිත්තසන්ථවේ සහජාතේති බහූසු අත්ථේසු දිස්සති. අයඤ්හි "කිසේ ථූලේ විවජ්ජෙත්වා සංසට්ඨා යෝජිතා හයා"ති (ජා. 2.22.70) එත්ථ සදිසේ ආගතෝ. "සංසට්ඨාව තුම්හේ අයේ‍ය විහරථා"ති (පාචි. 727) අවස්සුතේ. "ගිහි සංසට්ඨෝ විහරතී"ති (සං. නි. 3.3) මිත්තසන්ථවේ. "ඉදං සුඛං ඉමාය පීතියා සහගතං හෝති සහජාතං සංසට්ඨං සම්පයුත්ත"න්ති සහජාතේ. ඉධාපි සහජාතේ අධිප්පේතෝ. තත්ථ 'සහගතං' අසහජාතං අසංසට්ඨං අසම්පයුත්තං නාම

නත්ථි. සහජාතං පන සංසට්ඨං සම්පයුත්තං හෝතිපි, න හෝතිපි. රූපාරූපධම්මේසු හි ඒකතෝ ජාතේසු රූපං අරූපේන සහජාතං හෝති, න සංසට්ඨං, න සම්පයුත්තං; තථා අරූපං රූපේන; රූපඤ්ච රූපේන; අරූපං පන අරූපේන සද්ධිං නියමතෝව සහගතං සහජාතං සංසට්ඨං සම්පයුත්තමේව හෝතීති. තං සන්ධාය වුත්තං 'සෝමනස්සසහගත'න්ති.

**[ධම්මසඞ්ගණී අට්ඨකථා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය වණ්ණනා අංක 01 යටතේ); ධම්මසඞ්ගණී අට්ඨකථා 85-86 පිටු (හේ.වි.මු)]**

**සාත**න්ති සභාවවසේන වුත්තං, **මධුර**න්ති මධුරං වියාති උපමාවසේන. **පෝනෝබ්භවිකා**ති පුනබ්භවකරණසීලාතත්‍රතත්‍රාභිනන්දන .තේ නන්දී, නන්දිභූතෝ රාගෝ නන්දිරාගෝ, නන්දිරාගභාවේන සහගතාති **නන්දිරාගසහගතා**ති න එත්ථ සම්පයෝගවසේන සහගතභාවෝ අත්ථීති සහගතසද්දෝ තණ්හාය නන්දිරාගභාවං ජෝතේති. **නන්දිරාගභූතා**ති වස්ස අත්ථෝ. **නිස්සයේ**ති පාදකේ. **රූපාරූපාරම්මණාන**න්ති පථවීකසිණාදිආකාසාදිආරම්මණානං. **සංසට්ඨේ**ති බීරෝදකං විය සමෝදිතේ ඒකීභාවමිව ගතේ. **සහජාතේ**ති සම්පයුත්තසහජාතේ, න සහජාතමත්තේ. **ඉධාපී**ති "ඉමස්මිම්පි පදේ අයමේව අත්ථෝ අධිප්පේතෝ"ති ඉමිස්සා අට්ඨකථාය යථාදස්සිතසංසට්ඨසද්දෝ සහජාතේ අධිප්පේතෝති. **අරූපං රූපේනා**ති පටිසන්ධික්ඛණේ වත්ථුනා.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 01 කාමාවචරකුසලපද භාජනීය වණ්ණනා යටතේ)]**

"යං තස්මිං සමයේ චේතසිකං සාත"න්ති නිද්දිට්ඨත්තා සෝමනස්සවේදනා සාතසභාවාති ආහ **"සභාවවසේන වුත්ත"**න්ති. නිප්පරියායේන **මධුර**-සද්දෝ රසවිසේසපරියායෝ, ඉට්ඨභාවසාමඤ්ඤේන ඉධ උපචාරේන වුත්තෝති ආහ **"මධුරං වියා"**ති. පරමත්ථතෝ තණ්හාවිනිමුත්තෝ නන්දිරාගෝ නන්දිරාගභාවෝ වා නත්ථීති **"න එත්ථ සම්පයෝගවසේන සහගතභාවෝ අත්ථී"**ති, **"නන්දිරාගසහගතා"**ති ච වුච්චති. තේන විඤ්ඤායති "සහගතසද්දෝ තණ්හාය නන්දිරාගභාවං ජෝතේතී"ති. අවත්ථාවිසේසවාචකෝ වා සහ-සද්දෝ "සනිදස්සනා"තිආදීසු විය, සබ්බාසුපි අවත්ථාසු නන්දිරාගසභාවාවිජහනදීපනවසේන නන්දිරාගභාවං ගතා නන්දිරාගසහගතාති තණ්හා වුත්තා. ගත-සද්දස්ස වා "දිට්ඨිගත"න්තිආදීසු විය අත්ථන්තරාභාවතෝ නන්දිරාගසභාවා තණ්හා **"නන්දිරාගසහගතා"**ති වුත්තා, නන්දිරාගසභාවාති අත්ථෝ. **ඉධාපී**ති ඉමිස්සං අට්ඨකථායං. **ඉමස්මිම්පි පදේ**ති "සෝමනස්සසහගත"න්ති ඒතස්මිම්පි පදේ. **අයමේවත්ථෝ**ති සංසට්ඨෝ ඒව. යථාදස්සිතසංසට්ඨසදෝති අත්ථුද්ධාරප්පසඞ්ගේන පාළිතෝ අට්ඨකථාය ආගතසංසට්ඨසද්දෝ. **සහජාතේ**ති සහජාතත්ථේ.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 01 කාමාවචරකුසලපද භාජනීය වණ්ණනා යටතේ)]**

**සෝමනස්සසහගතං ඉති** සෝමනස්සසහගතං යනු **සාතමධුරවේදයිතසඞ්ඛාතේන** සැප මිහිරි වේදනා සඞ්ඛ්‍යාත **සෝමනස්සේන සහ** සොම්නස හා සමඟ **එකුප්පාදදිභාවං ගතං** ඒකෝත්පාදදී බවට ගිය **අයං පන සහගතසද්දෝ** මෙකී සහගත ශබ්දය වනාහි **තබ්භාවේ** ඒ ස්වභාවයෙහි **වෝකිණ්ණේ** ගැවසීමෙහි **නිස්සයේ** ආශ්‍රයෙහි **ආරම්මණේ** අරමුණෙහි **සංසට්ඨේ ඉති** මිශ්‍රවීමෙහි යන **ඉමේසු අත්ථේසු** මේ අර්ථයන්හි **දිස්සති** දක්නා ලැබෙයි **තත්‍ථ** එහි **යායං තණ්හා පෝණෝභවිකා නන්දිරාගසහගතා ඉති** යන තන්හි **තබ්භාවේ වේදිතබ්බෝ** ඒ ස්වභාවයෙහි යැයි දතයුතුයි **නන්දිරාගභූතා ඉති අත්ථෝ** තෘෂ්ණාව සමඟ වූ යන

අර්ථයි **යා භික්ඛවේ වීමංසා කෝසජ්ජසහගතා කෝසජ්ජසම්පයුත්තා ඉති** යන තන්හි **වෝකිණ්ණෝ වේදිතබ්බෝ** ගැවසීමෙහි යැයි දතයුතුයි **අන්තරන්තරා උප්පජ්ජමානේන කෝසජ්ජේන** අතරතුර උපදනා කුසීත බැවින් **වෝකිණ්ණා ඉති** ගැවසීගත් යනු **අයං එත්ථ අත්ථෝ** මේ මෙහි අර්ථයයි **අට්ඨිකසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවේති ඉති** යන තන්හි **නිස්සයේ වේදිතබ්බෝ** ආශ්‍රයෙහි යැයි දතයුතුයි **අට්ඨිකසඤ්ඤං නිස්සාය** අට්ඨිකසංඥාව ඇසුරු කොට **අට්ඨිකසඤ්ඤං භාවෙත්වා** අට්ඨිකසංඥාව වඩා **පටිලද්ධං ඉති අත්ථෝ** ලබනලද යන අර්ථයි **ලාභී හෝති රූපසහගතානං වා සමාපත්තීනං අරූපසහගතානං වා ඉති** යන තන්හි **ආරම්මණේ වේදිතබ්බෝ** අරමුණෙහි යැයි දතයුතුයි **රූපාරූපාරම්මණං ඉති** රූපාරූප ආරම්මණයන් යන **අත්ථෝ** අර්ථයි **ඉදං සුඛං ඉමාය පීතියා සහගතං හෝති සහජාතං සංසට්ඨං සම්පයුත්තං ඉති** යන තන්හි **සංසට්ඨේ (වේදිතබ්බෝ)** මිශ්‍රවීමෙහි යැයි දතයුතුයි **ඉමස්මිම්පි පදේ** මේ පදයෙහි ද **අයං ඒව අත්ථෝ** මේ අර්ථයම **අධිප්පේතෝ** අදහස් කරනලදි **සෝමනස්සසංසට්ඨඤ්හි** සෝමනස්ස සංසට්ඨ යන්න වනාහි **ඉධ** මෙහි දී **සෝමනස්සසහගතං ඉති වුත්තං** සෝමනස්සසහගත යැයි දේශනා කරනලදි.

**ඒස සංසට්ඨසද්දෝපි** මේ සංසට්ඨ ශබ්දය ද **සදිසේ** සමාන **අවස්සුතේ** කාම ආශාවෙන් මැඩුණු **මිත්තසන්ථවේ** මිත්‍රයන් හා එක්ව වීසීමෙහි **සහජාතේ ඉති** සහජාතය යන **බහූසු අත්ථේසු** බොහෝ අර්ථයන්හි **දිස්සති** දක්නා ලැබෙයි **කිසේ ථූලේ විවජ්ජෙත්වා සංසට්ඨා යෝජිතා හයා ඉති එත්ථ** යන මෙහි **අයං හි** මේ සහගත ශබ්දය **සදිසේ ආගතෝ** සමාන අර්ථයෙහි ආයේය **සංසට්ඨාව තුම්හේ අයෙය් විහරථ ඉති (එත්ථ)** යන මෙහි **අවස්සුතේ (ආගතෝ)** කාම ආශාවෙන් මැඩුණු යන අර්ථයෙහි ආයේය **ගිහි සංසට්ඨෝ විහරති ඉති (එත්ථ)** යන මෙහි **මිත්තසන්ථවේ (ආගතෝ)** මිත්‍රයන් හා එක්ව විසීම යන අර්ථයෙහි ආයේය **ඉදං සුඛං ඉමාය පීතියා සහගතං හෝති සහජාතං සංසට්ඨං සම්පයුත්තං ඉති (එත්ථ)** යන මෙහි **සහජාතේ (ආගතෝ)** සහජාත යන අර්ථයෙහි ආයේය **ඉධාපි** මෙහි ද **සහජාතේ අධිප්පේතෝ** සහජාත යන අර්ථය අදහස් කරනලදි **තත්ථ** එහි **සහගතං** සහගත ශබ්දය **අසහජාතං අසංසට්ඨං අසම්පයුත්තං නාම** අහසජාත අසංසට්ඨ අසම්පයුත්ත වීමක් නම් නත්ථි නැත **සහජාතං පන** සහජාත ශබ්දය වනාහි **සංසට්ඨං සම්පයුත්තං** සංසට්ඨ සම්පයුත්ත **හෝතිපි න හෝතිපි** වන්නේ ද නොවන්නේ ද වෙයි **රූපාරූපධම්මේසු හි** රූප අරූප ධර්මයන් වනාහි **ඒකතෝ ජාතේසු** එක්ව උපන් කල්හි **රූපං අරූපේන** රූප ධර්මය අරූප ධර්මය හා සමඟ **සහජාතං හෝති** සහජාත වෙයි **න සංසට්ඨං** සංසට්ඨ නොවෙයි **න සම්පයුත්තං** සම්ප්‍රයුක්ත නොවෙයි **අරූපං රූපෙන** අරූප ධර්මය රූප ධර්මන හා සමඟ ද **තථා** එසේමය **රූපඤ්ච රූපේන** රූප ධර්මය රූප ධර්මය හා සමඟ ද (**තථා** එසේමය) **අරූපං පන අරූපේන** අරූප ධර්මය වනාහි අරූප ධර්මය හා සමඟ **නියමතෝව** නියමයෙන්ම **සහගතං** සහගත වූයේ **සහජාතං** සහජාත වූයේ **සංසට්ඨං** සංසට්ඨ වූයේ **සම්පයුත්තමේව** සම්ප්‍රයුක්ත වූයේම ද **හෝති** වෙයි **තං සන්ධාය** එය සඳහා **සෝමනස්සසහගතං ඉති වුත්තං** සෝමනස්සසහගතං යනුවෙන් දේශනා කරනලදි. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

## සිත සෝමනස්සාදී වශයෙන් බෙදීමට හේතු:—

නනු ච අඤ්ඤෙඤ්පි ඵස්සාදයෝ සම්පයුත්තධම්මා අත්ථීති සොමනස්සාදීනං වසේනේව පන අට්ඨවිධතා කස්මා ගහිතාති? භේදකරභාවතෝ. ඵස්සාදීනඤ්හි

සබ්බචිත්තසාධාරණත්තා, සද්ධාදීනඤ්ච සබ්බකුසලසාධාරණත්තා න තේහි චිත්තස්ස විභාගෝ, සෝමනස්සාදයෝ පන කත්ථචි චිත්තේ හොන්ති, කත්ථචි න හොන්තීති පාකටෝව තේහි චිත්තස්ස විභාගෝති. කස්මා පනේතේ කත්ථචි චිත්තේ හොන්ති, කත්ථචි න හොන්තීති? කාරණස්ස සන්නිහිතාසන්නිහිතභාවතෝ. කිං පන නේසං කාරණන්ති? වුච්චතේ තත්ථ සෝමනස්සසහගතභාවෝ තාව ආරම්මණවසේන හෝති. ඉට්ඨාරම්මණස්මිඤ්හි සෝමනස්සසහගතචිත්තමුප්පජ්ජති.
**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 11 කාමාවචරකුසලපද වණ්ණනා යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 62 පිට]**

මෙහි අන්‍යවූ ස්පර්ශාදී සම්ප්‍රයුක්ත ධර්මයෝ ඇත්තාහු නොවෙත් ද, කුමක්හෙයින් සෝමනස්සාදීන්ගේ වශයෙන්ම චිත්තයාගේ අට වැදෑරුම් බව ගන්නාලද්දී ද යත්? භේදකරභාවය ඇති හෙයිනි. ඒ එසේමැයි. ස්පර්ශාදීහු සර්වචිත්තසාධාරණ බැවින්ද, ශ්‍රද්ධාදීහු සර්ව කුසලසාධාරණ බැවින්ද, ඒ ස්පර්ශාදීන් කරණකොටගෙන චිත්තයාගේ විභාගය නොකට හැක්කේය. සොම්නස් ආදීහු වනාහි ඇතැම් සිතෙක්හි වෙත්. ඇතැම් සිතෙක්හි නොවෙත්. එහෙයින් ඔහුන් කරණකොටගෙන චිත්තයාගේ විභාගය තෙම ප්‍රකටමැයි. කුමක්හෙයින් ඒ සොම්නස් වේදනාදීහු ඇතැම් සිතෙක්හි වන්නාහු ද? ඇතැම් සිතෙක්හි නොවන්නාහු ද යත්? හේතූන්ගේ සන්නිහිතාසන්නිහිත බැවිනි. හෙවත් හේතූන්ගේ ලඟ පිහිටීම හා නොපිහිටීම ඇති බැවිනි. ඒ සොම්නස් වේදනාදීන්ට හේතුව කුමක්දැයි ප්‍රශ්නයක් ඇති බැවින් ඊට පරිහාර කියනු ලැබේ. එහි සොම්නස් සහගත බව අරමුණු වශයෙන් වේ. ඒ එසේමැයි; ඉෂ්ට අරමුණෙහි සොම්නස් සහගත සිත උපදී.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 39-40 පිටු]**

## සිත සෝමනස්ස උපේක්‍ෂාසහගත වීමට හේතු:—

ආරම්මණවසේන පනෙත්ථ සෝමනස්සසහගතභාවෝ වේදිතබ්බෝ. ඉට්ඨාරම්මණස්මිඤ්හි උප්පන්නත්තා ඒතං සෝමනස්සසහගතං ජාතං. සද්ධාබහුලතාදීනිපෙත්ථ කාරණානියේව. අස්සද්ධානඤ්හි මිච්ඡාදිට්ඨීනඤ්ච ඒකන්තඉට්ඨාරම්මණභූතං තථාගතරූපම්පි දිස්වා සෝමනස්සං නුප්පජ්ජති. යේ ච කුසලප්පවත්තියං ආනිසංසං න පස්සන්ති තේසං පරේහි උස්සාහිතානං කුසලං කරොන්තානම්පි සෝමනස්සං නුප්පජ්ජති. තස්මා සද්ධාබහුලතා විසුද්ධදිට්ඨිතා ආනිසංසදස්සාවිතාති ඒවම්පෙත්ථ සෝමනස්සසහගතභාවෝ වේදිතබ්බෝ. අපිච ඒකාදසධම්මා පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය සංවත්තන්ති; බුද්ධානුස්සති ධම්මානුස්සති සඞ්ඝානුස්සති සීලානුස්සති චාගානුස්සති දේවතානුස්සති උපසමානුස්සති ලූඛපුග්ගලපරිවජ්ජනතා සිනිද්ධපුග්ගලසේවනතා පසාදනීය සුත්තන්තපච්චවෙක්ඛණතා තදධිමුත්තතාති. ඉමේහිපි කාරණේහෙත්ථ සෝමනස්සසහගතභාවෝ වේදිතබ්බෝ. ඉමේසං පන විත්ථාරෝ **බොජ්ඣඞ්ගවිභඞ්ගේ** (විභ. අට්ඨ. 367 බොජ්ඣඞ්ගපබ්බවණ්ණනා, 468-469) ආවි භවිස්සති.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය යටතේ); ධම්මසඞ්ගණී අටුවා 90 පිට (හේ.වි.මු); අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා කුසලපදත්ථ යටතේ); අභිධර්ම ප්‍රකාශය 47-48 පිටු]**

**ලූඛපුග්ගලා** දෝසබහුලා. අදෝසබහුලා **සිනිද්ධපුග්ගලා. තදධිමුත්තතා**ති පීතිනින්නචිත්තතා. **ඉමේහි**…**පෙ**…. **වේදිතබ්බෝ** පීතියා සෝමනස්ස විප්පයෝගාසම්භවතෝති අධිප්පායෝ.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය වණ්ණනා යටතේ)]**

පසාදසිනේහාභාවෝ දෝසබහුලතාය හෝතීති **ලූඛපුග්ගලා දෝසබහුලා**ති ආහ. **[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය වණ්ණනා යටතේ)]**

(පන ශබ්දය විශේෂාර්ථද්‍යෝතක නිපාතයි) **එත්ථ** මේ කාමාවචර චිත්තයෙහි **සෝමනස්සසහගතභාවෝ** සෝමනස්සසහගතබව **ආරම්මණවසේන** ආරම්මණයන්ගේ වශයෙන් **වේදිතබ්බෝ** දතයුතුයි **ඉට්ඨාරම්මණස්මිඤ්හි** ඉටුඅරමුණෙහි **උප්පන්නත්තා** උපන්බැවින් **ඒතං (චිත්තං)** ඒ කාමාවචර චිත්තය **සෝමනස්සසහගතං** සොම්නස් වේදනාවෙන් යුක්තව **ජාතං** උපදිනලදී **අපි** ඒ කිමසැබෑවකි **එත්ථ** ඒ කාමාවචර චිත්තයෙහි **සද්ධාබහුලතාදීනි** ශ්‍රද්ධාබහුල ආදී බව (**සෝමනස්සං** සෝමනස්සයට) **කාරණානියේව** කාරණයෝම (**හෝති** වෙයි) **හි** විශේෂයක් කියම් **අස්සද්ධානඤ්ච** අශ්‍රද්ධාවන්ත පුද්ගලයන්ට ද **මිච්ඡාදිට්ඨීනඤ්ච** මිසදිටු පුද්ගලයන්ටද **ඒකන්තඉට්ඨාරම්මණභූතං** ඒකාන්ත ඉටුඅරමුණක් වූ **තථාගතරූපම්පි** තථාගතරූපය ද **දිස්වා** දැක **සෝමනස්සං** සෝමනස්සය **නුප්පජ්ජති** නූපදී **ච** තවද **යේ** යමෙක් **කුසලපවත්තියං** කුසලප්‍රවෘත්තියෙහි **ආනිසංසං** අනුසස් **න පස්සන්ති** නොදකිත් ද **පරේහි** අනුන්විසින් **උස්සාහිතානං** උත්සාහවත් කරණලදුව **කුසලං කරොන්තානම්පි** කුසල් කරන්නාහු නමුදු **තේසං** ඔවුන්ට **සෝමනස්සං** සෝමනස්සය **නුප්පජ්ජති** නූපදී **තස්මා** එහෙයින් **සද්ධාබහුලතා** ශ්‍රද්ධාව බහුලබවය **විසුද්ධදිට්ඨිතා** පිරිසිදු දෘෂ්ටිය ඇතිබවය **ආනිසංසදස්සාවිතාති** අනුශස් දන්නාබවය **ඒවම්පි** මේ කරුණු හේතුකොටගෙනද **එත්ථ (චිත්තේ)** මේ කාමාවචර චිත්තයෙහි **සෝමනස්සසහගතභාවෝ** සොම්නස්සහගතබව **වේදිතබ්බෝ** දතයුතුයි **අපිච** එපමණක්නොව **බුද්ධානුස්සති** බුද්ධානුස්මෘතිය **ධම්මානුස්සති** ධර්මානුස්මෘතිය **සඞ්ඝානුස්සති** සඞ්ඝානුස්මෘතිය **සීලානුස්සති** සීලානුස්මෘතිය **චාගානුස්සති** ත්‍යාගානුස්මෘතිය **දේවතානුස්සති** දේවතානුස්මෘතිය **උපසමානුස්සති** උපසමානුස්මෘතිය **ලූඛපුග්ගලපරිවජ්ජනතා** රූක්ෂ පුද්ගලයන් දුරලීමය නොහොත් දෝෂබහුල පුද්ගලයන් දුරුකිරීමය ("පසාදසිනේහාභාවෝ දෝසබහුලතාය හෝති" යයි අනුටීකායෙහි කීයේය) **සිනිද්ධපුග්ගලසේවනතා** සිනිඳු පුද්ගලයන් සේවනය කිරීමය නොහොත් අදෝෂ බහුල පුද්ගලයන් සේවනය කිරීමය **පසාදනීයසුත්තන්තපච්චවෙක්ඛණතා** ප්‍රශාදය ගෙනදෙන සූත්‍රාන්ත ධර්මයන් ප්‍රත්‍යවේක්ෂා කිරීමය **තදධිමුත්තතා** ප්‍රීතිසම්බොජ්ඣඞ්ගයෙහි නැමීපවත්නා සිත් ඇති බවය **ඉති** යන **ඒකාදසධම්මා** එකොළොස් ධර්මයෝ **පීතිසම්බොජ්ඣඞ්ගස්ස** ප්‍රීතිසම්බොජ්ඣඞ්ගයාගේ **උප්පාදය** ඉපදීමපිණිස **සංවත්තන්ති** පවතිත් **ඉමේහිපි කාරණේහි** මේ කරුණු හේතුකොටගෙනද **එත්ථ (චිත්තේ)** මේ කාමාවචර චිත්තයෙහි **සෝමනස්සසහගතභාවෝ** සෝමනස්සසහගත බව **වේදිතබ්බෝ** දතයුතුයි **ඉමේසං පන** මොවුන්ගේ වනාහි **විත්ථාරෝ** විස්තරය **බොජ්ඣඞ්ගවිභඞ්ගේ** බොජ්ඣඞ්ගවිභඞ්ගයෙහි **ආවි භවිස්සති** ආවේ වන්නේය.

**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

බුද්ධානුස්සති, ධම්මසඞ්ඝසීලචාගදේවතානුස්සති, උපසමානුස්සති, ලූඛපුග්ගලපරිවජ්ජනතා, සිනිද්ධපුග්ගලසේවනතා, පසාදනීයසුත්තන්ත-පච්චවෙක්ඛණතා, තදධිමුත්තතාති.

බුද්ධගුණේ අනුස්සරන්තස්සාපි හි යාව උපචාරා සකලසරීරං ඵරමානෝ පීතිසම්බොජ්ඣඞ්ගෝ උප්පජ්ජති; ධම්මසඞ්ඝගුණේ අනුස්සරන්තස්සාපි, දීඝරත්තං අඛණ්ඩං කත්වා රක්ඛිතං චතුපාරිසුද්ධිසීලං පච්චවෙක්ඛන්තස්සාපි, ගිහිනෝ දසසීලං පඤ්චසීලං පච්චවෙක්ඛන්තස්සාපි, දුබ්භික්ඛභයාදීසු පණීතං භෝජනං සබ්‍රහ්මචාරීනං දත්වා "ඒවං නාම අදම්හා"ති චාගං පච්චවෙක්ඛන්තස්සාපි, ගිහිනෝපි ඒවරූපේ කාලේ සීලවන්තානං දින්නදානං පච්චවෙක්ඛන්තස්සාපි, යේහි ගුණේහි සමන්නාගතා දේවතා දේවත්තං පත්තා තථාරූපානං ගුණානං අත්තනි අත්ථිතං පච්චවෙක්ඛන්තස්සාපි, සමාපත්තියා වික්ඛම්භිතේ කිලේසේ සට්ඨිපි සත්තතිපි වස්සානි න සමුදාචරන්තීති පච්චවෙක්ඛන්තස්සාපි, චේතියදස්සන බෝධිදස්සනථේරදස්සනේසු අසක්කච්චකිරියාය සංසූචිතලූඛභාවේ බුද්ධාදීසු පසාදසිනේහාභාවේන ගද්‍රභපිට්ඨේ රජසදිසේ ලූඛපුග්ගලේ පරිවජ්ජේන්තස්සාපි, බුද්ධාදීසු පසාදබහුලේ මුදුචිත්තේ සිනිද්ධපුග්ගලේ සේවන්තස්සාපි, රතනත්තයගුණ පරිදීපකේ පසාදනීයසුත්තන්තේ පච්චවෙක්ඛන්තස්සාපි, ඨානනිසජ්ජාදීසු පීතිඋප්පාදනත්ථං නින්නපෝණපබ්භාරචිත්තස්සාපි උප්පජ්ජති. ඒවං උප්පන්නස්ස පනස්ස අරහත්තමග්ගෙන භාවනාපාරිපූරි හෝතීති පජානාති.

**[විභඞ්ග අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 367 බොජ්ඣඞ්ගපබ්බ වණ්ණනා යටතේ); විභඞ්ග අටුවා 198 පිට (හේ.වි.මු)]**

**පසාදසිනේහාභාවේනාති** පසාදසඞ්ඛාතස්ස සිනේහස්ස අභාවේන. **ගද්‍රභපිට්ඨේ** ලූඛරජෝ ලූඛතරෝ හුත්වා දිස්සතීති අතිලූඛතාය තං සදිසේ.

**[විභඞ්ග අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 367 යටතේ)]**

සම්පත්තිහේතුතාය පසාදෝ සිනේහපරියායේන වුත්තෝ.

**[විභඞ්ගමූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 367 යටතේ)]**

**බුද්ධානුස්සති** බුදුගුණ පුන පුනා සිහිකිරීමයැ **ධම්ම-සඞ්ඝ-සීල-චාග දේවතානුස්සති** ධර්මගුණ සඞ්ඝගුණ තමාගේ සීලගුණ ත්‍යාගගුණ දේවතාවන්ගේ ශ්‍රද්ධාදී ගුණයන් සාක්‍ෂ්‍යභාවයෙහි පිහිටුවා තමාගේ ශ්‍රද්ධාදී ගුණ පුන පුනා සිහිකිරීමයැ **උපසමානුස්සති** සංහුන් කෙලෙසුන් පුන පුනා සිහිකිරීමයැ හෙවත් නිර්වාණයාගේ ව්‍යුපශම ගුණය පුන පුනා සිහිකිරීමයැ **ලූඛපුග්ගලපරිවජ්ජනතා** රළුගුණැති පුඟුලන් ආශ්‍රයෙන් දුරුකරනබවයැ **සිනිද්ධපුග්ගලසේවනතා** මොළොක්ගුණැති පුඟුලන් ඇසුරුකරනබවයැ **පසාදනීයසුත්තන්තපච්චවෙක්ඛනතා** චිත්තප්‍රසාදය එළවන සූත්‍රාන්තයන් ප්‍රත්‍යවේක්‍ෂා කරනබවයැ **තදධිමුත්තතා** ඒ ප්‍රීතිසම්බොජ්ඣඞ්ගයෙහි නිම්නප්‍රවණප්‍රාග්භාර බවයැ **ඉති (ඉමේ ඒකාදසධම්මා)** මේ එකොළොස් ධර්මයෝයි.

**හි** විස්තර කෙරෙමි **බුද්ධගුණේ** බුද්ධගුණයන් **අනුස්සරන්තස්සාපි** පුන පුනා සිහිකරන මහණහට ද **ධම්ම-සඞ්ඝගුණේ** ධර්මගුණ සඞ්ඝගුණයන් **අනුස්සරන්තස්සාපි** පුන පුනා සිහිකරන මහණහට ද **යාව උපචාරා** උපචාරධ්‍යානය හිම්කොටැ **සකලසරීරං** සියල් සිරුර **ඵරමානෝ** පැතිරගෙනැ **පීතිසම්බොජ්ඣඞ්ගෝ** ප්‍රීතිසම්බොජ්ඣඞ්ගය තෙම **උප්පජ්ජති** උපදී. **දීඝරත්තං** දික්රැයක් මුළුල්ලෙහි **අඛණ්ඩං කත්වා** නොකඩකොටැ **රක්ඛිතං** රැක්කාවූ **චතුපාරිසුද්ධිසීලං** සිව්පිරිසිදු සිල්ගුණ **පච්චවෙක්ඛන්තස්සාපි** ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාවූ මහණහට ද **ගිහිනෝපි** ගිහිව සිටියදී **දසසීලං** දසසිල **පඤ්චසීලං** පන්සිල **පච්චවෙක්ඛන්තස්සාපි** ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාහට ද **දුබ්භික්ඛභයාදීසු** දුර්භික්‍ෂ භයාදීන්හි **පණීතං** ප්‍රණීත වූ

**භෝජනං** භෝජනය **සබ්‍රහ්මචාරීනං** සබ්‍රම්සරුන්ට **දත්‍වා** දී **ඒවං නාම** මෙබඳු නම් භෝජනයක් (**මයං** අපි) **අදම්භාති** දුනිමුයි **චාගං** ත්‍යාගගුණය **පච්චවෙක්ඛන්තස්සාපි** ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාවූ මහණහට ද **ගිහිනෝපි** ගිහිව සිටියදී නමුදු **ඒවරූපේ කාලේ** මෙබඳු දුර්භික්‍ෂ භයාදිකාලේ **සීලවන්තානං** සිල්වතුන්ට **දින්නදානං** පිරිනැමූ දක්‍ෂිණාව **පච්චවෙක්ඛන්තස්සාපි** ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාවූ මහණහටත් **යේහි ගුණේහි** යම් ශ්‍රද්ධාදී ගුණවලින් **සමන්නාගතා** යුක්තවූ **දේවතා** දේවතාවෝ තුමූ **දේවත්තං** දේවත්‍වයට **පත්තා** පැමිණියෝ ද **තථාරූපානං** එබඳුවූ **ගුණානං** ගුණයන්ගේ **අත්තනි** තමා කෙරෙහි **අත්ථිතං** ඇතිබවැ **පච්චවෙක්ඛන්තස්සාපි** ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ මහණහට ද **සමාපත්තියා** සමවත් කරණකොටැගෙන **වික්ඛම්භිතේ කිලේසේ** විකඹූ කෙලෙසුන් **සට්ඨිපි** සැටහවිරුදු මුළුල්ලෙහිත් **සත්තතිපි වස්සානි** සැත්තෑහවිරුදු මුළුල්ලෙහිත් **මේ** මාහට **කිලේසා** කෙලෙස්හු **න සමුදාචරන්තීති** නොපවත්නාහයි **පච්චවෙක්ඛන්තස්සාපි** ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාවූ මහණහට ද **චේතියදස්සන බෝධිදස්සන ථේරදස්සනේසු** චෛත්‍ය දර්ශන බෝධි දර්ශන ස්ථවිර දර්ශනයන්හි **අසක්කච්චකිරියාය** නොසකස්වැ කිරීමෙන් **සංසූචිතලූඛභාවේ** පහළ කළ රළුබැව් ඇති (පහළ කළ ලාමකත්‍වය ඇති වූ සේයි) **බුද්ධාදීසු** බුද්ධාදී වස්තූන්හි **පසාදසිනේහාභාවේන** පැහැදීම යැයි කියනලද ප්‍රේමයක් නැති බැවින් **ගද්‍රභපිට්ඨේ** කොටළුවකුගේ පිටෙහි **රජසදිසේ** රජස් බඳුවූ **ලූඛපුග්ගලේ** රළු පුගුලන් **පරිවජ්ජේන්තස්සාපි** දුරුකරන්නා වූ මහණහට ද **බුද්ධාදීසු** බුද්ධාදී වස්තූන්හි **පසාදබහුලේ** පැහැදීම යැයි කියනලද ප්‍රේමය බහුලකොට ඇති **මුදුචිත්තේ** මෙළෙක් සිතැති **සිනිද්ධපුග්ගලේ** සිනිදුවූ ගුණ ඇති පුගුලන් **සේවන්තස්සාපි** සෙවිනා මහණහට ද **රතනත්තයගුණපරිදීපකේ** තෙරුවන්ගුණ මොනවට දක්වන්නා වූ **පසාදනීයසුත්තන්තේ** තෙරුවන්හි ප්‍රසාදය එළවන සූත්‍රාන්තයන් **පච්චවෙක්ඛන්තස්සාපි** ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාවූ මහණහට ද **ඨානනිසජ්ජාදීසු** සිටීම් හිඳීම් ආදී ඉරියව් වැටුම්හි **පීතිඋප්පාදනත්ථං** ප්‍රීතිය දැනවීම පිණිසැ **නින්නපෝණපබ්භාරචිත්තස්සාපි** නිම්න ප්‍රවණ ප්‍රාග්භාර සිත් ඇත්තාවූ මහණහට ද **උප්පජ්ජති** උපදී. **ඒවං** මෙකී නයින් **උප්පන්නස්ස** උපන්නාවූ **අස්ස පන** ඒ ප්‍රීතිසම්බොජ්ඣඞ්ගයාගේ වනාහි **අරහත්තමග්ගේන** රහත් මඟ හේතුකොටගෙන භාවනා ආසේවනා තොමෝ **පාරිපූරී** සම්පූර්ණවන්නී **හෝතීති** වේ යයි **පජානාති** සම්‍යක් ප්‍රකාරයෙන් දනී.

බුද්ධාදී වස්තූන්හි ගේහසිත වූ ප්‍රේමය මෙහි අනභිමතයැ. ප්‍රසාද සඞ්ඛ්‍යාත ප්‍රේමයමැ ඓහිකාමුෂ්මික සම්පත්තියට හේතුවන බැවින් ප්‍රසාදය සෙනේහපරියාය වශයෙන් කියනලදැයි දතයුතුයි. එහෙයින් වියූ ටීකානුටීකා දෙක්හි. පසාදසිනේහාභාවේනාති පසාදසඞ්ඛාතස්ස සිනේහස්ස අභාවේන (මූ.ටී). සම්පත්ති හේතුතාය පසාදෝ සිනේහපරියායේන වුත්තෝ (අ.ටී).

කොටළුවාගේ පිට මතුයෙහි ඕළාරික රජෝජල්ලය තෙමේ අතිශයින් ඕදරික වූයේවැ දක්නා ලැබේනුයි අතිරූක්‍ෂ අත්‍යෞදරික වන බැවින් රූක්‍ෂ පුද්ගලයන්ගේ තත් සදෘශවූ නෛසර්ගීය රූක්‍ෂගුණයන් මේ උපමාවෙන් භගවා කීයේමැනෝ ගද්‍රභපිට්ඨේ ලූඛරජෝ හුත්වා දිස්සතීති අතිලූඛතාය තං සදිසේ (මූ.ටී).

**[විභඞ්ගප්පකරණ අටුවා සන්නය 1238-1241 පිටු]**

තත්ථ ඉට්ඨාරම්මණේ ලෝභබහුලතාදීහි කාරණේහි සෝමනස්සසහගතතා, අසද්ධම්මසවනඅකල්‍යාණමිත්තතාදීහි දිට්ඨිසම්පයුත්තතා ච වේදිතබ්බා.

**[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා අකුසලපදත්ථ යටතේ)]**

**තත්ථ ඉට්ඨාරම්මණේ** ඒ ඉටු අරමුණෙහි **ලෝභබහුලතාදීහි** ලෝභබහුල බව ආදී **කාරණේහි** කරුණු හේතුකොටගෙන **සෝමනස්සසහගතතා ච** සෝමනස්සසහගත බවද **අසද්ධම්මසවන** අසද්ධර්මශ්‍රවනය **අකල්‍යාණමිත්තතාදීහි** අකල්‍යාණමිත්‍ර ඇසුර ආදිය හේතුකොටගෙන **දිට්ඨිසම්පයුත්තතා ච** දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත බවද **වේදිතබ්බා** දතයුත්තාහ ෴ **[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

සෝමනස්සාදයෝ පන කත්ථචි චිත්තේ හොන්ති, කත්ථචි න හොන්තීති පාකටෝව තං වසේන චිත්තස්ස විසේසො. කස්මා පනේතේ කත්ථචි හොන්ති, කත්ථචි න හොන්තීති? කාරණස්ස සන්නිහිතාසන්නිහිතභාවතෝ කිං පන නේසං කාරණන්ති ? වුච්චතේ සභාවතෝ, පරිකප්පතෝ වා හි ඉට්ඨාරම්මණං, සෝමනස්සපටිසන්ධිකතා, අගම්භීරසභාවතා ච ඉධ සෝමනස්සස්ස කාරණං, ඉට්ඨමජ්ඣත්තාරම්මණං, උපෙක්ඛාපටිසන්ධිකතා, ගම්භීරසභාවතා ච උපෙක්ඛාය.
**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අකුසලචිත්ත වණ්ණනා යටතේ); විභාවනී ටීකා සන්නය 26-28 පිටු]**

**සෝමනස්සාදයෝ පන** සොම්නස් ආදීහු වනාහි (පන ශබ්දය විශේෂාර්ථ ද්‍යෝතක නිපාතයි) **කත්ථචි චිත්තේ** ඇතැම් සිතෙක්හි **හොන්ති** වෙත් **කත්ථචි චිත්තේ** ඇතැම් සිත්හි **න හොන්ති** නොවෙත් **ඉති (තස්මා) තං වසේන** ඒ ඇතැම් සිතෙක්හි වීමය ඇතැම් සිතෙක්හි නොවීමය යන මේ කාරණයාගේ වශයෙන් **චිත්තස්ස** චිත්තයාගේ **විසේසෝ** වෙනස **පාකටෝ** ප්‍රකටමැයි **තස්මා** එසේහෙයින් **සෝමනස්සසහගතාදි භාවෝ** සොම්නස් සහගතාදී භාවය **වුත්තෝ** කියනලදි **කස්මා** කුමක්හෙයින් **ඒතේ** ඒ සොම්නස් වේදනාදීහු **කත්ථචි චිත්තේ හොන්ති** ඇතැම් සිතෙක්හි වන්නාහු ද? **කත්ථචි චිත්තේ න හොන්ති** ඇතැම් සිතෙක්හි නොවන්නාහු ද? **ඉති (පුච්ඡායං සති** මෙබඳු ප්‍රශ්නයක් ඇති කල්හි) **කාරණස්ස** හේතුහුගේ **සන්නිහිතාසන්නිහිතභාවතෝ** ඇති බැවින් හා නැති බැවින් **කත්ථචි** ඇතැම් සිතෙක්හි **හොන්ති** වෙත් **කත්ථචි** ඇතැම් සිතෙක්හි **න හොන්ති** නොවෙත් **ඉති (විස්සජ්ජිතබ්බෝ හෝති** මෙසේ විසදිය යුතු වේ - මෙසේ සම්බන්ධ කටයුතුයි)

**ඉමේසං** ඒ සොම්නස් වේදනාදීන්ට **කාරණං** හේතුව **කිම්පන** කුමක්ද යත්? **ඉති (පුච්ඡායං සති** මෙසේ ප්‍රශ්නයක් ඇති කල්හි **පරිහාරෝ** විසදීම **මයා** මා විසින්) **වුච්චතේ** කියනු ලැබේ (ඒ විසදීම කුමක්දැයි යන චෝද්‍යයට පරිහාර වශයෙන් "සභාවතෝ වා පරිකප්පිතෝ වා" යනාදි පාඨය කියනලදි) **සභාවතෝ වා** ප්‍රකෘති වශයෙන් හෝ **පරිකප්පිතෝ වා** කල්පනා කිරීම් වශයෙන් හෝ **ඉට්ඨාරම්මණඤ්ච** කැමැති අරමුණක් වීමද **සෝමනස්සපටිසන්ධිකතා ච** සොම්නස් සහගත ප්‍රතිසන්ධි චිත්තය ඇති බවද **අගම්භීරසභාවතා ච** නොගැඹුරු ස්වභාව ඇති බවද **ඉධ** මේ සෝමනස්ස යන පදයෙහි **සෝමනස්සස්ස** සොම්නසට **කාරණං** හේතු වේ ("පරිකප්පිතෝ වා හි" යන්නෙහි "හි" ශබ්දය විස්තරාර්ථයෙහි වෙයි "සභාවතෝ" යන විශේෂණය ප්‍රකෘති ස්වභාව වූ ඉෂ්ටාලම්බණය සඳහා කියනලදි "පරිකප්පිතෝ" යන විශේෂණය වනාහි අනිෂ්ටාලම්බනය ද ඉෂ්ටාලම්බණයයි සඤ්ඤා විපල්ලාස වශයෙන් කල්පනා කිරීම සඳහා කියනලදි. මේ විශේෂණ ද්වය "ඉට්ඨාලම්බණං" යන පදය සමඟ මුත් මතු පද හා සම්බන්ධ නොකට යුතුයි. "වා" ශබ්දය වනාහි අනියමාර්ථයෙහි වැටේ. අගම්භීර ස්වභාව ඇත්තවුන්ට අර්ථයාගේ ඒකදේශයක් අවබෝධ වුයේද ඇලුම් නොකටයුතු වස්තුවක් ලද්දේ ද උපේක්ෂා හෝ දෙම්නස් හෝ

නොවී සොම්නස් සහගත වීම සුකර බැවින් අගම්භීර ස්වභාව ඇති බව සොම්නස් වීමට කාරණයයි කියනලදි)

(ආයුෂ්මත් ටීකාචාරීන් විසින් සෝමනස්ස හේතුව කියනලද්දේය. උපේක්‍ෂා දෘෂ්ටි අසංස්කාරිකයන්ගේ හේතු කවරේදැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "ඉට්ඨමජ්ඣත්තාරම්මණං -පෙ- අසඞ්ඛාරිකභාවස්ස" යන පාඨය කියනලදි) **ඉට්ඨමජ්ඣත්තාරම්මණතඤ්ච** ඉෂ්ටමධ්‍යස්ථ වූ හෙවත් මධ්‍යස්ථ වශයෙන් යහපත් වූ අරමුණක් වීමද **උපෙක්ඛාපටිසන්ධිකතා ච** උපේක්‍ෂා සහගිය සිතින් ගන්නාලද ප්‍රතිසන්ධි ඇති බවද **ගම්භීරසභාවතා ච** ගැඹුරු ස්වභාව ඇති බවද **උපෙක්ඛාය** උපේක්‍ෂාවට **කාරණං** හේතු වෙයි. **[විභාවනී ටීකා සන්නය 56-57 පිටු]**

එත්ථ ච බලවසද්ධාය දස්සනසම්පත්තියා පච්චයපටිග්ගාහකාදිසම්පත්තියාති ඒවමාදීහි කාරණේහි සෝමනස්සසහගතතා,

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 15 යටතේ); විභාවනි ටීකා සන්නය 50 පිට]**

**එත්ථ** මේ **සෝමනස්සසහගතං** යනාදී වචනයෙහි (ච ශබ්දය වාක්‍යාරම්භ ද්‍යෝතක නිපාතයි) **බලවසද්ධාය ච** බලවත් වූ ශ්‍රද්ධාවෙන් ද **දස්සනසම්පත්තියා ච** අනුසස් දන්නාසුලු වූ පඤ්ඤදසම්පත්තියෙන් ද **පච්චයපටිග්ගාහකාදී සම්පත්තියා ච** ප්‍රත්‍යය ප්‍රතිග්‍රහකයා යනාදීන්ගේ සම්පත්තියෙන් ද **ඉති ඒවමාදීහි** මේ ආදීවූ **කාරණේහි** හේතූන් කරණකොටගෙන **සෝමනස්සසහගතතා** සොම්නස් සහගිය බැව් **වේදිතබ්බා** දතයුත්තීය (පටිග්ගාහකාදී යන්නෙහි ආදී ශබ්දයෙන් දේශසම්පත්ති කාලසම්පත්ති ආදි ගැනේ) **[විභාවනී ටීකා සන්නය 86 පිට]**

කුශල චිත්තයෙහි ලැබියයුතු වූ සොම්නස්සහගතාදීන්ගේ හේතූන් අතුරෙන් ඇතැම් හේතු කෙනෙක් ක්‍රියාචිත්තයෙහි නොලැබියයුතුය. කවර හේතු කෙනෙක් ලැබියයුතු ද? කවර හේතු කෙනෙක් නොලැබියයුතුද? යනු; කුශලචිත්තයෙහි ලැබියයුතුවූ සොම්නස්සහගතභාවයාගේ හේතූන් අතුරෙන් දෙය්‍යධම්මසම්පත්තිය, ප්‍රතිග්‍රාහකසම්පත්තිය, දර්ශනසම්පත්තිය, බලවශ්‍රද්ධාවය යන මේ හේතූහු ක්‍රියාචිත්තයෙහි නොලැබියයුතු වෙයි. ඉෂ්ටාලම්බනය, සොම්නස් ප්‍රතිසන්ධිය, අගම්භීර ස්වභාවය යන මේ හේතූහුම ලැබියයුතු වේ. **[විභාවනී ටීකා සන්නය 96 පිට]**

අපිච සද්ධාබහුලතාදීහි ච කාරණේහි චිත්තස්ස සෝමනස්සසහගතතා වේදිතබ්බා. අස්සද්ධානං, හි මිච්ඡාදිට්ඨිකානඤ්ච ඒකන්තමිට්ඨාරම්මණභූතං තථාගතරූපම්පි දිස්වා සෝමනස්සං න උප්පජ්ජති. යේ ච කුසලප්පවත්තියං ආනිසංසං න පස්සන්ති, තේසං පරේහි උස්සාහිතානං කුසලං කරොන්තානම්පි සෝමනස්සං න උප්පජ්ජති, තස්මා සද්ධාබහුලතා විසුද්ධිදිට්ඨිතා ආනිසංසදස්සාවිතාති ඉමේහිපි කාරණේහි චිත්තස්ස සෝමනස්සසහගතතා හෝති.

අපිච යේ තේ ඒකාදස ධම්මා පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය සංවත්තන්ති. සෙය්‍යථීදං බුද්ධානුස්සති ධම්මානුස්සති සංඝානුස්සති සීලානුස්සති චාගානුස්සති දේවතානුස්සති උපසමානුස්සති ලූඛපුග්ගලපරිවජ්ජනං සිනිද්ධපුග්ගලසේවනා පසාදනීයසුත්තන්තපච්චවෙක්ඛණා තදධිමුත්තතාති ඉමේහිපි කාරණේහි චිත්තස්ස සෝමනස්සසහගතභාවෝ වේදිතබ්බෝ. බුද්ධාදිගුණේ අනුස්සරන්තස්ස හි යාව උපචාරුප්පාද සකලසරීරං ඵරමානා පීති උප්පජ්ජති. තථා දීඝරත්තං අක්ඛණ්ඩතාදිවසේන අත්තනා රක්ඛිතං චතුපාරිසුද්ධිසීලං පච්චවෙක්ඛන්තස්ස, ගිහිනෝ දසසීලං පඤ්චසීලං පච්චවෙක්ඛන්තස්ස, දුබ්භික්ඛභයාදීසු පණීතං

භෝජනං සබ්‍රහ්මචාරීනං දත්වා "ඒවං නාම දනං අදසි"න්ති අත්තනෝ චාගං පච්චවෙක්ඛන්තස්ස, ගිහිනෝපි තථාරූපේ කාලේ සීලවන්තානං දින්නදනං පච්චවෙක්ඛන්තස්ස, යේහි ගුණේහි සමන්නාගතා දේවා දේවත්තං ගතා, තථාරූපානං ගුණානං අත්තනි අත්ථිතං පච්චවෙක්ඛන්තස්ස, සමථවිපස්සනාහි වික්ඛම්භිතකිලේසේ සට්ඨිපි සත්තතිපි වස්සානි අසමුදචරන්තේ දිස්වා "අහෝ මය්හං කිලේසා න සමුදචරන්තී"ති චින්තෙන්තස්ස, චේතියදස්සනථේරදස්සනේසු අසක්කච්චකිරියාය සංසූචිතලූඛභාවේන බුද්ධාදීසු පසාදසිනේහාභාවේන ගද්‍රභපිට්ඨේ රජසදිසේ ලූඛපුග්ගලේ පරිවජ්ජන්තස්ස, බුද්ධාදීසු පසාදබහුලේ මුදුචිත්තේ සිනිද්ධපුග්ගලේ පටිසේවන්තස්ස, රතනත්තයගුණපරිදීපකේ පසාදනීයසුත්තන්තේ පච්චවෙක්ඛන්තස්ස, ඨානනිසජ්ජාදීසුපි පීතිඋප්පාදනත්ථං තන්නින්නතාදිවසේන පවත්තෙන්තස්ස යේභුයෙය්‍යන පීති උප්පජ්ජති. පීතියා ච සෝමනස්සේන සහ අවිනාභාවතෝ තදුප්පත්තියා තස්සාපි උප්පත්ති නියතාති ඒවං පීතිකාරණානිපි සෝමනස්සකාරණානීති දට්ඨබ්බානි. කිඤ්ච අගම්භීරපකතිතා, සෝමනස්ස පටිසන්ධිකතාති ඉමේහි ද්වීහි කාරණේහි සෝමනස්සසහගතතා හෝති. යෝ හි අගම්භීරපකතිකෝ හෝති, අප්පමත්තකේපි හිතෝපකරණේ තුස්සති, යෝ ච සෝමනස්සපටිසන්ධිකෝ අප්පසන්නේසු ආරම්මණේසුපි අප්පටික්කූලදස්සාවී, තස්ස යේභුයෙය්‍යන සෝමනස්සසහගතචිත්තං උප්පජ්ජති. යථාවුත්තානං පන සෝමනස්සකාරණානමභාවේන මජ්ඣත්තාරම්මණතාය ච උපෙක්ඛාසහගතතා වේදිතබ්බා.

"ඉට්ඨාරම්මණතා සද්ධාබාහුල්‍යං දිට්ඨිසුද්ධි ච;
ඵලදස්සාවිතා චේව, පීතිබොජ්ඣඞ්ගහෙතුයෝ.

"ඒකාදස තථා ධම්මා, අගම්භීරසභාවතා;
සෝමනස්සයුත්තා සන්ධි, ඉච්චේතේ සුඛහේතුයෝ.

"අභාවෝ සුඛහේතූනං, මජ්ඣත්තාරම්මණන්ති ච;
උපෙක්ඛුප්පත්තිහේතු ච, ඒවං ඤෙය්‍යා විභාවිනා.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 11 කාමාවචරකුසලපද වණ්ණනා යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 62-64-68 පිටු; සිත සිරුර සහ නිවන හෙවත් ධම්මසඞ්ගණී 15 පිට]**

තවද ශ්‍රද්ධා බහුලාදි කාරණයෙන් ද චිත්තයාගේ සොම්නස් සහගත බව දතයුත්තීය. ඒ එසේමැයි; අශ්‍රද්ධාවන්තයන්ට හා මිසදිටුවන්ට ද ඒකාන්ත ඉෂ්ට අරමුණක් වූ තථාගත රූපය නමුදු දැක සොම්නස නූපදනේයි. යම්කෙනෙක් කුසල ප්‍රවෘත්තියෙහි අනුසස් නොදකිත් ද ඔහුන්ට අනුන් විසින් උත්සාහ කරණලදුව කුසල් කරන්නාහු නමුදු සොම්නස නූපදී. එහෙයින් ශ්‍රද්ධාබහුල බවය, පිරිසිදු දෘෂ්ටි ඇති බවය, අනුසස් දක්නා බවය යන මේ කාරණා හේතුකොටගෙන චිත්තයාගේ සොම්නස් සහගතබව වෙයි. තවද බුද්ධානුස්මෘති, ධර්මානුස්මෘතිය, සඞ්ඝානුස්මෘතිය, සීලානුස්මෘතිය, ත්‍යාගානුස්මෘතිය, දේවතානුස්මෘතිය, උපසමානුස්මෘතිය, රූක්ෂ පුද්ගලයන් දුරලීමය, සිනිඳු පුද්ගලයන් සේවනය කිරීමය, පැහැදිය යුතු සූත්‍රාන්තයක් ප්‍රත්‍යවේක්ෂා කිරීමය, ප්‍රීතිසම්බොජ්ඣඞ්ගයෙහි නැමී පවත්නා බවය යන මේ ප්‍රීතිසම්බොජ්ඣඞ්ගය ඉපදීම පිණිස පවත්නා වූ එකොළොස් කාරණයෙනුදු චිත්තයාගේ සොම්නස් සහගත බව දතයුත්තේය. ඒ එසේමය; බුද්ධාදී රත්නත්‍රයෙහි ගුණානුස්මරණය කරන්නාහට උපචාර සමාධියගේ ඉපදීම දක්වා සියළු ශරීරය පැතිරෙමින් ප්‍රීතිය උපදී. එසේම බොහෝකලක් අඛණ්ඩතාදී වශයෙන් තමාවිසින්

රක්‍ෂා කරනලද චතුපාරිසුද්ධි සීලය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ ප්‍රව්‍රජිතයාහට ද දසසීල පඤ්චසීලයන් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ ගෘහස්ථයාහට ද දුර්භික්‍ෂභයාදී ඇති වූ කල්හි ප්‍රණීත භෝජනයක් සබ්‍රම්සරුන්ට දී මෙනම් දනයක් දුනිම් තමාගේ ත්‍යාගය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ ප්‍රව්‍රජිතයාහට ද එබඳු කාලයෙක්හි සීලවන්තයන්ට දෙනලද දනයක් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ ගෘහස්ථයාහට ද යම් ගුණයකින් යුක්තවූවාහු දෙව්බවට පැමිණියාහු ද එබඳු ගුණයන් තමා කෙරෙහි විද්‍යමාන බව ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාහට ද සමථ විදර්ශනාවන් කරණකොටගෙන විෂ්කම්භනය කරනලද ක්ලේශයන් සැට අවුරුදු සැත්තෑ අවුරුදු කාලයක් මුළුල්ලේ නොහටගන්නාවුන් දැක අඬෝමය මාගේ ක්ලේශයෝ නොහටගනිති සිතන්නාහට ද චෛත්‍ය දර්ශන බෝධි දර්ශන ථේර දර්ශනයන්හි නොසකස් ක්‍රියාවෙන් සංසූචිත රූක්‍ෂභාවය ඇති හෙයින් බුද්ධාදී තුණුරුවන් කෙරෙහි ප්‍රසාදය නැමැති ස්නේහය නැත්තාවූ කොටළු පිටෙහි රජස් සමාන වූ වියලිගිය හෘදය ඇති පුද්ගලයන් දුරුකරන්නාහට ද බුද්ධාදීන් කෙරෙහි ප්‍රසාද බහුලවූ මෘදුසිත් ඇති සිනිඳු ලය ඇති පුද්ගලයන් සේවනය කරන්නාහට ද රතනත්‍රයේ ගුණ ප්‍රකාශක සම්ප්‍රසාදනීයාදී සූත්‍රාන්තයන් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාහට ද ස්ථාන නිෂද්‍යායෙහි ප්‍රීති උපදනා පිණිස ඊට නැමීම් ආදීන් වශයෙන් පවත්නාහට ද බොහෝසෙයින් ප්‍රීතිය උපදනේයි. ප්‍රීතිය ද සොම්නස හා වෙන් නොවන බැවින් ඒ ප්‍රීතිය උපදනා කල්හි ඒ සොම්නසගේ ද උත්පත්තිය නියතනුයි මෙසේ ප්‍රීතිය ඉපදීමට හේතුධර්මයෝ ද සොම්නසගේ ඉපදීමට හේතූහු වෙත්යයි දතයුතුයි. තවද නොගැඹුරු ස්වභාව ඇති බවය, සොම්නස් සිතකින් ප්‍රතිසන්ධි ගත් බවය යන මේ දෙකාරණයෙන් ද සොම්නස් සහගත බව වෙයි. ඒ එසේමැයි; යමෙක් තෙමේ නොගැඹුරු ස්වභාව ඇත්තේ වේද හෙතෙමේ ස්වල්ප මාත්‍රවූද සතුටු වියයුතු කරුණෙහි සතුටු වෙයි. යමෙක් සොම්නස් සිතකින් ප්‍රතිසන්ධි ගත්තේවේද හෙතමේ අප්‍රසන්න අරමුණෙහි නමුදු නොපිළිකුල් දැකුම් ඇත්තෙක් වෙයි. ඔහුන්ට බොහෝසෙයින් සොම්නස් සහගත සිතක් උපදී. යටකියනලද සොම්නස් හේතූන්ගේ අභාවයෙන් හා මධ්‍යස්ථ අරමුණු ඇති බැවින් ද උපේක්‍ෂා සහගතබව දතයුත්තේයි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 40-41 පිටු]**

## (අකුසල සිතෙහි සෝමනස්ස- උපෙක්ඛා භේදය)

එත්ථච සෝමනස්සප්පටිසන්ධිකතා, අගම්භීරප්පකතිතා, ඉට්ඨාරම්මණ සමායෝගෝ, බ්‍යසනමුත්තිච සෝමනස්සස්ස කාරණං. සෝමනස්සප්පටිසන්ධිකෝහි සදා භවඞ්ගසෝමනස්සේන පරිභාවිත සන්තානෝ හෝතීති තස්ස චිත්තං උප්පජ්ජමානං යේභුයෙය්න සෝමනස්සසහගතං උප්පජ්ජතීති. අගම්භීරප්පකතිකෝ ච හීනජ්ඣාසයෝ අප්පකංපි මහන්තං මඤ්ඤති. හීනංපි පණීතං මඤ්ඤති. තස්මා තස්සපි චිත්තං උප්පජ්ජමානං යේභුයෙය්න සෝමනස්සසහගතං හෝතීති. ඉට්ඨාරම්මණසමායෝගෝති අත්තනා ඉච්ඡිතේන හීනේනවා පණීතේනවා ආරම්මණේන සමායෝගෝ. බ්‍යසනමුත්තීති ඤතිබ්‍යසනාදිතෝ මුත්ති. උපෙක්ඛාපටිසන්ධිකතා, ගම්භීරප්පකතිතා, මජ්ඣත්තාරම්මණසමායෝගෝ, බ්‍යසනමුත්තිච උපෙක්ඛාය කාරණං. එත්ථච ගම්භීරප්පකතිතානාම මහජ්ඣාසයතා. තාදිසෝ හි පුග්ගලෝ මහන්තංපි අප්පකං මඤ්ඤති, පණීතංපි හීනං මඤ්ඤතීති.

**[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 24 සෝභනචිත්තසඞ්ගහ යටතේ)]**

"සෝමනස්සස්සකාරණ"න්ති සෝමනස්සුප්පත්තියා කාරණං. සෝමනස්සුප්පත්තියා කාරණෝ වුත්තේ තං සහගතචිත්තුප්පත්තියාපි කාරණං සිද්ධං හෝතීති කත්වා තමේව වුත්තන්ති දට්ඨබ්බං. තේනාහ

“සෝමනස්සප්පටිසන්ධිකෝහී”ති ආදිං. හීනේන වා…පෙ…. ආරම්මණේන සමායෝගෝ, තේන සමායුත්තස්සාපි චිත්තං උප්පජ්ජමානන්ති ආදිනා වත්තබ්බං. තථා බ්‍යසනමුත්තියංපි. උපෙක්ඛාකාරණේ “බ්‍යසනමුත්තී”ති ඉදං දෝමනස්සප්පසඞ්ගපරිහාරවචනං.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 24 සෝභනචිත්තසඞ්ගහ යටතේ)]**

**එත්ථ** කාමාවචර සෝභනචිත්තයෙහි (ච ශබ්දය වාක්‍යාරම්භ ද්‍යෝතක නිපාතයි) **සෝමනස්සපටිසන්ධිකතා ච** සොම්නස් ප්‍රතිසන්ධියක් ඇතිබව ද **අගම්භීරප්පකතිතා ච** නොගැඹුරු ස්වභාව ඇතිබවද **ඉට්ඨාරම්මණසමායෝගෝ ච** ඉටුඅරමුණක් සමඟ එක්වීමද **බ්‍යසනමුත්ති ච** ව්‍යසනයන්ගෙන් මිදුණුබවද **සෝමනස්සකාරණං** සෝමනස්ස වේදනාවෙන් යුක්ත චිත්තයක් ඉපදීමට කරුණුයි **ඉති** විස්තර කෙරෙම් **සෝමනස්සප්පටිසන්ධිකෝහි** සෝමනස්ස ප්‍රතිසන්ධික තෙම වනාහි **සදා** හැමකල්හි **භවඞ්ගසෝමනස්සේන** සෝමනස්ස භවාඞ්ගය හේතුකොටගෙන **පරිභාවිත** පුරුදුකළ **සන්තානෝ** සිත්ඇත්තේ **හෝති** වෙයි **තස්ස** ඔහුට **චිත්තං** සිතක් **උප්පජ්ජමානං** උපදිනුයේ **යේභුයෝ්‍යන** බොහෝසෙයින් **සෝමනස්සසහගතං** සෝමනස්ස වේදනාවෙන් යුක්තව **උප්පජ්ජතීති** උපදීයයි කීම සැබෑවකි **ච** තවද **අගම්භීරපකතිතෝ** නොගැඹුරු ස්වභාව ඇති පුද්ගල තෙම **හීනජ්ඣාසයෝ** ලාමක අදහස් ඇත්තේ **අප්පකංපි** ස්වල්පවූවක් **මහන්තංපි** මහත් දෙයක් ලෙස **මඤ්ඤති** හඟී **හීනංපි** ලාමකවූවක් **පණීතං** ප්‍රණීත දෙයක් ලෙස **මඤ්ඤති** හඟී **තස්මා** එබැවින් **තස්සපි** ඔහුටද **උප්පජ්ජමානං චිත්තං** උපදනාවූ සිත **යේභුයෝ්‍යන** බොහෝසෙයින් **සෝමනස්සසහගතං** සෝමනස්සසහගතව **හෝති (උප්පජ්ජති)** උපදී (ඉති පරිසමාපනාර්ථයේ නිපාතයි) **ඉට්ඨාරම්මණසමායෝගෝති** ඉට්ඨාරම්මණසමායෝගෝ යනු **අත්තනා** තමා විසින් **ඉච්ඡිතේන** කැමතිවන **හීනේන වා** ලාමක හෝ **පණීතේන වා** ප්‍රණීත හෝ **ආරම්මණේන** අරමුණ හේතුකොටගෙන **සමායෝගෝ** එක්වීමයි හෙයින් අනුදීපනීටිකායෙහි හීන-ප්‍රණීත අරමුණ හේතුකොටගෙන එයින් යුක්තවූ පුද්ගලයාට උපදනාවූ සිතයයි කියනලදී **බ්‍යසනමුත්තීති** බ්‍යසනමුත්ති යනු **ඤාතිබ්‍යසනාදිතෝ** ඥාතිව්‍යසනාදියෙන් **මුත්ති** මිදීමයි.

**උපෙක්ඛාපටිසන්ධිකතා ච** උපෙක්ෂා ප්‍රතිසන්ධියක් ඇතිබවද **ගම්භීරප්පකතිතා ච** ගැඹුරුවූ ස්වභාව ඇති බවද **මජ්ඣත්තාරම්මණසමායෝගෝ ච** මැදහත්අරමුණක් සමඟ එක්වීමද **බ්‍යසනමුත්ති ච** ව්‍යසනයන්ගෙන් මිදීම නොහොත් දෙම්නස් වේදනාව සමඟ එක්නොවීමද **උපෙක්ඛාය** උපෙක්ෂා වේදනාවෙන් යුක්ත චිත්තයක් ඉපදීමට **කාරණං (හෝති)** කරුණු වෙයි **එත්ථ ච** මෙහිද **ගම්භීරප්පකතිතා නාම** ගැඹුරුවූ ස්වභාව ඇතිබව නම් **මහජ්ඣාසයතා** මහත් අදහස් ඇතිබවයි **තාදිසෝ හි පුග්ගලෝ** එවැනි පුද්ගල තෙම වනාහි **මහන්තංපි** මහත්වූ දෙයක් **අප්පකං** ස්වල්ප දෙයක්සේ **මඤ්ඤති** හඟී **පණීතංපි** ප්‍රණීතවූ දෙයක් **හීනංපි** ලාමක දෙයක්සේ **මඤ්ඤතීති** හඟී.

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

## (කුසල සිතෙහි සෝමනස්ස- උපෙක්ඛා භේදය)

අපිච සද්ධාසම්පත්ති දස්සනසම්පත්ති දෙය්‍යධම්ම පටිග්ගාහක සම්පත්තීති ඒවමාදි සෝමනස්සකාරණං, තබ්බිපරීතං උපෙක්ඛාකාරණං.

**[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 41 සෝභනචිත්තසඞ්ගහ යටතේ)]**

"දෙය්‍යධම්මපටිග්ගාහකසම්පත්ති"ති දෙය්‍යධම්ම වත්ථුසම්පත්ති, පටිග්ගාහක පුග්ගලසම්පත්ති. **[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 41 සෝභනචිත්තසඞ්ගහ යටතේ)]**

**අපිච** තවද **සද්ධාසම්පත්ති** ශ්‍රද්ධා සම්පත්තිය **දස්සනසම්පත්ති** දර්ශනසම්පත්තිය **දෙය්‍යධම්මසම්පත්ති** වස්තු සම්පත්තිය **පටිග්ගාහකසම්පත්ති** ප්‍රතිග්‍රහකසම්පත්තිය නොහොත් පුද්ගලසම්පත්තිය **ඉති** යන **ඒවමාදි** මේ ආදිය **සෝමනස්සකාරණං** සෝමනස්ස වේදනාවට කරුණුයි **තං** එයට **විපරීතං** වෙනස් වූයේ **උපෙක්ඛා** උපෙක්ෂා වේදනාවට **කාරණං** කරුණුයි.

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

උදාසිනභාවේන පෙක්ඛති අනුභවනාකාරේන ආරම්මණං පස්සතීති **උපෙක්ඛා**. උපපත්තිතෝ යුත්තිතෝ ඉක්ඛති පස්සතීතිවා උපෙක්ඛා. යථාහි සෝමනස්ස දෝමනස්සානි ආරම්මණං අධිමත්තතෝ පස්සන්ති. යතෝ සෝමනස්සිතෝ පුග්ගලෝ තේන ආරම්මණේන වියෝගේ විකාරපත්තෝ හෝති. දෝමනස්සිතෝච තේන ආරම්මණේන සංයෝගේ විකාරපත්තෝ හෝති. න තථා අයං, අයං පන යුත්තිතෝච පස්සති න ආරම්මණසංයෝග වියෝගහේතු පුග්ගලං විකාරං පාපේතීති. උපෙක්ඛාය සහගතන්ති සමාසෝ. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 22 ලෝභමූලචිත්තසඞ්ගහ යටතේ)]**

"උදාසිනභාවේනා"ති මජ්ඣත්තභාවේන. "යතෝ"ති යස්මා. විකාරපත්තෝ හෝති. තතෝ අධිමත්තපස්සනං විභද්ධඥයතීති යෝජනා.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 22 ලෝභමූලචිත්තසඞ්ගහ යටතේ)]**

**උදාසීනභාවේන** මධ්‍යස්ථ භාවයෙන් **පෙක්ඛති** බලයි **අනුභවනාකාරේන** අනුභවනාකාරයෙන් **ආරම්මණං** අරමුණ **පස්සති ඉති** දකිනුයි **උපෙක්ඛා** උපෙක්ෂා නම් නොහොත් **උපපත්තිතෝ** ඉපදීම් වශයෙන් **යුත්තිතෝ** යෙදීම් වශයෙන් **ඉක්ඛති** දකියි **පස්සතීතිවා** බලයිනුයි හෝ **උපෙක්ඛා** උපෙක්ෂා නම් **හි** ගලපා කියම් **යථා** යම් සේ වනාහි **සෝමනස්සදෝමනස්සානි ආරම්මණානි** සොමිනස් අරමුණු හෝ දෙම්නස් අරමුණු හෝ **අධිමත්තතෝ** අධිමාත්‍ර වශයෙන් **පස්සන්ති** දකිත් **යතෝ (යස්මා)** යම්හෙයකින් **සෝමනස්සිතෝ පුග්ගලෝ** සොම්නස් පුද්ගල තෙම **තේන ආරම්මණේන** ඒ අරමුණ හේතුකොටගෙන **වියෝගේ** වෙන්වීමෙහි **විකාරප්පත්තෝ** විකාරයට පැමිණියෙකු **හෝති** වෙයි **ච** එසේම **දෝමනස්සිතෝ** දෝමනස්සසහගත පුද්ගල තෙමේ **තේන ආරම්මණේන** ඒ අරමුණ හේතුකොටගෙන **සංයෝගේ** එක්වීමක් ඇති කල්හි **විකාරප්පත්තෝ** විකාරයට පැමිණියෙකු **හෝති** වෙයි **අයං** මේ උපෙක්ෂා පුද්ගලතෙම **න තථා** එසේ නොවෙයි **ඉති** ඒ කීම සැබෑව **අයං පන** මෙතෙම වනාහි **යුත්තිතෝච** යුක්ති වශයෙන්ම **පස්සති** දකී **ආරම්මණසංයෝගවියෝගහේතු** අරමුණෙහි එක්වීමෙහි වෙන්වීමෙහි හේතුවෙන් **පුග්ගලං විකාරං** පුද්ගලවිකාරයට **න පාපේති** නොපැමිණෙයි **උපෙක්ඛාය සහගතන්ති** උපෙක්ඛාසහගතං යනු **සමාසෝ** සමාස පදයි.

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

යෝග්‍ය වූ දානවස්තුවක් ලැබීමය, යෝග්‍ය වූ ප්‍රතිග්‍රාහකයෙක් ලැබීමය, යෝග්‍ය වූ කාලසම්පත්තියක් ලැබීමය, යෝග්‍ය වූ ප්‍රතිරූපදේශයක් ලැබීමය, යහපත් කල්‍යාණ මිත්‍රයන් ලැබීමය, පිරිසිදු සම්‍යක් දෘෂ්ටියක් ඇතිබවය, ප්‍රතිග්‍රාහකයාගේ ගුණ දැනීමය, දානයෙහි අනුසස් දැනීමය, සෝමනස්ස සහගත සතර පටිසන්ධියෙන් යම් සිතකින් පටිසන්ධි ගැණීමය යන මේ කාරණා නවයෙන් සම්පූර්ණ වූ කල්හි සෝමනස්ස

වේදනාවෙන් උතුම් වූ මහාකුසලචිත්තය උපදී. මේ කාරණා නවයෙන් එකක් හෝ බොහෝ ගණනක් හෝ අඩුවී නම් උපේක්ෂා සහගත කුසලචිත්තය උපදී.
**[විස්තර භාව සන්නය 37 පිට]**

## (විපාක සිතෙහි සෝමනස්ස-උපෙක්ඛා භේදය)

**මහාවිපාකේසු** පදත්ථතෝ වත්තබ්බං නත්ථි. වේදනාභේදෝ ආරම්මණවසේන වත්තබ්බෝ. තානිහි අතිඉට්ඨේ ඉට්ඨමජ්ඣත්තේ ච ආරම්මණේ යථාක්කමං සෝමනස්සේන උපෙක්ඛාය ච යුත්තානීති. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 44 යටතේ)]**

**මහාවිපාකේසු** කාමාවචර විපාක සිත්හි **පදත්ථතෝ** පද අර්ථ වශයෙන් **වත්තබ්බං** කිවයුත්තක් **නත්ථි** නැත **වේදනාභේදෝ** වේදනා භේදය **ආරම්මණවසේන** අරමුණු වශයෙන් **වත්තබ්බෝ** කිවයුතුයි **ඉති** විස්තර කෙරෙම් **තානිහි (විපාකචිත්තානි)** ඒ මහාවිපක චිත්තයෝ තුමූ **අතිඉට්ඨේ ච (ආරම්මණේ)** අති ඉෂ්ට අරමුණෙහි ද **ඉට්ඨමජ්ඣත්තේ ච ආරම්මණේ** ඉෂ්ට මධ්‍යස්ථ අරමුණෙහි ද **යථාක්කමං** පිළිවෙළින් **සෝමනස්සේන ච** සෝමනස්ස වේදනාව හේතුකොටගෙන ද **උපෙක්ඛාය ච** උපේක්ෂා වේදනාව හේතු කොටගෙන ද **යුත්තානි** උපදින්නාහු වෙත්.
**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

සෝභනං මනෝ, සුන්දරං වා මනෝ ඒතස්සාති සුමනෝ, සුමනස්ස භාවෝ සෝමනස්සං, මානසිකසුඛා වේදනා රුළ්හියා, සෝමනස්සේන උප්පාදතෝ පට්ඨාය යාව භඞ්ගා සහගතං පවත්තං සංසට්ඨං, සම්පයුත්තන්ති අත්ථෝ. **සෝමනස්සසහගතතා** චස්ස ආරම්මණවසේන වේදිතබ්බා. ඉට්ඨාරම්මණේ හි චිත්තං සෝමනස්සසහගතං හෝති.

උපෙක්ඛතීති උපෙක්ඛා, වේදයමානාපි ආරම්මණං අජ්ඣුපෙක්ඛති මජ්ඣත්තතාකාරසණ්ඨිතත්තාති අත්ථෝ. අථ වා උපේතා සුඛදුක්ඛානං අවිරුද්ධා ඉක්ඛා අනුභවනන්ති උපෙක්ඛා. අථ වා ඉට්ඨේ ච අනිට්ඨේ ච ආරම්මණේ පක්ඛපාතාභාවේන උපපත්තිතෝ යුත්තිතෝ ඉක්ඛති අනුභවතීති උපෙක්ඛා, තාය සහගතන්ති **උපෙක්ඛාසහගතං**. සේසං සබ්බං හෙට්ඨා වුත්තනයමේව.

තත්ථ **පටිග්ගාහකාදිසම්පත්ති**න්ති එත්ථ **ආදි**-සද්දේන දේසකාලකල්‍යාණ මිත්තාදිසම්පත්තිං සඞ්ගණ්හාති. **අඤ්ඤං වා සෝමනස්සහේතු**න්ති එත්ථ අඤ්ඤදග්ගහණේන සද්ධාබහුලතා, විසුද්ධදිට්ඨිතා, කුසලකිරියාය ආනිසංසදස්සාවිතා, සෝමනස්සපටිසන්ධිකතා, ඒකාදස පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මාති ඒවමාදීනං සඞ්ගහෝ. **[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 452 යටතේ)]**

**සෝභනං මනෝ, සුන්දරං වා මනෝ ඒතස්සාති සුමනෝ** ඉෂ්ට වේදනාවගේ යෝගයෙන් මනා වූ මනස හෝ මනා වූ මනස ඇත්තේ හෝ **සුමනෝ** සුමන නම් වේ **තස්ස (සුමනස්ස) භාවෝ සෝමනස්සං** ඔහුගේ භාවය සෝමනස්ස නම් **සෝමනස්සේන උප්පාදතෝ පට්ඨාය යාව භඞ්ගා සහගතං පවත්තං සංසට්ඨං සම්පයුත්තං සෝමනස්සසහගතං** සොම්නස් වේදනාව හා උත්පාදයෙහි පටන් ගෙන භඞ්ගය දක්වා සමඟ පැවැතියේ හැනුනේ සෝමනස්සසහගත නම් **ඉට්ඨාරම්මණේ හි චිත්තං සෝමනස්සසහගතං හෝති** ඉටු අරමුණෙහි සිත සොම්නස්ව උපදනා

බැවින් **සෝමනස්සසහගතත්තා චස්ස ආරම්මණවසේන වේදිතබ්බා** අරමුණු සොම්නස්සහගිය බව ඒ චිත්තයාගේ අරමුණු වශයෙන් දතයුතු.

**උපෙක්ඛතීති උපෙක්ඛා** විඳිනු ලබන්නාහුදු මධ්‍යස්ථාකාරයෙන් සිටි හෙයින් අරමුණු අද්ධ්‍යුපේක්‍ෂා කෙරේනුයි උපේක්‍ෂා නම් වේ යන අර්ථයි නොහොත් **උපේතා සුඛදුක්ඛානං අවිරුද්ධා ඉක්ඛා අනුභවනන්ති උපෙක්ඛා** සුඛ දුක්ඛයනට අවිරුද්ධ වූ ඊක්‍ෂාව අනුභවනය උපේක්‍ෂාව නම් නොහොත් **ඉට්ඨේ අනිට්ඨේ ච ආරම්මණේ පක්ඛපතාභාවේන උපපත්තිතෝ යුත්තිතෝ ඉක්ඛති අනුභවතීති උපෙක්ඛා** ඉටු අරමුණෙහිදු නොඉටු අරමුණෙහිදු පක්‍ෂපාතයක් නැති හෙයින් යුක්තීන් අනුභව කෙරේනුයි උපේක්‍ෂා නම් වේ **උපෙක්ඛාය සහගතං උපෙක්ඛාසහගතං** උපේක්‍ෂාව හා සහගියේ උපෙක්ඛාසහගත නම් වේ

**තත්‍ථ පටිග්ගහකාදිසම්පත්තිං** එහි පටිග්ගහාකාදිසම්පත්ති **එත්‍ථ** යන්නෙහි **ආදිසද්දේන** ආදි ශබ්දයෙන් **දේසකාලකල්‍යාණමිත්තාදිසම්පත්තිං** දේශ කාල කල්‍යාණමිත්‍රාදී සම්පත්තිය **සඞ්ගණ්හාති** සඞ්ග්‍රහ වේ **අඤ්ඤං වා සෝමනස්සහේතුන්ති** අඤ්ඤං වා සෝමනස්සහේතුං **ඉති එත්‍ථ** යනුයෙහි **අඤ්ඤග්ගහණේන** අන්‍යය ග්‍රහනයෙන් **සද්ධාබහුලතා** ශ්‍රද්ධා බාහුල්‍ල බවය **විසුද්ධදිට්ඨිතා** විසුද්ධ දෘෂ්ටි ඇති බවය **කුසලකිරියාය ආනිසංසදස්සාවිතා** කුශල ක්‍රියාවෙහි ආනිසංස දර්ශීබවය **සෝමනස්සපටිසන්ධිකතා** සොම්නස් පිළිසිඳ ඇති බවය **ඒකාදස පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මා** එකොළොස් ප්‍රීතිසම්බෝද්ධ්‍යඞ්ග ස්ථානීය ධර්මයහ **ඉති ඒවං** යන මේ **ආදීනං** ආදීන්ගේ **සඞ්ගහෝ** සඞ්ග්‍රහය (**හෝති** වේ).
**[විසුද්ධි මාර්ග සන්නය 1083-1084; සිංහල විසුද්ධි මාර්ගය විඤ්ඤාණස්කන්ධ නිර්දේශය 194-195 පිටු (තායිවාන් මුද්‍රණය)]**

බලවත් ශ්‍රද්ධාව හා දර්ශණ සම්පත්, ප්‍රතිග්‍රාහක සම්පත්, ප්‍රත්‍යය සම්පත්, කාල සම්පත්, ප්‍රදේශ සම්පත් ලැබීම සෝමනස්ස සහගත වීමේ හේතුය.
**[අභිධර්ම චන්ද්‍රිකාව 23 පිට]**

ශ්‍රද්ධාව බලවත්වීම් රිසිසේ දනවස්තූන් ලැබී ප්‍රිය ප්‍රතිග්‍රහකයන් ලැබීම් ආදියෙන් ඒ කුසලචිත්තය සෝමනස්සයෙන් යුක්තව ද ඒවා නොලත් අවස්ථාවල දී උපේක්‍ෂාවෙන් යුක්තව ද ඇති වේ. **[අභිධර්ම මාර්ගය 47 පිට]**

සෝමනස්ස සිතකින් පිළිසිඳ ගැනීම, ඉටු අරමුණ, නොගැඹුරු නුවණ යන මෙය සොම්නස් වේදනාවට කරුණුය. උපේක්‍ෂාසහගත චිත්තයකින් පිළිසිඳ ගැනීම, මැදහත් විසින් ඉටු අරමුණක් ලැබීම, ගැඹුරු නුවණ යන මෙය මැදහත් වේදනාවට කරුණුය.

වැඩුනු ශ්‍රද්ධාව, දර්ශණ සම්පත්තිය, ප්‍රත්‍යය සම්පත්තිය, ප්‍රතිග්‍රාහක සම්පත්තිය, යන මේ කරුණු මේ සිත් සොම්නසට පමුණුවන්නේය. "එත්ථ ච බලවසද්ධාය දස්සනසම්පත්තියා පච්චයපටිග්ගාහකාදීසම්පත්තියාති ඒවමාදීහි කාරණේහි සෝමනස්සසහගතා" යනු එහිලා කීහ. **[සද්ධර්මසාගරය 02/421-437 පිටු]**

ස්වභාව වශයෙන් ඉෂ්ටාරම්මණයක් වීමය (ඉෂ්ටාරම්මණයක් නොවූයේ නමුදු ඉෂ්ටාරම්මණය කල්පනා කටයුතු අරමුණක් වීමය) සොම්නස් වේදනාව හා එක්ව හටගත්තා වූ සිතකින් ප්‍රතිසන්ධිය ගැනීමය, නොගැඹුරු ස්වභාවය ඇත්තාවූ පුද්ගලයෙකු වීමය මේ තුන්දෙන තුමූ සෝමනස් වේදනාවගේ හටගැනීමගේ හේතූහුයි.

සෝමනස්ස සහගතං යන පදයෙහි සු-ශබ්දය සුගුණාර්ථ වාචක වන්නේ යැයි කල්පනා කොට සුන්දරං මනෝතීති සුමනෝ යනුවෙන් කර්ම ද්වාරය සමාස විග්‍රහ කරණු චිත්තය ලැබේ. **සුගුනං** යහපත් වූ **මනෝ** චිත්තයෙක්නුයි **සුමනෝ** සුමන නම් වෙයි. සුමනෝ ඒතස්ස අත්ථීති සුමනෝ යනුවෙන් අස්ත්‍යාර්ථ තද්ධිත විග්‍රහ කරණු. චිත්තයම ලැබේ. නොහොත් සුන්දරං මනෝ ඒතස්ස අත්ථීති සුමනෝ යනුවෙන් චතුර්ථී බහුබ්බීහි සමාස විග්‍රහ කරණු චිත්තය ලැබේ. සුමන ශබ්ද තෙමේ චිත්තය වාචක වන කල්හි සෝමනස්ස වේදනාව හේතුකොට ඇත්තේයි.

පුද්ගලයා වාචක වන කල්හි සෝමනස්ස වේදනාව ද, චිත්තය ද, හේතු කොටගෙන වාචක වෙයි. සුමනස්සභාවෝ සෝමනස්සං යනුවෙන් විග්‍රහ කරණු. **යං** යම් වේදනාවක් තොමෝ **සුමනස්ස** යහපත් වූ චිත්තයාගේ වා නොහොත් සිත් ඇත්තාවූ පුද්ගලයාගේ **භාවෝ** ස්වභාවයෙක් නුයි **ඉති (තස්මා)** එසේහෙයින් **තං** ඒ වේදනා තොමෝ **සෝමනස්සං** සෝමනස්ස නම් වේ. සොම්නස් වේදනාව මෙහි අර්ථ වශයෙන් ලැබේ. සුමන ශබ්දයෙන් පරව ණ්‍යතත්තා භාවේතු යන සූත්‍රයෙහි තු-ශබ්දය කරණකොටගෙන ස්සං-ප්‍රත්‍යාදේශ වේ. නොහොත් මහාපදේශ සූත්‍රයෙන් ණ-ප්‍රත්‍යයට ස්සං-ආදේශ කරණු. සහගත ශබ්දය මිශ්‍ර කිරීම් සඞ්ඛ්‍යාත වූ අර්ථය වාචක වන්නේයැයි කල්පනා කොට සෝමනස්සේන ඒකුප්පාදදී වසේන සහගතං සංසට්ඨන්ති සෝමනස්සසහගතං යනුවෙන් තෘතියා තත්පුරුෂසමාස විග්‍රහ කරණු.

**යං** යම් සිතක් තෙමේ **සෝමනස්සේන** සොම්නස් වේදනාව හා **ඒකුප්පාදදීවසේන** ඒකෝත්පාදීන්ගේ වශයෙන් **සහගතං සංසට්ඨං** මිශ්‍රවූයේනුයි **ඉති (තස්මා)** එසේ හෙයින් **තං** ඒ සිත් තෙමේ **සෝමනස්සසහගතං** සෝමනස්ස සහගත නම් වේ. නොහොත් සහගත ශබ්දය එක්වය යන අර්ථය වාචක වෙයි. ගත ශබ්දය පැමිණීම් සඞ්ඛ්‍යාත අර්ථය වාචක වන්නේ යැයි කල්පනා කොට **සෝමනස්සේන සහ ඒකුත්පාදදීභාවං ගතන්ති සෝමනස්සසහගතං** යනුවෙන් විග්‍රහ කරණු.

උප්පත්තිතෝ යුත්තිතෝ ඡදයතෝ ඉක්ඛතීති උපෙක්ඛා යනුවෙන් විග්‍රහ කරණු. උප පූර්ව ඉක්ඛ ධාතුවයි. උප යන උපසර්ග තෙමේ ඡදයාර්ථ වාචක වෙයි. **යා** යම් වේදනාවක් තොමෝ **වේදියමානාහි** ආලම්බනරසානුභවය කරන්නේ නමුදු **මජ්ඣත්තාකාර සංඨිතියා** මැදහත් ආකාරයෙහි මනාකොට පිහිටි හෙයින් **උප්පත්තිතෝ යුත්තිතෝ ඡදයතෝ** යුත්ති වශයෙන් **ඉක්ඛති** අනුභව කෙරේ ද **ඉති (තස්මා)** එසේහෙයින් **සා** ඒ වේදනා තොමෝ **උපෙක්ඛා** උපේක්ෂා නම් වේ. උපෙක්ඛාය ඒකුප්පාදදිවසේන සහගතං සංසට්ඨන්ති උපෙක්ඛාසහගත යනුවෙන් පදත්‍රය එක්කොට විග්‍රහ කරණු. **යං** යම් සිතක් තෙමේ **උපෙක්ඛාය** උපේක්ෂා වේදනාව හා **ඒකුප්පාදදිවසේන** එකට ඉපදීම් වශයෙන් **සහගතං සංසට්ඨං** මිශ්‍රවූයේ වේද **ඉති (තස්මා)** එසේහෙයින් **තං** ඒ සිත් තෙමේ **උපෙක්ඛාසහගතං** උපේක්ෂා සහගත නම් වේ. උපේක්ෂා වේදනාව හා එක්ව හටගත්තා වූ ලෝභමූලික චිත්තය ගැනේ.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 13-14-15 පිටු]**

සෝභනං මනෝති සුමනෝ යනුවෙන් විග්‍රහ කරණු. **සෝභනං** යහපත් වූ **මනෝ** චිත්තයෙක්නුයි **සුමනෝ** සුමන නම් වෙයි. මේ වනාහි අර්ථයයි. සොම්නස් වේදනාව හා සමඟ හටගන්නා වූ චිත්තය ලැබෙයි. සුමනෝ ඒතස්ස අත්ථීති සුමනෝ යනුවෙන් ද විග්‍රහ කරණු. සිත නිශ්‍රය කොට ගෙන හටගත්තා වූ සුඛ වේදනාව ලැබේ. සුමන ශබ්ද තෙමේ චිත්තය වාචක වන කල්හි සොම්නස් වේදනාව හේතු කොට ගෙන වාචක

වෙයි. පුද්ගලයා වාචක වන කල්හි මූල වූ සොමිනස් වේදනාව හේතුකොට ගෙන වාචක වෙයි. සොමිනස් වේදනා තොමෝ; සැප වූ ලක්‍ෂණ ඇත්තේයි. සම්ප්‍රයුක්ත ධර්මයන් වැඩීම කෘත්‍යය කොට ඇත්තේයි. සිනාවම වැටහෙන්නා වූ ආකාර කොට ඇත්තේයි. සංසිදීම ආසන්න කාරණා කොට ඇත්තේයි. සෝමනස්සේන සහ ඒකුප්පාදදීභාවං ගතන්ති සෝමනස්සසහගතං යනුවෙන් විග්‍රහ කරණු. ශ්‍රද්ධා බහුල බවය, දෘෂ්ටිහුගේ පිරිසිදු බවය, පූජා විශේෂය සම්පූර්ණ බවය යන මේ ත්‍රිවිධාකාර හේතූන් නිසා සොමිනස් වේදනාව හා සමග යෙදෙන්නේය. නොහොත් ඉට්ඨාලම්බනයක් ලැබීමය, නොගැඹුරු ස්වභාව ඇති බවය, සොමිනස් සහගත ප්‍රතිසන්ධිය ලැබීමය, විපාකානිසංශ දැකීමය යන මේ සතර ආකාර හේතූන් නිසා සොමිනස් වේදනාව හා සමඟ හටගන්නේය.

ඉෂ්ටමධ්‍යස්ථාලම්බනයක් ලැබීමය, උපේක්‍ෂා සහගත ප්‍රතිසන්ධිය ඇති බවය, ගැඹුරු ස්වභාව ඇති බවය යන මේ ත්‍රිවිධාකාර හේතූන් නිසා උපේක්‍ෂා වේදනාව හා එක්ව හටගන්නේය. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 25-26 පිටු]**

සෝමනස්ස සහගත පටිසන්ධි සතරෙන් යම්කිසි චිත්තයෙකින් පිළිසිඳීමය, ඉෂ්ටාරම්මණයක් වීමය, නොගැඹුරු ප්‍රඥ ඇති බවය මේ කාරණා ත්‍රයයි. උපෙක්ඛා සහගත පටිසන්ධි සය දෙනා අතුරෙන් යම්කිසි චිත්තයකින් පටිසන්ධි ගැනීමය, මධ්‍යස්ථ වශයෙන් යහපත් අරමුණක් ලැබීමය, ගැඹුරු නුවණ ඇති බවය මේ කාරණා තුනයි. **[විස්තර භාව සන්නය 16 පිට]**

ස්වභාව වශයෙන් හෝ පරිකල්පන වශයෙන් ඇතිවන ඉෂ්ටාරම්මණය, සෝමනස්ස පටිසන්ධි ඇති බවය, ගම්භීර ස්වභාව නැති බවය යන මේ අංග තුන ලෝභමූල චිත්තයෙහි සෝමනස්ස වේදනා ඇතිවීමට හේතු වේ. ඉෂ්ටමජ්ඣත්තාරම්මණය, උපෙක්ඛා පටිසන්ධි ඇති බවය, ගම්භීර ස්වභාව ඇති බවය යන මේ අංග තුන ලෝභමූල චිත්තයෙහි උපෙක්ඛා වේදනාය ඇතිවීමට හේතු වෙයි. **[අභිධර්ම ප්‍රකාශය 17 පිට]**

## චිත්තයාගේ අසඞ්ඛාර සසඞ්ඛාර භේදය:—

ඤාණසම්පයුත්තං හුත්වා උප්පන්නඤ්චේතං අසඞ්ඛාරේන අප්පයෝගේන අනුපායචින්තනාය උප්පන්නත්තා අසඞ්ඛාරං නාම ජාතං.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා කාමාවචර කුසලපද භාජනීය අංක 1 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 91 පිට (හේ.වි.මු)]**

**ඤාණසම්පයුත්තං හුත්වා** ඤාණසම්ප්‍රයුක්ත වී **උප්පන්නඤ්චේතං** උපන්නා වූ චිත්තය තෙමේ **අසඞ්ඛාරේන** අසංස්කාරිකව **අප්පයෝගේන** අනුන්ගේ ප්‍රයෝගයක් නොමැතිව **අනුපායචින්තනාය** උත්සාහයක් නොමැතිව **උප්පන්නත්තා** උපන් බැවින් **අසඞ්ඛාරං නාම ජාතං** අසංස්කාරික නම් විය. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

**සසඞ්ඛාරේනාති** ඉදමේව අපුබ්බං. තස්සත්ථෝ සහ සඞ්ඛාරේනාති සසඞ්ඛාරෝ. තේන සසඞ්ඛාරේන සප්පයෝගේන සඋපායේන පච්චයගණේනාති අත්ථෝ. යේන හි ආරම්මණාදිනා පච්චයගණේන පඨමං මහාචිත්තං උප්පජ්ජති, තේනේව සප්පයෝගේන සඋපායේන ඉදං උප්පජ්ජති.

තස්සේවං උප්පත්ති වේදිතබ්බා ඉධේකච්චෝ භික්ඛු විහාරපච්චන්තේ වසමානෝ චේතියඞ්ගණසම්මජ්ජනවේලාය වා ථේරුපට්ඨානවේලාය වා සම්පත්තාය, ධම්මසවනදිවසේ වා සම්පත්තේ "මය්හං ගන්ත්වා පච්චාගච්ඡතෝ අතිදූරං භවිස්සති, න ගමිස්සාමී"ති චින්තෙත්වා පුන චින්තේති "භික්ඛුස්ස නාම චේතියඞ්ගණං වා ථේරුපට්ඨානං වා ධම්මසවනං වා අගන්තුං අසාරුප්පං, ගමිස්සාමී"ති ගච්ඡති. තස්සේවං අත්තනෝ පයෝගේන වා, පරේන වා වත්තාදීනං අකරණේ ච ආදීනවං කරණේ ච ආනිසංසං දස්සෙත්වා ඔවදියමානස්ස, නිග්ගහවසේනේව වා "ඒහි, ඉදං කරෝහී"ති කාරියමානස්ස උප්පන්නං කුසලචිත්තං සසඞ්ඛාරේන පච්චයගණේන උප්පන්නං නාම හෝතීති.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 146 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 152-153 පිටු (හේ.වි.මු)]**

**සප්පයෝගේනා**ති ලීනස්ස චිත්තස්ස උස්සාහනපයෝගසහිතේන. **සඋපායේනා**ති කුසලස්ස කරණාකරණේසු ආදීනවානිසංසපච්චවෙක්ඛණං පරේහි උස්සාහනන්ති ඒවමාදිඋපායසහිතේන.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 146 යටතේ)]**

**උස්සාහනං** පේසනං නියෝජනං.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 146 යටතේ)]**

**සසඞ්ඛාරේන ඉති** සසඞ්ඛාරේන යනු **ඉදමේව අපුබ්බං** මෙය පෙර නොවූවක්මය **තස්ස** ඒ වචනයාගේ **අත්ථෝ** අර්ථය තෙමේ **සහ සඞ්ඛාරේන ඉති** තමා විසින් හෝ අනුන් විසින් හෝ කරනලද චිත්ත ප්‍රයෝග සඞ්ඛ්‍යාත වූ සංඛාරය සමඟ වූයේනුයි **සසඞ්ඛාරෝ** සසංස්කාර නම් **තේන සසඞ්ඛාරේන** ඒ සසංස්කාරයෙන් **සප්පයෝගේන** හැකිලුන චිත්තයාගේ උත්සාහවත් කිරීමේ ප්‍රයෝගයෙන් යුතුව **සඋපායේන** කුසල් කිරීමෙහි නොකිරීමෙහි ආදීනව ආනිසංශ ප්‍රත්‍යවේක්‍ෂා කිරීම අනුන් විසින් උත්සාහවත් කිරීමෙන් **පච්චයගණේන** ආරම්මණාදී ප්‍රත්‍යගණයෙන් **ඉති** යුක්ත වීමෙන් යන **අත්ථෝ** අර්ථයයි **යේන ආරම්මණාදිනා පච්චයගණේන** යම් ආරම්මණාදී ප්‍රත්‍යගණයකින් **පඨමං මහාචිත්තං** ප්‍රථම මහා කුසලචිත්තය **හි (යථා)** යම්සේ **උප්පජ්ජති** උපදී ද **තේනේව සප්පයෝගේන** ඒ හැකිලුන චිත්තයාගේ උත්සාහවත් කිරීමේ ප්‍රයෝගයෙන් **සඋපායේන** කුසල් කිරීම් නොකිරීමෙහි ආදීනව ආනිසංශ ප්‍රත්‍යවේක්‍ෂා කිරීම අනුන් විසින් උත්සාහවත් කිරීමෙන්ම **ඉදං (චිත්තං)** මේ දුතිය චිත්තය **උප්පජ්ජති** උපදී.

**තස්ස** ඒ දුතිය චිත්තයාගේ **උප්පත්ති** ඉපදීම **ඒවං** මෙසේ **වේදිතබ්බා** දතයුතුය **ඉධ** මේ ශාසනයෙහි **ඒකච්චෝ භික්ඛු** ඇතැම් භික්‍ෂුවක් තෙමේ **විහාරපච්චන්තේ** විහාරය කෙළවර **වසමානෝ** වසනුයේ **චේතියඞ්ගණසම්මජ්ජනවේලාය වා** චෛත්‍යය මළුව ඇමදීමෙහි වේලාව හෝ **ථේරුපට්ඨානවේලායං** ඇදුරු උවටැන් කරන වේලාව **සම්පත්තාය වා** පැමිණි කල්හි හෝ **ධම්මසවනදිවසේ වා සම්පත්තේ** ධර්මශ්‍රවණය කරන දවස පැමිණි කල්හි **ගන්ත්වා** ගොස් **පච්චාගච්ඡතෝ මය්හං** ආපසු එන්නා වූ මට **අතිදූරං** බොහෝ දුරක් **භවිස්සති** වන්නේය **න ගමිස්සාමි ඉති** නොයන්නෙමි යැයි **චින්තෙත්වා** සිතා **පුන චින්තේති** නැවත සිතයි **භික්ඛුස්ස නාම** භික්‍ෂුවට නම් **චේතියඞ්ගණං වා** චෛත්‍යය මළුව ඇමදීමට හෝ **ථේරුපට්ඨානං වා** ඇදුරු උවටැනට හෝ **ධම්මසවනං වා** ධර්මශ්‍රවණයට හෝ **අගන්තුං** නොයන්නට **අසාරුප්පං** සුදුසු නොවෙයි **ගමිස්සාමි ඉති** යන්නෙමි යැයි **ගච්ඡති** යයි **ඒවං** මෙසේ **තස්ස අත්තනෝ** ඒ තමාගේ **පයෝගේන වා** ප්‍රයෝගයෙන් හෝ **පරේන** අනුන් විසින්

**වත්තාදීනං අකරණේ ච** වත් ආදිය නොකිරීමෙහි **ආදීනවං** ආදීනව ද **කරණේ ච ආනිසංසං** කිරීමෙහි අනුසස් ද **දස්සෙත්වා** පෙන්වා **ඕවාදියමානස්ස** අවවාද කරන්නා වූ ඔහුට **වා** හෝ **නිග්ගහවසේනේව වා** නිග්‍රහ කිරීම් වශයෙන් හෝ **ඒහි** එව **ඉදං කරෝහි ඉති** මෙය කරව යැයි **කරියමානස්ස** කරවනු ලබන්නහුට **උප්පන්නං කුසලචිත්තං** උපදින්නා වූ ඒ දෙවෙනි කුසල චිත්තය **සසඞ්ඛාරේන** තමා විසින් හෝ අනුන් විසින් හෝ කරනලද චිත්ත ප්‍රයෝග සඞ්ඛ්‍යාත වූ සංඛාරයෙන් **පච්චයගණේන** ආරම්මණාදී ප්‍රත්‍යගණයෙන් **උප්පන්නං නාම හෝති** උපන්නේ නම් වෙයි.

**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

අත්තනෝ වා පරස්ස වා සමුස්සාහජනිතං චිත්තපයෝගසඞ්ඛාතං සඞ්ඛරණං සඞ්ඛාරෝ, සෝ ඒතස්ස නත්ථීති **අසඞ්ඛාරං.** තේන පන සහ සඞ්ඛාරේන පවත්තතීති **සසඞ්ඛාරං.** **[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 452 යටතේ)]**

අසඞ්ඛාරං අසංකාර වූ "අත්තනෝ වා පරස්ස වා සමුස්සාහජනිතං චිත්තප්පයෝගසඞ්ඛාතං සඞ්ඛරණං සඞ්ඛාරෝ" තමා විසින් හෝ අනුන් විසින් හෝ කරනලද චිත්ත ප්‍රයෝග සඞ්ඛ්‍යාත වූ සංස්කරණය සංස්කාර නම්. "සෝ ඒතස්ස නත්ථීති අසඞ්ඛාරං" ඒ සංස්කාරය මෝ හට නැත්නුයි අසංස්කාර නම්. "තේන පන සහ සඞ්ඛාරේන පවත්තතීති සසඞ්ඛාරං" ඒ සංස්කාරයා හා සමඟ පවතීනුයි සසංස්කාර නම්.

**[විසුද්ධි මාර්ග සන්නය 1084 පිට; සිංහල විසුද්ධි මාර්ගය විඥ්ඥණස්කන්ධ නිර්දේශය 194 පිට (තායිවාන් මුද්‍රණය)]**

සඞ්ඛරෝති චිත්තං තික්ඛභාවසඞ්ඛාතමණ්ඩනවිසේසේන සජ්ජේති, සඞ්ඛරීයති වා තං ඒතේන යථාවුත්තනයේන සජ්ජීයතීති සඞ්ඛාරෝ, තත්ථ තත්ථ කිච්චේ සංසීදමානස්ස චිත්තස්ස අනුබලප්පදානවසේන අත්තනෝ වා පරේසං වා පවත්තපුබ්බප්පයෝගෝ, සෝ පන අත්තනෝ පුබ්බභාගප්පවත්තේ චිත්තසන්තානේ චේව පරසන්තානේ ච පවත්තතීති තන්නිබ්බත්තිතෝ චිත්තස්ස තික්ඛභාවසඞ්ඛාතෝ විසේසෝව්ධ සඞ්ඛාරෝ, සෝ යස්ස නත්ථි තං අසඞ්ඛාරං, තදේව **අසඞ්ඛාරිකං**. සඞ්ඛාරේන සහිතං **සසඞ්ඛාරිකං**. තථා ච වදන්ති;

"පුබ්බප්පයෝගසම්භූතෝ, විසේසෝ චිත්තසම්භවී;
සඞ්ඛාරෝ තං වසේනෙත්ථ, හොත්‍යාසඞ්ඛාරිකාදිතා"ති.

අථ වා "සසඞ්ඛාරිකං අසඞ්ඛාරික"න්ති චේතං කේවලං සඞ්ඛාරස්ස සසඞ්ඛාරිකං අසඞ්ඛාරිකභාවාභාවං සන්ධාය වුත්තං, න තස්ස සහප්පවත්තිසබ්භාවාභාවතෝති භින්නසන්තානප්පවත්තිනෝපි සඞ්ඛාරස්ස ඉදමත්ථිතාය තංවසේන නිබ්බත්තං චිත්තං සඞ්ඛාරෝ අස්ස අත්ථීති **සසඞ්ඛාරිකං** "සලෝමකෝ සපක්ඛකෝ සද්දස්ස විජ්ජමානත්ථපරිදීපනතෝ ත්‍යාදීසු විය සහ" තබ්බිපරීතං පන තදභාවතෝ වුත්තනයේන **අසඞ්ඛාරිකං**.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 04 යටතේ); විභාවනී ටීකා සන්නය 24-26 පිටු]**

**පුබ්බයෝගෝ** යම් පූර්ව ප්‍රයෝගයක් තෙමේ **චිත්තං** (පසුව හටගන්නා වූ) චිත්තය **තික්ඛභාවසඞ්ඛාතමණ්ඩනවිසේසේන** තියුණු බව යැයි කියනලද සැරසීම් විශේෂයෙන් **සඞ්ඛරෝති (සජ්ජේති)** සදන්නේ වේද **වා** නොහොත් **ඒතේන** ඒ පූර්ව ප්‍රයෝගය කරණකොටගෙන **තං චිත්තං** ඒ (පසුව හටගන්නා) චිත්තය **යථා**

**වුත්තනයේන** කියනලද ක්‍රමයෙන් **සඞ්ඛරීයති (සජ්ජීයති)** සදනු ලැබේ ද **ඉති (තස්මා) සෝ පුබ්බපයෝගෝ** ඒ පූර්ව ප්‍රයෝග තෙමේ **සඞ්ඛාරෝ** සඞ්ඛාර නම් වේ. (පූර්ව විකල්පය කර්තෘ සාධනයි. පච්ඡිම විකල්පය කරණ සාධනයි. "යථා වුත්තනයේන" යන පාඨයෙන් "තික්ඛභාවසඞ්ඛාතමණ්ඩනවිසේසේන" යන පාඨය ආකර්ශණය කෙළේයි. "තත්ථ තත්ථ" යනාදී පාඨය ද්විප්‍රකාර වචනාර්ථයාගේ අභිධෙය්‍යාර්ථය දක්වන පිණිස කියනලදි)

**තත්ථ තත්ථ කිච්චේ** ඒ ඒ කෘත්‍යයෙහි **සන්සීදමානස්ස** යටපත් වන්නා වූ (පසුබස්නා වූ) **චිත්තස්ස** චිත්තයට **අනුබලප්පදානවසේන** තමාගේ ශක්තියෙන් රුකුල්දීම් වශයෙන් **අත්තනෝ වා** තමාගේ හෝ **පරේසං වා** මෙරමාගේ හෝ ("පුබ්බපයෝගෝ" යන්නෙහි සම්බන්ධ කටයුතුයි) **පවත්තපුබ්බපයෝගෝ** පූර්වයෙහි හටගත්තා වූ ව්‍යාපාරය (**ලබ්භති** ලැබෙයි) (ආයුෂ්මත් ටීකාචාරීනි පූර්ව ප්‍රයෝගය සංස්කාර නැමැයි කියේ නොවේද? මේ පසුව උපදනා චිත්තය හා සමඟ ඒ පූර්ව ප්‍රයෝගයාගේ හටගැනීමක් නැත්තේ නොවේ ද? මේ පසුව හටගන්නා චිත්තයෙහි සංස්කාරය කෙසේ යෙදෙන්නේ දැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "සෝ පන -පෙ- ඉධ සඞ්ඛාරෝ" යන පාඨය කියනලදි) **සෝ පන පුබ්බපයෝගෝ** ඒ පූර්ව ප්‍රයෝගය වනාහි **අත්තනෝ** තමාගේ **පුබ්බභාගප්පවත්තේ** පූර්ව භාගයෙහි පැවැත්තාවූ **චිත්තසන්තානේ චේව** චිත්තපරම්පරායෙහි ද **පරසන්තානේ ච** අනුන්ගේ සන්තානයෙහි ද **යස්මා** යම්හෙයකින් **පවත්තති** පවත්නේ ද **ඉති (තස්මා) තං නිබ්බත්තිතෝ** ඒ පූර්ව ප්‍රයෝගය විසින් උපදවන ලද්ද වූ **චිත්තස්ස** චිත්තයාගේ **තික්ඛභාවසඞ්ඛාතෝ** තියුණු බව යැයි කියනලද **විසේසෝව** වෙනසම **ඉධ** මේ අසඞ්ඛාරික සසඞ්ඛාරික යන පද සමුදයෙහි **සඞ්ඛාරෝ** සඞ්ඛාර නම් වේ (මෙහි භාවය "සඞ්ඛරෝති චිත්තං" යනාදි වචනාර්ථ දෙදෙනාගේ සමුදයෙහි පූර්ව ප්‍රයෝගයම මුඛ්‍ය වශයෙන් සඞ්ඛාර නම් වතුදු පූර්ව ප්‍රයෝග තෙම පසු චිත්තය හා සමඟ හටනොගන්නා හෙයින් මේ "අසඞ්ඛාරිකසසඞ්ඛාරික" යන පද සමුදයෙහි ඒ පූර්ව ප්‍රයෝගය උපදවන්නා වූ චිත්තයාගේ තියුණු බව යැයි කියනලද විශේෂයම කාරණූපචාර වශයෙන් සංස්කාර වේ යනු භාවයි)

**යස්ස චිත්තස්ස** යම් සිතකට **යෝ සඞ්ඛාරෝ** යම් ඒ තියුණු බව යැයි කියනලද මණ්ඩන විශේෂය **නත්ථි** නැත්තේ වේද **ඉති (තස්මා) තං චිත්තං** ඒ සිත් තෙමේ **අසඞ්ඛාරං** අසඞ්ඛාර නම් වේ ("නත්ථි යස්ස සඞ්ඛාරෝති අසඞ්ඛාරිකං"යි බහුබ්‍රීහි සමාස කටයුතුයි) **තදේව** ඒ තියුණුබව යැයි කියනලද මණ්ඩන විශේෂය නැත්තාවූ සිතම **අසඞ්ඛාරිකං** අසඞ්ඛාරික නම් වේ (ක-ප්‍රත්‍යයෙහි විශේෂ අර්ථයක් නැති බැවින් ස්වාර්ථයෙහි යයි කියයුතුයි)

**යං චිත්තං** යම් සිතක් තෙමේ **සඞ්ඛාරේන සහිතං** සංස්කාරයෙන් යුක්තවීද **ඉති (තස්මා) තං චිත්තං** ඒ සිත් තෙමේ **සසඞ්ඛාරිකං** සසඞ්ඛාරික නම් වේ (සහ පූර්ව පද ප්‍රථමාබහුබ්‍රීහි සමාසයි. "ස" ශබ්ද තෙමේ මෙහි ස්වභාවාර්ථයෙහි වැටෙනබව දක්වන පිණිස "හිතං"යි වර්ණනා කළේයි. "සසඞ්ඛාරං"යි නිෂ්පන්න වූ ශබ්දය ලහුක න්‍යාය වශයෙන් "සසඞ්ඛාරිකං"යි කියනලදි. යටකී නයින් ඉක-ප්‍රත්‍යය ස්වාර්ථයෙහි වැටෙයි)

(භවත් ටීකාචාරීනී මෙහි චිත්තයාගේ තියුණුබව යැයි කියනලද මණ්ඩන විශේෂයම මෙහි සංස්කාර නම් වේ යනු කවර නිදර්ශණයකින් සමර්ථනය කරන්නේ දැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "තථා ච වදන්ති -පෙ- අසඞ්ඛාරිකාදිතා" යන

ගාථාව කියනලදි) **තථා ච (තතෝ ඒව)** ඒ චිත්තයාගේ තියුණුබවයයි කියනලද මණ්ඩන විශේෂයම මෙහි සංස්කාර නම් වන හෙයින්ම **පුබ්බපයෝගසම්භූතෝ -පෙ- අසඞ්ඛාරිකාදිතා** පුබ්බපයෝග -පෙ- අසඞ්ඛාරිකාදිතා යනු **ආචරියා** ආචාර්‍ය්‍යවරයෝ **වදන්ති** කියත්.

**පුබ්බපයෝගසම්භූතෝ** පූර්ව ප්‍රයෝග හේතුවෙන් හටගත්තාවූ **චිත්තසම්භවී** (පසු) චිත්තය හා සමඟ හටගන්නා ස්වභාව ඇත්තාවූ **විසේසෝ** චිත්තයාගේ තියුණුබව යැයි කියනලද මණ්ඩන විශේෂ තෙම **සඞ්ඛාරෝ** සංස්කාර නම් වේ **තං වසේන** ඒ චිත්තයාගේ තියුණුබව යැයි කියනලද මණ්ඩන විශේෂයාගේ වශයෙන් **ඒත්ථ** මේ අසඞ්ඛාරිකසසඞ්ඛාරිකං යන දෙපදයෙහි **අසඞ්ඛාරිකාදිතා** අසඞ්ඛාරිකාදී භාවය **හෝති** වන්නේයි (ආදී ශබ්දයෙන් සසඞ්ඛාරිකය ගැනේ)

(මෙසේ සසඞ්ඛාරික යන පදයෙහි "ස" ශබ්දයාගේ තුල්‍ය යෝගාර්ථයයි කියනලද සහාර්ථය දක්වා දැන් භින්නාර්ථයයි කියනලද විද්‍යමානාර්ථය දක්වනු කැමතිව "අථවා" යනාදි පාඨය කියනලදි) **අථවා** නොහොත් **කේවලං** හුදෙක් **සසඞ්ඛාරිකමසඞ්ඛාරිකන්ති ඒතං පදද්වයං** සසඞ්ඛාරිකං අසඞ්ඛාරිකං යන මේ දෙපදය **සඞ්ඛාරස්ස** සංස්කාරයයි කියනලද පූර්ව ප්‍රයෝගයාගේ **භාවාභාව** විද්‍යමාන බව හා අවිද්‍යමාන බව **සන්ධාය** සඳහා **වුත්තං** කියනලදි **තස්ස** ඒ පූර්ව ප්‍රයෝගයාගේ **සහපවත්තිසබ්භාවාභාවතෝ** සිත හා සමඟ හටගැනීම ඇති නැති බව **සන්ධාය** සඳහා **න වුත්තං** නොකියනලදි ("අන්තරායේ අසේසතෝ" යනාදියෙහි මෙන් මෙහි තෝ-ප්‍රත්‍යය තෙමේ දුතියාවිභක්ත්‍යාර්ථයෙහි වැටේ) **භින්නසන්තානපවත්තිනෝපි** වෙනස් වූ සතන්හී හටගැන්ම ඇත්තාවූද **සඞ්ඛාරස්ස** සංස්කාරයාගේ **ඉධමත්ථිතාය** මේ පශ්චිම චිත්තයෙහි ඇති බැවින් **තං වසේන** ඒ පූර්ව ප්‍රයෝගයයි කියනලද මණ්ඩන විශේෂයාගේ වශයෙන් **නිබ්බත්තං** හටගත්තා වූ **චිත්තං** සිත් තෙමේ (සසඞ්ඛාරිකං යන්න හා සම්බන්ධ කටයුතුයි) **යස්ස චිත්තස්ස** යම් චිත්තයකට **සඞ්ඛාරෝ** පූර්ව ප්‍රයෝග තෙමේ **අත්ථි** ඇත්තේවේද **ඉති (තස්මා) තං චිත්තං** ඒ සිත් තෙමේ **සසඞ්ඛාරිකං** සසඞ්ඛාරික නම් වේ.

("භින්නසන්තානපවත්තිනෝපි" යන්නෙහි "අපි" ශබ්දය ගරහාර්ථයෙහි වැටේ. කෙසේ වෙනස් වූ සන්තානයෙහි හටගැනීම ඇත්තේ ද? යනු පූර්ව ප්‍රයෝගය වනාහි පූර්ව චිත්ත පරම්පරායෙහි ද අන්‍යයන්ගේ සන්තානයෙහි ද හටගනී. සසඞ්ඛාරික චිත්තය වනාහි පසු කාලයෙහි උපදී. මෙසේ වෙනස් වූ සන්තානයෙහි පූර්ව ප්‍රයෝගය හටගන්නේයයි කී නියායි)

මේ පසුව කී ක්‍රමයෙහි "සංවිජ්ජති සඞ්ඛාරෝ යස්සාති සසඞ්ඛාරිකං"යි විග්‍රහ කටයුතුයි. "සසඞ්ඛාරං"යි කියයුතු තන්හි ලහුක න්‍යාය වශයෙන් "සසඞ්ඛාරිකං"යි කියනලදි. ඉක-ප්‍රත්‍යය පෙර මෙන් ස්වාර්ථයෙහි වැටේ. (කුමක්හෙයින් "සංවිජ්ජති සඞ්ඛාරෝ යස්සාති සසඞ්ඛාරං"යි විග්‍රහ කටයුතු ද යන චෝද්‍යයට පරිහාර පිණිස "සලෝමකෝ -පෙ- පරිදීපනතෝ" යන පාඨය කියනලදි) **කස්මා** කුමක්හෙයින යත්? **සලෝමකෝ සපක්ඛකෝති ආදීසු විය** සලෝමකෝ සපක්ඛකෝ යනාදි පාඨයෙහි මෙන් **සහසද්දස්ස** සහ ශබ්දයාගේ **විජ්ජමානත්ථපරිදීපනතෝ** විද්‍යමානාර්ථය ප්‍රකාශ කරන හෙයිනි (ආදි ශබ්දයෙන් "සධනෝ සරාගෝ" යනාදිය ගැනේ. "සසඞ්ඛාරං" යන්නෙහි ස-ශබ්දය අපේක්ෂා කොට "සහසද්දස්ස" යනු කියනලදි)

**තබ්බිපරීතං පන** ඒ සසංස්කාරික චිත්තයට විපරීත වූ අසංස්කාරික චිත්තය වනාහි **තදභාවතෝ** ඒ පූර්ව ප්‍රයෝගය නැති හෙයින් **වුත්තනයේනේව** යට කියනලද ක්‍රමයෙන්ම **අසඞ්ඛාරිකං** අසඞ්ඛාරික නම් වේ ("වුත්තනයේනේව" යන පාඨයෙන් බහුබ්බීහි සමාසය දක්වයි) **[විභාවනී ටීකා සන්නය 50-53 පිටු]**

බලවඋතුභෝජනාදයෝ පන පච්චයා අසඞ්ඛාරිකභාවස්සාති.
**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අකුසලචිත්ත වණ්ණනා යටතේ); විභාවනී ටීකා සන්නය 28 පිටු]**

**බලවඋතුභෝජනාදයෝ** යෝග්‍ය වූ ඍතු භෝජනාදීහු **පච්චයා පන** ප්‍රත්‍යය ධර්මයෝ වනාහි **අසඞ්ඛාරිකස්ස** අසඞ්ඛාරික බවට **කාරණා** හේතු වෙත්. (ඉති ශබ්දය වනාහි පරිසමාපනාර්ථයි. බලවඋතුභෝජනයෝය යනු සත්ප්‍රාය වූ ඍතු භෝජනයෝයි. ආදි ශබ්දයෙන් සත්ප්‍රාය සේනාසන කල්‍යාණ මිත්‍රාදීහු ගැනේ)
**[විභාවනී ටීකා සන්නය 57 පිට]**

ආවාසසප්පායාදිවසෙන කායචිත්තානං කල්ලභාවතො, පුබ්බෙ දානාදීසු කතපරිචයතාදීහි ච අසඞ්ඛාරිකතා, තබ්බිපරියායෙන සසඞ්ඛාරිකතා ච වෙදිතබ්බා.
**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 15 යටතේ); විභාවනි ටීකා සන්නය 52 පිටු; අභිධර්ම ප්‍රකාශය 50 පිට]**

**ආවාසසප්පායාදිවසේන** ආවාසයනගේ යෝග්‍ය බැව් ආදීන්ගේ වශයෙන් **කායචිත්තානං** කාය චිත්ත දෙදෙනාගේ **කල්ලභාවතෝ ච** දක්ෂ බැවින් ද **පුබ්බේ** පෙර ජාතියෙහි **දානාදීසු** දන්දීමාදියෙහි **කතපරිචයතාදීහි ච** කළවිරූ පුරුදු බැව් ආදියෙන් ද **අසඞ්ඛාරිකතා ච** අසංස්කාරික බවද **තබ්බිපරියායේන** එසේ කියනලද හේතූන්ට විපරීත කාරණායන් කරණකොටගෙන **සසඞ්ඛාරිකතා ච** සසංස්කාරික බවද **වේදිතබ්බා** දතයුත්තීය. (ආවාසසප්පායාදීහි යන්නෙහි "ආදී" ශබ්දයෙන් උතුසත්ප්‍රාය භෝජනසත්ප්‍රාය සේනාසනසත්ප්‍රාය ආදීය ගැනේ. දානාදීසු යන්නෙහි "ආදී" ශබ්දයෙන් සීල භාවනාදී නවවිධ පුණ්‍ය ක්‍රියා ගැනේ. පරිචයතාදීහි යන්නෙහි "ආදී" ශබ්දයෙන් අත්තසම්මාපණිධි සත්පුරුෂෝපනිශ්‍රය ආදී චක්‍ර සම්පත්තීන් ගැනේ)
**[විභාවනී ටීකා සන්නය 87 පිට]**

කුශල චිත්තයෙහි ලැබියයුතු වූ අසංස්කාරිකභාවයාගේ හේතූන් අතුරෙන් ඇතැම් හේතු කෙනෙක් ක්‍රියාචිත්තයෙහි නොලැබියයුතුය. කවර හේතු කෙනෙක් ලැබියයුතු ද? කවර හේතු කෙනෙක් නොලැබියයුතුද? යනු; කුශලචිත්තයෙහි ලැබියයුතුවූ අසංස්කාරිකභාවයාගේ හේතූන් අතුරෙන් පුබ්බේදානාදීසු කතපරිචයතා යන හේතුව නොලැබිය යුතුය. "ආවාසසප්පායාදිවසේන කායචිත්තානං කල්ලභාවතෝ" යන හේතු මාත්‍රයක් ලැබිය යුත්තේය. **[විභාවනී ටීකා සන්නය 96 පිට]**

**අසඞ්ඛාරිකමේකං සසඞ්ඛාරිකමේක**න්ති එත්ථ සඞ්ඛාරෝති පුබ්බාභිසඞ්ඛාරෝ. සෝ ච දුවිධෝ පයෝගෝ, උපායෝචාති. තත්ථ ආණත්තියාවා අජ්ඣේසනායවා තජ්ජෙත්වා වා ඉදං කරෝහීති පරේහි කතෝ කායවචීපයෝගෝ පයෝගෝනාම. ආණත්තාදිනාපන විනාව කම්මස්ස කරණත්ථං තං තං උපායං පරේ ආචික්ඛන්ති, අකරණේ ආදීනවං කරණේච ආනිසංසං දස්සෙන්ති, කතිකං වා කරොන්ති, දණ්ඩං වා ඨපෙන්ති, සයමේව වා තං තං කාරණං අනුස්සරති, පච්චවෙක්ඛති. ඒවමාදිනා නයේන උපායෝ අනේකවිධෝ. සෝ දුවිධෝපි ඉධ සඞ්ඛාරෝ නාම. සඞ්ඛරෝති අත්තනෝ පකතියා කාතුං අනිච්ඡමානං චිත්තසන්තානං අකාතුං අදත්වා

කරණත්ථාය සංවිදහති තස්මිං තස්මිං කම්මේ පයෝජේතීති කත්වා. යෝ පන පච්චයගණෝ තේන සඞ්ඛාරේන විරහිතෝ හෝති. සෝ අසඞ්ඛාරෝ. යෝ පන තේන සහිතෝ හෝති. සෝ සසඞ්ඛාරෝති. වුත්තඤ්හේතං අට්ඨකථායං

එත්ථච පච්චයගණෝති ආරම්මණාදිකෝ සාධාරණෝ පච්චයගණෝ අට්ඨකථායං වුත්තෝ. අසාධාරණෝ පන කුසලකම්මේසු සප්පුරිසූපනිස්සයාදිකෝ අකුසලකම්මේසු අසප්පුරිසූපනිස්සයාදිකෝ පච්චයගණෝ විසේසෙත්වා යෝජේතුං යුත්තෝ. සෝ පන යද දුවිධේන සඞ්ඛාරේන විනා සයමේව චිත්තං අසංසීදමානං කත්වා උට්ඨාපේති සමුට්ඨාපේති, තද සෝ අසඞ්ඛාරෝ නාම. යදපන තේන විනා සයමේව චිත්තං උට්ඨාපේතුං සමුට්ඨාපේතුං න සක්කෝති, සඞ්ඛාරං සහායං ලභිත්වාව සක්කෝති, තද සෝ සසඞ්ඛාරෝ නාම. ඉති අසඞ්ඛාරෝ සසඞ්ඛාරෝතිච ඉදං පච්චය ගණස්සේව නාමං. න චිත්තස්ස. චිත්තං පන අසඞ්ඛාරේන සුද්ධේන පච්චයගණේන උප්පන්නං අසඞ්ඛාරිකං. සසඞ්ඛාරේන පච්චයගණේන උප්පන්නං සසඞ්ඛාරිකං, උප්පන්නත්ථේ හි අයං **ඉක** පච්චයෝති. යස්මිං සමයේ අකුසලං චිත්තං උප්පන්නං හෝති සෝමනස්සසහගතං දිට්ඨිගතසම්පයුත්තං සසඞ්ඛාරේනාති හි පාළියං වුත්තන්ති. එත්ථච සසඞ්ඛාරේන පච්චයගණේන උප්පන්නං හෝතීති යෝජේතබ්බන්ති. අයමෙත්ථ අසඞ්ඛාරිකසසඞ්ඛාරිකපදේසු පරමත්ථදීපනා.

**ටීකාසු** පන ඉමමත්ථං අසල්ලක්ඛෙත්වා චිත්තමේව අසඞ්ඛාරං සසඞ්ඛාරන්ති ච ගහෙත්වා යං වුත්තං, "නත්ථි සඞ්ඛාරෝ අස්සාති අසඞ්ඛාරං. තදේව අසඞ්ඛාරිකං. සහ සඞ්ඛාරේන වත්තතීති සසඞ්ඛාරං. සසඞ්ඛාරමේව සසඞ්ඛාරිකන්ති ච. සෝ යස්ස නත්ථි. තං අසඞ්ඛාරං. තදේව අසඞ්ඛාරිකං. සඞ්ඛාරේන සහිතං සසඞ්ඛාරිකන්ති ච". සබ්බමේතං න යුජ්ජතියේව.

යඤ්ච **විභාවනියං** සඞ්ඛරෝති චිත්තං තික්ඛභාවසඞ්ඛාතමණ්ඩනවිසේසේන සජ්ජේති. සඞ්ඛරීයතිවා තං ඒතේන යථාවුත්තනයේන සජ්ජීයතීති සඞ්ඛාරෝති වුත්තං. තංපි න සුන්දරං. එවඤ්හි සති සසඞ්ඛාරිකපි චිත්තං තික්ඛං නාම සියාති.

යඤ්ච **තත්ථ** "සෝ පන අත්තනෝ පුබ්බභාගප්පවත්තේ චිත්තසන්තානේවේව පරසන්තානේව පවත්තතීති තං නිබ්බත්තිතෝ චිත්තස්ස තික්ඛභාව සඞ්ඛාතෝ විසේසෝව ඉධ සඞ්ඛාරෝති" වුත්තං. තංපි අසඞ්ඛාරික සසඞ්ඛාරිකපදනං වචනත්ථේසු විරජ්ඣිත්වා තදනුරූපස්ස සඞ්ඛාරස්ස පරිකප්පනාවසේන වුත්තත්තා න යුත්තමේව.

ඒතේන

පුබ්බප්පයෝගසම්භූතෝ, විසේසෝ චිත්තසම්භවී;
සඞ්ඛාරෝ තං වසේනෙත්ථ, හොත්‍යාසඞ්ඛාරිකාදිතාති.

සාධකගාථාපි පටික්ඛිත්තා හෝතීති.

යඤ්ච **තත්ථ** "අථවා, සසඞ්ඛාරිකං අසඞ්ඛාරිකන්ති චේ තං කේවලං සඞ්ඛාරස්ස භාවාභාවං සන්ධාය වුත්තං. න තස්ස සහ පවත්තිසබ්භා වා භාවතෝති. භින්නසන්තානප්පවත්තිනෝපි සඞ්ඛාරස්ස ඉධමත්ථිතාය තං වසේන නිබ්බත්තං චිත්තං සඞ්ඛාරෝ අස්ස අත්ථීති සසඞ්ඛාරිකං. සලෝමකෝ සපක්ඛකෝත්‍යාදීසුවිය සහ සද්දස්ස විජ්ජමානත්ථපරිදීපනතෝ. තබ්බිපරීතම් පන තදභාවතෝ වුත්තනයේන අසඞ්ඛාරික"න්ති වුත්තං. තංපි පාළිඅට්ඨකථාසිද්ධං උජුං විසදං අත්ථං මුඤ්චිත්වා අත්තනෝ පරිකප්පනා වසේන වුත්තත්තා න ගහේතබ්බමේව.

එත්ථච අත්තනෝ ඉච්ඡාය විනා පරේසං ආණත්තියා වා අජ්ඣෙසනායවා යාචනායවා පවත්තිතං චිත්තං පයෝගසමුට්ඨිතං නාම. තථා අත්තනෝ ඉච්ඡාය විනා පරේසං භයේන වා ලජ්ජාය වා ගාරවේන වා කථිකාය වා දණ්ඩභයේන වා පවත්තිතං උපායසමුට්ඨිතං නාම. සයමේව වා අත්තනෝ ලීනං චිත්තං ඤත්වා තේන තේන උපායේන අත්තානං ඕවදිත්වා වා තං තං උපායං අනුස්සරිත්වා වා පවත්තිතං චිත්තං උපායසමුට්ඨිතං නාම. ඉදඤ්ච නයදස්සනමේවාති.

**[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 22 යටතේ)]**

සුට්ඨු කරෝති, පකතිපච්චයේන අනිප්ඵන්නං කම්මං අත්තනෝ බලේන නිප්ඵාදේතීති සඞ්ඛාරෝ. "පුබ්බාභිසඞ්ඛාරෝ"ති පුබ්බභාගේ අභිසඞ්ඛාරෝ. පයෝජේති නියෝජේතීති පයෝගෝ. උපේති එලසඞ්ඛාතෝ අත්ථෝ ඒතේනාති උපායෝ. "ආණත්තියා වා"ති පේසනාය වා. "අජ්ඣෙසනේන වා"ති ආයාචනේන වා. "තජ්ජෙත්වා වා"ති භයං දස්සෙත්වා වා. "තං තං උපායං පරේ ආචික්ඛ"න්ති. කථං ආචික්ඛන්තීති ආහ "අකරණේ"ති ආදිං. "තස්මිං තස්මිං කම්මේ පයෝජේතීති කත්වා ඉධ සඞ්ඛාරෝ නාමා"ති යොජනා. "පච්චයගණෝ"ති පකතිපච්චයගණෝ. "තේනා"ති සඞ්ඛාරේන. "සාධාරණෝ"ති කුසලාකුසලාබ්‍යාකතානං සාධාරණෝ. "දුවිධේන සඞ්ඛාරේනා"ති පයෝගේන වා උපායේන වා. "යෝ පන තේන සහිතෝ"ති ආදිනා පුබ්බේ වුත්තමේවත්ථං පකාරන්තරේන පාකටං කාතුං "සෝ පන යද"ති ආදි වුත්තං. "ඉතී"ති ආදි ලද්ධගුණවචනං. "පච්චයගණස්සේව නාම"න්ති පච්චයගණස්සේව විසේසනාමන්ති වුත්තං හෝති. උප්පන්නත්ථේ ඉක-පච්චයෝති කථං විඤ්ඤායතීති ආහ "යස්මිං සමයේ"ති ආදිං. "පාළිය"න්ති ධම්මසඞ්ගණිපාළියං. "අසල්ලක්ඛෙත්වා"ති අචින්තෙත්වා ඉච්චේවත්ථෝ. සබ්බමේතං න යුජ්ජතියේව. කස්මා, පාළිඅට්ඨකථාහි අසංසන්දනත්තා, අත්ථයුත්තිබ්‍යඤ්ජනයුත්තීනඤ්ච අවිසදත්තාති අධිප්පායෝ. "ත"න්ති චිත්තං. "ඒතේනා"ති පුබ්බප්පයෝගේන. "යථාවුත්තනයේනා"ති තික්ඛභාවසඞ්ඛාතමණ්ඩනවිසේසේන. "සෝ පනා"ති පුබ්බප්පයෝගෝ පන. "ඉතී"ති තස්මා. "තං නිබ්බත්තිතෝ"ති තේන පුබ්බප්පයෝගේන නිබ්බත්තිතෝ. "විරජ්ඣිත්වා"ති අයුත්තපක්ඛේ පතිත්වා. ඒතේන පටික්ඛිත්තා හෝතීති සම්බන්ධෝ. ගාථායං. "චිත්තසම්භවී"ති චිත්තස්මිං සම්භූතෝ. විසේසෝ සඞ්ඛාරෝ නාමාති යෝජනා. සලෝමකෝ, සපක්ඛකෝත්‍යාදීසු වියාති වුත්තං. සාසවා ධම්මා, සාරම්මණා ධම්මාත්‍යාදීසු වියාති පන වුත්තේ යුත්තතරං. "පාළිඅට්ඨකථා සිද්ධ"න්ති පාළිඅට්ඨකථාතෝ සිද්ධං. අපිච යත්ථ විසුද්ධිමග්ගාදීසු අසඞ්ඛාරං චිත්තං, සසඞ්ඛාරං චිත්තන්ති ආගතං. තත්ථ අයං පච්ඡිමනයෝ යුත්තෝ. උපායසමුට්ඨිතස්ස අනේකසතසම්භවතෝ "ඉදඤ්ච නයදස්සනමේවා"ති වුත්තං.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 22 යටතේ)]**

**අසඞ්ඛාරමේකං සසඞ්ඛාරමෙකං ඉති එත්ථ** අසඞ්ඛාරමෙකං සසඞ්ඛාරමේකං යන මෙහි **සඞ්ඛාරෝ ඉති** සඞ්ඛාරෝ යනු **පුබ්බාතිසඞ්ඛාරෝ** පූර්වභාග අභිසංස්කාරයයි "සුට්ඨු කරෝති, පකති පච්චයේන අභිනිප්ඵන්නං කම්මං අත්තනෝ බලෙන නිප්ඵාදේතීති සඞ්ඛාරෝ" **සෝ ච** ඒ සංස්කාර තෙමේද **පයෝගෝ ච උපායෝ ච ඉති** ප්‍රයෝගය ද උපාය යැයිද **දුවිධෝ** දෙවැදෑරුම් වෙත් **තත්ථ** එහි **ආණත්තියා වා** අණ කිරීම නොහොත් යැවීමෙන් හෝ **අජ්ඣෙසනාය වා** ආයාචනයෙන් හෝ **තජ්ජෙත්වා වා** තර්ජනය කොට නොහොත් බිය ගන්නවා හෝ **ඉදං කරෝහි ඉති** මෙය කරව යැයි **පරේහි** අන්‍යයන් විසින් **කතෝ** කරනලද **කායවචීපයෝගෝ** කාය වාග් ප්‍රයෝගය **පයෝගෝ නාම** ප්‍රයෝගය නම් වේ **පන** ප්‍රයෝග පක්‍ෂයෙන් අන්‍යය වූ

උපාය පක්‍ෂය දක්වමි **ආණත්තාදිනා විනාව** අණ කිරීම් ආදිය නොමැතිව **කම්මස්ස කරණත්ථං** ක්‍රියාව කිරීම පිණිස **තං තං උපායං** ඒ ඒ උපාය **පරේ** අන්‍යයන් **ආචික්ඛන්ති** විමසති **අකරණේ ආදීනවං ච** නොකිරීමෙහි ආදීනව ද **කරණේ ආනිසංසං** කිරීමෙහි අනුසස් **දස්සෙන්ති** දක්වත් **කතිකං වා කරොන්ති** කතාකාවත් හෝ කරත් **දණ්ඩං වා ඨපෙන්ති** දඩයක් හෝ තබත් **සයමේව වා** තෙමේම හෝ **තං තං කාරණං** ඒ ඒ කරුණු **අනුස්සරති** සිහි කරයි **පච්චවෙක්ඛති** ප්‍රත්‍යවේක්‍ෂා කරයි **ඒවමාදිනා නයේන** මේ ආදී ක්‍රමයෙන් **උපායෝ** උපාය තෙම **අනේකවිධෝ** නොයෙක් වැදෑරුම් වේ **සෝ දුවිධෝපි** ඒ දෙවැදෑරුම් වූ පයෝග උපාය යන දෙදෙන **ඉධ** මෙහි **සඞ්ඛාරෝ නාම** සංස්කාර නම් **සඞ්ඛාරෝ ඉති** සංස්කාර යනු **අත්තනෝ පකතියා කාතුං** තමාගේ ප්‍රකෘතියෙන් කරන්නට **අනිච්ඡමානං චිත්තසන්තානං** නොකැමැතිවන චිත්ත සන්තානයට **අකාතුං අදත්‍වා** නොකරන්නට නොදී **තස්මිං තස්මිං කම්මේ** ඒ ඒ කර්මයෙහි **පයෝජේති** යොදවයි **ඉති කත්‍වා** මෙසේ කොට **කරණත්ථාය** කිරීම පිණිස **සංවිදහති** සංවිදනය කරයි **යෝ පන පච්චයගණෝ** යම් ප්‍රත්‍යයගණයක් වේද (**සෝ පච්චයගණෝ** ඒ ප්‍රත්‍යයගණය තෙමේ) **තේන සඞ්ඛාරේන** ඒ සංස්කාරයෙන් **විරහිතෝ හෝති** විරහිත වෙයි **සෝ අසඞ්ඛාරෝ** ඒ ප්‍රත්‍යයගණය තෙමේ අසංස්කාරය **යෝ පන (පච්චයගණෝ)** යම් ප්‍රත්‍යයගණයක් තෙමේ **තේන (සඞ්ඛාරේන)** ඒ සංස්කාරයෙන් **සහිතෝ හෝති** සහිත වූයේ වෙයි ද **සෝ (පච්චයගණෝ)** ඒ ප්‍රත්‍යයගණය තෙමේ **සසඞ්ඛාරෝ** සසංස්කාරය **ඉති (හෝති)** වෙයි **අට්ඨකථායං** අර්ථකථායෙහි **ඒතං හි** මෙය වනාහි **වුත්තං** දේශනා කරනලදි.

**එත්ථ ච** මෙහි ද **පච්චයගණෝ ඉති** ප්‍රත්‍යයගණය යනු **ආරම්මණාදිකෝ** ආරම්මණාදී වූ **සාධාරණෝ** කුසල අකුසල අව්‍යාකත ධර්මයන්ට සාධාරණ වූ **පච්චයගණෝ** ප්‍රත්‍යයගණය **අට්ඨකථායං** අර්ථකථායෙහි **වුත්තෝ** දේශනා කරනලදි **පන** එසේ දේශනා කළේ නමුදු **අසාධාරණෝ (පච්චයගණෝ)** කුසල අකුසල අව්‍යාකත ධර්මයන්ට අසාධාරණ වූ ප්‍රත්‍යයගණය තෙම **කුසලකම්මේසු** කුසල කර්මයන්හි **සප්පුරිසූපනිස්සයාදිකෝ** සත්පුරුෂ උපනිශ්‍රය ආදී වූද **අකුසලකම්මේසු** අකුසල කර්මයන්හි **අසප්පුරිසූපනිස්සයාදිකෝ** අසත්පුරුෂ උපනිශ්‍රය ආදී වශයෙන් **පච්චයගණෝ** ප්‍රත්‍යයගණය **විසේසෙත්‍වා** විශේෂකොට **යෝජේතුං** යොදන්නට **යුත්තෝ** සුදුසුය **සෝ පන (පච්චයගණෝ)** ඒ ප්‍රත්‍යයගණය වනාහි **යදා** යම්කලෙක **දුවිධේන සඞ්ඛාරේන විනා** පයෝගය උපාය යන දෙවැදෑරුම් සංස්කාරය නොමැතිව **සයමේව** ඒ ප්‍රත්‍යයගණයම **අසංසීදමානං චිත්තං කත්‍වා** පසු නොබසින සිතක් කොට **උපට්ඨාපේති** පිහිටුවවයි **සමුට්ඨාපේති** යූ සේයි **තදා** එකල්හි **සෝ (පච්චයගණෝ)** ඒ ප්‍රත්‍යයගණය තෙමේ **අසඞ්ඛාරෝ නාම** අසංස්කාර නම් **යදා පන** යම්කලෙක වනාහි **තේන විනා** පයෝගය උපාය යන දෙවැදෑරුම් සංස්කාරය නොමැතිව **සයමේව** ඒ ප්‍රත්‍යයගණයම **(අසංසීදමානං) චිත්තං** පසු නොබසින සිතක් කොට **උපට්ඨාපේතුං සමුට්ඨාපේතුං** පිහිටුවන්නට **න සක්කෝති** නොහැකිවෙයි ද **සඞ්ඛාරං (සඞ්ඛාරානං)** සංස්කාරයන්ගේ **සහායං ලභිත්‍වාව** උපකාරය ලැබම (**උපට්ඨාපේතුං සමුට්ඨාපේතුං** පිහිටුවන්නට) **සක්කෝති** හැකි වෙයි **තදා** එකල්හි **සෝ (පච්චයගණෝ)** ඒ ප්‍රත්‍යයගණය **සසඞ්ඛාරෝ නාම** සසංස්කාර නම් **ඉති** මෙසේ **අසඞ්ඛාරෝ ච සසඞ්ඛාරෝ ච ඉති** අසංස්කාරය ද සසංස්කාරය යනු ද **පච්චයගණස්ස ඒව** ප්‍රත්‍යයගණයටම **ඉදං නාමං** මේ විශේෂ නාමයක් වෙයි **චිත්තස්ස න (නාමං)** චිත්තයට නමක් නොවෙයි **චිත්තං පන** චිත්තය වනාහි **අසඞ්ඛාරේන සුද්ධේන පච්චයගණේන** අසංස්කාර වූ පිරිසිදු ප්‍රත්‍යයගණයෙන් **උප්පන්නං (චිත්තං)** උපදිනලදද චිත්තය **අසඞ්ඛාරිකං (හෝති)** අසංස්කාරික වෙයි **සසඞ්ඛාරේන**

**පච්චයගණේන** සසංස්කාර වූ ප්‍රත්‍යයගණයෙන් **උප්පන්නං (චිත්තං)** උපදිනලද චිත්තය **සසඞ්ඛාරිකං (හෝති)** සසංස්කාරික වෙයි **අයං හි ඉක පච්චයෝ** මේ ඉක ප්‍රත්‍යය වනාහි **උප්පන්නත්ථේ** උපදින අර්ථයෙහි **ඉති (හෝති)** වෙයි (ආචාර්‍ය්‍යයින් මේ ඉක ප්‍රත්‍යය උපදින අර්ථයෙහි යැයි කෙසේ හැගේ ද? යන මෙසේ චෝද්‍යයක් ඇති කල්හි ඊට පරිහාර පිණිස "යස්මිං සමයේ" යනාදිය කීහ) **යස්මිං සමයේ අකුසලං චිත්තං උප්පන්නං හෝති සෝමනස්සසහගතං දිට්ඨිගතසම්පයුත්තං අසඞ්ඛාරේන ඉති** යනුවෙන් **පාළියං හි** දම්සඟුණු පෙළෙහි වනාහි **වුත්තං** දේශනා කරනලදි **එත්ථ ච** මෙහි ද **සසඞ්ඛාරේන පච්චයගණේන උප්පන්නං හෝති ඉති** යනුවෙන් **යෝජේතබ්බං** යෙදියයුතුයි **එත්ථ** මෙහි **අයං** මේ **අසඞ්ඛාරිකසසඞ්ඛාරිකපදේසු** අසංස්කාරික සසංස්කාරික පදයන්හි **පරමත්ථදීපනා** පරමත්ථදීපනියයි෴

**ටීකාසු පන** ටීකාවන්හි වනාහි **ඉමං අත්ථං** මේ අර්ථය **අසල්ලක්ඛෙත්වා** නොසලකා නොහොත් නොසිතා **චිත්තමේව** සිතම **අසඞ්ඛාරං සසඞ්ඛාරං ච ඉති** අසංස්කාර ද සසංස්කාර ද යැයි **ගහෙත්වා** ගෙන "නත්ථි සඞ්ඛාරෝ අස්සාති අසඞ්ඛාරං. තදේව අසඞ්ඛාරිකං. සහ සඞ්ඛාරේන වත්තතීති සසඞ්ඛාරං. සසඞ්ඛාරමේව සසඞ්ඛාරිකන්ති ච. සෝ යස්ස නත්ථි. තං අසඞ්ඛාරං. තදේව අසඞ්ඛාරිකං. සඞ්ඛාරේන සහිතං සසඞ්ඛාරිකන්ති ච" **යං වුත්තං** යමක් කියනලදි ද **ඒතං සබ්බං** ඒ සියල්ල **න යුජ්ජතියේව** නුසුදුසුමය෴

**විභාවනියං** විභාවනි ටීකායෙහි **චිත්තං** (පසුව හටගන්නා වූ) චිත්තය **තික්ඛභාවසඞ්ඛාතමණ්ඩනවිසේසේන** තියුණු බව යැයි කියනලද සැරසීම් විශේෂයෙන් **සඞ්ඛරෝති (සජ්ජේති)** සදන්නේ වේද **වා** නොහොත් **ඒතේන** ඒ පූර්ව ප්‍රයෝගය කරණකොටගෙන **තං චිත්තං** ඒ (පසුව හටගන්නා) චිත්තය **යථා වුත්තනයේන** කියනලද ක්‍රමයෙන් **සඞ්ඛරීයති (සජ්ජීයති)** සදනු ලැබේ ඉති යැයි යඤ්ච වුත්තං යමක් කියනලදි ද **තම්පි** ඒ කීම ද **න සුන්දරං** යහපත් නොවේ **ඒවඤ්හි සති** මෙසේ කීවූ කල්හි **සසඞ්ඛාරිකචිත්තං අපි** සසංස්කාරික සිත ද **තික්ඛං නාම සියා** තියුණු නම් වන්නේය෴

**තත්ථ** එහි **සෝ පන (පුබ්බපයෝගෝ)** ඒ පූර්ව ප්‍රයෝගය වනාහි **අත්තනෝ** තමාගේ **පුබ්බභාගප්පවත්තේ** පූර්ව භාගයෙහි පැවැත්තාවූ **චිත්තසන්තානේ චේව** චිත්තපරම්පරායෙහි ද **පරසන්තානේ ච** අනුන්ගේ සන්තානයෙහි ද **යස්මා** යම්හෙයකින් **පවත්තති** පවත්නේ ද **ඉති (තස්මා) තං නිබ්බත්තිතෝ** ඒ පූර්ව ප්‍රයෝගය විසින් උපදවන ලද්ද වූ **චිත්තස්ස** චිත්තයාගේ **තික්ඛභාවසඞ්ඛාතෝ** තියුණු බව යැයි කියනලද **විසේසෝව** වෙනසම **ඉධ** මේ අසඞ්ඛාරික සසඞ්ඛාරික යන පද සමුදයෙහි **සඞ්ඛාරෝ** සඞ්ඛාර නම් වේ යයි **යඤ්ච වුත්තං** යමක් කියනලදි ද **තම්පි** ඒ කීම ද **අසඞ්ඛාරිකසසඞ්ඛාරිකපදානං** අසංස්කාරික සසංස්කාරික පදයන්ගේ **වචනත්ථේසු** වචනාර්ථයන්හි **විරජ්ඣිත්වා** වරදවා නොහොත් අයුතු පක්ෂයෙහි සිට **තදනුරූපස්ස සඞ්ඛාරස්ස** එයට අනුරූප වූ සංස්කාරයාගේ **පරිකප්පනවසේන** කල්පනා කිරීම් වශයෙන් **වුත්තත්තා** කියනලද බැවින් **න යුත්තමේව** යුතු නොවේමය෴

ඒතේන එකරුණින් පුබ්බප්පයෝගසම්භූතෝ -පෙ- අසඞ්ඛාරිකාදිතා ඉති පුබ්බයෝග -පෙ- අසඞ්ඛාරිකාදිතා යන සාධකගාථාපි සාධක ගාථාව ද පටික්ඛිත්තා හෝති ප්‍රතික්ෂේප කරනලද්දේ වෙයි෴

තත්ථ විභාවනි ටීකායෙහි **අථවා** නොහොත් **කේවලං** හුදෙක් **සසඞ්ඛාරිකමසඞ්ඛාරිකන්ති ඒතං පදද්වයං** සසඞ්ඛාරිකං අසඞ්ඛාරිකං යන මේ දෙපදය **සඞ්ඛාරස්ස** සංස්කාරයයි කියනලද පූර්ව ප්‍රයෝගයාගේ **භාවාභාව** විද්‍යමාන බව හා අවිද්‍යමාන බව **සන්ධාය** සඳහා **වුත්තං** කියනලදි **තස්ස** ඒ පූර්ව ප්‍රයෝගයාගේ **සහපවත්තිසබ්භාවාභාවතෝ** සිත හා සමඟ හටගැනීම ඇති නැති බව **සන්ධාය** සඳහා **න වුත්තං** නොකියනලදි ("අන්තරායේ අසේසතෝ" යනාදියෙහි මෙන් මෙහි තෝ-ප්‍රත්‍යය තෙමේ ද්‍විතියාවිභක්ත්‍යාර්ථයෙහි වැටේ) **භින්නසන්තානපවත්තිනෝපි** වෙනස් වූ සතන්හී හටගැන්ම ඇත්තාවූද **සඞ්ඛාරස්ස** සංස්කාරයාගේ **ඉධමත්ථිතාය** මේ පච්ඡිම චිත්තයෙහි ඇති බැවින් **තං වසේන** ඒ පූර්ව ප්‍රයෝගයයි කියනලද මණ්ඩන විශේෂයාගේ වශයෙන් **නිබ්බත්තං** හටගත්තා වූ **චිත්තං** සිත් තෙමේ (සසඞ්ඛාරිකං යන්න හා සම්බන්ධ කටයුතුයි) **යස්ස චිත්තස්ස** යම් චිත්තයකට **සඞ්ඛාරෝ** පූර්ව ප්‍රයෝග තෙමේ **අත්ථි** ඇත්තේවේද **ඉති (තස්මා) තං චිත්තං** ඒ සිත් තෙමේ **සසඞ්ඛාරිකං** සසඞ්ඛාරික නම් වේ යැයි **යඤ්ච වුත්තං** යමක් කියනලදි ද **තම්පි** ඒ කීම ද **පාළිඅට්ඨකථාසිද්ධං උජුං විසදං අත්ථං** පාළි අර්ථකථාවෙන් සිදු වූ ඍජු පැහැදිලි අර්ථය **මුඤ්චිත්වා** හැර **අත්තනෝ** තමාගේ **පරිකප්පනාවසේන** කල්පනා කිරීම් වශයෙන් **වුත්තත්තා** කියනලද බැවින් **න ගහේතබ්බමේව** නොගතයුතුමය. ෴

**එත්ථ ච** මෙහි ද **අත්තනෝ** තමාගේ **ඉච්ඡාය විනා** කැමැත්ත නොමැතිව **පරේසං** අනුන්ගේ **ආණත්තියා වා** අණ කිරීමෙන් හෝ **අජ්ඣෙසනාය වා** ආයාචනයෙන් හෝ **යාචනාය වා** ඉල්ලීමෙන් හෝ **පවත්තිතං චිත්තං** පවතිනලද සිත **පයෝගසමුට්ඨිතං නාම** ප්‍රයෝගයෙන් හටගන්නා ලද්දේ නම් වෙයි **තථා** එසේ **අත්තනෝ** තමාගේ **ඉච්ඡාය විනා** කැමැත්ත නැතිව **පරේසං** අනුන්ට **භයේන වා** බියෙන් හෝ **ලජ්ජාය වා** ලැජ්ජාවෙන් හෝ **ගාරවේන වා** ගෞරවයෙන් හෝ **කථිකාය වා** කථාවකින් හෝ **දණ්ඩභයේන වා** දඬුවමට බියෙන් හෝ **පවත්තිතං (චිත්තං)** පවතිනලද සිත **උපායසමුට්ඨිතං නාම** උපායෙන් හටගන්නා ලද්දේ නම් වෙයි **වා** නොහොත් **සයමේව වා** තෙමේම හෝ **අත්තනෝ** තමාගේ **ලීනං චිත්තං ඤත්වා** හැකිලුනු සිත දැන **තේන තේන උපායේන** ඒ ඒ උපායෙන් **අත්තානං** තමාට **ඕවදිත්වා වා** අවවාද දී හෝ **තං තං උපායං** ඒ ඒ උපාය **අනුස්සරිත්වා වා** සිහි කොට හෝ **පවත්තිතං චිත්තං** පවතිනලද සිත **උපායසමුට්ඨිතං නාම** උපායෙන් හටගන්නා ලද්දේ නම් වෙයි **ඉදඤ්ච** මෙය ද **නයදස්සනමේව** නය දැක්වීමක්ම **ඉති (හෝති)** වෙයි. ෴ **[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

අසඞ්ඛාරිකකම්මජනිතප්පටිසන්ධිකතා, කල්ලතාය චිත්තතා, ඛන්ති බහුලතා, පුරිසකාරේසු දිට්ඨානිසංසතා, කම්මප්පසුතතා, උතුභෝජනාදි සප්පාය ලාභෝති ඉදං අසඞ්ඛාරිකකාරණං. තත්ථ ඛන්තිබහුලතාති සීතුණ්හාදීනං ඛමනබහුලතා. පුරිසකාරේසූති පුරිසේහි කත්තබ්බේසු කම්මේසු. කම්මප්පසුතතාති කම්මේසු චිණ්ණවසිතා. තබ්බිපරී තේන සසඞ්ඛාරිකකාරණං වේදිතබ්බං.

**[පරමත්ථදීපනී (ෂට්ඨසඞ්ගායනා අංක 24 යටතේ)]**

**අසඞ්ඛාරිකකම්මජනිතප්පටිසන්ධිකතා** අසඞ්ඛාරික කර්මයෙන් උපන් ප්‍රතිසන්ධියක් ඇති බව **කල්ලතාය චිත්තතා** (කෙලෙස් පීඩා නැති) නිරෝගී සිතක් ඇති බව **ඛන්ති බහුලතා** ශීත උෂ්ණාදිය ඉවසන බව **පුරිසකාරේසු දිට්ඨානිසංසතා**

පුරුෂයන් විසින් කළයුතු ක්‍රියාවන්හි දකිනලද ආනිශංස ඇති බව **කම්මප්පසුතතා** ක්‍රියාවන්හි මනා පළපුරුද්ද ඇති බව **උතුභෝජනාදි සප්පාය ලාභෝ ඉති ඉදං** සත්ප්‍රාය ඍතු භෝජනාදිය ලැබීම යනාදී මෙය **අසඞ්ඛාරිකකාරණං** අසංස්කාරික බවට කරුණුයි **තබ්බිපරිතේන** එයට විරුද්ධ ආකාරයෙන් **සසඞ්ඛාරිකකාරණං** සසංස්කාරික බවට කරුණු යැයි **වේදිතබ්බං** දතයුතුයි ⁂ **[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

ඉමානි චිත්තානි අත්තනෝ පකති පච්චයගණසමායෝගේ සති නුප්පජ්ජන්තීති නත්ථි. තස්මා අසඞ්ඛාරිකානේවාති වදන්ති. මූලටීකායං පන විපාකුද්ධාරේ අහේතුකවිපාකානං අපරිබ්‍යත්තකිච්චත්තා සසඞ්ඛාරික කම්ම විරුද්ධෝ අසඞ්ඛාරිකභාවෝපි නත්ථි. අසඞ්ඛාරිකකම්මවිරුද්ධෝ සසඞ්ඛාරිකභාවෝපි නත්ථි. තස්මා තේසං උභයකම්මේනපි උප්පත්ති ථේරේන අනුඤ්ඤාතාති වුත්තං.

ඒතේන තිණ්ණං ක්‍රියචිත්තානංපි තදුභයභාවාභාවෝ වුත්තෝ හෝති. තානිපිහි අපරිබ්‍යත්තකිච්චානියේවාති. අථවා. රූපදස්සන සද්දස්සවනාදීනි සත්තා කදචි අත්තනෝ ඉච්ඡාය කරොන්ති. කදචි පරේහි උස්සාහිතා කරොන්තීති පච්චක්ඛතෝව සිද්ධමේතං. තත්ථ යද අත්තනෝ ඉච්ඡාය කරොන්ති. තද පඤ්චද්වාරාවජ්ජනාදීනි සබ්බානි වීථිචිත්තානි අසඞ්ඛාරිකානි නාම හොන්ති. යද පරේහි උස්සාහිතා කරොන්ති. තද සසඞ්ඛාරිකානි නාම හොන්ති. ද්වාර විමුත්තේසු පන ද්වීසු උපෙක්ඛාසන්තීරණේසු අට්ඨමහාවිපාකේසු විය වත්තබ්බෝ. ඉති සබ්බානි අහේතුකචිත්තානි තේන පරියායේන සඞ්ඛාරභේදේන පච්චේකං භින්නානිඒව හොන්ති. ඒවං සන්තේපි අපරිබ්‍යත්තකිච්චත්තායේව තේසං සඞ්ඛාරභේදෝ පාළියං න වුත්තෝති වේදිතබ්බෝ.

**[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 37 යටතේ)]**

සඞ්ඛාර විචාරණායං "විපාකුද්ධාරේ"ති අට්ඨසාලිනියං විපාකුද්ධාරකථායං. "උභයකම්මේනපී"ති සසඞ්ඛාරිකකම්මේනපි, අසඞ්ඛාරිකකම්මේනපි. "ථේරේනා"ති මහාදත්තත්ථේරේන. "තදුභයභාවාභාවෝ"ති සසඞ්ඛාරික-අසඞ්ඛාරිකභාවානං අභාවෝ. "තානිපි හි අපරිබ්‍යත්තකිච්චානියේවා"ති එත්ථ ආවජ්ජනද්වයං ජවනානං පුරේචාරිකකිච්චත්තා අපරිබ්‍යත්තකිච්චං හෝතු. හසිතුප්පාදචිත්තං පන ජවනකිච්චත්තා කථං අපරිබ්‍යත්තකිච්චං භවෙයයාති. තම්පි සබ්බඤ්ඤුතඤ්ඤාණාදීනං අනුචාරිකමත්තත්තා අපරිබ්‍යත්තකිච්චං නාම හෝතීති. "අට්ඨමහාවිපාකේසු විය වත්තබ්බෝ"ති මහාවිපාකානං සසඞ්ඛාරිකා-සඞ්ඛාරිකභාවෝ පුරිමභවේ මරණාසන්නකාලේ ආරම්මණානං පයෝගේන සහ වා විනා වා උපට්ඨානං පටිච්ච වුත්තෝ, තථා වත්තබ්බෝති අධිප්පායෝ.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 37 යටතේ)]**

**ඉමානි චිත්තානි** මේ චිත්තයෝ **පකති පච්චයගණසමායෝගේ සති** (ආරම්මණාදී) ප්‍රකෘති ප්‍රත්‍යයගණය හා යෙදුනු කල්හි **නුපජ්ජන්ති නත්ථි** නූපදින්නේ නොවෙයි **තස්මා** එහෙයින් **අසඞ්ඛාරිකානේව ඉති** අසංස්කාරිකයෝම යැයි **වදන්ති** කියත් **මූලටීකායං පන** දම්සඟුණු මූලටීකායෙහි වනාහි **විපාකුද්ධාරේ** විපාක සිත් උදුරා දක්වන තැන්හි **අහේතුකවිපාකානං** අහේතුක විපාකයන්ගේ **අපරිබ්‍යත්තකිච්චත්තා** ව්‍යාපාර නොමැති කෘත්‍යය ඇති බැවින් **සසඞ්ඛාරිකකම්මවිරුද්ධෝ** සසංස්කාරික කර්මයට විරුද්ධ වූ **අසඞ්ඛාරිකභාවෝපි** අසංස්කාරික භාවයක් ද **නත්ථි** නැත **අසඞ්ඛාරිකකම්මවිරුද්ධෝ** අසංස්කාරික කර්මයට විරුද්ධ වූ **සසඞ්ඛාරිකභාවෝපි** සසංස්කාරික භාවයක් ද **නත්ථි** නැත **තස්මා** එහෙයින් **තේසං** ඒ අහේතුක විපාක චිත්තයන්ගේ **උප්පත්ති** ඉපදීම **උභයකම්මේනපි**

අසංස්කාරික සසංස්කාරික කර්මයෙන්ම **අනුකද්කදතාති** අනුදැන වදරණ ලදැයි **ථේරේන වුත්තං** මහාදත්ත තෙරුන් විසින් කියනලදි.

**ඒතේන** ඒ ක්‍රමයෙන් **තිණ්ණං ක්‍රියාචිත්තානං අපි** ක්‍රියා චිත්තයෝ තිදෙනාගේ ද **තදුභයභාවාභාවෝ** අසංස්කාරික සසංස්කාරික භාවය වීම නොවීම **වුත්තෝ හෝති** කියන ලද්දේ වෙයි **හි (සච්චං)** ඒ කීම සැබෑවකි **තානිපි** ඒ ක්‍රියා චිත්තයෝ තිදෙන ද **අපරිබ්‍යත්තකිච්චානියේව ඉති** ව්‍යාපාර නොමැති කෘත්‍යය ඇති බැවින්ම (**තදුභයභාවාභාවෝ** අසංස්කාරික සසංස්කාරික භාවය වීම නොවීම **වුත්තෝ හෝති** කියන ලද්දේ වෙයි) (මෙහි ක්‍රියාචිත්තයාගේ ව්‍යාපාර රහිත බව කවර නිදර්ශණයකින් සමර්ථනය කරන්නේ දැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "එත්‍ථ අවජ්ජනද්වයං -පෙ- නාම හෝතීති" යන වාක්‍යය කියනලදි)

**එත්‍ථ** මෙහි **ආවජ්ජනද්වයං** ආවර්ජන සිත් දෙදෙන **ජවනානං** ජවනයන්ට **පුරේචාරිකකිච්චත්තා** පෙරටුව හැසිරෙන කෘත්‍යය ඇති බැවින් **අපරිබ්‍යත්තකිච්චං** ව්‍යාපාර රහිත කෘත්‍යය **හෝතු** ඇත්තේ වේවා **හසිතුප්පාදචිත්තං පන** හසිතුප්පාද චිත්තය වනාහි **ජවනකිච්චත්තා** ජවන කෘත්‍යය ඇති බැවින් **කථං** කෙසේ **අපරිබ්‍යත්තකිච්චං භවෙය්‍ය ඉති?** ව්‍යාපාර රහිත කෘත්‍යය ඇත්තේ වන්නේද යත්? **තම්පි** ඒ හසිතුප්පාද චිත්තය ද **සබ්බඤ්ඤුතඤාණාදීනං** සර්වඥතා ඤාණාදීන්ට **අනුචාරිකමත්තත්තා** අනුව හැසිරෙන මාත්‍ර ඇති බැවින් **අපරිබ්‍යත්තකිච්චං නාම** හෝති ව්‍යාපාර රහිත කෘත්‍යය ඇත්තේ නම් වෙයි.

**අථවා** නොහොත් **සත්තා** සත්වයෝ **රූපදස්සනසද්දසවනාදීනි** රූප දර්ශන ශබ්ද ශ්‍රවණ ආදීය **අත්තනෝ** තමාගේ **ඉච්ඡාය** කැමැත්තෙන් නොහොත් කැමැත්තට **කරොන්ති** කරත් කදාචි කිසිකලෙක **පරේහි** අන්‍යයන් විසින් **උස්සාහිතා (සත්තා)** උත්සාහ කරන ලද්දාහු සත්වයෝ **කරොන්ති ඉති** කරත් යැයි **පච්චක්ඛතෝව** ප්‍රත්‍යක්ෂ වශයෙන්ම **ඒතං සිද්ධං** මෙය සිද්ධය **තත්‍ථ** ඒ ආකාර දෙක අතරින් **යදා** යම්කලෙක **අත්තනෝ** තමාගේ **ඉච්ඡාය කරොන්ති** කැමැත්තෙන් නොහොත් කැමැත්තට කරත් ද **තදා** එකල්හි **පඤ්චද්වාරාවජ්ජනාදීනි** පඤ්චද්වාරවර්ජනාදී වූ **සබ්බානි වීථිචිත්තානි** සියළු වීථි චිත්තයෝ **අසඞ්ඛාරිකානි නාම හොන්ති** අසංස්කාරිකයෝ නම් වෙත් **යදා** යම්කලෙක **පරේහි** අනුන් විසින් **උස්සාහිතා** උත්සාහවත් කරන ලද්දාහු සත්වයෝ **කරොන්ති** කරත් ද **තදා** එකල්හි (**පඤ්චද්වාරාවජ්ජනාදීනි** පඤ්චද්වාරවර්ජනාදී වූ **සබ්බානි වීථිචිත්තානි** සියළු වීථි චිත්තයෝ) **සසඞ්ඛාරිකානි නාම හොන්ති** සසංස්කාරිකයෝ නම් වෙත් **ද්වාරවිමුත්තේසු** ද්වාර විමුක්ත වූ **ද්වීසු උපෙක්ඛාසන්තිරණේසු පන** උපේක්ෂා සන්තීරණ සිත් දෙකෙහි වනාහි (**අසඞ්ඛාරිකසසඞ්ඛාරිකභාවෝ** අසංස්කාරික සසංස්කාරික බව) **අට්ඨමහාවිපාකේසු** මහා විපාක සිත් අටෙහි (**අසඞ්ඛාරිකසසඞ්ඛාරිකභාවෝ** අසංස්කාරික සසංස්කාරික බව) **විය** මෙන් **වත්තබ්බෝ** කිවයුතුයි **ඉති** මෙසේ හෙයින් **සබ්බානි අහේතුකචිත්තානි** සියළු අහේතුක චිත්තයෝ **තේන පරියායේන සඞ්ඛාරභේදේන** ඒ පයණීය වූ සංස්කාර භේදයෙන් **පච්චේකං** වෙන වෙනම **භින්නානි ඒව හොන්ති** බෙදන ලද්දේම වෙත් **ඒවං** මෙසේ **සන්තේපි** ඇති කල්හිදු **අපරිබ්‍යත්තකිච්චත්තා ඒව** ව්‍යාපාර රහිත කෘත්‍යය ඇති බැවින්ම **තේසං** ඒ අහේතුක චිත්තයන්ගේ **සඞ්ඛාරභේදෝ** සංස්කාර භේදය **පාළියං** දම්සඟුණු පෙළෙහි **න වුත්තෝ ඉති** නොම වදරණ ලදැයි **වේදිතබ්බං** දතයුතුයි.

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

නත්ථි සඞ්ඛාරෝ අස්සාති අසඞ්ඛාරෝ. සංවිජ්ජති සඞ්ඛාරෝ අස්සාති සසඞ්ඛාරෝ. සප්පුරිසූපනිස්සයාදිකෝ කුසලුප්පත්තියා පකතිපච්චයගණෝ. සෝහි යදා දුවිධේන සඞ්ඛාරේන විනා කේවලං අත්තනෝ බලේන කුසලචිත්තං සමුට්ඨාපේති. තදා අසඞ්ඛාරෝ නාම. සෝයේව යදා අත්තනෝ බලේන කුසලචිත්තං සමුට්ඨාපේතුං න සක්කෝති. සඞ්ඛාරසහායං ලභිත්වාව තං සමුට්ඨාපේති. තදා සසඞ්ඛාරෝනාම. අසඞ්ඛාරේන උප්පන්නං **අසඞ්ඛාරිකං**. සසඞ්ඛාරේන උප්පන්නං **සසඞ්ඛාරික**න්ති.

**[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 41 යටතේ)]**

**සඞ්ඛාරෝ අස්ස නත්ථීති** සංස්කාරයක් මොහුට නැත්තේනුයි **අසඞ්ඛාරෝ** අසංස්කාර නම් **සඞ්ඛාරෝ අස්ස සංවිජ්ජතීති** සංස්කාරයක් මොහුට විද්‍යමාන වෙයිනුයි **සසඞ්ඛාරෝ** සසංස්කාරෝ නම් **සප්පුරිසූපනිස්සයාදිකෝ** සත්පුරුෂ උපනිශ්‍රය ආදිය **කුසලුප්පත්තියා** කුසල චිත්තයකගේ ඉපදීමට **පකති පච්චයගණෝ (හෝති)** ප්‍රකෘති ප්‍රත්‍යයගණය වෙයි **සෝ හි** ඒ ප්‍රකෘති ප්‍රත්‍යයගණය වනාහි **යදා** යම්කලෙක **දුවිධේන සඞ්ඛාරේන විනා** පයෝග උපාය යන දෙවැදෑරුම් සංස්කාරය නොමැතිව **කේවලං** හුදෙක් **අත්තනෝ බලේන** තමාගේ බලයෙන් **කුසලචිත්තං** කුසල චිත්තයක් **සමුට්ඨාපේති** උපදවයි ද **තදා** එකල්හි **අසඞ්ඛාරෝ නාම** අසංස්කාර නම් වෙයි **සෝයේව** ඒ ප්‍රකෘති ප්‍රත්‍යයගණයම **යදා** යම්කලෙක **අත්තනෝ බලේන** තමාගේ බලයෙන් **කුසලචිත්තං** කුසල චිත්තයක් **සමුට්ඨාපේතුං** උපදවන්නට **න සක්කෝති** නොහැකි වෙයි ද **සඞ්ඛාරසහායං ලභිත්වාව** උපාය පයෝග යන සංස්කාරයන්ගේ සහාය ලැබම **තං (චිත්තං)** ඒ කුසල චිත්තය **සමුට්ඨාපේති** උපදවයි ද **තදා** එකල්හි **සසඞ්ඛාරෝ නාම** සසංස්කාර නම් වෙයි **අසඞ්ඛාරේන** අසංස්කාරයෙන් **උප්පන්නං (චිත්තං)** උපන්නා වූ සිත **අසඞ්ඛාරිකං** අසංස්කාරික නම් වෙයි **සසඞ්ඛාරේන** සසංස්කාරයකින් **උප්පන්නං (චිත්තං)** උපන්නා වූ සිත **සසඞ්ඛාරිකං** සසංස්කාරික නම් **ඉති (හෝති)** වෙයි.

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

නාස්ස සඞ්ඛාරෝ අත්ථීති අසඞ්ඛාරං, අසඞ්ඛාරමේව **අසඞ්ඛාරිකං**. සහ සඞ්ඛාරේන පවත්තමානං සසඞ්ඛාරං, තදේව **සසඞ්ඛාරිකං. සඞ්ඛාරෝ**ති චෙත්ථ අත්තනෝ, පරස්ස වා පුබ්බප්පයෝගෝ "සඞ්ඛරෝති තික්ඛභාවසඞ්ඛාතේන මණ්ඩනවිසේසේන සජ්ජේති, සඞ්ඛරීයති වා සජ්ජීයති චිත්තං ඒතේනා"ති කත්වා. තත්ථ දානාදිපුඤ්ඤකරණකාලේ මච්ඡේරමලථිනමිද්ධාදීහි උපක්කිලේසේහි සංසීදමානේ චිත්තේ උපක්කිලේසවූපසමවසේන, චිත්තස්ස ච උස්සාහජනනවසේන තීසු ද්වාරේසු පවත්තෝ සම්මාවායාමෝ **අත්තනෝ පයෝගෝ** නාම. කුසලකරණේ නිරුස්සාහස්ස පන "අම්භෝ, සප්පුරිස, කුසලකරණං නාම පණ්ඩිතේහි ආසේවිතමග්ගෝ, තත්ථ තයාපි පටිපජ්ජිතුං වට්ටති, තස්මා දානං දේහි, සීලං රක්ඛ, තඤ්හි තේ අත්ථාය හිතාය සුඛාය භවිස්සතී"තිආදිනා කුසලකරණත්ථාය උස්සාහජනනවසේන පරේසං කායවචීද්වාරේසු පවත්තා ආණත්ති **පරප්පයෝගෝ** නාම. තේසු පන පුරිමෝ පුබ්බභාගප්පවත්තචිත්තසන්තානේ, පච්ඡිමෝ පරේසං චිත්තසන්තානේයේව සම්භවතීති තන්නිබ්බත්තිතෝ චිත්තස්ස තික්ඛභාවසඞ්ඛාතෝ විසේසෝ ඉධ උපචාරතෝ සඞ්ඛාරෝති වේදිතබ්බෝ. තේනාහු ආචරියා;

"පුබ්බප්පයෝගසම්භූතෝ, විසේසෝ චිත්තසම්භවී;
සඞ්ඛාරෝ ඉති සඞ්ඛාර-සභාවඤ්ඤූහි කිත්තිතෝ"ති.

අථ වා **"සසඞ්ඛාරිකමසඞ්ඛාරික"**න්ති ච ඒතං කේවලං සඞ්ඛාරස්ස භාවාභාවමත්තාපෙක්ඛාය වුත්තං, න තස්ස සහප්පවත්තිසබ්භාවාභාවතෝති

භින්නසන්තානප්පවත්තිනෝපි සඞ්ඛාරස්ස ඉදමත්ථීතාය තං වසේන නිබ්බත්තං චිත්තං සඞ්ඛාරෝ අස්ස අත්ථීති **සසඞ්ඛාරිකං** සහ-සද්දස්ස විජ්ජමානත්ථපරිදීපනතෝ "සලෝමකෝ සපක්ඛකෝ"තිආදීසු විය. තබ්බිපරීතං පන තදභාවතෝ යථාවුත්තවසේනේව **අසඞ්ඛාරිකං.** අථ වා සඞ්ඛරණං, සඞ්ඛරීයති වා ඒතේන ආගන්තුකසම්භූතේන චිත්තසංසීදනසභාවාපනයනවසේනේව සජ්ජීයති, සඞ්ඛරෝති වා තං යථාවුත්තවසේනේවාති සඞ්ඛාරෝති උප්පකමේව පුබ්බප්පයෝගජනිතෝ තික්ඛභාවෝ වුච්චති, තදභාවතෝ **අසඞ්ඛාරිකං,** සභාවතික්ඛන්ති අත්ථෝ. තංසහගතාය **සසඞ්ඛාරිකං,** අථ වා මච්ඡේරමලාදීහි සඞ්ඛරීයතීති සඞ්ඛාරො, චිත්තස්ස සංසීදනසභාවෝ, සෝ යස්ස නත්ථීති **අසඞ්ඛාරිකං,** ඉතරං **සසඞ්ඛාරිකං.** පණීතඋතුභෝජනාදිකෝ වා බලවපච්චයෝ සඞ්ඛාරෝ "සඞ්ඛරෝති චිත්තං තික්ඛභාවේන, සඞ්ඛරීයති වා තං ඒතේනා"ති කත්වා. අ-කාරස්ස වුඩ්ඪත්ථවුත්තිතාය වුඩ්ඩිප්පත්තෝ සඞ්ඛාරෝ අස්සාති **අසඞ්ඛාරිකං,** බලවපච්චයවන්තන්ති අත්ථෝ. වුඩ්ඩිපරිදීපකේන පන අ-කාරේන අවිසේසිතත්තා **සසඞ්ඛාරිකං** සප්පච්චයං දුබ්බලපච්චයන්ති අධිප්පායෝ. අසඞ්ඛාරිකත්තං පන සප්පායඋතුභෝජනආවාසාදිපච්චයේහි හෝතීති.

"උතුභෝජනආවාස-සප්පායාදීහි හේතුහි;
අසඞ්ඛාරිකභාවෝපි, විඤ්ඤෙය්‍යතබ්බෝ විභාවිනා"ති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 60-62 පිටු]**

"නාස්ස සඞ්ඛාරෝ අත්ථීති අසඞ්ඛාරං, අසඞ්ඛාරමේව අසඞ්ඛාරිකං සහසඞ්ඛාරේන පවත්තමානං සසඞ්ඛාරං තදේව සසඞ්ඛාරිකං" යනු නිර්වචනයි. මෙහිද සඞ්ඛාර යනු තමාගේ හෝ මෙරමාගේ හෝ පැවැති පූර්ව ප්‍රයෝගයයි. "සඞ්ඛරෝති චිත්තං තික්ඛභාවසඞ්ඛාතේන මණ්ඩනවිසේසේන සජ්ජේති සඞ්ඛරීයති වා සජ්ජීයති චිත්තං ඒතෙනාති සඞ්ඛාරෝ" යනු වචනාර්ථයෝයි. එහි දනාදි පින්කම් කරණ කල්හි මසුරුමල ථීනමිද්ධාදි උපක්ලේශයන් කරණකොටගෙන සිත පසුබස්නා කල්හි උපක්ලේශ සංසිඳුවීම් වශයෙන් සිතට ද උත්සාහ ඉපදවීම් වශයෙන් ද්වාරත්‍රයෙහි හටගත්තා වූ සම්‍යක් ව්‍යායාම තෙමේ ප්‍රයෝග නම් වේ. කුසල කරණයෙහි නිරුත්සාහ වූවාහට වනාහි එම්භා සත්පුරුෂය! කුසල් කිරීම නම් පණ්ඩිතයන් විසින් ආසේවිත මාර්ගයෙක. එහි තා විසිනිදු පිළිපදින්නට යම්හෙයකින් වටනේ වේද එහෙයින් දන් දෙව, සිල් රකුව ඒ වනාහි තට වැඩ පිණිස හිත පිණිස වන්නේ යයි යනාදීන් කුසල් කිරීම පිණිස උත්සාහ දනවීම් වශයෙන් මෙරමාගේ කාය වාක් ද්වාරයන්හි ප්‍රවෘත්ත වූ ආණත්ති තොමෝ පරප්‍රයෝග නම් වෙයි. ඔහුන් අතුරෙහි වනාහි පළමුවන පූර්ව ප්‍රයෝගය තෙමේ පූර්ව භාගයෙහි පැවැති චිත්ත සන්තානයෙහි ද පශ්චිම වූ පරප්‍රයෝග තෙමේ මෙරමාගේ චිත්තසන්තානයෙහි ද යම්හෙයකින් සම්භව වේද එහෙයින් ඒ පූර්ව ප්‍රයෝගය විසින් උපදවනලද චිත්තයාගේ තියුණු බැව් සඞ්ඛ්‍යාත වූ විශේෂය තෙමේ මෙහි කාරණූපචාර වශයෙන් සඞ්ඛාර යයි දතයුත්තේ. එහෙයින් කීහු පුරාතනාචාරවරයෝ:—

පුබ්බපයෝගසම්භූතෝ - විසේසෝචිත්තසම්භවී;
සඞ්ඛාරෝ ඉති සඞ්ඛාර - සභාවඤ්ඤූහි කිත්තිතෝ ෴ යි ෴

නොහොත් "සසඞ්ඛාරිකමසඞ්ඛාරිකං" යන මේ දෙපදය හුදෙක් සංස්කාර යයි කියනලද පූර්ව ප්‍රයෝගයාගේ විද්‍යමාන අවිද්‍යමාන බැව් මාත්‍රයක් අපේක්ෂා කොට

කියනලදි. ඒ පූර්ව ප්‍රයෝගයාගේ සිත හි සමඟ හටගැන්ම ඇති නැති බව අපේක්ෂා කොට කියනලද්දේ නොවේනුයි වෙනස්වූ සතන්හි හටගැන්ම ඇත්තා වූද සංස්කාරයාගේ මේ පශ්චිම චිත්තයෙහි ඇති බැවින් ඒ පූර්ව ප්‍රයෝගයාගේ වශයෙන් හටගත්තා වූ චිත්තය තෙමේ "සඞ්ඛාරෝ අස්ස අත්ථීති" යන වාක්‍යයෙහි "සසඞ්ඛාරිකං" යනු වේ. කුමක්හෙයින යත්? "සලෝමකෝ සපක්ඛකෝ" යනාදි පාඨයෙහි මෙන් සහ ශබ්දයාගේ විද්‍යමානාර්ථය ප්‍රකාශ කරන හෙයිනි. ඒ සසංස්කාරික චිත්තයට විපරීත වූ අසංස්කාරික චිත්තය වනාහි ඒ පූර්ව ප්‍රයෝගය නැති හෙයින් යට කියනලද ක්‍රමයෙන්ම අසඞ්ඛාරික නම් වේ. නොහොත් "සඞ්ඛරණං-සඞ්ඛරීයති වා ඒතේන ආගන්තුකසම්භූතේන චිත්තසංසීදනසභාවාපනයනවසේනේව සජ්ජීයති සඞ්ඛරෝති වා තං යථාවුත්තවසේනේවාති සඞ්ඛාරෝති" යනු වචනාර්ථ බැවින් සකස්කිරීම හෝ චිත්තයාගේ පසු බස්නා ස්වභාව පහකරවීම් වශයෙන්ම ආගන්තුකව හටගත්තා වූ ඒ පූර්ව ප්‍රයෝගය විසින් සකස්කරනු ලැබේනුයි හෝ ඒ චිත්තය යථෝක්ත ක්‍රමයෙන්ම සකස්කෙරෙනුයි හෝ සඞ්ඛාර නම් වේ. මෙයින් සෘජුවම පූර්ව ප්‍රයෝගයෙන් උපදනාලද තික්ඛභාව විශේෂය කියනු ලැබේ. ඒ තියුණු බැව් සඞ්ඛ්‍යාත විශේෂය නැති හෙයින් අසඞ්ඛාරික නම් වෙයි. ස්වභාවයෙන් තියුණුය යන අර්ථයි. ඒ විශේෂය ඇති හෙයින් සසඞ්ඛාරික නම් වෙයි. නොහොත් "මච්ඡේරමලාදීහි සඞ්ඛරීයතීති සඞ්ඛාරෝ" යනු නිර්වචන හෙයින් චිත්තයාගේ පසුබස්නා ස්වභාවය තෙම සඞ්ඛාර නම් වේ. "සෝ යස්ස නත්ථි තං අසඞ්ඛාරිකං" යනු විග්‍රහ හෙයින් ඒ චිත්තයාගේ පසුබස්නා ස්වභාවය තෙමේ යම් චිත්තයකට නැත්තේ ද ඒ චිත්තය තෙම අසඞ්ඛාරික නම් වෙයි. "ඉතරං සසඞ්ඛාරිකං"යි කී හෙයින් එයින් අන්‍ය වූ චිත්තය හෙවත් ඒ ස්වභාවය යම් සිතකට ඇත්තේ ද එය සසඞ්ඛාරික නම් වෙයි. නොහොත් ප්‍රණීත ඍතු භෝජනාදී වූ බලවත් ප්‍රත්‍යය තෙම සඞ්ඛාර නම් වෙයි. "සඞ්ඛරෝති චිත්තං තික්ඛභාවේන සඞ්ඛරීයතීති වා තං ඒතේනාති සඞ්ඛාරෝ"යි නිර්වචන ග්‍රහණය කොට "අසඞ්ඛාරිකං" යන මෙහි අ-කාරය වෘද්ධ්‍යර්ථයෙහි වැටෙන හෙයින් "වුද්ධිප්පත්තෝ සඞ්ඛාරෝ අස්සාති අසඞ්ඛාරිකං" යනු වේ. හෙවත් බලවත් ප්‍රත්‍යයවත් වූ සිත අසඞ්ඛාරික නම් වේ යනු අර්ථයි. වෘද්ධ්‍යාර්ථ ප්‍රකාශක අ-කාරයෙන් නොවෙසෙසනලද බැවින් ප්‍රත්‍යය සහිතවූයේ සසඞ්ඛාරික නම් වේ. හෙවත් දුර්වල ප්‍රත්‍යයවත් වූ සිත සසඞ්ඛාරික නම් වේ යනු අභිප්‍රායයි.෴

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 37-39 පිටු]**

සභාවතික්ඛේන සභාවෝ තික්ඛෝ ඒතස්සාති සභාවතික්ඛං, තේන **සභාවතික්ඛේන**. **අස්ස පන** පටිඝසම්පයුත්තස්ස **පාණාතිපාතාදීසු** අකුසලකම්මේසු තික්ඛප්පවත්තිකාලේ අසඞ්ඛාරිකස්ස උප්පත්ති, මන්දප්පවත්තිකාලේ සසඞ්ඛාරිකස්ස උප්පත්ති වේදිතබ්බා. **[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 29 යටතේ)]**

**සභාවතික්ඛේනේවාති** ලෝභස්ස, මිච්ඡාභිනිවේසස්ස වා වසේන සරසේනේව තිඛිණේන කුරුරේන. මන්දේනාති දන්ධේන අතිඛිණේන. තාදිසං පන අත්තනෝ, පරස්ස වා සමුස්සාහනේන පවත්තතීති ආහ **"සමුස්සාහිතේනා"**ති. **පරස්ස භණ්ඩං වා හරතීති වා**-සද්දේන තථාපවත්තනකමුසාවාදදීනම්පි සඞ්ගහෝ වේදිතබ්බෝ. **කාමානං වාති** අනුභුය්‍යමානානං කාමගුණානං. **වා**-සද්දේන පරසන්තකස්ස අයථාධිප්පේතතාය යං ලද්ධං, තං ගහේතබ්බන්ති ගහණාදිකං සඞ්ගණ්හාති.

සම්පයුත්තධම්මවසේන භේදභාවතෝ දෝසමූලං අසඞ්ඛාරික-සසඞ්ඛාරිකභේදතෝ දුවිධං. යදි ඒවං කස්මා "දෝමනස්සසහගතං පටිඝසම්පයුත්ත"න්ති වුත්තං? අසාධාරණධම්මේහි තස්ස චිත්තස්ස උපලක්ඛණත්ථං.

පාණස්ස අතීව, අතික්කමිත්වා වා පාතනං **පාණාතිපාතෝ. ආදි**-සද්දේන අදින්නාදාන-මුසාවාද-පේසුඤ්ඤ-ඵරුස-සම්ඵප්පලාප-බ්‍යාපාදේ සඞ්ගණ්හාති. දසඅකුසලකම්මපථේසු හි කාමේසුමිච්ඡාචාර-අභිජ්ඣා-මිච්ඡාදිට්ඨිසඞ්ඛාතා තයෝව කම්මපථා ඉමිනා න සිජ්ඣන්ති. සභාවතික්ඛං හුත්වා පවත්තමානං චිත්තං අසඞ්ඛාරමේව හෝති, ඉතරං සසඞ්ඛාරන්ති අධිප්පායේනාහ **"තික්ඛමන්දප්පවත්තිකාලේ"**ති. මන්දං පන හුත්වා පවත්තමානං ඒකංසේන සසඞ්ඛාරමේවාති න සක්කාව විඤ්ඤාතුං. යං සසඞ්ඛාරේන සප්පයෝගේන පවත්තති, තං මන්දමේව හෝතීති කත්වා තථා වුත්තන්ති දට්ඨබ්බං.
**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අකුසල වණ්ණනා අංක 29 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 152 පිට]**

"සභාවතික්ඛේනේව" යනු ලෝභයාගේ හෝ මිත්‍යා අභිනිවේසයාගේ හෝ තියුණු වූ යනු අර්ථයි. "මන්දේන" යනු ලස් වූ ඉති තියුණු නොවූ යන අර්ථයි. එබඳු සිත වනාහි තමාගේ හෝ මෙරමාගේ හෝ උත්සාහය කරණකොටගෙන හටගන්නා හෙයින් "සමුස්සාහිතේන" යි කීයේයි. "පරස්ස භණ්ඩං වා හරති" යන මෙහි වා ශබ්දයෙන් එසේ පවත්නා මුසාවාදදිය සඞ්ග්‍රහ වේ යැයි දතයුතුයි. "කාමානං වා" යන මෙහි වා ශබ්දයෙන් අදහස් නොවූ පරිද්දෙන් යමක් ලබනලද ද එය ගතයුතු යැයි අනුන් සතු වස්තුව ගැනීම් ආදිය සඞ්ග්‍රහ වෙයි. සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ වශයෙන් භේදයක් නැති හෙයින් ද්වේෂමූලික සිත් තෙමේ අසඞ්ඛාරික සසඞ්ඛාරික භේද හෙයින් දෙවැදෑරුම් වෙයි. ඉදින් එසේ වී නම් කුමක් හෙයින් "දෝමනස්සසහගතං පටිඝසම්පයුත්තං" යි කියන ලද්දේ ද යත්? අසාධාරණ ධර්මයන් කරණකොටගෙන ඒ චිත්තය හඟවනු පිණිසයි. "පාණස්ස අතීව අතික්ඛමිත්වා වා පාතනං පාණාතිපාතෝ" යනු වචනාර්ථ හෙයින් ජීවිතෙන්ද්‍රිය යුහුසුළුවම නොහොත් ඉක්මණින් හෙළීම පාණාතිපාත නම් වේ. "පාණාතිපාතාදීසු" යන මෙහි ආදී ශබ්දයෙන් අදින්නාදාන-මුසාවාද-පේසුඤ්ඤ-ඵරුස-සම්ඵප්පලාප-බ්‍යාපාද යන මොහුන් සඞ්ග්‍රහ වෙයි. ඒ එසේමැයි. දස අකුසල කර්මපථයන් අතුරෙන් කාමමිත්‍යාචාර-අභිධ්‍යා-මිත්‍යා දෘෂ්ටි සඞ්ඛ්‍යාත තුන් කර්මපථයෝම මේ දෙම්නස් සහගත ප්‍රතිඝසම්පයුත්ත සිතින් සිද්ධ නොවෙත්. ස්වභාවයෙන් තියුණු වී හටගන්නා වූ සිත අසඞ්ඛාරිකම වෙයි, එයින් අන්‍ය වූ සිත සසඞ්ඛාරික වෙයි යන අභිප්‍රායෙන් "තික්ඛමන්දපවත්තිකාලේ" යි කීයේයි. ලැසිව හටගන්නා වූ සිත ඒකාන්තයෙන් සසඞ්ඛාරම වේ යැයි දැනගත නොහැකි වෙයි. සසඞ්ඛාරයෙන් ස-ප්‍රයෝගයෙන් හටගනීනුයි ඒ සිත මන්දම වෙයි. එහෙයින් එසේ කියනලදැයි දතයුතුයි. **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 115 පිට]**

අසඞ්ඛාරික යන්නෙන් පූර්ව ප්‍රයෝග රහිත බව කියන ලද්දේය. ඒ ඒ පූර්ව ප්‍රයෝගය තෙමේ තියුණු බව යැයි කියන සැරසීම් වෙසෙසින් සිත සරසන්නේය. එහෙනි "සඞ්ඛාර" නම් **"සඞ්ඛරෝති චිත්තං තික්ඛභාවසඞ්ඛාතමණ්ඩනවිසේසේන සජ්ජේති, සඞ්ඛරීයති වා තං ඒතේන යථාවුත්තනයේන සජ්ජීයතීති සඞ්ඛාරෝ."** යනු එහි අරුත් පැවසීමය.තවද ඒ ඒ කටයුතුවලදී පසුබස්නාහට අනුබල දීම් වශයෙන් තමා කෙරෙහි පැවැති පූර්ව ප්‍රයෝගය සඞ්ඛාර නම්. ඒ මේ සැරසීම, අනුබලදීම යම් සිතක නොවූයේ ද, ඒ සිත අසඞ්ඛාරික නම් වේ. යම් සිතක ඒ වූයේ නම් ඒ සසඞ්ඛාරික වේ. සුදුසු කාලය, සුදුසු නවාතැනය, සුදුසු ආහාරය, සුදුසු වස්ත්‍රාදිය, සුදුසු මිත්‍රය යන මොවුන් ලැබීම් අසඞ්ඛාරික භාවයට කරුණුය. මෙයින් යමක් අඩුව ගිය කල්හි ලැබෙනුයේ සසඞ්ඛාරික භාවයයි.

සුදුසු කාලය, සුදුසු නවාතැනය, සුදුසු ආහාරය, සුදුසු වස්ත්‍රාදිය, සුදුසු මිත්‍රයා යන මොවුන් ලැබීම් අසඞ්ඛාරික භාවයට කරුණුය. මෙයින් යමක් අඩුව ගිය කල්හි ලැබෙනුයේ සසඞ්ඛාරික භාවයයි.

ආවාස සප්පාය, උතු සප්පාය, භෝජන සප්පාය යන මෙයින් ලත් කයෙහි හා සිතෙහි සුදුසු බව, පෙර දන්දීම් පුරුදු බව යන මෙයින් අසඞ්ඛාරික භාවය වන්නේය. **"ආවාසසප්පායාදිවසෙන කායචිත්තානං කල්ලභාවතො, පුබ්බෙ දනාදීසු කතපරිචයතාදීහි ච අසඞ්ඛාරිකතා"** යනු දන්නේ. මේ කියූ හේතූන්ට විපරීත හේතූන් කරණකොට සසඞ්ඛාරික භාවය ද දතයුතු. **[සද්ධර්මසාගරය 02/420-421-422-437 පිටු]**

මෙහෙයුමක් උත්සාහවත් කරවීමක් නැතිව ඇතිවන සිතට අසඞ්ඛාරික සිත යැයි ද මෙහෙවීමක් හෝ උත්සාහවත් කරවීමක් හෝ ඇතිවන සිතය සසඞ්ඛාරික යැයි ද කියනු ලැබේ. **[අභිධර්ම මාර්ගය 31 පිට]**

අසඞ්ඛාර නම් පූර්ව ප්‍රයෝග රහිත බවය. හෙවත් අනුන්ගේ නියෝගය නිසා නොවැ තමාගේම පසුබැසීමෙනුත් නොවැ ස්වභාව තීක්‍ෂණ (=ඉබේම තියුණු) වූ සිතින් යුක්ත බවය. ආවාසසප්පාය ඍතුසප්පාය භෝජනසප්පාය ලැබීම, දන්දී පුරුදුබව යනාදිය අසඞ්ඛාර වීමට හේතුය. **[අභිධර්ම චන්ද්‍රිකාව 23 පිට]**

සඞ්ඛාරෝති චිත්තං තික්ඛභාවසඞ්ඛාත මණ්ඩනවසේන සජ්ජේතීති සඞ්ඛාරෝ යනුවෙන් විග්‍රහ කරණු. **යෝ** යම් පූර්ව ප්‍රයෝගයක් තෙමේ **චිත්තං** පසුව හටගත්තාවූ චිත්තය **තික්ඛභාවසඞ්ඛාතමණ්ඩනවසේන** තියුණු බැව් සඞ්ඛ්‍යාත අලංකාර විශේෂයෙන් **සඞ්ඛරෝති සජ්ජේති** සදන්නේ වේද **ඉති (තස්මා**) එසේහෙයින් **සෝ** හෙතෙමේ **සඞ්ඛාරෝ** සඞ්ඛාර නම් වේ. මෙසේ අර්ථ යෝජනා කරණු. සං පූර්ව කර-ධාතු තෙමේ සර්ජනාර්ථ වාචක වෙයි. ණ-ප්‍රත්‍යයි. "පුරසමුප" යනාදි සූත්‍රයෙන් කර-ධාතුව ඛර-ආදේශ කරණු. අදින්නාදනාදීහු අකුසල කර්ම කරන්නා වූ තන්හි පසුබට වීමක් ඇති කල්හි පච්ඡිම චිත්තයට අනුබල දීමක් වශයෙන් තමාගේ හෝ මෙරමාගේ හෝ කාය ද්වාර වාග් ද්වාරයෙහි හටගත්තා වූ ආණත්ති පූර්ව ප්‍රයෝගය මුඛ්‍ය වශයෙන් සඞ්ඛාරයැයි දතයුතු. තමාගේ හෝ මෙරමාගේ හෝ ආණත්ති පූර්ව ප්‍රයෝගයෙන් හටගත්තා වූ පච්ඡිම චිත්තයාගේ තියුණු බැව් සඞ්ඛ්‍යාත වූ තීක්‍ෂණ භාවය වනාහි හේතු කොට ඇත්තාවූ පූර්ව ප්‍රයෝගයාගේ සඞ්ඛාර යන නාමය විපාක භූත වූ තික්ඛභාවයෙහි ආරෝපනය කොට කාරුණූපචාර වශයෙන් පච්ඡිම චිත්තයාගේ තියුණුබව සඞ්ඛාර යැයි දතයුතු.

තත්ථ සඞ්ඛාරෝ ඒතස්සාති අසඞ්ඛාරෝ යනුවෙන් පද සම්බන්ධ කොට බහුබ්බීහිසමාස විග්‍රහ කරණු. **ඒතස්ස** ඒ චිත්තයට **සඞ්ඛාරෝ** මිත්‍යාවායාම සඞ්ඛ්‍යාත පූර්ව ප්‍රයෝග තෙමේ **වා** නොහොත් මිත්‍යාවායාම සඞ්ඛ්‍යාත වූ පූර්ව ප්‍රයෝගයෙන් හටගත්තා වූ තියුණු බවක් තෙමේ **නත්ථි** නැත්තේ වේද **ඉති** එසේහෙයින් (**තස්මා) තං** ඒ සිත් තෙමේ **අසඞ්ඛාරෝ** අසඞ්ඛාර නම් වේ. මෙසේ අර්ථ යෝජනා කරණු. අසඞ්ඛාරං ඒව අසඞ්ඛාරිකං යනුවෙන් විග්‍රහ කරණු. ණික ප්‍රත්‍යය තෙමේ විශේෂාර්ථයක් නැත්තේයි. සසඞ්ඛාරික පදය පසුභාගයෙහි කියන ලද්දවූ ක්‍රමය අනුව දතයුතුයි. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 14-15 පිටු]**

ආවාසසත්ප්‍රාය, උතුසත්ප්‍රාය, භෝජනසත්ප්‍රාය, සේනාසනසත්ප්‍රාය, කාය චිත්තයන්ගේ ඉවසන බව, දනාදියෙහි පුරුදුකළ බව, මෙසේ මේ හේතූන්ගෙන්

අසඞ්ඛාරි බව වෙයි. ඊට විපරීත වශයෙන් සසඞ්ඛාරික බව දත යුත්තේය. සත්‍රාය විහාරාදිය ආවාසයයි දතයුතුයි. එහෙයින් අභිධර්මාර්ථ දීපනියෙහි අවසන්ති එත්ථාති ආවාසෝ විහාරාදි යනු කීහ. ඇඳ පුටු ආදීවූ ස්ථාන තෙමේ සයනාසන නම් වෙයි. එහෙයින් එම ටීකාවෙහි සේනාසනන්ති මඤ්චපීඨාදී යනු කීහ.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 26 පිට]**

අසඞ්ඛාරික සසඞ්ඛාරික සිත් ඉපදීමට හේතු පසක් ඇතිවේ. ඒ කවරහුද යත්? ඊට යෝග්‍යවූ ඍතුවක් ලැබීමය, ඊට යෝග්‍යවූ වාසස්ථානයක් ලැබීමය, ඊට යෝග්‍යවූ භෝජනයක් ලැබීමය, ඊට යෝග්‍යවූ චීවර වස්ත්‍රාදිය ලැබීමය, ඊට යෝග්‍යවූ මිත්‍රයන් ලැබීමය යන මේ කාරණා පස ඇති කල්හි අසඞ්ඛාරික අකුසල් සිත් උපදී. මෙයින් යමක් අඩුවීමෙන් සසඞ්ඛාරික සිත් උපදී. **[විස්තර භාව සන්නය 17 පිට]**

දන වස්තුව මුක්ත ත්‍යාගතාවයෙන් යුක්තව ප්‍රතිග්‍රාහකයාගේ හස්තයෙහි පිහිටුවන්නේ වේද ඒකාන්තයෙන් ඒ දනයාගේ කුශලානිසංසය ලබම්හයි යන දෘඪතර කල්පනාවක් ඇත්තේ වේද යන මේ අඞ්ගද්වයෙන් සම්පූර්ණවී නම් මහාකුසලය අසඞ්ඛාරික වෙයි. මේ අඞ්ගද්වයෙන් හෝ එකෙකින් හෝ අඩුවී නම් සසඞ්ඛාරික කුසලචිත්තය වෙයි. සඞ්ඛාරය වනාහි ඒ චිත්තයෙහි යෙදෙන්නා වූ චෛතසික ධර්මයක්දෝහෝයි සැක නොකටයුතුයි. මෙරමාගේ සන්තානයෙහි හෝ තමාහට පූර්වභාගයෙහි උපදින්නා වූ චිත්තයකින් හෝ සසඞ්ඛාරය චිත්තයට ලැබෙන බැවින් චිත්තයාගේ සෑදීම නොහොත් සැරසීම සසඞ්ඛාරය යැයි දතයුතුයි. කුසල් කිරීමෙහි පුරුද්ද ඇත්තා වූ සත්වයෝ තමාගේ සිතින් සිතාමතා දන්දීම කෙරෙති. වස්තු තෘෂ්ණාව ආදී උපද්‍රව නිසා දන්දීමට මැලිවූවන්ට අනුන්ගේ අවවාද අනුශාසනාවෙන් දනාධ්‍යාශය උපදවා දන් දෙති. එහෙයින් තියුණු මුවහත් ඇති ශ්‍රස්ත්‍රයකින් කැපීමක් මෙන් ද මොට වූ ශ්‍රස්ත්‍රය මුවහත් තබා කැපීමක් මෙන් ද මේ අසඞ්ඛාර සසඞ්ඛාර චිත්තද්වය උපදින සැටි දතයුතුයි. **[විස්තර භාව සන්නය 37-38 පිට]**

## වේදනා හා සඞ්ඛාරභේදයට මෝහ මූල සිත පත්නොවීමට හේතුඃ—

උද්ධතස්ස භාවෝ උද්ධච්චං. උද්ධච්චස්ස සබ්බාකුසලසාධාරණභාවේපි ඉධ සම්පයුත්තධම්මේසු පධානං හුත්වා පවත්තතීති ඉදමේව තේන විසේසෙත්වා වුත්තං. ඒවඤ්ච කත්වා ධම්මුද්දේසපාළියං සේසාකුසලේසු උද්ධච්චං යේවාපනකවසේන වුත්තං, ඉධ පන "උද්ධච්චං උප්පජ්ජති"ති සරූපේනේව දේසිතං. හොන්ති චෙත්ථ;

"සබ්බාකුසලයුත්තම්පි, උද්ධච්චං අන්තමානසේ;
බලවං ඉති තංයේව, වුත්තමුද්ධච්චයෝගතෝ.

"තේනේව හි මුනින්දේන, යේවාපනකනාමතෝ;
වත්වා සේසේසු එත්ථේව, තං සරූපේන දේසිත"න්ති.

ඉමානි පන ද්වේ චිත්තානි මූලන්තරවිරහතෝ අතිසම්මූළ්හතාය, සංසප්පනවික්ඛිපනවසේන පවත්තවිචිකිච්ඡුද්ධච්චසමායෝගේන චඤ්චලතාය ච සබ්බත්ථාපි රජ්ජනදුස්සනරහිතානි උපෙක්ඛාසහගතානේව පවත්තන්ති, තතෝයේව ච සභාවතික්ඛතාය උස්සාහේතබ්බතාය අභාවතෝ සඞ්ඛාරභේදෝපි නේසං නත්ථි. හොන්ති චෙත්ථ;

"මූළ්හත්තා චේව සංසප්ප-වික්ඛේපා චේකහෙතුකං;
සෝපෙක්ඛං සබ්බද නෝ ච, භින්නං සඞ්ඛාරභේදතෝ.

"න හි තස්ස සභාවේන, තික්ඛතුස්සාහනීයතා;
අත්ථි සංසප්පමානස්ස, වික්ඛිපන්තස්ස සබ්බදා"ති.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ෂට්ඨසඞ්ගායනා අකුසලචිත්ත වණ්ණනා අංක 06 යටතේ); විභාවනී ටීකා සන්නය 34 පිට; සද්ධර්මසාගරය 02/424 පිට; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රශ්නෝත්තර 03 පිට; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 18 පිට; විස්තර භාව සන්නය 20 පිට]**

**උද්ධං** මත්තෙහි **ධුනාති (කම්පති)** සැලේනුයි **ඉති (තස්මා) උද්ධතෝ** උද්ධත නම් වේ **උද්ධතස්ස** අතිශයින්ම චංචල වූ චිත්තයාගේ **භාවෝ** ස්වභාව තෙමේ **උද්ධච්චං** උද්ධච්ච නම් වේ (අයුෂ්මත් ටීකාචාරීනි උද්ධච්ච චෛතසික තෙමේ සියළු අකුසල චිත්තයෙහි යුක්ත වන්නේ නොවේ ද? කුමක් හෙයින් මේ අන්තිම චිත්තයම ඖද්ධ්‍යත්‍යයෙන් වෙනස් කොට දේශනා කෙළේ දැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "උද්ධච්චස්ස -පෙ- වුත්තං" යන පාඨය කියනලදි) **උද්ධච්චස්ස** උදහසගේ **සබ්බාකුසලසාධාරණභාවේ සතිපි** සියළු අකුසල සිත් හා සාධාරණ බව ඇත්තේහිදු **සම්පයුත්තධම්මේසු** එක්ව යෙදුනා වූ ධර්මයන් අතුරෙහි **පධානං හුත්වා** ශ්‍රේෂ්ඨව **පවත්තති** පවත්නේ වේද **ඉති (තස්මා) ඉදමේව** මේ අවසාන අකුසල චිත්තයම **තේන** ඒ උදහස කරණකොටගෙන **විසේසෙත්වා** වෙනස් කොට **වුත්තං** කියනලදි (ආයුෂ්මත් ටීකාචාරීනි උදහස් තෙමේ අවසාන අකුසල් චිත්තයෙහි ප්‍රධානව හටගන්නේ යැයි කීයේ නොවේ ද? ඒ අවසාන චිත්තය ඖද්ධ්‍යත්‍යය ප්‍රධානත්වයෙන් හටගන්නා බව කෙසේ සිද්ධ කරන්නේ දැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "ඒවඤ්ච කත්වා -පෙ- දේසිතං" යන පාඨය කියනලදි) **ඒවඤ්ච කත්වා** එම කාරණයෙන් **ධම්මුද්දේසපාළියං** දම්සඟුණු පෙළෙහි **සේසාකුසලචිත්තේසු** ඖද්ධ්‍යත්‍යය සම්ප්‍රයුක්ත චිත්තයෙන් අන්‍යවූ අකුසල චිත්තයෙහි **උද්ධච්චං** උදහස **යේවාපනකවසේන** යේවාපනක වශයෙන් **වුත්තං** වදරන ලදී **ඉධ පන** මේ අවසන්හි වූ අකුසල චිත්තයෙහි වනාහි **උද්ධච්චං උප්පජ්ජතීති** උද්ධච්චං උප්පජ්ජති යනුවෙන් **සරූපේනේව** ස්වකීය ශබ්ද ස්වරූපයෙන්ම (භාගවතා යි කර්තෘව හා ධම්මසඞ්ගණියං යන ආධාරය ද යොදනු) **දේසිතං** දේශනා කරනලදි (යේවාපනක වශයෙන් දේශනා කළේය යනු "ලෝභෝ හෝති දෝසෝ හෝති" යනාදී ක්‍රමයෙන් ලෝභ ද්වේෂාදීන් මෙන් ස්වරූප උද්ධරනය නොකොට "යේවාපනඤ්ඤෙද්පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනෝ ධම්මා" යනුවෙන් දේශනා කළේය යනු භාවයි) **එත්ථ** මේ **උද්ධච්චස්ස** යනාදී වචනයෙහි (**ද්වේ සඞ්ගහගාථායෝ** සඞ්ග්‍රහ ගාථාවෝ දෙදෙනෙක් **හොන්ති** වෙත්) ච-ශබ්දය වාක්‍යාරම්භයෙහිය (කවර සඞ්ග්‍රහ ගාථා දෙදෙනෙක් දැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "සබ්බා -පෙ- දේසිතං" යනාදී ගාථා ද්වය කියනලදි)

**සබ්බාකුසලසම්පයුත්තම්පි** සියළු අකුසල් සිත් හා එක්ව යෙදුනා වුද **උද්ධච්චං** උදහස් තෙමේ **අන්තමානසේ** අවසන්හි වූ අකුසල චිත්තයෙහි **බලවං** බලවත් වූයේය (ප්‍රධාන වූයේය කී නියායි) **ඉති (තස්මා) තංයේව** ඒ අවසන්හි වූ චිත්තයම **උද්ධච්චයොගතෝ** ඖද්ධ්‍යත්‍යය යෝග වශයෙන් **ආචරියේන** අනුරුද්ධාචාරීන් විසින් **වුත්තං** කියනලදි.

**තේනේව** එසේ අවසන් චිත්තයෙහි බලවත් වූ හෙයින්ම **මුනින්දේන** මුනිඳු වූ භාග්‍යවතුන් වහන්සේ විසින් **සේසේසු** ඖද්ධ්‍යත්‍යය සම්ප්‍රයෝග සිතින් තොර වූ සෙසු එකොළොස් චිත්තයෙහි **උද්ධච්චං** උදහස **යේවාපනකනාමතෝ** යේවාපනක නම් වශයෙන් **වත්වා** දේශනා කොට **එත්ථේව** මේ අවසන්හි වූ අකුසල චිත්තයෙහිම **තං**

ඒ උදහස **සරූපේන** ස්වකීය රූපයෙන් හෙවත් උද්ධච්චං යන ස්වකීය නමින් **දේසිතං** දේශනා කරනලදි (තේනේවහි යන්නෙහි "හි" ශබ්දය පදලඞ්කාරයෙහිය)

(ආයුෂ්මත් ටීකාචාරීනි මේ ඒකහේතුක චිත්තයෝ කුමක් හෙයින් වේදනා වශයෙන් ප්‍රභේද නොකළාහු දැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "ඉමානි පන -පෙ- නත්ථි" යන පාඨය කියනලදි) **ඉමානි පන (ද්වේ චිත්තානි**) මේ චිත්තයෝ දෙදෙන වනාහි **මූලන්තරවිරහිතෝ** මූලන්තරයකින් හෙවත් දෙවැනි වූ මූලක් නැති හෙයින් (මේ හේත්වර්ථය "අතිසම්මූළ්හතාය" යන්නෙහි සම්බන්ධ කටයුතුයි) **අතිසම්මූළ්හතාය ච** අතිශයින් අරමුණෙහි මුලා වූ බැවින් ද (හොන්ති යන්නෙහි හේත්වර්ථය සම්බන්ධ කටයුතුයි) **සංසප්පනවික්ඛිපනවසේන පවත්තවිචිකිච්ඡුද්ධච්චසමායෝගේන** අරමුණ නිශ්චය නොකළහැකි බවය අරමුණෙහි අතිශය මුලා බවය යන මේ ස්වභාවන්ගේ වශයෙන් හටගන්නා වූ විචිකිච්ඡා ඖද්ධත්‍යයන් හා නිරන්තරයෙන් යුක්ත බැවින් (මේ හේත්වර්ථය "චංචලතාය" යන්නෙහිම සම්බන්ධ කටයුතුයි) **චංචලතාය ච** සැලෙන බව ඇති බැවින් ද **සබ්බථාපි** සියළු ඉෂ්ටාලම්බන අනිෂ්ටාලම්බනයෙහි ද **රජ්ජනදුස්සනරහිතානි හුත්වා** ඇලීම් වරදවා පිළිපැදීම් රහිතවූවාහු **උපෙක්ඛසහගතානේව හොන්ති** උපේක්‍ෂා වේදනා සහා ගියාහු වෙත් **තතෝ ඒව** එපරිද්දෙන් අරමුණු නිශ්චය නොකිරීම අරමුණෙහි මුලාවීම ඇති බැවින්ම (අභාවතෝ යන්නෙහි හේත්වර්ථය සම්බන්ධ කටයුතුයි) **සභාවතික්ඛතාය ච** සබා තියුණු බවක් හෝ **උස්සාහේතබ්බතාය ච** උත්සාහ කටයුතු බවක් හෝ **අභාවතෝ** අවිද්‍යමාන හෙයින් **නේසං** ඒ මෝහමූලික චිත්තයන්ගේ **සඞ්ඛාරභේදෝපි** සංස්කාර භේදය ද **නත්ථි** නැත්තේය **එත්ථ** මේ "ඉමිනා පන චිත්තානි" යනාදී පාඨයෙහි **ද්වේ සඞ්ගහගාථා** සඞ්ග්‍රහ ගාථාවෝ දෙදෙනෙක් තුමූ **හොන්ති** වෙත් (ච-ශබ්දය වාක්‍යාරම්භයෙහි වැටෙයි. මේ සඞ්ග්‍රහ ගාථාවෝ දෙදෙන කවරහු දැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "මූළ්හත්තා -පෙ- වික්ඛිපන්තස්ස සබ්බදා" යන ගාථා ද්වය කියනලදි)

**මූළ්හත්තා චේව** අරමුණෙහි මුලාවන බැවින් ද **සංසප්පවික්ඛේපා ච** අරමුණෙහි සැකය හා අරමුණෙහි වික්‍ෂිප්ත බව ඇති හෙයින් ද **ඒකහේතුකං** ඒක හේතුක සිත් තෙමේ **සබ්බදා** සියළු අරමුණෙහි **සෝපෙක්ඛං හෝති** උපේක්‍ෂා වේදනාව හා යුක්තවූයේ වෙයි **තේසං** ඒ ඒක හේතුක චිත්තයන්ගේ **සඞ්ඛාරභේදතෝ** සංස්කාර ප්‍රභේද වශයෙන් **භින්නඤ්ච** ප්‍රභේද වන ලද්දේ ද **නෝ හෝති** නොවෙයි ("හි" යනු කස්මා අර්ථයෙහිය) **සඞ්ඛාරභේදතෝ** සංස්කාර ප්‍රභේදයෙන් **භින්නං නෝ හෝති** (කුමක් හෙයින්) ප්‍රභේද වන ලද්දේ නොවේද යත්? **සංසප්පමාස්ස (සංසප්පමානත්තා ච** යි විභක්ති විපර්‍ය්‍යාසයි) අරමුණෙහි සැක සහිත බැවින් ද වික්ඛිපන්තස්ස **(වික්ඛිපන්නත්තා ච)** අරමුණෙහි වික්‍ෂිප්ත බැවින් ද **තස්ස** ඒ ඒක හේතුක චිත්තයාගේ **සභාවේන** සබා වශයෙන් **තික්ඛතා ච** තියුණු බවක් ද **උස්සාහනීයතා ච** උත්සාහ කටයුතු බවක් ද **සබ්බදා** සියළු අරමුණෙහි **යස්මා** යම්හෙයකින් **න අත්ථි** නැත්තේ වේද **තස්මා** එසේ හෙයින් **නේසං** ඒ චිත්තයන් දෙදෙනාගේ **සඞ්ඛාරභේදතෝ** සංස්කාර භේදයෙන් **භින්නං** බිඳෙන ලද්දේ **නෝ හෝති** නොවෙයි (මෙසේ අර්ථ යෝජනා කටයුතුයි) **[විභාවනී ටීකා සන්නය 63-65 පිටු]**

ධර්මෝද්දේශ පාළියෙහි අවශේෂ අකුසලයන් කෙරෙහි ඖද්ධත්‍යයා යේවාපනක වශයෙන් වදරන ලද. මෙහි වනාහි "උද්ධච්චං උප්පජ්ජති" කියා ස්වරූපයෙන්ම වදරන ලදි. පුරාතනයන් විසිනිදු කියන ලදමැයි;

"සබ්බාකුසලයුත්තම්පි උද්ධච්චං අන්තමානසේ
බලවං ඉති තංයේව වුත්තමුද්ධච්චයෝගතෝ
තේනේවහි මුනින්දේන යේවාපනකනාමතෝ
වත්වා සේසේසු එත්ථේව තං සරූපේන දේසිතං" යි.

මේ චිත්තයෝ දෙදෙන වනාහි ලෝභාදී මූලාන්තර විරහයෙන් අතිසම්මූඪ බැවින් ද, සංසර්ප වික්ෂේප වශයෙන් ප්‍රවෘතවූ විචිකිත්සා-ඖද්ධත්‍යය සමායෝගයෙන් චංචල බැවින් ද හැමතැන්හීම රඤ්ජන-දූසන රහිත වූවාහු උපේක්ෂා සහගතවම පවත්නාහ. එසේ හෙයින් ස්වභාව තීක්ෂණ බවක් ද, උත්සාහ කටයුතු බවක් ද නැති හෙයින්ම සංස්කාර භේදය ද මේ චිත්තයන් දෙදෙනාගේ නැති. එසේ හෙයින්ම කියන ලදි;

"මූළ්හත්තා චේව සංසප්ප-වික්ඛේපා චේකහෙතුකං;
සෝපෙක්ඛං සබ්බද නෝ ච, භින්නං සඞ්ඛාරභේදතෝ
න හි තස්ස සභාවේන, තික්ඛතුස්සාහනීයතා;
අත්ථි සංසප්පමානස්ස, වික්ඛිපන්තස්ස සබ්බද" යි

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ පුරාණ සන්නය 15 පිට]**

**මෝහමූලම්පි** විචිකිච්ඡුද්ධච්චයෝගතෝ දුවිධං හෝති උපෙක්ඛාසහගතං විචිකිච්ඡාසම්පයුත්තං, උපෙක්ඛාසහගතං උද්ධච්චසම්පයුත්තන්ති. තස්ස අසන්නිට්ඨානවික්ඛේපකාලේසු පවත්ති වේදිතබ්බාති.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 29 යටතේ); විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 453 යටතේ); විසුද්ධිමග්ග අටුවා 340 පිට (හේ.වි.මු)]**

මෝහමූලං චිත්තං මූලන්තරවිරහතෝ අතිමූළ්හං විචිකිච්ඡුද්ධච්චයෝගතෝ චඤ්චලඤ්චාති උපෙක්ඛාසහගතමේව හෝති, න තස්ස කදචිපි සභාවතික්ඛතා අත්ථි. ආරම්මණේ හි සංසප්පනවසේන, වික්ඛිපනවසේන ච පවත්තමානස්ස චිත්තද්වයස්ස කිං තාදිසේ කිච්චේ සභාවතික්ඛතාය, උස්සාහේතබ්බතාය වා භවිතබ්බං, තස්මා න තත්ථ සඞ්ඛාරභේදෝ අත්ථි. නනු ච උද්ධච්චං සබ්බාකුසලසාධාරණං, කස්මා පන ඒතමේව තේන විසේසෙත්වා වුත්තං "උද්ධච්චසහගත"න්ති. විසේසතෝ බලවභාවතෝ. ඉදඤ්හි ඒතස්මිං චිත්තේ බලවං, තස්මා සම්පයුත්තධම්මේසු පධානං හුත්වා පවත්තතීති ඉදමේව තේන විසේසිතබ්බං. තේනේව හි **පාළියං** සේසාකුසලේසු උද්ධච්චං යේවාපනකවසේන ආගතං, ඉධ පන සරූපතෝයේව නිද්දිට්ඨං. ඒවං අසාධාරණප්පධානධම්මවසේන මෝහමූලං විචිකිච්ඡාසම්පයුත්තං උද්ධච්චසම්පයුත්තන්ති දුවිධං වුත්තන්ති දට්ඨබ්බං. **අසන්නිට්ඨානං** සංසයෝ, **වික්ඛේපෝ** අවූපසමෝ, භන්තතාති අත්ථෝ. තත්ථ විචිකිච්ඡාසහගතස්ස අසන්නිට්ඨානකාලේ, උද්ධච්චසහගතස්ස වික්ඛේපකාලේ ච පවත්ති වේදිතබ්බා.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අකුසල වණ්ණනා යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 154 පිට]**

මෝහමූලික සිත් තෙමේ මූලන්තරයකින් හෙවත් මෝහමූලයෙන් අන්‍ය වූ ලෝභ-දෝසමූලයන් නැති හෙයින් අතිශයින් අරමුණෝ මුලාබව ද වෙයි. විචිකිච්චා ඖද්ධ්‍යත්‍යයන් හා නිරන්තරයෙන් යුක්ත බැවින් අරමුණෙහි සැලීම ද වෙයි. එහෙයින් උපෙක්ඛාසහගතම වෙයි. ඒ මෝහමූලික චිත්තයාගේ කිසිකලෙකත් ස්වභාවයෙන්

තියුණු බවක් නැත්තේය. අරමුණෙහි බැස ගන්නට අසමර්ථ බැවින් නිශ්චය නොකළහැකි වශයෙන් ද අරමුණෙහි වික්ෂිප්ත වීම් වශයෙන් ද හටගන්නා වූ චිත්තයන් දෙදෙනාගේ එබඳු කෘත්‍යයෙහි ස්වභාවයෙන් තියුණු බවක් හෝ උත්සාහ කටයුතු බවක් හෝ කෙසේ වියයුත්තේ ද යත්; නොවන්නේමැයි. එහෙයින් ඒ දෙසිතෙහි සංස්කාර භේදයක් නැත්තේය. ඖද්ධ්‍යත්‍යය සියළු අකුසල් සිත් හා සාධාරණ චෛතසිකයක් නොවේ ද? කුමක් හෙයින් වනාහි මේ එකම අකුසල චිත්තය ඒ ඖද්ධ්‍යත්‍යයෙන් වෙන් කොට "උද්ධච්චසහගතං" යි දේශනා කළේ ද යත්; වෙසෙසින් බලවත් බැවිනි. යම්හෙයකින් මේ ඖද්ධ්‍යත්‍යය ඒ අවසාන අකුසල් සිතෙහි බලවත් වේද එහෙයින් එක්ව යෙදුනා වූ ධර්මයන් අතුරෙහි ප්‍රධානව පවතීනුයි මේ අවසාන අකුසල චිත්තයම ඒ ඖද්ධ්‍යත්‍යයෙන් වෙසසිය යුයි. එහෙයින්ම දම්සඟුණු පෙළෙහි ඖද්ධ්‍යත්‍ය සම්පයුත්ත චිත්තයෙන් අන්‍යවූ අකුසල චිත්තයෙහි ඖද්ධ්‍යත්‍යය යේවාපනක වශයෙන් හෙවත් "ලෝභෝ හෝති දෝසෝ හෝති" යනාදී ක්‍රමයෙන් ලෝභ ද්වේෂාදීන් මෙන් ස්වරූප උද්ධරණය නොකොට "යේවාපනඤ්ඤේපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනෝ ධම්මා" යනුවෙන් දේශනා කළේය. මේ අවසාන අකුසල චිත්තයෙහි වනාහි "උද්ධච්චං හෝති" යනුවෙන් ස්වකීය ශබ්ද ස්වරූපයෙන්ම දක්වන ලද්දේයි. මෙසේ අසාධාරණ ධර්ම ප්‍රධාන ධර්ම වශයෙන් මෝහමූලික සිත විචිකිච්ඡා සම්ප්‍රයුක්තය උද්ධච්ච සම්ප්‍රයුක්ත යයි දෙවැදෑරුම් කොට කියනලදැයි දතයුතුයි. "අසන්නිට්ඨාන" යනු සැකයයි. "වික්ඛේප" යනු නොසන්සුන් බවයි. එහි විචිකිච්ඡා සහගත චිත්තයාගේ හටගැනීම සංසය කාලයෙහි ද උද්ධච්ච සහගත චිත්තයාගේ හටගැනීම නොසන්සුන් කාලයෙහි ද වේ යැයි දතයුතුයි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 115-116 පිටු]**

මෝහේකහේතුකං චිත්තං මූලන්තරවිරහතෝ අතිමූළ්හං, විචිකිච්ඡුද්ධච්චයෝගතෝ චඤ්චලඤ්චාති **උපෙක්ඛාසහගත**මේව හෝති, න තස්ස කදාචිපි සභාවතික්ඛතා අත්ථි. ආරම්මණේ හි සංසප්පනවසේන, වික්ඛිපනවසේන ච පවත්තමානස්ස චිත්තද්වයස්ස කීදිසේ කිච්චේ සභාවතික්ඛතාය, උස්සාහේතබ්බතාය වා භවිතබ්බං, තස්මා න තත්ථ සඞ්ඛාරභේදෝ අත්ථි. අඤ්ඤේසු අකුසලචිත්තේසු ලබ්භමානම්පි උද්ධච්චං විසේසතෝ එත්ථේව බලවං, තතෝ ඒව සම්පයුත්තධම්මේසු පධානං හුත්වා පවත්තතීති ඉදමේව උද්ධච්චේන විසේසෙත්වා වුත්තං **"උද්ධච්චසම්පයුත්ත"**න්ති. තථා හි **පාළියං** (ධ. ස. 427) ඉධ සරූපතෝ උද්ධච්චං ආගතං, ඒවං අසාධාරණපධානධම්මවසේන මෝහමූලං "විචිකිච්ඡාසම්පයුත්තං, උද්ධච්චසම්පයුත්ත"න්ති දුවිධං වුත්තන්ති දට්ඨබ්බං. **අසන්නිට්ඨානං** සංසයෝ. **වික්ඛේපෝ** අවූපසමෝ, භන්තතාති අත්ථෝ.

තයිදං ද්වාදසවිධම්පි අකුසලචිත්තං ඡසු ආරම්මණේසු යං වා තං වා ආලම්බිත්වා උපෙක්ඛාසහගතාහේතුකකිරියාමනෝවිඤ්ඤාණධාතානන්තරං කායද්වාරාදීහි තීහි ද්වාරේහි කායකම්මාදිවසේන යථාරහං පාණාතිපාතාදිකම්මපථවසේන චේව කම්මවසේන ච උප්පජ්ජතීති වේදිතබ්බං.

**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 453 යටතේ)]**

මෝහේකහේතුකචිත්තය මූලාන්තර විරහයෙන් අතිශයින් මූඪවූයේ ක්‍රමයෙන් විචිකිත්සා යෝගයෙන් ඖද්ධත්‍යය යෝගයෙන් චංචලනුයි උපේක්ෂා සහගතම වේ. ඔහුන් දෙදෙන හට කිසි කලෙක්හිදු ස්වභාව තීක්ෂණතාදියක් නොවේ. අරමුණෙහි සංසර්පණ වශයෙන් වික්ෂේප වශයෙන් පවත්නා වූ චිත්තයන් දෙදෙනාගේ කිසි කෘත්‍යයෙක තීක්ෂණ බව හෝ උත්සාහ කටයුතු බව හෝ නැති බැවින් ඉහි සඞ්ඛාර

භේදය නොලැබේ. සෙසු අකුශල චිත්තයෙහිදු ලභ්‍යමාන වූද ඖද්ධත්‍යය වෙසසින් මෙහිම බලවත්ව සම්ප්‍රයුක්ත ධර්මයන් කෙරෙහි ප්‍රධානව පවතීනුයි මෙම ඖද්ධත්‍යයෙන් වෙසසා "උද්ධච්චසම්පයුත්තං" යී කියනලදි. එහෙයින්ම පෙළද මෙම සිත උද්ධච්චය ස්වරූපයෙන් අයි. මෙසේ අසාධාරණ ප්‍රධාන ධර්ම වශයෙන් මෝහමූලය විචිකිත්සා සම්ප්‍රයුක්තය, ඖද්ධත්‍යය සම්ප්‍රයුක්ත යයි ද්විවිධ වෙයි යැයි දතයුතු. "අසංනිට්ඨානවික්ඛේපකාලේ" යනුයෙහි අසංනිට්ඨාන නම් සංශයය වික්ෂේප නම් අව්‍යුපශමයයි. භ්‍රාන්තබව යන අර්ථයයි.

මේ දෙළොස් වැදෑරුම් අකුශල චිත්තය ෂඩාලම්බණයන් කෙරෙහි යම්තම් අරමුණක් අරමුණු කොට උපේක්ෂාසහගතාහේතුකක්‍රියාමනෝවිඥාන ධාත්වානන්තරයෙහි කායද්වාරාදී ත්‍රිවිධ ද්වාරයෙන් කායකර්මාදී වශයෙන් යථායෝගයෙන් ප්‍රාණාතිපාතාදී කර්මපථ වශයෙනුදු කර්ම වශයෙනුදු උපදනේ යයි දතයුතු.

**[විසුද්ධි මාර්ග සන්නය 1090-1091 පිට; සිංහල විසුද්ධි මාර්ගය විඥානස්කන්ධනිර්දේශය 198 පිට (තායිවාන් මුද්‍රණය)]**

යස්මා ච ඉදං චිත්තද්වයං සත්තානං පකතිසභාවභූතන්ති පයෝගේන වා උපායේන වා කේනචි උප්පාදේතබ්බං නාම නත්ථි. සබ්බකාලම්පි භවඞ්ගචිත්තං විය අනෝසක්කමානං අසංසීදමානං අකිච්ඡේන අකසිරේන පවත්තති. තස්මා ඒකන්තේන අසඞ්ඛාරිකමේව හෝතීති කත්වා ඉධ සඞ්ඛාරභේදෝ න ගහිතෝති දට්ඨබ්බං. තේනේව ච පාළියංපි පුරිමචිත්තේසු විය ඉධ සසඞ්ඛාරේනාති දුතියචිත්තවාරෝ න වුත්තෝති. අයමෙත්ථ පරමත්ථදීපනා.

**විභාවනියං** පන ඉමානි ද්වේ චිත්තානි අතිසම්මුළ්හතාය අතිචඤ්චලතාය ච සබ්බත්ථපි රජ්ජනදුස්සනරහිතානි හොන්ති. තස්මා උපෙක්ඛාසහගතානේව පවත්තන්තීති වුත්තං. තං න සුන්දරං. රජ්ජන සහිතානංපි ලෝභමූලචිත්තානං උපෙක්ඛායොගස්ස දිට්ඨත්තාති.

යඤ්ච තත්ථ **මහාටීකායඤ්ච** "තතෝයේව ච සභාවතික්ඛතාය උස්සාහේතබ්බතාය ච අභාවතෝ සඞ්ඛාරභේදෝපි නේසං නත්ථී"ති වුත්තං. තත්ථ සභාවතික්ඛතාය අභාවතෝති ඉමිනා ඉමස්ස අසඞ්ඛාරිකභාවං පටික්ඛිපති. උස්සාහේතබ්බතාය අභාවතෝති ඉමිනා සසඞ්ඛාරිකභාවං පටික්ඛිපති. තදුභයේන පන ඉදං චිත්තද්වයං සබ්බසෝ සඞ්ඛාරවිමුත්තං හෝතීති දස්සේති. තං අට්ඨකථායපි තාව න සමේති.

පටිච්චසමුප්පාදවිභඞ්ගඅට්ඨකථායඤ්හි සඞ්ඛාරභේදේන අවිජ්ජාය දුවිධභාවෝව වුත්තෝ. යදි ච ඉදං ද්වයං සඞ්ඛාරමුත්තං සියා. ඒවං සති ඉධ මෝහෝපි සඞ්ඛාරමුත්තෝ සියා. සෝච අවිජ්ජායේවාති තිවිධභාවෝව අවිජ්ජාය තත්ථ වත්තබ්බෝ. නච වුත්තෝති. ඒවං තාව අට්ඨකථාය නසමේති.

යස්මාච ඉධ තික්ඛභාවෝ නාම විනා සඞ්ඛාරේන කේවලං පකති පච්චය ගණ වසේනේව පවත්තනසමත්ථතා වුච්චති. ඉදඤ්ච චිත්තං තථේව පවත්තති. තස්මා ඉදං සභාවතික්ඛං න හෝතීති න සක්කා වත්තුන්ති.

ලද්ධෝකාසේන මෝහේන සුට්ඨු මුය්හන්තීති මෝහමූහානීති වත්තබ්බේ නිරුත්තනයේන මෝමූහානීති වුත්තං. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 28 යටතේ)]**

“අනෝසක්කමාන”න්ති පච්ඡතෝ අනිවත්තමානං. “අසංසීදමාන”න්ති හෙට්ඨතෝ අපතමානං. උභයේන අබ්බොච්ඡින්නනන්ති වුත්තං හෝති. “අතිසම්මුළ්හතායා”ති මූලන්තර විරහේන මෝහේන අතිසම්මුළ්හතාය. “අතිවඞ්වලතායා”ති සංසප්පමානවික්ඛිපමාහේහි විචිකිච්ඡුද්ධච්චේහි අතිවඞ්වලතාය. “සබ්බත්ථපී”ති සබ්බේසුපි ආරම්මණේසු. අට්ඨකථායං සඞ්ඛාර භේදේන අවිජ්ජාය දුවිධභාවෝව වුත්තෝ. කථං වුත්තෝ. අවිජ්ජා අප්පටිපත්ති මිච්ඡා පටිපත්තිතෝ දුවිධා තථා සසඞ්ඛාරාසඞ්ඛාරතෝති වුත්තෝ. “තිවිධභාවෝවා”ති ඉමස්මිං චිත්තේ සඞ්ඛාරවිමුත්තාය අවිජ්ජාය සද්ධිං තිවිධභාවෝව. ඉමේසං ද්වින්නං චිත්තානං උප්පත්තිවිධානං විසුද්ධිමග්ගේ සඞ්ඛේපතෝව වුත්තං තස්ස අසන්නිට්ඨානවික්ඛේපකාලේ පවත්ති වේදිතබ්බාති.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 28 යටතේ)]**

**යස්මා** යම්හෙයකින් **සත්තානං** සත්වයන්ට **පකතිසභාවභූතං** ප්‍රකෘති ස්වභාවයෙන් හටගන්නා වූ **ඉදං චිත්තද්වයං ච** මේ සිත් දෙදෙන ද **කේනචි** කිසියම් **පයෝගේන වා** ප්‍රයෝගයකින් හෝ **උපායේන වා** උපායකින් හෝ **උප්පාදේතබ්බං නාම** ඉපදවිය යුතු සිතක් නම් **නත්ථි** නැත සබ්බකාලම්පි සියළු කාලයෙහිදු **භවඞ්ගචිත්තං විය** භවඞ්ග චිත්තය මෙන් **අනෝසක්කමානං** පසු නොබසිමින් **අසංසීදමානං** ගිලා නොබසිමින් **අකිච්ඡේන** වෙහෙසක් නොමැතිව **අකසිරේන** පීඩා නොමැතිව **පවත්තති (උප්පජ්ජති)** උපදී **තස්මා** එහෙයින් **ඒකන්තේන** ඒකාන්තයෙන් **අසඞ්ඛාරිකමේව හෝතීති කත්වා** අසංස්කාරිකම වේයයි කොට **ඉධ** මෙහි **සඞ්ඛාරභේදෝ** සංස්කාර භේදය **න ගහිතෝ ඉති** නොගන්නා ලද්දේ යැයි **දට්ඨබ්බං** දතයුතුයි **තේනේව ච** එහෙයිම ද **පාළියම්පි** දම්සඟුණු පාළියෙහිද **පුරිමචිත්තේසු විය** පූර්ව චිත්තයන්හි මෙන් **ඉධ** මේ මෝමූහ චිත්තයන්හි **සසඞ්ඛාරේන ඉති** සසංස්කාරයෙන් යැයි **දුතියචිත්තවාරෝ** දෙවැනි චිත්තවාරයක් **න වුත්තෝ** නොම වදාරණ ලදැයි **ඉති (දට්ඨබ්බෝ)** දතයුතුයි **එත්ථ** මෙහි **අයං පරමත්ථදීපනා** මේ පරමත්ථදීපනීයයි.

**විභාවනියං පන** විභාවනී ටීකායෙහි වනාහි **ඉමානි ද්වේ චිත්තානි** මේ මෝමූහ චිත්තයෝ දෙදෙන **අතිසම්මූළ්හතාය ච** අතිශ්‍රයින් මුළාව ඇති බැවින් ද **අතිවඤ්චලතාය** අතිශ්‍රයින් සැලෙන බැවින් ද **සබ්බත්ථපි** සියළු ආරම්මණයන්හි ද **රජ්ජනදුස්සනරහිතානි හොන්ති** නොඇලෙන නොගැටෙන චිත්තයෝ වෙති **තස්මා** එබැවින් **උපෙක්ඛාසහගතානේව** උපේක්ෂාසහගත චිත්තයෝම වී **පවත්තන්ති ඉති (උප්පජ්ජන්ති ඉති)** උපදිත් යැයි **වුත්තං** කියනලදි **රජ්ජනසහිතානම්පි** ඇලීම් සහිත වූ **ලෝභමූලචිත්තානං** ලෝභමූල චිත්තයන්ගේ ද **උපෙක්ඛායෝගස්ස** උපේක්ෂාවගේ යෙදීම **දිට්ඨත්තා** දකිනලද බැවින් **තං** ඒ කීම **න සුන්දරං** යහපත් නොවෙයි.

**තත්ථ මහාටීකායඤ්ච** ඒ විසුද්ධිමග්ග මහා ටීකායෙහි “තතෝයේව ච සභාවතික්ඛතාය උස්සාහේතබ්බතාය ච අභාවතෝ සඞ්ඛාරභේදෝපි නේසං නත්ථී” **ඉති** යැයි **යං වුත්තං** යමක් කියනලදි ද **තත්ථ** එහි **සභාවතික්ඛතාය** ස්වභාවයෙන් තීක්ෂණ බව **අභාවතෝති** නැති බැවින් යන **ඉමිනා (වචනේන)** මේ වචනයෙන් **ඉමස්ස** මොමූහ චිත්තයාගේ **අසඞ්ඛාරිකභාවං** අසංස්කාරික බව **පටික්ඛිපති** ප්‍රතික්ෂේප කරයි **උස්සාහේතබ්බතාය** උත්සාහ කටයුතු බව **අභාවතෝති** නැති බැවින් යන **ඉමිනා (වචනේන)** මේ වචනයෙන් **සසඞ්ඛාරිකභාවං** සසංස්කාරික බව **පටික්ඛිපති**

ප්‍රතික්ෂේප කරයි **තදුභයේන පන** ඒ වචන දෙකෙන් වනාහි **ඉදං චිත්තද්වයං** මේ චිත්තයෝ දෙදෙන **සබ්බසෝ** සියළු ආකාරයෙන් **සඞ්ඛාරවිමුත්තං හෝති ඉති** සංස්කාරයන්ගෙන් විනිර්මුක්ත වේයැයි **දස්සේති** දක්වයි **තං** එය **අට්ඨකථායපි** අර්ථකථාවට ද **න සමේති** සම නොවෙයි.

**පටිච්චසමුප්පාදවිභඞ්ගට්ඨකථායඤ්හි** පටිච්චසමුත්පාද විභඞ්ග අර්ථකථායෙහි වනාහි **සඞ්ඛාරභේදේන** සංස්කාර භේදයෙන් **අවිජ්ජාය** අවිද්‍යාවගේ **දුවිධභාවෝව** දෙවැදෑරුම් බවම **වුත්තෝ** දේශනා කරනලදි **යදි ච** ඉදින් **ඉදං ද්වයං** මේ දෙසිත **සඞ්ඛාරමුත්තං සියා** සංස්කාරයන්ගෙන් මුක්ත වන්නේ නම් **එවං සති** මෙසේ ඇති කල්හි **ඉධ** මේ දෙසිතෙහි **මෝහෝපි** මෝහය ද **සඞ්ඛාරමුත්තෝ සියා** සංස්කාරයන්ගෙන් මුක්ත වන්නේය **සෝ ච තිවිධභාවෝව** ඒ තෙවැදෑරුම් භාවයම **අවිජ්ජායේව ඉති** අවිද්‍යාවගේම හෙයින් **තතථ** මේ මෝමූහ දෙසිතෙහි **(සඞ්ඛාරවිමුත්තාය) අවිජ්ජාය (සද්ධිං)** සංස්කාරයන්ගෙන් මිදිනාවූ අවිද්‍යාව සමඟ **වත්තබ්බෝ** කිවයුතුයි **නව වුත්තෝ** එසේද නොකියනලදි **ඒවං** මෙසේද **තාව** පළමුව **අට්ඨකථාය** අර්ථකථාව හා සමග **න සමේති** සම නොවෙයි.

**යස්මා ච ඉධ** යම්හෙයකින් මෙහි **තික්ඛභාවෝ නාම** තියුණු බව නම් **සඞ්ඛාරේන විනා** සංස්කාරයන් නැතිව **කේවලං** හුදෙක් **පකති පච්චයගණවසේනේව** ප්‍රකෘති ප්‍රත්‍යයගණ වශයෙන්ම **පවත්තනසමත්ථතා** පැවැත්මට සමර්ථ බව **වුච්චති** කියනු ලැබෙයි **ඉදඤ්ච චිත්තං** මේ චිත්තය ද **තථේව** එසේම **පවත්තති (උප්පජ්ජති)** උපදි **තස්මා** එබැවින් **ඉදං** මේ චිත්තය **සභාවතික්ඛං** ස්වභාවයෙන් තියුණු **න හෝතීති** නොවෙයි යැයි **වත්තුං න සක්කා** කියන්නට නොහැක්කාහ.

**ලද්ධෝකාසේන මෝහේන** ලබනලද අවකාශ ඇති මෝහයෙන් **සුට්ඨු** මනාව **මුය්හන්තීති** මුළාකරත් නුයි **මෝහමූහානීති** මෝහමූහ යැයි **වත්තබ්බේ** කිවයුතු කල්හි **නිරුත්තිනයේන** නිරුත්ති ක්‍රමයෙන් **මෝමූහානීති** මෝමූහ යැයි **වුත්තං** දේශනා කරනලදි.
**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

තත්ථ සඞ්ඛාරාසඞ්ඛාරාභාවෝ කස්මා න වුත්තෝ? ඉමස්මිං වනේ චෝරා වා වාළමිගා වා වසන්තීති මුසා භණිත්වා අහිතකාමා පච්චත්ථිකා විමතිං උප්පාදේතුං සක්කොන්ති. තථා තං චිත්තං සසඞ්ඛාරිකං කස්මා න හෝති? එත්ථ වදම; ඉධ පුබ්බයෝගෝ අත්ථි, තේන පන පුබ්බයෝගේන කිඤ්චි කාතුං න සක්කොන්ති. විචිකිච්ඡා වසේන ද්වේළ්හක ජාතෝ. විසීදති සංසීදති. සෝ පුබ්බයෝගෝ අඑලෝ, සඞ්ඛාරෝති වත්තුං න යුත්තෝ. උද්ධච්චං පුබ්බයෝගේන න උප්පජ්ජති. යද සත්තා අනේක කිච්චපසුතා වා බහුං වාචෙන්තා වා විචාරේන්තා වා සපරහිතං චින්තේතුං අසමත්තා හොන්ති, තද තේසං චිත්තං භන්තං හෝති. චිත්තස්ස භන්තතා ඒවහි උද්ධච්චං, තං පරේ කථං උප්පාදෙස්සන්ති? තස්මා ඉමේසු ද්විසුපි චිත්තේසු සසඞ්ඛාරාසඞ්ඛාරාභාවෝ න පරියේසිතබ්බෝ. **[නවනීත ටීකා 04-05 පිටු]**

**තතථ (චිත්තේ)** ඒ මෝහමූහ චිත්තයෙහි **සඞ්ඛාරාසඞ්ඛාරභාවෝ** සංස්කාර අසංස්කාර බව **කස්මා** කුමක් හෙයින් **න වුත්තෝ?** නොකියන ලදිද? **ඉමස්මිං වනේ** මේ වනයෙහි **චෝරා වා** සොරු හෝ **වාළමිගා වා** චණ්ඩ වන මෘගයෝ හෝ **වසන්ති ඉති** වසත් යැයි **මුසා භණිත්වා** මුසාබස් කියා **අහිතකාමා පච්චත්ථිකා** දියුණුව අකැමැති පසමිතුරෝ **විමතිං** විමති **උප්පාදේතුං** උපදවන්නට **සක්කොන්ති** හැකිවෙත් **තථා** එසේ ගන්නා කල **තං චිත්තං** ඒ චිත්තය **කස්මා** කුමක් හෙයින් **සසඞ්ඛාරිකං**

සසංස්කාරික **න හෝති?** නොවෙයි ද? **එත්ථ** මේ කාරණෙහි ලා (**මයං ඒවං** අපි මෙසේ) **වදම** කියමු **ඉධ** මෙහි **පුබ්බයෝගෝ** **අත්ථි** පූර්ව යෙදීමක් ඇත **තේන පන පුබ්බයෝගේන** ඒ පූර්ව යෙදීමෙන් වනාහි **කිඤ්චි** කිසිවක් **කාතුං** කරන්නට **න සක්කොන්ති** නොහැකි වෙත් **විචිකිච්ඡාවසේන** විචිකිච්ඡා වශයෙන් **ද්වේළ්හකජාතෝ** එකක් නියම කරගත නොහැකි වූවෙක් වෙයි **විසීදති** කලකිරීමට පත් වෙයි **සංසීදති** පසු බසී **සෝ පුබ්බයෝගෝ** ඒ පූර්ව යෙදීම **අඵලෝ** ඵල රහිතය **සඞ්ඛාරෝති** සංස්කාරයැයි **වත්තුං** කියන්නට **න යුත්තෝ** යුතු නොවෙයි **උද්ධච්චං** උද්ධච්ච සිත **පුබ්බපයෝගේන** පූර්ව යෙදීමෙන් **න උප්පජ්ජති** නූපදී **යදා** යම්කලෙක **අනේකකිච්චපසුතා** නොයෙක් කෘත්‍යයන්හි යෙදුනා වූ **සත්තා** සත්වයෝ **වා** හෝ **බහුං වාචෙන්තා වා** බොහෝ කොට කියවන්නා වූ සත්වයෝ හෝ **විචිරෙන්තා වා** විමසන්නා වූ සත්වයෝ හෝ **සපරහිතං** අනුන්ගේ යහපත සහිතව **චින්තේතුං** සිතන්නට **අසමත්ථා හොන්ති** සමර්ථයෝ නොවෙත් **තදා** එකල්හි **තේසං** ඔහුන්ගේ **චිත්තං** සිත **භන්තං හෝති** නැසෙන ලද්දේ වෙයි **චිත්තස්ස** චිත්තයාගේ **භන්තතා ඒව හි** නැසුනු බවම **උද්ධච්චං** උද්ධච්චය නම් වෙයි **පරේ** අන්‍යයෝ **තං (චිත්තං)** ඒ සිත **කථං** කෙසේ **උප්පාදෙස්සන්ති?** උපදවන්නාහු ද? **තස්මා** එහෙයින් **ඉමේසු ද්වීසුපි චිත්තේසු** මේ සිත් දෙකෙහි **සසඞ්ඛාරාසඞ්ඛාරභාවෝ** සසංස්කාර අසංස්කාර බව **න පරියේසිතබ්බෝ** නොසවියයුතුයි. **[නවනීත ටීකා පරිවර්තනයි]**

## අකුසල පදය විස්තර කර ඇති අයුරුඃ—

**සබ්බං අකුසල**න්ති ද්වාදස විධං අකෝසල්ලසම්භූතං අකුසලං.
**[මහානිද්දේස අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 25 යටතේ); මහානිද්දේස අටුවා 155 පිට (හේ.වි.මු)]**

**සබ්බං අකුසලං ඉති** සියළු අකුසල් යනු **අකෝසල්ලසම්භූතං** නුනුවණින් උපදින ලද්දවූ **ද්වාදසවිධං** දෙළොස් වැදෑරුම් වූ **අකුසලං** අකුසල් චිත්තයෝයි. **[මහානිද්දේස අටුවා පරිවර්තනයි]**

න කුසලන්ති **අකුසලං,** කුසලපටිපක්ඛන්ති අත්ථෝ. න කුසලන්ති හි කුසලපටික්ඛේපේන අකුසලපදස්ස අවයවභේදේන අත්ථේ වුච්චමානේ යථා යං ධම්මජාතං න අරෝගං, න අනවජ්ජං, න සුඛවිපාකං, න ච කෝසල්ලසම්භූතං, තං අකුසලන්ති අයමත්ථෝ දස්සිතෝ හෝති, ඒවං යං න කුච්ඡිතානං සලනසභාවං, න කුසානං ලවනසභාවං, න කුසේන කුසේහි වා පවත්තේතබ්බං, න ච කුසෝ විය ලවනකං, තං අකුසලං නාමාති අයම්පි අත්ථෝ දස්සිතෝ හෝති. එත්ථ ච යස්මා කුසලං අකුසලස්ස උජුවිපච්චනීකභූතං, යතෝ චේතසිකරෝගපටිපක්ඛාදිභාවතෝ අරෝගාදිපරියායේනපි බෝධිතං, තස්මා අකුසලං පන කුසලස්ස උජුවිපච්චනීකභූතන්ති වුත්තං "කුසලපටිපක්ඛන්ති අත්ථෝ"ති. තං පන යථාක්කමං පහායකපහාතබ්බභාවේනේවාති දට්ඨබ්බං.
**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 451 යටතේ); මූලපණ්ණාස ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 89 සම්මාදිට්ඨිසුත්ත වණ්ණනා යටතේ)]**

"න කුසලන්ති අකුසලං" කුශල ප්‍රතිපක්‍ෂනුයි අකුශල නම් වේ යන අර්ථය දක්වනලද වේ. "න කුසලං" යී කුශල ප්‍රතිපක්‍ෂයෙන් අකුශල ශබ්දයාගේ අවයව භේදයෙන් අර්ථ කියනු ලබන කල්හි යම් ධර්මජාතයෙක් අරෝග නොවේ ද අනවද්‍ය නොවේ ද සුඛවිපාක නොවේ ද කෝසල්ලසම්භූත නොවේ ද හේ අකුශල නම් වේ යයි

යන මේ අර්ථය දක්වන ලද වේ. එසේම යමක් කුත්සිතයන්ගේ සලන ස්වභාව නැත්තේ වේද කුශලයන්ගේ ලවන ස්වභාව නැත්තේ වේද කුසයෙන් කසුයන්ගෙන් හෝ පැවැත්විය යුතු නොවේ ද කුසය මෙන් නොද කපන්නේ වේද හේ අකුශල නැමැයි යන මේ අර්ථය ද දක්වනලද වේ. යම් හෙයකින් කුශලය අකුශලයට සෘජු ප්‍රතිපක්‍ෂ ද යම් හෙයකින් චෛතසික රෝග ප්‍රතිපක්‍ෂාදී භාවයෙන් අරෝගාදී පර්‍යායයෙන් ද අවබෝධ කරන ලද්දේ ද එහෙයින් අකුශලය ද කුශලයට සෘජු ප්‍රතිපක්‍ෂනුයි "කුශල ප්‍රතිපක්‍ෂනුයි අකුශල නම් වෙයි යන අර්ථයි" කියනලදි. හේද යථාක්‍රමයෙන් ප්‍රභායක ප්‍රභාතව්‍යභාවයෙනැයි දතයුතු. **[විසුද්ධි මාර්ග සන්නය 1081 පිට]**

න කුසලා **අකුසලා**. මිත්තපටිපක්ඛා අමිත්තා විය, ලෝභාදිපටිපක්ඛා අලෝභාදයෝ විය ච, කුසලපටිපක්ඛාති අත්ථෝ.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා තිකමාතිකාපද වණ්ණනා අංක 01 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 63 පිට (හේ.වි.මු)]**

**අකුසලාති** කුසලපටිසේධනමත්තං කුසලාභාවමත්තවචනං තදඤ්ඤමත්තවචනං වා ඒතං න හෝති, කින්තු තප්පටිපක්ඛවචනන්ති දස්සේතුං **"මිත්තපටිපක්ඛා අමිත්තා වියා"**තිආදි වුත්තං. තප්පටිපක්ඛවචනතා ච අබ්‍යාකතතතියරාසිවචනේන විඤ්ඤායති. යදි හි කුසලාභාවමත්තවචනං අකුසලසද්දෝ, තේන න කෝචි ධම්මෝ වුත්තෝති අබ්‍යාකතවචනේනේව ච තතියෝ රාසි වුත්තෝ න සියා, කුසලා චේව ධම්මා අබ්‍යාකතා චාති දුකෝවායං ආපජ්ජති, න තිකෝ, ඒවඤ්ච සති අකුසලවචනේන න කෝචි අත්ථෝ. අථ සියා, "අනබ්‍යාකතා"ති ච වත්තබ්බං සියා කුසලානං විය අබ්‍යාකතානඤ්ච අභාවමත්තසම්භවා, තස්මා අභාවමත්තවචනේ අබ්‍යාකතභාවමත්තං විය කුසලාභාවමත්තං අකුසලං න කෝචි රාසීති "අබ්‍යාකතා"ති තතියෝ රාසි න සියා. තතියරාසිභාවේන ච අබ්‍යාකතා වුත්තාති අකුසලෝ ච ඒකෝ රාසීති විඤ්ඤායති. තස්මා නාභාවවචනතා, සභාවධාරණාදිඅත්ථේන ධම්මසද්දේන සමානාධිකරණභාවතෝ ච අකුසලසද්දස්ස කුසලාභාවමත්තවචනතා න හෝති, නාපි තදඤ්ඤමත්තවචනතා තතියරාසිවචනතෝ ඒව. යදි හි කුසලේහි අඤ්ඤේ අකුසලා චේතසිකේහි අඤ්ඤේ අචේතසිකා විය, කුසලාකුසලවචනේහි සබ්බේසං ධම්මානං සඞ්ගහිතත්තා අසඞ්ගහිතස්ස තතියරාසිස්ස අභාවා චේතසිකදුකෝ විය අයඤ්ච දුකෝ වත්තබ්බෝ සියා "කුසලා ධම්මා අකුසලා ධම්මා"ති, න "අබ්‍යාකතා"ති තතියෝ රාසි වත්තබ්බෝ, වුත්තෝ ච සෝ, තස්මා න තදඤ්ඤමත්තවචනං අකුසලසද්දෝ, පාරිසේසේන තප්පටිපක්ඛේසු අ-කාරස්ස පයෝගදස්සනතෝ ලෝකේ "අමිත්තා"ති සාසනේ "අලොභෝ"ති ඉධාපි තප්පටිපක්ඛවචනතා අකුසලසද්දස්ස සිද්ධා, තත්ථ නිරුළ්හත්තා ච න ඉතරවචනතා, තප්පටිපක්ඛභාවෝ ච විරුද්ධසභාවත්තා තප්පහෙය්‍යභාවතෝ ච වේදිතබ්බෝ, න කුසලවිනාසනතෝ. න හි කුසලා අකුසලේහි පහාතබ්බා, මහාබලවතාය පන කුසලායේව පයෝගනිප්ඵාදිතා සදනුසයිතේ අකුසලේ තදඞ්ගවික්ඛම්භනසමුච්ඡේදවසේන පජහන්තීති.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා තිකමාතිකාපද වණ්ණනා අංක 01 යටතේ)]**

**කුසලපටිසේධනං** කුසලාභාවෝ ඒව. අභාවෝ හි සත්තාපටිසේධෝති.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා තිකමාතිකාපද වණ්ණනා අංක 01 යටතේ)]**

**යේ ධම්මා** යම් ධර්ම කෙනෙක් තුමූ **කුසලා න** කුසල් නම් ඇත්තාහු නොවේද්ද **ඉති (තස්මා)** එසේ හෙයින් **තේ ධම්මා** ඒ ධර්මයෝ තුමූ **අකුසලා** අකුසල් නම් වෙත්

**මිත්තපටිපක්ඛා අමිත්තා විය** මිත්‍රයාගේ විරුද්ධ පක්‍ෂයෙහි වූවාහු අමිත්‍ර නම් වන්නාක්හු මෙන් **ලෝභාදිපටිපක්ඛා** ලෝභාදීන්ට විරුද්ධ පක්‍ෂයෙහි වූ **අලෝභාදයෝ විය ච** අලොභාදී නම් ඇත්තාහු මෙන් **කුසලපටිපක්ඛා** කුසලයට විරුද්ධ පක්‍ෂයෙහි වූ ධර්මයෝ තුමූ **අකුසලා** අකුසල් නම් වෙත් **ඉති (අත්ථෝ)** යන මේ අර්ථය **දට්ඨබ්බෝ** දතයුත්තේයි. **[අර්ථශාලිනී අර්ථකථා සන්නය 205 පිට]**

"කිලේසාතුරතාය අනාරොග්‍යට්ඨේන කිලේසවජ්ජසබ්භාවතෝ සාවජ්ජට්ඨේන අවිජ්ජාසම්භූතතාය අකෝසල්‍යසම්භූතට්ඨේන අකුසල"න්ති ච

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 365 යටතේ)]**

**කිලේසාතුරතාය** ක්ලේශයන්ගෙන් ගිලන් වූ බැවින් **අනාරෝග්‍යට්ඨේන ච** අනාරෝග්‍ය අර්ථයෙන් ද **කිලේසවජ්ජසබ්භාවතෝ** රාගාදී කෙලෙස් වැරදි ස්වභාවයෙන් යුක්ත බැවින් **සාවජ්ජට්ඨේන ච** වැරදි සහිත අර්ථයෙන් ද **අවිජ්ජාසම්භූතතාය** අවිද්‍යාවෙන් හටගත් බැවින් **අකෝසල්‍යසම්භූතට්ඨේන ච** නුනුවණින් උපදිනලද අර්ථයෙන් ද **අකුසලං ඉති** අකුසල යැයි (**වුච්චති** කියනු ලැබෙයි). **[ධම්මසඞ්ගණී අනුටීකා පරිවර්තනයි]**

සාවජ්ජානිට්ඨවිපාකලක්ඛණමකුසලං

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ)]**

සාවජ්ජානිට්ඨවිපාකලක්ඛණං අකුසලං.

**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 11 යටතේ)]**

**සාවජ්ජානිට්ඨවිපාකලක්ඛණමකුසල**න්ති එත්ථාපි "වජ්ජා රාගාදයෝ, තේ යස්ස සන්ති, තං සාවජ්ජං, අනිට්ඨෝ විපාකෝ යස්ස, තං අනිට්ඨවිපාක"න්ති ආදිනා වුත්තනයානුසාරේන පටිපක්ඛයෝජනා දට්ඨබ්බා. රසාදිතෝ පනේතං අනත්ථජනනරසං, සංකිලේසපච්චුපට්ඨානං. අථ වා ගාරය්හභාවතෝ සාවජ්ජලක්ඛණමේව, සංකිලේසභාවරසං, අනිට්ඨවිපාකපච්චුපට්ඨානං, අයෝනිසෝමනසිකාරපදට්ඨානං. වචනත්ථතෝ පන න කුසලන්ති **අකුසලං,** කුසලපටිපක්ඛන්ති අත්ථෝ. පටිපක්ඛත්ථේ හි අයං අකාරෝ, න පන අඤ්ඤත්ථේ, නාපි අභාවේ. ඉතරථා හි තිකං න සියා, දුකං, චතුක්කං වා ආපජ්ජෙය්‍ය. තථා හි යදි කුසලතෝ අඤ්ඤමකුසලං සියා, තද අබ්‍යාකතස්සාපි තතෝ අඤ්ඤභාවේන අකුසල-සද්දසඞ්ගහෝති කුසලාකුසලජාතිභේදතෝ දුවිධන්ති දුකං වත්තබ්බං. යදි ච කුසලාභාවෝ අකුසලං, තේන න කාචි ජාති ගය්හතීති කුසලාබ්‍යාකතජාතිභේදතෝ දුකමේව වත්තබ්බං. අථ සියා "අභාවෝපි විසුං ගහේතබ්බෝ"ති, ඒවං සති තස්ස ජාතියා අභාවතෝ ජාති-සද්දේන සහ සම්බන්ධෝ න සියා. විජ්ජමානස්ස හි ජාති නාම හෝති. යථේව වා කුසලස්ස අභාවෝ, ඒවං අබ්‍යාකතස්සාපි අභාවෝ අත්ථීති අනබ්‍යාකතජාතිපි වත්තබ්බාති චතුක්කං ආපජ්ජෙය්‍ය. න චේතමිට්ඨං කුසලාදිවසේන තිවිධජාතියා ඒව ඉච්ඡිතත්තා, **පාළියඤ්ච** "කුසලා ධම්මා අකුසලා ධම්මා අබ්‍යාකතා ධම්මා"ති තිකවසේනේව වුත්තත්තා "කුසලපටිපක්ඛ"න්ති පන වුච්චමානේ මිත්තපටිපක්ඛෝ අමිත්තෝ විය, ලෝභපටිපක්ඛෝ අලෝභෝ විය ච යං ධම්මජාතං කුසලස්ස උජුවිපච්චනීකභූතං, තං අකුසලන්ති තස්ස වසේන තිකං උපපන්නං හෝති, උජුවිපච්චනීකතා චස්ස සාවජ්ජානිට්ඨවිපාකත්තා, තේන පහාතබ්බභාවතෝ ච වේදිතබ්බා, න පන කුසලවිනාසනතෝ. න හි අකුසලේන කුසලං පහීයති, මහාබලත්තා පන කුසලමේව තං පජහති. කුසලඤ්හි මහාබලං, අකුසලං දුබ්බලං. තේනේවාහ "අබලා නං බලීයන්ති, මද්දන්තේ නං පරිස්සයා"ති (සු. නි. 776), තස්මා


පටුන

කුසලමේව යථාවුත්තනයේන අකුසලස්ස පහායකං, නාකුසලං ඉතරස්සාති වේදිතබ්බං.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 54 පිට]**

"සාවජ්ජානිට්ඨවිපාකලක්ඛණමකුසලං" යන මෙහි ද "වජ්ජා රාගාදයෝ තේ යස්ස සන්ති තං සාවජ්ජං අනිට්ඨෝ විපාකෝ යස්ස තං අනිට්ඨවිපාකං" යනා දී යට කියනලද ක්‍රමානුසාරයෙන් ප්‍රතිපක්ෂාර්ථ යෝජනාව දතයුත්තීය. රසාදී වශයෙන් වනාහි ඒ අකුසලය තෙම "අනත්ථජනනරසං" යනුවෙන් අනර්ථ ඉපදීම කෘත්‍යය කොට ඇත්තේය. "සඞ්කිලේසපච්චුපට්ඨානං" සිත කෙලසීම ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය. නොහොත් ගැරහිය යුතු බැවින් "සාවජ්ජලක්ඛණමේව" සාවද්‍ය ස්වභාවම ඇත්තේය. "සඞ්කිලේසභාවරසං, අනිට්ඨවිපාකපච්චුපට්ඨානං, අයෝනිසෝමනසිකාරපදට්ඨානං" යනුවෙන් සිත කෙලසීම කෘත්‍යය කොට ඇත්තේය. අනිෂ්ට විපාක දීම ඵල කොට ඇත්තේ. අනුපාය හෙයින් මෙනෙහි කිරීම ආසන්න කාරණා කොට ඇත්තේය. වචනාර්ථ වශයෙන් වනාහි "න කුසලන්ති අකුසලං" යනු වේ. කුසලයට ප්‍රතිපක්ෂය යනාර්ථයි. ඒ එසේමැයි; මේ අ-කාරය තෙමේ ප්‍රතිපක්ෂාර්ථයෙහි වැටේ. අන්‍ය අර්ථයෙහි නොවැටේ. අභාව අර්ථයෙහි ද නොවෙයි. එසේ නොගතහොත් ත්‍රිකයක් නොවන්නේය. දුක බවට හෝ චතුෂ්ක බවට හෝ පැමිණෙන්නේය. ඒ එසේමැයි; ඉදින් කුසලය කෙරෙන් අනිකක් අකුසලය වන්නේ නම් එකල්හි අව්‍යාකෘතය ද එයින් අනිකක් බැවින් අකුසල ශබ්දයට සඞ්ග්‍රහ වේනුයි "කුසලාකුසලජාතිභේදතෝ දුවිධං" යි දුකය කිවයුත්තේය. ඉදින් කුසලාගේ අභාවය තෙම අකුසලය වන්නේ නම් එකල්හි එයින් කිසිජාතියක් ගනු නොලැබේනුයි "කුසලාබ්‍යාකතජාතිභේදතෝ" යි දුකයම කියයුත්තේය. එසේ වන්නේ නම් අභාවයද වෙන්ව ගතයුත්තේය. එසේ ඇති කල්හි ඒ අකුසලයාගේ ජාතියක් නැති බැවින් ජාති ශබ්දය හා සමඟ සම්බන්ධ නොවන්නේය ෴

ඒ එසේමැයි; ජාතිය නම් විද්‍යමාන වූවාහටම වෙයි. නොහොත් යම්සේ කුසලයාගේ අභාවය වේද එපරිද්දෙන්ම අව්‍යාකෘතයාගේ ද අභාවය ඇති වෙයි. එකල්හි අන්‍ය අබ්‍යාකත ජාතියක් කියයුතු වන්නේනුයි චතුෂ්කයක් පැමිණෙන්නේය. එයද අභිමත නොවෙයි. කුමක් හෙයින් ද යත්? කුසලාදී වශයෙන් ත්‍රිවිධ ජාතියක්ම කැමතිවන ලදහෙයිනි. පාළියෙහි ද "කුසලා ධම්මා අකුසලා ධම්මා අබ්‍යාකතා ධම්මා" යි ත්‍රික වශයෙන්ම වදළ හෙයිනි. "කුසලපටිපක්ඛං" යි කියනුලබන කල්හි වනාහි මිත්‍රයාහට ප්‍රතිපක්ෂ වූ අමිත්‍රයා මෙන් ද ලෝභයට ප්‍රතිපක්ෂ වූ අලෝභය මෙන් ද යම් ධර්ම සමූහයක් තෙමේ කුසලයට ඉදුරා විරුද්ධ වීද ඒ ධර්ම සමූහය අකුසල් නම් වෙයි යන ඒ අර්ථයාගේ වශයෙන් ත්‍රිකය උපදනේ වෙයි. ඔහුගේ ඉදුරා විරුද්ධ බවද සාවද්‍ය අනිෂ්ට විපාක භාවයෙන් හා ඒ කුසලය විසින් පහාතව්‍යය භාවය ඇති හෙයින් ද දතයුත්තේය. කුසලය විනාශ කරන හෙයිනැයි නොදත යුතුයි. ඒ එසේමැයි; අකුසලයෙන් කුසලය ප්‍රහාණය නොකරනු ලැබේ. මහාබල ඇති හෙයින් කුසලයම අකුසලය ප්‍රහාණය කෙරෙයි. ඒ එසේමැයි; කුසලය තෙමේ මහාබල ඇත්තේය. අකුසල තෙමේ දුර්වල වෙයි. එහෙයින් වදළහ:— "අබලා නං බලීයන්ති මද්දන්තේ නං පරිස්සයා" යි ෴ එසේ හෙයින් කුසලයම යථෝක්ත ක්‍රමයෙන් අකුසලයාගේ ප්‍රහායක ධර්මයක් වෙයි. අකුසලය තෙම කුසලයාගේ ප්‍රහායක ධර්මයක් නොවේ යැයි දතයුතුයි. **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 32-33 පිටු]**

න පුනාතීති **අපුඤ්ඤං.** කුසලානං පටිපක්ඛං **අකුසලං.**

**[අභිධානප්පදීපිකා ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 84 යටතේ)]**

**න පුනාතීති** පිරිසිදු නොකරන්නේනුයි **අපුඤ්ඤං** අපුඤ්ඤ නම් **කුසලානං** කුසලයන්ට **පටිපක්ඛං** ප්‍රතිපක්ෂ වූයේ **අකුසලං** අකුසල නම්.

**[අභිධානප්පදීපිකා ටීකා පරිවර්තනයි]**

මෙහි කාමාවචර චිත්තයා කුසලාකුසල විපාක ක්‍රියා වශයෙන් චතුර්විධ වුවද කුසලයන් හා විපාක ක්‍රියාවන් නොකියා පළමු කොට අකුසලයන්ම දක්වන්නට හේතු කිමයත්? පාපයන් හා අහේතුකයන් වර්ජිත කොට ඇති එකුන්සැට චිත්තයන්ට ද මධ්‍යම පුඩුවෙන් නොහොත් (එකසිය විසිඑක් නයින්) ඒකානූ චිත්තයන්ට ද සෝභන නාමයෙන් ව්‍යවහාර කරණු පිණිස "පාපාහේතුකමුත්තානි සෝභනානීති වුච්චරේ" යන මතු කියන ක්‍රමයට ද අනුරූප කොට පාපයන් හා අහේතුකයන් පළමු කොට දක්වන්නාහු. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 11-12 පිටු]**

කුසල් නොවන්නේ අකුසල්ය. සිත කිලිටි කරන අපිරිසිදු කරන ලාමක ධර්ම අකුසල්ය. ඒ අකුසල චෛතසිකය. අකුසල චෛතසික හා එක්ව හටගන්නා සිතුත් අකුසල්ය. **[සිත සිරුර සහ නිවන හෙවත් ධම්මසඞ්ගණී 04 පිට]**

## පාප පදය විස්තර කර ඇති අයුරු:—

පාන්ති රක්ඛන්ති අත්තානමස්මාති **පාපං,** පකාරවණ්ණාගමෝ, දුග්ගතිං පාපනතෝ වා **පාපං.** **[අභිධානප්පදීපිකා ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 84 යටතේ)]**

**පානති රක්ඛන්ති සුජනා අත්තානං අස්මාති පාපං** සජ්ජනයෝ යමක් කෙරෙන් තමන් රකිත් ද ඒ පාප නම්. **අත්තානං දුග්ගතිං පාපේතීති පාපං** තමන් දුගතියට පමුණුවන්නේ පාපයයි. පාප යන මෙහි ආදී ප-කාරය තෙමේ අපාය කියයි. එහෙයින් ප යැයි කීයේ අපායයි. මේ කරණකොට අපායට යේනුයි පාප නම්. **ප සද්දෝ එත්ථ අපායවචනෝ, තස්මා පං අපායං පේති ගච්ඡති ඒතේනාති පාපං.**

**[සද්ධර්මසාගරය 01/167 පිට; සද්ධර්මසාගරය 03/800 පිට]**

## අකුසල චිත්තයාගේ ලක්ෂණාදිය:—

"සාවජ්ජදුක්ඛවිපාකලක්ඛණං, අනත්ථජනනරසං, සංකිලේසපච්චුපට්ඨානං, අයෝනිසෝමනසිකාරපදට්ඨානං, ගාරය්හභාවතෝ වා සාවජ්ජලක්ඛණං, සංකිලේසභාවරසං, අනිට්ඨවිපාකපච්චුපට්ඨානං, යථාවුත්තපදට්ඨානමේවා"ති ච ඒවමාදිනා වුත්තනයේන අනුගන්තබ්බතාය වුත්තං **"වුත්තනයං අනුගන්ත්වා"**ති.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 365 යටතේ); මොක්පුර රන්දෙර 2/278 පිට]**

**සාවජ්ජදුක්ඛවිපාකලක්ඛණං** වරද සහිත වීම නොහොත් නරක ඵල ඇති බව ලක්ෂණයයි **අනත්ථජනනරසං** නරක ඵල දීම කෘත්‍යය රසයයි **සංකිලේසපච්චුපට්ඨානං** චිත්ත සන්තතිය කිලිටි කරවියහැකි ස්වභාවය උපට්ඨානාකාර පච්චුපට්ඨානයයි **අයෝනිසෝමනසිකාරපදට්ඨානං** අයෝනිසෝමනසිකාරය පදට්ඨානයයි **වා (අපරෝ නයෝ)** වෙනත් ආකාරයකට **ගාරය්හභාවතෝ සාවජ්ජලක්ඛණං** අකුසල ධර්මයන් නියම ලෙස ගැරහිය යුතු බැවින් වැරදි සහිත බව ලක්ෂණයයි **සංකිලේසභාවරසං** චිත්ත සන්තතිය කිලිටි කරන බව සම්පත්ති රසයයි **අනිට්ඨවිපාකපච්චුපට්ඨානං** නරක අනිෂ්ඨ විපාක ඇති බව

ඵල පච්චුපට්ඨානයයි **යථාවුත්තපදට්ඨානමේව** අයෝනිසෝමනසිකාරය පදට්ඨානයයි.
**[ධම්මසඞ්ගණී අනුටීකා පරිවර්තනයි]**

සාවජ්ජදුක්ඛවිපාකලක්ඛණා අකුසලා.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 01 තිකමාතිකාපද වණ්ණනා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 63 පිට (හේ.වි.මු)]**

**සාවජ්ජදුක්ඛවිපාකලක්ඛණා**ති එත්ථ ච වුත්තවිධිඅනුසාරේන අත්ථෝ ච යෝජනා ච යථාසම්භවං වේදිතබ්බා.

**යථාසම්භව**න්ති සහ අවජ්ජේනාති සාවජ්ජා, ගරහිතබ්බභාවයුත්තා. තේන නේසං ගරහිතබ්බසභාවං දස්සේති. අඤ්ඤෙද්පි අත්ථි දුක්ඛභාවේන ගරහිතබ්බසභාවා අකුසලවිපාකාති සාවජ්ජවචනමත්තේන තේසම්පි අකුසලතාපත්තිදෝසං දිස්වා තං පරිහරිතුං **දුක්ඛවිපාකවචන**මාහ. **අවජ්ජ**–සද්දෝ වා රාගාදීසු ඒකන්තාකුසලේසු නිරුළ්හෝති තං සහවත්තිධම්මානං ඒව සාවජ්ජභාවේ කුසලාබ්‍යාකතේහි අකුසලානං විසේසෝ සාවජ්ජවචනේනේව දස්සිතෝ. අබ්‍යාකතේහි පන විසිට්ඨං කුසලාකුසලානං සාධාරණං සවිපාකතාලක්ඛණන්ති තස්මිං ලක්ඛණේ විසේසදස්සනත්ථං දුක්ඛවිපාකලක්ඛණං වුත්තං. ඉතෝ පරං "දුක්ඛෝ විපාකෝ ඒතේසන්ති දුක්ඛවිපාකා"තිආදිනා සුඛවිපාක අනවජ්ජකුසලපදනං ඨානේ දුක්ඛවිපාකසාවජ්ජඅකුසලපදනි ඨපෙත්වා යථාවුත්ත නයේන අත්ථෝ වේදිතබ්බෝ. යෝජනා ච සාවජ්ජවචනේන අකුසලානං පවත්තිදුක්ඛතං දස්සේති, දුක්ඛවිපාකවචනේන විපාකදුක්ඛතං. පුරිමඤ්හි අත්තනෝ පවත්තිසභාවවසේන ලක්ඛණවචනං, පච්ඡිමං කාලන්තරේ විපාකුප්පාදනසමත්ථතායාති. තථා පුරිමේන අකුසලානං අවිසුද්ධසභාවතං දස්සේති, පච්ඡිමේන අවිසුද්ධවිපාකතං. පුරිමේන ච අකුසලේ කුසලසභාවතෝ නිවත්තේති, පච්ඡිමේන අබ්‍යාකතසභාවතෝ සවිපාකත්තදීපකත්තා පච්ඡිමස්ස. පුරිමේන වා අවජ්ජවන්තතාදස්සනතෝ කිච්චට්ඨේන රසේන අනත්ථජනනරසතං දස්සේති, පච්ඡිමේන සම්පත්තිඅත්ථේන අනිට්ඨවිපාකරසතං. පුරිමේන ච උපට්ඨානාකාරට්ඨේන පච්චුපට්ඨානේන සංකිලේසපච්චුපට්ඨානතං, පච්ඡිමේන ඵලට්ඨේන දුක්ඛවිපාකපච්චුපට්ඨානතං. පුරිමේන ච අයෝනිසෝමනසිකාරං අකුසලානං පදට්ඨානං පකාසේති. තතෝ හි තේ සාවජ්ජා ජාතාති. පච්ඡිමේන අකුසලානං අඤ්ඤෙද්සං පදට්ඨානභාවං විභාවේති. තේ හි දුක්ඛවිපාකස්ස කාරණං හෝතීති. එත්ථ ච **දුක්ඛ**–සද්දෝ අනිට්ඨපරියායවචනන්ති වේදිතබ්බං. අනිට්ඨචතුක්ඛන්ධවිපාකා හි අකුසලා, න දුක්ඛවේදනාවිපාකාව. **විපාක**–සද්දස්ස ඵලපරියායභාවේ පන නිස්සන්දවිපාකේන අනිට්ඨරූපේනපි දුක්ඛවිපාකතා යෝජේතබ්බා. **[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 01 තිකමාතිකාපද වණ්ණනා යටතේ)]**

**සාවජ්ජදුක්ඛවිපාකලක්ඛණා** ප්‍රාඥයන් විසින් දුරුකටයුතු වූ ගැහිය යුතු වූ රාගාදී ක්ලේශ ධර්මයන් සමඟ හටගන්නා වූ අනිෂ්ට නාමස්කන්ධ සඞ්ඛ්‍යාත වූ විපාක දීම ලක්‍ෂණ කොට ඇත්තා වූ ධර්මයෝ තුමූ **අකුසලා හොන්ති** අකුසල් නම් වෙත් (නොහොත්) ප්‍රාඥයන් විසින් දුරුකටයුතු වූ ගැරහිය යුතු වූ රාගාදී ක්ලේශයන් සමඟ හටගන්නා බවය, අනිෂ්ට වූ නාමස්කන්ධ සඞ්ඛ්‍යාත විපාක දීම ස්වභාව කොට ඇති බවය යන මේ උභය ලක්‍ෂණ ඇත්තාවූ ධර්මයෝ තුමූ **අකුසලා හොන්ති** අකුසල නම් වෙත්.
**[අර්ථශාලිනී අර්ථකථා සන්නය 207 පිට]**

න කුසලං අකුසලං, මිත්තපටිපක්ඛෝ අමිත්තෝ විය පහායකපහාතබ්බ භාවේන කුසලපටිපක්ඛන්ති අත්ථෝ. තං පන සාවජ්ජදුක්ඛවිපාකලක්ඛණං, සාවජ්ජානිට්ඨවිපාක ලක්ඛණං වා, අනත්ථජනනරසං, අනිට්ඨවිපාකපච්චුපට්ඨානං, අයෝනිසෝමනසිකාරපදට්ඨානං. **[නමක්කාර ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 01 යටතේ)]**

මිත්‍රයා හට ප්‍රතිපක්‍ෂ වූ අමිත්‍රයා මෙන් යම් ධර්ම සමූහයක් තෙමේ කුසලයට ඉදුරා විරුද්ධ වීද ඒ ධර්ම සමූහය අකුසල් නම් වෙයි. අකුසලය තෙමේ කුසලය විසින් පහාතව්‍යය භාවය ඇති හෙයින් කුසලයට ප්‍රතිපක්‍ෂ යන අර්ථ ඇත්තේය. (කුසලය විනාශ කරන හෙයිනැයි නොදත යුතුයි. ඒ එසේමැයි; අකුසලයෙන් කුසලය ප්‍රහාණය නොකරනු ලැබේ. මහාබල ඇති හෙයින් කුසලයම අකුසලය ප්‍රහාණය කෙරෙයි) ලක්‍ෂණාදී වශයෙන් වනාහි ඒ අකුසලය තෙම "සාවජ්ජදුක්ඛවිපාකලක්ඛණං" යනුවෙන් සාවද්‍යය වූ දුක් විපාක ලක්‍ෂණ කොට ඇත්තේය. "අනත්ථජනනරසං" යනුවෙන් අනර්ථ ඉපදීම කෘත්‍යය කොට ඇත්තේය. අනිට්ඨවිපාකපච්චුපට්ඨානං" යනුවෙන් අනිෂ්ටවිපාකදීම ඵලය කොට ඇත්තේය. "අයෝනිසෝමනසිකාරපදට්ඨානං" යනුවෙන් අනුපාය හෙයින් මෙනෙහි කිරීම ආසන්න කාරණා කොට ඇත්තේය.

**[නමක්කාර ටීකා පරිවර්තනයයි]**

## ලෝභ සිත මුලින් දැක්වීමට හේතු:—

භව නිකන්ති පන පටිසන්ධි අනන්තරං පවත්තභවඞ්ගවීථිතෝ චුටිධීමත්තස්සේව අත්තනෝ ඛන්ධසන්තානං ආරබ්භ සබ්බේසම්පි උප්පජ්ජති.
**[පටිසම්භිදමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 232 යටතේ); පටිසම්භිදමග්ග අටුවා 403 පිට (හේ.වි.මු)]**

**භවනිකන්ති පන** භව නිකාන්තිය වනාහි **පටිසන්ධිඅනන්තරං** ප්‍රතිසන්ධියට අනතුරුව **පවත්තභවඞ්ගවීථිතෝ** පැවති භවඞ්ග වීථියෙන් **චුටිධීමත්තස්සේව** නැඟී සිටි මාත්‍රයෙන්ම **අත්තනෝ** තමාගේ **ඛන්ධසන්තානං** ස්කන්ධ සන්තානය **ආරබ්භ** අරබයා **සබ්බේසම්පි** සියළු සත්වයන්ටම **උප්පජ්ජති** උපදී.

**[පටිසම්භිදමග්ග අටුවා පරිවර්තනයි]**

තේසු තේසු ච භවේසු ගහිතපටිසන්ධිකස්ස සත්තස්ස ආදිතෝ වීථිචිත්තවසේන ලෝභසහගතචිත්තුප්පාදනමේව සම්භවතෝ තේයේව පඨමං දස්සෙත්වා තදනන්තරං ද්විහේතුකභාවසාමඤ්ඤේන දෝමනස්සසහගතේ, තදනන්තරං ඒකහේතුකේ ච දස්සේතුං **"සෝමනස්සසහගත"**න්ත්‍යාදිනා ලෝභමූලං තාව වේදනාදිට්ඨිසඞ්ඛාරභේදේන අට්ඨධා විභජිත්වා දස්සේති.
**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අකුසලචිත්ත වණ්ණනා යටතේ); විභාවනී ටීකා සන්නය 22 පිට]**

**තේසු තේසු** ඒ ඒ ස්වභාව ඇත්තාවූ **භවේසු** භවයෙහි **ගහිතපටිසන්ධිකස්ස** ගන්නාලද ප්‍රතිසන්ධි ඇත්තාවූ **සත්තස්ස** සත්වයාහට **ආදිතෝ** පළමු කොට **වීථිචිත්තවසේන** වීථි චිත්තයන්ගේ වශයෙන් **ලෝභසහගතචිත්තුප්පාදනමේව** ලෝභය හා ගිය චිත්තෝත්පාදයන්ගේම **සම්භවතෝ** සම්භවය වන හෙයින් **තේයේව** ඒ ලෝභ සහ ගිය චිත්තයන්ම **පඨමං** පළමු කොට **දස්සෙත්වා** දක්වා **තදනන්තරං** ඒ ලෝභ සහ ගිය චිත්තයන්ට අනතුරුව **දුහේතුකභාවසාමඤ්ඤේන** ද්විහේතුක චිත්තභාවයෙන් සමාන හෙයින් **දෝමනස්සසහගතේ ච** දෙම්නස් සහ ගිය චිත්තයෝ ද **තදනන්තරං** ඒ දෙම්නස් සහ ගිය චිත්තයන්ට අනතුරුව **ඒකහේතුකේ ච**

ඒකහේතුක චිත්තයෝ ද **දස්සේතුං** දක්වනු පිණිස **සෝමනස්සසහගතන්ති ආදිනා** සෝමනස්ස සහගතං යනාදී පාඨයෙන් ලෝභමූලික චිත්තය **තාව** පළමු කොට **වේදනාදිට්ඨිසඞ්ඛාරභේදේන** වේදනාභේදය දිට්ඨිභේදය සඞ්ඛාරභේදය යන භේද ත්‍රයකින් (අට්ඨධා යන්න හා සම්බන්ධ කරනු) **අට්ඨධා** අට පරිද්දෙකින් **විභජිත්වා** බෙද **දස්සේති** දක්වයි෴ **[විභාවනී ටීකා සන්නය 47 පිට]**

**විභාවනියං** පන තේසු තේසු ච භවේසු ගහිතප්පටිසන්ධිකස්ස සත්තස්ස ආදිතෝ වීථිචිත්තවසේන ලෝභසහගතචිත්තුප්පාදනමේව සම්භවතෝ තේයේව පඨමන්ති වුත්තං. තංපි න යුජ්ජති.

ආදිතෝ වීථිචිත්තවසේන මනෝද්වාරාවජ්ජනස්සේව සබ්බපඨමං උප්පජ්ජනතෝති. අකුසලේසු පන ලෝභමූලචිත්තං බහුකඤ්ච හෝති. ද්වීහි වට්ටමූලේහි යුත්තත්තා පධානං පාකටඤ්ච හෝතීති තදේව පඨමං වුත්තන්ති දට්ඨබ්බං. **[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 21 යටතේ)]**

“ආදිතෝ”ති ආදිම්හි. “චිත්තවීථිවසේනා”ති ඒතං මම, ඒසෝහමස්මි, ඒසෝ මේ අත්තාති ඒවං පවත්තස්ස භවනිකන්ති ජවනවීථිචිත්තස්ස වසේන. ඒවඤ්ච සති, කිං කාරණං ලෝභමූලචිත්තස්ස පඨමං වචනේති ආහ “අකුසලේසු පනා”ති ආදිං. “ද්වීහි වට්ටමූලේහි”ති ලෝභමෝහසඞ්ඛාතේහි ද්වීහි වට්ටමූලේහි.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 21 යටතේ)]**

**තේසු තේසු** ඒ ඒ ස්වභාව ඇත්තාවූ **භවේසු** භවයෙහි **ගහිතපටිසන්ධිකස්ස** ගන්නාලද ප්‍රතිසන්ධි ඇත්තාවූ **සත්තස්ස** සත්වයාහට **ආදිතෝ** පළමු කොට **වීථිචිත්තවසේන** වීථි චිත්තයන්ගේ වශයෙන් **ලෝභසහගතචිත්තුප්පාදනමේව** ලෝභය හා ගිය චිත්තෝත්පාදයන්ගේම **සම්භවතෝ** සම්භවය වන හෙයින් **තේයේව** ඒ ලෝභ සහ ගිය චිත්තයන්ම **පඨමං** පළමු කොට **ච (දස්සිතං ඉති)** දක්වන ලද්දේ යැයි **විභාවනියං පන** විභාවනී ටීකායෙහි වනාහි **වුත්තං** කියනලදි **තං අපි** ඒ කරුණ ද **න යුජ්ජති** නුසුදුසු යෙදීමකි෴

**සබ්බපඨමං** සියළු වීථිචිත්තයන්ට ප්‍රථමයෙන් **වීථිචිත්තවසේන** මෙය මගේ මම වෙමි මේ මගේ ආත්මයයි මෙසේ පවතින භවනිකන්තික වීථිචිත්තයන්ගේ වශයෙන් නොහොත් තමා උපන් භවයට ඇලීම් වශයෙන් **මනෝද්වාරාවජ්ජනස්සේව** මනෝද්වාරාවර්ජන වීථිචිත්තයාගේම **ආදිතෝ** පළමු කොට **උප්පජ්ජනතෝ** ඉපදීම් වශයෙන් (**හෝති** වෙයි) (එසේවීනම් අභිධර්මාර්ථ සඞ්ග්‍රහයෙහි ලෝභමූල චිත්තයෝ කුමක් හෙයින් පළමුව දක්වන ලද්දේ ද යන චෝද්‍යය සිත තබා එයට පරිහාර පිණිස “අකුසලේසු පන -පෙ- දට්ඨබ්බං” යනාදිය කියනලදි) **අකුසලේසු පන** අකුසල චිත්තයන් අතුරින් වනාහි **ලෝභමූලචිත්තං** ලෝභමූල සිත් **බහුකඤ්ච හෝති** බොහෝ ද වෙයි **ද්වීහි වට්ටමූලේහි** ලෝභ මෝහ සඞ්ඛ්‍යාත වට්ටමූල දෙක හේතුකොටගෙන **(සංසාරවට්ටේ)** සංසාර වෘත්තයෙහි **යුත්තත්තා** යොදවන බැවින් **තදේව** ඒ ලෝභමූල සිතම **පධානඤ්ච** ප්‍රධාන ද **පාකටඤ්ච** ප්‍රකට ද **හෝතීති** වේනුයි **පඨමං** සියළු චිත්තයන්ට ප්‍රථමයෙන් **වුත්තන්ති** කියනලද යයි **දට්ඨබ්බං** දතයුතුයි෴

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

භවයෙහි ගන්නා ලද ප්‍රතිසන්ධි ඇති සත්ත්වයා හට ආදීකොට වීථි චිත්ත වශයෙන් ලෝභ සහගත චිත්තයන්ගේ උත්පත්තියම සම්භව වන හෙයින් ලෝභ සහගත චිත්තයන් පළමු කොට දක්වා තදනන්තරව ද්විහේතුකභාව සාමාන්‍යයෙන් දෝමනස්ස සහගත චිත්තයන් ද ඒකහේතුක චිත්තයන් ද දක්වනු පිණිස "සෝමනස්ස සහගතං" යනාදීන් ලෝභ මූලකවූ චිත්තය වේදනා දෘෂ්ටි සංස්කාර භේද හෙයින් අෂ්ට ප්‍රකාරයෙකින් විභාග කොට දක්වන ලදැයි දතයුතු.
**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 07 පිට; විස්තර භාව සන්නය 12 පිට]**

ලෝභය වනාහි සියළු සත්වයන්ගේ පටිසන්ධි චිත්තයට අනතුරුව භවඞ්ග සිත් පසළොසක් හෝ සොළොසක් හෝ තදනන්තරව මනෝද්වාරාවර්ජන චිත්තය ඉපිද තමා උපන් භවයට ඇලුම්කිරීම් වශයෙන් මේ ලෝභමූලික සිත් 08 දෙනා අතුරෙන් යම්කිසි චිත්තයක් භව නිකාන්තික ජවන වශයෙන් ඉපිද නිරුද්ධ වේ. අවීචි මහා නරකයෙහි උපන් සත්වයාගේ පටන් නේවසඤ්ඤානාසඤ්ඤ සඞ්ඛ්‍යාත භවාග්‍රයෙහි උපන්නා වූ සත්වයාහට ද පළමු කොට වීථි චිත්ත වශයෙන් මේ ලෝභමූලික චිත්තය ඉපදීම ස්වභාව ධර්මයක් වේ. **[විස්තර භාව සන්නය 12 පිට; අභිධර්මාර්ථ ප්‍රදීපිකා 01/33 පිට]**

## දෙළොස් අකුසල් සිත්:—

තත්‍ථ කතමං කාමාවචරං? සෝමනස්සසහගතං දිට්ඨිගතසම්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, සෝමනස්සසහගතං දිට්ඨිගතවිප්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, උපෙක්ඛාසහගතං දිට්ඨිගතසම්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, උපෙක්ඛාසහගතං දිට්ඨිගතවිප්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකන්ති ඉමානි අට්ඨපි ලෝභසහගතචිත්තානි නාම.

දෝමනස්සසහගතං පටිඝසම්පයුත්තං අසඞ්ඛාරිකමේකං සසඞ්ඛාරිකමේකන්ති ඉමානි ද්වේපි පටිඝසම්පයුත්තචිත්තානි නාම.

උපෙක්ඛාසහගතං විචිකිච්ඡාසම්පයුත්තමේකං උපෙක්ඛාසහගතං උද්ධච්චසම්පයුත්තමෙකන්ති ඉමානි ද්වේපි මෝමූහචිත්තානි නාම. ඉච්චේවං සබ්බථාපි ද්වාදස අකුසලචිත්තානි සමත්තානි.

අට්ඨධා ලෝභමූලානි - දෝසමූලානි ච ද්විධා
මෝහමූලානි ච ද්වේති - ද්වාදසාකුසලා සියුං. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 11-12 පිටු]**

**තත්‍ථ** ඒ කාමාවචරාදි චතුර්විධ චිත්තයන් අතුරෙන් **කාමාවචරං** පළමු කොට දැක්වූ කාමාවචර චිත්තය **කතමං** කවරේද යත්? **සෝමනස්ස සහගතං** ඉෂ්ටානුභවන ලක්‍ෂණ වූ මානසික සුඛ වේදනාව හා ඒකෝත්පාදදි භාවයට ගියා වූ **දිට්ඨිගත සම්පයුත්තං** අනිත්‍යාදි ධර්ම ස්වභාව ඉක්ම නිත්‍ය සුඛ ශුභාදි වශයෙන් විපරීතාභිනිවේශ ස්වභාව වූ මිථ්‍යා දෘෂ්ටිය හා ඒකෝත්පාදදි ප්‍රකාරයෙන් යුක්ත වූ **අසඞ්ඛාරිකං** තමා විසින් හෝ මෙරමා විසින් හෝ කරණ ලද පූර්ව ප්‍රයෝග රහිත වූ **ඒකං (අකුසලචිත්තං)** එක් අකුසල චිත්තයෙක. **සසඞ්ඛාරිකං** යථෝක්ත වූ පූර්ව ප්‍රයෝග සහිත වූ **ඒකං** එක් අකුසල චිත්තයෙක තුන්වන සතරවන චිත්තය විපරීත දෘෂ්ටීන් විප්‍රයුක්ත වූ යනු වෙනසයි. අවශිෂ්ට සතර සිත් **උපෙක්ඛා සහගතං** මධ්‍යස්ථානුභවන ලක්‍ෂණ වූ උපෙක්ඛා වේදනාව හා ඒකෝත්පාදදි භාවයට ගියා වූ

යැයි යනු වෙනසයි. **ඉමානි අට්ඨ** මොහු අට දෙන **ලෝභ සහගත චිත්තානි නාම** ලෝභ සහගත චිත්තයෝ නම්.

**දෝමනස්සසහගතං** අනිෂ්ටානුභවන ලක්‍ෂණ වූ මානසික දුක්ඛ වේදනාව හා ඒකෝත්පාදාදි භාවයෙන් යුක්ත වූ **පටිඝසම්පයුත්තං** චාණ්ඩික්‍ය ස්වභාව වූ අරමුණෙහි ගැටෙමින් උපදනා වූ සංස්කාරස්කන්ධ පර්‍යාපන්න වූ ප්‍රතිඝයා හා සම්ප්‍රයුක්ත වූ **අසඞ්ඛාරිකං** යනාදියෙහි අර්ථ යටකී පරිද්දෙන් දතයුතු **ඉමානි ද්වේ** මොහු දෙදෙන **පටිඝචිත්තානි නාම** ප්‍රතිඝ සම්ප්‍රයුක්ත චිත්තයෝ නම් වෙත්.

**උපෙක්ඛාසහගතං** උපේක්‍ෂාසහගියා වූ **විචිකිච්ඡා සම්පයුත්තං** බුද්ධාදි අට තැන්හි උපදනා සංසය ලක්‍ෂණ වූ විචිකිත්සාව හා ඒකෝත්පාදාදි ප්‍රකාරයෙන් යුක්තවූ **ඒකං** එක් අකුසල චිත්තයෙක. **උද්ධච්චසම්පයුත්තං** ආලම්බනයෙහි නොසන්හුන් බව යැයි කියන ලද ඖද්ධත්‍යය හා ඒකෝත්පාදාදි ප්‍රකාරයෙන් යුක්තවූ **ඒකං** එක් අකුසල චිත්තයෙකැයි **ඉමානි ද්වේ** මොහු දෙදෙන **මෝමූහචිත්තානි නාම** මෝමූහ චිත්තයෝ නම් වෙත්.

**ඉච්චේවං** මෙසේ (යථෝක්ත ක්‍රමයෙන්) **සබ්බථාපි** (සෞමනස්‍යෝපේක්‍ෂා දෘෂ්ටි සම්ප්‍රයෝගාදි වශයෙන් ද ප්‍රතිඝ සම්ප්‍රයෝගාදි වශයෙන් ද විචිකිත්සා ඖද්ධත්‍ය සම්ප්‍රයෝගාදි වශයෙන් දැයි මෙසේ) සියලු සම්ප්‍රයෝගාදි ආකාරයෙන් **ද්වාදස අකුසලචිත්තානි** දෙළොස් අකුසල චිත්තයෝ **සමත්තානි** සඞ්ග්‍රහ කොට ගන්නා ලදහු; කියන ලදහු සේයි.

**ලෝභමූලානි** ලෝභමූලක වූ චිත්තයෝ **අට්ඨධා සියුං** වේදනාදි ප්‍රභේද හෙයින් අෂ්ටප්‍රකාර වන්නාහ. **දෝසමූලානි ච** ද්වේෂ මූලික වූ චිත්තයෝ ද **ද්විධා** සංස්කාර භේදයෙන් ද්විප්‍රකාර වන්නාහ. **මෝහමූලානි** ශුද්ධ මෝහය මුල් කොට ඇති චිත්තයෝ **ද්වේචේති** සම්ප්‍රයෝග භේදයෙන් දෙදෙනෙක් වෙතියි. **අකුසලා** අකුසල චිත්තයෝ **ද්වාදස සියුං** දෙළොසක් වන්නාහුයි. **]අභිධම්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 07-12 පිටු[**

## අකුසල් සිත උපදින ආකාරය:—

**අකුසලං** පන භූමිතෝ ඒකවිධං කාමාවචරමේව, නියතානියතවත්ථුවසේන ච ඒකහේතුකදුහේතුකවසේන ච පටිසන්ධිජනකාජනකවසේන ච දුවිධං, තීහි වේදනාහි යෝගතෝ ච ලෝභමූලං දෝසමූලං මෝහමූලන්ති මූලතෝ ච තිවිධං හෝති. තත්ථ **ලෝභමූලං** පන සෝමනස්සුපෙක්ඛාදිට්ඨිප්පයෝගභේදතෝ අට්ඨවිධං හෝති. සෙය්‍යථීදං සෝමනස්සසහගතං දිට්ඨිගතසම්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, සෝමනස්සසහගතං දිට්ඨිගතවිප්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, උපෙක්ඛාසහගතං දිට්ඨිගතසම්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, උපෙක්ඛාසහගතං දිට්ඨිගතවිප්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකන්ති. යදා හි "නත්ථි කාමේසු ආදීනවෝ"ති ආදිනා නයේන මිච්ඡාදිට්ඨිං පුරක්ඛත්වා හට්ඨතුට්ඨෝ කාමේ වා පරිභුඤ්ජති, දිට්ඨමඞ්ගලාදීනි වා සාරතෝ පච්චේති සභාවතික්ඛේනේව අනුස්සාහිතේන චිත්තේන, තදා පඨමං අකුසලචිත්තං උප්පජ්ජති. යදා මන්දේන සමුස්සාහිතේන චිත්තේන, තදා දුතියං. යදා මිච්ඡාදිට්ඨිං අපුරක්ඛත්වා කේවලං හට්ඨතුට්ඨෝ මේථුනං වා සේවති, පරසම්පත්තිං වා අභිජ්ඣායති, පරභණ්ඩං වා හරති සභාවතික්ඛේනේව අනුස්සාහිතේන චිත්තේන, තදා තතියං. යදා මන්දේන සමුස්සාහිතේන චිත්තේන, තදා චතුත්ථං. යදා පන කාමානං

වා අසම්පත්තිං ආගම්ම අඤ්ඤෙද්සං වා සෝමනස්සහේතූනං අභාවේන චතූසුපි විකප්පේසු සෝමනස්සරහිතා හොන්ති, තද සේසානි චත්තාරි උපෙක්ඛාසහගතානි උප්පජ්ජන්තීති ඒවං සෝමනස්සුපෙක්ඛාදිට්ඨිගතසඞ්ඛාරභේදතෝ අට්ඨවිධං ලෝභමූලං වේදිතබ්බං.

**දෝසමූලං** පන ඒකන්තසවත්ථුකතෝ ඒකවිධං, අසඞ්ඛාරසසඞ්ඛාරභේදතෝ දුවිධං දෝමනස්සසහගතං පටිඝසම්පයුත්තං අසඞ්ඛාරං, සසඞ්ඛාරන්ති. අස්ස පන පාණාතිපාතාදීසු තික්ඛමන්දප්පවත්තිකාලේ උප්පත්ති වේදිතබ්බා.

**මෝහමූලම්පි** විචිකිච්ඡුද්ධච්චයෝගතෝ දුවිධං හෝති උපෙක්ඛාසහගතං විචිකිච්ඡාසම්පයුත්තං, උපෙක්ඛාසහගතං උද්ධච්චසම්පයුත්තන්ති. තස්ස අසන්නිට්ඨානවික්ඛේපකාලේසු පවත්ති වේදිතබ්බාති.

ඒවං තාව ද්වාදසවිධං අකුසලචිත්තං වේදිතබ්බං, සබ්බං පනේතං යථානුරූපං අපායේසු උපපත්තියා, සුගතියම්පි දුක්ඛවිසේසස්ස අභිනිප්ඵාදකං හෝති. **[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 29 චිත්ත නිද්දේසය යටතේ)]**

**නියතානියතවත්ථුවසේනා**ති පටිඝසම්පයුත්තද්වයං කාමේයේව හදයවත්ථුං නිස්සාය ජායති, අඤ්ඤදභූමීසු න ජායති, තස්මා නියතවත්ථුකං හෝති. ඉතරානි පන අකුසලානි කාමරූපේසු උප්පජ්ජනකාලේ හදයවත්ථුං නිස්සාය ජායන්ති, අරූපේ හදයවත්ථුං අනිස්සාය ජායන්ති, තස්මා අනියතවත්ථුකානි, තේන. **පටිසන්ධිජනකාජනකවසේන චා**ති උද්ධච්චසහගතං පටිසන්ධිං න ජනේති. යදි පටිසන්ධිං ජනෙය්‍ය, අපායේසුයේව ජනෙය්‍ය. කස්මා? සෝතාපත්තිමග්ගේන ඒකදේසතෝ අපායගාමිකම්පි න ජහිතං, සබ්බං න ජහිතන්ති අත්ථෝ. සෝපි මග්ගෝ අපායගාමී න හෝති. අඤ්ඤෙ පන කිලේසා ඒකදේසවසේන අපායගාමිකා ජහිතා, තේන පඨමමග්ගේනාති තස්මා න ජනේති. ඒකාදසවිධං පන පටිසන්ධිං ජනේති, තේන.

**දිට්ඨමඞ්ගලාදීනී**ති **ආදි**-සද්දේන සුතමඞ්ගලාදීනි ගහිතානි. **සාරතෝ** උත්තමතෝ **පච්චේති** සද්දහති. සභාවතික්ඛේන සභාවෝ තික්ඛෝ ඒතස්සාති සභාවතික්ඛං, තේන **සභාවතික්ඛේන**.

**අස්ස පන** පටිඝසම්පයුත්තස්ස **පාණාතිපාතාදීසු** අකුසලකම්මේසු තික්ඛප්පවත්තිකාලේ අසඞ්ඛාරිකස්ස උප්පත්ති, මන්දප්පවත්තිකාලේ සසඞ්ඛාරිකස්ස උප්පත්ති වේදිතබ්බා.

**තස්ස** මෝමූහස්ස. **දුක්ඛවිසේසස්ස** දුක්ඛනානත්තස්ස.
**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 29 චිත්තනිද්දේස වණ්ණනා යටතේ)]**

ලෝභමූලවසේනට්ඨ, දෝසමූලවසා දුවේ;
මෝහමූලවසේන ද්වේ, ඒවං ද්වාදසධා සියුං.
**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 30 චිත්තනිද්දේසය යටතේ)]**

ලෝභමූලවසේන **අට්ඨ** චිත්තානි, දෝසමූලවසා **දුවේ** චිත්තානි, මෝහමූලවසේන **ද්වේ** චිත්තානි. **ඒවං** ඉමිනා මයා වුත්තප්පකාරේන අකුසලානි ද්වාදසප්පකාරානි **සියුං** භවෙය්‍යුං.

**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 30 චිත්තනිද්දේස වණ්ණනා යටතේ)]**

**අකුසලං පන** අකුසල් සිත් තෙමේ වනාහි **භූමිතෝ** භූමි වශයෙන් **ඒකවිධං** එක් වැදෑරුම් වෙයි **කාමාවචරං ඒව** කාමාවචරම වෙයි **නියතානියතවත්ථුවසේන ච** නියතවත්ථු අනියතවත්ථු වශයෙන් ද **ඒකහේතුකදුහේතුකවසේන ච** ඒකහේතුක ද්විහේතුක වශයෙන් ද **පටිසන්ධිජනකාජනකවසේන ච** ප්‍රතිසන්ධිය ඉපදවීම නො ඉපදවීම වශයෙන් ද **දුවිධං** දෙවැදෑරුම් වෙයි **තීහි වේදනාහි යෝගතෝ ච** (සුඛදුක්ඛෝපේක්‍ෂා සඞ්ඛ්‍යාත) ත්‍රිවිධ වේදනාවන් හා යෙදීම් වශයෙන් ද **ලෝභමූලං** ලෝභය මුල්කොට ඇත්තාවූ චිත්තය **දෝසමූලං** ද්වේෂය මුල්කොට ඇත්තාවූ චිත්තය **මෝහමූලන්ති** මෝහයම මුල් වූ චිත්තය යයි යන **මූලතෝති** මූල භේද වශයෙන් ද **ත්‍රිවිධං හෝති** තුන් වැදෑරුම් වෙයි **තත්‍ථ** ඔහුන් අතුරෙන් **ලෝභමූලං පන** ලෝභමූල චිත්තය වනාහි **සෝමනස්සූපෙක්ඛාදිට්ඨිපයෝගවිප්පයෝගභේදතෝ** සෝමනස්ස උපේක්‍ෂා මිත්‍යාදෘෂ්ටි යන මොහුන් හා සම්ප්‍රයුක්ත විප්පයුක්ත භේද හෙයින් **අට්ඨවිධං හෝති** අට වැදෑරුම් වේ **සෙය්‍යථීදං?** හේ කවරේ ද යත්? **සෝමනස්සසහගතං** සොම්නස් වේදනා සහ ගියාවූ **දිට්ඨිගතසම්පයුත්තං** මිත්‍යාදෘෂ්ටිය හා සැපියුතු වූ **අසඞ්ඛාරං** මෙහෙයුම් රහිත වූ **ඒකං** එක් අකුසල චිත්තයෙක **සසඞ්ඛාරිකං** මෙහෙයුම් සහිත වූ **ඒකං** එක් අකුසල චිත්තයෙක **සෝමනස්සසහගතං** සොම්නස් වේදනාව සහ ගියා වූ **දිට්ඨිගතවිප්පයුත්තං** මිත්‍යාදෘෂ්ටිය හා විපියුතු වූ **අසඞ්ඛාරිකං ඒකං සසඞ්ඛාරිකං ඒකං** (මෙහි අර්ථ පෙරසේමැයි) **උපෙක්ඛාසහගතං** මධ්‍යස්ථානුභවන ලක්‍ෂණ වූ උපේක්‍ෂා වේදනාව හා ඒකෝත්පාදදී භාවයට ගියාවූ **දිට්ඨිගතසම්පයුත්තං අසඞ්ඛාරිකං ඒකං සසඞ්ඛාරිකං ඒකං උපෙක්ඛාසහගතං දිට්ඨිගතවිප්පයුත්තං අසඞ්ඛාරිකං ඒකං සසඞ්ඛාරිකං** (යන මෙහි අර්ථ පෙරසේමැයි) **ඒකං ඉති** එක් අකුසල චිත්තයෙකැයි අට වැදෑරුම් වේ.෴

**යදා හි** යම් කලෙක්හි **කාමේසු** පඤ්චකාම ගුණයෙහි **ආදීනවෝ නත්‍ථි** අයුණු නැත්තේ යැයි **ඉති ආදිනා නයේන** මේ ආදී ක්‍රමයෙන් **මිච්ඡාදිට්ඨිං පුරක්ඛත්‍වා** මිත්‍යාදෘෂ්ටිය පෙරටු කොට ගෙන **කේවලං** හුදෙක් **හට්ඨතුට්ඨෝ** තුටුපහටු සිත් ඇත්තේ වී **සභාවතික්ඛේණෝව** ස්වභාවයෙන් තියුණුවූම **අනුස්සාහිතේන** උත්සාහ නොදනවනලද **චිත්තේන** සිත කරණකොටගෙන **කාමේ වා** පඤ්චකාම සම්පත් හෝ **පරිභුඤ්ජති** අනුභව කෙරේ ද **දිට්ඨමඞ්ගලාදීනි වා** දෘෂ්ටමඞ්ලාදිය හෝ **සාරතෝ** උතුම් වශයෙන් **පච්චේති** හඟින්නේ වේද **තදා** එකල්හි **යස්ස** ඕ හට **පඨමං අකුසලචිත්තං** පළමුවන අකුසල් සිත් තෙමේ **උප්පජ්ජති** උපදී.෴

**යදා පන** යම් කලෙක්හි වනාහි **කාමේසු** පඤ්චකාම ගුණයෙහි **ආදීනවෝ නත්‍ථි** අයුණු නැතැයි **ඉති ආදිනා නයේන** මේ ආදී ක්‍රමයෙන් **මිච්ඡාදිට්ඨිං පුරක්ඛත්‍වා** මිත්‍යාදෘෂ්ටිය පෙරටු කොටගෙන **හට්ඨතුට්ඨෝ හුත්‍වා** තුටුපහටු සිත් ඇත්තෝ වී (මෙසේ යට කී පාඨය ගෙන අර්ථ කියයුතුයි) **මන්දේන** ලස් වූ **සමුස්සාහිතේන** උත්සාහ දනවන ලද්දවූ **චිත්තේන** සිත කරණකොටගෙන **කාමේ වා** පඤ්චකාම සම්පත් හෝ **පරිභුඤ්ජති** අනුභව කෙරේ ද **දිට්ඨමඞ්ගලාදීනි වා** දෘෂ්ටමඞ්ගලාදීන් හෝ **සාරතෝ** උතුම් වශයෙන් **පච්චේති** හඟී ද (මේ “චිත්තේන” යනාදිය යට කී පාඨයෙන් මෙතනට ආවර්ථනය වේ) **තදා** එකල්හි **දුතියං (අකුසලචිත්තං)** දෙවැනි

අකුසල් සිත් තෙමේ (**උප්පජ්ජති** උපදී) **යදා පන** යම් කලෙක වනාහි **මිච්ඡාදිට්ඨිං අපුරක්ඛත්වා** මිත්‍යාදෘෂ්ටිය පෙරටු කොට නොගෙන **කේවලං** හුදෙක් **සභාවතික්ඛේන** ස්වභාවයෙන් තියුණු වූ **අනුස්සාහිතේන** උත්සාහ නොදනවන ලද **චිත්තේන** සිත කරණකොටගෙන **හට්ඨතුට්ඨෝ** තුටුපහටු සිත් ඇත්තේ වී **මේථුනධම්මං වා** මෙවුන්දම් හෝ **පරිභුඤ්ජති** අනුභව කෙරේ ද **පරසම්පත්තිං වා** අන්සතු වස්තුවක් හෝ **අභිජ්ඣායති** කැමති වේද **පරභණ්ඩං වා** අන්සතු බඩුවක් හෝ **හරති** පැහැර ගනිද **තදා** එකල්හි **තතියං (අකුසලචිත්තං)** තුන්වැනි අකුසල් සිත් තෙමේ (**උප්පජ්ජති** උපදී) **යදා පන** යම් කලෙක්හි (**මිච්ඡාදිට්ඨිං අපුරක්ඛත්වා** මිත්‍යාදෘෂ්ටිය පෙරටු කොට නොගෙන) **මන්දේන** ලස් වූ **සමුස්සාහිතේන** උත්සාහ දනවන ලද්දවූ (**චිත්තේන** සිත කරණකොටගෙන **හට්ඨතුට්ඨෝ** තුටුපහටු සිත් ඇත්තේ වී **මේථුනධම්මං වා** මෙවුන්දම් හෝ **පරිභුඤ්ජති** අනුභව කෙරේ ද **පරසම්පත්තිං වා** අන්සතු වස්තුවක් හෝ **අභිජ්ඣායති** කැමති වේද **පරභණ්ඩං වා** අන්සතු බඩුවක් හෝ **හරති** පැහැර ගනිද) **තදා** එකල්හි **චතුත්ථං (චිත්තං) උප්පජ්ජති** සතරවැනි සිත් තෙමේ උපදී **යදා පන** යම් කලෙක්හි වනාහි **කාමානං වා** කාම සම්පත්තීන්ගේ හෝ **අසම්පත්තිං ආගම්ම** අපරිපූර්ණත්වයක් ලැබ **අඤ්ඤේසං** අනිකුදු **සෝමනස්සහේතූනං වා** සොම්නස් හේතූන්ගේ හෝ **අභාවේන** අවිද්‍යමාන භාවයෙන් **චතුසු විකප්පේසුපි** සතර විකල්පයෙහිම (සතර තන්හීයයි කීනියායි) **සෝමනස්සරහිතා හොන්ති** සොම්නස් ඇත්තාහු නොවෙද්ද **තදා** එකල්හි **සේසානි චත්තාරි** සෙසු සතරාකාර වූ **උපෙක්ඛාසහගතානි** උපේක්ෂා සහගිය සිත් තුමූ **උප්පජ්ජන්තීති** උපදනාහු වෙත් යයි **ඒවං** මෙසේ **සෝමනස්සුපෙක්ඛාදිට්ඨිසම්පයෝගවිප්පයෝගභේදතෝ** සොම්නස් උපේක්ෂා දෘෂ්ටි යන මොහුන් හා සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත භේද හෙයින් **අට්ඨවිධං** අට වැදෑරුම් වූ **ලෝභමූලං** ලෝභමූලික චිත්තය **වේදිතබ්බං** දතයුත්තේය෴

**දෝසමූලං පන** ද්වේෂය මුල්කොට ඇත්තාවූ සිත් තෙමේ වනාහි **ඒකන්තසවත්ථුකතෝ** ඒකාන්තයෙන් හෘදයවස්තුව ඇසුරු කරණ හෙයින් **ඒකවිධං** එක් වැදෑරුම් වේ **දෝමනස්සසහගතං** දෙම්නස් වේදනා සහ ගියාවූ **පටිඝසම්පයුත්තං** ප්‍රතිඝය හා සැපියයුතු වූ **අසඞ්ඛාරං** මෙහෙයුම් රහිත වූ එක් අකුසල චිත්තයෙක **සසඞ්ඛාරං ඉති** මෙහෙයුම් රහිතවූ එක් අකුසල චිත්තයෙකැයි **අසඞ්ඛාරසසඞ්ඛාරභේදතෝ** අසඞ්ඛාර සසඞ්ඛාර භේද හෙයින් **දුවිධං** දෙවැදෑරුම් වෙයි **අස්ස පන** මේ ද්වේෂමූල චිත්තයාගේ වනාහි **පාණාතිපාතාදීසු** පණිවා ආදී පාප කර්මයෙහි **තික්ඛමන්දප්පවත්තිකාලේ** තියුණු බැවින් හා ලැසි බැවිනුත් පවත්නා කල්හි **උප්පත්ති වේදිතබ්බා** හටගැනීම දතයුත්තීය෴

**මෝහමූලම්පි** මෝහමූලික සිත් තෙමේ ද **උපෙක්ඛාසහගතං** උපේක්ෂා වේදනා සහගියා වූ **විචිකිච්ඡාසම්පයුත්තං** බුද්ධාදී අට තැන්හි උපදනා සංසය ලක්‍ෂණ වූ විචිකිත්සාව හා ඒකෝත්පාදදී ප්‍රකාරයෙන් යුක්තවූ එක් අකුසල චිත්තයෙක **උපෙක්ඛාසහගතං** උපේක්ෂා වේදනා සහගියා වූ **උද්ධච්චසම්පයුත්තං ඉති** ආලම්බනයෙහි නොසන්සුන් බවයැයි කියනලද ඖද්ධත්‍යය හා ඒකෝත්පාදදී ප්‍රකාරයෙන් යුක්ත වූ එක් අකුසල චිත්තයෙකැයි **විචිකිච්ඡුද්ධච්චයෝගතෝ** විචිකිත්සා ඖද්ධත්‍යයන් හා යෙදීම් වශයෙන් **දුවිධං හෝති** දෙවැදෑරුම් වේ **තස්ස** ඒ මෝහමූලික චිත්තයාගේ **අසන්නිට්ඨානවික්ඛේපකාලේසු** සැකය හා සිත නොසන්සුන් බව ඇති කල්හි **පවත්ති වේදිතබ්බාති** හටගැනීම දතයුත්තීය **ඒවං** මේ උක්ත ප්‍රකාරයෙන් **තාව** පළමු කොට **ද්වාදසවිධං** දෙළොස් වැදෑරුම් වූ **අකුසලචිත්තං** අකුසල් සිත **වේදිතබ්බං** දතයුත්තේයි෴

**ඒතං සබ්බං පන** මේ සියළු අකුසල් සිත් තෙමේ වනාහි **යථානුරූපං** ප්‍රතිසන්ධි ජනකාජනකබවට හා කර්මපථ බවට පැමිණි නොපැමිණි බවට ද සුදුසු පරිද්දෙන් නොහොත් ලෝභාදී හේතු ධර්මයන්ට සුදුසු පරිද්දෙන් **අපායේසු** සතර අපායෙහි **උප්පත්තියා** ප්‍රතිසන්ධි ගැනීමෙන් ද **සුගතියම්පි** සුගතියෙහි ද **දුක්ඛවිසේසස්ස** දුක්ඛ විශේෂය **අභිනිප්පාදකං හෝති** නිපදවන්නේ වෙයි.

**ලෝභමූලවසේන** ලෝභමූලික වශයෙන් **අට්ඨ** අකුසල් චිත්තයෝ අටදෙනෙක **දෝසමූලවසා** ද්වේෂමූලික වශයෙන් **දුවේ** දෙදෙනෙක **මෝහමූලවසේන** මෝහමූලික වශයෙන් **ද්වේ** දෙදෙනෙකැයි **ඒවං** මෙසේ **ද්වාදසධා** දෙළොස් ප්‍රකාරයෙකින් **සියුං** වන්නාහුය.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 110-112 පිටු]**

එත්තාවතා ච යං "කුසලාකුසලාබ්‍යාකතජාතිභේදතෝ තිවිධ"න්ති එත්ථ වුත්තං කුසලං, තං සරූපතෝ නිද්දිසිත්වා ඉදනි තදනන්තරුද්දිට්ඨං අකුසලං නිද්දිසන්තෝ ආහ **"අකුසලං පනා"**තිආදි. "භූමිතෝ ඒකවිධ"න්ති වුත්තමත්ථං නියමෙත්වා දස්සෙන්තෝ ආහ **"කාමාවචරමේවා"**ති. නිකායන්තරිකා පන රූපාරූපාවචරම්පි අකුසලං ඉච්ඡන්තීති තේසං මතිනිසේධනත්ථං අවධාරණං කතං. මහග්ගතභූමියං උප්පජ්ජන්තම්පි හේතං තත්ථ රූපධාතුයං පවත්තිවිපාකං දෙන්තම්පි ඒකන්තේන කාමාවචරමේවාති. කුතෝ පනේස නියමෝති? කාමතණ්හාවිසයභාවතෝ. කාමතණ්හාවිසයතා හි කාමාවචරභාවස්ස කාරණං යථා රූපාරූපතණ්හාවිසයතා රූපාරූපභාවස්ස. ඒකංසේන චේතං ඒවං සම්පටිච්ඡිතබ්බං. ඉතරථා බ්‍යාපිතලක්ඛණං න සියා. යදි හි ආලම්බිතබ්බධම්මවසේන භූමිවවත්ථානං කරෙය්‍ය, ඒවං සති අනාරම්මණානං සඞ්ගහෝ න සියා. අථ විපාකදානවසේන, ඒවම්පි අවිපාකානං සඞ්ගහෝ න සියා, තස්මා ආලම්බනධම්මවසේනේව පරියාපන්නානං සා කාතබ්බා. අපරියාපන්නානං පන ලෝකතෝ උත්තිණ්ණතාය ලෝකුත්තරතා, උත්තරිතරාභාවතෝ අනුත්තරතා ච වේදිතබ්බාති.

දෝමනස්සස්ස අනිවරණාවත්ථාය අභාවේන තංසහගතචිත්තුප්පාදෝ කාමභූමියංයේව පවත්තතීති සෝ නියතවත්ථුකෝ, ඉතරේ අරූපභූමියම්පි පවත්තනතෝ අනියතවත්ථුකාති ආහ **"නියතා** …**පෙ**…. **දුවිධ"**න්ති. විචිකිච්ඡුද්ධච්චසහගතානං මෝහේකහේතුකත්තා, ඉතරේසම්පි ලෝභමෝහදෝසමෝහවසේන ද්විහේතුකත්තා ආහ **"ඒකහේතුකදුහේතුකතෝ"**ති. ආදිතෝ ඒකාදසන්නං අකුසලචිත්තානං පටිසන්ධිජනනතෝ, උද්ධච්චසහගතස්ස තදභාවතෝ ආහ **"පටිසන්ධිජනකාජනකතෝ"**ති. උද්ධච්චසහගතඤ්හි පවත්තිවිපාකං දෙන්තම්පි පටිසන්ධිං නාකඩ්ඪති. යතෝ වක්ඛති;

"ඒකාදසවිධානං තු, හිත්වා උද්ධච්චමානසං;
ඒකාදසවිධා චේව, භවන්ති පටිසන්ධියෝ"ති. (අභිධ. 536);

යේන පන කාරණේන තං පටිසන්ධිං නාකඩ්ඪති, තං පටිසන්ධිවිනිච්ඡයකථාහි ඉමිස්සා ගාථාය වණ්ණනාපදේසේයේව වක්ඛාම. **තීහි වේදනාහීති** සුඛදුක්ඛෝපෙක්ඛාසඞ්ඛාතාහි තීහි වේදනාහි. යථාහ; "තිස්සෝ ඉමා, භික්ඛවේ, වේදනා. කතමා තිස්සෝ? සුඛා දුක්ඛා අදුක්ඛමසුඛා"ති (සං. නි. 4.249). යං පන කත්ථචි සුත්තේ "ද්වේමා, භික්ඛවේ, වේදනා සුඛා දුක්ඛා"ති (සං. නි. 4.267) වචනං, තං කුසලපක්ඛිකං උපෙක්ඛං සුඛේ, අකුසලපක්ඛිකඤ්ච දුක්ඛේ පක්ඛිපිත්වා පරියායේන

වුත්තන්ති දට්ඨබ්බං. සුප්පතිට්ඨිතභාවකාරණත්තා මූලමිවාති මූලං, ලෝභෝ මූලං ඒතස්සාති **ලෝභමූලං**. කිඤ්චාපි හි මෝහෝපි ලෝභමූලේසු අත්ථි, සෝ පන සබ්බාකුසලසාධාරණත්තා වවත්ථානකරෝ න හෝතීති අසාධාරණධම්මවසේන "ලෝභමූල"න්ත්වේව වුත්තං යථා "භේරිසද්දෝ යවඞ්කුරෝ"ති. තථා **"දෝසමූල"**න්ති එත්ථාපි. මූලන්තරවිරහතෝ මෝහෝ ඒව මූලං ඉමස්ස, නාඤ්ඤන්ති **මෝහමූලං**.

මිච්ඡාවසේන දස්සනං දිට්ඨි, දිට්ඨියේව දිට්ඨිගතං යථා "ආකාසගතං ථාමගත"න්ති. අථ වා විපරියේසග්ගාහිකාය දිට්ඨියා ගතමේව, න එත්ථ ගන්තබ්බවත්ථු තථාසභාවන්ති දිට්ඨිගතං, ද්වාසට්ඨියා වා දිට්ඨීසු අන්තෝගධන්ති දිට්ඨිගතං, තේන සමං පකාරේහි යුත්තන්ති **දිට්ඨිගතසම්පයුත්තං**.

**"යද හී"**තිආදි ලෝභමූලචිත්තානං පවත්තිආකාරදස්සනං. **මිච්ඡාදිට්ඨි**න්ති උච්ඡේදදිට්ඨිආදිං මිච්ඡාදිට්ඨිං. තාය හි විපල්ලත්තචිත්තා තාව කෝධවිසයෝ, යාව ඉන්ද්‍රියගෝචරෝති පරලෝකං පටික්ඛිපිත්වා "නත්ථි කාමේසු ආදීනවෝ"ති ගණ්හන්ති. **ආදි-**සද්දේන;

"ඒස පන්ථෝව්තථෝ දේවයානේ,
යේන යන්ති පුත්තවන්තෝ විසෝකා;

තං පස්සන්ති පසවෝ පක්ඛිනෝ ච,
තේන තේ මාතරිපි මිථුනං චරන්තී"ති.

ආදිනා නයේන පුත්තමුඛදස්සනං සග්ගමොක්ඛමග්ගෝති ඒවමාදිකං මිච්ඡාදිට්ඨිං සඞ්ගණ්හාති. **කාමේ වාති** එත්ථ **වා-**සද්දෝ අනියමත්ථෝ. තේන "බ්‍රාහ්මණානං සුවණ්ණහරණමේව අදින්නාදානේ සාවජ්ජං, ඉතරං අනවජ්ජං, ගුරූනං, ගුන්නං, අත්තනෝ ජීවිතස්ස, විවාහස්ස ච අත්ථාය මුසාවාදෝ අනවජ්ජෝ, ඉතරෝ සාවජ්ජෝ, ගුරුආදීනං අත්ථාය පේසුඤ්ඤකරණං අනවජ්ජං, ඉතරං සාවජ්ජං, භාරතයුද්ධසීතාහරණාදිකථා පාපවූපසමාය හෝති"ති ඒවමාදිකේ මිච්ඡාගාහේ සඞ්ගණ්හාති. **දිට්ඨමඞ්ගලාදීනී**ති දිට්ඨසුතමුතමඞ්ගලානි. **සාරතෝ පච්චේතී**ති වුඩ්ඪියා පුබ්බනිමිත්තභාවේන අග්ගහෙත්වා "ඉදමේව වුඩ්ඪිකාරණ"න්ති ඒවං සාරවසේන ගණ්හාති. **සභාවතික්ඛේනේවා**ති ලෝභස්ස, මිච්ඡාභිනිවේසස්ස වා වසේන සරසේනේව තිඛිණේන කුරූරේන. **මන්දේනා**ති දන්ධේන අතිඛිණේන. තාදිසං පන අත්තනෝ, පරස්ස වා සමුස්සාහනේන පවත්තතීති ආහ **"සමුස්සාහිතේනා"**ති. **පරස්ස භණ්ඩං වා හරතීති වා-**සද්දේන තථාපවත්තනකමුසාවාදදීනම්පි සඞ්ගහෝ වේදිතබ්බෝ. **කාමානං වාති** අනුභූයමානානං කාමගුණානං. **වා-**සද්දේන පරසන්තකස්ස අයථාධිප්පේතතාය යං ලද්ධං, තං ගහේතබ්බන්ති ගහණාදිකං සඞ්ගණ්හාති.

සම්පයුත්තධම්මවසේන භේදභාවතෝ දෝසමූලං අසඞ්ඛාරික සසඞ්ඛාරිකභේදතෝ දුවිධං. යදි ඒවං කස්මා "දෝමනස්සසහගතං පටිඝසම්පයුත්ත"න්ති වුත්තං? අසාධාරණධම්මේහි තස්ස චිත්තස්ස උපලක්ඛණත්ථං. පාණස්ස අතිච, අතික්කමිත්වා වා පාතනං **පාණාතිපාතෝ. ආදි-**සද්දේන අදින්නාදානමුසාවාදපේසුඤ්ඤඵරුසසම්ඵප්පලාපබ්‍යාපාදේ සඞ්ගණ්හාති. දසඅකුසලකම්මපථේසු හි කාමේසුමිච්ඡාචාරඅභිජ්ඣාමිච්ඡාදිට්ඨිසඞ්ඛාතා තයෝව කම්මපථා ඉමිනා න සිජ්ඣන්ති. සභාවතික්ඛං හුත්වා පවත්තමානං චිත්තං

අසඞ්ඛාරමේව හෝති, ඉතරං සසඞ්ඛාරන්ති අධිප්පායේනාහ **"තික්ඛමන්දප්පවත්තිකාලේ"**ති. මන්දං පන හුත්වා පවත්තමානං ඒකංසේන සසඞ්ඛාරමේවාති න සක්කාව විඤ්ඤාතුං. යං සසඞ්ඛාරේන සප්පයෝගේන පවත්තති, තං මන්දමේව හෝතීති කත්වා තථා වුත්තන්ති දට්ඨබ්බං.

මෝහමූලං චිත්තං මූලන්තරවිරහතෝ අතිමූළ්හං විචිකිච්ඡුද්ධච්චයෝගතෝ චඤ්චලඤ්චාති උපෙක්ඛාසහගතමේව හෝති, න තස්ස කදාචිපි සභාවතික්ඛතා අත්ථි. ආරම්මණේ හි සංසප්පනවසේන, වික්ඛිපනවසේන ච පවත්තමානස්ස චිත්තද්වයස්ස කිං තාදිසේ කිච්චේ සභාවතික්ඛතාය, උස්සාහේතබ්බතාය වා භවිතබ්බං, තස්මා න තත්ථ සඞ්ඛාරභේදෝ අත්ථි. නනු ච උද්ධච්චං සබ්බාකුසලසාධාරණං, කස්මා පන ඒතමේව තේන විසේසෙත්වා වුත්තං "උද්ධච්චසහගත"න්ති. විසේසතෝ බලවභාවතෝ. ඉදඤ්හි ඒතස්මිං චිත්තේ බලවං, තස්මා සම්පයුත්තධම්මේසු පධානං හුත්වා පවත්තතීති ඉදමේව තේන විසේසිතබ්බං. තේනේව හි **පාළියං** සේසාකුසලේසු උද්ධච්චං යේවාපනකවසේන ආගතං, ඉධ පන සරූපතෝයේව නිද්දිට්ඨං. ඒවං අසාධාරණප්පධානධම්මවසේන මෝහමූලං විචිකිච්ඡාසම්පයුත්තං උද්ධච්චසම්පයුත්තන්ති දුවිධං වුත්තන්ති දට්ඨබ්බං. **අසන්නිට්ඨානං** සංසයෝ, **වික්ඛේපෝ** අවූපසමෝ, භන්තතාති අත්ථෝ. තත්ථ විචිකිච්ඡාසහගතස්ස අසන්නිට්ඨානකාලේ, උද්ධච්චසහගතස්ස වික්ඛේපකාලේ ච පවත්ති වේදිතබ්බා.

**යථානුරූප**න්ති පටිසන්ධිජනකාජනකස්ස, කම්මපථභාවප්පත්තාපත්තස්ස ච අනුරූපතෝ. අථ වා **යථානුරූප**න්ති යෝ යස්ස හේතු, තදනුරූපතෝ. යේභුයෙය්න හි ලෝභමූලකේන ඛුප්පිපාසාදිනිරන්තරපේතවිසයේ උප්පජ්ජන්ති, දෝසමූලකේන දෝසෝ විය චණ්ඩජාතතාය තංසරික්ඛකේ නිරයේ, මෝහමූලකේන නිච්චසම්මූළ්හාය තිරච්ඡානයෝනියං, තස්මා ලෝභාදිහේතුඅනුරූපතෝ තත්ථ තත්ථ අපායේ උපපත්තිං නිප්ඵාදේතීති ආහ **"යථානුරූපං**...**පෙ**.... **උපපත්තියා"**ති. අකුසලවිපාකානං දුක්ඛප්පධානතාය **"දුක්ඛවිසේසස්සා"**ති වුත්තං.
**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අකුසල වණ්ණනා යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 150-154 පිටු]**

එහි භූමි වශයෙන් එක් වැදෑරුම් වෙයි කියනලද අර්ථය නියමකොට දක්වන්නා වූ ආචායර්‍යීන් වහන්සේ "කාමාවචරමේව" යන මෙයින් කාමභූමියෙහිම වේ යැයි කීයේ නිකායන්තරිකයෝ වනාහි රූපාරූපාවචර වූ අකුසල් සිතකුදු කැමති වෙති. එහෙයින් ඔහුන්ගේ ඒ මතය වළක්වනු පිණිස "කාමාවචරමේව" යන මෙහි ඒව ශබ්දයෙන් අවධාරණය හෙවත් නියම කරනලද්දේයි. ඒ එසේමැයි; මහග්ගත භූමියෙහි ඒ අකුසල් සිත උපදනේ නමුදු ඒ රූපභූමියෙහි ප්‍රවෘත්ති විපාක දෙන්නේ නමුදු ඒකාන්තයෙන් කාමාවචරම වේයයි දතයුතුයි. මේ නියමය වනාහි කුමක් හෙයින් වේද යත්? කාමතෘෂ්ණාවට විෂය වන බැවිනි. ඒ එසේමැයි; රූපාරූපතෘෂ්ණා විෂයත්වය රූපාරූපභාවයට හේතුවේ ද? එපරිද්දෙන්ම කාමතෘෂ්ණා විෂයත්වය කාමාවචර භාවයට හේතුවේයයි ඒකාන්තයෙන් මෙය එසේම පිළිගතයුතුයි. එසේ නොගතහොත් ඛ්‍යාධිලක්‍ෂණය නොවන්නේය. ඉදින් වනාහි අරමුණු වියයුතු ධර්මයන්ගේ වශයෙන් භූමි නියමය කරන්නේ වී නම් එසේ ඇති කල්හි අනාරම්මණයන්ගේ සඞ්ග්‍රහය නොවන්නේයි. යලි විපාකදන වශයෙන් භූමි ව්‍යවස්ථානය කරන්නේ වී නම් එසේ ඇති කල්හිදු අවිපාකයන්ගේ සඞ්ග්‍රහය නොවන්නේය. එහෙයින් අරමුණු ධර්මයන්ගේ වශයෙන්ම පරියාපන්න ධර්මයන්ගේ ඒ භූමි නියමය කටයුත්තීය. අපරියාපන්න

ධර්මයන්ගේ වනාහි ලෝකයෙන් එතර වූ හෙයින් ලෝකෝත්තර බවට ද උත්තරීතර භාවයෙන් නිරුත්තර බවද දතයුතුතීය. දෙම්නසගේ අනීවරණාවස්ථාවක් නැති හෙයින් ඒ දෙම්නස් සහ ගිය චිත්තෝත්පාද තෙමේ කාමභූමියෙහිම හටගනී. එහෙයින් ඒ දෙම්නස් සහ ගිය සිත් තෙමේ නියත වස්තුක වෙයි. සෙසු චිත්තයෝ අරූපභූමියෙහි ද හටගන්නා හෙයින් අනියත වස්තුකයෝ වෙත්නුයි "නියතා -පෙ- දුවිධං" යි කීයේයි. විචිකිච්ඡා උද්ධච්ච සහගත චිත්තයන් මෝහයාගේ වශයෙන් ඒකහේතුක බැවින් ද සෙසු චිත්තයන් ලෝභ-මෝහ, දෝස-මෝහ වශයෙන් ද්විහේතුක බැවින් ද "ඒකහේතුකදුහේතුකතෝ" යි කීයේයි. මුල පටන් එකොළොස් සිත් කෙනෙක් ප්‍රතිසන්ධිය උපදවන හෙයින් ද උද්ධච්ච සහගත චිත්තයාගේ ඒ ප්‍රතිසන්ධි ජනකභාවය නැති බැවින් ද "පටිසන්ධිජනකාජනකතෝ" යි කීයේයි. ඒ එසේමැයි; උද්ධච්ච සහගත සිත් තෙමේ ප්‍රවෘත්ති විපාක දෙන්නේ නමුදු ප්‍රතිසන්ධි විපාක නොදෙයි. එහෙයින්ම:—

"ඒකාදසවිධානං තු, හිත්වා උද්ධච්චමානසං;
ඒකාදසවිධා චේව, භවන්ති පටිසන්ධියෝ" යි.

මතු ව්‍යක්‍ෂමාන වන්නේයි. යම් කාරණයෙකින් ඒ උද්ධච්ච සහගත සිත් තෙමේ ප්‍රතිසන්ධිය නොදෙත් ද ඒ කාරණය විනිශ්චය කථාව හා සමඟ මේ කථාවගේ වර්ණනා ප්‍රදේශයෙහිම කියන්නෙමු. "තීහි වේදනාහි" යන මෙහි සුඛ වේදනා දුක්ඛ වේදනා උපේක්‍ෂා වේදනා යැයි කියනලද ත්‍රිවිධ වේදනාවන් හා යෙදීම් වශයෙන් යනු අර්ථයි. එහෙයින් වදාළහ:—

"තිස්සෝ ඉමා භික්ඛවේ වේදනා; කතමා තිස්සෝ? සුඛා දුක්ඛා අදුක්ඛමසුඛා" යි ඇතැම් සූත්‍රයෙක්හි "ද්වේමා භික්ඛවේ සුඛ දුක්ඛා" යි යම් වචනයක් වදාරණ ලද්දේ ද? ඒ වචනය වනාහි අනවද්‍ය පක්‍ෂයෙහි වූ උපේක්‍ෂා වේදනාව සැප වේදනාවෙහි ද සාවද්‍ය පක්‍ෂයෙහි වූ උපේක්‍ෂා වේදනාව දුක්ඛ වේදනාවෙහි ද සඞ්ග්‍රහ කොට පරියාය වශයෙන් කියන ලද්දේ යැයි දතයුතුයි. "සුප්පතිට්ඨිතභාවකාරණත්තා මූලම්වාති මූලං, ලෝභෝ මූලං ඒතස්සාති ලෝභමූලං" යනු හෙයින් මොනවට පිහිටීමට කරුණු වන හෙයින් මුලකට බඳු ස්වභාව ඇත්තේනුයි මූල නම් වෙයි. ලෝභය මූල වූයේ මොහුටනුයි ලෝභමූල නම් වෙයි. ඉදින් වනාහි මෝහය ද ලෝභමූල චිත්තයෙහි ඇත්තේ නමුදු ඒ මෝහය සියළු අකුසල් චිත්තයන්ට සාධාරණ චෛතසිකයක් බැවින් ව්‍යවස්ථානකර නොවෙයි. එහෙයින් අසාධාරණ ධර්ම වශයෙන් ලෝභමූලමයයි කියන ලද්දේය. කුමක්මෙන් ද යත්? යම්සේ භේරී ශබ්දය යවඞ්කුරයයි කියනු ලැබේ ද එමෙනි. "දෝසමූලං" යන මෙහි ද මෙම නයයි. අන්‍ය මූලයක් නැති හෙයින් මෝහයම මුල් වූයේ මේ සිතටනුයි මෝහමූල නම් වෙයි. "මිච්ඡාවසේන දස්සනං දිට්ඨි, දිට්ඨියේව දිට්ඨිගතං" යනු වචනාර්ථ හෙයින් මිත්‍යා වශයෙන් දැක්ම දෘෂ්ටි නම් වෙයි. දෘෂ්ටියම දිට්ඨිගත නම් වෙයි. "ආකාසගතං ථාමගතං" යනාදි පාඨයෙහි මෙනි. නොහොත් විපර්‍යාසග්‍රාහික දෘෂ්ටියගේ හටගැනීම් මාත්‍රයක්ම වේද මේ විපරීත දෘෂ්ටියෙහි දැනගතයුතු අවබෝධ කටයුතු වස්තුවක් සත්‍ය ස්වභාවක් නැත්තේ වේද ඒ විපරීත දෘෂ්ටිය දිට්ඨිගත නම් වේ. නොහොත් දෙසැටක් ප්‍රභේද ඇත්තා වූ මිත්‍යාදෘෂ්ටියෙහි ඇතුළත් වූයේනුයි දිට්ඨිගත නම් වේ. "තේන සමං පකාරේහි යුත්තන්ති දිට්ඨිගතසම්පයුත්තං" ඒ මිත්‍යාදෘෂ්ටිය හා ඉදිරි පසු නොවී සමව ඒකෝත්පාදදී සතර ආකාරයෙන් යෙදුනේනුයි දිට්ඨිගතසම්පයුත්ත නම් වේ. "යදදි" යනාදියෙන් ලෝභමූල චිත්තයන්ගේ හටගැනීම් ආකාරය දක්වයි. "මිච්ඡාදිට්ඨි" යන මෙයින් උච්ඡේද දෘෂ්ටි ආදී මිත්‍යාදෘෂ්ටිය දක්වයි. ඒ මිත්‍යාදෘෂ්ටියෙන් විපර්‍යාස සිත් ඇත්තාහු "තාව කෝධවිසයෝ යාව ඉන්ද්‍රියගෝචරෝ" යි යනුවෙන් පරලොව ප්‍රතික්ෂේප කොට පඤ්චකාම සම්පත්තියෙහි අයුණු නැතැයි ගනිති. (නත්ථි කාමේසු ආදීනවෝති යනාදි

නයේන) යන්නෙහි ආදී ශබ්දයෙන් "ඒස පන්ථෝච්තථෝ දේවයානෝ -පෙ- මාතරිපි මිථුනං චරන්ති" යනාදීන් දක්වනලද පුත්‍රමුඛ දර්ශණය ස්වර්ග මෝක්ෂ මාර්ගයයි යන මේ ආදී වූ මිත්‍යා වාදයන් ගැණෙයි. "කාමේ වා" යන මෙහි වා ශබ්ද තෙමේ අනියමාර්ථයෙහි වැටෙයි. ඒ වා ශබ්දයෙන් බ්‍රාහ්මණයන්ගේ රත්‍රන් පැහැර ගැනීමම අදින්නාදනය වෙයි. සෙස්සන්ගේ රත්‍රන් පැහැර ගැනීම අදින්නාදනය නොවෙයි. ගුරුන්ගේ හා තමාගේ ද ජීවිතය සඳහා බොරුකීම වරද නොවෙයි. සෙසු කාරණයක් සඳහා බොරු කීම වරද වෙයි. ආචාර්‍ය්‍යාදීන් සඳහා කේළාම් කීම නිවැරදි වෙයි. සෙසුසන් සඳහා කේළාම්බස් බිණීම වරද වෙයි. භාරතයුද්ධ සීතාහරණාදී කථා පැවැත්වීම පාප ව්‍යුපසමනය පිණිස වේ යැයි මේ ආදීන් පැවැති මිත්‍යාදෘෂ්ටීන් ගැණෙයි. දෘෂ්ටමඞ්ගලාදීන් යනු දෘෂ්ටමඞ්ගල සුතමඞ්ගල මුතමඞ්ගල යන මොහු වෙති. "සාරතෝ පච්චේති" යනු වෘද්ධියට පෙරනිමිති භාවයෙන් නොගෙන මෙයම වෘද්ධිකාරණයෙකැයි මෙසේ සාර වශයෙන් ගනී යන අර්ථයි. "සභාවතික්ඛේන" යනු ලෝභයාගේ හෝ මිත්‍යාභිනිවේසයාගේ හෝ වශයෙන් තියුණු වූ යන අර්ථයි. "මන්දේන" යනු ලස් වූ ඉතා තියුණු නුවූ යන අර්ථයි. එබඳු සිත වනාහි තමාගේ හෝ මෙරමාගේ හෝ උත්සාහය කරණකොටගෙන හටගන්නා හෙයින් "සමුස්සාහිතේන" යි කීයේයි. "පරභණ්ඩං වා හරති" යන මෙහි වා ශබ්දයෙන් එසේ පවත්නා මුසාවාදදිය සඞ්ග්‍රහ වේ යැයි දතයුතුයි. "කාමානං වා" යන මෙහි වා ශබ්දයෙන් අදහස් නොවූ පරිද්දෙන් යමක් ලබනලදද එය ගතයුතු යැයි අනුන් සතු වස්තුව ගැනීම් ආදිය සඞ්ග්‍රහ වෙයි.෴

සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ වශයෙන් භේදයක් නැති හෙයින් ද්වේෂමූලික සිත් තෙමේ අසඞ්ඛාරික සසඞ්ඛාරික භේද හෙයින් දෙවැදෑරුම් වෙයි. ඉදින් එසේ වී නම් කුමක් හෙයින් "දෝමනස්සසහගතං පටිඝසම්පයුත්තං" යි කියන ලද්දේ ද යත්? අසාධාරණ ධර්මයන් කරණකොටගෙන ඒ චිත්තය හඟවනු පිණිසයි (දෝමනස්සය වේදනාස්කන්ධයෙහි ද පටිඝය සංස්කාරස්කන්ධයෙහි ද ඇතුළත් යැයි දතයුතුයි) "පාපස්ස අතීව අතික්කමිත්වා වා පාතනං පාණාතිපාතෝ" යනු වචනාර්ථ හෙයින් ජීවිතේන්ද්‍රිය සුහුසුළුවම නොහොත් ඉක්මණින්ම හෙලීම පාණාතිපාත නම් වේ. "පාණාතිපාතාදීසු" යන මෙහි ආදී ශබ්දයෙන් අදින්නාදන-මුසාවාද-පේසුඤ්ඤ-ඵරුෂ-සම්ඵප්පලාප-ව්‍යාපාද යන මොහුන් සඞ්ග්‍රහ වෙයි. ඒ එසේමැයි; දස අකුසල කර්මපථයන් අතුරෙන් කාමමිත්‍යාචාර-අභිද්‍යා-මිත්‍යාදෘෂ්ටි සඞ්ඛ්‍යාත තුන් කර්මපථයෝම මේ දෙම්නස් සහගත ප්‍රතිඝසම්ප්‍රයුක්ත සිතින් සිද්ධ නොවෙත්. ස්වභාවයෙන් තියුණු වී හටගන්නා වූ සිත අසඞ්ඛාරිකම වෙයි. එයින් අන්‍යවූ සිත සසඞ්ඛාරික වෙයි යන අභිප්‍රායෙන් "තික්ඛමන්දප්පවත්තිකාලේ" යි කීයේයි. ලැසිව හටගන්නා වූ සිත ඒකාන්තයෙන් සසඞ්ඛාරම වේයයි දැනගත නොහැකි වෙයි. සසඞ්ඛාරයෙන් සප්‍රයෝගයෙන් හටගනීනුයි ඒ සිත මන්දම වෙයි. එහෙයින් එසේ කියනලදැයි දතයුතුයි.෴

මෝහමූලික සිත් තෙමේ මූලාන්තරයෙකින් හෙවත් මෝහමූලයෙන් අන්‍යවූ ලෝභ දෝස මූලයන් නැති හෙයින් අතිශයින් අරමුණෙහි මුළාබව ද වෙයි. විචිකිත්සා ඖද්ධත්‍යයන් හා නිරන්තරයෙන් යුක්ත බැවින් අරමුණෙහි සැලීම ද වෙයි. එහෙයින් උපේක්ෂා සහගතම වෙයි. ඒ මෝහමූලික චිත්තයාගේ කිසිකලෙකත් ස්වභාවයෙන් තියුණු බවක් නැත්තේය. අරමුණෙහි බැසගන්නට අසමර්ථ බැවින් නිශ්චය නොකළහැකි වශයෙන් ද අරමුණෙහි වික්ෂිප්ත වීම් වශයෙන් ද හටගන්නා වූ චිත්තයන් දෙදෙනාගේ එබඳු කෘත්‍යයෙහි ස්වභාවයෙන් තියුණු බවක් හෝ උත්සාහ කටයුතු බවක් හෝ කෙසේ වියයුත්තේ ද යත් නොවන්නේමැයි. එහෙයින් ඒ සිතෙහි

සංස්කාර භේදයක් නැත්තේය. ඖද්ධ්‍යත්‍යය සියළු අකුසල සිත් හා සාධාරණ චෛතසිකයක් නොවේ ද? කුමක්හෙයින් වනාහි මේ එකම අකුසල චිත්තය ඒ ඖද්ධ්‍යත්‍යයෙන් වෙනස් කොට "උද්ධච්චසහගතං" යි දේශනා කෙළේද යත්? වෙසෙසින් බලවත් බැවිනි. යම් හෙයකින් මේ ඖද්ධ්‍යත්‍යය ඒ අවසාන අකුසල සිතෙහි බලවත් වේද එහෙයින් එක්ව යෙදුනා වූ ධර්මයන් අතුරෙහි ප්‍රධානව පවතීනුයි මේ අවසාන අකුසල චිත්තයම ඒ ඖද්ධ්‍යත්‍යයෙන් වෙසසිය යුතුයි. එහෙයින්ම දම්සඟුණු පෙළෙහි ඖද්ධ්‍යත්‍යය සම්ප්‍රයුක්ත චිත්තයෙන් අන්‍යවූ අකුසල චිත්තයෙහි ඖද්ධ්‍යත්‍යය යේවාපනක වශයෙන් හෙවත් "ලෝභෝ හෝති දෝසෝ හෝති" යනාදී ක්‍රමයෙන් ලෝභ ද්වේෂාදීන් මෙන් ස්වරූප උද්ධරණය නොකොට "යේවාපනඤ්ඤේපි අත්‍ථි පටිච්චසමුප්පන්නා අරූපිනෝ ධම්මා" යනුවෙන් දේශනා කළේය. මේ අවසාන අකුසල චිත්තයෙහි වනාහි "උද්ධච්චං හෝති" යනුවෙන් ස්වකීය ශබ්ද ස්වරූපයෙන්ම දක්වන ලද්දේයි. මෙසේ අසාධාරණ ධර්ම ප්‍රධාන ධර්ම වශයෙන් මෝහමූලික සිත විචිකිච්ඡා සම්ප්‍රයුක්තය උද්ධච්ච සම්ප්‍රයුක්ත යයි දෙවැදෑරුම් කොට කියනලදැයි දතයුතුයි. "අසන්නිට්ඨාන" යනු සැකයයි. "වික්ඛේප" යනු නොසන්සුන් බවයි. එහි විචිකිච්ඡා සහගත චිත්තයාගේ හටගැනීම සංසය කාලයෙහි ද උද්ධච්ච සහගත චිත්තයාගේ හටගැනීම නොසන්සුන් කාලයෙහි ද වේ යැයි දතයුතුයි.෴

"යථානුරූපං" යන මෙහි ප්‍රතිසන්ධි ජනකාජනක බවට හා කර්මපථ බවට පැමිණීමට හා නොපැමිණීමට ද සුදුසු පරිද්දෙන් යනාර්ථයි. නොහොත් යම් අකුසල් සිතකට යම් ධර්මයක් හේතු වේද ඒ හේතුවට සුදුසු පරිද්දෙන් යනාර්ථයි. ඒ එසේමැයි; බොහෝසෙයින් ලෝභමූලික සිතින් ක්‍ෂුත්පිපාසාදියෙන් නිරතුරු වූ ප්‍රේත විෂයෙහි උපදිත්. ද්වේෂමූලික සිතින් ද්වේෂය මෙන් සැඩ ස්වභාව ඇති හෙයින් ඒ හා සමාන නරකයෙක්හි උපදිත්. මෝහමූලික සිතින් නිරතුරු මූඪ වූ තිරිසන් යෝනියෙහි උපදිත්. එහෙයින් ලෝභාදී හේතු ධර්මයන්ට සුදුසු පරිද්දෙන් උපප්‍රාප්තිය නිපදවානුයි "යථාරූපං -පෙ- උපපත්තියා" යි කීයේයි. අකුසල විපාකයන්ගේ දුක්ඛයම ප්‍රධාන බැවින් අදුක්ඛමසුඛ වේදනාව ද දුක්ඛයම කොට "දුක්ඛවිසේසස්ස" යි කියනලදි.෴ **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 112-116 පිටු]**

පාපාපාපෙස්වපාපේන, යං වුත්තං පාපමානසං;
පාපාපාපප්පහීනේන, තං මයා සමුදාහටං.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 31 යටතේ)]**

**යං පාපමානසං** යං අකුසලචිත්තං **පාපාපාපේසු** පාපඅපාපේසු කුසලාකුසලේසු **අපාපේන** අප්පවත්තේන පාපාපාපප්පහීනේන **වුත්තං** ඊරිතං කථිතං, **තං පාපමානසං** තං අකුසලචිත්තං මයා **සමුදාහටං** කථිතං.

**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 31 යටතේ)]**

**අපාපේන** අලාමකේන පාපාපාපප්පහීනේන **පාපාපාපේසු** මානසේසු යං පාපමානසං වුත්තං, පාපාපාපේසු පුග්ගලේසු අපාපේන පාපාපාපප්පහීනේන යං පාපමානසං වුත්තන්ති වා සම්බන්ධෝ. අථ වා පාපාපාපේසු මානසේසු පාපේන පාපමානසේන පාපවසේන පාපාපාපප්පහීනේන යං පාපමානසං වුත්තන්ති යෝජනා. අයං පනෙත්‍ථ අධිප්පායෝ; අසම්මාසම්බුද්ධේන තාව ධම්මසභාවස්ස දුබ්බිජානීයත්තා කුසලම්පි අකුසලතෝ, අකුසලම්පි කුසලතෝ වුච්චෙය්‍ය, භගවතෝ පන සහ වාසනාහි විද්ධංසිතාකුසලස්ස කම්මක්ඛයකරඤාණේන පච්චයවේකල්ලතෝ

විද්ධංසිතකුසලකම්මස්ස ච සම්මාසම්බුද්ධභාවතෝ ඒකන්තේනේව අකුසලදේසනා අකුසලධම්මවසේනේවාති. **[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 31 යටතේ)]**

**අපාපේන** අලාමක වූ නොහොත් පාපයන් ප්‍රහීණ කළාවූ සර්වඥයන් වහන්සේ විසින් **පාපඅපාපේසු** කුසලාකුසල සිත් අතුරෙන් **යං පාපමානසං** යම් අකුසල් සිතක් **වුත්තං** වදරණ ලද්දේ ද (නොහොත්)**පාපඅපාපේසු** පාප අපාප පුද්ගලයන් අතුරෙන් **අපාපේන** පාපයන් ප්‍රහීණ කළාවූ බුදුරජාණන් වහන්සේ විසින්) "යං පාපමානසං වුත්තං" යි සම්බන්ධ කරනු (නොහොත්) (**පාපාපාපපහීණේන** කුසලාකුසල කර්මයන් ප්‍රහීණ කළාවූ බුදුරජාණන් වහන්සේ විසින් **පාපාපාපේසු** කුසලාකුසල සිත් අතුරෙන් **පාපේන** අකුසල් වශයෙන් **යං පාපමානසං** යම් අකුසල් සිතක් **වුත්තං** වදරණ ලද්දේ ද **තං** ඒ අකුසල් සිත **මයා** මා විසින් **සමුද්දහටං** මොනවට කියන ලද්දේය ෴

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 112 පිට]**

තත්ථ **ලෝභමූලං** සෝමනස්සුපෙක්ඛාදිට්ඨිගතසඞ්ඛාරභෙදතෝ අට්ඨවිධං. සෙය්‍යථීදං, සෝමනස්සසහගතං දිට්ඨිගතසම්පයුත්තං අසඞ්ඛාරං සසඞ්ඛාරඤ්ච, තථා දිට්ඨිගතවිප්පයුත්තං. උපෙක්ඛාසහගතං දිට්ඨිගතසම්පයුත්තං අසඞ්ඛාරං සසඞ්ඛාරඤ්ච, තථා දිට්ඨිගතවිප්පයුත්තං.

යදා හි "නත්ථි කාමේසු ආදීනවෝ"ති (ම. නි. 1.469) ආදිනා නයේන මිච්ඡාදිට්ඨිං පුරක්ඛත්වා හට්ඨතුට්ඨෝ කාමේ වා පරිභුඤ්ජති, දිට්ඨමඞ්ගලාදීනි වා සාරතෝ පච්චේති සභාවතික්ඛේනේව අනුස්සාහිතේන චිත්තේන, තදා පඨමං අකුසලචිත්තං උප්පජ්ජති. යදා මන්දේන සමුස්සාහිතේන චිත්තේන, තදා දුතියං. යදා මිච්ඡාදිට්ඨිං අපුරක්ඛත්වා කේවලං හට්ඨතුට්ඨෝ මේථුනං වා සේවති, පරසම්පත්තිං වා අභිජ්ඣායති, පරභණ්ඩං වා හරති සභාවතික්ඛේනේව අනුස්සාහිතේන චිත්තේන, තදා තතියං. යදා මන්දේන සමුස්සාහිතේන චිත්තේන, තදා චතුත්ථං. යදා පන කාමානං වා අසම්පත්තිං ආගම්ම අඤ්ඤේසං වා සෝමනස්සහේතූනං අභාවේන චතූසුපි විකප්පේසු සෝමනස්සරහිතා හොන්ති, තදා සේසානි චත්තාරි උපෙක්ඛාසහගතානි උප්පජ්ජන්තීති ඒවං සෝමනස්සුපෙක්ඛාදිට්ඨිගතසඞ්ඛාරභේදතෝ අට්ඨවිධං ලෝභමූලං වේදිතබ්බං.

**දෝසමූලං** පන දෝමනස්සසහගතං පටිඝසම්පයුත්තං අසඞ්ඛාරං සසඞ්ඛාරන්ති දුවිධමේව හෝති, තස්ස පාණාතිපාතාදීසු තික්ඛමන්දප්පවත්තිකාලේ පවත්ති වේදිතබ්බා.

**මෝහමූලං** උපෙක්ඛාසහගතං විචිකිච්ඡාසම්පයුත්තං උද්ධච්චසම්පයුත්තඤ්චාති දුවිධං. තස්ස සන්නිට්ඨානවික්ඛේපකාලේ පවත්ති වේදිතබ්බාති ඒවං අකුසලවිඤ්ඤාණං ද්වාදසවිධං හෝති.

**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 453 යටතේ); විසුද්ධිමග්ග අටුවා 339 පිට (හේ.වි.මු); අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 04 අකුසලචිත්ත වණ්ණනා යටතේ); විභාවනී ටීකා සන්නය 28-30 පිටු; සද්ධර්මසාගරය 02/420-421 පිටු; අභිධර්ම චන්ද්‍රිකාව 9-11 පිටු; අභිධර්ම මාර්ගය 34-36 පිටු; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රශ්නෝත්තර 02 පිට]**

**මූලතෝ තිවිධ**න්ති තීණි අකුසලමූලානි ලෝභාදීනි, තේසං වසේන තං සහිතම්පි තිවිධන්ති අත්ථෝ. තානි හි සුප්පතිට්ඨිතභාවකාරණත්තා මූලමිවාති මූලානි, ලෝභෝ

මූලං ඒතස්සාති **ලෝභමූලං**. අසාධාරණේන නිද්දේසෝ යථා භේරිසද්දෝ, යවඞ්කුරෝති. තථා **දෝසමූලං.** මෝහෝ ඒව මූලං ඉමස්ස, නාඤ්ඤන්ති **මෝහමූලං**.

**සෝමනස්සුපෙක්ඛාදිට්ඨිගතසඞ්ඛාරභේදතෝ**ති සෝමනස්සුපෙක්ඛාභේදතෝ දිට්ඨිගතභේදතෝ සඞ්ඛාරභේදතෝති පච්චේකං භේදසද්දෝ යෝජේතබ්බෝ. යදෙත්ථ වත්තබ්බං, තං හෙට්ඨා වුත්තනයමේව. **දිට්ඨිගතසම්පයුත්ත**න්ති දිට්ඨියේව දිට්ඨිගතං "ගූථගතං, මුත්තගත"න්ති (ම. නි. 2.119; අ. නි. 9.11) යථා. අථ වා විපරියේසග්ගාහතාය දිට්ඨියා ගතමේව, න එත්ථ ගන්තබ්බවත්ථු තථා සභාවන්ති දිට්ඨිගතං. තයිදං "ඉදමේව සච්චං, මෝඝමඤ්ඤ"න්ති (ම. නි. 2.187, 202, 203, 427; 3.27-29) අභිනිවේසභාවතෝ ලෝභේනේව සද්ධිං පවත්තති, න දෝසේන.

**යදභී**තිආදි ලෝභමූලචිත්තානං පවත්තිආකාරදස්සනං. **මිච්ඡාදිට්ඨී**න්ති උච්ඡේදදිට්ඨිආදිමිච්ඡාදිට්ඨිං. තාය හි විපල්ලත්ථචිත්තා සත්තා "ඒතාවකෝ ජීවවිසයෝ යාව ඉන්ද්‍රියගෝචරෝ"ති පරලෝකං පටික්ඛිපිත්වා "නත්ථි කාමේසු ආදීනවෝ"ති යථා තථා කාමේසු පාතබ්‍යතං ආපජ්ජන්ති. **ආදි**-සද්දේන "ඒස පන්ථෝ පගේව විහිතෝ දේවයානේ, යේන යන්ති පුත්තවන්තෝ විසෝකා. තං පස්සන්ති පසවෝ, පක්ඛිනෝ ච, තේන තේ මාතරිපි මිථුනං චරන්තී"තිආදිනා නයේන පුත්තමුඛදස්සනං සග්ගමොක්ඛමග්ගෝති ඒවමාදිකං මිච්ඡාදිට්ඨිං සඞ්ගණ්හාති.

**කාමේ වා**ති එත්ථ **වා**-සද්දෝ අනියමත්ථෝ, තේන බ්‍රාහ්මණානං සුවණ්ණාහරණමේව අදින්නාදානේ සාවජ්ජං, ඉතරං අනවජ්ජං. ගරූනං, ගුන්නං, අත්තනෝ, ජීවිතස්ස, විවාහස්ස ච අත්ථාය මුසාවාදෝ අනවජ්ජෝ, ඉතරෝ සාවජ්ජෝ. ගරුආදීනං අත්ථාය පේසුඤ්ඤහරණං අනවජ්ජං, ඉතරං සාවජ්ජං. භාරතයුද්ධසීතාහරණාදිකථා පාපවූපසමාය හෝතීති ඒවමාදිකේ මිච්ඡාගාහේ සඞ්ගණ්හාති. **දිට්ඨමඞ්ගලාදීනී**ති දිට්ඨසුතමුතමඞ්ගලානි. **සභාවතික්ඛේනා**ති ලෝභස්ස, මිච්ඡාභිනිවේසස්ස වා වසේන සරසේනේව තිඛිණේන කුරූරේන. **මන්දේනා**ති දන්ධේන අතිඛිණේන. තාදිසං පන අත්තනෝ, පරස්ස වා සමුස්සාහනේන පවත්තතීති ආහ **"සමුස්සාහිතේනා"**ති. **පරභණ්ඩං වා හරතී**ති **වා**-සද්දේන තථා පවත්තනකමුසාවාදදීනම්පි සඞ්ගහෝ දට්ඨබ්බෝ. **කාමානං වා** අනුභුය්‍යමානානං. **වා**-සද්දේන පරසන්තකස්ස වා අයථාධිප්පේතතාය යං ලද්ධං, තං ගහේතබ්බන්ති ගහණාදිකං සඞ්ගණ්හාති.

**දුවිධමේව හෝති** සම්පයුත්තධම්මවසේන භේදාභාවතෝ. යදි ඒවං, කස්මා "දෝමනස්සසහගතං පටිඝසම්පයුත්ත"න්ති වුත්තන්ති? අසාධාරණධම්මේහි තස්ස චිත්තස්ස උපලක්ඛණත්ථං. **පාණාතිපාතාදීසූ**ති පාණාතිපාතනාදීසු. **ආදි**-සද්දේන අදින්නාදානමුසාවාදපේසුඤ්ඤඵරුසසම්ඵප්පලාපබ්‍යාපාදේ සඞ්ගණ්හාති. සභාවතික්ඛං හුත්වා පවත්තමානං චිත්තං අසඞ්ඛාරමේව හෝති, ඉතරං සසඞ්ඛාරන්ති අධිප්පායේනාහ **"තික්ඛමන්දප්පවත්තිකාලේ"**ති. මන්දං පන හුත්වා පවත්තමානං ඒකංසේන සසඞ්ඛාරමේවාති න සක්කා විඤ්ඤාතුං. යං සසඞ්ඛාරේන සප්පයෝගේන පවත්තති, තං මන්දමේව හෝතීති කත්වා තථා වුත්තන්ති දට්ඨබ්බං.

මෝහේකහේතුකං චිත්තං මූලන්තරවිරහතෝ අතිමූළ්හං, විචිකිච්ඡුද්ධච්චයෝගතෝ චඤ්චලඤ්චාති **උපෙක්ඛාසහගත**මේව හෝති, න තස්ස කදාචිපි සභාවතික්ඛතා අත්ථි. ආරම්මණේ හි සංසප්පනවසේන, වික්ඛිපනවසේන ච පවත්තමානස්ස චිත්තද්වයස්ස කීදිසේ කිච්චේ සභාවතික්ඛතාය, උස්සාහේතබ්බතාය

වා භවිතබ්බං, තස්මා න තත්ථ සඞ්ඛාරභේදෝ අත්ථි. අඤ්ඤේසු අකුසලචිත්තේසු ලබ්භමානම්පි උද්ධච්චං විසේසතෝ එත්ථේව බලවං, තතෝ ඒව සම්පයුත්තධම්මේසු පධානං හුත්වා පවත්තතීති ඉදමේව උද්ධච්චේන විසේසෙත්වා වුත්තං **"උද්ධච්චසම්පයුත්ත"**න්ති. තථා හි **පාළියං** (ධ. ස. 427) ඉධ සරූපතෝ උද්ධච්චං ආගතං, ඒවං අසාධාරණපධානධම්මවසේන මෝහමූලං "විචිකිච්ඡාසම්පයුත්තං, උද්ධච්චසම්පයුත්ත"න්ති දුවිධං වුත්තන්ති දට්ඨබ්බං. **අසන්නිට්ඨානං** සංසයෝ. **වික්ඛේපෝ** අවූපසමෝ, භන්තතාති අත්ථෝ.

තයිදං ද්වාදසවිධම්පි අකුසලචිත්තං ඡසු ආරම්මණේසු යං වා තං වා ආලම්බිත්වා උපෙක්ඛාසහගතාහේතුකකිරියාමනෝවිඤ්ඤාණධාතානන්තරං කායද්වාරාදීහි තීහි ද්වාරේහි කායකම්මාදිවසේන යථාරහං පාණාතිපාතාදිකම්මපථවසේන චේව කම්මවසේන ච උප්පජ්ජතීති වේදිතබ්බං.

**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 453 යටතේ)]**

**මූලතෝ තිවිධං** ලෝභාදී මූල වශයෙන් පිරිසිඳුනා ලද අවකාශ ඇති කාමතෘෂ්ණාවට විෂයභාවය සඳහා තත්සහගත චිත්තය ද ත්‍රිවිධ වේ යන අර්ථයි. ඒ ලෝභාදීහු වනාහි සුප්‍රතිෂ්ඨිතභාවයට කාරණ බැවින් "මූලම්වාති-මූලානි" යනු වෙත්. "ලෝභෝ මූලං ඒතස්සාති-ලෝභමූලං, භේරිසද්දෝ-යවඞ්කුරෝ" යනුවෙන් අසාධාරණ මූලයෙන් දැක්වීමයි. "දෝසමූලං" යනුදු එසේමය. "මෝහෝ ඒව මූලං ඉමස්ස නාඤ්ඤන්ති-මෝහමූලං" "සෝමනස්සූපෙක්ඛාදිට්ඨිගතසඞ්ඛාරභේදතෝ" යන්නෙහි "සෝමනස්සූපෙක්ඛාභේදතෝ, දිට්ඨිගතභේදතෝ, සඞ්ඛාරභේදතෝ" යි ප්‍රත්‍යේකයෙන් භේදශබ්දය යෙදිය යුතුයි. සෙස්ස යට කී නියෙන්ම දතයුතු.

"දිට්ඨිගතසම්පයුත්තං" යනුයෙහි "දිට්ඨියේව=දිට්ඨිගතං, ගූථගතං-මුත්තගතං" යනුමෙන් නොහොත් "විපරියේසගහාතාය දිට්ඨියාගතමේව, න එත්ථ ගන්තබ්බවත්ථු තථා සභාවන්ති දිට්ඨිගතං" යනු වේ. හෙතෙමේ "ඉධමේව සච්චං මෝඝමඤ්ඤං" යි අභිනිවේශයක් බැවින් ලෝභයා හා සමඟ පවත්නේයි. ද්වේෂයා හා සමඟ නොපවත්නේයි.

"යදහි" යනාදී ලෝභමූල චිත්තයන්ගේ ප්‍රවෘත්ත්‍යාකාර දර්ශණයි. මිච්ඡාදිට්ඨිං පුරක්ඛත්වා (පුරෙක්ඛත්වා) උච්ඡේදදෘෂ්ටි ආදී මිත්‍යාදෘෂ්ටිය පෙරදැරි කොට එයින් විපර්‍යාස්ථ වූ සිත් ඇති සත්වයෝ "ඒතාවකෝ ජීවවිෂයෝ යාව ඉන්ද්‍රියගෝචරෝ" යි පරලෝකය ප්‍රතික්ෂේප කොට කාමයෙහි ආදීනව නැතැයි කාමයෙහි පාතව්‍යතාවට පැමිණෙත් ආදි ශබ්දයෙන්:—

> එෂඃ පන්ථෝවිතථෝ - දේවයානෝ යන්ති පුත්‍රිනෝ විශෝකාඃ,
> තං පශ්‍යන්ති පශවෝ වයාංසි - තේන තේ මාතයීපි මෛථුනං චරන්ති.

යනාදී වේද වාක්‍යය ප්‍රමාණ කොට පුත්‍රමුඛ දර්ශණය ස්වර්ග මෝක්ෂ මාර්ගයයි මිත්‍යාදෘෂ්ටිය ගනී. "කාමේ වා" යනුයෙහි වා ශබ්දය අනියමාර්ථය. එයින් බමුණන්ගේ "ස්වර්ණ හරණයම අදින්නාදිනයෙහි සාවද්‍යය සෙස්ස අනවද්‍යය. ගුරුන් පිණිස ගවයන් පිණිස තමාගේ ජීවිතය පිණිස විවාහය පිණිස ද මෘසාවාදය අනවද්‍යය සෙස්ස සාවද්‍යය. ගුරුන් ආදීන් පිණිස පේසුඤ්ඤ හරණය අනවද්‍යය සෙස්ස සාවද්‍යය. භාරතයුද්ධ සීතාහරණාදී කථා පාපව්‍යුපශමය කෙරේ" යි යනාදී මිත්‍යාග්‍රහණයන් සඞ්ග්‍රහ කළෝ. **දිට්ඨමඞ්ගලාදීනි** දිට්ඨසුතමුතමඞ්ගලයන් **සාරතෝ පච්චේති** සාර හෙයින් හඟී ද **සභාවතික්ඛේනේව** ලෝභයාගේ මිත්‍යාභිනිවේශයාගේ

හෝ වශයෙන් ස්ව රසයෙන්ම තීක්‍ෂණ වූ කෲර වූ යන අර්ථයි **මන්දේන** දන්ධ වූ අතීක්‍ෂණ වූ අතීක්‍ෂණ බව වනාහි තමාගේ හෝ මෙරමාගේ හෝ උත්සාහයෙන් පවත්නේ යයි "සමුස්සාහිතේන" යි කීහු. "පරභණ්ඩං වා හරති" යනුයෙහි වා ශබ්දයෙන් තථා ප්‍රවර්ථනක මෘසාවාදදීන්ගේ සඞ්ග්‍රහය දතයුතු. **කාමානං වා අසම්පත්තිං අනුභුයයමානානං** කාමයන්ගේ අසම්පත්තිය හෝ වා ශබ්දයෙන් පරසන්තකයාගේ හෝ අයථාදී ප්‍රේතභාවයෙන් "යං ලද්ධං තං ගහේතබ්බං" යි ලැබීම් ආදිය සඞ්ග්‍රහ වේ.

**දුවිධමේව හෝති** සම්ප්‍රයුත්තක ධර්ම වශයෙන් භේදයක් නැති බැවින් දෙවැදෑරුම් වේ. එසේවී නම් "දෝමනස්සසහගතං පටිඝසම්පයුත්තං" යි කුමක් හෙයින් කිහුද යත්? අසාධාරණ ධර්ම වශයෙන් ඒ සිත හඟවන පිණිස කීහු. "පාණාතිපාතාදීසු" යනුයෙහි ආදී ශබ්දයෙන් අදින්නාදන-මුසාවාද-පේසුඤ්ඤ-ඵරුෂ-සම්ඵප්පලාප-ව්‍යාපාද යන මොහුන් සඞ්ග්‍රහ කෙරේ. ස්වභාව තීක්‍ෂණව පවත්තා චිත්තය අසඞ්ඛාර වෙයි. අනෙක සසඞ්ඛාර වෙයි යන අභිප්‍රායෙන් "තික්ඛමන්දප්පවත්තිකාලේ" යි කීහු. යමෙක් සසඞ්ඛාරයෙන්=සප්‍රයෝගයෙන් පවතී ද හේ මන්දම වේනුයි මන්දව පවත්නේ ඒකාන්තයෙන්ම සසඞ්ඛාර වේ.

මෝහේකහේතුක චිත්තය මූලාන්තර විරහයෙන් අතිශයින් මුළු වූයේ ක්‍රමයෙන් විචිකිත්සා යෝගයෙන් ඖද්ධ්‍යත්‍යය යෝගයෙන් චංචලනුයි උපේක්‍ෂා සහගතම වෙයි. ඔහුන් දෙදෙන හට කිසි කලෙක්හිදු ස්වභාවතීක්‍ෂණතාදියක් නොවේ. අරමුණෙහි සංසර්පන වශයෙන් වික්‍ෂේප වශයෙන් පවත්නා වූ චිත්තයන් දෙදෙනාගේ කිසි කෘත්‍යයෙක තීක්‍ෂණ බව හෝ උත්සාහ කටයුතු බව හෝ නැති බැවින් එහි සඞ්ඛාර භේදය නොලැබේ. සෙසු අකුසල චිත්තයෙහිදු ලබ්‍යමාන වූද ප්‍රධානව පවතීනුයි මෙම ඖද්ධ්‍යත්‍යයෙන් වෙසසා "උද්ධච්චසම්පයුත්තං" යි කියනලදි. එහෙයින්ම පෙළ ද මේ සිත උද්ධච්චය ස්වරූපයෙන් අයි (එන ලද්දේය). මෙසේ අසාධාරණ ප්‍රධාන ධර්ම වශයෙන් මෝහමූලය විචිකිත්සා සම්ප්‍රයුත්තය ඖද්ධ්‍යත්‍යය සම්ප්‍රයුත්තයයි ද්විධ වේ යැයි දතයුතු. "අසන්නිට්ඨානවික්ඛේපකාලේ" යනුයෙහි අසන්නිට්ඨාන නම් සංසයය, වික්ඛේප නම් අව්‍යුශමයයි භ්‍රාන්ත බවය යන අර්ථයි.

මේ දෙළොස් වැදෑරුම් අකුසල චිත්තය ෂඩාලම්පනයන් කෙරෙහි යම්තම් අරමුණක් අරමුණු කොට උපේක්‍ෂාසහගතාහේතුක ක්‍රියාමනෝවිඤ්ඤණ ධාත්වනන්තරයෙහි කායද්වාරාදී ත්‍රිවිධ ද්වාරයෙන් කාය කර්මාදී වශයෙන් යථායෝගයෙන් ප්‍රාණාතිපාතාදී කර්මපථ වශයෙනුදු කර්ම වශයෙනුදු උපදනේ යැයි දතයුතු.

**[විසුද්ධි මාර්ග සන්නය 1088-1091 පිටු; සිංහල විසුද්ධි මාර්ගය විඤ්ඤණස්කන්ධය 196-198 පිටු (තායිවාන් මුද්‍රණය)]**

යද හි "නත්ථි කාමේසු ආදීනවෝ"ති ආදිනා නයේන මිච්ඡාදිට්ඨිං පුරක්ඛත්වා හට්ඨතුට්ඨෝ කාමේ වා පරිභුඤ්ජති, දිට්ඨමඞ්ගලාදීනි වා සාරතෝ පච්චේති සභාවතික්ඛේනේව අනුස්සාහිතේන චිත්තේන, තද පඨමං අකුසලචිත්තමුප්පජ්ජති. යද මන්දේන සමුස්සාහිතේන චිත්තේන, තද දුතියං. යද මිච්ඡාදිට්ඨිං අපුරක්ඛත්වා කේවලං හට්ඨතුට්ඨෝ මේථුනං වා සේවති, පරසම්පත්තිං වා අභිජ්ඣායති, පරභණ්ඩං වා හරති සභාවතික්ඛේනේව අනුස්සාහිතේන චිත්තේන, තද තතියං. යද මන්දේන සමුස්සාහිතේන චිත්තේන, තද චතුත්ථං. යද පන කාමානං වා අසම්පත්තිං ආගම්ම අඤ්ඤේසං වා සෝමනස්සහේතූනං අභාවේන චතුසුපි විකප්පේසු

සෝමනස්සරහිතා හොන්ති, තද සේසානි චත්තාරි උපෙක්ඛාසහගතානි උප්පජ්ජන්තීති.

දෝමනස්සඤ්චෙත්ථ අනිට්ඨාරම්මණානුභවනලක්ඛණෝ වේදනාක්ඛන්ධ- පරියාපන්නෝ ඒකෝ ධම්මෝ, පටිඝෝ චණ්ඩික්කසභාවෝ සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නෝ ඒකෝ ධම්මෝති අයමේතේසං විසේසෝ එත්ථ ච යං කිඤ්චි අනිට්ඨාරම්මණං, නවවිධආඝාතවත්ථූනි ච දෝමනස්සස්ස කාරණං, පටිඝස්ස කාරණඤ්චාති දට්ඨබ්බං. ද්වින්නං පන නේසං චිත්තානං පාණාතිපාතාදීසු තික්ඛමන්දප්පවත්තිකාලේ උප්පත්ති වේදිතබ්බා.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 05 අකුසලචිත්ත වණ්ණනා යටතේ); විභාවනී ටීකා සන්නය 30-32 පිටු]**

**යද හි** යම් කලෙක්හි **කාමේසු** පඤ්චකාම ගුණයෙහි **ආදීනවෝ නත්ථි** අයුණු නැත්තේ යැයි **ඉති ආදිනා නයේන** මේ ආදී ක්‍රමයෙන් **මිච්ඡාදිට්ඨිං පුරක්ඛත්වා** මිත්‍යාදෘෂ්ටිය පෙරටු කොටගෙන **හට්ඨතුට්ඨෝ හුත්වා** තුටුපහටු සිත් ඇත්තෝ වී **සභාවක්තික්ඛේනේව** සබා තියුණුවූම **අනුස්සාහිතේන** උත්සාහ නොදනවනලද **චිත්තේන** සිත කරණකොටගෙන **කාමේ වා** පඤ්චකාම සම්පත් හෝ **පරිභුඤ්ජති** අනුභව කෙරේ ද **දිට්ඨමඞ්ගලාදීනි වා** දෘෂ්ටමඞ්ගලාදීන් හෝ **සාරතෝ** උතුම් වශයෙන් **පච්චේති** හඟින්නේ වේද **තද** එකල්හි **පඨමං අකුසලචිත්තං** පළමුවන අකුසල් සිත් තෙමේ **උප්පජ්ජති** උපදී (දිට්ඨමඞ්ගලාදීනි වා යන්නෙහි ආදී ශබ්දයෙන් සුත-මුත-විඤ්ඤාත මඞ්ගල්‍යයෝ ගැණෙත්. නත්ථි කාමේසු ආදීනවෝති ආදිනා නයේන යන්නෙහි "ආදී" ශබ්දයෙන් "ඒස පුත්තො විතථෝ දේවයානේ -පෙ- මාතරිපි මේථුනං චරන්ති" යනාදියෙන් දක්වනලද පුත්‍ර මුඛ දර්ශනය ස්වග මෝක්‍ෂ මාර්ගයයි යනාදී මිත්‍යාවාදයන් ගැණේ. කාමේ වා යන්නෙහි වා ශබ්දය අනියමාර්ථයෙහිය. ඒ වා ශබ්දයෙන් බ්‍රාහ්මණයන්ගේ රත්‍රං පැහැර ගැණීම අදින්නාදනය වෙයි. සෙස්සන්ගේ රත්‍රං පැහැර ගැණීම අදින්නාදනය නොවෙයි. තමාගේ ජීවිතය සඳහා බොරුකීම මුසාවාදය නොවෙයි. සෙසු කාරණයන් ගැන බොරුකීම මුසාවාදය වෙයි යනාදීන් පැවැති මිත්‍යාදෘෂ්ටීන් ගැණේ)

**යද පන** යම්කලෙක්හි වනාහි **කාමේසු** පඤ්චකාම ගුණයෙහි **ආදීනවෝ නත්ථි** අයුණු නැතැයි **ඉති ආදිනා නයේන** මේ ආදී ක්‍රමයෙන් **මිච්ඡාදිට්ඨිං පුරක්ඛත්වා** මිත්‍යාදෘෂ්ටිය පෙරටු කොටගෙන **හට්ඨතුට්ඨෝ හුත්වා** තුටුපහටු සිත් ඇත්තේ වී (මෙසේ යට කී පාඨය ගෙන අර්ථ කියයුතුයි) **මන්දේන** ලස් වූ **සමුස්සාහිතේන** උත්සාහ දනවන ලද්දවූ **චිත්තේන** සිත කරණකොටගෙන **කාමේ වා** පඤ්චකාම සම්පත් හෝ **පරිභුඤ්ජති** අනුභව කෙරේ ද **දිට්ඨමඞ්ගලාදීනි වා** දෘෂ්ටමඞ්ගලාදීන් හෝ **සාරතෝ** සාර වශයෙන් **පච්චේති** හඟී ද (මේ කාමේ වා යනාදී වාක්‍ය ද්වය යට කී පාඨයෙන් මෙතනට ආවර්තනය වේ) **තද** එකල්හි **දුතියං අකුසලචිත්තං** දෙවැනි අකුසල් සිත් තෙමේ **උප්පජ්ජති** උපදී **යද පන** යම් කලෙක වනාහි **මිච්ඡාදිට්ඨිං අපුරක්ඛත්වා** මිත්‍යාදෘෂ්ටිය පෙරටු කොට නොගෙන **කේවලං** හුදෙක් **සභාවතික්ඛේනේව** ස්වභාවයෙන් තියුණුවූම **අනුස්සාහිතේන** උත්සාහ නොදනවන ලද **චිත්තේන** සිත කරණකොටගෙන **හට්ඨතුට්ඨෝ හුත්වා** තුටුපහටු සිත් ඇත්තේ වී **මේථුනං වා සේවති** මෙවුන්දම් හෝ සෙවී ද **පරසම්පත්තිං වා** අන්සතු වස්තුවක් හෝ **අභිජ්ඣායති** කැමති වේද **පරභණ්ඩං වා** අන්සතු බඩුවක් හෝ **හරති** පැහැර ගනීද **තද** එකල්හි **තතියං අකුසලචිත්තං** තුන්වැනි අකුසල් සිත් තෙමේ **උප්පජ්ජති** උපදී.

**යද පන** යම් කලෙක වනාහි **මිච්ඡාදිට්ඨිං අපුරක්ඛත්වා** මිත්‍යාදෘෂ්ටිය පෙරටු කොට නොගෙන **කේවලං** හුදෙක් **මන්දේන** ලස්වූ **සමුස්සාහිතේන** උත්සාහ දනවන ලද්දවූ **චිත්තේන** සිත කරණකොටගෙන **කාමේ වා** පඤ්චකාම සම්පත් හෝ **පරිභුඤ්ජති** අනුභව කෙරේ ද **දිට්ඨමඞ්ගලාදීනි වා** දෘෂ්ටමඞ්ගලාදීන් හෝ **සාරතෝ** සාර වශයෙන් **පච්චේති** හඟී ද (මේ කාමේ වා යනාදී වාක්‍ය ද්වය යට කී පාඨයෙන් මෙතනට ආවර්තනය වේ) **තද** එකල්හි **චතුත්ථං අකුසලචිත්තං** සතරවැනි අකුසල් සිත් තෙමේ **උප්පජ්ජති** උපදී.෴

**යද පන** යම් කලෙක්හි වනාහි **කාමානං වා** කාම සම්පත්තීන්ගේ හෝ **අසම්පත්තිං ආගම්ම** අපරිපූර්ණත්වයක් ලැබ **අඤ්ඤේසං** අනිකුදු **සෝමනස්සහේතූනං වා** සොම්නස් හේතූන්ගේ හෝ **අභාවේන** අවිද්‍යමාන භාවයෙන් **චතුසු විකප්පේසුපි** සතර විකල්පයෙහිම (සතර තන්හීයයි කී නියායි) **සෝමනස්සරහිතා හොන්ති** සොම්නස් ඇත්තාහු නොවෙද්ද **තද** එකල්හි **සේසානි චත්තාරි** සෙසු සතරාකාර වූ **උපෙක්ඛාසහගතානි** උපේක්‍ෂා සහගිය සිත්හු තුමූ **උප්පජ්ජන්තීති** උපදනාහු වෙත්.෴

(දෝමනස්සසහගතං පටිඝසම්පයුත්තං යන පාඨයාගේ ප්‍රයෝජනය ආචාර්‍ය්‍යයන් විසින් කියන ලද්දේය. ඒ දෙම්නස් ප්‍රතිඝයන්ගේ විශේෂය කුමක්දැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "දෝමනස්සං චෙත්ථ -පෙ- ඒතේසං විසේසෝ" යන පාඨය කියනලදි) **එත්ථ** මේ දෙම්නස් ප්‍රතිඝයන් අතුරෙන් **දෝමනස්සං** දෙම්නස් තෙමේ (ච ශබ්දය වාක්‍යාරම්භද්‍යෝතකාර්ථයි) **අනිෂ්ඨාලම්බනානුභවනලක්ඛණෝ** නොකැමති අරමුණු අනුභවකිරීම ලක්‍ෂණ කොට ඇත්තාවූ **වේදනාක්ඛන්ධපරියාපන්නෝ** වේදනාස්කන්ධයෙහි ඇතුළත් **ඒකෝ ධම්මෝ** එක් ස්වභාව ධර්මයෙකි **පටිඝෝ** ප්‍රතිඝ තෙමේ **චණ්ඩික්කසභාවෝ** කැකුළු ස්වභාව ඇත්තාවූ **සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නෝ** සංස්කාරස්කන්ධයෙහි ඇතුළත් වූ **ඒකෝ ධම්මෝ** එක් ස්වභාව ධර්මයෙකි **ඉති (අයං)** මේ වනාහි **තේසං** ඒ දෙම්නස් ප්‍රතිඝයන්ගේ **විසේසෝ** ප්‍රභේදයයි (ඒ ධර්ම දෙදෙනාගේ විශේෂය ආචාර්‍ය්‍ය තෙමේ කීයේය) ඒ ධර්ම දෙදෙනාගේ හේතු කවරේදැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "එත්ථ ච -පෙ- දට්ඨබ්බං" යන පාඨය කියනලදි **එත්ථ** මේ දෙම්නස් සහ ගිය චිත්තයෙහි (**ඨිතස්ස** පිහිටියා වූ) **දෝමනස්සස්ස** දෙම්නසට (කාරණං යන්නෙහි සම්බන්ධ කටයුතුයි) **යංකිඤ්චි අනිට්ඨාරම්මණඤ්ච** සියළු අනිටු අරමුණ ද **නවවිධආඝාතවත්ථූනි ච** නව වැදෑරුම් ආඝාතවස්තූහු ද **කාරණඤ්ච හෝති** හේතු වෙයි **පටිඝස්ස** ප්‍රතිඝයට **කාරණඤ්ච හෝති** හේතු වෙයි **ඉති** මෙසේ **දට්ඨබ්බං** දතයුතුයි (නවවිධ ආඝාත වස්තූන්ගේ ස්වරූපය වනාහි "මගේ අර්ථ හානිය මෙතෙමේ පෙර කෙළේය, දැන් කරන්නේය, මතු කරන්නේ යයි මෙසේ තුනක; මගේ හිතමිත්‍රයාගේ අර්ථ හානිය මෙතෙම කෙළේය, කරන්නේය, මතු කරන්නේ යයි මෙසේ තුනක; මගේ සතුරාගේ අර්ථ සිද්ධිය මෙතෙමේ කෙළේය, කරන්නේය, මතු කරන්නේය යයි මෙසේ තුනකැයි" නව ප්‍රකාර වේ. මේ ධර්මයන්ගේ උත්පත්තිය ආචාර්‍ය්‍ය තෙම කීයේය. ඒ සිත් දෙදෙනාගේ උත්පත්තිය කෙසේදැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "ද්වින්නං පන -පෙ- වේදිතබ්බා" යන පාඨය කියනලදි) **ද්වින්නං නේසං චිත්තානං** ඒ චිත්තයන් දෙදෙනාගේ (පන ශබ්දය විශේෂාර්ථ ද්‍යෝත්ථකයි) **පාණාතිපාතාදීසු** පණිවා ආදී පාප කර්මයෙහි **තික්ඛමන්දප්පවත්තිකාලේ** තියුණු බැවින් හා ලැසි බැවිනුත් පවත්නා කල්හි **උප්පත්ති වේදිතබ්බා** හටගැනීම දතයුත්තීය (තියුණු වශයෙන් පවත්නා කල්හි අසංස්කාරික වෙයි. ලැසි භාවයෙන් පවත්නා කල්හි සසංස්කාරික වෙයි කී නියායි)

**[විභාවනී ටීකා සන්නය 57-62 පිටු; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 09-10 පිටු]**

තත්ථ ඉට්ඨාරම්මණෝ ලෝභබහුලතාදීහි කාරණේහි සෝමනස්සසහගතතා, අසද්ධම්මසවනඅකල්‍යාණමිත්තතාදීහි දිට්ඨිසම්පයුත්තතා ච වේදිතබ්බා. යදා හි "නත්ථි කාමේසු ආදීනවෝ"තිආදිනා නයේන මිච්ඡාදිට්ඨිං පුරක්ඛත්වා හට්ඨතුට්ඨෝ කාමේ වා පරිභුඤ්ජති, දිට්ඨමඞ්ගලාදීනි වා සාරතෝ පච්චේති සභාවතික්ඛේනේව අනුස්සාහිතේන චිත්තේන, තදා පඨමං අකුසලචිත්තං උප්පජ්ජති. යදා මන්දේන සමුස්සාහිතේන, තදා දුතියං. යදා මිච්ඡාදිට්ඨිං අපුරක්ඛත්වා කේවලං හට්ඨතුට්ඨෝ මේථුනං වා සේවති, පරසම්පත්තිං වා අභිජ්ඣායති, පරභණ්ඩං වා හරති සභාවතික්ඛේනානුස්සාහිතේන, තදා තතියං. යදා සමුස්සාහිතේන, තදා චතුත්ථං. යදා පන කාමානං වා අසම්පත්තිං ආගම්ම, අඤ්ඤේසං වා සෝමනස්සහේතූනං අභාවේන චතූසුපි විකප්පේසු සෝමනස්සරහිතතා හෝති, තදා සේසානි චත්තාරි උපෙක්ඛාසහගතානි උප්පජ්ජන්තීති අයං සම්පයෝගතෝ විනිච්ඡයෝ.

**[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා ලෝභමූල වණ්ණනා යටතේ)]**

**තත්ථ** ඒ ලෝභමූල චිත්තයෙහි **ඉට්ඨාරම්මණෝ** ඉටු අරමුණෙහි **ලෝභබහුලතාදීහි කාරණේහි** ලෝභ බහුලාදී කාරණයෙන් **සෝමනස්සසහගතතා** සෝමනස්ස සහගත බවද **අසද්ධම්මස්සවනඅකල්‍යාණමිත්තාදීහි** අසද්ධර්ම ශ්‍රවණය අකල්‍යාණ මිත්‍රාදීන්ගෙන් **දිට්ඨිගතසම්පයුත්තතා ච** දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත බවද **වේදිතබ්බා** දතයුතු **හි** විස්තර කෙරෙමි **යදා** යම්කලෙක **හට්ඨතුට්ඨෝ** සතුටුසිත් ඇත්තෙක්ව **සභාවතික්ඛේනේව** ස්වභාවයෙන් තීක්‍ෂණ වූ **අනුස්සාහිතේන** උත්සාහවත් නොකරනලද **චිත්තේන** සිතින් **නත්ථි කාමේසු ආදීනවෝ** නත්ථි කාමේසු ආදීනවෝ **ඉති ආදිනා නයේන** යනාදී නයින් **මිච්ඡාදිට්ඨිං පුරක්ඛත්වා** මිසදිටු බව පෙරටු කොටගෙන **කාමේ වා** පඤ්චකාම සම්පත් හෝ **පරිභුඤ්ජති** අනුභව කෙරේ ද **දිට්ඨමඞ්ගලාදීනි වා** දෘෂ්ටමඞ්ගලාදීන් හෝ **සාරතෝ** සාර වශයෙන් **පච්චේති** හඟීද **තදා** එකල්හි **පඨමං** ප්‍රථම **අකුසලචිත්තං** අකුසල් සිත **උප්පජ්ජති** උපදී **යදා** යම්කලෙක **මන්දේන** ලස්වූ **සමුස්සාහිතේන** උත්සාහවත් කරවන ලද්දවූ සිතින් (**නත්ථි කාමේසු** -පෙ- **පච්චේති** නත්ථි කාමේසු -පෙ- පච්චේති) **තදා** එකල්හි **දුතියං** දෙවැනි (**අකුසලචිත්තං** අකුසල් සිත **උප්පජ්ජති** උපදී) **යදා** යම්කලෙක **මිච්ඡාදිට්ඨිං** මිත්‍යාදෘෂ්ටිය **අපුරක්ඛත්වා** පෙරටු කොට නොගෙන **කේවලං** හුදෙක් **හට්ඨතුට්ඨෝ** සතුටුසිත් ඇත්තෙකුව **සභාවතික්ඛේන** ස්වභාවයෙන් තියුණු වූ **අනුස්සාහිතේන** උත්සාහවත් නොකරනලද (**චිත්තේන** සිතින්) **මේථුනං වා සේවති** මෛථුනසේවනය හෝ කරයි ද **පරසම්පත්තිං වා** අන්සතු වස්තුව හෝ **අභිජ්ඣායති** කැමති වේද **පරභණ්ඩං වා** අන්සතු බඩුවක් හෝ **හරති** පැහැර ගනීද **තදා** එකල්හි **තතියං** තෙවැනි (**අකුසලචිත්තං** අකුසල් සිත **උප්පජ්ජති** උපදී) **යදා** යම්කලෙක **සමුස්සාහිතේන** උත්සාහවත් කරනලද සිතින් (**මේථුනං වා** -පෙ- **හරති** මේථුනං වා -පෙ- හරති) **තදා** එකල්හි **චතුත්ථං** සතරවැනි (**අකුසලචිත්තං** අකුසල් සිත **උප්පජ්ජති** උපදී) **යදා පන** යම්කලෙක වනාහි **කාමානං වා** කාම සම්පත්තීන්ගේ හෝ **අසම්පත්තිං ආගම්ම** අපරිපූර්ණත්වයක් ලැබ **අඤ්ඤේසං** අන්‍ය වූ **සෝමනස්සහේතූනං වා** සොම්නස් හේතූන්ගේ හෝ **අභාවේන** අභාවයෙන් **චතූසු විකප්පේසුපි** සතර විකල්පයෙහිම **සෝමනස්සරහිතතා හෝති** සොම්නස් නැතිබව වේද **තදා** එකල්හි **සේසානි** සෙසු **චත්තාරි (අකුසලචිත්තානි)** සතරක් වූ අකුසල චිත්තයෝ **උපෙක්ඛාසහගතානි** උපේක්‍ෂාසහගත වූවෝම වී **උප්පජ්ජන්ති** උපදිත් **ඉති** මෙසේ **අයං** මේ **සම්පයෝගතෝ** සම්ප්‍රයෝග වශයෙන් **විනිච්ඡයෝ** විනිශ්චයයි ෴

[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]

විසයාදිප්පභේදතෝ පනේතේ ද්වාදසපි වත්ථාරම්මණවසේන තාව ඡබ්බිධා හොන්ති. තේසු ලෝභමෝහමූලා පන දස පඤ්චද්වාරේ හදයවත්ථුං නිස්සායේව, මනෝද්වාරේ නිස්සාය වා අනිස්සාය වා ජවනකිච්චං සාධයමානා ඡබ්බිධා. තථා දෝසමූලා නිස්සායේව පන පවත්තන්ති. ලෝභමූලා පන අදින්නාදන කාමමිච්ඡාචාර මුසාවාදපේසුඤ්ඤසම්ඵප්පලාපාභිජ්ඣාසඞ්ඛාතානං ඡන්නං කම්මපථානං වසේන ඡබ්බිධා. දිට්ඨිසම්පයුත්තා පනෙත්ථ මිච්ඡාදිට්ඨිවසේනාපීති සත්තවිධා හොන්ති. දෝසමූලා පන පාණාභිපාතාදින්නාදනමුසාවාදපේසුඤ්ඤඵරුසසම්ඵප්පලාප බ්‍යාපාදවසේන සත්තවිධා හොන්ති. දසන්නම්පි පනේසං ද්වාරකම්මවසේන චේව වීමංසාවජ්ජිතාධිපතිත්තයවසේන ච කුසලේ වුත්තනයේන විභාගෝ වේදිතබ්බෝ.

**[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා අකුසල වණ්ණනා යටතේ)]**

**විසයාදිප්පභේදතෝ පන** විෂයාදී ප්‍රභේද වශයෙන් වනාහි **ඒතේ** ඒ අකුසල චිත්තයෝ **ද්වාදසපි** දෙළොස් දෙන **තාව** පළමු කොට **වත්ථාරම්මණවසේන** වස්තු ආරම්මණ වශයෙන් **ඡබ්බිධා** සය වැදෑරුම් **හොන්ති** වෙත් **පන** ගළපා කියම් **තේසු** ඒ අකුසල් සිත් දෙළොස් දෙන අතුරෙන් **ලෝභමෝහමූලා** ලෝභ සිත් අට ද මෝහ සිත් දෙක ද යන **දස** චිත්තයෝ දස දෙන **පඤ්චද්වාරේ** පඤ්චද්වාරයෙහි **හදයවත්ථුං නිස්සායේව** හෘදය වස්තුව ඇසුරු කොට ද **මනෝද්වාරේ** මනෝද්වාරයෙහි **නිස්සාය වා** ඇසුරු කොට හෝ **අනිස්සාය වා** ඇසුරු නොකොට හෝ **ජවනකිච්චං** ජවන කෘත්‍යය **සාධයමානා** සිද්ධ කරමින් **ඡබ්බිධා (ඒව)** සය වැදෑරුම්ව (**උප්පජ්ජන්ති** උපදිත්) **පන (සච්චං)** ඒ කීම සැබෑව **තථා** එසේම **දෝසමූලා** ද්වේෂමූල චිත්තයෝ දෙදෙන **නිස්සායේව** හෘදය වස්තුව ඇසුරු කොටම **පවත්තන්ති** උපදිත් **පන** තවද **ලෝභමූලා** ලෝභමූල චිත්තයෝ අටදෙන **අදින්නාදන-කාමමිච්ඡාචාර-මුසාවාද-පේසුඤ්ඤ-සම්ඵප්පලාපාභිජ්ඣාසඞ්ඛාතානං** අදින්නාදනය කාමමිච්ඡාචාරය මුසාවාදය කේලම් කීමය හිස්වචන කීමය දැඩිලෝභය සඞ්ඛ්‍යාත **ඡන්නං** සය වැදෑරුම් **කම්මපථානං වසේන** කර්මපථයන්ගේ වශයෙන් **ඡබ්බිධා** සය වැදෑරුම් (**හොන්ති** වෙත්) **පන** එසේම **එත්ථ** මෙහි **දිට්ඨිගතසම්පයුත්තා** දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත චිත්තයෝ **මිච්ඡාදිට්ඨිවසේන අපි** මිත්‍යාදෘෂ්ටි වශයෙන් ද **ඉති** යැයි **සත්තවිධා** (**කම්මපථානං වසේන** කර්මපථ වශයෙන්ගේ) සත් වැදෑරුම් **හොන්ති** වෙත් **පන** එසේම **දෝසමූලා** ද්වේෂ මූල චිත්තයෝ දෙදෙන **පාණාතිපාතාදින්නාදන-මුසාවාද-පේසුඤ්ඤ-ඵරුස-සම්ඵප්පලාප-බ්‍යාපාදවසේන** පාණාතිපාතය අදින්නාදනය මුසාවාදය කේලම් කීමය ඵරුෂවචන කීමය හිස්වචන කීමය ව්‍යපාදය වශයෙන් **සත්තවිධා** කර්මපථ වශයෙන් සත් වැදෑරුම් **හොන්ති** වෙත් **පන** සංක්ෂේපයෙන් වනාහි **ඒසං දසන්නම්පි** ඒ චිත්තයෝ දස දෙනාගේ **ද්වාරකම්මවසේන** ද්වාර වශයෙන් කර්ම වශයෙන් **චේව** මෙන්ම **වීමංසාවජ්ජිතාධිපතිත්තයවසේන ච** වීමංසා අධිපති වර්ජිත ඡන්දය චිත්තය විරිය යන අධිපති තිදෙනාගේ වශයෙන් ද **කුසලේ** කුසලයෙහි **වුත්තනයේන** කියනලද ක්‍රමයෙන් **විභාගෝ** බෙදීම **වේදිතබ්බෝ** දතයුතු.

[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]

සඞ්ඛාරෝ තාව ඉමස්ස චිත්තස්ස භේදකරෝති තස්ස ඉධ ගහණං යුත්තං. වේදනා පටිඝාපන භේදකරා න හොන්තීති තේ ඉධ න ගහේතබ්බාති. වුච්චතේ, දෝමනස්සග්ගහණං තාව ඉමස්ස චිත්තස්ස කදාචි අඤ්ඤ වේදනායෝගතා පසඞ්ගනිවත්තනත්ථන්ති. යදාහි රාජානෝ හසමානායේව චෝරවධං පේසෙන්ති. යදාච

ජනා අත්තනෝ වේරිනං මරණෝ තුට්ඨිං පවේදෙන්ති. මරණං අභිනන්දන්ති. යදච බාලජනා හසමානාව මිගපක්ඛිනෝ මාරෙන්ති. තද ඉදං නුඛෝ සෝමනස්සේන යුත්තන්ති අත්ථේව පසඞ්ගෝ. උපෙක්ඛායෝගේ පන වත්තබ්බමේව නත්ථි. තප්පසඞ්ගනිවත්තනත්ථං දෝමනස්සග්ගහණන්ති. පටිඝග්ගහණංපි අඤ්ඤදම්ම සම්පයුත්තතා පසඞ්ගනිවත්තනත්ථං. තථාහි යේ නත්ථිකාහේතුකාකිරිය මිච්ඡාදිට්ඨිකා පාණවධේ අපුඤ්ඤං නාම නත්ථීති ගණ්හන්ති. යේච මනුස්සපාණවධේ ඒව අපුඤ්ඤං හෝති, තිරච්ඡානගතපාණවධේ අපුඤ්ඤං නත්ථීති ගණ්හන්ති. යේච පාණවධං කත්වා යඤ්ඤං යජන්තානං මහන්තං පුඤ්ඤං හෝති, දිබ්බසංවත්තනිකන්ති ගණ්හන්ති. තේ සක්කායදිට්ඨියාවිස්සට්ඨා පාණවධං සයංවා කරොන්ති. අඤ්ඤේවා පේසෙන්ති. තද ඉදං දිට්ඨියාපි සම්පයුත්තං සියාති පසඞ්ගෝ හෝතියේව. යේපන සම්මාදිට්ඨිකේසු බාලා අබ්‍යත්තා, තේ කදචි තේසං මිච්ඡාදිට්ඨිකානං ලද්ධිං ගහෙත්වා පාණං වධන්තා ආදිතෝ වේමතිකජාතාව හොන්ති. තද තේසං ඉදං විචිකිච්ඡායපි යුත්තං සියාති පසඞ්ගෝ හෝති. තප්පසඞ්ග නිවත්තනත්ථං පටිඝග්ගහණන්ති. ඉතරථා පුරිම චිත්තස්ස ලෝභසහගතභාවෝ විය ඉමස්ස පටිඝසම්පයුත්තභාවෝ චූළනිගමේනේව සිද්ධෝති තේසං ගහණං නිරත්ථකං සියාති. එත්ථච ඉස්සාමච්ඡරියකුක්කුච්චානං ථිනමිද්ධස්සච අග්ගහණං පුරිමචිත්තේ මානථිනමිද්ධනයේන වේදිතබ්බං. අයමෙත්ථ පරමත්ථදීපනා.

**විභාවනියං** පන **මහාටීකායඤ්ච** "අසාධාරණධම්මවසේන චිත්තස්ස උපලක්ඛණත්ථං දෝමනස්සග්ගහණ"න්ති වුත්තං. තත්ථ අසාධාරණධම්මවසේනාති ඉදං තාව නයුජ්ජති.

සතිපි ඉමස්ස සෝමනස්සුපෙක්ඛාසහගතභාවේ අනඤ්ඤසාධාරණෝනේව දෝමනස්සේන ඉමස්ස උපලක්ඛණත්ථන්ති අත්ථස්ස ආපජ්ජනතෝ. යථා තං සතිපි පුරිමස්ස ඉමස්සච චිත්තස්ස මෝහසහගතභාවේ අනඤ්ඤසාධාරණෝනේව ලෝභේන පටිඝේන ච උපලක්ඛණත්ථං ලෝභසහගතපටිඝසම්පයුත්තග්ගහණන්ති. උපලක්ඛණත්ථන්ති ච න වත්තබ්බං.

ඒවඤ්හි සති පාකටේන දෝමනස්සේන අපාකටානං අඤ්ඤදවේදනානංපි ඉධ ලද්ධභාවං උපලක්ඛේතීති ආපජ්ජති. යථා ලද්ධාතපත්තෝ රාජකුමාරෝති.

යඤ්ච **විභාවනියං** "පටිඝසම්පයුත්තභාවෝ පන උභින්නං ඒකන්ත සහචාරිතා දස්සනත්ථං වුත්තෝ"ති වුත්තං. තංපි න සුන්දරං.

ඉමස්ස චූළනිගමේනේව තදත්ථසිද්ධිතෝති. එත්ථච දෝසජ්ඣාසයතා, අගම්භීරප්පකතිතා, අප්පස්සුතතා, ආඝාතවත්ථුසමායෝගෝවා, අනිට්ඨාරම්මණසමායෝගෝවා දෙමනස්සස්ස පටිඝස්සච කාරණං. තත්ථ දෝසබහුල-භාවතෝ ආගතවසේන දෙසජ්ඣාසයතා දට්ඨබ්බා. අගම්භීරප්පකතිතා හීනජ්ඣාසයතා. අප්පස්සුතස්සච අනිට්ඨේ ලෝකධම්මේහි ඵුට්ඨස්ස තං කුතෙත්ථ ලබ්භාති පච්චවෙක්ඛනා නත්ථීති. ඉමේසම්පි ද්වින්නං උප්පත්තිවිධානං විසුද්ධිමග්ගේ ගහේතබ්බං. පිසද්දස්ස අත්ථෝපි වුත්තනයෝ ඒවාති.

යස්මා පන ඉදං චිත්තං මූලන්තරවිරහේන ලද්ධෝකාසේන සුට්ඨුබලවන්තේන මෝහේනවේව සංසප්පමානවික්ඛිපමානේහි විචිකිච්ඡුද්ධච්චේහි ච යුත්තං හෝති. තස්මා ඉධ වේදනාපි ආරම්මණං අධිමත්තතෝ අනුභවිතුං න සක්කෝතීති

උපෙක්ඛාවේදනාව යුත්තා හෝති. ඒවං සන්තේපි ඉදං චිත්තං සෝමනස්සදෝමනස්සසහගතානංපි අනන්තරේ උප්පජ්ජති. තස්මා තදුභයවේදනාහිපි ඉදං යුත්තං සියාති පසඞ්ගෝ හෝතීති තප්පසඞ්ගනිවත්තනත්ථං ඉධ උපෙක්ඛාගහණං කතං. අනඤ්ඤචිත්තසාධාරණේන ධම්මේන චිත්තස්ස නියමනත්ථං විචිකිච්ඡාගහණං. උද්ධච්චං පන සබ්බාකුසලේසු යුත්තංපි ඉධ ලද්ධෝකාසං හුත්වා සුට්ඨු බලවං හෝතීති දස්සනත්ථං ඉධේව ගහිතන්ති දට්ඨබ්බං. තේනේවහි ධම්මසඞ්ගණියං ධම්මුද්දේසවාරේ උද්ධච්චං අඤ්ඤේසු පාපචිත්තේසු සරූපතෝ අනුද්ධරිත්වා යේවාපනකභාවේනේව වුත්තං. ඉමස්මිං අන්තිමචිත්තේ ඒව සරූපතෝ උද්ධටන්ති දට්ඨබ්බං.

**[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 26-27-28 දෝසමූලචිත්ත සඞ්ග්‍රහ යටතේ)]**

"භේදකරෝ"ති අඤ්ඤමඤ්ඤවිසේසකරෝ. "භේදකරා න හොන්තී"ති ඉමස්ස චිත්තස්ස අඤ්ඤමඤ්ඤවිසේසකරා න හොන්ති. දෝමනස්සග්ගහණං පසඞ්ගනිවත්තනත්ථං ගහිතන්ති යෝජනා. පසඞ්ගෝති ච නානප්පකාරතෝ සජ්ජනං ලග්ගනං. කථං පසඞ්ගෝති ආහ "යදගී"ති ආදිං. "තුට්ඨිං පවේදෙන්තී"ති තුට්ඨා මයං ඉමේසං මරණේනාති ආදි චික්ඛන්ති. ඒවං සහගතප්පසඞ්ගං නිවත්තෙත්වා සම්පයුත්තප්පසඞ්ගං නිවත්තේතුං "පටිඝග්ගහණංපී"ති ආදි වුත්තං. තිරච්ඡානගතපාණවධේ අපුඤ්ඤං නාම නත්ථි. ආදිකප්පතෝ පට්ඨාය මනුස්සානං යථා කාම පරිභෝගත්ථාය ලෝකිස්සරියේන ඨාවරට්ඨායිනා නිම්මිතත්තාති අධිප්පායෝ. "විස්සට්ඨා"ති අනාසඞ්කා. "අඤ්ඤේ වා"ති අඤ්ඤේ වා ජනේ. විමති ඒව වේමතිකං. වේමතිකං ජාතං යේසං තේ වේමතිකජාතා. පුරිමචිත්තස්ස ලෝභසහගතභාවෝ ඉමානි අට්ඨපි ලෝභසහගතචිත්තානි නාමාති ඉමිනා චූළනිගමනේ නේව සිද්ධෝ වියාති යෝජනා. චූළනිගමනේන පටිඝසම්පයුත්ත භාවේ සිද්ධේ දෝමනස්සසහගතභාවෝපි තේන සිද්ධෝයේවාති කත්වා "තේසං ගහණං"ති වුත්තං. "තේස"න්ති දෝමනස්සපටිඝානං. ඉමස්මිං චිත්තේ ඉස්සාමච්ඡරියකුක්කුච්චානි ච ථිනමිද්ධානි ච අනියතයෝගීනි ච හොන්ති යේවාපනකානි ච. තේනාහ "පුරිමචිත්තේ"ති ආදිං. දෝමනස්සං ඉමස්මිං චිත්තේ අත්ථි, අඤ්ඤචිත්තේසු නත්ථි, තස්මා අසාධාරණධම්මෝ නාම. අනඤ්ඤසාධාරණ ධම්මෝතිපි වුච්චති. "යථා ත"න්ති තං නිදස්සනං තදුදහරණං යථා කතමන්ති අත්ථෝ. "උපලක්ඛේතී"ති සඤ්ඤපේති. ආතපං තායති රක්ඛතීති ආතපත්තං. සේතච්ඡත්තං. ලද්ධං ආතපත්තං යේනාති ලද්ධාතපත්තෝ. රාජකුමාරෝ. සෝ ආතපත්තං ලද්ධෝති වුත්තේ සබ්බං රාජසම්පත්තිං ලද්ධෝති විඤ්ඤායති. තස්මා ඉදං උපලක්ඛණවචනං ජාතන්ති දට්ඨබ්බං. "උභින්න"න්ති ද්වින්නං දෝමනස්ස පටිඝානං. පුබ්බේ දෝමනස්සසහගතන්ති වත්වා නිගමනේ පටිඝසම්පයුත්තචිත්තානීති වුත්තත්තා "ඉමස්ස...පෙ.... සිද්ධිතෝ"ති වුත්තං.

"අනිට්ඨලෝකධම්මේහී"ති අලාභෝ ච, අයසෝච, නින්දච, දුක්ඛඤ්චාති චතූහි අනිට්ඨලෝකධම්මේහි. "තං කුතෙත්ථ ලබ්භා"ති අහං අලාභාදීහි මාසමාගච්ඡීති පත්ථෙන්තස්සපි කුතෝ මේ එත්ථ ලෝකේ තං පත්ථනා පූරණං සබ්බකාලං ලබ්භාති අත්ථෝ. "ලබ්භා"ති ච කම්මත්ථදීපකං පාටිපදිකපදං. ඉමේසං උප්පත්තිවිධානං විසුද්ධිමග්ගේ සඞ්ඛේපතෝව වුත්තං තස්ස පාණාතිපාතාදීසු තික්ඛමන්දප්පවත්තිකාලේ පවත්ති වේදිතබ්බාති.

මෝහමූලචිත්තේ. "මූලන්තරවිරහේනා"ති අඤ්ඤමූලවිරහේන. සංසප්පතීති සංසප්පමානා. ඒවං නු ඛෝ, අඤ්ඤථානු ඛෝති ඒවං ද්විධා එරයති කම්පතීති

අත්ථො. වික්ඛිපතීති වික්ඛිපමානං. "නියමනත්ථ"න්ති ඉදං විචිකිච්ඡාසම්පයුත්තං නාමාති නියමනත්ථං. ඉදඤ්හි පටිඝසම්පයුත්තං විය නිගමනේන සිද්ධං න හොති. "ඉධ ලද්ධොකාසං හුත්වා"ති මූලන්තරවිරහත්තා ඒව ඉධ ලද්ධොකාසං හුත්වා. පකතිසභාවභූතං, ඉති තස්මා නත්ථීති යොජනා.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 26-27-28 යටතේ)]**

**තාව** පළමු කොට **සඞ්ඛාරෝ** සංස්කාරය තෙමේ **ඉමස්ස චිත්තස්ස** මේ ද්වේශ මූල චිත්තයාගේ **භේදකරෝති** ඔවුනොවුන්ගෙන් විශේෂ කරයිනුයි **ඉධ** මේ චිත්තයෙහි **තස්ස (සඞ්ඛාරස්ස)** ඒ සංස්කාරයාගේ **ගහණං** ගැණීම **යුත්තං** සුදුසුයි **පන** ඒ කීම සැබෑවකි **වේදනා පටිඝා** දෝමනස්ස වේදනාව හා ප්‍රතිඝය **භේදකරා න හොන්තීති** මේ චිත්තය ඔවුනොවුන්ගෙන් විශේෂ කිරීම නොවෙත්නුයි **ඉධ** මේ දෙම්නස් චිත්තයෙහි **තේ** ඒ වේදනා ප්‍රතිඝ දෙදෙන **න ගහේතබ්බාති** නොගතයුතුයි **තාව** පළමුව **ඉමස්ස චිත්තස්ස** මේ චිත්තයාගේ **දෝමනස්සග්ගහණං** දෙම්නස් වේදනාවගේ ගැණීම **කදචි** කිසිකලෙක **අඤ්ඤවේදනායෝගතා** අන්‍යය වේදනාවක් හා **පසඞ්ගනිවත්තනත්ථන්ති** යෙදීම වැළැක්වීම පිණිසයයි **වුච්චතේ** කියනු ලැබේ **හි** උපමාවක් දක්වම් **යද** යම් කලෙක **රාජානෝ** රජවරු **හසමානායේව** සිනාසෙමින්ම **චෝරවධං** සොරුං වධයට **පේසෙන්ති** පමුණුවත් **ච** එසේම **යද** යම් කලෙක **ජනා** මහජනයා **අත්තනෝ** තමන්ගේ **වේරිනං** වෛරී පුද්ගලයන්ගේ **මරණේ** මරණයෙහි **තුට්ඨිං** සතුට **පවේදෙන්ති** ප්‍රකාශ කරත් **මරණං** ඔවුන්ගේ මරණය **අභිනන්දන්ති** අභිනන්දනය කරත් (එහෙයින් අනුදීපනීපාඨ ටීකායෙහි "ඔහුන්ගේ මරණයෙන් අපි සතුටුවූවෝම යැයි කියත්" යි දක්වත්) **ච** එසේම **යද** යම් කලෙක **බාලජනා** බාල ජනයෝ **හසමානාව** සිනාසෙමින්ම **මිගපක්ඛිනෝ** මුව පොවුවන් පක්ෂීන් **මාරෙන්ති** මරත් **තද** එකල්හි **ඉදං** මේ සතුටුවීම **සෝමනස්සේන** සොම්නස් වේදනාවෙන් **යුත්තන්ති නු ඛෝ** යෙදීමක් වන්නේ නොවේද යන **පසඞ්ගෝ** යෙදීම **අත්ථි ඒව හෝති** ඇත්තේම වෙයි **උපෙක්ඛායෝගේ පන** උපේක්‍ෂා වේදනාවගේ යෙදීමෙහි වනාහි **වත්තබ්බමේව** කිවයුක්තක්ම **නත්ථි** නැත **තප්පසඞ්ගනිවත්තනත්ථං** ඒ සොම්නස් උපේක්‍ෂා වේදනාවන්ගේ යෙදීම නැවැත්වීම පිණිස **දෝමනස්සග්ගහණං** දෙම්නස් වේදනාවගේ ගැණීම **ඉති (වුත්තං)** කියනලදි.

**අපි** මෙසේ සහගත ප්‍රසඞ්ගය නවත්වා දැන් සම්ප්‍රයුක්ත ප්‍රසඞ්ගය නැවැත්වීම පිණිස "පටිඝග්ගහණංපි" ආදිය කියනලදි **අඤ්ඤධම්මසම්පයුත්තතා** අන්‍යය ධර්මයන් හා සම්ප්‍රයුක්ත භාවයෙන් **පසඞ්ගනිවත්තනත්ථං** යෙදීම වැළැක්වීම පිණිස **පටිඝග්ගහණං** ප්‍රතිඝ චෛතසිකයාගේ ගැණීම (**වුත්තං** කියනලදි) **හි** එයට උපමා දක්වම් **යේ නත්ථිකාහේතුකාකිරියමිච්ඡාදිට්ඨිකා** යම් නාස්තික අහේතුක අකිරිය ගත් මිත්‍යාදෘෂ්ටිකයෝ **පාණවධේ** පරපණ නැසීමෙහි **අපුඤ්ඤං නාම** අකුසල් නම් **නත්ථීති** නැත යන **(දිට්ඨිං) ගණ්හන්ති ච** දෘෂ්ටිය ගණිත් ද **තථා** එසේම **යේ** යම් මිත්‍යාදෘෂ්ටිකයෝ **මනුස්සපාණවධේ ඒව** මනුෂ්‍යයන්ගේ පරපණ නැසීමෙහිම **අපුඤ්ඤං හෝති** අකුසල් වෙයි **තිරච්ඡානපාණවධේ** තිරිසන්ගත සත්වයන්ගේ පරපණ නැසීමෙහි **අපුඤ්ඤං නත්ථීති** අකුසලයක් නැත යයි **(දිට්ඨිං) ගණ්හන්ති** දෘෂ්ටිය ගණිත් **ච** තවද **යේ** මිත්‍යාදෘෂ්ටිකයෝ **පාණවධං කත්වා** පරපණ නැසීම කොට **යඤ්ඤං යජන්තානං** යාග කරන්නවුන්ට **දිබ්බසංවත්තනිකං** දෙවියන් අතරට පමුණුවන **මහන්තං පුඤ්ඤං හෝතීති** මහත් පිනක් වේ යයි **(දිට්ඨිං) ගණ්හන්ති** දෘෂ්ටිය ගනිත් **සක්කායදිට්ඨියාවිස්සට්ඨා** සක්කායදෘෂ්ටිය නොමුදනලද **තේ** ඔවුහු **සයං වා** තෙමේම හෝ **පාණවධං** පරපණ නැසීම **කරොන්ති** කරත් **අඤ්ඤේ වා**

අන්‍යය ජනයෝ හෝ **පේසෙන්ති** පරපණ නැසීම පිණිස පිටත් කරත් **තද** එකල්හි **ඉදං (චිත්තං)** මේ චිත්තය **දිට්ඨියාපි සම්පයුත්තං සියාති** දෘෂ්ටිය හා සම්ප්‍රයුක්ත වන්නේදැයි **පසඞ්ගෝ හෝතියේව** ප්‍රසඞ්ගයම වෙයි **පන** තවද **සම්මාදිට්ඨිකේසු** සම්‍යක් දෘෂ්ටිකයන් අතුරින් **යේ බාලා අබ්‍යත්තා** යම් බාල අව්‍යත්ත ජනයෝ **කදචි** කිසිකලෙක **තේසං මිච්ඡාදිට්ඨිකානං** ඒ මිසදිටුවන්ගේ **ලද්ධිං ගහෙත්වා** ලබ්ධිය ගෙන **පාණං වධන්තා තේ** පරපණ නසන්නාවූ ඔවුහු **ආදිතෝ** පළමු කොට **වේමතිකජාතාව හොන්ති** විමති ඇත්තෝම වෙත් **තද** එකල්හි **තේසං** ඔහුන්ට **ඉදං (චිත්තං)** මේ චිත්තය තෙමේ **විචිකිච්ඡායපි යුත්තං සියාති** විචිකිච්ඡාව හා සම්ප්‍රයුක්ත වන්නේදැයි **පසඞ්ගෝ හෝති** ප්‍රසඞ්ගය වෙයි **තප්පසඞ්ගං** ඒ යෙදීම **නිවත්තනත්ථං** නැවැත්වීම පිණිස **පටිඝග්ගහණං** ප්‍රතිඝ චෛතසිකයාගේ ගැණීම **ඉති (වුත්තං)** කියනලදි **ඉතරථා** අන් අයුරකින් **පුරිම චිත්තස්ස** පෙර චිත්තයාගේ **ලෝභසහගතභාවෝ විය** ලෝභසහගත බව චූළනිගමනයෙන් සිද්ධවූවාක් මෙන් **ඉමස්ස** මේ දෝමනස්ස චිත්තයාගේ **පටිඝසම්පයුත්තභාවෝ සිද්ධෝති (පටිඝසම්පයුත්තභාවේ සිද්ධේ)** ප්‍රතිඝ සම්ප්‍රයුක්ත බව සිද්ධවූ කල්හි දෙම්නස් සහගත බවද ඒ චූළනිගමනයෙන්ම සිද්ධවන ලදයැයි කොට **තේසං** දෝමනස්ස ප්‍රතිඝ දෙදෙනාගේ **ගහණං** ගැණීම **නිරත්ථකං සියාති** නිරර්ථක වන්නේ යයි **ඉති (වුත්තං)** කියනලදි **එත්ථ ච** මේ දෙම්නස් චිත්තයෙහි ද **ඉස්සාමච්ඡරියකුක්කුච්චානඤ්ච** ඊෂ්‍යාව මාත්සය‍ර්‍යය කෞකෘත්‍යය ද **ථීනමිද්ධස්ස ච** ථීනය මිද්ධයාගේද **අග්ගහණං** නොගැණීම **පුරිම චිත්තේ** පෙර ලෝභමූල චිත්තයෙහි **මානථීනමිද්ධානයේන** මානය ථීනය මිද්ධය ගත් ක්‍රමයෙන් **වේදිතබ්බං** දතයුතු ("ඉස්සාමච්ඡරියකුක්කුච්චානඤ්ච" යන මෙහි මේ දෙම්නස් චිත්තයෙහි ඊර්ෂ්‍යාව මසුරුකම කුක්කුච්චය ථීන මිද්ධ දෙදෙන ද යන චෛතසිකයෝ අනියතයෝගී ද යේවාපනකයෝ ද වෙත්. දෝමනස්ස වේදනාව මේ චිත්තයෙහි ඇත. අන්‍යය චිත්තයන්හි නැත. එබැවින් එය අසාධාරණ ධර්මයකි. අනන්‍යසාධාරණ ධර්මයක් යයි කියනු ලැබේ) **එත්ථ** මෙහි **අයං** මේ **පරමත්ථදීපනා** පරමර්ථදීපනියයි.

**අසාධාරණධම්මවසේන** අසාධාරණ ධර්ම වශයෙන් **චිත්තස්ස** චිත්තයාගේ **උපලක්ඛණත්ථං** හැඳින්වීම පිණිස **දෝමනස්සග්ගහණං** දෝමනස්සයාගේ ගැණීම **විභාවනියං පන** විභාවනියෙහි ද **මහාටීකායඤ්ච** විසුද්ධිමග්ග මහාටීකාවෙහි ද **වුත්තං** කියනලදි **තත්ථ** එහි **අසාධාරණධම්මවසේන ඉති** අසාධාරණධම්මවසේන යන **ඉදං (වචනං)** මේ වචනය **තාව න යුජ්ජති** සුදුසු නොවෙයි.

**ඉමස්ස** ලෝභමූල චිත්තයාගේ **සෝමනස්සුපෙක්ඛාසහගතභාවේ සතිපි** සෝමනස්ස උපේක්ෂා සහගතබව ඇති කල්හිදු **අනඤ්ඤසාධාරණේනේව දෝමනස්සේන** අන්‍යයන්ට අසාධාරණවූ දෝමනස්සය හේතුකොටගෙනම **ඉමස්ස** මේ දෙම්නස් චිත්තයාගේ **උපලක්ඛණත්ථං ඉති** හැඳින්වීම පිණිස යන **අත්ථස්ස** අර්ථයාගේ **ආපජ්ජනතෝ** පැමිණීම් වශයෙනි **යථා තං** නිදර්ශනයක් දක්වම් (**කතමං** කෙසේද?) **පුරිමස්ස (චිත්තස්ස ච)** පෙර ලෝභමූල චිත්තයාගේ ද **ඉමස්ස චිත්තස්ස ච** මේ දෝමනස්ස චිත්තයාගේ ද **මෝහසහගතභාවේ සතිපි** මෝහසහගත බව ඇති කල්හිදු **අනඤ්ඤසාධාරණේනේව** අන්‍යයන්ට අසාධාරණවූම **ලෝභේන ච** ලෝභය හේතුකොටගෙන ද **පටිඝේන ච** ප්‍රතිඝය හේතුකොටගෙන ද **උපලක්ඛණත්ථං** ඒ ලෝභ දෝස චිත්තයන් හැඳින්වීම පිණිස **ලෝභසහගතපටිඝසම්පයුත්තග්ගහණං** ලෝභසහගත ප්‍රතිඝසම්ප්‍රයුක්ත බව ගන්නාලදි **ච (තං වචනං)** ඒ වචනය **ඉති (තං චිත්තං)** ඒ චිත්තයන් **උපලක්ඛණත්ථං** හැඳින්වීම පිණිස යැයි **න වත්තබ්බං** නොකියයුතුයි.

**ඒවඤ්හි සති** මෙසේ උපලක්‍ෂණයක් ඇති කල්හි **පාකටේන දෝමනස්සේන** ප්‍රකට දෝමනස්සය හේතුකොටගෙන **ඉධ (චිත්තේ)** මේ සිතෙහි **අපාකටානං අඤ්ඤවේදනානම්පි** අප්‍රකට අන්‍ය වේදනාවන්ගේ ද **ලද්ධභාවං** ලබනලද බව **උපලක්ඛේති** හඳුන්වයි **ඉති (දිට්ඨිං)** යන දෘෂ්ටියට **ආපජ්ජති** පැමිණෙයි **ඉති** උපමාවක් දක්වම් **යථා** යම්සේ ද **ලද්ධාතපත්තෝ** ලබනලද සේතච්ඡත්‍ර ඇති **රාජකුමාරෝ** රාජ කුමාරයෙකු මෙනි ("ආතපං තායති රක්ඛතීති ආතපත්තං, සේතච්ඡත්තං. ලද්ධං ආතපත්තං යේනාති ලද්ධාතපත්තෝ, රාජකුමාරෝ" යනු සමාසයි. ඒ රාජකුමාර තෙම සේතච්ඡත්‍ර ලබනලදැයි කිවූ කල්හි සියළු රාජ්‍ය සම්පත්තිය ලබනලදැයි හැගෙයි)

**පටිඝසම්පයුත්තභාවෝ පන** ප්‍රතිඝසම්ප්‍රයුක්ත බව වනාහි **උභින්නං** දෙම්නස් ප්‍රතිඝ දෙදෙනාගේ **ඒකන්තසහචාරිතා** ඒකාන්තයෙන් එකට හැසිරෙන බව **දස්සනත්ථං** දැක්වීම පිණිස **වුත්තෝ** කියනලදි **ඉති** යනුවෙන් **විභාවනියං** විභාවනී ටීකායෙහි **යඤ්ච** යම් වචනයක් **වුත්තං** කියනලදි ද **තම්පි** ඒ වචනය ද **න සුන්දරං** යහපත් නොවෙයි **ඉමස්ස** මේ දෝමනස්ස චිත්තයාගේ **තදත්ථං** දෝමනස්ස ප්‍රතිඝ දෙදෙනාගේ අර්ථය **චූළනිගමේනේව** චූළනිගමනයෙන්ම **සිද්ධිතෝ** සිද්ධය.

**එත්ථ ච** මේ චිත්තයෙහි ද **දෝසජ්ඣාසයතා** ද්වේශ අදහස් ඇති බවය **අගම්භීරපකතිතා** නොගැඹුරු ස්වභාව ඇති බවය **අප්පස්සුතතා** අල්පශ්‍රැත බව **ආඝාතවත්ථුසමායෝගෝ වා** නව ආඝාතවස්තු හා යෙදීම හෝ **අනිට්ඨාරම්මණසමායෝගෝ වා** අනිටු අරමුණක් සමඟ යෙදීම හෝ **දෝමනස්සස්ස ච** දෝමනස්ස වේදනාවගේ ද **පටිඝස්ස ච** ප්‍රතිඝයාගේ ද **කාරණං** ඉපදීමට කාරුණුයි **තත්ථ** එහි **දෝසබහුලභාවතෝ** බහුල වූ ද්වේශයට **ආගතවසේන** පැමිණීම් වශයෙන් **දෝසජ්ඣාසයතා** ද්වේශ අදහස් ඇති බව **දට්ඨබ්බා** දතයුත්තාහ **හීනජ්ඣාසයතා** ලාමක අදහස් ඇති බව **අගම්භීරපකතිතා** අගම්භීරපකතිතා නම් **අනිට්ඨලෝකධම්මේහි** අලාභය ද අයස ද නින්දව ද දුක ද යන සතර වැදෑරුම් අනිටු ලෝක ධර්මයෙන් **ඵුට්ඨස්ස අප්පස්සුතස්ස ච** පහසනලද අල්පශ්‍රැතයාට **තං කුතෙත්ථ ලබ්භාති** අලාභාදියෙන් පීඩා විඳි මට මාසයක් පැමිණියේය මේ ලෝකයෙහි මගේ ප්‍රාර්ථනා පූර්ණයට කාලයක් කොහෙන් ලබමු දැයි **පච්චවෙක්ඛනා** ප්‍රත්‍යවේක්‍ෂනයක් **නත්ථි** නැත **ඉමේසම්පි ද්වින්නං** මේ දෝමනස්ස ප්‍රතිඝ යන දෙදෙනාගේ **උප්පත්තිවිධානං** උත්පත්ති පිළිවෙළ **විසුද්ධිමග්ගේ** විසුද්ධි මාර්ගයෙන් **ගහේතබ්බං** ගතයුතුයි.

**යස්මා පන** යම්හෙයකින් වනාහි **ඉදං චිත්තං** මේ මෝහමූල චිත්තය **මූලන්තරවිරහේන** ලෝභාදි අන්‍ය මූල නොමැති හෙයින් **ලද්ධෝකාසේන** ලබනලද අවකාශයෙන් **සුට්ඨුබලවන්තේන** මනාව බලවත් වූ **මෝහේන චේව** මෝහයෙන්ම ද **සංසප්පමානවික්ඛිපමානේහි** සැකය හා වික්‍ෂේපය යන **විචිකිච්ඡුද්ධච්චේහි ච** විචිකිච්ඡා උද්ධච්චයෙන් ද **යුත්තං හෝති** යුක්ත වෙයි **තස්මා** එබැවින් **ඉධ** මේ මෝහමූල චිත්තයෙහි **වේදනාපි** වේදනාව ද **ආරම්මණං** අරමුණ ද **අධිමත්ථතෝ** අධිමාත්‍ර වශයෙන් **අනුභවිතුං** අනුභව කිරීමට **න සක්කෝතීති** නොහැක්කේ නුයි **උපෙක්ඛාවේදනාව** උපේක්‍ෂා වේදනාවෙන්ම **යුත්තා හෝති** යුක්ත වෙයි **ඒවං සන්තේපි** මෙසේ ඇති කල්හි ද **ඉදං චිත්තං** මේ චිත්තය **සෝමනස්සදෝමනස්සසහගතානම්පි** සෝමනස්ස සහගත දෝමනස්ස සහගත

වේදනාවන්ගේ ද **අනන්තරේ** අතරක් නැතිවම **උප්පජ්ජති** උපදී **තස්මා** එබැවින් **තදුභයවේදනාහිපි** ඒ උභය වේදනාවන් හා සමග **ඉදං** මේ මෝහමූල චිත්තය **යුත්තං සියාති** යුක්ත වන්නේ යයි **පසඞ්ගෝ හෝති** යෙදීමක් වෙයි **තප්පසඞ්ගනිවත්තනත්ථං** ඒ යෙදීම නැවැත්වීම පිණිස **ඉධ** මේ මෝහමූල චිත්තයෙහි **උපෙක්ඛාගහණං** උපේක්ෂා වේදනාවගේ ගැණීම **කතං** කරනලදි **අනඤ්ඤචිත්තසාධාරණධම්මේන** අන්‍ය චිත්තයන්ට අසාධාරණ ධර්මයකින් **නියමනත්ථං** මෙය විචිකිච්ඡා සම්ප්‍රයුක්ත යැයි නියම කිරීම පිණිස **(ඉමස්ස) චිත්තස්ස** මේ චිත්තයට **විචිකිච්ඡාගහණං** විචිකිච්ඡාවගේ ගැණීම (**කතං** කරනලදි) **උද්ධච්චං පන** උද්ධච්චය වනාහි **සබ්බාකුසලේසු** සියළු අකුසල චිත්තයන්හි **යුත්තම්පි** යුක්තවුවද **ඉධ** මේ උද්ධච්චසම්ප්‍රයුක්ත චිත්තයෙහි **ලද්ධෝකාසං හුත්වා** ලෝභාදි අන්‍ය මූලයක් නැති බැවින්ම ලබනලද අවකාශය ඇත්තෙක්ව වී **සුට්ඨුබලවං හෝතීති** මනාව බලවත් වේ යයි **දස්සනත්ථං** දැක්වීම පිණිස **ඉධේව** මේ උද්ධච්ච චිත්තයෙහිම **ගහිතන්ති** ගන්නාලද යයි **දට්ඨබ්බං** දතයුතුයි **තේනේවහි** එහෙයින්ම **ධම්මසඞ්ගණියං** දම්සඟුණු අටුවායෙහි **ධම්මුද්දේසවාරේ** ධම්මුද්දේස වාරයෙහි **උද්ධච්චං** මේ උද්ධච්චය තෙමේ **අඤ්ඤේසු පාපාචිත්තේසු** අන්‍ය අකුසල චිත්තයන්හි **සරූපතෝ** ස්වරූප වශයෙන් **අනුද්ධරිත්වා** නොම උදුරා **යේවාපනකභාවේනේව** යේවාපනක භාවයෙන්ම **වුත්තං** දේශනා කරනලදි **ඉමස්මිං අන්තිමචිත්තේ ඒව** මේ අවසන් සිතෙහිම **සරූපතෝ** ස්වරූප වශයෙන් **උද්ධටන්ති** උදුරනලදැයි **දට්ඨබ්බං** දතයුතුයි. **[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

සෝමනස්සසහගතං - උපෙක්ඛාසහිතං තථා
දිට්ඨිගතසම්පයුත්තං - විප්පයුත්තන්ති භේදිතං.

**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 21 යටතේ)]**

**සෝමනස්සසහගතං** සොම්නස් සහ ගිය සිත් සතර ද **උපෙක්ඛාසහිතං** උපේක්ෂා සහ ගිය සිත් සතර ද **ඉති** මෙසේ (**ලෝභමූලං** ලෝභමූල චිත්තය **අට්ඨාධා** අට පරිද්දෙකින්) **භේදිතං** භේදවන ලද්දේය **තථා** එසේම **දිට්ඨිගතසම්පයුත්තං** දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත සිත් සතර ද **දිට්ඨිගතවිප්පයුත්තං** දෘෂ්ටිගත විප්‍රයුක්ත සිත් සතර ද **ඉති** මෙසේ (**ලෝභමූලං** ලෝභමූලික චිත්තය **අට්ඨධා** අට පරිද්දෙකින්) **භේදිතං** භේදවන ලද්දේය. **[පරමත්ථවිභාවනි ව්‍යාඛ්‍යාව 14 පිට]**

අසඞ්ඛාරසසඞ්ඛාරමිති - භින්නං පුනට්ඨධා
ලෝභමූලං පකාසෙන්ති - ලෝභමෝහද්විහේතුකං

**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 22 යටතේ)]**

**අසඞ්ඛාරං** අසංස්කාර සිත් සතර ද **සසඞ්ඛාරං** සසංස්කාර සිත් සතර ද **ඉති** මෙසේ **ලෝභමූලං** ලෝභය මුල්කොට ඇති සිත **පුන** නැවත **අට්ඨධා** අට ප්‍රකාරයෙකින් **භින්නං (භේදිතං)** භේදවන ලද්දේය (**තං** ඒ ලෝභමූල චිත්තය) **ලෝභමෝහද්විහේතුකං** ලෝභ මෝහ යන හේතු දෙක ඇත්තේ යයි (**බුධා** පරමාර්ථයෙහි දක්ෂවූ උත්තමාචාර්‍යයෝ) **පකාසෙන්ති** ප්‍රකාශ කෙරෙත්.

**[පරමත්ථවිභාවනි ව්‍යාඛ්‍යාව 15 පිට]**

දෝමනස්සසහගතං - පටිඝේන සමායුතං
අසඞ්ඛාරසසඞ්ඛාරමිති - භින්නං ද්විධා පන

**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 23 යටතේ)]**

(**දෝසමූලං පන** ද්වේෂය මුල් කොට ඇති සිත වනාහි) **දෝමනස්සසහගතං** දෙම්නස් වේදනාව හා සමඟ උපන්නා වූ **පටිඝේන** ප්‍රතිඝය හා හෙවත් ද්වේෂය හා **සමායුතං** යෙදුනා වූ **අසඞ්ඛාරං** අසංස්කාරික සිත ද **සසඞ්ඛාරං** සසංස්කාරික සිත ද **ඉති** මෙසේ **ද්විධා** දෙපරිද්දෙකින් **භින්නං** භේදවන ලද්දේය.

**[පරමත්ථවිභාවනි ව්‍යාඛ්‍යාව 15 පිට]**

දෝසමූලං පකාසෙන්ති - දෝසමෝහද්විහේතුකං
විචිකිච්ඡාසහගතං - උද්ධච්චසහිතන්තිච

උපෙක්ඛාවේදනායුත්තං - මෝමූහං දුවිධං පන
මෝහමූලං පකාසෙන්ති - මෝහේනේවේකහේතුකං

**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 24-25 යටතේ)]**

(**තං** ඒ ද්වේෂ මූලක සිත) **දෝසමෝහද්විහේතුකං** දෝස මෝහ හේතු දෙක ඇත්තේ යැයි (**බුධා** පණ්ඩිතාචාර්‍යවරයෝ) **පකාසෙන්ති** ප්‍රකාශ කෙරෙත් **මෝමූහං පන** මෝහය මුල්කොට ඇති සිත වනාහි **උපෙක්ඛාවේදනායුත්තං** උපේක්‍ෂා වේදනාව හා යෙදුනාවූ **විචිකිච්ඡාසහගතඤ්ච** විචිකිත්සා සහ ගිය සිත ද **උද්ධච්චසහිතඤ්ච** ඖද්ධත්‍යය සහ ගිය සිත ද **ඉති ච** මෙසේම **දුවිධං** ද්විප්‍රකාරයෙක් ඇත්තේ (**හෝති** වේ) **මෝහමූලං** මෝහය මුල් කොට ඇති සිත **මෝහේනේව** එකම මෝහය කරණ කොටගෙන **ඒකහේතුකං** එක් හේතුවක් ඇත්තේ යැයි (**බුධා** පරමාර්ථවේදී පණ්ඩිතයෝ) **පකාසෙන්ති** ප්‍රකාශ කෙරෙත්.

"මිච්ඡා පස්සතීති දිට්ඨි" නිර්වචනයි. මිත්‍යාඥණ තෙම ලැබේ. යම් හෙයකින් සාධාරණ වචනයාගේ ද අර්ථ ප්‍රකරණාදිය කරණකොටගෙන විශේෂ විෂයභාව තොමෝ වන්නීද එහෙයින් මිත්‍යා දර්ශනයම දෘෂ්ටියයි කියනු ලැබේ. "දිට්ඨියේව දිට්ඨිගතං" සඞ්ඛාරගතං ථාමගතං යනාදියෙහි මෙන් ගත ශබ්දය තත්භාවයෙහි පවත්නා හෙයිනි. "ලෝභමූලං" යන මෙහි "මූලයති රුහති දුක්ඛාදී එතේනාති මූලං" නිර්වචනයි. "මූලයති ඡින්නෝපි කෝටි ඒතේන අච්ඡින්නේන පුනදේව රුහතීති මූලං" අච්ඡින්නේන නොසින්ඳ වූ මේ ලෝභය හේතුකොටගෙන ඡින්නෝපි සිඳින ලද්දවූ ද කෝටි කෙලවර පුනදේව නැවතද මූලයති මූලයති යයිසේයි රුහති හටගනී ඉති (තස්මා) එහෙයින් මූලං මූල නම් වේ නොහොත් "මූලයති සුප්පතිට්ඨෝ භවති රුක්ඛාදී ඒතේනාති මූලං" රුක්මුල ලැබේ. මේ ලෝභමූලචිත්තය වෘත්තයෙහි දැඩිව පිහිටන්නහුගේ භාවය නිපදවීම කරණකොටගෙන රුක්මුල හා සමාන වන හෙයින් සදෘශෝපචාර වශයෙන් මූල නම් වේ යැයි දතයුතු. "ලෝභෝ මූලං ඒතස්සාති ලෝභමූලං" මේ ලෝභමූල සිතෙහි මෝහ සඞ්ඛ්‍යාත හේතුවත් ඇත්තේ නොවේද? එසේ ඇති කල්හි ඒ මෝහය ලෝභමූල සිතෙහි ඇති කල්හිත් සියළු අකුසල් සිත් හා සාධාරණ බව හේතුකොටගෙන පිරිසිඳීමක් නොකෙරේ. එහෙයින් "භේරිසද්දෝ යවඞ්කුරෝ" යනාදියෙහි මෙන් අසාධාරණ නය කරණකොටගෙන "ලෝභමූලං" යනු කීයේයයි දතයුතු. "ඵස්ස චේතනා" යනාදී අන්‍යය වූ සම්ප්‍රයුක්ත ධර්මයන් ඇති කල්හි මේ සිත්හි සොම්නස්සහගතාදී භාවයම කුමක් හේතුකොටගෙන කියන ලද්දේ ද? සොම්නස් ආදීන්ගේම සියළු ධර්මයන් හා අසාධාරණ භාවය හේතුකොටගෙන කීයේ යයි දතයුතු.

"දුට්ඨුමනෝ දුමනෝ, තං වා ඒතස්සාති දුමනෝ, දුමනස්ස භාවෝ දෝමනස්සං" විග්‍රහයි. භාවයෙහි ණ්‍ය ප්‍රත්‍යය වේ. මහාවෘත්ති සූත්‍රයෙන් ප්‍රත්‍යය ණ-කාරය ලොප්

කොට "යවතං තලනාදී" සූත්‍රයෙහි "අත්තං" යන භාව නිර්දේශයෙන් ත්‍ය ප්‍රත්‍යයට ස-කාරය කොට රූපසිද්ධිය කටයුතු. දෝසමූල සිත ලෝභමූල සිත මෙන් වේදනා භේද නැත්තේ නම් කුමක් හේතුකොටගෙන "දෝමනස්සසහගතං" යී විශේෂණ පදය කියන ලද්දේ ද? දෙම්නස් සහගිය චිත්තයාගේ වේදනා වශයෙන් භේදයක් නැති කල්හි ද අසාධාරණ ධර්මයාගේ වශයෙන් චිත්තයාගේ උපලක්‍ෂණය පිණිස දෝමනස්ස ශබ්දය කියන ලද්දේ යයි දතයුතු. එසේ වූ කල්හි "දෝමනස්සසහගතං අසඞ්ඛාරං සසඞ්ඛාරං" යී කීමම නිපදවන්නේය. කිනම් ප්‍රයෝජනයක් සඳහා "පටිඝේන සමායුතං" යන විශේෂණ පදය කියන ලද්දේ ද? එම "පටිඝේන සමායුතං" යන පදය දෙම්නස් ප්‍රතිඝ දෙදෙනාගේ නියම වශයෙන් සමඟ හැසිරෙන බව දැක්වීම පිණිස කීයේ යයි දතයුතු.෴

මෝහමූලක සිත්හි "උද්ධච්චං" යන පදය වෙනස් කොට කීයේය. එම උද්ධච්චය තෙම සියළු අකුසල් සිත්හි සාධාරණ නොවේ ද? එසේ සාධාරණ බව ඇති කල්හි කිනම් විශේෂයක් නිසා ඒ අවසාන චිත්තය උද්ධච්චය කරණකොටගෙන වෙනසි කොට කියන ලද්දේ ද? එසේ සියළු චිත්තයන්හි සාධාරණ බව ඇති කල්හිත් ඒ අවසාන සිතෙහි සම්ප්‍රයුක්ත ධර්මයන්හි ප්‍රධානවැ උපදනා හෙයින් අවසාන වූ මෝහමූලක සිතම උද්ධච්ච චිත්තයෙන් විශේෂ කොට කියන ලද්දේය. එහෙයින් ටීකායෙහි:—

සබ්බා කුසලයුත්තම්පි - උද්ධච්චං අන්තමානසේ
බලවං ඉති තං යේව - වුත්තමුද්ධච්චයෝගතෝ

තේනේවහි මුනින්දේන - යේවපනකනාමතෝ
වත්‍වා සේසේසු එත්ථේව - තං සරූපේන දේසිතං යනු කියනලදි.෴

"මෝහේන මුය්හති අතිසයේන සම්මුය්හතීති මෝමූලං" විචිකිච්ඡා උද්ධච්ච සහගිය සිත ලැබේ. මේ පදයෙහි "මෝහමූලං" කියයුතු තන්හි එක හ-කාරයක් ලොප් කොට "මෝමූහං" යී කීයේය. "සද්දතිරේකා අත්ථාතිරේකෝ" යන ශබ්දය හා සම වේ. "මෝහමූහ" යන ශබ්ද ද්වය මුළාවීම යන අර්ථයම කියයි. "පදට්ඨානං රූපරූපං" යන තන්හි මෙන් අතිශයින් මුළාවීම යන අර්ථය ලැබෙන හෙයින් "අතිසයේන සම්මුය්හති" යනු කීයේයයි දතයුතු.෴ **[පරමත්ථවිභාවනි ව්‍යාඛ්‍යාව 15-17 පිටු]**

ද්වාදසාකුසලානාම - චතුරාපායසාධකා
ඒතේ සුගතියඤ්චාපි - විපත්තිඵලදයකා

**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 26 යටතේ)]**

**ද්වාදස** දෙළොස් ප්‍රකාර වූ **අකුසලා නාම** අකුශල යන නම් ඇති චිත්තයෝ නොහොත් **අකුසලා නාම** අකුශල යන නම් ඇත්තාවූ **ද්වාදස** දෙළොස් ප්‍රකාරවූ චිත්තයෝ **චතුරාපායසාධකා** සිව් අපායෙහි ලැබෙන පරිද්දෙන් සත් ප්‍රකාර වූ අහේතුක චිත්තයෝ නිපදවන්නාහු වෙත් **ඒතේ** මේ එකොළොස් අකුශල චිත්තයෝ **සුගතියඤ්චාපි** කාමාවචර රූපාවචර යන සුගති භවයෙහි ද **පවත්තානං** උපන් සත්වයන්ට **විපත්තිඵලදයකා** විපත්ති විපාක දෙන්නාහු හෙවත් නොකැමැතිවනලද ආකාරයෙන් දුක් විපාක දෙන්නාහු (**හොන්ති** වෙත්) නොහොත් **සුගතියඤ්ච** සුගති භූමියෙහි ද **අපි (පවත්තියං)** ප්‍රවෘත්ති කාලයෙහි ද **විපත්තිඵලදයකා** විපත්ති විපාක

වූ දුක්ඛ විශේෂය දෙන්නාහු (**හොන්ති** වෙත්) (අපි ශබ්දයෙන් "පවත්තියං" යනු සම්බන්ධ කෙරේ)
**[පරමත්ථවිභාවනි ව්‍යාඛ්‍යාව 17 පිට]**

අකුසලසිත් භූමි වශයෙන් නොබෙදේ. සියල්ල කාමාවචර බැවිනි. බෙදෙනුයේ මූල වශයෙනි. මූල යනු මුල්වීමයි නැතහොත් ප්‍රධාන හේතුවය. මූලතුනෙකි. ලෝභ-දෝස-මෝහ යනුයි. මේවායේ අයුරු සංස්කාරස්කන්ධයෙහි දැක්විණ. සියළු අකුසල් සිත් මේ මූලතුනට බෙදීගිය කල්හි දෙළොසෙක් වෙයි. ලෝභමූලික අටෙකි. දෝසමූලික දෙකෙකි. මෝහමූලික දෙකෙකි. නැවත ලෝභමූලික අකුසල් වේදනා භේදයෙන් දෙවැදෑරුම්ය. දිට්ඨි-සඞ්ඛාර භේදයෙන් ද එමෙනි. මිශ්‍ර වූ විට අට සම්පූර්ණ වේ. වේදනා-සඞ්ඛාර විස්තර පෙර පරිදිය. දිට්ඨි යනු වැරදි දැකීමයි. අරමුණෙහි වැරදි දැකීමක් ඇති අතර "මෙයට විපාක නොලැබේය" යන කර්ම ඵල අවිශ්වාසය ද දිට්ඨියෙහි ඇත. ලෝභය අධිකව යෙදීම නිසා "සෝමනස්ස" වේදනාව ද මදව යෙදීම නිසා "උපෙක්ඛා" වේදනාව ද යෙදින. "මෙයින් මට මතු විපාක නොලැබේ කියා හෝ මෙවැනි දේ මිනිසා විසින් කිරීම වැරදි නැත කියා හෝ" වැරදි දැකීමෙන් යුක්තවීමෙන් දිට්ඨිගත සම්පයුත්ත වෙයි. එවැනි මුළාවක් නොයෙදීම දිට්ඨිගත විප්පයුත්තවීමට හේතුයි. සඞ්ඛාර විස්තරය පෙර මෙනි. මේ සිත් උපදිනුයේ සොරකම, කාමමිච්ඡාචාරය ආදී ආශාවෙන් කරන පව්කම්වලදීය.

දෝසය-කිපීම මේ සිත්වලදී එනුයේ පටිඝ නාමයෙනි. එහි ස්වභාවය (හැටි) = අනුන්ගේ වරද දුටුවිට හැප්පීමයි. ඒ නිසාම සිත දූෂිත (කිලුටු) වේ. ඉක්බිති කයෙන් හෝ වචනයෙන් හෝ ක්‍රියාවේ යෙදෙවේ. ද්වේෂය හටගනිත්ම සිතෙහි නොසතුටුගතියක් ඇතිවීම ස්වභාවිකය. එහෙයින් සිත් දෙකම දෝමනස්ස වේදනාවම වේ. සඞ්ඛාර භේදය පෙර මෙනි. අනුන්ගේ මෙහෙයවීමක් නැතිවිට අසඞ්ඛාර වේ. මෙහෙයවීමක් ඇතිවිට සසඞ්ඛාරිකයි. සතුන් මැරීම, හිංසාකිරීම, පළිගැනීමේ අදහසින් කරන සොරකම ආදීදෑ මේ සිත් දෙකෙන් සිදුකෙරේ.

මෙහි වේදනා භේදයක් හෝ සඞ්ඛාර භේදයක් හෝ නොඑයි. ඊට හේතු සිතෙහි දිගටම පවතින තදගැම්මක් නොමැතිකමයි. සිත්දෙකම ස්වභාවික වශයෙන් චංචලය. සෙලවේ. එසේම ක්‍රියාවක් නොමැති නිසා සිතින්ම පහළවී එහිම කරකැවෙයි. මෝහය නිසා ස්ථිරනිගමනයකට බැසගැනීමට ද අසමර්ථය. කෙලෙස් ගති දෙකක් නිසා සිත් දෙකක් විය. එකක් විචිකිච්ඡා, අනෙක උද්ධච්චය.
**[තෙසැත්තෑ සදෑණ කථා 383-385 පිටු]**

## ඉෂ්ටාරම්මණයෙහි කෙසේ කුසල් සිත් පහළ වේද?

තත්ථ රූපං තාව ආරම්මණං කත්වා උප්පජ්ජමානං ඒතං මහාකුසලචිත්තං නීලපීතලෝහිතෝදතවණ්ණේසු පුප්ඵවත්ථධාතූසු අඤ්ඤතරං සුභනිමිත්තසඞ්ඛාතං ඉට්ඨං කන්තං මනාපං රජනීයං වණ්ණං ආරම්මණං කත්වා උප්පජ්ජති. නනු චේතං ඉට්ඨාරම්මණං ලෝභස්ස වත්ථු? කථං ඒතං චිත්තං කුසලං නාම ජාතන්ති? නියමිතවසේන පරිණාමිතවසේන සමුදාචාරවසේන ආභුජිතවසේනාති. යස්ස හි 'කුසලමෙව මයා කත්තබ්බ'න්ති කුසලකරණේ චිත්තං නියමිතං හෝති, අකුසලප්පවත්තිතෝ නිවත්තෙත්වා කුසලකරණේයේව පරිණාමිතං, අභිණ්හකරණේන කුසලසමුදාචාරේනේව සමුදාචරිතං, පතිරූපදේසවාස-සප්පුරිසූපනිස්සය-සද්ධම්මසවන-පුබ්බේකතපුඤ්ඤතාදීහි ච උපනිස්සයේහි

යෝනිසෝ ච ආභෝගෝ පවත්තති, තස්ස ඉමිනා නියමිතවසේන පරිණාමිතවසේන සමුදාචාරවසේන ආභුජිතවසේන ච කුසලං නාම ජාතං හෝති.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය අංක 01 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 90 පිට (හේ.වි.මු); සිත සිරුර සහ නිවන හෙවත් ධම්මසඞ්ගණී 13-14 පිට; මොක්පුර රන්දෙර 01/ 386 පිට]**

ගේරුකහරිතාලඤ්ජනාදිධාතුසු. **සුභනිමිත්තං** සුභග්ගහණස්ස නිමිත්තං. තං සුභනිමිත්තත්තා රඤ්ජනීයත්තා ච ලෝභස්ස වත්ථු. නියමිතස්ස චිත්තස්ස වසේන **නියමිතවසේන**. ඒවමිතරේසු ද්වීසු. ආභෝගෝ **ආභුජිතං**.
**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 01 කාමාවචරකුසලපද භාජනීය වණ්ණනා යටතේ)]**

**නියමිතස්සාති** කුසලමේව මයා උප්පාදේතබ්බන්ති ඒවං නියමිතස්ස.
**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 01 කාමාවචරකුසලපද භාජනීය වණ්ණනා යටතේ)]**

**තත්ථ** ඒ කාමාවචර කුසල් සිත් අතුරින් **තාව** පළමු කොට **රූපං ආරම්මණං කත්වා** රූපය අරමුණු කොට **උප්පජ්ජමානං** උපදින්නා වූ **ඒතං මහාකුසලචිත්තං** ඒ මහා කුසල් චිත්තය **නීලපීතලෝහිතෝදාතවණ්ණේසු** නිල් කහ රතු සුදු වර්ණ ඇති **පුප්ඵවත්ථධාතුසු** මල් වස්ත්‍රාදිය අතුරින් **අඤ්ඤතරං** එක්තරා **සුභනිමිත්තසඞ්ඛාතං** සුභ නිමිත්ත සඞ්ඛ්‍යාත **ඉට්ඨං** ඉෂ්ට වූ **කන්තං** කාන්ත වූ **මනාපං** මනාප වූ **රජනීයං** සිත් අලවන්නා වූ **වණ්ණං ආරම්මණං කත්වා** වර්ණයක් අරමුණු කොට **උප්පජ්ජති** උපදී **ඒතං ඉට්ඨාරම්මණං** ඒ ඉටු අරමුණ **ලෝභස්ස** ලෝභයට **වත්ථු** වස්තු **නනු ච?** නොවේද? **ඒතං චිත්තං** ඒ චිත්තය තෙමේ **කුසලං නාම** කුසල් නමින් **කථං** කෙසේ **ජාතන්ති?** උපදිත් ද? **ඉති (සච්චං)** ඒ කීම සැබෑවකි **නියමිතවසේන** නියම කිරීම් වශයෙන්ය **පරිණාමිතවසේන** පිරිනැමීම් වශයෙන්ය **සමුදාචාරවසේන** හැසිරීම් වශයෙන්ය **ආභුජිතවසේන** මෙනෙහි කිරීම් වශයෙන්ය **හි** විස්තර කෙරෙම් **කුසලමේව** කුසලයම **මයා** මා විසින් **කාතබ්බන්ති** කටයුතු යැයි **කුසලකරණේ** කුසල් කිරීමෙහි **යස්ස** යමෙකුගේ **චිත්තං** සිත **නියමිතං හෝති** පිරිනමන ලද්දේ වේද **අකුසලප්පවත්තිතෝ** අකුසල ප්‍රවෘත්තියෙන් **(චිත්තං) නිවත්තෙත්වා** සිත වළක්වා **කුසලකරණේයේව** කුසල් කිරීමෙහිම **පරිණාමිතං** පිරිනමන ලද්දේ වේද **අභිණ්හකරණේන** නිතර කිරීමෙන් **කුසලසමුදාචාරේනේව** කුසල් කිරීමෙහි පුරුද්දෙන් **සමුදාචරිතං** පුරුදු කරණ ලද්දේ වේද **පතිරූපදේසවාස** ප්‍රතිරූපදේශවාසය ද **සප්පුරුසූපනිස්සය** සත්පුරුෂෝපනිශ්‍රය ද **සද්ධම්මසවන** සද්ධර්මශ්‍රවණය ද **පුබ්බේකතපුඤ්ඤතාදීහි ච** පෙර කරණලද පිං ඇති බව ආදී **උපනිස්සයේහි** උපනිශ්‍රය හේතුකොට ගෙන ද **යෝනිසෝ ආභෝගෝ** නුවණින් මෙනෙහි කිරීම **පවත්තති ච** පවත්වයි ද **තස්ස** ඔහුට **ඉමිනා නියමිතවසේන ච** මේ නියම කිරීම් වශයෙන් ද **පරිණාමිතවසේන ච** පිරිනැමීම් වශයෙන් ද **සමුදාචාරවසේන ච** කුසල් කිරීමේ පුරුද්ද වශයෙන් ද **ආභුජිතවසේන ච** නුවණින් මෙනෙහි කිරීම් වශයෙන් ද **කුසලං නාම** කුසල් සිතක් නම් **ජාතං හෝති** උපදින ලද්දේ වෙයි.
**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

නනු ච ඉට්ඨාරම්මණං ලෝභස්ස වත්ථු රජ්ජනීයත්තාති කථං තත්ථ කුසලං උප්පජ්ජතීති? නයිදමේකන්තිකං ඉට්ඨේපි ආරම්මණේ නියමිතාදිවසේන කුසලස්ස උප්පජ්ජනතෝ. යස්ස හි "කුසලමේව මයා කත්තබ්බ"න්ති කුසලකරණේයේව චිත්තං නියමිතං හෝති, අකුසලප්පවත්තිතෝව නිවත්තෙත්වා කුසලකරණේයේව පරිණාමිතං, අභිණ්හකරණේන ච කුසලං සමුදාචිණ්ණං,

පටිරූපදෙසවාසසද්ධම්මස්සවනසප්පුරිසූපනිස්සයපුබ්බෙකතපුඤ්ඤතාසඞ්ඛාතචතුචක්කූපනිස්සයවසේන, යෝනිසෝ ච ආභෝගෝ පවත්තති, තස්ස ඉට්ඨේපි ආරම්මණේ අලෝභසම්පයුත්තමේව චිත්තමුප්පජ්ජති, න ලෝභසම්පයුත්තං. හෝති චෙත්ථ;

"නියාමපරිණාමේහි, සමුදාචිණ්ණතාය ච;
ඤාණපුබ්බඞ්ගමාභෝගා, ඉට්ඨේපි කුසලං සියා"ති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසල වණ්ණනා අංක 11 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 62-64 පිටු; විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 452 යටතේ)]**

ඉෂ්ට අරමුණ ලෝභ සහගත අකුසල් සිත ඉපදීමට වස්තුවක් වන්නේ නොවේ ද? කෙසේ එහි කුසල් සිත් උපදනේද යත්; ඒ ඒකාන්ත ස්වභාවයක් නොවේ. කුමක් හෙයින යත්? ඉෂ්ට අරමුණෙහි නමුදු නියමිතාදී වශයෙන් කුසල සිත උපදනා හෙයිනි. ඒ එසේමය. කුසලයක්ම මා විසින් කටයුතු යැයි කුසල් කිරීමෙහිම යමෙකුගේ සිත නියම කරනලද්දේ වේද අකුසල ප්‍රවෘත්තියෙන් සිත වළක්වා කුසල කරනයෙහිම සිත පිරිනමන ලද්දේ වේද නිතර කිරීමෙන් කුසල සමුදාචීර්ණ වේද ප්‍රතිරූපදේසවාසය සද්ධර්ම ශ්‍රවණය සත්පුරුෂෝපනිශ්‍රය පූර්වයෙහි කරනලද පිං ඇති බවයයි චතුශ්චක්‍ර සම්පත්ති වශයෙන් නුවණින් මෙනෙහි කිරීම හටගනීද ඕ හට ඉෂ්ට අරමුණෙහි නමුදු අලෝභ සම්ප්‍රයුක්ත වූ කුසල් සිතක්ම උපදී. ලෝභ සම්ප්‍රයුක්ත සිතක් නූපදනේ යයි සේයි ෴

"නියාමපරිණාමේහි, සමුදාචිණ්ණතාය ච;
ඤාණපුබ්බඞ්ගමාභෝගා, ඉට්ඨේපි කුසලං සියා" ෴ යි

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 40 පිට]**

නනු ච ඉට්ඨාරම්මණං ලෝභස්ස වත්ථු, කථං තත්ථ කුසලං හෝතීති? නයිදමේකන්තිකං ඉට්ඨේපි ආභෝගාදිවසේන කුසලස්ස උප්පජ්ජනතෝ. යස්ස හි චතුසම්පත්තිචක්කසමායෝගාදිවසේන යෝනිසෝව ආභෝගෝ හෝති, කුසලමේව ච මයා කාතබ්බන්ති කුසලකරණේ චිත්තං නියමිතං, අකුසලප්පවත්තිතෝ ච නිවත්තෙත්වා කුසලකරණේ ඒව පරිණාමිතං, අභිණ්හකරණවසේන ච සමුදාචරිතං, තස්ස ඉට්ඨේපි ආරම්මණේ අලෝභාදිසම්පයුත්තමේව චිත්තං හෝති, න ලෝභාදිසම්පයුත්තං. **[විසුද්ධිමග්ග මහා ටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 452 යටතේ)]**

ඉෂ්ටාලම්බණය ලෝභනීය වස්තුවක් නොවේද? ඒ ඉටු අරම්ණෙහි ලෝභය නොඉපිද කුශල් උපත් කෙසේවී යත්? හේතු සතරකින් වේ. කිසේය යත්? චතුෂ්චක්‍ර සම්පත්ති සමායෝගාදී වශයෙන් වන යෝනිසෝ ආභෝගයෙන් ද මා විසින් කුශල කර්මම කටයුතු යැයි කුශල කරණේ සිත්හු නියම කිරීමෙන් ද අකුශල ප්‍රවෘත්තියෙන් වළකා කුශල් කිරීමෙහිම පරිණාමනයෙන් ද එක්වන් කුශල් කිරීමෙහි සිත්හු පුරුදු කිරීමෙන් ද ඉෂ්ටාලම්බණයෙහිදු ලොභ නොඉපිද අලෝභාදී සම්ප්‍රයුක්තක කුශලයම උපදනේයි. මෙම කීහ:—

"යෝනිසෝ විෂයාභෝගාත් - පරිමිත්‍යාච්ප්‍රභසය්‍යච
නෛයයාමාත් පරිණාමාච්ච - ශුභමිෂ්ටේෂුවස්තුෂු" යි ෴

**[විසුද්ධි මාර්ග සන්නය 1083 පිට]**

නනු චේතානි ඉට්ඨකන්තමනාපානි ආරම්මණානි ලෝභස්ස වත්ථු, කථමෙත්ථ කුසලං උප්පජ්ජතීති? නියමාදිකාරණතෝ. චිත්තං හි "කුසලමේව මයා කත්තබ්බ"න්ති

පුබ්බේ නියමිතවසේන සබ්බත්ථ අකුසලප්පවත්තිං නිවත්තෙත්වා කුසලේ පරිණාමනවසේන ච අභිණ්හං ආසේවිතකුසලසමුදාචාරවසේන ච සප්පුරිසූපනිස්සයාදිඋපනිස්සයවසේන ච යෝනිසෝආභුජිතවසේන චාති ඉමේහි කාරණේහි කුසලං හුත්වා උප්පජ්ජතීති වේදිතබ්බං. ඒවමිමේසු ඡසු ආරම්මණේසු උප්පජ්ජනතෝ පච්චේකං ඡබ්බිධානි හොන්ති.

**[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා කුසලපදත්ථ යටතේ)]**

**ඒතානි ඉට්ඨකන්තමනාපානි** ඒ ඉෂ්ට කාන්ත මනාප වූ **ආරම්මණානි** ආරම්මණයෝ **ලෝභස්ස** ලෝභයට **වත්ථු** වස්තුවක් **නනුච?** නොවේද? **කථං** කෙසේ **එත්ථ (තස්මිං ආරම්මණේ)** ඒ අරමුණෙහි **කුසලං** කුසල් සිත **උප්පජ්ජති?** උපදී ද යත්? **ඉති (පුච්ඡායං සති** මෙසේ ප්‍රශ්නයක් ඇති කල්හි **පරිහාරෝ** විසඳීම **මයා** මා විසින් **වුච්චතේ** කියනු ලැබේ) **නියමාදිකාරණතෝ** නියමාදීහේතු වශයෙනි **හි** විස්තර කෙරෙමි **කුසලමේව** කුසලයම **මයා** මා විසින් **කත්තබ්බං ඉති** කළයුතු යැයි **පුබ්බේ** පෙර **නියමිතවසේන** නියමකිරීම් වශයෙන් **කුසලේ** කුසලයෙහි **පරිණාමනවසේන ච** පිරිනැමීම් වශයෙන් ද **අභිණ්හං** නැවත නැවත **ආසේවිතකුසලසමුදාචාරවසේන ච** කුසල් කිරීමෙහිම සිත් පවත්වා පරිචය කළ හෙයින් ද **සප්පුරිසූපනිස්සයාදි උපනිස්සයවසේන ච** සත්පුරුෂෝපනිශ්‍රය ආදී උපනිශ්‍රය වශයෙන් ද **යෝනිසෝආභුජිතවසේන චාති** නුවණින් සැලකීම් වශයෙන් ද යන **ඉමේහි කාරණේහි** මේ කාරණයන් හේතුවෙන් **සබ්බත්ථ** සියළුතැන්හි **අකුසලප්පවත්තිං** අකුසල ප්‍රවෘත්තිය **නිවත්තෙත්වා** නවතා **චිත්තං** චිත්තය තෙමේ **කුසලං හුත්වා** කුසල්සිතක් වී **උප්පජ්ජති ඉති** උපදී යයි **වේදිතබ්බං** දතයුතුයි **ඒවං** මෙසේ **ඉමේසු ඡසු ආරම්මණේසු** මේ සය අරමුණෙහි (**චිත්තං** චිත්තය තෙමේ) **උප්පජ්ජනතෝ** ඉපදීම් වශයෙන් **පච්චේකං** වෙන වෙනම **ඡබ්බිධානි (චිත්තානි)** සය වැදෑරුම් සිත් කෙනෙක් **හොන්ති** වෙත්.෴ **[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

"ප්‍රතිරූපේෂු දේශේෂු වාසඃ පණ්ඩිතසඞ්ගතිඃ
ශ්‍රවණං කෘතපුණ්‍යත්වං චතුශ්චක්‍රකමීරිතම්"෴ යි

කියන ලද පතිරූපදේශවාසාදී චතුශ්චක්‍ර සම්පත්තීන් යුක්ත බවය යනාදීන් නුවණින් ඉෂ්ටාලම්බනයෙහි ආභෝග පැවති හෙයින් ද කුසල් මා විසින් කළයුත්තේ යැයි කුසල් කරන්නට සිත නියම කළ හෙයින් ද අකුසල් දුරුකොට කුසල් කිරීමෙහිම සිත පිහිටුවා පිරිනැමූ හෙයින් ද නැවත නැවත කුසල් කිරීමෙහිම සිත් පවත්වා පරිචය කළ හෙයින් ද යන මේ සතර කාරණයෙන් සොම්නසට වස්තු වූ ඉෂ්ටාලම්බනයෙහිදු අකුසල් නොඉපිද කුසල්ම උපදී. කියන ලදමැයි;

"යෝනිසෝ විසයාභෝගා නියාමපරිණාමතෝ
පුඤ්ඤෙඤ් පරිචිතත්තාච ඉට්ඨේපි කුසලං සියා"෴ යි

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 18 පිට; සාමණේර ප්‍රශ්නය 13 පිට; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ පුරාණ සන්නය 25 පිට]**

## අකුසල චිත්තයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම්:—

දෙළොස් අකුසල චිත්තය හා තත්සම්ප්‍රයුක්ත සත්විසි චෛතසිකය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්, ආයතන වශයෙන් දෙවදෑරුම්, ධාතු වශයෙන් දෙවැදෑරුම්, සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වෙති. ස්කන්ධ වශයෙන් සතර

වැදෑරුම් වන්නාහු කෙසේද යත්:- සත්විසි චෛතසික අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වේ. සඤ්ඤ චෛතසිකය සඤ්ඤස්කන්ධය නම් වේ. ඉතිරි පස්විසි චෛතසික සංස්කාරස්කන්ධය නම් වේ. දෙළොස් අකුසල චිත්තය විඤ්ඤාණස්කන්ධය නම් වේ. මෙසේ ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වෙති. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්:- දෙළොස් අකුසල චිත්තය මනායතනය නම් වේ. සත්විසි චෛතසිකය ධම්මායතනය නම් වේ.මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වෙති. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්:- දෙළොස් අකුසල චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වේ. සත්විසි චෛතසිකය ධම්මධාතුව නම් වේ. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වෙති. ආර්ය සත්‍යය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්:- දෙළොස් අකුසල චිත්තය ද සත්විසි චෛතසිකයන් අතුරෙන් ලෝභය වර්ජිත සවිසි චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වේ. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම් වේ. මෙසේ ආර්ය සත්‍යය වශයෙන් දෙවැදෑරුම් වෙති.

**[අභිධර්ම භාවනා 01/17 පිට; විස්තර සහිත අභිධම්ම මාතිකා ව්‍යාඛ්‍යානය 15 පිට]**

# අහේතුකචිත්ත සඞ්ග්‍රහය

## අහේතුක යනු:—

**අබ්‍යාකතං** ජාතිභේදතෝ දුවිධං විපාකං කිරියඤ්ච. තත්ථ විපාකං භූමිතෝ චතුබ්බිධං කාමාවචරං රූපාවචරං අරූපාවචරං ලෝකුත්තරඤ්ච. තත්ථ කාමාවචරං දුවිධං කුසලවිපාකං අකුසලවිපාකඤ්ච. කුසලවිපාකම්පි දුවිධං අහේතුකං සහේතුකඤ්ච.

තත්ථ අලෝභාදිවිපාකහේතුවිරහිතං අහේතුකං, තං චක්ඛුවිඤ්ඤාණං, සෝතඝානජිව්හාකායවිඤ්ඤාණං, සම්පටිච්ඡනකිච්චා මනෝධාතු, සන්තීරණාදිකිච්චා ද්වේ මනෝවිඤ්ඤාණධාතුයෝ චාති අට්ඨවිධං.

අට්ඨවිධම්පි චේතං අහේතුකවිපාකවිඤ්ඤාණං නියතානියතාරම්මණත්තා දුවිධං. උපෙක්ඛාසුඛසෝමනස්සභේදතෝ තිවිධං. විඤ්ඤාණපඤ්චකං හෙත්ථ නියතාරම්මණං යථාක්කමං රූපාදීසුයේව පවත්තිතෝ, සේසං අනියතාරම්මණං. තත්‍ර හි මනෝධාතු පඤ්චසුපි රූපාදීසු පවත්තති, මනෝවිඤ්ඤාණධාතුද්වයං ඡසුති. කායවිඤ්ඤාණං පනෙත්ථ සුඛයුත්තං, ද්විට්ඨානා මනෝවිඤ්ඤාණධාතු සෝමනස්සයුත්තා, සේසං උපෙක්ඛායුත්තන්ති. ඒවං තාව **කුසලවිපාකාහේතුකං** අට්ඨවිධං වේදිතබ්බං.

කේවලං හි අකුසලවිපාකං අහේතුකමේව, තං චක්ඛුවිඤ්ඤාණං, සෝතඝානජිව්හාකායවිඤ්ඤාණං, සම්පටිච්ඡනකිච්චා මනෝධාතු, සන්තීරණාදිකිච්චා පඤ්චට්ඨානා මනෝවිඤ්ඤාණධාතූති සත්තවිධං.

**කිරියං** පන භූමිභේදතෝ තිවිධං කාමාවචරං රූපාවචරං අරූපාවචරඤ්ච. තත්ථ කාමාවචරං දුවිධං අහේතුකං සහේතුකඤ්ච. තත්ථ අලෝභාදිකිරියහේතුවිරහිතං අහේතුකං, තං මනෝධාතු මනෝවිඤ්ඤාණධාතු භේදතෝ දුවිධං.
**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 454 යටතේ); විසුද්ධිමග්ග අටුවා 340-341 පිටු (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය ඛන්ධනිද්දේසය 198-204 පිටු (තායිවාන් මුද්‍රණය)]**

“විඤ්ඤාණ”න්ති පදං අපෙක්ඛිත්වා **“අබ්‍යාකතං විපාක”**න්ති ආදිකෝ නපුංසකනිද්දේසෝ, තතෝ ඒව අධිකතාබ්‍යාකතාපෙක්ඛාය **දුවිධ**න්ති වුත්තං. අඤ්ඤථා රූපනිබ්බානානම්පි අබ්‍යාකතභාවතෝ තං චතුබ්බිධන්ති වත්තබ්බං සියා. විපාකස්ස කාමාවචරාදිභාවෝ කුසලේ වුත්තනයේනේව වේදිතබ්බෝ. අහේතුකතා සහේතුකතා විය සම්පයුත්තහේතුවසේන, න නිබ්බත්තකහේතුවසේන. විපාකස්ස හි සහේතුකතා සහේතුකකම්මවසේන සිජ්ඣමානාපි සම්පයුත්තහේතුවසේනේව වුච්චති, අඤ්ඤථා අහේතුකානම්පි සහේතුකතා ආපජ්ජෙය්‍යාති. කස්මා පන සහේතුකස්ස අහේතුකෝ විපාකෝ හෝතීති? තත්ථ කාරණං වුත්තමේව. කිඤ්ච ආරම්මණාභිනිපාතමත්තේසු පඤ්චසු විඤ්ඤාණේසු යථා අලෝභාදිසම්පයෝගෝ න සම්භවති, ඒවං මන්දතරමන්දකිච්චේසු සම්පටිච්ඡනසන්තීරණේසූති හේතූනං උප්පත්තියා අසම්භවතෝපි නේසං අහේතුකතා දට්ඨබ්බා. මනෝවිඤ්ඤාණතෝ උප්පජ්ජනවිසිට්ඨමනනකිච්චානං අභාවතෝ මනෝමත්තා ධාතු **මනෝධාතු**.
**ඡසූ**ති එත්ථ පුබ්බේ වුත්තනයේනේව විභාගෝ වේදිතබ්බෝ. කායස්ස නිස්සයභූතානං නාතිඉට්ඨඵොට්ඨබ්බභූතානං පටිඝට්ටනානිඝංසස්ස බලවභාවතෝ **කායවිඤ්ඤාණං සුඛසම්පයුත්තං**. උපාදරූපානංයේව ඝට්ටනා දුබ්බලාති චක්ඛුවිඤ්ඤාණාදීනි උපෙක්ඛාසහගතානි. තේනාහ **“සේසං උපෙක්ඛායුත්ත”**න්ති. **සේසං** ඡබ්බිධම්පි.

ලෝභාදීනං ඒකන්තසාවජ්ජතාය අයෝනිසෝමනසිකාරහේතුකානං නත්ථි විපාකභාවෝ, අලෝභාදීනම්පි ඒකන්තඅනවජ්ජසභාවානං කාරණස්ස තබ්බිධුරතාය නත්ථේව අකුසලවිපාකභාවෝති ආහ **“අකුසලවිපාකං අහේතුකමේවා”**ති. යථා අතිඉට්ඨේ, ඉට්ඨමජ්ඣත්තේ ච ආරම්මණේ වේදනාභේදසබ්භාවතෝ කුසලවිපාකමනෝවිඤ්ඤාණධාතු දුවිධා හෝති සෝමනස්සසහගතා, උපෙක්ඛාසහගතාති, න ඒවං අතිඅනිට්ඨේ, අනිට්ඨමජ්ඣත්තේ ච ආරම්මණේ වේදනාභේදෝ අත්ථීති අකුසලවිපාකමනෝවිඤ්ඤාණධාතු ඒකමේවාති **“සත්තවිධ”**න්ති වුත්තං. සති හි තත්ථ වේදනාභේදේ අතිඅනිට්ඨේ දෝමනස්සේන භවිතබ්බං, න ච පටිඝේන විනා දෝමනස්සං උප්පජ්ජතීති.

**භූමිභේදතෝ තිවිධං** ලෝකුත්තරස්ස අභාවතෝ. ලෝකුත්තරඤ්හි කිරියචිත්තං නත්ථි ඒකන්තේන අනන්තරවිපාකදායිභාවතෝ. වුත්තඤ්හි “සමාධිමානන්තරිකඤ්ඤමාහූ”ති (ඛු. පා. 6.5; සු. නි. 228). හෝතු තාව සෙක්ඛානං උප්පජ්ජමානං අනුත්තරං කුසලං පුග්ගලන්තරභාවූපනයනතෝ සඵලං, අරහතෝ පන උප්පජ්ජමානං පුග්ගලන්තරභාවූපනයනතෝ නිප්ඵලං, තස්ස කිරියභාවෝ කස්මා න ඉච්ඡිතෝති? ඉච්ඡිතබ්බෝ සියා. යදි තස්ස පුනප්පුනං උප්පත්ති සියා,

සකිංයේව පන ලෝකුත්තරකුසලං පවත්තති. යදි හි පුනප්පුනං පවත්තෙය්‍ය, මග්ගචිත්තං අරහතෝපි පවත්තතීති ලෝකුත්තරකිරියචිත්තං සියා, න චේතං අත්ථි පයෝජනාභාවතෝ. තස්මා නත්ථි ලෝකුත්තරකිරියවිඤ්ඤාණං. **කිරියවිඤ්ඤාණ**න්ති ච කිරියාමත්තං විඤ්ඤාණං, කුසලාකුසලං විය කිඤ්චි විපාකං අනුප්පාදෙත්වා කිරියාමත්තමේව හුත්වා පවත්තනකවිඤ්ඤාණන්ති අත්ථෝ. කස්මා පනේතං විපාකං න උප්පාදේතීති? වුච්චතේ; එත්ථ හි යදේතං ආවජ්ජනද්වයං, තං අනුපච්ඡින්නභවමූලේපි සන්තානේ පවත්තං අනාසේවනතාය දුබ්බලභාවතෝ අබීජසාමත්ථියං විය පුප්ඵං අඵලමේව හෝති. යං පන උච්ඡින්නභවමූලායං සන්තතියං පවත්තං අට්ඨාරසවිධං විඤ්ඤාණං, තං සමුච්ඡින්නමූලාය ලතාය පුප්ඵං විය ඵලදායි න හෝතීති වේදිතබ්බං. අඤ්ඤස්ස අසම්භවතෝ කිරියහේතුනා නාම අලෝභාදිනාව භවිතබ්බන්ති ආහ **"අලෝභාදිකිරියහේතුවිරහිත"**න්ති.

**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 454 යටතේ)]**

**අබ්‍යාකතං** අව්‍යාකෘතය **විපාකං ච** විපාක ද **කිරියඤ්ච** ක්‍රියා ද වශයෙන් **ජාතිභේදතෝ** ජාති භේදයෙන් **දුවිධං** දෙවැදෑරුම් (**හෝති** වෙයි) **තත්ථ** ඒ විපාක ක්‍රියා අතරින් **විපාකං** විපාකය **කාමාවචරං** කාමාවචරය **රූපාවචරං** රූපාවචරය **අරූපාවචරං** අරූපාවචරය **ලෝකුත්තරඤ්ච** ලෝකෝත්තරය යයිද **භූමිතෝ** භූමි වශයෙන් **චතුබ්බිධං** සතර වැදෑරුම් (**හෝති** වෙයි) **තත්ථ** ඒ අතුරින් ද **කාමාවචරං (විපාකං)** කාමාවචර විපාකය **කුසලවිපාකං** කුශල විපාකයය **අකුසලවිපාකඤ්ච** අකුශල විපාකය යයි **දුවිධං** දෙවැදෑරුම් (**හෝති** වෙයි) **කුසලවිපාකම්පි** කුශල විපාකය ද **අහේතුකං** අහේතුක විපාකය **සහේතුකඤ්ච** සහේතුක විපාකයයි **දුවිධං** දෙවැදෑරුම් (**හෝති** වෙයි) **තත්ථ** එහි **අලෝභාදිවිපාකහේතුවිරහිතං** අලෝභාදි විපාක හේතුන් විරහිත බැවින් **අහේතුකං** අහේතුක නම් **තං** ඒ අහේතුක කුශලවිපාකය **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඥනය **සෝතවිඤ්ඤාණං** ශ්‍රෝත්‍රවිඥනය **ඝානවිඤ්ඤාණං** ඝ්‍රාණවිඥනය **ජිව්හාවිඤ්ඤාණං** ජිව්හාවිඥනය **කායවිඤ්ඤාණං** කායවිඥනය **සම්පටිච්ඡනකිච්චා** සම්ප්‍රතෙ‍්‍යෂණ කෘත්‍යයවත් **මනෝධාතු** මනෝධාතු චිත්තය **ද්වේ** සෝමනස්ස සහගත උපේක්‍ෂා සහගත වූ **සන්තීරණාදීකිච්චා** සන්තීරණාදී කෘත්‍යයවත් වූ **මනෝවිඤ්ඤාණධාතුයෝ ච** මනෝවිඤ්ඤාණ ධාතුහුයයි **ඉති** මෙසේ **අට්ඨවිධං** අට වැදෑරුම් චිත්තයෝ (**හොන්ති** වෙත්) "සන්තීරණකිච්චා" යනුයෙහි "සන්තීරණ-තදරම්මණකිච්ච වා" "සන්තීරණ-තදරම්මණ-පටිසන්ධි-භවඞ්ග-චුති කිච්ච වා" යන අභිප්‍රායයි.

("අබ්‍යාකතං" යනාදියෙහි "විඤ්ඤාණං" යන පදය අපේක්‍ෂා කොට "අබ්‍යාකතං විපාකං" යනාදී නපුංසක නිර්දේශය කරනලදි. එහෙයින්ම ප්‍රස්තුත වූ අව්‍යාකෘතාපේක්‍ෂාවෙන් "දුවිධං" යී කියනලදි. නොඑසේවුව රූප නිර්වාණ යනුදු අව්‍යකෘත බැවින් "චතුබ්බිධං" යී කියයුතු වේ. විපාකයාගේ කාමාවචරාදී භාවය කුශලයෙහි කී නයින් දතයුතු. අහේතුකත්‍වය සහේතුකත්‍වය මෙන් සම්ප්‍රයුක්ත හේතු වශයෙන් වෙයි. නිර්වර්තක හේතු වශයෙන් නොවෙයි. විපාකයාගේ සහේතුකත්‍වය සහේතුක කර්ම වශයෙන් සිද්ධ වන්නේ ද සම්ප්‍රයුක්ත හේතු වශයෙන්ම කියනු ලැබේ. නො එසේවුව අහේතුකයනට ද සහේතුකත්‍ව ප්‍රසඞ්ගය වේ. කුමක්හෙයින් සහේතුක කර්මයාගේ අහේතුක විපාක වෙයි යත්? එහි කාරණ කියනලදමැයි. අනෙකකුදු අරමුණෙහි අභිනිපාත මාත්‍රවූ පඤ්චවිඥනයන් කෙරෙහි යම්සේ අලෝභාදී සම්ප්‍රයෝග සම්භව නොවේ ද; එසේම මන්දතර මන්ද කෘත්‍යය ඇති සම්ප්‍රතෙ‍්‍යෂණ සන්තීරණයන් කෙරෙහි හේතූන්ගේ උත්පත්තිය අසම්භව බැවිනිදු ඔහුන්ගේ

අහේතුකත්වය දතයුතුය. මනෝ විඥනයට වඩා උපදනා විශිෂ්ඨ මනන කෘත්‍යයක් නැති බැවින් "මනෝමත්තා ධාතූති මනෝධාතු" යනු ටීකායි)

**අට්ඨවිධම්පි** අට වැදෑරුම්වූම **ඒතං** මේ **අහේතුකවිපාකවිඤ්ඤාණං** අහේතුක විපාක විඥනතෙමේ **නියතානියතාරම්මණත්තා** නියත අනියත අරමුණු ඇති බැවින් **දුවිධඤ්ච** දෙවැදෑරුම් ද **උපෙක්ඛාසුඛසෝමනස්සභේදතෝ** උපේක්‍ෂා-සුඛ-සෞමනස්‍ය වේදනා භෙදයෙන් **තිවිධං** තෙවැදෑරුම් ද (**හෝති** වෙයි) **හි** විස්තර කෙරෙම් **එත්ථ** මෙහි **විඤ්ඤාණපඤ්චකං** චක්‍ෂුර්විඥනාදී පඤ්චවිඥනාදයෝ **යථාක්කමං** පිළිවෙළින් **රූපාදීසුයේව** රූපාරම්මණාදියෙහිම **පවත්තිතෝ** පැවැතීම් වශයෙන් **නියතාරම්මණං යේව** නියත අරමුණු ඇත්තේමය **සේසං** සම්පටිච්ඡන සන්තීරණ දෙදෙන **අනියතාරම්මණං** අනියත ආරම්මණ ඇත්තේ (**හෝති** වෙයි) **හි (සච්චං) තත්‍ර** ඒ දෙසිත අතුරින් වනාහි **මනෝධාතු** සම්පටිච්ඡන නම් වූ මනෝධාතුව **රූපාදීසු පඤ්චසුපි** රූපාදී අරමුණු පසෙහි ද **පවත්තති (උප්පජ්ජති)** උපදී **මනෝවිඤ්ඤාණධාතුද්වයං** සන්තීරණ නම් වූ මනෝවිඥනධාතු දෙසිත **ඡසුති** ෂඩාළම්බණයෙහි (**උප්පජ්ජති** උපදී) **පන** විශේෂාර්ථයක් දක්වම් **එත්ථ** මෙහි **කායවිඤ්ඤාණං** කායවිඥන චිත්තය තෙම **සුඛයුත්තං** සුඛසහගත වේ **සෝමනස්සයුත්තා** සොම්නස් සහගත **මනෝවිඤ්ඤාණධාතු** සන්තීරණ නම් වූ මනෝවිඤ්ඤාණධාතු චිත්තය තෙමේ **ද්විට්ඨානා** පඤ්චද්වාරයෙහි සම්පටිච්ඡන වොත්ථපනයන්ගේ අතර ද, මනෝද්වාරයෙහි ජවන භවඞ්ගයන්ගේ අතර ද යන ස්ථාන ද්වය ඇත්තේ වේ **සේසං** සෙසු චක්‍ෂුර්විඥනාදීහු **උපෙක්ඛායුත්තං** උපේක්‍ෂා සහගත වේ **ඒවං** මෙසේ **තාව** පළමු කොට **කුසලවිපාකාහේතුකං** අහේතුක කුශලවිපාක චිත්තයෝ **අට්ඨවිධං ඉති** අට වැදෑරුම් යැයි **වේදිතබ්බං** දතයුතු.

(කායප්‍රශාදයට නිශ්‍රයභූතයන්ගේ ද ඉෂ්ට ස්පෂ්ටව්‍ය නොවන්නා ද වූ භූතයන්ගේ ද අන්‍යෝන්‍ය ඝට්ටනය බලවත් බැවින් කායවිඥනය සුඛසම්ප්‍රයුක්තම වේ. උපාදය රූපයන්ගේම ඝට්ටනයක් බැවින් චක්‍ෂුර්විඥනාදීහු උපේක්‍ෂා සහ ගියා වෙත්. එහෙයින් කීහ "සේසං උපෙක්ඛායුත්තන්ති" යී. සෙසු ෂඩාළම්බණ චිත්තය උපේක්‍ෂා සහගියාම යන අර්ථයි)

**කේවලං** හුදෙක් **අකුසලවිපාකං හි** අකුශල විපාක චිත්තය වනාහි **අහේතුකමේව** අහේතුකමය **තං** ඒ අහේතුක අකුශලවිපාකය **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඥනය **සෝතවිඤ්ඤාණං** ශ්‍රෝත්‍රවිඥනය **ඝානවිඤ්ඤාණං** ඝ්‍රාණවිඥනය **ජිව්හාවිඤ්ඤාණං** ජිව්හාවිඥනය **කායවිඤ්ඤාණං** කායවිඥනය **සම්පටිච්ඡනකිච්චා** සම්ප්‍රතෙ‍්‍යෂණ කෘත්‍යයවත් **මනෝධාතු** මනෝධාතු චිත්තයය **සන්තීරණාදිකිච්චා** සන්තීරණාදී කෘත්‍යයවත් **පඤ්චට්ඨානා** ස්ථාන පසකින් යුතු **මනෝවිඤ්ඤාණධාතු** මනෝවිඤ්ඤාණ ධාතු චිත්තයයි **ඉති** මෙසේ **සත්තවිධං** සත් වැදෑරුම් චිත්තයෝ (**හොන්ති** වෙත්)

(සන්තීරණ කාලයෙහි සම්පටිච්ඡන වොත්ථපනයන්ගේ අතර ද, තදරම්මණ කාලයෙහි ජවන භවඞ්ගයන්ගේ අතර ද, ප්‍රතිසන්ධි කාලයෙහි වනාහි චුති භවඞ්ගයන්ගේ අතර ද, භවඞ්ග කාලයෙහි ප්‍රතිසන්ධි ආවර්ජනයන්ගේ අතර ද, තදරම්මණ ආවර්ජනයන්ගේ අතර ද, ජවන ආවර්ජනයන්ගේ අතර ද, වොත්ථපන ආවර්ජනයන්ගේ අතර ද, චුති කාලයෙහි තදරම්මණ ප්‍රතිසන්ධීන්ගේ අතර ද, ජවන ප්‍රතිසන්ධීන්ගේ අතර ස්ථාන පස දතයුතුයි)

(අයෝනිසෝ මනසිකාර හේතු කොට ඇති ලෝභාදීන් ඒකාන්ත සාවද්‍ය බැවින් විපාක බව නැත. ඒකාන්තයෙන් අනවද්‍ය ස්වභාව ඇති අලෝභාදීන්ගේ ද කාරණය විධුර බැවින් අකුශල විපාක භාවයක් නැත්නුයි "අකුසලවිපාකං අහේතුකමේව" යී කීහු. ඉතා ඉටු අරමුණෙහිදු ඉටු මැදහත් අරමුණෙහිදු වේදනා භේද සද්භාවයෙන් සෝමනස්සසහගතාය උපෙක්ඛාසහගතාය යයි කුශල විපාක අහේතුක මනෝවිඤ්ඤාණ ධාතුව යම්සේ ද්විවිධ වේද එසේ ඉතා අනිටු අරමුණෙහිදු අනිටු මැදහත් අරමුණෙහිදු වේදනා භේද නැත්නුයි අකුශල විපාක අහේතුක මනෝවිඤ්ඤාණධාතුව ඒක ස්වරූපම වේනුයි "සත්තවිධං" යී කියනලදි. ඉදින් එහි වේදනා භේදය ඇති නම් අති අනිෂ්ටයෙහි දෝමනසය වියයුතුය. භේද පටිඝය විනා නොපදනේ යයි දතයුතු. යනු ටීකායි)

**කිරියං පන** ක්‍රියා චිත්තය වනාහි **භූමිභේදතෝ** භූමි භේදයෙන් **කාමාවචරං** කාමාවචරය **රූපාවචරං** රූපාවචරය **අරූපාවචරඤ්ච** අරූපාවචරය යයි **තිවිධං** තෙවැදෑරුම් (**හෝති** වෙයි) **තත්‍ථ** ඒ අතරින් **කාමාවචරං** කාමාවචර චිත්තය **අහේතුකං** අහේතුක චිත්තය **සහේතුකඤ්ච** සහේතුක චිත්තය යයි **දුවිධං** දෙවැදෑරුම් (**හෝති** වෙයි) **තත්‍ථ** ඒ සිත්හි **අලෝභාදිකිරියහේතුවිරහිතං** අලෝභාදී ක්‍රියාහේතු විරහිත බැවින් **අහේතුකං** අහේතුක නම් **තං** ඒ ක්‍රියා චිත්තය තෙමේ **භේදතෝ** භේද වශයෙන් **මනෝධාතු** මනෝධාතුවය **මනෝවිඤ්ඤාණධාතු** මනෝවිඤ්ඤාණධාතු යයි **දුවිධං** දෙවැදෑරුම් (**හොන්ති** වෙත්)

(ක්‍රියා චිත්තය වනාහි ලෝකෝත්තර ක්‍රියා නැති බැවින් භූමිභේදයෙන් ත්‍රිවිධ වේ. ඵල චිත්තය වනාහි ඒකාන්තයෙන් අනන්තරඵලදයී බැවින් ලෝකෝත්තර ක්‍රියා චිත්තය නොවේ. මෙම කීහ "සමාධිමානන්තරිකඤ්ඤමාහු" යී. ශෛක්‍ෂයනට උපදනා වූ අනුත්තර කුශලය පුද්ගලාන්තර භාවයට පමුණුවන බැවින් සඵල වෙයි. රහතුන්ට වනාහි උපදනේ පුද්ගලාන්තර භාවයට නොපමුණුවන බැවින් අඵල වේනුයි ඔහුගේ ක්‍රියා භාවය කුමක් හෙයින් නොකැමැතිවන ලදද යත්? ඉදින් ඔහුගේ නැවත නැවත උත්පත්තිය වේ නම් කැමති වියයුතු වෙයි. ලෝකෝත්තර කුශලය වනාහි එකවටම උපදනේයි. ඉදින් නැවත නැවත උපදී නම් මාර්ග චිත්තය රහත්හට පවත්නේනුයි ලෝකෝත්තර ක්‍රියා චිත්තය වන්නේයි. ප්‍රයෝජන නැති බැවින් නැවත නොපවති. එහෙයින් ලෝකෝත්තර ක්‍රියා විඤ්ඤාණයෝ නොවෙයි. "කිරියාමත්තං විඤ්ඤාණං කිරියාවිඤ්ඤාණං" කුශලාකුශලයන් මෙන් කිසි විපාකයක් නොඋපදවා ක්‍රියා මාත්‍රවම පවත්නා විඤ්ඤාණය යන අර්ථයි. කුමක් හෙයින් ඒ ක්‍රියා චිත්තය විපාක නොඋපදවාද යත්? මෙහි යම් ආවර්ජන ද්වයක් වේද හෙතමේ අනුපච්ඡින්නභවමූල සන්තානයෙහිදු පැවැත්තේ සමාන ජාතික චිත්තයෙන් ආසේවන ප්‍රත්‍යය නොලැබීමෙන් දුර්වල හෙයින් බීජ සාමර්ථ්‍යය නැත්තාවූ පුෂ්පයක් මෙන් අඵලම වන්නේයි. උච්ඡින්න භවමූල ඇත්තාවූ සන්තානයෙහි ප්‍රවෘත්ත අටළොස් වැදෑරුම් යම් විඤ්ඤාණයෙක් ඇත්ද හේ සිඳුනාලද මුල් ඇත්තාවූ ලියහි කුසුමය මෙන් ඵලදයී නොවේ දතයුතු. "අලෝභාදිකිරියාහේතුවිරහිතං" යනු අනික් හේතුවක් සම්භව නොවන බැවින් ක්‍රියා හේතු නම් අලෝභාදි හේතු වන්නේ යයි කීහු. යනු ටීකායි)

**[විසුද්ධි මාර්ග සන්නය 1092-1099 පිටු]**

අබ්‍යාකතා පන ධම්මා ජාතිතෝ චතුබ්බිධා විපාකකිරියරූපනිබ්බානවසේන. තත්ථ විපාකාබ්‍යාකතා ධම්මා ජාතිතෝ ච ද්විධා හොන්ති කුසලාකුසලවිපාකවසේන. තත්ථ කුසලවිපාකා භූමිතෝ චතුබ්බිධා කාමරූපාරූපාවචරලෝකුත්තරවිපාකවසේන. තත්ථ **කාමාවචරවිපාකා** අහේතුකා සහේතුකාති දුවිධා. තත්ථ

අලෝභාදිසහජාතහේතුවිරහිතා අහේතුකා. තේ සම්පයෝගවත්ථාරම්මණාදිභේදතෝ අට්ඨවිධා. සෙය්‍යථිදං උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණං, තථා සෝතඝානජිව්හාවිඤ්ඤාණං, සුඛසහගතං කායවිඤ්ඤාණං, උපෙක්ඛාසහගතා මනෝධාතු, සෝමනස්සසහගතා මනෝවිඤ්ඤාණධාතු, තථා උපෙක්ඛාසහගතා චාති.

**[අභිධම්මමාතිකා පාළි (ජට්ඨසඞ්ගායනා අබ්‍යාකතපදත්ථෝ යටතේ)]**

**ජාතිතෝ** ජාති වශයෙන් **අබ්‍යාකතා ධම්මා පන** අව්‍යාකෘත ධර්මයෝ වනාහි **විපාකකිරියරූපනිබ්බානවසේන** විපාක ක්‍රියා රූප නිර්වාණ වශයෙන් **චතුබ්බිධා** සිව් වැදෑරුම් (**හොන්ති** වෙත්) **තත්‍ථ** ඒ සතර අතුරින් **විපාකාබ්‍යාකතා ධම්මා** විපාක අව්‍යාකෘත ධර්මයෝ **කුසලාකුසලවිපාකවසේන** කුසලවිපාක අකුසලවිපාක වශයෙන් **ජාතිතෝ** ජාති ලෙස **ද්විධා** දෙවැදෑරුම් **හොන්ති** වෙත් **තත්‍ථ** ඒ අතරින් **කුසලවිපාකා** කුසල විපාකයෝ තුමූ **කාමරූපාරූපාවචරලෝකුත්තරවසේන** කාමාවචර රූපාවචර අරූපාවචර ලෝකෝත්තර වශයෙන් **භූමිතෝ** භූමි ලෙස **චතුබ්බිධා** සිව් වැදෑරුම් (**හොන්ති** වෙත්) **තත්‍ථ** ඒ අතරින්ද **කාමාවචරවිපාකා** කාමාවචර විපාකයෝ තුමූ **අහේතුකා** අහේතුක **සහේතුකාති** සහේතුක යැයි **දුවිධා** දෙවැදෑරුම් (**හොන්ති** වෙත්) **තත්‍ථ** කාමාවචර විපාකයෝ **අලෝභාදිසහජාතහේතුවිරහිතා** අලෝභාදී සහජාත හේතු නැති බැවින් **අහේතුකා** අහේතුකයෝ නම් (**හොන්ති** වෙත්) **තේ** ඒ කාමාවචර අහේතුක කුසල විපාකයෝ තුමූ **සම්පයෝගවත්‍ථාරම්මණාදිභේදතෝ** සම්ප්‍රයෝග වස්තු ආරම්මණාදී භේදයෙන් **අට්ඨවිධා** අට වැදෑරුම් (**හොන්ති** වෙත්) **සෙය්‍යථීදං?** හේ කෙසේද යත්? **උපෙක්ඛාසහගතං** උපේක්ෂාසහගත **චක්ඛුවිඤ්ඤාණං** චක්ෂුර්විඤ්ඤාණය **තථා** එසේම උපේක්ෂාසහගත වූ **සෝතඝානජිව්හාවිඤ්ඤාණං** ශ්‍රෝත්‍රවිඤ්ඤාණය ඝ්‍රාණවිඤ්ඤාණය ජිව්හාවිඤ්ඤාණය **සුඛසහගතං** සුඛසහගත **කායවිඤ්ඤාණං** කායවිඤ්ඤාණය **උපෙක්ඛාසහගතා** උපේක්ෂාසහගත **මනෝධාතු** මනෝධාතු නම් වූ සම්පටිච්ඡන චිත්තය **සෝමනස්සසහගතා** සොමිනස් සහගත **මනෝවිඤ්ඤාණධාතු** මනෝවිඤ්ඤාණධාතු නම් වූ සන්තීරණ චිත්තය **තථා** එසේම **උපෙක්ඛාසහගතා** උපේක්ෂා සහගත සන්තීරණ චිත්තයයි **ඉති** මෙසේ **ච** (**අට්ඨවිධා** අට වැදෑරුම් **හොන්ති** වෙත්) ... **[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

අකුසලවිපාකා පන කාමාවචරාව, ලෝභාදිසම්පයුත්තහේතු අභාවතෝ අහේතුකා ඒව ච හොන්ති. තේ සම්පයෝගතෝ උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණං, තථා සෝතඝානජිව්හාවිඤ්ඤාණානි, තථා දුක්ඛසහගතං කායවිඤ්ඤාණං, උපෙක්ඛාසහගතා මනෝධාතු, තථා මනෝවිඤ්ඤාණධාතූති සත්තවිධා. විනිච්ඡයෝ පනේස සබ්බත්ථ තාදිසාහේතුකකුසලවිපාකේසු වුත්තනයෝ ඒව. කේවලං පනානිට්ඨාරම්මණතා, කායවිඤ්ඤාණස්ස දුක්ඛසහගතතා, උපෙක්ඛාසහගත මනෝවිඤ්ඤාණධාතුයා උද්ධච්චවජ්ජිතාකුසලපච්චයා චතූසු අපායේසු පටිසන්ධිභවඞ්ගචුතිකිච්චානි, සුගතියඤ්ච සන්තීරණතදාරම්මණකිච්චානි ච සාධනවසේන පවත්ති ච විසේසෝ, සේසං තාදිසමේව.

**[අභිධම්මමාතිකා පාළි (ජට්ඨසඞ්ගායනා අබ්‍යාකතපදත්ථෝ යටතේ)]**

**අකුසලවිපාකා පන** අකුසල විපාකයෝ වනාහි **කාමාවචරාව** කාමාවචරයෝම (**හොන්ති** වෙත්) **ලෝභාදිසම්පයුත්තහේතු** ලෝභාදී සම්ප්‍රයුක්ත හේතු **අභාවතෝ** නැති බැවින් **අහේතුකා ඒව ච** අහේතුකයෝම ද **හොන්ති** වෙත් **තේ** ඒ කාමාවචර අකුසල විපාකයෝ තුමූ **සම්පයෝගතෝ** සම්ප්‍රයෝග වස්තු ආරම්මණාදී භේදයෙන් **උපෙක්ඛාසහගතං** උපේක්ෂාසහගත **චක්ඛුවිඤ්ඤාණං** චක්ෂුර්විඤ්ඤාණය **තථා**

එසේම උපේක්ෂාසහගත වූ **සෝතඝානජිව්හාවිඤ්ඤාණං** ශ්‍රෝත්‍රවිඤ්ඤාණය ඝ්‍රාණවිඤ්ඤාණය ජිව්හාවිඤ්ඤාණය **දුක්ඛසහගතං** දුක්ඛසහගත **කායවිඤ්ඤාණං** කායවිඤ්ඤාණය **උපෙක්ඛාසහගතා** උපේක්ෂාසහගත **මනෝධාතු** මනෝධාතු නම් වූ සම්පටිච්ඡන චිත්තය **තථා** උපේක්ෂා සහගත **මනෝවිඤ්ඤාණධාතු** මනෝවිඤ්ඤාණධාතු නම් වූ සන්තීරණ චිත්තයයි **ඉති** මෙසේ **සත්තවිධා** සත් වැදෑරුම් **හොන්ති** වෙත් **සබ්බථා** සියළුතන්හි **ඒසෝ විනිච්ඡයෝ පන** ඒ විනිශ්චය වනාහි **තාදිසාහේතුකකුසලවිපාකේසු** එබඳුම වූ අහේතුක කුසල විපාක චිත්තයන්හි **වුත්තනයෝ ඒව** කියනලද ක්‍රමයම (**හෝති** වෙයි) **පන** විශේෂය වනාහි **කේවලං** හුදෙක් **අනිට්ඨාරම්මණතා** අනිෂ්ටාරම්මණ බව ද **කායවිඤ්ඤාණස්ස** කායවිඤ්ඤාණයාගේ **දුක්ඛසහගතතා** දුක්ඛසහගත බව ද **උපෙක්ඛාසහගත මනෝවිඤ්ඤාණධාතුයා** උපේක්ෂාසහගත මනෝවිඤ්ඤාණ ධාතුවගේ **උද්ධච්චවජ්ජිතාකුසලපච්චයා** උද්ධච්චසිත වර්ජිත වූ අන්‍ය අකුසල චිත්තයන්ගේ හේතුවෙන් **චතූසු අපායේසු** සතර අපායෙහි **පටිසන්ධිභවඞ්ගචුතිකිච්චානි** ප්‍රතිසන්ධි භවඞ්ග චුති කෘත්‍යය ද **සුගතියඤ්ච** සුගතියෙහි **සන්තීරණතදරම්මණකිච්චානි ච** සන්තීරණ තදරම්මණ කෘත්‍යය ද **සාධනවසේන** සිද්ධ කිරීම් වශයෙන් **පවත්ති ච** පැවැත්ම ද **විසේසෝ** විශේෂයයි **සේසං** සෙස්ස **තාදිසමේව** පෙර පරිදිමය නොහොත් අහේතුක කුසල විපාක හා සමානයහ. **[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

තදුභයවිපරීතලක්ඛනමබ්‍යාකතං, අවිපාකාරහං වා.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ)]**

තදුභයවිපරීතං තේහි උභයේහි කුසලාකුසලේහි විපරීතං අවිපාකලක්ඛණං ඒතස්සාති **තදුභයවිපරීතලක්ඛණං** අබ්‍යාකතං. වා අයං අඤ්ඤෝ නයෝ. **අවිපාකාරහං** විපාකස්ස අනනුච්ඡවිකං.

**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ)]**

**තදුභය**...**පෙ**.... **අබ්‍යාකත**න්ති යං ධම්මජාතං කුසලං විය න අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං, නාපි අකුසලං විය සාවජ්ජානිට්ඨවිපාකලක්ඛණං, අථ ඛෝ අවිපාකත්තා තදුභයවිපරීතලක්ඛණං, තං අබ්‍යාකතන්ති අත්ථෝ. නනු ච "තදුභයවිපරීතලක්ඛණ"න්ති වුත්තේ සුඛදුක්ඛවේදනානං විපරීතා උපෙක්ඛාවේදනා විය ඉට්ඨානිට්ඨවිපාකානං විපරීතෝ අඤ්ඤෝ කෝචි විපාකෝ යස්ස අත්ථි, තං අබ්‍යාකතන්ති ආපජ්ජතීති? නාපජ්ජති තථා අසම්භවතෝ. යථා හි ආලෝකන්ධකාරානං විපරීතෝ අඤ්ඤෝ කෝචි නත්ථි, ඒවමිට්ඨානිට්ඨවිපාකානං විපරීතෝ න කෝචි විපාකෝ අත්ථීති. අථ වා තං-සද්දෝ ඉධ ඉට්ඨානිට්ඨවිපාකනිරපෙක්ඛං කුසලාකුසලමත්තමේව පච්චාමසතීති කුසලාකුසලානං සවිපාකත්තා තදුභයවිපරීතලක්ඛණං, තං අවිපාකලක්ඛණන්ති අත්ථෝති අලමෙත්ථ අනුයෝගේන. කුසලාකුසලභාවේන න බ්‍යාකතන්ති **අබ්‍යාකතං**. කුසලාකුසලඤ්හි වත්වා අබ්‍යාකතස්ස වුත්තත්තා කුසලාකුසලභාවේනේව අවුත්තත්තාති විඤ්ඤායති, න පකාරන්තරේන. තථා අවචනඤ්ච තස්ස තදුභයවිපරීතලක්ඛණත්තායේව, න පන අවත්තබ්බත්තාමත්තේනාති දට්ඨබ්බං. අථ වා වි-සද්දෝ විරොධිවචනෝ. ආ-සද්දෝ අභිමුඛභාවප්පකාසනෝ, තස්මා අත්තනෝ පච්චයේහි අඤ්ඤමඤ්ඤං විරෝධාභිමුඛතං කතං ලක්ඛණවිරෝධතෝ පහායකප්පහාතබ්බභාවතෝ වාති බ්‍යාකතං, කුසලාකුසලං. තතෝ අඤ්ඤං **අබ්‍යාකතං**. තඤ්හි ලක්ඛණතෝ අඤ්ඤමඤ්ඤං කුසලාකුසලං විය න තස්ස විරුද්ධං. න හි අවිපාකතං

අනිට්ඨවිපාකතා විය, ඉට්ඨවිපාකතාය ඉට්ඨවිපාකතා විය ච අනිට්ඨවිපාකතාය ඉට්ඨානිට්ඨවිපාකතාහි විරුජ්ඣති, න චාපි අබ්‍යාකතං කුසලාකුසලේසු කිඤ්චි පජහති, න ච කේනචි පහාතබ්බන්ති. "තදුභයවිපරීතලක්ඛණමබ්‍යාකත"න්ති විකප්පියමානේ අහෝසි කම්මං, නාහෝසි කම්මවිපාකෝ, නත්ථි කම්මවිපාකෝ, න භවිස්සති කම්මවිපාකෝති ඉමිනා තිකේන සඞ්ගහිතස්ස ගතිඋපධිකාලප්පයෝගවිපත්තීහි අවිපාකස්ස දිට්ඨධම්මවේදනීයාදිකම්මස්ස භාවනායපහාතබ්බස්ස අකුසලස්ස ච අභිඤ්ඤාකුසලස්ස ච විපාකුප්පාදනාභාවතෝ "සියා නු ඛෝ අබ්‍යාකතභාවෝ වා"ති කදාචි කෝචි චින්තෙය්‍යාති තන්නිවාරණත්ථමාහ **"අවිපාකාරහං වා"**ති, විපාකං දාතුං නාරහති තත්ථ සාමත්ථියාභාවතෝති **අවිපාකාරහං**. ඉදං වුත්තං හෝති; දිට්ඨධම්මවේදනීයාදයෝ තාව පච්චයවේකල්ලාදීහි කාරණේහි අවිපාකා, සචේ පනේතේ තබ්බිදූරා අස්සු, තදා විපාකදානේ සමත්ථතාය විපාකාරහායේව, තං පන න තථා, අථ ඛෝ යේන කේනචි ආකාරේන විපාකදානේ අසමත්ථතායේව විපාකාරහං න හෝති, තං අබ්‍යාකතං නාමාති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 56 පිට]**

"තදුභයවිපරීතලක්ඛණමබ්‍යාකතං" යන මෙහි යම් ධර්ම සමුදයක් තෙමේ කුසලය මෙන් අනවද්‍යය ඉෂ්ටවිපාක ස්වභාවයක් නැත්තේ වේද අකුසලය මෙන් සාවද්‍යය අනිෂ්ටවිපාක ලක්‍ෂණයකුත් නැත්තේ වේද වැලිත් අවිපාක හෙයින් ඒ ලක්‍ෂණ ද්වයට විපර්‍ය්‍යාස වූ ස්වභාවයක් ඇත්තේ ද ඒ ධර්මය තෙමේ අව්‍යාකෘත නම් වේ යන අර්ථයි. තවද "තදුභයවිපරීතලක්ඛණං" යි කී කල්හි සුඛ දුක්ඛ වේදනාවන්ට විපරීත වූ උපේක්‍ෂා වේදනාව මෙන් ඉෂ්ටානිෂ්ට විපාකයන්ට විපරීත වූ අන්කිසි විපාකයක් තෙමේ යම් ධර්මයකට ඇත්තේ ද ඒ අව්‍යාකෘත බවට පැමිණෙන්නේ නොවේද යත්? නොපැමිණෙයි. කුමක්හෙයින යත්? එසේ සම්භව නොවන හෙයිනි. යම්සේ ආලෝකාන්ධකාරයන්ට විපරීත වූ අන් කිසිවක් නැත්තේ එපරිද්දෙන්ම ඉෂ්ට අනිෂ්ට විපාකයන්ට විපරීත වූ කිසි විපාකයෙක් නැත්තේය. නොහොත් "තදුභයවිපරීතලක්ඛණමබ්‍යාකතං" යන මෙහි "තං" ශබ්ද තෙමේ ඉෂ්ට අනිෂ්ට විපාකය අපේක්‍ෂා නොකොට කුසලාකුසලයන් සවිපාක බැවින් කුසලාකුසල මාත්‍රයක්ම ආමර්ශණය කෙරෙයි. එහෙයින් "තදුභයවිපරීතලක්ඛණං" යනු ඒ කුසලාකුසල ද්වයට විපරීත වූ ලක්‍ෂණ ඇත්තේය හෙවත් අවිපාක ස්වභාව ඇත්තේය යන අර්ථයි. "කුසලාකුසලභාවේන න අබ්‍යකතන්ති අබ්‍යාකතං" යනු වචනාර්ථ බැවින් යම් ධර්මයක් කුසලාකුසල භාවයෙන් නොවදාරණ ලද්දේ ද එහෙයින් ඒ ධර්මය අව්‍යාකෘත නම් වේ. ඒ එසේමැයි; කුසලාකුසල ධර්මය වදාරා තදන්තරව අව්‍යාකෘත ධර්මය වදළ බැවින් කුසලාකුසල භාවයෙන් නොවදළ බව මුත් අනික් ප්‍රකාරයෙකින් වදළ බවක් නොහැගේ. එසේ ප්‍රකාරාන්තරයකින් නොවැදෑරීම ද ඔහුන්ගේ ඒ කුසලාකුසල ද්වයට විපරීත ලක්‍ෂණ ඇති බැවින්ම මුත් නොකියයුතු බැව් මාත්‍රයකිනැයි නොදතයුතුයි. නොහොත් එහි වි-උපසර්ග තෙමේ විරෝධාර්ථ වාචක වෙයි. ආ-ශබ්ද තෙමේ අභිමුඛභාව ප්‍රකාශක වෙයි. එහෙයින් තමාගේ ප්‍රත්‍යයෙන් ඔවුනොවුන්ගේ විරෝධාභිමුඛත්වය කරන ලද්දේ ලක්‍ෂණ විරෝධයෙන් හා ප්‍රහායක ප්‍රහාතව්‍යය භාවය ඇති හෙයින් ද කුසලාකුසල ධර්මය තෙමේ "ඛ්‍යාකත" නම් වෙයි. එයින් අන්‍ය වූයේ "අබ්‍යාකත" නම් වෙයි. ඒ එසේමැයි; ඒ අව්‍යාකෘතය තෙමේ කුසලාකුසලය මෙන් ඔවුනොවුන්ට විරුද්ධ නොවේ. අවිපාකත්වය වනාහි ඉෂ්ටවිපාක බැව්හි අනිෂ්ට විපාකත්වය මෙන් ද අනිෂ්ට විපාක බැව්හි ඉෂ්ට විපාකත්වය මෙන් ද ඉෂ්ටානිෂ්ට විපාකත්වය හා විරුද්ධයක් නොවේ. අව්‍යාකෘතය තෙමේ කුසලාකුසලයන් අතුරෙහි කිසිවක් ප්‍රහාණය ද නොකෙරෙයි. කිසිවක්හු විසින් ප්‍රහාතව්‍යය ද නොවෙයි. එහෙයින්

ඒ කුසලාකුසල ද්වයට විපරීත වූ ලක්‍ෂණ ඇත්තේ අව්‍යාකෘත නම් වෙයි. හැගෙනු ලබන කල්හි "අහෝසිකම්මං නාහෝසිකම්මවිපාකෝ" යනාදී මේ ත්‍රිකයෙන් සඞ්ගෘහිත වූ ගති-උපධි-කාල-ප්‍රයෝග-විපත්තීන් කරණකොටගෙන අවිපාක වූ දෘෂ්ටධර්ම වේදනීයාදී කර්මයාගේ ද භාවනාපහාතව්‍ය අකුසලයාගේ ද අභිඤ්ඤාකුසලයාගේ විපාකෝත්පාදයක් නැති හෙයින් කිසි කලෙක්හි අව්‍යාකෘත භාවය වන්නේදෝහෝයි කිසිවෙක් සිතන්නේ නම් ඒ වළකනු පිණිස "අවිපාකාරහං වා" යනු කීයේයි. "විපාකං නාරහති තත්ථ සාමත්ථියාභාවතෝති අවිපාකාරහං" යනු නිර්වචනයි. මේ කියන ලද්දේ වෙයි. දෘෂ්ටධර්මවේදනීයාදීහු වනාහි ප්‍රත්‍යය වෛකල්‍යාදී කාරණයෙන් අවිපාක වෙති. ඉදින් වනාහි ඔවුහු ඒ ප්‍රත්‍යය වෛකල්‍යාදී විරුද්ධ ධර්මයක් නූවාහු නම් එකල්හි විපාක දීමේ පොහොසත් බැවින් විපාකාරහම වෙති. ඒ අව්‍යකෘතය වනාහි එසේ නොවෙයි. වැලි කෙසේ වේද යත්? යම්කිසි ආකාරයකින් විපාකදීමේ අසමර්ථ බැවින්ම විපාකාරහ නොවේ ද එය අව්‍යාකෘත නම් වෙයි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 33-34 පිටු]**

යස්මා පන හේතුයෝ නාම මහන්තධම්මා හොන්ති. තස්මා තේ දුබ්බලකම්මනිබ්බත්තේසු දුබ්බලවත්ථුකිච්චට්ඨානේසුච ඉමේසු චිත්තේසු නුප්පජ්ජන්ති. තත්ථ සබ්බං පාපකම්මං වික්ඛේපයුත්තං සයංපි චඤ්චලති දුබ්බලං හෝති. තස්මා තං කප්පට්ඨිතිකංපි සමානං කාලන්තරේ හේතුයුත්තං විපාකං ජනේතුං න සක්කෝති. තිහේතුකකම්මංපි සමානං දුබ්බලේසු චක්ඛාදිවත්ථූසුච දස්සනාදීසු කිච්චට්ඨානේසුච හේතුයුත්තං විපාකං ජනේතුං න සක්කෝති. ආවජ්ජනහසනකිච්චානිච දුබ්බලකිච්චානිඡේව හොන්ති. තස්මා ඉමානි සබ්බානි සම්පයුත්තහේතුරහිතානි ජාතානීති දට්ඨබ්බං.

**[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 38 යටතේ)]**

"දුබ්බල කම්මනිබ්බත්තේසූ"ති පටිසන්ධි භවඞ්ග චුතිකිච්චානි සන්ධාය වුත්තං. "දුබ්බලවත්ථු කිච්චට්ඨානේසූ"ති චක්ඛාදිවත්ථුකේසු ආවජ්ජනාදි දුබ්බලකිච්ච දුබ්බලට්ඨානිකේසු. "තත්ථා"ති ආදිනා තදත්ථං විවරති. තත්ථ "වික්ඛේපයුත්ත"න්ති වික්ඛේපකිච්චේන උද්ධච්චේනයුත්තං හුත්වා. "කප්පට්ඨිතිකං" නාම සඞ්ඝභේදකම්මං. ඡසුවත්ථුරූපේසු හදයවත්ථුමේව සුවණ්ණරජතං විය සාරවත්ථු හෝති. ඉතරානි එළිකානි විය පසාදමත්තතත්තා අසාරානි හොන්තීති වුත්තං "චක්ඛාදීසු දුබ්බලවත්ථූසූ"ති. දස්සනාදීනි ච කිච්චානි ජවන කිච්චස්ස පුරේචරත්තා ඛුද්දකිච්චානි හොන්ති. තේනාහ "දස්සනාදීසූ"තිආදිං.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 38 යටතේ)]**

**යස්මා පන** යම්හෙයකින් වනාහි **හේතුයෝ නාම** හේතූහු නම් **මහන්තධම්මා** මහත් ධර්මයෝ **හොන්ති** වෙත් **තස්මා** එබැවින් **දුබ්බලකම්මනිබ්බත්තේසු ච** දුර්වල කර්මයකින් උපන්නාවූ ද **දුබ්බලවත්ථු කිච්චට්ඨානේසු** දුර්වල වස්තු කෘත්‍යයස්ථාන වූ **ඉමේසු චිත්තේසු** මේ අහේතුක චිත්තයන්හි **තේ (හේතුයෝ)** ඒ හේතූහු **නුප්පජ්ජන්ති** නූපදිත් **තත්‍ථ** ඒ අර්ථය විස්තර කෙරෙම් **සබ්බං පාපකම්මං** සියළු අකුසල කර්ම **වික්ඛේපයුත්තං** වික්‍ෂේප කෘත්‍යය ඇති උද්ධච්චයෙන් යුක්තය **සයම්පි** තෙමේ ද **චංචලති** සැලෙයි **දුබ්බලං හෝති** දුර්වල ද වෙයි **තස්මා** එබැවින් **කප්පට්ඨිතිකම්පි සමානං** කල්පයක් පවතින්නා වූ සඞ්ඝභේද කර්මය හා සමාන වූ **තං (පාපකම්මං)** ඒ අකුසල කර්මය **කාලන්තරේ** විපාකයට එන කාලය අතරෙහි **හේතුයුත්තං විපාකං** හේතු සහිත විපාක සිත් **ජනේතුං** උපදවන්නට **න සක්කෝති** නොහැකිවෙයි **තිහේතුකකම්මම්පි සමානං** ත්‍රිහේතුක කර්මයක් හා සමාන වූ (**කුසලකම්මං** කුසල

කර්මය) **දුබ්බලේසු චක්ඛාදිවත්‍ථූසු ච** දුර්වල වූ චක්‍ෂුරාදී වස්තූන්හි ද **දස්සනාදීසු කිච්චට්ඨානේසු ච** දර්ශනාදී කෘත්‍යයස්ථානයන්හි ද **හේතුයුත්තං විපාකං** හේතු සහිත විපාක චිත්තයක් **ජනේතුං** උපදවන්නට **න සක්කෝති** නොහැකිවෙයි **ආවජ්ජනහසනකිච්චානි ච** ආවර්ජන හසන කෘත්‍යයෝ ද **දුබ්බලකිච්චානි ඒව** දුර්වල කෘත්‍යය ඇත්තෝම **හොන්ති** වෙත් **තස්මා** එබැවින් **ඉමානි සබ්බානි (අහේතුකචිත්තානි)** මේ සියළු අහේතුක චිත්තයෝ **සම්පයුත්තහේතුරහිතානි** සම්ප්‍රයුක්ත හේතු නොමැතිව **ජාතානීති** උපදින ලද්දෝ යයි **දට්ඨබ්බං** දතයුතුයි.

[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]

ඉදනි අහේතුකචිත්තානි දස්සේති. තත්ථ හේතූති මූලට්ඨේන කාරණං තස්මා සෝ සම්පයුත්තෝව හෝති න අසම්පයුත්තෝ. යථා පාදපස්ස මූලානි පාදපං දළ්හං කරොන්ති. ඒවං හේතූපි චිත්තං චිරතරං කරොන්ති. තේ ච ඡ හොන්ති. ලෝභෝ දෝසෝ මෝහෝ අලෝභෝ අදෝසෝ අමෝහෝති. එත්ථ පුරිමා තයෝ අකුසලහේතු පච්ඡිමාච තයෝ කුසලහේතු. තේසු ඒකෝපි චක්ඛුවිඤ්ඤාණාදිහි සම්පයෝගං න ගච්ඡති. තස්මා ඉමානි චිත්තානි අහේතුකානීති වුච්චන්ති. **[නවනීත ටීකා 05 පිට]**

**ඉදනි** දැන් **අහේතුකචිත්තානි** අහේතුක චිත්තයන් **දස්සේති** දක්වයි **තත්‍ථ** එහි **හේතූති** හේතු යනු **මූලට්ඨේන** මූල අර්ථයෙන් **කාරණං** හේතුයි **තස්මා** එබැවින් **සෝ (හේතු)** ඒ හේතු තෙමේ (**චිත්තේන සද්ධිං** සිත හා සමඟ) **සම්පයුත්තෝව හෝති** සම්ප්‍රයුක්තම වෙයි **අසම්පයුත්තෝ** අසම්ප්‍රයුක්ත **න (හෝති)** නොවෙයි **යථා** යම්සේ **පාදපස්ස** වෘක්‍ෂයගේ **මූලානි** මුල් **පාදපං** වෘක්‍ෂය **දළ්හං කරොන්ති** දැඩි කරත් **ඒවං** මෙසේ **හේතූපි** හේතූහු ද **චිත්තං** චිත්තය **චිරතරං කරොන්ති** ස්ථිර කරත් **තේ ච** ඒ හේතූහු ද **ලෝභෝ** ලෝභය **දෝසෝ** දෝසය **මෝහෝ** මෝහය **අලෝභෝ** අලෝභය **අදෝසෝ** අදෝසය **අමෝහෝති** අමෝහයයි **ඡ හොන්ති** සය දෙනෙක් වෙත් **එත්‍ථ** ඒ සය දෙනා අතුරින් **පුරිමා තයෝ** පළමු තිදෙන **අකුසලහේතු ච** අකුසල හේතු ද **පච්ඡිමා තයෝ** පසු තිදෙන **කුසලහේතු** කුසල හේතු ද (**හොන්ති** වෙත්) **තේසු** ඒ හේතු අතුරින් **ඒකෝපි** එක් හේතුවකුදු **චක්ඛුවිඤ්ඤාණාදීහි** චක්‍ෂුර්විඤ්ඤාණාදිය සමඟ **සම්පයෝගං** සම්ප්‍රයෝගයට **න ගච්ඡති** නොයයි **තස්මා** එබැවින් **ඉමානි චිත්තානි** මේ චිත්තයෝ **අහේතුකානීති** අහේතුක චිත්තයෝ යයි **වුච්චන්ති** කියනු ලැබෙත්.

[නවනීත ටීකා පරිවර්තනයි]

ලෝභ දෝස මෝහ අලෝභ අදෝස අමෝහ යන චෛතසික ධර්ම සයට හේතු යන නම ව්‍යවහාර කරනු ලැබේ. හේතු යන නාමය ව්‍යවහාර කරණ චෛතසික සයෙන් යටත් පිරිසෙයින් එකක් හෝ යෙදෙන සිතට සහේතුක සිතකැයි කියනු ලැබේ. එක හේතු ධර්මයෙකුදු නොලැබෙන සිත්වලට අහේතුක සිත්යැයි කියනු ලැබේ. අකුසල විපාකය කුසල විපාකය ක්‍රියාය කියා අහේතුක සිත් තුන් කොටසක් ඇත්තේය. ඒ සිත්වලට අහේතුක නාමය ව්‍යවහාර කරන්නේ ඒවා යම්කිසි හේතුවක් නැතිව ඉබේම ඇතිවන ඒවා නිසා නොව හේතු යන නම ව්‍යවහාර කරණ ලෝභාදී ධර්ම සයෙන් එකකුත් ඒ සිත්වල නැතිබව නිසා විශේෂයෙන් මතක තබා ගතයුතුය.

**[අභිධර්ම මාර්ගය 41 පිට; අභිධර්ම චන්ද්‍රිකාව 15 පිට; තෙසැත්තෑ ඤාණ කථා 387 පිට]**

## විපාක යනු:—

න බ්‍යාකතාති අබ්‍යාකතා, කුසලාකුසලභාවේන අකථිතාති අත්ථෝ. අවිපාකලක්ඛණා අබ්‍යාකතා.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා තිකමාතිකපදවණ්ණනා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 63 පිට (හේ.වි.මු)]**

**යේ ධම්මා** යම් ධර්ම කෙනෙක් තුමූ **බ්‍යාකතා න හොන්ති** කුසලාකුසල වශයෙන් ප්‍රකාශ කොට නොවදරණ ලද්දහු ද **ඉති (තස්මා)** එසේ හෙයින් **තේ ධම්මා** ඒ ධර්මයෝ තුමූ අබ්‍යාකත නම් වෙත්. **අවිපාකලක්ඛණා** විපාක ඉපදවීමෙහි නුසුදුසු බැව් සඞ්ඛ්‍යාත ධර්මයෝ තුමූ (හෙවත්) විපාක නොඉපදීම් ස්වභාව ලක්‍ෂණ කොට ඇත්තා වූ ධර්මයෝ තුමූ **අබ්‍යාකතා හොන්ති** අබ්‍යාකත නම් වෙත්.

**[අර්ථශාලිනී අර්ථකථා සන්නය 205-207 පිටු]**

**විපාකත්තිකේ** අඤ්ඤමඤ්ඤවිසිට්ඨානං කුසලාකුසලානං පාකාති **විපාකා**. විපක්කභාවමාපන්නානං අරූපධම්මානමේතං අධිවචනං.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 03 තිකමාතිකාපද වණ්ණනා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 65 පිට (හේ.වි.මු)]**

**විපක්කභාවමාපන්නානං අරූපධම්මාන**න්ති යථා සාලිබීජාදීනං ඵලානි තං සදිසානි නිබ්බත්තානි විපක්කානි නාම හොන්ති, විපාකනිරුත්තිඤ්ච ලභන්ති, න මූලඞ්කුරපත්තඛන්ධනාළානි, ඒවං කුසලාකුසලානං ඵලානි අරූපධම්මභාවේන සාරම්මණභාවේන සුක්කකණ්හාදිභාවේන ච තංසදිසානි විපක්කභාවමාපන්නානීති විපාකනිරුත්තිං ලභන්ති, න රූපධම්මා කම්මනිබ්බත්තාපි කම්මාසදිසාති දස්සේතුං වුත්තං. **[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 03 තිකමාතිකාපද වණ්ණනා යටතේ)]**

**විපාකනිරුත්තිඤ්ච ලභන්තී**ති තේසු විපාකසද්දස්ස නිරුළ්හතං දස්සේති. **සුක්කකණ්හාදීති ආදි-**සද්දේන අකණ්හඅසුක්කඑස්සාදිභාවෝ පරිග්ගහිතෝ. සති පන පාක-සද්දස්ස ඵලපරියායභාවේ රූපං විය න නිහීනෝ පක්කං විය විසිට්ඨෝ පාකෝති **විපාකෝ**ති ඒවං වා එත්ථ අත්ථෝ දට්ඨබ්බෝ.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 03 තිකමාතිකාපද වණ්ණනා යටතේ)]**

**විපාකත්තිකේ** විපාක ත්‍රිකයෙහි **අත්ථෝ** අර්ථය **වේදිතබ්බෝ** දතයුත්තේයි. **යේ ධම්මා** යම් ධර්මයෙක් තුමූ **අඤ්ඤමඤ්ඤවිසිට්ඨානං** ඔවුනොවුන්ට වෙස් වූ **කුසලාකුසලානං** කුසලාකුසලයන්ගේ **පාකා** විපාකයෝ වෙත් ද **ඉති (තස්මා)** එසේ හෙයින් **තේ ධම්මා** ඒ ධර්මයෝ තුමූ **විපාකා** විපාක නම් වෙත්. **ඒතං** මේ විපාක යන නාමය තෙමේ **විපක්කභාවං** විපාක භාවයට (නොහොත්) කුසලකර්ම අකුසලකර්ම යන හේතූන් කරණකොටගෙන හටගැනීම් පැසීම් සඞ්ඛ්‍යාත ස්වභාවයට **ආපන්නානං** පැමිණියා වූ **අරූපධම්මානං** නාම ධර්මයන්ට **අධිවචනං** නමෙකි.

**[අර්ථශාලිනී අර්ථකථා සන්නය 217 පිට]**

කිඤ්චාපි අරූපධම්මා විය රූපධම්මාපි කම්මසමුට්ඨානා අත්ථි, අනාරම්මණත්තා පන තේ කම්මසරික්ඛකා න හොන්තීති සාරම්මණා අරූපධම්මාව කම්මසරික්ඛත්තා විපාකාති වුත්තා බීජසරික්ඛකං ඵලං විය. සාලිබීජස්මිඤ්හි වපිතේ අඞ්කුරපත්තාදීසු නික්ඛන්තේසු සාලිඵලන්ති න වුච්චති. යදා පන සාලිසීසං පක්කං හෝති පරිණතං, තදා බීජසරික්ඛකෝ සාලි ඒව සාලිඵලන්ති වුච්චති. අඞ්කුරපත්තාදීනි පන බීජජාතානි බීජතෝ නිබ්බත්තානීති වුච්චන්ති, ඒමමේව රූපම්පි කම්මජන්ති වා උපාදිණ්ණන්ති වා වත්තුං වට්ටති.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 991 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 296 පිට(හේ.වි.මු)]**

**කිඤ්චාපි** කිසිසේත් **අරූපධම්මා විය** අරූප ධර්මයෝ මෙන් **කම්මසමුට්ඨානා** කර්මයෙන් හටගන්නාලද **රූපධම්මාපි** රූප ධර්මයෝ ද **අත්ථි** ඇත ද **තේ පන** ඒ රූප ධර්මයෝ වනාහි **අනාරම්මණත්තා** අරමුණු නොගන්නා බැවින් **කම්මසරික්ඛකා** කර්මයට සමාන **න හොන්ති ඉති** නොවෙත් **සාරම්මණා** අරමුණු සහිත **අරූපධම්මාව** අරූප ධර්මයෝම **කම්මසරික්ඛකත්තා** කර්මය හා සදෘශ හෙයින් **විපාකාති** විපාකයෝ යැයි **වුත්තා** කියනලදහ **බීජසරික්ඛකං** බීජය හා සමාන **ඵලං විය** ඵලය මෙනි **හි** උපමාවක් දක්වමි **සාලිබීජස්මිං** ඇල්බිජුවට **වපිතේ** වපුළ කල්හි **අඞ්කුරපත්තාදීසු** අඞ්කුර පත්‍රාදිය **නික්ඛන්තේසුපි** නික්මුන කල්හි ද **සාලිඵලන්ති** ඇල් ඵලයයි **න වුච්චති** නොකියනු ලැබෙයි **යදා පන** යම්කලෙක වනාහි **සාලිසීසං** ඇල්කරල **පක්කං හෝති** පැසෙන ලද්දේ වෙයි **පරිණතං (හෝති)** මුහුකුරා ගියේ වෙයි **තදා** එකල්හි **බීජසරික්ඛකෝ** බීජය හා සමාන **සාලි ඒව** ඇල් කරලම **සාලිඵලන්ති** සාලි ඵලය යැයි **වුච්චති** කියනු ලැබේ **අඞ්කුරපත්තාදිනි පන** අඞ්කුර පත්‍රාදිය වනාහි **බීජජාතානි** බීජයෙන් හටගත්තේ **බීජතෝ** බීජයෙන් **නිබ්බත්තානි ඉති** උපන්නේ යැයි **වුච්චන්ති** කියනු ලැබෙත් **ඒවමේව** මෙසේම **රූපම්පි** රූපය ද **කම්මජං ඉති වා** කර්මජ යැයි හෝ **උපාදිණ්ණං ඉති වා** උපාදින්න යැයි හෝ **වත්තුං** කියන්නට **වට්ටති** වටී.

**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

ඉතරං පන අබ්‍යාකතමවිපාකාරහතෝ ඒකවිධං හෝති, ජාතිභේදතෝ දුවිධං විපාකචිත්තං කිරියචිත්තන්ති. තත්ථ **විපාකචිත්තං** භූමිභේදතෝ චතුබ්බිධං කාමාවචරං රූපාවචරං අරූපාවචරං ලෝකුත්තරන්ති. තත්ථ කාමාවචරං දුවිධං කුසලවිපාකං අකුසලවිපාකන්ති. කුසලවිපාකං දුවිධං සහේතුකමහේතුකඤ්චේති.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 31 යටතේ)]**

**ඉතරං පන** කුසලාකුසලයන් ගෙන් අවශිෂ්ට වූ **අබ්‍යාකතං** අව්‍යාකෘත සිත් තෙමේ **අවිපාකාරහතෝ** විපාකාරහ නොවන හෙයින් **ඒකවිධං හෝති** එක් වැදෑරුම් වෙයි. **ජාතිභේදතෝ** ජාති භේද හෙයින් **විපාකචිත්තං** විපාක සිතය **ක්‍රියාචිත්තං ඉති** ක්‍රියා සිත යැයි **දුවිධං** දෙවැදෑරුම් වෙයි. **තත්ථ** ඔවුන් අතුරෙන් **විපාකචිත්තං** විපාක සිත් තෙමේ **භූමිභේදතෝ** භූමි භේද හෙයින් **කාමාවචරං** කාමාවචරවිපාක සිතය **රූපාවචරං** රූපාවචරවිපාක සිතය **අරූපාවචරං** අරූපාවචරවිපාක සිතය **ලෝකුත්තරඤ්ච ඉති** ලෝකෝත්තරවිපාක සිත යැයි **චතුබ්බිධං** සිව් වැදෑරුම් වෙයි. **තත්ථ** ඔවුන් අතුරෙන් **කාමාවචරං** කාමාවචර විපාකසිත් තෙමේ **කුසලවිපාකං** කුසල විපාක සිතය **අකුසලවිපාකං ඉති** අකුසල විපාක සිත යැයි **දුවිධං** දෙවැදෑරුම් වෙයි. **කුසලවිපාකං** කුසල විපාක සිත් තෙමේ ද **සහේතුකං** සහේතුක කුසල විපාක සිතය **අහේතුකඤ්ච ඉති** අහේතුක කුසල විපාක සිත දැයි **දුවිධං** දෙවැදෑරුම් වෙයි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 118 පිට]**

අඤ්ඤමඤ්ඤවිසිට්ඨානං කුසලාකුසලානං පාකන්ති විපාකං, විපක්කභාවමාපන්නානමරූපධම්මානමේතමධිවචනං. යථා හි ලෝකේ සාලිබීජාදීනං ඵලානි තංසදිසානි නිබ්බත්තානි විපක්කානි නාම හොන්ති, විපාකනිරුත්තිඤ්ච ලභන්ති, න මූලඞ්කුරපත්තදණ්ඩනළාදීනි, ඒවං කුසලාකුසලානං ඵලානි අරූපධම්මභාවේන, සාරම්මණභාවේන ච තංසදිසානි විපක්කභාවමාපන්නානීති විපාකනිරුත්තිං ලභන්ති, න පන කම්මාභිනිබ්බත්තාපි රූපධම්මා කම්මවිසදිසත්තා. විපාකමේව චිත්තං **විපාකචිත්තං**.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 31 අබ්‍යාකත වණ්ණනා යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 156 පිට]**

"අඤ්ඤමඤ්ඤවිසිට්ඨානං කුසලාකුසලානං පාකන්ති විපාකං" යනු නිර්වචන හෙයින් ඔවුනොවුන්ට විරුද්ධ වූවෝ විශිෂ්ඨ වූවෝ කුසලාකුසලයන්ගේ පාකය විපාක නම් වේ. විපාක උපදවන ස්වභාව ඇති අරූපධර්මයන්ට මේ නමෙකි. ඒ එසේමැයි; යම්සේ ලෝකයෙහි ශාලිබීජාදීන්ගේ ඵලයෝ ඒ හා සමානව උපන්නාහු පැසිය යුතු ස්වභාව ඇත්තාහු නම් වෙත් ද විපාක නිරුක්තිය ලබත් ද මුල් අඞ්කුර පත්‍ර කඳ නාළ යන මොහු එසේ විපාක නිරුක්තිය නොලබත් ද එපරිද්දෙන්ම කුසලාකුසලයන්ගේ ඵලයෝ අරූපධර්ම බැවින් ද අරමුණ සහිත බැවින් ද ඒ කුසලාකුසල කර්මයන් හා සදෘශවූවාහු විපාක උපදවන ස්වභාවයට පැමිණියාහු වෙති. එහෙයින් විපාක නිරුක්තිය ලබත්. රූප ධර්මයෝ තුමූ කර්මයෙන් හටගත්තාහු නමුදු විපාක ව්‍යවහාරය නොලබත්. (හෙවත් යම්සේ ශාලිබීජයෙන් මූලාඞ්කුර පත්‍රාදීහු හටගත්තාහු නමුදු ශාලිබීජයාගේ ඵලභාවයෙන් නොඋපද හෙයින් ශාලිඵලයයි නොකියා ශාලිබීජයෙන් උපන්නාහු යයි කියනු ලැබෙත් ද එමෙන්ම කර්මජ රූපයෝ කර්මයෙන් උපන්නාහු නමුදු කර්මයාගේ ඵලභාවයෙන් නොඋපදනා හෙයින් විපාකයෝ යයි නොකියනු ලැබෙති. කර්මයෙන් උපන්නාහු යැයි කියනු ලැබෙති) "විපාකමේව චිත්තං විපාකචිත්තං" යනු විග්‍රහ හෙයින් විපාකයම සිත් වූයේනුයි විපාකචිත්ත නම් වෙයි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 120 පිට]**

විපාකත්තිකේ අඤ්ඤමඤ්ඤවිසිට්ඨානං කුසලාකුසලානං පාකාති **විපාකා,** විපක්කභාවමාපන්නානං අරූපධම්මානමේතං අධිවචනං. කිඤ්චාපි අරූපධම්මා විය රූපධම්මාපි කම්මසමුට්ඨානා අත්ථි, අනාරම්මණත්තා පන තේ කම්මසරික්ඛකා න හොන්තීති සාරම්මණා අරූපධම්මාව කම්මසරික්ඛත්තා විපාකාති වුත්තා බීජසරික්ඛකං ඵලං විය. යථා හි සාලිබීජතෝ නික්ඛන්තසීසමේව සාලිඵලන්ති වුච්චති, න අඞ්කුරාදීනි, තානි පන "සාලිජාතානි, සාලිනිබ්බත්තානි වා"ති වුච්චන්ති, ඒවං කම්මසදිසා අරූපධම්මාව "විපාකා"ති වුච්චන්ති, රූපධම්මා පන කම්මජා "උපාදින්නා"ති වුච්චන්ති.

**[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා වේදනාත්තිකාදි වණ්ණනා යටතේ)]**

**විපාකත්තිකේ** විපාක ත්‍රිකයෙහි **අත්ථෝ** අර්ථය **වේදිතබ්බෝ** දතයුත්තේයි. **යේ ධම්මා** යම් ධර්මයෙක් තුමූ **අඤ්ඤමඤ්ඤවිසිට්ඨානං** ඔවුනොවුන්ට වෙනස් වූ **කුසලාකුසලානං** කුසලාකුසලයන්ගේ **පාකා** විපාකයෝ වෙත් ද **ඉති (තස්මා)** එසේ හෙයින් **තේ ධම්මා** ඒ ධර්මයෝ තුමූ **විපාකා** විපාක නම් වෙත්. **ඒතං** මේ විපාක යන නාමය තෙමේ **විපක්කභාවං** විපාක භාවයට (නොහොත්) කුසලකර්ම අකුසලකර්ම යන හේතූන් කරණකොටගෙන හටගැනීම් පැසීම් සඞ්ඛ්‍යාත ස්වභාවයට **ආපන්නානං** පැමිණියා වූ **අරූපධම්මානං** නාම ධර්මයන්ට **අධිවචනං** නමෙකි.

**කිඤ්චාපි** කිසිසේත් **අරූපධම්මා විය** අරූප ධර්මයෝ මෙන් **කම්මසමුට්ඨානා** කර්මයෙන් හටගන්නාලද **රූපධම්මාපි** රූප ධර්මයෝ ද **අත්ථි** ඇත ද **තේ පන** ඒ රූප ධර්මයෝ වනාහි **අනාරම්මණත්තා** අරමුණු නොගන්නා බැවින් **කම්මසරික්ඛකා** කළ කර්මයට සමාන **න හොන්ති** නොවෙත් **ඉති (තස්මා)** එහෙයින් **බීජසරික්ඛකං** බීජයට සමාන **ඵලං විය** ඵලය මෙන් **සාරම්මණා** අරමුණු සහිත වූ **අරූපධම්මාව** අරූප ධර්මයෝම **කම්මසරික්ඛකත්තා** කළ කර්මයට සමාන බැවින් **විපාකාති** විපාකයෝ යැයි **වුත්තා** කියනලදි **හි** උපමාවක් දක්වම් **යථා** යම්සේ **සාලිබීජතෝ** ඇල්බීජයෙන්

**නික්ඛන්තසීසමේව** නික්මුනාවූ ඇල් කරලම **සාලිඵලන්ති** සාලිඵලය යැයි **වුච්චති** කියනු ලැබේ **අඞ්කුරාදීනි** අඞ්කුරාදිය **න (සාලිඵලන්ති වුච්චති)** සාලිඵලය යැයි නොකියනු ලැබේ **පන** එසේම **තානි (අඞ්කුරාදීනි)** ඒ අඞ්කුර පත්‍රාදිය **සාලිජාතානි ච** ඇල්බීජයෙන් උපන්නාහු ද **සාලිනිබ්බත්තානි** ඇල්බීජයෙන් හටගත්තාහු **ඉති** යැයි **වුච්චන්ති** කියනු ලැබෙත් **ඒවං** මෙසේ **කම්මසදිසා** කර්මය හා සදෘශ වූ **අරූපධම්මාව** අරූප ධර්මයෝම **විපාකාති** විපාකයෝ යැයි **වුච්චන්ති** කියනු ලැබෙත් **කම්මජා** කර්මයෙන් හටගත්තාවූ **රූපධම්මා පන** රූප ධර්මයෝ වනාහි **උපාදින්නාති** උපාදින්නයෝ යැයි **වුච්චන්ති** කියනු ලැබෙත්. **[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

විපාකත්‍රික ප්‍රථම පදයෙහි කුසලාකුසලයන් ගෙන් හටගන්නා වූ කර්මජ රූපයෝ ද ඇතුළත් නොවිය යුත්තාහු යත්? මුඛ්‍යඵල වශයෙන් නාමවිපාකයෝම විපාක ව්‍යවහාරය ලබත්. එහෙයින් විභාවනී ටීකායෙහි කර්මජ රූපයන්ට විපාක ව්‍යවහාරය නොලැබෙන්නේ යැයි කියනලදි. කර්ම විපාක වශයෙන් හටගන්නා වූ නාමස්කන්ධ සතරට මුත් රූපයන්ට විපාක ව්‍යවහාරය නොලැබෙයි. කර්මයෙන් හටගන්නා රූපයන්ට කටත්තා රූප යැයි ව්‍යවහාර කෙරෙති. එහෙයින් මේ විපාකත්‍රික ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ වශයෙන් කර්මජ රූපයෝ උද්ධරණය නොකරන ලද්දාහුය. කුමක් හෙයින් ද යත්? සාලිබීජාදියෙන් හටගන්නා වූ අඞ්කුර පත්‍ර ආදී අවයවයෝ සාලිබීජයාගේ ඵලයයි ව්‍යවහාර නොකොට ඒ වෘක්ෂයෙහි හටගන්නා වූ ධාන්‍ය බීජයෝම සාලිබීජයාගේ ඵලයයි ව්‍යවහාර කරන්නාක් මෙනි. එහෙයින්ම කුසලාකුසල කර්මයන් හා අරූපධර්ම වශයෙන් සමාන වූ සතර අරූපස්කන්ධයන්ටම මුත් එම ධර්මයෙන් හටගත්තා වූ රූපයනට විපාක ව්‍යවහාරය නොලැබෙත් මැයි. එමෙන්ම බිජුවට හා සමාන වූ කුසලාකුසල චේතනාවන්ගෙන් හටගන්නා වූ සතිස් විපාක චිත්තයන්ටම විපාක ව්‍යවහාරය ලැබෙත් මැයි. එහෙයින් අර්ථශාලිනී අටුවායෙහි "අඤ්ඤමඤ්ඤවිරුද්ධානං පාකාති විපාකා, අරූපධම්මානමේතං අධිවචනං" යනු කියනලදි. මූලටීකායෙහි ද "යථා සාලිබීජාදීනං" යනාදී පාඨයෙන් දැන් කියනලද උපමාව දක්වන ලදි. විභාවනී ටීකායෙහි ද "කුසලාකුසලකම්මසමුට්ඨානානම්පි කටත්තාරූපානං නත්ථි විපාකෝ වෝහාරෝ යනු කියනලදි. එසේවී නම් උපාදින්නත්‍රිකයෙහි උපාදින්න පාදයෙන් කර්මජ රූපයන් කුමක් හෙයින් ගන්නා ලද්දේ ද යත්? විපාක ශබ්දයෙන් මුඛ්‍යඵලය ද උපාදින්න ශබ්දයෙන් මුඛ්‍යාමුඛ්‍යඵල ද්වය ද ගතයුතු හෙයිනැයි දතයුතුයි.

**[අභිධම්මමාතිකා පාළිය හා සුත්තන්තමාතිකා පාළිය 152-153 පිටු]**

අඤ්ඤමඤ්ඤවිරුද්ධානං කුසලාකුසලානං පාකාති **විපාකා,** විපක්කභාවමාපන්නානං අරූපධම්මානමේතං අධිවචනං. ඒවඤ්ච කත්වා කුසලාකුසලකම්මසමුට්ඨානානම්පි කටත්තාරූපානං නත්ථි විපාකවෝහාරෝ. අකුසලස්ස විපාකචිත්තානි **අකුසලවිපාකචිත්තානි**.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 09 යටතේ); විභාවනි ටීකා සන්නය 40 පිට]**

**යේ (ධම්මා)** යම් ධර්ම කෙනෙක් තුමූ **අඤ්ඤමඤ්ඤවිරුද්ධානං** අන්‍යෝන්‍ය ප්‍රතිපක්ෂ වූ **කුසලාකුසලානං** කුසලාකුසලයන්ගේ **විපාකා** විපාකයෝ වේද **ඉති (තස්මා) තේ (ධම්මා)** ඒ ධර්මයෝ තුමූ **විපාකා** විපාක නම් වෙත් **ඒතං** ඒ විපාක යන නාම තෙමේ **විපක්කභාවං** මුඛ්‍යඵලයාගේ ස්වභාවයට (හෙවත් හේතු සදෘශ වූ ඵල භාවයට) **ආපන්නානං** පැමිණියා වූ **අරූපධම්මානං** නාමධර්මයන්ට **අධිවචනං** නමෙකි (විසිට්ඨවිගතවිරුද්ධාදීවසේන බොහෝ ප්‍රභේද ඇත්තාවූ "වි" ශබ්දයාගේ අර්ථයන් අතුරෙන් මෙතුන්හි විරුද්ධාර්ථයෙහි පවත්නේය යන බව දක්වන පිණිස "වි"

ශබ්දය "විරුද්ධානං" යි වර්ණනා කෙළේයි. ඒ විරුද්ධ ස්වභාවය දක්වන පිණිස "අඤ්ඤමඤ්ඤ" යන පාඨය කියනලදි. "කුසලාකුසලානං" යන පාඨය වනාහි "විරුද්ධානං" යන පදයාගේ ප්‍රධාන බව දක්වන පිණිස කියනලදි. කර්මජ රූපයෝ ද කුසලාකුසල කර්මයන්ගේ විපාක වතුදු ඒ කර්මජ රූපයන්ගේ හේතු වූ කුසලාකුසල කර්මයන් හා නාම ස්වභාවෙන් සදෘශ නොවන හෙයින් ඒ කර්මජ රූපයන් වළක්වන පිණිස "විපක්ඛභාවං -පෙ- අධිවචනං" යි අභිධෙයාර්ථය කියනලදි)

**ඒවඤ්ච කත්වා** මෙසේ සිත්හි ලා **කුසලාකුසලකම්මසමුට්ඨානානම්පි** කුසලාකුසල කර්මයෙන් හටගත්තා වූද **කටත්තාරූපානං** කර්මජ රූපයන්ට **විපාකවෝහාරෝ නත්ථි** විපාකය යන ව්‍යවහාරය නැත්තේය **අකුසලස්ස** අකුසලයාගේ **විපාකචිත්තානි** විපාක වූ චිත්තයෝ තුමූ **අකුසලවිපාකචිත්තානි** අකුසල විපාක චිත්තයෝ නම් වෙත් (මේ ලඝුක න්‍යායයි) (ගරුක න්‍යායය වශයෙන් වනාහි "විපාකානි චිත්තානි" යි විශේෂණ පූර්වපද කම්මධාරය සමාසය කොට "අකුසලස්ස විපාකානි චිත්තානි අකුසලවිපාකචිත්තානි" යි විග්‍රහ කටයුතුයි. "නානාදුමපතිතපුප්ඵවාසිතසානු" යන සමාස පදයෙන් අකුසල ශබ්දයාගේ විපාක ශබ්දයම අපේක්ෂා කිරීම ඇති කල්හිදු අකුසල ශබ්දය විසින් අපේක්ෂා කරනලද විපාක ශබ්දයට අනතුරුව ඇති හෙයින් අපේක්ෂා නොකරනලද චිත්ත ශබ්දය හා සමාස වන්නේයි) **[විභාවනී ටීකා සන්නය 74-75 පිටු]**

එත්ථ **කේනට්ඨේන විපාකං නාමා**ති. විපච්චනට්ඨේන. කිඤ්ච විපච්චනන්ති. යථා ලෝකේ අම්බඵලාදීනං තරුණභාවං අතික්කම්ම පරිණතභාවප්පත්ති විපච්චනන්ති වුච්චති. ඒවමේවං ඉධාපි විපච්චනං වේදිතබ්බන්ති. අයඤ්ච අත්ථෝ චතූහි සමඞ්ගීතාහි දීපේතබ්බෝ. චතස්සෝහි සමඞ්ගීතානාම චේතනාසමඞ්ගිතා, කම්මසමඞ්ගිතා, උපට්ඨානසමඞ්ගිතා, විපාකසමඞ්ගිතාති. තත්ථ පුබ්බේ තං තං කම්මායූහනකාලේ යා කුසලාකුසලචේතනාය ඛණත්තයසමඞ්ගිතා. අයං චේතනාසමඞ්ගීතානාම. සා පන චේතනා නිරුජ්ඣමානා සබ්බසෝ අභාවං පත්වා න නිරුජ්ඣති. ආයතිං පන විපාකපාතුභාවාය අත්තනෝ සබ්බාකාරපරිපූරං ක්‍රියාවිසේසං තස්මිං චිත්තසන්තානේ නිදහිත්වාව නිරුජ්ඣති. සෝච ක්‍රියාවිසේසෝ යාව ඕකාසං න ලභති. තාව කප්පසතසහස්සංපි තං සන්තානං අනුගතෝයේව හෝති. යං සන්ධාය ධම්මපදේ;

න හි පාපං කතං කම්මං, සජ්ජුඛීරංව මුච්චති;
ඩහන්තං බාලමන්වේති, භස්මා ඡන්නෝව පාවකෝති වුත්තං.

සෝ පන විසුං ඒකෝ පරමත්ථධම්මෝතිපි සඞ්ඛ්‍යං න ගච්ඡති, අනුසයධාතුයෝ වියාති. අයං කම්මසමඞ්ගිතානාම. සෝපන යදා අත්තනෝ අනුරූපේ පච්චයේ ලභති. තදා විපච්චනත්ථාය ඕකාසං කරෝති. කථං කරෝතීති. සෝ ආසන්නමරණස්ස සත්තස්ස අත්තානං වා පච්චුපට්ඨාපේති. අත්තනෝ නිමිත්තං වා පච්චුපට්ඨාපේති. ගතිනිමිත්තං වා පච්චුපට්ඨාපේති. සෝච සත්තෝ තං අමුඤ්චමානෝ යදි ගණ්හාති. තදා ඕකාසං ලභති. අයං උපට්ඨානසමඞ්ගිතානාම. තං අමුඤ්චිත්වා චුතස්ස පන චුති අනන්තරමේව සෝ කම්මසඞ්ඛාතෝ ක්‍රියා විසේසෝ විසුං ඒකෝ සසම්පයුත්තෝ පරමත්ථධම්මරාසි හුත්වා ඒකං භවං පූරයමානෝ විපච්චති, ඒකං භවං පූරයමානෝතිච යාව තායුකං භවඞ්ගකිච්චං ඡසු ද්වාරේසු තං තං ද්වාරිකවිපාකකිච්චානි පරියෝසානේ චුතිකිච්චඤ්ච සාධයමානෝති අත්ථෝ. තත්ථ පුරිමා තිස්සෝ සමඞ්ගීතා තරුණාවත්ථානාම හොන්ති. පච්ඡිමා විපාකසමඞ්ගීතා පරිණතාවත්ථානාමාති වේදිතබ්බා. ඉති විපච්චන්තීති විපාකානි මුදුතරුණාවත්ථං

අතික්කමිත්වා පරිණතාවත්ථසඞ්ඛාතං විපක්කභාවං ආපජ්ජන්තීති ඒවමෙත්ථ අත්ථො වේදිතබ්බෝ. ඒවඤ්ච කත්වා පාළියං කුසලාකුසලකම්මසමුට්ඨානානංපි කටත්තාරූපානං විපාකපදේ අග්ගහණං හෝතීති. තානිහි කම්මසන්තානතෝ විසුං සිද්ධත්තා විසුං කම්මතෝ ජාතානියේව නාම හොන්ති, න විපක්කානි නාමාති. අඞ්කුරාදීසු ච ආකාරවිකාරෙහි ගහිතං අරූපධම්මානං සන්තානං. අඞ්කුරං රූපධම්මානන්ති. අයමෙත්ථ විපාකපදේ පරමත්ථදීපනා.

යේ පන අරූපභාවේන සාරම්මණභාවේනච කම්මේන සදිසතාමත්තං ගහෙත්වා අරූපධම්මානමේව විපාකත්තං සාධෙන්ති. තේසං විපාකසද්දෝ අරූපධම්මේසු රුළ්හීවසේන පවත්තෝති ආපජ්ජතීති. යඤ්ච තත්ථ සාලිබීජනිබ්බත්තේසු නාළපත්තපුප්ඵඵලේසු බීජසදිසානං ඵලානමේව සාලිඵලසාලිපක්කනාමං සිද්ධං වියාති උපමං දස්සෙන්ති, සාපි න සමේති. න හි ඵලානිපි තරුණකාලේ පාකනාමං ලභන්ති. නච නාළපත්තපුප්ඵානිපි පරිණතකාලේ පාකනාමං න ලභන්තීති. තානිපිහි තද නාළං පක්කං, පත්තං පක්කං, පුප්ඵං පක්කන්ති න නවුච්චන්තීති. **[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 33 යටතේ)]**

විපාකවචනත්ථේ. විපච්චතීති විපාකං. විපච්චතීති ච විපක්කභාවං ආපජ්ජති. පුබ්බේ කතකම්මං ඉදනි නිබ්බත්තිං පාපුණාතීති වුත්තං හෝති. ඉදනි තදත්ථං පාකටං කරොන්තෝ "අයඤ්ච අත්ථෝ"ති ආදිමාහ. අට්ඨකථායං ආයූහන සමඞ්ගිතාපි ආගතා. ඉධ පන සා චේතනා සමඞ්ගිතාය සඞ්ගහිතාති කත්වා "චතස්සෝ සමඞ්ගිතා"ති වුත්තං. සමඞ්ගිතාති ච සම්පන්නතා. "තං තං කම්මායූහන කාලේ"ති පාණාතිපාතාදිකස්ස තබ්බිරමණාදිකස්ස ච තස්ස තස්ස දුච්චරිත සුචරිතකම්මස්ස ආයූහනකාලේ. සමුච්ඡින්නකාලේති අත්ථෝ. "සබ්බසෝ අභාවං පත්වා න නිරුජ්ඣතී"ති යථා අබ්‍යාකතධම්මා නිරුජ්ඣමානා සබ්බසෝ අභාවං පත්වා නිරුජ්ඣන්ති. තථා න නිරුජ්ඣන්තීති අධිප්පායෝ. "සබ්බාකාරපරිපූර"න්ති පාණාතිපාතං කරොන්තස්ස කම්මානුරූපා බහූ කායවචීමනෝ විකාරා සන්දිස්සන්ති. ඒස නයෝ අදින්නාදනාදීසු. ඒවරූපේහි සබ්බේහි ආකාරවිකාරේහි පරිපූරං. "නිදහිත්වා වා"ති සණ්ඨපෙත්වා ඒව. "යං සන්ධායා"ති යං කිරියා විසේසනිධානං සන්ධාය.

ගාථායං. "සජ්ජු"ති ඉමස්මිං දිවසේ. "ඛීරං මුච්චතී"ති යථා ඛීරං නාම ඉමස්මිං දිවසේ මුච්චති. පකතිං ජහති. විපරිණාමං ගච්ඡති. න තථා පාපං කතං කම්මන්ති යෝජනා. කථං පන හෝතීති ආහ "දහන්තං බාලමන්වේතී"ති. "භස්මාඡන්නෝව පාවකෝ"ති ඡාරිකා ඡන්නෝවිය අග්ගි. "සෝ පනා"ති කිරියා විසේසෝ පන. "විසුං ඒකෝ පරමත්ථධම්මෝතිපි සඞ්ඛ්‍යං න ගච්ඡතී"ති විසුං සම්පයුත්තධම්මභාවේන සඞ්ඛ්‍යං න ගච්ඡතීති අධිප්පායෝ. සෝ හි කම්මපච්චයධම්මත්තා පරමත්ථධම්මෝ න හෝතීති න වත්තබ්බෝ. තේනාහ "අනුසයධාතුයෝ වියා"ති. "සෝ"ති කිරියා විසේසෝ. "ත"න්ති කම්මං වා, කම්මනිමිත්තං වා, ගතිනිමිත්තං වා. "තද ඕකාසං ලභතී"ති විපච්චනත්ථාය ඕකාසං ලභති. ඕකාසං ලභිත්වා පච්චුපට්ඨාතීති අධිප්පායෝ. "තත්ථා"ති තාසු චතූසු සමඞ්ගිතාසු. "ඉතී"ති ලද්ධගුණවචනං. "ඒවඤ්ච කත්වා"ති ආදි පුන ලද්ධගුණවචනං. "පාළිය"න්ති ධම්මසඞ්ගණී පාළියං. "කම්මසන්තානතෝ"ති අරූපසන්තානං ඒව වුච්චති. "යේ පනා"ති ගන්ථකාරා පන. "තේස"න්ති ගන්ථකාරානං. ආපජ්ජතීති සම්බන්ධෝ. තේසං වාදේති වා යෝජේතබ්බං. යඤ්ච උපමං දස්සෙන්තීති යෝජනා. "තත්ථා"ති තස්මිං වචනේ. න

ච න ලභන්තීති යෝජනා. "තද"ති තස්මිං පරිණතකාලේ. "නාළ"න්ති පුප්ඵඵලානං දණ්ඩකං.
**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 33 යටතේ)]**

**එත්ථ** විපාක වචනාර්ථයෙහි අර්ථය කියනු ලැබේ **කේනට්ඨේන** කුමන අර්ථයෙන් **විපාකං නාම** විපාක නම් **ඉති (හෝති)** වෙයි ද? **විපච්චනට්ඨේන** පැසවන අර්ථයෙන් (**විපාකං නාම** විපාක නම් **හෝති** වෙයි) **කිඤ්ච විපච්චන්ති?** කෙසේ පැසවත් ද? **යථා** යම්සේ **ලෝකේ** ලෝකයෙහි **අම්බඵලාදීනං** අඹ ඵල ආදීන්ගේ **තරුණභාවං** නොමේරූ බව **අතික්කම්ම** ඉක්ම **පරිණතභාවප්පත්ති** පැසුණු බවට පැමිණීම **විපච්චනන්ති** පැසවන ලද්දේයයි **වුච්චති** කියනු ලැබේ **ඒවමේව** මෙසේම **ඉධපි** මේ විපාකයන්හි ද **විපච්චනං** පැසවීම **වේදිතබ්බං** දතයුතුයි **අයඤ්ච අත්ථෝ** මේ අර්ථය ද **චතූහි සමඞ්ගීතාහි** සමඞ්ගිතා සතර සමගින් **දීපේතබ්බෝ** දැක්විය යුතුයි **චතස්සෝ හි සමඞ්ගීතා නාම** සමඞ්ගීතා සතර නම් වනාහි **චේතනාසමඞ්ගීතා** චේතනා සමඞ්ගීතාවය **කම්මසමඞ්ගීතා** කර්ම සමඞ්ගීතාවය **උපට්ඨානසමඞ්ගීතා** උපට්ඨාන සමඞ්ගීතාවය **විපාකසමඞ්ගීතා** විපාක සමඞ්ගීතාවයයි **ඉති (වේදිතබ්බං)** දතයුතුයි **තත්ථ** ඒ සතර අතුරින් **පුබ්බේ** පෙර **තං තං කම්මායූහනකාලේ** ප්‍රාණඝාතාදිය කරන්නාහට ද එයින් වළකින්නාහට ද ඒ ඒ දුශ්චරිත සුචරිත කර්මයාගේ රැස්කරන කාලයෙහි **කුසලාකුසලචේතනාය** කුසල අකුසල චේතනාවගේ **යා ඛණත්තයසමඞ්ගීතා** යම් ක්‍ෂණත්‍රය හා යුක්ත බවක් වේද **අයං** මෙය **චේතනාසමඞ්ගීතා නාම** චේතනාසමඞ්ගීතා නම් **නිරුද්ධමානා** නිරුද්ධ වන්නාවූ **සා පන චේතනා** ඒ චේතනාව වනාහි **සබ්බසෝ** සියළු ආකාරයෙන් **අභාවං පත්වා** අභාවයට පැමිණ **න නිරුජ්ඣන්ති** නිරුද්ධ නොවෙත් **ආයතිං පන** මත්තෙහි ද වනාහි **විපාකපාතුභාවාය** විපාක ඉපදවීම පිණිස **අත්තනෝ** තමාගේ **සබ්බාකාරපරිපූරං** සියළු ආකාරයෙන් පිරිපුන් වූ **ක්‍රියාවිසේසං** ක්‍රියා විශේෂයක් **තස්මිං චිත්තසන්තානේ** ඒ චිත්ත සන්තානයෙහි **නිදහිත්වා** නිදන් කොට **නිරුජ්ඣති** නිරුද්ධ වෙයි ("සබ්බාකාරපරිපූරං" යනු පරපණ නසන්නහු හට කර්මානුරූපව බොහෝ කාය වග් මනෝ විකාරයෝ දක්නා ලැබෙත්. අදින්නාදනාදියෙහි ද මේ ක්‍රමයයි. එබඳු වූ සියළු ආකාර විකාරයන්ගෙන් පිරිපුන් යනු අනුදීපනීපාඨයි) **සෝ ච ක්‍රියාවිසේසෝ** ඒ ක්‍රියා විශේෂය ද **යාව** යම්තාක් **ඕකාසං** අවකාශයක් **න ලබ්භති** නොලබයි ද **තාව** ඒතාක් **කප්පසතසහස්සම්පි** කල්ප සතසහස්සුයක් වුවද **තං සන්තානං** ඒ චිත්ත සන්තානය **අනුගතෝයේව** අනුව ගියේම **හෝති** වෙයි **ධම්මපදේ** ධම්මපදයෙහි **යං සන්ධාය** යම් නිදන කථාවක් සඳහා:—

**කතං** කරනලද **පාපකම්මං** පාප කර්මය **සජ්ජුඛීරං ඉව** දෙවාගත්ගමන් කිරි නොමිදෙන්නාක් මෙන් **න මුච්චති** කළ ක්‍ෂණයෙහිම විපාක නොදෙන්නේමය **භස්මච්ඡන්නෝ පාවකෝ ඉව** අළුයෙන් වැසුනාවූ ගින්නක් සේ **ඩහං** දවමින් **තං (බාලං)** ඒ පව්කළ තැනැත්තා **අන්වේති** (අනු ඒති) අනුව එයි **ඉති වුත්තං** යනුවෙන් දේශනා කරනලදි.

**සෝ පන** ඒ ක්‍රියා විශේෂය වනාහි **අනුසයධාතුයෝ වියාති** අනුශය ධර්මයක් මෙනි **විසුං** වෙන්වූ **ඒකෝ පරමත්ථධම්මෝතිපි** එක් පරමාර්ථ ධර්මයක් යන **සඞ්ඛ්‍යං** සඞ්ඛ්‍යාවට **න ගච්ඡති** නොයයි **අයං** මෙය **කම්මසමඞ්ගීතා නාම** කම්මසමඞ්ගීතා නම් ("විසුං ඒකෝ පරමත්ථධම්මෝතිපි සඞ්ඛ්‍යං න ගච්ඡති" යනු සම්ප්‍රයුක්ත ධර්ම භාවයෙන් වෙන් වූ සඞ්ඛ්‍යාවට නොයයි යන අදහසයි. ඒ කර්ම සමඞ්ගීතාවය කර්ම ප්‍රත්‍යයෙන් හටගත් ධර්මයක් බැවින් පරමාර්ථ ධර්මයක් නොවේ යැයි නොකියයුතුයි

එහෙයින් "අනුසයධාතුයෝ විය" යනුවෙන් අනුදීපනීපාඨ ටීකායෙහි කියනලදි) **සෝ පන** ඒ කම්ම සමඞ්ගීතාවය **යද** යම්කලෙක **අත්තනෝ** තමාට **අනුරූපේ පච්චයේ ලභති** සුදුසු ප්‍රත්‍යයන් ලබයි ද **තද** එකල්හි **විපච්චනත්ථාය** පැසවීම පිණිස **ඕකාසං** අවකාශ **කරෝති** කරයි **කථං** කෙසේ **කරෝතීති?** කරයි ද යත්? **සෝ** ඒ ක්‍රියා විශේෂය **ආසන්නමරණස්ස සත්තස්ස** ආසන්න වූ මරණය ඇති සත්වයාට **අත්තානං වා** කර්මය හෝ **පච්චුපට්ඨාපේති** එළවයි **අත්තනෝ** තමාගේ **නිමිත්තං වා** නිමිත්ත හෝ **පච්චුපට්ඨාපේති** එළවයි **ගතිනිමිත්තං වා** ගති නිමිත්ත හෝ **පච්චුපට්ඨාපේති** එළවයි **යදි** ඉදින් **සෝ ච සත්තෝ** ඒ සත්ව තෙමේ ද **තං** කර්මය හෝ කර්ම නිමිත්ත හෝ ගති නිමිත්ත **අමුඤ්චමානෝ** අත් නොහරිමින් **ගණ්හාති** ගනී ද **තද** එකල්හි **ඕකාසං ලභති** විපාක දීම පිණිස අවකාශය ලබයි **අයං** මෙය **උපට්ඨානසමඞ්ගීතා නාම** උපට්ඨාන සමඞ්ගීතාවය නම් **තං** කර්මය හෝ කර්ම නිමිත්ත හෝ ගති නිමිත්ත හෝ **අමුඤ්චිත්වා** අත නොහැර **චුතස්ස පන** චුත වූ පුද්ගලයාට වනාහි **චුති අනන්තරමේව** චුතියට අනතුරුවම **සෝ කම්මසඞ්ඛාතෝ** ඒ කර්ම සඞ්ඛ්‍යාත **ක්‍රියාවිසේසෝ** ක්‍රියා විශේෂය **විසුං** වෙන්ව **සසම්පයුත්තෝ** සම්ප්‍රයුක්ත ධර්ම සහිත **ඒකෝ** එක් **පරමත්ථධම්මරාසිං හුත්වා** පරමාර්ථ ධර්ම රාශියක් වී **ඒකං භවං පූරයමානෝ** එක් භවයක් සම්පූර්ණ කරමින් **විපච්චති** විපාක දෙයි **ඒකං භවං පූරයමානෝති** එක් භවයක් සම්පූර්ණ කරමින් යනු **යාවතායුකං** ආයුෂ යම්තාක් ද (**තාව** ඒ තාක්) **භවඞ්ගකිච්චං ච** භවඞ්ග කෘත්‍යය ද **ඡසු ද්වාරේසු** ෂඩ් ද්වාරයන්හි **තං තං ද්වාරිකවිපාකකිච්චානි** ඒ ඒ ද්වාරික විපාක කෘත්‍යයෝ ද **පරියෝසානේ** අවසානයෙහි **චුතිකිච්චඤ්ච** චුති කෘත්‍යය ද **සාධයමානෝති** සිද්ධ කරනුයේ යන **අත්ථෝ** අර්ථයයි **චතූසු** ඒ සතර සමඞ්ගීතාවයන් අතුරින් **පුරිමා** පෙර **තිස්සෝ සමඞ්ගීතා** සමඞ්ගීතා තිදෙන **තරුණාවත්ථා නාම** නොමේරූ අවස්ථාව නම් **හොන්ති** වෙත් **පච්ඡිමා** අවසානයෙහි වූ **විපාකසමඞ්ගීතා** විපාක සමඞ්ගීතාවය **පරිණතාවත්ථා නාමාති** මේරූ අවස්ථාව නමැයි **වේදිතබ්බා** දතයුතුයි **ඉති විපච්චන්තීති** ඉති විපච්චන්ති යනු **විපාකානි** විපාකයෝ **මුදුතරුණාවත්ථං** මෘදු නොමේරූ අවස්ථාව **අතික්කමිත්වා** ඉක්මවා **පරිණතාවත්ථසඞ්ඛාතං** මේරූ අවස්ථාව සඞ්ඛ්‍යාත **විපක්කභාවං** විපාක දුන් බවට **ආපජ්ජන්ති** පැමිණෙත් **ඉති ඒවං** මෙසේ **එත්ථ** මෙහි **අත්ථෝ** අර්ථය **වේදිතබ්බං** දතයුතුයි **ඒවඤ්ච කත්වා** මෙසේ ද කොට **පාළියං** දම්සඟුණු පෙළෙහි **කුසලාකුසලකම්මසමුට්ඨානානම්පි** කුසල අකුසල කර්මයෙන් හටගත්තා වූ **කටත්තාරූපානං** කර්මජ රූපයන්ගේ **අග්ගහණං** නොගැනීම **විපාකපදේ** විපාක පදයෙහි **හෝති** (කියන ලද්දේ) වෙයි **ඉති (තේන)** එහෙයින් **තානිහි** ඒ කර්මජ රූපයෝ වනාහි **කම්මසන්තානතෝ** අරූප සන්තානයෙන් **විසුං** වෙන්ව **සිද්ධත්තා** සිද්ධවූ බැවින් **කම්මතෝ** කර්මයෙන් **විසුං** වෙන්ව **ජාතානියේව නාම හොන්ති** උපදින ලද්දෝම නම් වෙත් **විපක්කානි නාම** විපාක දුන් රූපයෝ නම් **න (හොන්ති)** නොවෙත් **අරූපධම්මානං** අරූප ධර්මයන්ගේ **සන්තානං හි** පරම්පරාව වනාහි **අඤ්ඤං** අනිකකි **රූපධම්මානං** රූප ධර්මයන්ගේ (**සන්තානං** පරම්පරාව වනාහි) **අඤ්ඤං** අනිකකි **ඉති (වේදිතබ්බං)** යැයි දතයුතුයි **එත්ථ විපාකපදේ** විපාක පදයෙහි **අයං** මේ **පරමත්ථදීපනා** පරමාර්ථදීපනියයි.

**යේ පන** ග්‍රන්ථ කාරකයෝ වනාහි **අරූපභාවේන ච** අරූප භාවයෙන් ද **සාරම්මණභාවේන ච** අරමුණු සහිත භාවයෙන් ද **කම්මේන** කර්මයෙන් ද **සදිසතාමත්තං ගහෙත්වා** සමාන මාත්‍රය ගෙන **අරූපධම්මානමේව** අරූප ධර්මයන්ටම **විපාකත්තං** විපාක බව **සාධෙන්ති** සිද්ධකරත් **තේසං (ගන්ථකාරානං)** ඒ ග්‍රන්ථකාරකයන්ගේ **විපාකසද්දෝ** විපාක ශබ්දය තෙම **අරූපධම්මේසු** අරූප

ධර්මයන්හි **රූළ්හීවසේන** අර්ථානුගත නොවන ව්‍යවහාර වශයෙන් **පවත්තෝති** පවතින ලද්දේය යන **ආපජ්ජති** ව්‍යවහාරයට පැමිණෙයි **යඤ්ච** උපමාවක් දක්වම් **තථා** ඒ වචනයෙහි **සාලිබීජනිබ්බත්තේසු** ඇල් බීජයෙන් උපන්නාවූ **නාලපත්තපුප්ඵඵලේසු** දඬු පත්‍ර මල් ගෙඩි අතරින් **බීජසදිසානං** බීජයට හා සමාන **ඵලානමේව** ඵලයන්ටම **සාලිඵලසාලිපක්කනාමං** සාලි ඵලය යන නම **සිද්ධං වියාති** සිද්ධවන ලද්දක් මෙන් **උපමං** උපමාවක් **දස්සෙන්ති** දක්වත් **සාපි** ඒ උපමාව ද **න සමේති** නොගැළපෙයි **ඵලානිපි** ඵලයෝ වනාහි **තරුණකාලේ** නොමේරූ කාලයෙහි **පාකනාමං** පැසුණු නාමය **න ලබ්භන්ති** නොලබත් **නාලපත්තපුප්ඵානිපි** දඬු පත්‍ර මල් ද **පරිණතකාලේ** මේරූ කාලයෙහි **පාකනාමං** පැසුණු යන නාමය **න ච න ලබ්භන්ති** නොලබන්නේ නොවෙත් **තානිපිහි (නාලපත්තපුප්ඵානි)** ඒ දඬු පත්‍ර මල් **තඳ** මේරූ කාලයෙහි **නාලං** මල් ගෙඩිවල දණ්ඩ **පක්කං** මෝරන ලදි **පත්තං** පත්‍රය **පක්කං** මෝරන ලදි **පුප්ඵං** මල **පක්කන්ති** මෝරන ලද යැයි **න** නොකියන්නේ **න වුච්චන්ති** නොවෙත් (ඉති ශබ්දය පරිසමාපන අර්ථයෙහිය) ෴ **[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

කුසල වූ හෝ අකුසල වූ හෝ අතීතයෙහි උපන්නා වූ ජවනයක් නිසා ඒ සන්තානයෙහි අනාගතයෙහි පහළ වන්නා වූ ක්‍රියා සාධනය නොකරන්නා වූ මන්ද වේගය ඇත්තා වූ චිත්තයෝ විපාකයෝය. වී ඇටයක් රෝපණය කළ කල්හි එයින් ගොයම් ගසක් පහළ වේ. වී ඇටය ක්‍රමයෙන් දිරා අභාවයට පැමිණෙයි. එහෙත් අනාගතයෙහි වී ඇට ඇති වීමට හේතු වන එක්තරා ශක්ති විශේෂයක් වී ඇටයෙහි පරම්පරාව වූ ගොයම් ගස හා සම්බන්ධ වී ඉතිරිව පවතී. ගොයම් ගසෙහි ඇට හටගන්නා කාලය පැමිණි කල්හි එහි අන් ඇට වර්ගයක් පහළ නොවී වී ඇටම පහළ වන්නේ ගොයම් ගස හා බැඳී පළමු රෝපණය කළ බීජයෙන් ඉතිරි වී තිබුණු ඒ ශක්ති විශේෂය නිසාය. ගොයම් ගසෙහි හටගන්නා ඒ ඇට රෝපණය කළ වී ඇටයේ ඵලයෝය. එමෙන් කුසල අකුසල ජවන චිත්තයක් පහළ වූ කල්හි එය නිරුද්ධ වූ පසු ඒ චිත්ත පරම්පරාව හා සම්බන්ධ වී අනාගතයෙහි ඵල හෙවත් විපාක සිත් ඇති කිරීමේ ශක්තියක් ඉතිරි වේ.

න හි පාපං කතං කම්මං, සජ්ජුඛීරංව මුච්චති;
ඩහන්තං බාලමන්වේති, භස්මා ඡන්නෝව පාවකෝති

යනුවෙන් "පාප කර්මය අළුයෙන් වැසුනු ගිනි අඟුරු මෙන් යන්නේය" යි බුදුරජාණන් වහන්සේ විසින් වදාළේ ජවන චිත්තය නිරුද්ධ වූ පසු සන්තානයෙහි ඉතිරි වන්නා වූ ශක්ති විශේෂය සඳහාය. ගොයම් ගස හා බැඳී පවත්නා වූ බීජ ශක්තිය අනුක්‍රමයෙන් මේරීමෙන් ගොයම් ගසෙහි නැවත වී ඇට පහළ වන්නාක් මෙන් චිත්ත සන්තානය හා බැඳී ඉතිරිව පවත්නා වූ කුසල අකුසල ශක්තිය මේරීමට පැමිණීම් වශයෙන් ඒ සන්තානයෙහි ඒවාට අනුකූල වූ චිත්ත චෛතසික ධර්ම පිණ්ඩයෝ පහළ වෙති. "පාක" යනු මේරීමට පැසීමට නමෙකි. අතීත කුසල අකුසල ජවනයන්ගෙන් ඉතිරි වූ ශක්ති විශේෂය මේරීම් වශයෙන් පහළ වන බැවින් එසේ පහළ වන චිත්ත චෛතසික පිණ්ඩයට "පාක" යන නම කියනු ලැබේ. කුසල අකුසල දෙක ස්වභාව වශයෙන් ඔවුනොවුන්ට විරුද්ධය. විපාක යන මෙහි "වි" යන්නෙන් කියවෙන්නේ අන්‍යෝන්‍ය විරුද්ධ වූ කුසල අකුසලයෝය. ඒවායේ මේරීම් වශයෙන් පහළ වූ ධර්මයෝ විපාකයෝය. ධර්ම වශයෙන් නොදැක්විය හැකි, දැක්වීමට ලකුණක් නැති චිත්ත පරම්පරාව හා සම්බන්ධව පවත්නා වූ ශක්ති විශේෂය කුසල අකුසල ජවනයන්ගේ එක්තරා අවස්ථාවකි. විපාක චිත්තය එහි තවත් අවස්ථාවකි. ගොයම් ගස හා බැඳී පවත්නා බීජ ශක්තිය වී ඇට ඇතිවීමෙන් කෙළවර වේ. එයින් නැවත

නැවතත් එල හටගැනීමක් නොවේ. එමෙන් ජවනයෙන් ශේෂ වන ශක්ති විශේෂය ද පැසීමට පැමිණීම් වශයෙන් නැවත සිත් බවට පැමිණීමෙන් කෙළවර වේ. විපාක යන නාමය චිත්ත චෛතසියන්ට මුත් අනෙකකට නොකියනු ලැබේ.

උත්සාහවත් බව හා අශාන්ත බවත් අනිෂ්ට විපාක ඇති කරන බවත් අකුසලයන්ගේ ලක්‍ෂණයෝය. උත්සාහවත් බව හා ශාන්ත බවත් ඉෂ්ටවිපාකය ඇති කරන බවත් කුසලයන්ගේ ලක්‍ෂණයෝය. නිරුත්සාහ භාවය හා ශාන්ත භාවය ද විපාකයක් ඇති නොකරන බව ද විපාකයන්ගේ ලක්‍ෂණයෝය. උත්සාහවත් බව හා ශාන්ත බව ද විපාක නොදෙන බව ද ක්‍රියා චිත්තයන්ගේ ලක්‍ෂණයෝය.

**[අභිධර්මයේ මූලික කරුණු 60-61 පිටු]**

## ආරම්මණයාගේ ඉෂ්ට අනිෂ්ට භේදඃ—

තත්ථ කතමං රූපං හීනං? යං රූපං තේසං තේසං සත්තානං උඤ්ඤාතං අවඤ්ඤාතං හීළිතං පරිභූතං අචිත්තීකතං හීනං හීනමතං හීනසම්මතං අනිට්ඨං අකන්තං අමනාපං, රූපා සද්ද ගන්ධා රසා ඵොට්ඨබ්බා ඉදං වුච්චති රූපං හීනං.

තත්ථ කතමං රූපං පණීතං? යං රූපං තේසං තේසං සත්තානං අනුඤ්ඤාතං අනවඤ්ඤාතං අහීළිතං අපරිභූතං චිත්තීකතං පණීතං පණීතමතං පණීතසම්මතං ඉට්ඨං කන්තං මනාපං, රූපා සද්ද ගන්ධා රසා ඵොට්ඨබ්බා ඉදං වුච්චති රූපං පණීතං. තං තං වා පන රූපං උපාදායුපාදාය රූපං හීනං පණීතං දට්ඨබ්බං.

**[විභඞ්ජපකරණ පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 06 යටතේ)]**

එහි හීන රූපය කවරේ යත්? ඒ ඒ සත්‍වයන් විසින් අවමන් කරනලද ලාමක වශයෙන් සලකනලද බැහැර කළ පරිභව කළ නොගරු කළ හීන වූ හීන යයි සලකන ලද හීන යැයි සම්මත වූ අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ යම් රූපයෙක් වේද එබඳු වූ රූපයෝයැ ශබ්දයෝයැ ගන්ධයෝයැ රසයෝයැ ස්ප්‍රෂ්ටව්‍යයෝයැ යන මේ "හීන රූප" යි කියනු ලැබේ. එහි ප්‍රණීත රූපය කවරේ යත්? ඒ ඒ සත්‍වයන් විසින් අවමන් නොකරනලද ලාමක වශයෙන් නොසිතනලද බැහැර නොකළ පරිභව නොකළ ගරු කළ ප්‍රණීත වූ ප්‍රණීත යයි සලකනලද ප්‍රණීතයයි සම්මත වූ ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන යම් රූපයෙක් වේද එබඳු වූ රූපයෝයැ ශබ්දයෝයැ ගන්ධයෝයැ රසයෝයැ ස්ප්‍රෂ්ටව්‍යයෝයැ යන මේ "ප්‍රණීත රූප" යි කියනු ලැබේ. තවද ඒ රූපය නිසා හීන ප්‍රණීත රූපය දතයුතුයි. **[විභඞ්ගප්පකරණ පාළිය 04 පිට (බු.ජ)]**

**තේසං තේසං සත්තාන**න්ති බහූසු සත්තේසු සාමිවචනං. අපරස්සාපි අපරස්සාපීති හි වුච්චමානේ දිවසම්පි කප්පසතසහස්සම්පි වදන්තෝ එත්තකමේව වදෙය්‍ය. ඉති සත්ථා ද්වීහේව පදේහි අනවසේසේ සත්තේ පරියාදියන්තෝ 'තේසං තේසං සත්තාන'න්ති ආහ. එත්තකේන හි සබ්බම්පි අපරදීපනං සිද්ධං හෝති. **උඤ්ඤාත**න්ති අවමතං. **අවඤ්ඤාත**න්ති වම්හෙත්වා ඤාතං. රූපන්තිපි න විදිතං. **හීළිත**න්ති අගහේතබ්බට්ඨේන ඛිත්තං ඡඩ්ඩිතං, ජිගුච්ඡිතන්තිපි වදන්ති. **පරිභූත**න්ති කිමේතේනාති වාචාය පරිභවිතං. **අචිත්තීකත**න්ති න ගරුකතං. **හීන**න්ති ලාමකං. **හීනමත**න්ති හීනන්ති මතං, ලාමකං කත්වා ඤාතං. **හීනසම්මත**න්ති හීනන්ති ලෝකේ සම්මතං, හීනේහි වා සම්මතං, ගූථභක්ඛේහි ගූථෝ විය. **අනිට්ඨ**න්ති අප්පියං, පටිලාභත්ථාය වා අපරියේසිතං. සචේපි නං කෝචි පරියේසෙය්‍ය, පරියේසතු. ඒතස්ස පන ආරම්මණස්ස ඒතදේව නාමං. **අකන්ත**න්ති අකාමිතං, නිස්සිරිකං වා.

**අමනාප**න්ති මනස්මිං න අප්පිතං. තාදිසඤ්හි ආරම්මණං මනස්මිං න අප්පීයති. අථවා මනං අප්පායති වඩ්ඪේතීති මනාපං, න මනාපං අමනාපං.

අපරෝ නයෝ අනිට්ඨං සම්පත්තිවිරහතෝ. තං ඒකන්තේන කම්මසමුට්ඨානේසු අකුසලකම්මසමුට්ඨානං. **අකන්තං** සුඛස්ස අහේතුභාවතෝ. **අමනාපං** දුක්ඛස්ස හේතුභාවතෝ. **රූපා සද්දා**ති ඉදමස්ස සභාවදීපනං. ඉමස්මිඤ්හි පදේ අකුසලකම්මජවසේන අනිට්ඨා පඤ්ච කාමගුණා විභත්තා. කුසලකම්මජං පන අනිට්ඨං නාම නත්ථි, සබ්බං ඉට්ඨමේව.

පණීතපදනිද්දේසෝ වුත්තපටිපක්ඛනයේන වේදිතබ්බෝ. ඉමස්මිං පන පදේ කුසලකම්මජවසේන ඉට්ඨා පඤ්ච කාමගුණා විභත්තා. කුසලකම්මජඤ්හි අනිට්ඨං නාම නත්ථි, සබ්බං ඉට්ඨමේව. යථා ච කම්මජේසු ඒවං උතුසමුට්ඨානාදීසුපි ඉට්ඨානිට්ඨතා අත්ථි ඒවාති ඉමස්මිං දුකේ ඉට්ඨානිට්ඨාරම්මණං පටිවිභත්තන්ති වේදිතබ්බං. අයං තාව ආචරියානං සමානත්ථකථා. විතණ්ඩවාදී පනාහ; **ඉට්ඨානිට්ඨං** නාම පාටියෙක්කං පටිවිභත්තං නත්ථි, තේසං තේසං රුචිවසේන කථිතං. යථාහ;

“මනාපපරියන්තං ඛ්වාහං, මහාරාජ, පඤ්චසු කාමගුණේසු අග්ගන්ති වදාමි. තේව, මහාරාජ, රූපා ඒකච්චස්ස මනාපා හොන්ති, ඒකච්චස්ස අමනාපා හොන්ති. තේව, මහාරාජ, සද්දා, ගන්ධා, රසා, ඵොට්ඨබ්බා ඒකච්චස්ස මනාපා හොන්ති, ඒකච්චස්ස අමනාපා හොන්තී”ති (සං. නි. 1.123).

ඒවං යස්මා තේයේව රූපාදයෝ ඒකෝ අස්සාදේති අභිනන්දති, තත්ථ ලෝභං උප්පාදේති. ඒකෝ කුජ්ඣති පටිහඤ්ඤති, තත්ථ දෝසං උප්පාදේති. ඒකස්ස ඉට්ඨා හොන්ති කන්තා මනාපා, ඒකස්ස අනිට්ඨා අකන්තා අමනාපා. ඒකෝ චේතේ ‘ඉට්ඨා කන්තා මනාපා’ති දක්ඛිණතෝ ගණ්හාති, ඒකෝ ‘අනිට්ඨා අකන්තා අමනාපා’ති වාමතෝ. තස්මා ඉට්ඨානිට්ඨං නාම පාටියෙක්කං පටිවිභත්තං නාම නත්ථි. පච්චන්තවාසීනඤ්හි ගණ්ඩුප්පාදාපි ඉට්ඨා හොන්ති කන්තා මනාපා, මජ්ඣිමදේසවාසීනං අතිජේගුච්ඡා. තේසඤ්ච මෝරමංසාදීනි ඉට්ඨානි හොන්ති, ඉතරේසං තානි අතිජේගුච්ඡානීති.

සෝ වත්තබ්බෝ; “කිං පන ත්වං ඉට්ඨානිට්ඨාරම්මණං පාටියෙක්කං පටිවිභත්තං නාම නත්ථීති වදේසී”ති? “ආම නත්ථී”ති වදාමි. පුන තථේව යාවතතියං පතිට්ඨාපෙත්වා පඤ්හෝ පුච්ඡිතබ්බෝ; “නිබ්බානං නාම ඉට්ඨං උදාහු අනිට්ඨ”න්ති? ජානමානෝ “ඉට්ඨ”න්ති වක්ඛති. සචේපි න වදෙය්‍ය, මා වදතු. නිබ්බානං පන ඒකන්තඉට්ඨමේව. “නනු ඒකෝ නිබ්බානස්ස වණ්ණේ කථියමානේ කුජ්ඣිත්වා; ‘ත්වං නිබ්බානස්ස වණ්ණං කථෙසි, කිං තත්ථ අන්නපානමාලාගන්ධවිලේපන සයනච්ඡාදනසමිද්ධා පඤ්ච කාමගුණා අත්ථී’ති වත්වා ‘නත්ථී’ති වුත්තේ ‘අලං තව නිබ්බානේනා’ති නිබ්බානස්ස වණ්ණේ කථියමානේ කුජ්ඣිත්වා උභෝ කණ්ණේ ථකේතීති ඉට්ඨේතං. ඒතස්ස පන වසේන තව වාදේ නිබ්බානං අනිට්ඨං නාම හෝති. න පනේතං ඒවං ගහේතබ්බං. ඒසෝ හි විපරීතසඤ්ඤාය කථේති. සඤ්ඤාවිපල්ලාසේන ච තදේව ආරම්මණං ඒකස්ස ඉට්ඨං හෝති, ඒකස්ස අනිට්ඨං.

ඉට්ඨානිට්ඨාරම්මණං පන පාටියෙක්කං විභත්තං අත්ථීති. කස්ස වසේන විභත්තන්ති? මජ්ඣිමකසත්තස්ස. ඉදඤ්හි න අතිඉස්සරානං මහාසම්මතමහාසුදස්සනධම්මාසෝකාදීනං වසේන විභත්තං. තේසඤ්හි

දිබ්බකප්පම්පි ආරම්මණං අමනාපං උපට්ඨාති. න අතිදුග්ගතානං දුල්ලභන්නපානානං වසේන විභත්තං. තේසඤ්හි කණාජකභත්තසිත්ථානිපි පූතිමංසරසෝපි අතිමධුරෝ අමතසදිසෝ ච හෝති. මජ්ඣිමකානං පන ගණකමහාමත්තසෙට්ඨිකුටුම්බිකවාණිජාදීනං කාලේන ඉට්ඨං කාලේන අනිට්ඨං ලභමානානං වසේන විභත්තං. ඒවරූපා හි ඉට්ඨානිට්ඨං පරිච්ඡින්දිතුං සක්කොන්තීති.

තිපිටකචූළනාගත්ථේරෝ පනාහ; "ඉට්ඨානිට්ඨං නාම විපාකවසේනේව පරිච්ඡින්නං, න ජවනවසේන. ජවනං පන සඤ්ඤාවිපල්ලාසවසේන ඉට්ඨස්මිංයේව රජ්ජති, ඉට්ඨස්මිංයේව දුස්සති; අනිට්ඨස්මිංයේව රජ්ජති, අනිට්ඨස්මිංයේව දුස්සතී"ති. විපාකවසේනේව පනේතං ඒකන්තතෝ පරිච්ඡිජ්ජති. න හි සක්කා විපාකචිත්තං වඤ්චේතුං. සචේ ආරම්මණං ඉට්ඨං හෝති, කුසලවිපාකං උප්පජ්ජති. සචේ අනිට්ඨං, අකුසලවිපාකං උප්පජ්ජති. කිඤ්චාපි හි මිච්ඡාදිට්ඨිකා බුද්ධං වා සඞ්ඝං වා මහාචේතියාදීනි වා උළාරානි ආරම්මණානි දිස්වා අක්ඛීනි පිදහන්ති, දෝමනස්සං ආපජ්ජන්ති, ධම්මසද්දං සුත්වා කණ්ණේ ථකෙන්ති, චක්ඛුවිඤ්ඤාණසෝතවිඤ්ඤාණානි පන නේසං කුසලවිපාකානේව හොන්ති.

කිඤ්චාපි ගූථසූකරාදයෝ ගූථගන්ධං ඝායිත්වා 'ඛාදිතුං ලභිස්සාමා'ති සෝමනස්සජාතා හොන්ති, ගූථදස්සනේ පන තේසං චක්ඛුවිඤ්ඤාණං, තස්ස ගන්ධඝායනේ ඝානවිඤ්ඤාණං, රසසායනේ ජිව්හාවිඤ්ඤාණඤ්ච අකුසලවිපාකමේව හෝති. බන්ධිත්වා වරසයනේ සයාපිතසූකරෝ ච කිඤ්චාපි විරවති, සඤ්ඤාවිපල්ලාසේන පනස්ස ජවනස්මිංයේව දෝමනස්සං උප්පජ්ජති, කායවිඤ්ඤාණං කුසලවිපාකමේව. කස්මා? ආරම්මණස්ස ඉට්ඨතාය.

අපිච ද්වාරවසේනාපි ඉට්ඨානිට්ඨතා වේදිතබ්බා. සුඛසම්ඵස්සඤ්හි ගූථකලලං චක්ඛුද්වාරඝානද්වාරේසු අනිට්ඨං, කායද්වාරේ ඉට්ඨං හෝති. චක්කවත්තිනෝ මණිරතනේන පෝථියමානස්ස, සුවණ්ණසූලේ උත්තාසිතස්ස ච මණිරතනසුවණ්ණසූලානි චක්ඛුද්වාරේ ඉට්ඨානි හොන්ති, කායද්වාරේ අනිට්ඨානි. කස්මා? මහාදුක්ඛස්ස උප්පාදනතෝ. ඒවං ඉට්ඨානිට්ඨං ඒකන්තතෝ විපාකේනේව පරිච්ඡිජ්ජතීති වේදිතබ්බං. තං තං වා පනාති එත්ථ න හෙට්ඨිමනයෝ ඕලෝකේතබ්බෝ.

**[විභඞ්ග අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 06 යටතේ); විභඞ්ග අටුවා 06-08 පිටු (හේ.වි.මු); අභිධම්ම ප්‍රවේශනය 13 පිට]**

**එත්තකමේවාති** "තේසං තේස"න්ති ඉමිනා ආමේඩිතවචනේන අභිබ්‍යාපනත්ථේන වුත්තත්ථමේව. "අපරස්ස අපරස්සා"ති දීපනං **අපරදීපනං. පරියේසතූති** ඒතේන පරියේසනාය අනිට්ඨනාමනිවත්තනස්ස අකාරණභාවං දස්සේති. කම්මදෝසේන හි චිත්තවිපල්ලාසදෝසේන ච ගූථභක්ඛපාණාදයෝ උම්මත්තකාදයෝ ච පරියේසෙය්‍යුං දිට්ඨිවිපල්ලාසේන ච යෝනකාදයෝ න ආරම්මණස්ස පරියේසිතබ්බසභාවත්තා, අපරියේසිතබ්බසභාවත්තා පන ඒතස්ස අනිට්ඨමිච්චේව නාමන්ති අත්ථෝ.

**සම්පත්තිවිරහතෝති** රූපාදීනං දේවමනුස්සසම්පත්තිභවේ කුසලකම්මඵලතා සමිද්ධසෝභනතා ච සම්පත්ති, තබ්බිරහතෝති අත්ථෝ. තතෝ ඒව තං න පරියේසිතබ්බන්ති. සෝභනානි ච කානිචි හත්ථිරූපාදීනි අකුසලකම්මනිබ්බත්තානි න තේසංයේව හත්ථිආදීනං සුඛස්ස හේතුභාවං ගච්ඡන්තීති තේසං සඞ්ගණ්හනත්ථං

**"අකන්ත"**න්ති වුත්තං. තස්ස තස්සේව හි සත්තස්ස අත්තනා කතේන කුසලේන නිබ්බත්තං සුඛස්ස පච්චයෝ හෝති, අකුසලේන නිබ්බත්තං දුක්ඛස්ස. තස්මා කම්මජානං ඉට්ඨානිට්ඨතා කම්මකාරකසත්තස්ස වසේන යෝජනාරහා සියා. අට්ඨකථායං පන **"කුසලකම්මජං අනිට්ඨං නාම නත්ථී"**ති ඉදමේව වුත්තං, න වුත්තං "අකුසලකම්මජං ඉට්ඨං නාම නත්ථී"ති. තේන අකුසලකම්මජම්පි සෝභනං පරසත්තානං ඉට්ඨන්ති අනුඤ්ඤාතං භවිස්සති. කුසලකම්මජං පන සබ්බේසං ඉට්ඨමේවාති වදන්ති. තිරච්ඡානගතානං පන කේසඤ්චි මනුස්සරූපං අමනාපං, යතෝ තේ දිස්වාව පලායන්ති. මනුස්සා ච දේවතාරූපං දිස්වා භායන්ති, තේසම්පි විපාකවිඤ්ඤාණං තං රූපං ආරබ්භ කුසලවිපාකං උප්පජ්ජති, තාදිසස්ස පන පුඤ්ඤස්ස අභාවා න තේසං තත්ථ අභිරති හෝතීති අධිප්පායෝ. කුසලකම්මජස්ස පන අනිට්ඨස්සාභාවෝ විය අකුසලකම්මජස්ස සෝභනස්ස ඉට්ඨස්ස අභාවෝ වත්තබ්බෝ. හත්ථිආදීනම්පි හි අකුසලකම්මජං මනුස්සානං අකුසලවිපාකස්සේව ආරම්මණං, කුසලකම්මජං පන පවත්තේ සමුට්ඨිතං කුසලවිපාකස්ස. ඉට්ඨාරම්මණේන පන වෝමිස්සකත්තා අප්පකං අකුසලකම්මජං බහුලං අකුසලවිපාකුප්පත්තියා කාරණං න භවිස්සතීති සක්කා වත්තුන්ති. විපාකං පන කත්ථචි න සක්කා වඤ්චේතුන්ති විපාකවසේන ඉට්ඨානිට්ඨාරම්මණවවත්ථානං සුට්ඨු වුත්තං. තස්මා තං අනුගන්ත්වා සබ්බත්ථ ඉට්ඨානිට්ඨතා යෝජේතබ්බා.

**අනිට්ඨා පඤ්ච කාමගුණා**ති කස්මා වුත්තං, නනු "චක්ඛුවිඤ්ඤෙය්‍යානි රූපානි ඉට්ඨානී"ති (ම. නි. 1.166; 2.155; 3.190; සං. නි. 5.30) ඒවමාදිනා ඉට්ඨානේව රූපාදීනි "කාමගුණා"ති වුත්තානීති? කාමගුණසදිසේසු කාමගුණවෝහාරතෝ, සදිසතා ච රූපාදිභාවෝයේව, න ඉට්ඨතා. "අනිට්ඨා"ති වා වචනේන අකාමගුණතා දස්සිතාති කාමගුණවිසභාගා රූපාදයෝ "කාමගුණා"ති වුත්තා අසිවේ "සිවා"ති වෝහාරෝ විය. සබ්බානි වා ඉට්ඨානිට්ඨානි රූපාදීනි තණ්හාවත්ථුභාවතෝ කාමගුණායේව. වුත්තඤ්හි "රූපා ලෝකේ පියරූපං සාතරූප"න්තිආදි (දී. නි. 2.400; ම. නි. 1.133; විභ. 203). අතිසයේන පන කාමනීයත්තා සුත්තේසු "කාමගුණා"ති ඉට්ඨානි රූපාදීනි වුත්තානීති.

ද්වීසුපි හීනපණීතපදේසු **"අකුසලකම්මජවසේන කුසලකම්මජවසේනා"**ති වචනං **"තේසං තේසං සත්තාන"**න්ති සත්තවසේන නියමෙත්වා විභජිතත්තා, අයඤ්චත්ථෝ **"තේසං තේස"**න්ති අවයවයෝගේ සාමිවචනං කත්වා වුත්තෝති වේදිතබ්බෝ. සත්තසන්තානපරියාපන්නේසු කම්මජං විසිට්ඨන්ති **"කම්මජවසේනා"**ති වුත්තං. යදි පන තේහි තේහීති ඒතස්මිං අත්ථේ **තේසං තේස**න්ති සාමිවචනං, විසයවිසයීසම්බන්ධේ වා, න කම්මජවසේනේව රූපාදීනි විභත්තානි, සබ්බේසං පන ඉන්ද්‍රියබද්ධානං වසේන විභත්තානීති විඤ්ඤායන්ති. ඒත්ථ ච පාකටේහි රූපාදීහි නයෝ දස්සිතෝති චක්ඛාදීසුපි හීනපණීතතා යෝජේතබ්බා.

**මනාපපරියන්ත**න්ති මනාපං පරියන්තං මරියාදභූතං පඤ්චසු කාමගුණේසු වදමීති අත්ථෝ. කිං කාරණන්ති? යස්මා තේ ඒකච්චස්ස මනාපා හොන්ති, ඒකච්චස්ස අමනාපා, යස්ස යේව මනාපා, තස්ස තේව පරමා, තස්මා තස්ස තස්ස අජ්ඣාසයවසේන කාමගුණානං පරමතා හෝති, න තේසංයේව සභාවතෝ.

**ඒව**න්ති ඉමස්මිං සුත්තේ වුත්තනයේන. ඒකස්මිංයේව අස්සාදනකුජ්ඣනතෝ ආරම්මණසභාවස්සේව ඉට්ඨානිට්ඨාභාවතෝ අනිට්ඨං "ඉට්ඨ"න්ති ගහණතෝ ච, ඉට්ඨං "අනිට්ඨ"න්ති ගහණතෝ ච **ඉට්ඨානිට්ඨං නාම පාටියෙක්කං පටිවිභත්තං**

**නත්ථීති** අත්ථො. **සඞ්කප්පවිපල්ලාසේන චා**තිආදිනා නිබ්බානේ විය අඞ්ගෙද්සු ආරම්මණේසු සඞ්කප්පවිපල්ලාසේන ඉට්ඨානිට්ඨග්ගහණං හොති. පිත්තුම්මත්තාදීනං බීරසක්කරාදීසු දෝසුස්සදසමුට්ඨිතසඞ්කප්පවිපල්ලාසවසේන තිත්තගග්ගහණං වියාති ඉමමත්ථං සන්ධාය මනාපපරියන්තතා වුත්තාති දස්සේති.

**විභත්තං අත්ථීති** ච වවත්ථිතං අත්ථීති අත්ථො, අට්ඨකථාචරියේහි විභත්තං පකාසිතන්ති වා. තඤ්ච මජ්ඣිමකසත්තස්ස වසේන වවත්ථිතං පකාසිතඤ්ච, අඞ්ගෙද්සඤ්ච විපල්ලාසවසේන ඉදං ඉට්ඨං අනිට්ඨඤ්ච හොතීති අධිප්පායො. ඒවං වවත්ථිතස්ස පනිට්ඨානිට්ඨස්ස අනිට්ඨං ඉට්ඨන්ති ච ගහණේ න කේවලං සඞ්කප්පවිපල්ලාසෝව කාරණං, ධාතුක්ඛෝභවසේන ඉන්ද්‍රියවිකාරාපත්තිආදිනා කුසලාකුසලවිපාකුප්පත්තිහේතුභාවෝපීති සක්කා වත්තුං. තථා හි සීතුදකං ඝම්මාභිතත්තානං කුසලවිපාකස්ස කායවිඤ්ඤාණස්ස හේතු හොති, සීතාභිභූතානං අකුසලවිපාකස්ස. තූලපිචුසම්ඵස්සෝ වණේ දුක්ඛෝ නිවණේ සුඛෝ, මුදුතරුණහත්ථසම්බාහනඤ්ච සුඛං උප්පාදේති, තේනේව හත්ථේන පහරණං දුක්ඛං, තස්මා විපාකවසේන ආරම්මණවවත්ථානං යුත්තං.

**කිඤ්චාපීති**ආදිනා සතිපි සඞ්කප්පවිපල්ලාසේ බුද්ධරූපදස්සනාදීසු කුසලවිපාකස්සේව ගූථදස්සනාදීසු ච අකුසලවිපාකස්ස උප්පත්තිං දස්සෙන්තෝ තේන විපාකේන ආරම්මණස්ස ඉට්ඨානිට්ඨතං දස්සේති. විජ්ජමානේපි සඞ්කප්පවිපල්ලාසේ ආරම්මණේන විපාකනියමදස්සනං ආරම්මණනියම දස්සනත්ථමේව කතන්ති.

**අපිච ද්වාරවසේනපීති**ආදිනා ද්වාරන්තරේ දුක්ඛස්ස සුඛස්ස ච පච්චයභූතස්ස ද්වාරන්තරේ සුඛදුක්ඛවිපාකුප්පාදනතෝ විපාකේන ආරම්මණනියමදස්සනේන ඒකස්මිංයේව ච ද්වාරේ සමානස්සේව මණිරතනාදිඵොට්ඨබ්බස්ස සණිකං ඵුසනේ පෝථනේ ච සුඛදුක්ඛුප්පාදනතෝ විපාකවසේන ඉට්ඨානිට්ඨතා දස්සිතාති විඤ්ඤායති. **හෙට්ඨිමනයෝති** මජ්ඣිමකසත්තස්ස විපාකස්ස ච වසේන වවත්ථිතං ආරම්මණං ගහෙත්වා "තේසං තේසං සත්තානං උඤ්ඤාත"න්ති (විභ. 6) ච ආදිනා වුත්තනයෝ. **[විභඞ්ග මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 06 නිදානකථා යටතේ)]**

**අනිට්ඨනාමනිවත්තනස්සාති** අනිට්ඨනාමනිවත්තියා අකාරණභාවදස්සනේන ඉට්ඨනාමලාභාපනස්ස අකාරණභාවං දස්සේති.

**දේවමනුස්සසම්පත්තිභවේති** සම්පත්තියුත්තේ සම්පන්නේ දේවමනුස්සභවේ. **සමිද්ධසෝභනතාති** අභිවුද්ධසෝභනතා. **තතෝ ඒවාති** සම්පත්තිවිරහතෝ ඒව, අසම්පන්නත්තා ඒවාති අත්ථො. **තේසංයේව හත්ථිආදීනං සුඛස්ස හේතුභාවං න ගච්ඡන්ති** සාරණාදිවසේන දුක්ඛපච්චයත්තා. **තේසන්ති** හත්ථිරූපාදීනං. **"තස්ස තස්සේවා"**තිආදිනා යථාවුත්තමත්ථං විවරති. අකුසලේන අත්තනා කතේන නිබ්බත්තං දුක්ඛස්ස පච්චයෝ හොතීති යෝජනා. **තස්මාති** යස්මා කම්මං යස්මිං සන්තානේ නිබ්බත්තං, තත්ථේව සුඛදුක්ඛානං පච්චයෝ හොති, න අඤ්ඤත්ථ, තස්මා. **අට්ඨකථායං පනාති** ඒකච්චමතදස්සනං. තත්ථ **"අනිට්ඨං නාම නත්ථී"**ති යස්මා පටිසේධද්වයේන කුසලකම්මජස්ස ඉට්ඨභාවෝ නියතෝ, තස්මා "කුසලකම්මජමේව ඉට්ඨ"න්ති ඒවං අනියමෙත්වා "කුසලකම්මජං ඉට්ඨමේවා"ති ඒවමෙත්ථ නියමෝ ගහේතබ්බෝති දස්සෙන්තෝ **"අකුසලකම්මජම්පී"**තිආදිමාහ. කින්ති අකුසලකම්මජං සෝභනං, යං පරේසං ඉට්ඨං නාම සියා? යදි දුග්ගතියං

කේසඤ්චි තිරච්ඡානානං සණ්ඨානාදිසම්පත්ති සුගතියං සත්තානං අකුසලනිස්සන්දේන විරූපරූපතා විය කුසලනිස්සන්දේන, කථං තස්සා අකුසලකම්මජතා. අථ පන යං කේසඤ්චි අමනාපම්පි සමානං රූපං මනාපං හුත්වා උපට්ඨාති, තං සන්ධාය වුත්තං, ඒවම්පි යථා කේසඤ්චි තිරච්ඡානාදීනං කුසලකම්මජං මනුස්සාදිරූපං අමනාපතෝ උපට්ඨහන්තම්පි කුසලවිපාකස්සේව ආරම්මණභාවතෝ අත්ථතෝ ඉට්ඨමේව නාම හෝති, ඒවං අකුසලකම්මජං කේසඤ්චි මනාපං හුත්වා උපට්ඨහන්තම්පි අකුසලවිපාකස්සේව ආරම්මණභාවතෝ අත්ථතෝ අනිට්ඨමේව නාම හෝති, ඒවඤ්චේතං සම්පටිච්ඡිතබ්බං. අඤ්ඤථා "අට්ඨානමේතං අනවකාසෝ, යං කායදුච්චරිතස්ස ඉට්ඨෝ කන්තෝ මනාපෝ විපාකෝ උප්පජ්ජෙය්‍ය"තිආදි අට්ඨානපාළියා (ම. නි. 3.131) විරෝධෝ සියා. තේනේවාහ **"කුසලකම්මජස්ස පනා"**තිආදි. **සබ්බේස**න්ති අත්තනෝ, පරේසඤ්ච. **ඉට්ඨස්ස අභාවෝ වත්තබ්බෝ**ති යථා "කුසලකම්මජං අනිට්ඨං නාම නත්ථී"ති වුත්තං, ඒවං කිඤ්චාපි "අකුසලකම්මජං ඉට්ඨං නාම නත්ථී"ති අට්ඨකථායං න වුත්තං, තේන පන නයදස්සනේන අකුසලකම්මජස්ස අභාවෝ වුත්තෝ ඒව හෝතීති සෝ සංවණ්ණනාවසේන නිද්ධාරෙත්වා වත්තබ්බෝති අධිප්පායෝ. ඒතේන කුසලකම්මජමේව ඉට්ඨන්ති පුරිමපදවධාරණස්ස ගහේතබ්බතං දස්සේති.

ඉදානි **"හත්ථිආදීනම්පී"**තිආදිනා තමේවත්ථං විවරති. **කුසලවිපාකස්සා**ති ඒත්ථාපි කුසලවිපාකස්සේව ආරම්මණන්ති අත්ථෝ. **මනුස්සාන**න්ති ච නිදස්සනමත්තං දට්ඨබ්බං. ඉතරේසම්පි ච අකුසලකම්මජං අකුසලවිපාකස්සේව, කුසලකම්මජඤ්ච කුසලවිපාකස්සේව ආරම්මණන්ති දස්සිතෝවායං නයෝති. කස්මා පන ඉට්ඨානිට්ඨමිස්සිතේ වත්ථුම්හි මනාපතාව සණ්ඨාතීති ආහ **"ඉට්ඨාරම්මණේන…පෙ…. සක්කා වත්තු"**න්ති. **සුට්ඨු වුත්ත**න්ති "ඉට්ඨානිට්ඨං ඒකන්තතෝ විපාකේනේව පරිච්ඡිජ්ජතී"ති වදන්තේහි ඉට්ඨානිට්ඨාරම්මණවවත්ථානං සම්මදේව වුත්තං. **තං අනුගන්ත්වා**ති විපාකවසේන ඉට්ඨානිට්ඨාරම්මණවවත්ථානං අනුගන්ත්වා. **සබ්බත්ථා**ති සුගතිදුග්ගතීසු, සබ්බේසු වා ආරම්මණේසු.

"අනිට්ඨා"ති වචනේනේව තේසං ඉට්ඨතා නිවත්තිතාති ආහ **"සදිසතා ච රූපාදිභාවෝයේවා"**ති. ඉට්ඨානේව රූපාදීනි කාමගුණාති සුත්තේ වුත්තානීති මිත්තපටිපක්ඛෝ අමිත්තෝ විය ඉට්ඨපටිපක්ඛා අනිට්ඨාති අධිප්පේතාති වුත්තං **"අනිට්ඨාති…පෙ…. වෝහාරෝ වියා"**ති. **සබ්බානි වා**ති ඒත්ථ "පියරූපං සාතරූප"න්ති (දී. නි. 2.400; ම. නි. 1.133; විභ. 203) වචනතෝ කථං අනිට්ඨානං රූපාදීනං කාමගුණභාවාපත්තීති චේ? තේසම්පි විපල්ලාසවසේන තණ්හාවත්ථුභාවතෝ පියරූපභාවස්ස අධිප්පේතත්තා. යදි ඒවං කථං "චක්ඛුවිඤ්ඤෙය්‍යානි රූපානි ඉට්ඨානී"තිආදි සුත්තපදං (ම. නි. 1.166; 2.155; 3.57; සං. නි. 5.30) නීයතීති ආහ **"අතිසයේනා"**තිආදි.

ඉන්ද්‍රියබද්ධරූපවසේන පාළියං හීනදුකනිද්දේසෝ පවත්තෝති දස්සේතුං **"ද්වීසුපි හීනපණීතපදේසූ"**තිආදිමාහ. **අවයවයෝගේ සාමිවචනං,** න කත්තරීති අධිප්පායෝ. "තේසං තේසං සත්තාන"න්ති ඉන්ද්‍රියබද්ධරූපේ නිද්දිට්ඨේ කස්මා කම්මජවසේන අත්ථෝ වුත්තෝ, න චතුසන්තතිවසේනාති ආහ **"සත්තසන්තාන…පෙ…. වුත්ත"**න්ති. පධානත්තා හි කම්මජවසේන අත්ථං වත්වා සේසේසු "ඒවං උතුසමුට්ඨානාදීසුපී"ති අට්ඨකථායං අතිදේසෝ කතෝ. **"තේහි තේහීති ඒතස්මිං අත්ථේ"**ති ඉමිනා "තේසං තේස"න්ති කත්තරි සාමිවචනං

ආසඞ්කති. තථා සති විසයේ වා සාමිවචනේ ලද්ධගුණං දස්සේති **"න කම්මජවසේනේවා"**තිආදිනා, කම්මජග්ගහණඤ්චෙත්ථ උපලක්ඛණං දට්ඨබ්බං.

**මරියාදභූත**න්ති උත්තමමරියාදභූතං. තේනේවාහ **"යස්ස යේව මනාපා, තස්ස තේව පරමා"**ති. **තේස**න්ති කාමගුණානං. **සභාවතෝ**ති ලක්ඛණතෝ.

**"ඒකස්මිංයේව අස්සාදනකුජ්ඣනතෝ"**තිආදිනා "යස්මා තේයේව රූපාදයෝ ඒකෝ අස්සාදේති"තිආදිකං සුත්තන්තවිවරණං ඉට්ඨානිට්ඨභාවේ හේතුභාවේන වුත්තන්ති දස්සේති. **ඉට්ඨානිට්ඨග්ගහණං හෝතී**ති නිබ්බානේ විය අනිට්ඨග්ගහණං සඤ්ඤාවිපල්ලාසේන අඤ්ඤේසුපි ආරම්මණේසු ඉට්ඨානිට්ඨාභිනිවේසෝ හෝතීති අධිප්පායෝ.

විභාගෝ නාම අසඞ්කරෝ, විත්ථාරෝ වාති **"විභත්ත"**න්ති පදස්ස **"වවත්ථිතං, පකාසිත"**න්ති ච අත්ථමාහ. **අඤ්ඤේස**න්ති අතිඅඩ්ඪදලිද්දානං. **ඉදං ඉට්ඨං, අනිට්ඨඤ්ච හෝතී**ති එත්ථ **ච-**සද්දේන අනිට්ඨං, ඉට්ඨඤ්ච හෝතීති අයම්පි අත්ථෝ වුත්තෝති වේදිතබ්බං. **අනිට්ඨං ඉට්ඨ**න්ති ඉට්ඨස්ස "අනිට්ඨ"න්ති, අනිට්ඨස්ස "ඉට්ඨ"න්ති ගහණෝ යථාසඞ්ඛ්‍යං යෝජනා. **ඉන්ද්‍රියවිකාරාපත්තිආදිනා**ති එත්ථ **ආදි-**සද්දේන පුබ්බාභිසඞ්ඛාරාදිං සඞ්ගණ්හාති. පුරේතරං පවත්තචිත්තාභිසඞ්ඛාර වසේනාපි හි විනාව සඤ්ඤාවිපල්ලාසං ඉට්ඨං "අනිට්ඨ"න්ති, අනිට්ඨඤ්ච "ඉට්ඨ"න්ති ගය්හතීති.

**තේන විපාකේනා**ති තේන කුසලාකුසලවිපාකේන. **ආරම්මණස්ස ඉට්ඨානිට්ඨත**න්ති යත්ථ තං උප්පජ්ජති, තස්ස බුද්ධරූපාදිකස්ස ගූථාදිකස්ස ච ආරම්මණස්ස යථාක්කමං ඉට්ඨතං අනිට්ඨතඤ්ච නිදස්සේති. **විජ්ජමානේපි සඤ්ඤාවිපල්ලාසේ ආරම්මණේන විපාකනියමදස්සන**න්ති ඉට්ඨාරම්මණේ කුසලවිපාකෝව උප්පජ්ජති, අනිට්ඨාරම්මණේ අකුසලවිපාකෝවාති ඒවං ආරම්මණේන විපාකනියමදස්සනං. **ආරම්මණනියමදස්සනත්ථ**න්ති යං කුසලවිපාකස්ස ආරම්මණං, තං ඉට්ඨං නාම. යං අකුසලවිපාකස්ස ආරම්මණං, තං අනිට්ඨං නාමාති දස්සනත්ථං. ආරම්මණේන නියාමිතෝ හි විපාකෝ අත්තනෝ උපකාරකස්ස ආරම්මණස්ස නියාමකෝ හෝතීති.

ද්වාරන්තරේ දුක්ඛස්ස පච්චයභූතස්ස ආරම්මණස්ස ද්වාරන්තරේ සුඛවිපාකුප්පාදනතෝ, ද්වාරන්තරේ සුඛස්ස පච්චයභූතස්ස ආරම්මණස්ස ද්වාරන්තරේ දුක්ඛවිපාකුප්පාදනතෝ විපාකේන ආරම්මණනියමදස්සනේන විපාකවසේන ඉට්ඨානිට්ඨතා දස්සිතාති යෝජනා.

**[විභඞ්ග අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 06 යටතේ)]**

**හි** ඒ කීම සැබෑම හෙවත් ඒ එසේමැයි **අපරස්සාපි (රූපං)** අනිකක්හුගේ රූපය කියාත් **අපරස්සාපීති (රූපං)** අනිකක්හුගේ රූපය කියාත් **වුච්චමානේ** කියනුලබන කල්හි **දිවසම්පි** දවස මුළුල්ලෙහිත් **කප්පසතසහස්සම්පි** කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහිත් **වදන්තෝ** කියන තැනැත්තේ **එත්තකමේව** මේ තේසං තේසං සත්තානං යන ආමේණ්ඩිත වචනයෙන් ව්‍යාප්ත වූ අර්ථයමැ **වදෙය්‍ය** කියන්නේමය **ඉති (තස්මා)** එහෙයින් **සත්ථා** ශාස්තෲන් වහන්සේ **ද්විහේව පදේහි** දෙපදයන් කරණකොටගෙනම **අනවසේසේ සත්තේ** නිරවශේෂ සත්වයන් **පරියාදියන්තෝ** අන්තර්ගත කර වදාළ සේක්

**තේසං තේසං සත්තානන්ති** තේසං තේසං සත්තානං යන ආමෙණ්ඩිත වචනය **ආහ** වදාළ සේක **හි** කවර හෙයකින් (**ආහ** වදාළ සේක් ද යත්) **එත්තකේන** මේ තේසං තේසං යන ආමෙණ්ඩිත වචන මාත්‍රයෙකින් **සබ්බම්පි** සියළුම **අපරදීපනං** අනික් සතක්හු අනික් සතක්හු යයි දැක්වීම **සිද්ධං හෝති** සිද්ධ වේද (**තස්මා** එසේ හෙයින් **ආහ** වදාළ සේක) **උක්ඛන්දතන්ති** උක්ඛන්දත නම් **අවමතං** පහත් කොටැ සලකන ලද රූපය තෙමේයි **අවක්ඛන්දතන්ති** අවක්ඛන්දත නම් **වම්හෙත්වා ඤාතං** යටපත් කොටැ සලකන ලද රූපය තෙමේයි **රූපන්තිපි** රූපයෙකැ කියාත් **න වින්දිතං** නො දන්නාලද රූපය තෙමේයි **හීළිතන්ති** හිළිත නම් **අගහේතබ්බට්ඨේන** නොගතයුතු අර්ථ හෙයින් **ඛිත්තං ජඩ්ඩිතං** ඛිත්තං යිසේයි බැහැරලූ රූපය තෙමේ **ජිගුච්ජිතං** පිළිකුල් කරනලද රූපය තෙමේ **ඉතිපි** මෙසේ හෙයිනිදු **වදන්ති** කියත් **පරිභූතන්ති** පරිභූත රූපය නම් **ඒතේන** තෙල රූපයෙන් **කිං** කුම් නම් ප්‍රයෝජනයෙක් ද? **ඉති** මෙසේ **වාචාය** තෙපුලෙන් **පරිභවිතං** ගරහිත රූපය තෙමේයි **අචිත්තීකතන්ති** අචිත්තීකෘත නම් **න ගරුකතං** ගරු නොකළ රූපය තෙමේයි **හීනන්ති** හීන නම් **ලාමකං** ලාමක රූපය තෙමේ **හීනමතන්ති** හීනමත නම් **හීනන්ති** ලාමකයයි **මතං** සලකන ලද රූපය තෙමේයි **ලාමකං කත්වා** ලාමක කොටැ **ඤාතං** දන්නාලද රූපය යූසේයි **හීනසම්මතන්ති** හීනසම්මත නම් **හීනන්ති** හීන යයි **ලෝකේ** ලෙව්හි **සම්මතං** ව්‍යවහාරයට පැමිණි රූපය තෙමේයි **වා** නොහොත් **ගූථභක්ඛේහි** අසුචි අනුභව කරන්නා වූ සත්වයන් විසින් **ගූථෝ (සම්මතෝ) විය** පුරුෂය මැනවයි සම්මත කරන ලද්දක් මෙන් **හීනේහි** හීන ජනයන් විසින් **සම්මතං** මැනවයි සම්මත කළ රූපය තෙමේයි.෴

* ගූථභක්ෂක ශුනඛ සූකරාදීහු අසුචි අනිෂ්ට රූප නමුදු යම්සේ ඉෂ්ට රූපයයි සම්මත කෙරෙද්ද එමෙන් අනිෂ්ට වූ රූප නමුදු ඉෂ්ට රූපයයි හීන සත්වයන් විසින් සම්මත කරන ලද්දේ ශුනඛ සූකරාදීන්ගේ රූපයයි.

**අනිට්ඨන්ති** අනිෂ්ට නම් **අප්පියං** අප්‍රිය වූ රූපය තෙමේයි හෙවත් අමනාප වූ රූපය තෙමේයි **වා** නොහොත් **පටිලාභත්ථාය** ප්‍රතිලාභය පිණිසැ **අපරියේසිතං** නොසොයන ලද රූපය තෙමේයි **කෝචි** කිසිවෙක් **නං** ඒ අනිෂ්ටාලම්බන රූපය **සචේපි පරියේසෙය්‍ය** ඉදින් සොයන්නේ වී නම් **පරියේසතු** සොයාවා **පන (තථාපි)** එසේ වී නමුත් **ඒතස්ස ආරම්මණස්ස** ඒ ආලම්බනයට **ඒතදේව නාමං** ඒ අනිෂ්ටාලම්බනය යනම නම වේ **අකන්තන්ති** අකන්ත නම් **අකාමිකං** නොකැමති වූ රූපය තෙමේයි **වා** නොහොත් **නිස්සිරිකං** නිඃශ්‍රීක වූ රූපය තෙමේයි **අමනාපන්ති** අමනාප නම් **මනස්මිං** සිත්හි **න අප්පිතං** නොපිහිටියා වූ රූපය තෙමේයි **හි** ඒ එසේමැයි **තාදිසං** එබඳු වූ හීන ස්වභාවය ඇති **ආරම්මණං** අරමුණ **මනස්මිං** සිත්හි **න අප්පීයති** නොපිහිටනු ලැබේ **අථවා** නොහොත් (**යං රූපං** යම් රූපයෙක්) **මනං** සිත **අප්පායති** යිසේයි **වඩ්ඪේති** උපබෘංහණය කෙරේ ද **ඉති** එහෙයින් (**තං රූපං** ඒ රූපය තෙමේ) **මනාපං** මන වඩන රූ නම් **මනාපං** චිත්තවෘංහනය කරන්නා වූ රූපයෙක් **න** නොවන්නේ **අමනාපං** මන නොවඩන රූප නම්.෴

**අපරෝ නයෝ (වුච්චතේ)** අනික් නයෙක් කියනු ලැබේ **සම්පත්තිවිරහතෝ** සම්පත්තියෙන් තොර වූ හෙයින් **අනිට්ඨං** අනිෂ්ටාලම්බන නම් **තං** ඒ අනිෂ්ටාලම්බනය **ඒකන්තේන** ඒකාන්ත වශයෙන් **කම්මසමුට්ඨානේසු** කර්ම හේතුවෙන් හටගන්නා වූ රූපයන් අතුරෙන් **අකුසලකම්මසමුට්ඨානං** අකුශල කර්ම හේතුවෙන් හටගන්නා රූපයයි **සුඛස්ස** සුඛයට **අහේතුකභාවතෝ** කරුණු නොවන හෙයින්

**අකන්තං** නොකැමති වනුයෑ **දුක්ඛස්ස** දුක්ඛයට **හේතුභාවතෝ** කරුණු වන හෙයින් **අමනාපං** මන නොවඩනුයෑ **රූපා සද්දති** රූපා සද්ද යනාදිවූ **ඉදං** මේ පෙද **අස්ස** ඒ අනිෂ්ට රූපයාගේ **සභාවදීපනං** ස්වභාවය දැක්වීමට කරුණු වූ පෙදයි (රූපා සද්ද ඉති යන්නෙහි ඉති ශබ්දයා ආද්‍යාර්ථයෙහි හුනු බැවින් ගන්ධ රස ස්පෘෂ්ටව්‍ය රූපයන්ගේ ග්‍රහණය යෙදෙයි) **හි** ඒ කීම සැබෑව **ඉමස්මිං පදේ** මේ හීන යන පදයෙහි **අකුසලකම්මජ වසේන** අකුශල කර්ම සමුත්ථාන රූප ධර්මයාගේ වශයෙන් **අනිට්ඨා** අනිෂ්ටාලම්බන වූ **පඤ්චකාමගුණා** පඤ්චකාම කොට්ඨාශයෝ **විභත්තා** බෙදන ලදයහ **කුසලකම්මජං** කුශල කර්ම සමුත්ථාන රූපය තෙමේ **අනිට්ඨං නාම** අනිෂ්ටාලම්බන වූවෙක් නම් **නත්ථි පන** නැත්තේමය **සබ්බං** කුශල කර්ම සමුත්ථාන වූ රූපය තෙමේ **ඉට්ඨමේව** ඉෂ්ට වූ රූපයමැයි.

**පණීතපදනිද්දේසෝ** ප්‍රණීත පදයාගේ නිර්දේශය තෙමේ **වුත්තපටිපක්ඛනයේන** කියන ලද්දහුට ප්‍රතිපක්ෂ නය වශයෙන් **වේදිතබ්බෝ** දතයුතු **හි** ඒ කීම සැබෑව **ඉමස්මිං පන පදේ** මේ පණීතං යන පදයෙහි වනාහි (පන යනු පක්ෂාන්තර ද්‍යෝතකයෑ) **කුසලකම්මජ වසේන** කුශල කර්ම සමුත්ථාන රූප ධර්මයාගේ වශයෙන් **ඉට්ඨා** ඉෂ්ටාලම්බන වූ **පඤ්චකාමගුණා** පඤ්චකාම කොට්ඨාශයෝ **විභත්තා** බෙදන ලදයහ **හි** ඒ කීම සැබෑව **කුසලකම්මජං** කුශලකර්ම සමුත්ථාන රූපය තෙමේ **අනිට්ඨං නාම** අනිෂ්ටාලම්බන වූවෙක් නම් **නත්ථි** නැත **සබ්බං** කුශල කර්ම සමුත්ථාන වූ සියළු රූපය තෙමේ **ඉට්ඨමේව** ඉෂ්ට වූ රූපයමැයි **කම්මසමුට්ඨානේසු** කර්ම සමුත්ථාන රූපයන්හි (කම්මජේසු යිද පාඨාන්තරයි) **ඉට්ඨානිට්ඨතා** ඉෂ්ටාලම්බනානිෂ්ටාලම්බනත්වයෑ **යථා ච අත්ථි** යම්සේ ඇද්ද **ඒවං** එපරිද්දෙන් **උතුසමුට්ඨානාදීසුපි** ඍතුජ රූපාදීන්හිත් **ඉට්ඨානිට්ඨාතා** ඉෂ්ටාලම්බනානිෂ්ටාලම්බනත්වයෑ **අත්ථියේවාති** ඇත්තේම යයි (**වේදිතබ්බං** දතයුතුයෑ)

* මෙහි අර්ථකථාචාර්‍ය්‍යයන් විසින් අනිෂ්ට රූපයෑ අපර්යේෂිත රූපයයි වර්ණිතයෑ. අනිෂ්ට රූප සඞ්ඛ්‍යාත ගූථ මුත්‍රාදිය ශුනඛ සූකරාදීහු සොයත්නුයි කවර හෙයකින් අනිෂ්ට රූපය අපර්යේෂිත රූපයයි විවරණය කළෝ ද යන චෝදනාවට පරිහාර පිණිස "සචේපි නං කෝචි පරියේසෙය්‍ය -පෙ- ඒතදේව නාමං" යන පාඨය දක්වන ලදි. ශුනඛ සූකරාදී කුණපය ගූථ මුත්‍රය යන මේ ඈ අනිෂ්ට වූ උතුජ රූප නම්. දෙව් ලොවැ උද්‍යාන විමාන කල්පවෘක්ෂාදිය ද මිනිස්ලොවැ ස්වර්ණ රජත මුක්තා මාණික්‍යාදිය ද ඉෂ්ට වූ උතුජ රූප නම්. ගූථ මුත්‍රාදී ආහාරෝජා ඵරණයෙන් උපදනා රූපය අනිෂ්ට වූ ආහාරජ රූප නම්. කැඳ බත් ආදී ආහාරෝජා ඵරණයෙන් උපදනා රූපය ඉෂ්ට වූ ආහාරජ රූප නම්. අකුශල චිත්තෝත්පාදයන් විසින් උපදවන ලද රූපය අනිෂ්ට වූ චිත්තජ රූප නම්. කුශල ක්‍රියා විපාක චිත්තෝත්පාදයන් විසින් උපදවන ලද රූපය ඉෂ්ට වූ චිත්තජ රූප නම්.

**ඉමස්මිං දුකේ** මේ ද්විකයෙහි **ඉට්ඨානිට්ඨාරම්මණං** ඉෂ්ටාලම්බනය අනිෂ්ටාලම්බනය (**භගවතා** භාග්‍යවතුන් වහන්සේ විසින්) **පටිවිභත්තන්ති** වෙන් කොට බෙද වදළ සේකැයි **වේදිතබ්බං** දතයුතුයි **අයං** මේ කථා තොමෝ **තාව** පළමු කොටැ **ආචරියානං** ආචාර්‍ය්‍යයන්ගේ **සමානත්ථකථා** සමාන වූ අභිප්‍රාය ඇති කථා තොමෝයි **විතණ්ඩවාදී පන** විතණ්ඩවාදී වූ පුද්ගල තෙමේ වනාහි **ආහ** කීහ (පන යනු පක්ෂාන්තර ද්‍යෝතකයෑ) **ඉට්ඨානිට්ඨං නාම** ඉෂ්ටාලම්බන අනිෂ්ටාලම්බනය නම් **පාටියෙක්කං** වෙන් වශයෙන් **නත්ථි** නැත **තේසං තේසං** ඒ ඒ සත්‍වයන්ගේ **රුචිවසේන**

ඡන්ද වශයෙන් **කථිතං** වදරණ ලදයැ (**භගවා** භාග්‍යවතුන් වහන්සේ **මයා** මා විසින් **වුත්තස්ස** ඉෂ්ටානිෂ්ටාලම්බනයෙක් වෙන් වශයෙන් නැතැයි කියනලද වචනයාගේ **සාධකං** සාධක වූ) **යථා** කුම් නම් වචනයක් **ආහ** වදාළ සේක් ද? **මනාපපරියන්තං** -පෙ- **අමනාපා හොන්තීති** මනාපපරියන්තං -පෙ- අමනාපා හොන්ති යන වචනය **ආහ** වදාළ සේක **මහාරාජ!** මහරජාණෙනි! බුදු වූ මම **පඤ්චසු** පඤ්චවිධ වූ **කාමගුණේසු** කාම කොට්ඨාශයන්හි **මනාපපරියන්තං** මන වැඩීමමැ ඉම ඇතැයි නොහොත් මයහීදව වූයේ චිත්තවෘංහනයයි හෙවත් ඉම වූයේ මන වැඩීමයයි **වදමි** කියමි **මහාරාජ!** මහරජාණෙනි! **තේ ඒව රූපා** ඒ රූපයෝමැ **ඒකච්චස්ස** ඇතැම් පුගුලක්හුගේ **මනාපා** මන වඩන්නාහු නොහොත් **ඒකච්චස්ස** ඇතැම් පුගුලක්හු විසින් **මනාපා** කැමතිවන ලද්දහු **හොන්ති** වෙත් **ඒකච්චස්ස** ඇතැම් පුගුලක්හුගේ **අමනාපා** මන නොවඩන්නාහු නොහොත් **ඒකච්චස්ස** ඇතැම් පුගලක්හු විසින් **අමනාපා** නොකැමැතිවන ලද්දහු **හොන්ති** වෙත් **මහාරාජ!** මහරජාණෙනි! **තේව සද්ද** ඒ ශබ්දලම්බනයෝමැ **තේව ගන්ධා** ඒ ගන්ධාලම්බනයෝමැ **තේව රසා** ඒ රසාලම්බනයෝමැ **තේව ඵොට්ඨබ්බා** ඒ ස්පෘෂ්ටව්‍යාලම්බනයෝමැ **ඒකච්චස්ස** ඇතැම් පුගුලක්හුගේ **මනාපා** මන වඩන්නාහු නොහොත් **ඒකච්චස්ස** ඇතැම් පුගුලක්හු විසින් **මනාපා** කැමතිවන ලද්දහු **හොන්ති** වෙත් **ඒකච්චස්ස** ඇතැම් පුගුලක්හුගේ **අමනාපා** මන නොවඩන්නාහු නොහොත් **ඒකච්චස්ස** ඇතැම් පුගුලක්හු විසින් **අමනාපා** නොකැමති වන ලද්දහු **හොන්ති** වෙත් ෴

**ඒවං (ඉමිනා වුත්තනයේන)** මෙසේ වදාළ නයෙන් **තේයේව රූපාදයෝ** ඒ රූපාද්‍යාලම්බනයන්මැ **ඒකෝ** එක් පුගුලෙක් **යස්මා** යම්හෙයකින් **අස්සාදේති** ආශ්වාදය කෙරේ ද **අභිනන්දති** කැමති වේද **තත්‍ථ** ඒ රූපාද්‍යාලම්බනයන්හි **ලෝභං** ආලය **උප්පාදේති** උපදවා ද **ඒකෝ** එක් පුගුලෙක් **තත්‍ථ** ඒ රූපාද්‍යාලම්බනයන්හි **කුජ්ඣති** කිපේ ද **පටිහඤ්ඤති** ප්‍රතිඝ වශයෙන් පැකිලේ ද **දෝසං** ද්වේෂය **උප්පාදේති** උපදවා ද නොහොත් **දෝසං උප්පාදේති** වරද උපදවා ද **ඒකස්ස** එක් පුගුලක්හු විසින් **ඉට්ඨා** සොයන ලද්දහු **කන්තා** කැමති වන ලද්දහු **මනාපා** මන වඩන්නාහු **හොන්ති** වෙත් ද **ඒකස්ස** එක් පුගුලක්හු විසින් **අනිට්ඨා** නොසොයන ලද්දහු **අකන්තා** නොකැමති වන ලද්දහු **අමනාපා** මන නොවඩන්නාහු **හොන්ති** වෙත් ද **ඒකෝ ච** එක් පුගුලෙක් **තේ** ඒ රූපාද්‍යාලම්බනයෝ **ඉට්ඨා කන්තා මනාපාති** ඉෂ්ටයහ කාන්තයහ මනාපයහයි **දක්ඛිණතෝ** උතුම් කොටැ **ගණ්හාති** ගණී ද **ඒකෝ** එක් පුගුලෙක් **අනිට්ඨා අකන්තා අමනාපාති** අනිෂ්ටයහ අකාන්තයහ අමනාපයහයි **වාමතෝ** පහත් කොටැ **ගණ්හාති** ගණී ද **තස්මා** එහෙයින් **ඉට්ඨානිට්ඨං නාම** ඉෂ්ටාලම්බන අනිෂ්ටාලම්බනයක් නම් **පාටියෙක්කං** වෙන් කොට **පටිවිභත්තං නාම** පිරිසිඳ බෙද වදළේ නම් **නත්‍ථි** නැත **හි** ඒ එසේමැයි **පච්චන්තවාසීනං** පසල්දනව් වැසියන් විසින් **කණ්ඩුප්පාදදී** ගැඩවිල්ලෝ ද **ඉට්ඨා** සොයන ලද්දහු **කන්තා** කැමති වන ලද්දහු **මනාපා** මන වඩන ලද්දහු **හොන්ති** වෙති **මජ්ඣිමදේසවාසීනං** මධ්‍යම දේශවාසීන් විසින් **අතිජේගුච්ඡා** වැඩියක් පිළිකුල් කරන ලද්දහු නොහොත් **මජ්ඣිමදේසවාසීනං** මධ්‍යම දේශවාසීන්ට **අතිජේගුච්ඡා** ඉතා පිළිකුල් වූවාහු **හොන්ති** වෙත් **තේසඤ්ච** ඒ මධ්‍යම දේශවාසීන් විසිනිදු **මෝරමංසාදීනි** මයුර මාංසාදීහු **ඉට්ඨානි** සොයන ලද්දහු නොහොත් **තේසඤ්ච** ඒ මධ්‍යම දේශවාසීන්ට ද **මෝරමංසාදීනි** මයුර මාංසාදීහු **ඉට්ඨානි** ඉෂ්ටවූවාහු **හොන්ති** වෙත් **ඉතරේසං** පසල්දනව් වැස්සන් විසින් **තානි** ඒ මයුර මාංසාදීහු **අතිජේගුච්ඡානි** වැඩියක් පිළිකුල් කරන ලද්දහු නොහොත් **ඉතරේසං** පසල්දනව් වැස්සන්ට **තානි** ඒ මයුර මාංසාදීහු **අතිජේගුච්ඡානි** ඉතා පිළිකුල් වූවාහු **හොන්ති** වෙත් **ඉති** මෙසේ (**ආහ** කීයේය) ෴

**සෝ** ඒ විතණ්ඩවාදී පුද්ගල තෙමේ **ත්වං** තෝ **ඉට්ඨානිට්ඨාරම්මණං** ඉෂ්ටානිෂ්ටාලම්බනය **පාටියෙක්කං** වෙන් කොටැ **පටිවිභත්තං නාම** බෙද වදළ සේක් නම් **නත්ථි ඉති** නැතැයි **වදේසි කිම්පන** කියන්නෙහිදෝහෝ **ඉති** මෙසේ හෙයින් (**සකවාදිනා** සකවාදියා විසින්) **වත්තබ්බෝ** කියයුතු **නත්ථීති** පිරිසිඳ බෙද වදළේ නැතැයි **ආම වදමි** මම කීවෙමි සැබෑව (**ඉති වුත්තේ** මෙසේ කී කල්හි) **පුන** නැවත **තථේව** එපරිද්දෙන්ම **යාව තතියං** තුන්වන වර දක්වා **පතිට්ඨාපෙත්වා** තමාගේ ලබ්ධියෙහි පිහිටුවා **පඤ්හෝ** ප්‍රශ්නයෙක් **පුච්ඡිතබ්බෝ** විතාළයුතු (**කිම්පුච්ඡිතබ්බෝ** කුම් නම් ප්‍රශ්නයෙක් විතාළ යුත්තේ ද යත්?) **නිබ්බානං නාම** නිර්වාණය නම් **ඉට්ඨං** ඉෂ්ටාලම්බනයෙක්දෝහෝ **උදාහු** නැතහොත් **අනිට්ඨං** අනිෂ්ටාලම්බනයෙක්දෝහෝ **ඉති (පුච්ඡිතබ්බෝ)** මෙසේ විතාළ යුත්තේය **ජානමානෝ** දන්නා විතණ්ඩවාදී පුද්ගල තෙමේ **ඉට්ඨන්ති** ඉෂ්ටාලම්බනැයි **වක්ඛති** කියන්නේය **සචේපි න වදෙය්‍ය** ඉදින් නොකියන්නේ නම් **මා වදතු** නොකියාවා **පන (තථාපි)** එසේ වී නමුත් **නිබ්බානං** නිර්වාණය **ඒකන්තං** ඒකාන්ත වශයෙන් හෙවත් නියතයෙන් **ඉට්ඨමේව** ඉෂ්ටාලම්බනමැයි **ඒකෝ** එක් පුගුලෙක් **නිබ්බානස්ස** නිර්වාණයාගේ **වණ්ණේ** ගුණය **කථියමානේ** කියනුලබන කල්හි **කුජ්ඣිත්වා** කිපී **ත්වං** තෝ **නිබ්බානස්ස** නිර්වාණයාගේ **වණ්ණං** ගුණය **කථේසි නනු** කියන්නේ නොවේ ද **තත්‍ථ** ඒ නිර්වාණයෙහි **අන්නපානමාලාගන්ධවිලේපනසයනච්ඡාදනසමිද්ධා** -:- **අන්න** ආහාරය **පාන** පැන්ය **මාලාගන්ධවිලේපන** මල් ගඳ විලවුන්ය **සයන** ඇඳ පුටු ඈ සෙනසුන්ය **ඡාදන** වස්ත්‍රය යන මෙයින් **සමිද්ධා** සමෘද්ධ වූ **පඤ්චකාමගුණා** පඤ්චකාම සම්පත්තීහු **අත්‍ථීති** ඇද්දැයි **වත්‍වා** බැණ **නත්‍ථීති** නැතැයි **වුත්තේ** කී කල්හි **තව** තාගේ **නිබ්බානේන** නිර්වාණයෙන් **අලං** කම් නැත **ඉති** මෙසේ **නිබ්බානස්ස** නිර්වාණයාගේ **වණ්ණේ** ගුණය **කථියමානේ** කියනුලබන කල්හි **කුජ්ඣිත්වා** කිපී **උභෝ කණ්ණේ** දෙකන්සැකිළි **ථකේතීති** වසාගණියයි **ආහ** කීයි **ඒතං** මේ නිර්වාණය තෙමේ **ඉට්ඨං** ඉෂ්ටාලම්බනයෙක් වෙයි (අත්ථේතං යන පාඨයෙකුදු ඇත එසේවුවහොත් **ඒතං** මේ නිර්වාණය තෙමේ **අත්‍ථි** ඇතැයි යෝජනා කටයුතුයි) **ඒතස්ස පන** ඒ දෙකන්සිළු වසාගත් පුගුලාගේ **වසේන** වශයෙන් **තව** තාගේ **වාදේ** ලබ්ධියෙහි **නිබ්බානං** නිර්වාණය තෙම **අනිට්ඨං නාම** අනිෂ්ටාලම්බනයෙක් නම් **හෝතු** වේවා **ඒතං** මේ වචනය **ඒවං** මෙපරිද්දෙන් **න පන ගහේතබ්බං** නොගතයුතු.

* විතණ්ඩවාදියා විසින් කියනලද පරිද්දෙන් නොගතයුතුයයි වදරා කවර හෙයින් ඇතැම් කෙනෙකුන් විසින් කැමතිවන ලද අරමුණ ඇතැම් කෙනෙකු විසින් නොකැමති වන ලදදැයි යන චෝදනාවට පරිහාර පිණිස "ඒසෝ හි -පෙ- අත්ථීති" යි වදරත්.

**හි** කවර හෙයකින් (**න ගහේතබ්බං** නොගතයුත්තේ ද යත්?) **ඒසෝ** මේ පුගුල් තෙමේ **විපරීතසඤ්ඤාය** විපර්‍යාසයට පැමිණි සඤ්ඤාව කරණකොටගෙන **කථේති** කියයි **සඤ්ඤාවිපල්ලාසේන ච** සඤ්ඤාවිපර්‍යාසයෙනුදු **තදේවාරම්මණං** ඒ අරමුණමැ **ඒකස්ස** එක් පුගුලක්හු විසින් **ඉට්ඨං** කැමතිවන ලද්දේ **හෝති** වේ **ඉට්ඨානිට්ඨාරම්මණං පන** ඉෂ්ටාලම්බන අනිෂ්ටාලම්බන ද්වය වනාහි **පාටියෙක්කං** වෙන් කෙටැ **විභත්තං** (අර්ථකථාචාර්‍ය්‍යයන් විසින්) විභජනය කරන ලද්දේ **අත්‍ථීති** ඇත (ඉති ශබ්දයා පරිසමාපත්තියෙහි වැටේ. ඉති ශබ්දයා හේත්වර්ථයෙහි වුව **අත්‍ථි** ඇත්තේ ද **ඉති** එහෙයින් **න ගහේතබ්බං** නොගතයුතුයි යෝජනා කටයුතුයි) **කස්ස වසේන** කවර පුගුලක්හුගේ වශයෙන් **විභත්තං** විභජනය කරනලද ද? **ඉති (පුච්ඡායං**

**සති)** මෙසේ විචෑරීමක් ඇති කල්හි **මජ්ඣිමකසත්තස්ස** මධ්‍යම වූ සත්‍වයාගේ (**වසේන** වශයෙන් **ඉට්ඨානිට්ඨාරම්මණං** ඉෂ්ටානිෂ්ටාලම්බනය **විභත්තං** විභජනය කරන ලදැයි **ඉති විස්සජ්ජනා** මෙසේ විසදීම වේ) **හි** ඒ කීම සැබෑව **ඉදං** මේ ඉෂ්ටාලම්බන අනිෂ්ටාලම්බන ද්වය **අතිඉස්සරානං** වැඩියක් ඉසුරුමත් වූ **මහාසම්මත මහාසුදස්සනධම්මාසෝකාදීනං** මහාසම්මතය මහාසුදර්ශනය ධර්මාශෝකය යනාදී නරේශ්වරයන්ගේ **වසේන** වශයෙන් **විභත්තං** විභජනය කරන ලද්දේ **න** නොවෙයි **හි** කවර හෙයින යත්? **තේසං** ඒ මහාසම්මතාදීන්ට **දිබ්බකප්පං** දිව්‍යාලම්බනයක් හා සදෘශ වූ **ආරම්මණම්පි** අරමුණක් නමුත් **අමනාපං හුත්‍වා** මන නොවඩන්නේවැ **උපට්ඨාති** වැටහේ ද (**තස්මා** එහෙයින් **තේසං** ඔහුන්ගේ **වසේන** වශයෙන් **න විභත්තං** නොබෙද වදරණ ලදයැ) **අතිදුග්ගතානං** වැඩියක් දිලිදු වූ **දුල්ලභන්නපානානං** දුලබ බත් පැන් අහර ඇත්තාවූ සත්‍වයන්ගේ **වසේන** වශයෙන් **න විභත්තං** නොබෙද වදරණ ලදය **හි** කවර හෙයින යත්? **තේසං** ඒ දුලබ බත් පැන් ඇති සත්නට **කණාජකභත්තසිත්ථානිපි** කඩසහල් බත්හුළු ද **පූතිමංසරසෝපි** කුණු මස් රසය ද **අතිමදුරෝ** ඉතා මිහිරි වේද **අමතසදිසෝ ච** අමාවක් හා සම වූයේත් **හෝති** වේද (**තස්මා** එහෙයින් **න විභත්තං** නොබෙද වදරණ ලදයැ)

* අර්ථකථාචාර්‍ය්‍යයෝ පුද්ගල විභාගයක් නොකොට වදළ නමුදු කවර පුගුලක්හුගේ වශයෙන් ඉෂ්ටානිෂ්ට රූපය පිරිසිඳින ලදදැයි යන චෝදනාවට පරිහාර පිණිස "මජ්ඣිමකානං -පෙ- විභත්තං" යි දක්වත්.

**මජ්ඣිමකානං** හීනෝත්කෘෂ්ට පුද්ගලයන්ගේ අන්තරයෙහි වූ හෙයින් මධ්‍යම වූ **කාලේන** කිසිකලෙකැ **ඉට්ඨං** ඉටු අරමුණක් **කාලේන** කිසිකලෙකැ **අනිට්ඨං** අනිටු අරමුණක් **ලභමානානං** ලබන්නා වූ **ගණකමහාමත්තසෙට්ඨිකුටුම්බිකවාණිජාදීනං පන** -:- **ගණකමහාමත්ත** සෙනවිය මහා ඇමතිය **සෙට්ඨි** සිටුය **කුටුම්බික** කෙළෙඹිය **වාණිජාදීනං පන** වෙළඳදෙටුය යනාදී පුගුලන්ගේ **වසේන** වශයෙන් **විභත්තං** බෙද වදළ සේක නොහොත් **ගණක** -පෙ- **ආදීනං** සෙනවි මහා ඇමති -පෙ- ඈ පුගුලන්ගේ **කාලේන** කිසිකලෙකැ **ඉට්ඨං** ඉටු අරමුණක් **කාලේන** කිසිකලෙකැ **අනිට්ඨං** අනිටු අරමුණක් **ලභමානවසේන පන** ලැබීම් වශයෙන් වනාහි **විභත්තං** බෙද වදළ සේක.

* "ඉට්ඨං අනිට්ඨන්ති පදද්වයං ලභමානානං ඉති පදේ කම්මං" යි ද "ලභීයතේ ලභමානං භාවේමානප්පච්චයෝ ලභමානස්ස වසෝ පටිබද්ධෝ ලභමානවසෝ" යි ද යෝජනා ගත හෙයින් අර්ථ නය ද්වයම මෙහි යෙදේ. කවර හෙයකින් ඒ සේනාපත්‍යාදීන්ගේ වශයෙන් විභක්ත ද යන චෝදනාවට පරිහාර පිණිස "ඒවරූපාහි -පෙ- සක්කොන්ති" යි කියත්.

**හි** සැබෑව නොහොත් කවර හෙයින යත්? **ඒවරූපා** මෙබඳු වූ මධ්‍යම පුද්ගලයෝ **ඉට්ඨානිට්ඨං** ඉෂ්ටානිෂ්ටාලම්බන ද්වය **පරිච්ඡින්දිතුං** පිරිසිඳින්නට **සක්කොන්ති** හැකිවෙත් ද **ඉති** (**තස්මා** එහෙයින් **විභත්තං** බෙද වදළ සේක)

* සේන ප්‍රත්‍යාදී මධ්‍යම පුද්ගලයන්ගේ වශයෙන් ඉෂ්ටානිෂ්ටාලම්බනය විභත්ත යැයි කීමැ වනාහි ඔහුන්ගේ සඤ්ඤ විපර්‍ය්‍යාසයක් නොවන බැවින් ඉෂ්ටාලම්බනය ඉෂ්ටාලම්බනයයි ද අනිෂ්ටාලම්බනය අනිෂ්ටාලම්බනයයි ද ඇති සැටි ගන්නා හෙයින් කී පමණෙක්මය. එසේ වියු නමුදු ඉෂ්ටාලම්බනයෙහි කුශල විපාකයත් අනිෂ්ටාලම්බනයෙහි අකුශල විපාකයත් වන්නේ යයි නිශ්චය කොට දතයුතු හෙයින්

මූලටීකාචාර්‍ය්‍යයෝ "තඤ්ච මජ්ඣිමකසත්තස්ස වසේන වවත්ථිතං පකාසිතඤ්ච අඤ්ඤෙද්ඝඤ්ච විපල්ලාසවසේන ඉදං ඉට්ඨං අනිට්ඨඤ්ච හෝතීති අධිප්පායෝ" යනාදිය වියූහු. මෙසේ සත්තපඤ්ඤත්ති වශයෙන් ඉෂ්ටානිෂ්ටාලම්බනයන් ප්‍රභේද කොට දක්වා ප්‍රාප්තාවසරයෙහි පරමාර්ථ වශයෙන් ප්‍රභේද දක්වනු පිණිස "ත්‍රිපිටක චූලානාගත්ථේරෝ පනාහ" යනාදිය දක්වත්.

**ත්‍රිපිටකචූලනාගත්ථේරෝ පන** (තෙවලාධර) ත්‍රිපිටක චූලනාග තෙරුන් වන්සේ වනාහි **ආහ** වදළ සේක **ඉට්ඨානිට්ඨං නාම** ඉෂ්ටාලම්බනය අනිෂ්ටාලම්බනය නම් **විපාකවසේනේව** විපාකයාගේ වශයෙන්මැ **පරිච්ඡින්නං** පිරිසිඳන ලදයැ **ජවනවසේන** ජවන්හුගේ වශයෙන් **න** නොපිරිසිඳින ලදයැ (කවර හෙයකින් ජවන් වශයෙන් නොපිරිසිඳින ලද ද යන චෝදනාවට පරිහාර පිණිස "ජවනම්පන -පෙ- දුස්සතීති" යන පාඨය දක්වත්) **ජවනම්පන** ජවනය වනාහි **සඤ්ඤාවිපල්ලාසවසේන** සඤ්ඤා විපර්‍ය්‍යාස වශයෙන් **ඉට්ඨස්මිංයේව** ඉෂ්ටාලම්බනයෙහිමැ **රජ්ජති** ඇලෙයි **ඉට්ඨස්මිංයේව** ඉෂ්ටාලම්බනයෙහිමැ **දුස්සති** කිපෙයි (නොඇලෙයි යුසේයි) **අනිට්ඨස්මිංයේව** අනිෂ්ටාලම්බනයෙහිමැ **රජ්ජති** ඇලෙයි **අනිට්ඨස්මිංයේව** අනිෂ්ටාලම්බනයෙහිමැ **දුස්සති** කිපෙයි (නොඇලෙයි යුසේයි. ඉති ශබ්දයා පරිසමාප්තියෙහියැ) **විපාකවසේනේව පන** විපාකයාගේ වශයෙන්මැ **ඒතං** ඒ ඉෂ්ටාලම්බන අනිෂ්ටාලම්බන ද්වය **ඒකන්තතෝ** ඒකාන්තයෙන් **පරිච්ඡින්දති** පිරිසිඳින්නේයැ හෙවත් විනිශ්චය කරන්නේයැ **හි** ඒ එසේමැයි **විපාකචිත්තං** විපාක චිත්තය **වඤ්චේතුං** වරදන්නට හෝ රවටන්නට **න සක්කා** නොහැක්ක.

***** විපාකයාගේ වශයෙන් ඉෂ්ටාලම්බනය හා අනිෂ්ටාලම්බනය පිරිසිඳිනා ලද්දේ කෙසේද යන චෝදනාවට පරිහාර පිණිස "සචේ ඉට්ඨාරම්මණං -පෙ- අකුසලවිපාකං උප්පජ්ජති" යන පාඨය දක්වත්.

**ආරම්මණං** අරමුණ **ඉට්ඨං** ඉටු අරමුණෙක් **සචේ හෝති** ඉඳින් වේ නම් **කුසලවිපාකං** කුශල විපාක චිත්තෝත්පාද තෙම **උප්පජ්ජති** උපදනේය **අනිට්ඨං** අනිටු අරමුණෙක් (**සචේ හෝති** ඉඳින් වේ නම්) **අකුසලවිපාකං** අකුශල විපාක චිත්තෝත්පාද තෙම **උප්පජ්ජති** උපදනේය **ඉති** මෙපරිද්දෙන් (**පරිච්ඡිජ්ජති** පිරිසිඳින්නේ හෙවත් විනිශ්චය කරන්නේයි)

***** අර්ථකථාචාර්‍ය්‍යයෝ වනාහි ඉෂ්ටාලම්බනයෙක් වේ නම් කුශල විපාකය ද අනිෂ්ටාලම්බනයෙක් වේ නම් අකුශල විපාකය ද උපදනේ යැයි වැණූහ. එහෙත් මිත්‍යාදෘෂ්ටි ගත් පුද්ගලයන්ට ඒකාන්ත ඉෂ්ටාලම්බන වූ බුද්ධරූපාදී ආලම්බනයෙහිදු දෙම්නස් ජවන් උපදනා හෙයින් ජවනානුරූපවැ ඉෂ්ටාලම්බනයෙහිදු අකුශල විපාකය වියු යුත්තේ නොවේ ද? ශුනඛ සූකරාදීන්ට ඒකාන්ත අනිෂ්ටාලම්බන වූ මූත්‍ර පුරීෂාදී දර්ශනයෙහි දෙම්නස් ජවන් උපදනා හෙයින් ජවනානුරූපවැ අනිෂ්ටාලම්බනයෙහිදු කුශල විපාකය විය යුත්තේ නොවේද යන චෝදනාවට පරිහාර පිණිස "කිඤ්චාපිහි මිච්ඡාදිට්ඨිකා" යනාදිය දක්වත්.

**හි** ඒ කීම සැබෑව හෙවත් ඉටු අරමුණෙහි කුසල් විපාකයත් අනිටු අරමුණෙහි අකුසල් විපාකයත් වේ යයි කී තෙපුල එසේමය **මිච්ඡාදිට්ඨිකා** මිසදිටුවෝ **බුද්ධං වා** බුදුරජාණන් වහන්සේ හෝ **සඞ්ඝං වා** සඞ්ඝරත්නය හෝ **මහාචේතියාදීනි** රුවන්මැලි මහාසෑය මුල් කොට ඇති **උළාරානි** උදර වූ **ආරම්මණානි වා** අරමුණු හෝ **දිස්වා** දැක **අක්ඛීනි** ඇස් **කිඤ්චාපි පිදහන්ති** ඉඳින් පියත් නමුදු **දෝමනස්සං** චිත්ත

දුක්ඛානුභවයට හෙවත් දෙම්නසට **(කිඤ්චාපි) ආපජ්ජන්ති** ඉදින් පැමිණෙත් නමුදු **ධම්මසද්දං** බණ දෙසන පිරිවහන හඬ **සුත්වා** අසා **කණ්ණේ** කන්සඟළු **(කිඤ්චාපි) ඨකෙන්ති** ඉදින් වසත් නමුදු **පන** එසේවුවද **තේසං** ඒ මිසදිටුවන්ගේ **චක්ඛුවිඤ්ඤාණසෝතවිඤ්ඤාණානි** චක්‍ෂුර්විඥානශ්‍රෝත්‍රවිඥානයෝ **කුසලවිපාකානේව** කුශල විපාක චිත්තයෝමැ **හොන්ති** වෙත් **ගූථසූකරාදයෝ** ගූථ භක්‍ෂක සූකරාදී ප්‍රාණිහු **ගූථගන්ධං** අසුචි ගන්ධය **ඝායිත්වා** ආඝ්‍රාණය කොටැ **ඛාදිතුං** කන්නට **ලභිස්සාමාති** ලබන්නෙමුයි **සෝමනස්සජාතා** හටගත් සොම්නස් ඇත්තාහු ඒ ගූථ භක්‍ෂක සූකරාදි ප්‍රාණීන්ගේ **ගූථදස්සනේ** අසුචි දර්ශනයෙහි **චක්ඛුවිඤ්ඤාණඤ්ච** චක්‍ෂුර්විඥානය ද **තස්ස** ඒ අසුචියගේ **ගන්ධඝායනේ** ගන්ධාඝ්‍රාණයෙහි **ඝානවිඤ්ඤාණඤ්ච** ඝ්‍රාණවිඥානය ද **රසසායනේ** රසාශ්වදනයෙහි **ජිව්හාවිඤ්ඤාණඤ්ච** ජිව්හාවිඥානය ද **අකුසලවිපාකමේව** අකුශල විපාක චිත්තයමැ **හෝති** වේ **බන්ධිත්වා** බැඳ **වරසයනේ** උතුම් යහනෙක්හි **සයාපිතසූකරෝ ච** ශයනය කරවූ සූකරතෙමේ ද **කිඤ්චාපි විරවති** ඉදින් මොරගසා නමුදු **පන** එසේවුවද **සඤ්ඤාවිපල්ලාසේන** සඥා විපර්‍ය්‍යාසයෙන් **අස්ස** ඒ ශයනය කරවූ සූකරයාගේ **ජවනස්මිංයේව** ජවන් සිතෙහිමැ **දෝමනස්සං** දෙම්නස් වේදනා තොමෝ **උප්පජ්ජති** උපදී **කායවිඤ්ඤාණං** කායවිඥානය තෙමේ **කුසලවිපාකමේව** කුශල විපාකමැ වේ **කස්මා?** කවරහෙයින යත්? **ආරම්මණස්ස** අරමුණ **ඉට්ඨතාය** ඉටු බැවින ෴

***** මෙසේ විපාක වශයෙන් ඉෂ්ටාලම්බන අනිෂ්ටාලම්බනයන් පිරිසිඳ දක්වා දැන් ද්වාර වශයෙන් ඉෂ්ටාලම්බන අනිෂ්ටාලම්බනයන් පිරිසිඳ දක්වනු පිණිස "අපිච ද්වාරවසේනාපි -පෙ- ඒකන්තතෝ විපාකේනේව පරිච්ඡිජ්ජති" යන පාඨය දක්වත් ෴

**අපිච** අනික් නයෙක් කියනු ලැබේ **ද්වාරවසේනාපි** ද්වාරයන්ගේ වශයෙනුදු **ඉට්ඨානිට්ඨතා** ඉෂ්ටාලම්බනානිෂ්ටාලම්බනතා තොමෝ **වේදිතබ්බා** දතයුත්තීයැ **හි** විස්තර කෙරෙම් **සුඛසම්ඵස්සං** සුඛ ස්පර්ශ ඇති **ගූථකලලං** අසුචි කර්දමය තෙමේ **චක්ඛුද්වාරඝානද්වාරේසු** චක්‍ෂුද්වාර ඝ්‍රාණද්වාරයන්හි **අනිට්ඨං** අනිටු අරමුණෙක් **හෝති** වේ **චක්කවත්තිනෝ** සක්විති රජක්හුගේ **මණිරතනේන** මාණික්‍ය රත්නය කරණකොටගෙන **පෝථියමානස්ස ච** තාඩනය කරනුලබන ජනයාගේ ද **සුවණ්ණසූලේ** සුවර්ණ ශූලයෙහි **උත්තාසිතස්ස ච** උත්‍රාසයට පැමිණි ජනයාගේ ද (නගාළුඃ ජනයාගේ ද යුසේයි) **මණිරතනසුවණ්ණසූලානි** මාණික්‍ය රත්න ස්වර්ණ ශූලයෝ **චක්ඛුද්වාරේ** චක්‍ෂුද්වාරයෙහි **ඉට්ඨානි** ඉෂ්ටාලම්බනයෝ **හොන්ති** වෙත් **කායද්වාරේ** කායද්වාරයෙහි **අනිට්ඨානි** අනිෂ්ටාලම්බනයෝ (**හොන්ති** වෙත්) **කස්මා?** කවරහෙයින්ද යත්? **මහාදුක්ඛස්ස** ඉමහත් වූ දුකක් **උප්පාදනතෝ** උපදවන හෙයින **ඒවං** මේ කියනලද නයින් **ඒකන්තතෝ** නියත වශයෙන් **විපාකේනේව** විපාකයා විසින්මැ **ඉට්ඨානිට්ඨං** ඉෂ්ටාලම්බන අනිෂ්ටාලම්බන ද්වය **පරිච්ඡිජ්ජතීති** පිරිසිඳිනු ලැබේයයි **වේදිතබ්බං** දතයුතුයි **තං තං වා පනාති** එතථ තං තං වා පන යන මේ පාඨයෙහි **හෙට්ඨිමනයෝ** යට කී නය තෙමේ **න ඕලෝකේතබ්බෝ** අපේක්‍ෂා නොකටයුතු ෴

***** මධ්‍යම සත්වයන්ගේ ද විපාකයන්ගේ ද වශයෙන් පිරිසිඳ දක්වා වදළ අරමුණ ගෙන "තත්ථ කතමං රූපං තේසං තේසං සත්තානං උඤ්ඤාතං අවඤ්ඤාතං" යනාදී ස්වරූපයෙන් දැක්වූ නයෙමැ හෙට්ඨිම නයයි දතයුතු බැව් මූලටීකාචාර්‍ය්‍යයෝ යුහු. "හෙට්ඨිමනයෝති මජ්ඣිමකසත්තස්ස විපාකස්ස ච වසේන වවත්ථිතං ආරම්මණං

ගහෙත්වා තේසං තේසං උඤ්ඤදතන්ති ආදිනා වුත්තනයෝ" යි "තං තං වා පන" යන්නෙහි තත් ශබ්දයා ප්‍රක්‍රාන්ත විෂයෙහි නොවැ ප්‍රසිද්ධ විෂයෙහි වැටේ.

**[විභඞ්ග අටුවා සන්නය 41- 53 පිටු]**

කුසලාකුසලානං පන අප්පහීනවිපල්ලාසේසු සන්තානේසු පවත්තියා අතිඉට්ඨේපි ඉට්ඨමජ්ඣත්තඅනිට්ඨාකාරතෝ, අනිට්ඨේපි ඉට්ඨ ඉට්ඨමජ්ඣත්තාකාරතෝ ගහණං හෝති. තථා හි අස්සද්ධාදීනං බුද්ධාදීසු අතිඉට්ඨාරම්මණේසුපි උපෙක්ඛාජවනං හෝති, තිත්ථියාදීනඤ්ච දෝමනස්සජවනං, ගම්භීරපකතිකාදීනඤ්ච පටික්කූලාරම්මණේ උපෙක්ඛාජවනං, සූනඛාදීනඤ්ච තත්ථ සෝමනස්සජවනං, පුරිමපච්ඡාභාගප්පවත්තානි පන විපාකානි යථාවත්ථුකානේව. අපිච අසුචිදස්සනේ සුමනායමානානං සූනඛාදීනන්ති.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා තදරම්මණනියමවණ්ණනා අංක 26 යටතේ); විභාවනී ටීකා 208 පිට]**

**කුසලාකුසලානං පන** කුසලාකුසලයන්ගේ වනාහි (පවත්තියා යන්නෙහි සම්බන්ධයි) **අප්පහීණවිපල්ලාසේසු** මාර්ගයෙන් නිරවශේෂ ප්‍රහාණය නොකළාවූ ක්ලේශයෝ යයි කියනලද විපරීතය ඇත්තා වූ **සන්තානේසු** සත්ව සන්තානයෙහි **පවත්තියා** හටගැනීම වන හෙයින් **අතිඉට්ඨේපි** ඉතා කැමති අරමුණෙහි ද **ඉට්ඨමජ්ඣත්තඅනිට්ඨාකාරතෝ** මැදහත් කැමති ආකාරයෙන් හා නොකැමති ආකාරයෙන් **අනිට්ඨේපි** නොකැමති අරමුණෙහි ද **ඉට්ඨඉට්ඨමජ්ඣත්තාකාරතෝ** කැමති ආකාරයෙන් හා මධ්‍යස්ථව කැමති ආකාරයෙන් ද **ගහණං** ගැනීම **යස්මා හෝති** යම්හෙයකින් වේද **තස්මා** එසේ හෙයින් **තානි කුසලානි** ඒ කුසලයෝ තුමූ **අයථාරම්මණානි හොන්ති** අරමුණු වූ පරිද්දෙන් නොවෙත් (මෙසේ පාඨශේෂ බහා අර්ථ යෝජනා කටයුතුයි) (කුමක් හෙයින් මේ කියනලද නයින් කුසලාකුසලයෝ තුමූ වන්නාහු ද යන චෝද්‍යය සඳහා "තථාහි -පෙ- ජවනං" යන පාඨය කියනලදි) **තථා (තං වචනං)** ඒ වචනය **හි (යුත්තං)** යෙදේ **අස්සද්ධාදීනං** ශ්‍රද්ධාව නැත්තාවූ පුද්ගලාදීන්ට **බුද්ධාදීසු අතිඉට්ඨාරම්මණේසුපි** බුද්ධාදී ඉතා කැමති අරමුණෙහිදු **උපෙක්ඛාජවනං හෝති** උපේක්‍ෂා සහගිය ජවනය වේ **තිත්ථියානඤ්ච** තීර්ථකාදීන්ට ද **දෝමනස්සජවනං හෝති** දෙම්නස් ජවන වේ **ගම්භීරපකතිකානඤ්ච** ගැඹුරු වූ ධ්‍යානඞ්ග ස්වභාව ඇත්තා වූ පුද්ගලයන්ට ද **පටික්කූලාරම්මණේ** පිළිකුල් කටයුතු අරමුණෙහි **උපෙක්ඛාජවනං හෝති** උපේක්‍ෂා සහගිය ජවන් වේ **සූනඛාදීනඤ්ච** බලු කවුඩු ආදීන්ට ද **තත්ථ** ඒ පිළිකුල් අරමුණෙහි **සෝමනස්සජවනං හෝති** සොම්නස් සහගිය ජවන් වේ (අස්සද්ධාදීනං යන්නෙහි ආදි ශබ්දයෙන් රතනත්‍රයෙහි ගුණ නොදන්නා අඤ්ඤදණ සත්වයෝ ගැනෙත්. බුද්ධාදීසු යන්නෙහි ආදි ශබ්දයෙන් ධර්ම සඞ්ඝ යන රත්නද්වය ගැනෙත්. තිත්ථියාදීනං යන්නෙහි ආදි ශබ්දයෙන් බුද්ධාදී වූ සාධු සත්පුරුෂයන්ට විපක්‍ෂයන් ගැනෙත්. සූනඛාදීනං යන්නෙහි ආදි ශබ්දයෙන් හූරු කපුටු ආදී සත්වයෝ ගැනෙත්) (ආචාර්නි කුසලාකුසලයෝ තුමූ අරමුණු වූ පරිද්දෙන් නොවන්නාහු යයි කීයේය. එසේ වී නම් කුසලාකුසලයන්ට පෙර පසුව හටගන්නා වූ විපාක චිත්තයෝ තුමූ කෙසේ හටගන්නාහු ද යන චෝද්‍යය වළක්වනු පිණිස "පුරිම -පෙ- සූනඛාදීනං" යන පාඨය කියනලදි) **පුරිමපච්ඡාභාගප්පවත්තානි** පූර්වභාග පශ්චාද්භාගයෙහි හටගන්නා වූ **විපාකානි පන** විපාකයෝ වනාහි **අසුචිදස්සනේ සති** අමෙද්ධ්‍ය දර්ශනයක් ඇති කල්හි **සුමනායමානානං** සතුටුවනු ලබන්නා වූ සිත් ඇත්තා වූ **සූනඛාදීනං** බලු කවුඩු ආදීන්ට **යථාවත්ථුකානේව හොන්ති** අරමුණ වූ පරිද්දෙන්ම වෙත් (ඉති ශබ්දය පරිසමාපනාර්ථයි) (යථාවත්ථුකානේව යන්නෙහි වත්ථු ශබ්ද තෙමේ

මෙතන්හි ආලම්බන වාචක වේ. "වසන්ති පතිට්ඨහන්ති ආරම්මණිකා එත්ථාති වත්‍ථු" යි අධිකරණසාධන විග්‍රහ කටයුතුයි) **[විභාවනී ටීකා සන්නය 85-86 පිටු]**

ඉච්ඡිතබ්බන්ති ඉට්ඨං. කේන ඉච්ඡිතබ්බන්ති. ලෝකියමහාජනේන. තත්ථ ච අතිඋක්කට්ඨේ අතිදුග්ගතේච ජනේ අගහෙත්වා මජ්ඣිමකේන මහාජනේන. ඒවඤ්හි සති ඉට්ඨානිට්ඨානං සුට්ඨුවවත්ථානං හෝතීති අට්ඨකථායං වුත්තං. යස්මිං ආරම්මණේ කුසලවිපාකං උප්පජ්ජති, තදේව ඉට්ඨං නාම. යස්මිං පන අකුසලවිපාකං උප්පජ්ජති, තදේව අනිට්ඨං නාම. න හි සක්කා ඉට්ඨංවා අනිට්ඨංවා ආරම්මණං විපාකචිත්තං වඤ්චේතුන්තිච. අපිච ද්වාරවසේනාපි ඉට්ඨානිට්ඨතා වේදිතබ්බාති ච වුත්තං. තස්මා ඉන්ද්‍රියානින්ද්‍රියබද්ධසන්තානගතේ ඒකේකස්මිං රූපකලාපේ වණ්ණාදීසු රූපේසු කිඤ්චි ඉට්ඨං හෝති. කිඤ්චි අනිට්ඨං. කදාචි ඉට්ඨං හෝති. කදාචි අනිට්ඨං, තත්ථ කිඤ්චි ඉට්ඨං හෝති කිඤ්චි අනිට්ඨන්ති යථා කිස්මිංචි එකස්මිං පුප්ඵේ වණ්ණෝ ඉට්ඨෝ. ගන්ධෝ අනිට්ඨෝ, රසෝ අනිට්ඨෝ, ඵොට්ඨබ්බෝ අනිට්ඨෝ, ඛරසම්ඵස්සෝ. කිස්මිංචි වණ්ණෝපි ඉට්ඨෝ, ගන්ධෝපි ඉට්ඨෝ, රසාදයෝ අනිට්ඨායේව. තථා බුද්ධස්ස සරීරගතේපි ඒකස්මිං කලාපේ වණ්ණෝ ඉට්ඨෝ හෝති. ගන්ධෝ අනිට්ඨෝ. මතකණ්හසුනඛස්ස උද්ධුමාතසරීරේපි වණ්ණෝ ඉට්ඨෝ හෝති. ගන්ධෝ අනිට්ඨෝ. සෝ හි වණ්ණෝ යදි නිවත්ථපාරුතස්ස වත්ථස්ස භවෙය්‍ය. තං වත්ථං මහග්ඝං හෝතීති. කදාචි ඉට්ඨං කදාචි අනිට්ඨන්ති අග්ගිනාම හේමන්තේ ඉට්ඨෝ සුඛවිපාකස්ස පච්චයෝ. ගිම්හේ අනිට්ඨෝ දුක්ඛවිපාකස්ස පච්චයෝ. සීතුදකං ගිම්හේ ඉට්ඨං. හෙමන්තේ අනිට්ඨං. තථා සුඛසම්ඵස්සං වත්ථං පකතිකායේ ඉට්ඨං හෝති. වණං පත්වා අනිට්ඨං. තේනවා සණිකං ඵුසන්තස්ස ඉට්ඨං, ගාළ්හං ඵුසන්තස්ස අනිට්ඨන්ති. න ඉට්ඨන්ති අනිට්ඨං.

**[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 139 යටතේ)]**

"සබ්බථා පී"ති ආදීසු. ලෝකේ මජ්ඣිමකේහි මහාජනේහි ඉච්ඡිතම්පි කිඤ්චි ආරම්මණං අතිඋක්කට්ඨේහි මන්ධාතුරාජාදීහි ඉච්ඡිතං න හෝති. තථා තේහි මහාජනේහි අනිච්ඡිතම්පි කිඤ්චි ආරම්මණං අතිදුග්ගතේහි පච්චන්තවාසීහි ඉච්ඡිතං හෝති. තස්මා ආරම්මණානං ඉට්ඨානිට්ඨවවත්ථානං පත්වා අතිඋක්කට්ඨේහි ච අතිදුග්ගතේහි ච වවත්ථානං න ගච්ඡති, මජ්ඣිමකේහි ඒව වවත්ථානං ගච්ඡති. තේනාහ "තත්ථ චා"ති ආදිං. "ආරම්මණං"ති කත්තුපදං. "විපාකචිත්තං"ති කම්මපදං. "කිඤ්චී"ති කිඤ්චි රූපං. "කිස්මිඤ්චී"ති කස්මිංචි ඒකස්මිං පුප්ඵේ. "තේන වා"ති තේන වා සුඛසම්ඵස්සේන වත්ථේන. සේසමෙත්ථ සුවිඤ්ඤෙය්‍යං.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 139 යටතේ)]**

**ඉච්ඡිතබ්බන්ති ඉට්ඨං** කැමතිවිය යුත්තේනුයි ඉෂ්ට නම් **ඉච්ඡිතබ්බං** කැමතිවිය යුත්තේ **කේනාති?** කවරෙකු විසින් ද? **ලෝකියමහාජනේන** ලෞකික මහාජනයා විසින් (**ඉච්ඡිතබ්බං** කැමතිවිය යුතුයි)

(ටීකාචාර්‍ය්‍යයෝ පුද්ගල විභාගයක් නොකොට වදළ නමුදු කවර පුද්ගලයෙකුගේ වශයෙන් ඉෂ්ටානිෂ්ට රූපය පිරිසිඳින ලදදැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "තත්ථ ච -පෙ- මහාජනේ" යි දක්වත්)

**තත්ථ ච** ඒ ලෞකික මහාජනයා අතුරින් ද **අතිඋක්කට්ඨේ** ඉතා පොහොසත් වූද **අතිදුග්ගතේ ච** ඉතා දුප්පත් වූද **ජනේ** මහාජනයා **අගහෙත්වා** නොගෙන **මජ්ඣිමකේන මහාජනේන** මධ්‍යම වූ මහාජනයා විසින් (**ඉච්ඡිතබ්බං** කැමතිවිය

යුතුයි) (ලෝකයෙහි මධ්‍යම මහාජනයන් විසින් කැමතිවනලද කිසියම් අරමුණක් ඉතා පොහොසත් වූ මන්ධාතු රාජාදීහු විසින් නොකැමැති වෙයි. එසේම ඉතා පොහොසත් මහජනයන් විසින් නොකැමැති වනලද කිසියම් අරමුණක් ප්‍රත්‍යයන්ත වාසී දුප්පත් මහාජනයන් විසින් කැමැති වෙයි. එබැවින් ආරම්මණයන්ගේ ඉටු අනිටු ව්‍යවස්ථාපනයට පැමිණ ඉතා පොහොසත් වූද ඉතා දුප්පත් වූද මහාජනයන් විසින් කරණලද ව්‍යවස්ථාපනයට නොයයි. මධ්‍යම මහාජනයා විසින්ම කරණලද ව්‍යවස්ථාපනයට යයි. ඒනිසා "**තත්‍ථ ච**" යනාදිය කියනලදි. අනුදීපනීපාඨයි) **ඒවඤ්හි සති** මෙසේ ඇති කල්හි **ඉට්ඨානිට්ඨානං** ඉෂ්ට අනිෂ්ටයන්ගේ **සුට්ඨුවවත්ථානං** මනාව කරනලද ව්‍යවස්ථානයක් **හෝතීති** වේ යැයි **අට්ඨකථායං** අර්ථකථායෙහි **වුත්තං** කියනලදි **යස්මිං ආරම්මණේ** යම් අරමුණෙක්හි **කුසලවිපාකං** කුසල විපාක චිත්තයක් **උප්පජ්ජති** උපදී ද **තදේව** ඒ අරමුණම **ඉට්ඨං නාම** ඉෂ්ට නම් වේ **යස්මිං පන (ආරම්මණේ)** යම් අරමුණෙක්හි වනාහි **අකුසලවිපාකං** අකුසල් විපාක චිත්තයක් **උප්පජ්ජති** උපදී ද **තදේව** ඒ අරමුණම **අනිට්ඨං නාම** අනිෂ්ට නම් වේ **ච** ඒ කීම සැබෑවකි **ඉට්ඨං වා** ඉෂ්ට වූ හෝ **අනිට්ඨං වා** අනිෂ්ට වූ හෝ **ආරම්මණං** අරමුණ තෙම **විපාකචිත්තං** විපාක චිත්තය **වඤ්චේතුං** වඤ්චා කරන්නට **න හි සක්කා** නොහැක්කේය **අපිච** එසේ කීවේ නමුදු **ද්වාරවසේනාපි** ද්වාර වශයෙන් ද **ඉට්ඨානිට්ඨතා** ඉටු අනිටු බව **වේදිතබ්බාති ච** දතයුතුයයි ද **වුත්තං** කියනලදි **තස්මා** එබැවින් **ඉන්ද්‍රියානින්ද්‍රියබද්ධසන්තානගතේ** ඉන්ද්‍රිය අනින්ද්‍රිය හා බැඳුණු සන්තානගත **ඒකේකස්මිං රූපකලාපේ** එක් එක් රූප කලාපයක **වණ්ණාදීසු රූපේසු** වර්ණ ආදී රූපයන් අතුරින් **කිඤ්චි (රූපං)** කුමන රූපයක් **ඉට්ඨං හෝති?** ඉෂ්ට වෙයි ද? **කිඤ්චි (රූපං)** කුමන රූපයක් **අනිට්ඨං (හෝති?)** අනිෂ්ට වෙයි ද? **කදචි** කවර කලෙක (**රූපං** රූපය තෙමේ) **ඉට්ඨං හෝති?** ඉෂ්ට වෙයි ද? **කදචි** කවර කලෙක (**රූපං** රූපය තෙමේ) **අනිට්ඨං (හෝති?)** අනිෂ්ට වෙයි ද? **තත්‍ථ** මේ ප්‍රශ්න කර්මයෙහි මතු ව්‍යක්‍ෂමාන වන්නාවූ විසඳීම දතයුත්තේයි **කිඤ්චි ඉට්ඨං හෝති කිඤ්චි අනිට්ඨං හෝති** කිඤ්චි ඉට්ඨං හෝති කිඤ්චි අනිට්ඨං හෝති **ඉති** යන ප්‍රශ්න කර්මයෙහි මේ පරිහාරයයි **යථා** යම්සේ **කිස්මිඤ්චි ඒකස්මිං පුප්ඵේ** කිසියම් එක් පුෂ්පයෙක්හි **වණ්ණෝ** වර්ණය තෙමේ **ඉට්ඨෝ (හෝති)** ඉෂ්ට වෙයි **ගන්ධෝ** ගන්ධය තෙමේ **අනිට්ඨෝ (හෝති)** අනිෂ්ට වෙයි **රසෝ** රසය තෙමේ **අනිට්ඨෝ (හෝති)** අනිෂ්ට වෙයි **ඛරසම්ඵස්සෝ ඵොට්ඨබ්බෝ** රළු වූ ඵොට්ඨබ්බය තෙමේ **අනිට්ඨෝ (හෝති)** අනිෂ්ට වෙයි **කිස්මිඤ්චි (ඒකස්මිං පුප්ඵේ)** කිසියම් එක් පුෂ්පයෙක්හි **වණ්ණෝපි** වර්ණය තෙමේ ද **ඉට්ඨෝ (හෝති)** ඉෂ්ට වෙයි **ගන්ධෝපි** ගන්ධය තෙමේ ද **ඉට්ඨෝ (හෝති)** ඉෂ්ට වෙයි **රසාදයෝ** රස ඵොට්ඨබ්බය තුමූ ද **අනිට්ඨායේව (හොන්ති)** අනිෂ්ටයෝම වෙත් **තථා** එසේම **බුද්ධස්ස** භාග්‍යවතුන් වහන්සේගේ **සරීරගතේපි** ශරීරගත වූ **ඒකස්මිං කලාපේ** එක් රූපකලාපයෙක්හි **වණ්ණෝ** වර්ණය තෙමේ **ඉට්ඨෝ හෝති** ඉෂ්ට වෙයි **ගන්ධෝ** ගන්ධය තෙමේ **අනිට්ඨෝ (හෝති)** අනිෂ්ට වෙයි **මතකණ්හසුනඛස්ස** මැරුණු කළු වර්ණ ඇති සුනඛයෙකුගේ **උද්ධුමාතසරීරේපි** ඉදිමුණු මළ සිරුරෙහි ද **වණ්ණෝ** වර්ණය තෙමේ **ඉට්ඨෝ හෝති** ඉෂ්ට වෙයි **ගන්ධෝ** ගන්ධය තෙමේ **අනිට්ඨෝ (හෝති)** අනිෂ්ට වෙයි **යදි හි** ඉඳින් වනාහි **සෝ වණ්ණෝ** ඒ වර්ණය තෙමේ **නිවත්‍ථපාරුතස්ස වත්ථස්ස** හඳින පොරවන වස්ත්‍රයාගේ **භවෙය්‍ය** වන්නේ නම් **තං වත්‍ථං** ඒ වස්ත්‍රය ද **මහග්ඝං හෝති** මාහැඟි ද වෙයි.

**කදචි ඉට්ඨං කදචි අනිට්ඨං** කදචි ඉට්ඨං කදචි අනිටඨං **ඉති** යන ප්‍රශ්න කර්මයෙහි මේ පරිහාරයයි **අග්ගි නාම** ගින්න නම් **හේමන්තේ** හේමන්ත ඍතුවෙහි **ඉට්ඨෝ (හෝති)** ඉෂ්ට වෙයි **සුඛවිපාකස්ස** සැප විපාකයට **පච්චයෝ (හෝති)** ප්‍රත්‍යය

ද වෙයි **ගිම්හේ** ගිම්හාන ඍතුවෙහි **අනිට්ඨෝ (හෝති)** අනිෂ්ට වෙයි **දුක්ඛවිපාකස්ස** දුක් විපාකයට **පච්චයෝ (හෝති)** ප්‍රත්‍යය ද වෙයි **සීතුදකං** සිසිල් ජලය **ගිම්හේ** ගිම්හාන ඍතුවෙහි **ඉට්ඨං (හෝති)** ඉෂ්ට වෙයි **හේමන්තේ** හේමන්ත ඍතුවෙහි **අනිට්ඨං (හෝති)** අනිෂ්ට වෙයි **තථා** එසේම **සුඛසම්ඵස්සං** සැප ස්පර්ශ ඇති **වත්ථං** වස්ත්‍රය **පකතිකායේ** ප්‍රකෘති කයෙහි **ඉට්ඨං හෝති** ඉෂ්ට වෙයි **වණං පත්‍වා (වණං පත්තකායේ)** වණයට පැමිණි කයෙහි **අනිට්ඨං (හෝති)** අනිෂ්ට වෙයි **තේන වා** සැප ස්පර්ශ ඇති වස්ත්‍රයෙන් **සනිකං** හෙමින් **ඵුසන්තස්ස** ස්පර්ශ කරන්නහුට **ඉට්ඨං (හෝති)** ඉෂ්ට වෙයි **ගාළ්හං** තදින් **ඵුසන්තස්ස** ස්පර්ශ කරන්නහුට **අනිට්ඨං ඉති (හෝති)** අනිෂ්ට වෙයි **තස්මිං අනිට්ඨේ** ඒ අනිෂ්ට පදයෙහි පදර්ථය මෙසේය **න ඉට්ඨන්ති** ඉෂ්ට නොවේනුයි **අනිට්ඨං** අනිෂ්ට නමි. **[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

නනු ඉට්ඨානිට්ඨං නාම පාටෙක්කං පටිවිභත්තං නාම නත්ථි, ඒකං ඒකච්චස්ස ඉට්ඨං හෝති මනාපං, තදේව අඤ්ඤස්ස ච අනිට්ඨං හෝති. වත්ථාදීනි හි සූකරාදීනං නප්පියානි හොන්ති, න මනුස්සාදීනං, තේසඤ්ච වත්ථාභරණාදීනි පියානි, න සූකරාදීනන්ති, තස්මා රුචිවසේනේව ඉට්ඨානිට්ඨතා ගහේතබ්බා? න, ඉට්ඨානිට්ඨානං පාටෙක්කං විභත්තත්තා. කුසලකම්මජං හි කුසලවිපාකවිසයෝව ඉට්ඨං නාම, අකුසලකම්මජං අකුසලවිපාකවිසයෝව අනිට්ඨං නාම, සඤ්ඤාවිපල්ලාසේන පන කෝචි ඉට්ඨමේව බුද්ධරූපාදිං ජවනක්ඛණේ අනිට්ඨතෝ මනසි කරෝති, අනිට්ඨඤ්ච නිරයග්ගිසත්ථවිසාදිං ඉට්ඨතෝ මනසි කරෝති. ජවනේහි ඒව විපල්ලාසභාවෝ, න විපාකේහීති විපාකවසේන ඉට්ඨානිට්ඨං නියතං වේදිතබ්බං.

**සම්මෝහවිනෝදනියා** පන විභඞ්ගට්ඨකථාය; "සුඛසම්ඵස්සං හි ගූථකලලං චක්ඛුද්වාරඝානද්වාරේසු අනිට්ඨං, කායද්වාරේ ඉට්ඨං හෝති. චක්කවත්තිනෝ මණිරතනේන පෝථියමානස්ස, සුවණ්ණසූලේ උත්තාසියමානස්ස ච මණිරතනසුවණ්ණසූලානි චක්ඛුද්වාරේ ඉට්ඨානි හොන්ති, කායද්වාරේ අනිට්ඨානී"ති (විභ. අට්ඨ. 6) ඒවං ද්වාරවසේන ඒකස්සේව වත්ථුනෝ ඉට්ඨතා, අනිට්ඨතා ච වුත්තා. සා ච ඒකක්ඛණේ න යුත්තා ඒකකලාපගතභූතෝපාදායරූපානං ඒකසාමග්ගියමුප්පත්තිතෝ. න හි භූතේසු අකුසලවසේන අනිට්ඨේසු උප්පජ්ජන්තේසු තදුපාදායරූපාදිකුසලේන ඉට්ඨානි උප්පජ්ජන්ති, භින්නක්ඛණේ පන ඉට්ඨානි මණිරතනාදීනි තේහි පෝථියමානස්ස අකුසලපච්චයේන උතුනා අනිට්ඨානි විපරිණාමන්ති, කුසලපච්චයේන අනිට්ඨානි ගූථකලලාදීනි ඉට්ඨානීති, අයං නෝ අත්තනෝමති. **[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා ඛන්ධවිභඞ්ගමාතිකත්ථ වණ්ණනා යටතේ)]**

**ඉට්ඨානිට්ඨං නාම** ඉෂ්ට අනිෂ්ට රූපය නම් **පාටෙක්කං** වෙන වෙනම **පටිවිභත්තං නාම** බෙදීමක් නම් **නත්ථි නනු?** නැත්තේ නොවේද? **ඒකං** එක් අරමුණක් **ඒකච්චස්ස** ඇතැමෙකුට **ඉට්ඨං හෝති** ඉෂ්ට වෙයි **මනාපං (හෝති)** මනාප වෙයි **තදේව** ඒ අරමුණම **අඤ්ඤස්ස** අන්‍යයෙකුට **අනිට්ඨං ච** අනිෂ්ට ද **හෝති** වෙයි **හි** උපමාවක් දක්වමි **වත්‍ථාදීනි** වස්ත්‍රාදිය **සූකරාදීනං** සූකරාදීන්ට **නප්පියානි හොන්ති** ප්‍රිය නොවෙත් **මනුස්සාදීනං** මනුෂ්‍ය ආදීන්ට **න (නප්පියානි හොන්ති)** ප්‍රිය නොවන්නේ නොවෙත් (ප්‍රිය වන්නේමය) **ච (තථා)** එසේම **තේසං (මනුස්සානං)** ඒ මනුෂ්‍යයන්ට **වත්‍ථාභරණාදීනි** වස්ත්‍ර ආභරණාදිය **පියානි (හොන්ති)** ප්‍රිය වෙත් **සූකරාදීනං** සූකරාදීන්ට **න (පියානි හොන්ති)** ප්‍රිය නොවෙත් **තස්මා** එබැවින් **ඉට්ඨානිට්ඨතා** ඉෂ්ට අනිෂ්ට බව **රුචිවසේනේව** රුචි වශයෙන්ම **ගහේතබ්බා?** ගතයුත්තාහු ද? **ඉති (පුච්ඡායං සති** මෙසේ ප්‍රශ්නයක් ඇති කල්හි **පරිහාරෝ** විසදීම **මයා** මා විසින් **වුච්චතේ** කියනු ලැබේ) **ඉට්ඨානිට්ඨානං** ඉටු අනිටු අරමුණුවලගේ (**ඉට්ඨානිට්ඨතා**

ඉෂ්ට අනිෂ්ට බව) **පාටෙක්කං** වෙන වෙනම **විභත්තත්තා** බෙදනලද බැවින් **න (ගහේතබ්බා)** නොගතයුත්තාහ **හි (සච්චං)** ඒ කීම සැබෑව **කුසලවිපාකවිසයෝව** කුසල විපාක චිත්තයට විෂයවූම **කුසලකම්මජං** කුසල කර්ම සමුත්ථාන රූපය තෙමේ **ඉට්ඨං නාම** ඉෂ්ට නම් **අකුසලවිපාකවිසයෝව** අකුසල විපාක චිත්තයට විෂයවූම **අකුසලකම්මජං** අකුසල කර්ම සමුත්ථාන රූප තෙමේ **අනිට්ඨං නාම** අනිෂ්ට නම් **පන (තථාපි)** එසේ ගන්නා ලද්දේද **කෝචි** කිසිවෙක් වනාහි **සඤ්ඤාවිපල්ලාසේන** සංඥා විපර්‍යාසයෙන් **ඉට්ඨං** ඉෂ්ට වූ **බුද්ධරූපාදිං ඒව** බුද්ධරූපාදී ආරම්මණයෝ **ජවනක්ඛණේ** ජවනක්‍ෂණයෙහි **අනිට්ඨතෝ** අනිටු වශයෙන් **මනසි කරෝති** මෙනෙහි කරයි **අනිට්ඨං** අනිෂ්ට වූ **නිරයග්ගිසත්ථවිසාදිං ච** නිරය ගිනිදැල් ශස්ත්‍ර විෂ ආදිය ඉෂ්ට වශයෙන් **මනසි කරෝති** මෙනෙහි කරයි **ජවනේහි ඒව** ජවන චිත්තය හේතුකොටගෙනම **විපල්ලාසභාවෝ** ඒ විපර්‍යාස භාවය (**හෝති** වෙයි) **විපාකේහි** විපාක චිත්තය හේතුකොටගෙන **න (හෝති)** විපර්‍යාස භාවය නොවෙයි **ඉති** ඒ කීම සැබෑව (**තස්මා** එබැවින්) **විපාකවසේන** විපාක චිත්තයාගේ වශයෙන් **නියතං ඉට්ඨානිට්ඨං** නියත වූ ඉෂ්ටානිෂ්ට ආරම්මණය **වේදිතබ්බං** දතයුතුයි.

**සම්මෝහවිනෝදනියා පන** සම්මෝහවිනෝදනී නම් වූ **විභඞ්ගට්ඨකථාය හි** විභඞ්ග අර්ථකථායෙහි වනාහි **සුඛසම්ඵස්සං** සුඛ ස්පර්ශ ඇති **ගූථකලලං** අසුචි කර්දමය තෙමේ **චක්ඛුද්වාරඝානද්වාරේසු** චක්‍ෂුස්ද්වාර ඝ්‍රාණද්වාරයන්හි **අනිට්ඨං** අනිටු අරමුණෙක් **හෝති** වේ **චක්කවත්තිනෝ** සක්විති රජක්හුගේ **මණිරතනේන** මාණික්‍ය රත්නය කරණකොටගෙන **පෝථියමානස්ස ච** තාඩනය කරනුලබන ජනයාගේ ද **සුවණ්ණසූලේ** සුවර්ණ ශූලයෙහි **උත්තාසියමානස්ස ච** උත්‍රාසයට පැමිණි ජනයාගේ ද (නගාළුඃ ජනයාගේ ද යුසේයි) **මණිරතනසුවණ්ණසූලානි** මාණික්‍ය රත්න ස්වර්ණ ශූලයෝ **චක්ඛුද්වාරේ** චක්‍ෂුස්ද්වාරයෙහි **ඉට්ඨානි** ඉෂ්ටාලම්බනයෝ **හොන්ති** වෙත් **කායද්වාරේ** කායද්වාරයෙහි **අනිට්ඨානි** අනිෂ්ටාලම්බනයෝ (**හොන්ති** වෙත්) **ඉති (වුත්තං)** කියනලදි **ඒවං** මෙසේ **ද්වාරවසේන** ද්වාර වශයෙන් **ඒකස්සේව වත්ථුනෝ** එක් වස්තුවකටම **ඉට්ඨතා ච** ඉෂ්ට බවද **අනිට්ඨතා ච** අනිෂ්ට බවද **වුත්තා** කියනලදි **ඒකකලාපගතභූතෝපාදායරූපානං** එක් කලාපයකට ඇතුළත් භූත රූප උපාදාය රූපයන්ගේ **ඒකසාමග්ගියමුප්පත්තිතෝ** එකට අනුකූලභාවයෙන් ඉපදීම් වශයෙන් **සා ච** ඉෂ්ට අනිෂ්ට භාවය තුමූ ද **ඒකක්ඛණේ** එක් ක්‍ෂණයෙහි **න යුත්තං** නොයෙදෙයි **අකුසලවසේන** අකුසල වශයෙන් **අනිට්ඨේසු භූතේසු උප්පජ්ජන්තේසු** අනිටු වූ භූතරූපයන් උපන් කල්හි **ඉට්ඨානි** ඉෂ්ට වූ **තදුපාදායරූපාදි** ඒ කලාපය ඇසුරුකොට පහළවන උපාදාය රූපාදිය **කුසලේන** කුසලයෙන් **නහි උප්පජ්ජන්ති** නොම උපදවත් **පන** කවරහෙයින යත්? **භින්නක්ඛණේ** බිඳුණු ක්‍ෂණයෙහි **ඉට්ඨානි මණිරතනාදීනි** චක්‍ෂුස්ප්‍රසාදයට ඉෂ්ට වූ මාණික්‍ය රතනාදිය වේද **තේහි** ඒවා කරණකොටගෙන **පෝථියමානස්ස** තාඩනය කරනුලබන ජනයාට **අකුසලපච්චයේන** අකුසල ප්‍රත්‍යයෙන් වූ **උතුනා** ඍතුවෙන් **අනිට්ඨානි** අනිෂ්ට රූපයෝ **විපරිණමන්ති** පිරිනමත් **අනිට්ඨානි ගූථකලලාදීනි** චක්‍ෂු ඝ්‍රාණ ප්‍රශාදදියට අනිෂ්ට වූ ගූථ කලල ආදිය **කුසලපච්චයේන** කුසල ප්‍රත්‍යයෙන් **ඉට්ඨානි** කායප්‍රශාදයට ඉෂ්ට රූපයෝ **ඉති (විපරිණමන්ති)** පිරිනමත් **අයං** මේ වනාහි **නෝ** අපගේ **අත්තනෝමති** අත්තනෝ මතයයි.

**[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

## අටළොස් අහේතුක චිත්තයෝ:—

උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණං, තථා සෝතවිඤ්ඤාණං, ඝානවිඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණං, දුක්ඛසහගතකායවිඤ්ඤාණං, උපෙක්ඛාසහගතං සම්පටිච්ඡනං, තථා සන්තීරණඤ්චේති ඉමානි සත්තපි අකුසලවිපාකචිත්තානි නාම.

උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණං, තථා සෝතවිඤ්ඤාණං, ඝානවිඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණං, දුක්ඛසහගතකායවිඤ්ඤාණං, උපෙක්ඛාසහගතං සම්පටිච්ඡනං, සෝමනස්සසහගතං සන්තීරණං උපෙක්ඛාසහගතං සන්තීරණඤ්චේති ඉමානි අට්ඨපි කුසලවිපාකාහේතුකචිත්තානි නාම.

උපෙක්ඛාසහගතං පඤ්චද්වාරාවජ්ජනං, තථා මනෝද්වාරාවජ්ජනං, සෝමනස්සසහගතං හසිතුප්පාදඤ්චේති ඉමනි තීණිපි අහේතුකක්‍රියාචිත්තානි නාම. ඉච්චේවං සබ්බථාපි අට්ඨාරස අහේතුකචිත්තානි සමත්තානි.

සත්තාකුසලපාකානි - පුඤ්ඤපාකානි අට්ඨධා
ක්‍රියාචිත්තානි තීණීති - අට්ඨාරස අහේතුකා

**උපෙක්ඛාසහගතං** උපේක්‍ෂා වේදනාව හා ඒකෝත්පාදදි භාවයට ගියා වූ **චක්ඛුවිඤ්ඤාණං** රූප දර්ශනයට හේතු වූ චක්‍ෂු ප්‍රසාදය ආශ්‍රය කොට පවත්නා වූ චක්ඛුවිඤ්ඤාණය ද **තථා** එසේම උපේක්‍ෂා සහගත වූ **සෝතවිඤ්ඤාණං** ශබ්ද ශ්‍රවණයට හේතු වූ ශ්‍රොත්‍ර ප්‍රසාදය ආශ්‍රය කොට පවත්නා වූ ශ්‍රෝත්‍ර විඤ්ඤාණය ද **ඝානවිඤ්ඤාණං** ගන්ධාඝ්‍රාණයට හේතු වූ ඝ්‍රාණ ප්‍රසාදය ආශ්‍රය කොට පවත්නා වූ ඝ්‍රාණවිඤ්ඤාණය ද **ජිව්හාවිඤ්ඤාණං** රසාස්වාදයට හේතු වූ ජිව්හා ප්‍රසාදය ආශ්‍රය කොට පවත්නා වූ ජිව්හාවිඤ්ඤාණය ද **දුක්ඛසහගතං** අනිෂ්ටානුභවන ලක්‍ෂණ වූ කායික දුක්ඛ වේදනාව හා ඒකෝත්පාදදි භාවයට ගියා වූ **කායවිඤ්ඤාණං** ස්පර්ශයට හේතු වූ කාය ප්‍රසාදය ආශ්‍රය කොට පවත්නා වූ කායවිඤ්ඤාණය ද **උපෙක්ඛාසහගතං** උපේක්‍ෂා සහගියාවූ **සම්පටිච්ඡනං** රූපාදීන් ප්‍රතිග්‍රහණය කරණ සම්ප්‍රත්‍යෙෂණ චිත්තය ද **තථා** එසේම උපේක්‍ෂා සහගියාවූ **සන්තීරණඤ්චේති** රූපාදීන් තීරණය කරමින් උපදනා සන්තීරණ චිත්තය ද යන **ඉමානි සත්තපි** මොහු සත් දෙනද **අකුසලවිපාකචිත්තානි නාම** අකුසල විපාක චිත්තයෝ නම් වෙත්. කුසල විපාක චක්‍ෂු විඤ්ඤාණාදියට ද මෙසේම සුදුසු ලෙස අර්ථ කිය යුතුයි. **ඉමානි අට්ඨපි** මොහු අට දෙනද **කුසලවිපාකාහේතුකචිත්තානි** නාම කුසල විපාක වූ අහේතුක චිත්තයෝ නම් වෙත්.

**උපෙක්ඛාසහගතං** උපේක්‍ෂාසහ ගියා වූ **පඤ්චද්වාරාවජ්ජනං** පඤ්ච ද්වාරයෙහි ආපාතගත රූපාදියට චිත්තසන්තතිය යොමුකරන පඤ්චද්වාරාවර්ජන චිත්තයය **තථා** එසේම (උපේක්‍ෂාසහගියා වූ) **මනෝද්වාරාවජ්ජනං** මනෝද්වාරයට හමුවූ රූපාදියට චිත්තසන්තතිය යොමුකරන මනෝද්වාරාවර්ජන චිත්තය ද **සෝමනස්සසහගතං** සොම්නස්සහගියා වූ **හසිතුප්පාදඤ්චේති** අනෞදරික ආලම්බනයෙහි රහතුන්ට සිනා උපදවන හසිතෝත්පාද චිත්තය ද යන **ඉමානි තීණි** මොහු තුන්දෙන **අහේතුකකිරියචිත්තානි නාම** අහේතුක ක්‍රියා චිත්තයෝ නම් වෙත්.

**සබ්බථාපි** අකුසල විපාක, කුසල විපාක, ක්‍රියා භේද වශයෙන් සර්වප්‍රකාරයෙන්ම **අහේතුකචිත්තානි** සුප්‍රතිෂ්ඨිත භාවසාධනත්වයෙන් මූල සදෘශ වූ

ලෝභාදි අලෝභාදි හේතු රහිත හෙයින් අහේතුක වූ චිත්තයෝ **අට්ඨාරස** අටළොස් දෙන **ඉච්චේවං** මේ උක්ත ක්‍රමයෙන් **සමත්තානි** සඞ්ග්‍රහ කොට කියා නිමවන ලදහු.

**අකුසලවිපාකානි** අකුසල විපාකයෝ **සත්ත** සත් දෙනෙක **පුඤ්ඤපාකානි** කුසල විපාකයෝ **අට්ඨධා** අෂ්ට ප්‍රකාර වෙති. **ක්‍රියාචිත්තානි** විපාක දනයක් නැති හෙයින් හුදු කිරීම් මාත්‍රයක් හෙයින් ක්‍රියාව යැයි කියන ලද චිත්තයෝ **තීණි** තුන් දෙනෙකැයි **අහේතුකා** ලෝභාදි අලෝභිදි හේතු විරහයෙන් අහේතුකය යැයි කියන ලද චිත්තයෝ **අට්ඨාරස** අටළොසෙකි. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 12-16 පිටු]**

චක්ඛුසෝතඝානජිව්හා - කායවිඤ්ඤාණනාමකා
පඤ්චවිඤ්ඤාණයුගළා - යුගළං සම්පටිච්ඡනං.
**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 27 යටතේ)]**

**චක්ඛුසෝතඝානජිව්හාකායවිඤ්ඤාණනාමකා** චක්‍ෂුර්විඥාන ශ්‍රෝත්‍රවිඥාන ඝ්‍රාණවිඥාන ජිව්හාවිඥාන කායවිඥාන යන නම් ඇත්තාවූ **පඤ්චවිඤ්ඤාණයුගළා** දෙපස් විඥාන චිත්තයෝ ද **සම්පටිච්ඡනං යුගළං** සම්ප්‍රතෛ්‍යෂණ සිත් දෙක ද ...
**[පරමත්ථවිභාවනි ව්‍යාඛ්‍යාව 17 පිට]**

සන්තීරණද්වයං චේව - උපෙක්ඛාසහිතං තථා
පුඤ්ඤපුඤ්ඤවසේනේව - විපාකා දුවිධා ඨිතා.
**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 28 යටතේ)]**

**තථා** එසේම **උපෙක්ඛාසහිතං** උපේක්‍ෂා වේදනාව සමඟ උපන්නාවූ **සන්තීරණද්වයං චේව** සන්තීරණ සිත් දෙක ද **ඉති** මෙසේ **පුඤ්ඤපුඤ්ඤවසේනේව** කුශලවිපාක අකුශලවිපාක වශයෙන්ම **ඨිතා** සිටියාවූ **විපාකා** අහේතුක විපාක චිත්තයෝ **දුවිධා** ද්විප්‍රකාර ඇත්තාහු (**හොන්ති** වෙත්) ...
**[පරමත්ථවිභාවනි ව්‍යාඛ්‍යාව 18 පිට]**

උපෙක්ඛා සහිතා තත්ථ - මානසා ද්වාදසේරිතා
කායවිඤ්ඤාණයුගළං - සුඛදුක්ඛයුතං කමා.
**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 29 යටතේ)]**

**තත්ථ** ඒ කුශලවිපාක අකුශලවිපාකයන් අතුරෙන් **උපෙක්ඛා සහිතා** උපේක්‍ෂා වේදනාව හා සමඟ උපන්නාවූ **මානසා** චිත්තයෝ **ද්වාදස** දෙළොස් දෙනෙකැයි **ඊරිතා** කියන ලදහ **කායවිඤ්ඤාණයුගළං** කායවිඥාන යුගලය තෙම **කමා** පිළිවෙළින් **සුඛදුක්ඛයුතං** සැප වේදනා දුක් වේදනා හා යෙදුනේ (**හොන්ති** වෙත්) ...
**[පරමත්ථවිභාවනි ව්‍යාඛ්‍යාව 18 පිට]**

සෝමනස්සසහගතං - යං සන්තීරණමානසං
තං පුඤ්ඤපාකමේවාහු - පාපපාකං න විජ්ජති.
**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 30 යටතේ)]**

**සෝමනස්සසහගතං** සොම්නස් වේදනාව හා සමඟ උපන්නාවූ **යං සන්තීරණමානසං** යම් සන්තීරණ සිතක් තෙම **අත්ථි** ඇත්තේ ද **තං සන්තීරණමානසං** ඒ සන්තීරණ චිත්තය තෙම **පුඤ්ඤපාකමේව** කුශලයාගේ විපාකයෙක්ම (**හෝති** වේ)

**පාපපාකං** අකුශලයාගේ විපාක වූ සොමිනස් සහගිය සන්තීරණයෙක් **න විජ්ජති** නැත්තේය (**ඉති** මෙසේ) **ආහු** කියත්. [පරමත්ථවිභාවනි ව්‍යාඛ්‍යාව 18 පිට]

පඤ්චද්වාරමනෝද්වාර - වසේන දුවිධං පන
උපෙක්ඛාවේදනායුත්තං - ක්‍රියාවජ්ජනනාමකං.
[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 31 යටතේ)]

**පඤ්චද්වාරමනෝද්වාරවසේන** පඤ්චද්වාරාවර්ජන මනෝද්වාරාවර්ජනයන්ගේ වශයෙන් **දුවිධං** ද්විප්‍රකාර ඇත්තාවූ **උපෙක්ඛාවේදනායුත්තං පන** උපේක්‍ෂා වේදනාව හා යෙදුනාවූ වනාහි **ක්‍රියාවජ්ජනනාමකං** ක්‍රියා-ආවර්ජන සිත යන නම ඇත්තේ (**හෝති** වේ). [පරමත්ථවිභාවනි ව්‍යාඛ්‍යාව 18 පිට]

සෝමනස්සසහගතං - හසිතුප්පාදමානසං
ක්‍රියාජවනමිච්චේවං - තිවිධාහේතුකක්‍රියා.
[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 32 යටතේ)]

**සෝමනස්සසහගතං** සොමිනස් සහගියාවූ **හසිතුප්පාදමානසං** හසිතෝත්පාද චිත්තය තෙම **ක්‍රියාජවනං** ක්‍රියා ජවන සිතෙක් (**හෝති** වෙයි) **ඉච්චේවං** (ඉති ඒවං) මෙසේම **අහේතුකක්‍රියා** හේතු රහිත ක්‍රියා චිත්තයෝ **තිවිධා** තුන් ප්‍රකාර ඇත්තාහු (**හොන්ති** වෙත්). [පරමත්ථවිභාවනි ව්‍යාඛ්‍යාව 18-19 පිටු]

අට්ඨේව පුඤ්ඤපාකානි - පාපපාකානි සත්තධා
ක්‍රියාචිත්තානි තීණීති - අට්ඨාරස අහේතුකා.
[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 33 යටතේ)]

**පුඤ්ඤපාකානි** කුශලයාගේ විපාක වූ චිත්තයෝ **අට්ඨේව** අට දෙනෙක්ම (**හොන්ති** වෙත්) **පාපපාකානි** අකුශලයාගේ විපාක වූ චිත්තයෝ **සත්තධා (සත්තවිධා)** සත් ප්‍රකාර ඇත්තාහු (**හොන්ති** වෙත්) **ක්‍රියාචිත්තානි** ක්‍රියා චිත්තයෝ **තීණී** තුන් ප්‍රකාර ඇත්තාහු (**හොන්ති** වෙත්) **ඉති** මෙසේ භේද වශයෙන් **අහේතුකා** අහේතුක චිත්තයෝ **අට්ඨාරස** අටළොසෙක් (**හොන්ති** වෙත්).

චක්‍ෂුර්විඥාන ආදී වූ දෙපස් විඥානය සම්ප්‍රතීච්ඡණ දෙසිතය සන්තීරණ තෙසිතය යන මෙහුන්ගේ වශයෙන් විපාක සිත් පසළොස ද පඤ්චද්වාරාවර්ජන මනොද්වාරාවර්ජන හසිතෝත්පාදයන්ගේ වශයෙන් ක්‍රියා සිත් තුන ද පිඩු කළ කල්හි අටළොස් දෙනෙක් වෙත්. [පරමත්ථවිභාවනි ව්‍යාඛ්‍යාව 19 පිට]

## අහේතුක චිත්තයන්ගේ ධාත්වර්ථ:—

ඡක්කං නයනේ. නේති අත්තනෝ නිස්සිතං පුග්ගලන්ති **නයනං,** යු. **අසු** බ්‍යාපනේ, අසති විසයේසු බ්‍යාපී විය භවතීති **අක්ඛි, සස්ස කො,** අථ වා **අක්ඛ** බ්‍යාපන දස්සනේසු, අක්ඛති විසයේසු බ්‍යාපීභවති, අක්ඛති වා පස්සති ඒතේනාති අක්ඛි. නේතීති **නෙත්තං. ලෝචනං. අච්ඡ** දස්සනබ්‍යාපනේසු, ඉ, **අච්ඡි.** චක්ඛති අස්සාදේති රූපන්ති **චක්ඛු,** උ, චක්ඛති පස්සතීති වා **චක්ඛු.**

පඤ්චකං සෝතේ. සුණාති ඒතේනාති **සෝතං.** සද්දෝ ගය්හතේ අනේනාති **සද්දග්ගහෝ. කර** කරණේ, ණෝ, **කණ්ණෝ,** කණ්ණති සුණාති ඒතේනාති වා **කණ්ණෝ, කණ්ණ** සවනේ. සුණාති යේනාති **සවනං, සුති** ච, යු,ති ච.

චතුක්කං ඝානේ. නසන්ති ඒතායාති **නත්ථු,** ථු, ආ, **නාසා.** ණ්වු, **අක** ච **ඉ**කාරෝ ච **නාසිකා. ඝා** ගන්ධෝපාදනේ, ඝායති, ගන්ධෝපාදනං කරෝතීති **ඝානං,** යු, ඝායන්ත්‍යනේනාති වා **ඝානං.**

ද්වයං ජිව්හායං. ජීවති ඒතායාති **ජිව්හා,** හෝ, **ජීව** පාණධාරණේ. ජීවිතනිමිත්තං රසෝ ජීවිතං නාම, තං අව්හායතීති වා **ජිව්හා,** වණ්ණලෝපෝ. රසන්ති ඒතායාති **රසනා, රස** අස්සාදනේ, රසං ජානාතීති වා **රසනා, ඤස්ස නා, නී** නයේ වා, අ. **[අභිධානප්පදීපිකා ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 149-150 යටතේ)]**

## චක්ඛු

**චික්ඛ චක්ඛ වියත්තියං වාචායං.** චික්ඛති, ආචික්ඛති, අබ්භාචික්ඛති. ආචික්ඛකෝ. චක්ඛති, චක්ඛු. එත්ථ **චක්ඛු**ති චක්ඛතීති චක්ඛු, සමවිසමං අභිබ්‍යත්තං වදන්තං විය හෝතීති අත්ථෝ. අථ වා "සූපං චක්ඛති, මධුං චක්ඛතී"තිආදීසු විය යස්මා අස්සාදනත්ථෝපි **චක්ඛු**සද්දෝ භවති, තස්මා "චක්ඛති විඤ්ඤාණාධිට්ඨිතං රූපං අස්සාදෙන්තං විය හෝතී"ති අස්සාදනත්ථෝපි ගහේතබ්බෝ. "චක්ඛුං ඛෝ මාගණ්ඩිය රූපාරාමං රූපරතං රූපසම්මුදිත"න්ති හි වුත්තං. සතිපි සෝතාදීනං සද්දරාමතාදිභාවේ නිරූළ්හත්තා නයනේ ඒව **චක්ඛු**සද්දෝ පවත්තති **පඞ්කජා**දිසද්ද විය පදුමාදීසු.

චක්ඛ'ක්ඛි නයනං, ලෝචනං දිට්ඨි දස්සනං;

පෙක්ඛනං අච්ඡි පම්හං තු, "පඛුම"න්ති පවුච්චති. ඒතා **රුක්ඛා**දිකා **චක්ඛ**පරියන්තා **"අත්තනෝභාසා"**ති සද්දසත්ථවිදූ වදන්ති.

**[මහාසද්දනීතිය (ඡට්ඨසඞ්ගායනා ඛ-කාරන්ත ධාතු යටතේ); මහාසද්දනීතිය 301 පිට]**

**ඉක්ඛ+චක්ඛ** =දස්සනෙ **[පයෝගසිද්ධි (ඡට්ඨසඞ්ගායනා 49 වැනි සූත්‍රය යටතේ)]**

**චක්ඛ** වියත්තියං වාචායං, චක්ඛතීති චක්ඛු.

**[පදරූපසිද්ධිපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 651 යටතේ)]**

**චක්ඛ**-දස්සනේ (භූ) දැකීමෙහි; චක්ඛති. චක්ඛු. **[ව්‍යාකරණසද්දසින්ධු 274 පිට]**

**චක්ඛ**-දස්සේ; චක්ඛති; චක්ඛු, චක්ඛුක. **[කච්චායන ධාතු මඤ්ජූසා විවරණය 126 පිට]**

## සෝත

**සු සවනේ**. "සුණෝති, සුණාති. සුණිංසු. පටිස්සුණි, පටිස්සුණිංසු. අස්සෝසි, අස්සෝසුං. පච්චස්සෝසි, පච්චස්සෝසුං" ඉච්චාදීනි, "සුණිස්සති, සොස්සති" ඉච්චාදීනි ච භවන්ති. අබ්භාසවිසයේ "සුස්සූසති, සුස්සූසා" ඉච්චාදීනි. අනබ්භාසවිසයේ; සාවකෝ, සෝතෝ, සුණං, සුණන්තෝ, සුණමානෝ, සුය්‍යමානෝ,

සවනං, සුතං. අසුයිත්ථාති වා සුතං. සුතවා, සෝතං, සෝණෝ, සුණිතුං, සෝතුං. සුණිත්වා, සුණිය, සුණියාන, සුත්වා, සුත්වාන. කාරිතේ; සාවේති, සාවයති. කම්මේ; සද්දෝ සුය්‍යති, සූයති ච. භාවේ පදරූපමප්පසිද්ධං.

තත්ථ **සාවකෝ**ති අන්තේවාසිකෝ, සෝ දුවිධෝ ආගතප්ඵලෝ අනාගතප්ඵලෝ ච, තත්ථ ආගතප්ඵලෝ සවනන්තේ අරියාය ජාතියා ජාතෝති "සාවකෝ"ති වුච්චති, ඉතරෝ ගරූනං ඕවාදං සුණාතීති "සාවකෝ"ති. සාවකෝ, අන්තේවාසිකෝ, සිස්සෝති පරියායා.

එත්ථ **සුත**සද්දස්ස අත්ථුද්ධාරං වදාම සද්ධිං **සෝත**සද්දස්ස අත්ථුද්ධාරේන. **සුත**සද්දෝ සඋපසග්ගෝ අනුපසග්ගෝ ච අනුපපදේන, **සුත**සද්දෝ ච;

ගමනේ විස්සුතේ තින්තේ, නියෝගෝ'පචිතේපි ච;
සද්දේ ච සෝතද්වාරානු-සාරඤ්ඤාතේසු දිස්සති.

තථා හි "සේනාය පසුතෝ"තිආදීසු ගච්ඡන්තෝති අත්ථෝ. "සුතධම්මස්ස පස්සතෝ"තිආදීසු විස්සුතධම්මස්සාති අත්ථෝ. "අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්සා"තිආදීසු තින්තස්සාති අත්ථෝ. "යේ ඣානප්පසුතා ධීරා"තිආදීසු අනුයුත්තාති අත්ථෝ. "තුම්හේහි පුඤ්ඤං පසුතං අනප්පක"න්තිආදීසු උපචිතන්ති අත්ථෝ. "දිට්ඨං සුතං මුතං විඤ්ඤාත"න්තිආදීසු සද්දෝති අත්ථෝ. "බහුස්සුතෝ හෝති සුතධරෝ සුතසන්නිචයෝ"තිආදීසු සෝතද්වාරානුසාරවිඤ්ඤාතධම්මධරෝති අත්ථෝ.

**සෝත**සද්දෝපි අනේකත්ථප්පභේදෝ. තථා හේස;

මංසවිඤ්ඤාණඤාණේසු, තණ්හාදීසු ච දිස්සති;
ධාරායං අරියමග්ගේ, චිත්තසන්තතියම්පි ච.

"සෝතායතනං, සෝතධාතු, සෝතින්ද්‍රිය"න්තිආදීසු **සෝත**සද්දෝ මංසසෝතේ දිස්සති, "සෝතේන සද්දං සුත්වා"තිආදීසු සෝතවිඤ්ඤාණේ. "දිබ්බාය සෝතධාතුයා"තිආදීසු ඤාණසෝතේ. "යානි සෝතානි ලෝකස්මින්ති, යානි ඒතානි සෝතානි මයා කිත්තිතානි පකිත්තිතානි ආචික්ඛිතානි දේසිතානි පඤ්ඤපිතානි පට්ඨපිතානි විවරිතානි විභත්තානි උත්තානීකතානි පකාසිතානි. සෙය්‍යථීදං? තණ්හාසෝතෝ දිට්ඨිසෝතෝ කිලේසසෝතෝ දුච්චරිතසෝතෝ අවිජ්ජාසෝතෝ"තිආදීසු පඤ්චසු ධම්මේසු. "අද්දසා ඛෝ භගවා මහන්තං දරුක්ඛන්ධං ගඞ්ගාය නදියා සෝතේන වුය්හමාන"න්තිආදීසු උදකධාරායං. "අරියස්සේතං ආවුසෝ අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස අධිවචනං, යදිදං සෝතෝ"තිආදීසු අරියමග්ගේ. "පුරිසස්ස ච විඤ්ඤාණසෝතං පජානාති උභයතෝ අබ්බොච්ඡින්නං ඉධලෝකේ පතිට්ඨිතඤ්ච පරලෝකේ පතිට්ඨිතඤ්චා"තිආදීසු චිත්තසන්තතියන්ති.

**සෝණෝ**ති සුනඛෝ. සෝ හි සාමිකස්ස වචනං සුණාතීති සෝණෝති වුච්චති. ඉමානි තදභිධානානි;

සුනඛෝ සාරමෙයෙයා ච, සුණෝ සූනෝ ච කුක්කුරෝ;
සෝණෝ ස්වානෝ සුවානෝ ච, සාළූරෝ මිගදංසනෝ.

සා සුනිධාති'මේ සද්දා, පුමානේසු පවත්තරේ;

සුනඛී කුක්කුරී සී'ති, ඉමේ ඉත්ථීසු වත්තරේ.

සුනඛා සාරමෙය්‍යාති, ආදි බහුවචෝ පන;
පවත්තති පුමිත්ථීසු, අඤ්ඤදත්‍රාපි අයං නයෝ;
කුක්කුරෝති අයං තත්ථ, බාලකාලේ රවේන වේ;
මහල්ලකේපි සුනඛේ, රූළ්හියා සම්පවත්තති.

තථා හි අට්ඨකථාචරියා **කුක්කුරජාතකේ** "යේ කුක්කුරා රාජකුලම්හි වඩ්ඪා, කෝලෙය්‍යකා වණ්ණබලූපපන්නා"තිඉමස්මිං පදේසේ ඒවමත්ථං වණ්ණයිංසු "යේ කුක්කුරාති යේ සුනඛා. යථා හි තරුණෝපි පස්සාවෝ පූතිමුත්තන්ති තදහුජාතෝපි සිඞ්ගාලෝ" ජරසිඞ්ගාලෝ'ති, කෝමලාපි ගළාචීලතා 'පූතිලතා'ති, සුවණ්ණවණ්ණෝපි කායෝ 'පූතිකායෝ'ති වුච්චති, ඒවමේව වස්සසතිකෝපි සුනඛෝ 'කුක්කුරෝ'ති වුච්චති, තස්මා මහල්ලකා කායූපපන්නාපි තේ 'කුක්කුරා'ත්වේව වුත්තා"ති. **[මහාසද්දනීතිය (ඡට්ඨසඞ්ගායනා ස්වාදිගණ ධාතු යටතේ); මහාසද්දනීතිය 437-438 පිට]**

**සු**-සවණේ (සු) ඇසීමෙහි; සුණෝති, සුණාති **[ව්‍යාකරණසද්දසින්ධු 729 පිට]**

**සු (සු)** සවණේ - ඇසීමෙහි **[කච්චායන ධාතු මඤ්ජූසා විවරණය 116 පිට]**

## ඝාන

**ඝා ගන්ධෝපාදනේ**. ඝාති. ඝානං. ගන්ධං ඝත්වා. අත්‍රායං පාළි "ගන්ධං ඝත්වා සති මුට්ඨා"ති. ඒතිස්සා පන **දිවාදි**ගණං පත්තාය "ඝායති ඝායිත්වා"ති රූපානි භවන්ති. **[මහාසද්දනීතිය (ඡට්ඨසඞ්ගායනා ඝ-කාරන්ත ධාතු යටතේ); මහාසද්දනීතිය 303 පිට]**

**ඝා ගන්ධෝපාදනේ. ඝායතීති ඝානං**. ඝානේන ගන්ධං ඝායිතුං ඝායිත්වා.
**[මහාසද්දනීතිය (ඡට්ඨසඞ්ගායනා දිවාදිගණ ධාතු යටතේ); මහාසද්දනීතිය 426 පිට]**

**ඝා** ගන්ධෝපාදනේ, ඝායතීති ඝානං
**[මහාරූපසිද්ධි (ඡට්ඨසඞ්ගායනා කත්තුකරණපදේසු ච සූත්‍රය යටතේ); පයෝගසිද්ධිපාඨ (ඡට්ඨසඞ්ගායනා අනෝ සූත්‍රය යටතේ)]**

**ඝා** (දි) ගන්ධෝපාදනේ - ඉඹීමෙහි **[කච්චායන ධාතු මඤ්ජූසා විවරණය 92 පිට]**

**ඝා**-ගන්ධෝපාදනේ (භූ) ගඳ ගැන්මෙහි. ඝති- ඝාණං.
**ඝා**-ගන්ධෝපාදනේ (දි) ගඳ ගැමෙහි ඝායති, ඝාණං. **[ව්‍යාකරණසද්දසින්ධු 272 පිට]**

## ජිව්හා

**ඛේ ජේ සේ ඛයේ**. ඛායති. ජායති. සායති. ඛයං ගච්ඡතීති අත්ථෝ.

එත්ථ පන සියා "නනු ච භෝ **ඛායතී**ති පදස්ස ඛාදතීති වා පඤ්ඤායතීති වා අත්ථෝ භවති, තථා **ජායතී**ති පදස්ස නිබ්බත්තතීති අත්ථෝ, **සායතී**ති පදස්ස රසං අස්සාදේතීති අත්ථෝ, ඒවං සන්තේ භෝ කස්මා ඉධ ඒවං අත්ථෝ තුම්හේහි කථීයතී"ති? සච්චං, ධාතූනන්තු අනේකත්ථත්තා ඒවං අත්ථෝ කථේතුං ලබ්භති. තථා

හි "අප්පස්සුතායං පුරිසෝ, බලිබද්දෝව ජීරතී"ති එත්ථ **ජීරතී**ති අයං සද්දෝ ජරං පාපුණාතීති අත්ථං අවත්වා වඩ්ඪතීති අත්ථමේව වදති, ඒවං සම්පදමිදං දට්ඨබ්බං.
**[මහාසද්දනීතිය (ඡට්ඨසඞ්ගායනා භූවාදිගණ ධාතු යටතේ); මහාසද්දනීතිය 417 පිට]**

ජීවන්ති ඒතායාති ජිව්හා=රසනා.
**[මොග්ගල්ලාන බ්‍යාකරණං (ඡට්ඨසඞ්ගායනා අංක 222 යටතේ)]**

**සේ-** ඛයේ (භූ) ක්‍ෂයවීමෙහි; සායති. **[ව්‍යාකරණසද්දසින්ධු 736 පිට]**

උපෙක්ඛිතබ්බ යුත්තේ සමං පවත්තේ ධම්මේ ඉක්ඛති න භේදේති උපෙක්ඛා යනුවෙන් විග්‍රහකරණු. උප ශබ්ද තෙමේ සමාර්ථ වාචක වේ. ඉක්ඛ ධාතු තෙමේ අභේදර්ථ වාචක වෙයි. උපෙක්ඛාය ඒකුප්පාදදි වසේන සහගතං සංසට්ඨන්ති උපෙක්ඛාසහගතං යනුවෙන් එක්කොට විග්‍රහකරණු.

චක්ඛති විඤ්ඤාණයිට්ඨිතං සමවිසමං ආචික්ඛන්තං විය හෝතීති චක්ඛු. චක්ඛ ධාතුව කෙරෙන් පරව රු-ප්‍රත්‍යය ද ඒ රු-ප්‍රත්‍යයාගේ අවයව වූ ඌ-කාරය හ්‍රස්ව කොට චක්ඛු යන රූපය නිෂ්පන්න වෙයි. චක්‍ෂුර්ගෝලයාගේ මධ්‍යයෙහි කවර ප්‍රදේශයෙක්හි චක්‍ෂු පටල සත්දෙන පැතිරගොස් පිහිටියාහු ද යත්; චක්‍ෂුර්ගෝලයාගේ ප්‍රමාණය ඇත්තා වූ චක්ඛු යන පදය මුඛ්‍ය වශයෙන් වාචක වෙයි. චක්‍ෂුර්ගෝලයාගේ ඇටයෙන් වෙන් කරනලද්ද වූ මාංෂ ගෝලය ද ධානීහුගේ නාමය ධානයෙහි ආරෝපණය කොට ව්‍යවහාර කිරීම් සඞ්ඛ්‍යාත වූ ධානූපචාර වශයෙන් ලැබෙන්නේයි. **යං** උකුණු හිසට බඳු වූ ශීර්ෂයාගේ චක්‍ෂුර් ප්‍රශාද තෙමේ **විඤ්ඤාණාධිඨිතං හුත්වා** චක්‍ෂුවිඤ්ඤාණයාගේ පිහිටීමට ස්ථාන වශයෙන් **සමවිසමං** සමවිසම ස්ථානය **ආචික්ඛන්තං** විය අස්වන්නෙකු මෙන් **චක්ඛති (හෝති)** හටගන්නේ වෙයි. **ඉති (තස්මා)** එසේ හෙයින් **තං** ඒ උකුණු හිසට බඳුවූ චක්‍ෂුප්‍රශාද තෙමේ **චක්ඛු** චක්ඛු නම් වේ. මෙසේ අර්ථ යෝජනා කරණු. ආරම්මණං විජානාතීති විඤ්ඤාණං යනුවෙන් විග්‍රහකොට ඊට අනතුරුව චක්ඛු ශබ්දය හා සම්බන්ධ කොට පසාදරූප සඞ්ඛාතං චක්ඛුං නිස්සිතං විඤ්ඤාණන්ති චක්ඛුං විඤ්ඤාණං යනුවෙන් විග්‍රහකරණු. චක්ඛුවිඤ්ඤාණය ලැබේ.

විඤ්ඤාණාධිඨිතං හුත්වා සුණාතීති සෝතං යනුවෙන් විග්‍රකරණු. සු-ධාතුවෙන් පරව ත-ප්‍රත්‍යය වූ තැනි. සසම්භාර ශ්‍රෝත බිලයාගේ ඇතුලත්හි තඹවන් රෝමයෙන් ගැවසීගත්තා වූ ඇඟිලි මුදුවකට බඳු වූ රෝමයාගේ හටගත්තා වූ ස්ථාන වශයෙන් සටහන ද සදෘශ වෙයි. ඒ ස්ථානය හෙවත් ඇඟිලි මුදුවකට බඳු වූ ද්‍රව්‍යයෙහි ප්‍රසාද රූපය ලැබෙයි. සෝතම්හි නිස්සිතං විඤ්ඤාණන්ති සෝතවිඤ්ඤාණං යනුවෙන් විග්‍රහ කරණු. සෝතවිඤ්ඤාණ චිත්තය ලැබෙයි.

ඝායති ගන්ධෝපාදනං ඝානයති කරෝතීති ඝානං යනුවෙන් විග්‍රහකරණු. ඝ-ධාතුවෙන් පරය යු-ප්‍රත්‍යය කොට ඒ යු-ප්‍රත්‍යයට අයන ආදේශ කිරීමෙන් ඝාන ශබ්දය නිපන්නේයි. සසම්භාර ඝානයාගේ ඇතුලත්හි එළු කුරයකට බඳු වූ සටහන් ඇත්තා වූ ස්ථානයෙහි ඝනප්‍රශාදය ගැනේ. **යං** යම් ඝානප්‍රසාද රූපයක් තෙමේ **ගන්ධෝපාදනං** ගන්ධාලම්බනය ගැනීම **ඝානයති කරෝති** කරන්නේවේද **ඉති (තස්මා)** එසේ හෙයින් **තං** ඒ ධර්මය **ඝානං** ඝානය නම් වේ.

රසාරම්මණං සඞ්ඛාතං ජීවිතං අව්හයතීති ජිව්හා. ජීවිත ශබ්ද උප පද කොට ඇත්තා වූ පූර්ව වූ ජීව-ධාතුවෙන් සායනාර්ථ වාචක වෙයි. ජීවිත ශබ්දය ද අ-කාරය ද ලොප් වෙයි. සසම්භාර ජිව්හාවගේ මධ්‍යයෙහි හෙවත් ජිව්හාවගේ මුදුනෙහි මහනෙල් මල් පෙති අගක් බඳු වූ සටහන් ඇත්තා වූ ස්ථානයෙහි ජිව්හාප්‍රසාදය ලැබේ. ජිව්හාතෝ පත්තං විඤ්ඤාණන්ති ජිව්හාවිඤ්ඤාණං යනුවෙන් විග්‍රහ කරණු. ජිව්හාවිඤ්ඤාණ ධාතුව ලැබේ.

කුච්ඡිතානං කේසාදීනං ආයෝති කායෝ යනුවෙන් විග්‍රහකරණු. කු-ශබ්ද තෙමේ කුච්ඡිතාර්ථ වාචක වේ. කේසාග්‍රය, ලෝමාග්‍රය, නඛාග්‍රය, වියලී ගියා වූ සමය යන මෙතෙක් ස්ථානයන් හැර අවශේෂ වූ සකල ශරීරය පැතිරගෙන පිහිටියා වූ කායප්‍රසාදය ලැබේ.

පඤ්චවිඤ්ඤාණගහිතං රූපාදිං ආරම්මණං සම්පටිච්ඡතීති සම්පටිච්ඡනං යනුවෙන් සං පටි පූර්ව වූ ඡා-ධාතූහු කෙරෙන් පරව ය-ප්‍රත්‍යය වූ තැනි. ඡ-කාරය අසදිස ද්වේ භාවය කරණු.

සම්මාතීරේති යථා සම්පටිච්ඡිතුං රූපාදිං ආලම්බනං වීමංසතීති සන්තීරණං යනුවෙන් විග්‍රහකරණු. සං පූර්ව තිර-ධාතුවෙන් පරව යු-ප්‍රත්‍යය වූ තැනි. **යථා සම්පටිච්ඡිතං** යම් ආකාරයෙකින් පිළිගන්නා ලද්ද වූ **රූපාදිං ආරම්මණං** රූපාලම්බනාදී වූ අරමුණු **සම්මා** මොනවට **තීරේති වීමංසේති** විමස්නනේ වේද **ඉති (තස්මා)** එසේ හෙයින් **සන්තීරණං** සන්තීරණ නම් වෙයි.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 18-22 පිටු]**

## චක්ඛුවිඤ්ඤාණාදි අහේතුක විපාක සිත් ඉපදීමට හේතු:—

චක්ඛුවිඤ්ඤාණධාතුආදීනඤ්ච න කේවලං චක්ඛුරූපාදයෝ පච්චයා හොන්ති, අථ ඛෝ ආලෝකාදයෝපි. තේනාහු පුබ්බාචරියා "චක්ඛුරූපාලෝකමනසිකාරේ පටිච්ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. සෝතසද්දවිවරමනසිකාරේ පටිච්ච උප්පජ්ජති සෝතවිඤ්ඤාණං. ඝානගන්ධවායුමනසිකාරේ පටිච්ච උප්පජ්ජති ඝානවිඤ්ඤාණං. ජිව්හාරසආපමනසිකාරේ පටිච්ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං. කායඵොට්ඨබ්බපඨවීමනසිකාරේ පටිච්ච උප්පජ්ජති කායවිඤ්ඤාණං. භවඞ්ගමනධම්මමනසිකාරේ පටිච්ච උප්පජ්ජති මනෝවිඤ්ඤාණ"න්ති.

**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 523-524 යටතේ); විසුද්ධිමග්ග අටුවා 364-365 පිටු (හේ.වි.මු)]**

චක්ඛුවිඤ්ඤාණධාතුආදීනං චක්ඛාදීනං යථාවුත්තපච්චයධම්මතෝ අතිරේකේපි පච්චයධම්මේ දස්සේතුං **"න කේවල"**න්තිආදි ආරද්ධං. තත්ථ **ආලෝකාදයෝති** ආලෝකෝ නාම සූරියාලෝකාදි. තස්ස සුත්තන්තනයේන උපනිස්සයභාවෝ වේදිතබ්බෝ, ඒවං සේසානිපි.

**විවරං** නාම විසේසතෝ සෝතබිලං. **වායු** ගන්ධූපසංහරණකවාතෝ. **ආපෝ** මුඛේ පක්ඛිත්තආහාරස්ස තේමනකඋදකං. **පඨවී** කායප්පසාදස්ස නිස්සයභූතා පඨවීධාතු. **භවඞ්ගමනං** ද්වික්ඛත්තුං චලිතං භවඞ්ගචිත්තං. සබ්බත්ථ **මනසිකාරෝ** ආවජ්ජනමනසිකාරෝ. **[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 523-524 යටතේ)]**

**චක්ඛුවිඤ්ඤාණධාතුආදීනං** චක්‍ෂුර්විඥාන ධාතු ආදියට **කේවලං** හුදෙක් **චක්ඛුරූපාදයෝ** චක්‍ෂුප්‍රසාදය-වර්ණ රූපාදිය පමණක් **පච්චයා** ප්‍රත්‍යය **න හොන්ති** නොවෙත් **ච (සච්චං)** ඒ කීම සැබෑවකි **අථ ඛෝ** වැලිදු **ආලෝකාදයෝපි** ආලෝක ආදියද (**පච්චයා හොන්ති** ප්‍රත්‍යය වෙත්)

(චක්‍ෂුර් විඤ්ඤාණ ධාත්වාදීනට යථෝක්ත චක්‍ෂුරාදී ප්‍රත්‍යය ධර්මයන් කෙරෙන් අතිරේක ප්‍රත්‍යය ධර්මයන් දක්වනු පිණිස "න කේවලං" යනාදීන් ආරබ්ධයි. එහි "ආලෝකාදයෝපි" යනුයෙහි ආලෝක නම් සූර්‍ය්‍යාලෝක ආදියය. හේ වනාහි සූත්‍රාන්ත නයින් උපනිශ්‍රය ප්‍රත්‍යය වන්නේයි. සෙස්සහුන්ගේ ද මෙසේමැයි. යනු ටීකායි)

**තේන** එහෙයින් **ආහු** වදාළහ **පුබ්බාචරියා** පෙරැජ්ජෝ **චක්ඛුරූපාලෝකමනසිකාරේ** -:- **චක්ඛු** චක්‍ෂුර්ප්‍රසාදය **රූප** රූපාලම්බණය **ආලෝක** ආලෝකය **මනසිකාරේ** ආවර්ජන මනස්කාරයන් **පටිච්ච** නිසා **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඥාන චිත්තය තෙමේ **උප්පජ්ජති** උපදී **සෝතසද්දවිවරමනසිකාරේ** -:- **සෝත** ශ්‍රෝත්‍ර ප්‍රසාදය **සද්ද** ශබ්දය **විවර (විවරං නාම විසේසතෝ සෝතබිලං)** විවර නම් විශේෂයෙන් ශ්‍රෝත්‍ර බිලය **මනසිකාරේ** මනස්කාරයන් **පටිච්ච** නිසා **සෝතවිඤ්ඤාණං** ශ්‍රෝත්‍රවිඥාන චිත්තය තෙමේ **උප්පජ්ජති** උපදී **ඝානගන්ධවායුමනසිකාරේ** -:- **ඝාන** ඝ්‍රාණ ප්‍රසාදය **ගන්ධ** ගන්ධය **වායු (වායු ගන්ධූපසංහරණකවාතෝ)** ගන්ධෝපහරණය කරණ වාතය **මනසිකාරේ** මනස්කාරයන් **පටිච්ච** නිසා **ඝානවිඤ්ඤාණං** ඝ්‍රාණවිඥාන චිත්තය තෙමේ **උප්පජ්ජති** උපදී **ජිව්හාරසආපමනසිකාරේ** -:- **ජිව්හා** ජිව්හා ප්‍රසාදය **රස** රසය **ආප (මුඛේ පක්ඛිත්තආහාරස්ස තේමනකඋදකං)** මුඛයෙහි ප්‍රක්‍ෂිප්ත ආහාරාදී තේමන උදකය **මනසිකාරේ** මනස්කාරයන් **පටිච්ච** නිසා **ජිව්හාවිඤ්ඤාණං** ජිව්හාවිඥාන චිත්තය තෙමේ **උප්පජ්ජති** උපදී **කායඵොට්ඨබ්බපඨවිමනසිකාරේ** -:- **කාය** කායප්‍රසාදය **ඵොට්ඨබ්බ** ස්පර්ශ **පඨවි (කායප්පසාදස්ස නිස්සයභූතා පඨවිධාතු)** කායප්‍රසාදයට නිශ්‍රය වූ පෘථිවි ධාතුවය **මනසිකාරේ** මනස්කාරයන් **පටිච්ච** නිසා **කායවිඤ්ඤාණං** කායවිඥාන චිත්තය තෙමේ **උප්පජ්ජති** උපදී **භවඞ්ගමනධම්මමනසිකාරේ** -:- **භවඞ්ගමන (ද්වික්ඛත්තුං චලිතං භවඞ්ගචිත්තං)** දෙවරක් චලිතවන භවඞ්ග චිත්තය **ධම්ම** ධර්මාලම්බන **මනසිකාරේ** මනස්කාරයන් **පටිච්ච** නිසා **මනෝවිඤ්ඤාණං** මනෝවිඥාන තෙමේ **උප්පජ්ජති** උපදී ("ඉති" ශබ්දය පරිසමාපන අර්ථයෙහිය)
**[විසුද්ධි මග්ග සන්නය 1177-1178 පිටු; සිංහල විසුද්ධි මාර්ගය ආයතන-ධාතු නිර්දේශය 254 පිටු (තායිවාන් මුද්‍රණය)]**

විසයගාහෝ චාති චක්ඛු රූපවිසයං ගණ්හාති, සෝතාදීනි සද්දදිවිසයේ; **'උපනිස්සයමත්ථසෝ'**ති, 'උපනිස්සයතෝ' ච 'අත්ථතෝ' ච. තත්ථ අසම්භින්නත්තා චක්ඛුස්ස, ආපාථගතත්තා රූපානං, ආලෝකසන්නිස්සිතං, මනසිකාරහේතුකං චතූහි පච්චයේහි උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, සද්ධිං සම්පයුත්තධම්මේහි. තත්ථ මතස්සාපි චක්ඛු සම්භින්නං හෝති. ජීවතෝ නිරුද්ධම්පි, පිත්තේන වා සෙම්හේන වා රුහිරේන වා පලිබුද්ධම්පි, චක්ඛුවිඤ්ඤාණස්ස පච්චයෝ භවිතුං අසක්කොන්තං 'සම්භින්නං' නාම හෝති. සක්කොන්තං අසම්භින්නං නාම. සෝතාදීසුපි ඒසේව නයෝ. චක්ඛුස්මිං පන අසම්භින්නේපි බහිද්ධා රූපාරම්මණේ ආපාථං අනාගච්ඡන්තේ චක්ඛුවිඤ්ඤාණං නුප්පජ්ජති. තස්මිං පන ආපාථං ආගච්ඡන්තේපි ආලෝකසන්නිස්සයේ අසති නුප්පජ්ජති. තස්මිං සන්තේපි කිරියමනෝධාතුයා භවඞ්ගේ අනාවට්ටිතේ නුප්පජ්ජති. ආවට්ටිතේයේව උප්පජ්ජති. ඒවං උප්පජ්ජමානං

සම්පයුත්තධම්මේහි සද්ධිංයේව උප්පජ්ජති. ඉති ඉමේ චත්තාරෝ පච්චයේ ලභිත්වා උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං (ම. නි. 1.306 ඨෝකං විසදිසං).

අසම්භින්නත්තා සෝතස්ස, ආපාථගතත්තා සද්දානං, ආකාසසන්නිස්සිතං, මනසිකාරහේතුකං චතූහි පච්චයේහි උප්පජ්ජති සෝතවිඤ්ඤාණං, සද්ධිං සම්පයුත්තධම්මේහි. තත්ථ 'ආකාසසන්නිස්සිත'න්ති ආකාසසන්නිස්සයං ලද්ධාව උප්පජ්ජති, න විනා තේන. න හි පිහිතකණ්ණච්ඡිද්දස්ස සෝතවිඤ්ඤාණං පවත්තති. සේසං පුරිමනයේනේව වේදිතබ්බං. යථා චෙත්ථ ඒවං ඉතෝ පරේසුපි. විසේසමත්තං පන වක්ඛාම.

අසම්භින්නත්තා ඝානස්ස, ආපාථගතත්තා ගන්ධානං, වායෝසන්නිස්සිතං, මනසිකාරහේතුකං චතූහි පච්චයේහි උප්පජ්ජති ඝානවිඤ්ඤාණං, සද්ධිං සම්පයුත්තධම්මේහි. තත්ථ 'වායෝසන්නිස්සිත'න්ති ඝානබිලං වායුම්හි පවිසන්තේයේව උප්පජ්ජති, තස්මිං අසති නුප්පජ්ජතීති අත්ථෝ.

අසම්භින්නත්තා ජිව්හාය, ආපාථගතත්තා රසානං, ආපෝසන්නිස්සිතං, මනසිකාරහේතුකං චතූහි පච්චයේහි උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං, සද්ධිං සම්පයුත්තධම්මේහි. තත්ථ 'ආපෝසන්නිස්සිත'න්ති ජිව්හාතේමනං ආපං ලද්ධාව උප්පජ්ජති, න විනා තේන. සුක්ඛජිව්හානඤ්හි සුක්ඛඛාදනීයේ ජිව්හාය ඨපිතේපි ජිව්හාවිඤ්ඤාණං නුප්පජ්ජතේව.

අසම්භින්නත්තා කායස්ස, ආපාථගතත්තා ඵොට්ඨබ්බානං, පථවිසන්නිස්සිතං, මනසිකාරහේතුකං චතූහි පච්චයේහි උප්පජ්ජති කායවිඤ්ඤාණං, සද්ධිං සම්පයුත්තධම්මේහි. තත්ථ 'පථවිසන්නිස්සිත'න්ති කායපසාදපච්චයං පථවිසන්නිස්සයං ලද්ධාව උප්පජ්ජති, න තේන විනා. කායද්වාරස්මිඤ්හි බහිද්ධාමහාභූතාරම්මණං අජ්ඣත්තිකං කායපසාදං ඝට්ටෙත්වා පසාදපච්චයේසු මහාභූතේසු පටිහඤ්ඤති.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 498 විපාකුද්ධාරකථා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 248-249 පිටු (හේ.වි.මු); විස්තර භාව සන්නය 26-27 පිටු]**

**ආලෝකසන්නිස්සිත**න්ති ඉදම්පි ආලෝකේ සති සබ්භාවං සන්ධාය වුත්තං, න උපනිස්සයපච්චයතං. **[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 498 යටතේ)]**

**විසයග්ගාහෝ ච ඉති** විසයග්ගාහෝ යනු **චක්ඛු** චක්‍ෂුස **රූපවිසයං** රූපාරම්මණය **ගණ්හාති** ගනී **සෝතාදීනි** ශ්‍රෝත්‍රාදිය **සද්දාදිවිසයේ** ශබ්දාදී ආරම්මණයන් (**ගණ්හන්ති** ගනිත්) **උපනිස්සයමත්ථසෝ** උපනිස්සයමත්ථසෝ **ඉති** පදයෙහි **උපනිස්සයතෝ ච** උපනිස්සය වශයෙන් ද **අත්ථතෝ ච** අර්ථ වශයෙන් ද (යනු පද විසන්ධියයි) **තත්‍ථ** එහි **චක්ඛුස්ස** චක්‍ෂුවගේ **අසම්භින්නත්තා** නොබිඳුණු බැවින් ද **රූපානං** වර්ණ රූපයන්ගේ **ආපාථගතත්තා** ආපාථ ගතවූ බැවින් ද **ආලෝකසන්නිස්සිතං** ආලෝකයෙහි උපනිශ්‍රයෙන් ද ("ආලෝකසන්නිස්සිතං" යනු ආලෝකය ඇති කල්හි යන ස්වභාවය සලකා මෙය කියනලදි. උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් නොවෙයි යනු මූලටීකායි) **මනසිකාරහේතුකං** මනසිකාරය යන **චතූහි පච්චයේහි** ප්‍රත්‍යය සතර කරණකොටගෙන **සම්පයුත්තධම්මේහි සද්ධිං** සම්ප්‍රයුක්ත ධර්මයන් සමඟ **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඤ්ඤාණය **උප්පජ්ජති** උපදී **තත්‍ථ** එහි **මතස්සාපි** මැරුණු පුද්ගලයාගේ ද **චක්ඛු** චක්‍ෂුසය **සම්භින්නං හෝති** සම්භින්න වූයේ

වෙයි **ජීවතෝ** ජීවත් වන්නහුගේ **(චක්ඛුං) නිරුද්ධං** චක්‍ෂුස නිරුද්ධ වූයේ (අන්ධ වූයේ) **අපි (හෝති)** වෙයි ද **පිත්තේන වා** පිතෙන් හෝ **සෙම්හේන වා** සෙමෙන් හෝ **රුහිරේන වා** ලෙයින් හෝ **පළිබුද්ධං** කිලිටි වූයේ **අපි (හෝති)** වෙයි ද **චක්ඛුවිඤ්ඤාණස්ස** චක්‍ෂුර්විඥානයට **පච්චයෝ භවිතුං** ප්‍රත්‍යය වන්නට **අසක්කොන්තං (චක්ඛුං)** නොහැකි වන්නාවූ චක්‍ෂුසය **සම්භින්නං නාම හෝති** සම්භින්න නම් වෙයි **සක්කොන්තං (චක්ඛුං)** හැකිවන්නා වූ චක්‍ෂුසය **අසම්භින්නං නාම (හෝති)** අසම්භින්න නම් වෙයි **සෝතාදීසුපි** ශ්‍රෝත්‍රාදියෙහි ද **ඒසේව නයෝ** මේ ක්‍රමයයි **පන** එසේම **චක්ඛුස්මිං** චක්‍ෂුස **අසම්භින්නේපි** නොබිඳුණු කල්හි ද **බහිද්ධා රූපාරම්මණේ** බාහිර රූපාරම්මණය **ආපාථං අනාගච්ඡන්තේ** ආපාථයට (නොහොත් සම්මුඛයට) නොපැමිණි කල්හි **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඥානය **නුප්පජ්ජති** නූපදී **පන** තවද **තස්මිං (රූපාරම්මණේ)** ඒ රූපාරම්මණය **ආපාථං ආගච්ඡන්තේපි** ආපාථයට (නොහොත් සම්මුඛයට) පැමිණි කල්හි ද **ආලෝකසන්නිස්සයේ අසති** ආලෝකයෙහි උපනිශ්‍රය නැති කල්හි ද (**චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඥානය) **නුප්පජ්ජති** නූපදී **අපි** තවද **තස්මිං (ආලෝකසන්නිස්සිතේ)** ඒ ආලෝකයෙහි උපනිශ්‍රය **සන්තේ** ඇති කල්හිදු **කිරියාමනෝධාතුයා** ක්‍රියා මනෝධාතු නම් වූ පඤ්චද්වාරාවර්ජන චිත්තයාගේ **භවඞ්ගේ** භවඞ්ගයෙහි **අනාවට්ටිතේ** නොවැටුණු කල්හි (**චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඥානය) **නුප්පජ්ජති** නූපදී **ආවට්ටිතේයේව** භවඞ්ගයෙහි වැටුණු කල්හිම **උප්පජ්ජති** උපදී **ඒවං** මෙසේ **උප්පජ්ජමානං (චක්ඛුවිඤ්ඤාණං)** උපදින්නා වූ චක්‍ෂුර්විඥානය **සම්පයුත්තධම්මේහි සද්ධිංයේව** සම්ප්‍රයුක්ත ධර්ම සමඟම **උප්පජ්ජති** උපදී **ඉති** මෙසේ **ඉමේ චත්තාරෝ පච්චයේ** මේ ප්‍රත්‍යය සතර **ලභිත්වා** ලැබ **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඥානය **උප්පජ්ජති** උපදී.

**සෝතස්ස** ශ්‍රෝත්‍රප්‍රශාදයාගේ **අසම්භින්නත්තා** නොබිඳුණු බැවින් ද **සද්දානං** ශබ්දාරම්මණයන්ගේ **ආපාථගතත්තා** ආපාථගතවූ බැවින් ද **ආකාසසන්නිස්සිතං** අවකාශයෙහි උපනිශ්‍රය ද **මනසිකාරහේතුකං** මනසිකාරය යන **චතූහි පච්චයේහි** ප්‍රත්‍යය සතර කරණකොටගෙන **සම්පයුත්තධම්මේහි සද්ධිං** සම්ප්‍රයුක්ත ධර්මයන් සමඟ **සෝතවිඤ්ඤාණං** ශ්‍රෝත්‍රවිඥානය **උප්පජ්ජති** උපදී **තත්‍ථ** එහි **ආකාසසන්නිස්සිතං ඉති** ආකාසසන්නිස්සිතං යනු **ආකාසසන්නිස්සයං** අවකාශයෙහි උපනිශ්‍රය **ලද්ධාව** ලැබම (**සෝතවිඤ්ඤාණං** ශ්‍රෝත්‍රවිඥානය) **උප්පජ්ජති** උපදී **තේන විනා** අවකාශයෙහි උපනිශ්‍රය නොමැතිව (**සෝතවිඤ්ඤාණං** ශ්‍රෝත්‍රවිඥානය) **න (උප්පජ්ජති)** නූපදී **පිහිතකණ්ණච්ඡිද්දස්ස** වසනලද කණ් සිදුරු ඇති පුද්ගලයාට **සෝතවිඤ්ඤාණං** ශ්‍රෝත්‍රවිඥානය **නහි පවත්තති** නූපදී **සේසං** සෙස්ස **පුරිමනයේනේව** පළමු නයින්ම **වේදිතබ්බං** දතයුතුයි **එත්‍ථ ච යථා** මෙහි යම්සේ ද **ඉතෝ පරේසුපි** මෙයින් පරතැන්හි ද **ඒවං** මෙසේය **විසේසමත්තං පන** විශේෂ මාත්‍රයක්ම වනාහි **වක්ඛාම** කියමු.

**ඝානස්ස** ඝ්‍රාණප්‍රශාදයාගේ **අසම්භින්නත්තා** නොබිඳුණු බැවින් ද **ගන්ධානං** ගන්ධාරම්මණයන්ගේ **ආපාථගතත්තා** ආපාථගතවූ බැවින් ද **වායෝසන්නිස්සිතං** වායෝ ධාතුවගේ උපනිශ්‍රය ද **මනසිකාරහේතුකං** මනසිකාරය යන **චතූහි පච්චයේහි** ප්‍රත්‍යය සතර කරණකොටගෙන **සම්පයුත්තධම්මේහි සද්ධිං** සම්ප්‍රයුක්ත ධර්මයන් සමඟ **ඝානවිඤ්ඤාණං** ඝ්‍රාණවිඥානය **උප්පජ්ජති** උපදී **තත්‍ථ** එහි **වායෝසන්නිස්සිතං ඉති** වායෝසන්නිස්සිතං යනු **ඝානබිලං** නාස් සිඳුරට **වායුම්හි** වායෝ ධාතුව **පවිසන්තේයේව** පිවිසි කල්හිම (**ඝානවිඤ්ඤාණං** ඝ්‍රාණවිඥානය)

**උප්පජ්ජති** උපදී **තස්මිං** ඒ වායෝ ධාතුව **අසති** නොපිවිසි කල්හි (**ඝානවිඤ්ඤාණං** ඝ්‍රාණවිඤ්ඤාණය) **නුප්පජ්ජතීති** නූපදී යන **අත්ථෝ** අර්ථයයි෴

**ජිව්හාය** ජිව්හා ප්‍රශාදයාගේ **අසම්භින්නත්තා** නොබිඳුණු බැවින් ද **රසානං** රසාරම්මණයන්ගේ **ආපාථගතත්තා** ආපාථගතවූ බැවින් ද **ආපෝසන්නිස්සිතං** අප් ධාතුවෙහි උපනිශ්‍රය ද **මනසිකාරහේතුකං** මනසිකාරය යන **චතූහි පච්චයේහි** ප්‍රත්‍යය සතර කරණකොටගෙන **සම්පයුත්තධම්මේහි සද්ධිං** සම්ප්‍රයුක්ත ධර්මයන් සමඟ **ජිව්හාවිඤ්ඤාණං** ජිව්හාවිඤ්ඤාණය **උප්පජ්ජති** උපදී **තත්‍ථ** එහි **ආපෝසන්නිස්සිතං ඉති** ආපෝසන්නිස්සිතං යනු **ජිව්හාතේමනං** ජිව්හා තෙත් කරණ **ආපං** ආපෝ ධාතුව **ලද්ධාව** ලැබම (**ජිව්හාවිඤ්ඤාණං** ජිව්හාවිඤ්ඤාණය) **උප්පජ්ජති** උපදී **තේන විනා** අප් ධාතුවගේ උපනිශ්‍රය නොමැතිව (**ජිව්හාවිඤ්ඤාණං** ජිව්හාවිඤ්ඤාණය) **න (උප්පජ්ජති)** නූපදී **සුක්ඛජිව්හානඤ්හි** වියලුනු දිව ඇත්තහුන්ට වනාහි **සුක්ඛඛාදනීයේ** වියලි ආහාරයක් **ජිව්හාය** දිවෙහි **ඨපිතේ** තැබූ කල්හි **ජිව්හාවිඤ්ඤාණං** ජිව්හාවිඤ්ඤාණය **නුප්පජ්ජතේව** නූපදීමය෴

**කායස්ස** කාය ප්‍රශාදයාගේ **අසම්භින්නත්තා** නොබිඳුණු බැවින් ද **ඵොට්ඨබ්බානං** ඵොට්ඨබ්බාරම්මණයන්ගේ **ආපාථගතත්තා** ආපාථගතවූ බැවින් ද **පඨවිසන්නිස්සිතං** පඨවියෙහි උපනිශ්‍රය ද **මනසිකාරහේතුකං** මනසිකාරය යන **චතූහි පච්චයේහි** ප්‍රත්‍යය සතර කරණකොටගෙන **සම්පයුත්තධම්මේහි සද්ධිං** සම්ප්‍රයුක්ත ධර්මයන් සමඟ **කායවිඤ්ඤාණං** කායවිඤ්ඤාණය **උප්පජ්ජති** උපදී **තත්‍ථ** එහි **පඨවිසන්නිස්සිතං ඉති** පඨවිසන්නිස්සිතං යනු **කායපසාදපච්චයං** කායප්‍රශාදයට හේතු වූ **පඨවිසන්නිස්සයං** පඨවි ධාතුවගේ උපනිශ්‍රය **ලද්ධාව** ලැබම (**කායවිඤ්ඤාණං** කායවිඤ්ඤාණය) **උප්පජ්ජති** උපදී **තේන විනා** පඨවි ධාතුවගේ උපනිශ්‍රය නොමැතිව (**කායවිඤ්ඤාණං** කායවිඤ්ඤාණය) **න (උප්පජ්ජති)** නූපදී **කායද්වාරස්මිඤ්හි** කායද්වාරයෙහි **බහිද්ධා** බාහිර වූ **මහාභූතාරම්මණං** මහාභූතාරම්මණය **අජ්ඣත්තිකං** ආධ්‍යාත්මික වූ **කායපසාදං** කායප්‍රශාදය හා **ඝට්ටෙත්‍වා** ගැටී **පසාදපච්චයේසු** කායප්‍රශාදය ඇසුරු කරණ **මහාභූතේසු** මහාභූතයන්හි **පටිහඤ්ඤති** ගැටෙයි෴ **[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

විසයාදිප්පභේදතෝ පන චක්ඛුවිඤ්ඤාණාදීනි පඤ්ච යථාක්කමං චක්ඛාදිඑ්කේකමේව වත්ථුං නිස්සාය පච්චුප්පන්නේ, ඉට්ඨේ ච රූපාදිඑ්කේකාරම්මණෝ ඒව කිරියමනෝධාතු අනන්තරං ආලෝකාකාසවායු-ජලපථවීසහකාරීනි පසාදකාදීනි දස්සනසවනඝායනසායනඵුසනකිච්චානි සාධයමානානි චක්ඛුද්වාරාදීසු ඒකේකස්මිං ඒව විපච්චන්ති. ඒවමේතේසං වත්ථුද්වාරාරම්මණකිච්චානි විසුං නියතානි. ඨානං පන තේසං පඤ්චන්නම්පි ඒකමේව, තේන නේසං න භේදෝ. මනෝධාතු පන හදයවත්ථුං නිස්සායේව පච්චුප්පන්නේසු රූපාදීසු පඤ්චසුපි ආරම්මණේසු පඤ්චවිඤ්ඤාණානන්තරං සම්පටිච්ඡනකිච්චං සාධයමානා පඤ්චසුපි ද්වාරේසු පවත්තති, සෝමනස්සසහගතා මනෝවිඤ්ඤාණධාතු පන හදයවත්ථුං නිස්සායේව අතිඉට්ඨේ පච්චුප්පන්නේ පඤ්චාරම්මණේ විපාකමනෝධාතුඅනන්තරං සන්තීරණකිච්චං, ඡසුපි ද්වාරේසු ඡසු බලවකාමාවචරාරම්මණේසු අතීතාදීසු ජවනානන්තරං තදාරම්මණකිච්චඤ්ච සාධයමානා විපච්චති. ඒවමේතිස්සා ද්වාරාරම්මණකිච්චට්ඨානානි අනිබද්ධානි, තතෝ තේහි භේදෝ හෝති, වත්ථු පන තත්ථේව නිබද්ධං, තතෝ න භේදෝ,

**[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා අහේතුක කුසලවිපාක වණ්ණනා යටතේ)]**

**විසයාදිප්පභේදතෝ පන** විෂයාදී ප්‍රභේද වශයෙන් වනාහි **චක්ඛුවිඤ්ඤාණාදීනි පඤ්ච** චක්‍ෂුර්විඤ්ඤාණාදි පස **යථාක්කමං** පිළිවෙළින් **පච්චුප්පන්නේ** වර්තමානයෙහි **චක්ඛාදිඒකේකමේව වත්ථුං** චක්‍ෂු ආදී එක් එක් වස්තුවක් **නිස්සාය** ඇසුරු කොට **ඉට්ඨේ ච** ඉෂ්ට වූද **රූපාදිඒකේකාරම්මණේ ඒව** රූපාදී එක් එක් අරමුණෙහිම **කිරියමනෝධාතු** ක්‍රියා මනෝධාතු නම් වූ පඤ්චද්වාරාවර්ජනයට **අනන්තරං** අනතුරුව **ආලෝකාකාසවායුජලපඨවීසහකාරීනි** අලෝකය ආකාශය වාතය ජලය පඨවි ආදියෙන් සහය ලබන්නාවූ **පසාදකාදීනි** ප්‍රශාදදිය **දස්සනසවනඝායනසායන ඵුසනකිච්චානි** දර්ශන කෘත්‍යය ශ්‍රවණ කෘත්‍යය ආඝ්‍රාණ කෘත්‍යය සායන කෘත්‍යය ස්පර්ශ කෘත්‍යය **සාධයමානානි** සිද්ධ කරමින් **චක්ඛුද්වාරාදීසු** චක්‍ෂුර්ද්වාරාදියෙහි **ඒකේකස්මිං ඒව** එක් එක් ප්‍රශාදයක්හිම **විපච්චන්ති** උපදිත් **ඒවං** මෙසේ **ඒතේසං** ඒ චක්‍ෂුර්විඤ්ඤාණාදීන්ගේ **වත්ථුද්වාරාරම්මණකිච්චානි** වස්තු ද්වාර ආරම්මණ කෘත්‍යයන් **විසුං** වෙන වෙනම **නියතානි** නියත (**හොන්ති** වෙත්) **පන** එසේම **තේසං පඤ්චන්නං** ඒ පඤ්ච විඤ්ඤාණාදීන්ගේ **ඨානං** ස්ථානය **ඒකමේව** එකක්මය **තේන** එහෙයින් **නේසං** ඔහුන්ගේ **භේදෝ න** භේදයක් නොවෙයි **පන** තවද **මනෝධාතු** මනෝධාතු නම් වූ **සම්පටිච්ඡන** සිත් තෙමේ **හදයවත්ථුං නිස්සායේව** හෘදයවස්තුව ඇසුරු කොටගෙනම **පච්චුප්පන්නේසු රූපාදීසු පඤ්චසුපි ආරම්මණේසු** වර්තමාන රූපාදි පඤ්ච ආරම්මණයන්හි **පඤ්චවිඤ්ඤාණානන්තරං** පඤ්චවිඤ්ඤාණයන්ට අනතුරුව **සම්පටිච්ඡනකිච්චං** සම්පටිච්ඡන කෘත්‍යය **සාධයමානා** සිද්ධ කරමින් **පඤ්චසුපි ද්වාරේසු** ද්වාර පසෙහි **පවත්තති** උපදිත් **පන** තවද **සෝමනස්සසහගතා මනෝවිඤ්ඤාණධාතු** සොමිනස් සහගත මනෝවිඤ්ඤාණධාතුව නම් වූ සන්තීරණ චිත්තය **හදයවත්ථුං** හෘදයවස්තුව **නිස්සායේව** ඇසුරු කොටගෙනම **පච්චුප්පන්නේ** වර්තමාන **අතිඉට්ඨේ** අතිඉෂ්ට වූ **පඤ්චාරම්මණේ** පඤ්චාරම්මණයෙහි **විපාකමනෝධාතුඅනන්තරං** සම්පටිච්ඡන සිතට අනතුරුව **සන්තීරණකිච්චං** සන්තීරණ කෘත්‍යය ද **ඡසුපි ද්වාරේසු** ෂඩ් ද්වාරයෙහි **අතීතාදීසු** අතීතාදී වූ **ඡසු බලවකාමාවචාරාරම්මණේසු** බලවත් වූ කාමාවචර ෂඩ් අරමුණෙහි **ජවනානන්තරං** ජවනයට අනතුරුව **තදාරම්මණකිච්චඤ්ච** තදාරම්මණ කෘත්‍යය ද **සාධයමානා** සිද්ධ කරමින් **විපච්චති** උපදී **ඒවං** මෙසේ **ඒතිස්සා** තදාරම්මණ චිත්තයාගේ **ද්වාරාරම්මණකිච්චට්ඨානානි** ද්වාර ආරම්මණ කෘත්‍යය ස්ථානයෝ **අනිබද්ධානි** අනියතයහ **තතෝ** එබැවින් **තේහි** ඒ ද්වාරාදියෙහි **භේදෝ හෝති** භේදය වෙයි **වත්ථු පන** වස්තුව වනාහි **තත්ථේව** හදයවස්තුව වශයෙන්ම **නිබද්ධං** නියතය **තතෝ** එබැවින් (**තත්ථ** ඒ වස්තුවෙහි) **න භේදෝ** භේදයක් නොමැත

**[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

අසම්භේදේන චක්ඛුස්ස, රූපාපාථගමේන ච;
ආලෝකනිස්සයේනාපි, සමනක්කාරහේතුනා.

පච්චයේහි පනේතේහි, සමේතේහි චතූහිපි;
ජායතේ **චක්ඛුවිඤ්ඤාණං,** සම්පයුත්තේහි තං සහ.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 498-499 යටතේ); විස්තරභාව සන්නය 26 පිට; සද්ධර්මසාගරය 02/429 පිට]**

**අසම්භේදේන චක්ඛුස්සාති** තස්සාපි චක්ඛු අසම්භින්නං හෝති. ජීවිතා නිරුද්ධම්පි පිත්තේන වා සෙම්හේන වා රුහිරේන වා පලිබුද්ධං චක්ඛුවිඤ්ඤාණස්ස පච්චයෝ භවිතුං අසක්කොන්තං සම්භින්නං නාම, සක්කොන්තං අසම්භින්නං නාම හෝති. තේන චක්ඛුපසාදස්ස අසම්භින්නේන රූපාපාථගමනේන ආලෝකසන්නිස්සයේනාපි. තේන තිවිධේන පච්චයේන **සමනක්කාරහේතුනා** පඤ්චද්වාරාවජ්ජනපච්චයේන සහ පවත්තනේන. ඒතේහි පන චතූහි පච්චයේහි සං ඒකතෝ ඉන්ති පවත්තන්තීති සමේතා, **සමේතේහි** සහගතේහි සමාගමං ඒකීභාවං ආගතේහි, තං **චක්ඛුවිඤ්ඤාණං** චක්ඛුපසාදනිස්සිතං විඤ්ඤාණං සම්පයුත්තේහි චේතසිකේහි සහ ජායතේ. **[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 498-499 යටතේ)]**

**චක්ඛුස්ස ච** චක්‍ෂුර්ප්‍රශාදයාගේ **අසම්භේදේන** අසම්භේදයෙන් ද **අපි** එසේම **රූපාපාථගතමේන** රූපාලම්බණය ආපාථගත වීමෙන් ද **ආලෝකනිස්සයේන** ආලෝකයෙහි උපනිශ්‍රයෙන් ද **සමනක්කාරහේතුනා** ඒ ත්‍රිවිධ ප්‍රත්‍යයෙන් හා පඤ්චද්වාරාවර්ජනය නම් වූ මනසිකාර යන **ඒතේහි පන චතූහි පච්චයේහි** ඒ සතර වැදෑරුම් ප්‍රත්‍යයන් හා සමඟ **සමේතේහි** ඒකීභාවයට පැමිණීමෙන් **තං චක්ඛුවිඤ්ඤාණං** ඒ චක්‍ෂුර්විඤ්ඤාණය තෙමේ **සම්පයුත්තේහි සහ** ඵස්සාදී සම්ප්‍රයුක්ත ධර්මයන් සමඟ **ජායතේ** උපදී.

(රූපජීවිතේන්ද්‍රිය නිරුද්ධවීමෙන් ද පිත සෙම ලෙයින් කිලිටිවූයේ හෝ වේද චක්‍ෂුර්විඤ්ඤාණයට ප්‍රත්‍යය වන්නට නොහැකි වන්නාවූ චක්‍ෂුප්‍රශාදය සම්භින්න නම්. ප්‍රත්‍යය වන්නට හැකිවන්නේ නම් අසම්භින්න නම් වෙයි. ප්‍රශාදය රූපාලම්බණය ආලෝකය මනසිකාරය යන සතර වැදෑරුම් ප්‍රත්‍යයන් සමඟ ඒකීභාවයට පැමිණෙන්නේනුයි "සමේති" එහෙයින් ටීකායෙහි:— "ඒතේහි පන චතූහි පච්චයේහි සං ඒකතෝ ඉන්ති පවත්තන්තීති සමේතා" යනු කීහ) **[අභිධම්මාවතාර ටීකා පරිවර්තනයි]**

අසම්භේදේන සෝතස්ස, සද්දපාථගමේන ච;
ආකාසනිස්සයේනාපි, සමනක්කාරහේතුනා.

පච්චයේහි පනේතේහි, සමේතේහි චතූහිපි;
ජායතේ **සෝතවිඤ්ඤාණං,** සම්පයුත්තේහි තං සහ.
**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 500-501 යටතේ); විස්තර භාව සන්නය 26 පිට; සද්ධර්මසාගරය 02/429 පිට]**

**අසම්භේදේන සෝතස්ස** සෝතපසාදස්ස අසම්භින්නේන **සද්දපාථගමේන ච** සද්දස්ස ආපාථගමනේන ච. ආකාසනිස්සයේනාපි පිහිතකණ්ණච්ඡිද්දස්ස සෝතවිඤ්ඤාණං නුප්පජ්ජති. තේන තිවිධේන පච්චයේන. **සමනක්කාරහේතුනා** පඤ්චද්වාරාවජ්ජනපච්චයේන සහ පවත්තේන. ඒතේහි පන චතූහි පච්චයේහි **සමේතේහි** සහගතේහි සමාගමං ඒකීභාවං ආගතේහි තං සෝතවිඤ්ඤාණං සම්පයුත්තේහි සහ ජායති. **[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 500-501 යටතේ)]**

**සෝතස්ස ච** ශ්‍රෝත්‍රප්‍රශාදයාගේ ද **අසම්භේදේන** අසම්භේදයෙන් ද **අපි** එසේම **සද්දපාථගමේන** ශබ්ද රූපයාගේ ආපාථගත වීමෙන් ද **ආකාසසන්නිස්සයේන** ආකාශයෙහි උපනිශ්‍රයෙන් ද **සමනක්කාරහේතුනා** ඒ ත්‍රිවිධ ප්‍රත්‍යයෙන් හා පඤ්චද්වාරාවර්ජනය නම් වූ මනසිකාර යන **ඒතේහි පන චතූහි පච්චයේහි** ඒ සතර වැදෑරුම් ප්‍රත්‍යයන් හා සමඟ **සමේතේහි** ඒකීභාවයට පැමිණීමෙන් **තං**

**සෝතවිඤ්ඤාණං** ඒ ශ්‍රෝත්‍රවිඤ්ඤාණය තෙමේ **සම්පයුත්තේහි සහ** ඵස්සාදී සම්ප්‍රයුක්ත ධර්මයන් සමඟ **ජායතේ** උපදී. **[අභිධම්මාවතාර ටීකා පරිවර්තනයි]**

අසම්භේදේන ඝානස්ස, ගන්ධාපාථගමේන ච;
වායෝසන්නිස්සයේනාපි, සමනක්කාරහේතුනා.

පච්චයේහි පනේතේහි, සමේතේහි චතූහිපි;
ජායතේ **ඝානවිඤ්ඤාණං,** සම්පයුත්තේහි තං සහ.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 502-503 යටතේ); විස්තර භාව සන්නය 26 පිට; සද්ධර්මසාගරය 02/430 පිට]**

**අසම්භේදේන** ඝානස්ස ඝානපසාදස්ස අසම්භින්නේන **ගන්ධාපාථගමේන ච** ගන්ධස්ස ආපාථගමනේන ච. **වායෝසන්නිස්සයේනාපීති** ඝානබිලම්හි පවිසන්තේන වායුනාති අත්ථෝ. තේන තිවිධේන පච්චයේන. **සමනක්කාරහේතුනා** පඤ්චද්වාරාවජ්ජනපච්චයේන සහ පවත්තේන. ඒතේහි පන චතූහි පච්චයේහි **සමේතේහි** සහගතේහි සමාගමං ඒකීභාවං ආගතේහි තං ඝානවිඤ්ඤාණං සම්පයුත්තේහි සහ ජායති. **[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 502-503 යටතේ)]**

**ඝානස්ස ච** ඝ්‍රාණප්‍රශාදයාගේ ද **අසම්භේදේන** අසම්භේදයෙන් ද **අපි** එසේම **ගන්ධාපාථගමේන** ගන්ධ රූපයාගේ ආපාථගත වීමෙන් ද **වායෝසන්නිස්සයේන** වායෝ ධාතුවෙහි උපනිශ්‍රයෙන් ද **සමනක්කාරහේතුනා** ඒ ත්‍රිවිධ ප්‍රත්‍යයෙන් හා පඤ්චද්වාරාවර්ජනය නම් වූ මනසිකාර යන **ඒතේහි පන චතූහි පච්චයේහි** ඒ සතර වැදෑරුම් ප්‍රත්‍යයන් හා සමඟ **සමේතේහි** ඒකීභාවයට පැමිණීමෙන් **තං ඝානවිඤ්ඤාණං** ඒ ඝ්‍රාණවිඤ්ඤාණය තෙමේ **සම්පයුත්තේහි සහ** ඵස්සාදී සම්ප්‍රයුක්ත ධර්මයන් සමඟ **ජායතේ** උපදී. **[අභිධම්මාවතාර ටීකා පරිවර්තනයි]**

අසම්භේදේන ජිව්හාය, රසාපාථගමේන ච;
ආපෝසන්නිස්සයේනාපි, සමනක්කාරහේතුනා.

පච්චයේහි පනේතේහි, සමේතේහි චතූහිපි;
ජායතේ **ජිව්හාවිඤ්ඤාණං,** සම්පයුත්තේහි තං සහ.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 504-505 යටතේ); විස්තර භාව සන්නය 27 පිට; සද්ධර්මසාගරය 02/430 පිට]**

**අසම්භේදේන ජිව්හාය** ජිව්හාය අසම්භින්නේන **රසාපාථගමේන ච** රසස්ස ආපාථගමනේන ච. **ආපෝසන්නිස්සයේනාපීති** ජිව්හාතේමනං ආපං ලද්ධා ච උප්පජ්ජති, තේන විනා සුක්ඛඛාදනීයේ ජිව්හාය සායිතේපි ජිව්හාවිඤ්ඤාණං නුප්පජ්ජතීති අත්ථෝ. තේන තිවිධේන පච්චයේන. **සමනක්කාරහේතුනා** පඤ්චද්වාරාවජ්ජනපච්චයේන සහ පවත්තේන. ඒතේහි පන චතූහි පච්චයේහි **සමේතේහි** සහගතේහි සමාගමං ඒකීභාවං ආගතේහි තං ජිව්හාවිඤ්ඤාණං සම්පයුත්තේහි සහ ජායති. **[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 504-505 යටතේ)]**

**ජිව්හාය ච** ජිව්හාප්‍රශාදයාගේ ද **අසම්භේදේන** අසම්භේදයෙන් ද **අපි** එසේම **රසාපාථගමේන** රස රූපයාගේ ආපාථගත වීමෙන් ද **ආපෝධාතුසන්නිස්සයේන** අප් ධාතුවෙහි උපනිශ්‍රයෙන් ද **සමනක්කාරහේතුනා** ඒ ත්‍රිවිධ ප්‍රත්‍යයෙන් හා පඤ්චද්වාරාවර්ජනය නම් වූ මනසිකාර යන **ඒතේහි පන චතූහි පච්චයේහි** ඒ සතර

වැදෑරුම් ප්‍රත්‍යයන් හා සමඟ **සමේතේහි** ඒකීභාවයට පැමිණීමෙන් **තං ජිව්හාවිඤ්ඤාණං** ඒ ජිව්හාවිඤ්ඤාණය තෙමේ **සම්පයුත්තේහි සහ** ඵස්සාදී සම්ප්‍රයුක්ත ධර්මයන් සමඟ **ජායතේ** උපදී.

("ආපෝසන්නිස්සයේනාපි" යනු ජිව්හා තෙත්කරණ අප් ධාතුවගේ ලැබීමෙන් ජිව්හාවිඤ්ඤාණය උපදී. ඒ අප් ධාතුව නොමැතිව වියලි දෙයක් අනුභව කරණ කල්හි හෝ රසවිඳින කල්හි ජිව්හා ප්‍රශාදය ඇසුරුකොට ජිව්හා විඤ්ඤාණය නූපදී)
**[අභිධම්මාවතාර ටීකා පරිවර්තනයි]**

අසම්භේදේන කායස්ස, ඵොට්ඨබ්බාපාථසඞ්ගමා;
පඨවීනිස්සයේනාපි, සමනක්කාරහේතුනා.

පච්චයේහි පනේතේහි, සමේතේහි චතූහිපි;
ජායතේ **කායවිඤ්ඤාණං,** සම්පයුත්තේහි තං සහ.
**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 506-507 යටතේ); විස්තර භාව සන්නය 27 පිට; සද්ධර්මසාගරය 02/430 පිට]**

කායපසාදස්ස අසම්භේදේන ඵොට්ඨබ්බස්ස ආපාථගමනේන ච. **පඨවීනිස්සයේනාපී**ති තේන විනා කායද්වාරම්පිති බහිද්ධා මහාභූතාරම්මණං අජ්ඣත්තිකං කායපසාදං ඝට්ටෙත්වා පසාදපච්චයේසු මහාභූතේසු පටිහඤ්ඤති. තේන තිවිධේන පච්චයේන. **සමනක්කාරහේතුනා** පඤ්චද්වාරාවජ්ජනපච්චයේන සහ පවත්තේන. ඒතේහි පන චතූහි පච්චයේහි **සමේතේහි** සහගතේහි සමාගමං ඒකීභාවං ආගතේහි තං කායවිඤ්ඤාණං සම්පයුත්තේහි සහ ජායති.
**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 506-507 යටතේ); සද්ධර්මසාගරය 02/429-430 පිටු]**

**කායස්ස ච** කායප්‍රශාදයාගේ ද **අසම්භේදේන** අසම්භේදයෙන් ද **අපි** එසේම **ඵොට්ඨබ්බාපාථසඞ්ගමා** ස්පෘෂ්ටව්‍යාගේ ආපාථගත වීමෙන් ද **පඨවිනිස්සයේන** පඨවි ධාතුවෙහි උපනිශ්‍රයෙන් ද **සමනක්කාරහේතුනා** ඒ ත්‍රිවිධ ප්‍රත්‍යයෙන් හා පඤ්චද්වාරාවර්ජනය නම් වූ මනසිකාර යන **ඒතේහි පන චතූහි පච්චයේහි** ඒ සතර වැදෑරුම් ප්‍රත්‍යයන් හා සමඟ **සමේතේහි** ඒකීභාවයට පැමිණීමෙන් **තං කායවිඤ්ඤාණං** ඒ කායවිඤ්ඤාණය තෙමේ **සම්පයුත්තේහි සහ** ඵස්සාදී සම්ප්‍රයුක්ත ධර්මයන් සමඟ **ජායතේ** උපදී. **[අභිධම්මාවතාර ටීකා පරිවර්තනයි]**

**අසම්භේදේනා**ති අවිනට්ඨභාවේන, වාතපිත්තාදීහි අනුපහතභාවේන ච. වාතපිත්තාදිඋපහතම්පි හි චක්ඛුවිඤ්ඤාණස්ස පච්චයභාවානුපගමනතෝ සම්භින්නමේව නාම හෝති, පඤ්චින්ද්‍රියානං අත්ථීක්ඛණේයේව නිස්සයභාවූපගමනතෝ ඛණවසේන අසම්භේදෝපි යුජ්ජති. ඒස නයෝ සෝතපසාදාදීසුපි. **රූපාපාථගමේනා**ති දූරේ ඨිතස්ස ඵලිකාදීහි අන්තරිතස්ස චක්ඛුවිඤ්ඤාණුප්පත්තියා පච්චයෝ භවිතුං යෝග්‍යදේසේ අවට්ඨිතවසේන රූපස්ස ආපාථගමනේන. ඒවඤ්ච කත්වා දූරේ ඨිතං, පරම්මුඛේ ඨිතම්පි දිබ්බචක්ඛුස්ස ආපාථගතමේව නාම හෝති. **ආලෝකනිස්සයේනාපී**ති රූපාවභාසනසමත්ථආලෝකසඞ්ඛාතනිස්සයේන. ආලෝකේ සති සම්භවෝ චෙත්ථ ආලෝකනිස්සයතා, න ආලෝකස්ස නිස්සයපච්චයත්තා. මනක්කාරෝව හේතු මනක්කාරහේතු, තේන සහ වත්තතීති **සමනක්කාරහේතු**. තේන ආලෝකනිස්සිතං දස්සේති. **සමේතේහී**ති සංයුත්තේහි ඒකීභූතේහි, න ඒකස්සපි විරහේනාති අත්ථෝ.

**ආකාසනිස්සයේනා**ති කණ්ණච්ඡිද්දසඞ්ඛාතආකාසනිස්සයේන. තේනේව හි **අට්ඨකථායං** "න හි පිහිතකණ්ණච්ඡිද්දස්ස සෝතවිඤ්ඤාණං පවත්තතී"ති වුත්තං. බාහිරාකාසම්පි පන ඉච්ඡිතමේව. තථා හි අච්චරේ ගේහේ නිසීදිත්වා වුච්චමානානං බහි ඨිතා න සුණන්ති. **වායෝසන්නිස්සයේනා**ති නාසිකච්ඡිද්දං පවිසනවායු සන්නිස්සයේන. **ආපෝසන්නිස්සයේනා**ති බෙළසඞ්ඛාතආපෝසන්නිස්සයේන. **පථවීසන්නිස්සයේනා**ති කායපසාදවත්ථුස්ස පථවීධාතුසන්නිස්සයේන.
**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 498-509 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 366-368 පිටු]**

"අසම්භේදේන" යනු විනාශ නොවුන භාවය හෝ වා පිත් ආදියෙන් නොනැසුන බවයි. වා පිත් ආදියෙන් නැසුනාවූ චක්ෂුස්ප්‍රශාදය චනාහි චක්ෂුර්විඥානයට ප්‍රත්‍යය භාවය නොමවීමෙන් නැසුනේම නම් වෙයි. පඤ්චේන්ද්‍රියයන්ගේ ඇති ක්‍ෂණයෙහිම නිශ්‍රයභාවයට පැමිණීමේ ක්‍ෂණ වශයෙන් අසම්භේදය යෙදෙයි. ශ්‍රෝත්‍රප්‍රශාද ආදියෙහිදු මේ නයයි. "රූපාපාථගමේන" යනු දුර සිටියහුට ද එලක අතරෙහි සිටියහුට ද චක්ෂුර්විඥානය ඉපදීම පිණිස ප්‍රත්‍යය වන්නට සුදුසු ප්‍රදේශයෙහි සිටීම් වශයෙන් රූපාලම්බණයාගේ ආපාථගතවීමෙන්. මෙසේ කියනලදද දුර සිටිය ද ඉදිරියෙහි සිටිය ද දිව්‍යචක්ෂුවට ආපාථගත වන්නේම වෙයි. "ආලෝකනිස්සයේනාපි" යනු රූප දර්ශනයට සමර්ථ ආලෝක සඞ්ඛ්‍යාත නිශ්‍රයවීම් වශයෙනි. ආලෝකය ඇති කල්හි ආලෝකය ඇසුරුකිරීම් වශයෙන් මෙහි හටගැණීම වෙයි. ආලෝකයෙහි නිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් නොවෙයි. මනසිකාරයම හේතුවූයේනුයි "මනක්කාරහේතු" මනසිකාරය හා පවතීනුයි "සමනක්කාරහේතු" ඒ මනසිකාරය හා ආලෝකයෙහි රූප දර්ශනයට සමර්ථ ආලෝක සඞ්ඛ්‍යාත නිශ්‍රයවීම දක්වයි. "සමේතේහි" යනු ප්‍රශාදදි ධර්මයන්ගේ වෙසෙසින් යෙදීමෙන් එක්ව හටගැනීමෙන්. ප්‍රශාදදී එක් ධර්මයකගේ ද නැතිවීමෙන් චක්ඛුවිඤ්ඤාණාදිය නූපදි යන අර්ථයි.

"ආකාසනිස්සයේන" යනු කණ්සිදුරු සඞ්ඛ්‍යාත අවකාශය ඇසුරු කිරීමෙන්. එසේහෙයින් අර්ථකථාවෙහි "නහි පිහිතකණ්ණච්ඡිද්දස්ස සෝතවිඤ්ඤාණං පවත්තති" යී කියනලදි. වසනලද ගෙයක හිඳ කථා කරන්නහුන්ගේ ශබ්දය පිට සිටින්නහුට නොඇසෙති. එසේ හෙයින් බාහිර අවකාශයද කැමතිවන ලද්දේමය. "වායෝසන්නිස්සයේන" යනු නාස් සිදුරුවලට පිවිසෙන වායුව නිශ්‍රයවීම් වශයෙන්. "ආපෝසන්නිස්සයේන" යනු බෙළ සඞ්ඛ්‍යාත අප් ධාතුව නිශ්‍රයවීම් වශයෙන්. "පථවිසන්නිස්සයේන" යනු කායප්‍රශාද වස්තුවට පඨවි ධාතු නිශ්‍රයවීම් වශයෙනි.
**[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

එත්ථ ච චක්ඛුස්ස අසම්භින්නතා, ආලෝක සන්නිස්සයප්පටිලාභෝ, රූපානං ආපාතාගමනං, මනසිකාරෝති චත්තාරෝ පච්චයා චක්ඛුවිඤ්ඤාණස්ස උප්පත්තිකාරණානි. සෝතස්ස අසම්භින්නතා ආකාසසන්නිස්සයප්පටිලාභෝ, සද්දානං ආපාතාගමනං මනසිකාරෝති සෝතවිඤ්ඤාණස්ස. ඝානස්ස අසම්භින්නතා, වායුසන්නිස්සයප්පටිලාභෝ, ගන්ධානං ආපාතාගමනං මනසිකාරෝති ඝානවිඤ්ඤාණස්ස. ජිව්හාය අසම්භින්නතා ආපෝසන්නිස්සයප්පටිලාභෝ. රසානං ආපාතාගමනං, මනසිකාරෝති ජිව්හාවිඤ්ඤාණස්ස. කායස්ස අසම්භින්නතා, පථවිසන්නිස්සයප්පටිලාභෝ, තිණ්ණං ඵොට්ඨබ්බානං අඤ්ඤතරස්ස ආපාතාගමනං, මනසිකාරෝති කායවිඤ්ඤාණස්සාති. එත්ථච ආලෝක ආකාසාදීනං සන්නිස්සයානං ගහණං තේහි විනා රූපාදීනං පසාදේසු ආපාතාගමනස්සේව

අභාවතෝති දට්ඨබ්බං, න හි ආලෝකේ සති රූපානි සන්නිහිතානිපි චක්ඛුම්හි ආපාතමාගච්ඡන්ති. ඒස නයෝ සේසේසුපීති. යං පන අට්ඨකථායං;

චක්ඛුස්මිං පන අසම්භින්නේපි බහිද්ධාරූපාරම්මණේ ආපාතං අනාගච්ඡන්තේ චක්ඛුවිඤ්ඤාණං නුප්පජ්ජති. තස්මිං පන ආපාතං ආගච්ඡන්තේපි ආලෝකසන්නිස්සයේ අසති නුප්පජ්ජතීති වුත්තං.

තං විනා ආලෝකේන විඤ්ඤාණුප්පත්තියා අභාවදස්සනපරං. න පන ආපාථාගමනං නාම ආලෝකේ අසතිපි සම්භවතීති දස්සනපරන්ති දට්ඨබ්බං. ඉතරථා රත්තන්ධකාරේපි රූපානි චක්ඛුම්හි ආපාතං ආගච්ඡන්තීති ආපජ්ජතීති.

**[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 32 යටතේ)]**

"චක්ඛුස්ස අසම්භින්නතා"ති චක්ඛුපසාදරූපස්ස අභින්නතා. තස්මිඤ්හි භින්නේ සති අන්ධස්ස චක්ඛුස්ස රූපානිනුපට්ඨහන්තීති. "සෝතස්ස අසම්භින්නතා"ති ආදීසුපි ඒසනයෝ. "ආලෝකසන්නිස්සයප්පටිලාභෝ"ති චක්ඛු ච ආලෝකේ සති කිච්චකාරී හෝති. අසති න හෝති. තථා රූපඤ්ච. තස්මා ආලෝකෝ තේසං විසයවිසයීභාවූපගමනේ සන්නිස්සයෝ හෝති. තස්ස ආලෝකසන්නිස්සයස්ස පටිලාභෝ. ඒසනයෝ ආකාසසන්නිස්සයාදීසු. ඉමේසං අඞ්ගානං යුත්ති දීපනා උපරිරූපසඞ්ගහේ ආගමිස්සති. "අට්ඨකථාය"න්ති අට්ඨසාලිනියං. තත්ථ "තස්මිං පන ආපාතං ආගච්ඡන්තේපි ආලෝකසන්නිස්සයේ අසති චක්ඛුවිඤ්ඤාණං නුප්පජ්ජතී"ති වචනං අසම්භාවෙන්තෝ "තං විනා ආලෝකේනා"ති ආදිමාහ. "අභාවදස්සන පර"න්ති අභාවදස්සනප්පධානං. **[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 32 යටතේ)]**

**එත්ථ ච** මෙහි වනාහි **චක්ඛුස්ස** චක්‍ෂුස්ප්‍රශාදයාගේ **අසම්භින්නත්තා** නොබිඳුණු බැවින් ද **අලෝකසන්නිස්සයප්පටිලාභෝ** ආලෝකයෙහි නිශ්‍රය ලැබීම ද **රූපානං** රූපාලම්බණයාගේ **අපාථාගමනං** අපාථගත වීම ද **මනසිකාරෝ ඉති** මනසිකාරය යන **චත්තාරෝ පච්චයා** සිව් වැදෑරුම් ප්‍රත්‍යයෝ **චක්ඛුවිඤ්ඤාණස්ස** චක්‍ෂුර්විඤ්ඤාණයාගේ **උප්පත්තිකාරණානි** ඉපදීමට කාරණයෝය **සෝතස්ස** ශ්‍රෝත්‍රප්‍රශාදයාගේ **අසම්භින්නතා** නොබිඳුණු බැවින් ද **අකාසසන්නිස්සයප්පටිලාභෝ** අවකාශයෙහි නිශ්‍රය ලැබීම ද **සද්දානං** ශබ්දාලම්බණයාගේ **ආපාථාගමනං** ආපාථගත වීම ද **මනසිකාරෝ** මනසිකාරය යන **ඉති (ඉමේ චත්තාරෝ පච්චයා)** මේ සිව් වැදෑරුම් ප්‍රත්‍යයෝ **සෝතවිඤ්ඤාණස්ස** ශ්‍රෝත්‍රවිඤ්ඤාණයාගේ (**උප්පත්තිකාරණානි** ඉපදීමට කාරණයෝය) **ඝානස්ස** ඝ්‍රාණප්‍රශාදයාගේ **අසම්භින්නත්තා** නොබිඳුණු බැවින් ද **වායුසන්නිස්සයප්පටිලාභෝ** වායෝ ධාතුවෙහි නිශ්‍රය ලැබීම ද **ගන්ධානං** ගන්ධාලම්බණයාගේ **අපාථාගමනං** අපාථගත වීම ද **මනසිකාරෝ** මනසිකාරය යන **ඉති (ඉමේ චත්තාරෝ පච්චයා** මේ සිව් වැදෑරුම් ප්‍රත්‍යයෝ) **ඝානවිඤ්ඤාණස්ස** ඝ්‍රාණවිඤ්ඤාණයාගේ (**උප්පත්තිකාරණානි** ඉපදීමට කාරණයෝය) **ජිව්හාය** ජිව්හා ප්‍රශාදයාගේ **අසම්භින්නත්තා** නොබිඳුණු බැවින් ද **ආපෝසන්නිස්සයප්පටිලාභෝ** අප් ධාතුවෙහි නිශ්‍රය ලැබීම ද **රසානං** රසාලම්බණයාගේ **අපාථාගමනං** අපාථගත වීම ද **මනසිකාරෝ** මනසිකාරය යන **ඉති (චත්තාරෝ පච්චයා** සිව් වැදෑරුම් ප්‍රත්‍යයෝ) **ජිව්හාවිඤ්ඤාණස්ස** ජිව්හාවිඤ්ඤාණයාගේ(**උප්පත්තිකාරණානි** ඉපදීමට කාරණයෝය) **කායස්ස** කායප්‍රශාදයාගේ **අසම්භින්නත්තා** නොබිඳුණු බැවින් ද **පඨවිසන්නිස්සයප්පටිලාභෝ** පෘථිවි ධාතුවෙහි නිශ්‍රය ලැබීම ද **තිණ්ණං ඵොට්ඨබ්බානං** පඨවි තේජෝ වායෝ යන

ස්පෘෂ්ටව්‍යන් අතුරින් **අඤ්ඤතරස්ස** එක්තරා ස්පෘෂ්ටව්‍යකගේ **අපාථාගමනං** අපාථගත වීම ද **මනසිකාරෝ** මනසිකාරය යන **ඉති** (**ඉමේ චත්තාරෝ පච්චයා** මේ සිව් වැදෑරුම් ප්‍රත්‍යයෝ) **කායවිඤ්ඤාණස්ස** කායවිඤ්ඤාණයාගේ (**උප්පත්තිකාරණානි** ඉපදීමට කාරණයෝය) **ආලෝකආකාසාදීනං සන්නිස්සයානං** ආලෝක ආකාශ ආදී නිශ්‍රය ධර්මයන්ගේ **ගහණං** ගැණීම **තේහි විනා** ඒ ආලෝක ආකාශාදී ධර්මයන් හැර **රූපාදීනං** රූපාදී ආලම්බණයන්ට **පසාදේසු** ප්‍රශාදදීන්හි **ආපාථාගමනස්ස ඒව** අපාථගතවීමගේම **අභාවතෝති** නොවීම් වශයෙන් යැයි **දට්ඨබ්බං** දතයුතුය **හි** ඒ එසේමැයි **ආලෝකේ සති** ආලෝකය ඇති කල්හි ද **සන්නිහිතානිපි රූපානි** විද්‍යමාන රූපයෝ ද **චක්ඛුම්හි** චක්ෂුස්ප්‍රශාදයෙහි **න ආපාථමාගච්ඡන්ති** ආපාථගත නොවෙති **සේසේසුපි** සෙසු තැන්හිද **ඒස නයෝ** මෙම ක්‍රමයයි **ඉති** ඒ කීම සැබෑව **පන** තත් සම්බන්ධ වාක්‍යයක් දක්වම් **අට්ඨකථායං** අර්ථශාලිනී අර්ථකථාවෙහි:— **චක්ඛුස්මිං පන** චක්ෂුස්ප්‍රශාදය වනාහි **අසම්භින්නේපි** නො බිඳුණු කල්හි ද **බහිද්ධාරූපාරම්මණේ** බාහිර රූපාරම්මණයන් **ආපාථං අනාගච්ඡන්තේ** ආපාථයට නොපැමිණි කල්හි ද **චක්ඛුවිඤ්ඤාණං** චක්ෂුර්විඤ්ඤාණය **නුප්පජ්ජති** නූපදියි **තස්මිං පන** ඒ රූපාලම්බණය වනාහි **ආපාථං ආගච්ඡන්තේපි** ආපාථයට පැමිණි කල්හි ද **ආලෝකසන්නිස්සයේ අසති** ආලෝකයෙහි නිශ්‍රය වීම **අසති** නැති කල්හි ද (**චක්ඛුවිඤ්ඤාණං** චක්ෂුර්විඤ්ඤාණය) **නුප්පජ්ජතීති** නූපදීයැයි **වුත්තං** කියනලදි.

(රූපාලම්බණය ආපාථයට පැමිණි කල්හි ආලෝකයෙහි නිශ්‍රය වීම නැති කල්හි චක්ෂුර්විඤ්ඤාණය නූපදී යැයි යම් වචනයක් කියනලදි ද ඒ වචනයට ගෞරව නොකෙරෙමින් "තං විනා ආලෝකේනාති" යනුවෙන් කීහ)

**තං විනා** රූපාලම්බණය නැති කල්හි ද **ආලෝකේන** ආලෝකය හේතුවෙන් **විඤ්ඤාණුප්පත්තියා** චක්ෂුර්විඤ්ඤාණයාගේ ඉපදීමෙහි **අභාවදස්සනපරං** අභාවය දැක්වීම ප්‍රධාන කොට (**වුත්තං** කියනලදි) **පන** ආලෝකය නැති කල්හි රූපාලම්බණය ආපාථගත වේද යන චෝද්‍යය වැළැක්වීම පිණිස "න පන ආපාථාගමනං -පෙ- දට්ඨබ්බං" යන පාඨය කියනලදි **අපාථාගමනං නාම** රූපාලම්බනයාගේ ආපාථයට පැමිණීම නම් **ආලෝකේ අසතිපි** ආලෝකය නැති කල්හි ද **සම්භවන්ති ඉති** සිදුවේයැයි **දස්සනපරං** දැක්වීම ප්‍රධාන කොට **න** නොවේ යැයි **දට්ඨබ්බං** දතයුතු **ඉතරථා** අන් අයුරකින් කිවහොත් **රත්තන්ධකාරේපි** රාත්‍රී අන්ධකාරයෙහි ද **රූපානි** රූපාලම්බණයෝ **චක්ඛුම්හි** චක්ෂුස්ප්‍රශාදයන්හි **අපාථං** අපාථයට **ආගච්ඡන්ති ඉති** පැමිණෙත් යයි **ඉති (තං දිට්ඨිං)** යන මේ දෘෂ්ටියට **ආපජ්ජති** පැමිණෙයි.

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

සුට්ඨු පටිමුඛඤ්ච ඉච්ඡතීති **සම්පටිච්ඡනං**. සුට්ඨූති අමුඤ්චමානං. පටිමුඛන්ති අනඤ්ඤපෙක්ඛං. ඉච්ඡතීති කාමේති අභිනන්දති පටිග්ගණ්හති තේනේවහි භාසිතං අභිනන්දුන්ති එත්ථ සම්පටිච්ඡිංසූති වණ්ණයිංසු.

සුට්ඨු තීරේති තුලේති විචාරේතීති **සන්තීරණං**. ටීකායං තීරේති නිට්ඨාපේතීති වුත්තං. විභාවනියං තීරේති වීමංසතීති වුත්තං.

**[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 31 යටතේ)]**

"සුට්ඨු පටිමුඛඤ්ච ඉච්ඡතීති සම්පටිච්ඡනං" යනු නිර්වචනයි. **තත්‍ථ** එහි **සුට්ඨූති** සුට්ඨු යනු නොමුදමින් **පටිමුඛන්ති** පටිමුඛං යනු අන්‍යයෙකු අපේක්‍ෂා නොකරමින් **ඉච්ඡතීති** ඉච්ඡති යනු කැමති වෙයි සතුටු වෙයි පිළිගණියි **තේනේවහි** එසේ හෙයින් වනාහි **භාසිතං** කියනලද්ද **අභිනන්දුන්ති** සතුටුවූහ යන **එත්‍ථ** මෙහි **සම්පටිච්ඡිංසූති** පිළිගත්තාහ යැයි **වණ්ණයිංසු** වර්ණා කළහ.

**සුට්ඨු** මනාව **තීරේති** තීරණය කරයි **තූලේති** තුලනය කරයි **විචාරේති ඉති** විචාරණය කරයිනුයි **සන්තීරණං** සන්තීරණ නම් **ටීකායං** ටීකාවෙහි **තීරේති** තීරණය කරයි **නිට්ඨාපේතීති** නිෂ්ටාපනයට යයි යැයි **වුත්තං** කියනලදි **විභාවනියං** විභාවනියෙහි **තීරේති** තීරණය කරයි **වීමංසතීති** විමසයි යැයි **වුත්තං** කියනලදි.

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

## පඤ්ච විඤ්ඤාණයන්ගෙන් අන්‍ය සිත් ඉපදීමට හේතු:—

අසම්භින්නත්තා මනස්ස, ආපාථගතත්තා ධම්මානං, වත්ථුසන්නිස්සිතං, මනසිකාරහේතුකං චතූහි පච්චයේහි උප්පජ්ජති මනෝවිඤ්ඤාණං, සද්ධිං සම්පයුත්තධම්මේහි. තත්ථ 'මනෝ'ති භවඞ්ගචිත්තං. තං නිරුද්ධම්පි, ආවජ්ජනචිත්තස්ස පච්චයෝ භවිතුං අසමත්ථං මන්දථාමගතමේව පවත්තමානම්පි, සම්භින්නං නාම හෝති. ආවජ්ජනස්ස පන පච්චයෝ භවිතුං සමත්ථං අසම්භින්නං නාම. 'ආපාථගතත්තා ධම්මාන'න්ති ධම්මාරම්මණේ ආපාථගතේ. 'වත්ථුසන්නිස්සිත'න්ති හදයවත්ථුසන්නිස්සයං ලද්ධාව උප්පජ්ජති, න තේන විනා. අයම්පි පඤ්හෝ පඤ්චවෝකාරභවං සන්ධාය කථිතෝ. 'මනසිකාරහේතුක'න්ති කිරියමනෝවිඤ්ඤාණධාතුයා භවඞ්ගේ ආවට්ටිතේයේව උප්පජ්ජතීති අත්ථෝ.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 498 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 249 පිට (හේ.වි.මු)]**

**මනස්ස** භවඞ්ග චිත්තයාගේ **අසම්භින්නත්තා** නොබිඳුණු බැවින් ද **ධම්මානං** ධම්මාරම්මණයන්ගේ **ආපාථගතත්තා** ආපාථගතවූ බැවින් ද **වත්‍ථුසන්නිස්සිතං** හදයවස්තුවෙහි උපනිශ්‍රය ද **මනසිකාරහේතුකං** මනසිකාරය යන **චතූහි පච්චයේහි** ප්‍රත්‍යය සතර කරණකොටගෙන **සම්පයුත්තධම්මේහි සද්ධිං** සම්ප්‍රයුක්ත ධර්මයන් සමඟ **මනෝවිඤ්ඤාණං** මනෝවිඤ්ඤාණය **උප්පජ්ජති** උපදී **තත්‍ථ** එහි **මනෝ ඉති** මනෝ යනු **භවඞ්ගචිත්තං** භවඞ්ග චිත්තයයි **නිරුද්ධම්පි** නිරුද්ධ වූ **තං** භවඞ්ග චිත්තය ද **ආවජ්ජනචිත්තස්ස** ආවර්ජන චිත්තයට **පච්චයෝ භවිතුං** ප්‍රත්‍යය වන්නට **අසමත්ථං** අසමර්ථ වූ **මන්දථාමගතමේව** මඳ ශක්තියක් **පවත්තමානම්පි** ඇතිවම පවතින භවඞ්ග චිත්තය ද **සම්භින්නං නාම හෝති** සම්භින්න නම් වෙයි **ආවජ්ජනස්ස පන** ආවර්ජන චිත්තයට වනාහි **පච්චයෝ භවිතුං** ප්‍රත්‍යය වන්නට **සමත්ථං (භවඞ්ගං)** සමර්ථ භවඞ්ග චිත්තය **අසම්භින්නං නාම (හෝති)** අසම්භින්න නම් වෙයි **ආපාථගතත්තා ධම්මානං ඉති** ආපාථගතත්තා ධම්මානං යනු **ධම්මාරම්මණේ** ධම්මාරම්මණයක් **ආපාථගතේ** ආපාථගත වූ කල්හි **වත්‍ථුසන්නිස්සිතං ඉති** වත්‍ථුසන්නිස්සිතං යනු **හදයවත්‍ථුසන්නිස්සයං** හදයවස්තුවෙහි උපනිශ්‍රය **ලද්ධාව** ලැබම **(මනෝවිඤ්ඤාණං** මනෝවිඤ්ඤාණය) **උප්පජ්ජති** උපදී **තේන විනා** හදයවස්තුවෙහි උපනිශ්‍රය නොමැතිව **(මනෝවිඤ්ඤාණං** මනෝවිඤ්ඤාණය) **න (උප්පජ්ජති)** නූපදී (අරූපභවයෙහි හදයවස්තුවක් නොමැති කල්හි මනෝවිඤ්ඤාණය කේසේ උපදීද යන චෝද්‍යයට පරිහාර වශයෙන් "අයම්පි -පෙ- කථිතෝ" යි කියනලදි) **අයම්පි පඤ්හෝ** හදයවස්තුවෙහි උපනිශ්‍රයක් නොමැතිව

නුපදීද? යන මේ ප්‍රශ්නය **පඤ්චවෝකාරභවං** පඤ්චවොකාර භවය **සන්ධාය** සඳහා **කථිතෝ** දේශනා කරනලදි **මනසිකාරහේතුකං ඉති** මනසිකාරහේතුකං යනු **කිරියමනෝවිඤ්ඤාණධාතුයා** ක්‍රියා මනෝවිඤ්ඤාණ ධාතුව නම් වූ මනෝද්වාරාවර්ජන චිත්තයාගේ **භවඞ්ගේ** භවඞ්ග චිත්තයෙහි **ආවට්ටිතේයේව** වැටුණු කල්හිම (**මනෝවිඤ්ඤාණං** මනෝවිඤ්ඤාණය තෙමේ) **උප්පජ්ජතීති** උපදී යන **අත්ථෝ** අර්ථයයි. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

අසම්භේදා මනස්සාපි, ධම්මාපාථගමේන ච;
වත්ථුසන්නිස්සයේනාපි, සමනක්කාරහේතුනා.

පච්චයේහි පනේතේහි, සමේතේහි චතූහිපි;
**මනෝවිඤ්ඤාණ**මේවං තු, සම්පයුත්තේහි ජායතේ
**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 508-509 යටතේ)]**

**අසම්භේදා මනස්සාපීති මන**න්ති භවඞ්ගචිත්තං. තං නිරුද්ධම්පි ආවජ්ජනචිත්තස්ස පච්චයෝ භවිතුං අසමත්ථං මන්දතමගතමේව වත්තමානම්පි සම්භින්නං නාම හෝති. ආවජ්ජනස්ස පච්චයෝ භවිතුං සමත්ථං අසම්භින්නං නාම. මනස්ස අසම්භේදේන ධම්මස්ස ආපාථගමනේන ච **වත්ථුසන්නිස්සයේන** හදයවත්ථුසන්නිස්සයේන. තේන තිවිධේන පච්චයේන. **සමනක්කාරහේතුනා** මනෝද්වාරාවජ්ජනේන සහ පවත්තේන. ඒතේහි පන චතූහි පච්චයේහි **සමේතේහි** සහගතේහි සමාගමං ඒකීභාවං ආගතේහි **තං මනෝවිඤ්ඤාණං** තං මනෝවිඤ්ඤාණසඞ්ඛාතං ජවනචිත්තං සම්පයුත්තේහි සහ ජායතේ.
**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 508-509 යටතේ)]**

**මනෝවිඤ්ඤාණ**න්ති ජවනමනෝවිඤ්ඤාණං.
**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 508-509 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 368 පිට]**

**මනස්ස** භවඞ්ග චිත්තයාගේ **අසම්භේදාපි** නොබිඳීම ද **ධම්මාපාථගමේන ච** ධම්මාරම්මණයන්ගේ ආපාථගත වීම ද **වත්ථුසන්නිස්සයේන අපි** හදයවස්තුව ඇසුරු කිරීමෙන් ද **සමනක්කාරහේතුනා** මනෝද්වාරාවර්ජනය නම් වූ මනසිකාර හේතුවෙන් ද යන **ඒතේහි චතූහිපි පච්චයේහි** මේ සිව් ප්‍රත්‍යයන් හා **සමේතේහි** ඒකීභාවයට පැමිණීමෙන් **ඒවං** මෙසේ **මනෝවිඤ්ඤාණං තු** මනෝවිඤ්ඤාණ සඞ්ඛ්‍යාත ජවන චිත්තය වනාහි **සම්පයුත්තේහි** ඵස්සාදී සම්ප්‍රයුක්ත ධර්මයන් සමඟ **ජායතේ** උපදී.

("මනන්ති" භවඞ්ග චිත්තයයි. නිරුද්ධවූ භවඞ්ග චිත්තය ද, ආවර්ජන චිත්තයට ප්‍රත්‍යය වන්නට අසමර්ථ මඳ ශක්තියක් ඇතිව පවතින භවඞ්ග චිත්තය ද සම්භින්න නම් වෙයි. ආවර්ජන චිත්තයට ප්‍රත්‍යය වන්නට සමර්ථ භවඞ්ග චිත්තය අසම්භින්න නම් වෙයි) **[අභිධම්මාවතාර ටීකා පරිවර්තනයි]**

## කායවිඤ්ඤාණය ආපෝධාතුව හේතුකොටගෙන උපදී ද?

රූපං සද්දෝ ගන්ධෝ රසෝ ආපෝධාතු විවජ්ජිතං භූතත්තය සඞ්ඛාතං ඵොට්ඨබ්බං ච ගෝචරරූපං නාම **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 90 පිට]**

**රූපං** විඤ්ඤාණෝත්පත්තියට හේතුභාවයෙන් චක්‍ෂුඃප්‍රතිහනන ස්වභාවය වූ වර්ණායතනය ද **සද්දෝ** විඤ්ඤාණෝත්පත්තියට හේතුභාවයෙන් ශ්‍රෝත්‍රප්‍රතිහනන ස්වභාවය වූ ශබ්දායතනය ද **ගන්ධෝ** විඤ්ඤාණෝත්පත්තියට හේතුභාවයෙන් ඝ්‍රාණප්‍රතිහනන ස්වභාවය වූ ගන්ධායතනය ද **රසෝ** විඤ්ඤාණෝත්පත්තියට හේතුභාවයෙන් ජිහ්වාප්‍රතිහනන ස්වභාවය වූ රසායතනය ද **ආපෝධාතු විවජ්ජිතං** සූක්‍ෂම බැවින් අබ්ධාතුව ස්පර්ශයට අසමර්ථබව හේතුකොටගෙන අබ්ධාතු විවර්ජිත වූ **භූතත්තය සඞ්ඛාතං** භූතත්‍රය යැයි කියනලද **ඵොට්ඨබ්බං** ස්ප්‍රෂ්ටව්‍ය ද **ගෝචරරූපං නාම** පඤ්ච විඤ්ඤාණයන්ට විෂයබැවින් ගෝචරරූප නම් වේ.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 117 පිට]**

පුන දිට්ඨාදිරූපරූපාදිවත්ථාදිචතුක්කවසේන **චතුබ්බිධං**. තත්ථ රූපායතනං **දිට්ඨං** නාම දස්සනවිසයත්තා, සද්දායතනං **සුතං** නාම සවනවිසයත්තා, ගන්ධරසඵොට්ඨබ්බත්තයං **මුතං** නාම සම්පත්තගාහකඉන්ද්‍රියවිසයත්තා, සේසං **විඤ්ඤාතං** නාම විඤ්ඤාණස්සේව විසයත්තාති ඒවං තාව දිට්ඨාදිචතුක්කවසේන චතුබ්බිධං.

**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා රූපක්ඛන්ධකථා අංක 449 යටතේ); විසුද්ධිමග්ග අටුවා 337 පිට (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය ස්කන්ධ නිර්දේශය 190 පිට (තායිවාන් මුද්‍රණය)]**

දිට්ඨාදිචතුක්කවසේන, රූපරූපාදිචතුක්කවසේන, වත්ථාදිචතුක්කවසේනාති පාටෙක්කං චතුක්කසද්දෝ යෝජේතබ්බෝ. යං රූපායතනං අදක්ඛි යං පස්සති යං දක්ඛිස්සති යං පස්සෙය්‍ය, තං සබ්බං **දිට්ඨං** නාම දිට්ඨසභාවානාතිවත්තනතෝ යථා දුද්ධන්ති. ඒස නයෝ සේසේසුපි. **දස්සනවිසයත්තා**ති චක්ඛුවිඤ්ඤාණ විඤ්ඤෙය්‍යත්තා. **සවනවිසයත්තා**ති සෝතවිඤ්ඤාණ විඤ්ඤෙය්‍යත්තා. **ගන්ධරසඵොට්ඨබ්බත්තය**න්ති ගන්ධෝ රසෝ ඵොට්ඨබ්බන්ති ඒතං තයං. **මුතං** නාම මුත්වා පත්වා ගහේතබ්බතෝ. තේනාහ **"සම්පත්තග්ගාහකඉන්ද්‍රියවිසයත්තා"**ති.

කිමිදං ඵොට්ඨබ්බං නාමාති? පථවීතේජෝවායෝධාතුත්තයං. කස්මා පනෙත්ථ ආපෝධාතු අග්ගහිතා, නනු සීතතා ඵුසිත්වා ගය්හති, සා ච ආපෝධාතූති? සච්චං ගය්හති, න පන සා ආපෝධාතු. කිඤ්චරහීති? තේජෝධාතු ඒව. මන්දේ හි උණ්හභාවේ සීතබුද්ධි. න හි සීතං නාම කෝචි ගුණෝ අත්ථි, කේවලං පන උණ්හභාවස්ස මන්දතාය සීතතාභිමානෝ. කථමේතං විඤ්ඤාතබ්බන්ති චේ? අනවට්ඨිතත්තා සීතබුද්ධියා යථා පාරාපාරේ. තථා හි ඝම්මකාලේ ආතපේ ඨිතානං ඡායං පවිට්ඨානං සීතබුද්ධි හෝති, තත්ථේව පන පථවිගබ්භතෝ උට්ඨිතානං උණ්හබුද්ධි. යදි හි සීතතා ආපෝධාතු සියා, ඒකස්මිං කලාපේ උණ්හභාවේන සද්ධිං උපලබ්භෙය්‍ය, න ච උපලබ්භති. තස්මා විඤ්ඤායති න ආපෝධාතු සීතතාති. ඉදඤ්ච භූතානං අවිනිබ්භෝගවුත්තිතං ඉච්ඡන්තානං උත්තරං, අනිච්ඡන්තානම්පි පන චතුන්නං භූතානං ඒකස්මිං කලාපේ කිච්චදස්සනේන සභාගවුත්තිතාය සාධිතාය උත්තරමේව. යේ පන "වායෝධාතුයා ලක්ඛණං සීතතා"ති වදන්ති, තේසම්පි ඉදමේව උත්තරං. යදි හි වායෝධාතු සීතතා සියා, ඒකස්මිං කලාපේ උණ්හභාවේන සද්ධිං සීතතා උපලබ්භෙය්‍ය, න ච උපලබ්භති. තස්මා විඤ්ඤායති න වායෝධාතු සීතතාති. යේසං පන ද්‍රවතා ආපෝධාතු, සා ච ඵුසිත්වා ගය්හතීති දස්සනං. තේ වත්තබ්බා "ද්‍රවභාවෝපි ඵුසීයතීති ආයස්මන්තානං අධිමානමත්තං සණ්ඨානං විය"ති. වුත්තඤ්හේතං පුරාතනේහි;

"ද්‍රවතා සහවුත්තීනි, තීණි භූතානි සම්ඵුසං;

'ද්‍රවතං සම්ඵුසාමී'ති, ලෝකෝයමභිමඤ්ඤති.

"ඵුසං භූතානි සණ්ඨානං, මනසා ගණ්හතේ යථා;
'පච්චක්ඛතෝ ඵුසාමී'ති, ඤෙතබ්බා ද්‍රවතා තථා"ති.

**සේසන්**ති යථාවුත්තං රූපාදිසත්තවිධං රූපං ඨපෙත්වා අවසිට්ඨං ඒකවීසති විධං රූපං. **විඤ්ඤාණස්සේ**වාති මනෝවිඤ්ඤාණස්සේව.
**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා රූපක්ඛන්ධකථා අංක 449 යටතේ)]**

**පුන** නැවත ද මේ රූපධර්මයෝ **දිට්ඨාදිචතුක්කවසේන** දෘෂ්ටාදී චතුෂ්ක වශයෙන් ද **රූපරූපාදිචතුක්කවසේන** රූපරූපාදී චතුෂ්ක වශයෙන් ද **වත්ථාදිචතුක්කවසේන** වස්තු ආදී චතුෂ්ක වශයෙන් ද **චතුබ්බිධං** සිව් වැදෑරුම් වේ **තත්ථ** එහි **දිට්ඨං නාම** දර්ශන විඤ්ඤාණ විෂය හෙයින් **රූපායතනං** රූපායතනය තෙමේ **දිට්ඨං නාම** දෘෂ්ටරූප නම් වේ (යම් රූපායතනයක් පෙර දුටුවේ ද, යමක් දැන් දකීද, යමක් මතු දකින්නේ ද ඒ සියල්ලම දෘෂ්ටභාවය නොයික්මෙන බැවින් ඉන්ධනය යනු මෙන් දෘෂ්ට නම් වේ යනු ටීකායි. **"දුද්ධන්ති; යං දිට්ඨං යං දිස්සති යං දක්ඛති යං සමවායේ පස්සෙය්‍ය, තං සබ්බං දිට්ඨන්තේව ගහිතං කාලවිසේසස්ස අනාමට්ඨභාවතෝ යථා දුද්ධන්ති දස්සේති" දුකතිකචතුක්කනිපාත ටීකා ඡට්ඨ.සං අංක 23 යටතේ)** **දස්සනවිසයත්තා** චක්ෂුර්විඥාන විෂයය බැවින් **සද්දයතනං** ශබ්දයතනය තෙමේ **සුතං නාම** සුත නම් වෙයි **සවනවිසයත්තා** ශ්‍රෝත්‍රවිඥාන විෂයය බැවින් **ගන්ධරසඵොට්ඨබ්බත්තයං** ගන්ධය රසය ස්ප්‍රෂ්ටව්‍යය යන මේ තුන **මුතං නාම** පැමිණ ගතයුතු හෙයින් මුත නම් (එහෙයින් කීහු "සම්පත්තගග්ගාහකඉන්ද්‍රියවිසයත්තා" යි) **සේසං** මේ කියනලද සප්ත රූපයෝ හැර ඉතිරි එක්විසි රූපයෝ **විඤ්ඤාතං නාම** විඤ්ඤාත නම් වේ **විඤ්ඤාණස්සේව විසයත්තා** මනෝවිඥානයටම විෂයවන බැවිනි ("සේසන්ති යථාවුත්තං රූපාදිසත්තවිධං රූපං ඨපෙත්වා අවසිට්ඨං ඒකවීසති විධං රූපං. විඤ්ඤාණස්සේවාති මනෝවිඤ්ඤාණස්සේව" යනුවෙන් ටීකායෙහි කියනලදි) **ඒවං** මෙලෙස **තාව** පළමුව රූපය තෙමේ **දිට්ඨාදිචතුක්කවසේන** දෘෂ්ටාදී චතුෂ්ක වශයෙන් **චතුබ්බිධං** සතර වැදෑරුම් **ඉති** (**හෝති** වෙයි)

මෙහි ස්ප්‍රෂ්ටව්‍ය නම් කිමයත්? ආපෝධාතුව වර්ජිත භූත තය ස්ප්‍රෂ්ටව්‍ය නම්. කුමක් හෙයින් මෙහි අප් ධාතුව නොගන්නාලද ද? සීතල බව ස්පර්ශ කොට නොගන්නා ලැබේද? හේද අප් ධාතුය යත්? සැබෑව සීතල බව ස්පර්ශ කොට ගන්නා ලැබෙයි. ඒ වනාහි අප් ධාතු නොවේ. තේජෝ ධාතුමැයි. උෂ්ණභාවය මඳ කල්හි වනාහි ශීතබුද්ධිය වෙයි. ශීත නම් වූ කිසි ගුණයෙක් නොම ඇති. කේවල උෂ්ණභාවයාගේ මන්දත්වයෙන් ශීතත්වාභිමතය වේ. හේ කෙසේ දැනේ ද යත්? ශීතබුද්ධිය අනවස්ථිත බැවින් එතර මෙතර මෙන් හෙවත් මෙතර සිටි පුරුෂයා එතර ගිය කල්හි ඕ හට එතර මෙතර වෙයි. එතර සිටි පුරුෂයා මෙතරට ආ කල්හි ඕ හට මෙතර වෙයි. එමෙන්ම උෂ්ණ කාලයෙහි අව්වේ සිට ඡායාවට වන්නහුට ඡායාවෙහි ශීතබුද්ධිය වෙයි. පෘථිවි ගර්භයෙන් නැංගහුට වනාහි එහිම උෂ්ණබුද්ධිය වේ. ඉදින් ශීතත්වය අප් ධාතු වී නම් එකම කලබුයෙක (කලාපයෙක) උෂ්ණත්වය හා සමඟ ශීතත්වය ලැබිය යුතුතේය. එසේද නොලැබෙන්නේයි. එහෙයින් ශීතත්වය අප් ධාතු නොවේ යනු හැගේ. මේ වනාහි චතුර්භූතයන්ගේ අවිනිර්භෝග ප්‍රවෘතිය කැමැත්තහුනට උත්තරයි. නොකැමැත්තහුට ද සතර මහභූතයන්ගේ එක කලබුයෙක්හි (කලාපයෙක) කෘත්‍යය දර්ශනයෙන් සභාග වෘත්තිත්වය සාධිත කල්හි උත්තරම වේ. යමෙක් වනාහි වායු ධාතුවගේ ලක්‍ෂණය ශීතත්වය යයි කියත් ද ඔහුනට ද මෙම උත්තරයි. ඉදින් වායු ධාතුව ශීතත්වය වේ නම් එක කලබුයෙහි උෂ්ණභාවය

හා සමඟ ශීතත්වය ද ලැබෙන්නේය. එසේත් නොද ලැබෙයි. එහෙයින් වායෝ ධාතුව ශීතත්ව නම් නොවෙයි හැගෙයි. යම් කෙනෙක්නට වනාහි ද්‍රවතාව අප් ධාතුය භේද ස්පර්ශ කොට ගන්නා ලැබෙයි. දර්ශනය ද ඔහු මෙසේ කියයුතු වෙත්. ද්‍රවතාව ස්පර්ශ කරනු ලැබෙයි යනු ආයුෂ්මතුන්ගේ සංස්ථානය මෙන් අභිමාන මාත්‍ර වේ. මෙම කීහ නාගබෝධි ස්ථවිරයෝ:—

"ද්‍රවතා සහවුත්තීනි, තීණි භූතානි සම්ඵුසං;
'ද්‍රවතං සම්ඵුසාමී'ති, ලෝකෝයමභිමඤ්ඤති.

"ඵුසං භූතානි සණ්ඨානං, මනසා ගණ්හතේ යථා;
'පච්චක්ඛතෝ ඵුසාමී'ති, ඤාතබ්බා ද්‍රවතා තථා" යී.

**[විසුද්ධි මග්ග සන්නය 1174-1175 පිටු; සිංහල විසුද්ධි මාර්ගය රූපස්කන්ධ නිර්දේශය 190 පිටු (තායිවාන් මුද්‍රණය)]**

ආපෝධාතුයා සුඛුමභාවේන ඵුසිතුං අසක්කුණෙය්‍යත්තා වුත්තං **"ආපෝධාතු විවජ්ජිතං භූතත්තයසඞ්ඛාත"**න්ති. කිඤ්චාපි හි සීතතා ඵුසිත්වා ගය්හති, සා පන තේජෝයේව. මන්දේ හි උණ්හත්තේ සීතබුද්ධි සීතතාසඞ්ඛාතස්ස කස්සචි ගුණස්ස අභාවතෝ. තයිදං සීතබුද්ධියා අනවට්ඨිතභාවතෝ විඤ්ඤායති පාරාපාරේ විය. තථා හි ඝම්මකාලේ ආතපේ ඨත්වා ඡායං පවිට්ඨානං සීතබුද්ධි හෝති, තත්ථේව චිරකාලං ඨිතානං උණ්හබුද්ධි. යදි ච ආපෝධාතු සීතතා සියා, උණ්හභාවේන සහ ඒකස්මිං කලාපේ උපලබ්භෙය්‍ය, න චේවං උපලබ්භති, තස්මා විඤ්ඤායති "න ආපෝධාතු සීතතා"ති. යේ පන "ද්‍රවතා ආපෝධාතු, සා ච ඵුසිත්වා ගය්හතී"ති වදන්ති, තේ වත්තබ්බා "ද්‍රවතා නාම ඵුසිත්වා ගය්හතීති ඉදං ආයස්මන්තානං අභිමානමත්තං සණ්ඨානේ වියා"ති. වුත්තඤ්හේතං පෝරාණේහි;

"ද්‍රවතාසහවුත්තීනි, තීණි භූතානි සම්ඵුසං;
ද්‍රවතං සම්ඵුසාමීති, ලෝකෝ යමභිමඤ්ඤති.

"භූතේ ඵුසිත්වා සණ්ඨානං, මනසා ගණ්හතෝ යථා;
පච්චක්ඛතෝ ඵුසාමීති, විඤ්ඤෙය්‍යා ද්‍රවතා තථා"ති.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 06 රූපසමුද්දේස වණ්ණනා යටතේ); විභාවනී සන්නය 324 පිට]**

(ආයුෂ්මත් ටීකාචාරීන් වහන්ස ස්පර්ශාලම්බනයෙහි "ආපෝධාතු විවජ්ජිතං භූතත්තයසඞ්ඛාතං" යන වාක්‍ය කුමක් පිණිස අනුරුද්ධාචාරීන් විසින් කියන ලද්දේ ද යන චෝද්‍යය සඳහා "ආපෝධාතුයා -පෙ- සඞ්ඛාතන්ති" යන පාඨය ටීකාචාරීන් විසින් කියනලදි) **ආපෝධාතුයා** ආප් ධාතුහුගේ **සුඛුමභාවේන** සියුම් බැවින් (අසක්කුණෙය්‍යත්තා යන්නෙහි සම්බන්ධයි) **ඵුසිතුං** වැදගන්නට (හැපීමට හෝ) **අසක්කුණෙය්‍යත්තා** අසමර්ථ බැවින් **ආපෝ** -පෙ- **සඞ්ඛාතන්ති (ඉදං වචනං)** ආපෝ -පෙ- සඞ්ඛාතං යන මේ වචනය (**ආචරියේන** අනුරුද්ධාචරියන් විසින්) **වුත්තං** කියනලදි (ආචාරිනී ආපෝධාතුව ස්පර්ශ කිරිමෙහි අසමර්ථ යැයි කීයේය. කුමක් හෙයින් ආපෝධාතුව ස්පර්ශ නොකළ හැකි වන්නේ ද? සිහිල් වූ කල ඒ සිහිල් බව වැදගන්නේ නොවේද යන චෝද්‍ය සඳහා "කිඤ්චාපිහි -පෙ- තේජෝයේව" යන පාඨය කියනලදි) **හි (යස්මා)** යම්හෙයකින් **සීතතා** සිහිල් බව **ඵුසිත්වා** ස්පර්ශ කොට **කිඤ්චාපි ගය්හති** ඉදින් ගන්නා ලද්දේ වේද **පන (තථාපි)** එසේ ගන්නා ලද්දේ ද **සා**

**සීතතා** ඒ සිහිල් බැව් තොමෝ **තේජෝ ඒව හෝති** තේජෝධාතුම වේ **තස්මා** එසේ හෙයින් **ආපෝධාතු** ආපෝධාතුව **ඵුසිතුං** ස්පර්ශ කරනු පිණිස **අසක්කුණෙය්‍යා හෝති** අසමර්ථ වෙයි (මෙසේ අර්ථ යෝජනා කටයුතුයි. සිහිල් බව තේජෝධාතුවම වන්නේ යැයි ආචාර්‍ය්‍ය තෙම කියයි. සිහිල් බව ආපෝධාතු නොවේද? කුමක් හෙයින් සිහිල් බව තේජෝධාතු වන්නේ ද? යන චෝද්‍ය සඳහා "මන්දේ -පෙ- අභාවතෝ" යන පාඨය කියනලදි) **හි (යස්මා)** යම්හෙයකින් **උණ්හත්තේ** උණුසුම් බව **මන්දේ** දුර්වල වූ කල්හි (නොහොත් අඩු වූ කල්හි) **සීතතාසඞ්ඛාතස්ස** සිහිල් බව යැයි කියනලද **කස්සචි ගුණස්ස (තේජස්ස)** කිසිගුණ වූ තේජසක් **අභාවතෝ** නැති හෙයින් **සීතබුද්ධි හෝති** සිහිලය යන බුද්ධිය වේද (ඇතැම් ඉුරුම භාෂාමය පොත්හි වෘද්ධිශබ්දය කල්පනා කොට සීතගුණයාගේ වැඩීමයයි අර්ථ කියා තිබේ. ඒ මැනවයි නොහැගේ) **තස්මා** එසේ හෙයින් **තා (සීතතා)** ඒ සිහිල් බැව් තොමෝ තේජෝ ඒව හෝති තේජෝධාතුම වේ.

(ආචාරීනි එක් ආකාරයකින්ම දතයුත්තේ නොවේ ද? කෙසේ උණුසුම් බව දන්නා ලද්දේ ද? යන චෝද්‍ය සඳහා "තයිදං -පෙ- විඤ්ඤායති" යන පාඨය කියනලදි) **තයිදං (තං ඉදං උණ්හත්තං)** ඒ උණුසුම් බව **සීතබුද්ධියා** සිහිල් යන බුද්ධිය හෝ කල්පනාව **අනවට්ඨිතභාවතෝ** නිරන්තරයෙන් නොසිටිනා බැවින් **විඤ්ඤායති** හැගේ (**කිම්ව** කුමක් මෙන්ද යත්?) **පාරාපාරේ** පරතීරයෙහි (**පවත්තාබුද්ධි** හටගත්තාවූ බුද්ධිය **විඤ්ඤායති** විය හැගෙන්නාක් මෙන්) (මෙහි අභිප්‍රාය තමා සිටි තීරය මෙතර නම් වෙයි. තමා සිටි තීරයෙන් අන්‍යවූ තීරය එතර නම් වෙයි කියනලදි. තමාගේ ඒ සිටීම ද නිරන්තර නොවන බැවින් යම්කලෙක ඒ ගඞ්ගා නදියෙන් එතර ගියාවූ ඕ හට එතර මෙතර වෙනස් විය යුතු බැවින් එතර මෙතර යැයි කරන ව්‍යවහාරය ඒකාන්ත නොවන්නාක් මෙන් සිහිල යන බුද්ධිය සිහිල් වූ කල ලැබෙන්නාක් මෙන් උණුසුම් වූ කල උෂ්ණ බුද්ධිය ද වේ. එසේ හෙයින් සීත බුද්ධිය නිරන්තරයෙන් නොසිටිනා බැවින් උෂ්ණ බුද්ධිය ද හටගන්නේ යැයි දතයුතුයි) (ආචාරීනි ඒ ශීත උෂ්ණයන්ගේ හටගැනීම කෙසේ වන්නේ ද? එක එක කලාපයෙහි ඒකේකි ගුණය වියයුතු නොවේ ද? යන චෝද්‍යය සඳහා "තථා හි -පෙ- උණ්හබුද්ධි" යන පාඨය කියනලදි) **යථා (තං වචනං)** ඒ වචනය **හි (යුත්තං)** යෙදෙන්නේයි **ඝම්මකාලේ** ග්‍රීෂ්ම කාලයෙහි **ආතපේ ඨත්වා** අව්වේ සිට **ඡායං** සෙවනට **පවිට්ඨානං** පිවිසියවුන්ට **සීතබුද්ධි හෝති** සිහිල යන කල්පනාව වේ **තත්ථේව** ඒ සෙවනෙහිම **චිරකාලං** බොහෝ වේලාවක් මුළුල්ලේ **ඨිතානං** සිටියවුන්ට **උණ්හබුද්ධි හෝති** උණුසුම්ය යන කල්පනාව වෙයි (ආචාරීනි සිහිල් බව ආපෝධාතුව හෝ වේයයි කීයේ නොවේද? සිහිල් බව ආපෝධාතුව වන කල්හි කවර ස්වභාවක් වන්නේ ද? යන චෝද්‍යය සඳහා "යදි ච ආපෝධාතු -පෙ- උපලබ්භෙය්‍ය" යන පාඨය කියනලදි) **සීතතා** සිහිල් බව **ආපෝධාතු යදි සියා** ඉදින් ආපෝධාතු වන්නේ නම් **ඒවං සති** මෙසේ ඇති කල්හි **සා ආපෝධාතු** ඒ ආප් ධාතුව (මේ කර්මකාරකයි) **උණ්හභාවේන සහ** උණුසුම් බව හා සමඟ **ඒකස්මිං කලාපේ** එක් කලබුවෙක්හි (එක් කලාපයෙක්හි) **උපලබ්භෙය්‍ය** ලැබිය යුත්තේය **ඒවං** මෙසේ **න ච උපලබ්භති** නොද ලබන්නේයි **තස්මා** එසේ හෙයින් **සීතතා** සිහිල් බැව් තොමෝ **ආපෝධාතු න සියා** ආපෝධාතු නොවන්නේය **ඉති** මෙසේ **විඤ්ඤායති** හැගේ.

**යේ පන (ආචරියා)** යම් ආචාර්‍ය්‍ය කෙනෙක් තුමූ **දවතා** සිහිල් උණුසුම් බව **ආපෝධාතු** ආපෝධාතු නම් වෙයි **සා ච දවතා** ඒ ශීතෝෂ්ණතා සඞ්ඛ්‍යාත ආපෝධාතුව **ඵුසිත්වා ගය්හති** ස්පර්ශ කොට ගන්නා ලැබෙයි **ඉති වදන්ති** මෙසේ කියන්නාහු වෙත් ද **තේ (ආචරියා)** ඒ ආචාර්‍ය්‍යවරයෝ **වත්තබ්බා** ව්‍යක්‍ෂමාන වචනය

කියයුත්තාහුය **දවතා නාම** ශීතෝෂ්ණතා සඞ්ඛ්‍යාත ආප් ධාතු තොමෝ චනාහි **ඵුසිත්වා ගය්හති** ස්පර්ශ කොට ගන්නා ලැබෙයි **ඉති** මෙසේ **ආයස්මන්තානං** ආයුෂ්මතුන්ගේ **ඉදං** මේ මෙනෙහි කිරීම **අභිමානමත්තං හෝති** විපරීත වූ මෙනෙහි කිරීම් මාත්‍රයක්ම වෙයි (**කිම්ව** කුමක් මෙන්ද යත්?) (**සණ්ඨානේ වියාති** සටහන ස්පර්ශ වූ කල්හි විපරීත වූ හැඟීම වන්නාක් මෙනි) (එහි අභිප්‍රාය මෙසේයි. ආපෝධාතුවෙන් අන්‍යවූ මහාභූතයෝ තුන්දෙන ස්පර්ශ කොට (හෙවත්) අල්වා සටහන මා විසින් අල්වන ලද්දේ යැයි මහාභූතයන්ගේ සටහන ස්පර්ශ කිරීමෙහි මෙනෙහි කිරීම විපරීත වූ මෙනෙහි කිරීමක්ම වන්නාක් මෙන් ආපෝධාතුව ස්පර්ශ කොට අතින් අල්වා ගන්නා ලද්දේ යයි යන තොපගේ මෙනෙහි කිරීම විපරීත වූ මෙනෙහි කිරීම වෙයි. ඒකාන්ත වශයෙන් ආපෝධාතුව ස්පර්ශ කොට හෙවත් අතින් අල්වා නොගතහැක්කේය යනු භාවයි) (හි යනු "තදේව සච්චං" යන අර්ථයි) පෝරාණෝහි අර්ථකථාචාරීන් විසින් **දවතා** -පෙ- **යථාති** දවතා -පෙ- යථා යන **ඒතං** මේ වචනය **වුත්තං** කියනලදි.

**දවතාසහවුත්තීනි** ආපෝධාතුව හා සමඟ පවත්නා වූ **තීණිභූතානි** සෙසු භූතයෝ තුන්දෙන **සම්ඵුසං** ස්පර්ශ කරන්නා වූ **අයං** මේ අඥාන සත්ව සමූහ තෙමේ **දවතං** ආපෝධාතුව **සම්ඵුසාමීති** ස්පර්ශ කරන්නෙමියි (හෙවත්) අල්වන්නෙමියි **අභිමඤ්ඤති** විපරීතාකාරයෙන් මෙනෙහි කෙරෙයි **භූතේ** (ආපෝධාතු වර්ජිත) භූතයෝ තුන්දෙන **ඵුසිත්වා** ස්පර්ශ කොට **අහං** මම **සණ්ඨානං** මහාභූතයන්ගේ සටහන **පච්චක්ඛතෝ** ප්‍රත්‍යක්ෂ වශයෙන් **ඵුසාමීති** අල්වන්නෙමියි **මනසා** සිතින් **ගණ්හතෝ යථා** ගන්නාහට යම්සේද **තථා** එපරිද්දෙන් **භූතේ** තුන් මහාභූතයන් **ඵුසිත්වා** අල්වා **අහං** මම **දවතං** ආපෝධාතුව **පච්චක්ඛතෝ** ප්‍රත්‍යක්ෂ වශයෙන් **ඵුසාමි** ස්පර්ශ කරන්නෙමි **ඉති** මෙසේ **මනසා** සිතින් **ඵොට්ඨබ්බභාවේන** ස්පර්ශ භාවයෙන් **ගණ්හතේ** ගන්නා ලැබේ **ඉති** මෙසේ **දවතා** ආපෝධාතුව **විඤ්ඤෙය්‍යා** දතයුත්තීය (මේ අර්ථ යෝජනාව "ගණ්හතේ" යන පාඨයට සුදුසු පරිද්දෙනි. "ගණ්හතෝ" යන පාඨයක් ද ඇත්තේය. ඒ පාඨයට අනුව අර්ථ යෝජනා කරන කල්හි) **භූතේ** තුන් මහාභූතයන් **ඵුසිත්වා** ස්පර්ශ කොට **අහං** මම **සණ්ඨානං** සටහන **පච්චක්ඛතෝ** ප්‍රත්‍යක්ෂ වශයෙන් **ඵුසාමි** ස්පර්ශ කරන්නෙමි **ඉති** මෙසේ **මනසා** සිතින් **ගණ්හතෝ** ගන්නා වූ අඥාන පෘථක්ජනයාගේ **ගහණං** ගැනීම **ගහණමත්තං හෝති යථා** විපරීත වූ ගැනීම් මාත්‍රයක්ම යම්සේ වේද **තථා** එපරිද්දෙන් **තයෝ** තුන් මහාභූතයන් **ඵුසිත්වා** ස්පර්ශ කොට **අහං** මම **දවතං** ආපෝධාතුව **පච්චක්ඛතෝ** ප්‍රත්‍යක්ෂ වශයෙන් **ඵුසාමි ඉති** ස්පර්ශ කරන්නෙමියි **මනසා** සිතින් **ගණ්හතෝ** ගන්නා වූ අඥාන පෘථක්ජනයා විසින් (කර්තෘකාරකයෙහි ෂෂ්ඨීයි) **දවතා** ආපෝධාතුව **ඵොට්ඨබ්බභාවේන** ස්පර්ශ භාවයෙන් **විඤ්ඤෙය්‍යා** දන්නාලදි (මෙසේ අර්ථ යෝජනා දතයුතුයි)

**[විභාවනී ටීකා සන්නය 09-12 පිටු]**

ඵුසීයතීති ඵොට්ඨබ්බං, පථවීතේජවායවෝ;
ඵොට්ඨබ්බං චතුසම්භූතං, ඵොට්ඨබ්බාරම්මණං මතං.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 298 යටතේ)]**

**ඵුසීයතීති ඵොට්ඨබ්බං** යං ධම්මජාතං ජනේහි ඵුසීයතීති තස්මා ඵොට්ඨබ්බං, පථවීතේජවායවෝ. තං ඵොට්ඨබ්බං චතුසම්භූතං ඵොට්ඨබ්බාරම්මණං මතං.

**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 298 යටතේ)]**

**පඨවිතේජවායවෝ** පඨවි තේජෝ වායෝ යන යම් ධර්ම ස්වභාවයක් **ඵුසතීති** ස්පර්ශ කරයි ද **(තං)** ඒ ධර්ම ස්වභාවය **ඵොට්ඨබ්බං** ඵොට්ඨබ්බ නම් **චතුසම්භූතං**

සතර මහාධාතූන්ගෙන් හටගත් **ඵොට්ඨබ්බං** ඵොට්ඨබ්බය තෙමේ **ඵොට්ඨබ්බාරම්මණං** ඵොට්ඨබ්බාරම්මණය යයි **මතං** කියනලදි.

**[අභිධම්මාවතාර ටීකා පරිවර්තනයි]**

**ඵුසීයතීති** ඝට්ටියති. කිං තං ඵොට්ඨබ්බං නාමාති ආහ **"පඨවීතේජවායවෝ"**ති. ඉමිනා ධාතුත්තයමේව කායවිඤ්ඤාණවිඤ්ඤෙය්‍ය භාවසඞ්ඛාතඵොට්ඨබ්බං නාම, න අඤ්ඤන්ති දස්සේති. කස්මා පනෙත්ථ ආපෝධාතු න ගහිතා, නනු සීතතා ඵුසිත්වා ගය්හති, සා ච ආපෝධාතු ඒවාති? සච්චං ගය්හති, න පන ආපෝධාතු, කිඤ්චරහි තේජෝධාතු ඒව. මන්දේ හි උණ්හභාවේ සීතවුද්ධි, න සීතතා නාම කෝචි ගුණෝ අත්ථි. කේවලං පන උණ්හභාවස්ස මන්දතාය සීතතාභිමානෝ. කථං පනේතං විඤ්ඤාතබ්බන්ති චේ? සීතවුද්ධියා අනවට්ඨිතභාවතෝ පාරාපාරේ විය. තථා හි ඝම්මකාලේ ආතපේ ඨත්වා ඡායං පවිට්ඨානං සීතවුද්ධි හෝති, තත්ථේව පඨවිගබ්භතෝ උට්ඨිතානං උණ්හවුද්ධි ච. කිඤ්චරහි හිමපාතසමයාදීසු සීතස්ස පරිපාචකත්තදස්සනතෝ ච තේජෝධාතු ඒව සීතතාති දට්ඨබ්බං. යදි ච සීතතා ආපෝධාතු සියා, ඒකස්මිං කලාපේ උණ්හභාවේන සද්ධිං උපලබ්භෙය්‍ය ද්වින්නං ධාතූනං අවිනිබ්භෝගප්පවත්තිතෝ, න ච පනේවං උපලබ්භති, තස්මා ඤායති "න ආපෝධාතු සීතතා"ති. ඉදං චතුමහාභූතානං අවිනිබ්භෝගවුත්තිතං ඉච්ඡන්තානං උත්තරං, අනිච්ඡන්තානම්පි පන චතුන්නං මහාභූතානං ඒකස්මිං කලාපේ කිච්චදස්සනේන සභාගවුත්තිතාය සාධිතාය ඉදමේව උත්තරං. කේචි පන "වායෝධාතු සීතතා"ති වදන්ති, තේසම්පි ඉදමේව උත්තරං. යදි වායෝධාතු සීතතා සියා, ඒකස්මිං කලාපේ උණ්හභාවේන සද්ධිං උපලබ්භෙය්‍ය, න ච පනේවං උපලබ්භති, තස්මා විඤ්ඤායති "න වායෝධාතු සීතතා"ති. යේ පන වදන්ති "ද්‍රවතා ආපෝධාතු, සා ච ඵුසිත්වා ගය්හතී"ති, තේ වත්තබ්බා "ද්‍රවභාවෝපි නාම ඵුසීයතීති ඉදං ආයස්මන්තානං අධිමානමත්තං සණ්ඨානේ වියා"ති. වුත්තඤ්හේතං පෝරාණේහි;

"ද්‍රවභාසහවුත්තීනි, තීණි භූතානි සම්ඵුසං;
ද්‍රවතං සම්ඵුසාමීති, ලෝකෝයමභිමඤ්ඤති.

"භූතේ ඵුසිත්වා සණ්ඨානං, මනසා ගය්හතේ යථා;
පච්චක්ඛතෝ ඵුසාමීති, ඤාතබ්බා ද්‍රවතා තථා"ති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 298 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 294 පිට]**

ඝට්ටනය කරානුයි "ඵුසති" නම් වේ. ඒ ඵොට්ඨබ්බය කුමක්දැයි දක්වමින් පඨවි තේජෝ වායෝ යැයි කීහ. මෙයින් ධාතුත්‍රයම කායවිඤ්ඤාණයෙන් දැනගතයුතු සඞ්ඛ්‍යාත ඵොට්ඨබ්බය නම් වෙයි. එයින් අන්‍ය දෙයක් නොවේ යැයි දක්වයි. එහි වනාහි කුමක් හෙයින් ආපෝධාතුව නොගන්නා ලද්දේ ද? ශීතබව ස්පර්ශ කොට ගන්නේ නොවේ ද? ඒ සිසිල් බව වනාහි ආපෝ ධාතුව නොවේද? සිසිල් බව ස්පර්ශ කොට ගනී යන කීම සැබෑවකි, ඒ සිසිල් බව වනාහි ආපෝධාතුව නොවෙයි තේජෝ ධාතුවමය. උෂ්ණභාවය මද කල්හි සිසිල් බව වෙයි. සිසිල් බව නම් කිසි ගුණයක් ඇති දෙයක් නොවෙයි, හුදෙක් උෂ්ණබැව්හි මද බැවින් සීතබුද්ධිය වෙයි. ඉදින් එය කෙසේ දතයුතු ද? සිසිල් බව යන කල්පනාව පෙරලීම් වශයෙන් ගඟෙහි එතර මෙතර මෙනි. යම්සේ ග්‍රීස්ම කාලයෙහි අව්වේ සිට සෙවනට පැමිණියහුට ශීතල යැයි වැටහීම වෙයි. එසේම පර්වතයක් මුදුනට නැංගහුට උණුසුම යන වැටහීම වෙයි. කිසිසේත් වනාහි හිම වැටෙන කාලයන්හි සිසිල් බවගේ පැසවීම් බව දැක්වීම් වශයෙන් තේජෝ ධාතුවම ශීතල යැයි දතයුතු. ඉදින් ශීතල බව ආපෝ ධාතුව වන්නේ නම් උෂ්ණ

භාවය සමග එක් කාලාපයෙක ධාතූන් දෙදෙනාගේ අවිනිර්භෝග පැවැත්ම වශයෙන් ලබන්නේය, එසේ නොලබයි. සිසිල් බව ආපෝ ධාතුව නොවේ යැයි එහෙයින් දැනගනී. මේ සතර මහාභූතයන්ගේ කියනලද අවිනිර්භෝග බව කැමතිවනහුට පිළිතුරයි. නොකැමතිවන්නහුට ද සතර මහාභූතයන්ගේ එක් කලාපයක්හි කෘත්‍යය දැක්වීමෙන් සමාන පැවතුම් ඇති බවම පිළිතුරයි. ඇතමෙක් වනාහි වායෝ ධාතුව ශීතල යැයි කියත් ද ඔහුන්ට ද මෙයම පිළිතුරයි. ඉදින් වායෝ ධාතුව ශීතල වන්නේ නම් එක් කලාපයක උෂ්ණභාවය හා සමඟ සිසිල් බව ද ලැබෙන්නේය, එසේ නොලැබෙයි. වායෝ ධාතුව සිසිල් බව නොවේයයි එහෙයින් දැනගනී. යමෙක් වනාහි ද්‍රව බව ආපෝ ධාතුවයි, එය ද ස්පර්ශ කොට ගනී යැයි කියත්. ඔහුට මෙසේ කියයුතු වෙත්. ද්‍රවතාව ස්පර්ශ කරනු ලැබෙයි යනු ආයුෂ්මතුන්ගේ පෙනීමෙහි අධිමානමාත්‍රය වෙයි. එසේහෙයින් කියනලදි පුරාණ ආචාර්‍යයින් විසින්:—

"ද්‍රවභාසහවුත්තීනි, තීණි භූතානි සම්ඵුසං;
ද්‍රවතං සම්ඵුසාමීති, ලෝකෝයමභිමඤ්ඤති.

"භූතේ ඵුසිත්වා සණ්ඨානං, මනසා ගය්හතේ යථා;
පච්චක්ඛතෝ ඵුසාමීති, ඤාතබ්බා ද්‍රවතා තථා"ති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

**ඵුසීයතීති ඵොට්ඨබ්බං**. ඵුසනඤ්චෙත්ථ පසාදේන සහ ඝට්ටනං කලාපන්තරභූතේහි සද්ධිං පටිහනනඤ්ච වේදිතබ්බං. තදුභයංපි ආපෝ ධාතුයා නත්ථීති වුත්තං **ආපෝධාතුවිවජ්ජිත**න්ති. කස්මා පන තං තස්සා නත්ථි. නනු සීතතාවා ද්‍රවතාවා ඵුසිත්වා ගය්හතීති. වුච්චතේ, සීතතා හි තේජෝයේව, න ආපෝ. යදි හි සා ආපෝයේව සියා. පක්කුථිතේ සන්තත්තේ ලෝහරසේපිස්ස සීතතා ලබ්භමානා සියා. සෝ හි රසෝ ආපාධිකෝ හෝතීති. ඒවං පන න ලබ්භති. තස්මා සා තේජෝයේව, න ආපෝති. අපිච, සීතුණ්හානං ඒකස්මිං කලාපේ සහ අප්පවත්තනතෝ ඕරපාරානං විය තේසං අනවට්ඨානතෝච විඤ්ඤායති. න හි සීතකලාපේ උණ්හං, උණ්හකලාපේවා සීතං සහ පවත්තති. යස්මිං ච වත්ථුම්හි පුබ්බේ සීතසඤ්ඤා සණ්ඨාති. පච්ඡා තතෝ සීතතරේ ආගතේ තස්මිංයේව පුන උණ්හසඤ්ඤා සණ්ඨාති. පුබ්බේ උණ්හසඤ්ඤායංපි ඒසේව නයෝ. තථා උණ්හේ මන්දේ සීතසඤ්ඤා සණ්ඨාති. සීතේ මන්දේ උණ්හසඤ්ඤාති.

අථ පන ද්‍රවභාවභූතෝ ආපෝ ඵුසිත්වා ගය්හති. අයෝ පිණ්ඩාදීසු ආබන්ධනභූතෝපි ඵුසිත්වාව ගය්හෙය්‍ය. ඒවඤ්ච සති යථා තේසු ඉතරානි තීණි භූතානි විනා ඉතරීතරේන විසුං විසුං කායිකසුඛදුක්ඛානං ආරම්මණභූතානි හොන්ති. තථා සෝපි විනා ඉතරේහි විසුං කායිකසුඛදුක්ඛානං ආරම්මණභූතෝඒව සියා. න පන හෝති. යඤ්හි තානි අයෝපිණ්ඩාදීනි ඵුසන්තානං කායිකං සුඛංවා දුක්ඛංවා උප්පජ්ජති, තං සණ්හථද්ධතා වසේනවා උප්පජ්ජති. සීතුණ්හතාවසේනවා අබ්භන්තරථම්භනස්ස මන්දගාළ්හතාවසේනවා. නෝ අඤ්ඤථාති. තස්මා පුරිමභාගේ තීණි භූතානි ඵුසිත්වාවා වණ්ණං දිස්වාවා පච්ඡා භාගේ සුද්ධේන මනෝ විඤ්ඤාණසන්තානේන දීඝරස්සාදිසණ්ඨානංවා රත්තියං අලාතචක්කං වා තං තං ඡිද්දවිවරංවා ජානන්තා විය පඨමං ද්‍රවතාසහිතානි විලීනානි මුදූනි තීණි භූතානි පඨවිං ඒව වා ඵුසිත්වා පච්ඡා සුද්ධේන මනෝ විඤ්ඤාණසන්තානේන විසුං ද්‍රවභාවං අද්දතින්තභාවං ජානන්ති. ඒවං සන්තේපි තං ඵුසිත්වා ජානන්තා ඉච්චේව මඤ්ඤන්ති අවිසේසවිදුනෝති. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 156 රූපසඞ්ගහ යටතේ)]**

“ඵුසීයතී”ති ඵුසිත්වා විජානීයති. “තං”ති ඵුසනං. “තස්සා”ති ආපෝධාතුයා. “ද්‍රවතාවා”ති අද්දතින්තරසතාවා. ඵුසිත්වා ගය්හති, සා ච ආපෝධාතු සියාති චෝදේති. වුච්චතේ පරිහාරෝ. ඒවං පන න ලබ්භති, තස්මා සා තේජෝයේව. න ආපෝති. එත්ථ ඒවං අලබ්භමානාපි සාසීතතා ආපෝයේව, න තේජෝ. කස්මා, ආපස්සපි සීතුණ්හවසේන දුවිධතා සම්භවතෝ. තස්මිඤ්හි ලෝහරසේ උණ්හතා උණ්හආපෝ, සීතවත්ථූසු සීතතා සීතආපෝති චේ. ඒවං පන සති තේජෝ නාම නත්ථීති ආපජ්ජතීති පරිහාරෝ. “සහ අප්පවත්තනතෝ”ති ඒකතෝ අප්පවත්තනතෝ. “ඕරපාරානං විය”ති නදියං තීරං නාම ඉදං ඕරිමතීරං, ඉදං පාරිමන්ති නියමතෝ නත්ථි. යත්ථ සයං තිට්ඨති, තං ඕරිමන්ති, ඉතරං පාරිමන්ති වෝහරති. ඒවං ඕරපාරානං අනවට්ඨානං හෝතීති. එත්ථ ච “සීතුණ්හානං සහ අප්පවත්තනතෝ”ති ඒතේන යදි තේ සහ පවත්තෙය්‍යුං. තත්ථ සීතතා ආපෝනාම, උණ්හතා තේජෝනාමාති වත්තබ්බා සියුං. න පන තේ සහ පවත්තන්ති, තස්මා තථා න වත්තබ්බා හොන්තීති දස්සේති. න න වත්තබ්බා. කස්මා, උණ්හතේජේන යුත්තෝ හි ආපෝ උණ්හත්තමේව ගච්ඡති. යථා තං උණ්හතේජේන යුත්තා පථවීපි වායෝපි උණ්හත්තමේව ගච්ඡන්තීති. තස්මා තේ සහ න පවත්තන්ති. සහ අප්පවත්තේසුපි තේසු අඤ්ඤත්ථ සීතවත්ථූසු සීතතා ආපෝනාමාති වත්තබ්බමේව හෝතීති චෝදනා. ඒවං සන්තේ තස්මිං ලෝහරසේ සබ්බේපි රූපධම්මා උණ්හත්තං ගච්ඡන්තීති සබ්බේපි තේජෝභාවං පාපුණන්ති. ‘උණ්හත්ත ලක්ඛණෝ තේජෝ’තිහි වුත්තං. යදි ච සීතවත්ථූසු සීතභාවෝ නාම සියා. තත්ථපි තේන යුත්තා සබ්බේපි රූපධම්මා සීතතං ගච්ඡන්තියේව. තත්ථපි තව මතියා සබ්බේපි ආපෝභාවං පාපුණන්ති. න පන සක්කා තථා භවිතුං. න හි ඒවරූපං ලක්ඛණඤ්ඤථත්තං නාම තේසං අත්ථි. භාවඤ්ඤථත්තමේව අත්ථි. තත්ථ “ලක්ඛණඤ්ඤථත්තං” නාම පථවී ආපෝභාවං ගච්ඡති. ආපෝ පථවිභාවං ගච්ඡතීති ආදි. “භාවඤ්ඤථත්තං” නාම පථවී කදාචි කක්ඛළා හෝති. කදාචි මුදුකා. ආපෝ කදාචි ආබන්ධනමත්තෝ හෝති. කදාචි පග්ඝරණකෝ. තේජෝ කදාචි උණ්හෝ, කදාචි සීතෝ. වායෝ කදාචි විත්ථම්භනමත්තෝ, කදාචි සමුදීරණෝති. ඒවං ඒකමේකස්සා ධාතුයා තික්ඛ මන්ද ඕමත්තාධිමත්තවසේන ක්‍රියාසඞ්කන්ති නාම අත්ථීති. තස්මා යං වුත්තං ‘උණ්හතේජේන යුත්තෝහි ආපෝ උණ්හත්තමේව ගච්ඡති, යථා තං උණ්හතේජේන යුත්තා පථවීපි වායෝපි උණ්හත්තමේව ගච්ඡන්තී’ති. තං ලක්ඛණඤ්ඤථත්තවචනං හෝති. න යුජ්ජති. න හි උණ්හතේජේන යුත්තා සබ්බේ තේ ධම්මා උණ්හත්තං ගච්ඡන්ති. අත්තනෝ අත්තනෝ සභාවං න විජහන්ති. තථා හි තස්මිං පක්කුථිතේ සන්තත්තේ ලෝහරසේ භාවෝ උණ්හත්තං න ගච්ඡති. ආබන්ධන සභාවං වා පග්ඝරණ සභාවං වා න විජහති. යදි උණ්හත්තං ගච්ඡෙය්‍ය, තං සභාවං විජහෙය්‍ය. ඒවං සති, තස්මිං ලෝහරසේ ආබන්ධනාකාරෝ වා පග්ඝරණාකාරෝ වා න පඤ්ඤායෙය්‍ය. සබ්බේ රූපධම්මා වික්කිරෙය්‍යුං. වික්කිරිත්වා අන්තරධාරෙය්‍යුං. න ච න පඤ්ඤායති. නාපි වික්කිරන්ති. නෝච තත්ථ ආබන්ධනාකාරෝ උණ්හත්තං ගච්ඡති. අඤ්ඤෝහි ආබන්ධනාකාරෝ, අඤ්ඤං උණ්හත්තං. ආබන්ධනාකාරෝ ආපෝ, උණ්හත්තං තේජෝ. තත්ථ පථවිවායේසුපි ඒසේවනයෝ. තස්මා යං වුත්තං “යදි තේ සහ පවත්තෙය්‍යුං. තත්ථ සීතතා ආපෝ නාම, උණ්හතා තේජෝ නාමාති වත්තබ්බා සියුං. න පන තේ සහ පවත්තන්ති. තස්මා තථා න වත්තබ්බා හොන්තීති දස්සේතී”ති. තං සුවුත්තමේවාති දට්ඨබ්බං. “තේසං අනවට්ඨානතෝ”ති ඒතේන සචේ තේ සීතුණ්හා අවට්ඨිතා සියුං. අථ සබ්බකාලේපි සීතතා ආපෝ නාම, උණ්හතා තේජෝ නාමාති වත්තබ්බා සියුං. න පන තේ අවට්ඨිතා හොන්ති. අනවට්ඨිතා ඒව හොන්ති. තස්මා තථා න වත්තබ්බා හොන්තීති දස්සේති. එත්ථ ච අනවට්ඨිතේසු

සන්තේසු යදි සීතතා ආපෝ නාම, උණ්හතා තේජෝ නාමාති වදෙය්‍යුං. ඒවඤ්ච සති, ආපතේජාපි අනවට්ඨිතා සියුං. යෝ ඉදානි ආපෝ, සෝයේව ඛණන්තරේ තේජෝ නාම. යෝ වා ඉදානි තේජෝ, සෝයේව ඛණන්තරේ ආපෝ නාමාති ආපජ්ජෙය්‍යුං. න ච සක්කා තථා භවිතුං. ලක්ඛණඤ්ඤථත්තේ අසන්තේ වෝහාරඤ්ඤථත්තස්සපි අසම්භවතෝ. තේන වුත්තං "ඕරපාරානං විය තේසං අනවට්ඨානතෝ ච විඤ්ඤායතී"ති. තත්ථ "විඤ්ඤායතී"ති සාසීතතා තේජෝයේව, න ආපෝති විඤ්ඤායතීති.

"අථ පනා"ති ආදීසු. යං පුබ්බේ පරේන වුත්තං 'නනු ද්‍රවතා වා ඵුසිත්වා ගය්හතී'ති. තං විචාරේතුං "අථ පනා"ති ආදි වුත්තං. තත්ථ "අථ පනා"ති යදි පන ගය්හති, ඒවං සතීති ච. ඒවඤ්ච සති ආරම්මණභූතෝ ඒව සියාති සම්බන්ධෝ. අයං පනෙත්ථාධිප්පායෝ. සචේ ද්‍රවභාවභූතෝ ආපෝ ඵුසිත්වා ගය්හෙය්‍ය. ඒවං සති, අයෝපිණ්ඩාදීසු ආබන්ධනමත්තභූතෝ ආපෝපි ඵුසිත්වා ගහේතබ්බෝ සියා. කස්මා, ආපභාවේන ඒකත්තා. ඒවඤ්ච සති, තේසු අයෝපිණ්ඩාදීසු සෝ ආපෝ තානි හත්ථේන වා පාදේන වා ඵුසන්තස්ස පහරන්තස්ස විනා ඉතර මහාභූතේහි විසුං කායිකසුඛදුක්ඛානං ආරම්මණපච්චයෝ සියා. යථා තං, තේස්වේව අයෝපිණ්ඩාදීසු පථවිමහාභූතං විනා ඉතරමහාභූතේහි විසුං කායිකසුඛදුක්ඛානං ආරම්මණපච්චයෝ හෝති. ඒවං තේජෝවායේසුපීති. න පන සෝ විසුං කායිකසුඛදුක්ඛානං ආරම්මණ පච්චයෝ හෝති. තස්මා සෝ ඵොට්ඨබ්බසභාවෝ න හෝති. යථා ච සෝ ඵොට්ඨබ්බසභාවෝ න හෝති. තථා පකති උදකාදීසු ද්‍රවභාවභූතෝපි ආපෝ තානි ඵුසන්තස්ස පහරන්තස්ස කායිකසුඛදුක්ඛානං ආරම්මණපච්චයෝ න හෝති. න ච ඵොට්ඨබ්බසභාවෝති. ඒවඤ්ච සති, කථං අයෝපිණ්ඩාදීසු ආබන්ධනමත්තභූතෝ ආපෝ කායිකසුඛදුක්ඛානං පච්චයෝ න හෝති. කථඤ්ච තේසු ඉතරමහාභූතානි විසුං විසුං කායිකසුඛදුක්ඛානං පච්චයා හොන්තීති. තං දස්සේතුං "යඤ්හී"ති ආදිමාහ. තත්ථ "සණ්හථද්ධතාවසේන වා"ති තේසු ඨිතාය පථවිධාතුයා සණ්හථද්ධතාවසේන වා. සණ්හපථවීසුඛවේදනාය ථද්ධපථවීදුක්ඛවේදනාය ආරම්මණපච්චයෝති වුත්තං හෝති. ඒවං සේසේසු. "අබ්භන්තරත්ථම්භනස්සා"ති තේසං අයෝපිණ්ඩාදීනං අබ්භන්තරේ ඨිතස්ස චිත්ථම්භනසභාවස්ස. "නෝ අඤ්ඤථා"ති තානි තීණි කාරණානි ඨපෙත්වා ආබන්ධනක්‍රියං පටිච්ච කායිකසුඛදුක්ඛුප්පත්ති නාම නත්ථීති අධිප්පායෝ. ඉදානි පකතිඋදකාදීසු ද්‍රවභාවභූතං ආපෝධාතුම්පි ඵුසිත්වා ජානන්තීති මහාජනා මඤ්ඤන්ති. තබ්බිසෝධනේන සහ ලද්ධගුණං දස්සේතුං "තස්මා"ති ආදිමාහ. තත්ථ "පඨමං ද්‍රවතා සහිතානි -පෙ- ජානන්තී"ති ඉදං පධාන වචනං. ලෝකේ හත්ථේන පරාමසිත්වා වා චක්ඛුනා දිස්වා වා ඉදං රස්සං, ඉදං දීඝං, ඉදං වට්ටං, ඉදං මණ්ඩලන්ති ආදිනා සණ්ඨානං ජානන්තා හත්ථඵුසනේන වා චක්ඛුදස්සනේන වා සහේව තං ජානන්තීති මඤ්ඤන්ති. තත්ථ පන පුරිමභාගේ කායද්වාරවීථිචිත්තේන පච්චුප්පන්නානි තීණි භූතානි ඵුසිත්වා වා චක්ඛුද්වාරවීථිචිත්තේන පච්චුප්පන්නං රූපං දිස්වා වා පච්ඡා වත්ථුග්ගහණවීථියා උප්පන්නාය ඒව සණ්ඨානං ජානන්ති. ඒසේවනයෝ රත්තියං අලාතචක්කසණ්ඨානං ජානන්තස්සපි. තත්ථ පන බහූනිපි පුබ්බාපරවීථිචිත්තසන්තානානි ඉච්ඡිතබ්බානි. තථා ලෝකේ චක්ඛුනා දිස්වා ද්වාරවාතපානාදීනං ඡිද්දවිවරානි ජානන්තා චක්ඛුනා දස්සනේන සහේව තානි ජානන්තීති මඤ්ඤන්ති. තත්ථ පන පුරිමභාගේ චක්ඛුද්වාරිකවීථිචිත්තේන පච්චුප්පන්නානි කවාටරූපභිත්තිරූපානි පුනප්පුනං දිස්වා පච්ඡා අලාතචක්කස්ස මජ්ඣේ විවරංපි ජානන්තා විය විසුං උප්පන්නාය මනෝද්වාරික විඤ්ඤාණවීථියා ඒව තං ඡිද්දවිවරභූතං ආකාසං ජානන්ති. තථා හත්ථේන උදකං ඵුසන්තස්ස පඨමං ද්‍රවසහිතානි විලීනානි මුදූනි තීණි ඵොට්ඨබ්බමහාභූතානි විසුං විසුං කායද්වාරික වීථි

චිත්තේහි ඵුසනකිච්චේන ආරම්මණං කරිත්වා පච්ඡා විසුං සුද්ධාය මනෝද්වාරික වීථියා ඒව ද්‍රවභාවසඞ්ඛාතං පග්ඝරණක ආපෝධාතුං ජානන්ති. ඒවං සන්තේපි තං ද්‍රවභාවංපි හත්ථේන ඵුසනේන සහේව ජානන්තීති මඤ්ඤන්තීති අධිප්පායෝ.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 156 යටතේ)]**

**ඵුසියතීති** ස්පර්ශ කොට දැනගන්නේනුයි **ඵොට්ඨබ්බං** ඵොට්ඨබ්බ නම් **එත්ථ** මෙහි **ඵුසනඤ්ච** ස්පර්ශය ද **පසාදේන සහ ඝට්ටනං** ප්‍රශාදය හා සමඟ ගැටීම ද **කාලාපන්තරභූතේහි සද්ධිං** කලාපයන් අතර වූ භූතරූපයන් සමඟ **පටිහනනඤ්ච** පටිහනනය ද **වේදිතබ්බං** දතයුතුයි **ආපෝධාතුවජ්ජිතං ඉති** ආපෝධාතුවජ්ජිතං යනු **තදුභයම්පි** ප්‍රශාදයෙහි හා කලාප අතර භූතරූපයන්හි යන දෙතැන **ආපෝධාතුයා** ආපෝ ධාතුවගේ **නත්ථීති වුත්තං** නැත යැයි කියනලදි **කස්මා** කුමක් හෙයින් **තං** ඒ දෙතැන **තස්සා** ඒ ආපෝ ධාතුවගේ **නත්ථි** නැතිබව වේද? **සීතතා වා** සිසිල් බව හෝ **ද්‍රවතා වා** ද්‍රව බව හෝ **ඵුසිත්වා** ස්පර්ශ කොට **ගය්හති නනු** ගන්නේ නොවේද? **පන** (**පුච්ඡායං සති** ප්‍රශ්නයක් ඇති කල්හි) **වුච්චතේ** පරිහාරය මා විසින් කියනු ලැබේ **හි** **(සච්චං)** ඒ කීම සැබෑව **සීතතා** සිසිල් බව **තේජෝයේව** තේජෝ ධාතුවමය **න ආපෝ** ආපෝ ධාතුව නොවෙයි **යදි හි** ඉදින් වනාහි **සා** ඒ සිසිල් බව **ආපෝධාතුයේව** අප් ධාතුවම **සියා** වන්නේ නම් **සන්තත්තේ** ඉතා තදින් රත් වූ **ලෝහරසේ** ලෝහයෙහි වූ උෂ්ණය **පක්කමිතේ** පහවගිය කල්හි **අස්ස** ඒ ලෝහයාගේ **ලබ්භමානා** ලබන්නා වූ **සීතතා** සිසිල් බවක් **සියා** වන්නේය **සෝ හි රසෝ** ඒ ලෝහය වනාහි **ආපාධිකෝ** ආපෝ ධාතුව අධික වූයේ **හෝති** වෙයි යැයි **ඉති (මතිං)** අදසහකට පැමිණෙයි **ඒවං පන** මෙසේ වනාහි **න ලබ්භති** නොලබයි **තස්මා** එබැවින් **සා** ඒ සිසිල් බව **තේජෝයේව** තේජෝ ධාතුවමය **ආපෝ න** ආපෝ ධාතුව නොවෙයි **අපිච** එතකුදුවුවත් **ඒකස්මිං කලාපේ** එක් කලාපයෙක්හි **සීතුණ්හානං** සීත උෂ්ණ දෙදෙනාගේ **සහ අප්පවත්තනතෝ** එකට නොපැවැත්වීම් වශයෙන් **ඕරපාරානං විය** නදියෙහි එතර මෙතර මෙන් **තේසං** ඒ ශීත උෂ්ණයන්ගේ **අනවට්ඨානතෝ ච** පෙරලීම් වශයෙන්ම (**සීතුණ්හතා** සිසිල් උණුසුම් බව) **විඤ්ඤායති** දැනගනී (නදියෙහි මේ තෙර නම් මෙතරයි. මේ තෙර නම් එතරයි යනුවෙන් නියම වශයෙන් නැත. යම්තැනෙක තෙමේ සිටීද එතැන ඔහුට මෙතරයි. අනෙක් තෙර එතර යැයි වහරයි. මෙසේ එතර මෙතර පෙරලීම් වශයෙන් වෙයි. එනිසා මෙහි "සීතුණ්හානං සහ අප්පවත්තනතෝ" යි කියනලදි) **හි (සච්චං)** ඒ කීම සැබෑව **සීතකලාපේ** සිසිල් කලාපයෙහි **උණ්හං** උණුසුම **උණ්හකලාපේ වා** උණුසුම් කලාපයෙහි **සීතං** සිසිලස හෝ **න සහ පවත්තති** එකට නොපවති **යස්මිඤ්ච වත්ථුම්හි** යම් වස්තුවෙක්හි **පුබ්බේ** පෙර **සීතසඤ්ඤා** සිසිල් සඤ්ඤාව **සණ්ඨාති** පිහිටයි ද **පච්ඡා** පසුව **තතෝ සීතතරේ ආගතේ** ඊටවඩා සිසිල්බව පැමිණි කල්හි **පුන** නැවත **තස්මිංයේව** ඒ වස්තුවෙහිම **උණ්හසඤ්ඤා** උෂ්ණ සඤ්ඤාව **සණ්ඨාති** පිහිටයි **පුබ්බේ** පෙර **උණ්හසඤ්ඤායම්පි** උෂ්ණ සඤ්ඤාවෙහි ද **ඒසෝ නයෝ** මේ ක්‍රමයයි **තථා** එසේ **උණ්හේ මන්දේ** උෂ්ණය මද කල්හි **සීතසඤ්ඤා** සිසිල් සඤ්ඤාව **සණ්ඨාති** පිහිටයි **සීතේ මන්දේ** සිසිල් බව මද කල්හි **උණ්හසඤ්ඤා** උෂ්ණ සඤ්ඤාව **ඉති (සණ්ඨාති)** පිහිටයි.

**අථ පන** ඉදින් වනාහි **ද්‍රවභාවභූතෝ** ද්‍රවභාවය වූ **ආපෝ** ආපෝ ධාතුව **ඵුසිත්වා** ස්පර්ශ කොට **ගය්හති** ගනී නම් **අයෝ පිණ්ඩාදීසු** යකඩ පිණ්ඩාදීන්හි **ආබන්ධභූතෝපි** ආබන්ධන මාත්‍ර වූ ආපෝ ධාතුවම ද **ඵුසිත්වාව** ස්පර්ශ කොටම **ගය්හෙය්‍ය (ගහේතබ්බෝ සියා)** ආපෝ භාවයෙන් එකක්ම බැවින් ගතයුතු වන්නේය **ඒවඤ්ච සති** මෙසේ ඇති කල්හි **යථා** යම්සේ **තේසු (අයෝ පිණ්ඩාදීසු)** ඒ අයෝ

පිණ්ඩාදියෙහි **ඉතරීතරේන විනා** ආපෝ ධාතුව හැර **ඉතරානි තීණි භූතානි** පඨවි තේජෝ වායෝ යන භූතරූපයෝ තිදෙන **විසුං විසුං** වෙන වෙනම **කායිකසුඛදුක්ඛානං** කායික සුඛ දුක්ඛයට **ආරම්මණභූතානි** අරමුණු **හොන්ති** වෙත් **තථාපි** එසේම **ඉතරේහි විනා** පඨවි ආදී භූතරූප තිදෙන හැර **සෝ** ඒ ආපෝධාතුව **කායිකසුඛදුක්ඛානං** කායික සුඛ දුක්ඛයන්ට **ආරම්මණභූතෝ ඒව සියා?** අරමුණක් වන්නේ ද? **න හෝති** නොවෙයි **පන (කස්මා)** කුමක් හෙයින යත්? **හි** විස්තර කරම් **තානි අයෝ පිණ්ඩාදීනි** ඒ යකඩ පිඩු ආදිය **ඵුසන්තානං** ස්පර්ශ කරන්නහුට **යං කායිකං සුඛං වා දුක්ඛං** යම් කායික සැපයක් හෝ දුකක් හෝ **උප්පජ්ජති** උපදී **තං (සුඛං වා දුක්ඛං වා)** ඒ කායික සැප හෝ දුක **සණ්හථද්ධතා වසේන වා** යකඩ පිඩුවෙහි වූ පඨවි ධාතුවගේ සියුම්බව වශයෙන් හෝ තදබව වශයෙන් හෝ **උප්පජ්ජති** උපදී (යකඩ පිඩුවෙහි සණ්හ පඨවිය කායික සැප වේදනාවට ද ථද්ධ පඨවිය කායික දුක් වේදනාවට ආරම්මණ ප්‍රත්‍යයයි කියනලදි) **සීතුණ්හතා වසේන වා** යකඩ පිඩුවෙහි තේජෝ ධාතුවගේ ශීත උෂ්ණ වශයෙන් හෝ **තං (සුඛං වා දුක්ඛං වා)** ඒ සැප හෝ දුක (**උප්පජ්ජති** උපදී) (යකඩ පිඩුවෙහි සීත තේජෝව කායික සැප වේදනාවට ද උණ්හ තේජෝව කායික දුක් වේදනාවට ආරම්මණ ප්‍රත්‍යයයි කියනලදි) **අබ්භන්තරථම්භනස්ස** ඒ යකඩ පිඩු ආදීන්ගේ අභ්‍යන්තරයෙහි දැරීම් ස්වභාවයෙන් සිටියාහු වායෝ ධාතුවගේ **මන්දගාළ්හතා වසේන වා** මදව දැරීම් වශයෙන් හෝ දැඩිව දැරීම් වශයෙන් හෝ **තං (සුඛං වා දුක්ඛං වා)** ඒ සැප හෝ දුක (**උප්පජ්ජති** උපදී) (යකඩ පිඩුවෙහි මන්ද වායෝ ධාතුව කායික සැප වේදනාවට ද ගාළ්හ වායෝ ධාතුව කායික දුක් වේදනාවට ආරම්මණ ප්‍රත්‍යයයි කියනලදි) **නෝ අඤ්ඤතාති** අන් අයුරකින් නොවෙයි (ඒ කරුණු තුන හැර ආබන්ධන ක්‍රියාව හේතුකොට කායික සැප දුකකගේ ඉපදීමක් නම් නැතයි යන අදහසයි)

(මහජනයා ප්‍රකෘති උදකාදියෙහි ද්‍රව ස්වභාව වූ ආපෝ ධාතුව ද ස්පර්ශ කොට දැනගනිත් යැයි හඟිත්. එය දුරුකොට ලබ්ධි ගුණය දැක්වීමට "තස්මා" යි කියනලදි) තස්මා එබැවින් "පඨමං ද්‍රවතාසහිතානි -පෙ- ජානන්තීති" යන්න හා සම්බන්ධ කටයුතු **පුරිමභාගේ** පළමුව **තීණි භූතානි ඵුසිත්වාවා** භූතත්‍රය ස්පර්ශ කොට හෝ **වණ්ණං දිස්වා වා** වර්ණය දැක හෝ **පච්ඡාභාගේ** පසු කාලයෙහි **සුද්ධේන මනෝවිඤ්ඤාණසන්තානේන** පිරිසිදු මනෝවිඤ්ඤාණයෙන් **දීඝරස්සාදීසණ්ඨානං වා** දිග කොට සටහන් හෝ **රත්තියං** රාත්‍රියෙහි **අලාතචක්කං වා** ගිණි වළල්ලක් හෝ **තං තං ඡිද්දවිවරං වා** ඒ ඒ සිදුරු ඇති අවකාශයක් හෝ **ජානන්තා විය** දැනගන්නෝ මෙන් **පඨමං** ප්‍රථමයෙන් **ද්‍රවතාසහිතානි** ද්‍රව සහිත **විලීනානි** තෙත්ගතිය ඇති **මුදූනි** මෘදු වූ **තීණි භූතානි** පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය **ඵුසිත්වා වා** ස්පර්ශ කොට හෝ (**පඨමං** පළමුව) **පඨවිං** පඨවි ධාතුව **ඵුසිත්වා වා** ස්පර්ශ කොට හෝ **සුද්ධේන මනෝවිඤ්ඤාණසන්තානේන** පිරිසිදු මනෝවිඤ්ඤාණයෙන් **විසුං** වෙන් කොට **අද්දතින්තභාවං** අමු තෙත් ස්වභාවය වූ **ද්‍රවභාවං** ද්‍රවභාව සඞ්ඛ්‍යාත ආපෝ ධාතුව **ජානන්ති** දැනගනිත් **ඒවං සන්තේපි** මෙසේ ඇති කල්හිද **තං (ආපෝ ධාතුං)** ඒ ආපෝ ධාතුව **(හත්ථේන) ඵුසිත්වා** අතින් ස්පර්ශ කොට **ජානන්තා ඉති** දැනගන්නාහු යැයි මහජනයෝ **මඤ්ඤන්ති** හඟිත්.

(එහි අභිප්‍රාය මෙසේයි; "දීඝරස්සාදිසණ්ඨානං වා" යන මෙයින් ලෝකයෙහි යම් වස්තුවක් අතින් ස්පර්ශ කොට හෝ ඇසින් දැක හෝ "මෙය කොටය, මෙය දිගය, මෙය වටකුරුය, මෙය රවුම්ය" යනාදියෙන් සටහන් දැනගන්නා පුද්ගල තුමූ අතින් ස්පර්ශ කිරීමත් ඇසින් දැකීමත් සමඟම ඒ වස්තුව දැනගනිත් යැයි හඟිත්. එහි

වනාහි පළමුව කායද්වාර වීථියෙන් වර්තමාන භූතත්‍රය ස්පර්ශ කොට හෝ චක්ෂුර්ද්වාර වීථියෙන් වර්තමාන රූපාරම්මණය දැක හෝ පසුව හදයවස්තුව ඇසුරු කොට උපන් මනෝද්වාරික වීථියෙන්ම සටහන දැනගනිත්. රාත්‍රියෙහි ගිණි වළලු සටහන් දැනගන්නාහුට ද මේ ක්‍රමයයි. එහි දී වනාහි පූර්ව අපර බොහෝ වීථි චිත්තයෝ කැමතිවිය යුත්තාහ. ලෝකයෙහි දෙරටු වාකවුළු ආදීන්ගේ සිදුරු ඇති අවකාශයෝ ඇසින් දැක ඒ ඇසින් දැකීමත් සමගම ඒවා දැනගනිත් යයි හඟිත්. එසේම පළමුව චක්ඛුද්වාරික වීථියෙන් වර්තමාන කවුළු බිත්ති ආදිය නැවත නැවත දැක පසුව ගිණි වළල්ලගේ මධ්‍යයෙහි කවුළුව ද දකින්නාවූ මහජනයා ඒ ඇසින් දැකීමත් සමගම ඒවා දැනගනිත් යයි හඟින්නාක් මෙනි. මෙහි වෙන් වෙන්ව උපන්නාවූ මනෝද්වාරික චිත්ත වීථියෙන්ම ඒ වාකවුළු ආදී අවකාශය දැනගනිත්. එසේම අතින් ජලය ස්පර්ශ කරන්නාහුට පළමුව ආපෝ ධාතු සහිත වූ තෙත් වූ මෘදු භූතත්‍රය සඞ්ඛ්‍යාත ඵොට්ඨබ්බාරම්මණයෝ වෙන වෙනම කායද්වාරික වීථි සිත්වලින් ස්පර්ශය කෘත්‍යයෙන් අරමුණු කොට පසුව වෙන්වූම පිරිසිදු මනෝද්වාරික චිත්ත වීථියෙන්ම ද්‍රව සඞ්ඛ්‍යාත වැගිරෙන්නා වූ ආපෝ ධාතුව දැනගනිත්. මෙසේ ඇති කල්හිදු ඒ ද්‍රව ස්වභාව සඞ්ඛ්‍යාත ආපෝ ධාතුව ද අතින් ස්පර්ශ කිරීමත් සමගම දැනගනිත් යැයි හඟිත්. මේ වනාහි අදහසයි) **[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

## අහේතුක විපාක චිත්තයන්ගේ ලක්‍ෂණාදිය:—

තත්ථ චක්ඛුසන්නිස්සිතරූපවිජානනලක්ඛණං **චක්ඛුවිඤ්ඤාණං,** රූපමත්තාරම්මණරසං, රූපාභිමුඛභාවපච්චුපට්ඨානං, රූපාරම්මණාය කිරියමනෝධාතුයා අපගමපදට්ඨානං. සෝතාදිසන්නිස්සිතසද්දාදිවිජානනලක්ඛණානි **සෝතඝානජිව්හාකායවිඤ්ඤාණානි,** සද්දාදිමත්තාරම්මණරසානි, සද්දාදි අභිමුඛභාවපච්චුපට්ඨානානි, සද්දාරම්මණාදීනං කිරියමනෝධාතූනං අපගමපදට්ඨානානි.

චක්ඛුවිඤ්ඤාණාදීනං අනන්තරං රූපාදිවිජානනලක්ඛණා **මනෝධාතු,** රූපාදිසම්පටිච්ඡනරසා, තථාභාවපච්චුපට්ඨානා, චක්ඛුවිඤ්ඤාණාදි අපගමපදට්ඨානා.

අහේතුකවිපාකා සළාරම්මණවිජානනලක්ඛණා දුවිධාපි සන්තීරණාදිකිච්චා **මනෝවිඤ්ඤාණධාතු,** සන්තීරණාදිරසා, තථාභාවපච්චුපට්ඨානා, හදයවත්ථුපදට්ඨානා. සෝමනස්සුපෙක්ඛායෝගතෝ පන ද්විපඤ්චට්ඨානභේදතෝ ච තස්සා භේදෝ. ඒතාසු හි ඒකා ඒකන්තමිට්ඨාරම්මණේ පවත්තිසබ්භාවතෝ සෝමනස්සසම්පයුත්තා හුත්වා සන්තීරණතදාරම්මණවසේන පඤ්චද්වාරේ චේව ජවනාවසානේ ච පවත්තනතෝ ද්විට්ඨානා හෝති. ඒකා ඉට්ඨමජ්ඣත්තාරම්මණේ පවත්තිසබ්භාවතෝ උපෙක්ඛාසම්පයුත්තා හුත්වා සන්තීරණතදාරම්මණ පටිසන්ධිභවඞ්ගචුතිවසේන පවත්තනතෝ පඤ්චට්ඨානා හෝති.

**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 454 යටතේ); විසුද්ධිමග්ග අටුවා 340-341 පිටු (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය ස්කන්ධනිර්දේශය 199-200 පිටු (තායිවාන් මුද්‍රණය); ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 431 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 233 පිට (හේ.වි.මු); මොක්පුර රන්දෙර 02/268-272 පිටු]**

චක්ඛුසන්නිස්සිතං හුත්වා රූපස්ස විජානනං ලක්ඛණං ඒතස්සාති **චක්ඛුසන්නිස්සිතරූපවිජානනලක්ඛණං.** තත්ථ චක්ඛුසන්නිස්සිතවචනේන

රූපාරම්මණං අඤ්ඤදං විඤ්ඤදණං නිවත්තේති. විජානනග්ගහණේන චක්ඛුසන්නිස්සිතේ ඵස්සාදිකේ නිවත්තේති. චක්ඛුරූපග්ගහණේන නිස්සයතෝ, ආරම්මණතෝ ච විඤ්ඤදණං විභාවේති උභයාධීනවුත්තිකත්තා. යදි හි චක්ඛු නාම න සියා, අන්ධාපි රූපං පස්සෙය්‍යුං, න ච පස්සන්ති. යදි ච නීලාදිරූපං නාම න සියා, දේසාදිනියමේන න භවිතබ්බං, අත්ථේව ච නියමෝ, ඒකන්තසාරම්මණතා ච චිත්තස්ස වුත්තාති "ආරම්මණේන විනා නීලාදිආභාසං චිත්තං පවත්තතී"ති ඒවං පවත්තෝ වාදෝ මිච්ඡාවාදෝති වේදිතබ්බං. තේනාහ භගවා "චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤදණ"න්තිආදි (ම. නි. 1.204, 400; 3.421, 425; සං. නි. 2.44; 4.60; කථා. 465).

කස්මා පනෙත්ථ වචනභේදෝ කතෝති? ඒකම්පි චක්ඛු විඤ්ඤදණස්ස පච්චයෝ හෝති, රූපං පන අනේකමේව සංහතන්ති ඉමස්ස විසේසස්ස දස්සනත්ථං. කිං පන කාරණං ඒකම්පි චක්ඛු විඤ්ඤදණස්ස පච්චයෝ හෝති, රූපං පන අනේකමේවාති? පච්චයභාවවිසේසතෝ. චක්ඛු හි චක්ඛුවිඤ්ඤදණස්ස නිස්සයපුරේජාතඉන්ද්‍රියවිප්පයුත්තපච්චයේහි පච්චයෝ හොන්තං අත්ථිභාවේනේව හෝති, තස්මිං සති තස්ස භාවතෝ, අසති අභාවතෝ. යතෝ තං අත්ථිඅවිගතපච්චයේහිස්ස පච්චයෝ හෝතීති වුච්චති, තං නිස්සයතා චස්ස න ඒකදේසේන අල්ලීයනවසේන ඉච්ඡිතබ්බා අරූපභාවතෝ, අථ ඛෝ ගරුරාජාදීසු සිස්සරාජපුරිසාදීනං විය තප්පටිබද්ධවුත්තිතාය. ඉතරේ පන පච්චයා තේන තේන විසේසේන වේදිතබ්බා. ස්වායං පච්චයභාවෝ න ඒකස්මිං න සම්භවතීති ඒකම්පි චක්ඛු විඤ්ඤදණස්ස පච්චයෝ හෝතීති "චක්ඛුඤ්ච පටිච්චා"ති ඒකවචනේන නිද්දේසෝ කතෝ.

රූපං පන යදිපි චක්ඛු විය පුරේජාතඅත්ථිඅවිගතපච්චයේහි පච්චයෝ හෝති පුරේතරං හුත්වා විජ්ජමානක්ඛණේයේව උපකාරකත්තා, තථාපි අනේකමේව සංහතං හුත්වා පච්චයෝ හෝති ආරම්මණභාවතෝ. යඤ්හි පච්චයධම්මං සභාවභූතං, පරිකප්පිතාකාරමත්තං වා විඤ්ඤදණං විභාවෙන්තං පවත්තති, තදඤ්ඤෙද්සඤ්ච සතිපි පච්චයභාවේ සෝ තස්ස සාරම්මණසභාවතාය යං කිඤ්චි අනාලම්බිත්වා පවත්තිතුං අසමත්ථස්ස ඕලුබ්භ පවත්තිකාරණතාය ආලම්බනීයතෝ ආරම්මණං නාම. තස්ස යස්මා යථා තථා සභාවූපලද්ධිවසේන ආරම්මණපච්චයලාභෝ, තස්මා චක්ඛුවිඤ්ඤදණං රූපං ආරබ්භ පවත්තමානං තස්ස සභාවං විභාවෙන්තමේව පවත්තති. සා චස්ස ඉන්ද්‍රියාධීනවුත්තිකස්ස ආරම්මණසභාවූපලද්ධි, න ඒකද්විකලාපගතවණ්ණවසේන හෝති, නාපි කතිපයකලාපගතවණ්ණවසේන, අථ ඛෝ ආභෝගානුරූපං ආපාථගතවණ්ණවසේනාති අනේකමේව රූපං සංහච්චකාරිතාය විඤ්ඤදණස්ස පච්චයෝ හෝතීති දස්සෙන්තෝ භගවා "රූපේ චා"ති බහුවචනේන නිද්දිසි.

යං පන "රූපායතනං චක්ඛුවිඤ්ඤදණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයේන පච්චයෝ"ති (පට්ඨා. 1.1.2) වුත්තං, තං කථන්ති? තම්පි යාදිසං රූපායතනං චක්ඛුවිඤ්ඤදණස්ස ආරම්මණපච්චයේන පච්චයෝ හෝති, තාදිසමේව සන්ධාය වුත්තං. කීදිසං පන තන්ති? සමුදිතන්ති පාකටෝයමත්ථෝ. ඒවඤ්ච කත්වා යදේකේ වදන්ති "ආයතනසල්ලක්ඛණවසේන චක්ඛුවිඤ්ඤදණාදයෝ සල්ලක්ඛණාරම්මණා, න දබ්බසල්ලක්ඛණවසේනා"ති, තම්පි යුත්තමේව හෝති. න චෙත්ථ සමුදයාරම්මණතා ආසඞ්කිතබ්බා සමුදයාභෝගස්සේවාභාවතෝ. සමුදිතා පන වණ්ණධම්මා ආරම්මණපච්චයා හොන්ති. කථං පන පච්චේකං අසමත්ථා

සමුදිතා ආරම්මණා පච්චයා හොන්ති, න හි පච්චේකං දට්ඨුං අසක්කොන්තා අන්ධා සමුදිතා පස්සන්තීති? නයිදමේකන්තිකං විසුං විසුං අසමත්ථානං සිවිකාවහනාදීසු සමත්ථතාය දස්සනතෝ. කේසාදීනඤ්ච යස්මිං ඨානේ ඨිතානං පච්චේකං වණ්ණං ගහේතුං න සක්කා, තස්මිංයේව ඨානේ සමුදිතානං වණ්ණං ගහේතුං සක්කාති හියෙය්‍යාපි තේසං සංහච්චකාරිතා පරිබ්‍යත්තා. ඒතේන චක්ඛුවිඤ්ඤාණස්ස පරමාණුරූපං ආරම්මණං, උදාහු තං සමුදායෝතිආදිකා චෝදනා පටික්ඛිත්තාති වේදිතබ්බා. "සෝතඤ්ච පටිච්ච සද්දේ චා"තිආදීසුපි (ම. නි. 1.204, 400; 3.421, 425, 426) ඒසේව නයෝ. ඒවං උභයාධීනවුත්තිකතාය චක්ඛුවිඤ්ඤාණස්ස නිස්සයතෝ, ආරම්මණතෝ ච විභාවනං කතං, ඒවං සෝතවිඤ්ඤාණාදීසුපි යථාරහං වත්තබ්බං.

**රූපමත්තාරම්මණරස**න්ති රූපායතනමත්තස්සේව ආරම්මණකරණරසං. මත්තසද්දේන යථා ආරම්මණන්තරං නිවත්තේති, ඒවං රූපායතනේපි ලබ්භමානේ ඒකච්චේ විසේසේ නිවත්තේති. න හි චක්ඛුවිඤ්ඤාණං වණ්ණමත්තතෝ අඤ්ඤං කිඤ්චි විසේසං තත්ථ ගහේතුං සක්කෝති. තේනාහ භගවා "පඤ්චහි විඤ්ඤාණේහි න කිඤ්චි ධම්මං පටිවිජානාති අඤ්ඤත්‍ර අභිනිපාතමත්තා"ති. චක්ඛුවිඤ්ඤාණං උප්පජ්ජමානං රූපාරම්මණේ ඒව උප්පජ්ජනතෝ තදභිමුඛභාවේන ගය්හතීති වුත්තං **"රූපාභිමුඛභාවපච්චුපට්ඨාන"**න්ති. අත්තනෝ අනන්තරං උප්පජ්ජමානානං අරූපධම්මානං සමනන්තරවිගතා අරූපධම්මා පවත්තිඔකාසදානේන අනන්තරසමනන්තරනත්ථිවිගතපච්චයේහි උපකාරකා නිස්සයාරම්මණධම්මා විය ආසන්නකාරණන්ති දස්සෙන්තෝ ආහ **"රූපාරම්මණාය කිරියමනෝධාතුයා අපගමපදට්ඨාන"**න්ති. **සෝතවිඤ්ඤාණාදීසු**පි වුත්තනයේනේව අත්ථෝ වේදිතබ්බෝ.

චක්ඛුවිඤ්ඤාණාදිගහිතං රූපාදිආරම්මණං තදනන්තරමේව අපරිපතන්තං කත්වා සම්පටිච්ඡන්ති ගණ්හන්තී විය හෝතීති වුත්තං **"රූපාදිසම්පටිච්ඡනරසා"**ති. තථාභාවේන සම්පටිච්ඡනභාවේන පච්චුපතිට්ඨතීති **තථාභාවපච්චුපට්ඨානා**.

ඡසු ආරම්මණේසු කදාචි පඤ්චන්නං, තතෝ වා කතිපයානං විජානනසභාවාපි **ඡළාරම්මණවිජානනලක්ඛණා** වුත්තා තං සභාවානතිවත්තනතෝ, ඡස්වේව වා ඉතරේසං ආරම්මණානං අන්තෝගධත්තා. **සන්තීරණාදිකිච්චා**ති සන්තීරණතදාරම්මණකිච්චා වා, සන්තීරණතදාරම්මණපටිසන්ධිභවඞ්ගචුතිකිච්චා වාති අධිප්පායෝ. **"හදයවත්ථුපදට්ඨානා"**ති ඉදං ඉමාසං ද්වින්නං මනෝවිඤ්ඤාණධාතූනං ඒකන්තේනේව හදයවත්ථුසන්නිස්සයතාය වුත්තං. හෙට්ඨා වුත්තනයේන පන තං තං අනන්තරාතීතවිඤ්ඤාණාපගමපදට්ඨානාතිපි වත්තුං වට්ටතියේව. **තස්සා භේදෝ**ති තස්සා විපාකමනෝවිඤ්ඤාණධාතුයා "දුවිධා"ති වුත්තාය දුවිධතා සඞ්ඛාතෝ භේදෝ. **ඒකන්තමිට්ඨාරම්මණේ**ති ඒකන්තේනේව ඉට්ඨේ ආරම්මණේ, අතිවිය ඉට්ඨාරම්මණේති අත්ථෝ. **පඤ්චද්වාරේ චේව ජවනාවසානේ චා**ති එත්ථ පඤ්චද්වාරේ සම්පටිච්ඡනවොට්ඨබ්බනානං අන්තරාළං ඨානං, ඉතරත්‍ර ජවනභවඞ්ගානන්ති ඒවං **ද්විඨානා හෝති**. ඉතරායපි සන්තීරණතදාරම්මණකාලේ යථාවුත්තමේව ඨානං, පටිසන්ධිආදිකාලේ පන චුතිභවඞ්ගානං අන්තරාළං පටිසන්ධියා, පටිසන්ධිආවජ්ජනානං තදාරම්මණාවජ්ජනානං ජවනාවජ්ජනානං වොට්ඨබ්බනාවජ්ජනානඤ්ච අන්තරාළං භවඞ්ගස්ස, තදාරම්මණපටිසන්ධීනං ජවනපටිසන්ධීනං වා අන්තරාළං චුතියා ඨානන්ති වේදිතබ්බං.

**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 454 යටතේ)]**

**තත්‍ථ (විඤ්ඤාණේසු)** ඒ විපාක විඤ්ඤාණයන් අතුරින් **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඥානය **චක්ඛුසන්නිස්සිතරූපවිජානනලක්ඛණං** චක්‍ෂුඃ ප්‍රසාදය ඇසුරු කොට රූපාලම්බණය දැකීම් ලක්‍ෂණයයැ **රූපමත්තාලම්බනරසං** රූප මාත්‍රය අරමුණු කිරීම කෘත්‍යයයැ **රූපඅභිමුඛභාවපච්චුපට්ඨානං** රූපාලම්බණය වැටහෙන ආකාරයයැ **රූපාරම්මණාය කිරියමනෝධාතුයා අපගමපදට්ඨානං** තමහට අනතුරුව උපදනා (චක්ඛුවිඤ්ඤාණ චිත්තයට අනන්තර වීම් වශයෙන් උපකාරවන හෙයින්) පඤ්චද්වාරාවර්ජනචිත්ත සඞ්ඛ්‍යාත ක්‍රියාමනෝධාතුහුගේ අපගමය ආසන්න කාරණයයි **සෝතඝානජිව්හාකායවිඤ්ඤාණානි** ශ්‍රෝත්‍ර-ඝ්‍රාණ-ජිව්හා-කාය විඤ්ඤාණාදිහු ද **සෝතාදිසන්නිස්සිතසද්දාදිවිජානනලක්ඛණානි** ශ්‍රෝත්‍ර-ඝ්‍රාණ-ජිව්හා-කාය ප්‍රසාද ඇසුරු කොට ශබ්ද-ගන්ධ-රස-ස්පෂ්ටව්‍ය දැණීම් ලක්‍ෂණය කොට ඇත්තාහ **සද්දාදිමත්තාරම්මණරසානි** ශබ්ද-ගන්ධ-රස-ස්පෂ්ටව්‍ය අරමුණු කිරීම කෘත්‍යයහ **සද්දාදිඅභිමුඛභාවපච්චුපට්ඨානානි** ශබ්ද-ගන්ධ-රස-ස්පෂ්ටව්‍ය පිළිගැනීම වැටහෙන ආකාරයහ **සද්දාරම්මණාදීනං කිරියමනෝධාතූනං අපගමපදට්ඨානානි** ශබ්ද-ගන්ධ-රස-ස්පෂ්ටව්‍ය අරමුණු කොට ඇති කිරියමනෝධාතුහුගේ අපගමය ආසන්න කාරණයහ ෴

"චක්ඛුසන්නිස්සිතං හුත්වා රූපස්ස විජානනං ලක්ඛණං ඒතස්සාති චක්ඛුසන්නිස්සිතරූපවිජානනලක්ඛණං" මෙහි චක්‍ෂුසන්නිශ්‍රිත වචනයෙන් රූපය අරමුණු කොට ඇති සෙසු විඤ්ඤාණය වැළකූහු. විජානන ග්‍රහණයෙන් චක්‍ෂුසන්නිශ්‍රිත වූ ස්පර්ශාදීන් වැළකූහු. චක්ඛු රූප ග්‍රහණයෙන් නිශ්‍රය හෙයිනුදු ආලම්බන හෙයිනුදු උභයාධීන වෘත්ති ඇති බැවින් විඤ්ඤාණයම පහළකළෝ. ඉදින් චක්‍ෂුසෙක් නැත්නම් අන්ධයෝද රූප දක්නාහුයි ඔහු නොම දනිත්. ඉදින් නීලාදි රූපයෙක් නැති නම් දේශාදී නියම නොවන්නේයි. නියමයද නැත්නම් චිත්තයාගේ ඒකාන්ත සාලම්බණත්වය කියනලදනුයි අරමුණු නැතිවද නීලාද්‍යවභාසය ඇති චිත්තය පවත්නේ යයි මෙසේ ප්‍රවෘතවූ වාදය මිත්‍යාවාද යයි දතයුතුයි. එහෙයින්ම වදළේය "චක්ඛුඤ්ච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං" යනාදී. මෙහි කුමක් හෙයින් වචන භේදය කරණලද යත්? එකද චක්‍ෂුසෙක් විඤ්ඤාණයට ප්‍රත්‍යය වෙයි, රූපය වනාහි අනේක වූයේම සංහතව ප්‍රත්‍යය වෙයි, යන මේ විශේෂය දක්වන පිණිසයි. කවර කාරණයෙන් එකම චක්‍ෂුස විඤ්ඤාණයට ප්‍රත්‍යය වේද රූපය වනාහි අනේක වූයේ ප්‍රත්‍යය වේද යත්? ප්‍රත්‍යය භාව විශේෂයෙනි. චක්‍ෂුස් තෙමේ චක්‍ෂුර්විඤ්ඤාණයට නිශ්‍රය, පුරේජාත, ඉන්ද්‍රිය, විප්‍රයුක්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වනුයේ ද අස්තිභාවයෙන්ම වෙයි. චක්‍ෂුස්හු ඇති කල්හි විඤ්ඤාණය වන බැවින් හා නැති කල්හි නොවන බැවින් යම්හෙයකින් චක්‍ෂුස අස්ති, අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි කියනු ලැබේද විඤ්ඤාණයාගේ තන්නිශ්‍රය බවද තමා අරූප බවද ඒකදේශයකින් අල්ලීයන වශයෙන් නොවෙයි. ගුරු රාජාදීන් කෙරෙහි ශිෂ්‍ය රාජපුරුෂාදීන්ගේ මෙන් තත්ප්‍රතිබද්ධ වෘත්තිත්වයෙනැයි දතයුතු. සෙසු ප්‍රත්‍යයෝ තත් තද්විශේෂයෙන් වේදිතව්‍යයෝයි. ඒ ප්‍රත්‍යය භාවය එකක්හු කෙරෙහි සම්භව නොවේනුයි එකද චක්‍ෂුර්විඤ්ඤාණයට ප්‍රත්‍යය වේනුයි "චක්ඛුඤ්ච පටිච්ච" යී ඒකවචනයෙන් නිර්දේශය කරණලදි෴

රූපය වනාහි පූර්වජාතව විද්‍යමානක්‍ෂණයෙහි උපකාර වන බැවින් ඉදින් චක්‍ෂුස්හු මෙන් පුරේජාත, අස්ති, අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ නුමුදු අරමුණු බැවින් අනේක වූයේම සංහතව ප්‍රත්‍යය වේ. ස්වභාව ධර්මවූද පරිකල්පිතමාත්‍රවූ ද යම් ප්‍රත්‍යයෙක් තදන්‍යයනට ප්‍රත්‍යයත්ව ඇත ද විඤ්ඤාණයා විභාවනය කෙරෙමින් පවතී ද හෙතමේ සාලම්බණ ස්වභාව බැවින් කිසිවක් නොඑල්බ පටත්නට අසමර්ථ වූ විඤ්ඤාණයාගේ එල්බැ පැවැත්මට කාරණ බැවින් ආළම්බණීය හෙයින් ආලම්බන

නම් වේ. යම්හෙයකින් යම්තම් ප්‍රකාරයෙකින් ස්වභාවෝපලබ්ධි වශයෙන් ආලම්බන ප්‍රත්‍යය ලාභයද එහෙයින් චක්ෂුර්විඤ්ඤාණය රූපය අරමුණු කොට පවත්නේ උහුගේ ස්වභාව විභාවනය කෙරෙමින් පවති. ඉන්ද්‍රියාධීනවෘත්ති ඇති ඒ විඤ්ඤාණයාගේ ආලම්බණෝපලබ්ධිය ද එක කලාපගත වර්ණ වශයෙන් නොවෙයි. කතිපය කලාපගත වර්ණ වශයෙන් නොවේද වේ. වැලි කෙසේ වේද යත්? ආභෝගානුරූපව ආපාතගත වර්ණ වශයෙන් වෙයි. අනෙකම වූ රූපය සංහෘත්‍යකාරී බැවින් විඤ්ඤාණයට ප්‍රත්‍යය වෙයි. දක්වන භගවත් තෙමේ "රූපේ" යි බහුවචනයෙන් නිර්දේශය කෙළේයි. "රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානං ධම්මානං ආරම්මණපච්චයේන පච්චයෝ" යි යමෙක්වනාහි කියනලදද හේ කෙසේද යත්? හේද යම්බඳු රූපායතනයෙක් චක්ෂුර්විඤ්ඤාණයට ආලම්බන ප්‍රත්‍යය වේද එබඳු රූපායතනය සඳහාම කියනලදි. හේ කෙබඳුද යත්? සමුදිත වූ රූපායතනය යන මේ අර්ථය ප්‍රකටමැයි. එහෙයින්ම "ආයතනසල්ලක්ඛණවසේන චක්ඛුවිඤ්ඤාණාදයෝ සල්ලක්ඛණාරම්මණා න දබ්බසල්ලක්ඛණවසේන" යන කේචි වාදයද යුක්තම වේ. මෙහි සමුදයාරම්මණතාව ද ආසඞ්කනීය නොද වේ. සමුදයාභෝගයම නැති බැවින්. සමුදිතවූ වර්ණ ධර්මයෝ වනාහි ආලම්බන ප්‍රත්‍යයයෝ වෙත්. වෙන වෙනම දක්නට අසමර්ථ වූ අන්ධයෝ රැස්වූවාහු නොම දක්නාහු වෙති. මේ වනාහි ඒකාන්තික නොවේ. වෙන වෙනම අසමර්ථවූවන්ගේ ශිවිකොද්වාහනාදියෙහි සමර්ථබව දක්නා හෙයිනි. යම්තැනෙක සිටියාවූ කේශාදීන්ගේ වෙනවෙනම වර්ණය ගන්නට නොහැකි වෙයිද එක ස්ථානයෙහිම රැස්ව සිටියවුන්ගේ වර්ණය ගන්නට සමර්ථ වෙති. එහෙයින් බෙහෙවින් ඔහුන්ගේ සංහෘත්‍යකාරීත්වය පරිව්‍යත වේ. මෙයින් "චක්ඛුවිඤ්ඤාණස්ස පරමාණුරූපං ආරම්මණං උදාහු තං සම්දයෝ" යනාදී චොද්‍යය ප්‍රතික්ෂිප්තයයි වේදිතව්‍යයි. "සෝතඤ්ච පටිච්ච සද්දේ ච" යනාදියෙහිදු මෙම නයයි. මෙසේ උභයාධීනවෘත්තිත්වය ඇති බැවින් චක්ෂුර්විඤ්ඤාණයාගේ නිශ්‍රය හෙයිනිදු ආලම්බන හෙයිනිදු විභාවනය කරණලදි. ශ්‍රෝත්‍රවිඤ්ඤාණාදියෙහිදු යථාවයෙන් වක්තව්‍යයි.

"රූපමත්තාරම්මණරසං" රූපායතන මාත්‍රයම අරමුණු කිරීම කෘත්‍යය කොට ඇත්තේයි. මත්තා ශබ්දයෙන් යම්සේ ආලම්බණාන්තර නිවර්ථනය කෙරේද එසේම රූපායතනයෙහිදු ලබ්‍යමාන වූ සමහර විශේෂ කෙනෙකුන් නිවර්ථනය කෙරේ. චක්ෂුර්විඤ්ඤාණය වනාහි වර්ණ මාත්‍රයෙන් අන්කිසි විශේෂයක් ගන්නට අසමර්ථයි. එහෙයින් වදළහ "පඤ්චහි විඤ්ඤාණේහි න කිඤ්චි ධම්මං පටිවිජානාති, අඤ්ඤත්‍ර අභිනිපාතමත්තා" යි. චක්ෂුර්විඤ්ඤාණය උපදිනු ලබනුයේ රූපාලම්බනයෙහිම උපදනා හෙයින් තදභිමුඛභාවයෙන්ම ගන්නා ලැබේනුයි "රූපාභිමුඛභාවපච්චුපට්ඨානං" යි කීහු. තමහට අනන්තරයෙහි උත්පද්‍යමාන අරූප ධර්මයනට සමනන්තර විගත වූ අරූප ධර්මයෝ ප්‍රවෘත්ත්‍යවකාශදානයෙන් අනන්තර-සමනන්තර-නත්ථි-විගතප්‍රත්‍යයෙන් උපකාරක වූවාහු නිශ්‍රයාලම්බන ධර්මයන් මෙන් ආසන්න කාරණනුයි දක්වනුවෝ "රූපාරම්මණාය කිරියමනෝධාතුයා අපගමපදට්ඨානං" යි කීහු. ශ්‍රෝත්‍රවිඤ්ඤාණාදියෙහිදු කී නයින්ම අර්ථ දතයුතු. චක්ෂුර්විඤ්ඤාණාදීන් විසින් ග්‍රහීත වූ රූපාදී අරමුණු තදනන්තරයෙහිම හාත්පසින් නොහියදී පිළිගන්නියක මෙන් වේනුයි "රූපාදිසම්පටිච්ඡනරසා" යි කීහු. "තථාභාවපච්චුපට්ඨානා" සම්පටිච්ඡන භාවයෙන් පිළිගන්නා බැවින් වැටහෙන්නියි.

**සන්තීරණාදිකිච්චා** සන්තීරණ ආදී කෘත්‍ය ඇත්තාවූ **අහේතුකවිපාකා මනෝවිඤ්ඤාණධාතු දුවිධාපි** (අහේතුක විපාක මනෝවිඤ්ඤාණධාතු දෙදෙන) සන්තීරණ සිත් දෙක **සළාරම්මණවිජානනලක්ඛණා** ෂඩාලම්බනය දැනීම් ලක්ෂණයහ **සන්තීරණාදිරසා** සන්තීරණ තදාරම්මණාදී කෘත්‍යයහ **තථාභාවපච්චුපට්ඨානා** එබඳු

රූපාදිය තීරණය කිරීම වැටහෙන ආකාරයහ **හදයවත්‍ථුපදට්ඨානා** හෘදයවස්තුවම ආසන්න කාරණයහ **පන** පක්‍ෂාන්තරයක් දක්වම් **සෝමනස්සුපෙක්ඛායෝගතෝ** සෝමනස්ස උපේක්‍ෂා යෝගයෙන් ද **ද්විපඤ්චට්ඨානභේදතෝ ච** ද්විස්ථානික හා පඤ්චස්ථානික වශයෙන් ද **තස්සා** ඒ සන්තීරණයාගේ **භේදෝ (හෝති)** භේදය වේ **හි (සච්චං)** ඒ එසේමැයි **ඒතාසු** මොහුන් අතුරින් **ඒකා** සෝමනස්ස සන්තීරණ චිත්තය තුමූ **ඒකන්තමිට්ඨාරම්මණේ** ඒකාන්ත ඉෂ්ටාරම්මණයෙහි **පවත්තිසබ්භාවතෝ** පවත්නා හෙයින් **සෝමනස්සසමපයුත්තා හුත්‍වා** සොම්නස් වේදනා සම්ප්‍රයුක්තවැ **සන්තීරණවසේන** සන්තීරණ වශයෙන් **පඤ්චද්වාරේ ච** පඤ්චද්වාරයෙහි ද **තදරම්මණවසේන** තදරම්මණ වශයෙන් **ජවනාවසානේ චේව** ජවන අවසානයෙහි ෂඩ්ද්වාරයෙහිම ද **පවත්තනතෝ** පවත්නා හෙයින් **ද්විට්ඨානා හෝති** ද්විස්ථානිකයැ **ඒකා** උපේක්‍ෂා සහගත සන්තීරණ චිත්තය තුමූ **ඉට්ඨමජ්ඣත්තාරම්මණේ** ඉෂ්ට මධ්‍යස්ථාලම්බනයෙහි **පවත්තිසබ්භාවතෝ** පවත්නා හෙයින් **උපෙක්ඛාසම්පයුත්තා හුත්‍වා** උපේක්‍ෂා සහගතවැ **සන්තීරණතදරම්මණපටිසන්ධිභවඞ්ගචුතිවසේන** සන්තීරණ-තදරම්මණ-පටිසන්ධි-භවඞ්ග-චුති වශයෙන් **පවත්තනතෝ** පවත්නා හෙයින් **පඤ්චට්ඨානා හෝති** පඤ්චස්ථානික වෙයි.

**අහේතුකවිපාකා** අහේතුක මනෝවිඤ්ඤාණධාතුව **සළාරම්මණ විජානනලක්ඛණා** ෂඩාලම්බනයන් කිසිකලෙක පඤ්චාලම්බනයන් එයිනුදු කතිපයාලම්බන කෙනෙකුන් හෝ දන්නා ලකුණ තත්ස්වභාව නොයික්මෙන බැවින් "සළාරම්මණවිජානනලක්ඛණා" යි කීහු. "සන්තීරණාදිකිච්චා" යනුයෙහි "සන්තීරණ-තදරම්මණකිච්ච වා" "සන්තීරණ-තාරම්මණ-පටිසන්ධි-භවඞ්ග-චුතිකිච්ච වා" යන අභිප්‍රායයි. "හදයවත්‍ථුපදට්ඨානා" යන මේ වචනය මේ මනෝවිඤ්ඤාණ ධාතූන් දෙදෙනාගේ ඒකාන්තයෙන්ම හෘදයවස්තු සන්නිශ්‍රය බැවින් කියනලදි. යටකී නයින් වනාහි "තං තං අනන්තරාතීතවිඤ්ඤාණාපගමපදට්ඨානා" යිදු කියනුවට වටීමැයි. සන්තීරණස්ථාන නිබන්ධ නොවන බැවින් යට සිතට මෙන් පදට්ඨාන නොකියා "හදයවත්‍ථුපදට්ඨානා" යි කීහ යනු සත්‍යයි. **ද්විපඤ්චට්ඨානභේදතෝ** ද්විස්ථානික පඤ්චස්ථානික භේදයෙන් **තස්සාභේදෝ** "දුවිධාපි" යි කියනලද ඒ විපාක මනෝවිඤ්ඤාණ ධාතුවගේ ද්විවිධතා සඞ්ඛ්‍යාත භේදයයි. **ඒකන්තමිට්ඨාරම්මණේ** ඒකාන්තයෙන්ම ඉෂ්ටවූ ගෝචරයෙහි අතිශයින්ම ඉෂ්ටාලම්බනයෙහිය යන අර්ථයි. **පවත්තිසබ්භාවතෝ** ප්‍රවෘත්තිය ඇති බැවින් "පඤ්චද්වාරේ සන්තීරණවසේන, ඡද්වාරේ වා ජවනාවසානේ තදරම්මණවසේන" යි ද්විට්ඨානා හෝති. පඤ්චද්වාරයෙහි සම්පටිච්ඡන වොත්‍ථපනයන්ගේ අන්තරාලස්ථානයෙහි ද මනෝද්වාරයෙහි ජවන භවඞ්ගයන්ගේ අන්තරාලස්ථානයෙහි ද යන ස්ථාන ද්වය ඇත්තාහුයි. "පඤ්චට්ඨානා හෝති" යනුයෙහි සන්තීරණ තදලම්බන කාලයෙහි ස්ථානය කියනලද නයමැයි. ප්‍රතිසන්ධි ආදී කාලයෙහි වනාහි චුති භවඞ්ගයන්ගේ අන්තරාලය ප්‍රතිසන්ධියට ද, ප්‍රතිසන්ධි ආවර්ජනයන්ගේ තදලම්බන ආවර්ජනයන්ගේ ජවන ආවර්ජනයන්ගේ වොත්‍ථපන ආවර්ජනයන්ගේ හෝ අන්තරාලය භවඞ්ගයට ද, තදලම්බන ප්‍රතිසන්ධීන්ගේ හෝ ජවන ප්‍රතිසන්ධීන්ගේ හෝ අන්තරාලය චුතියට ස්ථානයයි දතයුතු. **[විසුද්ධි මාර්ග මහා සන්නය 1092-1095 පිටු]**

චක්ඛුසන්නිස්සිතඤ්ච තං රූපවිජානනඤ්චාති **චක්ඛුසන්නිස්සිතරූපවිජානනං**. ඒවං ලක්ඛණං චක්ඛුවිඤ්ඤාණං. තත්ථ චක්ඛුසන්නිස්සිතවචනේන රූපාරම්මණං අඤ්ඤවිඤ්ඤාණං පටික්ඛිපති. රූපවිජානනවචනේන චක්ඛුනිස්සයේ ඵස්සාදයෝ නිවත්තේති. චක්ඛුරූපවචනේහි ච

නිස්සයතෝ ආරම්මණතෝ ච විජානනං විභාවේති. රූපමත්තස්ස ආරම්මණස්ස ගහණං කිච්චමේතස්සාති **රූපමත්තාරම්මණරසං.**

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 431 යටතේ)]**

චක්ඛුසන්නිස්සිතඤ්ච තං රූපවිජානනඤ්චාති චක්ඛුසන්නිස්සිතරූපවිජානනං යනු සමාසයි (චක්‍ෂුස්ප්‍රශාදය ඇසුරු කරන්නේ ද එයයි, රූපාරම්මණය දැනගන්නේ ද එයිනුයි චක්ඛුසන්නිස්සිතරූපවිජානන නම්. එනම් චක්ඛුවිඤ්ඤාණ චිත්තයයි) **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඥානය තෙමේ **ඒවං** මෙබඳු **ලක්ඛණං** ලක්‍ෂණ ඇත්තේය **තත්‍ථ** එහි **චක්ඛුසන්නිස්සිතවචනේන** චක්ඛුසන්නිස්සිත වචනයෙන් **රූපාරම්මණං** රූපාරම්මණය ද **අඤ්ඤවිඤ්ඤාණං** අන්‍ය විඥානා චිත්තයෝ ද **පටික්ඛිපති** ප්‍රතික්‍ෂේප කරයි **රූපවිජානනවචනේන** රූපවිජානන වචනයෙන් **චක්ඛුනිස්සයේ** චක්‍ෂුස් ප්‍රශාදය ඇසුරු කරන **ඵස්සාදයෝ** ඵස්සාදී චෛතසික ධර්මයෝ **නිවත්තේති** නවත්වයි **චක්ඛුරූපවචනේහි** චක්ඛු-රූප යන වචනවලින් **නිස්සයතෝ ච** නිශ්‍රය වශයෙන් ද **ආරම්මණතෝ ච** අරමුණු කිරීම් වශයෙන් ද **විජානනං** දැනගැණීම **විභාවේති** ප්‍රකාශ කරයි **රූපමත්තස්ස** රූප මාත්‍ර වූ **ආරම්මණස්ස** ආරම්මණයාගේ **ගහණං කිච්චං** ගැණීම් කෘත්‍යය **ඒතස්සාති** මොහුටනුයි **රූපමත්තාරම්මණරසං** රූපමත්තාරම්මණරසං යනුයි.

**[ධම්මසඞ්ගණී මූලටීකා පරිවර්තනයි]**

මනෝධාතුනිද්දේසේ සභාවසුඤ්ඤතනිස්සත්තට්ඨේන මනෝයේව ධාතු **මනෝධාතු**. සා චක්ඛුවිඤ්ඤාණාදීනං අනන්තරං රූපාදිවිජානනලක්ඛණා, රූපාදීනං සම්පටිච්ඡනරසා, තථාභාවපච්චුපට්ඨානා, චක්ඛුවිඤ්ඤාණාදිඅපගමපදට්ඨානා.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 455 අහේතුකකුසලවිපාක යටතේ); ධම්මසඞ්ගණී අටුවා 234-235 පිටු (හේ.වි.මු); මොක්පුර රන්දෙර 02/270 පිට]**

අඤ්ඤේසං චිත්තානං සභාවසුඤ්ඤතසබ්භාවා මනෝධාතුභාවෝ ආපජ්ජතීති චේ? න, විසේසසබ්භාවා. චක්ඛුවිඤ්ඤාණාදීනඤ්හි චක්ඛාදිනිස්සිතතා චක්ඛාදීනං සවිසයේසු දස්සනාදිප්පවත්තිභාවතා ච විසේසෝ. මනෝවිඤ්ඤාණස්ස පන අනඤ්ඤනිස්සයමනෝපුබ්බඞ්ගමතාය අඤ්ඤනිස්සයවිඤ්ඤාණස්ස අනන්තරපච්චයත්තාභාවේන මනෝද්වාරනිග්ගමනමුඛභාවාභාවතෝ ච සාතිසයවිජානනකිච්චතා විසේසෝ. තබ්බිසේසවිරහා මනෝමත්තා ධාතු මනෝධාතූති තිවිධා මනෝධාතු ඒව වුච්චති, න විසේසමනෝ. තස්මා එත්ථ **මනෝ ඒව ධාතු මනෝධාතූ**ති **ඒව**-සද්දෝ මත්තසද්දත්ථෝ දට්ඨබ්බෝ. විසේසනිවත්තනත්ථෝ හි සෝ විඤ්ඤාණස්සාති. මනෝද්වාරනිග්ගමනපවේසමුඛභාවතෝ පන මනෝධාතුයා විජානනවිසේසවිරහෝ දට්ඨබ්බෝ, තතෝ ඒව මනෝවිඤ්ඤාණන්තිපි න වුච්චති. න හි තං විඤ්ඤාණං මනතෝ පවත්තං මනසෝ පච්චයෝ, නාපි මනසෝ පච්චයභූතං මනතෝ පවත්තං, දස්සනාදීනං පන පච්චයෝ, තේහි ච පවත්තං තේසං පුරේචරං අනුචරඤ්චාති. **[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 455 යටතේ)]**

**දස්සනාදිප්පවත්තිභාවතෝ**ති මනෝධාතු මනෝවිඤ්ඤාණධාතූනං අදස්සනාදිතාය සා ඒතේසං ඒව විසේසෝ. **අනඤ්ඤනිස්සයමනෝපුබ්බඞ්ගමතායා**ති අඤ්ඤනිස්සයමනෝපුබ්බඞ්ගමත්තාභාවතෝ. **අඤ්ඤනිස්සයවිඤ්ඤාණස්ස අනන්තරපච්චයත්තාභාවේනා**ති ඉමිනා කිරියාමනෝධාතුතෝපි විසේසස්ස වුත්තත්තා **"මනෝද්වාරනිග්ගමනමුඛභාවාභාවතෝ"**ති වුත්තං, න වුත්තං "නිග්ගමනපවේසමුඛභාවාභාවතෝ"ති. තිවිධේනපි හි මනෝධාතුවිඤ්ඤාණධාතූහි

මනෝවිඤ්ඤාණධාතුයා විසේසෝ දස්සිතෝති. **තතෝ ඒව** විජානනවිසේසවිරහතෝයේව. යදි මනෝධාතු "මනෝවිඤ්ඤාණ"න්ති න වුච්චති, ඡවිඤ්ඤාණකායාති කථං මනෝධාතුයා තත්ථ සඞ්ගහෝ හෝතීති? සඞ්ගහෝ ඒව පරියායදේසනත්තා. අත්ථි හි ඒස පරියායෝ "මනනමත්තං විඤ්ඤාණං මනෝවිඤ්ඤාණ"න්ති යථා "මනනමත්තා ධාතු මනෝධාතූ"ති. අපිච වත්ථුකිච්චේහි මනෝවිඤ්ඤාණසභාගත්තා තස්ස උපරමුප්පාදභාවතෝ අන්තාදිභාවතෝ ච මනෝවිඤ්ඤාණකායසඞ්ගහිතා මනෝධාතු, න සේසවිඤ්ඤාණකායසඞ්ගහිතා අතංසභාගත්තා, ඉධ පන නිප්පරියායකතත්තා මනසෝ සම්භූය විසිට්ඨමනෝකිච්චයුත්තං මනෝවිඤ්ඤාණන්ති තදභාවතෝ "මනෝවිඤ්ඤාණන්තිපි න වුච්චතී"ති ඉමමේවත්ථං සාධේතුං **"න හි තං විඤ්ඤාණං මනතෝ"**ති ආදි වුත්තං. තේන මනෝධාතුයා නිප්පරියායතෝ මනෝවිඤ්ඤාණකිච්චවිරහංයේව දස්සේති. **දස්සනාදීනං පනාති** ආදිනා අඤ්ඤවිඤ්ඤාණවිධුරං මනෝධාතුයා ච සභාවං දස්සේති.
**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 455 යටතේ)]**

**මනෝධාතුනිද්දේසේ** මනෝධාතු නිර්දේශයෙහි **සභාවසුඤ්ඤත නිස්සත්තට්ඨේන** ස්වභාවයෙන් සුඤ්ඤ වූ සත්ව නොවන අර්ථයෙන් **මනෝයේව ධාතු** මනන මාත්‍රයක්ම වූ ධාතුව **මනෝධාතු** මනෝධාතු නම් (අන්‍ය චිත්තයන්ගේ ස්වභාවයෙන්ම සුඤ්ඤත ස්වභාවය ඇති බැවින් මනෝධාතු භාවයට පැමිණෙන්නේ නොවේද? විශේෂ ස්වභාව බැවින් නොපැමිණෙයි. චක්ෂුර්විඤ්ඤාණාදීන්ගේ වනාහි චක්ෂුස්ප්‍රශාදදිය ඇසුරු කරන බැවින් ද චක්ෂුර්විඤ්ඤාණාදීන්ට විෂය වූ රූපාදියෙහි දැකීම් ආදී පැවතුම් ඇති බව ද විශේෂයයි. මනෝවිඤ්ඤාණ චිත්තයට වනාහි අන්‍ය චිත්තයන් ඇසුරු නොකරන්නා වූ භවඞ්ග චිත්තය පූර්වාඞ්ගම කොට ඇති බැවින් ද අන්‍ය ප්‍රශාදරූප අසුරු කරන්නා වූ චිත්තයන්ගේ අනන්තර ප්‍රත්‍යය බව නොමැති හෙයින් ද මනෝද්වාරය නම් වූ භවඞ්ග චිත්තයාගේ නිරුද්ධ නොවූ බැවින් ද අතිශයින් විජානන කෘත්‍යය ඇති බැවින් ද යනු මෙහි විශේෂයයි. ඒ විශේෂය නැත්තාවූ තෙවැදෑරුම් මනෝධාතුවම මනන මාත්‍රයක් ඇති ධාතුව තුමූ මනෝධාතුව යයි කියනු ලැබේ. විශේෂ චිත්තයක් නොවේ. එනිසා මෙහි මනෝ ඒව ධාතු මනෝධාතු යන්නෙහි ඒව ශබ්දය තෙමේ මාත්‍රය යන අර්ථයි දතයුතුයි. විඤ්ඤාණයාගේ විශේෂය නැවැත්වීම පිණිස ඒව ශබ්දය ගන්නාලදි. මනෝද්වාරය වනාහි මනෝධාතුවගේ නික්මෙන පිවිසෙන දෙරටුව බැවින් විජානන විශේෂයක් නැතැයි දතයුතුයි. එහෙයින් මනෝවිඤ්ඤාණය යැයි නොකියනු ලැබේ. ඒ මනෝධාතුව භවඞ්ගයෙන් පැවැත්මක් ද භවඞ්ගයට ප්‍රත්‍යය ද නොවේ. ) **සා** ඒ මනෝධාතු තුමූ **චක්ඛුවිඤ්ඤාණාදීනං** චක්ෂුර්විඤ්ඤාණාදීන්ට **අනන්තරං** අනතුරුව **රූපවිජානනලක්ඛණා** රූපාරම්මණාදිය දැනගැණීම ලක්ෂණ කොට ඇත්තීය **රූපාදීනං** රූපාරම්මණාදීන්ගේ **සම්පටිච්ඡනරසා** පිළිගැනීම කෘත්‍යය කොට ඇත්තීය **තථාභාවපච්චුපට්ඨානා** රූපාදී අරමුණු පිළිගන්නා බව වැටහීම් කොට ඇත්තීය **චක්ඛුවිඤ්ඤාණාදිඅපගමපදට්ඨානා** චක්ෂුර්විඤ්ඤාණ ආදීන්ගේ නිරෝධය නොහොත් අතුරුදහන්වීම ආසන්න කාරණා කොට ඇත්තීය.
**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

මනෝවිඤ්ඤාණධාතුනිද්දේසේසු පඨමමනෝවිඤ්ඤාණධාතුයං 'පීති'පදං අධිකං. වේදනාපි 'සෝමනස්ස' වේදනා හෝති. අයඤ්හි ඉට්ඨාරම්මණස්මිංයේව පවත්තති. දුතියමනෝවිඤ්ඤාණධාතු ඉට්ඨමජ්ඣත්තාරම්මණේ. තස්මා තත්ථ 'උපෙක්ඛා' වේදනා හෝතීති. ලක්ඛණාදිතෝ පනේසා දුවිධාපි මනෝවිඤ්ඤාණධාතු අහේතුකවිපාකා, ඡළාරම්මණවිජානනලක්ඛණා, සන්තීරණාදිරසා, තථාභාවපච්චුපට්ඨානා, හදයවත්ථුපදට්ඨානාති වේදිතබ්බා.


පටුන

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 469 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 235 පිට (හේ.වි.මු); මොක්පුර රන්දෙර 02/272 පිට]**

සමානවත්ථුකං අනන්තරපච්චයං ලභිත්වා උප්පජ්ජමානං සන්තීරණං මනෝධාතුතෝ බලවතරං හෝතීති තං යථාරම්මණං ආරම්මණරසං අනුභවන්තං ඉට්ඨේ සෝමනස්සසහගතං හෝති, ඉට්ඨමජ්ඣත්තේ උපෙක්ඛාසහගතං සාතිසයානුභවත්තා, තස්මා **"අයඤ්හි ඉට්ඨාරම්මණස්මිං යේවා"**තිආදි වුත්තං. වොට්ඨබ්බනං පන සතිපි බලවභාවේ විපාකප්පවත්තිං නිවත්තෙත්වා විසදිසං මනං කරොන්තං මනසිකාරකිච්චන්තරයෝගතෝ විපාකෝ විය අනුභවනමේව න හෝතීති සබ්බත්ථ උපෙක්ඛාසහගතමේව හෝති, තථා පඤ්චද්වාරාවජ්ජනං මනෝද්වාරාවජ්ජනඤ්ච කිච්චවසේන අපුබ්බත්තා.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 469 යටතේ)]**

**සමානවත්ථුකං අනන්තරපච්චයං ලභිත්වා**ති දස්සනාදිතෝ මනෝධාතුයා ච බලවභාවේ කාරණවචනං. **යථාරම්මණ**න්ති ආරම්මණානුරූපං. යදි සමානනිස්සයතාය මනෝධාතුතෝ බලවතරත්තං විපාකමනෝවිඤ්ඤාණධාතුයා සෝමනස්සසහගතාය, වොට්ඨබ්බනං කථං මජ්ඣත්තවේදනන්ති අනුයෝගං මනසි කත්වා තස්ස බලවභාවං සම්පටිච්ඡිත්වා සන්තතිපරිණාමනබ්‍යාපාරවිසේසා න සෝමනස්සවේදනන්ති පරිහාරං වදන්තෝ **"වොට්ඨබ්බන"**න්තිආදිමාහ. **විපාකෝ විය අනුභවනමේව න හෝතී**ති සති සමත්ථතාය විපාකානං ඒකන්තේන ආරම්මණරසානුභවනතාය වුත්තං. **[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 469 යටතේ)]**

**මනෝවිඤ්ඤාණධාතුනිද්දේසේසු** මනෝවිඤ්ඤාණධාතු නිර්දේශයෙහි **පඨමමනෝවිඤ්ඤාණධාතුයං** ප්‍රථම මනෝවිඤ්ඤාණධාතුව නම් වූ සෝමනස්සසහගත සන්තීරණ චිත්තයෙහි **පීතිපදං අධිකං** ප්‍රීති චෛතසිකය අධික වෙයි **වේදනාපි** වේදනාව ද **සෝමනස්සවේදනා හෝති** සොම්නස් වේදනාව වෙයි **අයඤ්හි** මේ චිත්තය වනාහි **ඉට්ඨාරම්මණස්මිංයේව** ඉටු අරමුණෙහිම **පවත්තති** පවතී **දුතියමනෝවිඤ්ඤාණධාතු** ද්විතීය මනෝවිඤ්ඤාණධාතුව නම් වූ උපේක්ෂාසහගත සන්තීරණ චිත්තය **ඉට්ඨමජ්ඣත්තාරම්මණෝ** ඉෂ්ට මධ්‍යස්ථාරම්මණයෙහි (**පවත්තති** පවතී) **තස්මා** එබැවින් **තත්ථ** ඒ චිත්තයෙහි **උපෙක්ඛාවේදනා හෝති** උපේක්ෂා වේදනාව වෙයි යයි **ඉති (දට්ඨබ්බා)** දතයුතුයි.

(සමානවස්තුක වූ සම්පටිච්ඡන චිත්තයාගේ අනන්තර ප්‍රත්‍යය ලැබ උපදින්නා වූ සන්තීරණ චිත්තය සම්පටිච්ඡන චිත්තයට වඩා බලවත් වෙයිනුයි ඒ සන්තීරණ චිත්තය ආරම්මණානුරූපව අරමුණු රසය අනුභව කරමින් ඉටු අරමුණෙහි සොම්නස් සහගත වෙයි. අරමුණ අතිශයින් අනුභවන කරන බැවින් ඉෂ්ට මධ්‍යස්ථාරම්මණයෙහි උපේක්ෂා සහගත වෙයි. එබැවින් "අයඤ්හි ඉට්ඨාරම්මණස්මිංයේව" යි කියනලදි)

(වොත්ථපන චිත්තය කෙසේ උපේක්ෂා සහගතම වන්නේ ද යන චෝද්‍යයට පරිහාර පිණිස "වොට්ඨබ්බනං පන -පෙ- උපෙක්ඛාසහගතමේව හෝති" යි කියනලදි)

(විපාක ප්‍රවෘත්තිය සිඳ අසමාන ජවනචිත්ත පරම්පරාවකට පරිවර්තනය කරන වොත්ථපනය වනාහි බලවත් භාවය ඇති කල්හිදු මනසිකාර කෘත්‍යය හා යෙදීම් වශයෙන් විපාක චිත්තය මෙන් ආරම්මණානුරූපව අරමුණු රසය අනුභවන නොකරන්නේනුයි සියළු තැන උපේක්ෂා සහගතම වේ යනු මූලටීකායි)

**ලක්ඛණාදිතෝ පන** ලක්‍ෂණාදි වශයෙන් වනාහි **අහේතුකවිපාකා** අහේතුක විපාක වූ **ඒසා දුවිධාපි මනෝවිඤ්ඤාණධාතු** ඒ දෙවැදෑරුම් මනෝවිඤ්ඤාණධාතු තුමූ **ඡළාරම්මණවිජානනලක්ඛණා** සයාරමුණු දැනගන්නා නොහොත් ගන්නා ස්වභාවය ලක්‍ෂණ කොට ඇත්තාහ **සන්තීරණරසා** අරමුණ තීරණය කිරීම නොහොත් නිශ්චය කිරීම කෘත්‍යය රසය කොට ඇත්තාහ **තථාභාවපච්චුපට්ඨානා** අරමුණ තීරණය කරන නොහොත් නිශ්චය කරන බව වැටහෙන ආකාරයයි **හදයවත්ථුපදට්ඨානාති** ඇසුරු කරන හදයවස්තු රූපය ආසන්න කාරණයයි **දට්ඨබ්බං** දතයුතුයි. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

තත්ථ චක්ඛුතෝ පවත්තං විඤ්ඤාණං, චක්ඛුම්හි සන්නිස්සිතං විඤ්ඤාණන්ති වා චක්ඛුවිඤ්ඤාණං, තථා සෝතවිඤ්ඤාණාදීනි, තත්ථ චක්ඛුසන්නිස්සිත රූපවිජානනලක්ඛණං චක්ඛුවිඤ්ඤාණං, රූපමත්තාරම්මණරසං, රූපාභිමුඛභාවපච්චුපට්ඨානං, රූපාරම්මණාය කිරියාමනෝධාතුයා අපගමපදට්ඨානං. තථා සෝතඝානජිව්හාකායවිඤ්ඤාණානි සෝතාදිසන්නිස්සිතසද්දාදිවිජානනලක්ඛණානි, සද්දාදිමත්තාරම්මණරසානි, සද්දාදීසු අභිමුඛභාවපච්චුපට්ඨානානි, සද්දාදිආරම්මණානං කිරියාමනෝධාතූනං අපගමපදට්ඨානානි. මනෝධාතුසම්පටිච්ඡනං පන චක්ඛුවිඤ්ඤාණාදීනං අනන්තරා රූපාදිවිජානනලක්ඛණං, රූපාදිසම්පටිච්ඡනරසං, තථාභාවපච්චුපට්ඨානං, චක්ඛුවිඤ්ඤාණාදීනං අපගමපදට්ඨානං.

සේසා පන ද්වේ අහේතුකමනෝවිඤ්ඤාණධාතුයෝ ඡළාරම්මණ විජානනලක්ඛණා, සන්තීරණාදිරසා, තථාභාවපච්චුපට්ඨානා, හදයවත්ථුපදට්ඨානාති වේදිතබ්බා. **[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 42 යටතේ)]**

**තත්ථ** එහි **චක්ඛුතෝ** චක්‍ෂුර්ද්වාරයෙහිම **පවත්තං** හටගත්තාවූ **විඤ්ඤාණං** විඤ්ඤාණ තෙමේ **චක්ඛුවිඤ්ඤාණං** චක්ඛුවිඤ්ඤාණ නම් වේ **වා** නොහොත් **චක්ඛුම්හි** චක්‍ෂුස්ප්‍රශාදයෙහි **සන්නිස්සිතං** ඇසුරුකළා වූ (හෙවත් ඇසුරු කොට හටගත්තාවූ) **විඤ්ඤාණං** විඤ්ඤාණ තෙමේ **චක්ඛුවිඤ්ඤාණං** චක්ඛුවිඤ්ඤාණ නම් වේ **සෝතවිඤ්ඤාණාදීනි** ශ්‍රෝත්‍රවිඤ්ඤාණාදීහු ද **තථා** එසේමැයි **තත්ථ** ඔහුන් අතුරෙන් **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඤ්ඤාණ තෙමේ **චක්ඛුසන්නිස්සිතරූපවිජානන ලක්ඛණං** චක්‍ෂුර්ප්‍රශාදය ඇසුරු කොටගෙන රූපාලම්බනය දැනගැනීම ලක්‍ෂණය කොට ඇත්තේය **රූපාමත්තාරම්මණරසං** රූපායතන මාත්‍රයක්ම අරමුණු කිරීම කෘත්‍යය කොට ඇත්තේය **රූපාභිමුඛභාව පච්චුපට්ඨානං** රූපාලම්බනයෙහිම අභිමුඛවීම ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය **රූපාරම්මණාය** රූපය අරමුණු කොට ඇති **ක්‍රියාමනෝධාතුයා** ක්‍රියාමනෝධාතු ආවර්ජන චිත්තයාගේ **අපගමපදට්ඨානං** පහවීම ආසන්න කාරණා කොට ඇත්තේය **තථා** එසේම **සෝතඝානජිව්හාකාය විඤ්ඤාණානි** ශ්‍රෝත්‍රවිඤ්ඤාණ ඝ්‍රාණවිඤ්ඤාණ ජිව්හාවිඤ්ඤාණ කායවිඤ්ඤාණ තුමූ **සෝතාදිසන්නිස්සිතානි** ශ්‍රෝත්‍රප්‍රශාදදිය නිශ්‍රිතව **සද්දාදිවිජානනලක්ඛණානි** ශබ්දරම්බනාදිය දැනගැනීම ලක්‍ෂණ කොට ඇත්තාහුය **සද්දාදිමත්තාරම්මණරසානි** ශබ්දයතනාදි මාත්‍රයක්ම අරමුණු කිරීම කෘත්‍යය කොට ඇත්තාහුය **සද්දාදිඅභිමුඛභාවපච්චුපට්ඨානානි** ශබ්දාලම්බනාදියෙහිම අභිමුඛවීම ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තාහුය **සද්දාදිආරම්මණානං** ශබ්දාදිය අරමුණු කොට ඇත්තාවූ **ක්‍රියාමනෝධාතූනං** ක්‍රියාමනෝධාතු චිත්තයන්ගේ **අපගමපදට්ඨානානි** පහවීම

ආසන්න කාරණා කොට ඇත්තාහුය **මනෝධාතුසම්පටිච්ඡනං පන** මනෝධාතු සම්ප්‍රතෙ‍්‍යෂණ සිත් තෙමේ වනාහි **චක්ඛුවිඤ්ඤාණාදීනං අනන්තරා** චක්‍ෂුර්විඤ්ඤාණාදීන්ගේ නිරුද්ධ වීමට අනතුරුව **රූපාදිවිජානනලක්ඛණං** රූපාලම්බනාදිය දැනගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය **රූපාදිසම්පටිච්ඡනරසං** රූපාලම්බනාදිය පිළිගන්නාක් වැනි වීම කෘත්‍යය කොට ඇත්තේය **තථාභාවපච්චුපට්ඨානං** ඒ පිළිගැනීම් ස්වභාවම ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය **චක්ඛුවිඤ්ඤාණාදීනං** චක්‍ෂුර්විඤ්ඤාණාදීන්ගේ **අපගමපදට්ඨානං** පහවීම ආසන්න කාරණා කොට ඇත්තේය **සේසා පන ද්වේ අහේතුක මනෝවිඤ්ඤාණධාතුයෝ** අවශේෂ වූ අහේතුක මනෝ විඤ්ඤාණ ධාතු චිත්තයෝ දෙදෙන තුමූ **ඡලාරම්මණවිජානනලක්ඛණා** ෂඩාලම්බනය දැනගැනීම ලක්‍ෂණ කොට ඇත්තාහුය **සන්තීරණාදිරසා** සන්තීරණාදි කෘත්‍යය කොට ඇත්තාහුය **තථාභාවපච්චුපට්ඨානා** සන්තීරණාදි ස්වභාවම ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තාහුය **හදයවත්ථුපදට්ඨානාති** හෘදයවස්තුව ආසන්න කාරණා කොට ඇත්තාහු යයි **වේදිතබ්බා** දතයුත්තාහුය.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 131-132 පිටු]**

**චක්ඛුතෝ පවත්ත**න්ති චක්ඛුද්වාරතෝව පවත්තං සබ්බවාක්‍යානං අවධාරණඵලත්තා. තේන මනෝධාතුආදීනං චක්ඛුවිඤ්ඤාණභාවෝ නිවාරිතෝ හෝති තේසං ද්වාරන්තරතෝපි පවත්තිසම්භවතෝ. අථ වා **"චක්ඛුතෝ පවත්ත"**න්ති ඉදං සඤ්ජාතිප්පවත්තිං සන්ධාය වුත්තං, න සඤ්චරණප්පවත්තිං, තස්මා යථා කුණ්ඩමුඛතෝ උදකං සඤ්චරණවසේන පවත්තති, න ඒවං පවත්තමිධ ගහිතං. යථා පන චන්දකන්තපාසාණතෝ උදකං සඤ්ජාතිවසේන පවත්තති, ඒවං පවත්තමේව චක්ඛුතෝ පවත්තන්ති ගහිතං. යථා ච කිං? යථා කුච්ඡිතෝ සමුට්ඨිතං පිත්තසෙම්භරුහිරාදි මුඛතෝ සන්දන්තම්පි "මුඛස්සවෝ"ති න වුච්චති, මුඛතෝයේව පන සමුට්ඨහිත්වා තතෝ සවන්තං ඛේළං "මුඛස්සවෝ"ති වුච්චති, ඒවං හදයවත්ථුසන්නිස්සයතෝ සමුට්ඨහිත්වා චක්ඛුතෝ පවත්තමානං චක්ඛුවිඤ්ඤාණං නාම න හෝති. චක්ඛුතෝයේව පන සමුට්ඨහිත්වා තතෝ පවත්තමානං චක්ඛුවිඤ්ඤාණං නාමාති. යෝ පන ඉමමත්ථං අසල්ලක්ඛෙත්වා බ්‍යඤ්ජනමත්තස්සේව අභිනිවිසිත්වා තං ද්වාරප්පවත්තානං සේසානම්පි චක්ඛුවිඤ්ඤාණභාවං මඤ්ඤෙය්‍ය, තං නිවාරේතුං පකාරන්තරේනපි විග්ගහං දස්සෙන්තෝ ආහ **"චක්ඛුම්හි සන්නිස්සිත"**න්ති. යථා චක්ඛුතෝ පවත්තං, චක්ඛුසන්නිස්සිතං වා විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං, ඒවං සෝතවිඤ්ඤාණාදීසුපි "සෝතතෝ පවත්තං, සෝතස්මිං සන්නිස්සිතං වා විඤ්ඤාණං සොතවිඤ්ඤාණ"න්ති ආදිනා යෝජනං අතිදිසන්තෝ ආහ **"තථා සෝතවිඤ්ඤාණාදීනී"**ති.

චක්ඛුසන්නිස්සිතං හුත්වා රූපස්ස විජානනලක්ඛණමේතස්සාති චක්ඛුසන්නිස්සිතරූපවිජානනලක්ඛණං. තත්ථ චක්ඛුසන්නිස්සිතවචනේන දිබ්බචක්ඛාදිකං අඤ්ඤං රූපාරම්මණං විඤ්ඤාණං නිවත්තේති. විජානනග්ගහණේන චක්ඛුසන්නිස්සිතේ ඵස්සාදිධම්මේ නිවත්තේති. චක්ඛුරූපග්ගහණේන නිස්සයතෝ, ආරම්මණතෝ ච චිත්තං විභාවේති උභයාධීනවුත්තිකත්තා. යදි හි චක්ඛු නාම න සියා, අන්ධාපි රූපං පස්සෙය්‍යුං, න ච පස්සන්ති. යදි ච නීලාදිරූපං නාම න සියා, දේසාදිනියමේන න භවිතබ්බං, අත්ථේව ච නියමෝ. ඒකන්තසාරම්මණතා ච චිත්තස්ස වුත්තාති ආරම්මණේන විනා නීලාදිආභාසං චිත්තං පවත්තතීති ඒවං පවත්තෝ වාදෝ මිච්ඡාවාදෝති ගහේතබ්බෝ. තේනාහ භගවා "චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණ"න්ති ආදි (ම. නි. 1.204, 400; 3.421, 425; සං. නි. 4.60; කථා. 465). ඒත්ථ සියා;

කිං පනේතං චක්ඛු, රූපඤ්ච විඤ්ඤාණස්ස පච්චයෝ හොන්තං ඒකමේව පච්චයෝ හෝති, උදාහු අනේකන්ති? චක්ඛු තාව ඒකම්පි, රූපං පන අනේකමේව සඞ්ගතං. කිං කාරණං? පච්චයභාවවිසේසතෝ. චක්ඛු හි චක්ඛුවිඤ්ඤාණස්ස නිස්සය-පුරේජාත-ඉන්ද්‍රිය-විප්පයුත්තපච්චයේහි පච්චයෝ හොන්තං අත්ථිභාවේනේව හෝති තස්මිං සති තස්ස භාවතෝ, අසති අභාවතෝ. යතෝ තං අත්ථි-අවිගතපච්චයේහිස්ස පච්චයෝති වුත්තං, ස්වායං පච්චයභාවෝ න ඒකස්මිං න සම්භවතීති ඒකම්පි චක්ඛුවිඤ්ඤාණස්ස පච්චයෝ හෝති. රූපං පන යදිපි චක්ඛු විය පුරේජාත-අත්ථි-අවිගතපච්චයේහි පච්චයෝ හෝති පුරේතරං උප්පන්නං හුත්වා විජ්ජමානක්ඛණේයේව උපකාරකත්තා, තථාපි අනේකමේව සඞ්ගතං හුත්වා පච්චයෝ හෝති ආරම්මණභාවතෝ. යඤ්හි තං ආරම්මණං තස්ස යථා තථා උපලබ්භනීයවසේනේව ආරම්මණපච්චයභාවෝ, විඤ්ඤාණස්ස ච ඉන්ද්‍රියාධීනවුත්තිකස්ස ආරම්මණසභාවූපලද්ධි න ඒකද්විකලාපගතවණ්ණවසේන හෝති, නාපි කතිපයකලාපගතවණ්ණවසේන, අථ ඛෝ ආභෝගානුරූපං ආපාථගතවණ්ණවසේනාති අනේකමේව රූපං සංහච්චකාරිතාය විඤ්ඤාණස්ස පච්චයෝ හෝතීති. අමුමේව හි විසේසං විභාවේතුං "චක්ඛුඤ්ච පටිච්ච රූපේ චා"ති (ම. නි. 1.204, 400; 3.421, 425; සං. නි. 4.60; කථා. 465) **පාළියං** වචනභේදෝ කතෝති. ඒවං සෝතවිඤ්ඤාණේපි යථාරහං වත්තබ්බං. ඝානවිඤ්ඤාණාදීනං පන සම්පත්තගාහතාය අත්තනෝ නිස්සයේන සහ අල්ලීනස්සේව ගහණතෝ ඒකකලාපගතම්පි ගන්ධාදිකං තේසං උප්පත්තියා පච්චයෝ හෝති.

**රූපමත්තාරම්මණරස**න්ති රූපායතනමත්තස්සේව ආරම්මණකරණරසං. **මත්ත-**සද්දේන යථා ආරම්මණන්තරං නිවත්තේති, ඒවං රූපායතනේපි ලබ්භමානේ ඒකච්චේ විසේසේ නිවත්තේති. න හි චක්ඛුවිඤ්ඤාණං වණ්ණමත්තතෝ අඤ්ඤං කිඤ්චි නීලාදිවිසේසං තත්ථ ගහේතුං සක්කෝති. තේනාහ භගවා; "පඤ්චහි විඤ්ඤාණේහි න කිඤ්චි ධම්මං පටිවිජානාති අඤ්ඤත්‍ර අභිනිපාතමත්තා"ති. චක්ඛුවිඤ්ඤාණං උප්පජ්ජමානං රූපාරම්මණේ ඒව උප්පජ්ජනතෝ තදභිමුඛභාවේන ගණ්හාතීති වුත්තං **"රූපාභිමුඛභාවපච්චුපට්ඨාන"**න්ති. අත්තනෝ අනන්තරං උප්පජ්ජමානානං අරූපධම්මානං සමනන්තරවිගතා අරූපධම්මා පවත්තිඕකාසදානේන අනන්තර-සමනන්තර-නත්ථි-විගතපච්චයේහි උපකාරකා, නිස්සයාරම්මණා ධම්මා විය ආසන්නකාරණාති දස්සෙන්තෝ ආහ **"රූපාරම්මණාය කිරියාමනෝධාතුයා අපගමපදට්ඨාන"**න්ති. **සෝතවිඤ්ඤාණාදී**සුපි වුත්තනයේනේව අත්ථෝ වේදිතබ්බෝ. කිරියාමනෝධාතුයා ආරම්මණභේදතෝ භින්නසභාවත්තා ආහ **"කිරියාමනෝධාතූන"**න්ති. චක්ඛුවිඤ්ඤාණාදීහි ගහිතං රූපාදිආරම්මණං තදනන්තරමේව අපරිපතන්තං කත්වා සම්පටිච්ඡන්තං ගණ්හන්තං විය හෝතීති වුත්තං **"රූපාදිසම්පටිච්ඡනරස"**න්ති. තථාභාවේන සම්පටිච්ඡනභාවේන පච්චුපට්ඨාතීති **තථාභාවපච්චුපට්ඨානං**.

ඡසු ආරම්මණේසු කදාචි පඤ්චන්නං ඡච්චන්ධාදිවසේන තතෝපි ඌනානං, බ්‍රහ්මලෝකේ ච ද්වින්නමේව විජානනසභාවාපි **ඡළාරම්මණවිජානනලක්ඛණා** වුත්තා තං සභාවානතිවත්තනතෝ, ඡස්වේව වා ඉතරේසං ආරම්මණානං අන්තෝගධත්තා. **සන්තීරණාදිරසාති** යථාසම්භවං සන්තීරණතදාරම්මණාදිකිච්චා, සන්තීරණ-තදාරම්මණ-පටිසන්ධි-භවඞ්ග-චුතිකිච්චාති අධිප්පායෝ. **"හදයවත්ථුපදට්ඨානා"**ති ඉදං ඉමාසං ද්වින්නං මනෝවිඤ්ඤාණධාතූනං අනිබද්ධට්ඨානතාය නිබද්ධකාරණං දස්සේතුං වුත්තං. වුත්තනයේන පන "තං තං අනන්තරාතීතවිඤ්ඤාණාපගමපදට්ඨාන"න්තිපි වත්තුං වට්ටතියේව.

අහේතුකචිත්තානං විසුං විසුං ලක්ඛණාදිකස්ස දස්සිතත්තා පරිසේසතෝ සහේතුකචිත්තානං ඒකසදිසමේව ලක්ඛණාදිකන්ති විඤ්ඤායති. තං පන හෙට්ඨා විභාවිතමේව. **[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 42 යටතේ)]**

“චක්ඛුතෝ පවත්තං” යන මෙහි සියළු වාක්‍යයන්ගේම අවධාරණ ඵලය බැවින් චක්ෂුර්ද්වාරයෙන්ම හටගත්තා වූ යන අර්ථය ලැබේ. ඒ කරණකොටගෙණ මනෝධාතු ආදීන්ගේ චක්ෂුර්විඤ්ඤාණ භාවය වළක්වන ලද්දේ වෙයි. කුමක් හෙයින යත්? ද්වාරානන්තරයකිනිදු ඒ මනෝධාතු ආදීන්ගේ හටගැන්ම ලැබෙන හෙයිනි. නොහොත් “චක්ඛුතෝ පවත්තං” යන මේ වාක්‍යය සඤ්ජාති දේශප්‍රවෘත්තිය සඳහා කියනලදි. සඤ්චාරන ප්‍රවෘත්තිය සඳහා නොකියනලදි. එහෙයින් යම් සේ සැලිමුඛයෙන් ජලය හැසිරීම් වශයෙන් පවතී ද එපරිද්දෙන් පැවැත්ම මෙහි නොගන්නාලදි. යම්සේ වනාහි චන්‍ද්‍රකාන්ත පාෂාණයෙන් ජලය සඤ්ජාතිදේශ වශයෙන් පවතී ද එපරිද්දෙන් පවත්නා වූම මේ විඤ්ඤාණය සඳහා “චක්ඛුතෝ පවත්තං” යි වාක්‍යය ගන්නා ලද්දේය. තවද කුසෙන් නගිනලද පිත්ත ශ්ලේෂ්ම රුධිරාදීය මුඛයෙන් වැගිරෙන්නේ නමුදු මුඛශ්‍රවයයි නොකියනු ලැබේ ද මුඛයෙන්ම ඉපිද එයින් වැගිරෙන්නා වූ බේළය මුඛාශ්‍රවය යයි කියනු ලැබේ ද එපරිද්දෙන්ම හෘදයවස්තුව සන්නිශ්‍රයෙන් ඉපිද චක්ෂුර්ද්වාරයෙන් හටගන්නා වූ විඤ්ඤාණය චක්ෂුර්විඤ්ඤාණ නම් නොවෙයි. චක්ෂුර්ද්වාරයෙන්ම ඉපිද එයින් හටගන්නාවූ විඤ්ඤාණය චක්ෂුර්විඤ්ඤාණ නමැයි දතයුතුයි. යමෙක් තෙමේ මේ අර්ථය නොසලකා ව්‍යඤ්ජනාර්ථ මාත්‍රයෙක්හිම ඇතුළත්ව හෙවත් ව්‍යඤ්ජනාර්ථ මාත්‍රයක්ම ගෙන ඒ ද්වාරයෙහි පවත්නා වූ සෙසු විඤ්ඤාණයන්ගේ ද චක්ෂුර්විඤ්ඤාණ භාවය හඟින්නේ ද ඒ වළකණු පිණිස ප්‍රකාරාන්තරයෙනුදු විග්‍රහය දක්වන්නාවූ ආචාර්‍ය්‍ය තෙමේ “චක්ඛුම්හි සන්නිස්සිතං” යි කීයේය. එහි යම්සේ “චක්ඛුතෝ පවත්තං චක්ඛුසන්නිස්සිත වා විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං” යි දැක්වූයේ ද එපරිද්දෙන් සෝතවිඤ්ඤාණාදියෙහි ද “සෝතතෝ පවත්තං සෝතසන්නිස්සිතං වා විඤ්ඤාණං සෝතවිඤ්ඤාණං” යි මේ ආදී ක්‍රමයෙන් වාක්‍ය යෝජනාව අතිදිසනය කරන්නා වූ ආචාර්‍ය්‍ය තෙමේ “තථා සෝතවිඤ්ඤාණාදීනි” යි කීයේයි. “චක්ඛුසන්නිස්සිතං හුත්වා රූපස්ස විජානනලක්ඛණමේතස්සාති චක්ඛුසන්නිස්සිත රූපවිජානනලක්ඛණං” යනු විග්‍රහ හෙයින් චක්ෂුස්ප්‍රසාදය ඇසුරු කොට රූපය දැනගැනීම ලක්‍ෂණ කොට ඇත්තේ මෝහටනුයි යන අර්ථයෙහි “චක්ඛුසන්නිස්සිත රූපවිජානනලක්ඛණ” නම් වේ. එහි “චක්ඛුසන්නිස්සිත” යන වචනයෙන් රූපය අරමුණු කොට ඇත්තාවූ අනික් දිබ්බචක්ඛු ආදී වූ විඤ්ඤාණය වළක්වයි. විජානන ග්‍රහණයෙන් චක්ෂුර්විඤ්ඤාණය ඇසුරු කොට ඇත්තාවූ ස්පර්ශාදී ධර්මයන් වළක්වයි. චක්ඛු-රූප ග්‍රහණයෙන් නිශ්‍රය වශයෙන් හා අරමුණු වශයෙන් ද චිත්තය ප්‍රකාශ කෙරෙයි. කුමක් හෙයින යත්? චක්ඛු-රූප දෙකට අයත් වූ පැවතුම් ඇති බැවිනි.

ඒ එසේමැයි; ඉඳින් චක්ෂුස්ප්‍රශාද රූපය නුවූයේනම් හෙවත් නොවියයුතු නම් අන්ධයෝත් රූප දක්නාහුය. නුමුත් චක්ෂුස්ප්‍රශාදය නැති බැවින් අන්ධයෝ රූප නොදක්නාහු වෙති. ඉඳින් නීල පීතාදී රූප නුවූවාහු නම් දිශා දේශාදී නියමයෙන් යුක්ත නොවිය යුත්තේය. ඒ දිශා දේශාදී නියමය ද ඇත්තේමැයි. ඒකාන්තයෙන් අරමුණු සහිතව හටගැනීම සිතට කියන ලද්දේය. එහෙයින් අරමුණෙන් තොරව නීලාදී ආලෝක සහිතව සිත උපදනේ යයි මෙසේ පැවති වාදය මිත්‍ථ්‍යාවාදයෙකැයි දතයුතු. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ “චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං” යනාදීන් චක්ෂුස්ප්‍රශාදය හා රූපාලම්බනයන් ද නිසා චක්ෂුර්විඤ්ඤාණය උපදනේය යනාදිය වදළේයි. මෙහි මෙබඳු චෝද්‍යයක් වේ. කිමෙක්

ද? ඒ චක්‍ෂුස්ප්‍රශාදය හා රූපයත් විඤ්ඤාණයට උපකාර වන්නාහු එකම ප්‍රත්‍යයක් වන්නේ ද? නොහොත් නොයෙක් ප්‍රත්‍යයන් වන්නේ ද යත්? චක්‍ෂුස්ප්‍රශාදය වනාහි හුදකලාව නොයෙක් රූපයන් එක්ව චක්‍ෂුර්විඤ්ඤාණයට උපකාර වන්නේයි. ඊට කාරණා කිමයත්? ප්‍රත්‍යය භාවයාගේ විශේෂ වශයෙනි. ඒ එසේමැයි. චක්‍ෂුස්ප්‍රශාදය චක්‍ෂුර්විඤ්ඤාණයට නිශ්‍රය ප්‍රත්‍යය, පුරේජාත ප්‍රත්‍යය, ඉන්ද්‍රිය ප්‍රත්‍යය, විප්‍රයුක්ත ප්‍රත්‍යය යන සතරාකාරයෙකින් ප්‍රත්‍යය වන්නාහු අස්තිභාවයෙන්ම උපකාර වේ. කුමක් හෙයින යත්? චක්‍ෂුස්ප්‍රශාදය ඇති කල්හිම චක්‍ෂුර්විඤ්ඤාණය වන හෙයින් ද චක්‍ෂුස්ප්‍රශාදය නැති කල්හි චක්‍ෂුර්විඤ්ඤාණය නොඋපද හෙයින් දැයි දතයුතු. යම්හෙයකින් ඒ චක්‍ෂුස්ප්‍රශාදය ඒ චක්‍ෂුර්විඤ්ඤාණයට අස්ති ප්‍රත්‍යය අවිගත ප්‍රත්‍යය වශයෙනුත් උපකාර වන්නේ යයි කියනු ලැබේ ද ඒ ප්‍රත්‍යය භාවය එකම ප්‍රශාදයෙක්හි නොලැබෙන්නේ නොවෙයි. හෙවත් ලැබෙන්මැයි. එසේ හෙයින් එක් වස්තුවකුදු චක්‍ෂුර්විඤ්ඤාණයට ප්‍රත්‍යය වන්නේයි. රූපය වනාහි ඉඳින් චක්‍ෂුස්ප්‍රශාදය මෙන් පුරේජාත ප්‍රත්‍යය, අස්ති ප්‍රත්‍යය, අවිගත ප්‍රත්‍යය යන ප්‍රත්‍යය තුනෙන් උපකාර වේද එසේද වුවත් නොයෙක් රූපාලම්බනයන් එකතුව ආලම්බන භාවයෙන් උපකාර වන්නේයි. ඒ ආලම්බනය වනාහි ඒ චක්‍ෂුර්විඤ්ඤාණයට යම්කිසි ආකාරයෙකින් ලැබියයුතු වශයෙන්ම ආලම්බන ප්‍රත්‍යය භාවය වෙයි. ඉන්ද්‍රියයන් අයත් කොට පවත්නා වූ විඤ්ඤාණයාගේ ආලම්බන ස්වභාව ලැබීම එකම රූපකලාපයක්හි ඇතුළත් වර්ණ වශයෙන් හෙවත් රූප වශයෙන් නොවේ. රූපකලාප කිහිපයකට ඇතුළත් වර්ණ වශයෙනුත් නොවේ. වැලිත් මෙනෙහි කිරීමට සුදුසු පරිදි හමුබවට පැමිණි රූපයන්ගේ වශයෙන් වේ. එහෙයින් නොයෙක් රූපයම එකතුවීමෙන් විඤ්ඤාණයට උපකාර වේනුයි මේ වෙනසම පහළ කරනු පිණිස "චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච" යන වාග් භේදය කරනලදි. ශ්‍රෝත්‍රවිඤ්ඤාණයෙහි ද මේ ක්‍රමය සුදුසු පරිදි කියයුත්තේයි. ඝ්‍රාණවිඤ්ඤාණාදීන්ගේ වනාහි සම්ප්‍රාප්ත විෂයග්‍රාහක බැවින් තමාගේ නිශ්‍රය වූ රූපකලාපය හා සමඟ ඇළුනාවූ ගන්ධ, රස, ස්පර්ශයම ගන්නා බැවින් එක එක රූප කලාපයෙක්හි ඇතුළත් වූ ගන්ධ, රස, ස්පර්ශය ද ඒ ඝ්‍රාණවිඤ්ඤාණ ජිව්හාවිඤ්ඤාණ කායවිඤ්ඤාණයන්ගේ ඉපදීමට උපකාර වන්නේ යයි දතයුතුයි.

"රූපමත්තාරම්මණරසං" යන මෙහි රූපායතන මාත්‍රයක්ම අරමුණු කිරීම කෘත්‍යය කොට ඇත්තේය යන අර්ථයි. මෙහි මත්ත ශබ්දයෙන් අන්‍යය අරමුණක් වලකාද එපරිද්දෙන් රූපායතනයෙහි නමුදු ලැබියයුතු ඇතැම් විශේෂයක් වලකයි. ඒ එසේමැයි; චක්‍ෂුර්විඤ්ඤාණ තෙමේ එහි වර්ණ මාත්‍රය හැර අන්කිසි විශේෂයක් ගන්නට නොහැකි වෙයි. එහෙයින් වදළහ භාග්‍යවතුන් වහන්සේ විසින් "පඤ්චහි විඤ්ඤාණේහි න කිඤ්චි ධම්මං පටිවිජානාති, අඤ්ඤත්‍ර අභිනිපාතමත්තා" යි.

චක්‍ෂුර්විඤ්ඤාණ තෙමේ උපදිනු ලබමින් රූප අරමුණෙහිම උපදින හෙයින් ඊට අභිමුඛ භාවයෙන් ගනු ලැබෙයි. එහෙයින් "රූපාභිමුඛභාවපච්චුපට්ඨානං" යි කියනලදි. සමනන්තරභාවයෙන් පහවූ අරූප ධර්මයෝ තම හට අනතුරුව උපදනා අරූප ධර්මයන්ගේ හටගැනීමට අවකාශ දීමෙන් අනන්තර, සමනන්තර, නත්ථි, විගත ප්‍රත්‍යයන්ගෙන් උපකාර වූ නිශ්‍රයාරම්මණ ධර්මයෝ මෙන් ආසන්න කාරණා වේ යයි දක්වන්නා වූ ආචාර්‍ය්‍යයන් වහන්සේ "රූපාරම්මණාය කිරියාමනෝධාතුයා අපගම පදට්ඨානං" යි කීයේයි. ශ්‍රෝත්‍රවිඤ්ඤාණාදියෙහිදු කියනලද ක්‍රමයෙන්ම අර්ථ දතයුත්තේයි. අරමුණු භේදයෙන් ක්‍රියා මනෝධාතුහුගේ වෙනස් වූ ස්වභාව ඇති හෙයින් "ක්‍රියා මනෝධාතූනං" යි කීයේයි. චක්‍ෂුර්විඤ්ඤාණාදීන් විසින් ගන්නාලද රූපාදී අරමුණ ඒ චක්‍ෂුර්විඤ්ඤාණාදියට අනතුරුවම නොවැටෙන්නවුන් කොට පිළිගන්නාක් මෙන් වෙයි. එහෙයින් "රූපාදිසම්පටිච්ඡනරසං" යි කියනලදි. ඒ

ස්වභාවයෙන් හෙවත් පිළිගන්නා ස්වභාවයෙන් වැටහේනුයි "තථාභාවපච්චුපට්ඨානං" නම් වේ.

සාරමුණු අතුරෙන් ඇතැම් කලෙක්හි පඤ්චාරම්මණයන්ගේ ද ජාත්‍යන්ධාදීන්ගේ වශයෙන් එයිනුදු අඩු වූ අරමුණන්ගේ ද බ්‍රහ්මලෝකයෙහි අරමුණු දෙකක්හුගේ ද දැනගන්නා ස්වභාව ඇත්තාවූ නමුදු ඒ ස්වභාව නොයික්මුනු හෙයිනුත් අනික් අරමුණු සාරමුණෙහිම ඇතුළ් වන හෙයිනුත් "ඡළාරම්මණවිජානනලක්ඛණා" යි කියනලදි. "සන්තීරණාදීරසා" යනු ලැබෙන ලැබෙන පරිද්දෙන් සන්තීරණ කෘත්‍යය හෝ තදලම්බන කෘත්‍යය හෝ ඇත්තාහුය යන අර්ථයි. නොහොත් සන්තීරණ තදරම්මණ ප්‍රතිසන්ධි භවඞ්ග චුති කෘත්‍යය හෝ ඇත්තාහු වෙති යනු අභිප්‍රායයි. "හදයවත්ථුපදට්ඨානා" යන මෙය මේ මනෝවිඤ්ඤාණ ධාතූන් දෙදෙනාගේ අනිබන්ධ කාරණය ඇති බැවින් නිබන්ධ කාරණය දක්වනු පිණිස කියනලදි. හෙවත් ඒකාන්තයෙන්ම හෘදයවස්තුව ඇසුරුකරණ බැවින් කියන ලදැයි දතයුතුයි. යට කියනලද ක්‍රමයෙන් ඒ ඒ චිත්තයට අනතුරුව ඉක්මගිය විඤ්ඤාණයන්ගේ පහවීම ආසන්න කාරණා කොට ඇත්තේයයි ද කියන්නට වටනේමය.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 134-137 පිටු]**

## අහේතුක විපාක සිත් උපදින ආකාරයः—

කුසලවිපාකානි තාව චක්ඛුවිඤ්ඤාණාදීනි පඤ්ච කුසලවිපාකේන අකුසලවිපාකේන වා නිබ්බත්තස්ස යථාක්කමං පරිපාකං උපගතින්ද්‍රියස්ස චක්ඛාදීනං ආපාථගතං ඉට්ඨං ඉට්ඨමජ්ඣත්තං වා රූපාදි ආරම්මණං ආරබ්භ චක්ඛාදිපසාදං නිස්සාය දස්සනසවනඝායනසායනඵුසනකිච්චං සාධයමානානි පවත්තන්ති. තථා අකුසලවිපාකානි පඤ්ච. කේවලඤ්හි තේසං අනිට්ඨං අනිට්ඨමජ්ඣත්තං වා ආරම්මණං හෝති.

අයමේව විසේසෝ; දසපි චේතානි නියතද්වාරාරම්මණවත්ථුට්ඨානානි නියතකිච්චානේව ච භවන්ති. තතෝ කුසලවිපාකානං චක්ඛුවිඤ්ඤාණාදීනං අනන්තරා කුසලවිපාකා මනෝධාතු තේසංයේව ආරම්මණං ආරබ්භ හදයවත්ථුං නිස්සාය සම්පටිච්ඡනකිච්චං සාධයමානා පවත්තති. තථා අකුසලවිපාකානං අනන්තරා අකුසලවිපාකා. ඉදඤ්ච පන ද්වයං අනියතද්වාරාරම්මණං නියතවත්ථුට්ඨානං නියතකිච්චඤ්ච හෝති.

සෝමනස්සසහගතා පන අහේතුකමනෝවිඤ්ඤාණධාතු කුසලවිපාක මනෝධාතුයා අනන්තරා තස්සා ඒව ආරම්මණං ආරබ්භ හදයවත්ථුං නිස්සාය සන්තීරණකිච්චං සාධයමානා ඡසු ද්වාරේසු බලවාරම්මණේ කාමාවචරසත්තානං යේභුයෙය්‍යන ලෝභසම්පයුත්තජවනාවසානේ භවඞ්ගවීථිං පච්ඡින්දිත්වා ජවනේන ගහිතාරම්මණේ තදරම්මණවසේන ච සකිං වා ද්වික්ඛත්තුං වා පවත්තතීති මජ්ඣිමට්ඨකථායං වුත්තං. අභිධම්මට්ඨකථායං පන තදරම්මණේ ද්වේ චිත්තවාරා ආගතා.

**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 621 සඞ්ඛාරපච්චයා විඤ්ඤාණ කථා යටතේ); විසුද්ධිමග්ග අටුවා 409-410 පිටු (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය පඤ්ඤභූමි නිර්දේශය 392-393 පිටු (තායිවාන් මුද්‍රණය); විභඞ්ග අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 227 යටතේ); විභඞ්ග අටුවා 106-107 පිටු (හේ.වි.මු);]**

**තාව** පළමු කොටැ **කුසලවිපාකානි** කුශලවිපාක වූ **චක්ඛුවිඤ්ඤාණාදීනි** චක්‍ෂුර්විඤ්ඤාණාදී වූ **පඤ්ච** පස්දෙන **කුසලවිපාකේන වා** කුශලවිපාකයෙකින් හෝ

**අකුසලවිපාකේන වා** අකුශල විපාකයෙකින් හෝ **නිබ්බත්තස්ස** පිළිසිඳ ගත්තා වූ **යථාක්කමං** පිළිවෙළින් **පරිපාකං** මිහිකිරීමට **උපගතින්‍ද්‍රියස්ස** පැමිණි ඉඳුරන් ඇති සත්වයාගේ **චක්ඛාදීනං** චක්‍ෂුරාදීන්ට **ආපාතගතං** හමුවූ **ඉට්ඨං වා** ඉෂ්ටාලම්බන වූ හෝ **ඉට්ඨමජ්ඣත්තං වා** ඉෂ්ට මධ්‍යස්ථාලම්බන වූ හෝ **රූපාදී ආරම්මණං** රූපාදී වූ ආලම්බනයක් **ආරබ්භ** අරමුණු කොටැ **චක්ඛාදිපසාදං** චක්‍ෂුරාදී ප්‍රසාදරූපයක් **නිස්සාය** ඇසුරුකොටැ ගෙනැ **දස්සනසවනඝායනසායනඵුසනකිච්චං** දර්ශන කෘත්‍යයැ ශ්‍රවණ කෘත්‍යයැ ආඝ්‍රාන කෘත්‍යයැ ආශ්වාදන කෘත්‍යයැ ස්පර්ශන කෘත්‍යය **සාධයමානානි** සිදුකරන්නෝවැ **පවත්තන්ති** පවතිත් **අකුසලවිපාකානි** අකුශල විපාක වූ **පඤ්ච** චක්‍ෂුර්විඥානාදී වූ පස්දෙන **තථා** එපරිද්දෙන් (**පවත්තන්ති** පවතිත්) හෙවත් කුශල විපාක චක්‍ෂුර්විඥානාදීන් මෙනි **හි** විශේෂය කියම් **කේවලං** හුදෙක් **තේසං** ඒ අකුශල විපාක පඤ්චවිඥානයන්ගේ **අනිට්ඨං** අනිෂ්ටාලම්බන වූ හෝ **අනිට්ඨමජ්ඣත්තං වා** අනිෂ්ටමධ්‍යස්ථාලම්බන වූ හෝ **රූපාදී ආලම්බනං** රූපාලම්බනාදී වූ ආලම්බනයෙක් **හෝති** වේ **අයමේව** මෙපමණෙක්මැ **විසේසෝ** වෙනසි.

**ච** ගලපා කියම් **දසපි** දසවිධ වූද **ඒතානි** මේ පඤ්චවිඥානයෝ තුමූ **නියතද්වාරාරම්මණවත්ථුට්ඨානානි ඒව ච** නියත වූ ද්වාර ආරම්මණ වස්තු ස්ථානයන් ඇත්තාහුමද **නියතකිච්චානේව ච** නියත කෘත්‍යය ඇත්තාහුමද **භවන්ති** වෙත් **තතෝ** තදනන්තරවැ හෙවත් ද්විපඤ්චවිඥානයන්ගේ නිරෝධයට ඉක්බිතිවැ (තතෝ යනු තත්ථ යිද දක්නා ලැබේ. එවිහුගේ වශයෙන් "තත්‍රාති තේසු දසසු විඤ්ඤාණේසු නිද්ධාරණං" යි පාල්‍යර්ථ යෝජනාවෙහි යු හෙයින්) **තත්‍ර** ඒ දශවිධ විඥානයන් අතරින් **කුසලවිපාකානං** කුශල විපාක වූ **චක්ඛුවිඤ්ඤාණාදීනි** චක්‍ෂුර්විඥානාදීන්ට **අනන්තරං** අනතුරුවැ **කුසලවිපාකමනෝධාතු** කුශලවිපාක මනෝධාතු තොමෝ හෙවත් කුශලවිපාක සම්ප්‍රතීච්ඡණයැ **තේසඤ්ඤේව** ඒ කුශලවිපාක වූ පඤ්චවිඥානයන්ගේමැ **ආරම්මණං** ආලම්බනය **ආරබ්භ** අරමුණු කොටැ **හදයවත්ථුං** හෘදයවස්තු රූපය **නිස්සාය** ඇසුරුකොටැ **සම්පටිච්ඡනකිච්චං** සම්ප්‍රතීච්ඡණ කෘත්‍යය හෙවත් අරමුණු පිළිගැනීම් කිස **සාධයමානා** සිදුකරන්නෝවැ **පවත්තති** පවති **අකුසලවිපාකානං** අකුශලවිපාක වූ පඤ්චවිඥානයන්ගේ **අනන්තරං** අනතුරු වූ **අකුසලවිපාකා** අකුශලවිපාක වූ මනෝධාතු තොමෝ හෙවත් අකුශලවිපාක සම්ප්‍රතීච්ඡණයැ **තථා** කුශලවිපාක සම්ප්‍රතීච්ඡණය මෙනි **ඉදඤ්ච පන ද්වයං** මේ මනෝධාතු ද්වයැ වනාහි හෙවත් මේ සම්ප්‍රතීච්ඡණ චිත්ත ද්වයැ වනාහි **අනියතද්වාරාරම්මණං** අනියත වූ ද්වාර ආලම්බන ඇත්තේ ද **නියතවත්ථුට්ඨානං** නියත වූ වස්තු ස්ථාන ඇත්තේ ද **නියතකිච්චඤ්ච** නියත වූ කෘත්‍යය ඇත්තේ ද **හෝති** වේ **පන** පක්‍ෂාන්තරයෙක් ඇත **සෝමනස්සසහගතා** සොම්නස් සහ ගියාවූ **අහේතුකමනෝවිඤ්ඤාණධාතු** අහේතුක මනෝවිඥාණ ධාතු තොමෝ හෙවත් සෞමනස්‍ය සන්තීරණ තෙම **කුසලවිපාකමනෝධාතුයා** කුශලවිපාක මනෝධාතු නම් ලද කුශලවිපාක සම්ප්‍රතීච්ඡණ චිත්තයාගේ **අනන්තරං** නිරෝධයට ඉක්බිති **තස්සා ඒව** ඒ කුශලවිපාක මනෝධාතුවගේමැ **ආරම්මණං** අරමුණ **ආරබ්භ** අරමුණු කොටැ **හදයවත්ථුං** හෘදයවස්තුව **නිස්සාය** ඇසුරු කොටැ **සන්තීරණකිච්චං** සන්තීරණ කෘත්‍යය **සාධයමානා ච** සිදුකරන්නෝවැ **ඡසු ද්වාරේසු** ෂට් ද්වාරයන්හි **බලවාරම්මණේ** බලවත් වූ ආරම්මණයෙහි **කාමාවචරසත්තානං** කාමාවචර සත්වයන්ට **යේභුය්‍යේන** බෙහෙවින් **ලෝභසම්පයුත්තජවනාවසානේ** ලෝභසම්ප්‍රයුක්ත ජවනයන්ගේ අන්තයෙහි **භවඞ්ගවීථිං** භවාඞ්ගවීථිය **පච්ඡිනිත්වා** පසිඳ **ජවනේන** ජවනයා විසින් **ගහිතාරම්මණේ** ගත් අරමුණෙහි **තදරම්මණවසේන**

**ච** තදලම්බන කෘත්‍යය වශයෙන් ද **සකිං වා** වරක් හෝ **ද්වික්ඛත්තුං වා** දෙවරක් හෝ **පවත්තතීති** පවති යනුවෙන් **මජ්ඣිමනිකායට්ඨකථායං** මැදුම්සඟි අර්ථකථාවෙහි **වුත්තං** කියනලදි **පන** අන්‍ය අර්ථයක් කියම් **අභිධම්මට්ඨකථායං** අභිධර්ම අර්ථකථාවෙහි **ද්වේ චිත්තවාරා** චිත්තවාර දෙකක් **ආගතා** එනලදි෴

**[විභඞ්ගප්පකරණ අටුවා සන්නය 02/654-663 පිටු]**

ඉමේසං පන පඤ්චන්නං චිත්තානං වත්ථුද්වාරාරම්මණානි නිබද්ධානේව හොන්ති, වත්ථාදිසඞ්කමනං නාමෙත්ථ නත්ථි. කුසලවිපාකචක්ඛුවිඤ්ඤාණඤ්හි චක්ඛුපසාදං වත්ථුං කත්වා ඉට්ඨේ ච ඉට්ඨමජ්ඣත්තේ ච චතුසමුට්ඨානික රූපාරම්මණේ දස්සනකිච්චං සාධයමානං චක්ඛුද්වාරේ ඨත්වා විපච්චති. සෝතවිඤ්ඤාණාදීනි සෝතපසාදාදීනි වත්ථුං කත්වා ඉට්ඨඉට්ඨමජ්ඣත්තේසු සද්දාදීසු සවනඝායනසායනඵුසනකිච්චානි සාධයමානානි සෝතද්වාරාදීසු ඨත්වා විපච්චන්ති. සද්දෝ පනෙත්ථ ද්විසමුට්ඨානිකෝයේව හෝති.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 439 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 234 පිට (හේ.වි.මු)]**

**පන** විස්තර කෙරෙම් **ඉමේසං පඤ්චන්නං චිත්තානං** මේ පස් වැදෑරුම් චිත්තයන්ගේ **නිබද්ධානේව** නිතර පවත්නාවූම **වත්ථුද්වාරාරම්මණානි** වස්තු ද්වාර ආරම්මණයෝ **හොන්ති** වෙත් **එත්ථ** මෙහි **වත්ථාදිසඞ්කමනං නාම නත්ථි** වස්තු ආදිය සඞ්ක්‍රමණයක් නම් නැත **කුසලවිපාකචක්ඛුවිඤ්ඤාණඤ්හි** කුසලවිපාක චක්ෂුර්විඤ්ඤාණය වනාහි **චක්ඛුපසාදං** චක්ෂුස්ප්‍රශාදය **වත්ථුං කත්වා** වස්තුව කොට **ඉට්ඨේ ච** ඉටු අරමුණෙහි ද **ඉට්ඨමජ්ඣත්තේ ච** ඉෂ්ට මධ්‍යස්ථාරම්මණයෙහි ද **චතුසමුට්ඨානිකරූපාරම්මණේ** චතුසමුට්ඨානික රූපාරම්මණයෙහි **දස්සනකිච්චං** දර්ශන කෘත්‍යය **සාධයමානං** සිද්ධ කරමින් **චක්ඛුද්වාරේ ඨත්වා** චක්ෂුස්ද්වාරයෙහි සිට **විපච්චති** විපාකයට පැමිණෙයි **සෝතවිඤ්ඤාණාදීනි** ශ්‍රෝත්‍රවිඤ්ඤාණාදිය **සෝතපසාදාදීනි** ශ්‍රෝත්‍රප්‍රශාදාදිය **වත්ථුං කත්වා** වස්තු කොට **ඉට්ඨඉට්ඨමජ්ඣත්තේසු** ඉෂ්ට ඉෂ්ට මධ්‍යස්ථාරම්මණයන්හි **සද්දාදීසු** ශබ්දාදී ආරම්මණයන්හි **සවනඝායනසායනඵුසනකිච්චානි** ශ්‍රවණ ආඝ්‍රාණ ආස්වාදන ස්පර්ශන යන කෘත්‍යයයෝ **සාධයමානානි** සිද්ධ කරමින් **සෝතද්වාරාදීසු** ශ්‍රෝත්‍රද්වාරාදියෙහි **ඨත්වා** සිට **විපච්චන්ති** විපාකයට පැමිණෙත් **එත්ථ පන** මෙහි වනාහි **සද්දෝ** ශබ්දය තෙමේ **ද්වීසමුට්ඨානිකෝයේව** චිත්ත උතු යන දෙකෙන් හටන්නේම **හෝති** වෙයි෴

**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

ඉමස්ස චිත්තස්ස වත්ථු නිබද්ධං හදයවත්ථුමේව හෝති. ද්වාරාරම්මණානි අනිබද්ධානි. තත්ථ කිඤ්චාපි ද්වාරාරම්මණානි සඞ්කමන්ති, ඨානං පන ඒකං සම්පටිච්ඡනකිච්චමේව හේතං හෝති. ඉදඤ්හි පඤ්චද්වාරේ පඤ්චසු ආරම්මණේසු සම්පටිච්ඡනං හුත්වා විපච්චති. කුසලවිපාකේසු චක්ඛුවිඤ්ඤාණාදීසු නිරුද්ධේසු තං සමනන්තරා තානේව ඨානප්පත්තානි රූපාරම්මණාදීනි සම්පටිච්ඡති.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 455 අහේතුක කුසලවිපාක යටතේ); ධම්මසඞ්ගණී අටුවා 234 පිටු (හේ.වි.මු)]**

**ඉමස්ස චිත්තස්ස** මේ සම්ප්‍රතෝෂණ චිත්තයාගේ **නිබද්ධං වත්ථුං** නිතර පවත්නාවූ වස්තුව **හදයවත්ථුමේව** හෘදයවස්තුවම **හෝති** වෙයි **ද්වාරාරම්මණානි** ද්වාර ආරම්මණයෝ **අනිබද්ධානි (හොන්ති)** නිතර නොපවත්නාහු වෙත් **තත්ථ** එහි **කිඤ්චාපි කිසිසේත්** **ද්වාරාරම්මණානි** ද්වාර ආරම්මණයෝ **සඞ්කමන්ති** සඞ්ක්‍රමණය වෙත් **ඨානං පන** ස්ථානය වනාහි **ඒකං (හෝති)** එක් ස්ථානයක්ම වෙයි **හි (සච්චං)** ඒ

කීම සැබෑවකි **ඒතං** ඒ ස්ථානය **සම්පටිච්ඡණකිච්චමේව** සම්ප්‍රතේෂ්ණ කෘත්‍ය ස්ථානයම (**හෝති** වෙයි) **ඉදඤ්හි** මේ චිත්තය වනාහි **පඤ්චද්වාරේ** පඤ්චද්වාරයෙහි **පඤ්චසු ආරම්මණේසු** රූපාදී පඤ්චාරම්මණයන්හි **සම්පටිච්ඡනං හුත්වා** සම්ප්‍රෙත්‍යෂණ කෘත්‍යය වී **විපච්චති** විපාකයට පැමිණෙයි **කුසලවිපාකේසු** කුසලවිපාක **චක්ඛුවිඤ්ඤාණාදීසු** චක්‍ෂුර්විඤ්ඤාණාදිය **නිරුද්ධේසු** නිරුද්ධ වූ කල්හි **තං (චිත්තං)** ඒ චිත්තය තෙමේ **සමනන්තරා** ඊට අනතුරුව **තානි ඨානප්පත්තානි රූපාරම්මණාදීනි ඒව** ඒ ස්ථානයට පැමිණි රූපාදී ආරම්මණයෝම **සම්පටිච්ඡති** පිළිගනී. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

මනෝවිඤ්ඤාණධාතුසු පඨමා ද්වීසු ඨානේසු විපච්චති. සා හි පඤ්චද්වාරේ කුසලවිපාකචක්ඛුවිඤ්ඤාණාදිඅනන්තරං, විපාකමනෝධාතුයා තං ආරම්මණං සම්පටිච්ඡිත්වා නිරුද්ධාය, තස්මිං යේවාරම්මණේ සන්තීරණකිච්චං සාධයමානා පඤ්චසු ද්වාරේසු ඨත්වා විපච්චති. ඡසු ද්වාරේසු පන බලවාරම්මණේ තදාරම්මණා හුත්වා විපච්චති. කථං? යථා හි චණ්ඩසෝතේ, තිරියං නාවාය ගච්ඡන්තියා, උදකං ඡිජ්ජිත්වා ථෝකං ඨානං නාවං අනුබන්ධිත්වා යථාසෝතමේව ගච්ඡති, ඒවමේව ඡසු ද්වාරේසු බලවාරම්මණේ පලෝභයමානේ ආපාථගතේ ජවනං ජවති. තස්මිං ජවිතේ භවඞ්ගස්ස වාරෝ. ඉදං පන චිත්තං භවඞ්ගස්ස වාරං අදත්වා ජවනේන ගහිතාරම්මණං ගහෙත්වා ඒකං ද්වේ චිත්තවාරේ පවත්තිත්වා භවඞ්ගමේව ඔතරති. ගවක්ඛන්ධේ නදිං තරන්තේපි ඒවමේව උපමා විත්ථාරේතබ්බා. ඒවමේසා යං ජවනේන ගහිතාරම්මණං තස්සේව ගහිතත්තා තදාරම්මණං නාම හුත්වා විපච්චති.

දුතියා පන පඤ්චසු ඨානේසු විපච්චති. කථං? මනුස්සලෝකේ තාව ජච්චන්ධ ජච්චබධිරජච්චජළජච්චුම්මත්තකඋභතෝබ්‍යඤ්ජනකනපුංසකානං පටිසන්ධිග්ගහණ කාලේ පටිසන්ධි හුත්වා විපච්චති. පටිසන්ධියා වීතිවත්තාය යාවතායුකං භවඞ්ගං හුත්වා විපච්චති. ඉට්ඨමජ්ඣත්තේ පඤ්චාරම්මණවීථියා සන්තීරණං හුත්වා, බලවාරම්මණේ ඡසු ද්වාරේසු තදාරම්මණං හුත්වා, මරණකාලේ චුති හුත්වාති ඉමේසු පඤ්චසු ඨානේසු විපච්චතීති.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 469 අහේතුකකුසලවිපාක යටතේ); ධම්මසඞ්ගණී අටුවා 235 පිටු (හේ.වි.මු)]**

**මනෝවිඤ්ඤාණධාතුසු** මනෝවිඤ්ඤාණධාතු නම් වූ සන්තීරණ චිත්තයන් දෙදෙන අතුරින් **පඨමා** පළමු මනෝවිඤ්ඤාණධාතු තුමූ **ද්වීසු ඨානේසු** දෙතැනෙක්හි **විපච්චති** විපාකයට පැමිණෙයි **සා හි** ඕ තුමූ වනාහි **පඤ්චද්වාරේ** පඤ්චද්වාරයෙහි **කුසලවිපාකචක්ඛුවිඤ්ඤාණාදි** කුසලවිපාක චක්‍ෂුර්විඤ්ඤාණාදියට **අනන්තරා** අනතුරුව **විපාකමනෝධාතුයා** විපාකමනෝධාතුව නම් වූ සම්ප්‍රෙත්‍යෂණ චිත්තය **තං ආරම්මණං** ඒ අරමුණ **සම්පටිච්ඡිත්වා** පිළිගෙන **නිරුද්ධාය** නිරුද්ධ වූ පසු **තස්මිං යේවාරම්මණේ** ඒ අරමුණෙහිම **සන්තීරණකිච්චං** සන්තීරණ කිස **සාධයමානා** සිද්ධ කරමින් **පඤ්චසු ද්වාරේසු ඨත්වා** පස් දෙරෙහි සිට **විපච්චති** විපාකයට පැමිණෙයි **පන** තවද **ඡසු ද්වාරේසු** සදෙරෙහි වනාහි **බලවාරම්මණේ** බලවත් අරමුණෙහි **තදාරම්මණා හුත්වා** තදාරම්මණ කෘත්‍යවත් වී **විපච්චති** විපාකයට පැමිණෙයි **කථං?** කෙසේද? **හි** විස්තර කෙරෙමි **යථා** යම්සේ **චණ්ඩසෝතේ** සැඩ ජල පහරෙහි **උදකං ඡිජ්ජිත්වා** ජලය කපා **තිරියං** හරහට **නාවාය ගච්ඡන්තියා** නැවක් යන කල්හි (**තං උදකං** ඒ ජලය) **ථෝකං ඨානං** ටික දුරක් **නාවං අනුබන්ධිත්වා** නැව ලුහුබැඳ නොහොත් නැව අනුව ගොස් **යථා** යම්සේ **සෝතමේව** සැඩ පහරෙහිම **ගච්ඡති** යයි

ද **ඒවමේව** මෙසේම **ඡසු ද්වාරේසු** සදෙරෙහි **පලෝභයමානේ** පොළඹවන ලද **බලවාරම්මණේ** බලවත් වූ අරමුණ **ආපාථගතේ** ආපාථගතවූ කල්හි **ජවනං ජවති** ජවන දුවයි **තස්මිං ජවිතේ** ඒ ජවන දිවූ කල්හි **භවඞ්ගස්ස වාරෝ** භවඞ්ග චිත්තයට වාරයයි **ඉදං පන චිත්තං** මේ චිත්තය වනාහි **භවඞ්ගස්ස** භවඞ්ග චිත්තයට **වාරං අදත්වා** වාරය නොදී **ජවනේන** ජවනය විසින් **ගහිතාරම්මණං** ගත්තාවූ අරමුණ **ගහෙත්වා** ගෙන **ඒකං (චිත්තං)** එක් චිත්තයක් තෙමේ **ද්වේ චිත්තවාරේ** චිත්තවාර දෙකක් **පවත්තිත්වා** පැවැත **භවඞ්ගමේව** භවඞ්ගයටම **ඕතරති** බැසගනී **ගවක්ඛන්ධේ** ගව රැළ **නදිං තරන්තේපි** නදිය තරණය කරන කල්හි ද **ඒවමේව** මෙසේම **උපමා** උපමාව **විත්ථාරේතබ්බා** විස්තර කළ යුතුයි **ජවනේන** ජවනය විසින් **යං ගහිතාරම්මණං** යම් ආරම්මණයක් ගන්නාලද ද **ඒවං** මෙසේ **ඒසා** මේ මනෝවිඤ්ඤාණධාතු තුමූ **තස්සේව** ඒ අරමුණගේම **ගහිතත්තා** ගත් බැවින් **තදාරම්මණං නාම හුත්වා** තදාරම්මණ නම් වී **විපච්චති** විපාකයට පැමිණෙයි.

**පන** පක්ෂාන්තරයක් දක්වමි **දුතියා** දෙවැනි මනෝවිඤ්ඤාණධාතු තුමූ වනාහි **පඤ්චසු ඨානේසු** ස්ථාන පසෙක්හි **විපච්චති** විපාකයට පැමිණෙයි **කථං?** කෙසේද? **තාව** පළමුව **මනුස්සලෝකේ** මනුෂ්‍ය ලෝකයෙහි **ජච්චන්ධ** උපතින් අන්ධ වූ **ජච්චබධිර** උපතින් බිහිරි වූ **ජච්චජළ** උපතින් කෙළතොලු වූ **ජච්චුම්මත්තක** උපතින් උමතු වූ **උභතෝබ්‍යඤ්ජනක** උභතෝබ්‍යඤ්ජනක වූ **නපුංසකානං** නපුංසක යන පුද්ගලයන්ගේ **පටිසන්ධිග්ගහණකාලේ** ප්‍රතිසන්ධිය ගන්නා කාලයෙහි **පටිසන්ධිං හුත්වා** ප්‍රතිසන්ධි චිත්තය වී **විපච්චති** විපාකයට පැමිණෙයි **පටිසන්ධියා** ප්‍රතිසන්ධිය **වීතිවත්තාය** ඉක්ම වූ කල්හි **යාවතායුකං** ආයුෂ ඇති තාක් **භවඞ්ගං හුත්වා** භවඞ්ග චිත්තය වී **විපච්චති** විපාකයට පැමිණෙයි **ඉට්ඨමජ්ඣත්තේ** ඉෂ්ට මධ්‍යස්ථ වූ ආරම්මණයෙහි **පඤ්චද්වාරම්මණවීථියා** පඤ්චද්වාරම්මණ වීථියෙහි **සන්තීරණං හුත්වා** සන්තීරණ චිත්තය වී ද **බලවාරම්මණේ** බලවත් වූ අරමුණෙහි **ඡසු ද්වාරේසු** සදෙරෙහි **තදාරම්මණං හුත්වා** තදාරම්මණ චිත්තය වී ද **මරණකාලේ** මැරෙන කාලයෙහි **චුති හුත්වාති** චුති චිත්තය වී දැයි **ඉමේසු පඤ්චසු ඨානේසු** මේ පඤ්ච ස්ථානයන්හි **විපච්චති** විපාකයට පැමිණෙයි (ඉති යනු පරිසමාපනාර්ථයි)

**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

**අහේතුකවිපාකචිත්තං** පන අලෝභාදිහේතුවිරහිතං උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණං, උපෙක්ඛාසහගතං සෝතවිඤ්ඤාණං, උපෙක්ඛාසහගතං ඝානවිඤ්ඤාණං, උපෙක්ඛාසහගතං ජිව්හාවිඤ්ඤාණං, සුඛසහගතං කායවිඤ්ඤාණං, උපෙක්ඛාසහගතං අහේතුකමනෝධාතුසම්පටිච්ඡනං, සෝමනස්සසහගතං අහේතුකමනෝවිඤ්ඤාණධාතුසන්තීරණං, උපෙක්ඛාසහගතං අහේතුකමනෝවිඤ්ඤාණධාතුසන්තීරණන්ති ඉදං පන අට්ඨවිධං අහේතුකවිපාකචිත්තං නාම.

ඉදං පන අට්ඨවිධං නියතවත්ථුකතෝ ඒකවිධං, නියතානියතාරම්මණතෝ දුවිධං. තත්ථ විඤ්ඤාණපඤ්චකං නියතාරම්මණං, සේසත්තයං අනියතාරම්මණං. සුඛසෝමනස්සුපෙක්ඛාවේදනායෝගතෝ තිවිධං. තත්ථ සුඛසහගතං කායවිඤ්ඤාණං, ද්විට්ඨානිකං සන්තීරණං සෝමනස්සුපෙක්ඛායුත්තං, සේසමුපෙක්ඛායුත්තන්ති.

දිට්ඨාරම්මණ-සුතාරම්මණ-මුතාරම්මණ-දිට්ඨසුතමුතාරම්මණ-දිට්ඨසුතමුත විඤ්ඤාතාරම්මණවසේන පඤ්චවිධං. තත්ථ දිට්ඨාරම්මණං චක්ඛුවිඤ්ඤාණං, සුතාරම්මණං සෝතවිඤ්ඤාණං, මුතාරම්මණං ඝාන-ජිව්හා-කායවිඤ්ඤාණත්තයං, දිට්ඨ-සුතමුතාරම්මණං මනෝධාතුසම්පටිච්ඡනං, දිට්ඨ-සුත-මුත-විඤ්ඤාතාරම්මණං සේසමනෝවිඤ්ඤාණධාතුද්වයන්ති.

වත්ථුතෝ ඡබ්බිධං. කථං? චක්ඛුවිඤ්ඤාණස්ස චක්ඛුමේව වත්ථු, තථා සෝත-ඝාන-ජිව්හා-කායවිඤ්ඤාණානං සෝත-ඝාන-ජිව්හා-කායවත්ථු, අවසේසත්තයස්ස හදයවත්ථුමේවාති.

ආරම්මණතෝ සත්තවිධං හෝති. කථං? රූපාරම්මණමේව චක්ඛුවිඤ්ඤාණං, තථා සද්දගන්ධරසඵොට්ඨබ්බාරම්මණානි පටිපාටියා සෝත-ඝාන-ජිව්හා-කාය විඤ්ඤාණානි, රූපාදිපඤ්චාරම්මණා මනෝධාතු, සේසමනෝවිඤ්ඤාණධාතුද්වයං ඡළාරම්මණන්ති.

තං සබ්බං පන අහේතුකවිපාකචිත්තං කිච්චතෝ අට්ඨවිධං හෝති. කථං? දස්සනකිච්චං චක්ඛුවිඤ්ඤාණං, සවන-ඝායන-සායන-ඵුසන-සම්පටිච්ඡන-සන්තීරණ-තදරම්මණකිච්චානි අවසේසානි. **[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 42 යටතේ)]**

**තත්ථ** එහි **අහේතුකවිපාකචිත්තං පන** අහේතුකවිපාක සිත් තෙමේ වනාහි මෙසේ දතයුත්තේයි **අලෝභාදිහේතුවිරහිතං** අලෝභාදී සම්ප්‍රයෝග හේතූන්ගෙන් තොර වූ **උපෙක්ඛාසහගතං** උපේක්ෂා වේදනාව හා ඒකෝත්පාදදී බවට ගියාවූ **චක්ඛුවිඤ්ඤාණං** (රූප දර්ශනයට කාරණා වූ චක්ෂුප්‍රශාදය ඇසුරුකොට පවත්නා වූ) චක්ෂුර්විඤ්ඤාණය ද **උපෙක්ඛාසහගතං** උපේක්ෂා වේදනා සහ ගියාවූ **සෝතවිඤ්ඤාණං** (ශබ්ද ශ්‍රවණයට හේතු වූ ශ්‍රෝත්‍රප්‍රශාදය ඇසුරුකොට පවත්නා වූ)සෝතවිඤ්ඤාණය ද **උපෙක්ඛාසහගතං** උපේක්ෂා වේදනා සහ ගියා වූ **ඝානවිඤ්ඤාණං** (ගන්ධාඝ්‍රානයට හේතු වූ ඝ්‍රානප්‍රශාදය ඇසුරුකොට පවත්නා වූ) ඝානවිඤ්ඤාණය ද **උපෙක්ඛාසහගතං** උපේක්ෂා වේදනා සහ ගියා වූ **ජිව්හාවිඤ්ඤාණං** (රසාශ්වාදයට හේතු වූ ජිව්හාප්‍රශාදය ඇසුරුකොට පවත්නා වූ) ජිව්හාවිඤ්ඤාණය ද **සුඛසහගතං** ඉෂ්ටානුභවනලක්ෂණ වූ මානසික සැප වේදනාව හා ඒකෝත්පාදදී භාවයට ගියාවූ **කායවිඤ්ඤාණං** (ස්පර්ශයට හේතු වූ කායප්‍රශාදය ඇසුරුකොට පවත්නා වූ) කායවිඤ්ඤාණය ද **උපෙක්ඛාසහගතං** උපේක්ෂා වේදනාව හා ඒකෝත්පාදදී බවට ගියා වූ **අහේතුකමනෝධාතුසම්පටිච්ඡනං** අහේතුක මනෝධාතු නම් වූ සම්ප්‍රතෝෂණ චිත්තය ද **සෝමනස්සසහගතං** සොම්නස් වේදනාව හා ඒකෝත්පාදදී බවට ගියා වූ **අහේතුකමනෝවිඤ්ඤාණධාතුසන්තීරණං** අහේතුක මනෝවිඤ්ඤාණධාතු නම් වූ සන්තීරණ චිත්තය ද **උපෙක්ඛාසහගතං** උපේක්ෂා වේදනාව හා ඒකෝත්පාදදී බවට ගියා වූ **අහේතුකමනෝවිඤ්ඤාණධාතුසන්තීරණං ඉති** අහේතුක මනෝවිඤ්ඤාණධාතු නම් වූ සන්තීරණ චිත්තය ද යන **ඉදං පන** මේ වනාහි **අට්ඨවිධං** අට වැදෑරුම් වූ **අහේතුකවිපාකචිත්තං නාම** අහේතුක විපාක චිත්තය නම් වේ **ඉදං පන අට්ඨවිධං** මේ අට වැදෑරුම් වූ අහේතුක විපාක සිත් තෙමේ වනාහි **නියතවත්ථුකතෝ** නියත වස්තුක වශයෙන් **ඒකවිධං** එක් වැදෑරුම් වේ **නියතානියතාරම්මණතෝ** නියතාරම්මණ අනියතාරම්මණ වශයෙන් **දුවිධං** දෙවැදෑරුම් වෙයි **තත්ථ** ඔවුන් අතුරෙන් **විඤ්ඤාණපඤ්චකං** චක්ෂුර්විඤ්ඤාණාදී විඤ්ඤාණ පඤ්චකය තෙමේ **නියතාරම්මණං** නියතාරම්මණ නම් වේ **සේසත්තයං**

සෙසු සම්ප්‍රතෙ‍ය්ෂණ සිත හා සන්තීරණ ද්වය යන සිත් තුන **අනියතාරම්මණං** අනියතාරම්මණ නම් වෙයි **සුඛසෝමනස්සුපෙක්ඛායෝගතෝ** සැපවේදනා සොම්නස්වේදනා උපේක්‍ෂාවේදනාවන් හා සම්ප්‍රයෝග භේද හෙයින් **තිවිධං** තුන් වැදෑරුම් වෙයි **තත්‍ථ** ඔවුන් අතුරෙන් **කායවිඤ්ඤාණං** කායවිඤ්ඤාණය තෙමේ **සුඛසහගතං** සැපවේදනා සහගත වේ **සන්තීරණං** සන්තීරණ සිත් තෙමේ **සෝමනස්සුපෙක්ඛායුත්තන්ති** සොම්නස් වේදනා යුක්තය උපේක්‍ෂා වේදනා යුක්ත යැයි **ද්විට්ඨානිකං** ද්වි ස්ථානික වේ **සේසං** සෙසු සම්ප්‍රතෙ‍ය්ෂණ සිත් තෙමේ **උපෙක්ඛායුත්තන්ති** උපේක්‍ෂා වේදනාවෙන් යුක්ත වෙයි **දිට්ඨාරම්මණ සුතාරම්මණ මුතාරම්මණ දිට්ඨසුතමුතාරම්මණ දිට්ඨසුතමුතවිඤ්ඤාතාරම්මණවසේන** දිට්ඨාරම්මණය සුතාරම්මණය මුතාරම්මණය දිට්ඨසුතමුතාරම්මණය දිට්ඨසුතමුතවිඤ්ඤාතාරම්මණය යන මොහුන්ගේ වශයෙන් **පඤ්චවිධං** පස් වැදෑරුම් වෙයි **තත්‍ථ** ඔවුන් අතුරෙන් **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඤ්ඤාණ තෙමේ **දිට්ඨාරම්මණං** දිට්ඨාරම්මණ නම් වේ (හෙවත් දිට්ඨ යැයි කියනලද රූපායතනය අරමුණු කොට ඇත්තේ වේ) **සෝතවිඤ්ඤාණං** ශ්‍රෝත්‍රවිඤ්ඤාණ තෙමේ **සුතාරම්මණං** සුතාරම්මණ නම් වේ (හෙවත් සුතයැයි කියනලද ශබ්දයතනය අරමුණු කොට ඇත්තේ වේ) **ඝානජිව්හාකායවිඤ්ඤාණත්තයං** ඝ්‍රාණවිඤ්ඤාණ ජිව්හාවිඤ්ඤාණ කායවිඤ්ඤාණ ත්‍රය **මුතාරම්මණං** මුතාරම්මණ නම් වේ (හෙවත් මුත යැයි කියනලද ගන්ධ රස ස්පර්ශායතනය අරමුණු කොට ඇත්තේ වේ) **මනෝධාතුසම්පටිච්ඡනං** මනෝධාතු නම් වූ සම්ප්‍රතෙ‍ය්ෂණ සිත් තෙමේ **දිට්ඨසුතමුතාරම්මණං** රූපායතන ශබ්දයතන ගන්ධ රස ස්පර්ශායතන යන මොහුන් අරමුණු කොට ඇත්තේ වේ **සේසමනෝවිඤ්ඤාණධාතුද්වයං** අවශේෂ මනෝවිඤ්ඤාණධාතු නම් වූ සන්තීරණ ද්වය **දිට්ඨසුතමුතවිඤ්ඤාතාරම්මණං** රූපායතන ශබ්දයතන ගන්ධ රස ස්පර්ශායතන ධර්මායතන යන මොහුන් අරමුණු කොට ඇත්තේ වේ **වත්‍ථුතෝ** වස්තු වශයෙන් **ඡබ්බිධං** සවැදෑරුම් වේ **කථං?** කෙසේද යත්? **චක්ඛුවිඤ්ඤාණස්ස** චක්‍ෂුර්විඤ්ඤාණයට **චක්ඛුමේව** චක්‍ෂුප්‍රශාදයම **වත්‍ථු** වස්තු වෙයි **තථා** එසේම **සෝතඝානජිව්හාකායවිඤ්ඤාණං** ශ්‍රෝත්‍රවිඤ්ඤාණ ඝ්‍රාණවිඤ්ඤාණ ජිව්හාවිඤ්ඤාණ කායවිඤ්ඤාණයන්ට **සෝතඝානජිව්හාකායවත්‍ථු** ශ්‍රෝත්‍රප්‍රශාද ඝාණප්‍රශාද ජිව්හාප්‍රශාද කායප්‍රශාද යන මොහු වස්තූහු වෙත් **අවසේසත්තයස්ස** සෙසු සම්පටිච්ඡන සන්තීරණත්‍රයට **හදයවත්‍ථුමේවාති** හෘදයරූපයම වස්තු වෙයි.

**ආරම්මණතෝ** අරමුණු වශයෙන් **සත්තවිධං හෝති** සත්වැදෑරුම් වෙයි **කථං?** කෙසේද යත්? **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඤ්ඤාණ තෙමේ **රූපං ඒව ආරම්මණං** රූපයම අරමුණු කොට ඇත්තේ වේ **තථා** එසේම **සෝතඝානජිව්හාකායවිඤ්ඤාණානි** ශ්‍රෝත්‍රවිඤ්ඤාණ ඝ්‍රාණවිඤ්ඤාණ ජිව්හාවිඤ්ඤාණ කායවිඤ්ඤාණයෝ තුමූ **පටිපාටියා** පිළිවෙළින් **සද්දගන්ධරසඵොට්ඨබ්බාරම්මණානි** ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන මොහුන් අරමුණු කොට ඇත්තාහු වෙත් **මනෝධාතු** මනෝධාතුව (හෙවත් මනෝධාතු යැයි කියනලද සම්ප්‍රතෙ‍ය්ෂණ චිත්තය) **රූපාදී පඤ්චාලම්බනං** රූපාදී පස අරමුණු කොට ඇත්තේය **සේසමනෝවිඤ්ඤාණධාතුද්වයං** අවශේෂ වූ මනෝවිඤ්ඤාණධාතු දෙදෙන **ඡලාරම්මණන්ති** රූපාදී සාරමුණ අරමුණු කොට ඇත්තේයි **තං සබ්බං පන අහේතුකවිපාකචිත්තං** ඒ සියළු අහේතුක විපාකසිත් තෙමේ වනාහි **කිච්චතෝ** කෘත්‍යය වශයෙන් **අට්ඨවිධං හෝති** අට වැදෑරුම් වෙයි **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඤ්ඤාණ තෙමේ **දස්සනකිච්චං** දර්ශනකෘත්‍යය ඇත්තේ වේ **අවසේසානි** සෙසු අහේතුක චිත්තයෝ තුමූ **සවනඝායනසායනඵුසනසම්පටිච්ඡන-**

**සන්තීරණතදරම්මණකිච්චානි** ශ්‍රවණ කෘත්‍යය ආඝ්‍රාන කෘත්‍යය රසාශ්වාද කෘත්‍යය ස්පර්ශන කෘත්‍යය සම්ප්‍රතෝෂණ කෘත්‍යය සන්තීරණ කෘත්‍යය තදරම්මණ කෘත්‍යය යන කෘත්‍යය ඇත්තාහු වෙත් ⸙ **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 129-131 පිටු]**

කස්මා පන සහේතුකස්ස කම්මස්ස අහේතුකවිපාකෝ හෝතීති? වුච්චතේ; චක්ඛුවිඤ්ඤාණාදීනං තාව පඤ්චන්නං ආරම්මණාභිනිපාතමත්තත්තා අලෝභාදිසම්පයෝගෝ න සම්භවති, තථා මන්දතරකිච්චේසු සම්පටිච්ඡනසන්තීරණේසූති ඒවං හේතූනං උප්පත්තියා අසම්භවතෝ ච නේසං අහේතුකතා දට්ඨබ්බා. උපෙක්ඛාදියෝගේ පන චක්ඛුවිඤ්ඤාණාදීනං තාව චතුන්නං ඉට්ඨාරම්මණේපි පවත්තමානානං වත්ථාරම්මණසඞ්ඝට්ටනාය දුබ්බලභාවතෝ උපෙක්ඛාසහගතතා, කායවිඤ්ඤාණස්ස ච තාය බලවභාවතෝ සුඛසහගතතා හෝති. සම්පටිච්ඡනං පන ආරම්මණඝට්ටනයෝග්‍යභාවේන ඕළාරිකත්තා, චතුචිත්තක්ඛණාතීතවසේන චිරජාතත්තා ච දුබ්බලමත්තනෝ නිස්සයේන සහ අසමානජාතිකඤ්ච චක්ඛාදිවත්ථුං නිස්සාය උප්පන්නේහි චක්ඛුවිඤ්ඤාණාදීහි ලද්ධානන්තරපච්චයතාය, අපුබ්බනිස්සයතාය ච ආරම්මණරසස්සාදේ දුබ්බලන්ති ඉට්ඨාදීසු ආරම්මණේසු උපෙක්ඛාසහගතමේව. සන්තීරණං පන වුත්තවිපරීතතෝ ඉට්ඨාරම්මණේ සුඛසහගතං, ඉට්ඨමජ්ඣත්තේ ච උපෙක්ඛාසහගතන්ති දට්ඨබ්බං. මනෝවිඤ්ඤාණධාතු විය විසිට්ඨමනනකිච්චාභාවතෝ මනෝමත්තා නිස්සත්තනිජ්ජීවාදිඅත්ථේහි ධාතු චාති **මනෝධාතු**. සා හි සතිපි විඤ්ඤාණභාවේ මනෝවිඤ්ඤාණතෝ සම්භවස්ස විසිට්ඨමනනකිච්චස්ස අකරණතෝ මනනමත්තායේව හෝති. වුත්තලක්ඛණවිපරීතතෝ පන මනෝ ච තං විඤ්ඤාණඤ්චාති මනෝවිඤ්ඤාණං, තදේව යථාවුත්තට්ඨේන ධාතූති **මනෝවිඤ්ඤාණධාතු**.

**විඤ්ඤාණපඤ්චකං නියතාරම්මණං** යථාක්කමං රූපාදිඒකේකස්සේව ආරම්මණකරණතෝ. **සේසත්තයමනියතාරම්මණං** පඤ්චාරම්මණික-ඡළාරම්මණික භාවතෝ.

දට්ඨබ්බතාය **දිට්ඨං,** රූපායතනං. සෝතබ්බතාය **සුතං,** සද්දායතනං. මුනිතබ්බතාය **මුතං,** සම්පත්තස්සේව ගහේතබ්බතායාති අත්ථෝ, ගන්ධාදිත්තයස්සේතං නාමං. චක්ඛාදීහි විනා කේවලං මනසා ඒව විජානිතබ්බතාය **විඤ්ඤාතං,** ධම්මායතනං. අනාමට්ඨකාලවිසේසවචනත්තා ච නේසං අතීතානාගතාපි රූපාදයෝ දිට්ඨාදිසද්දේහි වුච්චන්ති. තේනේව හි "දට්ඨබ්බතායා"තිආදිනා කාලසාමඤ්ඤේන නේසං නිබ්බචනං වුත්තං. දිට්ඨං ආරම්මණං යස්ස තං **දිට්ඨාරම්මණං**. ඒවං **සුතාරම්මණාදීසු**.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 41-42 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 166-168 පිටු]**

මෙහි කුමක්හෙයින් සහේතුක කර්මයාගේ අහේතුක විපාකය වේදැයි යන චෝද්‍යය සඳහා පරිහාර කියනු ලැබේ. චක්ෂුර්විඤ්ඤාණාදී වූ පඤ්චවිඤ්ඤාණයන්ගේ අරමුණට අභිමුඛව වැටහීම් මාත්‍රයක්ම ඇති බැවින් අලෝභ ආදී හේතු සම්ප්‍රයෝගය නොලැබෙයි. එසේම අතිශයින්ම ලස් වූ කෘත්‍යය ඇති සම්ප්‍රතෝෂණ චිත්තයෙහි ද මද වූ කෘත්‍යය ඇති සන්තීරණ චිත්තයෙහි ද අලෝභ ආදී හේතු සම්ප්‍රයෝගය නොලැබෙයි. මෙසේ හේතූන්ගේ උත්පත්තියක් නැති හෙයින් ද ඒ චිත්තයන්ගේ අහේතුක බව දතයුත්තීය. උපේක්ෂා ආදිය යෙදීමෙහි වනාහි වස්තු ආරම්මණයන්ගේ අන්‍යෝන්‍ය ඝට්ටනය දුර්වල බැවින් ඉෂ්ටාරම්මණයෙහි නමුදු

හටගන්නා වූ චක්ෂුර්විඥානාදි සතර විඥානයන්ගේ උපේක්ෂා සහගත බව වේ. ඒ වස්තු ආරම්මණයන්ගේ ඝට්ටනය බලවත් බැවින් කායවිඥානයාගේ සුඛසහගත බවද වේ. සම්ප්‍රතෝෂණ චිත්තය වනාහි ආරම්මණ ඝට්ටනයාගේ යෝග්‍ය බැවිහි ඖදරික හෙයින් ද සතර චිත්තක්ෂණයක් ඉක්මවීම් වශයෙන් කලකින් උපදින හෙයින් ද දුර්වල වෙයි. තමාගේ නිස්සය ස්ථානය හා අසමාන ජාතික වූ චක්ෂුරාදී වස්තූන් ඇසුරුකොට උපදිනා චක්ෂුර්විඥානාදීන්ගෙන් ලබනලද අනන්තර ප්‍රත්‍යය ඇති බැවින් ද පෙර නොවූ නිශ්‍රයක් ඇති බැවින් ද අරමුණු රසය අනුභව කිරීමෙහි දුර්වල වෙයි. එහෙයින් ඉෂ්ට අරමුණෙහි ද උපේක්ෂා සහගත වෙයි. සන්තීරණ සිත් තෙමේ වනාහි කියනලද්දට විපරීත වශයෙන් ඉෂ්ට අරමුණෙහි සුඛ සහගත වෙයි. ඉෂ්ටමධ්‍යස්ථාරමුණෙහි උපේක්ෂා සහගත වේයයි දතයුතුයි. මනෝවිඥාන ධාතුව මෙන් විශිෂ්ට වූ හැඟීම් කෘත්‍යයක් නැති හෙයින් හැඟීම් මාත්‍රයක් ඇත්තේනුයි සත්ත්වයෙක් ද නොවෙයි. ජීවයෙක් ද නොවෙයි යනාදී අර්ථයෙන් ධාතු නමුදු වේනුයි මනෝධාතු නම් වෙයි. ඒ එසේමැයි; ඒ මනෝධාතු තොමෝ විඥාන භාවය ඇති කල්හිදු මනෝවිඥානයෙන් හටගත් විශිෂ්ට වූ හැඟීම් කෘත්‍යය නැති හෙයින් මනෝ මාත්‍රයක්ම වෙයි. කියනලද ආකාරයට විපරීත වශයෙන් මනෝ වූයේද හේමය, විඥාන වූයේ හේමනුයි මනෝවිඥාන නම් වෙයි. ඒ මනෝවිඥානයම යට කියනලද අර්ථයෙන් ධාතු නම් වූයේනුයි මනෝවිඥාන ධාතු නම් වෙයි.෴

චක්ෂුර්විඥානාදී විඥාන පඤ්චකය තෙමේ යථාක්‍රමයෙන් රූපාදී එකී එකී අරමුණක්ම අරමුණු කරන හෙයින් නියතාරම්මණ නම් වෙයි. අවශේෂ වූ සම්ප්‍රතෝෂණ සිත හා සන්තීරණ ද්වය ද පඤ්චාරම්මණික ෂට්ධාරම්මණික බැවින් අනියතාරම්මණ නම් වේ. දැක්කයුතු හෙයින් රූපායතන තෙමේ දිට්ඨ නම් වෙයි. ඇසියයුතු හෙයින් ශබ්දයතන තෙමේ සුත නම් වෙයි. මුනිතව්‍ය හෙයින් හෙවත් සම්ප්‍රාප්ත වූවක්ම ගතයුතු හෙයින් මුත නම් වේ. ගන්ධ රස ස්පර්ශායතන ත්‍රයට මේ නමෙකි. චක්ෂුර්විඥානාදියෙන් වෙන්ව හුදෙක් සිතින්ම දතයුතු හෙයින් ධර්මායතනය තෙමේ විඥාත නම් වෙයි. ඔහුන්ගේ ආමර්ශනය නොකරනලද කාල විශේෂ ඇති වචනයක් බැවින් අතීත අනාගත වූද රූපාදීහු දිට්ඨාදී ශබ්දයෙන් නොකියනු ලැබෙත්. එහෙයින්ම "දට්ඨබ්බතාය" යි යනාදීන් කාල සාම්‍යයෙන්ම ඔහුන්ගේ නිර්වචන කියන ලද්දේයි. "දිට්ඨං ආරම්මණං යස්ස තං දිට්ඨාරම්මණං" යනු විග්‍රහයි. "සුතාරම්මණං" යනාදියෙහි ද මෙසේමැයි.෴

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 133-134 පිටු]**

**සම්පටිච්ඡනචිත්තං** ඉදං නාමං ආචරියේන කිච්චවසේන දින්නං. ධම්මසඞ්ගණියං පන ඉදං චිත්තං මනෝධාතුනාමේන ආගතං. සා ච මනෝධාතු කේවලං තිවිධා හෝති. ඒකා කිරියා සා පඤ්චද්වාරේ ආවජ්ජනකිච්චං සාධේති. ඉමස්මිං පකරණේ සාපි කිච්චවසේන පඤ්චද්වාරාවජ්ජනන්ති වුත්තා. ද්වේ විපාකමනෝධාතු, ඒකා කුසලවිපාකා, අපරා අකුසලවිපාකාති. සාහි යස්මා ද්විධාපි පඤ්චද්වාරේ චක්ඛුවිඤ්ඤාණාදීහි ගහිතං ආරම්මණං සම්පටිච්ඡති, යථා තේහි විඤ්ඤාණේහි ඤාතං තථේව සම්මා පටිච්ඡති, අඞ්ගී කරෝති, සම්පටිච්ඡනං තස්සා කිච්චං, තස්මා සුවිජානත්ථං තං කිච්චවසේන සම්පටිච්ඡනන්ති වුත්තා.

සම්මාතීරේති, යථා සම්පටිච්ඡිතං රූපාදිකං ආරම්මණං වීමංසතීති **සන්තීරණං.** අභිධම්මේ පන ඉදං චිත්තං විපාකා (අහේතුකා) මනෝවිඤ්ඤාණධාතුනාමේන වෝහරීයති. (ධම්මසඞ්ගණී) තස්මා

මනෝවිඤ්ඤාණධාතුයා ඉදං කිච්චං තේන සා ඉමස්මිං පකරණේ සන්තීරණන්ති වුත්තා. **[නවනීත ටීකා 07 පිටුව]**

**සම්පටිච්ඡනචිත්තං ඉදං නාමං** සම්පටිච්ඡනචිත්ත යන මේ නාමය **ආචරියේන** ආචාර්‍ය්‍යයන් වහන්සේ විසින් **කිච්චවසේන** කෘත්‍යය වශයෙන් **දින්නං** දෙනලදි **ධම්මසඞ්ගණියං පන** ධම්මසඞ්ගණියෙහි වනාහි **ඉදං චිත්තං** මේ සිත **මනෝධාතු නාමේන** මනෝධාතු නමින් **ආගතං** එනලදි **සා මනෝධාතු ච** ඒ මනෝධාතුවද **කේවලං** හුදෙක් **තිවිධා හෝති** තෙවැදෑරුම් වෙයි **ඒකා** එක් මනෝධාතුවක් තුමූ **කිරියා** ක්‍රියා චිත්තයෙකි **සා** ඕ තුමූ **පඤ්චද්වාරේ** පස් දෙරෙහි **ආවජ්ජනකිච්චං** ආවර්ජන කෘත්‍යය **සාධේති** සිද්ධ කරයි **ඉමස්මිං පකරණේ** නවනීත ටීකා නම් වූ මේ ප්‍රකරණයෙහි **සාපි** ඕ තුමූ **කිච්චවසේන** කෘත්‍යය වශයෙන් **පඤ්චද්වාරාවජ්ජනං ඉති** පඤ්ච ද්වාරාවර්ජනය යැයි **වුත්තා** කියනලදි **ද්වේ විපාකමනෝධාතු** විපාක මනෝධාතු දෙදෙනෙකි **ඒකා** එක් විපාක මනෝධාතුවක් තුමූ **කුසලවිපාකා** කුසල විපාකය **අපරා** අනික් විපාක මනෝධාතු තුමූ **අකුසලවිපාකා** අකුසල විපාක යැයි **ඉති (හෝති)** වෙයි **හි** ඒ කීම සැබෑව **යස්මා** යම්හෙයකින් **සා ද්විධාපි** ඒ දෙවැදෑරුම් වූ විපාක මනෝධාතු තුමූ **පඤ්චද්වාරේ** පඤ්චද්වාරයෙහි **චක්ඛුවිඤ්ඤාණාදීහි** චක්‍ෂුර්විඤ්ඤාණාදීන් විසින් **ගහිතං ආරම්මණං** ගන්නාලද අරමුණ **සම්පටිච්ඡති** පිළිගනී **යථා** යම්සේ වනාහි **තේහි විඤ්ඤාණේහි** ඒ විඤ්ඤාණයන් විසින් **ඤාතං** දැනගන්නාලද අරමුණ **තථා ඒව** එසේම **සම්මා පටිච්ඡති අඞ්ගි කරෝති** මනාව පිළිගනී **සම්පටිච්ඡනං** පිළිගැනීම **තස්සා** ඇයගේ **කිච්චං** කෘත්‍යය (**හෝති** වෙයි) **තස්මා** එබැවින් **කිච්චවසේන** කෘත්‍යය වශයෙන් **තං** ඒ චිත්තය **සුවිජානත්ථං** මනාව දැනගැනීම පිණිස **සම්පටිච්ඡනන්ති** සම්පටිච්ඡන යයි **වුත්තා** කියනලදි.

**සම්මාතීරේති** මනාව තීරණය කරයි **යථා** යම්සේ **සම්පටිච්ඡිතං** පිළිගන්නාලද **රූපාදිකං ආරම්මණං** රූපාදී අරමුණු **වීමංසතීති** විමසානුයි **සන්තීරණං** සන්තීරණ නම් වෙයි **අභිධම්මේ පන** අභිධර්මයෙහි වනාහි **ඉදං චිත්තං** මේ චිත්තය **විපාකා (අහේතුකා) මනෝවිඤ්ඤාණධාතුනාමේන** අහේතුක විපාක මනෝවිඤ්ඤාණ ධාතුව නමින් **වෝහරීයති** ව්‍යවහාර කරයි **තස්මා** එබැවින් **මනෝවිඤ්ඤාණධාතුයා** මනෝවිඤ්ඤාණ ධාතුවගේ **ඉදං කිච්චං** මේ කෘත්‍යයක් (**හෝති** වෙයි ද) **තේන** එහෙයින් **සා** ඒ චිත්තය තුමූ **ඉමස්මිං පකරණේ** මේ නවනීතටීකා නම් ප්‍රකරණයෙහි **සන්තීරණං ඉති** සන්තීරණ චිත්තය යැයි **වුත්තා** කියනලදි. **[නවනීත ටීකා පරිවර්තනයි]**

**චක්ඛති රූපං අස්සාදෙන්තං විය හෝතීති චක්ඛු. චක්ඛුම්හි නිස්සිතං විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං. රූපං** රූපාරම්මණය **චක්ඛති අස්සාදෙන්තං විය** ආස්වාදය කරන්නාක් මෙන් **හෝති** වෙයි **ඉති** එසේ හෙයින් **චක්ඛු** චක්ඛු නම් වේ. **චක්ඛුම්හි** චක්‍ෂු ප්‍රසාදයෙහි **නිස්සිතං** ඇසුරුකොටගෙන පවත්නා වූ **විඤ්ඤාණං** විඤ්ඤාණය **චක්ඛුවිඤ්ඤාණං** චක්ඛුවිඤ්ඤාණය නම් වේ. චක්ඛුවිඤ්ඤාණ චිත්තය සර්පයෙක් හා සමානයි. සර්ප තෙම අතු කොළ ආදියෙන් ආකූල වූ වන ලැහැබෙක්හි සිත් අලවා වාසය කෙරේ. චිත්තය ද ඉතා අලංකාර මල් උයන් මල් පොකුණු මල් කලස් ආදිය දැකීමම රුචි කෙරෙයි.

**විඤ්ඤාදිට්ඨිතං හුත්වා සුණාතීති සෝතං. සෝතස්මිං නිස්සිතං විඤ්ඤාණං සෝතවිඤ්ඤාණං. විඤ්ඤාදිට්ඨිතං හුත්වා** සෝතවිඤ්ඤාණයාගේ ආධාරස්ථානව **සද්දං** ශබ්දය **සුණාති** අසයි **ඉති** එසේ අසන හෙයින් **සෝතං** සෝත නම්. **සෝතස්මිං**

සෝත ප්‍රසාදයෙහි **නිස්සිතං** ඇසුරුකොටගෙන පවත්තා වූ **විඤ්ඤාණං** චිත්තය **සෝතවිඤ්ඤාණං** සෝතවිඤ්ඤාණය නම් වේ. සෝතවිඤ්ඤාණය කිඹුලෙක් හා සමාන වේ. කිඹුලා ඉතා ගැඹුරු ජලාශයෙහි සිත් අලවා වාසය කෙරේ. සෝතවිඤ්ඤාණ චිත්තය ද සසම්භාර කණ්බිලය ඇතුලේ හුලගිල්ලෙහි පැළඳි තඹ මුදුවක සටහන් ඇති සෝත ප්‍රසාද වස්තුරූපය ඇසුරු කරගෙන පවතී.

**ඝායති ඝන්ධෝපාදනං කරෝතීති ඝානං. ඝානස්මිං නිස්සිතං විඤ්ඤාණං ඝානවිඤ්ඤාණං. යං පසාදරූපං** යම් ප්‍රසාදරූපයක් **ඝායති ඝන්ධෝපාදනං කරෝති** ගඳ-සුවඳ ළගාකරගන්නාක් මෙන් පවතී ද **ඉති** එසේහෙයින් **තං පසාදරූපං** ඒ ප්‍රසාදරූපය **ඝානං** ඝාන නම් වේ. **ඝානස්මිං** ඝාන ප්‍රසාද රූපයෙහි **නිස්සිතං** ඇසුරුකොටගෙන පවතින්නා වූ **විඤ්ඤාණං** චිත්තය **ඝානවිඤ්ඤාණං** ඝානවිඤ්ඤාණය නම් වේ. ඝානවිඤ්ඤාණය පක්ෂියෙක් හා සමාන වේ. පක්ෂියාගේ අහසෙහි සුලං වේගය ගනිමින් පියාඹන ස්වභාව වෙයි. ඝානවිඤ්ඤාණය ද සුලඟ ඇසුරුකිරීමෙන් උපදී.

**ජීවිතං අව්හායතීති ජිව්හා. ජිව්හාය නිස්සිතං විඤ්ඤාණං ජිව්හාවිඤ්ඤාණං. යා පසාදජාති** යම් ප්‍රසාද ස්වභාවයක් **ජීවිතං** ජීවිතේන්ද්‍රිය නොහොත් ආහාර රසය **අව්හායති** කැඳවයි **ඉති** එසේ කැඳවන හෙයින් **සා පසාදජාති** ඒ ප්‍රසාද ස්වභාවය **ජිව්හා** ජිව්හා නම් වේ. **ජිව්හාය** ජිව්හා ප්‍රසාද රූපයෙහි **නිස්සිතං** ඇසුරුකොටගෙන පවතින්නා වූ **විඤ්ඤාණං** විඤ්ඤාණය **ජිව්හාවිඤ්ඤාණං** ජිව්හාවිඤ්ඤාණ නම් වේ. ජිව්හාවිඤ්ඤාණය ග්‍රාම සුනඛයෙක් හා සමාන වේ. ග්‍රාම සුනඛතෙම අළුගොඩ මැද ලැගීම ප්‍රිය කෙරේ. ජිව්හාවිඤ්ඤාණය ද සසම්භාර දිවමැද නෙළුම් පෙති අගක සටහන් ඇති ජිව්හා ප්‍රසාදය ඇසුරුකොට උපදී.

**කුච්ඡිතානං ආයෝ කායෝ. කායස්මිං නිස්සිතං විඤ්ඤාණං කායවිඤ්ඤාණං. කුච්ඡිතානං** නින්දිත වූ පාපධර්මයන්ගේ **ආයෝ** උත්පත්ති ස්ථානය **කායෝ** කාය නම්. **කායස්මිං** කාය ප්‍රසාද රූපයෙහි **නිස්සිතං** ඇසුරුකොට පවත්නා වූ **විඤ්ඤාණං** විඤ්ඤාණය **කායවිඤ්ඤාණං** කායවිඤ්ඤාණ නම්. කායවිඤ්ඤාණය වන සුනඛයෙක් (කැනහිලෙක්) හා සමාන වේ. වන සුනඛතෙම ජනසන්චරන ස්ථානයන්ගෙන් හිස් වූ වන පෙදෙසක සොහොන් බිමකම සිත් අලවයි. කායවිඤ්ඤාණය ද සුඛසහගත ස්පර්ශ ආරම්මණයක් හමු වූ කල්හිම සුඛසහගත කායවිඤ්ඤාණය ඇති වේ.

**පඤ්චවිඤ්ඤාණගහිතං රූපාදිආරම්මණං සම්පටිච්ඡතීති සම්පටිච්ඡනං. යං චිත්තං** යම් චිත්තයක් තෙමේ **පඤ්චවිඤ්ඤාණගහිතං** පඤ්චවිඤ්ඤාණය විසින් ගන්නාලද්ද වූ **රූපාදිආරම්මණං** රූපය ආදී වූ පඤ්චාරම්මණය **සම්පටිච්ඡති** පිළිගණී ද **ඉති** එසේ පිළිගන්නා හෙයින් **තං චිත්තං** ඒ චිත්තය **සම්පටිච්ඡනං** සම්පටිච්ඡන නම් වේ. පඤ්චවිඤ්ඤාණය විස්න දර්ශනය කරනලද ශ්‍රවණය කරනලද ආඝ්‍රනය කරනලද ආශ්වාදනය කරනලද ස්පර්ශ කරනලද අරමුණු පිළිගන්නා හෙයින් සම්පටිච්ඡන නම් වේ.

**යථා සම්පටිච්ඡිතං ආරම්මණං සම්මා තීරේතීති සන්තීරණං. යථා සම්පටිච්ඡිතං** සම්පටිච්චනය විසින් පිළිගන්නා වූ **ආරම්මණං** රූපාදී අරමුණ **සම්මා** මොනවට **තීරේති** විමසයි ද **ඉති** එසේ මොනවට විමසන හෙයින් **සන්තීරණං** සන්තීරණ නම් වෙයි. **[අභිධර්ම ප්‍රකාශය 27-29 පිටු]**

## අහේතුක චිත්තයෝ වේදනා භේදයෙන් වෙනස්වීමට හේතු:—

කේවලඤ්හි චක්ඛුවිඤ්ඤාණාදීසු 'උපෙක්ඛා' භාජිතා, කායවිඤ්ඤාණෙ 'සුඛ'න්ති, අයමෙත්ථ විසේසො. සොපි ච ඝට්ටනවසේන හෝතීති වේදිතබ්බෝ. චක්ඛුද්වාරාදීසු හි චතූසු උපාදරූපමේව උපාදරූපං ඝට්ටේති, උපාදරූපේයේව උපාදරූපං ඝට්ටෙන්තේ පටිඝට්ටනානිඝංසෝ බලවා න හෝති. චතුන්නං අධිකරණීනං උපරි චත්තාරෝ කප්පාසපිචුපිණ්ඩේ ඨපෙත්වා පිචුපිණ්ඩේහේව පහතකාලෝ විය ඵුට්ඨමත්තමේව හෝති. වේදනා මජ්ඣත්තට්ඨානේ තිට්ඨති. කායද්වාරේ පන බහිද්ධා මහාභූතාරම්මණං අජ්ඣත්තිකකායපසාදං ඝට්ටෙත්වා පසාදපච්චයේසු මහාභූතේසු පටිහඤ්ඤති. යථා අධිකරණීමත්ථකේ කප්පාසපිචුපිණ්ඩං ඨපෙත්වා කූටේන පහරන්තස්ස කප්පාසපිචුපිණ්ඩං ඡින්දිත්වා කූටං අධිකරණිං ගණ්හතීති, නිඝංසෝ බලවා හෝති, ඒවමේව පටිඝට්ටනානිඝංසෝ බලවා හෝති. ඉට්ඨේ ආරම්මණේ සුඛසහගතං කායවිඤ්ඤාණං උප්පජ්ජති, අනිට්ඨේ දුක්ඛසහගතං.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 439 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 237 පිට (හේ.වි.මු)]**

**කායප්පසාදං ඝට්ටෙත්වා පසාදපච්චයේසු මහාභූතේසු පටිහඤ්ඤතී**ති ආපාථං ගන්ත්වා පටිහඤ්ඤතීති අත්ථෝ. යථා ච "රූපං ආරබ්භ උප්පන්න"න්ති වුත්තේ න ආරම්මණුප්පාදනං පුබ්බාපරකාලතා හෝති, ඒවම්ධාපි ඝට්ටනපටිහනනේසු දට්ඨබ්බං. උපමාපි උභයඝට්ටනදස්සනත්ථං වුත්තා, න නිස්සිතනිස්සයඝට්ටනානං පුබ්බාපරතාදස්සනත්ථං. එත්ථ ච **බහිද්ධාති** ඒතං නිදස්සනමත්තං. අජ්ඣත්තම්පි හි ආරම්මණං හෝතීති. විඤ්ඤාණධාතුනිස්සයභූතේහි වා අඤ්ඤං "බහිද්ධා"ති වුත්තං. පටිඝට්ටනානිඝංසෝ බලවා හෝති, තතෝ ඒව ඉට්ඨානිට්ඨඵොට්ඨබ්බසමයෝගේ සුඛදුක්ඛපච්චයා ධාතුඅනුග්ගහධාතුක්ඛෝභා චිරං අනුවත්තන්ති.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 439 යටතේ)]**

අනතික්කමනේන භාවනාය. පසාදඝට්ටනං විසයස්ස යෝග්‍යදේසේ අවට්ඨානන්ති **"පසාදං ඝට්ටෙත්වා ආපාථං ගන්ත්වා"**ති වුත්තං. **මහාභූතේසු පටිහඤ්ඤතී**ති එත්ථ න සයං කිඤ්චි පටිහඤ්ඤති, නාපි කේනචි පටිහඤ්ඤියති අඵොට්ඨබ්බසභාවත්තා. විසයවිසයීභූතං පන අභිමුඛභාවප්පත්තියා විඤ්ඤාණුප්පත්තියා හේතුතාය විසිට්ඨභාවප්පත්තං පටිහතපටිඝාතකභාවේන වෝහරීයති, තස්මා තේසු සප්පටිඝවෝහාරෝ. "උපාදරූපං ඝට්ටේතීති ඒවමාදි ච උපචාරවසේනේව වේදිතබ්බං. මහාභූතාරම්මණේන පන කායප්පසාදනිස්සයභූතේසු මහාභූතේසු ඝට්ටියමානේසු පසාදෝපි ඝට්ටිතෝ ඒව නාම හෝතීති වත්වා වීමංසිතබ්බ"න්ති වදන්ති. යථාධිප්පේතේන ඒකදේසසාමඤ්ඤේන උපමාවචනතෝ නිස්සිතනිස්සයඝට්ටනානං සතිපි පුබ්බාපරභාවේ උපමත්තේ උපමාභාවේන ගහේතබ්බභාවං දස්සෙන්තෝ **"උභයඝට්ටනදස්සනත්ථ"**න්ති ආහ.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 439 යටතේ)]**

**හි** විස්තර කෙරෙම් **කේවලං** හුදෙක් **චක්ඛුවිඤ්ඤාණාදීසු** චක්‍ෂුර්විඤ්ඤාණාදී චිත්තයන්හි (**වේදනා** වේදනාව) **උපෙක්ඛා (වේදනා වසේන)** උපේක්‍ෂා වේදනා වශයෙන් **භාජිතං** බෙදනලදි **කායවිඤ්ඤාණේ** කායවිඤ්ඤාණයෙහි **සුඛං (වේදනං වසේන)** සුඛ වේදනාව වශයෙන් **ඉති (භාජිතං)** බෙදනලදි **එත්ථ** මෙහි **අයං විසේසෝ** මේ වෙනසයි **අපි** ඒ එසේමැයි **සෝ ච** ඒ සුඛ වේදනාව ද **ඝට්ටනවසේන** ගැටීම්

වශයෙන් **හෝතීති** වේ යයි **වේදිතබ්බෝ** දතයුතුයි **හි** විශේෂය කියම් **චක්ඛුද්වාරාදීසු** චතූසු චක්ෂුර්ද්වාරාදී සතර ද්වාරයෙහි **උපාදාරූපමේව** උපාදාරූපයම **උපාදාරූපං** උපාදාරූපය හා **ඝට්ටේති** ගැටෙයි **උපාදාරූපේයේව** උපාදාරූපයම **උපාදාරූපං** උපාදාරූපය හා **ඝට්ටෙන්තේ** ගැටෙන කල්හි **පටිඝට්ටනානිඝංසෝ** ගැටීම **බලවා න හෝති** බලවත් නොවෙයි **චතුන්නං අධිකරණීනං** කිණිහිර සතරකගේ **උපරි** මත්තෙහි **චත්තාරෝ කප්පාසපිචුපිණ්ඩේ** කපු පුළුන් පිඬවල් සතරක් **ඨපෙත්වා** තබා **පිචුපිණ්ඩේහේව** කපු පුළුන් පිඬුවලින්ම **පහටකාලෝ විය** පහරදුන් කල මෙන් **ඵුට්ඨමත්තමේව හෝති** ස්පර්ශ කළ මාත්‍රයම වෙයි **වේදනා** වේදනා තුමූ **මජ්ඣත්තට්ඨානේ** උපේක්ෂා ස්ථානයෙහි **තිට්ඨති** සිටී **කායද්වාරේ පන** කායද්වාරයෙහි වනාහි **බහිද්ධා** බාහිර **මහාභූතාරම්මණං** මහාභූතාරම්මණය තෙමේ **අජ්ඣත්තිකකායපසාදං** ආධ්‍යාත්මික කායප්‍රශාදය හා **ඝට්ටෙත්වා** ගැටී **පසාදපච්චයේසු** ප්‍රශාදය ඇසුරු කරන **මහාභූතේසු** මහාභූතයන්හි **පටිහඤ්ඤති** හැපෙයි ("බහිද්ධා" යනු එය නිදර්ශන මාත්‍රයකි. ආධ්‍යාත්මික මහාභූතයන් ද වනාහි අරමුණු වෙයි. කායවිඤ්ඤාණය ඇසුරු කරන්නා වූ ප්‍රශාදයන්ගෙන් අන්‍යයෝ බාහිර යැයි කියනලදි. "කායප්පසාදං ඝට්ටෙත්වා පසාදපච්චයේසු මහාභූතේසු පටිහඤ්ඤති" යනු ආපාථයට පැමිණ හැපෙයි යන අර්ථය යයි මූලටීකායෙහි කියනලදි) **යථා** යම්සේ **අධිකරණිමත්ථකේ** කිණිහිර මත්තෙහි **කප්පාසපිචුපිණ්ඩං** කපු පුළුන් පිඬක් **ඨපෙත්වා** තබා **කූටේන** කුළකින් **පහරන්තස්ස** පහර දෙන්නාගේ (**තං පහාරං** ඒ පහර) **කප්පාසපිචුපිණ්ඩං** කපු පුළුන් පිඬ **භින්දිත්වා (අතික්කමිත්වා)** ඉක්මවා **කූටං** කුළ **අධිකරණිං** කිණිහිර **ගණ්හාති** ගනී **ඉති** මෙසේ **නිඝංසෝ** ගැටීම **බලවා හෝති** බලවත් වෙයි **ඒවමේව** මෙසේම (**බහිද්ධා** බාහිර **මහාභූතාරම්මණං** මහාභූතාරම්මණය **අජ්ඣත්තිකකායපසාදං** ආධ්‍යාත්මික කායප්‍රශාදය හා) **පටිඝට්ටනානිඝංසෝ** ගැටීම **බලවා හෝති** බලවත් වෙයි **ඉට්ඨේ ආරම්මණේ** ඉටු අරමුණෙහි **සුඛසහගතං** සුඛසහගත **කායවිඤ්ඤාණං** කායවිඤ්ඤාණය තෙමේ **උප්පජ්ජති** උපදී **අනිට්ඨේ (ආරම්මණේ)** අනිටු අරමුණෙහි **දුක්ඛසහගතං** දුක්ඛසහගත (**කායවිඤ්ඤාණං** කායවිඤ්ඤාණය තෙමේ **උප්පජ්ජති** උපදී)

**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

කායවිඤ්ඤාණං පනෙත්ථ සුඛයුත්තං.

**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 454 යටතේ); විසුද්ධිමග්ග අටුවා 340 පිට (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය විඤ්ඤාණස්කන්ධ 200 පිට (තායිවාන් මුද්‍රණය)]**

කායස්ස නිස්සයභූතානං නාතිඉට්ඨඵොට්ඨබ්බභූතානං පටිඝට්ටනානිඝංසස්ස බලවභාවතෝ **කායවිඤ්ඤාණං සුඛසම්පයුත්තං**. උපාදාරූපානංයේව ඝට්ටනා දුබ්බලාති චක්ඛුවිඤ්ඤාණාදීනි උපෙක්ඛාසහගතානි. තේනාහ **"සේසං උපෙක්ඛායුත්ත"**න්ති. **සේසං** ඡබ්බිධම්පි.

**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 454 යටතේ)]**

**එත්ථ පන** මෙහි වනාහි **කායවිඤ්ඤාණං** කායවිඤ්ඤාණ තෙම **සුඛයුත්තං** සුඛසහතය ...

කායප්‍රශාදයට නිශ්‍රයභූතයන්ගේ ද අති ඉෂ්ට ස්ප්‍රෂ්ටව්‍ය නොවන්නාද වූ භූතයන්ගේ ද අන්‍යෝන්‍ය ඝට්ටනය බලවත් බැවින් කායවිඤ්ඤාණය සුඛසම්ප්‍රයුක්තම වේ. උපාදය රූපයන්ගේම ඝට්ටනයක් බැවින් චක්ෂුර්විඤ්ඤාණාදීහු උපේක්ෂාසහ

ගියා වෙත්. එහෙයින් කීහ "සේසං උපෙක්ඛායුත්තන්ති" යි සෙසු ෂඩාලම්බන චිත්තය උපේක්ෂාසහ ගියාම වේ යන අර්ථයි. **[විසුද්ධි මාර්ග මහා සන්නය 1096 පිට]**

චක්ඛුවිඤ්ඤාණාදීනි හි චත්තාරි චක්ඛුපසාදදීසු චතූසු උපාදයරූපේසු උපාදයරූපානං ඝට්ටනානිඝංසස්ස පිචුපිණ්ඩේ පිචුපිණ්ඩස්සේවාතිදුබ්බලතාය උපෙක්ඛාවේදනාසම්පයුත්තානේව හොන්ති. කායවිඤ්ඤාණං පන කායින්ද්‍රියේ ඵොට්ඨබ්බභූතත්තයඝට්ටනානිඝංසස්ස අධිකරණිමත්ථකේ ඨපිතපිචුපිණ්ඩේ කූටපහාරස්සේව බලවතාය පසාදනිස්සයේසුපි භූතේසු පටිඝාතසම්භවතෝ සුඛසහගතං හෝති, මනෝධාතු අත්තනෝ ගහණදුබ්බලතාය අතිඉට්ඨේපි උපෙක්ඛාසහගතාව, මනෝවිඤ්ඤාණධාතු පන අතිඉට්ඨේ සෝමනස්සසහගතා, ඉට්ඨමජ්ඣත්තේ උපෙක්ඛාසහගතාති අයං සම්පයෝගතෝ විනිච්ඡයෝ.

**[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා අබ්‍යාකතපදත්ථෝ යටතේ)]**

**හි** විස්තර කෙරෙමි **චක්ඛුපසාදදීසු** චක්‍ෂුස්ප්‍රශාදදී **චතූසු** සතර වැදෑරුම් වූ **උපාදයරූපේසු** උපාදය රූපයන්හි **උපාදයරූපානං** උපාදය රූපයන්ගේ **ඝට්ටනානිඝංසස්ස** ගැටීම **පිචුපිණ්ඩේ** පුළුන් පිඩෙහි **පිචුපිණ්ඩස්ස ඉව** පුළුන් පිඩකගේ ගැටීම මෙන් **අතිදුබ්බලත්තා** ඉතා දුර්වල බැවින් **චක්ඛුවිඤ්ඤාණාදීනි** චක්‍ෂුර්විඤ්ඤාණාදි වූ **චත්තාරි (චිත්තානි)** සිව් වැදෑරුම් චිත්තයෝ තුමූ **උපෙක්ඛාවේදනාසම්පයුත්තානේව** උපේක්‍ෂා වේදනාවෙන් යුක්තවූවෝම **හොන්ති** වෙත්(කායවිඤ්ඤාණය කුමක් හෙයින් සුඛසහගත වන්නේ ද? යන චෝද්‍ය සඳහා "කායවිඤ්ඤාණං -පෙ- සුඛසහගතං" යන පාඨය කියනලදි) **කායින්ද්‍රියේ** කායප්‍රශාදයෙහි **ඵොට්ඨබ්බභූතත්තය** පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සඞ්ඛ්‍යාත ඵොට්ඨබ්බාරම්මණයාගේ **ඝට්ටනානිඝංසස්ස** ගැටීම **අධිකරණිමත්ථකේ** කිණිහිරය මත්තෙහි **ඨපිතපිචුපිණ්ඩේ** තබනලද පුළුන් පිඩෙහි **කූටපහාරස්ස ඉව** කුලුගෙඩි පහරගේ ගැටීම මෙන් **බලවතාය** බලවත් බැවින් **පසාදනිස්සයේසුපි භූතේසු** කායප්‍රශාදය නිශ්‍රය කොට ඇති භූතරූපයන්හි **පටිඝාතසම්භවතෝ** ගැටීමහටගන්නා බැවින් **කායවිඤ්ඤාණං පන** කායවිඤ්ඤාණ චිත්තය තෙමේ වනාහි **සුඛසහගතං** සුඛසහගත **හෝති** වෙයි **මනෝධාතු** මනෝධාතු තුමූ **අත්තනෝ** තමාගේ **ගහණදුබ්බලතාය** අරමුණු ගැනීම දුර්වල බැවින් **අතිඉට්ඨේපි** අති ඉෂ්ටාරම්මණයෙහි ද **උපෙක්ඛාසහගතාව** උපේක්‍ෂා වේදනාවෙන් යුක්තවම (**හෝති** වෙයි) **මනෝවිඤ්ඤාණධාතු පන** මනෝවිඤ්ඤාණ ධාතු තුමූ වනාහි **අතිඉට්ඨේ** අති ඉෂ්ටාරම්මණයෙහි **සෝමනස්සසහගතා** සොම්නස් වේදනාවෙන් යුක්ත වෙයි **ඉට්ඨමජ්ඣත්තේ** ඉෂ්ට මධ්‍යස්ථ ආරම්මණයෙහි **උපෙක්ඛාසහගතා** උපේක්‍ෂා වේදනාවෙන් යුක්ත **ඉති (හෝති)** වෙයි **අයං** මේ **සම්පයෝගතෝ** සම්ප්‍රයෝග වශයෙන් **විනිච්ඡයෝ** විනිශ්චයයි. **[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

චක්ඛුවිඤ්ඤාණාදීනි පන චත්තාරි උභයවිපාකානිපි වත්ථාරම්මණඝට්ටනාය දුබ්බලභාවතෝ අනිට්ඨේ ඉට්ඨේපි ච ආරම්මණේ උපෙක්ඛාසහගතානේව. තේසඤ්හි චතුන්නම්පි වත්ථුභූතානි චක්ඛාදීනි උපාදරූපානේව, තථා ආරම්මණභූතානිපි රූපාදීනි, උපාදරූපකේන ච උපාදරූපකස්ස සඞ්ඝට්ටනං අතිදුබ්බලං පිචුපිණ්ඩකේන පිචුපිණ්ඩකස්ස ඵුසනං විය, තස්මා තානි සබ්බථාපි උපෙක්ඛාසහගතානේව. කායවිඤ්ඤාණස්ස පන ඵොට්ඨබ්බසඞ්ඛාතභූතත්තයමේව ආරම්මණන්ති තං කායප්පසාදේ සඞ්ඝට්ටිතම්පි තං අතික්කමිත්වා තන්නිස්සයේසු මහාභූතේසු පටිහඤ්ඤති. භූතරූපේහි ච භූතරූපානං සඞ්ඝට්ටනං බලවතරං අධිකරණිමත්ථකේ

පිචුපිණ්ඩකං ඨපෙත්වා කූටේන පහටකාලේ කූටස්ස පිචුපිණ්ඩකං අතික්කමිත්වා අධිකරණිග්ගහණං විය, තස්මා වත්ථාරම්මණඝට්ටනාය බලවභාවතෝ කායවිඤ්ඤාණං අනිට්ඨේ දුක්ඛසහගතං, ඉට්ඨේ සුඛසහගතන්ති. සම්පටිච්ඡනයුගළං පන අත්තනා අසමානනිස්සයානං චක්ඛුවිඤ්ඤාණාදීනමනන්තරං උප්පජ්ජතීති සමානනිස්සයතෝ අලද්ධානන්තරපච්චයතාය සහාගූපත්ථම්භරහිතෝ විය පුරිසෝ නාතිබලවං සබ්බථාපි විසයරසමනුභවිතුං න සක්කෝතීති සබ්බථාපි උපෙක්ඛාසහගතමේව. වුත්තවිපරියායතෝ කුසලවිපාකසන්තීරණං ඉට්ඨඉට්ඨමජ්ඣත්තාරම්මණේසු සුඛෝපෙක්ඛාසහගතන්ති. යදි ඒවං ආවජ්ජනද්වයස්ස උපෙක්ඛාසම්පයෝගං කස්මා වක්ඛති, නනු තම්පි සමානනිස්සයානන්තරං පවත්තතීති? සච්චං, තත්ථ පන පුරිමං පුබ්බේ කේනචි අග්ගහිතේයේව ආරම්මණේ ඒකවාරමේව පවත්තති, පච්ඡිමම්පි විසදිසචිත්තසන්තානපරාවත්තනවසේන බ්‍යාපාරන්තරසාපෙක්ඛන්ති න සබ්බථාපි විසයරසමනුභවිතුං සක්කෝති, තස්මා මජ්ඣත්තවේදනාසම්පයුත්තමේවාති. හොන්ති චෙත්ථ;

"වත්ථාලම්බසභාවානං, භූතිකානඤ්හි ඝට්ටනං;
දුබ්බලං ඉති චක්ඛාදි-චතුචිත්තමුපෙක්ඛකං.

"කායනිස්සයඵොට්ඨබ්බ-භූතානං ඝට්ටනාය තු;
බලවත්තා න විඤ්ඤාණං, කායික මජ්ඣවේදනං.

"සමානනිස්සයෝ යස්මා, නත්ථානන්තරපච්චයෝ;
තස්මා දුබ්බලමාලම්බේ, සෝපෙක්ඛං සම්පටිච්ඡන"න්ති.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අහේතුකචිත්ත වණ්ණනා අංක 10 යටතේ) විභාවනී ටීකා 42-46 පිටු; සද්ධර්මසාගරය 02/431-432 පිටු; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 14-15 පිටු; අභිධර්ම ප්‍රකාශය 30 පිට; විස්තර භාව සන්නය 20 පිට]**

**චක්ඛුවිඤ්ඤාණාදීනි** චක්‍ෂුර්විඤ්ඤාණාදී වූ **චත්තාරි පන** සතර ප්‍රභේද ඇත්තාවූ වනාහි **උභයවිපාකානිපි** කුසලාකුසල විපාකයෝ ද **වත්ථාරම්මණඝට්ටනාය** වස්තු ආලම්බනයන්ගේ අන්‍යෝන්‍ය ඝට්ටනයාගේ **දුබ්බලභාවතෝ** දුර්වල බැවින් **අනිට්ඨේ ආරම්මණේපි ච** අනිටු වූ අරමුණෙහි ද **ඉට්ඨේ ආරම්මණේපි ච** ඉටු අරමුණේ ද **උපෙක්ඛාසහගතානේව හොන්ති** උපේක්‍ෂා සහගත වූවාහුම වෙත්. (චක්‍ෂුර්විඤ්ඤාණාදීහු වස්තු ආලම්බනයන්ගේ අන්‍යෝන්‍ය ඝට්ටනය දුර්වල හෙයින් අනිෂ්ටාලම්බන ඉෂ්ටාලම්බනයෙහි ද උපේක්‍ෂා සහගතම වන්නාහුයයි ආචාර්‍ය්‍ය තෙම කීයේය. කුමක්හෙයින් වස්තු ආලම්බනයන්ගේ අන්‍යෝන්‍ය ඝට්ටනය දුර්වල වන්නේ දැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "තේසඤ්හි -පෙ- අතිදුබ්බලං" යන පාඨය කියනලදි)

(තේසඤ්හි යන්නෙහි "හි" ශබ්දය විස්තරාර්ථයෙහිය) **තේසං චතුන්නම්පි** ඒ සතර චිත්තයන්ගේ ද **වත්ථුභූතානි** නිශ්‍රයවස්තු වූ **චක්ඛාදීනි** චක්‍ෂුප්‍රසාදාදීහු **උපාදරූපානේව හොන්ති** උපාදරූපයෝම වෙත් **ආරම්මණභූතානි** අරමුණු වූ **රූපාදීනිපි** රූපාලම්බනාදීහු ද **තථා** එපරිද්දෙන් **උපාදරූපානේව හොන්ති** උපාදරූපයෝම වෙත් **උපාදරූපකේනච** උපාදරූපය හා සමග **උපාදරූපකස්ස** උපාදරූපයක්හුගේ **සඞ්ඝට්ටනං** ගැටීම **අතිදුබ්බලං හෝති** අතිශයින් දුර්වල වේ (කුමක්මෙන්ද යන චෝද්‍යයට පරිහාර පිණිස "පිචුපිණ්ඩකේන -පෙ- විය" යන පාඨය කියනලදි) (කිම්ව යන පාඨ ශේෂයි) **පිචුපිණ්ඩකේන** පුළුන් පිඩකින් **පිචුපිණ්ඩකස්ස**

පුළුන් පිඩකට **ඵුසනං විය** ස්පර්ශ කිරීමක් හෙවත් ගැටීමක් මෙනි **තස්මා** එසේ වස්තු ආලම්බනයන්ගේ ඝට්ටනය අතිශය දුර්වල හෙයින් **තානි** ඒ චක්ෂුර්විඥ්ඥාණාදී වූ චිත්තයෝ සතරදෙන **සබ්බථාපි** සියළු ඉෂ්ටාලම්බනාදී ප්‍රභේද වශයෙන් ද **උපෙක්ඛාසහගතානේව හොන්ති** උපේක්ෂා සහගත වූවාහුම වෙත් (චක්ෂුර්විඥ්ඥාණාදී චිත්තයෝ තුමූ වස්තු ආලම්බනයන්ගේ අන්‍යෝන්‍ය ඝට්ටනය දුර්වල බැවින් උපේක්ෂා සහගතම වෙති ආචාර්‍ය්‍ය තෙම කීයේය. කායවිඥ්ඥාණය වනාහි කුමක් හෙයින් දුක්ඛසහගත සුඛසහගත වන්නේදැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "කායවිඥ්ණස්ස පන -පෙ- සුඛසහගතන්ති" යන පාඨය කියනලදි)

**කායවිඤ්ඤාණස්ස පන** කායවිඥ්ඥාණයට වනාහි **ඵොට්ඨබ්බසඞ්ඛාත භූතත්තයමේව** පහස් අරමුණයයි කියනලද භූතත්‍රයගේ සමුදයම **ආරම්මණං හෝති** අරමුණු වේ **ඉති (තස්මා)** (බලවතරං යන්නෙහි සම්බන්ධ කටයුතුයි) **තං** ඒ පහස් අරමුණ **කායප්පසාදේ** කායප්‍රශාදයෙහි **සඞ්ඝට්ටිතම්පි** ගැටුනේ ද **තං** ඒ කායප්‍රශාදය **අතික්කමිත්වා** ඉක්මවා **තන්නිස්සයේසු** ඒ කායප්‍රශාදයාගේ නිශ්‍රය ස්ථානය වූ **මහාභූතේසු** මහාභූතයන් කෙරෙහි **පටිහඤ්ඤති** ප්‍රතිහණනය වේ **භූතරූපේහි** භූතරූපයන් හා **භූතරූපානං** භූතරූපයන්ගේ **සඞ්ඝට්ටනං** ගැටීම **බලවතරං හෝති** අතිශයින් බලවත් වේ (**කිම්ව** කුමක්මෙන් ද යත්?) **අධිකරණීමත්තකේ** කිණිර මුදුනෙහි **පිචුපිණ්ඩකං** පුළුන් පිඩක් **ඨපෙත්වා** තබා **කූටේන** කුළකින් **පහටකාලේ** පහළකල්හි **කූටස්ස** කුළගේ **පිචුපිණ්ඩකං** පුළුන් පිඩ **අතික්කමිත්වා** ඉක්මවා **අධිකරණිගහණං විය** කිණිර ගැනීමක් මෙන් **වත්ථාරම්මණඝට්ටනාය** කායප්‍රශාද වස්තු ස්පර්ශාලම්බනයන්ගේ අන්‍යෝන්‍ය ඝට්ටනයාගේ **තස්මා බලවභාවතෝ** එසේ ශක්තිය ඇති බැවින් **කායවිඤ්ඤාණං** කායවිඥ්ඥාණ තෙමේ **අනිට්ඨේ** අනිටු අරමුණෙහි **දුක්ඛසහගතං හෝති** දුක් වේදනා සහ ගියේ වේ **ඉට්ඨේ** ඉටු අරම්ණෙහි **සුඛසහගතං හෝති** සුඛ වේදනා සහ ගියේ වෙයි (ඉති ශබ්දය පරිසමාපනාර්ථයි)

(සම්ප්‍රතෝෂණ යුගලය වනාහි කුමක් හෙයින් උපේක්ෂා සහගතම වන්නේ ද? යන චෝද්‍යය සඳහා "සම්පටිච්ඡනයුගලං පන" යන පාඨය කියනලදි) **සම්පටිච්ඡනයුගලං පන** සම්ප්‍රතෝෂණ චිත්තයුග්මය වනාහි **අත්තනා** තමා හා **අසමානනිස්සයානං** අසමාන නිශ්‍රය ස්ථාන ඇත්තාවූ **චක්ඛුවිඤ්ඤාණාදීනං** චක්ෂුර්විඥ්ඥාණාදීන්ට **අනන්තරං** අනතුරුව **උප්පජ්ජති** උපදී **ඉති (තස්මා) සමානනිස්සයතෝ** සමාන නිශ්‍රය වූ චිත්තයකින් **අලද්ධානන්තරපච්චයතාය** අනන්තර ප්‍රත්‍යයක් නොලැබුණු හෙයින් **සභාගුපත්ථම්භරහිතෝ** ස්වභාව සදෘශවූ උපස්ථම්භක පුරුෂයෙකු කෙරෙන් වෙන් වූ **පුරිසෝ විය** පුරුෂයෙකු මෙන් **නාතිබලවං** අතිශයින් බලවත් නූයේ **යස්මා හෝති** යම්හෙයකින් වේද **තස්මා** එසේ හෙයින් **සබ්බථාපි** සියළු ඉෂ්ටාලම්බනාදීන්ගේ වශයෙන් ද **විසයරසං** ආලම්බන රසය **අනුභවිතුං** අනුභව කරන්නට **න සක්කෝති** නොහැකිවේද **ඉති (තස්මා) සබ්බථාපි** සියළු ඉෂ්ටාලම්බනාදියෙහි ද **උපක්ඛාසහගතමේව හෝති** උපේක්ෂා වේදනා සහ ගියේම වේ ෴

(වුත්තවිපරියායතෝ "අත්තනා අසමානනිස්සයං" යනාදි වශයෙන් කියනලද ක්‍රමයට විපරීත වශයෙන්) **කුසලවිපාකසන්තීරණං** කුසලවිපාක සන්තීරණ තෙමේ **ඉට්ඨඉට්ඨමජ්ඣත්තාරම්මණේසු** ඉෂ්ටාලම්බන ඉෂ්ටමධ්‍යස්ථාලම්බනයෙහි **සුඛෝපෙක්ඛාසහගතං හෝති** සුඛ වේදනා උපේක්ෂා වේදනාවන්ගෙන් යුක්තවූයේ වේ (වුත්තවිපරියායතෝ යන පාඨයෙන් සම්ප්‍රතෝෂණ යුගලයෙහි කියනලද "අත්තනා

අසමානනිස්සයානං” යනාදී වාක්‍යයට විපරීත වූ “අත්තනා සමානනිස්සයස්ස කුසලවිපාකසම්පටිච්ඡනස්ස අනන්තරං උප්පජ්ජතීති සමානනිස්සයතෝ ලද්ධානන්තරපච්චයතාය සභාගුපත්ථම්භසහිතෝ පුරිසෝ විය අතිබලවන්ති සබ්බථාපි ආලම්බනරසං අනුභවිතුං සක්කෝතීති ඉට්ඨඉට්ඨමජ්ඣත්තාරම්මණේසු යථාරහං සුඛෝපෙක්ඛාසහගතං හෝති” යන වාක්‍යය ප්‍රකාශ කෙළේයි)

**සමානනිස්සයතෝ** සමාන නිශ්‍රය වූ සිතකින් **ලද්ධානන්තරපච්චයතාය** ලබනලද අනන්තර ප්‍රත්‍යය ඇති බැවින් **කුසලවිපාකසන්තීරණං** කුසලවිපාක සන්තීරණ තෙමේ **සුඛෝපෙක්ඛාසහගතං යදි සියා** සුඛ වේදනා උපේක්‍ෂා වේදනාවන්ගෙන් ඉදින් යුක්ත වී නම් (සමානනිස්සයතෝ යනාදිය පාඨ ශේෂයි) **ඒවං සති** මෙසේ වීමක් ඇති කල්හි **ආවජ්ජනද්වයස්ස** පඤ්චද්වාරාවර්ජන මනෝද්වාරාවර්ජන දෙදෙන **උපෙක්ඛාසම්පයෝගං කත්වා** උපේක්‍ෂා වේදනාව හා සම්ප්‍රයෝග කොට **කස්මා** කුමක්හෙයින් **ආචරියෝ** අනුරුද්ධාචරිය තෙමේ **වක්ඛති** ව්‍යක්‍ෂමාන වන්නේද යත්? **තම්පි (ආවජ්ජනද්වයං)** ඒ ආවර්ජන යුගලය ද **සමානනිස්සයානන්තරං** සදෘශනිශ්‍රය ඇත්තා වූ **භවඞ්ගුපච්ඡේදයට** අනතුරුව **පවත්තති නනු?** පවත්නේ නොවේද යත්? **ඉති (චෝදනායං සති** මෙබඳු චෝදනාවක් ඇති කල්හි) **සච්චං** එසේවීම සැබෑයි (එසේවීම සැබෑ වන්නේ නම් කුමක්හෙයින් ආවර්ජනද්වය උපේක්‍ෂා වේදනාවෙන්ම යුක්ත වන්නේ ද යන චෝද්‍යය සඳහා “තත්ථ පන -පෙ- සම්පයුත්තමේව” යන පාඨය කියනලදි)

**පන (තථාපි)** එසේ සැබෑවූයේ ද **තත්ථ** ඒ ආවර්ජනා දෙසිත අතුරෙන් **පුරිමං** පෙරටුව හටගන්නා පඤ්චද්වාරාවර්ජන සිත් තෙමේ **පුබ්බේ** පූර්වයෙහි **කේනචි** කිසියම් වීථිචිත්තයක්හු විසින් **අගහිතේයේව** නොගන්නා ලද්දම වූ **ආරම්මණේ** අරමුණෙහි **ඒකවාරමේව** එක් වරක්ම **පවත්තති** පවත්නේයි **පච්ඡිමම්පි** පසුව හටගන්නා වූ මනෝද්වාරාවර්ජන තෙමේද **විසදිසචිත්තසන්තානපරාවත්තනවසේන** අසමාන වූ ජවන භවඞ්ග චිත්ත පරම්පරාවකට අනන්තරාදී ප්‍රත්‍යයෙන් පරිවර්තනය කරවීම් වශයෙන් **ව්‍යාපාරානන්තරසාපෙක්ඛං** ක්‍රියා විශේෂයක් අපේක්‍ෂා කිරීම හා සමඟ වන්නේයි **ඉති (තස්මා) සබ්බථාපි** සියළු ආකාරයෙනුදු **විසයරසං** ආලම්බන රසය **අනුභවිතුං න සක්කෝති** අනුභව කළ නොහැකි වෙත් **තස්මා** එසේහෙයින් **මජ්ඣත්තවේදනාසම්පයුත්තමේව හෝති** උපේක්‍ෂා වේදනාවෙන් යුක්තවූයේම වෙයි (ඉති ශබ්දය පරිසමාපනාර්ථයි) **එත්ථ** මේ අහේතුක චිත්ත විභාගයෙහි **සඞ්ගහ** නිගමන සඞ්ග්‍රහ ගාථාවෝ **හොන්ති** වෙත් (ඒ සඞ්ග්‍රහ ගාථාවෝ කවරහුදැයි යන චෝද්‍යයට පරිහාර පිණිස “වත්ථාලම්බසභාවානං -පෙ- සම්පටිච්ඡනං” යන ගාථාත්‍රය කියනලදි)

**වත්ථාලම්බනසභාවානං** වස්තු ස්වභාව ආලම්බන ස්වභාව ඇත්තාවූ **භූතිකානං** උපාදරූපයන්ගේ **ඝට්ටනං** ගැටීම **දුබ්බලං** දුර්වල වූයේ **හි (යස්මා)** යම්හෙයකින් **හෝති** වේද **ඉති (තස්මා) චක්ඛාදිවත්විත්තං** චක්‍ෂුර්විඤ්ඤාණාදී චිත්තයෝ සතරදෙන **උපෙක්ඛකං හෝති** උපේක්‍ෂා වේදනාවෙන් යුක්ත වූයේ වෙයි.

**කායනිස්සයඵොට්ඨබ්බයභූතානං** කායවිඤ්ඤාණයාගේ ආශ්‍රය ස්ථානය වූ ස්පර්ශාලම්බනයාගේ කෘත්‍යයකාරී වූ මහාභූතයන්ගේ **ඝට්ටනාය තු** ගැටීම වනාහි **බලවත්තා** බලවත් බැවින් **කායිකං** කායප්‍රශාදය නිශ්‍රය කොට හටගන්නා වූ

**විඤ්ඤාණං** විඤ්ඤාණ තෙමේ **මජ්ඣත්තවේදනං න හෝති** උපේක්‍ෂා වේදනාවෙන් යුක්තවූයේ නොවෙයි.

**සම්පටිච්ඡනස්ස** සම්ප්‍රතෝ්ෂණ චිත්තයට (මේ වනාහි සම්ප්‍රදාන විභක්තියි) **සමානනිස්සයෝ** සදෘශ වූ ආශ්‍රය ස්ථාන ඇත්තාවූ **අනන්තරපච්චයෝ** අනන්තර ප්‍රත්‍යය තෙමේ **යස්මා නත්ථි** යම්හෙයකින් නැත්තේ වේද **තස්මා** එසේ හෙයින් **ආලම්බේ** අරමුණෙහි **දුබ්බලං** දුර්වල වූ **සම්පටිච්ඡනං** සම්ප්‍රතෝ්ෂණ චිත්තය තෙමේ **සෝපෙක්ඛං හෝති** උපේක්‍ෂා වේදනාවෙන් යුක්තවූයේ වේ.

**[විභාවනී ටීකා සන්නය 76-80 පිටු]**

විජානාතීති **විඤ්ඤාණං**. යථාහ; විජානාති විජානාතීති ඛෝ භික්ඛවේ තස්මා විඤ්ඤාණන්ති වුච්චතීති. චක්ඛුං නිස්සිතං විඤ්ඤාණං **චක්ඛුවිඤ්ඤාණං**. චක්ඛුනා වා පච්චයභූතේන ජනිතං විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං. කම්මේන වා චක්ඛුස්ස උපනීතං විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං. චක්ඛුතෝ වා ජාතං විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං. චක්ඛුස්ස වා ඉන්ද්‍රියභාවේන සාමි භූතස්ස විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං. චක්ඛුස්මිං වා උප්පන්නං විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං. ඒස නයෝ සෝතවිඤ්ඤාණාදීසුපි. පාළියං පන මහා තණ්හාසඞ්ඛයසුත්තේ;

සෙය්‍යථාපි භික්ඛවේ කට්ඨඤ්ච පටිච්ච අග්ගි ජලති. කට්ඨග්ගීත්වේව සඞ්ඛ්‍යං ගච්ඡති. සකලිකඤ්ච පටිච්ච අග්ගි ජලති. සකලිකග්ගීත්වේව සඞ්ඛ්‍යං ගච්ඡති. තිණඤ්ච පටිච්ච අග්ගි ජලති. තිණග්ගීත්වේව සඞ්ඛ්‍යං ගච්ඡති. ගෝමයඤ්ච පටිච්ච අග්ගි ජලති. ගෝමයග්ගීත්වේව සඞ්ඛ්‍යං ගච්ඡති. ථුසඤ්ච පටිච්ච අග්ගි ජලති. ථුසග්ගීත්වේව සඞ්ඛ්‍යං ගච්ඡති. සඞ්කාරඤ්ච පටිච්ච අග්ගි ජලති. සඞ්කාරග්ගීත්වේව සඞ්ඛ්‍යං ගච්ඡති. ඒවමේව ඛෝ භික්ඛවේ චක්ඛුඤ්ච පටිච්ච රූපේච උප්පජ්ජති විඤ්ඤාණං. චක්ඛුවිඤ්ඤාණන්තේව සඞ්ඛ්‍යං ගච්ඡති. සෝතඤ්ච පටිච්ච සද්දේ ච උප්පජ්ජති විඤ්ඤාණං. සෝතවිඤ්ඤාණන්තේව සඞ්ඛ්‍යං ගච්ඡති. ඝානඤ්ච පටිච්ච ගන්ධේච උප්පජ්ජති විඤ්ඤාණං. ඝානවිඤ්ඤාණන්තේව සඞ්ඛ්‍යං ගච්ඡති. ජිව්හඤ්ච පටිච්ච රසේච උප්පජ්ජති විඤ්ඤාණං. ජිව්හාවිඤ්ඤාණන්තේව සඞ්ඛ්‍යං ගච්ඡති. කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බේච උප්පජ්ජති විඤ්ඤාණං. කායවිඤ්ඤාණන්තේව සඞ්ඛ්‍යං ගච්ඡති. මනඤ්ච පටිච්ච ධම්මේච උප්පජ්ජති විඤ්ඤාණං. මනෝ විඤ්ඤාණන්තේව සඞ්ඛ්‍යං ගච්ඡතීති වුත්තං.

**තථාති** ඉමිනා උපෙක්ඛාසහගතන්ති පදං ආකඩ්ඪති. දුක්ඛයතීති **දුක්ඛං**. සම්පයුත්තධම්මේ තං සමඞ්ගිපුග්ගලං වා බාධති හිංසතීති අත්ථෝ. දුට්ඨුවා ඛනති කායිකසුඛන්ති දුක්ඛං. දුක්කරේන වා ඛමිතබ්බන්ති දුක්ඛං. දුක්කරං ඕකාසදානං ඒතස්සාතිවා දුක්ඛං. කායිකදුක්ඛවේදනායේව නාමං.

**[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 31 යටතේ)]**

සුත්තපාළියං, "කට්ඨ"න්ති සුක්ඛදාරුං. "සකලික"න්ති ඡින්දිතඵාලිතං කට්ඨක්ඛණ්ඩකං. "ථුස"න්ති වීහිසුඞ්කං. "සඞ්කාර"න්ති කචවරං. චක්ඛුඤ්චරූපේ ච පටිච්ච යං විඤ්ඤාණං උප්පජ්ජති. තං චක්ඛුවිඤ්ඤාණන්ත්වේව වුච්චතීති ආදිනා යෝජේතබ්බං. තත්ථ "රූපේ"ති රූපාරම්මණානං. "සද්දේ"ති ආදීසුපි ඒසනයෝ. එත්ථ ච විඤ්ඤාණානි ඒකවත්ථුනිස්සිතානි හොන්ති. තස්මා වත්ථුද්වාරේසු ඒකවචනං වුත්තං. ආරම්මණානි පන ඒකවිඤ්ඤාණේනාපි බහූනි ගහිතානි. තස්මා ආරම්මණේසු බහුවචනං. "දුක්ඛයතී"ති දුක්ඛං කරෝති. නාමධාතුපදඤ්හේතං. යථා අත්තානං

සුඛේති වීණෝතීති සද්දවිදූ. ධාතුපාඨේසු පන සුඛදුක්ඛතක්කිරියායංති වුත්තං. තක්කිරියාති ච සුඛකිරියා දුක්ඛකිරියාති අත්ථෝ. සාතකිරියා අස්සාතකිරියාති වුත්තං හෝති. ච සද්දෝ ඕකාසත්ථෝති කත්වා "දුක්කරං ඕකාසදන"න්ති වුත්තං.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 31 යටතේ)]**

**විජානාතීති** දැනගන්නේනුයි **විඤ්ඤාණං** විඤ්ඤාණ නම් **යථා** එසේහෙයින් **විජානාති විජානාතීති බෝ භික්ඛවේ තස්මා විඤ්ඤාණන්ති වුච්චති ඉති ආහ** විජානාති -පෙ- වුච්චති යනුවෙන් වදාළ සේක **චක්ඛුං** චක්‍ෂුස්ප්‍රශාදය **නිස්සිතං** ඇසුරු කරනලද **විඤ්ඤාණං** විඤ්ඤාණය තෙම **චක්ඛුවිඤ්ඤාණං** චක්ඛුවිඤ්ඤාණ නම් **චක්ඛුනා වා පච්චයභූතේන** චක්‍ෂුර්ප්‍රශාදය ප්‍රත්‍යය වීමෙන් හෝ **ජනිතං** උපදිනලද **විඤ්ඤාණං** විඤ්ඤාණ තෙම **චක්ඛුවිඤ්ඤාණං** චක්ඛුවිඤ්ඤාණ නම් **කම්මේන වා** කර්මයෙන් හෝ **චක්ඛුස්ස** චක්‍ෂුස්ප්‍රශාදයට **උපනීතං** එළවනලද **විඤ්ඤාණං** විඤ්ඤාණ තෙම **චක්ඛුවිඤ්ඤාණං** චක්ඛුවිඤ්ඤාණ නම් **චක්ඛුතෝ වා** චක්‍ෂුස්ප්‍රශාදයෙන් හෝ **ජාතං** උපදිනලද **විඤ්ඤාණං** විඤ්ඤාණ තෙම **චක්ඛුවිඤ්ඤාණං** චක්ඛුවිඤ්ඤාණ නම් **චක්ඛුස්ස** චක්‍ෂුස්ප්‍රශාදයාගේ **ඉන්ද්‍රියභාවේන වා** ඉසුරුමත් භාවයෙන් හෝ **සාමි භූතස්ස** චක්‍ෂුස්ප්‍රශාදය නම් අධිපතිහුගේ **විඤ්ඤාණං** විඤ්ඤාණය තෙම **චක්ඛුවිඤ්ඤාණං** චක්ඛුවිඤ්ඤාණ නම් **චක්ඛුස්මිං වා** චක්‍ෂුස්ප්‍රශාදයෙහි හෝ **උප්පන්නං** උපදිනලද **විඤ්ඤාණං** විඤ්ඤාණය තෙම **චක්ඛුවිඤ්ඤාණං** චක්ඛුවිඤ්ඤාණ නම් **සෝතවිඤ්ඤාණාදීසුපි** ශ්‍රෝත්‍රවිඤ්ඤාණාදියෙහිදු **ඒසනයෝ** මේ ක්‍රමයයි.

**පාළියං** සූත්‍රාන්ත පාළියෙහි **මහාතණ්හාසඞ්ඛයසුත්තේ පන** මහාතණ්හාසඞ්ඛය සූත්‍රයෙහි වනාහි; **භික්ඛවේ** මහණෙනි! **සෙය්‍යථාපි** යම්සේද **කට්ඨඤ්ච** වියළි දර ද **පටිච්ච** හේතුවෙන් **අග්ගි** ගින්න **ජලති** දැල්වෙයි **කට්ඨග්ගි ඉති** වියළි දර වලින් උපන් ගින්න යන **සඞ්ඛං ඒව** සඞ්ඛ්‍යාවටම **ගච්ඡති** යයි **සකලිකඤ්ච** සිදිනලද පලනලද වියළි දර කැබලි ද **පටිච්ච** හේතුවෙන් **අග්ගි** ගින්න **ජලති** දැල්වෙයි **සකලිකග්ගි ඉති** සිදිනලද පලනලද දර කැබලිවලින් උපන් ගින්න යන **සඞ්ඛං ඒව** සඞ්ඛාවටම **ගච්ඡති** යයි **තිණඤ්ච** තෘණ ද **පටිච්ච** හේතුවෙන් **අග්ගි** ගින්න **ජලති** දැල්වෙයි **තිණග්ගි ඉති** තෘණ වලින් උපන් ගින්න යන **සඞ්ඛං ඒව** සඞ්ඛ්‍යාවටම **ගච්ඡති** යයි **ගෝමයඤ්ච** වියළි ගොම ද **පටිච්ච** හේතුවෙන් **අග්ගි** ගින්න **ජලති** දැල්වෙයි **ගෝමයග්ගි ඉති** වියළි ගොම වලින් උපන් ගින්න යන **සඞ්ඛං ඒව** සඞ්ඛ්‍යාවටම **ගච්ඡති** යයි **ථුසඤ්ච** වී පොතු ද **පටිච්ච** හේතුවෙන් **අග්ගි** ගින්න **ජලති** දැල්වෙයි **ථුසග්ගි ඉති** වී පොතු වලින් උපන් ගින්න යන **සඞ්ඛං ඒව** සඞ්ඛ්‍යාවටම **ගච්ඡති** යයි **සඞ්කාරඤ්ච** කැළිකසල ද **පටිච්ච** හේතුවෙන් **අග්ගි** ගින්න **ජලති** දැල්වෙයි **සඞ්කාරග්ගි ඉති** කැළිකසල වලින් උපන් ගින්න යන **සඞ්ඛං ඒව** සඞ්ඛ්‍යාවටම **ගච්ඡති** යයි **භික්ඛවේ** මහණෙනි! **ඒවමේව බෝ** මෙසේම වනාහි **චක්ඛුඤ්ච** චක්‍ෂුස්ප්‍රශාදය ද **රූපේ ච** රූපාරම්මණයන්ගේ ද **පටිච්ච** හේතුවෙන් **(යං) විඤ්ඤාණං** යම් විඤ්ඤාණයක් **උප්පජ්ජති** උපදී ද (**තං විඤ්ඤාණං** ඒ විඤ්ඤාණය) **චක්ඛුවිඤ්ඤාණං ඉති** චක්ඛුවිඤ්ඤාණය යන **සඞ්ඛං ඒව** සඞ්ඛ්‍යාවටම **ගච්ඡති** යයි **සෝතඤ්ච** ශ්‍රෝත්‍රප්‍රශාදය ද **සද්දේ ච** ශබ්දරම්මණයන්ගේ ද **පටිච්ච** හේතුවෙන් **(යං) විඤ්ඤාණං** යම් විඤ්ඤාණයක් **උප්පජ්ජති** උපදී ද (**තං විඤ්ඤාණං** ඒ විඤ්ඤාණය) **සෝතවිඤ්ඤාණං ඉති** ශ්‍රෝත්‍රවිඤ්ඤාණය යන **සඞ්ඛං ඒව** සඞ්ඛ්‍යාවටම **ගච්ඡති** යයි **ඝානඤ්ච** ඝ්‍රාණප්‍රශාදය ද **ගන්ධේ ච** ගන්ධාරම්මණයන්ගේ ද **පටිච්ච** හේතුවෙන් **(යං) විඤ්ඤාණං** යම් විඤ්ඤාණයක් **උප්පජ්ජති** උපදී ද (**තං විඤ්ඤාණං**

ඒ විඤ්ඤාණය) **ඝානවිඤ්ඤාණං ඉති** ඝ්‍රාණවිඤ්ඤාණය යන **සඞ්ඛං ඒව** සඞ්ඛ්‍යාවටම **ගච්ඡති** යයි **ජිව්හඤ්ච** ජිව්හාප්‍රශාදය ද **රසේ ච** රසාරම්මණයන්ගේ ද **පටිච්ච** හේතුවෙන් **(යං) විඤ්ඤාණං** යම් විඤ්ඤාණයක් **උප්පජ්ජති** උපදී ද (**තං විඤ්ඤාණං** ඒ විඤ්ඤාණය) **ජිව්හාවිඤ්ඤාණං ඉති** ජිව්හාවිඤ්ඤාණය යන **සඞ්ඛං ඒව** සඞ්ඛ්‍යාවටම **ගච්ඡති** යයි **කායඤ්ච** කායප්‍රශාදය ද **ඵොට්ඨබ්බේ ච** ඵොට්ඨබ්බාරම්මණයන්ගේ ද **පටිච්ච** හේතුවෙන් **(යං) විඤ්ඤාණං** යම් විඤ්ඤාණයක් **උප්පජ්ජති** උපදී ද (**තං විඤ්ඤාණං** ඒ විඤ්ඤාණය) **කායවිඤ්ඤාණං ඉති** කායවිඤ්ඤාණය යන **සඞ්ඛං ඒව** සඞ්ඛ්‍යාවටම **ගච්ඡති** යයි **මනඤ්ච** මනෝද්වාරය ද **ධම්මේ ච** ධම්මාරම්මණයන් ද **පටිච්ච** හේතුවෙන් **(යං) විඤ්ඤාණං** යම් විඤ්ඤාණයක් **උප්පජ්ජති** උපදී ද (**තං විඤ්ඤාණං** ඒ විඤ්ඤාණය) **මනෝවිඤ්ඤාණං ඉති** මනෝවිඤ්ඤාණය යන **සඞ්ඛං ඒව** සඞ්ඛ්‍යාවටම **ගච්ඡතීති** යයි යැයි **වුත්තං** දේශනා කරනලදි.

(මෙහි චක්ෂුර්විඤ්ඤාණයෝ ද එක් වස්තුවක් ඇසුරු කරන්නෝ වෙත්. එබැවින් වස්තු ද්වාරයන්හි උපදින විඤ්ඤාණය ඒකවචනයෙන් කියනලදි. ආරම්මණයෝ වනාහි එක් විඤ්ඤාණයකින් ද බොහෝ අරමුණු ගනිත්. එනිසා ආරම්මණයන්හි බහුවචනයෙන් කියනලදි)

**තථා ඉති** තථා යන **ඉමිනා** මෙයින් **උපෙක්ඛාසහගතං ඉති** උපේක්‍ෂාසහගත යන **පදං** පදය **ආකඩ්ඪති** අදී **දුක්ඛයතීති** දුක් වේදනා ඇති කරයිනුයි **දුක්ඛං** දුක්ඛ නම් (මෙය නාමධාතු පදයෙකි) **සම්පයුත්තධම්මේ වා** සම්ප්‍රයුක්ත ධර්මයන්ට හෝ **තං සමඞ්ගීපුග්ගලං වා** ඒ සම්ප්‍රයුක්ත ධර්මයන්ගෙන් යුත් පුද්ගලයාට හෝ **බාධති** බාධා කරයි **හිංසති ඉති** හිංසා කරයි යන **අත්ථෝ** අර්ථයයි **කායිකසුඛං** කායික සැපය **දුට්ඨු වා ඛනති** නොමනාසේ සාරයිනුයි නොහොත් කණීනුයි **දුක්ඛං** දුක්ඛ නම් **දුක්කරේන වා** දුකසේ හෝ **ඛමිතබ්බං ඉති** ඉවසියයුතු හෙයිනුයි **දුක්ඛං** දුක්ඛ නම් **දුක්කරං** දුකසේ **ඕකාසදානං** අවකාශය දීම **ඒතස්ස ඉති වා** මොහුටනුයි හෝ **දුක්ඛං** දුක්ඛ නම් **කායිකදුක්ඛවේදනායේව නාමං** කායික දුක් වේදනාවටම නමකි.

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

ඉට්ඨාරම්මණයෝගස්මිං, චක්ඛුවිඤ්ඤාණකාදිසු;
සති කස්මා උපෙක්ඛාව, වුත්තා චතූසු සත්ථුනා.

උපාදය ච රූපේන, උපාදරූපකෝ පන;
සඞ්ඝට්ටනානිඝංසස්ස, දුබ්බලත්තාති දීපයේ.

පසාදං පනතික්කම්ම, කූටංව පිචුපිණ්ඩකං;
භූතරූපේන භූතානං, ඝට්ටනාය සුඛාදිකං.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 84-86 යටතේ)]**

**චක්ඛුවිඤ්ඤාණකාදිසු චතූසු** චක්ෂුර්විඤ්ඤාණාදී සතරෙහි **ඉට්ඨාරම්මණයෝගස්මිං සති** ඉටු අරමුණක් හා යෙදීමක් ඇති කල්හි **සත්ථුනා** ශාස්තෘන්වහන්සේ විසින් **කස්මා?** කුමක්හෙයින් (**චක්ඛුවිඤ්ඤාණාදි චත්තාරි** චක්ෂුර්විඤ්ඤාණාදී සතර) **උපෙක්ඛාව** උපේක්‍ෂා වේදනාවෙන් යුක්තවම **වුත්තා** දේශනා කරනලදිද?

**පන** පරිහාරය මෙසේයි **උපාදය ච රූපේන** උපාදය රූපයක් සමඟ **උපාදරූපකේ** උපාද රූපයෙක්හි **සංඝට්ටනානිඝංසස්ස** ගැටීමගේ **දුබ්බලත්තා ඉති** දුබල බැවින් යැයි **දීපයේ** දක්වයි.

**පන** පක්‍ෂාන්තරයක් දක්වමි **පිචුපිණ්ඩකං** පුළුන් පිඩ **අතික්කම්ම** ඉක්මවා **කූටං ඉව** කුළ කිණිහිර ගන්නාක් මෙන් **පසාදං** කායප්‍රශාදය (**අතික්කම්ම** ඉක්මවා) **භූතරූපේන** භූතරූපයන් හා **භූතානං** භූතරූපයන්ගේ **ඝට්ටනාය** ගැටීමෙන් **සුඛාදිකං** සුඛ වේදනාව (**උප්පජ්ජති** උපදී) **[අභිධම්මාවතාර පරිවර්තනයි]**

නනු ච ඉට්ඨේ ආරම්මණේ සුඛවේදනා උප්පජ්ජති, අනිට්ඨේ දුක්ඛවේදනා, ඉට්ඨානිට්ඨමජ්ඣත්තේ උපෙක්ඛාවේදනා, චක්ඛුවිඤ්ඤාණාදයෝ ච කුසලවිපාකා ඉට්ඨේ, ඉට්ඨමජ්ඣත්තේ වා ආරම්මණේ උප්පජ්ජන්ති, තත්ථ යුත්තෝ තාව ඉට්ඨමජ්ඣත්තේ උපෙක්ඛාවේදනායෝගෝ, න පන ඉට්ඨාරම්මණේ, න චාපි ඒතං සක්කා වත්තුං පරිකප්පනාවසේන ඉට්ඨාරම්මණම්පි ඉට්ඨමජ්ඣත්තතෝ ගණ්හන්ති යථා "කම්මවිඤ්ඤාණ"න්ති විපාකානං අවඤ්චනීයභාවතෝ, තස්මා කථං ඉට්ඨේ, ඉට්ඨමජ්ඣත්තේ ච උප්පජ්ජමානේසු චක්ඛුසෝතඝානජිව්හාවිඤ්ඤාණේසු උපෙක්ඛාවේදනායේව සම්භවති, න සුඛවේදනා, යතෝ තේසු උපෙක්ඛාවේදනා වුත්තාති ඉමං චෝදනං සඞ්ඛේපතෝ දස්සේතුං **"ඉට්ඨාරම්මණයෝගස්මි"**න්ති ආදිං වත්වා පුන තස්සා සෝධනත්ථං **"උපාදය ච රූපේනා"**ති ආදි වුත්තං. භූතරූපං උපාදය නිස්සාය පවත්තං රූපං උපාදයරූපං. **"උපාදය ච රූපේනා"**ති පන "මනසි ච කාරෝ"ති ඒත්ථ වුත්තනයමේව. **"උපාදයකරූපේනා"**ති වා පාඨෝ, චක්ඛුවිඤ්ඤාණස්ස වත්ථුභූතේන චක්ඛුපසාදේන, තථා සෝතවිඤ්ඤාණාදීනං වත්ථුභූතේන සෝතපසාදදිනා ච උපාදයරූපේනාති අත්ථෝ. **උපාදරූපකේ පනා**ති ය-කාරලෝපං කත්වා නිද්දේසෝ "පටිසඞ්ඛා යෝනිසෝ"තිආදීසු විය, යථාක්කමං චක්ඛුවිඤ්ඤාණාදීනං ආරම්මණභූතේ රූපසද්දදිකේ උපාදයරූපේති අත්ථෝ. **සංඝට්ටනානිඝංසස්සා**ති සංඝට්ටනාසඞ්ඛාතස්ස නිඝංසස්ස. සංඝට්ටනායේව අඤ්ඤමඤ්ඤවිසයවිසයීභාවස්ස අනුරූපදේසුප්පත්තිසඞ්ඛාතනිඝංසෝ වියාති නිඝංසෝති වුච්චති. අථ වා සම්පත්තාසම්පත්තගගහණවසේන සංඝට්ටනාය නිඝංසස්ස චාති අත්ථෝ. චක්ඛුරූපසෝතසද්ද හි අඤ්ඤමඤ්ඤං අසම්පත්තායේව අනුරූපදේසුප්පත්තියා අඤ්ඤමඤ්ඤං ඝට්ටන්ති නාම. තතෝ තේසං වසේන ඝට්ටනාකාරභූතෝ අඤ්ඤමඤ්ඤාභිමුඛභාවෝ "සංඝට්ටනා"ති වුත්තෝ. ඝානගන්ධා, පන ජිව්හාරසා ච අඤ්ඤමඤ්ඤං සම්පත්තායේව ආසන්නතරදේසේ උප්පන්නා අඤ්ඤමඤ්ඤං නිඝංසෙන්ති ආහච්ච තිට්ඨන්ති. තතෝ තේසං වසේන නිඝංසෝ වුත්තෝති. **දුබ්බලත්තා**ති අධිකරණීමත්ථකේ පිචුපිණ්ඩකං ඨපෙත්වා පිචුපිණ්ඩේනේව පහතකාලේ විය ඵුට්ඨමත්තභාවේන දුබ්බලත්තා. **දීපයේ**ති ඒවං සංඝට්ටනානිඝංසස්ස දුබ්බලත්තා වේදනා මජ්ඣත්තට්ඨානේ තිට්ඨතීති උපෙක්ඛායෝගං පකාසෙය්‍ය. යදි ඒවං කායවිඤ්ඤාණේපි ඉදං සමානන්ති, නෝති ආහ **"පසාදං පනා"**තිආදි. යථා හි අධිකරණීමත්ථකේ කප්පාසපිචුපිණ්ඩං ඨපෙත්වා කූටේන පහරන්තස්ස කූටං පිචුපිණ්ඩමතික්කම්ම අධිකරණිං ගණ්හාති, ඒවමේවං කායද්වාරේ බහිද්ධා මහාභූතාරම්මණං අජ්ඣත්තිකකායපසාදං ඝට්ටෙත්වා තං අතික්කම්ම පසාදපච්චයේසු මහාභූතේසු පටිහඤ්ඤති, නිඝංසෝ බලවා හෝති, තස්මා ඉට්ඨාරම්මණේ කායවිඤ්ඤාණසම්පයුත්තා සුඛවේදනා හෝති, අනිට්ඨාරම්මණේ පන වුත්තනයේන දුක්ඛවේදනාති වුත්තං හෝති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 84-86 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 246-248 පිටු]**

ඉටු අරමුණෙහි සැප වේදනා තුමූ උපදින්නේ නොවේද? අනිටු අරමුණෙහි දුක් වේදනා තුමූ උපදින්නේ නොවේද? ඉටු වූද අනිටු වූද මැදහත් වූද ආරමුණෙහි උපේක්‍ෂා වේදනා තුමූ උපදින්නේ නොවේද? ඉටු අරමුණෙහි හෝ ඉෂ්ට මධ්‍යස්ථ අරමුණෙහි හෝ කුසල විපාක වූ චක්‍ෂුර්විඤ්ඤාණ ආදීහු උපදිත් ද? ඒ වේදනා අතරින් පළමුව ඉෂ්ට මධ්‍යස්ථ අරමුණෙහි උපේක්‍ෂා වේදනාව හා සමඟ යෙදීම සුදුසුයි. ඉටු අරමුණෙහි යෙදීම නුසුදුසුයි. එය එසේ කියන්නට නොහැකිය. කර්ම විඤ්ඤාණය යම්සේද එසේ විපාක විඤ්ඤාණයාගේ වෙඤ්චා නොකළහැකි බැවින් එය කියන්නට නොහැකිය. පරිකල්ප (කල්පනා කිරීම්) වශයෙන් ඉටු අරමුණ ද ඉෂ්ට මධ්‍යස්ථ වශයෙන් ගනිත්. එබැවින් ඉටු අරමුණෙහි ද ඉෂ්ට මධ්‍යස්ථ අරමුණෙහි ද චක්‍ෂු ශ්‍රෝත්‍ර ඝ්‍රාණ ජිව්හා විඤ්ඤාණයන් උපදින කල්හි උපේක්‍ෂා වේදනාවම කෙසේ හටගනී ද? සැප වේදනාව නොහටගනී ද? යම්හෙයකින් ඒ චක්‍ෂුර්විඤ්ඤාණාදියෙහි උපේක්‍ෂා වේදනා තුමූ කියනලදැයි යන මේ චෝද්‍යය සංක්‍ෂේප වශයෙන් දැක්වීම පිණිස "ඉට්ඨාරම්මණයෝගස්මිං" යනාදිය දේශනා කොට නැවත ඒ චෝද්‍යයගේ පිරිසිදු කිරීම පිණිස "උපාදය ච රූපේන" යනාදිය දේශනා කරනලදි.

භූතරූප ගෙන භූතරූප ඇසුරු කොට පවතින්නා වූ රූපය උපාදයරූප නම්. මෙහි "උපාදය ච රූපේන" යන වචනය වනාහි මනසී ච කාරෝ යන වචනයට කියනලද ක්‍රමයමයි. "උපාදයකරූපේන" යනුවෙන් හෝ පාඨයක් වෙයි. චක්‍ෂුර්විඤ්ඤාණයට වස්තුව වන චක්‍ෂුස්ප්‍රශාදය එසේම ශෝත්‍රවිඤ්ඤාදීන්ට වස්තු වන ශ්‍රෝත්‍රප්‍රශාදදීන් ද "උපාදයරූපේන" යන අර්ථයයි. "උපාදරූපකෝ පන" යන්නෙහි ය-කාරය ලොප් කොට "පටිසඞ්ඛා යෝනිසෝ" යනාදියෙහි මෙන් දක්වනලදි. පිළිවෙළින් චක්‍ෂුර්විඤ්ඤාණාදීන්ගේ අරමුණු වන රූප ශබ්දයන්ට "උපාදයරූපේ" යන අර්ථයයි. "සංඝට්ටනානිඝංසස්ස" යනු ගැටීම් සඞ්ඛ්‍යාත ඉලීමගේ. ඔහුනොවුන්ගේ විසයවිසයී භාවයට සුදුසු ප්‍රදේශයෙක්හි ඉපදීම් සඞ්ඛ්‍යාත ගැටීම මෙන් සංඝට්ටනයම නිඝංසයයි කියනු ලැබේ. නොහොත් සම්පත්තග්ග්‍රහණ අසම්පත්තග්ග්‍රහණ වශයෙන් සංඝට්ටනය නම් වූ නිඝංසයාගේ යන අර්ථයි. චක්‍ෂුස්ප්‍රශාදය ද රූපාරම්මණය ද ශ්‍රෝත්‍රප්‍රශාදය ද ශබ්දරම්මණය ද ඔහුනොවුන් නොපැමිණම නොහොත් අසම්ප්‍රාප්තවම සුදුසු ප්‍රදේශයෙහි ඉපදීම ඔහුනොවුන්ගේ ගැටීම නම් වෙයි. එහෙයින් අසම්ප්‍රාප්තයන්ගේ වශයෙන් ගැටීම් ආකාර වූ ඔහුනොවුන්ගේ අභිමුඛ බව "සංඝට්ටනා" යනුවෙන් කියනලදි. ඝ්‍රාණප්‍රශාදය ද ගන්ධාරම්මණය ද ජිව්හාප්‍රශාදය ද රසාරම්මණය ද ඔහුනොවුන් පැමිණම නොහොත් සම්ප්‍රාප්තවම ඉතා සමීප ප්‍රදේශයෙක්හි උපන්නාවූ ඔහුන් ඔහුනොවුන්ගේ ගැටෙත්; ගැටී සිටිත්. එහෙයින් ඒ සම්ප්‍රාප්තයන්ගේ වශයෙන් "නිඝංසෝ" යයි කියනලදි. "දුබ්බලත්තා" යනු කිණිහිර මත්තෙහි පුළුන් පිඩක් තබා පුළුන් පිඩකින්ම පහර කල්හි මෙන් ස්පර්ශ කළ මාත්‍රයාගේ භාවයෙන් දුබල බැවිනි. "දීපයේ" යනු මෙසේ ගැටීමගේ දුබල බැවින් වේදනා තුමූ මධ්‍යස්ථ ස්ථානයෙහි සිටීනුයි උපේක්‍ෂාව හා යෙදීම ප්‍රකාශ කළේය. ඉදින් මෙසේ කායවිඤ්ඤාණයෙහි ද උපමාව සමාන වේත්ද? සමාන නොවේත් ද? යන චෝද්‍යයට පරිහාර පිණිස "පසාදං පන" යනාදිය කීවේය. යම්සේ වනාහි කිණිහිර මත්තෙහි කපු පුළුන් පිඩක් තබා කුළකින් පහරදෙන්නහුගේ ඒ පහර පුළුන් පිඩ ඉක්මවා කිණිහිර ගන්නේ යම්සේ ද මෙසේම බාහිර මහාභූත ආරම්මණය කායද්වාරයෙහි වූ ආධ්‍යාත්මික කායප්‍රශාදය හා ගැටී ඒ කායප්‍රශාදය ඉක්මවා ප්‍රශාදය ඇසුරු කරණ මහාභූතයන්හි හැපෙයි. ගැටීම බලවත් වෙයි. එබැවින් ඉටු අරමුණෙහි කායවිඤ්ඤාණය හා සම්ප්‍රයුක්ත වූ සැප වේදනාව වෙයි. එසේම අනිටු අරමුණෙහි කියනලද ක්‍රමයෙන් දුක් වේදනාව වේ යයි දේශනා කරන ලද්දේ වෙයි.

**තත්ථ උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණන්ති** ඉදං අකුසලවිපාකං වා හෝතු කුසලවිපාකං වා උපෙක්ඛාසහගතමේව හෝති. කස්මා? අතිදුබ්බලත්තා. තත්ථ දෝමනස්සං වා සෝමනස්සං වා න උප්පජ්ජති. දිට්ඨේ දිට්ඨමත්තමේව තං හෝති, උපෙක්ඛාසහගතමේව. ඒවං සති කථං කුසලාකුසලභේදෝ ති. වේ ඉට්ඨානිට්ඨාරම්මණවසේන. යදා ඉට්ඨාරම්මණං චක්ඛුවිඤ්ඤාණං උප්පජ්ජති, තදා තං කුසලවිපාකන්ති, යදා අනිට්ඨාරම්මණං තදා අකුසලවිපාකන්ති වුච්චති. රූපායතනං චත්තාරි මහාභූතානි උපාදාය හෝති, නත්ථි තත්ථ ඉට්ඨානිට්ඨාදි විසේසෝ. සෝච බෝ කුසලාකුසලකම්මවිපාකේනේව විඤ්ඤායති. තස්මා යදා යස්ස කස්සචි යංකිඤ්චි අනිට්ඨං ආරම්මණං බායති, තදා තස්ස තමාරබ්භ අකුසලවිපාකං චක්ඛුවිඤ්ඤාණං, යදි ච තං ඉට්ඨං බායති, තදා කුසලවිපාකං චක්ඛුවිඤ්ඤාණං උප්පජ්ජතීති වේදිතබ්බං. ඒස නයෝ සෝතවිඤ්ඤාණාදීසු. යා කාචි කායිකාදුක්ඛාවේදනා, සා අකුසලකම්මවිපාකේනේව ජායති. තස්මා ඉධ **දුක්ඛසහගතං කායවිඤ්ඤාණන්ති** වුත්තං. **[නවනීත ටීකා 06-07 පිටු]**

**තත්ථ** එහි **උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණං ඉති** උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණං යන **ඉදං (චිත්තං)** මේ චිත්තය තෙම **අකුසලවිපාකං වා** අකුසල විපාක හෝ **කුසලවිපාකං වා** කුසල විපාක හෝ **හෝතු** වේවා **උපෙක්ඛාසහගතමේව** උපේක්‍ෂා වේදනාවෙන් යුක්තම **හෝති** වෙයි **කස්මා?** කුමක්හෙයින්ද යත්? **අතිදුබ්බලත්තා** ඉතා දුර්වල බැවිනි **තත්ථ (විඤ්ඤාණේ)** ඒ සිතෙහි **දෝමනස්සං වා** දොම්නස් වේදනාව හෝ **සෝමනස්සං වා** සොම්නස් වේදනාව හෝ **න උප්පජ්ජති** නූපදී **තං (විඤ්ඤාණං)** ඒ චිත්තය **දිට්ඨේ** දුටු දෙයෙහි **දිට්ඨමත්තමේව** දුටු මාත්‍රයම **හෝති** වෙයි (**තස්මා** එහෙයින්) **උපෙක්ඛාසහගතමේව** උපේක්‍ෂා වේදනාවෙන් යුක්තම (**හෝති** වෙයි) **ඒවං සති** මෙසේ ඇති කල්හි **කථං** කෙසේ **කුසලාකුසලභේදෝ** කුසල අකුසල භේදය **ඉති (හෝති?)** වෙයිද? **වේ** මෙසේ ප්‍රශ්නයක් ඇති කල්හි පරිහාරය කියනු ලැබේ **ඉට්ඨානිට්ඨාරම්මණවසේන** ඉටු අනිටු අරමුණු වශයෙන් (**හෝති** වෙයි) **යදා** යම්කලෙක **ඉට්ඨාරම්මණං** ඉටු අරමුණක් (**ගහෙත්වා** ගෙන) **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඤ්ඤාණය **උප්පජ්ජති** උපදී ද **තදා** එකල්හි **තං (චක්ඛුවිඤ්ඤාණං)** ඒ චක්‍ෂුර්විඤ්ඤාණය **කුසලවිපාකං ඉති** කුසල විපාකයක් යැයි (**වුච්චති** කියනු ලැබේ) **යදා** යම්කලෙක **අනිට්ඨාරම්මණං** අනිටු අරමුණක් (**ගහෙත්වා** ගෙන **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඤ්ඤාණය **උප්පජ්ජති** උපදී ද) **තදා** එකල්හි **අකුසලවිපාකං ඉති** අකුසල විපාකයක් යැයි **වුච්චති** කියනු ලැබේ **රූපායතනං** රූපාරම්මණය **චත්තාරි මහාභූතානි** සතර මහාභූතයන් **උපාදාය** ගෙන **හෝති** පවතී **තත්ථ** එහි **ඉට්ඨානිට්ඨාදිවිසේසෝ** ඉටු අනිටු ආදී විශේෂයක් **නත්ථි** නැත **සෝ ච බෝ** ඒ ඉටු අනිටු බවද **කුසලාකුසලකම්මවිපාකේන ඒව** කුසල අකුසල කර්ම විපාකයෙන්ම **විඤ්ඤායති** දැනගනී **තස්මා** එබැවින් **යදා** යම්කලෙක **යස්ස කස්සචි** යම් කිසිවෙකුට **යං කිඤ්චි** යම් කිසි **අනිට්ඨං ආරම්මණං** අනිටු අරමුණක් **බායති** වැටහෙයි ද **තදා** එකල්හි **තස්ස** ඔහුට **තං ආරබ්භ** ඒ අනිටු අරමුණ අරබයා **අකුසලවිපාකං** අකුසල විපාක වූ **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඤ්ඤාණය ද **යදි ච** ඉදින් වනාහි **තං** ඒ අරමුණ **ඉට්ඨං (ආරම්මණං)** ඉටු අරමුණක්ව **බායති** වැටහෙයි ද **තදා** එකල්හි **කුසලවිපාකං** කුසල විපාක වූ **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඤ්ඤාණය **උප්පජ්ජති ඉති** උපදී යයි **වේදිතබ්බං** දතයුතුයි **සෝතවිඤ්ඤාණාදීසු** ශ්‍රෝත්‍රවිඤ්ඤාණාදියෙහි ද **ඒස නයෝ** මේ ක්‍රමයයි **යා කාචි** යම්කිසි **දුක්ඛවේදනා** දුක් වේදනාවක් (**හෝති** වේ ද) **සා** ඒ දුක්

වේදනාව **අකුසලවිපාකේන ඒව** අකුසල විපාකයෙන්ම **ජායති** උපදී **තස්මා** එබැවින් **ඉධ** මෙහි **දුක්ඛසහගතං කායවිඤ්ඤාණං ඉති** දුක්ඛසහගතං කායවිඤ්ඤාණං යනුවෙන් **වුත්තං** කියනලදි.
**[නවනීත ටීකා පරිවර්තනයි]**

චක්ඛුවිඤ්ඤාණාදිය උපාදාය රූප හෙයින් දුර්වලත්වය හේතු කොටගෙන උපේක්ෂාසහගතව උපදී. කාය විඤ්ඤාණය වූ කලී භූතරූපයෙහි වැද සිටින හෙයින් අනිෂ්ට ඉෂ්ට ආරම්මණ වශයෙන් දුක්ඛ-සුඛ සහගතව උපදී.
**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රශ්නෝත්තර 03 පිට]**

## ද්විපඤ්ච විඤ්ඤාණයෙහි සම්පත්ත-අසම්පත්ත භේදය:—

චක්ඛාදිද්වයං අසම්පත්තවසේන ඝානාදිත්තයං සම්පත්තවසේනාති පඤ්චවිධම්පි ගෝචරග්ගාහිකරූපං නාම. ඉතරං අගෝචරග්ගාහිකරූපං.
**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 94 පිට]**

**චක්ඛාදිද්වයං** චක්‍ෂුඃරාදි ප්‍රසාදද්වය **අසම්පත්තවසේන** තමහට අසම්ප්‍රාප්ත ගෝචර වශයෙන් ද **ඝානාදිත්තයං** ඝ්‍රාණාදිත්‍රය **සම්පත්තවසේනාති** තමහට සම්ප්‍රාප්තයාගේ ගෝචර වශයෙනැයි **පඤ්චවිධං** පඤ්චප්‍රකාර වූ මේ රූපය **ගෝචරග්ගාහිකරූපං** තම තමාගේ විඤ්ඤාණය ලවා ගෝචරය ගන්වන හෙයින් ගෝචරග්‍රාහික රූප නම් වේ **ඉතරං** අවශේෂ තේවිසි වැදෑරුම් රූපය **අගෝචරග්ගාහිකරූපං** අගෝචරග්‍රාහික රූපය නම් වේ.
**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 123-124 පිට]**

චක්ඛුසෝතානි අසම්පත්තවිසයග්ගාහකානි අත්තනෝ නිස්සයං අනල්ලීනනිස්සයේ ඒව විසයේ විඤ්ඤාණහේතුත්තා. ඝානජිව්හාකායා සම්පත්තවිසයග්ගාහකා, නිස්සයවසේන චේව සයඤ්ච අත්තනෝ නිස්සයං අල්ලීනේයේව විසයේ විඤ්ඤාණහේතුත්තා.

අට්ඨකථායං පන "ආපාථගතත්තාව ආරම්මණං සම්පත්තං නාම. චන්දමණ්ඩලසූරියමණ්ඩලානඤ්හි ද්වාචත්තාලීසයෝජනසහස්සමත්ථකේ ඨිතානං වණ්ණෝ චක්ඛුපසාදං ඝට්ටේති. සෝ දූරේ ඨත්වා පඤ්ඤායමානෝපි සම්පත්තෝයේව නාම. තං ගෝචරත්තා චක්ඛු සම්පත්තගෝචරමේව නාම. දූරේ රුක්ඛං ඡින්දන්තානම්පි, රජකානඤ්ච වත්ථං ධෝවන්තානං දූරතෝව කායවිකාරෝ පඤ්ඤායති. සද්දෝ පන ධාතුපරම්පරාය ආගන්ත්වා සෝතං ඝට්ටෙත්වා සණිකං වවත්ථානං ගච්ඡතී"ති වුත්තං.

තත්ථ කිඤ්චාපි ආපාථගතත්තා ආරම්මණං සම්පත්තන්ති වුත්තං, චන්දමණ්ඩලාදිවණ්ණෝ පන චක්ඛුං අසම්පත්තෝ දූරේ ඨිතෝව පඤ්ඤායති. සද්දෝපි සචේ සණිකං ආගච්ඡෙය්‍ය, දූරේ උප්පන්නෝ චිරේන සුයෙය්‍ය, පරම්පරඝට්ටනාය ච ආගන්ත්වා සෝතං ඝට්ටෙන්තෝ අසුකදිසාය නාමාති න පඤ්ඤායෙය්‍ය. තස්මා අසම්පත්තගෝචරානේව තානි.

අහිආදිසමානානි චේතානි. යථා හි අහි නාම බහි සිත්තසම්මට්ඨට්ඨානේ නාභිරමති, සඞ්කාරට්ඨානතිණපණ්ණගහනවම්මිකානියේව පන පවිසිත්වා නිපන්නකාලේ අභිරමති, ඒකග්ගතං ආපජ්ජති, ඒවමේව චක්ඛුපේතං විසමජ්ඣාසයං

මට්ටේසු සුවණ්ණභිත්තිආදීසු නාභිරමති, ඕලෝකේතුම්පි න ඉච්ඡති, රූපචිත්තපුප්ඵලතාදිචිත්තේසුයේව පන අභිරමති. තාදිසේසු හි ඨානේසු චක්ඛුම්හි අප්පහොන්තේ මුඛම්පි විවරිත්වා ඕලෝකේතුකාමා හොන්ති.

සුසුමාරෝපි බහි නික්ඛන්තෝ ගහේතබ්බං න පස්සති, අක්ඛීනි නිම්මීලෙත්වාව චරති. යදා පන බ්‍යාමසතමත්තං උදකං ඕගාහිත්වා බිලං පවිසිත්වා නිපන්නෝ හෝති, තදා තස්ස චිත්තං ඒකග්ගං හෝති සුඛං සුපති, ඒවමේව සෝතම්පේතං බිලජ්ඣාසයං ආකාසසන්නිස්සිතං කණ්ණච්ඡිද්දකූපකේයේව අජ්ඣාසයං කරෝති. කණ්ණච්ඡිද්දකාසෝයේව තස්ස සද්දසවනේ පච්චයෝ හෝති. අජටාකාසෝපි වට්ටතියේව. අන්තෝලේණස්මිඤ්හි සජ්ඣායේ කරියමානේ න ලේණච්ඡදනං භින්දිත්වා සද්දෝ බහි නික්ඛමති, ද්වාරවාතපානච්ඡිද්දේහි පන නික්ඛමිත්වා ධාතුපරම්පරායේව ඝට්ටෙන්තෝ ගන්ත්වා සෝතපසාදං ඝට්ටේති. අථ තස්මිං කාලේ 'අසුකෝ නාම සජ්ඣායතී'ති ලේණපිට්ඨේ නිසින්නා ජානන්ති.

ඒවං සන්තේ සම්පත්තගෝචරතා හෝති. 'කිං පනේතං සම්පත්තගෝචර'න්ති? 'ආම, සම්පත්තගෝචරං'. 'යදි ඒවං, දූරේ භේරිආදීසු වජ්ජමානේසු දූරේ සද්දෝති ජානනං න භවෙය්‍යා'ති? 'නෝ න භවති. සෝතපසාදස්මිඤ්හි ඝට්ටිතේ දූරේ සද්දෝ ආසන්නේ සද්දෝ, පරතීරේ ඕරිමතීරේති තථා තථා ජානනාකාරෝ හෝති. ධම්මතා ඒසා'ති. 'කිං ඒතාය ධම්මතාය? යතෝ යතෝ ඡිද්දං තතෝ තතෝ සවනං හෝති, චන්දිමසූරියාදීනං දස්සනං වියාති අසම්පත්තගෝචරමේවේතං'.

පක්ඛීපි රුක්ඛේ වා භූමියං වා න රමති. යදා පන ඒකං වා ද්වේ වා ලෙඩ්ඩුපාතේ අතික්කම්ම අජටාකාසං පක්ඛන්දෝ හෝති, තදා ඒකග්ගචිත්තතං ආපජ්ජති, ඒවමේව ඝානම්පි ආකාසජ්ඣාසයං වාතූපනිස්සයගන්ධගෝචරං. තථා හි ගාවෝ නවවුට්ඨේ දේවේ භූමියං ඝායිත්වා ඝායිත්වා ආකාසාභිමුඛා හුත්වා වාතං ආකඩ්ඪන්ති. අඞ්ගුලීහි ගන්ධපිණ්ඩං ගහෙත්වාපි ච උපසිඞ්ඝනකාලේ වාතං අනාකඩ්ඪන්තෝ නේව තස්ස ගන්ධං ජානාති.

කුක්කුරෝපි බහි විචරන්තෝ ඛේමට්ඨානං න පස්සති ලෙඩ්ඩුපහාරාදීහි උපද්දුතෝ හෝති. අන්තෝගාමං පවිසිත්වා උද්ධනට්ඨානේ ඡාරිකං බ්‍යූහිත්වා නිපන්නස්ස පන ඵාසුකං හෝති, ඒවමේව ජිව්හාපි ගාමජ්ඣාසයා ආපෝසන්නිස්සිතරසාරම්මණා. තථා හි තියාමරත්තිං සමණධම්මං කත්වාපි පාතෝව පත්තචීවරමාදාය ගාමෝ පවිසිතබ්බෝ හෝති. සුක්ඛඛාදනීයස්ස ච න සක්කා ඛේළේන අතේමිතස්ස රසං ජානිතුං.

සිඞ්ගාලෝපි බහි චරන්තෝ රතිං න වින්දති, ආමකසුසානේ මනුස්සමංසං ඛාදිත්වා නිපන්නස්සේව පනස්ස ඵාසුකං හෝති, ඒවමේව කායෝපි උපාදිණ්ණකජ්ඣාසයෝ පථවීනිස්සිතඵොට්ඨබ්බාරම්මණෝ. තථා හි අඤ්ඤං උපාදිණ්ණකං අලභමානා සත්තා අත්තනෝව හත්ථතලේ සීසං කත්වා නිපජ්ජන්ති. අජ්ඣත්තිකබාහිරා චස්ස පථවී ආරම්මණග්ගහණේ පච්චයෝ හෝති. සුසන්ථතස්සපි හි සයනස්ස, හත්ථේ ඨපිතානම්පි වා ඵලානං, න සක්කා අනිසීදන්තේන වා අනිප්පීළෙන්තේන වා ථද්ධමුදුභාවෝ ජානිතුන්ති. අජ්ඣත්තිකබාහිරාපථවී ඒතස්ස කායපසාදස්ස ඵොට්ඨබ්බජානනේ පච්චයෝ හෝති.

**[ධම්මසඞ්ගණී අට්ඨකථා (ඡට්ඨසඞ්ගායනා අංක 600 උපාදාභාජනීයකථා යටතේ); ධම්මසඞ්ගණී අට්ඨකථා 271-273 පිටු (හේ.වි.මු)]**

අනල්ලීනෝ නිස්සයෝ ඒතස්සාති **අනල්ලීනනිස්සයෝ,** රූපසද්දසඞ්ඛාතෝ විසයෝ. ගන්ධරසානං නිස්සයා ඝානජිව්හානිස්සයේ අල්ලීයන්තීති තේ නිස්සයවසේන අල්ලීනා, ඵොට්ඨබ්බං සයං කායනිස්සයඅල්ලීනං භූතත්තයත්තා. **දූරේ**...**පෙ**.... **සම්පත්තෝ ඒව නාම** පටිඝට්ටනනිඝංසජනකතෝති අධිප්පායෝ. සද්දෝ පන **ධාතුපරම්පරාය** වායු විය **ආගන්ත්වා** නිස්සයවසේන සෝතනිස්සයේ අල්ලීයිත්වා **සෝතං ඝට්ටෙත්වා** වවත්ථානං ගච්ඡන්තෝ **සණිකං වවත්ථානං ගච්ඡතී**ති වුත්තෝ. ඒවං පන සති චිත්තසමුට්ඨානං සද්දායතනං සෝතවිඤ්ඤාණස්ස කදාචිපි ආරම්මණපච්චයෝ න සියා. න හි බහිද්ධා චිත්තසමුට්ඨානුප්පත්ති උපපජ්ජතීති.

**චිරේන සුය්‍යෙය්‍යා**ති කස්මා ඒතං වුත්තං, නනු දූරේ ඨිතේහි රජකාදිසද්ද චිරේන සුය්‍යන්තීති? න, දූරාසන්නානං යථාපාකටේ සද්දේ ගහණවිසේසතෝ. යථා හි දූරාසන්නානං වචනසද්දේ යථා පාකටීභූතේ ගහණවිසේසතෝ ආකාරවිසේසානං අග්ගහණං ගහණඤ්ච හෝති, ඒවං රජකාදිසද්දේපි ආසන්නස්ස ආදිතෝ පභුති යාවාවසානා කමේන පාකටීභූතේ දූරස්ස චාවසානේ මජ්ඣේ වා පිණ්ඩවසේන පවත්තිපාකටීභූතේ නිච්ඡයගහණානං සෝතවිඤ්ඤාණවීථියා පරතෝ පවත්තානං විසේසතෝ ලහුකං සුතෝ චිරේන සුතෝති අභිමානෝ හෝති. සෝ පන සද්දෝ යත්ථ උප්පන්නෝ, තං නිස්සිතෝව අත්තනෝ විජ්ජමානක්ඛණේ සෝතස්ස ආපාථමාගච්ඡති. දූරේ ඨිතෝ පන සද්දෝ අඤ්ඤත්ථ පටිඝෝසුප්පත්තියා භාජනාදිචලනස්ස ච අයෝකන්තෝ විය අයෝචලනස්ස පච්චයෝ හෝතීති දට්ඨබ්බෝ. යථා වා ඝණ්ටාභිඝාතානුජානි භූතානි අනුරවස්ස නිස්සයභූතානි ඝට්ටනසභාවානි, ඒවං ඝට්ටනානුජානි යාව සෝතප්පසාද උප්පත්තිවසේන ආගතානි භූතානි ඝට්ටනසභාවානේවාති තං නිස්සිතෝ සද්දෝ නිස්සයවසේන ධාතුපරම්පරාය ඝට්ටෙත්වා සණිකං වවත්ථානං ගච්ඡතීති වුත්තෝ. **අසුකදිසාය නාමාති න පඤ්ඤායෙය්‍ය.** කස්මා? සෝතප්පදේසස්සේව සද්දස්ස ගහණතෝ.

විසමේ අජ්ඣාසයෝ ඒතස්සාති විසමජ්ඣාසයෝ, අජ්ඣාසයරහිතම්පි චක්ඛු විසමනින්නත්තා විසමජ්ඣාසයං විය හෝතීති **"විසමජ්ඣාසය"**න්ති වුත්තං. චක්ඛුමතෝ වා පුග්ගලස්ස අජ්ඣාසයවසේන චක්ඛු **"විසමජ්ඣාසය"**න්ති වුත්තං.

කණ්ණකූපච්ඡිද්දේයේව පවත්තනතෝ ආරම්මණග්ගහණහේතුතෝ ච තත්ථේව **"අජ්ඣාසයං කරෝතී"**ති වුත්තං. තස්ස සෝතස්ස සෝතවිඤ්ඤාණනිස්සයභාවේන සද්දසවනේ. **අජටාකාසෝපි වට්ටතී**ති ඒතස්ස අට්ඨකථාධිප්පායේන අත්ථං වදන්තෝ **"අන්තෝලේණස්මි"**න්තිආදිමාහ. අත්තනෝ අධිප්පායේන වදන්තෝ **"කිං ඒතාය ධම්මතාය"**තිආදිමවෝච.

වාතූපනිස්සයෝ ගන්ධෝ ගෝචරෝ ඒතස්සාති **වාතූපනිස්සයගන්ධගෝචරං.** එත්ථ ච ගන්ධග්ගහණස්ස වාතෝ උපනිස්සයෝ, තබ්බෝහාරේන පන ගන්ධෝ "වාතූපනිස්සයෝ"ති වුත්තෝ. අථ වා වාතෝ ඒව උපනිස්සයෝ වාතූපනිස්සයෝ. කස්සාති? ඝානවිඤ්ඤාණස්ස. සෝ සහකාරීපච්චයන්තරභූතෝ ඒතස්ස අත්ථීති **වාතූපනිස්සයෝ,** ගන්ධෝ පච්චයෝ.

ආපෝ ච සහකාරීපච්චයන්තරභූතෝ ඛේළාදිකෝ. තථා පථවී. ගහේතබ්බස්ස හි ඵොට්ඨබ්බස්ස උප්පීළියමානස්ස ආධාරභූතා පථවී කායස්ස ච ඵොට්ඨබ්බේන

උප්පීළියමානස්ස නිස්සයභූතානං ආධාරභූතා සබ්බද ඵොට්ඨබ්බගහණස්ස උපනිස්සයෝති. උප්පීළනේන පන විනා ඵොට්ඨබ්බගහණෝ කායායතනස්ස නිස්සයභූතා පඨවී උපනිස්සයෝති දට්ඨබ්බා. සබ්බදපි ච තස්සා උපනිස්සයභාවෝ යුත්තෝ ඒව.

**පඤ්චවණ්ණානන්**ති වචනං තදධාරානං සුත්තානං නානත්තදස්සනත්ථං. පඤ්චප්පකාරා පඤ්චවණ්ණා. **ඒකන්තතෝ**ති ඉදං සබ්බද උප්පීළනේන විනිබ්භුජ්ජිතුං අසක්කුණෙය්‍යානං කලාපන්තරරූපානං සබ්භාවා තේසං නිවත්තනත්ථං වුත්තං. න හි තානි ඒකන්තේන අවිනිභුත්තානි කලාපන්තරගතත්තාති.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 600 යටතේ)]**

සම්පත්තෝයේව නාම සම්පත්තිකිච්චකරණතෝති ඉමමත්ථං දස්සේතුං **"පටි…පෙ…. නකතෝ"**ති වුත්තං. අතිසුඛුමභාවතෝ මංසචක්ඛුඅගෝචරේන රූපායතනේන සමන්නාගතසඞ්ඝාතවුත්තිතාය ච **"වායු වියා"**ති වුත්තං. **චිත්තසමුට්ඨානං සද්දයතනං සෝතවිඤ්ඤාණස්ස කදචිපි ආරම්මණපච්චයෝ න සියා** ධාතුපරම්පරාය ඝට්ටෙන්තස්ස උතුසමුට්ඨානත්තා. තේනාහ **"න හි…පෙ…. පජ්ජතී"**ති. **පට්ඨානේ** (පට්ඨා. 1.1.2) ච "සද්දයතනං සෝතවිඤ්ඤාණස්ස ආරම්මණපච්චයේන පච්චයෝ"ති අවිසේසේන වුත්තං.

**නනු චිරේන සුය්‍යන්තී**ති දූරේ ඨිතානං ලහුකං සවනං නත්ථි, තේසම්පි වා ලහුකං සවනේන දූරාසන්නභාවානං විසේසෝ න සියාති අධිප්පායෝ. **න, දූ…පෙ…. තෝ**ති න දූරේ ඨිතේහි රජකාදිසද්ද චිරේන සෝතවිඤ්ඤාණේන සුය්‍යන්ති, සචේ සවනූපචාරේ සෝ සද්දෝ දූරේ ආසන්නේ ච ඨිතානං යථාභූතේ ආපාථගතේ සද්දේ මනෝවිඤ්ඤාණසඞ්ඛාතතෝ ගහණවිසේසතෝ චිරේන සුතෝ සීඝං සුතෝති අභිමානෝති අත්ථෝ. ඒතමේවත්ථං විත්ථාරතෝ දස්සෙන්තෝ **"යථා හී"**තිආදිමාහ. **නිච්ඡය…පෙ…. අභිමානෝ හෝති,** සෝතවිඤ්ඤාණප්පවත්ති පන උභයත්ථාපි සමානා, යස්මා **සෝ පන සද්දෝ…පෙ…. ආගච්ඡතී**ති. යදි ධාතුපරම්පරාය සද්දෝ නප්පවත්තති, කථං පටිඝෝසාදීනං උප්පත්තීති ආහ **"දූරේ…පෙ…. පච්චයෝ හෝතී"**ති. **උප්පත්තිවසේන ආගතානී**ති ඒතේන රූපධම්මාපි යත්ථ උප්පජ්ජන්ති, තත්ථේව භිජ්ජන්ති, න දේසන්තරං සඞ්කමන්තීති දස්සේති. **ඝට්ටනසභාවානේවා**ති තේසං භූතානං සද්දසමුප්පත්තිහේතුභාවමාහ. **සෝතපදේසස්සා**ති සෝතදේසස්ස, සෝතදේසේ ඨිතස්සාති අත්ථෝ.

**චක්ඛුමතෝ පුග්ගලස්ස අජ්ඣාසයවසේනා**ති චිත්‍රවිචිත්‍රරූපායතනේ යේභුය්‍යේන සත්තානං චක්ඛුද්වාරිකජවනස්ස අනුකඩ්ඪනවසේන පවත්තිං සන්ධාය වුත්තං. **කණ්ණකූපච්ඡිද්දේයේව පවත්තනතෝ**ති ඒතේන අධිට්ඨානතෝ බහිද්ධා ඉන්ද්‍රියං පවත්තීති වාදං පටිසේධේති. අධිට්ඨානදේසේ ඒව හි ඉන්ද්‍රියං වත්තති තත්ථ කිච්චාදිප්පයෝගදස්සනතෝ. සතිපි පනස්ස බහිද්ධා වුත්තියං න විසයග්ගහණේ සමත්ථතා, අඤ්ඤථා අධිට්ඨානපිදහනේපි විසයග්ගහණං භවෙය්‍යාති. **ආරම්මණග්ගහණහේතුතෝ චා**ති කණ්ණකූපච්ඡිද්දේයේව ඨත්වා ආරම්මණකරණස්ස විඤ්ඤාණස්ස වා හේතුභාවතෝ.

**තබ්බෝහාරේනා**ති ගන්ධගන්ධග්ගහණස්ස සහචරිතාය ගන්ධෝපි තථා වුත්තෝති අධිප්පායෝ. **ගන්ධෝ පච්චයෝ**ති ගන්ධෝ සහකාරීපච්චයෝති අත්ථෝ.

බෙලාදිකෝ පච්චයෝති යෝජේතබ්බං. **තථා පඨවීති** සහකාරීපච්චයන්තරභූතා අජ්ඣත්තිකබාහිරා පඨවී ආරම්මණග්ගහණේ පච්චයෝති අත්ථෝ. **ආධාරභූතාති** තේජෝවායෝධාතූනං ආධාරභූතා. **නිස්සයභූතානන්ති** නිස්සයමහාභූතානං ආපෝතේජෝවායෝධාතූනං. **සබ්බදාති** උප්පීළනකාලේ ච අනුප්පීළනකාලේ ච. **තත්ථාති** චතුරාසීතිපභේදේ උපරිමකායසඞ්ඛාතේ රූපසමූහේ. **විනිබ්භුජ්ජිතුං අසක්කුණෙය්‍යානන්ති** ඉදං චක්ඛුදසකං ඉදං කායදසකං ඉදං භාවදසකන්ති ඒවං කලාපතෝපි විනිබ්භුජ්ජිතුං අසක්කුණෙය්‍යානං.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 600 යටතේ)]**

**චක්ඛුසෝතානි** චක්ෂු ශ්‍රෝත්‍ර යන ප්‍රසාද දෙදෙන **අත්තනෝ** තමාහට **නිස්සයං** නිශ්‍රය වූ මහාභූතයන් කෙරෙහි **අනල්ලීනනිස්සයේ ඒව විසයේ** නොඇළුනාවූ නිශ්‍රය ඇත්තාවූම රූප ශබ්ද අරමුණු විෂයෙහි **විඤ්ඤාණහේතුත්තා** විඤ්ඤාණයට හේතු බැවින් **අසම්පත්තවිසයග්ගාහිකානි** අසම්ප්‍රාප්ත විෂය ගන්නෝ (**හොන්ති** වෙත්) **ඝානජිව්හාකාය** ඝ්‍රාණ ජිව්හා කාය යන තිදෙන **සම්පත්තවිසයග්ගාහකා** තමන් කරා සම්ප්‍රාප්ත විෂය ගන්නෝ (**හොන්ති** වෙත්) **ච** විශේෂයක් කියම් **නිස්සයවසේන ඒව** ඝ්‍රාණ ජිව්හා ප්‍රසාද දෙදෙන තමාහට නිශ්‍රය වූ මහාභූතයන්ගේ වශයෙන්ම ද **සයඤ්ච** ස්ප්‍රෂ්ටව්‍ය තෙමේ ද **අත්තනෝ** කායප්‍රසාදයාගේ **නිස්සයං** නිශ්‍රය වූ මහාභූතයන් කෙරෙහි **අල්ලීනේයේව විසයේ** ඇළුනු විෂයෙහිම **විඤ්ඤාණහේතුත්තා** විඤ්ඤාණයට හේතු බැවිනි (රූප ශබ්ද දෙදෙනහට නිශ්‍රය වූ භූතයෝ චක්ෂු ශ්‍රෝත්‍ර දෙදෙන හට නිශ්‍රය වූ භූතයන් කෙරෙහි ගැටුනු කලම රූප ශබ්ද ගෝචරයෙහි ප්‍රසාදශ්‍රය වූ විඤ්ඤාණයන් නූපදින්නෙන් "අත්තනෝ නිස්සයං අනල්ලීනනිස්සයේ ඒව විසයේ විඤ්ඤාණහේතුත්තා" යි කීහු. "අනල්ලීනෝ නිස්සයෝ ඒතස්සාති අනල්ලීනනිස්සයෝ, රූපසද්දසඞ්ඛාතෝ විසයෝ"; ගන්ධ රසයන්ගේ නිශ්‍රයෝ ඝ්‍රාණ ජිව්හා නිශ්‍රයෙහි ඇලෙත්නුයි ඔවුහු නිශ්‍රය වශයෙන් ඇළුනෝ වෙත්. ස්ප්‍රෂ්ටව්‍ය තෙමේ භූතත්‍රය බැවින් කායනිශ්‍රයෙහි ඇලෙන්නෙක් වෙයි යනු මූලටීකායි)

**අට්ඨකථායං පන** අර්ථකථායෙහි වනාහි **ආරම්මණං** අරමුණ **ආපාථගතත්තාව** ආපාථගතවූ බැවින්ම **සම්පත්තං නාම** සම්ප්‍රාප්ත නම් යැයි (**වුත්තං** කියනලදි) **හි** ඊට උපමාවක් දක්වම් **ද්වාචත්තාලීසයෝජනසහස්සමත්ථකේ** යොදුන් සතළිස්දෙදහසක් මත්තෙහි **ඨිතානං** සිටියා වූ **චන්දමණ්ඩලසූරියමණ්ඩලානං** චන්ද මණ්ඩල සූර්‍ය්‍ය මණ්ඩලයන්ගේ **වණ්ණෝ** වර්ණය තෙම **චක්ඛුපසාදං** චක්ෂුප්‍රසාදය හා **ඝට්ටේති** ගැටෙයි **සෝ (වණ්ණෝ)** ඒ වර්ණය තෙම **දූරේ ඨත්වා** දුර සිට **පඤ්ඤායමානෝපි** ප්‍රකට වන්නේ ද **සම්පත්තෝයේ නාම** සම්ප්‍රාප්තම නම් ("දූරේ -පෙ- සම්පත්තෝ ඒව නාම" පටිඝට්ටනනිඝංසජනකතෝති අධිප්පායෝ යනු මූලටීකායි) **තං (වණ්ණං)** ඒ වර්ණය **ගෝචරත්තා** ආරම්මණ ගෝචර වූ බැවින් **චක්ඛු** චක්ෂුස්ප්‍රසාදය තෙම **සම්පත්තගෝචරමේව නාම** සම්ප්‍රාප්තගෝචර නම් **අපි** තවද **දූරේ** දුර **රුක්ඛං** වෘක්ෂයක් **ඡින්දන්තානං** සිඳිනහුන්ගේ ද **වත්ථං ධෝවන්තානං** වස්ත්‍ර සෝදන්නා වූ **රජකානඤ්ච** රජකයන්ගේ ද **කායවිකාරෝ** කායවිකාරය **දූරතෝ** දුරදීම **පඤ්ඤායති** ප්‍රකටවෙයි **සද්දෝ පන** ශබ්දය වනාහි **ධාතුපරම්පරාය** වායුව මෙන් ධාතුපරම්පරාවෙන් **ආගන්ත්වා** නිශ්‍රය වශයෙන් ශ්‍රෝත්‍ර ප්‍රසාදය නිශ්‍රය වූ මහාභූතයයන්හි ඇලී **සෝතං ඝට්ටෙත්වා** ශ්‍රෝත්‍රප්‍රසාදය හා ගැටී **සණිකං** වහා **වවත්ථානං** ව්‍යවස්ථාපනයට **ගච්ඡති ඉති** යයි යැයි **වුත්තං** කියනලදි.

(මෙසේ ඇති කල්හි චිත්තසමුට්ඨාන (සිතින් හටන්නාවූ) ශබ්දරම්මණය ශ්‍රෝත්‍රවිඤ්ඤාණයට කිසිකලෙකදු ආරම්මණ ප්‍රත්‍යය නොවන්නේය. කිමද යත්; ධාතුපරම්පරාවෙන් පැමිණ ගැටෙන කල්හි උතු සමුට්ඨාන බැවිනි. එසේම බාහිර චිත්තසමුට්ඨාන ශබ්ද ද නූපදී. යනු මූලටීකායි. අනුටීකාවෙහි ද "ධාතුපරම්පරාය ඝට්ටෙන්තස්ස උතුසමුට්ඨානත්තා. තේනාහ **"න හි…පෙ…. පජ්ජතී"**ති. **පට්ඨානේ** ච "සද්දායතනං සෝතවිඤ්ඤාණස්ස ආරම්මණපච්චයේන පච්චයෝ"ති අවිසේසේන වුත්තං" යි කියනලදි)

**තත්‍ථ** එහි **කිඤ්චාපි** කිසිසේත් **ආරම්මණං** අරමුණ **ආපාථගතත්තා** ආපාථගත වූ බැවින් **සම්පත්තන්ති** සම්ප්‍රාප්ත යැයි **වුත්තං** කියනලදි **චන්දමණ්ඩලාදිවණ්ණෝ පන** චන්ද්‍ර මණ්ඩලාදියෙහි වර්ණය වනාහි **චක්ඛුං** චක්‍ෂුස්ප්‍රසාදයට **අසම්පත්තෝ** සම්ප්‍රාප්ත නොවූයේ **දූරේ ඨිතෝව** දුර සිටින ලද්දේම **පඤ්ඤායති** ප්‍රකට වෙයි **සචේ** ඉදින් **සද්දෝපි** ශබ්දරම්මණය ද **සණිකං** වහා **ආගච්ඡෙය්‍ය** පැමිණෙන්නේ නම් **දූරේ උප්පන්නෝ (සද්දෝ)** දුර උපන් ශබ්දය තෙම **චිරේන** නොබෝ වේලාවකින් **සුය්‍යෙය්‍ය** අසන්නේය **පරම්පරඝට්ටනාය ච ආගන්ත්වා** පරම්පරා ගැටීම් වශයෙන් පැමිණ **සෝතං** ශ්‍රෝත්‍රප්‍රසාදය හා **ඝට්ටෙන්තෝ** ගැටෙනුයේ **අසුකදිසාය නාමාති** අසවල් දිශාවෙහි ශබ්දයක් නම් යැයි **න පඤ්ඤායෙය්‍ය** ප්‍රකට නොවන්නේය **තස්මා** එබැවින් **තානි** චක්‍ෂු ශ්‍රෝත්‍ර ප්‍රසාදයෝ **අසම්පත්තගෝචරානි ඒව** අසම්ප්‍රාප්තගෝචරයෝම (**හොන්ති** වෙත්)

("චිරේන සුය්‍යෙය්‍ය" යනු කුමක්හෙයින් මෙය කියනලදි ද? දුර සිටියවුන් විසින් රජකාදීන්ගේ ශබ්දයෝ වහා නොඅසත්ද? නොම අසත්. යම්සේ දුරාසන්න පුද්ගලයන්ගේ ප්‍රකට ශබ්දයන් ගැණීම් විශේෂයෙනි. යනු මූලටීකායි)

(දුර සිටියවුන්ට වහා ඇසීමක් නැත. ඔහුන්ට ද වහා ඇසීම හේතුකොටගෙන දුර ආසන්න භාවයෙහි විශේෂයක් නොවන්නේය යන අදහසයි. දුර සිටියවුන් විසින් රජකාදීන්ගේ ශබ්දයෝ දිගු කාලයකින් ශ්‍රෝත්‍රවිඤ්ඤාණයෙන් නොම අසත්. ඉදින් ඒ ශබ්දය දුර වූද ආසන්නයෙහි වූද ශ්‍රවණූපචාරයෙහි සිටියවුන්ට ශබ්දය සුදුසු පරිදි ආපාථගතවූ කල්හි මනෝවිඤ්ඤාණ සඞ්ඛ්‍යාත ගැණීම් විශේෂයෙන් දිගු කාලයකින් අසනලදි වහා අසනලදි යැයි අභිමානයක් වෙයි යන අදහසයි. මේ අර්ථය විස්තර වශයෙන් දක්වමින් මූලටීකායෙහි "යථා හි" යි යූ සේයි යනු අනුටීකායි)

(යම්සේ වනාහි දුරාසන්නයෙහි සිටි පුද්ගලයන්ට වචන ශබ්දය ප්‍රකටවූ කල්හි ගැණීම් විශේෂයෙන් ආකාර විශේෂයන්ගේ නොගැණීම ද, ගැණීම ද වෙයි. මෙසේම රජකාදීන්ගේ ශබ්දයන් ද ආසන්නයෙහි සිටි පුද්ගලයාට මුල පටන් අවසානය දක්වා ක්‍රමයෙන් ප්‍රකටවූ කල්හි, දුර සිටි පුද්ගලයාට ද අවසානයෙහි හෝ මධ්‍යයෙහි හෝ පිඩු වශයෙන් පැවැත්ම ප්‍රකටවූ කල්හි නිශ්චයකට පැමිණෙනහුන්ට ශ්‍රෝත්‍රවිඤ්ඤාණ වීථියෙන් පසුව ප්‍රවෘත්ති නිශ්චය ග්‍රහණය කරන මනෝද්වාර විඤ්ඤාණයාගේ විශේෂයෙන් වහා අසනලදි දිගු කාලයකින් අසනලදි යන අභිමානයක් වෙයි. ඒ ශබ්දය වනාහි යම්තැනක උපදින ලදිද, ඒ ශබ්දය නිශ්‍රිත කොටගෙනම තමාගේ විද්‍යමානක්‍ෂණයෙහි ශ්‍රෝත්‍රප්‍රසාදයාගේ ආපාථයට පැමිණෙයි. අයෝ චලනයට අයශ්කාන්තය මෙන් දුර ඇතිවූ ශබ්දය වනාහි අන්තැනක ප්‍රතිඝෝෂෝත්පත්තියට ද භාජන චලනයට ද ප්‍රත්‍යය වේ යයි දතයුතුයි. යම්සේ ඝණ්ටාවට පහර කල්හි අනුව උපන් භූතරූප අනුරාවයාගේ නිශ්‍රිත භූතරූපයන් හා ගැටෙන ස්වභාවෙනි. මෙසේ ගැටීමෙන් උපන් රූපයෝ ශ්‍රෝත්‍රප්‍රසාදය දක්වා උත්පත්ති වශයෙන් පැමිණෙන ලද

භූතරූප ගැටීම් ස්වභාවයෙනි. ඒ භූතරූප නිශ්‍රිත ශබ්දය තෙමේ නිශ්‍රය වශයෙන් ධාතුපරම්පරා වශයෙන් ගැටී වහා ව්‍යවස්ථානයට පැමිණෙයි යයි කියනලදි. යනු මූලටීකායි)

("උප්පතිවසේන ආගතානි" යන මෙයින් රූප ධර්මයෝ යම්තැනක උපදිත් ද එහිම බිඳෙත්. දේශාන්තරයකට සඞ්ක්‍රමණය නොවෙත් යයි දක්වයි. "ඝට්ටනසභාවානේව" යනු ඒ භූතරූපයන්ගේ ශබ්ද සමුප්පත්ති හේතු භාවයෙන් කීවේය. "**උප්පත්තිවසේන ආගතානී**ති ඒතේන රූපධම්මාපි යත්ථ උප්පජ්ජන්ති, තත්ථේව භිජ්ජන්ති, න දේසන්තරං සඞ්කමන්තීති දස්සේති. **ඝට්ටනසභාවානේවා**ති තේසං භූතානං සද්දසමුප්පත්තිහේතුභාවමාහ" යනු අනුටීකායි)

**ඒතානි** චක්ෂුස්ප්‍රශාද ශ්‍රෝත්‍රප්‍රශාද දෙදෙන **අහිආදිසමානානි** සර්පාදීන්ට සමානය **යථා හි** යම්සේ වනාහි **අහි නාම** සර්ප තෙමේ නම් **බහි** බාහිර **සිත්තසම්මට්ඨට්ඨානේ** පැන් ඉසි සමතලා කරනලද ස්ථානයෙහි නොහොත් අමදිනලද ස්ථානයෙහි **නාභිරමති** සිත් අලවා වාසය නොකරයි **සඞ්කාරට්ඨාන** කැළිකසල ඇති ස්ථාන **තිණපණ්ණගහන** තෘණ පත්‍ර බහුල **වම්මිකානියේව** තුඹස්හිම **පවිසිත්වා** පිවිස **නිපන්නකාලේ** නිදන කාලයෙහි **අභිරමති** සිත් අලවා වාසය කරයි **ඒකග්ගතං ආපජ්ජති** චිත්තේකාග්‍රයට පැමිණෙයි **ඒවමේව** මෙසේම **ඒතං විසමජ්ඣාසයං** ඒ විසම අදහස් ඇති **චක්ඛු** චක්ෂුස්ප්‍රශාදය තෙමේ **මට්ටේසු සුවණ්ණභිත්තිආදීසු** මට්ටම්කළ ස්වර්ණ බිත්ති ආදියෙහි **නාභිරමති** අභිරමනය නොකරයි **ඕලෝකේතුම්පි** බලන්නට ද **න ඉච්ඡති** නොකැමැති **වෙයි රූපචිත්තපුප්ඵලතාදිචිත්තේසුයේව පන** විසිතුරු රූප මල්වැල් ආදී චිත්‍ර කර්මයන්හිම වනාහි **අභිරමති** අභිරමනය කරයි **තාදිසේසු හි ඨානේසු** එබඳු ස්ථානයන්හි **චක්ඛුම්හි** ඇස් **අප්පහොන්තේ** පොහොසත් නොවන කල්හි **මුඛම්පි විවරිත්වා** මුඛයද විවරකොට **ඕලෝකේතුකාමා හොන්ති** බලනු කැමැත්තෝ වෙත්.

**සුසුමාරේපි** කිඹුල් තෙමේ ද **බහි නික්ඛන්තෝ** බැහැරට නික්මෙනුයේ **ගහේතබ්බං** ගතයුත්තක් **න පස්සති** නොම දකී **අක්ඛීනි** ඇස් **නිම්මීලෙත්වාව** පියාගෙනම **චරති** හැසිරෙයි **යදා පන** යම්කලෙක වනාහි **බ්‍යාමසතමත්තං උදකං** බඹ සියයක් පමණ ජලයට **ඕගාහෙත්වා** බැස **බිලං පවිසිත්වා** බිලට පිවිස **නිපන්නෝ හෝති** වැදහොන්නේ වෙයි **තදා** එකල්හි **තස්ස** ඔහුගේ **චිත්තං** සිත **ඒකග්ගං හෝති** එකඟ වෙයි **සුඛං සුපති** සැපසේ නිදයි **ඒවමේව** මෙසේම **බිලජ්ඣාසයං ඒතම්පි සෝතං** බිලජ්ඣාශය ඇති මේ ශ්‍රෝත්‍රප්‍රශාදය **ආකාසසන්නිස්සිතං** ආකාශය ඇසුරු කරන **කණ්ණච්ඡිද්දකූපකේයේව** කන් සිඳුර නම් වලෙහිම **අජ්ඣාසයං කරෝති** සයනය කරයි (කණ්ණකූපච්ඡිද්දේයේව පවත්තනතෝ ආරම්මණග්ගහණහේතුතෝ ච තත්ථේව **"අජ්ඣාසයං කරෝතී"**ති වුත්තං) **කණ්ණච්ඡිද්දකාසෝයේව** කන් සිඳුරු අවකාශයම **තස්ස** ඒ ශ්‍රෝත්‍රප්‍රශාදයට **සද්දසවණේ** ශබ්දය ඇසීමෙහි **පච්චයෝ හෝති** ප්‍රත්‍යය වෙයි **අජටාකාසෝපි** අජටාකාශය ද **වට්ටතියේව** වටීමය **අන්තෝලේණස්මිඤ්හි** ඇතුල් ලෙනෙහි **සජ්ඣායේ කරීයමානේ** සජ්ඣායනාව කරන කල්හි **ලේණච්ඡදනං** ලෙන් පියස්ස **භින්දිත්වා** බිඳගෙන **සද්දෝ** ශබ්දය **බහි** බැහැරට **න නික්ඛමති** නොනික්මෙයි **ද්වාරවාතපානච්ඡිද්දේහි පන** දොර වා කවුළු සිදුරුවලින් වනාහි **නික්ඛමිත්වා** නික්මී **ධාතුපරම්පරායේව** ධාතු පරම්පරාවෙන්ම **ඝට්ටෙන්තෝ** ගැටෙමින් **ගන්ත්වා** ගොස් **සෝතපසාදං ඝට්ටේති** ශ්‍රෝප්‍රශාදය හා ගැටෙයි **අථ** ඉක්බිති **තස්මිං කාලේ** එකල්හි **අසුකෝ නාම** අසවල් පුගුලා නම් **සජ්ඣායතීති**

සජ්ඣායනා කරයි යයි **ලේණපිට්ඨේ** ලෙන්පිට **නිසින්නා** හුන්නාහු **ජානන්ති** දැනගනිත්.

**ඒවං සන්තේ** මෙසේ ඇති කල්හි **සම්පත්තගෝචරතා හෝති** සම්ප්‍රාප්ත ගෝචර බව වෙයි **කිං** කිමෙක්ද **ඒතං පන** මෙය වනාහි **සම්පත්තගෝචරං ඉති** සම්ප්‍රාප්තගෝචර ද? **ආම** එසේය **සම්පත්තගෝචරං** සම්ප්‍රාප්තගෝචර නම් **යදි** ඉදින් **ඒවං** මෙසේ **දූරේ** දුර **භේරිආදීසු වජ්ජමානේසු** බෙර ආදිය වයන කල්හි **දූරේ සද්දෝති** දුර ශබ්දයක් යැයි **ජානනං** දැන ගැනීම **න භවෙය්‍යාති** නොවන්නේ ද? **නෝ න භවති** නොවන්නේ නොවෙයි **සෝතපසාදස්මිඤ්හි** ශ්‍රෝත්‍රප්‍රශාදයෙහි **ඝට්ටිතේ** ගැටුනු කල්හි **දූරේ සද්දෝ** දුර ශබ්දයෙක **ආසන්නේ සද්දෝ** ආසන්නයේ ශබ්දයෙක **පරතීරේ (සද්දෝ)** එතර ශබ්දයෙක **ඕරිමතීරේ (සද්දෝ)** මෙතර ශබ්දයෙක් **ඉති** යැයි **තථා තථා ජානනාකාරෝ හෝති** ඒ ඒ ලෙස දැනගන්නා ආකාරය වෙයි **ඒසා** එය **ධම්මතා** ධර්මතාවයකි **ඒතාය ධම්මතාය** ඒ ධර්මතාවයෙන් **කිං?** කිම? **පිද්දං** සිදුර **යතෝ යතෝ** යම් යම් ආකාරයෙන් වේද **සවනං** ඇසීම ද **තතෝ තතෝ** ඒ ඒ ආකාරයෙන් **හෝති** වෙයි **චන්දසූරියාදීනං** චන්ද්‍ර සූර්‍ය්‍ය ආදීන්ගේ **දස්සනං විය** දැකීම මෙන් **ඒතං** මේ ශ්‍රෝත්‍රප්‍රශාදය ද **අසම්පත්තගෝචරමේව** අසම්ප්‍රාප්තගෝචරමය.

**පක්ඛීපි** පක්ෂියා ද **රුක්ඛේ වා** ගසෙහි හෝ **භූමියං වා** භූමියෙහි හෝ **න රමති** රමනය නොකරයි **යදා පන** යම්කලෙක වනාහි **ඒකං වා ද්වේ වා ලෙඩ්ඩුපාතේ** ලෙඩ්ඩුපාත එකක් දෙකක් හෝ (ගල් කැටයක් උඩ විසිකළවිට යන දුර ලෙඩ්ඩුපාතයකි) **අතික්කම්ම** ඉක්ම **අජටාකාසං** අහසට **පක්ඛන්දෝ හෝති** පැනනැගුනේ වෙයි ද **තදා** එකල්හි **ඒකග්ගචිත්තං** සිත එකඟබවට **ආපජ්ජති** පැමිණෙයි **ඒවමේව** එපරිද්දෙන්ම **ආකාසජ්ඣාසයං** අහස පිළිබඳ අදහස් ඇති **ඝානම්පි** ඝ්‍රාණප්‍රශාදය ද **වාතූපනිස්සයගන්ධගෝචරං** වාතය උපනිශ්‍රය කොට ඇති ගන්ධය ආරම්මණ කොට ඇත **තථා හි** එසේම වනාහි **ගාවෝ** ගවයෝ **නවවුට්ඨේ දේවේ** අළුතින් වැසි වැටුනු **භූමියං** භූමියෙහි **ඝායිත්වා ඝායිත්වා** ආඝ්‍රාණය කොට **ආකාසාභිමුඛා හුත්වා** ආකාශයට අභිමුඛවූවෝ වී **වාතං ආකඩ්ඪන්ති** වාතය ඇදගනිත් **ච** තවද **අඞ්ගුලීහි** ඇඟිලිවලින් **ගන්ධපිණ්ඩං ගහෙත්වාපි** සුවඳ පිඬක් ගෙනද **උපසිඞ්ඝනකාලේ** සුවඳ බලන කාලයෙහි **වාතං අනාකඩ්ඪන්තෝ** වාතය ඇදී නොයෙන්නේ නම් **තස්ස** ඒ ගන්ධ පිඬගේ **ගන්ධං** සුවඳ **නේව ජානාති** නොදනීමය.

**කුක්කුරෝපි** සුනඛයා ද **බහි** බැහැර **විචරන්තෝ** හැසිරෙනුයේ **ඛේමට්ඨානං** නිර්භය ස්ථානයක් **න පස්සති** නොදකී **ලෙඩ්ඩුපහාරාදීහි** කැට පහරාදියෙන් **උපද්දුතෝ** උපද්‍රව ඇත්තෙක් **හෝති** වෙයි **අන්තෝගාමං පවිසිත්වා** ඇතුල් ගමට පිවිස **උද්ධනට්ඨානේ** උදුනක් ඇති ස්ථානයෙහි **ඡාරිකං බ්‍යූහිත්වා** අළු විසිරුවාගෙන **නිපන්නස්ස පන** නිදන්නහුට වනාහි **ඵාසුකං හෝති** පහසුවක් වෙයි **ඒවමේව** එපරිද්දෙන්ම **ගාමජ්ඣාසයා** ගම පිළිබඳ අදහස් ඇති **ජිව්හාපි** ජිව්හාප්‍රශාදය ද **ආපෝසන්නිස්සිතරසාරම්මණා** අප් ධාතුව නිශ්‍රය කොට ඇති රසය අරමුණු කොට ඇත **තථා හි** එසේම වනාහි **තියාමරත්තිං** තුන්යම් රාත්‍රියෙහි **සමණධම්මං කත්වාපි** ශ්‍රමණධර්මය කොට ද **පාතෝව** අළුයම **පත්තචීවරමාදාය** පා-සිවුරු ගෙන **ගාමෝ පවිසිතබ්බෝ හෝති** ගමට පිවිසිය යුත්තෙක් වෙයි **ඛේලේන** කෙළෙන් **අතේමිතස්ස** නොතෙමුනු **සුක්ඛඛාදනීයස්ස** වියළි ආහාරයගේ **රසං** රසය **ජානිතුං** දැනගන්නට **න සක්කා** නොහැක්කේය.

**සිඞ්ගාලෝපි** සිවලා **බහි** බැහැර **විචරන්තෝ** හැසිරෙනුයේ ද **රතිං** ඇලීමක් **න වින්දති** නොවිදී **ආමකසුසානේ** අමු සොහොනෙහි **මනුස්සමංසං ඛාදිත්වා** මිනීමස් කා **නිපන්නස්සේව පනස්ස** නිදන්නාවූ හිවලාටම **ඵාසුකං හෝති** පහසුවක් වෙයි **ඒවමේව** එපරිද්දෙන්ම **උපාදින්නකජ්ඣාසයෝ කායෝපි** උපාදින්නක අධ්‍යාශය ඇති කායප්‍රශාදය ද **පඨවිනිස්සිතඵොට්ඨබ්බාරම්මණෝ** පඨවි ධාතුව නිශ්‍රය කොට ඇති ඵොට්ඨබ්බය අරමුණු කොට ඇත **තථා හි** එසේම වනාහි **අඤ්ඤං උපාදින්නකං** අන්‍ය උපාදින්නකයක් **අලභමානා** නොලබන්නා වූ **සත්තා** සත්වයෝ **අත්තනෝ හත්ථතලේ** සිය අත්ලෙහිම **සීසං කත්වා** හිස තබාගෙන **නිපජ්ජන්ති** හොවිත් **තස්ස** ඔහුට **අජ්ඣත්තිකබාහිරා ච** පඨවි ආධ්‍යාත්මික වූද බාහිර වූද පඨවිය **ආරම්මණග්ගහණේ** අරමුණු ගැනීමෙහි **පච්චයෝ හෝති** ප්‍රත්‍යය වෙයි **හි** ඒ කීම සැබෑව **සුසන්ථස්සපි** මනාව අතුරනලද **සයනස්ස වා** සයනයකගේ (**නිපන්නස්ස** නිදන්නහුට) හෝ **හත්ථේ ඨපිතානම්පි** අත්ලෙහි හිස තබා (**නිපන්නස්ස** නිදන්නහුට) හෝ **අනිසීදන්තේන වා** නොහිඳින්නෙකු විසින් හෝ **අනිප්පීළෙන්තේන වා** නොපෙළෙන්නෙකු විසින් හෝ **ඵලානං (ඵලකානං)** ඵලකාදියගේ **ථද්ධමුදුභාවෝ** තද මෘදු බව **ජානිතුං** දැනගන්නට **න සක්කා** නොහැක්කේය **අජ්ඣත්තිකබාහිරපඨවී** ආධ්‍යාත්මික බාහිර පඨවි තෙම **ඒතස්ස කායපසාදස්ස** ඒ කායප්‍රශාදයාගේ **ඵොට්ඨබ්බජානනේ** ඵොට්ඨබ්බාරම්මණය දැනගැනීමෙහි **පච්චයෝ හෝති** ප්‍රත්‍යය වෙයි. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

චක්ඛුසෝතානි අසම්පත්තවිසයග්ගාහකානි අත්තනෝ නිස්සයං අනල්ලීනනිස්සයේ ඒව විසයේ විඤ්ඤාණහේතුත්තා. ඝානජිව්හාකායා සම්පත්තවිසයග්ගාහකා, නිස්සයවසේන චේව සයඤ්ච අත්තනෝ නිස්සයං අල්ලීනේයේව විසයේ විඤ්ඤාණහේතුත්තා.
**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 435 යටතේ) විසුද්ධිමග්ග අටුවා 333 පිට (හේ.වි.මු) සිංහල විසුද්ධි මාර්ගය ස්කන්ධ නිර්දේශය 174-175 පිටු (තායිවාන් මුද්‍රණය)]**

අනල්ලීනෝ නිස්සයෝ ඒතස්සාති **අනල්ලීනනිස්සයෝ,** රූපසද්දසඞ්ඛාතෝ විසයෝ. ගන්ධරසානං නිස්සයා ඝානජිව්හානං නිස්සයේ අල්ලීයන්තීති තේ නිස්සයවසේන අල්ලීනා. ඵොට්ඨබ්බං සයං කායනිස්සයඅල්ලීනං භූතත්තා. අපරෝ නයෝ; චක්ඛුසෝතානි අප්පත්තවිසයග්ගාහකානි සාන්තරේ, අධිකේ ච විසයේ විඤ්ඤාණුප්පත්තිහේතුභාවතෝ. සෝතම්පි සම්පත්තවිසයග්ගාහීති කේචි. යදි සෝතං සම්පත්තගාහි, චිත්තජෝ සද්දෝ සෝතවිඤ්ඤාණස්ස ආරම්මණං න සියා. න හි බහිද්ධා චිත්තසමුට්ඨානානං උප්පත්ති අත්ථි. **පාළියඤ්ච** අවිසේසේන සද්දාරම්මණස්ස සෝතවිඤ්ඤාණාරම්මණභාවෝ වුත්තෝ. කිඤ්ච දිසාදේසවවත්ථානඤ්ච සද්දස්ස න සියා, අත්තනෝ විසයිපදේසස්ස ඒව ගහේතබ්බතෝ ගන්ධෝ විය. තස්මා යත්ථ උප්පන්නෝ සද්දෝ, තත්ථේව ඨිතෝ. සචේ සෝතපථේ ආපාථමාගච්ඡති, නනු දූරේ ඨිතේහි රජකාදිසද්ද චිරේන සුය්‍යන්තීති? න දූරාසන්නානං යථාපාකටේ සද්දේ ගහණවිසේසතෝ. යථා හි දූරාසන්නානං වචනසද්දේ යථාපාකටේ ගහණවිසේසතෝ ආකාරවිසේසානං අග්ගහණං, ගහණඤ්ච හෝති, ඒවං රජකාදිසද්දේපි ආසන්නස්ස ආදිතෝ පභුති යාව අවසානා කමේන පාකටීභූතේ, දූරස්ස ච අවසානේ, මජ්ඣේ වා පිණ්ඩවසේන පවත්තිපාකටීභූතේ නිච්ඡයග්ගහණානං සේතවිඤ්ඤාණවීථියා පරතේ පවත්තානං විසේසතෝ ලහුකං සුතෝ "චිරේන සුතෝ"ති අධිමානෝ හෝති. සෝ පන සද්දෝ යත්ථ උප්පන්නෝ, තන්නිස්සිතෝව අත්තනෝ විජ්ජමානක්ඛණේ සෝතස්ස ආපාථමාගච්ඡති. යදි සද්දස්ස භූතපරම්පරාය සමන්තතෝ පවත්ති නත්ථි, කථං

පටිඝෝසුප්පත්තීති? දූරේ ඨිතෝපි සද්දෝ අභිඝාතත්ථ පටිඝෝසුප්පත්තියා, භාජනාදිචලනස්ස ච අයෝකන්තෝ විය අයෝචලනස්ස පච්චයෝ හෝතීති දට්ඨබ්බං.
**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 435 යටතේ)]**

**චක්ඛුසෝතානි අසම්පත්තවිසයග්ගහකානි** චක්‍ෂුස්ශ්‍රෝත්‍රයෝ දෙදෙන තමන් කරා අසම්ප්‍රාප්ත විෂය ගන්නාහුයි **අත්තනෝ නිස්සයං** තමහට නිශ්‍රයවූ මහාභූතයන් කෙරෙහි **අනල්ලීනනිස්සයේ ඒව විසයේ** නොඇලුනාවූ නිශ්‍රය ඇතිම රූප-ශබ්ද විෂයෙහි **විඤ්ඤාණහේතුත්තා** විඤ්ඤාණයට හේතු බැවිනි රූප ශබ්ද දෙදෙනහට නිශ්‍රය වූ භූතයෝ චක්‍ෂුස්ශ්‍රෝත්‍ර දෙදෙනහට නිශ්‍රයවූ භූතයන් කෙරෙහි ගැටුණු කලම රූප-ශබ්ද ගෝචරයෙහි ප්‍රශාදශ්‍රය වූ විඤ්ඤාණයන් නොඋපදනෙන් "අත්තනෝ නිස්සයං අනල්ලීනනිස්සයේ ඒව විසයේ විඤ්ඤාණහේතුත්තා" යි කීහු. "අනල්ලීනෝ නිස්සයෝ ඒතස්සාති අනල්ලීනනිස්සයෝ, රූපසද්දසඞ්ඛාතෝ විසයෝ" **ඝානජිව්හාකායා** ඝ්‍රාණ-ජිව්හා-කාය තුන්දෙන **සම්පත්තවිසයග්ගහකා** තමන් කරා සම්ප්‍රාප්ත විෂය ගන්නාහුයි **නිස්සයවසේන චේව** ඝ්‍රාණ-ජිව්හා දෙදෙන තමන්ගේ නිශ්‍රය වශයෙන් ද **සයඤ්ච** ස්ප්‍රෂ්ටව්‍ය තෙමේ ද **අත්තනෝ නිස්සයං අල්ලීනේයේව විසයේ** තමන්ගේ නිශ්‍රය වූ භූතයන් ඇළුණු විෂයෙහිම **විඤ්ඤාණහේතුත්තා** විඤ්ඤාණයට හේතු බැවිනි. නොහොත් සාන්තරවිෂයෙහිදු අධික විෂයෙහිදු විඤ්ඤාණෝත්පත්තියට හේතු බැවින් චක්‍ෂුස්ශ්‍රෝත්‍ර දෙදෙන අසම්ප්‍රාප්ත විෂයග්‍රාහී වෙත්. ඉදින් ප්‍රාප්තගාහීවූ නම් අක්‍ෂයෙන් විච්ඡින්න දේශවිෂය ද අක්‍ෂ ප්‍රමාණයට අධික ප්‍රමාණ විෂය ද නොගන්නාහුයි. යම්හෙයකින් දූරවිෂය ද අක්‍ෂප්‍රමාණයෙන් අධිකවිෂය ද ගන්නාහුද එහෙයින් අප්‍රාප්තග්‍රාහී වෙතියි දතයුත්තාහුයි. මෙම කීහ දින්නාගපාදයෝ:—

"සම්ප්‍රාප්තසම්ප්‍රයෝගේ ච - යදිෂ්ටං රූපශබ්දයෝඃ
විච්ඡින්නපෘථිවීඥනං - තණෛනරත්තයඃබාධකම්" යි

අනිකෙකුදු; ඉදින් චක්‍ෂුස සම්ප්‍රාප්ත ගෝචරග්‍රාහී වී නම් තමහට ආධාර වූ සසම්භාර චක්‍ෂුස්හි වර්ණය දක්නේයි. ඇස ගහනලා කෙළවර දක්නේයි. ඇස ගෑහූ අඳුන් දක්නේයි. වැලිදු ඒ නොදක්නේය. චන්ද්‍රබිම්බයෙහි ශශ ලාඤ්ජනය දක්නේයි. මෙම කීහ:—

"දූරේපි පරස්‍යාගසි - පටුර්ජනෝ නාත්මනඃ සමීපේපි
ස්වං ව්‍රණමක්ෂි නපශ්‍යති - ශශිනි කලඞ්කං නිරූපයති" යි

සමහර කෙනෙක් ශ්‍රෝත්‍රය ද සම්ප්‍රාප්ත විෂයග්‍රාහීය යෙත්. ඉදින් ශ්‍රෝත්‍රය සම්ප්‍රාප්තග්‍රාහී වී නම් බහිද්ධා චිත්තජ ශබ්දෝත්පත්තිය නැති බැවින් හේ ශ්‍රෝත්‍රවිඤ්ඤාණයට විෂය නොවන්නේයි. පාඨයෙහිදු අවිශේෂයෙන් ශබ්දයතනයාගේ ශ්‍රෝත්‍රවිඤ්ඤාණයට අරමුණු බව කියනලදි.

අනිකෙකුදු; ශබ්දයා ප්‍රාප්තග්‍රාහී වී නම් ඝ්‍රාණයෙහි ගන්ධය මෙන් ස්වාක්‍ෂ ප්‍රදේශයෙහිම උපලභ්‍යයෙන් ශබ්දයාගේ දික් දේශ ව්‍යවස්ථාව නොවන්නේයි. එහෙයින් ශබ්දය යම් තැනෙක උත්පන්න ද ඒ තැන්හිම සිටියේ ශ්‍රෝත්‍රපථයෙහි ආපාථයට යන්නේය. ඉදින් උත්පන්න ස්ථානයෙහි සිටම ශ්‍රෝත්‍රපථයෙහි ආපාථයට යේ නම් දුර සිටියවුන් විසින් රජකාදී ශබ්දයෝ කුමක් හෙයින් කලෙකින් අසනු ලැබෙත් ද යත්? දූරාසන්නයට ශබ්ය ප්‍රකටවූ ක්‍රමයෙන් ග්‍රහණවිශේෂය වන හෙයිනි. යම්සේ

දූරාසන්නයට වචන ශබ්දය ප්‍රකටවූ ක්‍රමයෙන් ග්‍රහණවිශේෂයෙන් අක්‍ෂර විශේෂයන්ගේ අග්‍රහණය ද ග්‍රහණය ද වේද එසේම රජකාදී ශබ්දය ද ආසන්නය හට ආදියෙහි පටන් අවසානය දක්වා ක්‍රමයෙන් ප්‍රකට වූ කල්හි දූරය හට අවසානයෙහි හෝ මධ්‍යයෙහි හෝ පිණ්ඩ වශයෙන් ප්‍රවෘත්තිය ප්‍රකටවූ කල්හි ශ්‍රෝත්‍රවිඥානය වීථියෙන් මත්‍තුයෙහි ප්‍රවෘත්ති නිශ්චය ග්‍රහණය කරණ මනෝද්වාර විඥානයන්ගේ විශේෂයෙන් වහා ඇසිණ කලෙකින් ඇසිණැයි අභිමානය වේ. ඒ ශබ්දය වනාහි යම්තැනෙක්හි උපන්නේ ද ඒ ශබ්දය නිශ්‍රිත කොටගෙනම තමාගේ විද්‍යමානක්‍ෂණයෙහි ශ්‍රෝත්‍රයාගේ හමුවට පැමිණේ. ඉදින් ශබ්දයාගේ භූත පරම්පරායෙන් හාත්පසින් ප්‍රවෘත්තිය නැත්නම් ප්‍රතිඝෝෂෝත්පත්තිය කෙසේද යත්? අයශ් චලනයට අයශ්කාන්තය මෙන් දූරාස්පද වූ ශබ්දය තෙමේ අනික් තැන ප්‍රතිඝෝෂෝත්පත්තියට ද භාජන චලනයට ද ප්‍රත්‍යය වෙයි දතයුතුයි.

**[විසුද්ධි මාර්ග මහා සන්නය 1053-1054 පිටු]**

ඒවමේතේසු චක්ඛුඤ්ච, සෝතං අපත්තගාහකං;
සේසං තු පන ඝානාදිත්තයං සම්පත්තගාහකං.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 663 යටතේ)]**

**ඒවං** මෙසේ **ඒතේසු** මේ ප්‍රශාදයන් අතුරින් **චක්ඛුඤ්ච** චක්‍ෂුස්ප්‍රශාදය ද **සෝතඤ්ච** ශ්‍රෝත්‍රප්‍රශාදය ද **අපත්තගාහකං** අසම්පත්තග්‍රාහක නම් **පන (තථා)** එසේම **සේසං තු ඝානාදිත්තයං** සෙසු ඝ්‍රාණාදිත්‍රය වනාහි **සම්පත්තගාහකං** සම්ප්‍රාප්තග්‍රහක නම්. **[අභිධම්මාවතාර ටීකා පරිවර්තනයි]**

ඒවං කම්මවිසේසතෝ විසිට්ඨේසු ච ඒතේසු ආරම්මණග්ගහණේපි අයං විසේසෝති දස්සේතුං **"ඒවමේතේසූ"**තිආදි වුත්තං. **අප්පත්තගාහක**න්ති අසම්පත්තග්ගාහකං අත්තනෝ නිස්සයේන සහ අනල්ලීයනනිස්සයේ ඒව රූපාදිවිසයේ විඤ්ඤාණුප්පත්තිහේතුභාවතෝ. කේචි පන තම්පි "සම්පත්තග්ගාහකමේවා"ති වදන්ති, තං න සුන්දරං සාන්තරේ අධිකේ ච විසයේ විඤ්ඤාණුප්පත්තිහේතුභාවතෝ. යදි හි චක්ඛුසෝතානි සම්පත්තවිසයමේව ගණ්හන්ති, චක්ඛුපසාදතෝ විච්ඡින්නදේසේ ඨිතේසු තාරකාදීසු නිස්සයවසේන ච පමාණතෝ අධිකේසු චන්දමණ්ඩලාදීසු රූපායතනේසු සෝතපසාදතෝ ච විච්ඡින්නදේසසම්භූතේසු උදරචම්මසන්ධිචම්මාදිඅන්තරිතේසු කුච්ඡිසද්ද-සන්ධිසද්දාදීසු පුථුලේසු ච සමුද්දසද්දාදීසු සද්දායතනේසු විඤ්ඤාණුප්පත්ති න සියා සම්පත්තග්ගාහකානං කායින්ද්‍රියාදීනං තථා අදස්සනතෝ.

එත්ථ ච වදෙය්‍ය; අධිට්ඨානතෝ බහින්ද්‍රියස්ස පවත්ති හෝතීති සම්පත්තවිසයමේව යත්තකං විසයං, තත්තකං විසයං ගහණාකාරං ඵරිත්වා ගණ්හාති, තස්මා අසිද්ධමේතං "සාන්තරේ අධිකේ ච විසයේ විඤ්ඤාණුප්පත්තිහේතුභාවතෝ"ති? තං න, අධිට්ඨානතෝ බහි ඉන්ද්‍රියුප්පත්තියා ඒව අභාවා. අධිට්ඨානදේසේ ඒව හි ඉන්ද්‍රියං පවත්තති තත්ථ කිච්චාදිප්පයෝග දස්සනතෝ. සති ච ඒතස්ස බහි පවත්තියං අධිට්ඨානේ පිහිතේපි විසයග්ගහණං සියා, තස්මා අධිට්ඨානදේසේ ඨිතානංයේව චක්ඛුසෝතානං අසම්පත්තවිසයස්සේව ගහණතෝ නාසිද්ධමේතං "සාන්තරේ අධිකේ ච විඤ්ඤාණුප්පත්තිහේතුභාවතෝ"ති. තේනාහු පෝරාණා;

"සබ්බගෝචරයෝග්ගේපි, දිට්ඨං රූපරවේසු යං;

විච්ඡින්නපුථුවිඤ්ඤාණං, සම්පත්තග්ගාහබාධක"න්ති.

තස්සත්ථො; සබ්බේසං චක්ඛාදීනං ගෝචරේන රූපාදිනා යෝගේ ඒකකාරියසාධකත්තා සම්බන්ධේ ඝට්ටනේ වා සමානේ සති **රූපරවේසු** රූපසද්දායතනේසු විසයභූතේසු චක්ඛාදිතෝ දූරභාවේන චේව කේනචි අනන්තරිතභාවේන ච විච්ඡින්නේසු පමාණතෝ පුථුලේසු ච විසයේසු උප්පජ්ජමානං යං විඤ්ඤාණං, තං චක්ඛුසෝතානං සම්පත්තග්ගාහස්ස සම්පත්තග්ගහණස්ස බාධකන්ති.

අපිච යදි චක්ඛු සම්පත්තග්ගාහකං සියා, අත්තනෝ මණ්ඩලේ ඨිතං වණ්ණම්පි පස්සෙය්‍ය. තථා අක්ඛිපුටේ අඤ්ජනං පඛුමමූලේ අක්ඛිවණ්ණං පඛුමමූලේ ඝට්ටියමානං අඤ්ජනසලාකම්පි පස්සෙය්‍ය, න ච පනේතං දිස්සති, තස්මා තන්නිස්සයේ දේසේ ඨිතමේව විසයං ගණ්හාති. සෝතායතනම්පි යදි සම්පත්තග්ගාහකං අභවිස්ස, චිත්තසමුට්ඨානං සද්දායතනං සෝතවිඤ්ඤාණස්ස කදාචිපි ආරම්මණපච්චයෝ න සියා. න හි බහිද්ධා චිත්තසමුට්ඨානානං උප්පත්ති අත්ථි. **පට්ඨානේ** ච "සද්දායතනං සෝතවිඤ්ඤාණධාතුයා ආරම්මණපච්චයේන පච්චයෝ"ති (පට්ඨා. 1.1.2) අවිසේසේනේව සද්දස්ස සෝතවිඤ්ඤාණාරම්මණභාවෝ වුත්තෝ. කිඤ්ච යදි සෝතං සම්පත්තග්ගාහකං සියා, අත්තනෝ විසයපදේසේයේව ගහේතබ්බතෝ ගන්ධස්ස විය සද්දස්සාපි දිසාදේසවවත්ථානං න සියා. ඒවඤ්ච සද්දානුසාරේන කණ්ඩං පාතෙන්තස්ස සද්දවේධිනෝ අත්තනෝ කණ්ණබිලේයේව සරපාතනං සියා, තස්මා යත්ථ උප්පන්නෝ සද්දෝ, තත්ථේව ඨිතෝ සෝතපථේ ආපාථමාගච්ඡති.

යදි ඒවං කථං දූරේ ඨිතේහි රජකාදිසද්ද චිරේන සුය්‍යන්ති. අසම්පත්තග්ගාහකත්තේ හි දූරාසන්නදේසවත්තීනං සමකමේව සවණේන භවිතබ්බන්ති? නයිදමේවං දූරාසන්නානං යථාපාකටේ සද්දේ ගහණවිසේසතෝ. යථා හි දූරාසන්නානං වචනසද්දේ යථාපාකටේව ගහණවිසේසතෝ අක්ඛරවිසේසනං ගහණං, අග්ගහණඤ්ච හෝති, ඒවං රජකාදිසද්දේපි ආසන්නස්ස ආදිතෝ පභුති යාව අවසානා කමේන පාකටීභූතේ, දූරස්ස ච අවසානේ, මජ්ඣේ වා පිණ්ඩවසේන පවත්තිපාකටීභූතේ යථාපාකටං නිච්ඡයග්ගාහකානං සෝතවිඤ්ඤාණවීථියා පරතෝ පවත්තානං මනෝද්වාරිකජවනානං ගහණවිසේසතෝ ලහුකං සුතෝ, චිරේන සුතෝති අභිමානෝ හෝති. සෝතවිඤ්ඤාණප්පවත්ති පන උභයත්ථ සමානා සද්දස්ස උප්පන්නදේසේ ඨිතස්ස අත්තනෝ විජ්ජමානක්ඛණේයේව සෝතාපාථගමනතෝ. යදි සද්දස්ස භූතපරම්පරාය සමන්තතෝ පවත්ති නත්ථි, කථං පටිඝෝසුප්පත්තීති? දූරේ ඨිතෝපි සද්දෝ අඤ්ඤත්ථ පටිඝෝසුප්පත්තියා, භාජනාදිචලනස්ස ච පච්චයෝ හෝති අයෝකන්තෝ විය අයෝචලනස්සාති දට්ඨබ්බං.

**සේසං**...**පෙ**.... **ගාහක**න්ති යං පන අවසේසං ඝානජිව්හාකායසඞ්ඛාතං පසාදත්තයං, තං සම්පත්තග්ගාහකං හෝති නිස්සයවසේන චේව සයඤ්ච අත්තනෝ නිස්සයේ අල්ලීනේයේව විසයේ විඤ්ඤාණුප්පත්තිහේතුභාවතෝ. ගන්ධරසානං නිස්සයේසු ඝානජිව්හානිස්සයේහි සහ අල්ලීනායේව ගන්ධරසා විඤ්ඤායන්ති. ඵොට්ඨබ්බඤ්ච භූතත්තයරූපං කායනිස්සයේන අල්ලීනමේව විඤ්ඤායතීති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 663 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 452-456 පිටු]**

මෙසේ කර්ම විශේෂයෙන් විසිතුරු වූ ඒ ප්‍රශාදයන්හි අරමුණු ගැනීමෙහි ද මේ විශේෂයයි දැක්වීමට "ඒවමේතේසු" යනාදිය කියනලදි. අප්පත්තගාහකං යනු තමා ඇසුරු කරන මහාභූතයන් හා සමග නොඇළුනාවූ නිශ්‍රය ඇත්තාවූම රූපාදි විෂයෙහි විඤ්ඤාණ උත්පත්තියට හේතු බැවින් අසම්ප්‍රාප්තග්‍රහක නම්. සාන්තරවිෂයෙහිදු අධිකවිෂයෙහිදු විඤ්ඤාණ උත්පත්තියට හේතු බැවින් ඇතමෙක් චනාහි චක්ෂුස්ප්‍රශාද ශ්‍රෝත්‍රප්‍රශාද යන දෙදෙන සම්පත්තග්‍රහකම යැයි කියත්. ඒ කීම සුදුසු නොවෙයි. ඉදින් චනාහි චක්ෂුස්ප්‍රශාද ශ්‍රෝත්‍රප්‍රශාද දෙදෙන සම්ප්‍රාප්ත විෂය ගනිත් නම් රූපාරම්මණ අතුරින් චක්ෂුස්ප්‍රශාදයෙන් විච්ඡින්න දේශයෙහි සිටි තාරකාදියෙහි ද ප්‍රමාණයෙන් අධික වූ චන්‍ද්‍රමණ්ඩලාදියෙහි ද, ශබ්දරම්මණ අතුරින් ශ්‍රෝත්‍රප්‍රශාදයෙන් විච්ඡින්න දේශයෙහි හටගත් කුසෙහි ද සන්ධි ආදිය අතරෙහි හටගන්නා කුච්ඡිශබ්ද සන්ධිශබ්ද ද පුථුල වූ සමුද්‍ර ශබ්දදියෙහි ද චක්ෂුස්-ශ්‍රෝත්‍ර දෙදෙනට නිශ්‍රය වීම් වශයෙන් විඤ්ඤාණ උත්පත්තිය නොවන්නේය. සම්ප්‍රාප්තග්‍රාහික කායින්‍ද්‍රිය ආදීන්ගේ එසේ නොදක්නා බැවිනි.

අධිෂ්ඨාන කිරීම් වශයෙන් බාහිර ඉන්‍ද්‍රියන්ගේ පැවැත්ම වෙයි යැයි කියන්නේ නම් සම්ප්‍රාප්ත විෂයම යම්පමණ විෂය වේද, එපමණ විෂය ගැනීම් ආකාරයෙන් පතුරුවා ගනියි. එහෙයින් අධිෂ්ඨාන කිරීම් වශයෙන් බාහිර ඉන්‍ද්‍රියන්ගේ පැවැත්ම වෙයි යැයි ඒ කීම ද නිෂ්ඵලය. සාන්තරවිෂයෙහිදු අධික විෂයෙහිදු විඤ්ඤාණ උත්පත්තියට හේතු වෙයි, අධිෂ්ඨාන කිරීම් වශයෙන් බාහිර ඉන්‍ද්‍රියන්ගේ ඉපදීම නොවන බැවින් එය ද එසේ නොවෙයි. එහි කෘත්‍යාදී ප්‍රයෝග දැක්වීම් වශයෙන් අධිෂ්ඨාන කළ ප්‍රදේශයෙහිම ඉන්‍ද්‍රිය පවතියි. ප්‍රශාදයාගේ බාහිර පැවැත්මක් ඇති කල්හි ද අධිෂ්ඨානය වැසූ කල්හි ද විෂය ග්‍රහණය වන්නේය. එහෙයින් සාන්තරවිෂයෙහිදු අධිකවිෂයෙහිදු විඤ්ඤාණ උත්පත්තියට හේතු භාවයෙන් අධිෂ්ඨා කළ ප්‍රදේශයෙහි සිටියා වූ චක්ෂුර්-ශ්‍රෝත්‍රයන්ගේ අසම්ප්‍රාප්ත විෂයෙහිම ග්‍රහණයෙන් එය සිදු නොවෙයි. එහෙයින් පෞරාණිකයෝ කීහු:--

"සබ්බගෝචරයෝගේපි, දිට්ඨං රූපරවේසු යං;
විච්ඡින්නපුථුවිඤ්ඤාණං, සම්පත්තග්ගාහබාධක"න්ති.

ඒ ගාථාවගේ අර්ථය මෙසේයි; සියළු චක්ෂුරාදීන්ට විෂය වන රූපාදිය සමග යෙදෙන කල්හි එක් ක්‍රියාවක් සිදුකරන හෙයින් සම්බන්ධයෙහි හෝ ඝට්ටනයෙහි හෝ සමානත්වයක් ඇති කල්හි විෂයභූත වූ රූප-ශබ්දදී ආරම්මණයන් අතුරින් චක්ෂුරාදියෙන් දූරභාවයෙන් මෙන්ම කිසියම් අතරක් නැති භාවයෙන් ද සිඳිනලද්දවූ ද ප්‍රමාණයෙන් පුළුල් ආරම්මණයන්හි උපන්නා වූ යම් විඤ්ඤාණයක් වේද එය චක්ෂුර්-ශ්‍රෝත්‍රාදීන්ට ලඟට පැමිණ ගැණීමෙහි ලා සම්ප්‍රාප්තග්‍රහණයට බාධාවකි.

තව ද ඉදින් චක්ෂුස්ප්‍රශාදය සම්ප්‍රාප්තග්‍රාහක වන්නේ නම් තමාගේ මණ්ඩලයෙහි පැවති වර්ණය ද දක්නේය. එසේම අක්ෂිපුටයෙහි ගල්වනලද අඤ්ජන ද, ඇස් පිහාටුව මුල ඇති වර්ණය ද, ඇස් පිහාටුව මුල ගැටෙන අදුන් කූර ද දක්නේය. එය චනාහි නොදකී. එහෙයින් එය නිශ්‍රිත ප්‍රදේශයෙහි ඇති අරමුණම ගනියි. ඉදින් ශ්‍රෝතප්‍රශාදය ද සම්ප්‍රාප්තග්‍රාහික වන්නේ නම් සිතින් උපදින්නා වූ ශබ්දරම්මණය ශ්‍රෝත්‍ර විඤ්ඤාණයට කිසිකලෙකත් ආරම්මණ ප්‍රත්‍යය නොවන්නේය. බාහිර සිතින් උපදින ශබ්දයෝ ඇත්තේ නොවෙයි. ප්‍රස්ථානයෙහි ද "සද්දායතනං සෝතවිඤ්ඤාණධාතුයා ආරම්මණපච්චයේන පච්චයෝ" යැයි විශේෂයක් නැතිවම ශබ්දයට ශ්‍රෝත්‍ර විඤ්ඤාණයාගේ ආරම්මණ භාවය කියනලදි. කිමෙක් ද? ඉදින්

ශ්‍රෝත්‍රය සම්ප්‍රාප්තග්‍රාහක වන්නේ නම් තමාගේ ළඟට පැමිණි අරමුණම ගැණීම් වශයෙන් ගන්ධයට මෙන් ශබ්දයට ද දිශා දේශ නියම කිරීමක් නොවන්නේය. මේ කිවූ ක්‍රමයෙන් ශබ්දනුසාරයෙන් ඊතලය හෙලන්නා වූ ශබ්දවේධීහුට තමාගේ කණ් සිදුරෙහිම ඊය වැටීම වන්නේය. යම්තැනෙක හටගත් ශබ්දය එහිම සිටියේ ශ්‍රෝත්‍ර පථයෙහි ආපාථයට පැමිණෙයි.

ඉදින් මෙසේ නම් දුර සිටින්නවුන් විසින් බොහෝ කලකින් අසන්නේ කෙසේද යත්? අසම්ප්‍රාප්තග්‍රාහකත්වයෙහි වනාහි දුර ආසන්න ප්‍රදේශයන්හි පවත්නා ශබ්දයාගේ ඇසීම සම තත්වයෙන්ම වියයුතුද? එය එසේ නොවෙයි. දුර ආසන්න පුද්ගලයන්ට යම්සේ ශබ්දය ප්‍රකට වූ කල්හි ගැණීම් විශේෂයෙනි. යම්සේ වනාහි දුර ආසන්න පුද්ගලයන්ට කථා කරන ශබ්දයෙහි ප්‍රකට අයුරින්ම ග්‍රහණ විශේෂතාවයෙන් අක්ෂර විශේෂයෙන් ගැණීම ද, නොගැණීම ද වෙයි. මෙසේ රජකාදී ශබ්දයෙහි ද ආසන්න පුද්ගලයාට මුල පටන් අවසානය තෙක් ක්‍රමයෙන් ප්‍රකට වූ කල්හි ද, දුර සිටි පුද්ගලයාට අවසානයෙහි හෝ මධ්‍යයෙහි හෝ පිඬු වශයෙන් හෝ ප්‍රවෘත්තිය ප්‍රකට වූ කල්හි ප්‍රකට වූ ලෙසින් නිශ්චයකට පැමිණෙන්නෙහුට ශ්‍රෝත්‍ර විඤ්ඤාණ වීථියෙන් පසු පවතින්නා වූ මනෝද්වාරික ජවනයන්ගේ ගැණීම් විශේෂයෙන් වහා අසනලදි, කල්ගතවී අසනලදැයි අභිමානය වෙයි. ශබ්දය හටගත් ප්‍රදේශයෙහි සිටියා වූ පුද්ගලයාට ශබ්දයාගේ විද්‍යමාන ක්ෂණයෙහිම ශ්‍රෝත්‍රයට අභිමුඛව යන හෙයින් ශ්‍රෝත්‍ර විඤ්ඤාණයෙහි පැවැත්ම දෙඅයුරින්ම සමානය. ඉදින් ශබ්දයාගේ භූත පරම්පරාවෙන් හාත්පසින් පැවැත්ම නොමැති ද? කෙසේ ප්‍රතිඝෝෂෝත්පත්තිය වේද? අයෝ චලනයට අයශ්කාන්තය මෙන් දුර ඇති වූ ශබ්දය වනාහි අන්තැනෙක ප්‍රතිඝෝෂෝත්පත්තියට ද භාජන චලනයට ද ප්‍රත්‍යය වේ යැයි දතයුතුයි.

සේසං -පෙ- ගාහකං යනු යම් ආකාර වූ සෙසු ඝ්‍රාණ ජිව්හා කාය සඞ්ඛ්‍යාත ප්‍රශාද ත්‍රයක් වේද නිශ්‍රය වශයෙන් මෙන්ම තෙමේ ද තමාගේ ප්‍රසාදයෙහි ඇලෙන්නා වූ ආරම්මණයෙහි විඤ්ඤාණ උත්පත්තියට හේතු භාවයෙන් එය සම්ප්‍රාප්තග්‍රහක වෙයි. ගන්ධ රසයන්ට ප්‍රශාදයන් අතුරින් ඝ්‍රාණ ජිව්හා ප්‍රශාදයන් සමඟ ඇලෙන්නාවූම ගන්ධ රසයෝ ප්‍රකය වෙත්. කාය ප්‍රශාදය සමඟම ඇලෙන්නා වූ භූතත්‍රය වූ ස්පර්ශය ද ප්‍රකට වෙයි. [අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]

අප්පත්තගෝචරග්ගාහිරූපං චක්ඛාදිකං ද්වයං;
සම්පත්තග්ගාහි ඝානාදි-ත්තයමග්ගාහිකං රූපං.

**[අභිධම්මාවතාරෝ; නාමරූපපරිච්ඡේදෝ (ඡට්ඨසඞ්ගායනා අංක 572 යටතේ)]**

**චක්ඛාදිකං ද්වයං** චක්‍ෂුරාදී දෙදෙන **අප්පත්තගෝචරග්ගාහිරූපං** තමා වෙත නොපැමිණි අරමුණු ගන්නේ නම් වෙයි **ඝානාදිත්තයං** ඝ්‍රාණාදිත්‍රය **සම්පත්තග්ගාහිකං රූපං** තමා වෙත පැමිණි අරමුණු ගන්නේ වෙයි.

]අභිධම්මාවතාරනාමරූපපරිච්ඡේද ; පරිවර්තනයි[

තත්ථ සයං සම්පත්ති ඵොට්ඨබ්බස්ස, නිස්සයවසේන සම්පත්ති ඝානජිව්හාකායගන්ධරසානං, උභයථාපි අසම්පත්ති චක්ඛුසෝතරූපසද්දනන්ති දට්ඨබ්බං.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 23 රූපවිභාග වණ්ණනා යටතේ); විභාවනී ටීකා 344 පිට]**

**තත්‍ථ** ඒ සප්‍රතිඝ රූපයන් අතුරෙන් **ඵොට්ඨබ්බස්ස** ස්පර්ශාලම්බනයාගේ **සයං** තමාගේ වශයෙන් **කායස්ස** කායප්‍රශාදයට **සම්පත්ති හෝති** පැමිණීම වේ **ගන්ධරසානං** ගන්ධාලම්බන රසාලම්බනයන්ගේ ("සම්පත්ති" යන්නෙහි සම්බන්ධයි) **නිස්සයවසේන** තම තමාගේ නිශ්‍රය ස්ථාන වූ මහාභූතයන්ගේ වශයෙන් **ඝානජිව්හානං** ඝනප්‍රශාද ජිව්හාප්‍රශාදයන්ට **සම්පත්ති හෝති** පැමිණීම වේ **ඉති** මෙසේ **ඝානජිව්හාකායගන්ධරසඵොට්ඨබ්බානං** ඝානප්‍රශාද ජිව්හාප්‍රශාද කායප්‍රශාද ගන්ධාලම්බන රසාලම්බන ස්පර්ශාලම්බනයන්ගේ **අඤ්ඤමඤ්ඤස්ස** එකෙක් තෙමේ එකෙකු කරා **සම්පත්ති හෝති** පැමිණීම වේ (මෙසේ පාඨ ශේෂ හා සම්පූර්ණ අර්ථ යෝජනා කටයුතුයි) ("ඝානජිව්හාකායගන්ධරසානං" යි ඇතැම් ටීකා පොත්හි දක්නා ලැබේ. එතකුදුවුවත් "ඵොට්ඨබ්බං" යන පාඨය මෙහි යෙදෙන්නේයි) **චක්ඛුසෝතරූපසද්දානං** චක්ෂුඃප්‍රශාද ශ්‍රෝත්‍රප්‍රශාද රූපාලම්බන ශබ්දාලම්බනයන්ගේ **උභයතාපි** තමාගේ වශයෙන් හා තමහට නිශ්‍රය වූ මහාභූතයන්ගේ වශයෙන් දැයි දෙයාකාරයෙන්ම **අසම්පත්ති හෝති** නොපැමිණීම වේ **ඉති** මෙසේ **දට්ඨබ්බං** දතයුතුයි.
**[විභාවනී සන්නය 39 පිට]**

**අසම්පත්තවසේනා**ති අත්තානං අසම්පත්තස්ස ගෝචරස්ස වසේන, අත්තනා විසයප්පදේසං වා අසම්පත්තවසේන. චක්ඛුසෝතානි හි රූපසද්දේහි අසම්පත්තානි, සයං වා තානි අසම්පත්තානේව ආරම්මණං ගණ්හන්ති. තේනේතං වුච්චති;

"චක්ඛුසෝතං පනේතේසු, හෝතාසම්පත්තගාහකං;
විඤ්ඤාණුප්පත්තිහේතුත්තා, සන්තරාධිකගෝචරේ.

"තථා හි දූරදේසට්ඨං, ඵලිකාදිතිරෝහිතං;
මහන්තඤ්ච නගාදීනං, වණ්ණං චක්ඛු උදික්ඛති.

"ආකාසාදිගතෝ කුච්ඡි-චම්මානන්තරිකෝපි ච;
මහන්තෝ ච ඝණ්ටාදීනං, සද්දෝ සෝතස්ස ගෝචරෝ.

"ගන්ත්වා විසයදේසං තං, ඵරිත්වා ගණ්හතීති චේ;
අධිට්ඨානවිධානේපි, තස්ස සෝ ගෝචරෝ සියා.

"භූතප්පබන්ධතෝ සෝ චේ, යාති ඉන්ද්‍රියසන්නිධිං;
කම්මචිත්තෝප්සම්භූතෝ, වණ්ණෝ සද්දෝ ච චිත්තජෝ.

"න තේසං ගෝචරා හොන්ති, න හි සම්භොන්ති තේ බහි;
වුත්තා ච අවිසේසේන, පාඨේ තං විසයාව තේ.

"යදි චේතං ද්වයං අත්තසමීපංයේව ගණ්හති;
අක්ඛිවණ්ණං තථා මූලං, පස්සෙය්‍ය භමුකස්ස ච.

"දිසාදේසවවත්ථානං, සද්දස්ස න භවෙය්‍ය ච;
සියා ච සරවේධිස්ස, සකණ්ණෝ සරපාතන"න්ති.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 26 රූපවිභාග වණ්ණනා යටතේ); විභාවනී ටීකා 346-348 පිටු]**

**අසම්පත්තවසේනාති** අසම්පත්තවසේන යනු **අත්තානං** තමා කරා **අසම්පත්තස්ස** නොපැමිණියා වූ **ගෝචරස්ස වසේන** ගෝචරයාගේ වශයෙන් **වා** නොහොත් **අත්තනා** තමා විසින් **විසයප්පදේසං** අරමුණ පිහිටි ස්ථානය කරා **අසම්පත්තවසේන** නොපැමිණීම් වශයෙන් (හි යනු "තදේව සච්චං" යනාර්ථයි) **චක්ඛුසෝතානි** චක්ෂුශ්ශ්‍රෝත්‍රයන් කරා ("අසම්පත්තානේව" යන්නෙහි සම්බන්ධයි) **චක්ඛුසෝතානි** චක්ෂුශ්ශ්‍රෝත්‍රයෝ තුමූ ("ගණ්හන්ති" යන්නෙහි සම්බන්ධයි) **රූපසද්දේහි** රූප ශබ්දයන් විසින් **අසම්පත්තානේව හුත්වා** නොපැමිණෙන ලද්දහුම වී **ආරම්මණං ගණ්හන්ති** අරමුණ ගනිත් **සයං වා** තුමූ කරා හෝ **තානි** ඒ රූපාලම්බන ශබ්දලම්බන තුමූ **අසම්පත්තානේව හුත්වා** නොපැමිණියාහුම වී **ආරම්මණං ගණ්හන්ති** අරමුණ ගනිත් **තේන** ඒ කාරණයෙන් **චක්ඛුසෝතං පනේතේසු** -පෙ- **ධිකගෝචරේති** "චක්ඛුසෝතං පනේතේසු -පෙ- ධිකගෝචරේ" යන **ඒතං** මේ වාද විනිශ්චය සඞ්ග්‍රහය **වුච්චති** කියනු ලැබේ (ඒ විනිශ්චය සඞ්ග්‍රහයෙහි අර්ථ මෙසේයි)

**ඒතේසු** ඒ පඤ්චප්‍රශාද වස්තු අතුරෙන් **චක්ඛුසෝතං පන** චක්ෂුශ්ශ්‍රෝත්‍ර වස්තු දෙදෙන වනාහි **සන්තරාධිකගෝචරේ** මේඝපටලාදීන්ගේ අභ්‍යන්තරයෙහි ඇත්තාවූ හෙවත් අධික වූ අතරක් ඇති අරමුණෙහි **තස්ස** ඒ චක්ෂුශ්ශ්‍රෝත්‍ර දෙදෙනාගේ **විඤ්ඤාණුප්පත්තිහේතුත්තා** චක්ෂුර්විඤ්ඤාණ ශ්‍රෝත්‍රවිඤ්ඤාණයන්ගේ ඉපදීමට කාරණා වූ හෙයින් **අසම්පත්තගාහකං හෝති** නොපැමිණි අරමුණක් ගන්නේ වෙයි **තථා හි (තතෝ ඒව)** එහෙයින්ම චක්ඛු චක්ෂුඃප්‍රශාද තෙමේ **දූරදේසට්ඨං** දුරුවූ ප්‍රදේශයෙක්හි පිහිටියා වූ (වණ්ණං යන්නෙහි විශේෂණ සම්බන්ධයයි) **ඵලිකාදී තිරෝහිතං** ඵලිඟු ආදියෙන් මුවහකරන ලද්ද වූ (පලිඟු ආදීන්ගේ ඇතුලේ පිහිටියා වූ) **වණ්ණඤ්ච** රූපාලම්බනය ද **මහන්තං** අතිශයින් මහත් වූ (වණ්ණං යන්නෙහි සම්බන්ධයි) **නගාදීනං** පර්වතාදීන්ගේ **වණ්ණඤ්ච** වර්ණය ද (විඤ්ඤාණාධිට්ඨිතත්තා චක්ෂුර්විඤ්ඤාණයාගේ නිශ්‍රය ස්ථාන බැවින්) **දිස්සති** දක්නා ලැබේ "විඤ්ඤාණාධිට්ඨිතත්තා" යනු හේත්වාර්ථය පිණිස ආධ්‍යාහාර කරනලදි "විඤ්ඤාණාධිට්ඨිතත්තා" යන පාඨයෙන් චක්ෂුඃප්‍රශාද රූප තෙමේ මුඛ්‍ය වශයෙන් රූපාලම්බනය දක්නේ නොවෙයි ("මඤ්චා උක්කුට්ඨිං කරොන්ති" යන පාඨයෙහි මෙන් ධානූපචාරාර්ථ වශයෙන්ම ආරෝපණය කොට කියන ලද්දේය යනාර්ථය ප්‍රකාශ කෙළේයි) **ආකාසාදිගතෝ** අකාශාදියෙහි හටගත්තා වූ **සද්දෝ ච** ශබ්දලම්බනය ද **කුච්ඡිචම්මානන්තරිකෝ** බඩ සමතුල පිහිටියා වූ **සද්දෝපි ච** ශබ්දලම්බනය ද **මහන්තෝ** උස්ව පැන නැග්ගාවූ **ඝනාදීනං සද්දෝ ච** මේඝාදීන්ගේ ගර්ජනා ශබ්දය ද **සෝතස්ස** ශ්‍රෝත්‍රප්‍රශාදයට **ගෝචරෝ හෝති** අරමුණු වේ (මෙහි ද "විඤ්ඤාණාධිට්ඨිතත්තා" යන හේත්වාර්ථය පෙර මෙන් ආධ්‍යාහාර කටයුතුයි) **තං (චක්ඛුසෝතං)** ඒ චක්ෂුශ්ශ්‍රෝත්‍ර දෙදෙන **විසයදේසං** අරමුණු පිහිටි ස්ථානය කරා **ගන්ත්වා** ගොස් **ඵරිත්වා** පතුරුවා **තං** ඒ රූපාලම්බන ශබ්දලම්බනද්වය **ගණ්හාති** ගන්නේ යයි (**කෝචි චෝදකෝ** යම්කිසි චෝදකයෙක්) **චේ (වදෙය්‍ය)** ඉදින් කියන්නේ වේද **ඒවං (සති)** මෙසේ කියන කල්හි **යෝගිනෝ** දිව්‍යඤ්චක්ෂුරභිඥන දිව්‍යශ්‍රෝත්‍රඥනයන්ගෙන් සම්පූර්ණ වූ යෝගී පුද්ගලයාගේ (යන සම්බන්ධ කාරකය ආධ්‍යාහාර කටයුතුයි) **අධිට්ඨානවිධානේන** දිව්‍යඤ්චක්ෂුරභිඥනය දිව්‍යශ්‍රෝත්‍රඥන යයි කියනලද අධිට්ඨාන විධියක් **සතිපි** ඇත්තේහිදු **තස්ස** ඒ අභිඥ දෙකින් පරිපූර්ණ පුද්ගලයා හට ("ගෝචර" යන්නෙහි සම්බන්ධයි) **සෝ විසයෝ** ඒ අධිෂ්ඨාන කරනලද දුර පිහිටියා වූ සූක්ෂම වූ රූපාලම්බන ශබ්දලම්බන දෙදෙන **ගන්ත්වා** ගොස් **ගෝචරෝ සියා** අරමුණු වේ (ආචාරීනි ඒකේකී කලබුවෙහි හටගත්තා වූ රූපාලම්බන ශබ්දලම්බන තුමූ චක්ෂුරේන්ද්‍රිය ශ්‍රෝත්‍රේන්ද්‍රියයන් පිහිටි තැනැත්තා කරා නොයන

සේක්වා. නොයෙක් කලබුවෙහි පිහිටියා වූ රූපාලම්බන ශබ්දලම්බන තුමූ ඉන්ද්‍රියයන් කරා පැමිණෙන්නාහු නොවෙත් දැයි යන චෝද්‍යය සඳහා "භූතප්පබන්ධතෝ -පෙ- න තේසං ගෝචරා හොන්ති" යන පාඨය කියනලදි) **සෝ** ඒ රූපාලම්බන ශබ්දලම්බන තෙමේ **භූතප්පබන්ධතෝ** නොයෙක් කලබුයෙහි හටගත්තාවූ භූතයන්ගේ පරම්පරා වශයෙන් **ඉන්ද්‍රියසන්නිධිං** චක්ෂුරේන්ද්‍රිය ශ්‍රෝත්‍රේන්ද්‍රියයන්ගේ සමීපයට **යාතීති** යන්නේ යයි **චේ (වදෙය්‍ය)** ඉදින් යම්කිසි චෝදකයෙක් කියන්නේ වී නම් **ඒවං සති** මෙසේ ඇති කල්හි **කම්මචිත්තෝජසම්භූතෝ** කර්ම චිත්ත දෙදෙනාගෙන් හටගත්තා වූ **වණ්ණෝ ච** වර්ණය ද **චිත්තජෝ** සිතින් හටගන්නා වූ **සද්දෝ ච** ශබ්දය ද **තේසං** ඒ චක්ෂුරේන්ද්‍රිය ශ්‍රෝත්‍රේන්ද්‍රියන්ට **ගෝචරා න හොන්ති** ගොදුරු නොවෙති (කුමක් හෙයින් ගොදුරු නොවන්නාහු ද යන චෝද්‍යය සඳහා "නහි -පෙ- බහි" යන පාඨය කියනලදි) **හි (යස්මා)** යම්හෙයකින් **තේ** ඒ කර්ම චිත්තයන් හේතුකොටගෙන හටගත්තාවූ රූපාලම්බන ශබ්දලම්බනයෝ තුමූ **බහි** ශරීරයෙන් පිටත්හි **න සම්භොන්ති** නොම හටගනිත් ද **තස්මා** එසේ හෙයින් **තේසං** ඒ චක්ෂුශ්ශ්‍රෝත්‍රේන්ද්‍රියන් **ගෝචරා න හොන්ති** ගොදුරු නොවෙති (ඒ කර්ම චිත්තයන් හේතුකොටගෙන හටගන්නා වූ රූපාලම්බන ශබ්දලම්බනයෝ තුමූ ඒ චක්ෂුරේන්ද්‍රිය ශ්‍රෝත්‍රේන්ද්‍රියන්ට අරමුණු නොවන සේක්වා. ඍතුජ වූ රූපශබ්දලම්බනයෝ තුමූ අරමුණු වන්නාහු නොවෙද්ද යන චෝද්‍යය සඳහා "වුත්තා ච -පෙ- විසයාවතේ" යන පාඨය කියනලදි) **පාඨේ** පටන්මහාපවුරුණු පාලියෙහි **විසයා** චක්ෂුරේන්ද්‍රිය ශ්‍රෝත්‍රේන්ද්‍රියයන්ට අරමුණු වූ ඒ රූපශබ්දලම්බනයෝ **අවිසේසේන ඒව** සාමාන්‍ය වශයෙන්ම (**භගවතා** භාග්‍යවතුන්වහන්සේ විසින්) **වුත්තා** වදරණ ලද්දහුය ("වුත්තා ච -පෙ- විසයාවතේ" යන පාඨය වනාහි කර්ම චිත්තයන් හේතුකොටගෙන හටගන්නා වූ රූපාලම්බන ශබ්දලම්බනයෝ තුමූ ශරීරයෙන් පිටත නොනික්මෙන හෙයින් චක්ෂුරේන්ද්‍රිය ශ්‍රෝත්‍රේන්ද්‍රියයන් කරා නොපැමිණෙන හෙයින් චක්ෂුරේන්ද්‍රිය ශ්‍රෝත්‍රේන්ද්‍රියයන්ගේ අසම්පත්ත ගෝචරබව කියන සේක්වා. ඍතුජ රූපාලම්බන ශබ්දලම්බනයෝ තුමූ ශරීරයෙන් පිටත නික්මෙන හෙයින් සම්පත්ත ගෝචර නොවිය යුත්තේ ද යන චෝද්‍යය සඳහා කියනලදි. ඒ පාඨයාගේ අභිප්‍රාය මෙසේයි. ඉදින් ඍතුජ වූ රූපාලම්බන ශබ්දලම්බනයෝම චක්ෂුරේන්ද්‍රිය ශ්‍රෝත්‍රේන්ද්‍රියයන්ට අරමුණු වන්නාහු නම් පටන්මහාපවුරුණු පාලියෙහි "උතුජ රූපායතනං චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණපච්චයේන පච්චයෝ, සද්දායතනං සෝතවිඤ්ඤාණස්ස ආරම්මණපච්චයේන පච්චයෝ" යනුවෙන් ඍතුජ වූ රූපාලම්බන ශබ්දලම්බනයෝ විශේෂ වශයෙන් දේශනා කටයුත්තේය. එසේ නොවදරා "රූපායතනං චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණපච්චයේන පච්චයෝ, සද්දායතනං සෝතවිඤ්ඤාණස්ස ආරම්මණපච්චයේන පච්චයෝ" යි සාමාන්‍ය වශයෙන් වදළ හෙයින් කර්ම චිත්තයන්ගෙන් හටගන්නා වූ රූපාලම්බන ශබ්දලම්බනයෝ ද චක්ෂුරේන්ද්‍රිය ශ්‍රෝත්‍රේන්ද්‍රියයන්ට අරමුණු වන්නාහුය. එහෙයින් චක්ෂුරේන්ද්‍රිය ශ්‍රෝත්‍රේන්ද්‍රියයෝ තුමූ අසම්පත්තගෝචරග්‍රාහක නම් වෙති යි කී නියායි) (ඒ චක්ෂුශ්ශ්‍රෝත්‍ර දෙදෙන අසම්පත්තගෝචරග්‍රාහක වන කල්හි තමා ලග පිහිටි අරමුණු ගැනීම කෙබඳු ස්වභාවක් වියයුතු ද යන චෝද්‍යය සඳහා "යදි චේතං -පෙ- සරපාතනං" යන ගාථා ද්වය කියනලදි) **ඒතං ද්වයං** ඒ චක්ෂුශ්ශ්‍රෝත්‍ර දෙදෙනාගේ සමුදය තෙමේ **අත්තසම්පංයේව** තමාගේ සමීපයෙහි හටගත්තාවූම **ගෝචරං** අරමුණ **යදි ගණ්හාති** ඉදින් ගන්නේ වී නම් **ඒවං සති** මෙසේ ඇති කල්හි **චක්ඛු** චක්ෂුඃප්‍රශාද තෙමේ **අක්ඛිවණ්ණං** සසම්භාරචක්ෂුසයයි කියනලද රූපාලම්බනය **පස්සෙය්‍ය** දැක්ක යුත්තේය **තථා** එපරිද්දෙන් **භමුකස්ස** භ්‍රෑරෝමරාජයාගේ **මූලඤ්ච** මුල ද **පස්සෙය්‍ය** දැක්ක යුත්තේය **සෝතං** ශ්‍රෝත්‍රප්‍රශාද තෙමේ **සද්දස්ස** ශබ්දයාගේ **දිසාදේසවවත්ථානඤ්ච** දික් දේශයන් නියමකර ගැනීම ද **න භවෙය්‍ය** නොවිය

යුත්තේය **සරවේධිස්ස** ශබ්දය අසා විදිනා ශබ්දවේධීහුගේ **සකණ්ණේ** තමාගේ කණ් සිදුර තුල **සරපාතනඤ්ච** ඊතලය හීම ද **සියා** වන්නේයි **ඉති (තස්මා)** එහෙයින් **ඒතං ද්වයං** මේ දෙදෙන **අත්තසමීපංයේව** තමහට ලංවූම **ගෝචරං** අරමුණ **න ගණ්හාති** නොගන්නේයි **ඉති (තස්මා)** එසේ හෙයින් **අසම්පත්තගාහකමේව හෝති** නොපැමිණි අරමුණක්ම ගන්නේ වේ (පාඨ ශේෂයන් බහා මෙසේ අර්ථ යෝජනා කටයුතුයි. "අත්තසමීපේයේව" යනු ඇතැම් ටීකා පොත්හි දක්නා ලැබෙතත් මණිසාරමඤ්ජුසායෙහි "අත්තසමීපංයේව" යනුවෙන්ම දක්නා ලැබේ. "සරවේධිස්ස" යන ටීකා පාඨය මණිසාරමඤ්ජුසායෙහි "සද්දවේධිස්ස සද්දං සුත්වා මිගාදයෝ විජ්ඣන්තස්ස" යි දක්නා ලද බැවින් ඒ පාඨයත් මැනවැයි සිතමි)

**[විභාවනී ටීකා සන්නය 41-44 පිටු]**

චක්ඛාදිද්වයං අසම්පත්තවසේන ගෝචරග්ගාහිකං. ඝානාදිත්තයං සම්පත්තවසේන ගෝචරග්ගාහිකන්ති පඤ්චවිධංපි ගෝචරග්ගාහිකරූපන්ති යෝජනා. තත්ථ පසාදේ අල්ලීයිත්වා ලග්ගිත්වා උප්පන්නං ආරම්මණං සම්පත්තං නාම. කේසග්ගමත්තංපි මුඤ්චිත්වා උප්පන්නං අසම්පත්තං නාම. කස්මා පනෙත්ථ චක්ඛාදිද්වයං අසම්පත්තමේව ගණ්හාති. ඝානාදිත්තයං සම්පත්තමේවාති, පච්චයවිසේසතෝ. ආලෝකෝ හි රූපගහණේ චක්ඛුස්ස පච්චයෝ. ආකාසෝච සද්දගහණේ සෝතස්සාති චක්ඛුරූපේසුච අඤ්ඤමඤ්ඤං ලග්ගිත්වා උප්පජ්ජමානේසු ආලෝකපරිවාරස්ස ඕකාසෝ නත්ථි. තථා සෝතසද්දේසුච ආකාසපරිවාරස්සාති. වායුආපපඨවියෝ පන ඝානාදිත්තයස්ස ගන්ධාදිගහණේ පච්චයා හොන්ති. තත්ථ වායුනාම ගන්ධාකඩ්ඪනකෝ නාසවාතෝයේව, සෝච සම්පත්තස්සේව පච්චයෝ. ආපෝ නාම ජිව්හාතේමනකෝ ආපෝ, සෝපි සම්පත්තස්සේව පච්චයෝ. න හි රසෝ සුක්ඛජිව්හාය ඵරතීති. පඨවීච ඝට්ටනත්ථාය පච්චයෝ. න හි දුබ්බලපඨවීසන්නිස්සයෝ ආලෝකෝ වා රජෝ වා කායේ පතමානෝපි පසාදේ ඝට්ටේතීති. ඉති පච්චයවිසේසතෝ තේසං සම්පත්තාසම්පත්තවසේන ගහණ විසේසෝ හෝතීති. තත්ථ චක්ඛුස්ස තාව අසම්පත්තගහණං පාකටං. තඤ්හි සමීපේ අක්ඛිවණ්ණං වා හමුකමූලං වා න පස්සති. දූරේ පන මහන්තං චන්දමණ්ඩලාදිකං වා ඵලිකාදිතිරෝහිතං වා වණ්ණං පස්සති. දිසාදේසවවත්ථානඤ්චස්ස පඤ්ඤායතීති. සෝතස්ස පන කථන්ති, තත්ථ හි දූරේ සද්දෝ චිරේන සුය්‍යමානෝ දිස්සති පච්ඡිමදිසාභාගේ උප්පන්නෝපි සද්දෝ අන්තරා මහන්තේ චේතියාදිකේ අන්තරිතේ සති දක්ඛිණපස්සතෝ වා සුය්‍යති. උත්තරපස්සතෝ වා. අසුය්‍යමානෝ වා හෝතීති. වුච්චතේ, උප්පන්නෝ සද්දසඞ්ඝාටෝ ආසන්නේ ඨිතානං ආදිතෝ පට්ඨාය යාව අවසානා කමේන පාකටීභූතෝ හෝති. පටිඝට්ටනානිඝංසෝච බලවා හෝති. අහං සුණෝමීති පවත්තා සල්ලක්ඛණවීථියෝ සීඝතරං නිරන්තරං විය පවත්තන්ති. දූරේ ඨිතානං පන පටිඝට්ටනානිඝංසෝ මන්දතරෝ හෝති. ආදිතෝ අපාකටෝ. මජ්ඣේ වා අවසානේ වා පිණ්ඩවසේන පාකටීභූතෝ. සල්ලක්ඛණවීථියෝ චිරේන පරේන පවත්තන්ති. තස්මා තේසං ලහුං සුතෝ. චිරේන සුතෝති අභිමානෝ හෝතීති. අපිච, සද්දෝ නාම නිස්සයධාතුපරංපරාය පවත්තිත්වා දූරංපි දේසං ගච්ඡතියේව. ඒවං ගච්ඡන්තෝච ගතගතට්ඨානේ ඒව ඨත්වා සවනූපචාරේ ඨිතානං සෝතසහස්සංපි ඝට්ටේති. මහන්තේ පන චේතියාදිකේ අන්තරිතේ සති යතෝ ආකාසෝ උජුං විවටෝ හෝති. තතෝ දක්ඛිණපස්සතෝ වා උත්තරපස්සතෝ වා ගතගතඨානතෝච සෝතං ඝට්ටේති. මන්දතරෝ පන සද්දෝ අසුය්‍යමානෝපි හෝති. ඒවං ගච්ඡන්තෝච යාව සෝතපසාදේ අල්ලීයිත්වා නුප්පජ්ජති. තාව අසම්පත්තෝයේව හෝති. යෝ පන අල්ලීයිත්වා උප්පජ්ජති. සෝ සම්පත්තෝ නාම හෝති. න සෝ සුය්‍යතීති. යදි පන

සෝතං සම්පත්තවිසයං සියා. යථා අන්තෝ කුච්ඡිගතෝ ගන්ධෝ බහි නඝායියති. තථා අන්තෝ කුච්ඡිගතෝ සද්දෝපි බහි න සුයෙය්‍ය. ගන්ධස්ස විය දිසාදේසවවත්ථානං විස්සන සියාති.

**[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 157 රූපසඞ්ගහ යටතේ)]**

“අසම්පත්තවසේනා”ති විසයට්ඨානං සයං අසම්පජ්ජනවසේන. අත්තනෝ ඨානං වා විසයස්ස අසම්පජ්ජනවසේන. තත්ථ විසයස්ස අසම්පත්තං දස්සෙන්තෝ “තත්ථා”ති ආදිමාහ. තථා සෝතසද්දේසු ච අඤ්ඤමඤ්ඤං ලග්ගිත්වා උප්පජ්ජමානේසු. “සම්පත්තියා ඒවා”ති සම්පජ්ජනත්ථාය ඒව. තථා ආපෝ ච සම්පත්තියා ඒව පච්චයෝති යෝජනා. දුබ්බලපඨවී ඒව සන්නිස්සයෝ යස්සාති විග්ගහෝ. “අස්සා”ති චක්ඛුස්ස. “සෝතස්ස පන කථං”ති සෝතස්ස අසම්පත්තග්ගහණං කථං පාකටං. සම්පත්තග්ගහණං ඒව පාකටන්ති දීපේති. තේනාහ “තත්ථහී”ති ආදිං. දක්ඛිණපස්සතෝ වා සුය්‍යති, චේතියාදිකස්ස පුරත්ථිමදිසාභාගේ ඨිතානන්ති අධිප්පායෝ. “පටිඝට්ටනානිඝංසෝ”ති සෝතේසු පටිඝට්ටනවේගෝ. “තේසං”ති ආසන්නේ වා දූරේ වා ඨිතානං. හෝතු දූරේ ඨිතානං චිරේන සුතෝති අභිමානෝ. කස්මා පන උජුකං අසුත්වා දක්ඛිණපස්සතෝ වා උත්තරපස්සතෝ වා සුණෙය්‍ය, අසුය්‍යමානෝ භවෙය්‍යාති පුච්ඡා. තං කථෙන්තෝ “අපිචා”ති ආදිමාහ. විභාවනිපාඨේ. “ගන්ත්වා විසයදේසං තං, ඵරිත්වා ගණ්හතීති චේ”ති තං චක්ඛුසෝත ද්වයං දූරේ විසයානං උප්පන්නදේසං ඵරිත්වා ගණ්හතීති චේ වදෙය්‍යාති අත්ථෝ. දූරේ ඨත්වා පස්සන්තෝ සුණන්තෝ ච මහන්තම්පි පබ්බතං ඒකක්ඛණේ පස්සති, මහන්තංපි මේඝසද්දං ඒකක්ඛණේ සුණාති. තස්මා උභයං අසම්පත්තගෝචරන්ති විඤ්ඤායති. ඉමස්මිං වචනේ ඨත්වා ඉදං පරිකප්පවචනං දස්සේති තං ද්වයං විසයප්පදේසං ගන්ත්වා මහන්තංපි පබ්බතං වා මේඝසද්දං වා ඵරිත්වා ගණ්හාති. තස්මා මහන්තංපි පස්සති, සුණාති. න අසම්පත්තගෝචරත්තා මහන්තං පස්සති සුණාතීති කෝචි වදෙය්‍යාති වුත්තං හෝති. අධිට්ඨානවිධානේපි තස්ස සෝ ගෝචරෝ සියාති. ඒවං සති, දිබ්බචක්ඛුදිබ්බසෝතාභිඤ්ඤානං අධිට්ඨානවිධානේපි සෝ රූපසද්දවිසයෝ තස්ස පසාදචක්ඛුසෝතස්ස ගෝචරෝ සියාති අභිඤ්ඤාධිට්ඨානකිච්චං නාම නත්ථි. චක්ඛුසෝතං දේවලෝකම්පි ගන්ත්වා දිබ්බරූපම්පි දිබ්බසද්දම්පි ගණ්හෙය්‍ය. න පන ගණ්හාති. තස්මා තස්ස විසයදේසගමනඤ්ච මහන්තදේසඵරණඤ්ච න චින්තේතබ්බන්ති වුත්තං හෝති.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 157 යටතේ)]**

**චක්ඛාදිද්වයං** චක්‍ෂු ආදී ප්‍රශාද දෙදෙන **අසම්පත්තවසේන** අසම්ප්‍රාප්ත වශයෙන් **ගෝචරග්ගාහිකං** අරමුණු ගන්නෝ (**හොන්ති** වෙත්) **ඝානාදිත්තයං** ඝ්‍රාණාදි ප්‍රශාද තිදෙන **සම්පත්තවසේන** සම්ප්‍රාප්ත වශයෙන් **ගෝචරග්ගාහිකං** අරමුණු ගන්නෝ (**හොන්ති** වෙත්) **ඉති** මෙසේ **ගෝචරග්ගාහිකරූපං** අරමුණු ගන්නාවූ ප්‍රශාදරූපයෝ **පඤ්චවිධම්පි** පස් වැදෑරුම් යැයි **යෝජනා** යෙදීමයි **තත්‍ථ (පඤ්චසු)** ඒ පඤ්ච ප්‍රශාදයන් අතුරින් **පසාදේ** ප්‍රශාදයෙහි **අල්ලීයිත්‍වා** ඇලී **ලග්ගිත්‍වා** ලැග **උප්පන්නං ආරම්මණං** උපන්නා වූ අරමුණ **සම්පත්තං නාම** සම්ප්‍රාප්ත නම් **කේසග්ගමත්තම්පි** කෙසග මාත්‍රයෙකුදු **මුඤ්චිත්‍වා** මුද **උප්පන්නං (ආරම්මණං)** උපන්නාවූ අරමුණ **අසම්පත්තං නාම** අසම්ප්‍රාප්ත නම් **එත්‍ථ පන** මෙහි වනාහි **කස්මා** කුමක්හෙයින් **චක්ඛාදිද්වයං** චක්‍ෂුප්‍රශාදදී දෙදෙන **අසම්පත්තමේව** අසම්ප්‍රාප්තවම (**ආරම්මණං** අරමුණ) **ගණ්හාති?** ගනිද? **ඝානාදිත්තයං** ඝ්‍රාණාදි ප්‍රශාද තිදෙන **සම්පත්තමේව** සම්ප්‍රාප්තවම **ඉති** (**ආරම්මණං** අරමුණ **ගණ්හාති?**) ගනිද? **පච්චයවිසේසතෝ** ප්‍රත්‍යය විශේෂයෙනි **හි** විශේෂයක් කියම් **ආලෝකෝ** ආලෝකය

තෙමේ **රූපගහණෝ** රූප ගැනීමෙහි **චක්ඛුස්ස** චක්‍ෂුස්ප්‍රශාදයට **පච්චයෝ (හෝති)** ප්‍රත්‍යය වෙයි **ආකාසෝ ච** ආකාශය ද **සද්දගහණෝ** ශබ්දය ගැනීමෙහි **සෝතස්ස** ශ්‍රෝත්‍රප්‍රශාදයට **ඉති (පච්චයෝ හෝති)** ප්‍රත්‍යය වෙයි **චක්ඛුරූපේසු ච** චක්‍ෂුස්ප්‍රශාදය ද රූපාරම්මණය ද **අඤ්ඤමඤ්ඤං** ඔහුනොවුන් **ලග්ගිත්වා** ලැග **උප්පජ්ජමානේසු** උපදින කල්හි **ආලෝකපරිවාරස්ස** ආලෝක පරිවාරයට **ඕකාසෝ නත්ථි** අවකාශය නැත **තථා** එසේම **සෝතසද්දේසු ච** ශ්‍රෝත්‍රප්‍රශාදය ද ශබ්දරම්මණය ද **අඤ්ඤමඤ්ඤං** ඔහුනොවුන් **ලග්ගිත්වා** ලැග **උප්පජ්ජමානේසු** උපදින කල්හි **ආකාසපරිවාරස්ස** අවකාශ පරිවාරයට **ඉති (ඕකාසෝ නත්ථි)** අවකාශය නැත **පන (තථා)** එසේම **වායුආපපඨවියෝ** වායෝධාතුව අප්ධාතුව පඨවිධාතුව වනාහි **ඝානාදිත්තයස්ස** ඝ්‍රාණ ප්‍රශාදදී තිදෙනට **ගන්ධාදිගහණේ** ගන්ධාරම්මණ ආදිය ගැනීමෙහි **පච්චයා හොන්ති** ප්‍රත්‍යයෝ වෙත් **තත්ථ** එහි **වායු නාම** වායෝධාතුව නම් **ගන්ධාකඩ්ඪනකෝ** ගන්ධාරම්මණය අදින්නා වූ **නාසවාතෝයේව (හෝති)** නාස වාතයම වෙයි **සෝපි** ඒ වායුවම **සම්පත්තස්සේව** සම්ප්‍රාප්ත විෂය ගැනීමට **පච්චයෝ (හෝති)** ප්‍රත්‍යය වෙයි **ආපෝ නාම** අප්ධාතුව නම් **ජිව්හාතේමනකෝ** ජිව්හාප්‍රශාදය තෙත් කරන්නා වූ **ආපෝ (හෝති)** අප්ධාතුව වෙයි **සෝපි** ඒ අප්ධාතුවම **සම්පත්තස්සේව** සම්පාප්ත විෂය ගැනීමට **පච්චයෝ (හෝති)** ප්‍රත්‍යය වෙයි **ඉති (සච්චං)** සැබෑවකි **රසෝ** රසාරම්මණය **සුක්ඛජිව්හාය** වියලුන ජිව්හාප්‍රශාදයෙහි **න ඵරති** නොපැතිරෙයි **පඨවි ච** පඨවිධාතුව ද **ඝට්ටනත්ථාය** ගැටීම පිණිස **පච්චයෝ (හෝති)** ප්‍රත්‍යය වෙයි **දුබ්බලපඨවිසන්නිස්සයෝ** දුර්වල පඨවි සන්නිශ්‍රිත වූ **ආලෝකෝ වා** අලෝකය හෝ **රජෝ වා** රජස් හෝ **කායේ** කයෙහි **පතමානෝපි** වැටුනේ ද **පසාදේ** ප්‍රශාදයෙහි **න හි ඝට්ටේති** නොගැටෙයි **ඉති** මෙසේ **තේසං** ඔහුන්ගේ **පච්චයවිසේසතෝ** ප්‍රත්‍යය විශේෂයෙන් **සම්පත්තාසම්පත්තවසේන** සම්ප්‍රාප්ත අසම්ප්‍රාප්ත වශයෙන් **ගහණවිසේසෝ හෝති** ගැනීම් විශේෂය වෙයි **තත්ථ** එහි **තාව** පළමුව **චක්ඛුස්ස** චක්‍ෂුස්ප්‍රශාදයාගේ **අසම්පත්තග්ගහණං** අසම්ප්‍රාප්තග්‍රහණය **පාකටං** ප්‍රකටය **තඤ්හි සමීපේ** ඒ චක්‍ෂුස්ප්‍රශාදය සමීපයෙහි වනාහි **අක්ඛිවණ්ණං වා** අක්‍ෂි වර්ණය හෝ **හමුකමූලං වා** ඇහිබැම මුල හෝ **න පස්සති** නොදකී **පන** එසේවුවත් **දූරේ** දුරවූ **මහන්තං චන්දමණ්ඩලාදිකං වා** මහත් චන්ද්‍ර මණ්ඩලාදිය හෝ **ඵලිකාදිතිරෝහිතං වණ්ණං වා** පළිගු ආදියෙන් මුහාකරන ලද්දවූ නොහොත් පළිගු ආදියෙන් ඇතුළෙහි පිහිටියා වූ වර්ණයක් හෝ **පස්සති** දකී **අස්ස (චක්ඛුස්ස)** ඒ චක්‍ෂුස්ප්‍රශාදයට **දිසාදේසවවත්ථානං** දිශා දේශ ව්‍යවස්ථාපනය **පඤ්ඤායති** ප්‍රකට වෙයි **සෝතස්ස** ශ්‍රෝත්‍රප්‍රශාදයාගේ **පන (අසම්පත්තග්ගහණං)** අසම්ප්‍රාප්තව අරමුණ ගැනීම **කථං (පාකටං හෝති)** කෙසේ ප්‍රකට වෙයි ද? **ඉති (පුච්ඡායං සති** මෙසේ ප්‍රශ්නයක් ඇති කල්හි **හි** මේ විසඳීමයි) **තත්ථ** එහි **දූරේ සද්දෝ** දුර ශබ්දය තෙම **චිරේන** බොහෝ වේලාවකින් **සුය්‍යමානෝ** අසන්නේ යයි **දිස්සති** පෙනෙයි **පච්ඡිමදිසාභාගේ** බටහිර දිශාවෙහි **උප්පන්නෝ සද්දෝපි** උපන්නාවූ ශබ්දය ද **අන්තරා මහන්තේ චේතියාදිකේ අන්තරිතේ සති** විශාල චෛත්‍යය දෙකක් අතර මැද ඇති කල්හි (**සෝ සද්දෝ** ඒ ශබ්දය) **දක්ඛිණපස්සතෝ වා** දකුණු දිශාවෙන් හෝ **සුය්‍යති** අසනු ලැබෙයි **උත්තරපස්සතෝ වා** උතුරු දිශාවෙන් හෝ (**සුය්‍යති** අසනු ලැබෙයි) **අසුය්‍යමානෝ වා** නොඅසනු ලබන්නේ හෝ හෝති වෙයි ද? **වුච්චතේ** එයට පරිහාරය කියනු ලැබේ **උප්පන්නෝ සද්දසඞ්ඝාටෝ** උපන්නාවූ ශබ්දය **ආසන්නේ ඨිතානං** ආසන්නයෙහි සිටයවුන්හට **ආදිතෝ පට්ඨාය** මුල පටන් **යාව අවසානා** අවසානය දක්වා **කමේන** ක්‍රමයෙන් **පාකටීභූතෝ හෝති** ප්‍රකට වෙයි **පටිඝට්ටනානිඝංසෝ ච** ශ්‍රෝත්‍රප්‍රශාදයෙහි ගැටීම් වේගය ද **බලවා හෝති** බලවත් වෙයි **අහං සුණෝමි ඉති** මම අසමි යනුවෙන් **සල්ලක්ඛණවීථියෝ** සලකන වීථිහු

**නිරන්තරං** නිරතුරුව **සීඝතරං** වේගයෙන් **පවත්තා විය** පවතින්නාක් මෙන් **පවත්තන්ති** පවතිත් **දූරේ ඨිතානං පන** දුර සිටියවුන්හට වනාහි **පටිඝට්ටනානිඝංසෝ** ශ්‍රෝත්‍රප්‍රශාදයෙහි ගැටීම් වේගය **මන්දතරෝ (හෝති)** මද වෙයි **ආදිතෝ** මුල පටන් **අපාකටෝ** ප්‍රකට නොවෙයි **මජ්ඣෙ වා** මධ්‍යයෙහි හෝ **අවසානේ වා** කෙළවර හෝ **පිණ්ඩවසේන** පිඩු වශයෙන් **පාකටීභූතෝ (හෝති)** ප්‍රකට වූයේ වෙයි ද **සල්ලක්ඛණවීථියෝ** සලකන වීථීහු **චිරේන පරේන** බොහෝ වේලාවකින් **පවත්තන්ති** පවතිත් **තස්මා** එහෙයින් **තේසං** ආසන්නයෙහි හෝ දුර හෝ සිටියවුන්හට **ලහුං** ලුහුව **සුතෝ (හෝති)** අසන ලද්දේ වෙයි **චිරේන සුතෝති** බොහෝ කාලයකින් අසන ලද්දේය යන **අතිමානෝ හෝති** අතිමානය වෙයි **අපි ච** එතකුදුවුවත් **සද්දෝ නාම** ශබ්දය නම් **නිස්සයධාතුපරම්පරාය** නිශ්‍රය ධාතුපරම්පරාවෙන් **පවත්තිත්වා** පැවැත **දූරම්පි දේසං** දුර ප්‍රදේශයකට ද **ගච්ඡතියේව** යන්නේමය **ඒවං** මෙසේ **ගච්ඡන්තෝ ච** යන්නේ ද **ගතගතට්ඨානේ ඒව ඨත්වා** ගිය ගිය තැන සිටම **සවනූපචාරේ** ශ්‍රවණූපචාරයෙහි **ඨිතානං** සිටියවුන්ගේ **සෝතසහස්සම්පි** ශ්‍රෝත්‍ර දහසක ද **ඝට්ටේති** ගැටෙයි **මහන්තේ පන චේතියාදිකේ අන්තරිතේ සති** මහත් වූ චෛත්‍යය දෙකක් අතර ඇති කල්හි **යතෝ** යම්හෙයකින් **ආකාසෝ** ආකාශය **උජුං** ඍජුව **විවටෝ හෝති** විවර වෙයි ද **තතෝ** එහෙයින් **දක්ඛිණපස්සතෝ වා** දකුණු දිශාවෙන් හෝ **උත්තරපස්සතෝ වා** උතුරු දිශාවෙන් හෝ **ගතගතට්ඨානතෝව** ගිය ගිය ස්ථානයෙන්ම **සෝතං ඝට්ටේති** ශ්‍රෝත්‍රප්‍රශාදය හා ගැටෙයි **මන්දතරෝ පන සද්දෝ** මද වූ ශබ්දය වනාහි **අසුය්‍යමානෝපි හෝති** නොඅසන්නේ ද වෙයි **ඒවං** මෙසේ **ගච්ඡන්තෝ ච** යනුයේ ද **යාව** යම්තාක් **සෝතප්පසාදේ අල්ලීයිත්වා** ශ්‍රෝත්‍රප්‍රශාදයෙහි ඇලී **නුප්පජ්ජති** නූපදී ද **තාව** ඒතාක් **අසම්පත්තෝයේව** අසම්ප්‍රාප්තම **හෝති** වෙයි **යෝ පන (සද්දෝ)** යම් ශබ්දයක් වනාහි **අල්ලීයිත්වා** ඇලී **උප්පජ්ජති** උපදී ද **සෝ (සද්දෝ)** ඒ ශබ්දය **සම්පත්තෝ නාම හෝති** සම්ප්‍රාප්ත නම් වෙයි **යදි පන** ඉදින් වනාහි **සෝ (සද්දෝ)** ඒ ශබ්දය **න සුය්‍යතීති** නොඅසනු ලබයි නම් **සෝතං** ශ්‍රෝත්‍රය **සම්පත්තවිසයං** සම්ප්‍රාප්ත විෂයෙහි **සියා** වන්නේය **අන්තෝ කුච්ඡිගතෝ ගන්ධෝ** ඇතුල් කුසතුල වූ ගන්ධය **බහි** බැහැර **න ඝායියති** ආඝ්‍රාණය නොකරනු ලබන්නේ **යථා** යම්සේ ද **තථා** එසේ **අන්තෝ කුච්ඡිගතෝ සද්දෝපි** ඇතුල් කුසතුල වූ ශබ්දය ද **බහි** බැහැරට **න සුයෙය්‍ය** නො ඇසෙන්නේය **ගන්ධස්ස** ගන්ධයාගේ **දිසාදේසවවත්ථානං** දිශා දේශ ව්‍යවස්ථානය **විස්සන සියා විය** විසම වන්නාක් මෙනි. **[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

## පඤ්චවිඤ්ඤාණයෝ කුසල් ද? අකුසල් ද?

පඤ්චවිඤ්ඤාණා කුසලාපි අකුසලාපීති? ආමන්තා. නනු පඤ්චවිඤ්ඤාණා උප්පන්නවත්ථුකා උප්පන්නාරම්මණාති? ආමන්තා. හඤ්චි පඤ්චවිඤ්ඤාණා උප්පන්නවත්ථුකා උප්පන්නාරම්මණා, නෝ ච වත රේ වත්තබ්බේ; "පඤ්චවිඤ්ඤාණා කුසලාපි අකුසලාපී"ති. නනු පඤ්චවිඤ්ඤාණා පුරේජාතවත්ථුකා පුරේජාතාරම්මණා අජ්ඣත්තිකවත්ථුකා බාහිරාරම්මණා අසම්භින්නවත්ථුකා අසම්භින්නාරම්මණා නානාවත්ථුකා නානාරම්මණා න අඤ්ඤමඤ්ඤස්ස ගෝචරවිසයං පච්චනුභොන්ති, න අසමන්නාහාරා උප්පජ්ජන්ති, න අමනසිකාරා උප්පජ්ජන්ති, න අබ්බෝකිණ්ණා උප්පජ්ජන්ති, න අපුබ්බං අචරිමං උප්පජ්ජන්ති, න අඤ්ඤමඤ්ඤස්ස සමනන්තරා උප්පජ්ජන්ති, නනු පඤ්චවිඤ්ඤාණා අනාභෝගාති? ආමන්තා. හඤ්චි පඤ්චවිඤ්ඤාණා අනාභෝගා, නෝ ච වත රේ වත්තබ්බේ; "පඤ්චවිඤ්ඤාණා කුසලාපි අකුසලාපී"ති.

චක්ඛුවිඤ්ඤාණං කුසලන්ති? ආමන්තා. චක්ඛුවිඤ්ඤාණං සුඤ්ඤතං ආරබ්භ උප්පජ්ජතීති? න හේවං වත්තබ්බේ …පෙ…. චක්ඛුවිඤ්ඤාණං සුඤ්ඤතං ආරබ්භ උප්පජ්ජතීති? ආමන්තා. චක්ඛුඤ්ච පටිච්ච සුඤ්ඤතඤ්ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණන්ති? න හේවං වත්තබ්බේ. චක්ඛුඤ්ච පටිච්ච සුඤ්ඤතඤ්ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණන්ති? ආමන්තා. චක්ඛුඤ්ච පටිච්ච සුඤ්ඤතඤ්ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණ"න්ති; අත්ථේව සුත්තන්තෝති? නත්ථි. "චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණ"න්ති; අත්ථේව සුත්තන්තෝති? ආමන්තා. හඤ්චි "චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණ"න්ති; අත්ථේව සුත්තන්තෝ, නෝ ච වත රේ වත්තබ්බේ; "චක්ඛුඤ්ච පටිච්ච සුඤ්ඤතඤ්ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණ"න්ති.

චක්ඛුවිඤ්ඤාණං කුසලම්පි අකුසලම්පීති? ආමන්තා. චක්ඛුවිඤ්ඤාණං අතීතානාගතං ආරබ්භ උප්පජ්ජතීති? න හේවං වත්තබ්බේ …පෙ….. චක්ඛුවිඤ්ඤාණං කුසලම්පි අකුසලම්පීති? ආමන්තා. චක්ඛුවිඤ්ඤාණං ඵස්සං ආරබ්භ…පෙ…. චිත්තං ආරබ්භ… චක්ඛුං ආරබ්භ…පෙ…. කායං ආරබ්භ… සද්දං ආරබ්භ…පෙ…. ඵොට්ඨබ්බං ආරබ්භ උප්පජ්ජතීති? න හේවං වත්තබ්බේ…පෙ…..

මනෝවිඤ්ඤාණං කුසලම්පි අකුසලම්පි, මනෝවිඤ්ඤාණං සුඤ්ඤතං ආරබ්භ උප්පජ්ජතීති? ආමන්තා. චක්ඛුවිඤ්ඤාණං කුසලම්පි අකුසලම්පි, චක්ඛුවිඤ්ඤාණං සුඤ්ඤතං ආරබ්භ උප්පජ්ජතීති? න හේවං වත්තබ්බේ…පෙ…. මනෝවිඤ්ඤාණං කුසලම්පි අකුසලම්පි, මනෝවිඤ්ඤාණං අතීතානාගතං ආරබ්භ උප්පජ්ජතීති? ආමන්තා. චක්ඛුවිඤ්ඤාණං කුසලම්පි අකුසලම්පි, චක්ඛුවිඤ්ඤාණං අතීතානාගතං ආරබ්භ උප්පජ්ජතීති? න හේවං වත්තබ්බේ…පෙ…. මනෝවිඤ්ඤාණං කුසලම්පි අකුසලම්පි, මනෝවිඤ්ඤාණං ඵස්සං ආරබ්භ…පෙ…. චිත්තං ආරබ්භ…පෙ…. කායං ආරබ්භ … සද්දං ආරබ්භ …පෙ…. ඵොට්ඨබ්බං ආරබ්භ උප්පජ්ජතීති? ආමන්තා. චක්ඛුවිඤ්ඤාණං කුසලම්පි අකුසලම්පි, චක්ඛුවිඤ්ඤාණං ඵස්සං ආරබ්භ…පෙ…. ඵොට්ඨබ්බං ආරබ්භ උප්පජ්ජතීති? න හේවං වත්තබ්බේ…පෙ…..

න වත්තබ්බං; "පඤ්චවිඤ්ඤාණා කුසලාපි අකුසලාපී"ති? ආමන්තා. නනු වුත්තං භගවතා; "ඉධ, භික්ඛවේ, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හෝති…පෙ…. න නිමිත්තග්ගාහී හෝති…පෙ…. සෝතේන සද්දං සුත්වා…පෙ…. කායේන ඵොට්ඨබ්බං ඵුසිත්වා නිමිත්තග්ගාහී හෝති…පෙ…. න නිමිත්තග්ගාහී හෝතී"ති! අත්ථේව සුත්තන්තෝති? ආමන්තා. තේන හි පඤ්චවිඤ්ඤාණා කුසලාපි අකුසලාපීති.

**[කථාවත්ථු පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 580-583 පඤ්චවිඤ්ඤාණා කුසලාපි අකුසලාපීති කථා යටතේ); කථාවත්ථු පාළි 02/ 518-522 පිටු (බු.ජ)]**

පඤ්චවිඤ්ඤාණයෝ කුසල්වූවාහුත් අකුසල්වූවාහුත් වෙත් ද? එසේයැ. පඤ්චවිඤ්ඤාණයෝ උත්පන්න වස්තුවක උත්පන්නාලම්බන වූවාහු නො? එසේයැ. ඉදින් පඤ්චවිඤ්ඤාණයෝ උත්පන්න වස්තුක උත්පන්නාලම්බන වූවාහු නම් භවත! "පඤ්චවිඤ්ඤාණයෝ කුසල්වූවාහුත් අකුසල්වූවාහුත් වෙති" යි නොකියැයුතුමැය. පඤ්චවිඤ්ඤාණයෝ පුරේජාත වස්තුක පුරේජාතාලම්බන වූවාහු අධ්‍යාත්මික වස්තුක බාහ්‍යාලම්බන වූවාහු අසම්භින්න වස්තුක අසම්භින්නාලම්බන වූවාහු නානාවස්තුක

නානාලම්බන වූවාහු උනුන් සතු ගෝචර විෂය නොවළඳන්නාහු නො? සමන්වාහාර රහිතවැ නූපදනාහු නො? අමනසිකාර හෙතුයෙන් නූපදනාහු නො? අව්‍යාකීර්ණව නූපදනාහු නො? පෙර පසු නොවී නූපදනාහු නො? උනුනට සමනන්තරවැ නූපදනාහු නො? -පෙ- පඤ්චවිඤ්ඤාණයෝ ආභෝග රහිත වූවාහු නො? එසේයැ. ඉදින් පඤ්චවිඤ්ඤාණයෝ අනාභෝග වෙත් නම් භවත! "පඤ්චවිඤ්ඤාණයෝ කුසල්වූවාහුත් අකුසල්වූවාහුත් වෙති" යි නොකියැයුතුමැයැ.

චක්‍ෂුර්විඤ්ඤාණය කුසල් වේද? එසේයැ. චක්‍ෂුර්විඤ්ඤාණය ශූන්‍යතා ඇරැබැ උපන්නේවේ ද? එසේ නොකියැයුතුයැ. චක්‍ෂුර්විඤ්ඤාණය ශූන්‍යතා ඇරැබැ උපන්නේවේ ද? එසේයැ. ඇසත් ශූන්‍යතාත් නිසා චක්‍ෂුර්විඤ්ඤාණය උපදනේවේ ද? එසේ නොකියැයුතුයැ. ඇසත් ශූන්‍යතාත් නිසා චක්‍ෂුර්විඤ්ඤාණය උපදනේ වේද? එසේයැ. "ඇසත් ශූන්‍යතාත් නිසා චක්‍ෂුර්විඤ්ඤාණය උපදනේ යැ" යි වදළ සූත්‍රාන්තයෙක් ඇද්ද? නැත. "ඇසත් රූපයනුත් නිසා චක්‍ෂුර්විඤ්ඤාණය උපදනේ යැ" යි වදළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු? එසේයැ. ඉදින් "ඇසත් රූපයනුත් නිසා චක්‍ෂුර්විඤ්ඤාණය උපදනේ යැ" යි වදළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ වේ නම්, භවත! "ඇසත් ශූන්‍යතාත් නිසා චක්‍ෂුර්විඤ්ඤාණය උපදනේ යැ" යි නොකියැයුතුමැ. චක්‍ෂුර්විඤ්ඤාණය කුසලත් අකුසලත් වේද? එසේයැ. චක්‍ෂුර්විඤ්ඤාණය අතීත අනාගතය ඇරැබැ උපදනේ වේද? එසේ නොකියැයුතුය. චක්‍ෂුර්විඤ්ඤාණය කුසලත් අකුසලත් වේද? එසේයැ. චක්‍ෂුර්විඤ්ඤාණය ස්පර්ශය ඇරැබැ -පෙ- චිත්තය ඇරැබැ -පෙ- චක්‍ෂුස ඇරැබැ -පෙ- කය ඇරැබැ -පෙ- ශබ්දය ඇරැබැ -පෙ- ස්ප්‍රෂ්ටව්‍යය ඇරැබැ උපදනේ වේද? එසේ නොකියැයුතුයැ.

මනෝවිඤ්ඤාණය කුසලත් අකුසලත් වෙයි. මනෝවිඤ්ඤාණය ශූන්‍යතාව ඇරැබැ උපදනේ වේද? එසේයැ. චක්‍ෂුර්විඤ්ඤාණය කුසලත් අකුසලත් වෙයි. චක්‍ෂුර් විඤ්ඤාණය ශූන්‍යතාව ඇරැබැ උපදනේ වේද? එසේ නොකියැයුතුය. මනෝවිඤ්ඤාණය කුසලත් අකුසලත් වෙයි. මනෝවිඤ්ඤාණය අතීත අනාගතය ඇරැබැ උපදනේ වේද? එසේයැ. චක්‍ෂුර්විඤ්ඤාණය කුසලත් අකුසලත් වෙයි. චක්‍ෂුර්විඤ්ඤාණය අතීත අනාගත ඇරැබැ උපදනේ වේද? එසේ නොකියැයුතුය. මනෝවිඤ්ඤාණය කුසලත් අකුසලත් වෙයි. මනෝවිඤ්ඤාණය ස්පර්ශය ඇරැබැ -පෙ- චිත්තය ඇරැබැ -පෙ- කය ඇරැබැ -පෙ- ශබ්දය ඇරැබැ -පෙ- ස්ප්‍රෂ්ටව්‍යය ඇරැබැ උපදනේ වේද? එසේයැ. චක්‍ෂුර්විඤ්ඤාණය කුසලත් අකුසලත් වෙයි. චක්‍ෂුර්විඤ්ඤාණය ස්පර්ශය ඇරැබැ -පෙ- ස්ප්‍රෂ්ටව්‍යය ඇරැබැ උපදනේ වේද? එසේ නොකියැයුතුය. "පඤ්චවිඤ්ඤාණය කුසලත් අකුසලත් වෙති" යි නොකියැයුතු වේද? එසේයැ. භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද මැ නු "මහණෙනි! මෙසස්නෙහි මහණ ඇසින් රූ දැක නිමිත්තග්‍රාහී වෙයි. -පෙ- නිමිත්තග්‍රාහී නොවෙයි. -පෙ- කණින් ශබ්ද අසා -පෙ- කයින් ස්ප්‍රෂ්ටව්‍යය ස්පර්ශ කොට නිමිත්තග්‍රාහී වෙයි. -පෙ- නිමිත්තග්‍රාහී නොවෙයි" යයි වදළ සූත්‍රාන්තයෙක් ඇත්තේමැ නො? එසේයැ. එකරුණෙන් පඤ්චවිඤ්ඤාණයෝ කුසල්වූවාහුත් අකුසල්වූවාහුත් වෙති.

**[කථාවත්ථු පාළි 02/ 519-523 පිටු]**

ඉදනි පඤ්චවිඤ්ඤාණසමඞ්ගිස්ස මග්ගකථා නාම හෝති. තත්ථ යේසං "චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හෝතී"ති සුත්තං නිස්සාය "පඤ්චවිඤ්ඤාණසමඞ්ගිස්ස අත්ථි මග්ගභාවනා"ති ලද්ධි, සෙය්‍යථාපි මහාසංඝිකානං, තේ සන්ධාය පුච්ඡා සකවාදිස්ස, පටිඤ්ඤා ඉතරස්ස. අථ නං "සචේ තස්ස මග්ගභාවනා අත්ථි, පඤ්චවිඤ්ඤාණගතිකේන වා මග්ගේන, මග්ගගතිකේහි

වා පඤ්චවිඤ්ඤාණේහි භවිතබ්බං, න ච තානි මග්ගගතිකානි අනිබ්බානාරම්මණත්තා අලෝකුත්තරත්තා ච, න මග්ගෝ පඤ්චවිඤ්ඤාණගතිකෝ තේසං ලක්ඛණේන අසඞ්ගහිතත්තා"ති චෝදේතුං **නනු පඤ්චවිඤ්ඤාණා උප්පන්නවත්ථුකා**තිආදිමාහ. තත්‍රායං අධිප්පායෝ; යදි පඤ්චවිඤ්ඤාණසමඞ්ගිස්ස මග්ගභාවනා සියා, යේන මනෝවිඤ්ඤාණේන මග්ගෝ සම්පයුත්තෝ, තම්පි පඤ්චවිඤ්ඤාණසමඞ්ගිස්ස සියා. ඒවං සන්තේ යදිදං "පඤ්චවිඤ්ඤාණා උප්පන්නවත්ථුකා"තිආදි ලක්ඛණං වුත්තං, තං ඒවං අවත්වා "ඡ විඤ්ඤාණා"ති වත්තබ්බං සියා. තථා පන අවත්වා "පඤ්චවිඤ්ඤාණා"ත්වේව වුත්තං, තස්මා න වත්තබ්බං "පඤ්චවිඤ්ඤාණසමඞ්ගිස්ස අත්ථි මග්ගභාවනා"ති. යස්මා චෙත්ථ අයමේව අධිප්පායෝ, තස්මා සකවාදී තං ලක්ඛණං පරවාදිං සම්පටිච්ඡාපෙත්වා **නෝ ච වත රේ වත්තබ්බේ පඤ්චවිඤ්ඤාණසමඞ්ගිස්ස අත්ථි මග්ගභාවනා**ති ආහ.

අපරෝ නයෝ; පඤ්චවිඤ්ඤාණා උප්පන්නවත්ථුකා, මග්ගෝ අවත්ථුකෝපි හෝති. තේ ච උප්පන්නාරම්මණා, මග්ගෝ න වත්තබ්බාරම්මණෝ. තේ පුරේජාතවත්ථුකාව මග්ගෝ අවත්ථුකෝපි. තේ පුරේජාතාරම්මණා, මග්ගෝ අපුරේජාතාරම්මණෝ. තේ අජ්ඣත්තිකවත්ථුකාව මග්ගෝ අවත්ථුකෝපි හෝති. තේ ච රූපාදිවසේන බාහිරාරම්මණා, මග්ගෝ නිබ්බානාරම්මණෝ. තේ අනිරුද්ධං වත්ථුං නිස්සයං කත්වා පවත්තනතෝ අසම්භින්නවත්ථුකා, මග්ගෝ අවත්ථුකෝපි. තේ අනිරුද්ධානේව රූපාදීනි ආරබ්භ පවත්තනතෝ අසම්භින්නාරම්මණා, මග්ගෝ නිබ්බානාරම්මණෝ. තේ නානාවත්ථුකා, මග්ගෝ අවත්ථුකෝ වා ඒකවත්ථුකෝ වා. තේ නානාරම්මණා මග්ගෝ ඒකාරම්මණෝ. තේ අත්තනෝ අත්තනෝව රූපාදිගෝචරේ පවත්තනතෝ න අඤ්ඤමඤ්ඤස්ස ගෝචරවිසයං පච්චනුභොන්ති, මග්ගෝ රූපාදීසු ඒකම්පි ගෝචරං න කරෝති. තේ කිරියමනෝධාතුං පුරේචාරිකං කත්වා උප්පජ්ජනතෝ න අසමන්නාහාරා න අමනසිකාරා උප්පජ්ජන්ති, මග්ගෝ නිරාවජ්ජනෝව. තේ සම්පටිච්ඡනාදීහි වෝකිණ්ණා උප්පජ්ජන්ති, මග්ගස්ස වෝකාරෝයේව නත්ථි. තේ අඤ්ඤමඤ්ඤං පුබ්බචරිමභාවේන උප්පජ්ජන්ති, මග්ගස්ස තේහි සද්ධිං පුරිමපච්ඡිමතාව නත්ථි, තේසං අනුප්පත්තිකාලේ තික්ඛවිපස්සනාසමයේ, තේසං අනුප්පත්තිදේසේ ආරුප්පේපි ච උප්පජ්ජනතෝ. තේ සම්පටිච්ඡනාදීහි අන්තරිතත්තා න අඤ්ඤමඤ්ඤස්ස සමනන්තරා උප්පජ්ජන්ති, මග්ගස්ස සම්පටිච්ඡනාදීහි අන්තරිතභාවෝව නත්ථි. තේසං අඤ්ඤත්‍ර අභිනිපාතා ආභෝගමත්තම්පි කිච්චං නත්ථි, මග්ගස්ස කිලේසසමුග්ඝාතනං කිච්චන්ති. යස්මා චෙත්ථ අයම්පි අධිප්පායෝ, තස්මා සකවාදී ඉමේහාකාරේහි පරවාදිං මග්ගස්ස අපඤ්චවිඤ්ඤාණගතිකභාවං සම්පටිච්ඡාපෙත්වා **නෝ ච වත රේ වත්තබ්බේ පඤ්චවිඤ්ඤාණසමඞ්ගිස්ස අත්ථි මග්ගභාවනා**ති ආහ.

**[කථාවත්ථු අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 576 යටතේ); පඤ්චප්පකරණ අටුවා 1/162 පිට (හේ.වි.මු)]**

## සම්පටිච්ඡන සිතට වඩා සන්තීරණ සිත බලවත් වන්නේ ඇයි?

සමානවත්ථුකං අනන්තරපච්චයං ලභිත්වා උප්පජ්ජමානං සන්තීරණං මනෝධාතුතෝ බලවතරං හෝතීති තං යථාරම්මණං ආරම්මණරසං අනුභවන්තං ඉට්ඨේ සෝමනස්සසහගතං හෝති, ඉට්ඨමජ්ඣත්තේ උපෙක්ඛාසහගතං සාතිසයානුභවත්තා, තස්මා **"අයඤ්හි ඉට්ඨාරම්මණස්මිං යේවා"**තිආදි වුත්තං.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 469 යටතේ)]**

**සමානවත්ථුකං අනන්තරපච්චයං ලභිත්වාති** දස්සනාදිතෝ මනෝධාතුයා ච බලවභාවේ කාරණවචනං. **යථාරම්මණ**න්ති ආරම්මණානුරූපං. යදි සමානනිස්සයතාය මනෝධාතුතෝ බලවතරත්තං විපාකමනෝවිඤ්ඤාණධාතුයා සෝමනස්සසහගතාය. **[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 469 යටතේ)]**

සමානවස්තුක වූ සම්පටිච්ඡන චිත්තයාගේ අනන්තර ප්‍රත්‍යය ලැබ උපදින්නා වූ සන්තීරණ චිත්තය සම්පටිච්ඡන චිත්තයට වඩා බලවත් වෙයිනුයි ඒ සන්තීරණ චිත්තය ආරම්මණානුරූපව අරමුණු රසය අනුභව කරමින් ඉටු අරමුණෙහි සොම්නස් සහගත වෙයි. අරමුණ අතිශයින් අනුභවන කරන බැවින් ඉෂ්ට මධ්‍යස්ථාරම්මණයෙහි උපේක්‍ෂා සහගත වෙයි. එබැවින් "අයඤ්හි ඉට්ඨාරම්මණස්මිංයේව" යි කියනලදි.

**[ධම්මසඞ්ගණී මූලටීකා පරිවර්තනයි]**

සම්පටිච්ඡනං පන ආරම්මණඝට්ටනයෝග්‍යභාවේන ඕළාරිකත්තා, චතුචිත්තක්ඛණාතීතවසේන චිරජාතත්තා ච දුබ්බලමත්තනෝ නිස්සයේන සහ අසමානජාතිකඤ්ච චක්ඛාදිවත්ථුං නිස්සාය උප්පන්නේහි චක්ඛුවිඤ්ඤාණාදීහි ලද්ධානන්තරපච්චයතාය, අපුබ්බනිස්සයතාය ච ආරම්මණරසස්සාදේ දුබ්බලන්ති ඉට්ඨාදීසු ආරම්මණේසු උපෙක්ඛාසහගතමේව. සන්තීරණං පන වුත්තවිපරීතතෝ ඉට්ඨාරම්මණේ සුඛසහගතං, ඉට්ඨමජ්ඣත්තේ ච උපෙක්ඛාසහගතන්ති දට්ඨබ්බං. මනෝවිඤ්ඤාණධාතු විය විසිට්ඨමනනකිච්චාභාවතෝ මනෝමත්තා නිස්සත්තනිජ්ජීවාදිඅත්ථේහි ධාතු චාති **මනෝධාතු**. සා හි සතිපි විඤ්ඤාණභාවේ මනෝවිඤ්ඤාණතෝ සම්භවස්ස විසිට්ඨමනනකිච්චස්ස අකරණතෝ මනනමත්තායේව හෝති. වුත්තලක්ඛණවිපරීතතෝ පන මනෝ ච තං විඤ්ඤාණඤ්චාති මනෝවිඤ්ඤාණං, තදේව යථාවුත්තට්ඨේන ධාතූති **මනෝවිඤ්ඤාණධාතු**.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 41-42 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 168 පිට]**

සම්ප්‍රතෝෂණ චිත්තය වනාහි ආරම්මණ ඝට්ටනයාගේ යෝග්‍ය බැවිහි ඖදරික හෙයින් ද සතර චිත්තක්‍ෂණයක් ඉක්මවීම් වශයෙන් කලකින් උපදින හෙයින් ද දුර්වල වෙයි. තමාගේ නිස්සය ස්ථානය හා අසමාන ජාතික වූ චක්‍ෂුරාදී වස්තූන් ඇසුරුකොට උපදිනා චක්‍ෂුර්විඤ්ඤාණාදීන්ගෙන් ලබනලද අනන්තර ප්‍රත්‍යය ඇති බැවින් ද පෙර නොවූ නිශ්‍රයක් ඇති බැවින් ද අරමුණු රසය අනුභව කිරීමෙහි දුර්වල වෙයි. එහෙයින් ඉෂ්ට අරමුණෙහි ද උපේක්‍ෂා සහගත වෙයි. සන්තීරණ සිත් තෙමේ වනාහි කියනලද්දට විපරීත වශයෙන් ඉෂ්ට අරමුණෙහි සුඛ සහගත වෙයි. ඉෂ්ටමධ්‍යස්ථාරමුණෙහි උපේක්‍ෂා සහගත වේයයි දතයුතුයි. මනෝවිඤ්ඤාණ ධාතුව මෙන් විශිෂ්ට වූ හැඟීම් කෘත්‍යයක් නැති හෙයින් හැඟීම් මාත්‍රයක් ඇත්තේනුයි සත්වයෙක් ද නොවෙයි. ජීවයෙක් ද නොවෙයි යනාදී අර්ථයෙන් ධාතු නමුදු වේනුයි මනෝධාතු නම් වෙයි. ඒ එසේමැයි; ඒ මනෝධාතු තොමෝ විඤ්ඤාණ භාවය ඇති කල්හිදු මනෝවිඤ්ඤාණයෙන් හටගත් විශිෂ්ට වූ හැඟීම් කෘත්‍යය නැති හෙයින් මනෝ මාත්‍රයක්ම වෙයි. කියනලද ආකාරයට විපරීත වශයෙන් මනෝ වූයේද හේමය, විඤ්ඤාණ වූයේ හේමනුයි මනෝවිඤ්ඤාණ නම් වෙයි. ඒ මනෝවිඤ්ඤාණයම යට කියනලද අර්ථයෙන් ධාතු නම් වූයේනුයි මනෝවිඤ්ඤාණ ධාතු නම් වෙයි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 133-134 පිට]**

## අකුසල සන්තීරණ එකක්ම කියන ලද්දේ කුමක්හෙයින් ද?

කස්මා පන යථා අකුසලවිපාකසන්තීරණං ඒකමේව වුත්තං, ඒවමවත්වා කුසලවිපාකසන්තීරණං ද්විධා වුත්තන්ති? ඉට්ඨඉට්ඨමජ්ඣත්තාරම්මණවසේන වේදනාභේදසම්භවතෝ. යදි ඒවං තත්ථාපි අනිට්ඨඅනිට්ඨමජ්ඣත්තාරම්මණවසේන වේදනාභේදේන භවිතබ්බන්ති? නයිදමේවං අනිට්ඨාරම්මණේ උප්පජ්ජිතබ්බස්සපි දෝමනස්සස්ස පටිඝේන විනා අනුප්පජ්ජනතෝ, පටිඝස්ස ච ඒකන්තාකුසලසභාවස්ස අබ්‍යාකතේසු අසම්භවතෝ. න හි භින්නජාතිකෝ ධම්මෝ භින්නජාතිකේසු උපලබ්භති, තස්මා අත්තනා සමානයෝගක්ඛමස්ස අසම්භවතෝ අකුසලවිපාකේසු දෝමනස්සං න සම්භවතීති තස්ස තං සහගතතා න වුත්තා. අථ වා යථා කෝචි බලවතා පෝථියමානෝ දුබ්බලපුරිසෝ තස්ස පටිප්පහරිතුං අසක්කොන්තෝ තස්මිං උපෙක්ඛකෝව හෝති, ඒවමේව අකුසලවිපාකානං පරිදුබ්බලභාවතෝ අනිට්ඨාරම්මණේපි දෝමනස්සුප්පාදෝ නත්ථීති සන්තීරණං උපෙක්ඛාසහගතමේව.
**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 10 යටතේ); විභාවනී ටීකා සන්නය 40-42 පිටු; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රශ්නෝත්තර 04 පිට]**

**කස්මා** කුමක්හෙයින් **අකුසලවිපාකසන්තීරණං** අකුසලයාගේ විපාක වූ සන්තීරණ චිත්තය **ඒකමේව** එකක්ම **වුත්තං?** (**යථා** යම්සේ කියන ලද්දේ වේද) **ඒවං (තථා)** එපරිද්දෙන් **අවත්‍වා** නොකියා **කුසලවිපාකසන්තීරණං** කුසලවිපාක සන්තීරණ චිත්තය **ද්විධා කත්‍වා** දෙවැදෑරුම් කොට **වුත්තං පන** කියන ලද්දේ ද යත්? **ඉති** (**අයං** මේ වනාහි **චෝදනා** චෝදනායි) **ඉට්ඨඉට්ඨමජ්ඣත්තාරම්මණවසේන** ඉෂ්ටාළම්බනය ඉෂ්ටමධ්‍යස්ථාළම්බනයන්ගේ වශයෙන් **වේදනාභේදසම්භවතෝ** වේදනාවගේ විශේෂය සම්භව වන හෙයින් **වුත්තං** කියනලදි **ඉති** (**අයං** මේ වනාහි **පරිහාරෝ** පරිහාරයයි) **වේදනාභේදසම්භවතෝ** වේදනා ප්‍රභේදය සම්භව වන හෙයින් **ද්විධා කත්‍වා** දෙවැදෑරුම් කොට **යදි වුත්තං සියා** ඉදින් කියන ලද්දේ නම් **ඒවං සති** මෙසේ ඇති කල්හි **තත්‍ථාපි** ඒ අකුසලාගේ විපාකයෙහිදු **අනිට්ඨ අනිට්ඨමජ්ඣත්තාරම්මණවසේන** අනිෂ්ටාළම්බනය අනිෂ්ට මධ්‍යස්ථාළම්බනය යන දෙදෙනාගේ වශයෙන් **වේදනාභේදේන භවිතබ්බං** වේදනා ප්‍රභේදයෙන් වියයුතුය **ඉති** (**අයං** මේ වනාහි **චෝදනා** චෝදනායි)

**ඉදං** මේ චෝදනා කටයුතු බව යැයි කියනලද මේ කාරණය **ඒවං** මෙසේ **න සියා** නොවන්නේයි **කස්මා න සියා** කුමක්හෙයින් නොවන්නේ ද යත්? **අනිට්ඨාරම්මණේ** අනිටු අරමුණෙහි **උප්පජ්ජිතබ්බස්ස** ඉපදිය යුතු වූ **දෝමනස්සස්ස** දෙම්නස් වේදනාවගේ **පටිඝේන විනා** ප්‍රතිඝයෙන් තොරව **අනුප්පජ්ජනතෝ** නූපදනා හෙයින් **ඒකන්තාකුසලභාවස්ස** ඒකාන්තයෙන් අකුසල ස්වභාව ඇත්තා වූ **පටිඝස්ස ච** ප්‍රතිඝයාගේ ද **අබ්‍යාකතේසු** අව්‍යාකෘත ධර්මයන් කෙරෙහි **අසම්භවතෝ** හටනොගතයුතු බැවින් (**න සියා** නොවන්නේ කුමක්හෙයින් ද? ඒකාන්ත අකුසල ස්වභාව ඇත්තාවූ ප්‍රතිඝ තෙමේ අව්‍යාකෘත ධර්මයන් අතුරෙහි නොවිය යුතුද යන චෝද්‍යය සිත තබා "න හි -පෙ- ලබ්භතීති" යන පාඨය කියනලදි)

**භින්නජාතිකෝ** වෙනස් ජාති ඇත්තාවූ **ධම්මෝ** ධර්මයක් **අභින්නජාතිකේසු** අභේද ජාති ඇත්තාවූ **ධම්මේසු** ධර්මයන් අතුරෙහි **හි (යස්මා)** යම්හෙයකින් **න උපබ්භති** නොලබනු ලැබේ ද **තස්මා** එසේ හෙයින් (**න සියා** නොවන්නේයි) **අත්තනා** තමා හා (අත්තනා යන පදයාගේ අර්ථය දෙම්නස් වේදනාවයි) **සමානයෝගක්ඛමස්ස** සමව එක්ව යෙදීම පිණිස යෝග්‍ය වූ ප්‍රතිඝයාගේ **තස්මා අසම්භවතෝ** එසේ

අව්‍යාකෘත ධර්මයන් අතුරෙහි නොලැබෙන හෙයින් **අකුසලවිපාකේසු** අකුසල විපාකයන් අතුරෙහි **දෝමනස්සං** දෙම්නස් තෙමේ **යස්මා** යම්හෙයකින් **න සම්භවති** සම්භව නොවේ ද **ඉති (තස්මා)** තස්ස ඒ අකුසල විපාක සන්තීරණයාගේ **තං සහගතත්තා** ඒ දෙම්නස් වේදනාව හා එක්ව උපදනා බව **න වුත්තා** නොකියනලදි **අථවා** නොහොත් **කොචි** යම්කිසි (පුරිසෝ යන්නෙහි විශේෂණයි) **බලවතා** ශක්තිමත් වූ පුරුෂයෙකු විසින් **බාධියමානෝ** පෙළනු ලබන්නා වූ **දුබ්බලපුරිසෝ** දුර්වල පුරුෂයෙකු තෙමේ **තස්ස** ඒ බලවත් පුරුෂයා හට **පටිප්පහරිතුං** පෙරලා පහරදීමට (සමානව පහරදීමට කියා හෝ අර්ථ ගතයුතුයි) **අසක්කොන්තෝ** නොහැකි වූයේ **තස්මා** ඒ බලවත් පුරුෂයා කෙරෙහි **උපෙක්ඛකෝව හෝති යථා** යම්සේ මධ්‍යස්ථම වේද **ඒවමේව** ඒපරිද්දෙන්ම **අකුසලවිපාකානං** අකුසල විපාකයන්ගේ **පරිදුබ්බලභාවතෝ** හාත්පසින් දුර්වල බැවින් **අනිට්ඨාරම්මණේපි** අනිටු අරමුණෙහි ද **දෝමනස්සුප්පාදෝ** දෙම්නස් වේදනාවගේ ඉපදීම **නත්ථි** නැත්තේය **ඉති (තස්මා) සන්තීරණං** අකුසල විපාක වූ සන්තීරණ සිත් තෙමේ **උපෙක්ඛාසහගතමේව හෝති** උපේක්‍ෂා සහගත වූයේම වේ. **[විභාවනී ටීකා සන්නය 75-76 පිටු]**

**විභාවනියං** පන අසමානනිස්සයේ හි තේහි ලද්ධපච්චයතාවසේන අයමත්ථෝ විභාවිතෝ, සන්තීරණං පන සයං පි බලවවත්ථුං නිස්සාය පවත්තති. තාදිසේන ච බලවවත්ථුනිස්සයේන පුරිමචිත්තේන ලද්ධපච්චයං හෝතීති ථෝකං බලවං හෝති. තස්මා තං කුසලවිපාකං ඉට්ඨේ උපෙක්ඛාසහගතං අතිඉට්ඨේ සෝමනස්සසහගතං හෝති. අකුසලවිපාකං පන අනිට්ඨේපි අතිඅනිට්ඨේපි උපෙක්ඛාසහගතමේව හෝති. කස්මා ඉති චේ. යදිහි තං අතිඅනිට්ඨාරම්මණවසේන වේදනා භේදයුත්තං සියා. දුක්ඛේන වා දෝමනස්සේන වා යුත්තං සියා. තත්ථ දුක්ඛේන තාව න යුජ්ජති, කස්මා, ඒකන්තකායිකත්තා දුක්ඛස්සාති. දෝමනස්සේනපි න යුජ්ජති. කස්මා, පටිඝේන පටිහඤ්ඤදත්තාඑව දෝමනස්සභාවං පත්තා දෝමනස්සවේදනා පටිඝේන විනා නප්පවත්තතීති. ඒකන්තාකුසලභූතේන පටිඝේන නිච්චයෝගිනෝ දෝමනස්සස්ස අබ්‍යාකතේසු අසම්භවතෝති. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 36 යටතේ)]**

"තේහී"ති පඤ්චවිඤ්ඤාණේහි. "පුරිමචිත්තේනා"ති සම්පටිච්ඡනචිත්තතෝ. "ත"න්ති අකුසලවිපාකසන්තීරණං. පටිඝේන විනා නප්පවත්තති. කස්මා නප්පවත්තතීති ආහ "ඒකන්තාකුසලභූතේනා"ති ආදිං. "අබ්‍යාකතේසු අසම්භවතෝ"ති අබ්‍යාකතචිත්තේසු යුජ්ජිතුං අසම්භවතෝ. කම්මානුභාවතෝ ච මුඤ්චිත්වා යථාපුරිමං විපාකසන්තානං කම්මානුභාවේන පවත්තං හෝති. තථා අප්පවත්තිත්වාති අධිප්පායෝ. **[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 36 යටතේ)]**

**අසමානනිස්සයේහි තේහි** අසමාන නිශ්‍රය ඇති පඤ්චවිඤ්ඤාණයන්ගෙන් **ලද්ධපච්චයතාවසේන** ලබනලද ප්‍රත්‍යය ඇති බැවින්ය යන වශයෙන් **විභාවනියං පන** විභාවනී ටීකායෙහි වනාහි **අයං අත්ථෝ** මේ අර්ථය **විභාවිතෝ** විස්තර කරනලදී **සන්තීරණං පන** සන්තීරණ චිත්තය ද වනාහි **සයම්පි** තෙමේ ද **බලවවත්ථුං නිස්සාය** බලවත් වස්තුවක් ඇසුරු කොට **පවත්තති** පවති **තාදිසේන ච** එබඳුවූම **බලවවත්ථුනිස්සයේන** බලවත් වස්තුවක් ඇසුරු කොට උපදිනලද **පුරිමචිත්තේන** සම්පටිච්ඡන චිත්තයෙන් **ලද්ධපච්චයං** ලබනලද ප්‍රත්‍යය **හෝතීති** ඇති හෙයින් **ථෝකං බලවං හෝති** ටිකක් බලවත් වෙයි **තස්මා** එබැවින් **කුසලවිපාකං තං** කුසල විපාක වූ ඒ සන්තීරණ සිත **ඉට්ඨේ** ඉෂ්ටාරම්මණයෙහි **උපෙක්ඛාසහගතං** උපේක්‍ෂා සහගත ද **අතිඉට්ඨේ** අති ඉෂ්ටාරම්මණයෙහි **සෝමනස්සසහගතං** සෝමනස්ස

සහගත ද **හෝති** වෙයි **අකුසලවිපාකං පන** අකුසල විපාක සන්තීරණ සිත වනාහි **අනිට්ඨේපි** අනිටු අරමුණෙහි ද **අතිඅනිට්ඨේපි** ඉතා අනිටු අරමුණෙහි ද **උපෙක්ඛාසහගතමේව හෝති** උපේක්‍ෂා සහගතම වෙයි **යදි හි** ඉදින් වනාහි **තං** ඒ අකුසල විපාක සන්තීරණ චිත්තය **අතිඅනිට්ඨාරම්මණවසේන** ඉතා අනිටු අරමුණු වශයෙන් **වේදනාභේදයුත්තං සියා** වේදනා භේදයෙන් යුතු වන්නේ නම් **දුක්ඛේන වා** දුක් වේදනාවෙන් හෝ **දෝමනස්සේන වා** දොම්නස් වේදනාවෙන් හෝ **යුත්තං සියා** යුතු වන්නේය **කස්මා** කුමක්හෙයින් **ඉති චේ (න සියා)** නොවූයේ ද යත්? **තාව** පරිහාරය කියනු ලැබේ **තත්ථ (චිත්තේ)** ඒ චිත්තයෙහි **දුක්ඛේන** දුක් වේදනාව සමඟ **න යුජ්ජති** නොපවති **කස්මා?** කුමක්හෙයින් නොපවතී ද? **දුක්ඛස්ස** දුක්ඛ වේදනාවගේ **ඉති (යුත්තං)** යෙදීම **ඒකන්තකායිකත්තා** ඒකාන්ත කායික වේදනාවක් බැවිනි **දෝමනස්සේනපි** දොම්නස් වේදනාව සමග ද **න යුජ්ජති** නොපවති **කස්මා?** කුමක්හෙයින් නොපවතී ද? **පටිඝේන** ප්‍රතිඝයෙන් **පටිහඤ්ඤත්තා ඒව** වෙහෙසට පත්වූ බැවින්ම **දෝමනස්සභාවං** දොම්නස් භාවයට **පත්තා දෝමනස්සවේදනා** පැමිණුනාවූ දොම්නස් වේදනා තුමූ **පටිඝේන විනා** ප්‍රතිඝය නොමැතිව **නප්පවත්තතීති** නොපවති **ඒකන්තාකුසලභූතේන** ඒකාන්තයෙන් අකුසල වූ **පටිඝේන** ප්‍රතිඝයෙන් **නිච්චයෝගිනෝ** නිත්‍යයෙන් යෙදෙන්නා වූ **දෝමනස්සස්ස** දොම්නස් වේදනාවගේ **අසම්භවතෝති** සම්භවයක් නොමැති බැවින් **අබ්‍යාකතේසු** අව්‍යාකෘත චිත්තයන්හි **යුජ්ජිතුං** යෙදීමට **අසම්භවතෝ (න සියා)** හටගැණීමක් නොවන්නේය.

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

යථා අතිඉට්ඨේ ඉට්ඨමජ්ඣත්තේ ච ආරම්මණේ වේදනාභේදසම්භවතෝ කුසලවිපාකමනෝවිඤ්ඤාණධාතු දුවිධා හෝති සෝමනස්සසහගතා, උපෙක්ඛාසහගතාති, ඒවං අතිඅනිට්ඨේ අනිට්ඨමජ්ඣත්තේ ච ආරම්මණේ වේදනාභේදෝ නත්ථීති අකුසලවිපාකමනෝවිඤ්ඤාණධාතු ඒකවිධාවාති **"සත්තාකුසලවිපාකානී"**ති වුත්තං. සති හි තත්ථ වේදනාභේදේ අතිඅනිට්ඨේ දෝමනස්සේන භවිතබ්බං, න ච පටිඝේන විනා දෝමනස්සං උප්පජ්ජතීති. කායවිඤ්ඤාණස්ස දුක්ඛසහගතා කුසලවිපාකේ වුත්තවිපරියායේන වේදිතබ්බා. එත්ථ ච අකුසලවිපාකේසු ලබ්භමානදුක්ඛං විය නාතිකටුකාපි උපෙක්ඛා ඒකන්තනිහීනස්ස අකුසලස්ස විපාකභාවතෝ දුක්ඛසභාවත්තා හීනා ඒව. න හි අකුසලස්ස විපාකෝ අදුක්ඛෝ හෝති, උපෙක්ඛාභාවෝ පනස්ස බලවතා බාධියමානස්ස පටිපහරිතුං අසක්කොන්තස්ස දුබ්බලපුරිසස්ස තේන කරියමානබාධස්ස උපෙක්ඛනා වියාති දට්ඨබ්බං.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අකුසලවිපාක වණ්ණනා යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 182 පිට; විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 454 යටතේ)]**

එහි යම්සේ අතිඉෂ්ට අරමුණෙහි හා ඉෂ්ට මධ්‍යස්ථ අරමුණෙහි ද සොම්නස් උපේක්‍ෂා වේදනා භේදය ලැබෙන හෙයින් කුසලවිපාක මනෝවිඤ්ඤාණ ධාතු තොමෝ සොම්නස් සහගතය, උපේක්‍ෂා සහගතයයි දෙවැදෑරුම් වන්නාක් මෙන් අති අනිෂ්ට අරමුණෙහි හා අනිෂ්ට මධ්‍යස්ථ අරමුණෙහි ද සොම්නස් දොම්නස් වේදනා භේදයක් නැති බැවින් අකුසල විපාක මනෝවිඤ්ඤාණ ධාතු සඞ්ඛ්‍යාත සන්තීරණ චිත්තය එක් වැදෑරුම් වෙයි. එහෙයින් අකුසල විපාක චිත්තයෝ සත් දෙනෙකැයි කියනලදි. ඒ එසේමැයි; එහි වේදනා භේදයක් වන්නේ නම් අති අනිෂ්ට අරමුණෙහි දොම්නස් වේදනාවෙන් යුක්ත වියයුතුයි. ප්‍රතිඝයෙන් වෙන්ව දොම්නස නොඋපදීයයි දතයුතුයි. කායවිඤ්ඤාණයාගේ දුක්ඛ සහගත බව කුසලවිපාකයෙහි කියනලද ක්‍රමයෙන් දතයුත්තීය. මෙහි ද අකුසල විපාකයන්හි ලැබියයුතු දුක්ඛය මෙන් උපේක්‍ෂා තොමෝ

ඉතා කටුක නොවූයේ නමුදු හීන වූ අකුසලයාගේ විපාක බැවින් හා දුක් ස්වභාව ඇති බැවින් ද හීනම වෙයි. ඒ එසේමැයි; අකුසලයාගේ විපාක තෙමේ දුක් රහිත නොවෙයි. ඒ අකුසල විපාකයාගේ උපේක්ෂා බව වනාහි බලවත් ශක්ති සම්පන්න පුරුෂයෙකු විසින් පෙළනු ලබන්නා වූ ඕ හට විරෝධ වන්නට අසමර්ථ වූ දුර්වළ පුරුෂයෙක්හුගේ ඒ බලවත් පුරුෂයා විසින් කරනුලබන පෙළීමට උපේක්ෂා වීම මෙනැයි දතයුතුයි.

**[අභිම්මාවතාර මහෝදධි ටීකා සන්නය 149 පිට]**

මෙහි අකුසල විපාක සන්තීරණය මෙන් එක සන්තීරණයකු නොකියා කුසල විපාක සන්තීරණයන් දෙදෙනෙකු කියන්නට කාරණය කිම්ද යත්? ඉෂ්ට, ඉෂ්ටමධ්‍යස්ථාලම්බන වශයෙන් වේදනාභේද හෙයින් කියන ලදි. එසේ වී නම් ඒ අකුසලයන් කෙරෙහිදු අනිෂ්ට, අනිෂ්ටමධ්‍යස්ථාලම්බන වශයෙන් වේදනාභේදය වන්නේ වේදයත්? ඒ කුසල විපාකයා මෙන් මේ අකුසල විපාක සන්තීරණයාගේ ආලම්බන වශයෙන් වේදනා භේදයක් නැත. අනිෂ්ටාලම්බනයෙහි ඉපැද්ද යුතු දෞර්මනස්‍යයා, ප්‍රතිඝය නැතිව නොඋපදනා හෙයිනි. ඒකාන්තයෙන් අකුසල ස්වභාව වූ ප්‍රතිඝයාගේ ද අව්‍යාකෘතයන් කෙරෙහි සම්භවයක් නැති හෙයින් අකුසල විපාකයන් කෙරෙහි දෞර්මනස්‍යය සම්භව නොවේනුයි තත්සහගතත්වය නොකියන ලදි. නොහොත් කිසි බලවත් ශක්ති සම්පන්න පුරුෂයෙකු විසින් පෙළෙනු ලබන්නා වූ දුර්වල පුරුෂ තෙමේ ඔහුහට විරෝධ වන්නට අසමර්ථ වූයේ ඔහු කෙරෙහි උපේක්ෂාවූයේම වේද එපරිද්දෙන්ම අකුසල විපාකයන් දුර්වල හෙයින් අනිෂ්ටාලම්බනයෙහිදු දෙම්නස් වේදනාවගේ උත්පත්තිය නැත්නුයි අකුසල විපාක සන්තීරණය උපේක්ෂා සහගතම වේ. කුසලාකුසල විපාක වූ චක්ඛුවිඤ්ඤාණාදි වූ සතර දෙන වනාහි වස්ත්වාලම්බන ඝර්ෂණය දුර්වල බැවින් අනිෂ්ටවූ ද ඉෂ්ටවූ ද ආලම්බනයෙහි උපේක්ෂා සහගතයෝමැයි. ඒ සතර දෙනාට වස්තු වූ චක්‍ෂු ප්‍රසාදදීහු ද ඒ ප්‍රසාදයන්ට අරමුණු වූ රූපාදීහු ද උපාදරූපයන් හා උපාදරූපයන්ගේ ඝර්ෂණ පිචු පිණ්ඩයෙන් පිචු පිණ්ඩයාගේ ස්පර්ශය මෙන් අතිදුර්වලය. එසේ හෙයින් සර්වප්‍රකාරයෙන්ම උපේක්ෂා සහගතයෝමැයි. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 14 පිට]**

සම්පටිච්ඡනය හදයවස්තුව නිශ්‍රය ස්ථානය කරගෙන පවතී. පඤ්චවිඤ්ඤාණය සම්පටිච්ඡනයට අනන්තර ප්‍රත්‍යයෙන් උපකාර කෙරෙයි. එසේහෙයින් නිශ්‍රය ස්ථානයෙන් සමාන නොවන්නා වූ පඤ්චවිඤ්ඤාණයාගේ උපකාරය ලැබීමට සම්පටිච්ඡනය ශක්තිය නැතිහෙයින් සම්පටිච්ඡන චිත්තය උපෙක්ඛා සහගත වෙයි. සන්තීරණ ත්‍රය සම්පටිච්ඡනය මෙන්ම හදයවස්තුව නිශ්‍රය ස්ථානය කරගෙන පවතී. හේ සම්පටිච්ඡනයට අනතුරුව උපදින හෙයින් සමාන අදහස් ඇති මිත්‍රයෙකුගෙන් උපකාර ලැබෙන්නේකු මෙන් අනන්තර ප්‍රත්‍යයෙන් උපකාර ලැබෙන්නේය. එසේහෙයින් කුසලවිපාක ස්ථානයෙහි ඉෂ්ට මධ්‍යස්ථාරම්මණයෙහි උපේක්ෂා වේදනාව ද අතිඉෂ්ටාරම්මණයේ සෝමනස්ස වේදනාව ද ඇති වන්නේය.

අකුසලවිපාකයෙහි දී ආපාතගත අරමුණ අනිෂ්ටම වෙයි. එහෙයින් සෝමනස්ස වේදනාවක් වැටීමට කොහෙත්ම ඉඩක් නොමැතිය. දුක්ඛ-දෝමනස්ස වේදනාවක් වැටිය යුතුසේ පෙනීයයි. දුක්ඛවේදනාව යනු කායික දුක්ඛය එකක්ම බැවින් ඒ සමඟ යෙදෙන වේදනාවයි. දෝමනස්ස වේදනාව ද්වේශයෙන් වෙන්ව ඉපදීමක් නොමැතිය. ද්වේශය ඒකාන්ත අකුසල පාක්ෂික ධර්මයකි. අකුසල පාක්ෂික ධර්මයක් සමඟ අව්‍යාකෘත ජාතික සන්තීරණය හා සම්බන්ධ නොකොට හැක්කේය. එහෙයින් අරමුණ අනිෂ්ටාරම්මණවුවත් දුක්ඛ-දෝමනස්ස වේදනාවන් යෙදෙන්නට ඉඩක් නොමැති

හෙයින් ඉඩ ලැබෙන සැටියට අනිෂ්ට මධ්‍යස්තාරම්මණයෙහි හෝ අතිඉෂ්ටාරම්මණයෙහි හෝ උපෙක්ඛා වේදනාව හා යෙදෙන්නේය.

**[අභිධර්ම ප්‍රකාශය 31 පිට; අභිධර්ම ප්‍රවේශනය 13-14 පිටු]**

## වොත්ථපනය සන්තීරණය මෙන් වේදනා භේදයක් නැත්තේ ඇයි?

වොට්ඨබ්බනං පන සතිපි බලවභාවේ විපාකප්පවත්තිං නිවත්තෙත්වා විසදිසං මනං කරොන්තං මනසිකාරකිච්චන්තරයෝගතෝ විපාකෝ විය අනුභවනමේව න හෝතීති සබ්බත්ථ උපෙක්ඛාසහගතමේව හෝති, තථා පඤ්චද්වාරාවජ්ජනං මනෝද්වාරාවජ්ජනඤ්ච කිච්චවසේන අපුබ්බත්තා.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 469 යටතේ)]**

වොට්ඨබ්බනං කථං මජ්ඣත්තවේදනන්ති අනුයෝගං මනසි කත්වා තස්ස බලවභාවං සම්පටිච්ඡිත්වා සන්තතිපරිණාමනබ්‍යාපාරවිසේසා න සෝමනස්සවේදනන්ති පරිහාරං වදන්තෝ **"වොට්ඨබ්බන"**න්තිආදිමාහ. **විපාකෝ විය අනුභවනමේව න හෝතීති** සති සමත්ථතාය විපාකානං ඒකන්තේන ආරම්මණරසානුභවනතාය වුත්තං. **[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 469 යටතේ)]**

(වොත්ථපන චිත්තය කෙසේ උපේක්‍ෂා සහගතම වන්නේ ද යන චෝද්‍යයට පරිහාර පිණිස "වොට්ඨබ්බනං පන -පෙ- උපෙක්ඛාසහගතමේව හෝති" යි කියනලදි)

විපාක ප්‍රවෘත්තිය සිඳ අසමාන ජවනචිත්ත පරම්පරාවකට පරිවර්තනය කරන වොත්ථපනය වනාහි බලවත් භාවය ඇති කල්හිදු මනසිකාර කෘත්‍යය හා යෙදීම් වශයෙන් විපාක චිත්තය මෙන් ආරම්මණානුරූපව අරමුණු රසය අනුභවන නොකරන්නේනුයි සියළු තැන උපේක්‍ෂා සහගතම වේ.

**[ධම්මසඞ්ගණී මූලටීකා පරිවර්තනයි]**

සම්පටිච්ඡනයුගළඹං පන අත්තනා අසමානනිස්සයානං චක්ඛුවිඤ්ඤාණාදීනමනන්තරං උප්පජ්ජතීති සමානනිස්සයතෝ අලද්ධානන්තර පච්චයතාය සභාගුපත්ථම්භරහිතෝ විය පුරිසෝ නාතිබලවං සබ්බථාපි විසයරසමනුභවිතුං න සක්කෝතීති සබ්බථාපි උපෙක්ඛාසහගතමේව. වුත්ත විපරියායතෝ කුසලවිපාකසන්තීරණං ඉට්ඨඉට්ඨමජ්ඣත්තාරම්මණේසු සුඛෝපෙක්ඛා සහගතන්ති. යදි ඒවං ආවජ්ජනද්වයස්ස උපෙක්ඛාසම්පයෝගං කස්මා වක්ඛති, නනු තම්පි සමානනිස්සයානන්තරං පවත්තතීති? සච්චං, තත්ථ පන පුරිමං පුබ්බේ කේනචි අග්ගහිතේයේව ආරම්මණේ ඒකවාරමේව පවත්තති, පච්ඡිමම්පි විසදිසචිත්තසන්තානපරාවත්තනවසේන බ්‍යාපාරන්තරසාපෙක්ඛන්ති න සබ්බථාපි විසයරසමනුභවිතුං සක්කෝති, තස්මා මජ්ඣත්තවේදනාසම්පයුත්තමේවාති. හොන්ති චෙත්ථ;

"සමානනිස්සයෝ යස්මා, නත්ථානන්තරපච්චයෝ;
තස්මා දුබ්බලමාලම්බේ, සෝපෙක්ඛං සම්පටිච්ඡන"න්ති

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අහේතුකචිත්ත වණ්ණනා අංක 10 යටතේ); විභාවනී ටීකා 42-46 පිට; අභිධර්ම ප්‍රවේශනය 14 පිට; සද්ධර්මසාගරය 02/432 පිට]**

(සම්ප්‍රතෝ්ෂණ යුගලය වනාහි කුමක් හෙයින් උපේක්‍ෂා සහගතම වන්නේ ද? යන චෝද්‍යය සඳහා "සම්පටිච්ඡනයුගලං පන" යන පාඨය කියනලදි) **සම්පටිච්ඡනයුගලං පන** සම්ප්‍රතෝ්ෂණ චිත්තයුග්මය වනාහි **අත්තනා** තමා හා **අසමානනිස්සයානං** අසමාන නිශ්‍රය ස්ථාන ඇත්තාවූ **චක්ඛුවිඤ්ඤාණාදීනං** චක්‍ෂුර්විඥ්ඥාණාදීන්ට **අනන්තරං** අනතුරුව **උප්පජ්ජති** උපදී **ඉති (තස්මා) සමානනිස්සයතෝ** සමාන නිශ්‍රය වූ චිත්තයකින් **අලද්ධානන්තරපච්චයතාය** අනන්තර ප්‍රත්‍යයක් නොලැබුණු හෙයින් **සභාගුපත්ථම්භරහිතෝ** ස්වභාව සදෘශවූ උපස්ථම්භක පුරුෂයෙකු කෙරෙන් වෙන් වූ **පුරිසෝ විය** පුරුෂයෙකු මෙන් **නාතිබලවං** අතිශයින් බලවත් නුයේ **යස්මා හෝති** යම්හෙයකින් වේද **තස්මා** එසේ හෙයින් **සබ්බථාපි** සියළු ඉෂ්ටාලම්බනාදීන්ගේ වශයෙන් ද **විසයරසං** ආලම්බන රසය **අනුභවිතුං** අනුභව කරන්නට **න සක්කෝති** නොහැකිවේද **ඉති (තස්මා) සබ්බථාපි** සියළු ඉෂ්ටාලම්බනාදියෙහි ද **උපක්ඛාසහගතමේව හෝති** උපේක්‍ෂා වේදනා සහ ගියේම වේ.

(වුත්තවිපරියායතෝ "අත්තනා අසමානනිස්සයං" යනාදි වශයෙන් කියනලද ක්‍රමයට විපරීත වශයෙන්) **කුසලවිපාකසන්තීරණං** කුසලවිපාක සන්තීරණ තෙමේ **ඉට්ඨඉට්ඨමජ්ඣත්තාරම්මණේසු** ඉෂ්ටාලම්බන ඉෂ්ටමධ්‍යස්ථාලම්බනයෙහි **සුඛෝපෙක්ඛාසහගතං හෝති** සුඛ වේදනා උපේක්‍ෂා වේදනාවන්ගෙන් යුක්තවූයේ වේ (වුත්තවිපරියායතෝ යන පාඨයෙන් සම්ප්‍රතෝ්ෂණ යුගලයෙහි කියනලද "අත්තනා අසමානනිස්සයානං" යනාදී වාක්‍යයට විපරීත වූ "අත්තනා සමානනිස්සයස්ස කුසලවිපාකසම්පටිච්ඡනස්ස අනන්තරං උප්පජ්ජතීති සමානනිස්සයතෝ ලද්ධානන්තරපච්චයතාය සභාගුපත්ථම්භසහිතෝ පුරිසෝ විය අතිබලවන්ති සබ්බථාපි ආලම්බනරසං අනුභවිතුං සක්කෝතීති ඉට්ඨඉට්ඨමජ්ඣත්තාරම්මණේසු යථාරහං සුඛෝපෙක්ඛාසහගතං හෝති" යන වාක්‍යය ප්‍රකාශ කෙළේයි)

**සමානනිස්සයතෝ** සමාන නිශ්‍රය වූ සිතකින් **ලද්ධානන්තරපච්චයතාය** ලබනලද අනන්තර ප්‍රත්‍යය ඇති බැවින් **කුසලවිපාකසන්තීරණං** කුසලවිපාක සන්තීරණ තෙමේ **සුඛෝපෙක්ඛාසහගතං යදි සියා** සුඛ වේදනා උපේක්‍ෂා වේදනාවන්ගෙන් ඉදින් යුක්ත වී නම් (සමානනිස්සයතෝ යනාදිය පාඨ ශේෂයි) **ඒවං සති** මෙසේ වීමක් ඇති කල්හි **ආවජ්ජනද්වයස්ස** පඤ්චද්වාරාවර්ජන මනෝද්වාරාවර්ජන දෙදෙන **උපෙක්ඛාසම්පයෝගං කත්වා** උපේක්‍ෂා වේදනාව හා සම්ප්‍රයෝග කොට **කස්මා** කුමක්හෙයින් **ආචරියෝ** අනුරුද්ධාචරිය තෙමේ **වක්ඛති** ව්‍යක්‍ෂමාන වන්නේද යත්? **තම්පි (ආවජ්ජනද්වයං)** ඒ ආවර්ජන යුගලය ද **සමානනිස්සයානන්තරං** සදෘශනිශ්‍රය ඇත්තා වූ **භවඞ්ගුපච්ඡේදයට** අනතුරුව **පවත්තති නනු?** පවත්නේ නොවේද යත්? **ඉති (චෝදනායං සති** මෙබඳු චෝදනාවක් ඇති කල්හි) **සච්චං** එසේවීම සැබෑයි (එසේවීම සැබෑ වන්නේ නම් කුමක්හෙයින් ආවර්ජනද්වය උපේක්‍ෂා වේදනාවෙන්ම යුක්ත වන්නේ ද යන චෝද්‍යය සඳහා "තත්ථ පන -පෙ- සම්පයුත්තමේව" යන පාඨය කියනලදි)

**පන (තථාපි)** එසේ සැබෑවූයේ ද **තත්ථ** ඒ ආවර්ජනා දෙසිත අතුරෙන් **පුරිමං** පෙරටුව හටගන්නා පඤ්චද්වාරාවර්ජන සිත් තෙමේ **පුබ්බේ** පූර්වයෙහි **කේනචි** කිසියම් වීථිචිත්තයක්හු විසින් **අගහිතේයේව** නොගන්නා ලද්දම වූ **ආරම්මණේ** අරමුණෙහි **ඒකවාරමේව** එක් වරක්ම **පවත්තති** පවත්නේයි **පච්ඡිමම්පි** පසුව හටගන්නා වූ මනෝද්වාරාවර්ජන තෙමේද **විසදිසචිත්තසන්තානපරාවත්තනවසේන**

අසමාන වූ ජවන භවඞ්ග චිත්ත පරම්පරාවකට අනන්තරාදී ප්‍රත්‍යයෙන් පරිවර්තනය කරවීම් වශයෙන් **ව්‍යාපාරානන්තරසාපෙක්ඛං** ක්‍රියා විශේෂයක් අපේක්‍ෂා කිරීම හා සමඟ වන්නේයි **ඉති (තස්මා) සබ්බථාපි** සියළු ආකාරයෙනුදු **විසයරසං** ආලම්බන රසය **අනුභවිතුං න සක්කෝති** අනුභව කළ නොහැකි වෙත් **තස්මා** එසේහෙයින් **මජ්ඣත්තවේදනාසම්පයුත්තමේව හෝති** උපේක්‍ෂා වේදනාවෙන් යුක්තවූයේම වෙයි (ඉති ශබ්දය පරිසමාපනාර්ථයි) **එත්ථ** මේ අහේතුක චිත්ත විභාගයෙහි **සඞ්ගහ** නිගමන සඞ්ග්‍රහ ගාථාවෝ **හොන්ති** වෙත්.

**සම්පටිච්ඡනස්ස** සම්ප්‍රතෙ‍්‍යෂණ චිත්තයට (මේ වනාහි සම්ප්‍රදාන විභක්තියි) **සමානනිස්සයෝ** සදෘශ වූ ආශ්‍රය ස්ථාන ඇත්තාවූ **අනන්තරපච්චයෝ** අනන්තර ප්‍රත්‍යය තෙමේ **යස්මා නත්ථි** යම්හෙයකින් නැත්තේ වේද **තස්මා** එසේ හෙයින් **ආලම්බේ** අරමුණෙහි **දුබ්බලං** දුර්වල වූ **සම්පටිච්ඡනං** සම්ප්‍රතෙ‍්‍යෂණ චිත්තය තෙමේ **සෝපෙක්ඛං හෝති** උපේක්‍ෂා වේදනාවෙන් යුක්තවූයේ වේ.

**[විභාවනී ටීකා සන්නය 78-80 පිටු]**

ආවජ්ජනද්වයං පන සන්තීරණතෝ පි ථෝකං බලවං හෝති. විපාකානඤ්හි පවත්තිතුංපි අත්තනෝ උස්සාහබලං නාම නත්ථි. බලවන්තේහි පන කම්මාදිපච්චයේහි ජාතානි බලවන්තානි නාම හොන්ති. දුබ්බලේහි ජාතානි දුබ්බලානි නාමාති. ඒවං සන්තේපි තං ආවජ්ජනද්වයං කම්මානුභාවතෝව මුච්චිත්වා විපාකසන්තානතෝව පච්චයං ගහෙත්වා උට්ඨිතත්තා දුබ්බලමේව හෝතීති සදපි උපෙක්ඛාසහගතමේවාති.

**විභාවනියං** පන; පඤ්චද්වාරාවජ්ජනං පුබ්බේ කේනචි අග්ගහිතේ ආරම්මණේ ඒකවාරමේව පවත්තත්තා මනෝද්වාරාවජ්ජනඤ්ච විසදිසචිත්තසන්තාන පරාවත්තනවසේන බ්‍යාපාරන්තරසාපෙක්ඛත්තා ආරම්මණරසං අධිමත්තතෝ අනුභවිතුං න සක්කෝතීති සබ්බත්ථපි මජ්ඣත්ත වේදනායුත්තමේවාති වුත්තං. තත්ථ බ්‍යාපාරන්තරසාපෙක්ඛත්තාති ඉදං න යුජ්ජති.

න හි චිත්තානං බලවදුබ්බලතාවිසේසෝ අත්තනෝ පච්ඡා පවත්තස්ස චිත්තස්ස වසේන සක්කා වත්තුං. අත්තනෝ පන පච්චයේහි ඒව සෝ සක්කා වත්තුන්ති. ඉතරථා සන්තීරණස්සපි බ්‍යාපාරන්තරසාපෙක්ඛතා සියා. තංපි හි විසදිසචිත්තසන්තානං අත්තනාපරං වත්තේති යේවාති. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 36 යටතේ)]**

"කේනචී"ති කේනචි චිත්තේන. "විසදිසචිත්තසන්තානපරාවට්ටනවසේනා"ති පුරිමේන විපාකචිත්තසන්තානේන විසදිසං කුසලාදිජවනචිත්තසන්තානං පරතෝ ආවට්ටාපනවසේන. තථාහිදං චිත්තද්වයං පාළියං ආවට්ටනා, අන්වාවට්ටනා, ආභෝගෝ, සමන්නාහාරෝති නිද්දිට්ඨං. "සබ්බත්ථාපී"ති ඉට්ඨාරම්මණේපි අනිට්ඨාරම්මණේපි. "අත්තනෝ පච්ඡා පවත්තස්ස චිත්තස්ස වසේනා"ති අත්තනෝ පච්ඡා පවත්තං චිත්තං පටිච්ච න වත්තබ්බෝති අධිප්පායෝ. "අත්තනෝ පච්චයේහි ඒව සෝ සක්කා වත්තු"න්ති අත්තනෝ පච්චයේසු බලවන්තේසු සති, බලවා හෝති. දුබ්බලේසු සති, දුබ්බලෝ හෝතීති සක්කා වත්තුන්ති අධිප්පායෝ. "විසදිස චිත්තසන්තාන"න්ති වොට්ඨබ්බනකිරියචිත්තසන්තානං.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 36 යටතේ)]**

**ආවජ්ජනද්වයං පන** ආවර්ජන දෙදෙන වනාහි **සන්තීරණතෝපි** සන්තීරණ චිත්තයට ද වඩා **ථෝකං** ටිකක් **බලවං හෝති** බලවත් වෙයි **හි (සච්චං)** සැබෑවකි **විපාකානං** විපාක චිත්තයන්ගේ **පවත්තිතුම්පි** පවත්වන්නට ද **අත්තනෝ** තමාගේ **උස්සාහබලං නාම නත්ථි** උත්සාහයක් බලයක් නම් ද නැත.

(ආවර්ජන දෙදෙන විපාක චිත්තයන්ගේ පැවැත්මට උපකාර නොවන බව ආචාරීන් විසින් කියනලදි. එසේ වී නම් ඒ විපාක චිත්තයන්ගේ පැවැත්ම කෙසේ වන්නේ ද යන චෝද්‍යයට පරිහාර පිණිස "බලවන්තේහි කම්මපච්චයේහි" යී කීහ)

**පන** එහි විශේෂය කියම් **බලවන්තේහි** බලවත් වූ **කම්මාදිපච්චයේහි** කර්මාදී ප්‍රත්‍යය හේතුකොටගෙන **ජාතානි (විපාකචිත්තානි)** උපන්නා වූ විපාක චිත්තයෝ **බලවන්තානි නාම හොන්ති** බලවත්වූවෝ නම් වෙත් **දුබ්බලේහි (කම්මාදිපච්චයේහි)** දුබල වූ කර්මාදී ප්‍රත්‍යය හේතුකොටගෙන **ජාතානි (විපාකචිත්තානි)** උපන්නා වූ විපාක චිත්තයෝ **දුබ්බලානි නාම** දුබලවූවෝ නම් **ඉති (හොන්ති)** වෙත් **ඒවං සන්තේපි** මෙසේ ඇති කල්හිදු **තං ආවජ්ජනද්වයං** ඒ ආවර්ජන චිත්තයෝ දෙදෙන **කම්මානුරූපතෝ ච** කර්මයට අනුරූප වශයෙන් ද **මුච්චිත්වා (න උප්පජ්ජිත්වා)** නොඉපිද **විපාකසන්තානතෝ ච** විපාක සන්තානයෙන් ද **පච්චයං ගහෙත්වා** ප්‍රත්‍යය ගෙන **උට්ඨිතත්තා** හටගත් බැවින් **දුබ්බලමේව හෝතීති** දුර්වලම වේනුයි **සදපි** සැමකල්හිම **උපෙක්ඛාසහගතමේව** උපේක්‍ෂා සහගිය වේදනාවෙන්ම **ඉති (යුත්තං හෝති)** යුක්ත වෙයි.

**විභාවනියං පන** විභාවනියෙහි වනාහි **පඤ්චද්වාරාවජ්ජනං** පඤ්චද්වාරාවර්ජන චිත්තයට **පුබ්බේ** පූර්වයෙහි **කේනචි** කිසි චිත්තයකින් **අග්ගහිතේ** නොගත් **ආරම්මණේ** අරමුණෙහි **ඒකවාරමේව** එක් වරම **පවත්තත්තා** පැවැති බැවින් ද **මනෝද්වාරාවජ්ජනඤ්ච** මනෝද්වාරාවර්ජන චිත්තය ද **විසදිසචිත්තසන්තාන පරාවත්තනවසේන** පෙර විපාක චිත්තසන්තානයෙන් විසදෘශ වූ අන්‍ය කුසලාදී ජවනචිත්ත සන්තානයකට පෙරලීම් වශයෙන් **බ්‍යාපාරාන්තරසාපෙක්ඛත්තා** ක්‍රියා විශේෂයක් නොහොත් උත්සාහයක් අපේක්‍ෂා කිරීම හා සමඟ වන බැවින් ද **ආරම්මණරසං** අරමුණු රසය **අධිමත්තතෝ** අධිමාත්‍ර වශයෙන් **අනුභවිතුං** අනුභව කිරීමට **න සක්කෝතීති** නොහැකි වේනුයි **සබ්බත්ථපි** ඉෂ්ටාරම්මණ අනිෂ්ටාරම්මණ යන සියළුතැන්හි ද **මජ්ඣත්තවේදනායුත්තමේවාති** මධ්‍යස්ථ වේදනාවෙන් යුක්තවම වේ යැයි **වුත්තං** කියනලදි තත්ථ ඒ චිත්තයෙහි **බ්‍යාපාරන්තරසාපෙක්ඛත්තාති** ක්‍රියා විශේෂයක් නොහොත් උත්සාහයක් අපේක්‍ෂා කිරීම හා සමඟ වන බැවිනි යනුවෙන් **ඉදං (වුත්තවචනං)** මේ කියනලද වචනය **න යුජ්ජති** සුදුසු නොවෙයි.

**චිත්තානං** චිත්තයන්ගේ **බලවදුබලතාවිසේසෝ** බලව දුබල භාවයාගේ විශේෂය **අත්තනෝ** තමාට **පච්ඡා** පසුව **පවත්තස්ස චිත්තස්ස** පවතින්නා වූ චිත්තයන්ගේ **වසේන** වශයෙන් **වත්තුං න සක්කා** කියන්නට නොහැකිය (අත්තනෝ පච්ඡා පවත්තං චිත්තං පටිච්ච න වත්තබ්බෝති අධිප්පායෝ යනු අනුදීපනීපාඨයි) **අත්තනෝ පන** තමාගේ වනාහි **පච්චයේහි ඒව** ප්‍රත්‍යය හේතුකොටගෙනම **සෝ** ඒ බලව දුබල විශේෂය **වත්තුං සක්කා** කියන්නට හැක්කේය ("අත්තනෝ පච්චයේසු බලවන්තේසු සති බලවා හෝති, දුබ්බලේසු සති දුබ්බලෝ හෝති" යනු අනුදීපනීපාඨයි) **ඉතරථා** අන්‍ය ප්‍රකාරයෙකින් **සන්තීරණස්සාපි** සන්තීරණ චිත්තයාගේ

ද **ඛ්‍යාපාරාන්තරසාපෙක්ඛතා සියා** ක්‍රියා විශේෂයක් නොහොත් උත්සාහයක් අපේක්‍ෂා කිරීම හා සමඟ වන්නේ නම් **තම්පි හි** ඒ සන්තීරණ චිත්තය ද වනාහි **අත්තනා පරං** තමාගෙන් අන්‍ය වූ **විසදිසචිත්තසන්තානං** විසදෘශ චිත්තසන්තානයකට නොහොත් වොට්ඨපන ක්‍රියා චිත්තසන්තානය **වත්තේතියේව** පවත්වන්නේමය.

[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]

## අහේතුක ක්‍රියා යනු:—

තත්ථ **කිරියාති** කරණමත්තං. සබ්බේසුයේව හි කිරියචිත්තේසු යං ජවනභාවං අප්පත්තං තං වාතපුප්ඵං විය. යං ජවනභාවප්පත්තං තං ඡින්නමූලකරුක්ඛපුප්ඵං විය අඵලං හෝති, තං තං කිච්චසාධනවසේන පවත්තත්තා පන කරණමත්තමේව හෝති. තස්මා කිරියාති වුත්තං.

[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 566 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 256-257 පිටු (හේ.වි.මු)]

**වාතපුප්ඵන්ති** මෝඝපුප්ඵං. තං අච්ඡින්නේපි රුක්ඛේ න ඵලති, ඡින්නරුක්ඛපුප්ඵං පන අච්ඡින්නේ ඵලෙය්‍ය. ඒවං අච්ඡින්නභවමූලස්සපි පවත්තමානං යං න ඵලති, තං වාතපුප්ඵසදිසං. ඉතරස්සේව පන පවත්තමානං ඡින්නරුක්ඛපුප්ඵසදිසං. තඤ්හි අච්ඡින්නේ භවමූලේ ඵලෙය්‍යාති.

[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 566 යටතේ)]

**තත්ථ** එහි **ක්‍රියාති** ක්‍රියා යනු **කරණමත්තං** ක්‍රියා මාත්‍රයෙකි **සබ්බේසුයේව හි කිරියචිත්තේසු** සියළුම ක්‍රියා චිත්තයන් අතුරින් **ජවනභාවං** ජවන භාවයට **අප්පත්තං** නොපැමිණෙන්නා වූ **යං** යම් ක්‍රියා චිත්තයක් වේ ද **තං** ඒ ක්‍රියා චිත්තය **වාතපුප්ඵං විය** බොරු මලක් මෙනි **ජවනභාවප්පත්තං** ජවන භාවයට පැමිණෙන්නා වූ **යං** යම් ක්‍රියා චිත්තයක් වේ ද **තං** ඒ ක්‍රියා චිත්තය **ඡින්නමූලකරුක්ඛපුප්ඵං විය** මුල සිඳිනලද ගසක මලක් මෙන් **අඵලං හෝති** ඵල නොදෙයි **තං තං කිච්චසාධනවසේන** ඒ ඒ කෘත්‍යය සිදුකිරීම් වශයෙන් **පවත්තත්තා පන** පවතින බැවින් වනාහි **කරණමත්තමේව හෝති** ක්‍රියා මාත්‍රයෙක්ම වෙයි **තස්මා** එබැවින් **කිරියාති වුත්තං** ක්‍රියා යැයි දේශනා කරනලදි.

(ඒ බොරු මල වනාහි ගස නොසිඳූ කල්හි ද ගෙඩි හටනොගනී. සිඳිනලද ගසෙහි මල් වනාහි ගස නොසිඳූ කල්හිදු ගෙඩි හටගන්නේය. මෙසේ නොසිඳිනලද භවමූලය ඇත්තාහට පවතින්නා වූ යම් චිත්තයක් වේ ද ඒ චිත්තය විපාක නොදෙයි. ඒ චිත්තය බොරු මලක් හා සමානය. රහතන්වහන්සේලාට වනාහි පවතින්නා වූ ක්‍රියා චිත්තය සිඳිනලද ගසක මල් හා සමානය. ඒ චිත්තය වනාහි නොසිඳිනලද භවමූලය ඇති කල්හි විපාක ගෙන දෙන්නේය) [ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]

කිරියාබ්‍යාකතා පන කාමරූපාරූපාවචරවසේන තිවිධා. තත්ථ කාමාවචරකිරියා අහේතුකා සහේතුකාති දුවිධා. තත්ථ සහජාතහේතුවිරහිතා අහේතුකා. තා සම්පයෝගාදිතෝ තිවිධා උපෙක්ඛාසහගතා මනෝධාතු, සෝමනස්සසහගතා මනෝවිඤ්ඤාණධාතු, තථා උපෙක්ඛාසහගතාති. **කිරියාති** කරණමත්තං, කිච්චමත්තන්ති අත්ථෝ. සබ්බේසුයේව හි කිරියචිත්තේසු යං ආවජ්ජනකිච්චද්වයං, තං අජවනවුත්තිතෝ මෝඝපුප්ඵං විය. යං ජවනවුත්තිකං, තං නිරානුසයසන්තානප්පවත්තිතෝ ඡින්නමූලරුක්ඛපුප්ඵං විය අඵලං හෝති. තං තං

ආවජ්ජනජවනකිච්චසාධනවසේන පවත්තත්තා පන කිච්චමත්තතං උපාදය "කිරියා"ති වුත්තං. **[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා අහේතුකකිරියා වණ්ණනා යටතේ)]**

**කිරියාබ්‍යාකතා පන** ක්‍රියා අව්‍යාකෘත චිත්තයෝ වනාහි **කාමරූපාරූපාවචරවසේන** කාමාවචර රූපාවචර අරූපාවචර වශයෙන් **තිවිධා** තෙවැදෑරුම් වෙයි **තත්ථ** ඒ චිත්තයන් අතුරින් **කාමාවචරකිරියා** කාමාවචර ක්‍රියා චිත්තයෝ තුමූ **අහේතුකා** අහේතුක **සහේතුකාති** සහේතුක යැයි **දුවිධා** දෙවැදෑරුම් වෙයි **තත්ථ** ඒ දෙදෙන අතුරින් **සහජාතහේතුවිරහිතා** සහජාත හේතු රහිතවූවෝ **අහේතුකා** අහේතුක චිත්තයෝයි **තා** ඒ චිත්තයෝ **සම්පයෝගාදිතෝ** සම්ප්‍රයෝගාදී වශයෙන් **උපෙක්ඛාසහගතා මනෝධාතු** උපේක්‍ෂා සහගත මනෝධාතු නම් වූ පඤ්චද්වාරාවර්ජන චිත්තය ද **සෝමනස්සසහගතා මනෝවිඤ්ඤාණධාතු** සෝමනස්ස සහගත මනෝවිඤ්ඤාණධාතු නම් වූ හසිතුප්පාද චිත්තය ද **තථා** එසේම **උපෙක්ඛාසහගතා (මනෝවිඤ්ඤාණධාතු) ඉති** උපේක්‍ෂා සහගත මනෝවිඤ්ඤාණධාතු නම් වූ මනෝද්වාරාවර්ජන චිත්තය යනුවෙන් **තිවිධා** තෙවැදෑරුම්ය **කිරියාති** ක්‍රියා යනු **කරණමත්තං** කිරීම් මාත්‍රයෙකි **කිච්චමත්තං ඉති අත්ථෝ** කෘත්‍ය මාත්‍රයක් යන අර්ථයයි **සබ්බේසුයේව හි කිරියචිත්තේසු** සියළුම ක්‍රියා චිත්තයන් අතුරින් වනාහි **යං ආවජ්ජනකිච්චද්වයං** ආවර්ජන කෘත්‍යවත් වූ යම් ක්‍රියා සිත් දෙකක් වේ ද **තං** ඒ ක්‍රියා සිත් **අජවනවුත්තිතෝ** ජවන වශයෙන් පැවැත්මක් නැති හෙයින් **මෝඝපුප්ඵං විය** බොරු මල් මෙනි **ජවනවුත්තිකං යං** ජවන වශයෙන් පැවැත්මක් ඇති යම් ක්‍රියා සිතක් වේ ද **තං** ඒ ක්‍රියා චිත්තය **නිරානුසයසන්තානප්පවත්තිතෝ** රහත් සන්තානයන්හි පැවතීම් වශයෙන් **ඡින්නමූලරුක්ඛපුප්ඵං විය** මුල සිඳූ වෘක්‍ෂයක මලක් මෙන් **අඵලං හෝති** විපාක නොදෙයි **තං තං ආවජ්ජනජවනකිච්චසාධනවසේන** ඒ ඒ ආවර්ජන කෘත්‍යය ජවන කෘත්‍යය සිදුකිරීම් වශයෙන් **පවත්තත්තා පන** පවතින බැවින් වනාහි **කිච්චමත්තං** කෘත්‍යය මාත්‍රය **උපාදය** ගෙන **කිරියාති වුත්තං** ක්‍රියා යනුවෙන් දේශනා කරනලදි.

**[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

වුත්තනයේන අහේතුකානිව තානි විපච්චන විපාකුප්පාදන කිච්චරහිතත්තා තං තං ක්‍රියාමත්තභූතානි චිත්තානිචාති අහේතුකක්‍රියචිත්තානි. එත්ථ ච වීථිමුත්තචිත්තානි කිච්චදුබ්බලත්තා පඤ්චවිඤ්ඤාණානි වත්ථුදුබ්බලත්තා සම්පටිච්ඡනාදීනි ච කිච්චට්ඨානදුබ්බලත්තා අත්තනෝ උස්සාහේන විනා කේවලං විපච්චනමත්තේන පවත්තන්තීති තානි සබ්බානි විපාකානි ඒව හොන්ති. යානි පන බලවකිච්චත්තා අත්තනෝ උස්සාහේන පවත්තන්ති. ආයතිං ච විපාකුප්පාදනත්ථං උස්සාහසහිතානි හොන්ති. තානි කුසලාකුසලානි නාම හොන්ති. යානි පන චිත්තානි විපච්චනමත්තං අතික්කම්ම අත්තනෝ උස්සාහේනේව පවත්තන්ති. තේසු ආවජ්ජනද්වයං විපාකසන්තානතෝ ලද්ධපච්චයත්තා ථෝකං දුබ්බලභාවතෝ ඉතරානි ච නිරානුසයසන්තානේ පවත්තත්තා සබ්බසෝ විපාකුප්පාදනත්ථං උස්සාහරහිතානි ඒව හොන්තීති තානි සබ්බානි ක්‍රියානි නාම ජාතානීති දට්ඨබ්බං.

**[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 35 යටතේ); සද්ධර්මසාගරය 02/435 පිට]**

"වුත්තනයේනා"ති සම්පයුත්තහේතුවිරහතෝති වුත්තනයේන. විපච්චන කිච්චං නාම විපාකානං කිච්චං. විපාකුප්පාදනකිච්චං නාම කුසලාකුසලානං කිච්චං. "තං තං කිරියාමත්තභූතානී"ති ආවජ්ජන කිරියා හසනකිරියාමත්තභූතානි. පටිසන්ධිභවඞ්ගචුතිචිත්තානි නාම කේවලං කම්මවේගුක්ඛිත්තභාවේන සන්තානේ පතිතමත්තත්තා දුබ්බලකිච්චානි හොන්ති. පඤ්ච විඤ්ඤාණානි ච අසාරානං

අබලානං පසාදවත්ථූනං නිස්සාය උප්පන්නත්තා දුබ්බලවත්ථුකානි හොන්ති. සම්පටිච්ඡනාදීනි ච පඤ්චවිඤ්ඤාණානුබන්ධමත්තත්තා දුබ්බල කිච්චට්ඨානානි හොන්ති. තස්මා තානි සබ්බානි අත්තනෝ උස්සාහේන විනා කේවලං විපච්චනමත්තේන පවත්තන්ති. "විපාකසන්තානතෝ"ති පඤ්චද්වාරාවජ්ජනඤ්ච මනෝද්වාරාවජ්ජනඤ්ච භවඞ්ගවිපාකසන්තානතෝ ලද්ධපච්චයං හෝති. වොට්ඨබ්බනං පඤ්චවිඤ්ඤාණාදි විපාකසන්තානතෝ ලද්ධපච්චයං. "ඉතරානි පනා"ති හසිතුප්පාදචිත්ත මහාකිරියචිත්තාදීනි. "නිරානුසයසන්තානේ"ති අනුසයරහිතේ ඛීණාසවසන්තානේ. "උස්සාහරහිතානි ඒවා"ති යථා රුක්ඛානං වාතපුප්ඵානි නාම අත්ථි. තානි ඵලුප්පාදකසිනේහරහිතත්තා ඵලානි න උප්පාදෙන්ති. තථා තානි ච විපාකුප්පාදකතණ්හාසිනේහරහිතත්තා උස්සාහබ්‍යාපාරරහිතානි ඒව.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 35 යටතේ)]**

**වුත්තනයේන** සම්ප්‍රයුක්ත හේතු රහිත යැයි කියනලද ක්‍රමයෙන් **තානි අහේතුකානි ච** ඒ අහේතුක චිත්තයෝ ද **විපච්චන කිච්චරහිතත්තා** විපාක චිත්තයන්ගේ කෘත්‍යය රහිත බැවින් ද **විපාකුප්පාදන** කුසල අකුසල චිත්තයන්ගේ (**කිච්චරහිතත්තා** කෘත්‍යය රහිත බැවින් ද) **තං තං ක්‍රියාමත්තභූතානි චිත්තානි** ඒ ඒ ආවර්ජන ක්‍රියා හසන ක්‍රියා මාත්‍ර වූ චිත්තයෝ **අහේතුකක්‍රියාචිත්තානි** අහේතුක ක්‍රියා චිත්තයෝ නම් **ඉති ච (හොන්ති)** වෙත් **එතථ** මෙහි **වීථිමුත්තචිත්තානි** වීථි මුක්ත චිත්තයෝ තුමූ **කිච්චදුබ්බලත්තා ච** කෘත්‍යය දුර්වල බැවින් ද **පඤ්චවිඤ්ඤාණානි ච** පඤ්චවිඤ්ඤාණ චිත්තයෝ තුමූ **වත්ථුදුබ්බලත්තා** වස්තු දුර්වල බැවින් ද **සම්පටිච්ඡනාදීනි** සම්ප්‍රතෙය්ෂණ ආදී චිත්තයෝ තුමූ **කිච්චට්ඨානදුබ්බලත්තා** කෘත්‍යය ස්ථාන දුර්වල බැවින් ද **අත්තනෝ** තමාගේ **උස්සාහේන විනා** උත්සාහයෙන් තොරව **කේවලං** හුදෙක් **විපච්චනමත්තේන** විපාකදීම් මාත්‍රයෙන් **පවත්තන්තීති** පවතිත්නුයි **තානි සබ්බානි** ඒ සියළු චිත්තයෝ **විපාකානි ඒව හොන්ති** විපාක චිත්තයෝම වෙත් **යානි පන** යම් චිත්ත කෙනෙක් වනාහි **බලවකිච්චත්තා** බලවත් කෘත්‍යය ඇති බැවින් **අත්තනෝ** තමාගේ **උස්සාහේන** උත්සාහයෙන් **පවත්තන්ති** පවතිත් ද **ච** එසේම **ආයතිං ච** මත්තෙහි ද **විපාකුප්පාදනත්ථං** විපාක ඉපදවීම පිණිස **උස්සාහසහිතානි** උත්සාහ සහිත චිත්තයෝ **හොන්ති** වෙත් ද **තානි** ඒ චිත්තයෝ **කුසලාකුසලානි නාම හොන්ති** කුසල අකුසල නම් වෙත් **යානි පන චිත්තානි** යම් චිත්තයෝ වනාහි **විපච්චනමත්තං** විපාක දෙන මාත්‍රය **අතික්කම්ම** ඉක්මවා **අත්තනෝ** තමාගේ **උස්සාහේනේව** උත්සාහයෙන්ම **පවත්තන්ති** පවතිත් **තේසු** ඒ චිත්තයන් අතරින් **ආවජ්ජනද්වයං** ආවර්ජන දෙදෙන **විපාකසන්තානතෝ** භවඞ්ග විපාක සන්තානයෙන් **ලද්ධපච්චයත්තා** ලබනලද ප්‍රත්‍යය ඇති බැවින් **ථෝකං** ටිකක් **දුබ්බලභාවතෝ** දුර්වල භාව වශයෙන් ද **ඉතරානි ච** අන්‍ය චිත්තයෝ **නිරානුසයසන්තානේ** රහත් සන්තානයෙහි **පවත්තත්තා** පවතින බැවින් **සබ්බසෝ** සියළු ආකාරයෙන් **විපාකුප්පාදනත්ථං** විපාක ඉපදවීම පිණිස **උස්සාහරහිතානි ඒව** උත්සාහ නැත්තෝම **හොන්තීති** වෙත් නුයි **තානි සබ්බානි** ඒ සියළු චිත්තයෝ **ක්‍රියා නාම** ක්‍රියා චිත්තයෝ නම් **ජාතානීති** වූයේ යැයි **දට්ඨබ්බං** දතයුතුයි.

(පඤ්චවිඤ්ඤාණ චිත්තයෝ අසාර වූ දුබල වූ ප්‍රශාද වස්තූන් නිසා උපදින බැවින් දුර්වල වස්තු ඇත්තෝ වෙත්. සම්ප්‍රතෙය්ෂණ ආදී චිත්තයෝ ද පඤ්චවිඤ්ඤාණ අනුබන්ධන මාත්‍ර බැවින් දුර්වල කෘත්‍යය ස්ථානයෝ වෙත්. එබැවින් ඒ සියළු චිත්තයෝ තමන්ගේ උත්සාහය නොමැතිව හුදෙක් විපාක දෙන මාත්‍රයෙන් පවතිත්)

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

විපාක උපදවන ස්වභාවයක් නැති යම්කිසි කර්මයක විපාකයක් නොවන සිත්වලට ක්‍රියාසිත් යැයි කියනු ලැබේ. යම්කිසි කෘත්‍යයක් සිදුකිරීම හැමසිතකම ස්වභාවයය. විපාක උපදවන සිත්වලට කුසල්ය, අකුසල්ය යන නම දුන් බැවිනුත් ඒවායින් උපදවන සිත්වලට විපාක යන නම දුන් බැවිනුත් ඉතිරිවන සිත් කොටසට ඒ ඒ කෘත්‍යයන් සිදුකිරීම් වශයෙන් ඇතිවීම නිමිත්ත කොට ක්‍රියා යන නාමය ව්‍යවහාර කරනු ලැබේ. අහේතුක ක්‍රියාසිත්වලට නම් තබා ඇත්තේ ද ඒ සිත්වලින් සිදුකරන කෘත්‍යයන් අනුවය. **[අභිධර්ම මාර්ගය 44 පිට; අභිධර්ම චන්ද්‍රිකාව 21 පිට]**

## අහේතුක ක්‍රියා සිත් ඉපදීමට හේතු:—

තත්ථ මනෝධාතුයා විපාකමනෝධාතුයං වුත්තනයේන සබ්බෝ විනිච්ඡයෝ වේදිතබ්බෝ. කේවලං පන පඤ්චද්වාරේ ඉට්ඨේසු වා අනිට්ඨේසු වා පඤ්චාරම්මණේසු පඤ්චපසාදේ ඝට්ටිතේසු උප්පන්නභවඞ්ගුපච්ඡේදනන්තරං තමේව පඤ්චාරම්මණමාරබ්භ හදයවත්ථුං නිස්සායේවාවජ්ජනකිච්චං සාධයමානා පඤ්චසුපි ද්වාරේසු පවත්තතීති අයං විසේසෝ.

විසයාදිප්පභේදතෝ පනෙත්ථ සෝමනස්සසහගතා තාව හදයවත්ථුඤ්ඤෙව නිස්සාය පඤ්චද්වාරේ වොට්ඨබ්බනකිච්චාය ච, මනෝද්වාරේ අනුළාරේසු ඡසු කාමාවචරාරම්මණේසු ආවජ්ජනකිච්චාය ච මනෝවිඤ්ඤාණධාතුයා අනන්තරං ජවනකිච්චං සාධයමානා ඛීණාසවානඤ්ඤෙව හසිතං උප්පාදෙන්තී පවත්තති.

උපෙක්ඛාසහගතා පන පඤ්චද්වාරේ හදයවත්ථුඤ්ඤෙව නිස්සාය සන්තීරණකිච්චාය විපාකමනෝවිඤ්ඤාණධාතුයා අනන්තරං වොට්ඨබ්බනකිච්චං, මනෝද්වාරේ සබ්බේසු ඡසුපි ආරම්මණේසු සවත්ථුකා, අවත්ථුකා වා භවඞ්ගචලනානන්තරං ආවජ්ජනකිච්චාං සාධයමානා පවත්තති. අයං හි තීසු භවේසු කස්සචි සචිත්තකපුග්ගලස්ස න කිස්මිඤ්චි විසයේ න උප්පජ්ජති, සබ්බඤ්ඤුතඤ්ඤාණසදිසං මහාගමනං නාමේතං චිත්තන්ති අයං විසේසෝ.

**[අභිධම්මමාතිකා පාළි (ජට්ඨසඞ්ගායනා අහේතුකකිරියා වණ්ණනා යටතේ)]**

**තත්‍ථ** එහි **මනෝධාතුයා** ක්‍රියා මනෝධාතුව නම් පඤ්චද්වාරාවර්ජන චිත්තයාගේ හේතු **විපාකමනෝධාතුයං** විපාක මනෝධාතු නම් සම්ප්‍රතෝෂණ චිත්තයෙහි **වුත්තනයේන** කියනලද ක්‍රමයෙන් **සබ්බෝ විනිච්ඡයෝ** සියළු විනිශ්චය **වේදිතබ්බෝ** දතයුතුයි **පන** විශේෂයක් කියම් **කේවලං** හුදෙක් **පඤ්චද්වාරේ** පඤ්චද්වාරයෙහි **ඉට්ඨේසු වා** ඉටු හෝ **අනිට්ඨේසු වා** අනිටු හෝ **පඤ්චාරම්මණේසු** පඤ්චාරම්මණයන් **පඤ්චපසාදේ** පඤ්ච ප්‍රශාදයන්හි **ඝට්ටිතේසු** ගැටුනු කල්හි **උප්පන්නභවඞ්ගුපච්ඡේදනන්තරං** උපන්නා වූ භවඞ්ගුපච්ඡේදයට අනතුරුව **තමේව පඤ්චාරම්මණමාරබ්භ** ඒ පඤ්චාරම්මණම අරභයා **හදයවත්‍ථුං** හදයවස්තුව **නිස්සායේවාවජ්ජනකිච්චං** ඇසුරු කොටම ආවර්ජන කිස **සාධයමානා** සිද්ධ කරමින් **පඤ්චසුපි ද්වාරේසු** පස් දෙරෙහි ද **පවත්තතී** පවති **ඉති (එත්‍ථ)** මෙහි **අයං** මේ විසේසෝ **විශේෂයයි.**

**එත්‍ථ** මෙහි **විසයාදිපභේදතෝ පන** විෂයාදී ප්‍රභේද වශයෙන් වනාහි **තාව** පළමුව **සෝමනස්සසහගතා** සොම්නස් සහගත හසන චිත්තය **හදයවත්‍ථුඤ්ඤෙව** හදය වස්තුවම **නිස්සාය** ඇසුරු කරමින් **පඤ්චද්වාරේ** පඤ්චද්වාරයෙහි

**වොට්ඨබ්බනකිච්චාය ච** වොත්ථපන කෘත්‍යයගේ ද **මනෝද්වාරේ** මනෝද්වාරයෙහි **අනුළාරේසු** ලාමක වූ **ඡසු කාමාවචරාරම්මණේසු** කාමාවචර සයාරමුණෙහි **ආවජ්ජනකිච්චාය ච** ආවර්ජන කෘත්‍යයගේ ද **මනෝවිඤ්ඤාණධාතුයා** මනෝවිඤ්ඤාණ ධාතුව නම් මනෝද්වාරාවර්ජනයට **අනන්තරං** අනතුරුව **ජවනකිච්චං** ජවන කෘත්‍යය **සාධයමානා** සිද්ධ කරමින් **ඛීණාසවානඤ්ඤෙව** රහතුන්හටම **හසිතං** සිනහව **උප්පාදෙන්තී** උපදවමින් **පවත්තති** පවතී.

**උපෙක්ඛාසහගතා පන** උපේක්ෂා සහගත මනෝද්වාරාවර්ජනය වනාහි **පඤ්චද්වාරේ** පඤ්චද්වාරයෙහි **හදයවත්ථුඤ්ඤෙව** හදයවස්තුවම **නිස්සාය** ඇසුරු කොට **විපාකමනෝවිඤ්ඤාණධාතුයා** විපාක මනෝවිඤ්ඤාණ ධාතුව නම් වූ **සන්තීරණකිච්චාය** සන්තීරණ කෘත්‍යයට **අනන්තරං** අනතුරුව **වොට්ඨබ්බනකිච්චං** වොත්ථපන කිස ද **මනෝද්වාරේ** මනෝද්වාරයෙහි **සබ්බේසු** සියළු **ඡසුපි ආරම්මණේසු** සයාරමුණෙහි ද **සවත්ථුකා වා** සවස්තුකව හෝ **අවත්ථුකා වා** අවස්තුකව හෝ **භවඞ්ගචලනානන්තරං** භවඞ්ග චලනයට අනතුරුව **ආවජ්ජනකිච්චං** ආවර්ජන කෘත්‍යය **සාධයමානා** සිද්ධ කරමින් **පවත්තති** පවතී **අයං හි** මේ මනෝද්වාරාවර්ජන චිත්තය **තීසු භවේසු** කාම-රූප-අරූප භවයන්හි **කස්සචි සචිත්තකපුග්ගලස්ස** කිසියම් සචිත්තක පුග්ගලෙකුට **කිස්මිඤ්චි විසයේ** කිසියම් අරමුණෙක්හි **න උප්පජ්ජති** නූපදින්නේ **න** නොවේ (උපදින්නේමය) **ඒතං චිත්තං** මේ මනෝද්වාරාවර්ජන චිත්තය **සබ්බඤ්ඤුතඤ්ඤාණසදිසං** සර්වඥතා ඥාණය හා සමානය **මහාගමනං නාම** මහත් අරමුණු ඇත්තෙක් නම් වෙයි **ඉති (එතථ)** මෙහි **අයං විසේසෝ** මේ විශේෂයයි. **[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

## අහේතුක ක්‍රියා චිත්තයන්ගේ ලක්‍ෂණාදිය:—

තත්ථ චක්ඛුවිඤ්ඤාණාදිපුරේචරරූපාදිවිජානනලක්ඛණා **මනෝධාතු,** ආවජ්ජනරසා, රූපාදිඅභිමුඛභාවපච්චුපට්ඨානා, භවඞ්ගවිච්ඡේදපදට්ඨානා, සා උපෙක්ඛායුත්තාව හෝති.

මනෝවිඤ්ඤාණධාතු පන දුවිධා සාධාරණා අසාධාරණා ච තත්ථ සාධාරණා උපෙක්ඛාසහගතාහේතුකකිරියා සළරම්මණවිජානනලක්ඛණා, කිච්චවසේන පඤ්චද්වාරමනෝද්වාරේසු වොට්ඨබ්බනාවජ්ජන රසා, තථාභාවපච්චුපට්ඨානා, අහේතුකවිපාකමනෝවිඤ්ඤාණධාතු භවඞ්ගානං අඤ්ඤතරාපගම පදට්ඨානා. අසාධාරණා සෝමනස්සසහගතාහේතුකකිරියා සළාරම්මණවිජානනලක්ඛණා, කිච්චවසේන අරහතං අනුළාරේසු වත්ථූසු හසිතුප්පාදනරසා, තථාභාවපච්චුපට්ඨානා, ඒකන්තතෝ හදයවත්ථුපදට්ඨානාති. ඉති කාමාවචරකිරියං අහේතුකං තිවිධං.
**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 454 යටතේ); විසුද්ධිමග්ග අටුවා 341 පිට (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය විඤ්ඤාණස්කන්ධය 204 පිට (තායිවාන් මුද්‍රණය); මොක්පුර රන්දෙර 02/266-274-284 පිටු]**

මනෝවිඤ්ඤාණතෝ උප්පජ්ජනවිසිට්ඨමනනකිච්චානං අභාවතෝ මනෝමත්තා ධාතු **මනෝධාතු**.

**සාධාරණාති** සෙක්ඛාසෙක්ඛපුථුජ්ජනානං සාධාරණා. **අසාධාරණාති** අසෙක්ඛානංයේව ආවේණිකා. **වොට්ඨබ්බනාවජ්ජනරසාති** පඤ්චද්වාරේ සන්තීරණේන ගහිතාරම්මණං වවත්ථපෙන්තී විය පවත්තනතෝ වොට්ඨබ්බනරසා,

මනොද්වාරේ පන වුත්තනයේන ආවජ්ජනරසා. තථාභාවේන පඤ්චද්වාරමනෝද්වාරේසු යථාක්කමං වොට්ඨබ්බනාවජ්ජනභාවේන පච්චුපතිට්ඨතීති **තථාභාවපච්චුපට්ඨානා**. වොට්ඨබ්බනකාලේ සන්තීරණකිච්චානං තිස්සන්නං අහේතුකවිපාකමනෝවිඤ්ඤාණධාතූනං ආවජ්ජනකාලේ යස්ස කස්සචි භවඞ්ගස්සාති ඉමේසං අඤ්ඤතරාපගමෝ ඒතිස්සා ආසන්නකාරණන්ති ආහ **"අහේතුක…පෙ…. පදට්ඨානා"**ති.

**අරහත**න්ති අරහතංයේව අසාධාරණභාවතෝ. **අනුළාරේසූ**ති අට්ඨිකසඞ්ඛලිකපේතරූපාදීසු, අඤ්ඤේසු වා අප්පණීතේසු වත්ථූසු. **හසිතුප්පාදනරසා**ති හසිතස්සේව උප්පාදනරසා. තථා හි තං චිත්තං "හසිතුප්පාදන"න්ත්වේව වුච්චති, න අඤ්ඤේසං හසිතුප්පාදකචිත්තානං අභාවතෝ. අඤ්ඤානිපි හි ද්වාදස සෝමනස්සසහගතානි පරිත්තකුසලාකුසලකිරියචිත්තානි යථාරහං පුථුජ්ජනාදීනං හසිතුප්පාදකානි විජ්ජන්ති, ඉදං පන චිත්තං විචාරණපඤ්ඤාවිරහිතං පරිත්තේසු අප්පණීතේසු ආරම්මණේසු අරහන්තානං සෝමනස්සමත්තං උප්පාදෙන්තං උප්පජ්ජති. භගවතෝපි උප්පජ්ජතීති අට්ඨකථායං වුත්තං, තං අතීතංසාදීසු අප්පටිහතඤාණං වත්වා "ඉමේහි තීහි ධම්මේහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතෝ සබ්බං කායකම්මං ඤාණපුබ්බඞ්ගමං ඤාණානුපරිවත්තී"ති (මහානි. 69; චූළනි. මොඝරාජමාණවපුච්ඡානිද්දෙස 85; පටි. ම. 3.5) වචනතෝ විචාරේතබ්බන්ති ඒකේ. තත්ථ හසිතුප්පාදචිත්තේන පවත්තියමානම්පි භගවතෝ සිතකරණං පුබ්බේනිවාසානාගතංසසබ්බඤ්ඤුතඤ්ඤාණානං අනුවත්තකත්තා ඤාණානුපරිවත්තියේවාති ඒවං පන ඤාණානුපරිවත්තිභාවේ සති න කෝචි පාළිඅට්ඨකථානං විරෝධෝ. ඒවඤ්ච කත්වා අට්ඨකථායං "තේසං ඤාණානං චිණ්ණපරියන්තේ ඉදං චිත්තං උප්පජ්ජතී"ති වුත්තං. අවස්සඤ්ච ඒතං ඒවං ඉච්ඡිතබ්බං, අඤ්ඤථා අඤ්ඤස්සාපි විඤ්ඤත්තිසමුට්ඨාපකස්ස අහේතුකචිත්තස්ස භගවතෝ උප්පත්ති න යුජ්ජේය්‍ය. න හි විඤ්ඤත්තිසමුට්ඨාපකස්ස තං සමුට්ඨිතාය විඤ්ඤත්තියා කායකම්මාදිභාවං ආපජ්ජනභාවෝ විබන්ධතීති. **ඒකන්තතෝ හදයවත්ථුපදට්ඨානා** පඤ්චවෝකාරභවේ ඒව උප්පජ්ජනතෝ. **[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 454)]**

**තත්ථ (කිරියාවිඤ්ඤාණේසු)** ඒ ක්‍රියා විඤ්ඤාණයන් අතරින් **මනෝධාතු** මනෝධාතු නම් වූ පඤ්චද්වාරාවර්ජන චිත්තය තුමූ **චක්ඛුවිඤ්ඤාණාදිපුරේචර** චක්ෂුර්විඤ්ඤාණාදීනට පුරේචාරීව **රූපාදිවිජානනලක්ඛණා** රූපාදී ආලම්බනයන්ගේ දැනීම ලක්‍ෂණ කොට ඇත්තීයි **ආවජ්ජනරසා** චිත්තසන්තානය රූපාදී අරමුණට නැමීම කෘත්‍යය කොට ඇත්තීයි නොහොත් චිත්ත සන්තානය පූර්වාකාරයෙන් පෙරලා අනික් ආකාරයකින් නැමීම කෘත්‍යය කොට ඇත්තීයි **රූපාදිඅභිමුඛභාවපච්චුපට්ඨානා** රූපාදියට අභිමුඛ කිරීම වැටහෙන ආකාරයය **භවඞ්ගවිච්ඡේදපදට්ඨානා** භවඞ්ග සන්තතිය සිඳීම ආසන්න කාරණය කොට ඇත්තීයි "උපෙක්ඛායුත්තාව හෝති" යි අපූර්වාලම්බනයෙහි එකවටම පවත්නීනුයි සර්වාකාරයෙන් විෂයරස අනුභවකට නොහේනුයි ඉෂ්ටාදී සියළු ගෝචරයෙහිම උපේක්‍ෂා සහගතම වෙයි.

මෝ වනාහි මනෝවිඤ්ඤාණයෙන් උත්පන්න වීද විශේෂ මනනකෘත්‍යයක් නැති බැවින් "මනෝමත්තාධාතු මනෝධාතු" යනු වේ. එහෙයින්ම මනෝවිඤ්ඤාණයට ප්‍රත්‍යය නොවේ. මේ මෙහි සංක්‍ෂේපයයි. විස්ථාරය වනාහි ධාතු නිර්දේශයෙහි එන්නේයි.

**මනෝවිඤ්ඤාණධාතු පන** මනෝවිඤ්ඤාණ ධාතු තුමූ වනාහි **සාධාරණා ච** සාධාරණ ද **අසාධාරණා ච** අසාධාරණ දැයි **දුවිධා** දෙවැදෑරුම් වේ **තත්‍ථ** ඒ දෙසිත අතුරින් **සාධාරණා** සාධාරණ මනෝවිඤ්ඤාණ ධාතු තුමූ නොහොත් **උපෙක්ඛාසහගතාහේතුකකිරියා** උපේක්‍ෂාසහගත අහේතුක ක්‍රියා මනෝවිඤ්ඤාණ ධාතුව **සළාරම්මණවිජානනලක්ඛණා** ෂඩාලම්බනය දැනගැනීම ලක්‍ෂණ කොට ඇත්තිය **කිච්චවසේන** කෘත්‍යය වශයෙන් **පඤ්චද්වාරේ** පඤ්චද්වාරයෙහි **වොට්ඨබ්බන (රසා)** වොත්‍ථපන කෘත්‍යය හා **මනෝද්වාරේ** මනෝද්වාරයෙහි **ආවජ්ජන රසා** ආවර්ජන කෘත්‍යය ඇත්තිය **තථාභාවපච්චුපට්ඨානා** ඒ කෘත්‍යයවත් ස්වභාවයෙන්ම වැටහෙන ආකාර ඇත්තිය **අහේතුකවිපාක මනෝවිඤ්ඤාණධාතු** පඤ්චද්වාරයෙහි තෙවැදෑරුම් සන්තීරණ චිත්තයන්ගේ ද **භවඞ්ගානං** මනෝද්වාරයෙහි භවඞ්ගයාගේ ද යන **අඤ්ඤතරාපගම** චිත්තයන් දෙදෙනාගෙන් එක් චිත්තයකගේ අපගමය **පදට්ඨානං** ආසන්න කාරණායය෴

**සාධාරණා** ශෛක්‍ෂාශෛක්‍ෂ පෘථග්ජනයනට සාධාරණයහ **අසාධාරණා** අශෛක්‍ෂයනටම වන හෙයින් අසාධාරණයහ (ආවේණිකය යන අර්ථයි) **වොට්ඨබ්බනාවජ්ජනරසා** පඤ්චද්වාරයෙහි සන්තීරණයා විසින් ගන්නාලද අරමුණ නිශ්චය කෙරෙමින් මෙන් පවත්නා හෙයින් ව්‍යවස්ථාපන කෘත්‍යය වෙයි. මනෝද්වාරයෙහි වනාහි උක්තනයින් ආවර්ජන කෘත්‍යයි **තථාභාවපච්චුපට්ඨානා** පඤ්චද්වාර මනෝද්වාරයෙහි යථාක්‍රමයෙන් ව්‍යවස්ථාපන ආවර්ජන භාවයෙන් වැටහෙන්නීයි ව්‍යවස්ථාපන කාලයෙහි සන්තීරණ කෘත්‍යය වූ තුන් අහේතුක විපාක මනෝවිඤ්ඤාණ ධාතූන්ගේ ද ආවර්ජන කාලයෙහි යම්කිසි භවඞ්ගයෙකුගේ ද යන මොහුන් කෙරෙන් අන්‍යතරයක්හුගේ ව්‍යුපගමය මෝහට ආසන්න කාරණනුයි "අහේතුක -පෙ- පදට්ඨානා" යි කීහු෴

**අසාධාරණා** අසාධාරණ මනෝවිඤ්ඤාණධාතුතුමූ **සෝමනස්සසහගතාහේතුක කිරියා** සොම්නස් සහගත හසන චිත්තය **සළාරම්මණවිජානනලක්ඛණා** ෂඩාලම්බනය දැනීම් ලක්‍ෂණ ඇත්තිය **කිච්චවසේන** කෘත්‍යය වශයෙන් **අරහතං** රහතුන්ට **අනුළාරේසු වත්‍ථූසු** අනෞදරික ආලම්බනයෙහි **හසිතුප්පාදනරසා** සිනහා ඉපදවීම කෘත්‍යය කොට ඇත්තිය **තථාභාවපච්චුපට්ඨානා** ඒ කෘත්‍යයවත් ස්වභාවයෙන් වැටහෙන ආකාර කොට ඇත්තිය **ඒකන්තතෝ** ඒකාන්තයෙන් **හදයවත්‍ථුපදට්ඨානා** හෘදයවස්තුව ආසන්න කාරණය කොට ඇත්ති **ඉති (හෝති)** වෙයි෴

"අරහතං" යනු අසාධාරණ බැවින් "අරහතං යේව" යනාර්ථයි. **අනුළාරේසු වත්‍ථූසු** අට්ඨිසඞ්කලික ප්‍රේතරූපාදී වස්තූන් කෙරෙහිදු සෙසු අප්‍රණීත වස්තුවෙහිදු **හසිතුප්පාදනරසා** මන්දස්මිතයම ඉපදවීම කෘත්‍යය කොට ඇත්තීයි එසේ හෙයින්ම ඒ චිත්තය හසිතුප්පාදය යැයි කියනු ලැබේ. සෙසු හසිතෝත්පාද චිත්තයන් නැති හෙයින් නොවේ. ඒ එසේමැයි; අනිකුදු සොම්නස්සහගියාවූ කාමාවචර කුසලාකුසල ක්‍රියා චිත්තයෝ දෙළොස්දෙන යථායෝගයෙන් පුහුදුන් ආදීනට සිනහා උපදවන්නාහ. මේ සිත වනාහි විචාරණ පඥා රහිතවූයේ කාමාවචර අප්‍රණීතාලම්බනයෙහි රහත්හට ස්මිතමාත්‍රයක් උපදවමින් උපදනේයි. භාග්‍යවතුන් වහන්සේට ද උපදනේ යයි අර්ථකථාවෙහි කියනලදි. හේ වචනය අතීතංශාදීයෙහි අප්‍රතිහතඥාණය කියා "ඉමේහි තීහි ධම්මේහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතෝ සබ්බං කායකම්මං ඤාණපුබ්බඞ්ගමං ඤාණානුපරිවත්තතී" යි වදළ බැවින් විචාරණීය යයි ඇතැම් ආචාර්‍ය්‍යවරයෝ කියත්. මෙහි හසිතෝත්පාද චිත්තයෙන් පවත්වනු ලබන භගවත්හුගේ ස්මිතකරණය පූර්වේනිවාසඤාණ අනාගතංසඤාණ සර්වඥතාඥාණයනට අනුව

පවත්නෙන් ඣදණානුපරිවත්තිීම වෙයි. මෙසේ ඣදණානුපරිවර්තිත්වය ඇති කල්හි පාළි අර්ථකථාවන්ගේ කිසි විරෝධයෙක් නොවන්නේයි. එහෙයින් අර්ථකථාවෙහි "තේසං ඣදණානං චිණ්ණපරියන්තේ ඉදං චිත්තං උප්පජ්ජති" යි කියනලදි. අවශ්‍යයෙන්ම මෙය මෙසේම පැසැස්ස යුත්තේය. නොඑසේවුව සෙසු විඥප්ති සමුත්ථාපක චිත්තයාගේ ද ඒ සිතින් උපදවන ලද විඥප්තිහුගේ කාය කර්මාදි භාවයට පැමිණෙන බවද බාධා නොකරන්නේමැයි. ඒකන්තතෝ හදයවත්ථුපදට්ඨානා පඤ්චවෝකාර භවයෙහිම උපදනා හෙයින් ඒකාන්තයෙන් හෘදයවස්තුව ආසන්න කාරණා කොට ඇත්තීයි. [විසුද්ධි මාර්ග මහා සන්නය 1100-1101 පිටු]

ලක්ඛණාදිතෝ පනේතාසු පුරිමං චක්ඛුවිඤ්ඤණාදීනං පුරේචරං රූපාදිවිජානනලක්ඛණං, ආවජ්ජනරසං, තථාභාවපච්චුපට්ඨානං, භවඞ්ගවිච්ඡේදපදට්ඨානං. දුතියං ඡළාරම්මණවිජානනලක්ඛණං, අරහතං අනෝළාරිකේසු වත්ථූසු හසිතුප්පාදරසං, තථාභාවපච්චුපට්ඨානං, ඒකන්තතෝ හදයවත්ථුපදට්ඨානං. තතියම්පි ඡළාරම්මණවිජානනලක්ඛණං, පඤ්චද්වාරමනෝද්වාරේසු වොට්ඨබ්බනාවජ්ජනරසං, තථාභාවපච්චුපට්ඨානං, අහේතුකවිපාකමනෝවිඤ්ඤණධාතුභවඞ්ගානං අඤ්ඤතරාපගමපදට්ඨානන්ති.
[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 55 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 184 පිට]

ලක්‍ෂණාදීන්ගේ වශයෙන් වනාහි ඔහුන් අතුරෙන් පළමුවෙනි ආවර්ජන සිත චක්ඛුවිඤ්ඤණාදීන්ට පෙරටු වී රූපාදී අරමුණු ගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය. ආභෝග කිරීම කෘත්‍යය කොට ඇත්තේය. එසේබව ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය. භවඞ්ග සන්තතිය සිඳීම ආසන්න කාරණා කොට ඇත්තේය. දෙවෙනි හසිතෝත්පාද සිත සාරමුණ දැනගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය. රහතුන්ට සියුම් වූ අරමුණෙහි නොහොත් අට්ඨිසඞ්කලික ප්‍රේතරූප ආදී වූ හෝ අන්‍යවූ හෝ අප්‍රණීත වස්තුවෙහි සිනහ ඉපදවීම කෘත්‍යය කොට ඇත්තේය. එසේබව ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය. පඤ්චවෝකාර භවයෙහිම උපදනා හෙයින් ඒකාන්තයෙන් හෘදයවස්තුව ආසන්න කාරණා කොට ඇත්තේය. තුන්වෙනි ව්‍යවස්ථාපන සිත ද සාරමුණු දැණගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය. පඤ්චද්වාරයෙහි සන්තීරණ සිතින් ගන්නාලද අරමුණ නියම කරන්නාක් මෙන් හටගැනීම හා මනෝද්වාරයෙහි අරමුණ ආභෝග කිරීම ද කෘත්‍යය කොට ඇත්තේය. පඤ්චද්වාර මනෝද්වාරයන්හි පිළිවෙළින් ව්‍යවස්ථාපන භාවය ආවර්ජන භාවය ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය. ව්‍යවස්ථාපන කාලයෙහි සන්තීරණ කෘත්‍යය ඇති අහේතුක විපාක මනෝවිඤ්ඤණ ධාතු තුන්දෙන ද ආවර්ජන කාලයෙහි යම්කිසි භවඞ්ගුපච්ඡේදයක් දැයි යන මොවුන් අතුරෙන් එක්තරා සිතක්හුගේ පහළවීම ආසන්න කාරණා කොට ඇත්තේය. [අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 155 පිට]

## අහේතුක ක්‍රියා සිත් උපදින ආකාරයඃ—

ඉදං පන පඤ්චද්වාරේ වළඤ්ජනකප්පවත්තිකාලේ සබ්බේසං පුරේ උප්පජ්ජති. කථං? චක්ඛුද්වාරේ තාව ඉට්ඨඉට්ඨමජ්ඣත්ත-අනිට්ඨඅනිට්ඨමජ්ඣත්තේසු රූපාරම්මණේසු යේන කේනචි පසාදේ ඝට්ටිතේ තං ආරම්මණං ගහෙත්වා ආවජ්ජනවසේන පුරේචාරිකං හුත්වා භවඞ්ගං ආවට්ටයමානං උප්පජ්ජති. සෝතද්වාරාදීසුපි ඒසේව නයෝති.

[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 566 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 257 පිට (හේ.වි.මු)]

**ඉදං පන** මේ පඤ්චද්වාරාවර්ජන චිත්තය වනාහි **පඤ්චද්වාරේ** පඤ්චද්වාරයෙහි **වළඤ්ජනකප්පවත්තිකාලේ** ප්‍රවෘත්ති කාලයෙහි **සබ්බේසං** සියළු චිත්තයන්ට **පුරේ** පෙර **උප්පජ්ජති** උපදී **කථං?** කෙසේ ද? **තාව** පළමුව **චක්ඛුද්වාරේ** චක්ෂුර්ද්වාරයෙහි **ඉට්ඨඉට්ඨමජ්ඣත්තඅනිට්ඨඅනිට්ඨමජ්ඣත්තේසු** ඉෂ්ටාරම්මණ වූ ඉෂ්ට මධ්‍යස්ථාරම්මණ වූ අනිෂ්ටාරම්මණ වූ අනිෂ්ට මධ්‍යස්ථාරම්මණ වූ **රූපාරම්මණේසු** රූපාරම්මණයන් අතුරින් (**යං ආරම්මණං** යම් අරමුණක්) **යේන කේනචි පසාදේ** යම්කිසි ප්‍රශාදයක **ඝට්ටිතේ** ගැටුනු කල්හි **තං ආරම්මණං** ඒ අරමුණ **ගහෙත්වා** ගෙන **ආවජ්ජනවසේන** ආවර්ජන වශයෙන් **පුරේචාරිකං හුත්වා** පෙරටුව යන්නෙක් වී **භවඞ්ගං ආවට්ටියමානං** භවඞ්ග චිත්තය පෙරලමින් **උප්පජ්ජති** උපදී **සෝතවිඤ්ඤාණාදීසුපි** ශ්‍රෝත්‍රවිඤ්ඤාණාදියෙහිදු **ඒසේව නයෝ** මේ ක්‍රමයයි.

**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

***උපෙක්ඛාසහගතා***ති ඉදං චිත්තං තීසු භවේසු සබ්බේසං සචිත්තකසත්තානං සාධාරණං, න කස්සචි සචිත්තකස්ස නුප්පජ්ජති නාම. උප්පජ්ජමානං පන පඤ්චද්වාරේ වොට්ඨබ්බනං හෝති, මනෝද්වාරේ ආවජ්ජනං. ඡ අසාධාරණඤාණානිපි ඉමිනා ගහිතාරම්මණමේව ගණ්හන්ති. මහාගජං නාමේතං චිත්තං; ඉමස්ස අනාරම්මණං නාම නත්ථි. ‘අසබ්බඤ්ඤුතඤ්ඤාණං සබ්බඤ්ඤුතඤ්ඤාණගතිකං නාම කතම’න්ති වුත්තේ ‘ඉද’න්ති වත්තබ්බං. සේසමෙත්ථ පුරිමචිත්තේ වුත්තනයේනේව වේදිතබ්බං.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 574 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 258 පිට (හේ.වි.මු)]**

ඉන්ද්‍රියපරෝපරියත්තආසයානුසයසබ්බඤ්ඤුතානාවරණඤාණානි ඉමස්ස අනන්තරං උප්පජ්ජමානානි යමකපාටිහාරියමහාකරුණාසමාපත්තිඤාණානි ච ඉමස්ස අනන්තරං උප්පන්නපරිකම්මානන්තරානි ඉමිනා ආවජ්ජිතාරම්මණේයේව පවත්තන්තීති ආහ **“ඡ…පෙ…. ගණ්හන්තී”**ති. මහාවිසයත්තා මහාගජෝ විය මහන්තන්ති **මහාගජං**. **[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 574 යටතේ)]**

**“ඉන්ද්‍රිය …පෙ…. ඉමස්සානන්තරං උප්පජ්ජමානානී”**ති වුත්තං තේසං ඤාණානං කාමාවචරත්තා. ඉතරේසං මහග්ගතත්තා **“පරිකම්මානන්තරානී”**ති වුත්තං. **[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 574 යටතේ)]**

**උපෙක්ඛාසහගතා ඉති** උපේක්ෂාසහගත යන **ඉදං චිත්තං** මේ මනෝද්වාරාවර්ජන චිත්තය තෙමේ **තීසු භවේසු** කාම-රූප-අරූප භවයන්හි **සබ්බේසං සචිත්තකසත්තානං** චිත්ත සන්තානය ඇති සියළු සත්වයන්ට **සාධාරණං** සාධාරණ වේ **කස්සචි සචිත්තකස්ස** කිසිදු සචිත්තක සත්වයෙකු හට **න නුප්පජ්ජති නාම** නූපදින්නේ නම් නොවෙයි (උපදින්නේමය) **උප්පජ්ජමානං (තං චිත්තං) පන** උපදින්නා වූ ඒ සිත වනාහි **පඤ්චද්වාරේ** පඤ්චද්වාරයෙහි **වොට්ඨබ්බනං නාම හෝති** වොත්ථපන චිත්තය නම් වෙයි **මනෝද්වාරේ** මනෝද්වාරෙහි **ආවජ්ජනං (නාම හෝති)** ආවර්ජන චිත්තය නම් වෙයි **ඡ අසාධාරණඤාණානිපි** අසාධාණ ඤාණ සය ද **ඉමිනා** මේ මනෝද්වාරාවර්ජන චිත්තය විසින් **ගහිතාරම්මණමේව** ගන්නාලද අරමුණම **ගණ්හන්ති** ගනිත්.

(මේ මනෝද්වාරාවර්ජන චිත්තයට අනතුරුව උපදින්නා වූ ඉන්ද්‍රියපරෝපරියත්ත ඤාණය, ආසයානුසය ඤාණය, සබ්බඤ්ඤුත ඤාණය,

අනාවරණ ඤාණයෝ ද, මේ මනෝද්වාරාවර්ජන චිත්තයට අනතුරුව උපදින පරිකර්මයන්ට අනතුරුව යමකපාටිහාරිය ඤාණය, මහාකරුණාසමාපත්තිය ද යන ඤාණයෝ ද මේ චිත්තය විසින් ආවර්ජනය කරනලද ආරම්මණයෙහිම පවතිත් යනු මූලටීකායි)

(ඉන්ද්‍රියපරෝපරියත්ත ඤාණය, ආසයානුසය ඤාණය, සබ්බඤ්ඤුත ඤාණය, අනාවරණ ඤාණය යන මේ ඤාණයෝ කාමාවචර නම් වෙති. යමකපාටිහාරිය ඤාණය, මහාකරුණාසමාපත්ති ඤාණය යන මොවුහු මහග්ගත නම් වෙති. එහෙයින් **"ඉන්ද්‍රිය** ...පෙ.... **ඉමස්සානන්තරං උප්පජ්ජමානානී"**ති වුත්තං තේසං ඤාණානං කාමාවචරත්තා. ඉතරේසං මහග්ගතත්තා **"පරිකම්මානන්තරානී"**ති අනුටීකායෙහි කියනලදි)

**ඒතං චිත්තං** මේ චිත්තය වනාහි **මහාගජං නාම** මහත් අරමුණු ඇති බැවින් මහා ඇතෙක් නම් **ඉමස්ස** මේ චිත්තයට **අනාරම්මණං නාම නත්ථි** ආරම්මණයක් නම් නැත්තේ නොවෙයි (ඇත්තේමය) **සබ්බඤ්ඤුතඤ්ඤාණගතිකං** සර්වඥතා ඤාණ ගතික වූ **අසබ්බඤ්ඤුතඤ්ඤාණං නාම** අසර්වඥතා ඤාණය නම් **කතමං ඉති?** කුමක් දැයි? **වුත්තේ** ඇසූ කල්හි **ඉදං (චිත්තං) ඉති** මේ මනෝද්වාරාවර්ජන චිත්තයයි **වත්තබ්බං** කියයුතුයි **එත්ථ** මෙහි **සේසං** සෙස්ස **පුරිමචිත්තේ** පෙර සිතෙහි **වුත්තනයේනේව** කියනලද නයින්ම **වේදිතබ්බං** දතයුතුයි.

**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

චක්ඛාදිපඤ්චද්වාරේ ඝට්ටිතමාරම්මණං ආවජ්ජේති තත්ථ ආභෝගං කරෝති, චිත්තසන්තානං වා භවඞ්ගවසේන පවත්තිතුං අදත්වා වීථිචිත්තභාවාය පරිණාමේතීති **පඤ්චද්වාරාවජ්ජනං,** කිරියාහේතුකමනෝධාතුචිත්තං. ආවජ්ජනස්ස අනන්තරපච්චයභූතං භවඞ්ගචිත්තං මනෝද්වාරං වීථිචිත්තානං පවත්තිමුඛභාවතෝ. තස්මිං දිට්ඨසුතමුතාදිවසේන ආපාථමාගතමාරම්මණං ආවජ්ජේති, වුත්තනයේන වා චිත්තසන්තානං පරිණාමේතීති **මනෝද්වාරාවජ්ජනං,** කිරියාහේතුක මනෝවිඤ්ඤාණධාතුඋපෙක්ඛාසහගතචිත්තං. ඉදමේව ච පඤ්චද්වාරේ යථාසන්තීරිතං ආරම්මණං වවත්ථපේතීති වොට්ඨබ්බනන්ති ච වුච්චති. හසිතං උප්පාදේතීති **හසිතුප්පාදං,** ඛීණාසවානං අනෝළාරිකාරම්මණේසු පහට්ඨාකාරමත්තහේතුකං කිරියාහේතුකමනෝවිඤ්ඤාණධාතු සෝමනස්සසහගත චිත්තං. **[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ); විභාවනි ටීකා සන්නය 48 පිට]**

**චක්ඛාදිපඤ්චද්වාරේ** චක්‍ෂුරාදී පඤ්චද්වාරයෙහි **ඝට්ටිතං** ගැටුනා වූ **ආරම්මණං** අරමුණ **ආවජ්ජේති** මෙනෙහි කෙරේද **තත්ථ** ඒ අරමුණෙහි **ආභෝගං** මෙනෙහි කිරීම **කරෝති** කෙරේද **ඉති (තස්මා) තං චිත්තං** ඒ සිත් තෙමේ **පඤ්චද්වාරාවජ්ජනං** පඤ්චද්වාරාවර්ජන නම් වේ **වා** නොහොත් **යං (චිත්තං)** යම් සිතක් තෙමේ **පඤ්චද්වාරේ** පඤ්චද්වාරයෙහි **පවත්තං** හටගත්තා වූ **චිත්තසන්තානං** චිත්තයන්ගේ පරම්පරාව **භවඞ්ගවසේන** භවාඞ්ග චිත්තයාගේ වශයෙන් **පවත්තිතුං අදත්වා** හටගැනීමට නොදී **වීථිචිත්තභාවාය** වීථිචිත්තයන්ගේ හටගැනීම පිණිස **ආවත්තති (පරිනාමේති)** පරිනමන්නේ වේද (නියෝග කරන්නේ යැයි කී නියායි) **ඉති (තස්මා) තං චිත්තං** ඒ සිත් තෙමේ **පඤ්චද්වාරාවජ්ජනං** පඤ්චද්වාරාවර්ජන නම් වේ **ක්‍රියාහේතුකමනෝධාතුචිත්තං** ක්‍රියාහේතුකමනෝධාතු චිත්තය (**ලබ්භති** ලැබෙයි අවපුන් සිත් තෙමේ ඤාණාවර්ජනය වලක්වන පිණිසත්

ආභෝගාවර්ජනය ගන්නා පිණිසත් "ආවජ්ජේති" යන්න "තත්‍ථ ආභෝගං කරෝති" යි වර්ණනා කරනලදි)

**ආවජ්ජනස්ස** ආවර්ජන යුගලයට **අනන්තරපච්චයභූතං** අනන්තර ප්‍රත්‍යය වූ **භවඞ්ගචිත්තං** භවාඞ්ග සිත් තෙමේ **වීථිචිත්තානං** වීථිචිත්තයන්ගේ **පවත්තිමුඛභාවතෝ** හටගැන්මට ද්වාර වන හෙයින් **මනෝද්වාරං** මනොද්වාර නම් වේ (භවඞ්ගුපච්ඡේද යැයි කී නියායි) "මනෝ ඒව ද්වාරං මනෝද්වාරං" යි අවධාරණ කම්මධාරයසමාස කටයුතුයි **යං (චිත්තං)** යම් සිතක් තෙමේ **තං** ඒ මනෝද්වාරයෙහි **දිට්ඨසුතමුතාදිවසේන** දුටුවිරූ ඇසූවිරූ ද ඝානාදී ත්‍රිවිධ විඥ්ඥාණයන් කරණකොටගෙන දැනගන්නාලදවිරූ ද යනාදීන්ගේ වශයෙන් **ආපාථං** හමුබවට **ආගතං** පැමිණියා වූ **ආරම්මණං** අරමුණ **ආවජ්ජේති** මෙනෙහි කෙරේ ද **වා** නොහොත් **වුත්තනයේන** කියනලද ක්‍රමයෙන් **චිත්තසන්තානං** චිත්ත පරම්පරාව **පරිනාමේති** පිරිනමන්නේ වේද (පෙරලෙන්නේ යැයි කී නියායි) **ඉති (තස්මා) තං චිත්තං** ඒ සිත් තෙමේ **මනෝද්වාරාවජ්ජනං** මනෝද්වාරාවර්ජන නම් වේ **ක්‍රියාහේතුකමනෝවිඤ්ඤාණධාතු උපෙක්ඛසහගතචිත්තං** ක්‍රියාහේතුක මනෝවිඤ්ඤාණ ධාතු උපේක්ෂා සහගත ක්‍රියා චිත්තය (**ලබ්භති** ලැබෙයි) (වුත්තනයේන යන පදයෙන් "භවඞ්ගවසේන පවත්තිතුං අදත්වා වීථිචිත්තභාවාය" යන පාඨය ආවර්ථනය කරනලදි)

**ඉදමේව චිත්තං** මේ මනෝද්වාරාවර්ජන සිතම **පඤ්චද්වාරේ** පඤ්චද්වාරයෙහි **යථා සන්තීරිතං** සන්තීරණ චිත්තය විසින් විමසන ලද්දවූ **ආරම්මණං** අරමුණ **වවත්ථපේති** නියම කෙරේ ද **ඉති (වචනත්ථේන)** මේ වචනාර්ථයෙන් **වොට්ඨබ්බනන්ති ච** ව්‍යවස්ථාපන චිත්තය යැයිද **වුච්චති** කියනු ලැබේ **යං (චිත්තං)** යම් සිතක් තෙමේ **හසිතං** සිනහව උප්පාදේති උපදවා ද **ඉති (තස්මා) තං චිත්තං** ඒ සිත් තෙමේ **හසිතුප්පාදං** හසිතෝත්පාද නම් වේ **ඛීණාසවානං** රහතුන්ට **අනෝළාරිකාරම්මණේසු** කුඩා වූ අරමුණෙහි (නොහොත් ලාකේ වූ අස්ථිසඞ්කලික ප්‍රේතාදී වූ රූපාරමුණෙහි) **පහට්ඨාකාරමත්තහේතුකං** පහටු ආකාර මාත්‍රයකට හේතු වූ **ක්‍රියාහේතුකමනෝවිඤ්ඤාණධාතු සෝමනස්සසහගතචිත්තං** ක්‍රියාහේතුක මනෝවිඤ්ඤාණ ධාතු සොම්නස් සහගත චිත්තය (**ලබ්භති** ලැබෙයි)

(අනෝළාරිකාරම්මණේසු යන්නෙහි පළමුවන අර්ථ යෝජනාව "අනෝළාරිකාරම්මණේසූති" "සුඛුමාරම්මණේසු" යන මණිසාරමඤ්ජුසා ටීකා පාඨයට ද දෙවෙනි අර්ථ යෝජනාව "අනෝළාරිකාරම්මණේසූති අනුළාරිකාරම්මණේසු අට්ඨිසඞ්කලිකපේතරූපාදීසු අඤ්ඤේසු වා අප්පණීතවත්ථූසු" යන පාඨයට ද අනුව දක්වනලදි. සිත, හසිත, විහසිත, උපසිත, අවහසිත, අතිහසිත යන සය වැදෑරුම් සිනහවන් අතරින් මෙතැන්හි සිත, හසිතයම ගතයුතු බව දක්වන පිණිස "පහට්ඨාකාරමත්තහේතුකං" යන විශේෂණය කියනලදි. සොම්නස් සහගත භාවයෙන් ලැබියයුතු බව දක්වන පිණිස "සෝමනස්සසහගතං" යන විශේෂණය කරනලදි. සෝමනස්ස සහගත සිත් අතුරෙනුදු මනෝවිඤ්ඤාණ ධාතු වශයෙන් ලැබියයුතු බව දක්වන පිණිස "මනෝවිඤ්ඤාණධාතු" යන විශේෂණය ද කියනලදි. සෞමනස්‍යය වනාහි කුසල පක්‍ෂයෙහිද ලැබියයුතු බැවින් කුසල සෞමනස්‍යය වලක්වනු පිණිස ක්‍රියා විශේෂනය කියනලදි. අහේතුක යන විශේෂණයෙන් සහේතුකය වැලක්වූහු)

**[විභාවනී ටීකා සන්නය 83-84 පිටු]**

චක්ඛාදිකෙ පඤ්චද්වාරෙ උප්පන්නං ආවජ්ජනං **පඤ්චද්වාරාවජ්ජනං,** තඤ්හි පඤ්චද්වාරෙ ඝට්ටිතං ආරම්මණං ගහෙත්වා ආවජ්ජනං උප්පජ්ජතීති. භවඞ්ගසඞ්ඛාතෙ මනොද්වාරෙ උප්පන්නං ආවජ්ජනං **මනොද්වාරාවජ්ජනං**. තඤ්හි තස්මිං ආපාතං ආගච්ඡන්තං ආරම්මණං ගහෙත්වා ආවජ්ජන්තං පවත්තතීති. එත්ථ ච මනොද්වාරන්ති සකලං භවඞ්ගචිත්තං දට්ඨබ්බං.

යංපන **ටීකායං** තාව "මනොද්වාරන්ති එත්ථ ආවජ්ජනස්ස අනන්තර පච්චයභූතං භවඞ්ගචිත්තං මනොති වුච්චති. තදෙව ද්වාරං ආවජ්ජනජවනාදි වීථිචිත්තපවත්තියා මුඛත්තා"ති වුත්තං.

යඤ්ච **විභාවනියං** "ආවජ්ජනස්ස අනන්තර පච්චයභූතං භවඞ්ගචිත්තං මනොද්වාරං, වීථිචිත්තානං පවත්තිමුඛභාවතො"ති වුත්තං. තං සබ්බංපි න යුජ්ජතියෙව.

යදි හි යස්ස භවඞ්ගස්ස අනන්තරං වීථිචිත්තානි පවත්තන්ති. තදෙව ඒකන්තෙන තෙසං පවත්තිමුඛත්තා මනොද්වාරං නාම හොති. න තතො පුරිමානීති අයමත්ථො සියා. ඒවඤ්ච සති යෙසු චක්ඛාදීසු රූපාදීනං ඝට්ටිතත්තා ආවජ්ජනාදීනි වීථිචිත්තානි පවත්තන්ති. තානෙව ඒකන්තෙන තෙසං පවත්තිමුඛත්තා ද්වාරානි නාම හොන්ති. න තතො අඤ්ඤානීති අයමත්ථො ආපජ්ජති. න ච තානි චක්ඛාදීනි නාම අත්ථි. යානි චක්ඛාදීනි ද්වාරරූපානි නාම න හොන්තීති. සබ්බමෙතං උපරි ද්වාරසඞ්ගහෙ ආවිභවිස්සතීති. හසනං හසිතං. මුඛස්ස පහට්ඨාකාරප්පවත්ති. තං උප්පාදෙති ජනෙතීති **හසිතුප්පාදො**. තං වා උප්පාදෙන්ති ඛීණාසවා ඒතෙනාති හසිතුප්පාදො. තං වා උප්පජ්ජති ඒතෙනාති හසිතුප්පාදො. සො ඒව චිත්තන්ති සමාසො. ඛීණාසවා නං අනොළාරිකෙසු ආරම්මණෙසු යෙන චිත්තෙන සිතං පාතුකරොන්ති, තස්සෙතං නාමං. න හි ඛීණාසවා ලොකිය මහාජනා විය රජ්ජනීයාදි භාවෙන ඕළාරිකෙසු හසනිය වත්ථූසු හසන්තීති. ටීකාසු පන චිත්තං අපෙක්ඛිත්වා හසිතුප්පාදන්ති නිද්දිට්ඨං සියාති. **[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 35 යටතේ)]**

"පඤ්චද්වාරෙ උප්පන්න"න්ති පඤ්චද්වාරවිකාරං පටිච්ච උප්පන්නත්තා වුත්තං. තෙනාහ "තඤ්හී"ති ආදිං. ඒසනයො මනොද්වාරාවජ්ජනෙපි.

යදි හි අයමත්ථො සියා, ඒවඤ්ච සති, අයමත්ථො ආපජ්ජතීති සම්බන්ධො. "තෙස"න්ති වීථිචිත්තානං. උප්පාදසද්දො නියතපුල්ලිඞ්ගොති කත්වා "ටීකාසු පන…පෙ…. නිද්දිට්ඨං" සියාති වුත්තං. **[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 35 යටතේ)]**

**චක්ඛාදිකෙ පඤ්චද්වාරෙ** චක්ෂුරාදී පඤ්චද්වාර වීථියෙහි **උප්පන්නං ආවජ්ජනං** උපදිනලද ආවර්ජන සිත **පඤ්චද්වාරාවජ්ජනං** පඤ්චද්වාරාවර්ජන සිත නම් **පඤ්චද්වාරෙ** පඤ්චද්වාරයෙහි **ඝට්ටිතං ආරම්මණං** ගැටෙනලද ආරම්මණය **ගහෙත්වා** ගෙන **තඤ්හි ආවජ්ජනං** ඒ ආවර්ජන සිත **උප්පජ්ජතීති** උපදීනුයි (**පඤ්චද්වාරාවජ්ජනං** පඤ්චද්වාරාවර්ජන නම්) **භවඞ්ගසඞ්ඛාතෙ** භවඞ්ග සඞ්ඛ්‍යාත **මනොද්වාරෙ** මනොද්වාරයෙහි **උප්පන්නං ආවජ්ජනං** උපදිනලද ආවර්ජන සිත **මනොද්වාරාවජ්ජනං** මනොද්වාරාවර්ජන සිත නම් **තඤ්හි** ඒ සිත වනාහි **තස්මිං** ඒ මනොද්වාරයෙහි **ආපාතං ආගච්ඡන්තං** ආපාතයට පැමිණෙන්නා වූ **ආරම්මණං ගහෙත්වා** අරමුණ ගෙන **ආවජ්ජන්තං** ආවර්ජන කෘත්‍යයවත්ව **පවත්තති**

**(උප්පජ්ජති)** උපදි **එතථ ච** මෙහි ද **මනෝද්වාරං ඉති** මනෝද්වාරය යනු **සකලං භවඞ්ගචිත්තං** සියළු භවඞ්ගසිතයි **දට්ඨබ්බං** දතයුතුයි.

**ටීකායං** ටීකාවෙහි **තාව** පළමුව **මනෝද්වාරං ඉති එතථ** මනෝද්වාරං යන මෙහි **ආවජ්ජනස්ස** ආවර්ජන චිත්තයට **අනන්තරපච්චයභූතං** අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන **භවඞ්ගචිත්තං** භවඞ්ග චිත්තය **මනෝ ඉති** මන යැයි **වුච්චති** කියනු ලැබේ **තදේව ද්වාරං** ඒ ද්වාරයම **ආවජ්ජනජවනාදි** ආවර්ජන ජවනාදී **වීථිචිත්තපවත්තියා** වීථිචිත්තයන්ගේ පැවැත්ම පිණිස **මුඛත්තා** ප්‍රමුඛ භාවයෙන් යැයි **යං වුත්තං** යමක් කියනලදි ද **ච (තථා)** එසේම **විභාවනියං** විභාවනී ටීකායෙහි **ආවජ්ජනස්ස** ආවර්ජන චිත්තයට **අනන්තරපච්චයභූතං** අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන **භවඞ්ගචිත්තං** භවඞ්ග චිත්තය **වීථිචිත්තානං පවත්තිමුඛභාවතෝ** වීථි චිත්තයන්ගේ පැවැත්මට ප්‍රමුඛ භාවයෙන් **මනෝද්වාරං ඉති** මනෝද්වාරය යැයි **යං වුත්තං** යමක් කියනලදි ද **තං සබ්බං අපි** ඒ කියනලද සියල්ලම **න යුජ්ජතියේව** සුදුසු නොවන්නේමය.

**යදි හි** මෙසේ ඇති කල්හි **යස්ස භවඞ්ගස්ස** යම් භවඞ්ග චිත්තයකට **අනන්තරං** අනතුරුව **වීථිචිත්තානි** වීථි චිත්තයෝ **පවත්තන්ති** පවතිත් ද **ඒකන්තේන** ඒකාන්තයෙන් **තේසං** ඒ වීථිචිත්තයන්ගේ **පවත්තිමුඛත්තා** පැවැත්ම පිණිස ප්‍රමුඛ වන බැවින් **තදේව** ඒ භවඞ්ග චිත්තයම **මනෝද්වාරං නාම හෝති** මනෝද්වාරය නම් වෙයි **තතෝ** එහෙයින් **පුරිමානි** පෙර අර්ථයෝ **න ඉති (හෝති)** නොවෙයි **අයං අත්ථෝ** මේ අර්ථයම **සියා** වන්නේය **ඒවඤ්ච සති** මෙසේ ඇති කල්හි ද **යේසු චක්ඛාදීසු** යම් චක්‍ෂුර් ප්‍රශාදදියෙහි **රූපාදීනං** රූපාදීන්ගේ **ඝට්ටිතත්තා** ගැටෙන බැවින් **ආවජ්ජනාදීනි වීථිචිත්තානි** ආවර්ජනාදි වූ වීථි චිත්තයෝ **පවත්තන්ති (උප්පජ්ජන්ති)** උපදිත් **ඒකන්තේන** ඒකාන්තයෙන් **තේසං** ඒ චිත්තයන්ගේ **පවත්තිමුඛත්තා** පැවැත්මට ප්‍රමුඛ වන බැවින් **තානි ඒව** ඒ ප්‍රශාදයෝම **ද්වාරානි නාම හොන්ති** ද්වාර නම් වෙත් **තතෝ** එහෙයින් **අඤ්ඤදනි** අන්‍ය අර්ථයක් **න** නොවෙයි **අයං අත්ථෝ** මේ අර්ථයම **ආපජ්ජති** පැමිණෙයි **තානි චක්ඛාදීනි නාම** ඒ චක්‍ෂුරාදි ප්‍රශාදයෝ නම් **න ච අත්ථි** ඇත්තේ නොවේ ද **යානි චක්ඛාදීනි ද්වාරරූපානි නාම** යම් චක්‍ෂුද්වාර රූපයෝ නම් **න හොන්ති** නොවෙති **ඒතං සබ්බං** මේ සියල්ල **උපරි** මත්තෙහි **ද්වාරසඞ්ගහේ** ද්වාරසඞ්ග්‍රහයෙහි **ආවිභවිස්සති** එන්නේය **හසනං හසිතං** සිනහව හසිත නම් **මුඛස්ස** මුවගේ **පහට්ඨාකාරප්පවත්ති** ප්‍රීතිමත් වූ ආකාරයගේ පැවැත්මයි **තං** ඒ සිනහව **උප්පාදේති ජනේතීති** උපදවයිනුයි **හසිතුප්පාදෝ** හසිතුප්පාද නම් **වා** නොහොත් **ඛීණාසවා** රහතන් වහන්සේලා **ඒතේන** ඒ චිත්තය කරණකොටගෙන **තං** ඒ සිනහව **උප්පාදෙන්ති** උපදවත්නුයි **හසිතුප්පාදෝ** හසිතුප්පාද නම් **වා** නොහොත් **ඒතේන** ඒ චිත්තය කරණකොටගෙන **තං** ඒ සිනහව **උප්පජ්ජති** උපදීනුයි **හසිතුප්පාදෝ** හසිතුප්පාද නම් **සෝ ඒව** ඒ හසිතුප්පාදයම **චිත්තං ඉති** චිත්තය වූයේනුයි (හසිතුප්පාදචිත්තං) යනු **සමාසෝ** සමාසයයි **ඛීණාසවා** රහතන් වහන්සේලා **අනෝළාරිකේසු ආරම්මණේසු** ලාමක අරමුණයන්හි **යේන චිත්තේන** යම් සිතකින් **නං සිතං** ඒ සිනහව **පාතු කරොන්ති** පහළ කරත් ද **තස්ස** ඒ චිත්තයට **ඒතං නාමං** මේ නමෙකි **හි (සච්චං)** සැබෑවකි **ඛීණාසවා** රහතන් වහන්සේලා **ලොකිය මහාජනා විය** ලෞකික ජනයා මෙන් **රජ්ජනීයාදී භාවේන** රජ්ජනීයාදී භාවයෙන් යුත් **ඕළාරිකේසු හසනිය වත්‍ථූසු** ඖදරික සිනාසිය යුතු වස්තූන්හි **න හසන්ති** සිනහා නොවෙත් **ටීකාසු පන** ටීකාවන්හි වනාහි **චිත්තං** චිත්තය **අපෙක්ඛිත්‍වා** අපේක්‍ෂා කොට **හසිතුප්පාදං ඉති** හසිතුප්පාදය යැයි **නිද්දිට්ඨං සියා** දක්වන ලද්දේ වන්නේය.

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

**අහේතුකකිරියචිත්තං** පන තිවිධං කිරියාහේතුකමනෝධාතු උපෙක්ඛාසහගතාවජ්ජනචිත්තං, කිරියාහේතුකමනෝ විඤ්ඤාණධාතු සෝමනස්සසහගතං හසිතුප්පාදචිත්තං, කිරියාහේතුකමනෝවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතං වොට්ඨබ්බනචිත්තන්ති.

තත්ථ කිරියාහේතුකමනෝධාතු උපෙක්ඛාසහගතා හදයවත්ථුං නිස්සාය චක්ඛුද්වාරේ ඉට්ඨඉට්ඨමජ්ඣත්තඅනිට්ඨඅනිට්ඨමජ්ඣත්තේසු රූපාරම්මණේසු යේන කේනචි පසාදේ ඝට්ටිතේ තං තං ආරම්මණං ගහෙත්වා ආවජ්ජනවසේන චක්ඛුවිඤ්ඤාණස්ස පුරේචාරී හුත්වා භවඞ්ගං ආවට්ටයමානා උප්පජ්ජති. සෝතද්වාරාදීසුපි ඒසේව නයෝ. ඉතරා පන ද්වේ අහේතුකමනෝවිඤ්ඤාණධාතුයෝ සාධාරණාසාධාරණාති දුවිධා හොන්ති. තත්ථ **අසාධාරණා** පන කිරියාහේතුකමනෝවිඤ්ඤාණධාතු සෝමනස්සසහගතා ඛීණාසවස්සේව ඡසු ද්වාරේසු ඡසු අනුළාරේසු ආරම්මණේසු හසිතුප්පාදකිච්චා නියතවත්ථුකා උප්පජ්ජති. **සාධාරණා** පන අහේතුකමනෝවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතා ඡළාරම්මණවිජානනලක්ඛණා, තථාභාවපච්චුපට්ඨානා, සා තීසු භවේසු සබ්බේසං සචිත්තකසත්තානං සාධාරණා, න කස්සචි පන සචිත්තකස්ස න උප්පජ්ජති නාම. උප්පජ්ජමානා පනායං පඤ්චද්වාරමනෝද්වාරේසු වොට්ඨබ්බනාවජ්ජනකිච්චා උප්පජ්ජති. ඡ අසාධාරණඤාණානිපි ඒතාය ගහිතාරම්මණමේව ගණ්හන්ති. සබ්බාරම්මණගහණසමත්ථතාය සබ්බඤ්ඤුතඤ්ඤාණගතිකාති වේදිතබ්බා. ඉමානි තීණි අහේතුකකිරියචිත්තානි. **[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 55 යටතේ)]**

**අනුළාරේසූති** බුද්දකේසු. **තථාභාවපච්චුපට්ඨානා** ඡළාරම්මණවිජානනගයේහාකාරා. සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස ගති විය ගති ඒතිස්සාති **සබ්බඤ්ඤුතඤ්ඤාණගතිකා**. **[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 55 යටතේ)]**

**අහේතුකකිරියාචිත්තං පන** අහේතුක ක්‍රියා චිත්තය වනාහි **කිරියාහේතුකමනෝධාතු උපෙක්ඛාසහගත ආවජ්ජනචිත්තං** ක්‍රියා අහේතුක මනෝධාතු නම් වූ උපේක්ෂා වේදනා සහ ගියාවූ ආවර්ජන චිත්තය ද **කිරියාහේතුකමනෝවිඤ්ඤාණධාතු සෝමනස්සසහගතං හසිතුප්පාදං** ක්‍රියා අහේතුක මනෝවිඤ්ඤාණ ධාතු සඞ්ඛාත සොම්නස් සහ ගියා වූ හසිතෝත්පාද චිත්තය ද **කිරියාහේතුකමනෝවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතං වොට්ඨබ්බනචිත්තන්ති** ක්‍රියා අහේතුක මනෝවිඤ්ඤාණ ධාතු සඞ්ඛ්‍යාත උපේක්ෂා සහගත ව්‍යවස්ථාපන චිත්තයයි **තිවිධං** තුන් වැදෑරුම් වෙයි **තත්‍ථ** ඔහුන් අතුරෙන් **උපෙක්ඛාසහගතා** උපේක්ෂා වේදනා සහ ගියාවූ **කිරියාහේතුකමනෝධාතු** ක්‍රියා අහේතුක මනෝධාතු තොමෝ **හදයවත්‍ථුං නිස්සාය** හෘදයවස්තුව ඇසුරු කොට **චක්ඛුද්වාරේ** චක්‍ෂුද්වාරයෙහි **ඉට්ඨඉට්ඨමජ්ඣත්තඅනිට්ඨඅනිට්ඨමජ්ඣත්තේසු** ඉෂ්ටවූ ද ඉෂ්ටමධ්‍යස්ථවූ ද අනිෂ්ටවූ ද අනිෂ්ටමධ්‍යස්ථවූ ද **රූපාරම්මණේසු** රූපාලම්බනයන් අතුරෙන් **යේන කේනචි** යම්කිසි අරමුණක් විසින් **පසාදේ** චක්‍ෂුස්ප්‍රශාද **ඝට්ටිතේ** ගැටෙන කල්හි **තං තං ආරම්මණං ගහෙත්‍වා** ඒ ඒ අරමුණ ගෙන **ආවජ්ජනවසේන** ආවර්ජනා කිරීම් වශයෙන් **චක්ඛුවිඤ්ඤාණස්ස** චක්‍ෂුර්විඤ්ඤාණයට **පුරේචාරී හුත්‍වා** පෙරටු වී **භවඞ්ගං** භවඞ්ග සන්තතිය **ආවට්ටීයමානා** පෙරළනු ලබමින් **උප්පජ්ජති** උපදී **සෝතද්වාරාදීසුපි** ශ්‍රෝත්‍රද්වාරාදියෙහි ද **ඒසෝ ඒව නයෝ** මේ ක්‍රමයම වේ **ඉතරා පන ද්වේ**

**අහේතුකමනෝවිඤ්ඤාණධාතුයෝ** අවශේෂ වූ අහේතුක මනෝවිඤ්ඤාණධාතුහු දෙදෙන වනාහි **සාධාරණාසාධාරණාති** සාධාරණ අසාධාරණහයි **දුවිධා හොන්ති** දෙවැදෑරුම් වෙත් **තත්‍ථ** ඔහුන් අතුරෙන් **අසාධාරණා** සාධාරණ නොවූ **සෝමනස්සසහගතා** සොම්නස් සහ ගියාවූ **කිරියාහේතුකමනෝවිඤ්ඤාණධාතු පන** ක්‍රියා අහේතුක මනෝවිඤ්ඤාණ ධාතු තොමෝ වනාහි **ඛීණාසවස්ස** රහතුන් වහන්සේගේ **ඡසු ද්වාරේසු** සදෙරෙහි **අනුළාරේසු ආරම්මණේසු** සියුම් වූ අරමුණෙහි (නොහොත් ලාමක වූ අස්ථිසඞ්ඛලික ප්‍රේතාදි රූපාරමුණෙහි) **හසිතුප්පාදකිච්චා** සිනහා පහළකිරීම් කෘත්‍යය ඇත්තී **නියතවත්‍ථුකා** නියත වස්තුක වූවා **උප්පජ්ජති** උපදී **උපෙක්ඛාසහගතා** උපේක්‍ෂා වේදනා සහ ගියා වූ **සාධාරණා පන අහේතුකමනෝවිඤ්ඤාණධාතු** සාධාරණ වූ අහේතුක මනෝවිඤ්ඤාණධාතු තොමෝ වනාහි **ඡළාරම්මණවිජානනලක්ඛණා** සාරමුණ විශේෂයෙන් දැනගැනීම ලක්‍ෂණ කොට ඇත්තීය **තථාභාවපච්චුපට්ඨානා** ඒ බව ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තීයි **සා** ඒ අහේතුක මනෝවිඤ්ඤාණධාතු තොමෝ **තීසු භවේසු** තුන් භවයෙහි **සබ්බේසං සචිත්තකසන්තානං** සියළු සිත් ඇති සත්‍වයන්ට **සාධාරණා** සාධාරණ වෙයි **කස්සචි පන සචිත්තකස්ස** කිසිම සිත් ඇති සත්‍වයෙකුට **න උප්පජ්ජති නාම න** නූපදනේ නම් නොවෙයි (උපදනේමැයි) **උප්පජ්ජමානා** උපදිනු ලබන්නා වූ **අයම්පන** මෝතොමෝ වනාහි **පඤ්චද්වාරමනෝද්වාරේසු** පඤ්චද්වාර මනෝද්වාරයන්හි **වොත්‍ථපනාවජ්ජනකිච්චා** ව්‍යවස්ථාපනකෘත්‍යය ආවර්ජනකෘත්‍යය ඇතිව **උප්පජ්ජති** උපදී **ඡ අසාධාරණඤාණානිපි** ෂට් අසාධාරණ ඥාණයෝ ද **ඒතාය** මේ අහේතුක මනෝවිඤ්ඤාණධාතුව විසින් **ගහිතාරම්මණං ඒව** ගන්නාලද අරමුණම **ගණ්හන්ති** ගනිත් **සබ්බාරම්මණගහණසමත්ථතාය** සියළු අරමුණු ගැනීමට පොහොසත් බැවින් **සබ්බඤ්ඤුතඤාණගතිකන්ති** සර්වඥතා ඥාණය ගතිකයැයි **වේදිතබ්බං** දතයුතුයි **ඉමානි තීණි** මොහු තුන් දෙන **අහේතුකකිරියාචිත්තානි** අහේතුක ක්‍රියා චිත්තයෝ නම් වෙත්.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 152-153 පිටු]**

ආවජ්ජතීති **ආවජ්ජනං,** ආභුඤ්ජති ඕණෝජේති පරිණාමේති වාරේතීති වා අත්ථෝ. තඤ්හි ආපාථගතං ආරම්මණං පඨමමාභුඤ්ජති, චක්ඛුවිඤ්ඤාණාදීනි වීථිචිත්තානි ආපාථගතාරම්මණාභිමුඛං ඕණෝජේති, චිත්තසන්තානං වා පුරිමාකාරතෝ අඤ්ඤථා පරිණාමේති, අනුප්පබන්ධතෝ පවත්තනකං භවඞ්ගචිත්තසන්තානං පරතෝ පවත්තිතුං අදත්වා ආපාථගතං වා ආරම්මණං අඤ්ඤත්ථ ගන්තුං අදත්වා වාරේති. හසිතං උප්පජ්ජති, උප්පාදීයති වා ඒතේනාති හසිතුප්පාදං, තදේව චිත්තන්ති **හසිතුප්පාදචිත්තං**. වොට්ඨපේතීති **වොට්ඨබ්බනං**.

**භවඞ්ගං ආවට්ටයමානාති** භවඞ්ගසන්තානං ආවට්ටයන්තී විය. **සාධාරණාති** සෙක්ඛාසෙක්ඛපුථුජ්ජනානං සාධාරණා. **අසාධාරණාති** අසෙක්ඛානංයේව ආවේණිකා. තේනාහ **"ඛීණාසවස්සා"**ති. **ඡසු ද්වාරේසු**...**පෙ**.... **ආරම්මණේසූ**ති චක්ඛාදීසු ඡසු ද්වාරේසු, පධානසාරුප්පට්ඨානාදිගතේසු ඡසු රූපාදිආරම්මණේසු. පධානසාරුප්පඤ්හි ඨානං දිස්වා දිට්ඨධම්මසුඛවිහාරත්ථාය "සාරුප්පමිදං ඨානං මයා ලද්ධ"න්ති තුසන්තස්ස චක්ඛුද්වාරේ රූපාරම්මණේ, භණ්ඩභාජනට්ඨානේ මහාසද්දං සුත්වා "ඒවරූපා ලෝලුප්පතණ්හා මේ පහීනා"ති තුසන්තස්ස සෝතද්වාරේ සද්දරම්මණේ, ගන්ධේහි වා පුප්ඵේහි වා චේතියපූජනකාලේ "ඒවරූපේන වත සුගන්ධේන භගවන්තං පූජේමී"ති තුසන්තස්ස ඝානද්වාරේ ගන්ධාරම්මණේ, රසසම්පන්නං පිණ්ඩපාතං සබ්‍රහ්මචාරීහි සහ භාජෙත්වා පරිභුඤ්ජනකාලේ "සාරණීයධම්මෝ වත මේ පූරිතෝ"ති තුසන්තස්ස ජිව්හාද්වාරේ රසාරම්මණේ,

ආභිසමාචාරිකවත්තපූරණකාලේ "කායේන වත්තපටිවත්තං පූරේමී"ති තුසන්තස්ස කායද්වාරේ ඵොට්ඨබ්බාරම්මණේති ඒවං පඤ්චද්වාරේසු පඤ්චාරම්මණේසු පවත්තති.

මනෝද්වාරේ පන යථාවුත්තෙස්වේව පඤ්චසු පච්චුප්පන්නාරම්මණේසු **ඝටිකාරසුත්තාදීසු** (ම. නි. 2.282 ආදයෝ) විය භගවතෝ පුබ්බේනිවාසඤාණේන පරිඤ්ඤාතේ අතීතාරම්මණේ, "අට්ඨිස්සරෝ නාම පච්චේකබුද්ධෝ භවිස්සතී"ති (ධ. ප. අට්ඨ. 1.16 දෙවදත්තවත්ථු) ආගතට්ඨානාදීසු විය අනාගතංසඤාණේන පරිච්ඡින්නේ අනාගතාරම්මණේ චාති ඒවං ඡස්වේවාරම්මණේසු හසිතං උප්පාදේතීති වේදිතබ්බං.
**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 55 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 184 පිට]**

"ආවජ්ජේන්තීති ආවජ්ජනං" යනු නිර්වචන හෙයින් කල්පනා කෙරේනුයි ආවර්ජන නම් වේ. "ආභුඤ්ජතී ඕණෝජේති පරිණාමේති වාරේතීති වා අත්ථෝ" ආභෝග කෙරේ, නතු කරයි, පිරිනමයි, වළක්වයි යන අර්ථ හෝ වෙයි. ඒ එසේමැයි; ඒ ආවර්ජන සිත් තෙමේ හමුවට පැමිණි අරමුණ පළමු කොට ආභෝගය හෙවත් මෙනෙහි කිරීම ද කරයි. චක්ෂුර්විඤ්ඤාණාදී වීථි චිත්තයන් හමුවට පැමිණි අරමුණට අභිමුඛ කොට පමුණුවයි. චිත්ත පරම්පරාව හෝ පළමු ආකාරයෙන් අනික් ආකාරයකට පිරිණමයි. අනුප්‍රබන්ධ වශයෙන් පරම්පරා වශයෙන් පවත්නා වූ භවඞ්ග චිත්ත පරම්පරාව මතු පවතින්ට නොදී හමුවට පැමිණි අරමුණ හෝ අන් තැනකට යා නොදී වළක්වයි යනු භාවයි. "හසිතං උප්පජ්ජති උප්පාදීයති වා ඒතේනාති හසිතුප්පාදං" යනු නිර්වචන හෙයින් සිනහා උපදීනුයි හෝ මේ කරණකොටගෙන සිනහා උපදවානුයි හෝ හසිතුප්පාද නම් වේ. "තදේව චිත්තන්ති හසිතුප්පාදචිත්තං" ඒ සිනහා ඉපදවීමම සිත් වූයේනුයි හසිතුප්පාදචිත්ත නම් වේ. "වොට්ඨපේතීති වොට්ඨබ්බනං" යනු නිර්වචන හෙයින් අරමුණ නියම කෙරේනුයි වොට්ඨබ්බන නම් වෙයි.

"සාධාරණා" යනු ශෛක්ෂ අශෛක්ෂ පෘථග්ජන යන මොහුන්ට සාධාරණ යන අර්ථයි. "අසාධාරණා" යනු අශෛක්ෂයන්ටම හෙවත් රහතුන්ටම අවේණිකය. අසාධාරණ යනු භාවයි. එහෙයින් "ඛීණාසවස්සේව" යි කියේයි. "ඡසු ද්වාරේසු -පෙ- ආරම්මණේසු" යනු චක්ෂුරාදී ෂට් ද්වාරයෙහි පධන් වීයඹියට සරුප්තැන් ආදියට පැමිණියා වූ රූපාදී ෂඩාලම්බනයෙහිය යන අර්ථයි. ඒ එසේමැයි; පධන් වියඹියට සරුප් වූ වෘක්ෂමූලාදී සෙනස්නක් දැක ඉහාත්මයෙහි නිරෝධසමාපත්තියට සමවැද නිවන්සැප විඳීමට මේ ස්ථානය සාරුපය. එබඳු සෙනස්නක් මා විසින් ලබනලදැයි සතුටු වන්නාවූ රහතන් වහන්සේට චක්ෂුද්වාරයෙහි රූපාලම්බනයන් අරමුණු කොටගෙන ද, පිරිකර බඩු බෙදන ස්ථානයෙහි පෘථග්ජන භික්ෂූන්ගේ (මස් බෙදන කෙවුලන්ගේ ශබ්දයට බඳු) මහත් ශබ්දය අසා මෙබඳු ලෝලුප්ප තෘෂ්ණාව මා විසින් ප්‍රහාණය කරන ලද්දීයයි සතුටු වන්නාවූ රහතන් වහන්සේට ශ්‍රෝත්‍රද්වාරයෙහි ශබ්දලම්බනයෙහි ද, ගඳින් හෝ මලින් හෝ චෛත්‍යය පුදන කාලයෙහි මෙබඳු සුවඳින් භාග්‍යවතුන් වහන්සේට ඒකාන්තයෙන් පිදියයුතුයි සතුටු වන්නාවූ රහතන් වහන්සේට ඝානද්වාරයෙහි ගන්ධාලම්බනයෙහි ද, රස සම්පන්න පිණ්ඩපාතය සබ්‍රම්සරුන් හා සමඟ බෙද වළඳන කාලයෙහි ඒකාන්තයෙන් මා විසින් සාරාණීය ධර්මය පුරන ලද්දේයයි සතුටු වන්නාවූ රහතන් වහන්සේට ජිව්හාද්වාරයෙහි රසාලම්බනයෙහි ද, ආභිසමාචාරික වත් පුරන කාලයෙහි කයින් වත් පිළිවෙත් පුරමීයි සතුටු වන්නාවූ රහතන් වහන්සේට කායද්වාරයෙහි ස්පර්ශාලම්බනයෙහි දැයි මෙසේ පඤ්චද්වාරයෙහි පඤ්චාලම්බනයෙහි හසිතෝත්පාද චිත්තය උපදනේයි.

මනෝද්වාරයෙහි වනාහි යටකියනලද ප්‍රත්‍යෝත්පන්න පඤ්චාලම්බනයෙහිම සටීකාර සූත්‍රාදියෙහි මෙන් භාග්‍යවතුන් වහන්සේ හට පූර්වේනිවාසඥානයෙන් පිරිසිඳ දැනගන්නා ලද අතීතාලම්බනයෙහි ද, සට්ඨීස්සර නම් පසේබුදුකෙනෙක් වන්නේ යැයි ආවාවූ ස්ථානයෙහි මෙන් අනාගතංසඥානයෙන් පිරිසිඳ දැනගන්නා ලද අනාගතාලම්බනයෙහි දැයි මෙසේ ෂඩාලම්බනයෙහිම සිනහා උපදවන්නේ යැයි දතයුතුයි. **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 155-156 පිටු]**

චක්ෂුරාදි පඤ්චද්වාරයන්ට ඉෂ්ට වූ හෝ අනිෂ්ට වූ හෝ අරමුණු ගැටුණු කල්හි සාධාරණ වශයෙන් ඒ අරමුණු ආවර්ජනා කිරීම් වශයෙන් උපදනා අහේතුක ක්‍රියා චිත්තයයි.

මනෝද්වාරාවර්ජනය යනු මනෝද්වාරයෙහි ගැටෙන්නා වූ ඉෂ්ට අනිෂ්ට සියළු අරමුණු ආවර්ජනා කිරීම් වශයෙන් උපදනා ක්‍රියා අහේතුක මනෝවිඤ්ඤාණ ධාතු චිත්තයයි. ඒ චිත්තයම චක්ෂුරාදී පඤ්චද්වාරයෙහි සන්තීරණ ජවනචිත්තයන්ගේ මධ්‍යයෙහි අරමුණු නියම කරගැනීම් වශයෙන් උපදනා කල්හි ව්‍යවස්ථාපන චිත්තය යැයි ව්‍යවහාර කරත්.

මේ හසිතුප්පාද චිත්තය වනාහි පඤ්චද්වාරයෙහි රහතුන්ට සිනා පහළකිරීම් වශයෙන්ම උපදී. මේ චිත්තයට අන් ක්‍රියාවක් නොකොට හැකිවෙයි. එහෙයින් හසිතුප්පාද යන නාමයම මෙම චිත්තයට අයිති වෙයි. සම්ප්‍රයුක්තක හේතු රහිත බැවින් අහේතුක අධිකාරයෙහි දක්වන ලදී. **[විස්තර භාව සන්නය 29-30 පිටු]**

චක්ඛාදිපඤ්චද්වාරේ ඝට්ටිතමාරම්මණං ආවජ්ජති තත්ථ ආභෝගං කරෝති චිත්තසන්තානං වා භවඞ්ගවසේන පවත්තිතුමදත්වා වීථිචිත්තභාවාය පරිණාමේතීති පඤ්චද්වාරාවජ්ජනං.

චක්ෂුරාදිපඤ්චද්වාරයෙහි ගැටෙනලද අරමුණ ආවර්ජනය කරයි. එහි සිතා බැලීම කරයි. චිත්ත පරම්පරාවට හෝ භවඞ්ග වශයෙන් පවතින්නට නොදී වීථි චිත්ත භාවයට පිරිනමන්නේ නුයි පඤ්චද්වාරාවජ්ජන චිත්තයි නම්.

මනෝද්වාරේන දිට්ඨසුතමුතාදි වසේන ආපාතමාගතමාරම්මණං ආවජ්ජේති, වුත්තනයේන චිත්තසන්තානං පරිනාමේති මනෝද්වාරාවජ්ජනං, ක්‍රියාහේතුකමනෝවිඤ්ඤාණධාතු, උපෙක්ඛාසහගත චිත්තං.

මෙහි ආවර්ජනයහට අනන්තර ප්‍රත්‍යය වූ භවඞ්ග චිත්තය තෙමේ වීථිචිත්ත ප්‍රවෘත්තියට ද්වාරවන බැවින් මනෝද්වාර නම් වේ. මෙම මනෝද්වාරාවජ්ජන චිත්තය ව්‍යවස්ථාපනය යැයි ද කියනු ලැබේ. **පඤ්චද්වාරේ යථාසන්තීරිතමාරම්මණං වවත්ථපේතීති වොත්ථපනං.**

හසිතං උප්පාදේතීති හසිතුප්පාදං. ක්‍රියාහේතුකමනෝවිඤ්ඤාණධාතු සෝමනස්සසහගතචිත්තං. කරණමත්තං කිරියා ඵලදනාසම්භවතෝ අහේතුකානි ච තානි කිරියචිත්තානි චේති අහේතුකකිරියචිත්තානි.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 16 පිට; සද්ධර්මසාගරය 02/433 පිට; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ පුරාණ සන්නය 21-22 පිටු; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රශ්නෝත්තර 04 පිට; අභිධර්ම ප්‍රකාශය 33 පිට]**

ක්‍රියාඅහේතුක මනෝවිඤ්ඤාණධාතු චිත්තය හසිතුප්පාද නම් වේ. මෙය වනාහි මානසික සුඛ වේදනාවෙන් යුක්තය. සිනහා උපදවන සිත හසිතුප්පාද නම්. "යං හසිතං උප්පාදේති තං චිත්තං හසිතුප්පාදං" යනු ආප්ත වචනයයි. සිනාහව උපදවන්නේ සෝමනස්සසහගත ක්‍රියාහේතුක මනෝවිඤ්ඤාණධාතුචිත්තයයි. මේ වනාහි රහතුන් වහන්සේට බලගතු විපාක ඇති දුගතියෙහි ඉපැත්මෙන් තොර වූ තම තමන් පිළිබඳ වූ ආත්මභාව සම්පත්තිය අරමුණු වීමෙන් තුටුපහටු ආකාරය උපදවමින් උපදනේය. කර්මයෙක් නොවේ. විපාකයෙක් ද නොවේ. ක්‍රියා මාත්‍රයෙක්.

**[සද්ධර්මසාගරය 02/434 පිට]**

පඤ්චද්වාරාවජ්ජන චිත්තය තෙමේ කිසියම් චිත්තයකින් නොගත්තා වූ අරමුණෙහි එක් වරක් උපදින හෙයින් ද තමා හා සමාන ජාතික නොවූ ජවන භවඞ්ග සන්තතීන්ගේ ව්‍යාපාරය හා සමග ඇතිවන හෙයින් යහපත් අයහපත් ආකාරයෙන් ආරම්මණයන්ගේ රසය අනුභව කරන්නට නොහැක්කේය. එහෙයින් උපෙක්ඛා වේදනා සහිතව උපදී.

පසුව ඇතිවන මනෝද්වාරාවර්ජන චිත්තය පඤ්චද්වාරාවර්ජන චිත්තය මෙන් නොවෙයි. වීථිචිත්තය විසින් ගන්නාලැබූ අරමුණ ද ගනී. ඒ අරමුණෙහි බොහෝවර වීථිසිත් උපදී. ආරම්මණ රසානුභවන කෘත්‍යය පමණක් අපේක්‍ෂා කරන්නේ නොවෙයි. තමා හා සමාන නොවූ ජවන චිත්ත භවඞ්ග චිත්ත සන්තතියට අනන්තර ප්‍රත්‍යය ආදීන්ගේ වශයෙන් ඉපදවීම යැයි කියන කෘත්‍යය අපේක්‍ෂා කරණ හෙයින් ද අරමුණු රසය අනුභව නොකරණ හෙයින් ද උපේක්‍ෂා සහගත වෙයි.

**[අභිධර්ම ප්‍රකාශය 31-32 පිටු]**

චක්‍ෂුරාදි ද්වාර පසින් යම්කිසිවකට අරමුණක් පැමිණියහොත් එකෙනෙහිම ඒ අරමුණ මනෝද්වාරයෙහි ද හැපේ. එහෙයින් භවඞ්ග සිත් ඉපදීම නැවතී ද්වාරයක යම්කිසි අරමුණක් ගැටුණු බව දැනගන්නා සිත් පහළ වේ. එය පඤ්චද්වාරයෙහි ගැටුණු අරමුණ මෙනෙහිකිරීමක් බැවින් ඒ සිතට පඤ්චද්වාරාවජ්ජන යයි කියනු ලැබේ.

පඤ්චද්වාරයෙහි ගැටීමක් නොවී කෙලින්ම මනෝද්වාරයට ද අරමුණු පැමිණේ. එසේ පැමිණෙන අරමුණු සම්බන්ධයෙන් මුලින්ම පහළවන සිත මනෝද්වාරාවර්ජන නම් වේ.

හසිතුප්පාද චිත්තය යනු සිනහාව උපදවන සිතය. සිනහා උපදවන සිත් තවත් ඇත්තේය. මේ අහේතුක ක්‍රියා චිත්තය ද ඉන් එකකි. සිනහා උපදවන අන් සිත් වලින් සිනහව පමණක් නොව තවත් දේද සිදුකරණු ලැබේ. මේ සිතින් කරන්නේ සිනහාව පමණකි. එබැවින් මෙයට හසිතුප්පාද යන නම තබා ඇත්තේය.

**[අභිධර්ම මාර්ගය 45 පිට]**

පඤ්චද්වාරයන් අතුරෙන් යම් ද්වාරයක අරමුණක් හැපුණු විට ඒ භවඞ්ග සන්තතිය සෙළවී සිඳී පස් දොර අතුරෙන් කවර දොරකින් මේ අරමුණ ආයේදැයි බලන්නාක් මෙන් උපදින සිත පඤ්චද්වාරාවජ්ජන චිත්තයයි. මකුළු නූලේ සතෙකු රැඳුණු කළ තමා සෙලවුම් කෑයෙන් කවර නූලකින් ඒ සතා රැඳුනේදැයි පරීක්‍ෂාකොට බලන මකුළුවා මෙනි. ඒද සොමිනස් හෝ දොම්නස් වන්නට ශක්තිය මඳ හෙයින් උපේක්‍ෂා සහගතම වෙයි. මේ උපේක්‍ෂා සහගත පඤ්චද්වාරාවජ්ජන චිත්තය පූර්ව

කුශලාකුශලයක විපාක නොවේ. එසේම ඊට මතු විපාක නොලැබෙන හෙයින් කුශලාකුශල කර්මයක් ද නොවේ. හුදෙක් ක්‍රියා මාත්‍රයෙක් යැයි දතයුතු.

මනෝද්වාරයෙහි වැටුන අරමුණ ආවර්ජනය කරන චිත්තය මනෝද්වාරාවර්ජන චිත්තයයි. එයද උපේක්ෂා සහගතම හෙයින් උපේක්ෂාසහගත මනෝද්වාරාවර්ජන චිත්තය යැයි කියනු ලැබේ. මනෝද්වාරය නම් ආවර්ජනයට නැමුනු භවඞ්ග චිත්තයයි. මෙයම පඤ්චද්වාරික චිත්තවීථීන්හිදී "වොත්ථපන චිත්තය" යි කියනු ලැබේ. මෙයද කර්මයක් හෝ විපාකයක් නොව ක්‍රියා මාත්‍රයකි.

හසිතුප්පාද නම් සිනහා ඉපැදවීමය. රහතන් වහන්සේලාට අනෞදරිකාරම්මණයෙහි (සුළු අරමුණුවලදී) සිනා උපදවන සිත "සෝමනස්සසහගත හසිතුප්පාදචිත්තය" යි මෙය ද ක්‍රියාවකි. කර්ම හෝ විපාක නොවේ.

**[අභිධර්ම චන්ද්‍රිකාව 21 පිට]**

ආරම්මණං ආවජ්ජතීති ආවජ්ජනං යනුවෙන් විග්‍රහ කරණු. ආ පූර්ව වජ ධාතු තෙමේ පරීක්ෂාකිරීම් සඞ්ඛ්‍යාත අර්ථවාචක වෙයි. **ආරම්මණං** පඤ්චප්‍රකාර වූ අරමුණ **ආවජ්ජති** ආවර්ජනය කරයි **ඉති (තස්මා**) එසේහෙයින් **ආවජ්ජනං** ආවජ්ජනා නම් වේ. මේ වනාහි අර්ථයයි. පඤ්චද්වාරේ ආවජ්ජනං පඤ්චද්වාරාවජ්ජනං යනුවෙන් විග්‍රහ කරණු. **පඤ්චද්වාරේ** පඤ්චද්වාරයෙහි **ආරම්මණං** පඤ්චප්‍රකාර වූ අරමුණ **ආවජ්ජේ** පරීක්ෂා කෙරේ ද **ඉති (තස්මා**) එසේහෙයින් **පඤ්චද්වාරාවජ්ජනං** පඤ්චද්වාරාවජ්ජන නම් වේ. මේ වනාහි අර්ථයි. පඤ්චද්වාරාවජ්ජන චිත්තය ලැබේ.

ඒ පඤ්චද්වාරාවජ්ජන සිත් තෙමේ හෘදයවස්තුව නිස්සය කොටගෙන චක්ඛුද්වාරයෙහි ඉෂ්ටාලම්බනය ඉෂ්ට මධ්‍යස්ථාලමබනය අනිෂ්ටාලම්බනය අනිෂ්ට මධ්‍යස්ථාලම්බනය යැයි කියන ලද්ද වූ රූපාලම්බනාදීන් අතුරෙන් එකෙකී අරමුණක් තෙමේ චක්ෂුරාදිහු ගැටෙන කල්හි ඒ ඒ අරමුණ ගෙන පරීක්ෂා කිරීම් වශයෙන් චක්ෂු විඤ්ඤාණාදි තොමෝ පූර්ව භාගයෙහි භවඞ්ගය වැලැක්වීම් වශයෙන් හටගත්තේයි.

ආරම්මණං මනති විජානාතීති මනෝ යනුවෙන් විග්‍රහ කරණු. මන ධාතුවෙන් පරව අ-ප්‍රත්‍යය වූ තැනී. **යං** භවඞ්ගුපච්ඡේද සඞ්ඛයාත වූ එකුන්විසි සිත්කෙනෙක් තෙමේ **ආරම්මණං** අරමුණ **මනති විජානාති** දැනගන්නේවේද **ඉති (තස්මා**) එසේ හෙයින් **තං** ඒ සිත් තෙමේ **මනෝ** මන නම් වේ. මේ වනාහි අර්ථයයි. මනෝ ඒව ද්වාරං මනෝද්වාරං යනුවෙන් එක්කොට විග්‍රහකරණු. උපෙක්ඛා සන්තීරණ දෙසිතය, මහාවිපාක අටය, මහග්ගතවිපාක නවය යන මෙකී භවඞ්ගුපච්ඡේද එකුන්විසි චිත්තය ලැබේ. "භවඞ්ගුපච්ඡේද සඞ්ඛාතේ මනෝද්වාරේ දිට්ඨ සුත මුත විඤ්ඤාත වසේන ආපාථමාගතං ආරම්මණං ආවජ්ජේති මනෝද්වාරාවජ්ජනං" යනුවෙන් විග්‍රහකරණු. **යං** යම් සිත්කෙනෙක් තෙමේ **භවගුපච්ඡේද සඞ්ඛාතේ** භවඞ්ගුපච්ඡේ යැයි කියනුලද්ද වූ **මනෝද්වාරේ** මනෝද්වාරයෙහි **දිට්ඨසුතමුතවිඤ්ඤාතවසේන** දිට්ඨසුතමුතවිඤ්ඤාත වශයෙන් දක්නාලද්දවූ ද සිතින් දැනගන්නාලද්දවූ ද ආලම්බනයාගේ වශයෙන් **ආපාථං ආගතං** වැටහීමට පැමිණියා වූ **ආරම්මණං** අරමුණ **ආවජ්ජේති** ආවර්ජනය කෙරේ ද **ඉති (තස්මා**) එසේ හෙයින් **තං** ඒ සිත් තෙමේ **මනෝද්වාරාවජ්ජනං** මනෝද්වාරාවර්ජන නම් වේ. මෙය වනාහි අර්ථයි. චක්ෂු විඤ්ඤාණයෙන් ගන්නාලද්ද වූ අරමුණු තෙමේ දිට්ඨ නම් වෙයි. ශ්‍රෝත්‍ර විඤ්ඤාණයෙන් ගන්නාලද්ද වූ අරමුණු තෙමේ සුත නම් වෙයි. ඝාන විඤ්ඤාණ ජිව්හා විඤ්ඤාණ කාය විඤ්ඤාණ සඞ්ඛ්‍යාත වූ ත්‍රිවිධ චිත්තයෙන් ගන්නාලද්ද වූ අරමුණු

තෙමේ මුත නම් වෙයි. පඤ්චෙන්ද්‍රියන් තබා හුදු සිතින්ම ගන්නාලද්ද වූ අරමුණු තෙමේ විඤ්ඤාත නම් වෙයි. ඒ අරමුණ මනෝද්වාරාවර්ජන චිත්තය විසින් පරීක්‍ෂා කරණු ලැබේ. මනෝද්වාරාවජ්ජනමේව චිත්තං යනුවෙන් විග්‍රහකරණු. මනෝද්වාරාවර්ජන චිත්තය ලැබේ.

හසිතං උප්පාදේතීති හසිතුප්පාදං යනුවෙන් විග්‍රහකරණු. **යං චිත්තං** යම් සිතක් තෙමේ **හසිතං** සිනහව **උප්පාදේති** උපදවා ද **ඉති (තස්මා**) එසේ හෙයින් **තං** ඒ සිත් තෙමේ **හසිතුප්පාදං** හසිතුප්පද නම් වේ. හසිතුප්පාදමේව චිත්තන්ති හසිතුප්පාදචිත්තං යනුවෙන් විග්‍රහකරණු. ඒ හසිතුප්පාද සිත් තෙමේ කෙලෙසුන් ගෙවුනා වූ රහතුන් කෙරෙහි හටගත්තේයි. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 22-23 පිටු]**

චක්ඛුද්වාරය සෝතද්වාරය ඝානද්වාරය ජිව්හාද්වාරය කායද්වාරය යන දෙරටු පහෙන් හෙවත් පඤ්චද්වාරයෙන් වැදගන්නා රූප ශබ්ද ගන්ධ රස ඵොට්ඨබ්බ යන අරමුණු වලට සිත් පරම්පරාව යොමුකිරීමක් වශයෙන් පහළවන සිත පඤ්චද්වාරාවජ්ජන සිත නම්. චක්ඛුවිඤ්ඤාණාදි විඤ්ඤාණ සිතක් ඉපදීමට පෙර මේ පඤ්චද්වාරාවජ්ජන සිත ආවර්ජන කෘත්‍යය සිද්ධ කරමින් ඉපිද නිරුද්ධ වේ. මේ සිත ඇතිවන්නේ හෘදයවස්තු රූපය ආශ්‍රය කරගෙනය. එහි අරමුණ එම චිත්ත වීථිය ඉපදීමට හේතු වූ අළුත් වර්තමාන රූපාදි අරමුණුවලින් එකෙකි. නමුත් මේ සිතට අරමුණ හැදින ගැනීමට ශක්තියක් නැත. එයට පසුව ඇතිවන චක්ඛුවිඤ්ඤාණාදි විඤ්ඤාණ සිතින්ම අරමුණ දැනගන්නේ වේ. මේ සිත දුර්වල ක්‍රියා සිතක් බැවින් උපෙක්ඛා වේදනාවෙන් යුක්ත වේ.

සිතින්ම හෙවත් මනෝද්වාරයෙන් ගන්නා අරමුණුවලට සිත් පරම්පරාව යොමු කිරීම් වශයෙන් උපදින සිත මනෝද්වාරාවර්ජන සිත නම්. පඤ්චද්වාරයෙන් ගනුලබන රූපාදී අරමුණු හැර අන් සියළු අරමුණු මනෝද්වාරයෙන් හෙවත් සිතින්ම ගනු ලැබේ. මනෝද්වාරික චිත්තවීථියක භවඞ්ග සිත බිදීමත් සමගම මේ සිත ආවර්ජන කෘත්‍යය සිද්ධ කරමින් ඉපාද නිරුද්ධ වූවායින් පසු ජවන් සිත් පෙළ ඇති වේ. තවද මේ සිත පඤ්චද්වාර චිත්තවීථියෙහි දී අරමුණු විමසා බැලීම නම් වූ සන්තීරණ කෘත්‍යය සිද්ධ කරන සන්තීරණ සිත ඉපිද නිරුද්ධ වූවායින් පසු ඒ අරමුණ මෙබඳු යැයි ස්ථිර වශයෙන් නිශ්චය කිරීම හෙවත් වොත්ථපන කෘත්‍යය සිද්ධ කරමින් උපදින්නේය. එවිට ඒ සිතට වොට්ඨපන සිත යැයි ද කියනු ලැබේ. මේ ආවර්ජන සිත් දෙකම චිත්තවීථියෙහි මුල් අවස්ථාවේ උපදින හෙයින් දුර්වලය. කුශල් හෝ අකුශල් හෝ වීමට නුපුළුවන් බැවින් ක්‍රියා සිත්ම වේ. මේ සිත් දෙකම උපෙක්ඛාසහගතය.

හසිතය යනු මඳ සිනහාවට නමකි. සිනහා පහළ කිරීම් වශයෙන් උපදින සිත හසිතුප්පාද සිත නම්. සිනහා පහළ කිරීමේ සතුටක් ඇතිවන හෙයින් එහි වේදනාව සෝමනස්ස වේ. සිනහා පහළ කිරීමට පමණක් මේ සිත් රහතන් වහන්සේලාට ඇතිවන හෙයින් එය ක්‍රියා සිතක් වේ. යම් පුද්ගලයෙකුගේ සසර ගතියක් දැක තමන් වහන්සේ ඒ ගතියෙන් මිදුනේ යැයි යනාදී වශයෙන් සතුටක් ඇතිවන කල්හි මඳ සිනහා පහළ කරවන මේ සිත ජවන කෘත්‍යය සිද්ධ කරමින් උපදී. අලෝභ අදෝස අමෝහ යන කුශල හේතු කිසිවක් මේ සිතෙහි යෙදී නැති හෙයින් දුර්වල වූ අහේතුක සිතක්ම වේ. **[අභිධර්මාර්ථ ප්‍රදීපිකා 01/54-56 පිටු]**

ඇස කණ නාසය දිව ශරීරය යන ඉන්ද්‍රිය පසට ද්වාර නොහොත් දෙරටු යැයි කියනු ලැබේ. මේ කියන ද්වාර පහෙන් එකකට යම්කිසි අරමුණක් ගැටුනු බව

දැනගන්නා සිතට පඤ්චද්වාරාවජ්ජනය යැයි කියනු ලැබේ. දෙරටු පසක් ඇති රජවාසලකට එයින් කවර හෝ දෙරටුවකින් කිසිවෙකු ඇතුළු වූ බව දැනගන්නාක් මෙන් මේ පඤ්චද්වාරයෙන් ඇතුළුවන අරමුණු හදුනාගන්නේ මේ පඤ්චද්වාරාවජ්ජන සිතයි.

පඤ්චද්වාරයෙහි නොගැටී කෙළින්ම මනෝද්වාරයට අරමුණු පැමිණේ. එළියේ සිටි මුර භටයන්ට නොදැනුවත්ම කෙළින්ම ඇතුළු දෙරට යන පුරුෂයෙකු මෙනි. එසේ කෙළින්ම මනෝද්වාරයට ඇතුළුවන සිතට මනෝද්වාරාවර්ජන සිත යැයි කියනු ලැබේ.

කලාතුරකින් බුදුවරයෙකුගේ හෝ රහත්කෙනෙකුගේ මුහුණෙහි පිළිබිඹු වන මඳ සිනහාව හසිතුප්පාද නම්. සිත තුල සොම්නස් ස්වභාවයක් ඇති බව මුහුණින් ප්‍රකටවන **"සිත"** නම් සිනහාවත් දත්වල අග පමණක් පෙණෙන පරිදි හඬ නොනගින **"හසිත"** නම් සිනහාවත් බුදු පසේබුදු රහත් පුද්ගලයන් විසින් කරනු ලැබේ.

**[අභිධර්ම විභාගය 41-42 පිටු]**

## හසිතය සෝම්නස් වී ආවර්ජන දෙදෙන උපේක්ෂා වීමටහේතු:—

කස්මා පනෙත්ථ ආවජ්ජනවොට්ඨබ්බනානි උපෙක්ඛාසහගතානි, හසිතුප්පාදඤ්ච සෝමනස්සසහගතන්ති? වුච්චතේ; ආවජ්ජනං තාව අපුබ්බාරම්මණෝ සකිදේව ච පවත්තමානසන්තතිවිච්ඡේදවසේන පවත්තනතෝ, දුබ්බලභවඞ්ගපච්චයං වා සබ්බථා විසයරසමනුභවිතුං න සක්කෝතීති ඉට්ඨාදීසු සබ්බත්ථ උපෙක්ඛායුත්තමේව හෝති. වොට්ඨබ්බනඤ්ච වුත්තවිපරියායේන වේදනාභේදරහම්පි සමානං විපාකප්පබන්ධං විච්ඡින්දිත්වා විසදිසචිත්තප්පබන්ධස්ස නිබ්බත්තනතෝ සන්තතිපරිණාමනේයේව කිච්චන්තරේ බ්‍යාවටත්තා විපාකං විය ආරම්මණරසස්සාදේ අසමත්ථමේවාති සබ්බත්ථ උපෙක්ඛාසහගතමේව. හසිතුප්පාදං පන වුත්තවිපරීතතෝ පරිහීනවිපල්ලාසානං ඛීණාසවානං සන්තානේ ඉට්ඨාරම්මණෝයේව උප්පජ්ජනතෝ සබ්බථා සෝමනස්සසහගතමේවාති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 55 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 184 පිට]**

මෙහි වනාහි කුමක් හෙයින් ආවර්ජන ව්‍යවස්ථාපන චිත්තයෝ දෙදෙන තුමූ උපේක්ෂා සහගත වෙද්ද? හසිතෝත්පාද සිත් සෝමනස්ස සහගත වේද යත්; පළමු කොට පෙර කිසි වීථිසිතක් විසින්හු අරමුණු කොට නොගන්නාලද විරූ අරමුණෙහි එක් වරක්ම පවත්නා වූ ආවර්ජන සිත් තෙමේ භවඞ්ග සන්තතිය සිඳීම් වශයෙන් හටගන්නා හෙයින් දුර්වල භවඞ්ග ප්‍රත්‍යය ඇත්තේ හෝ සර්වප්‍රකාරයෙන් අරමුණු රසය අනුභව නොකළ හැකි වේ. එහෙයින් ඉෂ්ටාදී සියළු අරමුණෙහි උපේක්ෂා සහගත වෙයි. ව්‍යවස්ථාපන සිත ද කියන ලද්දට විපය්‍යාස වශයෙන් වේදනා භේදයට සුදුසු වූයේ නමුදු විපාක පරම්පරාව සිඳ අසමාන චිත්ත පරම්පරාව වලක්වන හෙයින් චිත්ත සන්තතිය පිරිනමන්න වූ කෘත්‍යය විශේෂයෙක්හිම ව්‍යාවෘත වූ හෙයින් ද විපාකය මෙන් අරමුණු රස අනුභව කිරීමෙහි අපොහොසත් බැවින් ද සියළු අරමුණෙහි උපේක්ෂා සහගතම වෙයි. හසිතෝත්පාද සිත වනාහි කියන ලද්දට විපය්‍යාස වශයෙන් ප්‍රහීණ කරනලද විපය්‍යාස සිත් ඇත්තා වූ රහතුන්ගේ සන්තානයෙහි ඉෂ්ට අරමුණෙහිම උපදනා හෙයින් සර්වප්‍රකාරයෙන් සෝමනස්ස සහගතම වෙයි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 155 පිට]**

# භාග්‍යවතුන් වහන්සේට හසිතුප්පාද චිත්තය උපදී ද?

**මනෝවිඤ්ඤාණධාතු උප්පන්නා හෝති**...**පෙ**.... **සෝමනස්සසහගතා**ති, ඉදං චිත්තං අඤ්ඤෙසං අසාධාරණං. ඛීණාසවස්සේව පාටිපුග්ගලිකං. ඡසු ද්වාරේසු ලබ්භති. චක්ඛුද්වාරේ හි පධානසාරුප්පං ඨානං දිස්වා ඛීණාසවෝ ඉමිනා චිත්තේන සෝමනස්සිතෝ හෝති. සෝතද්වාරේ භණ්ඩභාජනීයට්ඨානං පත්වා මහාසද්දං කත්වා ලුද්ධලුද්ධේසු ගණ්හන්තේසු 'ඒවරූපා නාම මේ ලෝලුප්පතණ්හා පහීනා'ති ඉමිනා චිත්තේන සෝමනස්සිතෝ හෝති. ඝානද්වාරේ ගන්ධේහි වා පුප්ඵේහි වා චේතියං පූජෙන්තෝ ඉමිනා චිත්තේන සෝමනස්සිතෝ හෝති. ජිව්හාද්වාරේ රසසම්පන්නං පිණ්ඩපාතං ලද්ධා භාජෙත්වා පරිභුඤ්ජන්තෝ 'සාරණීයධම්මෝ වත මේ පූරිතෝ'ති ඉමිනා චිත්තේන සෝමනස්සිතෝ හෝති. කායද්වාරේ අභිසමාචාරිකවත්තං කරොන්තෝ 'කායද්වාරේ මේ වත්තං පූරිත'න්ති ඉමිනා චිත්තේන සෝමනස්සිතෝ හෝති. ඒවං තාව පඤ්චද්වාරේ ලබ්භති.

මනෝද්වාරේ පන අතීතානාගතමාරබ්භ උප්පජ්ජති. ජෝතිපාලමාණව (ම. නි. 2.282 ආදයෝ) මග්ඝදේවරාජ (ම. නි. 2.308 ආදයෝ) කණ්හතාපසාදිකාලස්මිඤ්හි (ජා. 1.10.11 ආදයෝ) කතං කාරණං ආවජ්ජෙත්වා තථාගතෝ සිතං පාත්වාකාසි. තං පන පුබ්බේනිවාසඤාණසබ්බඤ්ඤුතඤ්ඤාණානං කිච්චං. තේසං පන ද්වින්නං ඤාණානං චිණ්ණපරියන්තේ ඉදං චිත්තං හාසයමානං උප්පජ්ජති. අනාගතේ 'තන්තිස්සරෝ මුදිඞ්ගස්සරෝ පච්චේකබුද්ධෝ භවිස්සතී'ති සිතං පාත්වාකාසි. තම්පි අනාගතංසඤාණසබ්බඤ්ඤුතඤ්ඤාණානං කිච්චං. තේසං පන ද්වින්නං ඤාණානං චිණ්ණපරියන්තේ ඉදං චිත්තං හාසයමානං උප්පජ්ජති.

නිද්දේසවාරේ පනස්ස සේස අහේතුකචිත්තේහි බලවතරතාය චිත්තේකග්ගතා සමාධිබලං පාපෙත්වා ඨපිතා. වීරියම්පි වීරියබලං පාපෙත්වා. උද්දේසවාරේ පන 'සමාධිබලං හෝති වීරියබලං හෝතී'ති අනාගතත්තා පරිපුණ්ණේන බලට්ඨේනේතං ද්වයං බලං නාම න හෝති. යස්මා පන 'නේව කුසලං නාකුසලං' තස්මා බලන්ති වත්වාන ඨපිතං. යස්මා ච න නිප්පරියායේන බලං, තස්මා සඞ්ගහවාරේපි 'ද්වේ බලානි හොන්තී'ති න වුත්තං. සේසං සබ්බං සෝමනස්සසහගතාහේතුක මනෝවිඤ්ඤාණධාතුනිද්දේසේ වුත්තනයේනේව වේදිතබ්බං.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 568 කිරියමනෝවිඤ්ඤාණ යටතේ); ධම්මසඞ්ගණී අටුවා 257-258 පිටු (හේ.වි.මු)]**

**ලෝලුප්පතණ්හා පහීනා**ති ඉමස්ස චිත්තස්ස පච්චයභූතා පුරිමා පවත්ති දස්සිතා. ඉදං පන චිත්තං විචාරණපඤ්ඤාරහිතන්ති කේවලං සෝමනස්සමත්තං උප්පාදෙන්තස්ස හෝතීති. ඒවං චේතියපූජාදීසුපි දට්ඨබ්බං. **වත්තං කරොන්තෝ**ති ඉදං වත්තං කරොන්තස්ස ඵොට්ඨබ්බාරම්මණෝ කායද්වාරචිත්තප්පවත්තිං සන්ධාය වුත්තං. පඤ්චද්වාරානුගතං හුත්වා ලබ්භමානං සන්ධාය පඤ්චද්වාරේ ඒව වා ලෝලුප්පතණ්හාපහානාදිපච්චවෙක්ඛණහේතුභූතං ඉදමේව පවත්තිං සන්ධාය තත්ථ තත්ථ **"ඉමිනා චිත්තේන සෝමනස්සිතෝ හෝතී"**ති වුත්තන්ති **"ඒවං තාව පඤ්චද්වාරේ ලබ්භතී"**ති ආහ. අතීතංසාදීසු අප්පටිහතං ඤාණං වත්වා "ඉමේහි තීහි ධම්මේහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතෝ සබ්බං කායකම්මං ඤාණානුපරිවත්තී"තිආදිවචනතෝ (මහානි. 156 අත්ථතෝ සමානං) "භගවතෝ ඉදං උප්පජ්ජතී"ති වුත්තවචනං විචාරේතබ්බං.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 568 යටතේ)]**

**පුරිමා පවත්තී**ති මහාකිරියචිත්තප්පවත්තිං ආහ. තාය හි ඛීණාසවෝ ඒවං පච්චවෙක්ඛති. තේනේවාහ **"ඉදං පන චිත්තං විචාරණපඤ්ඤරහිත"**න්ති. **ඒව**න්ති යථා සෝතද්වාරේ, ඒවං ඝානද්වාරාදීසුපි මහාකිරියචිත්තේහි තස්මිං තස්මිං විසයේ ඉදමත්ථිකතාය පරිච්ඡින්නාය ඉදං චිත්තං වත්තතීති දස්සේති. **පඤ්චද්වාරානුගතං හුත්වා ලබ්භමාන**න්ති පඤ්චද්වාරේ පවත්තමහාකිරියචිත්තානං පිට්ඨිවට්ටකභාවේන ඉමස්ස චිත්තස්ස පවත්තිං සන්ධාය වුත්තං, පඤ්චද්වාරේ ඒව වා ඉදමේව පවත්තන්ති සම්බන්ධෝ. **"ලෝලුප්ප ...පෙ.... භූත"**න්ති වුත්තත්තා පඤ්චද්වාරේ පඨමං ඉමිනා චිත්තේන සෝමනස්සිතෝ හුත්වා පච්ඡා මහාකිරියචිත්තේහි තං තං අත්ථං විචිනෝතීති අයමත්ථෝ වුත්තෝ විය දිස්සති. පුබ්බේයේව පන මනෝද්වාරිකචිත්තේන පධානසාරුප්පට්ඨානාදිං පරිච්ඡින්දන්තස්ස පඤ්චද්වාරේ තාදිසස්සේව තාදිසේසු රූපාදීසු ඉදං චිත්තං පවත්තතීති වදන්ති. අයම්පි අත්ථෝ පඤ්චද්වාරේ ඒව පවත්තං ලෝලුප්පතණ්හාපහානාදිපච්චවෙක්ඛණාහේතු යථාවුත්තකාරණභූතං ජාතන්ති ඒවං යෝජෙත්වා සක්කා වත්තුං. ඒවඤ්ච සති ඉමස්ස චිත්තස්ස පච්චයභූතා පුරිමා පවත්තීති ඉදම්පි වචනං සමත්ථිතං හෝති.

එත්ථ ච පඤ්චද්වාරේ ඉමිනා චිත්තේන සෝමනස්සුප්පාදනමත්තං දට්ඨබ්බං, න හාසුප්පාදනං පඤ්චද්වාරිකචිත්තානං අවිඤ්ඤත්තිජනකත්තා, මනෝද්වාරේ පන හාසුප්පාදනං හෝති. තේනේව හි **අට්ඨකථායං** පඤ්චද්වාරේ "සෝමනස්සිතෝ හෝතී"ති එත්තකමේව වුත්තං, මනෝද්වාරේ ච "හාසයමාන"න්ති. ඉමිනා හසිතුප්පාදචිත්තේන පවත්තියමානම්පි භගවතෝ සිතකරණං පුබ්බේනිවාස-අනාගතංස-සබ්බඤ්ඤුතඤ්ඤාණානං අනුවත්තකත්තා ඤාණානුපරිවත්තියේවාති. ඒවං පන ඤාණානුපරිවත්තිභාවේ සති න කෝචි පාළිඅට්ඨකථානං විරෝධෝ, ඒවඤ්ච කත්වා **අට්ඨකථායං** "තේසං ඤාණානං චිණ්ණපරියන්තේ ඉදං චිත්තං උප්පජ්ජතී"ති වුත්තං. අවස්සඤ්ච ඒතං ඒවං ඉච්ඡිතබ්බං, අඤ්ඤථා ආවජ්ජනචිත්තස්සපි භගවතෝ පවත්ති න යුජ්ජෙය්‍ය. තස්සපි හි විඤ්ඤත්තිසමුට්ඨාපකභාවස්ස නිච්ඡිතත්තා, න ච විඤ්ඤත්තිසමුට්ඨාපකත්තේ තං සමුට්ඨිතාය විඤ්ඤත්තියා කායකම්මාදිභාවං ආවජ්ජනභාවෝ විබන්ධතීති.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 568 යටතේ)]**

**මනෝවිඤ්ඤාණධාතු උප්පන්නා හෝති** -පෙ- **සෝමනස්සසහගතානි ඉති** මනෝවිඤ්ඤාණධාතු -පෙ- සහගතානි යන **ඉදං චිත්තං** මේ හසිතුප්පාද චිත්තය තෙමේ **අඤ්ඤෙසං** අන්‍යයන්ට **අසාධාරණං** අසාධාරණයහ **ඛීණාසවස්සේව පාටිපුග්ගලිකං** රහත් වූ පුද්ගලයින්ටම අයත්ය **ඡසු ද්වාරේසු** ද්වාර සයෙහිම **ලබ්භති (උප්පජ්ජති)** උපදී **හි** විස්තර කෙරෙමි **ඛීණාසවෝ** ක්ෂීණාශ්‍රවයන් වහන්සේ **පධානසාරුප්පං** පධන්වීර්‍ය්‍ය වැඩුමට සුදුසු **ඨානං දිස්වා** ස්ථානයක් දැක **ඉමිනා චිත්තේන** මේ සිතින් **චක්ඛුද්වාරේ** චක්ෂුර්ද්වාරෙහි **සෝමනස්සිතෝ හෝති** සොම්නසින් යුක්තවූවෙක් වෙයි **භණ්ඩභාජනීයට්ඨානං පත්වා** භාණ්ඩ බෙදෙන ස්ථානයකට පැමිණ **මහාසද්දං කත්වා** මහත් ශබ්ද කොට **ලුද්ධලුද්ධේසු** ලොල් ලොල් වූ භාණ්ඩ **ගණ්හන්තේසු** ගන්නා කල්හි **මේ** මාගේ **ඒවරූපා නාම** මෙබඳු නම් **ලෝලුප්පතණ්හා** ලොල් වූ තෘෂ්ණාව **පහීනා ඉති** ප්‍රහීන යැයි **ඉමිනා චිත්තේන** මේ සිතින් **සෝතද්වාරේ** ශ්‍රෝත්‍රද්වාරයෙහි **සෝමනස්සිතෝ හෝති** සොම්නසින් යුක්තවූවෙක් වෙයි **ගන්ධේහි වා** ගන්ධයන්ගෙන් හෝ **පුප්ඵේහි වා** පුෂ්පයන්ගෙන්

හෝ **චේතියං** චෛත්‍යය **පූජෙන්තෝ** පුදනුයේ **ඉමිනා චිත්තේන** මේ සිතින් **ඝානද්වාරේ** ඝ්‍රාණද්වාරයෙහි **සෝමනස්සිතෝ හෝති** සොම්නසින් යුක්තවූයෙක් වෙයි.

("ලෝලුප්පතණ්හා පහීනා" යනු මේ හසිතුප්පාද චිත්තයට ප්‍රත්‍යය වූ පෙර පැවැති මහාක්‍රියා චිත්ත ප්‍රවෘත්තිය දක්වනලදි. ඒ ක්‍රියා සිතින් රහතන් වහන්සේලා මෙසේ ප්‍රත්‍යවේක්ෂාකරයි. මේ විචාරණ ප්‍රඥව රහිත වූ හසිතුප්පාද චිත්තය වනාහි හුදෙක් සෝමනස්ස මාත්‍රයක් උපදවන්නහුට වෙයි. එහෙයින් "ඉදං පන චිත්තං විචාරණාපඤ්ඤරහිතං" යනුවෙන් කියනලදි. චේතිය පූජාදියෙහි ද මෙසේ දතයුතුයි යනු මූලටීකායි. "ඒවං ඝානද්වාරාදීසුපි මහාකිරියචිත්තේහි තස්මිං තස්මිං විසයේ ඉදමත්ථිකතාය පරිච්ඡින්නාය ඉදං චිත්තං වත්තතීති දස්සේති" යනු අනුටීකායි)

**රසසම්පන්නං** රසින් යුක්ත වූ **පිණ්ඩපාතං ලද්ධා** පිණ්ඩපාතයක් ලැබ **භාජෙත්වා** (සඞ්ඝයාට) බෙද **පරිභුඤ්ජන්තෝ** පරිභෝග කරනුයේ **වත** ඒකාන්තයෙන් **මේ** මා විසින් **සාරාණීයධම්මෝ** සාරණීය ධර්මය **පූරිතෝ ඉති** පූරනලද්දේ යැයි **ඉමිනා චිත්තේන** මේ සිතින් **ජිව්හාද්වාරේ** ජිව්හාද්වාරයෙහි **සෝමනස්සිතෝ හෝති** සොම්නසින් යුක්තවූයෙක් වෙයි **අභිසමාචාරවත්තං කරොන්තෝ** ආභිසාමාචාරික වත් කරනුයේ **මේ** මා විසින් **කායද්වාරේ (කායද්වාරේන)** කායද්වාරයෙන් **වත්තං** වත් **පූරිතං ඉති** පූරනලද්දේ යැයි **ඉමිනා චිත්තේන** මේ සිතින් **කායද්වාරේ** කායද්වාරයෙහි **සෝමනස්සිතෝ හෝති** සොම්නසින් යුක්තවූයෙක් වෙයි **තාව** පළමුව **ඒවං** මෙසේ මේ සිත **පඤ්චද්වාරේ** පඤ්චද්වාරයෙහි **ලබ්භති (උප්පජ්ජති)** උපදී.

("වත්තං කරොන්තෝ" යනු මේ ආභිසමාචාරික වත කරන්නහුට ඵොට්ඨබ්බාරම්මණයෙහි කායද්වාරචිත්ත ප්‍රවෘත්තිය සඳහා කියනලදි. පඤ්චද්වාරයට අනුගත වී පඤ්චද්වාරයෙහි ලබන්නා වූ හසිතුප්පාදචිත්තය සඳහා හෝ, ලෝලුප්පතණ්හා ප්‍රහීන ආදීය ප්‍රත්‍යවේක්ෂණයට හේතු වූ මේ පැවැත්ම සඳහාම ඒ ඒ තැන "ඉමිනා චිත්තේන සෝමනස්සිතෝ හෝති" යනුවෙන් කියනලදැයි "ඒවං තාව පඤ්චද්වාරේ ලබ්භති" යැයි දේශනා කළේය යනු මූලටීකායි)

("පඤ්චද්වාරානුගතං හුත්වා ලබ්භමානං" යනු පඤ්චද්වාරයෙහි පැවති මහාක්‍රියා චිත්තයන්ට පසුව උපදින භාවයෙන් මේ චිත්තයාගේ පැවැත්ම සඳහා දේශනා කරනලදි. පඤ්චද්වාරයෙහිම හෝ මේ චිත්තය පවතිනලදැයි සම්බන්ධයයි. "ලෝලුප්ප -පෙ- භූතං" යනුවෙන් කියනලද බැවින් පඤ්චද්වාරයෙහි ප්‍රථමයෙන් මේ හසිතුප්පාද සිතින් සොම්නස් ඇත්තෙක් වී පසුව මහාක්‍රියා චිත්තයන්ගෙන් ඒ ඒ අර්ථය විමසයි යන මේ අර්ථය කියන ලද්දක් මෙන් පෙනෙයි. නොහොත් පෙර මනෝද්වාරික සිතින්ම පධන්වීයෑයට වැඩුමට සුදුසු එබඳු ස්ථානාදිය පිරිසිඳින්නහුට පඤ්චද්වාරයෙහි එබඳු රූපයන්හි මේ සිත පවති යැයි කියත්. මේ අර්ථය ද පඤ්චද්වාරයෙහිම පැවති ලෝලුප්පතණ්හාප්‍රහානාදී ප්‍රත්‍යවේක්ෂණ හේතු ලෙස ඉහතින් දක්වනලද කාරණයෙන් හටගන්නා ලද යැයි මෙසේ යොද කියන්නට හැකිය. මෙසේ ඇති කල්හි මේ චිත්තයට ප්‍රත්‍යය වූ පෙර මහාක්‍රියා චිත්තප්‍රවෘත්තිය පවතී යන මේ වචනය ද යෝග්‍ය වෙයි. මෙහි ද පඤ්චද්වාරයෙහි මේ සිතින් සොම්නස් වේදනාවගේ ඉපදීම් මාත්‍රයක් දතයුතුයි. පඤ්චද්වාරික චිත්තයන්ගේ විඤ්ඤත්ති නූපදවන බැවින් සිනහාව ඉපදවීමක් නොවෙයි. මනෝද්වාරයෙහි වනාහි සිනහාව ඉපදවීම වෙයි. එහෙයින් අර්ථකථායෙහි "පඤ්චද්වාරේ සෝමනස්සිතෝ හෝති" යැයි මෙපමණක්ම දේශනා කරනලදි. මනෝද්වාරයෙහි "හාසයමානං" යනුවෙන් දේශනා කරනලදි යනු අනුටීකායි)

**මනෝද්වාරේ පන** මනෝද්වාරයෙහි වනාහි **අතීතානාගතමාරබ්භ** අතීත අනාගත අරමුණු අරභයා **උප්පජ්ජති** උපදී **ජෝතිපාලමාණවක (කාලස්මිං)** ජෝතිපාල මාණවක කාලයෙහි **මග්ඝදේවරාජ (කාලස්මිං)** මග්ඝදේවරාජ කාලයෙහි **කණ්හතාපසාදිකාලස්මිඤ්චි** කණ්හ තාපස ආදී කාලයෙහි **කතං** කරනලද **කාරණං** කාරණා **ආවජ්ජෙත්වා** ආවර්ජනය කොට **තථාගතෝ** තථාගතයන් වහන්සේ **සිතං** සිනහාව **පාත්වාකාසි** පහලකළ සේක **තං පන** ඒ සිනහාව වනාහි **පුබ්බේනිවාසඤාණ** පූර්වේනිවාස ඤාණය **සබ්බඤ්ඤුතඤාණානං** සර්වඥතාඤාණය යන ඤාණයන්ගේ **කිච්චං** කෘත්‍යයි **තේසං පන ද්වින්නං ඤාණානං** ඒ ඤාණ දෙදෙනාගේ **චිණ්ණපරියන්තේ** සිඳුණු කෙළවරෙහි **ඉදං චිත්තං** මේ හසිතුප්පාද චිත්තය **හාසයමානං** සිනහාව උපදවමින් **උප්පජ්ජති** උපදී **අනාගතේ** අනාගතයෙහි **තන්තිස්සරෝ (පච්චේකබුද්ධෝ)** තන්තිස්සර නම් පසේ බුදුකෙනෙක් ද **මුදිඞ්ගස්සරෝ පච්චේකබුද්ධෝ** මුදිඞ්ගස්සර නම් පසේ බුදුකෙනෙක් ද **භවිස්සති ඉති** වන්නේ යැයි **සිතං** සිනහාව **පාත්වාකාසි** පහලකළ සේක **තම්පි** ඒ සිනහාව ද **අනාගතංසඤාණ** අනාගතංස ඤාණ **සබ්බඤ්ඤුතඤාණානං** සර්වඥතා ඤාණ යන ඤාණයන්ගේ **කිච්චං** කෘත්‍යයි **තේසං පන ද්වින්නං ඤාණානං** ඒ ඤාණ දෙදෙනාගේ **චිණ්ණපරියන්තේ** සිඳුණු කෙළවරෙහි **ඉදං චිත්තං** මේ හසිතුප්පාද චිත්තය **හාසයමානං** සිනහාව උපදවමින් **උප්පජ්ජති** උපදී.

(මේ හසිතුප්පාද සිතින් පවතින්නා වූ භාග්‍යවතුන්වහන්සේගේ සිනහා පහලකිරීම පූර්වේනිවාස, අනාගතංස, සර්වඥතා ඤාණයන්ට අනුවර්තක බැවින් ඤාණානුපරිවර්තකම වෙයි. මෙසේ ඤාණානුපරිවර්තක භාවය ඇති කල්හි පෙල-අර්ථකථාවන්ට කිසි විරෝධයක් නොවෙයි. මෙසේද දේශනා කොට අර්ථකථායෙහි "තේසං ඤාණානං චිණ්ණපරියන්තේ ඉදං චිත්තං උප්පජ්ජති" යැයි දේශනා කරනලදි. ඒකාන්තයෙන් මේ කාරණය මෙසේ කැමති වියයුතුයි. අන් අයුරකින් භාග්‍යවතුන් වහන්සේගේ මනෝද්වාරාවර්ජන චිත්තයගේ ද පැවැත්ම යුතු නොවන්නේය. ඒ චිත්තයට ද වනාහි විඤ්ඤත්ති ඉපදවීම් භාවය නොහැමැති බැවිනි. විඤ්ඤත්ති ඉපදවීම ඇති කල්හි ඒ මනෝද්වාරාවර්ජන සිත උපදවනලද විඤ්ඤත්තියෙන් කායකර්මාදී බව හා ආවර්ජන භාවය නොබැදෙයි යනු අනුටීකායි)

**නිද්දේසවාරේ පන** නිද්දේශ වාරයෙහි වනාහි **සේස අහේතුකචිත්තේහි** සෙසු අහේතුක චිත්තයන්ට වඩා **බලවතරතාය** බලවත් බැවින් **අස්ස** මේ චිත්තයාගේ **චිත්තේකග්ගතා** චිත්තේකාග්‍රතාව **සමාධිබලං පාපෙත්වා** සමාධි බලයට පමුණුවා **ඨපිතා** තබනලදි **විරියම්පි** වීර්‍ය්‍ය ද **විරියබලං** විරියබලයට **පාපෙත්වා** පමුණුවා (**ඨපිතා** තබනලදි) **උද්දේසවාරේ පන** උද්දේශ වාරයෙහි වනාහි **සමාධිබලං හෝති** සමාධි බලය වෙයි **වීරියබලං** වීර්‍ය්‍ය බලය **හෝති ඉති** වෙයි යැයි **අනාගතත්තා** නොපැමිණි බැවින් **පරිපුණ්ණේන බලට්ඨේන** පිරිපුන් බලය ඇති කාරණයෙන් **ඒතං ද්වයං** ඒ දෙක **බලං නාම** බල නම් **න හෝති** නොවෙයි **යස්මා පන** යම්හෙයකින් වනාහි **නේවකුසලා** කුසල හේතු නැති බැවින් ද **නාකුසලා** අකුසල හේතු නැති බැවින් ද **තස්මා** එබැවින් **බලන්ති** බලය යැයි **වත්වාන** දේශනා කොට **ඨපිතං** තබනලද්දේ ද **යස්මා ච** යම්හෙයකින් ද **නිප්පරියායෙන්** නිෂ්පර්‍ය්‍යායෙන් **න බලං** බල නම් නොවෙයි **තස්මා** එබැවින් **සඞ්ගහවාරේපි** සඞ්ග්‍රහ වාරයෙහි ද **ද්වේ බලානි හොන්ති ඉති** බල දෙකක් වෙත් යැයි **න වුත්තං** දේශනා නොකරනලදි **සේසං සබ්බං** සෙසු සියල්ල **සෝමනස්සසහගතාහේතුක මනෝවිඤ්ඤාණධාතුනිද්දේසේ** සෝමනස්සසහගත

අහේතුක මනෝවිඤ්ඤාණධාතු නිර්දේශයෙහි **වුත්තනයේනේව** දේසිත නයෙන්ම **වේදිතබ්බං** දතයුතුය. [ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]

නනු ච අතීතංසාදීසු අප්පටිහතාදීසු අප්පටිහතඤාණං වත්වා "ඉමේහි තීහි ධම්මේහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතෝ සබ්බං කායකම්මං ඤාණපුබ්බඞ්ගමං ඤාණානුපරිවත්ත"න්ති වචනතෝ විචාරණපඤ්ඤාරහිතාය ඒතාය කථං භගවතෝ උප්පත්ති යුජ්ජෙය්‍යාති? හසිතුප්පාදචිත්තේන පවත්තියමානම්පි භගවතෝ සිතකරණං පුබ්බේනිවාසඅනාගතංසසබ්බඤ්ඤුතඤ්ඤාණානං අනුවත්තකත්තා ඤාණානුපරිවත්තියේව, ඒවං පන ඤාණානුපරිවත්තිභාවේ සති න කෝචි පාළිවිරෝධෝ. ඒවඤ්ච කත්වා **අට්ඨකථායං** "තේසං ඤාණානං චිණ්ණපරියන්තේ ඉදං චිත්තං උප්පජ්ජතී"ති වුත්තං. අවස්සඤ්චේතං ඒවං ඉච්ඡිතබ්බං, ඉතරථා අඤ්ඤස්සාපි විඤ්ඤත්තිසමුට්ඨාපකස්ස අහේතුකචිත්තස්ස භගවතෝ උප්පත්ති න යුජ්ජෙය්‍ය. න හි විඤ්ඤත්තිසමුට්ඨාපකස්ස තං සමුට්ඨිතාය විඤ්ඤත්තියා කායකම්මාදිභාවං ආපජ්ජනභාවෝ විබන්ධතීති. ඒවඤ්ච කත්වා පඤ්චද්වාරේ ඉමිනා චිත්තේන සෝමනස්සුප්පාදනමත්තං දට්ඨබ්බං, න හාසුප්පාදනං පඤ්චද්වාරිකචිත්තානං අවිඤ්ඤත්තිජනකත්තා. මනෝද්වාරේ පන හාසුප්පාදනං. තේනේව හි **අට්ඨකථායං** පඤ්චද්වාරේ "සෝමනස්සිතෝ හෝතී"ති (ධ. ස. අට්ඨ. 568) එත්තකමේව වුත්තං, මනෝද්වාරේ ච "හාසයමාන"න්ති. ඉධ පන "හසිතුප්පාදකිච්චා"ති අවිසේසවචනං පඤ්චද්වාරේ සෝමනස්සකරණවසේන පවත්තස්සපි මනෝද්වාරේ හාසජනනස්ස පච්චයභාවං සන්ධාය වුත්තන්ති වේදිතබ්බං. **හසිතුප්පාදකිච්චා**ති හසිතස්සේව උප්පාදනකිච්චා. තේනේව හි තං "හසිතුප්පාද"න්ති වුච්චති, න පන අඤ්ඤේසං හසිතුප්පාදචිත්තානං අභාවතෝ. තථා හි වක්ඛති "කුසලතෝ චතූහී"තිආදි.

**ඡ අසාධාරණඤාණානී**ති ආසයානුසයඤාණං, ඉන්ද්‍රියපරොපරියඤාණං, යමකපාටිහාරියඤාණං, මහාකරුණාසමාපත්තිඤාණං, සබ්බඤ්ඤුතඤ්ඤාණං, අනාවරණඤාණන්ති ඉමානි ඡ පච්චේකබුද්ධාදීහි අසාධාරණානි ඤාණානි. නනු ච සබ්බඤ්ඤුතඤ්ඤාණමේව අනාවරණඤාණං, ඉතරථා සබ්බඤ්ඤුතානාවරණඤාණානං අසබ්බඤ්ඤුතසාවරණඤාණතා ච ආපජ්ජෙය්‍ය, තථා හි යදි සබ්බඤ්ඤුතඤ්ඤාණතෝ අඤ්ඤමනාවරණඤාණං සියා, තස්ස සාවරණත්තා සාවරණෝ ච විසයේ සභාවපටිවේධාභාවතෝ සබ්බඤ්ඤුභාවං න සිජ්ඣෙය්‍ය, අනාවරණඤාණස්ස ච අසබ්බධම්මාරම්මණභාවේන යත්ථ තං න පවත්තති, තත්ථාවරණසම්භවතෝ අනාවරණභාවෝපි න සියාති? සච්චමේතං, ඒකමේව තං ඤාණං අනවසේසසඞ්ඛතාසඞ්ඛතසම්මුතිධම්මවිසයත්තා සබ්බඤ්ඤුතඤ්ඤාණං, තත්ථ ච ආවරණාභාවතෝ නිස්සඞ්ගචාරමුපාදය අනාවරණඤාණන්ති ඒවං විසයපවත්තිභේදේන අඤ්ඤේහි අසාධාරණභාවදස්සනත්ථං ද්වේධා වුත්තන්ති. යථාහ;

"සබ්බං සඞ්ඛතමසඞ්ඛතං අනවසේසං ජානාතීති සබ්බඤ්ඤුතඤ්ඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණ"න්තිආදි (පටි. ම. 1.119).

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 55 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 184-186 පිටු]**

අතීතංසාදියෙහි හෙවත් අතීත කාලයෙහි නොපැකිළෙන අභිඥා නුවණ වදරා මේ තුන් වැදෑරුම් ධර්මයෙන් සමන්විත වූ භාග්‍යවතුන් වහන්සේගේ සියළු කාය

කර්මය නුවණ පෙරටු කොට පවත්නේය. නුවණට අනුව පවත්තේ යැයි ප්‍රතිසම්භිද මාර්ගයෙහි වදළ බැවින් භාග්‍යවතුන් වහන්සේ හට විචාරන ප්‍රඥවෙන් පහවූ මේ හසිතෝත්පාද චිත්තයාගේ උත්පත්තිය කෙසේ යෙදෙන්නේද යත්? භාග්‍යවතුන් වහන්සේගේ සිනහා පහළ කිරීම හසිතෝත්පාද චිත්තයෙන් උපදවනු ලබන්නේ නමුදු පූර්වේනිවාසඥාණ අනාගතංසඥාණ සර්වඥතාඥාණයන්ට අනුව පවත්නා හෙයින් නුවණට අනුවම හටගන්නේයි. මෙසේ ඥාණානුපරිවර්තීභාවය ඇති කල්හි කිසි පාළි විරෝධයක් නොවන්නේයි. එහෙයින් අටුවාවෙහි ඒ පූර්වේනිවාස අනාගතංස සර්වඥතාඥාණයන් පැවැතීමට අනතුරුවම මේ හසිතෝත්පාද චිත්තය උපදනේ යැයි කියනලදි. ඒකාන්තයෙන් මේ හසිතෝත්පාද චිත්තය මෙසේම කැමතිවිය යුත්තේය. අනික් ප්‍රකාරයෙකින් වී නම් විඥප්තිජනක වූ අන්‍යවූ අහේතුක චිත්තය ද භාග්‍යවතුන් වහන්සේහට ඉපදීම නොයෙදෙන්නේය. විඥප්ති ජනක වූ ඒ අහේතුක චිත්තය ද ඒ සිතින් හටගන්නා විඥප්තියගේ කාය කර්මාදී බවට පැමිණීම ද නොවළක්වන්නේයි. මෙහි ද භාග්‍යවතුන් වහන්සේලාට පඤ්චද්වාරයෙහි මේ හසිතෝත්පාද චිත්තයෙන් සොම්නස් ඉපදීම් මාත්‍රයක් දතයුත්තේයි. සිනහා ඉපදවීම නොදතයුත්තේය. කුමක් හෙයින යත්? පඤ්චද්වාරික චිත්තයන්ගේ විඥප්ති ජනක බවක් නැති හෙයිනි. මනෝද්වාරයෙහි සිනහා ඉපදවීම දතයුත්තේය. එහෙයින්ම අටුවායෙහි පඤ්චද්වාරයෙහි "සොම්නස් ඇති වෙයි" යනු මෙපමණක්ම කියන ලද්දේය. මනෝද්වාරයෙහි "සිනහා උපදවමින්" යන මෙපමණක් ද කියන ලද්දේය. මෙහි වනාහි "හසිතුප්පාදකිච්චා" යන අවිශේෂ වචනය පඤ්චද්වාරයෙහි සොම්නස් ඇති කිරීම් වශයෙන් හටගන්නා වූද මේ චිත්තයාගේ මනෝද්වාරයෙහි සිනහා ඉපදවීමට උපකාරවන බව සඳහා කියන ලද්දේ යැයි දතයුතුයි. "හසිතුප්පාදකිච්චා" යන මෙහි සිනහාවගේම ඉපදීම කෘත්‍යය කොට ඇත්තීය යන අර්ථයි. එහෙයින්ම ඒ සිත හසිතුප්පාදයයි කියනු ලැබේ. අනික් හසිතෝත්පාද චිත්තයන් නැති බැවින් නොවෙයි. එහෙයින් හෙවත් අනිකුදු හසිතෝත්පාද චිත්තයන් ඇති හෙයින් "කුසලතෝ චතූහි" යනාදිය කීයේය.

"ඡ අසාධාරණඥාණානි" යන මෙහි ආසයානුසනඥාණය ඉන්ද්‍රියපරෝපරියත්තඥාණය යමකපාටිහාරියඥාණය මහාකරුණාසමාපත්තිඥාණය සබ්බඤ්ඤුතඥාණය අනාවරණඥාණය යන මේ ඥාණයෝ සදෙන ප්‍රත්‍යේක බුද්ධාදීන් හා අසාධාරණ ඥාණයෝ නම් වෙති. මෙහි සර්වඥතා ඥාණයම අනාවරණඥාණ නම් නොවෙයි ද? එසේ නොවේ නම් සර්වඥතාඥාණ අනාවරණ ඥාණයන්ගේ අසර්වඥතාඥාණ සාවරණඥාණ බවට පැමිණෙන්නේ නොවේද යත්? ඒ එසේමැයි; ඉදින් සර්වඥතාඥාණයෙන් අන්‍යවූ අනාවරණඥාණයක් වියයුතු නම් ඒ ඥාණය ආවර්ණ සහිත බැවින් ආවර්ණ සහිත වූ ගෝචරයෙහි ද ස්වභාව ප්‍රතිවේධයක් නොවන හෙයින් සර්වඥ බව සිද්ධ නොවිය යුත්තේය. අනාවරණඥාණයට ද සර්ව ධර්මයන් අරමුණු නොවන හෙයින් යම්තැනක ඒ ඥාණය නොපවත්නේ ද එතන්හි ආවරණය සම්භව වන හෙයින් අනාවරණ භාවය ද නොවිය යුත්තේය. මේ වචනය සැබෑමය. සියළු සඞ්ඛතාසඞ්ඛත සම්මුති ධර්මයන් ගෝචර කොට ඇති බැවින් මේ ඥාණය එකක්ම නොවෙයි. යම්තැනක සර්වඥතාඥාණය පවත්නේ ද එහි ආවරණයක් නැති බැවින් නිස්ඞ්ගචාරසඞ්ඛ්‍යාත නොපැකිල පැවැත්ම කාරණා කොටගෙන අනාවරණඥාණයයි කියා ද ව්‍යවහාර කෙරෙත්. මෙසේ ගෝචර ප්‍රවෘත්ති භේදයෙන් අසාධාරණ බව දක්වනු පිණිස දෙයාකාරයෙන් කියන ලද්දේය. එහෙයින් වදළහ ප්‍රතිසම්භිදවෙහි:—

"සබ්බං සඞ්ඛතමසඞ්ඛතමනවසේසං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං තත්ථාවරණං නත්ථීති අනාවරණඤාණං" යි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 156-157 පිටු]**

## ආවර්ජන දෙදෙන විපාක නොදීමට හේතු:—

පෘථුග්ජන ශෛක්‍ෂ සන්තානයෙහි උපදනා වූ ඒ අහේතුක ක්‍රියාවෝ දෙදෙන ආසේවන ප්‍රත්‍යය නොලබන හෙයින් විපාක නොදෙන්නේ යැයිද දතයුතු. ඊට උපමා කවරයත්? කිසිකලෙක මල්ඵල හටනොගත්තා වූ වෘක්‍ෂයක් වැසි නැත්තාවූ කාලයෙක්හි අකල් මල් ගත්තේ ද එයින් ඵලය නූපදී. ඒ පරිද්දෙන්ම පෘථුග්ජන ශෛක්‍ෂ්‍ය සන්තානයෙහි උපදනා වූ පඤ්චද්වාරාවජ්ජන මනෝද්වාරාවජ්ජන දෙදෙන සමාන චිත්තයෙකින් ආසේවන ප්‍රත්‍යය නොලබන හෙයින් අකල් මල් මෙන් විපාක නූපදවන්නා වූ යැයි දතයුතුයි. **[විස්තර භාව සන්නය 36 පිට]**

## අහේතුක චිත්තයන්ගේ අර්ථ:—

තත්ථ දුවිධං චක්ඛු මංසචක්ඛු පඤ්ඤාචක්ඛු ච. ඒතේසු 'බුද්ධචක්ඛු සමන්තචක්ඛු ඤාණචක්ඛු දිබ්බචක්ඛු ධම්මචක්ඛූ'ති පඤ්චවිධං පඤ්ඤාචක්ඛු. තත්ථ "අද්දසං ඛෝ අහං, භික්ඛවේ, බුද්ධචක්ඛුනා ලෝකං වෝලෝකෙන්තෝ සත්තේ අප්පරජක්ඛේ…පෙ…. දුවිඤ්ඤාපයේ"ති (ම. නි. 1.283) ඉදං බුද්ධචක්ඛු නාම. "සමන්තචක්ඛු වුච්චති සබ්බඤ්ඤුතඤ්ඤාණ"න්ති ඉදං සමන්තචක්ඛු නාම. "චක්ඛුං උදපාදි ඤාණං උදපාදී"ති (සං. නි. 5.1081; මහාව. 15) ඉදං ඤාණචක්ඛු නාම. "අද්දසං ඛෝ අහං, භික්ඛවේ, දිබ්බේන චක්ඛුනා විසුද්ධේනා"ති (ම. නි. 1.284) ඉදං දිබ්බචක්ඛු නාම. "තස්මිං යේවාසනේ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදී"ති (ම. නි. 2.395) ඉදං හෙට්ඨිමමග්ගත්තයසඞ්ඛාතං ඤාණං ධම්මචක්ඛු නාම.

මංසචක්ඛුපි පසාදචක්ඛු සසම්භාරචක්ඛූති දුවිධං හෝති. තත්ථ යෝයං අක්ඛිකූපකේ පතිට්ඨිතෝ හෙට්ඨා අක්ඛිකූපකට්ඨිකේන, උපරි භමුකට්ඨිකේන, උභතෝ අක්ඛිකූටේහි, අන්තෝ මත්ථලුඞ්ගේන, බහිද්ධා අක්ඛිලෝමේහි පරිච්ඡින්නෝ මංසපිණ්ඩෝ. සඞ්ඛේපතෝ 'චතස්සෝ ධාතුයෝ, වණ්ණෝ ගන්ධෝ රසෝ ඕජා, සම්භවෝ සණ්ඨානං, ජීවිතං භාවෝ කායපසාදෝ චක්ඛුපසාදෝ'ති චුද්දසසම්භාරෝ. විත්ථාරතෝ 'චතස්සෝ ධාතුයෝ, තං සන්නිස්සිතවණ්ණගන්ධරසඕජාසණ්ඨානසම්භවා චා'ති ඉමානි දස චතුසමුට්ඨානිකත්තා චත්තාලීසං හොන්ති. ජීවිතං භාවෝ කායපසාදෝ චක්ඛුපසාදෝති චත්තාරි ඒකන්තකම්මසමුට්ඨානානේවාති ඉමේසං චතුචත්තාලීසාය රූපානං වසේන චතුචත්තාලීසසම්භාරෝ. යං ලෝකෝ සේතං චක්ඛුං පුථුලං විසටං විත්ථිණ්ණං 'චක්ඛු'න්ති සඤ්ජානන්තෝ න චක්ඛුං සඤ්ජානාති, වත්ථුං චක්ඛුතෝ සඤ්ජානාති, සෝ මංසපිණ්ඩෝ අක්ඛිකූපේ පතිට්ඨිතෝ, නහාරුසුත්තකේන මත්ථලුඞ්ගේ ආබද්ධෝ, යත්ථ සේතම්පි අත්ථි, කණ්හම්පි ලෝහිතකම්පි, පථවීපි ආපෝපි තේජෝපි වායෝපි, යං සෙම්භුස්සදත්තා සේතං, පිත්තුස්සදත්තා කණ්හං, රුහිරුස්සදත්තා ලෝහිතකං, පථවුස්සදත්තා පත්ථිණ්ණං හෝති, ආපුස්සදත්තා පග්ඝරති, තේජුස්සදත්තා පරිදය්හති, වායුස්සදත්තා සම්භමති, ඉදං **සසම්භාරචක්ඛු** නාම.

යෝ පනෙත්ථ සතෝ එත්ථ පටිබද්ධෝ චතුන්නං මහාභූතානං උපාදය පසාදෝ, ඉදං **පසාදචක්ඛු** නාම. තදේතං තස්ස සසම්භාරචක්ඛුනෝ

සේතමණ්ඩලපරික්ඛිත්තස්ස කණ්හමණ්ඩලස්ස මජ්ඣෙ, අභිමුඛෙ ඨිතානං සරීරසණ්ඨානුප්පත්තිදේසභූතේ දිට්ඨිමණ්ඩලේ, සත්තසු පිචුපටලේසු ආසිත්තතේලං පිචුපටලානි විය, සත්තක්ඛිපටලානි බ්‍යාපෙත්වා, ධාරණන්හාපනමණ්ඩනබීජනකිච්චාහි චතූහි ධාතීහි ඛත්තියකුමාරෝ විය, සන්ධාරණාබන්ධනපරිපාචනසමුදීරණකිච්චාහි චතූහි ධාතූහි කතූපකාරං, උතුචිත්තාහාරේහි උපත්ථම්භියමානං, ආයුනා අනුපාලියමානං, වණ්ණගන්ධරසාදීහි පරිවුතං, පමාණතෝ ඌකාසිරමත්තං, චක්ඛුවිඤ්ඤාණාදීනං යථාරහං වත්ථුද්වාරභාවං සාධයමානං තිට්ඨති. වුත්තම්පි චේතං ධම්මසේනාපතිනා;

"යේන චක්ඛුප්පසාදේන, රූපානි මනුපස්සති;
පරිත්තං සුඛුමං ඒතං, ඌකාසිරසමූපම"න්ති.

චක්ඛු ච තං ආයතනඤ්චාති **චක්ඛායතනං. යං චක්ඛු චතුන්නං මහාභූතානං උපාදාය පසාදෝ**ති ඉධාපි උපයෝගත්ථේයේව සාමිවචනං; චත්තාරි මහාභූතානි උපාදියිත්වා පවත්තප්පසාදෝති අත්ථෝ. ඉමිනා පසාදචක්ඛුමේව ගණ්හාති, සේසචක්ඛුං පටික්ඛිපති. යං පන ඉන්ද්‍රියගෝචරසුත්තේ "ඒකං මහාභූතං උපාදාය පසාදෝ පථවීධාතුයා තීහි මහාභූතේහි සඞ්ගහිතෝ ආපෝධාතුයා ච තේජෝධාතුයා ච වායෝධාතුයා ච," චතුපරිවත්තසුත්තේ "ද්වින්නං මහාභූතානං උපාදාය පසාදෝ පථවීධාතුයා ච ආපෝධාතුයා ච ද්වීහි මහාභූතේහි සඞ්ගහිතෝ තේජෝධාතුයා ච වායෝධාතුයා චා"ති වුත්තං, තං පරියායේන වුත්තං. අයඤ්හි සුත්තන්තිකකථා නාම පරියායදේසනා. යෝ ච චතුන්නං මහාභූතානං උපාදාය පසාදෝ සෝ තේසු ඒකේකස්සාපි ද්වින්නං ද්වින්නම්පි පසාදෝයේවාති ඉමිනා පරියායේන තත්ථ දේසනා ආගතා. අභිධම්මෝ පන නිප්පරියායදේසනා නාම. තස්මා ඉධ 'චතුන්නං මහාභූතානං උපාදාය පසාදෝ'ති වුත්තං.
**[ධම්මසඞ්ගණී අට්ඨකථා (ඡට්ඨසඞ්ගායනා අංක 596 උපාදාභාජනීයකථා යටතේ); ධම්මසඞ්ගණී අට්ඨකථා 266-267 පිටු (හේ.වි.මු)]**

අප්පරජක්ඛාදිසත්තසමූහදස්සනං **බුද්ධචක්ඛු,** ඡසු අසාධාරණඤාණේසු ඉන්ද්‍රියපරෝපරියත්තඤාණං දට්ඨබ්බං. සබ්බසඞ්ඛතාසඞ්ඛතදස්සනං **සමන්තචක්ඛු.** "දුක්ඛං පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාත"න්ති (සං. නි. 5.1081; මහාව. 15) ඒවමාදිනා ආකාරේන පවත්තං ඤාණදස්සනං **ඤාණචක්ඛු,** තම්පි පුරිමද්වයම්පි කාමාවචරං. චතුසච්චධම්මදස්සනං **ධම්මචක්ඛු**. උපත්ථම්භභූතා චතුසමුට්ඨානිකරූපසන්තතියෝ සම්භාරා. සහ සම්භාරේහි **සසම්භාරං,** සම්භාරවන්තං. **සම්භවෝ**ති ආපෝධාතුමේව සම්භවසම්භූතමාහ. **සණ්ඨාන**න්ති වණ්ණායතනමේව පරිමණ්ඩලාදිසණ්ඨානභූතං. තේසං පන විසුං වචනං තථාභූතානං අතථාභූතානඤ්ච ආපෝධාතුවණ්ණායතනානං යථාවුත්තේ මංසපිණ්ඩේ විජ්ජමානත්තා. චුද්දසසම්භාරෝ හි මංසපිණ්ඩෝ. සම්භවස්ස චතුධාතුනිස්සිතේහි සහ වුත්තස්ස ධාතුත්තයනිස්සිතතා යෝජේතබ්බා. ආපෝධාතුවණ්ණායතනානමේව වා සම්භවසණ්ඨානාභාවා විසුං වුත්තාති චතුධාතුනිස්සිතතා ච න විරුජ්ඣති. යං මංසපිණ්ඩං සේතාදිනා සඤ්ජානන්තෝ න පසාදචක්ඛුං සඤ්ජානාති, පත්ථිණ්ණතාදිවිසේසං වත්තුකාමෝ "පථවීපි අත්ථී"තිආදි වුත්තම්පි වදති.

**සරීරසණ්ඨානුප්පත්තිදේසභූතේ**ති ඒතේන අවසේසං කණ්හමණ්ඩලං පටික්ඛිපති. ස්නේහමිව සත්තක්ඛිපටලානි බ්‍යාපෙත්වා ඨිතාහේව අත්තනෝ නිස්සයභූතාහි චතූහි ධාතූහි කතූපකාරං තං නිස්සිතේහි ඒව ආයුවණ්ණාදීහි

අනුපාලිතපරිවාරිතං තිසන්තතිරූපසමුට්ඨාපකේහි උතුචිත්තාහාරේහි උපත්ථම්භියමානං තිට්ඨති. සත්තක්ඛිපටලානං බ්‍යාපනවචනේන ච අනේක කලාපගතභාවං චක්ඛුස්ස දස්සේති. **පමාණතෝ ඌකාසිරමත්ත**න්ති ඌකාසිරමත්තේ පදේසේ පවත්තනතෝ වුත්තං. **රූපානි මනුපස්සතී**ති **ම**-කාරෝ පදසන්ධිකරෝ. අථ වා **මනූ**ති මච්චෝ. උපකාරභූතේහි **සඞ්ගහිතෝ. පරියායේනා**ති චතුන්නං පසාදෝ තේසු ඒකස්ස ද්වින්නඤ්චාතිපි වත්තුං යුත්තෝ සමානධනානං ධනං වියාති ඒතේන පරියායේන. **[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 596 උපාදාභාජනීයකථා යටතේ)]**

සමන්තතෝ සබ්බසෝ දස්සනට්ඨේන චක්ඛු **සමන්තචක්ඛූ**ති ඉමමත්ථං දස්සේතුං **"සබ්බසඞ්ඛතාසඞ්ඛතදස්සන"**න්ති වුත්තං. **ඒවමාදිනා**ති එත්ථ **ආදි**-සද්දෝ "දුක්ඛං පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාත"න්ති තීසුපි පදේසු පච්චේකං යෝජේතබ්බෝ. "ඉදං දුක්ඛන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදී"තිආදිනා (මහාව. 15; පටි. ම. 2.30) හි පාළි පවත්තාති. **ආකාරේනා**ති ද්වාදසවිධේන ආකාරේන. **තම්පි කාමාවචරං** විපස්සනාපච්චවෙක්ඛණඤාණභාවතෝ. "ඤාණචක්ඛු සහඅරියමග්ගං විපස්සනාඤාණන්තිපි යුජ්ජතී"ති වදන්ති. අග්ගමග්ගේන පන සහ විපස්සනා පච්චවෙක්ඛණඤාණන්ති යුත්තං විය දිස්සති.

යථාවුත්තේ මංසපිණ්ඩේ සසම්භාරේ චක්ඛුවෝහාරෝ සන්තානවසේන පවත්තමානේ චතුසමුට්ඨානිකරූපධම්මේ උපාදාය පවත්තෝති **"චතු…පෙ…. සම්භාරා"**ති වුත්තං. **සණ්ඨාන**න්ති **වණ්ණායතනමේවා**ති තේන තේන ආකාරේන සන්නිවිට්ඨේසු මහාභූතේසු තං තං සණ්ඨානවසේන වණ්ණායතනස්ස විඤ්ඤායමානත්තා වුත්තං, න වණ්ණායතනස්සේව සණ්ඨානපඤ්ඤත්තියා උපාදානත්තා. තථා හි අන්ධකාරේ ඵුසිත්වාපි සණ්ඨානං විඤ්ඤායතීති. තථා ච වක්ඛති "දීඝාදීනි ඵුසිත්වාපි සක්කා ජානිතු"න්ති, (ධ. ස. අට්ඨ. 616) "දීඝාදිසන්නිවේසං භූතසමුදායං නිස්සායා"ති (ධ. ස. මූලටී. 616) ච.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 596 උපාදාභාජනීයකථා යටතේ)]**

**තත්ථ** මෙහි **චක්ඛු** චක්‍ෂුස **මංසචක්ඛු ච** මාංශ චක්‍ෂුස ද **පඤ්ඤචක්ඛු ච** පඤ්ඤා චක්‍ෂුස යැයි **දුවිධං** දෙවැදෑරුම් වෙයි **ඒතේසු** ඒ චක්‍ෂුහු දෙදෙනා අතරින් **පඤ්ඤචක්ඛු** පඤ්ඤා චක්‍ෂුස **බුද්ධචක්ඛු** බුද්ධචක්‍ෂුස **සමන්තචක්ඛු** සමන්තචක්‍ෂුස **ඤාණචක්ඛු** ඤාණචක්‍ෂුස **දිබ්බචක්ඛු** දිබ්බචක්‍ෂුස **ධම්මචක්ඛු ඉති** ධම්මචක්‍ෂුස යැයි **පඤ්චවිධං** පස් වැදෑරුම් වෙයි **තත්ථ** ඒ අතරින් **භික්ඛවේ** මහණෙනි **අහං බෝ** මම වනාහි **බුද්ධචක්ඛුනා** බුදු ඇසින් **ලෝකං** ලෝකය **වෝලෝකෙන්තෝ** බලනුයේ **අප්පරජක්ඛේ සත්තේ** අල්ප රජස් ඇති සත්වයන් -පෙ- **දුවිඤ්ඤාපයේ (සත්තේ)** අවබෝධ කරවීමට දුෂ්කර සත්වයන් **අද්දසං** දැක්කෙමි **ඉති ඉදං** යන මෙය **බුද්ධචක්ඛු නාම** බුද්ධචක්‍ෂුස නම් **සබ්බඤ්ඤුතඤාණං** සර්වඥතා ඤාණය **සමන්තචක්ඛු** සමන්ත චක්‍ෂුස **ඉති** යැයි **වුච්චති** කියනු ලැබේ **ඉදං** මෙය **සමන්තචක්ඛු නාම** සමන්ත චක්‍ෂුස නම් **චක්ඛුං උදපාදි** දහම් ඇස ඉපදුනේය **ඤාණං උදපාදි** ඤාණය ඉපදුනේය **ඉති ඉදං** යන මෙය **ඤාණචක්ඛු නාම** ඤාණ චක්‍ෂුස නම් **භික්ඛවේ** මහණෙනි **අහං බෝ** මම වනාහි **විසුද්ධේන** පිරිසිදු වූ **දිබ්බේන චක්ඛුනා** දිව්‍ය චක්‍ෂුසයෙන් **අද්දසං** දැක්කෙමි **ඉති ඉදං** යන මෙය **දිබ්බචක්ඛු නාම** දිබ්බ චක්‍ෂුස නම් **තස්මිංයේවාසනේ** ඒ ආසනයෙහිම **විරජං** කෙලෙස් රජස් නැති **වීතමලං** පහවූ කෙලෙස් මල ඇති **ධම්මචක්ඛුං** දහම් ඇස **උදපාදි** ඉපදුනේය **ඉති** යැයි **හෙට්ඨිමමග්ගත්තයසඞ්ඛාතං**

යට මාර්ගත්‍රය සඞ්ඛ්‍යාත වූ **ඉදං ඤාණං** මේ ඤාණය **ධම්මචක්ඛු නාම** ධම්ම චක්‍ෂුස නම් .

(අල්පරජස් ආදී සත්ව සමූහයා දකින්නා වූ බුද්ධචක්‍ෂුසයි. අසාධාරණ ඤාණ සය අතුරින් සඞ්ඛත අසඞ්ඛත සියල්ල දකින්නා වූ ඉන්ද්‍රිපරෝපරියත්ත ඤාණය සමන්ත චක්‍ෂුසයයි දතයුතුයි. (හාත්පසින් සියළු ආකාරයෙන් දකින අර්ථයෙන් චක්‍ෂුස සමන්ත චක්ඛු නම්. මේ අර්ථය දක්වන්නට "සබ්බසඞ්ඛතාසඞ්ඛතදස්සනං" යනුවෙන් දේශනා කරනලදි යනු අනුටීකායි) දුක්ඛං පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාතං යන මේ ආදී ආකාරයෙන් පැවතියා වූ ඤාණ දර්ශනය ඤාණ චක්‍ෂුසයි. ("ඒවමාදිනා" යන මෙහි ආදි ශබ්දයෙන් දුක්ඛං පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාතං යන මෙය අනිත් තුන් පදයන්හි වෙන වෙනම යෙදියුතුයි. "ආකාරේන" යනු දෙළොස් වැදෑරුම් ආකාරයෙන් යනු අනුටීකායි) චතුරාර්‍ය්‍ය සත්‍යය දකින්නා වූ ධම්ම චක්‍ෂුසය. මෙය ද විපස්සනා ප්‍රත්‍යවේක්‍ෂණ ඤාණ භාවයෙන් ඤාණචක්ඛු දිබ්බචක්ඛු යන දෙදෙනා මෙන් කාමාවචරයි. (අර්‍ය්‍ය මාර්ග සමඟ පැවති ඤාණ චක්‍ෂුස විපස්සනා ඤාණයක් හා යෙදෙයි යැයි කියත්. ආර්‍ය්‍ය මාර්ගය සමඟ විපස්සනා ප්‍රත්‍යවේක්‍ෂා ඤාණ ද යෙදෙන ලද්දක් මෙන් පෙනෙයි යනු අනුටීකායි) මූලටීකායි)

**මංසචක්ඛුපි** මාංශ චක්‍ෂුස ද **පසාදචක්ඛු** ප්‍රශාද චක්‍ෂුස **සසම්භාරචක්ඛු ඉති** සසම්භාර චක්‍ෂුස යැයි **දුවිධං** දෙවැදෑරුම් **හෝති** වෙයි **තත්‍ථ** ඒ අතරින් **යෝ අයං** යම් මේ චක්‍ෂුසක් **අක්ඛිකූපේ** අක්‍ෂි කූපයෙහි (ඇස් වළෙහි) **පතිට්ඨිතෝ** පිහිටන ලද්දේ ද (**සෝ** ඒ චක්‍ෂුස) **හෙට්ඨා** යටින් **අක්ඛිකූපකට්ඨිකේන** අක්‍ෂිකූප ඇටයෙන් ද **උපරි** ඉහළින් **භමුකට්ඨිකේන** බැම් ඇටයෙන් ද **උභතෝ** දෙපසින් **අක්ඛිකූටේහි** ඇස් කෙළවරින් ද **අන්තෝ** කෙළවර **මත්ථලුඞ්ගේන** හිස් මොළයෙන් ද **බහිද්ධා** බාහිරින් **අක්ඛිලෝමේන** අක්‍ෂි ලෝමයෙන් ද **පරිච්ඡින්නෝ මංසපිණ්ඩෝ** පිරිසිඳිනලද මාංශ පිණ්ඩයයි **සඞ්ඛේපතෝ** සඞ්ක්‍ෂේප වශයෙන් **චතස්සෝ ධාතුයෝ** සතර මහාධාතුහු **වණ්ණෝ** වර්ණය **ගන්ධෝ** ගන්ධය **රසෝ** රසය **ඕජා** ඕජාව **සම්භවෝ** සම්භවය **සණ්ඨානං** සණ්ඨානය ("**සම්භවෝ**ති ආපෝධාතුමේව සම්භවසම්භූතමාහ. **සණ්ඨාන**න්ති වණ්ණායතනමේව පරිමණ්ඩලාදිසණ්ඨානභූතං" යනු මූලටීකායි) **ජීවිතං** ජීවිතේන්ද්‍රය **භාවෝ** භාව රූපය **කායපසාදෝ** කායප්‍රශාදය **චක්ඛුපසාදෝ** චක්‍ෂුස්ප්‍රශාදය **ඉති** යන **චුද්දසසම්භාරෝ** තුදුස් රූප රාශියයි **විත්ථාරතෝ** විස්තර වශයෙන් **චතස්සෝ ධාතුයෝ** සතර මහාධාතූහු **තං සන්නිස්සිතවණ්ණගන්ධරසඕජා** එය ඇසුරු කොට පවතින්නා වූ වර්ණය ගන්ධය රසය ඕජාව **සණ්ඨානසම්භවා ච** සණ්ඨානය ද සම්භවය ද **ඉති** යන **ඉමානි දස** මේ රූපයෝ දස දෙන **චතුසමුට්ඨානිකත්තා** කර්මාදී සතරෙන් හටගත් බැවින් **චත්තාලීසං** සතළිසක් **හොන්ති** වෙත් **ජීවිතං** ජීවිතේන්ද්‍රිය **භාවෝ** භාව රූපය **කායපසාදෝ** කායප්‍රශාදය **චක්ඛුපසාදෝ ඉති** චක්‍ෂුප්‍රශාදය යන **චත්තාරි** සතර දෙන **ඒකන්ත** ඒකාන්තයෙන් **කම්මසමුට්ඨානානි ඒව** කර්මයෙන් හටගන්නෝම **ඉති (හොන්ති)** වෙත් **ඉමේසං චතුචත්තාලීසාය රූපානං වසේන** මේ සතළිස් සතරක් වූ රූපයන්ගේ වශයෙන් **චතුචත්තාලීසසම්භාරෝ** සිව්සාලිස් රූප සමූහයයි **ලෝකෝ** ලෝකයා **චක්ඛුං** ඇස **සේතං** සුදුය **පුථුලං** විශාලය **විසටං** පළලය **විත්ථිණ්ණං ඉති** මහත්ය යැයි **යං චක්ඛුං** යම් චක්‍ෂුසක් **චක්ඛුං ඉති** චක්‍ෂුස යැයි **සඤ්ජානන්තෝ** හැඳිනගන්නේ ද **චක්ඛුං** චක්‍ෂුස **න සඤ්ජානන්ති** නොහැඳිනගනී **වත්ථුං** වස්තුව **චක්ඛුතෝ** චක්‍ෂුස වශයෙන් **සඤ්ජානාති** හැඳිනගනී **සෝ මංසපිණ්ඩෝ** ඒ මාංශ පිණ්ඩය **අක්ඛිකූපේ** ඇස්වළෙහි **පතිට්ඨිතෝ** පිහිටනලදි **නහාරුසුත්තකේන** නහර වැල් සමඟින්

**මත්ථලුඞ්ගේ** හිස් මොළයෙහි **ආබන්ධෝ** බැඳෙන ලද්දේ (**හෝති** වෙයි) **යත්ථ** යම්තැනක **සේතම්පි අත්ථි** සුදු පැහැය ද ඇත **කණ්හම්පි (අත්ථි)** කළු පැහැය ද ඇත **ලෝහිතකම්පි (අත්ථි)** රතු පැහැය ද ඇත **පඨවීපි (අත්ථි)** පඨවි ධාතුව ද ඇත **ආපෝපි (අත්ථි)** ආපෝ ධාතුව ද ඇත **තේජෝපි (අත්ථි)** තේජෝ ධාතුව ද ඇත **වායෝපි (අත්ථි)** වායෝ ධාතුව ද ඇත **යං (චක්ඛුං)** යම් චක්‍ෂුසක් **සෙම්හුස්සදත්තා** සෙම උත්සන්න බැවින් **සේතං (හෝති)** සුදුපැහැ වූයේ වෙයි **පිත්තුස්සදත්තා** පිත උත්සන්න බැවින් **කණ්හං (හෝති)** කළුපැහැ වූයේ වෙයි **රුහිරුස්සදත්තා** ලේ උත්සන්න බැවින් **ලෝහිතකං (හෝති)** ලේවන් වූයේ වෙයි **පඨවුස්සදත්තා** පඨවි උත්සන්න බැවින් **පත්ථිණ්ණං හෝති** රළු ද වෙයි **ආපුස්සදත්තා** ආපෝ උත්සන්න බැවින් **පග්ඝරති** වැගිරෙයි **තේජුස්සදත්තා** තේජෝ උත්සන්න බැවින් **පරිඩය්හති** දැවෙයි **වායුස්සදත්තා** වායෝ උත්සන්න බැවින් **සම්භමති** භ්‍රමණය වෙයි ද **ඉදං** මෙය **සසම්භාරචක්ඛු නාම** සසම්භාර චක්‍ෂුස නම් ෴

**එත්ථ පන** මෙහි වනාහි **යෝ** යමක් **සතෝ** සුදු ද **එත්ථ** මෙහි **පටිබද්ධෝ** බැඳුණු **චතුන්නං මහාභූතානං උපාදය** සතර මහාභූතයන්ගේ උපාදය **පසාදෝ** ප්‍රශාදයක් වේද **ඉදං** මෙය **පසාදචක්ඛු නාම** ප්‍රශාද චක්‍ෂුස නම් **තං ඒතං** ඒ ප්‍රශාද චක්‍ෂුස **තස්ස සසම්භාරචක්ඛුනෝ** ඒ සසම්භාර චක්‍ෂුසගේ **සේතමණ්ඩලපරික්ඛිත්තස්ස** සුදු මණ්ඩලයකින් පරික්‍ෂිප්ත වූ **කණ්හමණ්ඩලස්ස මජ්ඣෙ** කළු මණ්ඩලයාගේ මැද **අභිමුඛේ** ඉදිරියෙහි **ඨිතානං** සිටියහුන්ගේ **සරීරසණ්ඨානුප්පත්තිදේසභූතේ** ශරීර සටහන් උපදින දේශය වූ **දිට්ඨිමණ්ඩලේ** දෘෂ්ටි මණ්ඩලයෙහි **සත්තසු පිචුපටලේසු** පුළුන් පටල සතක **ආසිත්තතේලං** ඉසිනලද තෙල **පිචුපටලානි විය** පුළුන් පටල (පැතිර පවත්නාක්) මෙන් **සත්තක්ඛිපටලානි බ්‍යාපෙත්වා** අක්‍ෂි පටල සතක පැතිර **චතූහි ධාතීහි** කිරිමව්වරු සතර දෙනෙක් විසින් **ධාරණන්හාපනමණ්ඩණබීජනකිච්චාහි** දැරීම් නැහැවීම් සැරසීම් පවන් සැලීම් යන කෘත්‍යය වලින් (සැලකිලි ලබන්නා වූ) **ඛත්තියකුමාරෝ විය** ක්‍ෂත්‍රිය කුමාරයෙකු මෙන් **චතූහි ධාතූහි** සතර ධාතූන් විසින් **සන්ධාරණආබන්ධනපරිපාචනසමුදීරණකිච්චාහි** දැරීම් බැඳීම් පැසවීම් සෙලවීම් යන කෘත්‍යයන්ගෙන් **චතූහි ධාතූහි** සතර මහාධාතූන් විසින් **කතූපකාරං** කරනලද උපකාර ඇතිව **උතුචිත්තාහාරෙහි** උතු චිත්ත ආහාරයෙන් **උපත්ථම්භියමානං** උපස්ථම්භනය කරනු ලබමින් **ආයුනා** ආයුෂ විසින් **අනුපාලියමානං** අනුපාලනය කරනු ලබමින් **වණ්ණගන්ධරසාදීහි පරිවුතං** වර්ණ ගන්ධ රසාදීන් විසින් පිරිවරන ලදුව **පමාණතෝ** ප්‍රමාණයෙන් **ඌකාසිරමත්තං** උකුණු හිසක් පමණැතිව **චක්ඛුවිඤ්ඤාණාදීනං** චක්‍ෂුර්විඥානාදීන්ට **යථාරහං** සුදුසු පරිදි **වත්ථුද්වාරභාවං සාධයමානං** වස්තු ද්වාර භාවය සිද්ධ කරමින් **තිට්ඨති** සිටි **ඒතං ච** මෙය ද **ධම්මසේනාපතිනා** දම්සෙනවි සැරියුත් මහතෙරුන් වහන්සේ විසින් **වුත්තං** දේශනා කරනලදි:—

**යේන චක්ඛුප්පසාදේන** යම් චක්‍ෂුස්ප්‍රශාදයක් විසින් **රූපානි අනුපස්සති** රූප දක්නා ලැබේ ද **ඒතං** එය **පරිත්තං** කුඩාය **සුඛුමං** සියුම්ය **ඌකාසිරසමූපමං** උකුණු හිසකට බඳු උපමා **ඉති (අත්ථි)** ඇත්තේය("ඌකාසිරමත්තං" යනු උකුණුහිසක් පමණ ප්‍රදේශයෙහි පැවතීම් වශයෙන් කියනලදි යනු මූලටීකායි) ෴

**චක්ඛු ච තං** චක්‍ෂුව වූයේ ද එයයි **ආයතනං ච තං** ආයතනය වූයේ ද එයනුයි **ඉති (තස්මා)** එහෙයින් **චක්ඛායතනං** චක්ඛායතන නම් **යං චක්ඛු චතුන්නං භූතානං උපාදය පසාදෝ ඉති** යං -පෙ- පසාදෝ යන **ඉධාපි** මෙහි ද **උපයෝගත්ථේයේව**

දුතියා අර්ථයෙහිම **සාමිවචනං** ෂෂ්ඨී වචනයයි **චත්තාරි මහාභූතානි** සතර මහාභූතයින් **උපාදායිත්වා** දැඩිව ගෙන **පවත්තප්පසාදෝ ඉති** පවත්නා ප්‍රශාදය යන **අත්ථෝ** අර්ථයයි **ඉමිනා** මෙයින් **පසාදචක්ඛුමේව** ප්‍රශාද චක්‍ෂුසම **ගණ්හාති** ගනී **සේස චක්ඛුං** සෙසු චක්‍ෂුස **පටික්ඛිපති** ප්‍රතික්ෂේප කරයි **ඉන්ද්‍රියගෝචරසුත්තේ පන** ඉන්ද්‍රියගෝචර සූත්‍රයෙහි වනාහි **ඒකං මහාභූතං උපාදාය පසාදෝ පඨවීධාතුයා තීහි මහාභූතේහි සඞ්ගහිතෝ ආපෝධාතුයා ච තේජෝධාතුයා ච වායෝධාතුයා ච ඉති** ඒකං මහාභූතං -පෙ- වායෝධාතුයා ච යනුවෙන් ද **චතුපරිවත්තසුත්තේ** චතුපරිවත්ත සූත්‍රයෙහි **ද්වින්නං මහාභූතානං උපාදාය පසාදෝ පඨවීධාතුයා ච ආපෝධාතුයා ච ද්වීහි මහාභූතේහි සඞ්ගහිතෝ තේජෝධාතුයා ච වායෝධාතුයා ච ඉති** ද්වින්නං මහභූතානං -පෙ- වායෝධාතුයා ච යනුවෙන් **යං (වචනං)** යම් වචනයක් **වුත්තං** වදාරණලදි ද **තං (වචනං)** ඒ වචනය **පරියායේන** පර්‍යායෙන් **වුත්තං** වදාරණලදි ("පරියායේනාති චතුන්නං පසාදෝ තේසු ඒකස්ස ද්වින්නඤ්චාතිපි වත්තුං යුත්තෝ සමානධනානං ධනං වියාති ඒතේන පරියායේන" යනු මූලටීකායි) **සුත්තන්තිකකථා නාම** සූත්‍රාන්තික දේශනා නම් වූ **අයං හි** මෙය වනාහි **පරියායදේසනා** පර්‍යාය දේශනා නම් **චතුන්නං මහාභූතානං උපාදාය** සතර මහාභූතයන් හේතුවෙන් වූ **යෝ ච පසාදෝ** යම් ප්‍රශාදයක් වේද **සෝ** ඒ ප්‍රශාදය තෙමේ **තේසු** ඒ මහාභූතයන් අතුරින් **ඒකේකස්සාපි** එක එක ධාතුවකට ද **ද්වින්නම්පි** ධාතූන් දෙදෙනෙකුට ද දෙදෙනෙකුට ද **දින්නං** දෙනලදුව **පසාදෝයේව ඉති** ප්‍රශාදය වේ මැයි **ඉමිනා පරියායේන** මේ පර්‍යායෙන් **තත්‍ථ** ඒ සූත්‍රයන්හි **දේසනා ආගතා** දේශනා තොමෝ පැමිණෙනලදි **අභිධම්මෝ පන** අභිධර්මය වනාහි **නිප්පරියායදේසනා නාම** නිෂ්පර්‍යාය දේශන නම් වේ **තස්මා** එහෙයින් **ඉධ** මෙහි **චතුන්නං මහභූතානං උපාදාය පසාදෝ ඉති** චතුන්නං -පෙ- පසාදෝ යැයි **වුත්තං** වදාරණලදි.

**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

සුණාතීති **සෝතං**. තං සසම්භාරසෝතබිලස්ස අන්තෝ තනුතම්බලෝමාචිතේ අඞ්ගුලිවේධකසණ්ඨානේ පදේසේ වුත්තප්පකාරාහි ධාතූහි කතූපකාරං, උතුචිත්තාහාරේහි උපත්ථම්භියමානං, ආයුනා අනුපාලියමානං, වණ්ණාදීහි පරිවුතං සෝතවිඤ්ඤාණාදීනං යථාරහං වත්ථුද්වාරභාවං සාධයමානං තිට්ඨති.

ඝායතීති **ඝානං**. තං සසම්භාරඝානබිලස්ස අන්තෝ අජපදසණ්ඨානේ පදේසේ යථාවුත්තප්පකාර උපකාරූපත්ථම්භනානුපාලනපරිවාරං හුත්වා ඝානවිඤ්ඤාණාදීනං යථාරහං වත්ථුද්වාරභාවං සාධයමානං තිට්ඨති.

සායනට්ඨේන **ජිව්හා.** සා සසම්භාරජිව්හාමජ්ඣස්ස උපරි උප්පලදලග්ගසණ්ඨානේ පදේසේ යථාවුත්තප්පකාර උපකාරූපත්ථම්භනානුපාලනපරිවාරා හුත්වා ජිව්හාවිඤ්ඤාණාදීනං යථාරහං වත්ථුද්වාරභාවං සාධයමානා තිට්ඨති.

යාවතා පන ඉමස්මිං කායේ උපාදින්නකරූපං නාම අත්ථි, සබ්බත්ථ කායායතනං, කප්පාසපටලේ ස්නේහෝ විය, යථාවුත්තප්පකාර උපකාරූපත්ථම්භනානුපාලනපරිවාරමේව හුත්වා කායවිඤ්ඤාණාදීනං යථාරහං වත්ථුද්වාරභාවං සාධයමානං තිට්ඨති. අයමෙත්ථ විසේසෝ. සේසෝ පාළිප්පභේදෝ ච අත්ථෝ ච චක්ඛුනිද්දේසේ වුත්තනයේනේව වේදිතබ්බෝ.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 600 උපාදාභාජනීයකථා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 289-270 පිටු (හේ.වි.මු)]**

**සුණාතීති** සෝතවිඤ්ඤාණස්ස නිස්සයභාවේන සුණාති. ජිව්හාසද්දේන විඤ්ඤායමානා කිරියා සායනන්ති කත්වා **"සායනට්ඨේනා"**ති ආහ. කුච්ඡිතානං දුක්ඛසම්පයුත්තඵස්සාදීනං ආයෝති **කායෝ,** දුක්ඛදුක්ඛවිපරිණාමදුක්ඛානං වා. කායායතනස්ස බ්‍යාපිතාය චක්ඛුපසාදේ කායපසාදභාවෝපි අත්ථි, තේන චක්ඛුපසාදස්ස අනුවිද්ධත්තා නෝ බ්‍යාපිතා ච න සියා, වුත්තා ච සා. තස්මා චක්ඛුපසාදස්ස ඵොට්ඨබ්බාවභාසනං කායපසාදස්ස ච රූපාවභාසනං ආපන්නන්ති ලක්ඛණසම්මිස්සතං චෝදේති. චක්ඛුකායානං අඤ්ඤනිස්සයත්තා කලාපන්තරගතතාය **"අඤ්ඤස්ස අඤ්ඤත්ථ අභාවතෝ"**ති ආහ. රූපරසාදිනිදස්සනං සමානනිස්සයානඤ්ච අඤ්ඤමඤ්ඤසභාවානුපගමේන අඤ්ඤමඤ්ඤස්මිං අභාවෝ, කෝ පන වාදෝ අසමානනිස්සයානන්ති දස්සේතුං වුත්තං. **[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 600 උපාදාභාජනීයකථා යටතේ)]**

සෝතවිඤ්ඤාණප්පවත්තියං සවනකිරියාවෝහාරෝති සෝතස්ස සවනකිරියාය කත්තුභාවෝ සෝතවිඤ්ඤාණස්ස පච්චයභාවේනාති වුත්තං **"සෝතවිඤ්ඤාණස්ස නිස්සයභාවේන සුණාතී"**ති. ජීවිතනිමිත්තමාහාරරසෝ ජීවිතං, තස්මිං නින්නතාය තං අව්හායතීති ජිව්හාති ඒවං සිද්ධේන ජිව්හා-සද්දේන පකාසියමානා රසාවිහායනසඞ්ඛාතා සායනකිරියා ලබ්භතීති කත්වා වුත්තං **"ජිව්හාසද්දේන විඤ්ඤායමානා කිරියාසායන"**න්ති. තථා ච වක්ඛති "ජීවිතමව්හායතීති ජිව්හා"ති (විභ. අට්ඨ. 154). **ආයෝති** උප්පත්තිදේසෝ. පසාදකායස්ස කායිකානං දුක්ඛසුඛානං නිස්සයභාවතෝ ඉතරේසං උපනිස්සයභාවතෝ **"දුක්ඛදුක්ඛවිපරිණාමදුක්ඛානං ආයෝ"**ති වුත්තං. **බ්‍යාපිතායාති** බ්‍යාපිභාවේ, බ්‍යාපිභාවේන වා. **කායප්පසාදභාවෝති** කායප්පසාදසබ්භාවෝ.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 600 උපාදාභාජනීයකථා යටතේ)]**

**සුණාති ඉති** අසන්නේනුයි **සෝතං** සෝත නම් **තං (සෝතං)** ඒ ශ්‍රෝත්‍ර ප්‍රශාදය **සසම්භාරසෝතබිලස්ස** සසම්භාර කන්බිලයාගේ **අන්තෝ** ඇතුළත **තනුතම්බලෝමාචිතේ** තුනී තඹලෝමයකින් කළ **අඞ්ගුලිවේධකසණ්ඨානේ** ඇඟිලි වෙළුමක සටහන් ඇති **පදේසේ** ප්‍රදේශයෙහි **වුත්තප්පකාරාහි ධාතූහි** වුත්තප්‍රකාර ධාතූන් විසින් **කතූපකාරං** කරනලද උපකාර ඇතිව **උතුචිත්තාහාරේහි** උතු චිත්ත ආහාරයන් විසින් **උපත්ථම්භියමානං** උපස්ථම්භනය ලබමින් **ආයුනා** ආයුෂ විසින් **අනුපාලියමානං** අනුපාලනය කරනු ලබමින් **වණ්ණාදීහි පරිවුතං** වර්ණාදීන් විසින් පිරිවරන ලදුව **සෝතවිඤ්ඤාණාදීනං** ශ්‍රෝත්‍රවිඤ්ඤාණාදීන්ට **යථාරහං** සුදුසු පරිදි **වත්ථුද්වාරභාවං** වස්තු ද්වාර භාවය **සාධයමානං** සිද්ධකරමින් **තිට්ඨති** සිටී.

**ඝායති ඉති** ආඝ්‍රාණය කරයිනුයි **ඝානං** ඝාන නම් **තං (ඝානං)** ඒ ඝ්‍රාණප්‍රශාදය **සසම්භාරඝානබිලස්ස** සසම්භාර ඝ්‍රාණබිලයාගේ **අන්තෝ** ඇතුළත **අජපදසණ්ඨානේ** එළු පා සටහන් ඇති **පදේසේ** ප්‍රදේශයෙහි **යථාවුත්තප්පකාර** පෙර කියනලද **උපකාරූපත්ථම්භනානුපාලනපරිවාරං හුත්වා** උපකාර උපස්ථම්භන අනුපාලනාදියෙන් පිරිවරන ලද්දෙක් වී **ඝානවිඤ්ඤාණාදීනං** ඝ්‍රාණවිඤ්ඤාණාදීන්ට **යථාරහං** සුදුසු පරිදි **වත්ථුද්වාරභාවං** වස්තු ද්වාර භාවය **සාධයමානං** සිදුකරමින් **තිට්ඨති** සිටී.

**සායනට්ඨේන** රසවිඳින අර්ථයෙන් **ජිව්හා** ජිව්හා නම් **සා (ජිව්හා)** ඒ ජිව්හාප්‍රශාදය තුමූ **සසම්භාරජිව්හාමජ්ඣස්ස** සසම්භාර දිව මැද **උපරි** මත්තෙහි **උප්පලදලග්ගසණ්ඨානේ** උපුල් පෙති අග සටහන් ඇති **පදේසේ** ප්‍රදේශයෙහි

**යථාවුත්තප්පකාර** පෙර කියනලද **උපකාරූපත්ථම්භනානුපාලනපරිවාරා හුත්වා** උපකාර උපස්ථම්භන අනුපාලනාදියෙන් පිරිවරනලද්දී වී **ජිව්හාවිඤ්ඤාණාදීනං** ජිව්හාවිඤ්ඤාණාදීන්ට **යථාරහං** සුදුසු පරිදි **වත්ථුද්වාරභාවං** වස්තු ද්වාර භාවය **සාධයමානා** සිද්ධකරමින් **තිට්ඨති** සිටී.

**ඉමස්මිං කායේ පන** මේ කයෙහි වනාහි **යාවතා** යම්තාක් **උපාදින්නකරූපං නාම** උපාදින්නක රූප **අත්ථි** ඇත ද **සබ්බත්ථ** ඒ සියළුතැන **කායායතනං** කායායතනයයි (කායප්‍රසාදයයි) (**තං කායායතනං** ඒ කායායතනය) **කප්පාසපටලේ ස්නේහෝ විය** පුළුන් පටලයෙහි පැතිරීගිය තෙල මෙන් **යථාවුත්තප්පකාර** පෙර කියනලද **උපකාරූපත්ථම්භනානුපාලනපරිවාරමේව හුත්වා** උපකාර උපස්ථම්භන අනුපාලනාදියෙන් පිරිවරන ලද්දෙකුම වී **කායවිඤ්ඤාණාදීනං** කායවිඤ්ඤාණාදීන්ට **යථාරහං** සුදුසු පරිදි **වත්ථුද්වාරභාවං** වස්තු ද්වාර භාවය **සාධයමානං** සිද්ධකරමින් **තිට්ඨති** සිටී **එත්ථ** මෙහි **අයං** මේ **විසේසෝ** විශේෂයයි **සේසෝ පාළිප්පභේදෝ ච** සෙසු පාළි ප්‍රභේදය ද **අත්ථෝ ච** අර්ථය ද **චක්ඛුනිද්දේසේ** චක්‍ෂුර්නිර්දේශයෙහි **වුත්තනයේනේව** දේශනා කරනලද ක්‍රමයෙන්ම **වේදිතබ්බෝ** දතයුතුයි.

**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

තත්ථ චක්ඛති විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා සමවිසමං ආචික්ඛන්තං විය හෝතීති චක්ඛු. අථ වා චක්ඛති රූපං අස්සාදෙන්තං විය හෝතීති චක්ඛු. චක්ඛතීති හි අයං සද්දෝ "මධුං චක්ඛති, බ්‍යඤ්ජනං චක්ඛතී"ත්‍යාදීසු විය අස්සාදනත්ථෝ හෝති. තේනාහ භගවා; "චක්ඛුං ඛෝ පන, මාගණ්ඩිය, රූපාරාමං රූපරතං රූපසම්මුදිත"න්ත්‍යාදි. යදි ඒවං "සෝතං ඛෝ, මාගණ්ඩිය, සද්දාරාමං සද්දරතං සද්දසම්මුදිත"න්ත්‍යාදි වචනතෝ (ම. නි. 2.209) සෝතාදීනම්පි සද්දාදිඅස්සාදනං අත්ථීති තේසම්පි චක්ඛුසද්දාභිධෙය්‍යතා ආපජ්ජෙය්‍යාති? නාපජ්ජති නිරූළ්හත්තා, නිරූළ්හෝ හේස චක්ඛුසද්දෝ දට්ඨුකාමතානිදානකම්මජභූතප්පසාදලක්ඛණෝ චක්ඛුප්පසාදේයේව මයූරාදිසද්ද විය සකුණවිසේසාදීසු, චක්ඛුනා සහවුත්තියා පන භමුකට්ඨිපරිච්ඡින්නෝ මංසපිණ්ඩෝපි "චක්ඛූ"ති වුච්චති. **අට්ඨකථායං** පන අනේකත්ථත්තා ධාතූනං චක්ඛති-සද්දස්ස විභාවනත්ථතාපි සම්භවතීති "චක්ඛති රූපං විභාවේතීති චක්ඛූ"ති (විසුද්ධි. 2.510) වුත්තං. චක්ඛුස්මිං විඤ්ඤාණං තන්නිස්සිතත්ථාති **චක්ඛුවිඤ්ඤාණං**. තථා හේතං "චක්ඛුසන්නිස්සිතරූපවිජානන ලක්ඛණ"න්ති (ධ. ස. අට්ඨ. 431; විසුද්ධි. 2.454) වුත්තං.

ඒවං **සෝතවිඤ්ඤාණාදීසුපි** යථාරහං දට්ඨබ්බං. **"තථා"**ති ඉමිනා උපෙක්ඛාසහගතභාවං අතිදිසති. විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා සුණාතීති **සෝතං**. ඝායති ගන්ධෝපාදානං කරෝතීති **ඝානං**. ජීවිතනිමිත්තං රසෝ ජීවිතං, තං අව්හායති තස්මිං නින්නතායාති **ජිව්හා** නිරුත්තිනයේන. කුච්ඡිතානං පාපධම්මානං ආයෝ පවත්තිට්ඨානන්ති **කායෝ**. කායින්ද්‍රියඤ්හි ඵොට්ඨබ්බග්ගහණසභාවත්තා තදස්සාදවසප්පවත්තානං, තම්මූලකානඤ්ච පාපධම්මානං විසේසකාරණන්ති තේසං පවත්තිට්ඨානං විය ගය්හති. සසම්භාරකායෝ වා කුච්ඡිතානං කේසාදීනං ආයෝති **කායෝ**. තං සහචරිතත්තා පන පසාදකායෝපි තථා වුච්චති. දු කුච්ඡිතං හුත්වා ඛනති කායිකසුඛං, දුක්ඛමන්ති වා **දුක්ඛං**. දුක්කරමෝකාසදානං ඒතස්සාති **"දුක්ඛ"**න්තිපි අපරේ. පඤ්චවිඤ්ඤාණග්ගහිතං රූපාදිආරම්මණං සම්පටිච්ඡති තදාකාරප්පවත්තියාති සම්පටිච්ඡනං. සම්මා තීරේතීයථා සම්පටිච්ඡිතං රූපාදි ආරම්මණං වීමංසතීති සන්තීරණං. සුඛයති කායචිත්තං, සුට්ඨු වා ඛනති

කායචිත්තාබාධං, සුඛේන ඛමිතබ්බන්ති වා සුඛං. සුකරමෝකාසදනං ඒතස්සාති සුඛන්තිපි අපරේ.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 09-10 යටතේ); විභාවනි ටීකා සන්නය 36-40 පිටු; අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා ආයතනවිභඞ්ගමාතිකාත්ථ වණ්ණනා යටතේ); සද්ධර්මසාගරය 02/425-428 පිටු]**

**තත්ථ** ඒ පාඨයෙහි **යං (පසාදරූපං)** යම් ප්‍රශාද රූපයක් තෙමේ **විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා** චක්ෂුර්විඥ්ඥාණයට ආධාරස්ථාන වී **සමවිසමං** සමවිසම භාවය **චක්ඛති (ආචික්ඛන්තං විය හෝති)** අස්වන්නෙකු මෙන් වෙයි ද **ඉති (තස්මා) තං (පසාදරූපං)** ඒ ප්‍රශාද රූප තෙමේ **චක්ඛු** චක්ඛු නම් වේ. (චක්ඛති යන ක්‍රියාවගේ අර්ථය "සමවිසමං ආචික්ඛන්තං විය හෝති" යි වර්ණනා කෙළෙයි. චක්ෂුඃප්‍රශාද තෙමේ රූප වුයේම කවර හෙයකින් සමවිසම භාවය අස්වන්නෙක් මෙන් වන්නේ ද යන චෝදනාවට පරිහාර පිණිස "විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා" යන පාඨය කියනලදි. චක්ඛ ධාතුහු කෙරෙන් පරව යු-ප්‍රත්‍යය වූ තුනී. චක්ඛ ධාතුහුගේ අර්ථය වනාහි චක්ෂුඃප්‍රශාදයාගේ රූපාලම්බනය හා ඝට්ටන ශක්තියයි. යු-ප්‍රත්‍යයාගේ අර්ථය මුඛ්‍ය වශයෙන් චක්ෂුඃප්‍රශාදයයි. චක්ෂුර්විඥ්ඥාණ තෙමේ ධානූපචාරාර්ථ වශයෙන් ලැබේ. කාරණූපචාරාර්ථ වශයෙන් ද ලැබෙන්නේ යැයි සමහරු කියති) **අථවා** නොහොත් **යං (පසාදරූපං)** යම් ප්‍රශාද රූපයක් තෙමේ **රූපං** වර්ණායතනය **චක්ඛති (අස්සාදෙන්තං විය හෝති)** ආශ්වාදය කරන්නාක් මෙන් වේද **ඉති (තස්මා) තං (පසාදරූපං)** ඒ ප්‍රශාද රූප තෙමේ **චක්ඛු** චක්ඛු නම් වේ. (මේ පච්ඡිම විකල්පයෙහි චක්ඛති යන ශබ්දය ආශ්වාදනාර්ථයෙහි වැටේ)

(ආයුෂ්මත් ටීකාචාරීන් වහන්ස "චක්ඛ-ආචික්ඛනේ" යන ධාතුහුගෙන් චක්ඛු ශබ්දය නිෂ්පන්න වන්නේ නම් චක්ඛති යන ශබ්දය ආචික්ඛනාර්ථයෙහි පවත්නේ නම් "චක්ඛති අස්සාදෙන්තං විය හෝති" යන වචනය කෙසේ යෙදෙන්නේ දැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "චක්ඛතීති හි -පෙ- අස්සාදනත්ථෝ හෝති" යන පාඨය කියනලදි) **හි** (තදේව සච්චං යනාර්ථයි) **චක්ඛතීති අයං සද්දෝ** චක්ඛති යන මේ ශබ්ද තෙමේ **මධුං චක්ඛති බ්‍යඤ්ජනං චක්ඛති ආදීසු විය** "මධුං චක්ඛති බ්‍යඤ්ජනං චක්ඛති" යනාදී පාඨයෙහි මෙන් **අස්සාදනත්ථෝපි හෝති** ආශ්වාදනාර්ථ ඇත්තේ වේ. (පි ශබ්දය ඵුප්තනිර්දිෂ්ටයි) එපරිද්දෙන් "චක්ඛති" ශබ්දයාගේ ආශ්වාදනාර්ථයෙහි පවත්නා බව කවර පාඨයකින් දතයුතුද යන චෝද්‍යයට පරිහාර පිණිස ("තේනාහ -පෙ- සමුද්දිතන්ති" යනාදී පාඨය කියනලදි)

**තේන** ඒ චක්ඛු ශබ්දය ආශ්වාදනාර්ථයෙහි පවත්නා බැවින් **භගවා** භාග්‍යවතුන් වහන්සේ **චක්ඛු ඛෝ පන -පෙ- සමුද්දිතන්ති ආදී** චක්ඛු ඛෝ පන -පෙ- සමුද්දිතනං යනාදී වචනය **ආහ** වදළේය **මාගධිය** එම්බා මාගධිය **ඛෝ පන** ඒකාන්තයෙන් **චක්ඛුං** චක්ෂුඃප්‍රශාද තෙමේ **රූපාරාමං** රූපාලම්බනයම රමනස්ථාන කොට ඇත්තේයි **රූපරතං** රූපාලම්බනයෙහි ඇළුම් කරන්නේයි **රූපසමුදිතං** රූපාලම්බනයෙහි උදවන්නේය (නොහොත් හටගන්නේය)

(ආයුෂ්මත් ටීකාචාරීනි "චක්ඛු ඛෝ පන" යනාදිය භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කළ බැවින් චක්ඛති ශබ්ද තෙමේ ආශ්වාදනාර්ථයෙහි ඉඳින් පවත්නේ නම් "සෝතං ඛෝ පන" යනාදිය ද භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කළ බැවින් සෝතාදී ශබ්දයන්ට ද චක්ඛ ශබ්දභිධෙය්‍යකත්වය නොපැමිණෙන්නේ ද යන චෝද්‍යයට පරිහාර පිණිස "යදි ඒවං -පෙ- ආපජ්ජෙය්‍ය" යන පාඨය කියනලදි)

**රූපඅස්සාදනතෝ** රූපාලම්බනයෙහි ආශ්වාදනය කිරීම ඇති හෙයින් **යදි චක්ඛු නාම සියා** ඉදින් චක්ඛු නම් වේ නම් ("රූපඅස්සාදනතෝ චක්ඛු නාම" යනු පාඨ ශේෂයි) **ඒවං සති** එසේ වීමක් ඇති කල්හි **සෝතං බෝ** -පෙ- **සමුදිතන්ති ආදී වචනතෝ** සෝතං බෝ -පෙ- සමුදිතං යනාදි වචනය වදළ බැවින් **සෝතාදීනම්පි** ශ්‍රෝත්‍රප්‍රශාදදීන්ට ද **සද්දදීඅස්සාදනං** ශබ්දලම්බනාදීන්ගේ රසවිඳ ගැනීම **අත්ථි** ඇත්තේයි **ඉති (තස්මා) තේසම්පි** ඒ ශ්‍රෝත්‍රප්‍රශාදදීන්ට ද **චක්ඛුසද්දාභිධෙය්‍යතා** චක්ඛුසද්දාභිධෙය්‍යකත්වය (හෙවත් චක්ඛු ශබ්දයෙන් ශ්‍රොත්‍රාදීන් වාචක වන බව) **ආපජ්ජෙය්‍ය** පැමිණිය යුත්තේයි (නාපජ්ජති යන පාඨයෙන් චෝදකයා විසින් ආරෝපනය කරනලද දෝෂය නිරාකරණය කරනලදි) **නාපජ්ජති** නොපැමිණෙයි **කස්මා** කුමක් හෙයින් නොපැමිණෙන්නේ ද යත්? **නිරූළ්හත්තා** ආරෝපණය කරනලද බැවින් (රූඪි ශබ්ද බැවිනැයි කී කියායි) **නාපජ්ජති** නොපැමිණෙයි (ඒ අර්ථය ප්‍රකට කොට දක්වන පිණිස "නිරූළ්හෝහි -පෙ- චක්ඛුපසාදේයේව" යන පාඨය කියනලදි)

**ඒස (ඒසෝ චක්ඛුසද්දෝ)** මේ චක්ඛු ශබ්දය **දට්ඨුකාමතානිදාන කම්මජභූතප්පසාදලක්ඛණේ** දකිනු ලැමති බව යැයි කියනලද කාම තෘෂ්ණාව කාරණ කොට ඇත්තාවූ කර්මයෙන් හටගත්තාවූ මහාභූතයන්ගේ ප්‍රශාදය ලක්ෂණ කොට ඇත්තාවූ **චක්ඛුප්පසාදේයේව** චක්ෂුඃප්‍රශාදයෙහිම **නිරූළ්හෝ** ආරෝපනය කරන ලද්දේය (නිරූළ්හෝහි යන්නෙහි "හි" ශබ්දය තත්ප්‍රකටීකරණද්‍යෝතක නිපාතයි. කවර ශබ්දයක් කවර පදර්ථයෙක්හි ආරෝපනය කරණ ලද්දක් වැනි දැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "මයූරාදි -පෙ- විසේසාදීසු" යන පාඨය කියනලදි)

**යථා (කිං)** කවර ශබ්දයක් කවර පදර්ථයෙක්හි ආරෝපනය කළාක් වැනිද යත්? **මයූරාදීසද්ද** මයූරාදී ශබ්දයෝ **සකුණවිසේසාදීසු** මයූරපක්ෂි ආදීවූ පක්ෂි විශේෂයෙහි (නිරූළ්හා විය ආරෝපනය කළාක් මෙනි. "මහියං රවතීති මයූරෝ" යනු නිර්වචන බැවින් මයූරයෝම පෘථිවියෙහි ශබ්ද කරන්නාහු නොවතුදු මයූරපක්ෂා කෙරෙහිම මයූර ශබ්දය ආරෝපනය කළාක් මෙන් සාධාරණ වූ චක්ඛු ශබ්දය චක්ෂුඃප්‍රශාදයෙහිම ආරෝපනය කෙළේමැයි කී නියායි. ආදී ශබ්දයෙන් පඞ්කජ මහිසාදී ශබ්දයන් ගැනේ)

(රූපාලම්බනය ආශ්වාදනය කරන්නාක් මෙන් වන හෙයින් ප්‍රසාදචක්ෂුස චක්ෂු නම් වේ යි ආචාර්‍ය්‍ය තෙම කීයේය. බැම ඇටින් පිලිසිඳිනා ලද මාංශ පිණ්ඩය කුසක් හෙයින් චක්ෂු නම් වන්නේ ද යන චෝද්‍යයට පරිහාර පිණිස "චක්ඛුනා -පෙ- වුච්චති" යන පාඨය කියනලදි)

**චක්ඛුනා සහ** චක්ෂුඃප්‍රශාදය හා සමඟ **වුත්තියා පන** හටගන්නා හෙයින් වනාහි **භමුකට්ඨිපරිච්ඡින්නෝ** බැම ඇටින් පිරිසිඳිනා ලද **මංසපිණ්ඩෝපි** මස් පිඩුව ද **චක්ඛූති වුච්චති** චක්ෂු යයි කියනු ලැබේ **අට්ඨකථායං පන** සම්මෝහවිනෝදනී නම් අටුවායෙහි වනාහි **ධාතූනං** ශබ්ද නිෂ්පත්තිමූලක ධාතූන්ගේ **අනේකත්ථත්තා** බොහෝ වූ අර්ථ ඇති බැවින් **චක්ඛති සද්දස්ස** චක්ඛති යන ශබ්දයාගේ **විභාවනත්ථතාපි** දැනගැනීම් සඞ්ඛ්‍යාත අර්ථ ඇති බවද **සම්භවති** සම්භව වෙයි **ඉති (මනසිකත්වා)** මෙසේ කී අර්ථය සිහිකොට **චක්ඛති රූපං විභාවේතීති චක්ඛූති** චක්ඛති -පෙ- චක්ඛු යි **වුත්තං** කියනලදි.

**යං (පසාදරූපං)** යම් ප්‍රශාදරූපයක් තෙමේ **චක්ඛති (විභාවේති)** රූපය දැනගන්නේ වේද **ඉති (තස්මා) තං (පසාදරූපං)** ඒ ප්‍රශාදරූප තෙමේ **චක්ඛු** චක්ඛු නම් වේ **තන්නිස්සිතත්තා** ඒ චක්‍ෂුඃප්‍රශාදය ආශ්‍රය කොටගෙන හටගත් බැවින් **යං විඤ්ඤාණං** යම් විඤ්ඤාණයක් තෙමේ **චක්ඛුස්මිං** චක්‍ෂුඃප්‍රශාදයෙහි **නිස්සිතං** නිශ්‍රය කොටගෙන **හෝති** වන්නේ ද **ඉති (තස්මා) තං විඤ්ඤාණං** ඒ විඤ්ඤාණ තෙමේ **චක්ඛුවිඤ්ඤාණං** චක්ඛුවිඤ්ඤාණ නම් වේ (තන්නිස්සිතත්තා යන හේත්වර්ථයෙන් "චක්ඛුස්මිං නිස්සිතං විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං" යන අර්ථය දක්වමින් "චක්ඛුස්මිං පවත්තං විඤ්ඤාණං" යන අර්ථය වැළැක්වූහු) **තථාහි (තතෝ ඒව)** එයින්ම **ඒතං** ඒ චක්‍ෂුර්විඤ්ඤාණය **චක්ඛුසන්නිස්සිතං රූපවිජානනලක්ඛණන්ති** චක්ඛුසන්නිස්සිතං රූපවිජානනලක්ඛණං යි **වුත්තං** කියනලදි.

(චක්ඛුවිඤ්ඤාණං චක්‍ෂුර්විඤ්ඤාණය තෙමේ චක්ඛුසන්නිස්සිතං චක්‍ෂුඃප්‍රශාදයෙහි ආශ්‍රිතව හටගත්තේයි රූපවිජානනලක්ඛණං රූපාලම්බනය දැනගැනීම ලක්‍ෂණ කොට ඇත්තේයි)

**ඒවං** මෙසේ **සෝතවිඤ්ඤාණාදිසුපි** ශ්‍රෝත්‍රවිඤ්ඤාණාදියෙහි ද **යථාරහං** සුදුසු පරිද්දෙන් **දට්ඨබ්බං** දතයුතුයි **තථාති ඉමිනා පදේන** තථා යන මේ පදය කරණකොට ගෙන **උපෙක්ඛාසහගතභාවං** ශ්‍රෝත්‍රවිඤ්ඤාණාදීන්ගේ උපේක්‍ෂා සහගිය බව **අතිදිස්සති** දක්වයි **යං (පසාදරූපං)** යම් ප්‍රශාදරූපයක් තෙමේ **විඤ්ඤාණාධිට්ඨිතං** හුත්වා ශ්‍රෝත්‍රවිඤ්ඤාණයට ආධාරස්ථානය වී **සද්දං** ශබ්දය **සුණාති** අසන්නේ වේද **ඉති (තස්මා) තං (පසාදරූපං)** ඒ ප්‍රශාදරූප තෙමේ **සෝතං** සෝත නම් වේ **යං (පසාදරූපං)** යම් ප්‍රශාදරූපයක් තෙමේ **විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා** ඝානවිඤ්ඤාණයට ආධාරස්ථාන වී (විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා යන යට වාක්‍යයෙන් ආවර්ථනය වේ) **ඝායති (ඝන්ධෝපදානං කරෝති)** ගන්ධාලම්බනය ලං කොට ගන්නේ වේද **ඉති (තස්මා) ඝානං** ඝාන නම් වේ **ජීවිතනිමිත්තං (ජීවිතනිමිත්තතත්තා)** ජීවිතේන්ද්‍රිය පැවැත්මට කාරණා වන හෙයින් **රසෝ** රසාලම්බන තෙමේ **ජීවිතං** ජීවිත නම් වේ (ජීවිත ශබ්දයෙන් මුඛ්‍ය වශයෙන් ජීවිතේන්ද්‍රිය වාචක වේ) **යං (පසාදරූපං)** යම් ප්‍රශාදරූපයක් තෙමේ **තස්මිං** ඒ රසාලම්බනයෙහි **නින්නතාය** නැමුනාවූ බැවින් **තං** ඒ රසාලම්බනය **අව්හායති** කැඳවන්නාක් වැනි වේද **ඉති (තස්මා) තං (පසාදරූපං)** ඒ ප්‍රශාදරූප තෙමේ **නිරුත්තිනයේන** පඤ්චවිධ නිරුත්ති ක්‍රමයෙන් **ජිව්හා** ජිව්හා නම් වේ (ජීවිත යැයි කිවයුතු තන්හි වි-කාර ත-කාරයන් ලොප් කොට ජිව්හා යන පද සිද්ධිය වන්නේ යැයි කී නියායි)

**යෝ (රූපකායෝ)** යම් රූප කයක් තෙමේ **කුච්ඡිතානං** පිළිකුල් කටයුතු වූ **පාපධම්මානං** අකුසල් ධර්මයන්ට **ආයෝ (පවත්තිට්ඨානං හෝති)** හටගැනීමට ස්ථාන වේද **ඉති (තස්මා) සෝ (රූපකායෝ)** ඒ රූපකාය තෙමේ **කායෝ** කාය නම් වේ (පවත්තිට්ඨානං යන පදයෙන් "කුච්ඡිතා පාපධම්මා ආයන්ති පවත්තන්ති එත්ථාති කායෝ" යි කාය ශබ්දය අධිකරණ සාධනයෙහි කටයුතු බව දැක්වූහ)

(ආයුෂ්මත් ටීකාචාරීනි අකුසල ධර්මයන්ගේ හෘදයවස්තුව ආශ්‍රය කොටගෙන හටගැන්ම වන හෙයින් හෘදයවස්තුව අකුසල ධර්මයන්ගේ හටගැනීමට ආශ්‍රය ස්ථාන නොවේද? කුමක් හෙයින් කායෙන්ද්‍රිය අකුසල ධර්මයන්ගේ ප්‍රවෘත්ති ස්ථානයක් මෙන් ගත්තේදැයි යන චෝද්‍යයට පරිහාර පිණිස "කායින්ද්‍රියන්හි -පෙ- ගය්හති" යන පාඨය කියනලදි)

**කායින්‍ද්‍රියං** කායෙන්‍ද්‍රියය තෙමේ **ඵොට්ඨබ්බග්ගහණසභාවත්තා** පහස් අරමුණු ගන්නා ස්වභාව ඇති බැවින් **තදස්සාදවසප්පවත්තානං** ඒ පහස් අරමුණ ආශ්වාදනය කිරීම් වශයෙන් හටගන්නා වූ **පාපධම්මානං** පාප ධර්මයන්ට ද **තම්මූලිකානං** ඒ පහස් අරමුණ මුල්හේතුකොටගෙන ඇත්තාවූ **පාපධම්මානඤ්ච** අකුසල ධර්මයන්ට ද **විසේසකාරණඤ්ච හෝති** වෙනස් වූ හේතු ද වෙයි **ඉති (තස්මා) කායින්‍ද්‍රියං** කායෙන්‍ද්‍රිය **තේසං** ඒ අකුසලධර්මයන්ට **පවත්තිට්ඨානං විය ගය්හති** ප්‍රභවස්ථානයක් මෙන් ගන්නා ලැබේ ("තදස්සාදවසප්පවත්තානං පාපධම්මානං" යන පාඨයෙන් ස්පෘෂ්ටව්‍යාලම්බනයයි කියනලද මෛථුනයෙහි ආශ්වාදනය කරන්නා වූ ලෝභමූලික චිත්තුප්පාද සඞ්ඛ්‍යාත පාප ධර්මයන් ගැනේ "තම්මූලිකානං පාපධම්මානං" යන පාඨයෙන් ස්පෘෂ්ටව්‍යාලම්බනය හේතු කොට ඇත්තාවූ අදින්නාදනාදී පාප ධර්මයන් ගැනේ) **වා** නොහොත් **සසම්භාරකායෝ** කායප්‍රශාදය හා සමඟ හටගත්තා වූ රූපකාය තෙමේ **කුච්ඡිතානං** ලාමක වූ **කේසාදීනං** හිසකේ ආදීන්ට **ආයෝ හෝති** ප්‍රභවස්ථාන වේද **ඉති (තස්මා) කායෝ** කාය නම් වේ **තං සහචරිත්තාපන** ඒ රූපකාය හා සමඟ හටගත් බැවින් වනාහි **පසාදකායෝපි** ප්‍රශාදකාය ද **තථා** ඒ රූපකායට සදෘශ කොට **වුච්චති** කියනු ලැබේ (මේ පශ්චිම ක්‍රමයෙහි වනාහි සසම්භාරකායම මුඛ්‍ය වශයෙන් කාය නම් වේ. ප්‍රශාද කාය වනාහි ඨානූපචාර වශයෙන් කාය නම් වෙයි දතයුතු)

**යං (වේදයිතං)** යම් වේදනාවක් තොමෝ **දු (කුච්ඡිතං හුත්වා)** ලාමකව **කායිකසුඛං** ශරීරයෙහි හටගන්නා වූ සැප වේදනාව **ඛණති** කණින්නේ වේද (හෙවත් විනාශ කරන්නේ වේද) **වා** නොහොත් **දුක්ඛමං (හෝති)** ඉවසීමට දුෂ්කර වේද **ඉති (තස්මා) තං (වේදයිතං)** ඒ වේදනා තොමෝ **දුක්ඛං** දුක්ඛ නම් වේ (පළමුවන විග්‍රහය දු-ශබ්ද උප පද ඛණු-ධාතුවෙන් ද, දෙවන විග්‍රහය දු-ශබ්ද උප පද ඛමු-ධාතුවෙන් ද සිද්ධයි) **ඒතස්ස** ඒ වේදනාවට **දුක්කරං** දුකසේ කටයුතු වූ **ඕකාසදානං (අත්ථි)** අවකාශ දීම ඇත්තේ වේද **ඉති (තස්මා) තං (වේදයිතං)** ඒ වේදනා තොමෝ **දුක්ඛං** දුක්ඛ නම් වේ **ඉතිපි** මෙසේද **අපරේ** අන්‍යාචාර්‍ය්‍යවරයෝ තුමූ (**වදන්ති** කියත්) **යං (චිත්තං)** යම් සිතක් තෙමේ **පඤ්චවිඤ්ඤාණගහිතං** පඤ්චවිඤ්ඤාණය විසින් ගන්නා ලද්දවූ **රූපාදීආරම්මණං** රූපාදී ආලම්බනය **තදාකාරප්පවත්තියා** ඒ අරමුණෙහි පිළිගන්නා ආකාර ඇති පැවැත්මෙන් **සම්පටිච්ඡති** පිළිගනීද **ඉති (තස්මා) තං (චිත්තං)** ඒ සිත් තෙමේ **සම්පටිච්ඡනං** සම්පටිච්ඡන නම් වේ (තදාකාරප්පවත්තියා යන පාඨයෙන් සම්ප්‍රතෙ‍්‍යෂණ චිත්තයාගේ හස්තාදියෙන් පිළිගැනීමක් මෙන් ඒකාන්ත වශයෙන් පිළිගන්නා බව වළක්වයි. පිළිගන්නා ආකාරයෙන් උපදනේය යනාර්ථයම දක්වයි)

**යං (චිත්තං)** යම් සිතක් තෙමේ **යථා සම්පටිච්ඡිතං** සම්ප්‍රතෙ‍්‍යෂණයා විසින් පිළිගන්නා ලද්දවූ **රූපාදීආරම්මණං** රූපාදී අරමුණ **සම්මාතීරයති (වීමංසති)** විමසන්නේ වේද **ඉති (තස්මා) තං චිත්තං** ඒ සිත් තෙමේ **සන්තීරණං** සන්තීරණ නම් වේ ෴

**යං (වේදයිතං)** යම් වේදනාවක් තොමෝ **කායචිත්තං** කාය චිත්ත යන දෙදෙන **සුඛයති** සුවපත් කරවා ද **වා** නොහොත් **කායචිත්තාබාධං** කාය චිත්ත දෙදෙනාගේ ගිලන්බව **සුට්ඨු** මොනයට **ඛණති** විනාශ කරන්නේ වේද **වා** නොහොත් **සුඛේන** සුවසේ **ඛමිතබ්බං** ඉවසිය යුතු වේද **ඉති (තස්මා) තං (වේදයිතං)** ඒ වේදනා තොමෝ **සුඛං** සුඛ නම් වේ (පළමුවන පදය සුඛ-ධාතුවෙන් හා දෙවන පදය සු-පූර්ව ඛණු-ධාතුවෙන්

ද තුන්වන පදය සු-පූර්ව බමු-ධාතුවෙන් ද සිද්ධයි) **ඒතස්ස** ඒ වේදනාවට **සුකරං** සුවසේ කටහැකි වූ **ඕකාසදානං (අත්ථි)** අවකාශ දනය ඇත්තේ වේද **ඉති (තස්මා) තං වේදයිතං** ඒ වේදනාව **සුඛං** සුඛ නම් වේ **ඉති** මෙසේද **අපරේ** අන්‍ය ආචාර්‍ය්‍යවරයෝ (**වදන්ති** කියත්) **[විභාවනී ටීකා සන්නය 69-75 පිටු]**

චක්ඛතීති **චක්ඛු,** රූපං විභාවේතීති අත්ථෝ.
**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 633-634 යටතේ)]**

**චක්ඛතීති චක්ඛු** චක්ඛතීති චක්ඛු යනු නිර්වචනයි **රූපං** රූපය **විභාවේති ඉති** ප්‍රකට කරයි යන **අත්ථෝ** අර්ථයයි.] **අභිධම්මාවතාර පරිවර්තනයි[**

**"චක්ඛතී"**තිආදි. අනේකත්ථත්තා ධාතූනං චක්ඛති-සද්දස්ස විභාවනත්ථතාපි සම්භවතීති කත්වා වුත්තං **"විභාවේතීති අත්ථෝ"ති. චක්ඛතී**ති පන විඤ්ඤාණාධිට්ඨිතං සමවිසමං ආචික්ඛන්තං විය, අභිබ්‍යත්තං වදන්තං විය හෝතීති අත්ථෝ. අථ වා **චක්ඛතී**ති විඤ්ඤාණාධිට්ඨිතං රූපං අස්සාදෙන්තං විය හෝතීති අත්ථෝ. චක්ඛතීති හි අයං සද්දෝ "මධුං චක්ඛති, බ්‍යඤ්ජනං චක්ඛතී"තිආදීසු විය අස්සාදත්ථෝ. වුත්තඤ්හේතං; "චක්ඛුං ඛෝ, මාගණ්ඩිය, රූපාරාමං රූපරතං රූපසමුදිත"න්ති (ම. නි. 2.209). චක්ඛති ච "රූපේසු ආවිඤ්ජනරස"න්ති. යදි ඒවං "සෝතං ඛෝ, මාගණ්ඩිය, සද්දරාම"න්තිආදි වචනතෝ (ම. නි. 2.209) සෝතාදීනම්පි සද්දාදි අස්සාදකභාවෝ අත්ථීති තේසම්පි චක්ඛුසද්දාභිධෙය්‍යතා ආපජ්ජතීති? නාපජ්ජති නිරුළ්හත්තා. නිරුළ්හෝ හි ඒස චක්ඛුසද්දෝ ලෝචනේයේව පදුමාදීසු පඞ්කජාදිසද්ද වියාති.
**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 633-634 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 434 පිට]**

ධාතූන්ගේ නොයෙක් අර්ථ ඇති බැවින් චක්ඛති ශබ්දයාගේ ප්‍රකට කිරීම පිණිස ද හටගනී යයි කොට විභාවේතීති අත්ථෝ යනුවෙන් දේශනා කරනලදි විස්තර කෙරෙම් චක්ඛති යනු චක්‍ෂුර්විඤ්ඤාණයට ආධාරස්ථාන වී සම විසම භාවය අස්වන්නෙකු මෙන් ද වෙසසින් පැහැදිලිතාවය කියන්නාක් මෙන් ද වෙයි යන අර්ථයයි නොහොත් චක්ඛති යනු චක්‍ෂුර්විඤ්ඤාණාදීන්ට ආධාරස්ථාන වී රූපය ආශ්වාදය කරන්නාක් මෙන් ද වෙයි යන අර්ථයයි චක්ඛති යන මේ ශබ්දය වනාහි මධුං චක්ඛති බ්‍යඤ්ජනං චක්ඛති යන ආදියෙහි මෙන් ආශ්වාද අර්ථයයි මාගන්ධිය ඒකාන්තයෙන් චක්‍ෂුර්ප්‍රශාදය තෙමේ රූපාරම්මණය රමනස්ථාන කොට ඇත්තේයි රූපාරම්මණයෙහි ඇළුම් කරන්නේයි රූපාරම්මණයෙහි උදවන්නේය (නොහොත් හටගන්නේය) මෙසේ එය දේශනා කරනලදි තවද චක්ඛති යනු රූපාරම්මණ කෙරෙහි (රූපාරම්මණ පැත්තට) පුද්ගලයා හෝ චේචා චීථිසිත් සන්තතිය හෝ චේචා ආකර්ෂණය කිරීම කෘත්‍යය වෙයි ඉදින් චක්ඛු නම් වේ නම් එසේ වීමක් ඇති කල්හි -පෙ- සෝතං ඛෝ -පෙ- සද්දරාමං යනාදි වචනය වදළ බැවින් ශ්‍රෝත්‍රප්‍රශාදදීන්ට ද ශබ්දලම්බනාදීන්ගේ රසවිඳ ගැනීම් ආදී බවක් ඇත්තේයි එහෙයින් ඒ ශ්‍රෝත්‍රප්‍රශාදදීන්ට ද චක්ඛුසද්දාභිධෙය්‍යකත්වය (හෙවත් චක්ඛු ශබ්දයෙන් ශ්‍රොත්‍රාදීන් වාචක වන බව) පැමිණිය යුත්තේයි (නාපජ්ජති යන පාඨයෙන් චෝදකයා විසින් ආරෝපනය කරනලද දෝෂය නිරාකරණය කරනලදි) නොපැමිණෙයි ( කුමක් හෙයින් නොපැමිණෙන්නේ ද යත්?) ආරෝපණය කරනලද බැවින් (රූඪී ශබ්ද බැවිනැයි කී නියායි) නොපැමිණෙයි පදුමාදියෙහි පඞ්කජ ආදී ශබ්දයෝ ආරෝපණය කළාක් මෙන් ඒ චක්‍ෂු ශබ්දය ඇසෙහිම නොහොත් චක්‍ෂුර්ප්‍රශාදයෙහිම ආරෝපණය කරන ලද්දේ වෙයි. **[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

තත්ථ චක්ඛු ද්විධා වුත්තං, පඤ්ඤාමංසප්පභේදතෝ;
තත්ථ පඤ්ඤාමයං චක්ඛු, හෝති පඤ්චවිධං පන.

බුද්ධධම්මසමන්තේහි, ඤාණදිබ්බේහි නාමතෝ;
යථානුක්කමතෝ තේසං, නානත්තං මේ නිබෝධථ.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 635-636 යටතේ)]**

**තත්ථ** එහි **චක්ඛු** චක්‍ෂුව **පඤ්ඤාමංසප්පභේදතෝ** ප්‍රඥා චක්‍ෂුස මාංශ චක්‍ෂුස යන ප්‍රභේද වශයෙන් **ද්විධා වුත්තං** දෙයාකාරයෙකින් දේශනා කරනලදි **තත්ථ** එහි **පඤ්ඤාමයං චක්ඛු පන** ප්‍රඥාමය චක්‍ෂුසය වනාහි **බුද්ධධම්මසමන්තේහි ඤාණදිබ්බේහි නාමතෝ** බුද්ධචක්‍ෂුස ධම්මචක්‍ෂුස සමන්තචක්‍ෂුස ඤාණචක්‍ෂුස දිබ්බචක්‍ෂුස යන නම් වශයෙන් **පඤ්චවිධං හෝති** පස් වැදෑරුම් වෙයි **තේසං** ඒ බුද්ධචක්‍ෂුස ආදීන්ගේ **නානත්තං** නානත්වය **යථානුක්කමතෝ** කියනලද ක්‍රමයෙන් **මේ** මගේ වචනයෙන් **නිබෝධථ** දැනගනිහු.

**[අභිධම්මාවතාර පරිවර්තනයි]**

චක්ඛුරූපස්ස නිද්දේසප්පකරණේපි චක්ඛු-සද්දසාමඤ්ඤතෝ ආගතං සබ්බම්පි චක්ඛුං පභේදතෝ දස්සේතුං **"තත්ථ චක්ඛූ"**තිආදි වුත්තං. **තත්ථා**ති තස්මිං චක්ඛුනිද්දේසේ. **පඤ්ඤාමංසප්පභේදතෝ**ති පඤ්ඤාචක්ඛු මංසචක්ඛූති ඒවං පඤ්ඤාමංසානං වසේන පභේදතෝ. **තත්ථා**ති තස්මිං දුවිධේ චක්ඛුම්හි. පඤ්ඤායේව **පඤ්ඤාමයං. නාමතෝ**ති නාමේහි පඤ්චවිධන්ති සම්බන්ධෝ. කතමේහි නාමේහීති ආහ **"බුද්ධධම්මා"**තිආදි. තත්ථ **බුද්ධධම්මසමන්තේහී**ති බුද්ධචක්ඛු ධම්මචක්ඛු සමන්තචක්ඛූති ඉමේහි නාමේහි. **ඤාණදිබ්බේහී**ති ඤාණචක්ඛු දිබ්බචක්ඛූති ච නාමේහි. **යථානුක්කමතෝ**ති යථාවුත්ත අනුක්කමතෝ. **නානත්ත**න්ති භේදං. **මේ**ති මය්හං සන්තිකා, මය්හං වචනතෝති වා අත්ථෝ. **නිබෝධථ** ජානාථ.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 635-636 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 434 පිට]**

චක්‍ෂු රූපයාගේ නිර්දේශ ප්‍රකරණයෙහි ද චක්‍ෂු ශබ්ද සමානතාවයෙන් එනලද සියළු චක්‍ෂුස ප්‍රභේද වශයෙන් දක්වන්නට "තත්ථ චක්ඛු" යනාදිය කියනලදි. "තත්ථ" යනු ඒ චක්‍ෂුර්නිර්දේශයෙහි. "පඤ්ඤාමංසප්පභේදතෝ" යනු ප්‍රඥාචක්‍ෂුස මාංශචක්‍ෂුස යැයි මෙසේ ප්‍රඥා-මාංශ චක්‍ෂූන්ගේ ප්‍රභේද වශයෙනි. "තත්ථ" යනු ඒ දෙවැදෑරුම් චක්‍ෂූන් අතුරින්; ප්‍රඥාවම පඤ්ඤාමය නම්. "නාමතෝ" යනු නාමයන්ගෙන් පස් වැදෑරුම් යන සම්බන්ධයයි. නාමයන්ගෙන් කොපමණ දැයි විචාරමින් "බුද්ධම්මා" යනුවෙන් කියනලදි. එහි "බුද්ධධම්මසමන්තේහි" යනු බුද්ධචක්‍ෂුස ධම්මචක්‍ෂුස සමන්තචක්‍ෂුස යන මේ නාමයන්ගෙනි. "ඤාණදිබ්බේහි" යනු ඤාණචක්‍ෂුස ද දිබ්බචක්‍ෂුස ද යන නාමයන්ගෙන්. "යථානුක්කමතෝ" යනු යම්සේ කියනලද ක්‍රමයෙනි. "නානත්තං" යනු භේදයයි. "මේ" යනු මගේ සමීපයෙහි නොහොත් මගේ වචනයෙන් යන අර්ථයි. "නිබෝධථ" නම් දැනගනිහු යන අර්ථයි.

**[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

ආසයානුසයේ ඤාණං, ඉන්ද්‍රියානං පරෝපරේ;
**බුද්ධචක්ඛු**න්ති නිද්දිට්ඨං, මුනිනා ලෝකචක්ඛුනා.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 637 යටතේ)]**

**ආසයානුසයේ ඤාණං** ආසයානුසයේ ඤාණය ද **ඉන්ද්‍රියානං පරෝපරේ** ඉන්ද්‍රියපරෝපරියත්ත ඤාණය ද **බුද්ධචක්ඛුං ඉති** බුද්ධචක්‍ෂුස යයි **ලෝකචක්ඛුනා මුනිනා** බුදුඇසින් ලෝකය බලන්නා වූ මුනින්‍ද්‍රයන් වහන්සේ විසින් **නිද්දිට්ඨං** දක්වනලදි. **[අභිධම්මාවතාර පරිවර්තනයි]**

තත්ථ "අද්දසං ඛෝ අහං, භික්ඛවේ, බුද්ධචක්ඛුනා ලෝකං වෝලෝකෙන්තෝ සත්තේ අප්පරජක්ඛේ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියේ"තිආදිනා (ම. නි. 1.283) ආගතං බුද්ධචක්ඛු නාමාති දස්සෙන්තෝ ආහ **"ආසයානුසයේ"**තිආදි. තත්ථ **ආසයානුසයේති** සත්තානං ආසයේ චේව අනුසයේ ච, තස්මිං පවත්තන්ති අත්ථෝ. තත්ථ ආගන්ත්වා සේති චිත්තං එත්ථාති ආසයෝ. බ්‍යග්ඝාසයෝ විය. යථා හි බ්‍යග්ඝෝ ගෝචරත්ථාය පක්කන්තෝපි පුන ආගන්ත්වා වනගහනේයේව සයති, තේනේව ච තං තස්ස ආසයෝති වුච්චති, ඒවං අඤ්ඤත්ථාපි පවත්තං චිත්තං ආගන්ත්වා යත්ථ සයති, තං තස්ස ආසයෝති වේදිතබ්බං. සෝ පන සස්සතදස්සනාදිවසේන චතුබ්බිධෝ හෝති. වුත්තඤ්හේතං;

"සස්සතුච්ඡේදදිට්ඨී ච, ඛන්ති චේවානුලෝමිකා;
යථාභූතඤ්ච යං ඤාණං, ඒතං ආසයසඤ්ඤිත"න්ති. (විසුද්ධි. මහා. 1.136; දී. නි. ටී. 1.පඨමමහාසඞ්ගීතිකථාවණ්ණනා; සාරත්ථ. ටී. 1. පඨමමහාසඞ්ගීතිවණ්ණනා; වි. වි. ටී. 1.වෙරඤ්ජකණ්ඩවණ්ණනා)

අනුසයකථා උපරි ආගමිස්සති. **ඉන්ද්‍රියානං පරෝපරේති** සද්ධාපඤ්චමකානං ඉන්ද්‍රියානං තික්ඛමුදුභාවේ. තික්ඛඤ්හි ඉන්ද්‍රියං උක්කට්ඨගතත්තා පරං, මුදු අපරං අනුක්කට්ඨගතත්තා. ඉදං පන **බුද්ධචක්ඛු** ඡසු අසාධාරණඤාණේසු පුරිමද්වයන්ති දට්ඨබ්බං.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 637 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 436 පිට]**

එහි මහණෙනි! මම බුදුඇසින් ලෝකය බලනුයේ අල්පරජස් ඇති සත්‍වයන් ද මහත් රජස් ඇති සත්‍වයන් ද තීක්‍ෂණ ඉන්ද්‍රිය ඇති සත්‍වයන් ද දැක්කෙමි යනාදියෙන් එනලදුයේ බුද්ධචක්ඛු නැමැයි දක්වමින් "ආසයානුසයේ" යනාදිය වදාළසේක. එහි "ආසයානුසයේ" යනු සත්‍වයන්ගේ ආසය මෙන්ම අනුසය වේද ඒ ආසය අනුසයෙහි පවතිත් යන අර්ථයි. චිත්තය අවුත් මෙහි සයනය කරයිනුයි ආසයෝ. ව්‍යාඝ්‍රයාගේ වාසස්ථානය මෙනි. යම්සේ වනාහි ව්‍යාඝ්‍ර තෙමේ ගොදුරු පිණිස පැන ගියේද නැවත පැමිණ වන ලැහැබෙහිම නිදයි. එහෙයින්ම චිත්තයට ද ඒ ආසයාදිය වාසස්ථානය යැයි කියනුලැබේ. මෙසේ අන්තැනක පැවති චිත්තය පැමිණ යම්තැනක හොවී ද ඒ තැන චිත්තයට වාසස්ථානය යැයි දතයුතුයි. ඒ ආසය වනාහි ශාස්වතදිට්ඨි ආදී වශයෙන් සිව් වැදෑරුම් වෙයි.

ශාස්වතදෘෂ්ටිය ද උච්ඡේදදෘෂ්ටිය මෙන්ම චතුරාර්‍ය්‍ය සත්‍යයගේ අනුලෝමික ඤාණය හෙවත් සඞ්ඛාරුපෙක්ඛා ඤාණය ද ප්‍රත්‍යය සහිත නාමරූපදර්ශන ඤාණය යන මෙයට ආසය යැයි කියනලදි. අනුසය කථාව මතුවට එන්නේය. "ඉන්ද්‍රියානං පරෝපරේ" යනු ශ්‍රද්ධාව පස්වැනි කොට ඇති ඉන්ද්‍රියයන්ගේ තීක්‍ෂණ මෘදු භාවයෙහි. ඉන්ද්‍රිය තීක්‍ෂණව උත්කෘෂ්ටව ගිය බැවින් උසස් නම් වෙයි. ඉන්ද්‍රිය මෘදුව උත්කෘෂ්ටව නොගිය බැවින් පහත් නම් වෙයි. මේ බුද්ධචක්‍ෂුස වනාහි ෂඩ් අසාධාරණඤාණ අතුරින් මුල් ඤාණ දෙක යැයි දතයුතුයි. **[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

හෙට්ඨාමග්ගත්තයේ ඤාණං, **ධම්මචක්ඛු**න්ති සඤ්ඤිතං;
ඤෙය්‍යං **සමන්තචක්ඛුන්ති,** ඤාණං සබ්බඤ්ඤුතා පන.
**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 638 යටතේ)]**

**හෙට්ඨාමග්ගත්තයේ ඤාණං** යට මාර්ගත්‍රයෙහි ඤාණය **ධම්මචක්ඛුං ඉති** ධම්මචක්ඛු ඤාණය යැයි **සඤ්ඤිතං** හඳුන්වනලදි **සබ්බඤ්ඤුතා ඤාණං පන** සර්වඥතා ඤාණය වනාහි **සමන්තචක්ඛු ඉති** සමන්තචක්ඛු ඤාණය යැයි **ඤෙය්‍යං** දතයුතුයි. **[අභිධම්මාවතාර පරිවර්තනයි]**

**හෙට්ඨා...පෙ.... සඤ්ඤිත**න්ති "තස්මිංයේව ආසනේ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදී"ති ඒවං වුත්තං හෙට්ඨා තීසු මග්ගේසු ඤාණං ධම්මචක්ඛුන්ති සඤ්ඤිතං. **ඤාණං සබ්බඤ්ඤුතා පනා**ති සබ්බඤ්ඤුභාවසඞ්ඛාතං ඤාණං. තඤ්හි සබ්බඤ්ඤූති අභිධානස්ස, බුද්ධියා ච පවත්තිනිමිත්තතාය සබ්බඤ්ඤුභාවෝ නාම හෝති. **ඤෙය්‍යං සමන්තචක්ඛු**න්ති ඛන්ධාදිවසේන සමන්තතෝ සබ්බසෝ දස්සනට්ඨේන සමන්තචක්ඛුන්ති ඤෙය්‍යං. තේනේවාහ;

"න තස්ස අද්දිට්ඨමිධත්ථි කිඤ්චි,
අථෝ අවිඤ්ඤාතමජානිතබ්බං;

සබ්බං අභිඤ්ඤාසි යදත්ථි ඤෙය්‍යං,
තථාගතෝ තේන සමන්තචක්ඛූ"ති. (චූළනි. මොඝරාජමාණවපුච්ඡානිද්දෙස 85);

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 638 යටතේ). අභිධම්මාවතාර ටීකා සන්නය 436 පිට]**

"හෙට්ඨා -පෙ- සඤ්ඤිතං" යනු ඒ ආසනයෙහිම කෙලෙස් රජස් නැති පහ වූ කෙලෙස් මල ඇති ධම්මචක්ෂුස ඉපදුණේයයි මෙසේ කියනලද යට මාර්ගත්‍රයෙහි ඤාණය ධම්මචක්ඛු ඤාණය යැයි හඳුන්වනලදි. "ඤාණං සබ්බඤ්ඤුතා පන" යනු සර්වඥතාභාව සඞ්ඛ්‍යාත ඤාණයයි. ඒ ඤාණය සබ්බඤුඤ යන නාමයාගේ ද නුවණගේ ද පැවැත්මට නිමිත්ත වූ බැවින් සබ්බඤ්ඤුත බව නම් වෙයි. "ඤෙය්‍යං සමන්තචක්ඛු" යනු ස්කන්ධාදී වශයෙන් හාත්පසින් සියළු ආකාරේන දැකීම් අර්ථයෙන් සමන්තචක්ඛු යයි දතයුතුයි. ඒ භාග්‍යවතුන් වහන්සේට මේ ලෝකයෙහි නොදකිනලද කිසිවක් නම් නැත. එසේම නොදතයුතු කිසිවක් ද නැත. දතයුතු යමක් වේද ඒ සියල්ල විශිෂ්ට ඤාණයෙන් දැනගත්තේය. එහෙයින් තථාගතයන් වහන්සේ සමන්තචක්ඛු යැයි නම් වේ. **[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

යං "චක්ඛුං උදපාදී"ති, ආගතං **ඤාණචක්ඛු** තං;
අභිඤ්ඤාචිත්තජා පඤ්ඤා, **දිබ්බචක්ඛු**න්ති වුච්චති.
**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 639 යටතේ)]**

**චක්ඛුං උදපාදි ඉති** චක්ඛුං උදපාදි යයි **යං** යම් ඤාණයක් **ආගතං** එන ලද්දේ ද **තං** ඒ ඤාණය **ඤාණචක්ඛු ඉති** ඤාණචක්ෂුස යයි **වුච්චති** කියනු ලැබේ **අභිඤ්ඤාචිත්තජා පඤ්ඤා** අභිඥා චිත්තයෙන් උපන් යම් ප්‍රඥාවක් වේද **තං දිබ්බචක්ඛුං ඉති** එය දිබ්බචක්ෂුස යයි **වුච්චති** කියනු ලැබේ.
**[අභිධම්මාවතාර පරිවර්තනයි]**

**යං චක්ඛුං උදපාදීති ආගත**න්ති යං ඤාණං "ඉදං දුක්ඛන්ති, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදී"ති (මහාව. 15) ඒවං තත්ථ තත්ථ සුත්තේසු ආගතං, චතූසු සච්චේසු තේපරිවට්ටවසේන "දුක්ඛං පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාත"න්ති ඒවමාදිනා ද්වාදසවිධේන ආකාරේන පවත්තං, ඉදං **ඤාණචක්ඛු**. යා පන "අද්දසං ඛෝ අහං, භික්ඛවේ, දිබ්බේන චක්ඛුනා විසුද්ධේනා"තිආදිනා (ම. නි. 1.284) ආගතා පඤ්චමජ්ඣානසඞ්ඛාතඅභිඤ්ඤාචිත්තසම්පයුත්තා පඤ්ඤා, අයං **දිබ්බචක්ඛූ**ති දස්සේතුං **"අභිඤ්ඤාචිත්තජා"**තිආදි වුත්තං. එත්ථ ච පඨමතතියඤාණානි කාමාවචරානියේව. චතුත්ථම්පි පන පුරිමද්වයම්ව කාමාවචරන්ති **ආනන්දචරියේන** වුත්තං. ඤාණචක්ඛුං සහඅරියමග්ගවිපස්සනාඤාණන්තිපි යුජ්ජතීති අපරේ. අග්ගමග්ගේන සහ විපස්සනාපච්චවෙක්ඛණාඤාණන්ති පන යුත්තං විය දිස්සති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 639 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 436-438 පිටු]**

"යං චක්ඛුං උදපාදීති ආගතං" යනු මහණෙනි! මෙය දුක යැයි පෙර නොඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළවිය, ඤාණය පහළවිය යැයි මෙසේ ඒ ඒ සූත්‍රයන්හි එනලද්ද වූ යම් ඤාණයක් වේද, "දුක්ඛං පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාතං" යැයි චතුරාර්‍ය්‍ය සත්‍යයෙහි තිපරිවට්ට වශයෙන් මේ ආදි දෙළොස් වැදෑරුම් ආකාරයෙන් පවතිනලද යම් ඤාණයක් වේද මෙය ඤාණචක්ඛු නම්. මහණෙනි! මම පිරිසිදු වූ දිව්‍යචක්ෂුසයෙන් දැක්කෙමි යනාදියෙන් පඤ්චම ධ්‍යාන සඞ්ඛ්‍යාත අභිඥචිත්ත සම්ප්‍රයුක්ත යම් ප්‍රඥවක් වේද මෙය දිබ්බචක්ඛුව යයි දක්වන්නට "අභිඤ්ඤාචිත්තජා" යනාදිය කියනලදි. මෙහි ද ප්‍රථම තෘතීය ඤාණයෝ (බුද්ධචක්ෂුස හා සමන්තචක්ෂුස) කාමාවචරම වෙත්. සතරවෙනි ඤාණය නම් වූ (ඤාණචක්ෂුස) පෙර ඤාණ දෙක මෙන්ම කාමාවචරම යැයි ආනන්දචර්‍ය්‍යයන් වහන්සේ විසින් කියනලදි. ඇතැමෙක් ඤාණචක්ෂුස සමඟ ආර්‍ය්‍ය මාර්ග විදර්ශනා ඤාණය ද යෙදේ යැයි කියත්. අග්‍ර මාර්ගය සමඟ විදර්ශනා ප්‍රත්‍යවේක්ෂණ ඤානයන් ද යෙදුනාක් මෙන් පෙනෙයි.

**[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

මංසචක්ඛුපි දුවිධං, සසම්භාරපසාදතෝ;
සසම්භාරඤ්ච නාමෙත්ථ, අක්ඛිකූපේ පතිට්ඨිතං.

අක්ඛිකූපට්ඨිනා හෙට්ඨා, උද්ධඤ්ච භමුකට්ඨිනා;
උභතෝ අක්ඛිකූටේහි, මත්ථලුඞ්ගේන අන්තතෝ.

බහිද්ධා අක්ඛිලෝමේහි, පරිච්ඡින්නෝ ච යෝ පන;
නහාරුසුත්තේන ආබන්ධෝ, මංසපිණ්ඩෝ පවුච්චති.

සකලෝපි ච ලෝකෝයං, කමලස්ස දලං විය;
පුටුලං විපුලං නීලං, ඉති ජානාති ලෝචනං.

චක්ඛු නාම න තං හෝති, වත්ථු තස්සාති වුච්චති;
ඉදං පන **සසම්භාර-චක්ඛු**න්ති පරිදීපිතං.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 640-644 යටතේ)]**

**සසම්භාරපසාදතෝ** සසම්භාර චක්‍ෂුස ප්‍රශාද චක්‍ෂුස වශයෙන් **මංසචක්ඛුපි** මාංශ චක්‍ෂුස ද **දුවිධං** දෙවැදෑරුම් (**හෝති** වෙයි) **එතථ** මේ අතුරින් **සසම්භාරඣද්ච නාම** සසම්භාර නම් චක්‍ෂුස **අක්ඛිකූපේ** ඇස් වලෙහි **පතිට්ඨිතං** පිහිටනලදි.

**හෙට්ඨා** යටින් **අක්ඛිකූපට්ඨිනා ච** අක්‍ෂිකූප අස්ථියෙන් ද **උද්ධං** උඩින් **භමුකට්ඨිනා** ඇහිබැම් අස්ථියෙන් ද **උභතෝ** දෙපසින් **අක්ඛිකූටේහි** ඇස් වලෙන් ද **අන්තතෝ** ඇතුලතින් **මත්ථලුඞ්ගේන** හිස්මොළයෙන් ද.

**බහිද්ධා** බාහිරින් **අක්ඛිලෝමේන** අක්‍ෂි ලෝමයෙන් **පරිච්ඡින්නෝ** පිරිසිඳින ලද **නහාරුසුත්තේන ආබන්ධෝ** නහර වැල්වලින් වෙළනලද **යෝ පන මංසපිණ්ඩෝ** යම් මාංශ පිණ්ඩයක් වේද (**සෝ සසම්භාරෝ ඉති** එය සසම්භාර චක්‍ෂුස යැයි) **පවුච්චති** කියනු ලැබේ.

**සකලෝපි ච ලෝකෝ** සියළු පෘථුජ්ජන ලෝකයා **පුථුලං** පළල් වූ **විපුලං** මහත් වූ **නීලං** නිල්පැහැ වූ **කමලස්ස දලං විය** පියුම් පෙත්ත මෙන් **යං** යම් මාංශ පිණ්ඩයක් **ලෝචනං ඉති** ඇස යැයි **ජානාති (ගණ්හාති)** ගනී ද.

**තං** ඒ මාංශ පිණ්ඩය **චක්ඛු නාම** චක්‍ෂුස නම් **න හෝති** නොවෙයි **තස්ස** ඒ පරමාර්ථ චක්‍ෂුසගේ **වත්‍ථු** වස්තුව **ඉති (පසාදචක්ඛු)** ප්‍රශාද චක්‍ෂුස යැයි **වුච්චති** කියනු ලැබේ **ඉදං පන** මේ මාංශ පිණ්ඩය වනාහි **සසම්භාරචක්ඛුං ඉති** සසම්භාර චක්‍ෂුස යැයි **පරිදීපිතං** දක්වනලදි. **[අභිධම්මාවතාර පරිවර්තනයි]**

ඒවං පඤ්චාදචක්ඛුස්ස පභේදං දස්සෙත්වා පුන මංසචක්ඛුස්සාපි පභේදං දස්සේතුං **"මංසචක්ඛුපී"**තිආදි වුත්තං. **සසම්භාරපසාදතෝ**ති සසම්භාරචක්ඛු පසාදචක්ඛූති ඉමේසං ද්වින්නං වසේන සම්භරීයති ඒතේහීති සම්භාරා, අවයවා. තේ පන උපත්ථම්භකභූතා චතුසමුට්ඨානිකරූපසන්තතියෝ දට්ඨබ්බා. සහ සම්භාරේහීති **සසම්භාරං**. සසම්භාරඤ්ච නාම මංසපිණ්ඩෝ පවුච්චතීති සම්බන්ධෝ. **අක්ඛිකූපට්ඨිනා හෙට්ඨා**ති හෙට්ඨාගතඅක්ඛිකූපස්ස අට්ඨිනා පරිච්ඡින්නෝති සම්බන්ධෝ. **උද්ධ**න්ති අක්ඛිකූපතෝ උද්ධං. **උභතෝ අක්ඛිකෝටීහී**ති අක්ඛිකූපස්ස උභයභාගේ අක්ඛිකෝටීහි. **මත්ථලුඞ්ගේන අන්තතෝ**ති අක්ඛිකූපස්ස අබ්භන්තරේ ඨිතේන මත්ථලුඞ්ගේන. **නහාරුසුත්තේන ආබන්ධෝ**ති නහාරුරජ්ජූහි අන්තෝ මත්ථලුඞ්ගේන සහ ආබන්ධෝ. **සකලෝපි ච ලෝකෝ**ති සකලෝපි බාලපුථුජ්ජනලෝකෝ. **යන්**ති යං මංසපිණ්ඩං. **කමලස්ස දලං වියා**ති පුථුලවිපුලනීලතාය නීලුප්පලදලං විය. **ජානාතී**ති ගණ්හාති. **චක්ඛු නාම න තං හෝතී**ති තථා ගය්හමානං තං චක්ඛු නාම න හෝති. කිඤ්චරහි තන්ති ආහ **"වත්ථු තස්සාති වුච්චතී"**ති. **තස්සා**ති තස්ස යථාධිප්පේතස්ස පරමත්ථචක්ඛුනෝ. **ඉදං පනා**ති නිගමනං.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 640-644 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 438 පිට]**

මෙසේ ප්‍රඥ චක්‍ෂුසගේ ප්‍රභේදය දක්වා මාංශ චක්‍ෂුසගේ ද ප්‍රභේදය දැක්වීම පිණිස "මංසචක්ඛුපි" යනාදිය කියනලදි. "සසම්භාරපසාදතෝ" යනු සසම්භාර චක්‍ෂුස ප්‍රශාද චක්‍ෂුස යන මොහුන් දෙදෙනාගේ වශයෙන් ඒවා කරණකොටගෙන රැස්කරණු ලැබේනුයි සම්භාර නම්; එනම් අවයවයෝයි. උපස්ථම්භක වන්නා වූ ඔවුහු වනාහි

චතුසමුට්ඨානික රූප සන්තතිය යැයි දතයුත්තාහ. පිරිවර දෑ සහිතනුයි සසම්භාර නම්. සසම්භාර නම් මාංශ පිණ්ඩය කියනුලැබේ යනු සම්බන්ධයි. "අක්ඛිකූපට්ඨිනා හෙට්ඨා" යනු යටින් අක්‍ෂිකූපයාගේ අස්ථියෙන් පිරිසිඳින ලදැයි යන සම්බන්ධයි. "උද්ධං" යනු අක්‍ෂිකූපයෙන් මතුයෙහි. "උභතෝ අක්ඛිකොටීහි" යනු අක්‍ෂිකූපයාගේ දෙපසින් වූ ඇස් කෙළවරින්. "මත්ථලුඞ්ගේන අන්තතෝ" යනු අක්‍ෂිකූපයාගේ අභ්‍යන්තරයෙහි සිටිනලද හිස් මොළයෙන්. "නහාරුසුත්තේන ආබන්ධෝ" යනු නහර වැල්වලින් ඇතුළත හිස් මොළය සමඟින් බැඳෙන ලද්දේ. "සකලෝපි ච ලෝකෝ" යනු සියළු බාල පෘථුජ්ජන ලෝකයා. "යං" යනු යම් මාංශ පිණ්ඩයක්. "කමලස්ස දලං විය" යනු පැතිරුණු මහත් නිල්පැහැයෙන් යුතු නිලුපුල් පෙත්තක් මෙනි. "ජානාති" යනු ගනී. "චක්ඛු නාම න තං හෝති" යනු එසේ ගන්නා වූ ඒ චක්‍ෂුස නම් නොවෙයි. ඒ චක්‍ෂුස කුමක්දැයි දක්වමින් "චතුු තස්සාති වුච්චති" යයි කීවේය. "තස්ස" යනු යම්සේ අපේක්‍ෂා කළ ඒ පරමාර්ථ චක්‍ෂුසගේ. "ඉදං පන" යනු නිගමනයයි.

**[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

වණ්ණෝ ගන්ධෝ රසෝ ඕජා, චතස්සෝ චාපි ධාතුයෝ;
භාවසම්භවසණ්ඨානං, ජීවිතානි තථේව ච.

කායචක්ඛුපසාදාති, සම්භාරා හොන්ති චුද්දස;
තථා විත්ථාරතො චෙතං, චතස්සො චාපි ධාතුයො.

වණ්ණෝ ගන්ධෝ රසෝ ඕජා, සණ්ඨානසම්භවෝ තථා;
දසේතේ චතුසමුට්ඨානා, චත්තාලීස භවන්ති තේ.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 645-647 යටතේ)]**

**චතස්සෝ චාපි ධාතුයෝ** සතර මහාධාතූහු ද **වණ්ණෝ** වර්ණය ද **ගන්ධෝ** ගන්ධය ද **රසෝ** රසය ද **ඕජා** ඕජාව ද **භාවසම්භවසණ්ඨානං** භාවරූපය සම්භවය සණ්ඨානය **ජීවිතානි** ජිවිතේන්ද්‍රිය රූපය ද එසේම.

**කායචක්ඛුපසාද ඉති** කායප්‍රසාදය චක්‍ෂුර්ප්‍රසාදය යන **චුද්දසසම්භාරා** තුදුස් රූප සමූහයෝ **හොන්ති** වෙත් **තථා** එසේම **ඒතං** එය **විත්ථාරතෝ ච** විස්තර වශයෙන් **චතස්සෝ චාපි ධාතුයෝ** සතර මහාධාතූහු ද.

**වණ්ණෝ** වර්ණය ද **ගන්ධෝ** ගන්ධය ද **රසෝ** රසය ද **ඕජා** ඕජාව ද **තථා** එසේම **සණ්ඨානසම්භවෝ** සණ්ඨානය ද සම්භවය ද යන **ඒතේ දස** මේ රූප දස දෙන **චතුසමුට්ඨානා** කර්මාදි සතරින්ම උපදින්නාහ **තේ** ඒ රූපයෝ **චත්තාලීස භවන්ති** සතලිසක් වෙත්. **[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

තං පන සසම්භාරචක්ඛු යේහි සම්භාරේහි සම්භරීයති, තේ සරූපතෝ, ගණනතෝ ච දස්සේතුං **"වණ්ණෝ ගන්ධෝ"**තිආදි වුත්තං. **භාවෝ**ති ඉත්ථියා ඉත්ථිභාවෝ, පුරිසස්ස පුම්භාවෝති ලබ්භමානකභාවෝ. **සම්භවෝ**ති ආපෝධාතුමේව සම්භවභූතමාහ. **සණ්ඨාන**න්ති ච තේන තේනාකාරේන සන්නිවිට්ඨේසු මහාභූතේසු තං තං සණ්ඨානවසේන විඤ්ඤායමානං වණ්ණායතනමාහ. ආපෝධාතු වණ්ණායතනේහි ච අනත්ථන්තරභූතානම්පි සම්භවසණ්ඨානානං විසුං වචනං තථාභූතානං, අතථාභූතානඤ්ච ආපාදීනං යථාවුත්තමංසපිණ්ඩේ විජ්ජමානත්තා. ආපෝධාතුවණ්ණායතනානඤ්හි සන්තානවසේන පවත්තමානානං අවත්ථාවිසේසෝ

සම්භවො සණ්ඨානඤ්චාති. **දසේතේති** චතස්සෝ ධාතුයෝ, තන්නිස්සිතා වණ්ණාදයෝ චාති ඉමේ දස. **චතුසමුට්ඨානාති** අන්තෝගතහෙත්වත්ථමිදං විසේසනං, චතුසමුට්ඨානිකත්තාති වුත්තං හෝති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 645-647 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 438 පිට]**

ඒ සසම්භාර චක්‍ෂුස වනාහි යම් සමූහයක් කරණකොටගෙන රැස්කරණු ලැබුයේ ද ඒ සමූහය ස්වරූප වශයෙන් ද ගණන් වශයෙන් ද දක්වන්නට "වණ්ණෝ ගන්ධෝ" යනාදිය කියනලදි. "භාවෝ" යනු ස්ත්‍රියගේ ස්ත්‍රීභාවය ද පුරුෂයාගේ පුරුෂභාවය ද යයි ලබන්නා වූ භාවරූපයයි. "සම්භවෝ" යනු ආපෝධාතුවමය. ශුක්‍ර ශ්‍රොනිත ධාතුව යැයි කීවේය. "සණ්ඨානං" යනු ඒ ඒ ආකාරයෙන් පිහිටි මහාභූතයන්හි ඒ ඒ සටහන් වශයෙන් හඟිනුලබන වර්ණායතනය කීවේය. ආපෝධාතුවෙන් ද වර්ණායතනයන්ගෙන් වෙනත් අර්ථයක් නොවන්නා වූ සම්භව සණ්ඨානයන්ගේ වෙනත් වචනයක් කීම, යම්සේ කියනලද මාංශ පිණ්ඩයෙහි එසේ වන්නාවූ හෝ නොවන්නා වූ හෝ ආපෝ ධාතූන්ගේ විද්‍යමාන බැවිනි. ආපෝ ධාතු වර්ණායතනයන්ගේ සන්තාන වශයෙන් පවත්නා වූ අවස්ථා විශේෂය සම්භව සණ්ඨාන නමි. "දසේතේ" යනු සතර මහාධාතූහු, ඔහුන් නිශ්‍රය කොට ඇති වර්ණාදී ධාතූන් යන මේ දස දෙන වෙත්. "චතුසමුට්ඨානා" යනු ඇතුළත් කරනලද හේත්වර්ථයෙහි මේ විශේෂණයයි. චතුසමුට්ඨානික බැවින් යයි කියනලද්දේ වෙයි.

**[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

චක්ඛු කායප්පසාදෝ ච, භාවෝ ජීවිතමේව ච;
චත්තාලීසඤ්ච රූපානි, චත්තාරි තු භවන්ති හි.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 648 යටතේ)]**

**චක්ඛුකායප්පසාදෝ ච** චක්‍ෂුර්ප්‍රසාදය ද කායප්‍රසාදය ද **ච ඒව (තථා)** එසේම **භාවෝ** භාව රූපය ද **ජීවිතං** ජීවිතේන්ද්‍රිය රූපය ද යන **චත්තාරි රූපානි** රූප සතර ද **හි** පෙර කියනලද **චත්තාලීසඤ්ච (රූපානි)** රූප සතලිස ද **තු** එකතු කොට **භවන්ති** රූප සිව් සාලිසක් වෙත්. **[අභිධම්මාවතාර පරිවර්තනයි]**

චක්ඛු…පෙ…. ජීවිතමේව චාති ඉමානි ඒකන්තකම්මසමුට්ඨානානි, පුරිමානි ච චතුසමුට්ඨානානීති **චත්තාලීසඤ්ච චත්තාරි ච** රූපානි භවන්ති, චතුචත්තාලීස රූපානි හොන්තීති අත්ථෝ.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 648 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 438 පිට]**

"චක්ඛු -පෙ- ජීවිතමේව ච" යන මේ රූපයෝ ඒකාන්තයෙන් කර්මයෙන්ම උපදින්නෝයි. පෙර කියනලද රූපයෝ චතුසමුට්ඨානික රූපයෝ වෙත්. "චත්තාලීසඤ්ච චත්තාරි ච රූපානි භවන්ති" යනු සිව්සාලිස් රූපයෝ වෙත් යන අර්ථයයි. **[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

ඉමේසං පන රූපානං, වසේන පරිපිණ්ඩිතං;
ඉදං සම්භාරචක්ඛුන්ති, පණ්ඩිතේහි පකාසිතං.

යෝ පනෙත්ථ සිතෝ අත්ථි, පරිබන්ධෝ පරිත්තකෝ;
චතුන්නං පන භූතානං, පසාදෝ කම්මසම්භවෝ.
ඉදං **පසාදචක්ඛු**න්ති, අක්ඛාතං පඤ්චචක්ඛුනා;

තදේතං තස්ස මජ්ඣෙ තු, සසම්භාරස්ස චක්ඛුනෝ.

සේතේන මණ්ඩලේනස්ස, පරික්ඛිත්තස්ස සබ්බසෝ;
කණ්හමණ්ඩලමජ්ඣෙ වා, නිවිට්ඨේ දිට්ඨමණ්ඩලේ.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 649-652 යටතේ)]**

**ඉමේසං රූපානං** මේ රූපයන්ගේ **වසේන පන** වශයෙන් වනාහි **පරිපිණ්ඩිතං** පිඬු කරනලද **ඉදං** මෙය **සසම්භාරචක්ඛුං ඉති** සසම්භාර චක්‍ෂුස යැයි **පණ්ඩිතේහි** නුවණැත්තන් විසින් **පකාසිතං** ප්‍රකාශකරනලදි.

**යෝ පන** යමක් වනාහි **සිතෝ අත්ථි** සුදුපැහැ වේද **එත්ථ පරිබද්ධෝ** සසම්භාර චක්‍ෂුස හා බැඳෙන ලද්දේ වේද **පරිත්තකෝ** ඉතා ස්වල්ප වූයේ වේද (**සෝ** එය වනාහි) **කම්මසම්භවෝ** කර්මයෙන් හටගත්තා වූ **චතුන්නං පන භූතානං** සතර මහාභූතයන්ගේ **පසාදෝ** ප්‍රශාදයයි.

**පඤ්චචක්ඛුනා** පඤ්ච චක්‍ෂුස පසක් ඇති භාග්‍යවතුන් වහන්සේ විසින් **ඉදං** මෙය **පසාදචක්ඛුං ඉති** ප්‍රශාද චක්‍ෂුසය යයි **අක්ඛාතං** දේශනා කරනලදි **තදේතං** ඒ මේ ප්‍රශාද චක්‍ෂුස **තස්ස සසම්භාරස්ස චක්ඛුනෝ** ඒ සසම්භාර චක්‍ෂුසගේ **මජ්ඣෙ** මධ්‍යයෙහි **සබ්බසෝ** සියළු ආකාරයෙන් **සේතේන මණ්ඩලේන** සුදු මණ්ඩලයකින් **පරික්ඛිත්තස්ස අස්ස** පරික්‍ෂේප වූවාවූ **කණ්හමණ්ඩලමජ්ඣෙ වා** කළු මණ්ඩලයාගේ මධ්‍යයෙහි හෝ **දිට්ඨමණ්ඩලේ** ඉදිරියෙහි සිටිනවූවන්ගේ ශරීර සටහන් උපදින ප්‍රදේශයෙහි **නිවිට්ඨේ (පතිට්ඨිතේ)** පිහිටියේ වෙයි. **[අභිධම්මාවතාර පරිවර්තනයි]**

**ඉමේසං පන රූපානං වසේනා**ති යථාවුත්තානං සඞ්ඛෙපතෝ චුද්දසන්නං, විත්ථාරතෝ චතුචත්තාලීසානඤ්ච රූපානං වසේන. **පරිපිණ්ඩිත**න්ති සමන්තතෝ පිණ්ඩිතං. යත්ථ සේතම්පි අත්ථි, කණ්හම්පි ලෝහිතම්පි පථවීපි ආපෝපි තේජෝපි වායෝපි, ඉදං පන සෙම්හුස්සදත්තා සේතං හෝති, පිත්තුස්සදත්තා කණ්හං, රුහිරුස්සදත්තා ලෝහිතකං, පථවුස්සදත්තා පත්ථිනං හෝති, ආපුස්සදත්තා පග්ඝරති, තේජුස්සදත්තා පරිඩය්හති, වායුස්සදත්තා සම්භමති. ඉදං සම්භාරවන්තතාය සම්භාරචක්ඛූති **පණ්ඩිතේහි** බුද්ධාදීහි **පකාසිතං** පරිදීපිතං. **එත්ථ සිතෝ**ති ඒතං සසම්භාරචක්ඛුං නිස්සිතෝ තදායත්තභූතෝ. තේනාහ "එත්ථ පටිබද්ධෝ"ති. **චතුන්නං පන භූතානං පසාදෝ**ති චතුන්නං භූතානං පසන්නතාසභාවෝ පසාදෝ, "සේතේන මණ්ඩලේනස්සා"ති පාඨෝ යුජ්ජති. පොත්ථකේසු පන "සේතේ තු මණ්ඩලේ තස්සා"ති ලිඛන්ති. **කණ්හමණ්ඩලමජ්ඣෙ**ති ඉධාපි "කණ්හමණ්ඩලස්ස මජ්ඣෙ"ති වත්තබ්බේ "චතුත්ථදූ"තිආදීසු විය ඡන්දනුරක්ඛණත්ථං විභත්තිලෝපං කත්වා "කණ්හමණ්ඩලමජ්ඣෙ"ති වුත්තං. ඒවඤ්හි අත්ථෝ ච යෝජනා ච සුට්ඨු උපපන්නා හොන්ති. **අට්ඨකථායම්පි** හි "සේතමණ්ඩලපරික්ඛිත්තස්ස කණ්හමණ්ඩලස්ස මජ්ඣෙ"ති (ධ. ස. අට්ඨ. 596) වුත්තං. අපරේ පන යථාඨිතවසේනේව පාඨං ගහෙත්වා "සබ්බසෝ පරික්ඛිත්තස්ස තස්ස සසම්භාරස්ස චක්ඛුනෝ මජ්ඣෙ සේතමණ්ඩලේ කණ්හමණ්ඩලේ මජ්ඣෙ"ති යෝජෙන්ති. **දිට්ඨමණ්ඩලේ**ති අභිමුඛෙ ඨිතානං සරීරසණ්ඨානුප්පත්තිදේසභූතේ දිට්ඨමණ්ඩලේ.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 649-652 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 440 පිට]**

"ඉමේසං පන රූපානං වසේන" යනු සඞ්ක්ෂේපයෙන් යට කියනලද තුදුස් රූපයන්ගේ වශයෙන්ද, විස්තාර වශයෙන් කියනලද සිව්සාලිස් රූපයන්ගේ වශයෙනි. "පරිපිණ්ඩිතං" යනු හාත්පසින් පිඬු කරනලද. යම් තැනෙක ස්වේත වර්ණය ඇත්තේ ද, කළු පැහැය ඇත්තේ ද, රතු පැහැය ඇත්තේ ද, පඨවි ධාතුව ද ආපෝ ධාතුව ද තේජෝ ධාතුව ද වායෝ ධාතුව ද ඇත්තේ වේද එනිසා මෙය වනාහි සෙම උත්සන්න බැවින් ස්වේත වර්ණය වෙයි. පිත උත්සන්න බැවින් කළු පැහැය වෙයි. ලෙය උත්සන්න බැවින් රත් පැහැය වෙයි. පඨවි ධාතුව උත්සන්න බැවින් කර්කශ වෙයි. අප් ධාතුව උත්සන්න බැවින් වැගිරෙයි. තේජෝ ධාතුව උත්සන්න බැවින් දැවෙයි. වායෝ ධාතුව උත්සන්න බැවින් භ්‍රමණය වෙයි. මෙය රාශිතාවය වන හෙයින් බුද්ධාදී පණ්ඩිතයන් විසින් සම්භාරචක්‍ෂුස යැයි මනා කොට දක්වනලදි. "එත්ථ සිතෝ" යනු ඒ සසම්භාර චක්‍ෂුස නිශ්‍රිත වූ එය හටගැනීමට හේතු වූයේයි. එහෙයින් "එත්ථ පටිබද්ධෝ" යි කීය. "චතුන්නං පන භූතානං පසාදෝ" යනු සිව් මහාභූතයන්ගේ ප්‍රසන්නවත් ස්වභාවය ප්‍රශාදය වෙයි. "සේතේන මණ්ඩලේනස්ස" යන පාඨය යෝග්‍යය වෙයි. පොත්වල වනාහි "සේතේ තු මණ්ඩලේ තස්ස" යනුවෙන් ලියති. "කණ්හමණ්ඩලමජ්ඣෙ" යන මෙහි ද "කණ්හමණ්ඩලස්ස මජ්ඣෙ" යැයි කිවයුතු කල්හි ඡන්දස් රැකීම පිණිස චතුර්ථ ද්විතියාදීහි මෙන් විභත්ති ලොප් කොට "කණ්හමණ්ඩලමජ්ඣෙ" යැයි කියනලදි. මෙසේ වනාහි අර්ථය ද යෙදීම ද මනාව හටගන්නා ලද්දේ වෙත්. දම්සඟුණු අර්ථකථාවෙහි ද "සේතමණ්ඩලපරික්ඛිත්තස්ස කණ්හමණ්ඩලස්ස මජ්ඣෙ" යැයි කියනලදි. අන්‍යයෝ වනාහි පැවති ලෙසින්ම පාඨය ගෙන "සබ්බසෝ පරික්ඛිත්තස්ස තස්ස සසම්භාරස්ස චක්ඛුනෝ මජ්ඣෙ සේතමණ්ඩලේ කණ්හමණ්ඩලේ මජ්ඣෙ" යැයි යොදති. "දිට්ඨමණ්ඩලේ" යනු අභිමුඛයෙහි සිටියවුන්ගේ ශරීර සටහන් හටගන්නා ප්‍රදේශය වූ දෘෂ්ටිමණ්ඩලයෙහි යන අර්ථයි. **[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

සන්ධාරණාදිකිච්චාහි, ධාතූහි ච චතූහිපි;
කතූපකාරං හුත්වාන, උතුචිත්තාදිනා පන.

උපත්ථම්භියමානං තං, ආයුනා කතපාලනං;
වණ්ණගන්ධරසාදීහි, රූපේහි පරිවාරිතං.

චක්ඛුවිඤ්ඤාණාදීනං, වත්ථුද්වාරඤ්ච සාධයං;
ඌකාසිරසමානේන, පමාණේනේව තිට්ඨති.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 653-655 යටතේ)]**

**චතූහිපි ධාතූහි** සතර මහාධාතූන් විසින් **සන්ධාරණාදිකිච්චාහි ච** දැරීම් ආදී කෘත්‍යයෙන් ද **කතූපකාරං හුත්වාන** කරනලද උපකාර ඇත්තේ වී **උතුචිත්තාදිනා පන** උතු චිත්තාදියෙන් **උපත්ථම්භියමානං** උපස්ථම්භනය ලබන්නා වූ ද **ආයුනා කතපාලනං** ජීවිතේන්ද්‍රියෙන් කරනලද ආරක්‍ෂාව ඇත්තා වූ ද **වණ්ණගන්ධරසාදීහි රූපේහි** වර්ණ ගන්ධ රස ආදී රූපයන් විසින් **පරිවාරිතං** පිරිවරනලද්දවූ ද **චක්ඛුවිඤ්ඤාණාදීනං** චක්‍ෂුර්විඤ්ඤාණ ආදීන්ට **වත්ථුද්වාරඤ්ච** වස්තු ද්වාර බව **සාධයං** සිද්ධකරමින් **ඌකාසිරසමානේන** පමාණේනේව උකුණු හිසකගේ ප්‍රමාණයෙන්ම **තං (පසාදං)** ඒ ප්‍රශාදය **තිට්ඨති** සිටියි. **[අභිධම්මාවතාර පරිවර්තනයි]**

**සන්ධාරණා**...**පෙ**.... **හුත්වානාති** සන්ධාරණනහාපනමණ්ඩනබීජනකිච්චාහි චතූහි ධාතීහි ඛත්තියකුමාරෝ විය සන්ධාරණාබන්ධනපරිපාචනසමුදීරණකිච්චාහි

අත්තනිස්සයභූතාහි චතූහි ධාතූහි කතූපකාරං හුත්වා. **උතුචිත්තාදිනාති** තීහි සන්තතිසමුට්ඨාපකේහි උතුචිත්තාහාරේහි. එත්ථ ච කලාපන්තරගතා උතුආහාරා අධිප්පේතාති වදන්ති. **ආයුනා කතපාලන**න්ති චතුධාතුනිස්සිතේනේව ජීවිතින්ද්‍රියේන රක්ඛියමානං. තථා හේතං කම්මජරූපපරිපාලනලක්ඛණං. **වණ්ණගන්ධරසාදීහීති ආදි**-ග්ගහණේන ඕජං සඞ්ගණ්හාති, "වණ්ණගන්ධරසෝජාහී"ති වා පාඨෝ. **වත්ථුද්වාරඤ්ච සාධය**න්ති යථායෝගං වත්ථුද්වාරභාවං සාධයමානං. චක්ඛුවිඤ්ඤාණස්ස හි නිස්සයභාවතෝ වත්ථුභාවං, පවත්තිමුඛභාවතෝ ද්වාරභාවඤ්ච සාධේති. සම්පටිච්ඡනාදීනං පන තදාරම්මණාවසානානං අඤ්ඤනිස්සිතත්තා ද්වාරභාවමේව සාධේති, න වත්ථුභාවං. **ඌකාසිරසමානේන පමාණේනාති** ඌකාසිරසමානේන පදේසප්පමාණේන ලක්ඛිතං හුත්වා ඌකාසිරසමානප්පමාණේ ඨානේති වා අත්ථෝ. **තිට්ඨතීති** සත්ත අක්ඛිපටලානි බ්‍යාපෙත්වා සත්තසු පිචුපටලේසු ආසිත්තතේලං විය තිට්ඨති. ඒවඤ්ච කත්වා චක්ඛුස්ස අනේක කලාපගතතා සිද්ධා හෝති. උපද්දවානං පටලනිරාකරණේපි හි චක්ඛු විජ්ජතේවාති. යථා ච චක්ඛු, ඒවම්මස්ස නිස්සයභූතා චතස්සෝ ධාතුයෝ, ආයුවණ්ණාදීනි ච සත්ත අක්ඛිපටලානි බ්‍යාපෙත්වා ඨිතානේව අවිනිබ්භෝගවුත්තිත්තාති ගහේතබ්බං.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 653-655 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 440 පිට]**

"සණ්ධාරණා -පෙ- හුත්වාන" යනු කිරිමව්වරු සතර දෙනෙකුන් විසින් දැරීම් නැහැවීම් සැරසවීම් පවන්සැලීම යන කෘත්‍යයන්ගෙන් උපකාර ලබන ක්‍ෂත්‍රිය කුමරෙකු මෙන්; තමා ඇසුරු කරන ලබන සතර මහාධාතූන් විසින් දැරීම් බැඳීම් පැසවීම් සෙලවීම් ආදී කෘත්‍යයෙන් කරනලද උපකාර ඇත්තෙක්ව. "උතුචිත්තාදිනා" යනු පරම්පරා වශයෙන් උපදවන්නා වූ උතු චිත්ත ආහාර යන තෙවැදෑරුම් රූපයන්ගෙන්. මෙහි ද කලාපයන්ට ඇතුළත් වූ අතු ආහාර රූප අදහස් කරනලදැයි කියත්. "ආයුනා කතපාලනං" යනු සතර මහාධාතු ඇසුරු කරන්නා වූ ජීවිතේන්‍ද්‍රියයෙන්ම රකිනු ලබන්නා වූ. එසේමය; ඒ ජීවිතේන්‍ද්‍රිය තෙමේ කර්මජ රූපයන් අනුපාලනය කරන ලක්‍ෂණ ඇත්තේ වෙයි. "වණ්ණගන්ධරසාදීහි" යන "ආදි" ශබ්දය ගැනීමෙන් ඕජා රූපය ද සඞ්ග්‍රහ වෙයි. "වණ්ණගන්ධරසෝජාහි" යන හෝ පාඨයි. "වත්ථුද්වාරඤ්ච සාධයං" යනු සුදුසු පරිදි වස්තු ද්වාර භාවය සිද්ධ කරමින් යන අදහසයි. එසේමැයි; චක්‍ෂුර්විඤ්ඤාණයාගේ ඇසුරු කිරීම් වශයෙන් වස්තු භාවය ද, පැවැතීම් ප්‍රමුඛ භාවයෙන් ද්වාර භාවය ද සිදුකරයි. සම්පටිච්ඡනය මුල් කොට ඇති තදාරම්මණය අවසන් කොට ඇති චිත්තයන්ට අන්‍ය වස්තුවක් ඇසුරු කරනලද බැවින් ද්වාර භාවයම සිදුකරයි. වස්තු භාවය සිදු නොකරයි. "ඌකාසිරසමානේන පමාණේන" යනු උකුණු හිසක් පමණ ප්‍රදේශ ප්‍රමාණයෙන් ලකුණු කරන ලද්දෙක් වී හෝ උකුණු හිසක් සමාන ප්‍රමාණ තන්හි යන අර්ථයි. "තිට්ඨති" යනු පුළුන් පටල සතක ඉසිනලද තෙලක් මෙන් අක්‍ෂි පටල සතක පැතිර සිටියි. මෙසේ ද කොට චක්‍ෂුවගේ නොයෙක් කලාපයන්ට ඇතුළත් භාවය සිද්ධ වේ. උපද්‍රව ඇත්තහුන්ගේ උපද්‍රව සහිත ඇස් පටලය දුරලීමෙහි ද චක්‍ෂුස විද්‍යමාන වේ. චක්‍ෂුස යම්සේද එසේම මෙයට නිශ්‍රය වූ සිව් ධාතූහු ද ආයු වර්ණාදීන් ද සත් අක්‍ෂි පටලයන් පැතිර සිටියාහුම අවිනිර්බෝග පැවතුම් භාවයෙනැයි ගතයුතුයි. **[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

වුත්තං හෙතං;

"යේන චක්ඛුපසාදේන, රූපානිමනුපස්සති;
පරිත්තං සුඛුමං ඒතං, ඌකාසිරසමූපම"න්ති.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 656 යටතේ)]**

**හි** එහෙයින් **යේන චක්ඛුප්පසාදේන** යම් චක්‍ෂුස්ප්‍රාසාදයක් විසින් **රූපානි අනුපස්සති** රූප දක්නා ලැබේ ද **ඒතං** එය **පරිත්තං** කුඩාය **සුඛුමං** සියුම්ය **ඌකාසිරසමූපමං** උකුණු හිසකට බඳු උපමා **ඉති (අත්ථි)** ඇත්තේයැයි **ඒතං** මේ ගාථාව **වුත්තං** දේශනා කරනලදී. **]අභිධම්මාවතාර පරිවර්තනයි[**

**වුත්ත**න්ති ධම්මසේනාපතිනා වුත්තං. **රූපානි මනුපස්සතී**ති ම-කාරෝ පදසන්ධිකරෝ "අඤ්ඤමඤ්ඤං සමණමචලෝ"තිආදීසු විය. අථ වා **මනූ**ති මච්චෝති අත්ථෝ. කිඤ්චාපි චක්ඛු රූපං න පස්සති, කිඤ්චරහි තන්නිස්සිතං විඤ්ඤාණමේව. තථා හි "මඤ්චා උක්කුට්ඨිං කරොන්තී"තිආදීසු විය නිස්සිතකිරියං නිස්සයේ විය කත්වා වෝහාරසම්භවතෝ "චක්ඛුපසාදේන පස්සතී"ති වුත්තං. **ආචරියජෝතිපාල**ත්ථේරේනාපි හි ඉමිනාව අධිප්පායේන ඉදං වුත්තං. ඉදමෙත්ථ සන්නිට්ඨානං, කිං චක්ඛු රූපං පස්සති, උදාහු විඤ්ඤාණන්ති, කිඤ්චෙත්ථ; යදි චක්ඛු පස්සෙය්‍ය, අඤ්ඤවිඤ්ඤාණසමඞ්ගිනෝපි චක්ඛු පස්සෙය්‍ය. අථ විඤ්ඤාණං, කුට්ටාදිඅන්තරිතම්පි පස්සෙය්‍ය තස්ස අප්පටිඝාතත්තා? නායං දෝසෝ. යස්ස "චක්ඛු පස්සතී"ති මතං, තස්සාපි න සබ්බං චක්ඛු පස්සති, අථ ඛෝ විඤ්ඤාණාධිට්ඨිතමේව. යස්ස පන විඤ්ඤාණං පස්සතීති මතං, තස්සාපි න සබ්බං විඤ්ඤාණං පස්සති, අථ ඛෝ චක්ඛුනිස්සිතමේව, තඤ්ච අන්තරිතේ නුප්පජ්ජති. යත්ථ ආලෝකස්ස කුට්ටාදීහි විනිබන්ධෝ, යත්ථ පන සෝ නත්ථි ඵලිකඅබ්භපටලාදිම්හි, තත්ථ අන්තරිතේපි උප්පජ්ජති ඒව, තස්මා තං අනුප්පන්නත්තා අන්තරිතං න පස්සති. ඉදමේව ච සන්නිට්ඨානං, යං ඛෝ චක්ඛුවිඤ්ඤාණං පස්සතීති. තඤ්හි දස්සනකිච්චං. යදි ඒවං කථං චක්ඛුනා රූපං දිස්වාති. තේන ද්වාරේන කරණභූතේනාති අයමෙත්ථ අභිසන්ධි. අථ වා නිස්සිතකිරියා නිස්සයස්ස පවුච්චති යථා "මඤ්චා උක්කුට්ඨිං කරොන්තී"ති. **ඌකාසිරසමූපම**න්ති ඌකාසිරසමානුපමං, ඌකාසිරප්පමාණන්ති වුත්තං හෝති. ඉදඤ්චස්ස පතිට්ඨානෝකාසවසේන වුත්තං, න පන අත්තනෝ පමාණවසේන. තඤ්හි පරමාණුපරියන්තේන පමාණේන අතිසුඛුමමේවාති. ඌකාසිරප්පමාණේ පන පදේසේ ඉදං පවත්තති. න කේවලඤ්ච ඉදමේව, සබ්බානිපි සබ්බට්ඨානිකරූපානි තත්ථ පවත්තන්තේව. ඉදඤ්ච තත්ථ නිබ්බත්තන්තං තං පදේසං පූරෙත්වා ඒව නිබ්බත්තති. ඒකූනපණ්ණාසකලාපවසේන ච සහේව පවත්තති, සත්තරසචිත්තක්ඛණායුකත්තා රූපානං, ඒකේකස්ස ච චිත්තස්ස තීසු තීසු ඛණේසු කම්මජරූපානං උප්පජ්ජමානත්තා.
**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 656 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 442 පිට]**

"වුත්තං" යනු දම්සෙනවි සැරියුත් මහතෙරුන් වහන්සේ විසින් දේශනා කරනලදී. "රූපානිමනුපස්සති" යන පදයෙහි ම-කාරය පද සන්ධිකරයි. "අඤ්ඤමඤ්ඤං සමණමචලෝ" යනාදියෙහි මෙනි. නොහොත් "මනු" යනු මිනිසා යන අර්ථයයි. කිසිසේත් ඇස (ප්‍රශාදය) රූපය නොදකී ද එසේවුවත් ඒ ප්‍රශාදය ඇසුරු කරන විඤ්ඤාණයම රූපය දකී. ඒ එසේමැයි; "මඤ්චා උක්කුට්ඨිං කරොන්ති" යනාදියෙහි මෙන් නිශ්‍රිත ක්‍රියාව නිශ්‍රයෙහි මෙන් කොට ව්‍යවහාර හටගන්නා හෙයින් "චක්ඛුපසාදේන පස්සති" යැයි දේශනා කරනලදී. ආචාර්ය ජෝතිපාල තෙරුන් වහන්සේ විසින් ද වනාහි මේ අදහසින්ම මෙය දේශනා කරනලදී.

මේ මෙහි තීරණයයි; කිමෙක්ද ඇස රූපය දකියි ද? නොහොත් විඤ්ඤාණය රූපය දකියි ද? කිමෙක් ද ඉදින් මෙහි චක්‍ෂුස රූපය දකින්නේ නම් අන්‍ය

විඤ්ඤාණයන් සමඟ වූ චක්‍ෂුස ද රූපය දකින්නේය. නොහොත් විඤ්ඤාණය රූපය දකින්නේ නම් ප්‍රශාදයාගේ හැපීමක් නොමැති බැවින් තාප්ප ආදිය ඇතුලත රූපය දකින්නේ ද? මෙය දෝෂයක් නොවේ. යමෙකුට ඇස යමක් බලයි යන මතයක් වේද එහිද ඔහුගේ මතයට අනුව ඇස ඒ සියළු රූපය නොදකී. එතකුදුවත් චක්‍ෂුර්විඤ්ඤාණයට ආධාරස්ථානයක්ම වෙයි. යමෙකුට විඤ්ඤාණයෙන් දකී යැයි මතයක් වේද ඔහුගේ මතයට අනුව විඤ්ඤාණය සියළු රූපය නොදකී. එතකුදුවුවත් ඒ විඤ්ඤාණය චක්‍ෂුස නිශ්‍රය කොටම පවතී. යම්තැනක තාප්ප ආදියෙන් ආලෝකයාගේ ඇහුරුමක් වේද ඒ චක්‍ෂුර් විඤ්ඤාණය තාප්ප ආදිය ඇතුලත නුපදී. පළිඟු වළාකුළු ආදී යම්තැනක ඒ ඇහුරුම නැත්තේ ද ඒ ඇතුලත උපදීමය. එබැවින් විඤ්ඤාණය නුපදින බැවින් ඇතුලත නොදකී. චක්‍ෂුර්විඤ්ඤාණය යමක් දකී යන මෙයම සනිටුහනයි. එය වනාහි දස්සන කෘත්‍යයි.

ඉඳින් ඇසින් රූපය දැක යැයි යන්න කෙසේ යෙදේ ද? ඒ ද්වාරය උපකාර කොට ගෙන රූපය දැක්කේ යැයි යන මේ මෙහි ගැලපීමයි. ඇඳන් මහත් ඝෝෂාව කරත් යයි කීම යම්සේ ද එසේ නිශ්‍රිත ක්‍රියාව නිශ්‍රයයට කියයි. "ඌකාසිරසමූපමං" යනු උකුණු හිසක් හා සමාන උපමා ඇති. උකුණු හිසක ප්‍රමාණ යැයි කියන ලද්දේ වෙයි. මෙය චක්‍ෂුර්විඤ්ඤාණයාගේ පිහිටන අවකාශ වශයෙන් කියනලදි. තමාගේ ප්‍රමාණය වශයෙන් නොවෙයි. එය වනාහි පරමාණුව කෙළවර කොට ඇති ප්‍රමාණයෙන් ඉතා සියුම්ය. උකුණු හිසකගේ ප්‍රමාණ වූ ප්‍රදේශයෙහි මෙය පවති. හුදෙක් මෙයම නොවෙයි. සබ්බස්ථානික සියළු රූපයන්ම එහි පවතිත්මය. මෙය වනාහි එහි හටගනුයේ ඒ ප්‍රදේශය පුරවාම හටගනියි. එකුන් පණස් කලාප වශයෙන්ම සමගම පවතිත්. චිත්තක්‍ෂණ සතලොසක් ආයු ඇති බැවින් රූපයනට, එක් එක් චිත්තයකගේ තුනක් තුනක් ක්‍ෂණයන්හි කර්මජ රූපයන්ගේ හටගැනීම වන බැවිනි.

**[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

සෝතාදීසු ච ඒසේව, නයෝ ඤෙදයෙයා විභාවිනා;
විසේසමත්තමේවෙත්ථ, පවක්ඛාමි ඉතෝ පරං.

සුණාතීති **සෝතං,** තං තනුතම්බලෝමාචිතේ අඞ්ගුලිවේධකසණ්ඨානේ පදේසේ වුත්තප්පකාරාහි ධාතූහි කතූපකාරං උතුචිත්තාහාරේහි උපත්ථම්භියමානං ආයුනා පරිපාලියමානං සෝතවිඤ්ඤාණාදීනං වත්ථුද්වාරභාවං සාධයමානං තිට්ඨති.

ඝායතීති **ඝානං,** තං සසම්භාරඝානබිලස්ස අන්තෝ අජපදසණ්ඨානේ පදේසේ යථාවුත්තප්පකාරා හුත්වා තිට්ඨති.

සායතීති **ජිව්හා,** ජීවිතමව්හායතීති වා **ජිව්හා,** සා සසම්භාරජිව්හාමජ්ඣස්ස උපරි උප්පලදලග්ගසණ්ඨානේ පදේසේ යථාවුත්තප්පකාරා හුත්වා තිට්ඨති.

කුච්ඡිතානං මලානං ආයෝති **කායෝ**. යාවතා පන ඉමස්මිං කායේ උපාදින්නකං රූපං අත්ථි, සබ්බත්ථ කායපසාදෝ කප්පාසපටලේ ස්නේහෝ විය යථාවුත්තප්පකාරෝ හුත්වා තිට්ඨති. **[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 657 යටතේ)]**

**සෝතාදීසු ච** ශ්‍රෝත්‍ර ප්‍රශාදියෙහි ද **ඒසේව නයෝ** මේ ක්‍රමය යැයි **විභාවිනා** නුවණැත්තන් විසින් **ඤෙදයෙයා** දතයුතුයි **ඉතෝපරං** මෙයින් පසුව **එත්ථ** මෙහි **විසේසත්ථමේව** විශේෂාර්ථයම **පවක්ඛාමි** කියමි.

**සුණාතීති** අසන්නේනුයි **සෝතං** ශ්‍රෝත්‍ර නම් **තං** ඒ ශ්‍රෝත්‍ර ප්‍රශාදය **තනුතම්බලෝමාචිතේ** තුනී තඹ ලෝමයකින් කළ **අඞ්ගුලිවේඨකසණ්ඨානේ පදේසේ** ඇඟිලි මුදුවක සටහන් ඇති ප්‍රදේශයෙහි **වුත්තප්පකාරාහි** කියනලද ආකාරයෙන් **ධාතූහි** සතර මහාධාතූන් විසින් **කතූපකාරං** කරනලද උපකාර ඇති **උතුචිත්තාහාරෙහි** උතු චිත්ත ආහාරයන් විසින් **උපස්ථම්භියමානං** උපස්ථම්භනය ලබමින් **ආයුනා** ආයුෂ විසින් **පරිපාලියමානං** රක්‍ෂාකරනු ලබමින් **සෝතවිඤ්ඤාණාදීනං** ශ්‍රෝත්‍රවිඤ්ඤාණාදීන්ට **වත්ථුද්වාරභාවං** වස්තු ද්වාර භාවය **සාධයමානං** සිද්ධකරමින් **තිට්ඨති** සිටී.

**ඝායති ඉති** ආඝ්‍රාණය කරයිනුයි **ඝානං** ඝාන නම් **තං (ඝානං)** ඒ ඝ්‍රාණප්‍රශාදය **සසම්භාරඝානබිලස්ස** සසම්භාර ඝ්‍රාණබිලයාගේ **අන්තෝ** ඇතුළත **අජපදසණ්ඨානේ** එළු පා සටහන් ඇති **පදේසේ** ප්‍රදේශයෙහි **යථාවුත්තප්පකාරා හුත්වා** පෙර කියනලද ආකාරයෙන් උපකාර උපස්ථම්භන අනුපාලනාදියෙන් පිරිවරන ලද්දෙක් වී **තිට්ඨති** සිටී.

**සායතීති** රසවිඳීනුයි **ජිව්හා** ජිව්හා නම් **ජීවිතං** ජීවිතය **අව්හයතීති** කැඳවයිනුයි හෝ **ජිව්හා** ජිව්හා නම් **සා (ජිව්හා)** ඒ ජිව්හාප්‍රශාදය තුමූ **සසම්භාරජිව්හාමජ්ඣස්ස** සසම්භාර දිව මැද **උපරි** මත්තෙහි **උප්පලදලග්ගසණ්ඨානේ** උපුල් පෙති අග සටහන් ඇති **පදේසේ** ප්‍රදේශයෙහි **යථාවුත්තප්පකාරා හුත්වා** පෙර කියනලද උපකාර උපස්ථම්භන අනුපාලනාදියෙන් පිරිවරනලද්දී වී **තිට්ඨති** සිටී.

**කුච්ඡිතානං** පිළිකුල් කටයුතු වූ **මලානං** ක්ලේශ මලයන්ට **ආයෝ (පවත්තිට්ඨානං හෝති)** හටගැනීමට ස්ථාන වේද **ඉති (තස්මා) සෝ (රූපකායෝ)** ඒ රූපකාය තෙමේ **කායෝ** කාය නම් වේ **ඉමස්මිං කායේ පන** මේ කයෙහි වනාහි **යාවතා** යම්තාක් **උපාදින්නකරූපං නාම** උපාදින්නක රූප නම් **අත්ථි** ඇත ද **සබ්බත්ථ** ඒ සියළුතැන **කායප්පසාදෝ** කායප්‍රශාදය **කප්පාසපටලේ ස්නේහෝ විය** පුළුන් පටලයෙහි පැතිරිගිය තෙල මෙන් **යථාවුත්තප්පකාරෝ හුත්වා** පෙර කියනලද උපකාර උපස්ථම්භන අනුපාලනාදියෙන් පිරිවරන ලද්දෙකුම වී **තිට්ඨති** සිටී.

**[අභිධම්මාවතාර පරිවර්තනයි]**

**සුණාතීති සෝත**න්ති එත්ථ කිං සෝතං සුණාති, උදාහු විඤ්ඤාණන්තිආදිනා හෙට්ඨා වුත්තනයේන යථාසම්භවං යෝජේතබ්බං. **තනුතම්බලෝමාචිතේ**ති සසම්භාරසෝතබිලස්ස අන්තෝ සුඛුමේහි තම්බවණ්ණලෝමේහි සඤ්චිතේ. **අඞ්ගුලිවේඨකසණ්ඨානේ පදේසේ**ති අඞ්ගුලිමුද්දිකාසණ්ඨානමංසයුත්තේ පදේසේ. **වුත්තප්පකාරාහී**ති සන්ධාරණාදිකිච්චාහි. **ආයුනා පරිපාලියමාන**න්ති එත්ථ වණ්ණාදීහි පරිවාරිතන්ති සම්බන්ධිතබ්බං. **තිට්ඨතී**ති පුබ්බේ වුත්තනයේන තං පදේසං පූරෙත්වා තිට්ඨති. සේසං වුත්තනයේන වේදිතබ්බං. **ඝායතී**ති ගන්ධෝපාදානං කරෝති. **සායතී**ති රසං වින්දති. **ජීවිතමව්හායතී**ති එත්ථ රසග්ගහණමූලකත්තා අජ්ඣෝහරණස්ස ජීවිතනිමිත්තං අජ්ඣෝහරණරසෝ ජීවිතං, තං අව්හායති තස්මිං නින්නතාය අව්හායන්තමිව හෝති. **උප්පලදලග්ගසණ්ඨානේ පදේසේ**ති මජ්ඣෙ ඡින්නස්ස උප්පලදලස්ස අග්ගභාගසණ්ඨානේ පදේසේ. **මලාන**න්ති කිලේසාදිමලානඤ්චේව මලවිසයානඤ්ච සාසවධම්මානං අනුත්තරියභාවං ගච්ඡන්තේසු කාමරාගනිදානකම්මජනිතේසු කාමරාගස්ස ච විසේසපච්චයේසු

ඝානජිව්හාකායේසු කායස්ස විසේසතෝ සාසවපච්චයත්තා සෝයේව තේසං ආයෝති වුච්චති. තේන හි ඵොට්ඨබ්බසුඛං අස්සාදෙන්තා සත්තා මේථුනම්පි සේවන්ති. අථ වා කායින්ද්‍රියවත්ථුකා චත්තාරෝ ඛන්ධා බලවකාමරාගාදිහේතුභාවතෝ විසේසතෝ මලා, තේසමයං ආයෝ හේතූති කායෝති වුත්තෝ. **ඉමස්මිං කායේති** ඉමස්මිං සසම්භාරකායේ. සෝපි හි කුච්ඡිතානං කේසාදිමලානං ආයභාවතෝ කායෝති වුච්චති. **යාවතා උපාදින්නකං අත්ථීති** ඉමිනා කේසග්ගනඛග්ගාදීසු කායපසාදස්ස අභාවමාහ. **කප්පාසපටලේ ස්නේහෝ වියාති** ඉමිනාස්ස නිරන්තරභාවං. ඉමේ ච පන චක්ඛාදයෝ රූපාදිගෝචරනින්නතාය වම්මිකඋදකආකාසගාමසිවථිකාසඞ්ඛාත ගෝචරනින්නතාය අහිසුංසුමාරපක්ඛිකුක්කුරසිගාලා විය දට්ඨබ්බා. විසමජ්ඣාසයතාය හි චක්ඛු වම්මිකච්ඡිද්දාභිරතසප්පෝ විය, බිලජ්ඣාසයතාය සෝතං උදකබිලාභිරතසුංසුමාරෝ විය, ආකාසජ්ඣාසයතාය ඝානං අජටාකාසාභිරතපක්ඛි විය, ගාමජ්ඣාසයතාය ජිව්හා ගාමාභිරතකුක්කුරෝ විය, උපාදින්නකජ්ඣාසයතාය කායෝ ආමකසුසානාභිරතසිගාලෝ වියාති. **විසමජ්ඣාසයතායාති** චක්ඛුස්ස විසමජ්ඣාසයං විය හෝතීති කත්වා වුත්තා. චක්ඛුමතෝ වා පුග්ගලස්ස අජ්ඣාසයවසේන චක්ඛු විසමජ්ඣාසයං. ඒස නයෝ සේසේසුපි.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 657 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 442-444 පිටු]**

"සුණාතීති සෝතං" යන මෙහි කිමෙක්ද ශ්‍රෝත්‍රස ශ්‍රවණය කරයිද? නැතහොත් විඥ්ඤණය දැයි යනාදියෙන් යට කියනලද ක්‍රමයෙන් සුදුසු පරිදි යෙදිය යුතුය. "තනුතම්බලෝමාචිතේ" යනු සසම්භාර ශ්‍රෝත්‍ර බිලයාගේ ඇතුලෙහි සියුම් තඹවන් ලොමින් ගැවසුණු. "අඞ්ගුලිවේඨකසණ්ඨානේ පදේසේ" යනු ඇඟිලි මුදුවක සටහන් ඇති මාංශයෙන් යුත් ප්‍රදේශයෙහි. "වුත්තප්පකාරාහි" යනු දැරීම් ආදී කෘත්‍යයන්ගෙන්. "ආයුනා පරිපාලියමානං" යනු මෙහි වර්ණාදීන්ගෙන් පිරිවරන ලදැයි සම්බන්ධ කටයුතුයි. "තිට්ඨති"යනු පෙර කියනලද ක්‍රමයෙන් එම ප්‍රදේශය පුරා සිටියි. සෙස්ස කියනලද ක්‍රමයෙන් දතයුතුයි.

"ඝායති" යනු ගන්ධාරම්මණය ලං කොට ගැනීම කරයි. "සායති" යනු රස විඳියි. "ජීවිතමව්හායති" යනු මෙහි රස ග්‍රහණය මූලිකතාවයෙන් ආහාර අනුභවයගේ ක්‍රියාව ජීවිතේන්ද්‍රිය පැවැත්මට කාරණ හෙයින් ජීවිතේන්ද්‍රිය ආහාර අනුභවය කෘත්‍යය කොට ඇත්තේය. ඒ රසාරම්මණයෙහි නැමුනාවූ බැවින් ඒ රසාරම්මණය කැඳවන්නාක් මෙන් වූයේ වෙයි. එහෙයින් ඒ ප්‍රශාදය තෙමේ ජීවිතේන්ද්‍රිය කැඳවයි. "උප්පලදලග්ගසණ්ඨානේ පදේසේ" යනු මැදින් සිඳිනලද මානෙල් පෙත්තක අග කොටස බඳු සටහන් ඇති ප්‍රදේශයෙහි. "මලානං" යනු ක්ලේශ මලාදීන්ගේ මෙන්ම ක්ලේශ මලාදියට විෂය වූ ආශ්‍රව සහිත ධර්මයන්ට අනුත්තරිය බවට යන්නාවූ කාමරාගය නිදනකොට ඇති කර්මයෙන් උපන් කාමරාගයට විශේෂ ප්‍රත්‍යය වූ ඝ්‍රාණ ජිව්හා කාය අතුරින් විශේෂයෙන් කාය ප්‍රශාදයට ආශ්‍රව ප්‍රත්‍යය බැවින් ඒ කායප්‍රශාදයම ඒ ආශ්‍රව ධර්මයන්ට ආය යැයි කියයනු ලැබේ. එහෙයින් පහස් අරමුණ ආශ්වාදය කරන්නා වූ සත්වයෝ මෛථුනය ද සේවනය කරයි. නොහොත් කායින්ද්‍රිය වස්තුක වූ සතර ස්කන්ධයෝ බලවත් කාමරාගාදියට හේතුභාව විශේෂයෙන් මල නම් වේ. මේ ප්‍රශාදය තෙමේ ඒ කාමරාගාදියට ඉපදීමට හේතුවූයේනුයි කාය යැයි කියනු ලැබේ. "ඉමස්මිං කායේ" යනු මේ සසම්භාර කයෙහි. පිළිකුල් කෙස් ලොම් ආදී අපද්‍රව්‍යයන්ගේ හටගන්නා භාවයෙන් ඒ සසම්භාර කය වනාහි කාය යැයි කියනු ලැබේ. "යාවතා උපාදින්නකං අත්ථි" යන මෙයින් කෙස් අග නිය අග ආදියෙහි

කායප්‍රශාදයාගේ අභාවය කීයේය. "කප්පාසපටලේ ස්නේහෝ විය" යන මෙයින් කායප්‍රශාදයාගේ නිරතුරුව පවත්නා බව කීහ. මේ චක්‍ෂුරාදී ප්‍රශාදයෝ වනාහි රූපාදී ආරම්මණයන්හි නිම්නවූ බැවින් තුඹස ජලය අකාශය ග්‍රාමය අමුසොහොන් සඞ්ඛ්‍යාත ගෝචරයන්හි නිම්නවූවාවූ සර්ප කිඹුල් පක්‍ෂි සුනඛ සිගාලයන් මෙන් දතයුත්තාහ. විෂම අදහස් ඇති බැවින් ඇස තුඹස් සිදුරෙහි ඇලුණු සර්පයෙකු මෙනි. බෙණයට නැඹුරු වූ අදහස් ඇති බැවින් ශ්‍රෝත්‍රස දිය බෙණයට ඇලුණු කිඹුලෙකු මෙනි. ආකාශ අජ්ඣාශය ඇති බැවින් ඝ්‍රාණය අහසෙහි ඇලුණු පක්‍ෂියෙකු මෙනි. ග්‍රාම අජ්ඣාශය ඇති බැවින් ජිව්හා ගමෙහි ඇලුණාවූ සුනඛයෙකු මෙනි. උපාදින්නකයෙහි අදහස් ඇති බැවින් කාය අමු සොහොනෙහි ඇලුණු සිවලෙකු මෙනි. "විසමජ්ඣාසයතාය" යනු විෂම අදහස් ඇති හෙයින් චක්‍ෂුවට විෂමධ්‍යාශය වේ යැයි කොට කියනලදි. ඇස් ඇති පුරුෂයාගේ විෂම අදහස් වශයෙන් චක්‍ෂුස විෂමධ්‍යාශ වේ. සෙස්සෙහි ද මේ ක්‍රමය මැයි. [අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]

කේචි පනාහු;

> තේජාධිකානං භූතානං, පසාදෝ පන චක්ඛුති;
> ආකාසානිලතෝයුබ්බිඅධිකානං තු සේසකා.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 658 යටතේ)]**

**කේචි පන** ඇතැමෙක් වනාහි **තේජාධිකානං භූතානං** තේජෝ ධාතුව අධික භූතයන්ගේ **පසාදෝ** ප්‍රශාදය තෙමේ වනාහි **චක්ඛුති** චක්‍ෂුස යැයි (**වුච්චති** කියනු ලැබේ) **අකාසානිලතෝයුබ්බිඅධිකානං** (**ආකාස** අවකාශය **අනිල** සුළඟ **තෝය** ජලය **උබ්බි** පඨවි **අධිකානං** අධික භූතයන්ගේ) **තු** පිළිවෙළින් **සේසකා** සෙසු ප්‍රශාදයෝ (**හොන්තීති** වෙත් යැයි) **ආහු** කීහ. **[අභිධම්මාවතාර පරිවර්තනයි]**

**කේචීති** මහාසඞ්ඝියේසු ඒකච්චේ. චක්ඛාදීසු තේජාදිඅධිකතා නාම තන්නිස්සයභූතානං තදධිකතායාති දස්සෙන්තෝ **"තේජාධිකාන"**න්තිආදිමාහ. තත්ථ **තේජාධිකාන**න්ති පමාණවසේන චතුන්නං ධාතූනං සමානභාවේපි කිච්චවසේන තේජෝධාතුඅධිකානං. ඒවං සේසේසුපි. **ආකාස** ...**පෙ**.... **සේසකාති** ආකාසාධිකානං භූතානං පසාදෝ සෝතං, වායුඅධිකානං ඝානං, තෝයාධිකානං ජිව්හා, ඵොට්ඨබ්බසඞ්ඛාතපඨවාධිකානං කායෝති අත්ථෝ.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 658 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 450 පිට]**

"කේචි" යනු මහාසඞ්ඝිකයන් අතුරින් ඇතමෙක්. චක්‍ෂුරාදී ප්‍රශාදයන්හි තේජෝ අධික බව නම් ඒ ප්‍රශාදය ඇසුරු කොට සිටින භූතයන්ගේ ඒ අධිකභාවය යයි දක්වමින් "තේජාධිකානං" යනාදියෙන් කීයේය. එහි "තේජාධිකානං" යනු ප්‍රමාණ වශයෙන් සතර මහාධාතූන්ගේ සමභාවය ඇති කල්හි කෘත්‍යය වශයෙන් තේජෝ ධාතු අධික භූතයන්ගේ. සෙසු තන්හි ද මෙසේයි. "ආකාස -පෙ- සේසකා" යනු අවකාශ ධාතුව අධික භූතයන්ගේ ප්‍රශාදය ශ්‍රෝත්‍රයයි. වායු ධාතුව අධික භූතයන්ගේ ප්‍රශාදය ඝ්‍රාණයයි. ජලය අධික භූතයන්ගේ ප්‍රශාදය ජිව්හායි. ඵොට්ඨබ්බ සඞ්ඛ්‍යාත පඨවි ධාතුව අධික භූතයන්ගේ ප්‍රශාදය කාය යයි යන අර්ථයි.

**[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

> තේ පනේවං තු වත්තබ්බා, "සුත්තං ආහරථා"ති හි;
> සුත්තමේව ච තේ අද්ධා, න දක්ඛිස්සන්ති කිඤ්චිපි.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 659 යටතේ)]**

**ඒවං** මෙසේ **තු** (**වදන්තානං** කියන්නා වූ) **තේ පන** ඔවුන්ට වනාහි **සුත්තං ආහරථ ඉති** සූත්‍රයක් ගෙනහැර දැක්වුව මැනවැයි **වත්තබ්බා** කිව යුත්තාහුය **හි** (**සචේ**) ඉදින් **තේ** ඔවුහු **කිඤ්චිපි** ඒ අර්ථය දක්වනලද **සුත්තමේව ච** එක් සූත්‍රයකුදු **අද්ධා** ඒකාන්තයෙන් **න දක්ඛිස්සන්ති** නොදකින්නාහ. **[අභිධම්මාවතාර පරිවර්තනයි]**

ඒවං පන වදන්තානං කිං උත්තරන්ති ආහ **"තේ පනා"**තිආදි. **සුත්තං ආහරථා**ති න තුම්හාකං වචනමත්තේනේව අයමත්ථෝ සක්කා සද්ධාතුං, තස්ස පන පරිදීපකං සුත්තමාහරථ. සුත්තේ හි ආහටේ තස්ස නෙය්‍යත්ථතං නීතත්ථතං විචාරෙත්වා යදි තස්ස වසේන අයමත්ථෝ පඤ්ඤායේථ, ගණ්හෙය්‍යාම නන්ති අධිප්පායෝ. **සුත්තමේව...පෙ.... කිඤ්චිපී**ති ඉතෝ චිතෝ ච සුත්තං ගවේසමානාපි අද්ධා ඒකන්තේන කිඤ්චිපි ඒකගාථාපදමත්තම්පි තදත්ථපරිදීපකං සුත්තං න දක්ඛිස්සන්තේව තේපිටකේ බුද්ධවචනේ තාදිසස්සේව සුත්තන්තස්ස අභාවතෝ.
**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 659 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 450 පිට]**

මෙසේ කියන්නවුන්ට කුමන උත්තරයක් දැයි "තේ පන" යනාදිය කීහ. "සුත්තං ආහරථ" යනු නුඹලාගේ වචන මාත්‍රයෙන්ම මේ අර්ථය අදහන්නට නොහැක්කාහ. ඒ අර්ථයාගේ දැක්වෙන්නා වූ නොහොත් පැහැදිළි කිරීමට සූත්‍රයක් ගෙනෙව්. සූත්‍රයක් ගෙනවිත් ඉදිරිපත්කළ කල්හි ඒ සූත්‍රයාගේ පමුණුවා ගතයුතු අර්ථය ද, පැහැදිළිව පෙනෙන අර්ථය ද විමසා ඉදින් ඒ සූත්‍රයගේ වශයෙන් මෙම අර්ථය ප්‍රකට වන්නේ ද එය ගන්නෙමු යන අදහසයි. "සුත්තමේව -පෙ- කිඤ්චිපි" යනු ඔබිනොබ සූත්‍රයක් සොයන්නාවූ ඔවුහු ඒකාන්තයෙන් කිසිසේත් ත්‍රිපිටක බුද්ධවචනයෙහි එබඳු සූත්‍රයක් නැති බැවින් ඒ අර්ථය දැක්වෙන්නා වූ එක් ගාථාමාත්‍රයකුදු ඇති සූත්‍රයක් නොදකින්නාහමය. **[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

විසේසේ සති භූතානං, පසාදෝ හි කථං භවේ;
සමානානං හි භූතානං, පසාදෝ පරිදීපිතෝ.
**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 660 යටතේ)]**

**භූතානං** මහාභූතයන්ගේ **විසේසේ සති** විශේෂයක් ඇති කල්හි **පසාදෝ හි** ප්‍රශාදය වනාහි **කථං භවේ** කෙසේ වන්නේ ද? **සමානානං භූතානං** සමාන වූ මහාභූතයන්ගේ **පසාදෝ පන** ප්‍රශාදය වනාහි **පරිදීපිතෝ** පුරාණ ඇදුරන් විසින් දක්වනලදි. **[අභිධම්මාවතාර පරිවර්තනයි]**

කිඤ්චාපි සුත්තන්තවසේන අයමත්ථෝ න දිස්සති, යුත්තිතෝ පන දිස්සතීති චේ, තම්පි නත්ථීති දස්සෙන්තෝ ආහ **"විසේසේ සතී"**තිආදි. භූතානඤ්හි විසේසේ සති පසාදෝ කථං භවේ, නේව භවෙය්‍ය, න ච භවෙය්‍ය, කිං කාරණන්ති ආහ **"සමානානඤ්හි භූතානං, පසාදෝ පරිදීපිතෝ"**ති. යස්මා සමානානමේව භූතානං පසාදෝ පෝරාණේහි පරිදීපිතෝ, න විසමානානං. පථවීධාතුඅධිකකලාපස්ස හි කක්ඛළත්තා, ආපෝධාතුඅධිකකලාපස්ස විස්සන්දනතෝ, තේජෝධාතුඅධිකකලාපස්ස පරිග්ගය්හමානත්තා, වායෝධාතුඅධිකකලාපස්ස ච විස්සරණතෝ න තේසු පසාදෝ පතිට්ඨාතුං සක්කෝති, තස්මා තේසං කිච්චතෝ සමානානංයේව පසාදෝ උප්පජ්ජේය්‍ය, න විසමානානන්ති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 660 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 450 පිට]**

කිසිසේත් සූත්‍රාන්ත වශයෙන් මේ අර්ථය නොපෙනෙයි. ඉදින් යුක්ති වශයෙන් වනාහි දිස් වේද යත්? එය ද නැතැයි දක්වමින් "විසේසේ සති" යනාදිය කීහ. මහාභූතයන්ගේ විශේෂයක් ඇති කල්හි ප්‍රශාදය තෙමේ කෙසේ වන්නේ ද? නොවන්නේය. කවර හේතුවකින් දැයි දක්වමින් "සමානානඤ්හි භූතානං, පසාදෝ පරිදීපිතෝ" යැයි කීහ. යම්හෙයකින් සමානවූම මහාභූතයන්ගේ ප්‍රශාදය තෙමේ පුරාණ ඇදුරන් විසින් මනාව කියනලදි. විෂම භූතයන්ගේ නොවෙයි. පඨවි ධාතු අධික කලාපයන්ගේ කර්කශ බැවින් ද, ආපෝධාතු අධික කලාපයන්ගේ ගලා බැසීම් වශයෙන් ද, තේජෝධාතු අධික කලාපයාගේ දැවීම් වශයෙන් ද, වායෝධාතු අධික කලාපයාගේ විසිරීම් වශයෙන් ඒ මහාභූතයන්හි ප්‍රශාදය තෙමේ පිහිටන්නට නොහැකි වෙයි. එබැවින් කෘත්‍යය වශයෙන් සමාන වූ ඒ මහාභූතයන්ගේම ප්‍රශාදය තෙමේ උපදින්නේමය. විෂම මහාභූතයන්ගේ නොවෙයි.

**[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

තස්මා නිස්සයභූතානං, චතුන්නං සබ්බසෝ පන;
පහායේව පනේතේසං, විසේසපරිකප්පනං.

ඤෙදයයා කම්මවිසේසේන, පසාදනං විසේසතා;
න හි භූතවිසේසේන, හෝති තේසං විසේසතා.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 661-662 යටතේ)]**

**තස්මා** එබැවින් **ඒතේසං චතුන්නං නිස්සයභූතානං** ප්‍රශාද නිශ්‍රය ඒ මහාභූත සතරදෙනගේ **විසේසපරිකප්පනං** මෙය ඌනය මෙය අධිකය යන විශේෂිත වූ කල්පනා කිරීම **සබ්බසෝයේව පන** සියළු ආකාරයෙන්ම වනාහි **පහාය** හැර **කම්මවිසේසේන පන** කර්ම විශේෂයෙන්ම වනාහි **පසාදනං** ප්‍රශාදයන්ගේ **විසේසතා** වෙනස් බව **ඤෙදයයා** දතයුත්තාහ **හි (සච්චං)** ඒ කීම සැබෑව **තේසං (පසාදනං)** ඒ ප්‍රශාදයන්ගේ **විසේසතා** වෙනස් බව **භූතවිසේසේන** මහාභූතයන්ගේ විශේෂයෙන් **න හෝති** නොවෙයි. **[අභිධම්මාවතාර පරිවර්තනයි]**

යදි ඒවං කථං පසාදනං විසේසතාති ආහ **"තස්මා"**තිආදි. යස්මා වුත්තප්පකාරේන පසාදවත්ථුකානං භූතානං විසේසේන න භවිතබ්බං, තස්මා **ඒතේසං** පසාදනිස්සයභූතානං ඉදමූනං, ඉදමධිකන්ති ඒතං **විසේසපරිකප්පනං සබ්බසෝ** සබ්බාකාරේන **පහාය ඤෙදයයා කම්මවිසේසේන පසාදනං විසේසතා**. යථා අවිසේසේපි භූතානං රූපානං රසාදයෝ අඤ්ඤදමඤ්ඤවිසදිසා හොන්ති, ඒවං චක්ඛාදයෝපි භූතවිසේසාභාවේපි අඤ්ඤදමඤ්ඤවිසදිසා හොන්ති. සෝ පනායං විසිට්ඨභාවෝ කම්මවිසේසේන විඤ්ඤාතබ්බෝ. ඒකම්පි හි කම්මං පඤ්චායතනිකත්තභාවපත්ථනානිප්ඵන්නං චක්ඛාදිවිසේසහේතුතාය අඤ්ඤමඤ්ඤස්ස අසාධාරණවිසිට්ඨං සාමත්ථියවිසේසතෝ. න හි යේන විසේසේන චක්ඛුස්ස පච්චයෝ, තේනේව සෝතස්ස හෝති ඉන්ද්‍රියන්තරභාවප්පත්තිතෝ. "පටිසන්ධික්ඛණේ මහග්ගතා චේතනා කටත්තාරූපානං කම්මපච්චයේන පච්චයෝ"ති වචනතෝ පටිසන්ධික්ඛණේ විජ්ජමානානං සබ්බේසංයේව කටත්තාරූපානං ඒකා චේතනා කම්මපච්චයෝ හෝතීති විඤ්ඤායති. නානාචේතනාය හි තද ඉන්ද්‍රියුප්පත්තියං සති පරිත්තේන ච මහග්ගතේන ච කම්මේන කටත්තාරූපං

ආපජ්ජෙය්‍ය, න චේකා පටිසන්ධි අනේකකම්මනිබ්බත්තා හෝතීති සිද්ධමේකේන කම්මේන අනේකින්ද්‍රියුප්පත්ති හෝතීති. **"න හි භූතවිසේසේන, හෝති තේසං විසේසතා"**ති ඉදං නිගමනවසේන වුත්තං.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 661-662 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 450-452 පිටු]**

ඉදින් මෙසේ ප්‍රශාදයන්ගේ වෙනස් බව කෙසේදැයි දක්වමින් "තස්මා" යනාදිය කීහ. යම්සේ කියනලද ආකාරයෙන් ප්‍රශාදයන් මූලාධාර කොට ඇති මහාභූතයන්ගේ විශේෂයෙන් නොවියයුතුයි. එහෙයින් ඒ ප්‍රශාද නිශ්‍රය මහාභූතයන්ගේ මෙය ඌනය, මෙය අධිකය යන මේ විශේෂිත වූ කල්පනා කිරීම සියළු ආකාරයෙන් හැර කර්මයාගේ විශේෂයෙන් ප්‍රශාදයන්ගේ වෙනස් බව දතයුත්තාහ. යම්සේ මහාභූත රූපයන්ගේ විශේෂයක් නැති කල්හිදු රසාදිහු ද ඔහුනොවුන්ට විසදෘසම වෙත්. මෙසේම චක්ෂුරාදීහු ද මහාභූතයන්ගේ විශේෂයක් නැති කල්හිදු ඔහුනොවුන්ට විසදෘසම වෙත්. ඒ මේ විශිෂ්ට භාවය කර්මයාගේ විශේෂයෙන් දතයුතුය. පඤ්චායතනයන්ට අයත් බව නම් වූ ප්‍රාර්ථනාවෙන් හටගත් එක් කර්මයක් වනාහි චක්ෂුරාදීන්ට විශේෂ හේතුභාවයෙන් ද ශක්ති විශේෂයෙන් ද ඔහුනොවුන්ට සාධාරණ නොවූ විශිෂ්ට භාවය වෙයි. යම් විශේෂයෙකින් චක්ෂුර්ප්‍රශාදයට ප්‍රත්‍යය නොවෙයි ද ඒ විශේෂයෙන්ම ඉන්ද්‍රියන්ගේ වෙනස් භාවයට පැමිණීම් වශයෙන් ශ්‍රෝත්‍රප්‍රශාදයට ද නොවෙයි. "පටිසන්ධික්ඛණේ මහග්ගතා චේතනා කටත්තාරූපානං කම්මපච්චයේන පච්චයෝ" යන වචනයෙන් ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි විද්‍යමාන වූ සියළුම කර්මජ රූපයනට එක් චේතනාවක්ම කර්ම ප්‍රත්‍යය වෙයි යැයි හැඟේ. එකල්හි වනාහි නොයෙක් නොයෙක් චේතනාවන්ගෙන් ඉන්ද්‍රියයන්ගේ ඉපදීම ඇති කල්හි කාමාවචර කර්මයකින් ද මහග්ගත කර්මයකින් ද කර්මජ රූප පැමිණෙන්නේය. එක් ප්‍රතිසන්ධියක් නොයෙක් කර්මයන්ගෙන් හටගත්තේ නොවෙයි යන මේ සිද්ධිය ද එක් කර්මයකින් නොයෙක් ඉන්ද්‍රියයන්ගේ උත්පත්තිය නොවෙයි යන මේ සිද්ධිය ද දක්වමින් "න හි භූතවිසේසේන, හෝති තේසං විසේසතා" යන මෙය නිගමන වශයෙන් කියනලදි.

**[අභිධම්මාවතාර අභිනව ටීකා පරිවර්තනයි]**

චක්ඛතීති **චක්ඛු,** විඤ්ඤාණාධිට්ඨිතං රූපං අස්සාදෙන්තං විය හෝතීති අත්ථෝ. **චක්ඛතී**ති හි අයං **චක්ඛති**-සද්දෝ "මධුං චක්ඛති, බ්‍යඤ්ජනං චක්ඛතී"ති ආදීසු විය අස්සාදනත්ථෝ. වුත්තඤ්හේතං "චක්ඛුං ඛෝ, මාගණ්ඩිය, රූපාරාමං රූපරතං රූපසමුදිත"න්ති (ම. නි. 2.209). අට්ඨකථායම්පි වුච්චති "රූපේසු ආවිඤ්ඡනරස"න්ති (විසුද්ධි. 2.433; ධ. ස. අට්ඨ. 600). සතිපි සෝතාදීනං සද්දාරම්මණාදිභාවේ නිරුළ්හත්තා දස්සනේ ඒව චක්ඛුසද්දෝ පවත්තති පදුමාදීසු පඞ්කජාදිසද්ද වියාති දට්ඨබ්බං. අථ වා **චක්ඛතී**ති විඤ්ඤාණාධිට්ඨිතං සමවිසමං ආචික්ඛන්තං විය අභිබ්‍යත්තං වදන්තං විය හෝතීති අත්ථෝ. අට්ඨකථායං පන "විභාවේති චා"ති (මහානි. අට්ඨ. 13; විභ. අට්ඨ. 154) වුත්තං. තං අනේකත්ථත්තා ධාතූනං විභාවනත්ථතාපි චක්ඛති-සද්දස්ස සම්භවතීති කත්වා වුත්තං. සුණාති ඒතේන, විඤ්ඤාණාධිට්ඨිතං සයං වා සුණාතීති **සෝතං**. ඝායති ඒතේන, සයං වා ඝායතීති **ඝානං.** රසග්ගහණමූලකත්තා අජ්ඣෝහරණස්ස ජීවිතනිමිත්තං ආහාරරසෝ ජීවිතං, තස්මිං නින්නතාය තං අව්හායතීති **ජිව්හා** නිරුත්තිනයේන. කුච්ඡිතානං සාසවධම්මානං ආයෝ උප්පත්තිට්ඨානන්ති **කායෝ** අනුත්තරියහේතුභාවං අනාගච්ඡන්තේසු කාමරාගනිදානකම්මජනිතේසු, කාමරාගස්ස ච විසේසපච්චයේසු ඝානජිව්හාකායේසු කායස්ස විසේසතෝ සාසවපච්චයත්තා. තේන හි ඵොට්ඨබ්බසුඛං අස්සාදෙන්තා සත්තා මේථුනම්පි සේවන්ති. කායින්ද්‍රියවත්ථුකා වා චත්තාරෝ ඛන්ධා

බලවකාමාසවාදිහේතුභාවතෝ විසේසේන සාසවාති කුච්ඡිතානං සාසවධම්මානං ආයෝති **කායෝ** වුත්තෝ. **[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 432 යටතේ)]**

"චක්ඛතීති චක්ඛු" විඤ්ඤාණාධිෂ්ඨිත වූයේ රූපය ආශ්වාද කරන්නක්හු මෙන් වේ යන අර්ථයි. "චක්ඛතීති" යන මේ චක්ඛති ශබ්දය (භාෂා ශබ්දය) තෙමේ "මධුං චක්ඛති, බ්‍යඤ්ජනං චක්ඛති" යනාදියෙහි මෙන් ආශ්වාදනාර්ථ වේ. වදාළේමය:— "චක්ඛුං ඛෝ මාගන්දිය රූපාරාමං රූපරථං රූපසම්මුසිතං" යි. අර්ථකථාවෙහිදු "රූපේසු ආවිඤ්ඡනරසං" යි කීහු. ශ්‍රෝත්‍රාදීන්ට ශබ්දරාමතාදීභාවය ඇත ද රූඪී හෙයින් නේත්‍රයෙහිම චක්ෂුස්ශබ්දය පවත්නේයි. පද්මාදියෙහි පඞ්කජාති ශබ්දයන් මෙනැයි දතයුතුයි. නොහොත් "චක්ඛතීති විඤ්ඤාණාධිට්ඨිතං සමවිසමං ආචික්ඛන්තං විය අභිබ්‍යත්තං වදන්තං විය හෝති" යන අර්ථයි. අර්ථකථාවෙහි වනාහි "විභාවේති ච" යි කීහු. හේ වනාහි ධාතූන් අනේකාර්ථ බැවින් විභාවනාර්ථ බව චක්ඛති ශබ්දයට සම්භවවන හෙයින් කීහු. "සුණාති ඒතේන, විඤ්ඤාණාධිට්ඨිතං සයං වා සුණාතීති සෝතං" මොහු කරණකොටගෙන අසානුයි හෝ විඤ්ඤාණාධිෂ්ඨිත වූයේ තෙමේම අසානුයි හෝ සෝත නම්. "ඝායති ඒතේන, සයං වා ඝායතීති ඝානං" "ජීවිතමව්හායතීති ජිව්හා" අභ්‍යවහරණය රස ග්‍රහණය මුල් කොට ඇති බැවින් ජීවිත නිමිත්ත වූ ආහාර රසය ජීවිත නම් වේ. තන්නිම්න බැවින් ජීවිත කැඳවානුයි ජිව්හා නම් වේ. නිරුක්ති නයින් යන අර්ථයි. "කුච්ඡිතානං සාසවධම්මානං ආයෝ උප්පත්තිට්ඨානන්ති කායෝ" අනුත්තරිය හේතුභාවයට නොයන්නා වූ කාමරාගය නිදානය කොට ඇති කර්මයෙන් ජනිත වූ කාමරාගයට විශේෂ ප්‍රත්‍යය වූ ඝාණ-ජිව්හා-කායයන් කෙරෙහි කය විශේෂයෙන් සාශ්‍රවයනට ප්‍රත්‍යය බැවින් "කුච්ඡිතානං සාසවධම්මානං ආයෝ උප්පත්තිට්ඨානන්ති කායෝ" යි කීහු. ඒ කයින් වනාහි ස්ප්‍රෂ්ටව්‍ය සුඛය ආශ්වාද කරණ සත්හු මෛථුන පවා සෙවිත්. නොහොත් කායින්ද්‍රිය වස්තුක වූ චතු ස්කන්ධයෝ බලවත් කාමාශ්‍රවාදීන්ට හේතු බැවින් විශේෂයෙන්ම සාශ්‍රවයෝනුයි "කුච්ඡිතානං සාසවධම්මානං ආයෝති කායෝ" යි කීහු.

**[විසුද්ධි මාර්ග මහා සන්නය 1045-1046 පිටු]**

චක්ඛතීති **චක්ඛු,** රූපං අස්සාදේති විභාවේති චාති අත්ථෝ. සුණාතීති **සෝතං**. ඝායතීති **ඝානං**. ජීවිතං අව්හයතීති **ජිව්හා**. කුච්ඡිතානං සාසවධම්මානං ආයෝති **කායෝ. ආයෝ**ති උප්පත්තිදේසෝ.

**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 510 යටතේ); විසුද්ධිමග්ග අටුවා 359 පිට (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය ආයතන නිර්දේශය 248-254 පිටු (තායිවාන් මුද්‍රණය)]**

චක්ඛාදිසද්දත්ථතෝති අත්ථෝ. **අස්සාදේතී**ති චක්ඛති-සද්දෝ "මධුං චක්ඛති, බ්‍යඤ්ජනං චක්ඛතී"ති රසසායනත්ථෝ අත්ථීති තස්ස වසේන අත්ථං වදති. "චක්ඛුං ඛෝ පන, මාගණ්ඩිය, රූපාරාමං රූපරතං රූපසම්මුදිත"න්ති (ම. නි. 2.209) වචනතෝ චක්ඛු **රූපං අස්සාදේති**. සතිපි සෝතාදීනං සද්දරාමතාදිභාවේ යෝ "යං චක්ඛු චතුන්නං මහාභූතානං උපාදාය පසාදෝ"තිආදිනා (ධ. ස. 597) පාළියං, "රූපාභිඝාතාරහභූතප්පසාදලක්ඛණා"න්තිආදිනා (ධ. ස. අට්ඨ. 600; විසුද්ධි. 2.433) අට්ඨකථායඤ්ච වුත්තෝ අත්ථවිසේසෝ, තත්ථේව නිරුළ්හත්තා චක්ඛුම්හි ඒව චක්ඛුසද්දෝ පවත්තතී ගවාදීසු ගෝසද්දාදි වියාති දට්ඨබ්බං.

**විභාවේති චා**ති සද්දලක්ඛණසිද්ධස්ස චක්ඛති-සද්දස්ස වසේන අත්ථං වදති. **චක්ඛතී**ති හි ආචික්ඛති, අභිබ්‍යත්තං වදතීති අත්ථෝ. නෙත්තස්ස ච වදන්තස්ස විය

සමවිසමවිභාවනමේව ආචික්ඛනන්ති කත්වා ආහ **"විභාවේති චාති අත්ථෝ"**ති, අනේකත්ථත්තා වා ධාතූනං විභාවනත්ථතා ච චක්ඛති-සද්දස්ස දට්ඨබ්බා.

රසග්ගහණමූලකත්තා අජ්ඣෝහරණස්ස ජීවිතහේතුම්හි ආහාරරසේ නින්නතාය **ජීවිතං අව්හයතීති ජිව්හා** නිරුත්තිලක්ඛණේන. **කුච්ඡිතානං සාසවධම්මානං ආයෝ**ති විසේසේන **කායෝ** වුත්තෝ අනුත්තරියහේතුභාවං අනාගච්ඡන්තේසු කාමරාගනිදානකම්මජනිතේසු, කාමරාගස්ස ච විසේසපච්චයේසු ඝානජිව්හාකායේසු කායස්ස විසේසතරසාසවපච්චයත්තා. තේන හි ඵොට්ඨබ්බසුඛං අස්සාදෙන්තා සත්තා මේථුනම්පි සේවන්ති. **උප්පත්තිදේසෝ**ති උප්පත්තිට්ඨානන්ති අත්ථෝ, කායින්ද්‍රියවත්ථුකා වා චත්තාරෝ ඛන්ධා බලවකාමාසවාදිහේතුභාවතෝ විසේසේන සාසවාති වුත්තාති තේසං උප්පත්තිට්ඨානන්ති අත්ථෝ.

**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 510 යටතේ)]**

**චක්ඛතීති චක්ඛු** චක්ඛතීති චක්ඛු යනු **රූපං** රූපය තෙමේ **අස්සාදේති** ආශ්වාද කරනුයේ **චක්ඛු** චක්‍ෂුස නම් **විභාවේති ච** සම විෂමත්‍වය ප්‍රකාශ කෙරේ **ඉති අත්ථෝ** යන අර්ථයි **සුණාතීති** අසනුයේනුයි **සෝතං** ශ්‍රෝත්‍රයයි **ඝායතීති** ආඝ්‍රාණය කරනුයේනුයි **ඝානං** ඝ්‍රාණයයි **ජීවිතං** ජීවිතය (පැවැත්මට උපකාරවූ රසය) **අව්හයතීති** කැඳවානුයි **ජිව්හා** ජිව්හා නම් **කුච්ඡිතානං** පිළිකුල් කටයුතු වූ **සාසවධම්මානං** ආශ්‍රව ධර්මයන්ගේ **ආයෝති** කැඳවානුයි **කායෝ** කාය නම් **ආයෝති** ආය යනු **උප්පත්තිදේසෝ** උත්පත්ති දේශයයි.

"චක්ඛති" ශබ්දය "මධුං චක්ඛති, බ්‍යඤ්ජනං චක්ඛති" යනුයෙහි රස සායනාර්ථ වේනුයි ඔහුගේ වශයෙන් අර්ථය කියනුයේ "අස්සාදේති" යි කීහු. "චක්ඛුං ඛෝ මාගන්දිය රූපාරාමං රූපරතං රූපසම්මුසිතං" යි වදාළ බැවින් චක්‍ෂුස රූපය ආශ්වාදය කෙරෙයි. ශ්‍රෝත්‍රාදීන්ට ශබ්දරාමතාදීභාවය ඇත ද "චතුන්නං මහාභූතානං උපාදය පසාදෝ" යනාදියෙන් පාළියෙහිදු "රූපාභිඝාතාරහභූතප්පසාදලක්ඛණා" යනාදියෙන් අර්ථකථාවෙහිදු කියනලද යම් අර්ථ විශේෂයෙක් ඇත ද එහිම නිරූඪ බැවින් චක්‍ෂුස්හිම චක්‍ෂුස්ශබ්දය පවත්නේය. ගවාදීන් කෙරෙහි "ගෝ" ශබ්දදීන් මෙනැයි දතයුතු. "විභාවේති ච" යි ශබ්ද ලක්‍ෂණ සිද්ධවූ "චක්ඛති" ශබ්දයාගේ වශයෙන් අර්ථය කීහු. ඒ එසේමැයි; "චක්ඛතීති ආචික්ඛති; අභිබ්‍යත්තං වදති" යන අර්ථයි. නේත්‍රයාගේ ද කියන්නක්හු මෙන් සම විෂම විභාවනයම ආචික්ඛන නම් වේනුයි "විභාවේති චාති අත්ථෝ" යි කීහු. ධාතූන් අනේකාර්ථ බැවින් "චක්ඛති" ශබ්දයාගේ විභාවනාර්ථතාව දතයුතු. ජීවිතමව්හයතීති ජිව්හා අභ්‍යාහාරය රසග්‍රහණ මූලක බැවින්. ජීවිත හේතු වූ ආහාර රසයෙහි නිම්නතාවයෙන් ජීවිතය කැඳවානුයි නිරුක්ති ලක්‍ෂණයෙන් ජීවිත නම් වේ යන අර්ථයි. **කුච්ඡිතානං සාසවධම්මානං** කුත්සිත වූ සාසවධර්මයනට **ආයෝති** විශේෂයෙන් ආයනුයි **කායෝ** කාය නම්. හෙවත් අනුත්තරියහේතු භාවයට නොයන්නාවූ කාමරාග නිදාන කර්මයෙන් ජනිත වූ කාමරාගයට විශේෂ ප්‍රත්‍යය වූ ඝ්‍රාණ-ජිව්හා-කායයන් කෙරෙහි කායයා විශේෂතර වූ ප්‍රත්‍යය බැවින් කාය නම් වේ යන අර්ථයි. එහෙයින්ම ස්ප්‍රෂ්ටව්‍යසුඛය ආශ්වාද කරන සත්වයෝ කාමසේවාද කෙරේ. උප්පත්තිදේසෝ උත්පත්ති ස්ථානයි. කායින්ද්‍රිය වස්තුක වූ සතර ඛන්ධහු හෝ බලවත් කාමාශ්‍රවාදියට හේතු බැවින් විශේෂයෙන් සාශ්‍රව යැයි කියනලදහුනුයි ඔහුනට උත්පත්ති ස්ථානය යන අර්ථයි.

**[විසුද්ධි මාර්ග මහා සන්නය 1161-1162 පිටු]**

චක්ඛතීති **චක්ඛු**. සමවිසමං ආචික්ඛති සමවිසමජානනස්ස තම්මූලකත්තා. රූපං වා අස්සාදේති ආපාතං ආගතාගතස්ස රූපස්ස අනිරාකරණතෝ. තං වා විභාවේතීති අත්ථෝ. සුණාතීති **සෝතං**. සුණන්ති සුය්‍යන්තිවා ඒතේ නාති සෝතං. ඝායතීති **ඝානං.** ඝායන්ති ඝායියන්තිවා ඒතේනාති ඝානං. ජීවිතනිමිත්තං රසෝ ජීවිතන්ති වුච්චති. තස්මිං නින්නතාය තං අව්හායතීති **ජිව්හා**. අථවා ජීවිතං වහති ඒතාය වා තං වහන්ති පවත්තෙන්ති ජීවිතවුත්තිසම්පාදනත්තාති ජිව්හා. ජීතිවා ජයෝ පරාජයෝවා වුච්චති. තදුභයං වහති වහන්තිවා ඒතායාති ජිව්හා. සසම්භාරජිව්හා. යථාහ

පුරිසස්ස හි ජාතස්ස, කුදරී ජායතේ මුඛේ;
යාය ඡින්දති අත්තානං, නරෝ දුබ්භාසිතං භණන්ති.

ඉධ පන තං සහචරිතත්තා ජිව්හාති පසාදරූපමෝ වුච්චති. කුච්ජිතානං කේසාදීනං පාපධම්මානඤ්ච ආයෝ උප්පත්තිට්ඨානන්ති **කායෝ**. සසම්භාරකායෝ. ඉධ පන තං සහචරිතෝ පසාද කායෝ ඒව අධිප්පේතෝ. පසීදන්තීති **පසාද**. පසීදන්ති වා එත්ථ චන්දමණ්ඩලාදීනි ආරම්මණනිමිත්තානි තත්ථ සංසීදමානානි විය සරූපතෝ සන්දිස්සන්තීති පසාද, සුපරිසුද්ධආදසමණ්ඩසදිසා කම්මජමණ්ඩා. ඉමේ පන පඤ්ච දට්ඨුකාමතාදි නිදන කම්මසමුට්ඨාන භූතපසාද ලක්ඛණා රූපාදි අභිඝාතාරහ භූතපසාදලක්ඛණා වා චක්ඛුපසාදදයෝ දට්ඨබ්බා. තත්ථ චක්ඛු තාව සේතමණ්ඩල පරික්ඛිත්තස්ස කණ්හමණ්ඩලස්ස මජ්ඣෙ ඌකාසිරපමාණේ අභිමුඛේ ඨිතානං සරීරසණ්ඨානුප්පත්ති පදේසභූතේ දිට්ඨමණ්ඩලේ තේලමිව සත්තපිචුපටලානි සත්තඅක්ඛිපටලානි බ්‍යාපෙත්වා තිට්ඨති. සෝතං සෝතබිලබ්භන්තරේ අඞ්ගුලිවේඨනාකාරං උපචිතතනුතම්බලෝමං පදේසං බ්‍යාපෙත්වා තිට්ඨති. ඝානං නාසිකබ්භන්තරේ අජපදසණ්ඨානං පදේසං බ්‍යාපෙත්වා තිට්ඨති. ජිව්හා සසම්භාර ජිව්හාමජ්ඣෙ උප්පලදලග්ගසණ්ඨානං පදේසං බ්‍යාපෙත්වා තිට්ඨති. කායෝ පන මහන්ති යා කප්පාස පටලවට්ටියං ආසිත්තතේලං විය ඵපෙත්වා පාචක තේජස්ස පතිට්ඨානට්ඨානං කේසග්ගලෝමග්ගනඛග්ගසුක්ඛචම්මානිච අවසේසං සකලසරීරං බ්‍යාපෙත්වා තිට්ඨතීති. තේ පන පඤ්ච යථාරහං පඤ්චද්වාරිකචිත්තානං වත්ථුද්වාරභාවං සාධෙන්ති. තේසු ච ඒකේකස්ස චතස්සෝ චතස්සෝ ධාතුයෝ සන්ධාරණආබන්ධනපරිපාචනසමුදීරණකිච්චේහි උපකාරං කරොන්ති. යථා ඛත්තියකුමාරස්ස චතස්සෝ ධාතියෝ ධාරණනහාපනමණ්ඩනබීජනකිච්චේහීති. උතුචිත්තාහාරාච නං උපත්ථම්භෙන්ති. යථා තං ඛත්තියකුමාරං පිතුජෙට්ඨභාතු ජෙට්ඨභගිනියෝ විය. ආයුච නං සුට්ඨු අනුපාලේති. යථා තං ඛත්තියකුමාරං දිසාපාමොක්ඛෝ රාජසම්මතෝ මහාභිසක්කෝ විය. වණ්ණාදයෝච නං පරිවාරෙන්ති. යථා තං ඛත්තියකුමාරං සහජාතා අමච්චපුත්තා වියාති. යස්මා පන සත්තානං චිත්තං නාම විචිත්තං හෝති. චිත්තවිචිත්තතාය සඤ්ඤාවිචිත්තා. සඤ්ඤාවිචිත්තතාය තණ්හාවිචිත්තා. තණ්හාවිචිත්ත තාය කම්මානි විචිත්තානි. කම්මවිචිත්තතාය කම්මසමුට්ඨානානි භූතානි විචිත්තානි. භූතවිචිත්තතාය ඉමේ පසාද විචිත්තා. අඤ්ඤමඤ්ඤං අසදිසා හොන්ති. තේහි පසාදමණ්ඩභූතාපි සමානා කේචි රූපස්සේව අභිඝාතාරහා හොන්ති, න සද්දාදීනං. කේචි සද්දාදීනං ඒව, න රූපස්සාති. තස්මා තේසං අඤ්ඤමඤ්ඤඤ්ච අඤ්ඤරූපේහිච ලක්ඛණතෝ අසංමිස්සතා වේදිතබ්බාති. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 156 යටතේ)]**

"සමවිසමං"ති සමට්ඨානඤ්ච විසමට්ඨානඤ්ච, සමදේසඤ්ච විසමදේසඤ්ච, සමපථඤ්ච විසමපථඤ්චාති ඒවමාදිං සමවිසමං. "ආචික්ඛති"ති ආචික්ඛන්තං විය තං ජානනකිච්චං සම්පාදේති. තේනාහ "සමවිසමජානනස්ස තං මූලකත්තා"ති.

"අනිරාකරණතෝ"ති අප්පටික්ඛිපනතෝ. "තං වා"ති රූපං වා. සුණන්ති ජනා. සුයයන්ති ජනේහි. ඒවං ඝායන්තීති ආදීසු. "ජීවිතනිමිත්තං"ති ජීවිතප්පවත්ති කාරණභූතෝ. "නින්නතායා"ති විසයවිසයීභාවූපගමනේන නින්නතාය. "ජීවිතවුත්ති සම්පාදකත්තා"ති නානාවචීභේදවචීකම්මප්පවත්තනේනාති අධිප්පායෝ. ඉමේ පන පඤ්චචක්ඛුපසාදදයෝති සම්බන්ධෝ. "දට්ඨුකාමතා"ති රූපතණ්හා වුච්චති. ආදි සද්දේන සෝතුකාමතා ඝායිතුකාමතා සායිතුකාමතා ඵුසිතුකාමතායෝ සඞ්ගය්හන්ති. අත්ථතෝ සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ඒව. "නිදානං"ති කාරණං. දට්ඨුකාමතාදයෝ නිදානමස්සාති විග්ගහෝ. කුසලාකුසලකම්මං. සමුට්ඨාති ඒතේනාති සමුට්ඨානං. කම්මමේව. දට්ඨුකාමතාදිනිදානකම්මං සමුට්ඨානං යේසන්ති සමාසෝ. පථවිආදීනි භූතානි. තේසං පසාදෝ ලක්ඛණං ඒතේසන්ති විග්ගහෝ. දුතිය විකප්පේ. රූපාදීනං පඤ්චාරම්මණානං අභිඝාතං අරහතීති රූපාදිඅභිඝාතාරහෝ. භූතානං පසාදෝ භූතප්පසාදෝ. සෝ ලක්ඛණං ඒතේසන්ති විග්ගහෝ. චක්ඛු ඌකාසිරප්පමාණේ දිට්ඨමණ්ඩලේ තිට්ඨතීති සම්බන්ධෝ. "දිට්ඨමණ්ඩලේ"ති මහාජනේහි පකතිචක්ඛුනා දිට්ඨේ පසන්නමණ්ඩලේ. තේලං සත්තපිචුපටලානි බ්‍යාපෙත්වා තිට්ඨති වියාති යෝජනා. "සෝතබිලං" නාම සෝතකූපෝ. "අඞ්ගුලිවේඨනා" නාම අඞ්ගුලිමුද්දිකා. "උපචිතතනුතම්බලෝමං"ති රාසිකතඤ්ච විරළඤ්ච තම්බලෝහවණ්ණඤ්ච සුඛුමලෝමං. උපචිතං රාසිකතං තනුතම්බලෝමං එත්ථාති විග්ගහෝ. "අජපදසණ්ඨානං"ති අජස්ස පාදේන අක්කන්තපදසණ්ඨානවන්තං. "උප්පලදලං" නාම උප්පලපණ්ණං. උප්පලදලස්ස අග්ගසණ්ඨානවන්තං. "වට්ටි" නාම ඉධ මනුස්සානං සරීරාකාරසණ්ඨිතා ආයතපිණ්ඩි. "සුක්ඛචම්මානි ච ඨපෙත්වා"ති සම්බන්ධෝ. තේ පන පඤ්චප්පසාද. සමුදීරණං චඤ්චලනං. "යථාතං"ති කතමං විය තං. ඉමේ පසාද විචිත්තා, කථං විචිත්තාති ආහ "අඤ්ඤමඤ්ඤං අසදිසා"ති. කථං අසදිසාති ආහ "තේහි"ති ආදිං.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 156 යටතේ)]**

**චක්ඛතීති** දැනගනීනුයි **චක්ඛු** චක්‍ෂු නම් **සමවිසමජානනස්ස** සම විසම ස්ථාන දැනගැනීමගේ **තං** ඒ චක්‍ෂුස **මූලකත්තා** මූලික බැවින් **සමවිසමං** සම ස්ථාන ද විසම ස්ථාන ද සම දේශය ද විසම දේශය ද සම පථය ද විසම පථයද **ආචික්ඛති** දක්වන්නෙකු මෙන් ඒ දැනීම් කෘත්‍යය සම්පාදනය කරයි (චක්ඛති යන ක්‍රියාවගේ අර්ථය "ආචික්ඛන්තං විය තං ජානනකිච්චං සම්පාදේති" යි ටීකායෙහි වර්ණනා කළෙයි. චක්‍ෂුස්ප්‍රශාදය කවර හෙයකින් සමවිසම භාවය දක්වක්නෙකු මෙන් වන්නේ ද යන චෝද්‍යයට පරිහාර පිණිස "සමවිසමජානනස්ස තම්මූලකත්තා" යන පාඨය කියනලදි) **වා** නොහොත් **ආපාතං** ඉදිරියට **ආගතාගතස්ස රූපස්ස** පැමිණි පැමිණි රූපයාගේ **අනිරාකරණතෝ** බැහැර නොකිරීම් වශයෙන් **රූපං** රූපය **අස්සාදේති** ආශ්වාදනය කරයි (**වා** නොහොත්) **තං වා** ඒ රූපය හෝ **විභාවේතීති** ප්‍රකාශ කරයි යන **අත්ථෝ** අර්ථයයි **සුණාතීති** අසන්නේනුයි **සෝතං** ශ්‍රෝත්‍ර නම් **ඒතේන** මෙය කරණකොටගෙන (**ජනා** ජනයෝ) **සුණන්ති වා** අසත්නුයි හෝ (**ජනේහි** ජනයන් විසින්) **සුයයන්ති වා** අසනුලබත්නුයි හෝ **සෝතං** ශ්‍රෝත්‍ර නම් **ඝායතීති** ආඝ්‍රානය කරයිනුයි **ඝානං** ඝ්‍රාණ නම් **ඒතේන** මෙය කරණකොටගෙන (**ජනා** ජනයෝ) **ඝායන්ති වා** ආඝ්‍රානය කරත්නුයි හෝ (**ජනේහි** ජනයන් විසින්) **ඝායියන්ති වා** ආඝ්‍රානය කරනුලබත්නුයි හෝ **ඝානං** ඝ්‍රාණ නම් **ජීවිතනිමිත්තං** ජීවිතපැවැත්මට කාරණ වූ **රසෝ** රසාරම්මණ තෙම **ජීවිතං ඉති** ජීවිතං යැයි **වුච්චති** කියනුලැබේ **තස්මිං** ඒ රසාලම්බනයෙහි **නින්නතාය** නැමුනා වූ බැවින් **තං** ඒ රසාරම්මණය **අව්හායති** කැඳවන්නේනුයි **ජිව්හා** ජිව්හා නම් **අථවා** නොහොත් **ඒතාය** රසාරම්මණය කරණකොටගෙන **ජීවිතං** ජීවිතය **වහති** උසුලයිනුයි **වා** හෝ

**ජීවිතවුත්තිසම්පාදනත්තා** නොයෙක් වාග්කර්ම පැවැත්වීම පිණිස **තං** ඒ ජීවිතය **වහන්ති** උසුලත් **පවත්තෙන්ති** පවත්වත්නුයි **ජිව්හා** ජිව්හා නම් වේ **ජීති** ජීති යනු **ජයෝ වා** ජය හෝ **පරාජයෝ වා** පරාජය හෝ **වුච්චති** කියනු ලැබේ **තදුභයං** ඒ ජය පරාජය යන දෙක **වහති** උසුලයි **වා** නොහොත් **ඒතාය වා** මෙය කරණකොට **වහන්ති** උසුලත්නුයි **ජිව්හා** ජිව්හා නම් **සසම්භාරජිව්හා** සසම්භාරජිව්හායි **යථාහ** එසේහෙයින් වදළ සේක **හි (යථා)** යම්සේ **නරෝ** මිනිසා **යාය** යමක් හේතුකොටගෙන **අත්තානං** ආත්මය **ජින්දති** සිඳී ද (**තථා** එසේ **සෝ නරෝ** ඒ මිනිසා) **දුබ්භාසිතං** නපුරු වචන **භණන්ති** කියත් (**තං පන** එය වනාහි) **ජාතස්ස පුරිසස්ස** උපන් පුරුෂයාගේ **මුඛේ** මුඛයෙහි **කුඨාරි** කෙටේරියක් **ජායතේ (ජායන්තම්ව)** උපන්නාක් මෙන් (**වුච්චති** කියනු ලැබේ)

**ඉධ පන** මෙහි වනාහි **තං සහචරිතත්තා** ඒ වාග් කර්මය සමග හැසිරෙන හෙයින් **පසාදරූපමෝ** ජිව්හාප්‍රශාදය තෙමේ **ජිව්හාති** ජිව්හා යයි **වුච්චති** කියනුලැබේ **කුච්ජිතානං** පිළිකුල් වූ **කේසාදීනඤ්ච** කේසාදීන්ගේ ද **පාපධම්මානඤ්ච** අකුසල ධර්මයන්ගේ ද **ආයෝ උප්පත්තිඨානන්ති** හටගැනීමට ස්ථානයක් වේනුයි **කායෝ** කාය නම් වේ **සසම්භාරකායෝ** සසම්භාරකායයි **ඉධ පන** මෙහි වනාහි **තං සහචරිතෝ** ඒ කේසාදී පිළිකුල් ධර්මයන් සමග හැසිරෙන හෙයින් **පසාදකායෝ ඒව** කායප්‍රශාදයම **අධිප්පේතෝ** අදහස් කරන ලද්දේ වේ **පසීදන්තීති** පහදිත්නුයි **පසාද** ප්‍රශාද නම් **වා** නොහොත් **එත්ථ** මෙහි **චන්දමණ්ඩලාදීනි** චන්‍ද්‍රමණ්ඩලාදී **ආරම්මණනිමිත්තානි** ආලම්බන නිමිති **තත්ථ** එහි **සංසීදමානානි විය** ගිලාබසින්නාක් මෙන් **පසීදන්ති** පහදිත් නොහොත් **සරූපතෝ** ස්වරූප වශයෙන් **සන්දිස්සතීති** දක්නා ලැබේනුයි **පසාද** ප්‍රශාද නම් වේ **සුපරිසුද්ධආදසමණ්ඩසදිසා** සුපිරිසිදු කැඩපතක් හා සමාන **කම්මජමණ්ඩා** කර්මජ රූපයන්ගේ ඔපයයි **ඉමේ පන පඤ්ච** මේ පඤ්චප්‍රශාදයෝ වනාහි **දට්ඨුකාමතාදිනිදාන** දැකීම් කැමතිබව නොහොත් රූප තෘෂ්ණාදිය කාරණ කොට ඇති **කම්මසමුට්ඨානභූතපසාදලක්ඛණා** කර්මයෙන් හටගත් මහාභූතයන්ගේ ප්‍රශාද බව ලක්‍ෂණයයි **වා** නොහොත් **රූපාදිඅභිඝාතාරහභූතපසාදලක්ඛණා** රූපාදී ආරම්මණයන්ගේ ආපාතගතවීම ලැබීමට සුදුසු මහාභූතයන්ගේ ප්‍රශාද බව ලක්‍ෂණයයි **චක්ඛුපසාදදයෝ** චක්‍ෂුර්ප්‍රශාදදීහු **දට්ඨබ්බා** දතයුත්තාහ **තත්ථ** ඒ පඤ්චප්‍රශාද අතුරින් **තාව** පළමු කොට **චක්ඛු** චක්‍ෂුර්ප්‍රශාදය තෙමේ **සේතමණ්ඩලපරික්ඛිත්තස්ස** සුදු මණ්ඩලයකින් පරික්‍ෂිප්ත වූ **කණ්හමණ්ඩලස්ස මජ්ඣෙ** කෘෂ්ණ මණ්ඩලයාගේ මධ්‍යයෙහි **ඌකාසිරපමාණේ** උකුණු හිසක් පමණ ප්‍රමාණ වූ **අභිමුඛේ ඨිතානං** ඉදිරියෙහි සිටියහුන්ගේ **සරීරසණ්ඨානුප්පත්තිපදේසභූතේ** ශරීර සටහන් උපදින්න ප්‍රදේශය වූ **දිට්ඨමණ්ඩලේ** දෘෂ්ටි මණ්ඩලයෙහි **සත්තපිචුපටලානි** පුළුන් පටල සතක **තේලම්ව** පැතිර පවත්නා තෙලක් මෙන් **සත්තඅක්ඛිපටලානි බ්‍යාපෙත්වා** අක්‍ෂි පටල සතක පැතිර **තිට්ඨති** සිටියි **සෝතං** ශ්‍රෝත්‍ර ප්‍රශාදය වනාහි **සෝතබිලබ්භන්තරේ** සසම්භාර කණ්බිලයාගේ ඇතුලත **උපචිතතනුතම්බලෝමං** රැස්කරනලද තුනී තඹලෝමයකින් කළ **අඞ්ගුලිවේධනාකාරං** ඇඟිලි මුදුවක ආකාර වූ **පදේසං** ප්‍රදෙශයෙක්හි **බ්‍යාපෙත්වා** පැතිර **තිට්ඨති** සිටියි **ඝානං** ඝ්‍රාණප්‍රශාදය තෙමේ **නාසිකබ්භන්තරේ** නාසිකාවගේ ඇතුලත **අජපදසණ්ඨානං** එළු කුරයකගේ සටහන් ඇති **පදේසං** ප්‍රදේශයෙක්හි **බ්‍යාපෙත්වා** පැතිර **තිට්ඨති** සිටියි **ජිව්හා** ජිව්හා ප්‍රශාදය තෙමේ **සසම්භාරජිව්හාමජ්ඣෙ** සසම්භාර ජිව්හාවගේ මධ්‍යයෙහි **උප්පලදලග්ගසණ්ඨානං** උපුල්පෙති අග සටහන් ඇති **පදේසං** ප්‍රදෙශයෙක්හි **බ්‍යාපෙත්වා** පැතිර **තිට්ඨති** සිටියි **කායෝ පන** කාය ප්‍රශාදය වනාහි **මහන්ති** මහත්ය **යා** ඒ කායප්‍රශාදය තුමූ

**කප්පාසපටලවට්ටියං** කපු පුළුන්පටල වැටියෙක්හි **ආසිත්තතේලං විය** ඉසිනලද තෙලක් මෙන් **පාචකතේජස්ස** පාචකතේජෝධාතුවගේ **පතිට්ඨානට්ඨානං** පිහිටන ස්ථානය ද **කේසග්ගලෝමග්ගනඛග්ගසුක්ඛචම්මානි ච** කෙස් අග ලොම් අග නිය අග වියලි සම් ද **ඨපෙත්වා** හැර **අවසේසං සකලසරීරං** ඉතිරි සියළු ශරීරයෙහි **බ්‍යාපෙත්වා** පැතිර **තිට්ඨති** සිටියි **ඉති (වුච්චති)** යැයි කියනු ලැබෙයි **තේ පන පඤ්ච** ඒ පඤ්ච ප්‍රශාදයෝ වනාහි **යථාරහං** සුදුසු පරිදි **පඤ්චද්වාරිකචිත්තානං** පඤ්චද්වාරික චිත්තයනට **වත්‍ථුද්වාරභාවං** වස්තු-ද්වාර බව **සාධෙන්ති** සිද්ධකරත් **තේසු ච** ඒ පඤ්චප්‍රශාදයන්හි ද **ඒකේකස්ස** එක් එක් ප්‍රශාදයකට **ඛත්තියකුමාරස්ස** ක්‍ෂත්‍රිය කුමරෙකුට **චතස්සෝ ධාතියෝ** කිරිමව්වරු සතරදෙනෙකු **ධාරණනාපනමණ්ඩනබීජනකිච්චේහි** දැරීම් නැහැවීම් සැරසීම් පවන් සැලීම් යන කෘත්‍යයන්ගෙන් **යථා** යම්සේ **ඉති (උපකාරං කරොන්ති)** උපකාර කරත් ද (**තථා** එසේ) **චතස්සෝ චතස්සෝ ධාතුයෝ** මහාධාතූහු සතර දෙන සතර දෙන **සන්ධාරණආබන්ධනපරිපාචනසමුදීරණකිච්චේහි** දැරීම් බැඳීම් පැසවීම් සෙලවීම් යන කෘත්‍යයන්ගෙන් **උපකාරං කරොන්ති** උපකාර කරත් **පිතුජෙට්ඨභාතුජෙට්ඨභගිනියෝ** පියාය ජ්‍යේෂ්ඨ සහෝදරයාය ජ්‍යේෂ්ඨ සහෝදරියය යන මොවුහු **තං ඛත්තියකුමාරං** ඒ ක්‍ෂත්‍රිය කුමරුහට **යථා විය** යම්සේ උපස්ථම්භනය වන්නාක් මෙන් (**තථා** එසේ) **උතුචිත්තාහාරා ච** උතු චිත්ත ආහාරයෝ ද **නං** ඒ ප්‍රශාදයට **උපත්ථම්භෙන්ති** උපස්ථම්භනය වෙත් **රාජසම්මතෝ** රාජ සම්මත **දිසාපාමොක්ඛෝ** දිසාපාමොක් **මහාභිසක්කෝ** වෛද්‍යවරයෙක් **තං ඛත්තියකුමාරං** ඒ ක්‍ෂත්‍රිය කුමරු **යථා විය** යම්සේ ආරක්‍ෂා කරන්නාක් මෙන් (**තථා** එසේ) **ආයු ච** ආයුෂය ද **නං** ඒ ප්‍රශාදය **සුට්ඨු අනුපාලේති** මනාව ආරක්‍ෂා කරයි **සහජාතා අමච්චපුත්තා** සමඟ උපන්නා වූ අමාත්‍ය පුත්‍රයෝ **තං ඛත්තියකුමාරං** ඒ ක්‍ෂත්‍රිය කුමරු **යථා විය** යම්සේ පිරිවරන්නාක් මෙන් (**තථා** එසේ) **වණ්ණාදයෝ ච** වර්ණාදීහු ද **නං** ඒ ප්‍රශාදය **පරිවාරෙන්ති** පිරිවරත් **යස්මා පන** යම්සේ වනාහි **සත්තානං** සත්වයන්ගේ **චිත්තං නාම** සිත නම් **විචිත්තං හෝති** විචිත්‍ර වෙයි **චිත්තවිචිත්තතාය** සිත විසිතුරු බැවින් **සඤ්ඤාවිචිත්තා (හෝති)** සංඥාව ද විචිත්‍ර වෙයි **සඤ්ඤාවිචිත්තතාය** සංඥාව විසිතුරු බැවින් **තණ්හාවිචිත්තා (හෝති)** තණ්හාව විසිතුරු වෙයි **තණ්හාවිචිත්තතාය** තණ්හාව විසිතුරු බැවින් **කම්මානි** කර්මයෝ **විචිත්තානි (හොන්ති)** විසිතුරු වෙත් **කම්මවිචිත්තතාය** කර්මය විසිතුරු බැවින් **කම්මසමුට්ඨානි භූතානි** කර්මසමුත්ථානික මහාභූතයෝ **විචිත්තානි (හොන්ති)** විසිතුරු වෙත් **භූතවිචිත්තතාය** මහාභූතයෝ විසිතුරු බැවින් **ඉමේ පසාදා** මේ ප්‍රශාද රූපයෝ **විචිත්තා (හොන්ති)** විසිතුරු වෙත් **අඤ්ඤමඤ්ඤං** ඔහුනොවුන්ට **අසදිසා හොන්ති** අසදෘශ වෙත් **තේහි** ඒ ප්‍රශාදයන්ගෙන් **කේචි** ඇතැමෙක් **පසාදමණ්ඩභූතා** භූතප්‍රශාදයෝ **සමානා අපි** සමානවූවාහු වෙත් ද (**තේ** ඔවුහු) **රූපස්සේව** රූපාරම්මණයාගේම **අභිඝාතාරහා හොන්ති** ආපාතගතවීමට සුදුසුවූවෝ වෙත් **සද්දාදීනං** ශබ්දාදී ආරම්මණයන්ගේ **න (හොන්ති)** ආපාතගතවීමට සුදුසුවූවෝ නොවෙත් **ඉති (තථා)** එසේම **කේචි** ඇතැම් භූතප්‍රශාදයෝ **සද්දාදීනං ඒව** ශබ්දාදී ආරම්මණයන්ගේම (**අභිඝාතාරහා හොන්ති** ආපාතගතවීමට සුදුසුවූවෝ වෙත්) **රූපස්ස** රූපාරම්මණයාගේ **න (හොන්ති)** ආපාතගතවීමට සුදුසුවූවෝ නොවෙත් **තස්මා** එහෙයින් **තේසං අඤ්ඤමඤ්ඤසඞ්ඛ** ඒ ඔහුනොවුන්ගේ ද (ප්‍රශාද රූපයන්ගේ) **ලක්ඛණතෝ** ලක්‍ෂණ වශයෙන් **අඤ්ඤරූපේහි ච** අන්‍ය රූපාරම්මණයන් සමඟ ද **අසම්මිස්සතා** මිශ්‍ර නොවන බව **වේදිතබ්බා** දතයුත්තාහ

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

තත්ථ විසේසතෝ තාව චක්ඛතීති **චක්ඛු;** රූපං අස්සාදේති, විභාවේති චාති අත්ථෝ. සුණාතීති **සෝතං**. ඝායතීති **ඝානං**. ජීවිතං අව්හායතීති **ජිව්හා**. කුච්ඡිතානං සාසවධම්මානං ආයෝති **කායෝ**. ආයෝති උප්පත්තිදේසෝ.
**[විභඞ්ග අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 154 යටතේ); විභඞ්ග අටුවා 31-32 පිටු (හේ.වි.මු); විභඞ්ගප්පකරණ අටුවා සන්නය 179-184 පිටු]**

**විසේසතෝ**ති ආයතන-සද්දත්ථො විය අසාධාරණතෝ චක්ඛාදිසද්දත්ථතෝති අත්ථෝ. **අස්සාදේතී**ති චක්ඛති-සද්දෝ "මධුං චක්ඛති බ්‍යඤ්ජනං චක්ඛතී"ති රසසායනත්ථෝ අත්ථීති තස්ස වසේන අත්ථං වදති. "චක්ඛුං ඛෝ, මාගණ්ඩිය, රූපාරාමං රූපරතං රූපසම්මුදිත"න්ති (ම. නි. 2.209) වචනතෝ චක්ඛු රූපං අස්සාදේති. සතිපි සෝතාදීනං සද්දරම්මණාදිරතිභාවේ නිරුළ්හත්තා චක්ඛුම්හියේව චක්ඛු-සද්දෝ පවත්තති පදුමාදීසු පඞ්කජාදිසද්ද වියාති දට්ඨබ්බං. **විභාවේති චා**ති සද්දලක්ඛණසිද්ධස්ස චක්ඛති-සද්දස්ස වසේන අත්ථං වදති. චක්ඛතීති හි ආචික්ඛති, අභිබ්‍යත්තං වදතීති අත්ථෝ. නයනස්ස ච වදන්තස්ස විය සමවිසමවිභාවනමේව ආචික්ඛනන්ති කත්වා ආහ **"විභාවේති චාති අත්ථෝ"**ති. අනේකත්ථත්තා වා ධාතූනං විභාවනත්ථතා චක්ඛු-සද්දස්ස දට්ඨබ්බා.

රසග්ගහණමූලකත්තා ආහාරජ්ඣෝහරණස්ස ජීවිතහේතුම්හි ආහාරරසේ නින්නතාය **ජීවිතං අව්හායතී**ති ජිව්හා වුත්තා නිරුත්තිලක්ඛණේන. **කුච්ඡිතානං සාසවධම්මානං ආයෝ**ති විසේසේන **කායෝ** වුත්තෝ අනුත්තරියහේතුභාවං අනාගච්ඡන්තේසු කාමරාගනිදානකම්මජනිතේසු කාමරාගස්ස ච විසේසපච්චයේසු ඝානජිව්හාකායේසු කායස්ස විසේසතරසාසවපච්චයත්තා. තේන හි ඵොට්ඨබ්බං අස්සාදෙන්තා සත්තා මේථුනම්පි සෙවන්ති. **උප්පත්තිදේසේ**ති උප්පත්තිකාරණන්ති අත්ථෝ. කායින්ද්‍රියවත්ථුකා වා චත්තාරෝ ඛන්ධා බලවකාමාසවාදිහේතුභාවතෝ විසේසේන **"සාසවා"**ති වුත්තා, තේසං උප්පජ්ජනට්ඨානන්ති අත්ථෝ.
**[විභඞ්ග මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 152 යටතේ)]**

දුතියේ අත්ථවිකප්පේ **චක්ඛතී**ති විඤ්ඤාණාධිට්ඨිතං සමවිසමං ආචික්ඛති, ආචික්ඛන්තං විය, විභාවෙන්තං විය වා හෝතීති අත්ථෝ. අජ්ඣෝහරණස්ස රසග්ගහණමූලතාවචනේන රසස්ස පරම්පරාය ජීවිතහේතු තං දස්සේති. රසනිමිත්තඤ්හි **රසග්ගහණං,** රසග්ගහණනිමිත්තං **අජ්ඣෝහරණං,** තං නිමිත්තං **ජීවිත**න්ති. රසග්ගහණමූලතා ච අජ්ඣෝහරණස්ස යේභුය්‍යතෝ වේදිතබ්බා. දිස්සති අපදිස්සති ඒතේන ඵලන්ති දේසෝ, හේතූති ආහ **"උප්පත්තිදේසෝති උප්පත්තිකාරණ"**න්ති. **[විභඞ්ග අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 154 යටතේ)]**

**තත්ථ** ඒ පදාර්ථ ලක්‍ෂණාදීන් අතුරෙන් විසේසතෝ ආවේණික වශයෙන් හෙවත් අසාධාරණ වශයෙන් (**අත්ථෝ** චක්‍ෂුරාදී වූ ශබ්දයන්ගේ අර්ථය තෙම) **තාව** චක්‍ෂුරාදී වූ ශබ්යන්ගේ සාධාරණ අර්ථයට පළමු කොටැ (**මයා** මා විසින් **වුච්චතේ** කියනු ලැබේ) නොහොත් **තත්ථ** ඒ පාලි මුත්තක නයෙහි **විසේසතෝ** අසාධාරණ වශයෙන් හෙවත් චක්‍ෂුරාදී ශබ්දාර්ථ වශයෙන් **තාව** පළමු කොටැ **විනිච්ඡයෝ** (විනිශ්චය තෙම **වේදිතබ්බෝ** දතයුත්තේය **යං පසාදරූපං** යම් ප්‍රශාදරූපයෙක් තෙම නොහොත් **යං ධම්මජාතං** යම් ධර්මසමූහයෙක් තෙම **රූපං** රූපාලම්බනය) **චක්ඛති** රසාශ්වාදනයක්හු මෙන් කෙරේද නොහොත් ප්‍රකාශවූවක්හු මෙන් කෙරේ ද **ඉති** එහෙයින් (**තං පසාදරූපං** ඒ ප්‍රශාදරූපය තෙම නොහොත් **තං ධම්මජාතං** ඒ ධර්ම සමූහය තෙම) **චක්ඛු** චක්‍ෂුස් නම් වේ **රූපං** රූපාලම්බනය **අස්සාදේති** රස විඳීමක්හු

මෙන් කෙරෙයි **විභාවේති ච** ප්‍රකාශවූවක්හු මෙන් කෙරෙයි **ඉති අත්ථෝ** මේ අර්ථය තෙම (**දට්ඨබ්බෝ** දතයුත්තේය)

* චක්ඛති යන මේ ශබ්දය තෙම පෙක්ඛණ ආචික්ඛනාදී වූ අර්ථයන්ගෙද වැටේ. ඒ පේක්ෂණාද්‍යාර්ථයන් අනභිමත වූයෙන් මෙතන්හි ආශ්වාදනාර්ථ විභාවනාර්ථයන්මැ අභිමත කළ බැව් හඟවනු පිණිසැ "රූපං අස්සාදේති විභාවේති චාති අත්ථෝ" යි විචාරණය කළහ. චක්‍ෂුඃප්‍රශාදය තමා රූපාලම්බන රසාශ්වාදනය කරන බවෙක් නැතද "ධනුනා විජ්ජති" යනාදී සාධක පාඨයන්හි පෙණෙන සසම්භාර කථා මෙන් සම්භාර වශයෙන් ද උපචාර වශයෙන් ද ගෙනැ "අස්සාදේති විභාවේති" යි වැනූහ. මුඛ්‍ය වශයෙන් වනාහි විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා රූපං චක්ඛති අස්සාදේති විභාවේතීති වා චක්ඛු යන නිර්වචන විය යුතුයහ. විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා චක්‍ෂුර්විඥ්ඥාණය නිශ්‍රය වූවෙකු කොටගෙනැ රූපං රූපාලම්බනය චක්ඛති යීසේයි අස්සාදේති ආශ්වාදනය කෙරෙයි ඉති එහෙයින් චක්ඛු චක්‍ෂුස් නම් වෙයි චක්ඛ චක්ඛනේ යන ධාතුව කෙරෙන් රූ-ප්‍රත්‍යයවැ කර්තෘ සාධනයෙහි සිද්ධයි. චක්ඛු ධාතු තෙමේ චක්‍ෂුඃප්‍රශාද රූපයාගේ රූපාලම්බනය ආශ්වාදනය කිරීමක් වැනි වූ ස්වභාව ශක්තිය දක්වා නොහොත් චක්‍ෂුඃප්‍රශාද රූපයාගේ රූපාලම්බනය මෙතැන්හි යැයි ප්‍රකාශ කිරීමක් වැනි වූ ස්වභාව ශක්තිය දක්වා රූ-ප්‍රත්‍යය තෙමේ තදුභය ස්වභාව ශක්තීන්ගේ ආධාර ස්ථානය වූ ශක්තිමත්වූ චක්‍ෂුඃප්‍රශාද රූපය දක්වා විඤ්ඤාණාධිට්ඨිතං යනාදි ක්‍රියා විශේෂණ සහිත වූ නිර්වචනය ද මෙහි උචිතබැව් "තත්ථ චක්ඛති විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා සමවිසමං ආචික්ඛන්තං විය හෝතීති චක්ඛු" යන අභිධර්මාර්ථ විභාවනීටීකා පාඨානුසාරයෙන් ප්‍රකාශ කෙරේ.෴

(**යං පසාදරූපං** යම් ප්‍රසාදරූපයෙක්තෙම **සද්දං** ශබ්දලම්බනය) **සුණාති** ශ්‍රවණය කෙරේද **ඉති** එහෙයින් (**තං ප්‍රසාදරූපං** ඒ ප්‍රසාදරූයතෙම) **සොතං** ශ්‍රෝත්‍ර නම් වේ (මෙහිදු "විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා" යන ක්‍රියාවිශේෂණය බහා චක්ඛුශබ්දයෙහි කී නයානුසාරයෙන් අභිප්‍රාය දතයුතුය.)

(**යං පසාදරූපං** යම් ප්‍රසාදරූපයෙක් **ඝානවිඤ්ඤාණාධිට්ඨිතං හුත්වා** ඝ්‍රාණවිඥනය නිඃශ්‍රය ස්ථානකොටගෙනැ **ගන්ධං** ගන්ධාලම්බනය) **ඝායති** ආඝ්‍රාණය කෙරේද **ඉති** එහෙයින් (**තං ප්‍රසාදරූපං** ඒ ප්‍රසාදරූයතෙම) **ඝානං** ඝ්‍රාණ නම් වේ.෴

(**යං පසාදරූපං** යම් ප්‍රසාදරූපයෙක් **ජිව්හාවිඤ්ඤාණාධිට්ඨිතං හුත්වා** ජිව්හාවිඥනය නිඃශ්‍රය ස්ථානකොටගෙනැ) **ජීවිතං** ජීවිතේන්ද්‍රියයැ නොහොත් ජීවිතේන්ද්‍රියට නිමිත්තවූ රසාලම්බනය **අව්හායති** අව්හානය කෙරේද හෙවත් කැඳවාද (**තං ප්‍රසාදරූපං** ඒ ප්‍රසාදරූපයතෙම) **ජිව්හා** ජිව්හා නම් වේ ("ජීවිතව්හා" යී වියයුතු තන්හි නිරුක්ති නයින් "ජිව්හා" යී සිද්ධියි) **අස්සාදෙන්ති** ආස්වාදනය කෙරෙත් **ඉති අත්ථෝ** මේ අර්ථයතෙම (**දට්ඨබ්බෝ** දතයුත්තේය)

(**යෝ පසාදකායෝ** යම් ප්‍රසාදරූපකායයෙක්තෙම) **කුච්ජිතානං** කුත්සිතවූ හෙවත් නින්දිතවූ **සාසවධම්මානං** සාශ්‍රව ධර්මයන්ගේ **ආයෝ** ප්‍රවෘත්තිකාරණය වේද **ඉති** එහෙයින් (**සෝ පසාදකායෝ** ඒ ප්‍රසාදරූපකායතෙමේ) **කායෝ** කාය නම් වේ **ආයෝති** ආය නම් **උප්පත්තිදේසෝ** උප්පත්ති ස්ථානය මෙන් ගන්නා ලද ප්‍රවෘත්තිකාරණයයි.෴ **[විභඞ්ග අටුවා සන්නය 179 -184 පිටු]**

**කායෝති** රූපකායෝ. සෝ හි අඞ්ගපච්චඞ්ගානං කේසාදීනඤ්ච සමූහට්ඨේන, ඒවං කුච්ඡිතානං ජේගුච්ඡානං ආයෝ උප්පත්තිදේසෝතිපි කායෝ. තත්‍රායං වචනත්ථෝ; ආයන්ති එත්ථාති ආයෝ. කේ ආයන්ති? කුච්ඡිතා කේසාදයෝ. ඉති කුච්ඡිතානං ආයෝතිපි කායෝ. අත්ථතෝ පන චතුසන්තතිවසේන පවත්තමානානං භූතුපාදයධම්මානං පුඤ්ජෝ.

**[ඉතිවුත්තක අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 77 යටතේ); ඉතිවුත්තක අටුවා 189 (හේ.වි.මු); නෙත්තිප්පකරණ අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 23 ලක්ඛණාහාරවිභඞ්ගවණ්ණනා යටතේ); නෙත්තිප්පකරණ අටුවා 80 පිට (හේ.වි.මු); පටිසම්භිදමග්ග අටුවා 01 (ඡට්ඨසඞ්ගායනා අංක 36 යටතේ); පටිසම්භිදමග්ග අටුවා 121-122 පිටු (හේ.වි.මු); මහානිද්දේස අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 03 යටතේ); මහානිද්දේස අටුවා 31 පිට (හේ.වි.මු); මූලපණ්ණාස අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 106 යටතේ); මජ්ඣිමනිකාය අටුවා 01/217 පිට (හේ.වි.මු); දීඝනිකාය මහාවග්ග අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 373 යටතේ); දීඝනිකාය අටුවා 02/544 පිට (හේ.වි.මු); ඒකකනිපාත ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 390 යටතේ)]**

**කායෝති** කාය යනු **රූපකායෝ** රූප කයයි **අඞ්ගපච්චඞ්ගානං ච** අඞ්ග ප්‍රත්‍යඞ්ගයන්ට ද **කේසාදීනඤ්ච** කේසාදීන්ට ද **සමූහට්ඨේන** සමූහර්ථයෙන් **සෝ** රූප කාය යැයි **හි (වුච්චති)** කියනු ලැබෙයි **ඒවං** මෙසේ **කුච්ඡිතානං** පිළිකුල් කටයුතු වූ කේසාදීන්ගේ ද **ජේගුච්ඡානං** ලාමක අකුසල ධර්මයන්ගේ ද **ආයෝ උප්පත්තිදේසෝතිපි** උපදින ප්‍රදේශය වේනුයි **කායෝ** කාය නම් වේ **තත්‍ර** එහි **අයං** මේ **වචනත්ථෝ** වචනාර්ථයයි **එත්ථ** මෙහි **ආයන්ති ඉති** පමුණුවත්නුයි **ආයෝ** ආයෝ නම් වේ **කේ** කවරහු **ආයන්ති?** පමුණුවත් ද? **කුච්ඡිතා කේසාදයෝ** පිළිකුල් කටයුතු කේසාදීහු (**ආයන්ති** පමුණුවත්) **ඉති (තස්මා)** එහෙයින් **කුච්ඡිතානං** පිළිකුල් කටයුතුවූවන්ගේ **ආයෝතිපි** පමුණුවයිනුයි **කායෝ** කාය නම් වේ **අත්ථතෝ පන** අර්ථ වශයෙන් වනාහි **චතුසන්තතිවසේන** චතුසන්තති වශයෙන් **පවත්තමානානං** පවතින්නා වූ **භූතුපාදයධම්මානං** භූතරූප උපාදය රූප යන ධර්මයන්ගේ **පුඤ්ජෝ** සමූහයයි. **[ඉතිවුත්තක අටුවා පරිවර්තනයි]**

"චක්ඛති විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා සමවිසමං ආචික්ඛන්තං විය හෝතීති චක්ඛු. චක්ඛති රූපං ආස්සාදෙන්තං විය හෝතීති චක්ඛු. චක්ඛති රූපං විභාවේතීති චක්ඛු."

"විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා සුණාතීති සෝතං. ඝායති ඝන්ධෝපාදනං කරෝතීති ඝානං. ජීවිතනිමිත්තං රසෝ ජීවිතං තං අව්හයති තස්මිං නින්නතායාති ජිව්හා." නිරුත්ති ක්‍රමයෙනි.

"කුච්ඡිතානං පාපාධම්මානං ආයෝ පතිට්ඨානන්ති කායෝ. චක්ඛුම්හි නිස්සිතං විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං. සුඛනං සුඛං. දුක්ඛනං දුක්ඛං. සුඛතීති සුඛං. දුක්ඛතීති දුක්ඛං. සුඛයති සුඛිතං කරෝතීති සුඛං. දුක්ඛයති දුක්ඛං කරෝතීති දුක්ඛං. සුඛයති සම්පයුත්තං කරජකායඤ්ච අස්සාදං අනුග්ගහිතං කරෝතීති සුඛං. සුඛයති සයං සුඛාකාරේන පවත්තතීති සුඛං. දුක්ඛයති සම්පයුත්තවත්ථුං කරජකායඤ්ච අනස්සාදං දුක්ඛිතං කරෝතීති දුක්ඛං. දුක්ඛයති සයං වා දුක්ඛාකාරේන පවත්තතීති දුක්ඛං." **[පරමත්ථවිනිච්ඡය ව්‍යඛ්‍යා 19 පිට]**

**විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා** චක්ෂුර්විඤ්ඤාණයට ආධාරස්ථාන වී **සමවිසමං** සමවිසම භාවය **චක්ඛති (ආචික්ඛන්තං විය හෝති)** අස්වන්නෙකු මෙන් වෙයි ද **ඉති (තස්මා) තං (පසාදරූපං)** ඒ ප්‍රශාද රූප තෙමේ **චක්ඛු** චක්ඛු නම් වේ. **රූපං** වර්ණායතනය **චක්ඛති (අස්සාදෙන්තං විය හෝති)** ආශ්වාදය කරන්නාක් මෙන් වේද

**ඉති (තස්මා) තං (පසාදරූපං)** ඒ ප්‍රශාද රූප තෙමේ **චක්ඛු** චක්ඛු නම් වේ. **චක්ඛති (විභාවේති)** රූපය දැනගන්නේ වේද **ඉති (තස්මා) තං (පසාදරූපං)** ඒ ප්‍රශාදරූප තෙමේ **චක්ඛු** චක්ඛු නම් වේ.

**විඤ්ඤාණාධිට්ඨිතං** හුත්වා ශ්‍රෝත්‍රවිඤ්ඤාණයට ආධාරස්ථානය වී **සද්දං** ශබ්දය **සුණාති** අසන්නේ වේද **ඉති (තස්මා) තං (පසාදරූපං)** ඒ ප්‍රශාදරූප තෙමේ **සෝතං** සෝත නම් වේ **යං (පසාදරූපං)** යම් ප්‍රශාදරූපයක් තෙමේ **විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා** ඝානවිඤ්ඤාණයට ආධාරස්ථාන වී (විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා යන යට වාක්‍යයෙන් ආවර්තනය වේ) **ඝායති (ඝන්ධෝපදානං කරෝති)** ගන්ධාලම්බනය ලං කොට ගන්නේ වේද **ඉති (තස්මා) ඝානං** ඝාන නම් වේ **ජීවිතනිමිත්තං (ජීවිතනිමිත්තත්තා)** ජීවිතේන්ද්‍රිය පැවැත්මට කාරණා වන හෙයින් **රසෝ** රසාලම්බන තෙමේ **ජීවිතං** ජීවිත නම් වේ (ජීවිත ශබ්දයෙන් මුඛ්‍ය වශයෙන් ජීවිතේන්ද්‍රිය වාචක වේ) **යං (පසාදරූපං)** යම් ප්‍රශාදරූපයක් තෙමේ **තස්මිං** ඒ රසාලම්බනයෙහි **නින්නතාය** නැමුනාවූ බැවින් **තං** ඒ රසාලම්බනය **අව්හායති** කැඳවන්නාක් වැනි වේද **ඉති (තස්මා) තං (පසාදරූපං)** ඒ ප්‍රශාදරූප තෙමේ **නිරුත්තිනයේන** පඤ්චවිධ නිරුත්ති ක්‍රමයෙන් **ජිව්හා** ජිව්හා නම් වේ.

**කුච්ඡිතානං** පිළිකුල් කටයුතු වූ **පාපධම්මානං** අකුසල් ධර්මයන්ට **ආයෝ (පවත්තිට්ඨානං හෝති)** හටගැනීමට ස්ථාන වේද **ඉති (තස්මා) සෝ (රූපකායෝ)** ඒ රූපකාය තෙමේ **කායෝ** කාය නම් වේ **චක්ඛුම්හි නිස්සිතං** චක්‍ෂුස ඇසුරු කරනලද **විඤ්ඤාණං** විඤ්ඤාණය **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඤ්ඤාණයයි **සුඛනං සුඛං** සැපය සුඛ නම් **දුක්ඛනං දුක්ඛං** දුක දුක්ඛ නම් **සුඛයති සුඛිතං කරෝතීති සුඛං** සුඛිත කරයිනුයි සුඛ නම් **දුක්ඛයති දුක්ඛං කරෝතීති දුක්ඛං** දුක්ඛිත කරයිනුයි දුක්ඛ නම් **සුඛයති සම්පයුත්තං කරජකායඤ්ච අස්සාදං අනුග්ගහිතං කරෝතීති සුඛං** තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් ද කරජ කාය ද ආශ්වාද කරයි අනුග්‍රහ (සැපවත්) කරයිනුයි සුඛ නම් **සුඛයති සයං සුඛාකාරේන පවත්තතීති සුඛං** තෙමේ සැප ආකාරයෙන් පවතීනුයි සුඛ නම් **දුක්ඛයති සම්පයුත්තවත්ථුං කරජකායඤ්ච අනස්සාදං දුක්ඛිතං කරෝතීති දුක්ඛං** සම්ප්‍රයුක්ත වස්තුව ද කරජ කාය ද ආශ්වාද නොකරයි දුකට පමුණුවයිනුයි දුක්ඛ නම් **දුක්ඛයති සයං වා දුක්ඛාකාරෙන පවත්තතීති දුක්ඛං** තෙමේම හෝ දුක් ආකාරයෙන් පවතීනුයි හෝ දුක්ඛ නම්.

**[පරමත්ථවිනිච්ඡය ව්‍යාඛ්‍යා පරිවර්තනයි]**

චක්ඛතීති **චක්ඛු**. තදේතං සසම්භාරචක්ඛුනෝ සේතමණ්ඩලපරික්ඛිත්තස්ස කණ්හමණ්ඩලස්ස මජ්ඣෙ අභිමුඛෙ ඨිතානං සරීරසණ්ඨානුප්පත්තිදේසභූතේ දිට්ඨිමණ්ඩලේ චක්ඛුවිඤ්ඤාණාදීනං යථාරහං වත්ථුද්වාරභාවං සාධයමානං තිට්ඨති. චක්ඛුතෝ පවත්තං විඤ්ඤාණං, චක්ඛුස්ස වා චක්ඛුසන්නිස්සිතං වා විඤ්ඤාණං **චක්ඛුවිඤ්ඤාණං**. සුණාතීති **සෝතං,** තං සසම්භාරසෝතබිලස්ස අන්තෝ තනුතම්බලෝමාචිතේ අඞ්ගුලිවේධකසණ්ඨානේ පදේසේ සෝතවිඤ්ඤාණාදීනං යථාරහං වත්ථුද්වාරභාවං සාධයමානං තිට්ඨති. ඝායතීති **ඝානං,** තං සසම්භාරඝානබිලස්ස අන්තෝ අජපදසණ්ඨානේ පදේසේ ඝානවිඤ්ඤාණාදීනං යථාරහං වත්ථුද්වාරභාවං සාධයමානං තිට්ඨති. ජීවිතං අව්හායතීති **ජිව්හා,** සායනට්ඨේන වා **ජිව්හා**. සා සසම්භාරජිව්හාය අතිඅග්ගමූලපස්සානි වජ්ජෙත්වා උපරිමතලමජ්ඣෙ භින්නඋප්පලදලග්ගසණ්ඨානේ පදේසේ ජිව්හාවිඤ්ඤාණාදීනං යථාරහං වත්ථුද්වාරභාවං සාධයමානා තිට්ඨති.

කුච්ඡිතානං ආසවධම්මානං ආයෝති **කායෝ**. ආයෝති උප්පත්තිදේසෝ. සෝ යාවතා ඉමස්මිං කායේ උපාදින්නපවත්ති නාම අත්ථි, තත්ථ යේභුයේ‍යන කායප්පසාදෝ කායවිඤ්ඤාණාදීනං යථාරහං වත්ථුද්වාරභාවං සාධයමානෝ තිට්ඨති.

**[චූළනිද්දේස අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 88 මෝඝරාජමාණවසුත්ත වණ්ණනා යටතේ); චූළනිද්දේස අටුවා 50-51 පිටු (හේ.වි.මු)]**

**චක්ඛති (විභාවේති)** රූපය දැනගන්නේනුයි **චක්ඛු** චක්‍ෂු නම් වේ **තං ඒතං** ඒ ප්‍රශාද චක්‍ෂුස **සසම්භාරචක්ඛුනෝ** සසම්භාර චක්‍ෂුසගේ **සේතමණ්ඩලපරික්ඛිත්තස්ස** සුදු මණ්ඩලයකින් පරික්‍ෂිප්ත වූ **කණ්හමණ්ඩලස්ස මජ්ඣේ** කළු මණ්ඩලයාගේ මැද **අභිමුඛේ** ඉදිරියෙහි **ඨිතානං** සිටියහුන්ගේ **සරීරසණ්ඨානුප්පත්තිදේසභූතේ** ශරීර සටහන් උපදින දේශය වූ **දිට්ඨිමණ්ඩලේ** දෘෂ්ටි මණ්ඩලයෙහි **චක්ඛුවිඤ්ඤාණාදීනං** චක්‍ෂුර්විඤ්ඤාණාදීන්ට **යථාරහං** සුදුසු පරිදි **වත්ථුද්වාරභාවං සාධයමානං** වස්තු ද්වාර භාවය සිද්ධ කරමින් **තිට්ඨති** සිටි **සුණාති ඉති** අසන්නේනුයි **සෝතං** සෝත නම් **සසම්භාරසෝතබිලස්ස** සසම්භාර කන්බිලයාගේ **අන්තෝ** ඇතුළත **තනුතම්බලෝමාචිතේ** තුනී තඹලෝමයකින් කළ **අඞ්ගුලිවේධකසණ්ඨානේ** ඇඟිලි වෙළුමක සටහන් ඇති **පදේසේ** ප්‍රදේශයෙහි **සෝතවිඤ්ඤාණාදීනං** ශ්‍රෝත්‍රවිඤ්ඤාණාදීන්ට **යථාරහං** සුදුසු පරිදි **වත්ථුද්වාරභාවං** වස්තු ද්වාර භාවය **සාධයමානං** සිද්ධකරමින් **තිට්ඨති** සිටී **ඝායති ඉති** ආඝ්‍රාහණය කරයිනුයි **සසම්භාරඝානබිලස්ස** සසම්භාර ඝ්‍රාණබිලයාගේ **අන්තෝ** ඇතුළත **අජපදසණ්ඨානේ** එළු පා සටහන් ඇති **පදේසේ** ප්‍රදේශයෙහි **ඝානවිඤ්ඤාණාදීනං** ඝ්‍රාණවිඤ්ඤාණාදීන්ට **යථාරහං** සුදුසු පරිදි **වත්ථුද්වාරභාවං** වස්තු ද්වාර භාවය **සාධයමානං** සිදුකරමින් **තිට්ඨති** සිටී **අව්හායතීති** කැඳවන්නේනුයි **ජිව්හා** ජිව්හා නම් වේ **සායනට්ඨේන** රසවිඳින අර්ථයෙන් **ජිව්හා** ජිව්හා නම් **සා** ඒ ජිව්හා ප්‍රශාදය තුමූ **සසම්භාරජිව්හාය** සසම්භාර ජිව්හාවගේ **අතිඅග්ගමූලපස්සානි** ඉතා ළඟවූ ද ඉතා දුරවූ ද ප්‍රදේශය **වජ්ජෙත්වා** හැර **උපරිමතලමජ්ඣේ** දිව මැද **භින්නඋප්පලදලග්ගසණ්ඨානේ** මැදින් සිඳිනලද උපුල් පෙති අග සටහන් ඇති **පදේසේ** ප්‍රදේශයෙහි **ජිව්හාවිඤ්ඤාණාදීනං** ජිව්හාවිඤ්ඤාණාදීන්ට **යථාරහං** සුදුසු පරිදි **වත්ථුද්වාරභාවං** වස්තු ද්වාර භාවය **සාධයමානා** සිද්ධකරමින් **තිට්ඨති** සිටී **කුච්ඡිතානං** පිළිකුල් කටයුතු වූ **ආසවධම්මානං** පාප ධර්මයන්ට **ආයෝ (උප්පත්තිදේසෝ)** හටගැනීමට ස්ථාන වේද **කායෝ** කාය නම් වේ **ඉමස්මිං කායේ පන** මේ කයෙහි වනාහි **උපාදින්නපවත්ති නාම** උපාදින්න ප්‍රවෘත්තිය **යාවතා** යම්තාක් **අත්ථි** ඇත ද **සෝ කායප්පසාදෝ** ඒ කායප්‍රශාදය **කායවිඤ්ඤාණාදීනං** කායවිඤ්ඤාණාදීන්ට **යථාරහං** සුදුසු පරිදි **වත්ථුද්වාරභාවං** වස්තු ද්වාර භාවය **සාධයමානං** සිද්ධකරමින් **තිට්ඨති** සිටී. **[චුල්ලනිද්දේස අටුවා පරිවර්තනයි]**

## අහේතුක චිත්තයන්ගේ ස්වරූපාර්ථයෝ:—

ධම්මුද්දේසාදිතෝ පන චක්ඛුවිඤ්ඤාණේ තාව ඵස්සපඤ්චකං, ඒකග්ගතා, ජීවිතන්ති සරූපේනාගතා සත්ත, යේවාපනකවසේන මනසිකාරෝ ඒකෝ චාති අට්ඨ ධම්මා හොන්ති. සඞ්ගහතෝ පනෙත්ථ ඛන්ධායතනධාතුආහාරින්ද්‍රියවසේන පඤ්චේවසඞ්ගහා. තත්ථ චක්ඛුවිඤ්ඤාණධාතු-ධම්මධාතුවසේන ධාතුසඞ්ගහෝ, මනො-උපෙක්ඛා-ජීවිතින්ද්‍රියවසේන ඉන්ද්‍රියසඞ්ගහෝ ච වේදිතබ්බෝ. සේසං

වුත්තනයමේව. එත්ථ ච විජ්ජමානාපි වේදනා ඣානඞ්ගතං න ගච්ඡති, ඉන්ද්‍රියං පන හෝති. ඒකග්ගතා ඉන්ද්‍රියමග්ගඞ්ගබලභාවම්පි න ගච්ඡති අතිදුබ්බලත්තා. විතක්කපච්ඡිමකං හි ඣානං, හේතුපච්ඡිමකෝ මග්ගෝ, බලඤ්ච. යථා චෙත්ථ, ඒවං සෝතඝානජිව්හාකායවිඤ්ඤාණේසුපි. කේවලං පන සඞ්ගහවාරේ සෝතවිඤ්ඤාණධාතුආදිවසේන ධාතුසඞ්ගහෝ, කායවිඤ්ඤාණේ වේදනාපරිවත්තනඤ්ච විසේසෝ. යථා චෙත්ථ, ඒවං මනෝධාතුයාපි. කේවලං පන විතක්කවිචාරා ද්වේ යේවාපනකා ච අධිමොක්ඛෝති තයෝ ධම්මා අධිකා. සඞ්ගහවාරේ මනෝධාතු-ධම්මධාතුවසේන ධාතුසඞ්ගහෝ, විතක්කවිචාරුපෙක්ඛේකග්ගතාහි චතූහි ඣානඞ්ගසඞ්ගහෝ ච විසේසෝ. පාළියං පනෙත්ථ කිඤ්චාපි ඣානඞ්ගසඞ්ගහෝ න උද්ධටෝ. තථාපි සවිතක්කේසු නියමේන ඣානඞ්ගතාසම්භවතෝ ගහේතබ්බෝව. යථා චෙත්ථ, ඒවං මනෝවිඤ්ඤාණධාතුද්වයේපි. සෝමනස්සසහගතතාය පනෙත්ථ පීති අධිකා, සඞ්ගහවාරේ ච පඤ්චඞ්ගජ්ඣානතා, වේදනාපරිවත්තනං, උභයත්ථාපි මනෝවිඤ්ඤාණධාතු-ධම්මධාතුවසේන ධාතුසඞ්ගහෝ ච විසේසෝ, සේසං තාදිසමේව. **[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා අබ්‍යාකතපදත්ථෝ යටතේ)]**

**ධම්මුද්දේසාදිතෝ පන** ධර්මෝද්දේශාදීන්ගේ වශයෙන් වනාහි **තාව** පළමුව **චක්ඛුවිඤ්ඤාණේ** චක්ෂුර්විඤ්ඤාණයෙහි **ඵස්සපඤ්චකං** ඵස්සය වේදනාවය සඤ්ඤාවය චේතනාවය චිත්තය **ඒකග්ගතා** ඒකාග්‍රතාවය **ජීවිතං ඉති** ජීවිතේන්ද්‍රිය යන **සත්ත** ධර්මයෝ සත්දෙන **සරූපේන** ස්වරූප වශයෙන් **ආගතා** පැමිණෙන ලද්දහ **යේවාපනකවසේන** යේවාපනක වශයෙන් **ඒකෝ මනසිකාරෝ චාති** එකක්ම වූ මනසිකාරය යන **අට්ඨධම්මා** ධර්මයෝ අටදෙනෙකු **හොන්ති** වෙත් **එත්ථ පන** මෙහි වනාහි **සඞ්ගහතෝ** සඞ්ග්‍රහ වශයෙන් **ඛන්ධායතනධාතුආහාරින්ද්‍රියවසේන** ස්කන්ධ ආයතන ධාතු ආහාර ඉන්ද්‍රිය වශයෙන් **පඤ්චේවසඞ්ගහා (හොන්ති)** සඞ්ග්‍රහ පසක්ම වෙත් **තත්ථ** එහි **චක්ඛුවිඤ්ඤාණධාතු** චක්ෂුර්විඤ්ඤාණධාතු **ධම්මධාතුවසේන** ධර්මධාතු වශයෙන් **ධාතුසඞ්ගහෝ** ධාතු සඞ්ග්‍රහය ද **මනෝ-උපෙක්ඛා-ජීවිතින්ද්‍රියවසේන** මනින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය ජීවිතේන්ද්‍රිය වශයෙන් **ඉන්ද්‍රියසඞ්ගහෝ ච** ඉන්ද්‍රිය සඞ්ග්‍රය ද **වේදිතබ්බෝ** දතයුතුයි **සේසං** සෙස්ස **වුත්තනයමේව** කියනලද ක්‍රමයමැයි **එත්ථ ච** මෙහි ද **විජ්ජමානාපි වේදනා** විද්‍යමාන වූ වේදනාව ද **ඣානඞ්ගගතං න ගච්ඡති** ධ්‍යානාඞ්ග සඞ්ඛ්‍යාවට නොයයි **ඉන්ද්‍රියං පන හෝති** ඉන්ද්‍රිය ධර්මයක් වෙයි **අතිදුබ්බලත්තා** ඉතා දුර්වල බැවින් **ඒකාග්ගතා** ඒකාග්‍රතාවය **ඉන්ද්‍රිය-මග්ගඞ්ග-බලභාවම්පි** ඉන්ද්‍රියඞ්ග මාර්ගාඞ්ග බලඞ්ග භාවයට ද **න ගච්ඡති** නොයයි **හි (සච්චං)** සැබෑවකි **විතක්කපච්ඡිමකං** විතර්කය පච්ඡිමක කොට ඇත්තේ **ඣානං** ධ්‍යානාඞ්ගයි **හේතුපච්ඡිමකෝ** හේතු පච්ඡිමක කොට ඇත්තේ **මග්ගෝ ච** මාර්ගාඞ්ග ද **බලඤ්ච** බලාඞ්ග ද **(හෝති** වෙයි) **එත්ථ** මෙහි **යථා ච** යම්සේ ද **සෝතඝානජිව්හාකායවිඤ්ඤාණේසුපි** ශ්‍රෝත්‍රවිඤ්ඤාණ ඝ්‍රාණවිඤ්ඤාණ ජිව්හාවිඤ්ඤාණ කායවිඤ්ඤාණ ආදියෙහි ද **ඒවං** මෙසේය **කේවලං පන** හුදෙක් වනාහි **සඞ්ගහවාරේ** සඞ්ග්‍රහ වාරයෙහි **සෝතවිඤ්ඤාණධාතුආදිවසේන** ශ්‍රෝත්‍රවිඤ්ඤාණධාතු ආදී වශයෙන් **ධාතුසඞ්ගහෝ** ධාතු සඞ්ග්‍රහයයි **කායවිඤ්ඤාණේ** කායවිඤ්ඤාණයෙහි **වේදනාපරිවත්තනඤ්ච** වේදනාවගේ පරිවර්තනය ද **විසේසෝ** විශේෂයයි **එත්ථ** මෙහි **යථා ච** යම්සේ ද **මනෝධාතුයාපි** මනෝධාතුවෙහි ද **ඒවං** මෙසේය **කේවලං පන** හුදෙක් වනාහි **විතක්කවිචාරද්වේ ච** විතර්ක විචාර දෙදෙන ද **අධිමොක්ඛෝති** අධිමෝක්ෂය ද යන **තයෝ යේවාපනකා ධම්මා** යේවාපනක ධර්ම තිදෙන **අධිකා (හොන්ති)** අධික වෙත් **සඞ්ගවාරේ** සඞ්ග්‍රහ

වාරයෙහි **මනෝධාතුධම්මධාතුවසේන** මනෝධාතු ධර්මධාතු වශයෙන් **ධාතුසඞ්ගහෝ (හෝති)** ධාතු සඞ්ග්‍රහය වෙයි **විතක්කවිචාරුපෙක්ඛේකග්ගතාහි චතූහි** විතර්ක විචාර උපෙක්ඛා ඒකාග්‍රතා යන ධර්ම සතරෙන් **ඣානසඞ්ගහෝ ච** ධ්‍යානසඞ්ග්‍රහය ද **විසේසෝ** විශේෂයයි **එත්ථ පන** මෙහි වනාහි **පාළියං** පෙළෙහි **කිඤ්චාපි** කිසිසේත් **ඣානසඞ්ගහෝ** ධ්‍යාන සඞ්ග්‍රහයක් **න උද්ධටෝ** නොම උදුරනලදි **තථාපි** එසේම **සවිතක්කේසු** විතර්ක සහිත ධර්මයන්හි **නියමේන** නියමකිරීමෙන් **ඣානඞ්ගතාසම්භවතෝ** ධ්‍යානඞ්ගධර්මයන්ගෙන් යුක්තව හටගැනීම **ගහේතබ්බෝව** ගතයුත්තේමය **එත්ථ** මෙහි **යථා ච** යම්සේ ද **මනෝවිඤ්ඤාණධාතුද්වයේපි** මනෝවිඤ්ඤාධාතු දෙකෙහි ද **ඒවං** මෙසේමය **එත්ථ පන** මෙහි වනාහි **සෝමනස්සසහගතතාය** සෝමනස්සයෙන් යුක්ත බැවින් **පීති අධිකා** ප්‍රීතිය අධිකය **සඞ්ගහවාරේ ච** සඞ්ග්‍රහ වාරයෙහි **පඤ්චඞ්ගජ්ඣානතා ච** අඞ්ග පසකින් යුතු ධ්‍යාන බැවින් ද **වේදනාපරිවත්තනං ච** වේදනාවගේ පරිවර්තනය ද **උභයත්ථාපි** දෙතැනෙහිම **මනෝවිඤ්ඤාණධාතු-ධම්මධාතුවසේන** මනෝවිඤ්ඤාණධාතු ධම්මධාතු වශයෙන් **ධාතුසඞ්ගහෝ ච විසේසෝ** ධාතු සඞ්ග්‍රහය ද විශේෂයයි **සේසං** සෙස්ස **තාදිසමේව** එබඳුමය. **[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

# කාමාවචර සෝභනචිත්ත සඞ්ග්‍රහය

## කුසල පදය විස්තර කර ඇති අයුරුː—

**'කුසල'**-සද්දෝ තාව ආරෝග්‍යඅනවජ්ජඡේකසුඛවිපාකේසු දිස්සති. අයඤ්හි "කච්චි නු භෝතෝ කුසලං, කච්චි භෝතෝ අනාමය"න්තිආදීසු (ජා. 1.15.146; 2.20.129) ආරෝග්‍යෙ දිස්සති. "කතමෝ පන, භන්තේ, කායසමාචාරෝ කුසලෝ? යෝ ඛෝ, මහාරාජ, කායසමාචාරෝ අනවජ්ජෝ"ති (ම. නි. 2.361) ච, "අපරං පන, භන්තේ, ඒතදනුත්තරියං යථා භගවා ධම්මං දේසේති කුසලේසු ධම්මේසූ"ති (දී. නි. 3.145) ච ඒවමාදීසු අනවජ්ජේ. "කුසලෝ ත්වං රථස්ස අඞ්ගපච්චඞ්ගානං" (ම. නි. 2.87), "කුසලා නච්චගීතස්ස සික්ඛිතා චාතුරිත්ථියෝ"තිආදීසු (ජා. 2.22.94) ඡේකේ. "කුසලානං, භික්ඛවේ, ධම්මානං සමාදානහේතු" (දී. නි. 3.80), "කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා"තිආදීසු (ධ. ස. 431) සුඛවිපාකේ. ස්වායමිධ ආරෝග්‍යෙපි අනවජ්ජේපි සුඛවිපාකේපි වත්තති.

වචනත්ථෝ පනෙත්ථ; කුච්ඡිතේ පාපකේ ධම්මේ සලයන්ති චලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්තීති කුසලා. කුච්ඡිතේන වා ආකාරේන සයන්තීති කුසා. තේ අකුසලසඞ්ඛාතේ කුසේ ලුනන්ති ඡින්දන්තීති කුසලා. කුච්ඡිතානං වා සානතෝ තනුකරණතෝ ඕසානකරණතෝ ඤාණං කුසං නාම. තේන කුසේන ලාතබ්බාති කුසලා; ගහේතබ්බා පවත්තේතබ්බාති අත්ථෝ. යථා වා කුසා උභයභාගගතං හත්ථප්පදේසං ලුනන්ති, ඒවමිමේපි උප්පන්නානුප්පන්නභාවේන උභයභාගගතං කිලේසපක්ඛං ලුනන්ති. තස්මා කුසා විය ලුනන්තීතිපි **කුසලා**.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා තිකමාතිකාපද වණ්ණනා අංක 01 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 62-63 පිටු (හේ.වි.මු); අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා කුසලත්තික වණ්ණනා යටතේ); අභිධර්ම මධු බින්දුව 03 පිට; සද්ධර්මසාගරය 03/586 පිට]**

"කච්චි නු භෝතෝ කුසල"න්ති ඒවං පුච්ඡිතමේවත්ථං පාකටං කත්වා පුච්ඡිතුං "කච්චි භෝතෝ අනාමය"න්ති වුත්තං, තස්මා කුසලසද්දෝ අනාමයත්ථෝ හෝති. **බාහිතිකසුත්තේ** (ම. නි. 2.361) භගවතෝ කායසමාචාරාදයෝ වණ්ණෙන්තේන

ධම්මභණ්ඩාගාරිකේන "යෝ ඛෝ, මහාරාජ, කායසමාචාරෝ අනවජ්ජෝ"ති කුසලෝ කායසමාචාරෝ වුත්තෝ. න හි භගවතෝ සුඛවිපාකං කම්මං අත්ථීති සබ්බසාවජ්ජරහිතා කායසමාචාරාදයෝ කුසලාති වුත්තා. **කුසලේසු ධම්මේසූති** ච බෝධිපක්ඛියධම්මා "කුසලා"ති වුත්තා. තේ ච විපස්සනාමග්ගඵලසම්පයුත්තා න ඒකන්තේන සුඛවිපාකායේවාති අනවජ්ජත්ථෝ කුසලසද්දෝ. **අඞ්ගපච්චඞ්ගාන**න්ති කුසලසද්දයෝගේන භුම්මත්ථේ සාමිවචනං, අඞ්ගපච්චඞ්ගානං වා නාමකිරියාපයෝජනාදීසූති අත්ථෝ. **නච්චගීතස්සාති** ච සාමිවචනං භුම්මත්ථේ, නච්චගීතස්ස විසේසේසූති වා යෝජේතබ්බං. කුසලානං ධම්මානං සමාදනහේතු ඒවමිදං පුඤ්ඤං පවඩ්ඪතීති පුඤ්ඤවිපාකනිබ්බත්තකකම්මං "කුසල"න්ති වුත්තං. **ධම්මා හොන්තීති** සුඤ්ඤධම්මත්තා සභාවමත්තා හොන්තීති අත්ථෝ. ඒවං **ධම්මේසු ධම්මානුපස්සීති** එත්ථාපි සුඤ්ඤතත්ථෝ ධම්මසද්දෝ දට්ඨබ්බෝ.

**සලයන්ති**…**පෙ**…. **විද්ධංසෙන්තීති** එත්ථ පුරිමස්ස පුරිමස්ස පච්ඡිමං පච්ඡිමං අත්ථවචනං. අථ වා සලනස්ස අත්ථදීපනානි චලනාදීනි තීණි තදඞ්ගප්පහානාදීහි යෝජේතබ්බානි. අප්පහීනභාවේන සන්තානේ සයමානා අකුසලා ධම්මා රාගාදිඅසුචිසම්පයෝගතෝ නානාවිධදුක්ඛහේතුතෝ ච **කුච්ඡිතේන ආකාරේන සයන්ති**. ඤාණවිප්පයුත්තානම්පි ඤාණං උපනිස්සයපච්චයෝ හෝතීති සබ්බේපි කුසලා ධම්මා **කුසේන** ඤාණේන පවත්තේතබ්බාති **කුසලා**. උප්පන්නංසානුප්පන්නංසභාගෙසු සඞ්ගහිතත්තා **උභයභාගගතං සංකිලේසපක්ඛං** පහානානුප්පාදනේහි **ලුනන්ති** සම්මප්පධානද්වයං විය.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා තිකමාතිකාපද වණ්ණනා අංක 01 යටතේ)]**

**අනවජ්ජත්ථෝ** අවජ්ජවිරහත්ථෝ. **නාමං** සඤ්ඤා, **කිරියා** කරණං, **පයෝජනං** රථරථඞ්ගවිභාවනේන තේසං පකාරතෝ යෝජනං. කුසේන ඤාණේන ලාතබ්බාති කුසලාති අයමත්ථෝ ඤාණසම්පයුත්තානං තාව හෝතු, ඤාණවිප්පයුත්තානං කථන්ති ආහ **"ඤාණවිප්පයුත්තානම්පී"**තිආදි. ඤාණවිප්පයුත්තාපි හි ඤාණේනේව පවත්තියන්ති හිතසුඛහේතුභූතාය පවත්තියා පඤ්ඤවන්තානං පටිපත්තිභාවතෝ. න හි අන්තරේන යෝනිසෝමනසිකාරං කුසලුප්පත්ති අත්ථීති. "යදි කුසලස්ස උභයභාගගතං සංකිලේසලවනං පාකටං සියා, කුසා විය ලුනන්තීති කුසලාති අයමත්ථෝ යුත්තෝ සියා"ති කෝචි වදෙය්‍යාති ආසඞ්කාය ආහ **"සම්මප්පධානද්වයං වියා"**ති. **[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා තිකමාතිකාපද වණ්ණනා අංක 01 යටතේ)]**

**තාව** පළමු කොට වදරන ලද්දවූ **කුසලසද්දෝ** කුසල ශබ්ද තෙමේ **ආරෝග්‍යානවජ්ජඡේකසුඛවිපාකේසු** ආරෝග්‍යාර්ථ අනවද්‍යාර්ථ ඡේකාර්ථය ඉෂ්ට විපාක ඇත්තාවූ නාමස්කන්ධය (හෙවත්) ඉෂ්ට වූ නාමස්කන්ධ සඞ්ඛ්‍යාත විපාක ඇත්තේය යනාර්ථය යන මෙතෙක් අර්ථයෙහි **දිස්සති** දක්නා ලැබේ (හි යනු විස්තරාර්ථ නිපාතයි) **අයං කුසලසද්දෝ** මේ කුසල ශබ්ද තෙමේ **කච්චිනු භෝතෝ** -පෙ- **අනාමයං ආදීසු** කච්චිනු -පෙ- අනාමයං යනාදී උදහරණයෙහි **අරෝග්‍ය** නිරෝගී බැව් සඞ්ඛ්‍යාත අර්ථයෙහි **දිස්සති** දක්නා ලැබේ (**කච්චි?** කිමෙක්ද? **භෝතෝ** පිංවත්හට **කුසලං අත්ථිනු** නිරෝගී බැව් ඇත්තේ ද? **කච්චි?** කිමෙක් ද? **භෝතෝ** පිංවත් හට **අනාමයං** ලෙඩින් පහවූ බව **අත්ථිනු** ඇත්තේ ද? **අනාමයං** දුකින් පහවූ බව **අත්ථිනු** ඇත්තේ ද? යනු උදහරණාර්ථයි) **කතමෝ පන** -පෙ- **ධම්මේසූති ච** කතමෝ -පෙ- ධම්මේසු යනු ද **ඉති ඒවමාදීසු** මේ ආදී තුන් පෙදෙහි **අනවජ්ජේ දිස්සති** අනවද්‍යාර්ථයෙහි දක්නා ලැබේ (උදහරණාර්ථ මෙසේය) **භන්තේ** වහන්ස

ආනන්දයෙනි **භගවතෝ** භාග්‍යවතුන් වහන්සේගේ **කතමෝ පන කායසමාචාරෝ** කවර නම් කායද්වාරයෙහි හටගත්තා වූ සමාචාරයක් තෙමේ **කුසලෝ** නිරවද්‍ය වන්නේ ද? **මහාරාජ** මහරජ **භගවතෝ** භාග්‍යවතුන් වහන්සේගේ **ඛෝ** ඒකාන්තයෙන් **යෝ කායසමාචාරෝ** කායද්වාරයෙහි හටගත්තා වූ යම් සමාචාරයෙක් තෙමේ **අනවජ්ජෝ** නිරවද්‍ය වූයේද **සෝ කායසමාචාරෝ** ඒ අනවද්‍ය වූ කායද්වාරයෙහි හටගත්තා වූ සමාචාර තෙමේ **කුසලෝ** කුසල් නම් වේ **භන්තේ** ස්වාමීණි භාග්‍යවතුන් වහන්ස **අපරං** අන්‍යවූ **ඒතං** මේ මතු වක්‍ෂමාන වනු ලබන්නා වූ **අනුත්තරියං** අනුත්තර බවෙක් ඇත්තේ වේද **යථා** යම් ආකාරයෙකින් **යාය** යම් දේශනාවක් කරණකොටගෙන **භගවා** භාග්‍යවතුන් වහන්සේ **ධම්මං දේසේති** ධර්මය දේශනා කළ සේක් ද **තුම්හාකං** නුඹවහන්සේලාගේ **සා දේසනා** ඒ දේශනා තොමෝ **අනුත්තරා සෙට්ඨා** උතුම් වන්නීය **තාය දේසනාය** ඒ දේශනාව කරණකොටගෙන **දේසිතේසු** දේශනා කරනලද **කුසලේසු** අනවද්‍ය වූ **ධම්මේසු** බෝධිපාක්‍ෂික ධර්මයන් නිමිතිකොට ගෙනද **භගවා** භාග්‍යවතුන් වහන්සේ **අනුත්තරෝ සෙට්ඨෝ** උතුම් වන්නේයි (මේ වනාහි දීර්ඝනිකායාගත සම්පසාදනී සූත්‍රයෙහි පාඨයෙකි. ඒ පාඨය ද "අපරං පන භන්තේ ඒතදනුත්තරියං" යනාදි පාළිය පරිද්දෙන් අර්ථ දක්වන ලදි. අට්ඨකථායං "පුන ච පරං භන්ත ඒකදනුත්තරියන්ති" පාඨෝ ආගතෝ. "ඉමං පන පාඨං ගහෙත්වා ඒකද අනුත්තරියං පදච්ඡේදෝති වදන්ති කේචි සම්පසාදනියසුත්තේ පන අපරං පන භන්තේ ඒතද අනුත්තරියන්ති පාඨෝයේව වුත්තෝ අට්ඨකථායං ච ඉදනි දිවාට්ඨානේ නිසීදිත්වා සමාපජ්ජිතේ සෝළසඅපරාපරියධම්මේ දේසේතුං අපරම්පන භන්තේ ඒතද අනුත්තරියන්ති දේසනාමාරභීති වුත්තං. තත්ථ භන්තේ භගවා භගවතෝ අපරං ඒතද අනුත්තරියං අඤ්ඤො ඒසෝ චක්ඛමානෝ අනුත්තරභාවෝ සෙට්ඨභාවෝ අත්ථීති අත්ථෝ" යනු මණිදීපටීකායි) **කුසලෝ ත්වං** -පෙ- **චාතුරිත්ථියෝති ආදීසු** කුසලෝ -පෙ- ආදීසු යනාදී උදහරණයෙහි **ඡේකේ** දක්‍ෂාර්ථයෙහි **දිස්සති** දක්නා ලැබේ (උදහරණාර්ථ මෙසේයි) **ත්වං** නුඹ **රථස්ස** රථයාගේ **අඞ්ගපච්චඞ්ගානං** අඞ්ග ප්‍රත්‍යඞ්ගයන් සම්බන්ධව **නාමකිරියාපයෝජනාදීසු** නාමය ක්‍රියාවය යෙදීමය යනාදීයෙහි **කුසලෝ** දක්‍ෂ වෙයි **නච්චගීතස්ස** නෘත්‍යගීතයට (නොහොත්) නෘත්‍යගීතයාගේ **විසේසේසු** විචිත්‍ර විශේෂයෙහි **කුසලා** දක්‍ෂ වූ **චාතුරා** චතුර ස්වභාවය ඇත්තාවූ **ඉත්ථියෝ** ස්ත්‍රීහු වෙත් ("අඞ්ගීයති ඤායති ලක්ඛීයති වා රථසඞ්ඛාතෝ සමුදයෝ ඒතේනාති අඞ්ගං චක්කඅක්ඛයුගාදිකං මහන්තඞ්ගං පතිඛුද්දකං අඞ්ගං පච්චඞ්ගං නේමිඅරස්සාදිකං ඛුද්දකඞ්ගං අඞ්ගපච්චඞ්ගාදී නමීයන්ති වෝහරීයන්ති පඤ්ඤායන්ති වා ඒතේනාති නාමං චක්කඅක්ඛයුගාදිං නේමිඅරස්සාදිකා සඤ්ඤා වාසිනිඛාදනාදීහි උපකරණේහි තච්ඡනවිජ්ජනාදිනා තේසං කරණං කිරියා තස්මිං තස්මිං යුත්තට්ඨානේ තේසං චක්කඅක්ඛනේමිඅරාදීනං නානාප්පකාරේන පයෝජනං ඨපනං අඤ්ඤමඤ්ඤේන වා පටිසන්ධහනං පයෝජනං" යනු මණිදීපටීකායි) **කුසලානං භික්ඛවේ** -පෙ- **උපචිත්තාති ආදීසු** කුසලානං -පෙ- ආදීසු යනාදී උදහරණයෙහි **සුඛවිපාකේ** ඉෂ්ට වූ නාමස්කන්ධ සඞ්ඛ්‍යාත විපාක ඇත්තාවූ අර්ථයෙහි **දිස්සති** දක්නා ලැබේ (උදහරණාර්ථ මෙසේයි) **භික්ඛවේ** මහණෙනි **කුසලානං** ඉෂ්ට වූ නාමස්කන්ධ සඞ්ඛ්‍යාත විපාක ඇත්තාවූ **ධම්මානං** ධර්මයන් **සමාදානහේතු** සමාදන් වීම් සඞ්ඛ්‍යාත කාරණයෙන් **ඒවං ඉදං පුඤ්ඤං පුඤ්ඤඵලං** මේ කුසලය හා කුසලවිපාකය ද **පවඩ්ඪීති** ප්‍රකර්ෂයෙන් වර්ධනය වේ **කුසලස්ස** ඉෂ්ට විපාක සඞ්ඛ්‍යාත නාමස්කන්ධය ඇත්තා වූ **කම්මස්ස** කර්මය **කතත්තා** කරනලද බැවින් **උපචිතත්තා** රැස්කරනලද බැවින් **චක්ඛුවිඤ්ඤාණං** චක්‍ෂුර්විඤ්ඤාණ තෙමේ **උප්පන්නං හෝති** ක්‍ෂණත්‍රයට පැමිණියේ වෙයි ("ඒවමිදං පුඤ්ඤං පවඩ්ඪති" යනු ටීකා පාඨයෙන් අවශිෂ්ට වූ පාඨ ශේෂයක්

වෙයි. "පුඤ්ඤඤ්ච පුඤ්ඤඵලඤ්ච පුඤ්ඤං" යි ඒකශේෂ සමාස කරනු. "පුඤ්ඤඵලන්ති ච උපරූපරිපුඤ්ඤන්ති පුඤ්ඤවිපාකෝපි වේදිතබ්බෝ" යනු චක්කවත්තිසීහනාද අර්ථකථායි) **සෝ අයං කුසලසද්දෝ** මේ කුසල ශබ්ද තෙමේ **ඉධ** මේ **කුසලා ධම්මා** යන පදයෙහි **ආරෝග්‍යේපි** නිරෝගී බැව් සඞ්ඛ්‍යාත අර්ථයෙහි ද **අනවජ්ජේපි** නිරවද්‍යාර්ථයෙහි ද **සුඛවිපාකේපි** ඉෂ්ට වූ නාමස්කන්ධ සඞ්ඛ්‍යාත විපාක ඇත්තේය යන අර්ථයෙහි ද (නොහොත්) ඉෂ්ට වූ නාමස්කන්ධයන් උපදවන ස්වභාව ඇත්තේය යනාර්ථයෙහි ද **වට්ටති** යෙදෙන්නේයි ("සුඛෝ ඉට්ඨෝ විපාකෝ යස්සාති සුඛවිපාකෝ" යන නිර්වචනය පළමුවෙනි අර්ථයෙහි ද "විපච්චනං විපාකෝ සුඛස්ස විපාකෝ යස්සාති සුඛවිපාකෝ" යන නිර්වචනය දෙවෙනි අර්ථයෙහි ද යෙදෙන්නේ යැයි දතයුතුයි)

**පන** අර්ථෝද්ධාරයෙන් අන්‍යවූ වචනාර්ථය කියම් **එතථ** මේ කුසලා ධම්මා යන පදයෙහි **වචනත්ථෝ** වචනාර්ථය (**ඒවං** මේ මතු කියනු ලබන්නාවූ ක්‍රමයෙන් **වේදිතබ්බෝ** දතයුත්තේයි) **යේ ධම්මා** යම් ධර්මකෙනෙක් තුමූ **කුච්ඡිතේ** ප්‍රාඥයන් විසින් පිළිකුල් කරන ලද්දවූ (හෙවත්) ගරහන ලද්දවූ **පාපකේ** ලාමක වූ **ධම්මේ** ධර්මයන් **සලයන්ති චලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්ති** විනාශ කරන්නාහු වෙත් ද **ඉති (තස්මා)** එසේ හෙයින් **තේ ධම්මා** ඒ ධර්මයෝ තුමූ **කුසලා** කුසල නම් වෙත් (විකල්පාර්ථ මෙසේයි) **යේ ධම්මා** යම් ධර්ම කෙනෙක් තුමූ **කුච්ඡිතේ** නුවණැත්තන් විසින් පිළිකුල් කටයුතු වූ **පාපකේ ධම්මේ** ලාමක ධර්මයන් **සලයන්ති චලයන්ති** තදඞ්ග ප්‍රහාණ වශයෙන් චලනය කරන්නාහු වෙත් ද **සලයන්ති කම්පෙන්ති** විෂ්කම්භන ප්‍රහාණ වශයෙන් අතිශයින් චලනය කරන්නාහු වෙත් ද **සලයන්ති විද්ධංසෙන්ති** සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් විනාශ කරන්නාහු වෙත් ද **ඉති (තස්මා)** එසේහෙයින් **තේ ධම්මා** ඒ ධර්මයෝ තුමූ **කුසලා** කුසල නම් වෙත්.

**වා** නොහොත් අනික් ක්‍රමයන් කියනු ලැබේ (**යේ ධම්මා** යම් ධර්ම කෙනෙක් තුමූ **රාගාදී අසුචිසම්පයෝගතෝ** අමේධ්‍යක් මෙන් ප්‍රාඥයන් විසින් පිළිකුල් කටයුතු වූ රාගාදී සංකිලේසික ධර්ම සඞ්ඛ්‍යාත වූ අසුචිය හා යෙදුනු හෙයින් ද **නානාවිධදුක්ඛහේතුතෝ ච** නන්වැදෑරුම් දුකට මූල කාරණා හෙයින් ද) **කුච්ඡිතේන** පිළිකුල් කටයුතු වූ **ආකාරේන** ආකාරයෙන් ("සන්තානේ" යනු ආධ්‍යාහාරයි) **සන්තානේ** සත්‍වයන්ගේ චිත්ත සන්තානේ **සයන්ති** හටගන්නාහු වෙත් ද **ඉති (තස්මා)** එසේහෙයින් **තේ ධම්මා** ඒ ධර්මයෝ තුමූ **කුසා** කුස නම් වෙත් **අකුසලධම්මසඞ්ඛාතේ** අකුසල ධර්මයයි කියන ලද්දවූ **තේ කුසේ** ඒ ප්‍රතිකූලාකාරයෙන් චිත්තපරම්පරාවෙහි හටගන්නා වූ ධර්මයන් **ලුනන්ති ඡින්දති** සිඳින්නාහු වෙත් ද **ඉති (තස්මා)** එසේහෙයින් **තේ ධම්මා** ඒ ධර්මයෝ තුමූ **කුසලා** කුසල නම් වෙත්.

**වා** අනික් ක්‍රමයක් කියනු ලැබේ **කුච්ඡිතානං** ප්‍රාඥයන් විසින් පිළිකුල් කරණ ලද්දවූ (නොහොත්) ගරහන ලද්දවූ අකුසලයන්ගේ **සානතෝ තනුකරණතෝ** තුනී බව (හෙවත්) විරියන බව කරන හෙයින් ද **වා** නොහොත් **ඕසානකරණතෝ** නැවත නූපදනා පරිද්දෙන් විනාශ කරණ හෙයින් **ඤාණං** ප්‍රඥාව **කුසං නාම** කුස නම් වෙයි **යේ ධම්මා** යම් ධර්ම කෙනෙක් තුමූ **කුසේන** කුස නම් ඇත්තා වූ **තේන ඤාණේන** ඒ ප්‍රඥාව විසින් **ලාතබ්බා** ගතයුත්තාහු ද (නොහොත්) ඉපදවිය යුත්තාහු ද **ඉති (තස්මා)** එසේහෙයින් **තේ ධම්මා** ඒ ධර්මයෝ තුමූ **කුසලා** කුසල නම් වෙත් **ගහේතබ්බා** ගතයුත්තාහුය **පවත්තේතබ්බා** ඉපදවිය යුත්තාහුය **ඉති (අයං)** මේ වනාහි **අත්ථෝ** අර්ථයි.

**වා** අනිකුදු ක්‍රමයක් කියම් **කුසා** කුස නම් වූ තෘණයෝ තුමූ **උභයභාගගතං** දෙපාර්ශවයට පැමිණියාවූ **හත්ථප්පදේසං** හස්ත ප්‍රදේශය **ලුනන්ති යථා** යම්සේ සිඳිත් ද **ඒවං** එපරිද්දෙන් **ඉමේපි** මේ කුසල ධර්මයෝ ද **උප්පනානුප්පන්නභාවේන** උපන්නා වූ අකුසල් හා සදෘශ වූ අනාගත වූ අකුසලය උපන්නා වූ අකුසල් හා විසදෘශ වූ අනාගත වූ අකුසලය යන මොහුන්ගේ ස්වභාවයෙන් **උභයභාගගතං** දේපාර්ශවයෙහි පිහිටියා වූ **සංකිලේසපක්ඛං** සංකිලේශික වූ අකුසල පක්‍ෂය **ලුනන්ති** සිඳින්නාහු වෙත් **තස්මා** එසේහෙයින් **යේ ධම්මා** යම් ධර්ම කෙනෙක් තුමූ **කුසා** කුස නම් වූ තෘණයෝ **උභයභාගගතං** දෙපාර්ශවයෙහි පිහිටියා වූ (හෙවත්) මිටින් ගන්නා ලද්දවූ **හත්ථප්පදේසං ලුනන්ති විය** හස්ත ප්‍රදේශය සිඳින්නාහු මෙන් **ලුනන්ති** සිඳින්නාහු ද **ඉතිපි** මේ අර්ථයෙන් ද **තේ ධම්මා** ඒ ධර්මයෝ තුමූ **කුසලා** කුසල නම් වෙත් (සල-ධාතුහුගේ හිංසන අපනයන සංවර්ණාදී අර්ථයෙහි ද වියයුතු හෙයින් ඒ අර්ථයන් වළක්වනු පිණිස "සලයන්ති" යන්න "චලයන්ති" යන්නෙන් වර්ණනා කෙළේයි. චල-ධාතුහුගේ ද පචලා යනාදී අර්ථයන් වළක්වනු පිණිස "කම්පෙන්ති" යනුවෙන් වර්ණනා කෙළේයි. කම්ප-ධාතුහුගේ ද එන්දනාදී අර්ථයන් වළක්වනු පිණිස "විද්ධංසෙන්ති" යනුවෙන් වර්ණනා කෙළේයි) එහෙයින් ටීකායෙහි "සලයන්ති -පෙ- විද්ධංසෙන්ති එතථ පුරිමස්ස පුරිමස්ස පච්ඡිමං පච්ඡිමං අත්ථවචනං" යනු කීහ. "අථවා සලනස්ස අත්ථදීපනානි චලනාදීනි තීණි තදඞ්ගප්පහානාදීහි යෝජේතබ්බානි" යනුද ටීකායි.

**[අත්ථශාලිනී අර්ථකථා සන්නය 200-204 පිටු]**

**කුසල**න්ති කුච්ඡිතානං සලනාදීහි අත්ථේහි කුසලං. අපිච ආරෝග්‍යට්ඨේන අනවජ්ජට්ඨේන කෝසල්ලසම්භූතට්ඨේන ච කුසලං. යථේව හි 'කච්චි නු භෝතෝ කුසල'න්ති (ජා. 1.15.146; 2.20.129) රූපකායේ අනාතුරතාය අගේලඤ්ඤේන නිබ්‍යාධිතාය ආරෝග්‍යට්ඨේන කුසලං වුත්තං, ඒවං අරූපධම්මේපි කිලේසාතුරතාය කිලේසගේලඤ්ඤස්ස ච කිලේසබ්‍යාධිනෝ අභාවේන ආරෝග්‍යට්ඨේන කුසලං වේදිතබ්බං. කිලේසවජ්ජස්ස පන කිලේසදෝසස්ස කිලේසදරථස්ස ච අභාවා අනවජ්ජට්ඨේන කුසලං. කෝසල්ලං වුච්චති පඤ්ඤා; කෝසල්ලතෝ සම්භූතත්තා කෝසල්ලසම්භූතට්ඨේන කුසලං.

'ඤාණසම්පයුත්තං' තාව ඒවං හෝතු; ඤාණවිප්පයුත්තං කථන්ති. තම්පි රුළ්හීසද්දේන කුසලමේව. යථා හි තාලපණ්ණේහි අකත්වා කිලඤ්ජාදීහි කතම්පි තං සරික්ඛත්තා රුළ්හීසද්දේන තාලවණ්ටන්ත්වේව වුච්චති, ඒවං 'ඤාණවිප්පයුත්ත'ම්පි කුසලන්ත්වේව වේදිතබ්බං. නිප්පරියායේන පන 'ඤාණසම්පයුත්තං' ආරෝග්‍යට්ඨේන අනවජ්ජට්ඨේන කෝසල්ලසම්භූතට්ඨේනාති තිවිධේනපි කුසලන්ති නාමං ලභති, ඤාණවිප්පයුත්තං දුවිධේනේව. ඉති යඤ්ච ජාතකපරියායේන යඤ්ච බාහිතිකසුත්තපරියායේන යඤ්ච අභිධම්මපරියායේන කුසලං කථිතං සබ්බං තං තීහිපි අත්ථේහි ඉමස්මිං චිත්තේ ලබ්භති.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 01 කාමාවචරකුසලපද භාජනීයං යටතේ); ධම්මසඞ්ගණී අටුවා 80-81 පිටු (හේ.වි.මු)]**

**රුළ්හීසද්දේනා**ති ඤාණසම්පයුත්තේසු රුළ්හේන සද්දේන, ඤාණසම්පයුත්තේසු වා පවත්තිත්වා අනවජ්ජසුඛවිපාකතාය තං සදිසේසු ඤාණවිප්පයුත්තේසු රුළ්හේන සද්දේන. අථ වා කිඤ්චි නිමිත්තං ගහෙත්වා සතිපි අඤ්ඤස්මිං තං නිමිත්තයුත්තේ කිස්මිඤ්චිදේව විසයේ සම්මුතියා චිරකාලතාවසේන නිමිත්තවිරහේපි පවත්ති රුළ්හී නාම යථා "මහියං සේතීති මහිංසෝ, ගච්ඡන්තීති

ගාවෝ"ති, ඒවං කුසලසද්දස්සපි රුළ්හිභාවෝ වේදිතබ්බෝ. පඤ්ඤදනිද්දේසේ "කෝසල්ල"න්ති අභිධම්මේ (ධ. ස. 16) වුත්තං, තස්ස ච භාවා කුසලසද්දප්පවත්තීති කෝසල්ලයෝගා කුසලන්ති අයං අභිධම්මපරියායෝ හෝති. **කුසල**න්ති කුසලභාවං ආහ. **[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 01 කාමාවචරකුසලපද භාජනීය වණ්ණනා යටතේ)]**

තත්ථ **කුසලං** භූමිභේදතෝ චතුබ්බිධං කාමාවචරං රූපාවචරං අරූපාවචරං ලෝකුත්තරඤ්ච.
**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 452 යටතේ); විසුද්ධිමග්ග අටුවා 338 පිටු (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය විඤ්ඤාණස්කන්ධය 194 පිට (තායිවාන් මුද්‍රණය)]**

**තත්ථ** එහි **කුසලං** කුශලය **කාමාවචරං** කාමාවචරය **රූපාවචරං** රූපාවචරය **අරූපාවචරං** අරූපාවචරය **ලෝකුත්තරං** ලෝකෝත්තරය යයි **භූමිතෝ** භූමි වශයෙන් **චතුබ්බිධං** සතර වැදෑරුම් (**හෝති** වේ) **[විසුද්ධි මාර්ග පරිවර්තනයි]**

තත්ථ කුසලට්ඨේන **කුසලං**. කෝයං කුසලට්ඨෝ නාම? ආරෝග්‍යට්ඨෝ අනවජ්ජට්ඨෝ සුඛවිපාකට්ඨෝ. ආරෝග්‍යට්ඨේනාපි හි කුසලං වුච්චති "කච්චි නු භෝතෝ කුසල"න්තිආදීසු (ජා. 1.15.146; 2.20.129). අනවජ්ජට්ඨේනාපි "කතමෝ පන, භන්තේ, කුසලෝ කායසමාචාරෝ? යෝ ඛෝ, මහාරාජ, අනවජ්ජෝ කායසමාචාරෝ"තිආදීසු (ම. නි. 2.361). සුඛවිපාකට්ඨේනාපි "කුසලානං, භික්ඛවේ, ධම්මානං සමාදානහේතු"තිආදීසු (දී. නි. 3.80). කුසලචිත්තඤ්හි රාගාදීනං චේතසිකරෝගානං අවජ්ජසභාවානං පටිපක්ඛභාවතෝ, සුඛවිපාකවිපච්චනතෝ ච අරෝගං, අනවජ්ජං, සුඛවිපාකඤ්චාති.

සද්දත්ථතෝ පන කුච්ඡිතේ පාපධම්මේ සලයති චලයති කම්පේති විද්ධංසේතීති **කුසලං**. කුච්ඡිතේන වා ආකාරේන සයන්තීති කුසා, පාපධම්මා, තේ කුසේ ලුනාති ඡින්දතීති **කුසලං**. කුච්ඡිතානං වා සානතෝ තනුකරණතෝ ඤාණං කුසං නාම, තේන ලාතබ්බං ගහේතබ්බං පවත්තේතබ්බන්ති **කුසලං**. යථා වා කුසෝ උභයභාගගතං හත්ථපදේසං ලුනාති, ඒවමිදං උප්පන්නානුප්පන්නවසේන උභයභාගගතං සංකිලේසපක්ඛං ලුනාති ඡින්දති, තස්මා කුසෝ විය ලුනාතීති **කුසලං**. කුච්ඡිතානං වා සාවජ්ජධම්මානං සලනතෝ සංවරණතෝ **කුසලං**. කුසලධම්මවසේන හි අකුසලා පවත්තිනිවාරණේන, අප්පවත්තිභාවාපාදනේන ච මනච්ඡට්ඨේසු ද්වාරේසු අප්පවත්තියා සංවුතා පිහිතා හොන්ති. කුච්ඡිතේ වා පාපධම්මේ සලයති කම්පේති අපනේතීති **කුසලං**. කුච්ඡිතානං වා පාණාතිපාතාදීනං පාපධම්මානං සානතෝ නිසානතෝ තේජනතෝ කුසා, දෝසලෝභාදයෝ. දෝසාදීනඤ්හි වසේන චේතනාය තික්ඛභාවප්පත්තියා පාණාතිපාතාදීනං මහාසාවජ්ජතා, තේ කුසේ ලුනාති ඡින්දතීති **කුසලං**. කුච්ඡිතානං වා සානතෝ අන්තකරණතෝ විනාසනතෝ කුසානි, පුඤ්ඤකිරියවසේන පවත්තානි සද්ධාදීනි ඉන්ද්‍රියානි, තේහි ලාතබ්බං පවත්තේතබ්බන්ති **කුසලං**. "කු" ඉති වා භූමි වුච්චති, අධිට්ඨානභාවේන තං සදිසස්ස අත්තනෝ නිස්සයභූතස්ස රූපාරූපප්පබන්ධස්ස සම්පති, ආයතිඤ්ච අනුදහනේන විනාසනතෝ කුං සියන්තීති කුසා, රාගාදයෝ, තේ විය අත්තනෝ නිස්සයස්ස ලවනතෝ ඡින්දනතෝ **කුසලං**. පයෝගසම්පාදිතා හි කුසලධම්මා අච්චන්තමේව රූපාරූපධම්මේ අප්පවත්තිකරණේන සමුච්ඡින්දන්තීති.
**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 451 යටතේ); සද්ධර්මසාගරය 03/586-587 පිටු]**

මෙහි "කුසලට්ඨේන කුසලං, කෝයං කුසලට්ඨෝ නාම? ආරෝග්‍යට්ඨෝ අනවජ්ජට්ඨෝ සුඛවිපාකට්ඨෝ" ආරෝග්‍යාර්ථයෙනුදු කුශලයයි කියනු ලැබේ. "කච්චිනු භෝතෝ කුසලං" යනාදියෙහි අනවද්‍යාර්ථයෙනුදු කියනු ලැබේ. "කතමෝ පන භන්තේ කුසලෝ කායසමාචාරෝ? යෝ බෝ මහාරාජ අනවජ්ජෝ කායසමාචාරෝ" යනාදියෙහි සුඛවිපාකාර්ථයෙනුදු කියනු ලැබේ. "කුසලානං භික්ඛවේ ධම්මානං සමාදානහේතු" යනාදියෙහි කුශල චිත්තය රාගාදී චෛතසික රෝගයනට ද අවද්‍ය ස්වභාවයනට ද ප්‍රතිපක්ෂ බැවින් ද සුඛවිපාකයන් විවස්නා බැවින් ද ආරෝග්‍ය ද අනවද්‍ය ද සුඛවිපාක ද වේ. ශබ්දර්ථයෙන් වනාහි "කුච්ඡිතේ පාපධම්මේ සලයති චලයති කම්පේති විද්ධංසේතීති කුසලං" ගරහණා පාප ධර්මයන් තදඞ්ගාදී වශයෙන් නසානුයි කුශල නම් වෙයි. "කුච්ඡිතේන වා ආකාරේන සයන්තීති කුසා, පාපධම්මා" ගරහණලද ආකාරයෙන් අප්‍රහීණ භාවයෙන් සන්තානේ පවතිත්නුයි හෝ රාගාදී පාප ධර්මයෝ කුස නම් වෙත්. "තේ කුසේ ලුනාති ඡින්දතීති කුසලං" ඒ රාගාදී පාප ධර්මයන් සිඳීනුයි කුශල නම් වේ. "කුච්ඡිතානං වා සනතෝ තනුකරණතෝ ඤාණං කුසං නාම" ගරහණලද පාප ධර්මයන් හෝ තුනු කරන හෙයින් ඥානය කුස නම් වෙයි. "තේන ලාතබ්බං ගහේතබ්බං පවත්තේතබ්බන්ති කුසලං" ඒ නුවණින් ගතයුතු බැවින් පැවැත්වියයුතු බැවින් කුශල නම් වෙයි. මේ අර්ථයෙහි ඥානවිප්‍රයුක්ත කුශලය ද ඥානෝපනිශ්‍රය බැවින් කුශල නම් වෙයි දතයුතු. "කුසා විය ලුනාතීති වා කුසලං" යම්සේ කුසතෘණය අතින් ගත්තහුගේ උභය භාගගත හත්ථ ප්‍රදේශය කපාද එසේම මෙය ද උත්පන්නානුත්පන්න වශයෙන් උභය භාගගත සංක්ලේශ පක්ෂය සිඳීනුයි කුශල නම් වෙයි. "කුච්ඡිතානං වා සාවජ්ජධම්මානං සලනතෝ සංවරණතෝ කුසලං" කුත්සිත වූ සාවද්‍ය ධර්මයන් සංවරණය කරනහෙයින් කුශල නම් වෙයි. කුශල ධර්ම වශයෙන් අකුශල ධර්මයන්ගේ ප්‍රවෘත්ති නිවාරණයෙනුදු අප්‍රවෘත්ති භාවාපාදනයෙනුදු මනස් ෂඩ්ඪද්වාරයෙහි අප්‍රවෘත්තියෙන් අකුශල ධර්මයෝ සංවෘත නම් පිහිත නම් වෙත්. "කුච්ඡිතේ පාපධම්මේ සලයති කම්පේති අපනේතීති කුසලං" ගරහිත වූ පාප ධර්මයන් කම්පා කෙරේනුයි පහකෙරේනුයි හෝ කුශල නම් වේ. "කුච්ඡිතානං වා පාණාතිපාතාදීනං සානතෝ නිසානතෝ තේජනතෝ කුසා, දෝසලෝභාදයෝ" ද්වේෂාදීන්ගේ වශයෙන් චේතනාවගේ තියුණු බවට පැමිණීමෙන් ප්‍රාණාතාපාතාදිහු මහා සාවද්‍ය වෙත්. "තේ කුසේ ලුනාති ඡින්දතීති කුසලං" ඒ ප්‍රාණාතිපාතාදීන් තියුණු කරන ද්වේෂාදී පාපයන් සිඳුනාහෙයින් කුශල නම් වෙයි. "කුච්ඡිතානං වා සානතෝ අන්තකරණතෝ විනාසනතෝ කුසානි, පුඤ්ඤකිරියවසේන පවත්තානි සද්ධාදීනි ඉන්ද්‍රියානි" කුත්සිත වූ පාප ධර්මයන් නසන හෙයින් පුණ්‍ය ක්‍රියා වශයෙන් ප්‍රවෘත්ත වූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයෝ කුස නම් වෙත්. "තේහි ලාතබ්බං පවත්තේතබ්බන්ති කුසලං" ඒ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් විසින් පැවැත්විය යුතු බැවින් කුශල නම් වෙත්. නොහොත් අධිෂ්ඨාන අර්ථයෙන් "කු" යයි භූමිය කියනු ලැබෙයි. තත් සදෘශ වූ තමහට නිශ්‍රය වූ රූපාරූප ධර්ම ප්‍රබන්ධය දැනුදු මතුයෙහිදු අනුධානයෙන් නසන හෙයින් "කුං සීයන්තීති කුසා, රාගාදයෝ. තේ විය අත්තනෝ නිස්සයස්ස ලවනතෝ ඡින්දනතෝ කුසලං" යනු වේ. ප්‍රයෝග සම්පාදිත වූ කුශල ධර්මයෝ අත්‍යන්තයෙන්ම රූපාරූප ධර්මයන් අප්‍රවෘත්ති කරණයෙන් සමුච්ඡේදය කෙරේ.

**[විසුද්ධි මාර්ග සන්නය 1080-1081 පිටු]**

නිබ්බානධාතු කුසලාති? ආමන්තා. සාරම්මණා, අත්ථි තාය ආවට්ටනා…පෙ…. පණිධීති? න හේවං වත්තබ්බේ…පෙ…. නනු අනාරම්මණා, නත්ථි තාය ආවට්ටනා…පෙ…. පණිධීති? ආමන්තා. හඤ්චි අනාරම්මණා, නත්ථි තාය ආවට්ටනා…පෙ…. පණිධි, නෝ ච වත රේ වත්තබ්බේ; "නිබ්බානධාතු කුසලා"ති.

අලෝභෝ කුසලෝ සාරම්මණෝ, අත්ථි තස්ස ආවට්ටනා…පෙ…. පණිධීති? ආමන්තා. නිබ්බානධාතු කුසලා සාරම්මණා, අත්ථි තාය ආවට්ටනා…පෙ…. පණිධීති? න හේවං වත්තබ්බේ …පෙ…. අදෝසෝ කුසලෝ…පෙ…. අමෝහෝ කුසලෝ…පෙ…. සද්ධා… වීරියං… සති… සමාධි…පෙ…. පඤ්ඤා කුසලා සාරම්මණා, අත්ථි තාය ආවට්ටනා…පෙ…. පණිධීති? ආමන්තා. නිබ්බානධාතු කුසලා සාරම්මණා, අත්ථි තාය ආවට්ටනා…පෙ…. පණිධීති? න හේවං වත්තබ්බේ…පෙ…..

නිබ්බානධාතු කුසලා අනාරම්මණා, නත්ථි තාය ආවට්ටනා…පෙ…. පණිධීති? ආමන්තා. අලෝභෝ කුසලෝ අනාරම්මණෝ, නත්ථි තස්ස ආවට්ටනා…පෙ…. පණිධීති? න හේවං වත්තබ්බේ…පෙ…. නිබ්බානධාතු කුසලා අනාරම්මණා, නත්ථි තාය ආවට්ටනා…පෙ…. පණිධීති? ආමන්තා. අදෝසෝ කුසලෝ…පෙ…. අමෝහෝ කුසලෝ…පෙ…. සද්ධා… වීරියං… සති… සමාධි…පෙ…. පඤ්ඤා කුසලා අනාරම්මණා, නත්ථි තාය ආවට්ටනා…පෙ…. පණිධීති? න හේවං වත්තබ්බේ…පෙ…..

න වත්තබ්බං; "නිබ්බානධාතු කුසලා"ති? ආමන්තා. නනු නිබ්බානධාතු අනවජ්ජාති? ආමන්තා. හඤ්චි නිබ්බානධාතු අනවජ්ජා, තේන වත රේ වත්තබ්බේ; "නිබ්බානධාතු කුසලා"ති.

**[කථාවත්ථු පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 844-846 යටතේ); කථාවත්ථුප්පකරණ පාළි 03/396 පිට (බු.ජ)]**

නිර්වාණධාතුව කුසල වේද? එසේය. සාලම්බන වේද? එයට ආවර්තනා -පෙ- ප්‍රණිධි ඇද්ද? එසේ නොකියයුතුය. අනාලම්බන නොමැත. එයට ආවර්තනා -පෙ- ප්‍රණිධි නැත්තේ නොවේද? එසේය. ඉදින් අනාලම්බන වේ නම් එයට අවර්තනා -පෙ- ප්‍රණිධි නැත්තේ නම් පිංවත "නිර්වාණධාතු කුසලා" යි නොකියයුතුමය.

අලෝභය කුසල වේද? සාලම්බන වේද? එයට ආවර්තනා -පෙ- ප්‍රණිධි ඇද්ද? එසේය. නිර්වාණධාතු කසල වේද? සාලම්බන වේද? එයට ආවර්තනා -පෙ- ප්‍රණිධි ඇද්ද? එසේ නොකියයුතුය. අදෝශය කුසල -පෙ- අමෝහය කුසල -පෙ- ශ්‍රද්ධා -පෙ- වියර්‍ය -පෙ- ස්මෘති -පෙ- සමාධි -පෙ- ප්‍රඥා කුසල වේද? සාලම්බන වේද? එයට ආවර්තනා -පෙ- ප්‍රණිධි ඇද්ද? එසේය. නිර්වාණධාතු කසල වේද? සාලම්බන වේද? එයට ආවර්තනා -පෙ- ප්‍රණිධි ඇද්ද? එසේ නොකියයුතුය.

නිර්වාණධාතු කුසල වේද? අනාලම්බන වේද? එයට ආවර්තනා -පෙ- ප්‍රණිධි ඇද්ද? එසේය. අලෝභය කුසල වේද? අනාලම්බන වේද? එයට ආවර්තනා ප්‍රණිධි ඇද්ද? නිර්වාණධාතු කුසල වේද? අනාලම්බන වේද? එයට ආවර්තනා -පෙ- ප්‍රණිධි ඇද්ද? එසේය. අද්වේශය කුසල -පෙ- අමෝහය කුසල -පෙ- ශ්‍රද්ධා -පෙ- වියර්‍ය -පෙ- ස්මෘති -පෙ- සමාධි -පෙ- ප්‍රඥා කුසල වේද? අනාලම්බන වේද? එයට ආවර්තනා ප්‍රණිධි නැද්ද? එසේ නොකියයුතුය. "නිර්වාණධාතුකුසලා" යි නොකියයුතු වේද? එසේය. නිර්වාණධාතු අනවද්‍ය නොවේද? එසේය. ඉදින් නිර්වාණධාතු අනවද්‍ය වී නම් පිංවත එකරුණින් "නිර්වාණධාතුකුසලා" යි කියයුතුමය.

**[කථාවත්ථුප්පකරණ පාළි 03/396-399 පිටු (බු.ජ)]**

තත්ථ අනවජ්ජම්පි කුසලං ඉට්ඨපාකම්පි. අනවජ්ජං නාම කිලේසවිප්පයුත්තං. අයං නයෝ ඨපෙත්වා අකුසලං සබ්බධම්මේ භජති. ඉට්ඨවිපාකං නාම ආයතිං

උපපත්තිපවත්තේසු ඉට්ඨඵලනිප්ඵාදකං පුඤ්ඤං. අයං නයෝ කුසලත්තිකේ ආදිපදමේව භජති. යේසං පන ඉමං විභාගං අග්ගහෙත්වා අනවජ්ජභාවමත්තේනේව නිබ්බානං කුසලන්ති ලද්ධි, සෙය්‍යථාපි අන්ධකානං, තේසං ඉට්ඨවිපාකට්ඨේන නිබ්බානස්ස කුසලතාභාවං දීපේතුං පුච්ඡා සකවාදිස්ස, අත්තනෝ ලද්ධිවසේන පටිඤ්ඤා ඉතරස්ස. සේසම්ධාපි හෙට්ඨා වුත්තනයත්තා උත්තානත්ථමේවාති.
**[පඤ්චප්පකරණ අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 844-846 යටතේ); පඤ්චප්පකරණ අටුවා 01/199 පිට (හේ.වි.මු)]**

**අනවජ්ජභාවමත්තේනේව නිබ්බානං කුසල**න්ති යංකිඤ්චි කුසලං, සබ්බං තං අනවජ්ජභාවමත්තේනේව, තස්මා නිබ්බානං කුසලන්ති වුත්තං හෝති.
**[පඤ්චප්පකරණ මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 844-846 යටතේ)]**

අනවජ්ජභාවමත්තේනේව කුසලන්ති යෝජනා. **තස්මා**ති යස්මා අවජ්ජරහිතං අනවජ්ජං, අනවජ්ජභාවමත්තේනේව ච කුසලං, තස්මා නිබ්බානං කුසලන්ති.
**[පඤ්චප්පකරණ අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 844-846 යටතේ)]**

**තත්‍ථ** එහි **අනවජ්ජම්පි** අනවද්‍ය අර්ථයෙන් ද **කුසලං** කුසල නම් වේ **ඉට්ඨවිපාකම්පි** ඉෂ්ට විපාකාර්ථයෙන්ද **කුසලං** කුසල නම් වේ **අනවජ්ජං නාම** අනවද්‍ය නම් **කිලේසවිප්පයුත්තං** කෙලෙසුන් හා නොයෙදුනු බවයි **අයං නයෝ** මේ ක්‍රමය **ඨපෙත්‍වා** හැර **අකුසලං** අකුසලය **සබ්බධම්මේ** සියළු ධර්මයන් **භජති** භජනය කරයි **ඉට්ඨවිපාකං නාම** ඉෂ්ට විපාක නම් **ආයතිං** මත්තෙහි **උපපත්තිපවත්තේසු** උප්පත්ති ප්‍රවෘත්තියෙහි **ඉට්ඨඵලනිප්ඵාදකං** ඉෂ්ටවිපාක උපදවන්නා වූ **පුඤ්ඤං** පිනයි **අයං නයෝ** මේ ක්‍රමය **කුසලතිකේ** කුසලත්‍රිකයෙහි **ආදිපදමේව** මුල් පදයම **භජති** භජනය කරයි **යේසං පන** යමෙකු විසින් වනාහි **ඉමං විභාගං අගහෙත්‍වා** මේ බෙදීම නොගෙන **අනවජ්ජභාවමත්තේනේව** අනවද්‍යභාව මාත්‍රයෙකින්ම **නිබ්බානං** නිර්වාණය **කුසලන්ති** කුසල්ය යන **ලද්ධිං** ලබ්ධිය **අන්ධකානං** අන්ධක රට වැසියනට **සෙය්‍යථාපි** යම්සේ ද **තේසං** ඔවුන්ට ද **ඉට්ඨවිපාකට්ඨේන** ඉෂ්ට විපාකාර්ථයෙන් **නිබ්බානස්ස** නිර්වාණයාගේ **කුසලතාභාවං** කුසලය යන බව **දීපේතුං** දක්වන්නට **සකවාදිස්ස** සකවාදියාගේ **පුච්ඡා** ප්‍රශ්න කිරීමයි **අත්තනෝ** තමාගේ **ලද්ධිවසේන** ලබ්ධිය වශයෙන් **ඉතරස්ස** අනෙකාගේ **පටිඤ්ඤා** ප්‍රතිඥාවයි ඉධ **මෙහි සේසම්පි** සෙස්ස ද **හෙට්ඨා** යට **වුත්තනයත්තා** කියනලද නය ඇති බැවින් **උත්තානත්ථමේව** ප්‍රකට අර්ථමැයි.
**[පඤ්චප්පකරණ අටුවා පරිවර්තනයි]**

යතෝ ඛෝ, ආවුසෝ, අරියසාවකෝ අකුසලඤ්ච පජානාති, අකුසලමූලඤ්ච පජානාති, කුසලඤ්ච පජානාති, කුසලමූලඤ්ච පජානාති. එත්තාවතාපි ඛෝ ආවුසෝ අරියසාවකෝ සම්මාදිට්ඨී හෝති.
**[ම.නි. මූලපණ්ණාස පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 89 යටතේ); ම.නි. මූලපණ්ණාස පාළි 01/110 පිට (බු.ජ)]**

ඇවැත්නි! යම් ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක් වනාහි අකුසලයත් දනියි ද අකුසල මූලයත් දනියි ද කුසලයත් දනියි ද කුසල මූලය දනියි ද මෙපමණකින් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ සම්‍යග්දෘෂ්ටික වෙයි.
**[ම.නි. මූලපණ්ණාස පාළි 113 පිට (බු.ජ)]**

**කුසල**න්ති එත්ථායං වචනත්ථෝ; කුච්ඡිතේ පාපධම්මේ සලයති චලයති කම්පේතීති **කුසලං,** කුච්ඡිතේන වා ආකාරේන සයන්තීති කුසා, පාපකා ධම්මා. තේ කුසේ ලුනාති ඡින්දතීති **කුසලං**. කුච්ඡිතානං වා සානතෝ තනුකරණතෝ ඤාණං කුසං

නාම, තේන ලාතබ්බං ගහේතබ්බං පවත්තේතබ්බන්ති **කුසලං**. යථා වා කුසෝ උභයභාගගතං හත්ථපදේසං ලුනාති, ඒවමිදං උප්පන්නානුප්පන්නවසේන උභයභාගගතං සංකිලේසපක්ඛං ලුනාති ඡින්දති, තස්මා කුසෝ විය ලුනාතීති **කුසලං**. කුච්ඡිතානං වා සාවජ්ජධම්මානං සලනතෝ සංවරණතෝ **කුසලං**. කුසලධම්මවසේන හි අකුසලා මනච්ඡට්ඨේසු ද්වාරේසු අප්පවත්තියා සංවුතා හොන්ති. කුච්ඡිතේ වා පාපධම්මේ සලයති ගමේති අපනේතීති **කුසලං**. කුච්ඡිතානං වා පාණාතිපාතාදීනං සානතෝ නිසානතෝ තේජනතෝ කුසා, දෝසලෝභාදයෝ. සාදීනවවසේන චේතනාය තික්ඛභාවප්පත්තියා පාණාතිපාතාදීනං මහාසාවජ්ජතා. තේ කුසේ ලුනාති ඡින්දතීති **කුසලං**. කුච්ඡිතානං වා සානතෝ අන්තකරණතෝ විනාසනතෝ කුසානි, පුඤ්ඤකිරියවසේන පවත්තානි සද්ධාදීනි ඉන්ද්‍රියානි. තේහි ලාතබ්බං පවත්තේතබ්බන්ති **කුසලං**. "කු"ඉති වා භූමි වුච්චති, අධිට්ඨානභාවේන තං සදිසස්ස අත්තනෝ නිස්සයභූතස්ස රූපාරූපපබන්ධස්ස සම්පති ආයතිඤ්ච අනුදහේන විනාසනතෝ කුං සසන්තීති කුසා, රාගාදයෝ. තේ විය අත්තනෝ නිස්සයස්ස ලවනතෝ ඡින්දනතෝ **කුසලං**. පයෝගසම්පාදිතා හි කුසලධම්මා අච්චන්තමේව රූපාරූපධම්මේ අප්පවත්තිකරණේන සමුච්ඡින්දන්ති. කුසලස්ස මූලන්ති **කුසලමූලං,** සුප්පතිට්ඨිතභාවසාධනේන කුසලස්ස පතිට්ඨා නිදනන්ති අත්ථෝ.

**[ම.නි. මූලපණ්ණාස ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 89 යටතේ)]**

මෙහි කුසල යන පදයාගේ මේ වචනාර්ථයයි "කුච්ඡිතේ පාපධම්මේ සලයති චලයති කම්පේතීති කුසලං" ගරහණ පාප ධර්මයන් තදඞ්ගාදී වශයෙන් නසානුයි කුශල නම් වෙයි. "කුච්ඡිතේන වා ආකාරේන සයන්තීති කුසා, පාපකා ධම්මා" ගරහණලද ආකාරයෙන් අප්‍රහීණ භාවයෙන් සන්තානේ පවතිත්නුයි හෝ රාගාදී පාප ධර්මයෝ කුස නම් වෙත්. "තේ කුසේ ලුනාති ඡින්දතීති කුසලං" ඒ රාගාදී පාප ධර්මයන් සිඳීනුයි කුශල නම් වේ. "කුච්ඡිතානං වා සනතෝ තනුකරණතෝ ඤාණං කුසං නාම" ගරහණලද පාප ධර්මයන් හෝ තුනී කරන හෙයින් ඤාණය කුස නම් වෙයි. "තේන ලාතබ්බං ගහේතබ්බං පවත්තේතබ්බන්ති කුසලං" ඒ නුවණින් ගතයුතු බැවින් පැවැත්වියයුතු බැවින් කුශල නම් වෙයි. මේ අර්ථයෙහි ඤාණවිප්‍රයුක්ත කුශලය ද ඤාණෝපනිශ්‍රය බැවින් කුශල නම් වෙයි දතයුතු. "කුසා විය ලුනාතීති වා කුසලං" යම්සේ කුසතෘණය අතින් ගත්තහුගේ උභය භාගගත හස්ථ ප්‍රදේශය කපාද එසේම මෙය ද උත්පන්නානුත්පන්න වශයෙන් උභය භාගගත සංක්ලේශ පක්‍ෂය සිඳීනුයි කුශල නම් වෙයි. "කුච්ඡිතානං වා සාවජ්ජධම්මානං සලනතෝ සංවරණතෝ කුසලං" කුත්සිත වූ සාවද්‍ය ධර්මයන් සංවරණය කරනහෙයින් කුශල නම් වෙයි. කුශල ධර්ම වශයෙන් අකුශල ධර්මයන්ගේ ප්‍රවෘත්ති නිවාරණයෙනුදු අප්‍රවෘත්ති භාවාපාදනයෙනුදු මනස් ෂඡ්ඨද්වාරයෙහි අප්‍රවෘත්තියෙන් අකුශල ධර්මයෝ සංවෘත නම් පිහිත නම් වෙත්. "කුච්ඡිතේ වා පාපධම්මේ සලයති කම්පේති අපනේතීති කුසලං" ගරහිත වූ පාප ධර්මයන් කම්පා කෙරේනුයි පහකෙරේනුයි හෝ කුශල නම් වේ. "කුච්ඡිතානං වා පාණාතිපාතාදීනං සානතෝ නිසානතෝ තේජනතෝ කුසා, දෝසලෝභාදයෝ" ද්වේෂාදීන්ගේ වශයෙන් චේතනාවගේ තියුණු බවට පැමිණීමෙන් ප්‍රාණාතිපාතාදීහු මහා සාවද්‍ය වෙත්. "තේ කුසේ ලුනාති ඡින්දතීති කුසලං" ඒ ප්‍රාණාතිපාතාදීන් තියුණු කරන ද්වේෂාදී පාපයන් සිඳුනාහෙයින් කුශල නම් වෙයි. "කුච්ඡිතානං වා සානතෝ අන්තකරණතෝ විනාසනතෝ කුසානි, පුඤ්ඤකිරියවසේන පවත්තානි සද්ධාදීනි ඉන්ද්‍රියානි" කුත්සිත වූ පාප ධර්මයන් නසන හෙයින් පුණ්‍ය ක්‍රියා වශයෙන් ප්‍රවෘත්ත වූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයෝ කුස නම් වෙත්. "තේහි ලාතබ්බං පවත්තේතබ්බන්ති කුසලං" ඒ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් විසින් පැවැත්විය යුතු බැවින් කුශල නම් වෙත්. නොහොත් අධිෂ්ඨාන අර්ථයෙන් "කු" යයි භූමිය කියනු ලැබෙයි. තත්

සදෘශ වූ තමහට නිශ්‍රය වූ රූපාරූප ධර්ම ප්‍රබන්ධය දැනුදු මතුයෙහිදු අනුධානයෙන් නසන හෙයින් "කුං සසන්තීති කුසා, රාගාදයෝ. තේ විය අත්තනෝ නිස්සයස්ස ලවනතෝ ඡින්දනතෝ කුසලං" යනු වේ. ප්‍රයෝග සම්පාදිත වූ කුශල ධර්මයෝ අත්‍යන්තයෙන්ම රූපාරූප ධර්මයන් අප්‍රවෘත්ති කරණයෙන් සමුච්ඡේදය කෙරේ. කුසලයාගේ මූලය වූයේනුයි "කුසලමූලං" මනාව පිහිටනලද බව සිද්ධකරමින් කුසලයාගේ ප්‍රතිෂ්ඨාවට නිදානය යන අර්ථයයි. **[මූලපණ්ණාස ටීකා පරිවර්තනයි]**

කෝසල්ලසම්භූතට්ඨේන, කුච්ඡිතානං වා පාපධම්මානං සලනතෝ විද්ධංසනතෝ, කුසානං වා රාගාදීනං ලවනතෝ, කුසා විය වා ලවනතෝ, කුසේන වා ඤාණේන ලාතබ්බතෝ පවත්තේතබ්බතෝ **කුසලානි,** තප්පටිපක්ඛතෝ **අකුසලානීති** පදත්ථෝ වේදිතබ්බෝ. **[නෙත්තිප්පකරණ අට්ඨකථා (ඡට්ඨසඞ්ගායනා අංක 03 යටතේ)]**

කුච්ඡිතේ පාපධම්මේ සලයන්තීති **කුසලානි,** කුසේ රාගාදයෝ ලුනන්තීති **කුසලානි,** කුසා විය ලුනන්තීති **කුසලානි,** කුසේන ඤාණේන ලාතබ්බානි පවත්තේතබ්බානීති **කුසලානි**. කුසලානං පටිපක්ඛානීති **අකුසලානි** අ-සද්දෝ චෙත්ථ පටිපක්ඛත්ථෝති. **[නෙත්තිවිභාවනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 03 යටතේ)]**

**කොසල්ලසම්භූතට්ඨේන** පඤ්ඤින්ද්‍රිය චෛතසිකයෙන් මොනවට හටගැනීම් සඞ්ඛ්‍යාත වූ අර්ථයෙන් ද **කුච්ඡිතානං වා** පිළිකුල් කටයුතු වූ **පාපධම්මානං** ලාමක අකුසල ධර්මයන්ගේ **සලනතෝ** තදඞ්ගප්පහාන වශයෙන් සෙලවීමෙන් හෝ **විද්ධංසනතෝ** සමුච්ඡේදප්‍රහාන වශයෙන් විධ්වංසනය කිරීමෙන් හෝ **කුසානං වා රාගාදීනං** කුස සඞ්ඛ්‍යාත වූ රාගාදීන්ගේ **ලවනතෝ** සිඳීම් වශයෙන් ද **කුසා විය වා ලවනතෝ** කුස නම් වූ තෘණයෝ තුමූ දෙපාර්ශවයට පැමිණියා වූ හස්ත ප්‍රදේශය සිඳින්නාක් මෙන් ද **කුසේන වා ඤාණේන** කුස සඞ්ඛ්‍යාත ඤාණයෙන් **ලාතබ්බතෝ** ගතයුතු හෙයින් නොහොත් **පවත්තේතබ්බතෝ** පැවැත්විය යුතු හෙයින් **කුසලානි** කුසලයෝ නම් වෙත් **තං** එයට **පටිපක්ඛතෝ** ප්‍රතිපක්ෂ වශයෙන් **අකුසලානීති** අකුසල ධර්මයෝ යැයි **පදත්ථෝ** පදාර්ථය **වේදිතබ්බෝ** දතයුතුයි.

**[නෙත්තිප්පකරණ අට්ඨකථා පරිවර්තනයි]**

තත්ථ **කුසල**න්ති පනේතස්ස කෝ වචනත්ථෝ?

> කුච්ඡිතානං සලනතෝ, කුසානං ලවනේන වා;
> කුසේන ලාතබ්බත්තා වා, කුසලන්ති පවුච්චති.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 10 යටතේ)]**

**තත්ථ** තස්මිං වචනේ "කුසල"න්ති ඒතස්ස සද්දස්ස පන කෝ වචනත්ථෝ. **කුච්ඡිතානං සලනතෝ** පාපකානං ධම්මානං කම්පනතෝ විද්ධංසනතෝ. කුච්ඡිතේනාකාරේන සයන්තීති කුසා, **කුසානං** අකුසලසඞ්ඛාතානං **ලවනේන** ඡින්දනතෝ. කුච්ඡිතේ සාති තනුං කරෝතීති කුසං, **කුසේන** ඤාණේන **ලාතබ්බත්තා** ගහේතබ්බත්තා. **වා** අයං අඤ්ඤෙදා නයෝ.

**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 10 යටතේ)]**

**කුච්ඡිතානං** නින්දිත වූ (හෙවත් නාගරික ජනයා විසින් අසුචියක් මෙන් නුවණැත්තන් විසින් ගැරහිය යුතුවූ) පාප ධර්මයන් **සලනතෝ** හිංසා කරන හෙයින්

හෝ පහකරවන හෙයින් ද (නොහොත්) **සලනතෝ** වැසීම කරන හෙයින් ද **කුසා නාම** රාගාදී අසුචි සම්ප්‍රයෝගයෙන් නානාවිධ දුක්ඛයන්ට හේතු බැවින් ද මාර්ගයෙන් අප්‍රහීණ හෙයින් නින්දිතාකාරයෙන් චිත්ත සන්තානයෙහි පවත්නා බැවින් කුස නම් ලද පාප ධර්මයන්ගේ (නොහොත් ප්‍රාණාතිපාතාදී සාවද්‍ය ධර්මයන් තියුණු වන හෙයින්) කුස නම් ලද දෝස ලෝභ ආදීන් **ලවනේන වා** සිඳන අර්ථයෙන් හෙවත් සුදුසු පරිද්දෙන් ප්‍රහාණය වන අර්ථයෙන් ද **කුසේන** (නින්දිත වූ පාප ධර්මයන් තුනී කරන හෙයින් අවසන් කරන හෙයින්) කුස නම් ලද ඥාණයෙන් **ලාතබ්බත්තා වා** ගතයුතු හෙයින් ද (හෙවත් සහජාත උපනිශ්‍රය ප්‍රත්‍යය භාවයෙන් චිත්ත සන්තානයෙහි) පැවැත්විය යුතු හෙයින් ද (නොහොත්) "කුසේන" යනු ජාති වාචක ශබ්දයක් බැවින් ඒකවචන නිර්දේශය කරන ලද්දේ නමුදු "කුසේහි" යි බහුවචන නිර්දේශයෙන් අර්ථ ගතයුතු වෙයි. එකල්හි **කුසේහි** පුඤ්ඤක්‍රියා වස්තු වශයෙන් රාගාදී ලාමක ධර්මයන් තුනී කරන හෙයින් අවසන් කරන හෙයින් කුස නම් ලද ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්මයන් විසින් **ලාතබ්බත්තා වා** චිත්ත සන්තානයෙහි පැවැත්විය යුතු හෙයින් ද **කුසලන්ති** කුසල යැයි **පවුච්චති** කියනු ලැබේ. **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 26-27 පිටු]**

**"කුච්ඡිතාන"**න්තිආදි විස්සජ්ජනං. තත්ථ **කුච්ඡිතාන**න්ති නින්දිතානං, අසුචි විය නාගරිකේහි විඤ්ඤූහි ගරහිතබ්බානං පාපධම්මානන්ති අත්ථෝ. **සලනතෝ**ති හිංසනතෝ, අපනයනතෝ වා. කුසලඤ්හි යථානුරූපං තදඞ්ගාදිවසේන අකුසලධම්මේ පජහන්තං තේ හිංසති, අපනයතීති වා වුච්චති. අථ වා **සලනතෝ** සංවරණතෝ, පිදහනතෝති අත්ථෝ. කුසලධම්මවසේන හි අකුසලප්පවත්ති නිවාරණේන, අප්පවත්තිධම්මතාපාදනේන ච මනච්ඡට්ඨේසු ද්වාරේසු අප්පවත්තියා සංවුතා පිහිතා හොන්ති. **කුසාන**න්ති රාගාදිඅසුචිසම්පයෝගේන නානාවිධදුක්ඛහේතුතාය ච කුච්ඡිතේනාකාරේන අප්පහීනභාවේන සන්තානේ සයන්ති පවත්තන්තීති කුසා, පාපධම්මා. අථ වා කුච්ඡිතානං පාණාතිපාතාදීනං සාවජ්ජධම්මානං සානතෝ නිසානතෝ තේජනතෝ කුසා, දෝසලෝභාදයෝ. දෝසාදීනඤ්හි වසේන චේතනාය තික්ඛභාවප්පත්තියා පාණාතිපාතාදීනං මහාසාවජ්ජතාති. තේසං **ලවනේන** ඡින්දනේන යථානුරූපං පජහනේනාති අත්ථෝ. **කුසේනා**ති කුච්ඡිතානං සානතෝ තනුකරණතෝ, ඕසානකරණතෝ වා "කුසා"ති ලද්ධනාමේන ඤාණේන. **ලාතබ්බත්තා**ති ආදාතබ්බත්තා, සහජාතඋපනිස්සයභාවේන සන්තානේ පවත්තේතබ්බත්තා. ඤාණඤ්හි තිහේතුකකුසලං සහජාතභාවේන චේව උපනිස්සයභාවේන ච, දුහේතුකකුසලං උපනිස්සයභාවේනේව සන්තානේ පවත්තේති. ඒවඤ්ච කත්වා කෝසල්ලසම්භූතට්ඨෝ කුසලට්ඨෝති සබ්බකුසලානං සාධාරණවසේන අත්ථෝ වුච්චති. අථ වා **කුසේනා**ති ජාතිසද්දතාය ඒකවචනනිද්දේසෝ, කුසේහීති පන අත්ථෝ. පුඤ්ඤකිරියාවසේන හි පවත්තානි සද්ධාදීනි ඉන්ද්‍රියානි යථාවුත්තනයේන "කුසානී"ති වුච්චන්ති, තේහි **ලාතබ්බත්තා** වුත්තනයේන පවත්තේතබ්බත්තා. අපිචෙත්ථ;

"කුසෝ විය ලුනාතීති, කුසා විය ලුනාති වා;
කුසලං කුං සලේතීති, ලුනාති කුසම්ච්චපී"ති.

තත්ථ යථා කුසෝ ගහිතෝ උභයභාගගතං හත්ථපදේසං ලුනාති, ඒවමිදම්පි උප්පන්නානුප්පන්නවසේන උභයභාගගතං කිලේසපක්ඛං ලුනාති ඡින්දති, සෙය්‍යථාපි; "අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදය ඡන්දං ජනේති, වායමති, උප්පන්නානං...පෙ.... පහානායා"ති ආගතං සම්මප්පධානං. තස්මා **කුසෝ විය ලුනාතීති කුසලං. කුසා විය ලුනාතී**ති එත්ථ "කු"ඉති භූමි වුච්චති,

ධම්මානං අධිට්ඨානභාවේන තං සදිසතාය ඉධ රූපාරූපක්ඛන්ධෝ වුත්තෝ. අත්තනෝ නිස්සයභූතස්ස තස්ස ඒතරහි, ආයතිඤ්ච අනුදහනතෝ විනාසනතෝ කුං සායන්තීති කුසා, රාගාදයෝ, තේ විය අත්තනෝ නිස්සයං ලුනාති ඡින්දතීති **කුසලං**. පයෝගසම්පාදිතා හි කුසලධම්මා අච්චන්තමේව රූපාරූපධම්මේ අප්පවත්තිකරණේන සමුච්ඡින්දන්ති අනුපාදිසේසනිබ්බානධාතුපාපනතෝති. වුත්තනයේන පන "කු"න්ති ලද්ධනාමස්ස රූපාරූපක්ඛන්ධස්ස සලනතෝ අපනයනතෝ **කුං සලේතීති කුසලං. කුසං ලුනාතී**ති පන කුච්ඡිතා එත්ථ සයන්තීති කුසෝ, කායෝ, තං ලුනාති යථාවුත්ත වසේනේවාති **කුසලං**.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 10 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 44-46 පිටු]**

මෙහි යම්හෙයකින් කුසලය තෙමේ තදඞ්ගාදී වශයෙන් අකුසල ධර්මයන් තුනී කරන්නේ ඒ අකුසල ධර්මයන් හිංසා කරන්නේ පහකරවන්නේ යැයි කියනු ලැබේ ද "සලනතෝති හිංසනතෝ අපණයනතෝ වා" යි ටීකායෙහි දක්වන ලද්දේය. යම්හෙයකින් කුසල ධර්ම වශයෙන් අකුසල ප්‍රවෘත්තිය වැළැක්වීමෙන් හා අප්‍රවෘත්ති ස්වභාවයට පැමිණවීමෙන් ද චක්‍ෂුරාදී ඡඞ් ද්වාරයන්හි නොපැවැත්ම කරණකොටගෙන මුහාවන ලද්දහු වෙත් ද එහෙයින් "සංවරණතෝ පිදහනතෝ" යි දක්වන ලද්දේය.෴

"කුසානං" යන මෙහි "රාගාදී අසුචි සම්ප්‍රයෝගේන නානාවිධදුක්ඛහේතුතාය ච කුච්ඡිතේනාකාරේන අප්පහීණභාවේන සන්තානේ සයන්ති පවත්තන්තීති කුසා පාපධම්මා" යනු නිර්වචනයි. "අථ වා කුච්ඡිතානං පාණාතිපාතාදීනං සාවජ්ජධම්මානං සානතෝ තේජනතෝ කුසා දෝසලෝභාදයෝ" යනුද නිර්වචනයි. ඒ එසේමැයි; ද්වේෂාදීන්ගේ වශයෙන් චේතනාව තියුණු බවට පැමිණීම හේතුකොටගෙන ප්‍රාණවධාදී දුශ්චරිතයන්ගේ මහා සාවද්‍ය බව වෙයි. "කුසේනාති කුච්ඡිතානං සානතෝ තනුකරණතෝ ඕසානකරණතෝ වා කුසාති ලද්ධනාමේන ඤාණේන ලාතබ්බත්තාති ආදාතබ්බත්තා සහජාතඋපනිස්සයභාවේන සන්තානේ පවත්තේතබ්බත්තා" යනු ටීකායි. ඒ එසේමැයි; ඥාණය තෙමේ ත්‍රිහේතුක කුසලය සහජාත ප්‍රත්‍යයෙන් හා උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ද ද්හේතුක කුසලය උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ද සන්තානයෙහි පවත්වයි. එසේහෙයින් "කෝසල්ලසම්භූතට්ඨෝ කුසලට්ඨෝති සබ්බකුසලසාධාරණවසේන අත්ථෝ වුච්චති" යනු දක්වන ලදි. එහිම අනිකුදු ක්‍රමයක් ඇත්තේයි හේ කෙසේ යත්?

කුසෝ විය ලුනාතීති - කුසා විය ලුනන්ති වා
කුසලං කුසලේහීති - ලුනාති කුසම්ච්චපි෴ යනුයි.

එහි යම්සේ කුසතණපතක් මිටින් ගන්නා ලද්දේ උභයභාගගත හස්ත ප්‍රදේශය සිඳේද එපරිද්දෙන්ම මේ ශ්‍රද්ධාදී කුසල ධර්ම සමූහය තෙම උපන්නාවූ ද මතු උපදනාවූ ද කෙලෙසුන්ගේ වශයෙන් උභයභාගගත ක්ලේශ පක්‍ෂය සිඳින්නේයි කුමක් මෙන්ද යත් "අනුප්පන්නානං අකුසලානං ධම්මානං අනුප්පාදය ඡන්දං ජනේති වායමති උප්පන්නානං -පෙ- පහාණාය" යනාදීන් ආවාවූ සම්‍යක් ප්‍රධානද්වය මෙනි. එහෙයින් "කුසෝ විය ලුනාතීති කුසලා" යනු නිර්වචන වෙයි. "කුසා විය ලුනන්ති" යන මෙහි භූමිය "කු" යයි කියනු ලැබේ ද එමෙන්ම මෙහි රූපාරූපස්කන්ධය ද රාගාදී ක්ලේශ ධර්මයන්ගේ පැවැත්මට ආධාර වන බැවින් "කු" යයි කියන ලද්දේ වෙයි. තමාගේ ආශ්‍රය ස්ථානය වූ ඒ "කු" සඞ්ඛ්‍යාත රූපාරූපස්කන්ධය දවන හෙයින් විනාශ කරන

හෙයින් රාගාදීහු ද කුස නම් යයි වෙත්. ඒ රාගාදීහු තමාගේ ආශ්‍රය ස්ථානය වූ රූපාරූපස්කන්ධය සිඳින්නාක් මෙන් ප්‍රයෝග සම්පාදනය කරන්නා වූ සෝවාන් ආදී කුසල ධර්මයෝ තුමූ අනුපාදිශේෂ නිර්වාණ ධාතුවගේ ලැබීම හේතුකොටගෙන අතිශයින් රූපාරූප ධර්මයන්ගේ අප්‍රවත්ති කරණයෙන් සිඳිත්නුයි කුසල නම් වෙයි. "කුසං ලුනාති" යන මෙහි නින්දිත වූ කේසාදිහු මෙහි පවත්තිනුයි යනාර්ථයෙහි කය තෙම කුස නම් වෙයි. ඒ කුස සඞ්ඛ්‍යාත කය යට කියනලද ක්‍රමයෙන් සිඳීනුයි හෝ කුසල නම් වෙයි. **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 27-28 පිටු]**

කුච්ඡිතේ (ධ. ස. අට්ඨ. 1) පාපධම්මේ සලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්ති අපගමෙන්තීති වා කුසලානි. අථ වා කුච්ඡිතාකාරේන සන්තානේ සයනතෝ පවත්තනතෝ කුසසඞ්ඛාතේ පාපධම්මේ ලුනන්ති ඡින්දන්තීති කුසලානි. අථ වා කුච්ඡිතේ පාපධම්මේ සානතෝ තනුකරණතෝ ඕසානකරණතෝ වා කුසසඞ්ඛාතේන ඤාණේන, සද්ධාදිධම්මජාතේන වා ලාතබ්බානි සහජාතූපනිස්සයභාවේන යථාරහං පවත්තේතබ්බානීති කුසලානි, තානේව යථාවුත්තත්ථේන කාමාවචරානි කුසලචිත්තානි චාති **කාමාවචරකුසලචිත්තානි**.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා කාමාවචර සෝභනචිත්ත වණ්ණනා අංක 15 යටතේ); විභාවනී ටීකා සන්නය 56 පිට; සද්ධර්මසාගරය 02/438-439 පිටු]**

**යානි චිත්තානි** යම්කිසි සිත් කෙනෙක් තුමූ **කුච්ඡිතේ** පිළිකුල් කටයුතු වූ **පාපධම්මේ** අකුසල ධර්මයන් **සලයන්ති (කම්පෙන්ති විද්ධංසෙන්ති අපගමෙන්ති)** නිරුද්ධ කරන්නා වූ වෙද්ද (පහකරන්නා වූ වෙතියි කී නියායි) (නොහොත්) **සලයන්ති (විද්ධංසෙන්ති)** සොලවන්නාහු වෙද්ද **වා** නොහොත් **සලයන්ති (අපගමෙන්ති)** නිරවශේෂයෙන් ප්‍රහීණ කරවන්නාහු වෙද්ද **ඉති (තස්මා) තානි චිත්තානි** ඒ චිත්තයෝ තුමූ **කුසලානි** කුසලයෝ නම් වෙත් (පළමුවැනි අර්ථ යොජනාව වනාහි මණිසාර මඤ්ජුසායෙහි "පුරිමස්ස පුරිමස්ස පච්ඡිමං පච්ඡිමං අත්ථවේවචනං" යන පාඨයට ද පසුව දැක්වූ අර්ථ යෝජනාව "අථ වා සලනස්ස අත්ථදීපනා කම්පනාදීනි තීණි තදඞ්ගප්පහානාදීහි යථාක්කමං යෝජේතබ්බානි" යන පාඨයට යෝග්‍ය පරිද්දෙන් ද කරනලදි මේ පශ්චිම විග්‍රහයෙහි "සලයන්ති" යන ක්‍රියාපදය "කම්පෙන්ති විද්ධංසෙන්ති අපගමෙන්ති" යන ක්‍රියාපද තුනකින් වර්ණා කෙළේයි. ඒ පදත්‍රය අතුරෙන් සලයන්ති යන්න "කම්පෙන්ති" යනුවෙන් තදඞ්ගප්පහානය ද "විද්ධංසෙන්ති" යනුවෙන් විෂ්කම්භන ප්‍රහාණයද "අපගමෙන්ති" යනුවෙන් සමුච්ඡේද ප්‍රහාණය ද කියනලදී "විද්ධංසෙන්ති" යන පාඨය ඇතැම් පොත්හි "හිංසෙන්ති" යි දක්නා ලැබේ. ඒ වනාහි මණිසාරමඤ්ජුසා අර්ථසාලිනී යන ටීකා අර්ථකථාවන් හා නොයෙදෙන හෙයින් අයුත්ත පාඨයි. කු ශබ්ද උපපද "සල" ධාතුහු කෙරෙන් ණ-ප්‍රත්‍යය වූ තැනි. "කම්පෙන්ති" යන ක්‍රියාව හා යෙදෙන කල්හි "සල" ධාතුහුගේ අර්ථ වශයෙන් කාමාවචර මහා කුසලයන්ගේ තදඞ්ගප්ප්‍රහාණ ශක්තිය ද "විද්ධංසෙන්ති" යන ක්‍රියාව හා යෙදෙන කල්හි "සල" ධාතුහුගේ අර්ථ වශයෙන් මහග්ගත කුසලයාගේ විෂ්කම්භනප්ප්‍රහාණ ශක්තිය ද "අපගමෙන්ති" යන ක්‍රියාව හා යෙදෙන කල්හි "සල" ධාතුහුගේ අර්ථ වශයෙන් සතර මාර්ග චිත්තයන්ගේ සමුච්ඡේද ප්‍රහාණ ශක්තිය ද ලැබේ. ණ-ප්‍රත්‍යයාගේ අර්ථ වශයෙන් ඒ ත්‍රිවිධ ශක්තියෙන් ව්‍යවස්ථා කරනලද ශක්තිමත් වූ එකුන්විසි කුසල චිත්තයෝම ලැබේ. මේ පච්ඡිම විකල්පයාගේ අර්ථයි. ප්‍රථම විකල්පයාගේ වශයෙන් කම්පනාදී වශයෙන් විශේෂ නොකොට සාමාන්‍ය වශයෙන් කිය යුත්තේයි)

**අථ වා** නොහොත් **යානි (චිත්තානි)** යම් සිත් කෙනෙක් තුමූ **කුච්ඡිතාකාරේන** පිළිකුල් ආකාරයෙන් **සන්තානේ** සත්ව සන්තානයෙහි **සයන්තෝ (පවත්තනතෝ)** හටගන්නා හෙයින් (මේ හේත්වර්ථය "කුසසඞ්ඛාතේ" යන්නෙහිම සම්බන්ධ කටයුතු) **කුසසඞ්ඛාතේ** කුස යයි කියන ලද්දවූ **පාපධම්මේ** ලාමක ධර්මයන් **ලුනන්ති (ඡින්දන්ති)** සිඳිනාහු වෙත් ද **ඉති (තස්මා) තානි චිත්තානි** ඒ චිත්තයෝ තුමූ **කුසලානි** කුසලයෝ නම් වෙත් (කුස ශබ්ද උපපද "ලූ" ධාතුහු කෙරෙන් ණ-ප්‍රත්‍යය වූ තැනි) **අථ වා** නොහොත් **යානි (චිත්තානි)** යම් සිත් කෙනෙක් (පවත්තේතබ්බානි යන්නෙහි සබඳනු) **කුච්ඡිතේ** පිළිකුල් කටයුතු වූ **පාපධම්මේ** පාප ධර්මයන් (සානතෝ යන්නෙහි කර්ම වශයෙන් සබඳනු) **සානතෝ (තනුකරණතෝ)** තුනී කරන හෙයින් **වා** නොහොත් **සානතෝ (ඕසානකරණතෝ)** කෙළවර කරන හෙයින් ද **කුසසඞ්ඛාතේන** කුස යයි කියන ලද්දවූ **ඤාණේන වා** ප්‍රඥාවෙන් හෝ **සද්ධාදිධම්මජාතේන වා** ශ්‍රද්ධාදී ධර්ම සමූහයෙන් හෝ **සහජාතඋපනිස්සයභාවේන** සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් හා උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් ද **යථාරහං** සුදුසු පරිද්දෙන් **ලාතබ්බානි (පවත්තේතබ්බානි)** ඉපදවිය යුතු වෙත් ද **ඉති (තස්මා) තානි චිත්තානි** ඒ චිත්තයෝ තුමූ **කුසලානි** කුසලයෝ නම් වෙත් ("සානතෝ තනුකරණතෝ" යන පාඨයෙන් "කුච්ඡිතේ සාති තනුං කරෝතීති කුසං" යන වචනාර්ථය දැක්වූහ) **යං ඤාණං** යම් ඤාණයක් තෙමේ **කුච්ඡිතේ** නින්දිත වූ **පාපධම්මේ** ලාමක ධර්මයන් **සාති (තනුං කරෝති)** තුනී කෙරේද **තං ඤාණං** ඒ ඤාණය තෙමේ **කුසං** කුස නම් වේ ("ඕසානකරණතෝ වා" යන පාඨයෙන් "කුච්ඡිතේ සාති ඕසානං කරෝතීති" යන වචනාර්ථය දැක්වූහ. මෙපමණක් මෙහි විශේෂයි. සෙස්ස පූර්ව විකල්පයට සමානයි. කු-ශබ්ද උපපද "සා" ධාතුහු කෙරෙන් පරව ණ-ප්‍රත්‍යය වූ තැනි. මේ විකල්ප ද්වයෙහි පර පද වශයෙන් පඤ්ඤව ලැබේ. "කුසේන ලාතබ්බානි පවත්තේතබ්බානීති කුසලානි" යි කර්ම සාධනය කටයුතුයි. කුස ශබ්ද උප පද "ලා" ධාතුහුගේ අර්ථ වනාහි කර්තෘ අර්ථ ක්‍රියාවෙන් ඤාණය හා කර්මාර්ථ ක්‍රියාවෙන් කුසලය ද වාචක වේ. ප්‍රඥාව විසින් ඤාණසම්ප්‍රයුක්ත කුසලය සහජාත ශක්තියෙන් උපදවනු ලැබේ. ඤාණවිප්‍රයුක්ත කුසලය වනාහි උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් උපදවනු ලැබේ. ශ්‍රද්ධාදී ධර්ම සමූහ තෙමේ සහජාත ශක්ති වශයෙන් ද උපනිශ්‍රය ශක්ති වශයෙන් ද කුසල් සිත් උපදවයි. එහෙයින් "සහජාතඋපනිස්සයභාවේන යථාරහං පවත්තේතබ්බානි" යි කියනලදි) **තානේව** ඒ කුසල චිත්තයෝම **යථාවුත්තත්ථේන** යම් යම් පරිද්දෙකින් කියනලද අර්ථයෙන් **කාමාවචරානි ච** කාමාවචර නමුදු වෙත් **චිත්තානි ච** චිත්තයෝ නමුදු වෙත් **ඉති (තස්මා) කාමාවචරකුසලචිත්තානි** කාමාවචරකුසල චිත්තයෝ නම් වෙත් ("කාමාවචරානි ච තානි කුසලචිත්තානි චේති කාමාවචරකුසලචිත්තානි" යි කම්මධාරය සමාස කටයුතුයි. "යථාවුත්තත්ථේන" යන පාඨයෙන් "කාමේතීති කාමෝ සෝ එත්ථ අවචරති ආරම්මණකරණවසේන" යනාදීන් යට කියනලද කාමාවචර ශබ්දයාගේ අර්ථය ද "චින්තේතීති චිත්තං" යනාදී ශබ්දයාගේ අර්ථය ද දැක්වූහ)

**[විභාවනී ටීකා සන්නය 91-93 පිටු]**

කාමාවචරානිච තානි කුසලානි චිත්තානිචාති විග්ගහෝ. තත්ථ ඡේකට්ඨේන කුසලානීති. ආරෝග්‍යට්ඨේන, සුන්දරට්ඨේන, ඡේකට්ඨේන, අනවජ්ජට්ඨේන, සුඛවිපාකට්ඨේනචාති. රාගාදයෝහි ධම්මා චිත්තසන්තානස්ස රුජ්ජනට්ඨේන රෝගා නාම. අහිතට්ඨේන අසුන්දරා නාම. අනිපුණට්ඨේන අඡේකානාම. ගාරය්හට්ඨේන වජ්ජානාම. අනිට්ඨ විපාකට්ඨේන දුක්ඛවිපාකානාම හොන්ති. ඉමානි පන තේහි වුට්ඨිතත්තා කුසලානි නාම අරෝගානි නාමාති අත්ථෝ. තප්පටිපක්ඛත්තාච සුන්දරානි ඡේකානි අනවජ්ජානි සුඛවිපාකානි ච නාම හොන්තීති. කුච්ඡිතේ පාපධම්මේ සලයන්ති

චාලෙන්ති කම්පෙන්ති විද්ධංසෙන්තීති **කුසලානි**. කුච්ඡිතේනවා ආකාරේන සත්තසන්තානේ සෙන්ති අනුසෙන්තීති කුසා. රාගාදයෝ. තේ ලුනන්ති ඡින්දන්තීති කුසලානි. කුසං වා වුච්චති ඤාණං කුච්ඡිතානං සානට්ඨේන තනුකරණට්ඨේන අන්තකරණට්ඨේනවා. කුසේන ලාතබ්බානීති කුසලානි. කුසාවිය හත්ථප්පදේසං සංකිලේසපක්ඛං ලුනන්තීතිවා කුසලානි. අපිච, කුච්ඡිතේ පාපධම්මේ සරන්ති හිංසන්තීති කුසලානි. රකාරස්ස ලකාරෝ. කෝසල්ලසම්භූතට්ඨේනවා කුසලානීති.

**[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 43 යටතේ)]**

වචනත්ථේ "රුජ්ජනට්ඨේනා"ති තුදනට්ඨේන. "අහිතට්ඨේනා"ති හිතවිරුද්ධට්ඨේන. "අනිපුණට්ඨේනා"ති අසණ්හා සුඛුමට්ඨේන. "අනිට්ඨවිපාකට්ඨේනා"ති අනිට්ඨං විපාකං ඒතේසන්ති අනිට්ඨ විපාකානි. තේසං භාවෝ අනිට්ඨවිපාකට්ඨෝ. තේන අනිට්ඨවිපාකට්ඨේන. "තප්පටිපක්ඛත්තා"ති රාගාදීහි පටිපක්ඛත්තා. ඒවං පරියායත්ථසඞ්ඛාතං අභිධානත්ථං දස්සෙත්වා ඉදනි අට්ඨකථාසු ආගතං වචනත්ථං දස්සේති කුච්ඡිතේති ආදිනා. තත්ථ "කුච්ඡිතේ"ති ජේගුච්ඡිතබ්බේ, නින්දිතබ්බේ වා. චාලෙන්ති තදඞ්ගප්පහානවසේන, කම්පෙන්ති වික්ඛම්භනප්පහානවසේන, විද්ධංසෙන්ති සමුච්ඡේදප්පහානවසේන. "තනුකරණට්ඨේනා"ති සල්ලිඛනට්ඨේන. "අන්තකරණට්ඨේනා"ති පරියෝසානකරණට්ඨේන. "අපි වා"ති ආදි දීපනීනයදස්සනං. "කෝසල්ල සම්භූතට්ඨේනා"ති මහාඅට්ඨකථානයෝ. තත්ථ, කුසලස්ස පණ්ඩිතස්ස භාවෝ කෝසල්ලං. ඤාණං. තේන සම්භූතං සඤ්ජාතං කෝසල්ලසම්භූතංති විග්ගහෝ.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 43 යටතේ)]**

**"කාමාවචරානි ච තානි කුසලානි චිත්තානි ච" ඉති විග්ගහෝ** යනු විග්‍රහයයි **තත්‍ථ** එහි **කේනට්ඨේන** කුමන අර්ථයකින් **කුසලානි ඉති** කුසල් වේද යත්? **ආරෝග්‍යට්ඨේන** ආරෝග්‍යාර්ථයෙන් **සුන්දරට්ඨේන** සුන්දර අර්ථයෙන් **ඡේකට්ඨේන** දක්‍ෂ අර්ථයෙන් **අනවජ්ජට්ඨේන** අනවද්‍යාර්ථයෙන් **සුඛවිපාකට්ඨේන ච** සැප විපාකාර්ථයෙන් ද **ඉති (කුසලානි හොන්ති)** කුසල් වන්නාහ **හි** විස්තර කෙරෙමි **රාගාදයෝ ධම්මා** රාගාදී ධර්මයෝ **චිත්තසන්තානස්ස** චිත්ත සන්තානයාගේ **රුජ්ජනට්ඨේන** පෙළන අර්ථයෙන් **රෝගා නාම** රෝගයෝ නම් වෙත් **අහිතට්ඨේන** විපත් එළවන අර්ථයෙන් **අසුන්දරා නාම** අසුන්දරෝ නම් වෙත් **අනිපුණට්ඨේන** අදක්‍ෂ අර්ථයෙන් **අඡේකා නාම** අඡේකයෝ නම් වෙත් **ගාරය්හට්ඨේන** ගැරහීම් අර්ථයෙන් **වජ්ජා නාම** වජ්ජයෝ නම් වෙත් **අනිට්ඨවිපාකට්ඨේන** අනිෂ්ට විපාක එළවන අර්ථයෙන් **දුක්ඛවිපාකා නාම හොන්ති** දුක්ඛ විපාකයෝ නම් වෙත් **ඉමානි පන** මේ චිත්තයෝ වනාහි **තේහි** ඒ අර්ථයන්ගෙන් **වුට්ඨිතත්තා** නැගීසිටි බැවින් **කුසලානි නාම** කුසලයෝ නම් **අරෝගානි නාම ඉති** රෝග නොමැත්තෝ නම් යන **අත්ථෝ** අර්ථයයි **තප්පටිපක්ඛත්තා ච** රාගාදීන්ට ප්‍රතිපක්‍ෂ බැවින් **සුන්දරානි** යහපත්වූවෝ ද **ඡේකානි** දක්‍ෂවූවෝ ද **අනවජ්ජානි** අනවද්‍යවූවෝ ද **සුඛවිපාකානි ච නාම හොන්ති** සැප විපාක ඇත්තෝ නම් ද වෙත් **කුච්ඡිතේ පාපධම්මේ** පිළිකුල් කටයුතු වූ පාප ධර්මයන් **සලයන්ති චාලෙන්ති** තදඞ්ගප්‍රහාන වශයෙන් සොලවත් ද **කම්පෙන්ති** විෂ්කම්භන ප්‍රහාන වශයෙන් කම්පා කරත් ද **විද්ධංසෙන්ති** සමුච්ඡේද ප්‍රහාන වශයෙන් විද්වංසනය කරත් **ඉති (තස්මා)** එහෙයින් **කුසලානි** කුසලයෝ නම් **කුච්ඡිතේන වා ආකාරේන** පිළිකුල් කටයුතු ආකාරයෙන් **සත්තසන්තානේ** සත්ව සන්තානයෙහි **සෙන්ති අනුසෙන්ති** සයනය කරයි **ඉති (තස්මා)** එහෙයින් **කුසා** කුසා නම් **රාගාදයෝ** රාගාදී ධර්මයෝයි **තේ** ඒ රාගාදී ධර්මයෝ **ලුනන්ති ඡින්දන්ති** සිඳිත් **ඉති (තස්මා)** එහෙයින්

**කුසලානි** කුසලයෝ නම් **වා** නොහොත් **කුසං** කුසය **කුසං** කුස යයි **වුච්චති** කියනු ලැබෙයි **කුච්ඡිතානං** පිළිකුල් කටයුතු ධර්මයන්ගේ **සානට්ඨේන** තුනීකරන අර්ථයෙන් **වා** නොහොත් **තනුකරණට්ඨේන** සිහින්කොට කපන අර්ථයෙන් **වා** නොහොත් **අන්තකරණට්ඨේන** කෙළවර කරන අර්ථයෙන් (**කුසලානි** කුසලයෝ නම් වෙත්) **කුසේන** කුස නම් ලද කුසණයෙන් **ලාතබ්බානීති** පැවැත්වියයුතු හෙයින් **කුසලානි** කුසලයෝ නම් වෙත් **වා** නොහොත් **හත්ථප්පදේසං** අත් ප්‍රදේශය **(ලුනන්තා) කුසා විය** සිඳින්නා වූ කුසතණ මෙන් **සංකිලේසපක්ඛං** සංක්ලේශ පක්‍ෂය **ලුනන්තීති** සිඳීයිනුයි **කුසලානි** කුසලයෝ නම් වෙත් **අපි ච** තව ද **කුච්ඡිතේ පාපධම්මේ** පිළිකුල් කටයුතු වූ පාප ධර්මයන් **සරන්ති (සලන්ති)** සොළවයි **හිංසන්තීති** හිංසාකරයිනුයි **කුසලානි** කුසලයෝ නම් වෙත් **රකාරස්ස** ර-කාරයට **ලකාරෝ** ල-කාරාදේශය වූ තැනී **වා** නොහොත් **කෝසල්ලසම්භූතට්ඨේන** නුවණින් හටගත් අර්ථයෙන් **කුසලානි ඉති** කුසලයෝ නම් වෙති. **[පරමත්ථදීපනී පරිවර්තනයි]**

"කුච්ඡිතේ පාපධම්මේ සලයන්ති කම්පේන්ති හිංසන්ති අපගමේතීති කුසලා" කුශලය තෙම ලැබේ. නොහොත් "කුච්ඡිතේන ආකාරේන අප්පහීනාභාවේන සන්තානේ සයන්ති පවත්තන්තීති කුසා" පාප ධර්මය ලැබේ. "කුසේ පාපධම්මේ ලුනාති ඡින්දතීති කුසලං" කුශලය ලැබේ. නොහොත් "කුච්ඡිතේ පාපධම්මේ සාති තනුං කරෝති ඔසානං වා කරෝතීති කුසං" කුසණය තෙම ලැබේ. "කුසේන කුසණේන ලාතබ්බං පවත්තේතබ්බන්ති කුසලං" එම කුශලය ලැබේ. එහෙයින් ටීකායෙහි:—

"කුච්ඡිතානං සලනතෝ - කුසානං ලවනේන වා
කුසේන ලාතබ්බත්තා - වා කුසලන්ති පවුච්චති" යනු කියනලදි.

නිශ්‍රය වූ භූමිය ගත් කල්හි නිශ්‍රිත වූ භවභෝග සම්පත්තීන් ද ලැබෙන හෙයින් "කාමේ සුගතිසාධකං" යනු කීයේය. "කාමාවචරෝ ඒව නානාවිධසම්පත්තීට්ඨානතෝ සෝභනා ගන්තබ්බතෝ ගතීති කාමාවචරසුගති" අභේද සත්තමී ඒකවචන විභත්තියගේ වශයෙන් "කාමේ සුගති" යනු කීයේය. "සුන්දරේන කම්මුනා සාධූහි අධිගන්තබ්බාති සුගති" භවභෝග සැපත ලැබෙයි. නොහොත් "සුන්දරේන කම්මුනා හේතුභූතේන ගච්ඡති අයති පවත්තරූපං උපලබ්භතීති සුගති" උත්පත්තිභවය යයි කියනලද විපාකස්කන්ධ කටත්තාරූප ලැබේ. "යා සුන්දරේන කම්මුනා අධිගමීයති සාධූහීති සුගති" ප්‍රවෘත්ති කාලයෙහි ලැබියයුතු භෝග සම්පත්තිය ලැබේ. "කාමේ සුගතීනං සාධකන්ති කාමේ සුගතිසාධකං" නිර්වචනයි. කුසලය ලැබෙයි යනු දක්වනලදි. **[පරමත්ථවිභාවනී ව්‍යාඛ්‍යාව 08-09 පිටු]**

කුච්ඡිතං පාපධම්මං සලයති චලයති කම්පේති විද්ධංසේතීති කුසලං, චතුභූමිකකුසලං ලබ්භති. කුපුබ්බෝ සලධාතු අ. තත්ථ කාමාවචරකුසලං තදඞ්ගප්පහානේන පාපධම්මං සලයති චලයති, මහග්ගත කුසලං වික්ඛම්භනප්පහානේන සලයති කම්පේති, ලෝකුත්තර කුසලං සමුච්ඡේදප්පහානේන සලයති විද්ධංසේතීති අත්ථෝ.

අථ වා කුච්ඡිතං අපායද්වාරං සලන්ති සංවරන්ති පිදහන්ති සාධවෝ ඒතේනාති කුසලං, **[නමක්කාර ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 01 යටතේ)]**

**කුච්ඡිතං පාපධම්මං** පිළිකුල් කටයුතු වූ පාප ධර්මයන් **සලයති චලයති** සොලවයි **කම්පේති** කම්පාකරයි **විද්ධංසෙන්ති ඉති** විධ්වංසනය කරයිනුයි **කුසලං**

කුසල නම් **චතුභූමිකකුසලං ලබ්භති** චාතුර්භූමික කුසලය ලැබෙයි **කුපුබ්බෝ** කු පද පූර්ව වූ **සලධාතු** සල ධාතුවයි **අ** අ-විකරණ ප්‍රත්‍යයි **තත්ථ** එහි **කාමාවචරකුසලං** කාමාවචර කුසලය **තදඞ්ගප්පානේන** තදඞ්ගප්‍රහාණයෙන් **පාපධම්මං** පාප ධර්මයන් **සලයති චලයති** සොලවයි **මහග්ගතකුසලං** මහග්ගත කුසලය **වික්ඛම්භනප්පහානේන** විෂ්කම්භන ප්‍රහාණයෙන් (**පාපධම්මං** පාප ධර්මයන්) **සලයති කම්පේති** සොලවයි කම්පාකරයි **ලෝකුත්තරකුසලං** ලෝකෝත්තර කුසලය **සමුච්ඡේදපහානේන** සමුච්ඡේද ප්‍රහාණයෙන් (**පාපධම්මං** පාප ධර්මයන්) **සලයති විද්ධංසේති ඉති** සොලවයි විධ්වංසනය කරයි යන **අත්ථෝ** අර්ථයයි.

**අථවා** නොහොත් **සාධවෝ** නුවණැත්තෝ **ඒතේන** මෙය කරණකොටගෙන **කුච්ඡිතං අපායද්වාරං** පිළිකුල් කටයුතු වූ අපාය ද්වාරය **සලන්ති** චංචල කරත් **සංවරන්ති** මුවහ කරත් **පිදහන්ති** වසත්නුයි **කුසලං** කුසල නම්.

**[නමක්කාර ටීකා පරිවර්තන]**

කුච්ඡිතේනාකාරේන සන්තානේ සෙන්තීති කුසා, රාගාදයෝ, තේ ලුනාති ඡින්දතීති **කුසලං.** **[අභිධානප්පදීපිකා ටීකා (ෂට්ඨසඞ්ගායනා අංක 85-86 යටතේ)]**

**කුච්ඡිතේනාකාරේන** පිළිකුල් කටයුතු වූ ආකාරයෙන් **සන්තානේ** චිත්ත සන්තානයෙහි **සෙන්ති** සයනය කරයි **ඉති (තස්මා)** එහෙයින් **කුසා** කුස නම් **රාගාදයෝ** රාගාදී ධර්මයෝයි **තේ (රාගාදයෝ)** ඒ රාගාදී ධර්මයෝ **ලුනාති ඡින්දති** සිඳියි **ඉති (තස්මා)** එහෙයින් **කුසලං** කුසල නම්. **[අභිධානප්පදීපිකා ටීකා පරිවර්තන]**

"කුච්ඡිතේ පාපධම්මේ සලෙන්ති කම්පෙන්ති හිංසෙන්ති අපගමෙන්තීති වා කුසලානි" නොහොත් "කුච්ඡිතේනාකාරෙන සන්තානේ සයන්ති පවත්තන්තීති කුසා පාපාධම්මා; තේ කුසේ ලුනන්ති ඡින්දන්තීති කුසලානි" නොහොත් "කුච්ඡිතේ පාපාධම්මේ සානතෝ තනුකරණතෝ ඕසානකරණතෝ වා කුසං, ඤාණං; තේන කුසේන සද්ධාදිධම්මජාතේන වා ලාතබ්බානි සහජාතූපනිස්සයභාවේන යථාරහං පවත්තේතබ්බානීති කුසලානි" "කුසා විය පාපධම්මේ ලුනන්තීති වා කුසලානි කාමාවචරානිච තානි කුසලචිත්තානිචාති කාමාවචරකුසලචිත්තානි"

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 19 පිට; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ පුරාණ සන්නය 26 පිට]**

යම්කිසිවකුගේ සන්තානයෙහි ඇතිවුවහොත් ඒ තැනැත්තාගේ සන්තානයෙහි ආනාගතයෙහි ඉෂ්ට විපාක ඇතිකරන්නා වූ සිත් වලට කුසල් සිත් යැයි කියනු ලැබේ. දන්දීම් සිල්රැකීම් ආදී වශයෙන් සාමාන්‍ය ජනයාට ඇතිවන කුසලය කාමාවචර කුසලයය. **[අභිධර්ම මාර්ගය 47 පිට]**

**"කුච්ඡිතේ පාපධම්මේ සලයන්ති චලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්තීති කුසලාති"** යනු වචනාර්ථයි. **යානි චිත්තානි** යම් සිත්කෙනෙක් (කාම, මහග්ගත, ලෝකෝත්තර යන කුසල චිත්තකෙනෙක්) **කුච්ඡිතේ** පිළිකුල් කටයුතු වූ **පාපධම්මේ** ලාමක අකුසල ධර්මයන් **සලයන්ති චලයන්ති** තදඞ්ගප්පහාන වශයෙන් සොලවත් ද **සලයන්ති කම්පෙන්ති** විෂ්කම්භනප්පහාන වශයෙන් කම්පා කෙරෙත් ද **සලයන්ති විද්ධංසෙන්ති** සමුච්ඡේදප්පහාන වශයෙන් විධ්වංසනය කෙරෙත් ද **ඉති (තස්මා)** එසේ තදඞ්ග විෂ්කම්භන සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කරන බැවින් **තානි චිත්තානි** ඒ චිත්තයෝ **කුසලානි** කුසලයෝ නම් වෙත්. මෙහි **චලයන්ති** යන්නෙන් කාමාවචර

කුසලය අකුසල ධර්මයන් තදඞ්ග වශයෙන් ප්‍රහාණය කරන බව දක්වයි. **කම්පෙන්ති** යන්නෙන් මහග්ගත කුසලයෙන් අකුසල ධර්මයන් විෂ්කම්භන වශයෙන් ප්‍රහාණය කරන බව දක්වයි. **විධ්වංසෙන්ති** යන්නෙන් ලෝකෝත්තර කුසලය අකුසල ධර්මයන් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කරන බව දක්වයි. එහෙයින් මූලටීකාවෙහි **"සලනස්ස අත්ථදීපනානි චලනාදීනි තදඞ්ගප්පහානාදීහි යෝජේතබ්බානි"** යි වණ්ණනා කළෝ. **සලනස්ස** සල-ධාතුහුගේ **අත්ථදීපනානි** අර්ථ දක්වන්නා වූ **චලනාදීනි** චලනාදීහු **තීණි** තිදෙන **තදඞ්ගප්පහානාදීහි** තදඞ්ග ප්‍රහාණාදිය හා **යෝජේතබ්බානි** යෙදිය යුත්තාහ. මෙසේ හෙයින් කුසල ධර්මයෝ අකුසල ධර්මයන් ප්‍රහාණය කරන හෙයින් පහායක නම් වෙත්. අකුසල ධර්මයෝ පහාතබ්බ නම් වෙත්.

පහායකං ච පුඤ්ඤං හි - පහාතබ්බං ච පාපකං
තං පදීපන්ධකාරංව - ද්වයං ඔත්වාබුකං විය

**පුඤ්ඤං හි** කුසල කර්මය වනාහි **පහායකං ච** ප්‍රහාණය කරන ධර්මයක්ම වේ. **පාපකං** අකුසල ධර්මය තෙම **පහාතබ්බං ච** ප්‍රහාණය කළයුතු ධර්මයක්ම වේ. **තං ද්වයං** ඒ කුසල් අකුසල් දෙකම **පදීපන්ධකාරංව** පහන් ආලෝකය හා අන්ධකාරය මෙන් ද **ඔත්වාබුකං විය (ඕතු ආබුකං විය)** බළලා හා මීයා මෙන් ද **හෝති** වෙයි. මේ වනාහි ප්‍රහාණ ත්‍රය හා කුසල ත්‍රය යෙදෙන ක්‍රමයයි. **[අභිධර්ම ප්‍රකාශය 58-59 පිටු]**

ඥාණසම්පයුක්ත කුසල් සිත් තෙමේ මුඛ්‍ය වශයෙන් කුසල් නම් වේ. විප්‍රයුක්ත සිත් තෙමේ රූළ්හි වශයෙන් කුසල නම් වෙයි. එහෙයින් අර්ථශාලිනි අටුවායෙහි **කෝසල්ලං වුච්චති පඤ්ඤා, කෝසල්ලතෝ සම්භූතත්තා කෝසල්ලසම්භූතට්ඨේන කුසලං. ඤාණසම්පයුත්තං තාව ඒවං හෝතු ඤාණසම්පයුත්තං කථන්ති? තම්පි රූළ්හීසද්දේන කුසලමෙව** යනු කීහ. **පඤ්ඤා** පඤ්ඤින්ද්‍රිය චෛතසිකයම **කෝසල්ලං වුච්චති** කෝසල්‍ය යැයි කියනු ලැබේ. **කෝසල්ලතෝ** පඤ්ඤින්ද්‍රිය චෛතසිකයෙන් **සම්භූතත්තා** මොනවට හටගත් හෙයින් **කෝසල්ලසම්භූතට්ඨේන** පඤ්ඤින්ද්‍රිය චෛතසිකයෙන් මොනවට හටගැනීම් සඞ්ඛ්‍යාත වූ අර්ථයෙන් **ඤාණසම්පයුත්තං** ඤාණය හා යෙදුනා වූ **කුසලං** කුසල්සිත් තෙමේ **තාව** පළමු කොට **ඒවං හෝතු** මෙසේ කුසල් නම් වේවා **ඤාණවිප්පයුත්තං කුසලං** ඤාණයෙන් විප්‍රයුක්ත වූ කුසල්සිත් තෙමේ **කථං හෝති?** කෙසේ කුසල් වන්නේ ද යත්? **ඉති** මේ වනාහි **චෝදනා** චෝදනාවයි. **තම්පි** ඒ ඤාණවිප්‍රයුක්ත සිත් තෙමේ ද **රූළ්හීසද්දේන** රූළ්හී ශබ්දයෙන් **කුසලමේව හෝති** කුසල නම් වෙයි **ඉති** මේ වනාහි **පරිහාරෝ** පරිහාරයයි මේ වනාහි අර්ථයි.
**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 28-29 පිටු]**

අකුසල් හෙවත් පාපගති නසන බැවින් කුසල් නම් වේ. ලෝභ දෝෂ මෝහාදි අකුසල මූලයන් නිසා ඇතිවන පාපධර්මයන් මැඩ පවත්වා යහපත් මඟට පමුණුවන්නා වූ, මනුෂ්‍යලෝක දිව්‍යලෝක ආදී කාම සුගතීන්හි ප්‍රතිසන්ධිය ඇති කොට මහත් වූ සැප-සම්පත් විපාක වශයෙන් ගෙනදීමේ ශක්තිය ඇති කුසලකර්ම කිරීමේ දී මේ සිත් පහළ වේ. දන්දීම් සිල්රැකීම් භාවනා කිරීම වතාවත් කිරීම බණ ඇසීම බණ දෙසීම පිං පැමිණවීම යනාදි උසස් පිංකම් කරන්නේත් මේ කුසල් සිත් අටෙනි.
**[අභිධර්මාර්ථ ප්‍රදීපිකා 1/59 පිට]**

**කු,** යි නාම-රූප පරම්පරාවට නමකි. රාගාදී කෙලෙසුන්ගේ පැවැත්මට ආධාර වන හෙයිනි. එහෙයින් රාගාදී වූ කෙලෙසුන් **කුස** යි කියති. එය ආධාර කොට පවත්නා

බැවිනි. ආධාරාධෙය්‍ය වශයෙන් පවත්නා නාම-රූප ධර්ම හා රාගාදී ක්ලේශ ධර්ම සිඳලන මේ චිත්ත කොට්ඨාසය කුසල යි කියනු ලැබේ. **[සද්ධර්මසාගරය 03/587 පිට]**

අසනීපයක් සෑදී සුව වුනාම "දැන් හොඳ" යැයි ව්‍යවහාර කරයි. මේ "හොඳ" යන තේරුම උඩද "කුසල" ශබ්දයෙහි ද යෙදී තිබේ. මෙහි වනාහි කෙලෙස් රෝග සුවවීම කුසල සිත් වලිනි. එහෙයින් එම හොඳ සිත් වලට කුසල් යැයි කියනු ලැබේ.

නිවැරදි හැසිරීමක් ඇති තැනැත්තාට "හොඳ" එක්කෙනා යැයි කියනු ලැබේ. මේ "හොඳ" හෙවත් නිවැරදි යන තේරුම උඩද කුසල් යැයි කියනු ලැබේ. නිවැරදි හැසිරීම නම් කුසල් සිතින් කරන හැසිරීමයි.

දියුණු වී පොහොසත් වී සැප විඳින කෙනෙකු දැකීමෙන් "එයාට දැන් හොඳ" යැයි කියනු ලැබේ, ඔහු සැප විපාක විඳින අවස්ථාව හෙයින්; ඒ "හොඳ" සැප විපාකය. මේ සැප විපාකවලට ද කුසල ශබ්දය යෙදී තිබේ. ඒ සැප විපාක නම් කුසල විපාකයෝය.

තවද නපුරු පාපයන් සොලවා හරින කම්පා කරන විද්වංශනය කරන සිත් කුසල්ය. "කුච්ඡිතේ පාපකේ ධම්මේ සලයන්ති චලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්තීති කුසලානි" **[සිත සිරුර සහ නිවන හෙවත් ධම්මසඞ්ගණී 03 පිට]**

## පුඤ්ඤ පදය විස්තර කර ඇති අයුරු:—

තත්ථ පුනාති අත්තනො කාරකං, පූරේති චස්ස අජ්ඣාසයං, පුජ්ජඤ්ච භවං නිබ්බත්තේතීති පුඤ්ඤො. අභිසඞ්ඛරෝති විපාකං කටත්තාරූපඤ්චාති අභිසඞ්ඛාරෝ. පුඤ්ඤො ච අභිසඞ්ඛාරෝ **පුඤ්ඤාභිසඞ්ඛාරෝ**. පුඤ්ඤපටිපක්ඛතෝ අපුඤ්ඤො. අපුඤ්ඤො ච අභිසඞ්ඛාරෝ **අපුඤ්ඤාභිසඞ්ඛාරෝ**. න ඉඤ්ජතීති ආනෙඤ්ජං. ආනෙඤ්ජමේව අභිසඞ්ඛාරෝ, ආනෙඤ්ජඤ්ච භවං අභිසඞ්ඛරෝතීති **ආනෙඤ්ජාභිසඞ්ඛාරෝ**.

**[විභඞ්ග අටුවා (ඡට්ඨසඞ්ගායනා සඞ්ඛාරපදනිද්දේසෝ අංක 226 යටතේ); විභඞ්ග අටුවා 98-99 පිටු (හේ.වි.මු); විභඞ්ගප්පකරණ අටුවා සන්නය 02/600 පිට; නෙත්තිප්පකරණ අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 58 යටතේ); නෙත්තිප්පකරණ අටුවා 136 පිට (හේ.වි.මු); නෙත්තිප්පකරණ ටීකා (ඡට්ඨසඞ්ගායනා ගන්ථාරම්භකථාවණ්ණනා යටතේ); ඒකකනිපාත ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 04 යටතේ); සගාථාවග්ග ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 04 හා 51 යටතේ); මූලපණ්ණාස ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 04 යටතේ); විනයවිනිච්ඡය ටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 3183 යටතේ); සීලක්ඛන්ධවග්ග අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා ගාන්ථාරම්භකථාවණ්ණනා යටතේ)]**

**පුනාතීති** සෝධේති අපුඤ්ඤඵලතෝ දුක්ඛසංකිලේසතෝ ච, හිතසුඛජ්ඣාසයේන පුඤ්ඤං කරෝතීති තං නිප්ඵාදනේන කාරකස්සජ්ඣාසයං පූරේතීති **පුඤ්ඤො,** පූරකෝ පුජ්ජනිබ්බත්තකෝ ච නිරුත්තිලක්ඛණේන **"පුඤ්ඤො"**ති වේදිතබ්බෝ. සමාධිපච්චනීකානං අතිදූරතාය **න ඉඤ්ජති** න චලතීති අත්ථෝ. **[විභඞ්ග මූලටීකා (ඡට්ඨසඞ්ගායනා සඞ්ඛාරපද නිද්දේසෝ අංක 226 යටතේ)]**

**"සෝධේති අපුඤ්ඤඵලතෝ"**ති ඉමිනා පුඤ්ඤස්ස විපාකදුක්ඛවිවිත්තතං ආහ, **"දුක්ඛතෝ"**ති ඉමිනා චේතෝදුක්ඛවිවිත්තතං, **"සංකිලේසතෝ"**ති ඉමිනා කිලේසදුක්ඛවිවිත්තතං. **"අපුඤ්ඤඵලතෝ"**ති වා ඉමිනා පුඤ්ඤස්ස ආයතිං

හිතතං දස්සේති. **"දුක්ඛසංකිලේසතෝ"**ති ඉමිනා පවත්තිහිතතං පවත්තිසුඛතඤ්ච දස්සේති. **තං නිප්ඵාදනේනා**ති හිතසුඛනිබ්බත්තනේන. පුජ්ජභවනිබ්බත්තකෝ **පුජ්ජනිබ්බත්තකෝ**. **[විභඞ්ග අනුටීකා (ඡට්ඨසඞ්ගායනා සඞ්ඛාරපද නිද්දේසෝ අංක 226 යටතේ)]**

**තත්ථ** ඒ තත්ථ කතමේ යනාදි පාවචන පාලියෙහි (**යෝ කුසලධම්මෝ** යම් කුශල ධර්මයෙක් තෙම) **අත්තනෝ** කුශලධර්ම සඞ්ඛ්‍යාතවූ තමා **කාරකං** කරන්නා වූ පුද්ගලයා **පුනාති** පවිත්‍රකෙරේයිද **අස්ස** ඒ කුශල ධර්මය කරන්නා වූ පුද්ගලයාගේ **අජ්ඣාසයඤ්ච** උදාරාධ්‍යාශයත් **පූරේති** සම්පූර්ණ කෙරෙයිද **පුජ්ජං** පූජ්‍යවූ **භවඤ්ච** භවයත් **නිබ්බත්තේති** උපදවයිද **ඉති** එහෙයින් (**සෝ කුසලධම්මෝ** ඒ කුශලධර්මයතෙම) **පුඤ්ඤෝ** පුණ්‍ය නම.

**විපාකඤ්ච** විපාකස්කන්ධයද **කටත්තාරූපඤ්ච** කර්මජරූපයද (**යෝ කුසලධම්මෝ** යම් කුශලධර්මයෙක්තෙම) **අභිසඞ්ඛරෝති** සකස්කෙරේද **ඉති** එහෙයින් (**සෝ කුසලධම්මෝ** ඒ කුශලධර්මයතෙම) **අභිසඞ්ඛාරෝ** අභිසංස්කාර නම **පුඤ්ඤෝච** කුශලයමැ (පුණ්‍යයමැ යුසේයි) **අභිසඞ්ඛාරෝ** අභිසංස්කාරයැ හෙවත් සකස්කිරීමැ **පුඤ්ඤාභිසඞ්ඛාරෝ** පුණ්‍යාභිසංස්කාර නම **පුඤ්ඤපටිපක්ඛතෝ** කුසල්නට ප්‍රතිපක්ෂවන හෙයින් **අපුඤ්ඤෝ** අපුණ්‍ය නම **අපුඤ්ඤෝච** අපුණ්‍යයමැ **අභිසඞ්ඛාරෝ** අභිසංස්කාරයැ හෙවත් සකස්කිරීමැ **අපුඤ්ඤාභිසඞ්ඛාරෝ** අපුණ්‍යාභිසංස්කාර නම **න ඉඤ්ජති** කම්පා නොවෙයි ද **ඉති** එහෙයින් **ආනිඤ්ජං** ආනිඤ්ජ නම **ආනිඤ්ජමේව** කම්පා නොවෙන්නාවූ කුශලධර්මයමැ **අභිසඞ්ඛාරෝ** අභිසංස්කාරයවේද **ච** නොහොත් **ආනිඤ්ජං** කම්පා නොවන්නාවූ **භවං** භවය **අභිසඞ්ඛරෝති** සකස්කෙරේද **ඉති** එහෙයින් **ආනෙඤ්ජාභිසඞ්ඛාරෝ** ආනෙඤ්ජාභිසඞ්ඛාකාර නම ෴

අපුණ්‍යඵලය කෙරෙන් ද දුක්ඛය කෙරෙන් ද සංක්ලේශයන් කෙරෙන් ද ප්‍රවණය කෙරේනුයි ශුද්ධ කෙරේනුයි වෙන් කෙරේනුයි කුශලය පුණ්‍ය නම්. එහෙයින් කීහ "පුනාතීති සෝධේති අපුඤ්ඤඵලතෝ දුක්ඛසංකිලේසතෝ ච" යි (මූ.ටී) "සෝධේති අපුඤ්ඤඵලතෝ" යන මේ ටීකා වචනයෙන් පුණ්‍යයාගේ විපාක දුක්ඛයෙන් විවිත්තභාවය දක්වා "දුක්ඛතෝ" යන්නෙන් පුණ්‍යයාගේ චිත්ත දුක්ඛයෙන් විවිත්තභාවය ද "සංකිලේසතෝ" යන්නෙන් ක්ලේශ දුක්ඛයෙන් විවිත්තභාවය ද දක්වා නොහොත් "අපුඤ්ඤඵලතෝ" යන්නෙන් පුණ්‍යයාගේ අනාගතයෙහි හිතත්වය ද "දුක්ඛසංකිලේසතෝ" යන්නෙන් ප්‍රවෘත්ති හිතත්වය ද ප්‍රවෘත්ති සෞඛ්‍යය ද දක්වා එහෙයින් විවරණය කළෝ අනුටීකාවෙහි "සෝධේති අපුඤ්ඤතෝති ඉමිනා පුඤ්ඤස්ස විපාකදුක්ඛවිවිත්තතං ආහ. දුක්ඛෝති ඉමිනා චේතෝදුක්ඛවිවිත්තං සංකිලේසතෝති ඉමිනා කිලේසදුක්ඛවිවිත්තං අපුඤ්ඤඵලතෝති වා ඉමිනා පුඤ්ඤස්ස ආයතිං හිතතං දස්සේති දුක්ඛසංකිලේසතෝති ඉමිනා පවත්තිහිතතං පවත්තිසුඛතඤ්ච දස්සේති" යි ෴

***** පිං කරන්නා හිතසුඛාධ්‍යාශයෙන් පිං කෙරේයි. තත්හිතසුඛ නිෂ්පාදනයෙන් කරන්නහුගේ අධ්‍යාශය පූරණය කෙරේනුයි පුණ්‍ය නම. මෙහි "පූරකෝ" යන්න ද "පුජ්ජනිබ්බත්තකෝ" යන්න ද නිරුත්ති ලක්‍ෂණයෙන් පුණ්‍ය යැයි සිද්ධයැ. මේද කීහ "හිතසුඛාජ්ඣාසයේන පුඤ්ඤං කරෝතීති තන්නිප්ඵාදනේන කාරකස්සජ්ඣාසයං පූරේතීති පුඤ්ඤෝ. පූරකෝ පුජ්ජනිබ්බත්තකෝ ච නිරුත්තිලක්ඛණේන පුඤ්ඤෝති වේදිතබ්බෝ" යි (මූ.ටී) ෴ "න ඉඤ්ජති" යනු සමාධියට ප්‍රතිපක්‍ෂ වන ධර්මයන්ට ඉතා

දුරවන බැවින් කීහ. "සමාධිපච්චනීකානං අතිදූරතාය න ඉඤ්ජති න චලතීති අත්ථො" යි (මූ.ටී) ✍ "න ඉඤ්ජතීති අනිඤ්ජං අනිඤ්ජමේව අභිසඞ්ඛාරෝ ආනිඤ්ජාභිසඞ්ඛාරෝ" යනු නිර්වචනයි. ආනඤ්ජාභිසඞ්ඛාරෝ යි වක්තව්‍ය ස්ථානයෙහි "ඉස්ස අකාරං කත්වා ආනඤ්ජාභිසඞ්ඛාරෝති වුත්තං" යි වියු බොහෝ පොත්හි "ආනෙඤ්ජාභිසඞ්ඛාරෝ" යි දක්නා හෙයින් ඉ-කාරයට එ-කාරවැ ශබ්ද නිෂ්පත්තියවැ පළමු කී නයට වැඩියක් මැනවයි අප වැටහීමයි ✍

**[විභඞ්ග අටුවා සන්නය 600-602 පිටු]**

**පුඤ්ඤාභිසඞ්ඛාරෝ**ති ආදීසු පුනාති අත්තනෝ කාරකං, පූරේති චස්ස අජ්ඣාසයං, පුජ්ජඤ්ච භවං නිබ්බත්තේතීති පුඤ්ඤං.

**[පටිසම්භිදමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 48 යටතේ); පටිසම්භිදමග්ග අටුවා 460 පිට (හේ.වි.මු)]**

**පුඤ්ඤාභිසඞ්ඛාරෝ ඉති ආදීසු** පුඤ්ඤාභිසඞ්ඛාරෝ යනාදියෙහි **අත්තනෝ** කුසල ධර්ම සඞ්ඛ්‍යාත වූ තමා **කාරකං** කරන්නා වූ පුද්ගලයා **පුනාති** පවිත්‍ර කෙරේද **අස්ස** ඒ කුසල ධර්ම කරන්නා වූ පුද්ගලයාගේ **අජ්ඣාසයඤ්ච** උදර අධ්‍යාශයත් **පූරේති** සම්පූර්ණ කෙරෙයි ද **පුජ්ජං භවඤ්ච** පූජ්‍ය වූ භවයත් **නිබ්බත්තේති** උපදවයි ද **ඉති** එහෙයින් ඒ කුසල ධර්ම තෙම **පුඤ්ඤං** පුඤ්ඤ නම් ✍

**[පටිසම්භිදමග්ග අටුවා පරිවර්තනයි]**

යත්ථ සයං උප්පජ්ජන්ති, තං සන්තානං පුනන්ති, පුජ්ජං භවඵලං නිබ්බත්තෙන්තීති වා පුඤ්ඤානි. **[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක (452 යටතේ)]**

පුණ්‍ය නම් ලද මොහු තමන් උපන් සන්තානය පවිත්‍ර කරණ බැවිනිදු පූජ්‍ය භවඵල නිපදවන බැවිනිදු පුණ්‍ය නම් වේ ✍ **[විසුද්ධි මාර්ග මහා සන්නය 1085 පිට]**

තත්ථ පුනාති අත්තනෝ සන්තානං අපුඤ්ඤඵලතෝ, දුක්ඛසංකිලේසතෝ ච සෝධේතීති පුඤ්ඤං. හිතසුඛජ්ඣාසයේන පුඤ්ඤං කරෝතීති තන්නිප්ඵාදනේන කාරකස්ස අජ්ඣාසයං පූරේති, පුජ්ජභවං නිබ්බත්තේතීති වා පුඤ්ඤං. ඉති පූරකෝ, පුජ්ජනිබ්බත්තකෝ ච නිරුත්තිනයේන පුඤ්ඤන්ති වේදිතබ්බෝ.

**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 592 යටතේ)]**

"පුනාතීති පුඤ්ඤං" තමාගේ සන්තානය අපුණ්‍යඵලයෙනුදු දුක්ඛසංක්ලේශයෙනුදු ශුද්ධ කෙරේනුයි පුණ්‍ය නම්. "පූරේතීති පුඤ්ඤං" හිතසුඛයෙහි අදහසින් පිං කරන බැවින් තන්නිෂ්පාදනයෙන් කාරකයාගේ අධ්‍යාශය පුරානුයි පුණ්‍ය නම්. නොහොත් "පුජ්ජභාවං නිබ්බත්තේතීති පුඤ්ඤං" පූජ්‍යභාවය නිපදවානුයි පුණ්‍ය නම්. මෙසේ පූරකයාත් නිර්වර්ථකයාත් නිරුත්තිනයින් පුණ්‍ය නම් ✍

**[විසුද්ධි මාර්ග මහා සන්නය 1287-1288 පිටු]**

පුජ්ජභවඵලං නිබ්බත්තෙන්ති, අත්තනෝ සන්තානං පුනන්තීති වා පුඤ්ඤානි.

**[ඉතිවුත්තක අටුවාව (ඡට්ඨසඞ්ගායනා අංක 60 යටතේ); ඉතිවුත්තක අටුවා 160 පිට (හේ.වි.මු)]**

**පුජ්ජභවඵලං** පූජ්‍ය භවඵලය **නිබ්බත්තෙන්ති** නිපදවන බැවින් ද **වා** නොහොත් **අත්තනෝ සන්තානං** තමාගේ චිත්ත සන්තානය **පුනන්ති** පිරිසිදු කරත් **ඉති (තස්මා)** එහෙයින් **පුඤ්ඤානි** පුණ්‍ය නම් වේ ✍ **[ඉතිවුත්තක අටුවා පරිවර්තන]**

පුනාතීති **පුඤ්ඤං.** **[අභිධානප්පදීපිකා ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 85-86 යටතේ)]**

පුඤ්ඤ ශබ්දය කුශල සුන්දර පවිත්‍ර යන අරුත්හි ආයේය. (පණ්ඩකේ සුකතේ) පුඤ්ඤං (මනුඤ්ඤේ පාවනේ තීසු) යනු කෝෂයි. **[සද්ධර්මසාගරය 01/187 පිට]**

## කුසලපදයෙහි ධාත්වර්ථඃ—

**සල චලනේ සංවරණේ ච, වල වල්ල චලනේ ච**. සංවරණාපෙක්ඛායං **ච**කාරෝ. සලති. කුසලං. වලති. වල්ලති. වල්ලූරෝ.

තත්ථ **කුසල**න්ති කුච්ඡිතේ පාපධම්මේ සලයති චලයති කම්පේති විද්ධංසේතීති කුසලං. කුච්ඡිතං අපායද්වාරං සලන්ති සංවරන්ති පිදහන්ති සාධවෝ ඒතේනාති කුසලං. වල්ලන්ති සංවරන්ති රක්ඛන්ති ඉතෝ කාකසේනාදයෝ සත්තේ අබාදනත්ථායාති **වල්ලූරෝ**.
**[මහාසද්දනීතිය (ඡට්ඨසඞ්ගායනා ල-කාරාන්ත ධාතු යටතේ); මහාසද්දනීතිය 390 පිට]**

**සල හුල චල කම්පනේ**. සලති. හුලති. චලති. කුසලං.

එත්ථ ච කුච්ඡිතේ පාපකේ ධම්මේ සලයතීති **කුසලං,** හේතුකත්තුවසේනිදං නිබ්බචනං දට්ඨබ්බං. තථා හි **අට්ඨසාලිනියං** "කුච්ඡිතේ පාපකේ ධම්මේ සලයන්ති චලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්තීති කුසලා"ති හේතුකත්තුවසේන අත්ථෝ කථිතෝ. ඉදං **සල**ධාතුවසේන **කුසල**සද්දස්ස නිබ්බචනං. අඤ්ඤේසම්පි ධාතූනං වසේන **කුසල**සද්දස්ස නිබ්බචනං භවති. තථා හි **අට්ඨසාලිනියං** අඤ්ඤනිපි නිබ්බචනානි දස්සිතානි. කථං? "කුච්ඡිතේන වා ආකාරේන සයන්තීති කුසා, තේ අකුසලධම්මසඞ්ඛාතේ කුසේ ලුනන්ති ඡින්දන්තීති **කුසලා**. කුච්ඡිතානං වා සානතෝ තනුකරණතෝ ඤණං කුසං නාම, තේන කුසේන ලාතබ්බාති **කුසලා,** ගහේතබ්බා පවත්තේතබ්බාති අත්ථෝ. යථා වා කුසා උභයභාගගතං හත්ථප්පදේසං ලුනන්ති, ඒවමිමේපි උප්පන්නානුප්පන්නභාවේන උභයභාගගතං කිලේසපක්ඛං ලුනන්ති, තස්මා කුසා විය ලුනන්තීතිපි **කුසලා**"ති. ඒවං අඤ්ඤනිපි නිබ්බචනානි දස්සිතානි. තත්‍ර "ධම්මා" ඉති පදපෙක්ඛං කත්වා තදනුරූපලිඞ්ගවචනවසේන "කුසලා"ති නිද්දේසෝ කතෝ, ඉධ පන සාමඤ්ඤනිද්දේසවසේන "කුසල"න්ති නපුංසකේකවචනනිද්දේසෝ අම්හේහි කතෝ. පුඤ්ඤවාචකෝ හි **කුසල**සද්දෝ ආරෝග්‍යවාචකෝ ච ඒකන්තේන නපුංසකලිඞ්ගෝ, ඉතරත්ථවාචකෝ පන තිලිඞ්ගිකෝ, යථා කුසලෝ ඵස්සෝ, කුසලා වේදනා. කුසලං චිත්තන්ති. **කුසල**සද්දෝ ඉමස්මිං **භූවාදි**ගණේ **ලා**ධාතු**සල**ධාතුවසේන නිප්ඵත්තිං ගතෝති වේදිතබ්බෝ.
**[මහාසද්දනීතිය (ඡට්ඨසඞ්ගායනා භූවාදිගණ සමෝධානගතධාතුයෝ යටතේ); මහාසද්දනීතිය 418 පිට]**

**සල** චලනේ සංවරණේ ච (භූ) සැලීමෙහි පැසීමෙහි සලති
**[ව්‍යාකරණසද්දසින්ධු 711 පිට]**

**ලා ආදනේ**. ලාති. ලානං, ගරුළෝ, සීහළෝ, රාහුලෝ, කුසලං, බාලෝ, මහල්ලකෝ, මහල්ලිකා. තත්ථ **කුසල**න්ති කුච්ඡිතානං පාපධම්මානං සානතෝ තනුකරණතෝ ඤණං **කුසං** නාම, තේන කුසේන ලාතබ්බං පවත්තේතබ්බන්ති **කුසලං.**

**[මහාසද්දනීතිය (ඡට්ඨසඞ්ගායනා ල-කාරන්තධාතු යටතේ); මහාසද්දනීතිය 386-388 පිට; ව්‍යාකරණසද්ද සින්ධු 618 පිට]**

**කු** යන නිපාතයෙන් නින්දිත වූ පාප ධර්මයන් දක්වයි. තුනී කිරීමෙහි වැටෙන **සා තනුකරණේ** යන ධාතුවෙන් තුනීකරන්නා වූ ධර්ම ශක්තියක් දක්වයි. **කු** යන නිපාතයත් **සා** යන ධාතුවත් දෙක එකතුවීමෙන් සිද්ධ වූ **කුස** ශබ්දය තෙමේ නින්දිත පාපාධර්මයන් තුනී කරන්නා වූ අවසන් කරන්නා වූ ඥාණ ශක්තියම ඇරදක්වා **ලා ආදානයෙහි** හුණුවා වූ ධාතුවෙන් පැවැත්විය යුතු ධර්ම කෙනෙකුන් දක්වයි. කරුණු මෙසේ හෙයින් **කු** නම් ලද නින්දිත වූ පාප ධර්මයන් **සා** නම් ලද සිඳපීම කරන්නා වූ **කුස** නම් ලද ඥාණයෙන් ලානය හෙවත් පැවැත්විය යුතු යම් ධර්ම කෙනෙක් ඇත්ද? එව්හු කුසල් නම් වෙත් යනු මෙහි එලිතාර්ථය බැව් දතයුතු.

**[අභිධර්ම මධු බින්දුව 05-06 පිටු]**

ඡේදන පූරණේ (සිදීමෙහි පිරවීමෙහි) **කුස** ධාතුවට **අල** ප්‍රත්‍යය වී කුසල යන කිතක පදය සෑදෙයි. කුසලං අත්ථීති කුසලෝ. කුසල යන නාම පදයට ණ-තද්ධිත ප්‍රත්‍යය වී කුසලෝ යන පදය සෑදෙයි. කුසලය ඇත්තා කුසලෝය. කුසලෝ යන්නට ඡේකෝ සමත්ථෝ පටිබලෝ යන අර්ථ දී ඇත. **[බුදුගුණ නාමාවලී 186 පිට]**

## පුඤ්ඤපදයෙහි ධාත්වර්ථ: —

**පු පවනේ**. පවති. පුත්තෝ, පුඤ්ඤං. එත්ථ **පුත්තෝ**ති අත්තනෝ කුලං පවති සෝධේතීති පුත්තෝ. **කියාදි**ගණං පන පත්වා "පුනාතී"ති වත්තබ්බං.

**පුඤ්ඤ**න්ති එත්ථ පන අත්තනෝ කාරකං පවති සෝධේතීති පුඤ්ඤං. **කියාදි**ගණං පන පත්වා පුනාතීති **පුඤ්ඤ**න්ති වත්තබ්බං.

අඤ්ඤෙදා අත්ථෝපි වත්තබ්බෝ, නිරුත්තිලක්ඛණස්සිතෝ;
තස්මා නිබ්බචනං ඤෙදය්‍යං, ජනපූජාදිතෝ ඉධ.

පරං පුජ්ජභවං ජනේතීති **පුඤ්ඤං**. සඳ පූජිතං වා ජනේතීති **පුඤ්ඤං**. ජනං අත්තකාරං පුනාතීති **පුඤ්ඤං**. අසේසං අපුඤ්ඤං පුනාතීති **පුඤ්ඤං**.

කල්‍යාණං කුසලං පුඤ්ඤං, සුභම්ච්චේව නිද්දිසේ;
කම්මස්ස කුසලස්සාධි-වචනං වචනේ පටු.

**[මහාසද්දනීතිය (ඡට්ඨසඞ්ගායනා ප-කාරන්තධාතු යටතේ); මහාසද්දනීතිය 361 පිට; ව්‍යාකරණසද්දසින්ධු 501 පිට; කච්චායන ධාතු මඤ්ජුසා විවරණය 133 පිට]**

අත්තනෝ කාරකං පවති සෝධේතීති පුඤ්ඤං, කුසලං. පුධාතු සෝධනේ ඤෙය්‍යා. අථ වා පරං පුජ්ජභාවං ජනේතීති පුඤ්ඤං, සඳ පූජිතං වා ජනේතීති පුඤ්ඤං, කුසලං. පූජසද්දූපපද ජනධාතු ඤෙය්‍යා. නිරුත්තිනයේන සද්දසිද්ධි වේදිතබ්බා. අවසේසං අපුඤ්ඤං පුනාති සෝධේතීති වා පුඤ්ඤං, කුසලං. පු ධාතු සෝධනේ ඤෙය්‍යා.

**[නමක්කාර ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 18 යටතේ); සද්ධර්මසාගරය 04/1213-1214 පිටු]**

කියාදීගණික පු-පවනේ යන ධාතුවෙන් පරව ණ-ප්‍රත්‍යයව ද පූරේති යනාදී ද්විතීය නයෙහි භවාදීගණික පූර-පූරණේ යන ධාතුවෙන් ණ-ප්‍රත්‍යයව ද තිබ්බත්තේති යනාදී තෘතීය නයෙහි "සබ්බධාතවෝ භූකරගබ්භා" යී උක්ත පරිභාෂානුරූපව පුප්ඵ-පද පූර්ව භූ-ධාතුවව ඕ හට ලොප්ව පුඤ්ඤ ශබ්දයාගේ සිද්ධිය වේ.

**[විභඞ්ගප්පකරණ අටුවා සන්නය 02/601 පිට]**

## කාමාවචර කුසලචිත්තයෝ අටදෙනා:—

සෝමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, සෝමනස්සසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකන්ති ඉමානි අට්ඨපි කමාවචරකුසලචිත්තානි නාම.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 14 පිට]**

**සෝමනස්ස සහගතං** ඉෂ්ටානුභවන ලක්‍ෂණ වූ මානසික සුඛ වේදනාව හා ඒකෝත්පාදදි භාවයට ගියා වූ **ඤාණසම්පයුත්තං** යථා ස්වභාව ප්‍රතිවේධ ලක්‍ෂණ වූ ඥානය හා සම්ප්‍රයුක්ත වූ **අසඞ්ඛාරිකං** තමා විසින් හෝ මෙරමා විසින් හෝ කරණ ලද පූර්ව ප්‍රයෝග රහිත වූ **ඒකං (කුසලචිත්තං)** එක් කුසල චිත්තයෙක. **සසඞ්ඛාරිකං** යථෝක්ත වූ පූර්ව ප්‍රයෝග සහිත වූ **ඒකං** එක් කුසල චිත්තයෙක තුන්වන සතරවන චිත්තය ඤාණ විප්‍රයුක්ත වූ යනු වෙනසයි. අවශිෂ්ට සතර සිත් **උපෙක්ඛා සහගතං** මධ්‍යස්ථානුභවන ලක්‍ෂණ වූ උපෙක්ඛා වේදනාව හා ඒකෝත්පාදදි භාවයට ගියා වූ යැයි යනු වෙනසයි. **ඉමානි අට්ඨ** මොහු අට දෙන **කාමාවචරකුසලචිත්තානි නාම** කාමාවචර කුසල චිත්තයෝ නම්. **[අභිධර්මාර් සඞ්ග්‍රහ සන්නය 17 පිට]**

## කාමාවචර කුසලචිත්තයාගේ ලක්‍ෂණාදිය:—

තදේතං ලක්ඛණාදිවසේන අනවජ්ජසුඛවිපාකලක්ඛණං, අකුසලවිද්ධංසනරසං, වෝදානපච්චුපට්ඨානං, යෝනිසෝමනසිකාරපදට්ඨානං. සාවජ්ජපටිපක්ඛත්තා වා අනවජ්ජලක්ඛණමේව කුසලං, වෝදානභාවරසං, ඉට්ඨවිපාකපච්චුපට්ඨානං, යථාවුත්තපදට්ඨානමේව.

**[ධම්මසඞ්ගණි අටුවා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය යටතේ); ධම්මසඞ්ගණි අටුවා 81 පිට (හේ.වි.මු)]**

විපාකාදීනං අවජ්ජපටිපක්ඛතා නත්ථීති කුසලමේව අනවජ්ජලක්ඛණං වුත්තං. **අනවජ්ජලක්ඛණමේවාති** සුඛවිපාකසභාවස්ස ලක්ඛණභාවනිවාරණත්ථං අවධාරණං කතං, තං නිවාරණඤ්ච තස්ස පච්චුපට්ඨානතං වත්ථුකාමතාය කතං. සම්පත්ති අත්ථේන රසේන **වෝදානභාවරසං**. ඵලට්ඨේන පච්චුපට්ඨානේන **ඉට්ඨවිපාකපච්චුපට්ඨානං.**

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය යටතේ)]**

**තං ඒතං (කුසලචිත්තං)** ඒ මේ කුසල චිත්තය තෙමේ **ලක්ඛණාදිවසේන** ලක්‍ෂණාදි වශයෙන් **අනවජ්ජසුඛවිපාකලක්ඛණං** වැරදි නැති හොඳ විපාක දීමේ ස්වභාව ලක්‍ෂණයයි **අකුසලවිද්ධංසනරසං** අකුසල වනසන බව කෘත්‍යය රසයයි **වෝදානපච්චුපට්ඨානං** පිරිසිදු බව උපට්ඨානාකාර පච්චුපට්ඨානයයි **යොනිසෝමනසිකාරපදට්ඨානං** යෝනිසෝමනසිකාරය ආසන්න කාරණයයි **වා**

වෙනත් ආකාරයකට **සාවජ්ජපටිපක්ඛත්තා** වැරදි සහිත වූ අකුසල ධර්මයන්ට ප්‍රතිවිරුද්ධ පැත්තෙහි වන බැවින් කුසලය වනාහි **අනවජ්ජලක්ඛණමේව** වැරදි නැති බව ස්වභාව ලක්‍ෂණයයි **වෝදනභාවරසං** පිරිසිදු බව සම්පත්ති රසයයි **ඉට්ඨවිපාකපච්චුපට්ඨානං** හොඳ ඉෂ්ටවිපාක ඵල තිබීම ඵල පච්චුපට්ඨානයයි **යථාවුත්තපදට්ඨානමේව** යොනිසෝමනසිකාරය ආසන්න කාරණයයි

**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තන]**

අනවජ්ජසුඛවිපාකලක්ඛණා කුසලා.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා තිකමාතිකාපද වණ්ණනා අංක 01 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 63 පිට (හේ.වි.මු)]**

**අනවජ්ජසුඛවිපාකලක්ඛණා**ති එත්ථ නත්ථි ඒතේසං අවජ්ජන්ති අනවජ්ජා, ගරහිතබ්බභාවරහිතා නිද්දෝසාති අත්ථෝ. තේන නේසං අගරහිතබ්බභාවං දස්සේති, න ගාරය්හවිරහමත්තං. අඤ්ඤේද්පි අත්ථි නිද්දෝසා අබ්‍යාකතාති අනවජ්ජවචනමත්තේන තේසම්පි කුසලතාපත්තිදෝසං දිස්වා තං පරිහරිතුං සුඛවිපාකවචනං ආහ. අවජ්ජපටිපක්ඛා වා ඉධ අනවජ්ජාති වුත්තා, න **බාහිතිකසුත්තේ** (ම. නි. 2.361) විය පටිප්පස්සද්ධාවජ්ජා විරහිතාවජ්ජමත්තා වා, තස්මා අනවජ්ජවචනේන අවජ්ජවිනාසනභාවෝ දස්සිතෝ. අබ්‍යාකතේහි පන විසිට්ඨං කුසලාකුසලානං සාධාරණං සවිපාකතාලක්ඛණන්ති තස්මිං ලක්ඛණේ විසේසදස්සනත්තං සුඛවිපාකවචනං අවෝච. සිද්ධෝ හි පුරිමේනේව අකුසලාබ්‍යාකතේහි කුසලානං විසේසෝති. සුඛෝ විපාකෝ ඒතේසන්ති සුඛවිපාකා. තේන කුසලාකුසලානං සාමඤ්ඤේ විපාකධම්මභාවේ සුඛවිපාකවිපච්චනසභාවං දස්සේති, න තේසං සුඛවිපාකසබ්භාවමේව. අනවජ්ජා ච තේ සුඛවිපාකා චාති අනවජ්ජසුඛවිපාකා. කුසලා ලක්ඛීයන්ති ඒතේනාති ලක්ඛණං, අනවජ්ජසුඛවිපාකලක්ඛණං ඒතේසන්ති **අනවජ්ජසුඛවිපාකලක්ඛණා**. නනු තේ ඒව කුසලා අනවජ්ජසුඛවිපාකා, කථං තේ සයමේව අත්තනෝ ලක්ඛණං හොන්තීති? විඤ්ඤාතාවිඤ්ඤාතසද්දත්ථභාවේන ලක්ඛණලක්ඛිතබ්බභාවයුත්තිතෝ. කුසලසද්දත්ථවසේන හි අවිඤ්ඤාතා කුසලා ලක්ඛිතබ්බා හොන්ති, අනවජ්ජසුඛවිපාකසද්දත්ථභාවේන විඤ්ඤාතා ලක්ඛණන්ති යුත්තමේතං. අථ වා ලක්ඛීයතීති ලක්ඛණං, සභාවෝ. අනවජ්ජසුඛවිපාකා ච තේ ලක්ඛණඤ්චාති **අනවජ්ජසුඛවිපාකලක්ඛණා,** අනවජ්ජසුඛවිපාකා හුත්වා ලක්ඛියමානා සභාවා කුසලා නාමාති අත්ථෝ.

අථ වා අනවජ්ජවචනේන අනවජ්ජත්තං ආහ, සුඛවිපාකවචනේන සුඛවිපාකත්තං, තස්මා අනවජ්ජඤ්ච සුඛවිපාකෝ ච අනවජ්ජසුඛවිපාකං, තං ලක්ඛණං ඒතේසං කරණත්ථේ ච කම්මත්ථේ ච ලක්ඛණසද්දේ සභාවභූතන්ති **අනවජ්ජසුඛවිපාකලක්ඛණා,** අනවජ්ජසුඛවිපාකසභාවේන ලක්ඛියමානා තං සභාවවන්තෝ ච කුසලාති වුත්තං හෝති. තත්ථ අනවජ්ජවචනේන පවත්තිසුඛතං කුසලානං දස්සේති, සුඛවිපාකවචනේන විපාකසුඛතං. පුරිමඤ්හි අත්තනෝ පවත්තිසභාවවසේන ලක්ඛණතාවචනං, පච්ඡිමං කාලන්තරේ විපාකුප්පාදනසමත්ථතායාති. තථා පුරිමේන කුසලානං අත්තසුද්ධිං දස්සේති, පච්ඡිමේන විසුද්ධවිපාකතං. පුරිමේන ච කුසලං අකුසලසභාවතෝ නිවත්තේති, පච්ඡිමේන අබ්‍යාකතසභාවතෝ සවිපාකත්තදීපකත්තා පච්ඡිමස්ස. පුරිමේන වා වජ්ජපටිපක්ඛභාවදස්සනතෝ කිච්චට්ඨේන රසේන අකුසලවිද්ධංසනරසතං දීපේති, පච්ඡිමේන සම්පත්තිඅත්ථේන ඉට්ඨවිපාකරසතං. පුරිමේන ච උපට්ඨානාකාරට්ඨේන පච්චුපට්ඨානේන වෝදනපච්චුපට්ඨානතං දස්සේති, පච්ඡිමේන ඵලත්ථේන

සුඛවිපාකපච්චුපට්ඨානතං. පුරිමේන ච යෝනිසෝමනසිකාරං කුසලානං පදට්ඨානං විභාවේති. තතෝ හි තේ අනවජ්ජා ජාතාති. පච්ඡිමේන කුසලානං අඤ්ඤෙඤ්සං පදට්ඨානභාවං දස්සේති. තේ හි සුඛවිපාකස්ස කාරණං හොන්තීති. එත්ථ ච සුඛවිපාකසද්දේ සුඛසද්දෝ ඉට්ඨපරියායවචනන්ති දට්ඨබ්බෝ. ඉට්ඨචතුක්ඛන්ධවිපාකා හි කුසලා, න සුඛවේදනාවිපාකාව. සඞ්ඛාරදුක්ඛෝපසම සුඛවිපාකතාය ච සම්භවෝ ඒව නත්ථි. න හි තං විපාකෝති. යදි පන විපාකසද්දෝ ඵලපරියායවචනං, නිස්සන්දවිපාකේන ඉට්ඨරූපේනාපි සුඛවිපාකතා යෝජේතබ්බා.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා තිකමාතිකපද වණ්ණනා අංක 01 යටතේ)]**

**තං පරිහරිතු**න්ති අබ්‍යාකතනිවත්තනමාහ. යදි ඒවං "සුඛවිපාකානවජ්ජා"ති වත්තබ්බං. අනවජ්ජා හි බ්‍යභිචාරිතාය විසේසිතබ්බාති? න, සුඛවිපාකවචනස්ස විසේසනභාවේන අග්ගහිතත්තා. සුඛවිපාකවචනේන හි කුසලභාවේ සමත්තෝ විඤ්ඤාදයති, අනවජ්ජවචනං පනෙත්ථ කුසලානං අගරහිතබ්බතාසඞ්ඛාතං කඤ්චි විසේසමාහ. තේනේව ච තස්ස විසේසනභාවේන වුත්තස්ස පවත්තිසුඛතාදිදස්සනභාවං සයමේව වක්ඛතීති. මනෝසමාචාරවිසේසභූතා ඵලධම්මා විසේසේන පටිප්පස්සද්ධාවජ්ජා නාම හොන්තීති සමාචාරත්තයවසේන තස්මිං සුත්තේ අනවජ්ජධම්මානං වුත්තත්තා ච තේ අනවසේසතෝ සඞ්ගහෙත්වා දස්සේතුං **"විරහිතාවජ්ජමත්තා"**ති වුත්තං. **අවජ්ජවිනාසනභාවෝ දස්සිතෝ** කණ්හසුක්කධම්මානං වජ්ඣඝාතකභාවස්ස නියතත්තා. **සවිපාකතා** විපාකධම්මතා. **සුඛෝ විපාකෝ ඒතේසන්ති සුඛවිපාකා**ති ඉමිනා සමාසේන කුසලානං සුඛවිපාකවන්තතා වුත්තා. සා ච නේසං න තං සමඞ්ගිතාය අසහවත්තනතෝති තදුප්පාදනසමත්ථතාති විඤ්ඤාදයතීති වුත්තං **"සුඛවිපාකවිපච්චනසභාවං දස්සේතී"**ති. **යුත්තමේත**න්ති පරමත්ථතෝ භේදාභාවේපි යථාවුත්තවචනවචනීයභාව සඞ්ඛාතෝ භේදෝ තස්මිං අභිධෙය්‍යත්ථභූතේ වත්ථුස්මිං උපචාරේන හෝතීති යුත්තමෙත්ථ ලක්ඛණලක්ඛිතබ්බභාවේන භේදවචනං. භවති හි සද්දත්ථ විසේසමත්තේනපි අභින්නේ වත්ථුස්මිං භේදවචනං යථා "සිලාපුත්තකස්ස සරීර"න්ති.

විනාපි භාවාභිධායිනා සද්දේන භාවප්පධානෝ නිද්දේසෝ හෝතීති වුත්තං **"අනවජ්ජවචනේන අනවජ්ජත්තං ආහා"**ති. ඒවඤ්චෙත්ථ පදවිග්ගහෝ ගහේතබ්බෝ න අවජ්ජං අනවජ්ජං, අවජ්ජපටිපක්ඛතාය අගරහිතබ්බසභාවෝ. සුඛෝ විපාකෝ අස්සාති සුඛවිපාකං, සුඛවිපාකවිපච්චනසමත්ථතා. අනවජ්ජඤ්ච තං සුඛවිපාකඤ්චාති අනවජ්ජසුඛවිපාකං, තං ලක්ඛණං ඒතේසන්ති **අනවජ්ජසුඛවිපාකලක්ඛණා**. අථ වා පුබ්බේ විය අනවජ්ජං, විපච්චනං විපාකෝ, සුඛස්ස විපාකෝ සුඛවිපාකෝ, අනවජ්ජඤ්ච සුඛවිපාකෝ ච අනවජ්ජසුඛවිපාකං ඒකත්තවසේන. තං ලක්ඛණං ඒතේසන්ති **අනවජ්ජසුඛවිපාකලක්ඛණා**. කිං පනෙත්ථ කාරණං පදද්වයපරිග්ගහේ, නනු ඒකේනේව පදේන ඉට්ඨප්පසිද්ධි. යදිපි "අවජ්ජරහිතං අනවජ්ජ"න්ති ඉමස්මිං පන පක්ඛේ අබ්‍යාකතනිවත්තනත්ථං සුඛවිපාකග්ගහණං කත්තබ්බං සියා, සුඛවිපාකග්ගහණේ පන කතේ අනවජ්ජග්ගහණං න කත්තබ්බමේව. "අවජ්ජපටිපක්ඛා අනවජ්ජා"ති ඒතස්මිං පන පක්ඛේ සුඛවිපාකග්ගහණඤ්චාති චෝදනං මනසි කත්වා ආහ **"තත්ථ අනවජ්ජවචනේනා"**තිආදි. තේන පවත්තිසුඛසුඛවිපාකතා අත්තසුද්ධිවිසුද්ධවිපාකතා අකුසලඅබ්‍යාකතසභාවනිවත්තිරසපච්චුපට්ඨානපදට්ඨානවිසේසදීපනතෝ ඒවං විපුලප්පයෝජනත්ථෝ පදද්වයපරිග්ග හෝති දස්සේති. **සුඛ**-සද්දස්ස ඉට්ඨපරියායතා විය "නිබ්බානපරමං සුඛං (ධ. ප. 203-204), සුඛා විරාගතා ලෝකෝ (උද. 11), තේසං වූපසමෝ සුඛෝ"තිආදීසු (දී. නි. 2.221, 272)

සඞ්ඛාරදුක්ඛූපසමපරියායතාපි විජ්ජති, තං අවිපාකතාය පන ඉධ සුඛවිපාකභාවෝ න සක්කා වත්තුන්ති දස්සෙන්තෝ ආහ **"සඞ්ඛා…පෙ…. නත්ථී"**ති. ඉදං වුත්තං හෝති තේභූමකකුසලානම්පි විවට්ටසන්නිස්සයභාවේන පවත්තිසභාවත්තා කිඤ්චාපි සබ්බේ කුසලා සඞ්ඛාරදුක්ඛූපසමසුඛනිප්ඵාදකා සම්භවන්ති, යථාවුත්තසුඛස්ස පන අවිපාකභාවතෝ න ඒතේන පදේන කුසලානං සුඛවිපාකතා සම්භවතීති. විපක්කභාවමාපන්නේසු අරූපධම්මේසු නිරුළ්හත්තා **විපාක**-සද්දස්ස **"යදි පනා"**ති සාසඞ්කං වදති.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා තිකමාතිකාපද වණ්ණනා අංක 01 යටතේ)]**

**අනවජ්ජසුඛවිපාකලක්ඛණා** ගරහා කටයුතු වූ ස්වභාවයෙන් වෙන්වූ ඉෂ්ට වූ සතර නාමස්කන්ධ සඞ්ඛ්‍යාත වූ සැප විපාක දීම ස්වභාව කොට ඇත්තා වූ ධර්මයෝ තුමූ **කුසලා හොන්ති** කුසල් නම් වෙත් (වජ්ජිතබ්බං ගරහිතබ්බං යනුවෙන් විග්‍රහ කටයුතුයි. වජ්ජ ශබ්දය තෙමේ භාව ප්‍රධාන වූ හෙයින් ගරහා කටයුතු ස්වභාව ලැබෙන්නේයි. "වජ්ජං ඒව අවජ්ජං" යනුවෙන් විග්‍රහ කටයුතුයි. අවජ්ජ ශබ්දයාගේ අ-කාර තෙමේ තබ්භාවයෙහි වැටේ. "නත්ථි අවජ්ජං ඒතේසන්ති අනවජ්ජං" යනුවෙන් විග්‍රහ කටයුතු වූ ශබ්දයෙන් කුසල ලැබෙන්නේයි. එහි අ-කාර ශබ්ද තෙමේ විරහාර්ථ ඇත්තේයි. අකුසලයන්ට වනාහි රාගාදී ක්ලේශ දෝෂ ඇති බැවින් ගරහා කටයුතු ස්වභාවෙන් වෙන් වූ ධර්මය යනාර්ථයි)

"ගරහිතබ්බභාවරහිතා නිද්දෝසාති අත්ථෝ. තේන නේසං අගරහිතබ්බභාවං දස්සේති. න ගාරය්හවිරහමත්තා" යනු මූලටීකායි. **නිද්දෝසා (නිද්දෝසත්තා)** ගැරහිය යුතු රාගාදී දෝෂයෙන් පහවූ හෙයින් **ගරහිතබ්බභාවරහිතා හොන්ති** ප්‍රඥයන් විසින් ගරහා කටයුතු භාවයෙන් පහවූවාහු වෙත් **ඉති (අත්ථෝ)** යන මේ අර්ථය **දට්ඨබ්බෝ** දතයුත්තේයි **තේන** ඒ අනවජ්ජ ශබ්දය කරණකොටගෙන **නේසං** ඒ කුසල ධර්මයන්ගේ **අගරහිතබ්බභාවං** ප්‍රඥයන් විසින් ගරහා නොකටයුතු බව **දස්සේති** දක්වයි **ගාරය්හවිරහමත්තං** ගරහා කටයුතු රාගාදී දෝෂයෙන් වෙන් වූ බැව් මාත්‍රයක් **න දස්සේති** නොදක්වයි යනු ටීකා පාඨයාගේ අර්ථයි.෴

අනවජ්ජ ශබ්දය කරණකොටගෙන කුසලයාගේ ලක්‍ෂණය ප්‍රකාශ කරමින් සුඛ විපාක ශබ්දය කුමක් හෙයින් දක්වන ලද්දේදැයි යනු චෝද්‍යයි. "අඤ්ඤේ අත්ථි නිද්දෝසා අබ්‍යාකතාති අනවජ්ජවචනමත්තේන තේසං කුසලතාපත්තිදෝසං දිස්වා තං පරිහරිතුං සුඛවිපාකවචනං ආහ" යනුවෙන් ඒ ප්‍රශ්නය මූලටීකායෙහි විසඳන ලද්දේය. **අඤ්ඤේ** කුසලයන් කෙරෙන් අන්‍යවූ **නිද්දෝසා** නිර්දෝෂ වූ **අබ්‍යාකතා** අව්‍යාකෘත ධර්මයෝ **අත්ථි** ඇත්තාහුය **ඉති** එසේ හෙයින් **අනවජ්ජවචනමත්තේන** අනවජ්ජ ශබ්ද මාත්‍රයෙකින් **තේසම්පි** ඒ අව්‍යාකෘත ධර්මයන්ගේ ද **කුසලතාපත්තිදෝසං දිස්වා** කුසල් බවට පැමිණෙන්නේය යන දෝෂය දැක **තං පරිහරිතුං** ඒ දෝෂය පහකරනු පිණිස **සුඛවිපාකවචනං** සුඛවිපාක ශබ්දය **සඞ්ගහකාරෝ** පුරාතන අර්ථකථාව සඞ්ග්‍රහ කළාවූ බුද්ධඝෝෂාචාර්‍ය්‍යයන් වහන්සේ **ආහ** කීයේය (නොහොත්) **අනවජ්ජසුඛවිපාකලක්ඛණා** සාධු සත්පුරුෂයන් විසින් අත්හරින ලද ගරහා කරනලද ක්ලේශයන්ට ප්‍රතිපක්‍ෂ වූ ඉෂ්ට වූ සතර නාමස්කන්ධ සඞ්ඛ්‍යාත විපාකදීම ස්වභාව කොට ඇත්තා වූ ධර්මයෝ තුමූ **කුසලා හොන්ති** කුසල නම් වෙත්.෴

("සාධූහි වජ්ජිතබ්බා පරිවජ්ජේතබ්බා පරිවජ්ජිතබ්බා ගරහිතබ්බා අනිට්ඨඵලත්තාති වජ්ජා අවජ්ජා ඒව අවජ්ජා රාගාදයෝ කිලේසා න වජ්ජා අනවජ්ජා

තේසං පටික්ඛාති අත්ථෝ" යනු මූලටීකායි. අනවජ්ජා යන පද තෙමේ න ශබ්දය අපේක්ෂා නොකොට හුදකළා ශබ්දයක් වී නම් රාගාදී වූ ක්ලේශ වාචක වේ. න ශබ්දය හා සම්බන්ධ කොට න අවජ්ජා අනවජ්ජා යනුවෙන් වාක්‍යය ගත් කල්හි කුසල වාචක වන හෙයින් න ශබ්දය හා තුල්‍යාධිකරණව කම්මධාරය සමාස වේ. මේ වනාහි පුරාතන ආචාර්‍ය්‍යවරයන්ගේ පරම්පරානුයාත අර්ථ වාර්ණනා ක්‍රමයයි. "අනවජ්ජවචනේන අවජ්ජවිනාසනභාවෝ දස්සිතෝ" යනු ද මූලටීකායි) **අනවජ්ජවචනේන** ප්‍රතිපක්ෂාර්ථ ඇත්තාවූ අනවජ්ජ ශබ්දය කරණකොටගෙන **අවජ්ජවිනාසනභාවෝ** සාධු සත්පුරුෂයන් විසින් අත්හරනා ලද ගරහන ලද රාගාදී ක්ලේශ ධර්මයන් විනාශ කරන බව **දස්සිතෝ හෝති** දක්වන ලද්දේ වෙයි "සුඛවිපාකෝ ඒතේසන්ති සුඛවිපාකා. තේන කුසලාකුසලානං සාමඤ්ඤෙද්පි විපාකධම්මභාවේපි සුඛවිපාකවිපච්චනභාවං දස්සේති, න තේසං සුඛවිපාකභාවමේව" යනු ද මූලටීකායි. **තේන** ඒ සුඛවිපාක ශබ්දය කරණකොටගෙන **කුසලාකුසලානං** කුසලාකුසල ධර්මයන්ගේ **විපාකධම්මභාවේ** විපාක උපදවන්නා වූ ස්වභාව **සාමඤ්ඤෙද්පි** සමාන වතුදු **සුඛවිපාකවිපච්චනභාවං** ඉෂ්ට වූ නාමස්කන්ධ සඞ්ඛ්‍යාත විපාකය උපදවන බව **දස්සේති** දක්වයි **තේසං** ඒ කුසල ධර්මයන්ගේ **සුඛවිපාකසභාවමේව** ඉෂ්ට වූ නාමස්කන්ධ සඞ්ඛ්‍යාත විපාකයාගේ ප්‍රකටව ඇති බවම **න දස්සේති** නොදක්වයි යනු ටීකා පාඨාර්ථයි. (නොහොත්) **අනවජ්ජසුඛවිපාකලක්ඛණා** ප්‍රඥයන් විසින් ගැරහිය යුතු ස්වභාවයෙන් වෙන්වූ බව (නොහොත්) ප්‍රඥයන් විසින් ගැරහිය යුතුවූ දුරුකටයුතු වූ රාගාදී ක්ලේශයන්ගේ ප්‍රතිපක්ෂ භාවය ඉෂ්ට වූ සතර නාමස්කන්ධ සඞ්ඛ්‍යාත විපාක ඇති බව යන මේ ද්විප්‍රකාර ලක්ෂණ ඇත්තාවූ ස්වභාව ධර්මයෝ තුමූ **කුසලා හොන්ති** කුසල නම් වෙත් "අථ වා අනවජ්ජවචනේන අනවජ්ජත්තං ආහ, සුඛවිපාකවචනේන සුඛවිපාකත්තං" යනු ද මූලටීකායි. **අථ වා** නොහොත් **අනවජ්ජවචනේන** අනවජ්ජ ශබ්දය කරණකොටගෙන **අනවජ්ජත්තං** නිරවද්‍ය ස්වභාව **ආහ** කීයේයි **සුඛවිපාකවචනේන** සුඛවිපාක ශබ්දය කරණකොටගෙන **සුඛවිපාකත්තං** සුපවිපාක ඇති බව **ආහ** කීයේයි යනු ටීකා පාඨාර්ථයි. "විනාපි භාවාභිධායිනා සද්දේන භාවප්පධානෝ නිද්දේසෝ හෝතීති වුත්තං. අනවජ්ජවචනේන අනවජ්ජත්තං ආහාති" යනු අනුටීකායි.

**[අර්ථශාලිනී අර්ථකථා සන්නය 205-207 පිටු]**

ඡේකේ කුසලසද්දෝයං, ආරෝග්‍යේ අනවජ්ජකේ;
දිට්ඨෝ ඉට්ඨවිපාකේපි, අනවජ්ජාදිකේ ඉධ.

තස්මා අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං කුසලං, අකුසලවිද්ධංසනරසං, වෝදානපච්චුපට්ඨානං. වජ්ජපටිපක්ඛත්තා අනවජ්ජලක්ඛණං වා කුසලං, වෝදානභාවරසං, ඉට්ඨවිපාකපච්චුපට්ඨානං, යෝනිසෝමනසිකාරපදට්ඨානං. සාවජ්ජානිට්ඨවිපාකලක්ඛණමකුසලං. තදුභයවිපරීතලක්ඛණමබ්‍යාකතං, අවිපාකාරහං වා. **[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 11 යටතේ)]**

**කුසලසද්දෝයං** අයං කුසලසද්දෝ ඡේකේ අත්ථේ ආරෝග්‍යත්ථේ අනවජ්ජත්ථේ ඉට්ඨවිපාකේ අත්ථේපි දිට්ඨෝ අම්හේහි. **ඉධ** ඉමස්මිං අධිකාරේ අනවජ්ජාදිකේ අත්ථේ දිට්ඨෝ. **ආදි-**සද්දේන ආරෝග්‍යත්ථ ඉට්ඨවිපාකත්ථා ගහේතබ්බා. දිට්ඨෝ යස්මා, තස්මා අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං කුසලං. නත්ථි අවජ්ජං කිලේසාවජ්ජං කිලේසදෝසෝ කිලේසදරථෝ ඒතස්සාති අනවජ්ජං, කම්මේන විපච්චීයතේති විපාකෝ, ඉට්ඨානිට්ඨාදිආරම්මණානුභවනවසේන, අත්තනෝ සභාවේන ච ඉට්ඨෝ විපාකෝ ඒතස්සාති ඉට්ඨවිපාකං, අනවජ්ජමේව ඉට්ඨවිපාකං,

තං ලක්ඛීයති අනේන අවිඤ්ඤාතං ලක්ඛිතබ්බං කුසලන්ති ලක්ඛණං, අනවජ්ජඉට්ඨවිපාකං ලක්ඛණං ඒතස්සාති **අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං**. අනවජ්ජඉට්ඨවිපාකමේව කුසලං. නනු කථං සයමේව අත්තනෝ ලක්ඛණං භවෙය්‍යාති චෝදනා භවෙය්‍ය විඤ්ඤාතාවිඤ්ඤාතසද්දත්ථභාවේන ලක්ඛණලක්ඛිතබ්බභාවයුත්තිතෝ. කුසලසද්දත්ථවසේන හි අවිඤ්ඤාතං අපාකටං කුසලං ලක්ඛිතබ්බං හෝති. අනවජ්ජඉට්ඨවිපාකසද්දත්ථවසේන විඤ්ඤාතං පාකටං කුසලං ලක්ඛණං හෝති. **අකුසලවිද්ධංසනරසං** අකුසලානං විද්ධංසනං අකුසලවිද්ධංසනං, තං රසෝ කිච්චමේතස්සාති අකුසලවිද්ධංසනරසං, අකුසලවිද්ධංසනකිච්චං. වෝදානභාවේන පච්චුපට්ඨාතීති **වෝදානපච්චුපට්ඨානං,** වෝදානඋපට්ඨානාකාරං වෝදානගය්හාකාරං. **වා** අයං අඤ්ඤො නයෝ. වජ්ජපටිපක්ඛත්තා අනවජ්ජලක්ඛණමේව කුසලං, වජ්ජපටිපක්ඛලක්ඛණං කුසලන්ති අත්ථෝ. **වෝදානභාවරසං** වෝදානභාවසම්පත්තිකං. **ඉට්ඨවිපාකපච්චුපට්ඨානං** ඉට්ඨවිපාකඵලං. යෝනිසෝමනසිකාරපදට්ඨානං පදඤ්ච තං ඨානඤ්චාති පදට්ඨානං, උභෝ කාරණත්ථාධිවචනං, තස්මා ආසන්නකාරණන්ති අත්ථෝ, ඉතරථා පුනරුත්තිදෝසෝ සියා, යෝනිසෝමනසිකාරෝ පදට්ඨානං ආසන්නකාරණං ඒතස්සාති **යෝනිසෝමනසිකාරපදට්ඨානං**.

සාවජ්ජානිට්ඨවිපාකලක්ඛණං අකුසලං. තදුභයවිපරීතං තේහි උභයේහි කුසලාකුසලේහි විපරීතං අවිපාකලක්ඛණං ඒතස්සාති **තදුභයවිපරීතලක්ඛණං** අබ්‍යාකතං. **වා** අයං අඤ්ඤො නයෝ. **අවිපාකාරහං** විපාකස්ස අනනුච්ඡවිකං.

**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 11 යටතේ)]**

ඉදානි කුසල-සද්දස්ස අත්ථුද්ධාරදස්සනත්ථමාහ **"ඡේකේ කුසල-සද්දෝය"**න්තිආදි. තත්ථ "කුසලෝ ත්වං රථස්ස අඞ්ගපච්චඞ්ගානං (ම. නි. 2.87), කුසලානච්චගීතස්ස, සික්ඛිතා චාතුරිත්ථියෝ"තිආදීසු (ජා. 2.22.94) **ඡේකේ** දිට්ඨෝ, ඡේකපරියායෝ පවීණත්ථෝති අත්ථෝ. "කච්චි නු භෝතෝ කුසලං, කච්චි භෝතෝ අනාමය"න්තිආදීසු (ජා. 1.15.146; 2.20.129) **ආරෝග්‍යේ**. "කතමෝ පන, භන්තේ, කායසමාචාරෝ කුසලෝ? යෝ ඛෝ, මහාරාජ, කායසමාචාරෝ අනවජ්ජෝ"ති (ම. නි. 2.361) ච "අපරං පන, භන්තේ, ඒතදනුත්තරියං, යථා භගවා ධම්මං දේසේති කුසලේසු ධම්මේසූ"ති (දී. නි. 3.145) ච ඒවමාදීසු **අනවජ්ජේ**. "කුසලානං ධම්මානං සමාදානහේතු ඒවමිදං පුඤ්ඤං වඩ්ඪති (දී. නි. 3.80), කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා"ති (ධ. ස. 431) ච ආදීසු **ඉට්ඨවිපාකේ. අනවජ්ජාදිකේ**ති අනවජ්ජඉට්ඨවිපාකේ, "අනවජ්ජාදිකේ"ති ච අත්තනා වක්ඛමානලක්ඛණස්ස අනුරූපත්තා වුත්තං, න පන ආරෝග්‍යත්ථස්ස අසම්භවතෝ. කිලේසරෝගස්ස හි අභාවතෝ කුසලං ආරෝග්‍යං හෝති.

වජ්ජා රාගාදයෝ, තේ යස්ස න සන්ති, තං අනවජ්ජං, ඉට්ඨෝ විපාකෝ චතුක්ඛන්ධසඞ්ඛාතෝ යස්ස, තං ඉට්ඨවිපාකං, ඉට්ඨවිපාකතා චස්ස තං සභාවවන්තතාය දට්ඨබ්බා, න තස්ස අවස්සං ඉට්ඨවිපාකසම්භවතෝයේව, ලක්ඛීයති අනේනාති ලක්ඛණං, අනවජ්ජඤ්ච තං ඉට්ඨවිපාකඤ්චාති අනවජ්ජඉට්ඨවිපාකං. තං ලක්ඛණමස්සාති **අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං**.

නනු ච කුසලමේව අනවජ්ජඉට්ඨවිපාකං, වුත්තනියාමේන පන අනවජ්ජඉට්ඨවිපාකතෝ අඤ්ඤං කුසලං සියා. න හි සයමේව අත්තනෝ ලක්ඛණන්ති සක්කා වත්තුන්ති? නායං දෝසෝ පරිඤ්ඤාතාපරිඤ්ඤාත

වචනත්ථභාවභේදේ ඒකස්සාපි ලක්ඛිතබ්බලක්ඛණභාවපරිකප්පනතෝ. "අනවජ්ජඉට්ඨවිපාක"න්ති හි පරිච්ඡන්නවචනත්ථං. "කුසල"න්ති අපරිච්ඡන්නවචනත්ථං. ඒවඤ්ච යේන සභාවේන පරිච්ඡන්නවචනත්ථස්ස සද්දස්ස අත්ථෝ හෝති, යේන ච අපරිච්ඡන්නවචනත්ථස්ස, තේසං පරිච්ඡන්නාපරිච්ඡන්නවචනත්ථසභාවානං භේදේන තං සමඞ්ගිස්ස කුසලස්ස ඒකස්සාපි භේදෝ පරිකප්පීයති යථා "පුරේ භවං පටු ආසි, පටුතරෝ ඒතරහී"ති ගුණභේදේන, වත්ථුභේදේන ච පරිකප්පීයති, තස්මා පරිච්ඡන්නවචනත්ථභාවේන ලක්ඛණං, අපරිච්ඡන්නවචනත්ථභාවේන ලක්ඛිතබ්බන්ති ඒවං පරිකප්පිතභේදේ පරිග්ගය්හමානේ න කෝචි දෝසෝ ආපජ්ජති.

අථ වා ලක්ඛීයතීති ලක්ඛණං, අනවජ්ජඉට්ඨවිපාකඤ්ච තං ලක්ඛණඤ්චාති **අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං,** යං අනවජ්ජඉට්ඨවිපාකං හුත්වා ලක්ඛීයති, තං කුසලන්ති අත්ථෝ. අථ වා අනවජ්ජ-සද්දේන අනවජ්ජභාවෝ වුත්තෝ, ඉට්ඨවිපාකසද්දේන ඉට්ඨවිපාකභාවෝ, තස්මා අනවජ්ජෝ ච ඉට්ඨවිපාකෝ ච අනවජ්ජඉට්ඨවිපාකං, තං ලක්ඛණමේතස්සාති කරණත්ථේ, කම්මත්ථේ වා ලක්ඛණ-සද්දේන අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණන්ති අනවජ්ජඉට්ඨවිපාකසභාවවන්තං, අනවජ්ජඉට්ඨවිපාකභාවේන ලක්ඛිතබ්බං වාති අත්ථෝ. කිං පනෙත්ථ කාරණං පදද්වයපරිග්ගහේන, නනු ඒකේනේව පදේන අධිප්පේතත්ථසිද්ධි සියා. කිඤ්චාපි හි "අනවජ්ජලක්ඛණ"න්ති වුත්තේ "අපරං පන, භන්තේ, ඒතදනුත්තරියං, යථා භගවා ධම්මං දේසේති කුසලේසු ධම්මේසූ"තිආදීසු (දී. නි. 3.145) විය වජ්ජරහිතත්තා අබ්‍යාකතස්සාපි පසඞ්ගෝ සියාති ඉට්ඨවිපාක-පදං වත්තබ්බමේව, "ඉට්ඨවිපාකලක්ඛණ"න්ති පන වුත්තේ ඉතරං න වත්තබ්බං අබ්‍යාකතස්ස විපාකාරහභාවේන ඉට්ඨවිපාකතාපසඞ්ගභාවතෝ? සච්චමේතං, අනවජ්ජ-පදේන කුසලස්ස පවත්තිසුඛතං, ඉට්ඨවිපාක-පදේන ච විපාකසුඛතං දස්සේතුං පදද්වයං වුත්තං. අනවජ්ජපදඤ්හි අත්තනෝ පවත්තිසභාවවසේන ලක්ඛණවචනං, ඉතරං කාලන්තරේ විපාකුප්පාදනසමත්ථතාවසේනාති. අථ වා කුසලස්ස අත්ථවිසුද්ධිං දස්සේතුං පුරිමපදං වුත්තං, පරිසුද්ධවිපාකතං දස්සේතුං පච්ඡිමං. පුරිමං වා කුසලස්ස අකුසලසභාවතෝ නිවත්තනං, පච්ඡිමං අබ්‍යාකතසභාවතෝති අලමතිපපඤ්චේන. එත්ථ ච "අනවජ්ජ...පෙ.... ලක්ඛණ"න්ති වචනේන කුසලස්ස සාමඤ්ඤලක්ඛණං වුත්තං අනවජ්ජඉට්ඨවිපාකසභාවස්ස කුසලජාතියා සාධාරණත්තා. අකුසලාදීනමසාධාරණභාවේන සභාවලක්ඛණං වාති දට්ඨබ්බං.

**අකුසලවිද්ධංසනරස**න්ති යථානුරූපං අකුසලප්පජහනකිච්චං. කුසලඤ්හි පරිත්තමහග්ගතලෝකුත්තරභේදභින්නං යථාක්කමං තදඞ්ග-වික්ඛම්භන-සමුච්ඡේදප්පහානවසේන අකුසලපක්ඛං පජහති. අථ තදඞ්ගාදිප්පහානානං කිං නානාකරණන්ති? වුච්චතේ; දානාදිපුඤ්ඤකිරියවත්ථුගතේන තේන තේන කුසලඞ්ගේන තස්ස තස්ස මච්ඡේරාදි අකුසලඞ්ගස්ස පහානං **තදඞ්ගප්පහානං,** තං දීපාලෝකේන අන්ධකාරවිද්ධංසනං විය දට්ඨබ්බං, කාමාවචරකුසලානං පරිත්තානුභාවතාය තේහි අත්තනෝ ඨිතික්ඛණේ විද්ධංසිතානමකුසලානං තදපගමේ සති පුන ආගමේන වොත්ථරණතෝ. තේසං තේසං නීවරණධම්මානං වික්ඛම්භනසඞ්ඛාතං පවත්තිනිවාරණවසේන පහානං **වික්ඛම්භනප්පහානං,** තං ඝටප්පහාරේන ජලතලේ සේවාලවියූහනං විය දට්ඨබ්බං. යථා හි බලවතා ඝටප්පහාරේන දූරීකතං සේවාලං තස්මිං අපනීතේපි තං පහාරවේගේන සහසා න ඔත්ථරති, ඒවමේව උපචාරප්පනාභේදේන ඣානේන වික්ඛම්භිතා කාමච්ඡන්දාදයෝ තදප්පවත්තිකාලේපි තස්ස බලේන සහසා න ඔත්ථරන්තීති. අනුප්පත්තිධම්මතාපාදනසඞ්ඛාතං සම්මා

උච්ඡේදවසේන පහානං **සමුච්ඡේදප්පහානං,** තං පන අසනිසම්පාතේන රුක්ඛාදීනං සමූලවිද්ධංසනං විය දට්ඨබ්බං. න හි අරියමග්ගේන සමුච්ඡින්නකිලේසා අනුසයමත්තකේනාපි සන්තානේ පවත්තන්ති. යථා පන ඒකවාරප්පවත්තේනපි ඉන්දග්ගිනා සහ මූලේහි විද්ධංසිතා රුක්ඛාදයෝ න පුන විරුහන්ති, ඒවමේවං ඒකචිත්තක්ඛණිකේනපි තේන අත්තනෝ උප්පාදමත්තේනේව අනුසයමත්තට්ඨායිනෝපි කිලේසා සබ්බේන සබ්බං විද්ධංසිතායේව හොන්ති.

වෝදනං විසුද්ධි, සංකිලේසමලවිමුත්තීති අත්ථෝ, තථා හුත්වා පච්චුපට්ඨානමස්සාති **වෝදනපච්චුපට්ඨානං,** පරිසුද්ධාකාරේන යෝගිනෝ ඤාණස්ස උපට්ඨාතීති වුත්තං හෝති.

ඒවං කුසලස්ස වජ්ජරහිතඉට්ඨවිපාකසභාවේහි ලක්ඛණං, කිච්චඋපට්ඨානාකාරවසේන ච රසපච්චුපට්ඨානානි වත්වා පුන වජ්ජපටිපක්ඛභාවවසේන ච ලක්ඛණං, සම්පත්තිඵලවසේන ච රසාදිකං දස්සේතුං **"වජ්ජපටිපක්ඛත්තා"**තිආදි වුත්තං. තත්ථ වජ්ජානං පටිපක්ඛභාවෝ **වජ්ජපටිපක්ඛත්තං,** තතෝ. ඒතේන "අනවජ්ජලක්ඛණ"න්ති එත්ථ අ-කාරෝ පටිපක්ඛත්ථෝති දස්සේති, තේන පනස්ස අබ්‍යාකතතෝ නිවත්තනං කතං. ඉතරථා හි නාස්ස වජ්ජං, වජ්ජතෝ අඤ්ඤං වා අනවජ්ජන්ති අබ්‍යාකතස්සාපි තං ලක්ඛණතාපසඞ්ගෝ සියා. "වජ්ජපටිපක්ඛත්තා"ති පන වුත්තේ යස්මා කුසලාකුසලානමේව පහායකප්පහාතබ්බභාවේන ආලෝකන්ධකාරානං විය අඤ්ඤමඤ්ඤං උජුවිපච්චනීකභාවෝ, තස්මා කුසලමේව වජ්ජපටිපක්ඛත්තා අනවජ්ජලක්ඛණං, න අඤ්ඤන්ති අයමත්ථෝ සිද්ධෝ හෝති. **වෝදනභාවරස**න්ති වෝදනභාවසම්පත්තිකං, කිලේසමලේහි අසංකිලිට්ඨභාවේන සම්පජ්ජනකන්ති අත්ථෝ. පච්චුපට්ඨාපීයති උපනීයති කාරණේන, අත්තනෝ වා කාරණං පටිච්ච, තප්පටිබද්ධභාවේන පටිමුඛං වා උපට්ඨාතීති පච්චුපට්ඨානං, ඉට්ඨෝ විපාකෝ පච්චුපට්ඨානමස්සාති **ඉට්ඨවිපාකපච්චුපට්ඨානං**.

අසති යෝනිසෝමනසිකාරේ කුසලස්ස අනුප්පජ්ජනතෝ, සති ච තස්මිං උප්පජ්ජනතෝ තස්ස සෝ ආසන්නකාරණන්ති ආහ **"යෝනිසෝමනසිකාරපදට්ඨාන"**න්ති. තත්ථ යෝනිසෝ පථේන උපායේන මනසිකාරෝ **යෝනිසෝමනසිකාරෝ,** අත්ථතෝ පන සානුසයසන්තානවතෝ ඡන්නං ද්වාරානමාපාථගතේස්වාරම්මණේසු පතිරූපදේසවාසාදිසම්පත්තියා කුසලධම්මානං පච්චයභාවේන භවඞ්ගං ආවට්ටෙත්වා උප්පන්නමාවජ්ජනං යෝනිසෝමනසිකාරෝ නාම. වුත්තපටිපක්ඛවසේන අයෝනිසෝමනසිකාරෝපි දට්ඨබ්බෝ. යං පන නිරනුසයසන්තානසමඞ්ගිස්ස කිරියචිත්තානං පච්චයභාවේන උප්පන්නං, තං ඨපෙත්වා නිරවජ්ජධම්මං සාවජ්ජධම්මස්ස කස්සචි පච්චයභාවානුපගමනතෝ යෝනිසෝමනසිකාරපක්ඛං වා භජෙය්‍ය. ඛීණාසවසන්තානගතත්තා යෝනිසෝඅයෝනිසෝභාවමනපෙක්ඛිත්වා ආපාථගතාරම්මණේසු උප්පත්තිමත්තං විනා න කස්සචි කුසලාකුසලභාවස්ස පච්චයෝ හෝතීති තදුභයවසේන නවත්තබ්බත්තා අබ්‍යාකතමනසිකාරෝති වා සඞ්ඛං ගච්ඡෙය්‍යාති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 10-11 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 46-54 පිටු]**

**අයං කුසලසද්දෝ** මේ කුසල ශබ්දය තෙමේ **ඡේකේ** (කුසලෝ ත්වං රථස්ස අඞ්ගපච්චඞ්ගානං, කුසලා නච්චගීතස්ස සික්ඛිතා චාතුරිත්ථියෝ) යනාදී තන්හි

ප්‍රවීණාර්ථයෙහි හෙවත් දක්‍ෂාර්ථයෙහි **දිට්ඨෝ** දක්නා ලද්දේය **ආරෝගෙය්** ("කච්චිනු භෝතෝ කුසලං කච්චිනු භෝතෝ අනාමයං" යනාදී තන්හි) ආරෝග්‍යාර්ථයෙහි **දිට්ඨෝ** දක්නා ලද්දේය **අනවජ්ජකේ** ("කතමෝ පන භන්තේ කායසමාචාරෝ කුසලෝ? යෝ බෝ මහාරාජ කායසමාචාරෝ අනවජ්ජෝ. පුන ච පරං භන්තේ ඒතදනුත්තරියං යථා භගවා ධම්මං දේසේසි කුසලේසු ධම්මේසු" යනාදී තන්හි) අනවද්‍යාර්ථයෙහි **දිට්ඨෝ** දක්නා ලද්දේය **ඉට්ඨවිපාකේපි** ("කුසලානං භාක්ඛවේ ධම්මානං සමාදානහේතු ඒවමිදං පුඤ්ඤං පවඩ්ඪති, කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා" යනාදී තන්හි) ඉෂ්ට විපාකාර්ථයෙහි **දිට්ඨෝ** දක්නා ලද්දේය **ඉධ** ("කුසලාකුසලඅබ්‍යාකතජාතිභේදතෝ තිවිධං" යන) මෙහි (කුසල ශබ්ද තෙමේ) **අනවජ්ජාදිකේ** අනවද්‍ය ඉෂ්ට විපාකයෙහි දක්නා ලද්දේය.

මෙහි "අනවජ්ජාදිකේ" යනු ද තමන් වහන්සේ විසින් වක්‍ෂ්‍යමාන ලක්‍ෂණයට අනුරූපව බැවින් කියන ලද්දෙය. ආරෝග්‍යාර්ථයාගේ සම්භවයක් නැති හෙයින් කියන ලද්දේ නොවේ. ඒ එසේමැයි. ක්ලේශ රෝගයාගේ අභාවයෙන් කුසලය තෙම අරෝග නම් වෙයි.

**තස්මා** ඒසේ හෙයින් **කුසලං** කුසලය තෙමේ **අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං** අනවද්‍ය ඉෂ්ට විපාක දීම ලක්‍ෂණ කොට ඇත්තේය නොහොත් අනවද්‍ය ඉෂ්ට විපාක හඳුන්වනු ලැබේ (නොහොත්) **අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං** අනවද්‍ය ස්වභාව හා ඉෂ්ට විපාක ස්වභාව ද ලක්‍ෂණ කොට ඇත්තේය **අකුසලවිද්ධංසනරසං** සුදුසු පරිද්දෙන් අකුසල් දුරුකිරීම කෘත්‍යය කොට ඇත්තේය **වෝදානපච්චුපට්ඨානං** පිරිසිදු කිරීම හෙවත් සංක්ලේශ මලයෙන් මිදීම වැටහීම් කොට ඇත්තේය (පිරිසිදු ආකාරයෙන් යෝගාවචරයාගේ නුවණට වැටහේයයි කියන ලද්දේ වෙයි)

මෙහි "වජ්ජා රාගාදයෝ, තේ යස්ස න සන්ති, තං අනවජ්ජං" යනු ද "ඉට්ඨෝ විපාකෝ චතුක්ඛන්ධසඞ්ඛාතෝ යස්ස, තං ඉට්ඨවිපාකං" යනු ද විග්‍රහයි. ඔහුගේ ඉෂ්ට විපාක බව ද ඒ ස්වභාවවත් බැවින් දතයුත්තේය. අවශයෙන්ම ඔහුගේ ඉෂ්ට විපාක සම්භවය ඇති හෙයින් නොවේ යැයි දතයුතුයි. "ලක්ඛීයති අනේනාති ලක්ඛණං අනවජ්ජඤ්ච තං ඉට්ඨවිපාකඤ්චාති අනවජ්ජඉට්ඨවිපාකං තං ලක්ඛණමස්සාති අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං" යනු වචනාර්ථයි. මෙහි කුසලයම අනවද්‍ය ඉෂ්ට විපාක ඇත්තේ නොවේ ද? යට කියනලද ක්‍රමයෙන් අනවද්‍ය ඉෂ්ට විපාකයෙන් අන්‍යවූ කුසලයක් වන්නේය. තෙමේම තමාගේ ලක්‍ෂණයයි කියන්නට නොහැක්කේ ද යත්? මෙය දෝෂයක් නොවේ. කුමක් හෙයින යත්? පරිඥාත අපරිඥාත වචනාර්ථ භාව භේදයෙන් එකක්හුගේ ද ලක්‍ෂිත ලක්‍ෂණ භාව පරිකල්පනය ඇති හෙයිනි. ඒ එසේමැයි. "අනවජ්ජඉට්ඨවිපාකං" යනු පරිඥාත වචනාර්ථයි. "කුසලං" යනු අපරිඥාත වචනාර්ථයි. මෙසේ යම් ස්වභාවයකින් පරිඥාත වචනාර්ථ ඇති ශබ්දයාගේ අර්ථය වේද යම් ස්වභාවයකින් අපරිඥාත වචනාර්ථ ඇති ශබ්දයාගේ අර්ථය වේද ඒ පරිඥාත අපරිඥාත වචනාර්ථ ස්වභාවයන්ගේ භේදයෙන් එයින් සමන්විත වූ එකම කුසලයාගේ භේදය තෙම පරිකල්පනය කරනු ලැබේ. කුමක් මෙන් ද යත්? "පුරේ භවං පටු ආසි, පටුතරෝ ඒතරහි" යනාදී තන්හි ගුණ භේදයෙන් හා වස්තු භේදයෙන් පරිකල්පනය කරනු ලැබේ ද එමෙනි. එහෙයින් පරිඥාත වචනාර්ථ භාවයෙන් ලක්‍ෂණය ද අපරිඥාත වචනාර්ථ භාවයෙන් ලක්‍ෂිතව්‍යය දැයි මෙසේ පරිකල්පිත භේදය පිරිසිඳිනු ලබන කල්හි කිසි දෝෂයෙක් නොපැමිණෙයි.

"අථ වා ලක්ඛීයතීති ලක්ඛණං, අනවජ්ජඉට්ඨවිපාකඤ්ච තං ලක්ඛණං චාති අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං" යම් ධර්මයක් තෙම අනවද්‍ය ඉෂ්ට විපාක ඇති හඳුන්වනු ලැබේ ද ඒ ධර්මය තෙම කුසල නම් වෙයි යන අර්ථයි. නොහොත් යම් හෙයකින් "අනවජ්ජ" ශබ්දයෙන් අනවද්‍ය ස්වභාවය ද "ඉට්ඨවිපාක" ශබ්දයෙන් ඉෂ්ට විපාක ස්වභාවය ද කියන ලද්දේ වේද එහෙයින් "අනවජ්ජෝ ච ඉට්ඨවිපාකෝ ච අනවජ්ජඉට්ඨවිපාකං තං ලක්ඛණමේතස්සාති" යි වාක්‍යය යෙදිය යුතුයි. කරණාර්ථයෙහි හෝ කර්මාර්ථයෙහි නිපන් ලක්ඛණ ශබ්දය කරණකොටගෙන "අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං" යනු අනවද්‍ය ඉෂ්ට විපාක ස්වභාව ඇත්තේය. අනවද්‍ය ඉෂ්ට විපාක භාවයෙන් ලක්ෂිතව්‍ය හෝ වෙයි යනු අර්ථයි. මෙහි වනාහි පද ද්වය ගැනීමෙන් කවර ප්‍රයෝජන ද? එකම පදයකින් අධිප්‍රේතාර්ථ සිද්ධිය නොවන්නේ ද යත්? ඒ එසේමැයි. ඉදින් "අනවජ්ජලක්ඛණං" යි කී කල්හි "පුනච පරං භන්තේ ඒතදනුත්තරියං, යථා භගවා ධම්මං දේසේසි කුසලේසු ධම්මේසු" යනාදී තන්හි මෙන් අනවද්‍ය බැවින් අව්‍යාකෘත ධර්මයාගේ ද ප්‍රසඞ්ගය වන්නේය. එහෙයින් "ඉට්ඨවිපාක" යන පදය කිය යුත්තේමය. එසේ වී නම් "ඉට්ඨවිපාකලක්ඛණං" යි කී කල්හි අනික් පදය නොකිය යුත්තේය. කුමක් හෙයින යත්? අව්‍යාකෘතය තමා විපාකාරහ නොවන බැවින් ඉෂ්ට විපාක භාව ප්‍රසඞ්ගය නොවන හෙයිනි. ඒ සැබෑව. "අනවජ්ජ" පදය කරණකොටගෙන වනාහි කුසලයාගේ ප්‍රවෘත්ති සුඛත්වය ද "ඉට්ඨවිපාක" පදය කරණකොටගෙන විපාක සුඛත්වය ද දක්වනු පිණිස උභය පදයම කියන ලද්දේය. ඒ එසේමැයි. අනවජ්ජ පද තෙමේ තමාගේ ප්‍රවෘත්ති ස්වභාව වශයෙන් ලක්‍ෂණ වචනයෙක් වේ. ඉට්ඨවිපාක පද තෙමේ කාලාන්තරයෙක්හි විපාකෝත්පාදයෙහි සමර්ථ බැවි වශයෙන් ලක්‍ෂණ වචනයෙක් වෙයි. නොහොත් කුසලයාගේ ආත්ම විසුද්ධිය දක්වනු පිණිස පළමුවන පදය ද පරිශුද්ධ විපාකත්වය දක්වනු පිණිස පශ්චිම පදය ද කියන ලද්දේය. තවද පළමුවන පද තෙමේ කුසලයාගේ අකුසල භාවයෙන් වැළැක්ම දක්වනු පිණිස ද පශ්චිම පදය අව්‍යාකෘත ස්වභාවයෙන් වැළැක්ම දක්වනු පිණිස ද කියන ලද්දේය. ඉතා විස්තර කිරීමෙන් ප්‍රයෝජන කිම. මෙහි "අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං" යන වචනයෙන් කුසලයාගේ සාමාන්‍ය ලක්‍ෂණය කියන ලද්දේය. කුමක් හෙයින යත්? අනවද්‍ය ඉෂ්ට විපාක ස්වභාවය කුසල ජාතියට සාධාරණ හෙයිනි. අකුසලාදීන්ට අසාධාරණ බැවින් ස්වභාව ලක්‍ෂණය හෝ වේ යැයි දතයුතුයි. "අකුසලවිද්ධංසනරසන්ති, යථානුරූපං අකුසලපජහනකිච්චං" යනු කියනලදි. ඒ එසේමැයි. කාමාවචර, මහග්ගත, ලෝකෝත්තර භේදයෙන් ප්‍රභේදවත් වූ කුසලය තෙමේ පිළිවෙළින් තදඞ්ග විෂ්කම්භන සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් අකුසල පක්‍ෂය ප්‍රහාණ කෙරෙත්. නොහොත් තදඞ්ගාදී ප්‍රහාණයන්ගේ නානාකරණය කවර යත්? දනාදී පුණ්‍යක්‍රියා වස්තුගත ඒ ඒ කුසලාඞ්ගය කරණකොටගෙන ඒ ඒ මාත්සය්‍යාදී අකුසලාඞ්ගයාගේ ප්‍රහාණය කිරීම තදඞ්ග ප්‍රහාණය නම් වෙයි. එය ප්‍රදීපාලෝකයෙන් අන්ධකාර විද්ධවංසනය වන්නාක් මෙන් දතයුතුයි. කුමක් හෙයින් යත්? කාමාවචර කුසලයන්ගේ ස්වල්ප ආනුභාව ඇති හෙයින් ඔහුන් විසින් තමාගේ ස්ත්‍රීක්‍ෂණයෙහි නසනලද අකුසලයන් ඒ චිත්තක්‍ෂණය පහවූ කල්හි නුවණ ඉපිද යටපත් කරන හෙයිනි. ඒ ඒ නීවරණ ධර්මයන්ගේ හටගැන්ම වැළැක්වීම් වශයෙන් මුවහා කිරීම යැයි කියනලද ප්‍රහාණය විෂ්කම්භන ප්‍රහාණය නම් වේ. එය ඝට ප්‍රහාරයෙන් ජල තලයෙහි සෙවාලයන්ගේ පහවීම මෙන් දතයුතුයි. යම්සේ වනාහි බලවත් වූ ඝට ප්‍රහාරය කරණකොටගෙන බැහැර යැවීම කරනලද සෙවාලය තෙම ඒ ඝටය පහකළ කල්හිදු ප්‍රහාර වේගය කරණකොටගෙන ඒ ජල තලය වහා යටපත් නොකෙරේ ද එපරිද්දෙන්ම උපචාර අර්පණා ප්‍රභේද වූ ධ්‍යානයෙන් විෂ්කම්භනය කරනලද කාමච්ඡන්දදීහු ඒ ධ්‍යාන චිත්තය නූපදනා කල්හිදු ඔහුගේ බලයෙන් වහා යටපත් නොකෙරේ. ක්ලේශයන්ගේ නැවත නූපදනා ස්වභාවයට පැමිණවීම් සඞ්ඛ්‍යාත

සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කිරීම සමුච්ඡේද ප්‍රහාණ නම් වේ. ඒ වනාහි අසනි සම්පාතය කරණකොටගෙන වෘක්ෂාදීන්ගේ සමූල විද්ධංසනය මෙන් දතයුතුයි. ඒ එසේමැයි. ආර්‍ය්‍ය මාර්ගයෙන් සමුච්ඡේදය කරනලද ක්ලේශයෝ අනුමාත්‍රයෙකිනුදු චිත්ත සන්තානයෙහි නැවත නූපදිත්. යම්සේ වනාහි එකවරක් පැවැත්තාවූ ද ඉන්ද්‍රාසනියෙන් මුල් සමඟ නසනලද වෘක්ෂාදීහු නැවත රූහනය නොවෙත් ද එපරිද්දෙන්ම ඒකචිත්තක්‍ෂණිකවූ ද මාර්ගයෙන් තමාගේ ඉපදීම් මාත්‍රයෙන්ම අනුමාත්‍ර වූ ද ක්ලේශයෝ සර්වප්‍රකාරයෙන් නසන ලද්දාහු වෙත්.

මෙසේ කුසලයාගේ වද්‍යරහිත ඉෂ්ට විපාක ස්වභාවයෙන් ලක්‍ෂණය ද කෘත්‍යය උපස්ථානාකාර වශයෙන් රස ප්‍රත්‍යුපස්ථානයන් ද කථනය කොට නැවත වද්‍ය ප්‍රතිපක්‍ෂ වශයෙන් ලක්‍ෂණය ද සම්පත්ති ඵල වශයෙන් රසාදිය ද දක්වනු පිණිස "වජ්ජපටිපක්ඛත්තා" යනාදිය කීහු.

**වා** නොහොත් **කුසලං** කුසලය තෙම **වජ්ජපටිපක්ඛත්තා** වද්‍යයන්ට ප්‍රතිපක්‍ෂ හෙයින් **අනවජ්ජං ඒව** අනවද්‍යයම **ලක්ඛණං** ස්වභාව කොට ඇත්තේය **වෝදනභාවරසං** පිරිසිදු බව සම්පත් කොට ඇත්තේය **ඉට්ඨවිපාකපච්චුපට්ඨානං** ඉෂ්ට විපාක දීම ඵල කොට ඇත්තේය **යෝනිසෝමනසිකාරපදට්ඨානං** උපාය හෙයින් මෙනෙහි කිරීම ආසන්නකාරන කොට ඇත්තේය.

එහි "වජ්ජානං පටිපක්ඛභාවෝ වජ්ජපටිපක්ඛත්තං තතෝ" යි වචනාර්ථය දක්වන ලදි. ඒ කරණකොටගෙන "අනවජ්ජලක්ඛණං" යන මෙහි අ-කාරය තෙමේ ප්‍රතිපක්‍ෂාර්ථ ඇත්තේ යැයි දක්වයි. එහෙයින් වනාහි කුසලය අව්‍යාකෘත භාවයෙන් වැළැක්වීම කරන ලද්දේය. එසේ නොගතහොත් "නාස්සවජ්ජං වජ්ජතෝ අඤ්ඤං වා අනවජ්ජං" යි වචනාර්ථ ලැබෙන හෙයින් අව්‍යාකෘත ධර්මයාගේ ද ඒ ලක්‍ෂණභාව ප්‍රසඞ්ගය වන්නේය. "වජ්ජපටිපක්ඛත්තා" යි කී කල්හි වනාහි යම්හෙයකින් කුසලාකුසලයන්ගේම ප්‍රහායක ප්‍රහාතව්‍ය භාවයෙන් ආලෝක අන්ධකාරයන්ගේ මෙන් ඔහුනොහුන්ගේ ඉඳුරා විරුද්ධ භාවය වේද, එහෙයින් කුසලයම වද්‍යයන්ට ප්‍රතිපක්‍ෂ බැවින් අනවද්‍ය ස්වභාව ඇත්තේය. අනිකක් එසේ නොවේ යන මේ අර්ථය තෙමේ සිද්ධ වෙයි. "වෝදනභාවරසන්ති වෝදනභාවසම්පත්තිකං, කිලේසමලේහි අසඞ්කිලිට්ඨභාවේන සම්පජ්ජනකන්ති අත්ථෝ. පච්චුපට්ඨාපියති උපනියති කාරණේන, අත්තනෝ වා කාරණං පටිච්ච, තප්පටිබද්ධභාවේන පටිමුඛං වා උපට්ඨාතීති පච්චුපට්ඨානං, ඉට්ඨෝ විපාකෝ පච්චුපට්ඨානමස්සාති ඉට්ඨවිපාකපච්චුපට්ඨානං" යනු වචනාර්ථයි.

යෝනිසෝ මනස්කාරය ඇති කල්හි කුසලය උපදනා හෙයින් ද එය නැති කල්හි නූපදනා හෙයින් ද යෝනිසෝ මනසිකාරය තෙම කුසලයට ආසන්න කාරණා වෙයි. එහෙයින් "යෝනිසෝමනසිකාරපදට්ඨානං" යි කීයේයි. එහි "යෝනිසෝ පථේන උපායේන මනසිකාරෝ යෝනිසෝමනසිකාරෝ" යනු වචනාර්ථයි. අර්ථ වශයෙන් වනාහි සානුසය සන්තාන ඇත්තාහුගේ ෂඩ් ද්වාරයන්ට හමුවූ අරමුණු ඇති කල්හි ප්‍රතිරූපදේශවාසාදී චතුචක්‍ර සම්පත්තිය කරණකොටගෙන කුසල ධර්මයන්ට ප්‍රත්‍යය භාවයෙන් භවඞ්ගය ආවර්ජනා කොට උපදනා ආවර්ජනා සිත යෝනිසෝමනසිකාර නම් වෙයි. කියනලද ප්‍රකාරයට ප්‍රතිපක්‍ෂ වශයෙන් අයෝනිසෝමනසිකාරය ද දතයුත්තේය. අනුසය රහිත සන්තාන ඇත්තහුගේ ක්‍රියා චිත්තයන්ට ප්‍රත්‍යය භාවයෙන් උපදනා යම් ආවර්ජනාවක් වේද එය නිරවද්‍ය ධර්මයක් හැර කිසි සාවද්‍ය ධර්මයක්හුගේ ප්‍රත්‍යය භාවයට නොපැමිණෙන හෙයින් යෝනිසෝමනසිකාර පක්‍ෂ්‍ය

හෝ භජනය කරන්නේය. ක්ෂීණාශ්‍රව සන්තාන ගත බැවින් යෝනිසෝ අයෝනිසෝ භාවය අපේක්ෂා නොකොට හමුවූ අරමුණෙහි උත්පත්ති මාත්‍රයක් හැර කිසි කුසලාකුසල භාවයකට ප්‍රත්‍යය නොවේනුයි ඒ කුසලාකුසල ද්වයගේ වශයෙන් නොකිය යුතු හෙයින් අව්‍යාකෘත මනස්කාරයයි කියා හෝ සඞ්ඛ්‍යාවට යන්නේය.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 28-32 පිටු]**

තං පන අනවජ්ජසුඛවිපාකලක්ඛණං, අකුසලවිද්ධංසනරසං, වෝදාන පච්චුපට්ඨානං, ඉට්ඨවිපාකපච්චුපට්ඨානං වා, යෝනිසෝමනසිකාර පදට්ඨානං.

**[නමක්කාර ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 01 යටතේ)]**

යහපත් විපාක දීම ලක්‍ෂණ කොට ඇත්තාහුය. යහපත් විපාකදීම වැටහෙන්නා වූ ආකාර කොට ඇත්තාහුය. යුතු පරිද්දෙන් මෙනෙහි කිරීම ඇතුළත්වීමම ආසන්න කාරණය කොට ඇත්තාහුය. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 28 පිට]**

## කුසලචිත්තය ඤාණසම්පයුත්ත හා විප්පයුත්ත වීමට හේතු:—

කම්මතෝ, උපපත්තිතෝ, ඉන්ද්‍රියපරිපාකතෝ, කිලේසදූරීභාවතෝති ඉමේහි පනෙත්ථ කාරණේහි ඤාණසම්පයුත්තතා වේදිතබ්බා. යෝ හි පරේසං ධම්මං දේසේති අනවජ්ජානි සිප්පායතනකම්මායතනවිජ්ජාට්ඨානානි සික්ඛාපේති ධම්මකථිකං සක්කාරං කත්වා ධම්මං කථාපේති, "ආයතිං පඤ්ඤවා භවිස්සාමී"ති පත්ථනං පට්ඨපෙත්වා නානප්පකාරං දානං දේති, තස්ස ඒවරූපං කම්මං උපනිස්සාය කුසලං උප්පජ්ජමානං ඤාණසම්පයුත්තං උප්පජ්ජති. අබ්‍යාපජ්ජේ ලෝකේ උප්පන්නස්ස වාපි "තස්ස තත්ථ සුඛිනෝ ධම්මපදා පිලවන්ති… දන්ධෝ, භික්ඛවේ, සතුප්පාදෝ, අථ සෝ සත්තෝ ඛිප්පංයේව විසේසගාමී හෝතී"ති (අ. නි. 4.191) ඉමිනා නයේන උපපත්තිං නිස්සායපි උප්පජ්ජමානං කුසලං ඤාණසම්පයුත්තං උප්පජ්ජති. තථා ඉන්ද්‍රියපරිපාකං උපගතානං පඤ්ඤාදසකප්පත්තානං ඉන්ද්‍රියපරිපාකං නිස්සායපි කුසලං උප්පජ්ජමානං ඤාණසම්පයුත්තං උප්පජ්ජති. යේහි පන කිලේසා වික්ඛම්භිතා තේසං කිලේසදූරීභාවං නිස්සායපි උප්පජ්ජමානං කුසලං ඤාණසම්පයුත්තං උප්පජ්ජති. වුත්තම්පි චේතං;

"යෝගා වේ ජායතී භූරි, අයෝගා භූරිසඞ්ඛයෝ"ති (ධ. ප. 282). ඒවං කම්මතෝ උපපත්තිතෝ ඉන්ද්‍රියපරිපාකතෝ කිලේසදූරීභාවතෝති ඉමේහි කාරණේහි ඤාණසම්පයුත්තතා වේදිතබ්බා. අපිච සත්ත ධම්මා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති; පරිපුච්ඡකතා, වත්ථුවිසදකිරියා, ඉන්ද්‍රියසමත්තපටිපාදනා, දුප්පඤ්ඤපුග්ගලපරිවජ්ජනා, පඤ්ඤවන්තපුග්ගලසේවනා, ගම්භීරඤාණචරිය පච්චවෙක්ඛණා, තදධිමුත්තතාති. ඉමේහිපි කාරණේහි ඤාණසම්පයුත්තතා වේදිතබ්බා.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය අංක 01 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 90-91 පිටු (හේ.වි.මු); අභිධර්ම ප්‍රකාශය 49-50 පිටු; සිත සිරුර සහ නිවන හෙවත් ධම්මසඞ්ගණී 15-16 පිටු]**

ජීවිතවුත්තියා ආයතනභාවතෝ හත්ථාරෝහාදිසිප්පමේව **සිප්පායතනං**. කසිවාණිජ්ජාදිකම්මමේව **කම්මායතනං**. ආයුවේදාදිවිජ්ජා ඒව **විජ්ජාට්ඨානං**. **අබ්‍යාපජ්ජේති** දෝමනස්සබ්‍යාපාදරහිතේ රූපභවේ. **ධම්මපදාති** ධම්මකොට්ඨාසා. **පිලවන්තීති** උපට්ඨහන්ති පදිස්සන්ති. **යෝගාති** භාවනාභියෝගා සමාධිතෝ.

**වත්ථුවිසදකිරියා**ති අජ්ඣත්තිකබාහිරානං වත්ථූනං නිම්මලභාවකිරියා. සද්ධාදීනං ඉන්ද්‍රියානං අඤ්ඤමඤ්ඤනතිවත්තනං **ඉන්ද්‍රියසමත්තපටිපාදනතා**. ගම්භීරානං ඤාණේන චරිතබ්බානං, ගම්භීරඤාණේන වා චරිතබ්බානං සුත්තන්තානං පච්චවෙක්ඛණා **ගම්භීරඤාණචරියපච්චවෙක්ඛණා**.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය වණ්ණනා අංක 01 යටතේ)**

**එත්ථ පන** මෙහි වනාහි **කම්මතෝ** කර්ම වශයෙන් ද **උපපත්තිතෝ** උප්පත්ති වශයෙන් ද **ඉන්ද්‍රියපරිපාකතෝ** ඉන්ද්‍රියපරිපාකයෙන් ද **කිලේසදූරීභාවතෝති** කිලේශ දූරීභාවයෙන් යන **ඉමේහි කාරණේහි** මේ කරුණු හේතුකොටගෙන **ඤාණසම්පයුත්තතා** ඤාණසම්ප්‍රයුත්ත බව **වේදිතබ්බෝ** දතයුතුයි **හි (සච්චං)** ඒ කීම සැබෑවකි **යෝ** යමෙකු **පරේසං** අනුන්හට හිතාධ්‍යාශයෙන් **ධම්මං** ධර්මය **දේසේති** දේශනා කරයිද **අනවජ්ජානි** නිරවද්‍ය වූ **සිප්පායතන** ඇත් අස් ආදී ශිල්පයන්ද **කම්මායතන** කෘෂි වනිද්‍යාදී (වෙළඳම් ආදී) කර්මයන් ද **විජ්ජට්ඨානානි** ආයුර්වේද ආදී විද්‍යාවන්ද යන ශිල්පාදිය **සික්ඛාපේති** හික්මවයිද **ආයතිං පඤ්ඤවා භවිස්සාමීති** මත්තෙහි හෝ පඤ්ඤවන්තයෙක් වන්නේ යයි **පත්ථනං පට්ඨපෙත්වා** ප්‍රාර්ථනා කොට **ධම්මකථිකං** ධර්මකථිකයන්හට **සක්කාරනං කත්වා** සත්කාර කොට **ධම්මං** ධර්මය කියවාද **නානප්පකාරං දනං** නානප්‍රකාරවූ දන් **දේති** දෙයිද **තස්ස** ඔහුට **ඒවරූපං** මෙබඳු **කම්මං** කර්ම **උපනිස්සාය** උපනිශ්‍රය කොට ගෙණ **උප්පජ්ජමානං** උපදින්නාවූ **කුසලං** කුසලය **ඤාණසම්පයුත්තං** ඤාණසම්ප්‍රයුත්තව **උප්පජ්ජති** උපදී **අපි** එසේම **අබ්‍යාපජ්ජේ ලෝකේ** දෙම්නස් ව්‍යාපාද රහිතවූ රූප භවයෙහි **උප්පන්නස්ස වා** උපන්නාහට **"තස්ස තත්ථ සුඛිනෝ ධම්මපද පිලවන්ති ....දන්ධෝ, භික්ඛවේ, සත්තුප්පාදෝ අථ සෝ සත්තෝ ඛිප්පයේව විසේසගාමී හෝති"** යන **ඉමිනා නයේන** මේ නයින් **උපපත්තිං** උප්පත්තිය **නිස්සායපි** හේතුකොටගෙන ද **උප්පජ්ජමානං** උපදින්නාවූ **කුසලං** කුසලය **ඤාණසම්පයුත්තං** ඤාණසම්ප්‍රයුත්තව **උප්පජ්ජති** උපදී **තථා** එසේම **ඉන්ද්‍රියපරිපාකං** ඉන්ද්‍රිය මේරීමෙන් **උපගතානං** යුක්තවූ **පඤ්ඤදසකප්පත්තානං** ප්‍රඥ දශකයට පැමිණිවුන්හට **ඉන්ද්‍රියපරිපාකං** ඉන්ද්‍රිය මේරීම **නිස්සායපි** හේතුකොටගෙන ද **උප්පජ්ජමානං** උපන්නාවූ **කුසලං** කුසලය **ඤාණසම්පයුත්තං** ඤාණසම්ප්‍රයුත්තව **උප්පජ්ජති** උපදී **පන** තවද **යේහි** යමෙකු විසින් **කිලේසා වික්ඛම්භිතා** ක්ලේශ විස්කම්භනය කරනලදී ද **තේසං** ඔහුන්ට **කිලේසදූරීභාවං** ක්ලේශදූරීභාවය **නිස්සායපි** හේතුකොටගෙනද **උප්පජ්ජමානං** උපදින්නාවූ **කුසලං** කුසලය **ඤාණසම්පයුත්තං** ඤාණසම්ප්‍රයුත්තව **උප්පජ්ජති** උපදී **වුත්තම්පි චේතං** එහෙයින් වදළහ **"යෝගා වේ ජායතී භූරි, අයෝගා භූරිසඞ්ඛයෝ" ඉති** යනුවෙන් **ඒවං** මෙසේ **කම්මතෝ** කර්ම වශයෙන් **උපපත්තිතෝ** උප්පත්ති වශයෙන් **ඉන්ද්‍රියපරිපාකතෝ** ඉන්ද්‍රිය මිහිකිරීම් (මේරීම්) වශයෙන් **කිලේසදූරීභාවතෝති** ක්ලේශ දූරීභාවයෙන් යයි **ඉමෙහි කාරණේහි** මේ කරුණු වලින් **ඤාණසම්පයුත්තතා** ඤාණසම්ප්‍රයුත්ත බව **වේදිතබ්බා** දතයුත්තාහ **අපිච** තවද **පරිපුච්ඡකතා** ස්කන්ධාදීන්ගේ අර්ථපිළිබඳ ප්‍රශ්නවිචාරීමද **වත්ථුවිසදකිරියා** ආධ්‍යාත්මික-බාහ්‍ය වස්තූන්ගේ නිර්මල බවද **ඉන්ද්‍රියසමත්තපටිපාදනා** ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ සමබව පිළියෙල කිරීමද **දුප්පඤ්ඤපුග්ගලපරිවජ්ජනා** දුශ්ප්‍රාඥ පුද්ගලයන් දුරුකිරීමද **පඤ්ඤවන්තපුග්ගලසේවනා** ප්‍රඥවන්ත පුද්ගලයන් සේවනය කිරීමද **ගම්භීරඤාණචරියපච්චවෙක්ඛණා** ගැඹුරු ඤාණයෙන් අවබෝධකටයුතුවූ සූත්‍රාන්තයන් හෝ ප්‍රත්‍යවේක්ෂා කෙරේද **තදධිමුත්තතාති** ඒ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගයෙහි නැමීපවත්නා සිත්ඇති බවය යන **සත්ත ධම්මා** ධර්මයෝ

සත්දෙන ද **ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස** ධම්මවිචය සම්බොජ්ඣඞ්ගයාගේ **උප්පාදාය** ඉපදීම පිණිස **සංවත්තන්ති** පවතිත් **ඉමේහි කාරණේහි** මේ කරුණු හේතුකොටගෙන ද **ඤාණසම්පයුත්තතා** ඤාණසම්ප්‍රයුත්තබව **වේදිතබ්බා** දතයුත්තාහ.
**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

**ඤාණසම්පයුත්ත**න්ති ඤාණේන සම්පයුත්තං, සමං ඒකුප්පාදාදිප්පකාරේහි යුත්තන්ති අත්ථෝ. යං පනෙත්ථ වත්තබ්බං සියා තං මාතිකාවණ්ණනාය වේදනාත්තිකේ වුත්තනයමේව. තස්මා ඒකුප්පාද ඒකනිරෝධා ඒකවත්ථුකා ඒකාරම්මණාති ඉමිනා ලක්ඛණේනේතං සම්පයුත්තන්ති වේදිතබ්බං. උක්කට්ඨනිද්දේසෝ චේස. අරූපේ පන විනාපි ඒකවත්ථුකභාවං සම්පයෝගෝ ලබ්භති.

එත්තාවතා කිං කථිතං? කාමාවචරකුසලේසු සෝමනස්සසහගතං තිහේතුකං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකං මහාචිත්තං කථිතං. "කතමේ ධම්මා කුසලා"ති හි අනියමිතපුච්ඡාය චතුභූමකකුසලං ගහිතං. 'කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හෝතී'ති වචනේන පන තේභූමකං කුසලං පරිච්චජිත්වා, අට්ඨවිධං කාමාවචරකුසලමේව ගහිතං. 'සෝමනස්සසහගත'න්ති වචනේන තතෝ චතුබ්බිධං උපෙක්ඛාසහගතං පරිච්චජිත්වා චතුබ්බිධං සෝමනස්සසහගතමේව ගහිතං. 'ඤාණසම්පයුත්ත'න්ති වචනේන තතෝ දුවිධං ඤාණවිප්පයුත්තං පරිච්චජිත්වා ද්වේ ඤාණසම්පයුත්තානේව ගහිතානි. අසඞ්ඛාරිකභාවෝ පන අනාභට්ඨතායේව න ගහිතෝ. කිඤ්චාපි න ගහිතෝ, පරතෝ පන 'සසඞ්ඛාරේනා'ති වචනතෝ ඉධ 'අසඞ්ඛාරේනා'ති අවුත්තේපි අසඞ්ඛාරිකභාවෝ වේදිතබ්බෝ. සම්මාසම්බුද්ධෝ හි ආදිතෝව ඉදං මහාචිත්තං භාජෙත්වා දස්සේතුං නියමෙත්වාව ඉමං දේසනං ආරභීති ඒවමෙත්ථ සන්නිට්ඨානං කතන්ති වේදිතබ්බං.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය අංක 01 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 86 පිට (හේ.වි.මු)]**

**ඤාණසම්පයුත්තං ඉති** ඤාණසම්ප්‍රයුක්තං යනු **ඤාණේන** නුවණින් **සම්පයුත්තං** සම්ප්‍රයුක්ත බවයි **ඒකුප්පාදාදිපකාරේහි** ඒකුප්පාදාදී ආකාරයන්ගෙන් **සමං** සමව **යුත්තං ඉති අත්ථෝ** යෙදුනේ යන අර්ථයයි **එත්ථ පන** මෙහි වනාහි **යං** යමක් **වත්තබ්බං සියා** කිවයුතු වන්නේ ද **තං** එය **මාතිකාවණ්ණනාය** මාතෘකා වර්ණනා **වේදනාත්තිකේ** වේදනා ත්‍රිකයෙහි **වුත්තනයමේව (හෝති)** කියනලද ක්‍රමයම වෙයි **තස්මා** එහෙයින් **ඒකුප්පාද** එකට ඉපදීම **ඒකනිරෝධා** එකට නිරුද්ධවීම **ඒකවත්ථුකා** එක් වස්තුවක් ඇසුරුකිරීම **ඒකාරම්මණා ඉති** එක අරමුණක් ගැනීම යන **ඉමිනා ලක්ඛණේන** මේ ලක්‍ෂණයෙන් **තං (ඤාණං)** ඒ නුවණ **සම්පයුත්තං ඉති** සම්ප්‍රයුක්ත යැයි **වේදිතබ්බං** දතයුතුයි **ඒස** ඒ සම්ප්‍රයුක්ත වීම ද **උක්කට්ඨනිද්දේසෝ ච (හෝති)** උත්කෘෂ්ට නිර්දේශ වශයෙන්ම වෙයි **පන** විශේෂයක් කියම් **අරූපේ** අරූපාවචර භූමියෙහි **ඒකවත්ථුකභාවං විනාපි** ඒකවත්ථුකභාවය නැතිව ද **සම්පයෝගෝ ලබ්භති** එකට යෙදීම ලබයි.

**එත්තාවතා** මෙපමණකින් **කිං කථිතං?** කුමක් කියනලදි ද? **කාමාවචරකුසලේසු** කාමාවචර කුසලයන් අතුරින් **සෝමනස්සසහගතං** සෝමනස්සසහගත **තිහේතුකං** ත්‍රිහේතුක **ඤාණසම්පයුත්තං** ඤාණසම්ප්‍රයුක්ත **අසඞ්ඛාරිකං** අසංස්කාරික **මහාචිත්තං** මහාචිත්තය **කථිතං** දේශනා කරනලදි **හි** විශේෂයක් කියම් **කතමේ ධම්මා කුසලා ඉති** කතමේ ධම්මා කුසලා යන **අනියමිතපුච්ඡාය** නියමයක් නැති ප්‍රශ්න

කිරීමෙන් **චතුභූමකකුසලං** චාතුර්භූමික කුසලය **ගහිතං** ගන්නාලදි **කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හෝති ඉති** කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හෝති යන මේ **වචනේන පන** වචනයෙන් වනාහි **තේභූමකකුසලං පරිච්චජිත්වා** ත්‍රෛභූමික කුසලය අතහැර **අට්ඨවිධං** අට වැදෑරුම් **කාමාවචරකුසලමේව** කාමාවචර කුසලයම **ගහිතං** ගන්නාලදි **සෝමනස්සසහගතං ඉති** සෝමනස්සසහගත යන **වචනේන** වචනයෙන් **තතෝ** කාමාවචර කුසලසිත් අටෙන් **චතුබ්බිධං** සතර වැදෑරුම් **උපෙක්ඛාසහගතං** උපේක්ෂාසහගත කුසලය **පරිච්චජිත්වා** අතහැර **චතුබ්බිධං** සතර වැදෑරුම් වූ **සෝමනස්සසහගතමේව** සෝමනස්සසහගත කුසලයම **ගහිතං** ගන්නාලදි **ඤාණසම්පයුත්තං ඉති** ඤාණසම්පයුත්තං යන **වචනේන** වචනයෙන් **තතෝ** ඒ සතරක් වූ සොම්නස් සිත් අතුරෙන් **දුවිධං** දෙවැදෑරුම් වූ **ඤාණවිප්පයුත්තං** ඤාණවිප්‍රයුක්ත කුසලය **පරිච්චජිත්වා** අතහැර **ද්වේ ඤාණසම්පයුත්තානි ඒව** ඤාණසම්ප්‍රයුක්ත කුසල් සිත් දෙකම **ගහිතානි** ගන්නාලද්දහ **අසඞ්ඛාරිකභාවෝ පන** අසඞ්ඛාරික භාවය වනාහි **අනාහට්ඨතායේව** නොකියනලද හෙයින්ම **න ගහිතෝ** මෙහි නොගන්නාලදි **කිඤ්චාපි න ගහිතෝ** කිසිසේත් නොගන්නා ලද්දේ ද **පරතෝ පන** පසුව වනාහි **සසඞ්ඛාරේන ඉති** සසඞ්ඛාරේන යන **වචනතෝ** වචනයෙන් **ඉධ** මේ චිත්තයෙහි **අසඞ්ඛාරේන ඉති** අසඞ්ඛාරේන යන වචනය **අවුත්තේපි** දේශනා නොකරන ලද්දේ ද **අසඞ්ඛාරිකභාවෝ** අසඞ්ඛාරික බව **වේදිතබ්බෝ** දතයුතුයි **සම්මාසම්බුද්ධෝ හි** සම්මාසම්බුදුරජාණන් වහන්සේ වනාහි **ආදිතෝව** පළමුවෙන්ම **ඉදං මහාචිත්තං** මේ මහාචිත්තය **භාජෙත්වා** බෙද **දස්සේතුං** දක්වන්නට **නියමෙත්වාව** නියම කොටම **ඉමං දේසනං** මේ දේශනාව **ආරභි ඉති** ආරම්භ කළ සේක් ද **ඒවං එත්ථ** මෙසේ මෙහි **සන්නිට්ඨානං කතන්ති** අධිෂ්ඨාන කරනලදැයි **වේදිතබ්බං** දතයුතුයි.
**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

පරිපුච්ඡකතා, වත්ථුවිසදකිරියා, ඉන්ද්‍රියසමත්තපටිපාදනා, දුප්පඤ්ඤපුග්ගල පරිවජ්ජනා, පඤ්ඤවන්තපුග්ගලසේවනා, ගම්භීරඤාණචරියපච්චවෙක්ඛණා, තදධිමුත්තතාති. තත්ථ පරිපුච්ඡකතාති ඛන්ධ-ධාතු-ආයතන-ඉන්ද්‍රිය-බල-බොජ්ඣඞ්ග-මග්ගඞ්ග-ඣාන-සමථ-විපස්සනානං අත්ථසන්නිස්සිත පරිපුච්ඡා බහුලතා. **වත්ථුවිසදකිරියා**ති අජ්ඣත්තිකබාහිරානං වත්ථූනං විසදභාවකරණං. යදා හිස්ස කේසනඛලෝමානි දීඝානි හොන්ති, සරීරං වා උස්සන්නදෝසඤ්චේව සේදමලමක්ඛිතඤ්ච, තදා අජ්ඣත්තිකං වත්ථු අවිසදං හෝති අපරිසුද්ධං. යදා පන චීවරං ජිණ්ණං කිලිට්ඨං දුග්ගන්ධං හෝති, සේනාසනං වා උක්ලාපං, තදා බාහිරං වත්ථු අවිසදං හෝති අපරිසුද්ධං. තස්මා කේසාදිච්ඡේදනේන උද්ධං විරේචනඅධෝවිරේචනාදීහි සරීරසල්ලහුකභාවකරණේන, උච්ඡාදනන්හාපනේන ච අජ්ඣත්තිකවත්ථු විසදං කාතබ්බං. සූචිකම්මධෝවනරජනපරිභණ්ඩකරණාදීහි බාහිරවත්ථු විසදං කාතබ්බං. ඒතස්මිඤ්හි අජ්ඣත්තිකබාහිරවත්ථුම්හි අවිසදේ උප්පන්නේසු චිත්තචේතසිකේසු ඤාණම්පි අවිසදං හෝති අපරිසුද්ධං; අපරිසුද්ධානි දීපකපල්ලකවට්ටිතේලානි නිස්සාය උප්පන්නදීපසිඛාය ඕභාසෝ විය. විසදේ පන අජ්ඣත්තිකබාහිරවත්ථුම්හි උප්පන්නේසු චිත්තචේතසිකේසු ඤාණම්පි විසදං හෝති පරිසුද්ධානි දීපකපල්ලකවට්ටිතේලානි නිස්සාය උප්පන්නදීපසිඛාය ඕභාසෝ විය. තේන වුත්තං "වත්ථුවිසදකිරියා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තතී"ති.

**ඉන්ද්‍රියසමත්තපටිපාදනා** නාම සද්ධාදීනං ඉන්ද්‍රියානං සමභාවකරණං. සචේ හිස්ස සද්ධින්ද්‍රියං බලවං හෝති, ඉතරානි මන්දානි, තතෝ වීරියින්ද්‍රියං පග්ගහකිච්චං,

සතින්ද්‍රියං උපට්ඨානකිච්චං, සමාධින්ද්‍රියං අවික්ඛෙපකිච්චං, පඤ්ඤින්ද්‍රියං දස්සනකිච්චං කාතුං න සක්කෝති. තස්මා තං ධම්මසභාවපච්චවෙක්ඛණේන වා යථා වා මනසිකරෝතෝ බලවං ජාතං, තථා අමනසිකාරේන හාපේතබ්බං. වක්කලිත්ථේරවත්ථු චෙත්ථ නිදස්සනං. සචේ පන වීරියින්ද්‍රියං බලවං හෝති, අථ නේව සද්ධින්ද්‍රියං අධිමොක්ඛකිච්චං කාතුං සක්කෝති, න ඉතරානි ඉතරකිච්චභේදං. තස්මා තං පස්සද්ධාදිභාවනාය හාපේතබ්බං. තත්‍රාපි සෝණත්ථේරවත්ථු දස්සේතබ්බං. ඒවං සේසේසුපි ඒකස්ස බලවභාවේ සති ඉතරේසං අත්තනෝ කිච්චේසු අසමත්ථතා වේදිතබ්බා.

විසේසතෝ පනෙත්ථ සද්ධාපඤ්ඤානං සමාධිවීරියානඤ්ච සමතං පසංසන්ති. බලවසද්ධෝ හි මන්දපඤ්ඤෝ මුද්ධප්පසන්නෝ හෝති, අවත්ථුස්මිං පසීදති. බලවපඤ්ඤෝ මන්දසද්ධෝ කේරාටිකපක්ඛං භජති, භේසජ්ජසමුට්ඨිතෝ විය රෝගෝ අතේකිච්ඡෝ හෝති "චිත්තුප්පාදමත්තේනේව කුසලං හෝතී"ති අතිධාවිත්වා දානාදීනි පුඤ්ඤානි අකරොන්තෝ නිරයේ උප්පජ්ජති. උභින්නං පන සමතාය වත්ථුස්මිංයේව පසීදති. බලවසමාධිං පන මන්දවීරියං, සමාධිස්ස කෝසජ්ජපක්ඛත්තා, කෝසජ්ජං අධිභවති. බලවවීරියං මන්දසමාධිං, වීරියස්ස උද්ධච්චපක්ඛත්තා, උද්ධච්චං අධිභවති. සමාධි පන වීරියේන සංයෝජිතෝ කෝසජ්ජේ පතිතුං න ලභති. වීරියං සමාධිනා සංයෝජිතං උද්ධච්චේ පතිතුං න ලභති. තස්මා තදුභයම්පි සමං කාතබ්බං. උභයසමතාය හි අප්පනා හෝති. අපිච සමාධිකම්මිකස්ස බලවතීපි සද්ධා වට්ටති. ඒවං සෝ සද්දහන්තෝ ඕකප්පෙන්තෝ අප්පනං පාපුණිස්සති.

සමාධිපඤ්ඤාසු පන සමාධිකම්මිකස්ස ඒකග්ගතා බලවතී වට්ටති. ඒවඤ්හි සෝ අප්පනං පාපුණාති. විපස්සනාකම්මිකස්ස පඤ්ඤා බලවතී වට්ටති. ඒවඤ්හි සෝ ලක්ඛණපටිවේධං පාපුණාති. උභින්නං පන සමතාය අප්පනා හෝතියේව. සති පන සබ්බත්ථ බලවතී වට්ටති. සති හි චිත්තං උද්ධච්චපක්ඛිකානං සද්ධාවීරියපඤ්ඤානං වසේන උද්ධච්චපාතතෝ, කෝසජ්ජපක්ඛිකේන ච සමාධිනා කෝසජ්ජපාතතෝ රක්ඛති. තස්මා සා, ලෝණධූපනං විය සබ්බබ්‍යඤ්ජනේසු, සබ්බකම්මිකඅමච්චෝ විය ච සබ්බරාජකිච්චේසු, සබ්බත්ථ ඉච්ඡිතබ්බා. තේනාහ "සති ච පන සබ්බත්ථිකා වුත්තා භගවතා. කිං කාරණා? චිත්තඤ්හි සතිපටිසරණං, ආරක්ඛපච්චුපට්ඨානා ච සති; න විනා සතියා චිත්තස්ස පග්ගහනිග්ගහෝ හෝතී"ති. **දුප්පඤ්ඤපුග්ගලපරිවජ්ජනා** නාම ඛන්ධාදිභේදේ අනෝගාළ්හපඤ්ඤානං දුම්මේධපුග්ගලානං ආරකා පරිවජ්ජනං. **පඤ්ඤවන්තපුග්ගලසේවනා** නාම සමපඤ්ඤාසලක්ඛණපරිග්ගාහිකාය උදයබ්බයපඤ්ඤාය සමන්නාගත පුග්ගල සේවනා. **ගම්භීරඤාණචරියපච්චවෙක්ඛණා** නාම ගම්භීරේසු ඛන්ධාදීසු පවත්තාය ගම්භීරපඤ්ඤාය පභේදපච්චවෙක්ඛණා. **තදධිමුත්තතා** නාම ඨානනිසජ්ජාදීසු ධම්මවිචයසම්බොජ්ඣඞ්ගසමුට්ඨාපනත්ථං නින්නපෝණපබ්භාර චිත්තතා. ඒවං උප්පන්නස්ස පනස්ස අරහත්තමග්ගේන භාවනාපාරිපූරී හෝතීති පජානාති.
**[විභඞ්ග අටුවා (ඡට්ඨසඞ්ගායනා බොජ්ඣඞ්ගපබ්බ වණ්ණනා අංක 367 යටතේ); විභඞ්ග අටුවා 194 පිට (හේ.වි.මු)]**

**පරිපුච්ඡකතා** ස්කන්ධාදීන්ගේ අරුත් පිළිබඳ පැන පුළුස්නා බවයැ **වත්ථුවිසදක්‍රියා** ආධ්‍යාත්මිකබාහ්‍යවස්තූන්ගේ නිදෙස් බැව් පිරිසිදු බැව් කිරීමයැ **ඉන්ද්‍රියසමත්තපටිපාදනා** ශ්‍රද්ධෙන්ද්‍රියාදීන් සමවන පරිදි පිළියෙළ කිරීමයැ **දුප්පඤ්ඤපුග්ගලපරිවජ්ජනං** නුවණ නැති පුගුලන් දුරු කිරීමයැ

**පඤ්ඤවන්තපුග්ගලසේවනා** නුවණ ඇති පුගුලන් සෙවිනා බවයැ **ගම්භීරඤාණචරියපච්චවෙක්ඛණා** ගැඹුරුවූ ස්කන්ධාදීන්හි පැවති ගැඹුරුවූ ප්‍රඥප්‍රභේදයන් ප්‍රත්‍යවේක්ෂා කිරීමයැ **තදධිමුත්තතා** ඒ ධර්මවිචය සම්බොජ්ඣඞ්ගයෙහි නිම්නප්‍රවණ ප්‍රාග්භාර සිත් ඇති බවය **ඉති (ඉමේ සත්තධම්මා)** මේ සප්තවිධ ධර්මයෝයි **තත්ථ** ඒ පරිපුච්ඡකතාදීන් අතුරෙන් **පරිපුච්ඡකතාති** පැන පුළුවුස්නා බව නම් **ඛන්ධ-ධාතු-ආයතන-ඉන්ද්‍රිය-බල-බොජ්ඣඞ්ග-මග්ගඞ්ග-ඣාන-සමථ-විපස්සසානං** ස්කන්ධ-ධාතු-ආයතන-ඉන්ද්‍රිය-බල-බොධ්‍යඞ්ග-මාර්ගාඞ්ග-ධ්‍යාන-සමථ-විදර්ශනාවන්ගේ **අත්ථසන්නිස්සිතපරිපුච්ඡාබහුලතා** අරුත් පිළිබඳ කොට පැවති පැන පිළිවිසීම් බහුලකොට ඇති බවයි **වත්ථුවිසදක්‍රියාති** වත්ථුවිසදක්‍රියා නම් **අජ්ඣත්තිකබාහිරානං** ආධ්‍යාත්මික බාහ්‍යවූ **වත්ථූනං** වස්තූන්ගේ **විසදභාවකරණං** නොකිළිටි බැව් පිරිසිදු බැව් කිරීමයැ **හි** විස්තරය කෙරෙම් **යදා** යම් කලෙකැ **අස්ස** ඒ මහණහුගේ **කේසනඛලෝමානි** කෙස් ලොම් නියහු **දීඝානි** දික්වූහු **හොන්ති** වෙද්ද **සරීරං වා** සිරුර හෝ **උස්සන්නදෝසඤ්චේව** වැඩිගිය දෙස් ඇත්තේද **සේදමලමක්ඛිතඤ්ච** ඩාදියමල වැකීගියේද **තදා** එකල්හි **අජ්ඣත්තිකං වත්ථු** ආධ්‍යාත්මික වස්තු තෙමේ **අවිසදං** කිළිටිවූයේ **අපරිසුද්ධං** පිරිසිදුනුවූයේ **හෝති** වේ **යදා පන** යම් කලෙක වනාහි **චීවරං** සිවුර **ජිණ්ණං** පැරණිවූයේ **කිළිට්ඨං** කිළිටිවූයේ **දුග්ගන්ධං** දුගඳ ඇතියේ **හෝති** වේද **සේනාසනං වා** සෙනස්න හෝ **උක්ලාපං** කැළිකසළ ඇතියේ වේද **තදා** එකල්හි **බාහිරවත්ථු** බාහ්‍යවස්තු තෙමේ **අවිසදං** කිළිටිවූයේ **අපරිසුද්ධං** පිරිසිදුනුවූයේ **හෝති** වේ **තස්මා** එහෙයින් **කේසාදිජේදනේන** කෙස් ඈ සිඳීමෙන්ද **උද්ධං විරේචනඅධෝවිරේචනාදීහි** ඌර්ධවිරේචන අධෝවිරේචනාදීයෙන්ද **සරීරසල්ලහුකභාවකරණේන** ශරීරයාගේ සැහැල්ලු බව කිරීමෙන්ද **උච්ඡාදනනහාපනේන ච** උද්වර්තනසනාපනයෙන්ද හෙවත් ඇඟ ඉලීම් නැහැවීමෙන්ද **අජ්ඣත්තිකවත්ථු** ආධ්‍යාත්මිකවූ වස්තුතෙමේ **විසදං** පිරිසිදුවූයේ **කාතබ්බං** කටයුතුයි **සූචිකම්මධෝවනරජනපරිභණ්ඩකරණාදීහි** සිවුරුගෙත්තම් කිරීම දෙවීම් රැදීම් පිරිබඩකිරීම් ආදියෙන් **බාහිරවත්ථු** බාහ්‍යවස්තු තෙමේ **විසදං** පිරිසිදුවූයේ **කාතබ්බං** කටයුතුයි **හි** විස්තරයකෙරෙම් **ඒතස්මිං අජ්ඣත්තිකබාහිරවත්ථුම්හි** තෙල ආධ්‍යාත්මික බාහ්‍යවස්තුව **අවිසදේ** අපිරිසිදු වූ කල්හි හෝ නොපහන්වූ කල්හි **උප්පන්නේසු** උපන්නාවූ **චිත්තචේතසිකේසු** චිත්ත චෛතසිකයන් මධ්‍යයෙහි වූ **ඤාණම්පි** නුවණද **අවිසදං** කිළිටිවූයේ **අපරිසුද්ධං** අපිරිසිදු වූයේ **හෝති** වේ (**යථා කිං** කුමක්මෙන්ද යත්) **අපරිසුද්ධානි** පිරිසිදුනුවූ **දීපකපල්ලිකවට්ටිතේලානි** පහන්මළා පහන්වැටි තෙල් **නිස්සාය** නිසා **උප්පන්නදීපසිඛාය** උපන් පහන් සිළුවගේ **ඕභාසෝ විය** ආලෝකය මෙනි **තේන** එහෙයින් **වත්ථුවිසදක්‍රියා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය සංවත්තතීති** සංවත්තති යි **වුත්තං** කියනලදයැ.

**ඉන්ද්‍රියසමත්තපටිපාදනා නාම** ඉන්ද්‍රියයන්ගේ සමබව පිළියෙළකිරීම නම් **සද්ධාදීනං ඉන්ද්‍රියානං** ශ්‍රද්ධාදීවූ ඉන්ද්‍රිය ධර්මයන්ගේ **සමභාවකරණං** සමබව කිරීමයි **හි** විස්තරය කෙරෙම් **අස්ස** ඒ මහණහුගේ **සද්ධින්ද්‍රියං** ශ්‍රද්ධෙන්ද්‍රිය තෙමේ **සචේ** ඉදින් **බලවං හෝති** බලවත් වූයේ වේද **ඉතරානි** තදිතරවූ වීර්යෙන්ද්‍රියාදීහු **මන්දනි** ලස්වූහු වෙද්ද (බෙලහීනයහු වෙද්ද යූසේයි) **තතෝ** එහෙයින් **විරියින්ද්‍රියං** වීර්යෙන්ද්‍රිය තෙමේ **පග්ගහකිච්චං** ප්‍රග්‍රහ කෘත්‍යය හෙවත් උපස්ථම්භන කෘත්‍යය **සතින්ද්‍රියං** ස්මෘතීන්ද්‍රිය තෙමේ **උපට්ඨානකිච්චං** අරමුණෙහි වැටහීම් කිස **සමාධින්ද්‍රියං** සමාධින්ද්‍රිය තෙමේ **අවික්ඛේපකිච්චං** අවික්ෂේපනම්ලද සන්සිඳීම්කිස **පඤ්ඤින්ද්‍රියං** ප්‍රඥෙන්ද්‍රිය තෙමේ **දස්සනකිච්චං** දර්ශනකෘත්‍යය **කාතුං** කරන්ට **න සක්කෝති** නොහැක්කේයි **තස්මා**

එහෙයින් **තං** ඒ ශ්‍රද්ධෙන්ද්‍රිය තෙමේ **ධම්මසභාවපච්චවෙක්ඛණේන වා** ධර්මස්භාවය මෙනෙහි කිරීමෙන් හෝ **යථා** යම් කරුණෙකින් **මනසිකරෝතෝ** මෙනෙහි කරනුවහට **බලවං ජාතං** (ශ්‍රද්ධෙන්ද්‍රිය) බලවත්වේද **තථා** ඒ කරුණෙන් **අමනසිකාරේන වා** මෙනෙහි නොකිරීමෙන් හෝ **හාපේතබ්බං** පිරිහෙළිය යුතුයි **එත්ථ** තෙල ශ්‍රද්ධාවගේ බලවත්බව පිරිහෙළීමෙහි **වක්කලිත්ථේරවත්ථු ච** වක්කලි තෙරුන්ගේ කථා වස්තුවද **නිදස්සනං** සාධකයි **සචේ පන** ඉදින් වනාහි **විරියින්ද්‍රියං** වීර්යෙන්ද්‍රිය තෙමේ **බලවං හෝති** බලවත්වූයේ වේද **අථ** එකල්හි **සද්ධින්ද්‍රියං** ශ්‍රද්ධෙන්ද්‍රිය තෙමේ **අධිමොක්ඛකිච්චං** අරමුණෙහි නිශ්චයාකාරයෙන් උපදනා අදහන කිස **කාතුං** කරන්ට **නේව සක්කෝති** නොමහැකිවෙයි **ඉතරානි** තදිතරවූ ස්මෘතීන්ද්‍රියාදීහු **ඉතරකිච්චභේදං** අනික් අනික් වැටහීම් ඈ කෘත්‍ය විශේෂය **කාතුං** කරන්ට **න සක්කොන්ති** නොහැකිවෙත් **තස්මා** එහෙයින් **තං** ඒ වීර්යෙන්ද්‍රිය තෙමේ **පස්සද්ධාදිභාවනාය** ප්‍රශ්‍රබ්ධිසංබෝධ්‍යඞ්ගාදි භාවනා වශයෙන් නොහොත් ප්‍රශ්‍රබ්ධිසංබෝධ්‍යඞ්ගාදි භාවනාව කරණකොටගෙනැ **හාපේතබ්බං** පිරිහෙළිය යුතුයි **තත්‍රාපි** තෙල වීර්යෙන්ද්‍රියයාගේ බලවත්බව පිරිහෙළීමෙහිදු **සෝණත්ථේරවත්ථු** සෝණස්ථවිර වස්තුව **දස්සේතබ්බං** දැක්විය යුතුයි **ඒවං** යථෝක්ත නයින් **සෙසේසුපි** අවශේෂවූ වීර්යෙන්ද්‍රියාදීන් අතුරෙනුදු **ඒකස්ස** එක් ඉන්ද්‍රියයක්හුගේ **බලවභාවේ සති** බලවත්බව ඇති කල්හි **ඉතරේසං** තදිතර ඉන්ද්‍රියයන්ගේ **අත්තනෝ කිච්චේසු** තම තමා අයත් කටයුතුවල **අසමත්ථතා** නොසමත්බැව් තොමෝ **වේදිතබ්බා** දතයුත්තීයැ **විසේසතෝ පන** විශේෂ වශයෙන් වනාහි **එත්ථ** මේ ඉන්ද්‍රියයන් අතුරෙන් **සද්ධාපඤ්ඤානං** ශ්‍රද්ධා ප්‍රඥා ඉන්ද්‍රියයන්ගේද **සමාධිවිරියානඤ්ච** සමාධිවිරිය ඉන්ද්‍රියයන්ගේද **සමතං** සමත්වය (**පණ්ඩිතා** පඬුවෝ) **පසංසන්ති** පසසත් **හි** ඒ එසේමැයි **බලවසද්ධෝ** බලවත් ශ්‍රද්ධාඇත්තාවූ **මන්දපඤ්ඤෝ** මඳ නුවණ ඇත්තා වූ පුග්ගල්තෙම **මුද්ධප්පසන්නෝ හෝති** මුගධ ජනයා කෙරෙහි ප්‍රසන්න වූයෙක් වේද නොහොත් මූඪවූ ගුණ විරහිතවූ ජනයා කෙරෙහි ප්‍රසන්න වූයෙක් වේ **අවත්ථුස්මිං** නොපැහැදිය යුතුවූ වස්තුවෙහි **පසීදති** පහදී **බලවපඤ්ඤෝ** බලවත් ප්‍රඥා ඇත්තාවූ **මන්දසද්ධෝ** මන්ද සැදැහැ ඇත්තාවූ පුග්ගල්තෙමේ **කේරාටිකපක්ඛං** කෛරාටික පක්ෂය **භජති** භජනය කරයි නොහොත් **කේරාටිකපක්ඛං** කෛරාටික ජනයාගේ පක්ෂයට **භජති** යෙයි වදනේයි **භේසජ්ජසමුට්ඨිතෝ** බෙහෙත් හේතුකොටගෙනැ නැඞිගාවූ (හටගත්තා වූ) **රෝගෝ විය** රෝගයක් මෙන් **අතේකිච්ඡෝ හෝති** පිළියම් කටැටි නුවූයේ වේ **චිත්තුප්පාදමත්තේනේව** සිත ඉපදුන පමණෙකින්මැ **කුසලං හෝතීති** කුසල්වේයයි **අතිධාවිත්වා** නොමගදිව **දානාදීනි** දනාදී වූ **පුඤ්ඤානි** පින් **අකරොන්තෝ** නොකරන්නේවැ නොහොත් නොකරන්නාවූ කෛරාටික ජනතෙම **නිරයේ** නරකයෙහි **උප්පජ්ජති** උපදී **උභින්නං පන** උභය ශ්‍රද්ධා ප්‍රඥෙන්ද්‍රියයන්ගේ **සමතාය** සමත්වය හේතුකොටගෙනැ **වත්ථුස්මිංයේව** පැහැදිය යුතු බුද්ධාදි වස්තුත්‍රයෙහිම **පසීදති** පහදී **පන** පක්ෂාන්තරයෙක් කියනු ලැබේ **බලවසමාධිං** බලවත්වූ සමාධිය ඇති **මන්දවිරියං** ලස්වූ විර්ය්‍යය ඇති මහණහු **සමාධිස්ස** සමාධියගේ **කෝසජ්ජපක්ඛත්තා** කෞෂිද්‍යපක්ෂය අයත්වන බැවින් **කෝසජ්ජං** කෞෂිද්‍ය තෙමේ **අධිභවති** මඩීයි **බලවවිරියං** බලවත් වූ වියසී ඇති **මන්දසමාධිං** ලස්වූ සමාධි ඇති මහණහු **විරියස්ස** වියසීයාගේ **උද්ධච්චපක්ඛත්තා** ඖද්ධත්‍ය පකෂය අයත්වන බැවින් **උද්ධච්චං** ඖද්ධත්‍යය තෙමේ **අධිභවති** මඩීයි (යෝජනාවෙහි මෙයට වෙනස්ව දක්නා ලැබේ හේ කීයේයැ යත් **බලවසමාධි** බලවත්වූ සමාධිතෙමේ **මන්දවිරියසමාධිස්ස** ලස්වූ විර්ය්‍යය ඇති සමාධියගේ **කෝසජ්ජපක්ඛත්තා** කෞෂිද්‍ය පක්ෂයෙහි වන බැවින් **කෝසජ්ජං** කෞෂිද්‍යය **අධිභවති** ඉක්ම පවත්වයි **බලවවිරියං** බලවත් වූ වියසී තෙමේ **මන්දසමාධිවිරියස්ස** ලස්වූ සමාධි ඇති වියසීයාගේ **උද්ධච්චපක්ඛත්තා** ඖද්ධත්‍ය

පක්‍ෂයෙහි වන බැවින් **උද්ධච්චං** ඖද්ධත්‍යය **අධිභවති** ඉක්ම පවත්වයි මෙසේ යෝජනා නයින් පෙළ හා අරුත් වියකැණ දතයුතුයි)

**විරියේන සංයෝජිතෝ** වීර්‍ය්‍යය හා සමකොටැ යොදන ලද්දවූ **සමාධි පන** සමාධිතෙම වනාහි **කෝසජ්ජේ** කෞසීද්‍යයෙහි **පතිතුං** හීමට **න ලබ්භති** නොලැබෙයි **සමාධිනා සංයෝජිතං** සමාධිය හා සමකොටැ යොදන ලද්දවූ **විරියං** වීර්‍ය්‍යය තෙමේ **උද්ධච්චේ** ඖද්ධත්‍යයෙහි **පතිතුං** හීමට **න ලබ්භති** නොලැබෙයි **හි** යම්හෙයකින් **උභයසමතාය** වීර්‍ය්‍යසමාධි දෙදෙනාගේ සමවීම හේතුකොටගෙනැ **අප්පණා හෝති** අර්පණා තොමෝ වේද **තස්මා** එහෙයින් **තදුභයම්පි** ඒ වීර්‍ය්‍යසමාධි ද්වයද **සමං කාතබ්බං** සමවූවහු කළයුතුය **අපිච** අනික් නයෙකුදු ඇත් **සමාධිකම්මිකස්ස** අර්පණා සමාධි භාවනා කර්මයෙහි නියුක්තවූ මහණහට **බලවතී සද්ධාපි** බලවත්වූ ශ්‍රද්ධා තොමෝත් **වට්ටති** වටනේයි ("බලවපීති සද්ධා වට්ටති"යි මුම්ම ව්‍යාඛ්‍යානයෙහි ගෘහිත පාඨයත් දැක්වූ අර්ථයත් නොයෙදේ) **ඒවං** ඒකාග්‍රතා බලවත් භාවයෙන් නොහොත් එසේ ඇතිකල්හි **සෝ** ඒ අර්පණාසමාධිභාවනා කර්මයෙහි නියුක්ත මහණතෙමේ **සද්දහන්තෝ** අරමුණු අදහනුයේවැ **ඕකප්පෙන්තෝ** අරමුණු කරා නැඹුරුවනුවැ **අප්පණං** අර්පණාවට **පාපුණිස්සති** පැමිණෙන්නේයි **සමාධිපඤ්ඤාසු** පන සමාධිප්‍රඥාවන් හෙවත් සමථවිදර්ශනාවන් අතුරෙන් වනාහි **සමාධිකම්මිකස්ස** සමථ භාවනාකර්මයෙහි නියුක්ත මහණහට **බලවතී** බලවත්වූ **ඒකග්ගතා** ඒකාග්‍රතා තොමෝ **වට්ටති** වටනේයි **හි** ඒ සැබෑව **ඒවං** ඒ ඒකාග්‍රතා බලවත් භාවයෙන් නොහොත් එසේ ඇති කල්හි **සෝ** ඒ සමථ භාවනාකර්මයෙහි නියුක්ත මහණතෙම **අප්පණං** අර්පණාවට **පාපුණාති** පැමිණෙයි **විපස්සනාකම්මිකස්ස** විදර්ශනා භාවනාකර්මයෙහි නියුක්තවූ මහණහට **බලවතී** බලවත්වූ **පඤ්ඤා** ප්‍රඥාතොමෝ **වට්ටති** වටනේයි **හි** ඒ සැබව **ඒවං** ඒ ප්‍රඥා බලවත් භාවයෙන් නොහොත් එසේ ඇතිකල්හි **සෝ** ඒ විදර්ශනා භාවනාකර්මයෙහි නියුක්තවූ මහණතෙම **ලක්ඛණපටිවේධං** අනිත්‍යාදි ලක්‍ෂණ ප්‍රතිවේධය කිරීමට **පාපුණාති** පැමිණෙයි **උභින්නං පන** උභය සමාධි ප්‍රඥාවන්ගේ වනාහි **සමතාය** සමත්වය හේතුකොටගෙනැ **අප්පණා** අර්පණාතොමෝ **හෝතියේව** වේමැයි **සති පන** ස්මෘතිතොමෝ වනාහි **සබ්බත්ථ** ඇමතන්හිම (සියලු කටයුතුවල යුසේයි) **බලවතී** බලවත්වූවා **වට්ටති** වටනේයි **හි** යම් හෙයකින් **සති** ස්මෘතිතොමෝ **චිත්තං** සිත **උද්ධච්චපක්ඛිකානං** ඖද්ධත්‍යයාගේ පක්ෂයෙහිවූ **සද්ධාවිරියපඤ්ඤානං** ශ්‍රද්ධා වීර්‍ය්‍ය ප්‍රඥාවන්ගේ **වසේන** ශක්තිවශයෙන් **උද්ධච්චපාතතෝ** ඖද්ධත්‍යයෙහි හීමෙන් (**රක්ඛති** රකීද) **කෝසජ්ජපක්ඛිකේන** කෞසීද්‍යයාගේ පක්ෂයෙහි වූ **සමාධිනා ච** සමාධිය හේතුකොටගෙනද **කෝසජ්ජපාතතෝ** කෞසීද්‍යයෙහි හීමෙන් **රක්ඛති** රකීද **තස්මා** එහෙයින් **සා** ඒ ස්මෘතිතොමෝ **සබ්බබ්‍යඤ්ජනේසු** සියලු සූපව්‍යඤ්ජනයන්හි **ලෝණධූපනං** විය ලුණු ලැමක්මෙන්ද **සබ්බරාජකිච්චේසු** සියලු රාජ කෘත්‍යයන්හි **සබ්බකම්මික අමච්චෝ වියච** සමස්ත රාජ කෘත්‍යයෙහි නියුක්තවූ ඇමැතියක්හු මෙන්ද **සබ්බත්ථ** චිත්තායත්තවූ සියලු කෘත්‍යයන්හි **ඉච්ඡිතබ්බා** කැමැතිවිය යුත්තීයැ **තේන** එහෙයින් **"සති ච පන -පෙ- පග්ගහනිග්ගහෝ හෝතීති"** හෝතීති **ආහ** (සිවුපිළිසිඹියාපත් රහත් නාගසේන මහතෙරුන් වහන්සේ) වදාළසේක **සති ච පන** ස්මෘති තොමෝ වනාහි (ච ශබ්ද වාක්‍යාරම්භයෙහි වැටේ) **සබ්බත්ථිකා** සියලු කටයුතුවල පවත්නීයයි **භගවතා** භාග්‍යවතුන් වහන්සේ විසින් **වුත්තා** වදරන ලදුයැ **කිං කාරණා?** කවරහෙයින යත්? **හි** යම්හෙයකින් **චිත්තං** සිත තෙමේ **සති පටිසරණං** සිහිය පිළිසරණ කොට ඇත්තේද **සතිච** සිහියත් **ආරක්ඛපච්චුපට්ඨානා** ආරක්ෂාවමැ වැටහීම් වනුද නොහොත් ආරක්ෂාවමැ වැටහීම් ඇත්තීද **සතියා විනා** සිහියෙන්

වෙන්වැ **චිත්තස්ස** සිත්හුගේ **පග්ගහනිග්ගහෝ** ප්‍රග්‍රහනිග්‍රහය තෙමේ (අනුබලදීම පිරිහෙළීම යුසේයි) **න හෝති** නොවේද **ඉති** එහෙයින ෴

**දුප්පඤ්ඤපුග්ගලපරිවජ්ජනං නාම** දුෂ්ප්‍රාඥ පුද්ගලයන් දුරු කිරීම නම් **ඛන්ධාදිභේදේ** ස්කන්ධාදීන් ප්‍රභේදවත්වූ පර්‍ය්‍යාප්ති ධර්මයෙහි **අනෝගාළ්හ පඤ්ඤානං** බැසනොගත් නුවණ ඇති **දුම්මේධපුග්ගලානං** අඥන පුද්ගලයන් **ආරකාපරිවජ්ජනං** දුරින් දුරලීමයි **පඤ්ඤවන්තපුග්ගලසේවනා නාම** නුවණැති පුගුලන් සේවනය කිරීම නම් **සමපඤ්ඤසලක්ඛණපරිග්ගාහිකාය** සමපණස් ලකුණු පිරික්සීමට සමර්ථවූ නොහොත් සමපණස් ලකුණු පිරිසිඳ දන්නාවූ **උදයබ්බයපඤ්ඤය** උදයව්‍යය ඥනයෙන් **සමන්නාගතපුග්ගලසේවනා** සමන්විතවූ පුද්ගලයන් සේවනකිරීමයි **ගම්භීරඤාණචරියපච්චවෙක්ඛණා නාම** ගම්භීර ඥනප්‍රවෘත්ති ප්‍රත්‍යවේක්ෂාව නම් **ගම්භීරේසු** ගැඹුරුවූ **ඛන්ධාදීසු** ස්කන්ධාදීන්හි **පවත්තාය** පැවැත්තා වූ **ගම්භීරපඤ්ඤය** ගැඹුරුවූ ප්‍රඥවගේ **පභේදපච්චවෙක්ඛණා** වෙනස ප්‍රත්‍යවේක්ෂා කිරීමයි **තදධිමුත්තතා නාම** තදධිමුත්තතා නම් **ඨානනිසජ්ජාදීසු** සිටීම් හිඳීම් ඈ ඉරියව්හි **ධම්මවිචය සම්බොජ්ඣඞ්ගසමුට්ඨාපනත්ථං** ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය උපදවාලීම පිණිසැ **නින්නපෝණපබ්භාරචිත්තතා** නිම්න ප්‍රවණ ප්‍රාග්භාරවූ සිත් ඇති බවයි **ඒවං** මෙකී කරුණෙන් **උප්පන්නස්ස** උපන්නාවූ **අස්ස පන** ඒ ධම්මවිචයසම්බොජ්ඣඞ්ගයාගේ වනාහි **අරහත්තමග්ගේන** රහත්මග හේතුකොටගෙනැ **භාවනා** ආසේවනා තොමෝ **පාරිපූරි** සම්පූර්ණ වන්නී **හෝතීති** වේයයි **පජානාති** සම්‍යක් ප්‍රකාරයෙන් දනී.

***** ස්කන්ධාදිප්‍රවචන පාලියගේ අර්ථයැ ස්කන්ධාදීන්ගේ අර්ථයයි කරුණු කොටැ "ඛන්ධ -පෙ- විපස්සනානං අර්ථසන්නිස්සිතපරිපුච්ඡාබහුලතා" යි කීහ. ඒ අර්ථ නිඃශ්‍රිත ග්‍රහණයෙන් ප්‍රවචන පාලිය ඇසුරුකළාවූ අර්ථ පළිවිසීම් යම්සේ ප්‍රඥ ප්‍රතිලාභය පිණිසැ පවත්නීද ප්‍රවචන පාලියෙන් මුක්තවූ පුච්ඡා තොමෝ එසේයින් ප්‍රඥප්‍රතිලාභය පිණිසැ නොපවත්නීයයි දක්වා කීයේ මැනෝ "ඛන්ධාදිපාලියා අත්ථෝ ඛන්ධාදිනං අත්ථෝති" කත්වා ආහ "ඛන්ධ -පෙ- විපස්සනානං අත්ථසන්නිස්සිත පරිපුච්ඡා බහුලතාති තේන පාළිමුත්තකපුච්ඡා න තථා පඤ්ඤසංවත්තනිකා යථා අත්ථ පරිපුච්ඡාති දස්සේති. [මූ:ටී] තේනාති අත්ථසන්නිස්සිතග්ගහණේන. [අ:ටී]

***** වහතිජ්වාලාදීන්හි මඳ බැවින් හෙවත් ප්‍රත්‍යය වශයෙන් දුබලවන බැවින් අබ්ධාත්වාදීන්ගේ ස්වකීය ස්වකීය කෘත්‍යයෙහි අසමර්ථතාවමෙන් වීර්යෙන්ද්‍රියාදීන්ගේද ස්වකීය ස්වකීය කෘත්‍යයෙහි අසාමර්ථ්‍යය කියනලදී. මේද යුහු "මන්දත්තා අග්ගිජාලාදීසු ආපෝධාතු ආදීනං විය විරියාදීනං සකිච්චේ සමත්ථතාවුත්තා" [මූ:ටී] "පච්චයවසේන දුබලභාවෝ මන්දතා" ෴

***** "බලවසමාධිං පන මන්දවිරියං -පෙ- උද්ධච්චං අධිභවති" යන පාඨය අර්ථයෝජනාවේ අන්පරිද්දෙකින් පිහිටිවා "බලවසමාධි පනාති පදං අභිභවතී පදේ කත්තා මන්දවිරිය සමාධිස්සාති පදං කෝසජ්ජපක්ඛත්තාති පදේ සම්බන්ධෝ මන්දවිරියං ඒතස්ස සමාධිස්සාති මන්දවිරියෝ ච සෝ සමාධිචාති මන්දවිරියසමාධි කෝසජ්ජන්ති පදං අධිභවතීති පදේ කම්මං අධිභවතීති අධිකං පවත්තේති බලවවිරියන්ති පදං අධිභවතීති පදේ කත්තා මන්දෝ සමාධි ඒතස්ස විරියස්සාති මන්දසමාධි මන්දසමාධි ච තං විරියංචාති මන්දසමාධිවිරියං"යි යෝජිතයි.

**[විභඞ්ග අටුවා සන්නය 1219 - 1228 පිටු]**

පරිපුච්ඡකතාති පරියෝගාහෙත්වා පුච්ඡකභාවෝ ආචරියේ පයිරුපාසිත්වා පඤ්චපි නිකායේ සහ අට්ඨකථාය පරියෝගාහෙත්වා යං යං තත්ථ ගණ්ඨිට්ඨානභූතං, තං තං ඉදං භන්තේ කථං, "ඉමස්ස කෝ අත්ථෝ" ති ඛන්ධායතනාදිඅත්ථං පුච්ඡන්තස්ස ධම්මවිචයසම්බොජ්ඣඞ්ගෝ උප්පජ්ජති. තේනාහ **"ඛන්ධධාතු…පෙ…. බහුලතා"**ති. **වත්ථූනං විසදභාවකරණ**න්ති එත්ථ චිත්තචේතසිකානං පවත්තිට්ඨානභාවතෝ සරීරං, තප්පටිබද්ධානි චීවරානි ච "වත්ථූනීති අධිප්පේතා"නි, තානි යථා චිත්තස්ස සුඛාවහානි හොන්ති, තථා කරණං තේසං විසදභාවකරණං. තේන වුත්තං **"අජ්ඣත්තිකබාහිරාන"**න්තිආදි. **උස්සන්නදෝස**න්ති වාතාදිඋස්සන්නදෝසං. **සේදමලමක්ඛිත**න්ති සේදේන චේව ජල්ලිකාසඞ්ඛාතේන සරීරමලේන ච මක්ඛිතං. **ච-**සද්දේන අඤ්ඤම්පි සරීරස්ස, චිත්තස්ස ච පීළාවහං සඞ්ගණ්හාති. **සේනාසනං වාති වා-**සද්දේන පත්තාදීනං සඞ්ගහෝ දට්ඨබ්බෝ. **අවිසදේ** සති, විසයභූතේ වා. කථං භාවනමනුයුත්තස්ස තානි විසයෝ? අන්තරන්තරා පවත්තනකචිත්තුප්පාදවසේනේවං වුත්තං. තේ හි චිත්තුප්පාද චිත්තේකග්ගතාය අපරිසුද්ධභාවාය සංවත්තන්ති. **චිත්තචේතසිකේසු** නිස්සයාදිපච්චයභූතේසු. **ඤාණම්පීති පි-**සද්දෝ සම්පිණ්ඩනත්ථෝ, තේන න කේවලං තං වත්ථුයේව, අථ ඛෝ තස්මිං අපරිසුද්ධේ ඤාණම්පි අපරිසුද්ධං හෝතීති නිස්සයාපරිසුද්ධියා තංනිස්සිතාපරිසුද්ධි විය විසයස්ස අපරිසුද්ධතාය විසයිනෝ අපරිසුද්ධිං දස්සේති.

**සමභාවකරණ**න්ති කිච්චතෝ අනූනාධිකභාවකරණං. සද්ධෙය්‍යවත්ථුස්මිං පච්චයවසේන අධිමොක්ඛකිච්චස්ස පටුතරභාවේන, පඤ්ඤාය අවිසදතාය, වීරියාදීනඤ්ච සිථිලතාදිනා සද්ධින්ද්‍රියං බලවං හෝති. තේනාහ **"ඉතරානි මන්දානී"**ති. **තතෝ**ති තස්මා සද්ධින්ද්‍රියස්ස බලවභාවතෝ, ඉතරේසඤ්ච මන්දත්තා. කෝසජ්ජපක්ඛේ පතිතුං අදත්වා සම්පයුත්තධම්මානං පග්ගණ්හනං අනුබලප්පදානං **පග්ගහෝ,** පග්ගහෝව කිච්චං **පග්ගහකිච්චං,** "කාතුං න සක්කෝතී"ති ආනෙත්වා සම්බන්ධිතබ්බං. ආරම්මණං උපගන්ත්වා ඨානං, අනිස්සජ්ජනං වා **උපට්ඨානං.** වික්ඛේපපටික්ඛේපෝ, යේන වා සම්පයුත්තා අවික්ඛිත්තා හොන්ති, සෝ **අවික්ඛේපෝ.** රූපගතං විය චක්ඛුනා යේන යාථාවතෝ විසයසභාවං පස්සති, තං **දස්සනකිච්චං. කාතුං න සක්කෝති** බලවතා සද්ධින්ද්‍රියේන අභිභූතත්තා. සහජාතධම්මේසු හි ඉන්ද්‍රට්ඨං කාරෙන්තානං සහපවත්තමානානං ධම්මානං ඒකරසතාවසේනේව අත්ථසිද්ධි, න අඤ්ඤථා. **තස්මාති** වුත්තමේවත්ථං කාරණභාවේන පච්චාමසති. **ත**න්ති සද්ධින්ද්‍රියං. **ධම්මසභාවපච්චවෙක්ඛණේනා**ති යස්ස සද්ධෙය්‍යස්ස වත්ථුනෝ උළාරතාදිගුණේ අධිමුච්චනස්ස සාතිසයප්පවත්තියා සද්ධින්ද්‍රියං බලවං ජාතං, තස්ස පච්චයපච්චයුප්පන්නතාදිවිභාගතෝ යාථාවතෝ වීමංසනේන. ඒවඤ්හි ඒවංධම්මතානයේන සභාවසරසතෝ පරිග්ගය්හමානේ සවිප්ඵාරෝ අධිමොක්ඛෝ න හෝති "අයං ඉමේසං ධම්මානං සභාවෝ"ති පරිජානනවසේන පඤ්ඤාබ්‍යාපාරස්ස සාතිසයත්තා. ධුරියධම්මේසු හි යථා සද්ධාය බලවභාවේ පඤ්ඤාය මන්දභාවෝ හෝති, ඒවං පඤ්ඤාය බලවභාවේ සද්ධාය මන්දභාවෝ හෝතීති. තේන වුත්තං **"තං ධම්මසභාවපච්චවෙක්ඛණේන වා, යථා වා මනසිකරෝතෝ බලවං ජාතං, තථා අමනසිකාරේන හාපේතබ්බ"**න්ති. **තථා අමනසිකාරේනාති** යේනාකාරේන භාවනං අනුයුඤ්ජන්තස්ස සද්ධින්ද්‍රියං බලවං ජාතං, තේනාකාරේන භාවනාය අනනුයුඤ්ජනතෝති වුත්තං හෝති. ඉධ දුවිධේන සද්ධින්ද්‍රියස්ස බලවභාවෝ අත්තනෝ වා පච්චයවිසේසේන කිච්චුත්තරියතෝ, වීරියාදීනං වා මන්දකිච්චතාය. තත්ථ පඨමවිකප්පේ හාපනවිධි දස්සිතෝ.

දුතියකප්පේ පන යථා මනසිකරොතො වීරියාදීනං මන්දකිච්චතාය සද්ධින්ද්‍රියං බලවං ජාතං, තථා අමනසිකාරේන, වීරියාදීනං පටුකිච්චභාවාවහේන මනසිකාරේන සද්ධින්ද්‍රියං තේහි සමරසං කරොන්තේන භාපේතබ්බං. ඉමිනා නයේන සේසින්ද්‍රියේසුපි භාපනවිධි වේදිතබ්බෝ.

**වක්කලිත්ථේරවත්ථූ**ති. සෝ හි ආයස්මා සද්ධාධිමුත්තතාය කතාධිකාරෝ සත්ථු රූපකායදස්සනප්පසුතෝ ඒව හුත්වා විහරන්තෝ සත්ථාරා "කිං තේ වක්කලි ඉමිනා පූතිකායේන දිට්ඨේන, යෝ ඛෝ වක්කලි ධම්මං පස්සති, සෝ මං පස්සතී"තිආදිනා (සං. නි. 3.87; දී. නි. අට්ඨ. 1.පඨමමහාසඞ්ගීතිකථා; අ. නි. අට්ඨ. 1.1.208; ධ. ප. අට්ඨ. 2.380; පටි. ම. අට්ඨ. 2.2.130; ධ. ස. අට්ඨ. 1007; ථෙරගා. අට්ඨ. 2.වක්කලිත්ථෙරගාථාවණ්ණනා) ඕවදිත්වා කම්මට්ඨානේ නියෝජිතෝපි තං අනනුයුඤ්ජන්තෝ පණාමිතෝ අත්තානං විනිපාතේතුං පපාතට්ඨානං අභිරුහි, අථ නං සත්ථා යථානිසින්නෝව ඕභාසං විස්සජ්ජේන්තේන අත්තානං දස්සෙත්වා;

"පාමෝජ්ජබහුලෝ භික්ඛු, පසන්නෝ බුද්ධසාසනේ;
අධිගච්ඡේ පදං සන්තං, සඞ්ඛාරූපසමං සුඛ"න්ති. (ධ. ප. 381)

ගාථං වත්වා "ඒහි වක්කලී"ති ආහ. සෝ තේන අමතේනේව අභිසිත්තෝ හට්ඨතුට්ඨෝ හුත්වා විපස්සනං පට්ඨපේසි. සද්ධාය බලවභාවතෝ විපස්සනාවීථිං න ඕතරති, තං ඤත්වා භගවා තස්ස ඉන්ද්‍රියසමත්තපටිපාදනාය කම්මට්ඨානං සෝධෙත්වා අදාසි. සෝ සත්ථාරා දින්නනයේ ඨත්වා විපස්සනං උස්සුක්කාපෙත්වා මග්ගප්පටිපාටියා අරහත්තං පාපුණි. තේනේතං වුත්තං "වක්කලිත්ථේරවත්ථු චෙත්ථ නිදස්සන"න්ති. **එත්ථා**ති සද්ධින්ද්‍රියස්ස අධිමත්තභාවේ සේසින්ද්‍රියානං සකිච්චාකරණේ.

**ඉතරකිච්චභේද**න්ති උපට්ඨානාදිකිච්චවිසේසං. **පස්සද්ධාදීති ආදි**-සද්දේන සමාධිඋපෙක්ඛාසම්බොජ්ඣඞ්ගානං සඞ්ගහෝ දට්ඨබ්බෝ. **භාපේතබ්බ**න්ති යථා සද්ධින්ද්‍රියස්ස බලවභාවෝ ධම්මසභාවපච්චවෙක්ඛණේන හායති, ඒවං වීරියින්ද්‍රියස්ස අධිමත්තතා පස්සද්ධිආදිභාවනාය හායති සමාධිපක්ඛියත්තා තස්සා. තථා හි සමාධින්ද්‍රියස්ස අධිමත්තතං කෝසජ්ජපාතතෝ රක්ඛන්තී වීරියාදිභාවනා විය වීරියින්ද්‍රියස්ස අධිමත්තතං උද්ධච්චපාතතෝ රක්ඛන්තී ඒකංසතෝ භාපේති. තේන වුත්තං **"පස්සද්ධආදිභාවනාය භාපේතබ්බ"**න්ති. **සෝණත්ථේරස්ස වත්ථූ**ති සුකුමාරසෝණත්ථේරස්ස වත්ථු. (මහාව. 242; අ. නි. අට්ඨ. 1.1.205) සෝ හි ආයස්මා සත්ථු සන්තිකේ කම්මට්ඨානං ගහෙත්වා සීතවනේ විහරන්තෝ "මම සරීරං සුඛුමාලං, න ච සක්කා සුඛේනේව සුඛං අධිගන්තුං, කිලමෙත්වාපි සමණධම්මෝ කාතබ්බෝ"ති තං ඨානචඞ්කමමේව අධිට්ඨාය පධානං අනුයුඤ්ජන්තෝ පාදතලේසු ඵෝටේසු උට්ඨිතේසුපි වේදනං අජ්ඣුපෙක්ඛිත්වා දළ්හං වීරියං කරොන්තෝ අච්චාරද්ධවීරියතාය විසේසං නිබ්බත්තේතුං නාසක්ඛි. සත්ථා තත්ථ ගන්ත්වා වීණූපමෝවාදේන ඕවදිත්වා වීරියසමතායෝජනවීථිං දස්සෙන්තෝ කම්මට්ඨානං සෝධෙත්වා ගිජ්ඣකූටං ගතෝ. ථේරෝපි සත්ථාරා දින්නනයේන වීරියසමතං යෝජෙත්වා භාවෙන්තෝ විපස්සනං උස්සුක්කාපෙත්වා අරහත්තේ පතිට්ඨාසි. තේන වුත්තං **"සෝණත්ථේරස්ස වත්ථු දස්සේතබ්බ"**න්ති. **සේසේසුපී**ති සතිසමාධිපඤ්ඤින්ද්‍රියේසුපි.

**සමතන්**ති සද්ධාපඤ්ඤානං අඤ්ඤමඤ්ඤං අනූනානධිකභාවං, තථා සමාධිවීරියානං. යථා හි සද්ධාපඤ්ඤානං විසුං විසුං ධුරියධම්මභූතානං කිච්චතෝ අඤ්ඤමඤ්ඤං නාතිවත්තනං විසේසතෝ ඉච්ඡිතබ්බං, යතෝ නේසං සමධුරතාය අප්පනා සම්පජ්ජති, ඒවං සමාධිවීරියානං කෝසජ්ජුද්ධච්චපක්ඛිකානං සමරසතාය සති අඤ්ඤමඤ්ඤූපත්ථම්භනතෝ සම්පයුත්තධම්මානං අන්තද්වයපාතාභාවේන සම්මදේව අප්පනා ඉජ්ඣති. **"බලවසද්ධෝ"**තිආදි බ්‍යතිරේකමුඛේන වුත්තස්සේව අත්ථස්ස සමත්ථනං. තස්සත්ථෝ යෝ බලවතියා සද්ධාය සමන්නාගතෝ අවිසදඤාණෝ, සෝ මුධප්පසන්නෝ හෝති, න අවෙච්චප්පසන්නෝ. තථා හි **අවත්ථුස්මිං පසීදති** සෙය්‍යථාපි තිත්ථියසාවකා. **කේරාටිකපක්ඛ**න්ති සාඨෙය්‍යපක්ඛං **භජති.** සද්ධාහීනාය පඤ්ඤාය අතිධාවන්තෝ "දෙය්‍යවත්ථුපරිච්චාගේන විනා චිත්තුප්පාදමත්තේනපි දානමයං පුඤ්ඤං හෝතී"තිආදීනි පරිකප්පේති හේතුපතිරූපකේහි වඤ්චිතෝ, ඒවංභූතෝ ච සුක්ඛතක්කවිලුත්තචිත්තෝ පණ්ඩිතානං වචනං නාදියති සඤ්ඤත්තිං න ගච්ඡති. තේනාහ **"භේසජ්ජසමුට්ඨිතෝ විය රෝගෝ අතේකිච්ඡෝ හෝතී"**ති. යථා චෙත්ථ සද්ධාපඤ්ඤානං අඤ්ඤමඤ්ඤං විසමභාවෝ න අත්ථාවහෝ, අනත්ථාවහෝව, ඒවං, සමාධිවීරියානං අඤ්ඤමඤ්ඤං විසමභාවෝ න අත්ථාවහෝ, අනත්ථාවහෝව, තථා න අවික්ඛේපාවහෝ, වික්ඛේපාවහෝවාති. **කෝසජ්ජං අභිභවති,** තේන අප්පනං න පාපුණාතීති අධිප්පායෝ. **උද්ධච්චං අභිභවතී**ති එත්ථාපි ඒසෝව නයෝ. **තදුභය**න්ති සද්ධාපඤ්ඤාද්වයං, සමාධිවීරියද්වයඤ්ච. **සමං කාතබ්බ**න්ති සමරසං කාතබ්බං.

**සමාධිකම්මිකස්සා**ති සමථකම්මට්ඨානිකස්ස. **ඒව**න්ති ඒවං සන්තේ, සද්ධාය ථෝකං බලවභාවේ සතීති අත්ථෝ. **සද්දහන්තෝ**ති "පථවී පථවීති මනසිකරණමත්තේන කථං ඣානුප්පත්තී"ති අචින්තෙත්වා "අද්ධා සම්මාසම්බුද්ධේන වුත්තවිධි ඉජ්ඣිස්සතී"ති සද්දහන්තෝ සද්ධං ජනෙන්තෝ. **ඕකප්පෙන්තෝ**ති ආරම්මණං අනුපවිසිත්වා විය අධිමුච්චනවසේන අවකප්පෙන්තෝ පක්ඛන්දන්තෝ. **ඒකග්ගතා බලවතී වට්ටති** සමාධිප්පධානත්තා ඣානස්ස. **උභින්න**න්ති සමාධිපඤ්ඤානං. සමාධිකම්මිකස්ස සමාධිනෝ අධිමත්තතාය පඤ්ඤාය අධිමත්තතාපි ඉච්ඡිතබ්බාති ආහ **"සමතායපී"**ති, සමභාවේනාපීති අත්ථෝ. **අප්පනා**ති ලෝකියප්පනා. තථා හි **"හෝතියේවා"**ති සාසඞ්කං වදති. ලෝකුත්තරප්පනා පන තේසං සමභාවේනේව ඉච්ඡිතා. යථාහ "සමථවිපස්සනං යුගනන්ධං භාවරතී"ති (අ. නි. 4.170; පටි. ම. 2.5).

යදි විසේසතෝ සද්ධාපඤ්ඤානං, සමාධිවීරියානඤ්ච සමතාව ඉච්ඡිතා, කථං සතීති ආහ **"සති පන සබ්බත්ථ බලවතී වට්ටතී"**ති. **සබ්බත්ථා**ති ලීනුද්ධච්චපක්ඛිකේසු පඤ්චසු ඉන්ද්‍රියේසු. උද්ධච්චපක්ඛිකේකදේසේ ගණ්හන්තෝ **"සද්ධාවීරියපඤ්ඤාන"**න්ති ආහ. අඤ්ඤථා පීති ච ගහේතබ්බා සියා. තථා හි **"කෝසජ්ජපක්ඛිකේන සමාධිනා"** ඉච්චේව වුත්තං, න "පස්සද්ධිසමාධිඋපෙක්ඛාහී"ති. **සා**ති සති. සබ්බේසු රාජකම්මේසු නියුත්තෝ **සබ්බකම්මිකෝ. තේනා**ති තේන සබ්බත්ථ ඉච්ඡිතබ්බට්ඨේන කාරණේන. **ආහ** අට්ඨකථායං. සබ්බත්ථ නියුත්තා **සබ්බත්ථිකා** සබ්බත්ථ ලීනේ, උද්ධතේ ච චිත්තේ ඉච්ඡිතබ්බත්තා, සබ්බේ වා ලීනේ, උද්ධතේ ච චිත්තේ භාවේතබ්බා බොජ්ඣඞ්ගා අත්ථිකා ඒතායාති **සබ්බත්ථිකා. චිත්ත**න්ති කුසලං චිත්තං. තස්ස හි සති පටිසරණං පරායණං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය. තේනාහ **"ආරක්ඛපච්චුපට්ඨානා"**තිආදි.

**බන්ධාදිභේදේ අනොගාළ්හපඤ්ඤනන්**ති පරියත්තිබාහුසච්චවසේනපි බන්ධායතනාදීසු අප්පතිට්ඨිතබුද්ධීනං. බහුස්සුතසේවනා හි සුතමයඤාණාවහා. තරුණවිපස්සනාසමඞ්ගීපි භාවනාමයඤාණෝ ඨිතත්තා ඒකංසතෝ පඤ්ඤවා ඒව නාම හෝතීති ආහ **"සමපඤ්ඤස ලක්ඛණපරිග්ගාහිකාය උදයබ්බයපඤ්ඤය සමන්නාගතපුග්ගලසේවනා"**ති. ඤෙය්‍යධම්මස්ස ගම්භීරභාවවසේන තප්පරිච්ඡේදකඤාණස්ස ගම්භීරභාවග්ගහණන්ති ආහ **"ගම්භීරේසු බන්ධාදීසු පවත්තාය ගම්භීරපඤ්ඤාය"**ති. තඤ්හි ඤෙය්‍යං තාදිසාය පඤ්ඤාය චරිතබ්බතෝ **ගම්භීරඤාණචරියං,** තස්සා වා පඤ්ඤාය තත්ථ පභේදතෝ පවත්ති ගම්භීරඤාණචරියා, තස්සා පච්චවෙක්ඛණාති ආහ **"ගම්භීරපඤ්ඤාය පභේදපච්චවෙක්ඛණා"**ති. යථා සතිවේපුල්ලප්පත්තෝ නාම අරහා ඒව, ඒවං පඤ්ඤාවේපුල්ලප්පත්තෝතිපි සෝ ඒවාති ආහ **"අරහත්තමග්ගේන භාවනාපාරිපූරී හෝතී"**ති. වීරියාදීසුපි ඒසේව නයෝ.

**[දී.නි. මහාවග්ග ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 385 යටතේ); ම.නි. මූලපණ්ණාස ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 118 යටතේ); සං.නි. මහවග්ග ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 232 යටතේ); අං.නි. ඒකකනිපාත ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 418 යටතේ)]**

තත්ථ **වත්ථුවිසදකිරියා** නාම අජ්ඣත්තිකබාහිරානං වත්ථූනං විසදභාවකරණං. යදා හිස්ස කේසනඛලෝමානි දීඝානි හොන්ති, සරීරං වා සේදමලග්ගහිතං, තදා අජ්ඣත්තිකවත්ථු අවිසදං හෝති අපරිසුද්ධං. යදා පනස්ස චීවරං ජිණ්ණං කිලිට්ඨං දුග්ගන්ධං හෝති, සේනාසනං වා උක්ලාපං හෝති, තදා බාහිරවත්ථු අවිසදං හෝති අපරිසුද්ධං. අජ්ඣත්තිකබාහිරේ ච වත්ථුම්හි අවිසදේ උප්පන්නේසු චිත්තචේතසිකේසු ඤාණම්පි අපරිසුද්ධං හෝති, අපරිසුද්ධානි දීපකපල්ලිකවට්ටිතේලානි නිස්සාය උප්පන්නදීපසිඛාය ඕභාසෝ විය. අපරිසුද්ධේන ඤාණේන සඞ්ඛාරේ සම්මසතෝ සඞ්ඛාරාපි අවිභූතා හොන්ති, කම්මට්ඨානමනුයුඤ්ජතෝ කම්මට්ඨානම්පි වුඩ්ඪිං විරූළ්හිං වේපුල්ලං න ගච්ඡති. විසදේ පන අජ්ඣත්තිකබාහිරේ වත්ථුම්හි උප්පන්නේසු චිත්තචේතසිකේසු ඤාණම්පි විසදං හෝති පරිසුද්ධං, පරිසුද්ධානි දීපකපල්ලිකවට්ටිතේලානි නිස්සාය උප්පන්නදීපසිඛාය ඕභාසෝ විය. පරිසුද්ධේන ච ඤාණේන සඞ්ඛාරේ සම්මසතෝ සඞ්ඛාරාපි විභූතා හොන්ති, කම්මට්ඨානමනුයුඤ්ජතෝ කම්මට්ඨානම්පි වුඩ්ඪිං විරූළ්හිං වේපුල්ලං ගච්ඡති.

**[විසුද්ධිමග්ග අටුවා 01 (ඡට්ඨසඞ්ගායනා අංක 61 යටතේ); විසුද්ධිමග්ග අටුවා 95-96 පිටු (හේ.වි.මු);]**

චිත්තචේතසිකානං හි පවත්තිට්ඨානභාවතෝ සරීරං, තප්පටිබද්ධානි චීවරාදීනි ච ඉධ "වත්ථූනී"ති අධිප්පේතානි. තානි යථා චිත්තස්ස සුඛාවහානි හොන්ති, තථා කරණං තේසං **විසදභාවකරණං**. තේන වුත්තං **"අජ්ඣත්තිකබාහිරාන"**න්තිආදි. **සරීරං වාති වා**-සද්දෝ අට්ඨානප්පයුත්තෝ, සරීරං සේදමලග්ගහිතං වා අඤ්ඤේන වා අවස්සුතකිච්චේන විබාධිතන්ති අධිප්පායෝ. **සේනාසනං වාති වා**-සද්දේන පත්තාදීනම්පි සඞ්ගහෝ දට්ඨබ්බෝ. නනු චායං නයෝ ඛුද්දකපලිබෝධුපච්ඡේදේන සඞ්ගහිතෝ, පුන කස්මා වුත්තෝති? සච්චං සඞ්ගහිතෝ, සෝ ච ඛෝ භාවනාය ආරම්භකාලේ. ඉධ පන ආරද්ධකම්මට්ඨානස්ස උපචාරජ්ඣානේ ඨත්වා අප්පනාපරිවාසං වසන්තස්ස කාලන්තරේ ජාතේ තථාපටිපත්ති අප්පනාකෝසල්ලාය වුත්තා. **අවිසදේ** සති, විසයභූතේ වා. කථං භාවනමනුයුඤ්ජන්තස්ස තානි විසයෝ? අන්තරන්තරා පවත්තනකචිත්තුප්පාදවසේනේවං වුත්තං. තේ හි චිත්තුප්පාදා චිත්තේකග්ගතාය අපරිසුද්ධභාවාය සංවත්තන්ති. **චිත්තචේතසිකේසු** නිස්සයාදිපච්චයභූතේසු.

**ඤාණම්පීති පි-**සද්දො සම්පිණ්ඩනෙ. තෙන "න කෙවලං තං වත්ථුයෙව, අථ ඛො තස්මිං අපරිසුද්ධෙ ඤාණම්පි අපරිසුද්ධං හොතී"ති දස්සිතං. තං සම්පයුත්තානං පන අපරිසුද්ධතා අවුත්තසිද්ධා, ඤාණස්ස ච විසුං ගහණං අප්පනාය බහුකාරත්තා. තථා හි ඣානං "දන්ධාභිඤ්ඤං, ඛිප්පාභිඤ්ඤ"න්ති ඤාණමුඛෙන නිද්දිට්ඨං. නිස්සයනිස්සයොපි නිස්සයොත්වෙව වුච්චතීති ආහ **"දීපකපල්ලිකවට්ටිතේලානි නිස්සායා"**ති. ඤාණෙ අවිසදෙ විපස්සනාභාවනා විය සමාධිභාවනාපි පරිදුබ්බලා හොතීති දස්සේතුං **"අපරිසුද්ධේන ඤාණේනා"**තිආදි වුත්තං. තත්ථ **කම්මට්ඨාන**න්ති සමථකම්මට්ඨානං ආහ. **වුඩ්ඪිං** අධිගපාතුභාවේන, **විරූළ්හිං** ගුණභාවේන, **වේපුල්ලං** සබ්බසො වසිභාවප්පත්තියා වේදිතබ්බං. **විසදේ පනා**ති සුක්කපක්ඛො, තස්ස වුත්තවිපරියායේන අත්ථො වේදිතබ්බො.

**[විසුද්ධිමග්ග මහාටීකා 01 (ඡට්ඨසඞ්ගායනා අංක 61 යටතේ)]**

**තත්ථ** එහි **වත්ථුවිසදකිරියා නාම** වත්ථුවිසදක්‍රියා නම් **අජ්ඣත්තිකබාහිරානං වත්ථූනං** ආධ්‍යාත්මික බාහ්‍යවූ වස්තූන්ගේ **විසදභාවකරණං** විශදබව කිරීමයි **යදා හි** යම් කලෙකැ **අස්ස** මොහුගේ **කේසනඛලෝමානි** කෙස් ලොම් නියපු **දීඝානි හොන්ති** දික් වෙද්ද **සරීරං වා** සිරුර හෝ **සේදමලමක්ඛිතඤ්ච** ස්වේද මල ගන්නාලද ද **තදා** එසමයෙහි **අජ්ඣත්තිකං වත්ථු අවිසදං හෝති** ආධ්‍යාත්මික වස්තු අවිසද නම් වේ **අපරිසුද්ධං** නොපිරිසිදු වේ **යදා පන** යම් කලෙක **චීවරං ජිණ්ණං** චීවරය ජීරණ වූයේ **කිළිට්ඨං** කිළිටිවූයේ **දුග්ගන්ධං හෝති** දුගඳවූයේ වේද **සේනාසනං වා උක්ලාපං** සෙනස්න හෝ කසල ඇත්තේ වේද වා ශබ්දයෙන් පාත්‍ර ආදීන්ගේ ද සඞ්ග්‍රහය දතයුතු **තදා බාහිරං වත්ථු අවිසදං හෝති** එකල්හි බාහ්‍යවස්තුව අවිසද වේ **අපරිසුද්ධං** නොපිරිසිදු වේ **අජ්ඣත්තිකබාහිරේ ච වත්ථුම්හි අවිසදේ** අජ්ඣත්තික බාහිර වස්තූන් අවිසඳ වූ කල්හි **උප්පන්නේසු චිත්තචේතසිකේසු** නිශ්‍රයාදී ප්‍රත්‍යය වශයෙන් උපන් චිත්ත චෛතසිකයන් කෙරෙහි **ඤාණම්පි අපරිසුද්ධං හෝති** නුවණද අපරිශුද්ධ වේ **අපරිසුද්ධානි** අපිරිසිදු වූ **දීපකපල්ලිකවට්ටිතේලානි නිස්සාය** පාන් කබල් පියළි තෙල් නිසා **උප්පන්නදීපසිඛාය** උපන් දීප සිඛාවෙහි **ඕභාසෝ විය** ආලෝකය මෙනි **අපරිසුද්ධේන ච ඤාණේන** නොපිරිසිදු වූ ඤාණයෙන් **සඞ්ඛාරේ සම්මසතෝ** සංස්කාරයන් සම්මර්ශනය කරන්නහුට **සඞ්ඛාරාපි අවිභූතා හොන්ති** සංස්කාරයෝ ද සබරහුදු පහළ නොවේ **කම්මට්ඨානමනුයුඤ්ජතෝ** කමටහන යොදන්නහුට **කම්මට්ඨානම්පි** කමටහන ද **වුද්ධිං විරූළ්හිං වේපුල්ලං න ගච්ඡති** වෘද්ධියට විරූඪියට විපුලබවට නොයේ **විසදේ පන අජ්ඣත්තිකබාහිරේ වත්ථුම්හි** අජ්ඣත්තික බාහිර වස්තූන් විසද කල්හි වනාහි **උප්පන්නේසු චිත්තචේතසිකේසු** උපන් චිත්ත චෛතසික ධමුන් (ධර්මයන්) කෙරෙහි **ඤාණම්පි විසදං හෝති** ඤාණයද විසඳ වේ **පරිසුද්ධානි** පිරිසිදු වූ **දීපකපල්ලිකවට්ටිතේලානි නිස්සාය** පාන් කබල් පියළි තෙල් නිසා **උප්පන්නදීපසිඛාය ඕභාසෝ විය** උපන් දීපසිඛාවෙහි ආලෝකය මෙනි **පරිසුද්ධේන ච ඤාණේන** පිරිසිදු වූ නුවණින් **සඞ්ඛාරේ සම්මසතෝ** සංස්කාරයන් සම්මර්ශනය කරන්නාහට **සඞ්ඛාරාපි විභූතා හොන්ති** සංස්කාරයෝ ද විභූත වෙති **කම්මට්ඨානමනුයුඤ්ජතෝ** කමටහන යොදන්නහුට **කම්මට්ඨානම්පි** සමථ කමටහන ද **වුද්ධිං විරූළ්හං වේපුල්ලං ගච්ඡති** අධිග ප්‍රාදූර්භාවයෙන් වෘද්ධියට ප්‍රගුණභාවයෙන් විරූඪියට සර්වප්‍රකාර වශීභාවයෙන් වෛපුල්‍යයට යේ.

**[විසුද්ධි මාර්ග සන්නය 310-311 පිටු; සිංහල විසුද්ධි මාර්ගය පඨවිකසිණනිර්දේශය 200 පිට (තායිවාන් මුද්‍රණය)]**

ඤාණේන සමං පකාරේහි යුත්තන්ති **ඤාණසම්පයුත්තං**. ඒකුප්පාදාදයෝ ඒව චෙත්ථ පකාරාති වේදිතබ්බා. තත්ථ කම්මූපපත්තිඉන්ද්‍රියපරිපාකකිලේසදූරීභාවා ඤාණසම්පයුත්තතාය කාරණං. යෝ හි පරේසං ධම්මං දේසේති, අනවජ්ජානි සිප්පායතනකම්මායතනවිජ්ජට්ඨානානි සික්ඛාපේතීති ඒවමාදිකං පඤ්ඤාසංවත්තනියං කරෝති, තස්ස කම්මූපනිස්සයවසේන කුසලචිත්තං උප්පජ්ජමානං ඤාණසම්පයුත්තං හෝති. තථා අබ්‍යාපජ්ජේ ලෝකේ උප්පන්නස්ස උපපත්තිං නිස්සාය ඤාණසම්පයුත්තං හෝති. වුත්තඤ්හේතං "තස්ස තත්ථ සුඛිනෝ ධම්මපදා ප්ලවන්ති, දන්ධෝ, භික්ඛවේ, සතුප්පාදෝ, අථ ඛෝ සෝ සත්තෝ ඛිප්පංයේව විසේසභාගී (අ. නි. 4.191) හෝතී"ති. තථා පඤ්ඤාදසකපත්තස්ස ඉන්ද්‍රියපරිපාකං නිස්සාය කුසලං උප්පජ්ජමානං ඤාණසම්පයුත්තං හෝති. යේන පන කිලේසා වික්ඛම්භිතා, තස්ස කිලේසදූරීභාවං නිස්සාය ඤාණසම්පයුත්තං හෝති. වුත්තම්පි චේතං "යෝගා වේ ජායතේ භූරි, අයෝගා භූරිසඞ්ඛයෝ"ති (ධ. ප. 282). ඤාණේන විප්පයුත්තං විරහිතන්ති **ඤාණවිප්පයුත්තං. විප්පයෝගෝ**ති චෙත්ථ ඤාණස්ස අභාවෝ අප්පවත්තියේවාති දට්ඨබ්බං. **ආදිනයප්පවත්ත**න්ති එත්ථ **ආදි**-සද්දේන න කේවලං "අත්ථි දින්න"න්තිආදීනං (ම. නි. 1.441; 2.95) නවන්නංයේව සම්මාදිට්ඨිවත්ථූනං ගහණං, අථ ඛෝ ධම්මවිචයසම්බොජ්ඣඞ්ගට්ඨානියාදීනම්පි සඞ්ගහෝ වේදිතබ්බෝ. **[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 452 යටතේ)]**

"ඤාණේන සමං පකාරේහි යුත්තන්ති ඤාණසම්පයුත්තං" ඤාණය හා සමව ඒකෝත්පාදාදි ප්‍රකාරයෙන් යුක්තනුයි ඤාණසම්ප්‍රයුක්ත නම්. මෙහි වනාහි ඒකෝත්පාද ඒකනිරෝධ ඒකාලම්බණ ඒකවස්තුක ලක්‍ෂණයෝම ප්‍රකාරයෝ යයි දතයුත්තාහුය. එහි කර්ම වශයෙන් උත්පත්ති වශයෙන් ඉන්‍ද්‍රියපරිපාක වශයෙන් කෙලේශ දූරීභාවයෙනැයි මෙතෙක් හේතුවෙන් කුශලය ඤාණසම්ප්‍රයුක්ත වේ මෙහි යමෙක් වනාහි ධර්මදේශනාය අනවද්‍ය කර්මායතන ශිල්පායතන විද්‍යාස්ථානයෙහි හික්මවීමය යනාදී කර්මෝපනිශ්‍රය වශයෙන් කුශල චිත්තය උපදනේ ඤාණසම්ප්‍රයුක්ත වේ. එසේම පීඩා මුක්ත දිව්‍ය ලෝකයෙහි උපනුවහට උත්පත්ති වශයෙන් ඤාණසම්ප්‍රයුක්ත වේ. කීයේමැයි "තස්ස තත්ථ සුඛිනෝ ධම්මපදා ප්ලවන්ති දන්ධෝ භික්ඛවේ සත්තුප්පාදෝ, අථ ඛෝ සෝ සත්තෝ ඛිප්පං යේව විසේසභාගී හෝතීති" එසේම පඤ්ඤාදසක ප්‍රාප්තයහට ඉන්‍ද්‍රිය පරිපාකය නිසා කුශලය උපදනේ ඤාණසම්ප්‍රයුක්තම වේ. ක්ලේශ විෂ්කම්භනය කළාහට ක්ලේශ දූරීභාවය නිසා ඤාණසම්ප්‍රයුක්තම වේ. මේ කීයේමය:—

"යෝගා වේ ජායතේ භූරී - අයෝගා භූරිසඞ්ඛයෝ"

ඤාණේන විප්පයුත්තං විරහිතන්ති ඤාණවිප්පයුත්තං" ඤාණයෙන් විප්‍රයුක්ත වූයේ ඤාණවිප්‍රයුක්ත නම්. විප්‍රයෝග නම් ඤාණයාගේ අභාවය අප්‍රවෘත්තියයි දතයුතු. "ආදිනයප්පවත්තං" යනුයෙහි ආදි ශබ්දයෙන් කේවල "අත්ථි දින්නං" යනාදී නව ප්‍රභේද සම්‍යක්දෘෂ්ටි වස්තූන්ගේම සඞ්ග්‍රහය නොවේ වැලිත් ධම්මවිචය . සම්බොජ්ඣඞ්ග ස්ථානීයාදීන්ගේ ද සඞ්ග්‍රහය වෙයි දතයුතු.

**[විසුද්ධි මාර්ග සන්නය 1083-1084 පිටු]**

ජානාති යථාසභාවං පටිවිජ්ඣතීති ඤාණං, තේන සමං ඒකුප්පාදාදීහි පකාරේහියුත්තන්ති **ඤාණසම්පයුත්තං.** ඤාණේන විප්පයුත්තං විරහිතන්ති **ඤාණවිප්පයුත්තං**.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 60-62 පිටු]**

ඤාණසම්පයුත්තස්ස පන කම්මතො උපපත්තිතො ඉන්ද්‍රියපරිපාකතො කිලෙසදූරීභාවතොති ඉමෙහි කාරණෙහි හොති. යො හි පරෙසං හිතජ්ඣාසයෙන ධම්මං දෙසෙති හීනුක්කට්ඨාදීනි ච නළකාරමුද්දගණනාදීනි සිප්පායතනානි, වඩ්ඪකීකසිවාණිජ්ජාදීනි ච කම්මායතනානි, විසහරණාදීනි ච විජ්ජායතනානීති එවං නිරවජ්ජසිප්පායතනාදීනි සික්ඛාපෙති, සයං වා සික්ඛති, ධම්මකථිකස්ස සක්කාරං කත්වා ධම්මං කථාපෙති, "ආයතිං පඤ්ඤවා භවිස්සාමී"ති පත්ථනං පට්ඨපෙත්වා නානප්පකාරං පුඤ්ඤකම්මං කරොති, තස්සෙවං නානප්පකාරං පඤ්ඤාසංවත්තනිකකම්මං සම්පාදෙන්තස්ස තං කම්මං උපනිස්සාය උප්පජ්ජමානං කුසලං ඤාණසම්පයුත්තං උප්පජ්ජති. තථා අබ්‍යාපජ්ජෙ ලොකෙ උප්පන්නස්ස උප්පජ්ජමානං කුසලං ඤාණසම්පයුත්තං හොති. වුත්තඤ්හෙතං; "තස්ස තත්ථ සුඛිනො ධම්මපදානි පිලවන්ති, දන්ධො, භික්ඛවෙ, සතුප්පාදො, අථ සො සත්තො ඛිප්පමෙව විසෙසභාගී හොතී"ති (අ. නි. 4.191).

තථා පඤ්ඤාදසකං සම්පත්තස්ස ඉන්ද්‍රියපරිපාකං නිස්සාය උප්පජ්ජමානං කුසලං ඤාණසම්පයුත්තං හොති. යෙන පන සමථවිපස්සනාභාවනාහි කිලෙසා වික්ඛම්භිතා, තස්ස කිලෙසදූරීභාවං නිස්සාය උප්පජ්ජමානං චිත්තං ඤාණසම්පයුත්තං උප්පජ්ජති. යථාහ; "යොගා වෙ ජායතෙ භූරි, අයොගා භූරිසඞ්ඛයො"ති. (ධ. ප. 282).

අපිච යෙ තෙ ධම්මා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති. සෙය්‍යථිදං පරිපුච්ඡකතා වත්ථුවිසදකිරියා ඉන්ද්‍රියසමත්තපටිපාදනා දුප්පඤ්ඤපුග්ගලපරිවජ්ජනා පඤ්ඤවන්තපුග්ගලසෙවනා ගම්භීරඤාණචරියපච්චවෙක්ඛණා තදධිමුත්තතාති ඉමෙහි කාරණෙහි ඤාණසම්පයුත්තභාවො හොති. තථා හි යො පඤ්ඤවන්තෙ උපසඞ්කම්ම ඛන්ධධාතුආයතනඉන්ද්‍රියබල බොජ්ඣඞ්ගමග්ගඞ්ගඣානඞ්ගසමථවිපස්සනාදීනං පරිපුච්ඡාබහුලො හොති, තස්ස තං වසෙන උප්පන්නං සුතමයඤාණං ආදිං කත්වා උප්පජ්ජමානං චිත්තං ඤාණසහගතං හොති. යෙන පන නඛකෙසචීවරසෙනාසනාදීනි අජ්ඣත්තිකබාහිරවත්ථූනි පුබ්බෙ අවිසදානි ඡෙදනමලහරණාදිනා විසදානි කතානි, තස්සෙවං විසදවත්ථුකස්ස උප්පන්නෙසු චිත්තචෙතසිකෙසු විසදං ඤාණං හොති පරිසුද්ධානි දීපකපල්ලකාදීනි නිස්සාය උප්පන්නදීපසිඛාය ඔභාසො විය. යස්ස ච සද්ධින්ද්‍රියාදීසු අඤ්ඤතරං බලවං හොති, ඉතරානි මන්දානි, තතො තානි සකසකකිච්චං කාතුං න සක්කොන්ති, තස්මා සො තස්ස බොජ්ඣඞ්ගවිභඞ්ගෙ ආගතනයෙන තෙන තෙන ආකාරෙන සමත්තං පටිපාදෙති, තස්සෙවං ඉන්ද්‍රියානං සමත්තං පටිපාදෙන්තස්ස විපස්සනාඤාණාදීනං වසෙන චිත්තං ඤාණසහගතං හොති. යො පන දුප්පඤ්ඤපුග්ගලෙ පරිවජ්ජෙති, පඤ්ඤවන්තපුග්ගලෙ වා පයිරුපාසති, ඛන්ධාදීසු ඔගාළ්හං භගවතො ගම්භීරඤාණචරියං වා පච්චවෙක්ඛති, ඨානනිසජ්ජාදීසු තදධිමුත්තචිත්තො වා විහරති, ඉමෙසම්පි උප්පජ්ජමානං කුසලං ඤාණසම්පයුත්තං හොති. අපිච බුද්ධාදිගුණානුස්සරණෙනපි චිත්තං ඤාණසහගතං හොති. යථාහ; "යස්මිං, මහානාම, සමයෙ අරියසාවකො තථාගතං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොස…පෙ…. න මොහපරියුට්ඨිතං චිත්තං හොති, උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති තථාගතං ආරබ්භ. උජුගතචිත්තො ඛො පන, මහානාම, අරියසාවකො ලභති

අත්ථවේදං, ලභති ධම්මවේදං, ලභති ධම්මූපසංහිතං පාමොජ්ජං, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායෝ පස්සම්භති, පස්සද්ධකායෝ සුඛං වේදේති, සුඛිනෝ චිත්තං සමාධියති, සමාහිතො යථාභූතං පජානාතී”තිආදි *(අ. නි. 6.10; 11.11)*. ඒවං බුද්ධානුස්සතිආදයෝපි රාගාදිමලවිසෝධනේන ඤාණුප්පත්තිහේතුකායේවාති දට්ඨබ්බං. කිඤ්ච තිහේතුකපටිසන්ධිකතා ඤාණුප්පත්තිකාරණං. පටිසන්ධිපඤ්ඤා හි ආදිතෝ පට්ඨාය භවඞ්ගසන්තතිවසේන බහුලං පවත්තමානා සන්තානපරිභාවනේන ඤාණුප්පත්තියා සවිසේසඋපනිස්සයෝ හෝති.

“කම්මූපපත්තිතෝ චේව, තථා ඉන්ද්‍රියපාකතෝ;
කිලේසූපසමා ධම්මවිචයස්ස ච හේතුහි.

“සත්තධම්මේහි බුද්ධාදි-ගුණානුස්සරණේන ච;
සප්පඤ්ඤසන්ධිතෝ චේව, චිත්තං ඤාණයුතං සියා.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 66-68 පිටු]**

ඥාණසම්ප්‍රයුක්ත බව වනාහි කර්ම වශයෙන් ද උත්පත්ති වශයෙන් ද ඉන්ද්‍රිය පරිපාකයෙන් ද ක්ලේශයන්ගේ දූරීභාවයෙන් දැයි යන මේ කාරණා හේතු කොටගෙන වේ. ඒ එසේමැයි; යමෙක් තෙමේ අනුන්ට හිතාධ්‍යාශයෙන් ධර්ම දේශනා කෙරේ ද, හීනෝත්කෘෂ්ට වූ නළකාර මුද්‍රාගණනාදී ශිල්පයන් ද වඩුකම්-කෘෂි-වනිද්‍යාදී කර්මයන් ද විස හරණාදී වූ විද්‍යාවන් දැයි මෙසේ නිරවද්‍යාදී වූ ශිල්පාදිය හික්මවත් ද, තෙමේ හෝ හික්මේ ද, ධර්මකථිකයන් හට සත්කාර කොට ධර්මය කියවා ද, මත්තෙහි හෝ ප්‍රඥාවන්තයෙක් වන්නේ මැයි ප්‍රාර්ථනා තබා නානාප්‍රකාරවූ පුණ්‍යකර්ම කෙරේ ද මෙසේ නානාප්‍රකාර වූ ප්‍රඥාව ඉපදීමට හේතු වූ කර්ම සම්පාදනය කරන්නා වූ ඕ හට ඒ කර්මය උපනිශ්‍රය කොටගෙන උපදනා වූ කුසල චිත්තය තෙමේ ඥාණසම්ප්‍රයුක්තව උපදී. එසේම දෙම්නස් ව්‍යාපාද රහිත වූ රූපභවයෙහි උපන්නා හට උපදනා කුසල චිත්තය තෙමේ ඥාණසම්ප්‍රයුක්ත වෙයි. වදාරන ලදමැයි— “තස්ස තත්ථ සුඛිනෝ ධම්මපදානි පිලවන්ති, දන්ධෝ, භික්ඛවේ, සතුප්පාදෝ, අථ සෝ සත්තෝ ඛිප්පමේව විසේසභාගී හෝති” යි ෴

එසේම ප්‍රඥාදසකයට පැමිණිය හට ඉන්ද්‍රියයන්ගේ මිහිකිරීම (මේරීම) නිසා උපදනා කුසල චිත්තය තෙමේ ඥාණසම්ප්‍රයුක්ත වෙයි. යමෙක් විසින් සමථ විදර්ශනා භාවනාවන් කරණකොටගෙන ක්ලේශයෝ විෂ්කම්භනය කරනලද්දහු ද ඕ හට ඒ ක්ලේශ දූරීභාවය නිසා උපදනා චිත්තය තෙමේ ඥාණසම්ප්‍රයුක්තව උපදී. එහෙයින් වදාළහ— “යෝගා වේ ජායතේ භූරි, අයෝගා භූරිසඞ්ඛයෝ” යි ෴

තවද ධර්මවිචය සම්බෝධ්‍යාඞ්ගයාගේ ඉපදවීම පිණිස පවත්නා වූ භාත්පසින් බැස විචාරන බවය. ආධ්‍යාත්මික බාහිර වස්තූන්ගේ නිර්මල බව කිරීමය. ඉඳුරන්ගේ සමබව පිළියෙළ කිරීමය. දුෂ්ප්‍රාඥ පුඟුලන් දුරුකිරීමය. පැණවත් (ප්‍රඥාවන්ත) පුඟුලන් සේවනය කිරීමය. ගැඹුරු වූ ඥාණයෙන් අවබෝධ කටයුතු වූ සූත්‍රාන්තයන් ප්‍රත්‍යවේක්ෂා කිරීමය ප්‍රඥාවෙහි නැමුනු බවය යන මේ සත් වැදෑරුම් කාරණයන් හේතුකොට ගෙන ද ඥාණසම්ප්‍රයුක්ත බව ද වෙයි. ඒ එසේමැයි; යමෙක් තෙමේ ප්‍රඥාවන්තයන් කරා එළඹ ස්කන්ධ-ධාතු-ආයතන-ඉන්ද්‍රිය-බල-බොධ්‍යඞ්ග-මාර්ගාඞ්ග-ධ්‍යානාඞ්ග-සමථවිදර්ශනා ආදීන්ගේ පිලිවිසීම් බහුල කෙනේ වේද ඕහට ඒ

පරිපුච්ඡාවන්ගේ වශයෙන් උපන් ශ්‍රුතමය ඥාණය පෙරටු කොට උපදනා සිත් තෙමේ ඥාණසම්ප්‍රයුක්ත වෙයි.

යමෙක් විසින් වනාහි පෙර අපිරිසිදු වූ කේශ නඛ චීවර සේනාසනාදී වූ ආධ්‍යාත්මික බාහිර වස්තූහු ඡේදන මලාපහරණාදියෙන් පිරිසිදු කරන ලද්දහු වෙත් ද මෙසේ පිරිසිදු කරන වස්තු ඇත්තහුගේ උපන් චිත්ත චෛතසිකයන් අතුරෙන් ඥාණය ද නිර්මල වෙයි. කුමක් මෙන්ද යත්? පිරිසිදු වූ පහන් කබල් ආදිය නිසා උපන් ප්‍රදීපශිඛාවගේ ආලෝකය මෙනි. යමෙක්හුගේ සද්ධෙන්ද්‍රියාදීන් අතුරෙන් එක්තරා ඉන්ද්‍රියක් බලවත් වේද, අනික් ඉන්ද්‍රියයෝ මඳ වෙත් ද ඒ හේතු කොටගෙන ඒ ඉන්ද්‍රියයෝත් තම තමාගේ කෘත්‍යය කරන්නට නොහැකි වෙති. එහෙයින් හෙතෙමේ බෝධ්‍යඞ්ග විභඞ්ගයෙහි ආ ක්‍රමයෙන් ඒ ඉන්ද්‍රිය ධර්ම සමූහයාගේ සමබව පිළියෙල කෙරේ ද, මෙසේ ඉන්ද්‍රියයන්ගේ සමබව ප්‍රතිපාදනය කරන්නා වූ ඕහට උපදනා චිත්තය තෙමේ විදර්ශනා ඥාණාදීන්ගේ වශයෙන් ඥාණසහගත වෙයි.

යමෙක් තෙමේ දුශ්ප්‍රාඥ පුද්ගලයන් දුරුකෙරේ ද ප්‍රඥවන්ත පුද්ගලයන් හෝ සේවනය කෙරේ ද ස්කන්ධාදියෙහි බැසගත් භාග්‍යවතුන් වහන්සේගේ ගැඹුරු ඥාණයෙන් අවබෝධ කටයුතු වූ සූත්‍රාන්තයක් හෝ ප්‍රත්‍යවේක්ෂා කෙරේ ද ස්ථාන නිසද්‍යාදියෙහි (සිටීම් හිඳීම් ආදියෙහි) ප්‍රඥවෙහි නැමුනු සිත් ඇතිව හෝ වෙසේ ද ඔහුන්ට උපදනා කුසල චිත්තය තෙමේ ඥාණසම්ප්‍රයුක්ත වෙයි. තවද බුද්ධාදීන්ගේ ගුණානුස්මරණයෙනුදු චිත්තය තෙම ඥාණසහගත වෙයි. එහෙයින් වදාලහ භාග්‍යවතුන් වහන්සේ "යස්මිං, මහානාම, සමයේ අරියසාවකෝ තථාගතං අනුස්සරති, නේවස්ස තස්මිං සමයේ රාගපරියුට්ඨිතං චිත්තං හෝති, න දෝස…පෙ…. න මෝහපරියුට්ඨිතං චිත්තං හෝති, උජුගතමේවස්ස තස්මිං සමයේ චිත්තං හෝති තථාගතං ආරබ්භ. උජුගතචිත්තෝ බෝ පන, මහානාම, අරියසාවකෝ ලභති අත්ථවේදං, ලභති ධම්මවේදං, ලභති ධම්මූපසංහිතං පාමෝජ්ජං, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායෝ පස්සම්භති, පස්සද්ධකායෝ සුඛං වේදේති, සුඛිනෝ චිත්තං සමාධියති, සමාහිතො යථාභූතං පජානාති" යනාදියි.

මෙසේ බුද්ධානුස්මෘති ආදීහු ද රාගමල විසෝධනයෙන් ඥාණෝත්පත්තියට හේතු වන්නාහුම වෙති දතයුතු. තවද ත්‍රිහේතුක ප්‍රතිසන්ධි ඇති බවද ඥාණෝත්පත්තියට හේතු වෙයි. ඒ එසේමැයි; මුල පටන් භවඞ්ග සන්තති වශයෙන් බහුලව හටගන්නා වූ ප්‍රතිසන්ධි ප්‍රඥ තොමෝ චිත්ත සන්තානයාගේ වැඩීමෙන් ඥාණෝත්පත්තියට විශේෂයෙන් උපනිශ්‍රය වෙයි. එහෙයින් කියනලද මැයි:—

"කම්මූපපත්තිතෝ චේව, තථා ඉන්ද්‍රියපාකතෝ;
කිලේසූපසමා ධම්මවිචයස්ස ච හේතුහි.

"සත්තධම්මේහි බුද්ධාදි-ගුණානුස්සරණේන ච;
සප්පඤ්ඤසන්ධිතෝ චේව, චිත්තං ඥාණයුතං සියා.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 41-43 පිටු]**

තත්ථ ජානාති යථාසභාවං පටිවිජ්ඣතීති **ඤාණං**. පඤ්ඤසංවත්තනික කම්මතෝ, අබ්‍යාපජ්ජලෝකූපපත්තිතෝ, ඉන්ද්‍රියපරිපාකතෝ, කිලේසදූරීභාවතෝ ච ඥාණසම්පයුත්තතා, තබ්බිපරියායේන ඥාණවිප්පයුත්තතා ච,

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 15 යටතේ); විභාවනී ටීකා සන්නය 50-52 පිටු]**

**යං (ධම්මජාතං)** යම් ධර්ම ස්වභාවක් තෙමේ **යථාසභාවං** ස්වභාවට සුදුසු පරිද්දෙන් **ජානාති (පටිවිජ්ඣති)** පිළිවිද දනී ද **ඉති (තස්මා) තං (ධම්මජාතං)** ඒ ධර්ම ස්වභාව තෙමේ **ඤාණං** ඤාණ නම් වේ (ජානාති යන මාත්‍රයක් කී කල්හි සඤ්ඤා විඤ්ඤාණයෝ ද ගැණෙත්. එහෙයින් සඤ්ඤා විඤ්ඤාණයන් වළක්වනු පිණිස යථාසභාවං පටිවිජ්ඣති යනු කියනලදි) **පඤ්ඤාසංවත්තනිකකම්මතෝ** පඤ්ඤාව ඉපදවීමට හේතු වූ කර්මයෙන් ද **අබ්‍යාපජ්ජලෝකූපපත්තිතෝ ච** බඹලොව ඉපදීමෙන් ද **ඉන්ද්‍රියපරිපාකතෝ ච** ඉඳුරන්ගේ මිහිකිරීමෙන් ද **කිලේසදූරීභාවතෝ ච** කෙලෙස් දුරුවූ බැවින් ද **ඤාණසම්පයුත්තතත්තා** ඤාණ සම්ප්‍රයුක්ත වන බව **වේදිතබ්බා** දතයුත්තීය (පඤ්ඤාසංවත්තනිකකම්මතෝ යන්නෙන් ධම්මදේසනා ධම්මුග්ගහණ පරිපුච්ඡාදිය ගැණේ) **තබ්බිපරියායේන** එසේ කියනලද්දට විපරීත වූ හේතූන් කරණකොටගෙන **ඤාණවිප්පයුත්තතත්තා ච** ඤාණවිප්‍රයුක්ත බවද වේදිතබ්බා දතයුත්තීය. **[විභාවනී ටීකා සන්නය 86-87 පිටු]**

කුශල චිත්තයෙහි ලැබියයුතු වූ ඤාණසම්ප්‍රයුක්තභාවයාගේ හේතූන් අතුරෙන් ඇතැම් හේතු කෙනෙක් ක්‍රියාචිත්තයෙහි නොලැබියයුතුය. කවර හේතු කෙනෙක් ලැබියයුතු ද? කවර හේතු කෙනෙක් නොලැබියයුතුද? යනු; කුශලචිත්තයෙහි ලැබියයුතුවූ ඤාණසම්ප්‍රයුක්තභාවයාගේ හේතූන් අතුරෙන් අව්‍යාපජ්ජලෝකූපපත්තිය, කිලේස දූරීභාවය යන මේ හේතුහු නොලැබියයුතු වේ. පඤ්ඤාසංවත්තනික කර්මය, ඉන්ද්‍රියපරිපාකය යන හේතුහුම ලැබියයුතු වේ. **[විභාවනී ටීකා සන්නය 96 පිට]**

තත්ථ ජානාතීති ඤාණං, යාථාවතෝ පටිවිජ්ඣතීති අත්ථෝ. ඤාණේන සම්පයුත්තං විප්පයුත්තන්ති සමාසෝ. පඤ්ඤා සංවත්තනික කම්මූපනිස්සයතා, අබ්‍යාපජ්ජලෝකූපපත්තිතා ඉන්ද්‍රියපරිපාකතා, කිලේසදූරතාච ඤාණුප්පත්තියා කාරණං. තිහේතුකපටිසන්ධිකතා, අමෝහජ්ඣාසයතා, පඤ්ඤවන්තපුග්ගලසේවනා. සුතචින්තාපසුතාතිපිවත්තුං යුජ්ජති. යානි ච ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස කාරණානි අට්ඨකථාසු වුත්තානි. තානිපි ඉධ වත්තබ්බානි. තබ්බිපරීතං ඤාණවිප්පයුත්තකාරණං. **[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 41 යටතේ)]**

"යාථාවතෝ"ති යථා සභාවතෝ. එත්ථ සියා ජානාතීති ඤාණන්ති වුත්තං, කිං සබ්බං ඤාණං යාථාවතෝ ජානාතීති. කිඤ්චෙත්ථ. යදි සබ්බං ඤාණං යාථාවතෝ ජානාති. ඒවං සති, ඤාණේන චින්තෙන්තානං අජානනං නාම නත්ථි, විරජ්ඣනං නාම නත්ථීති ආපජ්ජති. අථ සබ්බං ඤාණං යාථාවතෝ න ජානාති, කත්ථචි ජානාති, කත්ථචි න ජානාති. ඒවඤ්ච සති, යත්ථ ජානාති, තත්ථේව තං ඤාණං හෝති. යත්ථ න ජානාති, තත්ථ තං ඤාණමේව න හෝතීති ආපජ්ජතීති. වුච්චතේ. ඤාණේන චින්තෙස්සාමීති චින්තෙන්තානංපි යත්ථ යත්ථ යාථාවතෝ ජානනං න හෝති, තත්ථ තත්ථ ඤාණවිප්පයුත්තචිත්තං හෝති. ඤාණප්පටිරූපකා ච ධම්මා අත්ථි චිත්තඤ්ච විතක්කෝ ච, විචාරෝ ච, දිට්ඨි ච. ඒතේහි චින්තෙන්තාපි අහං ඤාණේන චින්තේමීති මඤ්ඤන්ති. "අබ්‍යාපජ්ජලෝකූපපත්තිතා"ති එත්ථ අබ්‍යාපජ්ජලෝකෝ නාම කායිකදුක්ඛ-චෙතසිකදුක්ඛරහිතෝ උපරිදේවලෝකෝ වා බ්‍රහ්මලෝකෝ වා. උපපජ්ජනං උපපත්ති. පටිසන්ධිවසේන උපගමනන්ති අත්ථෝ. අබ්‍යාපජ්ජලෝකං උපපත්ති යස්ස සෝ අබ්‍යාපජ්ජලෝකූපපත්ති. තස්ස භාවෝති විග්ගහෝ. "කිලේස දූරතා"ති සමාපත්ති බලේන වා, අඤ්ඤතරප්පටිපත්තියා වා, වික්ඛම්භිතකිලේසතා වා, අරියමග්ගේන සමුච්ඡින්නකිලේසතා වා.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 41 යටතේ)]**

**තත්ථ** එහි **ජානාති ඉති** දැනගනීනුයි **ඤාණං** ඤාණ නම් **යාථාවතෝ** යථා ස්වභාව වශයෙන් **පටිවිජ්ඣති ඉති** අවබෝධ කරයි නොහොත් සම්පූර්ණයෙන් දැනගනී යන **අත්ථෝ** අර්ථයයි (දැනගනීනුයි ඤාණය යැයි කියනලදි. කිමෙක්ද මෙහි යථා ස්වභාව වශයෙන් සියල්ල නුවණින් දැනගනී ද? ඉදින් මෙහි කිසිවෙක් යථා ස්වභාව වශයෙන් සියල්ල නුවණින් දැනගනියි. මෙසේ ඇති කල්හි නුවණින් සිතන්නවුන්හට නොදැනගන්නා දෙයක් නම් නැත, වැරදීමක් නැතය යන මතයට පැමිණෙයි. එසේවුවත් නුවණ යථා ස්වභාව වශයෙන් සියල්ල නොදැනගනියි, කිසිතැනෙක්හි දැනගනියි, කිසිතැනෙක්හි නොදැනගනියි. මෙසේ ඇති කල්හි ද යම්තැනෙක දැනගනියි ද එහිම ඒ නුවණ වෙයි. යම්තැනක නොදැනගනියි ද එහි නුවණ නොවෙයි යන මතයට පැමිණෙයි. මෙසේ ප්‍රශ්නයක් ඇතිකල ඊට පරිහාරය මා විසින් කියනුලැබේ. යම් යම් තැනෙක්හි නුවණින් සිතන්නෙමි යැයි සිතන්නවුන්හට යථා ස්වභාව වශයෙන් දැනගැනීමක් නම් නොවෙයි. ඒ ඒ තැන ඤාණවිප්‍රයුක්ත චිත්තය වෙයි. චිත්තය ද විතර්කය ද විචාරය ද දිට්ඨිය ද යන මේවා ඤාණප්‍රතිරූපක ධර්මයෝ වෙත්. ඒ ධර්මයන් කරණකොටගෙන සිතන්නාවූ පුද්ගලයෝ "මම නුවණින් සිතමි" යැයි හඟිත්. අනුදීපනීපාඨයි) **ඤාණේන** නුවණ හා **සම්පයුත්තං** සම්ප්‍රයුක්ත වූයේ ද **විප්පයුත්තං** විප්‍රයුක්ත වූයේ ද **ඉති** යනු **සමාසෝ** සමාසයි **පඤ්ඤාසංවත්තනිකකම්මූපනිස්සයතා** ප්‍රඥාව ලැබීමට හේතුවන කර්මයෙහි උපනිශ්‍රය වශයෙන් ද **අබ්‍යාපජ්ජලෝකූපපත්තිතා** කායික චෛතසික දුක් නැති ඉහළ දෙව්ලොවක හෝ බඹලොවක හෝ ඉපිද සිටීම් වශයෙන් ද **ඉන්ද්‍රියපරිපාකතා** ඉඳුරන් මිහිකිරීම් වශයෙන් ද **කිලේසදූරතා ච** සමාපත්ති බලයෙන් හෝ එක්තරා ප්‍රතිපත්තියෙකින් හෝ ක්ලේශයන් විෂ්කම්භනය කිරීම් වශයෙන් හෝ ආර්‍ය්‍ය මාර්ගයෙන් ක්ලේශයන් සමුච්ඡේද කිරීම් වශයෙන් හෝ ක්ලේශයන්ගෙන් දුරුව සිටීම ද **ඤාණුප්පත්තියා** නුවණ ඉපදීමට **කාරණං** කරුණුයි **තිහේතුකපටිසන්ධිකතා** ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ඇති බව **අමෝහජ්ඣාසයතා** අමෝහ අධ්‍යාශ ඇති බව **පඤ්ඤවන්තපුග්ගලසේවනතා** ප්‍රඥාවන්ත පුද්ගලයන් සෙවිනා බව **සුතචින්තාපසුතාතිපි** ඇසීමෙන් හෝ සිතීමෙහි යෙදුනු බව ද **වත්තුං** කියන්ට **යුජ්ජති** සුදුසුය **ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස** ධම්මවිචයසම්බොජ්ඣඞ්ගයට හේතුවන **යානි කාරණානි** යම් කරුණු වේද **ච (තානි)** ඒ කරුණු **අට්ඨකථාසු** අර්ථකථායෙහි **වුත්තානි** කියනලද්දාහ **තානිපි** ඒ කරුණු ද **ඉධ** මෙහි **වත්තබ්බානි** කිවයුත්තාහ **තබ්බිපරීතං** එසේ කියනලද්දට විපරීත කරුණු **ඤාණවිප්පයුත්තකාරණං** ඤාණවිප්‍රයුක්ත වීමට කරුණුයි ෴

[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]

ඤාණසම්පත්තිං පන පත්ථෙත්වා කතකම්මතෝ, බ්‍රහ්මාදිඋපපත්තිතෝ, පඤ්ඤාදසකවසේන ඉන්ද්‍රියපරිපාකතෝ, වික්ඛම්භනේන කිලේසදූරීභාවතෝ ච සත්තවිධ ධම්මවිචයසම්බොජ්ඣඞ්ගකාරණතෝ ච ඤාණසම්පයුත්තතා වේදිතබ්බා.

[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා කුසලපදත්ථ යටතේ)]

**ඤාණසම්පත්තිං පන** නුවණ ලැබීම **පත්ථෙත්වා** ප්‍රාර්ථනා කොට **කතකම්මතෝ** කරනලද කර්ම වශයෙන් ද **බ්‍රහ්මාදිඋපපත්තිතෝ** බ්‍රහ්මලෝකාදියෙහි උත්පත්තිය ලැබීම් වශයෙන් ද **පඤ්ඤාදසකවසේන** ප්‍රඥා දසකයට පැමිණීම් වශයෙන් ද **ඉන්ද්‍රියපරිපාකතෝ** ඉඳුරන් මුහුකුරා යෑමෙන් ද **වික්ඛම්භනේන** විෂ්කම්භන වශයෙන් **කිලේසදූරීභාවතෝ ච** කිලෙසුන්ගෙන් දුරුවීම් වශයෙන් ද **සත්තවිධ** සත් වැදෑරුම් **ධම්මවිචයසම්බොජ්ඣඞ්ගකාරණතෝ ච** ධම්මවිචයසම්බොජ්ඣඞ්ගයාගේ කරුණු වශයෙන් ද **ඤාණසම්පයුත්තතා** ඤාණසම්ප්‍රයුක්ත බව **වේදිතබ්බා** දතයුත්තාහ ෴

පඤ්ඤාව ලැබීමට හේතු කර්මය, බඹලොව ඉපිද සිටීමය, ඉඳුරන් මිහි කිරීමය, ක්ලේශයන්ගෙන් දුරුව සිටීමය යන මොවුහු ඤාණසම්පයුක්ත වීමේ හේතු වෙති.
**[අභිධර්ම චන්ද්‍රිකාව 23 පිට]**

යථා ස්වභාවය දැනීම ඤාණ නම්. දනාදී කුසල කර්මයන්ගෙන් ඉෂ්ටවිපාකයන් ලැබෙන්නේය යනාදිය දැනීමෙහි නුවණය ඒ. **"ජානාති යථාසභාවං පටිවිජ්ඣතීති ඤාණං"** යනු එය පැහැදිලි කිරීමය. ලෝකයෙහි ඇත්තා වූ ඒ ඒ වස්තූන් මේ මේයි හැඳීනීම ඤාණය නොවේ. ඒ ඒ වස්තූන් ස්කන්ධ ධාතු ආයතනාදීන්ගේ වශයෙන් විභාගකොට දැනීම ඤාණ නම්. ඒ ඤාණය ඒකෝත්පාදදී ප්‍රකාරයෙන් යෙදීමය ඤාණසම්පයුක්ත. එසේ නොයෙදීමය විප්පයුක්ත.

ප්‍රඥ ප්‍රතිලාභයට හේතු වූ කර්මය, බඹලොව ඉපදීම, ඉඳුරන් මුහුකිරීම, කෙලෙසුන්ගෙන් දුරුවීම යන මේ කරුණුය ඤාණසම්පයුක්ත වීමට මෙයට අනුබල දෙන්නේ. මේ ඒ කියූ සැටි:-**"පඤ්ඤ සංවත්තනිකකම්මතෝ අබ්‍යාපජ්ජ ලෝකුප්පත්තිතෝ ඉන්ද්‍රියපරිපාකතෝ කිලේසාදූරභාවතෝච ඤාණසම්පයුත්තා"** යනු.
**[සද්ධර්මසාගරය 02/436-437 පිටු]**

ජානාති යථාසභාවං පටිවිජ්ඣතීති ඤාණං යනුවෙන් විග්‍රහ කරණු. ඤා-ධාතු තෙමේ පඤ්ඤින්ද්‍රිය චෛතසිකය වාචක වෙයි. ඤාණේන ඒකුප්පාදදිසම්පයුත්තං යනුවෙන් විග්‍රහ කරණු. ඤාණය හි යෙදුනා වූ චිත්තය ලැබේ. ප්‍රඥව උපදවන්නා වූ කර්මයක් ඇති බවය, ද්වේෂයෙන් පහ වූ බ්‍රහ්ම ලෝකයෙහි හටගැනීමය, ඉන්ද්‍රියන් මුහුකළ බවය, කෙලෙසුන් කෙරෙන් දුරුබවය මේ සතරාකාර හේතූන් නිසා ඤාණයෙන් යුක්ත වේ.
**[අභිධර්මාර්ථ සංග්‍රහ ප්‍රකාශනී 25-26 පිටු]**

ත්‍රිහේතුක මහා විපාකසිතකින් ප්‍රතිසන්ධිය ලැබීම, ශ්‍රද්ධා ආදී ධර්මයන්ගේ මේරීම, අකුසල් කෙරෙන් ඈත් වීම, නුවණ වැඩෙන කටයුතු කිරීම මෙකී කරුණු අඩුවී නම් ඤාණවිප්‍රයුක්ත සිත් ඇති වේ.
**[අභිධර්මාර්ථ ප්‍රදීපිකා 01/61 පිට]**

## ඤාණය නැති කල සිත වනාහි කෙසේ කුසල් වන්නේ ද?

"ඤාණසම්පයුත්තං" තාව ඒවං හෝතු; ඤාණවිප්පයුත්තං කථන්ති. තම්පි රුළ්හීසද්දේන කුසලමේව. යථා හි තාළපණ්ණේහි අකත්වා කිලඤ්ජාදීහි කතම්පි තං සරික්ඛත්තා රුළ්හීසද්දේන තාලවණ්ටන්ත්වේව වුච්චති, ඒවං "ඤාණවිප්පයුත්ත"ම්පි කුසලන්ත්වේව වේදිතබ්බං. නිප්පරියායේන පන "ඤාණසම්පයුත්තං" ආරෝග්‍යට්ඨේන අනවජ්ජට්ඨේන කෝසල්ලසම්භූතට්ඨේනාති තිවිධේනපි කුසලන්ති නාමං ලභති, ඤාණවිප්පයුත්තං දුවිධේනේව. ඉති යඤ්ච ජාතකපරියායේන යඤ්ච බාහිතිකසුත්තපරියායේන යඤ්ච අභිධම්මපරියායේන කුසලං කථිතං සබ්බං තං තීහිපි අත්ථේහි ඉමස්මිං චිත්තේ ලබ්භති.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය අංක 01 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 80-81 පිටු (හේ.වි.මු)]**

**රුළ්හිසද්දේනාති** ඤාණසම්පයුත්තේසු රුළ්හේන සද්දේන, ඤාණසම්පයුත්තේසු වා පවත්තිත්වා අනවජ්ජසුඛවිපාකතාය තං සදිසේසු

ඤාණවිප්පයුත්තේසු රුළ්හේන සද්දේන. අථ වා කිඤ්චි නිමිත්තං ගහෙත්වා සතිපි අඤ්ඤස්මිං තං නිමිත්තයුත්තේ කිස්මිඤ්චිදේව විසයේ සම්මුතියා චිරකාලතාවසේන නිමිත්තවිරහේපි පවත්ති රුළ්හි නාම යථා "මහියං සේතීති මහිංසෝ, ගච්ඡන්තීති ගාවෝ"ති, ඒවං කුසලසද්දස්සපි රුළ්හිභාවෝ වේදිතබ්බෝ. පඤ්ඤනිද්දේසේ "කෝසල්ල"න්ති අභිධම්මේ (ධ. ස. 16) වුත්තං, තස්ස ච භාවා කුසලසද්දප්පවත්තීති කෝසල්ලයෝගා කුසලන්ති අයං අභිධම්මපරියායෝ හෝති. **කුසල**න්ති කුසලභාවං ආහ. **[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකුසලපද භාජනීය අංක 01 යටතේ)]**

**තාව** පළමුව **ඤාණසම්පයුත්තං** ඤාණසම්ප්‍රයුක්ත බව **ඒවං** මෙසේ **හෝතු** වේවා **ඤාණවිප්පයුත්තං** ඤාණවිප්‍රයුක්ත බව **කථන්ති?** කේසේද යත්? **තම්පි** ඒ ඤාණවිප්‍රයුක්ත සිත ද **රුළ්හීසද්දේන** රුළ්හී ශබ්දයෙන් **කුසලමේව (හෝති)** කුසල්ම වෙයි **හි** උපමාවක් දක්වම් **යථා** යම්සේ වනාහි **තාළපණ්ණේහි අකතම්පි** තල් කොළවලින් නොකොට **කිලඤ්ජාදීහි කතම්පි** කලාල ආදියෙන් කරනලද ද **තං සරික්ඛත්තා** එය හා සමාන බැවින් **රුළ්හීසද්දේන** රුළ්හී ශබ්දයෙන් **තාලවට්ටං ඉති ඒව** තල්වැටම යැයි **වුච්චති** කියනු ලැබේයි **ඒවං** මෙසේ **ඤාණවිප්පයුත්තම්පි** ඤාණවිප්‍රයුත්ත සිත ද **කුසලං ඉති ඒව** කුසල්ම යැයි **වේදිතබ්බං** දතයුතුයි **නිප්පරියායේන පන** නිෂ්පර්‍යායෙන් වනාහි **ඤාණසම්පයුත්තං** ඤාණසම්ප්‍රයුත්ත සිත **ආරෝග්‍යට්ඨේන** ආරෝග්‍යාර්ථයෙන් ද **අනවජ්ජට්ඨේන** අනවද්‍යාර්ථයෙන් ද **කෝසල්ලසම්භූතට්ඨේන ඉති** ප්‍රඥවෙන් හටගත් අර්ථයෙන් ද යන **තිවිධේනපි** ත්‍රිවිධාකාරයෙන් **කුසලං ඉති** කුසල යන **නාමං ලභති** නම ලබයි **ඤාණවිප්පයුත්තං** ඤාණවිප්‍රයුක්ත සිත **දුවිධේනේව** දෙයාකාරයකින්ම (**කුසලං ඉති** කුසල යන **නාමං ලභති** නම ලබයි) **ඉති** මෙසේ **යං** යම් සිතක් **ජාතකපරියායේන ච** ජාතක පර්‍යායෙන් ද **යං** යම් සිතක් **බාහිතිකසුත්තපරියායේන ච** බාහිතිකසූත්‍ර පර්‍යායෙන් ද **යං** යම් සිතක් **අභිධම්මපරියායේන ච** අභිධර්ම පර්‍යායෙන් ද **කුසලං කථිතං** කුසල යැයි දේශනා කරනලදි **තං සබ්බං** ඒ සියළු සිත **තීහිපි අත්ථේහි** අර්ථ තුනෙන් **ඉමස්මිං චිත්තේ** මේ සිතෙහි **ලබ්භති** ලැබෙයි. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

සහේතුකාමාවචරපුඤ්ඤපාකකිරියා වේදනාඤාණසඞ්ඛාරභේදේන පච්චේකං වේදනාභේදතෝ දුවිධත්තා, ඤාණභේදතෝ චතුබ්බිධත්තා, සඞ්ඛාරභේදතෝ අට්ඨවිධත්තා ච සම්පිණ්ඩෙත්වා චතුවීසති මතාති යෝජනා. නනු ච වේදනාභේදෝ තාව යුත්තෝ තාසං භින්නසභාවත්තා. ඤාණසඞ්ඛාරභේදෝ පන කථන්ති? ඤාණසඞ්ඛාරානං භාවාභාවකතෝපි භේදෝ ඤාණසඞ්ඛාරකතෝව යථා වස්සකතෝ සුභික්ඛෝ දුබ්භික්ඛෝති, තස්මා ඤාණසඞ්ඛාරකතෝ භේදෝ ඤාණසඞ්ඛාරභේදෝති න එත්ථ කෝචි විරෝධෝති.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 19 යටතේ); විභාවනී ටීකා සන්නය 58 පිට]**

**සහේතුකාමාවචරපුඤ්ඤපාකක්‍රියා** සහේතු කාමාවචර කුසල විපාක ක්‍රියා චිත්තයෝ **වේදනාඤාණසඞ්ඛාරභේදේන** වේදනාභේදය ඤාණභේදය සංස්කාරභේදය යන භේදත්‍රයෙන් **පච්චේකං** වෙන වෙනම **වේදනාභේදතෝ** වේදනා ප්‍රභේද වශයෙන් **දුවිධත්තා ච** ද්විප්‍රකාර වන හෙයින් ද **ඤාණභේදතෝ** ඤාණභේද වශයෙන් **චතුබ්බිධත්තා ච** සතර වැදෑරුම් වන හෙයින් ද **සඞ්ඛාරභේදතෝ** සංස්කාර ප්‍රභේද වශයෙන් **අට්ඨවිධත්තා ච** අට වැදෑරුම් වන හෙයින් ද **සම්පිණ්ඩෙත්වා** හකුළුවා **චතුවීසාති** සූවිසි ප්‍රභේද සිත් කෙනෙක් වෙති **මතා** දන්නා ලද්දහු වෙත් **ඉති (අයං)** මේ වනාහි **යෝජනා** අර්ථ යෝජනායි.

**තාසං** ඒ වේදනාවන්ගේ **භින්නසභාවතෝ** ප්‍රභේද වූ ස්වභාවන් ඇති හෙයින් **වේදනාභේදෝ** වේදනා ප්‍රභේද තෙමේ **තාව යුත්තෝ නනු** ඒ තාක් යුක්ත වූයේ වේවා **ඤාණසඞ්ඛාරභේදෝ පන** ඤාණ සංස්කාර ප්‍රභේදය වනාහි **කථං යුත්තෝ?** කෙසේ යෙදෙන්නේ ද යත්? **ඉති (පුච්ඡායං සති)** මෙබඳු ප්‍රශ්නයක් ඇති කල්හි **ඤාණසඞ්ඛාරානං** ඤාණ සංස්කාරයන්ගේ **භාවාභාවකතෝ** විද්‍යමාන අවිද්‍යමාන භාවය විසින් කරන ලද්දවූ **භේදෝපි** ප්‍රභේදය ද **ඤාණසඞ්ඛාරකතෝ ඒවාති** ඤාණ සංස්කාරයන් විසින් කරන ලද්දේමයයි **වුච්චති** කියනු ලැබේ **යථා (කිං?)** කුමක් මෙන්ද යත්? **සුභික්ඛෝ ච** සුභික්‍ෂත්වය ද **දුබ්භික්ඛෝ ච** දුර්භික්‍ෂත්වය ද **වස්සකතෝති** වර්ෂාව විසින් කරන ලද්දේයයිම **වුච්චති (යථා)** කියන ලද්දක් මෙනි **තස්මා** එසේ හෙයින් **ඤාණසඞ්ඛාරතෝ** ඤාණ සංස්කාරයන් විසින් කරන ලද්දවූ **භේදෝපි** ප්‍රභේදය ද **ඤාණසඞ්ඛාරභේදෝ** ඤාණභේදය සංස්කාර භේදය නම් වේද **ඉති (තස්මා)** එසේ හෙයින් **එතථ** මේ ඤාණභේදය සංස්කාර භේදය යන්නෙහි **කෝචි විරෝධෝ** කිසි විරුද්ධත්වයක් තෙමේ **නත්ථි** නැත්තේයි (ඉති ශබ්දය පරිසමාපනාර්ථයෙහිය)

**[විභාවනී ටීකා සන්නය 97-98 පිටු]**

වේදනා භේදය වනාහි සොම්නස් උපෙක්ඛා වශයෙන් දෙයාකාර බැවින් වේදනා භේදය ලැබෙන්නේමැයි. ඤාණ භේදය වනාහි ඤාණසම්පයුත්ත චිත්තයෙහි මුත් ඤාණවිප්පයුත්ත චිත්තයෙහි කේසේ ලැබෙන්නේ ද යත්? "වස්සකතෝ සුභික්ඛෝ දුබ්භික්ඛෝති" යන උදහරණයෙහි වර්ෂාව ඇති කල්හි ලැබෙන්නා වු සුභික්‍ෂත්වය වර්ෂාව නැති කල්හි ලැබෙන්නා වූ දුර්භික්‍ෂත්වය ද යන දෙකම වර්ෂාව විසින් කරන්නාක් මෙන් ඤාණය ඇති-නැති කල්හි වන්නා වූ භේදය ද ඤාණය විසින්ම කරනලද්දේ යැයි දතයුතුයි. **[විස්තර භාව සන්නය 38 පිට]**

## කාමාවචර කුසල් සිතෙහි හීන ප්‍රණීත භාවය:—

තත්ථ කුසලචිත්තං ඒකවීසතිවිධං හෝති, තදිදං භූමිතෝ චතුබ්බිධං හෝති; කාමාවචරං, රූපාවචරං, අරූපාවචරං, ලෝකුත්තරඤ්චේති.

තත්ථ **කාමාවචරකුසලචිත්තං** භූමිතෝ ඒකවිධං, සවත්ථුකාවත්ථුකභේදතෝ දුවිධං, හීන-මජ්ඣිම-පණීතභේදතෝ තිවිධං, සෝමනස්සුපෙක්ඛා ඤාණප්පයෝගභේදතෝ අට්ඨවිධං හෝති. සෙය්‍යථිදං; සෝමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, සෝමනස්සසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකන්ති ඉදං අට්ඨවිධම්පි කාමාවචරකුසලචිත්තං නාම.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 11 යටතේ)]**

**සවත්ථුකාවත්ථුකභේදතෝ**ති සවත්ථුකං හදයවත්ථුකං, අවත්ථුකං හදයවත්ථුවිරහිතං.

**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 11 යටතේ)]**

ඉදානි ඒවං තිකවසේන නිද්දිට්ඨේසු කුසලාදීසු පඨමං තාව කුසලචිත්තං විභජන්තෝ **"තත්ථ කුසලචිත්ත"**න්තිආදිනා තස්ස ගණනපරිච්ඡේදං දස්සේති. **ඒකවීසතිවිධ**න්ති අට්ඨ කාමාවචරානි, පඤ්ච රූපාවචරානි, චත්තාරි අරූපාවචරානි,

චත්තාරි ලෝකුත්තරානීති ඒවං සඞ්ඛෙපතෝ ඒකවීසතිවිධං. **භූමිතෝ චතුබ්බිධ**න්ති කාමරූපාරූපලෝකුත්තරභූමිසඞ්ඛාතානං චතුන්නං භූමීනං වසේන තත්ථ පවත්තමානං චිත්තම්පි චතුබ්බිධං හෝති. තත්ථ භවන්ති එත්ථාති **භූමි,** ඨානං, අවත්ථා ච. අවත්ථාපි හි අවත්ථවන්තානං පවත්තිට්ඨානං විය ගය්හති. ඒවඤ්හි නේසං සුඛග්ගහණං හෝති. **අවත්ථාති** චෙත්ථ ධම්මානං කාමතණ්හාදීහි පරිච්ඡින්නාපරිච්ඡින්නභාවෝ. තත්ථ පුරිමා තිස්සෝ භූමියෝ උභයවසේන වේදිතබ්බා, ඉතරා අවත්ථාවසේනේව. න හි ලෝකුත්තරධම්මානං කාමභවාදිතෝ අඤ්ඤං ඨානමුපලබ්භතීති.

අඤ්ඤත්ථ පවත්තමානස්සාපි වක්ඛමානනයේන කාමභූමිපරියාපන්නත්තා **භූමිතෝ ඒකවිධ**න්ති. **සවත්ථුකාවත්ථුකභේදතෝ**ති චක්ඛාදීනි පඤ්ච, හදයඤ්චාති ඡ වත්ථූනි. කුසලස්ස පන චක්ඛාදිනිස්සිතත්තාභාවතෝ හදයවත්ථු ඉධ වත්ථූති අධිප්පේතං. තේන සහිතං ඒකන්තේන තන්නිස්සිතප්පවත්තිතෝති **සවත්ථුකං,** කාමරූපධාතුයං පවත්තමානවිඤ්ඤාණං. තත්ථ හි අරූපස්ස රූපපටිබන්ධප්පවත්ති, අරූපධාතුයං පන රූපාභාවතෝ වත්ථුවිරහිතමේව පවත්තතීති තත්ථ පවත්තමානං **අවත්ථුකං. හීන**…**පෙ**…. **තිවිධ**න්ති එත්ථ පච්චයතෝ, ඵලතෝ ච මජ්ඣිමපණීතේහි නිහීනං, තේසං වා ගුණේහි පරිහීනන්ති **හීනං,** අත්තනෝ පච්චයේහි පධානභාවං නීතන්ති **පණීතං,** උභින්නං වේමජ්ඣෙ භවං **මජ්ඣිමං.** තත්ථ හීනේන ඡන්දේන චිත්තේන වීරියේන වීමංසාය වා පවත්තිතං **හීනං,** මජ්ඣිමේහි ඡන්දදීහි පවත්තිතං **මජ්ඣිමං,** පණීතේහි **පණීතං**. ඡන්දදීනං පන හීනාදිභාවෝ අධිමුත්තිවසේන දට්ඨබ්බෝ. හීනාධිමුත්තිවසේන හි නේසං හීනතා, පණීතාධිමුත්තිවසේන පණීතතා, තදුභයවේමජ්ඣවසේන මජ්ඣිමතා. යසකාමතාය වා කතං කුසලං **හීනං,** පුඤ්ඤඵලකාමතාය **මජ්ඣිමං,** "පුඤ්ඤං නාමේතං සාධූහි කත්තබ්බමේවා"ති ඒවං අරියභාවං නිස්සාය කතං **පණීතං.** "අහමස්මි දානපති, ඉමේ පනඤ්ඤේ දානදාසාදයෝ"තිආදිනා අත්තුක්කංසනපරවම්භනාහි උපක්කිලිට්ඨං පවත්තිතං වා **හීනං,** තථා අනුපක්කිලිට්ඨං **මජ්ඣිමං,** මග්ගඵලපදට්ඨානං **පණීතං**. භවභෝගසම්පත්තිනිමිත්තං වා කතං **හීනං,** සාවකපච්චේකබෝධිපාරමිතාවසේන අත්තනෝ විමොක්ඛත්ථාය කතං **මජ්ඣිමං,** සම්මාසම්බෝධිපාරමිතාවසේන සබ්බේසං විමොක්ඛත්ථාය කතං **පණීත**න්ති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 58 පිට]**

දැන් මෙසේ ත්‍රික වශයෙන් දක්වනලද කුසලාදීන් අතුරෙන් පළමු කොට කුසල චිත්තය විභාග කරන්නේ "තත්ථ කුසලචිත්තං" යනාදීන් ඔහුගේ ගණන පරිච්ඡේදය දක්වයි.

**තත්ථ** ඒ කුසලාදීන් අතුරෙන් **කුසලචිත්තං** කුසල චිත්තය තෙමේ **ඒකවීසතිවිධං හෝති** කාමාවචර කුසල් සිත් අටය රූපාවචර කුසල් සිත් පස්දෙනය අරූපාවචර කුසල් සිත් සිව්දෙනය ලෝකෝත්තර කුසල් සිත් සතරදෙනයයි මෙසේ සංක්ෂෙප වශයෙන් එක්විසි වැදෑරුම් වෙයි **තං ඉදං** ඒ චිත්තය තෙමේ **භූමිතෝ** (කාමරූපාරූපලෝකෝත්තර සඞ්ඛ්‍යාත සතර) භූමීන්ගේ වශයෙන් **කාමාවචරං** කාමාවචරය **රූපාවචරං** රූපාවචරය **අරූපාවචරං** අරූපාවචරය **ලෝකුත්තරඤ්ච ඉති** ලෝකෝත්තරයයි ද **චතුබ්බිධං හෝති** සිව් වැදෑරුම් වෙයි.

එහි "භවන්ති එත්ථාති භූමි-ඨානං අවත්ථා ච" යනු නිර්වචන බැවින් ධර්මයන්ගේ හටගන්නා වූ ස්ථානය හා අවස්ථාව ද භූමි නම් වෙයි. ඒ එසේමැයි;

අවස්ථාව ද අවස්ථාවත්වූ ධර්මයන්ගේ හටගැන්මට ස්ථානයක් මෙන් ගනු ලැබේ. එසේ ඇති කල්හි ඔහුන්ගේ සුඛග්‍රහණය වෙයි. එහි අවස්ථාව යනුද ධර්මයන්ගේ කාමතෘෂ්ණාදියෙන් පරිච්ඡින්න අපරිච්ඡින්න භාවයයි. ඔහුන් අතුරෙහි පළමුවන තුන් භූමීහු ස්ථාන අවස්ථා යන දෙදෙනාගේ වශයෙන් දතයුත්තාහුය. ලෝකෝත්තර භූමි තොමෝ අවස්ථා වශයෙන්ම දතයුත්තීය. කුමක් හෙයින යත්? යම් හෙයකින් ලෝකෝත්තර ධර්මයන්ට කාමභවාදියෙන් අන්‍යවූ ස්ථානයක් නොලැබේ ද එහෙයිනි.

**තත්‍ථ** ඔහුන් අතුරෙහි **කාමාවචරකුසලචිත්තං** කාමාවචර කුසල චිත්තය තෙමේ **භූමිතෝ** (අන් භූමියෙක්හි හටගන්නේ නමුදු වක්‍ෂ්‍යමාන නියායෙන් කාමභූමි පර්‍යාපන්න බැවින්) භූමි වශයෙන් **ඒකවිධං** එක් වැදෑරුම් වෙයි **සවත්‍ථුකඅවත්‍ථුකතෝ** සවස්තුක අවස්තුක වශයෙන් **දුවිධං** දෙවැදෑරුම් වෙයි **හීනමජ්ඣිමපණීතභේදතෝ** හීන මධ්‍යම ප්‍රණීත භේද හෙයින් **තිවිධං** තුන් වැදෑරුම් වෙයි සෝමනස්ස උපෙක්ඛා සම්ප්‍රයෝග විප්‍රයෝගභේදය ඥාණසම්ප්‍රයෝග විප්‍රයෝගභේදය සසංස්කාරික අසංස්කාරිකභේදය යන ප්‍රභේද හෙයින් **අට්ඨවිධං හෝති** අට වැදෑරුම් වෙයි.

"සවත්‍ථුකාවත්‍ථුකතෝ" යන මෙහි චක්‍ෂුරාදී පඤ්ච ප්‍රශාද වස්තූහුය හෘදයවස්තුව දැයි ෂඩ් වස්තු කෙනෙක් වෙත්. කුසලයට වනාහි චක්‍ෂුරාදිය නිශ්‍රිත නොවන බැවින් මෙහි වත්‍ථු යනු හෘදයවස්තුවම අධිප්‍රේතයි. "තේන සහිතං ඒකන්තේන තං නිස්සිතප්පවත්තනතෝති සවත්‍ථුකං, කාමරූපධාතුයං පවත්තමානං විඤ්ඤාණං" යනු වචනාර්ථ බැවින් කාම-රූප භූමි දෙක්හි උපදනා විඤ්ඤාණය තෙමේ ඒකාන්තයෙන් ඒ හෘදයවස්තුවම ඇසුරු කොට උපදනා හෙයින් ඒ හෘදයවස්තුවෙන් යුක්තවූයේනුයි සවත්‍ථුක නම් වෙයි. ඒ එසේමැයි; එහි අරූප ධර්මයාගේ හටගැන්ම රූපය පිළිබඳ වෙයි. අරූපභූමියෙහි වනාහි රූපයක් නැති හෙයින් වස්තු රහිතවම හටගනිනුයි එහි උපදනා විඤ්ඤාණය තෙමේ අවත්‍ථුක නම් වෙයි. "හීන -පෙ- තිවිධං" යන මෙහි "පච්චයතෝ ඵලතෝ ච මජ්ඣිමපණීතේහි නිහීනං තේසං වා ගුණේහි පරිහීනන්ති හීනං, අත්තනෝ පච්චයේහි පධානභාවං නීතන්ති පණීතං, උභින්නං වේමජ්ඣේ භවං මජ්ඣිමං" යනු නිර්වචනයි. එහි හීන වූ ඡන්ද චිත්ත විරිය වීමංසා යන මොහුන් කරණකොටගෙන උපදනා චිත්තය තෙම හීන නම් වෙයි. මධ්‍යම වූ ඡන්දදීන් කරණකොටගෙන උපදනා චිත්තය තෙම මධ්‍යම නම් වෙයි. ප්‍රණීත වූ ඡන්දදීන් කරණකොටගෙන උපදනා චිත්තය තෙම ප්‍රණීත නම් වෙයි. ඡන්දදීන්ගේ හීනාදී භාවය තෙමේ අධිමුක්ති වශයෙන් දතයුත්තේය. ඒ එසේමැයි; හීනාධිමුක්ති වශයෙන් ඔහුන්තේ හීන බවද ප්‍රණීතාධිමුක්ති වශයෙන් ප්‍රණීත බවද ඒ දෙදෙනාගේ මධ්‍ය වශයෙන් මධ්‍යම බවද දතයුත්තීය. නොහොත් යස කාමිත්වයෙන් කරනලද කුසලය තෙම හීන නම් වෙයි. පුණ්‍යඵල කාමිත්වයෙන් කරනලද කුසලය තෙම මධ්‍යම නම් වෙයි. මේ පුණ්‍යය නම් සත්පුරුෂයෙක් විසින් කටයුතුම යැයි මෙසේ ආර්‍ය්‍යභාවය නිසා කරනලද කුසලය තෙම ප්‍රණීත නම් වෙයි.

තවද මම දනපතියෙක් වෙමි අන්‍යවූ මොවුහු දනදසාදියයි යනාදීන් තමා උසස් කොට තැබීමය අනුන්ට ගැරහීමය යන මෙයින් සිත කෙලෙසන ලදුව උපදනා කුසලය තෙම හීන නම් වෙයි. එසේ නොකිලිටුවන ලදුව හටගන්නා කුසලය තෙම මධ්‍යම නම් වෙයි. මාර්ග-ඵලයන්ට ආසන්න කාරණා වූ කුසලය තෙම ප්‍රණීත නම් වෙයි. භවභෝග සම්පත් නිමිත්ත කොට හෝ කරනලද කුසලය තෙම හීන නම් වෙයි. ශ්‍රාවක ප්‍රත්‍යේකබෝධි පාරමිතා වශයෙන් තමාගේ විමෝක්‍ෂය පිණිස කරනලද කුසලය තෙම

මධ්‍යම නම් වෙයි. සම්‍යක් සම්බෝධි පාරමිතා වශයෙන් සකල සත්වයන්ගේ විමෝක්ෂය පිණිස කරනලද කුසලය තෙම ප්‍රණීත නම් වෙයි.

[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 34-36 පිටු]

## කාමාවචර කුසල සිත උපදින ආකාරයඃ—

ඒවං සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං හුත්වා උප්පන්නචෙතං අසඞ්ඛාරේන අප්පයෝගේන අනුපායචින්තනාය උප්පන්නත්තා අසඞ්ඛාරං නාම ජාතං. තයිදං රජනීයවණ්ණාරම්මණං හුත්වා උප්පජ්ජමානමේව තිවිධේන නියමේන උප්පජ්ජති; දානමයං වා හෝති, සීලමයං වා, භාවනාමයං වා.

කථං? යදා හි නීලපීතලෝහිතෝදාතේසු පුප්ඵාදීසු අඤ්ඤතරං ලභිත්වා වණ්ණවසේන ආභුජිත්වා 'වණ්ණදානං මය්හ'න්ති බුද්ධරතනාදීනි පූජේති, තදා දානමයං හෝති. තත්‍රිදං වත්ථු; භණ්ඩාගාරිකසඞ්ඝමිත්තෝ කිර ඒකං සුවණ්ණඛචිතං වත්ථං ලභිත්වා ඉදම්පි වත්ථං සුවණ්ණවණ්ණං, සම්මාසම්බුද්ධෝපි සුවණ්ණවණ්ණෝ, සුවණ්ණවණ්ණං වත්ථං සුවණ්ණවණ්ණස්සේව අනුච්ඡවිකං, අම්හාකඤ්ච වණ්ණදානං භවිස්සතීති මහාචේතියේ ආරෝපේසි. ඒවරූපේ කාලේ දානමයං හෝතීති වේදිතබ්බං. යදා පන තථාරූපමේව දෙය්‍යධම්මං ලභිත්වා 'මය්හං කුලවංසෝ, කුලතන්ති කුලප්පවේණී ඒසා, කුලවත්තං ඒත'න්ති බුද්ධරතනාදීනි පූජේති තදා සීලමයං හෝති. යදා පන තාදිසේනේව වත්ථුනා රතනත්තයස්ස පූජං කත්වා 'අයං වණ්ණෝ ඛයං ගච්ඡිස්සති, වයං ගච්ඡිස්සතී'ති ඛයවයං පට්ඨපේති, තදා භාවනාමයං හෝති.

දානමයං පන හුත්වා වත්තමානම්පි යදා තීණි රතනානි සහත්ථේන පූජේන්තස්ස පවත්තතත්ති, තදා කායකම්මං හෝති. යදා තීණි රතනානි පූජේන්තෝ පුත්තදාරදාසකම්මකරපෝරිසාදයෝපි ආණාපෙත්වා පූජාපේති තදා වචීකම්මං හෝති. යදා තදේව වුත්තප්පකාරං විජ්ජමානකවත්ථුං ආරබ්භ වණ්ණදානං දස්සාමීති චින්තේති තදා මනෝකම්මං හෝති. විනයපරියායං පත්වා හි 'දස්සාමි කරිස්සාමී'ති වාචා භින්නා හෝතීති (පාරා. 659) ඉමිනා ලක්ඛණේන දානං නාම හෝති. අභිධම්මපරියායං පත්වා පන විජ්ජමානකවත්ථුං ආරබ්භ 'දස්සාමී'ති මනසා චින්තිතකාලතෝ පට්ඨාය කුසලං හෝති. අපරභාගෙ කායේන වා වාචාය වා කත්තබ්බං කරිස්සතීති වුත්තං. ඒවං දානමයං කායවචීමනෝකම්මවසේනේව තිවිධං හෝති.

යදා පන තං වුත්තප්පකාරං වත්ථුං ලභිත්වා කුලවංසාදිවසේන සහත්ථා රතනත්තයං පූජේති තදා සීලමයං කායකම්මං හෝති. යදා කුලවංසාදිවසේනේව පුත්තදාරාදයෝ ආණාපෙත්වා පූජාපේති තදා වචීකම්මං හෝති. යදා 'මය්හං කුලවංසෝ, කුලතන්ති කුලප්පවේණී ඒසා, කුලවත්තමේත'න්ති විජ්ජමානකවත්ථුං ආරබ්භ 'වණ්ණදානං දස්සාමී'ති චින්තේති තදා මනෝකම්මං හෝති. ඒවං සීලමයං කායවචීමනෝකම්මවසේන තිවිධං හෝති.

යදා පන තං වුත්තප්පකාරං වත්ථුං ලභිත්වා තීණි රතනානි පූජෙත්වා චඞ්කමන්තෝ ඛයවයං පට්ඨපේති තදා භාවනාමයං කායකම්මං හෝති. වාචාය සම්මසනං පට්ඨපෙන්තස්ස වචීකම්මං හෝති, කායඞ්ගවාචඞ්ගානි අචෝපෙත්වා මනසාව සම්මසනං පට්ඨපෙන්තස්ස මනෝකම්මං හෝති. ඒවං භාවනාමයං

කායවචීමනෝකම්මවසේන තිවිධං හෝති. ඒවමේතං රූපාරම්මණං කුසලං තිවිධපුඤ්ඤකිරියවත්ථුවසේන නවහි කම්මද්වාරේහි භාජෙත්වා දස්සේසි ධම්මරාජා. සද්දාරම්මණාදීසුපි ඒසේව නයෝ.

භේරිසද්දාදීසු හි රජනීයසද්දං ආරම්මණං කත්වා හෙට්ඨා වුත්තනයේනේව තීහි නියමේහේතං කුසලං උප්පජ්ජති. තත්ථ සද්දං කන්දමූලං විය උප්පාටෙත්වා නීලුප්පලහත්ථකං විය ච හත්ථේ ඨපෙත්වා දාතුං නාම න සක්කා, සවත්ථුකං පන කත්වා දෙන්තෝ සද්දදානං දේති නාම. තස්මා යදා 'සද්දදානං දස්සාමී'ති භේරිමුදිඞ්ගාදීසු අඤ්ඤතරතූරියේන තිණ්ණං රතනානං උපහාරං කරෝති, 'සද්දදානං මේ'ති භේරිආදීනි ඨපාපේති, ධම්මකථිකභික්ඛූනං සරභේසජ්ජතේලඵාණිතාදීනි දේති, ධම්මසවනං ඝෝසේති, සරභඤ්ඤං භණති, ධම්මකථං කථේති, උපනිසින්නකකථං අනුමෝදනකථං කරෝති, තදා දානමයංයේව හෝති. යදා ඒතදේව විධානං කුලවංසාදිවසේන වත්තවසේන කරෝති තදා සීලමයං හෝති. යදා සබ්බම්පේතං කත්වා අයං එත්තකෝ සද්දෝ බ්‍රහ්මලෝකප්පමාණෝපි හුත්වා 'ඛයං ගමිස්සති, වයං ගමිස්සතී'ති සම්මසනං පට්ඨපේති තදා භාවනාමයං හෝති.

තත්ථ දානමයං තාව යදා භේරිආදීනි ගහෙත්වා සහත්ථා උපහාරං කරෝති, නිච්චුපහාරත්ථාය ඨපෙන්තෝපි සහත්ථා ඨපේති, 'සද්දදානං මේ'ති ධම්මසවනං ඝෝසේතුං ගච්ඡති, ධම්මකථං සරභඤ්ඤං කාතුං වා ගච්ඡති, තදා කායකම්මං හෝති. යදා 'ගච්ඡථ, තාතා, අම්හාකං සද්දදානං තිණ්ණං රතනානං උපහාරං කරෝථා'ති ආණාපේති, 'සද්දදානං මේ'ති චේතියඞ්ගණේසු 'ඉමං භේරිං, ඉමං මුදිඞ්ගං ඨපේථා'ති ආණාපේති, සයමේව ධම්මසවනං ඝෝසේති, ධම්මකථං කථේති, සරභඤ්ඤං භණති, තදා වචීකම්මං හෝති. යදා කායඞ්ගවාචඞ්ගානි අචෝපෙත්වා 'සද්දදානං දස්සාමී'ති විජ්ජමානකවත්ථුං මනසා පරිච්චජති, තදා මනෝකම්මං හෝති.

සීලමයම්පි 'සද්දදානං නාම මය්හං කුලවංසෝ කුලතන්ති කුලප්පවේණී'ති භේරිආදීහි සහත්ථා උපහාරං කරොන්තස්ස, භේරිආදීනි සහත්ථා චේතියඞ්ගණාදීසු ඨපෙන්තස්ස, ධම්මකථිකානං සරභේසජ්ජං සහත්ථා දදන්තස්ස, වත්තසීසේන ධම්මසවනඝෝසනධම්මකථාකථනසරභඤ්ඤභණනත්ථාය ච ගච්ඡන්තස්ස කායකම්මං හෝති. 'සද්දදානං නාම අම්හාකං කුලවංසෝ කුලතන්ති කුලප්පවේණී, ගච්ඡථ, තාතා, බුද්ධරතනාදීනං උපහාරං කරෝථා'ති ආණාපෙන්තස්ස කුලවංසවසේනේව අත්තනා ධම්මකථං වා සරභඤ්ඤං වා කරොන්තස්ස ච වචීකම්මං හෝති. 'සද්දදානං නාම මය්හං කුලවංසෝ සද්දදානං දස්සාමී'ති කායඞ්ගවාචඞ්ගානි අචෝපෙත්වා මනසාව විජ්ජමානකවත්ථුං පරිච්චජන්තස්ස මනෝකම්මං හෝති.

භාවනාමයම්පි යදා චඞ්කමන්තෝ සද්දේ ඛයවයං පට්ඨපේති තදා කායකම්මං හෝති. කායඞ්ගං පන අචෝපෙත්වා වාචාය සම්මසන්තස්ස වචීකම්මං හෝති. කායඞ්ගවාචඞ්ගං අචෝපෙත්වා මනසාව සද්දායතනං සම්මසන්තස්ස මනෝකම්මං හෝති. ඒවං සද්දාරම්මණම්පි කුසලං තිවිධපුඤ්ඤකිරියවත්ථුවසේන නවහි කම්මද්වාරේහි භාජෙත්වා දස්සේසි ධම්මරාජා.

මූලගන්ධාදීසුපි රජනීයගන්ධං ආරම්මණං කත්වා හෙට්ඨා වුත්තනයේනේව තීහි නියමේහේතං කුසලං උප්පජ්ජති. තත්ථ යදා මූලගන්ධාදීසු යං කිඤ්චි ගන්ධං

ලභිත්වා ගන්ධවසේන ආභුජිත්වා 'ගන්ධදානං මය්හ'න්ති බුද්ධරතනාදීනි පූජේති, තදා දානමයං හෝතීති සබ්බං වණ්ණදානේ වුත්තනයේනේව විත්ථාරතෝ වේදිතබ්බං. ඒවං ගන්ධාරම්මණම්පි කුසලං තිවිධපුඤ්ඤකිරියවත්ථුවසේන නවහි කම්මද්වාරේහි භාජෙත්වා දස්සේසි ධම්මරාජා.

මූලරසාදීසු පන රජනීයරසං ආරම්මණං කත්වා හෙට්ඨා වුත්තනයේනේව තීහි නියමේහේතං කුසලං උප්පජ්ජති. තත්ථ යදා මූලරසාදීසු යං කිඤ්චි රජනීයං රසවත්ථුං ලභිත්වා රසවසේන ආභුජිත්වා 'රසදානං මය්හ'න්ති දේති පරිච්චජති, තදා දානමයං හෝතීති සබ්බං වණ්ණදානේ වුත්තනයේනේව විත්ථාරතෝ වේදිතබ්බං. සීලමයේ පනෙත්ථ 'සඞ්ඝස්ස අදත්වා පරිභුඤ්ජනං නාම අම්හාකං න ආචිණ්ණ'න්ති ද්වාදසන්නං භික්ඛුසහස්සානං දාපෙත්වා සාදුරසං පරිභුත්තස්ස දුට්ඨගාමණිඅභයරඤ්ඤෝ වත්ථුං ආදිං කත්වා මහාඅට්ඨකථායං වත්ථූනි ආගතානි. අයමේව විසේසෝ. ඒවං රසාරම්මණම්පි කුසලං තිවිධපුඤ්ඤකිරියවත්ථුවසේන නවහි කම්මද්වාරේහි භාජෙත්වා දස්සේසි ධම්මරාජා.

ඵොට්ඨබ්බාරම්මණේපි පඨවීධාතු තේජෝධාතු වායෝධාතූති තීණි මහාභූතානි ඵොට්ඨබ්බාරම්මණං නාම. ඉමස්මිං ඨානේ ඒතේසං වසේන යෝජනං අකත්වා මඤ්චපීඨාදිවසේන කාතබ්බා. යදා හි මඤ්චපීඨාදීසු යං කිඤ්චි රජනීයං ඵොට්ඨබ්බවත්ථුං ලභිත්වා ඵොට්ඨබ්බවසේන ආභුජිත්වා 'ඵොට්ඨබ්බදානං මය්හ'න්ති දේති පරිච්චජති, තදා දානමයං හෝතීති සබ්බං වණ්ණදානේ වුත්තනයේනේව විත්ථාරතෝ වේදිතබ්බං. ඒවං ඵොට්ඨබ්බාරම්මණම්පි කුසලං තිවිධපුඤ්ඤකිරියවත්ථුවසේන නවහි කම්මද්වාරේහි භාජෙත්වා දස්සේසි ධම්මරාජා.

ධම්මාරම්මණේ ඡ අජ්ඣත්තිකානි ආයතනානි, තීණි ලක්ඛණානි, තයෝ අරූපිනෝ ඛන්ධා, පන්නරස සුඛුමරූපානි, නිබ්බානපඤ්ඤත්තීති ඉමේ ධම්මායතනේ පරියාපන්නා ච, අපරියාපන්නා ච, ධම්මා ධම්මාරම්මණං නාම. ඉමස්මිං පන ඨානේ ඒතේසං වසේන යෝජනං අකත්වා ඕජදානපානදානජීවිතදානවසේන කාතබ්බා. ඕජාදීසු හි රජනීයං ධම්මාරම්මණං ආරම්මණං කත්වා හෙට්ඨා වුත්තනයේනේව තීහි නියමේහේතං කුසලං උප්පජ්ජති.

තත්ථ යදා 'ඕජදානං මය්හ'න්ති සප්පිනවනීතාදීනි දේති, පානදානන්ති අට්ඨ පානානි දේති, ජීවිතදානන්ති සලාකභත්තසඞ්ඝභත්තාදීනි දේති, අඵාසුකානං භික්ඛූනං භේසජ්ජං දේති, වෙජ්ජං පච්චුපට්ඨාපේති, ජාලං ඵාලාපේති, කුමීනං විද්ධංසාපේති, සකුණපඤ්ජරං විද්ධංසාපේති, බන්ධනමොක්ඛං කාරාපේති, මා ඝාතභේරිං චරාපේති, අඤ්ඤානිපි ජීවිතපරිත්තාණත්ථං ඒවරූපානි කම්මානි කරෝති තදා දානමයං හෝති. යදා පන 'ඕජදානපානදානජීවිතදානානි මය්හං කුලවංසෝ කුලතන්ති කුලප්පවේණී'ති වත්තසීසේන ඕජදානාදීනි පවත්තේති තදා සීලමයං හෝති. යදා ධම්මාරම්මණස්මිං ඛයවයං පට්ඨපේති තදා භාවනාමයං හෝති.

දානමයං පන හුත්වා පවත්තමානම්පි යදා ඕජදානපානදානජීවිතදානානි සහත්ථා දේති, තදා කායකම්මං හෝති. යදා පුත්තදාරාදයෝ ආණාපෙත්වා දාපේති, තදා වචීකම්මං හෝති. යදා කායඞ්ගවාචඞ්ගානි අචෝපෙත්වා ඕජදානපානදානජීවිතදානවසේන විජ්ජමානකවත්ථුං 'දස්සාමී'ති මනසා චින්තේති, තදා මනෝකම්මං හෝති.

යද පන වුත්තප්පකාරං විජ්ජමානකවත්ථුං කුලවංසාදිවසේන සහත්ථා දේති, තද සීලමයං කායකම්මං හෝති. යද කුලවංසාදිවසේනේව පුත්තදාරාදයෝ ආණාපෙත්වා දපේති, තද වචීකම්මං හෝති. යද කුලවංසාදිවසේනේව වුත්තප්පකාරං විජ්ජමානකවත්ථුං 'දස්සාමී'ති මනසාව චින්තේති, තද මනෝකම්මං හෝති.

චඞ්කමිත්වා ධම්මාරම්මණෝ ඛයවයං පට්ඨපෙන්තස්ස පන භාවනාමයං කායකම්මං හෝති. කායඞ්ගං අචෝපෙත්වා වාචාය ඛයවයං පට්ඨපෙන්තස්ස වචීකම්මං හෝති. කායඞ්ගවාචඞ්ගානි අචෝපෙත්වා මනසාව ධම්මාරම්මණෝ ඛයවයං පට්ඨපෙන්තස්ස මනෝකම්මං හෝති. ඒවං භාවනාමයං කායවචීමනෝකම්මවසේන තිවිධං හෝති. ඒවමේතං ධම්මාරම්මණම්පි කුසලං තිවිධපුඤ්ඤකිරියවත්ථුවසේන නවහි කම්මද්වාරේහි භාජෙත්වා දස්සේසි ධම්මරාජා.

ඒවමිදං චිත්තං නානාවත්ථූසු නානාරම්මණවසේන දීපිතං. ඉදං පන ඒකවත්ථුස්මිම්පි නානාරම්මණවසේන ලබ්භතියේව. කථං? චතූසු හි පච්චයේසු චීවරේ ඡ ආරම්මණානි ලබ්භන්ති; නවරත්තස්ස හි චීවරස්ස වණ්ණෝ මනාපෝ හෝති දස්සනීයෝ, ඉදං වණ්ණාරම්මණං. පරිභෝගකාලේ පටපටසද්දං කරෝති, ඉදං සද්දාරම්මණං. යෝ තත්ථ කාළකච්ඡකාදිගන්ධෝ, ඉදං ගන්ධාරම්මණං. රසාරම්මණං පන පරිභෝගරසවසේන කථිතං. යා තත්ථ සුඛසම්ඵස්සතා, ඉදං ඵොට්ඨබ්බාරම්මණං. චීවරං පටිච්ච උප්පන්නා සුඛා වේදනා, ධම්මාරම්මණං. පිණ්ඩපාතේ රසාරම්මණං නිප්පරියායේනේව ලබ්භති. ඒවං චතූසු පච්චයේසු නානාරම්මණවසේන යෝජනං කත්වා දානමයාදිභේදෝ වේදිතබ්බෝ.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 01 කාමාවචරකුසලපද භාජනීය වණ්ණනා යටතේ); ධම්මසඞ්ගණී අටුවා 91-95 පිටු (හේ.වි.මු)]**

**වංසෝ**ති අනුක්කමෝ. **තන්තී**ති සන්තති. **පවේණී**ති සම්බන්ධෝ. සබ්බමේතං චාරිත්තකිරියාපබන්ධස්ස වචනං. චාරිත්තසීලත්තා **සීලමයං**. "දස්සාමී"ති වචීභේදේන වත්ථුස්ස පරිණතත්තා තතෝ පට්ඨාය දානං ආරද්ධං නාම හෝති, යතෝ තස්ස අත්තනෝ පරිණාමනාදීසු ආපත්ති හෝති. විජ්ජමානවත්ථුස්මිං චින්තනකාලතෝ පට්ඨාය දානං ආරද්ධන්ති තත්ථ දානමයං කුසලං හෝතීති අධිප්පායෝ. න හි දානවත්ථුං අවිජ්ජමානකම්පි සඞ්ඛරොන්තස්ස කුසලං න හෝතීති. තං පන දානමයස්ස පුබ්බභාගෝති තදේව භජෙය්‍ය, වුත්තං අට්ඨකථායං. **කුලවංසාදිවසේනා**ති උදාහරණමත්තමේවේතං. අත්තනා සමාදින්නවත්තවසේන සප්පුරිසවත්ත-ගාමජනපදවත්තාදිවසේන ච චාරිත්තසීලතා වේදිතබ්බා.

**සවත්ථුක**න්ති භේරිආදිවත්ථුසහිතං කත්වා. **විජ්ජමානකවත්ථු**න්ති භේරිආදිවත්ථුං. ධම්මස්සවනඝෝසනාදීසු ච සවත්ථුකං කත්වා සද්දස්ස දානං සද්දවත්ථූනං ඨානකරණානං සසද්දප්පවත්තිකරණමේවාති තස්ස චින්තනං විජ්ජමානවත්ථුපරිච්චාගෝ වේදිතබ්බෝ. භාජෙත්වා දස්සේසි ධම්මරාජා ඉධ ච රූපාරම්මණාදිභාවං, අඤ්ඤත්ථ ච "තීණිමානි, භික්ඛවේ, පුඤ්ඤකිරියවත්ථූනී"ති (දී. නි. 3.305) දානමයාදිභාවං, අපරත්ථ ච "කතමේ ධම්මා කුසලා? තීණි…පෙ…. තං සමුට්ඨානං කායකම්ම"න්තිආදිනා කායකම්මාදිභාවඤ්ච වදන්තෝ. **අපරියාපන්නා චා**ති පරමත්ථතෝ අවිජ්ජමානත්තා අඤ්ඤායතනත්තා ච අසඞ්ගහිතා.

**පරිභෝගරසෝ** පරිභෝගපච්චයං පීතිසෝමනස්සං. අයං පන රසසමානතාවසේන ගහණං උපාදය රසාරම්මණන්ති වුත්තෝ, න සභාවතෝ. සභාවේන පන ගහණං උපාදය පීතිසෝමනස්සං ධම්මාරම්මණමේව හෝතීති "සුඛා වේදනා ධම්මාරම්මණ"න්ති වුත්තං.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 01 කාමාවචරකුසලපද භාජනීය වණ්ණනා යටතේ)]**

**විජ්ජමානවත්ථුස්මි**න්ති ඒතේන "විනාපි දෙය්‍යධම්මපරිච්චාගේන චිත්තුප්පාදමත්තේනේව දානමයං කුසලං උපචිතං හෝතී"ති කේසඤ්චි අතිධාවනං නිවත්තිතං හෝතීති.

ධම්මසවනස්ස ඝෝසනං **ධම්මසවනඝෝසනං. තස්සා**ති "සද්දදානං දස්සාමී"ති සද්දවත්ථූනං ඨානකරණභේරිආදීනං සසද්දප්පවත්තිකරණස්ස. **චින්තනං** තථා තථා චිත්තුප්පාදනං. **අඤ්ඤත්ථා**ති සුත්තේසු. **අපරත්ථා**ති අභිධම්මපදේසු. **අපරියාපන්නා**ති පදස්ස අත්ථවණ්ණනා "පරිභෝගරසෝ"තිආදිකාය අත්ථවණ්ණනාය පරතෝ බහූසු පොත්ථකේසු ලිඛියති, යථාඨානේයේව පන ආනෙත්වා වත්තබ්බා. තත්ථ පරමත්ථතෝ අවිජ්ජමානත්තා ලක්ඛණපඤ්ඤත්තියෝ අඤ්ඤායතනත්තා ඡ අජ්ඣත්තිකායතනානි අසඞ්ගහිතා ධම්මායතනේනාති යෝජේතබ්බං.

"ඒකද්වාරිකකම්මං අඤ්ඤස්මිං ද්වාරේ උප්පජ්ජතී"ති කස්මා වුත්තං, නනු රූපාදීසු ඒකාරම්මණං චිත්තං යථා න අඤ්ඤාරම්මණං හෝති චිත්තවිසේසස්ස අධිප්පේතත්තා, ඒවං කම්මවිසේසේ අධිප්පේතේ කායද්වාරාදීසු ඒකද්වාරිකකම්මං අඤ්ඤස්මිං ද්වාරේ න උප්පජ්ජති තත්ථේව පරියෝසිතත්තා, අථ කම්මසාමඤ්ඤං අධිප්පේතං, රූපාදීසු ඒකාරම්මණන්ති ඉදං උදාහරණං න සියාති? න, අසදිසභාවවිභාවනවසේන උදාහටත්තා, ඉතරථා මනෝවිඤ්ඤාණභූතං ඉදං චිත්තං ඡසුපි විසයේසු පවත්තනතෝ අනිබද්ධාරම්මණන්ති ආරම්මණං සදිසූදාහරණභාවේන වුච්චෙය්‍ය ආරම්මණං විය ද්වාරම්පි අනිබද්ධන්ති. යස්මා පන සතිපි කම්මානං ද්වාරන්තරචරණේ යෙභුයෙය්න වුත්තියා තබ්බහුලවුත්තියා ච ද්වාරකම්මානං අඤ්ඤමඤ්ඤං වවත්ථානං වක්ඛති, තස්මා පාණාතිපාතාදිභාවසාමඤ්ඤේන කම්මං ඒකත්තනයවසේන ගහෙත්වා තස්ස වචීද්වාරාදීසු පවත්තිසබ්භාවතෝ කම්මස්ස අනිබද්ධත්තාති වුත්තන්ති ආහ **"කායද්වාරාදීසු ඒකද්වාරිකකම්මං අඤ්ඤස්මිං ද්වාරේ න නුප්පජ්ජතී"**ති. රූපාදීසු පන ඒකාරම්මණං චිත්තං තේනේවාරම්මණේන පරිච්ඡින්නන්ති විසිට්ඨමේව ගහිතන්ති ආරම්මණමේව නිබද්ධන්ති වුත්තන්ති චිත්තවිසේසෝ ඒව ගහිතෝ, න චිත්තසාමඤ්ඤං. "නනු ච රූපාරම්මණං වා…පෙ…. ධම්මාරම්මණං වා යං යං වා පනා"ති ආරම්මණම්පි අනියමේනේව වුත්තන්ති? සච්චමේතං, තත්ථ පන යං රූපාදීසු ඒකාරම්මණං චිත්තං, තං තේන විනා නප්පවත්තති, කම්මං පන කායද්වාරිකාදිභේදං වචීද්වාරාදීසු න නප්පවත්තතීති ඉමස්ස විසේසස්ස ජෝතනත්ථං පාළියං ආරම්මණමේව ගහිතං, ද්වාරං න ගහිතන්ති ඉමමත්ථං දස්සේති **"ආරම්මණමේව නිබද්ධ"**න්තිආදිනා. **වචීද්වාරේ උප්පජ්ජමානම්පි** පාණාතිපාතාදීති අත්ථෝ.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 01 කාමාවචරකුසලපද භාජනීය වණ්ණනා යටතේ)]**

**ඒවං** මෙසේ **ඤාණසම්පයුත්තං හුත්වා** ඤාණසම්ප්‍රයුක්ත වී **උප්පන්නඤ්චේතං** උපන්නා වූ චිත්තය **අසඞ්ඛාරේන අප්පයෝගේන** තමාගේ හෝ අනුන්ගේ හෝ උත්සාහයක් නොවීමෙන් **අනුපායචින්තනාය** උපාය නොසිතීමෙන් **උප්පන්නත්තා**

උපන් බැවින් **අසඞ්ඛාරං නාම ජාතං** අසංස්කාරව හටගත්තේ නම් වෙයි **රජනීයවණ්ණාරම්මණං හුත්වා (ගහෙත්වා)** ඇලෙන සුළු වර්ණාරම්මණයක් ගෙන **උප්පජ්ජමානං තං ඉදං (චිත්තං)** උපදින්නා වූ ඒ මේ චිත්තය **දානමයං වා හෝති** දානයෙන් හෝ වෙයි **සීලමයං වා (හෝති)** සීලයෙන් හෝ වෙයි **භාවනාමයං වා(හෝති)** භාවනාවෙන් හෝ වෙයි යන **තිවිධේන නියමේන ඒව** තෙවැදෑරුම් නියමයෙන්ම **උප්පජ්ජති** උපදී.

**කථං?** කෙසේද? **හි** විස්තර කෙරෙමි **යදා** යම්කලෙක **නීලපීතලෝහිතෝදාතේසු පුප්ඵාදීසු** නිල් කහ රතු සුදු යන මල් අතුරින් **අඤ්ඤතරං ලභිත්වා** එක්තරා මලක් ලැබ **වණ්ණවසේන** වර්ණ වශයෙන් **ආභුජිත්වා** සලකා **මය්හං** මගේ **වණ්ණදානං ඉති** වර්ණ දානයයි **බුද්ධරතනාදීනි** තෙරුවනට **පූජේති** පූජාකරයි ද **තදා** එකල්හි (**තං චිත්තං** ඒ සිත) **දානමයං හෝති** දානයෙන් උපන්නේ වෙයි **තත්‍ර** එහි **ඉදං වත්ථු** මේ උදාහරණ කථා වස්තුවයි **භාණ්ඩාගාරිකසඞ්ඝමිත්තෝ කිර** භාණ්ඩාගාරික සඞ්ඝමිත්ත තෙම වනාහි **ඒකං සුවණ්ණඛචිතං වත්ථං** රන් ඔබ්බවනලද එක් වස්ත්‍රයක් **ලභිත්වා** ලැබ **ඉදම්පි වත්ථං** මේ වස්ත්‍රය ද **සුවණ්ණවණ්ණං** රන්වන්ය **සම්මාසම්බුද්ධෝපි** සම්මාසම්බුදුරජාණන් වහන්සේ ද **සුවණ්ණවණ්ණෝ** රන්වන්ය **සුවණ්ණවණ්ණං වත්ථං** රන්වන් වස්ත්‍රය **සුවණ්ණවණ්ණස්සේව** රන්වන් වූ බුදුරජාණන් වහන්සේටම **අනුච්ඡවිකං** සුදුසුය **අම්හාකඤ්ච** අපට ද **වණ්ණදානං** වර්ණ දානයක් **භවිස්සතීති** වන්නේ යැයි **මහාචේතියේ** මහා චේතියෙහි **ආරෝපේසි** නැංවීය **ඒවරූපේ කාලේ** මෙබඳු කාලයෙහි (**තං චිත්තං** ඒ සිත) **දානමයං හෝතීති** දානයෙන් උපන්නේ වේ යැයි **වේදිතබ්බං** දතයුතුයි **පන** එයින් අන්‍ය අර්ථයක් කියමි **යදා** යම්කලෙක **තථාරූපමේව** එබඳුම **දෙය්‍යධම්මං ලභිත්වා** දියයුතු වස්තුවක් ලැබ (**දානං නාම** දානය නම්) **මය්හං** මගේ **කුලවංසෝ** කුලවංසයයි **කුලතන්ති** කුල පරම්පරාවයි **කුලප්පවේණී** කුල ප්‍රවේණිය **ඒසා** මෙයයි **ඒතං (දානං)** මේ දානය **කුලවත්තං ඉති** කුල චාරිත්‍රයක් යැයි **බුද්ධරතනාදීනි** තෙරුවනට **පූජේති** පූජාකරයි ද **තදා** එකල්හි (**තං චිත්තං** ඒ සිත) **සීලමයං හෝති** සීලයෙන් උපන්නේ වෙයි **පන** එයින් අන්‍ය අර්ථයක් කියමි **යදා** යම්කලෙක **තාදිසේනේව වත්ථුනා** එබඳුම වස්තුවකින් **රතනත්තයස්ස** තෙරුවනට **පූජං කත්වා** පූජා කොට **අයං වණ්ණෝ** මේ වර්ණය **ඛයං ගච්ඡිස්සති** ක්ෂය බවට යන්නේය **වයං ගච්ඡිස්සතීති** ව්‍යය බවට යන්නේයයි **ඛයවයං පට්ඨපේති** ක්ෂය ව්‍යය පිහිටුවයි **තදා** එකල්හි (**තං චිත්තං** ඒ සිත) **භාවනාමයං හෝති** භාවනාවෙන් උපන්නේ වෙයි. (කුල වංසාදී වශයෙන් දැක්වීම උදාහරණයක් පමණි. තමා සමාදන් වූ වතක් වශයෙන් ද සත්පුරුෂයන්ගේ වතක් වශයෙන් ද ගාම ජනපද වාසීන්ගේ වතක් යැයි සලකා දන් දීම ද සීලමය කුසලයක් වෙයි. එහෙයින් මූලටීකායෙහි "**කුලවංසාදිවසේනා**ති උදාහරණමත්තමේවේතං. අත්තනා සමාදින්නවත්තවසේන සප්පුරිසවත්තගාමජනපදවත්තාදිවසේන ච චාරිත්තසීලතා වේදිතබ්බා" යි කියනලදි)

**දානමයං පන හුත්වා වත්තමානම්පි** දානමය වී පවත්නා කර්මය ද වනාහි **යදා** යම්කලෙක **තීණි රතනානි** තුනුරුවණට **සහත්ථේන** සියතින් **පූජෙන්තස්ස** පූජාකරන්නහුට **පවත්තන්ත** පවතිත් ද **තදා** සියතින් පුදන කල්හි **කායකම්මං හෝති** කාය කර්මයක් වෙයි **යදා** යම්කලෙක **තීණි රතනානි** තුනුරුවණ **පූජෙන්තෝ** පුදනුයේ **පුත්තදාරදාසකම්මකාරපෝරිසාදයෝපි** අඹුදරු දැසි කම්කරු පුරුෂාදීන් ද **ආණාපෙත්වා** අණ කරවා **පූජාපේති** පූජාකරවයි ද **තදා** එකල්හි **වචීකම්මං හෝති** වචී කර්මයක් වෙයි **යදා** යම්කලෙක **වුත්තප්පකාරං** කියනලද ආකාරවූ **තදේව විජ්ජමානකවත්ථුං ආරබ්භ** විද්‍යමාන වූ එම වස්තුවම අරබයා **වණ්ණදානං** වර්ණ

දනයක් **දස්සාමි ඉති** දෙන්නෙමි යැයි **චින්තේති** සිතයි ද **තදා** එකල්හි **මනෝකම්මං හෝති** මනෝ කර්මයක් වෙයි **විනයපරියායං පත්වා හි** විනය පර්‍යායට පැමිණ වනාහි **දස්සාමි කරිස්සාමි ඉති** දෙන්නෙමි කරන්නෙමි යැයි **වාචා භින්නා හෝති ඉති** වාග්භේදය වෙයි යන **ඉමිනා ලක්ඛණේන** මේ ලක්‍ෂණයෙන් **දානං නාම හෝති** දනය නම් වෙයි **අභිධම්මපරියායං පත්වා පන** අභිධර්ම පර්‍යායට පැමිණ වනාහි **විජ්ජමානක වත්ථුං ආරබ්භ** පවත්නා වස්තුවක් අරබයා **දස්සාමි ඉති** දෙන්නෙමි යැයි **මනසා** සිතින් **චින්තිතකාලතෝ පට්ඨාය** සිතනලද කාලයේ පටන් **කුසලං හෝති** කුසල් වෙයි **අපරභාගේ** පසු කාලයෙහි **කායේන වා වාචාය වා** කයෙන් හෝ වචනයෙන් හෝ **කත්තබ්බං** කළයුත්තක් **කරිස්සති ඉති** කරන්නේ යැයි **වුත්තං** කියනලදි **ඒවං** මෙසේ **දානමයං (කුසලං)** දනමය කුසලය **කායවචීමනෝකම්මවසේනේව** කාය වාග් මනෝ කර්ම වශයෙන්ම **තිවිධං හෝති** තෙවැදෑරුම් වෙයි.

**යදා පන** යම්කලෙක වනාහි **වුත්තප්පකාරං** කියනලද ආකාර ඇති **තං වත්ථුං ලභිත්වා** ඒ වස්තුවක් ලැබ **කුලවංසාදිවසේන** කුලවංසාදී වශයෙන්ම **සහත්ථා** සියතින් **රතනත්තයං** තුනුරුවණට **පූජේති** පූජාකරයි ද **තදා** එකල්හි **සීලමයං (කුසලං හෝති)** සීලමය කුසලයක් වෙයි **කායකම්මං හෝති** කාය කර්මයක් ද වෙයි **යදා** යම්කලෙක **කුලවංසාදිවසේනේව** කුලවංසාදී වශයෙන්ම **පුත්තදාරාදයෝ** අඹු දරුවෝ **ආණාපෙත්වා** අණ කරවා **පූජාපේති** පූජාකරවයි ද **තදා** එකල්හි **වචීකම්මං හෝති** වාචී කර්මයක් වෙයි **යදා** යම්කලෙක **මය්හං** මගේ **කුලවංසෝ** කුලවංසය **කුලතන්ති** කුල පරම්පරාව **කුලප්පවේණි** කුල ප්‍රවේණිය **ඒසා** මෙයයි **ඒතං (දානං)** මේ දනය **කුලවත්තං ඉති** කුල චාරිත්‍රයක් යැයි **විජ්ජමානකවත්ථුං ආරබ්භ** පවතින්නා වූ වස්තුවක් අරබයා **වණ්ණදානං දස්සාමි ඉති** වර්ණ දනයක් දෙන්නෙමි යැයි **චින්තේති** සිතයි ද **තදා** එකල්හි **මනෝකම්මං හෝති** මනෝ කර්මයක් වෙයි **ඒවං** මෙසේ **සීලමයං (කුසලං)** සීලමය කුසලය **කායවචීමනෝකම්මවසේන** කාය වාග් මනෝ කර්ම වශයෙන් **තිවිධං හෝති** තෙවැදෑරුම් වෙයි.

**යදා පන** යම්කලෙක වනාහි **වුත්තප්පකාරං** කියනලද ආකාර ඇති **තං වත්ථුං ලභිත්වා** ඒ වස්තුවක් ලැබ **තීණි රතනානි පූජෙත්වා** තුනුරුවණට පූජාකොට **චඞ්කමන්තෝ** සක්මන් කරනුයේ **ඛයවයං** ක්‍ෂය ව්‍යය **පට්ඨපේති** පිහිටුවයි **තදා** එකල්හි **භාවනාමයං (කුසලං හෝති)** භාවනාමය කුසලයක් වෙයි **කායකම්මං හෝති** කාය කර්මයක් වෙයි **වාචාය සම්මසනං** වචනයෙන් සම්මර්ශණය **පට්ඨපෙන්තස්ස** පිහිටුවන්නහුට **වචීකම්මං හෝති** වචී කර්මයක් වෙයි **කායඞ්ගවාචාඞ්ගානි** කායඞ්ග වාචාඞ්ග **අචෝපෙත්වා** නොසොලවා **මනසාව** මනසින්ම **සම්මසනං** සම්මර්ශණය **පට්ඨපෙන්තස්ස** පිහිටුවන්නහුට **මනෝකම්මං හෝති** මනෝ කර්මයක් වෙයි **ඒවං** මෙසේ **භාවනාමයං (කුසලං)** භාවනාමය කුසලය **කායවචීමනෝකම්මවසේන** කාය වාග් මනෝ කර්ම වශයෙන් **තිවිධං හෝති** තෙවැදෑරුම් වෙයි **ඒවං** මෙසේ **ඒතං රූපාරම්මණං** ඒ රූපය අරමුණු කරනලද **කුසලං** කුසල චිත්තය **තිවිධපුඤ්ඤකිරියවත්ථුවසේන** තෙවැදෑරුම් පුණ්‍යක්‍රියාවස්තු වශයෙන් **නවහි කම්මද්වාරේහි** නව වැදෑරුම් වූ කම්ම ද්වාරයන්ගෙන් **භාජෙත්වා** බෙදා **ධම්මරාජා** දම්රජු වූ බුදුරජාණන් වහන්සේ **දස්සේසි** දැක්වූ සේක **සද්දාරම්මණාදීසුපි** ශබ්දාරම්මණාදීන්හි ද **ඒසේව නයෝ** මේ ක්‍රමයයි.

**භේරිසද්දාදීසු හි** බෙර ශබ්දාදීන් අතුරින් වනාහි **රජනීයසද්දං** සිත් අලවන ශබ්දයක් **ආරම්මණං කත්වා** අරමුණු කොට **හෙට්ඨා වුත්තනයේනේව** යට කියනලද

ක්‍රමයෙන්ම **තීහි නියමේහි** දාන සීල භාවනා යන තුන් නියමයන්ගෙන් **ඒතං කුසලං** මේ කුසල චිත්තය **උප්පජ්ජති** උපදියි **තත්‍ථ** එහි **සද්දං** ශබ්දය **කන්දමූලං විය** අලමුල් මෙන් **උප්පාටෙත්‍වා ච** උගුලුවා ද **නීලුප්පලහත්ථකං විය** නිල්මහනෙල් මිටක් මෙන් **හත්ථේ ඨපෙත්‍වා** අත්ලෙහි තබා **දාතුං නාම** දෙන්නට නම් **න සක්කා** නොහැක්කාහ **සවත්ථුකං පන කත්‍වා** වස්තුවක් සහිත කොට **දෙන්තෝ** දෙනුයේ **සද්දදානං නාම** ශබ්ද දානය නම් **දේති** දෙයි **තස්මා** එබැවින් **යදා** යම්කලෙක **සද්දදානං දස්සාමි ඉති** ශබ්ද දානය දෙන්නෙමි යැයි **භේරිමුදිඞ්ගාදීසු** බෙර මිහිඟුබෙර ආදිය අතුරින් **අඤ්ඤතරතූරියේන** එක්තරා තූර්යයකින් **තිණ්ණං රතනානං** තුනුරුවණට **උපහාරං කරෝති** උපහාර කරයි ද **මේ** මගේ **සද්දදානං ඉති** ශබ්ද දානය යැයි **භේරිආදීනි** බෙර ආදිය **ඨපාපේති** තබවයි ද **ධම්මකථිකභික්ඛූනං** ධර්මකථික භික්‍ෂූන්හට **සරභේසජ්ජතේලඵාණිතාදීනි** කණ්ඨ ස්වරය පිණිස වූ තෙල් බෙහෙත් පැණි ආදිය **දේති** දෙයි ද **ධම්මසවනං** ධර්මශ්‍රවණයට **ඝෝසේති** ඝෝෂා කරයි ද **සරභඤ්ඤං භණති** මිහිරි හඬින් කියයි ද **ධම්මකථං කථේති** දහම් කථා කියයි ද **උපනිසින්නකකථං (කථේති)** ළඟහුන් අයට කථා කියයි ද **අනුමෝදනකථං කරෝති** අනුමෝදනා කථා කරයි ද **තදා** එකල්හි **දානමයංයේව හෝති** දානමය කුසලයක්ම වෙයි **යදා** යම්කලෙක **ඒතදේව විධානං** මේ විධානයම **කුලවංසාදිවසේන** කුලවංසාදී වශයෙන් (**වා** හෝ) **වත්තවසේන** චාරිත්‍ර වශයෙන් **කරෝති** කරයි ද **තදා** එකල්හි **සීලමයං හෝති** සීලමය කුසලයක් වෙයි **යදා** යම්කලෙක **සබ්බම්පේතං කත්‍වා** මේ සියල්ල කොට **අයං ඒත්තකෝ සද්දෝ** මේ මෙතෙක් වූ ශබ්දය **බ්‍රහ්මලෝකප්පමාණෝපි හුත්‍වා** බ්‍රහ්මලෝක ප්‍රමාණ වීද **ඛයං ගමිස්සති** ක්‍ෂයට යන්නේය **වයං ගමිස්සති ඉති** ව්‍යයට යන්නේ යැයි **සම්මසනං** සම්මර්ශණය **පට්ඨපේති** පිහිටුවයි ද **තදා** එකල්හි **භාවනාමයං හෝති** භාවනාමය කුසලයක් වෙයි.

**තත්‍ථ** දාන සීල භාවනාමය අතුරින් **තාව** පළමුව **දානමයං** දානමය කුසලය නම් **යදා** යම්කලෙක **භේරිආදීනි** බෙර ආදිය **ගහෙත්‍වා** ගෙන **සහත්‍ථා** සියතින් **උපහාරං කරෝති** උපහාර කරයි ද **නිච්චුපහාරත්‍ථාය** නිත්‍ය උපහාරය පිණිස **ඨපෙන්තෝපි** තබනුයේ ද **සහත්‍ථා ඨපේති** සියතින් තබයි ද **මේ** මාගේ **සද්දදානං ඉති** ශබ්ද දානය යැයි **ධම්මසවනං** ධර්ම ශ්‍රවණයට **ඝෝසේතුං** ඝෝෂාකිරීම පිණිස **ගච්ඡති** යයි ද **සරභඤ්ඤං ධම්මකථං** මිහිරි හඬින් ධර්ම කථාවක් **කාතුං වා** කිරීමට හෝ **ගච්ඡති** යයි ද **තදා** එකල්හි **කායකම්මං හෝති** කාය කර්මයක් වෙයි **යදා** යම්කලෙක **තාතා** දරුවනි **ගච්ඡථ** යහු **අම්හාකං** අපගේ **සද්දදානං** ශබ්ද දානය **තිණ්ණං රතනානං** තුනුරුවනට **උපහාරං කරෝථ ඉති** උහාරය පිණිස කරහු යැයි **ආණාපේති** අණකරයි ද **සයමේව** තෙමේම **ධම්මසවණං** ධර්ම ශ්‍රවණයට **ඝෝසේති** ඝෝෂා කරයි ද **ධම්මකථං කථේති** ධර්ම කථාවක් කරයි ද **සරභඤ්ඤං භණති** මිහිරි හඬින් දේශනා කරයි ද **තදා** එකල්හි **වචීකම්මං හෝති** වචී කර්මයක් වෙයි **යදා** යම්කලෙක **කායඞ්ගවාචාඞ්ගානි** කායඞ්ග වාචඞ්ග **අචෝපෙත්‍වා** නොසොලවා **සද්දදානං දස්සාමි ඉති** ශබ්ද දානයක් දෙන්නෙමි යැයි **විජ්ජමානකවත්‍ථුං** විද්‍යමාන වස්තුවක් **මනසා පරිච්චජති** සිතින් පරිත්‍යාග කරයි ද **තදා** එකල්හි **මනෝකම්මං හෝති** මනෝ කර්මයක් වෙයි.

**සීලමයම්පි** සීලමය කුසලය වනාහි **සද්දදානං නාම** ශබ්ද දානය නම් **මය්හං** මගේ **කුලවංසෝ** කුලවංසය **කුලතන්ති** කුලපරම්පරාව **කුලප්පවේණි ඉති** කුල ප්‍රවේණියයි **භේරිආදීහි** බෙර ආදියෙන් **සහත්‍ථා** සියතින් **උපහාරං කරොන්තස්ස** උපහාර කරන්නාහට ද **භේරිආදීනි** බෙර ආදිය **සහත්‍ථා** සියතින් **චේතියඞ්ගනාදීසු**

චෛත්‍යය මළු ආදියෙහි **ඨපෙන්තස්ස** තබන්නාහට ද **ධම්මකථිකානං** ධර්ම කථිකයන්හට **සරභේසජ්ජං** කණ්ඨ ස්වරය පිණිස බෙහෙත් **සහත්ථා** සියතින් **දදන්තස්ස** දෙන්නහුට **වත්තසීසේන** වත් ශීර්ෂයෙන් **ධම්මසවනඝෝසනධම්මකථනසරභඤ්ඤභණනත්ථාය ච** ධර්ම ශ්‍රවණයය ඝෝෂාකිරීම සඳහා ද මිහිරි හඬින් ධර්මකථා කිරීම පිණිස **ගච්ඡන්තස්ස** යන්නාහට ද **කායකම්මං හෝති** කාය කර්මයක් වෙයි **සද්දදානං නාම** ශබ්ද දානය නම් **අම්හාකං** අපගේ **කුලවංසෝ** කුලවංසය **කුලතන්ති** කුල පරම්පරාව **කුලප්පවේණී** කුල ප්‍රවේණියයි **තාතා** දරුවනි **ගච්ඡථ** යහු **බුද්ධරතනාදීනං** බුද්ධරතනාදියට **උපහාරං** උපහාර **කරෝථ ඉති** කරහු යැයි **ආණාපෙන්තස්ස** අණකරන්නහුට ද **කුලවංසවසේනේව** කුලවංසය වශයෙන්ම **අත්තනා** තමා විසින් **ධම්මකථං වා** ධර්මකථාවක් හෝ **සරභඤ්ඤං වා** හඬනගා කීමක් හෝ **කරොන්තස්ස ච** කරන්නාහට ද **වචීකම්මං හෝති** වචී කර්මයක් වෙයි **සද්දදානං නාම** ශබ්ද දානය නම් **මය්හං** මගේ **කුලවංසෝ** කුලවංසයයි **සද්දදානං** ශබ්ද දානයක් **දස්සාමි ඉති** දෙන්නෙමි යැයි **කායඞ්ගවාචඞ්ගානි** කායඞ්ග වාචඞ්ග **අචෝපෙත්වා** නොසොලවා **මනසාව** සිතින්ම **විජ්ජමානකවත්ථුං** විද්‍යමාන වස්තුවක් **පරිච්චජන්තස්ස** පිරිනමන්නාහට ද **මනෝකම්මං හෝති** මනෝ කර්මයක් වෙයි ...

**භාවනාමයම්පි** භාවනාමය කුසලය ද **යදා** යම්කලෙක **චඞ්කමන්තෝ** සක්මන් කරනුයේ **සද්දේ** ශබ්දයෙහි **ඛයවයං පට්ඨපේති** ක්ෂය ව්‍යය පිහිටුවයි **තදා** එකල්හි **කායකම්මං හෝති** කාය කර්මයක් වෙයි **කායඞ්ගං පන** කායඞ්ග වනාහි **අචෝපෙත්වා** නොසොලවා **වාචාය** වචනයෙන් **සම්මසන්තස්ස** සම්මර්ශණය කරන්නාහට **වචීකම්මං හෝති** වචී කර්මයක් වෙයි **කායඞ්ගවාචඞ්ගං** කායඞ්ග වාචඞ්ග **අචෝපෙත්වා** නොසොලවා **මනසා** සිතින්ම **සද්දායතනං** ශබ්දාරම්මණය **සම්මසන්තස්ස** මෙනෙහි කරන්නාහට ද **මනෝකම්මං හෝති** මනෝ කර්මයක් වෙයි **ඒවං** මෙසේ **සද්දාරම්මණම්පි** ශබ්දාරම්මණය අරමුණු කරනලද **කුසලං** කුසල චිත්තය **තිවිධපුඤ්ඤකිරියවත්ථුවසේන** ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තු වශයෙන් **නවහි කම්මද්වාරේහි** කර්මද්වාර නවයෙන් **භාජෙත්වා** බෙදා **ධම්මරාජා** ධර්මරාජයන් වහන්සේ **දස්සේසි** දැක්වූ සේක ...

**මූලගන්ධාදීසුපි** මූලගන්ධාදිය අතුරෙන් ද **රජනීයගන්ධං** සිත් අලවන ගන්ධයක් **ආරම්මණං කත්වා** අරමුණු කොට **හෙට්ඨා වුත්තනයේනේව** යට දැක්වූ ක්‍රමයෙන්ම **තීහි නියමේහි** දාන සීල භාවනා යන නියම තුනෙන් **ඒතං කුසලං** ඒ කුසල චිත්තය **උප්පජ්ජති** උපදියි **යදා** යම්කලෙක **තත්ථ මූලගන්ධාදීසු** ඒ මූලගන්ධාදිය අතුරෙන් **යං කිඤ්චි ගන්ධං ලභිත්වා** යම්කිසි ගන්ධයක් ලැබ **ගන්ධවසේන** ගන්ධ වශයෙන් **ආභුජිත්වා** ගෙන **මය්හං** මගේ **ගන්ධදානං ඉති** ගන්ධ දානය යැයි **බුද්ධරතනාදීනි** බුද්ධ රතනාදියට **පූජේති** පූජාකරයි ද **තදා** එකල්හි **දානමයං හෝති** දානමය කුසලයක් වෙයි **ඉති** මෙසේ **සබ්බං** සියල්ල **වණ්ණදානේ** වර්ණ දානයෙහි **වුත්තනයේනේව** කියනලද ක්‍රමයෙන්ම **විත්ථාරතෝ** විස්තර වශයෙන් **වේදිතබ්බං** දතයුතුයි **ඒවං** මෙසේ **ගන්ධාරම්මණම්පි** ගන්ධාරම්මණය අරමුණු කරනලද **කුසලං** කුසල චිත්තය **තිවිධපුඤ්ඤකිරියවත්ථුවසේන** ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තු වශයෙන් **නවහි කම්මද්වාරේහි** කර්මද්වාර නවයෙන් **භාජෙත්වා** බෙදා **ධම්මරාජා** ධර්මරාජයන් වහන්සේ **දස්සේසි** දැක්වූ සේක ...

**මූලරසාදීසුපි** මූලරසාදිය අතුරෙන් ද **රජනීයරසං** සිත් අලවන රසයක් **ආරම්මණං කත්වා** අරමුණු කොට **හෙට්ඨා වුත්තනයේනේව** යට දැක්වූ ක්‍රමයෙන්ම **තීහි නියමේහි** දන සීල භාවනා යන නියම තුනෙන් **ඒතං කුසලං** ඒ කුසල චිත්තය **උප්පජ්ජති** උපදියි **යදා** යම්කලෙක **තත්‍ථ මූලරසාදීසු** ඒ මූලරසාදිය අතුරෙන් **යං කිඤ්චි රජනීයං රසවත්ථුං ලභිත්වා** යම්කිසි සිත් අලවන රස වස්තුවක් ලැබ **රසවසේන** රස වශයෙන් **ආභුජිත්වා** ගෙන **මය්හං** මගේ **රසදානං ඉති** රස දනය යැයි **දේති** දෙයි ද **පරිච්චජති** පරිත්‍යාග කරයි ද **තදා** එකල්හි **දානමයං හෝති** දානමය කුසලයක් වෙයි **ඉති** මෙසේ **සබ්බං** සියල්ල **වණ්ණදානේ** වර්ණ දනයෙහි **වුත්තනයේනේව** කියනලද ක්‍රමයෙන්ම **විත්ථාරතෝ** විස්තර වශයෙන් **වේදිතබ්බං** දතයුතුයි **එත්‍ථ** මෙහි **සීලමයේ පන** සීලමය කුසලයෙහි වනාහි **සඞ්ඝස්ස** අදත්වා සඞ්ඝයාට නොදී **පරිභුඤ්ජනං නාම** පරිභෝග කිරීම නම් **අම්හාකං** අපගේ **න ආචිණ්ණං ඉති** පුරුදු නොකරනලද්දකි යැයි **ද්වාදසන්නං භික්ඛුසහස්සානං** දෙළොස් දහසක් භික්‍ෂූන්ට **දාපෙත්වා** දෙවා **සාදුරසං** මනා වූ රසයක් **පරිභුත්තස්ස** පරිභෝග කළ **දුට්ඨගාමිණීඅභයරඤ්ඤෝ** දුටුගැමුණු රජුගේ **වත්ථුං ආදිං කත්වා** වස්තුව මුල් කොට **මහාඅට්ඨකථායං** මහාඅර්ථකථායෙහි **වත්ථූනි ආගතානි** කථා වස්තූන් එන ලද්දේ වෙයි **අයමේව විසේසෝ** විශේෂය මෙයමය **ඒවං** මෙසේ **රසාරම්මණම්පි** රසාරම්මණයක් අරමුණු කරණලද **කුසලං** කුසල චිත්තය **තිවිධපුඤ්ඤකිරියවත්‍ථුවසේන** ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තු වශයෙන් **නවහි කම්මද්වාරේහි** කර්මද්වාර නවයෙන් **භාජෙත්වා** බෙද **ධම්මරාජා** ධර්මරාජයන් වහන්සේ **දස්සේසි** දැක්වූ සේක.

**ඵොට්ඨබ්බාරම්මණේපි** ස්පර්ශ අරමුණෙහි ද **පඨවිධාතුතේජෝධාතු-වායෝධාතු ඉති** පඨවිධාතු තේජෝධාතු වායෝධාතු යන **තීනි මහාභූතානි** මහාභූතරූප තිදෙන **ඵොට්ඨබ්බාරම්මණං නාම** ඵොට්ඨබ්බාරම්මණ නම් **ඉමස්මිං ඨානේ** මෙතැන්හි **ඒතේසං වසේන** ඔහුන්ගේ වශයෙන් **යෝජනං අකත්වා** යෙදීම නොකොට **මඤ්චපීඨාදිවසේන** ඇඳ පුටු ආදීන්ගේ වශයෙන් **කාතබ්බා** කළයුත්තාහ **යදා හි** යම්කලෙක වනාහි **මඤ්චපීඨාදීසු** ඇඳ පුටු ආදීන් අතුරෙන් **යං කිඤ්චි** යම්කිසි **රජනීයං ඵොට්ඨබ්බවත්ථුං** සැප එළවන ස්පර්ශ වස්තුවක් **ලභිත්වා** ලැබ **ඵොට්ඨබ්බවසේන ආභුජිත්වා** ස්පර්ශ වශයෙන් ගෙන **මය්හං** මගේ **ඵොට්ඨබ්බදානං ඉති** ස්පර්ශ දනය යැයි **දේති** දෙයි ද **පරිච්චජති** පරිත්‍යාග කරයි ද **තදා** එකල්හි **දානමයං හෝති** දානමය කුසලයක් වෙයි **ඉති** මෙසේ **සබ්බං** සියල්ල **වණ්ණදානේ** වර්ණ දනයෙහි **වුත්තනයේනේව** කියනලද ක්‍රමයෙන්ම **විත්ථාරතෝ** විස්තර වශයෙන් **වේදිතබ්බං** දතයුතුයි **ඒවං** මෙසේ **ඵොට්ඨබ්බාරම්මණම්පි** ඵොට්ඨබ්බාරම්මණය අරමුණු කරනලද **කුසලං** කුසල චිත්තය **තිවිධපුඤ්ඤකිරියවත්‍ථුවසේන** ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තු වශයෙන් **නවහි කම්මද්වාරේහි** කර්මද්වාර නවයෙන් **භාජෙත්වා** බෙද **ධම්මරාජා** ධර්මරාජයන් වහන්සේ **දස්සේසි** දැක්වූ සේක.

**ධම්මාරම්මණේ** ධම්මාරම්මණයෙහි **ඡ අජ්ඣත්තිකානි ආයතනානි** ආධ්‍යාත්මික ආයතන සය ද **තීණි ලක්ඛණානි** ලක්‍ෂණ රූප තුන ද **තයෝ අරූපිනෝ ඛන්ධා** අරූප ස්කන්ධ තුන ද **පන්නරස සුඛුමරූපානි** සූක්‍ෂම රූප පසළොස ද **නිබ්බානපඤ්ඤත්ති ඉති** නිර්වාණ ප්‍රඥප්ති යන **ධම්මායතනේ** ධම්මාරම්මණයෙහි **පරියාපන්නා ච** ඇතුළත් වූද **අපරියාපන්නා ච** ඇතුළත් නොවූ ද **ඉමේ ධම්මා** මේ ධර්මයෝ **ධම්මාරම්මණං නාම** ධම්මාරම්මණ නම් **ඉමස්මිං ඨානේ පන** මේ ස්ථානයෙහි වනාහි **ඒතේසං වසේන** ඔහුන්ගේ වශයෙන් **යෝජනං අකත්වා** යෙදීම

නොකොට **ඕජදනපානදනජීවිතදනවසේන** ඕජාදන පානදන ජීවිතදන වශයෙන් **කාතබ්බං** කළයුතුයි **ඕජාදීසු හි** ඕජාදන අතුරෙන් වනාහි **රජනීයං ධම්මාරම්මණං** සිත් අලවන ධම්මාරම්මණයක් **ආරම්මණං කත්වා** අරමුණු කොට **හෙට්ඨා වුත්තනයේනේව** යට කියනලද ක්‍රමයෙන්ම **තීහි නියමේහි** නියම තුනෙන් **ඒතං කුසලං** මේ කුසල චිත්තය **උප්පජ්ජති** උපදියි.

**තත්‍ථ** ධම්මාරම්මණ අතුරෙන් **යද** යම්කලෙක **මය්හං** මගේ **ඕජදනං ඉති** ඕජාදනය යැයි **සප්පිනවනීතාදීනි දේති** ගිතෙල් වෙඬරු ආදිය දෙයි ද **පානදනං ඉති** පානදන යැයි **අට්ඨපානානි දේති** අෂ්ටපාන දෙයි ද **ජීවිතදනං ඉති** ජීවිතදනය යැයි **සලාකභත්තසඞ්ඝභත්තාදීනි දේති** සලාකබත සඟබත් ආදිය දෙයි ද **අඵාසුකානං භික්ඛූනං** ගිලන් භික්ෂූන්ට **භේසජ්ජං දේති** බෙහෙත් දෙයි ද **වෙජ්ජං පච්චුපට්ඨාපේති** වෙදෙකු වෙත පමුණුවයි ද **ජාලං ඵාලාපේති** දැල් ඉරාදමවයි නොහොත් විවෘත කරවයි ද **කුමීනං විද්ධංසාපේති** කෙමන් විනාශ කරවයි ද **සකුණපඤ්ජරං විද්ධංසාපේති** කුරුල්ලන් සිරකර තබන කූඩු විනාශ කරවයි ද **බන්ධනමොක්ඛං කාරාපේති** බැම්වලින් මිදීම කරවයි ද **මා ඝාතභේරින් චරාපේති** මැරීම තහනම් කරන බෙර හසුරුවයි ද **අඤ්ඤම්පි** අන්‍යවූ ද **ජීවිතපරිත්තාණත්ථං** ජීවිත ආරක්‍ෂා කිරීම පිණිස **ඒවරූපානි කම්මානි කරෝති** මෙවැනි ක්‍රියා කරයි ද **තද** එකල්හි **දනමයං** දනමය කුසලයක් වෙයි **යද පන** යම්කලෙක වනාහි **ඕජදනපානදනජීවිතදනානි** ඕජාදන පානදන ජීවිතදනයෝ **මය්හං** මගේ **කුලවංසෝ** කුලවංසය **කුලතන්ති** කුල පරම්පරාව **කුලප්පවේණී ඉති** කුල ප්‍රවේණිය යැයි **වත්තසීසේන** වත් ශිර්ෂයෙන් **ඕජදනාදීනි** ඕජාදනාදිය **පවත්තේති** පවත්වයි ද **තද** එකල්හි **සීලමයං හෝති** සීලමය කුසලයක් වෙයි **යද** යම්කලෙක **ධම්මාරම්මණස්මිං** ධම්මාරම්මණයෙහි **ඛයවයං පට්ඨපේති** ක්‍ෂය ව්‍යය පිහිටුවයි ද **තද** එකල්හි **භාවනාමයං හෝති** භාවනාමය කුසලයක් වෙයි.

**පන (තථාපි)** එසේ වී නමුත් **දනමයං හුත්වා පවත්තමානම්පි** දනමය වී පවත්නා කර්මයද **යද** යම්කලෙක **ඕජදනපානදනජීවිතදනානි** ඕජාදන පානදන ජීවිතදනයන් **සහත්ථා දේති** සියතින් දෙයි ද **තද** එකල්හි **කායකම්මං හෝති** කාය කර්මයක් වෙයි **යද** යම්කලෙක **පුත්තදරාදයෝ** අඹුදරුවන් **ආණාපෙත්වා** අණකරවා **දපේති** දෙවවයි ද **තද** එකල්හි **වචීකම්මං හෝති** වචී කර්මයක් වෙයි **යද** යම්කලෙක **කායඞ්ගවාචාඞ්ගානි** කායඞ්ග වාචාඞ්ගයන් **අචෝපෙත්වා** නොසොලවා **ඕජදනපානදනජීවිතදනවසේන** ඕජාදන පානදන ජීවිතදන වශයෙන් **විජ්ජමානකවත්ථුං** විද්‍යමාන වස්තුවක් **දස්සාමි ඉති** දෙන්නෙමි යැයි **මනසා** සිතින් **චින්තේති** සිතයි ද **තද** එකල්හි **මනෝකම්මං හෝති** මනෝ කර්මයක් වෙයි.

**යද පන** යම්කලෙක වනාහි **වුත්තප්පකාරං** කියනලද ආකාර ඇති **විජ්ජමානකවත්ථුං** විද්‍යමාන වස්තුවක් **කුලවංසාදිවසේන** කුලවංසාදී වශයෙන් **සහත්ථා දේති** සියතින් දෙයි ද **තද** එකල්හි **සීලමයං කායකම්මං හෝති** සීලමය කාය කර්මයක් වෙයි **යද** යම්කලෙක **කුලවංසාදිවසේනේව** කුලවංසාදී වශයෙන්ම **පුත්තදරාදයෝ** අඹුදරුවන් **ආණාපෙත්වා** අණකරවා **දපේති** දෙවවයි ද **තද** එකල්හි **වචීකම්මං හෝති** වචී කර්මයක් වෙයි **යද** යම්කලෙක **කුලවංසාදිවසේනේව** කුලවංසාදී වශයෙන්ම **වුත්තප්පකාරං** කියනලද ආකාර ඇති **විජ්ජමානකවත්ථුං** විද්‍යමාන වස්තුවක් **දස්සාමි ඉති** දෙන්නෙමි යැයි **මනසා** සිතින් **චින්තේති** සිතයි ද **තද** එකල්හි **මනෝකම්මං හෝති** මනෝ කර්මයක් වෙයි.

**චඞ්කමිත්වා** සක්මන් කොට නොහොත් සක්මන් කරමින් **ධම්මාරම්මණේ** ධම්මාරම්මණයෙහි **ඛයවයං** ක්ෂය ව්‍යය **පට්ඨපෙන්තස්ස පන** පිහිටුවන්නාහට වනාහි **භාවනාමයං කායකම්මං හෝති** භාවනාමය කාය කර්මයක් වෙයි **කායඞ්ගං අචෝපෙත්වා** කායඞ්ග නොසොලවා **වාචාය** වචනයෙන් **ඛයවයං** ක්ෂය ව්‍යය **පට්ඨපෙන්තස්ස** පිහිටුවන්නාහට **වචීකම්මං හෝති** වචී කර්මයක් වෙයි **කායඞ්ගවාචාඞ්ගානි** කායඞ්ග වාචාඞ්ගයන් **අචෝපෙත්වා** නොසොලවා **මනසාව** සිතින්ම **ධම්මාරම්මණේ** ධම්මාරම්මණයෙහි **ඛයවයං** ක්ෂය ව්‍යය **පට්ඨපෙන්තස්ස** පිහිටුවන්නාහට **මනෝකම්මං හෝති** මනෝ කර්මයක් වෙයි **ඒවං** මෙසේ **භාවනාමයං** භාවනාමය කුසලය **කායවචීමනෝකම්මවසේන** කාය කර්ම වචී කර්ම මනෝ කර්ම වශයෙන් **තිවිධං හෝති** තෙවැදෑරුම් වෙයි **ඒවං** මෙසේ **ඒතං රූපාරම්මණං** ඒ රූපය අරමුණු කරනලද **කුසලං** කුසල චිත්තය **තිවිධපුඤ්ඤකිරියවත්ථුවසේන** තෙවැදෑරුම් පුණ්‍යක්‍රියාවස්තු වශයෙන් **නවහි කම්මද්වාරේහි** නව වැදෑරුම් වූ කම්ම ද්වාරයන්ගෙන් **භාජෙත්වා** බෙදා **ධම්මරාජා** දම්රජ් වූ බුදුරජාණන් වහන්සේ **දස්සේසි** දැක්වූ සේක.

**ඒවං** මෙසේ **ඉදං චිත්තං** මේ සිත **නානාවත්ථූසු** නොයෙක් නොයෙක් වස්තූන්හි **නානාරම්මණවසේන** නොයෙක් නොයෙක් ආරම්මණ වශයෙන් **දීපිතං** දක්වනලදී **ඉදං පන (චිත්තං)** මේ සිත වනාහි **ඒකවත්ථුස්මිම්පි** එක් වස්තුවෙක්හි ද **නානාරම්මණවසේන** නොයෙක් නොයෙක් අරමුණු වශයෙන් **ලබ්භතියේව** ලැබෙයිමය **කථං?** කෙසේද යත්? **හි** විස්තර කෙරෙම් **චතූසු පච්චයේසු** සිව්පසය අතුරෙන් **චීවරේ** සිවුරෙහි **ඡ ආරම්මණානි** අරමුණු සයක් **ලබ්භන්ති** ලැබෙත් **හි** ඒ එසේමැයි **නවරත්තස්ස චීවරස්ස** අභිනවයෙන් පඬු පෙවූ සිවුරෙහි **වණ්ණෝ** වර්ණය **මනාපෝ** මනාපවූයේ ද **දස්සනීයෝ** දර්ශනීය වූයේ ද **හෝති** වෙයි **ඉදං වණ්ණාරම්මණං** මෙය වර්ණාරම්මණයයි **පරිභෝගකාලේ** පරිභෝග කරන කල්හි **පටපටසද්දං කරෝති** පට පට යන ශබ්දයක් කෙරෙයි **ඉදං සද්දාරම්මණං** මෙය ශබ්දාරම්මණයයි **තත්‍ථ** ඒ සිවුරෙහි **යෝ කාළකච්ඡකාදිගන්ධෝ** කළුවැල් ගස් ආදියක යම් ගන්ධයක් වේද **ඉදං ගන්ධාරම්මණං** මෙය ගන්ධාරම්මණයයි **රසාරම්මණං පන** රසාරම්මණය වනාහි **පරිභෝගරසවසේන** පරිභෝග රස වශයෙන් **කථිතං** කියනලදී **තත්‍ථ** එහි **යා සුඛසම්ඵස්සතා** යම් සුව පහස් බවක් වේද **ඉදං ඵොට්ඨබ්බාරම්මණං** මෙය ඵොට්ඨබ්බාරම්මණයයි **චීවරං පටිච්ච** සිවුර නිසා **උප්පන්නා සුඛා වේදනා** උපන් සැප වේදනාවක් වේද **(තං** එය**) ධම්මාරම්මණං** ධම්මාරම්මණයයි **පිණ්ඩපාතේ** පිණ්ඩපාතයෙහි **රසාරම්මණං** රසාරම්මණය **නිප්පරියායේනේව** නිෂ්පර්‍යායයෙන්ම (නිරායාශයෙන්ම) **ලබ්භති** ලැබෙයි **ඒවං** මෙසේ **චතූසු පච්චයේසු** සිව්පසයෙහි **නානාරම්මණවසේන** නොයෙක් නොයෙක් අරමුණු වශයෙන් **යෝජනං කත්වා** යෙදීම කොට **දානමයාදිභේදෝ** දානමය ආදී භේදය **වේදිතබ්බෝ** දතයුතුයි.

**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

තත්ථ **කාමාවචරං** සෝමනස්සුපෙක්ඛාඤාණසඞ්ඛාරභේදතෝ අට්ඨවිධං. සෙය්‍යථිදං; සෝමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරං සසඞ්ඛාරඤ්ච, තථා ඤාණවිප්පයුත්තං. උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරං සසඞ්ඛාරඤ්ච, තථා ඤාණවිප්පයුත්තං.

යදා හි දෙය්‍යධම්මපටිග්ගාහකාදිසම්පත්තිං අඤ්ඤං වා සෝමනස්සහේතුං ආගම්ම හට්ඨපහට්ඨෝ "අත්ථි දින්න"න්තිආදිනයප්පවත්තං (ම. නි. 1.441) සම්මාදිට්ඨිං

පුරක්ඛත්වා අසංසීදන්තෝ අනුස්සාහිතෝ පරේහි දානාදීනි පුඤ්ඤානි කරෝති, තදස්ස සෝමනස්සසහගතං ඤාණසම්පයුත්තං චිත්තං අසඞ්ඛාරං හෝති. යදා පන වුත්තනයේන හට්ඨතුට්ඨෝ සම්මාදිට්ඨිං පුරක්ඛත්වා අමුත්තචාගතාදිවසේන සංසීදමානෝ වා පරේහි වා උස්සාහිතෝ කරෝති, තදස්ස තදේව චිත්තං සසඞ්ඛාරං හෝති. ඉමස්මිඤ්හි අත්ථේ සඞ්ඛාරෝති ඒතං අත්තනෝ වා පරේසං වා වසේන පවත්තස්ස පුබ්බපයෝගස්සාධිවචනං. යදා පන ඤාතිජනස්ස පටිපත්තිදස්සනේන ජාතපරිචයා බාලදාරකා භික්ඛූ දිස්වා සෝමනස්සජාතා සහසා කිඤ්චිදේව හත්ථගතං දදන්ති වා වන්දන්ති වා, තදා තතියං චිත්තං උප්පජ්ජති. යදා පන "දේථ වන්දථා"ති ඤාතීහි උස්සාහිතා ඒවං පටිපජ්ජන්ති, තදා චතුත්ථං චිත්තං උප්පජ්ජති. යදා පන දෙය්‍යධම්මපටිග්ගාහකාදීනං අසම්පත්තිං අඤ්ඤේසං වා සෝමනස්සහේතූනං අභාවං ආගම්ම චතූසුපි විකප්පේසු සෝමනස්සරහිතා හොන්ති, තදා සේසානි චත්තාරි උපෙක්ඛාසහගතානි උප්පජ්ජන්තීති. ඒවං සෝමනස්සුපෙක්ඛාඤාණසඞ්ඛාරභේදතෝ අට්ඨවිධං කාමාවචරකුසලං වේදිතබ්බං.

**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 452 යටතේ); විසුද්ධිමග්ග අටුවා 338-339 පිටු (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය විඤ්ඤාණස්කන්ධය 194-195 පිටු (තායිවාන් මුද්‍රණය)]**

**පුරක්ඛත්වා**ති පුබ්බඞ්ගමං කත්වා. තඤ්ච ඛෝ සහජාතපුබ්බඞ්ගමවසේන "මනෝපුබ්බඞ්ගමා ධම්මා"තිආදීසු (ධ. ප. 1-2) විය සම්පයෝගස්ස අධිප්පේතත්තා. **අසංසීදන්තෝ**ති සිලෝකමච්ඡරියාදිවසේන පුඤ්ඤකිරියායං සංසීදං සඞ්කෝචං අනාපජ්ජන්තෝ, තේන මුත්තචාගතාදිං දස්සේති. **අනුස්සාහිතෝ**ති කේනචිපි න උස්සාහිතෝ. සරසතෝ හි පුඤ්ඤපටිපත්තිදස්සනමිදං. **පරේහී**ති පන පාකටුස්සාහනදස්සනං.

**දානාදීනී**ති දානං සීලං යාව දිට්ඨිජුකම්මන්ති ඉමානි දානාදීනි දස පුඤ්ඤානි, **දානාදීනී**ති වා දානසීලභාවනාමයානි ඉතරේසම්පි සත්තන්නං එත්ථේවන්තෝගධත්තා. **අස්ස** පුඤ්ඤචේතනාසමඞ්ගිනෝ. **අමුත්තචාගතා** දෙය්‍යධම්මේ සාපෙක්ඛචිත්තතා. **ආදි**-සද්දේන සීලසමාදානාදීසු අනධිමුත්තතාදිං සඞ්ගණ්හාති. **තදේවා**ති සෝමනස්සසහගතාදිනා සදිසතාය වුත්තං. සදිසම්පි හි "තදේවා"ති වෝහරීයති යථා "සා ඒව තිත්තිරී, තානියේව ඕසධානී"ති. **ඉමස්මිඤ්හි අත්ථේ**ති ලීනස්ස චිත්තස්ස උස්සාහනපයෝගසඞ්ඛාතේ අත්ථේ. **ඒත**න්ති "සඞ්ඛාරෝ"ති ඒතං පදං. **පුබ්බපයෝගස්සා**ති පුඤ්ඤකිරියායං සඞ්කෝචේ ජායමානෙ තතෝ විවේචෙත්වා සමුස්සාහනවසේන පවත්තස්ස චිත්තපයෝගස්ස, පුබ්බග්ගහණඤ්චෙත්ථ තථාපවත්තපුබ්බාභිසඞ්ඛාරවසේන සෝ සඞ්ඛාරෝ හෝතීති කත්වා වුත්තං, න තස්ස සඞ්ඛාරස්ස පුබ්බකාලිකත්තා. "අත්ථි දින්න"න්තිආදි (ම. නි. 1.441; 2.95) නයප්පවත්තාය සම්මාදිට්ඨියා අසම්භවදස්සනත්ථං **බාල**-ග්ගහණං. සංසීදනුස්සාහනාභාව දස්සනත්ථං **සහසා**-ගහණං. **සෝමනස්සරහිතා හොන්ති** පුඤ්ඤං කරොන්තාති අධිප්පායෝ. **සෝමනස්සහේතූනං අභාවං ආගම්මා**ති ඉදං නිදස්සනමත්තං දට්ඨබ්බං. මජ්ඣත්තාරම්මණතථාරූපචේතෝසඞ්ඛාරාදයෝපි හි උපෙක්ඛා සහගතතාය කාරණං හොන්තියේවාති.

**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 452 යටතේ)]**

**තත්ථ** ඔහුන් අතුරෙන් **කාමාවචරං (චිත්තං)** කාමාවචර සිත් තෙමේ **සෝමනස්සුපෙක්ඛාඤාණසඞ්ඛාරභේදතෝ** සෝමනස්ස උපේක්ෂා ඤාණ සඞ්ඛාර භේදයෙන් **අට්ඨවිධං** අට වැදෑරුම් වේ **සෙය්‍යථීදං?** යම්සේද? **සෝමනස්සසහගතං** සොම්නස් සහගිය වේදනාවෙන් යුක්තවූ **ඤාණසම්පයුත්තං** ඤාණසම්ප්‍රයුක්ත

**අසඞ්ඛාරං (චිත්තං)** අසංස්කාර චිත්තයය **ච (තථායේව)** එසේම **සසඞ්ඛාරං (චිත්තං)** සසංස්කාර චිත්තයය **තථා** එසේම **ඤාණවිප්පයුත්තං** ඤාණවිප්‍රයුක්ත **අසඞ්ඛාරං (චිත්තං)** අසංස්කාර චිත්තයය **සසඞ්ඛාරං (චිත්තං)** සසංස්කාර චිත්තයය **උපෙක්ඛාසහගතං** උපේක්ෂා සහගිය වේදනාවෙන් යුක්ත වූ **ඤාණසම්පයුත්තං** ඤාණසම්ප්‍රයුක්ත **අසඞ්ඛාරං (චිත්තං)** අසංස්කාර චිත්තයය **ච (තථායේව)** එසේම **සසඞ්ඛාරං (චිත්තං)** සසංස්කාර චිත්තයය **තථා** එසේම **ඤාණවිප්පයුත්තං** ඤාණවිප්‍රයුක්ත **අසඞ්ඛාරං (චිත්තං)** අසංස්කාර චිත්තයය **සසඞ්ඛාරං (චිත්තං)** සසංස්කාර චිත්තය යනුවෙනි.෴

(මෙසේ අට වැදෑරුම් කාමාවචර කුශල චිත්තයන් උද්දේශ කොට දැන් ඔහුන්ගේ ප්‍රවෘත්ති ආකාර දක්වනුවෝ "යදා හි" යනාදීහු කීහු) **හි** විස්තර කෙරෙම් **යදා** යම් කලෙක **දෙය්‍යධම්මපටිග්ගාහකාදිසම්පත්තිං** දියයුතු වස්තුව ප්‍රතිග්‍රහකාදී සම්පත්තිය ("පටිග්ගාහකාදිසම්පත්තිං" යනුයෙහි "ආදි" ශබ්දයෙන් දේශ-කාල-කල්‍යාණමිත්‍ර ආදී සම්පත්තිය සඞ්ග්‍රහ වේ) **අඤ්ඤං වා සෝමනස්සහේතුං ආගම්ම** අන්‍යවූ ද ශ්‍රද්ධා බහුලතාය, පරිශුද්ධ දෘෂ්ටිතාය කුශලක්‍රියාවෙහි ආනිසංස දැකීමය, සෝමනස්ස පටිසන්ධිය එකොළොස් ප්‍රීතිසම්බොද්ධ්‍යාඞ්ග ස්ථානීය ධර්ම යනාදි වූ සෝමනස්ස හේතුවක් ලැබ **හට්ඨපහට්ඨෝ** තුටුපහටුවැ **"අත්ථි දින්නං" ඉති** "අත්ථි දින්නං" මේ ආදීවූ **නයප්පවත්තං** ක්‍රමයෙන් පැවති ("ආදිනයප්පවත්තං" යනුයෙහි "ආදි" ශබ්දයෙන් කේවල "අත්ථි යිට්ඨං" යනාදි නව ප්‍රභේද සම්‍යක්දෘෂ්ටි වස්තූන්ගේම ග්‍රහණය නොවේ. වැලිත් ධම්මවිචය සම්බොජ්ඣඞ්ගාදී ස්ථානීයාදීගේ ද සඞ්ග්‍රහය වේ යැයි දතයුතු) **සම්මාදිට්ඨිං පුරක්ඛත්වා** සම්‍යක්දෘෂ්ටිය පෙරටුකොට ගෙන (හේ ද "මනෝ පුබ්බඞ්ගමා ධම්මා" යනාදියෙහි මෙන් සම්ප්‍රයෝගය අභිමත බැවින් සහජාත පූර්වාඞ්ගම වශයෙන් දතයුතු) **අසංසීදන්තෝ** මුක්තචාගාදී ගුණයෙන් යුක්තව (සිලෝක මාත්සර්‍යාදී වශයෙන් පුණ්‍ය ක්‍රියාවෙහි සඞ්කෝචයට නොපැමිණෝනුයේ යන මෙයින් මුක්තත්‍යාගතාදිය හඟවත් යනු ටීකායි) **පරේහි** අනුන් විසින් **අනුස්සාහිතෝ** කිසිවක්හු විසින් උත්සාහ නොකරනුයේ ("අනුස්සාහිතෝති කේනචිපි න උස්සාහිතෝ, සරසතෝ හි පුඤ්ඤපටිපත්ති දස්සනමිදං, පරේහීති පන පාකටුස්සහනදස්සනං" ටීකායි) **දානාදීනි පුඤ්ඤානි කරෝති** දානාදි පිංකම් කෙරේ නම් **තදා** එකල්හි **අස්ස** ඕ හට **සෝමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරං චිත්තං** සෝමනස්සසහගත ඤාණසම්ප්‍රයුක්ත අසංස්කාර චිත්තය **හෝති (උප්පජ්ජති)** උපදී.෴

("අසන්සීදන්තෝ" මෙයින් වත්හි ලග්න බැව් ආදී නැති බැවින් උත්සාහ ඇතිව නොලැගෙමින්; මෙයින් තමා විසින් සසඞ්ඛාර නැති බව කීහ. "අනුස්සාහිතෝ පරේහි" යනුවෙන් ජනා විසින් සසඞ්ඛාර නැති බව කීහ යනු සන්‍යයි. "දානාදීනි පුඤ්ඤානි" දානාදි දශ පුණ්‍යයන් නොහොත් දාන ශීල භාවනා පුණ්‍යයන් මේ පක්ෂයෙහි සෙසු සත් දෙන මෙහිම සඞ්ග්‍රහ වෙත්)

**යදා පන** යම්කලෙක වනාහි **වුත්තනයේන** පෙර කීසේ **හට්ඨතුට්ඨෝ** තුටුපහටුව **සම්මාදිට්ඨිං පුරක්ඛත්වා** සම්‍යක්දෘෂ්ටිය පෙරටු කොට **අමුත්තචාගාදිවසේන** දියයුතු වස්තුවෙහි අපේක්ෂා සහිත සිත් ඇති බැවින් අමුක්තත්‍යාගතාදි වශයෙන් (ආදි ශබ්දයෙන් ශීල සාමාදාන ආදියෙහි අනධිමුක්තතාදිය සඞ්ග්‍රහ වේ) **සංසීදමානෝ වා** පසුබට වූයේ හෝ **පරේහි වා උස්සාහිතෝ** මෙරමා විසින් උත්සාහවත් කරවන ලද්දේ හෝ **කරෝති** දානාදී පිංකම් කරයි ද **තදා** එකල්හි **අස්ස** ඕහට **තදේව** සෝමනස්ස

සහගතාදියෙන් යුක්තවූම **සසඞ්ඛාරං චිත්තං** සසංස්කාර චිත්තය **හෝති (උප්පජ්ජති)** උපදී ("තදේව" යනු සොම්නස් සහගත බැව් ආදියෙන් සදෘශ බැවින් කියනලදි. ඒ එසේමැයි; සදෘශය ද "තදේව" යයි ව්‍යවහාර කරනු ලැබේ. "සා ඒව තිත්තිරී, තානි ඒව ඕසධානි" යන්නෙහි මෙනි) **හි** පක්‍ෂාන්තරයක් දක්වම් **ඉමස්මිං අත්ථේ** මේ අර්ථයෙහි **සඞ්ඛාරෝ ඉති** සඞ්ඛාර යනු **අත්තනෝ වා** තමාගේ හෝ **පරේසං වා** මෙරමාගේ හෝ **වසේන** වශයෙන් **පවත්තස්ස** පැවැති **පුබ්බපයෝගස්ස** පූර්ව ප්‍රයෝගයට **ඒතං** සඞ්ඛාර යන මේ පදය **අධිවචනං** නමෙකි ("ඉමස්මිඤ්හි අත්ථේ" යනු ලීන චිත්තයාගේ උත්සාහන ප්‍රයෝග සඞ්ඛ්‍යාත මේ අර්ථයෙහි; "පුබ්බපයෝගස්ස" යනු පුණ්‍ය ක්‍රියාවෙහි සඞ්කෝචනය වන කල්හි එයින් වෙන් කොට සමුස්සාහන වශයෙන් ප්‍රවෘත්ත වූ චිත්ත ප්‍රයෝගයට නමෙකි. එහි පූර්ව ග්‍රහණය තථා ප්‍රවෘත්ත පූර්වාභිසංස්කාර වශයෙන් ඒ සසංස්කාරය වෙයි කියනලද ඒ සසංස්කාරය පූර්ව කාලික හෙයින් නොවේ) **යදා පන** යම් කලෙක වනාහි **ඤාතිජනස්ස** මව්-පියාදීන්ගේ **පටිපත්තිදස්සනේන** දන්දීම් ආදී ප්‍රතිපත්ති දර්ශනයෙන් **ජාතපරිචයා** උපන් පරිචය ඇති **බාලදාරකා** බාල දරුවෝ ("අත්ථි දින්නං" යනාදි නයින් ප්‍රවෘත්ත වූ සම්‍යක් දෘෂ්ටියගේ අසම්භව දර්ශනය පිණිස බාලදාරක ග්‍රහනය කරනලදි) **භික්ඛූ දිස්වා** භික්‍ෂූන් වහන්සේ දැක **සෝමනස්සජාතා** හටගත් සොම්නස් ඇත්තෝ වී **සහසා** මෙරමාගේ උත්සාහයක් නැතිව (සංසීදනෝත්සාහනාදීන්ගේ අභාවය දක්වන පිණිස "සහසා" ග්‍රහණය කරනලදි) **හත්ථගතං** අතටපත්වූ **කිඤ්චිදේව** කිසිවක්ම **දදන්ති වා** දෙන්නේ හෝ **වන්දන්ති වා** වඳින්නේ හෝ වේද **තදා** එකල්හි (**අස්ස** ඕහට) **තතියං චිත්තං** සොම්නස්සහගිය ඤාණවිප්‍රයුක්ත අසංස්කාර වූ තෙවෙනි සිත **උප්පජ්ජති** උපදී **යදා පන** යම් කලෙක වනාහි **දේථ වන්දථ ඉති** දේථ වන්දථ යනාදියෙන් **ඤාතීහි** මව්-පියාදීන් විසින් **උස්සාහිතා (දාරකා)** උත්සාහවත් කරවන ලද්දවූ දරුවෝ **ඒවං** මෙසේ **පටිපජ්ජන්ති (පටිපජ්ජෙය්‍යුං)** පිළිපදින්නේ නම් **තදා** එකල්හි (**අස්ස** ඕහට) **චතුත්ථං චිත්තං** සොම්නස් සහගිය ඤාණවිප්‍රයුක්ත සසංස්කාර සිව්වෙනි සිත **උප්පජ්ජති** උපදී **යදා පන** යම් කලෙක වනාහි **දෙය්‍යධම්මපටිග්ගහකාදීනං** දෙය්‍යධර්ම ප්‍රතිග්‍රහකාදීන්ගේ **අසම්පත්තිං** සම්පත් නොලැබීමෙන් **වා** හෝ **අඤ්ඤේසං** වෙන යම්කිසි **සෝමනස්සහේතූනං අභාවං ආගම්ම** සොම්නස් හේතූන්ගේ නොපැමිණීමෙන් **වා** හෝ ("සෝමනස්සහේතූනං අභාවං ආගම්ම" යනු නිදර්ශන මාත්‍රයෙක් යයි දතයුතු. මජ්ඣත්තාරම්මණ-තථාරූපචේතෝ-සඞ්ඛාර ආදීහුදු උපේක්‍ෂා සහගත බවට කාරණ වෙත්මැයි) **චතූසුපි විකප්පේසු** සතර විකල්පයෙහි **සෝමනස්සරහිතා හොන්ති** පිං කරන්නාහු සොම්නස් රහිතවූවෝ වෙත් ද **තදා** එකල්හි (**තේසං** ඔහුනට) **සේසානි** සෙසු **උපෙක්ඛාසහගතානි** උපේක්‍ෂා වේදනාව සහගිය **චත්තාරි චිත්තානි** සිව් වැදෑරුම් චිත්තයෝ **උප්පජ්ජන්ති** උපදිත් **ඉති ඒවං** මෙසේ **සෝමනස්සූපෙක්ඛා ඤාණසඞ්ඛාරභේදතෝ** සොමනස්ස උපේක්‍ෂා ඤාණ සඞ්ඛාරභේද වශයෙන් **අට්ඨවිධං** අට වැදෑරුම් **කාමාවචරකුසලං** කාමාවචර කුශලය **වේදිතබ්බං** දතයුතු. **[විසුද්ධි මග්ග අටුවා පරිවර්තනයයි]**

> ඉදං අට්ඨවිධං චිත්තං, කාමාවචරසඤ්ඤිතං;
> දසපුඤ්ඤක්‍රියවත්ථු-වසේනේව පවත්තති.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 20 යටතේ)]**

**අට්ඨවිධං චිත්තං** කාමාවචරසඤ්ඤිතං **ඉදං** අට්ඨවිධං චිත්තං. දසපුඤ්ඤකිරියවත්ථුවසේනේව පුඤ්ඤකිරියා ඒව තේසං තේසං ඵලානිසංසානං වත්ථූනි කාරණානීති පුඤ්ඤකිරියවත්ථූනි, තේසං වසෝ, තේන පවත්තති.

**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 20 යටතේ)]**

පුඤ්ඤඵලනිබ්බත්තනතෝ, අත්තසන්තානං පුනනතෝ ච පුඤ්ඤානි, කත්තබ්බතාය කිරියා, තේසං තේසං ආනිසංසානං වත්ථුතාය වත්ථූනි චාති පුඤ්ඤකිරියවත්ථූනි. ගණනතෝ දසපරිමාණත්තා දස ච තානි පුඤ්ඤකිරියවත්ථූනි චාති දස පුඤ්ඤකිරියවත්ථූනි, තේසං වසේනාති **දසපුඤ්ඤක්‍රියවත්ථුවසේන,** දසපුඤ්ඤකිරියවත්ථුභාවේන තං මයං හුත්වාති අත්ථෝ. **ඒව**-කාරේන පන රූපාරූපලෝකුත්තරං විය න කේවලං භාවනාවසේනේවාති දස්සේති. අථ වා දසපුඤ්ඤකිරියවත්ථුවසේනේව පවත්තති, න පන පරේහි පරිකප්පිත-පරපසංසාදිපුඤ්ඤකිරියවත්ථුවසේනාති **ඒව**-සද්දේන අවධාරණං. යතෝ වක්ඛති "සබ්බානුස්සතිපුඤ්ඤකඤ්චා"තිආදි.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 20 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 78 පිට]**

**කාමාවචරසඤ්ඤිතං** කාමාවචර නම් වූ **ඉදං අට්ඨවිධිං චිත්තං** මේ අට වැදෑරුම් වූ චිත්තය තෙමේ **දසපුඤ්ඤක්‍රියාවත්ථුවසේන ඒව** දස පුණ්‍යක්‍රියා වස්තු වශයෙන්ම **පවත්තති** හටගනී ඒව කාරයෙන් වනාහි රූපාරූප ලෝකෝත්තර චිත්තය මෙන් හුදෙක් භාවනා වශයෙන්ම නොපවතී යැයි දක්වයි. නොහොත් පර පරිකල්පිත පර පසංසාදී පුණ්‍යක්‍රියා වස්තු වශයෙන් නොපවතී යැයි ඒව ශබ්දයෙන් අවධාරණය කරන ලද්දේය෴

"පුඤ්ඤඵලං නිබ්බත්තනතෝ අත්තසන්තානං පුනනතෝ ච පුඤ්ඤානි කත්තබ්බත්තාය ක්‍රියා තේසං තේසං ආනිසංසානං වත්‍ථුතාය වත්‍ථූනි චාති පුඤ්ඤක්‍රියාවත්ථූනි" යනු නිර්වචන හෙයින් පූජ්‍ය වූ විපාක ඵලය උපදවන හෙයින් ද චිත්ත සන්තානය පිරිසිදු කරන හෙයින් ද පුණ්‍යයෝ නම් වෙත්. කටයුතු බැව් නැයි යන අර්ථයෙන් ක්‍රියා නම් වෙයි. ඒ ඒ ආනිශංසයන්ට කාරණා බැවින් වස්තු වූවාහු වෙත් නුයි පුණ්‍යක්‍රියා වස්තූහු නම් වෙත්. ගණන් වශයෙන් දස ප්‍රමාණ බැවින් "දස ච තානි පුඤ්ඤක්‍රියාවත්‍ථූනි චාති දසපුඤ්ඤක්‍රියාවත්‍ථූනි" යනුවෙන් වාක්‍යය ගතයුතුයි෴ **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 51-52 පිටු]**

## කුසල් අකුසල් අතරින් බලවත් කුමක් ද?

"ඛත්තියෝපි ඛෝ, වාසෙට්ඨ, කායේන ද්වයකාරී, වාචාය ද්වයකාරී, මනසා ද්වයකාරී, විමිස්සදිට්ඨිකෝ විමිස්සදිට්ඨිකම්මසමාදනෝ විමිස්සදිට්ඨිකම්මසමාදනහේතු [විමිස්සදිට්ඨිකෝ විමිස්සදිට්ඨිකම්මසමාදනෝ විමිස්සකම්මසමාදනහේතු (ස්‍යා), වීතිමිස්සදිට්ඨිකෝ වීතිමිස්සකම්මසමාදනහේතු (සී. පී.)] කායස්ස භේදා පරං මරණා සුඛදුක්ඛප්පටිසංවේදී හෝති.

**[පාථිකවග්ග පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 137 යටතේ); දී.නි පාථිකවග්ග පාළි 162 පිට (බු.ජ)]**

**වාසෙට්ඨා** වාශිෂ්ඨයෙනි **ඛත්තියෝපි ඛෝ** ක්‍ෂත්‍රියයා ද **කායේන** කයින් **ද්වයකාරී** (විටෙක කුසල් ද විටෙක අකුසල් දැයි) කුසලාකුසල දෙකම කරන සුලු වූයේ **වාචාය** වචනයෙන් **ද්වයකාරී** කුසලාකුසල දෙකම කරන සුලු වූයේ **මනසා** සිතින් **ද්වයකාරී** කුසලාකුසල දෙකම කරන සුලු වූයේ **විමස්සදිට්ඨිකෝ** (විටෙක සම්‍යක්දෘෂ්ටික ද විටෙක මිථ්‍යාදෘෂ්ටික දැයි) මිශ්‍රදෘෂ්ටි ඇතියේ **විමස්සදිට්ඨිකම්මසමාදනෝ** මිශ්‍රදෘෂ්ටික කර්මසමාදන ඇතියේ

**විමස්සදිට්ඨිකම්මසමාදනහේතු** මිශ්‍රදෘෂ්ටික කර්මසමාදන හේතුයෙන් **කායස්ස භේද පරම්මරණා** කාබුන් මරණින් මතු **සුඛදුක්ඛපටිසංවේදී හෝති** සුව දුක් විඳුනේ වෙයි.
**[දී.නි පාථිකවග්ග පාළි 163 පිට (බු.ජ)]**

**ද්වයකාරී**ති කාලේන කුසලං කරෝති, කාලේන අකුසලන්ති ඒවං උභයකාරී. **සුඛදුක්ඛප්පටිසංවේදී හෝතී**ති ඒකක්ඛණේ උභයවිපාකදනට්ඨානං නාම නත්ථි. යේන පන අකුසලං බහුං කතං හෝති, කුසලං මන්දං, සෝ තං කුසලං නිස්සාය ඛත්තියකුලේ වා බ්‍රාහ්මණකුලේ වා නිබ්බත්තති. අථ නං අකුසලකම්මං කාණම්පි කරෝති ඛුජ්ජම්පි පීඨසප්පිම්පි. සෝ රජ්ජස්ස වා අනරහෝ හෝති, අභිසිත්තකාලේ වා ඒවංභූතෝ භෝගේ පරිභුඤ්ජිතුං න සක්කෝති. අපරස්ස මරණකාලේ ද්වේ බලවමල්ලා විය තේ ද්වේපි කුසලාකුසලකම්මානි උපට්ඨහන්ති. තේසු අකුසලං බලවතරං හෝති, තං කුසලං පටිබාහිත්වා තිරච්ඡානයෝනියං නිබ්බත්තාපේති. කුසලකම්මම්පි පවත්තිවේදනීයං හෝති. තමේනං මඞ්ගලහත්ථිං වා කරොන්ති මඞ්ගලඅස්සං වා මඞ්ගලඋසභං වා. සෝ සම්පත්තිං අනුභවති. ඉදං සන්ධාය වුත්තං "සුඛදුක්ඛප්පටිසංවේදී හෝතී"ති.
**[දී.නි. පාථිකවග්ග අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 137 යටතේ); දීඝ නිකාය අටුවා 02/632 පිට (හේ.වි.මු)]**

**ද්වයකාරී ඉති** ද්වයකාරී යනු **කාලේන** කලෙක **කුසලං කරෝති** කුසල් කරයි **කාලේන** කලෙක **අකුසලං (කරෝති)** අකුසල් කරයි **ඉති** යැයි **ඒවං** මෙසේ **උභයකාරී** කුසලාකුසල දෙකම කරන තැනැත්තායි **සුඛදුක්ඛප්පටිසංවේදී හෝති ඉති** සුඛදුක්ඛප්පටිසංවේදී හෝති යනු **ඒකක්ඛණේ** එක් ක්‍ෂණයෙක්හි **උභයවිපාකදනට්ඨානං නාම** කුසලාකුසල කර්ම දෙකයෙහි විපාක දෙන ස්ථානයක් නම් **නත්ථි** නැත **යේන පන** යම් කෙනෙකුන් විසින් වනාහි **අකුසලං බහුං කතං හෝති** අකුසල් බොහෝ කරන ලද්දේ වෙයි ද **කුසලං මන්දං (කතං හෝති)** කුසල් මදව කරන ලද්දේ වෙයි ද **සෝ** හෙතෙමේ **තං කුසලං නිස්සාය** ඒ කුසල කර්මය නිසා (හේතුවෙන්) **ඛත්තියකුලේ වා** ක්‍ෂත්‍රිය කුලෙහි හෝ **බ්‍රාහ්මණකුලේ වා** බමුණු කුලෙහි හෝ **නිබ්බත්තති** උපදියි **අථ** ඉක්බිති **අකුසලකම්මං** ඒ අකුසල කර්මය **නං (පුග්ගලං)** ඒ පුද්ගලයාව **කාණම්පි කරෝති** එකැස් ඇත්තෙක් ද කරයි **ඛුජ්ජම්පි (කරෝති)** කුදු පුද්ගලයෙක් ද කරයි **පීඨසප්පිම්පි (කරෝති)** පිලෙක් ද (අත් පා කොරවූවෙක් ද) කරයි **සෝ** හෙතෙමේ **රජ්ජස්ස වා** රාජ්‍යයට හෝ **අනරහෝ හෝති** නුසුදුස්සෙක් ද වෙයි **ඒවංභූතෝ** විකල අවයව ඇති තැනැත්තේ **අභිසිත්තකාලේ වා** අභිෂේක කළ කාලයෙහි හෝ **භෝගේ** පඤ්චකාම භෝගයන් **පරිභුඤ්ජිතුං** පරිභෝග කරන්නට **න සක්කෝති** නොහැකි වෙයි **අපරස්ස** අන්‍යයෙකුට **ද්වේ බලවමල්ලා විය** බලවත් මල්ලවයෝ දෙදෙනෙකු මෙන් **තේ ද්වේපි කුසලාකුසලකම්මානි** ඒ කුසලාකුසල කර්ම දෙකම **උපට්ඨහන්ති** එළඹ සිටිත් **තේසු** ඒ දෙක අතරින් **අකුසලං** අකුසල කර්මය **බලවතරං හෝති** බලවත් වෙයි ද **තං (අකුසලං)** ඒ අකුසල කර්මය **කුසලං** කුසල කර්මය **පටිබාහිත්වා** වළක්වා **තිරච්ඡානයෝනියං** තිරිසන් යෝනියෙහි **නිබ්බත්තාපේති** උපදවයි **කුසලකම්මම්පි** කුසල කර්මය ද **පවත්තිවේදනීයං හෝති** ප්‍රවෘත්ති වේදනීය වෙයි **තං (කුසලං)** ඒ කුසල කර්මය **ඒනං** ඒ සත්වයා **මඞ්ගලහත්ථිං වා කරොන්ති** මඟුල් හස්ථියෙකු හෝ කරති **මඞ්ගලඅස්සං වා (කරොන්ති)** මඟුල් අශ්වයෙක් හෝ කරති **මඞ්ගලඋසභං වා (කරොන්ති)** මඟුල් වෘෂභයෙකු හෝ කරති **සෝ** හෙතෙමේ **සම්පත්තිං අනුභවති** සම්පත් ද අනුභව කරයි **ඉදං සන්ධාය** මෙය සඳහා **සුඛදුක්ඛප්පටිසංවේදී හෝති ඉති** සුඛදුක්ඛප්පටිසංවේදී හෝති යැයි **වුත්තං** කියනලදි.
**[දී.නි පාථිකවග්ග අටුවා පරිවර්තනයි]**

**ද්වයකාරීති** කුසලාකුසලද්වයස්ස කත්තා. තයිදං ද්වයං යස්මා ඒකජ්ඣං නප්පවත්තති, තස්මා ආහ **"කාලේනා"**තිආදි. **ඒකක්ඛණේ උභයවිපාකදානට්ඨානං නාම නත්ථි** ඒකස්මිං ඛණේ චිත්තද්වයූපසඤ්හිතාය සත්තසන්තතියා අභාවතෝ. යථා පන ද්වයකාරිනෝ සුඛදුක්ඛපටිසංවේදිතා සම්භවති, තං දස්සේතුං **"යේන පනා"**තිආදි වුත්තං. **ඒවංභූතෝති** විකලාවයවෝ. ද්වේපිහි කුසලාකුසලකම්මානි කතූපචිතානි සභාවතෝ බලවන්තානේව හොන්ති, තස්මා මරණකාලේ උපට්ඨහන්ති. **තේසු අකුසලං බලවතරං හෝති** පච්චයලාභතෝ. නිකන්තිආදයෝ හි පච්චයවිසේසා අකුසලස්සේව සභාගා, න කුසලස්ස, තස්මා කතූපචිතභාවේන සමානබලේසුපි කුසලාකුසලේසු පච්චයලාභේන විපච්චිතුං ලද්ධෝකාසතාය කුසලතෝ අකුසලං බලවතරං හෝතීති, තථාභූතම්පි **තං** යථා විපාකදානේ ලද්ධෝකාසස්ස කුසලස්සාපි අවසරෝ හෝති, තථා ලද්ධපච්චයං පටිසන්ධිදානාභිමුඛං **කුසලං පටිබාහිත්වා** පටිසන්ධිං දෙන්තං **තිරච්ඡානයෝනියං නිබ්බත්තාපේතීති**. "අකුසලං බලවතරං හෝතී"ති එත්ථ "අකුසලං චේ බලවතරං හෝති, තං කුසලං පටිබාහිත්වා"ති වුත්තනයේනේව අත්ථං වත්වා තේසු කුසලං චේ බලවතරං හෝති, තඤ්ච අකුසලං පටිබාහිත්වා මනුස්සයෝනියං නිබ්බත්තාපේති, අකුසලං පවත්තිවේදනීයං හෝති, අථ නං තං කාණම්පි කරෝති ඛුජ්ජම්පි පීඨසප්පිම්පි කුච්ඡිරෝගාදීහි වා උපද්දුතං. ඒවං සෝ පවත්තියං නානප්පකාරං දුක්ඛං පච්චනුභවතීති ඉදං සන්ධාය වුත්තං "සුඛදුක්ඛප්පටිසංවේදී හෝතී"ති. තත්‍රායං විනිච්ඡයෝ; වුත්තකාලේ වා කාරේන සමානබලේසු කුසලාකුසලකම්මේසු උපට්ඨහන්තේසු මරණස්ස ආසන්නවේලායං යදි බලවතරානි කුසලජවනානි ජවන්ති, යථාඋපට්ඨිතං අකුසලං පටිබාහිත්වා කුසලං වුත්තනයේන පටිසන්ධිං දේති. අථ බලවතරානි අකුසලජවනානි ජවන්ති, යථාඋපට්ඨිතං කුසලං පටිබාහිත්වා අකුසලං වුත්තනයේනේව පටිසන්ධිං දේති. තං කිස්ස හේතු? උභින්නං කම්මානං සමානබලවභාවතෝ, පච්චයන්තරසාපෙක්ඛතෝ චාති, සබ්බං වීමංසිත්වා ගහේතබ්බං.

**[දී.නි. පාථිකවග්ග ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 137 යටතේ)]**

ද්වයකාරී යනු කුසලාකුසල කර්ම දෙක කළ තැනැත්තායි. යම්හෙයකින් ඒ මේ කර්ම දෙක එකට නොපවතියි. එහෙයින් "කාලේන" යනාදිය වදරණලදි. එක් ක්‍ෂණයෙක්හි කුසලාකුසල චිත්තද්වය සමඟ පැවති සත්වසන්තතියකගේ නැති බැවින් එක් ක්‍ෂණයෙක්හි කුසල අකුසල කර්ම දෙදෙනාගේම විපාක දෙන ස්ථානයක් නම් නැත. යම්සේ වනාහි කුසලාකුසල දෙකම කරන්නෝ සුව දුක් දෙකම විඳින බව ලැබේ. එය දක්වන්නට "යේන පන" යනාදිය වදරණලදි. ඒවංභූතෝ යනු විකල අවයව ඇති තැනැත්තේයි. රැස්කරනලද කුසලාකුසල කර්ම දෙක වනාහි ස්වභාවයෙන් බලවත් වෙති. එහෙයින් මරණාසන්න කාලයෙහි එළඹ සිටිත්. ඒ කුසල අකුසලයන් අතුරින් ප්‍රත්‍යය ලැබීමෙන් අකුසල් බලවත් වෙයි. නිකන්ති ආදී ප්‍රත්‍යය විශේෂය අකුසලයටම සමාන පැවතුම් ඇත්තේය. කුසලයට සමාන පැවතුම් ඇත්තේ නොවෙයි. එහෙයින් රැස්කරනලද භාවයෙන් සමාන බලය ඇති කුසලාකුසලයන්හි ප්‍රත්‍යය ලාභයෙන් විපාකදීමට ලබනලද අවකාශ ඇතියෙන් කුසලයට වඩා අකුසලය බලවත් වෙයි. එසේ අකුසලය බලවත් වූයේද යම්සේ විපාක දීමෙහි ලබනලද අවකාශය ඇති කුසල චිත්තයට ඉඩ දෙයි. එසේවුවද ලබනලද ප්‍රත්‍යය ඇති ප්‍රතිසන්ධි දීමට අභිමුඛ වූයේ කුසල චිත්තය වළක්වා ප්‍රතිසන්ධි දෙන්නාවූ ඒ අකුසලය තිරිසන් යෝනියෙහි උපදවවයි. "අකුසලං බලවතරං හෝති" යන මෙහි "අකුසලං චේ බලවතරං හෝති, තං කුසලං පටිබාහිත්වා" යැයි කියනලද ක්‍රමයෙන්ම අර්ථය කියා ඉදින් ඔවුන් දෙදෙනා අතුරින් කුසලය බලවත් වෙයි ද ඒ කුසලය අකුසල චිත්තය වළක්වා මනුෂ්‍ය යෝනියෙහි උපදවවයි. අකුසලය ප්‍රවෘත්ති විපාක ගෙනදෙයි. ඉක්බිති ඒ අකුසල

කර්මය ඔහු එකැස් ඇත්තෙක් ද කරයි. කුදුවූවෙක් ද කරයි. පිලෙක් ද කරයි. උදර රෝගාදියෙන් හෝ පීඩා ලබනලදුයේ හෝ වෙයි. මෙසේ හෙතෙමේ ප්‍රවෘත්ති කාලයෙහි නොයෙක් ආකාර දුක් විඳියි යැයි "සුඛදුක්ඛප්පටිසංවේදී හෝති" යන වචනය මෙය සඳහා දේශනා කරනලදි. එහි මේ විනිශ්චයයි; කියනලද කාලයෙහි හෝ කිරීමෙන් හෝ සමබලැති කුසලාකුසල කර්මයන් එළඹ සිටි කල්හි; ඉඳින් මරණාසන්න වේලාවෙහි බලවත් වූ කුසල ජවනයෝ දුවත් ද යම්සේ එළඹ සිටි අකුසලය වළක්වා කියනලද ක්‍රමයෙන් කුසල කර්මය ප්‍රතිසන්ධි දෙයි. ඉක්බිති අකුසල ජවනයෝ දුවත් ද යම්සේ එළඹ සිටි කුසල කර්මය වළක්වා කියනලද ක්‍රමයෙන්ම අකුසල කර්මය ප්‍රතිසන්ධි දෙයි. එයට හේතුව කිම? කුසලාකුසල කර්මයන්ගේ සමබලැති බව ද ප්‍රත්‍යය අතර සාපේක්ෂ භාවයයි. සියල්ල විමසා ගතයුතුයි.

**[දී.නි පාථිකවග්ග ටීකා පරිවර්තනයි]**

"භන්තේ නාගසේන, කතමං අධිමත්තං බලවතරං කුසලං වා අකුසලං වා"ති? "කුසලං, මහාරාජ, අධිමත්තං බලවතරං, නෝ තථා අකුසල"න්ති. "නාහං, භන්තේ නාගසේන, තං වචනං සම්පටිච්ඡාමි 'කුසලං අධිමත්තං බලවතරං, නෝ තථා අකුසල'න්ති, දිස්සන්ති, භන්තේ නාගසේන, ඉධ පාණාතිපාතිනෝ අදින්නාදායිනෝ කාමේසුමිච්ඡාචාරිනෝ මුසාවාදිනෝ ගාමඝාතිකා පන්ථදූසකා නේකතිකා වඤ්චනිකා, සබ්බේ තේ තාවතකේන පාපේන ලභන්ති හත්ථච්ඡේදං පාදච්ඡේදං හත්ථපාදච්ඡේදං කණ්ණච්ඡේදං නාසච්ඡේදං කණ්ණනාසච්ඡේදං බිලඞ්ගථාලිකං සඞ්ඛමුණ්ඩිකං රාහුමුඛං ජෝතිමාලිකං හත්ථපජ්ජෝතිකං ඒරකවත්තිකං චීරකවාසිකං ඒණෙය්‍යකං බළිසමංසිකං කහාපණිකං ඛාරාපතච්ඡිකං පලිඝපරිවත්තිකං පලාලපීඨකං තත්තේනපි තේලේන ඕසිඤ්චනං සුනඛේහිපි ඛාදපනං ජීවසූලාරෝපනං අසිනාපි සීසච්ඡේදං, කේචි රත්තිං පාපං කත්වා රත්තිං යේව විපාකං අනුභවන්ති, කේචි රත්තිං කත්වා දිවා යේව අනුභවන්ති, කේචි දිවා කත්වා දිවා යේව අනුභවන්ති, කේචි දිවා කත්වා රත්තිං යේව අනුභවන්ති, කේචි ද්වේ තයෝ දිවසේ වීතිවත්තේ අනුභවන්ති, සබ්බේපි තේ දිට්ඨේව ධම්මේ විපාකං අනුභවන්ති. අත්ථි පන, භන්තේ නාගසේන, කෝචි ඒකස්ස වා ද්වින්නං වා තිණ්ණං වා චතුන්නං වා පඤ්චන්නං වා දසන්නං වා සතස්ස වා සහස්සස්ස වා සතසහස්සස්ස වා සපරිවාරං දානං දත්වා දිට්ඨධම්මිකං භෝගං වා යසං වා සුඛං වා අනුභවිතා සීලේන වා උපෝසථකම්මේන වා"ති?

"අත්ථි, මහාරාජ, චත්තාරෝ පුරිසා දානං දත්වා සීලං සමාදියිත්වා උපෝසථකම්මං කත්වා දිට්ඨේව ධම්මේ තේනේව සරීරදේහේන තිදසපුරේ සමනුප්පත්තා"ති [යසමනුපත්තාති (සී. පී.)]. "කෝ ච කෝ ච භන්තේ"ති? "මන්ධාතා, මහාරාජ, රාජා, නිමි රාජා, සාධීනෝ රාජා, ගුත්තිලෝ ච ගන්ධබ්බෝ"ති.

"භන්තේ නාගසේන, අනේකේහි තං භවසහස්සේහි අන්තරිතං, ද්වින්නම්පේතං අම්හාකං [දීපිතං, අම්හාකම්පේතං (ක.)] පරෝක්ඛං, යදි සමත්ථෝසි වත්තමානකේ භවේ භගවතෝ ධරමානකාලේ කථේහී"ති? "වත්තමානකේපි, මහාරාජ, භවේ පුණ්ණකෝ දාසෝ ථේරස්ස සාරිපුත්තස්ස භෝජනං දත්වා තදහේව සෙට්ඨිට්ඨානං අජ්ඣුපගතෝ, සෝ ඒතරහි පුණ්ණකෝ සෙට්ඨීති පඤ්ඤායි, ගෝපාලමාතා දේවී අත්තනෝ කේසේ වික්කිණිත්වා ලද්ධේහි අට්ඨහි කහාපණේහි ථේරස්ස මහාකච්චායනස්ස අත්තට්ඨමකස්ස පිණ්ඩපාතං දත්වා තදහේව රඤ්ඤෝ චන්දපජ්ජෝතස්ස [උදේනස්ස (සී. පී.)] අග්ගමහේසිට්ඨානං පත්තා. සුප්පියා උපාසිකා අඤ්ඤතරස්ස ගිලානභික්ඛුනෝ අත්තනෝ ඌරුමංසේන පටිච්ඡාදනීයං දත්වා

දුතියදිවසේ යේව රූළ්හවණා සඤ්ජ්ඡවී [සච්ඡවි (සී. පී.)] අරෝගා ජාතා. මල්ලිකා දේවී භගවතෝ ආභිදෝසිකං කුම්මාසපිණ්ඩං දත්වා තදහේව රඤ්ඤෝ කෝසලස්ස අග්ගමහේසී ජාතා. සුමනෝ මාලාකාරෝ අට්ඨහි සුමනපුප්ඵමුට්ඨීහි භගවන්තං පූජෙත්වා තං දිවසං යේව මහාසම්පත්තිං පත්තෝ. ඒකසාටකෝ බ්‍රාහ්මණෝ උත්තරසාටකේන භගවන්තං පූජෙත්වා තං දිවසං යේව සබ්බට්ඨකං ලභි, සබ්බේපේතේ, මහාරාජ, දිට්ඨධම්මිකං භෝගඤ්ච යසඤ්ච අනුභවිංසූ"ති.

"භන්තේ නාගසේන, විචිනිත්වා පරියේසිත්වා ඡ ජනේ යේව අද්දසාසී"ති. "ආම, මහාරාජා"ති. "තේන හි, භන්තේ නාගසේන, අකුසලං යේව අධිමත්තං බලවතරං, නෝ තථා කුසලං. අහඤ්හි, භන්තේ නාගසේන, ඒකදිවසං යේව දසපි පුරිසේ පස්සාමි පාපස්ස කම්මස්ස විපාකේන සූලේසු ආරෝපෙන්තේ, වීසම්පි තිංසම්පි චත්තාලීසම්පි පඤ්ඤාසම්පි පුරිසසතම්පි පුරිසසහස්සම්පි පස්සාමි පාපස්ස කම්මස්ස විපාකේන සූලේසු ආරෝපෙන්තේ. නන්දකුලස්ස, භන්තේ නාගසේන, භද්දසාලෝ නාම සේනාපතිපුත්තෝ අහෝසි. තේන ච රඤ්ඤා චන්දගුත්තේන සඞ්ගාමෝ සමූපබ්බූළ්හෝ අහෝසි. තස්මිං ඛෝ පන, භන්තේ නාගසේන, සඞ්ගාමේ උභතෝ බලකායේ අසීතිකබන්ධරූපානි අහේසුං, ඒකස්මිං කිර සීසකබන්ධේ පරිපාතේ [පරිපුණ්ණේ (සබ්බත්ථ)] ඒකං කබන්ධරූපං උට්ඨහති, සබ්බේපේතේ පාපස්සේව කම්මස්ස විපාකේන අනයබ්‍යසනං ආපන්නා. ඉමිනාපි, භන්තේ නාගසේන, කාරණේන භණාමි අකුසලං යේව අධිමත්තං බලවතරං, නෝ තථා කුසල"න්ති.

"සුය්‍යති, භන්තේ නාගසේන, ඉමස්මිං බුද්ධසාසනේ කෝසලේන රඤ්ඤා අසදිසදානං දින්න"න්ති? "ආම, මහාරාජ, සුය්‍යතී"ති. "අපි නු ඛෝ, භන්තේ නාගසේන, කෝසලරාජා තං අසදිසං දානං දත්වා තතෝනිදානං කඤ්චි දිට්ඨධම්මිකං භෝගං වා යසං වා සුඛං වා පටිලභී"ති [පටිලභතීති (ක.)]? "න හි, මහාරාජා"ති. "යදි, භන්තේ නාගසේන, කෝසලරාජා ඒවරූපං අනුත්තරං දානං දත්වාපි න ලභි [න ලභති (ක.)] තතෝනිදානං කඤ්චි දිට්ඨධම්මිකං භෝගං වා යසං වා සුඛං වා, තේන හි, භන්තේ නාගසේන, අකුසලං යේව අධිමත්තං බලවතරං, නෝ තථා කුසල"න්ති.

"පරිත්තතත්තා, මහාරාජ, අකුසලං ඛිප්පං පරිණමති, විපුලත්තා කුසලං දීඝේන කාලේන පරිණමති, උපමායපි, මහාරාජ, ඒතං උපපරික්ඛිතබ්බං. යථා, මහාරාජ, අපරන්තේ ජනපදේ කුමුදභණ්ඩිකා නාම ධඤ්ඤජාති මාසලූනා [මාසපූරා (ක.)] අන්තෝගේහගතා හෝති, සාලයෝ ඡප්පඤ්චමාසේහි පරිණමන්ති, කිං පනෙත්ථ, මහාරාජ, අන්තරං කෝ විසේසෝ කුමුදභණ්ඩිකාය ච සාලීනඤ්චා"ති? "පරිත්තතත්තා, භන්තේ, කුමුදභණ්ඩිකාය, විපුලත්තා ච සාලීනං. සාලයෝ, භන්තේ නාගසේන, රාජාරහා රාජභෝජනං, කුමුදභණ්ඩිකා දාසකම්මකරානං භෝජන"න්ති. "ඒවමේව ඛෝ, මහාරාජ, පරිත්තතත්තා අකුසලං ඛිප්පං පරිණමති, විපුලත්තා කුසලං දීඝේන කාලේන පරිණමතී"ති.

"යං තත්ථ, භන්තේ නාගසේන, ඛිප්පං පරිණමති, තං නාම ලෝකේ අධිමත්තං බලවතරං, තස්මා අකුසලං බලවතරං, නෝ තථා කුසලං. යථා නාම, භන්තේ නාගසේන, යෝ කෝචි යෝධෝ මහතිමහායුද්ධං පවිසිත්වා පටිසත්තුං උපකච්ඡකේ ගහෙත්වා ආකඩ්ඪිත්වා ඛිප්පතරං සාමිනෝ උපනෙය්‍ය, සෝ යෝධෝ ලෝකේ සමත්ථෝ සූරෝ නාම. යෝ ච භිසක්කෝ ඛිප්පං සල්ලං උද්ධරති රෝගමපනේති, සෝ භිසක්කෝ ඡේකෝ නාම. යෝ ගණකෝ සීඝසීඝං ගණෙත්වා ඛිප්පං දස්සයති, සෝ

ගණකෝ ඡේකෝ නාම. යෝ මල්ලෝ ඛිප්පං පටිමල්ලං උක්ඛිපිත්වා උත්තානකං පාතේති, සෝ මල්ලෝ සමත්ථෝ සූරෝ නාම. ඒවමේව ඛෝ, භන්තේ නාගසේන, යං ඛිප්පං පරිණාමති කුසලං වා අකුසලං වා, තං ලෝකේ අධිමත්තං බලවතර"න්ති.

"උභයම්පි තං, මහාරාජ, කම්මං සම්පරායවේදනීයමේව, අපි ච ඛෝ අකුසලං සාවජ්ජතාය ඛණේන දිට්ඨධම්මවේදනීයං හෝති, පුබ්බකේහි, මහාරාජ, ඛත්තියේහි ඨපිතෝ ඒසෝ නියමෝ 'යෝ පාණං හනති, සෝ දණ්ඩාරහෝ…පෙ…. යෝ අදින්නං ආදියති…පෙ…. යෝ පරදාරං ගච්ඡති…පෙ…. යෝ මුසා භණති…පෙ…. යෝ ගාමං ඝාතේති…පෙ…. යෝ පන්ථං දූසේති…පෙ…. යෝ නිකතිං කරෝති…පෙ…. යෝ වඤ්චනං කරෝති, සෝ දණ්ඩාරහෝ වධිතබ්බෝ ඡේත්තබ්බෝ භෙත්තබ්බෝ හන්තබ්බෝ'ති. තං තේ උපාදාය විචිනිත්වා විචිනිත්වා දණ්ඩෙන්ති වධෙන්ති ඡින්දන්ති භින්දන්ති හනන්ති ච, අපි නු, මහාරාජ, අත්ථි කේහිචි ඨපිතෝ නියමෝ 'යෝ දානං වා දේති, සීලං වා රක්ඛති, උපෝසථකම්මං වා කරෝති, තස්ස ධනං වා යසං වා දාතබ්බ'න්ති; අපි නු තං විචිනිත්වා විචිනිත්වා ධනං වා යසං වා දෙන්ති, චෝරස්ස කතකම්මස්ස වධබන්ධනං විය"ති? "න හි, භන්තෙ"ති. "යදි, මහාරාජ, දායකානං විචිනිත්වා විචිනිත්වා ධනං වා යසං වා දදෙය්‍යුං, කුසලම්පි දිට්ඨධම්මවේදනීයං භවෙය්‍ය, යස්මා ච ඛෝ, මහාරාජ, දායකේ න විචිනන්ති 'ධනං වා යසං වා දස්සාමා'ති, තස්මා කුසලං න දිට්ඨධම්මවේදනීයං. ඉමිනා, මහාරාජ, කාරණේන අකුසලං දිට්ඨධම්මවේදනීයං, සම්පරායේව සෝ අධිමත්තං බලවතරං වේදනං වේදයතී"ති. "සාධු, භන්තේ නාගසේන, තවාදිසේන බුද්ධිමන්තේන විනා නේසෝ පඤ්හෝ සුනිබ්බේඨියෝ, ලෝකිකං, භන්තේ නාගසේන, ලෝකුත්තරේන විඤ්ඤාපිත"න්ති.

**[මිලින්දපඤ්හෝ (ඡට්ඨසඞ්ගායනා කුසලාකුසලබලවතරපඤ්හෝ අංක 03 යටතේ); මිලින්දපඤ්හෝ 252-256 පිටු]**

ස්වාමීණි, නාගසේනයන් වහන්ස, කුශල කර්මය හෝ අකුශල කර්මය හෝ මේ දෙකින් කවරෙක් විශේෂයෙන්ම බලවතරවීදැ? යි විචාළෝය. මහරජාණෙනි! කුශල කර්මය විශේෂයෙන්ම බලතර වන්නේය. අකුශල කර්මය එසේ අධිකතර නැතැයි වදාළ සේක. ස්වාමීණි නාගසේනයන් වහන්ස! කුශල කර්මය විශේෂයෙන්ම බලතර වන්නේය, අකුශල කර්මය එසේ අධිකතර නැතැයි කියා වදාළ ඒ වචනය මම නොපිළිගන්නෙමි. ස්වාමීණි නාගසේනයන් වහන්ස මේ ලෝකයෙහි ප්‍රාණඝාතය කරනුවෝ ද දනා අයත් වස්තු වස්තු සොරකමින් හෝ බලහත්කාරයෙන් ග්‍රහණය කරනුවෝ ද සස්වාමික ස්ත්‍රී-පුරුෂයන් සම්බන්ධී වූ කාමයෙහි මිත්‍යාව හැසිරෙනුවෝ ද මුසාවාද කියනුවෝ ද ගාමඝාතකයෝ ද මාර්ගයෙහි යන-එන්නන් නසා වස්තු පැහැර ගන්නෝ ද සැගවී හිඳ වස්තු පැහැර ගන්නා වූ නේකතිකයෝ ද නොයෙක් වංචන ප්‍රයෝග ඇත්තාහු ද යනාදී සත්‍වයෝ දක්නා ලැබෙති. ඒ සියළු ජනයෝ එපමණ වූ පාප ක්‍රියාවෙන් හස්තච්ඡේදනය, පාදච්ඡේදනය, කර්ණච්ඡේදනය, නාසච්ඡේදනය, කර්ණනාසාච්ඡේදනය, බිලඞ්ගතාලික වධය, සඞ්කමුණ්ඩ වධය, රාජමුඛ වධය, ජෝතිමාලික වධය, හත්ථප්පජ්ජෝතික වධය, ඒරකවත්තික වධය, චීරකවාසික වධය, ඒණෙය්‍යක වධය, බලිසමංසික වධය, කහාපණක වධය, කාරාපතච්ඡික වධය, පලිඝපරිවත්තික වධය, පලාලපිට්ඨක වධය, හුණුකළ තෙලින් ඇඟ වත්කිරීමය, සුනඛයන් ලවා ඇඟ කවාලීමය, දිවස්හුල ගැගීමය, කඩුවෙන් හිස කැපීමය යනාදීන් නොයෙක් වධ බන්ධන ලබන්නාහුය. සමහර කෙනෙක් රාත්‍රියෙහි මිත්‍යාචාරාදී පාප ක්‍රියාවන් කොට දවල්හීම වධ බන්ධනාදී විපාක අනුභව කරන්නාහ. කිසිකෙනෙක් දවල්හි පාප ක්‍රියාවන් කොට එදවස්ම වධ බන්ධනාදිය අනුභව කරන්නාහ. සමහර කෙනෙක් දවල්හි ප්‍රාණඝාතාදී පව් කොට එදවස්ම රාත්‍රියෙහි

කර්කශ විපාක අනුභව කරන්නාහ. කිසිකෙනෙක් පව්වූ කර්ම කොට දෙතුන් දවසක් ඉකුත් වූ කල විපාක අනුභව කරන්නාහ. ඒ සියළු දෙනම ඉහාත්ම භාවයෙහිදීම විපාක දෙන්නා වූ දෘෂ්ටධර්මයෙහිම විපාක අනුභව කරන්නාහුය. ස්වාමීණි නාගසේනයන් වහන්ස! එක් නමකට හෝ දෙනමකට හෝ තුන් නමකට හෝ සතර නමකට හෝ පස් නමකට හෝ දස නමකට හෝ සියක් නමකට හෝ දහසක් නමකට හෝ ලක්‍ෂක් දෙනා වහන්සේට හෝ පිරිකර සහිත වූ මහදන්දී දෘෂ්ටධාර්මික වූ භෝගයක් හෝ යසසක් හෝ සැපතක් හෝ අනුභව කළාවූ යම්කිසි ශ්‍රද්ධාවත් වූ උපාසක කෙනෙක් ඇද්ද? සීලයෙන් හෝ උපෝසථ කර්මයෙන් හෝ මෙලොවම සැප ලැබූ කෙනෙක් ඇද්දැ? යි වදළෝය.

හැයි මහරජාණෙනි! දන් දී සිල් සමාදන්ව ගෙන පොහොය පෙහෙවී උපෝසථ කර්මය කොට දෘෂ්ටධර්මවේදනීය කුශල කර්මයෙන් එම ශරීර දේහයෙන්ම දිව්‍ය ලෝකයෙහි අනන්ත වූ යස සම්පත්තියට පැමිණියා වූ පුරුෂයෝ සතර දෙනෙක් ඇතැයි වදළ සේක. ස්වාමීණි ඔහු කවුරු කවරහු දැ? යි විචාළෝය.

මහරජාණෙනි! මහමන්ධාතු රජ්ජුරුවෝය, නිමි රජ්ජුරුවෝය, සාධීන රජ්ජුරුවෝය, ගන්ධර්වයෙහි දක්‍ෂ වූ ගුත්තිල පණ්ඩිතයෝයයි වදළ සේක. ස්වාමීණි නාගසේනයන් වහන්ස! ඒ කාරණය නොයෙක් සිය දහස් ගණන් ජාතියෙන් අතර වූ දෙයෙක. මේ නුඹවහන්සේ වදළ කාරණය අප දෙපක්‍ෂයටම පරොක්ඛයයි අනුමාන වූ නොදුටු කාරණයෙක. ඉඳින් ස්වාමීණි නුඹ වහන්සේ සමත්තයෙක් වී නම් මේ වර්තමාන කාලයෙහි අප බුදුන් ධර්මාන කාලයෙහි කථාවක් වදළ මැනවයි කීහ.

මහරජාණෙනි! මේ වර්තමාන භවයෙහි ද පුණ්ණක නම් දස තෙම සැරියුත් මහතෙරුන් වහන්සේට දන් දී එදවසෙහිම සිටු තනතුරට පැමිණියේය. ඒ පුණ්ණකයා දැන් මෙසමයෙහි පුණ්ණක සිටාණෝයයි කියා මුළුලොව ප්‍රසිද්ධ වීය. ගෝපාල මාතෘදේවී නම් දුක්පත් සිටු දුවණියෝ මාගේ හිසකේ කපා විකුණා ලත් අට කහවණුවකින් දන් සපයා මහා කෘත්‍යායන ස්ථවිරයන් වහන්සේ අටවැනි කොට ඇති සඟ අටනමකට පිණ්ඩපාත දනය දී එදවසෙහිම උදේනි නම් නරනිඳුන් හට අග්‍රමහේසිකා තනතුරට පැමිණියාය. සුප්පියා නම් උපාසිකා තොමෝ අන්‍යතර වූ උපසපන් ගිලන් නමකට තමාගේ කලවේ මාංශයෙන් මාංශ රසයක් කොට දන් දී දෙවැනි දවස්හි පිරි ප්‍රකෘති වූ වනච්ඡවි ඇතිව අරෝගී වූහ. මල්ලිකා දේවී ලොව්තුරා බුදුන්ට රැයක් ඉකුත්වීමෙන් ආභිදෝසික වූ කොමුපිඬු දන් දී එදස්හිම කොසොල් මහරජ හට අග්‍රමහේසිකා වූහ. සුමන මාලාකාර තෙම සමන්මල් අට මිටකින් ලොව්තුරා බුදුන්ට පූජා කොට එදවස්හිම මහත් වූ සම්පත්තියකට පැමිණියේය. ඒකසාටක බ්‍රාහ්මණ තෙම තමාගේ උතුරු සළුවෙන් බුදුන් පුද එදස්හිම ගම්වර අටක් බැගින් සියල්ලෙන්ම සබ්බට්ඨක නම් මහාරාජ සම්මානයක් ලැබූයේය. මහරජාණෙනි මේ කී සියළු දේම ඉහාත්ම භවයෙහිම ලැබිය යුතු දෘෂ්ටධාර්මික වූ භෝගය ද යසස් ද අනුභව කළාහුය යයි වදළ සේක.

අනේ ස්වාමීණි නාගසේනයන් වහන්ස මහා සමුද්‍රයට වැද මුතු සයක් සොයාගත් කෙනෙකු මෙන් නුඹවහන්සේ මෙතෙක් ජිනේද්‍ර සාසනයට වැද සොය සොයා ගොස් සදෙනෙකුන්ම දැක වදළ සේකැයි කීය. එසේය මහරජ යැයි වදළ සේක. එහෙයින් ස්වාමීණි නාගසේනයන් වහන්ස අකුශල කර්මය විශේෂයෙන්ම බලවතර වන්නේය. කුශල කර්මය එසේ අධිකතර නැත්තේය. ස්වාමීණි නාගසේනයන් වහන්ස මම වනාහි එක දවසෙහිම පාප කර්මයාගේ විපාකයෙන් දිවස්හුල නඟන්නා

වූ පුරුෂයන් දසදෙනෙකුනුදු දක්නෙමි. විස්සකුදු තිහකුදු සතලිසකුදු පණස් දෙනෙකුනුදු පුරුෂයන් දක්නෙමි. පාප කර්මයාගේ විපාකයෙන් හුල හිඳුවන්නා වූ පුරුෂයන් සියයකුදු පුරුෂයන් දහසකුදු දක්නෙමි. තවද ස්වාමීණි නාගසේනයන් වහන්ස මේ දඹදිවට අධිපතිව රජ කළ නන්දගුත්ත නම් බ්‍රාහ්මණ වංසයෙහි භද්‍රසාල නම් සේනාපති පුත්‍රයෙක් විය. හෙතෙම ශාක්‍යවංසාභිජාත වූ චන්‍ද්‍රගුප්ත නම් රජ හට විරුද්ධව අනන්ත සේනා වාහාන ගෙන ඒ චන්‍ද්‍රගුප්ත නම් රජු හා යුද්ධ කරනු පිණිස සන්නද්ධව අවුත් පැමිණි කල්හි මහත් වූ සංග්‍රාමෙක් පැමිණියේ විය. ස්වාමිණි නාගසේනයන් වහන්ස ඒ දෙදෙනාගේ යුද්ධයෙහි උභය පක්‍ෂයෙහි බලසේනායෙහි අසූවක් පමණ කවන්ධරූපීහු වූහ. ඇතුන් දසදහසක් හා අසුන් ලක්‍ෂයක් හා රථ පණස්දහස් එකසීයයක් හා පාබල සේනාවගෙන් සියක් කෝටියක් සත්ව ඝාතන යුද්ධ භූමියෙහි ශීර්ෂ රාසියට ශීර්ෂ කලන්ධයයි කියා පරසමය වාදීන්ගේ මතයෙක. ඒ එකම ශීර්ෂ කලන්ධයක් පරිපූර්ණ වූ කල්හි කවන්ධ රූපයයි කියන ලද හිස් නැති එක් මෘතශරීරයක් නැගිට යුද්ධ භූමියෙහි නටන්නේය. මෙබඳු කවන්ධ රූප අසූවෙක් වරින් වර ඒ යුද්ධ භූමියෙහි නැංගේය. මෙකී සියළු දෙනම පව්වු කර්මයාගේ විපාකයෙන් මහත් වූ අනයවියසනයට පැමිණියාහුය. ස්වාමීණි නාගසේනයන් වහන්ස මේ කාරණයෙනුදු අකුශලයම විශේෂයෙන්ම බලතර වන්නේයයි කියන්නෙමි. කුශලය එසේ අධිකතර නැත්තේය. ස්වාමීණි නාගසේනයන් වහන්ස මේ ගෞතම බුදුන්ගේ ශාසනයෙහි කොසොල් මහරජාණන් වහන්සේ විසින් අසදෘශ දනයක් දෙන ලද්දේයයි කියා අසන ලද්දේ ඇද? යි විචාළෝය. එසේය මහරජාණෙනි අසන ලද්දේ යයි වදළ සේක. කිමෙක් ද ස්වාමීණි නාගසේනයන් වහන්ස ඒ කොසොල් මහරජාණන් වහන්සේ ඒ අසදෘශ දනය දී ඒ හේතුවෙන් මදක්වත් දෘෂ්ටධාර්මික වූ භෝගයක් හෝ යසසක් හෝ සැපතක් හෝ ලැබූ සේක්දැයි විචාළෝය. නැත මහරජයි වදළ සේක. ඉදින් ස්වාමීනි නාගසේනයන් වහන්ස කොසොල් මහරජාණන් වහන්සේ මෙබඳු වූ නිරුත්තර වූ මහා දනයක් දීපියාත් ඒ දන් දුන් හේතුයෙන් දෘෂ්ටධාර්මික වූ භෝගයක් හෝ යසසක් හෝ සැපතක් හෝ නොලැබූ සෙක් වී නම් එහෙයින් ස්වාමීණි නාගසේනයන් වහන්ස අකුශලයම විශේෂයෙන්ම බලතර වන්නේය. කුශලය එසේ අධිකතර නැත්තේයයි කීහ.

මහරජාණෙනි අකුශලය ඉතා ස්වල්ප බැවින් වහාම පිරී නැමෙන්නේය. කුශල ඉතා මහත් බැවින් දීර්ඝකාලයෙකින් පිරී නැමෙන්නේය. මහරජාණෙනි මේ කාරණය උපමායෙනුදු පරීක්‍ෂා කටයුත්තේය. මහරජාණෙනි යම්සේ අපරන්ත ජනපදයෙහි වපුරන්නා වූ කුමුදුභණ්ඩිකා නම් ධාන්‍ය ජාතියක් මසින් සිඳින හෙයින් මසලු නම් විය. ඒ ධාන්‍ය ජාතිය ගොවියන්ගේ ඇතුළු ගෙට එක් මසින් යන ලද වන්නේය. හැල් ජාතිය පස් මාසයෙකින් ගොවියන්ගේ ගෙට පැමිණෙන්නේය. කිමෙක් ද මහරජාණෙනි කුමුදුභණ්ඩිකා නම් ශස්‍ය ජාතියගේ ද හැල් ජාතියගේ ද යන මේ දෙභාගයෙහි භේද වූ විශේෂය කවරේදැයි විචාළ සේක. ස්වාමීණි වහන්ස කුමුදුභණ්ඩික ධාන්‍ය ජාතියගේ ස්වල්ප බැවින් හා හැල් ජාතින්ගේ ඉතා මහත් බැවින. භවත් නාගසේනයන් වහන්ස හැල් ජාතිය නම් රාජාර්හ වන්නේය. රාජභෝජනය වන්නේය. කුමුදුභණ්ඩිකා ධාන්‍යය නම් දස කම්මකාරයන්ට භෝජනය වන්නේයයි කීහ. මහරජාණෙනි එපරිද්දෙන්ම අකුශලය ස්වල්ප බැවින් වහා පිරිනැමෙන්නේය. කුශලය ඉතා මහත් බැවින් දීර්ඝ කාලයකින් පිරිනැමෙන්නේ යයි වදළ සේක. ස්වාමීණි නාගසේනයන් වහන්ස එහි යමක් වහා පිරිනැමේ නම් ඒ දෙය ලෝකයෙහි විශේෂයෙන්ම බලතර නම් වන්නේය. ඒ කාරණයෙන් අකුශලය විශේෂයෙන්ම බලතර වන්නේය. කුශලය එසේ අධිකතර නැත්තේය. ස්වාමීණි නාගසේනයන් වහන්ස යම්සේ යම්කිසි යෝධයෙක් මහත් වූ මහායුද්ධ භූමියකට ගොස් බලවත් සතුරන් අල්වාගෙන හිස් කිසිල්ලෙන්

දැඩිකොටගෙන ඇඳගෙන වහාම තමාගේ ස්වාමීන්ට සමීප කොට නමන්නේ වී නම් ඒ යෝධ තෙම ලෝකයෙහි සමර්ථ නම් වන්නේය. ශූර නම් වන්නේය. යම් වෛද්‍යාචාරයෙක් තෙම අනුන් වෙර ඇනි උලක් වහා උගුළුවා සුවපත් කෙරේ ද ව්‍යාධි පහකොට සුවපත් කෙරේ ද ඒ වෛද්‍යාචාරී තෙම දක්‍ෂ නම් වන්නේය. යම් ගණකයෙක් වහ වහා ගණන් කොට කඩිනම දක්වා ද ඒ ගණකතෙම දක්‍ෂ නම් වන්නේය. යම් මල්ලවයෙක් වහාම ප්‍රතිමල්ලවයා ඔසවා උත්තාන කොට ඇඳ හෙලන්නේ වී නම් ඒ මල්ලව තෙම සමර්ථ වන්නේය. ශූර නම් වන්නේය. ස්වාමීණී නාගසේනයන් වහන්ස කුශලය හෝ අකුශලය හෝ යමක් වහාම පිරිනැමෙන්නේ වී නම් ඒ දෙය ලෝකයෙහි විශේෂයෙන්ම බලතර වන්නේයයි කීහ. මහරජාණෙනි මේ කුශලාකුශල කර්ම දෙකමත් අනතුරු භවයෙහි ඉෂ්ටානිෂ්ට වූ විපාකානිසංස විඳුවන්නේමය. එතකුදුවුවත් අකුශලය සාවද්‍ය බැවින් පව් කළ ඇසිල්ලෙන්ම දෘෂ්ටධර්මවේදනීය වූ දුක්ඛවිපාක වන්නේය. මහරජාණෙනි පූර්ව වූ රජදරුවන් විසින් යමෙක් ප්‍රාණඝාතය කළේ නම් හෙතෙම වධදණ්ඩයට ධනදණ්ඩයට සුදුසු වන්නේය. යමෙක් වස්තු ස්වාමීහු විසින් කයින් වචසින් නොදුන් වස්තු සොරකමින් හෝ බලහත් කාරයෙන් ගනී ද යමෙක් අනුන් පිළිබඳ ස්ත්‍රීන් කෙරෙහි හැසිරේ ද යමෙක් මුසාවාද කියා ද යමෙක් මංපැහැර ගනී ද යමෙක් සැඟවීහිඳ වස්තු පැහැර ගැනීම් ආදී වූ වඤ්චන ප්‍රයෝග කෙරේ ද වධදණ්ඩයට ධනදණ්ඩයට සුදුසු වන්නේය. ඔහු අල්වා වධ කළ යුත්තේය. කැපිය යුත්තේය. බින්ද යුත්තේය. නැසිය යුත්තේයයි කියා මේ නියමය තබන ලද්දේය. ඒ නියමය කළ වධ්‍යයා (වධය) සොයාගෙන ඒ වධකාරක ජනයෝ දඬුවම් කෙරෙති. වධ කෙරෙති. හිස් කපති. අත් පා බිඳිති. ජීවිතය නසති. කිමෙක් ද මහරජාණෙනි යමෙක් දනයක් හෝ දේද සීලයක් හෝ රක්‍ෂා කෙරේ ද උපෝසථ කර්මයක් හෝ කෙරේ ද ඕහට ධනයක් හෝ යසසක් හෝ දියයුත්තේ යයි කියා කිසිකෙනෙකුන් විසින් තබන ලද්දවූ නියමයෙක් ඇද්ද, නොහොත් කරනලද පාප ක්‍රියා ඇති සොරහු හට කරන වධ බන්ධනය මෙන් ඒ සුචරිත ක්‍රියාව කළාවූ පුරුෂයා සොයා ධනයක් හෝ යසසක් හෝ දෙන්නාහුදැයි විචාළ සේක. නැත ස්වාමීනි වහන්ස යැයි කීහ.

ඉඳින් මහරජාණෙනි දයකයන්ටත් සොය සොයා ධන සම්පත් හෝ යස සම්පත් හෝ දෙන්නාහු වී නම් කුශල ධර්මයන් දෘෂ්ටධර්මවේදනීය වන්නේය. මහරජාණෙනි යම්හෙයකින් ධනයක් හෝ යසසක් හෝ දෙම්හයි කියා කිසිකෙනෙක් දයකයන් නොසොයත් ද එහෙයින් කුශල කර්මය දෘෂ්ටධර්මවේදනීය නොවන්නීය. මහරජාණෙනි මේ කාරණයෙනුදු අකුශල කර්මය දෘෂ්ටධර්මවේදනීය වන්නේය. යම් දයකයෙක් පරලෙව්හි සැප වේදනාව විඳිනු ලැබේ ද එහෙයින් ඒ කුශල කර්මය විශේෂයෙන්ම අධිකතරයයි වදළ සේක. සාධු සාධු ස්වාමීණී නාගසේනයන් වහන්ස නුඹවහන්සේ හා සදෘශ වූ ප්‍රඥවතුන් වහන්සේ කෙනෙකුන් විසින් හැර මේ ප්‍රශ්නය සුනිර්වේඨනය කළහැකි නොවන්නේය. ස්වාමීණී නාගසේනයන් වහන්ස මා විචාළ මේ ලෞකික වූ ප්‍රශ්නය ලෝකෝත්තර වූ අර්ථයෙන් හඟවන ලදැයි ස්තෝත්‍ර කළහ.

**[සිංහල මිලින්ද ප්‍රශ්නය 16-21 පිටු]**

## සෝමනස්ස-උපේක්‍ෂා දෙදෙනාගේ බලව-දුබල භාවය:—

තත්ථ සබ්බේපි සබ්බඤ්ඤුබෝධිසත්තා පච්ඡිමපටිසන්ධිග්ගහණේ පඨමේන සෝමනස්සසහගතතිහේතුකඅසඞ්ඛාරිකමහාවිපාකචිත්තේන පටිසන්ධිං ගණ්හන්ති. තං පන මෙත්තාපුබ්බභාගචිත්තස්ස විපාකං හෝති. තේන දින්නාය පටිසන්ධියා අසඞ්ඛෙය්‍යයං ආයු. කාලවසේන පන පරිණමති. **මහාසීවත්ථේරෝ** පනාහ; 'සෝමනස්සසහගතතෝ උපෙක්ඛාසහගතං බලවතරං. තේන පටිසන්ධිං ගණ්හන්ති.

තේන ගහිතපටිසන්ධිකා හි මහජ්ඣාසයා හොන්ති. දිබ්බේසුපි ආරම්මණේසු උප්පිලාවිනෝ න හොන්ති, තිපිටකචූළනාගත්ථේරාදයෝ විය'ති. අට්ඨකථායං පන 'අයං ථේරස්ස මනෝරථෝ,' 'නත්ථි ඒත'න්ති පටික්ඛිපිත්වා 'සබ්බඤ්ඤුබෝධිසත්තානං හිතූපචාරෝ බලවා හෝති, තස්මා මෙත්තාපුබ්බභාග කාමාවචර කුසලවිපාක සෝමනස්සසහගතතිහේතුක අසඞ්ඛාරික චිත්තේන පටිසන්ධිං ගණ්හන්තී'ති වුත්තං.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 498 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 236 පිට (හේ.වි.මු)]**

ඒතේසු බලවං දුබ්බලඤ්ච විචාරේතුං **"තත්ථ සබ්බේපි සබ්බඤ්ඤුබෝධිසත්තා"**තිආදිමාහ. **කාලවසේන පන පරිණමතී**ති අප්පායුකසංවත්තනිකකම්මබහුලේ කාලේ තං කම්මසහිත සන්තානජනිත සුක්කසෝණිතපච්චයානං තං මූලකානං චන්දසූරිය විසමපරිවත්තාදිජනිතඋතාහාරාදිවිසමපච්චයානඤ්ච වසේන පරිණමති.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 498 යටතේ)]**

පඨමපඤ්චමචිත්තානං අඤ්ඤමඤ්ඤබලවදුබ්බලභාවවිචාරේන දුතියඡට්ඨාදීනම්පි සෝ විචාරිතෝ හෝතීති **"ඒතේසු බලවං දුබ්බලඤ්ච විචාරේතු"**න්ති වුත්තං. යථා සාලිආදීනං ඨද්ධමුදුභූමිවසේන තිණාදීනං අනිහරණනිහරණවසේන උතුආදිඅවසේසපච්චයානං විපත්තිසම්පත්තිවසේන ච ඵලවිසේසයෝගෝ, ඒවං කම්මස්ස සුගතිදුග්ගතිවසේන අවිසුද්ධවිසුද්ධපයෝගවසේන උපපත්තියා විපත්තිසම්පත්තිවසේන ච විසිට්ඨඵලතාය පරිණාමනං, ඒවමේව ගිම්හවස්සකාලාදීසු බීජානං ඵලවිසේසයෝගෝ විය තං තං කාලවිසේසේන කම්මස්ස ඵලවිසේසයෝගෝ හෝතීති ආහ **"කාලවසේන පරිණමතී"**ති. **සුක්කසෝණිතපච්චයාන**න්ති කම්මවිසේස පරිභාවිත සන්තානුප්පන්නතාය සුක්කසෝණිතානං ආයුවිසේසහේතුභාවමාහ සුක්කසෝණිතවසේනපි වණ්ණාදිවිසේසදස්සනතෝ, යේන "පිතූනං ආකාරං පුත්තෝ අනුවිදහතී"ති වුච්චති. **තං මූලකාන**න්ති අප්පායුකසංවත්තනියකම්මමූලකානං. **ආහාරාදීති ආදි**-සද්දේන විසමූපක්කමාදයෝ පරිග්ගණ්හාති.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 498 යටතේ)]**

**තත්ථ** ඒ සෝමනස්ස උපේක්ෂා දෙසිත අතුරින් **සබ්බේපි සබ්බඤ්ඤුබෝධිසත්තා** සර්වඥ බෝධිසත්වයන් වහන්සේලා සියළු දෙන **පච්ඡිමපටිසන්ධිග්ගහණේ** පශ්චිම ප්‍රතිසන්ධි ගැනීමෙහි **පඨමේන** ප්‍රථම **සෝමනස්සසහගතතිහේතුකඅසඞ්ඛාරිකමහාවිපාකචිත්තේන** සොම්නස් සහගත වේදනාව සහ ගියාවූ ත්‍රිහේතුක අසංස්කාරික මහාවිපාක සිතින් **පටිසන්ධිං ගණ්හන්ති** ප්‍රතිසන්ධිය ගනිත් **තං පන** ඒ ප්‍රතිසන්ධිය වනාහි **මෙත්තාපුබ්බභාගචිත්තස්ස** මෛත්‍රී පූර්වභාග චිත්තයාගේ **විපාකං හෝති** විපාකයක් වෙයි **තේන** ඒ මෛත්‍රී පූර්වභාග විපාක චිත්තයෙන් **දින්නාය පටිසන්ධියා** දෙනලද ප්‍රතිසන්ධියෙන් **ආයු** ආයුෂ **අසඞ්ඛෙය්‍යං (හෝති)** අසඞ්ඛෙය්‍යක් වෙයි **කාලවසේන පන** නැවත කාල වශයෙන් වනාහි **පරිණමති** වෙනස් වෙයි (කාලවසේන පරිණමති යනු අල්ප ආයුෂ ඇති කර්ම බහුල කාලයෙහි ඒ කර්ම සහිත සන්තානයෙන් උපන් ශුක්‍ර සෝණිත ප්‍රත්‍යය මූලික වූ ඒ ප්‍රතිසන්ධියට සඳ හිරු දෙදෙනගේ විෂම පරිවර්තනාදියෙන් හටගත් උතු ආහාර ආදී විෂම ප්‍රත්‍යයන්ගේ වශයෙන් වෙනස් වේ. යනු මූ. ටීකායි) **මහාසිවත්ථේරෝ පන** මහාසිව තෙරුන් වහන්සේ වනාහි **සෝමනස්සසහගතතෝ** සෝමනස්සසහගත ප්‍රතිසන්ධියට වඩා **උපෙක්ඛාසහගතං** උපේක්ෂා සහගත ප්‍රතිසන්ධිය **බලවතරං**

**(හෝති)** බලවත් වෙයි **තේන** එයින් **පටිසන්ධිං** ප්‍රතිසන්ධිය **ගණ්හන්ති** ගනිත් **තේන** එයින් **ගහිතපටිසන්ධිකා හි** ගන්නාලද ප්‍රතිසන්ධිය ඇති පුද්ගලයෝ වනාහි **මහජ්ඣාසයා හොන්ති** මහත් අදහස් ඇති පුද්ගලයෝ වෙත් **දිබ්බේසුපි ආරම්මණේසු** දිව්‍ය ආරම්මණයන්හි ද **උප්පිලාවිනෝ න හොන්ති** ප්‍රීතිමත් වන්නාහු නොවෙත් **ත්‍රිපිටකචූලනාගත්ථේරාදයෝ විය** ත්‍රිපිටක චූලනාග තෙරුන් වහන්සේලා මෙන් යැයි **ආහ** කීවේය **අට්ඨකථායං** අර්ථකථායෙහි **අයං පන** මේ කීම වනාහි **ථේරස්ස** තෙරුන්වහන්සේගේ **මනෝරථෝ** අදහසකි **ඒතං** එකරුණ **නත්ථි ඉති** එසේ නොවේයැයි **පටික්ඛිපිත්වා** ප්‍රතික්ෂේප කොට **සබ්බඤ්ඤු බෝධිසත්තානං** සර්වඥ බෝසතානන් වහන්සේලාගේ **හිතූපචාරෝ** හිතෝපචාරය **බලවා හෝති** බලවත් වෙයි **තස්මා** එහෙයින් **මෙත්තාපුබ්බභාගකාමාවචරකුසලවිපාකසෝමනස්සසහගත-තිහේතුකඅසඞ්ඛාරිකචිත්තේන** මෛත්‍රී පූර්වභාග කාමාවචර කුසල විපාක සෝමනස්ස සහගත ත්‍රිහේතුක අසංස්කාරික සිතින් **පටිසන්ධිං ගණ්හන්ති ඉති** ප්‍රතිසන්ධිය ගනිත් යැයි **වුත්තං** දේශනා කරනලදි. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තන]**

ඉමේසු පන අට්ඨසු චිත්තේසු සෝමනස්සසහගතතෝ උපෙක්ඛාසහගතං බලවතරං, ඤාණවිප්පයුත්තතෝ ඤාණසම්පයුත්තං, සසඞ්ඛාරිකතෝ අසඞ්ඛාරිකං සදිසං බලවතරං. විසදිසං පන වේදනාඤාණප්පයෝගවසේන බලවං, දුබ්බලඤ්ච හෝති.සෝමනස්සසහගතතිහේතුකඅසඞ්ඛාරිකතෝ හි උපෙක්ඛාසහගතතිහේතුක-සසඞ්ඛාරිකං බලවතරං, උපෙක්ඛාසහගතදුහේතුකඅසඞ්ඛාරිකතෝ සොමනස්ස-සහගතතිහේතුකඅසඞ්ඛාරිකං බලවතරං. ඉති චතුත්ථචිත්තතෝ තතියචිත්තං බලවතරං, තතෝ අට්ඨමචිත්තං, තතෝ සත්තමචිත්තං, තතෝ දුතියචිත්තං, තතෝ පඨමචිත්තං, තතෝ ඡට්ඨචිත්තං, තතෝ පඤ්චමචිත්තන්ති ඒවම්මේසං බලවබලවතරභාවෝ වේදිතබ්බෝ.
**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 25 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 92 පිට]**

මේ සිත් අට අතුරෙන් සොම්නස් සහගත සිතට වඩා උපෙක්ෂා සහගත සිත අතිශයින් බලවත් වෙයි. ඤාණවිප්‍රයුක්ත සිතට වඩා ඤාණසම්ප්‍රයුක්ත සිත ඉතා බලවත් වෙයි. සසංස්කාරික සිතට වඩා අසංස්කාරික සදෘශ සිත ඉතා බලවත් වෙයි. විසදෘශ සිත වනාහි වේදනා-ඤාණ-යෝග වශයෙන් බලවත්ද දුර්වල ද වෙයි. සොම්නස් සහගත ත්‍රිහේතුක අසංස්කාරික සිතට වඩා උපෙක්ෂා සහගත ත්‍රිහේතුක සසංස්කාරික සිත ඉතා බලවත් වෙයි. උපෙක්ෂා සහගත දුහේතුක අසංස්කාරික සිතට වඩා සොම්නස් සහගත ත්‍රිහේතුක අසංස්කාරික සිත ඉතා බලවත් වෙයි. මෙසේ සතරවැනි සිතට වඩා තුන්වෙනි සිත ඉතා බලවත් වෙයි. ඊට වඩා අටවැනි සිතද ඊට වඩා සත්වැනි සිතද ඊට වඩා දෙවැනි සිතද ඊට වඩා පළමුවැනි සිතද ඊට වඩා සවැනි සිතද ඊට වඩා පස්වැනි සිතදැයි මෙසේ මේ අටවැදෑරුම් මහා කුසල චිත්තයන්ගේ අතිශයින් බලවත්බව දතයුත්තේයි **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 62 පිට]**

ඕළාරිකසුඛුමනිද්දෙසේ **අකුසලා වේදනා**තිආදීනි ජාතිතෝ ඕළාරිකසුඛුමභාවං දස්සේතුං වුත්තානි. **දුක්ඛා වේදනා ඕළාරිකා**තිආදීනි සභාවතෝ. **අසමාපන්නස්ස වේදනා**තිආදීනි පුග්ගලතෝ. **සාසවා**තිආදීනි ලෝකියලෝකුත්තරතෝ ඕළාරිකසුඛුමභාවං දස්සේතුං වුත්තානි. තත්ථ අකුසලා තාව සදරථට්ඨේන දුක්ඛවිපාකට්ඨේන ච ඕළාරිකා. කුසලා නිද්දරථට්ඨේන සුඛවිපාකට්ඨේන ච සුඛුමා. අබ්‍යාකතා නිරුස්සාහට්ඨේන අවිපාකට්ඨේන ච සුඛුමා. කුසලාකුසලා සඋස්සාහට්ඨේන සවිපාකට්ඨේන ච ඕළාරිකා. අබ්‍යාකතා වුත්තනයේනේව සුඛුමා.

දුක්ඛා අසාතට්ඨේන දුක්ඛට්ඨේන ච ඕළාරිකා. සුඛා සාතට්ඨේන සුඛට්ඨේන ච සුඛුමා. අදුක්ඛමසුඛා සන්තට්ඨේන පණීතට්ඨේන ච සුඛුමා. සුඛදුක්ඛා ඛෝභනට්ඨේන ඵරණට්ඨේන ච ඕළාරිකා. සුඛවේදනාපි හි ඛෝභේති ඵරති. තථා දුක්ඛවේදනාපි. සුඛඤ්හි උප්පජ්ජමානං සකලසරීරං ඛෝභෙන්තං ආලුළෙන්තං අභිසන්දයමානං මද්දයමානං ඡාදයමානං සීතෝදකඝටේන ආසිඤ්චයමානං විය උප්පජ්ජති. දුක්ඛං උප්පජ්ජමානං තත්තඵාලං අන්තෝ පවෙසන්තං විය තිණුක්කාය බහි ඣාපයමානං විය උප්පජ්ජති. අදුක්ඛමසුඛා පන වුත්තනයේනේව සුඛුමා. අසමාපන්නස්ස වේදනා නානාරම්මණේ වික්ඛිත්තභාවතෝ ඕළාරිකා. සමාපන්නස්ස වේදනා ඒකත්තනිමිත්තේයේව චරතීති සුඛුමා. සාසවා ආසවුප්පත්තිහේතුතෝ ඕළාරිකා. ආසවචාරෝ නාම ඒකන්තඕළාරිකෝ. අනාසවා වුත්තවිපරියායේන සුඛුමා.

තත්ථ ඒකෝ නේව කුසලත්තිකේ කෝවිදෝ හෝති, න වේදනාත්තිකේ. සෝ "කුසලත්තිකං රක්ඛාමී"ති වේදනාත්තිකං භින්දති; "වේදනාත්තිකං රක්ඛාමී"ති කුසලත්තිකං භින්දති. ඒකෝ "තිකං රක්ඛාමී"ති භූමන්තරං භින්දති. ඒකෝ න භින්දති. කථං? "සුඛදුක්ඛා වේදනා ඕළාරිකා, අදුක්ඛමසුඛා වේදනා සුඛුමා"ති හි වේදනාත්තිකේ වුත්තං. තං ඒකෝ පටික්ඛිපති; න සබ්බා අදුක්ඛමසුඛා සුඛුමා. සා හි කුසලාපි අත්ථි අකුසලාපි අබ්‍යාකතාපි. තත්ථ කුසලාකුසලා ඕළාරිකා, අබ්‍යාකතා සුඛුමා. කස්මා? කුසලත්තිකේ පාළියං ආගතත්තාති. ඒවං කුසලත්තිකෝ රක්ඛිතෝ හෝති, වේදනාත්තිකෝ පන භින්නෝ.

"කුසලාකුසලා වේදනා ඕළාරිකා, අබ්‍යාකතා වේදනා සුඛුමා"ති යං පන කුසලත්තිකේ වුත්තං, තං ඒකෝ පටික්ඛිපති; න සබ්බා අබ්‍යාකතා සුඛුමා. සා හි සුඛාපි අත්ථි දුක්ඛාපි අදුක්ඛමසුඛාපි. තත්ථ සුඛදුක්ඛා ඕළාරිකා, අදුක්ඛමසුඛා සුඛුමා. කස්මා? වේදනාත්තිකේ පාළියං ආගතත්තාති. ඒවං වේදනාත්තිකෝ රක්ඛිතෝ හෝති, කුසලත්තිකෝ පන භින්නෝ. කුසලත්තිකස්ස පන ආගතට්ඨානේ වෙදනාත්තිකං අනෝලෝකෙත්වා වේදනාත්තිකස්ස ආගතට්ඨානේ කුසලත්තිකං අනෝලෝකෙත්වා කුසලාදීනං කුසලත්තිකලක්ඛණේන, සුඛාදීනං වේදනාත්තිකලක්ඛණේන ඕළාරිකසුඛුමතං කථෙන්තෝ න භින්දති නාම.

යම්පි "කුසලාකුසලා වේදනා ඕළාරිකා, අබ්‍යාකතා වේදනා සුඛුමා"ති කුසලත්තිකේ වුත්තං, තත්ථේකෝ "කුසලා ලෝකුත්තරවේදනාපි සමානා ඕළාරිකා නාම, විපාකා අන්තමසෝ ද්විපඤ්චවිඤ්ඤාණසහජාතාපි සමානා සුඛුමා නාම හෝතී"ති වදති. සෝ ඒවරූපං සන්තං පණීතං ලෝකුත්තරවේදනං ඕළාරිකං නාම කරොන්තෝ, ද්විපඤ්චවිඤ්ඤාණසම්පයුත්තං අහේතුකං හීනං ජළං වේදනං සුඛුමං නාම කරොන්තෝ "තිකං රක්ඛිස්සාමී"ති භූමන්තරං භින්දති නාම. තත්ථ තත්ථ භූමියං කුසලං පන තං තං භූමිවිපාකේනේව සද්ධිං යෝජෙත්වා කථෙන්තෝ න භින්දති නාම. තත්‍රායං නයො; කාමාවචරකුසලා හි ඕළාරිකා; කාමාවචරවිපාකා සුඛුමා. රූපාවචරාරූපාවචරලෝකුත්තරකුසලා ඕළාරිකා; රූපාවචරාරූපාවචර ලෝකුත්තර විපාකා සුඛුමාති. ඉමිනා නීහාරේන කථෙන්තෝ න භින්දති නාම.

**තිපිටකචූළනාගත්ථේරෝ** පනාහ; "අකුසලේ ඕළාරිකසුඛුමතා නාම න උද්ධරිතබ්බා. තඤ්හි ඒකන්තඕළාරිකමේව. ලෝකුත්තරේපි ඕළාරිකසුඛුමතා න උද්ධරිතබ්බා. තඤ්හි ඒකන්තසුඛුම"න්ති. ඉමං කථං ආහරිත්වා තිපිටකචූළාභයත්ථේරස්ස කථයිංසු; ඒවං ථේරේන කථිතන්ති. තිපිටකචූළාභයත්ථේරෝ ආහ; "සම්මාසම්බුද්ධේන අභිධම්මං පත්වා ඒකපදස්සාපි

ද්වින්නම්පි පදනං ආගතට්ඨානේ නයං දතුං යුත්තට්ඨානේ නයෝ අදින්නෝ නාම නත්ථි, නයං කාතුං යුත්තට්ඨානේ නයෝ අකතෝ නාම නත්ථි. ඉධ පනේකච්චෝ ‘ආචරියෝ අස්මී’ති විචරන්තෝ අකුසලේ ඕළාරිකසුඛුමතං උද්ධරමානෝ කුක්කුච්චායති. සම්මාසම්බුද්ධේන පන ලෝකුත්තරේපි ඕළාරික සුඛුමතා උද්ධරිතා”ති. ඒවඤ්ච පන වත්වා ඉදං සුත්තං ආහරි; “තත්‍ර, භන්තේ, යායං පටිපදා දුක්ඛා දන්ධාභිඤ්ඤා, අයං, භන්තේ, පටිපදා උභයේනේව හීනා අක්ඛායති - දුක්ඛත්තා දන්ධත්තා චා”ති (දී. නි. 3.152). එත්ථ හි චතස්සෝ පටිපදා ලෝකියලෝකුත්තරමිස්සකා කථිතා.

**තං තං වා පනා**ති එත්ථ න හෙට්ඨිමනයෝ ඕලෝකේතබ්බෝ. තං තං වා පන වසේනේව කථේතබ්බං. දුවිධා හි අකුසලා; ලෝභසහගතා දෝසසහගතා ච. තත්ථ දෝසසහගතා ඕළාරිකා, ලෝභසහගතා සුඛුමා. දෝසසහගතාපි දුවිධා; නියතා අනියතා ච. තත්ථ නියතා ඕළාරිකා, අනියතා සුඛුමා. නියතාපි කප්පට්ඨිතිකා ඕළාරිකා, නෝකප්පට්ඨිතිකා සුඛුමා. කප්පට්ඨිතිකාපි අසඞ්ඛාරිකා ඕළාරිකා, සසඞ්ඛාරිකා සුඛුමා. ලෝභසහගතාපි ද්විධා; දිට්ඨිසම්පයුත්තා දිට්ඨිවිප්පයුත්තා ච. තත්ථ දිට්ඨිසම්පයුත්තා ඕළාරිකා, දිට්ඨිවිප්පයුත්තා සුඛුමා. දිට්ඨිසම්පයුත්තාපි නියතා ඕළාරිකා, අනියතා සුඛුමා. සාපි අසඞ්ඛාරිකා ඕළාරිකා, සසඞ්ඛාරිකා සුඛුමා.

සඞ්ඛේපතෝ අකුසලං පත්වා යා විපාකං බහුං දේති සා ඕළාරිකා, යා අප්පං සා සුඛුමා. කුසලං පත්වා පන අප්පවිපාකා ඕළාරිකා, බහුවිපාකා සුඛුමා. චතුබ්බිධේ කුසලේ කාමාවචරකුසලා ඕළාරිකා, රූපාවචරකුසලා සුඛුමා. සාපි ඕළාරිකා, අරූපාවචරකුසලා සුඛුමා. සාපි ඕළාරිකා, ලෝකුත්තරකුසලා සුඛුමා. අයං තාව භූමීසු අභේදතෝ නයෝ.

භේදතෝ පන කාමාවචරා දානසීලභාවනාමයවසේන තිවිධා. තත්ථ දානමයා ඕළාරිකා, සීලමයා සුඛුමා. සාපි ඕළාරිකා, භාවනාමයා සුඛුමා. සාපි දුහේතුකා තිහේතුකාති දුවිධා. තත්ථ දුහේතුකා ඕළාරිකා, තිහේතුකා සුඛුමා. තිහේතුකාපි සසඞ්ඛාරිකඅසඞ්ඛාරිකභේදතෝ දුවිධා. තත්ථ සසඞ්ඛාරිකා ඕළාරිකා, අසඞ්ඛාරිකා සුඛුමා. රූපාවචරේ පඨමජ්ඣානකුසලවේදනා ඕළාරිකා, දුතියජ්ඣානකුසලවේදනා සුඛුමා…පෙ…. චතුත්ථජ්ඣානකුසලවේදනා සුඛුමා. සාපි ඕළාරිකා, ආකාසානඤ්චායතනකුසලවේදනා සුඛුමා ආකාසානඤ්චායතනකුසලවේදනා ඕළාරිකා…පෙ….. නේවසඤ්ඤානාසඤ්ඤායතනකුසලවේදනා සුඛුමා. සාපි ඕළාරිකා, විපස්සනාසහජාතා සුඛුමා. සාපි ඕළාරිකා, සෝතාපත්තිමග්ගසහජාතා සුඛුමා. සාපි ඕළාරිකා…පෙ…. අරහත්තමග්ගසහජාතා සුඛුමා.

චතුබ්බිධේ විපාකේ කාමාවචරවිපාකවේදනා ඕළාරිකා, රූපාවචරවිපාකවේදනා සුඛුමා. සාපි ඕළාරිකා…පෙ…. ලෝකුත්තරවිපාකවේදනා සුඛුමා. ඒවං තාව අභේදතෝ.

භේදතෝ පන කාමාවචරවිපාකා අත්ථි අහේතුකා, අත්ථි සහේතුකා. සහේතුකාපි අත්ථි දුහේතුකා, අත්ථි තිහේතුකා. තත්ථ අහේතුකා ඕළාරිකා, සහේතුකා සුඛුමා. සාපි දුහේතුකා ඕළාරිකා, තිහේතුකා සුඛුමා. තත්ථාපි සසඞ්ඛාරිකා ඕළාරිකා, අසඞ්ඛාරිකා සුඛුමා. පඨමජ්ඣානවිපාකා ඕළාරිකා, දුතියජ්ඣානවිපාකා සුඛුමා…පෙ…. චතුත්ථජ්ඣානවිපාකා සුඛුමා. සාපි ඕළාරිකා, ආකාසානඤ්චායතනවිපාකා සුඛුමා. සාපි ඕළාරිකා…පෙ….

නේවසඤ්ඤානාසඤ්ඤායතනවිපාකා සුඛුමා. සාපි ඕළාරිකා, සෝතාපත්තිඵලවේදනා සුඛුමා. සාපි ඕළාරිකා, සකදාගාමි…පෙ…. අරහත්තඵලවේදනා සුඛුමා.

තීසු කිරියාසු කාමාවචරකිරියවේදනා ඕළාරිකා, රූපාවචරකිරියවේදනා සුඛුමා. සාපි ඕළාරිකා, අරූපාවචරකිරියවේදනා සුඛුමා. ඒවං තාව අභේදතෝ. භේදතෝ පන අහේතුකාදිවසේන භින්නාය කාමාවචරකිරියාය අහේතුකකිරියවේදනා ඕළාරිකා, සහේතුකා සුඛුමා. සාපි දුහේතුකා ඕළාරිකා, තිහේතුකා සුඛුමා. තත්ථාපි සසඞ්ඛාරිකා ඕළාරිකා, අසඞ්ඛාරිකා සුඛුමා. පඨමජ්ඣානේ කිරියවේදනා ඕළාරිකා, දුතියජ්ඣානේ සුඛුමා. සාපි ඕළාරිකා, තතියේ…පෙ…. චතුත්ථේ සුඛුමා. සාපි ඕළාරිකා, ආකාසානඤ්චායතනකිරියවේදනා සුඛුමා. සාපි ඕළාරිකා, විඤ්ඤාණඤ්චා…පෙ…. නේවසඤ්ඤානාසඤ්ඤායතනකිරියවේදනා සුඛුමා. යා ඕළාරිකා සා හීනා. යා සුඛුමා සා පණීතා. **[විභඞ්ග අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ); විභඞ්ග අටුවා 10-13 පිටු (හේ.වි.මු)]**

කිලේසග්ගිසම්පයෝගතෝ **සදරථා**. ඒතේන සභාවතෝ ඕළාරිකතං දස්සේති, **දුක්ඛවිපාකට්ඨේනා**ති ඒතේන ඕළාරිකවිපාකනිප්ඵාදනේන කිච්චතෝ. කම්මවේගක්ඛිත්තා කම්මපටිබද්ධභූතා ච කායකම්මාදිබ්‍යාපාරවිරහතෝ නිරුස්සාහා විපාකා, සඋස්සාහා ච කිරියා අවිපාකා. සවිපාකා ච සගබ්භා විය ඕළාරිකාති තබ්බිපක්ඛතෝ අවිපාකා **සුඛුමා**ති වුත්තා.

**අසාතට්ඨේනා**ති අමධුරට්ඨේන. තේන සාතපටිපක්ඛං අනිට්ඨසභාවං දස්සේති. **දුක්ඛට්ඨේනා**ති දුක්ඛමට්ඨේන. තේන දුක්ඛානං සන්තාපනකිච්චං දස්සේති. "යායං, භන්තේ, අදුක්ඛමසුඛා වේදනා, සන්තස්මිං ඒසා පණීතේ සුඛේ වුත්තා භගවතා"ති (ම. නි. 2.88; සං. නි. 4.267) වචනතෝ **අදුක්ඛමසුඛා** ඵරණසභාවවිරහතෝ අසන්තානං කාමරාගපටිඝානුසයානං අනුසයනස්ස අට්ඨානත්තා **සන්තා,** සුඛේ නිකන්තිං පරියාදාය අධිගන්තබ්බත්තා පධානභාවං නීතාති **පණීතා**ති. තථා අනධිගන්තබ්බා ච කාමාවචරජාතිආදිසඞ්කරං අකත්වා සමානජාතියං ඤාණසම්පයුත්තවිප්පයුත්තාදිකේ සමානභේදේ සුඛතෝ පණීතාති යෝජේතබ්බා. උපබ්‍රූහිතානං ධාතූනං පච්චයභාවේන සුඛා **බෝහේති** විබාධිතානං පච්චයභාවේන දුක්ඛා ච. උභයම්පි කායං බ්‍යාපෙන්තං විය උප්පජ්ජතීති **ඵරති. මදයමාන**න්ති මදං කරොන්තං. **ඡාදයමාන**න්ති ඉච්ඡං උප්පාදෙන්තං, අවත්ථරමානං වා. ඝම්මාභිතත්තස්ස සීතෝදකඝටේන ආසිත්තස්ස යථා කායෝ උපබ්‍රූහිතෝ හෝති, ඒවං සුඛසමඞ්ගිනෝපීති කත්වා **"ආසිඤ්චමානං විය"**ති වුත්තං. **ඒකත්තනිමිත්තේයේවා**ති පථවීකසිණාදිකේ ඒකසභාවේ ඒව නිමිත්තේ. **චරතී**ති නානාවජ්ජනේ ජවනේ වේදනා විය විප්ඵන්දනරහිතත්තා **සුඛුමා**.

අධිප්පායේ අකුසලතාය **අකෝවිදෝ. කුසලත්තිකේ …පෙ…. ආගතත්තා**ති "කුසලාකුසලාවේදනා ඕළාරිකා, අබ්‍යාකතාවේදනා සුඛුමා"ති ඒවං ආගතත්තා. භූමන්තරභේදේ දස්සේතුං **"යම්පී"**ති ආදි ආරද්ධං. **ඉමිනා නීහාරේනා**ති ඒතේන "කාමාවචරසුඛතෝ කාමාවචරුපෙක්ඛා සුඛුමා"ති ආදිනා සභාවාදිභේදේන ච ඕළාරිකසුඛුමභාවං තත්‍ර තත්‍රේව කථෙන්තෝ න භින්දතීති නයං දස්සේති.

**ලෝකියලෝකුත්තරමිස්සකා කථිතා,** තස්මා ඒකන්තපණීතේ හීනපණීතානං උද්ධටත්තා ඒවමේව ඒකන්තහීනේ ච යථාසම්භවං හීනපණීතතා උද්ධරිතබ්බාති අනුඤ්ඤාතං හෝතීති උභයත්ථ තදුද්ධරණේ න කුක්කුච්චායිතබ්බන්ති අත්ථෝ.

අකුසලානං කුසලාදීහි සුඛුමත්තාභාවතෝ පාළියා ආගතස්ස අපරිවත්තනීයභාවේන **"හෙට්ඨිමනයෝ න ඕලෝකේතබ්බෝ"**ති වුත්තන්ති වදන්ති, තං තං වා පන වසේන කථනේපි පරිවත්තනං නත්ථීති න පරිවත්තනං සන්ධාය "හෙට්ඨිමනයෝ න ඕලෝකේතබ්බෝ"ති වුත්තං, හෙට්ඨිමනයස්ස පන වුත්තත්තා අවුත්තනයං ගහෙත්වා "තං තං වා පනා"ති වත්තුං යුත්තන්ති "හෙට්ඨිමනයෝ න ඕලෝකේතබ්බෝ"ති වුත්තන්ති වේදිතබ්බෝ. බහුවිපාකා අකුසලා දෝසුස්සන්නතාය **ඕළාරිකා,** තථා අප්පවිපාකා කුසලා. මන්දදෝසත්තා අප්පවිපාකා අකුසලා **සුඛුමා,** තථා බහුවිපාකා කුසලා ච. ඕළාරිකසුඛුමනිකන්තිවත්ථුභාවතෝ කාමාවචරාදීනං **ඕළාරිකසුඛුමතා**. **සාපීති** භාවනාමයාය භේදනේන දනමයසීලමයානඤ්ච පච්චේකං භේදනං නයතෝ දස්සිතන්ති වේදිතබ්බං. **සාපීති** වා තිවිධාපීති යෝජේතබ්බං.

**[විභඞ්ග මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ)]**

**සන්තාපනකිච්චන්**ති පරිඩහනකිච්චං. **ජාතිආදිසඞ්කරන්**ති ජාතිසභාවපුග්ගල ලෝකියලෝකුත්තරතෝ සඞ්කරං සම්භේදං අකත්වා. **සමානජාතියන්**ති ඒකජාතියං. සුඛතෝ තජ්ජාතියා අදුක්ඛමසුඛා පණීතාති යෝජේතබ්බාති සම්බන්ධෝ. **සමානභේදේති** භූමන්තරාදිසමානවිභාගේ. **උපබෲහිතානං ධාතූනන්**ති උළාරරූපසමුට්ඨාපනේන පණීතානං රූපධම්මානං. **විබාධිතානන්**ති නිප්පීළිතානං මිලාපිතානං. **උභයන්**ති සුඛාදිද්වයං. එත්ථ ච බෝහනා, ආලුළනා ච කායිකසුඛස්ස වසේන වේදිතබ්බා. අභිසන්දනා ඣානසුඛස්ස. මදයනා කාමසුඛස්ස. තථා ඡාදනා. ආසිඤ්චනා සබ්බස්ස. ඡාදනා ආසිඤ්චනා වා සබ්බස්ස වසේන වේදිතබ්බා.

**සභාවාදිභේදේන චා**ති සභාවපුග්ගලලෝකියාදිභේදේන ච. ඒකන්තපණීතේ ලෝකුත්තරේ හීනපණීතානං පටිපදනං වසේන හීනපණීතතා. ඒකන්තහීනේ අකුසලේ ඡන්දදිවසේන හීනපණීතතා, ඕළාරිකසුඛුමතා ච. තථා හි වුත්තං **අට්ඨකථායං** "යා ඕළාරිකා, සා හීනා. යා සුඛුමා, සා පණීතා"ති (විභ. අට්ඨ. 11). අකුසලාදීසු දෝසසහගතාදිඅන්තරභේදවසේන උපාදයුපාදය ඕළාරිකසුඛුමතා තං තං වා පන වසේන වුච්චති, න කුසලාකුසලාදිවසේනාති ආහ **"තං තං වා පන වසේන කථනේපි පරිවත්තනං නත්ථී"**ති. **දෝසුස්සන්නතායාති** කිලේසාධිකතාය. **තථාති** දෝසුස්සන්නතාය. කථං පන කුසලේසු දෝසුස්සන්නතා? උපනිස්සයවසේන, කිලේසාධිකේහි සන්තානේ පවත්තමානා කුසලා ධම්මා කිලේසේහි සම්බාධප්පත්තියා තිණාදීහි සම්බාධප්පත්තානි විය සස්සානි විපුලඵලඋළාරඵලා න හොන්තීති. **තථාති** මන්දදෝසතාය. කුසලානං මන්දදෝසතාපි වුත්තනයානුසාරේන වේදිතබ්බා. **ඕළාරිකසුඛුමනිකන්තීති** එත්ථ අන්තෝගධවිසේසං නිකන්තියා ඕළාරිකසුඛුමතා සාමඤ්ඤදං වුත්තං. යථා හෙත්ථ ඕළාරිකසාමඤ්ඤේන ඕළාරිකෝළාරිකතරෝළාරිකතමා නිකන්තියෝ ගය්හන්ති, තථා සුඛුමසුඛුමතරසුඛුමතමා සුඛුමතාසාමඤ්ඤේන ගය්හන්තීති. සුඛුමතමනිකන්තිවත්ථුන්ති චෙත්ථ යාව භවග්ගං විපස්සනාඤාණඤ්ච වේදිතබ්බං

**[විභඞ්ග අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ)]**

**ඕළාරිකසුඛුමනිද්දේසේ** ඖදරික සූක්‍ෂම නිර්දේශයෙහි **අකුසලා වේදනාති ආදීනි** අකුසලා වේදනාති යනාදී වූ පදයෝ **ජාතිතෝ** ජාති වශයෙන් **ඕළාරිකසුඛුමභාවං** ඖදරික සූක්‍ෂම භාවය **දස්සේතුං** දක්වන්නට **වුත්තානි** වදරණලදයහ **දුක්ඛා වේදනා ඕළාරිකාති ආදීනි** දුක්ඛා වේදනා ඕළාරිකාති යනාදී පදයෝ **සභාවතෝ** ස්වභාව වශයෙන් (ඕළාරිකසුඛුමභාවං ඖදරික සූක්‍ෂම භාවය

දස්සේතුං දක්වන්නට වුත්තානි වදරණලදයහ) **අසමාපන්නස්ස වේදනාති ආදීනි** අසමාපන්නස්ස වේදනාති පදයෝ **පුග්ගලතෝ** පුද්ගල වශයෙන් (ඕළාරිකසුඛුමභාවං ඖදරික සූක්‍ෂම භාවය දස්සේතුං දක්වන්නට වුත්තානි වදරණලදයහ) **සාසවාති ආදීනි** සාසවා යනාදි පදයෝ **ලෝකිය ලෝකුත්තරතෝ** ලෞකික ලෝකෝත්තර වශයෙන් **ඕළාරිකසුඛුමභාවං** ඖදරික සූක්‍ෂම භාවය **දස්සේතුං** දක්වන්නට **වුත්තානි** වදරණලදයහ (අටුවාවෙහි "ඕළාරිකසුඛුමභාවං දස්සේතුං වුත්තානි" යන්න ආද්‍යන්තයෙහිම දැක්වූ හෙයින් ආද්‍යන්තදීපක නය නමයි දතයුතු) **තත්‍ථ** ඒ වේදනාවන් අතුරෙන් (**අකුසලා** අකුශල වේදනාවෝ තුමූ **තාව** කුශල වේදනාවන් කෙරෙන් පළමු කොට **මයා වුච්චන්තේ** මා විසින් කියනු ලැබෙත්) **අකුසලා** අකුශල වේදනාවෝ තුමූ **සදරථට්ඨේන ච** ක්ලේශාග්නී සන්තාපය හා සම්ප්‍රයුක්ත වන අර්ථයෙන් ද **දුක්ඛවිපාකට්ඨේන ච** දුක්වූ විපාකයන් එළවන අර්ථයෙන් ද **ඕළාරිකා** ඖදරිකයහ **කුසලා** කුශල වේදනාවෝ තුමූ **නිද්දරථට්ඨේන ච** ක්ලේශාග්නි සන්තාපයෙන් ඉවත්වූ අර්ථයෙන් ද **සුඛවිපාකට්ඨේන ච** සැප එළවන අර්ථයෙන් ද **සුඛුමා** සූක්‍ෂමයහ **අබ්‍යාකතා** අව්‍යාකෘත වේදනා තුමූ **නිරුස්සාහට්ඨේන ච** කාය කර්මාදී ව්‍යාපාර රහිත අර්ථයෙන් ද **අවිපාකට්ඨේන ච** විපාකයන් නොදවන අර්ථයෙන් ද **සුඛුමා** සූක්‍ෂමයහ **කුසලාකුසලා** කුශලාකුශල වේදනා තුමූ **සඋස්සාහට්ඨේන ච** කාය කර්මාදී ව්‍යාපාර සහිත අර්ථයෙන් ද **සවිපාකට්ඨේන ච** විපාකයන් දනවන අර්ථයෙන් ද නොහොත් තමා සතුවූ විපාකයන් ඇති අර්ථයෙන් ද **ඕළාරිකා** ඖදරිකයහ **අබ්‍යාකතා** අව්‍යාකෘත වූ වේදනා තුමූ **වුත්තනයේනේව** යටකී නයිමැ **සුඛුමා** සූක්‍ෂමයහ (යටකී නයිමැ යනු නිරුස්සාහට්ඨේන අවිපාකට්ඨේන යන්න සඳහා කීහ) **දුක්ඛා** දුක්ඛ වේදනා තුමූ **අසාතට්ඨේන ච** සුඛ වේදනාවට විපක්‍ෂ වූ අමධුර අනිට්ඨ අර්ථයෙන් ද **දුක්ඛට්ඨේන ච** නොසෑහිය හැකි අර්ථයෙන් ද **ඕළාරිකා** ඖදරිකයැ **සුඛා** සුඛ වේදනා තුමූ **සාතට්ඨේන ච** ආශ්වාදනාර්ථයෙන් ද **සුඛට්ඨේන ච** සැප එළවන අර්ථයෙන් ද සෑහියහැකි අර්ථයෙන් ද **සුඛුමා** සූක්‍ෂමයහ **අදුක්ඛමසුඛා** අදුක්ඛමසුඛ වේදනා තොමෝ **සන්තට්ඨේන ච** ශාන්ත වූ අර්ථයෙන් ද **පණීතට්ඨේන** ච ප්‍රණීත වූ අර්ථයෙන් ද හෙවත් ප්‍රධාන භාවයට පැමිණියාවූ අර්ථයෙන් ද **සුඛුමා** සූක්‍ෂමයහ **සුඛදුක්ඛා** සුඛ වේදනා දුක්ඛ වේදනාවෝ තුමූ **ඛෝභට්ඨේන ච** කලඹන අර්ථයෙන් ද **ඵරනට්ඨේන ච** ස්ඵරනාර්ථයෙන් ද **ඕළාරිකා** ඖදරිකයැ **හි** ඒ කීම සැබෑය **සුඛවේදනාපි** සුඛ වේදනා තොමෝ ද **සකලසරීරං** මුළු සිරුර **ඛෝභේති** කලඹා **ඵරති** ස්ඵරනය කෙරෙයි **තථා** එපරිද්දෙන් **දුක්ඛවේදනාපි** දුක්ඛ වේදනා තොමෝ ද (**සකලසරීරං** මුළු සිරුර **ඛෝභේති** කලඹා **ඵරති** ස්ඵරනය කෙරේ) **හි** විස්තර කෙරෙම් **සුඛං** වේදනා සුඛය **උප්පජ්ජමානා** උපදනේ **සකලසරීරං** මුළු සිරුර **ඛෝභෙන්තං** කලඹමින් **ආලුළෙන්තං** ආලෝඩනය කෙරෙමින් **අභිසන්දයමානං** වතුරුවන්නාක් මෙන් කෙරෙමින් **මදයමානං** මත්වීමක් මෙන් කෙරෙමින් **ඡාදයමානං** මැඩගෙන යන්නාක් මෙන් කෙරෙමින් (ඡනදයමානං යන පාඨය වුව කැමැත්ත දක්වමින් යන අර්ථයි) **සීතෝදකඝටේන** සිහිල් පැන් කළසින් **ආසිඤ්චයමානං විය** ඉසින්නාක් මෙන් **උප්පජ්ජති** උපදී.*

***** "ඛෝභේන්ති ආලුළෙන්තං" යන පදද්වය පර්‍යාය වශයෙන් යුහෙයින් අර්ථ විශේෂයෙක් නැති. "ඛෝභේන්තං ආලුළෙන්තං" යන්නෙන් කායික සුඛ වේදනාව ද "අභිසන්දයමානං" යන්නෙන් ධ්‍යානයන් හා පැවති සුඛ වේදනාව ද "මදයමානං ඡාදයමානං" යන්නෙන් කාමගුණයන් හා පැවති සුඛ වේදනාව ද "සීතෝදකඝටේන ආසිඤ්චයමානං විය" යන්නෙන් සියළු සුඛ වේදනාව ද දැක්වූ සේක. මේ අර්ථකථා මතය සිත්හිලා අනුටීකාචාර්‍ය්‍යයෝ කීහ. "ඵත්‍ථ ච ඛෝභනා ආලුළනා ච කායිකසුඛස්ස

වසේන වේදිතබ්බා. අභිසන්දනා ඣානසුඛස්ස මදයනා, කාමසුඛස්ස තථා ඡාදනා ආසිඤ්චනා සබ්බස්ස” යි.

**දුක්ඛං** දුක්ඛ වේදනාව **උප්පජ්ජමානං** උපදනේ **තත්තඵාලං** රත්වූ සීවැලක් නොහොත් තප්ත වාලුකා චූර්ණයක් **අන්තෝ** උදරාභ්‍යන්තරයෙහි **පවේසෙන්තං විය** ප්‍රවේශ කරන්නාක් මෙන් ද **තිණුක්කාය** තෘණෝල්කායෙන් **බහි** පිටතැ **ඣාපයමානං විය** දවන්නාක් මෙන් ද **උප්පජ්ජති** උපදනේයි **අදුක්ඛමසුඛා පන** අදුක්ඛමසුඛ වේදනා තොමෝ වනාහි **වුත්තනයේනේව** සන්තට්ඨේන පණීතට්ඨේන ච යි යටකී නයිමැ **සුඛුමා** සූක්ෂමයැ **අසමාපන්නස්ස** සමවතුන් සමනොවන් පුගුලාගේ **වේදනා** වේදනා තොමෝ **නානාරම්මණේ** අනේක විධ වූ ආරම්මණෙහි **වික්ඛිත්තභාවතෝ** වික්ෂිප්ත භාවය හේතුකොටගෙන **ඕළාරිකා** ඖදරිකයහ **සමාපන්නස්ස** සමවතුන් සමවන් පුගුලාගේ **වේදනා** වේදනා තොමෝ **ඒකත්තනිමිත්තේයේව** පෘථුවිකෘතස්නාදී වූ ඒක ස්වභාව ඇති අරමුණෙක්හිමැ **චරති** අරමුණු කිරීම් විසින් පවතී ද **ඉති** එහෙයින් **සුඛුමා** සූක්ෂමයැ **සාසවා** ආශ්‍රව ධර්මයන්ට අරමුණු වූ වේදනා තොමෝ **ආසවුප්පත්තිහේතුතෝ** ආශ්‍රවයන්ගේ හටගැන්මට කරුණු වන හෙයින් **ඕළාරිකා** ඖදරිකයැ **ආසවචාරෝ නාම** ආශ්‍රවයන්ගේ පැවැත්ම නම් **ඒකන්තඕළාරිකෝ** ඒකාන්තයෙන් ඖදරිකයැ **අනාසවා** ආශ්‍රව ධර්මයන්ට අරමුණු නොවූ වේදනා තොමෝ **වුත්තවිපරියායේන** කියනලද සාශ්‍රව වේදනාවට විපක්‍ෂ වශයෙන් **සුඛුමා** සූක්‍ෂමයැ **තත්‍ථ** ඒ වේදනාස්කන්ධ නිර්දේශාධිකාරයෙහි හෙවත් වේදනා විභාගයෙහි **ඒකෝ** එක් ආචාර්‍ය්‍ය පුද්ගලයෙක් **කුසලත්තිකේ** කුශල ත්‍රිකයෙහි **කෝවිදෝ** දක්‍ෂයක් **නේව හෝති** නොම වේද **වේදනාත්තිකේ** වේදනා ත්‍රිකයෙහි **න (කෝවිදෝ ඒව හෝති)** නොම දක්‍ෂයෙක් වේද **සෝ** ඒ ආචාර්‍ය්‍ය පුද්ගල තෙම **කුසලත්තිකං** කුශල ත්‍රිකය **රක්ඛාමීති** රකිමැයි යන ආභෝගයෙන් **වේදනාත්තිකං** වේදනා ත්‍රිකය **භින්දති** විනාශ කෙරෙයි **වේදනාත්තිකං** වේදනා ත්‍රිකය **රක්ඛාමීති** රකිමැයි යන ආභෝගයෙන් **කුසලත්තිකං** කුශල ත්‍රිකය **භින්දති** විනාශ කෙරෙයි **ඒකෝ** එක් ආචාර්‍ය්‍ය පුද්ගලයෙක් **තිකං** ත්‍රිකය **රක්ඛාමීති** රකිමැයි යන ආභෝගයෙන් **භුම්මන්තරං** භූම්‍යන්තරය හෙවත් භූමි විශේෂය **භින්දති** විනාශ කෙරෙයි **ඒකෝ** එක් ආචාර්‍ය්‍ය පුද්ගලයෙක් තෙම **භුම්මන්තරං** භූම්‍යන්තරය හෙවත් භූමි විශේෂය **න භින්දති** විනාශ නොකෙරෙයි.

***** ඇතැම් ආචාර්‍ය්‍ය කෙනෙක් කුම්නම් (කුමන නම්) ත්‍රිකයක් විනාශ කෙරෙත් දැයි යන චෝදනාව ළෙහි පිහිටුවා පරිහාර පිණිස “කථං සුඛදුක්ඛාවේදනා ඕළාරිකා -පෙ- කුසලත්තිකෝ පන භින්නෝ” යි දක්වත්.

**කථං (භින්දති)** කෙසේ නම් විනාශ කෙරේද යත් **හි** විස්තර කෙරෙමි **සුඛදුක්ඛා** සුව දුක් වූ **වේදනා** වේදනා තුමූ **ඕළාරිකා** ඖදරිකයහ **අදුක්ඛමසුඛා** අදුක්ඛමසුඛ වේදනා තොමෝ **සුඛුමා** සූක්ෂමය **ඉති** මෙපරිද්දෙන් **වේදනාත්තිකේ** වේදනා ත්‍රිකයෙහි **වුත්තං** භාග්‍යවතුන් වහන්සේ වදළ සේක **තං** ඒ වේදනා ත්‍රිකයෙහි වදළ වචනය **ඒකෝ** එක් ආචාර්‍ය්‍ය පුද්ගලයෙක් **පටික්ඛිපති** පිළිකෙව් කෙරෙයි (කෙසේ පිළිකෙව් කෙරෙද යන චෝදනාව ළෙහිලා කියත්. “න සබ්බා අදුක්ඛමසුඛා -පෙ- වේදනාත්තිකෝ භින්නෝ” යි) **සබ්බා** සියළු **අදුක්ඛමසුඛා** අදුක්ඛමසුඛ වේදනා තොමෝ **න සුඛුමා** නොද සූක්ෂමයැ **හි** ඒ එසේමැයි **සා** ඒ අදුක්ඛමසුඛ වේදනා තොමෝ **කුසලාපි** කුශල් වූවකුදු **අත්‍ථි** ඇත **අකුසලාපි** අකුශල් වූවකුදු (**අත්‍ථි** ඇත) **අබ්‍යාකතාපි** අව්‍යාකෘත වුවකුදු (**අත්‍ථි** ඇත) **තත්‍ථ** ඒ ත්‍රිවිධ වූ අදුක්ඛමසුඛ වේදනාවන් අතුරෙන් **කුසලාකුසලා** කුශලාකුශල වූ අදුක්ඛමසුඛ වේදනාවෝ තුමූ **ඕළාරිකා** ඖදරිකයහ **අබ්‍යාකතා**

අව්‍යාකෘත වූ අදුක්ඛමසුඛ වූ වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයහ **කස්මා** කවර හෙයින යත් **කුසලත්තිකේ** කුශල ත්‍රිකයෙහි **පාළියං** පෙලෙහි **ආගතත්තාති** ආ හෙයින (ඉති ශබ්දයා පරිසමාප්තියෙහියැ) **එවං** මේ කියනලද නයින් **කුසලත්තිකෝ** කුශල ත්‍රිකය තෙම **රක්ඛිතෝ හෝති** රක්නා ලද්දේ වේ **වේදනාත්තිකෝ** වේදනා ත්‍රිකය තෙම **භින්නෝ (හෝති)** විනාශ කරන ලද්දේ වේ **කුසලාකුසලා** කුශලාකුශල වූ **වේදනා** වේදනාවෝ තුමූ **ඕළාරිකා** ඖදරිකයහ **අබ්‍යාකතා** අව්‍යාකෘත වූ වේදනා තුමූ **සුඛුමා** සූක්‍ෂමයහ **ඉති පන** මෙහි වනාහි **යං** යම් වචනයක් **කුසලත්තිකේ** කුශල ත්‍රිකයෙහි **වුත්තං** භාග්‍යවතුන් වහන්සේ වදළ සේක් ද **තං** ඒ කුශල ත්‍රකයෙහි වදළ වචනය **ඒකෝ** එක් ආචාර්‍ය්‍ය පුද්ගලයෙක් **පටික්ඛිපති** පිළිකෙව් කෙරෙයි (කෙසේ පිළිකෙව් කෙරෙද යන චෝදනාව ළෙහිලා (සිත තබා) කියත් "න සබ්බා අබ්‍යාකතා -පෙ- කුසලත්තිකෝ පන භින්නෝ" යි) **සබ්බා** සියළු **අබ්‍යාකතා** අව්‍යාකෘත වූ වේදනා තුමූ **න සුඛුමා** නොද සූක්‍ෂමයහ **හි** ඒ කීම සැබෑය **සා** ඒ අව්‍යාකෘත වේදනා තොමෝ **සුඛාපි** සැප වූවකුදු **අත්ථි** ඇත **දුක්ඛාපි** දුක් වූවකුදු (**අත්ථි** ඇත) **අදුක්ඛමසුඛාපි** අදුක්ඛමසුඛ වූවකුදු (**අත්ථි** ඇත) **තත්‍ථ** ඒ ත්‍රිවිධ වේදනාවන් අතරින් **සුඛදුක්ඛා** සුඛ දුක්ඛ වූ අව්‍යාකෘත වේදනාවෝ තුමූ **ඕළාරිකා** ඖදරිකයහ **අදුක්ඛමසුඛා** අදුක්ඛමසුඛ වූ අව්‍යාකෘත වූ වේදනාවෝ තුමූ **සුඛුමා** සූක්‍ෂමයහ **කස්මා** කවර හෙයින යත් **වේදනාත්තිකේ** වේදනා ත්‍රිකයෙහි **පාළියං** පෙලෙහි **ආගතත්තා** ආ හෙයිනි (ඉති ශබ්දය සමාප්තියෙහියැ) **ඒවං** මේ කී නයින් **වේදනාත්තිකෝ** වේදනා ත්‍රිකය තෙම **රක්ඛිතෝ හෝති** රක්නා ලද්දේ වෙයි **කුසලත්තිකෝ** කුශල ත්‍රිකය තෙම **භින්නෝ (හෝති)** විනාශ කරන ලද්දේ වෙයි (කිනම් යුක්තියක් ගෙන එක් ආචාර්‍ය්‍යවරයෙක් ත්‍රික ද්වයාගේ භේදය නොකරේද යන චෝදනාව ළෙහිලා කියත් "කුසලත්තිකස්ස පන -පෙ- න භින්දති නාම" යි) **පන** වෙනස කියනු ලැබේ (මෙහි පන යනු විශේෂාර්ථ ද්‍යෝතකයැ) **කුසලත්තිකස්ස** කුශල ත්‍රිකයාගේ **ආගතට්ඨානේ** ආ තන්හි **වේදනාත්තිකං** වේදනා ත්‍රිකය **අනෝලෝකෙත්‍වා** නොබලා **වේදනාත්තිකස්ස** වේදනා ත්‍රිකයාගේ **ආගතට්ඨානේ** ආ තන්හි **කුසලත්තිකං** කුශල ත්‍රිකය **අනෝලෝකෙත්‍වා** නොබලා **කුසලාදීනං** කුසලාදීන්ගේ **කුසලත්තිකලක්ඛණේන** කුශල ත්‍රික ලක්‍ෂණය හේතුකොට ගෙන **සුඛාදීනං** සුඛ වේදනාදීන්ගේ **වේදනාත්තිකලක්ඛණේන** වේදනා ත්‍රික ලක්‍ෂණය හේතුකොට ගෙන **ඕළාරිකසුඛුමතං** ඖදරික සූක්‍ෂම භාවය **කථෙන්තෝ** බණන්නාවූ ආචාර්‍ය්‍ය තෙමේ **න භින්නති නාම** විනාශ නොකෙරේ නම් වේ.

* මෙහි අභිප්‍රාය නම් කුශල ත්‍රිකය නොබලා වේදනාවන්ගේ ඖදරික සූක්‍ෂම භාවය දක්වන්නා වූ ආචාර්‍ය්‍ය තෙමේ "සුඛදුක්ඛා වේදනා ඕළාරිකා අදුක්ඛමසුඛා වේදනා සුඛුමා" යි වේදනා ත්‍රිකයෙහි ස්වභාවයෙන් වදළා වූ වේදනාවන්ගේ ඖදරික සූක්‍ෂම භාවය නොබලා "කුසලාකුසලා වේදනා ඕළාරිකා අබ්‍යාකතා වේදනා සුඛුමා" යි කුශල ත්‍රිකයෙහි ජාති වශයෙන් වදළ වේදනාවන්ගේ ඖදරික සූක්‍ෂම භාවය ගෙන කීය. වේදනා ත්‍රිකය බලා වේදනාවන්ගේ ඖදරික සූක්‍ෂම භාවය දක්වන්නා වූ ආචාර්‍ය්‍ය තෙමේ "කුසලාකුසලා වේදනා ඕළාරිකා අබ්‍යාකතා වේදනා සුඛුමා" යි කුශල ත්‍රිකයෙහි ජාති වශයෙන් වදළා වූ වේදනාවන්ගේ ඖදරික සූක්‍ෂම භාවය නොබලා "සුඛදුක්ඛා වේදනා ඕළාරිකා අදුක්ඛමසුඛා වේදනා සුඛුමා" යි වේදනා ත්‍රිකයෙහි ස්වභාවයෙන් වදළා වූ වේදනාවන්ගේ ඖදරික සූක්‍ෂම භාවය ගෙන කීය. එක් ත්‍රිකයක් ගන්නා ආචාර්‍ය්‍ය තෙමේ අනෙක් ත්‍රිකයක් නොබලා එක් ත්‍රිකයෙක්හිම ආ නය පමණක් ගෙන දක්වන සේක් නම් ත්‍රික භේදය නොකෙරෙයි යනුයි. මෙසේ නොදක්වා එක් ත්‍රිකයක් කෙරෙන් අනික් ත්‍රිකය බලා කිව හොත් ත්‍රික භේදය කෙරෙයි යුසේයි. දැන් භූම්‍යන්තර

විනාශ කාරණය ඇර දක්වන්නා වූ අර්ථකථාචාර්‍ය්‍යයෝ "යම්පි කුසලාකුසලා වේදනා -පෙ- භුම්මන්තරං භින්දති නාම" යි කියත්.

"කුසලාකුසලා වේදනා ඕළාරිකා අබ්‍යාකතා වේදනා සුඛුමාති කුසලා -පෙ- සුඛුමා" යි **කුසලත්තිකේ** කුශල ත්‍රිකයෙහි **යම්පි වචනං** යම් වචනයකුත් **වුත්තං** භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක් ද **තත්‍ථ** ඒ වචනයෙහි **ඒකෝ** එක් ආචාර්‍ය්‍ය පුද්ගලයෙක් තෙමේ **කුසලා (වේදනා)** කුශල වේදනා තොමෝ **ලෝකුත්තරවේදනාපි සමානා** ලෝකෝත්තර වේදනාවක්වූවා නමුදු **ඕළාරිකා නාම** ඖදරික නම **විපාකා (වේදනා)** විපාක වේදනා තොමෝ **අන්තමසෝ** යටත්පිරිසෙයින් **ද්විපඤ්චවිඤ්ඤාණසහජාතාපි සමානා** දෙපස් විඥානයන් සමඟ වූවා නමුදු **සුඛුමා නාම හෝතීති** සූක්‍ෂම නම් වේයැයි **වදති** තෙපලා ද **සෝ** ඒ ආචාර්‍ය්‍ය තෙමේ **ඒවරූපං** මෙබඳු වූ ස්වභාවය ඇති **සන්තං** ශාන්ත වූ **පණීතං** ප්‍රණීත වූ හෙවත් උත්තම වූ **ලෝකුත්තරං** ලෝකෝත්තර වූ **වේදනං** වේදනාව **ඕළාරිකං නාම** ඖදරික නම් වේදනාවක් **කරොන්තෝ** කරන්නෙක්වැ (භින්දති නාම යන්න හා සම්බන්ධයි) **ද්විපඤ්චවිඤ්ඤාණසම්පයුත්තං** දෙපස් විඥානය හා සමඟ යෙදුනා වූ **අහේතුකං** සම්ප්‍රයුක්ත හේතු රහිත වූ **හීනං** ලාමක වූ **ජළං** ජඩවූ **වේදනං** වේදනාව **සුඛුමං නාම** සූක්‍ෂම වේදනාවක් නම් **කරොන්තෝ** කරන්නෙක්වැ **තිකං** ත්‍රිකය **රක්ඛිස්සාමි** රකින්නෙමි **ඉති (මනසි කරිත්‍වා)** ආභෝග කොටැ **භුම්මන්තරං** භූම්‍යන්තරය **භින්දති නාම** විනාශ කෙරේ නම් වේ.

* කෙසේ තෙපලන ආචාර්‍ය්‍යයෙක් භූම්‍යන්තරය විනාශ කෙරෙත් ද යන චෝදනාව ළෙහිලා පරිහාර පිණිස "තත්‍ථ තත්‍ථ -පෙ- න භින්දති නාම" යන පාඨය දක්වත්.

**තත්‍ථ තත්‍ථ භූමියං** ඒ ඒ භූමියෙහි **කුසලම්පන** කුශලය වනාහි **තං තං භූමිවිපාකේනේව සද්ධිං** ඒ ඒ භූමියෙහි වූ විපාකයන් හා සමඟමැ **යෝජෙත්‍වා** යොදැ **කථෙන්තෝ** වදරන්නා වූ ආචාර්‍ය්‍ය තෙමේ **න භින්දති නාම** විනාශ නොකෙරේ නම් වේ **තත්‍ර** එහි **අයං නයෝ** මේ වක්‍ෂ්‍යමාන නය තෙමේ (**වේදිතබ්බෝ** දතයුතු) නොහොත් **තත්‍ර තත්‍ර** ඒ ඒ භූමියෙහි වූ කුශලය ඒ ඒ භූමියෙහි වූ විපාකයා සමඟ ගලපා කීමෙහි **අයං** මේ වක්‍ෂ්‍යමාන වූයේ **නයෝ** නය තෙමේයි **හි** විස්තර කෙරෙම් **කාමාවචරකුසලා** කාමාවචර වූ කුශල වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **කාමාවචරවිපාකා** කාමාවචර විපාක වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **රූපාවචරාරූපාවචර ලෝකුත්තරකුසලා** රූපාවචර අරූපාවචර ලෝකෝත්තර කුශල වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **රූපාවචරාරූපාවචරලෝකුත්තරවිපාකා** රූපාවචර අරූපාවචර ලෝකෝත්තර විපාක වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **ඉති** මෙසේ **ඉමිනා නීහාරේන** මේ නයින් **කථෙන්තෝ** වදරන්නා වූ ආචාර්‍ය්‍ය තෙමේ **න භින්දති නාම** විනාශ නොකෙරේ නම් වේ.

* "ඉමිනා නීහාරේන" යනාදී පාඨයෙන් කාමාවචර සුඛ වේදනාවට වඩා කාමාවචර උපේක්‍ෂා වේදනා තොමෝ සියුම්යැ යනාදී නය ද දක්වා එහෙයින් මූලටීකාවෙහි "ඉමිනා නීහාරේනාති ඒතේන කාමාවචරසුඛතෝ කාමාවචරඋපෙක්ඛා සුඛුමාති ආදිනා සභාවාදිභේදේන ඕළාරිකසුඛුමභාවං තත්‍ර තත්‍රේව කථෙන්තෝ න භින්දතීති නයං දස්සේති" යි වියු.

**තිපිටකචූළනාගත්ථේරෝ පන** ත්‍රිපිටක චූළනාග ස්ථවිරයන් වහන්සේ වනාහි **ආහ** වදාළ සේක (**කිමාහ** කුමක් වදාළ සේක් ද) **අකුසලේ** අකුශල චිත්තයෙහි **ඕළාරිකසුඛුමතා නාම** ඖදරික සූක්‍ෂම භාවය නම් **න උද්ධරිතබ්බා** නොඉදිරිය යුතු **හි** යම්හෙයකින් **තං** ඒ අකුශල චිත්තය **ඒකන්තං** ඒකාන්තයෙන් **ඕළාරිකමේව** ඖදරිකම වේද (**ඉති** එහෙයින) **ලෝකුත්තරේපි** ලෝකෝත්තර චිත්තයෙහි ද **ඕළාරිකසුඛුමතා** ඖදරික සූක්‍ෂම භාවය **න උද්දරිතබ්බා** නොඉදිරිය යුතු **හි** යම්හෙයකින් **තං** ඒ ලෝකෝත්තර චිත්තය **ඒකන්තං** ඒකාන්තයෙන් **සුඛුමං** සූක්‍ෂම වේද **ඉති** එහෙයින **ඉමං කථං** මේ ත්‍රිපිටක චූළනාග ස්ථවිර වාදය **ආහරිත්වා** ගෙවුත් **තිපිටකචූළාභයත්ථේරස්ස** ත්‍රිපිටක චූළාභය ස්ථවිරයන් වහන්සේට **ථේරේන** ත්‍රිපිටක චූළනාග ස්ථවිරයන් වහන්සේ විසින් **ඒවං** මෙසේ ලෝකෝත්තර භූමියෙහි ඖදරික සූක්‍ෂම භාවය උද්ධරණය නොකටයුතුය යන වචනය **කථිතන්ති** වදරණ ලදයයි **කථයිංසු** සැළකළහ **තිපිටකචූළාභයත්ථේරෝ** ත්‍රිපිටක චූළාභය ස්ථවිරයන් වහන්සේ **ආහ** වදාළ සේක **සම්මාසම්බුද්ධේන** සර්වඥයන් වහන්සේ විසින් **අභිධම්මං** අභිධර්මයට **පත්වා** පැමිණ **ඒකස්ස පදස්සපි** එක් පදයක්හුගේ ද **ද්වින්නම්පි පදනං** දෙපද කෙනෙකුන්ගේ ද **ආගතට්ඨානේ** ආ තන්හි **නයං** නය **දතුං** දෙන්නට **යුත්තට්ඨානේ** යුතුතන්හි **නයෝ** නය තෙමේ **අදින්නෝ නාම** නොදී වදාළ සේක් නම් **නත්ථි** නැත **නයං** නය **කාතුං** කරන්නට **යුත්තට්ඨානේ** යුතුතන්හි **නයෝ** නය තෙමේ **අකතෝ නාම** නොකොට වදාළ සේක් නම් **නත්ථි** නැත **ඉධ පන** මේ සස්නෙහි නොහොත් මේ අකුශල ලෝකෝත්තර භූමියෙහි ඖදරික සූක්‍ෂම භාවය උදුරා දක්වන තන්හි **ඒකච්චෝ** ඇතැම් ආචාර්‍ය්‍යයෙක් (**අහං** මම) **ආචරියෝ අස්මීති** ආචාර්‍ය්‍ය වේමැයි **විචරන්තෝ** හැසිරෙන්නේ **අකුසලේ** අකුශලයෙහි **ඕළාරිකසුඛුමතං** ඖදරික සූක්‍ෂම භාවය **උද්ධරමානෝ** උදුරන්නේවැ **කුක්කුච්චායති** කුකුස් උපදවයි **සම්මාසම්බුද්ධේන පන** සර්වඥයන් වහන්සේ විසින් වනාහි **ලෝකුත්තරේපි** ලෝකෝත්තරයෙහිදු **ඕළාරිකසුඛුමතා** ඖදරික සූක්‍ෂම භාවයෑ **උද්ධරිතාති** උදුරන ලදයෑ (**ආහ** කී සේක) **ඒවඤ්ච පන** මෙපරිද්දෙන් වනාහි **වත්වා** බැණ "තත්‍ර භන්තේ යායං පටිපදා -පෙ- දන්ධත්තා චාති තත්‍ර භන්තේ -පෙ- දන්ධත්තා ච" යි **ඉදං සුත්තං** මේ ප්‍රවචන පාළිය **ආහරි** ගෙන ඇර දැක්වූ සේක **භන්තේ** වහන්ස **තත්‍ර** ඒ ප්‍රතිපදාවන් අතුරෙන් **යා අයං පටිපදා** යම් ප්‍රතිපදාවක් තොමෝ **දුක්ඛා** නොසැප වූ ආසේවනය ඇත්තී ද **දන්ධාභිඤ්ඤා** ලස් වූ අභිඥා ඇත්තී ද **භන්තේ** වහන්ස **අයං පටිපදා** මේ ප්‍රතිපදා තොමෝ **දුක්ඛත්තා ච** නොසැප වූ ආසේවනය ඇති බැවින් ද **දන්ධත්තා ච** ලස් වූ අභිඥා ඇති බැවින් ද **ඉති (ඉමිනා) උභයේනේව** මේ දෙයාකාරයෙන්ම **හීනා** අධමයයි **අක්ඛායති** වැටහේ **හි** ඒ ප්‍රකට කරණය කෙරෙන් **එත්ථ** මේ ප්‍රවචන පාළියෙහි **චතස්සෝ පටිපදා** ප්‍රතිපදාවෝ සතර දෙන **ලෝකියලෝකුත්තරමිස්සකා** ලෞකික ලෝකෝත්තර මිශ්‍රවූවාහු **කථිතා** වදරණ ලදයහ.

* "චතස්සෝ පටිපදා" යනු දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා, සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා යන ප්‍රතිපදාවෝ සතර දෙනයහ. සාධක පාඨයෙහි නිදර්ශන යන විසින් එක් ප්‍රතිපදාවක්ම දැක්වූහ. මේ දේශනා පාඨයෙහි ලෞකික ලෝකෝත්තර ධර්ම මිශ්‍ර වූ චතුර්විධ ප්‍රතිපදාවන් වදාළ හෙයින් "දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා" යි වදාළ ලෝකෝත්තර ධර්මයෝ හීනයහ. "සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා" යි වදාළ ලෝකෝත්තර ධර්මයෝ ප්‍රණීතයහ. මෙසේ ලෝකෝත්තර භූමියෙහි හීන ප්‍රණීත භාවය වදාළ කාරණයෙන් ලෝකෝත්තර භූමියෙහි ඖදරික සූක්‍ෂම භාවය ද උපුටා දැක්විය යුත්තේය යන නයදානය කරණ ලදැයි ස්මරණය කොටැ "සම්මාසම්බුද්ධේන අභිධම්මං පත්වා

ඒකපදස්සාපි ද්වින්නම්පි පදනං ආගතට්ඨානේ නයං දතුං යුත්තට්ඨානේ නයෝ අදින්නෝ නාම නත්ථි" යන වචනය ත්‍රිපිටක චූළාභය ස්ථවිරයන් වහන්සේ වදළ සේක. තවද උත්තම වූ ලෝකෝත්තර භූමියෙහි හීන ප්‍රණීත භාවෝද්ධරණය නොයෙදේදෝ හෝ යන චෝදනාව සිත්හිලා පරිහාර දක්වන ටීකාචාර්‍ය්‍යයෝ "ලෝකියලෝකුත්තරමිස්සකා කථිතාති, තස්මා ඒකන්තපණීතේ හීනපණීතානං උද්ධටත්තා ඒවමේව ඒකන්තහීනේ ච යථාසම්භවං හීනපණීතතා උද්ධරිතබ්බාති අනුකඩ්ඪනං හෝතීති උභයත්ථ තදුද්ධරණේ න කුක්කුච්චායිතබ්බන්ති අත්ථෝ" යි යුහු.

**තං තං වා පනාති එත්ථ** තං තං වා පන යන මේ පාඨයෙහි **හෙට්ඨිමනයෝ** යට කී නය තෙමේ **න ඕලෝකේතබ්බෝ** අපේක්ෂා නොකොට යුතු (මෙහි හෙට්ඨිම නය නම් පෙළෙහි ස්වරූප වශයෙන් වදළා වූ "අකුසලා වේදනා ඕළාරිකා කුසලා අබ්‍යාකතා වේදනා සුඛුමා" යනාදී නයයි) "තං තං වා පන වසේනේව" ඒ ඒ ප්‍රවචන පාළියෙහි වදරණ ලද්දවුන් කෙරෙන් අන්‍යවූ නය විසින්මැ (**ඕළාරිකසුඛුමතං** ඖදරික සූක්‍ෂම භාවය) **කථේතබ්බං** කියයුතු.

* භදන්ත බුද්ධඝෝෂාචාර්‍ය්‍යයෝ පෙළෙහි ඖදරික සූක්‍ෂම භාව වශයෙන් වදරණ ලද්දවුන් කෙරෙන් අන්‍යවූ නයග්‍රහවිධීන් වේදනාවන්ගේ ඖදරික සූක්‍ෂම භාවය දැක්වූහ යනු භාවයි. තදන්‍යවූ නයග්‍රහනය කුමක්දැයි ඇසිය යුතු පැණ විසඳනු සඳහා "දුවිධාහි අකුසලා" යනාදිය ඇර දක්වත්.

**හි** විස්තර කෙරෙමි **අකුසලා** අකුශල වේදනා තොමෝ **ලෝභසහගතා ච** ලෝභසහගතැයි ද **දෝසසහගතා ච** ද්වේෂ සහගතැයි ද **දුවිධා** ද්විප්‍රකාරයැ **තත්ථ** ඒ ලෝභසහගත ද්වේෂසහගත වේදනාවන් අතුරෙන් **දෝසසහගතා** ද්වේෂය එක්වැ පැවති වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **ලෝභසහගතා** ලෝභය එක්වැ පැවති වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **දෝසසහගතාපි** ද්වේෂය එක්වැ පැවති වේදනා තොමෝ ද **නියතා ච** නියත වේදනාවකැ කියාත් **අනියතා ච** අනියත වේදනාවකැ කියාත් **දුවිධා** ද්විප්‍රකාරයැ **තත්ථ** ඒ නියතානියත වේදනාවන් අතුරෙන් **නියතා** නියත වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **අනියතා** අනියත වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **නියතාපි** නියත වේදනා තොමෝ ද **කප්පට්ඨිතිකා** කල්පස්ථායික වූ හෙවත් කල්පයක් මුළුද අවීචි නරකයෙහි දුක් විඳීමට නොනිසි වූ නියත වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **කප්පට්ඨිතිකාපි** කල්පස්ථායික වූ වේදනා තොමෝ ද **අසඞ්ඛාරිකා** අසංස්කාරික වූ කල්පස්ථායික වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **සසඞ්ඛාරිකා** සසංස්කාරික වූ කල්පස්ථායික වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ.

* පඤ්චානන්තර්‍ය්‍ය කර්මයන් සම්බන්ධී වූ ද්වේෂය සමඟ පවත්නා වූ වේදනාව නියත නමැයි ද ආනන්තර්‍ය්‍ය කර්මයන් කෙරෙන් අන්‍යවූ ප්‍රාණඝාත කර්මයන් සම්බන්ධී වූ ද්වේෂය සමඟ පවත්නා වේදනාව අනියත නමැයි ද සඞ්ඝභේද කර්මය සමඟ සම්බන්ධී වූ නියත වේදනාව කල්පස්ථායික නමැයි ද සඞ්ඝභේද කර්මයෙන් අන්‍යවූ ආනන්තර්‍ය්‍ය කරමයන් සම්බන්ධී වූ නියත වේදනාව අකල්පස්ථායික නමැයි ද දතයුතු.

**ලෝභසහගතාපි** ලෝභය හා එක්වැ පැවති වේදනා තොමෝ ද **දිට්ඨිසම්පයුත්තා ච** මිත්‍යාදෘෂ්ටිය හා ඒකෝත්පාදදී ප්‍රකාරයෙන් යුක්ත වේදනාවකැ

කියාත් **දිට්ඨිවිප්පයුත්තා ච** මිත්‍යාදෘෂ්ටිය හා ඒකෝත්පාදී ප්‍රකාරයෙන් යුක්ත නොවූ වේදනාවකැ කියාත් **දුවිධා** ද්විප්‍රකාරයැ **තත්‍ථ** ඒ දෘෂ්ටිසම්ප්‍රයුක්ත දෘෂ්ටිවිප්‍රයුක්ත වේදනාවන් අතුරෙන් **දිට්ඨිසම්පයුත්තා** දෘෂ්ටිසම්ප්‍රයුක්ත වේදනා තොමෝ **ඕළාරිකා** ඖාරිකයැ **දිට්ඨිවිප්පයුත්තා** දෘෂ්ටිවිප්‍රයුක්ත වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **දිට්ඨිසම්පයුත්තාපි** දෘෂ්ටිසම්ප්‍රයුක්ත වේදනා තොමෝ ද **නියතා** නියතමිත්‍යාදෘෂ්ටිය හා එක්ව පැවති වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **අනියතා** අනියතමිත්‍යාදෘෂ්ටිය එක්ව පැවති වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ නියතමිත්‍යාදෘෂ්ටිය එක්වැ පැවති වේදනා තොමෝ ද **අසඞ්ඛාරිකා** අසංස්කාරික වූවා **ඕළාරිකා** ඖදරිකයැ **සසඞ්ඛාරිකා** සසංස්කාරික වූවා **සුඛුමා** සූක්‍ෂමයැ **සඞ්ඛේපතෝ** සැකවින් **අකුසලං පත්‍වා** පාප පක්‍ෂය කරා පැමිණ **යා** යම් වේදනාවක් තොමෝ **බහුං** බොහෝ වූ **විපාකං** විපාකය **දේති** දෙද්ද **සා** ඒ වේදනා තෝමෝ **ඕළාරිකා** ඖදරිකයැ **යා** යම් වේදනාවක් තොමෝ **අප්පං** ස්වල්ප විපාකයක් (**දේති** දෙද්ද) **සා** ඒ වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ෴

**කුසලං** පන පුණ්‍ය පක්‍ෂයට වනාහි **පත්‍වා** පැමිණ **අප්පවිපාකා** ස්වල්ප විපාකයක් ගෙන දෙන්නා වූ වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **බහුවිපාකා** බොහෝ වූ විපාකයක් ගෙන දෙන්නා වූ වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **චතුබ්බිධේ** සිව් වැදෑරුම් වූ **කුසලේ** කුශලයෙහි **කාමාවචරකුසලා** කාමාවචර කුශල වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **රූපාවචරකුසලා** රූපාවචර කුශල වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ රූපාවචර කුශල වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ **අරූපාවචරකුසලා** අරූපාවචර කුශල වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ අරූපාවචර කුශල වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ **ලෝකුත්තරකුසලා** ලෝකෝත්තර කුශල වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **අයං** මේ කියන ලදුයේ **තාව** පළමුකොටැ **භූමීසු** චතුර්විධ භූමීන්හි **අභේදතෝ** අභේද වශයෙන් හෙවත් නොවෙනස් වශයෙන් **නයෝ** නයයි **භේදතෝ පන** භේද වශයෙන් වනාහි **කාමාවචරා** කාමාවචර වේදනා තොමෝ **දානසීලභාවනාවසේන** දානමය සීලමය භාවනාමය වේදනාවන්ගේ වශයෙන් **තිවිධා** ත්‍රිවිධයැ **තත්‍ථ** ඒ ත්‍රිවිධ වේදනාවන් අතුරෙන් **දානමයා** දානමය වූ වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **සීලමයා** ශීලමය වූ වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ ශීලමය වූ වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකා **භාවනාමයා** භාවනාමය වූ වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ භාවනාමය වූ වේදනා තොමෝ ද **දුහේතුකා** ද්විහේතුක වූ වේදනායයි ද **තිහේතුකා** ත්‍රිහේතුක වේදනායයි ද **ඉති** මෙපරිද්දෙන් **දුවිධා** ද්විප්‍රකාර වේ **තත්‍ථ** ඒ ද්විප්‍රකාර වේදනාවන් අතුරෙන් **දුහේතුකා** ද්විහේතුක වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **තිහේතුකා** ත්‍රිහේතුක වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **තිහේතුකාපි** ත්‍රිහේතුක වූ වේදනා තොමෝ ද **සසඞ්ඛාරිකඅසඞ්ඛාරිකභේදතෝ** සසංස්කාරික අසංස්කාරික වේදනා භේද වශයෙන් **දුවිධා** ද්විප්‍රකාර වේ **තත්‍ථ** ඒ ද්විප්‍රකාර වේදනාවන් අතුරෙන් **සසඞ්ඛාරිකා** සසංස්කාරික වූ වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **අසඞ්ඛාරිකා** අසංස්කාරික වූ වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **රූපාවචරේ** රූපාවචර භූමියෙහි **පඨමජ්ඣානකුසලවේදනා** ප්‍රථමධ්‍යාන කුශල වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **දුතියජ්ඣාන** -පෙ- **චතුත්ථජ්ඣානකුසලවේදනා** ද්විතීය ධ්‍යාන කුශල වේදනා -පෙ- චතුර්ථ ධ්‍යාන කුශල වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමය **සාපි** ඒ චතුර්ථ ධ්‍යාන කුශල වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ **ආකාසානඤ්චායතනකුසලවේදනා** ආකාශානඤ්චායතන කුශල වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **ආකාසානඤ්චායතන කුසලවේදනාපි** ආකාශානඤ්චායතන කුශල වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ

-පෙ- **නේවසඤ්ඤානාසඤ්ඤායතනකුසලවේදනා** නෛවසංඥානාසංඥායතන කුශල වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ නෛවසංඥනාසංඥ කුශල වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ **විපස්සනාසහජාතා** විදර්ශනාව හා සමග උපන් වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ විදර්ශනාව හා සමග උපන් වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ **සෝතාපත්තිමග්ගසහජාතා** ශ්‍රෝතාපත්ති මාර්ගය හා සමග උපන් වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ ශ්‍රෝතාපත්ති මාර්ගය හා සමග උපන් වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ -පෙ- **අරහත්තමග්ගසහජාතා** අර්හත් මාර්ගය හා සමග උපන් වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ.

**චතුබ්බිධේ** සිව් වැදෑරුම් වූ **විපාකේ** විපාකයෙහි **කාමාවචරවිපාකවේදනා** කාමාවචර විපාක වේදනා තෝමෝ **ඕළාරිකා** ඖදරිකයැ **රූපාවචරවිපාකවේදනා** රූපාවචර විපාක වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ රූපාවචර විපාක වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකය -පෙ- **ලෝකුත්තරවිපාකවේදනා** ලෝකෝත්තර විපාක වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **ඒවං** මෙකී නයින් **අභේදතෝ** සාමාන්‍ය වශයෙන් **තාව** භේදයට පළමු (**නයෝ** නයයි) **භේදතෝ පන** විශේෂ වශයෙන් වනාහි **කාමාවචරවිපාකා** කාමාවචර විපාකයෝ **අහේතුකා** අහේතුක විපාක කෙනෙකුදු **අත්ථි** ඇත්තාහ **සහේතුකා** සහේතුක විපාක කෙනෙකුදු **අත්ථි** ඇත්තාහ **සහේතුකාපි** සහේතුක කාමාවචර විපාකයෝ ද **දුහේතුකා** ද්විහේතුක විපාක කෙනෙකුදු **අත්ථි** ඇත්තාහ **තිහේතුකා** ත්‍රිහේතුක විපාක කෙනෙකුදු **අත්ථි** ඇත්තාහ **තත්ථ** ඒ කාමාවචර විපාකයන් අතුරෙන් **අහේතුකා** අහේතුක කාමාවචර විපාක වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **සහේතුකා** සහේතුක විපාක වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ සහේතුක කාමාවචර විපාක වේදනා තොමෝ ද **දුහේතුකා** ද්විහේතුක වූවා **ඕළාරිකා** ඖදරිකයැ **තිහේතුකා** ත්‍රිහේතුක වූවා **සුඛුමා** සූක්‍ෂමයැ **තත්ථාපි** ඒ ත්‍රිහේතුක කාමාවචර විපාක වේදනාවන් අතුරෙහිදු **සසඞ්ඛාරිකා** සසංස්කාරික වූවා **ඕළාරිකා** ඖදරිකයැ **අසඞ්ඛාරිකා** අසංස්කාරික වූවා **සුඛුමා** සූක්‍ෂමයැ **පඨමජ්ඣානවිපාකා** ප්‍රථමධ්‍යාන විපාක වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **දුතිය** -පෙ- **චතුත්ථජ්ඣානවිපාකා** ද්විතීය -පෙ- චතුර්ථ ධ්‍යාන විපාක වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ චතුර්ථ ධ්‍යාන විපාක වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ **ආකාසානඤ්චායතනවිපාකා** ආකාශානඤ්චායතන විපාක වේදනා තොමෝ ද **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ ආකාශානඤ්ඤායතන විපාක වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ -පෙ- **නේවසඤ්ඤානාසඤ්ඤායතනවිපාකා** නෛවසංඥනාසංඥායතන විපාක වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ නෛවසංඥනාසංඥ විපාක වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ **සෝතාපත්තිඵලවේදනා** ශ්‍රෝතාපත්ති ඵල වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ ශ්‍රෝතාපත්ති ඵල වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ **සකදාගාමී** -පෙ- **අරහත්තඵලවේදනා** සකෘදගාමී -පෙ- අර්හත් ඵල වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ.

**තීසු ක්‍රියාසු** ත්‍රිවිධ ක්‍රියා වේදනාවන් අතුරෙන් **කාමාවචරක්‍රියාවේදනා** කාමාවචර ක්‍රියා වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **රූපාවචරක්‍රියාවේදනා** රූපාවචර ක්‍රියා වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ රූපාවචර ක්‍රියා වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ **අරූපාවචරක්‍රියාවේදනා** අරූපාවචර ක්‍රියා වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **ඒවං** මේ කී නයින් **අභේදතෝ** සාමාන්‍ය වශයෙන් **තාව** භේදයට පළමු (**නයෝ** නයයි) **භේදතෝ පන** විශේෂ වශයෙන් වනාහි **අහේතුකාදිවසේන** අහේතුකාදීන්ගේ වශයෙන් **භින්නාය** භේදයට පැමිණියා වූ

**කාමාවචරක්‍රියාය** කාමාවචර ක්‍රියාවෙහි **අහේතුකක්‍රියාවේදනා** අහේතුක ක්‍රියා වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **සහේතුකක්‍රියා** සහේතුක ක්‍රියා වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ සහේතුක ක්‍රියා වේදනා තොමෝ ද **දුහේතුකා** ද්විහේතුක වූවා **ඕළාරිකා** ඖදරිකයැ **තිහේතුකා** ත්‍රිහේතුක වූවා **සුඛුමා** සූක්‍ෂමයැ **තත්‍ථාපි** ඒ ත්‍රිහේතුක කාමාවචර ක්‍රියා වේදනාවන් අතුරෙහිදු **සසඞ්ඛාරිකා** සසංස්කාරික ත්‍රිහේතුක කාමාවචර ක්‍රියා වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **අසඞ්ඛාරිකා** අසංස්කාරික ත්‍රිහේතුක කාමාවචර ක්‍රියා වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **පඨමජ්ඣානේ** ප්‍රථමධ්‍යානයෙහි ක්‍රියා වේදනා තොමෝ **ඕළාරිකා** ඖදරිකයැ **දුතියජ්ඣානේ** ද්විතීය ධ්‍යානයෙහි (**ක්‍රියාවේදනා** ක්‍රියා වේදනා තොමෝ) **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ ද්විතීය ධ්‍යාන ක්‍රියා වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ **තතියේ** -පෙ- **චතුත්ථේ** තෘතීය ධ්‍යානයෙහි -පෙ- චතුර්ථ ධ්‍යානයෙහි (**ක්‍රියාවේදනා** ක්‍රියා වේදනා තොමෝ) **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ චතුර්ථ ධ්‍යාන ක්‍රියා වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ **ආකාසානඤ්චායනතක්‍රියාවේදනා** ආකාශානඤ්චායතන ක්‍රියා වේදනා තොමෝ **සුඛුමා** සූක්‍ෂමයැ **සාපි** ඒ ආකාශානඤ්ඤායතන ක්‍රියා වේදනා තොමෝ ද **ඕළාරිකා** ඖදරිකයැ **විඤ්ඤාණඤ්චායතන** -පෙ- **නේවසඤ්ඤානාසඤ්ඤායතනක්‍රියාවේදනා** -පෙ- නෛවසංඥානාසංඥායතන ක්‍රියා වේදනා තොමෝ සුඛුමා සූක්‍ෂමයැ **යා** යම් වේදනාවක් තොමෝ **ඕළාරිකා** ඖදරික වේද **සා** ඒ වේදනා තොමෝ **හීනා** හීන වනුයැ **යා** යම් වේදනාවක් තොමෝ **සුඛුමා** සූක්‍ෂම වේද **සා** ඒ වේදනා තොමෝ **පණීතා** ප්‍රණීත වනුයැ.

**[විභඞ්ගප්පකරණ අටුවා සන්නය 01/64-75 පිට]**

## කාමකුසල චිත්තයට "මහාකුසල සිත" යැයි කියනුයේ ඇයි?

**මහාකුසලචිත්ත**න්ති සෝමනස්සසහගතතාදිඅඞ්ගපාරිපූරියා මහන්තං කුසලචිත්තං. අථ වා පච්ඡිමභවිකබෝධිසත්තානං පටිසන්ධිආකඩ්ඪනතෝ මහන්තං පූජිතං කුසලචිත්තන්ති **මහාකුසලචිත්තං**. සබ්බේසම්පි හි සබ්බඤ්ඤුබෝධිසත්තානං පටිසන්ධි මෙත්තාපුබ්බඞ්ගමස්ස තිහේතුකසෝමනස්සමයස්ස අසඞ්ඛාරිකචිත්තස්ස විපාකෝති වුත්තං.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 25 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 90 පිට]**

සොම්නස් සහගතාදි අඞ්ගපරිපූර්ණත්වය හේතුකොටගෙන මහත්වූ කුසල චිත්තය නොහොත් පශ්චිමභවික බෝධිසත්වයන්ගේ ප්‍රතිසන්ධිය ගෙනදෙන හෙයින් පූජිතවූ කුසල චිත්තය මහා කුසල චිත්තය නම් වේ. ඒ එසේමැයි සියළුම සර්වඥ බෝධිසත්වයන්ගේ ප්‍රතිසන්ධිය මෛත්‍රී පූර්වඞ්ගම ත්‍රිහේතුක සොම්නස් සහගත අසංස්කාරික චිත්තයාගේ විපාකයයි කියනලදී.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 61පිට]**

කාමාවචර සිත් සූවිස්ස හා "මහා" යන ගුණ විශේෂණය කුමක්හෙයින් යෙදුවේ ද? කාම ප්‍රතිසන්ධි (09) නවය සප්තකාම ස්වර්ගයෙහි ප්‍රතිසන්ධි විපාක දනය කරන හෙයින් මහා යන ගුණ විශේෂණය යෙදුවේය.

රූපාවචර කුසලය තෙම රූපාවචර භූමියෙහි රූපාවචර විපාකයක්ම දෙයි. අරූපාවචර කුසලය තෙම අරූපාවචර භූමියෙහි අරූපාවචර විපාකයක්ම දෙයි. ලෝකෝත්තර විෂයෙහි සෝතාපත්තිමග්ග කුසලචිත්ත තෙම සෝතාපත්ති ඵලචිත්තය -පෙ- අරහත්තමග්ග කුසලචිත්තය අරහත්ත ඵලචිත්තයක්ම උපදවයි.

මෙසේ විපාක සඞ්ඛ්‍යාව මදහෙයින් රූපාරූපලෝකුත්තර චිත්තයන් හා මහා ශබ්දය නොයොදන ලදී.

කාමාවචර කුසල් එසේ නොවෙයි. ප්‍රතිසන්ධි වශයෙන් විපාක සිත් (09) නවයකි. එය භූමි වශයෙන් (07) සතක විපාක දෙයි. මෙසේ විපාක දනයෙහි මහත් වූ විෂය ඇති බැවින් කාමාවචර කුසලයෙහි මහා ශබ්දය යොදනලදී.

තවද අකුසල සිත් හා අහේතුක සිත්වලට වඩා ගුණ මහත්තත්වය ඇති බැවින් "මහා" ශබ්දය යොදන ලදී. තවද අර්පණා චිත්තයාගේ පූර්වභාගයෙහි ඥාණසම්පයුත්ත කාමාවචර කුසලය පතිතව ඒකාන්තයෙන් මහත් ගුණ ඇති බැවින් "මහා" ශබ්දය යොදන ලදී. මහාවිපාක මහාක්‍රියා වනාහි මහාකුසලයන්ගේ විපාක හා මහාකුසලයන්ගේ ක්‍රියාවන් වූ බැවින් "මහා" ශබ්දය යෙදීම යුක්තිතරයි. අභිධම්මාවතාර ටීකාවෙහි පශ්චිමභවික වූ බෝධිසත්වයින්ගේ ප්‍රතිසන්ධි චිත්තය යැයි කියන ලද විපාකචිත්තය උපදවන බැවින් මහාකුසලය යැයි කියන ලදි. මෙහි මහා ශබ්දය තෙම පූජා අර්ථය ප්‍රකාශකෙරේ. **"පච්ඡිමභවිකබෝධිසත්තානං පටිසන්ධිආකඩ්ඪනතෝ මහන්තං පූජිතං කුසලචිත්තන්ති මහාකුසලචිත්තං"**යි කියන ලදි. **පච්ඡිමභවිකබෝධිසත්තානං** අන්තිම භවයෙහි උපන්නා වූ බෝධිසත්වයින්ගේ **පටිසන්ධිආකඩ්ඪනතෝ** ප්‍රතිසන්ධිචිත්තය ආකඩ්ඪනය කරන හෙයින් **මහන්තං පූජිතං** පූජිත වූ **කුසලචිත්තං** කුසලචිත්තයයි **ඉති (තස්මා)** එසේ පූජිතකුසලචිත්තයක් වූ හෙයින් **මහාකුසලචිත්තං** මහාකුසලචිත්ත නම් වේ. (මේ ටීකාකාර මතයයි).

**[අභිධර්ම ප්‍රකාශය 55-56 පිටු; සද්ධර්මසාගරය 02/439-440 පිටු; අභිධර්ම ප්‍රවේශනය 19 පිට]**

මේ කාමාවචර කුසලයට මහා කුසලය යැයිද කියනු ලැබේ. එසේ කියන්නේ රූපාවචර අරූපාවචර ලෝකෝත්තර කුසලයන් මෙන් එය උසස් නිසා නොව ලෝකයේ සෑමතැනකම වෙසෙන බොහෝ දෙනාට ඇතිවන කුසලය නිසාය. රූපාවචර අරූපාවචර ලෝකෝත්තර කුසල් ඉතා ටික දෙනෙකුට පමණක් කලාතුරකින් ඇතිවන ඒවාය.

**[අභිධර්ම මාර්ගය 48 පිට]**

මහා යන විශේෂණය කොට කාමාවචර චිත්තයන් කෙරෙන් අතිශයින් පූජ්‍ය වූ මහග්ගත ලෝකෝත්තර චිත්තයන් සමග ඒ මහා යන විශේෂණය කුමක් හෙයින් නොයිදූ සේක්ද යත්? ඒ මහග්ගත කුසලයන් අතරින් ප්‍රථමධ්‍යාන කුසලය ප්‍රථමධ්‍යාන භූමියෙහි ද ද්විතීය තෘතීය චතුර්ථ ධ්‍යානයෝ ඒ ඒ භූමියෙහි ද සතර අරූපාවචර ධ්‍යානයෝ සතර අරූපභූමියෙහි ද විපාක දෙත්මය. සෝවාන් සකෘදගාමී අනාගාමී අරිහත් යන සතරමාර්ග කුසලචිත්තයෝ තම තමන්ගේ විපාකචිත්තයම උපදවත්. මෙසේ මහග්ගත ලෝකෝත්තර චිත්තයන්ගේ විපාකදන ස්වභාව සංක්ෂේප බැවින් මහා යන විශේෂණය නොකරන ලද්දේයි. කාමාවචර කුසලය වනාහි එසේ නොවේ. ප්‍රතිසන්ධි වශයෙන් කාමාවචර ප්‍රතිසන්ධිහු නවදෙනෙක් ද කාම සුගතිභූමීහු සත්දෙනෙක ද දියහැකි වෙති. ප්‍රවෘත්ති විපාකය වනාහි අවීචි මහා නරකය පටන් භවාග්‍රය දක්වා එක්තිස් භූමියෙහිම සුදුසු පරිද්දෙන් දියහැකි වෙයි. එසේම මනුෂ්‍යය ලෝකයෙහි ප්‍රවෘත්ති කාලයෙහි චක්‍රවර්ති රාජ්‍ය සම්පත්තිය, මණ්ඩලික රාජ්‍ය සම්පත්තිය, ප්‍රදේශ රාජ්‍ය සම්පත්තිය, ඒකරාජ රාජ්‍ය සම්පත්තිය. බ්‍රාහ්මණ මහාසාර ගෘහපතිමහාසාර ක්ෂත්‍රියමහාසාර සම්පත් ආදිය දෙති. මෙසේ කාමාවචර කුසලචිත්තයාගේ විෂය මහන්තත්වය හේතුකොටගෙන "මහා" යන විශේෂණය කළ පමණමුත් පූජ්‍ය අර්ථයෙන් "මහා" යැයි අර්ථ නොගත යුතු.

කාමාවචර විපාකය කුමක්හෙයින් "මහා විපාකය" යැයි ව්‍යවහාර කළේද යත්? මහග්ගත ලෝකෝත්තර විපාකයන්ට වඩා මහත් වූ විපාකදෝහෝයි සැකකටයුතු වෙයි. මහාකුසලයන්ගේ විපාක හෙයින් මහා විපාක යැයි ව්‍යවහාර කළ පමණමුත් මහග්ගත ලෝකෝත්තර විපාකයන් කෙරෙන් මහත් වූ අර්ථයෙන් මහා විපාක යැයි ව්‍යවහාර නොකෙරේ. එසේම කාමාවචර විපාකයන්ට ද "මහා" යන විශේෂණය මහා කුසලයන්ට බඳු බැවින් මහා ක්‍රියා යැයි ව්‍යවහාර කෙරේ.

**[විස්තර භාව සන්නය 35-36 පිටු]**

## "සහේතුක" ශබ්දය විපාක-ක්‍රියාවන්ට කීමට හේතු:—

**සහේතුකකාමාවචරකුසලවිපාකකිරියචිත්තානීති** එත්ථ සහේතුකග්ගහණං විපාකකිරියාපෙක්ඛං විසේසනං කුසලස්ස ඒකන්තසහේතුකත්තා. හෝති හි යථාලාභයෝජනා, "සක්ඛරකථලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පී"ත්‍යාදීසු (දී. නි. 1.249) විය සක්ඛරකථලස්ස චරණායෝගතෝ මච්ඡගුම්බාපෙක්ඛාය චරණකිරියා යෝජීයතීති.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 18 යටතේ); විභාවනී ටීකා සන්නය 58 පිට; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 19-20 පිටු; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ පුරාණ සන්නය 27 පිට]**

**සහේතුක** -පෙ- **ක්‍රියාචිත්තානීති එත්ථ (පාඨේ)** "සහේතුක -පෙ- ක්‍රියාචිත්තානි" යන මේ පාඨයෙහි **සහේතුකග්ගහණං** සහේතුක ශබ්දයාගේ ග්‍රහණය **විපාකක්‍රියාපෙක්ඛං** විපාක ක්‍රියාවන් අපේක්ෂා කරන්නාවූ **විසේසනං** විශේෂණයයි **කස්මා?** කුමක් හෙයින යත්? **කුසලස්ස** කුසලයාගේ **ඒකන්තසහේතුකත්තා** ඒකාන්තයෙන් සහේතුක බැවිනි (හි යනු තදේව සච්චං යනාර්ථයි) (යථාලාභ යෝජනායයි ආචාර්‍ය්‍යී තෙමේ කීයේය. කවර ප්‍රයෝගයෙක්හි යථාලාභ යෝජනාව වන්නේද යන චොද්‍යය සඳහා "සක්ඛරකඨලිකම්පි -පෙ- යෝජීයති" යන පාඨය කියනලද්) **සක්ඛරකඨලිකම්පි මච්ඡගුම්බම්පි විචරන්තම්පි තිට්ඨන්තම්පීති** "සක්ඛර -පෙ- තිට්ඨන්තම්පි" යනාදි පාඨයෙහි **සක්ඛරකඨලිකස්ස** සකුරුකැට කැබිලිතිහුගේ **චරණායෝගතෝ** ගමන ක්‍රියාව හා නොයෙදෙන හෙයින් **මච්ඡගුම්බාපෙක්ඛාය** මත්ස්‍ය සමූහය අපේක්ෂා කිරීම් වශයෙන් **චරණක්‍රියා** ගමනක්‍රියා තොමෝ **යෝජීයති** යොදනු ලැබේ (උදහරණයාගේ අර්ථ මෙසේයි) **සක්ඛරකඨලිකම්පි** සකුරුකැට කැබිලිත්ත ද **මච්ඡගුම්බම්පි** මත්ස්‍ය සමූහය ද **විචරන්තම්පි** හැසිරෙන්නාවූ ද **තිට්ඨන්තම්පි** සිටින්නාවූ ද **පස්සති** දක්නේය.

(පස්සති යනු ක්‍රියා පිණිස යොදනලදි. "සක්ඛරකඨලිකම්පි -පෙ- තිට්ඨන්තම්පි" යන පාඨයෙහි ලැබෙන්නා වූ යථාලාභ යෝජනාව කෙසේද යත්? සකුරුකැට කැබිලිතිහු ගමනක්‍රියාව හා නොයෙදෙන හෙයින් "සක්ඛරකඨලිකම්පි" යන කර්මය "විචරන්තම්පි" යන ක්‍රියාව හා සම්බන්ධ නොකටයුතුයි. "තිට්ඨන්තම්පි" යන ක්‍රියාව හා සමඟ යෙදියයුතුයි. මත්ස්‍ය සමූහය වනාහි ගමනක්‍රියා ස්ථිතික්‍රියා ද්වයම හා සමඟ යෙදෙන බැවින් "විචරන්තම්පි" යන ක්‍රියාව හා සමඟ ද "තිට්ඨන්තම්පි" යන ක්‍රියාව හා සමඟ ද යෙදේ. මෙසේ "සක්ඛරකඨලිකම්පි" යන කර්මය "විචරන්තං" යන ක්‍රියාව ඉක්මවා "තිට්ඨන්තං" යන ක්‍රියාව හා සම්බන්ධ වන හෙයින් යථාලාභ යෝජනා නම් වේ. යථාලාභ න්‍යායයයිදු කියත්. "ආදීසු විය" යි "විය" ශබ්දය හා සමඟද සමහර පොතක දක්නා ලැබේ. ඒ අයුක්ත පාඨයි. "මේ සහේතු -පෙ- චිත්තානි" යන පාඨයෙහි ද සහේතුක ශබ්දය පුඤ්ඤ ශබ්දය හා සම්බන්ධ නොකොට විපාක ශබ්දය සමඟම සම්බන්ධ කටයුතු හෙයින් යථාලාභ යෝජනායී කී නියායි)

**[විභාවනී ටීකා සන්නය 96-97 පිටු]**

මහාකුසලයෙහි සහේතුක ශබ්දය නොයොද මහාවිපාක මහාක්‍රියාවන්හි කුමක්හෙයින් සහේතුක ශබ්දය යෙදුවේ ද? මහාකුසල් ඒකාන්ත සහේතුක ස්වභාවය හෙයිනි. සහේතුක භාවයෙහි සැකයක් නැත්තේය. එහෙයින් සහේතුක ශබ්දය නොයොද මහාවිපාක මහාක්‍රියා සිත් සහේතුකදෝ හෝ අහේතුකදෝ හෝයි සැකයක් ඇතිවිය හැකි බැවින් සහේතුක ශබ්දය යොදන ලදි. **"සහේතුකග්ගහණං විපාකකිරියාපෙක්ඛං විසේසනං කුසලස්ස ඒකන්තසහේතුකත්තා"** (විභාවනී ටීකා) **සහේතුකග්ගහණං** සහේතුක ශබ්දය තෙම **විපාකක්‍රියාපෙක්ඛං** විපාක-ක්‍රියා සිත් අපේක්ෂා කරන්නා වූ **විසේසනං** විශේෂණයකි **කස්මා** කුමක්හෙයින්ද යත් **කුසලස්ස** මහාකුසලචිත්තය තමා **ඒකන්තසහේතුකත්තා** ඒකාන්තයෙන් සහේතුක වන බැවිනි.
**[අභිධර්ම ප්‍රකාශය 56 පිට; අභිධර්ම ප්‍රවේශනය 19 පිට; විස්තර භාව සන්නය 35 පිට]**

## කාමාවචර කුසල් සිත් වැඩිවන ආකාරයः—

"කමේන පුඤ්ඤවත්ථූහි, ගෝචරාධිපතීහි ච;
කම්මහීනාදිතෝ චේව, ගණෙය්‍ය නයකෝවිදෝ"ති.

ඉමානි හි අට්ඨ චිත්තානි දසපුඤ්ඤකිරියවත්ථුවසේන පවත්තනතෝ පච්චේකං දස දසාති කත්වා අසීති චිත්තානි හොන්ති, තානි ච ඡසු ආරම්මණේසු පවත්තනතෝ පච්චේකං ඡග්ගුණිතානි සාසීතිකානි චත්තාරි සතානි හොන්ති, අධිපතිභේදේන පන ඤාණවිප්පයුත්තානං චත්තාලීසාධිකද්විසතපරිමාණානං වීමංසාධිපති සම්පයෝගාභාවතෝ තානි තිණ්ණං අධිපතීනං වසේන තිගුණිතානි වීසාධිකානි සත්තසතානි, තථා ඤාණසම්පයුත්තානි ච චතුන්නං අධිපතීනං වසේන චතුග්ගුණිතානි සසට්ඨිකානි නව සතානීති ඒවං අධිපතිවසේන සහස්සං සාසීතිකානි ච ඡ සතානි හොන්ති, තානි කායවචීමනෝකම්මසඞ්ඛාතකම්මත්තිකවසේන තිගුණිතානි චත්තාලීසාධිකානි පඤ්ච සහස්සානි හොන්ති, තානි ච හීනමජ්ඣිමපණීතභේදතෝ තිගුණිතානි වීසසතාධිකපන්නරසසහස්සානි හොන්ති. යං පන වුත්තං **ආචරියබුද්ධදත්තත්ථේරේන**;

"සත්තරස සහස්සානි, ද්වේ සතානි අසීති ච;
කාමාවචරපුඤ්ඤානි, භවන්තීති විනිද්දිසේ"ති.

තං අධිපතිවසේන ගණනපරිහානිං අනාදියිත්වා සෝතපතිතවසේන වුත්තන්ති දට්ඨබ්බං, කාලදේසාදිභේදේන පන නේසං භේදෝ අප්පමෙය්‍යෝව.
**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 15 කාමාවචරසෝභනචිත්ත වණ්ණනා යටතේ); විභාවනී ටීකා සන්නය 54-56 පිටු; අභිධර්ම ප්‍රකාශය 45 පිට; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 18-19 පිටු; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ පුරාණ සන්නය 25-26 පිටු; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 28 පිට; පරමාර්ථ ධර්ම සඞ්ග්‍රහය 01/58 පිට]**

**තථා හි (තතෝ ඒව)** දශපුණ්‍යක්‍රියා වස්තු ආදීන්ගේ වශයෙන් බොහෝ ප්‍රභේද වන හෙයින්ම **"කමේන -පෙ- නය කෝවිදෝති"** කමේන -පෙ- නය කෝවිදෝ යනු **ආචාරියා** ආචාර්ය වරයෝ **වදන්ති** කියත් **නයකෝවිදෝ** න්‍යාය දක්ෂ පණ්ඩිත තෙමේ (මහාකුසලචිත්තං යන කර්මය ආධ්‍යාහාර වේ) **කමේන** පිළිවෙළින් **පුඤ්ඤක්‍රියාවත්ථූහි ච** පුණ්‍යක්‍රියා වස්තූන්ගේ වශයෙන්ද **ගෝචරාධිපතිහි ච**

ආලම්බණ අධිපති ධර්මයන්ගේ වශයෙන්ද **කම්මහීනාදිතෝචේව** කර්මලාමකාදි ප්‍රභේද වශයෙන් ද **ගණෙයය** ගණන් කරන්නේයි (පුණ්‍යක්‍රියාවස්තු ආදීන්ගේ වශයෙන්) ගණන් කරන්නේයයි ආචාර්ය තෙම කියේය. මහා කුසල චිත්තය කවර පරිද්දෙකින් පුණ්‍යක්‍රියා වස්තු ආදීන්ගේ වශයෙන් ගණන් කරන්නේදැයි යන චෝද්‍යය සඳහා "ඉමානිහි" යනාදී පාඨය කියනලදී.

(හි යනු විස්තරාර්ථයෙහි නිපාතයි) **ඉමානි අට්ඨ චිත්තානි** මේ චිත්තයෝ අටදෙන **දසපුඤ්ඤක්‍රියාවත්ථුවසේන** දස පින් කිරිය වත් වශයෙන් **පවත්තනතෝ** හටගන්නා හෙයින් **පච්චේකං** වෙන වෙනම **දස දසේති** දසය දසයකැයි **කත්වා** කොට **අසීති චිත්තානි හොන්ති** අසූසිත්කෙනෙක් වෙත් **තානිච** ඒ අසූවක් ප්‍රභේද වූ චිත්තයෝ ද **ඡසු ආරම්මණේසු** ෂඩාලම්බණයන්හි **පවත්තනතෝ** හටගන්නා හෙයින් **පච්චේකං** වෙන වෙනම **ඡගුණිතානි** සයින් ගුණිතකරණ ලද්දවුන් **කත්වා** කොට **සාසීතිකානි** අසූවකින් යුත්තවූ (හෙවත් අසූවක් අධිකකොට ඇත්තාවූ) **චත්තාරි සතානි** සාරසිය සිත්කෙනෙක් **හොන්ති** වෙත් **අධිපතිභේදේන පන** අධිපති ප්‍රභේදයෙන් වනාහී **චත්තාළීසාදික ද්විසතපරිමාණානං** සතළිසක් අධිකකොට ඇත්තාවූ දෙසියක් ප්‍රමාණවූ **ඤාණවිප්පයුත්තානං** ඤාණවිප්‍රයුක්ත චිත්තයන්ගේ **වීමංසාධිපතිසහයෝගාභාවතෝ** වීමංසාධිපති ධර්මයෙන් යෙදීමක් නැතිහෙයින් **තානි** ඒ සතළිසක් අධිකකොට ඇත්තාවූ දෙසියක් චිත්තයෝ **තිණ්ණං අධිපතීනං වසේන** ඡන්ද-චිත්ත-විරිය යන ධර්මයන් තුන්දෙනාගේ වශයෙන් **තිගුණිතානි කත්වා** තුණෙන් ගුණිතකළාවුන් කොට **වීසාධිකානි** විස්සක් අධිකකොට ඇත්තාවූ **සත්තසතානි හොන්ති** සත්සිය සිත්කෙනෙක් වෙත් **තථා** එපරිද්දෙන් **ඤාණසම්පයුත්තානිච** ඤාණසම්ප්‍රයුක්ත චිත්තයෝ ද **චතුන්නං අධිපතීනං වසේන** සතර අධිපතීන්ගේ වශයෙන් **චතුගුණිතානි කත්වා** සතරින් ගුණිතකළාවුන් කොට **සසට්ඨිකානි** සැටක් අධිකකොට ඇත්තාවූ **නවසතානි හොන්ති** නවසියයක් වෙත් (තථා ශබ්දයෙන් ඤාණවිප්‍රයුක්ත දෙසිය සතළිස පරිද්දෙන් ඤාණසම්ප්‍රයුක්ත දෙසියසතළිසද ගන්නේ යයි දැක්වූහු)

**ඒවං** එපරිද්දෙන් **අධිපතීනං වසේන** සතර අධිපති ධර්මයන්ගේ වශයෙන් **සහස්සඤ්ච** දහසක්ද **සාසීතිකානි** අසූවක් අධිකකොට ඇත්තාවූ **ඡ සතානිච හොන්ති** සසියයක්ද වෙත් **තානි** ඒ එක්දහස්සසියඅසූවක්වූ මහාකුසල චිත්තයෝ තුමූ **කාය-වචී-මනෝකම්ම සඞ්ඛ්‍යාත කම්මත්තිකවසේන** කාය-වාග්-මනෝකර්ම සඞ්ඛ්‍යාත කර්ම ත්‍රිකයාගේ වශයෙන් **තිගුණිතානි කත්වා** තුණෙන් ගුණිත කළ වූවක් කොට **චත්තාළීසාධිකානි** සතළිසක් අධිකකොට ඇත්තාවූ **පඤ්චසහස්සානි හොන්ති** පන්දහසක් සිත්කෙනෙක් වෙත් **තානි** ඒ පන්දහස් සතළිසක් ප්‍රභේදවූ මහාකුසල චිත්තයෝ තුමූ **හීණ-මජ්ඣිම-පණීතභේදතෝ** හීන-මධ්‍යම-පණීත යන ප්‍රභේද වශයෙන් **තිගුණිතානි කත්වා** තුණෙන් ගුණිත කළ වූවක් කොට **වීසසතාධික පණ්ණරස සහස්සානි හොන්ති** එක්සිය විස්සක් අධිකකොට ඇත්තාවූ පසළොස්දහස් සිත් කෙනෙක් වෙත් (ආයුෂ්මත් ටීකාචාරීනි මහාකුසල චිත්තයෝ තුමූ පසළොස්දහස් එක්සිය විස්සෙක් වෙතියි ආචාර්ය තෙම කීයේය. එසේ වී නම් කුමක්හෙයින් ආචාර්ය බුද්ධදත්තස්ථවිරයෝ "සත්තරසසහස්සානි" යනාදි ගාථාවකීහු දැයි යන චෝද්‍යය සඳහා "යං පන වුත්තං -පෙ- වුත්තන්ති දට්ඨබ්බං" යන පාඨය කියනලදී) **ආචරිය බුද්ධදත්තත්ථේරේන** ආචාර්ය බුද්ධදත්තස්ථවිරයන් වහන්සේ විසින් **සත්තරසසහස්සානි** -පෙ- **නිද්දිසේති** සත්තරස සහස්සානි -පෙ- නිද්දිසේ යන **යං පන (වචනං)** යම් වචනයක් වනාහි **වුත්තං** කියන ලද්දේද **තං (වචනං)** ඒ වචනය

**අධිපති වසේන** අධිපති ධර්මයන්ගේ වශයෙන් **ගණනපරිහාණිං** ගණන් අඩුකිරීම **අනාදියිත්වා** නොගෙණ **සෝතපතිතවසේන** (ඤාණසම්ප්‍රයුක්ත චිත්තයයි කියනලද) ගණන් ශ්‍රෝතයෙහි (ගණිත නමැති වේගයෙහි) හෙලීම් වශයෙන් **වුත්තං** කියන ලද්දේය **ඉති** මෙසේ **දට්ඨබ්බං** දතයුතුයි.

(ගාථාවෙහි අර්ථ මෙසේයි)

**කාමාවචරපුඤ්ඤානි** කාමාවචර කුසලයෝ තුමූ **සත්තරස සහස්සානිච** සතොළොස් දහසක්ද **ද්වේ සතානිච** දෙසියක්ද **අසීතිච** අසූවක්ද **භවන්ති** වෙත් **ඉති** මෙසේ **විනිද්දිසේ** දැක්වූයේයි.

**කාලදේසාදිභේදේන පන** කාලදේශාදීන්ගේ ප්‍රභේදයෙන් වනාහි **නේසං** ඒ කාමාවචර කුසලයන්ගේ **පභේදෝ** ප්‍රභේදතෙමේ **අප්පමෙය්‍යොව හෝති** ගණන් නොකළ හැක්කේම වේ. **[විභාවනී ටීකා සන්නය 89-91 පිටු]**

**අට්ඨපීති** එත්ථ පිසද්දෝ සම්පිණ්ඩනත්ථෝ. තේන ඉමේසං ඉධ වුත්තප්පකාරතෝ අඤ්ඤේහි පකාරේහි අනේකවිධතං සම්පිණ්ඩේති. තත්‍රායං නයෝ. ඉමානි අට්ඨචිත්තානි දසහි පුඤ්ඤක්‍රියාවත්ථූහි ගුණිතානි අසීති හොන්ති. පුන තානි ඡහි ආරම්මණේහි ගුණිතානි චත්තාරිසතානිචේව අසීති ච හොන්ති. පුන තානි තීහි කම්මේහි ගුණිතානි සහස්සං චත්තාරි සතානි චත්තාලීසංච හොන්ති. පුන තානි තීහි හීනමජ්ඣිමපණීතේහි ගුණිතානි චත්තාරි සහස්සානි තීණි සතානි වීසතිච හොන්ති. තානි ඉමානි සුද්ධිකානීති කත්වා ද්වීසු ඨානේසු ඨපේතබ්බානි. තතෝ ඒකං ඨානං ගහෙත්වා ද්විධා කරොන්තස්ස ඤාණසම්පයුත්තානි ද්වේසහස්සානි සතං සට්ඨීච හොන්ති. තථා ඤාණවිප්පයුත්තානීති. පුන තත්ථ ඤාණසම්පයුත්තානි චතූහි අධිපතීහි ගුණිතානි අට්ඨසහස්සානි ඡසතානි චත්තාලීසංච හොන්ති. ඤාණවිප්පයුත්තානි පන වීමංසාවජ්ජිතේහි තීහි අධිපතීහි ගුණිතානි ඡසහස්සානි චත්තාරිසතානි අසීතිච හොන්ති. පුන තදුභයානි සම්පිණ්ඩිතානි දසසහස්සං පඤ්චසහස්සානි සතං වීසතිච හොන්ති. පුන තානි පුබ්බේ විසුං ඨපිතේහි සුද්ධිකේහි සම්පිණ්ඩිතානි දසසහස්සං නවසහස්සානි චත්තාරි සතානි චත්තාලීසඤ්ච හොන්තීති. යං පන ටීකායං ඉධ වුත්තනයේන සුද්ධිකානිච ඤාණවිප්පයුත්තානි ච විසුං අකත්වා සබ්බානි පුඤ්ඤක්‍රියාදීහි සමං ගුණිතානි සත්තරස සහස්සානි ද්වේ සතානි අසීතිච හොන්තීති වුත්තං.

යඤ්ච **විභාවනියං** සුද්ධිකානි විසුං අකත්වා ඤාණවිප්පයුත්තානිඒව විසුං කත්වා තථා ගුණිතානි වීස සතාධික පන්නරස සහස්සානි හොන්තීති වුත්තං. තං සබ්බං න යුත්තං.

ඒවඤ්හි සති ඉමානි කාමාවචරකුසලානි නිච්චං සාධිපතිකානි හුත්වා නියතාධිපතිකානිනාම භවෙය්‍යුං. නව ඉමානි උපරි මහග්ගත කුසලානි විය ලෝකුත්තරානි විය ච නියතාධිපතිකානි හොන්තීති. ටීකානයේන පන ඤාණවිප්පයුත්තානිපි වීමංසාසහගතානීති ආපජ්ජතීති. යථාවා කෝසල්ලසම්භූතට්ඨේන කුසලාති එත්ථ ඤාණවිප්පයුත්තානිපි කෝසල්ලේන නානාවජ්ජනවීථියං පවත්තේන උපනිස්සයඤාණේන සම්භූතත්තා කුසලානි ඒව නාම හොන්ති. ඒවම්ධපි තානි තේනේව වීමංසාධිපතිභූතේන සම්භූතත්තා වීමංසාධිපතෙය්‍යානිපි නාම හොන්තීති න නසක්කා වත්තුන්ති ඉමිනා අධිප්පායේන තානි විසුං අකතානි සියුන්ති. ඒවං සන්තේපි කාමකුසලානි නාම අධිපතිවිමුත්තානි

ඒව බහුතරානි හොන්ති. තස්මා නසක්කා සබ්බානි කාමකුසලානි වීමංසාධිපතිමූලිකානි භවිතුන්ති. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 42 යටතේ)]**

අට්ඨපීති එත්ථ පිසද්දේන ඉමානි චිත්තානි න කේවලං අට්ඨේව හොන්ති. අථ ඛෝ තතෝ බහූනිපි බහුතරානිපි හොන්තීති ඉමං සම්පිණ්ඩනත්ථං දීපේතීති දස්සේතුං "තේනා"ති ආදි වුත්තං. දසසු පුඤ්ඤකිරියාවත්ථූසු දිට්ඨුජුකම්මං නාම ඤාණකිච්චං. තං කථං ඤාණවිප්පයුත්තචිත්තේහි කරොන්තීති. වුච්චතේ. ඤාණසම්පයුත්ත චිත්තේහි දිට්ඨිං උජුං කරොන්තා තේසං අන්තරන්තරා ඤාණසෝතේ පතිතවසේන ඤාණවිප්පයුත්තචිත්තේහිපි කරොන්තියේව. සබ්බේ සත්තා කම්මස්සකාති ආදිනා, බුද්ධෝ සෝ භගවා, ස්වාක්ඛාතෝ සෝ ධම්මෝ, සුප්පටිපන්නෝ සෝ සඞ්ඝෝ,ති ආදිනා චාති දට්ඨබ්බං. තේනාහ "ඉමානි අට්ඨ චිත්තානී"ති ආදිං. තත්ථ දසපුඤ්ඤකිරියවත්ථූනි නාම 'දානං, සීලං, භාවනා, අපචායනං, වෙය්‍යාවච්චං, පත්තිදානං, පත්තානුමෝදනං, ධම්මස්සවනා, ධම්මදේසනා, දිට්ඨුජුකම්මං. තේහි ගුණිතානි වඩ්ඪිතානි. තානි ච අට්ඨ ඡසු ආරම්මණේසු උප්පජ්ජන්ති. තීණි ච කම්මානි කරොන්තා තේහේව අට්ඨහි කරොන්ති. තානියේව ච සබ්බානි අත්ථි හීනානි, අත්ථි මජ්ඣිමානි, අත්ථි පණීතානි. තස්මා පුන අනුක්කමේන ආරම්මණාදීහි වඩ්ඪනං කරෝති. තත්ථ "තානි ඨපේතබ්බානී"ති සම්බන්ධෝ. "සුද්ධිකානී"ති අධිපතීහි අමිස්සිතානි. "ඉති කත්වා"ති ඉති මනසි කරිත්වා. තථා ඤාණවිප්පයුත්තානි ද්වේසහස්සානි සතං සට්ඨි ච හොන්තීති යෝජනා. "වීමංසාවජ්ජිතේහී"ති වීමංසාධිපති වජ්ජිතේහි. "තථාගුණිතානී"ති සබ්බානි පුඤ්ඤකිරියාදීහි සමං ගුණිතානි. "කෝසල්ලේනා"ති කෝසල්ලසඞ්ඛාතේන. "නානාවජ්ජනවීථිය"න්ති ඤාණවිප්පයුත්තවීථීහි විසුං භූතාය ආවජ්ජනාය යුත්තවීථියං. "තේනේවා"ති වීමංසාධිපතිභූතේන තේනේව උපනිස්සයඤ්ඤාණේන. ඒවං සන්තේපි න සක්කා භවිතුන්ති සම්බන්ධෝ. **[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 42 යටතේ)]**

**අට්ඨපි ඉති** අට්ඨපි යන **එත්ථ** මෙහි **පිසද්දෝ** පි-ශබ්දය **සම්පිණ්ඩනත්ථෝ** සම්පිණ්ඩනාර්ථයි **තේන** ඒ පි-ශබ්දයෙන් **ඉධ** මෙහි **ඉමේසං** මේ කුසල චිත්තයන්ගේ **වුත්තප්පකාරතෝ** කියනලද ආකාරයෙන් **අඤ්ඤේහි පකාරේහි** අන්‍ය ප්‍රකාර වූ **අනේකවිධතං** නොයෙක් වැදෑරුම් බව **සම්පිණ්ඩේති** සම්පිණ්ඩනය කරයි **තත්‍ර** එහි **අයං නයෝ** මේ ක්‍රමයයි **ඉමානි අට්ඨ චිත්තානි** මේ චිත්තයෝ අටදෙන **දසහි පුඤ්ඤක්‍රියාවත්‍ථූහි** දස පුණ්‍යක්‍රිය වස්තුවලින් **ගුණිතානි** ගුණකරනලද්දේ **අසීති හොන්ති** සිත් අසූවක් වෙත් **පුන** නැවත **තානි (අසීති චිත්තානි)** ඒ අසූවක් වූ චිත්තයෝ **ඡහි ආරම්මණේහි** අරමුණු සයෙන් **ගුණිතානි** ගුණකරනලද්දේ **චත්තාරිසතානිචේව අසීති ච හොන්ති** සාරසිය අසූවක් චිත්තයෝ වෙත් **පුන** නැවත **තානි** ඒ සාරසිය අසූවක් වූ චිත්තයෝ **තීහි කම්මේහි** කාය වාග් මනෝ යන කර්ම තුනෙන් **ගුණිතානි** ගුණකරනලද්දේ **සහස්සං චත්තාරිසතානි චත්තාළීසඤ්ච හොන්ති** එක්දහස් සාරසිය සතළිසක් චිත්තයෝ වෙත් **පුන** නැවත **තානි** එක්දහස් සාරසිය සතළිසක් වූ චිත්තයෝ **තීහි හීනමජ්ඣිමපණීතේහි** හීන මධ්‍යම ප්‍රණීත වූ කාය වාග් මනෝ යන කර්ම තුනෙන් **ගුණිතානි** ගුණකරනලද්දේ **චත්තාරිසහස්සානි තීණිසතානි වීසති ච හොන්ති** සාරදහස් තුන්සිය විස්සක් චිත්තයෝ වෙත් **තානි ඉමානි (චිත්තානි)** ඒ මේ චිත්තයෝ **සුද්ධිකානීති කත්‍වා** අධිපතීන් හා මිශ්‍ර නොවූ චිත්තයෝ යැයි මෙනෙහි කොට **ද්වීසු ඨානේසු** දෙකොටසක් කොට **ඨපේතබ්බානි** තැබියයුත්තාහ **තතෝ** එයින් **ඒකං ඨානං ගහෙත්‍වා** එක් කොටසක් ගෙන **ද්විධා කරොන්තස්ස** දෙවැදෑරුම් කරන්නහුට **ඤාණසම්පයුත්තානි** ඤාණසම්ප්‍රයුක්ත චිත්තයෝ **ද්වේසහස්සානි සතං සට්ඨි ච**

**හොන්ති** දෙදහස් එකසිය සැටක් වෙත් **තථා** එසේම **ඤාණවිප්පයුත්තානි** ඤාණවිප්‍රයුක්ත චිත්තයෝ ද **ඉති (ද්වේසහස්සානි සතං සට්ඨි ච හොන්ති)** දෙදහස් එකසිය සැටක් වෙත් **පුන** නැවත **තත්‍ථ** එහි **ඤාණසම්පයුත්තානි (චිත්තානි)** ඤාණසම්ප්‍රයුක්ත චිත්තයෝ **චතූහි අධිපතීහි** සතර අධිපති ධර්මයන්ගෙන් **ගුණිතානි** ගුණකරනලද්දේ **අට්ඨසහස්සානි ඡසතානි චත්තාළීසඤ්ච හොන්ති** අටදහස් සයසිය සතළිසක් ද වෙත් **ඤාණවිප්පයුත්තානි පන** ඤාණවිප්‍රයුක්ත චිත්තයෝ වනාහි **වීමංසා වජ්ජිතේහි තීහි අධිපතීහි** වීමංසාධිපති වර්ජිත වූ ඡන්ද චිත්ත විරිය යන අධිපති ධර්මයන් තුනෙන් **ගුණිතානි** ගුණකරනලද්දේ **ඡසහස්සානි චත්තාරිසතානි අසීති ච හොන්ති** සයදහස් සාරසිය අසූවක් චිත්තයෝ වෙත් **පුන** නැවත **තදුභයානි** ඒ සිත් කොටස් දෙක **සම්පිණ්ඩිතානි** සම්පිණ්ඩනය කරනලද්දේ **දසසහස්සං පඤ්චසහස්සානි සතං වීසති ච හොන්ති** පසළොස්දහස් එකසිය විස්සක් චිත්තයෝ වෙත් **පුන** නැවත **තානි** මේ චිත්තයෝ **පුබ්බේ විසුං ඨපිතේහි සුද්ධිකේහි** පෙර අධිපති ධර්මයන් සමඟ මිශ්‍ර නොකොට තබනලද චිත්තයන් හා **සම්පිණ්ඩිතානි** සම්පිණ්ඩනය කරනලද්දේ **දසසහස්සං නවසහස්සානි චත්තාරිසතානි චත්තාළීසඤ්ච හොන්ති** දහනවහස් සාරසිය සතළිසක් චිත්තයෝ වෙති.

**ටීකායං පන** විභාවනී ටීකායෙහි වනාහි **ඉධ වුත්තනයේන** මෙහි කියනලද ක්‍රමයෙන් **සුද්ධිකානි ච** අධිපති ධර්මයෝ ද **ඤාණවිප්පයුත්තානි ච** ඤාණවිප්‍රයුක්ත චිත්තයෝ ද **විසුං අකත්‍වා** වෙන් නොකොට **පුඤ්ඤකිරියාදීහි** පුණ්‍යකිරියාදීන් සමඟ **සමං** සමව **සබ්බානි** සියළු චිත්තයෝ **ගුණිතානි** ගුණ කරනලද්දේ **සත්තරසසහස්සානි ද්වේසතානි අසීති ච හොන්තීති** දහත්දහස් දෙසිය අසූවක් වෙත් යැයි **යං වුත්තං** යමක් කියනලදි.

**සුද්ධිකානි විසුං අකත්‍වා** අධිපති ධර්මයන් වෙන් නොකොට **ඤාණවිප්පයුත්තානි ඒව** ඤාණවිප්‍රයුක්ත චිත්තයෝම **විසුං කත්‍වා** වෙන් කොට **තථා** එසේ **ගුණිතානි** ගුණ කරනලද්දේ **වීසසතාධිකපන්නරසසහස්සානි හොන්තීති** පසළොස්දහස් එකසිය විස්සක් චිත්තයෝ වෙත් යැයි **විභාවනියං** විභාවනී ටීකායෙහි **යඤ්ච වුත්තං** යමක් කියනලදි ද **තං සබ්බං** ඒ සියල්ල **න යුත්තං** සුදුසු නොවෙයි.

**ඒවඤ්හි සති** මෙසේ ඇති කල්හි **ඉමානි කාමාවචරචිත්තානි** මේ කාමාවචර චිත්තයෝ **නිච්චං** නිත්‍යයෙන්ම **සාධිපතිකානි හුත්‍වා** අධිපති ධර්ම සහිත චිත්තයෝ වී **නියතාධිපතිකානි නාම භවෙය්‍යුං** නියත අධිපතිධර්ම ඇති චිත්තයෝ නම් වන්නාහ **ඉමානි** මේ චිත්තයෝ **උපරි** මතු කියනුලබන **මහග්ගතකුසලානි විය** මහග්ගත කුසල චිත්තයෝ මෙන් ද **ලෝකුත්තරානි විය ච** ලෝකෝත්තර කුසල චිත්තයෝ මෙන් ද **නියතාධිපතිකානි** නියත අධිපතිධර්ම ඇති චිත්තයෝ **නච හොන්තීති** නොවෙති **ටීකානයේන පන** ටීකානයින් වනාහි **ඤාණවිප්පයුත්තානිපි** ඤාණවිප්‍රයුක්ත චිත්තයෝ ද **වීමංසාසහගතානීති** වීමංසා අධිපතිධර්මය සහිත චිත්තයෝ යැයි **ආපජ්ජති** පැමිණෙයි **යථා වා** යම්සේ නොහොත් **කෝසල්ලසම්භූතට්ඨේන කුසලානි** කෝසල්ලසම්භූතාර්ථයෙන් කුසලයෝ යැයි **එත්‍ථ** මෙහි **ඤාණවිප්පයුත්තානිපි** ඤාණවිප්‍රයුක්ත චිත්තයෝ ද **නානාවජ්ජනවීථියං** ඤාණවිප්‍රයුක්ත වීථියෙන් වෙන්ව හටගත්තාවූ ආවර්ජනයෙන් යුක්ත වීථියෙහි **පවත්තේන උපනිස්සයඤාණේන** පැවැති උපනිශ්‍රය ඤාණයෙන් **සම්භූතත්තා** හටගත් බැවින් **කෝසල්ලේන** කෝසල්ල සඞ්ඛ්‍යාතයෙන් **කුසලානි ඒව නාම හොන්ති** කුසලචිත්තයෝම නම් වෙත් **ඒවං** මෙසේ **ඉධාපි** මෙහි ද **තානි** ඒ ඤාණවිප්‍රයුක්ත චිත්තයෝ **තේනේව වීමංසාධිපතිභූතේන** ඒ

වීමංසාධිපති ධර්මය වූ උපනිශ්‍රය ලක්ෂණයෙන් **සම්භූතත්තා** හටගත් බැවින් **වීමංසාධිපතෙය්‍යානිපි නාම** වීමංසාධිපතෙය්‍ය චිත්තයෝ නම් **හොන්තීති** වෙති යන මෙය **වත්තුං** කියන්නට **න නසක්කා ඉති** නොහැක්කේ නොවේ යයි **ඉමිනා අධිප්පායේන** මේ අදහසින් **විසුං** වෙන්ව **අකතානි තානි** නොකරනලද චිත්තයෝ **සියුං** වන්නේය **ඒවං සන්තේපි** මෙසේ ඇති කල්හිදු **කාමකුසලානි නාම** කාමාවචර කුසලයෝ නම් **අධිපතිවිමුත්තානි ඒව බහුතරානි හොන්ති** අධිපතිධර්මයන්ගෙන් විනිර්මුක්තවූම බොහෝ චිත්තයෝ වෙත් **තස්මා** එබැවින් **සබ්බානි කාමකුසලානි** සියළු කාමාවචර කුසලයෝ **වීමංසාධිපතිමූලිකානි** වීමංසාධිපති ධර්මය මුල්කොට ඇති චිත්තයෝ **භවිතුං** වන්නට **නසක්කා** නොහැක්කාහ. **[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

දසපුඤ්ඤක්‍රියාදීනං, වසේන ච බහූනිපි;
ඒතානි පන චිත්තානි, භවන්තීති පකාසයේ.
**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 26 යටතේ)]**

**දසපුඤ්ඤක්‍රියාදීනං වසේන ච බහූනිපි භවන්ති** ඒතානි පන චිත්තානි දසපුඤ්ඤකිරියාදීනං වසේනපි බහූනිපි භවන්ති **ඉති** ඒවං **පකාසයේ** භගවා පකාසෙය්‍ය. **[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 26 යටතේ)**

ඒවං පාළියං ආගතනයේන වේදනාඤාණප්පයෝගභේදතෝ අට්ඨවිධතං නිද්දිසිත්වා ඉදානි අට්ඨකථායං ආගතපුඤ්ඤකිරියාදීනං වසේනපි පභේදං දස්සේතුං **"දස පුඤ්ඤක්‍රියාදීන"**න්තිආදි වුත්තං. **ආදි-**සද්දේන ඡන්නං ආරම්මණානං, චතුන්නං අධිපතීනං, තිණ්ණං කම්මානං, හීනාදිභේදස්ස ච සඞ්ගහෝ දට්ඨබ්බෝ. තේනේවාහු;

"කමේන පුඤ්ඤවත්ථූහි, ගෝචරාධිපතීහි ච;
කම්මහීනාදිතෝ චාපි, ගණෙය්‍ය නයකෝවිදෝ"ති.
**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 26 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 92 පිට]**

සත්තරස සහස්සානි, ද්වේ සතානි අසීති ච;
කාමාවචරපුඤ්ඤානි, භවන්තීති විනිද්දිසේ.
තං පන යථානුරූපං කාමාවචරසුගතියං භවභෝගසම්පත්තිං අභිනිප්ඵාදේති.
**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 27 යටතේ)]**

කාමාවචරපුඤ්ඤානි සත්තරස සහස්සානි ච ද්වේ සතානි ච අසීති ච භවන්ති, **ඉති** වචනං **විනිද්දිසේ** ආචරියෝ කථෙය්‍ය.
දසපුඤ්ඤක්‍රියාවත්ථූ, ඡද්වාරාධිපතීහි ච;
කායාදීහි ච තීහේව, හීනාදීහි ච තීහි තු.
**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 27 යටතේ)]**

ඉදානි තථා පවත්තමානස්ස තස්ස යෝ යෝ තේසං තේසං වසේන ලබ්භමානෝ ගණනපරිච්ඡේදෝ, තං සම්පිණ්ඩිත්වා දස්සේතුං **"සත්තරස සහස්සානී"**තිආදි වුත්තං. තත්රේවං ගණනා වේදිතබ්බා; ඉමානි තාව අට්ඨ විඤ්ඤාණානි දසන්නං පුඤ්ඤකිරියවත්ථූනං වසේන පවත්තනතෝ පච්චේකං දස දසාති කත්වා අසීති චිත්තානි හොන්ති, තානි ච ඡසු ආරම්මණේසු පවත්තනතෝ ඡග්ගුණිතානි සාසීතිකානි

චත්තාරි සතානි හොන්ති, තානි චතුන්නං අධිපතීනං සහයෝගවසේන චතුග්ගුණිතානි සහස්සං, වීසාධිකානි ච නව සතානි හොන්ති, තානි ච කායවචීමනෝසඞ්ඛාතානං තිණ්ණං කම්මානං වසේන තිගුණිතානි සසට්ඨිසත්තසතාධිකානි පඤ්ච සහස්සානි හොන්ති, තානි ච හීනමජ්ඣිමපණීතභේදතෝ තිගුණිතානි සාසීතිකද්විසතාධිකානි සත්තරස සහස්සානි හොන්තීති. නනු ච ඤාණවිප්පයුත්තචිත්තානං වීමංසාධිපතිසහයෝගාභාවතෝ අධිපතිවසේන සහස්සං, සාසීතිකානි ච ඡ සතානි හොන්තීති තානි කම්මාදීනං වසේන සම්පිණ්ඩිතානි වීසසතාධිකානි පන්නරස සහස්සානි භවන්තීති? සච්චමේතං, සෝතපතිතවසේන පන තං අනාදියිත්වා අධිපතිගණනා ගහිතාති න තස්ස වසේන ගණනහානි කතාති දට්ඨබ්බං.
**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා චිත්තනිද්දේස වණ්ණනා අංක 27 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 92-94 පිටු]**

**ඒතානි චිත්තානි** ඒ මහාකුසල චිත්තයෝ අටදෙන වනාහි **දසපුඤ්ඤක්‍රියාදීනං** දසපුණ්‍යක්‍රියා වස්තු ආදීන්ගේ **වසේන** වශයෙන්ද **බහූනිපි භවන්තීති** බොහෝද වේත්යයි **පකාසයේ** ප්‍රකාශ කරන්නේය.

මෙහි ආදිශබ්දයෙන් ෂඩාලම්බණයන්ගේ හා සතර අධිපතීන්ගේද තුන්වැදෑරුම් කර්මයන්ගේ හා හීනාදි භේදයාගේද සඞ්ග්‍රහය දතයුත්තේයි එහෙයින්ම කීහු පුරාතනයෝ:—

කාමේන පුඤ්ඤවත්ථූහි - ගෝචරාධිපතීහිච
කම්මහීනාදිතෝචාපි - ගණෙය්‍ය නයකෝවිදෝ යි.

දැන් එසේ හටගනු ලබන්නාවූ ඒ චිත්තයාගේ ඒ ඒ භේදයන්ගේ වශයෙන් ලැබිය යුතු වූ යම් යම් ගණන් පිරිසිදීමක්වේද ඒ සියල්ල පිඬුකොට දක්වනු පිණිස "සත්තරස සහස්සානී" යනාදි ගාථාව කියන ලද්දේයි.

**කාමාවචරපුඤ්ඤනි** කාමාවචර කුසලයෝතුමු **සත්තරස සහස්සානි ච** සතළොස් දහසක්ද **ද්වේසතානි ච** දෙසියයක්ද **අසීති ච** අසූවක්ද **භවන්ති** වෙත් **ඉති** මෙසේ **විනිද්දිසේ** විස්තර වශයෙන් දැක්වූයේයි.

එහි ගණන් ක්‍රමය මෙසේ දතයුත්තේයි කෙසේද යත්? පළමුකොට මේ චිත්තයෝ අටදෙන දසපුණ්‍යක්‍රියා වස්තූන්ගේ වශයෙන් හටගන්නා හෙයින් වෙන වෙනම දශයෙන් ගුණිතකොට අසූ සිත්කෙනෙක් වෙත්. ඒ අසූවක් ප්‍රභේද වූ චිත්තයෝද ෂඩාලම්බණයන්හී හටගන්නා හෙයින් සයෙන් ගුණිත කරන ලද්දවුන්කොට අසූවකින් යුක්තවූ හෙවත් අසූවක් අධික කොට ඇත්තාවූ සාරසිය සිත්කෙනෙක් වෙත්. ඒ සාරසිය අසූවක් චිත්තයෝ ඡන්ද චිත්ත විරිය වීමංසා යන සතර අධිපති ධර්මයන්ගේ වශයෙන් සතරින් ගුණිතකරන ලද්දවුන් කොට එක්දහස් නවසිය විසි සිත්කෙනෙක් වෙති. ඒ එක්දහස් නවසිය විස්සක් මහා කුසල් චිත්තයෝ තුමූ කායවාග්මනෝ සඞ්ඛ්‍යාත ත්‍රිවිධ කර්මයන්ගේ වශයෙන් තුණෙන් ගුණිතකරණ ලද්දවුන් කොට පන්දහස් සත්සිය සැටක් චිත්තයෝ වෙත්. ඒ පන්දහස් සත්සිය සැටක් මහා කුසල්චිත්තයෝ තුමූ හීන මධ්‍යම ප්‍රණීත යන ප්‍රභේද වශයෙන් තුණෙන් ගුණිතකරණ ලද්දවුන්කොට සතළොස්දහස් දෙසිය අසූසිත් කෙනෙක් වෙත්. මෙහි ඤාණවිප්‍රයුක්ත චිත්තයන්ගේ වීමංසාධිපති ධර්මයෙන් යෙදීමක් නැතිහෙයින් අධිපති ධර්මයන්ගේ වශයෙන් එක්දහස් සසිය අසූවක් චිත්තයෝ නොවෙද්ද? ඒ චිත්තයෝ කර්මාදීන්ගේ වශයෙන් සම්පිණ්ඩනය කරණලද්දහු පසළොස්දහස් එකසිය විස්සක් චිත්තයෝ

නොවෙද්ද යත්? ඒ සැබව වීමංසාධිපතියෙන් යුත් ඤාණසම්ප්‍රයුක්ත කුසලය දේශනාශ්‍රෝතයෙහි හෙලිම් වශයෙන් එය නොගෙන අධිපති ගණනාව ගන්නාලද හෙයින් ඔවුන්ගේ වශයෙන් ගණන් අඩුකිරීම නොකරනලදී යයි දතයුතුයි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 63-64 පිටු]**

## එක්විසි කුසල්සිත්හි අභිධෙය්‍යාර්ථ:—

අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එක්විසි කුසලචිත්තය ද තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරෙකි. ආයතන වශයෙන් දෙකෙකි. ධාතු වශයෙන් දෙකෙකි. ආර්ය සත්‍යය වශයෙන් දෙකෙකි. ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහු කෙසේද යත්? අටතිස් චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වේ. සඤ්ඤ චෛතසිකය සඤ්ඤස්කන්ධය නම් වේ. ඉතිරි සතිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වේ. එක්විසි කුසලචිත්තය විඤ්ඤාණස්කන්ධය නම් වේ. මෙසේ ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වෙති. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්? එක්විසි කුසලචිත්තය මනායතනය නම් වේ. අටතිස් චෛතසිකය ධම්මායතනය නම් වේ. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වේ. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්? එක්විසි කුසලචිත්තය මනෝවිඤ්ඤාණධාතු නම් වේ. අටතිස් චෛතසිකය ධම්මධාතු නම් වේ. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරු වේ. ආර්ය සත්‍යය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේද යත්? ලෞකික කුසල්සිත් සතළොස ද තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද දුක්ඛසත්‍යය නම් වේ. සතර මාර්ගචිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි යන සෝතාපත්ති මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක් ද (සම්මාසඞ්කප්ප වර්ජිත) සත්දෙන සතර වරක් ද සකදාගාමී මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක් ද සත්දෙන සතර වරක් ද අනාගාමී මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක් ද සත්දෙන සතර වරක් අරහත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක් ද සත්දෙන සතර වරක් ද යන මෙතෙක් ධර්මයෝ මාර්ගසත්‍යය නම් වෙති. අතිරික්ත මාර්ගචිත්තුප්පාදයෝ එකුන්තිස්දෙනා සත්‍යය විනිර්මුක්ත වෙති. මෙසේ ආර්යසත්‍යය වශයෙන් දෙවැදෑරුම් වෙති.

**[අභිධර්ම භාවනා 01/15-16 පිටු; අභිධර්ම මධු බින්දුව 23-24 පිටු; අභිධම්මමාතිකා පාළි ව්‍යඛ්‍යානය 14-15 පිටු]**

## කාමාවචර විපාක ක්‍රියා චිත්තයෝ:—

සෝමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, සෝමනස්සසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකන්ති ඉමානි අට්ඨපි සහේතුක කමාවචරවිපාකචිත්තානි නාම. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 14 පිට]**

**සෝමනස්ස සහගතං** ඉෂ්ටානුභවන ලක්‍ෂණ වූ මානසික සුඛ වේදනාව හා ඒකෝත්පාදදි භාවයට ගියා වූ **ඤාණසම්පයුත්තං** යථා ස්වභාව ප්‍රතිවේධ ලක්‍ෂණ වූ ඥනය හා සම්ප්‍රයුක්ත වූ **අසඞ්ඛාරිකං** තමා විසින් හෝ මෙරමා විසින් හෝ කරණ ලද පූර්ව ප්‍රයෝග රහිත වූ **ඒකං (කුසලචිත්තං)** එක් කුසල චිත්තයෙක. **සසඞ්ඛාරිකං** යථෝක්ත වූ පූර්ව ප්‍රයෝග සහිත වූ **ඒකං** එක් කුසල චිත්තයෙක තුන්වන සතරවන

චිත්තය ඥාණ විප්‍රයුක්ත වූ යනු වෙනසයි. අවශිෂ්ට සතර සිත් **උපෙක්ඛා සහගතං** මධ්‍යස්ථානුභවන ලක්‍ෂණ වූ උපෙක්ඛා වේදනාව හා ඒකෝත්පාදදි භාවයට ගියා වූ යැයි යනු වෙනසයි. **ඉමානි අට්ඨ** මොහු අට දෙන **සහේතුකකාමාවචරවිපාකචිත්තානි නාම** සහේතුක කාමාවචර විපාක චිත්තයෝ නම්. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 17 පිට]**

සෝමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, සෝමනස්සසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකං, උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකන්ති ඉමානි අට්ඨපි සහේතුකකාමාවචරක්‍රියාචිත්තානි නාම. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 14 පිට]**

**සෝමනස්ස සහගතං** ඉෂ්ටානුභවන ලක්‍ෂණ වූ මානසික සුඛ වේදනාව හා ඒකෝත්පාදදි භාවයට ගියා වූ **ඤාණසම්පයුත්තං** යථා ස්වභාව ප්‍රතිවේධ ලක්‍ෂණ වූ ඥානය හා සම්ප්‍රයුක්ත වූ **අසඞ්ඛාරිකං** තමා විසින් හෝ මෙරමා විසින් හෝ කරණ ලද පූර්ව ප්‍රයෝග රහිත වූ **ඒකං (කුසලචිත්තං)** එක් කුසල චිත්තයෙක. **සසඞ්ඛාරිකං** යථෝක්ත වූ පූර්ව ප්‍රයෝග සහිත වූ **ඒකං** එක් කුසල චිත්තයෙක තුන්වන සතරවන චිත්තය ඥාණ විප්‍රයුක්ත වූ යනු වෙනසයි. අවශිෂ්ට සතර සිත් **උපෙක්ඛා සහගතං** මධ්‍යස්ථානුභවන ලක්‍ෂණ වූ උපෙක්ඛා වේදනාව හා ඒකෝත්පාදදි භාවයට ගියා වූ යැයි යනු වෙනසයි. **ඉමානි අට්ඨ** මොහු අට දෙන **සහේතුකකාමාවචරක්‍රියාචිත්තානි නාම** සහේතුක කාමාවචර ක්‍රියා චිත්තයෝ නම්. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 17 පිට]**

## විපාක-ක්‍රියා චිත්තයන්ගේ ලක්‍ෂණාදිය:—

තදුභයවිපරීතලක්ඛණමබ්‍යාකතං, අවිපාකාරහං වා.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ)]**

තදුභයවිපරීතං තේහි උභයේහි කුසලාකුසලේහි විපරීතං අවිපාකලක්ඛණං ඒතස්සාති **තදුභයවිපරීතලක්ඛනං** අබ්‍යාකතං. **වා** අයං අඤ්ඤෙදා නයෝ. **අවිපාකාරහං** විපාකස්ස අනනුච්ඡවිකං.

**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ)]**

**අබ්‍යාකත**න්ති යං ධම්මජාතං කුසලං විය න අනවජ්ජඉට්ඨවිපාකලක්ඛණං, නාපි අකුසලං විය සාවජ්ජානිට්ඨවිපාකලක්ඛණං, අථ ඛෝ අවිපාකත්තා තදුභයවිපරීතලක්ඛණං, තං අබ්‍යාකතන්ති අත්ථෝ. නනු ච "තදුභයවිපරීතලක්ඛණ"න්ති වුත්තේ සුඛදුක්ඛවේදනානං විපරීතා උපෙක්ඛාවේදනා විය ඉට්ඨානිට්ඨවිපාකානං විපරීතෝ අඤ්ඤෙදා කෝචි විපාකෝ යස්ස අත්ථි, තං අබ්‍යාකතන්ති ආපජ්ජතීති? නාපජ්ජති තථා අසම්භවතෝ. යථා හි ආලෝකන්ධකාරානං විපරීතෝ අඤ්ඤෙදා කෝචි නත්ථි, ඒවමිට්ඨානිට්ඨවිපාකානං විපරීතෝ න කෝචි විපාකෝ අත්ථීති. අථ වා තං-සද්දෝ ඉධ ඉට්ඨානිට්ඨවිපාකනිරපෙක්ඛං කුසලාකුසලමත්තමේව පච්චාමසතීති කුසලාකුසලානං සවිපාකත්තා තදුභයවිපරීතලක්ඛණං, තං අවිපාකලක්ඛණන්ති අත්ථෝති අලමෙත්ථ අනුයෝගේන. කුසලාකුසලභාවේන න බ්‍යාකතන්ති **අබ්‍යාකතං**. කුසලාකුසලඤ්හි වත්වා අබ්‍යාකතස්ස වුත්තත්තා කුසලාකුසලභාවේනේව අවුත්තත්තාති විඤ්ඤෙයති, න පකාරන්තරේන. තථා අවචනඤ්ච තස්ස තදුභයවිපරීතලක්ඛණත්තායේව, න පන අවත්තබ්බත්තාමත්තේනාති දට්ඨබ්බං. අථ වා වි-සද්දෝ විරෝධිවචනෝ. ආ-සද්දෝ

අභිමුඛභාවප්පකාසනෝ, තස්මා අත්තනෝ පච්චයේහි අඤ්ඤමඤ්ඤං විරෝධාභිමුඛතං කතං ලක්ඛණවිරෝධතෝ පහායකප්පහාතබ්බභාවතෝ වාති බ්‍යාකතං, කුසලාකුසලං. තතෝ අඤ්ඤං **අබ්‍යාකතං**. තඤ්හි ලක්ඛණතෝ අඤ්ඤමඤ්ඤං කුසලාකුසලං විය න තස්ස විරුද්ධං. න හි අවිපාකතං අනිට්ඨවිපාකතා විය, ඉට්ඨවිපාකතාය ඉට්ඨවිපාකතා විය ච අනිට්ඨවිපාකතාය ඉට්ඨානිට්ඨවිපාකතාහි විරුජ්ඣති, න චාපි අබ්‍යාකතං කුසලාකුසලේසු කිඤ්චි පජහති, න ච කේනචි පහාතබ්බන්ති. "තදුභයවිපරීතලක්ඛණමබ්‍යාකත"න්ති විඤ්ඤායමානේ අහෝසි කම්මං, නාහෝසි කම්මවිපාකෝ, නත්ථි කම්මවිපාකෝ, න භවිස්සති කම්මවිපාකෝති ඉමිනා තිකේන සඞ්ගහිතස්ස ගතිඋපධිකාලප්පයෝගවිපත්තීහි අවිපාකස්ස දිට්ඨධම්මවේදනීයාදිකම්මස්ස භාවනායපහාතබ්බස්ස අකුසලස්ස ච අභිඤ්ඤාකුසලස්ස ච විපාකුප්පාදනාභාවතෝ "සියා නු ඛෝ අබ්‍යාකතභාවෝ වා"ති කදාචි කෝචි චින්තෙය්‍යාති තන්නිවාරණත්ථමාහ **"අවිපාකාරහං වා"**ති, විපාකං දාතුං නාරහති තත්ථ සාමත්ථියාභාවතෝති **අවිපාකාරහං.** ඉදං වුත්තං හෝති; දිට්ඨධම්මවේදනීයාදයෝ තාව පච්චයවේකල්ලාදීහි කාරණේහි අවිපාකා, සචේ පනේතේ තබ්බිදූරා අස්සු, තදා විපාකදානේ සමත්ථතාය විපාකාරහායේව, තං පන න තථා, අථ ඛෝ යේන කේනචි ආකාරේන විපාකදානේ අසමත්ථතායේව විපාකාරහං න හෝති, තං අබ්‍යාකතං නාමාති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 56 පිට]**

"තදුභයවිපරීතලක්ඛණමබ්‍යාකතං" යන මෙහි යම් ධර්ම සමුදයක් තෙමේ කුසලය මෙන් අනවද්‍යය ඉෂ්ටවිපාක ස්වභාවයක් නැත්තේ වේද අකුසලය මෙන් සාවද්‍යය අනිෂ්ටවිපාක ලක්‍ෂණයකුත් නැත්තේ වේද වැලිත් අවිපාක හෙයින් ඒ ලක්‍ෂණ ද්වයට විපර්‍ය්‍යාස වූ ස්වභාවයක් ඇත්තේ ද ඒ ධර්මය තෙමේ අව්‍යාකෘත නම් වේ යන අර්ථයි. තවද "තදුභයවිපරීතලක්ඛණං" යි කී කල්හි සුඛ දුක්ඛ වේදනාවන්ට විපරීත වූ උපේක්‍ෂා වේදනාව මෙන් ඉෂ්ටානිෂ්ට විපාකයන්ට විපරීත වූ අන්කිසි විපාකයක් තෙමේ යම් ධර්මයකට ඇත්තේ ද ඒ අව්‍යාකෘත බවට පැමිණෙන්නේ නොවේද යත්? නොපැමිණෙයි. කුමක්හෙයින යත්? එසේ සම්භව නොවන හෙයිනි. යම්සේ ආලෝකාන්ධකාරයන්ට විපරීත වූ අන් කිසිවක් නැත්තේ එපරිද්දෙන්ම ඉෂ්ට අනිෂ්ට විපාකයන්ට විපරීත වූ කිසි විපාකයෙක් නැත්තේය. නොහොත් "තදුභයවිපරීතලක්ඛණමබ්‍යාකතං" යන මෙහි "තං" ශබ්ද තෙමේ ඉෂ්ට අනිෂ්ට විපාකය අපේක්‍ෂා නොකොට කුසලාකුසලයන් සවිපාක බැවින් කුසලාකුසල මාත්‍රයක්ම ආමර්ශණය කෙරෙයි. එහෙයින් "තදුභයවිපරීතලක්ඛණං" යනු ඒ කුසලාකුසල ද්වයට විපරීත වූ ලක්‍ෂණ ඇත්තේය හෙවත් අවිපාක ස්වභාව ඇත්තේය යන අර්ථයි. "කුසලාකුසලභාවේන න අබ්‍යකතන්ති අබ්‍යාකතං" යනු වචනාර්ථ බැවින් යම් ධර්මයක් කුසලාකුසල භාවයෙන් නොවදාරණ ලද්දේ ද එහෙයින් ඒ ධර්මය අව්‍යාකෘත නම් වේ. ඒ එසේමැයි; කුසලාකුසල ධර්මය වදරා තදන්තරව අව්‍යාකෘත ධර්මය වදළ බැවින් කුසලාකුසල භාවයෙන් නොවදළ බව මුත් අනික් ප්‍රකාරයෙකින් වදළ බවක් නොහැගේ. එසේ ප්‍රකාරාන්තරයකින් නොවැදෑරීම ද ඔහුන්ගේ ඒ කුසලාකුසල ද්වයට විපරීත ලක්‍ෂණ ඇති බැවින්ම මුත් නොකියයුතු බැව් මාත්‍රයකිනැයි නොදතයුතුයි. නොහොත් එහි වි-උපසර්ග තෙමේ විරෝධාර්ථ වාචක වෙයි. ආ-ශබ්ද තෙමේ අභිමුඛභාව ප්‍රකාශක වෙයි. එහෙයින් තමාගේ ප්‍රත්‍යයෙන් ඔවුනොවුන්ගේ විරෝධාභිමුඛත්වය කරන ලද්දේ ලක්‍ෂණ විරෝධයෙන් හා ප්‍රහායක ප්‍රහාතව්‍යය භාවය ඇති හෙයින් ද කුසලාකුසල ධර්මය තෙමේ "බ්‍යාකත" නම් වෙයි. එයින් අන්‍ය වූයේ "අබ්‍යාකත" නම් වෙයි. ඒ එසේමැයි; ඒ අව්‍යාකෘතය තෙමේ කුසලාකුසලය මෙන්

ඔවුනොවුන්ට විරුද්ධ නොවේ. අවිපාකත්වය වනාහි ඉෂ්ටවිපාක බැවිහි අනිෂ්ට විපාකත්වය මෙන් ද අනිෂ්ට විපාක බැවිහි ඉෂ්ට විපාකත්වය මෙන් ද ඉෂ්ටානිෂ්ට විපාකත්වය හා විරුද්ධයක් නොවේ. අව්‍යාකෘතය තෙමේ කුසලාකුසලයන් අතුරෙහි කිසිවක් ප්‍රහාණය ද නොකෙරෙයි. කිසිවක්හු විසින් ප්‍රහාතව්‍යය ද නොවෙයි. එහෙයින් ඒ කුසලාකුසල ද්වයට විපරීත වූ ලක්‍ෂණ ඇත්තේ අව්‍යාකෘත නම් වෙයි. හැගෙනු ලබන කල්හි "අහෝසිකම්මං නාහෝසිකම්මවිපාකෝ" යනාදී මේ ත්‍රිකයෙන් සඞ්ගෘහිත වූ ගති-උපධි-කාල-ප්‍රයෝග-විපත්තීන් කරණකොටගෙන අවිපාක වූ දෘෂ්ටධර්ම වේදනීයාදී කර්මයාගේ ද භාවනාපහාතව්‍ය අකුසලයාගේ ද අභිඥද්ඣදකුසලයාගේ විපාකෝත්පාදයක් නැති හෙයින් කිසි කලෙක්හි අව්‍යාකෘත භාවය වන්නේදෝහෝයි කිසිවෙක් සිතන්නේ නම් ඒ වළකනු පිණිස "අවිපාකාරහං වා" යනු කීයේයි. "විපාකං නාරහති තත්‍ථ සාමත්ථියාභාවතෝති අවිපාකාරහං" යනු නිර්වචනයි. මේ කියන ලද්දේ වෙයි. දෘෂ්ටධර්මවේදනීයාදීහු වනාහි ප්‍රත්‍යය වෛකල්‍යාදී කාරණයෙන් අවිපාක වෙති. ඉදින් වනාහි ඔවුහු ඒ ප්‍රත්‍යය වෛකල්‍යාදී විරුද්ධ ධර්මයක් නුවාහු නම් එකල්හි විපාක දීමේ පොහොසත් බැවින් විපාකාරහම වෙති. ඒ අව්‍යකෘතය වනාහි එසේ නොවෙයි. වැලි කෙසේ වේද යත්? යම්කිසි ආකාරයකින් විපාකදීමේ අසමර්ථ බැවින්ම විපාකාරහ නොවේ ද එය අව්‍යාකෘත නම් වෙයි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 33-34 පිටු]**

අවිපාකලක්ඛණා අබ්‍යාකතා.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා තිකමාතිකාපද වණ්ණනා අංක 01 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 63 පිට (හේ.වි.මු)]**

විපාකාරහතා කුසලාකුසලානං ලක්ඛණභාවේන වුත්තා, තබ්භාවේන අකථිතා අබ්‍යාකතා අවිපාකාරහසභාවා හොන්තීති ආහ **"අවිපාකලක්ඛණා අබ්‍යාකතා"**ති. යථේව හි සුඛදුක්ඛවිපාකාරහා සුඛදුක්ඛවිපාකාති ඒවං ලක්ඛණතා කුසලාකුසලානං වුත්තා, ඒවම්ධාපි අවිපාකාරහා අවිපාකාති ඒවං ලක්ඛණතා අබ්‍යාකතානං වුත්තා. තස්මා "අහෝසි කම්මං නාහෝසි කම්මවිපාකෝ න භවිස්සති කම්මවිපාකෝ නත්ථි කම්මවිපාකෝ, අත්ථි කම්මං නත්ථි කම්මවිපාකෝ න භවිස්සති කම්මවිපාකෝ, භවිස්සති කම්මං න භවිස්සති කම්මවිපාකෝ"ති (පටි. ම. 1.234) ඒවං පකාරානං කුසලාකුසලානං කුසලාකුසලභාවානාපත්ති අබ්‍යාකතභාවාපත්ති වා න හෝති. න හි තේ සුඛදුක්ඛවිපාකාරහා න හොන්ති විපාකධම්මත්තා, අවිපාකාරහා වා න හොන්ති අවිපාකධම්මත්තාභාවාති.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා තිකමාතිකාපද වණ්ණනා අංක 01 යටතේ)]**

විපාකධම්මතාපටිසේධවසේන අබ්‍යාකතානං අවිපාකලක්ඛණාති ලක්ඛණං වුත්තන්ති තදත්ථං දස්සෙන්තෝ **"අවිපාකාරහසභාවා"**ති ආහ.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා තිකමාතිකාපද වණ්ණනා අංක 01 යටතේ)]**

**අබ්‍යාකතා** අව්‍යාකෘත චිත්තයෝ **අවිපාකලක්ඛණා (හොන්ති)** විපාක නොදෙන ලක්‍ෂණ ඇත්තෝ වෙත්.

කුසල අකුසලයන්ගේ විපාකයට සුදුසු ලක්‍ෂණ භාවයෙන් දේශනා කරනලදි. කුසල අකුසල ස්වභාවයෙන් නොකියනලද අව්‍යාකෘත චිත්තයෝ විපාක නොදෙන ස්වභාව ඇත්තෝ වෙත් යැයි "අවිපාකලක්ඛණා අබ්‍යාකතා" යනුවෙන් දේශනා කරනලදි. යම්සේම වනාහි කුසල අකුසල චිත්තයන්ගේ සැප දුක් විපාක දීමට සුදුසු වූ සැප දුක් විපාක චිත්තයෝ ලක්‍ෂණ වශයෙන් දේශනා කරනලදි. මෙසේ මෙහි ද

අව්‍යාකෘත චිත්තයන්ගේ විපාක නොදීමට සුදුසු වූ අවිපාක චිත්තයෝ යැයි මෙසේ ලක්‍ෂණ වශයෙන් දේශනා කරනලදි. එහෙයින් "අහෝසි කම්මං නාහෝසි කම්මවිපාකෝ න භවිස්සති කම්මවිපාකෝ නත්ථි කම්මවිපාකෝ, අත්ථි කම්මං නත්ථි කම්මවිපාකෝ න භවිස්සති කම්මවිපාකෝ, භවිස්සති කම්මං න භවිස්සති කම්මවිපාකෝ" යැයි පිළිවෙළින් කුසල අකුසලයන්ගේ කුසල අකුසල භාවයට නොපැමිණීම හෝ අව්‍යාකෘත භාවයට පැමිණීම හෝ නොවෙයි. විපාක ධර්මතා වූ ඒ චිත්තයෝ සැප දුක් විපාකයට සුදුසුවූවෝ නොවන්නේ නොවෙත්. අවිපාක ධර්මතා ස්වභාව වූ ඒ චිත්තයෝ විපාක දීමට සුදුසුවූවෝ හෝ නොවන්නේ නොවෙත්. යනු මූලටීකායි..... [ධම්මසඞ්ගණී අටුවා පරිවර්තන]

## කාමාවචර විපාක-ක්‍රියා චිත්තය විස්තර කර ඇති අයුරුඃ—

අලෝභාදිවිපාකහේතුසම්පයුත්තං පන **සහේතුකං,** තං කාමාවචරකුසලං විය සෝමනස්සාදිභේදතෝ අට්ඨවිධං. යථා පන කුසලං දානාදිවසේන ඡසු ආරම්මණේසු පවත්තති, න ඉදං තථා. ඉදඤ්හි පටිසන්ධිභවඞ්ගචුතිතදාරම්මණවසේන පරිත්තධම්මපරියාපන්නේසුයේව ඡසු ආරම්මණේසු පවත්තති. සඞ්ඛාරාසඞ්ඛාරභාවෝ පනෙත්ථ ආගමනාදිවසේන වේදිතබ්බෝ. සම්පයුත්තධම්මානඤ්ච විසේසේ අසතිපි ආදාසතලාදීසු මුඛනිමිත්තං විය නිරුස්සාහං විපාකං, මුඛං විය සඋස්සාහං කුසලන්ති වේදිතබ්බං.

සහේතුකං පන සෝමනස්සාදිභේදතෝ කුසලං විය අට්ඨවිධං, කේවලං හි කුසලං සේඛපුථුජ්ජනානං උප්පජ්ජති, ඉදං අරහත්තං යේවාති, අයමෙත්ථ විසේසෝ. **[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 454 යටතේ); විසුද්ධිමග්ග අටුවා 341 පිට (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය විඤ්ඤාණස්කන්ධය 201-202 පිටු (තායිවාන් මුද්‍රණය)]**

අලෝභාදෝසාමෝහා චේව අලෝභාදෝසා ච අලෝභාදයෝ, තේහි අලෝභාදීහි විපාකහේතූහි සම්පයුත්තං **අලෝභාදිවිපාකහේතුසම්පයුත්තං. කාමාවචරකුසලං විය සෝමනස්සාදිභේදතෝ**ති යථා කාමාවචරං කුසලං සෝමනස්සුපෙක්ඛාඤාණසඞ්ඛාරභේදතෝ අට්ඨවිධං, ඒවමිදම්පීති අට්ඨවිධතාය සදිසතං දස්සේති. කාමාවචරභාවතෝ හීනාදිතෝ, යෝනීසු උප්පත්තිතෝ ච සදිසමේව, සම්පයුත්තධම්මතෝ පන ආරම්මණතෝ, පවත්තිආකාරතෝ ච විසදිසං. තථා හි කුසලං කම්මද්වාරවසේන පවත්තති, න ඉදං, විපාකානං අවිඤ්ඤත්තිජනකත්තා. උප්පත්තිද්වාරවසේන පන ඉමස්සාපි අත්ථේව පවත්තිභේදෝ පඤ්චද්වාරමනෝද්වාරේසු මහාවිපාකානං තදාරම්මණවසේන පවත්තිසම්භවතෝ. යථා පන කුසලං ගතිවසේන පඤ්චවිධං, විඤ්ඤාණට්ඨිතිවසේන සත්තවිධඤ්ච, න ඒවමිදං තදේකදේසේ ඒව උප්පජ්ජනතෝ. තත්ථ ආරම්මණතෝ, ඒකච්චපවත්තිආකාරතෝ ච විසදිසතං දස්සේතුං **"යථා පනා"**තිආදි වුත්තං. **ඡසු ආරම්මණේසූ**ති පරිත්තාදිඅතීතාදිඅජ්ඣත්තාදිප්පභේදේසු ඡසු ආරම්මණේසු.

**ආගමනාදිවසේනා**ති ආගමනපච්චයවසේන. තත්ථ ඒකච්චානං ආචරියානං මතේන මුඛේ චලිතේ ආදාසතලේ මුඛනිමිත්තං චලනං විය අසඞ්ඛාරස්ස කුසලස්ස විපාකෝ අසඞ්ඛාරෝ, සසඞ්ඛාරස්ස කුසලස්ස විපාකෝ සසඞ්ඛාරෝති ඒවං ආගමනවසේන. ඒකච්චානං පන ආචරියානං මතේන බලවන්තේහි විභූතේහි පච්චයේහි කම්මාදීහි උප්පන්නෝ අසඞ්ඛාරෝ, දුබ්බලේහි සසඞ්ඛාරෝති ඒවං පච්චයවසේන. **සම්පයුත්තධම්මාන**න්ති පාළියං සරූපතෝ

ආගතසම්පයුත්තධම්මානං. තේසං හි වසේන කුසලතෝ විපාකස්ස විසේසාභාවෝ. **නිරුස්සාහ**න්ති එත්ථ උස්සාහෝ නාම අනුපච්ඡින්නාවිජ්ජාතණ්හාමානසන්තානේ විපාකුප්පාදනසමත්ථතාසඞ්ඛාතෝ බ්‍යාපාරෝ, සෝ විපාකේසු නත්ථීති තං නිරුස්සාහං. කුසලේසු පන අභිඣ්ඣාදවසපවත්තේසුපි අත්ථේවාති තං **සඋස්සාහං**.

**අයමෙත්ථ විසේසෝති** අයං සෙක්ඛපුථුජ්ජනානං උප්පත්තියා විපාකුප්පාදනසමත්ථතා, අරහතං උප්පත්තියා තදභාවෝති උභයේසං සන්තානේ උප්පත්තිසමුපලක්ඛිතෝ එත්ථ කුසලකිරියවිඤ්ඤාණේසු විසේසෝ. ඒවඤ්ච කත්වා පච්චයවේකල්ලේන අවිපාකස්සාපි කුසලාකුසලස්ස කිරියභාවප්පසඞ්ගෝ නිවත්තිතෝ හෝති. පරතෝ **කුසලතෝ විසේසෝ**ති එත්ථාපි ඒසේව නයෝ.

**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 454 යටතේ)]**

**පන (යං චිත්තං)** යම් චිත්තයක් තෙමේ **අලෝභාදිවිපාකහේතුසම්පයුත්තං** අලෝභාදි විපාකහේතූන් හා සම්ප්‍රයුක්ත වේද **(තං චිත්තං)** ඒ චිත්තය තෙමේ **සහේතුකං** සහේතුක නම් වේ **තං (විපාකචිත්තං)** ඒ විපාක සිත් තෙමේ **කාමාවචරකුසලං විය** කාමාවචර කුසල් සිත මෙන් **සෝමනස්සාදිභේදතෝ** සොම්නස් ආදී භේද වශයෙන් **අට්ඨවිධං** අට වැදෑරුම් **(හෝති)** වෙයි **යථා පන** යම්සේ වනාහි **කුසලං** කාමාවචර කුසල් සිත **දානාදිවසේන** දානාදී වශයෙන් **ඡසු ආරම්මණේසු** ෂඩාලම්බනයන්හි **පවත්තති (උප්පජ්ජති)** උපදී **ඉදං (විපාකචිත්තං)** මේ විපාක චිත්තය තෙමේ **තථා** එපරිද්දෙන් **න (උප්පජ්ජති)** නූපදී **හි (සච්චං)** සැබෑවකි **ඉදං (විපාකචිත්තං)** මේ විපාක චිත්තය තෙමේ **පටිසන්ධිභවඞ්ගචුතිතදාරම්මණවසේන** ප්‍රතිසන්ධි භවඞ්ග චුති තදාරම්මණ වශයෙන් **පරිත්තධම්මපරියාපන්නේසු** කාමාවචර ධර්මයන්ට ඇතුලත්වූ **ඡසු ආරම්මණේසුයේව** ෂඩාලම්බනයන්හිම **පවත්තති (උප්පජ්ජති)** උපදී **එතථ පන (චිත්තේසු)** මේ විපාකචිත්තයන්හි වනාහි **සසඞ්ඛාරාසඞ්ඛාරභාවෝ** සසංස්කාරික අසංස්කාරික බව **ආගමනාදිවසේන** ආගමනාදි වශයෙන් **වේදිතබ්බෝ** දතයුතුය **සම්පයුත්තධම්මානඤ්ච** සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ ද **විසේසේ අසතිපි** විශේෂයක් නැත්තේහිදු **විපාකං** විපාක සිත් තෙමේ **ආදාසතලාදීසු** කැටපත් ආදියෙහි **මුඛනිමිත්තං විය** මුඛය නිසා හටගත් ප්‍රතිබිම්බ නිමිත්තක් මෙන් **නිරුස්සහං** ව්‍යාපාර රහිත වෙයි **කුසලං** කුසල් සිත් තෙමේ **මුඛං විය** මුඛය මෙන් **සඋස්සහං ඉති** ව්‍යාපාර සහිත වේයයි **වේදිතබ්බං** දතයුතුයි.

"අලෝභාදිවිපාකහේතුසම්පයුත්තං" යනුයෙහි අලෝභ අද්වේෂ අමෝහයෝ ද අලෝභ අද්වේෂයෝ ද අලෝභාදී නම් වෙත්. ඒ අලෝභාදී විපාක හේතූන් හා සම්ප්‍රයුක්ත චිත්තය අලෝභාදී විපාක හේතු සම්ප්‍රයුක්තය යන අර්ථයි. "කාමාවචරකුසලං විය සෝමනස්සාදිභේදතෝ" යනුයෙන් යම්සේ කාමාවචර කුසලය සෞමනස්‍යෝපෙක්‍ෂා ඥාණ සංස්කාර භේදයෙන් අෂ්ට විධ වේද මේද එසේමයයි අෂ්ට විධතාවයෙන් සදෘශබව කීහු. කාමාවචර භාවයෙනුදු හීනාදී වශයෙනුදු යෝනියෙහි උත්පත්ති වශයෙනුදු සදෘශමැයි. සම්ප්‍රයුක්ත ධර්මහෙයිනුදු අරමුණු හෙයිනුදු ප්‍රවෘත්‍යාකාර හෙයිනුදු විසදෘශ වෙයි. කිසේද යත්? කුශලය කර්මද්වාර වශයෙන් පවත්නේය. මෙතෙමේ විපාකයන් අවිඥප්ති ජනක හෙයින් කර්මද්වාර වශයෙන් නොපවත්නේයි. උත්පත්තිද්වාර වශයෙන් වනාහි මේ විපාකයාගේ ද ප්‍රවෘත්ති භේදය ඇත්තේමැයි. පඤ්චද්වාර මනෝද්වාරයෙහි මහාවිපාකයන්ගේ තදාලම්බන වශයෙන් ප්‍රවෘත්ති සද්භාවය ඇති හෙයිනි. යම්සේ වනාහි කුශලය ගති වශයෙන් පස් වැදෑරුම් වේද විඤ්ඤාණස්ථිති වශයෙන් සප්තවිධ වේද විපාකයන් තදේකදේශයක උපදනෙන් එසේ නොවෙයි. එහි අරමුණු වශයෙනුදු ඒකත්‍යප්‍රවෘත්ත්‍යාකාරයෙනුදු විසදෘශතාව

දක්වනු පිණිස "යථා පන" යනාදිය කියනලදි. **ඡසු ආරම්මණේසු** පරිත්තාදි-අතීතාදී-අධ්‍යාත්මාදී ප්‍රභේද ඇති සාරමුණෝ **පරිත්තධම්මපරියාපන්නේසු** කාමාවචර ධර්මයන් කෙරෙහි ඇතුළත් වූ **ආගමනාදිවසේන වේදිතබ්බෝ** ආගමන වශයෙන් ප්‍රත්‍යය වශයෙන් දතයුතු. සමහර ඇදුරන්ගේ මතයෙන් මුඛය චලිත කල්හි ආදර්ශතලයෙහි මුඛනිමිත්තයාගේ චලනය මෙන් අසංස්කාර කුශලයාගේ විපාකය අසංස්කාර වෙයි. සසංස්කාර කුශලයාගේ විපාකය සසංස්කාර වෙයි. මෙසේ ආගමන වශයෙන් දතයුතුයි. ඇතැම් ආචාර්‍ය්‍යවරයන්ගේ මතයෙන් බලවත් වූ ප්‍රකට වූ කර්මාදි ප්‍රත්‍යයෙන් උපන්නේ අසංස්කාර වෙයි. දුර්වල වූ අප්‍රකට වූ කර්මාදි ප්‍රත්‍යයෙන් සසංස්කාර වෙයි. මෙසේ ප්‍රත්‍යය වශයෙන් දතයුතුයි. සම්පයුක්තධම්මානඤ්ච විසේසේ අසතිපි පාළියෙහි ස්වරූපයෙන් ආ සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ වශයෙන් කුශලයා කෙරෙන් විපාකයාගේ විශේෂයෙක් නැතද යන අර්ථයි. "නිරුස්සහං" යනුයෙහි අනුපච්ඡින්න වූ අවිද්‍යා තෘෂ්ණා මාන ඇති සන්තානයෙහි විපාකෝත්පාදන සාමර්ථ්‍යසඞ්ඛ්‍යාත ව්‍යාපාරය උත්සාහ නම් වේ. හෙතෙමේම (ඒ ව්‍යාපාරය තෙමේ) විපාකයන් කෙරෙහි නැත්නුයි විපාකය නිරුත්සාහ නම් වෙයි. කුශලයන් කෙරෙහි වනාහි අභිඥ වශයෙන් ප්‍රවෘත්තයන් කෙරෙහිදු ඇත්නුයි කුශලය සෝත්සාහ නම්.

**සහේතුකං (කිරියචිත්තං) පන** සහේතුක ක්‍රියාචිත්තය තෙමේ වනාහි **සෝමනස්සාදිභේදතෝ** සොම්නස් ආදී භේද වශයෙන් **කුසලං විය** කුසල් චිත්තය මෙන් **අට්ඨවිධං** අට වැදෑරුම් **(හෝති)** වෙයි **හි** ඒ එසේමැයි **කේවලං** හුදෙක් **කුසලං** කුසල් සිත **සෙක්ඛපුථුජ්ජනානං** ශෛක්‍ෂ පෘථග්ජනයන්ට **උප්පජ්ජති** උපදී **ඉදං (කිරියචිත්තං)** මේ ක්‍රියා චිත්තය තෙමේ **අරහත්තං ඒව** රහතුන්ටම **ඉති (උප්පජ්ජති)** උපදී **එත්ථ** මෙහි **අයං විසේසෝ** මේ වෙනසයි.

අයමෙත්ථ විසේසෝ ශෛක්‍ෂ පෘථග්ජනයනට ඉපැත්මෙන් විපාකෝත්පාදනයෙහි සාමර්ථ්‍යය රහත්හට ඉපැත්මෙන් තදභාවය යන රහත් පුහුදුන්ගේ උභය සන්තානයෙහි උත්පත්තියෙන් සමුපලක්‍ෂිත වූ කුශල ක්‍රියා විඥ්ඥාණයන් කෙරෙහි මේ වෙනෙසයි. මෙයින් ප්‍රත්‍යය වෛකල්‍යයෙන් අවිපාක වූ කුශලාකුශලයන්ගේ ක්‍රියාභාව ප්‍රසඞ්ගය නිර්වර්තිත වේ.

**[විසුද්ධි මාර්ග මහා සන්නය 1096-1101 පිටු]**

අලෝභාදිවිපාකහේතුසම්පයුත්තා පන සහේතුකා, තේ සම්පයෝගතෝ කාමාවචරකුසලා විය අට්ඨවිධා. සෝමනස්සඤාණාදිසම්පයෝගෝ පනෙත්ථ ආගමනාදිතෝ වේදිතබ්බෝ. තිහේතුකං හි කාමාවචරකුසලං තිහේතුකද්විහේතුකපටිසන්ධියෝ දත්වා පවත්තේ ඡසු ද්වාරේසු සෝළස විපාකානි දේති, දුහේතුකං පන කුසලං දුහේතුකාහේතුකපටිසන්ධියො දත්වා පවත්තේ ඡසු ද්වාරේසු තිහේතුකරහිතානි ද්වාදස විපාකානි දේති. අසඞ්ඛාරික-සසඞ්ඛාරිකභාවෝ පනෙත්ථ පච්චයවිසේසතෝපි හෝති. බලවපච්චයේනාපි හි උප්පන්නං අසඞ්ඛාරිකං හෝති, දුබ්බලේනාපි ඉතරං. කේචි පන අසඞ්ඛාරිකේන සසඞ්ඛාරවිපාකානං, සසඞ්ඛාරිකේන ච අසඞ්ඛාරිකානං උප්පත්තිං න ඉච්ඡන්ති. යස්මා පනේතානි පටිසන්ධිදයකතෝ අඤ්ඤේනාපි කම්මේන පවත්තේ අකුසලවිපාකානි පවත්තන්ති, **පට්ඨානේ** ච "සහේතුකං භවඞ්ගං අහේතුකස්ස භවඞ්ගස්ස අනන්තරපච්චයේන පච්චයෝ"ති (පට්ඨා. 3.1.102) වුත්තං, තස්මා අහේතුකපටිසන්ධිකස්ස පුග්ගලස්ස සුගතියං පවත්තේ සහේතුකානිපි විපාකානි පවත්තන්ති. දුග්ගතියං, පන රූපාවචරභූමියඤ්ච අහේතුකානේව පවත්තන්ති. තේසුපි අතිඉට්ඨේ ආරම්මණේ

සෝමනස්සසහගතානි, ඉට්ඨමජ්ඣත්තේ උපෙක්ඛාසහගතානීති ඒවං ආගමනාදිතෝ සම්පයෝගභේදෝ වේදිතබ්බෝ.

**[අභිධම්මමාතිකා පාළි (ජට්ඨසඞ්ගායනා සහේතුකකුසලවිපාක වණ්ණනා යටතේ)]**

**අලෝභාදිවිපාකහේතුසම්පයුත්තා පන** අලෝභ ආදි විපාකහේතු සම්ප්‍රයුක්ත චිත්තයෝ **සහේතුකා** සහේතුකයෝය **තේ** ඒ විපාක චිත්තයෝ **සම්පයෝගතෝ** සම්ප්‍රයෝග වශයෙන් **කාමාවචරකුසලා විය** කාමාවචර කුසලයන් මෙන් **අට්ඨවිධා** අටවැදෑරුම් වෙයි **එත්ථ පන** මෙහි වනාහි **සෝමනස්සඤාණාදිසම්පයෝගෝ** සෝමනස්ස-ඥාන ආදි සම්ප්‍රයෝගය **ආගමනාදිතෝ** ආගමන ආදී වශයෙන් නොහොත් ප්‍රත්‍යාදී වශයෙන් **වේදිතබ්බෝ** දතයුතුයි **හි** විස්තර කෙරෙමි **තිහේතුකං කාමාවචරකුසලං** ත්‍රිහේතුක කාමාවචර කුසලය **තිහේතුකද්විහේතුකපටිසන්ධියෝ දත්වා** ත්‍රිහේතුක-ද්විහේතුක ප්‍රතිසන්ධි දී **පවත්තේ** ප්‍රවෘත්ති කාලයෙහි **ඡසු ද්වාරේසු** ද්වාර සයෙහි **සෝළස විපාකානි** සොළොස් විපාකයෝ **දේති (උප්පජ්ජති)** උපදවයි **දුහේතුකං කුසලං පන** ද්විහේතුක කුසලය වනාහි **දුහේතුකාහේතුකපටිසන්ධියෝ දත්වා** ද්විහේතුක අහේතුක ප්‍රතිසන්ධි දී **පවත්තේ** ප්‍රවෘත්ති කාලයෙහි **ඡසු ද්වාරේසු** ද්වාර සයෙහි **තිහේතුකරහිතානි** ත්‍රිහේතුක විපාක රහිත **ද්වාදසවිපාකානි දේති (උප්පජ්ජති)** දෙළොස් විපාකයෝ උපදවයි **එත්ථ පන** මෙහි වනාහි **අසඞ්කාරික-සසඞ්ඛාරිකභාවෝ** අසංස්කාරික සසංස්කාරික බව **පච්චයවිසේසතෝපි** ප්‍රත්‍යය විශේෂයෙන්ද **හෝති** වෙයි **හි** ඒ එසේමැයි **බලවපච්චයේනාපි** බලවත්වූ ප්‍රත්‍යයෙන් **උපන්නං (චිත්තං)** උපන්නාවූ චිත්තය **අසඞ්කාරිකං හෝති** අසංස්කාරික වෙයි **දුබ්බලේනාපි** දුර්වල ප්‍රත්‍යයෙන් උපන්නාවූ **ඉතරං (චිත්තං සසඞ්ඛාරිකං හෝති)** අන්‍යවූ චිත්තය සසංස්කාරික වෙයි **කේචි පන** ඇතමෙක් වනාහි **අසඞ්කාරිකේන (චිත්තේන)** අසංස්කාරික චිත්තයෙන් **සසඞ්ඛාරිකවිපාකානං** සසංස්කාරික විපාකයන්ගේද **සසඞ්ඛාරිකේන (චිත්තේන)** සසංස්කාරික චිත්තයෙන් **අසඞ්කාරිකානං** අසංස්කාරික විපාකයන්ගේද **උප්පත්තිං** හටගැනීම **න ඉච්ඡන්ති** නොකැමැති වෙත් **යස්මා පන** යම්හෙයකින් වනාහි **පටිසන්ධිදයකතෝ** ප්‍රතිසන්ධි දීමෙන් පසු **පවත්තේ** ප්‍රවෘත්ති කාලයෙහි **අඤ්ඤේනාපි කම්මේන** අන්‍ය කර්මයකින් ද **ඒතානි අකුසලවිපාකානි** ඒ අකුසලවිපාකයෝ **පවත්තන්ති** පවතිත් **පට්ඨානේ** ච පට්ඨානමහාප්‍රකරණයෙහිද **සහේතුකං භවඞ්ගං** සහේතුක භවඞ්ග චිත්තය **අහේතුකස්ස භවඞ්ගස්ස** අහේතුක භවඞ්ගයට **අනන්තරපච්චයේන** අනන්තරප්‍රත්‍යයෙන් **පච්චයෝ ඉති** ප්‍රත්‍යවේ යයි **වුත්තං** දේශනා කරනලදි **තස්මා** එබැවින් **සුගතියං** සුගතියෙහි උපන්නාවූ **අහේතුකපටිසන්ධිකස්ස පුග්ගලස්ස** අහේතුකප්‍රතිසන්ධික පුද්ගලයාහට **පවත්තේ** ප්‍රවෘත්ති කාලයෙහි **සහේතුකානිපි විපාකානි** සහේතුක විපාකයෝද **පවත්තන්ති** පවතිත් **දුග්ගතියං** දුගතියෙහි (**අහේතුකපටිසන්ධිකස්ස පුග්ගලස්ස** අහේතුකප්‍රතිසන්ධික පුද්ගලයාහට **පවත්තේ** ප්‍රවෘත්ති කාලයෙහි **සහේතුකානිපි විපාකානි** සහේතුක විපාකයෝද **පවත්තන්ති** පවතිත්) **පන (තථා)** එසේම **රූපාවචරභූමියඤ්ච** රූපාවචර භූමියෙහි ද **අහේතුකානේව (විපාකානි)** අහේතුක විපාකයෝ ද **පවත්තන්ති** පවතිත් **තේසුපි** ඒ විපාක චිත්තයන් අතුරින් ද **අතිඉට්ඨේ ආරම්මණේ** අතිඉෂ්ටාරම්මණයෙහි **සෝමනස්සසහගතානි (විපාකානි)** සෝමනස්ස සහගත විපාකයෝ ද **ඉට්ඨමජ්ඣත්තේ (ආරම්මණේ)** ඉටු මැදහත් අරමුණෙහි **උපෙක්ඛාසහගතානි (විපාකානි) ඉති** උපේක්ෂා සහගත විපාකයෝ ද යැයි **ඒවං** මෙසේ **ආගමනාදිතෝ** ආගමනාදී වශයෙන් **සම්පයෝගභේදෝ** සම්ප්‍රයෝග භේදය ද **වේදිතබ්බෝ** දතයුතුයි.

**[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

අලෝභාදිකිරියාහේතුසම්පයුත්තා පන සහේතුකා, තේ සම්පයෝගතෝ කුසලා විය අට්ඨවිධා. සබ්බෝපෙත්ථ විනිච්ඡයෝ කුසලේසු වුත්තනයෝ ඒව.

**[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා කාමාවචරකිරියා වණ්ණනා යටතේ)]**

**අලෝභාදිකිරියාහේතුසම්පයුත්තා පන** අලෝභාදී ක්‍රියා හේතු සම්ප්‍රයුක්ත චිත්තයෝ වනාහි **සහේතුකා** සහේතුකයෝය **තේ** ඒ ක්‍රියා චිත්තයෝ **සම්පයෝගතෝ** සම්ප්‍රයෝග වශයෙන් **කුසලා විය** කුසල සිත් මෙන් **අට්ඨවිධා** අට වැදෑරුම් වෙත් **එත්ථ පන** මෙහි වනාහි **සබ්බෝපි විනිච්ඡයෝ** සියළු විනිශ්චය ද **කුසලේසු** කුසල් චිත්තයන්හි **වුත්තනයෝ ඒව** කියනලද ක්‍රමයෙන්ම (**වේදිතබ්බෝ** දතයුතුයි)

**[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

ඉතරං පන අබ්‍යාකතමවිපාකාරහතෝ ඒකවිධං හෝති, ජාතිභේදතෝ දුවිධං විපාකචිත්තං කිරියචිත්තන්ති. තත්ථ **විපාකචිත්තං** භූමිභේදතෝ චතුබ්බිධං කාමාවචරං රූපාවචරං අරූපාවචරං ලෝකුත්තරන්ති. තත්ථ කාමාවචරං දුවිධං කුසලවිපාකං අකුසලවිපාකන්ති. කුසලවිපාකං දුවිධං සහේතුකමහේතුකඤ්චේති.

තත්ථ **සහේතුකවිපාකචිත්තං** සකකුසලං විය සෝමනස්සුපෙක්ඛාඤාණප්පයෝගභේදතෝ අට්ඨවිධං. සෙය්‍යථිදං; සෝමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරං, සසඞ්ඛාරං, සෝමනස්සසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරං, සසඞ්ඛාරං, උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරං, සසඞ්ඛාරං, උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරං, සසඞ්ඛාරන්ති ඉදං අට්ඨවිධං සහේතුකවිපාකං නාම.

යථා පනස්ස කුසලං දානාදිවසේන ඡසු ආරම්මණේසු පවත්තති, න ඉදං තථා. ඉදං හි පටිසන්ධිභවඞ්ගචුතිතදාරම්මණවසේන පරිත්තධම්මපරියාපන්නේසුයේව ඡසු ආරම්මණේසු පවත්තති. සම්පයුත්තධම්මානඤ්ච විසේසේ අසතිපි ආදාසතලාදීසු මුඛනිමිත්තං විය නිරුස්සාහං විපාකං, මුඛං විය සඋස්සාහං කුසලන්ති වේදිතබ්බං. ඉමේසං පන විපච්චනට්ඨානං වේදිතබ්බං. ඉමානි හි පටිසන්ධිභවඞ්ගචුතිතදාරම්මණානි හුත්වා විපච්චන්ති.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 31 යටතේ)]**

**යථා පනස්ස** යථා පන අස්ස විපාකස්ස කුසලං **දානාදිවසේන** දානාදීනං දසපුඤ්ඤකිරියවත්ථූනං වසේන ඡසු ආරම්මණේසු පවත්තති, **ඉදං** විපාකචිත්තං තථා **න** පවත්තති. **හි** සච්චං **ඉදං** විපාකං පටිසන්ධිභවඞ්ගචුතිතදාරම්මණවසේන **පරිත්තධම්මපරියාපන්නේසු** කාමාවචරධම්මන්තෝගධේසු ඡසු ආරම්මණේසු පවත්තති. සම්පයුත්තධම්මානඤ්ච විසේසේ අසතිපි කුසලසම්පයුත්තධම්මතෝ අස්ස විපාකස්ස, සම්පයුත්තධම්මානඤ්ච නානත්තේ අසතිපි ඉදං විපාකං **ආදාසතලාදීසු** ධම්මජාතේසු මුඛනිමිත්තං විය නිරුස්සාහං. අයමස්සාධිප්පායෝ; යථා ආදාසතලේ මුඛනිමිත්තං මුඛේ චලිතේ චලති, අචලිතේ න චලති, මුඛස්ස කාරණං විනා මුඛනිමිත්තස්ස විය කාරණං නත්ථි, ඒවං කුසලකාරණා විපාකස්ස අඤ්ඤං කාරණං නත්ථි, නිරුස්සාහං විපාකං. **[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 31 යටතේ)]**

**ඉතරම්පන** කුසලාකුසලයන්ගෙන් අවශිෂ්ට වූ **අබ්‍යාකතං** අව්‍යාකෘතසිත් තෙමේ **අවිපාකාහරතෝ** විපාකාරහ නොවන හෙයින් **ඒකවිධං හෝති** එක්වැදෑරුම් වෙයි **ජාතිභේදතෝ** ජාතිභේද හෙයින් **විපාකචිත්තං** විපාක සිතය **ක්‍රියාචිත්තං ඉති**

ක්‍රියා සිත යයි **දුවිධං** දෙවැදෑරුම් වෙයි **තත්ථ** ඔවුන් අතුරෙන් **විපාකචිත්තං** විපාක සිත්තෙමේ **භූමිභේදතෝ** භූමිභේද හෙයින් **කාමාවචරං** කාමාවචර විපාකසිතය **රූපාවචරං** රූපවචර විපාකසිතය **අරූපාවචරං** අරූපාවචර විපාකසිතය **ලෝකුත්තරඤ්ච ඉති** ලෝකෝත්තර විපාකසිතදැයි **චතුබ්බිධං** සිව්වැදෑරුම් වෙයි **තත්ථ** ඔවුන් අතුරෙන් **කාමාවචරං** කාමාවචර විපාකසිත් තෙමේ **කුසලවිපාකං** කුසලවිපාක සිතය **අකුසලවිපාකං ඉති** අකුසලවිපාක සිතයයි **දුවිධං** දෙවැදෑරුම් වෙයි **කුසලවිපාකං** කුසලවිපාක සිත්තෙමේද **සහේතුකං** සහේතුක කුසල විපාකසිතය **අහේතුකඤ්ච ඉති** අහේතුක සිතදැයි **දුවිධං** දෙවැදෑරුම් වෙයි **තත්ථ** ඔවුන් අතුරෙන් **සහේතුකවිපාකචිත්තං** සහේතුක විපාක සිත්තෙමේ **සහේතුකකුසලං විය** සහේතුක කුසලසිත මෙන් **සෝමනස්සුපෙක්ඛාඤාණසම්පයෝග භේදතෝ** සොම්නස් උපේක්ෂා ඤාණ යන මොවුන්ගේ සම්ප්‍රයුක්ත භේද හෙයින් **අට්ඨවිධං** අටවැදෑරුම් වෙයි **සෙය්‍යථීදං?** හේ කවරේක්ද යත්? ("සෝමනස්ස සහගතං" යනාදියෙහි යටකී ක්‍රමයෙන් අර්ථ දතයුතුයි) **ඉදං අට්ඨවිධං** මේ අටවැදෑරුම් සිත්තෙමේ **සහේතුකවිපාකං නාම** සහේතුකවිපාක සිත් නම් වෙයි **යථා පන** යම්සේ වනාහි **අස්ස** ඒ විපාක චිත්තයාගේ **කුසලං** කුසල් සිත්තෙමේ **දනාදිවසේන** දනාදීන්ගේ වශයෙන් **ඡසු ආරම්මණේසු** ෂඩාළම්බණයෙහි **පවත්තති** හටගනීද **තථා** එපරිද්දෙන් **ඉදං** මේ විපාකසිත් තෙමේ **න (පවත්තති)** නොහටගණී **හි** ඒ එසේමැයි **ඉදං** මේ විපාකසිත් තෙමේ **පටිසන්ධි-භවඞ්ග-චුති-තදරම්මණවසේන** ප්‍රතිසන්ධි-භවඞ්ග-චුති-තදරම්මණ වශයෙන් **පරිත්තධම්මපරියාපන්නේසුයේව** කාමාවචර ධර්මයන්ට ඇත්තාවූම **ඡසු ආරම්මණේසු** සාරමුණෙහි **පවත්තති** හටගණී **සම්පයුත්තධම්මානං** පෙළෙහි ස්වකීය ශබ්දරූපයෙන් ආවාවූ සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ **විසේසේ අසතිපි** වෙනසක් නැත්තේහිදු **විපාකං** විපාක සිත් තෙමේ **ආදසතලාදීසු** කැටපත් ආදියෙහි **මුඛනිමිත්තං විය** මුඛය නිසා හටගත් ප්‍රතිබිම්බ නිමිත්තක් මෙන් **නිරුස්සාහං** ව්‍යාපාර රහිත වෙයි **කුසලං** කුසල්සිත් තෙමේ **මුඛං විය** මුඛය මෙන් **සඋස්සාහං ඉති** ව්‍යාපාර සහිත වේ යයි **වේදිතබ්බං** දතයුතුයි **ඉමේසං පන** මේ විපාක චිත්තයන්ගේ වනාහි **විපච්චනට්ඨානං** විපාක දීම් වශයෙන් හටගන්නා ස්ථානය **වේදිතබ්බං** දතයුතුයි **හි** ඒ එසේමැයි **ඉමානි** මේ විපාකසිත්තුමූ **පටිසන්ධි-භවඞ්ග-චුති-තදරම්මණානි හුත්වා** ප්‍රතිසන්ධි-භවඞ්ග-චුති-තදරම්මණ කෘත්‍යයෝ වී **විපච්චන්ති** විපාක දෙත්.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 118-119 පිටු]**

විපාකමේව චිත්තං **විපාකචිත්තං**. කරණමත්තං කිරියා ඵලදනාසම්භවතෝ. යේන පන කාරණේන තස්ස ඵලදනං න සම්භවති, තං හෙට්ඨා වුත්තමේව. කිරියා ඒව චිත්තං **කිරියචිත්තං**. විපාකස්ස කාමාවචරාදිභාවෝ කුසලේ වුත්තනයේන යථාසම්භවං වේදිතබ්බෝ. අලෝභාදිසම්පයුත්තහේතූහි සහ වත්තනතෝ **සහේතුකං**. තදභාවතෝ **අහේතුකං**. නිබ්බත්තකහේතුවසේන සිජ්ඣමානම්පි හේතං සම්පයුත්තහේතුවසේනේව "සහේතුකමහේතුක"න්ති වුච්චති, ඉතරථා වවත්ථානාභාවතෝ.

**සකකුසලං වියාති** අත්තනෝ ජනකං කාමාවචරකුසලං විය. ජනකජනිතබ්බසම්බන්ධවසේන හි තං තං කුසලං තස්ස තස්ස විපාකස්ස සකං නාමං හෝති.

"සකකුසලං වියා"ති වුත්තත්තා පවත්තාකාරආරම්මණාදිතෝ චස්ස තං සදිසතා ආපජ්ජේය්‍යාති තං නිවාරණත්ථමාහ **"යථා පනා"**තිආදි. **ඡසු**

**ආරම්මණේසූ**ති පරිත්තාදිඅතීතාදිඅජ්ඣත්තාදිභේදේසු ඡසු රූපාදිආරම්මණේසු. භවන්තරපටිසන්ධානතෝ **පටිසන්ධි**. අවිච්ඡේදප්පවත්තිහේතුභාවේන භවස්ස අඞ්ගන්ති **භවඞ්ගං**. නිබ්බත්තිතභවතෝ පරිගඣද්ඣදතාය චුතිහේතුතාය **චුති. පරිත්තධම්මපරියාපන්නේසූ**ති කාමාවචරධම්මපරියාපන්නේසු. කාමාවචරධම්මා හි කිලේසවික්ඛම්භනාදීසු අසමත්ථභාවේන පරිත්තානුභාවතාය, ඕළාරිකාහි වා කාමතණ්හාදීහි පරිතෝ ගහිතත්තා "පරිත්තා"ති වුච්චන්ති. විපාකස්ස සඞ්කප්පෙත්වා ආරම්මණග්ගහණාභාවතෝ කම්මානුරූපමේව පවත්තතීති පරිත්තකම්මවිපාකෝ පරිත්තාරම්මණෝයේව පවත්තිතුමරහති, න මහග්ගතඅප්පමාණාරම්මණෝති වුත්තං "පරිත්තධම්මපරියාපන්නේසූ"ති. යදි ඒවං මහග්ගතවිපාකෝපි මහග්ගතාරම්මණෝයේව ආපජ්ජතීති? නාපජ්ජති, සඣද්ඣදයත්තාරම්මණස්ස සමාධිප්පධානස්ස කම්මස්ස අප්පනාපත්තස්ස තාදිසේනේව විපාකේන භවිතබ්බත්තා. වණ්ණලක්ඛණාදිකඣද්හි අග්ගහෙත්වා ලෝකසඣද්ඣදනුරෝධේනේව ගහිතේ පථවාදිකේ පරිකම්මසඣද්ඣදය සමුප්පාදිතං පටිභාගනිමිත්තසඞ්ඛාතමාරම්මණං සඣද්ඣදවසං සඣද්ඣදයත්තං හෝති, තස්මා තදාරම්මණස්ස සමාධිප්පධානස්ස අප්පනාපත්තස්ස කම්මස්ස විපාකේන සමාධිප්පධානඅප්පනාපත්තේහි විය සඣද්ඣදයත්තාරම්මණතාය නිබ්බිසේසේනේව භවිතබ්බං. පරිත්තවිපාකෝ පන මහග්ගත-අප්පමාණ-පඣද්ඣදත්තාරම්මණ-කම්මනිබ්බත්තෝපි හෝති, සෝ පරතෝ ආගමිස්සති.

**මුඛනිමිත්තං වියා**ති මුඛං පටිච්ච උප්පන්නනිමිත්තං විය. යථා හි තං නිරීහං අපරං මුඛනිමිත්තං උප්පාදේතුං, අඣද්ඣදං වා කිඣද්චි අත්තනෝ බලේන කාතුං න සක්කෝති, ඒවමේතම්පි විපාකුප්පාදනාදීසු න උස්සහති. තේනාහ **"නිරුස්සාහ"**න්ති. **උස්සාහෝ**ති චෙත්ථ අනුපච්ඡින්නාවිජ්ජාතණ්හාමානානුසයස්මිං සන්තානේ විපාකුප්පාදනසමත්ථතාසඞ්ඛාතෝ, ආසේවනපච්චයභාවසඞ්ඛාතෝ, විඣද්ඣදත්තිජනකතාසඞ්ඛාතෝ ච බ්‍යාපාරෝ. සෝ විපාකේ නත්ථි කම්මවේගුක්ඛිත්තත්තා පතිතං විය හුත්වා පවත්තමානස්ස තස්ස ඒකන්තේන දුබ්බලභාවතෝති තං නිරුස්සාහං.

**විපච්චනට්ඨාන**න්ති විපච්චනවසේන පවත්තනට්ඨානං, පටිසන්ධිභවඞ්ගචුතිතදාරම්මණවසේන චතුකිච්චානමේතේසං පවත්ති ඕකාසෝති අත්ථෝ. තත්ථ චුතිභවඞ්ගානං අන්තරාළං පටිසන්ධිකිච්චානං ඨානං, පටිසන්ධිආවජ්ජනානං, තදාරම්මණාවජ්ජනානං, ජවනාවජ්ජනානං, වොට්ඨබ්බනාවජ්ජනානඣද්ච අන්තරාළං භවඞ්ගකිච්චානං ඨානං, තදාරම්මණපටිසන්ධීනං, ජවනපටිසන්ධීනං, භවඞ්ගපටිසන්ධීනං වා අන්තරාළං චුතිකිච්චානං ඨානං, ජවනභවඞ්ගානං අන්තරාළං තදාරම්මණකිච්චානං ඨානන්ති දට්ඨබ්බං. යස්මා පනේතං ඨානං ධම්මානං තං තං කිච්චවසේන පාකටං හෝති, තස්මා ඨානං වේදිතබ්බන්ති ඨානං උද්ධරිත්වා පාකටකිච්චවසේනේව තං පකාසේතුං **"ඉමානි හී"**තිආදි වුත්තං. අථ වා කිච්චම්පි කිච්චවන්තානං පවත්තිට්ඨානභාවේන ගය්හතීති ඨානන්තිපි කිච්චමේව උද්ධටන්ති තං සරූපතෝ දස්සේතුං **"ඉමානි හී"**තිආදි වුත්තං.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අබ්‍යාකතවණ්ණනා අංක 31 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 156-160 පිටු]**

"විපාකමේව චිත්තං විපාකචිත්තං" යනු විග්‍රහ හෙයින් විපාකයම සිත් වූයේනුයි විපාකචිත්ත නම් වේ. "කරණමත්තා කිරියා" යනු නිර්වචන හෙයින් විපාක දනයක්

නොලැබෙන හෙයින් කිරීම් මාත්‍රයම ක්‍රියා නම් වෙයි. යම් කාරණයකින් ඒ ක්‍රියා චිත්තයාගේ විපාකදීමක් විද්‍යමාන නොවේද ඒ කාරණය යට කියන ලද්දේමැයි. "කිරියා ඒව චිත්තං කිරියාචිත්තං" ක්‍රියාවම සිදුවූයේනුයි ක්‍රියා චිත්ත නම් වෙයි. විපාක චිත්තයාගේ කාමාවචරාදීභාවය කුසල්සිත්හි කියනලද නියායෙන් ලැබෙන පරිද්දෙන් දතයුතුයි. අලෝභාදී සම්ප්‍රයුක්ත හේතූන් හා සමඟ හටගන්නා හෙයින් සහේතුක නම් වෙයි. එයින් තොරවූ හෙයින් අහේතුක නම් වෙයි. ඒ එසේමැයි මේ සිත නිර්වර්තක (උපදවන) හේතූන්ගේ වශයෙන් සිද්ධ වන්නේ නමුදු සම්ප්‍රයුක්ත හේතූන්ගේ වශයෙන්ම සහේතුක අහේතුක බව කියනු ලැබේ. එසේ නොගතහොත් ව්‍යවස්ථානයක් නොවන හෙයිනි. "සක කුසලං විය" යන මෙහි තමා උපදවන්නාවූ කාමාවචර කුසලය මෙනැයි යන අර්ථයයි. ඒ එසේමැයි ජනකජනිතව්‍ය සම්බන්ධ වශයෙන් ඒ ඒ කුසලය ඒ විපාකයාගේ "සක" නම් වෙයි. හෙවත් තමන් පිළිබඳ බව වෙයි. " සක කුසලං විය" යී කියනලද හෙයින් පැවතීම් ආකාර ආරම්මණාදීන්ගේ වශයෙන්ද තත්සදෘශත්වය පැමිණෙන්නේය. එහෙයින් එය වළකනු පිණිස "යථා පන" යනාදිය කීයේයි. "ඡසු ආරම්මණේසු" යන මෙහි පරිත්තාදි අතීතාදි අජ්ඣත්තාදි ප්‍රභේද වූ රූපාදී සාරමුණෙහිය යන අර්ථයයි. අතීත භවයෙන් අනික් අනික් භවය නැවත නැවත ගැළපීම කරන හෙයින් ප්‍රතිසන්ධි නම් වෙයි. "අවිච්ඡේදප්පවත්ති හේතු භාවේන භවස්ස අඞ්ගන්ති භවඞ්ගං" යනු විග්‍රහ හෙයින් නොසිඳ පැවැත්මට හේතුභවයෙන් උපප්‍රාප්ති භවයාගේ කාරණ භාවය තෙමේ භවඞ්ග නම් වේ. "නිබ්බත්තභවතෝ චුති හේතුතාය චුති" ප්‍රකටව ඇත්තාවූ හටගත් භවයෙන් ගිළිහීමට හේතු බැගින් චුති නම් වෙයි. "පරිත්තධම්මපරියාපන්නේසු" යන මෙහි කාමාවචර ධර්මයන්ට ඇතුලත්වූම සාරමුණෙහි හටගණි යනු අභිප්‍රායි. ඒ එසේමැයි කාමාවචර ධර්මයෝ ක්ලේශ විස්කම්භනාදීහි අසමර්ත බව හේතුකොටගෙන ස්වල්පවූ ආනුභාවය ඇති හෙයින් ඖදරිකවූ කාම තෘෂ්ණාදීන් විසින් හාත්පසින් ගන්නා ලද බැවින් පරිත්තයෝ යැයි කියනු ලැබෙත්. විපාකය තමා සඞ්කල්පනා කොට අරමුණු ගැනීමක් නැතිහෙයින් කර්මානුරූපවම හටගණීනුයි පරිත්ත කර්ම විපාක නම්වෙයි. පරිත්තාරම්මණයෙහිම හටගැනීමට සුදුසු වෙයි. මහද්ගත අප්පණාරම්මනණයෙහි නොහටගණී. එහෙයින් "පරිත්තධම්මපරියාපන්නේසුයේව" යී කියනලදි. ඉදින් මහද්ගත කර්මයාගේ නොහොත් නව රූපාරූප කුසල කර්මයාගේ විපාකයද මහද්ගතාළම්බණ සඞ්ඛ්‍යාත ප්‍රතිභාග නිමිත්තාළම්බණයෙහිම පැමිණෙන්නේ නොවේද යත්? නොපැමිණේන්නේයි. කුමක් හෙයින යත්? සඤ්ඤාතොමෝද අරමුණු සහිතවූ සමාධිය ප්‍රධානකොට ඇත්තාවූ කාමාවචර කර්මයාගේද අර්පණා බවට පැමිණි කර්මයාගේද එබඳුමවූ විපාකයකින් යුක්තවිය යුතු වර්ණ ලක්ෂණාදිය නොගෙන ලෝකයාගේ සඤ්ඤාවට අනුකූල වශයෙන්ම ගන්නාලද්ද වූ පෘථිව්‍යාදී කසිණයෙහි පරිකර්ම සංඥවෙන් මොනවට උපද්දවනලද්දවූ පතිභාගනිමිත්තයයි කියනලද ආළම්බණයද සංඥවද ඒ ධ්‍යානයට අයත්වේ. එහෙයින් ඒ කසිණ ප්‍රතිභාග නිමිත්තාළම්බණය අරමුණු කොට ඇත්තාවූ සමාධිය ප්‍රධානකොට ඇති අර්පණාවට පැමිණියාවූද කර්මයාගේ විපාකය හා සමඟ සමාධිය ප්‍රධානකොට ඇතිබැවින් අර්පණාවට පැමිණීමක් මෙන් සංඥව අරමුණු සහිත බැවින් නිර්විශේෂවම හෙවත් වෙනසක් නැතිවම විය යුතුවේ. කාමාවචර විපාකය වනාහි මහද්ගත අප්‍රමාණ ප්‍රඥප්තාළම්බණ කර්මයෙන් නිපන්නේද වසන්ත ඍතුවෙහි මල්පල්ලෙන් සැදීම් සඞ්ඛ්‍යාත ශ්‍රීයාවෙන් සමුද්ගතවූ උයන්හි වාසය කොටත් රසතෘෂ්ණාවෙන් අමුසොහොනට අභිමුඛවගියාවූ ශෘගාලයාට (හිවලාට) මෙන් මහද්ගත අප්‍රමාණ ධර්මයන් අරමුණු කොට පැවැතේ නමුදු කාමතෘෂ්ණා වශයෙන් කාමාවචර ධර්මයෙහිම නැමුනාවූ කර්මයාගේ විපාකයක් බැවින් කර්මානුරූප වශයෙන් කාමාවචර ධර්මයක්ම අරමුණු කොට පවත්නේ යයි දතයුතුයි. වැලිදු යම්සේ ස්වාමියා

අයත් පැවතිම් ඇත්තාවූ දසියගේ පුත්‍රතෙමේ මවවිසින් කැමැති කැමැතිවන ලද්දක්ම නොකොට හැකිවේද යළිත් ස්වාමියා විසින් කැමැති කැමැති වන ලද්දක්ම කෙරේද එපරිද්දෙන්ම කාමතෘෂ්ණාවට අයත්වූ කාමාවචර කර්මයාගේ විපාකයද කර්මය විසින් ගන්නාලද අරමුණක් නොගෙණ කාමතෘෂ්ණා විසින් ගන්නාලද අරමුණක්ම ගන්නේයි. එසේ හෙයින් කාමාවචර ධර්මයන්ම අරමුණු කොට පවත්නේය. මහද්ගත අප්‍රමාණ කර්මයක් අරමුණු කොට නොපවත්නේයි. එසේ හෙයින්ම පට්ඨානමහාප්‍රකරණයෙහි:—

"මහග්ගතාරම්මණෝ ධම්මෝ පරිතාරම්මණස්ස ධම්මස්ස කම්මපච්චයේන පච්චයෝ" යනුවෙන්ද ධම්මසඞ්ගණී ප්‍රකරණයෙහිද "සබ්බෝ කාමාවචරස්ස විපාකෝ කිරියාමනෝධාතු කිරියාහේතුකමනෝ විඤ්ඤාණධාතු සෝමනස්සසහගතා ඉමේ ධම්මා පරිත්තාරම්මණා" යනුවෙන් කාමාවචර විපාකයාගේ ඒකාන්ත කාමාවචරාලම්බණ බව වදාරණ ලද්දීය.

(පට්ඨාන පාඨයාගේ අර්ථය මෙසේයි; මහද්ගතාලම්බණවූ ධර්මයක් තෙමේ කාමාවචරාලම්බණවූ ධර්මයට කර්ම ප්‍රත්‍යයෙන් උපකාර වන්නේය. අප්‍රමාණාලම්බණවූ ධර්මයක් තෙමේ කාමාවචරාලම්බණවූ ධර්මයට කර්ම ප්‍රත්‍යයෙන් උපකාර වන්නේය යනුයි. දම්සඟුණු පාඨයාගේ අර්ථය මෙසේයි; සියලු කාමාවචර කුසලාකුසලකර්මයාගේ විපාක තෙමේ පඤ්චද්වාරාවජ්ජන චිත්ත සඞ්ඛ්‍යාත මනෝධාතුවය සොම්නස් සහගත මනෝවිඤ්ඤාණ ධාතු හසිතෝත්පාද චිත්තය යන මේ ධර්මයෝ තුමූ කාමාවචරාලම්බණික වෙත්ම යනුයි)

කියනලද ස්වභාවයෙන් විරහිතවූ කර්මයාගේ විපාක බැවින් කාමාවචර ධර්මයක්ම අරමුණු කෙරෙයි. මහද්ගත ධර්මයක් හෝ ප්‍රඥප්ති ධර්මයක් හෝ අරමුණු නොකෙරෙයි. එසේ හෙයින් භාග්‍යවතුන් වහන්සේ:—

"සබ්බෝ කාමාවචරස්ස විපාකෝ ක්‍රියාමනෝධාතු ක්‍රියාහේතුක මනෝවිඤ්ඤාණධාතු සොම්නස්සසහගතා ඉමේ ධම්මා පරිත්තාරම්මණා" යී දම්සඟුණු පාලියෙහි වදළේයි. "සම්පයුත්තධම්මානං" යන මෙහි පාලියෙහි ස්වරූප වශයෙන් ආවාවූ සම්පයුත්ත ධර්මයන්ගේ යන අර්ථයි. ඒ සම්ප්‍රයුත්ත ධර්මයන්ගේ වශයෙන් වනාහි කුසලයෙන් විපාකයාගේ වෙනස නොවෙයි. යේවාපනක වශයෙන් වෙනස වෙයි; එය මතු පහලවන්නේය. "මුඛ නිමිත්තං විය" යන මෙහි මුඛය නිසා උපන් නිමිත්ත මෙනැයි යනු අර්ථයි. යම්සේ වනාහි ඒ මුඛනිමිත්ත තෙමේ අනික් මුඛනිමිත්තක් උපදවන්නට හෝ අන්කිසිවක් තමාගේ බලයෙන් කරන්ට හෝ නොහැකිවේද එපරිද්දෙන්ම විපාකෝත්පාදනාදියෙහි උත්සාහ නොකරයි; එහෙයින් "නිරුස්සහං" යී කීයේයි. මෙහි උත්සාහය නම් අප්‍රහීන අවිද්‍යා තෘෂ්ණා මාන ඇති සන්තානයෙහි විපාක ඉපදවීමෙහි සමර්ථ බවයි කියනලද ආසේවන ප්‍රත්‍යයභාවයෙන් කරණලද විඥප්ති ජනකසඞ්ඛ්‍යාත ව්‍යාපාරයයි. ඒ ව්‍යාපාරය විපාක සිත්හි නැත්තේය. කුමක් හෙයින යත්? කර්ම වේගයෙන් දමාගසනලද හෙයින් වැටුනක්හු මෙන්වී හටගන්නාවූ ඒ විපාක චිත්තය ඒකාන්තයෙන් දුර්වල බැවිනි. එහෙයින් ඒ විපාක සිත "නිරුස්සාහ" නම් වෙයි. "විපච්චනට්ඨාන" යනු විපාක දීම් වශයෙන් හටගන්නා ස්ථානයයි. ප්‍රතිසන්ධි-භවාඞ්ග-චුති-තදාලම්බණ වශයෙන් සතර කෘත්‍යයක් ඇති මේ විපාක චිත්තයන්ගේ හටගන්නා අවකාශය යනු භාවයයි. ඔවුන් අතුරෙන් චවන කෘත්‍ය භවාඞ්ගකෘත්‍යයන්ගේ අතරතුර ප්‍රතිසන්ධිකෘත්‍යයන්ගේ ස්ථානය වේ. ප්‍රතිසන්ධිකෘත්‍ය ආවර්ජනකෘත්‍යයන්ගේ ද තදරම්මණකෘත්‍ය ආවර්ජනකෘත්‍යයන්ගේ ද ජවනකෘත්‍ය

ආවර්ජනකෘත්‍යයන්ගේද ව්‍යවස්ථාපනකෘත්‍ය ආවර්ජනකෘත්‍යයන්ගේද අතරතුර භවඞ්ගකෘත්‍යයන්ගේ ස්ථානයවේ. තදරම්මණ ප්‍රතිසන්ධිචිත්තයන්ගේද භවඞ්ග ප්‍රතිසන්ධිචිත්තයන්ගේද අතරතුර චුතිකෘත්‍යයන්ගේ ස්ථානය වේ. ජවන භවඞ්ගයන්ගේ අතරතුර තදරම්මණකෘත්‍යයන්ගේ ස්ථානයයි දතයුතුයි. යම්හෙයකින් වනාහි ඒ ස්ථානය ධර්මයන්ගේ ඒ ඒ කෘත්‍ය වශයෙන් ප්‍රකට වේද එහෙයින් ඒ ස්ථානය දතයුත්තේනුයි ස්ථානය උද්ධරණය කොට ප්‍රකටවූ කෘත්‍ය වශයෙන්ම ඒ ප්‍රකාශකරනු පිණිස "ඉමානි හි" යනාදිය කියනලදී. නොහොත් කෘත්‍යය ද කෘත්‍යවන්තයන්ගේ හටගන්නා ස්ථානභාවයෙන් ගණුලැබේනුයි ස්ථානයද කෘත්‍යයම වේ යයි උද්ධරණය කරණලද්දේය. එහෙයින් එය ස්වරූප වශයෙන් දැක්වනු පිණිස "ඉමානි හි" යනාදිය කියන ලද්දේය. **[අභිධම්මාවතාරමහෝදධි ටීකා සන්නය 120-123 පිටු]**

**කිරියාබ්‍යාකතචිත්තං** පන අවිපාකතෝ ඒකවිධං, පරිත්තමහග්ගතතෝ දුවිධං, කාමාවචරරූපාවචරඅරූපාවචරභූමිභේදතෝ තිවිධං. තත්ථ කාමාවචරං දුවිධං සහේතුකමහේතුකන්ති. තත්ථ **සහේතුකං** ඒකවිධං අරහතෝ ඒව උප්පජ්ජනතෝ. සෝමනස්සුපෙක්ඛාඤාණප්පයෝගභේදතෝ කාමාවචරකුසලං විය අට්ඨවිධං හෝති. සෙය්‍යථීදං; සෝමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකං, සසඞ්ඛාරිකං, සෝමනස්සසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකං, සසඞ්ඛාරිකං, උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකං, සසඞ්ඛාරිකං, උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකං, සසඞ්ඛාරිකන්ති ඉමානි අට්ඨ සහේතුකකිරියචිත්තානි. ඒතානි පන යථානුරූපං දනාදිවසේන ඛීණාසවානංයේව පවත්තන්ති. ඒවං සහේතුකකිරියචිත්තානි වේදිතබ්බානි.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 55 යටතේ)]**

**කිරියාබ්‍යාකතචිත්තං පන** කිරියා අව්‍යාකෘත සිත් තෙමේ වනාහි **අවිපාකතෝ** විපාක නොඋපදවන හෙයින් **ඒකවිධං** එක් වැදෑරුම් වෙයි **පරිත්තමහග්ගතතෝ** පරිත්ත මහග්ගත වශයෙන් **දුවිධං** දෙවැදෑරුම් වෙයි **කාමාවචරරූපාරූපාවචරභූමිභේදතෝ** කාමාවචර රූපාවචර අරූපාවචර යන භූමි භේද හෙයින් **තිවිධං** තුන් වැදෑරුම් වෙයි. **තත්‍ථ** ඔහුන් අතුරෙන් **කාමාවචරං** කාමාවචර ක්‍රියා සිත් තෙමේ **සහේතුකං අහේතුකං ඉති** සහේතුක ක්‍රියා සිතය අහේතුක ක්‍රියා සිතයයි **දුවිධං** දෙවැදෑරුම් වෙයි. **තත්‍ථ** ඔහුන් අතුරෙන් **සහේතුකං** සහේතුක ක්‍රියා සිත් තෙමේ **අරහතෝ ඒව උප්පජ්ජනතෝ** රහතුන් වහන්සේටම උපදනා හෙයින් **ඒකවිධං** එක් වැදෑරුම් වෙයි **සෝමනස්සුපෙක්ඛාඤාණසම්පයෝගභේදතෝ** සොම්නස් උපේක්‍ෂා ඤාණ යන මොහුන් හා සම්ප්‍රයෝග භේද හෙයින් **කාමාවචරකුසලං විය** කාමාවචර කුසලය මෙන් **අට්ඨවිධං හෝති** අට වැදෑරුම් වෙයි **සෙය්‍යථීදං?** හේ කවරහයත්? "සෝමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමේකං -පෙ- උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමේකං සසඞ්ඛාරිකමේකන්ති" මෙහි පෙර කී පරිද්දෙන් අර්ථ දතයුතුයි **ඉමානි අට්ඨ** මොහු අටදෙන **සහේතුකකිරියාචිත්තං** සහේතුක ක්‍රියා චිත්තයෝ නම් වෙත් **ඒතානි පන** ඔවුහූ වනාහි **යථාරූපං** සුදුසු පරිද්දෙන් **දනාදිවසේන** දනාදීන්ගේ වශයෙන් **ඛීණාසවානං ඒව** රහතුන්ටම **පවත්තන්ති** හටගනිත් **ඒවං** මේ උක්ත ප්‍රකාරයෙන් **සහේතුකකිරියාචිත්තානි** සහේතුක ක්‍රියා චිත්තයෝ **වේදිතබ්බානි** දතයුත්තාහුය.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 152 පිට]**

**දනාදිවසේනාති** පවත්තාකාරමත්තතෝ දනාදිවසේන, න පන පුඤ්ඤකිරියවත්ථුවසේන ඛීණාසවසන්තානගතස්ස පුඤ්ඤකිරියභාවාභාවතෝති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 55 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 184 පිට]**

එහි "දනාදිවසේන" යනු පැවැතීම් ආකාර මාත්‍රයෙන් දනාදී වශයෙනි. පුණ්‍යක්‍රියා වස්තු වශයෙන් නොවේ. කුමක් හෙයිනයත්? ක්ෂීණාශ්‍රව සන්තානගත පුණ්‍යක්‍රියා වස්තුභාවයක් නැති හෙයිනැයි කියන ලද්දේය.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 154 පිට]**

යථා පනේතානි (කාමාවචරකුසලචිත්තානි) පුඤ්ඤකිරියවසේන, කම්මද්වාරවසේන, කම්මවසේන, අධිපතිවසේන ච පවත්තන්ති, නේවං විපාකානි දනාදිවසේන අප්පවත්තනතෝ, විඤ්ඤත්තිසමුට්ඨාපනාභාවතෝ, අවිපාකසභාවතෝ, ඡන්දදීනි පුරක්ඛත්වා අප්පවත්තිතෝ ච, තස්මා තං වසේන පරිහාපෙත්වා යථාරහං ගණනභේදෝ යෝජේතබ්බෝ. ඉමානිපි ඉට්ඨඉට්ඨමජ්ඣත්තාරම්මණවසේන යථාක්කමං සෝමනස්සුපෙක්ඛාසහිතානි. පටිසන්ධාදිවසප්පවත්තියං කම්මස්ස බලවාබලවභාවතෝ, තදරම්මණප්පවත්තියං යේභුයෙන ජවනානුරූපතෝ, කදචි තත්ථාපි කම්මානුරූපතෝ ච ඤණසම්පයුත්තානි, ඤණවිප්පයුත්තානි ච හොන්ති. යථාපයෝගං විනා සප්පයෝගඤ්ච යථා උපට්ඨිතේහි කම්මාදිපච්චයේහි උතුභෝජනාදි සප්පායාසප්පායවසේන අසඞ්ඛාරිකසසඞ්ඛාරිකානි.

කිරියචිත්තානම්පි කුසලේ වුත්තනයේන යථාරහං සෝමනස්සසහගතාදිතා වේදිතබ්බෝ.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 16-17-18 යටතේ); විභාවනී ටීකා සන්නය 58 පිට; සද්ධර්මසාගරය 02/440-442 පිටු; අභිධර්ම ප්‍රකාශය 57 පිට; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 19-20 පිටු; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ පුරාණ සන්නය 27 පිට]**

**ඒතානි** ඒ කාමාවචර චිත්තයෝ තුමූ **පුඤ්ඤක්‍රියාවසේන** පුණ්‍යක්‍රියා වශයෙන් ද **කම්මද්වාරවසේන ච** කායද්වාර ආදීහු ඉපදවියයුතු වශයෙන් ද **කම්මවසේන ච** කායකර්මාදීන් හා යුක්තවීම් වශයෙන් ද **අධිපතිවසේන ච** අධිපති ධර්මයන්ගේ වශයෙන් ද **පවත්තන්ති යථා** යම්සේ පවත්නාහු වෙත් ද **ඒවං (තථා)** එපරිද්දෙන් **විපාකානි** විපාකයෝ තුමූ **නප්පවත්තන්ති** නොපවතිත් **කස්මා? (නප්පත්තන්ති)** කුමක් හෙයින් නොපවත්නාහු ද යත්? **දනාදිවසේන ච** දන්දීම් ආදීන්ගේ වශයෙන් **අප්පවත්තනතෝ ච** හටනොගන්නා හෙයින් **විඤ්ඤත්තිසමුට්ඨාපනාභාවතෝ ච** කායවාග් විඥප්ති නොඋපදවන හෙයින් ද **අවිපාකසභාවතෝ ච** විපාක දෙන ස්වභාව නැති හෙයින් ද **ඡන්දදීනි** ඡන්දදීහු **පුරක්ඛත්වා** අධිපති කොටගෙන **අප්පවත්තිතෝ ච** හටනොගන්නා හෙයින් ද **නප්පවත්තන්ති** නොපවත්නාහු වෙත් **තස්මා** එසේ හෙයින් **තං වසේන** ඒ පුණ්‍යක්‍රියාදීන්ගේ වශයෙන් **පරිහාපෙත්වා** ගණන් අඩුකොට **යථාරහං** සුදුසු පරිද්දෙන් **ගණනභේදෝ** ගණන් ප්‍රභේදය **යෝජේතබ්බෝ** යෙදිය යුතුතේයි.

(ආයුෂ්මත් ටීකාචාරීනී කුශල චිත්තයෝ වනාහි සොම්නස්සහගත උපේක්ෂාසහගත වෙත්වා විපාකයෝ වනාහි කුමක් හෙයින් සොම්නස්සහගත උපේක්ෂාසහගත වන්නාහුදැයි යන චොද්‍යය සඳහා "ඉමානිපි -පෙ- සහිතානි" යන පාඨය කියනලදි)

**ඉමානිපි** මේ විපාක චිත්තයෝ ද **ඉට්ඨඉට්ඨමජ්ඣත්තාරම්මණවසේන** ඉෂ්ටාලම්බන ඉෂ්ටමධ්‍යස්ථාලම්බනයන්ගේ වශයෙන් **යථාක්කමං** පිළිවෙළින් **සෝමනස්සුපෙක්ඛාසහිතානි හොන්ති** සෝමනස්සසහගත උපේක්ෂාසහගතවූවාහුම වෙත් ෴

(ආයුෂ්මත් ටීකාචාරිනී යුෂ්මත්හු විසින් සොම්නස්සහගත උපේක්‍ෂාසහගත වීමෙහි හේතුහු කියනලදි. ඥාණසම්ප්‍රයුක්ත ඥාණවිප්‍රයුක්ත වීමෙහි හේතුහු කුමක්ද යන චොද්‍යය සඳහා "පටිසන්ධාදිවසප්පවත්තියං -පෙ- ඤාණවිප්පයුත්තානි ච හොන්ති" යන පාඨය කියනලදි)

**පටිසන්ධාදිවසප්පවත්තියං (සති)** ප්‍රතිසන්ධි ආදී වශයෙන් හටගැණීමක් ඇති කල්හි **කම්මස්ස** ප්‍රතිසන්ධි දෙන්නාවූ කර්මයාගේ **බලවාබලවභාවතෝ ච** බලවත් අබලවත් බැවින් ද **තදලම්බනප්පවත්තියං (සති)** ප්‍රතිසන්ධි දුන් කර්මයෙන් තදළම්බනයාගේ ඉපදීමක් ඇති කල්හි **යේභුයෙය්න** බොහෝසෙයින් **ජවනානුරූපතෝ** ච ඥාණසම්ප්‍රයුක්ත ඥාණවිප්‍රයුක්ත ජවනයන්ට සුදුසු පරිද්දෙන් උපදනා හෙයින් ද **කදච්** කිසිකලෙක්හි **තථාපි** ඒ තදරම්මණයන්ගේ හටගැණීමෙහි ද **කම්මානුරූපතෝ ච** ප්‍රතිසන්ධි දුන් කර්මයෙන් අන්‍යවූ කර්මයකට සුදුසු පරිද්දෙන් හටගන්නා හෙයින් ද **ඤාණසම්පයුත්තානි ච හොන්ති** ඥාණසම්ප්‍රයුක්ත චිත්තයෝ ද වෙත් **ඤාණවිප්පයුත්තානි ච හොන්ති** ඥාණවිප්‍රයුක්ත චිත්තයෝ ද වෙත් ෴

(පටිසන්ධාදි යන්නෙහි ආදි ශබ්දයෙන් භවඞ්ග චුතීන්ගේ වශයෙන් හටගැණීම හැගේ. "කම්මස්ස බලවාබලවභාවතෝ" යන පාඨයාගේ අභිප්‍රාය වනාහි ඉදින් ත්‍රිහේතුක උත්කෘෂ්ට වූ කුශල කර්ම තෙමේ ප්‍රතිසන්ධිය දෙන්නේ වී නම් ප්‍රතිසන්ධිය දෙන්නාවූ කුශල කර්මය බලවත් බැවින් ඥාණසම්ප්‍රයුක්ත ප්‍රතිසන්ධිය වේ. ඉදින් ත්‍රිහේතුක ඕමක කර්මය හෝ ද්විහේතුක උත්කෘෂ්ට කර්මය හෝ ප්‍රතිසන්ධිය දෙන්නේ වී නම් ඒ කර්මය දුර්වල බැවින් ඥාණවිප්‍රයුක්ත ප්‍රතිසන්ධිය වෙයි කී නියායි. "යේභුයෙය්න කදච්" යන පාඨයාගේ අභිප්‍රාය වනාහි ප්‍රතිසන්ධි දෙන්නාවූ කර්මයාගේ වශයෙන් තදලම්බනය වන කල්හි ප්‍රතිසන්ධිය දුන්නාවූ ජවනයන්ට සුදුසු පරිද්දෙන් තදලම්බන වීම ඒකාන්ත නොවේ. බොහෝසෙයින් වෙයි. ඒ කෙසේ වන්නාහුද යත්? බොහෝසෙයින් අකුශල ජවනයන්ගේ දිවීම හා කුශල ජවනයන්ගේ දිවීම ස්වල්ප බැවින් අහේතුක තදලම්බනය වෙයි. කුශල ජවනයෙහි පුරුදු වූ පුද්ගලයා හට සමහර කලෙක අකුශල් ජවන් උපදනා කල්හි කුශල ජවනයන්ට අනතුරුව හටගැණීම පුරුදු හෙයින් අකුශල ජවනයෙහි පුරුද්ද ස්වල්ප බැවින් අකුශල ජවනයන්ගෙන් පසුවද ත්‍රිහේතුක තදලම්බනය වන්නේ යයි කී නියායි)

("තථාපි කම්මානුරූපතෝ" යන පාඨයාගේ අභිප්‍රාය වනාහි ප්‍රතිසන්ධිය දුන්නාවූ කර්මයෙන් අනික් කර්මයෙකින් තදලම්බනය වන කල්හි ප්‍රතිසන්ධි දුන් කර්මය අපේක්ෂා නොකොට ප්‍රවෘත්ති කර්මයට සුදුසු පරිද්දෙන් ත්‍රිහේතුක තදරම්මණය වෙයි. ත්‍රිහේතුකඕමක ද්විහේතුක උත්කෘෂ්ට කර්මයන් වී නම් ද්විහේතුක අහේතුක තදරම්මණයක් වෙයි යනු අභිප්‍රායි)

(විපාක චිත්තයාගේ ඥාණසම්ප්‍රයුක්ත ඥාණවිප්‍රයුක්තවීමට හේතුහු ආචාර්‍ය්‍යී තෙම කීයේය. අසංස්කාරික සසංස්කාරික වීමෙහි හේතුහු කුමක්ද යන චොද්‍යය සඳහා "යථාපයෝගං -පෙ හොන්ති" යන පාඨය කියනලදි)

**යථාපයෝගං** යම් යම් පරිද්දෙකින් කියනලද තමාගේ උත්සාහයකින් හෝ මෙරමාගේ උත්සාහයකින් හෝ **විනා ච** වෙන්ව ද **සප්පයෝගඤ්ච** තමාගේ උත්සාහයකින් හෝ මෙරමාගේ උත්සාහයකින් හෝ යුක්තව ද **උපට්ඨිතේහි** මරණාසන්න වූ සත්වයන්ට එළඹ සිටියාවූ **කම්මාදිපච්චයේහි ච** කර්මාදි ප්‍රත්‍යයන් හේතුකොටගෙන ද **උතුභෝජනාදිසප්පායාසප්පායවසේන ච** ඍතු භෝජනාදීන්ගේ සත්ප්‍රාය අසත්ප්‍රාය වශයෙන් ද **අසඞ්ඛාරිකසසඞ්ඛාරිකානි හොන්ති** අසංස්කාරික සසංස්කාරික චිත්තයෝ ද වෙත් ෴

(පූර්ව ප්‍රයෝගයෙන් වෙන්ව එළඹ සිටියාවූ කර්මාදි ප්‍රත්‍යයෙන් හා අසත්ප්‍රාය ඍතු භෝජනාදි හේතුවෙන් ද සසංස්කාරික විපාක චිත්තයෝ වෙති යනු අභිප්‍රායි. "යථාපයෝගං විනා -පෙ- පච්චයේහි" යන මේ හේත්වාර්ථය ප්‍රතිසන්ධි භවඞ්ග චුති සඳහා කියනලදි. "උතු -පෙ- වසේන" යන හේත්වාර්ථය වනාහි තදලම්බනය සඳහා කියනලදි. මෙසේ වෙන් වෙන් වශයෙන් අර්ථ යෝජනා කටයුතුයි. "කම්මාදි" යන්නෙහි ආදි ශබ්දයෙන් කම්මනිමිත්ත ගතිනිමිත්තයෝ ගැණෙත්. "භෝජනාදි" යන්නෙහි ආදි ශබ්දයෙන් ආවාස සේනාසනයෝ ගැණෙත්. මේ විභාගය මහාවිපාකයන් සඳහායි දතයුතු)

(කුශලවිපාක චිත්තයන්ගේ සොම්නස්සහගතාදිභාවයට හේතූහු ආචාර්‍ය්‍යයින් විසින් කියනලදි. ක්‍රියාචිත්තයන්ගේ සොම්නස්සහගතාදිභාවය කෙසේ වන්නේ ද යන චොද්‍යය සඳහා "ක්‍රියාචිත්තානං -පෙ- වේදිතබ්බෝ" යන පාඨය කියනලදි) **ක්‍රියාචිත්තානම්පි** ක්‍රියාචිත්තයන්ගේ ද **කුසලේ වුත්තනයේන** කුශලයෙහි කියනලද ක්‍රමයෙන් **යථාරහං** සුදුසු පරිද්දෙන් **සෝමනස්සසහගතාදිතා** සොම්නස් සහගතාදිභාවය **වේදිතබ්බෝ** දතයුත්තීය ෴

(කුශලචිත්තයෙහි ලැබියයුතු වූ සොම්නස්සහගතාදීන්ගේ හේතූන් අතුරෙන් ඇතැම් හේතු කෙනෙක් ක්‍රියාචිත්තයෙහි නොලැබියයුතු හෙයින් "යථාරහං" යි කියනලදි. කවර හේතු කෙනෙක් ලැබියයුතු ද? කවර හේතු කෙනෙක් නොලැබියයුතුද? යනු කුශලචිත්තයෙහි ලැබියයුතුවූ සොම්නස්සහගතභාවයාගේ හේතූන් අතුරෙන් දෙය්‍යධම්මසම්පත්තිය, ප්‍රතිග්‍රාහකසම්පත්තිය, දර්ශනසම්පත්තිය, බලවශ්‍රද්ධාවය යන මේ හේතූහු ක්‍රියාචිත්තයෙහි නොලැබියයුතු වෙයි. ඉෂ්ටාලම්බනය, සොම්නස් ප්‍රතිසන්ධිය, අගම්භීර ස්වභාවය යන මේ හේතූහුම ලැබියයුතු වේ. ඥාණසම්ප්‍රයුක්තභාවයාගේ හේතූන් අතුරෙන් අව්‍යාපජ්ජලෝකූපපත්තිය, කිලේස දූරීභාවය යන මේ හේතූහු නොලැබියයුතු වේ. පඤ්ඤසංවත්තනික කර්මය, ඉන්ද්‍රියපරිපාකය යන හේතූහුම ලැබියයුතු වේ. අසංස්කාරිකභාවයාගේ හේතූන් අතුරෙන් පුබ්බේදනාදීසු කතපරිචයතා යන හේතුව නොලැබිය යුතුය. "ආවාසසප්පායාදිවසේන කායචිත්තානං කල්ලභාවතෝ" යන හේතු මාත්‍රයක් ලැබිය යුත්තේය යන භාවයි) **[විභාවනී ටීකා සන්නය 93-96 පිටු]**

**මහාවිපාකේසු** පදත්ථතෝ වත්තබ්බං නත්ථි. වේදනාභේදෝ ආරම්මණවසේන වත්තබ්බෝ. තානිහි අතිඉට්ඨේ ඉට්ඨමජ්ඣත්තේ ච ආරම්මණේ යථාක්කමං සෝමනස්සේන උපෙක්ඛාය ච යුත්තානීති. සම්පයෝගභේදෝ කම්මවසේන ජවනවසේනච වත්තබ්බෝ. තානිහි බලවකම්මේන ජනිතානි ඤාණසම්පයුත්තානි හොන්ති. දුබ්බලකම්මේන ජනිතානි ඤාණවිප්පයුත්තානි. කදචිපන තදාරම්මණවසේන පවත්තිකාලේ යේභුයේන තිහේතුකජවනානුබන්ධානි ඤාණසම්පයුත්තානි හොන්ති. ඉතරජවනානුබන්ධානි ඤාණවිප්පයුත්තානීති. සඞ්ඛාරභේදෝපි කේහිචි ආචරියේහි

කම්මවසේනේව කථිතෝ. අසඞ්ඛාරිකකම්මජනිතානි අසඞ්ඛාරිකානි. සසඞ්ඛාරිකකම්මජනිතානි සසඞ්ඛාරිකානීති. සඞ්ගහකාරේන පන සන්නිහිතපච්චයවසේන වුත්තෝ. තානිහි පටිසන්ධියං පුරිමභවේ මරණාසන්නකාලේ ඤාතකාදීහි තේන තේන පයෝගේන උපට්ඨාපිතානි කම්මාදීනි ආරම්මණානි ගහෙත්වා පවත්තානි සසඞ්ඛාරිකානි නාම හොන්ති. තාදිසේන පයෝගේන විනා සයමේව කම්මබලේන උපට්ඨිතානි ගහෙත්වා පවත්තානි අසඞ්ඛාරිකානි නාම හොන්ති. තදාරම්මණ කාලේ පන අසඞ්ඛාරිකජවනානුබන්ධානි අසඞ්ඛාරිකානි නාම. සසඞ්ඛාරික ජවනානුබන්ධානි සසඞ්ඛාරිකානි නාමාති. එත්ථාපි සම්පිණ්ඩනත්ථෝ විසද්දෝ. තෙන ආරම්මණජක්ක හීනත්තිකවසේනේව කාලදේස සන්තානාදිවසේනච තේසං අනේකභේදත්තං සම්පිණ්ඩේති. යස්මා පනේතානි දානාදිවසේන කායකම්මාදිවසේන ඡන්දදීනි ධුරං කත්වා ච න පවත්තන්ති. තස්මා තානි පුඤ්ඤක්‍රියාවත්ථූනං කම්මාධිපතීනඤ්ච වසේන වඩ්ඪනං න ලභන්තීති.

**විභාවනියං** පන ඉමානි විඤ්ඤත්තිසමුට්ඨාපනාභාවතෝ කම්මද්වාර වසේන න පවත්තන්ති. අවිපාකසභාවතෝච කම්මවසේන න පවත්තන්තීති වුත්තං. තං විචාරේතබ්බං.

හෙට්ඨාහි කුසලේසු කම්මත්තිකවසේනේව වඩ්ඪනං වුත්තං. න පන විසුං කම්මද්වාරවසේන. කම්මත්තිකඤ්ච නාම තිවිධ කම්මද්වාර වසේනේව සිද්ධන්ති. නනු අට්ඨකථායං යෝහි කාමාවචරකුසලේසු කම්මද්වාර කම්මපථ පුඤ්ඤක්‍රියාවත්ථුභේදෝ වුත්තෝ. සෝ ඉධ නත්ථි. කස්මා. අවිඤ්ඤත්තිජනකතෝ අවිපාක ධම්මතෝ තථා අප්පවත්තියාචාති වුත්තන්ති. සච්චං. තත්ථ පන අවිඤ්ඤත්තිජනකතෝ කම්මද්වාර භේදෝ ඉධ නත්ථීති ඒතේන කායකම්මං වචීකම්මං මනෝකම්මන්ති ඒවං භේදස්ස අභාවං වදති. අවිපාකධම්මතෝ කම්මපථභේදෝ ඉධ නත්ථීති ඒතේන දසවිධස්ස කම්මපථභේදස්ස අභාවං වදති. ඉධ පන කුසලේසුපි කම්මපථභේදං අග්ගහෙත්වා තිවිධකම්මද්වාර භේදභින්නං කම්මත්තිකමේව ගහිතං. තඤ්ච විඤ්ඤත්ති සමුට්ඨාපනාභාවතෝ තිවිධකම්මද්වාරවසේන න පවත්තන්තීති ඉමිනාව සිද්ධං. යදිච හෙට්ඨා කුසලේසුපි දසවිධකම්මපථභේදවසේන විසුං වඩ්ඪනං වුත්තං සියා. ඒවං සති ඉධාපි අවිපාකසභාවතෝ කම්මපථවසේන න පවත්තන්තීති ඉදං වත්තබ්බමේවාති.

මහාක්‍රියචිත්තේසුපි මහාවිපාකේසු විය ආරම්මණවසේනේව වේදනාභේදෝ උපරි සයමේව වක්ඛති. ඤාණසම්පයුත්ත, විප්පයුත්ත, අසඞ්ඛාරික, සසඞ්ඛාරිකභේදෝ පන යථාරහං කුසලේසු වුත්තනයේන වේදිතබ්බෝ.

**විභාවනියං** පන තථා අවිචාරෙත්වා ක්‍රියචිත්තානංපි කුසලේ වුත්තනයේන යථාරහං සෝමනස්සසහගතාදිතා වේදිතබ්බාති වුත්තං. තං න යුජ්ජති.

**[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 44-45 යටතේ)]**

"බලවකම්මේනා"ති තිහේතුකුක්කට්ඨකම්මේන. "දුබ්බලකම්මේනා"ති තිහේතුකෝමකේන වා ද්විහේතුකකුසලකම්මේන වා. "කේහිචි ආචරියේහී"ති මෝරවාපිවාසී මහාදත්තත්ථේරං සන්ධාය වුත්තං. "සඞ්ගහකාරේනා"ති භද්දන්ත බුද්ධඝෝසත්ථේරේන. "සන්නිහිතපච්චයවසේනා"ති ආසන්නේ සණ්ඨිතපච්චය වසේන. පච්චුප්පන්නපච්චයවසේනේවාති වුත්තං හෝති. උපට්ඨිතානි කම්මාදීනි ආරම්මණානි. පවත්තානි මහාවිපාකානි. "අවිපාකසභාවතෝ"ති අවිපච්චන

සභාවතෝ. අවිපාකුප්පාදනසභාවතෝති වුත්තං හෝති. "අට්ඨකථාය"න්ති ධම්මසඞ්ගණිට්ඨකථායං. "ඉධා"ති මහාවිපාකචිත්තේ. "තථා අප්පවත්තියා චා"ති දනාදිවසේන අප්පවත්තිතෝ ච.

මහාකිරියචිත්තේ. "උපරී"ති වීථිසඞ්ගහේ තදරම්මණනියමේ. "සයමේවා"ති අනුරුද්ධත්ථේරේනේව. "වක්ඛතී"ති වුච්චිස්සති. "යථාරහ"න්ති ඛීණාසවසන්තානේ උප්පන්නානං මහාකිරියානං අරහානුරූපං. භූතකථනවිසේසනං තේන නිවත්තේතබ්බස්ස අත්ථස්ස අභාවාති අධිප්පායෝ

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 44-45 යටතේ)]**

**මහාවිපාකේසු** මහාවිපාක චිත්තයන්හි **පදත්ථතෝ** පදර්ථ වශයෙන් **වත්තබ්බං** කිවයුක්තක් **නත්ථි** නැත **වේදනාභේදෝ** වේදනා භේදය **ආරම්මණවසේන** ආරම්මණ වශයෙන් **වත්තබ්බෝ** කිවයුතුයි **හි** විස්තර කෙරෙම් **තානි** ඒ විපාක චිත්තයෝ **අතිඉට්ඨේ (ආරම්මණේ) ච** අතිඉෂ්ට අරමුණෙහි ද **ඉට්ඨමජ්ඣත්තේ ආරම්මණේ** ඉටු මදහත් අරමුණෙහි ද **යථාක්කමං** සුදුසුපරිදි **සෝමනස්සේන ච** සෝමනස්ස වේදනාවෙන් ද **උපෙක්ඛාය ච** උපේක්ෂා වේදනාවෙන් ද **යුත්තානි** යුක්තවූවාහු යැයි **ඉති (වේදිතබ්බානි)** දතයුත්තාහ **සම්පයෝගභේදෝ** සම්ප්‍රයෝග භේදය **කම්මවසේන ච** කර්ම වශයෙන් ද **ජවනවසේන ච** ජවන වශයෙන් ද **වත්තබ්බෝ** කිවයුතුයි **හි** විස්තර කෙරෙම් **බලවකම්මේන** ත්‍රිහේතුක උත්කෘෂ්ට කර්මයෙන් **ජනිතානි** උපදිනලද **තානි (විපාකචිත්තානි)** ඒ විපාක චිත්තයෝ **ඤාණසම්පයුත්තානි** ඥාණසම්ප්‍රයුක්ත චිත්තයෝ **හොන්ති** වෙත් **දුබ්බලකම්මේන** ත්‍රිහේතුක ඕමක කර්මයකින් හෝ ද්විහේතුක කුසල කර්මයකින් හෝ **ජනිතානි** උපදිනලද (**තානි විපාකචිත්තානි** ඒ විපාක චිත්තයෝ) **ඤාණවිප්පයුත්තානි** ඥාණවිප්‍රයුක්ත චිත්තයෝ (**හොන්ති** වෙත්) **කදචි පන** කිසිකලෙක වනාහි **යේභුයෙය්න** බොහෝසෙයින් **පවත්තිකාලේ** ප්‍රවෘත්ති කාලයෙහි **තදරම්මණවසේන** තදරම්මණ වශයෙන් **තිහේතුකජවනානුබන්ධානි** ත්‍රිහේතුක ජවන අනුව යන්නාවූ (**තානි චිත්තානි** ඒ චිත්තයෝ) **ඤාණසම්පයුත්තානි** ඥාණසම්ප්‍රයුක්ත චිත්තයෝ **හොන්ති** වෙත් **ඉතරජවනානුබන්ධානි** ත්‍රිහේතුක ඕමක ද්විහේතුක ජවන අනුව යන්නාවූ (**තානි චිත්තානි** ඒ චිත්තයෝ) **ඤාණවිප්පයුත්තානි** ඥාණවිප්‍රයුක්ත චිත්තයෝ **ඉති (හොන්ති)** වෙත් **කේහිචි ආචරියේහි** මොරවාපිවාසී මහාදත්ත තෙරුන් වහන්සේ විසින් **අසඞ්ඛාරිකකම්මජනිතානි** අසංස්කාරික කර්මයෙන් උපදවන ලද්දවූ චිත්තයෝ **අසඞ්ඛාරිකානි** අසංස්කාරික යැයි ද **සසඞ්ඛාරිකකම්මජනිතානි** සසංස්කාරික කර්මයෙන් උපදවන ලද්දවූ චිත්තයෝ **සසඞ්ඛාරිකානීති** සසංස්කාරික යැයි **සඞ්ඛාරභේදෝපි** සංස්කාර භේදය ද **කම්මවසේනේව** කර්ම වශයෙන්ම **කථිතෝ** දේශනා කරනලදි **සඞ්ගහකාරේන පන** සඞ්ග්‍රහකාරක බුද්ධඝෝෂාචාර්‍යයන් වහන්සේ විසින් **සන්නිහිතපච්චයවසේන** ආසන්නයෙහි සිටිනලද ප්‍රත්‍යය වශයෙන් නොහොත් වර්තමාන ප්‍රත්‍යය වශයෙන් **වුත්තෝ** දේශනා කරනලදි **හි** විස්තර කෙරෙම් **පටිසන්ධියං** ප්‍රතිසන්ධියෙහි **තානි** ඒ විපාක චිත්තයෝ **පුරිමභවේ මරණාසන්නකාලේ** පෙර භවයෙහි මරණාසන්න කාලයෙහි **ඤාතකාදීහි** ඥාති ආදීන් විසින් **තේන තේන පයෝගේන** ඒ ඒ ප්‍රයෝගයෙන් **උපට්ඨාපිතානි කම්මාදීනි ආරම්මණානි** එළවනලද කර්මාදී ආරම්මණයන් **ගහෙත්වා** ගෙන **පවත්තානි (චිත්තානි)** පවතිනලද ඒ විපාක චිත්තයෝ **සසඞ්ඛාරිකානි නාම හොන්ති** සසංස්කාරික නම් වෙත් **තාදිසේන පයෝගේන විනා** එබඳු ප්‍රයෝගයක් නොමැතිව **සයමේව කම්මබලේන** ස්වකීය කර්ම බලයෙන්ම **උපට්ඨිතානි (කම්මාදීනි ආරම්මණානි)** එළවනලද කර්මාදී ආරම්මණයන්

**ගහෙත්වා** ගෙන **පවත්තානි (චිත්තානි)** පවතිනලද ඒ විපාක චිත්තයෝ **අසඞ්ඛාරිකානි නාම හොන්ති** අසංස්කාරික නම් වෙත් **පන** තවද **තදාරම්මණකාලේ** තදාරම්මණ කාලයෙහි **අසඞ්ඛාරිකජවනානුබන්ධානි** අසංස්කාරික ජවනය අනුව ගියාවූ චිත්තයෝ **අසඞ්ඛාරිකානි නාම** අසංස්කාරික නම් **සසඞ්ඛාරිකජවනානුබන්ධානි** සසංස්කාරික ජවනය අනුව ගියාවූ චිත්තයෝ **සසඞ්ඛාරිකානි නාම ඉති** සසංස්කාරික යැයි (**වේදිතබ්බානි** දතයුත්තාහ) **එත්ථාපි** මෙහි ද **විසද්දෝ** වි-ශබ්දය **සම්පිණ්ඩනත්ථෝ** සම්පිණ්ඩන අර්ථයයි **තේන** ඒ වි-ශබ්දයෙන් **ආරම්මණඡක්ක** අරමුණු සය **හීනත්තිකවසේනේ ච** හීන-මධ්‍යම-උත්කෘෂ්ට වශයෙන් ද **කාලදේස** කාල දේශ දෙක **සන්තානාදිවසේන ච** සන්තාන ආදී වශයෙන් ද **තේසං** ඔවුන්ගේ **අනේකභේදත්තං** නොයෙක් භේද ඇතිබව **සම්පිණ්ඩේති** සම්පිණ්ඩනය කරයි **යස්මා පන** යම්හෙයකින් වනාහි **ඒතානි (චිත්තානි)** ඒ විපාක චිත්තයෝ **දනාදිවසේන ච** දනාදී වශයෙන් ද **කායකම්මාදිවසේන ච** කාය කර්මාදී වශයෙන් ද **ඡන්දදීනි ධුරං කත්වා** ඡන්දදිය ප්‍රධාන කොට **න පවත්තන්ති** නොපවතිත් **තස්මා** එබැවින් **තානි (චිත්තානි)** ඒ විපාක චිත්තයෝ **පුඤ්ඤක්‍රියාවත්ථූනං ච** පුණ්‍යක්‍රියා වස්තූන්ගේ ද **කම්මාධිපතීනඤ්ච** කර්ම අධිපතීන්ගේ ද **වසේන** වශයෙන් **වඩ්ඪනං** වැඩීමක් **න ලබ්භන්ති** නොලබත්෴

**ඉමානි (චිත්තානි) පන** මේ විපාක චිත්තයෝ වනාහි **විඤ්ඤත්තිසමුට්ඨාපනාභාවතෝ** කාය-වචී විඥප්ති නොඉපදවීම් ස්වභාවය ඇති බැවින් **කම්මද්වාරවසේන** කර්මද්වාර වශයෙන් **න පවත්තන්ති** නොපවතිත් **අවිපාකසභාවතෝ** විපාක නූපදවන ස්වභාව ඇති බැවින් **කම්මවසේන ච** කර්ම වශයෙන් ද **න පවත්තතීති** නොපවතිත් යැයි **විභාවනියං** විභාවනී ටීකායෙහි **වුත්තං** කියනලදි **තං** ඒ කීම **විචාරේතබ්බං** විමසිය යුතුයි෴

**හෙට්ඨා හි** යට වනාහි **කුසලේසු** කුසලයන්හි **කම්මත්තිකවසේනේව** කර්ම ත්‍රික වශයෙන්ම **වඩ්ඪනං** වැඩීම **වුත්තං** කියනලදි **කම්මද්වාරවසේන පන** කර්මද්වාර වශයෙන් වනාහි **විසුං** වෙන වෙනම **න (වුත්තං)** නොකියනලදි **කම්මත්තිකඤ්ච නාම** කර්මත්‍රිකය නම් **තිවිධකම්මද්වාරවසේනේව** තෙවැදෑරුම් කර්මද්වාර වශයෙන්ම **සිද්ධන්ති** සිද්ධවෙත් **අට්ඨකථායං** දම්සඟුණු අර්ථකථායෙහි **කාමාවචරකුසලේසු හි** කාමාවචර කුසලයන්හි වනාහි **යෝ** යම් **කම්මද්වාර** කර්මද්වාර **කම්මපථ** කර්මපථ **පුඤ්ඤක්‍රියාවත්ථුභේදෝ** පුණ්‍යක්‍රියාවස්තුභේදය **වුත්තෝ නනු?** කියනලද්දේ නොවේද? **සෝ (කම්මද්වාරකම්මපථපුඤ්ඤක්‍රියාවත්ථුභේදෝ)** ඒ කර්මද්වාර කර්මපථ පුණ්‍යක්‍රියාවස්තුභේදය **ඉධ** මේ විපාකචිත්තයෙහි **නත්ථි** නැත **කස්මා?** කුමක්හෙයින්ද? **අවිඤ්ඤත්තිජනකතෝ** විඥප්ති නූපදවීම් වශයෙන් ද **අවිපාකධම්මතෝ** විපාක නූපදවන ධර්ම වශයෙන් ද **තථා** එසේම **අප්පවත්තියාචාති** දනාදී වශයෙන් නොපැවැතීම් වශයෙන් ද **වුත්තන්ති** කියනලදි **සච්චං** ඒ කීම සැබෑවකි **තත්ථ පන** එහි වනාහි **අවිඤ්ඤත්තිජනකතෝ** විඥප්ති නූපදවීම් වශයෙන් **කම්මද්වාරභේදෝ** කර්මද්වාරභේදය **ඉධ** මේ විපාකචිත්තයෙහි **නත්ථීති** නැත යැයි **ඒතේන** එකරුණින් **කායකම්මං** කායකර්ම **වචීකම්මං** වචීකර්ම **මනෝකම්මන්ති** මනෝකර්ම යයි **ඒවං** මෙසේ **භේදස්ස** භේදයාගේ **අභාවං** අභාවය **වදති** කියයි **අවිපාකධම්මතෝ** විපාක නූපදවන ධර්ම වශයෙන් **කම්මපථභේදෝ** කර්මපථ භේදය **ඉධ** මේ විපාකචිත්තයෙහි **නත්ථීති** නැත යැයි **ඒතේන** එකරුණින් **දසවිධස්ස කම්මපථභේදස්ස** දස වැදෑරුම් කර්මපථ භේදයාගේ **අභාවං** අභාවය **වදති** කියයි **කුසලේසුපි** කුසලචිත්තයන්හි ද **කම්මපථභේදං** කර්මපථභේදය **අග්ගහෙත්වා** නොගෙන **ඉධ පන** මේ විපාකචිත්තයෙහි වනාහි **තිවිධකම්මද්වාරභේදභින්නං**

තෙවැදෑරුම් කර්මද්වාර වශයෙන් භේද භින්න වූ **කම්මත්තිකමේව** කර්මත්‍රිකයම **ගහිතං** ගන්නාලදි **තඤ්ච** විපාකචිත්තය ද **විඤ්ඤත්තිසමුට්ඨාපනාභාවතෝ** විඥප්ති නූපදවීම් වශයෙන් **තිවිධකම්මද්වාරවසේන** තෙවැදෑරුම් කර්මද්වාර වශයෙන් **න පවත්තන්තීති** නොපවතිත් යයි **ඉමිනාව සිද්ධං** මෙකරුණින්ම සිද්ධය **යදි ච** ඉදින් වනාහි **හෙට්ඨා** යට **කුසලේසුපි** කුසලචිත්තයන්හි **දසවිධකම්මපථභේදවසේන** දස වැදෑරුම් කර්මපථභේද වශයෙන් **විසුං** වෙන වෙනම **වඩ්ඪනං** වැඩීම **වුත්තං සියා** කියනලද්දේ වන්නේය **ඒවං සති** මෙසේ ඇති කල්හි **ඉධපි** මේ විපාකචිත්තයෙහි ද **අවිපාකසභාවතෝ** විපාක නූපදවන ස්වභාව වශයෙන් **කම්මපථවසේන** කර්මපථ වශයෙන් **න පවත්තන්තීති** නොපවතිත් යයි **ඉදං** මෙය **වත්තබ්බමේවාති** කිවයුතු වන්නේමය ෴

**මහාක්‍රියාචිත්තේසුපි** මහාක්‍රියා චිත්තයන්හි ද **මහාවිපාකේසු විය** මහාවිපාක චිත්තයන්හි මෙන් **ආරම්මණවසේනේව** ආරම්මණ වශයෙන්ම **වේදනාභේදෝ** වේදනා භේදය **උපරි** වීථිසඞ්ග්‍රහයේ තදාරම්මණ නියමයෙහි **සයමේව** අනුරුද්ධ තෙරුන් වහන්සේ විසින්ම **වක්ඛති (වුච්චිස්සති)** කියනු ලබන්නේය **ඤාණසම්පයුත්ත** ඥාණසම්ප්‍රයුක්ත **විප්පයුත්ත** ඥාණවිප්‍රයුක්ත **අසඞ්ඛාරික** අසංස්කාරික **සසඞ්ඛාරිකභේදෝ පන** සසංස්කාරික භේදය වනාහි **යථාරහං** ක්ෂීණාශ්‍රව සන්තානයෙහි උපන්නාවූ මහාක්‍රියා චිත්තයනට සුදුසුපරිදි **කුසලේසු** කුසල චිත්තයන්හි **වුත්තනයේන** කියනලද ක්‍රමයෙන් **වේදිතබ්බෝ** දතයුතුයි ෴

**විභාවනීයං පන** විභාවනී ටීකායෙහි වනාහි **තථා** එසේ **අවිචාරෙත්වා** නොවිචාරා **ක්‍රියාචිත්තානම්පි** ක්‍රියාචිත්තයන්ගේ ද **සෝමනස්සසහගතාදිතා** සෝමනස්සසහගතාදී භාවය **කුසලේ** කුසලචිත්තයෙහි **වුත්තනයේන** කියනලද ක්‍රමයෙන් **යථාරහං** සුදුසුපරිදි **වේදිතබ්බාති** දතයුතු යිය **වුත්තං** කියනලදි **තං** එකරුණ **න යුජ්ජති** සුදුසු නොවෙයි ෴ **[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

මේ විපාක සිත් සාමාන්‍යයෙන් යට දැක්වූ කුසල් සිත් බඳුය. රූපයෙකින් හටගන්නා සෙවනැල්ල බොහෝසෙයින් ඒ රූපාකාරයෙන්ම පවත්නා මෙනි. විශේෂ සැකවින් මෙහි දක්වනු ලැබේ. මොහු සත්වයන් පිළිබඳව ප්‍රතිසන්ධි වශයෙන් ද භවඞ්ග වශයෙන් ද තදාරම්මණ වශයෙන් ද චුති වශයෙන් දැයි සතරාකාරයෙකින් පවතිත්. ප්‍රතිසන්ධි වශයෙන් පවත්නා කල්හි ප්‍රතිසන්ධි විපාක යැයි කියනු ලැබෙත්. භවඞ්ග තදාරම්මණ චුති වශයෙන් පවත්නා කල්හි ප්‍රවෘත්ති විපාක යැයි කියනු ලැබේ. ප්‍රතිසන්ධි නම් අභිනව භවයෙහි පිළිසිඳ ගැන්මය. හෙවත් භවයකින් භවයක් ගැළපීමය. භවඞ්ග නම් චක්ෂුරාදී ද්වාරවලින් අරමුණු නොගෙන සිත තැන්පත්ව තිබීමය. තදාරම්මණ නම් චිත්තවීථීන්හි දී ජවනය විසින් ගන්නාලද අරමුණු ගැණීමය. චුති නම් ඒ භවයෙන් ගිලිහීමයි.

මේ සිත්වල ලක්ෂණ යට දැක්වූ කාමාවචර කුසල සිත්වලට කී ලක්ෂණ බඳුය. විශේෂය නම් රහතන් වහන්සේලාට පමණක් මේ සිත උපදින බවයි. ඒ එසේමැයි පෘථග්ජනයෙක් හෝ ශෛක්ෂ පුද්ගලයෙක් හෝ සොම්නසින් හා නුවණින් යුක්තව තමාගේ ඕනෑකමින් කුසල කර්මයක් කළේ නම් එවිට ඔහුට සෝමනස්ස සහගත ඥාණසම්පයුක්ත අසඞ්ඛාර යන පළමුවන කාමාවචර කුසල චිත්තය ලැබෙන්නේය. එබඳුම වූ ස්ථානයෙහි ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේලාට සෝමනස්ස සහගත ඥාණසම්පයුක්ත අසඞ්ඛාර යන පළමුවන කාමාවචර ක්‍රියා චිත්තය ලැබෙන්නේය.

සෙසු සිත් සතෙහි ද ක්‍රමය මෙසේය. මේ සිත් මතු විපාක නොලබන හෙයින් කුසල නොවේ. පෙර කළ කර්මයකට විපාකත් නොවන හෙයින් විපාකත් නොවේ. එබැවින් මොහු ක්‍රියා චිත්තයෝයි කියනු ලැබෙත්.

**[අභිධර්ම චන්ද්‍රිකාව 27-30 පිටු; අභිධර්ම විභාගය 46-48 පිටු]**

සම්පූර්ණයෙන් තණ්හාව නැතිකළා වූ මතු කිසිකලෙක සසර නූපදින්නා වූ රහතුන්ට පින්-පව් නැත. එහෙත් රහත්හු ද ලෝකයෙහි "පින්" යැයි සම්මත වූ පිදිය යුත්තන් පිදීම්, දහම් දෙසීම්, දහම් ඇසීම් ආදී සත්ක්‍රියා කෙරෙති. ඒවා කිරීම් වශයෙන් රහතුන් කෙරෙහි ඇති වන සිත් කාමාවචර කුසල චිත්තයට සමානවතුදු කුසලයෙහි සේ මතු විපාක ඉපදවීමේ ශක්තියක් ඒවායේ නැත. එබැවින් ඒවා කුසල් නොවේ. රහතුන්ගේ සන්තානයෙහි ඇතිවන ඒ සිත්වලට ඒ ඒ ක්‍රියා සිදුකිරීම් මාත්‍රය පමණක් ඇති බැවින් "ක්‍රියා සිත්" යැයි කියනු ලැබේ. **[අභිධර්ම මාර්ගය 52 පිට]**

## කාමාවචර විපාක-ක්‍රියා චිත්තයන් වැඩිවන ආකාරයඃ—

අට්ඨපි යන ශබ්ද පදයෙන් පි-ශබ්දයෙන් බොහෝ වූ කාමාවචර විපාක චිත්තයන් සම්පිණ්ඩනය කෙරෙත්. කෙසේ සම්පිණ්ඩනය කරන්නාහු ද යත්?මහා විපාක සිත් අටදෙන තුමූ ෂඩාලම්බනයෙහි හටගත් හෙයින් වෙන වෙනම සයකින් ගුණ කළ කල්හි (48) අටසාලිස් සිත් කෙනෙක් වෙත්. හීන-මධ්‍යම-ප්‍රණීතයන්ගේ වශයෙන් වැඩිකළ කල්හි (144) සූ සාලිසක් අධික කොට ඇත්තා වූ සියයක් සිත්කෙනෙක් වෙත්. කාල සන්තාන දේශාදීන්ගේ වශයෙන් වැඩිකළ කල්හි බොහෝ වූ විපාක චිත්තයෝ තුමූ හටගනිත්.

අට්ඨපි යන පි-ශබ්දයෙන් බොහෝ වූ ක්‍රියා චිත්තයන් සම්පිණ්ඩනය කෙරෙත්. කෙසේ සම්පිණ්ඩනය කරන්නාහු ද යත්? මහා කුසල චිත්තයන් කියන ලද්දවූ ක්‍රමයන් අතුරෙන් හීන ත්‍රිකය දුරුකොට දන මාත්‍රාදී වූ පුණ්‍ය ක්‍රියා දසයෙන් වැඩිකොට ෂඩාලම්බනයන්ගේ වශයෙන් වැඩි කොට සතර අධිපතීන්ගේ වශයෙන් වැඩි කොට කම්මද්වාරයන්ගේ වශයෙන් වැඩි කොට කායද්වාරමත්ත වචීද්වාරමත්ත මනොද්වාර මාත්‍රයන්ගේ වශයෙන් වැඩි කොට මහා ක්‍රියා චිත්තයන්ගේ සඞ්ඛ්‍යාව දතයුත්තේය. ඒ පරිද්දෙන් ගණන් කළාවූ චිත්තයෝ තුමූ කාල සන්තාන දේශාදීන්ගේ වශයෙන් බොහෝ වූ ප්‍රභේදයෝ වෙත්. ඒ කාමාවචර කුසල, සහේතුක විපාක-ක්‍රියා තුමූ වේදනා වශයෙන් ද්විප්‍රකාරයෙක් වෙත්. ඥාණ වශයෙන් සතරාකාර වෙත්. සඞ්ඛාර වශයෙන් අෂ්ට ප්‍රකාරයෙක් වෙත්. එහෙයින් ඒ සූවිසි සිත් කෙනෙක් වෙත්.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 29 පිට]**

# මහග්ගතචිත්ත සඞ්ග්‍රහය

## රූපාවචර කුසලචිත්තයෝ පස්දෙනඃ—

විතක්කවිචාරපීතිසුඛේකග්ගතා සහිතං පඨමජ්ඣානකුසලචිත්තං, විචාරපීති සුඛේකග්ගතා සහිතං දුතියජ්ඣානකුසලචිත්තං, පීතිසුඛේකග්ගතා සහිතං තතියජ්ඣානකුසලචිත්තං, සුඛේකග්ගතා සහිතං චතුත්ථජ්ඣානකුසලචිත්තං, උපෙක්ඛේකග්ගතා සහිතං පඤ්චමජ්ඣානකුසලචිත්තං චේති ඉමානි පඤ්චපි රූපාවචරකුසලචිත්තානි නාම. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 16 පිට]**

**විතක්ක** තමා හා සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයන් අරමුණට නංවන විතර්කය ද **විචාර** තමා හා සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයන් අරමුණෙහි හසුරුවන විචාරය ද **පීති** ඉෂ්ටාලම්බන ප්‍රතිලාභයෙහි ප්‍රීණනය කරණ ප්‍රීතිය ද **සුඛ** ප්‍රතිලබ්ධාරම්මණයෙහි රසාස්වාද කරණුව උපදනා සුඛය ද **ඒකග්ගතා** නානාලම්බණ ග්‍රහණය නොකොට එක අරමුණක්ම උතුම් කොට ඇති බැවින් සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ අවික්ෂිප්තභාව සාධක වූ සමාධිය ද යන උපනිධ්‍යාන කෘත්‍යයෙහි බලවත් මේ පස් දෙනා හා **සහිතං** ඒකෝත්පාදදි ප්‍රකාරයෙන් යුක්ත වූ **පඨමජ්ඣාන කුසලචිත්තං** දේශනානුක්‍රමයෙන් හා උත්පත්ති ක්‍රමයෙන් පළමු වූ ධ්‍යාන කුසල චිත්තය. මත්තෙහිදු ද්විතීය ධ්‍යානාදියට මෙම ලෙස සුදුස සුදුසු පරිද්දෙන් අර්ථ කියයුතුය. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 20-21 පිටු]**

**රූපාවචරං** පන ඣානඞ්ගභේදතෝ පඤ්චවිධං හෝති. සෙය්‍යථිදං, විතක්කවිචාරපීතිසුඛසමාධියුත්තං පඨමං, අතික්කන්තවිතක්කං දුතියං, තතෝ අතික්කන්තවිචාරං තතියං, තතෝ විරත්තපීතිකං චතුත්ථං, අත්ථඞ්ගතසුඛං උපෙක්ඛාසමාධියුත්තං පඤ්චමන්ති.
**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 452 යටතේ); විසුද්ධිමග්ග අටුවා 339 පිට (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය විඤ්ඤාණස්කන්ධ නිර්දේශය 195 පිට (තායිවාන් මුද්‍රණය)]**

**රූපාවචරං පනාති පන** සද්දෝ විසේසත්ථජෝතකෝ. තේන යථා කාමාවචරං කිලේසානං තදඞ්ගප්පහානමත්තකරං, න ඒවමිදං, ඉදං පන වික්ඛම්භනප්පහානකරං. යථා වා තං වේදනාඤාණසඞ්ඛාරභේදතෝ අට්ඨධා භිජ්ජති, න ඒවමිදං, ඉදං පන තතෝ අඤ්ඤථා වාති වක්ඛමානං විසේසං ජෝතේති. තං පනේතං සවත්ථුකං, සාසවං, විනීවරණඤ්ච රූපාවචරන්ති දට්ඨබ්බං. **"සවත්ථුකං ඒවා"**ති හි ඉමිනා අරූපාවචරං නිවත්තේති, **"සාසව"**න්ති ඉමිනා පඨමමග්ගචිත්තං, **"විනීවරණ"**න්ති ඉමිනා පටිඝසහිතද්වයං. කත්ථචි පඤ්ච ඣානඞ්ගානි, කත්ථචි චත්තාරි, කත්ථචි තීණි, කත්ථචි ද්වේ, කත්ථචි අපරානි ද්වේති ඒවං ඣානාඞ්ගයෝගභේදතෝ පඤ්චවිධන්ති සඞ්ඛේපතෝ වුත්තමත්ථං විවරිතුං **"සෙය්‍යථිද"**න්තිආදි ආරද්ධං. තත්ථ යං වත්තබ්බං, තං හෙට්ඨා **ඣානකථායං** (විසුද්ධි. 1.79 ආදයෝ) වුත්තමේව. තයිදං භාවනාමයමේව හුත්වා වුත්තනයේන පථවීකසිණාදිකං ආලම්බිත්වා යථාරහං ඤාණසම්පයුත්තකුසලානන්තරං උප්පජ්ජති, හීනාදිභේදභින්නං පනේතං යථාක්කමං බ්‍රහ්මපාරිසජ්ජාදීසු සෝළසසුපි බ්‍රහ්මලෝකේසු උපපත්තිනිප්ඵාදකන්ති දට්ඨබ්බං.
**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 452 යටතේ)]**

**රූපාවචරං පන** රූපාවචර කුසල චිත්තය වනාහි **ඣානඞ්ගයෝගභේදතෝ** ධ්‍යානාඞ්ග යෝග භේද වශයෙන් **පඤ්ච විධං** පස් වැදෑරුම් **හෝති** වෙයි **සෙය්‍යථීදං?** යම්සේද? **විතක්කවිචාරපීතිසුඛසමාධිසම්පයුත්තං** විතර්කය විචාරය ප්‍රීතිය සුඛය චිත්තේකාග්‍රතාවයෙන් යුක්තවූයේ **පඨමං** ප්‍රථමධ්‍යාන චිත්තය නම් **තතෝ** ඒ විතර්කාදී සම්ප්‍රයුක්ත ධර්මයන්ගෙන් **අතික්කන්තවිතක්කං** ඉක්මගිය විතර්කය ඇත්තේ **දුතියං** දුතියධ්‍යානය නම් **තතෝ** ඒ විතර්කාදී සම්ප්‍රයුක්ත ධර්මයන්ගෙන් **අතික්කන්තවිචාරං** ඉක්මගිය විචාරය ඇත්තේ **තතියං** තෙවැනි ධ්‍යානය නම් **තතෝ** ඒ විතර්කාදී සම්ප්‍රයුක්ත ධර්මයන්ගෙන් **විරත්තපීතිකං** නොඇලුනු ප්‍රීතිය ඇත්තේ **චතුත්ථං** සිව්වැනි ධ්‍යානය නම් **අත්ථඞ්ගතසුඛං** ඉවත්වගිය සුඛය ඇති **උපෙක්ඛාසමාධියුත්තං** උපේක්‍ෂා චිත්තේකාග්‍රතාවයෙන් යුක්තවූයේ **පඤ්චමං** පස්වැනි ධ්‍යානය නම් **ඉති** මෙසේ පස් වැදෑරුම් වේ.෴

"රූපාවචරං පන" යනුයෙහි පන ශබ්දය විශේෂාර්ථ ද්‍යෝතක වෙයි. ඒ "පන" ශබ්දයෙන් යම්සේ කාමාවචර කුසල චිත්තය ක්ලේශයන්ගේ තදඞ්ග ප්‍රහාණ මාත්‍රයක් කෙරේද, මේ වනාහි එසේ නොවෙයි. මේ වනාහි විෂ්කම්භන ප්‍රහාණය කෙරේ. යම්සේ හේ කාමාවචර කුසලය වේදනා-ඥාණ-සංස්කාර භේදයෙන් අට පරිද්දෙකින් ප්‍රභේද වන්නේ ද මේ එසේ නොවෙයි. මේ වනාහි එයින් අන්‍ය ප්‍රකාරයෙන් බිඳෙයි යනු කියා වක්‍ෂ්‍යමාන විශේෂය ද්‍යෝතනය කෙරේ. ඒ රූපාවචර චිත්තය වනාහි සවස්තුකය සාශ්‍රවය විනීවරණයයි දතයුතුයි. ඒ එසේමැයි; "සවත්ථුකං ඒව" යන්නෙන් අරූපාවචර චිත්තය වළක්වයි. "සාසවං" යන මෙයින් සෝවාන් මාර්ග චිත්තය වළක්වයි. "විනීවරණං" යන මෙයින් ප්‍රතිඝ දෙසිත වළක්වයි. කිසි චිත්තයෙක ධ්‍යානාඞ්ග පසක් ද, කිසි සිතෙක සතරක් ද, කිසි සිතෙක තුනක් ද, කිසි සිතෙක දෙදෙනෙක් ද, කිසි සිතෙක අනික් දෙදෙනෙක් දැයි මෙසේ "ඣානඞ්ගයෝගභේදෝ පඤ්චවිධං" යි සංක්‍ෂේපයෙන් කී අර්ථය විවරණය කරණු පිණිස "සෙය්‍යථීදං" යනාදී කීහු. එහි යමෙක් වක්තව්‍ය ද හේ යට ධ්‍යානකථාවෙහි කී නියායෙන් දතයුතුයි. මේ රූපාවචර කුසලය තෙමේ භාවනාමයවම උක්තනයින් පෘථිවි කසිණාදීන් අරමුණු කොට යථායෝගයෙන් ඥාණසම්ප්‍රයුක්ත කුසලානන්තරයෙහි උපදනේයි. හීනාදී භින්නවූයේ වනාහි යථාක්‍රමයෙන් බ්‍රහ්මපාරිෂද්‍යාදී සොළොස් බඹතලයෙහි ප්‍රතිසන්ධි නිෂ්පාදකයයි දතයුතු.෴ **[විසුද්ධි මාර්ග මහා සන්නය 1086-1087 පිටු]**

## රූපාවචර කුසල චිත්තය විස්තර කර ඇති ආකාරයඃ—

"ඣාන"න්ති විතක්කෝ, විචාරෝ, පීති, සුඛං, චිත්තස්සේකග්ගතා.

**[විභඞ්ග පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 569 යටතේ); විභඞ්ගප්පකරණ පාළි 54 පිට (බු.ජ)]**

විතක්කෝ ච විචාරෝ ච පීති ච සුඛඤ්ච ඒකග්ගතා චාති ඉමේහි සහිතං **විතක්කවිචාරපීතිසුඛේකග්ගතාසහිතං**. තත්ථ ආරම්මණං විතක්කේති සම්පයුත්තධම්මේ අභිනිරෝපේතීති **විතක්කෝ,** සෝ සහජාතානං ආරම්මණාභිනිරෝපනලක්ඛණෝ, යථා හි කෝචි ගාමවාසී පුරිසෝ රාජවල්ලභං සම්බන්ධිනං මිත්තං වා නිස්සාය රාජගේහං අනුපවිසති, ඒවං විතක්කං නිස්සාය චිත්තං ආරම්මණං ආරෝහති. යදි ඒවං කථං අවිතක්කං චිත්තං ආරම්මණං ආරෝහතීති? තම්පි විතක්කබලේනේව අභිනිරෝහති. යථා හි සෝ පුරිසෝ පරිචයේන තේන විනාපි නිරාසඞ්කෝ රාජගේහං පවිසති, ඒවං පරිචයේන විතක්කේන විනාපි අවිතක්කං චිත්තං ආරම්මණං අභිනිරෝහති. **පරිචයෝති** චෙත්ථ සවිතක්කචිත්තස්ස

සන්තානේ අභිණ්හප්පවත්තිවසේන නිබ්බත්තා චිත්තභාවනා. අපි චෙත්ථ පඤ්චවිඤ්ඤාණං අවිතක්කම්පි වත්ථාරම්මණසඞ්ඝට්ටනබලේන, දුතියජ්ඣානාදීනි ච හෙට්ඨිමභාවනාබලේන අභිරෝහන්ති.

ආරම්මණේ තේන චිත්තං විචරතීති **විචාරෝ**. සෝ ආරම්මණානුමජ්ජනලක්ඛණෝ. තථා හේස "අනුසන්ධානතා"ති (ධ. ස. 8) නිද්දිට්ඨෝ. එත්ථ ච විචාරතෝ ඕළාරිකට්ඨේන, තස්සේව පුබ්බඞ්ගමට්ඨේන ච පඨමඝණ්ටාභිඝාතෝ විය චේතසෝ පඨමාභිනිපාතෝ විතක්කෝ, අනුරවෝ විය අනුසඤ්චරණං විචාරෝ. විප්ඵාරවාචෙත්ථ විතක්කෝ චිත්තස්ස පරිප්ඵන්දනභූතෝ, ආකාසේ උප්පතිතුකාමස්ස සකුණස්ස පක්ඛවික්ඛේපෝ විය, පදුමාභිමුඛපාතෝ විය ච ගන්ධානුබන්ධචේතසා භමරස්ස, සන්තවුත්ති විචාරෝ චිත්තස්ස නාතිපරිප්ඵන්දනභූතෝ, ආකාසේ උප්පතිතස්ස සකුණස්ස පක්ඛප්පසාරණං විය, පදුමස්ස උපරිභාගේ පරිබ්භමනං විය ච පදුමාභිමුඛපතිතස්ස භමරස්ස.

පිනයති කායචිත්තං තප්පේති, වඩ්ඪේතීති වා **පීති,** සා සම්පියායනලක්ඛණා, ආරම්මණං කල්ලතෝ ගහණලක්ඛණාති වුත්තං හෝති, සම්පයුත්තධම්මේ සුඛයතීති **සුඛං,** තං ඉට්ඨානුභවනලක්ඛණං සුභෝජනරසස්සාදකෝ රාජා විය. තත්ථ ආරම්මණප්පටිලාභේ පීතියා විසේසෝ පාකටෝ කන්තාරඛින්නස්ස වනන්තෝදකදස්සනේ විය, යථාලද්ධස්ස අනුභවනේ සුඛස්ස විසේසෝ පාකටෝ යථාදිට්ඨඋදකස්ස පානාදීසු වියාති. නානාරම්මණවික්ඛේපාභාවේන ඒකං ආරම්මණං අග්ගං ඉමස්සාති ඒකග්ගං, චිත්තං, තස්ස භාවෝ **ඒකග්ගතා,** සමාධි. සෝ අවික්ඛේපලක්ඛණෝ. තස්ස හි වසේන සසම්පයුත්තං චිත්තං අවික්ඛිත්තං හෝති.

පඨමඤ්ච දේසනාක්කමතෝ චේව උප්පත්තික්කමතෝ ච ආදිභූතත්තා තං ඣානඤ්ච ආරම්මණූපනිජ්ඣානතෝ, පච්චනීකඣාපනතෝ චාති පඨමජ්ඣානං, විතක්කාදිපඤ්චකං. ඣානඞ්ගසමුදයේ යේව හි ඣානවෝහාරෝ නේමිආදිඅඞ්ගසමුදයේ රථවෝහාරෝ විය, තථා හි වුත්තං **විභඞ්ගේ** "ඣානන්ති විතක්කෝ විචාරෝ පීති සුඛං චිත්තස්සේකග්ගතා"ති (විභ. 569). පඨමජ්ඣානේන සම්පයුත්තං කුසලචිත්තං **පඨමජ්ඣානකුසලචිත්තං**.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 21 යටතේ); විභාවනී ටීකා 60-64 පිටු]**

**විතක්කෝ ච** විතර්කයද **විචාරෝ ච** විචාරයද **පීති ච** ප්‍රීතියද **සුඛඤ්ච** සුඛයද **ඒකග්ගතා ච ඉති** ඒකාග්‍රතාවදැයි යන **ඉමේහි** මේ පඤ්ච ප්‍රකාරවූ ධ්‍යානාඞ්ගයන්ගෙන් **යං (චිත්තං)** යම් සිතක් තෙමේ **සහිතං** යුක්තවූයේද **ඉති (තස්මා) තං (චිත්තං)** ඒ සිත් තෙමේ **විතක්ක** -පෙ- **සහිතං** විතක්ක -පෙ- සහිත නම් වේ **තත්ථ** ඒ විතක්කාදී පාඨයෙහි **අවයවත්ථෝ** අවයවවූ අර්ථය **ඒවං** මෙසේ **වේදිතබ්බෝ** දතයුත්තේයි.

**යෝ (ධම්මෝ)** යම් ස්වභාවධර්මයක් තෙමේ **සම්පයුත්තධම්මේ** තමා හා එක්ව යෙදුනාවූ ධර්මයන් **ආරම්මණං** අරමුණට **විතක්කේති (ආරෝපේති)** නංවන්නේ වේද **ඉති (තස්මා) සෝ (ධම්මෝ)** ඒ ස්වභාව ධර්මතෙමේ **විතක්කෝ** විතර්ක නම් වේ (විතක්කේති යන ක්‍රියාතොමෝ චින්තේති යන ක්‍රියාවගේ අර්ථයද වාචක වන බැවින් චින්තේති යන ක්‍රියාවගේ වැළැක්වීම පිණිස "ආරෝපේති" යනුවෙන් වර්ණනා කෙළේයි) **සෝ (විතක්කෝ)** ඒ විතර්ක තෙමේ **සහජාතානං** එක්ව උපදනාවූ ධර්මයන් **ආරම්මණාභිනිරෝපනලක්ඛණෝ** අරමුණට අභිමුඛ කොට නැන්වීම ලක්ෂණ කොට

ඇත්තේය (උපමා කෙබඳුදැයි යන චෝද්‍යය සඳහා "යථාහි -පෙ- ආරෝහති" යන පාඨය කියනලදී; යථාහි යන්නෙහි "හි" ශබ්දය විස්තාරද්‍යෝතක නිපාතයි) **කෝචි** යම්කිසි **ගාමවාසීපුරිසෝ** පිටිසර ගම්වැසි පුරුෂයෙක් තෙමේ **රාජවල්ලභං වා** රජු හා මිත්‍රවූ යමෙක් හෝ **සම්බන්ධිනං මිත්තං වා** රජු හා මිත්‍රවූ තමාගේ නෑයෙක් හෝ **නිස්සාය** යහළු කොටගෙණ **රාජගේහං** රජගෙට **අනුපවිසති යථා** යම්සේ ප්‍රවිෂ්ටවේද **ඒවං (තථා)** එපරිද්දෙන් **විතක්කං නිස්සාය** විතර්කය ආශ්‍රය කොටගෙණ **චිත්තං** සිත්තෙමේ **ආරම්මණං** අරමුණට **ආරෝහති** නගිනේවේද **විතක්කං නිස්සාය** විතර්කය ආශ්‍රය කොටගෙණ **චිත්තං** සිත්තෙමේ **ආරම්මණං** අරමුණට **යදි ආරෝහති** ඉදින් නගිනේවේද **ඒවං සති** මෙසේ අරමුණට නැගීමක් ඇතිකල්හි **අවිතක්කං චිත්තං** විතර්ක රහිතවූ සිත්තෙමේ **ආරම්මණං** අරමුණට **කථං ආරෝහති** කෙසේ නගිනේද යත්? **ඉති** මෙසේ (**වේ වදෙයුං** ඉදින් කියන්නාහු නම්) **ඒවං සති** මෙසේ ඇතිකල්හි **තම්පි** ඒ අවිතර්ක සිත්තෙමේද **විතක්කබලේනේව** විතර්ක ශක්තියෙන්ම **ආරෝහති** නගිනේ වෙයි **සෝ පුරිසෝ** ඒ පුරුෂ තෙමේ **පරිචයේන** රජගෙයි හැසිරීම පුරුදු හෙයින් **තේන විනාපි** ඒ රාජකුළුපග පුරුෂයන්ගෙන් තොරවද **නිරාසඞ්කෝ** සැක නැත්තේ **රාජගේහං** රජගෙට **පවිසති යථා** යම්සේ ප්‍රවිෂ්ටවේද **ඒවං (තථා)** එපරිද්දෙන් **පරිචයේන** සවිතර්ක චිත්තයාගේ සන්තානයෙහි නිරතුරු හටගත් පුරුද්දෙන් **විතක්කේන විනාපි** විතර්කයෙන් තොරවද **අවිතක්කං චිත්තං** අවිතර්ක සිත්තෙමේ **ආරම්මණං** අරමුණට **අභිරෝහති** නගිනේයි.

**එත්ථ** මේ පරිචයේන යන පදයෙහි (ච ශබ්දය වාක්‍යාරම්භයෙහිය) **පරිචයෝති** පරිචය යනු **සවිතක්කස්ස චිත්තස්ස** සවිතර්ක චිත්තයාගේ **සන්තානේ** සතන්හි **අභිණ්හං** නිරන්තරයෙන් **පවත්තිවසේන** හටගැනීම් වශයෙන් **නිබ්බත්තා** හටගත්තාවූ **චිත්තභාවනා** චිත්තයාගේ හටගැන්වීමයි (අවිතර්ක චිත්තයාගේ විතර්කයෙන් තොරව අරමුණට නැගීමෙහි ක්‍රමාන්තරයක් දැක්වීමට "අපි චෙත්ථ -පෙ -ආරෝහන්ති" යන පාඨය කියනලදී)

(**අපිච (අපරෝ නයෝ)** අනික් ක්‍රමයක් **මයා** මාවිසින් **වුච්චතේ** කියනු ලැබේ) **එත්ථ** මේ අවිතර්ක චිත්තයන් අතුරෙන් **පඤ්චවිඤ්ඤාණං** පස්විනැණ තෙමේ **අවිතක්කම්පි** විතර්කය නැත්තේද **වත්ථාළම්බණසඞ්ඝට්ටනබලේන** වස්තු ආලම්බණයන්ගේ ඔවිනොවුන් ගැටීම් වශයෙන් **අභිරෝහති** අරමුණට නැගේ.

**දුතියජ්ඣානාදීනිච** ද්විතීය ධ්‍යානාදීහුද **හෙට්ඨිමහෙට්ඨිමභාවනාබලේන** යට යට භාවනාවන්ගේ ශක්තියෙන් **අභිරෝහන්ති** ප්‍රතිභාග නිමිත්තාළම්බණයට නැගෙත් **තේන (ධම්මේන)** ඒ ධර්මය කරණකොටගෙන **චිත්තං** සිත්තෙමේ **ආරම්මණේ** අරමුණෙහි **විචරති** හැසිරෙන්නේ වේද **ඉති (තස්මා) සෝ (ධම්මෝ)** ඒ ධර්ම තෙමේ **විචාරෝ** විචාර නම් වේ **සෝ (විචාරෝ)** ඒ විචාර තෙමේ **ආරම්මණානුමජ්ජන ලක්ඛණෝ** අරමුණ පිරිමැදීම ලක්ෂණ කොට ඇත්තේය **තථාහි (තතෝ ඒව)** එහෙයින්ම **ඒස (ඒසෝ විචාරෝ)** මේ විචාරය **අනුසන්ධානතාති** අනුසන්ධානතායයි **නිද්දිට්ඨෝ** දක්වන ලදී (අනුසන්ධානත්වය යනු විතර්කයට අනුව ගැළපෙන බවයි විතර්ක විචාරයන්ගේ විනිශ්චය ආචාර්යතෙම කීයේය ඒ විතර්ක විචාරයන්ගේ විශේෂ කවරේද යන චෝද්‍යය සඳහා "එත්ථ ච" යනාදී පාඨය කියනලදී) **එත්ථ** මේ විතර්ක විචාරයන් අතුරෙන් (ච ශබ්දය වාක්‍යාරම්භයෙහිය) **විචාරතෝ** විචාරයට වඩා **ඕළාරිකට්ඨේනච** ලාමකවූ ඖදරිකාර්ථයෙන්ද **තස්සේව** ඒ විචාරයටම **පුබ්බඞ්ගමට්ඨේනච** පෙරටුව යන අර්ථයෙන්ද **පඨමඝණ්ටාභිඝාතෝ විය** පළමුකොට

ඝණ්ටාවෙහි පැහැරීමක් මෙන් **චේතසෝ** චිත්තයාගේ **පඨමාභිනිපාතෝ** පළමුකොට අරමුණෙහි වැටීම **විතක්කෝ** විතර්ක නම් වේ **අනුරවෝ විය** (ඝණ්ටාවෙන්) පසුව නික්මෙන ශබ්දය මෙන් **අනුසඤ්චරණං** නැවත නැවත හැසිරීම **විචාරෝ** විචාර නම් වේ. ...

**එත්ථ** මේ විතර්ක විචාරයන් අතුරෙන් **විතක්කෝ** විතර්කතෙමේ **විප්ඵාරවාවහෝති** පැතිර හටගැණීම් ඇත්තේ වේ **චිත්තස්ස** චිත්තයාගේ **පරිප්ඵන්දනභූතෝ ච හෝති** සැලෙනුනාවූ හටගැනීම් ඇත්තේද වේ (**කිම්ව හෝති** කුමක්මෙන් වන්නේද යත්?) **ආකාසේ** අහස්හි **උප්පතිතුකාමස්ස** නගිනු කැමතිවූ **සකුණස්ස** පක්ෂීහුගේ **පක්ඛවික්ඛේපෝ විය ච** පියාපත් ගැසීමක් මෙන්ද **ගන්ධානුබද්ධචේතසෝ** සුවඳෙහි බැඳුනු සිත් ඇත්තාවූ **භමරස්ස** බමරාගේ **පදුමාභිමුඛපාතෝ විය ච** පියුම්බලා බැසීමක් මෙන්ද **හෝති** වේ. ...

**විචාරෝ** විචාරතෙමේ **චිත්තස්ස** චිත්තයාගේ **සන්තවුත්ති** සන්සුන් හටගැනීම් ඇත්තේ වේ **නාතිපරිප්ඵන්දනභූතෝ** නොසැලෙන හටගැනීම් ඇත්තේ වේ (**කිම්ව හෝති** කුමක්මෙන් හටගන්නේද යත්?) **ආකාසේ** අහස්හි **උප්පතිතස්ස** නැංගාවූ **සකුණස්ස** පක්ෂීහුගේ **පක්ඛපසාරණං විය ච** පියාපත් දිගහැරීමක් මෙන්ද **පදුමාභිමුඛපතිතස්ස** පියුම්බලා බැස්සාවූ **භමරස්ස** බමරුගේ **පදුමස්ස** පද්ම පුෂ්පයාගේ **උපරිභාගේ** මතුභාගයෙහි **පරිබ්භමනං විය ච හෝති** සිසාරා හැසිරීමක් වැනිද වේ. ...

**යා (ධම්මජාති)** යම් ස්භාවධර්මයක් තොමෝ **කායචිත්තං** නාමකාය හා චිත්තය **පීනයති (තප්පේති)** තෘප්තියට පමුණුවාද (සතුටු කරවන්නේ වේදැයි කී නියායි) **වා** නොහොත් **පීනයති (වඩ්ඪේති)** දියුණු කරවා ද **ඉති (තස්මා) සා ධම්මජාති** ඒ ස්වභාව ධර්ම තොමෝ **පීති** ප්‍රීති නම් වේ **සා පීති** ඒ ප්‍රීති තොමෝ **සම්පියායනලක්ඛණා** අරමුණ ප්‍රියකරවීම ලක්ෂණ කොට ඇත්තීය (ආචාර්යතෙම් අරමුණ ප්‍රියකිරීම ලක්ෂණ කොට ඇත්තීයයි කීයේය ඒ ප්‍රීතියගේ අරමුණ ප්‍රියකරවන ලක්ෂණය කෙසේ දතයුතුදැයි යන චෝද්‍යය සඳහා "ආරම්මණං -පෙ -හෝති" යන පාඨය කියනලදී) **ආරම්මණං** අරමුණ **කල්ලතෝ** සුදුසු පරිද්දෙන් **ගහණලක්ඛණා** ගැනීම ලක්ෂණ කොට ඇත්තීයයි **ඉති** මෙසේ **වුත්තං (වුත්තා හෝති)** කියනලද්දී වේ. ...

**යං (වේදයිතං)** යම් වේදනාවක් තොමෝ **සම්පයුත්තධම්මේ** තමා හා එක්ව යෙදුනාවූ ධර්මයන් **සුඛයති** සුවපත් කෙරේද **ඉති (තස්මා) තං (වේදයිතං)** ඒ වේදනා තොමෝ **සුඛං** සුඛ නම් වේ **තං (සුඛං)** ඒ සුඛතෙමේ **ඉට්ඨානුභවනලක්ඛණං** කැමති අරමුණු රස විඳගැනීම ලක්ෂණකොට ඇත්තේය **සභෝජනරසස්සාදකෝ** යහපත් භෝජන රසය අනුභව කරන්නාවූ **රාජා විය** රජෙකු මෙනි (ප්‍රීතිය අරමුණ සුදුසු පරිද්දෙන් ගැණීම ලක්ෂණ කොට ඇත්තීයයිද සුඛය කැමැති අරමුණුරසවිඳ ගැණීම ලක්ෂණකොට ඇත්තේයයිද ආචාර්යතෙම කීයේය ඒ ප්‍රීති-සුඛයන්ගේ විශේෂයක් නැත්තේදැයි යන චෝද්‍යය සඳහා "තත්ථ -පෙ- පාණාදීසුවියාති" යන පාඨය කියනලදී) **තත්ථ** ඒ ප්‍රීති-සුඛයන් අතුරෙන් **ආරම්මණපටිලාභේ** අරමුණු පිළිලැබීමෙහි **පීතියා විසේසෝ** ප්‍රීතියගේ වෙනස **පාකටෝ** පහළ වේ (**කිම්ව** කුමක්මෙන්ද යත්?) **කන්තාරඛිනනස්ස** දුර්මාර්ගයෙහි උදක ක්ලාන්තවූ පුරුෂයාගේ **වනන්තෝදකදස්සනේ** ආරණ්‍ය ගත ජලය දැක්මෙහි (**තුට්ඨා විය** සතුටුවීමක් මෙනි)

**යථාලද්ධස්ස** යම් යම් පරිද්දෙකින් ලබනලද්දවූ අරමුණ **අනුභවනේ** අනුභව කිරීමෙහි **සුඛස්ස විසේසෝ** සුඛයාගේ වෙනස **පාකටෝ** පහළ වේ (**කිම්ව** කුමක්මෙන්ද යත්?) **යථා දිට්ඨඋදකස්ස** යම්පරිද්දෙකින් දක්නාලද ජලය **පාණාදීසු** පීමාදියෙහි (**අනුභවනං විය** සුඛාස්වාදය මෙනි) (ඉති ශබ්දය පරිසමාපනාර්ථයි)

**නානාලම්බණවික්ඛේපාභාවේන** නන් අරමුණෙහි නොදැමීම් වශයෙන් **ඉමස්ස චිත්තස්ස** මේ චිත්තයට **ඒකං ආරම්මණං** එක අරමුණයයි කියනලද **අග්ගං** අග්‍රභාගය **අත්ථි** ඇත්තේයි **ඉති (තස්මා) තං (චිත්තං)** ඒ සිත්තෙමේ **ඒකග්ගං** ඒකග්ග නම් වේ ("ඒකං අග්ගං අස්සාති ඒකග්ගං" යී චතුර්ථී බහුබ්‍රීහිසමාස කටයුතුයි "ඒකං" යන්න "ආරම්මණං" යන්නෙන් වර්ණනා කෙළේය) **චිත්තං** සිත (**ලබ්භති** ලැබේ) **තස්ස** ඒ එකම අරමුණක් ඇත්තාවූ චිත්තයාගේ **භාවෝ** ස්වභාව තෙමේ **ඒකග්ගතා** ඒකග්ගතා නම් වේ (මේ ලහුකන්‍යායයි) "ඒකග්ගස්ස භාවෝ ඒකග්ගතා" යී විග්‍රහ කටයුතුයි **සමාධි** සමාධිය (**ලබ්භති** ලැබේ) **සෝ (සමාධි)** ඒ සමාධි තෙමේ **අවික්ඛේපලක්ඛණෝ** අරමුණෙහි ස්ථිර බව ලක්ෂණකොට ඇත්තේයි (සමාධි තෙමේ අරමුණෙහි ස්ථිරව පිහිටීම ලක්ෂණ කොට ඇත්තේයයි කී නියායි කුමක්හෙයින් සමාධිතෙමේ අරමුණෙහි ස්ථිරව පිහිටීම ලක්ෂණකොට ඇත්තේද යන චෝද්‍යය සඳහා "තස්සහි -පෙ- හෝති" යන පාඨය කියනලදී) **තස්ස (සමාධිස්ස) වසේන** ඒ සමාධිහුගේ වශයෙන් **සසම්පයුත්තං චිත්තං** සම්ප්‍රයුක්ත ධර්ම සහිතවූ සිත්තෙමේ **අවික්ඛිත්තං** අරමුණෙහි නොදමන ලද්දේ **හි (යස්මා හෝති)** යම්හෙයකින් වේද **තස්මා** එසේහෙයින් **සමාධි** සමාධිතෙමේ **අවික්ඛේපලක්ඛණෝ හෝති** අවික්ෂිප්ත බව ලක්ෂණ කොට ඇත්තේ වේ (මෙසේ අර්ථයොජනා කටයුතුයි) **දේසනාක්කමතෝ චේව** දේශනාක්‍රම වශයෙන්ද **උපපතික්‍රමතෝ ච** උපදනාක්‍රම වශයෙන්ද **ආදිභූතත්තා** පෙරටුව හටගත් බැවින් **පඨමඤ්ච හෝති** පළමුවනුද වේ **තං** ඒ පෙරටුවහටගැනීම වනාහි **ආලම්බණූපනිජ්ඣාපනතෝච** කසිණාදී අරමුණ අභිමුඛ කොට නරඹන හෙයින්ද **පච්චනිකඣාපනතෝ ච** ප්‍රතිපක්ෂවූ නීවර්ණ ධර්මයන් භෂ්මකරණ හෙයින්ද (නොහොත්) ප්‍රතිපක්ෂවූ නීවර්ණ ධර්මයන් නවත්වන අර්ථයෙන් හෝ **ඣානඤ්ච හෝති** ධ්‍යාන නම් වෙයි **ඉති (තස්මා) පඨමජ්ඣානං** පඨමජ්ඣාන නම් වේ **විතක්කාදිපඤ්චකං** විතර්කාදී ධ්‍යානාඞ්ගයන් පස්දෙනාගේ සමූහය **ලබ්භති** ලැබේ ("දේසනාක්කමතෝ" යන පාඨය වශීභාවය පුරුදුකරන ලද්දවූ පුද්ගලතෙමේ ප්‍රතිලෝම වශයෙන්ද ඒකනුතරිකද්ව්‍යන්තරික වශයෙන්ද සමවදනාහෙයින් පඤ්ච වසීභාවයෙහි මුදුන්පැමිණි යෝගාවචර පුද්ගලයා සඳහා කියනලදී "උපපත්තික්කමතෝ" යන පාඨය වනාහි ආදිකම්මික පුද්ගල තෙමේ ප්‍රථම ධ්‍යානය ලැබ ඊට අනතුරුව ද්විතිය ධ්‍යානය ලබන හෙයින් ආදිකම්මික පුද්ගලයා සඳහා කියනලදී "ආදිභූතත්තා" යන පාඨයෙන් "පඨමං" යන පදයාගේය "පඨමං ජාතන්ති පඨමං" යන ජාත තද්ධිතයාගේ ස්වභාව දක්වමින් පට්ඨානාර්ථය වැළැක්වූහු "ආලම්බණූපනිජ්ඣානතෝ" යන පාඨයෙන් "ඣානං" යන පදයාගේ "කසිණාදි ආලම්බණං ඣායති උපනිජ්ඣායතීති ඣානං" යන වචනාර්ථය දැක්වූහ "පච්චනිකජ්ඣාපනතෝ" යන පාඨයෙන් "පච්චනිධම්මේ ඣාපේති ඩය්හාපේතීති ඣානං" යන වචනාර්ථය දැක්වූහ)

ආයුෂ්මත් ටීකාචාරීනි "විතක්කාදිපඤ්චකං" යී අභිධෙය්‍යාර්ථය දැක්වූහ. පරමාර්ථ වශයෙන් සමුදයක් නැතිහෙයින් විතර්කාදී පඤ්චප්‍රකාර ධ්‍යානාඞ්ගයන් අතුරෙන් එක එකක්ම ධ්‍යානයයි කියනලද්දේ නොවේද? එසේ කියනලද්දේ වී නම්

කුමක්හෙයින් "විතක්කාදි පඤ්චකං" යි අභිධෙය්‍යාර්ථය කියනලද්දේ දැයි යන චෝද්‍යය සඳහා "ඣානඞ්ගසමුදයේයේව -පෙ- වෝහාරෝ" යන පාඨය කියනලදී.

**කස්මා** කුමක්හෙයින් **විතක්කාදී පඤ්චකං** විතර්කාදී ධ්‍යානාඞ්ගයන්ගේ සමුදය තෙමේ **ඣානං** ධ්‍යාන නම් වෙත් **ඉති** (**පුච්ඡා සති** මෙබඳු ප්‍රශ්නයක් ඇතිකල්හි) **ඣානසමුදයේයේව** ධ්‍යානාඞ්ග සමුදයෙහිම **ඣානවෝහාරෝ** ධ්‍යාන යන ව්‍යවහාර තෙමේ **හි (යස්මා හෝති)** යම්හෙයකින් වේද **තස්මා** එසේහෙයින් **විතක්කාදිපඤ්චකං** විතර්කාදී ධ්‍යානාඞ්ගසමුදය තෙමේ **ඣානං** ධ්‍යාන නම් වේ **ඉති** (**විස්සජ්ජේතබ්බෝ** මෙසේ විසඳිය යුත්තේයි) (කුමක්මෙන්ද යන චෝද්‍යය සඳහා "නේමි ආදී -පෙ- විය" යන පාඨය කියනලදී)

**නේමි ආදී අඞ්ගසමුදයේ** නිම්වලලු ආදී අවයව සමූහයෙහි **රථවෝහාරෝ විය** රථය යන ව්‍යවහාරය මෙනි (අඞ්ග ශබ්දයෙන් සමුදයගේ අවයවය කාරණය සලකුණය ආලෝකය යන මෙතෙක් අර්ථයන් වාච්‍ය වේ මේ ධ්‍යානාඞ්ග යන පදයෙහි අඞ්ග ශබ්දය වනාහි අවයව වාචකම වේ යයි දතයුතු අවයවයන්ගේ සමුදයෙහිම ධ්‍යාන ශබ්දය වැටෙන බව කවර පාඨයකින් දතයුතුදැයි යන චෝද්‍යය සඳහා "තථාහි වුත්තං -පෙ- ඒකග්ගතා" යන පාඨය කියනලදී) **තථාහි (තතෝ ඒව)** එසේහෙයින්ම **විභඞ්ගේ** ධ්‍යානවිභඞ්ගයෙහි **ඣානන්ති** -පෙ- **ඒකග්ගතාති** ඣානන්ති -පෙ-ඒකග්ගතා යී **වුත්තං** කියනලදී (උදාහරණ පාඨයාගේ අර්ථ මෙසේයි) **ඣානන්ති** ධ්‍යානය යනු **විතක්කෝ ච** විතර්කය ද -පෙ- **චිත්තේකග්ගතා ච** චිත්තේකග්‍රතාවය ද **ඉති (ඉමේ)** මේ ධර්මයෝයි.

**යං (කුසල චිත්තං)** යම් කුසලචිත්තයක් තෙමේ **පඨමජ්ඣානේන සම්පයුත්තං** ප්‍රථම ධ්‍යානයෙන් යුක්තවීද **ඉති (තස්මා) තං (කුසල චිත්තං)** ඒ කුසලචිත්ත තෙමේ **පඨමජ්ඣානකුසලචිත්තං** ප්‍රථමධ්‍යාන කුසලචිත්ත නම් වේ.

**[විභාවනී ටීකා සන්නය 99-104 පිටු]**

රූපාවචරධම්මා පන කුසලා ඣානඞ්ගසම්පයෝගභේදතෝ පඤ්චවිධා හොන්ති. සෙය්‍යථීදං විතක්කවිචාරපීතිසුඛේකග්ගතාසම්පයුත්තං පඨමජ්ඣානිකං, තතෝ වූපසන්තං අතික්කන්තවිතක්කං විචාරපීතිසුඛේකග්ගතාසම්පයුත්තං දුතියජ්ඣානිකං, තතෝ වූපසන්තං අතික්කන්තවිචාරං පීතිසුඛේකග්ගතාසම්පයුත්තං තතියජ්ඣානිකං, තතෝ වූපසන්තං විරත්තපීතිකං සුඛේකග්ගතාසම්පයුත්තං චතුත්ථජ්ඣානිකං, තතෝ වූපසන්තං අත්ථඞ්ගතසුඛං උපෙක්ඛේකග්ගතාසම්පයුත්තං පඤ්චමජ්ඣානිකන්ති. ඒවං සම්පයෝගභේදතෝ විනිච්ඡයෝ වේදිතබ්බෝ.

**[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා දසකසිණ මූල විභාගකථා යටතේ)]**

**රූපාවචරධම්මා කුසලා පන** රූපාවචර ධර්ම වූ කුසලයෝ වනාහි **ඣානඞ්ගසම්පයෝගභේදතෝ** ධ්‍යාන අඞ්ග සම්ප්‍රයෝග භේදයෙන් **පඤ්චවිධා හොන්ති** පස් වැදෑරුම් වෙත් **සෙය්‍යථීදං?** ඒ කෙසේද යත්? **විතක්කවිචාරපීතිසුඛේකග්ගතාසම්පයුත්තං පඨමජ්ඣානිකං** විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සම්ප්‍රයුක්ත වූ ප්‍රථම ධ්‍යානය **තතෝ** ඒ ප්‍රථම ධ්‍යානයෙන් **වූපසන්තං** සංසිඳුවනලද **අතික්කන්තවිතක්කං** ඉක්මවනලද විතර්කය ඇති **විචාරපීතිසුඛේකග්ගතාසම්පයුත්තං දුතියජ්ඣානිකං** විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සම්ප්‍රයුක්ත වූ දුතිය ධ්‍යානය **තතෝ** ඒ දුතිය ධ්‍යානයෙන් **වූපසන්තං**

සංසිඳුවනලද **අතික්කන්තවිචාරං** ඉක්මවනලද විචාරය ඇති **පීතිසුඛේකග්ගතාසම්පයුත්තං තතියජ්ඣානිකං** ප්‍රීති සුඛ ඒකාග්‍රතා සම්ප්‍රයුක්ත වූ තතිය ධ්‍යානය **තතෝ** ඒ තතිය ධ්‍යානයෙන් **වූපසන්තං** සංසිඳුවනලද **විරත්තපීතිකං** නොඇළුනු ප්‍රීතිය ඇති **සුඛේකග්ගතාසම්පයුත්තං චතුත්ථජ්ඣානිකං** සුඛ ඒකාග්‍රතා සම්ප්‍රයුක්ත වූ චතුර්ථ ධ්‍යානය **තතෝ** ඒ චතුර්ථ ධ්‍යානයෙන් **වූපසන්තං** සංසිඳුවනලද **අත්ථඞ්ගතසුඛං** අස්තයට ගිය සුඛය ඇති **උපෙක්ඛේකග්ගතාසම්පයුත්තං පඤ්චමජ්ඣානිකං ඉති** උපේක්‍ෂා ඒකාග්‍රතා සම්ප්‍රයුක්ත වූ පඤ්චම ධ්‍යානය යයි **ඒවං** මෙසේ **සම්පයෝගභේදතෝ** සම්ප්‍රයෝග භේදයෙන් **විනිච්ඡයෝ** විනිශ්චය **වේදිතබ්බෝ** දතයුතුයි. **[අභිධම්මමාතිකා පාළි පරිවර්තන]**

**රූපාවචරකුසලචිත්තං** සවත්ථුකතෝ ඒකවිධං, ද්වීසු භවේසු උප්පජ්ජනතෝ දුවිධං, හීනමජ්ඣිමපණීතභේදතෝ තිවිධං, පටිපදාදිභේදතෝ චතුබ්බිධං, ඣානඞ්ගයෝගභේදතෝ පඤ්චවිධං. සෙය්‍යථිදං; කාමච්ඡන්ද-බ්‍යාපාද-ථිනමිද්ධ-උද්ධච්චකුක්කුච්ච-විචිකිච්ඡාවිප්පහීනං විතක්ක-විචාර-පීති-සුඛ-චිත්තේකග්ගතා සම්පයුත්තං පඨමං, විතක්කවිප්පහීනං විචාරපීතිසුඛචිත්තේකග්ගතාසම්පයුත්තං දුතියං, විතක්කවිචාරවිප්පහීනං පීතිසුඛචිත්තේකග්ගතාසම්පයුත්තං තතියං, විතක්කවිචාරපීතිවිප්පහීනං සුඛචිත්තේකග්ගතාසම්පයුත්තං චතුත්ථං, විතක්කවිචාරපීතිසුඛවිප්පහීනං උපෙක්ඛාචිත්තේකග්ගතාසම්පයුත්තං පඤ්චමන්ති ඉදං පඤ්චවිධං රූපාවචරකුසලචිත්තං නාම.

තං පන යථාසම්භවං පථවීකසිණාදීසු ආරම්මණේසු පවත්තිවසේන අනේකවිධං හෝති. සබ්බං පනේතං රූපාවචරභාවනාපුඤ්ඤවසප්පවත්තං යථානුරූපං රූපාවචරූපපත්තිනිප්ඵාදකං හෝති. ඒවං තාව රූපාවචරකුසලං වේදිතබ්බං. **[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 27 යටතේ)]**

**ද්වීසු භවේසු** කාමභවරූපභවේසු. **පටිපදාදිභේදතෝ** දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං, දුක්ඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං, සුඛාපටිපදං දන්ධාභිඤ්ඤං, සුඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං. **රූපාවචරභාවනාපුඤ්ඤවසප්පවත්තං** රූපාවචරේ පවත්තස්ස භාවනාපුඤ්ඤස්ස වසේන පවත්තං **රූපාවචරූපපත්තිනිප්ඵාදකං** රූපාවචරේ උපපත්තියා පටිසන්ධියා නිප්ඵාදකං හෝති.
**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 27 යටතේ)]**

**රූපාවචරකුසලචිත්තං** රූපාවචර කුසලසිත් තෙමේ **සවත්ථුකතෝ** වස්තුසහිත හෙයින් (හෙවත් ඒකාන්තයෙන් හෘදයවස්තුව ඇසුරු කරණහෙයින්) **ඒකවිධං** එක්වැදෑරුම් වෙයි **ද්වීසු භවේසු** කාමභව රූපභව දෙක්හි **උප්පජ්ජනතෝ** ඉපදීම් වශයෙන් **දුවිධං** දෙවැදෑරුම් වෙයි **හීණ-මජ්ඣිම-පණීතභේදතෝ** හීණ-මජ්ඣිම-පණීත භේද හෙයින් **තිවිධං** තුන්වැදෑරුම් වෙයි **පටිපදාදිභේදතෝ** දුක්ඛාපටිපද දන්ධාභිඤ්ඤාදිවූ ප්‍රතිපදවන්ගේ භේදහෙයින් **චතුබ්බිධං** සිව්වැදෑරුම් වේ **ඣානඞ්ගයෝග භේදතෝ** ධ්‍යානාඞ්ගයෝග භේදහෙයින් **පඤ්චවිධං** පස්වැදෑරුම් වේ **සෙය්‍යථීදං?** හේ කවරේද? **කාමච්ඡන්ද-ව්‍යාපාද-ථිනමිද්ධ-උද්ධච්චකුක්කුච්ච-විචිකිච්ඡාවිප්පහීනං** කාමච්ඡන්දනීවරණය-ව්‍යාපාදනීවරණය-ථිනමිද්ධනීවරණය-උද්ධච්චකුක්කුච්චනීවරණය-විචිකිච්ඡානීවරණය යන පඤ්චනීවරණය විප්‍රහීනවූ **විතක්ක-විචාර-පීති-සුඛ-චිත්තේකග්ගතාසම්පයුත්තං** විතර්කය-විචාරය-ප්‍රීතිය-සැපය-චිත්තේකාග්‍රතාය යන මේ පස හා ඒකොත්පාදදී ප්‍රකාරයෙන් යුක්තවූ **පඨමං**

දේශනා ක්‍රමයෙන් හා උත්පත්ති ක්‍රමයෙන් පළමුවනුවූ කුසල චිත්තය **විතක්කවිප්පහීනං** විතර්කය විප්‍රහීනවූ **විචාර-පීති-සුඛ-චිත්තේකග්ගතාසම්පයුත්තං** විචාර-ප්‍රීති-සැප-චිත්තේකග්‍රතා යන සතර හා සැපිය යුතුවූ **දුතියං** දෙවැනි කුසල චිත්තය **විතක්ක-විචාරවිප්පහීනං** විතර්ක-විචාර දෙක විප්‍රහීනවූ **පීති-සුඛ-චිත්තේකග්ගතාසම්පයුත්තං** ප්‍රීති-සැප-චිත්තේකාග්‍රතා යන තුණ හා සැපිය යුතුවූ **තතියං** තුන්වෙනි කුසල චිත්තය **විතක්ක-විචාර-පීතිවිප්පහීනං** විතර්ක-විචාර-ප්‍රීතින් විප්‍රහීනවූ **සුඛ-ඒකග්ගතාසම්පයුත්තං** සැප-චිත්තේකාග්‍රතා යන දෙක හා සැපිය යුතුවූ **චතුත්ථං** සතර වැනි කුසල චිත්තය **විතක්ක-විචාර-පීති-සුඛවිප්පහීනං** විතර්ක-විචාර-ප්‍රීති-සැප යන මොවුන් විප්‍රහීනවූ **උපෙක්ඛා චිත්තේකග්ගතාසම්පයුත්තං** උපේක්ෂා චිත්තේකාග්‍රතාවන් හා සැපිය යුතුවූ **පඤ්චමං ඉති** පස්වැනි කුසල සිතයයි යන **ඉදං** මේ **පඤ්චවිධං** පස්වැදෑරුම්වූ **රූපාවචරකුසලචිත්තං නාම** රූපාවචර කුසල සිත් නම් වේ.෴

**තම්පන** ඒ කුසල්සිත් වනාහි **යථාසම්භවං** සම්භව වන පරිද්දෙන් **පඨවි කසිණාදීසු ආරම්මණේසු** පෘථිවි කසිණාදී අරමුණෙහි **පවත්ති වසේන** හටගැනීම් වශයෙන් **අනේකවිධං හෝති** නන්වැදෑරුම් වෙයි **රූපාවචරභාවනා පුඤ්ඤ වසප්පවත්තං** රූපාවචර භාවනා කුසලයන්ගේ වශයෙන් හටගත්තාවූ **ඒතං සබ්බං පන** ඒ සියලු චිත්තය වනාහි **යථානුරූපං** හීනාදීන්ට සුදුසු පරිද්දෙන් **රූපාවචරූපපත්ති නිප්ඵාදකං හෝති** රූපභවයෙහි ප්‍රතිසන්ධිගැන්ම නිපදවන්නේ වෙයි **තාව** පළමු කොට **ඒවං** මේ උක්තප්‍රකාරයෙන් **රූපාවචරකුසලං** රූපාවචර කුසලය **වේදිතබ්බං** දතයුතුයි.෴ **]අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 66-67 පිටු[**

**සවත්ථුකතෝ ඒකවිධං** ඒකන්තේන වත්ථුසන්නිස්සිතත්තා. න හි අරූපධාතුයං රූපාවචරධම්මා ලබ්භන්ති රූපවිරාගභාවනාය නිබ්බත්තත්තා පුන රූපාවචරජ්ඣානසමාපත්තියා අභාවතෝ.

**හීනමජ්ඣිමපණීතභේදතෝ**ති එත්ථ පුබ්බේ විය අධිපතීනං හීනාදිභාවේහි ඣානස්ස හීනාදිභාවෝ යෝජේතබ්බෝ. අථ වා පටිලද්ධමත්තමනාසේවිතං **හීනං** පරිදුබ්බලභාවතෝ, නාතිසුභාවිතං අපරිපුණ්ණවසිභාවං **මජ්ඣිමං,** අතිවිය සුභාවිතං පන සබ්බසෝ පරිපුණ්ණවසිභාවං **පණීතං**. තථා උළාරපුඤ්ඤඵලකාමතාවසේන පවත්තිතං **හීනං,** ලෝකියාභිඤ්ඤත්ථාය පවත්තිතං **මජ්ඣිමං,** විවේකකාමතාය අරියභාවේ ඨිතේන පවත්තිතං **පණීතං**. අත්තහිතාය වා පවත්තිතං **හීනං,** කේවලං අලෝභජ්ඣාසයේන පවත්තිතං **මජ්ඣිමං,** පරහිතාය පවත්තිතං **පණීතං**. වට්ටජ්ඣාසයේන වා පවත්තිතං **හීනං,** විවේකජ්ඣාසයේන පවත්තිතං **මජ්ඣිමං,** විවට්ටජ්ඣාසයේන ලෝකුත්තරපාදකත්ථං පවත්තිතං **පණීතං**.

**ඣානඞ්ගයෝගභේදතෝ**ති කත්ථචි පඤ්ච ඣානඞ්ගානි, කත්ථචි චත්තාරි, කත්ථචි තීණි, කත්ථචි ද්වේ, කත්ථචි අපරානි ද්වේති ඒවං ඣානඞ්ගානං සම්පයෝගභේදතෝ.
**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 27 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 96-100 පිටු]**

"සවත්ථුකතෝ ඒකවිධං" යනු ඒකාන්තයෙන් හෘදයවස්තුව ඇසුරුකරන හෙයින් එක්වැදෑරුම් වෙයි යනු අර්ථයි. ඒ එසේමැයි අරූපභවයෙහි රූපාවචර ධර්මයෝ

නොලැබියයුත්තාහු වෙත්. කුමක්හෙයින යත්? රූපවිරාග භාවනාවෙන් උපන්නවුන්ගේ එහි රූපාවචර ධ්‍යානසමාපත්තියක් නැතිහෙයිනි. හීණ-මධ්‍යම-ප්‍රණීත භේදයෙන්ය යන මෙහි පෙර මෙන් අධිපතීන්ගේ හීනාදීභාවය ඇතිකල්හි ධ්‍යානයාගේද හීනාදීභාවය යෙදිය යුත්තේයි. නොහොත් ලබනලද මාත්‍රයක්වූ අනාසේවිතවූ ධ්‍යානය හාත්පසින් දුර්වල බැවින් හීන නම් වෙයි අතිශයින් භාවිතා නොකරණලද්දවූ නොපිරිපුන් වසීභාව ඇත්තාවූ ධ්‍යානය මධ්‍යම නම් වෙයි. මනාකොට ප්‍රගුණකරණලද්දවූ සර්වප්‍රකාරයෙන් පිරිපුන් වසීතා ඇත්තාවූ ධ්‍යානය ප්‍රණීත නම් වෙයි. ඒසේම මහත් පුණ්‍යඵල කැමැතිවීම් වශයෙන් පවත්නාලද රූපාවචර කුසල චිත්තය තෙමේ හීන නම් වේ. ලෞකික අභිඥ පිණිස පවත්නාලද සිත් තෙමේ මධ්‍යම නම්. විවේක කැමැති බැවින් ආර්‍ය්‍යභාවයෙහි සිටියහු විසින් පවත්වනලද සිත්තෙමේ ප්‍රණීත නම්. තවද තමහට හිතපිණිස පවත්වන ලද්දේ හීන නම්. හුදෙක් අලෝභාධ්‍යාශයෙන් පවත්වන ලද්දේ මධ්‍යම නම්. අනුන්ට හිතපිණිස පවත්වන ලද්දේ ප්‍රණීත නම්. නොහොත් වෘත්තාධ්‍යාශයෙන් පවත්වන ලද්දේ හීන නම්. විවේකාධ්‍යාශයෙන් පවත්වන ලද්දේ මධ්‍යම නම්. විවට්ටාධ්‍යාශයෙන් හෙවත් නිර්වාණය අදහස් කිරීමෙන් ලෝකෝත්තර සිතට පාදකවනු පිණිස පවත්වන ලද්දේ ප්‍රණීත නම් ෴

ධ්‍යානාඞ්ගයෝග භේදහෙයින් යන මෙහි කිසි ධ්‍යානයෙක්හි ධ්‍යානාඞ්ගයෝ පස්දෙනෙක් වෙති. ඇතැම් ධ්‍යානයෙක්හි සතර දෙනෙක් වෙති. ඇතැම් ධ්‍යානයෙක්හි තුන්දෙනෙක් වෙති. ඇතැම් ධ්‍යානයෙක්හි දෙදෙනෙක් වෙති. ඇතැම් ධ්‍යානයෙක්හි අනික් අඞ්ගයෝ දෙදෙනෙක් වෙතියි මෙසේ ධ්‍යානාඞ්ගයන්ගේ සම්ප්‍රයෝග භේද හෙයින්ය යන අර්ථයි ෴ **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 67-71 පිටු]**

තක්කචාරපීතිසුඛ - චිත්තස්සෙකග්ගතායුතං
පඨමජ්ඣානකුසලං - පඤ්චඞ්ගිකමුදාහටං

**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 11 යටතේ)]**

(**කාමච්ඡන්ද-ව්‍යාපාද-ථීනමිද්ධ-උද්ධච්චකුක්කුච්ච-විචිකිච්ඡා-විප්පහීනං** කාමච්ඡන්ද -පෙ- විචිකිච්ඡාවන් කෙරෙන් පහවූ) **තක්කචාරපීතිසුඛ චිත්තස්සේකග්ගතායුතං** විතර්ක විචාර ප්‍රීති සුඛ චිත්තේකාග්‍රතා යන පඤ්චප්‍රකාර ධ්‍යානාඞ්ගයන් හා යෙදුනා වූ **පඨමජ්ඣානකුසලං** ප්‍රථමද්ධ්‍යාන කුසල් සිත **පඤ්චඞ්ගිකං** ධ්‍යානාඞ්ග පසක් ඇත්තේ යැයි **උදාහටං** කියන ලද්දේය ෴

**[පරමත්ථවිභාවනී ව්‍යාඛ්‍යාව 09 පිට]**

විතක්කහීනං දුතියං - ඣානං තු චතුරඞ්ගිකං
විචාරහීනං තතියං - ඣානං පන තිවඞ්ගිකං

**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 12 යටතේ)]**

**විතක්කහීනං** විතර්කය විසින් වර්ජිත වූ **දුතියං ඣානං තු** විචාර ප්‍රීති සුඛ චිත්තේකග්‍රතා සඞ්ඛ්‍යාත ධ්‍යානාඞ්ග සතරක් ඇති ද්විතීය ධ්‍යාන කුසල් සිත **චතුරඞ්ගිකං** ධ්‍යානාඞ්ග සතරක් ඇති කුසල් සිත යයි (**උදාහටං** කියන ලද්දේය) **විචාරහීනං** විචාරය විසින් වර්ජිත වූ **තතියං ඣානං පන** ප්‍රීති සුඛ චිත්තේකග්‍රතා යන ධ්‍යානාඞ්ග තුනක් ඇති තෘතීය ධ්‍යාන කුසල් සිත වනාහි **තිවඞ්ගිකං** ධ්‍යානාඞ්ග තුනක් ඇති කුසල් සිත යයි (**උදාහටං** කියන ලද්දේය) **[පරමත්ථවිභාවනී ව්‍යාඛ්‍යාව 09 පිට]**

පීතිහීනං චතුත්ථඤ්ච - උපෙක්ඛේකග්ගතායුතං
පඤ්චමඤ්ච පකාසෙන්ති - උභයම්පි දුවඞ්ගිකං
**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 13 යටතේ)]**

**පීතිහීනං** ප්‍රීතිය විසින් වර්ජිත වූ සුඛ චිත්තේකග්‍රතා යන ධ්‍යානාඞ්ග දෙක ඇත්තාවූ **චතුත්ථඤ්ච** චතුර්ථ ධ්‍යාන කුසල් සිත ද **උපෙක්ඛේකග්ගතායුතං** උපේක්‍ෂා ඒකාග්‍රතා යන ධ්‍යානාඞ්ග දෙක හා යෙදුනා වූ **පඤ්චමඤ්ච** පඤ්චම ධ්‍යාන කුසල් සිත ද **ඉති** මෙසේ **උභයම්පි** චතුර්ථ ධ්‍යාන පඤ්චම ධ්‍යාන කුසල්සිත් දෙක ද **දුවඞ්ගිකං** අඞ්ග දෙකක් ඇති සිත යයි **පකාසෙන්ති** ප්‍රකාශ කෙරෙත්. නොහොත් **තක්කචාරපීතිසුඛචිත්තස්සේකග්ගතායුතං** විතර්ක -පෙ- චිත්තේකග්ගතාවන් හා යෙදුන බව හේතුකොටගෙන **පඤ්චඞ්ගිකං** අඞ්ග පසක් ඇත්තාවූ **ඣානකුසලං** ධ්‍යානය හා යෙදුනාවූ කුසල් සිත **පඨමජ්ඣානකුසලං** ප්‍රථමද්ධ්‍යාන කුසල් සිත යයි **උදහටං** කියන ලද්දේය. **විතක්කහීනං (විතක්කහීනයුත්තතත්තා)** විතර්කය කෙරෙන් පහවූ විචාර -පෙ- චිත්තේකාග්‍රතාවන් හා යෙදුන බව හේතුකොටගෙන **චතුරඞ්ගිකං** අඞ්ග සතරක් ඇත්තාවූ **ඣානං තු** ධ්‍යානය හා යෙදුනා වූ කුසල් සිත වනාහි **දුතියං** ද්විතීය ධ්‍යාන කුසල් සිත යයි **උදහටං** කියන ලද්දේය. **විචාරහීනං (විචාරහීන යුත්තතත්තා)** විචාරය කෙරෙන් පහවූ ප්‍රීති සුඛ චිත්තේකාග්‍රතාවන් හා යෙදුනු බව හේතුකොටගෙන **තිවඞ්ගිකං** අඞ්ග තුනක් ඇත්තාවූ **ඣානං පන** ධ්‍යානය හා යෙදුනු කුසල් සිත වනාහි **තතියං** තෘතීය ධ්‍යාන කුසල් සිත යයි **උදහටං** කියන ලද්දේය. **පීති හීනං (පීතිහීනයුත්තතත්තා)** ප්‍රීතිය කෙරෙන් පහවූ සුඛ චිත්තේකාග්‍රතාවන් හා යෙදුන බව හේතුකොටගෙන **දුවඞ්ගිකං** අඞ්ග දෙකක් ඇත්තාවූ **ඣානඤ්ච** ධ්‍යානය හා යෙදුන සිතම **චතුත්ථඤ්ච** චතුර්ථ ධ්‍යාන කුසල් සිත යයි ද **උපෙක්ඛේකග්ගතායුතං (උපෙක්ඛේකග්ගතායුත්තතත්තා)** උපේක්‍ෂා ඒකාග්‍රතාවන් හා යෙදුන බව හේතුකොට ගෙන **දුවඞ්ගිකං** අඞ්ග දෙකක් ඇත්තාවූ **ඣානඤ්ච** ධ්‍යානය හා යෙදුන කුසල් සිතම **පඤ්චමඤ්ච** පඤ්චම ධ්‍යාන කුසල් සිත යයි ද **ඉති** මෙසේ **දුවඞ්ගිකම්පි** අඞ්ග දෙකක් ඇති චතුර්ථ ධ්‍යාන පඤ්චම ධ්‍යාන කුසල් සිත ද **උභයං** ද්විප්‍රකාර වූ පඤ්චම ධ්‍යාන කුසල් සිත යයි **පකාසෙන්ති** ප්‍රකාශ කෙරෙත්. **[පරමත්ථවිභාවනී ව්‍යාඛ්‍යාව 09-10 පිටු]**

ඒවං ඣානඞ්ගභේදේන - චිත්තං පඤ්චවිධං භවේ
රූපාවචරකුසලං - රූපභූමිපවත්තකං
**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 14 යටතේ)]**

**ඒවං** මෙසේ **රූපාවචරකුසලං චිත්තං** රූපාවචර කුසල් සිත තෙම **ඣානඞ්ගභේදේන** පඤ්චවිධ චතුර්විධාදී ධ්‍යානාඞ්ගයන් හා යෙදීම් භේදයෙන් **පඤ්චවිධං** පඤ්චඞ්ගික චතුරඞ්ගික ආදී වශයෙන් පඤ්චප්‍රකාර ඇත්තේ **භවේ** වන්නේය (**තං** ඒ රූපාවචර කුසල චිත්තය තෙම) **රූපභූමිපවත්තකං** රූපභූමියෙහි උපදවන්නේ **භවේ** වන්නේය. **[පරමත්ථවිභාවනී ව්‍යාඛ්‍යාව 10 පිට]**

## රූපාවචර සිත පුද්ගලයන් පෙරටු කොට දේශනා කිරීමටහේතු:—

කස්මා පනෙත්ථ, යථා කාමාවචරකුසලනිද්දේසේ ධම්මපුබ්බඞ්ගමා දේසනා කතා තථා අකත්වා, පුග්ගලපුබ්බඞ්ගමා කතාති? පටිපදාය සාධේතබ්බතෝ. ඉදඤ්හි චතූසු පටිපදාසු අඤ්ඤතරාය සාධේතබ්බං; න කාමාවචරං විය විනා පටිපදාය

උප්පජ්ජති. පටිපද ච නාමේසා පටිපන්නකෝ සති හෝතීති ඒතමත්ථං දස්සේතුං පුග්ගලපුබ්බඞ්ගමං දේසනං කරොන්තෝ 'රූපූපපත්තියා මග්ගං භාවේතී'ති ආහ.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 160 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 159 පිට (හේ.වි.මු)]**

**ඵත්ථ පන** මේ කාමාවචර කුසල නිර්දේශයෙහි වනාහි **ධම්මපුබ්බඞ්ගමා දේසනා කතා** ධර්මය පෙරටු කොට දේශනාව කරන ලද්දේ **යථා** යම්සේ **තථා අකත්වා** එසේ දේශනා නොකොට **පුග්ගලපුබ්බඞ්ගමා (දේසනා) කතා** පුද්ගලයින් පෙරටු කොට දේශනාවක් කරන ලද්දේ **කස්මා ඉති?** කුමක් හෙයින් ද? **පටිපදය** ප්‍රතිපදවෙන් **සාධේතබ්බතෝ** සිද්ධකළයුතු බැවිනි **හි (සච්චං)** ඒ කීම සැබෑවකි **ඉදං** රූපාවචර චිත්තය තෙමේ **චතුසු පටිපදසු** ප්‍රතිපද සතර අතුරින් **අඤ්ඤතරාය** එක්තරා ප්‍රතිපදවකින් **සාධේතබ්බා** සිද්ධකළයුතුයි **කාමාවචරං විය** කාමාවචර චිත්තය මෙන් **පටිපදය විනා** ප්‍රතිපදවක් නොමැතිව (**රූපාවචර චිත්තං** රූපාවචර චිත්තය) **න උප්පජ්ජති** නූපදී **පටිපද ච නාම ඒසා** ප්‍රතිපදව නම් වූ මෝතොමෝ **පටිපන්නකෝ සති** පිළිපදිනවුන් ඇති කල්හිම **හෝති ඉති** වෙයි යැයි **ඒතං අත්ථං** මේ අර්ථය **දස්සේතුං** දැක්වීම පිණිස **පුග්ගලපුබ්බඞ්ගමං දේසනං කරොන්තෝ** පුද්ගලයා පෙරටු කොට දේශනා කරමින් **රූපූපපත්තියා මග්ගං භාවේති ඉති** රූපූපපත්තියා මග්ගං භාවේති යැයි **ආහ** දේශනා කරනලදි. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තන]**

## සතර ප්‍රතිපදවෝ:—

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි...පෙ.... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං [දුක්ඛාපටිපදං (බහූසු)] දන්ධාභිඤ්ඤං පථවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති...පෙ.... අවික්ඛේපෝ හෝති...පෙ.... ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි...පෙ.... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පථවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති...පෙ.... අවික්ඛේපෝ හෝති...පෙ.... ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි...පෙ.... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං [සුඛාපටිපදං (බහූසු)] දන්ධාභිඤ්ඤං පථවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති...පෙ.... අවික්ඛේපෝ හෝති...පෙ.... ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි...පෙ.... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පථවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති...පෙ.... අවික්ඛේපෝ හෝති...පෙ.... ඉමේ ධම්මා කුසලා...පෙ....
**[ධම්මසඞ්ගණී පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 176-179 යටතේ); ධම්මසඞ්ගණී පාළි 01/84-86 පිටු (බු.ජ); අභිධර්ම ප්‍රකාශය 60 පිට]**

කවර ධර්මයෝ කුසලහ යත්? යම් කලෙකැ රූප භවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- දුක් වූ පිළිවෙත් ඇති ලැසි වූ අභිඥ

ඇති, පඨවී කසිණ සඞ්ඛ්‍යාත වූ ප්‍රථම ධ්‍යානය උපදවා වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, -පෙ- අවික්ෂේපය වෙයි, -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසලහ යත්? යම් කලෙකැ රූප භවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- දුක් වූ පිළිවෙත් ඇති නොලස් වූ අභිඥ ඇති, පඨවී කසිණ සඞ්ඛ්‍යාත වූ ප්‍රථම ධ්‍යානය උපදවා වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, -පෙ- අවික්ෂේපය වෙයි, -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසලහ යත්? යම් කලෙකැ රූප භවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- සුව වූ පිළිවෙත් ඇති ලැසි වූ අභිඥ ඇති, පඨවී කසිණ සඞ්ඛ්‍යාත වූ ප්‍රථම ධ්‍යානය උපදවා වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, -පෙ- අවික්ෂේපය වෙයි, -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසලහ යත්? යම් කලෙකැ රූප භවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- සුව වූ පිළිවෙත් ඇති නොලස් වූ අභිඥ ඇති, පඨවී කසිණ සඞ්ඛ්‍යාත වූ ප්‍රථම ධ්‍යානය උපදවා වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, -පෙ- අවික්ෂේපය වෙයි, -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

[ධම්මසඞ්ගණී පාළි 01/85-87 පිටු (බු.ජ)]

ඉදානි යස්මා ඒතං ඣානං නාම පටිපදාකමේන සිජ්ඣති, තස්මා තස්ස පටිපදාභේදං දස්සේතුං පුන **කතමේ ධම්මා කුසලා**තිආදි ආරද්ධං. තත්ථ දුක්ඛා පටිපදා අස්සාති **දුක්ඛපටිපදං**. දන්ධා අභිඤ්ඤා අස්සාති **දන්ධාභිඤ්ඤං**. ඉති දුක්ඛපටිපදන්ති වා දන්ධාභිඤ්ඤන්ති වා පඨවීකසිණන්ති වා තීණිපි ඣානස්සේව නාමානි. **දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤ**න්තිආදීසුපි ඒසේව නයෝ.

තත්ථ පඨමසමන්නාහාරතෝ පට්ඨාය යාව තස්ස තස්ස ඣානස්ස උපචාරං උප්පජ්ජති තාව පවත්තා ඣානභාවනා 'පටිපදා'ති වුච්චති. උපචාරතෝ පන පට්ඨාය යාව අප්පනා තාව පවත්තා පඤ්ඤා 'අභිඤ්ඤා'ති වුච්චති. සා පනේසා පටිපදා ඒකච්චස්ස දුක්ඛා හෝති. නීවරණාදිපච්චනීකධම්මසමුදාචාරගහනතාය කිච්ඡා අසුඛසේවනාති අත්ථෝ. ඒකච්චස්ස තදභාවේන සුඛා. අභිඤ්ඤාපි ඒකච්චස්ස දන්ධා හෝති, මන්දා, අසීඝප්පවත්ති. ඒකච්චස්ස ඛිප්පා අමන්දා සීඝප්පවත්ති. තස්මා යෝ ආදිතෝ කිලේසේ වික්ඛම්භෙන්තෝ දුක්ඛේන සසඞ්ඛාරේන සප්පයෝගේන කිලමන්තෝ වික්ඛම්භේති, තස්ස දුක්ඛා පටිපදා නාම හෝති. යෝ පන වික්ඛම්භිතකිලේසෝ අප්පනාපරිවාසං වසන්තෝ චිරේන අඞ්ගපාතුභාවං පාපුණාති, තස්ස දන්ධාභිඤ්ඤා නාම හෝති. යෝ ඛිප්පං අඞ්ගපාතුභාවං පාපුණාති තස්ස ඛිප්පාභිඤ්ඤා නාම හෝති. යෝ කිලේසේ වික්ඛම්භෙන්තෝ සුඛේන අකිලමන්තෝ වික්ඛම්භේති, තස්ස සුඛා පටිපදා නාම හෝති.

තත්ථ යානි සප්පායාසප්පායානි ච පලිබෝධුපච්ඡේදාදීනි පුබ්බකිච්චානි ච අප්පනාකෝසල්ලානි ච **විසුද්ධිමග්ගේ** චිත්තභාවනානිද්දේසේ නිද්දිට්ඨානි, තේසු යෝ අසප්පායසේවී හෝති, තස්ස දුක්ඛා පටිපදා දන්ධා ච අභිඤ්ඤා හෝති. සප්පායසේවිනෝ සුඛා පටිපදා ඛිප්පා ච අභිඤ්ඤා. යෝ පන පුබ්බභාගේ අසප්පායං සේවිත්වා අපරභාගේ සප්පායසේවී හෝති, පුබ්බභාගේ වා සප්පායං සේවිත්වා අපරභාගේ අසප්පායසේවී, තස්ස වෝමිස්සකතා වේදිතබ්බා. තථා පලිබෝධුපච්ඡේදාදිකං පුබ්බකිච්චං අසම්පාදෙත්වා භාවනං අනුයුත්තස්ස දුක්ඛා

පටිපදා හෝති, විපරියායේන සුඛා. අප්පනාකෝසල්ලානි පන අසම්පාදෙන්තස්ස දන්ධා අභිඤ්ඤා හෝති, සම්පාදෙන්තස්ස ඛිප්පා.

අපිච තණ්හාඅවිජ්ජාවසේන සමථවිපස්සනාකතාධිකාරවසේන චාපි ඒතාසං පභේදෝ වේදිතබ්බෝ. තණ්හාභිභූතස්ස හි දුක්ඛා පටිපදා හෝති, අනභිභූතස්ස සුඛා. අවිජ්ජාභිභූතස්ස ච දන්ධා අභිඤ්ඤා හෝති, අනභිභූතස්ස ඛිප්පා. යෝ ච සමථේ අකතාධිකාරෝ තස්ස දුක්ඛා පටිපදා හෝති, කතාධිකාරස්ස සුඛා. යෝ පන විපස්සනාය අකතාධිකාරෝ හෝති, තස්ස දන්ධා අභිඤ්ඤා හෝති, කතාධිකාරස්ස ඛිප්පා.

කිලේසින්ද්‍රියවසේන චාපි ඒතාසං පභේදෝ වේදිතබ්බෝ. තිබ්බකිලේසස්ස හි මුදින්ද්‍රියස්ස දුක්ඛා පටිපදා හෝති දන්ධා ච අභිඤ්ඤා, තික්ඛින්ද්‍රියස්ස පන ඛිප්පා අභිඤ්ඤා. මන්දකිලේසස්ස ච මුදින්ද්‍රියස්ස සුඛා පටිපදා හෝති දන්ධා ච අභිඤ්ඤා, තික්ඛින්ද්‍රියස්ස පන ඛිප්පා අභිඤ්ඤාති.

ඉති ඉමාසු පටිපදාඅභිඤ්ඤාසු යෝ පුග්ගලෝ දුක්ඛාය පටිපදාය දන්ධාය අභිඤ්ඤාය ඣානං පාපුණාති, තස්ස තං ඣානං දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤන්ති වුච්චති. සේසේසුපි ඒසේව නයෝ.

තත්ථ 'තදනුධම්මතා සති සන්තිට්ඨති ඨිතිභාගිනී පඤ්ඤා'ති (විභ. 799) ඒවං වුත්තසතියා වා තං තං ඣානනිකන්තියා වා වික්ඛම්භනේ පටිපදා, තං තං ඣානූපචාරප්පත්තස්ස අප්පනාය පරිවාසේ අභිඤ්ඤා ච වේදිතබ්බා. ආගමනවසේනාපි ච පටිපදා අභිඤ්ඤා හොන්තියේව. දුක්ඛපටිපදාඤ්හි දන්ධාභිඤ්ඤං පඨමජ්ඣානං පත්වා පවත්තං දුතියම්පි තාදිසමේව හෝති. තතියචතුත්ථේසුපි ඒසේව නයෝ. යථා ච චතුක්කනයේ ඒවං පඤ්චකනයේපි පටිපදාවසේන චතුධා භේදෝ වේදිතබ්බෝ. ඉති පටිපදාවසේනපි චත්තාරෝ නවකා වුත්තා හොන්ති. තේසු පාඨතෝ ඡත්තිංස චිත්තානි, අත්ථතෝ පන පඤ්චකනයේ චතුක්කනයස්ස පවිට්ඨත්තා වීසතිමේව භවන්තීති.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 176-180 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 173-174 පිටු (හේ.වි.මු)]**

**තස්ස තස්ස ඣානස්ස උපචාර**න්ති නීවරණවිතක්කවිචාරනිකන්තියාදීනං වූපසමා ථිරභූතෝ කාමාවචරසමාධි. **තදනුධම්මතා**ති තදනුරූපතාභූතා, සා පන තදස්සාදසඞ්ඛාතා තදස්සාදසම්පයුත්තක්ඛන්ධසඞ්ඛාතා වා මිච්ඡාසතීති වදන්ති. අවිගතනිකන්තිකා තං තං පරිහරණසතීතිපි වත්තුං වට්ටතීති ඒවඤ්ච කත්වා **"සතියා වා නිකන්තියා වා"**ති විකප්පෝ කතෝ. **ආගමනවසේනාපි ච පටිපදා හොන්තියේවා**ති ඉදං කදාචි දුතියාදීනං පඨමාදිආගමනකතපටිපදාතං සන්ධාය වුත්තං. **අපි**–සද්දෝ හි අනේකන්තිකතං දීපේති, ඒතස්ස අනේකන්තිකත්තා ඒව ච පාළියං ඒකේකස්මිං ඣානේ චතස්සෝ පටිපදා චත්තාරි ආරම්මණානි සෝළසක්ඛත්තුකඤ්ච විසුං විසුං යෝජිතං. අඤ්ඤථා ඒකේකස්මිං පටිපදාදිම්හි නව නව ඣානානි යෝජේතබ්බානි සියුන්ති.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 176-180 යටතේ)]**

**තදනුරූපතා**ති තස්ස පඨමාදිජ්ඣානස්ස අනුරූපසභාවා. යථාලද්ධජ්ඣානං සන්තතෝ පණීතතෝ දිස්වා අස්සාදයමානා නිකන්ති තං සම්පයුත්තා ඛන්ධා වා

තදාරක්ඛභූතා සතියේව වා තස්ස ඣානස්ස අනුච්ඡවිකතාය "තදනුධම්මතා සතී"ති වුත්තාති. **කදාචී**ති යදා පඨමං අධිගන්ත්වා යථානිසින්නෝයේව විනා පයෝගන්තරං දුතියාදීනි අධිගච්ඡති, ඊදිසේ කාලේති අත්ථෝ.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 176-180 යටතේ)]**

**ඉදානි** දැන් **යස්මා** යම්හෙයකින් **ඒතං ඣානං නාම** මේ ධ්‍යානය නම් **පටිපදාක්කමේන** ප්‍රතිපදා ක්‍රමයෙන් **සිජ්ඣති** සිද්ධවෙයි **තස්මා** එහෙයින් **තස්ස** ඒ ධ්‍යානයාගේ **පටිපදාභේදං** ප්‍රතිපදා භේදය **දස්සේතුං** දැක්වීම පිණිස **පුන** නැවත **කතමේ ධම්මා කුසලා ඉති ආදි** කතමේ ධම්මා කුසලා යනාදිය **ආරද්ධං** අරබනලදි **තත්ථ (පටිපදාසු)** ඒ ප්‍රතිපදාවන් අතුරින් **දුක්ඛා පටිපදා අස්ස ඉති** දුක් ප්‍රතිපදාව මොහුටනුයි **දුක්ඛපටිපදං** දුක් ප්‍රතිපදාව නම් **දන්ධා අභිඤ්ඤා අස්ස ඉති** ලස් වූ අභිඥාව මොහුටනුයි **දන්ධාභිඤ්ඤං** ලස් වූ අභිඥාව නම් **ඉති** මෙසේ **දුක්ඛපටිපදං ඉති වා** දුක් ප්‍රතිපදාව යැයි හෝ **දන්ධාභිඤ්ඤං ඉති වා** ලස් වූ අභිඥාව යැයි හෝ **පඨවීකසිණං ඉති වා** පඨවි කසිණය යැයි හෝ **ඣානස්සේව** ධ්‍යානයටම **තීණිපි නාමානි** මේ නම් තුනෙකි **දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං ඉති ආදීසුපි** දුක් ප්‍රතිපදාව නොලස් අභිඥාව යනාදියෙහි ද **ඒසේව නයෝ** ක්‍රමය මෙයමයි.

**තත්ථ** එහි **පඨමසමන්නාහාරතෝ පට්ඨාය** පළමුව පරිකර්ම භාවනාව පටන්ගත් තැන් සිට **යාව** යම්තාක් **තස්ස තස්ස ඣානස්ස** ඒ ඒ ධ්‍යාන චිත්තයාගේ **උපචාරං උප්පජ්ජති** උපචාරය උපදී ද **තාව** ඒතාක් **පවත්තා** පැවති **ඣානභාවනා** ධ්‍යාන භාවනාව **පටිපදා ඉති වුච්චති** ප්‍රතිපදාව යැයි කියනු ලැබේ **උපචාරතෝ පන පට්ඨාය** උපචාරයේ පටන් **යාව අප්පනා** අර්පණාව යම්තාක් ද **තාව** ඒතාක් **පවත්තා පඤ්ඤා** පැවති ප්‍රඥා තුමූ **අභිඤ්ඤා ඉති වුච්චති** අභිඥාව යැයි කියනු ලැබේ **සා පන ඒසා පටිපදා** ඒ මේ ප්‍රතිපදාව වනාහි **ඒකච්චස්ස** ඇතැමෙකුට **දුක්ඛා හෝති** දුක් වෙයි **නීවරණාදිපච්චනීකධම්මසමුදාචාරග්ගහනතාය** නීවරණ ආදී විරුද්ධ ධර්මයන්ගේ හැසිරීම ග්‍රහණ බැවින් **කිච්ඡා** දුකය **අසුඛසේවනාති අත්ථෝ** සැප නොවූ සේවනය යන අර්ථයි **ඒකච්චස්ස** ඇතැමෙකුට **තං අභාවේන** ඒ නීවරණ ආදී විරුද්ධ ධර්මයන්ගේ අභාවයෙන් (**පටිපදා** ප්‍රතිපදාව) **සුඛා** සැපය **අභිඤ්ඤාපි** අභිඥාව ද **ඒකච්චස්ස** ඇතැමෙකුට **දන්ධා හෝති** ලස් වෙයි **මන්දා (හෝති)** මඳ  වූයේ වෙයි **අසීඝප්පවත්ති (හෝති)** ශීඝ්‍රව නොපවතින්නේ වෙයි **ඒකච්චස්ස** ඇතැමෙකුට **ඛිප්පා (හෝති)** වහා සිදුවෙයි **අමන්දා (හෝති)** මඳ වූයේ නොවෙයි **සීඝප්පවත්ති (හෝති)** ශීඝ්‍රව පැවතුනේ වෙයි **තස්මා** එහෙයින් **යෝ** යමෙක් **ආදිතෝ** මුල පටන් **කිලේසේ වික්ඛම්භෙන්තෝ** ක්ලේශයන් විෂ්කම්භනය කරමින් **සසඞ්ඛාරේන සප්පයෝගේන** සසංකාරිකව සප්‍රයෝගිකව **දුක්ඛේන** දුකසේ **කිලමන්තෝ** වෙහෙසෙමින් **වික්ඛම්භේති** ක්ලේශයන් විෂ්කම්භනය කරයි ද **තස්ස** ඔහුගේ (**පටිපදා** ප්‍රතිපදාව) **දුක්ඛා පටිපදා නාම හෝති** දුක්ඛා පටිපදා නම් වෙයි **යෝ පන** යමෙක් වනාහි **වික්ඛම්භිතකිලේසෝ** විෂ්කම්භනය කරනලද කෙලෙස් ඇත්තේ **අප්පනාපරිවාසං වසන්තෝ** අර්පණා පරිවාසය වසනුයේ **චිරේන** බොහෝ කලක් ගතකිරීමෙන් **අඞ්ගපාතුභාවං** ධ්‍යානාඞ්ගයන්ගේ පහළවීමට **පාපුනාති** පැමිණෙයි ද **තස්ස** ඔහුගේ (**අභිඤ්ඤා** අභිඥාව) **දන්ධාභිඤ්ඤා නාම හෝති** දන්ධාභිඤ්ඤා නම් වෙයි **යෝ** යමෙක් **ඛිප්පං** වහා **අඞ්ගපාතුභාවං** ධ්‍යානාඞ්ගයන්ගේ පහළවීමට **පාපුනාති** පැමිණෙයි ද **තස්ස** ඔහුගේ (**අභිඤ්ඤා** අභිඥාව) **ඛිප්පාභිඤ්ඤා නාම හෝති** ඛිප්පාභිඤ්ඤා නම් වෙයි **යෝ** යමෙක් **කිලේසේ වික්ඛම්භෙන්තෝ** ක්ලේශයන් විෂ්කම්භනය කරනුයේ **සුඛේන** සැපසේ **අකිලමන්තෝ** වෙහෙසක් නොමැතිව **වික්ඛම්භේති** ක්ලේශයන් විෂ්කම්භනය

කරයි ද **තස්ස** ඔහුගේ (**පටිපදා** ප්‍රතිපදාව) **සුඛා පටිපදා නාම හෝති** සුඛා පටිපදා නම් වෙයි.

**තත්ථ** එහි **යානි සප්පායාසප්පායානි ච** යම් සත්‍ප්‍රාය අසත්‍ප්‍රායෝ ද **පලිබෝධුපච්ඡේදාදීනි** පළිබෝධ සිඳීම් ආදී **පුබ්බකිච්චානි ච** පූර්ව කෘත්‍යයෝ ද **අප්පනාකෝසල්ලානි ච** අර්පණා කුසලතාවයෝ ද **විසුද්ධිමග්ගේ** විසුද්ධි මාර්ගයෙහි **චිත්තභාවනානිද්දේසේ** චිත්තභාවනා නිර්දේශයෙහි **නිද්දිට්ඨානි** දක්වනලදහ **තේසු** ඒ අතුරින් **යෝ** යමෙක් වනාහි **අසප්පායසේවී හෝති** අසත්ප්‍රාය සේවනය කරන්නේ වෙයි ද **තස්ස** ඔහුට **දුක්ඛා පටිපදා දන්ධා ච අභිඤ්ඤා හෝති** දුක් ප්‍රතිපදාව ද ලස් වූ අභිඥාව ද වෙයි **සප්පායසේවිනෝ** සත්ප්‍රාය සෙවුනහුට **සුඛා පටිපදා ඛිප්පා ච අභිඤ්ඤා (හෝති)** සැප ප්‍රතිපදාව ද නොලස් වූ අභිඥාව ද වෙයි **යෝ පන** යමෙක් වනාහි **පුබ්බභාගේ** පූර්ව භාගයෙහි **අසප්පායං සේවිත්වා** අසත්ප්‍රාය සේවනය කොට **අපරභාගේ** පසු කාලයෙහි **සප්පායසේවී හෝති** සත්ප්‍රාය සේවනය කරන්නෙක් වෙයි ද **වා** නොහොත් **පුබ්බභාගේ** පූර්ව භාගයෙහි **සප්පායං සේවිත්වා** සත්ප්‍රාය සේවනය කොට **අපරභාගේ** පසු කාලයෙහි **අසප්පායසේවී (හෝති)** අසත්ප්‍රාය සේවනය කරන්නෙක් වෙයි **තස්ස** ඔහුගේ **වෝමිස්සකතා** මිශ්‍ර බව **වේදිතබ්බා** දතයුතුයි **තථා** එසේම **පලිබෝධුපච්ඡේදාදිකං පුබ්බකිච්චං** පළිබෝධ සිඳීම් ආදී පූර්ව කෘත්‍යය **අසම්පාදෙත්වා** සම්පාදනය නොකොට **භාවනං අනුයුත්තස්ස** භාවනාවෙහි යෙදුනහුට **දුක්ඛා පටිපදා හෝති** දුක් ප්‍රතිපදාව වෙයි **විපරියායේන** විපර්‍යාස වශයෙන් **සුඛා (පටිපදා හෝති)** සැප ප්‍රතිපදාව වෙයි **පන (තථාපි)** එසේම **අප්පනාකෝසල්ලානි** අර්පණා කෞශල්‍යය **අසම්පාදෙන්තස්ස** සම්පාදනය නොකරන්නා හට **දන්ධා අභිඤ්ඤා හෝති** ලස් වූ අභිඥාව වෙයි **සම්පාදෙන්තස්ස** සම්පාදනය කරන්නා හට **ඛිප්පා (අභිඤ්ඤා හෝති)** නොලස් වූ අභිඥාව වෙයි.

**අපි ච** තව ද **තණ්හාඅවිජ්ජාවසේන ච** තෘෂ්ණා අවිද්‍යා වශයෙන් ද **සමථවිපස්සනාකතාධිකාරවසේන චාපි** සමථ විදර්ශනා කෘත්‍යාධිකාර නොහොත් කළ පුරුදු වශයෙන් දැයි **ඒතාසං** ප්‍රතිපදාදීන්ගේ **පභේදෝ** ප්‍රභේය **වේදිතබ්බෝ** දතයුතුයි **හි** විස්තර කෙරෙමි **තණ්හාභිභූතස්ස** තෘෂ්ණාවෙන් මඩනා ලද්දහුට **දුක්ඛා පටිපදා හෝති** දුක් ප්‍රතිපදාව වෙයි **අනභිභූතස්ස** තෘෂ්ණාවෙන් නොමඩනා ලද්දහුට **සුඛා (පටිපදා හෝති)** සැප ප්‍රතිපදාව වෙයි **ච (තථාපි)** එසේම **අවිජ්ජාභිභූතස්ස** අවිද්‍යාවෙන් මඩනා ලද්දහුට **දන්ධා අභිඤ්ඤා (හෝති)** ලස් වූ අභිඥාව වෙයි **අනභිභූතස්ස** අවිද්‍යාවෙන් නොමඩනා ලද්දහුට **ඛිප්පා (අභිඤ්ඤා හෝති)** නොලස් වූ අභිඥාව වෙයි **ච (තථාපි)** එසේම **යෝ** යමෙක් වනාහි **සමථේ** සමථ භාවනාවෙහි **අකතාධිකාරෝ** කළ පුරුදු නැත්තෙක් වේ ද **තස්ස** ඔහුට **දුක්ඛා පටිපදා හෝති** දුක් ප්‍රතිපදාව වෙයි **කතාධිකාරස්ස** කළ පුරුද්ද ඇත්තහුට **සුඛා (පටිපදා හෝති)** සැප ප්‍රතිපදාව වෙයි **යෝ පන** යමෙක් වනාහි **විපස්සනාය** විදර්ශනාවෙහි **අකතාධිකාරෝ හෝති** කළ පුරුදු නැත්තෙක් වෙයි ද **තස්ස** ඔහුට **දන්ධා අභිඤ්ඤා හෝති** ලස් වූ අභිඥාව වෙයි **කතාධිකාරස්ස** කළ පුරුද්ද ඇත්තහුට **ඛිප්පා (අභිඤ්ඤා හෝති)** නොලස් වූ අභිඥාව වෙයි.

**අපි (අපරෝ නයෝ)** වෙනත් ක්‍රමයක් **කිලේසින්ද්‍රියවසේන ච** ක්ලේශයන්ගේ හා ඉන්ද්‍රියයන්ගේ වශයෙන් ද **ඒතාසං** ප්‍රතිපදාදීන්ගේ **පභේදෝ** ප්‍රභේදය **වේදිතබ්බෝ** දතයුතුයි **හි** විස්තර කෙරෙමි **තිබ්බකිලේසස්ස** තියුණු කෙලෙස් ඇති **මුදින්ද්‍රියස්ස** මෘදු ඉන්ද්‍රිය ඇත්තහුට **දුක්ඛා පටිපදා ච** දුක් ප්‍රතිපදාව ද **දන්ධා අභිඤ්ඤා ච හෝති** ලස්

වූ අභිඥාව ද වෙයි **පන** ඊට විපරීත වශයෙන් (**තිබ්බකිලේසස්ස** තියුණු කෙලෙස් ඇති) **තික්ඛින්ද්‍රියස්ස** තීක්‍ෂණ ඉන්ද්‍රිය ඇත්තහුට (**දුක්ඛා පටිපදා ච** දුක් ප්‍රතිපදාව ද) **ඛිප්පා අභිඤ්ඤා (ච හෝති)** නොලස් වූ අභිඥාව ද වෙයි **මන්දකිලේසස්ස** අල්ප වූ කෙලෙස් ඇති **මුදින්ද්‍රියස්ස** මෘදු ඉන්ද්‍රිය ඇත්තහුට **සුඛා පටිපදා ච** සැප ප්‍රතිපදාව ද **දන්ධා අභිඤ්ඤා ච හෝති** ලස් වූ අභිඥාව ද වෙයි **පන** ඊට විපරීත වශයෙන් (**මන්දකිලේසස්ස** අල්ප වූ කෙලෙස් ඇති) **තික්ඛින්ද්‍රියස්ස** තීක්‍ෂණ ඉන්ද්‍රිය ඇත්තහුට (**සුඛා පටිපදා ච** සැප ප්‍රතිපදාව ද) **ඛිප්පා අභිඤ්ඤා (ච හෝති)** නොලස් වූ අභිඥාව ද වෙයි.

**ඉති** මෙසේ **ඉමාසු පටිපදාභිඤ්ඤාසු** මේ ප්‍රතිපදා අභිඥාවන්හි **යෝ පුග්ගලෝ** යම් පුද්ගලයෙක් තෙමේ **දුක්ඛාය පටිපදාය** දුක් ප්‍රතිපදාවෙන් ද **දන්ධාය අභිඤ්ඤාය** ලස් වූ අභිඥාවෙන් ද **ඣානං පාපුණාති** ධ්‍යානයට පැමිණෙයි ද **තස්ස** ඔහුගේ **තං ඣානං** ඒ ධ්‍යානයට **දුක්ඛපටිපදං** දුක් ප්‍රතිපදා **දන්ධාභිඤ්ඤං ඉති** ලස් වූ අභිඥාව යැයි **වුච්චති** කියනු ලැබේ **සේසේසුපි** සෙස්සෙහි ද **ඒසේව නයෝ** මේ ක්‍රමයමයි.

**තත්ථ** එහි ද තදනුධම්මතා සති සන්තිට්ඨති ඨිතිභාගානී පඤ්ඤා **ඉති** යැයි විභඞ්ග පාලියෙහි **ඒවං** මෙසේ **වුත්තසතියා වා** දේශනා කරනලද සතිය හෝ **තං තං ඣානනිකන්තියා වා වික්ඛම්භනේ** ඒ ඒ ධ්‍යානයට වූ තෘෂ්ණාව විෂ්කම්භනය කළ කල්හි **පටිපදා ච** ප්‍රතිපදාව ද **තං තං ඣානුපචාරප්පත්තස්ස** ඒ ඒ ධ්‍යාන උපචාරයට පැමිණියහුට **අප්පනාය පරිවාසේ** අර්පණා පරිවාසයෙහි **අභිඤ්ඤා ච වේදිතබ්බා** අභිඥාව ද දතයුතුයි **ආගමනවසේනාපි** ද්විතියධ්‍යානාදියට පැමිණීම් වශයෙන් ද **පටිපදා ච** ප්‍රතිපදාව ද **අභිඤ්ඤා ච** අභිඥාව ද **හොන්තියේව** වෙත්මය **හි (සච්චං)** ඒ කීම සැබෑවකි **දුක්ඛපටිපදං** දුක් ප්‍රතිපදාව ද **දන්ධා අභිඤ්ඤං** ලස් වූ අභිඥාව ද ඇති **පඨමජ්ඣානං පත්වා පවත්තං** ප්‍රථම ධ්‍යානයට පැමිණ පැවතියේ යම්සේ ද **දුතියම්පි** ද්විතියධ්‍යානය ද **තාදිසමේව හෝති** එබඳුම වෙයි **තතියචතුත්ථේසුපි** තෘතීය චතුර්ථ ධ්‍යානයන්හි ද **ඒසේව නයෝ** මේ ක්‍රමයමයි **චතුක්කනයේ යථා ච** චතුෂ්ක නයෙහි යම්සේද **ඒවං** මෙසේ **පඤ්චකනයේපි** පඤ්චක නයෙහි ද **පටිපදාවසේන** ප්‍රතිපදාවන්ගේ වශයෙන් **චතුධා භේදෝ** සිව්වැදෑරුම් භේදය **වේදිතබ්බෝ** දතයුතුයි **ඉති** මෙසේ **පටිපදාවසේනපි** ප්‍රතිපදා වශයෙන් ද **චත්තාරෝ නවකා** නවක සතරක් **වුත්තා හොන්ති** දේශනා කරන ලද්දේ වෙත් **තේසු** එහි **පාඨතෝ** පාඨ වශයෙන් **ඡත්තිංස චිත්තානි** චිත්තයෝ සතිසක් වෙත් **අත්ථතෝ පන** අර්ථ වශයෙන් වනාහි **පඤ්චකනයේ** පඤ්චක නයෙහි **චතුක්කනයස්ස පවිට්ඨත්තා** චතුෂ්ක නය ඇතුලත් බැවින් **වීසතිමේව භවන්ති** විස්සක්ම වෙති. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තනයි]**

**පටිපදාදිභේදතෝ**ති දුක්ඛපටිපදාදන්ධාභිඤ්ඤාදීනං පටිපදාභිඤ්ඤානං භේදේන. පටිපදාවචනේනේව වා තදවිනාභාවතෝ අභිඤ්ඤාපි ලබ්භති. තථා හෙත්ථ පටිපදාචතුක්කන්ති වෝහරන්තීති **ආදි**-සද්දේන අධිපතිආදීනං සඞ්ගහෝ දට්ඨබ්බෝ, තස්මා **පටිපදාදිභේදතෝ**ති පටිපදාභේදතෝ, අධිපතිභේදතෝ, ආරම්මණභේදතෝ, හානභාගියාදිභේදතෝති අත්ථෝ. තත්ථ පටිපදාභේදතෝ තාව දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං, දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං, සුඛපටිපදං දන්ධාභිඤ්ඤං, සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤන්ති ඒවං චතුබ්බිධං හෝති. තත්ථ දුක්ඛා පටිපදා අස්සාති **දුක්ඛපටිපදං**. දන්ධා අභිඤ්ඤා අස්සාති **දන්ධාභිඤ්ඤං**. ඒස නයෝ **"දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤ"**න්තිආදීසුපි.

තත්ථ අප්පහීනනීවරණස්ස, අවික්ඛම්භිතඣානනිකන්තිකස්ස ච ඤාණකිච්චස්ස අපරිබ්‍යත්තතාය පරිනිට්ඨිතසකලපුබ්බකිච්චස්ස "පථවී පථවී"ති වා "ආපෝ ආපෝ"ති වා ඒවං පවත්තපඨමසමන්නාහාරතෝ පට්ඨාය යාව තස්ස තස්ස ඣානස්ස උපචාරුප්පත්තියා නීවරණප්පහානං, නිකන්තිවික්ඛම්භනඤ්ච හෝති, තාව පවත්තා පුබ්බභාගභාවනා **පටිපදා** නාම "පටිපජ්ජති ඣානං ඒතායා"ති කත්වා. පහීනනීවරණස්ස, පන වික්ඛම්භිතඣානනිකන්තිකස්ස ච ඤාණකිච්චස්ස පරිබ්‍යත්තභාවතෝ උපචාරජ්ඣානං ආදිං කත්වා යාව අප්පනාය උප්පත්ති, තාව පවත්තා පඤ්ඤා පුබ්බභාගපඤ්ඤාය විසිට්ඨභාවතෝ **අභිඤ්ඤා** නාම, තස්මා යෝ ආදිතෝ කිලේසේ ඣානනිකන්තිඤ්ච වික්ඛම්භෙන්තෝ දුක්ඛේන සසඞ්ඛාරේන සප්පයෝගේන කිලමන්තෝ වික්ඛම්භේති, වික්ඛම්භිතකිලේසඣානනිකන්ති ච අප්පනාපරිවාසං වසන්තෝ චිරේන අධිගපාතුභාවං පාපුණාති, තස්ස දුක්ඛපටිපදං, දන්ධාභිඤ්ඤඤ්ච ඣානං හෝති. යෝ පන සසඞ්ඛාරේන කිලේසාදිකේ වික්ඛම්භෙත්වා න චිරේන අධිගපාතුභාවං පාපුණාති, තස්ස දුක්ඛපටිපදං, ඛිප්පාභිඤ්ඤඤ්ච. යෝ කිලේසාදිකේ වික්ඛම්භෙන්තෝ සුඛේන අකිලමන්තෝ වික්ඛම්භේති, අප්පනාපරිවාසං පන චිරායති, තස්ස සුඛපටිපදං, දන්ධාභිඤ්ඤං. යෝ පන සුඛේනේව කිලේසාදිකේ වික්ඛම්භෙත්වා සීඝමේව අප්පනං පාපුණාති, තස්ස සුඛපටිපදං, ඛිප්පාභිඤ්ඤන්ති වේදිතබ්බං.

සෝ පනායං පටිපදාභිඤ්ඤානං භේදෝ කිලේසින්ද්‍රියාධිකාරවසේන වේදිතබ්බෝ. යස්ස හි රාගාදයෝ කිලේසා තිබ්බා හොන්ති, සද්ධාපඤ්චමකානි ච ඉන්ද්‍රියානි මුදූනි. යෝ ච සමථවිපස්සනාසු අකතාධිකාරෝ, තස්ස පවත්තඣානං දුක්ඛපටිපදං, දන්ධාභිඤ්ඤඤ්ච හෝති. තස්ස හි කිලේසසමුදාචාරතිබ්බතාය නීවරණවික්ඛම්භනස්ස කිච්ඡේන කසිරේන සම්පජ්ජනතෝ පටිපදා දුක්ඛා අසුඛා, තස්සේව සද්ධාදීනං ඉන්ද්‍රියානං මුදුතාය අභිඤ්ඤාපි දන්ධා මන්දා අසීඝප්පවත්තිනී හෝති. භවන්තරේ වා සමථේ අකතාධිකාරත්තා පටිපදා දුක්ඛා, විපස්සනාය අකතාධිකාරත්තා අභිඤ්ඤාපි දන්ධා. යෝ පන වුත්තවිපරීතෝ හෝති, තස්ස කිලේසානං අතිබ්බසමුදාචාරතාය, ඉන්ද්‍රියානඤ්ච තික්ඛණතාය සමථවිපස්සනාසු කතාධිකාරතාය යථාක්කමං සුඛපටිපදා, ඛිප්පාභිඤ්ඤා ච හෝති. භවන්තරේ කතපරිචයස්ස හි යථා පගුණං කත්වා විස්සට්ඨගන්ථෝ අප්පමත්තකේන පයෝගේන සුප්පවත්ති වාචුග්ගතෝ ච හෝති, ඒවං භාවනා අප්පකසිරේනේව ඉජ්ඣතීති. ස්වායං අකතෝ, කතෝ ච අධිකාරෝ සමථනිස්සිතෝ පටිපදායං වුත්තෝ සමාධිප්පධානත්තා පටිපදාය. විපස්සනානිස්සිතෝ අභිඤ්ඤාය ඤාණප්පධානත්තා අප්පනායාති දට්ඨබ්බං.

යෝ පන තිබ්බකිලේසෝ තික්ඛින්ද්‍රියෝ විපස්සනායමේව වා කතාධිකාරෝ හෝති, තස්ස වුත්තනයේන දුක්ඛා පටිපදා, ඛිප්පා පන අභිඤ්ඤා හෝති, තබ්බිපරීතස්ස සුඛපටිපදා දන්ධාභිඤ්ඤාති. තස්මා කිලේසානං තිබ්බමන්දභාවතෝ, ඉන්ද්‍රියානං තිඛිණමුදුභාවතෝ, පුබ්බපරිචයස්ස ච සම්භවාසම්භවවසේනාති ඒවං කිලේසින්ද්‍රියාධිකාරවසේන ඉමාසං භේදෝ වේදිතබ්බෝ.

අපිච යානි පරතෝ සප්පායාසප්පායානි, පලිබෝධුපච්ඡේදාදීනි පුබ්බකිච්චානි, අප්පනාකෝසල්ලානි ච ආගමිස්සන්ති, තේසු යෝ උපචාරාධිගමතෝ පුබ්බේ, පච්ඡා ච අසප්පායසේවී හෝති, තස්ස දුක්ඛා පටිපදා, දන්ධා ච අභිඤ්ඤා හෝති. උභයත්ථ සප්පායසේවිනෝ සුඛා පටිපදා, ඛිප්පා ච අභිඤ්ඤා. යෝ පන තතෝ පුබ්බභාගේ

අසප්පායං සේවිත්වා අපරභාගේ සප්පායසේවී හෝති, තස්ස දුක්ඛා පටිපදා, ඛිප්පා අභිඤ්ඤා. තබ්බිපරීතස්ස සුඛා පටිපදා, දන්ධා අභිඤ්ඤා ච වේදිතබ්බා.

තථා පලිබෝධුපච්ඡේදාදිපුබ්බකිච්චං අසම්පාදෙත්වා භාවනමනුයුඤ්ජන්තස්ස සපරිපන්ථතාය දුක්ඛා පටිපදා, විපරියායේන අපරිපන්ථතාය සුඛා. අප්පනාකෝසල්ලානි අසම්පාදෙන්තස්ස ඤාණස්ස අවිසදතාය දන්ධා අභිඤ්ඤා හෝති, සම්පාදෙන්තස්ස විපරියායතෝ ඛිප්පා අභිඤ්ඤාති. කිඤ්ච; තණ්හාවිජ්ජාභිභවනවසේන ඒතාසං භේදෝ වේදිතබ්බෝ. තණ්හාභිභූතස්ස හි දුක්ඛා පටිපදා හෝති තස්සා සමාධිස්ස උජුපටිපක්ඛත්තා සමථපටිපදාය පරිපන්ථකභාවතෝ, අනභිභූතස්ස තදභාවතෝ සුඛා. අවිජ්ජාභිභූතස්ස ච තස්සා පඤ්ඤාය උජුපටිපක්ඛභාවතෝ දන්ධා අභිඤ්ඤා, ඉතරස්ස ඛිප්පා අභිඤ්ඤාති. සෝ පනායං පටිපදාභේදෝ කේවලං සමථභාවනාවසේන පටිලද්ධජ්ඣානස්ස, මග්ගාධිගමවසේන පටිලද්ධජ්ඣානස්ස පන නත්ථි දුක්ඛපටිපදාදිභේදෝ. කේචි පන මග්ගවසේනේව තස්ස පටිපදාදිභේදං වණ්ණෙන්ති "මග්ගස්ස හි දුක්ඛපටිපදාදිභාවේ තස්මිං දුක්ඛපටිපදාදික"න්ති.

අධිපතිභේදාදීසු පන ඡන්දාධිපතෙය්‍යං චිත්තාධිපතෙය්‍යං වීරියාධිපතෙය්‍යං වීමංසාධිපතෙය්‍යන්ති ඒවං අධිපතිභේදතෝ, පරිත්තං පරිත්තාරම්මණං, පරිත්තං අප්පමාණාරම්මණං, අප්පමාණං පරිත්තාරම්මණං, අප්පමාණං අප්පමාණාරම්මණන්ති ඒවං ආරම්මණභේදතෝ, හානභාගියං ඨිතිභාගියං විසේසභාගියං නිබ්බේධභාගියන්ති ඒවං හානභාගියාදිභේදතෝ ච චතුබ්බිධතා වේදිතබ්බා. තත්ථ "ඡන්දවතෝ චේ ඣානං නිබ්බත්තිස්සති, මය්හම්පි නිබ්බත්තිස්සතී"ති ඒවං ඡන්දං ධුරං කත්වා උප්පන්නං **ඡන්දාධිපතෙය්‍යං**. ඒස නයෝ **"චිත්තාධිපතෙය්‍යා"**දීසුපි. අප්පගුණං පන උපරිඣානස්ස පච්චයෝ භවිතුං අසක්කොන්තං **පරිත්තං,** සුප්පසරාවමත්තේසු අවඩ්ඪිතාරම්මණේසු නිබ්බත්තං **පරිත්තාරම්මණං**. වුත්තපටිපක්ඛතෝ පන යථාක්කමං **අප්පමාණාරම්මණා**දීනි වේදිතබ්බානි. හානභාගියාදිවිසේසං සයමේව වක්ඛති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 27 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 96-100 පිටු]**

ප්‍රතිපදාදිභේද හෙයින් යනු "දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා" යනාදිවූ ප්‍රතිපදාවන්ගේ භේදහෙයින් යන අර්ථයි. "පටිපදා" යන වචනයෙන්ම ඒ අභිඥාව වෙන්නොවන හෙයින් අභිඥාවද ලැබියයුතු වෙයි. එහෙයින්ම මෙහි ප්‍රතිපදා චතුස්කයයි ව්‍යවහාර කෙරෙත්. මෙහි ආදි ශබ්දයෙන් අධිපති ආදීන්ගෙන් සඞ්ග්‍රහය දතයුත්තේයි. එහෙයින් "පටිපදාදිභේදතෝ" යන මෙහි ප්‍රතිපදාභේද හෙයින් අධිපතිභේද හෙයින් ආරම්මණභේද හෙයින් හානභාගියාදිභේද හෙයින් යන අර්ථය වේ. ඔවුන් අතුරෙහි පළමුකොට ප්‍රතිපදාභේද හෙයින් "දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං දුක්ඛා පටිපදං ඛිප්පාභිඤ්ඤං සුඛා පටිපදං දන්ධාභිඤ්ඤං සුඛා පටිපදං ඛිප්පාභිඤ්ඤං" යි මෙසේ සිව්වැදෑරුම් වෙයි. එහි "දුක්ඛාපටිපදා අස්සාති දුක්ඛාපටිපදං-දන්ධාභිඤ්ඤා අස්සාති දන්ධාභිඤ්ඤං" යනුවෙන් විග්‍රහ කටයුතුයි. "දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤං" යනාදී පදයන්හිද මෙම නයයි. එහි "පටිපජ්ජති ඒතායාති පටිපදා" යනු නිර්වචන බැවින් අප්‍රහීන නීවර්ණ ඇත්තාවූ ධ්‍යාන නිකාන්තිය විස්කම්භනය නොකළාවූ ඥාණකෘත්‍යය අප්‍රකට බැවින් නිමවනලද සියළු පූර්ව කෘත්‍යය ඇත්තාවූ හෙවත් සීලවිසුද්ධිය සම්පූර්ණ කළාවූ යෝගාවචරයාගේ "පඨවි පඨවී" කියා හෝ "ආපෝ ආපෝ" කියා හෝ මෙසේ පටන්ගන්නාලද පළමුවන

පරිකර්ම භාවනාව පටන්ගත් තැන්සිට යම්තාක් ඒ ඒ ධ්‍යානයාගේ උපචාර ධ්‍යානය ඉපදීමෙන් නීවර්ණයන්ගේ ප්‍රහාණය මදින් මද වේද නිකන්ති විස්කම්භය වේද ඒතාක් උපදනා පූර්වභාග භාවනා තොමෝ ප්‍රතිපදනම් වෙයි. ප්‍රහීණ කරනලද නීවර්ණයන් ඇත්තාවූ විස්කම්භය කරනලද ධ්‍යානනිකාන්තිය ඇත්තාවූ යෝගාවචරයාගේ ඍදණකෘත්‍යය ප්‍රකට බැවින් උපචාරධ්‍යානය ආදී කොට යම්තාක් අර්පණා ධ්‍යානයාගේ ඉපදීම වේද ඒතාක් උපන් ප්‍රඥතොමෝ පූර්වභාග ප්‍රඥවට විශිෂ්ට හෙයින් අභිඥ නම් වෙයි. එහෙයින් යම් යෝගාවචර පුද්ගලයෙක් තෙමේ පළමුකොටම කෙලෙසුන් හා ධ්‍යානනිකාන්තියද විස්කම්භනය කරමින් උත්සාහ වැඩීමෙන් දුකසේ ක්ලේශ විෂ්කම්භනය කෙරේද එසේ විස්කම්භනය කරනලද කෙලෙසුන් හා ධ්‍යානනිකාන්තිය ඇති යෝගාවචර තෙමේ අර්පණා පරිවාසය වසමින් බොහෝ කාලයක්හුගේ ඇවෑමෙන් ධ්‍යානාඞ්ගයන්ගේ පහලවීමට පැමිණේද ඒ යෝගාවචරයාහට උපදනාධ්‍යානය වනාහි දුක්ඛාපටිපද  දන්ධාභිඤ්ඤ ධ්‍යානය වෙයි. යම් යෝගාවචරයෙක් තෙමේ එසේම දුකසේ ක්ලේශ විස්කම්භනාදිය කොට නොබෝකලකින්ම ධ්‍යානාඞ්ගයන්ගේ පහලවීමට පැමිණේද හෙවත් අර්පණා ධ්‍යානචිත්තය උපදවන්නේ වේද ඔහුගේ ධ්‍යානය දුක්ඛාපටිපද ඛිප්පාභිඤ්ඤ ධ්‍යානය නම් වෙයි. යම් යෝගාවචරයෙක් තෙමේ ක්ලේශ විෂ්කම්භනාදිය කරුණු පිණිස නොවෙහෙසී සුවසේ විස්කම්භනය කෙරේද අර්පණාධ්‍යානය ඉපදවීම ප්‍රමාද වේද ඔහුගේ ධ්‍යානය සුඛාපටිපද දන්ධාභිඤ්ඤ ධ්‍යානය නම් වේ. යම් යෝගාවචරයෙක් තෙමේ සුවසේ ක්ලේශාදිය විෂ්කම්භනය කොට වහාම අර්පණා ධ්‍යානයට පැමිණේද ඔහුගේ ධ්‍යානය සුඛාපටිපද ඛිප්පාභිඤ්ඤ ධ්‍යානය නම් වේ යයි දතයුතුයි. ඒ ප්‍රතිපදභිඥවන්ගේ භේදය වනාහි රාගාදී කෙලෙසුන්ගේ හා ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේද අධිකාරවශයෙන් දතයුත්තේයි. ඒ එසේමැයි; යම් යෝගාවචරයෙක්හුගේ රාගාදී ක්ලේශයෝ තියුණු වෙද්ද ශ්‍රද්ධාපඤ්චමක ඉන්ද්‍රියධර්මයෝ මෘදු වෙද්ද එසේ නොවී නම් යමෙක් තෙමේ අතීතසංසාරයෙහි සමථවිදර්ශනා භාවනාවන්හි කළ පුරුද්ද නැත්තේ වේද ඔහට උපදනා ධ්‍යානය දුක්ඛාපටිපද දන්ධාභිඤ්ඤ නම් වෙයි. ඔහට වනාහි ක්ලේශයන්ගේ පැවැත්ම අතිශයින් තියුණු බැවින් නීවර්ණයන්ගේ විෂ්කම්භන ප්‍රහාණය දුකසේ සමෘද්ධ කටයුතු හෙයින් ප්‍රතිපදව දුක්ම වන්නීය. ඔහුගේ ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්මයන් මෘදු බැවින් අභිඥවද ලස්වන්නීය; හෙවත් සීඝ්‍රව නොහටගන්නීය. නොහොත් භවාන්තරයෙහි සමථ භාවනායෙහි කළපුරුදු නැතිහෙයින් ප්‍රතිපදව දුක් වන්නීය. විදර්ශනා භාවනායෙහි කළපුරුද්ද නැති හෙයින් අභිඥවද ලස්වන්නීය. යම් යෝගාවචරයෙක් තෙමේ ඒ කියනලද ක්‍රමයන්ට විපරීතවූයේ නම් ඔහුගේ ක්ලේශයන් තියුණුව පැවත්මක් නැතිහෙයින්ද ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් තියුණු බැවින්ද එසේම භවාන්තරයෙහි සමථවිදර්ශනා භාවනාවන්හි කළපුරුද්ද ඇති හෙයින්ද යථාක්‍රමයෙන් සුඛාපටිපද ඛිප්පාභිඤ්ඤ ධ්‍යානය ලැබෙයි.  ඊට උපමා කවර යත්? යම්සේ අතිශයින් දුෂ්කරවූ ග්‍රන්ථයක් ප්‍රගුණ වාචොද්ගතකොට තැන්පත්කරතබා අන්කිසි කටයුත්තක ව්‍යාවෘතවූ පුද්ගලයාහට නැවතත් ඒ පළමු පුහුණුකළ ග්‍රන්ථය පාඩම් පිරිසිදුකර ගැනීමට උවමනා වීනම් ඉතා ස්වල්ප පරිශ්‍රමයකින් ඒ ග්‍රන්ථය පාඩම් කී හැකිවේද එපරිද්දෙන්ම භාවනාව ස්වල්ප පරිශ්‍රමයකින්ම සමෘද්ධ වෙයි; හෙවත් භවාන්තරයෙහි සමථභාවනාව කළ පුරුද්ද මේ ආත්මයෙහි සුඛාපටිපදවටද භවාන්තරයෙහි විදර්ශනා භාවනාවෙහි කළ පුරුද්ද මේ ආත්මයෙහි ඛිප්පාභිඤ්ඤවටද යථා ක්‍රමයෙන් උපනිශ්‍රය වෙත් මැයි. ඒ ආවාවූ සමථ නිශ්‍රිත කෘතාධිකාරය තෙමේ ප්‍රතිපදව සඳහා කියන ලද්දේය. කුමක්හෙයින යත්? ප්‍රතිපදවට සමාධිය ප්‍රධාන හෙයිනි. විදර්ශනා නිශ්‍රිත කෘතාධිකාරය තෙමේ අභිඥව සඳහා කියන ලද්දේය. කුමක්හෙයින යත්? අර්පණාවට ඍදණය ප්‍රධාන හෙයිනැයි දතයුතුයි. යම් යෝගාවචරයෙක් තෙමේ තීව්‍රවූ කෙලෙස් ඇත්තේ වේද තියුණු ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇත්තේ වේද

විදර්ශනාවෙහිම කළ පුරුද්ද ඇත්තේ හෝ වේද ඒ යෝගාවචරයාහට යට කියනලද ක්‍රමයෙන් දුක්ඛාපටිපද ඛිප්පාභිඤ්ඤ ධ්‍යානය වෙයි. එහෙයින් විපර්යාසවූවාහට සුඛාපටිපද දන්ධාභිඤ්ඤ ධ්‍යානය වෙයි. එහෙයින් කෙලෙසුන්ගේ තීව්‍ර-මන්දභාවයෙන්ද ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ තියුණු මෘදු භාවයෙන්ද පූර්වජාති පරිචය ඇති නැති බැවින් දැයි මෙසේ කිලේසින්ද්‍රිය අධිකාර වශයෙන් මේ ප්‍රතිපද භිඥවන්ගේ ප්‍රභේදය දතයුත්තේයි. වැලිදු යම් සැප නොසැප සෙනසුන් ආදියද පළිබෝධයන්ගේ සිඳීම් ආදියද භාවනාවිධානයාගේ නොපිරිහීම් ආදීවූ පූර්වකෘත්‍යයන්ද අර්පණා කෞශල්‍යයන්ද මතු පහලවන්නාහු වෙද්ද ඔවුන් අතුරෙන් යම් යෝගාවචරයෙක් තෙමේ උපචාර සමාධිය ලැබීමට පූර්වභාග පශ්චාද් භාගයෙහි අසත්ප්‍රාය ආවාසාදිය සේවනය කෙරේද ඕහට දුක්වූ ප්‍රතිපත්තිය වන්නීය. ලස්වූ අභිඥද වන්නීය. එසේම පූර්වභාග පශ්චාද්භාග දෙක්හි සත්ප්‍රාය සේනාසනාදිය සේවනය කරන්නාහට සුඛාපටිපද ඛිප්පාභිඤ්ඤ ධ්‍යානය වෙයි. යම් යෝගාවචරයෙක් තෙමේ වනාහී ඉන් පූර්වභාගයෙහි අසත්ප්‍රාය සෙනසුන් ආදිය සේවනය කොට මෑත භාගයෙහි සත්ප්‍රාය සේනාසනාදිය සෙවිනේ වේද ඕහට දුක්ඛාපටිපද ඛිප්පාභිඤ්ඤ ධ්‍යානය වෙයි. තද්විපරීත යෝගාවචරයාහට සුඛාපටිපද දන්ධාභිඤ්ඤ ධ්‍යානය වේයයි දතයුත්තේයි. තවද පළිබෝධසිඳීම් ආදී පූර්වකෘත්‍ය නොසපයා භාවනාවෙහි යෙදුනහට සතුරන් ඇති බැවින් දුකවූ ප්‍රතිපත්ති වන්නීය. ඊට විපරීත වශයෙන් පළිබෝධ සිඳීම් ආදී පූර්වකෘත්‍ය සපයා භාවනාවේ යෙදෙන්නාහට සතුරන් නැතිබැවින් සුවවූ පතිපත්ති වන්නීය. එසේම දසවිධ අර්පණා කෞශල්‍යයන් සම්පාදනය නොකළාවූ යෝගාවචරයාහට ඤාණය අපිරිසිදු බැවින් අභිඥව ලස්වන්නීය. ඒ දසවිධ අර්පණා කෞශල්‍යයන් සපයන්නාහට නුවණ පිරිසිදුවූ බැවින් ක්ෂිප්‍රවූ හෙවත් තියුණුවූ අභිඥව වන්නීය. තවද තෘෂ්ණා අවිද්‍යා දෙදෙනාගේ මැඩපැවැත්වීම් වශයෙන් මොවුන්ගේ භේදය දතයුත්තේයි. ඒ එසේමැයි; තෘෂ්ණාධිකයහට හෙවත් තෘෂ්ණාවෙන් මැඩපැවැත්වූ සිත් ඇත්තාහට ප්‍රතිපදව දුක්වන්නීය. කුමක්හෙයින යත්? තෘෂ්ණාව සමාධියට ඉඳුරා විරුද්ධ හෙයින්ද සමථ ප්‍රතිපදවට සතුරු හෙයින්ද ප්‍රතිපදවද දුක්වන්නීය. තෘෂ්ණාවෙන් මැඩනොපැවැත්වූ යෝගාවචරයාහට ප්‍රතිපදව සැප වන්නීය. එසේම අවිද්‍යාවෙන් මැඩපැවැත්තාවූ සිත් ඇත්තාහට අභිඥව ලස්වන්නීය. කුමක්හෙයින යත්? අවිද්‍යාව ප්‍රඥවට ඉඳුරා ප්‍රතිපක්ෂ හෙයිනි. අවිද්‍යාවෙන් මැඩනොපැවැත්වූ යෝගාවචරයාහට අභිඥව තියුණුවන්නීය. මේ ප්‍රතිපද භේදය වනාහි හුදු සමථභාවනාවගේ වශයෙන් ලබන ලද්දවූ ධ්‍යානයටමුත් මාර්ගාධිගමවශයෙන් ලබනලද ධ්‍යානයට දුක්ඛාපටිපදදී භේදය නොලැබෙන්නේයයි දතයුතුයි. ඇතැම් ආචාර්යවරයෝ වනාහි මර්ග වශයෙන් ඒ ධ්‍යානයාගේ ප්‍රතිපදදීභේදය වර්ණනා කෙරෙත්. කුමක්හෙයින යත්? මාර්ගයාගේ දුක්ඛාපටිපදදී භේදය ඇතිකල්හි ඒ ධ්‍යානයෙහිද දුක්ඛාපටිපදදී භාවය වන හෙයිනැයි කියත්෴

අධිපති භේදදීන් අතුරෙන් ඡන්දධිපතිය චිත්තාධිපතිය විරියාධිපතිය වීමංසාධිපතියයි මෙසේ අධිපතිභේද හෙයින් සිව්වැදෑරුම්වේ. පරිත්ත පරිත්තාරම්මණධ්‍යානය පරිත්ත අප්පමාණාරම්මණධ්‍යානය අප්පමාණ පරිත්තාරම්මණධ්‍යානය අප්පමාණ අප්පමාණාරම්මණධ්‍යානයයි මෙසේ ආරම්මණභේද හෙයින් සිව්වැදෑරුම් වේ. හානභාගියධ්‍යානය ඨිතිභාගිධ්‍යානය නිර්වේදභාගීයධ්‍යානය විසේසභාගීයධ්‍යානයයි මෙසේ හානභාගියාදීභේද හෙයින්ද සිව්වැදෑරුම් බව දතයුතුයි. එහි ඡන්දය ධුරකොට උපන් ධ්‍යානය ඡන්දධිපතෙය්‍ය නම් වේ. චිත්තාධිපතෙය්‍යාදියෙහිද මෙම නයයි. අතිශයින් ප්‍රගුණනුවූ මත්තේහි ධ්‍යානයට උපකාර නොවියහැකිවූ ධ්‍යානය පරිත්ත නම් වෙයි. සුප්පමත්ත

සරාවමත්තවූ හෙවත් කුළු වට්ට් පමණවූ හෝ මාලාවක් පමණවූ හෝ නොවඩන ලද්දවූ ප්‍රතිභාග නිමිත්ත අරමුණු කොටගෙණ උපදවන ලද්දවූ ධ්‍යානය පරිත්තාලම්බණ නම් වෙයි. කියනලද ක්‍රමයට ප්‍රතිපක්ෂ වශයෙන් යථාක්‍රමයෙන් අප්පමාණ අප්පමාණාරම්මණාදීහු දතයුත්තාහුයි.

හානභාගියාදින්ගේ විශේෂය බුද්ධදත්තාචාරීන් වහන්සේම මතුප්‍රකාශ කරන්නේය. **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 67-71 පිටු]**

පටිපදභේදතෝ පච්චේකං චතුබ්බිධා හොන්ති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං, දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං, සුඛපටිපදං දන්ධාභිඤ්ඤං, සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤන්ති. තත්ථ පඨමසමන්නාහාරතෝ පට්ඨාය යාව උපචාරං උප්පජ්ජති, තාව පවත්තා ඣානභාවනා "පටිපදා"ති වුච්චති. සා ඒකච්චස්ස දුක්ඛා නීවරණාදිපච්චනීකධම්මසමුදාචාරගහනතාය අසුඛසේවනා හෝති, ඒකච්චස්ස තදභාවතෝ සුඛා. උපචාරතෝ පන පට්ඨාය යාව අප්පනා, තාව පවත්තා පඤ්ඤා "අභිඤ්ඤා"ති වුච්චති. සා ඒකච්චස්ස දන්ධා අසීඝප්පවත්තිනී, ඒකච්චස්ස ඛිප්පා. අසප්පායසේවිනෝ දුක්ඛා පටිපදා හෝති දන්ධා ච අභිඤ්ඤා, සප්පායසේවිනෝ සුඛා පටිපදා හෝති ඛිප්පා ච අභිඤ්ඤා. පුබ්බාපරකාලේසු සප්පායාසප්පායසේවනවසේන වෝමිස්සතා ච වේදිතබ්බා. තථා පලිබෝධුපච්ඡේදාදිකං පුබ්බකිච්චං අසම්පාදෙන්තස්ස පටිපදා දුක්ඛා, සම්පාදෙන්තස්ස සුඛා පටිපදා. අප්පනාකෝසල්ලං අසම්පාදෙන්තස්ස දන්ධාභිඤ්ඤා, සම්පාදෙන්තස්ස ඛිප්පා. කිලේසින්ද්‍රියානං වා තික්ඛමුදුතාය පඨමා, විපරියායේන චතුත්ථා, වෝමිස්සතාය මජ්ඣිමා ද්වේති වේදිතබ්බා. තණ්හාවිජ්ජාභිභවනානභිභවනවසේන වා සමථවිපස්සනාසු කතාධිකාරාකතාධිකාරතාවසේන වාපි ඒතාසං පභේදෝ වේදිතබ්බෝ. පඨමජ්ඣානාදිආගමනවසේනාපි දුතියාදීනං පටිපදාභිඤ්ඤාභේදෝ හෝතියේවාති දට්ඨබ්බං. ඒවං පටිපදාවසේන පච්චේකං චතුබ්බිධා හොන්තීති වේදිතබ්බා.

**[අභිධම්මමාතිකා පාළි (අට්ඨසාලිනීගායනා දසකසිණ මූල විභාගකථා යටතේ)]**

**දුක්ඛපටිපදං** දුක් ප්‍රතිපදාව **දන්ධාභිඤ්ඤං** ලස් වූ අභිඥාව ද **දුක්ඛපටිපදං** දුක් ප්‍රතිපදාව **ඛිප්පාභිඤ්ඤං** නොලස් වූ අභිඥාව ද **සුඛපටිපදං** සැප ප්‍රතිපදාව **දන්ධාභිඤ්ඤං** ලස් වූ අභිඥාව ද **සුඛ පටිපදං** සැප ප්‍රතිපදාව **ඛිප්පාභිඤ්ඤං ඉති** නොලස් වූ අභිඥාව යැයි **පටිපදාභේදතෝ** ප්‍රතිපදා භේද වශයෙන් **පච්චේකං** වෙන වෙනම **චතුබ්බිධා හොන්ති** සතර වැදෑරුම් වෙත් **තත්‍ථ** එහි **පඨමසමන්නාහාරතෝ පට්ඨාය** පරිකර්ම භාවනාව පටන් ගත් තැන සිට **යාව** යම්තාක් **උපචාරං උප්පජ්ජති** උපචාරය උපදී ද **තාව** ඒතාක් **පවත්තා ඣානභාවනා** පැවති ධ්‍යාන භාවනාව **පටිපදා ඉති වුච්චති** ප්‍රතිපදා යැයි කියනු ලැබේ **සා** ඒ ප්‍රතිපදා තොමෝ **ඒකච්චස්ස** ඇතැමෙකුට **නීවරණාදිපච්චනීකධම්මසමුදාචාරගහනතාය** නීවරණ ආදී විරුද්ධ ධර්මයන්ගේ හැසිරීම ග්‍රහණ බැවින් **දුක්ඛා (හෝති)** දුකක් වෙයි **අසුඛසේවනා හෝති** සැපනොවූ සේවනය වෙයි **ඒකච්චස්ස** ඇතමෙකුට **තං අභාවතෝ** ඒ නීවරණ ආදී විරුද්ධ ධර්මයන් නොමැති බැවින් **සුඛා (හෝති)** සැප වෙයි **පන** එසේම **උපචාරතෝ පට්ඨාය** උපචාරයේ පටන් **යාව අප්පනා** අර්පණාව යම්තාක් ද **තාව** ඒතාක් **පවත්තා පඤ්ඤා** පැවති ප්‍රඥා තොමෝ **අභිඤ්ඤා ඉති වුච්චති** අභිඥා යැයි කියනු ලැබේ **සා** ඒ අභිඥා තොමෝ **ඒකච්චස්ස** ඇතමෙකුට **දන්ධා (හෝති)** ලස් වෙයි **අසීඝප්පවත්ති** ශීඝ්‍රව නොපැවැත්ම වෙයි **ඒකච්චස්ස ඛිප්පා (හෝති)** නොලස් වෙයි **අසප්පායසේවිනෝ** අසත්ප්‍රාය සෙවුනහුට **දුක්ඛා පටිපදා ච** දුක් ප්‍රතිපදාව ද **දන්ධාභිඤ්ඤා හෝති** ලස් වූ අභිඥාව ද වෙයි **සප්පායසේවිනෝ** සත්ප්‍රාය සෙවුනහුට

**සුඛා පටිපදා ච** සැප ප්‍රතිපදාව ද **ඛිප්පාභිඤ්ඤා හෝති** නොලස් වූ අභිඥාව ද වෙයි **පුබ්බාපරකාලේසු** පෙර අපර කාලයන්හි **සප්පායාසප්පායසේවනවසේන** සත්ප්‍රාය අසත්ප්‍රාය සේවනය කිරීම් වශයෙන් **වෝමිස්සතා ච** මිශ්‍රබව ද **වේදිතබ්බා** දතයුතුයි **තථා** එසේම **පලිබෝධුපච්ඡේදාදිකං පුබ්බකිච්චං** පළිබෝධ සිඳීම් ආදී පූර්ව කෘත්‍යය **අසම්පාදෙන්තස්ස** සම්පාදනය නොකරන්නාගේ **පටිපදා දුක්ඛා (හෝති)** ප්‍රතිපදාව දුක් වෙයි **සම්පාදෙන්තස්ස** සම්පාදනය කරන්නාගේ **පටිපදා සුඛා (හෝති)** ප්‍රතිපදාව සැප වෙයි **අප්පනාකෝසල්ලං** අර්පණා කෞශල්‍යය **අසම්පාදෙන්තස්ස** සම්පාදනය නොකරන්නාගේ **අභිඤ්ඤා දන්ධා (හෝති)** අභිඥාව ලස් වෙයි **සම්පාදෙන්තස්ස** සම්පාදනය කරන්නාගේ **(අභිඤ්ඤා) ඛිප්පා (හෝති)** අභිඥාව නොලස් වෙයි **වා (යථා වුත්තනයේන)** කියනලද ක්‍රමයෙන් අනික් ක්‍රමයක් කියම් **කිලේසින්ද්‍රියානං** ක්ලේශයන්ගේ ද ඉන්ද්‍රියයන්ගේ ද **තික්ඛමුදුතාය** තීක්ෂණ මෘදු භාවයෙන් **පඨමා (හෝති)** දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං යන පළමු ප්‍රතිපදාව වෙයි **විපරියායේන** විපර්‍ය්‍යාසයෙන් **චතුත්ථා (හෝති)** සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං යන සිවු වැනි ප්‍රතිපදාව වෙයි **වෝමිස්සතාය** මිශ්‍රවීම් වශයෙන් **මජ්ඣිමා ද්වේ (හොන්ති) ඉති** දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං සුඛපටිපදං දන්ධාභිඤ්ඤං යන ප්‍රතිපදා දෙදෙන වෙත් යැයි **වේදිතබ්බා** දතයුත්තාහ **වා (යථා වුත්තනයේන)** කියනලද ක්‍රමයෙන් අනික් ක්‍රමයක් කියම් **තණ්හාවිජ්ජාභිභවනානභිභවනවසේන වා** තණ්හා අවිද්‍යාවගේ මැඬීම් නොමැඬීම් වශයෙන් හෝ **සමථවිපස්සනාසු** සමථ විදර්ශනා භාවනාවන්හි **කතාධිකාරාකතාධිකාරවසේන අපි** පුරුදු කිරීම් වශයෙන් හා පුරුදු නොකිරීම් වශයෙන් ද **ඒතාසං** ඒ ප්‍රතිපදාවන්ගේ **පභේදෝ** ප්‍රභේදය **වේදිතබ්බෝ** දතයුතුයි **පඨමජ්ඣානාදිආගමනවසේනාපි** ප්‍රථම ධ්‍යානාදියට පැමිණීම් වශයෙන් ද **දුතියාදීනං** ද්විතීය ධ්‍යානාදියගේ **පටිපදාභිඤ්ඤාභේදෝ** ප්‍රතිපදා අභිඥා භේදය **හෝතියේවාති** වෙයිම යැයි **දට්ඨබ්බං** දතයුතුයි **ඒවං** මෙසේ **පටිපදාවසේන** ප්‍රතිපදා වශයෙන් **පච්චේකං** වෙන වෙනම **චතුබ්බිධා හොන්ති ඉති** සතර වැදෑරුම් වෙත් යැයි **වේදිතබ්බා** දතයුත්තාහ ෴ **[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

එත්ථ ඣානං අනුයුඤ්ජන්තස්ස නිමිත්තුප්පාදතෝ පුබ්බං පටිපදාය ඛෙත්තං, පච්ඡා අභිඤ්ඤාය ඛෙත්තං. තත්ථ පුබ්බේ විරුද්ධපච්චයානං සන්නිහිතේන කිලමන්තස්ස සතෝ පටිපජ්ජන්තස්ස භාවනා පටිපදා දුක්ඛා නාම හෝති. අකිලමන්තස්ස සුඛා. පච්ඡාච දන්ධං අප්පනං පත්තස්ස භාවනාභිඤ්ඤා දන්ධාභිඤ්ඤා නාම හෝති. ඛිප්පං පත්තස්ස ඛිප්පාභිඤ්ඤා නාම. තත්ථ පුබ්බේ දුක්ඛා පටිපදා පච්ඡා දන්ධං වා ඛිප්පං වා උප්පන්නං ඣානං දුක්ඛප්පටිපදං නාම කරෝති. සුඛා පන සුඛප්පටිපදං නාම කරෝතීති. දුතියජ්ඣානාදීසු පන පුරිමජ්ඣානේ නිකන්ති වික්ඛම්භනස්ස දුක්ඛසුඛතාවසේන පටිපදාභේදෝ වේදිතබ්බෝ. යෝ පන ඒතරහි ගහට්ඨෝ වා පබ්බජිතෝ වා පුබ්බභවේ අකතාධිකාරෝපි අන්තරායිකධම්මමුත්තෝ කල්‍යාණපටිපත්තියං ඨිතෝ ඡින්නපලිබෝධෝ පහිතත්තෝ ඣානං භාවේති. තස්ස ඣානභාවනා න සම්පජ්ජතීති නත්ථීති නිට්ඨමෙත්ථ ගන්තබ්බන්ති. **[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 52 යටතේ)]**

පටිපදා අභිඤ්ඤාවවත්ථානේ. “නිමිත්තුප්පාදතෝ”ති පටිභාගනිමිත්තස්ස උප්පාදතෝ. සුඛා පන පටිපදා, පච්ඡාදන්ධං වා ඛිප්පං වා උප්පන්නං ඣානං සුඛප්පටිපදං නාම කරෝතීති යෝජනා. “පුබ්බභවේ”ති ආසන්නේ පුබ්බභවේ. අන්තරායිකධම්මා නාම ‘කිලේසන්තරායිකෝ ච, කම්මන්තරායිකෝ ච, විපාකන්තරායිකෝ ච, පඤ්ඤත්තිවීතික්කමන්තරායිකෝ ච, අරියූපවාදන්තරායිකෝ

ච. තත්ථ තිස්සෝ නියතමිච්ඡාදිට්ඨියෝ කිලේසන්තරායිකෝ නාම. පඤ්චානන්තරිය කම්මානි කම්මන්තරායිකෝ නාම. අහේතුක-ද්විහෙතුකප්පටිසන්ධිවිපාකා විපාකන්තරායිකෝ නාම. භික්ඛුභාවේ ඨිතානං විනයපඤ්ඤත්තිං වීතික්කමිත්වා අකතප්පටිකම්මෝ වීතික්කමෝ පඤ්ඤත්තිවීතික්කමන්තරායිකෝ නාම. පටිකම්මේ පන කතේ අන්තරායිකෝ න හෝති. අරියපුග්ගලානං ජාතිආදීහි උපවදිත්වා අක්කොසිත්වා අකතප්පටිකම්මං අක්කෝසනං අරියූපවාදන්තරායිකෝ නාම. ඉධපි පටිකම්මේ කතේ අන්තරායිකෝ න හෝති. සේසේසු තීසු පටිකම්මං නාම නත්ථි. ඉමේ ධම්මා ඉමස්මිං භවේ ඣානමග්ගානං අන්තරායං කරොන්තීති අන්තරායිකා නාම. තේහි විමුත්තෝ අන්තරායිකධම්මවිමුත්තෝ නාම. "කල්‍යාණප්පටිපත්තියං ඨිතෝ"ති සීලවිසුද්ධි ආදිකාය කල්‍යාණප්පටිපත්තියං පරිපූරණවසේන ඨිතෝ. "ඡින්නපලිබෝධෝ"ති ආවාසපලිබෝධාදීනි දසවිධානි පලිබෝධකම්මානි ඡින්දිත්වා ඨිතෝ. "පහිතත්තෝ"ති, යන්තං පුරිසථාමේන පුරිසපරක්කමේන පත්තබ්බං, න තං අපත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතීති ඒවං පවත්තේන සම්මප්පධානවීරියේන සමන්නාගතෝ. සෝ හි පහිතෝ පේසිතෝ අනපෙක්ඛිතෝ අත්තභාවෝ අනේනාති පහිතත්තෝති වුච්චති. "න සම්පජ්ජතීති නත්ථි". සචේ පඤ්ච පධානියඞ්ගසමන්නාගතෝ හෝතීති අධිප්පායෝ. පඤ්ච පධානියඞ්ගානි නාම සද්ධාසම්පන්නතා, අසාඨෙය්‍යං, ආරොග්‍යං, අලීනවීරියතා, පඤ්ඤවන්තතා,ති.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 52 යටතේ)]**

**එත්ථ** මෙහි **ඣානං** ධ්‍යානයෙහි **අනුයුඤ්ජන්තස්ස** යෙදෙන්නහුට **නිමිත්තුප්පාදතෝ පුබ්බං** ප්‍රතිභාග නිමිත්ත ඉපදීමට පූර්වයෙහි **ඛෙත්තං** ක්ෂේත්‍රය **පටිපදය** ප්‍රතිපදාවෙන් ද **පච්ඡා** පසුව **ඛෙත්තං** ක්ෂේත්‍රය **අභිඤ්ඤය (හොන්ති)** අභිඥාවෙන් වෙත් **තත්ථ** එහි **පුබ්බේ** පෙර **විරුද්ධපච්චයානං** විරුද්ධ ප්‍රත්‍යයන්ගේ **සන්නිහිතේන** යුක්තවීමෙන් **කිලමන්තස්ස** වෙහෙස වන්නාවූ **සතෝ පටිපජ්ජන්තස්ස** සිහි නුවණින් යෙදෙන්නහුගේ **භාවනාපටිපද** භාවනා ප්‍රතිපදාව **දුක්ඛා නාම හෝති** දුක් නම් වෙයි **අකිලමන්තස්ස** වෙහෙස නොවන්නහුට **සුඛා (හෝති)** ප්‍රතිපදාව සැප නම් වෙයි **ච** තවද **පච්ඡා** පසුව **දන්ධං** ලස්ව **අප්පනං** අර්පණාවට **පත්තස්ස** පැමිණියහුගේ **භාවනාභිඤ්ඤ** භාවනා අභිඥා තොමෝ **දන්ධාභිඤ්ඤ නාම හෝති** ලස් වූ අභිඥා නම් වෙයි **ඛිප්පං** නොලස්ව **පත්තස්ස** පැමිණියහුගේ (**භාවනාභිඤ්ඤ** භාවනා අභිඥා තොමෝ) **ඛිප්පාභිඤ්ඤ නාම (හෝති)** නොලස් වූ අභිඥා නම් වෙයි **තත්ථ** එහි **පුබ්බේ** පෙර **දුක්ඛා පටිපද** දුක් ප්‍රතිපදාව **පච්ඡා** පසුව **දන්ධං වා** ලස්ව හෝ **ඛිප්පං වා** නොලස්ව හෝ **උප්පන්නං ඣානං** උපන්නා වූ ධ්‍යානය **දුක්ඛප්පටිපදං නාම කරෝති** දුක් ප්‍රතිපදාවක් කරයි **සුඛා පන** සැප ප්‍රතිපදාව වනාහි **සුඛප්පටිපදං නාම කරෝති** සුප ප්‍රතිපදාවක් කරයි **ඉති (වේදිතබ්බා)** යැයි දතයුතුයි **දුතියජ්ඣානාදීසු පන** ද්විතීය ධ්‍යානාදියෙහි වනාහි **පුරිමජ්ඣානේ** පළමු ධ්‍යානයෙහි **නිකන්ති** තෘෂ්ණාව **වික්ඛම්භනස්ස** විෂ්කම්භනය කළහුට **දුක්ඛසුඛතාවසේන** සැප දුක් වශයෙන් **පටිපදභේදෝ** ප්‍රතිපදා භේදය **වේදිතබ්බෝ** දතයුතුයි **ඒතරහි පන** දැන් වනාහි **යෝ ගහට්ඨෝ වා පබ්බජිතෝ වා** යම් ගෘහස්ථයෙක් හෝ පැවිද්දෙක් හෝ **පුබ්බභවේ** පෙර භවයෙහි **අකතාධිකාරෝපි** නොකරනලද පුරුදු ඇත්තේ ද **අන්තරායිකධම්මමුත්තෝ** ක්ලේශ අන්තරාය කර්මාන්තරාය විපාකාන්තරාය ප්‍රඥප්ති වීතික්කමණ අන්තරාය ආර්‍ය්‍ය උපවාද අන්තරාය යන අන්තරාය ධර්මයන්ගෙන් මිදෙන ලද්දේ ද **කල්‍යාණපටිපත්තියං ඨිතෝ** සීලවිසුද්ධි ආදී කල්‍යාණ ප්‍රතිපත්තියෙහි සිටින ලද්දේ ද **ඡින්නපලිබෝධෝ** ආවාස පළිබෝධ ආදී දස වැදෑරුම් පළිබෝධයන් සිඳ සිටින ලද්දේ **පහිතත්තෝ** පුරුෂ පරාක්‍රමයෙන් **ඣානං භාවේති** ධ්‍යාන වඩයි ද **තස්ස**

ඔහුගේ **ඣානභාවනා** ධ්‍යාන භාවනාව **න සම්පජ්ජති නත්ථි ඉති** සමෘර්ධමත් නොවන්නේ නොවෙයි **එතථ** මෙහි **නිට්ඨං** නිෂ්ඨාවට **ගන්තබ්බං** යා යුතුයි.

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

## ධ්‍යාන සිත උපදවන්නට අරමුණු සතරකි:—

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පරිත්තං පරිත්තාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පරිත්තං අප්පමාණාරම්මණං පඨවීකසිණං ‚ තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති අප්පමාණං පරිත්තාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති අප්පමාණං අප්පමාණාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විතක්කවිචාරානං වූපසමා…පෙ…. දුතියං ඣානං…පෙ…. තතියං ඣානං…පෙ…. චතුත්ථං ඣානං…පෙ…. පඨමං ඣානං…පෙ…. පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති පරිත්තං පරිත්තාරම්මණං පඨවීකසිණං…පෙ…. පරිත්තං අප්පමාණාරම්මණං පඨවීකසිණං…පෙ…. අප්පමාණං පරිත්තාරම්මණං පඨවීකසිණං…පෙ…. අප්පමාණං අප්පමාණාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

**[ධම්මසඞ්ගණී පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 181-185 යටතේ); ධම්මසඞ්ගණී පාළි 86-88 පිටු (බු.ජ); අභිධර්ම ප්‍රකාශය 60 පිට]**

කවර ධර්මයෝ කුසල්හ යත්? යම් කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- පරිත්ත (අප්‍රගුණ) වූ පරිත්තාලම්බන වූ පඨවී කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම් කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ පඨවී කසිණ

සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම් කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ පඨවී කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම් කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ පඨවී කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම් කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් -පෙ- ද්විතීය ධ්‍යානයට -පෙ- තෘතීය ධ්‍යානයට -පෙ- චතුර්ථ ධ්‍යානයට -පෙ- ප්‍රථම ධ්‍යානයට -පෙ- පරිත්ත වූ පරිත්තාලම්බන වූ පඨවී කසිණ සඞ්ඛ්‍යා වූ පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද, -පෙ- පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ පඨවී කසිණ සඞ්ඛ්‍යාත -පෙ- අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ පඨවී කස්ණ සඞ්ඛ්‍යාත වූ -පෙ- අප්‍රමාණ වූ (එරණ වශයෙන්) අප්‍රමාණාලම්බන වූ පඨවී කසිණ සඞ්ඛ්‍යාත වූ පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

**[ධම්මසඞ්ගණී පාළි 01/87-89 පිටු (බු.ජ)]**

ඉදනි යස්මා ඒතං ඣානං නාම යථා පටිපදාභේදේන ඒවං ආරම්මණභේදේනාපි චතුබ්බිධං හෝති. තස්මාස්ස තං පභේදං දස්සේතුං පුන **කතමේ ධම්මා කුසලා**තිආදි ආරද්ධං. තත්ථ **පරිත්තං පරිත්තාරම්මණ**න්තිආදීසු යං අප්පගුණං හෝති, උපරිජ්ඣානස්ස පච්චයෝ භවිතුං න සක්කෝති, ඉදං **පරිත්තං නාම**. යං පන අවඩ්ඪිතේ සුප්පමත්තේ වා සරාවමත්තේ වා ආරම්මණේ පවත්තං, තං පරිත්තං ආරම්මණං අස්සාති **පරිත්තාරම්මණං**. යං පගුණං සුභාවිතං උපරිජ්ඣානස්ස පච්චයෝ භවිතුං සක්කෝති, ඉදං **අප්පමාණං** නාම. යං විපුලේ ආරම්මණේ පවත්තං තං වුඩ්ඪිප්පමාණත්තා අප්පමාණං ආරම්මණං අස්සාති **අප්පමාණාරම්මණං**. වුත්තලක්ඛණවෝමිස්සකතාය පන වෝමිස්සකනයෝ වේදිතබ්බෝ. ඉති ආරම්මණවසේනපි චත්තාරෝ නවකා වුත්තා හොන්ති. චිත්තගණනාපෙත්ථ පුරිමසදිසා ඒවාති.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 181 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 174-175 පිටු (හේ.වි.මු)]**

**අප්පගුණ**න්ති පඤ්චහි වසිතාහි අවසීකතං.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 181 යටතේ)]**

**ඉදනි** දැන් **යස්මා** යම්හෙයකින් **ඒතං ඣානං නාම** ඒ ධ්‍යානය නම් **පටිපදාභේදේන** ප්‍රතිපදා භේදයෙන් **යථා අපි** යම්සේ ද **ඒවං** මෙසේ **ආරම්මණභේදේනාපි** ආරම්මණ භේදයෙන් ද **චතුබ්බිධං හෝති** සතර වැදෑරුම් වෙයි **තස්මා** එහෙයින් **අස්ස** ඒ ධ්‍යානයාගේ **තං පභේදං** ඒ ප්‍රභේදය **දස්සේතුං** දක්වන්නට **පුන** නැවත **කතමේ ධම්මා කුසලා ඉති ආදි** කතමේ ධම්මා කුසලා යනාදිය **ආරද්ධං** අරබනලදි නොහොත් දක්වනලදි **තත්ථ** එහි **පරිත්තං පරිත්තාරම්මණං**

**ආදීසු** පරිත්තං පරිත්තාරම්මණං යනාදියෙහි **යං (ඣානං)** යම් ධ්‍යානයක් **අප්පගුණං හෝති** පඤ්ච වසීතාවයෙන් වසී නොකරන ලද්දේ වෙයි ද **උපරිජ්ඣානස්ස** මතු ධ්‍යානයට **පච්චයෝ භවිතුං** ප්‍රත්‍යය වන්නට **න සක්කෝති** නොහැකි වෙයි ද **ඉදං (ඣානං)** මේ ධ්‍යානය **පරිත්තං නාම (හෝති)** පරිත්ත නම් වෙයි **පන** තවද **සුප්පමත්තේ වා** කුල්ලක් පමණ හෝ **සරාවමත්තේ වා** සරාවක් පමණ හෝ **අවඩ්ඪිතේ** නොවඩනලද **ආරම්මණේ** අරමුණෙහි **පවත්තං යං (ඣානං)** පවතිනලද යම් ධ්‍යානයක් වේද **තං පරිත්තං ආරම්මණං** ඒ පරිත්ත අරමුණ **අස්ස ඉති** මේ ධ්‍යානයටනුයි **පරිත්තාරම්මණං** පරිත්තාරම්මණ නම් **යං (ඣානං)** යම් ධ්‍යානයක් **පගුණං** ප්‍රගුණ ද **සුභාවිතං** මොනවට භාවිත කරනලද ද **උපරිජ්ඣානස්ස** මතු ධ්‍යානයට **පච්චයෝ භවිතුං** ප්‍රත්‍යය වන්නට **සක්කෝති** හැකිවෙයි ද **ඉදං (ඣානං)** මේ ධ්‍යානය **අප්පමාණං නාම (හෝති)** අප්‍රමාණ නම් වෙයි **විපුලේ ආරම්මණේ** පැතුරුණු අරමුණෙහි **පවත්තං යං** පවතිනලද යම් ධ්‍යානයක් වේද **තං (ඣානං)** ඒ ධ්‍යානය **වුඩ්ඪිප්පමාණත්තා** වැඩුණු ප්‍රමාණ ඇති බැවින් **අප්පමාණං ආරම්මණං** අප්‍රමාණ අරමුණ **අස්ස ඉති** මේ ධ්‍යානයටනුයි **අප්පමාණාරම්මණං** අප්‍රමාණාරම්මණ නම් **පන (තථාපි)** එසේම **වුත්තලක්ඛණවෝමිස්සකතාය** කියනලද ලක්‍ෂණයන්ගේ මිශ්‍ර භාවයෙන් **වෝමිස්සකනයෝ** මිශ්‍ර නය ක්‍රමය **වේදිතබ්බෝ** දතයුතුයි **ඉති** මෙසේ **ආරම්මණවසේනපි** අරමුණු වශයෙන් ද **චත්තාරෝ නවකා** නවක සතරක් **වුත්තා හොන්ති** දේශනා කරන ලද්දේ වෙති. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තන]**

ආරම්මණභේදතෝපි පච්චේකං චතුබ්බිධා හොන්ති පරිත්තං පරිත්තාරම්මණං, පරිත්තං අප්පමාණාරම්මණං, අප්පමාණං පරිත්තාරම්මණං, අප්පමාණං අප්පමාණාරම්මණන්ති. තත්ථ යං අප්පගුණං, උපරිජ්ඣානස්ස පච්චයෝ භවිතුං න සක්කෝති, ඉදං **පරිත්තං**. යං පන අවඩ්ඪිතේ ආරම්මණේ පවත්තං, තං පරිත්තං ආරම්මණං අස්සාති **පරිත්තාරම්මණං**. විපරියායතෝ **අප්පමාණං අප්පමාණාරම්මණං**. තදුභයවෝමිස්සතාය මජ්ඣෙ ඉතරද්වයං වේදිතබ්බං. ඒවං ආරම්මණභේදතෝ චතුබ්බිධා හොන්තීති වේදිතබ්බා.

**[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා දසකසිණ මූල විභාගකථා යටතේ)]**

**ආරම්මණභේදතෝ අපි** ආරම්මණ භේද වශයෙන් ද **පරිත්තං පරිත්තාරම්මණං** පරිත්ත වූ පරිත්තාරම්මණය **පරිත්තං අප්පමාණාරම්මණං** පරිත්ත වූ අප්‍රමාණාරම්මණය **අප්පමාණං පරිත්තාරම්මණං** අප්‍රමාණ වූ පරිත්තාරම්මණය **අප්පමාණං අප්පමාණාරම්මණං ඉති** අප්‍රමාණ වූ අප්‍රමාණාරම්මණය යැයි **පච්චේකං** වෙන වෙනම **චතුබ්බිධා හොන්ති** සතර වැදෑරුම් වෙත් **තත්ථ** එහි **යං (ඣානං)** යම් ධ්‍යානයක් **අප්පගුණං** පඤ්ච වසීතාවයෙන් වසී නොකරන ලද්දේ ද **උපරිජ්ඣානස්ස** මතු ධ්‍යානයට **පච්චයෝ භවිතුං** ප්‍රත්‍යය වන්නට **න සක්කෝති** නොහැකිවෙයි ද **ඉදං (ඣානං)** මේ ධ්‍යානය **පරිත්තං** පරිත්ත නම් **පන (තථාපි)** එසේම **අවඩ්ඪිතේ ආරම්මණේ** නොවඩනලද අරමුණෙහි **පවත්තං යං (ඣානං)** පවතිනලද යම් ධ්‍යානයක් වේද **තං පරිත්තං ආරම්මණං** ඒ පරිත්තාරම්මණය **අස්ස ඉති** මේ ධ්‍යානයටනුයි **පරිත්තාරම්මණං** පරිත්තාරම්මණ නම් **විපරියායතෝ** ඊට විපරීත වශයෙන් (**යං (ඣානං)** යම් ධ්‍යානයක් **පගුණං** ප්‍රගුණ ද **උපරිජ්ඣානස්ස** මතු ධ්‍යානයට **පච්චයෝ භවිතුං** ප්‍රත්‍යය වන්නට **සක්කෝති** හැකිවෙයි ද **ඉදං (ඣානං)** මේ ධ්‍යානය) **අප්පමාණං නාම (හෝති)** අප්‍රමාණ නම් වෙයි (**වඩ්ඪිතේ ආරම්මණේ** වඩනලද අරමුණෙහි **පවත්තං යං** පවතිනලද යම් ධ්‍යානයක් වේද **තං අප්පමාණං ආරම්මණං** ඒ අප්‍රමාණ අරමුණ **අස්ස ඉති** මේ ධ්‍යානයටනුයි) **අප්පමාණාරම්මණං**

අප්‍රමාණාරම්මණ නම් **තදුභයවෝමිස්සතාය** මේ දෙදෙනාගේ මිශ්‍රවීම් වශයෙන් **මජ්ඣෙ ඉතරද්වයං** මැද වූ අනික් දෙදෙන **වේදිතබ්බං** දතයුතුයි **ඒවං** මෙසේ **ආරම්මණභේදතෝ** ආරම්මණ භේද හෙයින් **චතුබ්බිධා හොන්ති ඉති** සතර වැදෑරුම් වෙත් යැයි **වේදිතබ්බා** දතයුත්තාහ.

**[අභිධම්මමාතිකා පාළි පරිවර්තන]**

## ධ්‍යාන සිත බෙදී යන ආකාර:—

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං පඨවීකසිණං තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි …පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං පඨවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමෙ ධම්මා කුසලා? යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විතක්කවිචාරානං වූපසමා…පෙ…. දුතියං ඣානං…පෙ…. තතියං ඣානං…පෙ…. චතුත්ථං ඣානං…පෙ…. පඨමං ඣානං…පෙ…. පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං පඨවීකසිණං…පෙ…. දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං පඨවීකසිණං…පෙ…. දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං පඨවීකසිණං…පෙ…. දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං පඨවීකසිණං…පෙ…. දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං පඨවීකසිණං…පෙ…. දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං පඨවීකසිණං…පෙ…. දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං පඨවීකසිණං…පෙ…. දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං පඨවීකසිණං…පෙ…. සුඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං පඨවීකසිණං…පෙ…. සුඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං පඨවීකසිණං…පෙ…. සුඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං පඨවීකසිණං…පෙ…. සුඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං පඨවීකසිණං…පෙ…. සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං පඨවීකසිණං…පෙ…. සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං පඨවීකසිණං…පෙ…. සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං පඨවීකසිණං…පෙ…. සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං පඨවීකසිණං තස්මිං සමයෙ ඵස්සො හොති…පෙ…. අවික්ඛෙපො හොති…පෙ…. ඉමෙ ධම්මා කුසලා.

**[ධම්මසඞ්ගණී පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 186-202 යටතේ); ධම්මසඞ්ගණී පාළි 88-94 පිටු (බු.ජ); අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 23 පිට]**

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- දුක් වූ පිළිවෙත් ඇති ලස් වූ අභිඥ ඇති පරිත්ත වූ පරිත්තාලම්බන වූ පඨවී කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- දුක් වූ පිළිවෙත් ඇති ලස් වූ අභිඥ ඇති පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ පඨවී කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- දුක් වූ පිළිවෙත් ඇති දන්ධාභිඥ වූ අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ පඨවී කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- දුක් වූ පිළිවෙත් ඇති දන්ධාභිඥ වූ අප්‍රමාණ

වූ අප්‍රමාණාලම්බන වූ පඨවි කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- දුක් වූ පිළිවෙත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ පරිත්ත වූ පරිත්තාලම්බන වූ පඨවි කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- දුක් වූ පිළිවෙත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ පඨවි කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- දුක් වූ ප්‍රතිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ පඨවි කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- දුක් වූ ප්‍රතිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ පඨවි කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- සුඛ වූ ප්‍රතිපත් ඇති දන්ධ වූ අභිඥ ඇති පරිත්ත වූ පරිත්තාලම්බන වූ පඨවි කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- සුඛ වූ ප්‍රතිපත් ඇති දන්ධ වූ අභිඥ ඇති පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ පඨවි කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- සුඛ වූ ප්‍රතිපත් ඇති දන්ධ වූ අභිඥ ඇති අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ පඨවි කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- සුඛ වූ ප්‍රතිපත් ඇති දන්ධ වූ අභිඥ ඇති අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ පඨවි කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ

ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- සුඛ වූ ප්‍රතිපත් ඇති ක්ෂිප්‍ර වූ අභිඥ ඇති පරිත්ත වූ පරිත්තාලම්බන වූ පඨවී කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- සුඛ වූ ප්‍රතිපත් ඇති ක්ෂිප්‍ර වූ අභිඥ ඇති පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ පඨවී කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- සුඛ වූ ප්‍රතිපත් ඇති ක්ෂිප්‍ර වූ අභිඥ ඇති අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ පඨවී කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන්වැ මැ -පෙ- සුඛ වූ ප්‍රතිපත් ඇති ක්ෂිප්‍ර වූ අභිඥ ඇති අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ පඨවී කසිණ සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් -පෙ- දෙවැනි දැහැන -පෙ- තෙවැනි දැහැන -පෙ- සතරවැනි දැහැන -පෙ- පළමුවැනි දැහැන -පෙ- දුක් වූ පිළිවෙත් ඇති ලස් වූ අභිඥ ඇති අල්ප වූ අල්පාලම්බන වූ පඨවී කසිණ පස්වැනි දැහැන -පෙ- දුක් වූ පිළිවෙත් ඇති දන්ධ වූ අභිඥ ඇති පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ පඨවී කසිණ -පෙ- දුක් වූ පිළිවෙත් ඇති දන්ධ වූ අභිඥ ඇති අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ පඨවී කසිණ -පෙ- දුක් වූ පිළිවෙත් ඇති දන්ධ වූ අභිඥ ඇති අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ පඨවී කසිණ -පෙ- දුක් වූ පිළිවෙත් ඇති නොලස් වූ අභිඥ ඇති පරිත්ත වූ පරිත්තාලම්බන වූ පඨවී කසිණ -පෙ- දුක් වූ පිළිවෙත් ඇති නොලස් වූ අභිඥ ඇති පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ පඨවී කසිණ -පෙ- දුක් වූ පිළිවෙත් ඇති නොලස් වූ අභිඥ ඇති අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ පඨවී කසිණ -පෙ- දුක් වූ පිළිවෙත් ඇති නොලස් වූ අභිඥ ඇති අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ පඨවී කසිණ -පෙ- සුඛ වූ ප්‍රතිපත් ඇති දන්ධ වූ අභිඥ ඇති පරිත්ත වූ පරිත්තාලම්බන වූ පඨවී කසිණ -පෙ- සුඛ වූ ප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ පඨවී කසිණ -පෙ- සුඛ ප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ පඨවී කසිණ -පෙ- සුඛ ප්‍රතිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ පරිත්ත වූ පරිත්තාලම්බන වූ පඨවී කසිණ -පෙ- සුඛ ප්‍රතිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ පඨවී කසිණ -පෙ- සුඛ ප්‍රතිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ පඨවී කසිණ -පෙ- සුඛ

ප්‍රතිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ පඨවි කසිණ (පඤ්චම ධ්‍යානය වඩා ද) එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වෙයි -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි. **[ධම්මසඞ්ගණී පාළි 01/89-95 පිටු (බු.ජ)]**

ඉදනි ආරම්මණපටිපදමිස්සකං සෝළසක්ඛත්තුකනයං දස්සේතුං පුන **කතමේ ධම්මා කුසලා**තිආදි ආරද්ධං. තත්ථ පඨමනයේ වුත්තජ්ඣානං දුක්ඛපටිපදත්තා දන්ධාභිඤ්ඤත්තා පරිත්තත්තා පරිත්තාරම්මණත්තාති චතූහි කාරණේහි **හීනං,** සෝළසමනයේ වුත්තජ්ඣානං සුඛපටිපදත්තා ඛිප්පාභිඤ්ඤත්තා අප්පමාණත්තා අප්පමාණාරම්මණත්තාති චතූහි කාරණේහි **පණීතං**. සේසේසු චුද්දසසු ඒකේන ද්වීහි තීහි ච කාරණේහි හීනප්පණීතතා වේදිතබ්බා.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 186 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 175 පිටු (හේ.වි.මු)]**

**ඉදනි** දැන් **ආරම්මණපටිපදමිස්සකං** ආරම්මණ ද ප්‍රතිපද ද මිශ්‍ර වූ **සෝළසක්ඛත්තුකනයං** සොළොස් වරක් නය ක්‍රමය **දස්සේතුං** දැක්වීම පිණිස **පුන** නැවත ද **කතමේ ධම්මා කුසලා ඉති ආදි** කතමෙ ධම්මා කුසලා යනාදිය **ආරද්ධං** දේශනා කරනලදි **තත්ථ** එහි **පඨමනයේ** ප්‍රථම ක්‍රමයෙහි **වුත්තජ්ඣානං** දේසිත දැහැන **දුක්ඛපටිපදත්තා** දුක් ප්‍රතිපදව ඇති බැවින් ද **දන්ධාභිඤ්ඤත්තා** ලස් වූ අභිඥව ඇති බැවින් ද **පරිත්තත්තා** පරිත්ත බැවින් ද **පරිත්තාරම්මණත්තා ඉති** පරිත්තාලම්බන ඇති බැවින් යන **චතූහි කාරණේහි** සිවු කරුණින් **හීනං** හීනය **සෝළසමනයේ** සොළොස්වැනි ක්‍රමයෙහි **වුත්තජ්ඣානං** දේසිත දැහැන **සුඛපටිපදත්තා** සැප ප්‍රතිපදව ඇති බැවින් ද **ඛිප්පාභිඤ්ඤත්තා** නොලස් වූ අභිඥව ඇති බැවින් ද **අප්පමාණත්තා** අප්‍රමාණ බැවින් ද **අප්පමාණාරම්මණත්තා ඉති** අප්‍රමාණාලම්බන ඇති බැවින් යන **චතූහි කාරණේහි** සිවු කරුණින් **පණීතං** ප්‍රණීතය **සේසේසු චුද්දසසු** සෙසු තුදුසෙහි **ඒකේන** එක් ධ්‍යානයක් හා **ද්වීහි තීහි ච කාරණේහි** කරුණු දෙකක් ද තුනක් ද කරණකොටගෙන **හීනප්පණීතතා** හීන ප්‍රණීත බව **වේදිතබ්බා** දතයුතුයි. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තන]**

ඉමානි පඤ්චපි රූපාවචරකුසලචිත්තානි යන පාඨයෙහි අපි ශබ්දයෙන් සංගෘහිත ධ්‍යාන චිත්තයෝ බොහෝ වෙති. රූපාවචර ධ්‍යාන චිත්තය තෙම චතුක්ක නයින් 4 යි පඤ්චක නයින් 5 යි එකතුව සුද්ධිකනවක 1 යි. ඒ නවකය දුක්ඛා පටිපදා දන්ධා අභිඤ්ඤා යන ආදී වූ පටිපද 4න් වැඩි කිරීමෙන් පටිපද නවක 4 ක් වෙත්. පරිත්තං පරිත්තාරම්මණං යනාදී වූ ආරම්මණ චතුෂ්කයෙන් වැඩිකළ කල්හි ආරම්මණ නවක 4 ක් වෙත්. මෙසේ සුද්ධික නවක පටිපද නවක ආරම්මණ නවක යන තුන එකතුව නවක 9 ක් වෙත්. පටිපද චතුක්කය ආරම්මණ චතුක්කයෙන් වැඩිකළ කල්හි (16) සොළොසක් වෙති. ඒ සොළොසින් මුලින් දක්වනු ලැබූ සුද්ධික නවකය වැඩිකළ කල්හි නවක සොළොසක් වෙති. ඒ සොළොස හා නවක නවය එකතු කළ කල්හි නවක (25) විසිපහක් වෙති. පඨවි කසිණය ආදී කොට ඕදත කසිණය අවසන් කොට ඇති කසිණ අටෙහි මුල් කසිණ සතර අතුරෙන් එක් එක් කසිණයෙහි සුද්ධික නවක 1 යි. පටිපද 4 යි. ආරම්මණ නවක 2 යි. පටිපද ආරම්මණ නවක 8 යි. ඒ සියල්ලෙහි එකතුව නවක 15 ක් වෙත්. මෙසේ නවක 60 ක් දක්වනලදි.

**[අභිධර්ම ප්‍රකාශය 61 පිට]**

## ධ්‍යාන සිත චතුෂ්ක-පඤ්චක ක්‍රමයෙන් දේශනා කිරීමට හේතු:—

කස්මා පනායං නයෝ දේසිතෝති? ඣානුප්පත්තිකාරණත්තා. සම්මාසම්බුද්ධේන හි පඨවීකසිණෝ සුද්ධිකජ්ඣානං චතුක්කනය වසේන පඤ්චකනය වසේන ච දස්සිතං; තථා සුද්ධිකපටිපද, තථා සුද්ධිකාරම්මණං. තත්ථ යා දේවතා පඨවීකසිණෝ සුද්ධිකජ්ඣානං චතුක්කනය වසේන දේසියමානං බුජ්ඣිතුං සක්කොන්ති, තාසං සප්පාය වසේන සුද්ධිකජ්ඣානේ චතුක්කනයෝ දේසිතෝ. යා පඤ්චකනය වසේන දේසියමානං බුජ්ඣිතුං සක්කොන්ති, තාසං සප්පාය වසේන පඤ්චකනයෝ. යා සුද්ධිකපටිපදය, සුද්ධිකාරම්මණෝ චතුක්කනය වසේන දේසියමානං බුජ්ඣිතුං සක්කොන්ති, තාසං සප්පාය වසේන සුද්ධිකපටිපදය සුද්ධිකාරම්මණෝ චතුක්කනයෝ දේසිතෝ. යා පඤ්චකනය වසේන දේසියමානං බුජ්ඣිතුං සක්කොන්ති තාසං සප්පාය වසේන පඤ්චකනයෝ. ඉති හෙට්ඨා පුග්ගලජ්ඣාසයවසේන දේසනා කතා.

දේසනාවිලාසප්පත්තෝ චේස පභින්නපටිසම්භිදෝ දසබල-චතුවේසාරජ්ජවිසදඤාණෝ ධම්මානං යාථාවසරසලක්ඛණස්ස සුප්පටිවිද්ධත්තා ධම්මපඤ්ඤත්තිකුසලතාය යෝ යෝ නයෝ ලබ්භති තස්ස තස්ස වසේන දේසනං නියමේතුං සක්කෝති, තස්මා ඉමාය දේසනාවිලාසප්පත්තියාපි තේන ඒසා පඨවීකසිණෝ සුද්ධිකචතුක්කනයාදිවසේන දේසනා කතා.

යස්මා පන යේ කේචි ඣානං උප්පාදෙන්ති නාම න තේ ආරම්මණපටිපදහි විනා උප්පාදේතුං සක්කොන්ති, තස්මා නියමතෝ ඣානුප්පත්තිකාරණත්තා අයං සෝළසක්ඛත්තුකනයෝ කථිතෝ.

එත්තාවතා සුද්ධිකනවකෝ, චත්තාරෝ පටිපදනවකා, චත්තාරෝ ආරම්මණනවකා, ඉමේ ච සෝළස නවකාති පඤ්චවීසති නවකා කථිතා හොන්ති. තත්ථ ඒකේකස්මිං නවකේ චතුක්කපඤ්චකවසේන ද්වේ ද්වේ නයාති පඤ්ඤාස නයා. තත්ථ "පඤ්චවීසතියා චතුක්කනයේසු සතං, පඤ්චකනයේසු පඤ්චවීසසත"න්ති පාඨතෝ පඤ්චවීසාධිකානි ද්වේ ඣානචිත්තසතානි හොන්ති. පඤ්චකනයේ පන චතුක්කනයස්ස පවිට්ඨත්තා අත්ථතෝ පඤ්චවීසාධිකමේව චිත්තසතං හෝති. යානි චේතානි පාඨේ පඤ්චවීසාධිකානි ද්වේ චිත්තසතානි තේසු ඒකේකස්ස නිද්දේසේ ධම්මවවත්ථානාදයෝ තයෝ තයෝ මහාවාරා හොන්ති. තේ පන තත්ථ තත්ථ නයමත්තමේව දස්සෙත්වා සංඛිත්තාති.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 186 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 175-176 පිටු (හේ.වි.මු)]**

**හෙට්ඨාති** සෝළසක්ඛත්තුකතෝ පුබ්බේ. **යේ කේචි ඣානං උප්පාදෙන්ති නාමාති** වචනේන යේ කතාධිකාරා සෙක්ඛා මග්ගේනේව උප්පාදිතජ්ඣානා, තේසං ඣානානි මග්ගපටිබද්ධතාය සුද්ධිකනවකසඞ්ගහිතානීති වේදිතබ්බානි. න හි තේ උප්පාදෙන්ති නාමාති. **[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 186 යටතේ)]**

කුසලජ්ඣානස්ස අධිගතත්තා "සෙක්ඛා"ති වුත්තං. **න හි තේ උප්පාදෙන්ති නාමාති** අරියමග්ගක්ඛණෝ රූපාවචරජ්ඣානානං අනුප්පජ්ජමානතං සන්ධායාහ.
**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 186 යටතේ)]**

**කස්මා** කුමක් හෙයින් **අයං නයෝ** මේ චතුෂ්ක පඤ්චක නය ක්‍රමය **දේසිතෝ ඉති?** දේශනා කරන ලද්දේ ද යත්? **පන (පරිහාරෝ මයා වුච්චතේ)** පරිහාරය මා විසින් කියනු ලැබේ **ඣානුප්පත්තිකරණත්තා** ධ්‍යාන උත්පත්තියට කාරණ බැවින්

(**දේසිතෝ** දේශනා කරනලදි) **හි** විස්තර කෙරෙම් **සම්මාසම්බුද්ධේන** සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් **පඨවීකසිණේ** පඨවී කසිණයෙහි **සුද්ධිකජ්ඣානං** සුද්ධික ධ්‍යානය **චතුක්කනයවසේන ච** චතුෂ්ක නය වශයෙන් ද **පඤ්චකනයවසේන ච** පඤ්චක නය වශයෙන් ද **දස්සිතං** දක්වනලදි **තථා** එසේම **සුද්ධිකපටිපදා** සුද්ධික ප්‍රතිපදාව ද (**දස්සිතං** දක්වනලදි) **තථා** එසේම **සුද්ධිකාරම්මණං** සුද්ධික ආරම්මණය ද (**දස්සිතං** දක්වනලදි) **තත්ථ** එහි **පඨවීකසිණේ** පඨවී කසිණයෙහි **චතුක්කනයවසේන** චතුෂ්ක නය වශයෙන් **සුද්ධිකජ්ඣානං** සුද්ධික ධ්‍යානය **දේසියමානං** දේශනා කරනුයේ **යා දේවතා** යම් දේතාවෝ **බුජ්ඣිතුං** අවබෝධ කරන්නට **සක්කොන්ති** හැකිවෙත් ද **තාසං** ඒ දේවතාවන්ට **සප්පාය වසේන** සත්ප්‍රාය වශයෙන් **සුද්ධිකජ්ඣානේ** සුද්ධික ධ්‍යානයෙහි **චතුක්කනයෝ** චතුෂ්ක නය **දේසිතෝ** දේශනා කරනලදි (**පඨවීකසිණේ** පඨවී කසිණයෙහි **පඤ්චකනයවසේන** පඤ්චක නය වශයෙන් **සුද්ධිකජ්ඣානං** සුද්ධික ධ්‍යානය **දේසියමානං** දේශනා කරනුයේ **යා දේවතා** යම් දේතාවෝ **බුජ්ඣිතුං** අවබෝධ කරන්නට **සක්කොන්ති** හැකිවෙත් ද) **තාසං** ඒ දේවතාවන්ට **සප්පාය වසේන** සත්ප්‍රාය වශයෙන් (**සුද්ධිකජ්ඣානේ** සුද්ධික ධ්‍යානයෙහි) **පඤ්චකනයෝ** පඤ්චක නය (**දේසිතෝ** දේශනා කරනලදි) **සුද්ධිකපටිපදාය** සුද්ධික ප්‍රතිපදාවෙහි ද **සුද්ධිකාරම්මණේ** සුද්ධික ආරම්මණයෙහි ද **චතුක්කනයවසේන** චතුෂ්ක නය වශයෙන් **දේසියමානං** දේශනා කරනුයේ **යා (දේවතා)** යම් දේවතාවෝ **බුජ්ඣිතුං** අවබෝධ කරන්නට **සක්කොන්ති** හැකිවෙත් ද **තාසං** ඒ දේවතාවන්ට **සප්පාය වසේන** සත්ප්‍රාය වශයෙන් **සුද්ධිකපටිපදාය** සුද්ධික ප්‍රතිපදාවෙහි ද **සුද්ධිකාරම්මණේ** සුද්ධික ආරම්මණයෙහි ද **චතුක්කනයෝ** චතුෂ්ක නය **දේසිතෝ** දේශනා කරනලදි (**සුද්ධිකපටිපදාය** සුද්ධික ප්‍රතිපදාවෙහි ද **සුද්ධිකාරම්මණේ** සුද්ධික ආරම්මණයෙහි ද) **පඤ්චකනයවසේන** පඤ්චක නය වශයෙන් **දේසියමානං** දේශනා කරනුයේ **යා (දේවතා)** යම් දේවතාවෝ **බුජ්ඣිතුං** අවබෝධ කරන්නට **සක්කොන්ති** හැකිවෙත් ද **තාසං** ඒ දේවතාවන්ට **සප්පාය වසේන** සත්ප්‍රාය වශයෙන් (**සුද්ධිකපටිපදාය** සුද්ධික ප්‍රතිපදාවෙහි ද **සුද්ධිකාරම්මණේ** සුද්ධික ආරම්මණයෙහි ද) **පඤ්චකනයෝ** පඤ්චක නය (**දේසිතෝ** දේශනා කරනලදි) **ඉති** මෙසේ **පුග්ගලජ්ඣාසවසේන** පුද්ගලධ්‍යාශ වශයෙන් **හෙට්ඨා** පූර්වයෙහි සොළොස් වරක් කොට **දේසනා කතා** දේශනාව කරනලදි.

**දේසනාවිලාසප්පත්තෝ ච** අභිරුචි වශයෙන් පෙරළා දේශනා කරන්නට සමර්ථ **පභින්නපටිසම්භිදෝ** අර්ථාදීන්හි සුවිශේෂ භේදගත ප්‍රතිසම්භිදා ඥාණ ඇති **දසබලචතුවේසාරජ්ජවිසදඤාණෝ** දසබලඥාණ නොපැකිලෙන්නා වූ සතර වෙසරද නුවණ ඇති **ඒසෝ** ඒ භාග්‍යවතුන් වහන්සේ **ධම්මානං** ධර්මයන්ගේ **යාථාවසරසලක්ඛණස්ස** අවිපරීත ස්වභාවය ද අනිත්‍යාදී පොදු ලක්ෂණය ද **සුප්පටිවිද්ධත්තා** මනාව අවබෝධ කරගත් හෙයින් ද **ධම්මපඤ්ඤත්තිකුසලතාය** ධර්ම ප්‍රඥප්ති කුසලතාවයෙන් **යෝ යෝ නයෝ** යම් යම් නය ක්‍රම **ලබ්භති** ලැබෙයි ද **තස්ස තස්ස වසේන** ඒ ඒ නය ක්‍රමයගේ වශයෙන් **දේසනං නියමේතුං** දේශනා නියම කරන්නට **සක්කෝති** හැකිවන සේක **තස්මා** එහෙයින් **ඉමාය දේසනාවිලාසප්පත්තියා අපි** මේ දේශනා විලාශයට පැමිණියා වූ **තේන** භාග්‍යවතුන් වහන්සේ විසින් **පඨවීකසිණේ** පඨවි කසිණයෙහි **සුද්ධිකචතුක්කනයාදිවසේන** සුද්ධික චතුෂ්ක නය ආදී වශයෙන් **ඒසා දේසනා කතා** මේ දේශනා තොමෝ කරනලදි.

**යස්මා පන** යම්හෙයකින් වනාහි **යේ කේචි** යම් කිසිවෙක්හු **ඣානං උප්පාදෙන්ති නාම** ධ්‍යානයක් උපදවත් නම් **තේ** ඔවුහූ **ආරම්මණපටිපදාහි විනා**

ආරම්මණ ප්‍රතිපදාවෙන් තොරව **උප්පාදේතුං** උපදවන්නට **න සක්කොන්ති** නොහැකි වෙත් **තස්මා** එහෙයින් **ඣානුප්පත්තිකාරණත්තා** ධ්‍යාන උත්පත්තියට කරණු හෙයින් **නියමතෝ** නියම කිරීම් වශයෙන් **අයං සෝළසක්ඛත්තුනයෝ** මේ සොළොස් වාර නය **කථිතෝ** දේශනා කරනලදි.

**එත්තාවතා** මෙපමණකින් **සුද්ධිකනවකෝ ච** සුද්ධික නවකය ද **චත්තාරෝ පටිපදා නවකා ච** ප්‍රතිපදා නවක සතර ද **චත්තාරෝ ආරම්මණනවකා ච** ආරම්මණ නවක සතර ද **ඉමේ සෝළසනවකා ඉති** මේ සොළොස් නවක දැයි **පඤ්චවීසති නවකා** පස්විසි නවකයෝ **කථිතා හොන්ති** දේශනා කරන ලද්දේ වෙත් **තත්ථ** එහි **ඒකේකස්මිං නවකේ** එක් එක් නවකයෙහි **චතුක්කපඤ්චකවසේන** චතුෂ්ක පඤ්චක වශයෙන් **ද්වේ ද්වේ නයා ඉති** නය දෙක දෙක දැයි **පඤ්ඤාස නයා** නය පනසෙකි **තත්ථ** එහි **පඤ්චවීසතියා චතුක්කනයේ** පස්විසි චතුෂ්ක නයෙහි **සතං** සියයෙකි **පඤ්චකනයේසු** පඤ්චක නයෙහි **පඤ්චවීසසතං ඉති** පස්විස්සක් අධික සියයෙක් යැයි **පාඨතෝ** පෙළ වශයෙන් ද **පඤ්චවීසාධිකානි ද්වේ ඣානචිත්තසතානි හොන්ති** ධ්‍යාන චිත්තයෝ දෙසිය විසිපහක් වෙත් **පඤ්චකනයේ පන** පඤ්චක නයෙහි වනාහි **චතුක්කනයස්ස පවිට්ඨත්තා** චතුෂ්ක නය ඇතුලත් බැවින් **අත්ථතෝ** අර්ථ වශයෙන් **පඤ්චවීසාධිකමේව චිත්තසතං හෝති** පස්විස්සක් අධිකවූම සිත් සියයක් වෙයි **පාඨේ** පෙළෙහි **යානි ච ඒතානි පඤ්චවීසාධිකානි ද්වේ චිත්තසතානි** යම් ඒ දෙසිය විසිපහක් වූ චිත්තයෝ වේද **නිද්දේසේ** නිර්දේශයෙහි **තේසු** ඔහුන් අතුරෙන් **ඒකේකස්ස** එක් එක් චිත්තයකට **තයෝ තයෝ මහාවාරා හොන්ති** මහාවාරයෝ තුන තුන වෙත් **තේ පන** ඒ මහාවාරයෝ වනාහි **තත්ථ තත්ථ** ඒ ඒ තැන **නයමත්තමේව** නය මාත්‍රයම **දස්සෙත්වා** දක්වා **සඞ්ඛිත්තා** සංක්ෂේප කරනලදැයි **ඉති (වේදිතබ්බා)** දතයුතුයි.

**[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තන]**

කේනපන ඉමේසං ඣානානං අඞ්ගභේදෝ කතෝති. පුග්ගලජ්ඣාසයේන කතෝති. යෝහි විතක්කසහායෝ හුත්වා පඤ්චඞ්ගිකං පඨමජ්ඣානං උප්පාදෙත්වා තත්ථ වසීභාවං කත්වා පුන විතක්කේ නිබ්බින්දති. තස්ස විතක්කං සමතික්කමිත්වා අවිතක්කං චතුරඞ්ගිකං ඣානං අධිගන්තුං අජ්ඣාසයෝ සණ්ඨාති. තදා සෝ තමේව පඨමජ්ඣානං පාදකභාවත්ථාය දළ්හං සමාපජ්ජිත්වා වුට්ඨාය තේන අජ්ඣාසයේන සහේව පුන භාවනං අනුයුඤ්ජන්තෝ අවිතක්කං චතුරඞ්ගිකං ඣානං අධිගච්ඡති. තත්ථ සා භාවනා සයං විතක්කයුත්තාපි තේන අජ්ඣාසයේන පරිභාවිතත්තා විතක්කවිරාගභාවනා නාම හෝති. තස්සා භාවනාය බලේන තං ඣානං උප්පජ්ජමානං අවිතක්කං චතුරඞ්ගිකං උප්පජ්ජති. සේසජ්ඣානාධිගමේසුපි ඒසේවනයෝති. ඒවං පුග්ගලජ්ඣාසයේන තේසං ඣානානං අඞ්ගභේදෝ කතෝති වේදිතබ්බෝ. එත්ථච උත්තරුත්තරජ්ඣානාධිගමනේ පාදකභාවත්ථාය පුරිමපුරිමජ්ඣානස්ස සමාපජ්ජනං අවස්සං ඉච්ඡිතබ්බං. හෙට්ඨිමං හෙට්ඨිමං පගුණජ්ඣානං උපරිමස්ස උපරිමස්ස පදට්ඨානං හෝතීති අට්ඨකථායං වුත්තං. අජ්ඣාසයබලේන පන උත්තරජ්ඣානං උප්පජ්ජමානං පාදකජ්ඣානසදිසං න හෝති. පාදකජ්ඣානතෝහි පුග්ගලජ්ඣාසයෝව බලවතරෝ. තේනාහ භගවා ඉජ්ඣති භික්ඛවේ සීලවතෝ චේතෝපණිධි විසුද්ධත්තාති. අයඤ්ච අත්ථෝ උපරි ලෝකුත්තරචිත්තං පත්වා ආවි භවිස්සතීති.

**[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 49 යටතේ)]**

"අඞ්ගභේදෝ"ති පඨමජ්ඣානේ පඤ්ච අඞ්ගානි, දුතියජ්ඣානේ චත්තාරි අඞ්ගානීති ආදිකෝ අඞ්ගභේදෝ. "පුග්ගලජ්ඣාසයේනා"ති පුග්ගලස්ස

ඉච්ඡාවිසේසේන. ඉති අයං විසජ්ජනා. "සෝ"ති සෝ පුග්ගලෝ. "හී"ති විත්ථාරජෝතකෝ. විතක්කෝ සහායෝ යස්සාති විතක්කසහායෝ. "විතක්කේ නිබ්බින්දතී"ති ඕළාරිකෝවතායං විතක්කෝ, නීවරණානං ආසන්නේ ඨිතෝති ඒවං විතක්කේ ආදීනවං දිස්වා නිබ්බින්දති. තස්ස අජ්ඣාසයෝති සම්බන්ධෝ. විතක්කං විරාජේති විගමේති අතික්කමාපේතීති විතක්කවිරාගෝ. විතක්කවිරාගෝ ච සෝ භාවනා චාති සමාසෝ. "උත්තරුත්තරජ්ඣානාධිගමනේ"ති උත්තරි උත්තරි ඣානප්පටිලාභේ. අජ්ඣාසයබලේන පාදකජ්ඣානසදිසං න හෝතීති සම්බන්ධෝ. චේතෝපණිධි ඉජ්ඣතීති සම්බන්ධෝ. "විසුද්ධත්තා"ති සීලවිසුද්ධත්තා.

**[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 49 යටතේ)]**

**කේන පන** කුමක් හෙයින් වනාහි **ඉමේසං ඣානානං** මේ ධ්‍යානයන්ගේ **අඞ්ගභේදෝ** ප්‍රථම ධ්‍යානයෙහි අඞ්ග පසයි ද්‍විතිය ධ්‍යානයෙහි අඞ්ග සතරයි යැයි අඞ්ග භේදය **කතෝති?** කරනලද් ද? **පුග්ගලජ්ඣාසයේන** පුද්ගලධ්‍යාශයෙන් **කතෝ** කරන ලද්දේ **ඉති (හෝති)** වෙයි **හි** විස්තර කෙරෙමි **යෝ (පුග්ගලෝ)** යම් පුද්ගලයෙක් වනාහි **විතක්කසහායෝ හුත්වා** විතර්ක සහායෙකු වී **පඤ්චඞ්ගිකං** අඞ්ග පසකින් යුත් **පඨමජ්ඣානං** ප්‍රථම ධ්‍යානය **උප්පාදෙත්වා** උපදවා **තත්ථ** එහි **වසීභාවං කත්වා** පඤ්ච වසීතාවයෙන් වසී කොට **පුන** නැවත **විතක්කේ නිබ්බින්දති** මේ විතර්කය ඖදරිකයි නීවර්ණයන්ට ආසන්නව සිටින ලදැයි මෙසේ විතර්කයෙහි ආදීනව දැක කලකිරෙයි **තස්ස** ඔහුගේ අදහසට අනුව **විතක්කං සමතික්කමිත්වා** විතර්කය ඉක්මවා **අවිතක්කං** විතර්කය නොමැති **චතුරඞ්ගිකං** අඞ්ග සතරකින් යුත් **ඣානං** ධ්‍යානය **අධිගන්තුං** අවබෝධ කරන්නට **අජ්ඣාසයෝ** අදහස **සණ්ඨාති** පිහිටයි **තද** එකල්හි **සෝ (පුග්ගලෝ)** ඒ පුද්ගල තෙමේ **තමේව පඨමජ්ඣානං** ඒ ප්‍රථම ධ්‍යානයම **පාදකභාවත්ථාය** පාදකභාව පිණිස **දළ්හං** මනාව **සමාපජ්ජිත්වා** සමවැද **වුට්ඨාය** නැගී සිට **තේන අජ්ඣාසයේන සහේව** ඒ අදහසින් යුතුවම **පුන** නැවත **භාවනං අනුයුඤ්ජන්තෝ** භාවනාවෙහි යෙදෙනුයේ **අවිතක්කං** විතර්කය නොමැති **චතුරඞ්ගිකං** අඞ්ග සතරකින් යුත් **ඣානං** ධ්‍යානය **අධිගච්ඡති** අවබෝධ කරයි **තත්ථ** එහි **සා භාවනා** ඒ භාවනා තුමූ **සයං විතක්කයුත්තාපි** තෙමේ විතර්කයෙන් යුක්තවූයේද **තේන අජ්ඣාසයේන** ඒ විතර්කය නොමැති අදහසින් **පරිභාවිතත්තා** වැඩූ බැවින් **විතක්කවිරාගභාවනා නාම හෝති** විතර්කය නොමැති භාවනාවක් නම් වෙයි **තස්සා භාවනාය බලේන** ඒ භාවනාවගේ බලයෙන් **උප්පජ්ජමානං තං ඣානං** උපදින්නා වූ ඒ ධ්‍යානය **අවිතක්කං** විතර්කය නොමැතිව **චතුරඞ්ගිකං** අඞ්ග සතරකින් යුක්තව **උප්පජ්ජති** උපදී **සේසජ්ඣානාධිගමේසුපි** සෙසු ධ්‍යාන අවබෝධ කිරීමෙහි ද **ඒසේව නයෝ** මේ ක්‍රමයම **ඉති (හෝති)** වෙයි **ඒවං** මෙසේ **පුග්ගලජ්ඣාසයේන** පුද්ගලධ්‍යාශ වශයෙන් **තේසං ඣානානං** ඒ ධ්‍යානයන්ගේ **අඞ්ගභේදෝ** අඞ්ග භේදය **කතෝති** කරනලදැයි **වේදිතබ්බෝ** දතයුතුයි **ච** විශේෂයක් කියම් **එත්ථ** මෙහි **උත්තරුත්තරජ්ඣානාධිගමනේ** මතු මතු ධ්‍යාන අවබෝධ කිරීමෙහි **පාදකභාවත්ථාය** පාදකභාවය පිණිස **පුරිමපුරිමජ්ඣානස්ස** පෙර පෙර ධ්‍යානයට **සමාපජ්ජනං** සමවැදීම **අවස්සං** ඒකාන්තයෙන් **ඉච්ඡිතබ්බං** කැමතිවිය යුතුයි **හෙට්ඨිමං හෙට්ඨිමං පගුණජ්ඣානං** යට යට ප්‍රගුණ ධ්‍යානය **උපරිමස්ස උපරිමස්ස** මතු මතු ධ්‍යානයට **පදට්ඨානං හෝතීති** ආසන්න කාරණය වෙයි යැයි **අට්ඨකථායං** අර්ථකථායෙහි **වුත්තං** දේශනා කරනලදි **අජ්ඣාසයබලේන පන** අධ්‍යාශයෙහි බලයෙන් **උප්පජ්ජමානං** උපදින්නා වූ **උත්තරජ්ඣානං** මතු ධ්‍යානය **පාදකජ්ඣානසදිසං** පාදක ධ්‍යානය හා සමාන **න හෝති** නොවෙයි **හි (සච්චං)** ඒ කීම සැබෑවකි **පාදකජ්ඣානතෝ** පාදක ධ්‍යානයට වඩා **පුග්ගලජ්ඣාසයෝව**

පුද්ගලඥ්‍යාශයම **බලවතරෝ** බලවත්ය **තේන** එහෙයින් **භගවා** භාග්‍යවතුන් වහන්සේ **භික්ඛවේ** මහණෙනි **විසුද්ධත්තා** පිරිසිදු බැවින් **සීලවතෝ** සිල්වතාගේ **චේතෝපණිධි** චිත්ත ප්‍රාර්ථනාව **ඉජ්ඣති ඉති** සමෘද්ධ වෙයි යැයි **ආහ** දේශනා කළ සේක **උපරි** මත්තෙහි ද **ලෝකුත්තරචිත්තං පත්වා** ලෝකෝත්තර චිත්තයට පැමිණ ද **අයඤ්ච අත්ථෝ** මේ අර්ථයම **ආවි භවිස්සති** එන්නේය. **[පරමත්ථදීපනී ටීකා පරිවර්තන]**

## විතර්කාදී ධර්ම පසට ධ්‍යාන යැයි කීමට හේතු:—

යං පන වුත්තං **"පඤ්චඞ්ගවිප්පහීනං පඤ්චඞ්ගසමන්නාගත"**න්ති, තත්ථ කාමච්ඡන්දෝ, බ්‍යාපාදෝ, ථිනමිද්ධං, උද්ධච්චකුක්කුච්චං, විචිකිච්ඡාති ඉමේසං පඤ්චන්නං නීවරණානං පහානවසේන පඤ්චඞ්ගවිප්පහීනතා වේදිතබ්බා. න හි ඒතේසු අප්පහීනේසු ඣානං උප්පජ්ජති. තේනස්සේතානි පහානඞ්ගානීති වුච්චන්ති. කිඤ්චාපි හි ඣානක්ඛණේ අඤ්ඤේපි අකුසලා ධම්මා පහීයන්ති, තථාපි ඒතානේව විසේසේන ඣානන්තරායකරානි. කාමච්ඡන්දේන හි නානාවිසයප්පලෝභිතං චිත්තං න ඒකත්තාරම්මණේ සමාධියති. කාමච්ඡන්දාභිභූතං වා තං න කාමධාතුප්පහානාය පටිපදං පටිපජ්ජති. බ්‍යාපාදේන චාරම්මණේ පටිහඤ්ඤමානං න නිරන්තරං පවත්තති. ථිනමිද්ධාභිභූතං අකම්මඤ්ඤං හෝති. උද්ධච්චකුක්කුච්චපරේතං අවූපසන්තමේව හුත්වා පරිබ්භමති. විචිකිච්ඡාය උපහතං ඣානාධිගමසාධිකං පටිපදං නාරෝහති. ඉති විසේසේන ඣානන්තරායකරත්තා ඒතානේව **පහානඞ්ගානී**ති වුත්තානීති.

යස්මා පන විතක්කෝ ආරම්මණේ චිත්තං අභිනිරෝපෙති, විචාරෝ අනුප්පබන්ධති, තේහි අවික්ඛේපාය සම්පාදිතප්පයෝගස්ස චේතසෝ පයෝගසම්පත්තිසම්භවා පීති පීණනං, සුඛඤ්ච උපබ්‍රෑහනං කරෝති. අථ නං සසේස සම්පයුත්තධම්මං ඒතේහි අභිනිරෝපනානුප්පබන්ධනපීණනඋපබ්‍රෑහනේහි අනුග්ගහිතා ඒකග්ගතා ඒකත්තාරම්මණේ සමං සම්මා ච ආධියති, තස්මා විතක්කෝ විචාරෝ පීති සුඛං චිත්තේකග්ගතාති ඉමේසං පඤ්චන්නං උප්පත්තිවසේන පඤ්චඞ්ගසමන්නාගතතා වේදිතබ්බා. උප්පන්නේසු හි ඒතේසු පඤ්චසු ඣානං උප්පන්නං නාම හෝති. තේනස්ස ඒතානි පඤ්ච **සමන්නාගතඞ්ගානී**ති වුච්චන්ති. තස්මා න ඒතේහි සමන්නාගතං අඤ්ඤදේව ඣානං නාම අත්ථීති ගහේතබ්බං. යථා පන අඞ්ගමත්තවසේනේව චතුරඞ්ගිනී සේනා, පඤ්චඞ්ගිකං තූරියං, අට්ඨඞ්ගිකෝ ච මග්ගෝති වුච්චති, ඒවමිදම්පි අඞ්ගමත්තවසේනේව පඤ්චඞ්ගිකන්ති වා පඤ්චඞ්ගසමන්නාගතන්ති වා වුච්චතීති වේදිතබ්බං.

**[විසුද්ධිමග්ග අටුවා 01 (ඡට්ඨසඞ්ගායනා අංක 74 යටතේ); විසුද්ධිමග්ග අටුවා 107-108 පිටු (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය පඨවිකසිණ නිර්දේශය 220-222 පිටු (තායිවාන් මුද්‍රණය)]**

පඤ්ච අඞ්ගානි වික්ඛම්භනවසේන පහීනානි ඒතස්සාති **පඤ්චඞ්ගවිප්පහීනං**. "අග්‍යාහිතෝ"ති එත්ථ ආහිත-සද්දස්ස විය විප්පහීන-සද්දස්සෙත්ථ පරවචනං දට්ඨබ්බං, පඤ්චහි අඞ්ගේහි විප්පහීනන්ති වා **පඤ්චඞ්ගවිප්පහීනං**. නනු අඤ්ඤේපි අකුසලා ධම්මා ඉමිනා ඣානේන පහීයන්ති, අථ කස්මා පඤ්චඞ්ගවිප්පහීනතාව වුච්චතීති ආහ **"කිඤ්චාපී"**තිආදි. ඣානලාභිනෝපි අඣානසමඞ්ගිකාලේ ඣානපටිපක්ඛලෝභචිත්තාදීනං පවත්තිසබ්භාවතෝ **"ඣානක්ඛණේ"**ති වුත්තං. **පහීයන්තී**ති විගච්ඡන්ති, නප්පවත්තන්තීති අත්ථෝ. **ඒකත්තාරම්මණේ**ති පඨවීකසිණාදිවසේන ඒකසභාවේ, ඒකග්ගතාසඞ්ඛාතේ ඒකත්තාවහේ වා ආරම්මණේ. **තන්**ති තං නානාවිසයපලෝභිතං චිත්තං.

**කාමධාතුප්පහානායාති** නානාවිසයසමුපබ්‍යූළ්හාය කාමධාතුයා පහානාය සමතික්කමාය පටිපදං ඣානං නප්පටිපජ්ජති. **නිරන්තර**න්ති වික්ඛේපේන අනන්තරිතං, සහිතන්ති අත්ථෝ. **අකම්මඤ්ඤ**න්ති අකම්මනීයං, භාවනාකම්මස්ස අයෝග්‍යන්ති අත්ථෝ. **උද්ධච්චකුක්කුච්චපරේත**න්ති උද්ධච්චකුක්කුච්චේන අභිභූතං. **පරිබ්භමති** අනවට්ඨානතෝ, අවට්ඨානස්ස සමාධානස්ස අභාවතෝති අත්ථෝ. **විචිකිච්ඡාය උපහත**න්ති සාතිසයස්ස විචාරස්ස අභාවතෝ "සම්මාසම්බුද්ධෝ නු ඛෝ භගවා, න නු ඛෝ"ති, "පඨවී පඨවී"තිආදිනා මනසිකාරේන, "ඣානං සියා නු ඛෝ, න නු ඛෝ"තිආදිනා ච පවත්තාය විචිකිච්ඡාය උපහතං. **නාරෝහති** අප්පටිපත්තිනිමිත්තත්තා. **විසේසේන ඣානන්තරායකරත්තාති** සමාධිආදීනං උජුවිපච්චනීකභාවේන ඣානාධිගමස්ස අන්තරායකරණතෝ.

**තේහීති** ඣානාධිගමස්ස පච්චයභූතේහි විතක්කවිචාරේහි. **අවික්ඛේපාය සම්පාදිතප්පයෝගස්සාති** තතෝ ඒවං සමාධානාය නිප්ඵාදිතභාවනාපයෝගස්ස. **චේතසෝ පයෝගසම්පත්තිසම්භවාති** යථාවුත්තභාවනාපයෝගසම්පත්තිසමුට්ඨානා. **පීති පීණනං** භාවනාවසේන තප්පනං. **උපබෲහනං** භාවනාවසේන පරිවුද්ධිං චේතසෝ **කරෝතීති** සම්බන්ධෝ. **න**න්ති චිත්තං. **සසේසසම්පයුත්තධම්ම**න්ති අවසිට්ඨඵස්සාදිධම්මසහිතං, සමං සම්මා ච ආධියතීති සම්බන්ධෝ. ඉන්ද්‍රියසමතාවසේන **සමං,** පටිපක්ඛධම්මානං. දූරීභාවේ ලීනුද්ධච්චාභාවේන **සම්මා** ච ඨපේතීති අත්ථෝ. ඒකග්ගතා හි සමාධානකිච්චේන චිත්තං, සම්පයුත්තධම්මේ ච අත්තානං අනුවත්තාපෙන්තී ඣානක්ඛණේ සාතිසයං සමාහිතේ කරෝතීති. **උප්පත්තිවසේනාති** යථාපච්චයං උප්පජ්ජනවසේන. ඒතේසු විතක්කාදීසු ඣානං **උප්පන්නං නාම** හෝති තත්ථේව ඣානවෝහාරතෝ. තේනාහ **"තස්මා"**තිආදි. **"යථා පනා"**තිආදිනාපි උපමාවසේන තමේවත්ථං පාකටතරං කරෝති.

**[විසුද්ධිමග්ග මහාටීකා 01 (ඡට්ඨසඞ්ගායනා අංක 74 යටතේ)]**

"පඤ්චඞ්ගවිප්පහීනං පඤ්චඞ්ගසමන්නාගතන්ති යං පන වුත්තං එත්ථ" යි යොදනු **කාමච්ඡන්දෝ** කාමච්ඡන්දය **ව්‍යාපාදෝ** ව්‍යාපාදය **ථීනමිද්ධං** ථීනමිද්ධය **උද්ධච්චකුක්කුච්චං** ඖද්ධත්‍යකෞකෘත්‍යය **විචිකිච්ඡාති** විචිකිත්සාය යන **ඉමේසං පඤ්චන්නං නීවරණානං** මේ පඤ්ච නීවරණයන්ගේ **පහානවසේන** ප්‍රහාන වශයෙන් **පඤ්චඞ්ගවිප්පහීනතා** පඤ්චාඞ්ග විප්‍රහීනබව **වේදිතබ්බා** දතයුතු පඤ්චඞ්ගානි වික්ඛම්භනවසේන පහීනානි ඒතස්සාති පඤ්චඞ්ගවිප්පහීනං පඤ්චහි අඞ්ගේහි විප්පහීනන්ති වා පඤ්චඞ්ගවිප්පහීනං යනු වේ. **ඒතේසු අප්පහීනේසු** ඒ කාමච්ඡන්දදීන් අප්‍රහීන කල්හි **ඣානං නහි උප්පජ්ජති** ධ්‍යානය නොම උපදී **තේන** එහෙයින් **අස්ස** මේ ධ්‍යානයාගේ **ඒතානි** මේ කාමච්ඡන්දදීහු **පහානඞ්ගානීති** ප්‍රහාන අඞ්ගයහයි **වුච්චන්ති** කියනු ලැබෙත් **කිඤ්චාපි හි** කිසිසේත් **ඣානක්ඛණේ** ධ්‍යාන ක්‍ෂණයෙහි ධ්‍යානලාභීහට ධ්‍යාන සමන්විත නොවන කාලයෙහි ධ්‍යාන ප්‍රතිපක්‍ෂ නොවන ලෝභචිත්තාදීන්ගේ ප්‍රවෘත්ති සද්භාවයෙන් "ඣානක්ඛණේ" යි කීහු. **අඤ්ඤේපි අකුසලා ධම්මා** ලෝභ චිත්තෝත්පාදදී සෙසු අකුසල ධර්මයෝ ද **පහීයන්ති** පැහෙත්; නොපවතී යන අර්ථයි. **තථාපි** එතකුදුවුවත් **ඒතානේව** මේ කාමච්ඡන්දදීහුම **විසේසේන ඣානන්තරායකරානි** වෙසෙසින් ධ්‍යානයට අන්තරාය කරන්නෝයි **කාමච්ඡන්දේන හි** කාමච්ඡන්දයෙන් **නානා (ලම්බන) විසයප්පලෝභිතං චිත්තං** නානාලම්බන හෙයින්ම පොලොඹවනලද සිත **ඒකතාරම්මණේ** පඨවිකසිණාදි විසින් ඒකස්වභාවාලම්බනයෙහි (එක එක ස්වභාවාලම්බනයෙහි) නොහොත් ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත ඒකත්වය එළවන අරමුණෙහි **න සමාධියති** සමාහිත නොවේ

**කාමච්ඡන්දාභිභූතං වා** කාමච්ඡන්දයෙන් මඩනාලද **තං** ඒ චිත්තය **කාමධාතුප්පහානාය** නානා විෂය සම්මුඛ වූ කාමධාතුවගේ ප්‍රහානය (සමතික්‍රමය පිණිස) **පටිපදං** ධ්‍යානයට **න පටිපජ්ජති** නොපැමිණේ **ව්‍යාපාදේන ච** ව්‍යාපාදයෙනුදු **ආරම්මණේ පටිහඤ්ඤමානං** අරමුණෙහි ගැටෙන්නේ **න නිරන්තරං පවත්තති** නිරන්තරයෙන් නොපවතී; වික්ෂේපයෙන් අන්තරිතනොව සමාහිතව නොපවතී යන අර්ථයි. **ථීනමිද්ධාභිභූතං** ථීනමිද්ධයෙන් මඩනාලද්දේ **අකම්මඤ්ඤං හෝති** භාවනා කර්මයට ක්‍ෂම නොවේ; යෝග නොවේ යන අර්ථයි. **උද්ධච්චකුක්කුච්චපරේතං** ඖද්ධත්‍යකෞකෘත්‍යය දෙකෙන් යුක්තවූයේ; මඩනාලද්දේ. **අවූපසන්තමේව හුත්වා** නොසංහිඳීම **පරිබ්භමති** බමා; නොසංහුන්නහුට සමාදනයක් නැති හෙයින් පරිභ්‍රමණය කෙරේ යන අර්ථයි. **විචිකිච්ඡාය උපහතං** සාතිසය විචාරය නැති බැවින් භගවත් සම්බුද්ධවේදෝ හෝ නොහොත් නොවේදෝ හෝයි ද පඨවි පඨවී යනාදි මනස්කාරයෙන් ධ්‍යානය වේදෝ හෝ නොවේදෝ හෝයි ද යනාදී නයින් ප්‍රවෘත්ත වූ විචිකිත්සායෙන් පහරනා ලද්දේ **ඣානාධිගමසධිකං පටිපදං** ධ්‍යානයාගේ අධිගමය සාදන්නා වූ පිළිවෙතට **නාරෝහති** අප්‍රතිපත්ති නිමිත්ත හෙයින් නොනැගේ **ඉති** මෙසේ **විසේසේන** වෙසසින් **ඣානන්තරායකරත්තා** සමාධි ආදීන්ට සෘජු ප්‍රතිපක්‍ෂ බැවින් ධ්‍යානයට අන්තරාය කරන හෙයින් **ඒතානේව** මේ කාමච්ඡන්දාදීහුම **පහානාඞ්ගානීති වුත්තානි** ප්‍රහානඞ්ගයහයි කියනලදහු.

**යස්මා පන** යම්හෙයකින් වනාහි **විතක්කෝ** විතර්කය තෙමේ **ආරම්මණේ චිත්තං අභිනිරෝපේති** අරමුණේ සිත්හු නඟා ද **විචාරෝ** විචාරය තෙමේ **අනුබන්ධති** අරමුණෙහි සිත්හු බඳීද **තේහි** ධ්‍යානාධිගමයට ප්‍රත්‍යය වූ ඒ විතර්ක විචාර දෙකින් **අවික්ඛේපාය සම්පාදිතප්පයෝගස්ස** වික්ෂේප නොවනු පිණිස නිපදවනලද ප්‍රයෝග ඇත්තහුගේ **චේතසෝ** සිත්හුගේ "පීණනං උපබ්‍රෑහනඤ්ච කරෝති" යි යොදනු. **පයෝගසම්පත්තිසම්භවා** පීති යථෝක්ත භාවනාවගේ ප්‍රයෝග සම්පත්තීන් උපන් ප්‍රීති තොමෝ **පීණනං** භාවනා වශයෙන් තර්පණය ද **සුඛඤ්ච** සුඛය ද **උපබ්‍රෑහනං** සුඛ පරිවෘද්ධිය ද **කරෝති** කෙරේ **අථ** ඉක්බිත්තෙන් **සසේසසම්පයුත්තධම්මං** සෙසු ස්පර්ශාදී සම්ප්‍රයුක්ත ධර්මයන් සහිත වූ **නං** ඒ චිත්තය "සමං සම්මා ආධියති" සම්බන්ධ කරනු. **අභිනිරෝපනානුප්පබන්ධනපීණනඋපබ්‍රෑහණේහි** අභිනිරෝපනය අනුබන්ධනය ප්‍රීණනය උපබ්‍රෑහනය යන මොහුන් කරන **ඒතේහි** විතර්කය විචාරය ප්‍රීතිය සුඛය යන මොහුන් විසින් **අනුග්ගහිතා ඒකග්ගතා** අනුග්‍රහ කරනලද ඒකාග්‍රතා තොමෝ **ඒකත්තාරම්මණේ** යථෝක්ත ලක්‍ෂණ ඒකත්වාලම්බනයෙහි **සමං** ඉන්ද්‍රියසමතා වශයෙන් සම කොට **සම්මා** ප්‍රතිපක්‍ෂ භාවයන්ගේ දූරීභාවයෙහි ලීනෝද්ධත නොවන බැවින් මනා කොට **ආධියති** පිහිටුවා ඒකාග්‍රතා තොමෝ සමාධාන කෘත්‍යයෙන් චිත්තය ද සම්ප්‍රයුක්ත ධර්මයන් ද තමා අනුකරන්නී ධ්‍යාන ක්‍ෂණයෙහි සාතිසයවම සමාහිත කෙරේ **තස්මා** එහෙයින් **විතක්කෝ** විතර්කය **විචාරෝ** විචාරය **පීති** ප්‍රීතිය **සුඛං** සුඛය **චිත්තේකග්ගතාති** චිත්තේකාග්‍රතා යයි **ඉමේසං පඤ්චන්නං** මේ පස් දෙනාගේ **උප්පත්තිවසේන** යථාප්‍රත්‍යයෙන් උත්පත්ති වශයෙන් **පඤ්චඞ්ගසමන්නාගතතා වේදිතබ්බා** පසඟින් සමන්විතබව දතයුත්තීයි **උප්පන්නේසු හි ඒතේසු පඤ්චසු** මේ විතර්කාදී ධ්‍යානාඞ්ගයන් පස් දෙනා උපන් කල්හි **ඣානං උප්පන්නං නාම හෝති** ධ්‍යාන ව්‍යවහාරය මොහුන් කෙරෙහිම බැවින් ධ්‍යානය උත්පන්න නම් වෙයි **තේන** එහෙයින් **අස්ස** මේ ධ්‍යානයාගේ **ඒතානි පඤ්ච** මේ විතර්කාදි පස් දෙන **සමන්නාගතඞ්ගානීති** යෙදෙන අඞ්ගයහයි **වුච්චන්ති** කියනු ලැබෙත්.

**තස්මා** එහෙයින් **ඒතේහි සමන්නාගතං** මේ විතර්කාදි පසගින් සමන්විත වූ **අඤ්ඤදේව ඣානං නාම අත්ථීති** ඒ පඤ්චාඞ්ගයන් මිස අනෙක්ම ධ්‍යානයෙක් නම් ඇතැයි **න ගහේතබ්බං** නොගතයුතු **යථා පන** යම්සේ **අඞ්ගමත්තවසේනේව** අඞ්ගමාත්‍ර වශයෙන්ම **චතුරඞ්ගිනී සේනා** සතරඅඟින්යුත් සේනාය **පඤ්චඞ්ගිකඤ්ච තූරියං** පඤ්චාඞ්ගයක් ඇති තූරියය **අට්ඨඞ්ගිකෝ ච මග්ගෝති** අෂ්ටාඞ්ගයක් ඇති මාර්ගයයි **වුච්චති** කියනු ලැබේද **ඒවං** එපරිද්දෙන්ම **ඉදම්පි** මේ ධ්‍යානය ද **අඞ්ගමත්තවසේනේව** අඞ්ගමාත්‍ර විසින් **පඤ්චඞ්ගිකං ඉති වා** පඤ්චාඞ්ගයක් ඇත්තේයයිදු **පඤ්චඞ්ගසමන්නාගතන්ති වා** පඤ්චාඞ්ගයෙන් යුක්තයයිදු **වුච්චතීති** කියනු ලැබෙයි **වේදිතබ්බං** දතයුතු ෴ **[විසුද්ධි මාර්ග මහා සන්නය 352-355 පිටු]**

කස්මා පන අඤ්ඤේසු ඵස්සාදීසු සම්පයුත්තධම්මේසු විජ්ජමානේසු ඉමේයේව පඤ්ච ඣානඞ්ගවසේන වුත්තාති? වුච්චතේ උපනිජ්ඣානකිච්චවන්තතාය, කාමච්ඡන්දාදීනං උජුපටිපක්ඛභාවතෝ ච. විතක්කෝ හි ආරම්මණේ චිත්තං අභිනිරෝපේති. විචාරෝ අනුප්පබන්ධේති, පීති චස්ස පීනනං, සුඛඤ්ච උපබ්‍රූහනං කරෝති, අථ නං සසම්පයුත්තධම්මං ඒතේහි අභිනිරෝපනානුප්පබන්ධන පීනනඋපබ්‍රූහනේහි අනුග්ගහිතා ඒකග්ගතා සමාධානකිච්චේන අත්තානං අනුවත්තාපෙන්තී ඒකත්තාරම්මණේ සමං, සම්මා ච ආධියති. ඉන්ද්‍රියසමතාවසේන සමං පටිපක්ඛධම්මානං දූරීභාවේන ලීනුද්ධච්චාභාවේන සම්මා ච ඨපේතීති ඒවමේතේ සමේව උපනිජ්ඣානකිච්චං ආවේණිකං. කාමච්ඡන්දදිපටිපක්ඛභාවේ පන සමාධි කාමච්ඡන්දස්ස පටිපක්ඛෝ රාගප්පණිධියා උජුපච්චනීකභාවතෝ. කාමච්ඡන්දවසේන හි නානාරම්මණේහි පලෝභිතස්ස පරිබ්භමන්තස්ස චිත්තස්ස සමාධානං ඒකග්ගතාය හෝති. පීති බ්‍යාපාදස්ස පාමොජ්ජසභාවත්තා. විතක්කෝ ථිනමිද්ධස්ස යෝනිසෝ සඞ්කප්පනවසේන සවිප්ඵාරප්පවත්තිතෝ සුඛං අවූපසමානුතාපසභාවස්ස උද්ධච්චකුක්කුච්චස්ස වූපසන්තසීතලසභාවත්තා. විචාරෝ විචිකිච්ඡාය ආරම්මණේ අනුමජ්ජනවසේන පඤ්ඤාපතිරූපසභාවත්තා. ඒවං උපනිජ්ඣානකිච්චවන්තතාය, කාමච්ඡන්දාදීනං උජුපටිපක්ඛභාවතෝ ච ඉමේයේව පඤ්ච ඣානඞ්ගභාවේන වවත්ථිතාති. යථාහු;

"උපනිජ්ඣානකිච්චත්තා, කාමාදිපටිපක්ඛතෝ;
සන්තේසුපි ච අඤ්ඤේසු, පඤ්චේව ඣානසඤ්ඤිතා"ති.

උපෙක්ඛා පනෙත්ත සන්තවුත්තිසභාවත්තා සුඛේව අන්තෝගධාති දට්ඨබ්බං. තේනාහු "උපෙක්ඛා සන්තවුත්තිත්තා, සුඛමිච්චේව භාසිතා"ති. (විභ. අට්ඨ. 232; විසුද්ධි. 2.644)

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 21 යටතේ); විභාවනී ටීකා 66-64 පිටු; අභිධර්ම ප්‍රවේශනය 24-26 පිටු; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ පුරාණ සන්නය 29-32 පිටු; සද්ධර්මසාගරය 02/445-446 පිටු; විස්තර භාව සන්නය 46 පිට; සාමණේර ප්‍රශ්නය 16 පිට; අභිධර්ම චන්ද්‍රිකාව 32 පිට; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 22-23 පිටු]**

**කස්මා** කුමක් හෙයින් **අඤ්ඤේසු** අවශේෂ වූ **ඵස්සාදීසු** ස්පර්ශාදිහු **සම්පයුත්තධම්මේසු** එක්ව යෙදුනාවූ ධර්මයෝ තුමූ **විජ්ජමානේසුපි** විද්‍යමාන වතුදු **ඉමේයේව පඤ්ච** මේ ධර්මයෝ පස්දෙනම **ඣානවසේන** ධ්‍යානයාගේ වශයෙන් **වුත්තා පන** කියනලද්දහු දැයි **ඉති** (**අයං** මේ වනාහි **පුච්ඡා** ප්‍රශ්නයයි **පරිහාරෝ** ඊට පරිහාරය **මයා** මා විසින් **වුච්චතේ** කියනු ලැබේ ඒ පරිහාරය කුමක්දැයි යන චෝද්‍යය සඳහා "උපනිජ්ඣාන -පෙ- භාවතෝ" යනාදි පාඨය කියනලදි)

**උපනිජ්ඣානකිච්චවන්තතාය ච** කසිණාදී වූ අරමුණ කරා එළඹ නරඹන කෘත්‍යය ඇති හෙයින් ද **කාමච්ඡන්දදීනං** කාමච්ඡන්ද නීවර්ණාදීන්ට **උජුපටිපක්ඛභාවතෝ ච** ඉදුරා ප්‍රතිපක්ෂ හෙයින් ද **වුත්තා** කියනලද්දහුය (විතර්කාදී පස් වැදෑරුම් ධර්මයෝ තුමූ කසිණාදී අරමුණු කරා එළඹ නරඹන කෘත්‍ය ඇති හෙයිනැයි ආචාර්ය තෙම කීයේය. ඒ කසිණාදී අරමුණ කරා එළඹ කෙසේ නරඹන්නේ දැයි චෝද්‍යය සඳහා "විතක්කෝ හි" යනාදී පාඨය කියන ලදි)

(හි යනු විත්ථාරයිස්සාමි යනාර්ථයි) **විතක්කෝ** විතර්ක තෙමේ **ආරම්මණේ** අරමුණෙහි **චිත්තං** සිත **අභිනිරෝපයති** අභිමුඛ කොට නංවයි **විචාරෝ** විචාර තෙමේ **අනුප්පබන්ධේති** අනුකූලකොට ගළපයි **පීති ච** ප්‍රීති තොමෝ ද **අස්ස (ආරම්මණස්ස)** ඒ අරමුණ **පීනනං කරෝති** ප්‍රිය භාවය කරවයි **සුඛඤ්ච** සුඛය ද **උපබ්‍රෑහණං කරෝති** වැඩි වර්ධනය කරයි **අථ** ඊට අනතුරුව (අථ ශබ්දය මඞ්ගලාර්ථයෙහි නිපාතයි. මඞ්ලාර්ථය යනු පද අලඞ්කාර මාත්‍රයෙකි) **ඒතේහි අභිනිරෝපනානුප්පබන්ධන-පීනනඋපබ්‍රෑහණේහි** ඒ නැංවීම ගැළපීම ප්‍රිය කරවීම වැඩීම යන කෘත්‍යවත් වූ විතර්ක විචාර ප්‍රීති සුඛයන් විසින් **අනුග්ගහිතා** අනුග්‍රහ කරන ලද්දවූ **ඒකග්ගතා** සමාධි තෙමේ **සසම්පයුත්තධම්මං** සම්ප්‍රයුක්ත ධර්ම සහිත වූ **තං චිත්තං** ඒ ධ්‍යාන චිත්තය (අනුවත්තාපෙන්ති ආධියති යන ක්‍රියා දෙපදය හා සමඟම කර්මය සම්බන්ධ කටයුතුයි) **සමාධානකිච්චේන** මොනවට අරමුණෙහි පිහිටුවන කෘත්‍යයෙන් **අත්තානං** තමා හට **අනුවත්තාපෙන්ති** අනුව පවත්වත් **ඒකන්තාරම්මණේ** එකක් බවට පැමිණි අරමුණෙහි **සමං** සමකොට **සම්මා ච** මනා කොට ද **ආධියති** පිහිටුවයි (සමව මොනවට පිහිටුවන්නේ යයි ආචාර්ය තෙම කීයේය. කවර ප්‍රකාරයෙකින් සමව මොනවට පිහිටුවන්නේද යන චෝද්‍යය සඳහා "ඉන්ද්‍රියසමතාවසේන -පෙ- ඨපේති" යන පාඨය කියනලදි)

**ඉන්ද්‍රියසමතාවසේන** ශ්‍රද්ධාදී පඤ්චේන්ද්‍රියයන්ගේ සමානත්ව සඞ්ඛ්‍යාත ශක්ති වශයෙන් **සමං** සමකොට **පටිපක්ඛධම්මානං** ප්‍රතිපක්ෂ වූ නීවර්ණ ධර්මයන්ගේ **දූරීභාවේන** දුරුවූ බැවින් **ලීනුද්ධච්චාභාවේන** චිත්තයාගේ සැඟවුන බව හා නොසන්සුන් බව නැති බැවින් **සම්මා ච** මනාකොට ද **ඨපේති** පිහිටුවයි (ඉන්ද්‍රියසමතාවසේන යන පාඨයෙන් "සමං" යන පදයාගේ අර්ථය ද "පටිපක්ඛධම්මානං දූරීභාවේන ලීනුද්ධච්චාභාවේන" යන පාඨයෙන් "සම්මා" යන පදයාගේ අර්ථය ද "ඨපේති" යන ක්‍රියා පදයෙන් "ආදියති" යන ක්‍රියාවගේ අර්ථය ද දක්වන ලද්දහුය) **ඒවං** මෙසේ **ඒතේසමේව** ඒ විතර්කාදී පඤ්චප්‍රකාර ධර්මයන්ටම **උපනිජ්ඣානකිච්චං** කසිණාදී අරමුණු නරඹන කෘත්‍ය තෙමේ **ආවේණිකං හෝති** වෙන් වශයෙන් අයත්වූයේ වේ (කාමච්ඡන්දදී නීවර්ණ ධර්මයන්ට ප්‍රතිපක්ෂ වූ හෙයින් විතර්කාදී පඤ්චප්‍රකාර ධර්මයෝ තුමූ ධ්‍යානාඞ්ග නම් වෙති කීහු. කරව ධ්‍යානාඞ්ගයක් තෙමේ කවර නීවර්ණ ධර්මයකට ප්‍රතිපක්ෂ වන්නේ ද යන චෝද්‍යය සඳහා "කාමච්ඡන්දදී" යනාදී පාඨය කියනලදි)

**කාමච්ඡන්දීපටිපක්ඛභාවේ පන** කාමච්ඡන්දදීන්ට ප්‍රතිපක්ෂ භාවයෙහි වනාහි **විනිච්ඡයෝ** විනිශ්චය **ඒවං** මේ වක්ෂ්‍යමාන ප්‍රකාරයෙන් **වේදිතබ්බෝ** දතයුතුයි (මෙසේ පාඨශේෂ බහා අර්ථ යෝජනා කටයුතුයි) **රාගප්පණිධියා** අරමුණෙහි දැඩි වශයෙන් ඇලුණාවූ තෘෂ්ණාවට **උජුපච්චනීකභාවතෝ** ඉඳුරා පසමිතුරු බැවින් **සමාධි** ඒකාග්‍රතා තොමෝ **කාමච්ඡන්දස්ස** කාමච්ඡන්ද නීවර්ණයට **පටිපක්ඛෝ** සතුරු වේ (සමාධි තෙමේ කාමච්ඡන්දයට ඉඳුරා විරුද්ධ යයි කීහ. ඒ විරුද්ධ වීම කෙසේදැයි

යන චෝද්‍යය සඳහා "කාමච්ඡන්දවසේන -පෙ- ඒකග්ගතාය හෝති" යන පාඨය කියනලදි)

(හි යනු කස්මා අර්ථයෙහි නිපාතයි) **කාමච්ඡන්දවසේන** කාමච්ඡන්දයාගේ වශයෙන් **නානාරම්මණේහි** නන් අරමුණන් විසින් **පලෝභිතස්ස** පොළඹවන ලද්දවූ **පරිබ්භමන්තස්ස** හාත්පසින් භ්‍රමණය කරන්නාවූ **චිත්තස්ස** චිත්තයාගේ **සමාධානං** මොනවට අරමුණෙහි පිහිටීම **ඒකග්ගතාය හෝති** සමාධියෙන් වේද **තස්මා** එසේ හෙයින් **සමාධි** සමාධි තෙමේ **කාමච්ඡන්දස්ස** කාමච්ඡන්ද නීවර්ණයට **උජුපටිපක්ඛෝ හෝති** ඉඳුරා ප්‍රතිපක්‍ෂ වේ **පාමොජ්ජසභාවත්තා** අරමුණෙහි ප්‍රමුදිත ස්වභාව ඇති හෙයින් **පීති** ප්‍රීති තොමෝ **ව්‍යාපාදස්ස** ද්වේශයට **පටිපක්ඛා හෝති** පසමිතුරු වේ **යෝනිසෝ** හේතු යුක්ති වශයෙන් **සඞ්කප්පනවසේන** කල්පනා කිරීම් වශයෙන් **සවිප්ඵාරප්පවතිතෝ** පැතිරීම් සහිත හටගැණීම් ඇති හෙයින් **විතක්කෝ** විතර්ක තෙමේ **ථීනමිද්ධස්ස** ථිනමිද්ධ නීවර්ණයට **පටිපක්ඛෝ හෝති** පසමිතුරු වේ **සුඛං** සුඛ තෙමේ **වූපසන්තසීතලසභාවත්තා** චිත්තයාගේ සංසුන් සිසිල් ස්වභාව ඇති හෙයින් **අවූපසමානුතාපසභාවස්ස** චිත්තයාගේ නොසංසුන් පසුතැවිලි ස්වභාව ඇත්තාවූ **උද්ධච්චකුක්කුච්චස්ස** උද්ධච්චකුක්කුච්ච නීවර්ණයට **පටිපක්ඛං හෝති** පසමිතුරු වේ **විචාරෝ** විචාර තෙමේ **ආරම්මණේ** අරමුණෙහි **අනුමජ්ජනවසේන** නැවත නැවත පිරිමැදීම් වශයෙන් **පඤ්ඤාපටිරූපසභාවත්තා** පඤ්ඤාව හා සදෘශ ස්වභාව ඇති බැවින් **විචිකිච්ඡාය** විචිකිච්ඡා නීවර්ණයට **පටිපක්ඛෝ හෝති** පසමිතුරු වේ **ඒවං** මෙසේ **උපනිජ්ඣානකිච්චවන්තතාය ච** කසිණාදී අරමුණු නරඹන කෘත්‍ය ඇති හෙයින් ද **කාමච්ඡන්දදීනං** කාමච්ඡන්දදී නීවර්ණයන්ට **උජුපටිපක්ඛභාවතෝ ච** ඉඳුරා පසමිතුරු බැවින් ද **ඉමේසේව** පඤ්ච මේ ධර්මයෝ පස්දෙනම **ඣානඞ්ගභාවේන** ධ්‍යානාඞ්ග වශයෙන් **වවත්ථිතා** නියම කරනලද්දහුය.

**යථා (යේන පකාරේන)** යම් පරිද්දෙකින් **ඉමේ යේව පඤ්ච** මේ ධර්මයෝ පස්දෙනම **ඣානඞ්ගභාවේන** ධ්‍යානාඞ්ග වශයෙන් **වවත්ථිතා** නියම කරනලද්දහු ද **තථා (තේන පකාරේන)** එපරිද්දෙන් **පෝරාණා** අර්ථකථාචාර්‍ය්‍යවරයෝ තුමූ **උපනිජ්ඣාන** -පෙ- **සඤ්ඤිතාති** උපනිජ්ඣාන -පෙ- සඤ්ඤිතා යන **ඉමං ගාථං** මේ ගය **ආහ** කීහු.

**උපනිජ්ඣානකිච්චත්තා ච** කසිණාදී අරමුණු කරා එළඹ නරඹන කෘත්‍ය ඇති හෙයින් ද **කාමාදිපටිපක්ඛතෝ ච** කාමච්ඡන්දදී නීවර්ණ ධර්මයන්ට ඉඳුරා ප්‍රතිපක්‍ෂ හෙයින් **අඤ්ඤේසු** පඤ්චධ්‍යානාඞ්ගයන්ගෙන් අන්‍යවූ ධර්මයෝ තුමූ **සන්තේසුපි** ඇත්තාහුදු **පඤ්චේව** විතර්කාදී ධ්‍යානාඞ්ග පඤ්චකයම **ඣානසඤ්ඤිතා** ධ්‍යාන යයි සම්මත කරනලද්දහුය (විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා යන පස්දෙනම ධ්‍යානාඞ්ගහයි ආචාර්‍ය්‍ය තෙම කීයේය. උපේක්‍ෂාව ද ධ්‍යානාඞ්ග වශයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනාකරන ලද්දේ නොවේද යන චෝද්‍යයට පරිහාර පිණිස "උපෙක්ඛා පනෙත්ථ -පෙ- දට්ඨබ්බං" යන පාඨය කියනලදි) **එත්ථ** මේ ධ්‍යානාඞ්ග විනිශ්චයෙහි ("දට්ඨබ්බං" යන්නෙහි සම්බන්ධයි. නොහොත්) **එත්ථ** මේ විතර්කාදී පඤ්චප්‍රකාර ධ්‍යානාඞ්ගයන් අතුරෙන් ("සුඛේයේව" යන්නෙහි සම්බන්ධයි) **උපෙක්ඛා පන** උපේක්‍ෂා තොමෝ වනාහි **සන්තවුත්තිසභාවත්තා** සංසුන් ස්වභාව ඇති හෙයින් **සුඛේයේව** සුඛයෙහිම **අන්තෝගධා** ඇතුළත් වන්නීය **ඉති** මෙසේ **දට්ඨබ්බං** දතයුතුයි **තේන** එසේ උපේක්‍ෂා වේදනාව සුඛයෙහි ඇතුළත් වන හෙයින් **උපෙක්ඛා** -පෙ-

**භාසිතාති** උපෙක්ඛා -පෙ- භාසිතා යනු **ආචරියා** අර්ථකථාචාය්‍ය්‍යීවරයෝ තුමූ **ආහු** කීහු.

(උදහරණයාගේ අර්ථ මෙසේයි) **උපෙක්ඛා** උපේක්‍ෂා වේදනාව **සන්තවුත්තිත්තා** සංසුන් ස්වභාව ඇති බැවින් **සුඛමිච්චේව** සුඛයයි කියාම **භාසිතා** වදරණ ලදි.
**[විභාවනී ටීකා සන්නය 104-107 පිටු]**

ඒවං කාමචිත්තසඞ්ගහං දස්සෙත්වා ඉදනි යථානුප්පත්තං රූපචිත්තසඞ්ගහං දස්සෙන්තෝ **විතක්කවිචාරපීතිසුඛේකග්ගතාසහිත**න්තිආදිමාහ. විතක්කෝච විචාරෝච පීතිච සුඛඤ්ච ඒකග්ගතාචාති ද්වන්දෝ. තාහි සහිතන්ති සමාසෝ. විතක්කවිචාරපීතිසුඛේකග්ගතා සඞ්ඛාතේන සමුදිතේන පඨමජ්ඣානේන සම්පයුත්තං කුසලචිත්තං **පඨමජ්ඣානකුසලචිත්තං**. තත්ථ කේනට්ඨේනපඨමං, කේනට්ඨේනච ඣානන්ති. ආදිතෝ පට්පජ්ජිතබ්බත්තා **පඨමං**. කසිණාදිකස්ස ආරම්මණස්ස අනිච්චාදිලක්ඛණස්සච උපනිජ්ඣායනතෝ පච්චනීකධම්මානඤ්ච ඣාපනතෝ දය්හනතෝ **ඣානං**. ඉමේසු ද්වීසු අත්ථෙසු ඒකග්ගතාඒව සාතිසයයුත්තාති දට්ඨබ්බා. සා හි ඒකත්තාරම්මණසඞ්ඛාතෝ ඒකෝ අග්ගෝකෝට්කොට්ඨාසෝවා අස්සාති අත්ථේන ඒකග්ගසඞ්ඛාතස්ස චිත්තස්ස තථාපවත්තනේ ආධිපච්චගුණයෝගේන **ඒකග්ගතා**ති ච වුච්චති. සායේව චිත්තං නානාරම්මණේසු වික්ඛිපිතුං අදත්වා ඒකස්මිං යේවාරම්මණේ පට්පක්ඛධම්මානං දූරීභාවේන සම්මා ච ආධියති ඨපේති. ඉන්ද්‍රියානඤ්ච සමභාවං කත්වා තත්ථේව ලීනුද්ධච්චාභාවාපාදනේන සමඤ්ච ආධියති ඨපේතීති අත්ථේන සමාධීතිච වුච්චති. සායේව ච පාළියං අවික්ඛේපෝ අවිසාහාරෝ සණ්ඨිති අවට්ඨිතීති නිද්දිට්ඨාති. විතක්කාදයෝපි පන තස්සා සාතිසයං උපකාරකත්තා ඣානන්තේව වුත්තා. තථා හි විතක්කෝ තාව චිත්තං ථිනමිද්ධවසේන ඕසක්කිතුං අදත්වා දළ්හං ආරම්මණාභිමුඛමේව කරෝති. ආරම්මණාභිනිරෝපන ලක්ඛණෝහි විතක්කෝ. ථිනමිද්ධනීවරණස්සච උජුප්පට්පක්ඛෝති. විචාරෝ ච නං විචිකිච්ඡාවසේන සංසප්පිතුං අදත්වා දළ්හං ආරම්මණානුබන්ධමේව කරෝති. ආරම්මණානුමජ්ජනලක්ඛණෝ හි විචාරෝ පඤ්ඤදපකතිකෝ. විචිකිච්ඡානීවරණස්ස ච උජුප්පට්පක්ඛෝති. පීති ච චිත්තං බ්‍යාපාදවසේන උක්කණ්ඨිතුං අදත්වා ආරම්මණේ පරිතුට්ඨමේව කරෝති. ආරම්මණසංපියායනලක්ඛණා හි පීති. බ්‍යාපාදනීවරණස්ස ච උජුප්පට්පක්ඛාති. තථා සුඛඤ්ච නං උද්ධච්චකුක්කුච්චවසේන අවූපසමිතුං අදත්වා ආරම්මණේ ලද්ධසාතං උපබ්‍රෑහිතං කරෝති. සාකලක්ඛණඤ්හි සුඛං, උද්ධච්චකුක්කුච්චනීවරණස්සච උජුප්පට්පක්ඛන්ති.

උපෙක්ඛාච සන්තසභාවත්තා සුඛේඒව සඞ්ගහිතාති. ඒවං කරොන්තාව තේ ධම්මා තස්මිං ආරම්මණේ තස්ස චිත්තස්ස සුට්ඨු ඒකග්ගභාවත්ථාය ච හොන්ති. ඒකග්ගභාවෝති ච ඒකග්ගතායේව. සා ච ඒකග්ගතා තේහි ධම්මේහි තථා අනුග්ගහිතා සුට්ඨු බලවතී හුත්වා සයං කාමච්ඡන්දවසේන නානාරම්මණේසු චිත්තවිධාවනං නීවාරෙත්වා කසිණනිමිත්තාදිකේ තස්මිං ආරම්මණේ නිච්චලං ඨත්වා තං ආරම්මණං උපගන්ත්වා නිජ්ඣායති ඕලෝකේති. තස්මා තේ සබ්බේපි ධම්මා උපනිජ්ඣායනට්ඨේනපි ඣානන්ති වුත්තාති. තේසුච තථා පවත්තමානේසු තප්පච්චනීකා නීවරණධම්මා ඕකාසං අලභිත්වා මනස්මිංපි පරියුට්ඨිතුං න සක්කොන්ති. ඣාපිතා නාම හොන්ති. තස්මා තේ පච්චනීකජ්ඣාපනට්ඨේනපි ඣානන්ති වුත්තාති. ඒවං සන්තේපි යස්මා ඣාන මග්ග සම්බෝධිසඞ්ඛාතේසු තීසු ඨානේසු ධම්මසාමග්ගී පධානං හෝති. අඞ්ගානං සමග්ගභාවේ ඒව අප්පනාපත්තිවසේන උපනිජ්ඣායනාදි කිච්චසංසිද්ධිතෝ. යස්මා ච ඒතේ ධම්මා

වුත්තනයේන විසුං විසුං අත්තනෝ කිච්චං කරොන්තාපි චිත්තස්ස ආරම්මණේ නිච්චලප්පවත්ති සඞ්ඛාතං ඒකමේව උපනිජ්ඣානකිච්චං සාධෙන්ති. තස්මා රථඞ්ගානං සමුදයේඒව රථවෝහාරෝ විය තේසං සමුදයේඒව ඣානවෝහාරෝ සිද්ධෝති වේදිතබ්බෝ. අපරේ පන පඤ්චන්නංපි තේසං ආරම්මණාභිනිරෝපනාදීනි යථාසකං කිච්චානියේව විසුං විසුං උපනිජ්ඣානකිච්චානි නාම හොන්තීති පට්ඨානේ ඣානපච්චයං පත්වා සබ්බේපේතේ විසුං විසුං ඣානපච්චයං සාධෙන්තියේව. තස්මා තේ විසුං විසුංපි ඣානානියේව හොන්තීති සක්කා වත්තුං. යථා ච පඤ්චඞ්ගිකං සීලං දසඞ්ගිකං සීලන්ති එත්ථ පඤ්චසමුදිතාදීනි තේසං සීලානං පඤ්චඞ්ගිකාදිනාම ලාභස්සේව කාරණානි හොන්ති. න සීලභාවස්ස. න හි පාණාතිපාතා වේරමණාදිකං ඒකංපි සමානං සීලං නාම න හෝතීති. ඒවමේවං ඉධපි පඤ්චසමුදිතාදීනි පඤ්චඞ්ගිකාදි භාවස්සේව පඨමජ්ඣානාදි භාවස්සේවච කාරණානි. න පන ඣානභාවස්සාති න සක්කා විඤ්ඤාතුං. ඉතරථා ඣානපච්චයේ ඣානඞ්ගානි පච්චනියානියේව සියුන්තිපි වදන්ති. එත්තාවතා සතිපි ඉමස්ස චිත්තස්ස ඵස්සාදීහිපි සහිතභාවේ තේසං තථාවිධකිච්චවිසේසාභාවා ඉධ අග්ගහණන්තිපි සිද්ධං නහෝතීති. විචාරපීතිසුඛේකග්ගතා සඞ්ඛාතේන දුතියජ්ඣානේන සම්පයුත්තං කුසලචිත්තං දුතියජ්ඣාන කුසලචිත්තං, ඒවං සේසේසුපි.

**[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 48 යටතේ)]**

"සමුදිතේනා"ති පඤ්චඞ්ගසමුදිතේන. පඤ්චන්නං අඞ්ගානං ඒකතෝ සාමග්ගිභූතේනාති අත්ථෝ. පඤ්චන්නඤ්හි ඒකතෝ සාමග්ගියං සතියේව අප්පනා හෝති, නෝ අසති. සාමග්ගියන්ති ච සුට්ඨු බලවතාය සමග්ගභාවේති අත්ථෝ. "පටිපජ්ජිතබ්බත්තා"ති පත්තබ්බත්තා. ඣානං දුවිධං ආරම්මණූපනිජ්ඣානඤ්ච ලක්ඛණූපනිජ්ඣානඤ්චාති ආහ "කසිණාදිකස්සා"ති ආදිං. ඉධ පන ආරම්මණූපනිජ්ඣානං අධිප්පේතං. උපනිජ්ඣානන්ති ච කසිණ නිමිත්තාදිකං ආරම්මණං චේතසා උපගන්ත්වානිජ්ඣානං ඕලෝකනං. ඣානසද්දස්ස ඣාපනත්ථෝපි සම්භවතීති වුත්තං "පච්චනීකධම්මානඤ්ච ඣාපනතෝ"ති. අග්ගිනා විය කට්ඨානං කිලේසානං දය්හනතෝති අත්ථෝ. ඒකග්ගතා ඒව සාතිස්සය යුත්තා අප්පනාපත්තකාලේති අධිප්පායෝ. පුබ්බභාගේ පන පඨමජ්ඣානේ විතක්කස්ස බලවභාවෝ ඉච්ඡිතබ්බෝ. "සාහී"ති ආදිනා තදත්ථං විවරති. සාහි ඒකග්ගතාති ච වුච්චතීති සම්බන්ධෝ. ඒකෝ අත්තාසභාවෝ අස්සාති ඒකත්තං. ඒකත්තං ආරම්මණමස්සාති ඒකත්තාරම්මණා. ඒකග්ගතා. තස්ස භාවෝති විග්ගහෝ.

අග්ගසද්දෝ කෝටි අත්ථෝ. කොට්ඨාසට්ඨෝවා. "තථා පවත්තනේ"ති චිත්තස්ස ඒකග්ගභාවේන පවත්තියං. "ආධිප්පච්චගුණයෝගේනා"ති අධිපතිභාවගුණයෝගේන. ඉන්ද්‍රියපච්චයතාගුණයෝගේනාති වුත්තං හෝති. සායේව ඒකග්ගතා ඒකග්ගතා, සමාධී,ති ච වුච්චතීති සම්බන්ධෝ. "සමාධී"ති පදස්ස සංආධීති-වා, සමආධීති-වා, ද්විධා පදච්ඡේදෝ. තත්ථ සංඋපසග්ගෝ සම්මාසද්දත්ථෝ. සමසද්දෝ පන ධම්මේන සමේන රජ්ජං කාරේතීති ආදීසු විය නාමිකසද්දෝති ද්විධා විකප්පං දස්සෙන්තෝ "සායේව චිත්ත"න්ති ආදිමාහ. සායේව චිත්තං සම්මා ච ආධියතීති සමාධි, සායේව චිත්තං සමඤ්ච ආධියතීති සමාධීති ද්විධා විකප්පෝ. තත්ථ සම්මා චාති සුන්දරේන. ආධියතීති ආදහති. ආදහනඤ්ච ඨපනමේවාති වුත්තං "ඨපේතී"ති. සමඤ්චාති අවිසමඤ්ච. "තත්රේවා"ති තස්මිං ආරම්මණේ ඒව. "ලීනුද්ධච්චාභාවාපාදනේනා"ති ලීනස්ස ච උද්ධච්චස්ස ච අභාවෝ ලීනුද්ධච්චාභාවෝ. තස්ස ආපාදනං ආපජ්ජාපනන්ති විග්ගහෝ. විවිධේන චිත්තස්ස සංහරණං විසාහාරෝ. න විසාහාරෝ අවිසාහාරෝ. සායේව ච නිද්දිට්ඨා. ඉති ඒවං

ඉමේසු ද්වීසු අත්ථේසු ඒකග්ගතා ඒව සාතිස්සයයුත්තාති යෝජේතබ්බං. ඒවං පන සති, ඒකග්ගතා ඒව ඣානන්ති වත්තබ්බා, න විතක්කාදයෝති චෝදනං පරිහරන්තෝ "විතක්කාදයෝ පනා"ති ආදිමාහ. අපිසද්දෝ සම්පිණ්ඩනත්ථෝ. පනසද්දෝ පක්ඛන්තරත්ථෝ. තස්සා ඒකග්ගතාය. "සාතිස්සය"න්ති අතිස්සයේන සහ. "ඕසක්කිතු"න්ති සංසීදිතුං. "නං"ති චිත්තං. "සංසප්පිතු"න්ති ඒවං නු ඛෝ, අඤ්ඤථා නු ඛෝති ද්විධා චඤ්චලිතුං. "උක්කණ්ඨිතු"න්ති අඤ්ඤාභිමුඛී භවිතුං. ආරම්මණන්ති වුත්තං හෝති. ලද්ධං සාතං යේනාති ලද්ධස්සාතං. "සාතං"ති සාරත්තං. "උපබ්‍රෑහිතං"ති භුසංවඩ්ඪිතං. "සන්තසභාවත්තා"ති උපසන්තසභාවත්තා. "තථා අනුග්ගහිතා"ති ආරම්මණාභිමුඛකරණාදිවසේන අනුග්ගහිතා. සමාධිස්ස කාමච්ඡන්දනීවරණප්පටිපක්ඛත්තා "සයං…පෙ…. නීවාරෙත්වා"ති වුත්තං. "නිච්චලං ඨත්වා"ති අප්පනාකිච්චමාහ.

ඒවං උපනිජ්ඣානත්ථං දස්සෙත්වා ඣාපනත්ථං දස්සෙන්තෝ "තේසු වා"ති ආදිමාහ. "තප්පච්චනීකා"ති තේසං ඣානඞ්ගධම්මානං පච්චනීකා පටිපක්ඛා. "මනස්මිං පී"ති මනෝද්වාරේපි. පගේව කායවචීද්වාරේසූති ඒවං සම්භාවනත්ථෝ චෙත්ථ පිසද්දෝ. අපිසද්දෝපි යුජ්ජති. "ඣාපිතා නාම හොන්තී"ති ඣානඞ්ග ධම්මග්ගීහි දඩ්ඪානාම හොන්ති. "ඒවං සන්තේපි තේසං සමුදායේ ඒව ඣාන වෝහාරෝ සිද්ධෝ"ති යෝජනා. "ධම්මසාමග්ගිපධාන"න්ති ඣානට්ඨානේ ඣානඞ්ග ධම්මානං මග්ගට්ඨානේ මග්ගඞ්ගධම්මානං බෝධිට්ඨානේ බොජ්ඣඞ්ගධම්මානං සමග්ගභාවප්පධානං.

ඒවං සඞ්ගහකාරානං මතියා ඣානං වත්වා ඉදානි අපරේසානං මතියා තං දස්සේතුං "අපරේ"ති ආදිමාහ. අපරේ පන වදන්තීති සම්බන්ධෝ. තත්ථ "යථා සකං කිච්චානී"ති සස්ස ඉදං සකං. සස්සාති අත්තනෝ. ඉදන්ති සන්තකං. යානි යානි අත්තනෝ සන්තකානීති අත්ථෝ. "ඉතී"ති තස්මා. "පට්ඨානේ ඣානපච්චයං පත්වා…පෙ…. සාධෙන්තියේව". වුත්තඤ්හි තත්ථ. ඣානපච්චයෝති ඣානඞ්ගානි ඣානසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ඣානපච්චයේන පච්චයෝ. මග්ගපච්චයෝති මග්ගඞ්ගානි මග්ගසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං මග්ගපච්චයේන පච්චයෝති. "පඤ්චසමුදිතාදීනී"ති පඤ්චසමූහ දසසමූහානි. "පඨමජ්ඣානාදිභාවස්සේවචා"ති පඨමජ්ඣානාදි නාමලාභස්සේවචාති අධිප්පායෝ. "ඣානභාවස්සා"ති ඣානනාමලාභස්ස. "තථාවිධකිච්චවිසේසාභාවා"ති තථා විධානං ආරම්මණාභිනිරෝපනාදීනං කිච්ච විසේසානං අභාවතෝ. **[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 48 යටතේ)]**

**ඒවං** මෙසේ **කාමචිත්තසඞ්ගහං** කාමාවචර චිත්ත සඞ්ග්‍රහය **දස්සෙත්වා** දක්වා **ඉදානි** දැන් **යථානුප්පත්තං** පිළිවෙළින් පැමිණියා වූ **රූපචිත්තසඞ්ගහං** රූපාවචර චිත්ත සඞ්ග්‍රහය **දස්සෙන්තෝ** දක්වමින් **විතක්කවිචාරපීතිසුඛේකග්ගතාසහිතං ඉති ආදිමාහ** විතක්කවිචාරපීතිසුඛේකග්ගතාසහිතං යනාදිය වදළ සේක **විතක්කෝ ච** විතර්කය ද **විචාරෝ ච** විචාරය ද **පීති ච** ප්‍රීතිය ද **සුඛං ච** සුඛය ද **ඒකග්ගතා ච ඉති** ඒකාග්‍රතාවය ද යනු **ද්වන්දෝ** ද්වන්දයකි **තාහි සහිතං ඉති සමාසෝ** ඒ ධර්මයන් හා යුක්තවූයේනුයි සමාසයි **විතක්කවිචාරපීතිසුඛේකග්ගතා සඞ්ඛාතේන සමුදිතේන** විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සඞ්ඛාත අඞ්ග පසකින් හටගත් **පඨමජ්ඣානේන සම්පයුත්තං කුසලචිත්තං** ප්‍රථම ධ්‍යානය හා සම්ප්‍රයුක්ත කුසල චිත්තය **පඨමජ්ඣානකුසලචිත්තං** ප්‍රථම ධ්‍යාන කුසලචිත්තය නම් **තත්‍ථ** එහි **කේනට්ඨේන**

**පඨමං (හෝති?)** කවර අර්ථයකින් ප්‍රථම වෙයි ද? **කේනට්ඨේන ඣානං ඉති (හෝති?)** කවර අර්ථයකින් ධ්‍යාන වෙයි ද? **ච (ඒවං** මෙසේ **පුච්ඡායං සති** ප්‍රශ්නයක් ඇති කල්හි **පරිහාරෝ වුච්චතේ** පරිහාරය කියනු ලැබේ) **ආදිතෝ** මුලින්ම **පටිපජ්ජිතබ්බත්තා** පැමිණිය යුතු බැවින් **පඨමං** ප්‍රථම නම් **කසිණාදිකස්ස ආරම්මණස්ස** කසිණාදි අරමුණාගේ ද **අනිච්චාදිලක්ඛණස්ස ච** අනිත්‍යාදී ලක්ෂණයාගේ ද **උපනිජ්ඣායනතෝ** ළඟට එළඹ නරඹන හෙයින් ද **පච්චනීකධම්මානඤ්ච ඣාපනතෝ දය්හනතෝ** ගින්න දර දවන්නාක් මෙන් කාමච්ඡන්දදී සතුරු ධර්මයන්ගේ දවන හෙයින් ද **ඣානං** ධ්‍යාන නම් (ආරම්මණුපනිජ්ඣායනය ද ලක්ඛණුපනිජ්ඣායනය යැයි ධ්‍යානය දෙවැදෑරුම් වෙයි. මෙහි වනාහි ආරම්මණුපනිජ්ඣායනයම අදහස් කරනලදි යනු අනුදීපනීපාඨයි) **ඉමේසු ද්විසු අත්ථේසු** මේ අර්ථ දෙකෙහි **ඒකග්ගතා ඒව** අර්පණාවට පැමිණි කාලයෙහි වූ ඒකාග්‍රතාවයම **සාතිසයයුත්තා ඉති දට්ඨබ්බා** අතිශයින් යුක්ත යැයි දතයුතුයි **සා හි** ඒකාග්‍රතා තුමූ වනාහි **ඒකත්තාරම්මණසඞ්ඛාතෝ** එකග වූ ආරම්මණ සඞ්ඛ්‍යාත **ඒකෝ** එකග බවක් **අග්ගෝ කෝටි කොට්ඨාසෝ වා** ශ්‍රේෂ්ඨ බවක් **අස්ස ඉති අත්ථේන** චිත්තයටනුයි යන අර්ථයෙන් **ඒකග්ගසඞ්ඛාතස්ස චිත්තස්ස** ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත චිත්තයාගේ **තථාපවත්තනේ** එසේ පැවතීමෙහි **ආධිපච්චගුණයෝගේන** අධිපතිභාව ගුණයෙන් යුක්තවීමෙන් **ඒකග්ගතා ඉති ච** ඒකාග්‍රතා යැයි ද **වුච්චති** කියනු ලැබේ **සායේව** ඒ ඒකාග්‍රතා තුමූම **චිත්තං** චිත්තය **නානාරම්මණේසු** නානාරම්මණයන්හි **වික්ඛිපිතුං අදත්වා** විසිරේන්නට නොදී **පටිපක්ඛධම්මානං** කාමච්ඡන්දදී ප්‍රතිපක්ෂ ධර්මයන්ගේ **දූරීභාවේන** දුරුකිරීමෙන් **ඒකස්මිං යේවාරම්මණේ** එක් අරමුණෙක්හි **සම්මා ච** මනා කොට ද **ආධියති** පිහිටුවයි **ඨපේති** තබයි **ඉන්ද්‍රියානඤ්ච** ශ්‍රද්ධාදී පඤ්චේන්ද්‍රියන්ගේ ද **සමභාවං කත්වා** සම භාවය කොට ද **තත්ථේව** එසේම **ලීනුද්ධච්චාභාවාපාදනේන** චිත්තයාගේ නොහැකිලුණු බවට ද නොවිසිරෙන බවට ද පැමිණවීමෙන් **සමඤ්ච** මනා කොට ද **ආධියති** පිහිටුවයි **ඨපේති ඉති** තබයි යන **අත්ථේන** අර්ථයෙන් **සමාධි ඉති ච** සමාධිය යැයි ද **වුච්චති** කියනු ලැබේ **ච** විශේෂයක් කියම් **සායේව** ඒ සමාධියම **පාළියං** දම්සඟුණු පෙළෙහි **අවික්ඛේපෝ අවිසාහාරෝ සණ්ඨිති අවට්ඨිති ඉති** අවික්ඛේපෝ අවිසාහාරෝ සණ්ඨිති අවට්ඨිති යැයි **නිද්දිට්ඨා** දක්වනලදි (ආචාර්‍යයන් වහන්ස මෙසේ ඇති කල්හි ඒකාග්‍රතාවයම ධ්‍යානය යැයි කිවයුතු වන්නේ ද? විතර්කාදිය ධ්‍යානය යැයි නොකියයුතු වන්නේද? යන චෝද්‍යයට පරිහාර පිණිස "විතක්කාදයෝපි පන" යැයි දේශනා කළේය. අපි ශබ්දය සම්පිණ්ඩනාර්ථයි) **පන** පක්‍ෂාන්තරයක් දක්වම් **විතක්කාදයෝපි** විතර්ක විචාරදිය ද **තස්සා** ඒකාග්‍රතාවයට **සාතිසයං උපකාරත්තා** අතිශයින් උපකාර බැවින් **ඣානං ඉති ඒව** ධ්‍යානයම යැයි **වුත්තා** දේශනා කරනලදි **හි** විස්තර කෙරෙම් **තථා** එසේම **විතක්කෝ** විතර්කය තෙමේ **තාව** පළමුව **චිත්තං** චිත්තය **ථීනමිද්ධවසේන** ථීනමිද්ධයාගේ වශයෙන් **ඕසක්කිතුං** පසුබසින්නට **අදත්වා** නොදී **දළ්හං** මනා කොට **ආරම්මණාභිමුඛමේව කරෝති** ආරම්මණයට අභිමුඛ කොට නැංවීම කරයි **විතක්කෝ හි** විතර්කය වනාහි **ආරම්මණාභිනිරෝපනලක්ඛණෝ (හෝති)** ආරම්මණයට අභිමුඛ කොට නැංවීමේ ලක්‍ෂණය වෙයි **ථීනමිද්ධනීවරණස්ස ච** ථීනමිද්ධ නීවරණයට ද **උජුප්පටිපක්ඛෝ ඉති (හෝති)** ඍජුවම ප්‍රතිපක්‍ෂ වෙයි **විචාරෝ ච** විචාරය තෙමේ ද **නං (චිත්තං)** ඒ චිත්තය **විචිකිච්ඡාවසේන** විචිකිච්ඡාවගේ වශයෙන් **සංසප්පිතුං** එසේද මෙසේද යැයි දෙයාකාරයෙන් සැලෙන්නට **අදත්වා** නොදී **දළ්හං** මනා කොට **ආරම්මණානුබන්ධමේව කරෝති** ආරම්මණයට අනුකූල කොට ගැළපීම කරයි **විචාරේ හි** විචාරය වනාහි **පඤ්ඤපකතිකෝ ඉති (හෝති)** ප්‍රකෘතියෙන් ප්‍රඥාවෙන් යුක්ත වෙයි

**විචිකිච්ඡානීවරණස්ස ච** විකිච්ඡා නීවරණයට ද **උජුප්පටිපක්කෝ ඉති (හොති)** සෘජුව ප්‍රතිපක්‍ෂ වෙයි **පීති ච** ප්‍රීතිය ද **චිත්තං** චිත්තය **ව්‍යාපාදවසේන** ව්‍යාපාදයාගේ වශයෙන් **උක්කණ්ඨිතුං** අරමුණෙහි කලකිරෙන්නට **අදත්වා** නොදී **ආරම්මණේ** අරමුණෙහි **පරිතුට්ඨමේව කරෝති** වෙසෙසින් සතුටුම කරයි **පීති හි** ප්‍රීතිය වනාහි **ආරම්මණසම්පියායනලක්ඛණා (හෝති)** අරමුණෙහි පිනවන ලක්‍ෂණය ඇත්තේම වෙයි **බ්‍යාපාදනීවරණස්ස ච** ව්‍යාපාද නීවරණයට ද **උජුපටිපක්ඛා ඉති (හෝති)** සෘජුවම ප්‍රතිපක්‍ෂ වෙයි **තථා** එසේම **සුඛං ච** සුඛය ද **නං (චිත්තං)** ඒ චිත්තය **උද්ධච්චකුක්කුච්චවසේන** උද්ධච්ච කුක්කුච්චයාගේ වශයෙන් **අවූපසමිතුං** නොසංසිඳෙන්නට **අදත්වා** නොදී **ආරම්මණේ** අරමුණෙහි **ලද්ධසාතං** ලබනලද සුවය ඇත්තේ **උපබ්‍රෑහිතං කරෝති** සම්ප්‍රයුක්ත ධර්මයන් වර්ධනය කරයි **සුඛං හි** සුඛය වනාහි **සාතලක්ඛණං (හෝති)** සැප එලවන ස්වභාවය ලක්‍ෂණය වෙයි **උද්ධච්චකුක්කුච්චනීවරණස්ස ච** උද්ධච්ච කුක්කුච්ච නීවරණයට ද **උජුපටිපක්ඛං ඉති (හෝති)** සෘජුව ප්‍රතිපක්‍ෂ වෙයි.

**උපෙක්ඛා ච** උපේක්‍ෂාව ද **සන්තසභාවත්තා** ශාන්ත ස්වභාවය ඇති බැවින් **සුඛේ ඒව** සැපයෙහිම **සඞ්ගහිතා ඉති (හෝති)** සඞ්ග්‍රහ කරන ලද්දේ වෙයි **ඒවං (තථාරූපං)** මෙබඳු **කරොන්තා ච තේ ධම්මා** (කෘත්‍යයන්) කරන්නා වූ ඒ ධර්මයෝ **තස්මිං ආරම්මණේ** මේ අරමුණෙහි **තස්ස චිත්තස්ස** ඒ චිත්තයට **සුට්ඨු** මනා කොට **ඒකග්ගභාවත්ථාය** එකඟභාවය පිණිස ද **ච (උපකාරකා) හොන්ති** උපකාරකයෝ වෙත් **ඒකග්ගභාවෝ ඉති ච** ඒකග්ගභාවය යනු ද **ඒකග්ගතායේව** ඒකාග්‍රතාවයම වේ **සා ච ඒකග්ගතා** ඒ ඒකාග්‍රතාවය ද **තේහි ධම්මේහි** ඒ ධර්මයන්ගෙන් **තථා** එසේ **අනුග්ගහිතා** අනුග්‍රහ ලබන ලද්දේ **සුට්ඨු** මනාව **බලවතී හුත්වා** බල ඇත්තියක් වී **සයං** තුමූ **කාමච්ඡන්දවසේන** කාමච්ඡන්දයාගේ වශයෙන් **නානාරම්මණේසු** නානාරම්මණයන්හි **චිත්තවිධාවනං** චිත්තයාගේ දිවීම **නීවාරෙත්වා** නවත්වා **කසිණනිමිත්තාදිකේ** කසිණ නිමිත්ත ආදී වූ **තස්මිං ආරම්මණේ** ඒ අරමුණෙහි **නිච්චලං ඨත්වා** නිශ්චලව සිට **තං ආරම්මණං** ඒ අරමුණ වෙතට **උපගන්ත්වා** පැමිණ **නිජ්ඣායති** මෙනෙහි කරයි **ඕලෝකේති** බලයි **තස්මා** එහෙයින් **තේ සබ්බේපි ධම්මා** ඒ සියළු ධර්මයෝ ද **උපනිජ්ඣායනට්ඨේනපි** උපනිජ්ඣායන අර්ථයෙන් ද **ඣානං ඉති** ධ්‍යානය යැයි **වුත්තා ඉති (හොන්ති)** දේශනා කරන ලද්දේ වෙත් (මෙසේ උපනිජ්ඣායන අර්ථය දක්වා ඣාපන අර්ථය දක්වමින් "තේසු ච" යනුවෙන් දේශනා කරනලදි) **තථා** එසේම **තේසු ච පවත්තමානේසු** ඒ ධර්මයන් පවතින කල්හි **තප්පච්චනීකා නීවරණධම්මා** ඒ ධ්‍යානයට පසමිතුරු නීවරණ ධර්මයෝ **ඕකාසං අලභිත්වා** අවකාශයක් නොලැබ **මනස්මිං අපි** මනෝද්වාරයෙහි ද **පරියුට්ඨිතුං** නැඟී සිටින්නට **න සක්කොන්ති** නොහැකි වෙත් **ඣාපිතා නාම හොන්ති** ධ්‍යානාඞ්ග ධර්ම නැමැති ගින්නෙන් දවන ලද්දේ නම් වෙති **තස්මා** එහෙයින් **තේ** ඒ ධ්‍යානාඞ්ග ධර්මයෝ **පච්චනීකජ්ඣාපනට්ඨේනපි** පසමිතුරු ධර්මයන් දවන අර්ථයෙන් ද **ඣානං ඉති** ධ්‍යාන යැයි **වුත්තා ඉති (හොන්ති)** දේශනා කරන ලද්දේ වෙත් (මෙසේ ඇති කල්හි ද ඒ ධර්මයන්ගේ සමූහයම ධ්‍යාන ව්‍යවහාරය සිද්ධය යනු අනුදීපනී ටීකායි) **ඒවං සන්තේපි** මෙසේ ඇති කල්හි දු **යස්මා** යම්හෙයකින් **ඣානමග්ගසම්බෝධිසඞ්ඛාතේසු තීසු ඨානේසු** ධ්‍යාන මාර්ග සම්බෝධි සඞ්ඛ්‍යාත තුන් ස්ථානයන්හි **ධම්මසාමග්ගී පධානං හෝති** ධ්‍යාන ස්ථානයෙහි ධ්‍යානාඞ්ග ධර්මයන්ගේ ද මාර්ග ස්ථානයෙහි මාර්ගාඞ්ග ධර්මයන්ගේ ද බෝධි ස්ථානයෙහි බොජ්ඣඞ්ග ධර්මයන්ගේ ද සමභාවය ප්‍රධාන වෙයි **අඞ්ගානං** ධ්‍යානාඞ්ගයන්ගේ **සමග්ගභාවේ ඒව** සමභාවයෙහිම **අප්පනාපත්තිවසේන** අර්පණා ප්‍රාප්ත වශයෙන් **උපනිජ්ඣායනාදි**

විමසා බැලීම් ආදී **කිච්චසංසිද්ධිතෝ** කෘත්‍යය සම්පූර්ණ වීම් වශයෙන් ද (**පධානං හෝති** ප්‍රධාන වෙයි) **ච (සච්චං)** ඒ කීම සැබෑවකි **යස්මා** යම්හෙයකින් **ඒතේ ධම්මා** ඒ ධ්‍යාන ධර්මයෝ **වුත්තනයේන** කියනලද ක්‍රමයෙන් **විසුං විසුං** වෙන වෙනම **අත්තනෝ කිච්චං** තමාගේ කිස **කරොන්තාපි** කරමින් ද **චිත්තස්ස** චිත්තයට ද **ආරම්මණේ** අරමුණෙහි **නිච්චලප්පවත්තිසඞ්ඛාතං** නිශ්චලව පැවතීම් සඞ්ඛ්‍යාත **ඒකමේව උපනිජ්ඣානකිච්චං සාධෙන්ති** ඒකම උපනිජ්ඣායන කිස ද සිද්ධ කරත් **තස්මා (යස්මා)** යම්සේ **රථඞ්ගානං** රථ අඞ්ගයන්ගේ **සමුදයේ ඒව** සමූහයෙහිම **රථවෝහාරෝ විය** රථය යන ව්‍යවහාරය මෙන් **තේසං** මේ ධ්‍යාන ධර්මයන්ගේ **සමුදයේව** සමුහයෙහිම **ඣානවෝහාරෝ සිද්ධෝ ඉති** ධ්‍යානය ව්‍යවහාරය සිද්ධ යැයි **වේදිතබ්බෝ** දතයුතුයි (මෙසේ සඞ්ග්‍රහකරක තෙරවරුන්ගේ මතයෙන් ධ්‍යානය විස්තර කොට දැන් අන්‍යයන්ගේ මතයෙන් ඒ ධ්‍යානය විස්තර කිරීම පිණිස "අපරේ" යැයි දේශනා කරනලදි) **අපරේ පන** අන්‍යයෝ වනාහි **තේසං පඤ්චන්නං අපි** ඒ ධ්‍යාන ධර්ම පස්දෙනාගේම **ආරම්මණාභිනිරෝපනාදීනි** ආරම්මණාභිනිරෝපන ආදී වූ **යථාසකං කිච්චානියේව** ස්වකීය කෘත්‍යයෙහිම **විසුං විසුං** වෙන වෙනම **උපනිජ්ඣානකිච්චානි නාම** උපනිජ්ඣායන කෘත්‍යයෝ නම් **හොන්ති** වෙත් **ඉති (තස්මා)** එහෙයින් **පට්ඨානේ** ප්‍රස්ථානයෙහි **ඣානපච්චයං පත්වා** ධ්‍යාන ප්‍රත්‍යයට පැමිණ **ඒතේ සබ්බේපි** ඒ සියළු ධ්‍යානාඞ්ග ධර්මයෝම **විසුං විසුං** වෙන වෙනම **ඣානපච්චයං සාධෙන්තියේව** ධ්‍යාන ප්‍රත්‍යය සිද්ධකරත්මය **තස්මා** එහෙයින් **තේ** ඒ ධ්‍යානාඞ්ග ධර්මයෝ **විසුං විසුං අපි** වෙන වෙනම ද **ඣානානියේව හොන්ති ඉති** ධ්‍යානයෝම වෙත් යැයි **වත්තුං** කියන්නට **සක්කා** හැකිය **ච** උපමාවක් දක්වම් **යථා** යම්සේ **පඤ්චඞ්ගිකං සීලං** අඞ්ග පසකින් යුත් සීලය **දසඞ්ගිකං සීලං ඉති** අඞ්ග දහයකින් යුත් සීලය යන **එත්ථ** මෙහි **පඤ්චසමුදිතාදීනි** අඞ්ග පසකින් හටගත්තා වූ **තේසං සීලානං** ඒ සීලයන්ට **පඤ්චඞ්ගිකාදිනාමලාභස්සේව** අඞ්ග පසකින් යුත් සීලයක් යන නාමය ලැබීමටම **කාරණානි හොන්ති** කාරණයෝ වෙත් **සීලභාවස්ස න (හොන්ති)** සීල ස්වභාවයට නොවෙත් **හි** එසේම **පාණාතිපාතා වේරමණාදිකං** පාණාතිපාතා වේරමණී ආදී වූ **සාමනං ඒකං අපි** සමාන වූ එක ශික්ෂා පදයකුදු **සීලං නාම** සීලය නම් **න න හෝති** නොවන්නේ නොවෙයි **ඒවමේවං** මෙසේම **පඤ්චසමුදිතාදීනි** අඞ්ග පසකින් හටගත්තා වූ **ඉධපි** මේ ධ්‍යානයෙහි ද **පඤ්චඞ්ගිකාදි භාවස්සේව** අඞ්ග පසක් ඇති බවම **පඨමජ්ඣානාදි භාවස්සේව** ප්‍රථම ධ්‍යානාදී නාමය ලැබීමට **කාරණානි** කාරණයෝ **ච (හොන්ති)** වෙත් **පන (තස්මා)** එහෙයින් **ඣානභාවස්සා** ධ්‍යාන නාමය ලැබීමගේ **විඤ්ඤාතුං** දැනගන්නට **න න සක්කා** නොහැක්කේ නොවෙයි **ඉතරථා** අන් ආකාරයකින් **ඣානපච්චයේ** ධ්‍යාන ප්‍රත්‍යයෙහි **ඣානාඞ්ගානි** ධ්‍යානාඞ්ගයෝ **පච්චනියානියේව** ප්‍රත්‍යය ධර්මයෝම **සියුන්තිපි** වන්නාහ යැයි **වදන්ති** කියත් **එත්තාවතා** මෙපමණකින් **ඉමස්ස චිත්තස්ස** මේ චිත්තයාගේ **සතිපි** සතිය ද **ඵස්සාදි හි අපි සහිතභාවේ** ඵස්සාදී ධර්මයන් ඇති කල්හි ද **තේසං** ඒ ධර්මයන්ගේ **තථාවිධකිච්චවිසේසාභාවා** එසේ අභිනිරෝපනාදී වූ කෘත්‍යය විශේෂයන්ගේ අභාවයෙන් **ඉධ** මෙහි **අග්ගහණං** නොගැණීමෙන් ද **ඉතිපි (තස්මා)** එහෙයින් (**තේසං** ඒ ධර්මයන්ට **ඣානනාමං** ධ්‍යානය යන නාමය) **සිද්ධං න හෝති** සිද්ධ නොවෙයි **විචාරපීතිසුඛේකග්ගතා සඞ්ඛාතේන** විචාරපීතිසුඛේකග්ගතා සඞ්ඛ්‍යාත වූ **දුතියජ්ඣානේන** දුතිය ධ්‍යානය හා **සම්පයුත්තං කුසලචිත්තං** සම්ප්‍රයුක්ත කුසලචිත්තය **දුතියජ්ඣානකුසලචිත්තං** ද්වීතිය ධ්‍යාන කුසල චිත්තයයි **සේසේසුපි** සෙසු ධ්‍යානයන්හි ද **ඒවං** මෙසෙමැයි.

[පරමත්ථදීපනී ටීකා පරිවර්තන]

ඣානඞ්ගයෝගභේදතෝ පඤ්චවිධතා ච වුත්තාති. කාමච්ඡන්දෝ බ්‍යාපාදෝ ථීනමිද්ධං උද්ධච්චකුක්කුච්චං විචිකිච්ඡාති ඉමානි පඤ්ච නීවරණානි විප්පහීනානි ඒතස්සාති **කාමච්ඡන්ද**…**පෙ**…. **විප්පහීනං**. "අග්‍යාහිතෝ"ති එත්ථ ආහිත-සද්දස්ස විය විප්පහීන-සද්දස්සෙත්ථ පරවචනං දට්ඨබ්බං. කාමච්ඡන්දදීහි වා විප්පහීනං විසංයුත්තං තේසං පහායකභාවේනාති **කාමච්ඡන්ද**…**පෙ**…. **විප්පහීනං**. තත්ථ කාමේතීති කාමෝ, ඡන්දනට්ඨේන ඡන්දෝ චාති කාමච්ඡන්දෝ, බහලකාමරාගස්සේතං අධිවචනං. බ්‍යාපාදදීනමත්ථං වක්ඛති. යස්මා කාමච්ඡන්දදීසු අප්පහීනේසු ඣානං නුප්පජ්ජති, තස්මා තානිස්ස පහානඞ්ගානීති වේදිතබ්බානි. නනු අඤ්ඤේපි අකුසලා ධම්මා ඉමිනා ඣානේන පහීයන්ති, අථ කස්මා පඤ්චේව පහානඞ්ගවසේන වුත්තානීති? විසේසේන ඣානන්තරායකරත්තා. කාමච්ඡන්දවසේන හි නානාවිසයපලෝභිතං චිත්තං න ඒකත්තාරම්මණේ සමාධියති. කාමච්ඡන්දාභිභූතං වා නානාවිසයසමුපබ්‍රූළ්හාය කාමධාතුයා පහානපටිපදං න පටිපජ්ජති, බ්‍යාපාදේන ච ආරම්මණේ පටිහඤ්ඤමානං න සමාහිතං පවත්තති, ථීනමිද්ධාභිභූතං අකම්මඤ්ඤං හෝති, උද්ධච්චකුක්කුච්චපරේතං අවූපසන්තමේව හුත්වා පරිබ්භමති, විචිකිච්ඡාඋපහතං ඣානාධිගමපටිපදං නාරෝහති "සම්මාසම්බුද්ධෝ නු ඛෝ, න නු ඛෝ, පථවී පථවී"තිආදිනා පවත්තමනසිකාරේන "ඣානං සියා නු ඛෝ, න නු ඛෝ"තිආදිනා විචිකිච්ඡන්තස්ස ඣානාධිගමපටිපදය අසංසිජ්ඣනතෝ. යතෝ වක්ඛති;

"භාගී අස්සමහං අද්ධා, ඉමාය පටිපත්තියා;
පවිවේකසුඛස්සාති, කත්වා උස්සාහමුත්තම"න්ති.

තස්මා සමාධිආදීනං උජුවිපච්චනීකභාවේන විසේසේන ඣානාධිගමස්ස අන්තරායකරණතෝ ඒතානේව පහානඞ්ගානීති වුත්තානි. හෝති චෙත්ථ;

"පච්චනීකා යතෝ පඤ්ච, සමාධාදීනමෙත්ථ හි;
ඣානන්තරායිකා තස්මා, පහානඞ්ගේ නියාමිතා"ති.

ඒවමිදං පහානඞ්ගවසේන දස්සෙත්වා ඉදානි සම්පයෝගඞ්ගවසේන දස්සේතුං **"විතක්ක**…**පෙ**…. **සම්පයුත්ත"**න්ති වුත්තං. තත්ථ විතක්කාදයෝ වචනත්ථලක්ඛණාදිවසේන උපරි ආගමිස්සන්ති. යස්මා පන ඉමේසු උප්පන්නේසු ඣානං උප්පන්නං නාම හෝති, තේනස්ස ඉමානි සම්පයෝගඞ්ගානීති වේදිතබ්බානි, තස්මා න ඒතේහි සමන්නාගතං අඤ්ඤදේව ඣානං නාම අත්ථීති ගහේතබ්බං. යථා පන නේමිආදිඅඞ්ගසමුදයේ රථාදිවෝහාරෝ හෝති, ඒවං ඣානඞ්ගසමුදයේ ඣානවෝහාරෝ. වුත්තම්පි හේතං **විභඞ්ගේ** "ඣානන්ති විතක්කෝ විචාරෝ පීති සුඛං චිත්තස්සේකග්ගතා"ති (විභ. 569). කස්මා පන අඤ්ඤේසුපි ඵස්සාදීසු සම්පයුත්තධම්මේසු විජ්ජමානේසු ඉමානියේව පඤ්ච ඣානඞ්ගවසේන වුත්තානීති? වුච්චතේ උපනිජ්ඣානකිච්චවන්තතාය, කාමච්ඡන්දදීනං උජුපටිපක්ඛභාවතෝ ච. විතක්කෝ හි ආරම්මණේ චිත්තං අභිනිරෝපේති, විචාරෝ අනුබන්ධති. ඒවං ඣානාධිගමස්ස විසේසපච්චයභූතේහි තේහි අවික්ඛේපාය සමාදහිතපයෝගස්ස චේතසෝ පයෝගසම්පත්තිසමුට්ඨානා පීති පීණනං, සුඛඤ්ච උපබ්‍රූහනං කරෝති. අථ නං සසම්පයුත්තධම්මං ඒතේහි අභිනිරෝපනානුබන්ධනපීණනඋපබ්‍රූහනේහි අනුග්ගහිතා ඒකග්ගතා සමාධානකිච්චේන අත්තානං අනුවත්තාපෙන්තී ඒකත්තාරම්මණේ සමං, සම්මා ච ආධියති, ඉන්ද්‍රියසමතාවසේන සමං, පටිපක්ඛධම්මානං දූරීභාවේන ලීනුද්ධච්චාභාවේන සම්මා ච ඨපේතීති

ඒවමේතේසමේව උපනිජ්ඣානකිච්චං ආවේණිකං. කාමච්ඡන්දදිපටිපක්ඛභාවේන පන සයමේව වක්ඛති. ඒවං උපනිජ්ඣානකිච්චවන්තතාය, කාමච්ඡන්දදීනං උජුපටිපක්ඛභාවතෝ ච ඉමේයේව පඤ්ච ඣානඞ්ගභාවේන වවත්ථිතාති. යථාහු;

"උපනිජ්ඣානකිච්චත්තා, කාමාදිපටිපක්ඛතෝ;
සන්තේසුපි ච අඤ්ඤේසු, පඤ්චේව ඣානසඤ්ඤිතා"ති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 27 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 102-104 පිටු]**

ධ්‍යානාඞ්ගයෝගභේද හෙයින් පස් වැදෑරුම් බවම මෙහි කියන ලද්දීය. "කාමච්ඡන්දෝ ව්‍යාපාදෝ ථීනමිද්ධං උද්ධච්චකුක්කුච්චං විචිකිච්ඡාති ඉමානි පඤ්චනීවරණානි විප්පහීනානි ඒතස්සාති කාමච්ඡන්ද -පෙ- විප්පහීනං" යනු සමාස විග්‍රහයි. "අග්‍යාහිතෝ" යන තන්හි ආහිත ශබ්දය මෙන් මෙහි විප්පහීන ශබ්දයාගේ පර නිපාතය දතයුත්තේයි. "කාමච්ඡන්දදීහි වා විප්පහීනං විසංයුත්තං තේසං පහායකභාවේනාති කාමච්ඡන්ද -පෙ- විප්පහීනං" යනු විග්‍රහයි. "තත්ථ කාමේතීති කාමෝ, ඡන්දනට්ඨේන ඡන්දෝ චාති කාමච්ඡන්දෝ" යනු නිර්වචනනයි. කාමච්ඡන්දය යනු බහල කාමරාගයට මේ නමෙකි. බ්‍යාපාදදීන්ගේ අර්ථය මතු කියන්නේය. යම් හෙයකින් කාමච්ඡන්දදී පඤ්ච නීවර්ණයන් ප්‍රහීණ නොකළ කල්හි ධ්‍යානය නොපදනේද එහෙයින් ඒ කාමච්ඡන්දදී පඤ්ච නීවර්ණ ධර්මයෝ මේ ධ්‍යානයාගේ ප්‍රහාණාඞ්ගයෝ යයි දතයුත්තාහ. ලෝභ චිත්තෝත්පාදදී සෙසු අකුසල ධර්මයෝ ද මේ ධ්‍යානයෙන් ප්‍රහීන වන්නාහු නොවේද යත්, එසේ ඇති කල්හි කුමක් හෙයින් පසක්ම ප්‍රහාණාඞ්ග වශයෙන් කියනලද්දහු ද යත්? මේ කාමච්ඡන්දදී පස් දෙනම විශේෂයෙන් ධ්‍යානයට අන්තරායකර හෙයිනි. ඒ එසේමැයි; කාමච්ඡන්ද වශයෙන් නොයෙක් අරමුණෙහි පොලඹවනලද සිත පෘථුවිකසිණාදී ඒකේකී ස්වභාවාලම්බණයක හෝ එකගබව එළවන වෙන අරමුණෙක හෝ නොපිහිටන්නේ වේ. ඒ කාමච්ඡන්ද සඞ්ඛ්‍යාත කාමතෘෂ්ණාවෙන් මඩනාලද සිත රූපාදී නොයෙක් අරමුණෙන් මුළාවූ කාම ලෝකය ප්‍රහාණ කිරීම පිණිස හෙවත් ඉක්මීම පිණිස පවත්නා වූ ධ්‍යාන ප්‍රතිපත්තියට හෝ නොපැමිණෙයි. ව්‍යාපාදයෙනුදු මඩනාලද සිත අරමුණෙහි ගැටෙමින් එකග නොවී පවත්නේය. ථීනමිද්ධයෙන් මඩනාලද සිත භාවනා කර්මයට යෝග්‍යය නොවෙයි. ඖද්ධත්‍ය කෞකෘත්‍යය දෙකින් මඩනාලද සිත නොසංසිඳීම හාත්පස භ්‍රමණය කෙරෙයි. විචිකිච්චාවෙන් මඩනාලද සිත ධ්‍යානාධිගමය සිද්ධකරන්නාවූ ප්‍රතිපත්තියට නොගැගෙයි. කුමක් හෙයින යත්? භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධ වේදෝ හෝ නොවේදෝ හෝයි පඨවි පඨවී යනාදීන් පැවැති මෙනෙහි කිරීමෙන් ධ්‍යානය වන්නේදෝහෝ නොවන්නේදෝ හෝයි සැක උපදවන්නාහට ධ්‍යානාධිගම ප්‍රතිපදව සිද්ධ නොවන හෙයිනි. යම් හෙයකින්:—

"භාගී අස්සමහං අද්ධා - ඉමාය පටිපත්තියා
පවිවේකසුඛස්සාති - කත්වා උස්සාහමුත්තමං" යි.

මතු කියන්නේ ද එහෙයින් සමාධි ආදීන්ට ඉඳුරා විරුද්ධ බැවින් විශේෂයෙන් ධ්‍යානාධිගමයට අන්තරායකර හෙයින් මේ කාමච්ඡන්දදීහුම ප්‍රහාණාඞ්ගයෝ යයි කියන ලද්දහුය. කියනලදමැයි:—

"පච්චනීකා යතෝ පඤ්ච - සමාධාදිනමේත්ථ හි
ඣානන්තරායිකා තස්මා - පහාණඞ්ගේ නියාමිතා" යි.

මෙසේ මේ රූපාවචර කුසල චිත්ත ප්‍රහාණාඞ්ග වශයෙන් දක්වා දැන් සම්ප්‍රයෝගාඞ්ග වශයෙන් දක්වනු පිණිස "විතක්ක -පෙ- සම්පයුත්තං" යි කියන ලද්දේයි. එහි විතර්කාදීහු වචනාර්ථ ලක්‍ෂණාදී වශයෙන් මතු පහළ වන්නාහුය. යම් හෙයකින් වනාහි මේ විතර්කාදී ධ්‍යානාඞ්ගයන් පස්දෙන උපන් කල්හි ධ්‍යානය උපන්නේ නම් වේද එහෙයින් ඒ ධ්‍යානයාගේ මේ විතර්කාදී පස්දෙන සම්ප්‍රයෝගාඞ්ගයෝ යයි දතයුත්තාහුය. එහෙයින් මේ විතර්කාදී පසඟින් යුක්තවූ අනික් ධ්‍යාන නම් ලද ධර්මයක් ඇතැයි අර්ථ නොගත යුතුයි. යම්සේ නිමවළලු ආදී අවයව සමුදය එක්වූ කල්හි රථාදී ව්‍යවහාරය වේද එපරිද්දෙන්ම ධ්‍යානාඞ්ග සමුදය ඇති කල්හි ධ්‍යානය යන ව්‍යවහාරය වේ. වදාරණ ලදමැයි ධ්‍යානවිභඞ්ගයෙහි:—

"ඣානන්ති විතක්කෝ විචාරෝ පීති සුඛං චිත්තේකග්ගතා" යී

කුමක් හෙයින් අවශේෂ වූ ස්පර්ශාදී සම්ප්‍රයුක්ත ධර්මයන් විද්‍යමාන වතුදු මේ ධර්මයෝ පස්දෙනම ධ්‍යානාඞ්ග වශයෙන් වදරණ ලද්දහු දැයි යන ප්‍රශ්නයෙහි ලා පරිහාර කියනු ලැබේ. කසිණාදී වූ අරමුණ කරා එළැඹ හැරඹීම් සඞ්ඛ්‍යාත කෘත්‍ය ඇති හෙයින් ද කාමච්ඡන්ද නීවර්ණාදීන්ට ඉඳුරා ප්‍රතිපක්‍ෂ හෙයින් ද වදරණ ලද්දහුය. ඒ එසේමැයි; විතර්ක තෙමේ අරමුණෙහි සිත අභිමුඛ කොට නංවයි. විචාර තෙමේ අනුකූල කොට ගළපයි. මෙසේ ධ්‍යානාධිගමයට විශේෂ ප්‍රත්‍යය වූ ඒ විතර්ක විචාර දෙකින් වික්ෂේප නොවනු පිණිස නිපයනලද භාවනා ප්‍රයෝග ඇත්තහුගේ සිත පිළිබඳ යථෝක්ත භාවනාවගේ ප්‍රයෝග සම්පත්තීන් උපන් ප්‍රීතිය හා සුවය භාවනා වශයෙන් සිත පිනවීම හා වැඩීම කෙරෙයි. ඉක්බිත්තෙන් සෙසු ස්පර්ශාදී සම්ප්‍රයුක්ත ධර්ම සහිත වූ ඒ චිත්තය අරමුණට නැඟීමය, හැසිරීමට, පිනවීමය, වැඩීමය යන මේ කෘත්‍ය කරන්නා වූ විතර්කය, විචාරය, ප්‍රීතිය, සුවය යන මෙහුන් විසින් අනුග්‍රහ කරනලද ඒකාග්‍රතා තෝමෝ සමාදන කෘත්‍යයෙන් තමා අනුව පවත්නීයි. එකම අරමුණෙක ඉඳුරන්ගේ සමබව පිළියෙල කිරීම් වශයෙන් සමකොට ප්‍රතිපක්‍ෂ ධර්මයන්ගේ දූරීභාව හේතු කොටගෙන ලුනෝද්ධත නොවන බැවින් හෙවත් චිත්තයාගේ සැඟවුනබව හා නොසංසුන්බව නැති බැවින් මනාකොට ද පිහිටුවන්නේයි. මෙසේ ඒ විතර්කාදී පඤ්ච ප්‍රකාර ධර්මයන්ටම උපනිධ්‍යාන කෘත්‍යය හෙවත් කසිණාදී අරමුණු නරඹන කෘත්‍ය තෙමේ වෙන් වශයෙන් අයත්වූයේ වෙයි. කාමච්ඡන්දදීන්ට ප්‍රතිපක්‍ෂබව වනාහි තමන්වහන්සේම මතු කියන්නේයි. මෙසේ කසිණිදී අරමුණු නරඹන කෘත්‍යය බලවත් බැවින් ද කාමච්ඡන්දදී නීවර්ණයන්ට ඉඳුරා ප්‍රතිපක්‍ෂ බැවින් ද මේ ධර්මයෝ පස්දෙනම ධ්‍යානාඞ්ග වශයෙන් නියමකරන ලද්දහුය. එහෙයින් කීහු:—

"උපනිජ්ඣානකිච්චත්තා - කාමදීපටිපක්ඛතෝ
සන්තේස්වපිච අඤ්ඤේසු - පඤ්චේව ඣානසඤ්ඤිතා" යි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 71-73 පිටු]**

පඤ්ච ප්‍රකාර වූ නීවරණ ධර්මයෝ මේ ධ්‍යානය කරණකොට දුරුකරන ලද්දහු නොවෙත් ද? එසේ නම් කුමක් හේතුකොටගෙන මේ ධර්මයෝම ප්‍රහානඞ්ග භාවයෙන් කියන ලද්දහු ද? සමාධි ආදීන්ගේ ප්‍රත්‍යනීක භාවය හේතු කොටගෙන ද විශේෂයෙන් ධ්‍යානය ලැබීමට අන්තරාය කරන හෙයින් ද මේ ධර්මයෝ ප්‍රහාණාඞ්ග භාවයෙන් කියන ලද්දහුය. මේ අර්ථය වනාහි:—

"පච්චනීකා යතෝ පඤ්ච - සමථාදීනමෙත්ථ හි

ඣානන්තරායකා තස්මා - පහානඞ්ගා නියාමිතා" යන ගාථාව මෙනෙහි කොට දතයුතුයි.

ඵස්සාදී අන්‍යවූ සම්ප්‍රයුක්ත ධර්මයන් ඇති කල්හි මේ ධර්ම පසම ධ්‍යානාඞ්ග භාවයෙන් කුමක් හේතුකොට කියන ලද්දහු ද? ලඟට පැමිණ දැකීම් කෘත්‍යය ඇති හෙයින් ද, කාමච්ඡන්දදීන්ගේ සෘජුව ප්‍රතිපක්‍ෂ බව හෙයින් ද මේ ධර්ම පසම ධ්‍යානාඞ්ග භාවයෙන් කියන ලදහ. ඒ අර්ථය වනාහි:—

"උපනිජ්ඣානකිච්චත්තා - කාමාදිපටිපක්ඛතො
සන්තේසුපි ච අඤ්ඤෙසු - පඤ්චේව ඣානසඤ්ඤිතා" යන ගාථාව මෙනෙහි කොට දතයුතුයි. **[පරමත්ථවිභාවනී ව්‍යාඛ්‍යාව 11 පිටු]**

**ආරම්මණං ඣායති උපනිජ්ඣායතීති ඣානං** යනුවෙන් විග්‍රහ කරණු. **යං** යම් ස්වභාව ධර්මයක් තෙමේ **ආරම්මණං** පෘථුවි කසිණාදී අරමුණ **ඣායති උපනිජ්ඣායතීති** ළං කොට බලන්නේ වේද **ඉති (තස්මා)** ඒසේහෙයි **තං** ඒ ස්වභාව ධර්ම තෙමේ **ඣානං** ධ්‍යාන නම් වේ. ඣ-ධාතුව උපනිජ්ඣායාර්ථ වාචක වේ. නොහොත් **පච්චනීක ධම්මේ ඣාපේති ඩය්හතීති ඣානං** යනුවෙන් විග්‍රහ කරණු. ඣෙ-ධාතුව ඩය්හතාර්ථ වාචක වේ. **යං** යම් ස්වභාව ධර්මයක් තෙමේ **පච්චනීකධම්මේ** සතුරු වූ නීවරණ ධර්මයන් **ඣාපේති ඩය්හති** දවන්නේ වේ ද **ඉති (තස්මා)** එසේහෙයින් ඒ ස්වභාව ධර්ම තෙමේ **ඣානං** ධ්‍යාන නම් වේ. මේ වනාහි අර්ථයි. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 31 පිට]**

## ධ්‍යානය දෙවැදෑරුම් වෙයි:—

**ඣාන**න්ති දුවිධං ඣානං ආරම්මණූපනිජ්ඣානං ලක්ඛණූපනිජ්ඣානන්ති. තත්ථ අට්ඨ සමාපත්තියෝ පඨවිකසිණාදි ආරම්මණං උපනිජ්ඣායන්තීති ආරම්මණූපනිජ්ඣානන්ති සඞ්ඛ්‍යං ගතා. විපස්සනාමග්ගඵලානි පන ලක්ඛණූපනිජ්ඣානං නාම. තත්ථ විපස්සනා අනිච්චාදිලක්ඛණස්ස උපනිජ්ඣානතෝ ලක්ඛණූපනිජ්ඣානං. විපස්සනාය කතකිච්චස්ස මග්ගේන ඉජ්ඣනතෝ මග්ගෝ ලක්ඛණූපනිජ්ඣානං. ඵලං පන නිරෝධසච්චං තථලක්ඛණං උපනිජ්ඣායතීති ලක්ඛණූපනිජ්ඣානං නාම. තේසු ඉමස්මිං අත්ථේ ආරම්මණූපනිජ්ඣානං අධිප්පේතං. තස්මා ආරම්මණූපනිජ්ඣානතෝ පච්චනීකජ්ඣාපනතෝ වා ඣානන්ති වේදිතබ්බං.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 160 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 161-162 පිටු (හේ.වි.මු); අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 31 පිට]**

**ඣානං ඉති** ධ්‍යානය යන (**එත්ථ** මෙහි) **ඣානං** ධ්‍යානය **ආරම්මණූපනිජ්ඣානං** ආරම්මණූපනිජ්ඣානය **ලක්ඛණූපනිජ්ඣානං ඉති** ලක්ඛණූපනිජ්ඣානය යැයි **දුවිධං** දෙවැදෑරුම්ය **තත්ථ** ඒ අතරින් **අට්ඨසමාපත්තියෝ** අට්ඨ සමාපත්තීහු **පඨවීකසිණාදි ආරම්මණං** පඨවි කසිණාදී අරමුණ **උපනිජ්ඣායන්ති** නැවත නැවත විමසා බලන්නේ වෙත් ද **ඉති (තස්මා)** එහෙයින් **ආරම්මණූපනිජ්ඣානං ඉති** ආරම්මණූපනිජ්ඣාන යන **සඞ්ඛං ගතා** සඞ්ඛ්‍යාවට යන ලද්දහ **විපස්සනාමග්ගඵලානි පන** විපස්සනා මාර්ග ඵලයෝ වනාහි **ලක්ඛණූපනිජ්ඣානං නාම** ලක්ඛණූපනිජ්ඣාන නම් **තත්ථ** ඒ අතුරින් **විපස්සනා** විපස්සනා තුමූ **අනිච්චාදිලක්ඛණස්ස** අනිච්චාදී ලක්‍ෂණයගේ **උපනිජ්ඣානතෝ** නැවත නැවත විමසා බලන හෙයින් **ලක්ඛණූපනිජ්ඣානං**

ලක්ඛණූපනිජ්ඣානය **විපස්සනාය** විපස්සනාවෙන් **කතකිච්චස්ස** කරනලද කෘත්‍යයාගේ **මග්ගේන** මාර්ගයෙන් **ඉජ්ඣනතෝ** සමෘද්ධ වීමෙන් **මග්ගෝ** මාර්ගය තෙමේ **ලක්ඛණූපනිජ්ඣානං** ලක්ඛණූපනිජ්ඣානය **ඵලං පන** ඵලය වනාහි **නිරෝධසච්චං** නිරෝධ සත්‍යය නම් වූ **තථලක්ඛණං** තථ ලක්‍ෂණය **උපනිජ්ඣායති** විමසා බලයි **ඉති (තස්මා)** එහෙයින් **ලක්ඛණූපනිජ්ඣානං නාම** ලක්ඛණූපනිජ්ඣානය නම් **තේසු** ඒවා අතුරින් **ඉමස්මිං අත්ථේ** මේ අර්ථයෙහි **ආරම්මණූපනිජ්ඣානං** ආරම්මණූපනිජ්ඣානය **අධිප්පේතං** අභිප්‍රේතය **තස්මා** එහෙයින් **ආරම්මණූපනිජ්ඣානතෝ වා** අරමුණ නැවත නැවත විමසා බලන හෙයින් හෝ **පච්චනීකජ්ඣාපනතෝ** නීවරණාදී පසමිතුරු ධර්මයන් දවන හෙයින් හෝ **ඣානං ඉති** ධ්‍යාන යැයි **වේදිතබ්බං** දතයුතුයි. **[ධම්මසඞ්ගණී අටුවා පරිවර්තන]**

## රූපාවචර සිත සඞ්ඛාර භේදයකට පත් නොවන්නේ ඇයි?

අථෙත්ථ කාමාවචරකුසලේසු විය සඞ්ඛාරභේදෝ කස්මා න ගහිතෝ. ඉදම්පි හි කේවලං සමථානුයෝගවසේන පටිලද්ධං සසඞ්ඛාරිකං, මග්ගාධිගමවසේන පටිලද්ධං අසඞ්ඛාරිකන්ති සක්කා වත්තුන්ති? නයිදමේවං මග්ගාධිගමවසේනසත්තිතෝ පටිලද්ධස්සාපි අපරභාගේ පරිකම්මවසේනේව උප්පජ්ජනතෝ, තස්මා සබ්බස්සපි ඣානස්ස පරිකම්මසඞ්ඛාතපුබ්බාභිසඞ්ඛාරේන විනා කේවලං අධිකාරවසේන අනුප්පජ්ජනතෝ "අසඞ්ඛාරික"න්තිපි, අධිකාරේන ච විනා කේවලං පරිකම්මාභිසඞ්ඛාරේනේව අනුප්පජ්ජනතෝ "සසඞ්ඛාරික"න්තිපි න සක්කා වත්තුන්ති. අථ වා පුබ්බාභිසඞ්ඛාරවසේනේව උප්පජ්ජමානස්ස න කදචි අසඞ්ඛාරිකභාවෝ සම්භවතීති "අසඞ්ඛාරික"න්ති ච බ්‍යභිචාරාභාවතෝ "සසඞ්ඛාරික"න්ති ච න වුත්තන්ති.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 21 යටතේ); විභාවනී ටීකා 68 පිට; අභිධර්ම ප්‍රකාශය 65-67 පිටු; සාමණේර ප්‍රශ්නය 16-17 පිටු]**

**එත්ථ** මේ රූපාවචර කුසල ධ්‍යානයෙහි (අථ ශබ්දය "එත්ථ" යන පදයාගේ මඞ්ගල්‍යය පිණිස කියනලදි) **කාමාවචරකුසලේසු විය** කාමාවචර කුසලයෙහි මෙන් **සඞ්ඛාරභේදෝ** සංස්කාර ප්‍රභේදය **කස්මා න ගහිතෝ?** කුමක් හෙයින් නොගන්නා ලද්දේ ද යත්? (හි යනු තදේවසච්චං යනාර්ථයි) **ඉදම්පි** මේ රූපාවචර කුසල ධ්‍යානය ද **කේවලං** මාර්ගාධිගමය හා මිශ්‍ර නොකොට **සමථානුයෝගවසේන** කමටහන්හි නැවත නැවත උත්සාහ කිරීම් වශයෙන් (උත්සාහ කිරීම හේතුකොටගෙන හෝ) **පටිලද්ධං** පිළිලද දැහැන **සසඞ්ඛාරිකන්ති** සසංස්කාරිකයයිදු **වත්තුං සක්කා** කිවහැකි වේ **මග්ගාධිගමවසේන** මාර්ගයාගේ ලැබීම වශයෙන් **පටිලද්ධං** පිළිලද දැහැන **අසඞ්ඛාරිකන්ති** අසංස්කාරිකයයිදු **වත්තුං සක්කා** කිවහැකි වේ **ඉති (අයං)** මේ වනාහි **චෝදනා** චෝදනායි **ඉදං** මේ වචනය **ඒවං** මෙසේ **න වත්තබ්බං** කුමක් හෙයින් නොකියයුතු වන්නේද යත් **මග්ගාධිගමවසේන** මාර්ගයාගේ ලැබීම් වශයෙන් ("ලද්ධස්සාපි" යන්නෙහි කරණ සම්බන්ධයයි. "මග්ගාධිගමවසේන" යනු නොකියා "පත්තිතෝ" යි කුමක් හෙයින් කියන ලද්දේ ද යත්; ඉදින් "මග්ගාධිගමවසේන" යී කීයේ නම් මාර්ගය හා සමඟම ධ්‍යානය ලැබියයුතුවාක් මෙන් හැගේ. එහෙයින් "පත්තිතෝ" යී කියනලදි)

**පත්තිතෝ** මාර්ගයාගේ ආනුභාවයෙන් ("ලද්ධස්සාපි" යන්නෙහි හේතු සම්බන්ධයයි. "පවත්තිතෝ" යී ඇතැම් පොත්හි පෙණෙන්නාවූ පාඨය

මණිසාරමඤ්ජූසාව හා ගැළපේ. "සත්තිතෝ" කියා ද ඇතැම් පොත්හි තිබේ) **පටිලද්ධස්සාපි** පිළිපැද්දවූ රූපාවචර කුසල ධ්‍යානයාගේ ද **අපරභාගේ** මෑත භාගයෙහි **පරිකම්මවසේනේව** පිරියම් භාවනා කිරීම් වශයෙන්ම **උප්පජ්ජනතෝ** හටගැනීම වන හෙයින් **න වත්තබ්බං** නොකියයුතුයි **තස්මා** එසේ හෙයින් **සබ්බස්සාපි** සියළුම **ඣානස්ස** ධ්‍යානයට **පරිකම්මසඞ්ඛාතපුබ්බාභිසඞ්ඛාරේන විනා** පිරියමැයි කියනලද පූර්ව භාගයෙහි හටගත්තාවූ වීර්යයෙන් තොරව **කේවලං** පරිකර්මය හා මිශ්‍ර නොකොට **අධිකාරවසේන** ධ්‍යානය කළාවූ පරිචය බලයෙන් (භාවනායෙහි පුරුදු කළ විරූ බැවින් කියා හෝ අර්ථ ගතයුතුයි) **අනුප්පජ්ජනතෝ** හටනොගන්නා හෙයින් **අසඞ්ඛාරන්තිපි** අසංස්කාරයයි ද **වත්තුං න සක්කා** කිව නොහැකි වේ **අධිකාරේන ච විනා** පෙර කළ පුරුද්දෙන්ද වෙන්ව **කේවලං** අධිකාරය හා මිශ්‍ර නොකොට **පරිකම්මාදිසඞ්ඛාරේනේව** පිරියම් ආදියෙහි උත්සාහ කිරීම් වශයෙන්ම **අනුප්පජ්ජනතෝ** හටනොගන්නා හෙයින් **සසඞ්ඛාරන්තිපි** සසංස්කාරයයි ද **වත්තුං න සක්කා** කිව නොහැකි වේ (ඉති ශබ්දය පරිසමාපනාර්ථයෙහිය. මෙහි වනාහි දෙවැනි පෘච්ඡාව පළමුවන විසර්ජනාවෙන් හා පළමුවෙනි පෘච්ඡාව දෙවැනි විසර්ජනාවෙන් ද විසඳූ හෙයින් ප්‍රතිලෝම විසර්ජනා යැයි කියනලදි) **අථ වා** නොහොත් **පුබ්බාභිසඞ්ඛාරවසේන** පූර්ව භාගයෙහි කරනලද උත්සාහයාගේ වශයෙන්ම **උප්පජ්ජමානස්ස** හටගන්නාවූ රූපාවචර කුසල ධ්‍යානයාගේ **කදාචි** කිසිකලෙක්හි **අසඞ්ඛාරිකභාවෝ** අසංස්කාරික භාවය තෙමේ **න සම්භවති** සම්භව නොවේ **ඉති (තස්මා) අසඞ්ඛාරිකන්ති ච** අසංස්කාරිකයයිදු **න වුත්තං** නොකියනලදි **බ්‍යාභිචාරාභාවතෝ** ඒකාන්ත අසංස්කාරික නොවන හෙයින් **සසඞ්ඛාරිකන්ති ච** සසංස්කාරිකයයි ද **න වුත්තං** නොකියනලදි (ඉති ශබ්දය පරිසමාපනාර්ථයි) (පූර්ව ක්‍රමයෙන් රූපාවචර කුසලද්ධ්‍යානය අසංස්කාරිකයයිදු සසංස්කාරිකයයිදු නොකියනලදි. "අථ වා" යන්නෙන් ප්‍රාරබ්ධ පශ්චිම ක්‍රමයෙන් රූපාවචර කුසලද්ධ්‍යාන තෙමේ ඒකාන්ත සසංස්කාරිකම වන හෙයින් අසංස්කාරික භාවය හා මිශ්‍රවීමක් නැත්තේනුයි කාමාවචර කුසලය මෙන් සසංස්කාර භේදයක් නැතැයි කී නියායි)

**[විභාවනී ටීකා සන්නය 107-109 පිටු]**

කස්මා ඉධ සඞ්ඛාරභේදෝ න වුත්තෝති. පාළියමේව අවුත්තත්තා. කස්මාච සෝ පාළියං අවුත්තෝති. පටිපදා භේදවචනේනේව සිද්ධත්තාති. තථාහි සබ්බේසං පි ලෝකිය ලෝකුත්තරජ්ඣානානං සුඛප්පටිපදාභාවේ සිද්ධේ අසඞ්ඛාරිකභාවෝ සිද්ධෝයේව හෝති. දුක්ඛප්පටිපදාභාවේ ච සිද්ධේ තේසං සසඞ්ඛාරිකභාවෝ සිද්ධෝයේව හෝතීති. කථං විඤ්ඤායතීති චේ. අට්ඨකථාදස්සනතෝ. වුත්තඤ්හේතං අට්ඨසාලිනියං;

යෝ ආදිතෝ කිලේසේ වික්ඛම්භෙන්තෝ දුක්ඛේන සසඞ්ඛාරේන සප්පයෝගේන කිලමන්තෝ වික්ඛම්භේති. තස්ස දුක්ඛා පටිපදා හෝති. යෝ කිලේසේ වික්ඛම්භෙන්තෝ සුඛේන අකිලමන්තෝ වික්ඛම්භේති. තස්ස සුඛාපටිපදා හෝතීති.

තථා සම්මෝහවිනෝදනී විසුද්ධිමග්ගේසුපීති. එත්ථච පුබ්බවාක්‍යේ දුක්ඛේන සසඞ්ඛාරේන සප්පයෝගේනාති දිට්ඨත්තා පරවාක්‍යේපි සුඛේන අසඞ්ඛාරේන අප්පයෝගේනාති දිට්ඨමේව හෝති. තත්ථ සසඞ්ඛාරේන සප්පයෝගේනාති සඞ්ඛාරප්පයෝගසහිතේන කාමාදීනවදස්සනාදිනා පච්චයගණේනාති අත්ථෝ. ඒතේන සබ්බේසං දුක්ඛප්පටිපදජ්ඣානානං සසඞ්ඛාරිකභාවෝ වුත්තෝ හෝති. අසඞ්ඛාරේන අප්පයෝගේනාති සඞ්ඛාරප්පයෝගරහිතේන තේනේව පච්චයගණේන. ඒතේන සබ්බේසං සුඛප්පටිපදජ්ඣානානං අසඞ්ඛාරිකභාවෝ වුත්තෝ හෝතීති.

බිප්පාභිඤ්ඤජ්ඣානානංපිහි දුක්ඛප්පටිපදභාවේ සති සසඞ්ඛාරිකතාව විඤ්ඤයති. දන්ධාභිඤ්ඤජ්ඣානානංපි සුඛප්පටිපදභාවේ සති අසඞ්ඛාරිකතාව විඤ්ඤයතීති. යදි ඒවං පටිපදරහිතානං මග්ගසිද්ධඋපපත්තිසිද්ධජ්ඣානානං කථං සඞ්ඛාරභේදෝ සිද්ධෝති. තේසංපි වළඤ්ජනකාලේ සමාපත්තිප්පටිබන්ධකානං පච්චයානං සන්නිහිතාසන්නිහිතවසේන දුක්ඛසුඛප්පටිපදභාවසම්භවෝ හෝතියේවාති. තත්ථ මග්ගසිද්ධජ්ඣානං නාම සුද්ධවිපස්සනායානිකානං මග්ගප්පටිලාභේන සහේව සිද්ධජ්ඣානං. තං දුවිධං හෙට්ඨිමමග්ගසිද්ධං, අරහත්තමග්ගසිද්ධන්ති. තත්ථ මහාසමයසුත්තේ ආගතානං පඤ්චසතානං භික්ඛූනං ඣානං හෙට්ඨිමමග්ගසිද්ධං. ආනන්දත්ථේරස්ස ඣානං අරහත්තමග්ගසිද්ධං. යංපි අනාගාමීනං අජානන්තානඤ්ඤෙව සත්ථේන හනිත්වා සහසා මරන්තානං උප්පන්නං. තංපි මග්ගසිද්ධගතිකං. යෝ පන අට්ඨසමාපත්තියෝ භාවෙත්වා අඤ්ඤතරස්මිං රූපි බ්‍රහ්මලෝකේ නිබ්බත්ති. තස්ස තා සමාපත්ති යෝ තත්ථ පාකතිකා ඒව හොන්ති. ඉදං උපපත්තිසිද්ධන්ති. ඒකස්මිං භවේපි හි ලද්ධජ්ඣානානි වළඤ්ජනකාලේ සන්නිහිතපච්චයවසේන නා නා පටිපදයුත්තානි හොන්තීති. ඣානුප්පත්තිප්පටිපද රහිතත්තාවා අසඞ්ඛාරිකජ්ඣානේසු තේසං සඞ්ගහෝ යුත්තෝ සියාති. අපිච, නේත්තිපාළියං සබ්බේසං ලෝකිය ලෝකුත්තරසමාධීනං සඞ්ඛාරභේදෝ සරූපතෝව නිද්දිට්ඨෝ. යථාහ-ද්වේ සමාධයෝ සසඞ්ඛාරෝ සමාධි අසඞ්ඛාරෝ සමාධීති. අට්ඨකථායඤ්ච සුඛප්පටිපද පුබ්බකානං ද්වින්නං දන්ධාභිඤ්ඤබිප්පාභිඤ්ඤසමාධීනං අසඞ්ඛාරභාවෝ දුක්ඛප්පටිපද පුබ්බකානං ද්වින්නං සසඞ්ඛාරභාවෝච වුත්තෝති. ඒත්තාවතා සබ්බේසං මහග්ගතලෝකුත්තරජ්ඣානචිත්තානං අසඞ්ඛාරිකසසඞ්ඛාරිකවසේන විසුං විසුං දුවිධභාවෝ සිද්ධෝ හෝති. යස්මා පන අයං සඞ්ඛාරවෝහාරෝ අකුසලානංපි සාධාරණෝ. පටිපදවෝහාරෝ පන විසේසේන පටිපත්තිධම්මේස්වේව පාකටෝ. මහග්ගතලෝකුත්තරධම්මා ච ඒකන්තං පටිපත්තිධම්මා ඒව. තස්මා තේසං භේදං සඞ්ඛාරවසේන අවත්වා පටිපදවසේනේව ධම්මසඞ්ගණිපාළියංපි වුත්තෝති දට්ඨබ්බෝ. අයමෙත්ථ පරමත්ථදීපනා.

යං පන **විභාවනියං** "සබ්බස්සපි ඣානස්ස පරිකම්මසඞ්ඛාත පුබ්බාභිසඞ්ඛාරේන විනා කේවලං අධිකාරවසේන අනුප්පජ්ජනතෝ අසඞ්ඛාරිකන්තිපි. අධිකාරේනච විනා කේවලං පරිකම්මාභිසඞ්කාරවසේනේව අනුප්පජ්ජනතෝ සසඞ්ඛාරිකන්තිපි න සක්කා වත්තු"න්ති වුත්තං. තත්ථ පරිකම්මසඞ්ඛාත -පෙ- අසඞ්ඛාරිකන්තිපි න සක්කා වත්තුන්ති ඉදං තාව න යුජ්ජති.

න හි පරිකම්මසඞ්ඛාතපුබ්බාභිසඞ්ඛාරෝ ඉමස්මිං සඞ්ඛාරභේදේ සඞ්ඛාරෝ ඒව නාම හෝති. කස්මා, ඣානුප්පත්තියා පකතිපච්චයභූතත්තා, තථාහි ලෝකේ සාසනේච සබ්බංපි කුසලාකුසලකම්මං අත්තනෝ අනුරූපේන පරිකම්මසඞ්ඛාත පුබ්බාභිසඞ්ඛාරේන විනා උප්පන්නං නාම නත්ථි. අන්තමසෝ ආලෝපභික්ඛාදානමත්තංපීති. යඤ්ච චිත්තං යේන අත්තනෝ අනුරූපේන පරිකම්මසඞ්ඛාතපුබ්බාභිසඞ්ඛාරේන විනා න උප්පජ්ජති. සෝ තස්ස චිත්තස්ස පකතිපච්චයගණෝ ඒව අන්තෝගධෝ හෝති. ඣානානිච ලෝකියලෝකුත්තරභූතානි සබ්බානි අත්තනෝ අනුරූපේන පරිකම්මසඞ්ඛාත පුබ්බභාගභාවනාභිසඞ්ඛාරේන විනා උප්පන්නානි නාම නත්ථීති සෝ තේසං පකතිපච්චයගණේසු ඒව අන්තෝගධෝ හෝතීති. ඉතරථා සබ්බංපි කුසලාකුසලකම්මං අසඞ්ඛාරිකං නාම නත්ථීති ආපජ්ජතීති.

යඤ්ච **තත්ථ** අධිකාරේනව විනා කේවලං -පෙ- සසඞ්ඛාරිකන්තිපි න සක්කා වත්තුන්ති වුත්තං. තංපි න යුජ්ජතියේව.

න හි ලෝකියජ්ඣානානි නාම අධිකාරේන විනා නුප්පජ්ජන්තීති අත්ථි. කේවලං පන පුබ්බේ සමථකම්මේසු කතාධිකාරස්ස සුඛප්පටිපදජ්ඣානං උප්පජ්ජති. අකතාධිකාරස්ස පන දුක්ඛප්පටිපදජ්ඣානන්ති ඒවමේව අට්ඨකථාසු ආගතං. වුත්තඤ්හි තත්ථ යෝ ච සමථේ අකතාධිකාරෝ. තස්ස දුක්ඛා පටිපදා හෝති. කතාධිකාරස්සසුඛාති. අපිච, පුරිමභවේ සිද්ධං අධිකාරං ගහෙත්වා ඉධ සඞ්ඛාරභේදවිචාරණාපි න යුත්තා ඒව. කුසලක්‍රියජ්ඣානේසු හි සන්නිහිතපච්චයවසේනේව තබ්බිචාරණා යුත්තාති.

**එත්තාවතා** අථවාතිආදිකෝ පච්ඡිම විකප්පෝපි පටික්ඛිත්තෝ ඒව හෝතීති.
**[පරමත්ථදීපනී ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 50-51 යටතේ)]**

සඞ්ඛාරභේදවිචාරණායං. "සඞ්ඛාරභේදෝ න වුත්තෝ"ති පඨමජ්ඣාන කුසලචිත්තං අසඞ්ඛාරිකමේකං, සසඞ්ඛාරිකමේකන්ති ආදිනා න වුත්තෝති අධිප්පායෝ. "සෝ"ති සඞ්ඛාරභේදෝ. "සිද්ධත්තා"ති සඞ්ඛාරභේදස්ස සිද්ධත්තා. කථං සිද්ධෝති ආහ "තථාහී"ති ආදිං. සුඛාපටිපදා යේසං තානි සුඛප්පටිපදානි. තේසං භාවෝති විග්ගහෝ. "යෝ"ති යෝගීපුග්ගලෝ. "ආදිතෝ"ති ආදිම්හි. "වික්ඛම්භෙන්තෝ"ති විමෝචෙන්තෝ වියෝගං කරොන්තෝ. දුක්ඛේන වික්ඛම්භේතීති සම්බන්ධෝ. "කාමාදීනවදස්සනාදිනා"ති අට්ඨිකඞ්කලූපමාකාමා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවෝ එත්ථ භියෝති ආදිනා කාමේසු ආදීනවං දිස්වා. ආදි සද්දේන විතක්කාදීසු ආදීනවදස්සනං සඞ්ගය්හති. "තේනේවා"ති කාමාදීනවදස්සනාදිනා ඒව. එත්ථ අභිඤ්ඤාභේදේන සඞ්ඛාරභේදෝ න වත්තබ්බෝ, පටිපදාභේදේනේව වත්තබ්බෝති දස්සේතුං "ඛිප්පාභිඤ්ඤජ්ඣානානංපී"ති ආදි වුත්තං. තත්ථ, අභිජානනං අභිඤ්ඤා. ඛිප්පා සීඝා අභිඤ්ඤා යේසං තානි ඛිප්පාභිඤ්ඤානි. දන්ධා අසීඝා අභිඤ්ඤා යේසං තානි දන්ධාභිඤ්ඤානි. ඣානානි. "යදි ඒවා"න්ති ඒවං පටිපදා භේදේන සඞ්ඛාරභේදෝ යදි සියාති අත්ථෝ. "වළඤ්ජනකාලේ"ති සමාපත්ති සමාපජ්ජනකාලේ. පටිබන්ධකා නාම අන්තරායිකා. "සන්නිහිතාසන්නිහිතවසේනා"ති ආසන්නේ සණ්ඨිතාසණ්ඨිතවසේන. සුද්ධං විපස්සනායානං යේසං තේ සුද්ධවිපස්සනායානිකා. "සුද්ධං"ති සමථජ්ඣානේන අසම්මිස්සං. "සත්ථේන හනිත්වා"ති පරේ න සත්ථේන හනනතෝ ඡින්දනතෝ. "සහසා"ති සීඝතරේන. "මරන්තානං උප්පන්නං"ති මරණාසන්නකාලේ උප්පන්නංති අධිප්පායෝ. අනාගාමිනෝ හි සුද්ධ විපස්සනායානිකාපි සමානා සමාධිස්මිං පරිපූරකාරිනෝ නාම හොන්ති. ඉච්ඡන්තේසු සති කිඤ්චි නිමිත්තං ආරබ්භමනසිකාරමත්තේනපි ඣානං ඉජ්ඣති. තේනාහ "තංපි මග්ගසිද්ධගතික"න්ති. "රූපීබ්‍රහ්මලෝකේ"ති ඉදං අට්ඨන්නං සමාපත්තීනංපි තත්ථ පාකතිකභාවං සන්ධාය වුත්තං. අරූපී බ්‍රහ්මලෝකේ පන ඒකා ඒව සමාපත්ති පාකතිකාසම්භවති. උපපත්තිසිද්ධජ්ඣානානං භවන්තරේ සන්නිහිතපච්චයභේදේන සඞ්ඛාරභේදෝ වුත්තෝ, සෝ කථං පච්චේතබ්බෝති ආහ "ඒකස්මිං භවේපි...පෙ.... යුත්තානි හොන්තී"ති. ඒකස්මිං භවේ සබ්බපඨමං ලද්ධකාලේ සඞ්ඛාරභේදස්ස ආසන්නත්තා වළඤ්ජනකාලේපි සෝ ඒව සඞ්ඛාරභේදෝ සියාති ආසඞ්කාසම්භවතෝ ඉදං වුත්තං. තේන භවන්තරේ උපපත්ති සිද්ධජ්ඣානානං සන්නිහිතපච්චයභේදේන සඞ්ඛාරභේදේ වත්තබ්බමේව නත්ථීති දස්සේති. ඉදානි තානි මග්ගසිද්ධජ්ඣාන උපපත්ති සිද්ධජ්ඣානානි සන්නිහිතපච්චයං අනපෙක්ඛිත්වා මග්ගක්ඛණඋපපත්තික්ඛණේසු සිද්ධකාලේ ඣානුප්පත්ති පටිපදාය

ඒව සබ්බසො අභාවං ගහෙත්වා අපරං විකප්පං දස්සෙතුං "ඣානුප්පත්ති පටිපද රහිතත්තා වා"ති ආදි වුත්තං. ඒවං මහග්ගතඣානානං අට්ඨකථාවසේන සිද්ධං සඞ්ඛාරභේදං වත්වා ඉදානි පාළිවසේනාපි සො සිද්ධො යේවාති දස්සෙතුං "අපිචා"ති ආදි ආරද්ධං. දුක්ඛප්පටිපදපුබ්බකානං ද්වින්නං දන්ධාභිඤ්ඤාදිඛිප්පාභිඤ්ඤාසමාධීනං. "එත්තාවතා"ති ඒතං පරිමාණං අස්සාති එත්තාවං. එත්තාවන්තේන. එත්ථ සියා, කස්මා ඉධ සඞ්ඛාරභේදො න වුත්තොති ආදිනා වචනක්කමේන සිද්ධො හෝතීති සම්බන්ධො. සේසං සුවිඤ්ඤෙය්‍යං.

විභාවනිපාඨේ. පරිකම්මං නාම පඨවී, පඨවී, ආපො, ආපෝති ආදිකං, රූපං අනිච්චං, රූපං දුක්ඛං, රූපං අනත්තාති ආදිකඤ්ච භාවනාපරිකම්මං අධිකාරෝ නාම පුබ්බභවේකතභාවනාකම්මං. පුබ්බභවේ ඣානමග්ගඵලානි පත්ථෙත්වා කතං දානසීලාදිපුඤ්ඤකම්මඤ්ච. "ඉදං තාව න යුජ්ජතී"ති එත්ථ තාව සද්දෝ වත්තබ්බන්තරාපෙක්ඛනේ නිපාතෝ. තේන අපරංපි වත්තබ්බං අත්ථීති දීපේති. පුබ්බාභිසඞ්ඛාරෝ දුවිධෝ පකති පුබ්බාභිසඞ්ඛාරෝ, පයෝගපුබ්බාභිසඞ්ඛාරෝති. තත්ථ පරිකම්ම පුබ්බාභිසඞ්ඛාරෝ පකති පුබ්බාභිසඞ්ඛාරෝ නාම, අයං පකති පච්චයගණෝ ඒව. පුබ්බේ වුත්තෝ පුබ්බප්පයෝගෝ පයෝගපුබ්බාභිසඞ්ඛාරෝ නාම. සො ඒව ඉධාධිප්පේතෝති දස්සෙතුං "නහී"ති ආදිමාහ. "අන්තමසෝ"ති අන්තිම පරිච්ඡේදේන. "ආලෝපභික්ඛා" නාම ඒකාලෝපභික්ඛා. සෝ පරිකම්මසඞ්ඛාතපුබ්බාභිසඞ්ඛාරෝ. ඣානානි ච සබ්බානි උප්පන්නානි නාම නත්ථීති සම්බන්ධෝ. "ඉතී"ති තස්මා. "සෝ"ති භාවනාභිසඞ්ඛාරෝ. "තේසං"ති සබ්බේසංපි ඣානානං. න හි ලෝකියජ්ඣානානි නාම ...පෙ.... අත්ථි, ඉමේසං සත්තානං සබ්බකප්පේසුපි කප්පවිනාසකාලේ ඣානානි භාවෙත්වා බ්‍රහ්මලෝක පරායනතා සබ්භාවාති අධිප්පායෝ. "පුබ්බේ සමථකම්මේසු කතාධිකාරස්සා"ති ආසන්නභවේකතාධිකාරං සන්ධාය වුත්තං. දූරභවේ පන සමථකම්මේසු අකතාධිකාරෝ නාම කෝචි නත්ථීති. "ඒවමේවා"ති ඒවං ඒව. විපාකජ්ඣානේසු සඞ්ඛාරභේදස්ස පුබ්බකම්මවසේන වත්තබ්බත්තා "කුසල ක්‍රියජ්ඣානේසූ"ති වුත්තං. "අථ වාති ආදිකො පච්ඡිමවිකප්පෝ නාම" අථ වා පුබ්බාභිසඞ්ඛාරේනේව උප්පජ්ජමානස්ස න කදාචි අසඞ්ඛාරිකභාවෝ සම්භවතීති අසඞ්ඛාරිකන්ති ච, බ්‍යභිචාරාභාවතෝ සසඞ්ඛාරිකන්ති ච න වුත්තන්ති අයං විකප්පෝ. තත්ථ අසඞ්ඛාරිකන්ති ච න වුත්තන්ති සම්බන්ධෝ. "බ්‍යභිචාරාභාවතෝ"ති අසඞ්ඛාරිකභාවේන පසඞ්ගාභාවතෝ. සසඞ්ඛාරිකන්ති ච න වුත්තං. යදි වුච්චෙය්‍ය. නිරත්ථකමේව තං භවෙය්‍ය. කස්මා, සම්භවබ්‍යභිචාරානං අභාවතෝ. සම්භවේ බ්‍යභිචාරේ ච. විසේසනං සාත්ථකං සියාති හි වුත්තං. න ච නිරත්ථකවචනං පණ්ඩිතා වදන්ති. කස්මා, අපණ්ඩිතලක්ඛණත්තා. සති පන සම්භවේ ච බ්‍යභිචාරේ ච, තථා සක්කා වත්තුං. කස්මා, සාත්ථකත්තා. සාත්ථකමේව පණ්ඩිතා වදන්ති. කස්මා, පණ්ඩිත ලක්ඛණත්තාති අධිප්පායෝ. **[අනුදීපනීපාඨ (ඡට්ඨසඞ්ගායනා අංක 50-51 යටතේ)]**

**ඉධ (චිත්තේසු)** මේ රූපාවචර චිත්තයන්හි **සඞ්ඛාරභේදෝ** සංස්කාර භේදය **කස්මා** කුමක් හෙයින් **න වුත්තෝ ඉති?** නොවදරණ ලද්දේ ද? **පාළියමේව** පෙළෙහිම **අවුත්තත්තා** නොවදරණ ලද බැවිනි **කස්මා ච** කුමක් හෙයින් **සෝ (සඞ්ඛාරභේදෝ)** ඒ සංස්කාර භේදය **පාළියං** පෙළෙහි **අවුත්තෝති?** නොවදරණ ලදිද? **පටිපද භේද වචනේනේව** ප්‍රතිපද භේද වචනයෙන්ම **සිද්ධත්තා** සිද්ධවූ බැවිනි **තථා හි (කථං සිද්ධෝති?)** කෙසේ සිද්ධ වී ද යත්? **සබ්බේසම්පි** සියළු **ලෝකික ලෝකුත්තරජ්ඣානානං** ලෞකික ලෝකෝත්තර ධ්‍යානයන්ගේ **සුඛප්පටිපදභාවේ සිද්ධේ** සුඛප්‍රතිපද භාවය සිද්ධවූ කල්හි **අසඞ්ඛාරිකභාවෝ** අසංස්කාරික භාවය

**සිද්ධෝයේව හෝති** සිද්ධවූයේම වෙයි **තේසං** ඒ ලෞකික ලෝකෝත්තර ධ්‍යානයන්ගේ **දුක්ඛපටිපදභාවේ සිද්ධේ ච** දුක්ඛප්‍රතිපද භාවය සිද්ධවූ කල්හිම **සසඞ්ඛාරිකභාවෝ** සසංස්කාරික භාවය **සිද්ධෝයේව හෝති** සිද්ධවූයේම වෙයි **වේ** ඉඳින් **කථං** කෙසේ **විඤ්ඤායතීති?** දැනගනු ලැබේද යත්? **අට්ඨකථාදස්සනතෝ** අර්ථකථාව දැක්වීමෙනි **අට්ඨසාලිනියං** අර්ථශාලිනී අර්ථකථාවෙහි **යෝ (යෝගීපුග්ගලෝ)** යම් යෝගී පුද්ගලයෙක් තෙමේ **ආදිතෝ** ආරම්භයෙහි **කිලේසේ වික්ඛම්භෙන්තෝ** ක්ලේශයන් යටපත් කරනුයේ **සසඞ්ඛාරේන සප්පයෝගේන** සසංකාරිකව සප්‍රයෝගිකව **දුක්ඛේන** දුකසේ **කිලමන්තෝ** වෙහෙසෙමින් **වික්ඛම්භේති** ක්ලේශයන් යටපත් කරයි ද **තස්ස** ඔහුගේ (**පටිපද** ප්‍රතිපදව) **දුක්ඛා පටිපද නාම හෝති** දුක්ඛා පටිපද නම් වෙයි **යෝ (යෝගීපුග්ගලෝ)** යම් යෝගී පුද්ගලයෙක් තෙමේ **කිලේසේ වික්ඛම්භෙන්තෝ** ක්ලේශයන් යටපත් කරනුයේ **සුඛේන** සැපසේ **අකිලමන්තෝ** වෙහෙසක් නොමැතිව **වික්ඛම්භේති** ක්ලේශයන් යටපත් කරයි ද **තස්ස** ඔහුගේ (**පටිපද** ප්‍රතිපදව) **සුඛා පටිපද නාම හෝති ඉති** සුඛ පටිපද නම් වෙයි යැයි **ඒතං වුත්තං** මෙය දේශනා කරනලදි.

**සම්මෝහවිනෝදනී** විභඞ්ග අර්ථකථාවෙහි ද **විසුද්ධිමග්ගේසුපි** විසුද්ධි මාර්ගයෙහි ද **ඉති (ඒතං කාරණං)** මේ කරුණ **තථා** එසේම වේ **එත්ථ ච** මෙහි ද **පුබ්බවාකෙය්** පූර්ව වාක්‍යයෙහි **දුක්ඛේන සසඞ්ඛාරේන සප්පයෝගේන ඉති** දුක්ඛේන සසඞ්ඛාරේන සප්පයෝගේන යැයි **දිට්ඨත්තා** දැක්වූ බැවින් **පරවාකෙය්පි** පසු වාක්‍යයෙහි ද **සුඛේන අසඞ්ඛාරේන අප්පයෝගේන ඉති** සුඛේන අසඞ්ඛාරේන අප්පයෝගේන යනුවෙන් **දිට්ඨමේව හෝති** දක්වන ලද්දේම වෙයි **තත්‍ථ** එහි **සසඞ්ඛාරේන සප්පයෝගේන ඉති** සසඞ්ඛාරේන සප්පයෝගේන යනු **සඞ්ඛාරප්පයෝගසහිතේන** සංස්කාර ප්‍රයෝග සහිත වූ **කාමාදීනවදස්සනාදිනා** ගිනි අඟුරු වලකට බඳු උපමා ඇති කාමයෝ බොහෝ දුක් බොහෝ උපායාස ඇත්තේය මෙහි ආදීනව බොහෝය යනාදියෙන් කාමයන්හි ආදිනව දකින **පච්චයගණේන ඉති අත්ථෝ** ප්‍රත්‍යය ගණයෙන් යන අර්ථයයි (ආදි ශබ්දයෙන් විතර්කාදීන්හි ආදීනව දැකීම සඞ්ග්‍රහ වෙයි යනු අනුදීපනීපාඨයි) **ඒතේන** මෙයින් **සබ්බේසං** සියළු **දුක්ඛප්පටිපදජ්ඣානානං** දුක් ප්‍රතිපදවෙන් ඉපදවූ ධ්‍යානය ඇති පුද්ගලයන්ට **සසඞ්ඛාරිකභාවෝ** සසංස්කාරික භාවය **වුත්තෝ හෝති** කියන ලද්දේ වෙයි **අසඞ්ඛාරේන අප්පයෝගේන ඉති** අසඞ්ඛාරේන අප්පයෝගේන යනු **සඞ්ඛාරප්පයෝගරහිතේන** සංස්කාර ප්‍රයෝග රහිත වූ **තේනේව (කාමාදීනවදස්සනාදිනා ඒව)** ගිනි අඟුරු වලකට බඳු උපමා ඇති කාමයෝ බොහෝ දුක් බොහෝ උපායාස ඇත්තේය මෙහි ආදීනව බොහෝය යනාදියෙන් කාමයන්හි ආදිනව දැකීමෙන්ම වූ **පච්චයගණේන** ප්‍රත්‍යය ගණයෙන් (**ඉති අත්ථෝ** යන අර්ථයයි) **ඒතේන** මෙයින් **සබ්බේසං** සියළු **සුඛප්පටිපදජ්ඣානානං** සැප ප්‍රතිපදවෙන් ඉපදවූ ධ්‍යානය ඇති පුද්ගලයන්ට **අසඞ්ඛාරිකභාවෝ** අසංස්කාරික භාවය **වුත්තෝ හෝති** කියන ලද්දේ වෙයි (ආචාර්‍යයින් විසින් ප්‍රතිපද භේදයෙන් සඞ්ඛාර භේදය කියනලදි. අභිඥ භේදයෙන් සඞ්ඛාර භේදය නොකියයුතු ද? යි දක්වන්නට "ඛිප්පාභිඤ්ඤජ්ඣානානං අපි" යනාදිය කියනලදි) **ඛිප්පාභිඤ්ඤජ්ඣානානම්පි හි** නොලස් අභිඥවෙන් ඉපදවූ ධ්‍යානය ඇති පුද්ගලයන්ට ද වනාහි **දුක්ඛප්පටිපදභාවේ සති** දුක් ප්‍රතිපද භාවය ඇති කල්හි **සසඞ්ඛාරිකතාව විඤ්ඤායති** සසංස්කාරික බවම දැනගනු ලැබේ **දන්ධාභිඤ්ඤජ්ඣානානම්පි** ලස් වූ අභිඥවෙන් ඉපදවූ ධ්‍යානය ඇති පුද්ගලයන්ට ද **සුඛප්පටිපදභාවේ සති** සැප ප්‍රතිපද භාවය ඇති කල්හි **අසඞ්ඛාරිකතාව විඤ්ඤායති** අසංස්කාරික බවම දැනගනු ලැබේ **යදි** ඉඳින් **ඒවං**

මෙසේ ප්‍රතිපදා භේදයෙන් සඞ්ඛාර භේදය වන්නේ නම් **පටිපදරහිතානං** ප්‍රතිපදා නොමැති **මග්ගසිද්ධඋපපත්තිසිද්ධජ්ඣානානං** මග්ගසිද්ධ උපපත්තිසිද්ධ ධ්‍යාන ඇති පුද්ගලයන්ට **සඞ්ඛාරභේදෝ** සංස්කාර භේදය **කථං** කෙසේ **සිද්ධෝ ඉති?** සිද්ධ වෙයි ද? **අපි** විස්තර කෙරෙමි **තේසං** ඔහුන්ට වනාහි **වළඤ්ජනකාලේ** සමාපත්තියට සමවදින කාලයෙහි **සමාපත්තිප්පටිබන්ධකානං** සමාපත්තියට සතුරු වූ **පච්චයානං** ප්‍රත්‍යයන්ගේ **සන්නිහිතාසන්නිහිතවසේන** ආසන්නයෙහි සිටීම් නොසිටීම් වශයෙන් **දුක්ඛසුඛප්පටිපදාභාවසම්භවෝ** දුක් ප්‍රතිපදා සැප ප්‍රතිපදා භාවය සිද්ධ **හෝතියේව ඉති (දට්ඨබ්බෝ)** වෙයිම යැයි දතයුතුයි **තත්ථ** එහි **මග්ගසිද්ධජ්ඣානං නාම** මග්ගසිද්ධ ධ්‍යානය නම් **සුද්ධවිපස්සනායානිකානං** ශුද්ධ විපස්සනායානික පුද්ගලයාට **මග්ගප්පටිලාභේන සහේව** මාර්ග ප්‍රතිලාභය හා සමගම **සිද්ධජ්ඣානං** හටගත් ධ්‍යානයයි **තං** එය වනාහි **හෙට්ඨිමමග්ගසිද්ධං** යට මාර්ගයෙන් සිද්ධ වූ ධ්‍යානය **අරහත්තමග්ගසිද්ධං** අර්හත් මාර්ගයෙන් සිද්ධ වූ ධ්‍යානය යැයි **දුවිධං ඉති (හෝති)** දෙවැදෑරුම් වෙයි **තත්ථ** එහි **මහාසමයසුත්තේ** මහාසමය සූත්‍රාන්තයෙහි **ආගතානං** පැමිණියා වූ **පඤ්චසතානං භික්ඛූනං** පන්සියයක් භික්ෂූන්ගේ **ඣානං** ධ්‍යානය **හෙට්ඨිමමග්ගසිද්ධං** යට මාර්ගයෙන් සිද්ධය **ආනන්දත්ථේරස්ස** ආනන්ද තෙරුන් වහන්සේගේ **ඣානං** ධ්‍යානය **අරහත්තමග්ගසිද්ධං** අර්හත් මාර්ගයෙන් සිද්ධය **සත්ථේන හනිත්වා** අන්‍යකු විසින් ශස්ත්‍රයකින් පහර දී **අජානන්තානං** නොදැන **සහසා මරන්තානං** වහා මියයන්නා වූ **අනාගාමීනං ඒව** අනාගාමී ආර්‍යයන් වහන්සේලාට **යං උප්පන්නං (ඣානං) අපි** උපදින ලද යම් ධ්‍යානයක් වේද **තං අපි** ඒ ධ්‍යානය ද **මග්ගසිද්ධගතිකං** මාර්ගයෙන් සිද්ධය (ශුෂ්ක විපස්සනායානික අනාගාමී ආර්‍යයන් වහන්සේලා වනාහි (සමථයානික අනාගාමී ආර්‍යයන් වහන්සේලා) හා සමාන වූයේ සමාධියෙහි සම්පූර්ණ වූවෝම වෙත්. ධ්‍යානයන් අතුරෙන් යම්කිසි ධ්‍යානයක් කැමති වන කල්හි කිසියම් නිමිත්තක් අරබයා මනසිකාර කළ මාත්‍රයෙන්ම ධ්‍යානය සමෘද්ධ වෙයි. එහෙයින් "තම්පි මග්ගසිද්ධගතිකං" යනු අනුදීපනීපාඨයි) **යෝ පන** යම් යෝගී පුද්ගලයෙක් වනාහි **අට්ඨසමාපත්තියෝ භාවෙත්වා** අෂ්ට සමාපත්ති වඩා **අඤ්ඤතරස්මිං** එක්තරා **රූපීබ්‍රහ්මලෝකේ** රූපාවචර බ්‍රහ්ම ලෝකයෙක්හි **නිබ්බත්ති** ඉපදුනේය **තස්ස** ඔහුගේ **තා සමාපත්තියෝ** ඒ සමාපත්තීහු **තත්ථ** එහි **පාකතිකා ඒව හොන්ති** ප්‍රකෘතියෙන්ම වෙත් **ඉදං** මෙය **උපපත්තිසිද්ධං** උපපත්තියෙන් සිද්ධ **ඉති (හෝති)** වෙයි (උපපත්තියෙන් සිද්ධ වූ ධ්‍යාන ඇති පුද්ගලයන්ට භවන්තරයෙහි ආසන්නයෙහි සිටි ප්‍රත්‍යය භේදයෙන් සංස්කාර භේදය කියනලදි. ඒ සංස්කාර භේදය කෙසේ දතයුතු දැයි දක්වමින් "ඒකස්මිං භවේපි -පෙ- යුත්තානි හොන්ති" යැයි කීවේය) **ඒකස්මිං භවේපි හි** එක් භවයක වනාහි **ලද්ධජ්ඣානානි** ලබනලද ධ්‍යානයෝ **වළඤ්ජනකාලේ** සමාපත්තියට සමවදින කාලයෙහි **සන්නිහිතපච්චයවසේන** ආසන්නයෙහි සිටි ප්‍රත්‍යයගේ වශයෙන් **නානාපටිපදයුත්තානි හොන්ති** නොයෙක් නොයෙක් ප්‍රතිපදාවෙන් යුක්ත වූ ධ්‍යානයෝ වෙත් (දැන් ඒ මග්ගසිද්ධ ධ්‍යානයෝ උපපත්තියෙන් සිද්ධ ධ්‍යානයෝ ආසන්නයෙහි සිටි ප්‍රත්‍යය අපේක්ෂා නොකොට මාර්ගක්ෂණ උපපත්තික්ෂණ සිද්ධ වූ කාලයෙහි ධ්‍යානුප්පත්ති ප්‍රතිපදාවෙන්ම සියළු ආකාරයෙන් අභාවය ගෙන අන්‍ය වූ විකල්පයක් දැක්වීම පිණිස "ඣානුප්පත්තිපටිපදා රහිතත්තා වා" යනාදිය කියනලදි) **ඣානුප්පත්තිපටිපදා** ධ්‍යානුප්පත්ති ප්‍රතිපදාව **රහිතත්තා වා** නැති බැවින් හෝ **අසඞ්ඛාරිකජ්ඣානේසු** අසංස්කාරික ධ්‍යානයන්හි **තේසං** මහග්ගත චිත්තයන්ගේ **සඞ්ගහෝ යුත්තෝ සියා** සඞ්ග්‍රහය යුක්ත වන්නේය (මෙසේ මහග්ගත චිත්තයන්ගේ අර්ථකථා වශයෙන් සිද්ධවනලද සංස්කාර භේදය කියා දැන් පෙළ වශයෙන් ද ඒ සංස්කාර භේදය සිද්ධවේම යැයි දැක්වීම පිණිස "අපි ච" යන වචනය අරඹනලදි)

**අපි ච** එතකුදුවුවත් **නෙත්තිපාළියං** නෙත්තිප්ප්‍රකරණයෙහි **සබ්බේසං ලෝකිය ලෝකුත්තරසමාධීනං** සියළු ලෞකික ලෝකෝත්තර සමාධීන්ගේ **සඞ්ඛාරභේදෝ** සංස්කාර භේදය **සරූපතෝව** ස්වරූප වශයෙන්ම **නිද්දිට්ඨෝ** දක්වනලදි **යථා** යම්සේ **සසඞ්ඛාරෝ සමාධි** සසංස්කාර සමාධිය **අසඞ්ඛාරෝ සමාධි ඉති** අසංස්කාර සමාධිය යැයි **ද්වේ සමාධයෝ** සමාධි දෙදෙනෙක් **ආහ** දේශනා කළ සේක **අට්ඨකථායං ච** අර්ථකථාවෙහි ද **සුඛපටිපද පුබ්බකානං** සැප ප්‍රතිපදව පූර්ව කොට ඇති **දන්ධාභිඤ්ඤඛිප්පාභිඤ්ඤසමාධීනං ද්වින්නං** ලස් වූ අභිඥ ඇති නොලස් වූ අභිඥ ඇති සමාධි දෙදෙනගේ **අසඞ්ඛාරභාවෝ ච** අසංස්කාර භාවය ද **දුක්ඛපටිපද පුබ්බකානං** දුක් ප්‍රතිපදව පූර්ව කොට ඇති **දන්ධාභිඤ්ඤඛිප්පාභිඤ්ඤසමාධීනං ද්වින්නං** ලස් වූ අභිඥ ඇති නොලස් වූ අභිඥ ඇති සමාධි දෙදෙනගේ **සසඞ්ඛාරභාවෝ ච** සසංස්කාර භාවය ද **වුත්තෝ** දේශනා කරනලදි **ඉති** මෙසේ **එත්තාවතා** මෙපමණකින් **සබ්බේසං මහග්ගතලෝකුත්තරජ්ඣානචිත්තානං** සියළු මහග්ගත ලෝකෝත්තර ධ්‍යාන චිත්තයන්ගේ **අසඞ්ඛාරිකසසඞ්ඛාරිකවසේන** අසංස්කාරික සසංස්කාරික වශයෙන් **විසුං විසුං** වෙන වෙනම **දුවිධභාවෝ සිද්ධෝ හෝති** දෙවැදෑරුම් බව සිද්ධ වෙයි **යස්මා පන** යම්හෙයකින් වනාහි **අයං සඞ්ඛාරවෝහාරෝ** මේ සංස්කාර ව්‍යවහාරය **අකුසලානං අපි** අකුසල චිත්තයන්ට ද **සාධාරණෝ** සාධාරණය **පටිපදවෝහාරෝ පන** ප්‍රතිපද ව්‍යවහාරය වනාහි **විසේසේන** විශේෂයෙන් **පටිපත්තිධම්මේස්වේව** ප්‍රතිපත්ති ධර්මයන්හිම **පාකටෝ** ප්‍රකටය **මහග්ගතලෝකුත්තරධම්මා ච** මහග්ගත ලෝකෝත්තර ධර්මයෝ ද **ඒකන්තං** ඒකාන්තයෙන් **පටිපත්තිධම්මා ඒව** ප්‍රතිපත්ති ධර්මයෝම වෙයි **තස්මා** එහෙයින් **තේසං** ඔහුන්ගේ **භේදං** භේදය **සඞ්ඛාරවසේන අවත්වා** සංස්කාර වශයෙන් නොකියා **පටිපදවසේනේව** ප්‍රතිපදවගේ වශයෙන්ම **ධම්මසඞ්ගණී පාළියං අපි** දම්සඟුණු පෙළෙහි ද **වුත්තෝ ඉති** දේශනා කරනලදැයි **දට්ඨබ්බං** දතයුතුයි **අයං එත්ථ** මේ මෙහි **පරමත්ථදීපනා** පරමත්ථදීපනියයි

**විභාවනීයං පන** විභාවනි ටීකාවෙහි වනාහි **සබ්බස්සාපි** සියළුම **ඣානස්ස** ධ්‍යානයට **පරිකම්මසඞ්ඛාතපුබ්බාභිසඞ්ඛාරේන විනා** පරිකර්මය යැයි කියනලද පූර්ව භාගයෙහි හටගත්තාවූ වීර්යයෙන් තොරව **කේවලං** පරිකර්මය හා මිශ්‍ර නොකොට **අධිකාරවසේන** ධ්‍යානය කළාවූ පරිචය බලයෙන් නොහොත් පූර්ව භවයෙහි ධ්‍යාන මාර්ග ඵල ප්‍රාර්ථනා කොට කරනලද දන සීලාදී පුණ්‍ය කර්ම බලයෙන් **අනුප්පජ්ජනතෝ** හටනොගන්නා හෙයින් **අසඞ්ඛාරන්තිපි** අසංස්කාරයයි ද **වත්තුං න සක්කා** කිව නොහැකි වේ **අධිකාරේන ච විනා** පෙර කළ පුරුද්දෙන්ද වෙන්ව **කේවලං** අධිකාරය හා මිශ්‍ර නොකොට **පරිකම්මාදිසඞ්ඛාර වසේනේව** පරිකර්ම ආදියෙහි උත්සාහ කිරීම් වශයෙන්ම **අනුප්පජ්ජනතෝ** හටනොගන්නා හෙයින් **සසඞ්ඛාරන්තිපි** සසංස්කාරයයි ද **වත්තුං න සක්කා ඉති** කිව නොහැකි යැයි **යං වුත්තං** යමක් කියනලදි **තත්ථ** එහි **පරිකම්මසඞ්ඛාත -පෙ- අසඞ්ඛාරිකන්තිපි න සක්කා වත්තුං ඉති** පරිකම්මසඞ්ඛාත -පෙ- අසඞ්ඛාරිකන්තිපි න සක්කා වත්තුං යන **ඉදං** මේ පාඨය **න යුජ්ජති** සුදුසු නොවෙයි

**පරිකම්මසඞ්ඛාතපුබ්බාභිසඞ්ඛාරෝ** පරිකර්ම සඞ්ඛ්‍යාත පුබ්බාභිසඞ්ඛාරය තෙමේ **ඉමස්මිං සඞ්ඛාරභේදේ** මේ සංස්කාර භේදයෙහි **සඞ්ඛාරෝ ඒව නාම** සංස්කාරයම නම් **න හි හෝති** නොවෙයි (පුබ්බාභිසඞ්ඛාරය තෙමේ ප්‍රකෘති පුබ්බාභිසඞ්ඛාරය ද ප්‍රයෝග පුබ්බාභිසඞ්ඛාරය ද යැයි දෙවැදෑරුම් වේ. මෙහි පරිකර්ම පුබ්බාභිසඞ්ඛාරය ප්‍රකෘති පුබ්බාභිසඞ්ඛාරය නම්. මේ ප්‍රකෘති

පුබ්බාභිසඞ්ඛාරයම ප්‍රකෘති ප්‍රත්‍යයගණයම වෙයි. පෙර කියනලද පූර්ව ප්‍රයෝගය තෙමේ ප්‍රයෝග පුබ්බාභිසඞ්ඛාර නමි. එයම අදහස් කරනු ලැබේ යැයි දැක්වීම පිණිස "න හි" යනුවෙන් කියනලදි) **කස්මා?** කුමක් හෙයින්ද යත්? **ඣානුප්පත්තියා** ධ්‍යානුත්පත්තියට **පකතිපච්චයභූතත්තා** ප්‍රකෘති ප්‍රත්‍යය වන බැවිනි **හි (සච්චං)** ඒ කීම සැබෑවකි **යථා** යම්සේ **ලොකේ ච** ලෝකයෙහි ද **සාසනේ ච** ශාසනයෙහි ද **සබ්බම්පි කුසලාකුසලකම්මං** සියළු කුසල කර්ම ද අකුසල කර්ම ද **අත්තනෝ** තමාට **අනුරූපේන** සුදුසු පරිදි **පරිකම්මසඞ්ඛාත පුබ්බභිසඞ්ඛාරේන විනා** පරිකර්ම සඞ්ඛ්‍යාත පුබ්බාභිසඞ්ඛාරය නොමැතිව **උප්පන්නං නාම නත්ථි** ඉපදීමක් නම් නැත **අන්තමසෝ** යටත්පිරිසෙන් **ආලෝපභික්ඛාදනමත්තම්පි** බත් හුලක් දීම් මාත්‍රය ද (**පරිකම්මසඞ්ඛාත පුබ්බභිසඞ්ඛාරේන විනා** පරිකර්ම සඞ්ඛ්‍යාත පුබ්බාභිසඞ්ඛාරය නොමැතිව **උප්පන්නං නාම නත්ථි** ඉපදීමක් නම් නැත) **යඤ්ච චිත්තං** යම් චිත්තයක් ද **අත්තනෝ** තමාට **අනුරූපේන යේන පරිකම්මසඞ්ඛාතපුබ්බාභිසඞ්ඛාරේන විනා** අනුරූප වූ යම් පරිකර්ම සඞ්ඛ්‍යාත පුබ්බාභිසඞ්ඛාරයක් නොමැතිව **න උප්පජ්ජති** නූපදී **ඉති (තස්මා)** එහෙයින් **සෝ (පරිකම්මසඞ්ඛාතපුබ්බාභිසඞ්ඛාරෝ)** ඒ පරිකර්ම සඞ්ඛ්‍යාත පුබ්බාභිසඞ්ඛාරය තෙමේ **තස්ස චිත්තස්ස** ඒ චිත්තයට **පකතිපච්චයගණෝ ඒව** ප්‍රකෘති ප්‍රත්‍යය ගණයෙහිම **අන්තෝගධෝ හෝති** ඇතුළත් වෙයි **ලෝකියලෝකුත්තරභූතානි සබ්බානි ඣානානි ච** ලෞකික ලෝකෝත්තර වූ සියළු ධ්‍යානයෝ ද **අත්තනෝ** තමාට **අනුරූපේන** සුදුසු පරිදි **පරිකම්මසඞ්ඛාතපුබ්බභාගභාවනාභිසඞ්ඛාරේන විනා** පරිකර්ම සඞ්ඛ්‍යාත පූර්ව භාග භාවනාභිසඞ්ඛාරය නොමැතිව **උප්පන්නානි නාම නත්ථි** උපදින ලද්දාහු නම් නොමැත **ඉති (තස්මා)** එහෙයින් **සෝ (භාවනාභිසඞ්ඛාරෝ)** ඒ භාවනාභිසඞ්ඛාරය තෙමේ **තේසං (සබ්බේසම්පි ඣානානං)** ඒ සියළු ධ්‍යානයන්ට **පකතිපච්චයගණේසු ඒව** ප්‍රකෘති ප්‍රත්‍යය ගණයන්හිම **අන්තෝගධෝ හෝති** ඇතුළත් වෙයි **ඉති** මෙසේ **ඉතරථා** අන් අයුරකින් **අසඞ්ඛාරිකං සබ්බම්පි කුසලාකුසලකම්මං නාම** අසඞ්ඛාරික වූ සියළු කුසල අකුසල කර්ම නම් **නත්ථි ඉති ආපජ්ජති** නැත යැයි (අදහසකට) පැමිණෙයි.

**තත්ථ** විභාවනී ටීකායෙහි **අධිකාරේන ච විනා** පෙර කළ පුරුද්දෙන්ද වෙන්ව **කේවලං** අධිකාරය හා මිශ්‍ර නොකොට **පරිකම්මාභිසඞ්ඛාර වසේනේව** පරිකර්ම ආදියෙහි උත්සාහ කිරීම් වශයෙන්ම **අනුප්පජ්ජනතෝ** හටනොගන්නා හෙයින් **සසඞ්ඛාරන්තිපි** සසංස්කාරයයි ද **වත්තුං න සක්කා ඉති** කිව නොහැකි යැයි **යං වුත්තං** යමක් කියනලදි ද **තම්පි** ඒ කීම ද **න යුජ්ජතියේව** සුදුසු නොවේමය.

**ලෝකියඣානානි නාම** ලෞකික ධ්‍යානයෝ නම් **අධිකාරේන විනා** පෙර කරනලද පුරුද්දෙන් වෙන්ව **නුප්පජ්ජන්ති ඉති** නූපදිත් යැයි **න හි අත්ථි** ඇත්තේ නොවේ (මේ සත්වයන්ට සියළු කල්පයන්හි කල්පය විනාශ වන කාලයෙහි ධ්‍යාන වඩා බ්‍රහ්ම ලෝකයට ගිය බැවින් යන අදහසයි) **කේවලං පන** හුදෙක් වනාහි **පුබ්බේ** පෙර **සමථකම්මේසු** සමථ කර්මයන්හි **කතාධිකාරස්ස** කරනලද පුරුද්ද ඇති පුද්ගලයාට **සුඛප්පටිපදජ්ඣානං** සැප ප්‍රතිපදවෙන් ධ්‍යානය **උප්පජ්ජති** උපදී **අකතාධිකාරස්ස පන** කරනලද පුරුද්ද නැති පුද්ගලයාට වනාහි **දුක්ඛප්පටිපදජ්ඣානං** දුක් ප්‍රතිපදවෙන් ධ්‍යානය **ඉති (උප්පජ්ජති)** උපදී **ඒවමේව** මෙසේම **අට්ඨකථාසු** අර්ථකථාවන්හි **ආගතං** එන ලද්දේය **තත්ථ** එහි **සමථේ** සමථයෙහි **අකතාධිකාරෝ යෝ ච** කරනලද පුරුද්ද නැති යම් යෝගී පුද්ගලයෙක් තෙමේ වේද **තස්ස** ඔහුට **දුක්ඛාපටිපදා හෝති** දුක් ප්‍රතිපදව වෙයි **කතාධිකාරස්ස** කරනලද පුරුද්ද ඇති පුද්ගලයාට **සුඛ (පටිපදා)** සැප ප්‍රතිපදව **ඉති (හෝති)** වෙයි **අපිච** එතකුදුවුවත්

**පුරිමභවේ** පෙර භවයෙහි **සිද්ධං අධිකාරං ගහෙත්වා** කරනලද පුරුද්ද ගෙන **ඉධ** මෙහි **සඞ්ඛාරභේදවිචාරණාපි** සංස්කාර භේදයෙහි නියම කිරීමක් ද **න යුත්තා ඒව** නොයොදන ලද්දේමය **හි** තවද **කුසලක්‍රියාජ්ඣානේසු** කුසල ක්‍රියා ධ්‍යානයන්හි **සන්නිහිතපච්චයවසේනේව** ආසන්නයෙහි සිටි ප්‍රත්‍යයගේ වශයෙන්ම **තං විචාරණා** ඒ නියම කිරීම **යුත්තා** යොදනලදි.

**එත්තාවතා** මෙපමණකින් **අථ වා** නොහොත් **පුබ්බාභිසඞ්ඛාරවසේන** පූර්ව භාගයෙහි කරනලද උත්සාහයාගේ වශයෙන්ම **උප්පජ්ජමානස්ස** හටගන්නාවූ රූපාවචර කුසල ධ්‍යානයාගේ **කදචි** කිසිකලෙක්හි **අසඞ්ඛාරිකභාවෝ** අසංස්කාරික භාවය තෙමේ **න සම්භවති** සම්භව නොවේ **ඉති (තස්මා) අසඞ්ඛාරිකන්ති ච** අසංස්කාරිකයයිදු **න වුත්තං** නොකියනලදි **බ්‍යාභිචාරාභාවතෝ** ඒකාන්ත අසංස්කාරික නොවන හෙයින් **සසඞ්ඛාරිකන්ති ච** සසංස්කාරිකයයි ද **න වුත්තං** නොකියනලදි මෙසේ **පච්ඡිමවිකප්පෝපි** මේ පශ්චිම විකල්පය ද **පටික්ඛිත්තෝ ඒව** ප්‍රතිකෙෂ්පම **හෝති** වෙයි.
**[පරමත්ථදීපනී ටීකා පරිවර්තන]**

නනු චෙත්ථ කාමාවචරකුසලේ විය සඞ්ඛාරභේදෝ කස්මා න ගහිතෝ. ඉදම්පි හි කේවලං සමථානුයෝගවසේන පටිලද්ධං සසඞ්ඛාරං, මග්ගාධිගමවසේන පටිලද්ධමසඞ්ඛාරං, තස්මා "ඣානඞ්ගසඞ්ඛාරයෝගභේදතෝ දසවිධ"න්ති වත්තබ්බන්ති? නයිදමේවං, මග්ගාධිගමවසේන සත්තිතෝ පටිලද්ධස්සාපි අපරභාගේ පරිකම්මවසේනේව උප්පජ්ජනතෝ, තස්මා සබ්බස්සපි ඣානස්ස පරිකම්මසඞ්ඛාත පුබ්බාභිසඞ්ඛාරේන විනා කේවලං අධිකාරවසේන අනුප්පජ්ජනතෝ "අසඞ්ඛාර"න්තිපි වත්තුං න සක්කා, අධිකාරේන ච විනා කේවලං පරිකම්මාභිසඞ්ඛාරේනේව අනුප්පජ්ජනතෝ "සසඞ්ඛාර"න්තිපි වත්තුං න සක්කාති.
**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 27 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 100 පිට]**

මේ රූපාවචර කුසලයෙහි කාමාවචර කුසලයෙහි මෙන් සංස්කාර භේදය කුමක් හෙයින් නොගන්නා ලද්දේ ද යත්? යම් හෙයකින් මේ රූපාවචර කුසල චිත්තය ද හුදෙක් සමථානුයෝග වශයෙන් ප්‍රතිලබ්ධවූයේ සසංස්කාරිකය, මාර්ගාධිම වශයෙන් ප්‍රතිලබ්ධවූයේ අසංස්කාරිකයයි කියන්නට හැකිවේ ද එහෙයින් ධ්‍යානාඞ්ග සංස්කාර භේදයෙන් දස වැදෑරුම් වේ යැයි කියයුත්තේ ද යත්; මේ රූපාවචර කුසල චිත්තය එසේ නොකිය යුත්තේයි. කුමක් හෙයින යත්; මාර්ගාධිගම වශයෙන් ශක්ති හෙයින් ප්‍රතිලබ්ධ වූ රූපාවචර ධ්‍යානයාගේ ද අපරභාගයෙහි පරිකර්ම වශයෙන්ම උපදනා හෙයිනි. එසේ හෙයින් සියළු ධ්‍යානයාගේම පරිකර්ම සඞ්ඛ්‍යාත පූර්වාභිසංස්කාරයෙන් තොරව හුදෙක් කෘතාධිකාර වශයෙන් නුපදනා හෙයින් අසංස්කාරිකයයි ද කියන්නට නොහැකි වෙයි. කෘතාධිකාරයක් නැතිව හුදෙක් පරිකර්මාභිසංස්කාරයෙන්ම නොපදනා හෙයින් සංස්කාරිකයයි ද කියන්නට නොහැකිවෙයි.
**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 71 පිට]**

මේ රූපාවචර කුසල චිත්තයෙහි කාමාවචර කුසල චිත්තයෙහි මෙන් සංස්කාර භේදයක් කුමක් හේතුකොටගෙන නොගන්නා ලද්දේ ද? මේ රූපාවචර කුසල ධ්‍යානය ද ඒකාන්තයෙන් සමථානුයෝග වශයෙන් ලබන ලද්දේ සසංස්කාරිකය, මාර්ග අධිගම වශයෙන් ලබන ලද්දේ අසංස්කාරිකය කියා ද කියන්නට හැකි වෙයි. මාර්ග අධිගම වශයෙන් ලබනල ධ්‍යානය ද පසු කාලයෙහි පරිකර්ම වශයෙන්ම උපදින හෙයින් එසේ නොකිය යුතු. එහෙයින් සියළු ධ්‍යානයම පරිකර්මය කියනලද පූර්වාභිසංස්කාරයෙන් වෙන්වැ ඒකාන්තයෙන් අධිකාරයාගේ වශයෙන් නුපදනා හෙයින් අසංස්කාරිකය කියා

ද, අධිකාරයෙන් වෙන්ව ඒකාන්තයෙන් පරිකර්මාභිසංස්කාරයාගේ වශයෙන්ම නූපදනා හෙයින් සසංස්කාරික කියා ද කියන්නට නොහැකි වෙයි. නොහොත් පූර්වාභිසංස්කාර වශයෙන්ම උපදනා ධ්‍යානයාගේ කිසි කලෙක අසංස්කාරික භාවයෙක් නොලැබේ. එහෙයින් අසංස්කාරිකය කියා ද ඒකාන්ත බවක් නැති හෙයින් සසංස්කාරිකය කියා ද නොකියන ලද්දේය ...... **[පරමත්ථවිභාවනී ව්‍යාඛ්‍යාව 10-11 පිටු]**

මේ රූපාවචර කුසලයේහි කාමාවචර කුසලය මෙන් සඞ්ඛාර භේද කුමක් හෙයින් නොගන්නා ලද ද? මේ රූපාවචර කුසල චිත්තය ද හුදෙක් ශමථානුයෝග වශයෙන් ප්‍රතිලබ්ධවූයේ සසඞ්ඛාරිකය. මාර්ගාධිගම වශයෙන් ප්‍රතිලබ්ධ වූයේ අසඞ්ඛාරික යැයි කියන්නට පිළිවන් වුව එසේ නොගත්තේ කුමක් පිණිස ද? මේ රූපාවචර කුසල චිත්තය කාමාවචර කුසල චිත්තය මෙන් එසේ සංස්කාරික භේදයක් ඇත්තේ නොවේ. මාර්ගාධිගම වශයෙන් ශක්ති හෙයින් ප්‍රතිලබ්ධ වූ රූපාවචර ධ්‍යානයාගේ ද අපරභාගයෙහි පරිකර්ම වශයෙන්ම උපදනා හෙයිනි. එසේ හෙයින් සියළු ධ්‍යානයාගේම පරිකර්ම සඞ්ඛ්‍යාත පූර්වාභි සංස්කාරයක් නැතිව හුදෙක් කෘත්‍යයාධිකාර වශයෙන්ම නොඋපදනා හෙයින් අසංස්කාරිකයි කියාද කෘත්‍යයාධිකාරයක් නැතිව හුදෙක් පරිකර්මාභිසඞ්ඛාරයෙන්ම නූපදනා හෙයින් සසංස්කාරිකයි ද කියන්නට නොපිළිවනි. නොහොත් පූර්වාභිසංස්කාර වශයෙන්ම උපදනා ධ්‍යානයාගේ කිසි කලෙක්හි අසංස්කාරිකත්වය සම්භව නොවේනුයි අසංස්කාරික යැයි කියා ද ව්‍යාභිචාරයක් නැති හෙයින් සසංස්කාරිකයයි කියා ද කියන්නට නොපිළිවනි. කියනලද මැයිඃ—

"කේවලං පුබ්බයෝගේන - උස්සාහේනේව වා ඉධ
අනිප්ඵජ්ජනතෝ තිණ්ණං - නත්ථි සඞ්ඛාරිකාදිතා"යි.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 23 පිට]**

කාමාවචර කුසල තෙමේ අසඞ්ඛාරික සසඞ්ඛාරික වශයෙන් ප්‍රභේද වන්නාක් මෙන් රූපාවචර කුසල චිත්තයෙහි අසඞ්ඛාරික චිත්තය සසඞ්ඛාරික චිත්තය යන ප්‍රභේදයක් නැත්තේය. කුමක්හෙයින් සසඞ්ඛාරික භේදයක් නැත්තේ ද යත්:- පරිකර්ම සඞ්ඛ්‍යාත වූ පූර්ව භාගයෙහි හටගත්තා වූ අර්පණා සකස්කිරීම කරන්නා වූ පඨවි පඨවී යනාදීන් හටගන්නා වූ භාවනාමය කාමාවචර කුසල කර්මයෙන් තොරව පූර්ව භාගයෙහි ධ්‍යානය උපදවන්නා වූ සමථ භාවනා වැඩීම යම්කිසි කුසල කර්මයක් කොට ධ්‍යානය ලබම්හයි ප්‍රාර්ථනා කිරීම වශයෙන් හුදු අසඞ්ඛාරික එක් ක්‍රමයක්හුගේ වශයෙන් නොහටගැනිම වන හෙයින් අසඞ්ඛාරික යැයි කියාද නොකිය යුත්තේයි. සෝතාපත්ති මාර්ගාදිය ලැබීම මාර්ගයාගේ ආනුභාවයෙන් වෙන්ව රූප ධ්‍යානය ලැබීම පිණිස උත්සාහ කරන්නාහට නොලැබෙන්නේ නමුදු ඒ ලැබුවා වූ ධ්‍යානය ලැබීමෙන් මත්තෙහි පූර්ව භව සංස්කාරයෙන් තොරව සමවැදීම පිණිස නොහැකි වෙයි. ඒහෙයින් අසඞ්ඛාරික යැයි කියා ද නොකිය යුත්තේයි.

පූර්ව භවයෙහි ධ්‍යානය ලැබීමය, සමථ භාවනා වැඩීමය, යම්කිසි කුසලයක් කොට ධ්‍යානය ලැබේවායි ප්‍රාර්ථනා කිරීම හැර හුදු පරිකර්ම සඞ්ඛ්‍යාත වූ අර්පණාව සකස් කරන්නා වූ පඨවි පඨවි යනාදීන් හටගන්නා වූ භාවනාමය කාමාවචර කුසලයන් නොහටගන්නා හෙයින් සසඞ්ඛාරිකයි කියා ද නොකිය යුත්තේයි. ලෞකික උපමා වශයෙන් වනාහි තල අබ ආදී බීජයන් මිශ්‍ර කොට තෙල් සිඳීමෙන් හටගන්නා වූ තෛලය අබ තෙලින් තොරව නොහටගන්නා හෙයින් තල තෙල් යන අනිත් නාමයකින් ව්‍යවහාර නොකට යුත්තේය. තල අබ හා මිශ්‍ර නොවූ හෙයින් තල තෙල යන නාමය

ව්‍යවහාර නොකට යුත්තේය. ඒ පරිද්දෙන් සඞ්ඛාර දෙපක්‍ෂය හා මිශ්‍ර කොට අසඞ්ඛාරික රූපාවචර කුසල චිත්තය යැයි කියා ද අනික් නමකින් නොකිය යුත්තේය. ඒහෙයින් අසඞ්ඛාරික සසඞ්ඛාරික ප්‍රභේදය නොගිනිය යුත්තේය.

එහෙයින් සඞ්ඛේපවණ්ණනා ටීකායෙහි අසඞ්ඛාරික සසඞ්ඛාරික ස්වභාවගේ ඒකාන්ත වශයෙන් නොලැබෙන බව පහළ කරණු කැමතිව **කස්මා ඉදං අසඞ්ඛාර සසඞ්ඛාර වසේන වුත්තං. නනු මග්ගාධිගමනවසේන ලද්ධං ඣානං අසඞ්ඛාරිකං නාම. සමථානුයෝගේන ලද්දං සසඞ්ඛාරිකං නාමාති වත්තුං සක්කෝති. න සක්කා මග්ගාධිගමනවසේනහි පටිලද්ධස්සාපි අධිකාරේන විනා පුබ්බාභිසඞ්ඛාරේන උප්පජ්ජිතුං අසක්කුණෙය්‍යත්තා සසඞ්ඛාරිකන්ති වත්තුං න සක්කා** යනු කීහ. **කස්මා** කුමක්හෙයින් **ඉදං** මේ රූපාවචර කුසල චිත්තය **අසඞ්ඛාරසසඞ්ඛාරවසේන** අසංස්කාරික සසංස්කාරික වශයෙන් **න වුත්තං** නොකිය යුත්තේ ද යත් **මග්ගාධිගමනවසේන** මාර්ගය ලැබීමගේ වශයෙන් **ලද්ධං** ලබන ලද්ද වූ **ඣානං** ධ්‍යාන තෙමේ **අසඞ්ඛාරිකං නාම** අසංස්කාරික නම් වේ. **සමථානුයෝගේන** කර්මස්ථානානුයෝගීව නැවත නැවත උත්සාහ කිරීමෙන් **ලද්දං ඣානං** ලබන ලද්ද වූ ධ්‍යාන තෙමේ **සසඞ්ඛාරිකං නාම** සසංස්කාරික නම් වේ. **ඉති වත්තුං** මෙසේ කීමට **සක්කා නනු** හැක්කේ නොවේද යත්? **ඉති චේ වදෙය්‍ය** ඉදින් මෙසේ කියන්නේ නම් **න සක්කා** නොහැකි වෙයි. **හි** කුමක්හෙයි යත්? **මග්ගාධිගමනවසේන** මාර්ගය ලැබීමෙන් **පටිලද්ධස්සාපි** ලබන ලද්ද වූ ධ්‍යානයාගේ ද **අපරභාගේ** මෑත භාගයෙහි **පුබ්බාභිසඞ්ඛාරේන** සමවැදීමට මත්තෙන් පූර්ව භාගයෙහි උත්සාහ කිරීමෙන් තොරව **අධිකාරේන වසේන** පූර්ව භවයෙහි ධ්‍යානය ඉපදවීම පිණිස සමථ භාවනා වැඩීමය.

යම්කිසි කුසලක් කොට ධ්‍යානය ලබම්වයි ප්‍රාර්ථනා කිරීම් වශයෙන් **සමාපජ්ජිතුං** සමවදිනු පිණිස **අසක්කුණෙය්‍යයත්තා** නොහැකිවන හෙයින් **අසඞ්ඛාරිකන්තිච** අසඞ්ඛාරික යැයි කියා ද **වත්තුං න සක්කා** කිව නොහැකි වෙයි. **සමථානුයෝගවසේන** විදර්ශනාවෙහි යෙදීම් වශයෙන් **පටිලද්ධස්සාපි** ලබන ලද්ද වූ ධ්‍යානයාගේ ද **අධිකාරේන විනා** ප්‍රාර්ථනාවෙන් තොරව **පුබ්බාභිසඞ්ඛාරේනේව** පූර්ව භවයෙහි උත්සාහ කිරීමෙන්ම **උප්පජ්ජිතුං** උපදිනු පිණිස **අසක්කුණෙය්‍යත්තා** නොහැකි බැවින් **සසඞ්ඛාරිකන්තිච** සසංස්කාරික යැයි කියා ද **වත්තුං න සක්කා** කිව නොහැකි වෙයි. නොහොත් සියළු ධ්‍යානයාගේ පූර්වාභිසඞ්ඛාරයෙන් තොරව නොමගන්නා හෙයින් සසංස්කාරිකම වෙත්. ඒසේ සසංස්කාරික වන කල්හි අසංස්කාරික යැයි කියා නොකිය යුත්තේය. ඒසේ නොකිය යුතු හෙයින් සසංස්කාරික වන්නේ නමුදු සසංස්කාරික යැයි කියා ද නොකිය යුත්තේය. ඒහෙයින් සඞ්ඛේපවණ්ණනා ටීකාවෙහි සසංස්කාරික බව දක්වයි. ඒකාන්ත වශයෙන් ලැබිය යුත්තේ නමුදු අනේකාන්ති බවක් නැති හෙයින් සසංස්කාරික යැයි කියා ද නොකිය යුතු බව විකල්පයෙන් ප්‍රකාශ කළේයි.

**අථවා සබ්බස්සාපි ඣානස්ස පුබ්බාභිසඞ්ඛාරේන විනා අනුප්පජ්ජනතෝ අසඞ්ඛාරිකන්ති ව්‍යාභිචාරෝ නත්ථි. තස්මා සසඞ්ඛාරිකන්ති න වුත්තං** යනු කියන ලද්දේයි. **අථවා** නොහොත් **සබ්බස්සාපි ඣානස්ස** සියළු ධ්‍යානයාගේ **පුබ්බාභිසඞ්ඛාරේන** පරිකර්ම සඞ්ඛ්‍යාත වූ පූර්ව භාගයෙහි අර්පණාව සකස් කරන්නා වූ පඨවි පඨවි යනාදියෙන් හටගන්නා වූ භාවනාමය කාමාවචර කුසලයෙන් **විනා** තොරව **අනුප්පජ්ජනතෝ** නූපදනා හෙයින් **අසඞ්ඛාරිකන්ති** අසංස්කාරික යැයි කියා

ද **ව්‍යභිචාරෝ නත්ථි** මාරුවීමෙක් නැත්තේයි. **තස්මා** ඒසේහෙයින් **සසඞ්ඛාරිකන්ති න වුත්තං** සසංස්කාරික යැයි කියා ද නොකියන ලද්දේයි. මේ වනාහි අර්ථයි.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 32-33 පිටු]**

## විතර්ක විචාරයන් ප්‍රහීණ වන ආකාරයඃ—

දේසනාක්කමතෝ, මහග්ගතධම්මේසු පඨමං අධිගන්තබ්බතෝ ච **පඨමං,** පඨමං සමාපජ්ජිතබ්බන්තිපි **පඨම**න්ති වදන්ති. තං පන න ඒකන්තලක්ඛණං ඣානපටිලෝමාදිවසේන සමාපජ්ජනේ අසම්භවතෝ.

පුරිමපච්ඡිමචිත්තේසු උප්පජ්ජමානස්සාපි අප්පනාක්ඛණේ අනුප්පජ්ජනතෝ විතක්කෝ විප්පහීනෝ ඒතස්ස, තතෝ වා ඒතං විප්පහීනන්ති **විතක්කවිප්පහීනං.** භාවනාය හි පහීනත්තා විතක්කෝ ඣානක්ඛණේ නුප්පජ්ජති. අසංකිලිට්ඨසභාවත්තා පන උපචාරභාවනාය ච තං පහාතුං අසමත්ථභාවතෝ පුරිමභාගේ, පච්ඡාභාගේ ච අපච්චනීකචිත්තප්පවත්තිතෝ උප්පජ්ජතියෙවාති.

නනු ච "අසංකිලිට්ඨසභාවත්තා"ති වුත්තං, අථ කථං ඣානේන ඒස පහීයති? න හි කුසලේහි අසංකිලිට්ඨධම්මස්ස පහානං අත්ථි රාගාදිසංකිලිට්ඨානං පාපධම්මානමේතස්ස උජුපටිපක්ඛභාවතෝති? වුච්චතේ; අසංකිලිට්ඨසභාවස්සාපි ඒතස්ස ඕළාරිකතාය දුබ්බලභාවතෝ ඣානක්ඛණේ අනුප්පත්තිසභාවාපාදනත්ථං තත්ථ නිකන්තිවික්ඛම්භනවසේන දුතියජ්ඣානභාවනා හෝතීති තස්සා බලේන තං ඣානක්ඛණේ අනුප්පජ්ජන්තං නිකන්තිවික්ඛම්භනවසේන වා වික්ඛම්භිතං පහීනං නාම හෝති. යදි ඒවං උපචාරේනපි නිකන්ති වික්ඛම්භීයතීති තත්ථපිස්ස පහානං සියා, යථා පඨමජ්ඣානස්ස උපචාරේ නීවරණානීති? නයිදමේවං, නීවරණප්පහානස්ස විය විතක්කාරම්මණිකනිකන්ති වික්ඛම්භනස්ස උපචාරේන සාතිසයං අනිප්ඵජ්ජනතෝ. සාතිසයඤ්හි තත්ථ නිකන්තිප්පහානං අප්පනාය ඒව හෝති, තස්මා යදවෝචුම්හා "උපචාරභාවනාය ච තං පහාතුං අසමත්ථභාවතෝ"ති, තං සුට්ඨු උපපරික්ඛිත්වා වුත්තන්ති දට්ඨබ්බං. **"විචාරවිප්පහීන"**න්තිආදීසුපි වුත්තනයානුසාරේන අත්ථෝ දට්ඨබ්බෝ. දුතියජ්ඣානේයේව පහීනස්ස විතක්කස්ස ඉධ අප්පවත්තිමත්තදස්සනත්ථං **"විතක්කවිචාරවිප්පහීන"**න්ති විතක්කග්ගහණං කතං. ඒවං **"විතක්කවිචාරපීතිවිප්පහීන"**න්තිආදීසුපි.

**යථාසම්භව**න්ති පඨවිකසිණාදීසු යං යං ආරම්මණං යස්ස යස්ස සම්භවති තදනතික්කමතෝ කසිණානාපානේසුහි පඤ්චේව ඣානානි පවත්තන්ති. අසුභකායගතාසතීසු පඨමජ්ඣානං අනුපෙක්ඛාබ්‍රහ්මවිහාරේසු පඤ්චමජ්ඣානවජ්ජානි උපෙක්ඛාබ්‍රහ්මවිහාරේ පඤ්චමජ්ඣානන්ති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 27 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 104-106 පිටු]**

මහද්ගත ධර්මයන් කෙරෙහි දේශනා ක්‍රමයෙන් හෝ පළමුකොට පැමිණිය යුතු ධ්‍යානය බැවින් හෝ ප්‍රථම නම් වෙයි. පළමුකොට සමවැදිය යුතු හෙයින්ද ප්‍රථම නම් වේයයිද කියත්. ඒ වනාහි ඒකාන්ත ලක්ෂණයක් නොවේ කුමක් හෙයින යත්? ධ්‍යාන ප්‍රතිලෝමාදී වශයෙන් සමවැදීමෙහි සම්භව නොවන හෙයිනි. පුරිම පශ්චිම චිත්තයන්හි උපදනේ නමුදු අර්පණා ක්‍ෂණයෙහි නූපදනා හෙයින් "විතක්කෝ විප්පහීනෝ ඒතස්ස තතෝ වා ඒතං විප්පහීනන්ති විතක්ක විප්පහීනං"යි වාක්‍ය

ගතයුතු. භාවනාවෙන් ප්‍රහාණය කළ හෙයින් විතර්ක තෙමේ ධ්‍යාන ක්‍ෂණයෙහි නූපදී. එතකුදුවුවත් නොකිලිටු ස්වභාව ඇති හෙයින් උපචාර භාවනාවෙන්ද එය ප්‍රහාණය කරන්ට නොහැකි හෙයින් පූර්වභාග පශ්චාද්භාග දෙක්හි සතුරු නොවූ චිත්ත ප්‍රවෘත්ති ඇති බැවින් උපදනේමැයි. නොකිලිටු ස්වභාව ඇති හෙයිනැයි කියනලද්දේ නොවේද? එසේ නම් ධ්‍යානයෙන් ඒ විතර්කය කෙසේ ප්‍රහාණය වේදයත්? කුසලය කරණකොටගෙන නොකිලිටු ධර්මයාගේ ප්‍රහාණයක් නම් නැත්තේය. රාගාදීන් කිලිටුවූ පාප ධර්මයන්ට මේ විතර්කය ඉඳුරා ප්‍රතිපක්‍ෂ බැවින් නොකිලිටු ස්වභාව ඇත්තාවූද ඒ විතර්කයාගේ ඖදරිකවත්වය කරණකොටගෙන දුර්වල බැවින් ධ්‍යාන ක්‍ෂණයෙහි අනුත්පත්ති ස්වාභාවාපාදනය පිණිස කියනු ලැබේ. එහි නිකාන්ති විස්කම්භන වශයෙන් ද්විතීය ධ්‍යාන භාවනාව වේනුයි ඒ භාවනාවගේ බලයෙන් ධ්‍යාන ක්‍ෂණයෙහි නූපදනා ඒ විතර්කය නිකාන්ති විස්කම්භන වශයෙන් හෝ විස්කම්භනය කරණලද්දේ ප්‍රහාණය වූයේ නම් වෙයි. ඉදින් එසේවී නම් උපචාර ධ්‍යානයෙනුදු නිකාන්ති විස්කම්භය වනු ලැබෙයි. එහෙයින් යම්සේ ප්‍රථම ධ්‍යානයාගේ උපචාරයෙහි නීවර්ණ ප්‍රහාණය වේද එපරිද්දෙන් ඒ උපචාර ධ්‍යානයෙහිදු මේ විතර්කයාගේ ප්‍රහාණය වන්නේ නොවේද යත්? මේ එසේ නොවෙයි කුමක් හෙයිනයත්? නීවර්ණ ප්‍රහාණයමෙන් විතර්කාරම්මණික නිකාන්ති විස්කම්භනය උපචාරයෙන් අතිශයින් සිද්ධනොවන හෙයිනි. යම්හෙයකින් එහි නිකාන්ති ප්‍රහාණය අතිශයින් අර්පණාවෙන්ම වේද එහෙයින් "උපචාර භාවනාවෙන් එය ප්‍රහාණය කරන්නට අසමර්ථබැවිනැයි" යන යම් වචනයක් කීමුද ඒ වචනය මොනවට පරීක්ෂාකොට කියනලද්දේ යයි දතයුතුයි. "විචාරවිප්පහීනං" යනාදියෙහිදු කියනලද අනුසාරයෙන් අර්ථ දතයුත්තේයි.

ද්විතීය ධ්‍යානයෙහිම ප්‍රහීණවූ විතර්කයාගේ මෙහි හෙවත් මේ තෘතීය ධ්‍යානයෙහි අප්‍රවෘත්ති මාත්‍රයක් දැක්වීම පිණිස "විතක්ක විචාර විප්පහීනං"යී විතක්ක ශබ්දයාගේ ගැණීම කරණ ලද්දේයි. "විතක්ක විචාර පීති විප්පහීනං"යනාදියෙහිද සම්භව වන පරිද්දෙන් හෙවත් පෘථිවි කසිණාදීන් අතුරෙහි යම් යම් අරමුණක් යම් යම් සිතකට වේද ඒ ඒ අරමුණ නොයික්මවන හෙයින් මෙසේම ගන්නා ලද්දේයි. ඒ එසේමැයි; දස කසිණ ආනාපානසති යන මෙහි ධ්‍යානයෝ පස්දෙනම උපදිත්. දස අසුභ කායගතාසති යන මෙහි ප්‍රථම ධ්‍යානය උපදී. උපේක්ෂා බ්‍රහ්මවිහාර වර්ජිත සෙසු තුන් බ්‍රහ්මවිහාරයන්හි පඤ්චම ධ්‍යාන වර්ජිත අවශේෂ සතර ධ්‍යානයෝ උපදිත්. උපේක්ෂා බ්‍රහ්මවිහාරයෙහි පඤ්චම ධ්‍යානය උපදී.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 73-74 පිටු]**

## අභිභායතන යනුː—

## සූත්‍රාන්ත ක්‍රමයට අභිභායතන

"රාගස්ස, භික්ඛවේ, අභිඤ්ඤාය අට්ඨ ධම්මා භාවේතබ්බා. කතමේ අට්ඨ? අජ්ඣත්තං රූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය 'ජානාමි පස්සාමී'ති ඒවංසඤ්ඤී හෝති. අජ්ඣත්තං රූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය 'ජානාමි පස්සාමී'ති ඒවංසඤ්ඤී හෝති. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය 'ජානාමි පස්සාමී'ති ඒවංසඤ්ඤී හෝති. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය 'ජානාමි පස්සාමී'ති ඒවංසඤ්ඤී හෝති. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලදස්සනානි නීලනිභාසානි පීතානි පීතවණ්ණානි...පෙ.... ලෝහිතකානි

ලෝහිතකවණ්ණානි…පෙ…. ඕදාතානි ඕදාතවණ්ණානි…පෙ…. ඕදාතනිභාසානි, තානි අභිභුය්‍ය 'ජානාමි පස්සාමී'ති ඒවංසඤ්ඤී හෝති _ රාගස්ස, භික්ඛවේ, අභිඤ්ඤාය ඉමේ අට්ඨ ධම්මා භාවේතබ්බා".

**[අ. නි. අට්ඨකනිපාත පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 118 යටතේ); අ. නි. 05 පාථිකවග්ග පාළි 362 පිට (බු.ජ)]**

මහණෙනි! රාගයාගේ අභිජානනය පිණිස අෂ්ට ධර්මයෝ බැවියයුතුවහ. කවර අට දෙනෙක යත්? ආධ්‍යාත්මයෙහි රූප සංඥා ඇතියේ නොවැඩූ ස්වර්ණ දුවර්ණ බාහිර රූපායතනයන් දක්නේය. ඔවුන් මැඩගෙන දනිමි දකිමි යන මෙබඳු සංඥා ඇතියේ වෙයි. ආධ්‍යාත්මයෙහි රූප සංඥා ඇතියේ අප්‍රමාණ වූ ස්වර්ණ දුවර්ණ වූ බාහිර රූපායතනයන් දක්නේය. ඔවුන් මැඩගෙන දනිමි දකිමි යන මෙබඳු සංඥා ඇතියේය. ආධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇතියේ නොවැඩූ ස්වර්ණ දුවර්ණ වූ බාහිර රූපායතනයන් දක්නේය. ඔවුන් මැඩගෙන දනිමි දකිමි යන මෙබඳු සංඥා ඇතියේ වෙයි. ආධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇතියේ අප්‍රමාණ වූ ස්වර්ණ දුවර්ණ වූ බාහිර රූපායතනයන් දක්නේය. ඔවුන් මැඩගෙන දනිමි දකිමි යන මෙබඳු සංඥා ඇතියේ වෙයි. ආධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇතියේ නීල වූ නීල වර්ණ වූ නීල නිදර්ශන වූ (එක නීලවරපන්නේ) නීල ප්‍රභා ඇති බාහිර රූපායතනයන් දක්නේය. -පෙ- පීත වූ පීත වර්ණ වූ -පෙ- ලෝහිත වූ ලෝහිත වර්ණ වූ -පෙ- අවදාත වූ අවදාත වර්ණ වූ -පෙ- අවදාත ප්‍රභා ඇත්තා වූ ඔවුන් මැඩගෙන දනිමි දකිමි යන මෙබඳු සංඥා ඇතියේ වෙයි. මහණෙනි! රාගයාගේ අභිජානනය පිණිස මේ අට දහම්හු බැවිය යුතුවහයි.

**[අඞ්ගුත්තර නිකාය 05/363 පිට (බු.ජ)]**

"අට්ඨ ඛෝ ඉමානි, ආනන්ද, අභිභායතනානි. කතමානි අට්ඨ? අජ්ඣත්තං රූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි. 'තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී'ති ඒවං සඤ්ඤී හෝති. ඉදං පඨමං අභිභායතනං.

"අජ්ඣත්තං රූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි. 'තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී'ති ඒවං සඤ්ඤී හෝති. ඉදං දුතියං අභිභායතනං.

"අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි. 'තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී'ති ඒවං සඤ්ඤී හෝති. ඉදං තතියං අභිභායතනං.

"අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි. 'තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී'ති ඒවං සඤ්ඤී හෝති. ඉදං චතුත්ථං අභිභායතනං.

"අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලදස්සනානි නීලනිභාසානි. සෙය්‍යථාපි නාම උමාපුප්ඵං නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං. සෙය්‍යථා වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතෝභාග විමට්ඨං නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං. ඒවමේව අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලදස්සනානි නීලනිභාසානි. 'තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී'ති ඒවං සඤ්ඤී හෝති. ඉදං පඤ්චමං අභිභායතනං.

"අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි. සෙය්‍යථාපි නාම කණිකාරපුප්ඵං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං. සෙය්‍යථා වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතෝභාග විමට්ඨං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං. ඒවමේව අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි. 'තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී'ති ඒවං සඤ්ඤී හෝති. ඉදං ඡට්ඨං අභිභායතනං.

"අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති ලෝහිතකානි ලෝහිතකවණ්ණානි ලෝහිතකනිදස්සනානි ලෝහිතකනිභාසානි. සෙය්‍යථාපි නාම බන්ධුජීවකපුප්ඵං ලෝහිතකං ලෝහිතකවණ්ණං ලෝහිතකනිදස්සනං ලෝහිතකනිභාසං. සෙය්‍යථා වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතෝභාග විමට්ඨං ලෝහිතකං ලෝහිතකවණ්ණං ලෝහිතකනිදස්සනං ලෝහිතකනිභාසං. ඒවමේව අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති ලෝහිතකානි ලෝහිතකවණ්ණානි ලෝහිතකනිදස්සනානි ලෝහිතකනිභාසානි. 'තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී'ති ඒවං සඤ්ඤී හෝති. ඉදං සත්තමං අභිභායතනං.

"අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති ඕදාතානි ඕදාතවණ්ණානි ඕදාතනිදස්සනානි ඕදාතනිභාසානි. සෙය්‍යථාපි නාම ඕසධිතාරකා ඕදාතා ඕදාතවණ්ණා ඕදාතනිදස්සනා ඕදාතනිභාසා. සෙය්‍යථා වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතෝභාග විමට්ඨං ඕදාතං ඕදාතවණ්ණං ඕදාතනිදස්සනං ඕදාතනිභාසං. ඒවමේව අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති ඕදාතානි ඕදාතවණ්ණානි ඕදාතනිදස්සනානි ඕදාතනිභාසානි. 'තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී'ති ඒවං සඤ්ඤී හෝති. ඉදං අට්ඨමං අභිභායතනං. ඉමානි ඛෝ, ආනන්ද, අට්ඨ අභිභායතනානි.

**[දී. නි මහවග්ග පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 173 යටතේ); දී. නි. 02 මහවග්ග පාළි 172- 174 පිටු (බු.ජ); දී. නි පාථිකවග්ග පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 338 යටතේ); දී. නි. 03 පාථිකවග්ග පාළි 444-446 පිටු (බු.ජ); දී. නි. පාථිකවග්ග පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 358 යටතේ); දී. නි. 03 පාථිකවග්ග පාළි 518-520 පිටු (බු.ජ); ම. නි. මජ්ඣිමපණ්ණාස පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 249 යටතේ); ම. නි. 02 මජ්ඣිමපණ්ණාස පාළි 350-352 පිටු (බු.ජ); අ. නි. ඒකකනිපාත පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 427-434 යටතේ); අ. නි. 01 ඒකක-දුතිය-තිකනිපාත පාළි 84 පිට (බු.ජ); අ. නි. අට්ඨකනිපාත පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 65 යටතේ); අ. නි. 05 අට්ඨක-නවකනිපාත පාළි 278-280 පිටු (බු.ජ); අ. නි දසකනිපාත පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 29 යටතේ); අ. නි. 06 දසක-ඒකාදසකනිපාත පාළි 108-112 පිටු (බු.ජ); විස්තර භාව සන්නය 62-64 පිටු; තෙසැත්තෑ ඤාණ කථා 28-30 පිටු]**

අනඳයෙනි! මේ අභිභායතන අටෙකි. කවර අටෙක් ද යත්? එකෙක් අධ්‍යාත්ම රූපයෙහි පරිකර්ම වශයෙන් රූප සංඥා ඇත්තේ පිටත්හි ස්වර්ණ හෝ දුවර්ණ හෝ පරිත්තාරම්මණ ප්‍රතිභාග නිමිති දකී. ඒ නිමිති මැඩ "දනිමියි දකිමි" යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ පළමු අභිභායතනයයි.෴

එකෙක් අධ්‍යාත්මයෙහි රූප සංඥා ඇත්තේ පිටත්හි අප්‍රමාණ වූ ස්වර්ණ දුවර්ණ නිමිත්ත රූපයන් දකී. එම රූප මැඩ "දනිමියි දකිමි" යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ දෙවන අභිභායතනයයි.෴

එකෙක් අධ්‍යාත්ම අරමුණෙහි පරිකර්ම සංඥා නැත්තේ පිටත්හි වූ ස්වර්ණ හෝ දුවර්ණ වූ පරිත්ත වූ පරිකර්ම නිමිති ද ප්‍රතිභාග නිමිති ද දකී. ඒ අරමුණු මැඩ "දනිමියි දකිමි" යි මෙබඳු සංඥා ඇත්තේ වෙයි. මේ තෙවන අභිභායතනයයි.

එකෙක් අධ්‍යාත්ම අරමුණෙහි රූප සංඥා නැත්තේ පිටත්හි වූ අප්‍රමාණ වූ ස්වර්ණ දුවර්ණ රූපයන් දකී. ඒ රූප අභිබවා "දනිමි දකිමි" යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ සතරවන අභිභායතනයයි.

එකෙක් අධ්‍යාත්ම රූපයෙහි පරිකර්ම සංඥා නැත්තේ, නිල් වූ නිල්වන් නිල් දැකුම් ඇති නිල්පැහැ ඇති  පිටත්හි රූප දකී. නිල්, නිල්වන්, නිල් දැකුම් ඇති, නිල්පැහැ ඇති දියමෙරලිය මලක් යම්සේ වේද, පෙටම මොළොක් කසීවතෙක් යම්සේ නිල් වේද, නිල්වන් වේද, නිල් දැකුම් ඇත්තේ වේද,  නිල්පැහැ වේද, එසේම එකෙක් අධ්‍යාත්ම රූපයෙහි පරිකර්ම සංඥා නැත්තේ නිල් වූ නිල්වන් වූ නිල් දැකුම් ඇති නිල්පැහැති බාහිර නීල කසිණාලම්බන රූප දකී. ඒ රූප අභිබවා "දනිමි දකිමි" යි මෙබඳු සංඥා ඇත්තේ වෙයි. මේ පස්වන අභිභායතනයයි.

එකෙක් අධ්‍යාත්ම රූපයෙහි පරිකර්ම සංඥා නැත්තේ, රන්වන් වූ, රන්වන් දැකුම් ඇති, රන්පැහැති බාහිර පීත රූප දකී. රන්වන් වූ රන්වන් දැකුම් ඇති, රන්පැහැ ඇති පීත වූ කිණිහිරි මලෙක් යම්සේ වේද, දෙපස මටසිලිටි වූ රන්වන් වූ රන්වන් දැකුම් ඇති රන්පැහැති පීත වූ කසීවතෙක් හෝ යම්සේ ද, එසේම එකෙක් අධ්‍යාත්ම රූපයෙහි රූප සංඥා නැත්තේ, රන්වන්, රන්වන් දැකුම් ඇති, රන්පැහැති බාහාර පීත කසිණ රූපයන් දකී. ඔවුන් මැඩැ "දනිමියි දකිමි" යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ සවනවන අභිභායතනයයි.

එකෙක් අධ්‍යාත්ම රූපයෙහි රූප සංඥා නැත්තේ රතු වූ රත්වන් වූ රත්වන් දැකුම් ඇති, රත්පැහැති, බාහිර රූපයන්දකී. රතු වූ රත්වන් වූ රත්වන් දැකුම් ඇති, රත්පැහැ වූ, බඳුවද මලෙක් යම්සේ වේද, දෙපැසැ මටසිලිටි වූ රතු වූ රත්වන් වූ රත්වන් දැකුම් ඇති රත්පැහැ වූ කසීවතෙක් හෝ යම්සේ වේද, එසේම එකෙක් අධ්‍යාත්ම රූපයෙහි රූප සංඥා නැත්තේ, රතු වූ රත්වන් වූ රත්වන් දැකුම් ඇති රත්පැහැ වූ බාහිර රූපයන් දකී. ඔවුන් මැඩ "දනිමියි දකිමි" යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ සත්වන අභිභායතනයයි.

එකෙක් අධ්‍යාත්ම රූපයෙහි රූප සංඥා නැත්තේ, සුදු වූ සුදුවන් වූ සුදුවන් දැකුම් ඇති සුදුපැහැ වූ බාහිර රූපාලම්බනයන් දකී. සුදු වූ සුදුවන් දැකුම් ඇති සුදුපැහැ වූ ඔසධී තාරකාව යම්සේ ද දෙපැසැ මටසිලිටි වූ සුදු වූ සුදුවන් වූ සුදුවන් දැකුම් ඇති සුදුපැහැති කසීවතෙක් හෝ යම්සේ වේද, එසේම සුදු වූ සුදුවන් වූ සුදු දැකුම් ඇති සුදුපැහැ වූ බාහිර කසිණ රූපයන් දකී. ඔවුන් මැඩ "දනිමියි දකිමි" යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ අටවන අභිභායතනයයි. අනඳයෙනි! මොහු අටදෙන අභිභායතනයෝය. **[දීඝනිකාය 02; මහවග්ගපාළි 173-175 පිටු (බු.ජ)]**

**අභිභායතනානී**ති අභිභවනකාරණානි. කිං අභිභවන්ති? පච්චනීකධම්මේපි ආරම්මණානිපි. තානි හි පටිපක්ඛභාවේන පච්චනීකධම්මේ අභිභවන්ති, පුග්ගලස්ස ඤාණුත්තරියතාය ආරම්මණානි.

**අජ්ඣත්තං රූපසඤ්ඤීති**ආදීසු පන අජ්ඣත්තරූපේ පරිකම්මවසේන අජ්ඣත්තං රූපසඤ්ඤී නාම හෝති. අජ්ඣත්තඤ්හි නීලපරිකම්මං කරොන්තෝ කේසේ වා පිත්තේ වා අක්ඛිතාරකාය වා කරෝති. පීතපරිකම්මං කරොන්තෝ මේදේ වා ඡවියා වා හත්ථපාදපිට්ඨේසු වා අක්ඛීනං පීතකට්ඨානේ වා කරෝති. ලෝහිතපරිකම්මං කරොන්තෝ මංසේ වා ලෝහිතේ වා ජිව්හාය වා අක්ඛීනං රත්තට්ඨානේ වා කරෝති. ඕදාතපරිකම්මං කරොන්තෝ අට්ඨිම්හි වා දන්තේ වා නඛේ වා අක්ඛීනං සේතට්ඨානේ වා කරෝති. තං පන සුනීලං සුපීතං සුලෝහිතකං සුඕදාතකං න හෝති, අවිසුද්ධමේව හෝති.

**ඒකෝ බහිද්ධා රූපානි පස්සතීති** යස්සේවං පරිකම්මං අජ්ඣත්තං උප්පන්නං හෝති, නිමිත්තං පන බහිද්ධා, සෝ ඒවං අජ්ඣත්තං පරිකම්මස්ස බහිද්ධා ච අප්පනාය වසේන; "අජ්ඣත්තං රූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සතී"ති වුච්චති. **පරිත්තානීති** අවඩ්ඪිතානි. **සුවණ්ණදුබ්බණ්ණානීති** සුවණ්ණානි වා හොන්ති, දුබ්බණ්ණානි වා. පරිත්තවසේනේව ඉදං අභිභායතනං වුත්තන්ති වේදිතබ්බං. **තානි අභිභුය්‍යාති** යථා නාම සම්පන්නගහණිකෝ කටච්ඡුමත්තං භත්තං ලභිත්වා; "කිං ඒත්ථ භුඤ්ජිතබ්බං අත්ථී"ති සඞ්කඩ්ඪිත්වා ඒකකබළමේව කරෝති, ඒවමේව ඤාණුත්තරිකෝ පුග්ගලෝ විසදඤාණෝ; "කිං එත්ථ පරිත්තකේ ආරම්මණේ සමාපජ්ජිතබ්බං අත්ථි, නායං මම භාරෝ"ති තානි රූපානි අභිභවිත්වා සමාපජ්ජති, සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පනං පාපේතීති අත්ථෝ. **ජානාමි පස්සාමීති** ඉමිනා පනස්ස ආභෝගෝ කථිතෝ. සෝ ච ඛෝ සමාපත්තිතෝ වුට්ඨිතස්ස, න අන්තෝසමාපත්තියං. **ඒවං සඤ්ඤී හෝතීති** ආභෝගසඤ්ඤායපි ඣානසඤ්ඤායපි ඒවං සඤ්ඤී හෝති. අභිභවනසඤ්ඤා හිස්ස අන්තෝසමාපත්තියම්පි අත්ථි, ආභෝගසඤ්ඤා පන සමාපත්තිතෝ වුට්ඨිතස්සේව.

**අප්පමාණානීති** වඩ්ඪිතප්පමාණානි, මහන්තානීති අත්ථෝ. **අභිභුය්‍යාති** එත්ථ පන යථා මහග්ඝසෝ පුරිසෝ ඒකං භත්තවඩ්ඪිතකං ලභිත්වා; "අඤ්ඤම්පි හෝතු, කිං ඒතං මය්හං කරිස්සතී"ති තං න මහන්තතෝ පස්සති, ඒවමේව ඤාණුත්තරෝ පුග්ගලෝ විසදඤාණෝ "කිං ඒත්ථ සමාපජ්ජිතබ්බං, නයිදං අප්පමාණං, න මය්හං චිත්තේකග්ගතාකරණේ භාරෝ අත්ථී"ති තානි අභිභවිත්වා සමාපජ්ජති, සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පනං පාපේතීති අත්ථෝ.

**අජ්ඣත්තං අරූපසඤ්ඤීති** අලාභිතාය වා අනත්ථිකතාය වා අජ්ඣත්තරූපේ පරිකම්මසඤ්ඤාවිරහිතෝ.

**ඒකෝ බහිද්ධා රූපානි පස්සතීති** යස්ස පරිකම්මම්පි නිමිත්තම්පි බහිද්ධාව උප්පන්නං, සෝ ඒවං බහිද්ධා පරිකම්මස්ස චේව අප්පනාය ච වසේන; "අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සතී"ති වුච්චති. සේසමෙත්ථ චතුත්ථාභිභායතනේ වුත්තනයමේව. ඉමේසු පන චතූසු පරිත්තං විතක්කචරිතවසේන ආගතං, අප්පමාණං මෝහචරිතවසේන, සුවණ්ණං දෝසචරිතවසේන, දුබ්බණ්ණං රාගචරිතවසේන. ඒතේසඤ්හි ඒතානි සප්පායානි. සා ච නේසං සප්පායතා විත්ථාරතෝ විසුද්ධිමග්ගේ චරිතනිද්දේසේ වුත්තා.

පඤ්චමඅභිභායතනාදීසු **නීලානීති** සබ්බසඞ්ගාහකවසේන වුත්තං. **නීලවණ්ණානීති** වණ්ණවසේන. **නීලනිදස්සනානීති** නිදස්සනවසේන, අපඤ්ඤායමානවිවරානි අසම්භින්නවණ්ණානි ඒකනීලානේව හුත්වා දිස්සන්තීති වුත්තං හෝති.

**නීලනිභාසානී**ති ඉදං පන ඔභාසවසේන වුත්තං, නීලෝභාසානි නීලප්පභායුත්තානීති අත්ථෝ. ඒතේන නේසං විසුද්ධතං දස්සේති. විසුද්ධවණ්ණවසේනේව හි ඉමානි චත්තාරි අභිභායතනානි වුත්තානි. **උමාපුප්ඵ**න්ති ඒතඤ්හි පුප්ඵං සිනිද්ධං මුදු, දිස්සමානම්පි නීලමේව හෝති. ගිරිකණ්ණිකපුප්ඵාදීනි පන දිස්සමානානි සේතධාතුකානේව හොන්ති. තස්මා ඉදමේව ගහිතං, න තානි. **බාරාණසෙය්‍යක**න්ති බාරාණසිසම්භවං. තත්ථ කිර කප්පාසෝපි මුදු, සුත්තකන්තිකායෝපි තන්තවායාපි ඡේකා, උදකම්පි සුචි සිනිද්ධං. තස්මා තං වත්ථං උභතෝභාගවිමට්ඨං හෝති; ද්වීසුපි පස්සේසු මට්ඨං මුදු සිනිද්ධං ඛායති.

**පීතානී**තිආදීසුපි ඉමිනාව නයේන අත්ථෝ වේදිතබ්බෝ. "නීලකසිණං උග්ගණ්හන්තෝ නීලස්මිං නිමිත්තං ගණ්හාති පුප්ඵස්මිං වා වත්ථස්මිං වා වණ්ණධාතුයා වා"තිආදිකං පනෙත්ථ කසිණකරණඤ්ච පරිකම්මඤ්ච අප්පනාවිධානඤ්ච සබ්බං විසුද්ධිමග්ගේ විත්ථාරතෝ වුත්තමේව. ඉමානිපි අට්ඨ අභිභායතනානි අභීතභාවදස්සනත්ථමේව ආනීතානි.

**[දී. නි. මහාවග්ග අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 173 යටතේ); දීඝනිකාය අටුවා 01/390-391 පිටු (හේ.වි.මු); ම. නි. මජ්ඣිමපණ්ණාස අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 249 යටතේ); මජ්ඣිම නිකාය අටුවා 03/176-178 පිටු (හේ.වි.මු); අ. නි. අට්ඨකාදිනිපාත අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 65 යටතේ); අඞ්ගුත්තර නිකාය අටුවා 02/781-782 පිටු (හේ.වි.මු)]**

අභවතීති **අභිභූ,** පරිකම්මං, ඤාණං වා. අභිභූ ආයතනං ඒතස්සාති **අභිභායතනං,** ඣානං. අභිභවිතබ්බං වා ආරම්මණසඞ්ඛාතං ආයතනං ඒතස්සාති **අභිභායතනං.** ආරම්මණාභිභවනතෝ අභිභූ ච තං ආයතනඤ්ච යෝගිනෝ සුඛවිසේසානං අධිට්ඨානභාවතෝ, මනායතනධම්මායතනභාවතෝ චාතිපි සසම්පයුත්තං ඣානං **අභිභායතනං.** තේනාහ **"අභිභවනකාරණානී"**තිආදි. **තානි හී**ති අභිභායතනසඞ්ඛාතානි ඣානානි. **"පුග්ගලස්ස ඤාණුත්තරියතාය"**ති ඉදං උභයත්ථාපි යෝජේතබ්බං. කථං? පටිපක්ඛභාවේන පච්චනීකධම්මේ අභිභවන්ති පුග්ගලස්ස ඤාණුත්තරියතාය ආරම්මණානි අභිභවන්ති. ඤාණබලේනේව හි ආරම්මණාභිභවනං විය පටිපක්ඛාභිභවෝ පීති.

**පරිකම්මවසේන අජ්ඣත්තං රූපසඤ්ඤී,** න අප්පනාවසේන. න හි පටිභාගනිමිත්තාරම්මණා අප්පනා අජ්ඣත්තවිසයා සම්භවති, තං පන අජ්ඣත්තපරිකම්මවසේන ලද්ධං කසිණනිමිත්තං **අවිසුද්ධමේව හෝති,** න බහිද්ධාපරිකම්මවසේන ලද්ධං විය විසුද්ධං.

**පරිත්තානී**ති යථාලද්ධානි සුප්පසරාවමත්තානි. තේනාහ **"අවඩ්ඪිතානී"**ති. **පරිත්තවසේනේවා**ති වණ්ණවසේන ආභෝගේ විජ්ජමානේපි පරිත්තවසේනේව **ඉදං අභිභායතනං වුත්තං.** පරිත්තතා හෙත්ථ අභිභවනස්ස කාරණං. වණ්ණාභෝගේ සතිපි අසතිපි අභිභායතනභාවනා නාම තික්ඛපඤ්ඤස්සේව සම්භවති, න ඉතරස්සාති ආහ **"ඤාණුත්තරිකෝ පුග්ගලෝ"**ති. **අභිභවිත්වා සමාපජ්ජතී**ති ඒත්ථ අභිභවනං, සමාපජ්ජනඤ්ච උපචාරජ්ඣානාධිගමසමනන්තරමේව අප්පනාඣානුප්පාදනන්ති ආහ **"සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පනං පාපේතී"**ති. **සහ නිමිත්තුප්පාදේනා**ති ච අප්පනාපරිවාසාභාවස්ස ලක්ඛණං වචනමේතං. යෝ "ඛිප්පාභිඤ්ඤෝ"ති වුච්චති, තතෝපි ඤාණුත්තරස්සේව අභිභායතනභාවනා. **ඒත්ථා**ති ඒතස්මිං නිමිත්තේ. **අප්පනං පාපේතී**ති භාවනං අප්පනං නේති.

එත්ථ ච කේචි "උප්පන්නේ උපචාරජ්ඣානේ තං ආරබ්භ යේ හෙට්ඨිමන්තේන ද්වේ තයෝ ජවනවාරා පවත්තන්ති, තේ උපචාරජ්ඣානපක්ඛිකා ඒව, තදනන්තරඤ්ච භවඞ්ගපරිවාසේන, උපචාරාසේවනාය ච විනා අප්පනා හෝති, සහ නිමිත්තුප්පාදේනේව අප්පනං පාපේතී"ති වදන්ති, තං තේසං මතිමත්තං. න හි පරිවාසිතපරිකම්මේන අප්පනාවාරෝ ඉච්ඡිතෝ, නාපි මහග්ගතප්පමාණජ්ඣානේසු විය උපචාරජ්ඣානේ ඒකන්තතෝ පච්චවෙක්ඛණා ඉච්ඡිතබ්බා, තස්මා උපචාරජ්ඣානාධිගමනතෝ පරං කතිපයභවඞ්ගචිත්තාවසානේ අප්පනං පාපුණන්තෝ "සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පනං පාපේතී"ති වුත්තෝ. **සහ නිමිත්තුප්පාදේනේවා**ති ච අධිප්පායිකමිදං වචනං, න නීතත්ථං, අධිප්පායෝ වුත්තනයේනේව වේදිතබ්බෝ, න අන්තෝසමාපත්තියං තදා තථාරූපස්ස ආභෝගස්ස අසම්භවතෝ. සමාපත්තිතෝ වුට්ඨිතස්ස ආභෝගෝ පුබ්බභාගභාවනායවසේන ඣානක්ඛණේ පවත්තං අභිභවනාකාරං ගහෙත්වා පවත්තෝති දට්ඨබ්බං. **අභිධම්මට්ඨකථායං** පන "ඉමිනා තස්ස පුබ්බාභෝගෝ කථිතෝ"ති (ධ. ස. අට්ඨ. 204) වුත්තං. අන්තෝසමාපත්තියං තථා ආභෝගාභාවේ කස්මා "ඣානසඤ්ඤයපී"ති වුත්තන්ති ආහ **"අභිභවන…පෙ…. අත්ථී"**ති.

**වඩ්ඪිතප්පමාණානී**ති විපුලප්පමාණානීති අත්ථෝ, න ඒකඞ්ගුලද්වඞ්ගුලාදිවසේන වඩ්ඪිං පාපිතානීති තථා වඩ්ඪනස්සේවෙත්ථ අසම්භවතෝ. තේනාහ **"මහන්තානී"**ති. **භත්තවඩ්ඪිතක**න්ති භුඤ්ජනභාජනං වඩ්ඪෙත්වා දින්නභත්තං, ඒකාසනේ පුරිසේන භුඤ්ජිතබ්බභත්තතෝ උපඩ්ඪභත්තන්ති අත්ථෝ.

රූපේ සඤ්ඤා **රූපසඤ්ඤා,** සා අස්ස අත්ථීති **රූපසඤ්ඤී,** න රූපසඤ්ඤී **අරූපසඤ්ඤී,** සඤ්ඤාසීසේන ඣානං වදති. රූපසඤ්ඤාය අනුප්පාදනං ඒවෙත්ථ අලාභිතා.

**බහිද්ධාව උප්පන්න**න්ති බහිද්ධා වත්ථුස්මිංයේව උප්පන්නං. **අභිධම්මේ** පන "අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි…පෙ…. අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානී"ති (ධ. ස. 220) ඒවං චතුන්නං අභිභායතනානං ආගතත්තා **අභිධම්මට්ඨකථායං** (ධ. ස. අට්ඨ. 204) "කස්මා පන 'යථා සුත්තන්තේ අජ්ඣත්තං රූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති පරිත්තානීතිආදි වුත්තං, ඒවං අවත්වා ඉධ චතුසුපි අභිභායතනේසු අජ්ඣත්තං අරූපසඤ්ඤිතාව වුත්තා'ති චෝදනං කත්වා 'අජ්ඣත්තරූපානං අනභිභවනීයතෝ'ති කාරණං වත්වා, තත්ථ වා හි ඉධ වා බහිද්ධා රූපානේව අභිභවිතබ්බානි, තස්මා තානි නියමතෝ වත්තබ්බානීති තත්‍රාපි ඉධාපි වුත්තානි. 'අජ්ඣත්තං රූපසඤ්ඤී'ති ඉදං පන සත්ථු දේසනාවිලාසමත්තමේවා"ති වුත්තං. ඒත්ථ ච වණ්ණාභෝගරහිතානි, සහිතානි ච සබ්බානි පරිත්තානි "පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානී"ති වුත්තානි, තථා අප්පමාණානි "අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානී"ති. අත්ථි හි සෝ පරියායෝ පරිත්තානි අභිභුය්‍ය තානි චේ කදාචි වණ්ණවසේන ආභුජිතානි හොන්ති, සුවණ්ණදුබ්බණ්ණානි අභිභුය්‍යාති. පරියායකථා හි සුත්තන්තදේසනාති. **අභිධම්මේ** (ධ. ස. 222) පන නිප්පරියායදේසනත්තා වණ්ණාභෝගරහිතානි විසුං වුත්තානි, තථා සහිතානි. අත්ථි හි උභයත්ථ අභිභවනවිසේසෝති. තථා ඉධ පරියායදේසනත්තා විමොක්ඛානම්පි අභිභවනපරියායෝ අත්ථීති "අජ්ඣත්තං රූපසඤ්ඤී"තිආදිනා පඨමදුතිය අභිභායතනේසු පඨමවිමොක්ඛෝ, තතියචතුත්ථ අභිභායතනේසු දුතියවිමොක්ඛෝ,

වණ්ණාභිභායතනේසු තතියවිමොක්ඛො ච අභිභවනප්පවත්තිතො සඞ්ගහිතො. **අභිධම්මේ** පන නිප්පරියායදේසනත්තා විමොක්ඛාභිභායතනානි අසඞ්කරතො දස්සේතුං විමොක්ඛේ වජ්ජේත්වා අභිභායතනානි කථිතානි; සබ්බානි ච විමොක්ඛකිච්චානි ඣානානි විමොක්ඛදේසනායං වුත්තානි. තදේතං "අජ්ඣත්තං රූපසඤ්ඤී"ති ආගතස්ස අභිභායතනද්වයස්ස **අභිධම්මේ** අභිභායතනේසු අවචනතො "රූපී රූපානි පස්සතී"ති ආදීනඤ්ච සබ්බවිමොක්ඛකිච්චසාධාරණවචනභාවතො ච වවත්ථානං කතන්ති විඤ්ඤායති. "අජ්ඣත්තරූපානං අනභිභවනීයතො"ති ඉදං කත්ථචිපි "අජ්ඣත්තං රූපානි පස්සතී"ති අවත්වා සබ්බත්ථ යං වුත්තං "බහිද්ධා රූපානි පස්සතී"ති, තස්ස කාරණවචනං, තේන යං අඤ්ඤහේතුකං, තං තේන හේතුනා වුත්තං. යං පන දේසනාවිලාසහේතුකං අජ්ඣත්තං අරූපසඤ්ඤිතාය ඒව අභිධම්මේ (ධ. ස. 223) වචනං, න තස්ස අඤ්ඤං කාරණං මග්ගිතබ්බන්ති දස්සේති. අජ්ඣත්තරූපානං අනභිභවනීයතා ච තේසං බහිද්ධා රූපානං විය අභූතත්තා. දේසනාවිලාසො ච යථාවුත්තවවත්ථානවසේන වේදිතබ්බො වේනෙය්‍යජ්ඣාසයවසේන විජ්ජමානපරියායකථාභාවතො. "සුවණ්ණදුබ්බණ්ණානී"ති ඒතේනේව සිද්ධත්තා න නීලාදි අභිභායතනානි වත්තබ්බානීති චේ? තං න, නීලාදීසු කතාධිකාරානං නීලාදිභාවස්සේව අභිභවනකාරණත්තා. න හි තේසං පරිසුද්ධාපරිසුද්ධවණ්ණානං පරිත්තතා, අප්පමාණතා වා අභිභවනකාරණං, අථ ඛො නීලාදිභාවො ඒවාති. ඒතේසු ච පරිත්තාදිකසිණරූපේසු යං යං චරිතස්ස ඉමානි අභිභායතනානි ඉජ්ඣන්ති, තං දස්සේතුං **"ඉමේසු පනා"**තිආදි වුත්තං.

**සබ්බසඞ්ගාහකවසේනා**ති සකලනීලවණ්ණනීලනිදස්සනනීලනිභාසානං සාධාරණවසේන. **වණ්ණවසේනා**ති සභාවවණ්ණවසේන. **නිදස්සනවසේනා**ති පස්සිතබ්බතාවසේන චක්ඛුවිඤ්ඤාණාදිවිඤ්ඤාණවීථියා ගහේතබ්බතාවසේන. **ඔභාසවසේනා**ති සප්පභාසතාය අවභාසනවසේන. **උමාපුප්ඵ**න්ති අතසිපුප්ඵං. **නීලමේව හෝති** වණ්ණසඞ්කරාභාවතො. **බාරාණසිසම්භව**න්ති බාරාණසියං සමුට්ඨිතං.

ඒකච්චස්ස ඉතො බාහිරකස්ස අප්පමාණං අතිවිත්ථාරිතං කසිණනිමිත්තං ඔලෝකෙන්තස්ස භයං උප්පජ්ජෙය්‍ය "කිං නු ඛො ඉදං සකලං ලෝකං අභිභවිත්වා අජ්ඣොත්ථරිත්වා ගණ්හාතී"ති, තථාගතස්ස පන තාදිසං භයං වා සාරජ්ජං වා නත්ථීති **අභීතභාවදස්සනත්ථමේව ආනීතානි.**

**[දී. නි. මහාවග්ග ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 173 යටතේ); ම. නි. උපරිපණ්ණාස ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 249 යටතේ); අ. නි. අට්ඨකාදිනිපාත ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 65 යටතේ)**

**අභිභායතනානි ඉති** අභිභායතනානි යනු **අභිභවනකාරණානි** මැඩපවත්වන කාරණයෝය **කිං අභිභවන්ති?** කුමක් මැඩපවත්වත්ද යත්? **පච්චනීකධම්මේපි** ප්‍රතිපක්‍ෂ ධර්මයන් හා **ආරම්මණානිපි** පරිකර්ම ප්‍රතිභාග ආරම්මණයන් ද (අභිභවන්ති මැඩපවත්වත්) ("අභිභවතීති අභිභූ, පරිකම්මං, ඤාණං වා" පරිකර්ම නිමිත්ත හෝ ඥාණය මැඩපවත්වයිනුයි අභිභූ නම් වේ, "අභිභූ ආයතනං ඒතස්සාති අභිභායතනං, ඣානං" මැඩපවත්වන ආයතනය මොහුටනුයි අභිභායතන නම්, ධ්‍යානය ලැබෙයි. නොහොත් "අභිභවිතබ්බං වා ආරම්මණසඞ්ඛාතං ආයතනං ඒතස්සාති අභිභායතනං" මැඩපැවැත්විය යුතු ආරම්මණ සඞ්ඛ්‍යාත ආයතනය මොහුටනුයි අභිභායතන නම් වෙයි. "ආරම්මණාභිභවනතො අභිභූ ච තං ආයතනඤ්ච යෝගිනෝ සුඛවිසේසානං අධිට්ඨානභාවතො,

මනායතනධම්මායතනභාවතෝ වාතිපි සසම්පයුත්තං ඣානං අභිභායතනං” ආරම්මණය මැඩපැවැත්වීම් වශයෙන් අභිභූ වූයේද, එයම ආයතනය වූයේද, යෝගීන්ගේ සැප විශේෂයට ආධාරවන බැවින් මනායතන ධම්මායතන බැවින් හෝ සම්ප්‍රයුක්ත ධර්මයන් සහිත ධ්‍යානය අභිභායතන නම් වේ යනු දී.නි. මහවග්ග ටීකායි) **තානි හි** මැඩපැවැත්වීමෙන් යුක්ත වූ ධ්‍යානයෝ **පටිපක්ඛභාවේන** ප්‍රතිපක්‍ෂ භාවයෙන් **පච්චනීකධම්මේ** සතුරු ධර්මයන් **අභිභවන්ති** මැඩපවත්වති **පුග්ගලස්ස** පුද්ගලයාගේ **ඤාණුත්තරියතාය** ඤාණුත්තරීය භාවයෙන් **ආරම්මණානි** පරිකර්ම ප්‍රතිභාග ආරම්මණයන් (**අභිභවන්ති** මැඩපවත්වත්)

**අජ්ඣත්තං රූපසඤ්ඤී ඉති ආදීසු පන** අජ්ඣත්තං රූපසඤ්ඤී යනාදියෙහි වනාහි **අජ්ඣත්තරූපේ** ආධ්‍යාත්තක රූපයෙහි නොහොත් තමාගේ ශරීරගත රූපයෙහි **පරිකම්මවසේන** පරිකර්ම භාවනා කිරීම් වශයෙන් **අජ්ඣත්තං රූපසඤ්ඤී නාම හෝති** අජ්ඣත්තං රූපසඤ්ඤී නම් වෙයි (“පරිකම්මවසේන අජ්ඣත්තං රූපසඤ්ඤී” යන මෙය අර්පණා වශයෙන් නොවෙයි. ප්‍රතිභාග නිමිත්තාරම්මණය ඇති අර්පණාව ආධ්‍යාත්මික විෂයෙහි නොහටගනී. එය වනාහි ආධ්‍යාත්මික පරිකර්ම භාවනා වශයෙන් ලබනලද කසිණ නිමිත්තයි ටීකායි) **හි (සච්චං)** ඒ කීම සැබෑවකි **අජ්ඣත්තං** ආධ්‍යාත්මයෙහි **නීලපරිකම්මං කරොන්තෝ** නීල කසිණයට පිරියම් කරන යෝගී තෙමේ **කේසේ වා පිත්තේ වා** කේශයන්හි හෝ පිතෙහි හෝ **අක්ඛිතාරකාය වා** ඇස් මිගිනියෙහි නොහොත් ඇස් ඉංගිරියාවෙහි හෝ නීල වර්ණය ගෙන **කරෝති** නීල කසිණයට පිරියම් භාවනාව කරයි **පීතපරිකම්මං** පීත කසිණයට **කරොන්තෝ** පිරියම් කරන යෝගී තෙමේ **මේදේ වා** මේද තෙලෙහි හෝ **ඡවියා වා** රන්වන් වූ ඡවියෙහි හෝ **හත්ථපාදපිට්ඨේසු වා** අත්තල පා තල පිටෙහි හෝ **අක්ඛීනං** අක්‍ෂීන්ගේ **පීතකට්ඨානේ වා** රන්වන් තැන හෝ **කරෝති** පීත වර්ණය ගෙන පීත කසිණයට පිරියම් භාවනා කරයි **ලෝහිතපරිකම්මං කරොන්තෝ** ලෝහිත කසිණයට පිරියම් කරන යෝගී තෙමේ **මංසේ වා** මාංශයෙහි හෝ **ලෝහිතේ වා** ලෙහෙයෙහි හෝ **ජිව්හාය වා** දිවෙහි හෝ **අක්ඛීනං රත්තට්ඨානේ වා** ඇසෙහි රක්ත වර්ණයෙහි හෝ **කරෝති** රක්ත වර්ණය ගෙන පිරියම් භාවනාව කරයි **ඕදාතපරිකම්මං කරොන්තෝ** ඕදාත කසිණයට පිරියම් කරන යෝගී තෙමේ **අට්ඨිම්හි වා** අස්ථීන්හි හෝ **දන්තේ වා** දත්වල හෝ **නඛේ වා** නිය පිට හෝ **අක්ඛීනං සේතට්ඨානේ වා** ඇසෙහි ස්වේත මණ්ඩලයෙහි හෝ **කරෝති** ස්වේත වර්ණය ගෙන පිරියම් භාවනාව කරයි **තං පන** ඒ සතරාකාර පරිකර්ම නිමිත්ත වනාහි **සුනීලං** පිරිසිදු නීල වර්ණය හෝ **සුපීතං** පිරිසිදු පීත වර්ණය හෝ **සුලෝහිතකං** පිරිසිදු රක්ත වර්ණය හෝ **සුඕදාතකං** පිරිසිදු ස්වේත වර්ණය හෝ **න හෝති** නොවෙයි **අවිසුද්ධමේව හෝති** බාහිර පරිකර්ම භාවනා වශයෙන් ලබන ලද්දක් මෙන් පිරිසිදු නොවෙයි.

**ඒකෝ බහිද්ධා රූපානි පස්සති ඉති** ඒකෝ බහිද්ධා රූපානි පස්සති යනු **ඒවං** මෙසේ **යස්ස** යම් යෝගියෙකු හට **පරිකම්මං අජ්ඣත්තං උප්පන්නං** පරිකර්ම නිමිත්ත ආධ්‍යාත්මයෙහි උපදින ලද්දේ **හෝති** වෙයි ද **නිමිත්තං පන** නිමිත්ත වනාහි **බහිද්ධා** බාහිර (**උප්පන්නං හෝති** උපදින ලද්දේ වෙයි) **ඒවං** මෙසේ **සෝ** ඒ යෝගී පුද්ගල තෙමේ **අජ්ඣත්තං** ආධ්‍යාත්මයෙහි උපන් **පරිකම්මස්ස ච** පරිකර්ම නිමිත්තගේ හා **බහිද්ධා** බාහිරව උපන් **අප්පනාය ච වසේන** ප්‍රතිභාග නිමිත්ත අරභයා උපදවා ගන්නාලද අර්පණා ධ්‍යානයාගේ ද වශයෙන් **අජ්ඣත්තං රූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති ඉති** අජ්ඣත්තං රූපසඤ්ඤී බහිද්ධා රූපානි

පස්සති යැයි වුච්චති කියනු ලැබේ **පරිත්තානි ඉති** පරිත්තානි යනු **අවඩ්ඪිතානි** යම් යම් පරිද්දකින් කුළු වට්ටි පමණ වූ හෝ සරාව මාත්‍ර වූ හෝ නොවඩනලද **සුවණ්ණදුබ්බණ්ණානි ඉති** සුවණ්ණදුබ්බණ්ණානි යනු **සුවණ්ණානි වා** පළමුව හටගත් ප්‍රමාණ වූ හෝ පිරිසිදු වර්ණ ඇත්තාවූ හෝ **දුබ්බණ්ණානි වා** දුර්වර්ණ වූ හෝ ආලම්බනයෝ **හොන්ති** වෙත් **පරිත්තවසේනේව** වර්ණ වශයෙන් මෙනෙහි කිරීම විද්‍යමාන කල්හි ද පරිත්ත වශයෙන් හෙවත් ස්වල්ප වශයෙන්ම **ඉදං අභිභායතනං** මේ අභිභායතනය **වුත්තං ඉති** දේශනා කරන ලදැයි **වේදිතබ්බං** දතයුතුයි **තානි අභිභුය්‍ය ඉති** තානි අභිභුය්‍ය යනු **යථා නාම** යම්සේ **සම්පන්නගහණිකෝ** සම්පූර්ණ කුක්ෂියක් ඇත්තා වූ පුරුෂයෙක් තෙමේ **කටච්ඡුමත්තං භත්තං ලභිත්වා** සැන්දක් පමණ බතක් ලැබ **එත්ථ** මෙහි **භුඤ්ජිතබ්බං කිං අත්ථි ඉති?** වැළඳිය යුතු කුමක් ඇද්දැයි? **සඞ්කඩ්ඪිත්වා** හකුළුවා **ඒකකබළමේව කරෝති** එක් පිඩක් කොට වැළඳීම කරයි ද **ඒවමේව** එපරිද්දෙන්ම **ඤාණුත්තරිකෝ** ඤාණයෙන් උත්තරීතර වූ **විසදඤාණෝ** පුග්ගලෝ විසඳ ප්‍රඥා ඇත්තා වූ බුද්ධානුබුද්ධාදී පුද්ගල තෙමේ **එත්ථ** මේ **පරිත්තකේ ආරම්මණේ** ස්වල්ප ආලම්බනයෙහි **සමාපජ්ජිතබ්බං** සමවැදිය යුතු **කිං අත්ථි ඉති** කුමක් ඇත්තේදැයි **අයං** මෙය **මම** මට **න භාරෝ ඉති** බැරෑරුම් නොවේ යැයි **තානි රූපානි** ඒ කසිණ ප්‍රතිභාග නිමිත්තාලම්බනයෝ **අභිභවිත්වා** මැඩපවත්වා **සමාපජ්ජති** දැහැනට සමවදියි හෙවත් **නිමිත්තුප්පාදේනේව සහ** ප්‍රතිභාග නිමිත්ත ඉපදීම හා සමගම **එත්ථ** මේ අරමුණෙහි **අප්පනං පාපේති ඉති** අර්පණාවට පැමිණෙයි යන **අත්ථෝ** අර්ථයි (අභිභායතන භාවනාව නම් වර්ණය මෙනෙහි කිරීම ඇති කල්හි ද නැති කල්හි ද තීක්ෂණ ප්‍රඥා ඇති පුද්ගලයාටම හටගනී. අන් පුද්ගලයන්ට නොවෙයි. එහෙයින් "ඤාණුත්තරිකෝ පුග්ගලෝ" යැයි වදරණ ලදී. "අභිභවිත්වා සමාපජ්ජති" යන මෙහි මැඩපැවැත්වීම ද සමවැදීම ද උපචාර ධ්‍යාන අධිගමයට සමනන්තරවම අර්පණා ධ්‍යාන ඉපදීම වේ. එහෙයින් "සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පනං පාපේති" යනුවෙන් වදරණ ලදී. "සහ නිමිත්තුප්පාදේන" යනු ද අර්පණාවට මුලින් උපදනා පරිකර්මාදී චිත්තයන්ගේ අභාවය දක්වයි. යමෙක් ක්ෂිප්‍රාභිඥයයි කියනු ලැබේ ද, ඕ හට වනාහි උපචාර අනුලෝම ගොත්‍රභූ යන උපචාර ධ්‍යානයෝ තුන්දෙනෙක් වෙති. ඔහුටත් වඩා ඤාණුත්තරිය පුද්ගලයා හට අභිභායතන භාවනාව සමෘද්ධ වියයුතු හෙයින් මේ ප්‍රතිභාග නිමිත්ත ඉපදීම සමගම උපචාර ධ්‍යානයෝ නොඉපිදම අර්පණාවට පැමිණෙන්නේය යනු ටීකායි) **ජානාමි පස්සාමි ඉති** ජානාමි පස්සාමි යනු **ඉමිනා පන** මෙයින් වනාහි **අස්ස** ඒ යෝගී පුද්ගලයාගේ **ආභෝගෝ** මෙනෙහි කිරීම **කථිතෝ** කියනලදි **සෝ ච ඛෝ** ඒ අභෝගය ද වනාහි **අන්තෝසමාපත්තියං** සමාපත්තිය තුළ **න (හෝති)** නොවෙයි **සමාපත්තිතෝ** සමාපත්තියෙන් **වුට්ඨිතස්ස** නැඟී සිටියා වූ යෝගී පුද්ගලයාට (**හෝති** වෙයි) **ඒවං සඤ්ඤී හෝති ඉති** ඒවං සඤ්ඤී හෝති යනු **ආභෝගසඤ්ඤායපි** මෙනෙහි කිරීමේ සංඥාවෙන් ද **ඣානසඤ්ඤායපි** ධ්‍යාන සංඥාවෙන් ද **ඒවං** මෙසේ **සඤ්ඤී** සංඥා ඇත්තේ **හෝති** වෙයි **හි (සච්චං)** ඒ කීම සැබෑවකි **අස්ස** ඒ යෝගී පුද්ගලයා හට **අභිභවනසඤ්ඤා** ප්‍රතිපක්ෂ ධර්මයන් මැඩපැවැත්වීමේ සංඥාව ද **අන්තෝසමාපත්තියම්පි** සමාපත්තිය තුළ ද **අත්ථි** ඇත **සමාපත්තිතෝ** සමාපත්තියෙන් **වුට්ඨිතස්සේව** නැඟී සිටි පුද්ගලයා හටම **ආභෝගසඤ්ඤා** මෙනෙහි කිරීමේ සංඥාව **පන (හෝති)** වෙයි.

**අප්පමාණානි ඉති** අප්පමාණානි යනු **වඩ්ඪිතප්පමාණානි** ප්‍රතිභාග නිමිත්ත වැඩීමෙන් අප්‍රමාණ වූ **මහන්තානි ඉති** මහත් වූ යන **අත්ථෝ** අර්ථයි **අභිභුය්‍ය ඉති** අභිභුය්‍ය යන **එත්ථ පන** මෙහි වනාහි **යථා** යම්සේ **මහග්ඝසෝ පුරිසෝ** බොහෝ

අනුභව කරනු කැමති සම්පූර්ණ කුක්ෂියක් ඇත්තා වූ පුරුෂයෙක් තෙමේ **ඒකං භත්තවඩ්ඪිතකං ලභිත්‍වා** එක් වේලකට අනුභව කළයුතු ආහාරයෙන් කොටසක් ලැබ **අඤ්ඤම්පි හෝතු** අනිත් අනිත් බතකුත් ලැබුයේ නම් යෙහෙක **ඒතං** මේ ස්වල්ප වූ බත **මය්හං** මට **කිං කරිස්සති ඉති** කුමක් කරන්නේදැයි **තං** ඒ බත් කොටස **මහන්තතෝ න පස්සති** මහත් වශයෙන් නොදකී **ඒවමේව** එපරිද්දෙන් **ඤාණුත්තරෝ** ඤාණයෙන් උත්තරීතර වූ **විසදඤාණෝ පුග්ගලෝ** විසද ප්‍රඥා ඇත්තා වූ බුද්ධානුබුද්ධාදී පුද්ගල තෙමේ **එත්‍ථ** මෙහි සමාපජ්ජිතබ්බං කිං? සමවැදිය යුතු කුමක් ඇත්තේ ද? **ඉදං** මේ ප්‍රතිභාග නිමිත්ත **න අප්පමානං** අප්‍රමාණ නොවෙයි **මය්හං** මගේ **චිත්තේකග්ගතාකරණේ** සිත එකඟ කිරීමෙහි **භාරෝ න අත්‍ථි ඉති** බැරෑරුම් නොවෙයි යැයි **තානි අභිභවිත්‍වා** ඒ පරිකර්ම ප්‍රතිභාග නිමිති මැඩපවත්වා **සමාපජ්ජති** සමාපත්තියට සමවදී **නිමිත්තුප්පාදේනේව සහ** ප්‍රතිභාග නිමිත්ත ඉපදීම හා සමඟම **එත්‍ථ** මෙහි **අප්පනං පාපේති ඉති** අර්පණාවට පැමිණෙයි යන **අත්‍ථෝ** අර්ථයි.

(මෙහි සමහර ආචාර්‍ය්‍යවරයෝ වනාහි උපචාර ධ්‍යානය උපන් කල්හි ඒ ධ්‍යානය අරභයා යටත්පිරිසෙන් දෙතුන් ජවන කෙනෙක් උපදිත් ද ඒ ජවනයෝත් උපචාර ධ්‍යාන පක්ෂයෙහිම වෙත්. ඊට අනතුරුව භවඞ්ග පරිවාසයෙන් හෝ උපචාර ආසේවනයෙන් තොරව අර්පණා ධ්‍යානයාගේ ඉපදීම නිමිත්තෝත්පත්තිය හා සමඟ අර්පණාවට පැමිණවීම යැයි කියත්. ඒ ඔහුන්ගේ මතිමාත්‍රයෙකි. භවඞ්ග පරිවාසයෙන් හෝ පරිකර්ම ආසේවනයෙන් හෝ අර්පණා වාරය නොකැමැතිවන ලද්දේය. මහද්ගත අප්‍රමාණ්‍ය ධ්‍යානයෙහි මෙන් උපචාර ධ්‍යානයෙහි ඒකාන්තයෙන් ප්‍රත්‍යවේක්ෂා ජවනයෝ ද කැමැති නොවිය යුත්තාහ. එහෙයින් උපචාර ධ්‍යානයට පැමිණීමෙන් මතු භවඞ්ග කිහිපයකුගේ කෙළවර අර්පණාවට පැමිණෙන්නාහු නිමිත්තෝත්පත්තිය හා සමඟ අර්පණාවට පැමිණ වීම යැයි කියන ලද්දේයි. "සහ නිමිත්තුප්පාදේනේව" යන අර්ථකථා වචනය අභිප්‍රාය සහිත වචනයක් වෙයි. හෙවත් ශෙදයාර්ථ වචනයක් වේ. නීතාර්ථ වචනයක් නොවේමැයි. එහි අභිප්‍රාය යට කියනලද ක්‍රමයෙන් දතයුතුයි. එකල්හි එබඳු ආභෝගයක් නැති බැවින් සමවත් ඇතුළත නොවෙයි. සමවතින් නැගී සිටියාහුගේ මෙනෙහි කිරීම පූර්වභාග භාවනා වශයෙන් ධ්‍යානක්ෂණයෙහි පැවැති මැඩපැවැත්වීම් ආකාර ගෙන පැවතියේ යැයි දතයුතුයි. දම්සඟණු අර්ථකථායෙහි මෙයින් ඒ ධ්‍යානයාගේ පූර්වභාගය කියන ලද්දේ යැයි දක්වනලදි. සමාපත්ති අභ්‍යන්තරයෙහි එබඳු මෙනෙහි කිරීමක් නැති කල්හි කුමක් හෙයින් ධ්‍යාන සංඥාවෙන් යැයි කියන ලද්දේදැයි යන චෝද්‍ය සඳහා "අභිභවනං -පෙ- අත්‍ථි" යනුවෙන් අර්ථකථායෙහි කීහ. මෙසේ පරිත්තාලම්බනයන් හා ධ්‍යානයෝත් මැඩපවත්තා ධ්‍යාන නැමැති නුවණින් දනිම් යි ධ්‍යාන නැමැති ඇසින් දක්නෙම් යි යන සංඥා ඇත්තේ වෙයි. යනු ටීකායි)

**අජ්ඣත්තං අරූපසඤ්ඤී ඉති** අජ්ඣත්තං අරූපසඤ්ඤී යනු **අලාභිතාය වා** නොලැබූ බැවින් හෝ **අනත්‍ථිකතාය වා** නොකැමැති බැවින් හෝ **අජ්ඣත්තරූපේ** ආධ්‍යාත්මික රූපයෙහි හෙවත් ස්වකීය ශරීරයෙහි කේශාදියෙහි නීල වර්ණාදිය **පරිකම්මසඤ්ඤාවිරහිතෝ** පරිකර්ම නිමිත්ත වශයෙන් නොගත් හෙයිනි.

**ඒකෝ බහිද්ධා රූපානි පස්සති ඉති** ඒකෝ බහිද්ධා රූපානි පස්සති යනු **යස්ස** යම් යෝගී පුද්ගලයෙකු හට **පරිකම්මම්පි** පරිකර්ම නිමිත්ත ද **නිමිත්තම්පි** ප්‍රතිභාග නිමිත්ත ද **බහිද්ධාව උප්පන්නං** බාහිරව උපදින ලද්දේ (**හෝති** වෙයි ද) **සෝ** ඒ

යෝගී පුද්ගල තෙමේ **ඒවං** මෙසේ **බහිද්ධා** බාහිර **පරිකම්මස්ස චේව** පරිකර්මය මෙන්ම **අප්පනාය ච වසේන** බාහිර ප්‍රතිභාග නිමිත්තෙහි උපදවන ලද්ද වූ අර්පණාවගේ ද වශයෙන් **අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති ඉති** අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති යැයි **වුච්චති** කියනු ලැබේ **එත්ථ** මෙහි **සේස** සෙස්ස **චතුත්ථාභිභායතනේ** සිවුවැනි අභිභායතනයෙහි **වුත්තනයමේව** කියනලද ක්‍රමයමැයි **ඉමේසු පන චතූසු** මේ අභිභායතනයන් සතර දෙනා අතුරෙන් **පරිත්තං** පරිත්තාලම්බන අභිභායතනය **විතක්කචරිතවසේන** විතර්ක චරිතයන්ගේ වශයෙන් ද **ආගතං** එනලද්දී **අප්පමාණං** අප්‍රමාණාලම්බන අභිභායතනය **මෝහචරිතවසේන** මෝහ චරිතයාගේ වශයෙන් (**ආගතං** එනලද්දී) **සුවණ්ණං** යහපත් පිරිසිදු වූ අභිභායතනය **දෝසචරිතවසේන** ද්වේෂ චරිතයාගේ වශයෙන් (**ආගතං** එනලද්දී) **දුබ්බණ්ණං** දුර්වර්ණ වූ අභිභායතනය **රාගචරිතවසේන** රාග චරිතයාගේ වශයෙන් (**ආගතං** එනලද්දී) **ඒතානි** ඒ ඒ අභිභායතනයෝ **ඒතේසඤ්හි** ඒ චරිතයන්ට වනාහි **සප්පායානි (හොන්ති)** සත්ප්‍රාය වෙත් **තේසං** ඒ ඒ චරිතයන්ට **සා ච සප්පායතා** ඒ සත්ප්‍රාය බව **විත්ථාරතෝ** විස්තර වශයෙන් **විසුද්ධිමග්ගේ** විසුද්ධි මාර්ගයෙහි **චරිතනිද්දේසේ** චරිත නිර්දේශයෙහි **වුත්තා** දේශනා කරනලද.

**පඤ්චමඅභිභායතනාදීසු** පස්වන අභිභායතනාදියෙහි **නීලානි ඉති** නිලානි යනු **සබ්බසඞ්ගාහකවසේන** සියල්ල සඞ්ග්‍රහ කිරීම් වශයෙන් **වුත්තං** දේශනා කරනලද්දී **නීලවණ්ණානි ඉති** නීලවණ්ණානි යනු **වණ්ණවසේන** වර්ණ වශයෙන් (**වුත්තං** දේශනා කරනලද්දී) **නීලනිදස්සනානි ඉති** නීලනිදස්සනානි යනු **නිදස්සනවසේන** නිදර්ශන වශයෙන් **අපඤ්ඤායමානවිවරානි** ප්‍රකට නොවූ විවර ඇති **අසම්භින්නවණ්ණානි** මිශ්‍ර නොවූ වර්ණ ඇති **ඒකනීලානේව හුත්වා** එකම නීල වර්ණයක්ම වී **දිස්සන්ති ඉති** පෙණෙත් යැයි **වුත්තං හෝති** දේශනා කරන ලද්දේ වෙයි **නීලනිභාසානි ඉති** නීලනිභාසානි යනු **ඉදං පන** මෙය වනාහි **ඕභාසවසේන** ඕභාස වශයෙන් **වුත්තං** දේශනා කරනලද්දී **නීලෝභාසානි** නීලෝභාසානි යනු **නීලප්පභායුත්තානි ඉති අත්ථෝ** නීල ප්‍රභාවයෙන් යුතු යන අර්ථයයි **ඒතේන** මෙයින් **තේසං** මෙහුන්ගේ **විසුද්ධතං** පිරිසිදු බව **දස්සේති** දක්වයි **විසුද්ධවණ්ණවසේනේව හි** පිරිසිදු වර්ණ වශයෙන්ම වනාහි **ඉමානි චත්තාරි අභිභායතනානි** මේ සතර අභිභායතනයෝ **වුත්තානි** දේශනා කරනලද්දී **උමාපුප්ඵං ඉති** උමාපුප්ඵං යනු **ඒතඤ්හි පුප්ඵං** ඒ දියබෙරලිය පුෂ්පය වනාහි **සිනිද්ධං** සිනිදුය **මුදු** මෘදුය **දිස්සමානම්පි** දකිනු ලබනුයේ ද **නීලමේව හෝති** නිල් පැහැයම දකින්නේ වෙයි **ගිරිකණ්ණිකපුප්ඵාදීනි පන** නිල් කටරොළු මල් **දිස්සමානානි** දකිනු ලබනුයේ ද **සේතධාතුකානේව හොන්ති** සුදු පැහැයම වෙත් **තස්මා** එහෙයින් **ඉදමේව ගහිතං** දියබෙරලිය මල්ම ගන්නාලද්දී **තානි** නිල් කටරොළු මල් **න (ගහිතානි)** නොගන්නාලද්දී **බාරාණසෙය්‍යකං ඉති** බාරාණසෙය්‍යකං යනු **බාරාණසිසම්භවං** බරණැස හටගන්නා ලද **තත්ථ කිර** එහි වනාහි **කප්පාසෝපි** කපු ද **මුදු** මෘදුය **සුත්තන්තිකායෝපි** නූල් කටින්නියෝ ද **තන්තවායාපි** රෙදි වියන්නෝ ද **ඡේකා** දක්ෂයෝ වෙත් **උදකම්පි** ජලය ද **සුචි** පිරිසිදුය **මුදු** මෘදුය **තස්මා** එහෙයින් **තං වත්ථං** ඒ වස්ත්‍රය **උභතෝභාගවිමට්ඨං හෝති** දෙකෙළවර මට්ටම් වේ **ද්වීසුපි පස්සේසු** දෙපස ද **මට්ඨං** මට්ටම්ව **මුදු** මෘදුව **සිනිද්ධං** සිනිදුව **ඛායති** වැටහෙයි.

**පීතානි ඉති ආදීසුපි** පීතානි යනාදියෙහි ද **ඉමිනා ඒව නයේන** මේ ක්‍රමයෙන්ම **අත්ථෝ** අර්ථය **වේදිතබ්බෝ** දතයුතුයි **එත්ථ පන** මෙහි වනාහි **නීලකසිණං උග්ගණ්හන්තෝ** නීල කසිණය ඉගෙන ගන්නා පුද්ගල තෙමේ **නීලස්මිං** නීල වර්ණ **පුප්ඵස්මිං වා** පුෂ්පයෙහි හෝ **වත්ථස්මිං වා** වස්ත්‍රයෙහි හෝ **වණ්ණධාතුයා වා** නිල්

පැහැයෙහි හෝ **නිමිත්තං ගණ්හාති** නිමිත්ත ගනී **ඉති ආදිකං** යනාදිය මුල්කොට ඇති **කසිණකරණඤ්ච** කසින මණ්ඩලය කරගැනීම ද **පරිකම්මඤ්ච** කසිණ පිරියම ද **අප්පනාවිධානඤ්ච** අර්පණා විධානය ද **සබ්බං** යන සියල්ල **විසුද්ධිමග්ගේ** විසුද්ධි මාර්ගයෙහි **විත්ථාරතෝ** විස්තර වශයෙන් **වුත්තමේව** දේශනා කරන ලද්දේමය **ඉමානිපි අට්ඨ අභිභායතනානි** මේ අභිභායතන අටදෙන **අභීතභාවදස්සනත්ථමේව** තථාගතයන් වහන්සේට බියක් තැතිගැන්මක් නොමැතිබව දැක්වීම පිණිස ගෙනහැර දක්වනලදි.

**[දීඝනිකාය අටුවා පරිවර්තන]**

**අජ්ඣත්තං රූපසඤ්ඤී**තිආදීසු අජ්ඣත්තරූපේ පරිකම්මවසේන අජ්ඣත්තං රූපසඤ්ඤී නාම හෝති. අජ්ඣත්තඤ්හි නීලපරිකම්මං කරොන්තෝ කේසේ වා පිත්තේ වා අක්ඛිතාරකාය වා කරෝති, පීතපරිකම්මං කරොන්තෝ මේදේ වා ඡවියා වා හත්ථපාදතලේසු වා අක්ඛීනං පීතකට්ඨානේ වා කරෝති, ලෝහිතපරිකම්මං කරොන්තෝ මංසේ වා ලෝහිතේ වා ජිව්හාය වා අක්ඛීනං රත්තට්ඨානේ වා කරෝති, ඕදාතපරිකම්මං කරොන්තෝ අට්ඨිම්හි වා දන්තේ වා නඛේ වා අක්ඛීනං සේතට්ඨානේ වා කරෝති. තං පන සුනීලං සුපීතං සුලෝහිතකං සුඕදාතකං න හෝති, අවිසුද්ධමේව හෝති.

**ඒකෝ බහිද්ධා රූපානි පස්සතී**ති යස්සේවං පරිකම්මං අජ්ඣත්තං උප්පන්නං හෝති, නිමිත්තං පන බහිද්ධා. සෝ ඒවං අජ්ඣත්තං පරිකම්මස්ස බහිද්ධා ච අප්පනාය වසේන "අජ්ඣත්තං රූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සතී"ති වුච්චති. **පරිත්තානී**ති අවඩ්ඪිතානි. **සුවණ්ණදුබ්බණ්ණානී**ති සුවණ්ණානි වා හොන්තු දුබ්බණ්ණානි වා, පරිත්තවසේනේව ඉදං අභිභායතනං වුත්තන්ති වේදිතබ්බං. **තානි අභිභුය්‍යා**ති යථා නාම සම්පන්නගහණිකෝ කටච්ඡුමත්තං භත්තං ලභිත්වා "කිං එත්ථ භුඤ්ජිතබ්බං අත්ථී"ති සඞ්කඩ්ඪිත්වා ඒකකබලමේව කරෝති, ඒවමේව ඤාණුත්තරිකෝ පුග්ගලෝ විසදඤාණෝ "කිං ඒත්ථ පරිත්තකේ ආරම්මණේ සමාපජ්ජිතබ්බං අත්ථි, නායං මම භාරෝ"ති තානි රූපානි අභිභවිත්වා සමාපජ්ජති, සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පනං පාපේතීති අත්ථෝ. **ජානාමි පස්සාමී**ති ඉමිනා පනස්ස ආභෝගෝ කථිතෝ. සෝ ච ඛෝ සමාපත්තිතෝ වුට්ඨිතස්ස, න අන්තෝසමාපත්තියං. **ඒවංසඤ්ඤී හෝතී**ති ආභෝගසඤ්ඤායපි ඣානසඤ්ඤායපි ඒවංසඤ්ඤී හෝති. අභිභවසඤ්ඤා හිස්ස අන්තෝසමාපත්තියම්පි අත්ථි, ආභෝගසඤ්ඤා පන සමාපත්තිතෝ වුට්ඨිතස්සේව.

**අප්පමාණානී**ති වඩ්ඪිතප්පමාණානි, මහන්තානීති අත්ථෝ. **අභිභුය්‍යා**ති ඒත්ථ පන යථා මහග්ඝසෝ පුරිසෝ ඒකං භත්තවඩ්ඪිතකං ලභිත්වා "අඤ්ඤම්පි හෝතු, කිං ඒතං මය්හං කරිස්සතී"ති තං න මහන්තතෝ පස්සති, ඒවමේව ඤාණුත්තරෝ පුග්ගලෝ විසදඤාණෝ "කිං එත්ථ සමාපජ්ජිතබ්බං, නයිදං අප්පමාණං, න මය්හං චිත්තේකග්ගතාකරණේ භාරෝ අත්ථී"ති තානි අභිභවිත්වා සමාපජ්ජති, සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පනං පාපේතීති අත්ථෝ.

**අජ්ඣත්තං අරූපසඤ්ඤී**ති අලාභිතාය වා අනත්ථිකතාය වා අජ්ඣත්තරූපේ පරිකම්මසඤ්ඤාවිරහිතෝ.

**බහිද්ධා රූපානි පස්සතී**ති යස්ස පරිකම්මම්පි නිමිත්තම්පි බහිද්ධාව උප්පන්නං, සෝ ඒවං බහිද්ධා පරිකම්මස්ස චේව අප්පනාය ච වසේන "අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝව බහිද්ධා රූපානි පස්සතී"ති වුච්චති. සේසමෙත්ථ

චතුත්ථඅභිභායතනේ වුත්තනයමේව. ඉමේසු පන චතූසු පරිත්තං විතක්කචරිතවසේන ආගතං, අප්පමාණං මෝහචරිතවසේන, සුවණ්ණං දෝසචරිතවසේන, දුබ්බණ්ණං රාගචරිතවසේන. ඒතේසඤ්හි ඒතානි සප්පායානි, සා ච නේසං සප්පායතා විත්ථාරතෝ විසුද්ධිමග්ගේ චරියනිද්දේසේ වුත්තා.

පඤ්චමඅභිභායතනාදීසු **නීලානී**ති සබ්බසඞ්ගාහකවසේන වුත්තං. **නීලවණ්ණානී**ති වණ්ණවසේන. **නීලනිදස්සනානී**ති නිදස්සනවසේන, අපඤ්ඤායමානවිවරානි අසම්භින්නවණ්ණානි ඒකනීලානේව හුත්වා දිස්සන්තීති වුත්තං හෝති. **නීලනිභාසානී**ති ඉදං පන ඔභාසවසේන වුත්තං, නීලෝභාසානි නීලප්පභායුත්තානීති අත්ථෝ. ඒතේන නේසං සුවිසුද්ධතං දස්සේති. විසුද්ධවණ්ණවසේනේව හි ඉමානි චත්තාරි අභිභායතනානි වුත්තානි. "නීලකසිණං ගණ්හන්තෝ නීලස්මිං නිමිත්තං ගණ්හාති පුප්ඵස්මිං වා වත්ථස්මිං වා වණ්ණධාතුයා වා"තිආදිකං පනෙත්ථ කසිණකරණඤ්ච පරිකම්මඤ්ච අප්පනාවිධානඤ්ච සබ්බං විසුද්ධිමග්ගේ විත්ථාරතෝ වුත්තමේව. ඉමානි පන අට්ඨ අභිභායතනජ්ඣානානි වට්ටානිපි හොන්ති වට්ටපාදකානිපි විපස්සනාපාදකානිපි දිට්ඨධම්මසුඛවිහාරානිපි අභිඤ්ඤාපාදකානිපි නිරෝධපාදකානිපි, ලෝකියානේව පන න ලෝකුත්තරානීති වේදිතබ්බානි.

**රූපී රූපානි පස්සතී**ති එත්ථ අජ්ඣත්තං කේසාදීසු නීලකසිණාදීසු නීලකසිණාදිවසේන උප්පාදිතං රූපජ්ඣානං රූපං, තං අස්ස අත්ථීති රූපී. **බහිද්ධා රූපානි පස්සතී**ති බහිද්ධාපි නීලකසිණාදීනි රූපානි ඣානචක්ඛුනා පස්සති. ඉමිනා අජ්ඣත්තබහිද්ධාවත්ථුකේසු කසිණේසු උප්පාදිතජ්ඣානස්ස පුග්ගලස්ස චත්තාරිපි රූපාවචරජ්ඣානානි දස්සිතානි. **අජ්ඣත්තං අරූපසඤ්ඤී**ති අජ්ඣත්තං න රූපසඤ්ඤී, අත්තනෝ කේසාදීසු අනුප්පාදිතරූපාවචරජ්ඣානෝති අත්ථෝ. ඉමිනා බහිද්ධාපරිකම්මං කත්වා බහිද්ධාව උප්පාදිතජ්ඣානස්ස පුග්ගලස්ස රූපාවචරජ්ඣානානි දස්සිතානි.

**සුභන්ත්වේව අධිමුත්තෝ හෝතී**ති ඉමිනා සුවිසුද්ධේසු නීලාදීසු වණ්ණකසිණේසු ඣානානි දස්සිතානි. තත්ථ කිඤ්චාපි අන්තෝඅප්පනායං සුභන්ති ආභෝගෝ නත්ථි, යෝ පන විසුද්ධං සුභං කසිණාරම්මණං කත්වා විහරති, සෝ යස්මා "සුභන්ති අධිමුත්තෝ හෝතී"ති වත්තබ්බතං ආපජ්ජති, තස්මා ඒවං දේසනා කතා. පටිසම්භිදාමග්ගේ පන "කථං සුභන්ත්වේව අධිමුත්තෝ හෝතීති විමොක්ඛෝ; ඉධ භික්ඛු මෙත්තාසහගතේන චේතසා ඒකං දිසං ඵරිත්වා විහරති…පෙ…. මෙත්තාය භාවිතත්තා සත්තා අප්පටික්කූලා හොන්ති. කරුණාසහගතේන…පෙ…. මුදිතාසහගතේන…පෙ…. උපෙක්ඛාසහගතේන චේතසා ඒකං දිසං ඵරිත්වා විහරති…පෙ…. උපෙක්ඛාය භාවිතත්තා සත්තා අප්පටික්කූලා හොන්ති. ඒවං සුභන්ත්වේව අධිමුත්තෝ හෝතීති විමොක්ඛෝ"ති (පටි. ම. 1.212) වුත්තං. **සබ්බසෝ රූපසඤ්ඤාන**න්තිආදීසු යං වත්තබ්බං, තං සබ්බං විසුද්ධිමග්ගේ වුත්තමේව.
**[අ. නි. ඒකකනිපාත අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 427-435 යටතේ); අඞ්ගුත්තර නිකාය අටුවා 01/284-286 පිටු (හේ.වි.මු)]**

යථා ඉත්ථීසු කථා පවත්තා අධිත්ථීති වුච්චති, ඒවං අත්තානං අධිකිච්ච පවත්තා **අජ්ඣත්තං.** "ඒවං පවත්තමානා මයං 'අත්තා'ති ගහණං ගමිස්සාමා"ති ඉමිනා විය අධිප්පායේන අත්තානං අධිකිච්ච උද්දිස්ස පවත්තා සත්තසන්තති පරියාපන්නා අජ්ඣත්තං. තස්මිං **අජ්ඣත්තරූපේ,** අත්තනෝ කේසාදිවත්ථුකේ

කසිණරූපේති අත්ථෝ. **පරිකම්මවසේන අජ්ඣත්තං රූපසඤ්ඤීති** පරිකම්මකරණවසේන අජ්ඣත්තං රූපසඤ්ඤී, න අප්පනාවසේන. න හි පටිභාගනිමිත්තාරම්මණා අප්පනා අජ්ඣත්තවිසයා සම්භවති. තං පන අජ්ඣත්තං පරිකම්මවසේන ලද්ධං කසිණනිමිත්තං අවිසුද්ධමේව හෝති, න බහිද්ධා පරිකම්මවසේන ලද්ධං විය විසුද්ධං. තේනාහ; **"තං පනා"**තිආදි.

**යස්සේවං පරිකම්මං අජ්ඣත්තං උප්පන්න**න්ති යස්ස පුග්ගලස්ස ඒවං වුත්තප්පකාරේන අජ්ඣත්තං පරිකම්මං ජාතං. **නිමිත්තං පන බහිද්ධාති** පටිභාගනිමිත්තං සසන්තතිපරියාපන්නං න හෝතීති බහිද්ධා. **පරිත්තානීති** යථාලද්ධානි සුප්පසරාවමත්තානි. තේනාහ; **"අවඩ්ඪිතානී"**ති. **පරිත්තවසේනේවාති** වණ්ණවසේන ආභෝගේ විජ්ජමානේපි පරිත්තවසේනේව ඉදං අභිභායතනං වුත්තං පරිත්තතා හෙත්ථ අභිභවනස්ස කාරණං. වණ්ණාභෝගේ සතිපි අසතිපි අභිභවතීති අභිභූ, පරිකම්මං, ඤාණං වා. අභිභූ ආයතනං ඒතස්සාති **අභිභායතනං,** ඣානං. අභිභවිතබ්බං වා ආරම්මණසඞ්ඛාතං ආයතනං ඒතස්සාති **අභිභායතනං**. අථ වා ආරම්මණාභිභවනතෝ අභිභූ ච තං ආයතනඤ්ච යෝගිනෝ සුඛවිසේසානං අධිට්ඨානභාවතෝ මනායතනධම්මායතනභාවතෝ චාති සසම්පයුත්තජ්ඣානං **අභිභායතනං**. අභිභායතනභාවනා නාම තික්ඛපඤ්ඤස්සේව සම්භවති, න ඉතරස්සාති ආහ; **"ඤාණුත්තරිකෝ පුග්ගලෝ"**ති. **අභිභවිත්වා සමාපජ්ජතීති** ඒත්ථ අභිභවනං සමාපජ්ජනඤ්ච උපචාරජ්ඣානාධිගමනසමනන්තරමේව අප්පනාඣානුප්පාදනන්ති ආහ; **"සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පනං පාපේතී"**ති. **සහ නිමිත්තුප්පාදේනාති** ච අප්පනාපරිවාසාභාවස්ස ලක්ඛණවචනමේතං. යෝ ඛිප්පාභිඤ්ඤෝති වුච්චති, තතෝපි ඤාණුත්තරස්සේව අභිභායතනභාවනා. **එත්ථාති** ඒතස්මිං නිමිත්තේ. **අප්පනං පාපේතීති** භාවනාඅප්පනං නේති.

එත්ථ ච කේචි "උප්පන්නේ උපචාරජ්ඣානේ තං ආරබ්භ යේ හෙට්ඨිමන්තේන ද්වේ තයෝ ජවනවාරා පවත්තන්ති, තේ උපචාරජ්ඣානපක්ඛිකා ඒව, තදනන්තරං භවඞ්ගපරිවාසේන උපචාරසේවනාය ච විනා අප්පනා හෝති, සහ නිමිත්තුප්පාදේනේව අප්පනං පාපේතී"ති වදන්ති, තං තේසං මතිමත්තං. න හි පාරිවාසිකපරිකම්මේන අප්පනාවාරෝ ඉච්ඡිතෝ, නාපි මහග්ගතප්පමාණජ්ඣානේසු විය උපචාරජ්ඣානේ ඒකන්තතෝ පච්චවෙක්ඛණා ඉච්ඡිතබ්බා. තස්මා උපචාරජ්ඣානාධිගමතෝ පරං කතිපයභවඞ්ගචිත්තාවසානේ අප්පනං පාපුණන්තෝ **"සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පනං පාපේතී"**ති වුත්තෝ. **සහ නිමිත්තුප්පාදේනාති** ච අධිප්පායිකමිදං වචනං, න නීතත්ථං, තත්ථ අධිප්පායෝ වුත්තනයේනේව වේදිතබ්බෝ. **න අන්තෝසමාපත්තියං** තදා තථාරූපස්ස ආභෝගස්ස අසම්භවතෝ. **සමාපත්තිතෝ වුට්ඨිතස්ස ආභෝගෝ** පුබ්බභාගභාවනාවසේන ඣානක්ඛණේ පවත්තං අභිභවනාකාරං ගහෙත්වා පවත්තෝති දට්ඨබ්බං. අභිධම්මට්ඨකථායං පන "ඉමිනාස්ස පුබ්බාභෝගෝ කථිතෝ"ති වුත්තං. අන්තෝසමාපත්තියං තදා තථා ආභෝගාභාවේ කස්මා ඣානසඤ්ඤායපීති වුත්තන්ති ආහ; **"අභිභවසඤ්ඤා හිස්ස අන්තෝසමාපත්තියම්පි අත්ථී"**ති.

**වඩ්ඪිතප්පමාණානීති** විපුලප්පමාණානීති අත්ථෝ, න ඒකඞ්ගුල ද්වඞ්ගුලාදි වඩ්ඪිං පාපිතානි තථා වඩ්ඪනස්සේවෙත්ථ අසම්භවතෝ. තේනාහ; **"මහන්තානී"**ති.

**භත්තවඩ්ඪිතක**න්ති භුඤ්ජනභාජනේ වඩ්ඪෙත්වා දින්නං භත්තං, ඒකාසනේ පුරිසේන භුඤ්ජිතබ්බභත්තතෝ උපඩ්ඪභත්තන්ති අත්ථෝ.

රූපේ සඤ්ඤා රූපසඤ්ඤා, සා අස්ස අත්ථීති රූපසඤ්ඤී, න රූපසඤ්ඤී **අරූපසඤ්ඤී.** සඤ්ඤාසීසේන ඣානං වදති. රූපසඤ්ඤාය අනුප්පාදනමේවෙත්ථ **අලාභිතා. බහිද්ධාව උප්පන්න**න්ති බහිද්ධාවත්ථුස්මිංයේව උප්පන්නං. ඒත්ථ ච; "අජ්ඣත්තං රූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි. අජ්ඣත්තං රූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානී"ති (දී. නි. 3.338, 358; අ. නි. 8.65; 10.29);

ඒවමිධ චත්තාරි අභිභායතනානි ආගතානි. **අභිධම්මේ** (ධ. ස. 244-245) පන "අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානී"ති ඒවමාගතානි. තත්ථ ච කාරණං අභිධම්මට්ඨකථායං වුත්තමේව. තථා හි වුත්තං අට්ඨසාලිනියං (ධ. ස. අට්ඨ. 204); "කස්මා පන යථා සුත්තන්තේ 'අජ්ඣත්තං රූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති පරිත්තානී'තිආදි වුත්තං, ඒවං අවත්වා ඉධ චතූසුපි අභිභායතනේසු අජ්ඣත්තං අරූපසඤ්ඤිතාව වුත්තාති. අජ්ඣත්තරූපානං අනභිභවනීයතෝ. තත්ථ වා හි ඉධ වා බහිද්ධා රූපානේව අභිභවිතබ්බානි, තස්මා තානි නියමතෝ වත්තබ්බානී"ති.

තත්‍රාපි ඉධාපි වුත්තානි "අජ්ඣත්තං රූපසඤ්ඤී අජ්ඣත්තං අරූපසඤ්ඤීති ඉදං පන සත්ථු දේසනාවිලාසමත්තමේවා"ති. අයං පනෙත්ථ අධිප්පායෝ; ඉධ වණ්ණාභෝගරහිතානි සහිතානි ච සබ්බානි පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි අභිභූයාති. පරියායකථා හි සුත්තන්තදේසනාති. අභිධම්මේ පන නිප්පරියායදේසනත්තා වණ්ණාභෝගරහිතානි විසුං වුත්තානි, තථා සහිතානි. අත්ථි හි උභයත්ථ අභිභවනවිසේසෝති. තථා ඉධ පරියායදේසනත්තා විමොක්ඛානම්පි අභිභවනපරියායෝ අත්ථීති "අජ්ඣත්තං රූපසඤ්ඤී"ති ආදිනා පඨම-දුතිය-අභිභායතනේසු පඨමවිමොක්ඛෝ, තතිය-චතුත්ථ-අභිභායතනේසු දුතියවිමොක්ඛෝ, වණ්ණාභිභායතනේසු තතියවිමොක්ඛෝ ච අභිභවනපත්තිතෝ සඞ්ගහිතෝ. අභිධම්මේ පන නිප්පරියායදේසනත්තා විමොක්ඛාභිභායතනානි අසඞ්කරතෝ දේසේතුං විමොක්ඛේ වජ්ජේත්වා අභිභායතනානි කථිතානි. සබ්බානි ච විමොක්ඛකිච්චානි ඣානානි විමොක්ඛදේසනායං වුත්තානි. තදේතං "අජ්ඣත්තං රූපසඤ්ඤී"ති ආගතස්ස අභිභායතනද්වයස්ස අභිධම්මේ අභිභායතනේසු අවචනතෝ "රූපී රූපානි පස්සතී"තිආදීනඤ්ච සබ්බ විමොක්ඛකිච්චසාධාරණ වචනභාවතෝ වවත්ථානං කතන්ති විඤ්ඤායති.

**අජ්ඣත්තරූපානං අනභිභවනීයතෝ**ති ඉදං අභිධම්මේ කත්ථචිපි "අජ්ඣත්තරූපානි පස්සතී"ති අවත්වා සබ්බත්ථ යං වුත්තං; "බහිද්ධා රූපානි පස්සතී"ති, තස්ස කාරණවචනං. තේන යං අඤ්ඤහේතුකං සුත්තන්තේ "බහිද්ධා රූපානි පස්සතී"ති වචනං, තං තේන හේතුනා වුත්තං. යං පන දේසනාවිලාසහේතුකං අජ්ඣත්තං අරූපසඤ්ඤිතාය ඒව අභිධම්මේ වචනං, න තස්ස අඤ්ඤං කාරණං මග්ගිතබ්බන්ති දස්සේති. අජ්ඣත්තරූපානං අනභිභවනීයතා ච තේසං බහිද්ධාරූපානං විය අවිභූතත්තා. දේසනාවිලාසෝ ච යථාවුත්ත වවත්ථානවසේන

වේදිතබ්බෝ වේනෙය්‍යජ්ඣාසයවසේන විජ්ජමානපරියායකථනභාවතෝ. දේසනාවිලාසෝ හි නාම වේනෙය්‍යජ්ඣාසයානුරූපං විජ්ජමානස්ස ච පරියායස්ස විභාවනං, න යස්ස කස්සචි, තස්මා "ඉධ පරියායදේසනත්තා"තිආදිනා වුත්තප්පකාරං වචත්ථානං දේසනාවිලාසනිබන්ධනන්ති දට්ඨබ්බං.

**සුවණ්ණදුබ්බණ්ණානී**ති ඒතේනේව සිද්ධත්තා න නීලාදිඅභිභායතනානි වත්තබ්බානීති චේ? න නීලාදීසු කතාධිකාරානං නීලාදිභාවස්සේව අභිභවනකාරණත්තා. න හි තේසං පරිසුද්ධාපරිසුද්ධවණ්ණානං පරිත්තතා අප්පමාණතා වා අභිභවනකාරණං, අථ ඛෝ නීලාදිභාවෝ ඒවාති. ඒතේසු ච පරිත්තාදිකසිණරූපේසු යං යං චරිතස්ස ඉමානි අභිභායතනානි ඉජ්ඣන්ති, තං දස්සේතුං; **"ඉමේසු පනා"**තිආදි වුත්තං.

**සබ්බසඞ්ගාහිකවසේනා**ති නීලවණ්ණනීලනිදස්සනනීලනිභාසානං සාධාරණවසේන. **වණ්ණවසේනා**ති සභාවවණ්ණවසේන. **නිදස්සනවසේනා**ති පස්සිතබ්බතාවසේන, චක්ඛුවිඤ්ඤාණවීථියා ගහේතබ්බතාවසේන. **ඕභාසවසේනා**ති සප්පභාසතාය අවභාසනවසේන. **වණ්ණධාතුයා** **වා**ති අඤ්ජනරජතවත්ථාදිවණ්ණධාතුයා. **ලෝකියානේව** රූපාවචරජ්ඣානභාවතෝ.

**රූපී**ති ඒත්ථ යේනායං සසන්තතිපරියාපන්නේන රූපේන සමන්නාගතෝ, තං යස්ස ඣානස්ස හේතුභාවේන විසිට්ඨරූපං හෝති. යේන විසිට්ඨේන රූපීති වුච්චෙය්‍ය, තදේව සසන්තතිපරියාපන්නරූපනිමිත්තං ඣානං. ඉධ පන පරමත්ථතෝ රූපීභාවසාධකන්ති ආහ; **"අජ්ඣත්තං කේසාදීසූ"**තිආදි. **රූපජ්ඣානං රූප**න්ති උත්තරපදලෝපේන වුත්තං; "රූපූපපත්තියා"තිආදීසු (ධ. ස. 160-161, 185-190 ආදයෝ, 244-245 ආදයෝ; විභ. 625) විය.

**සුභන්ත්වේව අධිමුත්තෝ හෝතී**ති අයං තතියවිමොක්ඛෝ. ඉධ සුපරිසුද්ධනීලාදිවණ්ණකසිණජ්ඣානවසේන වුත්තෝති දස්සෙත්වා ඉදනි පටිසම්භිදපාළියං තස්ස බ්‍රහ්මවිහාරජ්ඣානවසේන ආගතභාවං දස්සේතුං; **"පටිසම්භිදමග්ගේ පනා"**තිආදි ආරද්ධං. ඉධ පන උපරි පාළියංයේව බ්‍රහ්මවිහාරානං ආගතත්තා තං නයං පටික්ඛිපිත්වා පරිසුද්ධනීලාදිවණ්ණකසිණවසේනේව සුභවිමොක්ඛෝ අනුඤ්ඤාතෝ.

**[අ. නි. ඒකකනිපාත ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 427-435 යටතේ)]**

## අභිධර්ම ක්‍රමයට අභිභායතන

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විතක්කවිචාරානං වූපසමා…පෙ…. දුතියං ඣානං …පෙ…. තතියං ඣානං…පෙ…. චතුත්ථං ඣානං…පෙ…. පඨමං ඣානං…පෙ…. පඤ්චමං

ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

## චතස්සෝ පටිපදා

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං දන්ධාභිඤ්ඤං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විතක්කවිචාරානං වූපසමා…පෙ…. දුතියං ඣානං…පෙ…. තතියං ඣානං…පෙ…. චතුත්ථං ඣානං…පෙ…. පඨමං ඣානං…පෙ…. පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං…පෙ…. දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං …පෙ…. සුඛපටිපදං දන්ධාභිඤ්ඤං…පෙ…. සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

## ද්වේ ආරම්මණානි

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති

පරිත්තං පරිත්තාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති අප්පමාණං පරිත්තාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විතක්කවිචාරානං වූපසමා…පෙ…. දුතියං ඣානං…පෙ…. තතියං ඣානං…පෙ…. චතුත්ථං ඣානං…පෙ…. පඨමං ඣානං…පෙ…. පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති පරිත්තං පරිත්තාරම්මණං…පෙ…. අප්පමාණං පරිත්තාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

## අට්ඨක්ඛත්තුකං

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විතක්කවිචාරානං වූපසමා…පෙ…. දුතියං ඣානං…පෙ…. තතියං ඣානං…පෙ…. චතුත්ථං ඣානං…පෙ…. පඨමං ඣානං…පෙ…. පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං…පෙ… දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං …පෙ… දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං…පෙ… දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං…පෙ… සුඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං…පෙ… සුඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං…පෙ… සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං…පෙ…. සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං පරිත්තාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

## ඉදම්පි අට්ඨකඛත්තුකං

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං

උපසම්පජ්ජ විහරති, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විතක්කවිචාරානං වූපසමා…පෙ…. දුතියං ඣානං…පෙ…. තතියං ඣානං…පෙ…. චතුත්ථං ඣානං…පෙ…. පඨමං ඣානං…පෙ…. පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

## අප්පමාණානි

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විතක්කවිචාරානං වූපසමා…පෙ…. දුතියං ඣානං…පෙ…. තතියං ඣානං…පෙ…. චතුත්ථං ඣානං…පෙ…. පඨමං ඣානං…පෙ…. පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

## චතස්සෝ පටිපදා

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති

සුඛපටිපදං දන්ධාභිඤ්ඤං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විතක්කවිචාරානං වූපසමා…පෙ…. දුතියං ඣානං…පෙ…. තතියං ඣානං…පෙ…. චතුත්ථං ඣානං…පෙ…. පඨමං ඣානං…පෙ…. පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං…පෙ…. දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං…පෙ…. සුඛපටිපදං දන්ධාභිඤ්ඤං…පෙ…. සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

## ද්වේ ආරම්මණානි

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පරිත්තං අප්පමාණාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති අප්පමාණං අප්පමාණාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විතක්කවිචාරානං වූපසමා…පෙ…. දුතියං ඣානං…පෙ…. තතියං ඣානං…පෙ…. චතුත්ථං ඣානං…පෙ…. පඨමං ඣානං…පෙ…. පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති පරිත්තං අප්පමාණාරම්මණං…පෙ…. අප්පමාණං අප්පමාණාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

## අපරම්පි අට්ඨක්ඛත්තුකං

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි...පෙ.... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති...පෙ.... අවික්ඛේපෝ හෝති...පෙ.... ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි...පෙ.... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති...පෙ.... අවික්ඛේපෝ හෝති...පෙ.... ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි...පෙ.... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති...පෙ.... අවික්ඛේපෝ හෝති...පෙ.... ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි...පෙ.... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති...පෙ.... අවික්ඛේපෝ හෝති...පෙ.... ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි...පෙ.... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති...පෙ.... අවික්ඛේපෝ හෝති...පෙ.... ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි...පෙ.... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති...පෙ.... අවික්ඛේපෝ හෝති...පෙ.... ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි...පෙ.... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති...පෙ.... අවික්ඛේපෝ හෝති...පෙ.... ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය

ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විතක්කවිචාරානං වූපසමා…පෙ…. දුතියං ඣානං…පෙ…. තතියං ඣානං…පෙ…. චතුත්ථං ඣානං…පෙ…. පඨමං ඣානං…පෙ…. පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං…පෙ… දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං…පෙ… දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං…පෙ… දුක්ඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං…පෙ… සුඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං…පෙ… සුඛපටිපදං දන්ධාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං…පෙ… සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං…පෙ… සුඛපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පමාණං අප්පමාණාරම්මණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති …පෙ…. ඉමේ ධම්මා කුසලා.

## ඉදම්පි අට්ඨක්ඛත්තුකං

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විතක්කවිචාරානං වූපසමා…පෙ…. දුතියං ඣානං…පෙ…. තතියං ඣානං…පෙ…. චතුත්ථං ඣානං…පෙ…. පඨමං ඣානං…පෙ…. පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

**[ධම්මසඞ්ගණී පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 204-245 යටතේ); ධම්මසඞ්ගණී පාළි 96- 112 පිටු (බු.ජ); සිත සිරුර සහ නිවන හෙවත් ධම්මසඞ්ගණී 215-266 පිටු]**

### අභිභායතන

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි (මෙනෙහි කොට) කාමයන්ගෙන්

වෙන්වමැ -පෙ- ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි (මෙනෙහි කොට) විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් -පෙ- ද්විතීය ධ්‍යානයට -පෙ- තෘතීය ධ්‍යානයට -පෙ- චතුර්ථ ධ්‍යානයට -පෙ- ප්‍රථම ධ්‍යානයට -පෙ- පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

## චතස්සෝ පටිපදා

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා සහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි (මෙනෙහි කොට) කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- දුක් වූ පටිපදා ඇති දන්ධ වූ අභිඥා ඇති ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- දුක් වූ පටිපදා ඇති ක්ෂිප්‍රාභිඥා වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා සහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- සුඛ වූ පටිපදා ඇති දන්ධ වූ අභිඥා ඇති ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා සහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- සුඛ වූ පටිපදා ඇති ක්ෂිප්‍රාභිඥා වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් -පෙ- ද්විතීය ධ්‍යානයට -පෙ- තෘතීය ධයානයට -පෙ- චතුර්ථ ධ්‍යානයට -පෙ- ප්‍රථම ධ්‍යානයට -පෙ- දුක් වූ පටිපදා ඇති දන්ධ වූ අභිඥා ඇති පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද, -පෙ- දුක් වූ පටිපදා ඇති ක්ෂිප්‍රාභිඥා වූ -පෙ- සුඛ ප්‍රතිපත් ඇති දන්ධාභිඥා වූ -පෙ- සුඛ ප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥා වූ පඤ්චම ධ්‍යානයට පැමිණ

වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

## ද්වේ ආරම්මණානි

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- පරිත්ත වූ පරිත්තාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි විතර්ක විචාරයන්ගෙන් සංසිඳීමෙන් -පෙ- ද්විතීය ධ්‍යානයට -පෙ- තෘතීය ධ්‍යානයට -පෙ- චතුර්ථ ධ්‍යානයට -පෙ- ප්‍රථම ධ්‍යානයට -පෙ- පරිත්ත වූ පරිත්තාලම්බන වූ පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද, -පෙ- අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ (පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද) එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

## අජ්ඣත්තබහිද්ධාරම්මණත්තිකං

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- දුක් වූ පටිපදා ඇති දන්ධ අභිඥා වූ පරිත්ත වූ පරිත්තාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- දුක් වූ පටිපදා ඇති දන්ධ අභිඥා වූ අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- දුක් වූ පටිපදා ඇති ක්ෂිප්‍රාභිඥා අභිඥා වූ පරිත්ත වූ පරිත්තාලම්බන වූ ප්‍රථම ධ්‍යානය

පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- දුක් වූ පටිපද ඇති ක්ෂිප්‍රාභිඥා අභිඥා වූ අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- සුඛ පටිපද ඇති දන්ධ අභිඥා වූ පරිත්ත වූ පරිත්තාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- සුඛ පටිපද ඇති දන්ධ අභිඥා වූ අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- සුඛ පටිපද ඇති ක්ෂිප්‍රාභිඥා වූ පරිත්ත වූ පරිත්තාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ කසිණ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- සුඛ පටිපද ඇති ක්ෂිප්‍රාභිඥා වූ අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥා රහිත වූයේ පරිත්ත වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් -පෙ- දෙවන ධ්‍යානයට -පෙ- තෙවන ධ්‍යානයට -පෙ- සතරවන ධ්‍යානයට -පෙ- පළමුවන ධ්‍යානයට -පෙ- දුක් වූ පටිපද ඇති දන්ධ අභිඥා වූ පරිත්ත වූ පරිත්තාලම්බන වූ පස්වන ධ්‍යානය පැමිණ වෙසේ ද, -පෙ- දුක් පටිපද ඇති දන්ධ අභිඥා වූ අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ -පෙ- දුක් පටිපද ඇති ක්ෂිප්‍රාභිඥා වූ පරිත්ත වූ පරිත්තාලම්බන

වූ -පෙ- දුක් පටිපද ඇති ක්‍ෂිප්‍රාභිඥ වූ අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ -පෙ- සුඛ පටිපද ඇති දන්ධ අභිඥ වූ පරිත්ත වූ පරිත්තාලම්බන වූ -පෙ- සුඛ පටිපද ඇති දන්ධ අභිඥ වූ අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ -පෙ- සුඛ පටිපද ඇති ක්‍ෂිප්‍රාභිඥ වූ පරිත්ත වූ පරිත්තාලම්බන වූ -පෙ- සුඛ පටිපද ඇති ක්‍ෂිප්‍රාභිඥ වූ අප්‍රමාණ වූ පරිත්තාලම්බන වූ පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්‍ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

## ඉදම්පි අට්ඨක්ඛත්තුකං

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ පරිත්ත වූ සුවර්ණ දුර්වර්ණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්‍ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ පරිත්ත වූ සුවර්ණ දුර්වර්ණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් -පෙ- දෙවන ධ්‍යානයට -පෙ- තෙවන ධ්‍යානයට -පෙ- සතරවන ධ්‍යානයට -පෙ- පළමුවන ධ්‍යානයට -පෙ- පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්‍ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

## අප්පමාණානි

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්‍ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් -පෙ- දෙවන ධ්‍යානයට -පෙ- තෙවන ධ්‍යානයට -පෙ- සතරවන ධ්‍යානයට -පෙ- පළමුවන ධ්‍යානයට -පෙ- පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්‍ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

## චතස්සෝ පටිපද

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- දුක් පටිපද ඇති දන්ධ වූ අභිඥ ඇති ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්‍ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිම් දකිම් යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- දුක් පටිපද ඇති ක්‍ෂිප්‍රාභිඥ වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්‍ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ සහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිම් දකිම් යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- සුඛ වූ පටිපද ඇති දන්ධ වූ අභිඥ ඇති ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්‍ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ සහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිම් දකිම් යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- සුඛ වූ පටිපද ඇති ක්‍ෂිප්‍රාභිඥ වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්‍ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකි ද, ඒ රූපයන් මැඩගෙන දනිම් දකිම් යි විතර්ක විචාරයන්ගේ සංසිදීමෙන් -පෙ- ද්විතීය ධ්‍යානයට -පෙ- තෘතීය ධයානයට -පෙ- චතුර්ථ ධ්‍යානයට -පෙ- ප්‍රථම ධ්‍යානයට -පෙ- දුක් වූ පටිපද ඇති දන්ධ වූ අභිඥ ඇති පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද, -පෙ- දුක් ප්‍රතිපත් ඇති ක්‍ෂිප්‍රාභිඥ වූ -පෙ- සුඛ ප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ සුඛ ප්‍රතිපත් ඇති ක්‍ෂිප්‍රාභිඥ වූ පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්‍ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

## ද්වේ ආරම්මණානි

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍ය රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිම් දකිම් යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්‍ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍ය රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිම් දකිම් යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්‍ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍ය රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිම් දකිම් යි විතර්ක විචාරයන්ගෙන් සංසිදීමෙන් -පෙ- ද්විතීය ධ්‍යානයට -පෙ- තෘතීය ධ්‍යානයට -පෙ- චතුර්ථ ධ්‍යානයට -පෙ- ප්‍රථම

ධ්‍යානයට -පෙ- පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද, -පෙ- අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

## අපරම්පි අට්ඨක්ඛත්තුකං

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- දුක් වූ පටිපද ඇති දන්ධ අභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- දුක් වූ පටිපද ඇති දන්ධ අභිඥ වූ අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- දුක් වූ පටිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- දුක් වූ පටිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- සුඛ පටිපද ඇති දන්ධ අභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- සුඛ පටිපද ඇති දන්ධ අභිඥ වූ අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ ප්‍රථම ධ්‍යානය

පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- සුඛ පටිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- සුඛ පටිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි විතර්ක විචාරයන්ගේ සංසිදීමෙන් -පෙ- දෙවන ධ්‍යානයට -පෙ- තෙවන ධ්‍යානයට -පෙ- සතරවන ධ්‍යානයට -පෙ- පළමුවන ධ්‍යානයට -පෙ- දුක් වූ පටිපද ඇති දන්ධ අභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ පස්වන ධ්‍යානය පැමිණ වෙසේ ද, -පෙ- දුක් පටිපද ඇති දන්ධ අභිඥ වූ අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ -පෙ- දුක් පටිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ -පෙ- දුක් පටිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ -පෙ- සුඛ පටිපද ඇති දන්ධ අභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ -පෙ- සුඛ පටිපද ඇති දන්ධ අභිඥ වූ අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ -පෙ- සුඛ පටිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ -පෙ- සුඛ පටිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ පඤ්චම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

## ඉදම්පි අට්ඨක්ඛත්තුකං

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ සුවර්ණ දුර්වර්ණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි කාමයන්ගෙන් වෙන්වමැ -පෙ- ප්‍රථම ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

කවර ධර්මයෝ කුසල්හ යත්? යම්කලෙකැ රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම අරූපයෙහි පරිකර්ම සංඥ රහිත වූයේ අප්‍රමාණ වූ සුවර්ණ දුර්වර්ණ වූ බාහ්‍යවූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දකිමි යි විතර්ක විචාරයන්ගේ සංසිදීමෙන් -පෙ- දෙවන ධ්‍යානයට -පෙ- තෙවන ධ්‍යානයට -පෙ-

සතරවන ධ්‍යානයට -පෙ- පළමුවන ධ්‍යානයට -පෙ- පස්වන ධ්‍යානය පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂේපය වේ -පෙ- මේ ධර්මයෝ කුසලයෝයි.

**[ධම්මසඞ්ගණී ප්‍රකරණ පාළි 97-113 පිටු (බු.ජ)]**

ඒවං අට්ඨසු කසිණේසු රූපාවචරකුසලං නිද්දිසිත්වා, ඉදානි යස්මා සමානේපි ආරම්මණේ භාවනාය අසමානං ඉමේසු අට්ඨසු කසිණේසු අඤ්ඤම්පි අභිභායතනසඞ්ඛාතං රූපාවචරකුසලං පවත්තති, තස්මා තං දස්සේතුං පුන **කතමේ ධම්මා කුසලා**තිආදි ආරද්ධං. තත්ථ **අජ්ඣත්තං අරූපසඤ්ඤී**ති අලාභිතාය වා අනත්ථිකතාය වා අජ්ඣත්තරූපේ පරිකම්මසඤ්ඤාවිරහිතෝ. **බහිද්ධා රූපානි පස්සතී**ති බහිද්ධා අට්ඨසු කසිණේසු කතපරිකම්මතාය පරිකම්මවසේන චේව අප්පනාවසේන ච තානි බහිද්ධා අට්ඨසු කසිණේසු රූපානි පස්සති. **පරිත්තානී**ති අවඩ්ඪිතානි. **තානි අභිභුය්‍යා**ති යථා නාම සම්පන්නගහණිකෝ කටච්ඡුමත්තං භත්තං ලභිත්වා 'කිං ඒත්ථ භුඤ්ජිතබ්බං අත්ථී'ති සඞ්කඩ්ඪිත්වා ඒකකබළමේව කරෝති, ඒවමේව ඤාණුත්තරිකෝ පුග්ගලෝ විසදඤාණෝ 'කිමෙත්ථ පරිත්තකේ ආරම්මණේ සමාපජ්ජිතබ්බං අත්ථි, නායං මම භාරෝ'ති තානි රූපානි අභිභවිත්වා සමාපජ්ජති. සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පනං නිබ්බත්තේතීති අත්ථෝ. **ජානාමි පස්සාමී**ති ඉමිනා පනස්ස පුබ්බභාගෝ කථිතෝ. **ආගමට්ඨකථාසු** පන වුත්තං _ ඉමිනාස්ස පන ආභෝගෝ කථිතෝ. සෝ ච ඛෝ සමාපත්තිතෝ වුට්ඨිතස්ස, න අන්තෝසමාපත්තියන්ති (අ. නි. අට්ඨ. 3.8.65).

**අප්පමාණානී**ති වඩ්ඪිතප්පමාණානි. **අභිභුය්‍යා**ති ඒත්ථ පන යථා මහග්ඝසෝ පුරිසෝ ඒකං භත්තවඩ්ඪිතකං ලභිත්වා 'අඤ්ඤම්පි හෝතු 'කිමේසා මය්හං කරිස්සතී'ති තං න මහන්තතෝ පස්සති, ඒවමේව ඤාණුත්තරෝ පුග්ගලෝ විසදඤ්ඤාණෝ 'කිමෙත්ථ සමාපජ්ජිතබ්බං, න ඉදං අප්පමාණං, න මය්හං චිත්තේකග්ගතාකරණේ භාරෝ අත්ථී'ති තානි අභිභවිත්වා සමාපජ්ජති. සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පනං නිබ්බත්තේතීති අත්ථෝ.

පරිත්තං පරිත්තාරම්මණං අප්පමාණං පරිත්තාරම්මණන්ති ඉධ පරිත්තානීති ආගතත්තා අප්පමාණාරම්මණතා න ගහිතා, පරතෝ අප්පමාණානීති ආගතත්තා පරිත්තාරම්මණතා. **අට්ඨකථායං** පන වුත්තං; 'ඉමස්මිං ඨානේ චත්තාරි චත්තාරි ආරම්මණානි අග්ගහෙත්වා ද්වේ ද්වේව ගහිතානි. කිං කාරණා? චතූසු හි ගහිතේසු දේසනා සෝළසක්ඛත්තුකා හෝති, සත්ථාරා ච හෙට්ඨා සෝළසක්ඛත්තුකා දේසනා කිලඤ්ජම්හි තිලේ පත්ථරන්තේන විය විත්ථාරතෝ කථිතා. තස්ස ඉමස්මිං ඨානේ අට්ඨක්ඛත්තුකං දේසනං කාතුං අජ්ඣාසයෝ. තස්මා ද්වේ ද්වේයේව ගහිතානීති වේදිතබ්බානීති.

**සුවණ්ණදුබ්බණ්ණානී**ති පරිසුද්ධාපරිසුද්ධවණ්ණානි. පරිසුද්ධානි හි නීලාදීනි සුවණ්ණානි, අපරිසුද්ධානි ච දුබ්බණ්ණානීති ඉධ අධිප්පේතානි. **ආගමට්ඨකථාසු** පන 'සුවණ්ණානි වා හොන්තු දුබ්බණ්ණානි වා, පරිත්තඅප්පමාණවසේනේව ඉමානි අභිභායතනානි දේසිතානී'ති (අ. නි. අට්ඨ. 3.8.65) වුත්තං. ඉමේසු පන චතූසු පරිත්තං විතක්කචරිතවසේන ආගතං, අප්පමාණං මෝහචරිතවසේන, සුවණ්ණං දෝසචරිතවසේන, දුබ්බණ්ණං රාගචරිතවසේන. ඒතේසඤ්හි ඒතානි සප්පායානි. සා ච තේසං සප්පායතා විත්ථාරතෝ **විසුද්ධිමග්ගේ** (විසුද්ධි. 1.43) චරියනිද්දේසේ වුත්තා.

කස්මා පන, යථා සුත්තන්තේ "අජ්ඣත්තං රූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති පරිත්තානී"තිආදි (දී. නි. 2.173; ම. නි. 2.249; අ. නි. 8.65) වුත්තං, ඒවං අවත්වා ඉධ චතූසුපි අභිභායතනේසු අජ්ඣත්තං අරූපසඤ්ඤිතාව වුත්තාති? අජ්ඣත්තරූපානං අනභිභවනීයතෝ. තත්ථ වා හි ඉධ වා බහිද්ධාරූපානේව අභිභවිතබ්බානි, තස්මා තානි නියමතෝ වත්තබ්බානීති තත්‍රාපි ඉධාපි වුත්තානි. අජ්ඣත්තං අරූපසඤ්ඤීති ඉදං පන සත්ථු දේසනාවිලාසමත්තමේව. අයං තාව චතූසු අභිභායතනේසු අපුබ්බපදවණ්ණනා. සුද්ධිකනය පටිපදාභේදෝ පනෙත්ථ පථවීකසිණේ වුත්තනයේනේව ඒකේකස්මිං අභිභායතනේ වේදිතබ්බෝ. කේවලඤ්චෙත්ථ ආරම්මණචතුක්කං ආරම්මණදුකං හෝති, සෝළසක්ඛත්තුකඤ්ච අට්ඨක්ඛත්තුකං. සේසං තාදිසමේව. ඒවමෙත්ථ ඒකේකස්මිං අභිභායතනේ ඒකෝ සුද්ධිකනවකෝ, චත්තාරෝ පටිපදානවකා, ද්වේ ආරම්මණනවකා, ආරම්මණපටිපදාමිස්සකේ අට්ඨ නවකාති පන්නරස නවකාති චතූසුපි අභිභායතනේසු සමසට්ඨි නවකා වේදිතබ්බා.

**[ධම්මසඞ්ගණී අට්ඨකථා (ඡට්ඨසඞ්ගායනා අංක 204-245 යටතේ); ධම්මසඞ්ගණී අට්ඨකථා 177-179 පිටු (හේ.වි.මු); තෙසැත්තෑ ඤාණ කථා 31 පිට]**

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි…පෙ…. ලෝහිතකානි ලෝහිතකවණ්ණානි ලෝහිතකනිදස්සනානි ලෝහිතකනිභාසානි…පෙ…. ඕදාතානි ඕදාතවණ්ණානි ඕදාතනිදස්සනානි ඕදාතනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා කුසලා.
ඉමානිපි අභිභායතනානි සෝළසක්ඛත්තුකානි.

**[ධම්මසඞ්ගණී පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 246-247 යටතේ); ධම්මසඞ්ගණී පාළි 112-114 පිටු (බු.ජ)]**

පඤ්චමඅභිභායතනාදීසු **නීලානීති** සබ්බසඞ්ගාහිකවසේන වුත්තං. **නීලවණ්ණානීති** වණ්ණවසේන, **නීලනිදස්සනානීති** නිදස්සනවසේන, අපඤ්ඤායමානවිවරානි, අසම්භින්නවණ්ණානි, ඒකනීලානේව හුත්වා දිස්සන්තීති වුත්තං හෝති. **නීලනිභාසානීති** ඉදං පන ඕභාසනවසේන වුත්තං; නීලෝභාසානි නීලප්පභායුත්තානීති අත්ථෝ. ඒතේන නේසං සුවිසුද්ධතං දස්සේති. සුවිසුද්ධවණ්ණවසේන හි ඉමානි චත්තාරි අභිභායතනානි වුත්තානි. **පීතානීති**ආදීසුපි ඉමිනාව නයේන අත්ථෝ වේදිතබ්බෝ. නීලකසිණං උග්ගණ්හන්තෝ නීලස්මිං නිමිත්තං ගණ්හාති. පුප්ඵස්මිං වා වත්ථස්මිං වා වණ්ණධාතුයා වාතිආදිකං පනෙත්ථ කසිණකරණඤ්ච පරිකම්මඤ්ච අප්පනාවිධානඤ්ච සබ්බං **විසුද්ධිමග්ගේ** (විසුද්ධි. 1.93 ආදයෝ) විත්ථාරතෝ වුත්තමේව. යථා ච පථවීකසිණේ ඒවමෙත්ථ ඒකේකස්මිං අභිභායතනේ පඤ්චවීසති පඤ්චවීසති නවකා වේදිතබ්බා.

**[ධම්මසඞ්ගණී අට්ඨකථා (ඡට්ඨසඞ්ගායනා අංක 246 යටතේ); ධම්මසඞ්ගණී අට්ඨකථා 179 පිට (හේ.වි.මු)]**

**අඤ්ඤම්පීති** කේවලං කසිණායතනසඞ්ඛාතමේව අහුත්වා අභිභායතනසඞ්ඛාතම්පි පවත්තතීති සතිපි අභිභායතනානං කසිණායතනත්තේ කසිණායතනභාවතෝ අඤ්ඤෙදා අභිභායතනභාවෝ කසිණනිමිත්තාභිභවනක භාවනානිමිත්තනානත්තතෝති දස්සේති. තත්ථ අභිභවතීති අභිභූ, පරිකම්මං, ඤාණං වා. අභිභූ ආයතනං ඒතස්සාති **අභිභායතනං,** ඣානං. අභිභවිතබ්බං වා ආරම්මණසඞ්ඛාතං ආයතනං ඒතස්සාති **අභිභායතනං,** ඣානං. ආරම්මණාභිභවනතෝ අභිභූ ච තං ආයතනඤ්ච යෝගිනෝ සුඛවිසේසානං අධිට්ඨානභාවතෝ මනායතනධම්මායතනභාවතෝ චාතිපි සසම්පයුත්තං ඣානං **අභිභායතනං**. මග්ගප්පටිබද්ධතාය තද සමාපත්තිතෝ වුට්ඨිතස්ස ආභෝගෝ පුබ්බභාගභාවනාවසේන ඣානක්ඛණේ පවත්තං අභිභවනාකාරං ගහෙත්වා පවත්තෝ වුත්තෝති දට්ඨබ්බෝ. ආගමේසු පන "අජ්ඣත්තං රූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි. අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි. අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ...පෙ.... පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි. අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානී"ති (දී. නි. 2.173; ම. නි. 2.249; අ. නි. 8.65) ඉමේසං චතුන්නං අභිභායතනානං ආගතත්තා **ආගමට්ඨකථාසු** (දී. නි. අට්ඨ. 2.173; ම. නි. අට්ඨ. 2. 249-250; අ. නි. අට්ඨ. 3.8.65) "වණ්ණවසේන ආභෝගේ විජ්ජමානේපි පරිත්තඅප්පමාණවසේනේව ඉමානි අභිභායතනානි දේසිතානී"ති වුත්තං. පරිත්තඅප්පමාණතා හි අභිභවනස්ස කාරණං වණ්ණාභෝගේ සතිපි අසතිපි. තත්ථ ච වණ්ණාභෝගරහිතානි සහිතානි ච සබ්බානි පරිත්තානි "සුවණ්ණදුබ්බණ්ණානී"ති වුත්තානි, තථා අප්පමාණානීති දට්ඨබ්බානි. අත්ථි හි ඒසෝ පරියායෝ පරිත්තානි අභිභුය්‍ය තානි චේ කදචි වණ්ණවසේන ආභුජිතානි හොන්ති සුවණ්ණදුබ්බණ්ණානි අභිභුය්‍යාති. ඉධ පන නිප්පරියායදේසනත්තා වණ්ණාභෝගරහිතානි විසුං වුත්තානි සහිතානි ච. අත්ථි හි උභයත්ථ අභිභවනවිසේසෝති.

තත්ථ ච පරියායදේසනත්තා විමොක්ඛානම්පි අභිභවනපරියායෝ අත්ථීති "අජ්ඣත්තං රූපසඤ්ඤී"ති අභිභායතනද්වයං වුත්තං, තතියචතුත්ථඅභිභායතනේසු දුතියවිමොක්ඛෝ වණ්ණාභිභායතනේසු තතියවිමොක්ඛෝ ච අභිභවනප්පවත්තිතෝ සඞ්ගහිතෝ, ඉධ පන නිප්පරියායදේසනත්තා විමොක්ඛාභිභායතනානි අසඞ්කරතෝ දස්සේතුං විමොක්ඛේ වජ්ජෙත්වා අභිභායතනානි කථිතානි. සබ්බානි ච විමොක්ඛකිච්චානි විමොක්ඛදේසනාය වුත්තානි, තදේතං **"අජ්ඣත්තං රූපසඤ්ඤී"**ති ආගතස්ස අභිභායතනද්වයස්ස අභිභායතනේසු අවචනතෝ "රූපී රූපානි පස්සතී"තිආදීනඤ්ච සබ්බවිමොක්ඛකිච්චසාධාරණවචනභාවතෝ වවත්ථානං කතන්ති විඤ්ඤායති.

**අජ්ඣත්තරූපානං අනභිභවනීයතෝ**ති ඉදං කත්ථචිපි "අජ්ඣත්තං රූපානි පස්සතී"ති අවත්වා සබ්බත්ථ යං වුත්තං "බහිද්ධා රූපානි පස්සතී"ති, තස්ස කාරණවචනං. තේන යං අඤ්ඤහේතුකං, තං තේන හේතුනා වුත්තං. යං පන දේසනාවිලාසහේතුකං අජ්ඣත්තං අරූපසඤ්ඤිතාය ඒව ඉධ වචනං, න තස්ස අඤ්ඤං කාරණං මග්ගිතබ්බන්ති දස්සේති. අජ්ඣත්තරූපානං අනභිභවනීයතා ච බහිද්ධාරූපානං විය අවිභූතත්තා, දේසනාවිලාසෝ ච යථාවුත්තවවත්ථානවසේන වේදිතබ්බෝ. **සුවණ්ණදුබ්බණ්ණානී**ති ඒතේනේව සිද්ධත්තා නීලාදිඅභිභායතනානි න වත්තබ්බානීති චේ? න, නීලාදීසු කතාධිකාරානං නීලාදිභාවස්සේව අභිභවනකාරණත්තා. න හි තේසං පරිසුද්ධාපරිසුද්ධවණ්ණපරිත්තතා තදප්පමාණතා වා අභිභවනකාරණං, අථ ඛෝ නීලාදිභාවෝ ඒවාති.

පටිභාගනිමිත්තභූතං කසිණාරම්මණසඞ්ඛාතං ආයතනං කාරණං ඒතස්සාති **කසිණායතනං,** ඣානං. අථ වා ආරම්මණස්ස අනවසේසඵරණට්ඨේන කසිණඤ්ච තං ආයතනඤ්ච යෝගිනෝ සුඛවිසේසානං අධිට්ඨානභාවතෝ මනායතනධම්මායතනභාවතෝ චාති සසම්පයුත්තං ඣානං **කසිණායතනං**. තේනේවාහ "සතිපි අභිභායතනානං කසිණායතනත්තේ"ති. භාවනාය නිමිත්තං භාවනානිමිත්තං, ආරම්මණස්ස පරිත්තප්පමාණතා සුවිසුද්ධනීලාදිතා ච, තදේව නානත්තං. භාවනා ඒව වා පුබ්බභාගභූතා භාවනානිමිත්තං, තස්ස නානත්තං භාවනානිමිත්තනානත්තං. පුබ්බභාගභාවනා හි යථාවුත්තවිසේසේ ආරම්මණේ පවත්තිආකාරවිසේසතෝ නානාසභාවාති. කසිණනිමිත්තස්ස අභිභවනක භාවනානිමිත්තනානත්තං **කසිණ ...පෙ.... නානත්තං,** තතෝති යෝජේතබ්බං.

එත්ථ ච පුරිමානි චත්තාරි අභිභායතනානි භූතකසිණාරම්මණානි, භූතකසිණේසු ච යං සුවණ්ණං දුබ්බණ්ණන්ති ච න සක්කා වත්තුං. තත්ථ පවත්තිතානි සබ්බත්ථ වා වණ්ණාභෝගරහිතේන පවත්තිතානි පඨමතතියාභිභායතනානීති දුතියචතුත්ථානි වණ්ණකසිණාරම්මණානි. යදි ඒවං දුතියචතුත්ථේහි පඤ්චමාදීනං කෝ විසේසෝති "පඤ්චමාදීනි වණ්ණතෝ රමණීයතරානි, න තථා ඉතරානී"ති වදන්ති. පුරිමානිපි චත්තාරි අට්ඨ කසිණාරම්මණානේව, තස්මා තං නේසං මතිමත්තං "අට්ඨසු කසිණේසූ"ති වුත්තත්තා. විමොක්ඛේසු ච පඨමදුතියවිමොක්ඛා අට්ඨ කසිණාරම්මණා. තතියෝ වණ්ණකසිණාරම්මණෝ. පඨමදුතියාපි වා වණ්ණකසිණාරම්මණා ඒව "බහිද්ධා නීලකසිණාදිරූපානි ඣානචක්ඛුනා පස්සතී"ති වුත්තත්තා. ආරම්මණමනුඤ්ඤතාය හි තත්ථ අනිග්ගහිතභාවේන තේසං පවත්තීති. ඒවං සන්තේ තතියස්ස ඉතරේහි කෝ විසේසෝති? සුභාකාරාභෝගෝ. තතියෝ ඒව හි සුභන්ති ආභුජනවසේන පවත්තති, න ඉතරේති.

**ඤාණං** අප්පනාපඤ්ඤා. **විජ්ජමානේපීති අපි**-සද්දේන අවිජ්ජමානේපීති දස්සේති. **පරිත්තප්පමාණතා අභිභවනස්ස කාරණං** ඉමේසු චතූසු අභිභායතනේසූති අධිප්පායෝ. නනු ච සබ්බත්ථ **"සුවණ්ණදුබ්බණ්ණානී"**ති වචනතෝ වණ්ණාභෝගසහිතානියේව ගහිතානීති? න ගහිතානීති දස්සෙන්තෝ **"තත්ථ වා"**තිආදිමාහ. **තත්ථාති** ආගමේසු. **තථා අප්පමාණානීති** වණ්ණාභෝගරහිතානි ච සබ්බානි අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානීති අත්ථෝ. යදි ඒවං කථං විසිට්ඨානං වණ්ණාභෝගේන රහිතානං සහිතානඤ්ච ඒකජ්ඣං මනසි කරෝති? න ඒකජ්ඣං, විසුංයේව පන තේසු මනසිකාරෝ. යදි විසුං කථමේකන්ති? පරිත්තභාවසාමඤ්ඤතෝ. යදි ඒවං "සුවණ්ණදුබ්බණ්ණග්ගහණං අතිරිච්ඡතී"ති, නාතිරිච්ඡතීති දස්සෙන්තෝ **"අත්ථි හි ඒසෝ පරියායෝ"**තිආදිමාහ. තත්ථ යදිදං වණ්ණාභෝගජනිතං විසේසං අග්ගහෙත්වා පරිත්තසාමඤ්ඤේන ඒකත්තං නෙත්වා "පරිත්තානි අභිභුය්‍යා"ති වත්වා පුන තදන්තෝගධධම්මප්පභේදං විනෙය්‍යවසේන දස්සේතුං "තානි චේ කදචි වණ්ණවසේන ආභුජිතානි හොන්ති සුවණ්ණදුබ්බණ්ණානි අභිභුය්‍යා"ති වත්තබ්බතාය වණ්ණාභෝගරහිතානි සහිතානි ච විසුං මනසි කත්වා උභයත්ථාපි වණ්ණාභෝගරහිතපරිත්තාභිභවනේ තං සහිතපරිත්තාභිභවනේ ච පරිත්තාභිභවනස්ස සාමඤ්ඤං ගහෙත්වා ඒකන්ති වචනං, ඒසෝ පරියායෝ විජ්ජතීති අයමධිප්පායෝ.

ඒවං සුත්තන්තාභිධම්මපාඨවිසේසතෝ අට්ඨකථාය විරෝධාභාවං දස්සෙත්වා ඉදානි සුත්තන්තාභිධම්මපාඨානං අවිරෝධං අධිප්පායවිභාවනේන දස්සේතුං

**"තත්ථචා"**තිආදිමාහ. ඒවං අභිධම්මේ වණ්ණාභෝගරහිතානි සහිතානි ච විසුං වුත්තානි. සුත්තන්තේ පන "උභයානි ඒකජ්ඣ"න්ති වුත්තං, තං කථං විඤ්ඤායතීති ආහ **"තදේත"**න්තිආදි. තත්ථ **ආගතස්සාති** සුත්තන්තේ ආගතස්ස. තත්ථ හි "අජ්ඣත්තං රූපසඤ්ඤී"ති ආගතං. **අවචනතෝති** අභිධම්මේ අවචනතෝ. යදිපි විමොක්ඛා විසුං දේසිතා, කසිණායතනභාවෝ විය පන අභිභායතනානං විමොක්ඛකිච්චතාපි අත්ථීති අභිභායතනවිමොක්ඛානං ඉධාපි සඞ්කරෝ දුන්නිවාරෝති චෝදනං මනසි කත්වා ආහ **"සබ්බවිමොක්ඛකිච්චසාධාරණවචනභාවතෝ"**ති. තේන යථා අභිභායතනදේසනායං අභිභායතනකිච්චානි නිරවසේසතෝ වුත්තානි, ඒවං විමොක්ඛදේසනායං විමොක්ඛකිච්චානීති ඉධ තේසං අසඞ්කරෝයේවාති දස්සේති.

යේ ච යථාවුත්තං චවත්ථානං න සම්පටිච්ඡන්ති, තේහි සුත්තන්තාභිධම්මපාඨභේදේ අඤ්ඤං කාරණං වත්තබ්බං සියා. කිමෙත්ථ වත්තබ්බං, නනු අට්ඨකථායං "කස්මා පන යථා සුත්තන්තේ"තිආදිං වත්වා "අජ්ඣත්තරූපානං අනභිභවනීයතෝ"ති කාරණං වුත්තන්ති. න තං තස්ස කාරණවචනන්ති දස්සෙන්තෝ **"අජ්ඣත්තරූපාන"**න්තිආදිමාහ. තත්ථ **යන්ති** ඉධ සුත්තන්තේ ච "බහිද්ධා රූපානි පස්සතී"ති (අ. නි. 8.65) වුත්තවචනං සන්ධායාහ. බහිද්ධා රූපානියේව හි අභිභවනීයානීති. **අඤ්ඤහේතුක**න්ති දේසනාවිලාසතෝ අඤ්ඤං අභිභවනීයහේතු ඒතස්සාති අඤ්ඤහේතුකං. අජ්ඣත්තඅරූපසඤ්ඤිතාය ඒව, න සුත්තන්තේ විය අජ්ඣත්තරූපසඤ්ඤිතාය චාති අත්ථෝ. **අවිභූතත්තාති** ඉදං ඤාණුත්තරානං සහ නිමිත්තුප්පාදනේන අප්පනානිබ්බත්තනං ආරම්මණස්ස අභිභවෝ න සුට්ඨු විභූතභාවමන්තරේන සම්භවතීති කත්වා වුත්තං. නනු ච අට්ඨකථායං පාඨද්වයවිසේසස්ස දේසනාවිලාසෝ කාරණභාවේන වුත්තෝති ආහ **"දේසනාවිලාසෝ ච යථාවුත්තවවත්ථානවසේන වේදිතබ්බෝ"**ති. දේසනාවිලාසෝ හි නාම විනෙය්‍යජ්ඣාසයානුරූපං විජ්ජමානස්සේව පරියායස්ස විභාවනං න යස්ස කස්සචීති. තත්ථ ච "පරියායදේසනත්තා"තිආදිනා වුත්තප්පකාරවවත්ථානං දේසනාවිලාසනිබන්ධනමාහ. තථා චේව හි පුරතෝ දේසනාවිලාසෝ විභාවිතෝ.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 204 යටතේ)]**

කසිණවසේන අට්ඨවිධා චේතේ අභිභායතනවසේන පන පච්චේකං අට්ඨවිධා හොන්ති. භගවතා හි; "අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, තානි අභිභුය්‍ය…පෙ…. අප්පමාණානි. තානි අභිභුය්‍ය …පෙ…. පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි…පෙ…. අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි සුවිසුද්ධං නීලං පීතං ලෝහිතං ඕදාත"න්ති (ධ. ස. 211 ආදයෝ)

අට්ඨ අභිභායතනානි දේසිතානි, තානි ච කසිණේස්වේව අභිභවිත්වා සමාපජ්ජනවසේන ඣානුප්පත්තිවිසේසතෝ, අනාරම්මණවිසේසතෝ. තත්ථ හි **අජ්ඣත්තං අරූපසඤ්ඤීති** අලාභිතාය වා අනත්ථිකතාය වා අජ්ඣත්තරූපේ කසිණවසේන පරිකම්මසඤ්ඤාවිරහිතෝව. **බහිද්ධා රූපානි පස්සතීති** බහිද්ධා අට්ඨ කසිණරූපානි පරිකම්මවසේන චේව අප්පනාවසේන ච පස්සති. **පරිත්තානීති** ඛුද්දකපරිමාණානි, තානි අභිභුය්‍ය පස්සන්තෝ ච සම්පන්නගහණිකෝ කටච්ඡුමත්තං භත්තං ලභිත්වා "කිං ඒත්ථ භුඤ්ජිතබ්බං අත්ථී"ති සඞ්කඩ්ඪිත්වා සබ්බං ඒකකබළමේව කරෝති, ඒවමේව ඤාණුත්තරිකෝ "කිමෙත්ථ පරිත්තකේ ආරම්මණේ සමාපජ්ජිතබ්බං අත්ථි, නායං මම භාරෝ"ති තානි අභිභවිත්වා සහ නිමිත්තුප්පාදේනේව අප්පනං නිබ්බත්තේති, තස්මා තං ඣානං "අභිභායතන"න්ති

වුච්චති. **අප්පමාණානීති** මහන්තානි. **තානි අභිභුය්‍යාති** මහග්ඝසෝ ඒකං භත්තපාතිං ලභිත්වා විය ඣදුත්තරෝ අප්පමාණං ලභිත්වා "ඒතං වා හෝතු අඤ්ඤං වා, කිමෙත්ථ සමාපජ්ජිතබ්බ"න්ති අප්පනං නිබ්බත්තේති. **සුවණ්ණදුබ්බණ්ණානීති** පරිසුද්ධාපරිසුද්ධවණ්ණානි. පරිසුද්ධානි හි නීලාදීනි, අපරිසුද්ධානි ච සුවණ්ණදුබ්බණ්ණානීති ඉධ අධිප්පේතානි, ඒතානිපි "සුවණ්ණානි වා හොන්තු දුබ්බණ්ණානි වා, පරිත්තඅප්පමාණවසේනේව අභිභායතනානී"ති **ආගමට්ඨකථාසු** (දී. නි. අට්ඨ. 2.173; ම. නි. අට්ඨ. 2.249; අ. නි. අට්ඨ. 3.8.65) වණ්ණිතානි. වණ්ණාභෝගස්ස හි අත්ථිතාය පුරිමානි අභිභායතනානි වණ්ණාභෝගරහිතසහිතතාය ඒත්ථ කේවලතෝ විසේසසබ්භාවා චතුධා වුත්තානි, නීලාදීනි පන චත්තාරි සුවිසුද්ධවණ්ණවසේන සුඛාරෝහතාය ඣදුත්තරිකෝ අභිභවිත්වා අප්පනං නිබ්බත්තේති, තස්මා ආරම්මණවිසේසාභාවේපි ඣානුප්පත්තිවිසේසතෝ ඉමේසං අට්ඨන්නං අභිභායතනානං වසේන පච්චේකං අට්ඨවිධා හොන්තීති වේදිතබ්බා.

**[අභිධම්මමාතිකා පාළි (ජට්ඨසඞ්ගායනා දසකසිණ මූලවිභාග කථා යටතේ)]**

**"යථාසම්භවං...පෙ.... අනේකවිධ"**න්ති වා වචනේන රූපාවචරජ්ඣානේ සබ්බෝපි ලබ්භමානකභේදෝ සඞ්ගහිතෝති අභිභායතනවිමොක්ඛඣානානි විසුං න වුත්තානි, තානි පන සරූපතෝ ඒවං වේදිතබ්බානි.

තත්ථ ඣදුත්තරස්ස යෝගාවචරස්ස පථවීකසිණාදිආරම්මණං අභිභවිත්වා "න මෙත්ථ අප්පනානිබ්බත්තනේ භාරෝ"ති පටිපන්නස්ස නිමිත්තුප්පත්තිතෝ උද්ධං දුතියතතියවීථියං, චතුත්ථපඤ්චමවීථියං වා පටිලද්ධං ඣානං **අභිභායතනං** නාම. තඤ්හි ආරම්මණං අභිභවතීති අභිභූ, යෝගිනෝ සුඛවිසේසානං අධිට්ඨානතාය, මනායතනධම්මායතනපරියාපන්නතාය වා ආයතනන්ති අභිභායතනං, අභිභවිතබ්බං වා අභිභූ, ආලම්බණං, තං ආයතනමස්සාති අභිභායතනං. අථ වා ආලම්බණාභිභවනතෝයේව අභිභූ, පරිකම්මං, ඤාණං වා, තං ආයතනං කාරණමස්සාති අභිභායතනං. පරිකම්මං, ඤාණං වා ආලම්බණං අභිභවිත්වා පවත්තමානං උපචාරුප්පත්තිතෝ පඤ්චමවීථිමනතික්කමිත්වා අප්පනං නිබ්බත්තේති. පඤ්චමවීථිතෝ පරං නිබ්බත්තං පන අභිභවිතුකාමතාය නිබ්බත්තිතම්පි අභිභායතනං නාම න හෝති. සාමඤ්ඤගතියා පන කසිණායතනමේව හෝති. ඉමමේව හි සීඝතරප්පවත්තිං සන්ධාය **අට්ඨකථායං** "තානි අභිභවිත්වා සමාපජ්ජති, සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පනං නිබ්බත්තේතී"ති (ධ. ස. අට්ඨ. 204) වුත්තං. නනු ච අට්ඨකථායං යථාරුතවසේනේව අත්ථෝ කස්මා න ගය්හති. "සහ නිමිත්තුප්පාදේනේවා"ති (ධ. ස. අට්ඨ. 204) හි වුත්තත්තා නිමිත්තුප්පත්තියා සහුප්පන්නං ඣානමභිභායතනන්ති විඤ්ඤායතීති? නයිදමේවං, නිමිත්තුප්පාදේන සහ අප්පනාය අසම්භවතෝ. නිමිත්තුප්පාදෝති හි ඉධ පටිභාගනිමිත්තස්ස උප්පත්ති තදාරම්මණස්ස වා උපචාරජ්ඣානස්ස, කිං තාව පටිභාගනිමිත්තුප්පත්තියා සහ අප්පනාය නිබ්බත්ති උපචාරජ්ඣානේ අසති තස්සා අසම්භවතෝ, නාපි උපචාරජ්ඣානේන සහ ඒකවීථියං නිබ්බත්ති තස්සා උපචාරභාවනාපබන්ධසේවිතබ්බභාවේන තදා අසම්භවතෝ, තස්මා නාතිචිරායනප්පවත්තිදස්සනත්ථං සමීපිම්හි සමීපකාරියූපචාරේන අට්ඨකථායං තථා වුත්තන්ති වේදිතබ්බං. යදි නිමිත්තුප්පත්තිතෝ නාතිචිරප්පවත්තමභිභායතනං, කථං තස්ස දන්ධාභිඤ්ඤඛිප්පාභිඤ්ඤභේදෝ පාළියං වුත්තෝති? වුච්චතේ; චතුත්ථපඤ්චමජවනවීථියං උප්පන්නං චිරකාලනිබ්බත්තිතාය දන්ධාභිඤ්ඤං, දුතියතතියවීථියං උප්පන්නං තබ්බිපරීතලක්ඛණතාය ඛිප්පාභිඤ්ඤන්ති. කේචි පන "අභිභායතනං නාම වසිභාවප්පත්තමේව, නේතර"න්ති වදන්ති, තං තේසං

මතිමත්තං, වසිභාවප්පත්තියා නිමිත්තුප්පත්තිතෝ දූරතරභාවේන "සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පනං නිබ්බත්තේතී"ති අට්ඨකථාවචනේන සහ විරුජ්ඣනතෝ.

අපිච වසිභාවප්පත්තං ඣානං අභිභවනකාරණනිරපෙක්ඛං වසිභාවබලේනේව සක්කච්චං සමාපජ්ජිතුං න සක්කාති න තං අභිභායතනං නාම හෝති, තස්මා අප්පත්තවසිභාවා පඨමුප්පන්නායේව අභිභායතනන්ති නිට්ඨමෙත්ථ ගන්තබ්බං. යදි ඒවං කථං "අප්පමාණං පරිත්තාරම්මණං, අප්පමාණං අප්පමාණාරම්මණ"න්ති (ධ. ස. 212-213) අභිභායතනදේසනායං වුත්තං. වසිභාවප්පත්තඤ්හි ඣානං අප්පමාණන්ති වුච්චති. ඉදඤ්ච උප්පන්නමත්තතත්තා පරිත්තමේවාති? නායං දෝසෝ. පඨමං අභිභායතනවසේන පටිලද්ධජ්ඣානං පච්ඡා වසිභාවප්පත්තම්පි අභිභායතනනාමමේව ලභතීති වසිභාවප්පත්තමභිභායතනං අප්පමාණං, ඉතරං පරිත්තං.

අථ වා වසිභාවප්පත්තං අප්පමාණන්ති උක්කංසගතිපරිග්ගහවසේන වුච්චති. තං පන යං බලවතරං, තං අප්පමාණන්ති ඉමස්ස අත්ථස්ස උපලක්ඛණං කත්වා වදන්ති. බලවභාවනිබන්ධනං අප්පමාණත්තං. බලවභාවෝ ච පඨමඅප්පනාවාරතෝ පච්ඡිම පච්ඡිම අප්පනාවාරානං බලවතාය අවසිතාපත්තේපි ඣානේ සම්භවතීති බලවන්තං අප්පමාණං, ඉතරං පරිත්තන්ති ඒවං අවසිතාපත්තේපි ඣානේ අප්පමාණාදිභාවෝ වේදිතබ්බෝ. අථ වා අප්පනාය බලවභාවෝ නාම උපචාරස්ස බලවතාය සති හෝති. උපචාරඤ්ච තං බලවං, යං සහසා අප්පනං උප්පාදේතුං සක්කුණෙය්‍ය, තස්මා බිප්පාභිඤ්ඤානං ද්වින්නං අභිභායතනඣානානං උපචාරවීථියා අනන්තරං දුතියවීථියං උප්පන්නං උපචාරජ්ඣානස්ස බලවතාය සයම්පි බලවතරන්ති අප්පමාණං නාම හෝති. දුතියවීථිමතික්කමිත්වා තතියවීථියං උප්පන්නං තදිතරසභාවතාය පරිත්තං. තථා දන්ධාභිඤ්ඤානං චතුත්ථවීථියං උප්පන්නං අප්පමාණං. පඤ්චමවීථියං උප්පන්නං පරිත්තන්ති. අථ වා යත්ථ කත්ථචි අප්පනාවීථියං පඤ්චමං උප්පජ්ජනකඅප්පනාතෝ චතුත්ථං උප්පජ්ජමානාය බලවභාවෝති තං වසේනාපෙත්ථ පරිත්තඅප්පමාණතා වේදිතබ්බා.

තං පනේතං ගණනතෝ අට්ඨවිධං හෝති. යථාහ; "අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, 'තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී'ති ඒවං සඤ්ඤී හෝති. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමි. නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමි. පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි. ලෝහිතානි ලෝහිතවණ්ණානි ලෝහිතනිදස්සනානි ලෝහිතනිභාසානි. ඕදාතානි ඕදාතවණ්ණානි ඕදාතනිදස්සනානි ඕදාතනිභාසානි, 'තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී'ති ඒවං සඤ්ඤී හෝතී"ති (දී. නි. 2.173; 3.338; ම. නි. 2.249; අ. නි. 1.427-434; 8.65).

තත්ථ **අජ්ඣත්තං අරූපසඤ්ඤී**ති අලාභිතාය වා අනත්ථිකතාය වා අජ්ඣත්තේසු කේසාදීසු පරිකම්මඅප්පනාසඤ්ඤාවිරහිතෝ. **බහිද්ධා රූපානි පස්සතී**ති බහිද්ධා අට්ඨසු කසිණේසු, චතූසු භූතකසිණේසු ඒව වා කතපරිකම්මකතාය පරිකම්මවසේන චේව අප්පනාවසේන ච තානි බහිද්ධා අට්ඨ, චත්තාරි වා

කසිණරූපානි පස්සති. **පරිත්තානී**ති අමහන්තානි. **අභිභුය්‍යා**ති යථා මහග්ඝසෝ සම්පන්නගහණිකෝ පුරිසෝ කටච්ඡුමත්තං භත්තං ලභිත්වා “කිං ඒත්ථ භුඤ්ජිතබ්බං භත්තං අත්ථී”ති සඞ්කඩ්ඪිත්වා සබ්බං ඒකකබළමේව කරෝති, ඒවමේව ඤාණුත්තරිකෝ පුග්ගලෝ විසදඤාණෝ “කිං ඒත්ථ පරිත්තකේ ආරම්මණේ සමාපජ්ජිතබ්බං අත්ථි, නායං මම භාරෝ”ති තානි රූපානි පරිකම්මේන, ඤාණේන වා අභිභවිත්වා සමාපජ්ජති. හෙට්ඨා වුත්තනයේන සීඝං අප්පනං නිබ්බත්තේති. **“ජානාමි පස්සාමී”**ති ඉමිනා පනස්ස පුබ්බාභෝගෝ කථිතෝ, තදගමනතෝ ච අන්තෝසමාපත්තියං චිත්තාභිසඞ්ඛාරෝ. ඉතරථා අනේන ආභෝගමත්තේ කථිතේ තේන සාධිතබ්බං ඣානං න වුත්තං හෝති, අභිභායතනදේසනාවායං ඣානවිසයාති. **ආගමට්ඨකථාසු** පන සමාපත්තිතෝ වුට්ඨිතස්ස පුබ්බභාගභාවනාවසේන ඣානක්ඛණේ පවත්තමභිභවනාකාරං ගහෙත්වා පවත්තමාභෝගං සන්ධාය; “ඉමිනා පනස්ස ආභෝගෝ කථිතෝ. සෝ ච ඛෝ සමාපත්තිතෝ වුට්ඨිතස්ස, න අන්තෝසමාපත්තිය”න්ති (දී. නි. අට්ඨ. 2.173; ම. නි. අට්ඨ. 2.249; අ. නි. අට්ඨ. 3.8.65) වුත්තං.

දුතියේ **සුවණ්ණදුබ්බණ්ණානී**ති පරිසුද්ධාපරිසුද්ධවණ්ණානි. පරිසුද්ධානි හි නීලාදීනි සුවණ්ණානි, අපරිසුද්ධානි දුබ්බණ්ණානීති ඉධ අධිප්පේතානි.

තතියේ **අප්පමාණානී**ති වුද්ධිප්පමාණානි විපුලානි බලමණ්ඩලාදීනි. වඩ්ඪනවසේන පනෙත්ථ අප්පමාණතා න ගහිතා කසිණවඩ්ඪනස්ස ඉධ අසම්භවතෝ. කසිණස්ස හි ද්වේ වඩ්ඪනභූමියෝ උපචාරභූමි, අප්පනාභූමි වා. තත්ථ න තාව ඉධ උපචාරභූමියං වඩ්ඪනං සම්භවති. නිමිත්තුප්පත්තියා සමකාලං විය උප්පජ්ජමානේ ඣානේ කුතෝ තස්ස ඕකාසෝති, නාපි අප්පනාභූමියං. වඩ්ඪිතස්ස පඨමුප්පන්නඣානාරම්මණතා න යුජ්ජති, තස්මා සභාවමහන්තානේව ආලම්බණානි ඉධ අප්පමාණානීති අධිප්පේතානි. කේචි පන “වඩ්ඪිතවසේනේව අප්පමාණානීති ගහෙත්වා පඨමං අභිභවනිච්ඡාය අභාවේන වඩ්ඪෙත්වා පච්ඡා අභිභවනිච්ඡාය සති අභිභවනාකාරේන පවත්තෝ තස්මිං අප්පනං නිබ්බත්තේතීති අප්පනං පටිලභිත්වා වඩ්ඪිතනිමිත්තේසු ඉදං අභිභායතනං වුත්ත”න්ති වදන්ති.

චතුත්ථේ **අභිභුය්‍යා**ති අභිභවිත්වා. යථා නාම සම්පන්නගහණිකෝ මහග්ඝසෝ පුරිසෝ ඒකං භත්තවඩ්ඪිතකං ලභිත්වා “‘අඤ්ඤෝපි හෝතු, අඤ්ඤෝපි හෝතූ’ති කිං ඒස මය්හං කරිස්සතී”ති න තං මහන්තතෝ පස්සති, ඒවමේව ඤාණුත්තරෝ විසදඤාණෝ පුග්ගලෝ “‘කිං ඒත්ථ සමාපජ්ජිතබ්බං, නයිදං අප්පමාණ’න්ති මය්හං චිත්තේකග්ගතාකරණේ භාරෝ”ති අභිභවිත්වා සමාපජ්ජති. වුත්තනයේනේව අප්පනං නිබ්බත්තේති.

පඤ්චමේ **නීලානි**...**පෙ**.... **නීලනිභාසානී**ති ඒතානි පරියායනාමානීති තත්ථ **“නීලානී”**ති සබ්බසඞ්ගාහකවසේන වුත්තං. එත්තකේයේව පන වුත්තේ තංයෝගතෝ තබ්බෝහාරේන ගුණයුත්තේපි පසඞ්ගෝ සියාති තන්නිවාරණත්ථං **“නීලවණ්ණානී”**ති වණ්ණවසේන වුත්තං. ඒවම්පි හි බහුබ්බීහිවසේන ගුණෝපි පසඞ්ගෝ හෝතීති **“නීලනිදස්සනානී”**ති නිදස්සනවසේන වුත්තං. නිදස්සිතබ්බඤ්හි නිදස්සනං, චක්ඛුනා දට්ඨබ්බං රූපං. තතෝ සේතාදිනිවාරණත්ථං නීල-සද්දේන සහ සමාසෝ කතෝති අපඤ්ඤායමානවිවරානි අසම්භින්නවණ්ණානි ඒකනීලානේව හුත්වා දිස්සමානානීති වුත්තං හෝති. **“නීලනිභාසානී”**ති ඉදං පන ඕභාසවසේන වුත්තං, නීලෝභාසානි නීලප්පභායුත්තානීති අත්ථෝ. ඒතේන තේසං සුවිසුද්ධතං දස්සේති. **“පීතානී”**තිආදීසුපි ඉමිනාව නයේන අත්ථෝ වේදිතබ්බෝ. අට්ඨසු චේතේසු පුරිමං

අභිභවනාකාරේන වණ්ණාභෝගරහිතානි අට්ඨපි කසිණානි පරිත්තානි ආරම්මණං කත්වා උප්පන්නං සන්ධාය වුත්තං. තතියං තථා අප්පමාණානි. දුතියචතුත්ථානියේව ද්වේ වණ්ණාභෝගසහිතානි ආරබ්භ උප්පන්නං, න පන වණ්ණකසිණවසේන උප්පන්නං තස්ස විසුං වක්ඛමානත්තා.

පඤ්චමාදීනි පන තේසු කතාධිකාරේ සන්ධාය සුවිසුද්ධවණ්ණවසේනේව දේසිතානි. න හි තේසං අභිභවනස්ස පරිත්තතා, අප්පමාණතා වා කාරණං, අථ ඛෝ සුවිසුද්ධනීලාදිභාවෝ. තත්ථ හි තේ කතාධිකාරාති. නනු ච **ආගමට්ඨකථාසු** "සුවණ්ණානි වා හොන්තු දුබ්බණ්ණානි වා, පරිත්තඅප්පමාණවසේනේව ඉමානි අභිභායතනානි දේසිතානී"ති (දී. නි. අට්ඨ. 2.173; ම. නි. අට්ඨ. 2.249; අ. නි. අට්ඨ. 3.8.65) වුත්තන්ති? සච්චං, තං පන ආගමේ අභිභායතනානං අඞ්ඥදථා ආගතත්තා වුත්තං. තත්ථ හි; "අජ්ඣත්තං රූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි, අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානී"ති (දී. නි. 2.173; 3.338; ම. නි. 2.249; අ. නි. 1.427-434; 8.65)

ඒවං චත්තාරියේව අභිභායතනානි ආගතානි, තස්මා **තදට්ඨකථාසු** වණ්ණාභෝගේ විජ්ජමානේ අවිජ්ජමානේපි පරිත්තඅප්පමාණතාවසේනේව ඉමේසං දේසිතභාවෝ වුත්තෝ. පරිත්තඅප්පමාණතා හි ඉමේසු චතූසු අභිභවනස්ස කාරණං වණ්ණාභෝගේ විජ්ජමානේ අවිජ්ජමානේපීති. නනු ච සබ්බත්ථ "සුවණ්ණදුබ්බණ්ණානී"ති වචනතෝ වණ්ණාභෝගසහිතානියේව තත්ථ ගහිතානීති? තං න, වණ්ණාභෝගරහිතානි, සහිතානි ච සබ්බානි පරිත්තානි ඒකතෝ කත්වා "පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානී"ති වුත්තානි, තථා "අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානී"ති. යදි ඒවං කථං විසිට්ඨානං වණ්ණාභෝගරහිතානං, සහිතානඤ්ච ඒකජ්ඣං මනසිකාරෝ, න ඒකජ්ඣං, විසුංයේව තේසං මනසිකාරෝ. යදි ඒවං විසුං කථමේකත්තන්ති? පරිත්තභාවසාමඤ්ඤතෝ. යදි ඒවං සුවණ්ණදුබ්බණ්ණග්ගහණමතිරිච්චති අවසිට්ඨෝති? නාතිරිච්චති පරියායදේසනාභාවතෝ. අත්ථි හි ඒස පරියායෝ, යදිදං වණ්ණාභෝගජනිතාජනිතං විසේසං අග්ගහෙත්වා පරිත්තභාවසාමඤ්ඤේන ඒකත්තං නෙත්වා "පරිත්තානි අභිභුය්‍යා"ති වත්වා පුන තදන්තෝගධමේව පභේදං විනෙය්‍යවසේන දස්සේතුං තානි ච කදචි වණ්ණවසේන ආවජ්ජිතානි හොන්ති, "සුවණ්ණදුබ්බණ්ණානි අභිභුය්‍යා"ති වත්තබ්බතාය වණ්ණාභෝගරහිතානි, සහිතානි ච විසුං මනසි කත්වා උභයත්ථාපි වණ්ණාභෝගරහිතපරිත්තාභිභවනේ, තං සහිතපරිත්තාභිභවනේ ච පරිත්තාභිභවනසාමඤ්ඤං ගහෙත්වා ඒකත්තං කතන්ති. **අභිධම්මේ** පන නිප්පරියායදේසනත්තා වණ්ණාභෝගරහිතානි, සහිතානි ච විසුං වුත්තානි. අත්ථි හි උභයත්ථාභිභවනවිසේසෝති. හෝතු තාව, ඒවං සුත්තාභිධම්මපාඨවිසේසතෝ අට්ඨකථාය පාඨභේදේ පන කෝ අධිප්පායෝති? වුච්චතේ; සුත්තන්තේ හි පඨමවිමොක්ඛං ද්වේධා භින්දිත්වා පඨමදුතියඅභිභායතනානි වුත්තානි, පරියායදේසනත්තා විමොක්ඛානම්පි අභිභවනපරියායෝ විජ්ජතීති "අජ්ඣත්තං රූපසඤ්ඤී"ති අභිභායතනද්වයං වුත්තං.

තතියචතුත්ථඅභිභායතනේසු දුතියවිමොක්ඛෝ, වණ්ණාභිභායතනේසු තතියවිමොක්ඛෝ ච අභිභවනප්පවත්තිතෝ සඞ්ගහිතෝ, ඉධ පන නිප්පරියායදේසනත්තා විමොක්ඛාභිභායතනානි අසඞ්කරතෝ දස්සේතුං විමොක්ඛේ

වජ්ජෙත්වා අභිභායතනානි කථිතානි. සබ්බානි ච විමොක්ඛකිච්චානි විමොක්ඛදෙසනාය වුත්තානි, තදේතං “අජ්ඣත්තං රූපසඤ්ඤී”ති සුත්තේ ආගතස්ස අභිභායතනද්වයස්ස අභිධම්මේ අවචනතෝ “රූපී රූපානි පස්සතී”තිආදීනඤ්ච සබ්බවිමොක්ඛකිච්චසාධාරණවචනභාවතෝ වවත්ථානං කතන්ති විඤ්ඤායති. අවස්සඤ්චේතං ඒව සම්පටිච්ඡිතබ්බං, න සම්පටිච්ඡන්තේහි සුත්තාභිධම්මපාඨභේදේ අඤ්ඤං කාරණං වත්තබ්බං. අථ කිමෙත්ථ වත්තබ්බං, නනු අට්ඨකථායමේව “කස්මා පන යථා සුත්තන්තේ ‘අජ්ඣත්තං රූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති පරිත්තානී’තිආදි වුත්තං, ඒවං අවත්වා ඉධ චතූසුපි අභිභායතනේසු අජ්ඣත්තං අරූපසඤ්ඤිතාව වුත්තා”ති වත්වා “අජ්ඣත්තරූපානං අනභිභවනීයතෝ”ති කාරණං වුත්තන්ති? න තං තස්ස කාරණවචනං, අථ ඛෝ කත්ථචි “අජ්ඣත්තං රූපානි පස්සතී”ති අවත්වා සබ්බත්ථ යං වුත්තං “බහිද්ධා රූපානි පස්සතී”ති, තස්ස ච කාරණවචනං. තේනේව හි තත්ථ වා ඉධ වා “බහිද්ධා රූපානියේව අභිභවිතබ්බානී”ති තත්රේව වුත්තං, අනභිභවනීයතා ච අජ්ඣත්තරූපානං බහිද්ධා රූපානි විය අවිභූතත්තා. න හි සුට්ඨු විභූතභාවමන්තරේන ඤාණුත්තරානං ආරම්මණාභිභවනං සම්භවතීති. නනු ච අට්ඨකථායං පාඨද්වයවිසේසස්ස දේසනාවිලාසෝ කාරණභාවේන වුත්තෝති? සච්චං වුත්තෝ, සෝ ච යථාවුත්තවවත්ථානවසේනේව වේදිතබ්බෝ. දේසනාවිලාසෝ හි නාම විනෙය්‍යජ්ඣාසයානුරූපං විජ්ජමානස්සේව පරියායස්ස විභාවනං, න යස්ස කස්සචීති. ඒවං තාව අභිභායතනං වේදිතබ්බං.

තත්ථ **විමොක්ඛෝති** පටිලද්ධජ්ඣානස්ස ඣානං සමාපජ්ජිතුකාමතාවසප්පවත්තජවනවීථිසමනන්තරමේව පිතුඅඞ්කේ විස්සට්ඨඅඞ්ගපච්චඞ්ගස්ස විය දාරකස්ස ආරම්මණේ නිරාසඞ්කමේව හුත්වා පඨමකප්පනා විය ච ලහුං අවුට්ඨහිත්වා අන්තමසෝ චතුපඤ්චචිත්තක්ඛණතෝ අනෝසක්කිත්වා ආරම්මණේ අභිරතිවසේන පවත්තස්ස වසීභාවප්පත්තස්ස ඣානස්සේතං අධිවචනං. තඤ්හි කසිණායතනවසේන වා අභිභායතනවසේන වා උප්පන්නං පච්චනීකධම්මේහි සුට්ඨු විමුත්තත්තා, ආරම්මණේ අධිමුත්තතාය ච “විමොක්ඛෝ”ති වුච්චති. වුත්තම්පි චේතං **අට්ඨකථායං**; “කේනට්ඨේන පන විමොක්ඛෝ වේදිතබ්බෝති? අධිමුච්චනට්ඨේන. කෝ අයං අධිමුච්චනට්ඨෝ නාම? පච්චනීකධම්මේහි ච සුට්ඨු විමුච්චනට්ඨෝ, ආරම්මණේ ච අභිරතිවසේන සුට්ඨු අධිමුච්චනට්ඨෝ”ති (ධ. ස. අට්ඨ. 248).

යදි වසීභාවප්පත්තමේව විමොක්ඛෝ, කථමස්ස ආරම්මණචතුක්කේ පරිත්තතා **පාළියං** වුත්තා. අවසිතාපත්තඤ්හි ඣානං පරිත්තන්ති වුච්චතීති? නායං දෝසෝ, පරිපුණ්ණවසීභාවප්පත්තං සන්ධාය අපරිපුණ්ණවසීභාවප්පත්තස්ස පරිත්තභාවේන තත්ථ අධිප්පේතත්තා, තස්මා වසීභාවප්පත්තමේව ඣානං විමොක්ඛෝ නාම, න ඉතරං. ඉතරං පන යදි කසිණායතනවසේන උප්පන්නං, කසිණායතනං. අථ අභිභායතනවසේන, අභිභායතනමේවාති. කේචි පන “පඨමඅප්පනාතෝ පච්ඡිමපච්ඡිමාය පටිපක්ඛතෝ සුට්ඨු විමුත්තත්තා කසිණායතනවසේන, අභිභායතනවසේන ච උප්පන්නං පඨමකප්පනං ඨපෙත්වා සේසං විමොක්ඛෝයේවා”ති වදන්ති.

තං පනේතං ගණනතෝ තිවිධං. යථාහ; “රූපී රූපානි පස්සති, අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති, සුභන්තේව අධිමුත්තෝ හෝතී”ති (දී. නි. 2.174; 3.339; පටි. ම. 1.209).

තත්ථ **රූපීති** අජ්ඣත්තං කේසාදීසු උප්පාදිතං රූපජ්ඣානං රූපං, තදස්ස අත්ථීති රූපී. **රූපානි පස්සතීති** බහිද්ධාපි නීලකසිණාදිරූපානි ඣානචක්ඛුනා පස්සති. ඉමිනා අජ්ඣත්තබහිද්ධවත්ථුකේසු කසිණේසු ඣානපටිලාභෝ දස්සිතෝ. **අජ්ඣත්තං අරූපසඤ්ඤීති** අජ්ඣත්තං න රූපසඤ්ඤී, අත්තනෝ කේසාදීසු අනුප්පාදිතරූපාවචරජ්ඣානෝති අත්ථෝ. ඉමිනා බහිද්ධා පරිකම්මං කත්වා බහිද්ධාව පටිලද්ධජ්ඣානතා දස්සිතා. **"සුභ"න්ති** ඉමිනා සුවිසුද්ධේසු නීලාදීසු වණ්ණකසිණේසු ඣානානි දස්සිතානි. තත්ථ කිඤ්චාපි අන්තෝඅප්පනායං "සුභ"න්ති ආභෝගෝ නත්ථි, යෝ පන සුවිසුද්ධං සුභකසිණං ආරම්මණං කත්වා විහරති, සෝ යස්මා "සුභ"න්ති අධිමුච්චනවසේන පඨමජ්ඣානං උපසම්පජ්ජිත්වා විහරති, තථා දුතියාදීනි, තස්මා ඒවං දේසනා කතාති. **පටිසම්භිදාමග්ගේ** පන "ඉධ භික්ඛු මෙත්තාසහගතේන චේතසා ඒකං දිසං ඵරිත්වා විහරතී"තිආදිනා (පටි. ම. 1.212) බ්‍රහ්මවිහාරවසේන සුභවිමොක්ඛෝ වුත්තෝ. **ධම්මසඞ්ගණියං** පන බ්‍රහ්මවිහාරානං විසුංයේව ආගතත්තා තං නයං පටික්ඛිපිත්වා සුනීලකාදිවසේනේව සුභවිමොක්ඛෝ අට්ඨකථායං අනුඤ්ඤාතෝති ඉධාපි තත්ථ වුත්තනයේනේව වවත්ථානං කතන්ති ඒවං තාව විමොක්ඛඣානං වේදිතබ්බං.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 27 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 106-118 පිටු]**

"යථා සම්භවං -පෙ- අනේකවිධං" යන වචනයෙන් රූපාවචර ධ්‍යානයෙහි සියළුම ලැබිය යුතු භේදය සඞ්ග්‍රහ වන ලද්දේයයි අභිභායතන විමෝක්ෂ ධ්‍යානයෝ වෙනම නොකියන ලද්දාහුය. ඔව්හු වනාහි ස්වරූප වශයෙන් මෙසේ දතයුත්තාහුයි. එහි අභිභායතනය යනු පෘථිවිකසිණාදී ප්‍රතිභාග නිමිත්ත මැඩපවත්වා මෙබඳු ආලම්බණයෙහි අර්පණා සඞ්ඛ්‍යාත ධ්‍යාන ඉපදවීමෙහි කුමන බරෙක්දැයි කල්පනා කොට ධ්‍යාන ඉපදවීමෙහි පිළිපදනාවූ ඥාණුත්තරියර යෝගාවචරයාගේ ප්‍රතිභාග නිමිත්තොත්පත්තියෙන් මත්තෙහි දෙවෙනි තුන්වෙනි චිත්තවීථියෙහි හෝ සතරවෙනි පස්වෙනි වීථියේ හෝ ලබන ලද්දවූ ධ්‍යානය අභිභායතන නම් වේ. ඒ ධ්‍යානය වනාහි "ආරම්මණං අභිභවතීති අභිභූ. යෝගිනෝ සුඛවිසේසානං අධිට්ඨානතාය මනායතන ධම්මායතන පරියාපන්නතාය වා ආයතනන්ති අභිභායතනං. අභිභවිතබ්බං වා අභිභූ. ආලම්බණං තං ආයතනමස්සාති අභිභායතනං. අථවා ආලම්බණාභිභවනතෝ යේව අභිභූ. පරිකම්මඤාණං වා තං ආයතනං කාරණමස්සාති අභිභායතනං" යනු විග්‍රහ හෙයින් කසිණාලම්බණය හෙවත් කසිණාලෝකය මහත්කොට නොපතුරුවා මැඩපවත්වන අර්ථයෙන් හෙවත් කසිණාලෝකය උපදනවා හා සමඟම උපදවන්නාවූ ධ්‍යානය අභිභූ නම් වෙයි. යෝගාවචරයාගේ සැප විශේෂයට ආධාරස්ථාන බැවින් හෝ මනායතන ධර්මායතනයන්ට ඇතුළත් බැවින් හෝ ඒ උපදවා ගන්නාලද ධ්‍යානය ආයතනයක් නොහොත් බස්නා තොටක් වැනිනුයි අභිභායතන නම් වෙයි යනු පළමුවැනි විග්‍රහයෙහි අර්ථයි. නොහොත් මැඩපැවැත්විය යුතු අරමුණ අභිභූ නම් වෙයි. ඒ අරමුණම මෝහට හෙවත් මේ ධ්‍යානයාගේ ඉපදීමට ආයතනයක් හෙවත් සඤ්ජාති දේසයක් වේනුයි අභිභායතන නම් වෙයි යනු දෙවෙනි විග්‍රහයෙහි අර්ථයි. නොහොත් ප්‍රතිභාගනිමිති සඞ්ඛ්‍යාත වූ අරමුණ මැඩපවත්වන හෙයින්ම පරිකර්මය හෝ ඥාණය හෝ අභිභූ නම් වෙයි. එය මේ අර්පණා ධ්‍යානයට ආයතන වෙයි හෙවත් කාරණය වෙයි එහෙයින් අභිභායතන නම් වෙයි යනු තෘතීය විග්‍රහයෙහි භාවයයි.

ඒ එසේමැයි පරිකර්මය හෝ ඥාණය හෝ කසිණ ප්‍රතිභාගනිමිති සඞ්ඛ්‍යාත අරමුණ මැඩපවත්වා පවතිනු ලබනුයේ උපචාරෝත්පත්තියෙන් මත්තෙහි පස්වෙනි

චිත්තවීථිය නොයික්මවා අර්පණාව උපදවන්නේ වෙයි. පස්වෙනි චිත්තවීථියෙන් මත්තෙහි උපදවන්නා වූ අර්පණාව වනාහි මැඩපවත්වනු කැමැත්තෙන් උපදවනු ලද්දේ නමුදු අභිභායතන නම් නොවෙයි. සාමාන්‍ය ගතියෙන් වනාහි කසිණායතනයක්ම වෙයි. මෙම අතිශයින් සීඝ්‍රව පැවතීම සඳහා හෙවත් ඉතා යුහුසුලුව අර්පණාව ඉපදවීම සඳහා ධම්මසඞ්ගණී අටුවාවෙහි "තානි අභිභවිත්වා සමාපජ්ජති සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පණං නිබ්බත්තේති" යනු කියනලදී. අටවාවෙහි වනාහි ශබ්දයට සුදුසු පරිද්දෙන්ම කුමක්හෙයින් අර්ථය නොගන්නා ලද්දේ වේද? "සහ නිමිත්තුප්පාදේනේව" යන වචනය කීහෙයින් ප්‍රතිභාගනිමිත්තොත්පත්තිය හා සමග උපන් ධ්‍යානය අභිභායතන යයි හැඟෙන්නේ නොවේද යත්? මේ අර්ථය එසේ නොවෙයි. කුමක්හෙයින යත්? නිමිත්තොත්පාදනය හා සමග අර්පණා නොලැබෙන හෙයිනි. මෙහි නිමිත්තොත්පත්තිය යනු ප්‍රතිභාගනිමිතිහුගේ ඉපදීම වෙයි. ඒ ප්‍රතිභාගනිමිත්ත අරමුණු කොට ඇත්තාවූ උපචාර ධ්‍යානයාගේ ඉපදීම හෝ වෙයි. එහි පළමුකොට ප්‍රතිභාග නිමිත්තොත්පත්තිය හා සමග අර්පණාවගේ ඉපදීම නොලැබෙයි. කුමක්හෙයින යත්? උපචාර ධ්‍යානය නැති කල්හි ඒ අර්පණාව නොලැබෙන හෙයිනි. උපචාර ධ්‍යානය හා සමග එක චිත්තවීථියෙහි අර්පණාව නොද උපදනේ වෙයි. ඒ අර්පණාවගේ උපචාර භාවනා පරම්පරා වශයෙන් එකල්හි නොලැබෙන හෙයිනි. එහෙයින් ඉතා බොහෝකල් නොගොස් පවත්නා බව දක්වනු පිණිස සමීපයෙහි සාමිප්‍යකාර්යෝපචාර වශයෙන් අටුවාවෙහි එසේ කියනලද්දේයයි දතයුතුයි.

ඉදින් නිමිත්තොත්පත්තියෙන් මත්තෙහි බොහෝකල් නොයික්මවාම ධ්‍යානය ලැබීම අභිභායතනයයි කියන්නේ වීනම් ඒ ධ්‍යානයාගේ දන්ධාභිඤ්ඤ ඛිප්පාභිඤ්ඤ ප්‍රභේදය දේශනා පාලියෙහි කුමක්හෙයින් වදරණ ලද්දේද යත්? ඊට පරිහාර කියනුලැබේ; මේ අභිභායතන ක්‍රමයෙහි වනාහි සතරවන පස්වන චිත්තවීථියෙහි උපන් අර්පණා ධ්‍යානය බොහෝකලකින් උපදනා බැවින් දන්ධාභිඤ්ඤ නම් වෙයි. දෙවෙනි තුන්වෙනි වීථියෙහි උපදින ලද්දවූ ධ්‍යානය ඊට විපරීත ලක්ෂණ ඇති බැවින් ඛිප්පාභිඤ්ඤ නම් වෙයි. ඇතැම් ආචාර්යවරයෝ වනාහි පඤ්චවසීතාවෙන් වසඟකරණලද්දවූ ධ්‍යානයම අභිභායතන නම් වෙයි. වසීභූත නොකරන ලද්දවූ ධ්‍යානය අභිභායතන නම් නොවෙයි කියත්. ඒ ඔහුගේ මති මාත්‍රයෙකි; කුමක්හෙයින යත්? වශීභාව ප්‍රාප්තිය නිමිත්තොත්පත්තියෙන් දූරතර බැවින් "සහ නිමිත්තුප්පාදේනේවෙත්ථ අප්පණං නිබ්බත්තේති" යන අටුවා වචනය හා විරුද්ධ වන හෙයිනි.

වැලිත් වශීභාව ප්‍රාප්ත ධ්‍යාන අභිභවන කාරණය නිරපේක්ෂ වෙයි. වසීතා බලයෙන්ම සකස්කොට ධ්‍යානයට සමවැදිය නොහැකි වේනුයි ඒ ධ්‍යානය අභිභායතන නම් නොවෙයි. එහෙයින් නොපැමිණෙන ලද වශීභාවයෙන් පළමුව උපදනාවූ අර්පණාව මෙහි අභිභායතනයයි කියා නිෂ්ටාවට යායුතුයි. ඉදින් මෙසේ වීනම් පරිත්තාලම්බණවූ අප්‍රමාණ ධ්‍යානය අප්‍රමාණාලම්බණවූ අප්‍රමාණ ධ්‍යානයයි අභිභායතන දේශනාවෙහි කෙසේ වදරණ ලද්දේද යත්? ඒ එසේමැයි; වසීතාප්‍රාප්තවූ ධ්‍යානයම අප්‍රමාණයයි ලැබේ. මේ අභිභායතන ධ්‍යානයද උපන් මාත්‍රයක් බැවින් පරිත්ත ධ්‍යානයම වෙයි. එහෙයින් මේ දෝෂයෙක් නොවෙයි. නොහොත් පළමුකොට අභිභායතන වශයෙන් ලබනලද්ද වූ පරිත්තාලම්බණ අප්‍රමාණ ධ්‍යානය පසුභාගයෙහි වශීභාවප්‍රාප්තවූයේ නමුදු අභිභායතන නාමයම ලබයි. එහෙයින් වශීතාප්‍රාප්තවූ අභිභායතන අප්‍රමාණ නම් වෙයි. වශීභාවප්‍රාප්තනුවූ අභිභායතනය පරිත්ත නම් වෙයි. නොහොත් වශීභාවප්‍රාප්ත අභිභායතනය අප්‍රමාණ අභිභායතනය වෙයි යන

මේ වචනය උත්කෘෂ්ට ගතිය ගැණීම් වශයෙන් කියනු ලැබෙයි. ඒ වනාහි යම් ධ්‍යානයක් බලවත් වන්නේ නම් ඒ ධ්‍යානය අප්‍රමාණ නම් වේ යන මේ අර්ථය හඟවනු පිණිස වශීභාවප්‍රාප්ත බව කියන ලද්දේයි. අප්‍රමාණ බව බලවත් බවට කාරණා වෙයි. ඒ බලවත් බවද පළමු පළමු අර්පණා ද්වාරයෙන් පසු පසු අර්පණා ද්වාරයන්ගේ බලවත් බැවින් වශීභාව ප්‍රාප්තනුවූ ධ්‍යානයෙහිද ඒ බලවත් බව සම්භවේනුයි ඒ බලවත්වූ ධ්‍යානය අප්‍රමාණ නම් වෙයි. බලවත්නුවූ ධ්‍යානය පරිත්ත නම් වෙයි; යනු මෙසේ වශීභාවප්‍රාප්තනුවූ ධ්‍යානයෙහිද අප්‍රමාණාදි භාවය දතයුත්තේයි. නොහොත් අර්පණාවගේ බලවත් බව වනාහි උපචාර ධ්‍යානයාගේ බලවත් බව ඇතිකල්හි වෙයි. යම් උපචාර ධ්‍යානයක් වනාහි වහාම අර්පණාව උපදවන්නට හැකිවන්නේද ඒ උපචාර ධ්‍යානය බලවත් නම් වෙයි. එහෙයින් ඛිප්පාභිඤ්ඤද දන්ධාභිඤ්ඤදවූ අභිභායතන ධ්‍යානයන් දෙදෙනාගේ උපචාර වීථියට අනතුරුව දෙවෙනි වීථියෙහි උපන් අර්පණාව උපචාර ධ්‍යානයාගේ බලවත් බැවින් තෙමේත් ඉතා බලවත් වේනුයි අප්‍රමාණ නම් වෙයි. දෙවෙනි වීථිය ඉක්මවා තුන්වෙනි වීථියෙහි උපන් ධ්‍යානය එයින් අන්‍යවූ ස්වභාවක් ඇති හෙයින් පරිත්ත නම් වෙයි. එපරිද්දෙන් දන්ධාභිඤ්ඤදයන්ගේ සතරවැනි වීථියෙහි උපන්නාවූ ධ්‍යානය අප්‍රමාණ නම් වෙයි. පස්වැනි වීථියෙහි උපන් ධ්‍යානය පරිත්ත නම් වෙයි. නොහොත් යම්කිසි අර්පණා වීථියෙක්හි පස්වෙනුව උපදනා අර්පණාව කෙරෙන් සතරවෙනුව උපදිනු ලබන්නාවූ අර්පණාවගේ බලවත් බව වේනුයි ඔවුන්ගේ වශයෙනුදු මෙහි පරිත්ත අප්පමාණ භාවය දතයුත්තේයි. ඒ අභිභායතනය වනාහි ගණන් වශයෙන් අට වැදෑරුම් වෙයි. එහෙයින් වදළහ:—

"අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති ඒවං සඤ්ඤී හෝති. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමි. නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමි. පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි. ලෝහිතානි ලෝහිතවණ්ණානි ලෝහිතනිදස්සනානි ලෝහිතනිභාසානි. ඔදතානි ඔදතවණ්ණානි ඔදතනිදස්සනානි ඔදතනිභාසානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති ඒවං සඤ්ඤී හෝති " යි.

එහි "අජ්ඣත්තං අරූපසඤ්ඤී" යනු නොලැබුනු බැවින් හෝ නොකැමැති බැවින් හෝ ආධ්‍යාත්ම කේසාදියෙහි පරිකර්ම සංඥ අර්පණා සංඥ විරහිත වූයේය යනු අර්ථයි. "බහිද්ධා රූපානි පස්සති" යනු බාහිර වූ අට කසිණයෙහි හෝ සතර භූත කසිණයෙහිම හෝ පරිකර්ම වශයෙන් හා අර්පණා වශයෙන් ඒ අට කසිණ රූපයන් හා සතර භූතකසිණ රූපයන් දක්නේය යන අර්ථයි. "පරිත්තානි" යනු මහත්නුවූ යන අර්ථයි. "අභිභුය්‍ය" යනු යම්සේ සම්පූර්ව කුක්ෂියක් ඇති බොහෝ කනු කැමැතිවූ පුරුෂයෙක් තෙමේ සැන්දක් පමණ බතක් ලැබ මෙහි වැලඳිය යුතු කුමක් ඇද්දැයි සිතා හකුළුවාගෙණ එකපිඩක්ම කෙරේද එපරිද්දෙන්ම ඥණයෙන් උත්තරීතරවූ විශද ප්‍රඥ සම්පන්නවූ පුද්ගලතෙමේ මේ පරිත්තාලම්බණයෙහි සමවැද්ද යුතු කුමක් ඇත්තේද මේ මට බරඇරුම් නොවෙයි සිතා ඒ උපන්නාවූ කසිණ රූපයන් පරිකර්මයෙන් ඥණයෙන් හෝ මැඩපවත්වා සමවදනේයි හෙවත් යට කියනලද ක්‍රමයෙන් ප්‍රතිභාග නිමිත්ත ඉපදීම හා සමඟම අර්පණාව උපදවන්නේය යන අර්ථයි.

"ජානාමි පස්සාමි" යන මෙයින් ඒ ධ්‍යානයාගේ පූර්වාභෝගය කියන ලද්දේය. සමාපත්ති අභ්‍යන්තරයෙහි චිත්තාභිසංස්කාරයද ඒ පූර්වාභෝගයාගේ ආගමන වශයෙන්ම වෙයි. එසේ නොගෙන මෙයින් ආභෝග මාත්‍රයක් කීකල්හි එයින් සිද්ධ කටයුතු වූ ධ්‍යානය නොකීන ලද්දේ වෙයි. මේ අභිභායතන දේශනාවද ධ්‍යානය විෂය කොට ඇත්තේයි.

ආගමාර්ථ කථාවන්හි වනාහි "සමවතින් නැගගහුගේ පූර්වභාග භාවනා වශයෙන් ධ්‍යාන ක්‍ෂණයෙහි පැවති අභිභවනාකාරය ගෙන පැවති ආභෝගය සඳහා මෙයින් ඔහුගේ ආභෝගය කියන ලද්දේ යනුද; හේද වනාහි සමවතින් නැගහුගේ වෙයි සමාපත්ති අභ්‍යන්තරයෙහි නොවේයයිද කියනලද්දේය.

දෙවෙනි අභිභායතනයෙහි "සුවණ්ණදුබ්බණ්ණානි" යනු පරිසිදු අපිරිසුදු වර්ණ ඇත්තාවූ යන අර්ථයි. ඒ එසේමැයි; පිරිසිදුවූ නීලාදිය සුවර්ණ නම් වෙත්. අපිරිසිදු නීලාදිය දුවර්ණ නම් වෙතියි; මෙහි අභිප්‍රාය කරණලද්දහුය. "අප්පමාණානි" යනු වඩනලද ප්‍රමාණ ඇත්තාවූ හෙවත් මහත්වූ යන අර්ථයි. කලවිටමඬුලු ආදිය වැඩීම් වශයෙන් වනාහි මෙහි අප්‍රමාණ බව නොගන්නා ලද්දීය. කුමක්හෙයින යත්? කසිණාලෝකය වැඩීමක් මෙහි නැති හෙයිනි. ඒ එසේමැයි; කසිණවඩ්ඪණ භූමීහු උපචාර භූමිය අර්පණා භූමි යයි කියා දෙදෙනෙක් වෙති. ඔවුන් අතුරෙන් මේ අභිභායතන ක්‍රමයෙහි පළමුකොට උපචාර භූමියෙහි කසිණාලෝකය වැඩීමක් නොලැබෙයි. ප්‍රතිභාග නිමිත්තොත්පත්තියට සමකාලිකව මෙන් උපදිනු ලබන ධ්‍යානයෙහි ඒ ප්‍රතිභාගනිමිත්ත සඞ්ඛ්‍යාත කසිණාලෝකයාගේ වැඩීමට අවකාශයක් කොහින් ලැබේද; නොලැබේ මැයි. අර්පණා භූමියෙහි වැඩීමක්ද නොදලැබෙයි. ඔහුගේ ප්‍රථමොත්පන්න ධ්‍යානයට අරමුණු බව යෙදෙයි. එහෙයින් ස්වභාවයෙන් මහත්වූම ආලම්බණයෝ මෙහි අප්‍රමාණාලම්බණයෝ යයි අභිප්‍රාය කරණ ලද්දහුය.

ඇතැම් ආචාර්‍ය්‍යයෝ වනාහි කසිණාලෝකය වඩනු ලැබීම් වශයෙන්ම අප්‍රමාණාලම්බණයෝ නම් වෙතියි ගෙන පළමුකොට මැඩපවත්වනු කැමැත්ත නැතිබැවින් කසිණාලෝකය වඩා; පසුව මැඩපවත්වනු කැමැත්ත ඇතිකල්හි අභිභවනාකාරයෙන් පැවතියේ එහි අර්පණාව උපදවයි. මෙසේ අර්පණාව ලැබ වඩනලද නිමිත්තෙහි මේ අභිභායතනය කියන ලද්දේයයි කියත්.

"අභිභුය්‍ය" යනු මැඩපවත්වා යන අර්ථයි. යම්සේ බොහෝ කනු කැමතිවූ සම්පූර්ණ ග්‍රහණියක් හෙවත් කුක්ෂියක් ඇත්තාවූ පුරුෂයෙක් තෙමේ එක් වේලකට කෑ යුතු බතින් කොටසක් බෙද දෙනලද බත් වස්නක් ලැබ අනිකුදු අනිකුදු බතක් ලැබේවා මේ ස්වල්පවූ බත මට කුමක් කරන්නේදැයි ඒ බත ස්වල්ප වශයෙන් දක්නේද එපරිද්දෙන්ම ඥානුත්තරික වූ නිර්මල ඥානයෙන් යුත්තවූ පුද්ගල තෙමේ මහත්වූ ප්‍රතිභාග නිමිත්ත උපදවා මෙහි සමවැදිය යුතු කුමක් ඇත්තේද; මේ නිමිත්ත අප්‍රමාණ නොවෙයි මාගේ සිත එකග කිරීමෙහි බර ඇරුම් බවෙක් නැත්තේයයි ඒ පරිකර්ම ප්‍රතිභාගනිමිති මැඩපවත්වා ධ්‍යානයට සමවදනේය. යට කියනලද ක්‍රමයෙන් අර්පණාව උපදවයි යන අර්ථයි.

පස්වෙනි අභිභායතනයෙහි "නීල නීලවණ්ණ නීලනිදස්සන නීලනිභාස" යන මොහු පර්‍ය්‍යාය නාමයෝ වෙත්. එහි "නීලානි" යනු සර්වසඞ්ග්‍රාහික වශයෙන් කියන ලද්දේයි. මෙපමණක්ම කියනලද කල්හි ඒ නීලගුණයෝගය ඇති හෙයින් තද්ව්‍යවහාරයෙන් ගුණයුත්තයා කෙරෙහිද ප්‍රසඞ්ගය වන්නේයයි ඒ වළකනු පිණිස

"නීලවණ්ණානි" යි වර්ණ වශයෙන් කියනලදී. එසේ ඇතිකල්හිදු බහුබ්‍රීහිසමාස වශයෙන් ගුණිහුගේ ද හෙවත් නීලගුණ ඇත්තහුගේ ද ප්‍රසඞ්ගය වේනුයි ඒ වළකනු පිණිස "නීලනිදස්සනානි" යි නිදස්සන වශයෙන් කියනලදී. ඒ එසේමැයි; නිස්සේසයෙන් දැක්ක යුත්ත නිදස්සන නම් වේ. චක්ෂුර්විඥනයෙන් දැක්ක යුතු ස්වරූපයයි. එහෙයින් ස්වෙතාදිය වළකනු පිණිස නීල ශබ්දය හා සමඟ සමාස කරණ ලද්දේනුයි නොපෙණෙනු ලබන විවර ඇති අසම්භින්න වර්ණ ඇති නොහොත් එකම නීල වර්ණයක්ව පැණෙන්නාවූ කසිණ රූපයෝයයි කියන ලද්දේ වේ. "නීලනිභාසානි" යනමෙය ඕභාස වශයෙන් කියනලදී. නීල ප්‍රභාවෙන් යුක්තවූ යන අර්ථයි. මෙයින් ඔවුන්ගේ ඉතා පිරිසිදුබව දක්වයි. "පීතානි" යනාදියෙහිදු මෙම ක්‍රමයෙන් අර්ථ දතයුතුයි.෴

මේ අෂ්ට අභිභායතනයන් අතුරෙන් පළමුවැනි අභිභායතනය වර්ණාභෝග රහිතවූ ස්වල්පවූ අෂ්ට කසිණ රූපයන් අභිභවනාකාරයෙන් අරමුණු කොට උපන් ධ්‍යානය සඳහා කියනලදී. තුන්වෙනි අභිභායතනය එසේම අප්‍රමාණවූ කසිණ රූපයන් අභිභවනාකාරයෙන් අරමුණු කොට උපන් ධ්‍යානය සඳහා කියනලදී. දෙවෙනි සතරවෙනි අභිභායතනයෝ දෙදෙන වනාහි වර්ණාභෝග සහිතවූ එම කසිණ රූපයන් අරභයා උපන් ධ්‍යානය සඳහා කියනලද්දහ. වර්ණකසිණ වශයෙන් උපන් ධ්‍යානය සඳහා නොවෙත්. කුමක්හෙයින යත්? ඒ වර්ණකසිණය වෙනම වක්ෂ්‍යමාන හෙයිනි. පස්වෙනි අභිභායතනය ආදී අභිභායතන ධ්‍යානයෝ වනාහි එහි කෘත්‍යාධිකාරයන් සඳහා අති විසුද්ධ වර්ණ වශයෙන්ම දේශනා කරණ ලද්දහුය. ඔහුන්ගේ අභිභවනයට ස්වල්ප බව හෝ අප්‍රමාණ බව හෝ කාරණා නොවෙයි. වැලි සුපරිශුද්ධ නීලාදී භාවයම කාරණා වෙයි. ඒ එසේමැයි; එහි ඔව්හු කෘත්‍යාධිකාරයම කාරණ කොට ඇත්තාහු වෙත්.෴

ආගමාර්ථකථාවන්හි යහපත් වර්ණ ඇත්තාහු හෝ වෙත්වා දුර්වර්ණවූවාහු හෝ වෙත්වා පරිත්ත අප්පමාණ වශයෙන්ම මේ අභිභායතනයෝ දේශනාකරණ ලද්දහුයයි කියන ලද්දේ නොවේද යත්? ඒ සැබව; ඒ වනාහි ආගමයෙහි අභිභායතනය අන්පරිද්දෙකින් ආහෙයින් කියන ලද්දේය. ඒ එසේමැයි; එහි "අජ්ඣත්තං රූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි අජ්ඣත්තං අරූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි" යි.෴

මෙසේ සතර අභිභායතන කෙනෙක්ම දේශනා කරණ ලද්දහුය. එහෙයින් තදර්ථකථාවන්හි වර්ණාභෝගය විද්‍යමාන වූයේද නොවූයේ ද පරිත්ත අප්පමාණතා වශයෙන්ම මේ අභිභායතනයන් දේශනාකරණලද බව කියනලද්දේය. ඒ එසේමය; මේ සතර අභිභායතනයෙහි වර්ණාභෝගය විද්‍යමානවූයේද අවිද්‍යමානවූයේද පරිත්ත අප්පමාණත්වය අභිභවනයට කාරණා වෙයි. තවද හැමතන්හි "සුවණ්ණදුබ්බණ්ණානි" යි වදළ හෙයින් එහි වර්ණාභෝග සහිතවූම ආලම්බණයෝ ගන්නා ලද්දවූ නොවේද යත්? ඒ එසේ නොවෙයි; වර්ණාභෝග රහිතවූද සහිතවූද සියළු පරිත්තාලම්බණයන් එක්කොට "පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි" යි කියන ලද්දහුය. ඉදින් එසේවී නම් විශිෂ්ටවූ වර්ණාභෝග රහිතවූද සහිතවූද ආලම්බණයන් එක්කොට මෙනෙහිකිරීම කෙසේ වේද යත්? එක්කොට මෙනෙහි කිරීමක් නොවෙයි. වෙන්වම ඔහුගේ මෙනෙහි කිරීම වෙයි. ඉදින් වෙනම මෙනෙහි කිරීමක් වේනම්; ඒකත්වය කෙසේ වේද යත්? පරිත්තභාව සාමාන්‍ය

හෙයිනි. ඉදින් එසේ වීනම් "සුවණ්ණදුබ්බණ්ණ" ග්‍රහණය ඉතිරි නොවේද යත්? ඉතිරි නොවේමැයි. කුමක්හෙයින යත්? පර්‍ය්‍යාය දේශනාවක් බැවිනි. ඒ එසේමැයි; වර්ණාභෝග ජනිත විශේෂය නොගෙණ පරිත්තසාමාන්‍ය හෙයින් ඒකත්වය ගෙණ "පරිත්තානි අභිභුය්‍ය" යී වදරා නැවත ඊට ඇතුලත්වූ ධර්ම ප්‍රභේදය වෛනෙය ජනයාගේ වශයෙන් දක්වනු පිණිස ඔව්හු කිසිකලෙක්හි වර්ණ වශයෙන් ආවර්ජනා කරණ ලද්දහු වෙද්ද එකල්හි "සුවණ්ණදුබ්බණ්ණානි අභිභුය්‍ය" යී කියයුතු බැවින් වර්ණාභෝග රහිතවූද සහිතවූද ආලම්බණයන් වෙනම මෙනෙහි කොට වර්ණාභෝග රහිත පරිත්තාභිභවනයෙහිද ඒ වර්ණාභෝග සහිත පරිත්තාභිභවනයෙහි දැයි යන දෙතන්හිම පරිත්තාභිභවන සාමාන්‍ය ගෙණ යම් ඒකත්වයක් කරණ ලද්දේද එබඳු පර්‍ය්‍යායක් ඇත්තේය.෴

අභිධර්මය වනාහි නිෂ්පර්‍ය්‍යාය දේශනාවක් බැවින් වර්ණාභෝග රහිතවූද සහිතවූද ආලම්බණයෝ වෙනම කියන ලද්දහුය. යම්හෙයකින් වර්ණාභෝග රහිතවූද සහිතවූ දැයි යන දෙතන්හිම අභිභවන විශේෂයක් ඇත්තේද එහෙයින් වෙනම කියන ලද්දහුය. ඒ එසේවේවා; සූත්‍රාභිධර්මපාඨ විශේෂයට වඩා අර්ථකථා පාඨයාගේ විශේෂය හෙවත් විරුද්ධ බව වන්නේය. එතකුදුවුවත් සූත්‍රාභිධර්ම පාඨ භේදයෙහි වනාහි අභිප්‍රාය කවරේද යත්? ඊට පරිහාර කියනු ලැබේ; සූත්‍රාන්තයෙහිද පළමුවෙනි විමෝක්ෂය දෙකක් කොට බෙද පර්‍ය්‍යාය දේශනාවක් බැවින් විමෝක්ෂයන්ගේද අභිභවන පර්‍ය්‍යාය ඇත්තේනුයි "අජ්ඣත්තං රූපසඤ්ඤී" යනුවෙන් පළවෙනි දෙවෙනි අභිභායතනයෝ කියනලද්දහුය. තුන්වෙනි සතරවෙනි අභිභායතනයන්හි දෙවෙනි විමෝක්ෂයද වර්ණාභිභායතනයන්හි තුන්වෙනි විමෝක්ෂයද අභිභවන ප්‍රවෘත්ති වශයෙන් සඞ්ග්‍රහ වන ලද්දේය. මෙහි වනාහි නිෂ්පර්‍ය්‍යාය දේශනාව බැවින් විමෝක්ෂාභිභායතනයන් අසඞ්කර වශයෙන් හෙවත් මිශ්‍ර නොවීම් වශයෙන් දක්වනු පිණිස විමෝක්ෂයන් හැර අභිභායතනයෝ කියන ලද්දහුය. සියළු විමෝක්ෂ කෘත්‍යයෝ ද විමෝක්ෂ දේශනාවෙහි වදරණ ලද්දහුය. ඒ අසඞ්කර ව්‍යවස්ථානය නොහොත් පර්‍ය්‍යාය නිෂ්පර්‍ය්‍යාය සඞ්ඛ්‍යාත ව්‍යවස්ථානය කෙසේ හැඟේද යත්? "අජ්ඣත්තං අරූපසඤ්ඤී" යනාදීන් සූත්‍රයෙහි ආවාවූ අභිභායතන ද්වය අභිධර්මයෙහි අභිභායතනයන්හි නොවදළ හෙයින්ද "රූපී රූපානි පස්සති" යනාදීන්ගේ සියළු විමෝක්ෂ කෘත්‍යය සාධාරණ වශයෙන් වදළ හෙයින්ද හැඟේ. අවශ්‍යයෙන්ම මෙය මෙසේ පිළිගතයුතුයි. නොපිළිගන්නවුන් විසින් සූත්‍රාභිධර්ම පාඨභේදයෙහි අනික් කරුණක් කියයුතු වන්නේය. වැලි කුමක් කියයුතු වන්නේද යත්? අර්ථකථාවෙහිම "කස්මා පන යථා සුත්තන්තේ අජ්ඣත්තං රූපසඤ්ඤී ඒකෝ බහිද්ධා රූපානි පස්සති පරිත්තානීති ආදි වුත්තං. ඒවං අවත්වා ඉධ චතුසුපි අභිභායතනේසු අජ්ඣත්තං අරූපසඤ්ඤී තාව වුත්තාති" යී කියා "අජ්ඣත්තරූපානං අනභිභවනීයතෝ" යී කාරණය කියන ලද්දේ නොවේද යත්? එය ඊට කාරණ වචනයක් නොවෙයි. එතකුදුවුවත් "අජ්ඣත්තරූපානං අනභිභවනීයතෝ" යන මේ වචනය කිසි තැනෙක්හි "අජ්ඣත්තං රූපානි පස්සති" යී නොකියා සූත්‍රාන්ත අභිධර්ම යන සියළුතන්හි "බහිද්ධා රූපානි පස්සති" යන යම් වචනයක් කියන ලද්දේද ඒ වචනයාගේ කාරණ වචනය වෙයි. එහෙයින්ම ඒ "අජ්ඣත්තං රූපානි පස්සති" යන වචනය හැමතන්හිම නොගන්නා ලද්දේය. බාහිරවූ රූපයෝම මැඩපැවැත්විය යුත්තාහුනුයි එහිම කියන ලද්දේය. කුමක්හෙයින යත්? ආධ්‍යාත්ම රූපයන්ගේ අනභිභවනීයත්වයද බාහිර රූපයන්ගේ මෙන් අප්‍රකට හෙයිනි. ඤාණුත්තරිකයන්ගේ ආරම්මණාභිභවනය හැර මොනවට ප්‍රකට බව සම්භව නොවෙයි. අර්ථකථාවෙහි පාඨද්වයගේ විශේෂයට දේශනා විලාසය කාරණ භාවයෙන් කියන ලද්දේ නොවේද යත්? සැබව කියන ලද්දේය. ඒ දේශනා විලාසයද යට කියනලද

ව්‍යවස්ථාන වශයෙන්ම දතයුත්තේය. ඒ එසේමැයි; දේශනා විලාසය නම් විනෙයාධ්‍යාශයට සුදුසු පරිද්දෙන් විද්‍යමානවූම පර්යායගේ ප්‍රකාශ කිරීම වෙයි. යම්කිසිවක්හුගේ ප්‍රකාශ කිරීම නොවෙයි. මෙසේ පළමුකොට අභිභායතනය දතයුත්තේය.

එහි විමෝක්ෂය යනු ලබනලද ධ්‍යාන ඇත්තාවූ පුද්ගලයාගේ ඒ ධ්‍යානයට සමවදිනු කැමැත්ත වශයෙන් හෙවත් මම ඉතින් ධ්‍යානයට සමවදීමැයි උපදනා ලද්දවූ කාමාවචර කුසල-ක්‍රියා ජවන වීථියට අනතුරුවම පියාගේ ඇකයෙහි කැමැති පරිද්දෙන් අත්පා දිගුකොට සයනය කරන්නාවූ ළදරුවෙකු මෙන් ප්‍රතිභාග නිමිත්තාලම්බණයෙහි සැකයක් නැතිවම පළමුවන අර්පණා වීථියෙහි මෙන් වහා නොනැගිට යටත්පිරිසෙයින් සතරපස් චිත්තක්ෂණයකින් පසුබට නොවී අරමුණෙහි කැමැති පරිද්දෙන් පවත්නාවූ පඤ්ච වසීතාවෙන් පුරුදුකරණ ලද්දවූ ධ්‍යානයට මේ නමෙකි. ඒ ධ්‍යානය වනාහි කසිණායතන වශයෙන් හෝ උපදිනලද සතුරුවූ පඤ්චනීවරණ ධර්මයන් කෙරෙන් මොනවට මිදුණු හෙයින්ද අරමුණෙහි අධිමුක්ති සඞ්ඛ්‍යාත අදහස ඇති හෙයින් ද විමෝක්ෂයයි කියනු ලැබේ. එහෙයින් කියනලදී අභිධම්ම අටුවාවෙහි:—

"කේනට්ඨේන පන විමොක්ඛෝ වේදිතබ්බෝති? අධිමුච්චනට්ඨේන. කෝ අයං අධිමුච්චනට්ඨෝ නාම? පච්චනීකධම්මේහි ච සුට්ඨු විමුච්චනට්ඨෝ. ආරම්මණෝ ච අභිරතිවසේන සුට්ඨු අධිමුච්චනට්ඨෝ" යි.

ඉදින් වශීභාව ප්‍රාප්ත ධ්‍යානයම විමෝක්ෂය වේ නම් ආරම්මණ චතුෂ්කයෙහි ඒ ධ්‍යානයාගේ පරිත්තාලම්බණ බව පාලියෙහි කෙසේ කියන ලද්දේද යත්? ඒ එසේමැයි; වසීතාවට නොපැමිණි ධ්‍යානය පරිත්තයි කියනු ලැබෙයි. මේ වනාහි දෝෂයක් නොවෙයි. පරිපූර්ණ වශීභාවප්‍රාප්ත ධ්‍යානය සඳහා අපරිපූර්ණ වශීභාවප්‍රාප්ත ධ්‍යානයාගේ පරිත්තාලම්බණ භාවයෙන් එහි අභිප්‍රාය කරණලද හෙයින් කියන ලද්දේය. එහෙයින් වශීභාවප්‍රාප්තවූ ධ්‍යානයම විමෝක්ෂ නම් වෙයි. එයින් අන්‍යවූ හෙවත් වශීභාවප්‍රාප්තවූ ධ්‍යානය විමෝක්ෂ නම් නොවෙයි. ඉදින් කසිණායතන වශයෙන් උපන්නේ නම් එය කසිණායතන ධ්‍යානයම වෙයි. අභිභායතන වශයෙන් උපන්නේ නම් එය අභිභායතන ධ්‍යානයම වෙයි දතයුතුයි. ඇතැම් ආචාර්යවරයෝ වනාහි පළමුවෙනි අර්පණාවෙන් පසුව උපදනා අර්පණාව කරණකොටගෙන නීවර්ණ ධර්මයන්ගෙන් මොනවට මිදුණු හෙයින් කසිණායතන වශයෙන් හෝ අභිභායතන වශයෙන් හෝ උපදින ලද්දවූ පළමුවන අර්පණාව හැර අවශේෂ ධ්‍යානය විමෝක්ෂයම වේයයි ව්‍යවහාර කෙරෙත්. ඒ විමෝක්ෂය වනාහි තුන්වැදෑරුම් වෙයි. එහෙයින් වදළහ:—

"රූපී රූපානි පස්සති. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති. සුභන්තේව අධිමුත්තෝ හෝති"යි.

එහි "රූපී" යනු අධ්‍යාත්මයෙහිවූ හිසකේ ආදී නීල කසිණාදියෙහි පිරියම් භාවනා කොට උපදවා ගන්නාලද රූප ධ්‍යානය රූප නම් වෙයි. "තදස්ස අත්ථීති රූපී" යනු වාක්‍ය හෙයින් ඒ රූප ධ්‍යානය මෝහට ඇත්තේනුයි ඒ යෝගාවචර පුද්ගල තෙමේ රූපී නම් වෙයි. "රූපානි පස්සති" යනු බාහිරවූද නීල කසිණාදී රූපයන් ධ්‍යාන නැමති ඇසින් දක්නේය යන අර්ථයි. මෙයින් ආධ්‍යාත්ම බාහිර වස්තුක කසිණයන්හි ධ්‍යාන ප්‍රතිලාභය දක්වන ලද්දේයි. "අජ්ඣත්තං අරූපසඤ්ඤී" යනු තමාගේ කේසාදි

නීල කසිණාදියෙහි නොඋපදවනලද රූපාවචර ධ්‍යානලාභී පුද්ගල තෙමේය යන අර්ථයි. මෙයින් බාහිරවූ නීලාදියෙහි පිරියම් භාවනා කොට බාහිරවූම කසිණ ප්‍රතිභාග නිමිත්තෙහි ලබනලද ධ්‍යානය ඇති බව දක්වන ලද්දීය.

"සුභං" යන මෙහි ඉතා පිරිසිදුවූ නීලාදී වර්ණ කසිණයන්හි උපදවා ගන්නාලද ධ්‍යානයෝ දක්වන ලද්දහුය. එහි අර්පණා ඇතුළත සුභයයි මදකුදු ආභෝගයක් නැත්තේය. යමෙක් තෙමේ වනාහි ඉතා පිරිසිදුවූ සුභකසිණය අරමුණු කොට වාසය කෙරේද හෙතෙම් යම් හෙයකින් සුභයයි අධිමුක්ති වශයෙන් ප්‍රථම ධ්‍යානය උපදවා වාසය කෙරේද එසේම ද්විතීය ධ්‍යානාදිය උපදවා වාසය කෙරේද එහෙයින් මෙසේ දේශනා කරණලද්දීය.

ප්‍රතිසම්භිදමාර්ගයෙහි වනාහි "ඉධ භික්ඛු මෙත්තාසහගතේන චේතසා ඒකං දිසං ඵරිත්වා විහරති" යනාදීවූ බ්‍රහ්මවිහාර වශයෙන් සුභ විමෝක්ෂය කියන ලද්දේය. ධම්මසඞ්ගණී ප්‍රකරණයෙහි වනාහි බ්‍රහ්මවිහාරයන් වෙන්වම ආහෙයින් ඒ ක්‍රමය ප්‍රතික්ෂේප කොට සුනීලකාදී වශයෙන්ම සුභ විමෝක්ෂය අටුවාවෙහි දක්වන ලද්දේය. එහෙයින් මෙහිදු ඒ අටුවාවෙහි කියනලද ක්‍රමයෙන්ම ව්‍යවස්ථානය කියනලද්දේයි. මෙසේ විමෝක්ෂ ධ්‍යානය දතයුත්තේයි.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 74-83 පිටු]**

## රූපාවචර විපාක ක්‍රියා චිත්තයෝ:—

විතක්කවිචාරපීතිසුඛේකග්ගතා සහිතං පඨමජ්ඣානවිපාකචිත්තං, විචාරපීතිසුඛේකග්ගතා සහිතං දුතියජ්ඣානකුසලවිපාකචිත්තං, පීතිසුඛේකග්ගතා සහිතං තතියජ්ඣානවිපාකචිත්තං, සුඛේකග්ගතා සහිතං චතුත්ථජ්ඣානවිපාකචිත්තං, උපෙක්ඛේකග්ගතා සහිතං පඤ්චමජ්ඣානවිපාකචිත්තං චේති ඉමානි පඤ්චපි රූපාවචරවිපාකචිත්තානි නාම. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 16 පිට]**

**විතක්ක** තමා හා සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයන් අරමුණට නගන විතර්කය ද **විචාර** තමා හා සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයන් අරමුණෙහි හසුරුවන විචාරය ද **පීති** ඉෂ්ටාලම්බන ප්‍රතිලාභයෙහි ප්‍රීණනය කරණ ප්‍රීතිය ද **සුඛ** ප්‍රතිලබ්ධාරම්මණයෙහි රසාස්වාද කරණුව උපදනා සුඛය ද **ඒකග්ගතා** නානාලම්බණ ග්‍රහණය නොකොට එක අරමුණක්ම උතුම් කොට ඇති බැවින් සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ අවික්ෂිප්තභාව සාධක වූ සමාධිය ද යන උපනිධ්‍යාන කෘත්‍යයෙහි බලවත් මේ පස් දෙනා හා **සහිතං** ඒකෝත්පාදදි ප්‍රකාරයෙන් යුක්ත වූ **පඨමජ්ඣාන විපාකචිත්තං** දේශනානුක්‍රමයෙන් හා උත්පත්ති ක්‍රමයෙන් පළමු වූ ධ්‍යාන විපාක චිත්තය. මත්තෙහිදු ද්විතීය ධ්‍යානාදියට මෙම ලෙස සුදුස සුදුසු පරිද්දෙන් අර්ථ කියයුතුය. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 20-21 පිටු]**

විතක්කවිචාරපීතිසුඛේකග්ගතා සහිතං පඨමජ්ඣානක්‍රියාචිත්තං, විචාරපීතිසුඛේකග්ගතා සහිතං දුතියජ්ඣානක්‍රියාචිත්තං, පීතිසුඛේකග්ගතා සහිතං තතියජ්ඣානක්‍රියාචිත්තං, සුඛේකග්ගතා සහිතං චතුත්ථජ්ඣානක්‍රියාචිත්තං, උපෙක්ඛේකග්ගතා සහිතං පඤ්චමජ්ඣානක්‍රියාචිත්තං චේති ඉමානි පඤ්චපි රූපාවචරක්‍රියාචිත්තානි නාම. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 16 පිට]**

**විතක්ක** තමා හා සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයන් අරමුණට නඟන විතර්කය ද **විචාර** තමා හා සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයන් අරමුණෙහි හසුරුවන විචාරය ද **පීති** ඉෂ්ටාලම්බන ප්‍රතිලාභයෙහි ප්‍රීණනය කරණ ප්‍රීතිය ද **සුඛ** ප්‍රතිලබ්ධාරම්මණයෙහි රසාස්වාද කරණුව උපදනා සුඛය ද **ඒකග්ගතා** නානාලම්බණ ග්‍රහණය නොකොට එක අරමුණක්ම උතුම් කොට ඇති බැවින් සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ අවික්ෂිප්තභාව සාධක වූ සමාධිය ද යන උපනිධ්‍යාන කෘත්‍යයෙහි බලවත් මේ පස් දෙනා හා **සහිතං** ඒකෝත්පාදදි ප්‍රකාරයෙන් යුක්ත වූ **පඨමජ්ඣාන ක්‍රියාචිත්තං** දේශනානුක්‍රමයෙන් හා උත්පත්ති ක්‍රමයෙන් පළමු වූ ධ්‍යාන ක්‍රියා චිත්තය. මත්තෙහිදු ද්විතීය ධ්‍යානාදියට මෙම ලෙස සුදුස සුදුසු පරිද්දෙන් අර්ථ කියයුතුය.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 20-21 පිටු]**

සපුඤ්ඤෙඤ්හි සමානාව - මහාපාකා මහාක්‍රියා
මහග්ගතක්‍රියාපාකා - ඵලචිත්තානි චක්කමා.

**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 34 යටතේ)]**

**මහාපාකා ච** මහාවිපාක චිත්තයෝ ද **මහාක්‍රියා ච** මහාක්‍රියා චිත්තයෝ ද **මහග්ගතක්‍රියාපාකා ච** මහග්ගත ක්‍රියා චිත්ත මහග්ගත විපාක චිත්තයෝ ද **ඵලචිත්තානි ච** ලෝකෝත්තර ඵල චිත්තයෝ ද **කමා** පිළිවෙළින් **සපුඤ්ඤෙඤ්හි** තම තමන්ගේ කුශලචිත්තයන් හා **සමානා ච** සමවූවාහුම (**හොන්ති** වෙත්)

මේ ගාථාවෙහි; මහා කුසල්සිත තෙම සොම්නස් සහගිය ඤාණසම්ප්‍රයුක්ත, සොම්නස් සහගිය ඤාණවිප්‍රයුක්ත, උපේක්ෂා සහගිය ඤාණසම්ප්‍රයුක්ත, උපේක්ෂා සහගිය ඤාණවිප්‍රයුක්ත අසංස්කාරික සසංස්කාරික සිත් යැයි අෂ්ටවිධ භේද ඇත්තාක් මෙන් ඒ සමාන වූ මහාවිපාක මහාක්‍රියා සිත් අටක් වන හෙයින් "සපුඤ්ඤෙඤ්හි සමානාව" යනු කීයේය. කර්ම, ද්වාර, කුශලවිපාක, ක්‍රියාවස්තූහු විපාක චිත්තයන්ගේ විඥප්ති ජනක නොවැ අවිපාක ස්වභාව වූ හෙයින් ද විපාක නොවූපදවන හෙයින් ද විපාක සිත් කුශල් සිත් හා සමාන නොවෙත් යයි දතයුතු. ක්‍රියාසිත්හි ද මේ ක්‍රමයම වේ. රූපාවචර කුශල් සිත් තෙම පඤ්චඞ්ගික, චතුරඞ්ගික, තිවඞ්ගික, දුවඞ්ගික නැවත දුවඞ්ගික සිත යැයි පඤ්චවිධ භේද ඇත්තාක් මෙන් විපාක ක්‍රියා චිත්තය ද පඤ්චවිධ වන හෙයින් "සපුඤ්ඤෙඤ්හි සමානාව" යනු කීයේය. අරූපාවචර විපාකසිත් හා ලෝකෝත්තර විපාක සිත් ද මේ නය හා සම වෙත්. එහෙයින් අනුටීකායෙහි:—

"අවිඤ්ඤත්තිජනකත්තා - අවිපාකසභාවතෝ
අප්පවත්තනතෝ චේව - පාකා පුඤ්ඤෙඤ්හි නෝ සමා" යනු කියනලදි.

**[පරමත්ථවිභාවනි ව්‍යාඛ්‍යාව 20-21 පිටු]**

## රූපාවචර විපාක-ක්‍රියා සිත් විස්තර කර ඇති ආකාරයඃ—

ඉදනි රූපාවචරාදිවිපාකං දස්සේතුං පුන **කතමේ ධම්මා අබ්‍යාකතා**තිආදි ආරද්ධං. තත්ථ යස්මා කාමාවචරවිපාකං අත්තනෝ කුසලේන සදිසම්පි හෝති, අසදිසම්පි, තස්මා න තං කුසලානුගතිකං කත්වා භාජිතං. රූපාවචරාරූපාවචරවිපාකං පන යථා හත්ථිඅස්සපබ්බතාදීනං ඡායා හත්ථිආදි සදිසාව හොන්ති, තථා අත්තනෝ කුසලසදිසමේව හෝතීති කුසලානුගතිකං කත්වා භාජිතං. කාමාවචරකම්මඤ්ච යද කදචි විපාකං දේති, රූපාවචරාරූපාවචරං පන

අනන්තරායේන, දුතියස්මිංයේව අත්තභාවේ, විපාකං දේතීතිපි කුසලානුගතිකමේව කත්වා භාජිතං. සේසං කුසලේ වුත්තනයේනේව වේදිතබ්බං. අයං පන විසේසෝ පටිපදදිභේදෝ ච හීනපණීතමජ්ඣිමභාවෝ ච ඒතේසු ඣානාගමනතෝ වේදිතබ්බෝ. ඡන්දදීනං පන අඤ්ඤතරං ධුරං කත්වා අනුප්පාදනීයත්තා නිරධිපතිකානේව ඒතානීති.

**[ධම්මසඞ්ගණී අට්ඨුවා (ඡට්ඨසඞ්ගායනා අංක 499 යටතේ); ධම්මසඞ්ගණී අට්ඨුවා 253-254 පිටු (හේ.වි.මු); අභිධර්ම ප්‍රකාශය 61-62 පිටු]**

**අනන්තරායේනාති** පරිහානිපච්චයවිරහේන. **පටිපදදිභේදෝති** පටිපදරම්මණභේදෝ. තථා හි දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං ඣානං උප්පාදෙත්වා පුනප්පුනං සමාපජ්ජන්තස්ස තං ඣානං තං පටිපදමේව හෝති. ඒතස්මිං අපරිහීනේ තස්ස විපාකෝ නිබ්බත්තමානෝ තප්පටිපදෝව භවිතුං අරහතීති. ඡන්දධිපතෙය්‍යාදිභාවෝ පන තස්මිං ඛණේ විජ්ජමානානං ඡන්දදීනං අධිපතිපච්චයභාවේන හෝති, න ආගමනවසේන. තථා හි ඒකමේව ඣානං නානාක්ඛණේසු නානාධිපතෙය්‍යං හෝති. චතුත්ථජ්ඣානස්සේව හි චතුරිද්ධිපාදභාවේන භාවනා හෝති, තස්මා විපාකස්ස ආගමනවසේන ඡන්දධිපතෙය්‍යාදිතා න වුත්තා. **[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 499 යටතේ)]**

**තස්මිං ඛණේ විජ්ජමානානං ඡන්දදින්**ති ඒතේන විපාකජ්ඣානේ දුක්ඛාපටිපදදිභාවස්ස අවිජ්ජමානතං දස්සේති. න හි කුසලජ්ඣානං විය විපාකජ්ඣානං පරිකම්මවසේන නිබ්බත්තතීති. න චෙත්ථ පටිපදභේදෝ විය කුසලානුරූපෝ විපාකස්ස ආරම්මණභේදෝපි න පරමත්ථිකෝ සියාති සක්කා වත්තුං ඒකන්තේන සාරම්මණත්තා අරූපධම්මානං විපාකස්ස ච කම්මනිමිත්තාරම්මණතාය අඤ්ඤත්‍රාපි විජ්ජමානත්තා. **නානාක්ඛණේසු නානාධිපතෙය්‍ය**න්ති "යස්මිං ඛණේ යං ඣානං යදධිපතිකං, තතෝ අඤ්ඤස්මිං ඛණේ තං ඣානං ඒකන්තේන තදධිපතිකං න හෝතී"ති කත්වා වුත්තං. **චතුත්ථජ්ඣානස්සේවාති** ච පටිපදා විය අධිපතයෝ න ඒකන්තිකාති ඉමමේවත්ථං දස්සේති.

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 499 යටතේ)]**

කතමේ ධම්මා අබ්‍යාකතා? යස්මිං සමයේ රූපාවචරං ඣානං භාවේති කිරියං නේව කුසලං නාකුසලං න ච කම්මවිපාකං දිට්ඨධම්මසුඛවිහාරං විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පථවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා අබ්‍යාකතා.

කතමේ ධම්මා අබ්‍යාකතා? යස්මිං සමයේ රූපාවචරං ඣානං භාවේති කිරියං නේව කුසලං නාකුසලං න ච කම්මවිපාකං දිට්ඨධම්මසුඛවිහාරං විතක්කවිචාරානං වූපසමා…පෙ…. දුතියං ඣානං…පෙ…. තතියං ඣානං…පෙ…. චතුත්ථං ඣානං…පෙ…. පඨමං ඣානං…පෙ…. පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති පථවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති…පෙ…. ඉමේ ධම්මා අබ්‍යාකතා.

**[ධම්මසඞ්ගණී පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 577-578 යටතේ); ධම්මසඞ්ගණී පාළි 252 පිට (බු.ජ)]**

රූපාවචරාරූපාවචරකිරියනිද්දේසේසු **දිට්ඨධම්මසුඛවිහාර**න්ති දිට්ඨධම්මේ, ඉමස්මිංයේව අත්තභාවේ, සුඛවිහාරමත්තං. තත්ථ ඛීණාසවස්ස පුථුජ්ජනකාලේ නිබ්බත්තිතා සමාපත්ති යාව න නං සමාපජ්ජති තාව කුසලාව සමාපන්නකාලේ කිරියා

හෝති. ඛීණාසවකාලේ පනස්ස නිබ්බත්තිතා සමාපත්ති කිරියාව හෝති. සේසං සබ්බං තං සදිසත්තා කුසලනිද්දේසේ වුත්තනයේනේව වේදිතබ්බන්ති.
**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 577 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 258-259 පිටු (හේ.වි.මු); අභිධර්ම මාර්ගය 56 පිට; අභිධර්ම විභාගය 54-55 පිටු]**

ඉදනි යානි කිරියානි ජාතානි, තානි වේදිතබ්බානීති ඒවං යෝජනා කාතබ්බා. **අත්තභාවෝති** පඤ්චක්ඛන්ධා වුච්චන්ති.
**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 577 යටතේ)]**

ආහිතෝ අහං මානෝ එත්ථාති අත්තා, සෝ ඒව භවති උප්පජ්ජති, න පරපරිකප්පිතෝ විය නිච්චෝති **අත්තභාවෝ**. අත්තාති වා දිට්ඨිගතිකේහි ගහේතබ්බාකාරේන භවති පවත්තතීති **අත්තභාවෝ**.
**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 577 යටතේ)]**

රූපාවචරමානසං **ඣානභේදේන** පඤ්චහි චතූහි තීහි ද්වීහි පුන ද්වීහි ඣානඞ්ගේහි සම්පයෝගභේදේන **පඤ්චධා** පඤ්චඞ්ගිකං චතුරඞ්ගිකං තිවඞ්ගිකං දුවඞ්ගිකං පුන දුවඞ්ගිකන්ති පඤ්චවිධං හෝති අවිසේසේන, පුන තං පුඤ්ඤපාකකිරියානං පච්චේකං පඤ්චන්නං පඤ්චන්නං භේදා පඤ්චදසධා භවෙත්‍යත්ථෝ.
**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 25 යටතේ); විභාවනී ටීකා සන්නය 68-69 පිටු]**

**රූපාවචරමානසං** රූපාවචර සිත්තෙමේ **ඣානභේදේන** ධ්‍යාන ප්‍රභේද වශයෙන් **පඤ්චහි ඣානඞ්ගේහි ච** පස්වැදෑරුම් ධ්‍යානාඞ්ග හා සමඟ ද **චතූහි ඣානඞ්ගේහි ච** සතරාකාර ධ්‍යානාඞ්ගයන් හා සමඟ ද **තීහි ඣානඞ්ගේහි ච** තුන්වැදෑරුම් ධ්‍යානාඞ්ගයන් හා සමඟ ද **ද්වීහි ඣානඞ්ගේහි ච** දෙවැදෑරුම් ධ්‍යානාඞ්ගයන් හා සමඟ ද **පුන** නැවත **ද්වීහි ඣානඞ්ගේහි ච** දෙවැදෑරුම් ධ්‍යානාඞ්ගයන් හා සමඟ ද **සම්පයෝගභේදේන** සමව එක්ව යෙදුනාවූ ප්‍රභේදයෙන් **පඤ්චඞ්ගිකන්ති ච** අඞ්ග පසකින් සම්පූර්ණ ධ්‍යානයයි කියා ද **චතුරඞ්ගිකන්ති ච** සිව්රඟකින් සම්පූර්ණ ධ්‍යානයයි කියා ද **තිවඞ්ගිකන්ති ච** අඞ්ගත්‍රයකින් සම්පූර්ණවූ ධ්‍යානයයි කියා ද **දුවඞ්ගිකන්ති ච** දෙයඟකින් යුක්තවූ ධ්‍යානයයි කියා ද **පුන** නැවත **දුවඞ්ගිකන්ති ච** දෙයඟකින් යුක්ත වූ ධ්‍යානය යයි කියා ද **අවිසේසේන** අවිශේෂ වශයෙන් **පඤ්චධා (පඤ්ච විධං හෝති)** පස්වැදෑරුම් වේ **තං** ඒ රූපාවචර සිත්තෙම් **පුන** නැවත **පච්චේකං** වෙන වෙනම **පඤ්චන්නං පඤ්චන්නං** පස් පස් වැදෑරුම්වූ **පුඤ්ඤපාකක්‍රියානං** කුසල විපාක ක්‍රියාවන්ගේ **භේදා (භේදේන)** ප්‍රභේද වශයෙන් (නොහොත්) **තං** ඒ ධ්‍යාන සිත්තෙමේ **පුන** නැවත **පච්චේකං** වෙන වෙනම **පුඤ්ඤපාකක්‍රියානං** කුසල විපාක ක්‍රියා යැයි කියනලද **පඤ්චන්නං පඤ්චන්නං** පස් පස් ප්‍රකාර අඞ්ගයන්ගේ **භේදේන** ප්‍රභේදයෙන් **පඤ්චදසධා භවේ** පසළොස් ප්‍රකාර වේ **ඉති (අත්ථෝ)** මේ අර්ථය **දට්ඨබ්බෝ** දතයුතුයි. ("පඤ්චධා" යන්න "පඤ්ච විධං" යි වර්ණාකෙළේයි ඒ "පඤ්ච විධං" යන පාඨයෙන් "පඤ්චධා" යන පදයාගේ "පඤ්චප්පකාරා ඒතස්සාති පඤ්චධා" යන අස්සත්ථි තද්ධිතාර්ථය දක්වමින් "පඤ්චහි පකාරේහීති පඤ්චධා" යන ප්‍රකාර තද්ධිතාර්ථය වලක්වනලදී.)
**[විභාවනී ටීකා සන්නය 111 පිට]**

විපාකජ්ඣානේ කාමකුසලං අප්පනං අපත්තං මුදුභූතං දුබ්බලං හෝති. පරිත්තේසු නානාකිච්චට්ඨානේසුච හීනේසුපි අත්තභාවේසුච විපච්චති. තස්මා තං

අත්තනා අසදිසංපි විපාකං ජනේති. මහග්ගතකුසලං පන අප්පනාපත්තං තික්ඛං බලවං හෝති. උළාරේ බ්‍රහ්මත්තභාවේ භවඞ්ගට්ඨානේසුයේව විපච්චති. තස්මා තං සදපි අත්තනා සදිසමේව විපාකං ජනේති. තේනේව විතක්කවිචාරපීති සුඛේකග්ගතා සහිතන්තිආදිනා විපාකංපි සබ්බසෝ කුසල සදිසමේව දස්සේති.

අනන්තරභවේයේව ඵලදනත්තා තං අත්තනා සදිසමේව විපාකං ජනේතීතිච වදන්ති, තං න සුන්දරං.

ඒවඤ්හි සති කාමකුසලංපි සත්තමජවනං අත්තනා සදිසවිපාකමේව ජනෙය්‍යාති. යස්මාච කුසලමේව නිරනුසයසන්තානේ පවත්තං ක්‍රියජ්ඣානං නාම හෝති. තස්මා ක්‍රියචිත්තංපි කුසල සදිසමේව දස්සේති.

**පඤ්චධා**තිආදිසඞ්ගහගාථා. තත්ථ **ඣානභේදේනා**ති පඨමජ්ඣානාදීහි පඤ්චහි ඣානේහි සම්පයෝගභේදේන. රූපාවචරමානසං ඣානභේදේන පඤ්චධා හෝති. පඨමජ්ඣානිකං, දුතියජ්ඣානිකං, තතියජ්ඣානිකං, චතුත්ථජ්ඣානිකං, පඤ්චමජ්ඣානිකන්ති ඒවං පඤ්චවිධං හෝතීති අත්ථෝ. තමේව පුඤ්ඤපාකක්‍රියාභේදේන පඤ්චදසධා භවේති යෝජනා.

**විභාවනියං** පන ඣානභේදේනාති ඣානඞ්ගේහි සම්පයෝගභේදේනාති වුත්තං. තං න සුන්දරං.

අඞ්ගෙදා හි ඣානභේදෝ. අඞ්ගෙදෝ ඣානඞ්ගභේදෝ. තත්ථ පඨමං ඣානං දුතියං ඣානන්තිආදිඣානභේදෝ. පඨමජ්ඣානේ පඤ්ච අඞ්ගානි. දුතියජ්ඣානේ චත්තාරීතිආදි ඣානඞ්ගභේදෝ. තේසු ඉධ ඣානභේදෝව අධිප්පේතෝ. න ඣානඞ්ගභේදෝ. චිත්තඤ්හි ඣානභේදේ නේව පඤ්චවිධං හෝති. න ඣානඞ්ගභේදේන. ඣානමේව පන ඣානඞ්ගභේදේන පඤ්චවිධන්ති.

යඤ්ච **තත්ථ** "පඤ්චධාති පඤ්චඞ්ගිකං චතුරඞ්ගිකං තිවඞ්ගිකං දුවඞ්ගිකං පුන දුවඞ්ගිකන්ති පඤ්චවිධං හෝතී"ති වුත්තං. තංපි න සුන්දරං. ඣානමේව හි පඤ්චඞ්ගිකාදි හෝති. න චිත්තන්ති.

**[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 53-54 යටතේ); සද්ධර්මසාගරය 02/446 පිට]**

රූපාවචරවිපාකාපි සම්පයෝගභේදතෝ අත්තනෝ කුසලා විය පඤ්චවිධා හොන්ති. සබ්බෝ චෙත්ථ විනිච්ඡයභේදෝ කුසලේ වුත්තනයෝ ඒව. විපාකභාවතෝ පනෙත්ථ යථා හත්ථිආදීනං ඡායා තං සදිසා, ඒවං කුසලාගමනතෝ ච ඣානඞ්ගාදිසම්පයුත්තධම්මසමායෝගෝ, පටිපදදිභේදෝ ච හෝති. අපිචෙත්ථ තිවිධාය පඨමජ්ඣානභූමියා පඨමජ්ඣානවිපාකා, තථා දුතියජ්ඣානභූමියා දුතියජ්ඣානවිපාකා තතියජ්ඣානවිපාකා ච, තතියජ්ඣානභූමියා චතුත්ථජ්ඣාන-විපාකා, වේහප්ඵලපඤ්චසුද්ධාවාසවසේන ඡබ්බිධාය චතුත්ථජ්ඣානභූමියා පඤ්චමජ්ඣානවිපාකා ච වුත්තනයේන පටිසන්ධිභවඞ්ගචුතිකිච්චානි සාධයමානා හදයවත්ථුං නිස්සාය ද්වාරවිනිමුත්තාව කම්මනිමිත්තසඞ්ඛාතපඤ්ඤත්තාරම්මණා හුත්වා විපච්චන්තීති අයං විසේසෝ, සේසං තාදිසමේව.

**[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා රූපාවචරවිපාක වණ්ණනා යටතේ); අභිධර්ම චන්ද්‍රිකාව 35 පිට]**

ඉදනි **රූපාවචරවිපාකචිත්තානි** වුච්චන්ති. තානි නියතවත්ථුකතො ඒකවිධානි, ඣානඞ්ගයෝගභේදතෝ පඤ්චවිධානි. කථං? විතක්කවිචාරපීතිසුඛ-චිත්තේකග්ගතාසම්පයුත්තං පඨමං, විචාරපීතිසුඛචිත්තේකග්ගතාසම්පයුත්තං දුතියං, පීතිසුඛචිත්තේකග්ගතාසම්පයුත්තං තතියං, සුඛචිත්තේකග්ගතාසම්පයුත්තං චතුත්ථං, උපෙක්ඛාචිත්තේකග්ගතාසම්පයුත්තං පඤ්චමන්ති ඉමානි පඤ්චපි රූපාවචරවිපාකචිත්තානි උපපත්තියං පටිසන්ධිභවඞ්ගචුතිවසේන පවත්තන්ති.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 43 යටතේ)]**

**ඉදනි** දැන් **රූපාවචරවිපාකචිත්තානි** රූපාවචර විපාක චිත්තයෝ **වුච්චන්ති** කියනු ලැබෙත් **තානි** ඒ විපාක චිත්තයෝ **නියතවත්ථුකතෝ** ඒකාන්තයෙන් හෘදයවස්තුව ඇසුරුකරන හෙයින් **ඒකවිධානි** එක්වැදෑරුම් වෙත් **ඣානඞ්ගයෝග භේදතෝ** ධ්‍යානාඞ්ගයන් හා සම්ප්‍රයෝග භේදහෙයින් **පඤ්ච විධානි** පස්වැදෑරුම් වෙත් **කථං?** කෙසේද යත්? **විතක්ක-විචාර-පීති-සුඛ-චිත්තේකග්ගතා සම්පයුත්තං** විතර්කය-විචාරය-ප්‍රීතිය-සැපය-චිත්තේකාග්‍රතාය යන මේ පස හා ඒකොත්පාදදී ප්‍රකාරයෙන් සැපියුතුවූ **පඨමං** පළමුවනුවූ විපාකචිත්තය **විචාර-පීති-සුඛ-චිත්තේකග්ගතා සම්පයුත්තං** විචාර-ප්‍රීති-සැප-චිත්තේකග්‍රතාය යන අඞ්ගසතර හා සැපියුතුවූ **දුතියං** දෙවෙනි විපාකචිත්තය **පීති-සුඛ-චිත්තේකග්ගතා සම්පයුත්තං** ප්‍රීති-සැප-චිත්තේකග්‍රතාය යන අඞ්ගත්‍රය හා සැපියුතුවූ **තතියං** තුන්වෙනි විපාකචිත්තය **සුඛ-චිත්තේකග්ගතා සම්පයුත්තං** සැපය-චිත්තේකාග්‍රතාය යන අඞ්ගද්වය හා සැපියුතුවූ **චතුත්ථං** සතරවෙනි විපාකචිත්තය **උපෙක්ඛා-චිත්තේකග්ගතා සම්පයුත්තං** උපේක්ෂා-චිත්තේකාග්‍රතා යන අඞ්ගද්වය හා සැපියුතුවූ **පඤ්චමං ඉති** පස්වෙනි විපාක චිත්තයයි පස්වැදෑරුම් වෙත් **පඤ්චපි** පස්වැදෑරුම්වූද **ඉමානි රූපාවචරවිපාකචිත්තානි** මේ රූපාවචර විපාකචිත්තයෝ තුමූ **උපපත්තියං** උපප්‍රජ්ති භවයෙහි **පටිසන්ධි-භවඞ්ග-චුතිවසේන** ප්‍රතිසන්ධි-භවාඞ්ග-චුති කෘත්‍යය වශයෙන් **පවත්තන්ති** හටගණිත්.

**]අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 139-140 පිටු[**

මහග්ගතවිපාකානං තං තං කුසලාගමනවසේනේව ඣානඞ්ගහානි, න පන භාවනාවිසේසේනාති තේසං පහානඞ්ගානි අනුද්ධටානි. **උපපත්තිය**න්ති උපපත්තිභවේ. අරූපාවචරවිපාකචිත්තානි වුච්චන්තීති සම්බන්ධෝ.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 43 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 174 පිට]**

එහි මහද්ගත විපාකයන්ගේ ධ්‍යානාඞ්ග ප්‍රහාණිය ඒ ඒ කුසලාගමන වශයෙන්ම වෙයි. භාවනා වශයෙන් නොවෙයි. එහෙයින් ඒ විපාකයන්ගේ ප්‍රහාණාඞ්ගයෝ උද්ධරණය නොකරන ලද්දහුය. **]අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 141 පිට[**

කුසලානුගතං කත්වා, භාපිතං කිං මහග්ගතං;
කාමාවචරපුඤ්ඤංව, නාසමානඵලං යතෝ.

අත්තනෝ කුසලේහේව, සමානං සබ්බථා ඉදං;
ගජාදීනං යථා ඡායා, ගජාදිසදිසා තථා.

කාමාවචරපුඤ්ඤංව, නාපරාපරියවේදනං;
ඣානා අපරිහීනස්ස, සත්තස්ස භවගාමිනෝ.

කුසලානන්තරංයේව, ඵලං උප්පජ්ජතීති ච;
ඤාපනත්ථං පනේතස්ස, කුසලානුගතං කතං.

පටිප්පදක්කමෝ චේව, හීනාදීනඤ්ච භේදතෝ;
ඣානාගමනතෝ චෙත්ථ, වේදිතබ්බෝ විභාවිනා.

අභාවෝධිපතීනඤ්ච, අයමේව විසේසකෝ;
සේසං සබ්බං ච සේසේන, කුසලේන සමං මතං.

ඒවං රූපාවචරාරූපාවචරවිපාකා වේදිතබ්බා.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 44-45-46-47-48-49 යටතේ)]**

කුසලානුගතං කත්වා භාජිතං කිං මහග්ගතං විපාකචිත්තං **කුසලානුගතං** කුසලං අනුගතං කත්වා මහග්ගතකුසලචිත්තේන සමානං කත්වා භගවතා **භාජිතං** දේසිතං. **කිං** කේන කාරණේන? **කාමාවචරපුඤ්ඤංව** කාමාවචරකුසලං ඉව අසමානඵලං නත්ථි **යතෝ** යස්මා කාරණා, තස්මා විපාකං කුසලානුගතං කත්වා භගවතා භාජිතං දේසිතං. **කාමාවචරපුඤ්ඤංවාති** යථා අට්ඨවිධේසු කාමාවචරකුසලේසු උක්කට්ඨතිහේතුකකුසලං කාමසුගතියං තිහේතුකපටිසන්ධිං දත්වා පවත්තේ සෝළස කුසලවිපාකානි නිප්ඵාදේති, තිහේතුකඔමකඤ්ච දුහේතුකඋක්කට්ඨඤ්ච කාමසුගතියං දුහේතුකපටිසන්ධිං දත්වා පවත්තේ තිහේතුකවිරහිතානි අහේතුකදුහේතුකසඞ්ඛාතානි විපාකානි නිප්ඵාදේති, දුහේතුකඔමකං පන කාමසුගතියං අහේතුකපටිසන්ධිං දත්වා පවත්තේ අට්ඨ අහේතුකවිපාකානි නිප්ඵාදේති, ඒවං කාමාවචරපුඤ්ඤං අසමානඵලංව හෝති.

ගජාදීනං ඡායා ගජාදිසදිසා හෝති යථා, ඒවං මහග්ගතවිපාකං **සබ්බථා** සබ්බපකාරේන අත්තනෝ කුසලේහේව සමානං හෝති.

**කාමාවචරපුඤ්ඤංව** **නාපරාපරියවේදනං** ඉදං මහග්ගතකුසලං කාමාවචරපුඤ්ඤංව අපරාපරියවේදනං අපරස්මිං භවේ ඵලදායකං **න** හෝති, ඣානා අපරිහීනස්ස **භවගාමිනෝ** පටිසන්ධිගාමිනෝ සත්තස්ස කුසලානන්තරංයේව ඵලං උප්පජ්ජති, ඉති ච ඤාපනත්ථං **ඒතස්ස** මහග්ගතවිපාකස්ස **කුසලානුගතං** කුසලානුගමනං භගවතා **කතං**.

**එත්ථ** ඒතස්මිං මහග්ගතවිපාකේ පටිපදක්කමෝ තේසඤ්ච හීනාදීනං භේදතෝ **ඣානාගමනතෝ** මහග්ගතකුසලඣානස්ස ආගමනවසේන **විභාවිනා** පණ්ඩිතේන වේදිතබ්බෝ.

එත්ථ විපාකේ ඡන්දදි**අධිපතීනං** අභාවෝ, අයමේව විසේසතෝ කුසලතෝ අයං ඒව විසේසෝ, සේසං සබ්බපකාරං අවිසේසේන කුසලේන සමං **මතං** කථිතං භගවතා. **[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 44-45-46-47-48-49 යටතේ)]**

**මහග්ගතං** මහද්ගතවිපාක සිත්තෙමේ **කුසලානුගතං කත්වා** කුසල්සිත් සදෘශ කොට **කිං** කුමක්හෙයින් **භාජිතං** බෙදන ලද්දේද යත්? **යතෝ** යම්හෙයකින් **කාමාවචර පුඤ්ඤං ඉව** කාමාවචර කුසලය මෙන් **අසමාන ඵලං න** අසදෘශ ඵල නැත්තේ වේද (හෙවත් සමාන ඵල ඇත්තේම වේද එහෙයිනි) **යථා** යම්සේ **ගජාදීනං** හස්ති ආදීන්ගේ **ඡායා** ඡායා තොමෝ **ගජාදි සදිසා** ඒ හස්ති ආදීන් හා සමාන වේද

**තථා** එපරිද්දෙන් **ඉදං** මේ මහද්ගතවිපාක තෙමේ **සබ්බථා** සර්වප්‍රකාරයෙන් **අත්තනෝ** තමාගේ **කුසලේහි ඒව සමානං** කුසලය හා සමානම වේ. **කාමාවචරපුඤ්ඤං ඉව** කාමාවචර කුසලය මෙන් **අපරාපරියවේදනං න** අපරාපරියවෙද්‍ය විපාකද නොවෙයි **ඣානඅපරිහීනස්ස** ධ්‍යානයෙන් නොපිරිහුනාවූ **භවගාමිනෝ සත්තස්ස** භවගාමී සත්වයාහට **කුසලානන්තරං යේව** කුසලය රැස්කළ භවයට අනතුරුවම **ඵලං උප්පජ්ජති** විපාක උපදී **ඉති ච** මෙසේද **ඒතස්ස පන** මේ අර්ථය වනාහි **ඤාපනත්ථං** හැඟවීම පිණිස **කුසලානුගතං කතං** කුසලය හා සමාන කරණ ලද්දේය.

**එත්ථ ච** මෙහි ද **පටිපදක්කමෝ චේව** ප්‍රතිපද ක්‍රමය ද **හීනාදීනඤ්ච භේදතෝ** හීනාදීන්ගේ ප්‍රභේදය ද **විභාවිනා** පණ්ඩිතයා විසින් **ඣානාගමනතෝ** ධ්‍යානාගමන වශයෙන් (ධ්‍යානයාගේ ඊම) **වේදිතබ්බා** දතයුත්තාහුය **අධිපතීනං අභාවෝ ච** අධිපතීන්ගේ නොලැබීමක් වේද **අයං ඒව** මේ තෙමේම **විසේසතෝ** විශේෂයෙන් දතයුත්තේය (හෙවත් වෙනසයි දතයුත්තේය) **සේසං සබ්බඤ්ච** සෙසු සියල්ල ද **සේසේන කුසලේන** සෙසු කුසල් හා **සමං මතං** සදෘශ යයි දන්නා ලදී **ඒවං** මේ උක්ත ප්‍රකාරයෙන් **රූපාවචරාරූපාවචරවිපාකා** රූපාවචර අරූපාවචර විපාකයෝ **වේදිතබ්බා** දතයුත්තාහුය. **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 140-141 පිටු]**

**කුසලානුගතං කත්වාති** කුසලානුරූපං කුසලසදිසං කත්වා. යථා කාමාවචරවිපාකං කුසලතෝ විසදිසම්පි කත්වා විභත්තං, ඒවමකත්වා කුසලසදිසමේව කත්වාති අත්ථං වදන්ති. අට්ඨකථායං පන කුසලානන්තරං කත්වා මහග්ගතවිපාකානං භාජිතපාළිං සන්ධාය "කුසලානුගතං කත්වා භාජිත"න්ති වුත්තං. පාළියඤ්හි; "කතමේ ධම්මා අබ්‍යාකතා? යස්මිං සමයේ කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං චක්ඛුවිඤ්ඤාණං උප්පන්නං හෝතී"තිආදිනා (ධ. ස. 431)

කාමාවචරවිපාකං විභජිත්වා මහග්ගතවිපාකං විභජන්තේන; "කතමේ ධම්මා අබ්‍යාකතා? යස්මිං සමයේ රූපූපපත්තියා මග්ගං භාවේති, විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පථවීකසිණං, තස්මිං සමයේ ඵස්සෝ හෝති…පෙ…. අවික්ඛේපෝ හෝති, ඉමේ ධම්මා කුසලා, තස්සේව රූපාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පථවීකසිණං…පෙ…. ඉමේ ධම්මා අබ්‍යාකතා"ති (ධ. ස. 498).

ඒවං කුසලං උද්දිසිත්වා තදනන්තරං කත්වා මහග්ගතං විපාකං විභත්තං, තස්මා යථා කාමාවචරවිපාකං, ඒවං අවිභජිත්වා ඉදං කුසලානන්තරං කත්වා විභත්තන්ති ඉමමත්ථං ජෝතේතුං අට්ඨකථායං "කුසලානුගතං කත්වා"ති වුත්තං. ඉමිනාපි ච ආචරියේන පරිහාරමුඛේන වක්ඛමානඅත්ථවිසේසවචනිච්ඡාය තත්ථ වුත්තනයේනේව චෝදනා කතා. ඒවඤ්හි සති කුසලානන්තරංයේව ඵලං උප්පජ්ජතීති ඤාපනං සුට්ඨුපපන්නං හෝතීති අයමෙත්ථ අම්භාකං ආචරියස්ස මග්ගෝ.

**මහග්ගත**න්ති මහග්ගතවිපාකං. තඤ්හි ඉධ අධිගතං. **කාමා…පෙ…. යතෝ**ති යස්මා කාමාවචරකුසලං අසමානඵලං හෝති තිහේතුකස්ස දුහේතුකාහේතුකවිපාකානං, දුහේතුකස්ස ච අහේතුකවිපාකානම්පි ජනනතෝ, න ඒවමිදං, ඉදං පන ඒකන්තේනේව සදිසවිපාකජනනතෝ සමානඵලමේව, තස්මාති

අත්ථෝ. ඒත්ථ ච "කුසල"න්ති අවුත්තේපි කාමාවචරපුඤ්ඤංවාති උපමිතත්තා උපමෙය්‍යස්සපි කුසලභාවෝ විඤ්ඤායති. කස්මා පනේතං සදිසවිපාකං, න කාමාවචරං විය විසදිසවිපාකම්පීති? වුච්චතේ; කාමාවචරපුඤ්ඤඤ්හි ආචිනන්තෝ රූපතණ්හාදිනානාවත්ථුකකාමතණ්හූපනිස්සයතෝ ආචිනති, තස්මා තදූපනිස්සයකුසලං තදනුරූපතෝ නානාවත්ථුකං විපාකං ජනේති. මහග්ගතං පන ආචිනන්තෝ ඒකවත්ථුකායේව භවතණ්හාය වසේන ආචිනතීති තදනුරූපතෝ තං නානාවත්ථුං අජනෙත්වා ඒකවත්ථුමේව ජනේතීති.

**සබ්බථාති** ධම්මතෝ ආරම්මණතෝ පටිපදාදිතෝ ච. තථා හි යේ ඵස්සාදයෝ කුසලේ ච ලබ්භන්ති, තේ විපාකේපි ලබ්භන්ති, යස්මිඤ්ච ආරම්මණේ කුසලං පවත්තති, තත්ථේව ඉදං විපාකම්පි. යාව පටිපදාදයෝ කුසලස්ස ලබ්භන්ති, තාව ඉමස්ස විපාකස්සපීති. කාමං යස්ස කස්සචි ඡායා තං තං වත්ථුසදිසාව, මහන්තස්ස පන කුසලවිපාකස්ස මහන්තාභියේව උපමාහි භවිතබ්බන්ති **"ගජාදීන"**න්තිආදි වුත්තං. අපරේ අපරේ අත්තභාවේ භවං වේදනමස්සාති **අපරාපරියවේදනං**. යදි අපරාපරියවේදනං න හෝති, කථඤ්චරහි ඉමස්ස ඵලුප්පත්තීති ආහ **"ඣානා අපරිහීනස්සා"**තිආදි.

**කුසලානන්තර**න්ති කුසලභවානන්තරං. යස්මිඤ්හි භවේ තං කුසලං කතං, සෝ ඉධ කුසල-සද්දේන උපචාරතෝ ගහිතෝ කම්මානන්තරංයේව ඵලස්ස අසම්භවතෝ. න හි තං ලෝකුත්තරකුසලං විය අනන්තරඵලනිප්ඵාදකං, අථ ඛෝ ඒකච්චකාමාවචරකුසලං විය අපරාපරියවේදනං අහුත්වා සතිපි අනේකේයේව කාමාවචරකම්මේ මහෝඝො විය පරිත්තං උදකං තමජ්ඣොත්ථරිත්වා අත්තනෝයේව විපාකදානේන ඒකන්තේන අනන්තරභවේයේව ඵලං නිබ්බත්තේති. නනු ච අපරිහීනජ්ඣානස්සේව කස්සචි නිකන්තිවසේන කාමභවේ පටිසන්ධි හෝති. තථා හි තිස්සමහාබ්‍රහ්මා උපරිබ්‍රහ්මලෝකූපපත්තියා භාවිතමග්ගෝ භික්ඛූහි යාචිතෝ තතෝ චවිත්වා මොග්ගලිබ්‍රාහ්මණස්ස ගේහේ පටිසන්ධිං අග්ගහේසීති වුත්තන්ති තං කථන්ති? නිකන්තිබලේනේව ඣානං පරිහායතීති තතෝ පරිහීනජ්ඣානෝ නිබ්බත්තතීති වදන්ති. අපරේ පන ආචරියා "අනීවරණාවත්ථාය නිකන්තියා ඣානස්ස පරිහානි වීමංසිත්වා ගහේතබ්බා"ති වත්වා "සතිපි මහග්ගතකම්මුනෝ විපාකං පටිබාහනසමත්ථස්සේව පරිත්තකම්මස්ස අභාවේ 'ඉජ්ඣති, භික්ඛවේ, සීලවතෝ චේතෝපණිධි විසුද්ධත්තා'ති (අ. නි. 8.35) වචනතෝ කාමභවේ චේතෝපණිධි මහග්ගතකම්මස්ස විපාකං පටිබාහිත්වා පරිත්තකම්මුනෝ විපාකස්ස ඕකාසං කරෝතී"ති වදන්ති, තං යුත්තං. **ඒතස්සාති** ඉමස්සත්ථස්ස ඤාපනත්ථන්ති සම්බන්ධෝ.

ඒවං අවිසේසේන කුසලසදිසතං අතිදිසිත්වා ඉදානි විසේසං දස්සේතුං **"පටිපදක්කමෝ චේවා"**තිආදි වුත්තං. යථා හි දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං ඣානං උප්පාදෙත්වා පුනප්පුනං සමාපජ්ජන්තස්ස තං ඣානං තං පටිපදමේව හෝති, ඒවං තස්මිං තස්මිං අපරිහීනේ තස්ස තස්ස විපාකෝ නිබ්බත්තමානෝ තං තං පටිපදෝව භවිතුං අරහති. ඡන්දාධිපතෙය්‍යාදිභාවෝ පන තස්මිං ඛණේ විජ්ජමානානං ඡන්දාදීනං අධිපතිපච්චයභාවේන හෝති, න ආගමනවසේන. තථා හි ඒකමේව ඣානං නානක්ඛණේසු නානාධිපතෙය්‍යං හෝති, තස්මා විපාකස්ස ආගමනවසේන ඡන්දාධිපතෙය්‍යාදිතා න ගහිතා. තේනාහ **"අභාවෝධිපතීන"**න්ති. තදභාවතෝව සරසතෝ තස්ස හීනාදිතා න සම්භවතීති සාපි ඣානාගමනතෝව වුත්තා.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 44-45-46-47-48-49 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 174-178 පිට]**

ගාථාවෙහි "මහග්ගතං" යනු මහද්ගත විපාකය යන අර්ථයි "කාමා -පෙ- යතෝ" යන මෙහි යම්හෙයකින් කාමාවචර කුසලයතෙමේ අසදෘශ විපාක ඇත්තේ වේද හෙවත් ත්‍රිහේතුක කුසල ත්‍රිහේතුක-ද්විහේතුක-අහේතුක විපාකද ද්විහේතුක කුසලය ද්විහේතුක-අහේතුක විපාකද උපදවන නමුත් මේ මහද්ගත විපාකය එසේ නොවෙයි. මේ වනාහි ඒකාන්තයෙන්ම සදෘශ විපාක උපදවන හෙයින් සමානඵල ඇත්තේම වේද එහෙයින්ය යන අර්ථයි. මෙහිද "කුසලං" යී නොකීවද "කාමාවචර පුඤ්ඤකදංච" යී උපමාකරණලද හෙයින් උපමේයයාගේ ද කුසලභාවය හැඟෙයි.

කුමක්හෙයින් මේ මහද්ගත කුසලය සදෘශවිපාක වේද? කාමාවචරකුසලය මෙන් අසදෘශ විපාක නොවන්නේ දැයි යන චෝද්‍යය සඳහා පරිහාර කියනුලැබේ. ඒ එසේමැයි කාමාවචර කුසලය රැස්කරණුයේ රූප තෘෂ්ණාදි නානාවස්තුක කාමතෘෂ්ණාව උපනිශ්‍රය වීමෙන් හෙවත් හේතු වීමෙන් රැස්කෙරෙයි. එහෙයින් ඒ නානාවස්තුක කාමතෘෂ්ණාව උපනිශ්‍රය කොට ඇති කුසලය තෙමේ ඊට සුදුසු පරිද්දෙන් නානාවස්තුක විපාකය උපදවයි. මහද්ගත කුසලය රැස්කරණුයේ ඒකවස්තුකවූම භව තෘෂ්ණාවගේ වශයෙන් රැස්කෙරෙයි. එහෙයින් ඒ මහද්ගත කුසල්තෙමේ ඊට සුදුසු පරිද්දෙන් නානාවස්තුක විපාක නොඋපදවා ඒකවස්තුකවූම විපාක උපදවයි.

සර්වප්‍රකාරයෙන්ය යනු ධර්ම වශයෙන් හා අරමුණු වශයෙන් ද ප්‍රතිපදදීන්ගේ වශයෙන් ද තමාගේ කුසලය හා සමානය යන අර්ථයි. ඒ එසේමැයි; ස්පර්ශාදී යම් ධර්ම කෙනෙක් කුසලයෙහි ලැබෙත් ද ඒ ධර්මයෝ විපාකයෙහි ද ලැබෙත්. යම් අරමුණෙක්හි කුසලය හටගනීද එම අරමුණෙහි මෙම විපාකය ද හටගනී. යම් පමණ ප්‍රතිපදදීහු කුසලයට ලැබෙත් ද එපමණම මේ විපාකයට ලැබෙත්. ඒකාන්තයෙන් යම්කිසිවක්හුගේ ඡායා තොමෝ ඒ ඒ වස්තුව හා සමානම වේද එසේද වුවත් මහත්වූ කුසලවිපාකයට මහත්වූම උපමාවකින් වියයුතු යයි දක්වනු පිණිස "ගජාදීනං" යනාදිය කියනලදි.

"අපරේ අපරේ අත්තභාවේ භවං වේදනමස්සාති අපරාපරියවේදනං" යනු විග්‍රහ හෙයින් අනික් අනික් අත්බැවෙක්හි හටගත් වේදනාව ඇත්තේ මෝ හටනුයි අපරාපරියවේදන නම් වේ. ඉදින් අපරාපරියවේදනයක් නොවේ නම් කෙසේ වනාහි මොහුගේ විපාකෝත්පත්තිය වේ දැයි දක්වනු පිණිස "ඣානා අපරිහීනස්ස" යනාදිය කීයේයි. "කුසලානන්තරං" යනු කුසල භවයට අනතුරුව යන අර්ථයි. ඒ එසේමැයි; යම් භවයෙක්හි ඒ කුසලය කරණ ලද්දේ ද ඒ භවය තෙමේ මෙහි කුසල ශබ්දයෙන් උපචාර වශයෙන් ගන්නා ලද්දේය. කුමක් හෙයින යත්? කර්මට අනතුරුවම ඵලය ලැබෙන හෙයිනි. ඒ මහද්ගත කුසල් තෙමේ ලෝකෝත්තර කුසලය මෙන් අනතුරු විපාක නිපදවන්නේ නොවෙයි. එතකුදු වුවත් ඇතැම් කාමාවචර කුසලයක් මෙන් අපරාපර්‍යයවේද්‍ය නොවී නොයෙක් කාමාවචර කර්මයන් ඇති කල්හිදු ස්වල්ප ජලයක් වතුරුවා යන මහෝගයක් මෙන් තමාගේම විපාකය දීමෙන් ඒකාන්තයෙන් අනතුරු භවයෙහිම විපාක උපදවයි. නොපිරිහුන් ධ්‍යාන ඇත්තාවූම කිසිවක් හට නිකාන්ති වශයෙන් කාම භවයෙහි ප්‍රතිසන්ධිය දෙන්නේ නොවේද යත්? ඒ එසේමැයි; මතු බ්‍රහ්ම ලෝකෝත්පත්තිය පිණිස වඩනලද මාර්ගය ඇති තිස්ස නම් බ්‍රාහ්මණ තෙමේ භික්‍ෂූන් විසින් යාඥ කරණ ලදුයේ එයින් සැව මොග්ගලී නම් බමුණුහුගේ ගෘහයෙහි පිළිසිඳ

ගත්තේ යයි කියනලදි. හේ කෙසේ වීද යත්? නිකාන්ති බලයෙන්ම ධ්‍යානය පිරිහෙයි. එයින් පිරිහුන ධ්‍යාන ඇත්තේ උපචාර සමාධි කාමාවචර කුසල කර්ම බලයෙන් මිනිස් ලොව උපදී යයි කියත්. අන්‍ය ආචාර්යයෝ වනාහි නොවැලැක්විය හැකි අවස්ථාවෙහි වූ නිකාන්තිය කරණකොටගෙන ධ්‍යානයාගේ පිරිහීම විමසා ගතයුතු යයි කියා මහද්ගත කර්ම විපාකය වැලකීමට සමර්ථ වූ කාමාවචර කර්මයක් නැති කල්හිදු "ඉජ්ඣති භික්ඛවේ සීලවතෝ චේතෝපණිධි විසුද්ධත්තා" යි වදාළ හෙයින් කාමභවයෙහි චිත්ත ප්‍රණිධි තොමෝ මහද්ගත කර්මයාගේ විපාකය වළකා කාමාවචර කර්මයාගේ විපාකයට අවකාශ කෙරේ කියත්. (තං යුත්තං) ඒ යෙදෙයි.

මෙසේ අවිශේෂයෙන් කුසල සදෘශ බව අතිදිසනය කොට දැන් විශේෂ දක්වනු පිණිස "පටිපදක්කමෝ චේව" යනාදිය කියනලදි. යම්සේ වනාහි දුක්ඛාපටිපද දන්ධාභිඤ්ඤ ධ්‍යානය උපදවා නැවත නැවත සමවදනාහට ඒ ධ්‍යානය ඒ ප්‍රතිපදවම වේද එපරිද්දෙන්ම ඒ ඒ ධ්‍යානය නොපිරිහුනු කල්හි ඒ ඒ ධ්‍යානයාගේ විපාක උපදිනු ලබන්නේ ඒ ඒ ප්‍රතිපදවම ඇති වන්නට සුදුසු වේ.

ඡන්දධිපතෙය්‍යාදි භාවය වනාහි එකෙනෙහි විද්‍යමාන වූ ඡන්දදීන්ගේ අධිපති ප්‍රත්‍යය භාවයෙන් වෙයි. ආගමන වශයෙන් නොවෙයි. ඒ එසේමැයි; එකම ධ්‍යානයක් නානාක්‍ෂණයෙහි නානාධිපතිභාවය වෙයි. එහෙයින් විපාකයාගේ ඡන්දධිපතෙය්‍යාදීභාවය ආගමන වශයෙන් නොගන්නා ලද්දීය. එහෙයින් "අභාවෝධිපතීනං" යි කීයේයි. ඒ අභාවය හේතුකොටගෙනම ඒ විපාකයාගේ හීනාදීභාවය කෘත්‍ය සහිත වශයෙන් සම්භව නොවෙයි. එහෙයින් ඒ හීනාදීභාවය ද ධ්‍යානාගමන වශයෙන්ම කියන ලද්දීය.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 141-143 පිටු]**

රූපාවචර විපාක චිත්තයෝ තුමූ රූපාවචර භූමියෙහිම හටගනිති. රූපාවචර ක්‍රියා චිත්තයෝ තුමූ මනුෂ්‍ය භූමි, දිව්‍ය භූමි, පසළොස් රූපභූමි යන මෙතෙක් තැන්හි හටගන්නාහු වෙත්. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 33 පිට]**

රූපාවචර ධ්‍යාන උපදවා ගත් තැනැත්තා ධ්‍යානයෙන් නොපිරිහී කලුරිය කළහොත් වැරදීමක් නැතිව බ්‍රහ්ම ලෝකයේ උපදින්නේය. මරණයට අනතුරුවම ඔහුට ඔහුගේ රූපාවචර කුසලයේ ආනුභාවයෙන් බ්‍රහ්ම ලෝකයෙහි රූපාවචර ධ්‍යාන චිත්තයක් පහළ වේ. ඒ සිත එහි පහළ වීම බ්‍රහ්ම ලෝකයේ ඉපදීමය. රූපාවචර කුසල ධ්‍යානයක් උපදවාගත් අයට මරණින් මතු ඒ කුසල ධ්‍යාන චිත්තයන්ගේ ආනුභාවයෙන් බ්‍රහ්ම ලෝකයේදී උපදනා ධ්‍යාන සිත් රූපාවචර විපාක සිත්ය. එක් එක් කුසල ධ්‍යාන සිතකට විපාක සිත්ද එක බැගින් ඇති බැවින් **විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත ප්‍රථම ධ්‍යාන චිත්තය** යනාදී වශයෙන් රූපාවචර විපාක සිත් ද පසක් ඇත්තේය.

ධ්‍යාන සුවයෙන් විසිය හැකිවනු පිණිස ද, ඍද්ධි ප්‍රාතිහාර්ය කිරීමේ බලය ලබනු පිණිස ද රහත්හු ද සමහර විට ධ්‍යාන උපදවති. එසේ රහතුන් විසින් උපදවන රූපාවචර ධ්‍යාන සිත් වල මතු විපාක ඇති කිරීමේ ශක්තිය නැති බැවින් රූපාවචර ක්‍රියා නම් වේ. රූපාවචර ක්‍රියා සිත් ද **විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත ප්‍රථම ධ්‍යාන චිත්තය** යනාදීන් කුසලයසේම පසෙක් වේ. **[අභිධර්ම මාර්ගය 55-56 පිටු]**

# අරූපාවචර කුසල චිත්තයෝ:—

ආකාසානඤ්චායතනකුසලචිත්තං, විඤ්ඤාණඤ්චායතනකුසලචිත්තං, ආකිඤ්චඤ්ඤායතනකුසලචිත්තං, නේවසඤ්ඤානාසඤ්ඤායතනකුසලචිත්තං චේති ඉමානි චත්තාරිපි අරූපාවචරකුසලචිත්තානි නාම. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 18 පිට]**

**ආකාසානඤ්චායතනකුසලචිත්තං** (රූපසමතික්‍රමණය කොට කිසුණු ඉගිළුවූ අහස්හි උපදනා) ආකාසානඤ්චායතන කුසලචිත්තය ද **විඤ්ඤාණඤ්චායතනකුසල චිත්තං** (ආකාශ සමතික්‍රමණය කොට එහි ප්‍රවෘත්ත විඤ්ඤාණ ගොචර කොට ඇති) විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තය ද **ආකිඤ්චඤ්ඤායතනකුසලචිත්තං** (ප්‍රථමාරූප්‍ය සමතික්‍රමණය කොට ඔහුගේ නාස්තිත්වය විෂය කොට ඇති) ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තය ද **නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසලචිත්තඤ්චේති** (ඒ ප්‍රථමාරූප්‍යාගේ නාස්තිත්වය සමතික්‍රමණය කොට එහි ප්‍රවෘත්ත තෘතීයාරූප්‍යය අරමුණු කොට ඇති) නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තය ද යන **ඉමානි චත්තාරිපි** (රූපාදීන් ඉක්ම කසිණෝද්ඝාටප ආකාශාදීන් විෂය කොට ඇති උපේක්ෂා ඥාණසම්ප්‍රයුක්ත කුසලානන්තරයෙහි භාවනාමයව උපදනා) මොහු සතර දෙනම **අරූපාවචරකුසලචිත්තානි නාම** අරූපාවචර කුසලචිත්තයෝ නම් වෙත්. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 24-25 පිටු]**

**අරූපාවචරං** චතුන්නං ආරුප්පානං යෝගවසේන චතුබ්බිධං. වුත්තප්පකාරේන හි ආකාසානඤ්චායතනජ්ඣානේන සම්පයුත්තං පඨමං, විඤ්ඤාණඤ්චායතනාදීහි දුතියතතියචතුත්ථානි.
**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 452 යටතේ); විසුද්ධිමග්ග අටුවා 339 පිට (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය විඤ්ඤාණස්කන්ධ නිර්දේශය 195 පිට (තායිවාන් මුද්‍රණය)]**

රූපසඤ්ඤාසමතික්කමාදිනා සමධිගන්තබ්බං **අරූපාවචරං. චතුන්නං අරූපාන**න්ති උපෙක්ඛාසමාධිසඞ්ඛාතේහි චතූහි අරූපජ්ඣානේහි. කරණේ හි ඒතං සාමිවචනං. අරූපානං වා යෝ ආරම්මණාදිකතෝ සම්පයුත්තධම්මේහි යෝගෝ යෝගභේදෝ, තස්ස වසේන. **වුත්තප්පකාරේනාති** හෙට්ඨා **ආරුප්පකථායං** (විසුද්ධි. 1.275 ආදයෝ) වුත්තප්පකාරේන. **පඨම**න්ති පඨමං අරූපාවචරකුසලචිත්තං. **දුතියතතියචතුත්ථානීති** එත්ථාපි ඒසේව නයෝ. තානිමානි භාවනාමයානේව හුත්වා යථානුපුබ්බං කසිණුග්ඝාටිමාකාසං, පඨමාරුප්පවිඤ්ඤාණං, නත්ථිභාවං, ආකිඤ්චඤ්ඤායතනන්ති ඉමානි ආලම්බිත්වා උපෙක්ඛාසහගතඤාණසම්පයුත්ත කුසලානන්තරං උප්පජ්ජිත්වා චතූසු අරූපිබ්‍රහ්මලෝකේසු පටිසන්ධිපවත්තිවිපාකදායීනි. සේසං පනෙත්ථ යං වත්තබ්බං, තං හෙට්ඨා වුත්තමේව **[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 452 යටතේ)]**

**අරූපාවචරං** අරූපාවචර කුසල චිත්තය තෙමේ **චතුන්නං ආරුප්පානං** සතර අරූප ධ්‍යානයන් හා **යෝගවසේන** යෙදීම් වශයෙන් **චතුබ්බිධං** සතර වැදෑරුම් වෙයි **හි** ඒ එසේමැයි **වුත්තප්පකාරේන** පඨවිකසිණ නිර්දේශයෙහි කී ආකාරයෙන් **ආකාසානඤ්චායතනඣානේන** ආකාසානඤ්චායතන ධ්‍යානය හා **සම්පයුත්තං** සම්ප්‍රයුක්තවූයේ **පඨමං** ප්‍රථම අරූපාවචර කුසලචිත්තය නම් **විඤ්ඤාණඤ්චායතනාදීහි** විඤ්ඤාණඤ්චායතන ධ්‍යානාදීන් හා (**සම්පයුත්තං** සම්ප්‍රයුක්තවූයේ) **දුතියතතියචතුත්ථානි** ද්විතීය තෘතීය චතුර්ථ අරූපාවචර කුසල චිත්තයෝ නම් වෙත්.

**අරූපාවචරං** රූප සංඥා සමතික්‍රමනාදීන් පැමිණිය යුතු වූ අරූපාවචර කුසලය **චතුන්නං ආරුප්පානං යෝගවසේන** උපේක්‍ෂා සමාධි සඞ්ඛ්‍යාත වූ සතර අරූප ධ්‍යානයන් හා යෝග වශයෙන් (මේ සාමීවචනය කරණ කාරකයෙහි වේ) නොහොත් අරූප ධ්‍යානයන්ගේ ආලම්බනාදී වශයෙන් කරනලද සම්ප්‍රයුක්ත ධර්මයන් සමඟ යම් යෙදීමක් හෝ යෝගභේදයක් හෝ වේද ඒ භේදයාගේ වශයෙන් **වුත්තප්පකාරේන** යට ආරුප්‍ය කථායෙහි උක්ත ප්‍රකාරයෙන් **පඨමං** පළමුවන අරූපාවචර කුසල චිත්තයයි "දුතියතතියචතුත්ථානි" යනුදු මෙසේමැයි. මොහු භාවනාමයවම යථානුපූර්වයෙන් කිසුණු ඉගුළුවූ ආකාශය ප්‍රථමාරූප්‍ය විඥ්ඥාණය උහුගේම නාස්තිත්වය ආකාඤ්චඤ්ඤායතනය යන මෙහුන් අරමුණු කොට උපේක්‍ෂාසහගිය ඥාණසම්ප්‍රයුක්ත කුසලානන්තරයෙහි ඉපිද සතර අරූපාවචර බ්‍රහ්මලෝකයෙහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දෙන්නාහුයි. සෙස්ස යට කී නියෙන්ම දතයුතුයි. **[විසුද්ධි මාර්ග මහා සන්නය 1087 පිට]**

## අරූපාවචර කුසල චිත්තය විස්තර කර ඇති ආකාරයඃ—

ඉදානි අරූපාවචරං ආරම්මණභේදේන චතුධා විභජිත්වා දස්සෙන්තෝ ආහ **"ආකාසානඤ්චායතනා"**තිආදි. තත්ථ උප්පාදදිඅන්තරහිතතාය නාස්ස අන්තෝති අනන්තං, ආකාසඤ්ච තං අනන්තඤ්චාති ආකාසානන්තං, කසිණුග්ඝාටිමාකාසෝ. "අනන්තාකාස"න්ති ච වත්තබ්බේ "අග්‍යාහිතෝ"ත්‍යාදීසු විය විසේසනස්ස පරනිපාතවසේන "ආකාසානන්ත"න්ති වුත්තං. ආකාසානන්තමේව ආකාසානඤ්චං සකත්ථේ භාවපච්චයවසේන. ආකාසානඤ්චමේව ආයතනං සසම්පයුත්තධම්මස්ස ඣානස්ස අධිට්ඨානට්ඨේන දේවානං දේවායතනං වියාති ආකාසානඤ්චායතනං. තස්මිං අප්පනාප්පත්තං පඨමාරුප්පජ්ඣානම්පි ඉධ "ආකාසානඤ්චායතන"න්ති වුත්තං යථා පඨවීකසිණාරම්මණං ඣානං "පඨවීකසිණ"න්ති. අථ වා ආකාසානඤ්චං ආයතනං අස්සාති ආකාසානඤ්චායතනං, ඣානං, තේන සම්පයුත්තං කුසලචිත්තං **ආකාසානඤ්චායතනකුසලචිත්තං**.

විඤ්ඤාණමේව අනන්තං විඤ්ඤාණානන්තං, පඨමාරුප්පවිඤ්ඤාණං. තඤ්හි උප්පාදදිඅන්තවන්තම්පි අනන්තාකාසේ පවත්තනතෝ අත්තානං ආරබ්භ පවත්තාය භාවනාය උප්පාදදිඅන්තං අග්ගහෙත්වා අනන්තතෝ ඵරණවසේන පවත්තනතෝ ච "අනන්ත"න්ති වුච්චති. විඤ්ඤාණානන්තමේව විඤ්ඤාණඤ්චං ආකාරස්ස රස්සත්තං, න-කාරස්ස ලෝපඤ්ච කත්වා. දුතියාරුප්පවිඤ්ඤාණේන වා අඤ්චිතබ්බං පාපුණිතබ්බන්ති විඤ්ඤාණඤ්චං, තදේව ආයතනං දුතියාරුප්පස්ස අධිට්ඨානත්තාති **විඤ්ඤාණඤ්චායතනං**. සේසං පුරිමසමං.

නාස්ස පඨමාරුප්පස්ස කිඤ්චනං අප්පමත්තකං අන්තමසෝ භඞ්ගමත්තම්පි අවසිට්ඨං අත්ථීති අකිඤ්චනං, තස්ස භාවෝ **ආකිඤ්චඤ්ඤං,** පඨමාරුප්පවිඤ්ඤාණාභාවෝ. තදේව ආයතනන්ත්‍යාදි පුරිමසදිසං.

ඕළාරිකාය සඤ්ඤාය අභාවතෝ, සුඛුමාය ච සඤ්ඤාය අත්ථිතාය නේවස්ස සසම්පයුත්තධම්මස්ස සඤ්ඤා අත්ථි, නාපි අසඤ්ඤං අවිජ්ජමානසඤ්ඤන්ති නේවසඤ්ඤානාසඤ්ඤං, චතුත්ථාරුප්පජ්ඣානං. දීඝං කත්වා පන "නේවසඤ්ඤානාසඤ්ඤ"න්ති වුත්තං. නේවසඤ්ඤානාසඤ්ඤමේව ආයතනං මනායතනධම්මායතනපරියාපන්නත්තාති නේවසඤ්ඤානාසඤ්ඤායතනං. අථ වා

සඤ්ඤාව විපස්සනාය ගෝචරභාවං ගන්ත්වා නිබ්බේදජනනසඞ්ඛාතස්ස පටුසඤ්ඤාකිච්චස්ස අභාවතෝ නේවසඤ්ඤා ච උණ්හෝදකේ තේජෝධාතු විය සඞ්ඛාරාවසේසසුඛුමභාවේන විජ්ජමානත්තා න අසඤ්ඤාති නේවසඤ්ඤානාසඤ්ඤා, සා ඒව ආයතනං ඉමස්ස සසම්පයුත්තධම්මස්ස ඣානස්ස නිස්සයාදිභාවතෝති නේවසඤ්ඤානාසඤ්ඤායතනං. සඤ්ඤාවසේන චෙත්ථ ඣානූපලක්ඛණං නිදස්සනමත්තං. වේදනාදයෝපි හි තස්මිං ඣානේ නේවවේදනානාවේදනාදිකායේවාති. නේවසඤ්ඤානාසඤ්ඤායතනේන සම්පයුත්තං කුසලචිත්තං **නේවසඤ්ඤානාසඤ්ඤායතනකුසලචිත්තං**. **පි**-සද්දේන චෙත්ථ ආරම්මණප්පටිපදමිස්සකනයවසේන සෝළසක්ඛත්තුකදේසනං (ධ. ස. 265-268), අඤ්ඤම්පි ච **පාළියං** ආගතනයභේදං සඞ්ගණ්හාති.

ආරම්මණානං අතික්කමිතබ්බානං, කසිණාකාසවිඤ්ඤාණතදභාවසඞ්ඛාතානං ආලම්බිතබ්බානඤ්ච ආකාසාදිචතුන්නං ගෝචරානං පභේදේන ආරුප්පමානසං චතුබ්බිධං හෝති. තඤ්හි යථාක්කමං පඤ්චමජ්ඣානාරම්මණං කසිණනිමිත්තං අතික්කම්ම තදුග්ඝාටෙන ලද්ධං ආකාසමාලම්බිත්වා තම්පි අතික්කම්ම තත්ථ පවත්තං විඤ්ඤාණමාලම්බිත්වා තම්පි අතික්කම්ම තදභාවභූතං අකිඤ්චනභාවමාලම්බිත්වා තම්පි අතික්කම්ම තත්ථ පවත්තං තතියාරුප්පවිඤ්ඤාණමාලම්බිත්වා පවත්තති, න පන රූපාවචරකුසලං විය පුරිමපුරිමඅඞ්ගාතික්කමවසේන පුරිමපුරිමස්සාපි ආරම්මණං ගහෙත්වා. තේනාහු ආචරියා;

"ආරම්මණාතික්කමතෝ, චතස්සෝපි භවන්තිමා;
අඞ්ගාතික්කමමේතාසං, න ඉච්ඡන්ති විභාවිනෝ"ති; (ධ. ස. අට්ඨ. 268);

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 26-30 යටතේ); විභාවනී ටීකා සන්නය 70-76 පිටු; සද්ධර්මසාගරය 02/448-449 පිටු]**

**ඉදනි** දැන් වනාහි **අරූපාවචරං** අරූපාවචර චිත්තය **ආලම්බණභේදේන** ආලම්බණ ප්‍රභේදයෙන් **චතුධා** සතර පරිද්දෙකින් **විභජිත්වා** බෙද **දස්සෙන්තෝ** දක්වනු කැමති වූ (**ආචරියෝ** අනුද්ධාචරිය තෙමේ) **ආකාසානඤ්චායතනන්තයාදි** ආකාසානඤ්චායතනං යනාදිය **ආහ** කීයේය **තත්ථ** ඒ ආකාසානඤ්චායතනං යනාදී පාඨයෙහි **අත්ථෝ** අර්ථය **ඒවං** මෙසේ වක්‍ෂ්‍යමානාකාරයෙන් **වේදිතබ්බෝ** දතයුතුයි **උප්පාදදීඅන්තරහිතතාය** උත්පාදක්‍ෂණාදී පිරිසිඳීම් රහිත බැවින් **අස්ස** ඒ ආකාශයට (ආකාශයාගේ හෝ) **අන්තෝ** පරිච්ඡේද තෙමේ **නත්ථි** නැත්තේ ද **ඉති (තස්මා) තං ආකාසං** ඒ ආකාශ තෙමේ **අනන්තං** අනන්ත නම් වේ (නාස්ස අන්තෝති අනන්තං යන විග්‍රහ මාත්‍රයක් කටයුතුයි)

("උප්පාදදීඅන්තරහිතතාය" යන පාඨයෙන් ආකාශයාගේ උත්පාද ස්ථිති භඞ්ග යයි කියනලද පරිච්ඡේද රහිත බව දක්වමින් ආකාශ යයි එක් පරිච්ඡේදයක් අවිද්‍යමාන බව වැළැක්වූහ) **යං (ධම්මජාතං)** යම් ස්වභාව ධර්මයක් තෙමේ **ආකාසානඤ්ච හෝති** අහසත් වේද **තං** ඒ අහස් තෙමේ **අනන්තඤ්ච හෝති** උත්පාදදී පරිච්ඡේදයකුත් නැත්තේ වේද **ඉති (තස්මා) තං (ධම්මජාතං)** ඒ ස්වභාව ධර්ම තෙමේ **ආකාසානන්තං** ආකාසානන්ත නම් වේ **කසිණුග්ඝාටිමාකාසෝ** කිසුණු උගුළුවා ලබනලද අහස **ලබ්භති** ලැබෙයි.

("කසිණස්ස උග්ඝාටෝ කසිණුග්ඝාටෝ" යී ෂෂ්ඨී තත්පුරුෂ සමාස කොට "කඨිණුග්ඝාටේන ලද්ධෝ කඨිණුග්ඝාටිමෝ" යී ලබ්ධ තද්ධිත විග්‍රහ කටයුතුයි. "අනන්ත" යන පද තෙමේ විශේෂණ වූ හෙයින් "අනන්තාකාසං" යී විශේෂණ පදය පූර්වයෙහි තබා කියයුතු තන්හි කුමක් හෙයින් අපරභාගයෙහි තැබුයේදැයි යන චෝද්‍යය සඳහා "අනන්තාකාසන්ති -පෙ- වුත්තං" යන පාඨය කියනලදි)

**අනන්තාකාසන්ති** අනන්ත ආකාසයයි **වත්තබ්බේ** කියයුතු තන්හි **අග්‍යාහිතෝති ආදීසු විය** අග්‍යාහිතෝ යනාදී පාඨයෙහි මෙන් **විසේසනස්ස** විශේෂණ පදයාගේ **පරනිපාතවසේන** අපරභාගයෙහි හේලීම් වශයෙන් **ආකාසානන්තන්ති** ආකාසානන්ත යයි **වුත්තං** කියනලදි (අග්‍යාහිතෝ යනු පුදනලද ගිනි දෙවියා ඇති බ්‍රාහ්මණ තෙමේය යනාර්ථයි. "අනන්තාකාසන්ති ච" යන්නෙහි "ච" ශබ්දය වාක්‍යාරම්භයෙහිය. ආදී ශබ්දයෙන් "භණ්ඩජාතෝ සෝමනස්සජාතෝ" යනාදී උදහරණ ගැණේ. "අග්ගි අග්ගිතෝ පූජිතෝ යේනාති අග්‍යාහිතෝ" යී තෘතියා බහුබ්බීහි සමාස කටයුතුයි) **ආකාසානන්තමේව** අපරිච්ඡේදකාශයම **සකත්ථේ** ස්වාර්ථයෙහි **භාවපච්චයවසේන** භාව ප්‍රත්‍යයාගේ වශයෙන් **ආකාසානඤ්ච** ආකාසානඤ්ච නම් වේ (භාවපච්චයවසේන යනු "ණ්‍යත්තතා" යන සූත්‍රයාගේ යෝග විභාග වශයෙන් ආදේශ වන්නාවූ ණ්‍ය-ප්‍රත්‍යය යයි කී නියායි. ආකාසානන්ත ශබ්දය තබා ණ්‍ය-ප්‍රත්‍යයාදේශ කොට ණ-කාරානුබන්ධය ලොප් කොට න්ත-ශබ්දය හා ය-කාරය සංයෝග කොට මහාපදේස සූත්‍රයෙන් ත්‍යක්ෂරයට ච-කාරාදේශ කොට නන්ත යන්නෙහි න-කාර සංයෝගය හා න-කාරයට නිග්ගහීතාදේශය ද කොට "ආකාසානඤ්ච" යන පදය සිද්ධයි)

**ආකාසානඤ්චමේව** අපරිච්ඡේදකාශයම **සසම්පයුත්තධම්මස්ස** සමුප්‍රයුක්ත ධර්ම සහිත වූ **අස්ස (ඣානස්ස)** මේ ධ්‍යානයට **අධිට්ඨානට්ඨේන** ආධාර ස්ථාන වන අර්ථයෙන් **දේවානං** දෙවියන්ගේ **ආයතනං** ආධාර ස්ථානය **දේවායතනං විය** දේවායතන නම් වන්නාක් මෙන් **ආයතනං හෝති** ආධාර ස්ථාන වෙයි **ඉති (තස්මා) ආකාසානඤ්චායතනං** ආකාසානඤ්චායතන නම් වෙයි (මේ විශේෂ විග්‍රහයයි. "ආකාසානඤ්චමේව ආයතනං ආකාසානඤ්චායතනං" යී අවධාරණ කම්මධාරය සමාසය කටයුතුයි. උත්පාදදී පරිච්ඡේද රහිත ආකාශ සඞ්ඛ්‍යාත ආලම්බණය ලැබෙයි. ආයතන ශබ්ද තෙමේ හටගන්නා ප්‍රදේශය, හේතුය, වාසස්ථානය, ආකරය, රාශීභූත වන තැනය, පදපූර්ණය යන මෙතෙක් අර්ථයෙහි පවත්නා හෙයින් මෙහි ආධාරාර්ථයෙහි පවත්නා බව දක්වන පිණිස "අධිට්ඨානට්ඨේන" යන විශේෂණය කරනලදි. "සසම්පයුත්තධම්මස්ස ඣානස්ස" යන පාඨය වනාහි "ආයතනං" යන පදයාගේ සම්බන්ධය පිණිස තබනලදි)

**තස්මිං** ඒ අපරිච්ඡේද කසිණය උගුළුවා ලබනලද නොපිරිසුන් අහස්හි **අප්පණාප්පවත්තං** අර්පණාවට පැමිණියාවූ **පඨමාරුප්පඣානම්පි** ප්‍රථමාරූප්‍යධ්‍යානය ද **ඉධ** මේ ආකාසානඤ්චායතනකුසලචිත්තං යන පාඨයෙහි **ආකාසානඤ්චායතනන්ති වුත්තං** ආකාසානඤ්චායතන යයි කියනලදි (මෙහි අභිප්‍රාය "ආකාසානඤ්චමේව ආයතනං ආකාසානඤ්චායතනං" යන කම්මධාරය සමාසයෙහි පරිච්ඡේද රහිත වූ කසිණය උගුළුවා ලබනලද ධ්‍යානයාගේ අරමුණ වූ අහස යයි කියනලද අරමුණම මුඛ්‍ය වශයෙන් ලැබෙතුදු ආළම්බණ තෙමේ ආළම්බණිකයාගෙන් වෙන්ව නොලැබෙන හෙයින් ආළම්බණික වූ ධ්‍යානය ද ඨානූපචාරාර්ථ වශයෙන් "ආකාසානඤ්චායතන" යයි කී නියායි) **යථා (කිං?)** කුමක්

මෙන්ද යත්? **පඨවිකසිණාරම්මණං** පොළෝකිසුණ අරමුණු කොට ඇත්තාවූ **ඣානං** ධ්‍යානය **පඨවිකසිණන්ති** පොළෝකිසුණ යයි **වුත්තං යථා** කියන ලද්දක් මෙනි **අථ වා** නොහොත් **අස්ස (ඣානස්ස)** මේ ධ්‍යානයට **ආකාසානඤ්චං** අපරිච්ඡේද ආකාශ සඞ්ඛ්‍යාතවූම **ආයතනං** ආධාරස්ථානය **අත්ථි** ඇත්තේ වේද **ඉති (තස්මා) තං ඣානං** ඒ ධ්‍යාන තෙමේ **ආකාසානඤ්චායතනං** ආකාසානඤ්චායතන නම් වේ (**ඣානං** ධ්‍යානය **ලබ්භති** ලැබේ. බහුබ්බීහි සමාසයි) **යං (කුසලචිත්තං)** යම් කුසලචිත්තයක් තෙමේ **තේන** ඒ අපරිච්ඡේද ආකාශයම අරමුණු කොට පැවැත්තාවූ ධ්‍යානය හා **සම්පයුත්තං හෝති** සම්ප්‍රයුක්ත වූයේ වේද **ඉති (තස්මා) තං කුසලචිත්තං** ඒ කුසලසිත් තෙමේ **ආකාසානඤ්චායතනකුසලචිත්තං** ආකාසානඤ්චායතන කුසලචිත්ත නම් වේ (මේ ලහුක න්‍යායයි. "ආකාසානඤ්චායතනේන සම්පයුත්තං කුසලචිත්තං ආකාසානඤ්චායතනකුසලචිත්තං" යී මධ්‍යපද ලෝප තෘතියා තත්පුරුෂය සමාස කටයුතුයි. "ආකාසානඤ්චායතනං" යන කම්මධාරය සමාස පක්‍ෂයෙහි වනාහි "ආකාසානඤ්චායතනේ පවත්තං කුසලචිත්තං ආකාසානඤ්චායතනකුසලචිත්තං" යී මධ්‍යපද ලෝප සප්තමී තත්පුරුෂ සමාස වේ)

**විඤ්ඤාණමේව** ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයම **අනන්තං** උත්පාදදී අන්තරහිත වූයේනුයි **විඤ්ඤාණානන්තං** විඤ්ඤාණානන්ත නම් වෙයි **පඨමාරුප්පවිඤ්ඤාණං** ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණය (**ලබ්භති** ලැබේ)

(ආයුෂ්මත් ටීකාචාරීනි ප්‍රථමාරූප්‍යවිඤ්ඤාණ තෙමේ විඤ්ඤාණානන්ත නැමැයි යුෂ්මත්හු විසින් කියනලදහ. එතකුදුවුවත් ප්‍රථමාරූප්‍යවිඤ්ඤාණය උත්පාදදී අනන්තයන්ගෙන් යුක්තවූයේ නොවේද? කවර හෙයකින් අනන්ත නම් වන්නේද යන චෝද්‍යය සඳහා "තං හි -පෙ- වුච්චති" යන පාඨය කියනලදි) **තං** ඒ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණය (වුච්චති යන්නෙහි සම්බන්ධයි) **උප්පාදදීඅන්නවන්තම්පි** උත්පාදදී පරිච්ඡේද ඇත්තේහිදු **අනන්තාකාසේ** උත්පාදදී පරිච්ඡේද රහිත ආකාශාලම්බණයෙහි **පවත්තනතෝ ච** හටගන්නා හෙයින් ද **අන්තානං** (ආකාශය) තමා **ආරබ්භ** අරමුණු කොට **පවත්තාය** හටගත්තාවූ **භාවනාය** කාමාවචර වූ පරිකර්ම භාවනාවගේ (පවත්තනතෝ යන්නෙහි සම්බන්ධයි) **උප්පාදදීඅන්තං** උත්පාදක්‍ෂණාදී පරිච්ඡේදය **අග්ගහෙත්වා** නොගෙන **අනන්තතෝ** අපරිච්ඡේද වශයෙන් **ඵරණවසේන** පැතිරීම් වශයෙන් **පවත්තනතෝ ච** හටගන්නා හෙයින් ද **අනන්තන්ති** අනන්තං යී **හි (යස්මා)** යම් හෙයකින් **වුච්චති** කියනු ලැබේද **තස්මා** එසේ හෙයින් **පඨමාරුප්පවිඤ්ඤාණං** ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණ තෙමේ **අනන්තං** අනන්ත නම් වේ (මෙසේ අර්ථ යෝජනා කටයුතුයි. මේ පළමුවන අර්ථ යෝජනාවයි. දෙවන අර්ථ යෝජනාව මෙසේයි)

**විඤ්ඤාණමේව අනන්තන්ති** විඤ්ඤාණමේව අනන්තං යී **යං වචනං** යම් වචනයක් **මයා** මා විසින් **වුත්තං** කියනලද ද (හි යනු තදේවයුත්තං යනාර්ථයි) **තං** ඒ වචනය -පෙ- **වුච්චති** කියනු ලැබේ (මෙසේ අර්ථ යෝජනා කටයුතුයි. පූර්ව විකල්පයෙහි හි ශබ්දය කරණාර්ථයෙහි වැටේ. පශ්චිම විකල්පයෙහි දළ්හි කරණාර්ථයෙහි නිපාතයි. "තං හි -පෙ- පවත්තනතෝ" යන පාඨයෙන් අරමුණු වූ අනන්තාකාශයෙහි ආළම්බණික වූ විඤ්ඤාණය ආරෝපණය කොට ආළම්බණික වූ විඤ්ඤාණය ද අනන්ත යැයි කී බැවින් ඨානූපචාර යයි දතයුතුයි. "අත්තානං -පෙ- පවත්තනතෝ" යන පාඨයෙන් හේතු වූ භාවනාවෙහි ඵලභූත වූ විඤ්ඤාණය

ආරෝපණය කොට ඵලභූත වූ විඤ්ඤාණය ද අනන්ත යයි කී හෙයින් ඵලූපචාර වශයෙන් කීයේ යයි දතයුතුයි)

**විඤ්ඤාණන්තමේව** උත්පාදදී අන්ත රහිත ආකාශාලම්බණයෙහි හටගත්තා වූ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයම (හෙවත් විඤ්ඤාණානන්ත ශබ්දයම) **ආකාරස්ස** ආ-කාරය හට **රස්සත්තං කත්වා** හ්‍රස්ව බව කොට **නකාරස්ස** න-කාරයාගේ **ලෝපඤ්ච කත්වා** ලෝපය ද කොට **විඤ්ඤානඤ්චං** විඤ්ඤානඤ්ච නම් වේ (විඤ්ඤාණා යන්නෙහි ආ-කාරයට හ්‍රස්ව ද විඤ්ඤාණන්ත ශබ්දයෙහි න-කාර ලෝපය ද කොට ත්‍යක්ෂරයට ච-කාරාදේශ කොට න-කාර සංයෝගයට නිග්ගහීත ද ඒ නිග්ගහීතයට ච-කාරාදේශ කොට "ආකාසානඤ්චං" යන පදය සිද්ධයි. සෙස්ස ආකාසානඤ්ච යන පදයට සමාන කොට සිද්ධ කටයුතු) **වා** නොහොත් **යං (පඨමවිඤ්ඤාණං)** යම් පළමුවෙනි අරූපධ්‍යාන චිත්තයකට **දුතියාරුප්පවිඤ්ඤාණේන** දෙවෙනි අරූපාවචර ධ්‍යාන චිත්තය කරණකොටගෙන **ආරම්මණකරණවසේන** අරමුණු කිරීම් වශයෙන් (මේ වනාහි ක්‍රියා විශේෂණයි) **අඤ්චිතබ්බං (පාපුණිතබ්බං)** පැමිණිය යුතු වේද **ඉති (තස්මා) තං පඨමාරුප්පවිඤ්ඤාණං** ඒ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණ තෙමේ **විඤ්ඤාණඤ්චං** විඤ්ඤාණඤ්ච නම් වේ **තදේව** ඒ ද්විතීයාරූප්‍ය විඤ්ඤාණය විසින් පැමිණිය යුතුවූ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයම **දුතියාරුප්පස්ස** දෙවෙනි අරූපාවචර ධ්‍යාන සිතට **අධිට්ඨානත්තා** ආධාරස්ථාන බැවින් **ආයතනං හෝති** අරමුණු වේ **ඉති (තස්මා) විඤ්ඤාණඤ්චායතනං** විඤ්ඤාණඤ්චායතන නම් වේ **සේසං** සෙසු විස්තරය **පුරිමසමං** පෙර කී "ආකාසානඤ්චායතනකුසලචිත්තං" යන පදය හා සමාන වේ (තදේවායතනං යන පාඨයෙන් "විඤ්ඤාණඤ්චායතනං" යන පදයාගේ අවධාරණ කම්මධාරය සමාස බව කීයේය. "සේසං" යන පදයාගේ අර්ථය "තස්මිං අත්තනාප්පවත්තං" යනාදී වාක්‍යයයි) **අස්ස (පඨමාරුප්පස්ස)** ඒ පළමුවන අරූප විඤ්ඤාණයාගේ **කිඤ්චනං (අප්පමත්තකං)** ස්වල්පමාත්‍ර වූද **අන්තමසෝ** යටත් පිරිසෙයින් **භවඞ්ගමත්තම්පි** භවඞ්ගක්ෂණ මාත්‍රයෙකුදු **අවසිට්ඨං** ඉතිරි වූයේ **න අත්ථි** නැත්තේ වේද **ඉති (තස්මා) තං පඨමාරුප්පවිඤ්ඤාණං** ඒ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණ තෙමේ **ආකිඤ්චනං** ආකිඤ්චන නම් වේ (මේ ටීකා ගත විග්‍රහයයි. "නත්ථි අස්ස කිඤ්චනන්ති ආකිඤ්චනං" ෂෂ්ඨී බහුබ්බීහි සමාස කරනු) **තස්ස** ඒ භවඞ්ග මාත්‍රයෙකුදු අවශිෂ්ට නොවූ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයාගේ **භාවෝ** ස්වභාවය **ආකිඤ්චඤ්ඤං** ආකිඤ්චඤ්ඤ නම් වේ (භාව තද්ධිතයි) **පඨමාරුප්පවිඤ්ඤාණාභාවෝ** ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයාගේ අවිද්‍යමාන භාව සඞ්ඛ්‍යාත නත්ථිභාවප්‍රඥප්තිය (**ලබ්භති** ලැබේ) **තදේව ආයතනන්ති ආදී** තදේව ආයතනං යනාදී වචන තෙමේ **පුරිමසමං** පෙර කී "ආකාසානඤ්චායතනං" යන පදයාගේ අර්ථය හා සම වේ **ඕළාරිකාය** ඖදරික වූ (හෙවත් ලාමක වූ) **සඤ්ඤාය** සංඥාවගේ අභාවතෝ ච නැති හෙයින් ද **සුඛුමාය** සියුම් වූ (හෙවත් ප්‍රණීත වූ) **සඤ්ඤාය** සංඥාවගේ **අත්ථිතාය ච** ඇති හෙයින් ද **සසම්පයුත්තධම්මස්ස** සම්ප්‍රයුක්ත ධර්ම සහිත වූ **අස්ස (ඣානස්ස)** මේ ධ්‍යානයට **සඤ්ඤා** ඖදරික වූ සංඥා තොමෝ **නේව අත්ථි** නොම ඇත්තේයි **අසඤ්ඤං (අවිජ්ජමානසඤ්ඤම්පි)** සියුම් වූ සංඥාවගේ අවිද්‍යමානභාවය ද **න හෝති** නොවන්නේ වේද **ඉති (තස්මා) තං ඣානං** ඒ ධ්‍යානං **නේවසඤ්ඤානාසඤ්ඤං** නේවසඤ්ඤානාසඤ්ඤ නම් වේ **චතුත්ථාරුප්පඣානං** සතරවන අරූප ධ්‍යානය (**ලබ්භති** ලැබේ. මේ ලහුක න්‍යායයි. ගරුක න්‍යාය වනාහි "නේවසඤ්ඤාති නේවසඤ්ඤං, නාස්ස අසඤ්ඤාති නාසඤ්ඤං" යී බහුබ්බීහි සමාස කොට "නේවසඤ්ඤඤ්ච තං නාසඤ්ඤඤ්චාති නේවසඤ්ඤානාසඤ්ඤ" යී කම්මධාරය සමාසය කටයුතුයි)

(ආයුෂ්මත් ටීකාචාරීනි ඖදරික සංඥවක් නැති හෙයින් ද සියුම් වූ සංඥවක් නැත්තේත් නොවන හෙයින් ද "නේවසඤ්ඤානාසඤ්ඤ" යයි කිවයුතු තන්හි කුමක් හෙයින් "නේවසඤ්ඤානාසඤ්ඤා" යී කීයේදැයි යන චෝද්‍යය සඳහා "දීඝං කත්වා පන -පෙ- වුත්තං" යන පාඨය කියනලදි) **දීඝං කත්වා පන** දීර්ඝ කොට වනාහි **නේවසඤ්ඤානාසඤ්ඤාන්ති** නේවසඤ්ඤානාසඤ්ඤා යී කියනලදි (දීඝං කත්වා යනු වනාහි නේවසඤ්ඤං නාසඤ්ඤං යී කියයුතු වූද පද සෝභනත්වය පිණිස "නේවසඤ්ඤ" යන්නෙහි ඤ-කාර අවයවය දීර්ඝ කොට නේවසඤ්ඤානාසඤ්ඤා යී කියනලදැයි කී නියායි) **නේවසඤ්ඤානාසඤ්ඤමේව** නේවසංඥනාසංඥයතන ධ්‍යානයම **මනායතනධම්මායතනපරියාපන්නත්තා** මනායතන ධර්මායතනයෙහි ඇතුළත් වූ හෙයින් **ආයතනං හෝති** සම්ප්‍රයුක්ත ධර්මයන්ට ආධාරස්ථාන වෙයි **ඉති (තස්මා) නේවසඤ්ඤානාසඤ්ඤායතනං** නේවසඤ්ඤානාසඤ්ඤායතන නම් වේ ("නේවසඤ්ඤානාසඤ්ඤමේව ආයතනං නේවසඤ්ඤානාසඤ්ඤායතනං" යී අවධාරණ කම්මධාරය සමාස කටයුතුයි. මේ "නේවසඤ්ඤානාසඤ්ඤායතනං" යන පදයෙහි ආයතන ශබ්ද තෙමේ ආකාසානඤ්චායතන ශබ්දදියෙහි මෙන් ආළම්බණ වාචක නොව මනායතය ධර්මායතන වාචක වේ යයි දක්වනු පිණිස "මනායතනධම්මායතනපරියාපන්නත්තා" යන හේත්වාර්ථය කියනලදි. මෙසේ බහුබ්බීහි සමාස වශයෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතන ශබ්දයාගේ ව්‍යුත්පත්තිය දක්වා දැන් වනාහි කම්මධාර සමාසය දක්වනු පිණිස "අථ වා" යනාදී පාඨය කියනලදි)

**අථ වා** නොහොත් **සඤ්ඤාව** සංඥා තොමෝම **නේවසඤ්ඤාව හෝති** නේවසංඥාත් වේද **න අසඤ්ඤාව හෝති** න අසංඥාත් වේද **විපස්සනාය** විදර්ශනා ප්‍රඥවට **ගෝචරභාවං** ගොදුරු බවට **ගන්ත්වා** ගොස් **නිබ්බේදජනනසඞ්ඛාතස්ස** සංස්කාර ධර්මයන් කෙරෙහි කලකිරීම ඉපදවීම යයි කියනලද **පටුසඤ්ඤාකිච්චස්ස** ව්‍යක්ත වූ සංඥා කෘත්‍යයාගේ **අභාවතෝ** අවිද්‍යමාන හෙයින් **සඤ්ඤාව** ව්‍යක්ත වූ සංඥවක් ද **නේව හෝති** නොවන්නේමැයි (නොහොත්) **නේවසඤ්ඤාව හෝති** නේවසංඥා නම් ද වෙයි **උණ්හෝදකේ** උණු දියෙහි **තේජෝධාතු විය** ඇත්තාවූ තේජෝධාතුව මෙන් **සඞ්ඛාරාවසේස සුඛුමභාවේන** ඖදරික වූ සංස්කාර ධර්මයන් කෙරෙන් අවශිෂ්ට වූ සියුම් සංස්කාර ධර්මයන් ඇති හෙයින් **සඤ්ඤාය** සංඥවගේ (මේ සම්බන්ධයයි) **විජ්ජමානත්තා** ප්‍රකටව ඇති හෙයින් **අසඤ්ඤාව න හෝති** සංඥව නැත්තේ ද නොවෙයි **ඉති (තස්මා) නේවසඤ්ඤානාසඤ්ඤා** නේවසංඥානාසංඥා නම් වේ.

("නේවසඤ්ඤානාසඤ්ඤා චාති නේවසඤ්ඤානාසඤ්ඤා" යී කම්මධාරය සමාස කටයුතු. "උණ්හෝදකේ තේජෝධාතු විය" යන පාඨයෙහි අභිප්‍රාය මෙසේයි. ආපෝධාත්වාධික කලාප සඞ්ඛ්‍යාත උණු දියෙහි උෂ්ණ සඞ්ඛ්‍යාත සියුම් වූ තේජෝ ධාතුවක් ඇත්තාක් මෙන් සියුම් වූ සංඥව ඇති හෙයින් සංඥව නැත්තේ යයි ද නොකිය යුතුය යනු භාවයි) **සා ඒව** ඒ ප්‍රකට සංඥා ද නොවූ සියුම් සංඥා ස්වභාව නොවන්නේ ද නොවූ සංඥා තොමෝම **සසම්පයුත්තධම්මස්ස** සම්ප්‍රයුක්ත ධර්ම සහිත වූ **ඉමස්ස (ඣානස්ස)** මේ ධ්‍යානයට **නිස්සයාදීභාවතෝ** සහජාතනිශ්‍රය ප්‍රත්‍යය භාවයෙන් **ආයතනං හෝති** ආධාර ස්ථාන වෙයි **ඉති (තස්මා) නේවසඤ්ඤානාසඤ්ඤායතනං** නේවසඤ්ඤානාසඤ්ඤායතන නම් වේ.

("නේවසඤ්ඤානාසඤ්ඤා ඒව ආයතනං නේවසඤ්ඤානාසඤ්ඤායතනං" යී අවධාරණ කම්මධාරය සමාස කටයුතු. "නිස්සයාදී" යන්නෙහි ආදී ශබ්දය "පමාද ලිඛිතෝ, තබ්භාවවුත්ති වා" යනු මණිසාරමඤ්ජූසායෙහි කී බැවින් ප්‍රමාද ලිපියක් හෝ තද්භාවයෙහි ආදී ශබ්දය හෝ වියයුතුයි. "නිස්සභාවතෝ" යනු සුද්ධ පාඨයි. ඉඳින් ටීකාචාර්‍ය්‍යයන් විසින් ආදී ශබ්දය යොදන ලද්දේ නම් තද්භාව අර්ථයෙහි මුත් වෙන අර්ථයක නොවැටෙන බව දතයුතුයි) **එත්ථ** මේ සතරවෙනි අරූප විඤ්ඤාණයෙහි **සඤ්ඤාවසේන** සංඥාවගේ වශයෙන් **ඣානූපලක්ඛණං** ධ්‍යානය සලකුණු කිරීම (හෙවත් හැඳින්වීම) **නිදස්සනමත්තං** උදාහරණ මාත්‍රයෙකි (නිදස්සන න්‍යාය මාත්‍රයෙකැයි කී නියායි)

**තස්මිං ඣානේ** ඒ ධ්‍යානයෙහි **වේදනාදයෝපි** වේදනාදී වූ ධර්මයෝ ද **නේවවේදනානාවේදනාධිකා යේව හොන්ති** නේවවේදනානාවේදනාදීහුම වෙත් (ඉති ශබ්දය පරිසමාපණාර්ථයි) **යං (කුසලචිත්තං)** යම් කුසල චිත්තයක් තෙමේ නේ**වසඤ්ඤානාසඤ්ඤායතනේන** ඖදාරික සංඥාව ද නැත්තාවූ සියුම් සංඥාව ද නැත්තේ ද නොවන්නා වූ ධ්‍යානය නම් වූ ආධාරය හා **සම්පයුත්තං** එක්ව යෙදුනේ වේද **ඉති (තස්මා) තං කුසලචිත්තං** ඒ කුසලචිත්ත තෙමේ **නේවසඤ්ඤා නාසඤ්ඤායතනකුසලචිත්තං** නේවසඤ්ඤානාසඤ්ඤායතනකුසලචිත්ත නම් වේ.

**එත්ථ** මේ "ඉමානි චත්තාරිපි" යන නිගමනයෙහි **පිසද්දේන** පි ශබ්දය කරණකොටගෙන **ආරම්මණපටිපදාමිස්සකනයවසේන** ආලම්බණය ප්‍රතිපදාය ආලම්බණප්‍රතිපදාවන්ගේ මිශ්‍ර කිරීමය යන ක්‍රම වශයෙන් **සෝළසක්ඛත්තුකදේසනඤ්ච** සෝඩෂ වාර දේශනාව ද **අඤ්ඤම්පි** අනිකුදු **පාළියං** වදාළ පෙලෙහි **ආගතනයභේදඤ්ච** ආවාවූ ක්‍රම විශේෂය ද **සඞ්ගණ්හාති** පිඩු කෙරේ.

("සෝළසක්ඛත්තුකදේසනා" යනු දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා යන පළමුවන ප්‍රතිපදා මූලකයෙහි ද සතරාකාර වූ ආලම්බණ එකක, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා යන ද්විතීය ප්‍රතිපදා මූලකයෙහි ද සතරාකාර ආලම්බණ එකක, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා යන තෘතීය ප්‍රතිපදා මූලකයෙහි ද සතරාකාර ආලම්බණ එකක, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා යන චතුත්ථ ප්‍රතිපදා මූලකයෙහි ද සතරාකාර වූ ආලම්බණ එකකය යන මේ චතුෂ්ක චතුෂ්කයෙහි සෝළසක්ඛත්තුක දේශනාව ආයේයි. "අඤ්ඤම්පි ච ආගතනයභේදං" යනු වනාහි සෝළසක්ඛත්තුක දේශනාවෙන් අන්‍යවූ සුද්ධික එකක, චතු පටිපදා එකක, චතු ආරම්මණ එකක යන මේ එකකයන් සඳහා කියනලදි) **ආරම්මණානං (අතික්කමිතබ්බානං)** ඉක්මවිය යුතුවූ **කසිණාකාසවිඤ්ඤාණතදභාවසඞ්ඛාතානං** කසිණය, කසිණුග්ඝාටිකමාකාශය, ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණය, ඒ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයාගේ අභාව සඞ්ඛ්‍යාත නත්ථිභාව ප්‍රඥප්තියයි කියනලද **චතුන්නං** සතරාකාර වූ **ගෝචරානඤ්ච** ආලම්බණයාගේ ද **ආලම්බණානං (ආලම්බිතබ්බානං)** අරමුණු කරන ලද්දවූ **ආකාසාදී චතුන්නං** ආකාශාදී සතරාකාර වූ **ගෝචරානඤ්ච** ආලම්බණයන්ගේ ද **පභේදේන** ප්‍රභේද වශයෙන් **ආරුප්පමානසං** අරූපාවචර සිත් තෙමේ **චතුබ්බිධං හෝති** සතර වැදෑරුම් වේ ("ආලම්බණානං අතික්කමිතබ්බානං" යී කියන ලද්දේ ආලම්බණ ශබ්දයාගේ වචනාර්ථය "ආලම්බිතබ්බා අතික්කමිතබ්බාති ආලම්බණා" යී කටයුතු බැවින් "ආලම්බණානං ආලම්බිතබ්බානං" යී කියන ලද්දේ "ආලම්බිතබ්බාති ආලම්බණා" යී කටයුතු බැවිනි) **යේ (ගෝචරා)** යම් අරමුණු කෙනෙක් **ආලම්බිතබ්බා**

**(අතික්කමිතබ්බා)** ඉක්මවියයුතු වෙත් ද **ඉති (තස්මා) තේ ගෝචරා** ඒ ආලම්බණ වූ ධර්මයෝ තුමූ **ආලම්බණා** ආලම්බණයෝ නම් වෙත් **යේ (ගෝචරා)** යම් අරමුණු කෙනෙක් **ආලම්බිතබ්බා** එල්බිය යුතු වෙත් ද **ඉති (තස්මා) තේ (ගෝචරා)** ඒ ආලම්බණයෝ තුමූ **ආලම්බණා** ආලම්බණයෝ නම් වෙත් (පූර්ව විකල්පයෙහි අතික්‍රමණාර්ථ වාචක වූ ලම්බ ධාතුව හා පශ්චිම විකල්පයෙහි ආරම්මණාර්ථ වාචක වූ ලම්බ ධාතු යයිද දතයුතු)

(දැන් වනාහි ඒ වචනයාගේ විස්තර දක්වන පිණිස "තඤ්හි" යනාදී පාඨය කියනලදි. හි යනු විස්තරාර්ථයෙහි නිපාතයි) **තඤ්හි** ඒ අරූප ධ්‍යාන තෙමේ (පවත්තති යන්නෙහි කර්‍තෘව සම්බන්ධ කරනු) **යථාක්කමං** පිළිවෙළින් **පඤ්චමජ්ඣානාලම්බණං** පඤ්චමද්ධ්‍යානයට අරමුණු වූ **කසිණනිමිත්තං** කසිණ ප්‍රතිභාග නිමිත්ත යැයි කියනලද අරමුණ **අතික්කම්ම** ඉක්මවා **තදුග්ඝාටේන** ඒ කසිණ නිමිත්ත උගුළුවීමෙන් **ලද්ධං** ලබන ලද්දවූ **ආකාසං** අහස **ආලම්බිත්වා** අරමුණු කොට ගෙන **තම්පි** ඒ ආකාශාලම්බණය ද **අතික්කම්ම** ඉක්මවා **තත්‍ථ** ඒ කිසුණු උගුළුවා ලබනලද ආකාශයයි කියනලද අරමුණෙහි **පවත්තං** හටගත්තා වූ **විඤ්ඤාණං** ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණය **ආලම්බිත්වා** අරමුණු කොට ගෙන **තම්පි** ඒ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණය ද **අතික්කම්ම** ඉක්මවා **තදභාවභූතං** ඒ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයාගේ නාස්තිභාවයම වූ **අකිඤ්චනභාවං** නත්ථිභාව ප්‍රඥප්තිය **ආලම්බිත්වා** අරමුණු කොට ගෙන **තම්පි** ඒ නත්ථිභාව ප්‍රඥප්තිය ද **අතික්කම්ම** ඉක්මවා **තත්‍ථ** ඒ නත්ථිභාව ප්‍රඥප්තියෙහි **පවත්තං** හටගත්තා වූ **තතියාරුප්පවිඤ්ඤාණං** තෘතීය අරූපාවචර ධ්‍යාන චිත්තය **ආලම්බිත්වා** අරමුණු කොට ගෙන **පවත්තති** හටගනී **රූපාවචරකුසලං විය** රූපාවචර කුසලය මෙන් **පුරිම පුරිම අධිගාතික්කමවසේන** පූර්ව පූර්ව වූ අධිගයන් ඉක්මවීම් වශයෙන් **පුරිමස්ස පුරිමස්සාපි** පූර්ව පූර්ව වූ ධ්‍යානයාගේ ද **ආරම්මණං ගහෙත්වා** අරමුණ ගෙන **න පන පවත්තන්ති** නොම හටගනී **තේන** ඒ කාරණයෙන් **ආචරියා** අර්ථකථාචාර්‍යයවරයෝ **"ආරම්මණාතික්කමතෝ** -පෙ- **න ඉච්ඡන්ති විභාවිනෝති"** ආරම්මණාතික්කමතෝ -පෙ- න ඉච්ඡන්ති විභාවිනෝ යන මෙය **ආහු** කීවාහුය (උදාහරණයාගේ අර්ථ මෙසේයි)

**ඉමා** මේ අරූප සමාපත්තිහු තුමූ **ආරම්මණාතික්කමතෝ** අරමුණ ඉක්මවීම් වශයෙන් **චතස්සෝපි** සතරාකාර ඇත්තාහුදු **භවන්ති** වෙත් **ඒතාසං** ඒ අරූප සමාපත්තීන්ගේ **අධිගාතික්කමං** අධිගයන් ඉක්මවීම **විභාවිනෝ** පරමාර්ථධර්ම දන්නා පණ්ඩිතයෝ තුමූ **න ඉච්ඡන්ති** නොපසසිත්. **[විභාවනී ටීකා සන්නය 112-120 පිටු]**

ඉදානි යථානුප්පත්තං අරූපචිත්තං නිද්දිසන්තෝ ආකාසානඤ්චායතනකුසලචිත්තන්තිආදි මාහ. තත්ථ භුසෝ කාසති දිබ්බතීති **ආකාසෝ**. සෝ හි සයං සරූපතෝ අනුපලබ්භමානෝපි චන්දසූරියෝභාසාදීනං වසේන අතිවිජ්ජෝතමානෝවිය ඛායතීති. න කස්සති ඡේදන භේදන වසේන න විලේඛීයතීති අකාසෝ. අකාසෝ ඒව ආකාසෝ තිපි වදන්ති. සෝ පන අජටාකාසෝ පරිච්ඡින්නාකාසෝ කසිණුග්ඝාටිමාකාසෝ රූපකලාපපරිච්ඡේදකාසෝති චතුබ්බිධෝ හෝති. තත්ථ ඉධ කසිණුග්ඝාටිමාකාසෝ අධිප්පේතෝ. සෝ හි අනන්තේන අජටාකාසේන සහ ඒකීභූතෝවිය හෝති. යෝගිනාච අනන්තභාවේන ඵරීයති. තස්මා අනන්තෝ ආකාසෝති ආකාසානන්තෝ. නාස්ස උප්පාදන්තෝවා වයන්තෝවා පඤ්ඤායතීති අනන්තෝතිපි වුත්තං. සෝයේව ආකාසානඤ්චං. සකත්ථේ යකාරේන සහ සිද්ධත්තා. යථා පන දේවානං අධිට්ඨානවත්ථු දේවායතනන්ති වුච්චති. තථා

ඉධපි තස්මිං අප්පනාපත්තස්ස සසම්පයුත්තස්ස ඣානස්ස අධිට්ඨානට්ඨේන තදේව ආයතනන්තිපි වුච්චති. ඉති ආකාසානඤ්චං ආයතනමස්සාති ආකාසානඤ්චායතනං. චිත්තචේතසිකරාසි.

ආකාසානඤ්චා යතනන්ති ආකාසානඤ්චා යතනං සමාපන්නස්සවා උපපන්නස්සවා දිට්ඨධම්මසුඛවිහාරිස්සවා චිත්ත චේත සිකාධම්මාති හි විභඞ්ගේ වුත්තං.

ආකාසානඤ්චායතනේ පවත්තං කුසලචිත්තන්ති **ආකාසානඤ්චායතනකුසලචිත්තං**. විඤ්ඤාණඤ්චායතනන්ති ඒත්ථ විඤ්ඤාණං නාම ආකාසානඤ්චායතනචිත්තමේව. තං පන සයං උප්පාදදි අන්තවන්තංපි අනන්තසඤ්ඤිතේ ආකාසේ පවත්තනතෝ අනන්තන්ති වුච්චති. කොට්ඨාසත්ථෝවා අන්තසද්දෝ. අත්තනෝ උප්පාදදීසු කොට්ඨාසේසු ඒකදේසේ අට්ඨත්වා සකලස්ස ඵරණවසේන තදාරම්මණාය භාවනාය පවත්තනතෝ අනන්තන්ති වුච්චති. අනන්තසඤ්ඤිතේවා ආකාසේ පවත්තනතෝ අනන්තන්ති ඒවං තදාරම්මණාය භාවනාය පවත්තත්තා අනන්තන්ති වුච්චති. අනන්තසඤ්ඤිතේවා ආකාසේ අත්තනෝ ඵරණාකාර වසේනපි අනන්තන්ති වත්තුං යුජ්ජතියේව. අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණානන්තං. තමේව විඤ්ඤාණඤ්චං නිරුත්තිනයේන, විඤ්ඤාණඤ්චං ආයතනං අස්සාති **විඤ්ඤාණඤ්චායතනං**. විඤ්ඤාණඤ්චායතන සඞ්ඛාතේ චිත්තචේතසිකරාසිම්හි පවත්තං කුසලචිත්තන්තිසමාසෝ.

විඤ්ඤාණඤ්චායතනන්ති විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්සවා උපපන්නස්සවාදිට්ඨධම්මසුඛවිහාරිස්සවාචිත්තචේතසිකාධම්මාතිහි විභඞ්ගේ වුත්තං.

**විභාවනියං** පන **මහාටීකායඤ්ච** "දුතියා රුප්ප විඤ්ඤාණේන අඤ්චිතබ්බං පාපුණිතබ්බන්ති විඤ්ඤාණඤ්ච"න්තිපි වුත්තං. තං පාළියා න සමේති.

අනන්තං විඤ්ඤාණන්ති තදේව විඤ්ඤාණං ඤාණේන වුට්ඨං මනසිකරෝති, අනන්තං ඵරති. තේන වුච්චති අනන්තං විඤ්ඤාණන්තීතිහි වුත්තං. ඒතේන ච තංවිඤ්ඤාණං ඒකන්තේන අනන්තවිසේසනයුත්තං හෝතීති විඤ්ඤායතීති. තමේව ආකාසන්තිපි පාඨෝ. ආකිඤ්චඤ්ඤායතනන්ති ඒත්ථ කිඤ්චි කිඤ්චනන්ති අත්ථතෝ ඒකං අප්පමත්තකස්ස නාමං. නත්ථි කිඤ්චනං අප්පමත්තකං අන්තමසෝ භඞ්ගමත්තංපි අවසිට්ඨං අස්ස පඨමා රුප්පවිඤ්ඤාණස්සාති අකිඤ්චනං. අකිඤ්චනස්ස භාවෝ **ආකිඤ්චඤ්ඤං**. පඨමාරුප්පවිඤ්ඤාණාභාවෝ. සෝ හි නත්ථි කිඤ්චීති මනසිකාර වසේන තං නාමං ලභතීති. ආකිඤ්චඤ්ඤං ආයතනමස්සාතිආදි වුත්තනයමේව. **නේවසඤ්ඤා නාසඤ්ඤායතන**න්ති ඒත්ථ ඕළාරික සඤ්ඤං සන්ධාය නේවත්ථි සඤ්ඤා අස්සාති නේවසඤ්ඤං. සුඛුමසඤ්ඤං සන්ධාය නව නත්ථි සඤ්ඤා අස්සාති නාසඤ්ඤං, නේවසඤ්ඤාඤ්ච තං නාසඤ්ඤඤ්චාති නේවසඤ්ඤානාසඤ්ඤං මජ්ඣේධ දීඝං කත්වා, චිත්ත චේතසිකරාසිඒව. තමේව යෝගිනෝ සුඛවිසේසානං අධිට්ඨානට්ඨේන ආයතනන්ති නේවසඤ්ඤා නාසඤ්ඤායතනං. තස්මිං පවත්තං කුසල චිත්තන්ති සමාසෝ. අථවා. සඤ්ඤායේව පටුසඤ්ඤාකිච්චස්ස අභාවතෝ නේවසඤ්ඤාව හෝති. සඞ්ඛාරාවසේස සුඛුමභාවේන විජ්ජමානත්තා අසඤ්ඤාව නහෝතීති කත්වා නේවසඤ්ඤානා සඤ්ඤානාම, සායේව ආයතනං, තේනච සම්පයුත්තං කුසල චිත්තන්ති සමාසෝ. ඒත්ථච යස්මා ආදිතෝ පට්ඨාය ඕළාරිකේ නීවරණධම්මේ විතක්කාදිකේච පජහිත්වා සේසධම්මේච භාවනා බලේන උපරූපරි සුඛුමභාවං පාපෙත්වා අනුක්කමේන

පටිපජ්ජන්තා සුඛුමටියේන ලෝකියධම්මේසු මුද්ධභූතං ඉමං සමාපත්තිං පාපුණන්ති. තස්මා ඉධ චිත්තංපි නේවචිත්තනාචිත්තමේව හෝති. ඵස්සෝපි නේව ඵස්සනාඵස්සෝඒව හෝති, තථා වේදනාදයෝපීති. තස්මා ඉධසඤ්ඤග්ගහණං දේසනාසීසමත්තන්ති දට්ඨබ්බං. විපාකේසු විඤ්ඤාණඤ්චායතනන්ති ඒත්ථ විඤ්ඤාණන්ති පඨමාරුප්පකුසල විඤ්ඤාණමේව. තඤ්ච අතීතානන්තරභවේ පවත්තං දට්ඨබ්බං. අකිඤ්චන භාවෝච තස්සේව නත්ථී භාවෝති. ක්‍රියචිත්තේසු පන විඤ්ඤාණං නාම කුසලභූතං ක්‍රියභූතඤ්ච දුවිධං පඨමාරුප්පවිඤ්ඤාණං වේදිතබ්බං. අකිඤ්චනභාවෝච තස්සේව දුවිධස්ස විඤ්ඤාණස්ස අභාවෝ යේවාති.

සඞ්ගහගාථායං **ආරම්මණප්පභේදේනා**ති ආලම්බි තබ්බානං කසිණුග්ඝාටිමාකාසාදීනං චතුන්නං ආරම්මණානං පභේදේන. දුවිධංහි ඉධ ආරම්මණචතුක්කං, අතිමික්කතබ්බ චතුක්කං, ආලම්බි තබ්බ චතුක්කඤ්ච. තත්ථ පඨමාරුප්පේ රූපපඤ්චමජ්ඣානස්ස ආරම්මණ භූතං. කසිණනිමිත්තං අතික්කමි තබ්බංනාම. තං උග්ඝාටෙත්වා ලද්ධං ආකාසං ආලම්බිතබ්බං නාම. දුතීයාරුප්පේ පඨමාරුප්පස්ස ආරම්මණභූතං ආකාසං අතික්කමිතබ්බංනාම. පඨමාරුප්පවිඤ්ඤාණං ආලම්බි තබ්බංනාම. තතියාරුප්පේ තං පඨමාරුප්පවිඤ්ඤාණං අතික්කමිතබ්බං නාම. තස්ස නත්ථිභාවෝ ආලම්බිතබ්බංනාම. චතුත්ථාරුප්පේ සෝ නත්ථී භාවෝ අතික්කමිතබ්බං නාම. තතියාරුප්පවිඤ්ඤාණං ආලම්බි තබ්බං නාමාති. තත්ථ කිඤ්චාපි ඉමං ආරුප්පමානසං චතුන්නං අතික්කමි තබ්බානංපි භේදේන චතුබ්බිධං හෝති, තථාපි ආකාසානඤ්චාය තනන්තිආදිනා ඉධ ආලම්බිතබ්බානඤ්ඤෙව සරූපතෝ ගහිතත්තා තේසං භේදේන ඉමස්ස භේදෝ පාකටෝති දට්ඨබ්බං. ආරුප්පමානසං ආලම්බණප්පභේදේන චතුධා ඨිතං. තදේව පුඤ්ඤපාක ක්‍රියභේදේන ද්වාදසධා ඨිතන්ති යෝජනා. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 55-56 යටතේ)]**

**අරූපාවචරකුසලචිත්තං** තාව උපෙක්ඛාවේදනායෝගභේදතෝ ඒකවිධං, සවත්ථුකාවත්ථුකභේදතෝ දුවිධං, හීනමජ්ඣිමපණීතභේදතෝ තිවිධං, ආරම්මණභේදතෝ චතුබ්බිධං. කසිණුග්ඝාටිමාකාසං, තත්ථ පවත්තවිඤ්ඤාණං, තස්ස අපගමෝ, ආකිඤ්චඤ්ඤයතනන්ති ඉදමස්ස චතුබ්බිධමාරම්මණං. යථාපටිපාටියා ඒතස්සාරම්මණස්ස භේදතෝ චතුබ්බිධං හෝති. සෙය්‍යථීදං; සබ්බසෝ රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්ත සඤ්ඤානං අමනසිකාරා ආකාසානඤ්චායතනසඤ්ඤසහගතං, විඤ්ඤාණඤ්චායතනසඤ්ඤසහගතං, ආකිඤ්චඤ්ඤයතනසඤ්ඤසහගතං, නේවසඤ්ඤානාසඤ්ඤයතනසඤ්ඤසහගතන්ති ඉදං චතුබ්බිධං අරූපාවචරකුසල චිත්තං නාම. සබ්බං පනේතං අරූපාවචරභාවනාපුඤ්ඤ වසප්පවත්තං යථානුරූපං අරූපූපපත්තිනිප්ඵාදකං හෝති. ඒවං අරූපාවචරකුසලචිත්තං වේදිතබ්බං.

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 27 යටතේ)]**

ආකාසානඤ්චායතනස්ස **කසිණුග්ඝාටිමාකාසං** ආරම්මණං. විඤ්ඤාණඤ්චායතනස්ස **තත්ථ පවත්තවිඤ්ඤාණං,** තස්මිං කසිණුග්ඝාටිමාකාසේ පවත්තං විඤ්ඤාණං චිත්තං ආරම්මණං හෝති. ආකිඤ්චඤ්ඤයතනස්ස **තස්ස අපගමෝ** තස්ස ආකාසානඤ්චායතනස්ස අපගමෝ අභාවෝ වෝහාරෝ ආරම්මණං හෝති. නේවසඤ්ඤානාසඤ්ඤයතනස්ස **ආකිඤ්චඤ්ඤයතනං** ආරම්මණං හෝති.

රූපේ සඤ්ඤා **රූපසඤ්ඤා**. සඤ්ඤාසීසේන චිත්තම්පි ගහිතං. **සමතික්කමා** කසිණුග්ඝාටිමාකාසසමතික්කමනේන. පටිඝේ ද්වාරාරම්මණානං සඞ්ඝට්ටනේ පවත්තා සඤ්ඤා පටිඝසඤ්ඤා. ද්විපඤ්චවිඤ්ඤාණානං අධිවචනං. තාසං **පටිඝසඤ්ඤානං** ද්විපඤ්චවිඤ්ඤාණානං **අත්ථඞ්ගමා** අත්ථඞ්ගමේන. නානා අත්තා සභාවෝ ඒතස්සාති නානත්තං, ආරම්මණං, නානත්තේ නානාසභාවේ පවත්තා සඤ්ඤා **නානත්තසඤ්ඤා,** නානා අත්තා සභාවෝ ඒතිස්සාති වා නානත්තා, සායේව සඤ්ඤා **නානත්තසඤ්ඤා,** කාමාවචරසඤ්ඤාති අත්ථෝ. තාසං **නානත්තසඤ්ඤානං** **අමනසිකාරා** අමනසිකාරේන. **[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 27 යටතේ)]**

**තාව** පළමුකොට **අරූපාවචරකුසලචිත්තං** අරූපාවචර කුසල් සිත්තෙමේ වනාහි **උපෙක්ඛාවේදනායෝගභේදතෝ** උපේක්ෂා වේදනා යෝගභේද හෙයින් **ඒකවිධං** එක්වැදෑරුම් වෙයි **සවත්ථුකඅවත්ථුකභේදතෝ** වස්තුසහිත වස්තුරහිත භේද හෙයින් **දුවිධං** දෙවැදෑරුම් වෙයි **හීණ-මජ්ඣිම-පණීතභේදතෝ** හීණ-මධ්‍යම-පණීත භේද හෙයින් **තිවිධං** තුන්වැදෑරුම් වෙයි **ආරම්මණභේදතෝ** අරමුණු භේද හෙයින් **චතුබ්බිධං** සිව්වැදෑරුම් වෙයි **කසිණුග්ඝාටිමාකාසං** කිසුණු ඉගුළු අහසය **තත්ථ පවත්තිං විඤ්ඤාණං** එහි හෙවත් ඒ කිසුණු ඉගුළු අහස අරමුණු කොට උපදවාගත් ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණය **තස්ස අපගමෝ** ඒ ආකාසානඤ්චායතන කුසල චිත්තයාගේ පහවීම හෙවත් (නත්ථිභාව ප්‍රඥප්තිය) **ආකිඤ්චඤ්ඤායතනං ඉති** ආකිඤ්චඤ්ඤායතන කුසලචිත්තය යන **ඉදං** මෙය **අස්ස** ඔහුගේ **චතුබ්බිධං** **ආරම්මණං** සිව්වැදෑරුම් අරමුණ නම් වෙයි **යථා පටිපාටියා** කියනලද පිළිවෙළින් **ඒතස්ස ආරම්මණස්ස භේදතෝ** මේ අරමුණගේ භේදහෙයින් **චතුබ්බිධං හෝති** සිව්වැදෑරුම්වෙයි **සෙය්‍යථීදං?** හේ කවරේද? **සබ්බසෝ** සර්වප්‍රකාරයෙන් නොහොත් **සබ්බසෝ** නිරවශේෂවූ **රූපසඤ්ඤානං** රූප සංඥාවගේ (හෙවත් රූපාවචර ධ්‍යානයන්ගේ හා ඔවුන්ට අරමුණු වූ පඨවි කිසුණු ආදී අරමුණුවලගේද) **සමතික්කමා** ඉක්මවීමෙන්ද (හෙවත් විරාගයෙන් හා නිරෝධයෙන්ද) **පටිඝසඤ්ඤානං** ප්‍රතිඝ සංඥාවන්ගේ (හෙවත් රූප සංඥාදීන්ගේ) **අත්ථඞ්ගමා** අස්තංගමයෙන්ද **නානත්තසඤ්ඤානං** නානාස්වභාව ඇති අරමුණෙහි පැවති සංඥාවන්ගේ (නොහොත්) නානාස්වභාව සංඥාවන්ගේ **අමනසිකාරා** මෙනෙහි නොකිරීමෙන්ද උපදනා ලද්දවූ **ආකාසානඤ්චායතනසඤ්ඤාසහගතං** ආකාසානඤ්චායතන සංඥාවෙන් යුක්තවූ අරූපාවචර කුසල චිත්තය **විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා සහගතං** විඤ්ඤාණඤ්චායතන සංඥාවෙන් යුක්තවූ චිත්තය (හෙවත් කිසිණු ඉගුළු අහසෙහි පැවති විඤ්ඤාණය අරමුණුකොට ඇති ධ්‍යාන චිත්තය) **ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාසහගතං** ආකාසානඤ්චායතන සංඥාවෙන් යුක්තවූ චිත්තය (හෙවත් ආකාසානඤ්චායතන විඤ්ඤාණයාගේ නත්ථිභාව ප්‍රඥප්තිය අරමුණු කොට ඇති ධ්‍යාන චිත්තය) **නේවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාසහගතං** නේවසඤ්ඤානාසඤ්ඤායතන සංඥාවෙන් යුක්තවූ චිත්තයයි **චතුබ්බිධං** සිව්වැදෑරුම්වූ **ඉදං** මේ චිත්තය තෙමේ **අරූපාවචරකුසලචිත්තං නාම** අරූපාවචර කුසලචිත්තය නම් වෙයි **අරූපාවචරභාවනාපුඤ්ඤවසප්පවත්තං** අරූපාවචර භාවනා පුණ්‍ය වශයෙන් හටගත්තාවූ **ඒතං සබ්බං පන** ඒ සියලු චිත්තය වනාහි **යථානුරූපං** සුදුසු පරිද්දෙන් **අරූපුප්පත්ති නිප්ඵාදකන්ති** අරූපභවයෙහි ප්‍රතිසන්ධි ගැන්ම නිපදවන්නේ වෙයි **ඒවං** මෙසේ **අරූපාවචරකුසලචිත්තං** අරූපාවචර කුසල චිත්තය **වේදිතබ්බං** දතයුත්තේයි. **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 86-85 පිටු]**

ඉදානි අරූපාවචරකුසලස්ස නිද්දේසාවකාසෝ අනුප්පත්තෝති තන්නිද්දේසත්ථමාහ **"සේසේසු පනා"**තිආදි. ආකාසකසිණවජ්ජිතස්ස යස්ස කස්සචි කසිණස්ස උග්ඝාටනතෝ ලද්ධමාකාසං **කසිණුග්ඝාටිමාකාසං. තත්ථ පවත්තං විඤ්ඤාණ**න්ති ආකාසානඤ්චායතනමාහ. තඤ්හි දුතියාරුප්පස්ස ආරම්මණං හෝති. **සබ්බසෝ**ති සබ්බාකාරේන, රූපනිමිත්තදණ්ඩාදානසම්භවදස්සනාදිනා සබ්බේන රූපධම්මේසු, පථවීකසිණාදිරූපනිමිත්තේසු තදාරම්මණජ්ඣානේසු ච දෝසදස්සනාකාරේන, තේසු ඒව වා රූපනිමිත්තේසු නිකන්තිප්පහානඅසමාපජ්ජිතුකාමතාදිනා ආකාරේනාති අත්ථෝ. අථ වා **සබ්බසෝ**ති සබ්බාසං, කුසලාදිභේදේන අනවසේසානන්ති අත්ථෝ. **රූපසඤ්ඤාන**න්ති සඤ්ඤාසීසේන වුත්තරූපාවචරජ්ඣානානඤ්චේව තදාරම්මණානඤ්ච. රූපාවචරජ්ඣානම්පි හි "රූප"න්ති වුච්චති උත්තරපදලෝපේන "රූපී රූපානි පස්සතී"තිආදීසු විය. තදාරම්මණම්පි කසිණරූපං පුරිමපදලෝපේන "දේවේන දත්තෝති, බහිද්ධා රූපානි පස්සතී"තිආදීසු විය, තස්මා ඉධ රූපේ රූපජ්ඣානේ තංසහගතසඤ්ඤා රූපසඤ්ඤාති ගහිතා, සඤ්ඤාසීසේන වුත්තරූපාවචරජ්ඣානානමේතං අධිවචනං. "රූප"න්ති සඤ්ඤා අස්සාති රූපසඤ්ඤං, රූපනාමවන්තන්ති අත්ථෝ. තංගහිතේන පථවීකසිණාදිභේදස්ස තදාරම්මණස්ස චේතං නාමන්ති දට්ඨබ්බං. "රූපසඤ්ඤාන"න්ති හි සරූපේකසේසවසේන නිද්දේසෝ කතෝ. **සමතික්කමා**ති විරාගා, නිරෝධා ච. කිං වුත්තං හෝති? ඒතාසං කුසලවිපාකකිරියාවසේන පඤ්චදසන්නං ඣානසඞ්ඛාතානං රූපසඤ්ඤානං, ඒතේසඤ්ච පථවීකසිණාදිවසේන නවන්නං ආරම්මණසඞ්ඛාතානං රූපසඤ්ඤානං අනවසේසානං සබ්බාකාරේන ච, තේසු ඒව වා නිකන්තිප්පහානඅසමාපජ්ජිතුකාමතාදිනා ආකාරේන විරාගා, නිරෝධා ච ජිගුච්ඡනතෝ චේව තප්පටිබන්ධඡන්දරාගවික්ඛම්භනතෝ ච නිබ්බත්තං ආකාසානඤ්චායතනසඤ්ඤාය සහගතං අරූපාවචරකුසලචිත්තං. න හි සක්කා සබ්බසෝ අනතික්කන්තරූපසඤ්ඤේන තං නිබ්බත්තේතුන්ති.

න කේවලං ඒතාසංයේව සමතික්කමනතෝ ඉදං නිබ්බත්තං, අථ ඛෝ පටිඝසඤ්ඤාදීනමත්ථඞ්ගමාදිතෝපීති ආහ **"පටිඝසඤ්ඤාන"**න්තිආදි. තත්ථ චක්ඛාදීනං වත්ථූනං, රූපාදීනඤ්ච ආරම්මණානං පටිඝාතේන අඤ්ඤමඤ්ඤසමෝධානසඞ්ඛාතේන පටිහනනේන උප්පන්නා සඤ්ඤා **පටිඝසඤ්ඤා,** රූපසඤ්ඤාදිද්විපඤ්චසඤ්ඤානමේතං අධිවචනං. යථාහ; "තත්ථ කතමා පටිඝසඤ්ඤා? රූපසඤ්ඤා සද්දසඤ්ඤා ගන්ධසඤ්ඤා රසසඤ්ඤා ඵොට්ඨබ්බසඤ්ඤා, ඉමා වුච්චන්ති පටිඝසඤ්ඤායෝ"ති (විභ. 603).

තාසං කුසලාකුසලවිපාකභූතානං **අත්ථඞ්ගමා** පහානා අසමුප්පාදා අප්පවත්තිකරණෝනාති වුත්තං හෝති. නනු ච ඒතා රූපාවචරජ්ඣානසමාපන්නස්සාපි න සන්ති. න හි පඨමජ්ඣානාදිසමාපන්නකාලේ පඤ්චද්වාරවසේන චිත්තං පවත්තතීති? සච්චමේතං, යථා පන "සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරතී"ති ඒත්ථ පසංසාවසේන අඤ්ඤත්ථ පහීනානම්පි සුඛදුක්ඛානං චතුත්ථජ්ඣානේ, "සක්කායදිට්ඨිවිචිකිච්ඡානං පහානා රාගදෝසමෝහානං තනුත්තා සකදාගාමිමග්ගං උපසම්පජ්ජ විහරතී"ති ඒත්ථ පඨමමග්ගේයේව පහීනානං සක්කායදිට්ඨාදීනං දුතියමග්ගේ ච වචනං, ඒවමේව ඉමස්මිං ඣානේ පටිපජ්ජනකානං උස්සාහජනනත්ථං ඉමස්ස ඣානස්ස පසංසාවසේන ඒතාසං ඒත්ථ වචනන්ති වේදිතබ්බං. අථ වා කිඤ්චාපි තා රූපාවචරසමාපන්නස්සාපි න සන්ති, න

පන පහීනත්තා න සන්ති. කිඤ්චරහි පච්චයාභාවේන. න හි රූපාවචරභාවනා රූපවිරාගාය සංවත්තති, රූපායත්තා ඒව තාසං පවත්තීති. අරූපභාවනා පන රූපවිරාගාය සංවත්තති, තස්මා "තා ඒත්ථ පහීනා"ති වත්තුං වට්ටති. තථා හි ඒතාසං ඉතෝ පුබ්බේ අප්පහීනත්තායේව "පඨමජ්ඣානං සමාපන්නස්ස සද්දෝ කණ්ටකෝ"ති වුත්තෝ භගවතා. ඉධ ච පහීනත්තා ඒව අරූපසමාපත්තීනං ආනේඤ්ජාභිසඞ්ඛාරවචනාදීහි, "යේ තේ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපේ අරූපා"තිආදිනා ච ආනේඤ්ජතා, සන්තවිමොක්ඛතා ච වුත්තා.

**නානත්තසඤ්ඤාන**න්ති නානත්තේ ගෝචරේ පවත්තානං, නානත්තානං වා සඤ්ඤානං, වුත්තාවසේසානං චතුචත්තාලීසකාමාවචරසඤ්ඤානන්ති අත්ථෝ. ඒතා ඒව හි; "තත්ථ කතමා නානත්තසඤ්ඤා? අසමාපන්නස්ස මනෝධාතුසමඞ්ගිස්ස වා මනෝවිඤ්ඤාණධාතුසමඞ්ගිස්ස වා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, ඉමා වුච්චන්ති නානත්තසඤ්ඤායෝ"ති (විභ. 604)

ඒවං **විභඞ්ගේ** විභජිත්වා වුත්තා. තා පන යස්මා රූපසද්දාදිභේදේ නානත්තේ නානාසභාවේ ආරම්මණේ පවත්තන්ති, යස්මා ච අට්ඨ කාමාවචරකුසලසඤ්ඤා, ද්වාදස අකුසලසඤ්ඤා, ඒකාදස කාමාවචරකුසලවිපාකසඤ්ඤා, ද්වේ අකුසලවිපාකසඤ්ඤා, ඒකාදස කාමාවචරකිරියසඤ්ඤාති ඒවං චතුචත්තාලීසප්පභේදා නානාසභාවා, අඤ්ඤමඤ්ඤං අසදිසා, තස්මා "නානත්තසඤ්ඤා"ති වුච්චන්ති. **අමනසිකාරා**ති සබ්බසෝ අනාවජ්ජනා අසමන්නාහාරා අපච්චවෙක්ඛණාහේතු ජවනපටිපාදකේන වා භවඞ්ගචිත්තස්ස අන්තෝ අකරණා ඨපෙත්වා කසිණුග්ඝාටිමාකාසං නානාරම්මණේ චිත්තස්ස අසඞ්ඛරණතෝති වුත්තං හෝති. ඉමිනා හි නානත්තසඤ්ඤාමනසිකාරහේතූනං රූපධම්මානං සමතික්කමෝපි වුත්තෝ, රූපජ්ඣානේ පන තදභාවතෝ "නානත්තසඤ්ඤානං අමනසිකාරා"ති න වුත්තං. අථ සමතික්කමාදීනං කිං නානාකරණන්ති? වුච්චතේ; යස්මා රූපසඤ්ඤා, පටිඝසඤ්ඤා ච ඉමිනා ඣානේන නිබ්බත්තිතභවේපි න විජ්ජන්ති, අරූපසඤ්ඤාය භාවනාය අභාවේ චුතිතෝ උද්ධං උප්පත්තිරහානං රූපසඤ්ඤාපටිඝසඤ්ඤානං යාව අත්තනෝ විපාකුප්පත්ති, තාව අනුප්පත්තිධම්මතං ආපාදියමානත්තා, පගේව පන ඉමං ඣානං සමාපන්නකාලේ, තස්මා "සමතික්කමා, අත්ථඞ්ගමා"ති උභයථාපි තාසං අභාවෝයේව දස්සිතෝ. නානත්තසඤ්ඤාසු පන යා තස්මිං භවේ න උප්පජ්ජන්ති ඒකන්තරූපනිස්සිතත්තා, තා අනෝකාසතාය න උප්පජ්ජන්ති, න අරූපභාවනාය නිවාරිතත්තා, අනිවාරිතත්තා ච කාචි උප්පජ්ජන්ති, තස්මා තාසං අමනසිකාරෝ අනාවජ්ජනං අපච්චවෙක්ඛණං ජවනපටිපාදකේන වා භවඞ්ගමනස්ස අන්තෝ අකරණං අප්පවේසනං වුත්තං. තත්‍ර පවත්තමානානම්පි හි ඣානං සමාපන්නස්ස තාසං අමනසිකාරෝයේව ඉතරථා ඣානසමාපත්තියා අභාවතෝ. ඉති සඞ්ඛේපතෝ "රූපසඤ්ඤානං සමතික්කමා"ති ඉමිනා සබ්බරූපාවචරධම්මානං පහානං වුත්තං, "පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා"ති සබ්බේසං කාමාවචරචිත්තචේතසිකානං පහානං, අමනසිකාරෝ ච වුත්තෝ, තීහි පනේතේහි සමාධිස්ස ථිරභාවෝ කථිතෝති.

**ආකාසානඤ්චායතනසඤ්ඤාසහගත**න්ති ඒත්ථ පන නාස්ස අන්තෝති අනන්තං, අනන්තං ආකාසං ආකාසානන්තං, කසිණුග්ඝාටිමාකාසං, අනන්තතා පන උප්පාදවයන්තාභාවතෝ අනන්තමනසිකාරවසේන වා වේදිතබ්බා. න හි ඒතස්ස උප්පාදන්තෝ, වයන්තෝ වා පඤ්ඤායති අසභාවධම්මත්තා. සභාවධම්මෝ හි අහුත්වා සම්භවනතෝ, හුත්වා ච විනස්සනතෝ උප්පාදවයන්තපරිච්ඡින්නෝ,

නේතරෝ. න ච පනේතං මනසි කරොන්තෝ යෝගාවචරෝ තස්ස පරිච්ඡේදසඞ්ඛාතමන්තං ගණ්හාති, අථ ඛෝ රූපවිවේකමත්තස්සේව ගහණේන අනන්තඵරණාකාරේනේව මනසිකාරං පවත්තේති, තස්මා උප්පාදවයන්තවිරහතෝ මනසිකාරවසේන වා ඒතමනන්තන්ති වේදිතබ්බං. "අනන්තාකාස"න්ති ච වත්තබ්බේ අනන්ත-සද්දස්ස පරනිපාතවසේන "ආකාසානන්ත"න්ති වුච්චති. ආකාසානන්තමේව ආකාසානඤ්චං සංයෝගපරස්ස ත-කාරස්ස ච-කාරං කත්වා, තදේව ආයතනං සසම්පයුත්තධම්මස්ස ඣානස්ස ආරම්මණභාවතෝ අධිට්ඨානට්ඨේන දේවායතනං වියාති ආකාසානඤ්චායතනං, තස්මිං අප්පනාපත්තා සඤ්ඤා ආකාසානඤ්චායතනසඤ්ඤා, තාය සහගතං විඤ්ඤාණං **ආකාසානඤ්චායතනසඤ්ඤාසහගතං**. අථ වා ආකාසානඤ්චං ආයතනමස්සා සසම්පයුත්තධම්මාය සඤ්ඤායාති ආකාසානඤ්චායතනා, සායේව සඤ්ඤා, තාය ඣානං සහගතන්ති ආකාසානඤ්චායතනසඤ්ඤාසහගතං.

**විඤ්ඤාණ**...**පෙ**.... **සහගත**න්ති යදේතං පඨමාරුප්පවිඤ්ඤාණං, තංසභාවධම්මත්තා උප්පාදදිඅන්තවන්තම්පි ආරම්මණකරණවසේන අනන්තාකාසේ ඵරණතෝ අත්තානං ආරබ්භ අන්තස්ස අග්ගහණවසේන පවත්තමනසිකාරතෝ වා අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණානන්තං, "විඤ්ඤාණානඤ්ච"න්ති වත්තබ්බේ විඤ්ඤාණඤ්ච-සද්දෝ තදත්ථේ නිරූළ්හෝ ආ-කාර න-කාරලෝපෝති වා කත්වා "විඤ්ඤාණඤ්ච"මිච්චේව වුත්තං. ඒවඤ්ච කත්වා වක්ඛති; "විඤ්ඤාණානන්තමිච්චේවං, වත්තබ්බං පනිදං සියා"ති.

අථ වා දුතියාරුප්පවිඤ්ඤාණේන අඤ්චිතබ්බං ආරම්මණවසේන පාපුණිතබ්බන්ති විඤ්ඤාණඤ්චං. සේසං පුරිමසදිසමේව.

**ආකිඤ්චඤ්ඤ**...**පෙ**.... **සහගත**න්ති නාස්ස පඨමාරුප්පවිඤ්ඤාණස්ස කිඤ්චනන්ති අකිඤ්චනං, අන්තමසෝ භඞ්ගමත්තම්පි අවසිට්ඨං නත්ථීති වුත්තං හෝති. සති හි භඞ්ගමත්තේපි තස්ස සකිඤ්චනතා සියා. අකිඤ්චනස්ස භාවෝ ආකිඤ්චඤ්ඤං, ආකාසානඤ්චායතනවිඤ්ඤාණාභාවස්සේතං අධිවචනං. සේසං වුත්තනයමේව.

**නේවසඤ්ඤා**...**පෙ**.... **සහගත**න්ති හෙට්ඨිමඣානේසු විය ඔළාරිකාය සඤ්ඤාය අභාවතෝ නේවස්ස සඤ්ඤා අත්ථීති නේවසඤ්ඤං, සුඛුමාය ච සඤ්ඤාය අත්ථිතාය නාස්ස සඤ්ඤා නත්ථීති නාසඤ්ඤං, නේවසඤ්ඤඤ්ච තං නාසඤ්ඤඤ්චේති නේවසඤ්ඤානාසඤ්ඤං, චතුත්ථාරුප්පජ්ඣානං. යදි ඒවං "නේවසඤ්ඤනාසඤ්ඤ"න්ති වත්තබ්බං? සච්චමේතං. වචනසෝභනත්ථං පන දීඝං කත්වා වුත්තං. අථ වා නේවස්ස සඤ්ඤා නාසඤ්ඤාති ඒවං ඒකජ්ඣං බහුබ්බීහිසමාසවසේන "නේවසඤ්ඤානාසඤ්ඤ"න්ති වුත්තං. නේවසඤ්ඤානාසඤ්ඤඤ්ච තං ආයතනඤ්ච මනායතනධම්මායතන පරියාපන්නත්තාති නේවසඤ්ඤානාසඤ්ඤායතනං, තේන සම්පයුත්තං සඤ්ඤා සහගතං **නේවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාසහගතං**. අථ වා සඤ්ඤායේව පටුසඤ්ඤා කිච්චකරණේ අසමත්ථතාය නේවසඤ්ඤා, උණ්හෝදකේ තේජෝධාතු විය සඞ්ඛාරාවසේසසුඛුමභාවප්පත්තියා නාසඤ්ඤාති නේවසඤ්ඤානාසඤ්ඤා, සා ඒව සේසධම්මානං නිස්සයපච්චයතාය, අධිට්ඨානට්ඨේන ධම්මායතනපරියාපන්නතාය ඒව වා ආයතනන්ති නේවසඤ්ඤානාසඤ්ඤායතනං, නේවසඤ්ඤානාසඤ්ඤායතනභූතාය සඤ්ඤාය සහගතන්ති නේවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාසහගතං.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා අරූපාවචරකුසල වණ්ණනා යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 120-126 පිටු]**

එහි ආකාස කසිණය තොරකොට ඇති යම්කිසි කසිණයක් අහසෙහි පතුරුවා නැවත මෙනෙහි නොකිරීමෙන් උගුළුවා ලබනලද ආකාසය කිසුණු ඉගුළු අහස නම් වෙයි. එහි පැවති විඤ්ඤාණය යනු ආකාසානඤ්චායතන කුසල චිත්තයයි. ඒ චිත්තය වනාහි ද්විතීයාරූප්‍ය විඤ්ඤාණයට අරමුණු වෙයි. "සබ්බසෝ" යනු සියළු ආකාරයෙන් හෙවත් රූප නිමිත්ත දණ්ඩාදාන සම්භව දර්ශනාදීන් පෘථිවි කසිණාදී රූප ධර්මයෙහිද පෘථිවි කසිණාදී රූප නිමිත්තෙහිද තදාලම්බණ ධ්‍යාන ධර්මයෙහිද දෝෂ දර්ශනාකාරයෙන් හෝ එම රූප නිමිත්තයන් කෙරෙහි නිකාන්ති ප්‍රහාණය ආවර්ජනා නොකරණු කැමැතිබවය. ඒ රූපාවචර ධ්‍යානයට සමවදිනු නොකැමැතිබවය. යනාදි ආකාරයෙන් හෝ යනු අර්ථයි. නොහොත් "සබ්බසෝ " යනු ("සබ්බාසං" යී සේයි) කුසලාදී භේදයෙන් නිරවශේෂවූ ("රූපසඤ්ඤානං" යන්නට විශෙශ්ෂයි) "රූපසඤ්ඤානං" යනු සංඥා ශීර්ෂයෙන් වදාරණ ලද්දවූ රූපාවචර ධ්‍යානයන්ගේද ඔවුන්ට අරමුණුවූ පෘථිවි කසිණාදී ආලම්බණයන්ගේද යන අර්ථයි. ඒ එසේමැයි; රූපාවචර ධ්‍යානයද "රූපී රූපානි පස්සති" යනාදියෙහි මෙන් "රූපජ්ඣාන" ශබ්දයෙහි "ඣාන" යන උත්තර පද ලෝපයෙන් "රූප" යයි කියනු ලැබේ. එසේම ඊට අරමුණුවූ කසිණ රූපයද "දේවදත්ත" යන තන්හි "දේව" යන පූර්වපද ලෝපයෙන් "දත්ත" යයි ව්‍යවහාර කරන්නාක් මෙන් "කසිණ රූප" ශබ්දයෙහි "කසිණ" යන පූර්වපද ලෝපයෙන් "බහිද්ධා රූපානි පස්සති" යනාදියෙහි මෙන් රූපයයි කියනු ලැබේද එහෙයින් මෙහිද රූප ධ්‍යානයෙහි ඒ ධ්‍යාන සහ ගිය සංඥා තොමෝ රූප සංඥායයි ගන්නාලදී. මෙසේ රූප සංඥාය යනු සංඥා ශීර්ෂයෙන් කියනලද රූපාවචර ධ්‍යානයට මේ නමෙක් වෙයි. "රූපන්ති සඤ්ඤා අස්සාති රූප සඤ්ඤා" යනු වාක්‍ය හෙයින් රූපය යන සංඥාව ඇතිවූයේ මෝහට නුයි යන අර්ථයෙහි රූප සඤ්ඤා නම් වේ. හෙවත් රූපය යන නම් ඇත්තේ වෙයි කී නියායි. මෙසේ පෘථිවි කසිණාදී ප්‍රභේද ඇත්තාවූ ඒ ධ්‍යානාලම්බණයටද මේ නමෙක් වේයයි දතයුතුයි. ඒ එසේමැයි; "රූප සඤ්ඤානං" යනු ස්වරූපේකශේෂ වශයෙන් නිර්දේශ කරණ ලද්දේය. "සමතික්කමා" යනු විරාගයෙන්ද නිරෝධයෙන්ද යන අර්ථයි. කුමක් කීනියාද යත්? කුසල-විපාක-ක්‍රියා වශයෙන් පසළොස් ප්‍රකාරවූ මේ ධ්‍යාන සඞ්ඛ්‍යාත රූප සංඥාවන්ගේ හෝ පෘථිවි කසිණාදී වශයෙන් නව ප්‍රකාරවූ ආලම්බණ සඞ්ඛ්‍යාත මේ රූප සංඥාවන්ගේ හෝ යන මේ සියළු ධර්මයන්ගේ සර්වාකාරයෙන්ද ඒ ධර්මයන් කෙරෙහි නිකාන්ති ප්‍රහාණය ආවර්ජනා නොකරනු කැමැති බවය සම නොවදිනු කැමති බවය යනාදී ආකාරයෙන්ද විරාගයෙන් හා නිරෝධයෙන් හෙවත් පිළිකුල් කිරීමෙන් හා ඒ පිළිබඳ ඡන්දරාග විෂ්කම්භයෙන්ද උපදවන ලද්දවූ ආකාසානඤ්චායතන සංඥාවෙන් යුක්තවූ අරූපාවචර කුසල චිත්තයයි කී නියායි.

සර්වප්‍රකාරයෙන් නොයික්ම වන ලද රූපසංඥා ඇත්තාහු විසින් ඒ ආකාසානඤ්චායතන ධ්‍යානය උපදවා වාසයකරනුට නොපිළිවන් වෙයි. හුදෙක් මේ රූප සංඥාවන් පමණක්ම ඉක්මවීමෙන් ඒ ධ්‍යානය උපදවන ලද්දේ නොවේ. වැලිදු ප්‍රතිඝ සංඥාදීන්ගේ අස්තඞ්ගමයෙනුදු උපදවන ලද්දේයයි දක්වනු පිණිස "පටිඝසඤ්ඤානං" යනාදිය කීයේයි. එහි චක්ෂුරාදී ප්‍රශාද වස්තූන්ගේද රූපාදී ආලම්බණයන්ගේද පටහැනිවීමෙන් හෙවත් ඔවුනොවුන්ගේ එක්වීම සඞ්ඛ්‍යාත ගැටීමෙන් උපන් සංඥාව ප්‍රතිඝසංඥා නම් වෙයි. රූප සංඥාදී දෙපස් විඤ්ඤාණ සහගත සංඥාවන්ට මේ නමෙකි. එයින් වදාළහ විභඞ්ග ප්‍රකරණයෙහි:—

"තත්ථ කතමා පටිඝසඤ්ඤා රූපසඤ්ඤා සද්දසඤ්ඤා ගන්ධසඤ්ඤා රසසඤ්ඤා ඵොට්ඨබ්බසඤ්ඤා ඉමා වුච්චන්ති පටිඝසඤ්ඤායෝ" යි.

පඤ්ච ප්‍රකාරවූ අහේතුක කුසලවිපාකයන්ගේද පඤ්ච ප්‍රකාරවූ අකුසල විපාකයන්ගේද වශයෙන් දශ ප්‍රකාරවූ ඒ ප්‍රතිඝසංඥාවන්ගේ අස්තඞ්ගමයෙන්ද ප්‍රහාණයෙන්ද නොඉපදවීමෙන්ද නොපවැත්ම කිරීමෙන්දැයි කී නියායි. මේ ප්‍රතිඝසංඥාවෝ රූපාවචර ධ්‍යානයට සමවන්නහුටද නැත්තාහු නොවේද? එසේම ප්‍රථම ධ්‍යානාදියට සමවැදවසන කාලයෙහි පඤ්චද්වාරවශයෙන් සිත නොපවත්නේ නොවේද? ඒ සැබව; යම්සේ වනාහි "සුඛස්සච පහානා දුක්ඛස්සච පහනා අදුක්ඛමසුඛං උපෙක්ඛා සති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති" යන මෙහි ධ්‍යානයෙහි ප්‍රාහාණවූද සුඛ දුක්ඛයන් චතුර්ථජ්ඣානයෙහි ප්‍රසංශා වශයෙන්ද "සක්කායදිට්ඨි විචිකිච්ඡානං පහානා රාග-දෙස-මෝහානං තනුත්තා සකදාගාමිමග්ගං උපසම්පජ්ජ විහරති" යන මෙහි පළමුවෙනි මාර්ගයෙහිම ප්‍රහීණවූ සක්කායදෘෂ්ටි ආදිය දෙවෙනි මාර්ගයෙහිත් කීම ප්‍රසංශා වශයෙන්ද කීවාක්මෙන් මේ අරූප ධ්‍යානයෙහි පිළිපදනවුන්ගේ උත්සාහ උපදවනු පිණිස මේ ධ්‍යානයට ප්‍රසංශා වශයෙන් මේ ප්‍රතිඝසංඥාවන් මේ ප්‍රථමාරූප්‍ය කථාවෙහි නැති බව කීයේයයි දතයුතුයි.

නොහොත් ඒ ප්‍රතිඝසංඥාවෝ කිසිසේත් රූපාවචර ධ්‍යානයට සමවන්නාහට නොවෙති. එතකුදුවුවත් ප්‍රහීණකල හෙයින් නැත්තාහු නොවෙති. රූපයෙහි නොඇලීම පිණිස රූපාවචර භාවනාව නොපවත්නේමය. මේ ප්‍රතිඝසංඥාවගේ පැවැත්ම රූපය අයත් කොටම වන්නීය. එහෙයින් මේ අරූපධ්‍යානයෙහි ඒ රූපසංඥාවෝ ප්‍රහීණයහයි කියන්ට වටනේයි. ඒ එසේමැයි; ඒ ප්‍රතිඝසංඥාවන් අරූපධ්‍යාන භාවනාවට පූර්වභාගයෙහි අප්‍රහීණ බැවින් ප්‍රථම ධ්‍යානට සමවැද වසන්නහුට ශබ්දය කණහුනු කටුවක් මෙනැයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේය. මේ අරූප ධ්‍යානයෙහි ප්‍රතිඝසංඥාවන් ප්‍රහීණහෙයින්ම ආනෙඤ්ජාභිසඞ්ඛාර වචනාදීන් කම්පා නැතිබවද "යේ තේ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපේ ආරුප්පා" යනාදීන් සාන්ත විමෝක්ෂ බවද කියනලදී.

"නානත්ත සඤ්ඤානං" යන මෙහි නානාස්වභාව ඇති අරමුණෙහි පැවති සංඥාවන්ගේ හෝ නානාස්වභාව ඇති සංඥාවන්ගේ හෝ හෙවත් කියනලද සංඥාවන්ගෙන් ඉතිරිවූ සුසාළිස් කාමාවචර සංඥාවන්ගේය යන අර්ථයි. ඒ එසේමැයි; මේ කාමාවචර සංඥාවෝම "තත්ථ කතමා නානත්තසඤ්ඤා අසමාපන්නස්ස මනෝධාතු සමඞ්ගිස්ස වා මනෝවිඤ්ඤාණධාතු සමඞ්ගිස්ස වා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං ඉමා වුච්චන්ති නානාත්තසඤ්ඤායෝ" යි විභඞ්ගයෙහි බෙදා වදාරණ ලද්දාහුය. ඒ සංඥාවෝ වනාහි යම්හෙයකින් රූප ශබ්දාදී ප්‍රභේදවූ නානාස්වභාව ඇති අරමුණෙහි පවතිද්ද යම්හෙයකින් කාමාවචර කුසල සංඥාවෝ අටදෙනය; අකුසල සංඥාවෝ දෙළොස්දෙනය; කාමාවචර කුසල විපාක සංඥාවෝ එකොළොස්දෙනය; අකුසල විපාක සංඥාවෝ දෙදෙනය; කාමාවචර ක්‍රියා සංඥාවෝ එකොළොස්දෙනයයි මෙසේ සුසාළිසක් ප්‍රභේදවූ සංඥාවෝ නොයෙක් සභාව ඇත්තාහු ඔවුනොවුන්ට අසදෘශවූවෝ වෙද්ද හෙයින් නානත්තසඤ්ඤාවෝ යයි කියනු ලැබෙත්. "අමනසිකාරා" යනු සර්වප්‍රකාරයෙන් ආවර්ජනා නොකිරීම හේතුකොටගෙනද ආභෝග නොකිරීම හේතුකොටගෙනද ප්‍රත්‍යවේක්ෂා නොකිරීම හේතුකොටගෙනද යන අර්ථයි. නොහොත් ජවන ප්‍රතිපාදක මනසිකාරයෙන් භවඞ්ග චිත්තය අතරෙහි නොකිරීම ප්‍රවේශ නොකිරීම හේතුකොටගෙන කසිණුග්ඝාටිමාකාසය හැර නොයෙක් අරමුණෙහි සිත නොහැසිරවීම හේතුකොටගෙනයයි කියන ලද්දේ වේ.

ඒ එසේමැයි මෙයින් නානත්තසඤ්ඤාවන්ගේ මෙනෙහිකිරීමට හේතුවූ රූප ධර්මයන්ගේ ඉක්මවීමද කියන ලද්දේයි. රූප ධ්‍යානයෙහි වනාහි ඒ රූප සමතික්‍රමය නැතිහෙයින් "නානාත්ත සඤ්ඤානං අමනසිකාරා" යී නොකියනලදී. එසේවීනම් සමතික්ක්‍රමාදීන්ගේ හෙවත් සමතික්කම අත්ථඞ්ගම අමනසිකාරය යන මොවුන්ගේ වෙනස කවරේද යත්? ඊට පරිහාර කියනු ලැබේ. යම්හෙයකින් රූප සංඥාවන් හා ප්‍රතිඝසංඥාවෝද මේ අරූප ධ්‍යානයෙන් උපන් භවයෙහිත් විද්‍යමාන නොවෙද්ද ආරුප්‍ය භාවනාවක් නැති කල්හි චුතියෙන් මත්තෙහි ඉපදීමට සුදුසුවූ රූප සංඥා ප්‍රතිඝසංඥාදීන්ගේ යම්තාක් තමාගේ විපාකෝත්පත්තියවේද ඒතාක් නූපදනා ස්වභාවට පැමිණවීම වන හෙයින් මේ ධ්‍යානයට සමවැද වසන කල්හි පළමුවම නොවන්නාහයි දතයුතුයි.

එහෙයින් "සමතික්කමා අත්ථඞ්ගමා" යී දෙපරිද්දෙන්ම ඔහුන්ගේ අභාවයම දක්වන ලද්දේයි. නානත්තසංඥාවන් කෙරෙහි වනාහි යම් සංඥා කෙනෙක් ඒ භවයෙහි නූපදනාහුද ඒ සංඥාවෝ ඒකාන්ත රූප නිශ්‍රිත බැවින් අනවකාස හෙයින් නූපදනාහු වෙත්. අරූප භාවනාවෙන් නිවාරිත බැවින් නොවේ. අනිවාරිත හෙයින් කිසි සංඥා කෙනෙක් උපදනාහුයි; හෙයින් ඒ සංඥාවන්ගේ ආභෝග නොකිරීම ආවර්ජනා නොකිරීම ප්‍රත්‍යවේක්ෂා නොකිරීම ජවන ප්‍රතිපාදක මනසිකාරයෙන් හෝ භවඞ්ග චිත්තයාගේ ඇතුළත් නොකිරීම කියන ලද්දේයි. ඒ අරූප භවයෙහිද මේ ධ්‍යානයට සමවැද වසනුයේ ඒ නානත්තසංඥාවන්ගේ මෙනෙහි නොකිරීමෙන්ම සමවැද වාසය කෙරෙයි. අන්පරිද්දෙකින් ඒ ධ්‍යානයට සමවැදීම නොවන හෙයිනැයි මෙසේ සංක්ෂේප වශයෙන් රූප සංඥාවන්ගේ ඉක්මවීමෙනැයි යන මේ වචනයෙන් සියළු රූපාවචර ධර්මයන්ගේ ප්‍රභාණය කියනලදී. ප්‍රතිඝසංඥාදීන්ගේ අස්තඞ්ගමයෙන් නානත්තසංඥාවන්ගේ මෙනෙහි නොකිරීමෙනැයි යන මේ වචනයෙන් සියළු කාමාවචර චිත්ත චෛතසිකයන්ගේ ප්‍රභාණයද මෙනෙහි නොකිරීමද කියන ලද්දේයි. මේ තුන් පදයෙන්ම සමාධිහුගේ ස්ථිර භාවය කියන ලද්දේයයි දතයුතුයි.

"ආකාසානඤ්චායතනසඤ්ඤාසහගතං" යන මේ පදයෙහි "නාස්ස අන්තෝති අනන්තං; අනන්තං ආකාසං ආකාසානන්තං" යනු විග්‍රහහෙයින් "ආකාසානන්ත" යන මෙයින් කිසුණු ඉගුළු අහස කියන ලද්දේයි. මෙහි අනන්ත බව වනාහි උත්පාදන්ත ව්‍යාන්ත නැති හෙයින් හෝ අනන්තයයි මෙනෙහි කිරීම් වශයෙන් හෝ දතයුත්තීය. ඒ එසේමැයි; මේ ආකාසයාගේ උත්පාදන්ත සඞ්ඛ්‍යාත උත්පාදක්ෂණයද ව්‍යාන්ත සඞ්ඛ්‍යාත භඞ්ගක්ෂණයද නොපැණෙයි. කුමක්හෙයින යත්? අස්වාභාව ධර්මයක් හෙයිනි. ස්වභාව ධර්මය වනාහි පෙර නොවී උපදනා හෙයින්ද ඉපිද විනාශ වන හෙයින්ද උත්පාදන්ත ව්‍යාන්ත දෙකින් පිරිසිඳිනා ලද්දේ වෙයි. අස්වාභාව ධර්මය එසේ පිරිසිඳිනා ලද්දේ නොවෙයි. මේ කිසුණු ඉගුළු අහස මෙනෙහි කරන්නාවූ යෝගාවචරතෙමේ ඒ ආකාසයාගේ පරිච්ඡේද සඞ්ඛ්‍යාත අන්තය නොගනී. එතකුදුවුවත් රූපයෙන් වෙන්කළ මාත්‍රයක් ගැනීමෙන් අනන්ත බව පැතිරවීම් ආකාරයෙම පරිකර්ම මනස්කාරය පවත්වයි. එහෙයින් උත්පාදන්ත ව්‍යාන්ත නැති බැවින් අනන්ත හෙයින් මෙනෙහි කිරීම් වශයෙන්ම මේ කිසුණු ඉගුළු අහස අනන්තයයි දතයුතුයි. "අනන්තආකාසං" යී කියයුතුතන්හි අනන්ත ශබ්දයාගේ පර නිපාත වශයෙන් "ආකාසානන්ත" යයි කියනු ලැබේ. ඒ "ආකාසානන්ත"යම "ණපත්තතා භාවේතු" යන සූත්‍රයන් ස්වාර්ථය ප්‍රත්‍ය කොට "ත" කාර "ය" කාරයන් සඞ්යෝග කොට "යවතං" යනාදි සූත්‍රයෙන් ච-කාරාදේශය කොට "ආකාසානඤ්ච"යයි කියනු ලැබේ. ඒ ආකාසානඤ්චයම දෙවියන්ට දේවායතන සඞ්ඛ්‍යාත දේවාලය මෙන් සම්ප්‍රයුක්ත ධර්ම සහිත මේ ධ්‍යානයට අරමුණු වන බැවින් ආධාර වන අර්ථයෙන් ආයතන වේ

නුයි ආකාසානඤ්චායතනය නම් වෙයි. එහි අර්පණා බවට පැමිණි සංඥාතොමෝ ආකාසානඤ්චායතන සංඥා නම් වෙයි. ඒ සංඥාවෙන් යුක්තවූ විඤ්ඤාණය ආකාසානඤ්චායතන සඤ්ඤාසහගත නම් වෙයි. නොහොත් ආකාසානඤ්චය සම්ප්‍රයුක්ත ධර්ම සහිතවූ මේ සංඥාවට ආයතන වූයේනුයි "ආකාසානඤ්චායතන" නම් වේ. ඒ සංඥාවූයේනුයි "ආකාසානඤ්චායතන සඤ්ඤා" නම් වේ. ඒ සංඥාවෙන් යුක්තවූ ධ්‍යානය "ආකාසානඤ්චායතන සඤ්ඤා සහගත" නම් වේ෴

"විඤ්ඤාණං -පෙ- සහගතං" යන මෙහි යම් ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයක් වේද එය ස්වභාව ධර්මයක් බැවින් උත්පාදදී අන්තයෙන් යුක්ත වූයේ නමුදු අරමුණු කිරීම් වශයෙන් අනන්තාකාසයෙහි පතුරුවන හෙයින්ද තමා අරමුණු කොට අන්තයක් නොගැනීම් වශයෙන් පැවති මෙනෙහි කිරීම ඇති හෙයින්ද අනන්තවූ විඤ්ඤාණය ඇත්තේනුයි විඤ්ඤාණානන්ත නම් වෙයි. "විඤ්ඤාණානන්ත"යී කියයුතු තන්හි "විඤ්ඤාණඤ්ච" ශබ්දය එම අර්ථයෙහි නිපාතනය කරණ ලද්දේයි. ආකාරයට හ්‍රශ්වද "න" කාර ලෝපය කොටද හෝ "විඤ්ඤාණඤ්ච" යයි කියන ලද්දේය. එහෙයින්ම "විඤ්ඤාණානන්තමිච්චේව වත්තබ්බං පනිදං සියා" යී මතු කියනු ලබන්නේය. නොහොත් "දුතියාරුප්පවිඤ්ඤාණේන අඤ්චිතබ්බං ආරම්මණකරණවසේන පාපුණිතබ්බන්ති විඤ්ඤාණඤ්චං" යනු නිර්වචන හෙයින් ද්විතීයාරූප්‍ය විඤ්ඤාණයෙන් අරමුණු කිරීම් වශයෙන් පැමිණිය යුතුනුයි "විඤ්ඤාණඤ්ච" නම් වේ. සෙස්ස පළමු ආකාසානඤ්චායතනයට කී පරිද්දේන් දතයුතුයි෴

"ආකිඤ්චඤ්ඤා -පෙ- සහගතං" යන මෙහි "නාස්ස පඨමාරුප්පවිඤ්ඤාණස්ස කිඤ්චනං අප්පමත්තකන්ති අකිඤ්චනං" යනු විග්‍රහ හෙයින් මේ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණ නැමති ස්වභාව ධර්මයාගේ ස්වල්ප මාත්‍රයකුදු නැත්තේනුයි අකිඤ්චන නම් වේ. යටත්පිරිසයින් භවඞ්ගමාත්‍රයකුදු ඒ විඤ්ඤාණයාගේ ඉතිරිව නැත්තේයයි කියන ලද්දේ වේ. භවඞ්ග මාත්‍රයකුදු ඇති කල්හි ඒ චිත්තයාගේ දසකිඤ්චනත්වය වන්නේයි. "අකිඤ්චනස්ස භාවෝ ආකිඤ්චඤ්ඤං" ඒ අකිඤ්චනයාගේ භාවය ආකිඤ්චඤ්ඤා නම් වේ. මේ වනාහි ආකාසානඤ්චායතන විඤ්ඤාණයාගේ පහවීමට නමෙකි. සෙස්ස යට කියනලද ක්‍රමය මැයි෴

"නේවසඤ්ඤා -පෙ- සහගතං" යන මෙහි යට ධ්‍යානයන්හි මෙන් ඖදරික සංඥාවක් නැතිහෙයින් "නේවස්ස සඤ්ඤා අත්ථීති නේවසඤ්ඤං" යන වාක්‍යයෙහි මෝහට සංඥාවක් නැත්තේනුයි නේවසඤ්ඤා නම් වේ. සියුම්වූ සංඥාවක් ඇති හෙයින් "නාස්ස සඤ්ඤා නත්ථීති නාසඤ්ඤං" යන වාක්‍යයෙහි "නාසඤ්ඤා" නම් වෙයි. "නේවසඤ්ඤා" වූයේත් හේමය "නාසඤ්ඤා" වූයේත් හේමනුයි නේවසඤ්ඤානාසඤ්ඤා නම් වෙයි. චතුත්ථාරූප්‍ය ධ්‍යානයට මේ නමෙකි. ඉදින් එසේවීනම් "නේවසඤ්ඤානාසඤ්ඤා" යයි කියයුතු නොවේද යත්? ඒ සැබව වචන සෝභනත්වය පිණිස වනාහි එය දීර්ඝකොට කියනලදී. නොහොත් "නේවස්ස සඤ්ඤා නාසඤ්ඤා" යී මෙසේ එක්කොට බහුබීහිසමාස වශයෙන් "නේවසඤ්ඤානාසඤ්ඤං" යී කියනලදී. ඒ චතුත්ථාරූප්‍ය ධ්‍යානයම මනායතන ධම්මායතනයන්ට ඇතුළත් බැවින් "නේවසඤ්ඤානාසඤ්ඤා" වූයේත් හේමය "ආයතන" වූයේත් හේමනුයි නේවසඤ්ඤානාසඤ්ඤායතන නම් වෙයි. එයින් සැපියුතු සංඥාවෙන් යුක්තවූයේ "නේවසඤ්ඤානාසඤ්ඤායතන සඤ්ඤාසහගත" නම් වේ. ඕ තොමෝම දක්ෂවූ විදර්ශනා කෘත්‍යය කිරීමෙහි අපොහොසත් බැවින් "නේවසඤ්ඤා" නම් වෙයි.


පටුන

සංස්කාරාවශේෂ සූක්ෂමභාවයෙන් විද්‍යමාන හෙයින් "නාසඤ්ඤ" නම් ද වේනුයි ඒ දෙපදය ගළපා "නේවසඤ්ඤනාසඤ්ඤ" යයි කියනලදැයි දතයුතුයි. "නේවසඤ්ඤනාසඤ්ඤ" වූයේත් හේමය නිශ්‍රය ප්‍රත්‍යය භාවයෙන් අවශේෂ ධර්මයන්ට ආධාරාර්ථයෙන් හෝ මනායතන ධර්මායතනයන් ඇතුළත් බැවින් හෝ "ආයතන" වූයේත් හේමනුයි නේවසඤ්ඤනාසඤ්ඤායතන නම් වේ. "නේවසඤ්ඤනාසඤ්ඤායතන" වූ සංඥාවෙන් යුක්ත වූයේනුයි "නේවසඤ්ඤනාසඤ්ඤායතනසඤ්ඤාසහගත" නම් වේ.

**[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 85-91 පිටු]**

අරූපාවචරා පන කුසලධම්මා සම්පයෝගතෝ න භින්නා, සබ්බේපි උපෙක්ඛෙකග්ගතාසම්පයුත්තාව, ධම්මුද්දේසාදිතෝපි සබ්බසෝ රූපාවචරපඤ්චමජ්ඣානසදිසා. අරූපාවචරභාවෝ ඒව හෙත්ථ විසේසෝ. **විසයාදිප්පභේදතෝ**ති එත්ථ පන ආරම්මණතෝ තේ චතුබ්බිධා හොන්ති. සෙය්‍යථිදං ආකාසානඤ්චායතනං විඤ්ඤාණඤ්චායතනං ආකිඤ්චඤ්ඤායතනං නේවසඤ්ඤනාසඤ්ඤායතනන්ති. තත්ථ හි කසිණුග්ඝාටිමාකාසේ "අනන්තෝ ආකාසෝ"ති පවත්තං පඨමං, තස්මිං පඨමාරුප්පවිඤ්ඤාණේ "අනන්තං විඤ්ඤාණ"න්ති පවත්තං දුතියං, තස්ස පඨමාරුප්පවිඤ්ඤාණස්ස අභාවේ "නත්ථි කිඤ්චී"ති පවත්තං තතියං, තස්මිං තතියේ "සන්තමේතං පණීතමේත"න්ති පවත්තං චතුත්ථං. පුරිමපුරිමේහි පච්ඡිමපච්ඡිමං සන්තසන්තතරසන්තතමන්ති ච වේදිතබ්බං.

නනු රූපාවචරේසු විතක්කාදිඅඞ්ගසමතික්කමතෝ උපරූපරිඣානානං සන්තතරාදිභාවෝ වුත්තෝ, අඞ්ගාතික්කමරහිතේසු පන ආරුප්පේසු කථන්ති? ආරම්මණාතික්කමතෝ. ඒතේසු හි කසිණරූපසමතික්කමතෝ පඨමං ඣානං රූපාවචරපඤ්චමජ්ඣානතෝ සන්තං, තතෝපි කසිණුග්ඝාටිමාකාසාතික්කමතෝ දුතියං, තතෝපි ආකාසේ පවත්තවිඤ්ඤාණාතික්කමතෝ තතියං, තතෝපි ආකාසේ පවත්තවිඤ්ඤාණස්ස සමතික්කමතෝ චතුත්ථන්ති. ඒවං අඞ්ගසමත්තේපි ථූලථූලාතික්කමේන සුඛුමසුඛුමාරම්මණතාය උපරූපරිජ්ඣානානං සන්තතරාදිභාවෝ වේදිතබ්බෝ සමායාමවිත්ථාරානම්පි වත්ථානං සුත්තසුඛුමතරාදිභාවෝ විය. නනු අභාවාරම්මණතාය තතියාරුප්පං සන්තපණීතතෝ මනසි කරොන්තස්ස චතුත්ථාරුප්පස්ස කථං තත්ථ නිකන්තිපරියාදානං, කථං ච සමතික්කමෝ වා හෝතීති? අසමාපජ්ජිතුකාමතාය, සා ච අත්තනෝ සන්තපණීතතාය. යථා හි රාජා දන්තකාරාදිසිප්පිකානං අතිසුඛුමමනාපසිප්පං දිස්වා "ඡේකා වතිමේ ආචරියා"ති තේසං ඡේකතාය තුස්සන්තෝපි න තං සිප්පිකභාවං පත්ථේති, තං සමතික්කම්ම රාජභාවේ ඒව තිට්ඨති, ඒවංසම්පදමිදං දට්ඨබ්බං. ඒවං ආරම්මණභේදතෝ චතුබ්බිධානම්පේතේසං පුන පටිපදාරම්මණාධිපතිහීනත්තිකභේදේහි පුබ්බේ වුත්තනයේනේව පච්චේකං භේදෝ වේදිතබ්බෝ.

එත්ථ ච රූපාවචරචතුත්ථජ්ඣානනිකන්තිපරියාදානදුක්ඛතාය පඨමාරුප්පස්ස, පඨමාරුප්පාදිනිකන්තිපරියාදානදුක්ඛතාය දුතියාරුප්පාදීනඤ්ච දුක්ඛපටිපදතා, පරියාදිණ්ණනිකන්තිකස්ස තදප්පනාපරිවාසදන්ධතාය දන්ධාභිඤ්ඤතා, විපරියායේන ඉතරා ච වේදිතබ්බා. පරිත්තකසිණුග්ඝාටිමාකාස මූලකානං පන චතුන්නං පරිත්තාරම්මණතා, විපරියායානං අප්පමාණාරම්මණතා වේදිතබ්බා. රූපාරූපාවචරා පනෙත්ථ අධිපතිසහිතාව උප්පජ්ජන්ති, න විනා අධිපතීහි. කාමාවචරා තු අධිපතිරහිතාපි උප්පජ්ජන්ති, තේ ච ආරම්මණාධිපති සහජාතාධිපතීති ද්වේපි ලබ්භන්ති. රූපාරූපාවචරා පන සහජාතාධිපතිමේව,

ණේතරං. තත්ථ ච ඡන්දාධිපතිනා සහජාතා ධම්මා ඡන්දාධිපතෙය්‍යා, ඡන්දෝ පන අධිපති ඒව, න ඡන්දාධිපතෙය්‍යෝ. ඉතරේ පන අධිපතෙය්‍යාව, නාධිපතයෝ අඤ්ඤස්ස අත්තනා සහජාතස්ස ඡන්දස්ස, ඉතරේසඤ්ච අධිපතියත්ථස්ස අභාවා. ඒකස්මිං හි චිත්තුප්පාදේ ඡන්දාදීසු චතූසුපි විජ්ජමානේසු යථාපච්චයං සහජාතාධිපති ඒකෝව ලබ්භති. ඒවං වීරියාධිපතියාදීසුපි යථානුරූපං ඤාතබ්බං. ඒවං විසයාදිප්පභේදතෝ විනිච්ඡයෝ ඤාතබ්බෝ.

**[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා අරූපාවචරකුසලධම්ම යටතේ)]**

**සබ්බේපි අරූපාවචරා කුසලධම්මා පන** සියළු අරූපාවචර කුසල ධර්මයෝ වනාහි **උපෙක්ඛේකග්ගතාසම්පයුත්තාව** උපේක්ෂා ඒකාග්‍රතා සම්ප්‍රයුක්ත බැවින්ම **සම්පයෝගතෝ** සම්ප්‍රයෝග වශයෙන් **න භින්නා** නොබෙදන ලදහ **සබ්බසෝ** සියළු ආකාරයෙන්ම **ධම්මුද්දේසාදිතෝපි** ධම්මුද්දේශ වශයෙන් ද **රූපාවචරපඤ්චමජ්ඣානසදිසා** රූපාවචර පඤ්චමද්ධ්‍යානය හා සමානයහ **එත්ථ හි** මෙහි වනාහි **අරූපාවචරභාවෝ ඒව** අරූපාවචර බවම **විසේසෝ** වෙනසයි **පන (සච්චං)** ඒ කීම සැබෑවකි **එත්ථ** මෙහි **තේ** ඒ අරූපාවචර කුසල චිත්තයෝ **ආරම්මණතෝ** ආරම්මණ වශයෙන් **චතුබ්බිධා** සතර වැදෑරුම් **හොන්ති** වෙත් **සෙය්‍යථීදං?** ඒ යම්සේද? **ආකාසානඤ්චායතනං** ආකාසානඤ්චායතන කුසල් සිත **විඤ්ඤාණඤ්චායතනං** විඤ්ඤාණඤ්චායතන කුසල් සිත **ආකිඤ්චඤ්ඤායතනං** ආකිඤ්චඤ්ඤායතන කුසල් සිත **නේවසඤ්ඤානාසඤ්ඤායතනන්ති** නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසල් සිත වශයෙනි **හි** විස්තර කෙරෙම් **තත්ථ** ඒ අරූපාවචර කුසල් සිත් සතර අතරින් **කසිණුග්ඝාටිකමාකාසේ** කිසිණු ඉගුළු අහසෙහි **අනන්තෝ ආකාසෝ ඉති** අනන්ත ආකාශය යයි **පවත්තං** පවත්වනලද චිත්තය තෙමේ **පඨමං** ප්‍රථම අරූපාවචර කුසල චිත්තයයි **තස්මිං** ඒ ප්‍රථමාරූප්ප විඤ්ඤාණයෙහිම **අනන්තං විඤ්ඤාණං ඉති** විඤ්ඤාණය අනන්ත යයි **පවත්තං** පවත්වනලද චිත්තය තෙමේ **දුතියං** දෙවැනි අරූපාවචර කුසල චිත්තයයි **තස්ස පඨමාරුප්පවිඤ්ඤාණස්ස** ඒ ප්‍රථමාරුප්ප විඤ්ඤාණයාගේ **අභාවේ (අවිජ්ජමානේ)** අවිද්‍යමාන කල්හි **නත්ථි කිඤ්චි ඉති** කිසිවක් නැත යැයි **පවත්තං** පවත්වනලද චිත්තය තෙමේ **තතියං** තෘතීයාරූපාවචර කුසල චිත්තයයි **තස්මිං තතියේ** ඒ තෙවැනි කුසල චිත්තයෙහි **සන්තමේතං පණීතමේතං ඉති** එයම ශාන්තය එයම ප්‍රණීතය යනුවෙන් **පවත්තං** පවත්වනලද චිත්තය තෙමේ **චතුත්ථං** සිව්වැනි අරූපාවචර කුසල චිත්තයයි **පුරිමපුරිමේහි** පෙර පෙර කුසල චිත්තයන්ට වඩා **පච්ඡිමපච්ඡිමං** පශ්චිම පශ්චිම කුසල චිත්තයෝ **සන්තසන්තතරසන්තතමන්ති ච** ශාන්තතර ද ශාන්තතම ද යැයි **වේදිතබ්බං** දතයුතු ෴

**රූපාවචරේසු** රූපාවචර චිත්තයන්හි **විතක්කාදිඅඞ්ගසමතික්කමතෝ** විතර්කාදී අඞ්ග ඉක්මවීමෙන් **උපරූපරිඣානානං** මතු මතු ධ්‍යානයන්ගේ **සන්තතරාදිභාවෝ** ශාන්තතරාදී භාවය **වුත්තෝ නනු?** කියනලද්දේ නොවේද? **ආරුප්පේසු** අරූපාවචරයෙහි **අඞ්ගාතික්කමරහිතේසු** අඞ්ග ඉක්මවීමක් නැති කල්හි **කථං?** කෙසේද? **ඉති (පුච්ඡායං සති)** මෙසේ ප්‍රශ්නයක් ඇති කල්හි **පන (අයං පරිහාරෝ)** මේ පරිහාරයයි **ආරම්මණාතික්කමතෝ** අරමුණු ඉක්මවීම් වශයෙනි **හි** විස්තර කෙරෙම් **ඒතේසු** ඒ අරූපාවචර චිත්තයන් අතරින් **පඨමං ඣානං** ප්‍රථම ධ්‍යාන චිත්තය **කසිණරූපසමතික්කමතෝ** කසිණරූපය ඉක්මවීම් වශයෙන් **රූපාවචරපඤ්චමජ්ඣානතෝ** රූපාවචර පඤ්චම ධ්‍යාන චිත්තයට වඩා **සන්තං** ශාන්තය **තතෝපි** ඒ ප්‍රථමාරූපාවචර ධ්‍යාන චිත්තයට වඩා

**කසිණුග්ඝාටිමාකාසාතික්කමතෝ** කිසිණු ඉගුළු අකාශය ඉක්මවීම් වශයෙන් **දුතියං** ද්වීතියාරූපාවචර ධ්‍යාන චිත්තය (**සන්තං** ශාන්තය) **තතෝපි** ඒ ද්විතීයාරූපාවචර චිත්තයට වඩා **ආකාසේ** කසිණුග්ඝාටික ආකාශයෙහි **පවත්තවිඤ්ඤාණාතික්කමතෝ** පවත්වනලද විඤ්ඤාණය ඉක්මවීම් වශයෙන් **තතියං** තෘතීයාරූපාවචර ධ්‍යාන චිත්තය (**සන්තං** ශාන්තය) **තතෝපි** ඒ තෘතීයාරූපාවචර චිත්තයට වඩා **ආකාසේ** කිසිණු ඉගුළු ආකාශයෙහි **පවත්තවිඤ්ඤාණස්ස** පවත්වනලද විඤ්ඤාණයාගේ නාස්තිභාවය **සමතික්කමතෝ** සමතික්‍රමණය කොට ප්‍රවෘත්ත තෘතීයාරූපාවචර චිත්තය අරමුණු කොට ඇති **චතුත්ථං** චතුර්ථාරූපාවචර ධ්‍යාන චිත්තය (**සන්තං** ශාන්තය) **ඉති ඒවං** මෙසේ **අඞ්ගසමත්තේපි** අඞ්ග සමකල්හි ද **ථූලථූලාතික්කමේන** පුථුල පුථුලාරම්මණ ඉක්මවීමෙන් **සුඛුමසුඛුමාරම්මණතාය** සියුම් සියුම් අරමුණු ඇති බැවින් **උපරූපරිජ්ඣානානං** මතු මතු ධ්‍යානයන්ගේ **සන්තතරාදිභාවෝ** ශාන්තතරාදී භාවය **සමායාමචිත්ථාරානම්පි** (සම+ආයාම+චිත්ථාරානං+අපි) සමවූ දිග පළලින් යුක්ත **වත්ථානං** වස්ත්‍රයකගේ **සුත්තසුඛුමතරාදිභාවෝ විය** නූල්වල සුඛුමතර භාවය මෙන් **වේදිතබ්බෝ** දතයුතු.

**අභාවාරම්මණතාය** ප්‍රථම අරූප චිත්තයාගේ නාස්තිභාවයම අරමුණු කොට ඇති හෙයින් **තතියාරුප්පං** තෘතීයාරුප්ප ධ්‍යාන චිත්තය **සන්තපණීතතෝ** ශාන්ත ප්‍රණීත වශයෙන් **මනසි කරොන්තස්ස** මෙනෙහි කරන්නාහට **කථං** කෙසේ **චතුත්ථාරුප්පස්ස** චතුත්ථාරුප්ප ධ්‍යාන චිත්තයාගේ **නිකන්තිපරියාදානං** නිකන්ති පරියාදානයක් **නනු?** නොවන්නේ ද? **සමතික්කමෝ වා** සමතික්‍රමණය හෝ **කථං හෝතීති?** කෙසේ වන්නේ දැයි **තත්‍ථ (පුච්ඡායං සති)** මෙසේ ප්‍රශ්න ඇති කල්හි **ච** ඊට පරිහාර කියනු ලැබේ **අසමාපජ්ජිතුකාමතාය** සම නොවදිනු කැමැති බැවිනි **සා ච** ඒ සම නොවදිනු කැමැත්ත වනාහි **අත්තනෝ** චතුර්ථ ධ්‍යානයාගේ **සන්තපණීතතාය** ශාන්ත ප්‍රණීතතාවයෙනි **හි** උපමාවක් දක්වම් **යථා රාජා** යම්සේ රජු **දන්තකාරකාදිසිප්පිකානං** ඇත් දත් කැටයම් ආදී කරන්නාවූ ශිල්පීන්ගේ **අතිසුඛුමමනාපසිප්පං දිස්වා** අතිශයින් සියුම් මනාප ශිල්ප කර්මයක් දැක **වත** ඒකාන්තයෙන් **ඉමේ ආචරියා** මේ ආචාර්‍ය්‍ය තුමූ **ඡේකාති** දක්ෂයෝ යැයි **තේසං** ඔහුන්ගේ **ඡේකතාය** දක්ෂ බවෙහි **තුස්සන්තෝපි** සතුටු වන්නේ ද **තං සිප්පිකභාවං** ඒ ශිල්පභාව **න පත්ථේති** නොම පතයි **තං සමතික්කම්ම** ඒ ශිල්පභාවය ඉක්මවා **රාජභාවේ ඒව** රජ බවෙහිම **තිට්ඨති** සිටියි **ඉදං සම්පදං** මේ උපමාව **යථා** යම්සේද **ඒවං (තථා)** එසේ චතුත්ථාරුප්ප චිත්තය **දට්ඨබ්බං** දතයුතු **ඒවං** මෙසේ **ආරම්මණභේදතෝ** ආරමුමණ භේද වශයෙන් **චතුබ්බිධානං** අපි **ඒතේසං** සතර වැදෑරුම් වූ ඒ චිත්තයන්ගේ **පුන** නැවතද **පටිපදාරම්මණාධිපතිහීනත්තිකභේදේහි** පටිපදා ආරම්මණ අධිපති හීනත්‍රික භේදයන්ගෙන් **පුබ්බේ** පෙර **වුත්තනයේනේව** කියනලද නයින්ම **පච්චේකං** වෙන වෙනම **භේදෝ** පටිපදාදී භේදය **වේදිතබ්බෝ** දතයුතුයි.

**ච** විස්තර කරම් **ඒත්‍ථ** මෙහි **රූපාවචරචතුත්ථජ්ඣාන** රූපාවචර චතුත්ථ ධ්‍යානයෙහි වූ **නිකන්තිපරියාදානදුක්ඛතාය** නිකන්තිය නම් වූ ඡන්දරාගය ක්ෂයවීම දුක් පිණිස වන හෙයින් **පඨමාරුප්පස්ස** ප්‍රථම අරූප ධ්‍යානයාගේ ද **පඨමාරුප්පාදි** ප්‍රථම අරූපාවචර ධ්‍යානාදියෙහි **නිකන්තිපරියාදානදුක්ඛතාය** නිකන්තිය නම් වූ ඡන්දරාගය ක්ෂයවීම දුක් පිණිස වන හෙයින් **දුතියාරුප්පාදීනං** ද්විතීය අරූපාවචර ධ්‍යානාදීන්ගේ ද **ච (ඒවං)** මෙසේ **දුක්ඛපටිපදතා** දුක්ඛ ප්‍රතිපදා වශයෙන් ද **පරියාදිණ්ණනිකන්තිකස්ස** හාත්පසින් ගන්නාලද නිකන්තිය ඇත්තහුට

**තදප්පනාපරිවාසදන්ධතාය** ඒ අර්පණා පරිවාසය දන්ධ බැවින් **දන්ධාභිඤ්ඤතා** දන්ධාභිඥ වශයෙන් ද **ච (ඒවං)** මෙසේ **විපරියායේන** විපර්‍යාසයෙන් (වෙනස් වීමෙන්) **ඉතරා (පටිපදා)** අනෙක් ප්‍රතිපදාවෝ ද **වේදිතබ්බා** දතයුත්තීය **පරිත්තකසිණුග්ඝාටිකමාකාසමූලකානං** පරිත්ත කිසිණු ඉගුළු ආකාශය මුල් කොට ඇති **චතුන්නං** සිත් සතරට **පරිත්තාරම්මණතා** පරිත්තාරම්මණ බවද **විපරියායානං** වෙනස් වූ චිත්තයන්ට **අප්පමාණාරම්මණතා** අප්පමාණාරම්මණ බවද **පන (ඒවං ආරම්මණභේදා)** මෙසේ ආරම්මණ භේදයෝ **වේදිතබ්බා** දතයුත්තීය **එත්ථ පන** මෙහි වනාහි **රූපාරූපාවචරා** රූපාවචර අරූපාවචර චිත්තයෝ **අධිපතිසහිතාව** අධිපති ධර්ම සහිත වූවෝම වී **උප්පජ්ජන්ති** උපදිත් **අධිපතීහි විනා** අධිපති ධර්මයන් නොමැතිව **න (උප්පජ්ජන්ති)** නූපදිත් **කාමාවචරා තු** කාමාවචර චිත්තයෝ වනාහි **අධිපතිරහිතාපි** අධිපති ධර්ම රහිත වූවෝද වී **උප්පජ්ජන්ති** උපදිත් **තේ ච** භේද වනාහි **ආරම්මණාධිපති** ආරම්මණාධිපති **සහජාතාධිපතීති** සහජාතාධිපති යැයි **ද්වේපි** දෙකක්ම **ලබ්භන්ති** ලබත් **රූපාරූපාවචරා පන** රූපාවචර අරූපාවචර චිත්තයෝ වනාහි **සහජාතාධිපතිමේව** සහජාතාධිපති බවම (**ලබ්භන්ති** ලබත්) **ඉතරං** ආරම්මණාධිපති බව **න (ලබ්භන්ති)** නොලබත් **තත්ථ ච** එහිද **ඡන්දාධිපතිනා** ඡන්දාධිපතිය සමග **සහජාතා ධම්මා** එකට උපන් ධර්මයෝ **ඡන්දාධිපතෙය්‍යා** ඡන්දාධිපතෙය්‍ය නම් **ඡන්දෝ පන** ඡන්දය වනාහි **අධිපති ඒව** අධිපති ධර්මයක්මය **ඡන්දාධිපතෙය්‍යා** ඡන්දාධිපතෙය්‍ය නම් **න (හෝති)** නොවෙයි **ඉතරේ පන** සහජාත ධර්මයෝ වනාහි **අධිපතෙය්‍යාව** අධිපතෙය්‍ය නම් (**හොන්ති** වෙත්) **නාධිපතයෝ** අධිපති නොවන ධර්මයෝ **අත්තනා සහජාතස්ස අඤ්ඤස්ස ඡන්දස්ස** තමා හා උපන් අන්‍ය වූ ඡන්දයකට (**අධිපති න හොන්ති** අධිපති නොවෙත්) **ඉතරේසං** අන්‍යවූ **අධිපතියට්ඨස්ස** අධිපති අර්ථය ඇති ධර්මයකගේ **අභාවා** අභාවයෙනි **හි** ඒ එසේමැයි **ඒකස්මිං චිත්තුප්පාදේ** එක් චිත්තෝත්පාදයෙක්හි **ඡන්දාදීසු චතූසුපි විජ්ජමානේසු** ඡන්දාදී අධිපති ධර්ම සතරක් විද්‍යමාන කල්හි **යථාපච්චයං** ප්‍රත්‍යය ධර්මයන්ට සුදුසු පරිදි **සහජාතාධිපති** සහජාතාධිපතිය **ඒකෝව** එක් ධර්මයක්ම **ලබ්භති** ලබයි **විරියාධිපතියාදීසුපි** විරියාධිපති ආදියෙහි ද **ඒවං** මෙසේ **යථානුරූපං** සුදුසු පරිදි **ඤාතබ්බං** දතයුතු **ඒවං** මෙසේ **විසයාදිප්පභේදතෝ** ආරම්මණාදි ප්‍රභේදයෙන් **විනිච්ඡයෝ** විනිශ්චය **ඤාතබ්බෝ** දතයුතු.

**[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

ආකාසානඤ්චායතනං - කුසලං පඨමං භවේ
විඤ්ඤාණඤ්චායතනන්ති - දුතියං තතියං තථා

ආකාසානඤ්චායතනන්තු - චතුත්ථං පන මානසං
නේවසඤ්ඤානාසඤ්ඤය - තනඤ්චේති චතුබ්බිධං

**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 15-16 යටතේ)]**

**ආකාසානඤ්චායතනං** ආකාසානඤ්චායතන යන නම් ඇති **කුසලං** කුශලය තෙම **පඨමං** ප්‍රථම ධ්‍යාන කුසල් සිත **භවේ** වනනේය **විඤ්ඤාණඤ්චායතනං** විඤ්ඤාණඤ්චායතන යන නම් ඇති **කුසලං** කුශලය තෙමේ **දුතියං තු** ද්විතීය ධ්‍යාන කුශල් සිත **භවේ** වන්නේය **තථා** එසේම **ආකිඤ්චඤ්ඤායතනං** ආකිඤ්චඤ්ඤායතන යන නම් ඇති **කුසලං** කුශලය තෙමේ **තතියං තු** තෘතීය ධ්‍යාන කුශල් සිත **භවේ** වන්නේය **නේවසඤ්ඤානාසඤ්ඤායතනං** නේවසඤ්ඤානාසඤ්ඤායතන යන නම් ඇති **මානසං පන** කුශල් සිත වනාහි **චතුත්ථං** චතුර්ථ ධ්‍යාන කුශල් සිත **භවේ**

වන්නේය **ඉති** මෙසේ (**ආරුප්පකුසලං** අරූපාවචර කුශල් සිත) **චතුබ්බිධං** සතර ප්‍රකාරයෙක් **හවේ** වන්නේය. [පරමත්ථවිභාවනී ව්‍යාඛ්‍යාව 11 පිට]

ආරුප්පකුසලං නාම - උපෙක්ඛෙකග්ගතායුතං
දුවඞ්ගිකවිධං සබ්බං - ආරුප්පභවසාධකං

[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 17)]

**ආරුප්පකුසලං නාම** අරූපාවචර කුශලය තෙම වනාහි **උපෙක්ඛෙකග්ගතායුතං** උපේක්ෂා ඒකාග්‍රතාවන් හා යුක්තවූයේ **දුවඞ්ගිකං** අඞ්ග දෙකක් ඇත්තේ (**හවේ** වන්නේය) **ඉදං සබ්බං** මේ සියළු අරූපාවචර කුශලය තෙම **ආරුප්පභවසාධකං** අරූප භවයෙහි ප්‍රතිසන්ධි විපාකය නිපදවන්නේය ("උප්පාදදිඅන්තරහිතතාය නාස්ස අන්තන්ති අනන්තං, ආකාසඤ්ච තං අනන්තං චාති ආකාසානන්තං" නිර්වචනයි. කිසුණු උගුළුවා ලබනලද ආකාශ ප්‍රඥප්තිය ලැබේ. මෙහි "අනන්තාකාසං" යී කියයුතු තන්හි "අග්ග්‍යාහිතෝ" යනාදියෙහි මෙන් "අනන්ත" යන විශේෂණ පදයාගේ පර නිපාත වශයෙන් "ආකාසානන්තං" යී කීයේ යයි දතයුතු. "ආකාසානන්තමේව ආකාසානඤ්චං" ස්වාර්ථයෙහි භාව ප්‍රත්‍යය වශයෙනි. "ආකාසානඤ්චමේව ආයතනං අස්ස ඣානස්සාති ආකාසානඤ්චායතනං" නිර්වචනයි. ආකාසානඤ්ච වූ ආකාශ ප්‍රඥප්තියෙහි අර්පණාවට පැමිණි ප්‍රථමාරූප්‍ය ධ්‍යානය ද කාරුණ්‍යුපචාර වශයෙන් මෙහි "ආකාසානඤ්චායතනං" යී කියනලදි. කුමක් මෙන්ද? පෘථිවි කසිණ අරමුණු කොට උපන් ධ්‍යානයට පෘථිවි කසිණය කියන්නාක් මෙනි. නොහොත් "ආකාසානඤ්චං ආයතනං අස්සාති ආකාසානඤ්චායතනං" නිර්වචනයි. ධ්‍යානය ලැබෙයි. "ආකාසානඤ්චායතනේන සම්පයුත්තං ආකාසානඤ්චායතනං" සිත ලැබෙයි. "විඤ්ඤාණමේව අනන්තං විඤ්ඤාණානන්තං" ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණය ලැබෙයි. ඒ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණය උත්පාදදිවූ අවසානය ඇත්තේ ද අනන්තාකාශයෙහි උපදින හෙයින් තමන් අරමුණු කොට උපන් භාවනාවගේ උත්පාදදි අන්තය නොගෙන අනන්ත වශයෙන් පැතිරීම් වශයෙන් ඉපදීම හේතු කොටගෙන අනන්තයයි කියනු ලැබේ ද එහෙයින් ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණය අනන්ත නම් වේ. "විඤ්ඤාණමේ අනන්තං විඤ්ඤාණානන්තං" යී කියයුතු තන්හි ණා-යන්නෙහි ආ-කාරය හ්‍රස්ව කිරීම ද න-කාර ලෝපය ද පූර්ව නයද ආශ්‍රය කොට "විඤ්ඤාණඤ්චං" යී දතයුතුයි) [පරමත්ථවිභාවනී ව්‍යාඛ්‍යාව 12 පිට]

**න කසීයතී න විලේඛීයතීති ආකාසං** යනුවෙන් විග්‍රහකරණු. **යං** යම් ආකාශයක් **න කසීයති න විලේඛීයති** නොලිය හැක්කේ වේද **ඉති (තස්මා)** එසේහෙයින් **තං** ඒ ආකාශ තෙමේ **අකාසං** අකාශ නම් වේ. මේ වනාහි අර්ථයි. **උප්පාදදී අන්තරහිතතාය නාස්ස අන්තෝති අනන්තං** යනුවෙන් විග්‍රහ කරණු. **උප්පාදදී අන්තරහිතතාය** උත්පාදදී වූ පරිච්ඡේදයක් නැති බැවින් **අස්ස** ඒ ආකාශයාගේ **අන්තෝ** කෙළවරක් තෙමේ **නත්ථි** නැත්තේ වේද ඉති (තස්මා) එසේහෙයින් **තං** ඒ ආකාශ තෙමේ **අනන්තං** අනන්ත නම් වේ. මේ වනාහි අර්ථයි. **ආකාසානං ච තං අන්තං චාති ආකාසානන්තං** යනුවෙන් විග්‍රහකරණු. කසිණ උගුළුවා ලබන ලද්ද වූ ආකාශය ලැබේ. අනන්ත ආකාශය යැයි කියයුතු වුව ද අග්‍යාහිතෝ ඡන්දදතෝ යනාදී ප්‍රයෝගයන් මෙන් පදයට පෙර පසු වශයෙන් ආකාසානන්තය යැයි කියන ලද්දේයි. "ණ්‍යයත්තා භාවේතු" යන සූත්‍රයෙහි තු-ශබ්දයෙන් ණ්‍ය-ප්‍රත්‍යයාදේශ වේ. ණ-කාරය ලොප් වෙයි. ත-කාරය ය-කාරයට සම්බන්ධ කරණු. යවතං යනාදී නාම සූත්‍රයෙන් ත්‍ය-කාරයට ච-කාරාදේශ කොට න-

කාරයට නිග්ගහීත කොට අ-කාරයට ආ-කාරාදේශ කොට ආකාසානඤ්ච යැයි සිද්ධයි.

**ආකාසානඤ්ච මේව ආයතනං අස්සාති ආකාසානඤ්චායතනං** යනුවෙන් විග්‍රහකරණු. ධ්‍යානය ලැබේ. **අස්ස** ඒ ධ්‍යානයට **ආකාසානඤ්චං** කෙළවරක් නැත්තා වූ කසිණ සඞ්ඛ්‍යාත වූ **ආයතනං අත්‍ථි** පිහිටන්නා වූ අරමුණක් ඇත්තේ වේද **ඉති (තස්මා)** එසේහෙයින් **තං** ඒ ධ්‍යාන තෙමේ **ආකාසනඤ්චායතනං** ආකාසානඤ්චායතන නම් වේ. **ආකාසානඤ්චායතනේන සම්පයුත්තං කුසලචිත්තන්ති ආකාසානඤ්චායතන කුසලචිත්තං** යනුවෙන් විග්‍රහකරණු. උපෙක්ඛා ඒකග්ගතා සඞ්ඛ්‍යාත වූ ධ්‍යාන අඞ්ගද්වය හා එක්ව යෙදුනා වූ ආකාසානඤ්චායතන කුසල චිත්තය ලැබේ.

**විඤ්ඤාණමේව අනත්තංති විඤ්ඤාණන්තං** යනුවෙන් විග්‍රහකරණු. මේ ස්ථානයෙහි අනන්ත විඤ්ඤාණය යැයි කියයුත්තේ නමුදු අනන්ත යන විශේෂණ පදයාගේ අනතුරු තන්හි ත්‍ය-කාරය ලොප්වීම් වශයෙන් විඤ්ඤාණනන්තං යැයි කීයේයි. විග්‍රහයාගේ අර්ථය ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයයි. **විඤ්ඤාණමේව** ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයම **අනන්තං** උත්පාදදී වූ අන්තරහිත වූයේනුයි **ඉති (තස්මා)** එසේහෙයින් **විඤ්ඤාණනන්තං** විඤ්ඤාණනන්ත නම් වේ. මේ වනාහි අර්ථයයි. ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණ තෙමේ උත්පාදදී වූ අන්ත රහිත වූයේ නමුදු අස්ථාන වූ පිරිසිඳීමක් නැත්තා වූ ආකාශයාගේ අන්තය යන නාමය ස්ථානී වූ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයෙහි ආරෝපණය කොට ධානෝපචාර වශයෙන් ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණය අන්ත යැයි කීයේයි. **විඤ්ඤාණඤ්චායතනං අස්සාති විඤ්ඤාණඤ්චායතනං** යනු කීහ. උපෙක්ඛා ඒකග්ගතා සඞ්ඛ්‍යාත වූ ධ්‍යාන විග්‍රහයාගේ අර්ථ වශයෙන් ලැබේ. **විඤ්ඤාණඤ්චායතනේන සම්පයුත්තං කුසලචිත්තන්ති විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තං** යනුවෙන් විග්‍රහකරණු චිත්තය ලැබේ.

**නත්‍ථි කිඤ්චනං අප්පමත්තකං අන්තමසෝභඞ්ගමත්තං අවසිට්ඨං අස්සාති අකිඤ්චනං** යනුවෙන් විග්‍රහකරණු. **අස්ස** ඒ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයට **කිඤ්චනං අප්පමත්තකං** ස්වල්ප මාත්‍රයකුදු **නත්‍ථි** නැත්තේනුයි **අන්තමසෝ** යටත් පිරිසෙන් **අවසිට්ඨං** උත්පාද ස්ථිතින්ගේ අවසිට්ඨ වූ **භඞ්ගමත්තම්පි** භඞ්ගක්‍ෂණ මාත්‍රයකුදු **නත්‍ථි** නැත්තේනුයි **ඉති (තස්මා)** එසේහෙයින් **තං** ඒ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණ තෙමේ **අකිඤ්චනං** අකිඤ්චන නම් වේ. මෙසේ අර්ථ යෝජනා කරණු. ප්‍රථමාරූපය විඤ්ඤාණය උත්පාදක්‍ෂණයෙහි ස්ථිති භඞ්ගයෝ තූමූ උත්පාදක්‍ෂණයන්ගෙන් අවශිෂ්ට නම් වෙත්. **අකිඤ්චනස්සභාවෝ අකිඤ්චඤ්ඤං** යනුවෙන් විග්‍රහකරණු. ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයාගේ නැති බැව් සඞ්ඛ්‍යාත වූ නත්‍ථිභාව පඤ්ඤත්තිය ලැබේ. භාවාර්ථයෙහි ණ්‍ය-ප්‍රත්‍යයාදේශ කරණු. ණ-කාරය ලොප් වෙයි. න-කාරය ය-කාරයට සම්බන්ධ කරණු. "යවතං" යනාදී වූ නාම සූත්‍රයෙන් න්‍ය-කාරයට ඤ-කාරාදේශ කරණු. ඤ-කාරය සදිස ද්වේභාවය කරණු. අ-කාරයට ආ-කාරාදේශ කොට ආකිඤ්චඤ්ඤ යැයි සිද්ධයි. **ආකිඤ්චඤ්ඤමේව තතියාරුප්පඣානස්ස අධිට්ඨානට්ඨේන ආයතන්ති ආකිඤ්චඤ්ඤයතනං** යනුවෙන් විග්‍රහකරණු. **ආකිඤ්චඤ්ඤමේව** ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණයාගේම නැති බැව් සඞ්ඛ්‍යාත වූ නත්‍ථිභාව පඤ්ඤත්තියම **තතියාරුප්පඣානස්ස** තෘතීයාරූප්‍ය ධ්‍යානයාගේ **අධිට්ඨානට්ඨේන** ආධාර සඞ්ඛ්‍යාත වූ අර්ථයෙන් **ආයතනං හෝති** ආයතන නම් වේද **ඉති (තස්මා)** එසේහෙයින් **තං** ඒ නත්‍ථිභාවපඤ්ඤත්ති තොමෝ

ආකිඤ්චඤ්ඤායතනං නම් වේ. මේ වනාහි අර්ථයි. නත්ථිභාව පඤ්ඤත්තිය ද විග්‍රහයාගේ අර්ථය ද මුඛ්‍ය වශයෙන් ලැබේ. නත්ථිභාව පඤ්ඤත්තියෙහි අර්පණාවට පැමිණියා වූ තෘතීයාරූප්‍ය ධ්‍යානය ද ස්ථාන වූ නත්ථිභාව පඤ්ඤත්තියගේ ආකිඤ්චඤ්ඤායතන යන නාමය ස්ථානීය වූ තෘතීයාරූප්‍ය ධ්‍යානයෙහි ආරෝපනය කොට ඨානෝපචාර වශයෙන් ඒ ධ්‍යානය ද ආකිඤ්චඤ්ඤායතන යැයි කියන ලද්දේයි. **ආකිඤ්චඤ්ඤායතනේන සම්පයුත්තං කුසලචිත්තන්ති ආකිඤ්චඤ්ඤායතන කුසලචිත්තං** යනුවෙන් විග්‍රහකරණු චිත්තය ලැබේ.

**ඕළාරිකාය සඤ්ඤායාභාවතෝ සුඛුමායච සඤ්ඤාභාවතෝ නේවස්ස සසම්පයුත්තධම්මස්ස ඣානස්ස සඤ්ඤා න අසඤ්ඤාති නේවසඤ්ඤානාසඤ්ඤං** යනුවෙන් විග්‍රහකරණු. ධ්‍යානය ලැබේ. **ඕළාරිකාය** ලාමකව **සඤ්ඤාය අභාවතෝ ච** සඤ්ඤාවගේ නැති බැවින් ද **සසම්පයුත්තධම්මස්ස** සම්පයුත්ත ධර්ම සහිතව **අස්ස ඣානස්ස** ඒ ධ්‍යානයම සඤ්ඤා ලාමක වූ සඤ්ඤාවක් තොමෝ **නේව අත්ථි** නැත්තේ වේද **අසඤ්ඤා** සියුම් සඤ්ඤාවක් නැත්තේත් **න හෝති** නොවේ ද? **ඉති (තස්මා)** ඒසේහෙයින් **තං** ඒ ධ්‍යානය තෙමේ **නේවසඤ්ඤානාසඤ්ඤං** නේවසඤ්ඤානාසඤ්ඤා වේ. මේ වනාහි අර්ථයයි. **නේවසඤ්ඤානාසඤ්ඤා ච සා ආයතනා චාති නේවසඤ්ඤානාසඤ්ඤායතනං** යනුවෙන් විග්‍රහකරණු. ධ්‍යානය ලැබේ. **නේවසඤ්ඤානාසඤ්ඤායතනේන සම්පයුත්තං කුසලචිත්තන්ති නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසලචිත්තං** යනුවෙන් එක්කොට විග්‍රහකරණු. චිත්තය ලැබේ. මේ ස්ථානයෙහි සඤ්ඤාවගේ වශයෙන් ධ්‍යානය ගතයුත්තේයි. නිදර්ශන න්‍යායයි. එහෙයින් ඒ ධ්‍යානයෙහි වේදනාව ද නේවවේදනානාවේදනා නම් වේ. චිත්තය ද නේවචිත්තනාචිත්ත නම් වේ. ස්පර්ශ තෙමේ නේවඵස්සෝනාඵස්සෝ නම් වේ. සියුම් සඤ්ඤාවක් නැත්තේත් නොවේ. සඤ්ඤාවම සම්පයුත්ත ධර්ම සහිතව උපෙක්ඛා ඒකග්ගතා සඞ්ඛ්‍යාත වූ මේ ධ්‍යානයට නිශ්‍රයාදී වූ ප්‍රත්‍යයන් වන හෙයින් ආධාරස්ථාන වෙයි. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 33-35 පිටු; අභිධර්ම ප්‍රවේශනය 30-32 පිටු]**

**ආකාසානඤ්චායතන කුසලචිත්තං** (රූපසමතික්‍රමණය කොට කිසුණු ඉගිළුවූ අහස්හි උපදනා) ආකාසානඤ්චායතන කුසලචිත්තය ද **විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තං** (ආකාශ සමතික්‍රමණය කොට ඒහි ප්‍රවෘත්ත විඤ්ඤාණ ගෝචර කොට ඇති) විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තය ද **ආකිඤ්චඤ්ඤායතන කුසලචිත්තං** (ප්‍රථමාරූප්‍ය සමතික්‍රමණය කොට ඔහුගේ නාස්තිත්වය විෂය කොට ඇති) ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තය ද **නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසලචිත්තඤ්චේති** (ඒ ප්‍රථමාරූප්‍යාගේ නාස්තිත්වය සමතික්‍රමණය කොට ඒහි ප්‍රවෘත්ත තෘතීයාරූප්‍යය අරමුණු කොට ඇති) නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තය ද යන **ඉමානි චත්තාරිපි** (රූපාදීන් ඉක්ම කසිණෝද්ඝාටප ආකාශාදීන් විෂය කොට ඇති උපේක්ෂා ඥාණසම්ප්‍රයුක්ත කුසලානන්තරයෙහි භාවනාමයව උපදනා) මොහු සතර දෙනම **අරූපාවචරකුසලචිත්තානි නාම** අරූපාවචර කුසලචිත්තයෝ නම් වෙත්. මත්තෙහි විපාක ක්‍රියාවටත් මෙසේම දතයුතු.

එහි "නාස්ස අන්තොති අනන්තං." උත්පාදදි අන්ත රහිත බැවින් ද අනන්ත වශයෙන් ස්ඵරණය වන බැවින් ද මෝහට අන්තයෙක් නැත්නුයි අනන්ත නම් වේ. "ආකාසඤ්ච තං අනන්තඤ්චාති ආකාසානන්තං. කසිණුග්ඝාටිමාකාසෝ." "අනන්තාකාසං" යැයි කියයුතු තැන්හි "අග්‍යාහිතෝ" යනාදියෙහි මෙන් විශේෂණයාගේ පරනිපාත වශයෙන් "ආකාසානන්තං" යැයි කියන ලදි. ස්වාර්ථයෙහි

"ණ" ප්‍රත්‍යය කොට "ආකාසානන්තමේව ආකාසානඤ්චං" යැයි වේ. "තදේව ආයතනං සම්පයුත්තධම්මස්ස ඣානස්ස අධිට්ඨානට්ඨේන දේවානං දේවායතනං වියාති ආකාසානඤ්චායතනං" කිසුණු ඉගුළුවූ ආකාශයම ආකාසානඤ්චායතන නම් වේ. යම්සේ පඨවි කසිණය අරමුණු කොට උපන් ධ්‍යානය පඨවි කසිණය යැයි කියනු ලැබේ ද ඒසේම ආකාසානඤ්චායතනය යැයි කියන ලද කිසුණු ඉගුළුවූ ආකාශයෙහි ප්‍රවෘත්ත වූ අර්පණා ප්‍රාප්ත ප්‍රථමාරූප්‍ය චිත්තය ද ආකාසානඤ්චායතනය යැයි කියනු ලැබේ. නොහොත් "ආකාසානඤ්චං ආයතනං අස්සාති ආකාසානඤ්චායතනං ඣානං. තේන සම්පයුත්තං කුසලචිත්තං ආකාසානඤ්චායතන කුසලචිත්තං. විඤ්ඤාණමේව අනන්තං විඤ්ඤාණානන්තං. පඨමාරුප්පවිඤ්ඤාණං" ඒ ප්‍රථමාරූප්‍ය විඤ්ඤාණය ද උත්පාදදි අන්ත ඇත්තේ ද අනන්ත වූ ආකාශයෙහි පවත්නා හෙයින් තමා අරහයා ප්‍රවෘත්ත වූ භාවනාවගේ උත්පාදදි වශයෙන් අන්තයක් නොගෙන අනන්ත ස්ඵරණ වශයෙන් පවත්නා හෙයින් ද අනන්ත යැයි කියනු ලැබේ.

විඤ්ඤාණානන්තමේව විඤ්ඤාණඤ්ච. ආකාරයහට හ්‍රස්ව ද, න-කාරයහට ලොප් ද කොට "විඤ්ඤාණඤ්ච" කියා ද වේ. සෙස්ස ප්‍රථමාරූප්‍යයට කී පරිද්දෙන් දතයුතුය. නොහොත් දුතියාරූප්ප විඤ්ඤාණේන අඤ්චිතද්ධං පාපුණිතද්ධන්ති විඤ්ඤාණඤ්චං. තදේව ආයතනං දුතියාරුප්පස්ස අධිට්ඨානත්තාති විඤ්ඤාණඤ්චායතනං. නාස්ස පඨමාරුප්පස්ස කිඤ්චනං අප්පමත්තකං අන්තමසෝ භඞ්ග මත්තම්පි අවසිට්ඨං අත්ථීති අකිඤ්චනං. අකිඤ්චනස්ස භාවෝ ආකිඤ්චඤ්ඤං පඨමාරුප්පවිඤ්ඤාණාභාවෝ. තදේව ආයතනං අස්ස සම්පයුත්තධම්මස්ස තතියාරුප්පඣානස්සාති ආකාඤ්චඤ්ඤයතනං. නේවස්ස සඤ්ඤා න අසඤ්ඤන්ති නේවසඤ්ඤානාසඤ්ඤං. චතුත්ථාරුප්පඣානං. නේවසඤ්ඤානාසඤ්ඤමේව ආයතනං මනායතනධම්මායතන පරියාපන්නත්තාති නේවසඤ්ඤානාසඤ්ඤායතනං. නොහොත් සඤ්ඤා ඒව පටුසඤ්ඤාකිච්චකරණෝ අසමත්ථතාය නේවසඤ්ඤා උණ්හෝදකේ තේජෝධාතු විය සුඛුමවසේන විජ්ජමානතෝ න අසඤ්ඤාති නේවසඤ්ඤානාසඤ්ඤා යැයි කියන ලදි. නේවසඤ්ඤානාසඤ්ඤායේව ආයතනං අස්ස සම්පයුත්තධම්මස්ස ඣානස්ස නිස්සයාදිභාවතෝති නේවසඤ්ඤානාසඤ්ඤායතනං.

මෙහි සඤ්ඤා වශයෙන් ධ්‍යානයට උපලක්‍ෂණ වූ නිදර්ශන ක්‍රමය දක්වන ලදි. ඒ ධ්‍යානයෙහි වේදනාදීහු ද "නේවවේදනානාවේදනා" යනාදිහුම වෙත්. නේවසඤ්ඤානාසඤ්ඤායතනේන සම්පයුත්තං කුසලචිත්තං නේවසඤ්ඤා-නාසඤ්ඤායතන කුසලචිත්තං. මෙහි අපි ශබ්දයෙන් ආලම්බන ප්‍රතිපද මිශ්‍රකනය වශයෙන් ෂෝඩශප්‍රකාර ඇති දේශනාව ද මෙයින් අන්‍ය වූ පාළියෙහි ආගත නය ප්‍රභේදය ද සඞ්ග්‍රහ කෙරේ.

**ආරුප්පමානසං** අරූපාවචර චිත්තය **ආලම්බනප්පභේදේන** අතික්‍රමණය කළයුතු වූ කෘත්ස්නාකාශ විඤ්ඤාණ තද්භාව සඞ්ඛ්‍යාත ආරම්මණයන්ගේ ද අරමුණු කටයුතු වූ කෘත්සේනාද්ඝාටජාකාශාදි චතුර්විධ ආලම්බනයන්ගේ ද ප්‍රභේද හෙයින් **චතුධා හෝති** චතුර්විධ වන්නේය. **පුන** නැවත (ඒ අරූපාවචර චිත්තය) **පුඤ්ඤපාකක්‍රියාභේද** කුසල විපාක ක්‍රියා භේද හෙයින් **ද්වාදසධා** දෙළොස් පරිද්දකින් **ඨිතං** සිටියේයි.

මෙහි අරූපාවචරයෝ රූපාවචරයන් මෙන් අඞ්ගාතික්‍රමණ වශයෙන් උපදින්නාහු නොවෙති. ආලම්බනාතික්‍රමණ වශයෙන් උපදිත්. ඔහු සතරදෙන යථාක්‍රමයෙන් පඤ්චම ධ්‍යානයට අරමුණු වූ කසිණ නිමිත්තය අතික්‍රමණය කොට ඒ කිසුණු ඉගිළුවූ ආකාශය අරමුණු කොට ප්‍රථමාරූප්‍යය උපදන්නේය. ඒ ආකාශය අතික්‍රමණය කොට එහි ප්‍රවෘත්ත වූ විඤ්ඤාණය අරමුණු කොට විඤ්ඤාණඤ්චායතනය උපදන්නේය. ඒ විඤ්ඤාණය අතික්‍රමණය කොට විඤ්ඤාණයාගේ අභාවය යැයි කියන ලද අකිඤ්චනත්‍වය අරමුණු කොට ආකිඤ්චඤ්ඤායතනය උපදන්නේය. ඒ අකිඤ්චනත්‍වය අතික්‍රමණය කොට එහි ප්‍රවෘත්ත වූ තතියාරූප්‍යය විඤ්ඤාණය අරමුණු කොට චතුත්ථාරූප්‍යය චිත්තය උපදන්නේය. කියනලදමැයි

"ආරම්මණාතික්කමතෝ චතස්සෝපි භවන්තිමා
අඞ්ගාතික්කමමේතාසං න ඉච්ඡන්ති විභාවිනෝ" යි.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 24-26 පිටු; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ පුරාණ සන්නය 34-36 පිටු]**

ආකාසානාන්ත කියයුතු තැන්හි සුබෝච්චාරන සඳහා ආකාසානඤ්ච යී කියන ලද්දේ අනන්ත ආකාස යනු එහි අර්ථය. අනන්ත ආකාසය නම් උප්පාදන්ත වයන්ත නැති කසිණුග්ඝාටිකමාකාසයයි හෙවත් කිසුණු ඉගුළු අහසයි. කිසුණු ඉගුළු අහස අරමුණු කොටගෙන භාවනා කරන යෝගාවචරයාට අනුක්‍රමයෙන් උපදින ධ්‍යාන චිත්තය ආකාසානඤ්චායතන කුසල චිත්තය යැයි කියනු ලැබේ.

විඤ්ඤාණානන්ත කියයුතු තන්හි විඤ්ඤාණඤ්ච යැයි කියන ලද්දේය. අනන්ත වූ විඤ්ඤානය යනු එහි අර්ථය. අනන්ත විඤ්ඤාණ නම් තමා විසින්ම කලින් උපදවා ගත් ආකාසානඤ්චායතන චිත්තයයි. එය අරමුණු කොටගෙන භාවනා කරන්නහුට යථාවිධින් ලැබෙන ධ්‍යාන චිත්තය විඤ්ඤානඤ්චායතන කුසල චිත්තය යැයි කියනු ලැබේ.

කිසිවක් නැත්තේ යන අර්ථයෙන් අකිඤ්චය යි කියනු ලැබේ. අකිඤ්චන භාවය හෙවත් කිසිවක් නැතිබව ආකිඤ්චඤ්ඤ නම්. ආකාසානඤ්චායතනය උපදවා ගත් යෝගාවචරයා විඤ්ඤාණඤ්චායතනය උපදවා ගත් කල්හි ඔහුගේ ආකාසානඤ්චායතන චිත්තය අභාවයට යන්නේය. ඒ අභාව මාත්‍රයම මෙහි ආකිඤ්චඤ්ඤ ශබ්දයෙන් කියනු ලැබේ. ඒ අරමුණු කොට උපදවන ධ්‍යාන චිත්තය ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තය යි කියනු ලැබේ.

යම් සමාපත්ති චිත්තයෙක් හි ඕළාරික වශයෙන් සඤ්ඤව නැත්තේ ද සූක්‍ෂම වශයෙන් සඤ්ඤා මාත්‍රයෙක් ඇත්තේ ද ඒ සමාපත්ති චිත්තය නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තය යි කියනු ලැබේ. තෙල් ඇතැයි ද නැතැයි ද නොකිය හැකි තෙල් ගෑවුන භාජනය මෙනි. **[අභිධර්ම චන්ද්‍රිකාව 30-41 පිටු]**

## අරූපාවචර විපාක ක්‍රියා චිත්තයෝ:—

ආකාසානඤ්චායතනවිපාකචිත්තං, විඤ්ඤාණඤ්චායතනවිපාකචිත්තං, ආකිඤ්චඤ්ඤායතනවිපාකචිත්තං, නේවසඤ්ඤානාසඤ්ඤායතනවිපාකචිත්තං චේති ඉමානි චත්තාරිපි අරූපාවචරවිපාකචිත්තානි නාම. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 18 පිට]**

**ආකාසානඤ්චායතනවිපාකචිත්තං** (රූපසමතික්‍රමණය කොට කිසුණු ඉගිළුවූ අහස්හි උපදනා) ආකාසානඤ්චායතන විපාකචිත්තය ද **විඤ්ඤාණඤ්චායතනවිපාකචිත්තං** (ආකාශ සමතික්‍රමණය කොට එහි ප්‍රවෘත්ත විඤ්ඤාණ ගොචර කොට ඇති) විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තය ද **ආකිඤ්චඤ්ඤායතනවිපාකචිත්තං** (ප්‍රථමාරූප්‍ය සමතික්‍රමණය කොට ඔහුගේ නාස්තිත්වය විෂය කොට ඇති) ආකිඤ්චඤ්ඤායතන විපාක චිත්තය ද **නේවසඤ්ඤානාසඤ්ඤායතන විපාකචිත්තඤ්චේති** (ඒ ප්‍රථමාරූප්‍යාගේ නාස්තිත්වය සමතික්‍රමණය කොට එහි ප්‍රවෘත්ත තෘතීයාරූප්‍යය අරමුණු කොට ඇති) නේවසඤ්ඤානාසඤ්ඤායතන විපාක චිත්තය ද යන **ඉමානි චත්තාරිපි** මොහු සතර දෙනම **අරූපාවචරවිපාකචිත්තානි නාම** අරූපාවචර විපාකචිත්තයෝ නම් වෙත්.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 24-25 පිටු]**

ආකාසානඤ්චායතනක්‍රියාචිත්තං, විඤ්ඤාණඤ්චායතනක්‍රියාචිත්තං, ආකිඤ්චඤ්ඤායතනක්‍රියාචිත්තං, නේවසඤ්ඤානාසඤ්ඤායතනක්‍රියාචිත්තං චේති ඉමානි චත්තාරිපි අරූපාවචරක්‍රියාචිත්තානි නාම. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 18 පිට]**

**ආකාසානඤ්චායතනක්‍රියාචිත්තං** (රූපසමතික්‍රමණය කොට කිසුණු ඉගිළුවූ අහස්හි උපදනා) ආකාසානඤ්චායතන ක්‍රියාචිත්තය ද **විඤ්ඤාණඤ්චායතනක්‍රියාචිත්තං** (ආකාශ සමතික්‍රමණය කොට එහි ප්‍රවෘත්ත විඤ්ඤාණ ගොචර කොට ඇති) විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තය ද **ආකිඤ්චඤ්ඤායතන කුසලචිත්තං** (ප්‍රථමාරූප්‍ය සමතික්‍රමණය කොට ඔහුගේ නාස්තිත්වය විෂය කොට ඇති) ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා චිත්තය ද **නේවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියාචිත්තඤ්චේති** (ඒ ප්‍රථමාරූප්‍යාගේ නාස්තිත්වය සමතික්‍රමණය කොට එහි ප්‍රවෘත්ත තෘතීයාරූප්‍යය අරමුණු කොට ඇති) නේවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා චිත්තය ද යන **ඉමානි චත්තාරිපි** මොහු සතර දෙනම **අරූපාවචරක්‍රියාචිත්තානි නාම** අරූපාවචර ක්‍රියාචිත්තයෝ නම් වෙත්.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 24-25 පිටු]**

## අරූපාවචර විපාක-ක්‍රියා සිත් විස්තර කර ඇති ආකාරය:—

එවං අරූපාවචරවිපාකාපි ආරම්මණභේදතෝ අත්තනෝ කුසලා විය චතුබ්බිධා හොන්ති. විනිච්ඡයෝ ච සබ්බෝ කුසලේ වුත්තනයෝව. කුසලතෝ පෙත්ථ විසේසෝ රූපාවචරවිපාකේ වුත්තනයේන වේදිතබ්බෝ. කේවලං පනෙත්ථ කම්මනිමිත්තභූතපඤ්ඤත්තාරම්මණෝ ආකාසානඤ්චායතනවිපාකෝ පඨමාරුප්පභූමියං, තථා මහග්ගතාරම්මණෝ විඤ්ඤාණඤ්චායතනවිපාකෝ දුතියාරුප්පභූමියං, කම්මනිමිත්තභූතපඤ්ඤත්තාරම්මණෝ ආකිඤ්චඤ්ඤායතන විපාකෝ තතියාරුප්පභූමියං, මහග්ගතාරම්මණෝ නේවසඤ්ඤානාසඤ්ඤායතන විපාකෝ චතුත්ථාරුප්පභූමියඤ්ච අවත්ථුකා වුත්තනයෙන පටිසන්ධිභවඞ්ගචුතිකිච්චානි සාධයමානාව පවත්තන්තීති අයමේව විසේසෝ.

**[අභිධම්මමාතිකා පාළි (ඡට්ඨසඞ්ගායනා අරූපාවචරවිපාක වණ්ණනා යටතේ)]**

**ඒවං** මෙසේ **අරූපාවචරවිපාකාපි** අරූපාවචර විපාක චිත්තයෝ ද **ආරම්මණභේදතෝ** ආරම්මණ භේද වශයෙන් **අත්තනෝ** තමාගේ **කුසලා විය** අරූපාවචර කුසල චිත්තයෝ මෙන් **චතුබ්බිධා** සතර වැදෑරුම් **හොන්ති** වෙත් **සබ්බෝ විනිච්ඡයෝ ච** සියළු විනිශ්චය ද **කුසලේ** කුසල චිත්තයෙහි **වුත්තනයෝව** කියනලද

නයින්ම (**වේදිතබ්බෝ** දතයුතුයි) **එත්ථ** මෙහි **විසේසෝ** විශේෂය **කුසලතෝ ච** කුසල වශයෙන් ද **රූපාවචරවිපාකේ** රූපාවචර විපාක චිත්තයෙහි **වුත්තනයේන ච** කියනලද ක්‍රමයෙන් ද **වේදිතබ්බෝ** දතයුතු **පන (කථං?)** හේ කෙසේද යත්? **එත්ථ** මෙහි **කේවලං** හුදෙක් **කම්මනිමිත්තභූතපඤ්ඤත්තාරම්මණෝ** කර්මනිමිත්ත වශයෙන් හටගත් ප්‍රඥප්ති අරමුණ ඇති **ආකාසානඤ්චායතනවිපාකෝ** ආකාසානඤ්චායතන විපාක චිත්තය තෙමේ **පඨමාරූප්පභූමියං** ප්‍රථම අරූප භූමියෙහි ද **තථා** එසේම **මහග්ගතාරම්මණෝ** මහග්ගත අරමුණ ඇති **විඤ්ඤාණඤ්චායතනවිපාකෝ** විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තය තෙමේ **දුතියාරූප්පභූමියං** දෙවැනි අරූප භූමියෙහි ද **කම්මනිමිත්තභූත පඤ්ඤත්තාරම්මණෝ** කර්මනිමිත්ත වශයෙන් හටගත් ප්‍රඥප්ති අරමුණ ඇති **ආකිඤ්චඤ්ඤායතනවිපාකෝ** ආකිඤ්චඤ්ඤායතන විපාක චිත්තය තෙමේ **තතියාරූප්පභූමියං** තෘතීයාරූප්ප භූමියෙහි ද **මහග්ගතාරම්මණෝ** මහග්ගතාරම්මණ ඇති **නේවසඤ්ඤානාසඤ්ඤායතනවිපාකෝ** නේවසඤ්ඤානාසඤ්ඤායතන විපාක චිත්තය තෙමේ **චතුත්ථාරූප්පභූමියඤ්ච** චතුත්ථාරූප්ප භූමියෙහි ද **අවත්ථුකා** අත්‍ථුකවම **වුත්තනයේන** කියනලද ක්‍රමයෙන් **පටිසන්ධිභවඞ්ගචුතිකිච්චානි** ප්‍රතිසන්ධි භවඞ්ග චුති කෘත්‍යයන් **සාධයමානාව** සිද්ධ කරමින්ම **පවත්තන්තීති** හටගනිත් යැයි **අයමේව** මේ **විසේසෝ** වෙනසයි.

**[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

අරූපාවචරකිරියා ච කුසලා විය චතුබ්බිධා. විනිච්ඡයෝ ච තත්ථ වුත්තනයෝ ඒව. කේවලං හි කුසලා සේඛපුථුජ්ජනානං සවත්ථුකා, අවත්ථුකා වා හෙට්ඨා වුත්තනයේන යථායෝගං පඤ්ඤත්තිමහග්ගතාරම්මණා මනොද්වාරේ ජවනකිච්චං සාධයමානා පවත්තන්ති, ඉමේ පන අසේඛානන්ති අයං විසේසෝ. අරූපාවචරකිරියා.

**[අභිධම්මමාතිකා පාළි (ජට්ඨසඞ්ගායනා අරූපාවචරකිරියා වණ්ණනා යටතේ)]**

**අරූපාවචරකිරියා ච** අරූපාවචර ක්‍රියා චිත්තයෝ ද **කුසලා විය** කුසල චිත්තයෝ මෙන් **චතුබ්බිධා** සතර වැදෑරුම් වෙයි **තත්ථ** එහි **විනිච්ඡයෝ ච** විනිශ්චය ද **වුත්තනයෝ ඒව** කියනලද ක්‍රමය ඇත්තේමය **හි** විශේෂයක් කියම් **කේවලං** හුදෙක් **කුසලා** කුසල චිත්තයෝ **සෙක්ඛපුථුජ්ජනානං** ශෛක්‍ෂ පුහුදුන්හට **සවත්ථුකා වා** සවස්තුකව හෝ **අවත්ථුකා වා** අවස්තුකව හෝ **හෙට්ඨා වුත්තනයේන** යට කියනලද ක්‍රමයෙන් **යථායෝගං** සුදුසු පරිදි **පඤ්ඤත්තිමහග්ගතාරම්මණා** ප්‍රඥප්ති මහග්ගත අරමුණු ඇත්තෝ වී **මනෝද්වාරේ** මනෝද්වාරයෙහි **ජවනකිච්චං සාධයමානා** ජවන කෘත්‍යය සිද්ධකරමින් **පවත්තන්ති** හටගනිත් **ඉමේ පන** මේ අරූපාවචර ක්‍රියා චිත්තයෝ වනාහි **අසෙක්ඛානං** රහතුන්ට **ඉති** (**පවත්තන්ති** හටගනිත්) **අයං විසේසෝ** මේ වෙනසයි. **[අභිධම්මමාතිකා පාළි පරිවර්තනයි]**

අරූප ධ්‍යාන ලාභී පුද්ගලයා මරණින් මතු ඒ කුසලයේ බලයෙන් අරූප ලෝකයේ උපදින්නේය. අරූප භවයෙහි ඉපදීම් වශයෙන් ද ඒ අරූප භවය නොසිඳී පැවැත්මට ද අරූප කුසලයට සමානවූම ධ්‍යාන සිත් ඇතිවේ. ඒවා අරූපාවචර විපාකයෝය.

අනාගාමී අරිහත් පුද්ගලයන්ට පමණක් අයිති නිරෝධ සමාපත්ති නම් වූ සමවතක් ඇත්තේය. එය සිතින් තොරව විසීමකි. එයට සමවැදිය හැක්කේ රූපාරූප ධ්‍යාන සියල්ලම ලබා ඇති අනාගාමීන්ට හා රහතුන්ටය. නිරෝධ සමාපත්තියට

සමවැදීමට හැකිවීමට රත්හුද අරූප ධ්‍යාන උපදවති. රහතුන් විසින් උපදවන විපාක දන ශක්තිය නැත්තා වූ අරූප ධ්‍යාන සිත් අරූපාවචර ක්‍රියා සිත්ය.

**[අභිධර්ම මාර්ගය 60-61 පිටු]**

ආකාසානඤ්ඤායතනය ධ්‍යානය උපදවා ගත් තැනැත්තේ එයින් නොපිරිහි කලුරිය කළේ ආකාසානඤ්චායතන නම් බ්‍රහ්ම ලෝකයේ උපදින්නේය. එහි ඉපදීම් වශයෙන් පහළ වන ප්‍රතිසන්ධි චිත්තය ද එතැන් සිට චුත වනතෙක් ඇතිවන භවඞ්ග චිත්තය ද චුත වීම් වශයෙන් ඇති වන චුති චිත්තය ද ප්‍රථම විපාක චිත්තය වන්නේය.

විඤ්ඤාණඤ්චායතනය ධ්‍යානය උපදවා ගත් තැනැත්තේ එයින් නොපිරිහි කලුරිය කළේ විඤ්ඤාණඤ්චායතනය අරූප බ්‍රහ්ම ලෝකයේ උපදින්නේය. එහි දී ද්විතීය විපාක චිත්තය ප්‍රතිසන්ධි භවඞ්ග චුති වශයෙන් විපාක දෙයි.

ආකිඤ්චඤ්චායතනය ධ්‍යානය උපදවා ගත් තැනැත්තේ එයින් නොපිරිහි කලුරිය කළේ ආකිඤ්චඤ්චායතනය අරූප බ්‍රහ්ම ලෝකයේ උපදින්නේය. එහි දී තෘතීය විපාක චිත්තය ප්‍රතිසන්ධි භවඞ්ග චුති වශයෙන් උපදින්නේය.

නේවසඤ්ඤානාසඤ්ඤායතනය ධ්‍යානය උපදවා ගත් තැනැත්තේ එයින් නොපිරිහි කලුරිය කළේ නේවසඤ්ඤානාසඤ්ඤායතනය අරූප බ්‍රහ්ම ලෝකයේ උපදින්නේය. එහි දී මේ චතුර්ථ විපාක චිත්තය ප්‍රතිසන්ධි භවඞ්ග චුති වශයෙන් විපාක දෙයි.

ක්‍රියා සිත් රහතුන් වහන්සේට පමණක් උපදී. අන්‍යයන්ට උපදිනු නැත. රහතුන් වහන්සේ විසින් උපදවනු ලබන ආකාසානඤ්චායතන ධ්‍යානය උන් වහන්සේට ආකාසානඤ්චායතන ක්‍රියා චිත්තය වේ. සෙසු ධ්‍යාන තුන ද උන් වහන්සේට ක්‍රියාම වේ. **[සද්ධර්මසාගරය 02/440-450 පිටු; අභිධර්ම චන්ද්‍රිකාව 43-44 පිටු]**

# ලෝකෝත්තර චිත්ත සඞ්ග්‍රහය

## ලෝකෝත්තර කුසල් චිත්තයෝ සිව් දෙනා:—

සෝතාපත්තිමග්ගචිත්තං, සකදාගාමිමග්ගචිත්තං, අනාගාමිමග්ගචිත්තං, අරහත්තමග්ගචිත්තඤ්චෙති ඉමානි චත්තාරිපි ලෝකුත්තරකුසලචිත්තානි නාම.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 18 පිට]**

**සෝතාපත්තිමග්ගචිත්තං** සෝවාන් මාර්ග චිත්තය **සකදාගාමිමග්ගචිත්තං** සකෘදාගාමී මාර්ග චිත්තය **අනාගාමිමග්ගචිත්තං** අනාගාමී මාර්ග චිත්තය **අරහත්තමග්ගචිත්තඤ්චෙති** අර්හත් මාර්ග චිත්තය ද යන **ඉමානි** මේ **චත්තාරිපි** සතර දෙනම **ලෝකුත්තරකුසලචිත්තානි නාම** ලෝකෝත්තර කුසල චිත්තයෝ නම් වෙත්.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 26 පිට]**

ලෝකුත්තරං චතුමග්ගසම්පයෝගතෝ චතුබ්බිධන්ති.

**[විසුද්ධිමග්ග අටුවා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 452 යටතේ); විසුද්ධිමග්ග අටුවා 339 පිට (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය විඤ්ඤාණස්කන්ධ නිර්දේශය 195 පිට (තායිවාන් මුද්‍රණය)]**

ඡවිසුද්ධිපරම්පරාය සමධිගන්තබ්බං **ලෝකුත්තරං**. තත්ථ වත්තබ්බං පරතෝ ආගමිස්සති. **චතුමග්ගසම්පයෝගතෝති** සෝතාපත්තිමග්ගෝ යාව අරහත්තමග්ගෝති ඉමේහි චතූහි අරියමග්ගේහි සම්පයෝගතෝ. චතුබ්බිධම්පි චේතං භාවනාමයමේව හුත්වා නිබ්බානං ආලම්බිත්වා සුඤ්ඤතෝ විමොක්ඛෝ, අනිමිත්තෝ විමොක්ඛෝ, අප්පණිහිතෝ විමොක්ඛෝති නාමේන උප්පජ්ජති, සත්තභවාදිභවූපපත්තිනිබ්බත්තකන්ති දට්ඨබ්බං.

**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 452 යටතේ)]**

**ලෝකුත්තරං** ලෝකෝත්තර කුසල චිත්තය තෙමේ **චතුමග්ගසම්පයෝගතෝ** චතුර්විධ මාර්ග සම්ප්‍රයෝග වශයෙන් **චතුබ්බිධං** සිව් වැදෑරුම් **ඉති (හෝති)** වෙයි.

**ලෝකුත්තරං පන** ෂඩ් විසුද්ධි පරම්පරායෙන් පැමිණියයුතු ලෝකෝත්තර කුසලය වනාහි (එහි කියයුතු විභාග මතුයෙහිම පහළ වේ) **චතුමග්ගසම්පයෝගතෝ** ශ්‍රෝතාපත්ති මාර්ගය සකෘදාගාමී මාර්ගය අනාගාමී මාර්ගය අරහත් මාර්ගය යන මේ සතර ආර්‍ය්‍ය මාර්ගයන් හා සම්ප්‍රයෝගයෙන්. මේ මාර්ගය භාවනාමවම නිර්වාණය අරමුණු කොට සුඤ්ඤත විමෝක්ෂය අනිමිත්ත විමෝක්ෂය අප්පණිහිත විමෝක්ෂය යන නාමයෙන් උපදනේයි. සප්තභවාදී භවෝත්පත්ති නිර්වර්තක යයි දතයුතු.

**[විසුද්ධි මාර්ග මහා සන්නය 1087-1088 පිටු]**

## ලෝකෝත්තර කුසල චිත්තය විස්තර කර ඇති ආකාරය:—

කතමේ ධම්මා කුසලා? යස්මිං සමයේ ලෝකුත්තරං ඣානං භාවේති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චේව කාමේහි…පෙ…. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං,

**[ධම්මසඞ්ගණී පාළි (ඡට්ඨසඞ්ගායනා අංක 277 යටතේ); ධම්මසඞ්ගණී පාළි 226 පිට (බු.ජ)]**

ඒවං භවත්තයසම්පත්තිනිබ්බත්තකං කුසලං දස්සෙත්වා ඉදානි සබ්බභවසමතික්කමනාය ලෝකුත්තරකුසලං දස්සේතුං පුන **කතමේ ධම්මා කුසලා**තිආදි ආරද්ධං. තත්ථ **ලෝකුත්තර**න්ති කේනට්ඨේන ලෝකුත්තරං? ලෝකං තරතීති ලෝකුත්තරං, ලෝකං උත්තරතීති ලෝකුත්තරං; ලෝකං සමතික්කම්ම අභිභුය්‍ය තිට්ඨතීති ලෝකුත්තරං (පටි. ම. 2.43). **ඣානං භාවේතී**ති ඒකචිත්තක්ඛණිකං අප්පනාඣානං භාවේති ජනේති වඩ්ඪේති.

ලෝකතෝ නිය්‍යාති වට්ටතෝ නිය්‍යාතීති **නිය්‍යානිකං**. නිය්‍යාති වා ඒතේනාති නිය්‍යානිකං. තංසමඞ්ගී හි පුග්ගලෝ දුක්ඛං පරිජානන්තෝ නිය්‍යාති, සමුදයං පජහන්තෝ නිය්‍යාති, නිරෝධං සච්ඡිකරොන්තෝ නිය්‍යාති, මග්ගං භාවෙන්තෝ නිය්‍යාති. යථා ච පන තේභූමකකුසලං වට්ටස්මිං චුතිපටිසන්ධියෝ ආචිනාති වඩ්ඪේතීති ආචයගාමී නාම හෝති, න තථා ඉදං. ඉදං පන යථා ඒකස්මිං පුරිසේ අට්ඨාරසහත්ථං පාකාරං චිනන්තේ අපරෝ මහාමුග්ගරං ගහෙත්වා තේන චිතචිතට්ඨානං අපචිනන්තෝ විද්ධංසෙන්තෝ ඒව ගච්ඡෙය්‍ය, ඒවමේව තේභූමකකුසලේන චිතා චුතිපටිසන්ධියෝ පච්චයවේකල්ලකරණේන අපචිනන්තං විද්ධංසෙන්තං ගච්ඡතීති අපචයගාමී.

**දිට්ඨිගතානං පහානායා**ති, එත්ථ දිට්ඨියෝ ඒව දිට්ඨිගතානි, ගූථගතං මුත්තගතන්ති ආදීනි (අ. නි. 9.11) විය. ද්වාසට්ඨියා වා දිට්ඨීනං අන්තෝගධත්තා දිට්ඨීසු ගතානීතිපි දිට්ඨිගතානි. දිට්ඨියා වා ගතං ඒතේසන්තිපි දිට්ඨිගතානි. දිට්ඨිසදිසගමනානි දිට්ඨිසදිසප්පවත්තානීති අත්ථෝ. කානි පන තානීති? සසම්පයුත්තානි සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස-අපායගමනීයරාග-දෝස-මෝහාකුසලානි. තානි හි යාව පඨමමග්ගභාවනා තාව පවත්තිසබ්භාවතෝ දිට්ඨිසදිසගමනානීති වුච්චන්ති. ඉති දිට්ඨියෝ ච දිට්ඨිගතානි ච දිට්ඨිගතානි. තේසං **දිට්ඨිගතානං. පහානායා**ති සමුච්ඡේදවසේනේව පජහනත්ථාය. **පඨමායා**ති ගණනවසේනපි පඨමුප්පත්තිවසේනපි පඨමාය. **භූමියා**ති "අනන්තරහිතාය භූමියා"තිආදීසු (පාරා. 27; ම. නි. 2.296) තාව අයං මහාපථවී භූමීති වුච්චති. "සුඛභූමියං කාමාවචරේ"තිආදීසු (ධ. ස. 988) චිත්තුප්පාදෝ. ඉධ පන සාමඤ්ඤඵලං අධිප්පේතං. තඤ්හි සම්පයුත්තානං නිස්සයභාවතෝ තේ ධම්මා භවන්ති එත්ථාති භූමි. යස්මා වා සමානේපි ලෝකුත්තරභාවේ සයම්පි භවති උප්පජ්ජති, න නිබ්බානං විය අපාතුභාවං, තස්මාපි භූමීති වුච්චති; තස්සා **පඨමාය භූමියා. පත්තියා**ති සෝතාපත්තිඵලසඞ්ඛාතස්ස පඨමස්ස සාමඤ්ඤඵලස්ස පත්තත්ථාය පටිලාභත්ථායාති ඒවමෙත්ථ අත්ථෝ වේදිතබ්බෝ. **විවිච්චා**ති සමුච්ඡේදවිවේකවසේන විවිච්චිත්වා, විනා හුත්වා.

ඉදානි කිඤ්චාපි ලෝකියජ්ඣානම්පි න විනා පටිපදාය ඉජ්ඣති, ඒවං සන්තේපි ඉධ සුද්ධිකනයං පහාය ලෝකුත්තරජ්ඣානං පටිපදාය සද්ධිංයේව ගරුං කත්වා දේසේතුකාමතාය **දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤ**න්තිආදිමාහ.

තත්ථ යෝ ආදිතෝව කිලේසේ වික්ඛම්භෙන්තෝ දුක්ඛේන සසඞ්ඛාරේන සප්පයෝගේන කිලමන්තෝ වික්ඛම්භේති තස්ස දුක්ඛා පටිපදා හෝති; යෝ පන වික්ඛම්භිත කිලේසෝ විපස්සනාපරිවාසං වසන්තෝ චිරේන මග්ගපාතුභාවං පාපුණාති තස්ස දන්ධාභිඤ්ඤා හෝති. ඉති යෝ කෝචි වාරෝ දුක්ඛපටිපදාදන්ධාභිඤ්ඤෝ නාම කතෝ.

කතමං පන වාරං රෝචේසුන්ති? යත්ථ සකිං වික්ඛම්භිතා කිලේසා සමුදාචරිත්වා දුතියම්පි වික්ඛම්භිතා පුන සමුදාචරන්ති, තතියං වික්ඛම්භිතේ පන තථාවික්ඛම්භිතේව කත්වා මග්ගේන සමුග්ඝාතං පාපේති, ඉමං වාරං රෝචේසුං. ඉමස්ස වාරස්ස දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාති නාමං කතං. එත්තකේන පන න පාකටං හෝති. තස්මා ඒවමෙත්ථ ආදිතෝ පට්ඨාය විභාවනා වේදිතබ්බා; යෝ හි චත්තාරි මහාභූතානි පරිග්ගහෙත්වා උපාදාරූපං පරිග්ගණ්හාති, අරූපං පරිග්ගණ්හාති, 'රූපාරූපං' පන පරිග්ගණ්හන්තෝ දුක්ඛේන කසිරේන කිලමන්තෝ පරිග්ගහේතුං සක්කෝති, තස්ස දුක්ඛා පටිපදා නාම හෝති. පරිග්ගහිතරූපාරූපස්ස පන විපස්සනාපරිවාසේ මග්ගපාතුභාවදන්ධතාය දන්ධාභිඤ්ඤා නාම හෝති.

යෝපි රූපාරූපං පරිග්ගහෙත්වා 'නාමරූපං' වවත්ථපෙන්තෝ දුක්ඛේන කසිරේන කිලමන්තෝ වවත්ථපේති, වවත්ථාපිතේ ච නාමරූපේ විපස්සනාපරිවාසං වසන්තෝ චිරේන මග්ගං උප්පාදේතුං සක්කෝති, තස්සාපි දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා නාම හෝති.

අපරෝ නාමරූපම්පි වවත්ථපෙත්වා 'පච්චයේ' පරිග්ගණ්හන්තෝ දුක්ඛේන කසිරේන කිලමන්තෝ පරිග්ගණ්හාති, පච්චයේ ච පරිග්ගහෙත්වා විපස්සනාපරිවාසං වසන්තෝ චිරේන මග්ගං උප්පාදේති, ඒවම්පි දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා නාම හෝති.

අපරෝ පච්චයේපි පරිග්ගහෙත්වා 'ලක්ඛණානි' පටිවිජ්ඣන්තෝ දුක්ඛේන කසිරේන කිලමන්තෝ පටිවිජ්ඣති, පටිවිද්ධලක්ඛණෝ ච විපස්සනාපරිවාසං වසන්තෝ චිරේන මග්ගං උප්පාදේති, ඒවම්පි දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා නාම හෝති.

අපරෝ ලක්ඛණානිපි පටිවිජ්ඣිත්වා විපස්සනාඤාණේ තික්ඛේ සූරේ පසන්නේ වහන්තේ උප්පන්නං 'විපස්සනානිකන්තිං' පරියාදියමානෝ දුක්ඛේන කසිරේන කිලමන්තෝ පරියාදියති, නිකන්තිඤ්ච පරියාදියිත්වා විපස්සනාපරිවාසං වසන්තෝ චිරේන මග්ගං උප්පාදේති, ඒවම්පි දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා නාම හෝති. ඉමං වාරං රෝචේසුං. ඉමස්ස වාරස්ස ඒතං නාමං කතං. ඉමිනාව උපායේන පරතෝ තිස්සෝ පටිපදා වේදිතබ්බා.

**[ධම්මසඞ්ගණී අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 277 යටතේ); ධම්මසඞ්ගණී අටුවා 198-200 පිටු (හේ.වි.මු)]**

**ලෝකං තරතී**ති ඒතේන ලෝකසමතික්කමපටිපත්තිමාහ. **උත්තරතී**ති ඒතේන ලෝකස්සන්තගමනං එලේ පතිට්ඨානං එලං. **සමතික්කම්මා**තිආදිනා නිබ්බානං. **සමතික්කම්මා**ති හි නිස්සරිත්වා. **අභිභුය්‍යා**ති විසංයුත්තං භුත්වාති අත්ථෝ. තිවිධෝපි චත්ථෝ මග්ගාදීසු ඒකේකස්මිං යෝජේතබ්බෝ, මග්ගේයේව වා ඉධ තස්ස අධිප්පේතත්තා. **ඒකචිත්තක්ඛණික**න්ති ඒකමග්ගස්ස ද්වේ වාරේ අනුප්පත්තිං සන්ධායාහ. අඤ්ඤමඤ්ඤං ධම්මානං අනතිවත්තනාදිසාධිකාය පඤ්ඤාය වඩ්ඪේති. "නියාතීති නියානීය"න්ති වත්තබ්බේ ඊ-කාරස්ස රස්සත්තං ය-කාරස්ස ච ක-කාරං කත්වා **"නියානික"**න්ති වුත්තං. නියාති ඒතේනාති නියානං, නියානමේව **නියානිකං** වේනයිකෝ විය. එත්ථ "නෙයානික"න්ති වත්තබ්බේ ඉ-කාරස්ස ඒ-කාරත්තං අකත්වා වුත්තං.

**ඵල**න්ති චිත්තචේතසිකරාසි වුච්චති, තං අඤ්ඤමඤ්ඤං සම්පයුත්තානං ධම්මානං අත්තනෝ අවයවභූතානං නිස්සයෝ හෝති. ඵලඤ්ඤාණං වා **ඵලං,** සම්මාදිට්ඨිආදයෝ අඞ්ගානි වා. **ලෝකුත්තරභාවේ**ති ලෝකං උත්තිණ්ණභාවේ. තේන ඵලනිබ්බානානි සඞ්ගණ්හාති. තේසු යං භවති ඵලං, තං **"භූමී"**ති වුච්චති. යථා වා කම්මනිබ්බත්තා කාමභවාදයෝ තංසමඞ්ගිනෝ නිස්සයභාවේන "භූමී"ති වුච්චන්ති, ඒවං මග්ගේන නිබ්බත්තං ඵලං අරියසාවකස්ස කාලේන කාලං සමාපජ්ජිතබ්බතාය නිස්සයභාවතෝ "භූමී"ති වුච්චති, තතෝයේව අරියා චිරතරං තිට්ඨන්ති. **සමුච්ඡේදවිවේකවසේනා**ති එත්ථ අපායගමනීයානං අච්චන්තසමුච්ඡේදෝ ඉතරේසඤ්ච විජ්ජුතෝභාසේන විය තමස්ස සමුච්ඡේදෝ දට්ඨබ්බෝ. ලෝකියජ්ඣානම්පි පුථුජ්ජනස්ස අරියස්ස ච අකතාධිකාරස්ස න විනා පටිපදාය ඉජ්ඣති, කතාධිකාරස්ස පන අරියස්ස මග්ගේනේව සමිජ්ඣනතෝ විපාකානං විය කුසලේන තථා සමිද්ධස්ස අරියමග්ගේන සදිසතාය අභාවතෝ අතබ්බිපාකත්තා ච න මග්ගපටිපදා තස්ස ඣානස්ස පටිපදාති සක්කා වත්තුන්ති තත්ථ තථා ගරුං කත්වා පටිපදාහි ඒව දේසනා න කතා, යථාවුත්තජ්ඣානසඞ්ගහත්ථං සුද්ධිකදේසනාපි කතා.

ඉධ පන කස්සචි විනා පටිපදාය අසිද්ධිතෝ ගරුං කත්වා දස්සේතුං **"දුක්ඛපටිපදා"**න්තිආදි වුත්තං. **යෝ කෝචි වාරෝ**ති සකිං ද්වික්ඛත්තුං තික්ඛත්තුං චතුක්ඛත්තුං අනේකක්ඛත්තුන්ති ඒවමාදීසු වික්ඛම්භනවාරේසු යෝ කෝචි. සකිං ද්වික්ඛත්තුඤ්ච වික්ඛම්භනවාරා සුඛා පටිපදා ඒව, න ච තතෝ උද්ධං සුඛා පටිපදා හෝතීති තික්ඛත්තුං වික්ඛම්භනවාරං දුක්ඛා පටිපදාති රෝචේසුං අට්ඨකථාචරියා. තස්මිං තථාරෝචිතේ තතෝ පරේසු චතුක්ඛත්තුං වික්ඛම්භනවාරාදීසු වත්තබ්බමේව නත්ථීති. රූපාරූපානං ලක්ඛණාදීහි පරිච්ඡින්දිත්වා ගහණං රූපාරූපපරිග්ගහෝ, නාමරූපමත්තමේතං, න අඤ්ඤෝ කෝචි සත්තාදිකෝති වවත්ථාපනං නාමරූපවවත්ථාපනං. පරිග්ගහිතරූපාරූපස්ස මග්ගපාතුභාවදන්ධතා ච නාමරූපවවත්ථාපනාදීනං කිච්ඡසිද්ධිතෝ සියාති න රූපාරූපපරිග්ගහකිච්ඡතාය ඒව දුක්ඛපටිපදතා වත්තබ්බාති චේ? තං න, නාමරූපවවත්ථාපනාදීනං පච්චනීකකිලේසමන්දතාය සුඛසිද්ධියම්පි තථාසිද්ධවිපස්සනාසහගතානං ඉන්ද්‍රියානං මන්දතාය මග්ගපාතුභාවදන්ධභාවතෝ.

**රූපාරූපං පරිග්ගහෙත්වා**ති අකිච්ඡේනපි පරිග්ගහෙත්වා. කිච්ඡේන පරිග්ගහිතේ වත්තබ්බමේව නත්ථි. ඒවං සේසේසුපි. **ඉමං වාරං රෝචේසු**න්ති කලාපසම්මසනාවසානේ උදයබ්බයානුපස්සනාය වත්තමානාය උප්පන්නස්ස විපස්සනුපක්කිලේසස්ස තික්ඛත්තුං වික්ඛම්භනේන කිච්ඡතාවාරං දුක්ඛා පටිපදාති රෝචේසුං ඒතදන්තත්තා පටිපදාය. ඒතස්ස අකිච්ඡත්තේපි පුරිමානං කිච්ඡත්තේ දුක්ඛපටිපදතා වුත්තනයාවාති න පටිසිද්ධාති දට්ඨබ්බං. යථාවුත්තං වා සබ්බං රූපාරූපපරිග්ගහාදිකිච්ඡතං තික්ඛත්තුං වික්ඛම්භනවාරතාවසේන **"ඉමං වාර"**න්ති ආහ. යස්ස පන සබ්බත්ථ අකිච්ඡතා, තස්ස සුඛා පටිපදා වේදිතබ්බා.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 277 යටතේ)]**

"කේනට්ඨේන ලෝකුත්තරා"න්තිආදි පටිසම්භිදාවචනං (පටි. ම. 2.43) අට්ඨකථාය ආභතං, තස්මා තත්ථ "තිවිධෝපි අනුත්තරධම්මෝ ලෝකං තරතී"තිආදිනා සඞ්ගහිතෝති තං තීහි පදේහි යෝජෙත්වා දස්සේතුං **"ලෝකං තරතීති ඒතේනා"**තිආදිමාහ. ඒකේකස්මිං යෝජේතබ්බෝ ලෝකස්ස අන්තගමනාදිතාය මග්ගාදීසුපි ලබ්භමානත්තා. මග්ගේයේව වා තිවිධෝපි අත්ථෝ යෝජේතබ්බෝති සම්බන්ධෝ. **අනතිවත්තනාදීති ආදි-**සද්දේන ඉන්ද්‍රියානං ඒකරසතා

තදුපගවීරියවාහනං ආසේවනාති ඉමේ තයෝ භාවනාවිසේසේ සඞ්ගණ්හාති. යස්මා චේතේ භාවනාවිසේසා සංකිලේසවෝදානේසු වට්ටවිවට්ටේසු ච තං තං ආදීනවානිසංසදස්සනභූතාය පුබ්බභාගපඤ්ඤාය සම්පාදිතේන ඤාණවිසේසේන නිප්ඵජ්ජන්ති, තස්මා වුත්තං **"අඤ්ඤමඤ්ඤං…පෙ…. වඩ්ඪේතී"**ති.

**නිස්සයෝ හෝතී**ති රුක්ඛෝ විය සාඛාය ආධාරභාවේන වෝහරීයතීති අත්ථෝ. ඵලඤාණඵලඞ්ගානං නිස්සයවචනං නිස්සයපච්චයත්තා. තතෝයේව නිස්සයභාවතෝ පතිට්ඨාභාවතෝ. අරියඵලසන්නිස්සයේන හි අරියා කතකිච්චා සුට්ඨු නිබ්බින්නසබ්බභවාපි චිරතරං ලෝකේ පරහිතාය තිට්ඨන්ති. කිලේසානං ඕධිසෝ පජහනකාපි අරියමග්ගා අවිසේසේන සබ්බාකුසලානං සබ්බකුසලපටිපක්ඛතාය අඤ්ඤමග්ගප්පහාතබ්බේසුපි කේනචි පහානාකාරේන පවත්තන්තීති තං පහානාකාරං දස්සෙන්තෝ **"ඉතරේසං විජ්ජුතෝභාසේන විය තමස්සා"**ති ආහ. යේන **පාළියං** හෙට්ඨිමමග්ගඤාණානං විජ්ජූපමතා දස්සිතා. යදි ඒවං උපරිමග්ගවජ්ඣා කිලේසා ඉතරේති ඉධාධිප්පේතා. න තේසං සමුච්ඡේදවචනං යුත්තං. න හි භාවනාය පහාතබ්බේ දස්සනමග්ගෝ සමුච්ඡින්දිතුං සක්කෝති. තථා ච සති දස්සනේන පහාතබ්බා ඒව තේ සියුං. අථ තදඞ්ගප්පහානං අධිප්පේතං, යේන "විජ්ජුතෝභාසේන විය තමස්සා"ති වුත්තං, තං පුබ්බභාගවිපස්සනාය ඒව සිද්ධං න ච යුත්තං ලෝකුත්තරමග්ගෝ තදඞ්ගවසේන කිලේසේ පජහතීති. වික්ඛම්භනේපි ඒසේව නයෝ, අනුලෝමඤාණේනේව තස්ස සාතිසයං සාධිතත්තා. අථ පන පඨමමග්ගවජ්ඣා ඒව කිලේසා ඉතරේති අධිප්පේතා, ඒවං සන්තේ තේසං ඉතරභාවෝව න සියා, න ච අනපායගමනීයා නාම කිලේසා දස්සනේන පහාතබ්බා අත්ථි, නාපි පඨමමග්ගවජ්ඣා කිලේසා තේන විජ්ජුතෝභාසේන විය තමෝ සමුච්ඡින්දිතබ්බාති වත්තුං යුත්තන්ති උපපරික්ඛිතබ්බෝයං "ඉතරේසං…පෙ…. සමුච්ඡේදෝ"ති. ලෝකියජ්ඣානම්පි **න විනා පටිපදාය ඉජ්ඣතී**ති ඉදං අධිප්පායවසේන නේතබ්බං නෙය්‍යත්ථත්තාති තං අධිප්පායං විභාවෙන්තෝ **"අකතාධිකාරස්සා"**ති ආහ. තේන යථාවුත්තවචනස්ස ච සප්පදේසතං දස්සේති. නනු ච කතාධිකාරස්ස අරියස්ස මග්ගේන සමිජ්ඣමානම්පි ඣානං මග්ගපටිපදාවසේන පටිපදාසහිතමේවාති. න විනා පටිපදාය ඉජ්ඣතීති සක්කා වත්තුං, තේනේතං වචනං නිප්පදේසමේවාති අනුයෝගං සන්ධායාහ **"කතාධිකාරස්ස පනා"**තිආදි. ඉදානි තස්ස වචනස්ස අධිප්පායවසේන ගහේතබ්බත්ථතා පාළිතෝපි විඤ්ඤායතීති දස්සෙන්තෝ ආහ **"යථාවුත්ත…පෙ…. කතා"**ති.

"යෝ කෝචී"ති අවිසේසවචන"න්ති තස්ස අපවාදං දස්සෙන්තෝ **"සකිං ද්වික්ඛත්තු"**න්ති ආදිමාහ. පරිච්ඡින්දිත්වා ගහණං පරිජානනං. **නාමරූපවවත්ථාපනාදීන**න්ති නාමරූපවවත්ථාපන-පච්චයපරිග්ගහලක්ඛණ පටිවේධ-නිකන්තිපරියාදානානං. **කිච්ඡසිද්ධිතෝ**ති නාමරූපවවත්ථාපනාදීනං කේසඤ්චි සබ්බේසම්පි වා කිච්ඡසිද්ධිතෝ. ඒස නයෝ දුතියවාරාදීසුපි යථාසම්භවං. **සුඛසිද්ධියම්පී**ති නාමරූපවවත්ථාපනාදීනං කිච්ඡසිද්ධි මග්ගපාතුභාවදන්ධභාවස්ස කාරණභාවේ අනේකන්තිකා. විපස්සනාසහගතින්ද්‍රියානං පන මන්දතා තස්ස ඒකන්තකාරණන්ති දස්සේති.

**ඒතදන්තත්තා පටිපදායා**ති ඒතේන නිප්පරියායතෝ පටිපදාඤාණදස්සනවිසුද්ධිසඞ්ඛාතාය විපස්සනාපඤ්ඤාය චිරාචිරප්පවත්තිවසේන මග්ගස්ස ඛිප්පදන්ධාභිඤ්ඤතා වුත්තාති දස්සේති. **පුරිමාන**න්ති පුරිමවාරානං, ලක්ඛණපටිවේධාදීනංයේව වා. හෙට්ඨිමකෝටියා තික්ඛත්තුං කිලේසවික්ඛම්භනේ

සති දුක්ඛාපටිපදාභාවෝ, න තතෝ හෙට්ඨාති නිච්ඡිතත්තා ආහ **"තික්ඛත්තුං වික්ඛම්භනවාරතාවසේනා"**ති. **තස්ස සුඛාපටිපදා වේදිතබ්බා** උක්කංසවසේනාති අධිප්පායෝ. **[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 277 යටතේ)]**

ඉතරං පන **ලෝකුත්තරකුසලචිත්තං** නිබ්බානාරම්මණතෝ ඒකවිධං, නියතානියතවත්ථුකභේදතෝ දුවිධං, තීහි විමොක්ඛමුඛේහි පත්තබ්බතෝ තිවිධං, චතුමග්ගයෝගභේදතෝ චතුබ්බිධං. සෙය්‍යථීදං; සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාසසඤ්ඤොජනප්පහානකරං සෝතාපත්තිමග්ගචිත්තං, රාගදෝසමෝහානං තනුත්තකරං සකදාගාමිමග්ගචිත්තං, කාමරාගබ්‍යාපාදනං නිරවසේසප්පහානකරං අනාගාමිමග්ගචිත්තං, රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජාපහානකරං අරහත්තමග්ගචිත්තන්ති ඉදං චතුබ්බිධං ලෝකුත්තරකුසලචිත්තං නාම. ඒකේකං පනෙත්ථ ඣානඞ්ගයෝගභේදතෝ පඤ්චවිධං හෝති, තස්මා වීසතිවිධං හෝති. සබ්බං පනේතං ලෝකුත්තරභාවනාපුඤ්ඤදවසප්පවත්තං මග්ගානුරූපඵලප්පවත්තියා චත්තාරෝ අරියපුග්ගලේ අභිනිප්ඵාදේති. ඒවං ලෝකුත්තරකුසලං වේදිතබ්බං. **[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 27 යටතේ)]**

**නියතානියතවත්ථුකභේදතෝ**ති සෝතාපත්තිමග්ගෝ නියතවත්ථුකෝ. කස්මා? කාමරූපේසුයේව හදයවත්ථුං නිස්සාය උප්පජ්ජනතෝ. ඉතරේ පන තයෝ මග්ගා අනියතවත්ථුකා. කස්මා? කාමරූපේසු හදයවත්ථුං නිස්සාය ජායන්ති, අරූපේ හදයවත්ථුං අනිස්සාය ජායන්ති, තස්මා අනියතවත්ථුකා. **තීහි විමොක්ඛමුඛේහී**ති සුඤ්ඤතඅනිමිත්තඅප්පණිහිතසඞ්ඛාතේහි තීහි විමොක්ඛමුඛේහි.

යස්ස සංවිජ්ජන්ති, තං පුග්ගලං වට්ටස්මිං සංයෝජේන්ති බන්ධන්තීති සංයෝජනා. සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාසායේව සංයෝජනා සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස-සංයෝජනා, තේසං පහානං සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස-සංයෝජනප්පහානං, තං කරෝතීති **සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස-සංයෝජනප්පහානකරං,** සෝතාපත්ති මග්ගචිත්තං. මානෝපි ඒකදේසතෝ අපායගාමිකෝයේව පහිය්‍යතේ. සෝතාපත්තිමග්ගේන නිස්සේසතෝ න පහිය්‍යතේ. සේසකිලේසේසුපි ඒසේව නයෝ. උද්ධච්චං පන ඒකදේසතෝපි අපායගාමිකම්පි න පහිය්‍යති. සකදාගාමිමග්ගචිත්තං රාගදෝසමෝහානං තනුත්තකරං. සෝතාපත්තිමග්ගේන නාසිතසංයෝජනානං පහානං කස්මා න වුත්තන්ති චේ? පඨමමග්ගතෝ දුතියමග්ගස්ස මහන්තත්තා පඨමමග්ගේන නාසිතා සංයෝජනා දුතියමග්ගේන නාසිතාති පඤ්ඤායති, ඉති යස්මා, තස්මා න වුත්තං. තතියචතුත්ථමග්ගේසුපි ඒසේව නයෝ. **එත්ථ** ඒතස්මිං ලෝකුත්තරචිත්තේ. **ඒකේක**න්ති විච්ඡාවසේන වුත්තං. **මග්ගානුරූප**න්ති වචනං පඨමමග්ගස්ස පඨමඵලඤ්ච අනුරූපන්ති විඤ්ඤාපනත්ථං.

**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 27 යටතේ)]**

**ඉතරම්පන** ලෞකික කුසලචිත්තයන් කෙරෙන් අන්‍යවූ **ලෝකුත්තරකුසලචිත්තං** ලෝකෝත්තර කුසල්සිත් තෙමේ **නිබ්බානාරම්මණතෝ** නිර්වාණය අරමුණුකරණ හෙයින් **ඒකවිධං** එක්වැදෑරුම් වේ **නියතානියතත්ථුක භේදතෝ** නියත වස්තුක අනියත වස්තුක භේද හෙයින් **දුවිධං** දෙවැදෑරුම් වෙයි **තීහි විමොක්ඛමුඛේහි** ත්‍රිවිධ විමෝක්ෂ ද්වාරයෙන් **පත්තබ්බතෝ** පැමිණියයුතු හෙයින් **තිවිධං** තුන්වැදෑරුම් වෙයි **චතුමග්ගයෝගභේදතෝ** සතර මාර්ගයන් හා සම්ප්‍රයෝග භේද හෙයින් **චතුබ්බිධං** සිව්වැදෑරුම් වෙයි **සෙය්‍යථීදං?** හේ කවරේද? **සක්කායදිට්ඨි විචිකිච්ඡා**

**සීලබ්බතපරාමාසසඤ්ඤෝජනප්පහානකරණං** සක්කායදෘෂ්ටිය-විචිකිච්ඡා-සීලබ්බත පරාමාසය යන සංයෝජනයන්ගේ සමුච්ඡේද ප්‍රහාණය කරන්නාවූ **සෝතාපත්තිමග්ගචිත්තං** නිර්වාණ සඞ්ඛ්‍යාත මහාසමුද්‍රය කරා ගලායන්නාවූ ස්‍රෝතසයයි කියනලද ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට පළමුකොට පැමිණීමෙන් ලැබියයුතු මාර්ගය හා සැපියුතු චිත්තය (නොහොත් නිර්වාණ සඞ්ඛ්‍යාත මහා සමුද්‍රය කරා වහනය වන්නාවූ අෂ්ටාඞ්ගික මාර්ග නැමති ජල ස්‍රෝතසයට පළමුවන පැමිණීම ඇත්තාවූ ආර්‍ය්‍ය පුද්ගලයාගේ මාර්ගය හා සැපියුතු චිත්තය) **රාග-දෝස-මෝහානං** රාග-ද්වේෂ- මෝහ යන කෙලෙසුන්ගේ **තනුත්තකරං** තුනීබව කරන්නාවූ **සකදාගාමිමග්ගචිත්තං** සකෘදාගාමි මාර්ගය හා සැපියුතු චිත්තය (නොහොත් ප්‍රතිසන්ධි වශයෙන් මේ මනුෂ්‍ය ලෝකයට එක් වරක්ම එන්නාවූ ආර්‍ය්‍ය පුද්ගලයාගේ මාර්ගය හා සැපියුතු චිත්තය) **කාමරාගව්‍යාපාදානං** කාමරාග ව්‍යාපාදයන්ගේ **නිරවසේසප්පහාණකරං** අනවසේස ප්‍රහාණය කරන්නාවූ **අනාගාමිමග්ගචිත්තං** අනාගාමි මාර්ගය හා සැපියුතු චිත්තය (නොහොත් ප්‍රතිසන්ධි වශයෙන් මේ කාමධාතුවට නොඑන්නාවූ ආර්‍ය්‍ය පුද්ගලයාගේ මාර්ගය හා සැපියුතු චිත්තය) **රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජාපහාණකරං** රූපරාගය-අරූපරාගය-මානය-උද්ධච්චය-අවිද්‍යාය යන මේ කෙලෙසුන්ගේ සමුච්ඡේද ප්‍රහාණය කරන්නාවූ **අරහත්තමග්ගචිත්තන්ති** අර්හත් මාර්ගය හා සැපියුතු චිත්තය (නොහොත් අර්හත් පුද්ගලයාගේ ස්වභාව සඞ්ඛ්‍යාත අර්හත් ඵලයට කාරණාවූ මාර්ගය හා සැපියුතු චිත්තය දැයි) **ඉදං** මේ **චතුබ්බිධං** සිව්වැදෑරුම්වූ **ලොකුත්තරං කුසලචිත්තං** ලොකෝත්තර කුසලචිත්තය නම් වේ **එත්ථ පන** මේ සිව්වැදෑරුම් කුසලසිත් අතුරෙන් **ඒකේකං** එකිඑකී කුසල්සිතක් තෙමේ **ඣානඞ්ගයෝගභේදතෝ** රූපාවචර විෂයවූ ධ්‍යානාඞ්ග පඤ්චකය හා සම්ප්‍රයෝග භේද හෙයින් **පඤ්චවිධං හෝති** (යම්හෙයකින්) පස්වැදෑරුම් වේද **තස්මා** එහෙයින් **වීසතිවිධං හෝති** විසිවැදෑරුම් වෙයි **ලෝකුත්තරභාවනාපුඤ්ඤවසප්පවත්තං** ලෝකෝත්තර භාවනා පුණ්‍යාගේ වශයෙන් හටගත්තාවූ **ඒතං සබ්බං පන** මේ සියළු සිත්තෙමේ වනාහි **මග්ගානුරූපඵලප්පවත්තියා** මාර්ගයට සුදුසු ඵලය නිපදවීම හේතුකොටගෙන **චත්තාරෝ අරියපුග්ගලේ** (ඒ ඒ ඵලයට පැමිණියාවූ සෝතාපන්න-සකදාගාමි-අනාගාමි-අර්හත් යන සාමාන්‍යයෙන්) සතර ආර්‍ය්‍ය පුද්ගලයන් **අභිනිප්ඵාදේති** නිපදවයි **ඒවං** මෙසේ **ලෝකුත්තරකුසලං** ලෝකෝත්තර කුසල්සිත **වෙදිතබ්බං** දතයුත්තේයි. **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 92-93 පිටු]**

ඒවං තිවිධම්පි ලෝකියකුසලං නිද්දිසිත්වා ඉදානි ලෝකුත්තරකුසලං නිද්දිසන්තෝ ආහ **"ඉතරං පනා"**තිආදි. ලුජ්ජනපලුජ්ජනට්ඨේන ලෝකෝ, සෝ තිවිධෝ; සඞ්ඛාරලෝකෝ සත්තලෝකෝ භාජනලෝකෝති. තතෝ ඉදං උත්තරතීති ලෝකුත්තරං. චත්තාරෝපි හි මග්ගා උපාදානක්ඛන්ධසඞ්ඛාතසඞ්ඛාරලෝකතෝ උත්තරන්ති අනාසවභාවේන. සත්තලෝකේසු ච සෝතාපත්තිමග්ගෝ අනරියලෝකතෝ උත්තරති, සකදාගාමිමග්ගෝ සෝතාපන්නලෝකතෝ, අනාගාමිමග්ගෝ සකදාගාමිලෝකතෝ, අරහත්තමග්ගෝ අනාගාමිලෝකතෝ උත්තරති. භාජනලෝකේසු පන පඨමමග්ගෝ අපායලෝකතෝ උත්තරති, සකදාගාමිමග්ගෝ කාමලෝකේකදේසතෝ, අනාගාමිමග්ගෝ සකලකාමලෝකතෝ, අරහත්තමග්ගෝ රූපාරූපලෝකතෝ උත්තරති. ඉති චතුබ්බිධම්පි මග්ගචිත්තං තිවිධලෝකතෝ උත්තරතීති ලෝකුත්තරං, කුච්ඡිතසලනාදිතෝ පන කුසලං, චින්තනාදිතෝ චිත්තඤ්චාති **ලෝකුත්තරකුසලචිත්තං**. ඵලං පන ලෝකතෝ උත්තිණ්ණත්තා ලෝකුත්තරං, උභයම්පි වා සහ නිබ්බානේන

උපාදානක්ඛන්ධසඞ්ඛාතලෝකතෝ උත්තරං විසිට්ඨතරන්ති ලෝකුත්තරං. යථාහ "යාවතා, භික්ඛවේ, ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා, විරාගෝ තේසං ධම්මානං අග්ගමක්ඛායතී"ති (අ. නි. 4.34; ඉතිවු. 90).

**නියතානියතවත්ථුකභේදතෝ**ති සෝතාපත්තිමග්ගස්ස පරතෝඝෝසපච්චයේන විනා අනුප්පජ්ජනතෝ අරූපභවේ සම්භවෝ නත්ථීති තං නියතවත්ථුකං, ඉතරං පන සත්තවිධම්පි පරතෝඝෝසං විනාපි විපස්සනාබලේනේව නිප්ඵජ්ජනතෝ තත්ථාපි සම්භවතීති අනියතවත්ථුකං.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා ලෝකුත්තරකුසල වණ්ණනා යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 128 පිට]**

එහි "ලුජ්ජනපලුජ්ජනට්ඨේන ලෝකෝ" යනු කී හෙයින් ලුජ්ජන පලුජ්ජනාර්ථයෙන් ලෝක නම් වේ. ඒ ලෝකතෙමේ සංස්කාරලෝකය සත්වලෝකය අවකාශලෝක යයි තුන්වැදෑරුම් වේ. "තතෝ ඉදං උත්තරතීති ලෝකුත්තරං" යනු නිර්වචන හෙයින් ඒ තුන්වැදෑරුම් ලෝකය කෙරෙන් මේ සිත ඉක්මයානුයි ලෝකුත්තර නම් වේ. ඒ එසේමැයි; සතර මාර්ගයෝ ද උපාදනස්කන්ධ සඞ්ඛ්‍යාත සංස්කාරලෝකය කෙරෙන් අනාශ්‍රව භාවයෙන් ඉක්මෙති. සත්ව ලෝකයන් අතුරෙහිද සෝවාන් මාර්ගය තෙමේ අනාර්ය්‍ය ලෝකය කෙරෙන් ඉක්මෙයි. සකෘදගාමි මාර්ග තෙමේ සෝතාපන්න ලෝකය කෙරෙන් ඉක්මෙයි. අනාගාමි මාර්ග තෙමේ සකෘදගාමි ලෝකය කෙරෙන් ඉක්මෙයි. අර්හත් මාර්ග තෙමේ අනාගාමි ලෝකය කෙරෙන් ඉක්මෙයි. අවකාස ලෝකයන් අතුරෙහිද පළමුවෙනි මාර්ග තෙමේ අපාය ලෝකය කෙරෙන් ඉක්මෙයි. සකෘදගාමි මාර්ග තෙමේ කාමලෝකයාගේ ඒකදේශයක් කෙරෙන් ඉක්මෙයි. අනාගාමි මාර්ග තෙමේ සියළු කාමලෝකය කෙරෙන් ඉක්මෙයි. අර්හත් මාර්ග තෙමේ රූපාරූප ලෝකය කෙරෙන් ඉක්මෙයි. මෙසේ සිව්වැදෑරුම්වූද මාර්ගසිත් තෙමේ තුන්වැදෑරුම් ලෝකය කෙරෙන් ඉක්මේනුයි ලෝකුත්තර නම් වෙයි. කුත්සිතවූ පාප ධර්මයන්ගේ සලනාදී කාරණයෙන් කුසල්නම්ද චිත්තාදී කාරණයෙන් චිත්ත නම් ද වූයේනුයි ලෝකෝත්තර කුසලචිත්ත නම් වෙයි. ඵලසිත වනාහි ලෝකය කෙරෙන් ඉක්මෙනු ලැබූහෙයින් හෙවත් ඉක්මී කෙළවරවූ හෙයින් ලෝකෝත්තර නම් වේ. නොහොත් නිර්වාණය හා සමඟ ඒ මාර්ගඵල යන දෙසිතම උපාදනස්කන්ධ සඞ්ඛ්‍යාත ලෝකය කෙරෙන් විශිෂ්ටනුයි අධිකනුයි ලොකෝත්තර නම් වේ. එයින් වදළහ:— "යාවතා භික්ඛවේ ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා විරාගෝ තේසං ධම්මානං අග්ගමක්ඛායති" යී.

"නියතානියතවත්ථුකතෝ" යන මෙහි සෝවාන් මාර්ගය පරතෝඝෝෂ ප්‍රත්‍යයෙන් වෙන්ව නෝපදනා හෙයින් අරූප භාවයෙහි නොලැබේනුයි ඒ සෝවාන් මාර්ගය නියතවස්තුක නම් වේ. අවශේෂවූ සත්වැදෑරුම් මාර්ගඵල චිත්තයම පරතෝ ඝෝෂ ප්‍රත්‍යයක් නැතිවද විදර්ශනා බලයෙන්ම උපදනා හෙයින් ඒ අරූප භවයෙහිද ලැබේනුයි අනියත වස්තුක නම් වෙයි. **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 94 පිට]**

ලෝකුත්තරා පන කුසලා මග්ගසම්පයෝගභේදතෝ චතුබ්බිධා. සෙය්‍යථීදං; සෝතාපත්තිමග්ගසම්පයුත්තං සකදගාමිමග්ගසම්පයුත්තං අනාගාමිමග්ග සම්පයුත්තං අරහත්තමග්ගසම්පයුත්තන්ති. නනු චතුසුපි චේතේසු මග්ගසම්පයෝගෝ සමානෝ අට්ඨන්නම්පි මග්ගඞ්ගානං සබ්බත්ථ උප්පත්තිතෝ කථං තත්ථ භේදෝති? අනුසයප්පහානසඞ්ඛාතස්ස මග්ගකිච්චස්ස භේදතෝ. අනුසයේ මාරෙන්තෝ ගච්ඡතීති හි **මග්ගෝ**. මග්ගා හි යථාසකං අනුසයේ පජහන්ති

ඒව, නිමිත්තා චුටිඨහන්ති, පවත්තඤ්ච ඡින්දන්ති නාමාති වුච්චන්ති. නිමිත්තන්ති ච පඤ්චක්ඛන්ධා, පවත්තන්තිපි තේ ඒව. තං දුවිධං උපාදින්නකං, අනුපාදින්නකඤ්ච.

**[අභිධම්මමාතිකා (ඡට්ඨසඞ්ගායනා ලෝකුත්තරකුසලධම්ම යටතේ)]**

ඉදානි ලෝකුත්තරකුසලං චතුමග්ගයෝගතෝ, ඵලඤ්ච තදනුරූපප්පවත්තියා චතුධා විභජිත්වා දස්සේතුං **"සෝතාපත්තිමග්ගචිත්ත"**න්තයාදි වුත්තං. නිබ්බානං පතිසවනතෝ උපගමනතෝ, නිබ්බානමහාසමුද්දනින්නතාය සෝතසදිසත්තා වා "සෝතෝ"ති වුච්චති අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ, තස්ස ආපත්ති ආදිතෝ පජ්ජනං පාපුණනං පඨමසමන්නාගමෝ සෝතාපත්ති ආ-උපසග්ගස්ස ආදිකම්මනි පවත්තනතෝ. නිබ්බානං මග්ගේති, නිබ්බානත්ථිකේහි වා මග්ගීයති, කිලේසේ මාරෙන්තෝ ගච්ඡතීති වා මග්ගෝ, තේන සම්පයුත්තං චිත්තං මග්ගචිත්තං, සෝතාපත්තියා ලද්ධං මග්ගචිත්තං **සෝතාපත්තිමග්ගචිත්තං**. අථ වා අරියමග්ගසෝතස්ස ආදිතෝ පජ්ජනං ඒතස්සාති සෝතාපත්ති, පුග්ගලෝ, තස්ස මග්ගෝ සෝතාපත්තිමග්ගෝ, තේන සම්පයුත්තං චිත්තං **සෝතාපත්තිමග්ගචිත්තං**.

සකිං ඒකවාරං පටිසන්ධිවසේන ඉමං මනුස්සලෝකං ආගච්ඡතීති සකදාගාමී, ඉධ පත්වා ඉධ පරිනිබ්බායී, තත්ථ පත්වා තත්ථ පරිනිබ්බායී, ඉධ පත්වා තත්ථ පරිනිබ්බායී, තත්ථ පත්වා ඉධ පරිනිබ්බායී, ඉධ පත්වා තත්ථ නිබ්බත්තිත්වා ඉධ පරිනිබ්බායීති පඤ්චසු සකදාගාමීසු පඤ්චමකෝ ඉධාධිප්පේතෝ. සෝ හි ඉතෝ ගන්ත්වා පුන සකිං ඉධ ආගච්ඡතීති. තස්ස මග්ගෝ සකදාගාමිමග්ගෝ. කිඤ්චාපි මග්ගසමඞ්ගිනෝ තථාගමනාසම්භවතෝ ඵලට්ඨෝයේව සකදාගාමී නාම, තස්ස පන කාරණභූතෝ පුරිමුප්පන්නෝ මග්ගෝ මග්ගන්තරාවච්ඡේදනත්ථං ඵලට්ඨේන විසේසෙත්වා වුච්චති "සකදාගාමිමග්ගෝ"ති. ඒවං අනාගාමිමග්ගෝති. සකදාගාමිමග්ගේන සම්පයුත්තං චිත්තං **සකදාගාමිමග්ගචිත්තං**.

පටිසන්ධිවසේන ඉමං කාමධාතුං න ආගච්ඡතීති අනාගාමී, තස්ස මග්ගෝ අනාගාමිමග්ගෝ, තේන සම්පයුත්තං චිත්තං **අනාගාමිමග්ගචිත්තං**. අග්ගදක්ඛිණෙය්‍යභාවේන පූජාවිසේසං අරහතීති අරහා, අථ වා කිලේසසඞ්ඛාතා අරයෝ, සංසාරචක්කස්ස වා අරා කිලේසා හතා අනේනාති අරහා, පාපකරණේ රහාභාවතෝ වා අරහා, අට්ඨමකෝ අරියපුග්ගලෝ, තස්ස භාවෝ අරහත්තං, චතුත්ථඵලස්සේතං අධිවචනං, තස්ස ආගමනභූතෝ මග්ගෝ අරහත්තමග්ගෝ, තේන සම්පයුත්තං චිත්තං **අරහත්තමග්ගචිත්තං**.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 31 යටතේ); විභාවනී ටීකා සන්නය 76-78 පිටු]**

**ඉදානි** දැන් **ලෝකුත්තරකුසලං** ලෝකෝත්තර කුසලය **චතුමග්ගයෝගතෝ** සිව්වැදෑරුම් පහායක මාර්ගය හා යුක්තවූ හෙයින් **ඵලඤ්ච** ඵලයද **තදනුරූපප්පවත්තියා** ඒ මාර්ගයට සුදුසු පරිද්දෙන් හටගන්නා හෙයින් **චතුධා** සතර පරිද්දකින් **විභජිත්වා** බෙද **දස්සේතුං** දක්වනු පිණිස **සෝතාපත්තිමග්ගචිත්තන්ති ආදී** සෝතාපත්තිමග්ගචිත්තං යනාදිය **වුත්තං** කියනලදී.

**නිබ්බානං** නිර්වාණයට **පතිසවණතෝ (උපගමනතෝ)** අරමුණු කිරීම් වශයෙන් අභිමුඛ කොට එළඹෙන හෙයින් **අරියෝ** කෙලෙස් නැමති මල රහිතවූ **අට්ඨඞ්ගිකෝ** අෂ්ටප්‍රකාරවූ අඞ්ගයකින් සම්පූර්ණවූ **මග්ගෝ** මාර්ගය **සෝතෝති වුච්චති** සෝතයයි කියනු ලැබේ **වා** නොහොත් **නිබ්බානමහසමුද්දනින්නතාය** නිර්වාණ සඞ්ඛ්‍යාත මහා සමුදුරට නිම්න භාවයෙන් (හෙවත් නියත කිරීම් වශයෙන්) **සෝතසදිසත්තා**

ජලප්‍රවාහයකට බදුවූ හෙයින් **අරයෝ** ක්ලේශමල රහිතවූ **අට්ඨඞ්ගිකෝ** අෂ්ටාඞ්ගයකින් යුත්ත වූ **මග්ගෝ** මාර්ගය **සෝතෝති වුච්චති** සෝතයයි කියනු ලැබේ ("නිබ්බානං පතිසවණතෝ උපගමනතෝ සෝතෝති වුච්චති" යන පාඨයෙන් "නිබ්බානං පතිසවති උපගච්ඡති ආරම්මණකරණවසේනාති සෝතෝ" යී විග්‍රහ කටයුතු බව දැක්වූයේයි "නිබ්බානමහාසමුද -පෙ- වුච්චති" යන පාඨයෙන් "සවති සන්දතීති සෝතෝ" යී කොට "සෝතෝ වියාති සෝතෝ" යී උපමා තද්ධිත විග්‍රහය කටයුතු බව ප්‍රකාශ කෙළේයි) **යෝ (අරියමග්ගෝ)** යම් ආර්ය්‍ය මාර්ගයක් තෙමේ **නිබ්බානං** නිවනට **ආරම්මණකරණවසේන** අරමුණු කිරීම් වශයෙන් **සවති (උපගච්ඡති)** පැමිණෙන්නේ වේද **ඉති (තස්මා) සෝ(අරියමග්ගෝ)** ඒ ආර්ය්‍යමාර්ග තෙමේ **සෝතෝ** සෝත නම් වේ (ආර්ය්‍ය මාර්ගය ලැබේ. උපගමනාර්ථයෙහිවූ "සු උපසවේ" යන ධාතුවෙන් මේ පදය සිද්ධයි) **යෝ (ජලප්පවාහෝ)** යම් ජලප්‍රවාහයක් තෙමේ **සවති (සන්දති)** වහනය වේද **ඉති (තස්මා) සෝ (ජලප්පවාහෝ)** ඒ ජල ප්‍රවාහය තෙමේ සෝතෝ සෝත නම් වේ (ජල ප්‍රවාහය ලැබේ. මේ පච්ඡිම විකල්පයෙහි සන්දනාර්ථයෙහි සු ධාතුවෙන් පදය සිද්ධයි) **යෝ (අරියමග්ගෝ)** යම් ආර්ය්‍ය මාර්ගයක් තෙමේ **සෝතෝ විය** ජල ප්‍රවාහයක් මෙන් **පවත්තති** හටගන්නේ වේද **ඉති (තස්මා) සෝ (අරියමග්ගෝ)** ඒ ආර්ය්‍ය මාර්ග තෙමේ **සෝතෝ** සෝත නම් වේ ("මග්ගෝ" යන්න පමණක් නොකියා "අරියෝ" යන විශේෂණය වනාහි මාර්ග ශබ්දයෙන් පථය වච්ච මාර්ගය යනාදී අර්ථයන්ද වාචක වන හෙයින් ඒ අර්ථයන් වළකනු පිණිස කියනලදී. ආර්ය්‍ය මාර්ගයාගේද පඤ්චඞ්ගික මාර්ගයකුදු ඇතිහෙයින් ඒ වළකනු පිණිස "අට්ඨඞ්ගිකෝ" යන විශේෂණය කියනලදී) **තස්ස** ඒ අෂ්ටාඞ්ගික මාර්ගයට **ආපත්ති (ආදිතෝ පජ්ජනං පාපුණනං පඨමසමන්නාගමෝ)** පළමුකොට පැමිණීම **සෝතාපත්ති** සෝතාපත්ති නම් වේ (සෝතස්ස ආපත්ති සෝතාපත්තීති) යී ෂෂ්ඨී තත්පුරුෂසමාස කටයුතුයි "ආපත්ති" යන්නෙහි ආ පූර්වවූ පද ධාතුහුගේ ගත්‍යර්ථය වළකනු පිණිස "පාපුණනං" යී කියනලදී. පාපුණනයද සාමාන්‍ය පැමිණීමක් නොව සම්පූර්ණත්වයයි දක්වනු පිණිස "පඨමසමන්නාගමෝ" යී කියනලදී)

(ආයුෂ්මත් ටීකාචාරීනි සංවර්ණිතව්‍ය පාඨයෙහි "ආපත්ති" යී ඇත්තේහිදු කුමක්හෙයින් "ආදිතෝ" යී සංවර්ණා පදය කීයේදැයි යන චෝද්‍යය සඳහා "ආ උපසග්ගස්ස -පෙ- පවත්තනතෝ" යන පාඨය කියනලදී) **කස්මා** කුමක්හෙයින් **ආදිතෝති** ආදිතෝ යී **ආචරියේන** ආචාර්යන් විසින් **වුත්තං** කියන ලද්දේද යත්? **ආ උපසග්ගස්ස** ආ යන උපසර්ගයාගේ **ආදිකම්මනි** පෙරටු වූ යන අර්ථයෙහි **පවත්තනතෝ** පවත්නා හෙයින් **ආදිතෝති වුත්තං** ආදිතෝ යී කියනලදී. (මෙසේ පාඨශේෂ බහා අර්ථ කියයුතුයි)

**යෝ (ධම්මෝ)** යම් ස්වභාව ධර්මයක් **නිබ්බානං මග්ගේති** නිවන් සොයන්නේ වේද **වා** නොහොත් **යෝ (ධම්මෝ)** යම් ස්වභාව ධර්මයක් **නිබ්බානත්ථිකේහි** නිවන් කැමැත්තවුන් විසින් **මග්ගීයති** සොයනු ලැබේද **වා** නොහොත් **යෝ (ධම්මෝ)** යම් ස්වභාව ධර්මයක් තෙමේ **කිලේසේ** කෙලෙසුන් **මාරෙන්තෝ** මරමින් **නිබ්බානං ගච්ඡති** නිවනට පැමිණේ ද **ඉති (තස්මා) සෝ (ධම්මෝ)** ඒ ධර්ම තෙමේ **මග්ගෝ** මග්ග නම් වේ (ප්‍රථම විකල්පයෙහි මග්ග ශබ්දය කර්තෘ සාධනයෙහිද ද්විතීය විකල්පයෙහි කර්ම සාධනයෙහිද සිද්ධයි. තෘතීය විකල්පයෙහි වනාහි "කිලේසේ මාරේතීති මාරෙන්තෝ නිබ්බානං ගච්ඡතීති ගෝ" යී කර්තෘ සාධනයෙහි කොට "මාරෙන්තෝව ගෝවාති මාරෙන්තගෝ" යී කර්මධාරය සමාස කටයුතුයි. මේ තෘතීය විකල්පයෙහි

වනාහි "මාරෙන්තගෝ" යී කියයුතු තන්හි නිරුක්තිනයින් "මග්ගෝ" යී සිද්ධ කරණලදී.)

**තේන** ඒ මාර්ගය හා **සම්පයුත්තං** එක්වයෙදුනාවූ **චිත්තං** සිත්තෙමේ **මග්ගචිත්තං** මාර්ගචිත්තය නම් වේ ("මග්ගේන සම්පයුත්තං චිත්තං මග්ගචිත්තං" යී මධ්‍ය පදලෝප තෘතීයාතත්පුරුෂ සමාස කරණු) **සෝතාපත්තියා** ආර්‍ය්‍ය මාර්ගය පළමුකොට පැමිණීමෙන් (හෙවත් පැමිණීම හේතුකොටගෙන) **ලද්ධං** ලබන්නාවූ **මග්ගචිත්තං** මාර්ගය හා යුක්තවූ සිත්තෙමේ **සෝතාපත්තිමග්ගචිත්තං** සෝතාපත්තිමග්ගචිත්ත නම් වේ (මධ්‍ය පදලෝප තෘතීයා තත්පුරුෂයද යෙදේ) **අථ වා** නොහොත් **ඒතස්ස (පුග්ගලස්ස)** ඒ පුද්ගලයාගේ **අරියමග්ගසෝතස්ස** ආර්‍ය්‍ය මාර්ග ශ්‍රෝත්‍රයට **ආදිතෝපජ්ජනං** පළමුවන පැමිණීම **අත්ථි** ඇත්තේ වේද **ඉති (තස්මා) සෝ (පුග්ගලෝ)** ඒ පුද්ගලතෙම සෝතාපත්ති නම් වේ **පුග්ගලෝ** පුද්ගලයෙක් (**ලබ්භති** ලැබේ)

තවද "සෝතස්ස ආපත්ති ඒතස්සාති සෝතාපත්ති" යන භින්නාධිකරණ බාහිරත්ථ බහුබීහිසමාසය ද යෙදේ (**තස්ස** ඒ ආර්‍ය්‍ය මාර්ගයට පළමුකොට පැමිණි පුද්ගලයාගේ **මග්ගෝ** මාර්ගතෙමේ **සෝතාපත්තිමග්ගෝ** සෝතාපත්ති මාර්ග නම් වේ ("සෝතාපත්තිස්ස මග්ගෝ සෝතාපත්තිමග්ගෝ" යී ෂෂ්ඨීතත්පුරුෂ සමාස වේ) **තේන** ඒ සෝතාපත්ති මාර්ගය හා **සම්පයුත්තං** එක්වයෙදුනාවූ **චිත්තං** සිත්තෙමේ **සෝතාපත්තිමග්ගචිත්තං** සෝතාපත්ති මාර්ග චිත්තය නම් වේ ("සෝතාපත්ති මග්ගේන සම්පයුත්තං චිත්තං" යී මධ්‍ය පදලෝප තෘතීයාතත්පුරුෂ සමාස වේ)

**යෝ (පුග්ගලෝ)** යම් පුද්ගලයෙක් තෙමේ **සකිං (ඒකවාරං)** එක්වරක් **පටිසන්ධිවසේන** පිළිසිඳගැනීම් වශයෙන් **ඉමං මනුස්සලෝකං** මේ මිනිස්ලොවට **ආගච්ඡති** එන්නේ වේද **ඉති (තස්මා) සෝ (පුග්ගලෝ)** ඒ පුද්ගලතෙමේ **සකදාගාමී** සකදාගාමී නම් වේ (මේ ආදි වචනාර්ථය බලන කල "සකිං ආගාමී" යී කියයුතු තන්හි නිරුක්ති නය වශයෙන් "සකදාගාමී" යයි කියනලද බව හැඟේ. ප්‍රතිසන්ධි වශයෙන් මේ මිනිස්ලොවට එන බැවින් සකෘදගාමී නම් වෙයි ආචාර්යතෙම් කියේය. සකෘදගාමී පුද්ගලයන් පස්දෙනා අතුරෙන් මෙතන්හි කවර පුද්ගලයෙක් අභිමතදැයි යන චෝද්‍යය සඳහා "ඉධ පත්වා -පෙ- අධිප්පේතෝ" යන පාඨය කියනලදී)

**ඉධ** මේ මිනිස්ලොවෙහි **පත්වා** සකෘදගාමී ඵලයට පැමිණ **ඉධ** මේ මිනිස්ලොවෙහි **පරිනිබ්බායි** පිරිනිවන්පානා සකෘදගාමි ඵලස්ථයෙක **තත්ථ** ඒ දිව්‍යලෝකයෙහි **පත්වා** සකෘදගාමී ඵලයට පැමිණ **තත්ථ** ඒ දිව්‍යලෝකයෙහි **පරිනිබ්බායි** පිරිනිවන්පානා සකෘදගාමී පුද්ගලයෙක **ඉධ පත්වා** මේ මිනිස්ලොව සකෘදගාමී ඵලයට පැමිණ **තත්ථ පරිනිබ්බායි** ඒ දෙව්ලොව්හි පිරිනිවන්පානා සකෘදගාමී පුද්ගලයෙක **තත්ථ පත්වා** ඒ දෙව්ලොව්හි සකෘදගාමී ඵලයට පැමිණ **ඉධ පරිනිබ්බායි** මේ මිනිස්ලොවෙහි පිරිනිවන්පානා සකෘදගාමී පුද්ගලයෙක **ඉධ පත්වා** මේ මිනිස්ලොවෙහි සකෘදගාමි ඵලයට පැමිණ **තත්ථ නිබ්බත්තිත්වා** ඒ දෙව්ලොව්හි ඉපිද **ඉධ පරිනිබ්බායි** මේ මිනිස්ලොවෙහි පිරිනිවන්පානා සකෘදගාමී පුද්ගලයෙක **ඉති** මේ උක්තප්‍රකාරයෙන් **පඤ්චසු සකදාගාමීසු** පස්වැදෑරුම්වූ සකෘදගාමී පුද්ගලයන් අතුරෙන් **පඤ්චමකෝ** පස්වැනිවූ සකෘදගාමී පුද්ගලයා **ඉධ** මේ සකදාගාමීමග්ග චිත්තං යන පදයෙහි **අධිප්පේතෝ** කැමතිවනලදී.

(මේ සතරාකාරවූ සකෘදගාමී පුද්ගලයෝද සකෘදගාමී භාවයෙන් වෙනස් නොවන්නාහුදු කුමක්හෙයින් පස්වැනි සකෘදගාමී පුද්ගලයාම මේ "සකදගාමීමග්ග චිත්තං" යන පදයෙහි කැමතිවන ලද්දේද යන චෝද්‍යය සඳහා "සෝ හි -පෙ- ආගච්ඡතීති" යන පාඨය කියනලදී) **සෝ** ඒ පස්වෙනි සකෘදගාමී පුද්ගලතෙමේ **ඉතෝ ගන්ත්වා** මේ මිනිස්ලොවින් දෙව්ලොවට ගොස් **පුන** නැවත **සකිං** එක්වරක් **ඉධ** මේ මිනිස්ලොවට **හි (යස්මා)** යම්හෙයකින් **ආගච්ඡති** එන්නේ වේද **ඉති (තස්මා) පඤ්චමකෝ** පස්වෙනි සකෘදගාමී පුද්ගලයා **ඉධ** මේ සකදගාමිමග්ගචිත්තං යන පදයෙහි **අධිප්පේතෝ** කැමතිවනලදී. (මෙසේ අර්ථයෝජනා කටයුතුයි) **තස්ස** ඒ සකදගාමී පුද්ගලයාගේ **මග්ගෝ** මාර්ගතෙමේ **සකදගාමීමග්ගෝ** සකෘදගාමී මාර්ග නම් වේ ("සකදගාමිනෝ මග්ගෝ සකදගාමී මග්ගෝ" යී විග්‍රහ කටයුතුයි)

ආයුෂ්මත් ටීකාචාරීනි මාර්ගස්ථ පුද්ගලයාගේ මාර්ගයවූ හෙයින් "සකදගාමි මග්ගසමඞ්ගි මග්ගෝ" යී කියයුතු නොවේද කුමක්හෙයින් "සකදගාමීමග්ගෝ" යී ඵලස්ථ පුද්ගලයාගේ වශයෙන් වෙනස් කොට කීයේදැයි යන චෝද්‍යය සඳහා "කිඤ්චාපි මග්ගසමඞ්ගිනෝ -පෙ- වුච්චති සකදගාමීමග්ගෝති" යන පාඨය කියනලදී) **මග්ගසමඞ්ගිනෝ** මාර්ගයෙන් පරිපූර්ණවූ පුද්ගලයාගේ (ආගමනං යන්නෙහි සම්බන්ධයි) **තථා ආගමනාසම්භවතෝ** එසේ එක්වරක් ප්‍රතිසන්ධි ගැනීම් වශයෙන් මේ මිනිස්ලොවට නොපැමිණෙන හෙයින් **ඵලට්ඨෝ ඒව** ඵලස්ථ පුද්ගල තෙමේම **කිඤ්චාපි සකදගාමී නාම** ඉදින් සකෘදගාමී වන්නේ නම් **පන (තථාපි)** එසේ වන්නේහිදු **තස්ස** ඒ ඵලස්ථ පුද්ගලයාගේ (මග්ගෝ යන්නෙහි සම්බන්ධයි) **කාරණභූතෝ** හේතුභූතවූ **පුරිමුප්පන්නෝ** ඵලයට පළමුකොට උපන්නාවූ **මග්ගෝ** මාර්ගය **මග්ගන්තරාවච්ඡේදනත්ථං** ප්‍රථමමාර්ග තෘතීයමාර්ගයයි කියනලද අනික් මාර්ගයන්ගෙන් වෙනස් කරණු පිණිස **ඵලට්ඨේන** ඵලස්ථ පුද්ගලයාගේ වශයෙන් **විසේසෙත්වා** වෙනස් කොට **සකදගාමීමග්ගෝති** සකෘදගාමීමග්ගෝ යි **වුච්චති** කියනුලැබේ. (චෝදකයාගේ ආභෝගය වනාහි "මග්ගෝ" යන පදය හා "සකදගාමී මග්ගසමඞ්ගි" යී යන පදයද සමාස කොට "සකදගාමීමග්ගසමඞ්ගී මග්ගෝ" යි කියයුතු බවයි. ඊට පරිහාරය වනාහි එසේ "සකදගාමීමග්ගසමඞ්ගි මග්ගෝ" යී කියන ලද්දේ වී නම් මාර්ගසමඞ්ගී පුද්ගලයාගේ එක්වරක් ප්‍රතිසන්ධි ගැණීම් වශයෙන් මේ මිනිස්ලොවට ඊමක් (ඒමක්) නැති හෙයින් ඵලස්ථ පුද්ගලයාගේම ඒ ඊම (ඒම) ඇතිවන බැවින් ඵලස්ථ පුද්ගලයාගේ වශයෙන් වෙනස් කොට "සකදගාමීමග්ගෝ" යී කියන ලද්දේය යනු භාවයි)

**ඒවං** මේ සකෘදගාමී මාර්ගයට කී නයින් **අනාගාමීමග්ගෝපි** අනාගාමි මාර්ගයද **වුච්චති** කියනුලැබේ (ච ශබ්දය පරිසමාපනාර්ථයි) **සකදගාමීමග්ගේන** සකෘදගාමී මාර්ගය හා **සම්පයුත්තං චිත්තං** සම්ප්‍රයෝගවූ චිත්තය **සකදගාමීමග්ගචිත්තං** සකදගාමීමග්ගචිත්ත නම් වේ **යෝ (පුග්ගලෝ)** යම් පුද්ගලයෙක් තෙමේ **පටිසන්ධිවසේන** පිළිසිඳගැනීම් වශයෙන් **ඉමං කාමධාතුං** මේ කාම භූමියට **න ආගච්ඡති** නොඑන්නේ වේද **ඉති (තස්මා) සෝ (පුග්ගලෝ)** ඒ පුද්ගල තෙමේ **අනාගාමී** අනාගාමී නම් වේ **තස්ස** ඒ අනාගාමී පුද්ගලයාගේ **මග්ගෝ** මාර්ග තෙමේ **අනාගාමීමග්ගෝ** අනාගාමීමාර්ග නම් වේ **තේන** ඒ අනාගාමී මාර්ගය හා **සම්පයුත්තං චිත්තං** සම්ප්‍රයෝග වූ චිත්තය **අනාගාමීමග්ගචිත්තං** අනාගාමීමග්ගචිත්ත නම් වේ **යෝ (පුග්ගලෝ)** යම් පුද්ගලයෙක් තෙමේ **අග්ගදක්ඛිණෙය්‍යභාවේන** උතුම් දක්ෂිණාව පිළිගැනීමට සුදුසු බැවින් **පූජාවිසේසං** පූජා විශේෂය **පටිගණ්හිතුං** පිළිගැණිම පිණිස **අරහති** සුදුසු වේද **ඉති (තස්මා) සෝ**

**(පුග්ගලෝ)** ඒ පුද්ගල තෙමේ **අරහා** අරහා නම් වේ ("පටිගණ්හිතුං" යන්න සම්බන්ධය පිණිස තබනලදි) **අථ වා** නොහොත් **අනේන** මේ පුද්ගලයා විසින් **කිලේසසඞ්ඛාතා** කෙලෙස් යැයි කියන ලද්දවූ **අරයෝ** ශත්‍රුහු වා නොහොත් **සංසාරචක්කස්ස** සංසාර යයි කියනලද චක්‍රයාගේ **අරා** දැව් වැනි වූ (ක්ලේශයෝ) **හතා** නසන ලද්දහුය **ඉති (තස්මා)** නොහොත් ඒ නසනලද සංසාර චක්‍රයාගේ දැව් ඇති බැවින් **සෝ (පුග්ගලෝ)** ඒ පුද්ගල තෙම **අරහා** අරහා නම් වේ (අථ වා යන්නෙන් දක්වන ලද "කිලේසසඞ්ඛාතා අරයෝ" යන පළමුවන ක්‍රමයෙහි "අරයෝ හතා අනේනාති අරහා" යි විග්‍රහ කරණු. "අරි හතා" යි කියයුතු තන්හි නිරුත්ති නයින් "අරහා" යයි කියනලදි. "සංසාරචක්කස්ස වා" යනාදී පශ්චිම ක්‍රමයෙහි වනාහි "අරා හතා අනේනාති අරහා" යි විග්‍රහ කරණු. "අරහහා" යි කියයුතු තන්හි නිරුත්ති නයින් "අරහා" යි කියනලදි. තෘතියා බහුබ්බීහි සමාසයි)

**පාපකරණේ** පව් කිරීමෙහි **රහාභාවතෝ** රහස් නැති බැවින් **අරහා** අරහා නම් වේ (මේ "පාපකරණේ රහාභාවතෝ" යන වාක්‍යයෙහි "නත්‍ථි රහෝ යස්සාති අරහා" යි චතුර්ථී බහුබ්බීහි සමාස කටයුතුයි) **යස්ස (පුග්ගලස්ස)** යම් පුද්ගලයෙක් හට **රහෝ** රහස් ගත තන්හි පව් කිරීමෙක් **නත්‍ථි** නැත්තේ වේද **ඉති (තස්මා) සෝ පුග්ගලෝ** ඒ පුද්ගල තෙමේ **අරහා** අරහා නම් වේ **අට්ඨමකෝ** අටවැනි වූ **අරියපුග්ගලෝ** ආර්‍ය්‍ය පුද්ගලයා (**ලබ්භති** ලැබේ) **තස්ස** ඒ රහත් පුද්ගලයාගේ **භාවෝ** ස්වභාව තෙමේ (අරහත්ත ශබ්ද මග්ග ශබ්දයන්ගේ තුල්‍යාධිකරණ භාවය කල්පනා කරනවුන්ගේ සතරවැනි මාර්ගයාගේ අර්හත් භාවය යෙදෙන්නේය යන කල්පනාව වළක්වනු පිණිස "චතුත්ථඵලස්සේතං අධිවචනං" යන අභිධෙයාර්ථය කියනලදි)

**ඒතං** මේ අරහත්ත යන නාමය තෙමේ **චතුත්ථඵලස්ස** සතරවැනි ඵලයට **නාමං** නමෙකි **තස්ස** ඒ අරිහත් ඵලයට **ආගමනභූතෝ** පැමිණීමට කාරණ වූ **මග්ගෝ** මාර්ග තෙමේ **අරහත්තමග්ගෝ** අරහත්තමග්ග නම් වේ ("අරහත්තස්ස ආගමනභූතෝ මග්ගෝ අරහත්තමග්ගෝ" යි මධ්‍ය පද ලෝප ෂෂ්ඨී තත්පුරුෂ සමාස කටයුතුයි) **තේන** ඒ අරහත් මාර්ගය හා **සම්පයුත්තං චිත්තං** එක්ව යෙදුනාවූ චිත්තය **අරහත්තමග්ගචිත්තං** අරහත්තමග්ගචිත්ත නම් වේ (මේ ලහුක න්‍යායයි) ("අරහත්තමග්ගේන සම්පයුත්තං චිත්තං අරහත්තමග්ගචිත්තං" යි මධ්‍ය පද ලෝප තෘතියා තත්පුරුෂ සමස කටයුතුයි) **[විභාවනී ටීකා සන්නය 121-126 පිටු]**

ඉදනි යථානුප්පත්තං ලෝකුත්තර චිත්තං දස්සෙන්තෝ **සෝතාපත්තිමග්ගචිත්තන්**තිආදිමාහ. තත්ථ සවති සන්දති අනිවත්තගමනවසේන පවත්තතීති සෝතෝ, ගඞ්ගාදීසු ජලප්පවාහෝ. සෝහි පභවතෝ පට්ඨාය යාවමහාසමුද්ද අන්තරා අනිවත්ත මානෝ සවති සන්දති පවත්තතීති. සෝතෝවියාති සෝතෝ. අට්ඨඞ්ගිකෝ අරියමග්ගෝ, යථාහ-යෝබෝ ආවුසෝ අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ. සෙය්‍යථීදං, සම්මාදිට්ඨි. පෙ. සම්මාසමාධි. අයං වුච්චතාවුසෝ සෝතෝති. අයංපිහි යද උප්පජ්ජති. තතෝ පට්ඨාය ආනුභාවඵරණවසේන යාවඅනුපාදිසේසනිබ්බානධාතුයා අන්තරා අනිවත්තමානෝයේව හුත්වා සවති සන්දති පවත්තතීති. යථාහ;

සෙය්‍යථාපි භික්ඛවේ යාකාචි මහානදියෝ. සෙය්‍යථීදං. ගඞ්ගා, යමුනා, අචිරවතී, සරභූ, මහී. සබ්බා තා සමුද්දනින්නා හොන්ති සමුද්දපොණා

සමුද්දපබ්භාරා. ඒවමේව ඛෝ භික්ඛවේ භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තෝ බහුලීකරොන්තෝ නිබ්බානනින්නෝ හෝති නිබ්බානපොණෝ නිබ්බාන පබ්භාරෝති.

එත්ථච තේන තේන මග්ගේන පහීනානං කිලේසානං පුන අනුපගමන වසේන සද්ධාදීනං ඉන්ද්‍රියානං අනුක්කමේන පරිපාකගමනවසේනච අනිවත්තගමනං දට්ඨබ්බං. යථාහ;

සෙය්‍යථාපි භික්ඛවේ ඝටෝ නික්කුජ්ජෝ වමතේව උදකං. නෝපච්චාවමති. ඒවමේවඛෝ භික්ඛවේ අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තෝ බහුලීකරොන්තෝ වමතේව පාපකේ අකුසලේ ධම්මේ. නෝපච්චාවමතීති. යථාචාහ; සෝතාපත්ති මග්ගඤාණේන යේ කිලේසා පහීනා, තේ කිලේසේ න පුනේති න පච්චේති න පච්චාගච්ඡතීතිආදි.

යථාච පුථුජ්ජනා පහීණේපි කිලේසේ පුන උපගච්ඡන්ති. තිහේතුකභූතාපි පුන ද්විහේතුකාහේතුකභාවං ගච්ඡන්ති. යතෝ තේ උපරිභවග්ගේ නිබ්බත්තාපි පුන අපායේසු සන්දිස්සන්ති. සීලවන්තාපි පුන දුස්සීලා හොන්ති. සමාහිතාපි පුන උම්මත්තකාවා ඛිත්තචිත්තාවා හොන්ති. පඤ්ඤවාපි පුන දුප්පඤ්ඤ ඒළමූගා හොන්ති. න තථා අරියා. තේපන තේන තේන මග්ගේන පහීනේ කිලේසේ පුන න උපගච්ඡන්ති. පුථුජ්ජනභාවං වා හෙට්ඨිමාරිය භාවං වා න ගච්ඡන්ති. අනුක්කමේන සද්ධාදීනං ඉන්ද්‍රියානං පරිපක්කභාවමේව උපගච්ඡන්තීති. සබ්බඤ්චේතං අරියමග්ගස්සේව ආනුභාවේන සිද්ධන්ති සෝතෝතිනාමං මූලප්පභවභූතේ තස්මිං මග්ගේඒව නිරුළ්හන්ති දට්ඨබ්බං. තස්ස සෝතස්ස ආදිතෝ පජ්ජනං පාපුණනං සෝතාපත්ති. සෝතාපත්තියා අධිගමමානෝ මග්ගෝ සෝතාපත්තිමග්ගෝ. අථවා, ධම්මසෝත සමාපන්නෝ අරියෝති පවුච්චතීති වුත්තත්තා සබ්බේ අරියසන්තානගතා ලෝකිය ලෝකුත්තරභූතා බෝධිපක්ඛියධම්මා උපරි සම්බෝධිපරා යනතාවසේන අනුපාදිසේසනිබ්බාන පරායනතාවසේනච අනිවත්ත ගතියා පවත්තමානා යථාවුත්තේන අත්ථෙන සෝතෝති වුච්චන්ති. තං සෝතං ආදිතෝ පජ්ජන්ති පාපුණන්ති ඒතාය පටිපදායාති සෝතාපත්ති. සෝතාපත්තිච සා මග්ගෝචාති සෝතාපත්තිමග්ගෝ, පඨමමග්ගසඞ්ඛාතාය සෝතාපත්තියා අඞ්ගන්ති සෝතාපත්ති යඞ්ගන්තිහි අට්ඨකථායං වුත්තං, මග්ගෝතිච පථෝ උපායෝ. නිබ්බානං මග්ගේති, නිබ්බානත්ථිකේහි මග්ගීයති, කිලේසේ මාරෙන්තෝ ගච්ඡතීති මග්ගෝතිච වදන්ති.

**විභාවනියං** පන අරියමග්ගසෝතස්ස ආදිතෝ පජ්ජනං ඒතස්සාති සෝතාපත්ති. පුග්ගලෝති වුත්තං. තං න සුන්දරං. න හි පුග්ගලේ පවත්තෝ සෝතාපත්තිසද්දෝ කත්ථචි දිට්ඨෝති.

ඒතේන තස්ස මග්ගෝ සෝතාපත්තිමග්ගෝති ඉදංපි පටික්ඛිත්තං හෝති. සෝතාපත්තිමග්ගේන සම්පයුත්තං චිත්තං සෝතාපත්තිමග්ගචිත්තං.

**ටීකාසු** පන සෝතාපත්තියා ලද්ධං මග්ගචිත්තං සෝතාපත්ති මග්ගචිත්තන්ති වුත්තං. තං න සුන්දරං. න හි චිත්තසද්දසම්බන්ධෝ සෝතාපත්තිසද්දෝ කත්ථචි පාළියං දිට්ඨෝති.

පටිසන්ධිවසේන සකිං ඉමංලෝකං ආගච්ඡති සීලේනාති **සකදගාමී**. දුතියඵලට්ඨෝ. සෝ හි අසමුච්ඡින්නකාම රාගානුසයත්තා කාමලෝකාගමන කිලේසසබ්භාවේන තං සභාවානාති වත්තනතෝ උපරි භවග්ගේ ඨිතෝපි පටිසන්ධිවසේන පුන ඉමං කාමධාතුං ආගමනප්පකතිකෝඒව හෝතීති. වුත්තඤ්හේතං චතුක්කනිපාතේ;

ඉධ සාරිපුත්ත ඒකච්චස්ස පුග්ගලස්ස ඕරම්භාගියානි සංයෝජනානි අප්පහීනානි හොන්ති, සෝ දිට්ඨේවධම්මේ නේවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සෝ අපරිහීනෝ කාලං කුරුමානෝ නේසඤ්ඤානාසඤ්ඤා-යතනුපගානං දේවානං සහබ්‍යතං උපපජ්ජති. සෝ තතෝ චුතෝ ආගාමී හෝති ආගන්ත්වා ඉත්ථත්තං. ඉධ පන සාරිපුත්ත ඒකච්චස්ස පුග්ගලස්ස ඕරම්භාගියානි සංයෝජනානි පහීනානි හොන්ති, සෝ දිට්ඨේව .පෙ. සෝ තතෝ චුතෝ අනාගාමී හෝති අනාගන්ත්වා ඉත්ථත්තන්ති.

අට්ඨකථායඤ්ච ඉත්ථත්තන්ති ඉමං කාමාවචර පඤ්චක්ඛන්ධ භාවන්ති වුත්තං. අයඤ්ච අත්ථෝ කිලේසගතිවසේන වුත්තෝ. න පුග්ගල ගතිවසේන. න හි බ්‍රහ්මභූතා සෝතාපන්න සකද ගාමිනෝ පටිපටිසන්ධිවසේන හෙට්ඨිමංපි බ්‍රහ්මලෝකං ආගච්ඡන්ති. කුතෝ කාම ලෝකං. කථං විඤ්ඤායතීති චේ. අනුසයයමකේ;

කාමධාතුයා චුතස්ස රූපධාතුං අරූපධාතුං උපපජ්ජන්තස්ස කස්සචි සත්තඅනුසයා අනුසෙන්ති, කස්සචි පඤ්චඅනුසයා අනුසෙන්ති, කස්සචි තයෝ අනුසයා අනුසෙන්තීති වත්වා රූප ධාතුයා අරූපධාතුයා චුතස්ස කාමධාතුං උපපජ්ජන්තස්ස සත්තේව අනුසයා අනුසෙන්තීති.

වුත්තත්තා විඤ්ඤායති. තත්ථ පුරිමවාක්‍යේ පුථුජ්ජනස්ස වසේන සත්ත. ද්වින්නං සෝතාපන්නසකදගාමීනං වසේන පඤ්ච. අනාගාමිස්ස වසේන තයෝති වුත්තං, පච්ඡිමවාක්‍යේපන බ්‍රහ්මභූතානං සෝතා පන්නසකදගාමිඅනාගාමීනං පටිසන්ධිවසේන කාමලෝකං ගමනස්ස නත්ථිතාය කේවලං පුථුජ්ජනස්සේව වසේන සත්තේවාති වුත්තං. ධම්මහදය විභඞ්ගට්ඨකථායඤ්ච;

"රූපාවචරේ නිබ්බත්තා සෝතාපන්නසකදගාමිනෝ නපුන ඉධා ගච්ඡන්ති, තත්ථේව පරිනිබ්බායන්ති. ඒතේහි ඣානඅනාගාමිනෝ නාමා"ති ච. "නවසු බ්‍රහ්මලෝකේසු නිබ්බත්තඅරිය සාවකානං තත්‍රූප පත්තිපි හෝති උපරූපපත්තිපි. න හෙට්ඨූ පපත්ති. පුථුජ්ජනානංපන තත්‍රූපපත්තිපි හෝති උපරූපපත්ති හෙට්ඨූපපත්තිපී"ති ච.

වුත්තං. තඤ්ච බෝ අනාගමනං මග්ගසභායේන ඣානානුභාවේනේව සිද්ධං. නමග්ගානුභාවේනාති. එත්ථච ඉමං ලෝකන්ති පදස්ස ඉමං මනුස්සලෝකන්ති වා ඉමං කාමාවචරලෝකන්තිවා ද්විධාපි අත්ථෝ අට්ඨකථාසු වුත්තෝ. තත්ථ පුරිමස්මිං අත්ථෙ සති ආගච්ඡතීති ඒතස්ස දේවලෝකතෝ ආගච්ඡතීති අත්ථෝ. පච්ඡිමස්මිං පන බ්‍රහ්මලෝකතෝපි ච ආගච්ඡතීති. පාළියංපන පච්ඡිමත්ථෝව වුත්තෝවිය දිස්සති. වුත්තඤ්හේතං පුග්ගලපඤ්ඤත්තියං අනාගන්ත්වා ඉත්ථත්තං අනාගාමී තේන දට්ඨබ්බෝ. ආගන්ත්වා ඉත්ථත්තං සෝතාපන්නසකදගාමිනෝ තේන දට්ඨබ්බාති. එත්ථච අනාගන්ත්වා ඉත්ථත්තන්ති ඉමිනා ඉමං කාමාවචරලෝකං න ආගච්ඡතීති අනාගාමීති අත්ථං දස්සේති. ආගන්ත්වා ඉත්ථත්තන්ති ඉමිනාපන ද්වේපි

සෝතාපන්නසකදාගාමිනෝ සකිං පුන ඉමං කාමාවචරලෝකං ආගච්ඡන්තීති සකදාගාමිනෝති අත්ථං දස්සේති. කස්මා, නිරන්තරවාක්‍යේසු ඨිතානං ද්වින්නං ඉත්ථත්ත සද්දානං නානාත්ථා සම්භවතෝ. මජ්ඣිමපණ්ණාසේච කණ්ණකත්ථ සුත්තේ;

යෝ සෝ මහාරාජ බ්‍රහ්මා සබ්‍යාපජ්ඣෝ, සෝ බ්‍රහ්මා ආගන්තා ඉත්ථත්තං. යෝසෝ බ්‍රහ්මා අබ්‍යාපජ්ඣෝ, සෝ බ්‍රහ්මා අනාගන්තා ඉත්ථත්තන්ති.

භගවතා වුත්තං. තත්ථ සබ්‍යාපජ්ඣෝති ඒතේන පුථුජ්ජනේන සහ සෝතාපන්නසකදාගාමිභූතා බ්‍රහ්මානෝ ගහිතා හොන්ති. තේහි පටිඝානුසයස්ස අප්පහීනත්තා චේතසිකදුක්ඛසඞ්ඛාතං බ්‍යාපජ්ඣංපි අපහීනමේවාති සබ්‍යාපජ්ඣා නාම. ආගන්තා ඉත්ථත්තන්ති ඉමං කාමලෝකං පටිසන්ධිවසේන පුන ආගමනසීලෝ ආගමනප්පකතිකෝති අත්ථෝ. තබ්බිපරීතේන පච්ඡිමස්ස වාක්‍යස්ස අත්ථෝ වේදිතබ්බෝ. තේසු පන ද්වීසු සකදාගාමීසු පුරිමස්ස අනඤ්ඤසාධාරණේනේව සබ්බපඨමං අරිය මග්ග සෝතාධි ගමන ගුණේන සෝතාපන්නෝ ත්වේව නාමං සිද්ධන්ති දට්ඨබ්බං. පුග්ගලගතිවසේන පනෙත්ථ බ්‍රහ්මලෝකේ ඨිතානං සත්තක්ඛත්තුපරමතාදිභාවෝවිය සකදාගාමිභාවෝපි නත්ථි. පඨමදුතියඵලට්ඨාපිහි තත්ථ අනාගාමිසඞ්ඛ්‍යමේව ගච්ඡන්ති. තස්මා සකදාගාමීති ඉදං කාමජාතිකානංඒව දුතියඵලට්ඨානං සිද්ධං නාමන්ති කත්වා තේසං කාමලෝකේ ඒව හෙට්ඨූපරූපපත්ති වසේන සකිං ආගමනං අට්ඨකථාසු වුත්තන්ති දට්ඨබ්බං. ඒවඤ්ච කත්වා පාළියංපි පඤ්චන්නං ඉධ නිට්ඨා සත්තක්ඛත්තුපරමස්ස කෝලංකෝලස්ස ඒකබීජිස්ස සකදාගාමිස්ස යෝච දිට්ඨේවධම්මේ අරහාති වුත්තන්ති. සෝපන ඡබ්බිධෝ හෝති. ඉධපත්වා ඉධපරිනිබ්බායී, තත්ථ පත්වා තත්ථ පරිනිබ්බායී, ඉධපත්වා තත්ථ පරිනිබ්බායී, තත්ථ පත්වා ඉධ පරිනිබ්බායී, ඉධපත්වා තත්ථනිබ්බත්තිත්වා ඉධ පරිනිබ්බායී. තත්ථපත්වා ඉධනිබ්බත්තිත්වා තත්ථපරිනිබ්බායීති. තත්ථ ඉධ පත්වා ඉධ පරිනිබ්බායීති ඉධ මනුස්සභවේ සකදාගාමිමග්ගං පත්වා ඉධමනුස්සභවේයේව අරහත්තමග්ගං ලභිත්වා පරිනිබ්බායනධම්මෝ. තත්ථ පත්වා තත්ථ පරිනිබ්බායීති තස්මිං දේවලෝකේ සකදාගාමිමග්ගං පත්වා තස්මිං දේවලෝකේයේව අරහත්තමග්ගං ලභිත්වා පරිනිබ්බායනධම්මෝ. නිබ්බත්තිත්වාති පටිසන්ධිග්ගහණවසේන උප්පජ්ජිත්වා. යේසං පන ඉමං ලෝකන්ති පදස්ස ඉමං මනුස්සලෝකන්ති අත්ථෝ. තේසං සෝ පඤ්චවිධෝයේව වුත්තෝ, න ඡට්ඨෝ පුග්ගලෝ.

**විභාවනියඤ්ච** "පඤ්චසු සකදාගාමීසු පඤ්චමකෝව ඉධාධිප්පේතෝ, සෝ හි ඉතෝ ගන්ත්වා පුන සකිං ඉධ ආගච්ඡතී"ති වුත්තං.

මහාපරිනිබ්බාන සුත්තට්ඨකථායං පන මහාවග්ග සංයුත්තට්ඨකථා යඤ්ච සෝපි ඡට්ඨෝ පුග්ගලෝ සකිං ආගමනට්ඨේන ආගතෝයේව. යස්මාච සබ්බඤ්ඤුබුද්ධාපි යාව උපරිමග්ගෝ නාගච්ඡති. තාව පඨමඵලට්ඨභූතා සත්තක්ඛත්තු පරමතායංවිය දුතියඵලට්ඨභූතා සකිං ආගමනප්පකතියං සණ්ඨිතායේව හොන්ති. තස්මා ඉධ කෝචි දුතියඵලට්ඨෝ සකිං ආගමනට්ඨේන නිප්පරියායේන සකදාගාමීනාම න නහෝතීති සබ්බෝපි සෝ ඡබ්බිධෝ පුග්ගලෝ ඉධ නිප්පරියායේන සකදාගාමියේවනාම හෝතීති දට්ඨබ්බෝ. සකදාගාමිස්ස මග්ගෝ සකදාගාමිමග්ගෝ. සෝ හි සයං ජනකභූතෝ සකදාගාමීනං ජනේතබ්බං ජනේතීති ඉධ

ජනේතබ්බ ජනකසම්බන්ධෙන විසේසන විසේසිතබ්බතා සදියාගතා ඒව හෝති. යථා තිස්සමාතා ඵුස්සමාතාති.

**විභාවනියං** පන සාඣදයාගතාඒව නහෝති. පයෝජනං පන කිඤ්චි අත්ථි. පයෝජනවසේන අවිරුද්ධා හෝතීති ඉමිනා අධිප්පායේනයං වුත්තං "කිඤ්චාපි මග්ගසමඞ්ගිනෝ තථාගමනාසම්භවතෝ ඵලට්ඨෝයේව සකදාගාමීනාම. තස්සපන කාරණභූතෝ පුරිමුප්පන්නෝ මග්ගෝ මග්ගන්තරාවච්ඡේදනත්ථං ඵලට්ඨේන විසේසෙත්වා වුච්චති සකදාගාමිමග්ගෝති. ඒවං අනාගාමිමග්ගෝ"ති. තං න යුජ්ජති. සකදාගාමිමග්ගේන සම්පයුත්තං චිත්තන්ති සමාසෝ.

ඕරම්භාගියසංයෝජනානං සබ්බසෝ සමුච්ඡින්නත්තා පටිසන්ධිවසේන පුන ඉමං කාමලෝකං න ආගච්ඡතීති **අනාගාමී**. ඒකන්තේන බ්‍රහ්මලෝකපරායනෝඒව හෝතීති අත්ථෝ. ඉදඤ්ච කේවලං ඉමස්ස මග්ගස්ස ආනුභාවවසේනේව වුත්තං. උපරිමග්ග විපස්සනාය පන ආගතාය සෝ තස්මිං ඨානේයේව අරහත්ත මග්ගපරායනෝපි හෝතියේව. අනාගාමිස්ස තතියඵලට්ඨස්සමග්ගෝ. තේන සම්පයුත්තං චිත්තන්ති විග්ගහෝ.

මහප්ඵලකාරිතාගුණයෝගේන පූජාවිසේසං අරහතීති **අරහා**. ඛීණාසවෝ චතුත්ථඵලට්ඨෝ. අරහතෝ භාවෝ අරහත්තං, චතුත්ථඵලං. තස්ස මග්ගෝ. තේන සම්පයුත්තචිත්තන්ති නිබ්බචනං. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 57-60 යටතේ)]**

චතුමග්ගප්පභේදේන, චතුධා කුසලං තථා.
පාකං තස්ස ඵලත්තාති, අට්ඨධානුත්තරං මතං.
**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 34 යටතේ); අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 20 පිට]**

**චතුමග්ගප්පභේදේනාති** ඉන්ද්‍රියානං අපාටවපාටවතරතමභේදේන භින්නසාමත්ථියතාය සක්කායදිට්ඨිවිචිකිච්ඡාසීලබ්බතපරාමාසානං නිරවසේසප්පහානං කාමරාගබ්‍යාපාදනං තනුභාවාපාදනං තේසමේව නිරවසේසප්පහානං රූපාරූපරාගමානුද්ධච්චාවිජ්ජානං අනවසේසප්පහානන්ති ඒවං සංයෝජනප්පහානවසේන චතුබ්බිධානං සෝතාපත්තිමග්ගාදීනං අට්ඨඞ්ගිකමග්ගානං සම්පයෝගභේදේන චතුමග්ගසඞ්ඛාතං ලෝකුත්තරකුසලං චතුධා හෝති, විපාකං පන **තස්සේව** කුසලස්ස **ඵලත්තා** තදනුරූපතෝ තථා චතුධාති ඒවං **අනුත්තරං** අත්තනෝ උත්තරිතරාභාවේන අනුත්තරසඞ්ඛාතං ලෝකුත්තරං චිත්තං අට්ඨධා මතන්ති යෝජනා.
**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 34 යටතේ; විභාවනී ටීකා සන්නය 80-82 පිටු]**

**චතුමග්ගප්පභේදේනාති** චතුමග්ගප්පභේදේන යනු **ඉන්ද්‍රියානං** ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන්ගේ **අපාටවපාටවතරමතභේදේන** අව්‍යාකතය ව්‍යාකතය විශේෂයෙන් ව්‍යාකතය අතිශය විශේෂයෙන් ව්‍යාකතය යන සතරාකාර ප්‍රභේදයෙන් (මේ විශේෂණය භින්න ශබ්දයෙහිම සබඳනු) **භින්නසාමත්ථියතාය** වෙනස් වූ ශක්ති ඇති බැවින් (චතුබ්බිධානං යන්නෙහි හේත්වාර්ථය සබඳනු) **සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාසානං** සක්කායදෘෂ්ටිය විචිකිත්සාය සීලව්‍රතපරාමර්ශය යන මොහුන් **අනවසේසප්පහාණං** ඉතිරි නොකට නැසීමය **කාමරාගව්‍යාපාදනං** කාමරාග ව්‍යාපාදයන්ගේ **තනුභාවාපදනං** තුනීබවට පැමිණවීමය **තේසමේව** ඒ කාමරාග ව්‍යාපාදයන්ගේම **අනවසේසප්පහාණං** ඉතිරි නොකට නැසීමය **රූපාරූපරාග-**

**මානුද්ධච්චාවිජ්ජානං** රූපරාග අරූපරාග මාන ඖද්ධත්‍ය අවිද්‍යාවන්ගේ **අනවසේසප්පහාණං** ඉතිරි නොකොට නැසීමය **ඉති (ඒවං)** මෙසේ **සංයෝජනප්පහාණවසේන** සංයෝජන ධර්මයන්ගේ ප්‍රහාණය කිරීම් වශයෙන් **චතුබ්බිධානං** සතර වැදෑරුම් වූ **සෝතාපත්තිමග්ගාදීනං** ශ්‍රෝතාපත්ති මාර්ගාදී වූ **අට්ඨඞ්ගිකමග්ගානං** ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයන්ගේ **සම්පයෝගභේදේන** එක්ව යෙදුනා වූ චිත්තයන්ගේ ප්‍රභේද වශයෙන් **චතුමග්ගසඞ්ඛාතං** සතර මාර්ගය හා යෙදීමයයි කියනලද (නොහොත් සතරාකාර මාර්ගයන්ගේ සමුදය වූ) **ලෝකුත්තරකුසලං** ලොව්තුරා කුසල් තෙමේ **චතුබ්බිධා හෝති** සතර වැදෑරුම් වේ.

**විපාකං පන** විපාක චිත්තය වනාහි **තස්සේව කුසලස්ස** ඒ කුසලයාගේම **ඵලත්තා** විපාක වූ හෙයින් (චතුධා හෝති යන්නෙහි සබඳනු) **තදනුරූපතෝ** ඒ කුසලයට සුදුසු පරිද්දෙන් **තථා** ඒ කුසලයට කී නයින්ම **චතුධා හෝති** සතර වැදෑරුම් වේ **ඒවං** මෙසේ **අත්තනෝ** තමාට වඩා **උත්තරිතරාභාවේන** අධික වූ ධර්මයක් නැති හෙයින් **අනුත්තරං (අනුත්තරසඞ්ඛාතං)** අනුත්තර යයි කියනලද **ලෝකුත්තරචිත්තං** ලෝකෝත්තර චිත්තය **අට්ඨධා** අෂ්ට ප්‍රකාරයයි **මතං** දන්නාලදි **ඉති (අයං)** මේ වනාහි **යෝජනා** අර්ථ යෝජනායි ("අත්තතෝ" කියා ද සමහර පොත්හි තිබේ. "අත්තනෝති නිස්සක්කත්ථේ සාමිවචනං, අත්තනෝති අත්තතෝ" යී මණිසාරමඤ්ජූසායෙහි කී හෙයින් "අත්තනෝ" යන පාඨය මණිසාරමඤ්ජූසාව හා ගැළපේ. "උත්තරිතරාභාවතෝ" යන පාඨයෙන් උත්තර ශබ්දයාගේ අධිකාර්ථය ඇති බව දක්වමින් "උත්තරදිසා" යනාදී අර්ථයන් වළක්වයි. "නත්ථි උත්තරං අධිකං ඒතස්සාති අනුත්තරං" යී විග්‍රහ කටයුතුයි) **[විභාවනී ටීකා සන්නය 128-129 පිට]**

සඞ්ගහගාථායං **චතුමග්ගප්පභේදේනාති** චතුක්ඛත්තුං පත්තබ්බත්තා චතුබ්බිධානං අට්ඨඞ්ගිකමග්ගානං පභේදේන. කස්මාපන තේ චතුක්ඛත්තුං පත්තබ්බාති. වුච්චතේ. සෝතාපත්තිමග්ගේ තාව සද්ධාදීනි ඉන්ද්‍රියානි මුදූනි හොන්ති, තස්මා සෝ දිට්ඨිවිචිකිච්ඡාඒව සමුච්ඡින්දිතුං සක්කෝති. අඤ්ඤේ පන කාමරාගබ්‍යාපාදේපි තනුභූතේපි කාතුං න සක්කෝති. දුතියමග්ගේ තානි ථෝකං පටූනි හොන්ති. තස්මා සෝ කාමරාගබ්‍යාපාදේ තනුභූතේ කාතුං සක්කෝති. සමුච්ඡින්දිතුං පන න සක්කෝතියේව. තතියමග්ගේ තානි පටුතරානි හොන්ති. තස්මා සෝ කාමරාගබ්‍යාපාදේ සමුච්ඡින්දිතුං සක්කෝති. රූපාරූපරාගමානුද්ධච්චාවිජ්ජායෝපන සමුච්ඡින්දිතුං න සක්කෝතියේව. චතුත්ථ මග්ගේ පන තානි ඉන්ද්‍රියානි පටුතමානි හොන්ති. තස්මා සෝ තාව අඤ්ඤේව සබ්බේපි පාපධම්මේ සමුච්ඡින්දිතුං සක්කෝති. ඒවං චතුක්ඛත්තුං පවත්තමානාඒව පරිනිට්ඨිතකිච්චත්තා තේ මග්ගා චතුක්ඛත්තුං පත්තබ්බා හොන්තීති. කුසලං චිත්තං චතුමග්ගප්පභේදේන චතුධා මතං. පාකංපි තස්ස චතුබ්බිධස්ස කුසලස්ස ඵලත්තා තථා චතුධාමතං. ඉති අනුත්තරං චිත්තං අට්ඨධා මතන්ති යෝජනා. නත්ථි අත්තනෝ උත්තරං අධිකං ඒතස්සාති **අනුත්තරං**. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 62 යටතේ)]**

සෝතාපත්තිමග්ගචිත්තං - පඨමානුත්තරං තථා
සකදාගාමනාගාමී - අරහත්තන්ති සබ්බථා

චතුධා මග්ගභේදේන - ඣානභේදේන පඤ්චධා
වීසතාපරියාන්න - කුසලං ද්වයමිස්සිතං

**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 18-19 යටතේ)]**

**සෝතාපත්තිමග්ගචිත්තං** ශ්‍රෝතාපත්ති මාර්ග චිත්තය තෙම **පඨමං** ප්‍රථම වූ **අනුත්තරං** ලෝකෝත්තර සිත නම් වේ **තථා** එසේම **සකදාගාමී** සකෘදාගාමී මාර්ග චිත්තය තෙම (**දුතියං** දෙවෙනි වූ) **අනුත්තරං** ලෝකෝත්තර සිත නම් වේ **අනාගාමී** අනාගාමී මාර්ග චිත්තය තෙමේ (**තතියං** තුන්වෙනි වූ) **අනුත්තරං** ලෝකෝත්තර සිත නම් වේ **අරහත්තං** අර්හත් මාර්ග චිත්තය තෙම (**චතුත්ථං** සතරවෙනි වූ) **අනුත්තරං** ලෝකෝත්තර සිත නම් වේ **ඉති** මෙසේ **අපරියාපන්නකුසලං** භවත්‍රයෙහි ඇතුළත් නොවූ ලෝකෝත්තර කුශලය තෙම **සබ්බථා (සබ්බේන)** සියළු **මග්ගභේදේන** අෂ්ටාඞ්ගික මාර්ගයාගේ සම්ප්‍රයෝග භේද වශයෙන් **චතුධා (චතුබ්බිධං)** සතර ප්‍රකාරයෙක් ඇත්තේ (**හෝති** වේ) **ඣානභේදේන** පඤ්චවිධ චතුර්විධාදී ධ්‍යානාඞ්ගයන් හා යෙදුනු සම්ප්‍රයෝග භේද වශයෙන් **පඤ්චධා (පඤ්චවිධං)** පඤ්චාඞ්ගික චතුරඞ්ගිකාදී වශයෙන් පඤ්චප්‍රකාර භේද ඇත්තේ (**හෝති** වේ) **ද්වයමිස්සිතං** මාර්ග, ධ්‍යාන ද්වය මිශ්‍රවූ **අපරියාපන්නකුසලං** ලෝකෝත්තර කුශලය තෙම නොහොත් **ද්වයමිස්සිතං** මාර්ග, ධ්‍යාන ද්වය චතුර්විධ පඤ්චවිධ යයි වෙන් නොකොට එක්ව මිශ්‍රකරන ලද්දවූ **අපරියාපන්නකුසලං** ලෝකෝත්තර කුශලය තෙම **වීසති** විංශති භේද ඇත්තේ (**හෝති** වේ)

("කුසලද්වයමිස්සිතං" කියා ද වේ) කුසලද්වයමිස්සිතං ලෞකික ලෝකෝත්තර කුශල ද්වය මිශ්‍රකරන ලද්දාහු (කත්වා කොට) ඣානභේදේන ධ්‍යාන භේදයෙන් වීසති විස්සෙක් (හෝති වෙයි) කියා ද පුරාණටීකායි. මේ පාළිය ඇසුරුකොට අභිනව ටීකායෙහි "අභිඤ්ඤාද්වයකුසලමිස්සකවසේන" යනාදීන් චිත්තයන්ගේ වැඩීම කියන තන්හි මෙනෙහි කටයුත්තේය. මෙහි ප්‍රථම ගාථාවෙහි "සකදාගාමීමග්ගචිත්තං අනාගාමීමග්ගචිත්තං අරහත්තමග්ගචිත්තං" යී කියයුතු තන්හි ගාථාවූ හෙයින් "මග්ගචිත්තං" යන පශ්චිම පදය ලොප් කොට "සකදාගාමී" කියාම කීයේ යයිද "සෝතාපත්තිමග්ගචිත්තං" යන මෙහි "මග්ගචිත්තං" යන්න තථා ශබ්දයෙන් සම්බන්ධ කොට අධිකාර වශයෙන් දැනගතහැකි හෙයින් නොකීයේ යැයි ද සැලකිය යුතු. "නිබ්බානං ආරම්මණකරනවසේන සවතීති සෝතෝ" නිර්වචනයි. අයඃී මාර්ග තෙම ලැබෙයි. ශ්‍රෝත සබ්දදිය මහා සමුද්‍රය මුඛ්‍ය වශයෙන් කීයේය. සියළු නදීහු මහා සමුද්‍රයටම ප්‍රවේශ වීම සමවන හෙයින් සදෘශෝපචාර වශයෙන් ආර්‍යඃී මාර්ග තෙම ශ්‍රෝත නැමැයි දතයුතුයි. "සෝතස්ස ආපත්ති ආදිතෝපජ්ජනං සෝතාපත්ති" "සෝතාපත්ති" යන මෙහි ආ-ශබ්දය තෙම ආදී කර්මයෙහි පවත්නා හෙයින් "ආදිතෝපජ්ජනං" යන අර්ථය වේ යයි දතයුත්තේය. "නිබ්බානං මග්ගති නිබ්බානත්ථිකේහි මග්ගීයති කිලේසේ මාරෙන්තෝ ගච්ඡතීති වා මග්ගෝ, තේන සම්පයුත්තං මග්ගචිත්තං, සෝතාපත්තියා වා ලද්ධං මග්ගචිත්තං සෝතාපත්තිමග්ගචිත්තං, වා අරියමග්ගසෝතස්ස ආදිතෝපජ්ජනං ඒතස්සාති සෝතාපත්ති" පුද්ගල තෙම ලැබේ. "තස්ස මග්ගෝ" යනාදිය කටයුතු. "සකිං ඒකවාරං පටිසන්ධිවසේන ඉමං මනුස්සලෝකං ආගච්ඡතීති සකදාගාමී, පටිසන්ධිවසේන ඉමං කාමධාතුං න ආගච්ඡතීති අනාගාමී"

**[පරමත්ථවිභාවනි ව්‍යාඛ්‍යාව 12-14 පිටු]**

ලෝකෝත්තර කුසලය සතරාකාර වූ සෝතාපත්ති මාර්ගාදී වූ අෂ්ටාඞ්ගික මාර්ගයන් හා යෙදීම් වශයෙන් සතරාකාරයකින් බෙද ප්‍රකාශ කිරීම් පිණිස සෝතාපත්ති මග්ගචිත්තං යනාදිය කීහ. **ආරම්මණභූතේ නිබ්බානේ සවති ආරම්මණ කාරණවසේන උපගච්ඡති පවත්තතීති සෝතෝ** යන්නෙන් විග්‍රහකරණු. අඞ්ග අටක් ඇත්තාවූ මාර්ගය ලැබේ. **යෝ** අඞ්ග අටක් ඇත්තා වූ මාර්ගයක් තෙමේ **ආරම්මණභූතේ** අරමුණු වන්නා වූ **නිබ්බානේ** නිර්වාණයෙහි **ආරම්මණ කාරණවසේන**

අරමුණු කිරීම් වශයෙන් **සවති ගච්ඡති පවත්තතීති** හටගන්නේ වේද **ඉති (තස්මා)** එසේහෙයින් **සෝ** ඒ ධර්ම තෙමේ **සෝතෝ** සෝත නම් වේ. අඞ්ග අටක් ඇත්තා වූ මාර්ගය ලැබේ.

සු-ධාතුවෙන් පරව ත-ප්‍රත්‍යයව පවත්තනාර්ථ වාචක වේ. **ආ-පඨමං පජ්ජනං ආපත්ති** යනුවෙන් විග්‍රහ කරණු. ආ-යන උපසර්ග පදයාගේ පළමු කොට හටගැනීම් සඞ්ඛ්‍යාත අර්ථය, කෘත්‍යාර්ථය, භූෂාර්ථය, අභිමුඛාර්ථය යන මෙතෙක් අර්ථයෙහි වේ. මේ ස්ථානයෙහි වනාහි පළමු කොට යන අර්ථයෙහි වැටේ. **නිබ්බානං මග්ගේති ගවේසතීති මග්ගෝ** යනුවෙන් විග්‍රහ කරණු. **යෝ** යම් ස්වභාව ධර්මයක් තෙමේ **නිබ්බානං** නිර්වාණය **මග්ගේති ගවේසති** සොයන්නේ වේද **ඉති (තස්මා**) එසේහෙයින් **සෝ** ඒ ස්වභාව ධර්ම තෙමේ **මග්ගෝ** මග්ග නම් වේ. මෙසේ අර්ථ යෝජනා කරණු.

**නිබ්බානත්ථිකේහි මග්ගීයතීති මග්ගෝ** යනුවෙන් විකල්ප විග්‍රහය කරණු. මග්ග-ධාතු තොමෝ ගවේසනාර්ථ වාචක වේ. **යෝ** යම් ස්වභාව ධර්මයක් තෙමේ **නිබ්බානත්ථිකේහි** නිවන් කැමති පුද්ගලයන් විසින් **මග්ගීයති** සොයනු ලැබේ ද **ඉති (තස්මා)** එසේහෙයින් **සෝ** ඒ ස්වභාව ධර්ම තෙමේ **මග්ගෝ** මග්ග නම් වේ. මෙසේ අර්ථ යෝජනා කරණු. **කිලේසේ මාරෙන්තෝ ගච්ඡතීති මග්ගෝ** යනුවෙන් ද විකල්ප විග්‍රහය කරණු. මාරෙන්ත ශබ්දය උප පද කොට ඇත්තා වූ ගමු-ධාතුවෙන් පරව ඞ-ප්‍රත්‍යය වූ තැනි. **කිලේසේ** කෙලෙසුන් **මාරෙන්තෝ** මරමින් **ගච්ඡති** යන්නේ වේද **ඉති (තස්මා)** එසෙහෙයින් **මග්ගෝ** මග්ග නම් වේ. එසේ අර්ථ යෝජනා කරණු.

මාරෙන්තගෝයයි කිය යුත්තේ නමුදු නිරුත්ති න්‍යාය වශයෙන් මග්ගෝ යනුවෙන් කීයේයි. නොහොත් **කිලේසේ මාරේතීති මෝ නිබ්බානං ගච්ඡතීති ගෝ මෝච සෝ ගෝචාති මග්ගෝ** යනුවෙන් විග්‍රහ කරණු. **මග්ගේන සම්පයුත්තං චිත්තං මග්ගචිත්තං** යනුවෙන් විග්‍රහ කරණු. මධ්‍යය පද ලෝප සමාසයයි. **සෝතාපත්තියා ලද්ධං මග්ගචිත්තං සෝතාපත්ති මග්ගචිත්තං** යනුවෙන් පදයන් සම්බන්ධ කොට විග්‍රහ කරණු. **සෝතාපත්තියා** නිවන් අරමුණු කිරීම් වශයෙන් සමීප වූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයට පළමු කොට පැමිණීමෙන් **ලද්ධං** ලබන ලද්ද වූ **මග්ගචිත්තං** මාර්ගය හා යෙදුනා වූ චිත්තයෙක්නුයි **සෝතාපත්ති මග්ගචිත්තං** සෝතාපත්ති මග්ගචිත්ත නම් වේ. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයට පළමු කොට පැමිණීමෙන් ලැබිය යුතු වූ මාර්ගය හා යෙදුනා වූ චිත්තයයි. මෙසේ අර්ථ යෝජනා කරණු. සෝතාපත්ති මාර්ග චිත්තය ලැබේ.

**සකිං ඒකවාරං පටිසන්ධි වසේන ඉමං මනුස්සලෝකං ආගච්ඡතීති සකදගාමී** යනුවෙන් විග්‍රහ කරණු. සකිං ශබ්ද උප පද කොට ඇත්තා වූ ආ-පූර්ව ගමු-ධාතුවෙන් පරව නී-ප්‍රත්‍යය වූ තැනී. **යෝ පුග්ගලෝ** යම් පුද්ගලයෙක් තෙමේ **සකිං ඒකවාරං** එක් වරක් **පටිසන්ධිවසේන** ප්‍රතිසන්ධිහුගේ වශයෙන් **ඉමං මනුස්සලෝකං** මේ මනුෂ්‍ය ලෝකයට **ආගච්ඡති** එන්නේ වේද **ඉති (තස්මා)** එසේහෙයින් **සෝ** ඒ පුද්ගල තෙමේ **සකදගාමී** සකදගාමී නම් වේ. පුදගලයා ලැබේ. **තේන සකදගාමිනා පුග්ගලේන පටිලද්ධෝ මග්ගෝ සකදගාමී මග්ගෝ** යනුවෙන් විග්‍රහ කරණු. **තේන සකදගාමිනා පුග්ගලේන** ප්‍රතිසන්ධි වශයෙන් මේ මනුෂ්‍ය ලෝකයට එක් වරක් එන්නා වූ පුද්ගලයා විසින් **පටිලද්ධෝ මග්ගෝ** ලබන ලද මාර්ගයෙක්නුයි **සකදගාමී මග්ගෝ** සකදගාමී මග්ග නම් වේ. මේ වනාහි අර්ථයි. මාර්ගය ලැබේ. මාර්ගයෙන් සම්පූර්ණ වූ පුදග්ලයාගේ එසේ ප්‍රතිසන්ධි වශයෙන් මේ මනුෂ්‍ය භූමියට එක් වරක්ම නොඑන්නේ

නමුදු ඵලයාගේ පූර්ව භාගයෙහි ලබන ලද්ද වූ දෙවැනි මාර්ගය, ප්‍රථම මාර්ගය, තෘතීය මාර්ගය, චතුර්ථ මාර්ගය යැයි කියන ලද්ද වූ මාර්ගයෙන් අන්‍ය වූ විශේෂය පළකරණු කැමතිව ඵලස්ථ පුද්ගලයාගෙන් වෙනස් කරණු කැමතිව සකදගාමී මාර්ගය යැයි කියන ලද්දේයි. ඒ පරිද්දෙන් අනාගාමී මාර්ගය ද කියන ලද්දේයි. **සකදගාමී මග්ගේන සම්පයුත්තං චිත්තං සකදගාමී මග්ගචිත්තං** යනුවෙන් එක් කොට විග්‍රහ කරණු. **සකදගාමී මග්ගේන** පටිසන්ධි වශයෙන් මේ මනුෂ්‍ය භූමියට එක් වරක්ම එන්නා වූ පුද්ගලයාගේ මාර්ගය හා **සම්පයුත්තං චිත්තං** සම්ප්‍රයෝග වූ චිත්තයෙක් නුයි **සකදගාමී මග්ගචිත්තං** සකදගාමී මග්ග චිත්ත නම් වේ. චිත්තය ලැබේ.

**පටිසන්ධිවසේන ඉමං කාමධාතුං න ආගච්ඡතීති අනාගාමී** යනුවෙන් විග්‍රහ කරණු. පුද්ගලයා ලැබේ. න-කාරයට පූර්ව වූ ආ-කාරය පෙරටුකොට ඇත්තා වූ ගමු-ධාතුවෙන් පරව ණී-ප්‍රත්‍යය පූර්ව න-කාරයට අන-යනාදේශ කරණු. **යෝ** යම් පුද්ගලයෙක් තෙමේ **පටිසන්ධිවසේන** ප්‍රතිසන්ධිහුගේ වශයෙන් **ඉමං කාමධාතුං** මේ කාම ධාතුවට **න ආගච්ඡති** නොපැමිණෙන්නේ වේද **ඉති (තස්මා)** එසේහෙයින් **සෝ** ඒ පුද්ගල තෙමේ **අනාගාමී** අනාගාමි නම් වේ. මේ ආදී ක්‍රමයෙන් විග්‍රහ කරණු. මේ අනාගාමී පුද්ගල තෙමේ ප්‍රතිසන්ධිහුගේ වශයෙන් කාමභූමියට ඒමක් නැත්තේයි.

**අග්ගදක්ඛිණෙය්‍ය භාවේන පූජාවිසේසං අරහතීති අරහං** යනුවෙන් විග්‍රහ කරණු. අරහ-ධාතුවෙන් පරව අ-ප්‍රත්‍යය වූ තැනී. **යෝ** යම් පුද්ගලයෙක් තෙමේ **අග්ගදක්ඛිණෙය්‍ය භාවේන** උතුම් වූ දක්ෂිණාව පිළිගැන්මට සුදුසු බැවින් **පූජාවිසේසං** මහානුභාව සම්පන්න දෙව් මින්සුන් විසින් කරන ලද්ද වූ පූජා විශේෂයට **අරහති** පිළිගැනීමට සුදුසු වේද **ඉති (තස්මා)** එසේහෙයින් **සෝ** ඒ පුද්ගල තෙමේ **අරහං** අරහ නම් වේ. නොහොත් **කිලේසසඞ්ඛාතා අරයෝ සංසාරචක්කස්ස වා අරා කිලේසා හතා අනේනාති අරහං** යනුවෙන් විග්‍රහ කරණු. **අනේන** මේ පුද්ගලයා විසින් **කිලේසසඞ්ඛතා** කිලේසයෝ යැයි කියන ලද්ද වූ සතුරන් **හතා** නසන ලද්දහුද **ඉති (තස්මා)** එසේහෙයින් **සෝ** ඒ පුද්ගල තෙමේ **අරහං** අරහං නම් වේ. වා නොහොත් **අනේන** මේ පුද්ගලයා විසින් **සංසාරචක්කස්ස** සක ආයතන ධාතූන්ගේ පටිපාටිය නොසිඳීම යැයි කියන ලද්ද වූ සංසාර චක්‍රයාගේ **අරා** දැව් සඞ්ඛ්‍යාත වූ **කිලේසෝ** ක්ලේශයෝ **හතා** නසන ලද්දහු වෙත් ද **ඉති (තස්මා)** එසේහෙයින් **සෝ** ඒ පුද්ගල තෙමේ **අරහං** අරහ නම් වේ. අෂ්ටාර්ය පුද්ගලයා ලැබේ. **තස්සභාවෝ අරහන්තං** යනුවෙන් විග්‍රහ කරණු. චතුර්ථ ඵලය ලැබේ. **තස්ස** ඒ මහානුභාව සම්පන්න වූ දෙව් මිනිසුන් විසින් පවත්වන ලද්ද වූ පූජා විශේෂය පිළිගැණීමට සුදුසු වූ මහරහත් පුද්ගලයාගේ **භාවෝ** ස්වභාව වශයෙක්නුයි **අරහත්තං** අරහත්ත නම් වේ. දෙව් මිනිසුන් විසින් කටයුතු වූ පූජා විශේෂය පිළිගැණීමට සුදුසු වූ මහරහත් පුද්ගලයාගේ ස්වභාවයයි. **තස්ස ආගමනභූතෝ මග්ගෝ අරහත්තමග්ගෝ** යනුවෙන් විග්‍රහ කරණු. **තස්ස** ඒ මහානුභාවසම්පන්න දෙව් මිනිසුන් විසින් කටයුතු වූ පූජා විශේෂය පිළිගැනීමට සුදුසු වූ රහත් පුද්ගලයාගේ ස්වභාව සඞ්ඛ්‍යාත වූ අරහත් ඵලයාගේ **ආගමනභූතෝ** හේතුභූත වූ **මග්ගෝ** මාර්ගයෙක්නුයි **අරහත්තමග්ගෝ** අරහත්ත මග්ග නම් වේ. **තේන සම්පයුත්තං චිත්තං අරහත්තමග්ගචිත්තං** යනුවෙන් විග්‍රහ කරණු.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 36-38 පිටු]**

ආර්ය අෂටාඞ්ගික මාර්ගය සෝත නම්. නිර්වාණ නැමති මහා සමුද්‍රයට පමුණුවන බැවින් ආර්ය මාර්ගය මේ නම ලබයි. සෝතාත්ති නම්. ආර්ය මාර්ගයට හාපුරා කියා පැමිණීමය. **සෝතෝති වුච්චති අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ, තස්ස**

**ආපත්ති ආදිතෝ පජ්ජනං පාපුණනං පඨමසමන්නාගමෝ සෝතාපත්ති**. යනු ඒ වග කියයි. ඒ ආර්ය මාර්ගයට පැමිණීමෙන් ලැබෙන මාර්ග චිත්තය සෝතාපත්ති මග්ගචිත්ත නම් වේ. ඒ වග මේ:- **සෝතාපත්තියා ලද්ධං මග්ගචිත්තං සෝතාපත්ති මග්ගචිත්තං** යනු සෝතාපත්ති යන්නෙන් මෙපමණක් නොව ආර්ය මාර්ගයට මුලින්ම පැමිණි තැනැත්තේ ද ගැණේ. එවිට ඔහු පිළිබඳ මාර්ගය සෝතාපත්ති මග්ග නම්. ඒ ස්‍රෝතාපත්ති මාර්ගය හා එක්ව යෙදුනු චිත්තය ස්‍රෝතාපත්ති මාර්ගයයි. මේ ඒ කියූ සැටි:- **අරියමග්ගසෝතස්ස ආදිතෝ පජ්ජනං එතිස්සාති සෝතාපත්ති, පුග්ගලෝ, තස්ස මග්ගෝ, සෝතාපත්තිමග්ගෝ, තේන සම්පයුත්තං චිත්තං සෝතාපත්ති මග්ගචිත්තං** යනු.

පිළිසිඳ ගැණීම් විසින් මිනිස් ලොවට එක් වරක් එන්නේ සකදගාමී නම්. ඔහුගේ මාර්ගය හා එක්ව යෙදුනු සිත සකදගාමී මග්ගචිත්තයයි. මේ ඒ කියූ සැටි:- **සකිං එකවාරං පටිසන්ධිවසේන ඉමං මනුස්සලෝකං ආගච්ඡතීති සකදගාමී**, **තස්ස මග්ගෝ සකදගාමී මග්ගෝ, සකදගාමී මග්ගේන සම්පයුත්තං චිත්තං සකදගාමී මග්ගචිත්තං** යනුයි.

පිළිසිඳ ගැනීමට නැවත මේ කාම ලෝකයට නොඑන්නේ අනාගාමී නම්. ඔහුගේ මාර්ගය හා එක්ව යෙදුනු සිත අනාගාමී මග්ගචිත්ත නම් වේ. **පටිසන්ධිවසේන ඉමං කාමධාතුං න ආගච්ඡතීති අනාගාමී, තස්ස මග්ගෝ අනාගාමී මග්ගෝ, තේන සම්පයුත්තං චිත්තං අනාගාමීමග්ගචිත්තං** යනු ඒ බව කීයේය.

අර්හත් ඵලය අරහත්ත නම්. ඒ අර්හත් ඵලයට පැමිණීමට කරුණු වූ මාර්ගය අර්හත්ත මග්ග නම් වේ. ඒ අර්හත් මාර්ගය හා එක්ව යෙදුනු සිත අර්හත්ත මග්ග චිත්තයයි. **අරහතෝ භාවෝ අරහත්තං චතුත්ථඵලස්සේතං අධිවචනං තස්ස ආගමන මග්ගභූතෝ මග්ගෝ අරහත්තමග්ගෝ, තේන සම්පයුත්තං චිත්තං අරහත්තමග්ග චිත්තං** යනු ඒ බව කීයේය.
**[සද්ධර්මසාගරය 02/451-452 පිටු; අභිධර්ම චන්ද්‍රිකාව 45-47 පිටු; අභිධර්ම ප්‍රවේශනය 35-36 පිටු; අභිධර්ම විභාගය 62-65 පිටු; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 26-28 පිටු]**

"උපාදානක්ඛන්ධසඞ්ඛාතලෝකතෝ උත්තරති අනාසවභාවේනාතික්කමතීති ලෝකුත්තරං" මග්ගචිත්තං; ඵල චිත්තය වනාහි "ලෝකතෝ උත්තිණ්ණන්ති ලෝකුත්තරං" යනු වේ. නොහොත් නිර්වාණය හා සමඟ මාර්ග-ඵල චිත්තය "ලෝකතෝ උත්තරං අධිකං යථාවුත්තගුණවසේනේති ලෝකුත්තරං" යී වාක්‍ය ගතයුතුයි. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 07 පිට]**

ලෝකෝත්තර කුසල් සිත වනාහි අවස්ථා භේදයෙන් සතරක් වෙයි. ඒ අවස්ථා කෙලෙස් විනාශකරමින් නිර්වාණය දක්නා අවස්ථාවයි. ලෝකෝත්තර කුසල්සිත් උපදිනුයේ එක් වරකි. නැවත ඒ කුසල් නූපදී. මක්නිසාද? ඒ සමඟම විපාකසිත උපදින හෙයිනි. අකාලික යන දහම්ගුණය මෙහිලා සිහිපත් කලයුතු. තවද හේතුවකි. එක් කුසල්සිතකින් විනාශකළ කෙලෙස් නැවත නූපදින හෙයිනි. ඉතිරි කෙලෙස් මුල් කුසල්සිතට විනාශ කිරීමට නොහැකිය. ඒවා විනාශ කරනුයේ ඊලග ඊලග කුසල්සිත් වලිනි. එහෙයින් එක්වරක් පමණක් උපදී. බොහෝ කාලයක සිට පල් වෙමින් පැවත ගෙන එන කෙලෙස් සමූහය එක්වරකින්ම විනාශ කිරීමට නොහැකිය. එහෙයින් අවස්ථා සතරක් විය. කෙලෙස් බලවේගය අවස්ථා සතරකින් අවසන්වෙයි. පහක් හෝ ඊට වැඩිය හෝ නොමැත. මෙයද "ස්වක්ඛාත" ගුණයයි.

එහි පළමුවැනි අවස්ථාව සෝවාන් මාර්ග නම්. "සෝතාපත්ති" යනු පාලි වචනයයි. මෙහි "සෝත" යනු සැඩ වතුර පහරට නමකි. මෙහි ද එය යෙදුණේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයටයි. සැඩ වතුර පහරට යමක් අසුවුවහොත් එය නවතිනුයේ මහා සමුද්‍රයෙහිය. එසේම යමෙක් සම්පූර්ණ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට අසුවුවහොත් (පත්වුවහොත්) හේ නවතිනුයේ නිර්වාණයෙහිමය. එහෙයින් සැඩ වතුර පහරට බඳු නිසා ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට "සෝත" යන්න යෙදිණ. "ආපත්ති" යනු පැමිණීමයි. මේ වචනදෙක එක්වූ විට සෝතාපත්තියි. අදහස; ප්‍රථම වරට ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට පැමිණීම යනුයි.

සෝවාන් මාර්ගය ඉපදෙනුයේ සක්කායදිට්ඨිය-විචිකිච්ඡා-සීලබ්බත පරාමාස යන සසර බැඳතබන සංයෝජන ධර්ම විනාශ කරමිනි. මාර්ග සිත සමඟ නිර්වාණයද දකියි. කෙලෙස් ඉතිරිව ඇති නිසා ඒ දැකීම පැහැදිලි නැත. එහෙත් ස්ථිරය. ලෞකික කුසල්සිත් මෙන් නොපිරිහෙයි.

දෙවැනි අවස්ථාව "සකදාගාමී"නම්. මෙහි අදහස; වරක් හැරී ඒනුයේ යනුයි. සකිං ආගාමි සකදාගාමි. මෙහිදී නැවත වරක් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට පැමිණීම සිදුවේ. එවිට කාමරාග-පටිඝ දෙක්හි තද ගතිය ප්‍රහීණ වේ. දෙවැනි වරටත් නිර්වාණය අරමුණු වේ. පෙරට වඩා පැහැදිලිව පෙනෙයි. ඊලගට තුන්වැනි අවස්ථාව අනාගාමී මාර්ගයයි. අනාගාමි යන්නෙහි අදහස; උප්පත්ති වශයෙන් කාමලෝකයට නැවත නො එයි යනුයි. න ආගාමි අනාගාමි. ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට තුන්වැනි වරටත් පැමිණේ. එවිට කාමරාග-පටිඝ දෙක සම්පූර්ණයෙන්ම ප්‍රහීණ වී වඩාත් පැහැදිලි ලෙස නිර්වාණය දකියි. සිව්වැනි අවස්ථාව අර්හත් මාර්ගයයි. අර්හත් යනු සුදුසුය යන තේරුමයි. කුමකටද? පරලොව සුව ගෙන දීමටය. දක්ෂිණෙය්‍ය නාමයද මේ සඳහා යෙදේ. තවද තේරුමකි; කෙලෙසුන් කෙරෙන් දුරුවූ බැවින්ද අර්හත්ය. සිව්වැනි වරටත් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට පැමිණීම සිදු වේ. එවිට රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජා යන සංයෝජන ධර්ම පහම සහමුලින්ම විනාශ වේ. මධ්‍යාහනයෙහි සූර්‍ය්‍ය රශ්මියෙන් යමක් මනාසේ පෙනෙන්නාක් මෙන් නිර්වාණය ඉතාමත් පැහැදිලි ලෙස දකියි. නැවත උප්පත්තියද අවශානය.

**[තෙසැත්තෑ ඤාණ කථා 381-383 පිටු]**

## මාර්ග සිත් නය ක්‍රමවලට බෙදෙන ආකාරයඃ—

**පි**-සද්දේන එකේකස්ස මග්ගස්ස නයසහස්සවසේන චතුන්නං චතුසහස්සභේදං **සච්චවිභඞ්ගේ** (විභ. 206; විභ. අට්ඨ. 206-214) ආගතං සට්ඨිසහස්සභේදං නයං හෙට්ඨා වුත්තනයේන අනේකවිධත්තම්පි සඞ්ගණ්හාති. තත්ථායං නයසහස්සමත්තපරිදීපනා, කථං? සෝතාපත්තිමග්ගෝ තාව ඣානනාමේන පටිපදාභේදං අනාමසිත්වා කේවලං සුඤ්ඤතෝ අප්පණිහිතෝති ද්විධා විභත්තෝ, පුන පටිපදාචතුක්කේන යෝජේත්වා පච්චේකං චතුධා විභත්තෝති ඒවං ඣානනාමේන දසධා විභත්තෝ. තථා මග්ග-සතිපට්ඨාන-සම්මප්පධාන-ඉද්ධිපාද-ඉන්ද්‍රිය-බල-බොජ්ඣඞ්ග-සච්ච-සමථ-ධම්ම-ඛන්ධ-ආයතන-ධාතු-ආහාර-ඵස්ස-වේදනා-සඤ්ඤා-චේතනා-චිත්තනාමේහිපි පච්චේකං දසදසාකාරේහි විභත්තෝ තථා තථා බුජ්ඣනකානං පුග්ගලානං වසේන. තස්මා ඣානවසේන දසමග්ගාදීනං ඒකූනවීසතියා වසේන දස දසාති වීසතියා ඨානේසු ද්වේ නයසතානි හොන්ති. පුන තානි චතූහි අධිපතීහි යෝජේත්වා පච්චේකං චතුධා විභත්තානීති ඒවං අධිපතීහි

අමිස්සෙත්වා ද්වේ සතානි, මිස්සෙත්වා අට්ඨ සතානීති සෝතාපත්තිමග්ගේ නයසහස්සං හෝති, තථා සකදගාමිමග්ගාදීසුපි.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 31 යටතේ); විභාවනී ටීකා සන්නය 78-80 පිටු; අභිධර්ම ප්‍රකාශය 76 පිට]**

"ඉමානි චත්තාරිපි ලෝකුත්තරමග්ගචිත්තානි නාම" යන පාඨයෙහි "චත්තාරිපි" යන්නෙහි **පි-සද්දේන** "පි" ශබ්දය කරණකොටගෙන **ඒකේකස්ස මග්ගස්ස** එකි එකී මාර්ගයාගේ **නයසහස්සවසේන** දහසක් නය ක්‍රමයන්ගේ වශයෙන් **චතුන්නං** සතරාකාර වූ මාර්ගයන්ගේ **චතුසහස්සභේදං** සාරදහසක් ප්‍රභේද ඇත්තාවූ **නයඤ්ච** නය ක්‍රමය ද **සච්චවිභඞ්ගේ** විභඞ්ගප්‍රකරණාගත සත්‍යවිභඞ්ගයෙහි **ආගතං** ආවාවූ **සට්ඨිසහස්සභේදං** සැටදහසක් ප්‍රභේද ඇත්තාවූ **නයඤ්ච** නය ක්‍රමය ද (පන ශබ්දය විශේෂාර්ථ ද්‍යෝතකයි) **හෙට්ඨා** යට රූපාවචර චිත්තයෙහි **වුත්තනයේන** කියනලද ක්‍රමයෙන් **අනේකවිධම්පි ච** බොහෝවූ ප්‍රභේදය ද **සඞ්ගහති** සඞ්ග්‍රහ කෙරේ (සච්චවිභඞ්ගයෙහි ආවාවූ සැටදහසක් නය ක්‍රමය යනු සච්චවිභඞ්ගයෙහි නිරෝධසත්‍යයෙහි අට්ඨඞ්ගිකවාරය පඤ්චඞ්ගිකවාරය සබ්බසඞ්ගාහිකවාරයයි කියනලද තුන් වාරයන් අතුරෙන් පළමු කොට අට්ඨඞ්ගිකවාරයෙහි වදාරණලද **"තණ්හාය පහාණං, තණ්හාය ච අවසේසානඤ්ච කිලේසානං පහාණං, තණ්හාය ච අවසේසානඤ්ච කිලේසානං අවසේසානඤ්ච අකුසලානං ධම්මානං පහාණං, තණ්හාය ච අවසේසානඤ්ච කිලේසානං අවසේසානඤ්ච කුසලානං ධම්මානං තිණ්ණඤ්ච කුසලමූලානං සාසවානං පහාණං, තණ්හාය ච අවසේසානඤ්ච කිලේසානං අවසේසානඤ්ච අකුසලානං ධම්මානං තිණ්ණඤ්ච කුසලමූලානං සාසවානං අවසේසානඤ්ච කුසලානං ධම්මානං"** යන මේ පඤ්චප්‍රකාරවූ කොට්ඨාශයන් අතුරෙන් "තණ්හාය පහාණං" යන ප්‍රථම කොට්ඨාශයෙහි ධ්‍යානාභිනිවේසයෙහි සුද්ධිකපටිපද සුද්ධිකසුඤ්ඤතා සුඤ්ඤතපටිපද සුද්ධිකපණිහිත අප්පණිහිත පටිපද වශයෙන් පඤ්චප්‍රකාර වූ ස්ථාන කෙනෙක් වෙත්. ඒ පඤ්චප්‍රකාර වූ ස්ථානයන් අතුරෙන් ඒකස්ථානයෙක්හි චතුක්කනය පඤ්චකනය වශයෙන් එක එක ක්‍රමය වන හෙයින් දසවිධ නය කෙනෙක් වෙත්. අවශේෂ වූ මාර්ග, සතිපට්ඨාන, සම්මප්පධාන, ඉර්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, සත්‍යය, සමථ, විදර්ශනා, ලෝකුත්තර ධර්ම, ස්කන්ධ, ආයතන, ධාතු, ආහාර, ස්පර්ශ, වේදනා, සඤ්ඤා, චේතනා, චිත්ත යන මේ එකුන්විසි අභිනිවේස ධර්මයෙහි ද දසය දසය වන හෙයින් විංශති ප්‍රකාර වූ අභිනිවේස ධර්මයෙහි නය දෙසියයක් වෙත්. ඒ නය දෙසීය සතර අධිපතීන්ගෙන් ගුණිත කළ කල්හි අටසීයයක් වෙත්. සතර අධිපතීන්ගෙන් ගුණිත කොට ලැබූ අටසියය හා සුද්ධික දෙසීය මිශ්‍ර කළ කල්හි සෝතාපත්ති මාර්ගයෙහි නය දහසක් වෙත්. සෝතාපත්ති මාර්ගයෙහි මෙන්ම අවශේෂ මාර්ග ත්‍රයෙහි ද දහස දහස වන හෙයින් සතර මාර්ගයෙහි නය සාරදහසක් වෙත්. පළමුවෙනි කොට්ඨාශයෙහි මෙන් අවශේෂ කොට්ඨාස සතරෙහි ද සාරදහස වන හෙයින් පඤ්චප්‍රකාර කොට්ඨාශයෙහි විසිදහසක් නය ක්‍රම ලැබෙත්. අට්ඨඞ්ගික වාරයෙහි විසිදහසක් නය ලැබුණාක් මෙන් පඤ්චඞ්ගික වාරයෙහි ද විසිදහසක් නය ලැබේ. සර්වසඞ්ග්‍රාහක වාරයෙහි ද විසිදහසයයි යන තෙවිසිදහස පිඬු කළ කල්හි සැටදහසක් නය ක්‍රම ලැබේ)

("හෙට්ඨා වුත්තනයේන අනේකවිධන්තම්පි" යන්නෙන් කුසලචිත්ත නිගමණයෙහි කියනලද කාල, දේශ, සන්තාන යනාදී ප්‍රභේදයද රූපාවචරචිත්ත නිගමනයෙහි කියනලද සුද්ධිකපටිපද චතුෂ්කයන්ගේ වශයෙන් ලැබෙන්නා වූ සතිස්නවක ප්‍රභේදය ද ගැනේ. "තත්ථායං" යනාදි පාඨයෙන් සතරාකාර මාර්ගයන්

අතුරෙන් එකිඑකී මාර්ගයෙහි වන්නාවූ නය සහස්‍ර භේදය දැක්වූහ) **තථා** ඒ ද්විප්‍රකාර වූ සහස්‍ර නය ෂෂ්ඨිසහස්‍ර නය භේදයන් අතුරෙන් **අයං** මේ වක්ෂ්‍යමාන ක්‍රමය වනාහි **නයසහස්සමත්තපරිදීපනා** සහස්‍ර නය මාත්‍රයාගේ ප්‍රකාශ කිරීම වේ **නයසහස්සං** දහසක් නය **කථං හෝති?** කෙසේ වන්නේ ද යත්? **සෝතාපත්තිමග්ගෝ** සෝතාපත්ති මාර්ගය තෙමේ (තාව ශබ්දය වක්තව්‍යන්තරාර්ථයෙහි නිපාතයි) **ඣානනාමේන** ධ්‍යාන නාමය කරණකොටගෙන **පටිපදභේදං අනාමසිත්වා** ප්‍රතිපද භේදය ආමර්ශනය නොකොට **කේවලං** හුදෙක් **සුඤ්ඤතෝති** සුඤ්ඤත මාර්ගයයි කියා ද **අප්පණිහිතෝති** අප්පණිහිත මාර්ගයයි කියා ද දෙපරිද්දෙකින් **විභත්තෝ** බෙදන ල්දේය **පුන** නැවත **පටිපදචතුක්කේන** ප්‍රතිපද චතුෂ්කයෙන් **යෝජෙත්වා** යොද **පච්චේකං** වෙන වෙනම **චතුධා** සතර පරිද්දෙකින් **විභත්තෝ** බෙදනලදි **ඉති (ඒවං)** මෙසේ **ඣානනාමේන** ධ්‍යානයන්ගේ නමින් **දසධා** දස ප්‍රකාරයෙකින් විභත්තෝ බෙදනලදි **තථා** එපරිද්දෙන් **මග්ග-සතිපට්ඨාන-සම්මප්පධාන-ඉද්ධිපාද** -පෙ- **චිත්තනාමේහි** මග්ග-සතිපට්ඨාන-සම්මප්පධාන-ඉර්ධිපාද-ඉන්‍ද්‍රිය-බල-බොජ්ඣඞ්ග-සච්ච-සමථ-විපස්සනා-ලෝකුත්තරධම්ම-ඛන්ධ-ආයතන-ධාතු-ආහාර-ඵස්ස-වේදනා-සඤ්ඤා-චේතනා-චිත්ත යන නාමයන්ගෙන් ද **පච්චේකං** වෙන වෙනම **දසදසාකාරයෙහි** දස දස ආකාරයෙන් **තථා තථා** ඒ ඒ පරිද්දෙන් (ධ්‍යානාදී නාමයන්) **විභජිත්වා** බෙද **දේසිතේ සති** දේශනා කිරීමක් ඇති කල්හි (මේ දෙපදය පාඨ ශේෂයි) **බුජ්ඣනකානං** චතුරාර්‍ය්‍යසත්‍යය අවබෝධ කරන්නාවූ **පුග්ගලානං වසේන** විනෙය්‍ය ජනයන්ගේ වශයෙන් **විභත්තෝ** බෙදන ලද්දේයි **තස්මා** එසේහෙයින් **ඣානවසේන** ධ්‍යානයාගේ වශයෙන් **දස** නය දසයක් ද **මාග්ගාදීනං** මාර්ගාදී වූ **ඒකූනවිසිතියා වසේන** එකක් ඌණ විස්සක් ප්‍රමාණ ඇත්තාවූ ස්ථානයාගේ වශයෙන් **දස දස** දස දස නය කෙනෙක් ද **ඉති** මෙසේ **වීසතියා ඨානේසු** විසි තැනෙක්හි **ද්වේ නයසතානි හොන්ති** නය දෙසියයක් වෙත් **පුන** නැවත **තානි** ඒ දෙසියයක් නය ක්‍රමයන් **චතූහි අධිපතීහි** සතර අධිපති ධර්මයන් හා **යෝජෙත්වා** යොද **පච්චේකං** වෙන වෙනම **චතුධා විභත්තානි** සතරාකාරයකින් බෙදන ලද්දහුය **ඒවං** මෙසේ **අධිපතීහි** අධිපති ධර්මයන් හා **අමිස්සිත්වා** මිශ්‍ර නොකොට **ද්වේ සතානි** දෙසියයක් ද **අධිපතීහි මිස්සිත්වා** අධිපති ධර්මයන් හා මිශ්‍ර කොට **අට්ඨ සතානි** අටසියයක් ද **ඉති (ඉමිනා පභේදේන)** මේ ප්‍රභේදයෙන් **සෝතාපත්තිමග්ගේ** සෝවාන් මාර්ගයෙහි **නයසහස්සං හෝති** නය දහසක් වෙයි **සකදගාමීමග්ගාදීසුපි** සෙදගැමි මාර්ගාදියෙහි ද **තථා** ඒ සෝතාපත්ති මාර්ගයට කී නයින් නය දහස දහස යොදගත යුතුයි.

**[විභාවනී ටීකා සන්නය 126-128 පිටු]**

පිසද්දේන පාළියං විභත්තේ මග්ගචිත්තප්පභේදේ සම්පිණ්ඩේති. තත්ථ ධම්මසඞ්ගණියං තාව පඨමමග්ගේ ඣානනාමේන වුත්තේසු පඤ්චසු වාරේසු පඨමේ සුද්ධිකපටිපදවාරේද්වින්නං චතුක්කපඤ්චකනයානං වසේන නවචිත්තානි හොන්ති. තථා සුද්ධිකසුඤ්ඤතාය සුඤ්ඤතප්පටිපදය සුද්ධිකප්පණිහිතේ අප්පණිහිතප්පටිපදයචාති පඤ්චසු වාරේසු දසන්නං නයානං වසේන පඤ්චචත්තාලීසචිත්තානි හොන්ති. තථා මග්ගසතිපට්ඨානාදීහි ඒකූනවීසතියා නාමේහි වුත්තේසු පච්චේකං පඤ්චසු වාරේසූති වීසතියා නාමේහි වුත්තේ වාරසතේ ද්වින්නං නයසතානං වසේන නවචිත්තසතානි හොන්ති. පුන චතූහි අධිපතීහි යෝජෙත්වා වුත්තේසු චතූසු වාරසතේසු අට්ඨන්නං නයසතානං වසේන තීණි සහස්සානි ඡසතානිච හොන්තීති. ඒවං පඨමමග්ගේ නය සහස්සවසේන චත්තාරිචිත්තසහස්සානි පඤ්චචිත්ත සතානිච හොන්ති. තථා සේසමග්ගේසුපීති ඒවං චතූසු මග්ගේසු චතුන්නං නය සහස්සානං වසේන අට්ඨාරස මග්ග චිත්ත සහස්සානි හොන්ති. සච්චසතිපට්ඨාන විභඞ්ගේසු පන වීසතිනය සහස්සානං වසේන

නවුතිමග්ගචිත්තසහස්සානි. මග්ගවිභඞ්ගෙ අට්ඨවීසතියා නය සහස්සානං වසේන සතසහස්සං ඡබ්බීසතිසහස්සානි ච මග්ගචිත්තානි හොන්තීති. අට්ඨකථාසුපන නයභේදඳ්ඒව වුත්තා. නචිත්ත භේදති.

යං පන **විභාවනියං** පිසද්දේන සච්චවිභඞ්ගේ ආගතං සට්ඨිසහස්සභේදං නයං සඞ්ගණ්හාතීති වුත්තං. තං ඉමස්මිං කුසලනිගමේ න වත්තබ්බං. සෝහි සට්ඨිසහස්සභේදෝ නයෝ විපාකට්ඨානේ ඒව අට්ඨකථායං ආගතෝති.

යඤ්ච **තත්ථ** පටිපදභේදං අනාමසිත්වා කේවලං සුඤ්ඤතෝ අප්පණිහි තෝති ද්විධා විභත්තෝති වුත්තං. තං නයුජ්ජති.

පාළියඤ්හි පටිපදාභේදෝ ආදිම්හියේව ආගතෝති. නච ආදිම්හි සුඤ්ඤතෝ අප්පණිහිතෝති ද්විධා විභත්තෝ නිරන්තරවාරෝ අත්ථීති.

යඤ්ච **තත්ථ** සුඤ්ඤතෝ ඒකෝ නයෝ, අප්පණිහිතෝ ඒකෝ, පටිපද විසිට්ඨා සුඤ්ඤතා චත්තාරෝ, අප්පණිහිතා චත්තාරෝති කත්වා දසනයා හොන්තීති අධිප්පායේන ඒවං ඨාන නාමේන දසධා විභත්තෝති වුත්තං. තංපි න යුජ්ජතියේව.

න හි සුඤ්ඤතාදයෝ ඉධ නයානාම හොන්ති. තේසු පන ඒකේ කස්මිං ද්වේ ද්වේ චතුක්කපඤ්චකනයාඒව ඉධ නයානාමාති. ඒතේන තථා මග්ගසතිපට්ඨානිච්චාදිකංපි සබ්බං පටික්ඛිත්තං හොතීති. [මග්ගචිත්තං]

ඵලචිත්තේ **ඵල**න්ති විපාකභූතෝ අට්ඨඞ්ගික මග්ගෝ. සම්පයුත්තධම්මසමූහෝවා. සෝතාපත්තියා අධිගතං ඵලං. තේන සම්පයුත්තං, තත්ථවා පරියාපන්නං චිත්තන්ති සෝතාපත්ති ඵල චිත්තං. ඒසනයෝ දුතියතතියේසුපි. අරහත්තඤ්ච තං ඵලඤ්චාති **අරහත්තඵලං**. තේන සම්පයුත්තං, තස්මිංවා පරියාපන්නං චිත්තන්ති නිරුත්ති.

සඞ්ගහගාථායං **චතුමග්ගප්පභේදේනා**ති චතුක්ඛත්තුං පත්තබ්බත්තා චතුබ්බිධානං අට්ඨඞ්ගිකමග්ගානං පභේදේන. කස්මාපන තේ චතුක්ඛත්තුං පත්තබ්බාති. වුච්චතේ. සෝතාපත්තිමග්ගේ තාව සද්ධාදීනි ඉන්ද්‍රියානි මුදූනි හොන්ති, තස්මා සෝ දිට්ඨිවිචිකිච්ඡාඒව සමුච්ඡින්දිතුං සක්කෝති. අඤ්ඤේපන කාමරාගබ්‍යාපාදේපි තනුභූතේපි කාතුං න සක්කෝති. දුතියමග්ගේ තානි ථෝකං පටූනි හොන්ති. තස්මා සෝ කාමරාගබ්‍යාපාදේ තනුභූතේ කාතුං සක්කෝති. සමුච්ඡින්දිතුං පන නසක්කෝතියේව. තතියමග්ගේ තානි පටුතරානි හොන්ති. තස්මා සෝ කාමරාගබ්‍යාපාදේ සමුච්ඡින්දිතුං සක්කෝති. රූපාරූප රාගමානුද්ධච්චාවිජ්ජායෝපන සමුච්ඡින්දිතුං න සක්කෝතියේව. චතුත්ථ මග්ගේපන තානි ඉන්ද්‍රියානි පටුතමානි හොන්ති. තස්මා සෝ තාව අඤ්ඤේච සබ්බේපි පාපධම්මේ සමුච්ඡින්දිතුං සක්කෝති. ඒවං චතුක්ඛත්තුං පවත්තමානාඒව පරිනිට්ඨිතකිච්චත්තා තේ මග්ගා චතුක්ඛත්තුං පත්තබ්බා හොන්තීති. කුසලං චිත්තං චතුමග්ගප්පභේදේන චතුධා මතං. පාකංපි තස්ස චතුබ්බිධස්ස කුසලස්ස ඵලත්තා තථා චතුධාමතං. ඉති අනුත්තරං චිත්තං අට්ඨධා මතන්ති යෝජනා. නත්ථි අත්තනෝ උත්තරං අධිකං ඒතස්සාති **අනුත්තරං**.

කස්මා පනෙත්ථ ක්‍රියචිත්තං නාම න ගහිතන්ති, ක්‍රියානුත්තරස්ස අභාවාති, කස්මා පනස්ස අභාවෝති. මග්ගචිත්තස්ස ඒකචිත්තක්ඛණිකත්තාති. යදි හි තං ලෝකියකුසලංවිය නානාක්ඛණේසු පවත්තෙය්‍ය. තද නිරනුසයසන්තානේපි පවත්තිත්වා ක්‍රියා නුත්තරංනාම සියාති. කස්මාපන තං ඒකචිත්තක්ඛණිකමේව හෝතීති. මග්ගස්ස මහානුභාවත්තාති. කථඤ්ච මහානුභාවෝති. වුච්චතේ. අරියමග්ගෝහි නාම සකිං පවත්තමානෝයේව අත්තනා පහාතබ්බේ කිලේසේ පුන අනුප්පාදධම්මතං ආපාදෙත්වා පජහති. අයමස්ස ඒකෝ ආනුභාවෝ. විපාකඤ්ච කුසලක්‍රියජවනංවිය ජවනකිච්ච යුත්තං යද කදචි සමාපජ්ජනක්ඛමඤ්ච කත්වා අත්තනෝ අනන්තරතෝ පට්ඨාය ජනේති. අයමස්ස දුතීයෝ ආනුභාවෝ. තස්මා තස්ස කිලේසප්පහානත්ථායපි පුන උප්පාදේතබ්බකිච්චංනාම නත්ථි. තථා සමාපත්ති අත්ථායපීති. සචේපි හි කෝචි අහං ඵලං සමාපජ්ජිතුං න ඉච්ඡාමි. පුබ්බේ ලද්ධං මග්ගමේව සමාපජ්ජිස්සාමීති පරිකම්මං කරෙය්‍ය. තද පුබ්බේ සකිං උප්පජ්ජිත්වා නිරුද්ධමග්ගචේතනානුභාවේන ඵලචිත්තමේව පවත්තෙය්‍ය. න මග්ගචිත්තං. කස්මා, අප්පටිබාහි යානුභාවත්තා මග්ගස්ස. අයඤ්හි මග්ගානුභාවෝනාම කේනචි ඡන්දේන වා වසේනවා අජ්ඣාසයේනවා පරිකම්මේනවා පටිබාහිතුං අසක්කුණෙය්‍යායේව හෝතීති. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 60-63 යටතේ)]**

තත්ථ අට්ඨඞ්ගිකවාරස්ස "තණ්හාය අවසේසානඤ්ච කිලේසානං පහාන"න්තිආදීසු පඤ්චසු කොට්ඨාසේසු පඨමකොට්ඨාසේ තාව සෝතාපත්තිමග්ගේ ඣානාභිනිවේසේ සුද්ධිකපටිපද, සුද්ධිකසුඤ්ඤතා, සුඤ්ඤතපටිපද, සුද්ධිකඅප්පණිහිතං, අප්පණිහිතපටිපදති ඉමේසු පඤ්චසු වාරේසු ද්වින්නං ද්වින්නං චතුක්කපඤ්චකනයානං වසේන **දස නයා** හොන්ති. ඒවං සේසේසුපීති වීසතියා අභිනිවේසේසු **ද්වේ නයසතානි**. තානි චතූහි අධිපතීහි චතුග්ගුණිතානි අට්ඨ. ඉති සුද්ධිකානි ද්වේ සාධිපතී අට්ඨාති සබ්බම්පි **නයසහස්සං** හෝති. යථා ච සෝතාපත්තිමග්ගේ, ඒවං සේසමග්ගේසුපීති **චත්තාරි නයසහස්සානි** හොන්ති. යථා ච පඨමකොට්ඨාසේ චත්තාරි, ඒවං සේසේසුපීති අට්ඨඞ්ගිකවාරේ පඤ්චසු කොට්ඨාසේසු **වීසති නයසහස්සානි** හොන්ති. තථා පඤ්චඞ්ගිකවාරේ සබ්බසඞ්ගාහිකවාරේ චාති සබ්බානිපි **සට්ඨි නයසහස්සානි** සත්ථාරා විභත්තානි. පාළි පන සඞ්ඛේපේන ආගතා. ඒවමිදං තිවිධමහාවාරං පඤ්චදසකොට්ඨාසං සට්ඨිනයසහස්සපටිමණ්ඩිතං අභිධම්මභාජනීයං නාම නිද්දිට්ඨන්ති වේදිතබ්බං.
**[විභඞ්ග අටුවා (ඡට්ඨසඞ්ගායනා අංක 206-214 යටතේ); විභඞ්ග අටුවා 86 පිට (හේ.වි.මු); විස්තර භාව සන්නය 192-193 පිටු]**

**තත්ථ** ඒ අෂ්ටාඞ්ගික වාරාදීන් අතුරෙහි (ත්‍රිවිධ මහාවාරයන් අතුරෙන්යි සන්නයි) **අට්ඨඞ්ගිකවාරස්ස** අෂ්ටාඞ්ගයෙකින් යුක්තවූ වාරයාගේ නොහොත් අෂ්ටාඞ්ගයක් ඇති වාරයාගේ "තණ්හාය ච අවසේසානඤ් ච කිලේසානං පහානන්ති ආදිසු තණ්හායච -පෙ- පහානං" යනාදිවූ **පඤ්චසු** පඤ්චවිධවූ **කොට්ඨාසේසු** කොට්ඨාසයන් අතුරෙන් **පඨමකොට්ඨාසේ** පළමුවන කොටසෙහි **තාව** අනික් මාර්ගයන් කෙරෙන් පළමු **සෝතාපත්තිමග්ගේ** ශ්‍රෝතාපත්තිමාර්ගයෙහි (නය සහස්සං හෝති යන්න හා සම්බන්ධයි) **ඣානාභිනිවේසේ** ධ්‍යානාභිනිවේශයෙහි හෙවත් ධ්‍යානශීර්ෂයෙන් දේශනාවට බැසගැන්මෙහි නොහොත් ධ්‍යානශීර්ෂයෙන් භාවනාවට බැසගැන්මෙහි **සුද්ධිකපටිපද** ශුද්ධිකප්‍රතිපදවද **සුද්ධිකසුඤ්ඤතා** ශුද්ධිකශූන්‍යතාවද **සුඤ්ඤතපටිපද** ශූන්‍යතා ප්‍රතිපදවද **සුද්ධිකඅප්පණිහිතං** ශුද්ධික අප්‍රණිහිතයද **අප්පණිහිතපටිපදති** අප්‍රණිහිත ප්‍රතිපදවද යන **ඉමේසු**

**පඤ්චසු වාරේසු** මේ පස්වැදෑරුම් වාරයන්හි **ද්වින්නං ද්වින්නං චතුක්කපඤ්චකනයානං වසේන** චතුෂ්කපඤ්චකනය දෙදෙන දෙදෙනාගේ වශයෙන් **දස නයා** නය දශදෙනෙක් **හොන්ති** වෙත් **සේසේසුපි** සෙසු අභිවේශයන්හිත් **ඒවං** මේ ධ්‍යානාභිනිවේශයෙහි මෙනි **ඉති** මෙකී නයින් **වීසතියා අභිනිවේසේසු** විසිවැදෑරුම්වූ අභිනිවේශයන්හි **ද්වේ නයසතානි** දෙසිය නය කෙනෙක් වෙත් **තානි** ඒදෙසිය නය **චතූහි අධිපතීහි** චතුර්විධ අධිපතීන් විසින් **චතුග්ගුණිතානි** සතර ගුණකරන ලද්දහු **අට්ඨ (සතානි)** අටසිය නය කෙනෙක් වෙත් **ඉති** මේ කියනලද නයින් **සුද්ධිකානි** අමිශ්‍රවූ **ද්වේ (නයසතානි)** නය දෙසිය දෙනද **සාධිපතී** අධිපතීන් හා සමගවූ **අට්ඨ (නයසතානි)** නය අටසිය දෙනද **ඉති සබ්බම්පි** යන මේ සියල්ලම **නයසහස්සං** නයදහසෙක් **හෝති** වේ **සෝතාපත්තිමග්ගේ** සෝවාන්මගෙහි **යථාච** යම්සේද **ඒවං** එමෙන් **සේසමග්ගේසුපි** සෙදගැමි අනගැමි රහත් යන අවශිෂ්ට මාර්ගයන්හිද (**නය සහස්සං හෝති** නය දහස බැගින් වේ) **ඉති** මෙසේ ගත්කල්හි **චත්තාරි නයසහස්සානි** නය සාරදහසක්හු **හොන්ති** වෙත් **පඨමකොට්ඨාසේ** පළමු කොටසෙහි **යථාච** යම්සේ **චත්තාරි (නයසහස්සානි)**නය සාරදහසක්හුවේද්ද **සෙසේසුපි** සෙසු කොටස්හි ද **ඒවං** එමෙනි (එසේ නය සාරදහස බැගින් වෙත් යුසේයි) **ඉති** මෙපරිද්දෙන් **අට්ඨඞ්ගිකවාරේ** අෂ්ටාඞ්ගික වාරයෙහි **පඤ්චසු කොට්ඨාසේසු** පස්වැදෑරුම් කොටස්හි **වීසතිනයසහස්සානි** විසිදහස්නය කෙනෙක් **හොන්ති** වෙත් **පඤ්චඞ්ගිකවාරේ ච** පඤ්චඞ්ගිකවාරයෙහිද **සබ්බසඞ්ගාහිකවාරේ ච** සර්වසඞ්ග්‍රාහික වාරයෙහිද **තථා** එසේමයැ හෙවත් ඒ අෂ්ටාඞ්ගික වාරයෙහි මෙනි **ඉති** මෙපරිද්දෙන් **සබ්බානිපි** සියලුම **සට්ඨී නයසහස්සානි** සැටදහස්නය කෙනෙක් **සත්ථාරා** ශාස්තෲන්වහන්සේ විසින් **විභත්තානි** විභජනය කරනලද්දහ **පාළි පන** පෙළ වනාහි **සඞ්ඛේපේන** සැකෙවින් **ආගතා** ආය **ඒවං** යථෝක්ත නයින් **තිවිධ මහාවාරං** ත්‍රිවිධ මහාවාරයන් ඇති **පඤ්චදසකොට්ඨාසං** පසළොස් කොටස් ඇති **සට්ඨී නයසහස්සපතිමණ්ඩිතං** සැටදහස්නයින් හෙබියාවූ **අභිධම්මභාජනියං නාම** අභිධර්ම භාජනිය නම් වූ **(ඉදං)** මේ භාජනීයය **නිද්දිට්ඨන්ති** දක්වා වදළසේකැයි **වේදිතබ්බං** දතයුත්තේය. **[විභඞ්ග අටුවා සන්නය 510-512 පිටු]**

## ලෝකෝත්තර විපාක චිත්තයෝ සිව් දෙන:—

සෝතාපත්තිඵලචිත්තං, සකදාගාමිඵලචිත්තං, අනාගාමිඵලචිත්තං, අරහත්තඵලචිත්තඤ්චේති ඉමානි චත්තාරිපි ලෝකුත්තරවිපාකචිත්තානි නාම.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 18 පිට]**

**සෝතාපත්තිඵලචිත්තං** සෝවාන් ඵල චිත්තය **සකදගාමීඵලචිත්තං** සකෘදගාමී ඵල චිත්තය **අනාගාමීඵලචිත්තං** අනාගාමී ඵල චිත්තය **අරහත්තඵලචිත්තඤ්චේ** අර්හත් ඵල චිත්තය ද යන **ඉමානි** මේ **චත්තාරිපි** සතර දෙනම **ලෝකුත්තරවිපාකචිත්තානි නාම** ලෝකෝත්තර විපාක චිත්තයෝ නම් වෙත්.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 26 පිට]**

## ලෝකෝත්තර විපාක සිත විස්තර කර ඇති ආකාරය:—

ලෝකුත්තරවිපාකම්පි කුසලසදිසත්තා කුසලානුගතිකමේව කත්වා භාජිතං. යස්මා පන තේභූමකකුසලං චුතිපටිසන්ධිවසේන වට්ටං ආචිනාති වඩ්ඪේති, තස්මා තත්ථ **කතත්තා උපචිතත්තා**ති වුත්තං. ලෝකුත්තරං පන තේන ආචිතම්පි අපචිනාති, සයම්පි චුතිපටිසන්ධිවසේන න ආචිනාති, තේනෙත්ථ කතත්තා උපචිතත්තා'ති අවත්වා **කතත්තා භාවිතත්තා**ති වුත්තං.

**[ධම්මසඞ්ගණී අට්ඨකථා (ඡට්ඨසඞ්ගායනා අංක 505 යටතේ); ධම්මසඞ්ගණී අට්ඨකථා 254 පිට (හේ.වි.මු)]**

යථා වට්ටං ආචිනති, තථා තණ්හාදීහි අභිසඞ්ඛතං ලෝකියකම්මං උපචිතන්ති වුච්චති. ලෝකුත්තරං පන ඒවං න හෝතීති තථා න වුත්තං.

**[ධම්මසඞ්ගණී මූලටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 505 යටතේ)]**

තණ්හාවිජ්ජාදීහි ආහිතවිසේසං ලෝකියකම්මං විපාකුප්පාදනසමත්ථං හෝති, න අඤ්ඤදථාති වුත්තං **"තණ්හාදීහි අභිසඞ්ඛත"**න්ති

**[ධම්මසඞ්ගණී අනුටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 505 යටතේ)]**

**ලෝකුත්තරවිපාකම්පි** ලෝකෝත්තර විපාක චිත්තය ද **කුසලසදිසත්තා** කුසලය හා සමාන බැවින් **කුසලානුගතිකමේව කත්වා** කුසලානුගතිකවම කොට **භාජිතං** බෙදනලදි **යස්මා පන** යම්හෙයකින් වනාහි **තේභූමකකුසලං** ත්‍රෛභූමික කුසලචිත්තය තෙමේ **චුතිපටිසන්ධිවසේන** චුති ප්‍රතිසන්ධි වශයෙන් **වට්ටං** සංසාර වෘර්තය **ආචිනාති වඩ්ඪේති** වඩයි ද **තස්මා** එහෙයින් **තත්ථ** ඒ ත්‍රෛභූමික කුසලයෙහි **කතත්තා උපචිතත්තා ඉති** කතත්තා උපචිතත්තා යැයි **වුත්තං** කියනලදි **තේන** ත්‍රෛභූමික කුසලයන් විසින් **ආචිතම්පි** පුරුදු කරනලද **ලෝකුත්තරං** ලෝකෝත්තර චිත්තය තෙමේ **අපචිනාති** වට්ට ධර්මයන් විනාශකරයි **පන (සච්චං)** ඒ කීම සැබෑවයි **සයම්පි** ලෝකෝත්තර චිත්තය තෙමේ **චුතිපටිසන්ධිවසේන** චුති ප්‍රතිසන්ධි වශයෙන් **න ආචිනාති** රැස් නොකරයි **තේන** එහෙයින් **එත්ථ** මෙහි **කතත්තා උපචිතත්තා ඉති** කතත්තා උපචිතත්තා යැයි **අවත්වා** නොකියා **කතත්තා භාවිතත්තා ඉති** කතත්තා භාවිතත්තා යනුවෙන් **වුත්තං** කියනලදි.

**[ධම්මසඞ්ගණී අට්ඨකථා පරිවර්තනයයි]**

**ලෝකුත්තරවිපාකං** චතුමග්ගයුත්තචිත්තඵලත්තා චතුබ්බිධං, තං මග්ගවීථිවසේන චේව සමාපත්තිවසේන ච ද්විධා පවත්තති.

**[විසුද්ධිමග්ග අට්ඨකථා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 454 යටතේ); විසුද්ධිමග්ග අට්ඨකථා 341 පිට (හේ.වි.මු); සිංහල විසුද්ධි මාර්ගය ඛන්ධනිද්දේසඛණ්ඩය 203 පිට (තායිවාන් මුද්‍රණය)]**

**චතුමග්ගයුත්තචිත්තඵලත්තා**ති චතූහි අරියමග්ගේහි සම්පයුත්තකුසලචිත්තස්ස ඵලත්තා, චතුබ්බිධසාමඤ්ඤඵලසම්පයුත්තභාවතෝති අත්ථෝ. මග්ගවීථියං ද්වික්ඛත්තුං, තික්ඛත්තුං වා ඵලසමාපත්තියං අපරිච්ඡින්නපරිමාණං පවත්තමානම්පි ද්වීසු ඨානේසු පවත්තියා **"ද්විධා පවත්තතී"**ති වුත්තං.

**[විසුද්ධිමග්ග මහාටීකා 02 (ඡට්ඨසඞ්ගායනා අංක 454 යටතේ)]**

**ලෝකුත්තරවිපාකං** ලෝකෝත්තර විපාකය තෙමේ **චතුමග්ගයුත්තචිත්තඵලත්තා** සතර මාර්ග චිත්තයාගේ ඵල බැවින් **චතුබ්බිධං** සතර වැදෑරුම් වෙත් **තං (ලෝකුත්තරවිපාකං)** ඒ ලෝකෝත්තර විපාක චිත්තය තෙමේ **මග්ගවීථිවසේන චේව** මාර්ග වීථි වශයෙන් මෙන්ම **සමාපත්තිවසේන ච** සමාපත්ති වීථි වශයෙන් ද **ද්විධා** දෙයාකාරයකින් **පවත්තති** හටගනී.

චතුමග්ගයුත්තචිත්තඵලත්තා සතර ආර්‍ය්‍ය මාර්ගය හා සම්ප්‍රයුක්ත කුසල චිත්තයාගේ ඵල බැවින් චතුර්විධ වේ. චතුර්විධ ශ්‍රාමණ්‍ය ඵල සම්ප්‍රයුක්ත බැවින යන අර්ථයි. මාර්ග වීථියෙහි දෙතුන් විටෙක ඵලසමාපත්ති වීථියෙහි අපරිච්ඡින්න පරිමාණව පවත්නේ ද දෙතැන පවත්නා බැවින් "ද්විධා පවත්තති" යි කීහු.

**[විසුද්ධි මාර්ග මහා සන්නය 1099 පිට]**

සෝතාපත්තියා ලද්ධං, සෝතාපත්තිස්ස වා ඵලචිත්තං විපාකභූතං චිත්තං **සෝතාපත්තිඵලචිත්තං**. අරහත්තඤ්ච තං ඵලචිත්තඤ්චාති **අරහත්තඵලචිත්තං**.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 32 යටතේ; විභාවනී ටීකා සන්නය 80 පිට]**

**සෝතාපත්තියා** ආර්‍ය්‍ය මාර්ගයට පළමුකොට පැමිණීමෙන් **ලද්ධං** ලබනලද **ඵලචිත්තං (විපාකභූතං චිත්තං)** මාර්ගයාගේ විපාක වූ චිත්තය **වා** නොහොත් **සෝතාපත්තිස්ස** සෝවාන් පුද්ගලයාගේ **ඵලචිත්තං** විපාක වූ සිත් තෙමේ **සෝතාපත්තිඵලචිත්තං** සෝතාපත්තිඵලචිත්ත නම් වේ (සෝතාපත්තිස්ස යන සම්බන්ධය චිත්තං යන්න හා සබඳනු) ඵල ශබ්ද තෙමේ සම්මාදිට්ඨි ආදී අෂ්ට ප්‍රකාරවූ මාර්ගාඞ්ගයෙහි ද චිත්ත චෛතසික සමුදයෙහි ද කේවල චිත්තයෙහි ද වැටේ. මෙහි වනාහි කේවල චිත්තයෙහිම පවත්නා බව දක්වනු පිණිස ඵල ශබ්දය "විපාකභූතං" යී වර්ණනා කරනලදි.

**යං (මානසං)** යම් සිතක් තෙමේ **අරහත්තඤ්ච හෝති** රහතුන්ට අයත්වූයේත් වේද **තං** ඒ රහතුන්ට අයත් වූ චිත්තය **ඵලචිත්තඤ්ච හෝති** ඵල සිතක් වේද **ඉති (තස්මා) තං මානසං** ඒ චිත්තය තෙමේ **අරහත්තඵලචිත්තං** අරහත්තඵලචිත්ත නම් වේ.

**[විභාවනී ටීකා සන්නය 128 පිට]**

ඵලචිත්තේ **ඵල**න්ති විපාකභූතෝ අට්ඨඞ්ගිකමග්ගෝ. සම්පයුත්තධම්මසමූහෝවා. සෝතාපත්තියා අධිගතං ඵලං. තේන සම්පයුත්තං, තත්ථවා පරියාපන්නං චිත්තන්ති සෝතාපත්ති ඵල චිත්තං. ඒසනයෝ දුතියතතියේසුපි. අරහත්තඤ්ච තං ඵලඤ්චාති **අරහත්තඵලං**. තේන සම්පයුත්තං, තස්මිංවා පරියාපන්නං චිත්තන්ති නිරුත්ති. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 61 යටතේ)]**

ඉදනි **ලෝකුත්තරවිපාකචිත්තානි** හොන්ති. තානි චතුමග්ගයුත්තචිත්ත ඵලත්තා චතුබ්බිධානි හොන්ති. කථං? සෝතාපත්තිමග්ගඵලචිත්තං, සකදගාමිමග්ගඵලචිත්තං, අනාගාමිමග්ගඵලචිත්තං, අරහත්තමග්ගඵලචිත්තන්ති. ඒවං පනෙත්ථ ඒකේකං ඣානඞ්ගයෝගභේදතෝ පඤ්චවිධං, පුන මග්ගවීථිඵලසමාපත්තිවසේන පවත්තිතෝ දුවිධං. ඒවං ලෝකුත්තරකුසලවිපාක චිත්තානි වේදිතබ්බානි. **[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 49 යටතේ)]**

එත්ථ විපාකේ ඡන්දදි **අධිපතීනං** අභාවෝ, අයමේව විසේසතෝ කුසලතෝ අයං ඒව විසේසෝ, සේසං සබ්බපකාරං අවිසේසේන කුසලේන සමං **මතං** කථිතං භගවතා. **[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 49 යටතේ)]**

**ඉදනි** දැන් **ලෝකුත්තරවිපාකචිත්තානි** ලෝකෝත්තර විපාක චිත්තයෝ **වුච්චන්ති** කියනු ලැබෙත් **තානි** ඔවුහූ තුමූ **චතුමග්ගචිත්තඵලත්තා** සතර ආර්‍ය්‍ය මාර්ගය හා සැපියුතු කුසලචිත්තයාගේ සිව් වැදෑරුම් ශ්‍රාමණ්‍යඵල සම්ප්‍රයුක්ත

චිත්තය බැවින් **සෝතාපත්තිමග්ගඵලචිත්තං** සෝවාන් මාර්ගයාගේ ඵලසිතය **සකදාගාමිමග්ගඵලචිත්තං** සකදාගාමිමාර්ගයාගේ ඵලසිතය **අනාගාමිමග්ගඵලචිත්තං** අනාගාමී මාර්ගයාගේ ඵලසිතය **අරහත්තමග්ගඵලචිත්තන්ති** අර්හත් මාර්ගයාගේ ඵලසිතයයි **චතුබ්බිධානි හොන්ති** සිව් වැදෑරුම් වෙත් **ඒවං පන** මෙසේ වනාහි **එත්ථ** මෙහි **ඒකේකං** එකි එකී ඵලචිත්තය **ඣානඞ්ගයෝගභේදතෝ** විතර්කාදී ධ්‍යානාඞ්ගයන් හා සම්ප්‍රයෝග භේද හෙයින් **පඤ්චවිධං** පස් වැදෑරුම් වෙයි **පුන** නැවත **මග්ගවීථිඵලසමාපත්තිවසේන** මාර්ගවීථිය හා ඵල සමාපත්ති වශයෙන් **පවත්තනතෝ** හටගන්නා හෙයින් **දුවිධං** දෙවැදෑරුම් වෙයි **ඒවං** මේ උක්ත ප්‍රකාරයෙන් **ලෝකුත්තරකුසලවිපාකචිත්තානි** ලෝකෝත්තර කුසලයන්ගේ විපාක චිත්තයෝ **වේදිතබ්බානි** දතයුත්තාහුය **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 144 පිට]**

මග්ගචිත්තස්ස විය ඵලචිත්තස්ස මග්ගයෝගතෝ භේදභාවේන "චතුමග්ගයෝගතෝ"ති අවත්වා **"චතුමග්ගසම්පයුත්තචිත්තඵලත්තා"**ති වුත්තං, චතූහි අරියමග්ගේහි සම්පයුත්තකුසලචිත්තස්ස ඵලත්තා චතුබ්බිධසාමඤ්ඤඵලසම්පයුත්තචිත්තභාවතෝති අත්ථෝ. සෝතාපත්තිමග්ගස්ස ඵලං චිත්තං **සෝතාපත්තිමග්ගඵලචිත්තං.** ඒවං සේසේසු. මග්ගවීථියං ද්වික්ඛත්තුං, තික්ඛත්තුං වා ඵලසමාපත්තියා අපරිච්ඡින්නපරිමාණං පවත්තමානම්පි ද්වීස්වේව ඨානේසු පවත්තියා දුවිධමේව හෝතීති ආහ **"මග්ගවීථිඵලසමාපත්තිවසේන පවත්තිතෝ දුවිධ"**න්ති.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා ලෝකුත්තරවිපාක වණ්ණනා යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 180 පිට]**

එහි මාර්ග චිත්තයාගේ මෙන් ඵල චිත්තයාගේ මාර්ගයෝග වශයෙන් භේදයක් නැති හෙයින් "චතුමග්ගයෝගතෝ" යී නොකියා "චතුමග්ගයුත්තචිත්තඵලත්තා" යී කියනලදි. සතර ආර්‍ය්‍ය මාර්ගය හා සැපියුතු වූ කුසලචිත්තයාගේ සිව් වැදෑරුම් ශ්‍රාමණ්‍යඵල සම්ප්‍රයුක්ත චිත්තය බැවින් යනු එහි අභිප්‍රායයි. "සෝතාපත්තිමග්ගස්ස ඵලචිත්තං සෝතාපත්තිමග්ගඵලචිත්තං" යනු විග්‍රහයි. සෙසු පදයන්හිද මෙසේම වාක්‍ය යොදගතයුතුයි.

මාර්ගවීථියෙහි දෙවරක් හෝ තුන්වරක් හෝ ඵල සමාපත්ති වීථියෙහි පිරිසිදීමක් නැතිව අප්‍රමාණව හටගන්නේ නමුදු දෙතැනෙක්හිම හටගන්නා බැවින් ද්විප්‍රකාරම වේ යැයි දක්වනු පිණිස "මග්ගවීථිඵලසමාපත්තිවසේන පවත්තනතෝ දුවිධං" යී කීයේයි. **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 145 පිට]**

**ඵලති විපච්චති විපාකභාවේන ඒතීති ඵලං** යනුවෙන් විග්‍රහ කරණු. ඵල ධාතු තොමෝ පාකාර්ථ වාචක වේ. **යං** යම් සිතක් තෙමේ **විපාකභාවේන** විපාකයාගේ ස්වභාවයෙන් **ඵලති විපච්චති** මුහුකුරු වන්නේ වේද **ඉති (තස්මා)** එසේහෙයින් **තං** ඒ සිත් තෙමේ **ඵලං** ඵල නම් වේ. මෙසේ අර්ථ දියයුතුයි. **ඵලඤ්ච තං චිත්තං චාති ඵලචිත්තං** යනුවෙන් පද සම්බන්ද කොට විග්‍රහ කරණු. **ඵලඤ්ච හෝති** විපාකත් වෙයි ද **තං** ඒ විපාක යන නාම තෙමේ **චිත්තං හෝති** චිත්තයත් වේද **ඉති (තස්මා)** එසේහෙයින් **ඵලචිත්තං** ඵලචිත්ත නම් වේ. මෙසේ අර්ථ යෝජනා කරණු. **සෝතාපත්තියා ලද්ධං ඵලචිත්තන්ති සෝතාපත්තිඵලචිත්තං** යනුවෙන් සියළු පදයන් සම්බන්ධ කොට විග්‍රහ කරණු. අවශිෂ්ඨ වූ තුන් තැන්හිද ඒ පරිද්දෙන් විග්‍රහ කරණු. **සෝතාපත්තියා** නිර්වාණය අරමුණු කිරීම් වශයෙන් ලංකොට පැමිණෙන්නා වූ ආර්ය

අෂ්ටාඞ්ගික මාර්ගයට පළමු කොට පැමිණීමෙන් **ලද්ධං** ලබන ලද්ද වූ **ඵලචිත්තං** විපාක චිත්තයෙක්නුයි **සෝතාපත්තිඵලචිත්තං** සෝතිපත්තිඵලචිත්ත නම් වේ. මෙසේ අර්ථ යෝජනා කරණු. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 39 පිට]**

ලෝකෝත්තර විපාක සිත් සතරකි. ඵල යනු මේවාට කියන නාමයකි. කුසල්, මාර්ග යනුවෙන් හැඳින්වූ අතර විපාක, ඵල යන නාමයෙන් හැඳින් වූහ. මොවුහු ලෞකික විපාකසේ විපාක දීමට කල් නොයත්. ඒ මොහොතේම ලැබෙත්. අකාලික ගුණය දක්වනුයේ එහෙයිනි. විපාක දෙන අවස්ථා ප්‍රධාන වශයෙන් දෙකකි. ප්‍රථමයෙන් ඵල සිත් උපන් අවස්ථාවය. දෙවනුව ඵල සමාපත්තීන්ට පැමිණුන අවස්ථාව යනුයි. අරහත් ඵලය මේ දෙකත් සමඟ, පිරිනිවීමෙන් (මරණින්) පසු අවස්ථාවෝ නිර්වාණයට පිවිසීමත් යන අවස්ථා තුනකි. ඵලසිත් වලින් චුති ප්‍රතිසන්ධි නොලැබේ. සෝවාන් ආදී ඵලයකට පත්වූ ශෛක්‍ෂයෙක් (අරහත් ඵලයට පත්වූවහු හැර ඉතිරි සත්දෙනා ශෛක්‍ෂයෝය) මරණ අවස්ථාවේදී හා උත්පත්ති අවස්ථාවේදී උපදනුයේ කාමාවචර ඤාණ සම්ප්‍රයුක්ත විපාක සිතක් හෝ තමන් ලත් ධ්‍යානයකට අනතුරුව රූපාවචර විපාක සිතක් හෝ මේ දෙකෙන් එකකි.

**[තෙසැත්තෑ ඤාණ කථා 388-389 පිටු; අභිධර්ම චන්‍ද්‍රිකාව 48 පිට]**

## ලෝකෝත්ර ක්‍රියා සිත් නොලැබීමට හේතු:—

කිරියානුත්තරස්ස පන අසම්භවතෝ ද්වාදසවිධතා න වුත්තා. කස්මා පන තස්ස අසම්භවෝති? මග්ගස්ස ඒකචිත්තක්ඛණිකත්තා. යදි හි මග්ගචිත්තං පුනප්පුනං උප්පජ්ජෙය්‍ය, තදුප්පත්තියා කිරියභාවෝ සක්කා වත්තුං. තං පන කිලේසසමුච්ඡේදකවසේනේව උපලභිතබ්බතෝ ඒකවාරප්පවත්තේනේව ච තේන අසනිසම්පාතේන විය තරුආදීනං සමූලවිද්ධංසනස්ස තං තං කිලේසානං අච්චන්තං අප්පවත්තියා සාධිතත්තා පුන උප්පජ්ජමානේපි කාතබ්බාභාවතෝ දිට්ඨධම්මසුඛවිහාරත්ථඤ්ච ඵලසමාපත්තියා ඒව නිබ්බානාරම්මණවසේන පවත්තනතෝ න කදාචි සෙක්ඛානං අසෙක්ඛානං වා උප්පජ්ජති. තස්මා නත්ථි සබ්බථාපි ලෝකුත්තරකිරියචිත්තන්ති.

**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 34 යටතේ; විභාවනී ටීකා සන්නය 82 පිට; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ පුරාණ සන්නය 39 පිට; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 28 පිට; අභිධර්ම ප්‍රකාශය 87-88 පිටු]**

**කිරියානුත්තරස්ස** ලෝකෝත්තර ක්‍රියා චිත්තයන්ගේ (පන ශබ්දය විශේෂාර්ථ ද්‍යෝත්‍යක නිපාතයි) **අසම්භවතෝ** අවිද්‍යමාන හෙයින් **ද්වාදසවිධතා** දොළොස් වැදෑරුම් බව **න වුත්තා** නොකියනලදි **කස්මා** කුමක් හෙයින් **තස්ස** ඒ ලොව්තුරා ක්‍රියා චිත්තයාගේ **අසම්භවෝ හෝති** අවිද්‍යමාන බව වන්නේද යත් **ඉති (අයං පුච්ඡා)** මේ ප්‍රශ්නයයි **මග්ගස්ස** මාර්ග චිත්තයාගේ **ඒකචිත්තක්ඛණිකත්තා** එක් සිතක්හුගේ ක්‍ෂණයට බඳු ක්‍ෂණයක් ඇති හෙයින් **අසම්භවෝ හෝති** අවිද්‍යමාන බව වෙයි **ඉති (අයං පරිහාරෝ)** මේ පරිහාරයයි.

(ආයුෂ්මත් ටීකාචාරීනි මාර්ග චිත්තය ඒකක්‍ෂණික බැවින් ලොව්තුරා ක්‍රියා සිත් නැතැයි කීහ. මාර්ග චිත්තය එකක්‍ෂණික වුවත් මාර්ග චිත්තයාගේ කුසලභාව ඇති හෙයින් ක්‍රියා සිත් ඇතිවියයුතු නොවේද? යන චෝද්‍ය සඳහා "යදි හි" යනාදී පාඨය කියනලදි) (හි යනු තද්ව සච්චං යන අර්ථයි) **මග්ගචිත්තං** මාර්ග සිත් තෙමේ **පුනප්පුනං** නැවත නැවත **යදි උප්පජ්ජෙය්‍යුං** ඉදින් උපදනාහු නම් **ඒවං සති** මෙසේ මාර්ග චිත්තය නැවත නැවත ඉපදීමක් ඇති කල්හි **තදුප්පත්තියා** ඒ මාර්ග

චිත්තයාගේ නැවත නැවත ඉපදීමෙන් **ක්‍රියාභාවෝ** ක්‍රියා ස්වභාවය **වත්තුං සක්කා** කිව හැකිවේ (ආයුෂ්මත් ටීකාචාරීනි මාර්ග චිත්තය එක වරක්ම උපදනා හෙයින් ක්‍රියාභූත වූ ලොව්තුරා සිතක් නැතැයි කීයේය. කවර පාඨයකින් ඒ අර්ථය සිද්ධකටයුතු දැයි යන චෝද්‍යය සඳහා "තම්පන" යනාදී පාඨය කියනලදි)

**තම්පන** ඒ මාර්ග චිත්තය වනාහි (න උප්පජ්ජති යන්නෙහි සම්බන්ධයි) **කිලේසසමුච්ඡේදකවසේනේව** කෙලෙසුන් නිරවශේෂ ප්‍රහාණය කිරීම් වශයෙන්ම **උපලභිතබ්බතෝ ච** ලැබියයුතු හෙයින් ද **ඒකවාරපවත්තේනේව** එක් වරක් හටගන්නාවූම **තේන මග්ගචිත්තේන** ඒ මාර්ග චිත්තය විසින් (සාධිතත්තා යන්නෙහි සාදිත කර්තෘව සම්බන්ධ කරනු) **අසනිසම්පාතේන** පතනය වන්නාවූ හෙනය විසින් ("සාධිතභාවෝ විය" යන්නෙහි සාධිත ශබ්දයෙහි කර්තෘව සම්බන්ධ කරනු) **තරුආදීනං** වෘක්ෂාදීන්ගේ **සමූලවිද්ධංසනස්ස** මුල හා සමඟ විනාශ කිරීම **සාධිතභාවෝ විය** සිද්ධ කරවන බවක් මෙන් **තං තං කිලේසානං** ඒ ඒ කෙලෙසුන්ගේ **අච්චන්තං** අතිශයින් **අප්පවත්තියා** නොම හටගැණීම **සාධිතත්තා ච** සිද්ධ කරවනලද හෙයින් ද **පුන** නැවත **උප්පජ්ජමානේපි** මාර්ග සිත උපදිනු ලබන්නේ ද **කාතබ්බාභාවතෝ ච** කටයුතු කෘත්‍යයක් නැති හෙයින් ද **දිට්ඨධම්මසුඛවිහාරත්ථං** වර්තමානාත්මභාවයෙහි සුඛ විහරණයයි කියනලද ඵලසමාපත්තිය පිණිස **ඵලසමාපත්තායා ඒව** ඵලසමවත්හුගේම **නිබ්බාණාරම්මණවසේන** නිවන් අරමුණු කිරීම් වශයෙන් **පුනප්පුනං** නැවත නැවත **පවත්තනතෝ ච** හටගන්නා හෙයින් ද **කදචි** කිසි කලෙක්හි **සෙක්ඛානං වා** ශෛක්ෂයන්ට හෝ **අසේඛානං වා** අශෛක්ෂයන්ට හෝ **පුනප්පුනං** නැවත නැවත **න උප්පජ්ජති** (මාර්ග සිත) නො උපදී (පුනප්පුනං යනු අධිකාර පිණිසයි) **තස්මා** එසේ හෙයින් **සබ්බථාපි** සියළු ආකාරයෙනුදු **ලෝකුත්තරක්‍රියාචිත්තං** ලොව්තුරා ක්‍රියාසිත් තෙමේ **නත්ථි** නැත්තේය.

(වෙන වෙනම ඒ ඒ ප්‍රකරණානුසන්ධි සමඟ අභිප්‍රාය වනාහි කෙසේද යත්; ටීකාචාර්‍ය්‍යීන් විසින් මාර්ග චිත්තය නැවත නැවත හටගන්නේ නම් ලොව්තුරා ක්‍රියා චිත්තය ඇතිවිය යුතුය. කුමක් හෙයින් මාර්ග සිත් තෙමේ නැවත නැවත නොඋපදනේ ද යන චෝද්‍යය සඳහා "තම්පන පුන උප්පජ්ජමානේපි කත්තබ්බාභාවතෝ න කදචි අසේඛානං වා සේඛානං වා පුනප්පුනං උප්පජ්ජති" යන පාඨය කියනලදි. කුමක් හෙයින් කටයුතු කෘත්‍යයක් නැත්තේ ද යන චෝද්‍යය වළක්වනු පිණිස "කිලේසසමුච්ඡේදකවසේනේව උපලභිතබ්බතෝ" යන පාඨය කියනලදි. කෙලෙසුන්ගේ නිරවශේෂ ප්‍රහාණ වශයෙන් ලැබියයුතු හෙයින් මාර්ග චිත්ත තෙමේ නැවත නැවත නූපදනේයයි කීයේය. මාර්ග සිත් තෙමේ නැවත නැවත ඉපිද ක්ලේශයන්ගේ නිරවශේෂ ප්‍රහාණය වියයුතු නොවේ ද? එසේ වන බැවින් මාර්ග සිත් තෙමේ නැවත නැවත ඉපදිය යුතුවුවද කුමක් හෙයින් නූපදනේදැයි යන චෝද්‍යය වළක්වනු පිණිස "ඒකවාරප්පවත්තේනේව තේන තං තං කිලේසානමච්චන්තමප්පවත්තියා සාධිතත්තා" යන පාඨය කියනලදි. කුමක් මෙන් ක්ලේශ සමුච්ඡේදය වන්නේදැයි යන චෝද්‍යය සඳහා "අසනිපාතේන විය තරුආදිනං සමූලවිද්ධංසනස්ස" යන පාඨය කියනලදි. මෙසේ කියනලද හෙයින් මාර්ග සිත් තෙමේ එක් වරක් හටගැණීම ඇති කල්හි මාර්ග සිත මෙන් නොඉපද කුමක් හෙයින් ඵල චිත්තය නැවත නැවත උපදනේදැයි යන චෝද්‍යය වළක්වනු පිණිස "දිට්ඨධම්මසුඛවිහාරත්ථඤ්ච ඵලසමාපත්තියා ඒව නිබ්බාණාරම්මණවසේන පවත්තනතෝ" යන පාඨය කියනලදි. මෙසේ ප්‍රකරණානුසන්ධි ගළපා අභිප්‍රායාර්ථය දතයුතුයි) **[විභාවනී ටීකා සන්නය 129-131 පිටු]**

කස්මා පනෙත්ථ ක්‍රියචිත්තං නාම න ගහිතන්ති, ක්‍රියානුත්තරස්ස අභාවාති, කස්මා පනස්ස අභාවෝති. මග්ගචිත්තස්ස ඒකචිත්තක්ඛණිකත්තාති. යදි හි තං ලෝකියකුසලං විය නානාක්ඛණේසු පවත්තෙය්‍ය. තද නිරනුසයසන්තානේපි පවත්තිත්වා ක්‍රියා නුත්තරංනාම සියාති. කස්මාපන තං ඒකචිත්තක්ඛණිකමේව හෝතීති. මග්ගස්ස මහානුභාවත්තාති. කථඤ්ච මහානුභාවෝති. වුච්චතේ. අරියමග්ගෝහි නාම සකිං පවත්තමානෝයේව අත්තනා පහාතබ්බේ කිලේසේ පුන අනුප්පාදධම්මතං ආපාදෙත්වා පජහති. අයමස්ස ඒකෝ ආනුභාවෝ. විපාකඤ්ච කුසලක්‍රියජවනංවිය ජවනකිච්ච යුත්තං යද කදචි සමාපජ්ජනක්ඛමඤ්ච කත්වා අත්තනෝ අනන්තරතෝ පට්ඨාය ජනේති. අයමස්ස දුතියෝ ආනුභාවෝ. තස්මා තස්ස කිලේසප්පහානත්ථායපි පුන උප්පාදේතබ්බකිච්චංනාම නත්ථි. තථා සමාපත්ති අත්ථායපිති. සචේපි හි කෝචි අහං ඵලං සමාපජ්ජිතුං න ඉච්ඡාමි. පුබ්බේ ලද්ධං මග්ගමේව සමාපජ්ජිස්සාමීති පරිකම්මං කරෙය්‍ය. තද පුබ්බේ සකිං උප්පජ්ජිත්වා නිරුද්ධමග්ගචේතනානුභාවේන ඵලචිත්තමේව පවත්තෙය්‍ය. න මග්ගචිත්තං. කස්මා, අප්පටිබාහි යානුභාවත්තා මග්ගස්ස. අයඤ්හි මග්ගානුභාවෝනාම කේනචි ඡන්දේන වා වසේනවා අජ්ඣාසයේනවා පරිකම්මේනවා පටිබාහිතුං අසක්කුණෙයෙය්‍යායේව හෝතීති. **[පරමත්ථදීපනී (ඡට්ඨසඞ්ගායනා අංක 63 යටතේ)]**

**එත්ථ පන** ලෝකෝත්තරයෙහි වනාහි **ක්‍රියාචිත්තං නාම** ක්‍රියාචිත්තය නම් **කස්මා** කුමක්හෙයින් **න ගහිතන්ති?** නොගන්නා ලද්දේ ද? **අනුත්තරස්ස** ලෝකෝත්තරයෙහි **ක්‍රියා (චිත්තං)** ක්‍රියා චිත්තය **අභාවාති** නොලැබෙන හෙයිනි **අස්ස පන** ලෝකෝත්තරයෙහි වනාහි **කස්මා** කුමක්හෙයින් ක්‍රියා සිත් **අභාවෝති?** නොලැබේද යත්? **මග්ගචිත්තස්ස** මාර්ග චිත්තයාගේ **ඒකචිත්තක්ඛණිකාති** ඒකචිත්තක්‍ෂණික බැවිනි **හි** විස්තර කෙරෙමි **යදි** ඉදින් **තං (ක්‍රියාචිත්තං)** ඒ ක්‍රියා චිත්තය **ලෝකිය කුසලං විය** ලෞකික කුසලසිත මෙන් **නානාක්ඛණේසු** නානක්‍ෂණයන්හි **පවත්තෙය්‍ය** පවත්නේ නම් **තද** එකල්හි **නිරානුසයසන්තානේපි** රහතුන්ගේ සන්තානයෙහිද **පවත්තිත්වා** පැවැත **ක්‍රියානුත්තරං නාම** ලෝකෝත්තර ක්‍රියා නම් **සියාති** වන්නේය **තං (ක්‍රියාචිත්තං) පන** ඒ ක්‍රියාචිත්තය වනාහි **කස්මා** කුමක්හෙයින් **ඒකචිත්තක්ඛණිකමේව** ඒකචිත්තක්‍ෂණිකම **හෝතීති?** වෙයිද? **මග්ගස්ස** මාර්ග චිත්තයාගේ **මහානුභාවත්තාති** මහා ආනුභාව බැවිනි **කථඤ්ච** කෙසේ **මහානුභාවෝති?** මහානුභාව වෙයිද? **වුච්චතේ** කියනුලැබේ **සකිං** එක්වරක් **පවත්තමානෝයේව** පවතින්නාවූම **අරියමග්ගෝ හි නාම** ආර්‍ය්‍යමාර්ග චිත්තය වනාහි **අත්තනා** තමා විසින් **පහාතබ්බේ කිලේසේ** ප්‍රහාණයකලයුතු ක්ලේශධර්මයන් **පුන** නැවත **අනුප්පාදධම්මතං** නූපදවන ධර්මතාවයට **ආපාදෙත්වා** පමුණුවා **පජහති** දුරුකරයි **අස්ස** මාර්ගචිත්තයාගේ **අයං** මේ **ඒකෝ ආනුභාවෝති** එක් ආනුභාවයකි **කුසලක්‍රියාජවනං විය** කුසලක්‍රියා ජවනයමෙන් **ජවනකිච්චයුත්තං** ජවනකෘත්‍යයෙන් යුත්ත **විපාකඤ්ච** විපාකයද **යද** යම්කලෙක **කදචි සමාපජ්ජනක්ඛමඤ්ච කත්වා** කිසිසමාපත්තියකට සමවැදීමට යෝග්‍ය වූවක් ද කොට **අත්තනෝ** තමාට **අනන්තරතෝ පට්ඨාය** අනතුරුව එතැන් සිට **ජනේති** විපාකය උපදවයි **අස්ස** මාර්ග චිත්තයාගේ **අයං** මේ **දුතියෝ** දෙවන **ආනුභාවෝ** ආනුභාවයයි **තස්මා** එබැවින් **තස්ස** ඒ මාර්ග චිත්තයට **කිලේසප්පහානත්ථායපි** කෙලෙස් ප්‍රහාණය කිරීම පිණිස ද **පුන** නැවත **උප්පාදේතබ්බකිච්චං නාම** ඉපදවියයුතු කෘත්‍යයක් නම් **නත්ථි** නැත **තථා** එසේම **සමාපත්ති අත්ථායපිති** සමාපත්තියට සමවැදීම පිණිසද (**පුන උප්පාදේතබ්බකිච්චං නාම නත්ථි** නැවත ඉපදවියයුතු කෘත්‍යයක් නම් නැත) **සචේපි හි කෝචි** ඉදින් කිසිවෙකු වනාහි **අහං** මම **ඵලං** ඵලසමාපත්තියට **සමාපජ්ජිතුං**

සමවදින්නට **න ඉච්ඡාමි** නොකැමතිවෙමි **පුබ්බේ ලද්ධං** පෙර ලැබුවාවූ **මග්ගමේව** මාර්ගයටම **සමාපජ්ජිස්සාමීති** සමවදින්නෙමි යයි **පරිකම්මං** පරිකර්ම **කරෙය්‍ය** කරන්නේ නම් **තදා** එකල්හි **පුබ්බේ** පෙර **සකිං උප්පජ්ජිත්වා** එකවරක් උපදවා **නිරුද්ධමග්ගචේතනානුභාවේන** නිරුද්ධවූ මාර්ගචිත්තයේ ආනුභාවයෙන් **ඵලචිත්තමේව** ඵලචිත්තයම **පවත්තෙය්‍ය** පවතින්නේය **මග්ගචිත්තං** මාර්ගචිත්තය **න (පවත්තෙය්‍ය)** නොපවතින්නේය **කස්මා?** කුමක්හෙයින යත්? **මග්ගචිත්තස්ස** මාර්ගචිත්තයාගේ **අප්පටිබාහියානුභාවත්තා** වැලැක්විය නොහැකි ආනුභාව ඇති හෙයිනි **අයඤ්හි මග්ගානුභාවෝ නාම** මේ මග්ගානුභාවය නම් වනාහි **කේනචි** කිසියම් **ඡන්දේන වා** ඡන්දයෙන් හෝ **වසේන වා** විෂයකින් හෝ **අජ්ඣාසයේන වා** අදහසකින් හෝ **පරිකම්මේන වා** මෙනෙහිකිරීමකින් හෝ **පටිබාහිතුං** ප්‍රතිබාහනය කරන්නට **අසක්කුණෙය්‍යොයේව** නොහැකිවන්නේම **හෝතීති** වෙයි.

**[පරමත්ථදීපනී ටීකා පරිවර්තනයි]**

ලෝකුත්තරක්‍රියචිත්තං - පන කස්මා න විජ්ජති
ඒකචිත්තක්ඛණත්තා හි - මග්ගස්සාති න විජ්ජති

**[අභිධම්මාවතාරෝ (ඡට්ඨසඞ්ගායනා අංක 61 යටතේ)]**

**ලෝකුත්තරක්‍රියචිත්තං, පන කස්මා න විජ්ජති**? මග්ගස්ස ඒකචිත්තක්ඛණිකත්තා න විජ්ජති. අයමෙත්ථ අධිප්පායෝ; චතුමග්ගට්ඨෝ ඛීණාසවෝ නාම න හෝති, මග්ගානන්තරමේව ඵලං උප්පජ්ජති, මග්ගෝපි ඒකචිත්තක්ඛණිකෝ යදි චිත්තං බහුචිත්තක්ඛණිකං, ඵලසමඞ්ගිනෝ ඛීණාසවස්සපි මග්ගචිත්තං භවෙය්‍ය, ඒවං සති ලෝකුත්තරකිරියචිත්තං භවෙය්‍යාති අධිප්පායෝ.

**[අභිධම්මාවතාර පුරාණ ටීකා (ඡට්ඨසඞ්ගායනා අංක 61 යටතේ)]**

**ලෝකුත්තරක්‍රියාචිත්තම්පන** ලෝකෝත්තර ක්‍රියා සිතක් වනාහි **කස්මා** කුමක් හෙයින් **න විජ්ජති** විද්‍යමාන නොවේද? **හි** ඒ එසේමැයි; **මග්ගස්ස** මාර්ග චිත්තය තමා **ඒකචිත්තක්ඛණත්තා** එක් චිත්තක්ෂණයෙහිම පවත්නා හෙයින් **න විජ්ජති** ක්‍රියා සිත් ඇති නොවෙයි. **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 160 පිට]**

**ඒකචිත්තක්ඛණත්තා**ති ඒකචිත්තක්ඛණෝයේව පවත්තනතෝ. යදි හි සෝ පුනප්පුනං උප්පජ්ජෙය්‍ය, තදස්ස අරහතෝ උප්පත්තියා කිරියභාවෝ ඉච්ඡිතබ්බෝ සියා. සකිංයේව පන පවත්තති චතුසච්චපටිවේධකිච්චස්ස ඒකවාරේනේව පරිනිට්ඨානතෝ, තක්කිච්චේන ච විනා තස්ස අනුපලබ්භනීයත්තා. තේනාහ; "න පාරං දිගුණං යන්තී"ති (සු. නි. 719), තස්මා නත්ථි ලෝකුත්තරං කිරියචිත්තන්ති අයමෙත්ථ අධිප්පායෝ.

**[අභිධම්මාවතාර අභිනව ටීකා (ඡට්ඨසඞ්ගායනා 61 යටතේ); අභිධම්මාවතාර ටීකා සන්නය 188 පිට]**

"ඒකචිත්තක්ඛණත්තා" යන මෙහි එක් චිත්තක්ෂණයෙහිම හටගන්නා හෙයින් යන අර්ථයි. ඉදින් ඒ මාර්ග චිත්තය නැවත නැවත උපදනේ වී නම් එකල්හි ඔහුගේ උත්පත්තිය රහත්නට වන හෙයින් ක්‍රියාභාවය කැමතිවිය යුතු වන්නේය චතුස්සත්‍යය ප්‍රතිවේධ කෘත්‍යය එක වරින්ම නිමවන හෙයින් ද ඒ කෘත්‍යයෙන් වෙන්ව ඒ මාර්ගය නොලැබිය යුතු හෙයින් ද මාර්ග සිත් තෙමේ එකවරක්ම හටගනී. එහෙයින් වදළහ:— "න පාරං දිගුණං යන්ති" යි. **[අභිධම්මාවතාර මහෝදධි ටීකා සන්නය 162 පිට]**

කුමක් හෙයින් ලෝකෝත්තර චිත්තයෙහි ක්‍රියා චිත්තය නැත්තේද යත්? මාර්ග චිත්තයාගේ එක් වරක් හටගැනීම ඇති හෙයින් නැවත නැවත හටගැනීමෙන් තොරව ක්‍රියා සිත් නැත්තේයි. ඒ මාර්ග සිත් තෙමේ කෙලෙසුන් නිරවශේෂ වශයෙන් නසන හෙයින් ද, එක් වරක්ම හටගන්නා වූ මාර්ග සිත් තෙමේ යහපත්ව වසින්නා වූ මේඝචක්‍රය කුඩා වෘක්ෂාදීන්ගේ මූලය හා සමඟ විනාශ කරන්නාක් මෙන් ඒකාන්ත වශයෙන් නොහටගැනීම සිද්ධවන බැවින් ද නැවත හටගන්නේ නමුදු ක්ලේශයන් ප්‍රහාණය කිරීම් සඞ්ඛ්‍යාත වූ කෘත්‍යය නැති හෙයින් ද ලෝකෝත්තර ක්‍රියා චිත්තයන් නැත්තේයි. ප්‍රත්‍යුප්පන්න ආත්මභාවයෙහි සුවසේ හිදිනු පිණිස ඵලසමාපත්ති වශයෙන් නිර්වාණය අරමුණු කිරීම් වශයෙන් හටගන්නා හෙයින් ද සප්ත ශෛක්ෂ පුද්ගලයන්ට ද රහතුන්ට ද නැවත මාර්ග චිත්තයාගේ හටගැනීමක් නැත්තේයි. එසේ හෙයින් සියළු ලෝකෝත්තර ධර්මයන්ගේ ක්‍රියා සිත් නැත්තේයි.

**[අභිධම්මාර්ථ සඞ්ග්‍රහ ප්‍රකාශනී 39 පිට]**

ලෝකෝත්තර කුසල් සිත් එක්වරක විනා දෙවරක් කිසිවිටෙක නූපදනා බැවින් ලෝකෝත්තර ක්‍රියා නම් සිත් වර්ගයක් නැත්තේය.

**[අභිධර්ම විභාගය 65 පිට; අභිධර්ම චන්ද්‍රිකාව 49 පිට]**

ලෝකෝත්තර ක්‍රියා සිත් නැත්තේ එක් එක් මාර්ග සිතක් එක් පුද්ගලයෙකු තුළ එක් වරකට වඩා ඇති නොවන බැවිනි. මාර්ග චිත්තය පළමුවන වර ඇති වීමේදීම එක වරකට ඒ ඒ මාර්ග චිත්තයේ ශක්ති ප්‍රමාණයෙන් ක්ලේශ ප්‍රහාණයක් සිදුවේ. මාර්ග චිත්තයන් නැවත නැවත ඇති නොවන්නේ ප්‍රහීණ ක්ලේශයෙහි නැවත ප්‍රහාණයක් කරන්නට දෙයක් නැති බැවිනී. **[අභිධර්ම මාර්ගය 64 පිට]**

මෙහි ක්‍රියා සිත් නැත මාර්ග චිත්තය ඒකක්ෂණික බැවිනි. ලෝකෝත්තර සිත් එක් වරක් විනා දෙවරක් නූපදී. ඉදින් මඟසිත් නැවත නැවත උපදින්නේ නම් ඒ මඟසිත් නැවත ඉපදීමෙන් ක්‍රියා ස්වභාවය කියනු හැකිය. නැවත ඉපදීමෙක් නැත. එහෙයින් ලෝකෝත්තර ක්‍රියා චිත්තයන්ගේ සම්භවයෙක් නොවේ.

**[සද්ධර්මසාගරය 02/452 පිට]**

## ලෝකෝත්තර සිත්වල විස්තාර ක්‍රමය:—

ඉත්ථමේකූනනවුති - පභේදං පන මානසං
ඒකවීසසතං වාථ - විභජන්ති විචක්ඛණා. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 20 පිට]**

**ඉත්ථං** මෙසේ (යථෝක්ත කුසලාදි ජාතිභේදයෙන් භින්න වූ චාතුර්භූමක චිත්තයන්ගේ භේද වශයෙන්) **මානසං පන** චිත්තය වනාහි **ඒකූනනවුතිප්පභේදං** ඒකූන ප්‍රභේද කොට හෝ **අථ** නොහොත් **ඒකවීසසතං වා** වක්ෂ්‍යමාණ ක්‍රමයෙන් එක්සිය එක්විස්සක් කොට හෝ **විචක්ඛණා** විශේෂයෙන් අර්ථ දක්නා ස්වභාවය ඇති ප්‍රාඥයෝ **විභජන්ති** විභාග කොට දක්වත්. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 29 පිට]**

කථමේකූනනවුතිවිධං චිත්තං ඒකවීසසතං හෝති? විතක්කවිචාර පීතිසුඛේකග්ගතාසහිතං පඨමජ්ඣානසෝතාපත්තිමග්ගචිත්තං, විචාරපීති සුඛේකග්ගතාසහිතං දුතියජ්ඣානසෝතාපත්තිමග්ගචිත්තං, පීතිසුඛේකග්ගතා සහිතං තතියජ්ඣානසෝතාපත්තිමග්ගචිත්තං, සුඛේකග්ගතාසහිතං චතුත්ථජ්ඣාන

සෝතාපත්තිමග්ගචිත්තං, උපෙක්ඛේකග්ගතාසහිතං පඤ්චමජ්ඣාන සෝතාපත්තිමග්ගචිත්තඤ්චේති ඉමානි පඤ්චපි සෝතාපත්තිමග්ගචිත්තානි නාම.

තථා සකදාගාමිමග්ගඅනාගාමිමග්ගඅරහත්තමග්ගචිත්තඤ්චේති සමවීසති මග්ගචිත්තානි. තථා ඵලචිත්තානි චේති **සමචත්තාලීස ලෝකුත්තරචිත්තානි** භවන්තීති. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 20 පිට]**

**ඒකූනනවුතිවිධං චිත්තං** ඒකූනනූ ප්‍රභේදය ඇති චිත්තයම **කථං ඒකවීසසතං හෝති?** කෙසේ එක්සිය එක්විස්සක් වේද? **විතක්ක** විතර්කය **විචාර** විචාරය **පීති** ප්‍රීතිය **සුඛ** සුඛය **ඒකග්ගතා** ඒකාග්‍රතාය යන මෙවුන් හා **සහිතං** යුක්ත වූ **පඨමජ්ඣාන සෝතාපත්තිමග්ගචිත්තං** (විතර්කාදි පඤ්චඞ්ගික ධ්‍යානයෙන් සම්ප්‍රයුක්ත වූ) ශ්‍රෝත ආපත්ති මාර්ග චිත්තයය. ද්විතීය ධ්‍යානාදී ශ්‍රෝත ආපත්ති මාර්ගාදියට ද මෙසේම සුදුසු සුදුසු පරිද්දෙන් අර්ථ කියයුතු ෴

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 30 පිට]**

ඣානඞ්ගයෝගභේදේන - කත්වේකේකන්තු පඤ්චධා
වුච්චතානුත්තරං චිත්තං - චත්තාළීස විධන්ති ච. **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 20 පිට]**

**ඒකේකන්තු** එක එකක් ලෝකෝත්තර චිත්තය වනාහි **ඣානඞ්ගයෝගභේදේන** විතර්කාදී ධ්‍යානඞ්ගයන් හා සම්ප්‍රයෝග භේද හෙයින් **පඤ්චධා කත්වා** පඤ්චප්‍රකාර කොට **අනුත්තරං චිත්තං** ලෝකෝත්තර චිත්තය **චත්තාලිසවිධන්තිච** සතලිස් වැදෑරුම් වන්නේයැයි කියා ද **වුච්චති** කියනු ලැබේ ෴

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 31 පිට]**

යථා ච රූපාවචරං - ගය්හතානුත්තරං තථා
පඨමාදිඣානභේදේ - ආරුප්පඤ්චාපි පඤ්චමේ.

**[අභිධර්මාර්ථ සඞ්ග්‍රහය 22 පිටු]**

**රූපාවචරං** රූපාවචර චිත්තය **පඨමාදිඣානභේදේ** ප්‍රථමාදී වූ පඤ්චවිධ ධ්‍යානභේදයෙහි **යථා ගය්හති** ("පඨමජ්ඣානචිත්තං" යනාදීන්) යම්සේ කියනු ලැබේ ද **අනුත්තරං** ලෝකෝත්තර චිත්තය ද **පඨමාදිඣානභේදේ** ප්‍රථමාදි ධ්‍යාන භේදයෙහි **තථා ගය්හති** එසේම (ප්‍රථම ධ්‍යාන ශ්‍රෝත ආපත්ති මාර්ග චිත්තය යනාදීන්) කියනු ලැබේ. **ආරුප්පඤ්චාපි** අරූපාවචර චිත්තය ද **පඤ්චමේ** (උපේක්ෂා වේදනා චිත්තේකාග්‍රතා යෝග හෙයින් අඞ්ග සමත්වය හේතු කොටගෙන) පඤ්චම ධ්‍යානයෙහි (කියනු ලැබේ) හෙවත් පඤ්චම ධ්‍යාන ව්‍යවහාරය වේ. නොහොත් **රූපාවචරං** රූපාවචර චිත්තය ද **අනුත්තරඤ්ච** ලෝකෝත්තර චිත්තය ද **පඨමාදිඣානභේදේ** ප්‍රථමාදි ධ්‍යාන භේදයෙහිලා **යථා ගය්හති** (පඨමජ්ඣාන කුසලචිත්තං; පඨමජ්ඣාන සෝතාපත්තිමග්ගචිත්තං යනාදීන්) යම්සේ කියනු ලැබේ ද **ආරුප්පඤ්චාපි** අරූපාවචර චිත්තය ද **පඤ්චමේ** පඤ්චම ධ්‍යානයෙහිලා **තථා ගය්හති** එපරිද්දෙන්ම කියනු ලැබේ ෴ **[අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය 31 පිට]**

චිත්තමේකූනනවුතිවිධං - තත්ථ විභාවයේ
ඒකනවුතිවිධං චාපි - ඒකවීසසතම්පි වා

**[පරමත්ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 03 යටතේ)]**

**තත්‍ථ** ඒ උද්දේශයෙහි (**වුත්තං** කියන ලද්දවූ) **චිත්තං** සිත **ඒකූනනවුතිවිධං** එකුන් අනූවක් භේද ඇත්තේ යැයි **විභාවයේ** ප්‍රකාශ කරන්නේය **වා** නොහොත් **ඒකූනනවුතිවිධං** එක්අනූවක් භේද ඇත්තේ යැයි **විභාවයේ** ප්‍රකාශ කරන්නේය **වා** නොහොත් **ඒකවීසසතං** එකසිය එක්විස්සක් භේද ඇත්තේ යයි **විභාවයේ** ප්‍රකාශ කරන්නේය **අපි** ඊට වඩා අධික භේද ඇති චිත්තය ද **විභාවයේ** ප්‍රකාශ කරන්නේය නොහොත් **චිත්තං** සිත **ඒකූනනවුතිවිධං වා** එකුන්අනූවක් භේද ඇත්තේ යයි ද **ඒකනවුතිවිධං වා** එක්අනූවක් භේද ඇත්තේ යයි ද **ඒකවීසසතං වා** එකසිය එක්විස්සක් භේද ඇත්තේ යයි ද **අපි වා** ඊට ද වඩා අධික චිත්තභේද ඇත්තේ යයිද **විභාවයේ** ප්‍රකාශ කරන්නේය.෴

මේ ගාථාවෙහි "ඒකනවුතිවිධං" යන තන්හි රූපාවචරකුසල-ක්‍රියා පඤ්චමද්ධ්‍යානය අභිඥ කෘත්‍යය කරන සිත් දෙකය, අභිඥ කෘත්‍යය නොකරන සිත් දෙකයයි වෙන් කොට අභිඥ කෘත්‍යය කරන සිත් දෙක ඒකූනනු (89) චිත්තයෙහි බහා එක්අනූවක් වේ යයි දතයුතු. එයින් අන්‍යවූ ලෝකෝත්තර සිත සාමාන්‍ය ධ්‍යානාඞ්ග වශයෙන් මාර්ගයෙහි පසක, ඵලයෙහි පසක යන දසය ගෙන එක්අසූවක් ලෞකික සිත්හි බහා ද එක්අනූවක් භේද ඇත්තේ යයි දතයුතු. මේ පශ්චිම නය තෙම:—

"චතුමග්ගඵලානන්තු - වසේනට්ඨපි ඣානතෝ
දසෝභයම්පි මිස්සෙත්වා - තාළීසානුත්තරා සියුං" යී

මතු දක්වන මේ ප්‍රකරණයෙහි වචනය හා සමාන වේ. එහි අපි ශබ්දවෙන් වනාහි ලෝකෝත්තර සිත් අට ද, අභිඥසිත් දෙක ද එක්අසූවක් ලෞකික සිත්හි බහාලූ කල එක්අනූවක් වේ. මාර්ග ධ්‍යාන පසද ඵල ධ්‍යාන පසද අභිඥ දෙසිත ද එම එක්අසූවක් සිත්හි බහාලූ කල තේයානූවෙක් වේ. තේයානූවක් සිත්හි කුසලාභිඥ පස ද ක්‍රියාභිඥ පස ද යන දසය "චතුධා පඤ්චධා" යන ද්විප්‍රකාරය වෙන් නොකොට ද්විප්‍රකාර වූ මාර්ග කුසල් විස්ස ද යන සමතිස් චිත්තය බහාලූ කල එකසියතෙවිස්සෙක් වෙයි. එක්අසූවක් ලෞකික සිත්හි දසවිධ අභිඥ කුසල චිත්තය ද මාර්ගසිත් සතර ද ඵලසිත් සතර ද යන අටළොස බහාලූ කල නවනූවෙක් වේ. එම එක්අසූවක් සිත්හි දසවිධ අභිඥ චිත්තය ද ලෝකෝත්තර ධ්‍යානසිත් දසය ද බහාලූ කල එකසිය එකෙක් වේ. එම එකසිය එකක් චිත්තයෙහි අභිඥ සිත් දසය ද මිශ්‍රක කුසල්සිත් විස්ස ද බහාලූ කල එකසිය එක්තිසෙක් වේ යයි දතයුතු.෴

**[පරමත්‍ථවිභාවනී ව්‍යාඛ්‍යාව 04-05 පිටු]**

ඉත්‍ථමේකූනනවුති - විධං චිත්තං භවේ තථා
ඒකනවුතිවිධං වාපි - ඒකවීසසතම්පි වා.

**[පරමත්‍ථවිනිච්ඡයෝ (ඡට්ඨසඞ්ගායනා අංක 35 යටතේ)]**

**ඉත්‍ථං** මේ උක්ත ප්‍රකාරයෙන් **චිත්තං** සිත තෙම **ඒකූනනවුතිවිධං** එකුන්අනූවක් භේද ඇත්තේ **භවේ** වන්නේය **තථා** එසේම **ඒකනවුතිවිධං වාපි** එක්අනූවක් භේද ඇත්තේ ද **භවේ** වන්නේය **ඒකවීසසතම්පි වා** එක්සිය එක්විස්සක් භේද ඇත්තේ ද **භවේ** වන්නේය.෴ **[පරමත්‍ථවිභාවනි ව්‍යාඛ්‍යාව 21 පිට]**

ඣානඞ්ගවසේන පඨමජ්ඣානසදිසත්තා පඨමජ්ඣානඤ්ච තං සෝතාපත්තිමග්ගචිත්තඤ්චේති **පඨමජ්ඣානසෝතාපත්තිමග්ගචිත්තං**. පාදකජ්ඣාන-සම්මසිතජ්ඣාන-පුග්ගලජ්ඣාසයේසුපි, හි අඤ්ඤතරවසේන තං තං

ඣානසදිසත්තා විතක්කාදිඅඞ්ගපාතුභාවේන චත්තාරෝපි මග්ගා පඨමජ්ඣානාදිවෝහාරං ලභන්තා පච්චේකං පඤ්චධා විභජන්ති. තේනාහ "ඣානඞ්ගයෝගභේදේනා"ත්‍යාදි, තත්ථ පඨමජ්ඣානාදීසු යං යං ඣානං සමාපජ්ජිත්වා තතෝ තතෝ වුට්ඨාය සඞ්ඛාරේ සම්මසන්තස්ස වුට්ඨානගාමිනිවිපස්සනා පවත්තා, තං **පාදකජ්ඣානං** වුට්ඨානගාමිනිවිපස්සනාය පදට්ඨානභාවතෝ. යං යං ඣානං සම්මසන්තස්ස සා පවත්තා, තං **සම්මසිතජ්ඣානං**. "අහෝ වත මේ පඨමජ්ඣානසදිසෝ මග්ගෝ පඤ්චඞ්ගිකෝ, දුතියජ්ඣානාදීසු වා අඤ්ඤතරසදිසෝ චතුරඞ්ගාදිභේදෝ මග්ගෝ භවෙය්‍යා"ති ඒවං යෝගාවචරස්ස උප්පන්නජ්ඣාසයෝ **පුග්ගලජ්ඣාසයෝ** නාම.

තත්ථ යේන පඨමජ්ඣානාදීසු අඤ්ඤතරං ඣානං සමාපජ්ජිත්වා තතෝ වුට්ඨාය පකිණ්ණකසඞ්ඛාරේ සම්මසිත්වා මග්ගෝ උප්පාදිතෝ හෝති, තස්ස සෝ මග්ගෝ පඨමජ්ඣානාදීසු තං තං පාදකජ්ඣානසදිසෝ හෝති. සචේ පන විපස්සනාපාදකං කිඤ්චි ඣානං නත්ථි, කේවලං පඨමජ්ඣානාදීසු අඤ්ඤතරං ඣානං සම්මසිත්වා මග්ගෝ උප්පාදිතෝ හෝති, තස්ස සෝ සම්මසිතජ්ඣානසදිසෝ හෝති. යදා පන යං කිඤ්චි ඣානං සමාපජ්ජිත්වා තතෝ වුට්ඨාය අඤ්ඤතරං සම්මසිත්වා මග්ගෝ උප්පාදිතෝ හෝති, තදා පුග්ගලජ්ඣාසයවසේන ද්වීසු අඤ්ඤතරසදිසෝ හෝති. සචේ පන පුග්ගලස්ස තථාවිධෝ අජ්ඣාසයෝ නත්ථි, හෙට්ඨිමහෙට්ඨිමජ්ඣානතෝ වුට්ඨාය උපරූපරිඣානධම්මේ සම්මසිත්වා උප්පාදිතමග්ගෝ පාදකජ්ඣානං අනපෙක්ඛිත්වා සම්මසිතජ්ඣානසදිසෝ හෝති. උපරූපරිඣානතෝ පන වුට්ඨාය හෙට්ඨිම හෙට්ඨිමජ්ඣානධම්මේ සම්මසිත්වා උප්පාදිතමග්ගෝ සම්මසිතජ්ඣානං අනපෙක්ඛිත්වා පාදකජ්ඣානසදිසෝ හෝති. හෙට්ඨිමහෙට්ඨිමජ්ඣානතෝ හි උපරූපරිඣානං බලවතරන්ති. වේදනානියමෝ පන සබ්බත්ථාපි වුට්ඨානගාමිනිවිපස්සනානියමේන හෝති. තථා සුක්ඛවිපස්සකස්ස සකලජ්ඣානඞ්ගනියමෝ. තස්ස හි පාදකජ්ඣානාදීනං අභාවේන තේසං වසේන නියමාභාවතෝ විපස්සනානියමේන පඤ්චඞ්ගිකෝව මග්ගෝ හෝතීති. අපිච සමාපත්තිලාභිනෝපි ඣානං පාදකං අකත්වා පකිණ්ණකසඞ්ඛාරේ සම්මසිත්වා උප්පාදිතමග්ගෝපි විපස්සනානියමේනේව පඤ්චඞ්ගිකෝව හෝතීති අයමෙත්ථ අට්ඨකථාදිතෝ උද්ධටෝ විනිච්ඡයසාරෝ. ථේරවාදදස්සනාදිවසප්පවත්තෝ පන පපඤ්චෝ අට්ඨකථාදීසු වුත්තනයේන වේදිතබ්බෝ. යථා චෙත්ථ, ඒවං සබ්බත්ථාපි විත්ථාරනයෝ තත්ථ තත්ථ වුත්තනයේන ගහේතබ්බෝ. ගන්ථභීරුකජනානුග්ගහත්ථං පනෙත්ථ සඞ්ඛේපකථා අධිප්පේතා.
**[අභිධම්මත්ථසඞ්ගහෝ (ඡට්ඨසඞ්ගායනා අංක 38 යටතේ); විභාවනී ටීකා සන්නය 84-88 පිටු; අභිධර්ම චන්ද්‍රිකාව 54-55 පිටු; අභිධර්ම ප්‍රකාශය 88-89 පිටු; අභිධර්මාර්ථ සඞ්ග්‍රහ පුරාණ සන්නය 42-44 පිටු]**

**ඣානඞ්ගවසේන** ධ්‍යානඞ්ගයන්ගේ වශයෙන් **පඨමජ්ඣානසදිසත්තා** ප්‍රථම ධ්‍යානය හා සදෘශ බැවින් **පඨමජ්ඣානඤ්ච හෝති** ප්‍රථමද්ධ්‍යානත් වේද **තං** ඒ ප්‍රථමද්ධ්‍යානය වනාහි **සෝතාපත්තිමග්ගචිත්තඤ්ච හෝති** සෝතාපත්ති මාර්ගචිත්තයත් වේද **ඉති (තස්මා) තං චිත්තං** ඒ සිත් තෙමේ **පඨමජ්ඣාන සෝතාපත්තිමග්ගචිත්තං** පඨමජ්ඣානසෝතාපත්තිමග්ගචිත්ත නම් වේ.

("පඨමජ්ඣානසදිසත්තා" යන පාඨයෙන් "පඨමජ්ඣානං" යන පදයාගේ "පඨමජ්ඣානං වියාති පඨමජ්ඣානං" යන උපමා තද්ධිතාර්ථය දක්වනලදි. "ඣානවසේන පඨමජ්ඣානසදිසත්තා" යන පාඨයාගේ අභිප්‍රාය වනාහි සෝතාපත්ති මාර්ග තෙමේ රූපාවචර ධ්‍යානය මෙන් ප්‍රථමද්ධ්‍යානාදීන්ගේ වශයෙන් පිළිවෙළින්

ලබන පිණිස උත්සාහ කටයුතු හෙයිනිදු ප්‍රථමද්ධ්‍යාන නම් නොවෙයි. පිළිවෙළින් සමවැද්දයුතු හෙයිනිදු ප්‍රථමද්ධ්‍යාන නම් නොවෙයි. රූපාවචර ප්‍රථමද්ධ්‍යානයෙහි මෙන් ධ්‍යානාඞ්ග පඤ්චකයෙන් යුක්ත හෙයින්ම ප්‍රථමද්ධ්‍යාන නම් වෙයි කී නියායි. ප්‍රථමද්ධ්‍යානය හා සමානත්වයෙන්ම කුමක් හෙයින් ප්‍රථමද්ධ්‍යාන ව්‍යවහාරය වන්නේ දැයි යන චෝද්‍යය සඳහා "පාදක -පෙ- විභජන්ති" යන පාඨය කියනලදි)

(හි යනු තදේව සච්චං යනාර්ථයි) **පාදකජ්ඣාන-සම්මසිතජ්ඣාන-පුග්ගලජ්ඣාසයේසු** පාදකද්ධ්‍යානය සම්මසිතද්ධ්‍යානය පුද්ගලධ්‍යසයද්ධ්‍යානය යන මොහුන් අතුරෙන් **අඤ්ඤතරවසේන** එක්තරා ධ්‍යානයක්හුගේ වශයෙන් **තං තං ඣානසදිසත්තා** ඒ ඒ ධ්‍යානය හා සදෘශ බැවින් (ලභන්තා යන්නෙහි සම්බන්ධයි) **විතක්කාදීඅඞ්ගපාතුභාවේන** විතර්කාදී වූ අඞ්ගයන්ගේ ප්‍රකටව හටගැණීම් වශයෙන් (විභජන්ති යන්නෙහි කරණය සම්බන්ධයි) නොහොත් විතර්කාදී අඞ්ගයන්ගේ ප්‍රකටව හටගැණීම වන හෙයින් (විභජන්ති යන්නෙහි හේත්වාර්ථය සම්බන්ධයි) **චත්තාරෝ** සතර වැදෑරුම් වූ **මග්ගාපි** මාර්ගයෝ ද **පඨමජ්ඣානාදීවෝහාරං** ප්‍රථමද්ධ්‍යානාදී ව්‍යවහාරය **ලභන්තා** ලබන්නාහු **පච්චේකං** වෙන වෙනම **පඤ්චධා** පස් පරිද්දෙකින් **විභජන්ති** බෙදන ලද්දාහු වෙත් **තේන** ඒ කාරණයෙන් **ඣානඞ්ගයෝගභේදේනාති ආදී** ඣානඞ්ගයෝගභේදේන යනාදිය **ආහ** කීහු (මෙසේ ප්‍රථමද්ධ්‍යානාදිය හා සදෘශ හෙයින් ප්‍රථමද්ධ්‍යානාදී නාමයෙන් ව්‍යවහාර කරනලද බව සැකවින් දක්වා ප්‍රථමද්ධ්‍යානාදී ප්‍රභේදය විස්තර වශයෙන් දක්වනු කැමතිව "තත්‍ථ" යනාදී පාඨය කියනලදි)

**තත්‍ථ** ඒ පාදකද්ධ්‍යාන සම්මසිතද්ධ්‍යාන පුද්ගලධ්‍යාසය ධ්‍යානයන් අතුරෙන් (පාදකජ්ඣානං නාම යන්නෙහි නිද්ධාරණය සම්බන්ධයි) **පඨමජ්ඣානාදීසු** ප්‍රථමද්ධ්‍යානාදීන් අතුරෙන් **යං යං ඣානං** යම් යම් ධ්‍යානයක් **සමාපජ්ජිත්වා** සමවැද **තතෝ තතෝ** ඒ ඒ සමවන් ධ්‍යානයෙන් **වුට්ඨාය** නැගීසිට **සඞ්ඛාරේ** සංස්කාර ධර්මයන් **සම්මසන්තස්ස** අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනය කරන්නාවූ පුද්ගලයාගේ (විපස්සනා යන්නෙහි සම්බන්ධයි. සම්මර්ශනය කරන්නාවූ පුද්ගලයා හට කියා හෝ සම්ප්‍රදනාර්ථ යෝජනා කොට "පවත්තා" යන්නෙහි ද සම්බන්ධ කටයුතුයි) **වුට්ඨානගාමිනීවිපස්සනා** වුට්ඨානගාමිනී විදර්ශනා තොමෝ **පවත්තා** හටගන්නා ලද්දීද **තං** ඒ සමවත් ධ්‍යාන තෙමේ **පාදකජ්ඣානං නාම** පාදකද්ධ්‍යාන නම් වේ **කස්මා** කුමක් හෙයින් **තං** ඒ සමවන් දැහැන **පාදකජ්ඣානං නාම හෝති?** පාදකද්ධ්‍යාන නම් වන්නේ ද යත්? **වුට්ඨානගාමිනීවිපස්සනාය** වුට්ඨානගාමිනී විපස්සනාවගේ (පදට්ඨාන යන්නෙහි සම්බන්ධයි) **සමාපන්නඣානස්ස** සමවත් ධ්‍යානයාගේ (මේ වනාහි භාව සම්බන්ධයයි) **පදට්ඨානභාවතෝ** ආසන්න කාරණා වූ හෙයින් **තං** ඒ සමවන් ධ්‍යාන තෙමේ **පාදකජ්ඣානං නාම හෝති** පාදකද්ධ්‍යාන නම් වෙයි (මෙසේ පාඨශේෂ බහා අර්ථ යෝජනා කටයුතුයි)

(වුට්ඨානගාමිනී විදර්ශනාව වනාහි මාර්ගචිත්තයට පූර්වභාගයෙහි හටගන්නාවූ පරිකර්ම උපචාර අනුලෝම චිත්තයෝයි. කුමක් හෙයින් ඒ විදර්ශනා තොමෝ වුට්ඨානගාමිනී විදර්ශනා නම් වන්නේ ද යත්? "රූප-වේදනා-සඤ්ඤා සඞ්ඛාර-විඤ්ඤාණනිමිත්තතෝ වුට්ඨාතීති වුට්ඨානං" යනු විග්‍රහයි. මාර්ග චිත්තය අභිධෙය්‍යාර්ථයි. "ගච්ඡති පච්චයභාවේනාති ගාමිනී" අභිධෙය්‍යාර්ථය විදර්ශනාවයි. "වුට්ඨානං ගාමිනී වුට්ඨානගාමිනී" යී ද්විතීයා තත්පුරුෂසමාස කටයුතු. අභිධෙය්‍යාර්ථය වුට්ඨානගාමිනී විදර්ශනාවයි. "වුට්ඨානගාමිනී ඒව විපස්සනා

වුට්ඨානගාමිනීවිපස්සනා" යි අවධාරණ කම්මධාරය සමාසය වෙයි. මෙසේ වචනාර්ථය වන හෙයින් වුට්ඨානගාමිනී විදර්ශනා නම් වේ)

**යං ඣානං** යම් ධ්‍යානයක් **සම්මසන්තස්ස** අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනය කරන්නාවූ පුද්ගලයා හට **සා** ඒ වුට්ඨානගාමිනී විදර්ශනා තොමෝ **පවත්තා** හටගන්නී වේද **තං** ඒ සම්මර්ශනය කළාවූ ධ්‍යාන තෙමේ **සම්මසිතජ්ඣානං නාම** සම්මසිතජ්ඣාන නම් වේ **මේ** මට **පඨමජ්ඣානසදිසෝ** ප්‍රථමද්ධ්‍යානය හා සදෘශ වූ **පඤ්චඞ්ගිකෝ** පඤ්ච ප්‍රකාර අඞ්ගයකින් සම්පූර්ණ වූ **මග්ගෝ වා** මාර්ගය හෝ **දුතියජ්ඣානාදීසු** ද්විතීය ධ්‍යානාදීන් අතුරෙන් **අඤ්ඤතරසදිසෝ** එක්තරා ධ්‍යානයක් හා සදෘශ වූ **චතුරඞ්ගාදිභේදෝ** සිව්රඟකින් සම්පූර්ණ වූ මාර්ගාදී ප්‍රභේද ඇත්තාවූ **මග්ගෝ වා** මාර්ගයක් හෝ **භවෙය්‍ය** වූයේ නම් **අහෝ වත** ඉතා මැනව **ඉති (ඒවං)** මෙසේ **යෝගාවචරස්ස** යෝගාවචර පුද්ගලයා හට **උප්පන්නජ්ඣාසයෝ** හටගත්තාවූ කැමැත්ත **පුග්ගලජ්ඣාසයෝ නාම** පුද්ගලයාගේ අදහස නම් වේ.

(ආචාර්‍ය්‍යයන් වහන්ස පාදක ධ්‍යාන නම් වන හේතුව දක්වන ලද්දේය. ප්‍රථම ධ්‍යානාදීන් හා සදෘශභාවය කෙසේ වන්නේදැයි යන චෝද්‍යය සඳහා "තත්‍ථ යේන" යනාදී පාඨය කියනලදි) තත්‍ථ ඒ පාදකද්ධ්‍යානාදීන් හා සදෘශභාවයෙහි විනිච්ඡයෝ විනිශ්චය ඒවං මේ වක්‍ෂ්‍යමාන ක්‍රමයෙන් වේදිතබ්බෝ දතයුතුයි (මෙසේ පාඨශේෂ බහා අර්ථ යෝජනා කටයුතුයි)

**යේන** යම්කිසි යෝගාවචර පුද්ගලයෙකු විසින් **පඨමජ්ඣානාදීසු** ප්‍රථමද්ධ්‍යානාදීන් අතුරෙන් **අඤ්ඤතරං ඣානං** එක්තරා ධ්‍යානයක් **සමාපජ්ජිත්‍වා** සමවැද **තතෝ** ඒ සමවන් ප්‍රථමද්ධ්‍යානාදියෙන් **වුට්ඨාය** නැඟීසිට **පකිණ්ණකසඞ්ඛාරේ** මිශ්‍රවූ සංස්කාර ධර්මයන් **සම්මසිත්‍වා** සම්මර්ශනය කොට **මග්ගෝ** මාර්ගය **උප්පාදිතෝ හෝති** උපදවන ලද්දේ වේද **තස්ස** ඒ යෝගාවචරයාගේ **සෝ මග්ගෝ** ඒ මාර්ග තෙමේ **පඨමජ්ඣානාදී තං තං පාදකජ්ඣානසදිසෝ** ප්‍රථමද්ධ්‍යානාදී වූ ඒ ඒ පාදකද්ධ්‍යානය හා සදෘශ වූයේ **හෝති** වෙයි **විපස්සනාපාදකං** විදර්ශනාවට කාරණ වූ **යං කිඤ්චි ඣානං** යම්කිසි ධ්‍යානයක් **නත්‍ථි** නැත්තේ වේද **කේවලං** හුදෙක් **යේන** යම් යෝගාවචර පුද්ගලයෙකු විසින් **පඨමජ්ඣානාදීසු** ප්‍රථමද්ධානාදීන් අතුරෙන් **අඤ්ඤතරං** එක්තරා ධ්‍යානයක් **සම්මසිත්‍වා** සම්මර්ශනය කොට **මග්ගෝ** මාර්ගය **උප්පාදිතෝ** උපදවන ලදුයේ **සචේ පන හෝති** ඉදින් වේද **තස්ස (යෝගාවචරස්ස)** ඒ යෝගාවචරයාගේ **සෝ මග්ගෝ** ඒ මාර්ග තෙමේ **සම්මසිතජ්ඣානසදිසෝ හෝති** සම්මර්ශනය කළ ධ්‍යානය හා සදෘශ වේ **යදා පන** යම් කලෙක්හි වනාහි **යං කිඤ්චි ඣානං** යම්කිසි දැහැනක් **සමාපජ්ජිත්‍වා** සමවැද **තතෝ වුට්ඨාය** ඒ දැහැනින් නැඟීසිට **අඤ්ඤං** අනික් දැහැනක් **සම්මසිත්‍වා** සම්මර්ශනය කොට **මග්ගෝ උප්පාදිතෝ හෝති** මාර්ගය උපදවන ලද්දේ වේද **තදා** එකල්හි **පුග්ගලජ්ඣාසයවසේන** පුද්ගලයාගේ කැමැත්ත පරිද්දෙන් **ද්වීසු** දෙවැදෑරුම් වූ පාදක ධ්‍යාන සම්මසිත ධ්‍යානයන් අතුරෙන් **අඤ්ඤතරසදිසෝ හෝති** එක්තරා ධ්‍යානයක් හා සදෘශ වූයේ වේ (අයුෂ්මත් ටීකාචාරීනි පුද්ගලයාගේ කැමැත්ත ඇති කල්හි කෙබඳු මාර්ගයක් හටගන්නේ දැයි යන චෝද්‍යය සඳහා "සචේ පන -පෙ- පාදකජ්ඣානසදිසෝ" යන පාඨය කියනලදි)

**පුග්ගලස්ස** පුද්ගලයාගේ **තථා විධෝ** එබඳු ස්වභාවයක් ඇත්තාවූ **අජ්ඣාසයෝ** අධ්‍යාශයක් තෙමේ **සචේ පන නත්‍ථි** ඉදින් නැත්තේ වේද

**හෙට්ඨිමහෙට්ඨිමඣානතෝ** යට යට උපන්නාවූ ධ්‍යානයෙන් **වුට්ඨාය** නැගීසිට **උපරූපරිඣානධම්මේ** මතු මත්තෙහි ධ්‍යාන ධර්මයන් **සම්මසිත්වා** සම්මර්ශනය කොට **උප්පාදිතමග්ගෝ** උපදවනලද මාර්ග තෙමේ **පාදකජ්ඣානං** පාදකද්ධ්‍යානය **අනපෙක්ඛිත්වා** අපේක්‍ෂා නොකොට **සම්මසිතජ්ඣානසදිසෝව හෝති** සම්මර්ශනය කළ ධ්‍යානය හා සදෘශ වූයේම වේ **උපරූපරිඣානතෝ පන** මතු මත්තේ ධ්‍යානයෙන් වනාහි **වුට්ඨාය** නැගීසිට **හෙට්ඨිමහෙට්ඨිමඣානධම්මේ** යට යට ධ්‍යාන ධර්මයන් **සම්මසිත්වා** සම්මර්ශනය කොට **උප්පාදිතමග්ගෝ** උපදවනලද මාර්ග තෙමේ **සම්මසිතජ්ඣානං** සම්මර්ශනය කළ ධ්‍යානය **අනපෙක්ඛිත්වා** අපේක්‍ෂා නොකොට **පාදකජ්ඣානසදිසෝව හෝති** පාදකද්ධ්‍යානය හා සදෘශ වූයේම වේ (කුමක් හෙයින් මත්තෙහි හටගත්තාවූ ධ්‍යානය හා සදෘශ වූ මාර්ගය හටගන්නේ දැයි යන චෝද්‍යය සඳහා "හෙට්ඨිමහෙට්ඨිමඣානතෝ හි -පෙ- බලවතරන්ති" යන පාඨය කියනලදි) **කස්මා?** කුමක් හෙයින් ද යත්? **හෙට්ඨිමහෙට්ඨිමඣානතෝ** යට යට ධ්‍යානයට වඩා **උපරූපරිඣානං** මතු මත්තෙහි ධ්‍යාන තෙමේ **බලවතරං** විශේෂයෙන් බලවත් වූයේ **යස්මා හෝති** යම්හෙයකින් වේද **ඉති (තස්මා)** එසේ හෙයින් **උපරූපරිඣානසදිසෝව හෝති** මතු මත්තෙහි ධ්‍යානය හා සදෘශ වූයේම වේ (මෙසේ අර්ථ යෝජනා කටයුතුයි)

(ආයුෂ්මත් ටීකාචාරීනි ආර්‍යයී මාර්ගයාගේ ධ්‍යානඞ්ග ව්‍යවස්ථාව පාදකද්ධ්‍යානාදීන්ගේ නියමයෙන් වන සේක්වා. වේදනා නියමය වනාහි කෙසේ වන්නේදැයි යන චෝද්‍යය සඳහා "වේදනානියමෝ පන -පෙ- හෝති" යන පාඨය කියනලදි)

**වේදනානියමෝ පන** වේදනා නියමය වනාහි **සබ්බත්ථාපි** සියළු පාදක ධ්‍යානාදීන්ගේ ව්‍යවස්ථයෙහිදු (නොහොත් සියළු පාදක ධ්‍යානාදීන් හේතු කොට හටගන්නා වූ මාර්ගයෙහි ද) **වුට්ඨානගාමිනීවිපස්සනානියමේන** වුට්ඨානගාමිනී විදර්ශනාවගේ නියමය කරණකොටගෙන **හෝති** වෙයි (මෙහි අභිප්‍රාය වනාහි වුට්ඨානගාමිනී විදර්ශනා සඞ්ඛ්‍යාත උපචාර අනුලෝම ගෝත්‍රභූ චිත්තයෝ තුමූ සොම්නස් වේදනා සහගතවූවාහු නම් මාර්ගය ද සොම්නස් සහගත වේ. උපේක්‍ෂා සහගතවූවාහු නම් උපේක්‍ෂා සහගත වෙයි කී නියායි)

(සමාපත්තිලාභී පුද්ගලයා හට වේදනා නියම ආචාර්‍යයී තෙම කීයේය. ශුෂ්ක විදර්ශක පුද්ගලයාගේ ආර්‍යයී මාර්ගයාගේ ධ්‍යානාඞ්ග නියමය කෙසේ වන්නේදැයි යන චෝද්‍යය සඳහා "තථා සුක්ඛ -පෙ- ඣානඞ්ගනියමෝ" යන පාඨය කියනලදි)

**සුක්ඛවිපස්සකස්ස** ශුෂ්ක විදර්ශක පුද්ගලයා හට **සකලඣානාඞ්ගනියමෝ** සුයළු ධ්‍යානාඞ්ග නියම තෙමේ **තථා හෝති** එපරිද්දෙන් වේ (පඤ්චඞ්ගික මාර්ගයම වන්නේ යයි කී නියායි) (එපරිද්දෙන් සියළු ධ්‍යානාඞ්ග නියමය ප්‍රකාශ කොට දක්වන පිණිස "තස්ස හි -පෙ- මග්ගෝ හෝති" යන පාඨය කියනලදි) **තස්ස** ඒ ශුෂ්ක විදර්ශක පුද්ගලයා හට (හි යනු විස්තාර ද්‍යෝතක නිපාතයි) **පාදකජ්ඣානාදීනං** පාදකද්ධ්‍යානාදීන්ගේ **අභාවේන** අවිද්‍යමානත්වයෙන් **තේසං වසේන** ඒ පාදක ධනාදීන්ගේ වශයෙන් **නියමාභාවතෝ** නියමයක් නැති හෙයින් **විපස්සනානියමේන** විදර්ශනා නියමය කරණකොටගෙන **පඤ්චඞ්ගිකෝව** පඤ්චඞ්ගයක් ඇත්තාවූම **මග්ගෝ හෝති** මාර්ගය වෙයි **අපි ච (අපරෝ නයෝ)** අනික් ක්‍රමයක් **මයා** මා විසින් **වුච්චතේ** කියනු ලැබේ **සමාපත්තිලාභිතෝපි** සමාධිය ලැබූ පුද්ගලයාගේ ද (මග්ගෝ යන්නෙහි සම්බන්ධයි. ධ්‍යානලාභී පුද්ගලයා සමාධිලාභී යයි කියනලද) **ඣානං** ධ්‍යානය **පාදකං අකත්වා** කාරණාකොට නොගෙන **පකිණ්ණකසඞ්ඛාරේ** මිශ්‍රවූ

සංස්කාර ධර්මයන් **සම්මසිත්වා** අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනය කොට **උප්පාදිතමග්ගෝපි** උපදවනලද මාර්ගය ද **විපස්සනා නියමේනේව** විදර්ශනා නියමයෙන්ම **පඤ්චඞ්ගිකෝ හෝති** පඤ්චාඞ්ගයක් ඇත්තේ වේ **එත්ථ** මේ ධ්‍යානාඞ්ග නියම, වේදනා නියමයන්හි (ඉති අයං විනිච්ඡයෝ යන්නෙහි සම්බන්ධයි. නොහොත්) **එත්ථ** මේ ප්‍රකරණයෙහි (උද්ධටෝ යන්නෙහි සම්බන්ධයි) **ඉති අයං විනිච්ඡයෝ** මෙසේ කියනලද මේ විනිශ්චය තෙමේ **අට්ඨකථාදිතෝ** අටුවාකථා ආදියෙන් **උද්ධටෝ** උගුළුවා ගන්නා ලද්දවූ **විනිච්ඡයසාරෝ** උතුම් වූ විනිශ්චයයි (ඒකාන්ත වූ විනිශ්චයයි කියා හෝ වේ. "සාරෝ බලේ ථිරං සේසු උත්තමේසෝ තිලිඞ්ගිකෝ" යනු අභිධාන බැවින් සාර ශබ්ද තෙමේ යුද්ධ සේනාවෙහි ද ස්ථිර අර්ථයෙහි ද උත්තමාර්ථයෙහි ද වැටේ. මෙහි වනාහි ස්ථිර අර්ථය, උතුම් අර්ථය යන අර්ථ ද්වයම යෙදේ. "විනිච්ඡයසාරෝ" යනු "අග්‍යාහිතෝ" යනාදියෙහි මෙන් විශේෂණ පරපද කම්මධාරය සමාසයි. කුමක් හෙයින් විනිශ්චය සාර මාත්‍රයක් උද්ධරණය කරන්නේ ද; ඒ අර්ථකථා ටීකාවන්හි කියන ලද්දවූ විස්තර විනිශ්චය මේ ප්‍රකරණයෙහි කියන ලද්දේ නොවේද යන චෝද්‍යය සඳහා "ථේරවාද -පෙ- වේදිතබ්බෝ" යන පාඨය කියනලදි)

**ථේරවාදදස්සනාදිවසප්පවත්තෝ** ස්ථවිරවාදදිය දැක්වීමාදී වශයෙන් පැවැත්තා වූ **පපඤ්චෝ පන** විස්තරය වනාහි **අට්ඨකථාදීසු** අටුවාකථාදියෙහි **වුත්තනයේන** කියනලද ක්‍රමයෙන් **වේදිතබ්බෝ** දතයුතුයි **එත්ථ යථා** මේ ධ්‍යානාඞ්ග නියම වේදනා නියමයෙහි යම්සේද **ඒවං (තථා)** එපරිද්දෙන් **සබ්බත්ථාපි** බෝධ්‍යාඞ්ග නියම මාර්ගාඞ්ග නියමාදී සියළු තන්හිද **විත්ථාරවිනිච්ඡයෝ** විස්තර වූ විනිශ්චය **තත්ථ තත්ථ** ඒ ඒ ප්‍රකරණයෙහි **වුත්තනයේන** කියනලද ක්‍රමයෙන් **ගහේතබ්බෝ** ගතයුත්තේය (විස්තර වූ විනිශ්චය කියනලද කල්හි ශ්‍රෝතෘ ජනයාගේ අවබෝධ ඥානය වැඩි වර්ධනය වන්නේ නොවේද? එසේ වන්නේහිදු ටීකාචාර්‍ය්‍යයන් විසින් විස්තර විනිශ්චය අත හැර සංක්ෂේප විනිශ්චයම කුමක් හෙයින් කරන ලද්දේ ද යන චෝද්‍යය සඳහා "ගන්ථභීරුකජනානුග්ගහත්ථං -පෙ- අධිප්පේතෝ" යන පාඨය කියනලදි)

**ගන්ථභීරුකජනානුග්ගහත්ථං පන** ග්‍රන්ථභීරුක ශ්‍රෝතෘ ජනයාහට අනුග්‍රහ පිණිස වනාහි **එත්ථ** මේ අභිධර්මාර්ථ විභාවනී නම් ටීකාවෙහි **සඞ්ඛේපකථා** සංක්ෂේප වූ අර්ථ වර්ණනාව **අධිප්පේති** කැමතිවනලදි. **[විභාවනී ටීකා සන්නය 134-140 පිටු]**

යම් යෝගාවචරයෙක් ධ්‍යාන උපදවා ඒ ධ්‍යානයෙහි අන්තර්ගත ධර්මයන් පාදක කොට ගෙන විදර්ශනා වඩා මාර්ග ඵල ලබන්නේ නම් ඒ පුද්ගලයා හට ඒ ඒ ධ්‍යාන සිත්හි යෙදෙන ධ්‍යානාඞ්ග ආදී සම්ප්‍රයුක්ත ධර්මයන් හා යෙදුන මාර්ග සිත් හා ඵල සිත් උපදනේය. ධ්‍යාන සිත් පහෙන්ම මාර්ග සතරත් ඵල සතරත් ලැබිය හැකි වේ. එවිට ප්‍රථම ධ්‍යානය ඇතිව ලබන මාර්ග සතරත් ඵල සතරත් යන ලෝකෝත්තර ධ්‍යාන සිත් අටක් ලැබෙන්නේය. මේ ක්‍රමයෙන් දෙවැනි තුන්වැනි සතරවැනි පස්වැනි ධ්‍යානයන් ඇතිව ලබන මාර්ග ඵල සිත් අට බැගින් ලැබෙන්නේය. මෙසේ ලෝකෝත්තර ධ්‍යාන සිත් සතළිසක් වන්නේය. **[අභිධර්මාර්ථ ප්‍රදීපිකාව 01/105 පිට]**

විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකග්ගතා සහිත ප්‍රථමධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය, විචාර ප්‍රීති සුඛ ඒකග්ගතා සහිත ද්‍විතියධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය, ප්‍රීති සුඛ ඒකග්ගතා සහිත තතියධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය, සුඛ ඒකග්ගතා සහිත චතුත්ථධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය, උපෙක්ඛා ඒකග්ගතා සහිත

පඤ්චමධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය යැයි සෝතාපත්ති මග්ග චිත්ත පසෙක් වේ. මෙසේම පඨමජ්ඣාන සකදාගාමී මග්ග චිත්ත ආදී වශයෙන් සකෘදාගාමී මාර්ග චිත්ත ද පසෙක් වේ. පඨමජ්ඣාන අනාගාමී මග්ග චිත්ත ආදී වශයෙන් අනාගාමී මාර්ග චිත්ත ද පසෙක් වේ. පඨමජ්ඣාන අරහත් මග්ග චිත්ත ආදී වශයෙන් අරහත් මාර්ග චිත්ත ද පසෙක් වේ. මෙසේ මාර්ග සිත් විස්සකි. ඵල සිත් මෙසේම විස්සකැයි ලෝකෝත්තර සිත් මුළුල්ල සතළිසෙක් වන්නේය.

**[අභිධර්ම චන්ද්‍රිකාව 54 පිට; අභිධර්ම විභාගය 65-66 පිටු]**

ධ්‍යාන රූපාවචර සිත්වල පමණක් නොව ලෝකෝත්තර සිත්වල ද ඇත්තේය. එබැවින් "ධ්‍යාන සිත්ය" යන නාමය ලෝකෝත්තර සිත්වලට යෙදෙන්නේය. ධ්‍යාන නොලබූවන්ට උපදනා ලෝකෝත්තර සිත් සෑම කල්හිම ප්‍රථම ධ්‍යානයෙන් යුක්තව උපදී. ධ්‍යාන ලැබූවන්ගේ ලෝකෝත්තර සිත් ප්‍රථමාදී ධ්‍යාන පසින් යුක්ත විය හැකිය. එබැවින් සංක්ෂේප ක්‍රමයේදී එකක් වශයන් දැක්වුනු සෝතාපත්ති මග්ග චිත්තය ධ්‍යාන භේදයෙන් ප්‍රථමධ්‍යාන සෝතාපත්ති මාර්ග සිතය, ද්විතීය ධ්‍යාන සෝතාපත්ති මාර්ග සිතය, තෘතීය ධ්‍යාන සෝතාපත්ති මාර්ග සිතය, චතුර්ථ ධ්‍යාන සෝතාපත්ති මාර්ග සිතය, පඤ්චම ධ්‍යාන සෝතාපත්ති මාර්ග සිතය කියා සිත් පසක් වේ. සකදාගාමී, අනාගාමී, අරහත් මාර්ග සිත් තුන ද එසේම පස බැගින් වේ. මෙසේ ධ්‍යාන භේදයෙන් එක් එක් ලෝකෝත්තර කුසල් සිතක් පස බැගින් වන නිසා ලෝකෝත්තර කුසල් සිත (20) විස්සක් වේ. ඵල සිත් සතර ද එසේම ධ්‍යාන වශයෙන් ප්‍රභේදයට පැමිණෙන බැවින් ලෝකෝත්තර විපාක සිත් ද (20) විස්සක් වේ. කුසල් සිත් විස්සක් හා විපාක සිත් විස්සක් වන බැවින් විස්තාර ක්‍රමයෙන් ලෝකෝත්තර සිත් (40) සතළිසක් වේ. **[අභිධර්ම මාර්ගය 65 පිට]**

ලෝකෝත්තර චිත්තය සමාපත්තිලාභීන්ට ධ්‍යාන සම්ප්‍රයුක්තව ලැබෙන බැවින් එක එක ලෝකෝත්තර චිත්තය ධ්‍යාන පඤ්චකය වශයෙන් ගිනූ කල්හි ලෝකෝත්තර සමසතළිසකි. හේ මෙසේය:- විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකග්ගතා සහිත ප්‍රථමධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය, විචාර ප්‍රීති සුඛ ඒකග්ගතා සහිත දුතියධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය, ප්‍රීති සුඛ ඒකග්ගතා සහිත තතියධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය, සුඛ ඒකග්ගතා සහිත චතුත්ථධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය, උපෙක්ඛා ඒකග්ගතා සහිත පඤ්චමධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය.

සෝතාපත්ති මග්ගචිත්තය ධ්‍යානාඞ්ග යෝගයෙන් මෙසේ පසකට බෙදෙන්නා සේ සකදාගාමී මග්ග චිත්තය ද, අනාගාමී මග්ග චිත්තය ද, අරහත්ත මග්ග චිත්තය ද ධ්‍යානාඞ්ග යෝගයෙන් පසකට පසකට බෙදෙත්. එවිට මාර්ග සිත් විස්සකි. ඵල සිත් ද මෙසේ ඒ ඒ ඵල නාමයෙන් පසක් පසක් බැගින් විස්සෙක් වේ. ලෝකෝත්තර සිත් මෙසේ සතළිසෙක් වේ. මෙය කීහ මෙසේ:-

ඣානාඞ්ගයෝගභේදේන - කත්වේකේකන්තු පඤ්චධා
වුච්චතානුත්තරං චිත්තං - චත්තාළීසවිධන්තිච

එකේකී ලෝකෝත්තර චිත්තය ධ්‍යානාඞ්ග හා සම්ප්‍රයෝග භේදයෙන් පස් වැදෑරුම් කොට ලෝකෝත්තර සිත් සතළිස් වැදෑරුම් වේ යනු එහි තේරුමයි.

**[සද්ධර්මසාගරය 02/453 පිට]**

ධ්‍යාන ලැබූ කෙනෙක් තමා ලැබූ ධ්‍යානයට සමවැද එයින් නැගී සංස්කාර ධර්ම සම්මර්ශනය (මෙනෙහි) කර සෝවාන් මාර්ගය ඉපදවී නම් ඒ සෝවාන් මාර්ගයට ලබාගත් ධ්‍යාන නාමය ද යොද ව්‍යවහාර වේ. මේ එක් ක්‍රමයකි. අනෙක් ක්‍රමය තමන් ලත් ධ්‍යානයට සමවැදීමක් නොකොට ඒ ධ්‍යානයෙහි ඇති අඞ්ග අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනයකර මාර්ගය උපදවයි. එවිට ද ඒ මාර්ග ධ්‍යාන නාමය යොද ව්‍යවහාර වෙයි. තුන්වැනි ක්‍රමය තමන් ලත් ධ්‍යානයට සමවැදී එයින් නැගී සිට ලැබගත් ධ්‍යානය පරිදි මාර්ග ලබම්යි සිතුවේ නම් හෝ නැතහොත් ඉදියට සම්මර්ශනය කරනු ලබන අඞ්ග ඇති ධ්‍යාන පරිදි මාර්ග ලබම්යි සිතුවේ නම් හෝ ඒ සිතූ පරිද්දෙන් ධ්‍යාන අනුව මාර්ග උපදී. එවිට ඒ මාර්ගය ද ධ්‍යාන නාමය අනුව ව්‍යවහාර වෙයි. මෙසේ ධ්‍යානයට අනුව මාර්ග සිත් ඉපදවීමේ ක්‍රම තුනක් ඇත. මේවාට පිළිවෙළින් කියනු ලබන නම්; පාදකජ්ඣානය, සම්මසිතජ්ඣානය, පුග්ගලජ්ඣාසජ්ඣානය යනුයි. ධ්‍යාන පසක් නිසා මාර්ග සිත් විස්සෙකි. එහි පිළිවෙළ විතක්කවිචාරපීතිසුඛඒකාග්‍රතා සහිත පඨමජ්ඣානසෝතාපත්තිමග්ගචිත්තය යනාදී වශයෙනි.

**[තෙසැත්තෑසඳණ කථා 383 පිට]**

## “විස්තර වර්ණනා සහිත අභිධර්මාර්ථ සඞ්ග්‍රහයෙහි”

## චිත්තසඞ්ග්‍රහ විභාගය නම් වූ ප්‍රථම පරිච්ඡේදය

## නිමියේය